ධර්මසේන හිමිගේ

# සද්ධර්ම රත්නාවලිය


රත්නපුර - මාරපණ

ශාස්ත්‍රෝදය පරිවේණාධිපති රාජකීය පණ්ඩිත

කිරිඇල්ලේ ඥාණවිමල ස්වාමිපාදයන් වහන්සේ

විසින් සකස් කරන ලදි.

# ප්‍රස්තාවනා

## සද්ධර්ම රත්නාවලිය

උගත් නූගත් බොහෝ දෙනා ප්‍රියකරණ - කියවන - වර්ණනා කරණ - විවේචන ය කරණ හැම සිංහල ගෙදරක ම පාහේ සම්පූර්ණ පොත නැතහොත් කාණ්ඩයක් වත් තිබෙන මේ පොත ගැණත් මෙහි කර්තෘ ගැණත් අඳුන්වන්ට යෑම සිංහලයන්ට බත් අඳුන්වා දීමට උත්සාහ ගැනීමක් වැන්නකි. එහෙත් මෙහිලා කෙරෙන අපගේ විවේචනය මුක්කරු ගරා ඉවත දමා ගිය නාම්බුවක ඉතිරි වන වෛරෝඩි - ආර්නුල් ආදී අගනා රත්න ජාති තෝරන ලාංකිකයකුගේ ක්‍රියාවට සම ය යි කියතො ත් එය බොරු නොවේ.

සද්ධර්ම රත්නාවලි නමැති ආකරයෙන් බැහැරට ගෙණ තම තමන් හඳුනන පමණින් හේතු - ඵල - න්‍යාය - උපමා - උපහාස ආදී අගනා රත්න වර්ග තෝරා පෙන්නුම් කර ඉවත ලූ කථා වස්තු නමැති නාම්බුවෙහි අර්ථරස - ධර්මරස ආදී නාඳුනන තව ත් බොහෝ රත්න ජාති ඇති හෙයිනි.

එ හෙයින් සද්ධර්ම රත්නාවලිය - එහි කර්තෘ හා තත්කාලීන අන්‍ය ග්‍රන්ථ කර්තෘන් ගැණත්, ඔවුන්ගේ රචනා ගැණත් ග්‍රන්ථ රචන ය පිළිබඳ එකී ග්‍රන්ථ කර්තෘන් රැගෙන තිබෙන විවිධ මාර්ග - ඒ අනුව ඔවුන්ගේ පැවැත්ම හා සද්ධර්ම රත්නාවලි ලෝලයන් ගැන ත් අප ඇසට පෙනෙන යමක් ලිවීම ය මෙහි අදහස.

## ග්‍රන්ථකාරක සමය

සිංහලයන්ට උවමනා හැම දෙයක් ම සම්පූර්ණ කළ මහ පැරකුම්බා රජුගෙන් පසු රට අවුල් විය. කලිඟු-පඩි කඹ ඇදිල්ලට හවුල් වීම නිසා සිංහලයෝ හොඳට ම හෙම් බත් වූහ. පෙර විදි සැපවත් ජීවිතයෙහි රස පවා ඔවුන්ට අමතක වි ය. මේ අතරට සිංහලයන්ගේ දුර්වල තැනක් සොයා පහරදීමට කවද ත් ලැස්ති ව සිටින ඉන්දියානුවන්ට එ කල ලක්දිව පැවති තත්ව ය දුන ගන්ට ලැබී සතලිස් දහසක් පමණ බල සෙනගක් සමඟ පැමිණ අපරට අත්පත් කර ගත් මාඝ - ජයබාහු යන මළල - දමිළ දෙ රජුන් නිසා සිංහලයන්ට වැඩි සැප - කුල - සිරිත් ධර්ම - ශාස්ත්‍ර තබා බඩ වියත පවා රැක ගැනීමට මහක් නැති වි ය. මෙ සේ සතලිස් වසක් පසුවී යන අතර අළු යටින් මතු වූ ගිනි පුපුරක් වැනි පිඩිසර පෙදෙසකින් මතු වූ වත්හිමි (3 විජය බාහු) කුමරු මායාරට දඹදෙණි නුවර රජ බවට පැමිණියේ සිය පිත් (කලිකාල සාහිච්ච සබ්බඤ්ඤු පණ්ඩිත) ii පැරකුම්බා කුමරු මහා සඞ්ඝයා වහන්සේගේ ආධාර ද ඇති ව ඇති - දැඩි කිරීම නිසා නැවත ත් සිංහලයන්ගේ නැති වූ සෞභාග්‍ය ය උදා වි ය.

ග්‍රන්ථකාරක සම ය නමින් හැඳින්වෙන්නේ වත් හිමි iii විජයබා ඇතුළු ii පැරකුම්බා iv විජයබා i බුවනෙකබා යන මේ සිවු රජුන් ගේ දෙ පණස් වසරක් පමණ වූ රාජ්‍යකාල ය යි.

ලක්වැසියාගේ යහපත පිණිස අවශ්‍ය හැම දෙයක් ම මේ රජුන් අතින් සැපයෙන අතර පඬිවරයෝ ද රටේ කාගේ ත් පොදු ප්‍රයෝජනයට පිරිමැසෙන පරිදි පොත් පත් නිපදවූහ. ඔවුහු විවිධ ප්‍රයෝජනයට පිරිමැසෙන පරිදි පොත් පත් නිපදවූහ. ඔවුහු විවිධ මාර්ග ගෙණ විවිධ විෂයයන් පිළිබඳ ස්වකීය ග්‍රන්ථ රචනා කළහ.

එයින් සමහරෙක් ආධුනිකානුග්‍රහ ය, උගතුන්ගේ ප්‍රයෝජන ය හා භාෂා පෝෂණ ය පිණිස ත් පොත් ලියන අතර තවත් සමහරෙක් උගතුන්ට ධර්මඥාන ය හා ශ්‍රද්ධාභක්ති ය ත් දෙලොව අභිවෘද්ධි ය ත් සැලසෙන සේ ලිහිල් සිය බසින් පොත් ලියූහ.

තරහ ලීලාවෙන් නැතහොත් සරදම් වශයෙන් ලියූයේ ය යි සිතිය හැකි ප්‍රයෝජන ව ත් පොත් දෙකක් ද මේ අතර ඇත. ඔවුන්ගේ යටි සිතෙහි පැවති හැඟීම් හා ප්‍රතිභාන ශක්ති ය ද අප අතරට පත්වූයේ මේ කරුණු නිසා ය.

### ග්‍රන්ථ කර්තෘවරු හා ග්‍රන්ථ සංඛ්‍යාව

පහත පළවනුයේ ශත වර්ෂ භාගයක් පමණ වූ පූර්වෝක්ත කාල ය තුළ විසූ එකී ග්‍රන්ථ කර්තෘන් විසින් සම්පාදිත ග්‍රන්ථ සමූහය හා ඒ පිළිබඳ විවේචනයකි.

### 1 විජය සුන්දරාරාමාධිපති සංඝරක්ඛිත (ග්‍රාමවාසී) මහා ස්ථවිර

1. වුත්තොදය – (*පාළි ඡන්දස්*)
2. සුබොධාලඞ්කාරය (*පාළි අලඞ්කාර*)
3. සුසද්ද සිද්ධිපජ්යොග (*පාළි*)
4. සුමඞ්ගලප්පසාදිනී (*පාළි ඛුද්දක සික්ඛා ටීකා*)
5. සම්බන්ධ චින්තා (*පාළි*)

### 2. මහානෙත්‍ර පාදමූල සුමඞ්ගල මහා ස්ථවිර

1. අභිධම්මත්ථ විභාවිනී (*පාළි අභිධම්මත්ථ සඞ්ගහ ටීකා*)
2. අභිධම්මත්ථ විකාසිනී (*පාළි–අභිධම්මාවතාර ටීකා*)

### 3. දිඹුලාගල ආරණ්‍යක මෙධංකර (වනවාසී) මහා ස්ථවිර[1]

1. විනයාර්ථ සමුච්චය (*සිංහල*) විනය සන්නය

---

1. මුන් වහන්සේ දෙ වැනි පැරකුම්බා රාජ්‍යොදයෙන් තිස් වැන්නෙහි කරණ ලද ශාසන ශොධනයෙන් පසු ව පළා බත්ගල විසූහ.

### 4. අත්තනගල්ලේ ප්‍රතිරාජ පරිවෙණාධිපති අනවමදර්ශි (උභය වාසයෙහි ම) සඞ්ඝරාජ ස්ථවිර

1. දෛවඥ කාමධේනු (සංස්කෘත)
2. පරෝපකාරය (සංස්කෘත)

### 5.

3. හත්ථවනගල්ල විහාරවංශ (පාළි–චම්පූ) මෙය සඞ්ඝරාජයන්ගේ නියම ය ලෙස කරණ ලද අන්‍යතර පඬිවරයෙකුගේ කෘතියෙකි.

### 6. පඤ්චමූල පරිවෙණාධිපති මහා ස්ථවිර

1. භෙසජ්ජමඤ්ජූසා (පාළි)[1]

### 7. පළාබත්ගල ප්‍රතිරාජ පිරුවන්හි වෛදේහ මහා ස්ථවිර

1. සද්දලක්ඛණය (සිංහල ව්‍යාකරණ)
2. සමන්තකූට වණ්ණනා (පාළි)
3. රසවාහිනී (පාළි)

### 8. දෙවැනි පැරකුම්බා රජතුමා

1. විසුද්ධිමාර්ග මහා සන්නය (සිංහල)
2. නිස්සන්දෙහ නම් වන විනිස සන්නය (සිංහල)
3. කව්සිළුමිණ (සිංහල මහා කාව්‍යයක්)

### 9. මයුරපාද පරිවෙණාධිපති බුද්ධපුත්‍රයන් වහන්සේ[2]

1. පූජාවලිය (සිංහල)
2. යොගාර්ණවය (සිංහල වෙදකම)
3. ප්‍රයොගරත්නාවලිය (සිංහල වෙදකම)

### 10. චොලිය බුද්ධප්පිය මහා ස්ථවිර[3]

1. මහා රූප සිද්ධි (පාළි)
2. පජ්ජමධු (පාළි)

### 11. ත්‍රිපිටකධාරී ධර්මසේන මහා ස්ථවිර

1. සද්ධර්මරත්නාවලිය (සිංහල)

### 12. ගොතම මහා ස්ථවිර[4]

1. සම්බන්ධ චින්තා ව්‍යාඛ්‍යාව (සිංහල)

---

1. මුන් වහන්සේ පළාබත්ගල – වාගිරිගල – මයූරපාද පිරිවෙණ යන තුන් තන්හි ම විසූහ. පූජාවලිය පළාබත්ගලදීත්, යොගාර්ණවය වාගිරිගලදීත්, ප්‍රයොගරත්නාවලිය මයූරපාද පිරිවෙන්හිදීත් ලියූහ.
2. මුන් වහන්සේ වෛදේහ හිමියන්ගේ පැවිදි සොහොයුරෙකි. ලඞ්කාවෙ දක්ෂිණාරාමයේ සහ සොළී රට බාලාදිත්‍ය චූඩාමණිකණ් විහාරයෙහිත් විසූහ.
3. මුන්වහන්සේ ද වෛදේහ හිමියන්ගේ පැවිදි සොහොයුරෙකි.
4. සිබවලඳ විනිසෙහි පාළි පරිවර්තනය වූ සික්ඛාපදවලඤ්ජනය ද මුන් වහන්සේගේ කෘතියක් ලෙස සලකති.

මේ දෙළොස් මහ පඬිවරුන්ගේ ග්‍රන්ථකාරකත්ව ය ගැණ සලකා බලන කල බුද්ධපුත්‍ර හිමියන් එක් පසෙකත්, ධර්මසේන හිමියන් වෙන පසෙකත්, රජතුමා ඇතුළු අනෙක් හැම දෙන ම තවත් පසෙකත් ඇතුළත් කළ හැක. බුද්ධපුත්‍ර–ධර්මසේන දෙ නම හැර ඉතිරි දස දෙනා අතුරෙන් පස් නමක-ගෙන් ව්‍යාකරණ—ඡන්දස්—කාව්‍ය– අලඞ්කාර සහිත පාළි සාහිත්‍යයේ දියුණුවත්, එක නමකගෙන් පාලි සාහිත්‍යයේ හා හෙළු වියරණයේ දියුණු වත්, තවත් එක නමකගෙන් සංස්කෘත සාහිත්‍යයේ පෝෂණයත් ඉතිරි තුන්දෙනාගේ කෘති වලින් පෙළබස හදරණ අයගේ පහසුවත් සැලසෙන බව පෙනේ. මේ අතර භික්ෂූන් වහන්සේගේ ප්‍රයෝජනය පිණිස පමණක් (ගර්භිණී–කුමාර චිකිත්සා හැර) පාළි භාෂාවෙන් ලියූ වෙද පොතක්[1] හා සංස්කෘත භාෂාවෙන් ලියූ නක්ෂත්‍ර[2] පොත් දෙකක් ද තිබෙන නමුත් ස්වභාෂාව පමණක් දන්නා අයට ඒවායින් වැඩි ප්‍රයෝජනයක් ගැනීම දුෂ්කර ය. පොතපත ම හදරා පොත පතෙහි ම එන දෑය ම ලියූ, පොත පත ගැන ම විශාරද බුද්ධිමතුන් වූ මේ දස පඬිවරයන්ගේ කෘති වලින් සාමාන්‍ය ජනයාට සෑහෙන ප්‍රයෝජනයක් අත් වෙතොත් කලාතුරකිනි.

ඉතිරි මයූරපාද–ධර්මසේන දෙ නම වරෙක එක මහක ත් තව වරෙක මයූරපාද හිමියන් පමණක් තනි ව වෙන මහකත් ගමන් කරමින් ලක්-වැසියන්ගේ අභිවෘද්ධිය සඳහා ක්‍රියා කළ බැව් පෙනේ. මේ දෙ නම ම ග්‍රන්ථ සම්පාදනය කර තිබෙන්නේ ව්‍යවහාර සිංහලයෙනි. පොදු ජන–යාට ප්‍රයෝජන වත් වන ලෙසිනි. ඒ ග්‍රන්ථ සැරසීමෙහිලා බොහෝ සෙයින් ම උපයෝගී කොට තිබෙන්නේ එකල ජන ප්‍රවාදයෙහි පැවති උපමා – උපහාසාදි ය ම ය. සීනියට වඩා හකුරෙහි රසය දන්නා පිටිසර–යෙකු මෙන් ගතානුගතික ග්‍රන්ථ සම්පාදනයට වහල් නොවී පොදු බෞද්ධ ජනතාව තුළ කියවීම් රුචිය හා ඒ මගින් ධර්මඥනයත් ඇතිවන සේ සද් ධර්ම රත්නාවලිය ලියන අතර පූජාවලියෙන් ඒ සියල්ලත් තුනුරුවන් කෙරෙහි ශ්‍රද්ධාභක්තියත්, තවත් ලංකා ශාසන ප්‍රවෘත්ති හා සිංහල ඉති හාස ආදියත් උගන්වයි. පඤ්චමූල පරිවෙණාධිපතීන් වහන්සේ විසින් භික්ෂූන් වහන්සේගේ ප්‍රයෝජනයට පමණක් සෑහෙන පරිදි ගර්භිණී —කුමාර චිකිත්සා අත හැර වෙද පොතක් පාළි භාෂාවෙන් ලියා විශෙෂ ශික්ෂා ගරුකත්වයක් පෙන්වන අතර තරහයකට නැතහොත් සරදමකට මෙන් පූජාවලී කතෘන් වහන්සේ ගර්භිනී–කුමාර චිකිත්සා ඇතුළු හැම චිකිත්සාවක්ම ඇතුළත් කොට හැම දෙනාගේ ම ප්‍රයෝජනය පිණිස කාටත් තේරුම් ගතහැකි ව්‍යවහාර සිංහල භාෂාවෙන් වෙද පොත් දෙකක් ලියති.

---

1. භෙසජ්ජමඤ්ජූසා—
   සබ්‍රහ්මචාරිනො භික්ඛූ – ජාතවෙය්‍යත්තියා 'මුයා
   කල්ලා හොන්තූති රොපෙසු - අඤ්ඤමඤ්ඤතිකිච්ඡකා.

2. දෛවඥ කාම ධෙනු - පරොපකාර

මෙ සේ බලන කල පූජාවලී— සද්ධර්ම රත්නාවලී කර්තෘවරු ගැමියන් අතර ඉපදී, ගැමි ජීවිතයෙහි රසවිඳ හොඳට පුරුදු නාගරික ජීවිතය ගැනත් පරීක්ෂාවෙන් ලබා ගත් මනා අවබෝධයක් ඇත්තෝ ය. බාහිරශාස්ත්‍ර-ඥානය අතින් මයූර පාද හිමියෝ ධර්මසේන හිමියන් ඉක්මවා යෙති. ධර්මසේන හිමියෝ ත්‍රිපිටක ධර්මය පිළිබඳ හසළ බුද්ධිමතෙකි. බහුශ්‍රැත මහ තෙර නමෙකි. ඒ බැව් ග්‍රන්ථාවසානයෙහි එන කර්තෘ සන්දර්ශන ගාථාවන්හි ද ඇතුළත් ව තිබේ. එ සේ ම යමක් ගැන නිදහස් ලෙස සිතා මතා ගැන්මෙන් හා ගැඹුරු ධර්මයක් තමා අවට තිබෙන කවුරුත් දන්නා සාමාන්‍ය වස්තුවක් උපමා වශයෙන් ගෙණහැර පා අවබොධ කරවීමෙන් ලත් බුද්ධිප්‍රභාවය අතින් නම් එ කල විසූ සියලු පඬිවරයන් ම ඉක්මවා ගමන් කර තිබෙන බව පෙනේ. මෙ සේ මේ දෙ නම ගේ ලෝකාර්ථ-චර්‍ය්‍යාවෝ වරෙක එක ම මගෙක ගමන් කළ නමුත් ප්‍රයෝජන පක්ෂය ගෙණ තුලනාත්මකව පරීක්ෂා කිරීමේ දී ලැබෙනුයේ මනෝ-රොග නිවාරණය පිණිස එක පොතකුත්, කායික රොග නිවාරණය පිණිස පොත් දෙකකුත් ලියූ බුද්ධපුත්‍ර හිමියන්ට මුල් තැන ත්, මනොරොග නිවාරණය පිණිස පොතක් ලියූ ධර්මසේන හිමියන්ට දෙවැනි තැනත් ය.

**සද්ධර්ම රත්නාවලිය**

මුලට පූර්විකාව–සූවිසි විවරණය හා බුද්ධ චරිතයත් මැදට කථා වස්තු 308 කුත්, අගට මඞ්ගල සූත්‍රාදි කථාන්තර 33 කුත් ඇතුළත් මෙ මාහැඟි මහා ග්‍රන්ථ රත්නය වූකලි අර්ථ කථාචාර්‍ය්‍ය අනුබුද්ධ බුද්ධඝොෂ මහා සාමීන් විසින් ධම්මපද පාළියට ලියූ අටුවා වෙහි එන කථා වස්තු සමූහය කින් හා නාගසේන කථා ආදී තවත් බොහෝ සවිස්තර කරුණු වලිනුත් යුක්ත වූවකි.

මෙය ව්‍යවහාර සිංහල භාෂාවෙන් ලියවුන සාහිත්‍ය ග්‍රන්ථයක් වශ-යෙනුත්, උගත්–නූගත් හැම දෙනාගේ ම සිත් ගන්නා සුළු ධර්ම ග්‍රන්ථයක් වශයෙනුත්, දඹදෙණි සමයේ ලක්දිව පැවැති සිරිත්–විරිත්–ජනකථා ආදිය උගන්වන සමාජ දර්ශන ග්‍රන්ථයක් වශයෙනුත්, ලඞ්කාවාසීන් අතර සම්-භාවිත ය. දඹදිව සිදුවූ කථා ප්‍රවෘත්ති ලක්දිව ගැමි වහරෙහි ආ උපමා—උපහාසාදියෙන් සරසා රසවත් කරණ ලද මේ ග්‍රන්ථය මහනුවර රජුන් ගේ සිංහල සිංහාසනයට සමාන යැ යි කියහැක. අපරදිග සැලැස්මක් අනුව නිමවා අපරදිගින් පිරිනැමුණු ඒ ආසනයෙහි ලක්දිව රන් කැටයම් මැණික්—රාජලාඤ්ඡනාදියෙන් සැරසීමෙන් අපරදිග ලක්ෂණය අතුරුදහන් වූවා සේ පොතේ ඇතුළත් දඹදිව කථා වස්තු කියවන විට සිතෙහි පහළ වනුයේ ලක්දිව සිදුවූ කථා ප්‍රවෘත්ති ලක්ෂණයන් ය.

විවිධ රසයෙන් රස කැවුන, හාස්‍ය රසයෙන් පිරි කථා වස්තු ඇති හෙයින් සද්ධර්ම රත්නාවලිය සැදැහැ ඇත්තන් මෙන් ම සැදැහැ නැත්තන් ද, බෞද්ධයන් මෙන් ම අබෞද්ධයන් ද, කියවන්නකි. සිනමා බැලීමට අවසර නැති බර සිල් ඇත්තවුන්ට ද මෙය කියවීමෙන් උපවිඥානයෙහි වූවමනා පමණ බෞද්ධ චිත්‍ර ජවනිකා පහළ කර ගත හැක.

නිතර පොත් අස්සේ හිස ගසා ගැනීම නිසා පාණ්ඩිත්‍යයෙන් ඉදී—බෙරිවී ගිය හිස් නැති පොත පත කියවීමෙන් හා අවට බැලීමෙන් ලබා ගත් නිවහල් වූ පළල් අවබොධයක් ඇති ගැමි ජීවිතයේ රස විඳ නාගරික පරිසරයෙන් ඔප් නැඟුනු අදහස් ඇති, පඬිවරු මෙය අගනා සිංහල සාහිත්‍ය ග්‍රන්ථයක් ලෙස සලකති.

සිංහල සාහිත්‍යය දියුණු වේවා!

මෙයට,

පණ්ඩිත කිරිඇල්ලේ ඤාණවිමල ස්ථවිර

2504/1961 පෙරබවාරි 28 දින

මාරපණ ශාස්ත්‍රොදය පිරුවන්හි දී ය.

# පටුන

පිටුව

1. පූර්විකාව ... ... ... ... 1
2. සූවිසි විවරණය ... ... ... 3
3. බුද්ධ චරිතය ... ... ... 23
4. චක්ඛුපාල තෙරුන් වහන්සේගේ වස්තුව ... ... 32
5. මට්ටකුණ්ඩලී වස්තුව ... ... ... 53
6. නාගසේන මහ තෙරුන් වහන්සේගේ කථාව ... ... 66
7. ථුල්ල තිස්ස තෙරුන් වහන්සේගේ කථාව ... ... 93
8. කාළි යකින්නගේ කථාව ... ... ... 101
9. කොසඹෑ නුවර වහන්දෑගේ කථාව ... ... 109
10. මහාකාළ තෙරුන් වහන්සේගේ කථාව ... ... 120
11. කාසාව පරිදහන කථාව ... ... ... 128
12. අගසවු වත ... ... ... ... 134
13. නන්ද මහ තෙරුන් වහන්සේගේ වස්තුව ... ... 159
14. චුන්ද නම් හූරු වැද්දගේ වස්තුව ... ... 167
15. ධම්මික උපාසකයන්ගේ වස්තුව ... ... 170
16. දේවදත්ත වස්තුව ... ... ... ... 173
17. සමන්දේවි වත ... ... ... ... 190
18. මිත්‍ර දෙනමගේ වස්තුව ... ... ... 192
19. උදේනි වස්තුව ... ... ... ... 196
20. ඝොෂක සිටාණන්ගේ කථාව ... ... ... 203
21. සාමාවතීන්ගේ කථාව ... ... ... 219
22. වාසුලදත්තාවගේ කථාව ... ... ... 224
23. මාගන්දියගේ කථාව ... ... ... 230
24. සාමාවතී මරණ පරිදීපන කථාව ... ... 238
25. කුම්භඝොෂක සිටාණන්ගේ කථාව ... ... 255
26. චූල්ල පන්ථක තෙරුන් වහන්සේගේ වස්තුව ... 263
27. බාලනක්ඛත්ත වත ... ... ... 277
28. දික්සඟි අටුවායෙහි කථාව ... ... ... 279
29. අනිත්ථි ගන්ධකුමාරයන්ගේ කථාව ... ... 284
30. මහසුප් තෙරුන් වහන්සේගේ වස්තුව ... ... 295

පිටුව


31. ද්විසහායක භික්ෂු වස්තුව ... ... ... 297
32. මහාලි ප්‍රශ්න වස්තුව ... ... ... 299
33. එක්තරා භික්ෂු කෙණකුන්ගේ වස්තුව ... ... 311
34. නිගමතිස්ස තෙරුන් වහන්සේ ගේ වස්තුව ... ... 312
35. මෙඝිය තෙරුන් වහන්සේගේ වස්තුව ... ... 314
36. එක්තරා භික්ෂු කෙණකුන් වහන්සේගේ වස්තුව ... 315
37. එක් භික්ෂු කෙණකුන්ගේ වස්තුව ... ... 321
38. භාගිනෙය්‍ය සඞ්ඝරක්ඛිත තෙරුන් වහන්සේගේ වස්තුව 325
39. චිත්තහත්ථ තෙරුන් වහන්සේගේ වස්තුව ... ... 326
40. ආරබ්ධ විදර්ශක භික්ෂූන් වහන්සේගේ වස්තුව ... 332
41. පූතිගත්ත තිස්ස තෙරුන් වහන්සේගේ වස්තුව ... 334
42. නන්ද ගෝපාල වස්තුව ... ... ... 338
43. සොරෙය්‍ය වස්තුව ... ... ... ... 339
44. පෘථිවි සන්නිශ්‍රිත කථාකරණ භික්ෂූන් වහන්සේගේ වස්තුව 344
45. මිරිඟු කමටහන් කළ භික්ෂූන් වහන්සේගේ වස්තුව ... 346
46. විඩූඩභ වස්තුව ... ... ... ... 347
47. පති පූජිකා වස්තුව ... ... ... ... 371
48. මච්ඡරිය කොසිය සිටාණන්ගේ වස්තුව ... ... 374
49. පාථෙය්‍යකාජීවක වස්තුව ... ... ... 381
50. ඡත්තපාණි උපාසක වස්තුව ... ... ... 384
51. විශාඛා වස්තුව ... ... ... ... 387
52. අනඳ මහ තෙරුන් වහන්සේගේ පැන විසඳීම් වත ... 418
53. සක් දෙව්ඳු බත් දුන් වත ... ... ... 420
54. ගොධික තෙරුන් වහන්සේගේ වත ... ... 424
55. සිරිගුත්ත වස්තුව ... ... ... ... 426
56. කුමුදුපප්පලානීත දුග්ගත සේවක වස්තුව ... ... 438
57. මහා කාශ්‍යප සද්ධිවිහාරික එක නමකගේ වස්තුව ... 449
58. ආනන්ද සිටාණන්ගේ වස්තුව ... ... ... 453
59. ගණ්ඨිභෙදක චෞර වස්තුව ... ... ... 456
60. ලාළුදයි තෙරුන් වහන්සේගේ වස්තුව ... ... 457
61. භද්දවග්ගීය තෙරුන් වහන්සේගේ වස්තුව ... ... 458

පිටුව

62. සුප්පබුද්ධ කුෂ්ඨ වස්තුව ... ... ... 460
63. එක්තරා කණිකයක්හුගේ වස්තුව ... ... 462
64. සුමන මාලාකාර වස්තුව ... ... ... 465
65. උත්පලවර්ණා වස්තුව ... ... ... 470
66. ජම්බුකාජීවක වස්තුව ... ... ... 472
67. කාක ප්‍රේත වස්තුව ... ... ... 481
68. අහි ප්‍රේත වස්තුව ... ... ... ... 482
69. සට්ඨීකූට ප්‍රේත වස්තුව ... ... ... 484
70. සුධම් තෙරුන් වහන්සේගේ වස්තුව ... ... 481
71. වනවාසික තිස්ස තෙරුන් වහන්සේගේ වස්තුව ... 494
72. රාධ තෙරුන් වහන්සේගේ වස්තුව ... ... 509
73. අස්සජි පුන්බ්බසුක වස්තුව ... ... ... 512
74. ඡන්න තෙරුන් වහන්සේගේ වස්තුව ... ... 513
75. මහාකප්පින තෙරුන් වහන්සේගේ වස්තුව ... ... 515
76. පණ්ඩිත සාමණේර වස්තුව ... ... ... 526
77. ලකුණ්ටක භද්දිය තෙරුන් වහන්සේගේ වස්තුව ... 542
78. කාණමාතා වස්තුව ... ... ... 543
79. පන්සියක් දෙනා වහන්සේගේ වස්තුව ... ... 547
80. ධම්මික තෙරුන් වහන්සේගේ වස්තුව ... ... 549
81. ධර්මශ්‍රවණ වස්තුව ... ... ... ... 551
82. ආගන්තුක පන් සියක් දෙනා වහන්සේගේ වස්තුව ... 552
83. ජීවකයන් පැන විවාළ වත ... ... ... 553
84. මහසුප් මහ තෙරුන් වහන්සේගේ වස්තුව ... ... 555
85. බෙල්ලට්ඨීසීස තෙරුන් වහන්සේගේ වස්තුව ... 557
86. කාෂ්ඨවාහන රජ්ජුරුවන්ගේ කථාව ... ... 558
87. අනුරුද්ධ මහ තෙරුන් වහන්සේගේ වත ... ... 568
88. කසයින් තෙරුන් වහන්සේගේ කථා වස්තුව ... 570
89. සැරියුත් මහ තෙරුන් වහන්සේගේ වස්තුව ... 571
90. කෝසඹෑ නුවර තිස්ස තෙරුන් වහන්සේගේ වත ... 573
91. සැරියුත් මහ තෙරුන් වහන්සේ ප්‍රශ්න විසඳූ වස්තුව ... 576
92. ඛදිරවනිය රේවත තෙරුන් වහන්සේගේ වස්තුව ... 577

පිටුව

93. එක්තරා ස්ත්‍රියකගේ වස්තුව ... ... ... 585
94. තඹදාළි නම් වූ සොරාගේ වස්තුව ... ... 586
95. දරුචීරිය තෙරුන් වහන්සේගේ වස්තුව ... ... 590
96. කුණ්ඩලකේසිගේ වස්තුව ... ... ... 594
97. අනාජී විවාළ බමුණන්ගේ වස්තුව ... ... 600
98. සැරියුත් මහ තෙරුන් වහන්සේගේ
මයිල් බමුණානන්ගේ වත ... ... 602
99. සැරියුත් මහ තෙරුන් වහන්සේගේ බෑණ
බමුණානන්ගේ වත ... ... 603
100. සාතාගිර—හේමවත දෙ දෙනාගේ උත්පත්ති කථාව ... 604
101. සැරියුත් මහ තෙරුන් වහන්සේගේ
මිත්‍ර බමුණානන්ගේ කථාව ... ... 613
102. දීඝායු කුමාරයාණන්ගේ වත ... ... ... 614
103. සංකිච්ච සාමණේර වස්තුව ... ... ... 617
104. බාහු කොණ්ඩඤ්ඤ වස්තුව ... ... ... 628
105. සප්පදස තෙරුන් වහන්සේගේ වත ... ... 629
106. පටාචාරා වහන්දෑගේ වස්තුව ... ... 633
107. කිසාගෝතමීන්දෑගේ වස්තුව ... ... 640
108. බහුපුත්තික ස්ථවිරින්දෑගේ ... ... ... 644
109. සුළු එක්සළු බමුණන්ගේ වත ... ... 647
110. සෙය්‍යසක තෙරුන් වහන්සේගේ වස්තුව ... 652
111. ළද දෙව්දුවගේ වත ... ... ... 653
112. අනාථපිණ්ඩික සිටාණන්ගේ වස්තුව ... ... 656
113. අසඤ්ඤත භික්ෂූන් වහන්සේගේ වස්තුව ... ... 661
114. බිළාලපාදක සිටාණන්ගේ වස්තුව ... ... 662
115. මහධන වෙළඳාණන්ගේ වස්තුව ... ... 665
116. කුක්කුටමිත්තයන්ගේ වස්තුව ... ... 667
117. කෝක නම් වැද්දහුගේ වස්තුව ... ... 673
118. මණිකාර කුලූපග තිස්ස තෙරුන් වහන්සේගේ වත ... 676
119. තුන් දෙනකුන් වහන්සේගේ වස්තුව ... ... 679
120. සුප්‍රබුද්ධ ශාක්‍ය වස්තුව ... ... ... 684

| | | පිටුව |
|---|---|---|
| 121. | සවග වහන්දෑගේ වස්තු දෙක ... ... | 668 |
| 122. | බොහෝ කුමාරවරුන්ගේ වස්තුව ... ... | 688 |
| 123. | කුණ්ඩධාන තෙරුන් වහන්සේගේ වස්තුව ... | 689 |
| 124. | විශාඛාදී උපාසිකාවරුන්ගේ පෙහෙවස් විචාළ වස්තුව | 694 |
| 125. | අජගර ප්‍රේත වස්තුව ... ... ... | 696 |
| 126. | මුගලන් මහ තෙරුන් වහන්සේගේ වස්තුව ... | 700 |
| 127. | බහුභාණ්ඩික නම් තෙරුන් වහන්සේගේ වස්තුව ... | 705 |
| 128. | සන්තති ඇමැත්තන්ගේ වස්තුව ... ... | 710 |
| 129. | පිළෝතික තෙරුන් වහන්සේගේ වස්තුව ... | 715 |
| 130. | සුඛ සාමණේර වස්තුව ... ... ... | 718 |
| 131. | වීශාඛාවන්–යෙහෙළියන්ගේ වත ... ... | 728 |
| 132. | සිරිමා වස්තුව ... ... ... ... | 731 |
| 133. | උත්තරා නම් සළුවිරින්දෑගේ වස්තුව ... ... | 736 |
| 134. | රූපනන්ද නම් සළුවිරින්දෑගේ වස්තුව ... ... | 739 |
| 135. | මල්ලිකා බිසොවුන්ගේ වස්තුව ... ... | 743 |
| 136. | ලාලුදායි තෙරුන් වහන්සේගේ වස්තුව ... ... | 746 |
| 137. | අනඳ මහ තෙරුන් වහන්සේ ප්‍රශ්න විචාළ වත ... | 749 |
| 138. | මහධන සිටුපුත්හුගේ වස්තුව ... ... | 751 |
| 139. | බෝධිරාජ කුමාරයන්ගේ වස්තුව ... ... | 753 |
| 140. | උපනන්ද තෙරුන් වහන්සේගේ වස්තුව ... ... | 757 |
| 141. | පධානික තිස්ස තෙරුන් වහන්සේගේ වස්තුව ... | 760 |
| 142. | කුමාරකසුප් තෙරුන් වහන්සේගේ මෑණියන්දෑගේ වස්තුව . | 762 |
| 143. | මහාකාළ නම් සෝවාන් උපාසකයන්ගේ වස්තුව ... | 766 |
| 144. | දේවදත්ත–සඞසභෙදක වස්තු දෙක ... ... | 768 |
| 145. | කාළ නම් තෙරුන් වහන්සේගේ වස්තුව ... | 770 |
| 146. | චූළකාළ උපාසකයන්ගේ වස්තුව ... ... | 772 |
| 147. | අත්තදත්ථ තෙරුන් වහන්සේගේ වස්තුව ... | 774 |
| 148. | දහර භික්ෂු කෙණකුන් වහන්සේගේ වස්තුව ... | 775 |
| 149. | සුදෙවුන් මහ රජ්ජුරුවන්ගේ වස්තුව ... ... | 777 |
| 150. | පන්සියක් දෙනා වහන්සේගේ වස්තුව ... ... | 779 |

පිටුව

151. අභයරාජ කුමාරයන්ගේ වස්තුව ... ... 780
152. සම්මුඤ්ජනී තෙරුන් වහන්සේගේ වස්තුව ... 781
153. අඞ්ගුලිමාල් තෙරුන් වහන්සේගේ වස්තුව ... 783
154. පෙහෙර දූවණියන්ගේ වත ... ... ... 784
155. තිසක් පමණ භික්ෂූන් වහන්සේගේ වස්තුව ... 788
156. චිඤ්චමානවිකාවන්ගේ වස්තුව ... ... 789
157. අසදිස දන වස්තුව ... ... ... 793
158. අනේපිඩු මහ සිටුහුගේ පුත් කාළ නම්
සිටු පුත්‍රයාගේ වස්තුව ... ... 798
159. මාර දූන් තුන්දෙනාගේ වස්තුව ... ... 801
160. යමා මහ පෙළහර වත ... ... ... 805
161. ඒරකපත්ත නා රජ්ජුරුවන්ගේ වත ... ... 828
162. අනඳ මහ තෙරුන් වහන්සේ ප්‍රශ්න විචාළ වස්තුව ... 832
163. අනභිරත භික්ෂූන් වහන්සේගේ වස්තුව ... 834
164. අග්ගිදත්ත නම් පෙරෙවි බමුණානන්ගේ වස්තුව ... 836
165. අනඳ මහ තෙරුන් වහන්සේ ප්‍රශ්න විචාළ වස්තුව ... 841
166. බොහෝ භික්ෂූන් වහන්සේගේ වස්තුව ... 842
167. තෝදෙය්‍ය බ්‍රාහ්මණ වස්තුව ... ... 843
168. නෑයන්ගේ කලහය සන්හිඳ වූ වස්තුව ... ... 844
169. මාරයාගේ වත ... ... ... ... 847
170. කොසොල් රජ්ජුරුවන්ගේ පරාජය වත ... 848
171. එක්තරා කුලදරුවාණ කෙණකුන්ගේ වස්තුව ... 849
172. එක්තරා උපාසක කෙණකුන්ගේ වස්තුව ... 850
173. පසේනදි කොසොල් රජ්ජුරුවන්ගේ වත ... 853
174. තිස්ස නම් තෙර කෙණකුන් වහන්සේගේ වස්තුව ... 855
175. සක්දෙවිඳුහුගේ වත ... ... ... 856
176. තුන්පිය පුත් මා කෙණකුන්ගේ වස්තුව ... 858
177. එක්තරා කෙලෙඹියාණ කෙණකුන්ගේ වස්තුව ... 860
178. විශාඛාවන්ගේ වස්තුව ... ... ... 862
179. ලිච්ඡවීන්ගේ වස්තුව ... ... ... 863

පිටුව

180. අනිත්ථිගන්ධ කුමාරයන්ගේ වස්තුව ... ... 864
181. එක්තරා බ්‍රාහ්මණයකුගේ වස්තුව ... ... 866
182. පන්සියයක් දරුවන්ගේ වස්තුව ... ... 868
183. අනගැමි තෙර කෙණකුන් වහන්සේගේ වස්තුව ... 869
184. නන්දික උපාසකයන්ගේ වත ... ... 871
185. රෝහිණී බිසවුන්ගේ වස්තුව ... ... 873
186. එක්තරා භික්ෂු කෙණකුන් වහන්සේගේ වස්තුව ... 876
187. උත්තරාවන්ගේ වත ... ... ... 878
188. මුගලන් මහ තෙරුන් වහන්සේ ප්‍රශ්න විචාළ වස්තුව 887
189. සාකේත වත ... ... ... ... 890
190. පුණ්ණා නම් දියණියන්ගේ වස්තුව ... ... 892
191. අතුල උපාසකයන්ගේ වත ... ... 895
192. සවග වහන්දෑගේ ... ... ... 897
193. ගෙරි මරා කන එකකුගේ පුතකුගේ වත ... 898
194. එක්තරා බ්‍රාහ්මණ කෙණකුන්ගේ වත ... 901
195. තිස්ස නම් භික්ෂු කෙණකුන්ගේ වත ... ... 902
196. ලාළුදයි තෙරුන් වහන්සේගේ වත ... ... 904
197. එක්තරා කුලදරුවාණ කෙණකුන්ගේ වත ... 906
198. සැරියුත් මහ තෙරුන් වහන්සේගේ
සද්ධිවිහාරික නමකගේ වත ... 908
199. පන්සියයක් උපාසකවරුන්ගේ වත ... ... 910
200. තිස්ස නම් ලදරු භික්ෂූන්දෑගේ වත ... ... 911
201. උපාසකවරුන් පස්දෙනකුගේ වත ... ... 913
202, මෙණ්ඩක මහ සිටාණන්ගේ වත ... ... 916
203. වරද සොයන තෙරුන් වහන්සේගේ වත ... 924
204. සුභද්‍ර පරිබ්‍රාජකයන්ගේ වත ... ... 925
205. විනිශ්චයාමාත්‍යයන්ගේ වත ... ... 926
206. සවග වහන්දෑගේ වත ... ... ... 927
207. එකුදන රහත් තෙර කෙණකුන් වහන්සේගේ වත ... 928
208. ලකුණ්ටක භද්දිය තෙරුන් වහන්සේගේ වස්තුව ... 930

| | | පිටුව |
|---|---|---|
| 209. | බොහෝ වහන්දෑගේ වස්තුව ... ... | 931 |
| 210. | හත්ථකයන්දෑගේ වස්තුව ... ... ... | 932 |
| 211. | එක්තරා බ්‍රාහ්මණයාන කෙණකුන්ගේ වස්තුව ... | 932 |
| 212. | තිත්ථයන්ගේ වස්තුව ... ... ... | 933 |
| 213. | බිලී වැද්දකුගේ වස්තුව ... ... | 934 |
| 214. | බොහෝ වහන්දෑගේ වත ... ... | 936 |
| 215. | පන්සියයක් දෙනාවහන්සේගේ වත ... ... | 937 |
| 216. | වස්තු තුනක් ... ... ... ... | 938 |
| 217. | පධාන කම්මික තිස්ස තෙරුන් වහන්සේගේ වත ... | 940 |
| 218. | සූකර ප්‍රේත වත ... ... ... | 941 |
| 219. | පොට්ඨිල තෙරුන් වහන්සේගේ වත ... ... | 945 |
| 220. | මහළු වහන්දෑගේ වත ... ... ... | 948 |
| 221. | සැරියුත් මහ තෙරුන් වහන්සේගේ සද්ධිවිහාරික නමකගේ වත ... | 950 |
| 222. | මහදන වෙළෙඳාණන්ගේ වත ... ... | 953 |
| 223. | කිසාගෝතමීන්දෑගේ වත ... ... | 954 |
| 224. | පටාචාරාවන්ගේ වත ... ... ... | 955 |
| 225. | ගඞ්ගාරෝහණ වස්තුව ... ... ... | 956 |
| 226. | චිත්ත නම් සිටාණන්ගේ වස්තුව ... ... | 967 |
| 227. | කුකුළු බිජුවට කන කුමාරිකාවගේ වස්තුව ... | 968 |
| 228. | හද්දිය නුවර වහන්දෑගේ වස්තුව ... ... | 969 |
| 229. | ලකුණ්ටක හද්දිය තෙරුන් වහන්සේගේ වස්තු දෙක | 970 |
| 230. | දරුසාකටිකයන්ගේ වස්තුව ... ... | 972 |
| 231. | වජ්ජිපුත්තක භික්ෂූන් වහන්සේගේ වස්තුව ... | 974 |
| 232. | කුඩාසුභද්‍රාවන්ගේ වස්තුව ... ... | 976 |
| 233. | ඒකවිහාරිය තෙරුන් වහන්සේගේ වස්තුව ... | 980 |
| 234. | සුන්දරී පරිබ්‍රාජිකාවන්ගේ වස්තුව ... ... | 981 |
| 235. | දුශ්චරිත ඵලානුභවය කරණ සත්වයන්ගේ වස්තුව ... | 984 |
| 236. | වග්ගුමුදු නම් හෝ තෙර වසන වහන්දෑගේ වත ... | 985 |
| 237. | ඛෙම නම් උපාසකයන්ගේ වස්තුව ... ... | 986 |

| | | |
|---|---|---|
| | | පිටුව |
| 238. | දූව්ව නමකගේ වස්තුව ... ... ... | 988 |
| 239. | එක්තරා ස්ත්‍රියකගේ වස්තුව ... ... | 988 |
| 240. | ආගන්තුක බොහෝ වහන්දෑගේ වස්තුව ... | 989 |
| 241. | නිවටුන්ගේ වස්තුව ... ... ... | 990 |
| 242. | නිවට සවුවන්ගේ වස්තුව ... ... ... | 991 |
| 243. | තමන් වහන්සේම අරහයා වදළ වස්තුව ... | 992 |
| 244. | හස්තිශිල්පයෙහි දක්ෂකෙණකුන් වහන්සේගේ වස්තුව | 993 |
| 245. | එක්තරා මාළු බමුණාන කෙණකුන්ගේ වස්තුව ... | 994 |
| 246. | පසේනදි කොසොල් රජ්ජුරුවන්ගේ වස්තුව ... | 999 |
| 247. | සානු සාමණෙර වස්තුව ... ... ... | 1000 |
| 248. | බද්ධෙරක නම් ඇතුගේ වත ... ... | 1004 |
| 249. | පන්සියක් දෙනා වහන්සේගේ වස්තුව ... | 1005 |
| 250. | මාරයාගේ වත ... ... ... | 1006 |
| 251. | කපිල නම් මත්ස්‍යයාගේ වස්තුව ... ... | 1009 |
| 252. | සූකර පෝතිකාවගේ වත ... ... ... | 1014 |
| 253. | සිවුරු හළ කෙණකුන්ගේ වත ... ... | 1017 |
| 254. | බන්ධනාගාර වස්තුව ... ... ... | 1019 |
| 255. | ඛෙමා නම් මෙහෙණින්නන්ගේ වත ... ... | 1021 |
| 256. | උග්ගසේන නම් සිටුපුත්හුගේ වත ... ... | 1026 |
| 257. | ධනුග්ගහ වත ... ... ... | 1028 |
| 258. | මාරයාගේ වත ... ... ... | 1032 |
| 259. | උපකාජීවකයන්ගේ වස්තුව ... ... | 1033 |
| 260. | සක්දෙවිඳුහුගේ වස්තුව ... ... ... | 1034 |
| 261. | අපුත්තක සිටාණන්ගේ වත ... ... | 1038 |
| 262. | අඞකුර වස්තුව ... ... ... | 1040 |
| 263. | භික්ෂුවහන්දෑ පස් නමකගේ වස්තුව ... ... | 1041 |
| 264. | හංසඝාතක භික්ෂූන්දෑගේ වස්තුව ... ... | 1043 |
| 265. | කෝකාලික වස්තුව ... ... ... | 1046 |
| 266. | ධම්මාරාම තෙරුන් වහන්සේගේ වත ... ... | 1047 |
| 267. | විපක්ෂ සේවක භික්ෂූන් වහන්සේගේ වස්තුව ... | 1049 |

| | | | පිටුව |
|---|---|---|---|
| 268. | පඤ්චග්ගදායක බමුණානන්ගේ වස්තුව | ... | 1050 |
| 269. | බොහෝ වහන්දෑගේ වස්තුව ... | ... | 1053 |
| 270. | පන්සියක් දෙනා වහන්සේගේ වස්තුව | ... | 1059 |
| 271. | සන්තකාය තෙරුන් වහන්සේගේ වස්තුව | ... | 1060 |
| 272. | නඞ්ගලකුර තෙරුන් වහන්සේගේ වස්තුව | ... | 1061 |
| 273. | වක්කලී තෙරුන් වහන්සේගේ වස්තුව | ... | 1063 |
| 274. | සුමන සාමණෙර වත ... ... | ... | 1064 |
| 275. | ප්‍රසාද බහුල බමුණානන්ගේ වත ... | ... | 1078 |
| 276. | බොහෝ වහන්දෑගේ වස්තුව ... | ... | 1079 |
| 277. | මාරයාගේ වස්තුව ... ... | ... | 1079 |
| 278. | එක්තරා බමුණු කෙණකුන්ගේ වස්තුව | ... | 1080 |
| 279. | අනද මහ තෙරුන් වහන්සේගේ වත | ... | 1081 |
| 280. | එක්තරා පැවිදි කෙණකුන්ගේ වත ... | ... | 1082 |
| 281. | සැරියුත් මහ තෙරුන් වහන්සේගේ වස්තුව | ... | 1082 |
| 282. | මහා ප්‍රජාපතී ගෝතමීන්දෑගේ වස්තුව | ... | 1084 |
| 283. | සැරියුත් මහ තෙරුන් වහන්සේගේ වස්තුව | ... | 1085 |
| 284. | දූළුලු බමුණාන කෙණකුන්ගේ වස්තුව | ... | 1086 |
| 285. | කොවුන් බමුණකුගේ වස්තුව ... | ... | 1086 |
| 286. | කිසාගෝතමීන්දෑගේ වස්තුව ... | ... | 1089 |
| 287. | එක්තරා බ්‍රාහ්මණ කෙණකුන්ගේ වත හා උග්ගසේන සිටු පුත්‍රයාගේ වස්තුව | ... | 1090 |
| 288. | බමුණන් දෙන්නකුගේ වස්තුව ... | ... | 1091 |
| 289. | අක්කොසක භාරද්වාජ නම් බමුණානන්ගේ වස්තුව | | 1092 |
| 290. | සැරියුත් මහ තෙරුන් වහන්සේගේ වත | ... | 1093 |
| 291. | උපුල්වන් ස්ථවිරීන්දෑගේ වස්තුව ... | ... | 1094 |
| 292 | එක්තරා බ්‍රාහ්මණ කෙණකුන්ගේ වස්තුව | ... | 1095 |
| 293. | ඛෙමා නම් ස්ථවිරීන්දෑගේ වස්තුව ... | ... | 1095 |
| 294. | පබ්භාරවාසී තිස්ස තෙරුන් වහන්සේගේ වස්තුව | | 1096 |
| 295. | එක්තරා භික්ෂු කෙණකුන් වහන්සේගේ වත | ... | 1099 |
| 296. | හෙරණ වහන්දෑ සතුර නමකගේ වස්තුව | ... | 1100 |
| 297. | මහාපන්ථක තෙරුන් වහන්සේගේ වස්තුව | ... | 1103 |

| | | පිටුව |
|---|---|---|
| 298. | පිලින්දිවච්ඡ මහ තෙරුන් වහන්සේගේ වස්තුව ... | 1104 |
| 299. | එක් තෙර කෙණකුන් වහන්සේගේ වත ... | 1105 |
| 300. | සැරියුත්–මුගලන් මහ තෙරුන් වහන්සේලා දෙ නමගේ කථා වස්තුව | 1106 |
| 301. | රෙවත තෙරුන් වහන්සේගේ වස්තුව ... | 1107 |
| 302. | චන්ද්‍රාභ තෙරුන් වහන්සේගේ වත ... | 1107 |
| 303. | සීවලි මහ තෙරුන් වහන්සේගේ වත ... | 1111 |
| 304. | සුන්දර සමුද්ද තෙරුන් වහන්සේගේ වත ... | 1112 |
| 305. | ජටිල තෙරුන් වහන්සේගේ වත ... ... | 1117 |
| 306. | ජොතිය තෙරුන් වහන්සේගේ වත ... ... | 1136 |
| 307. | රහත් වූ දෙනමකගේ වස්තු දෙක ... ... | 1138 |
| 308. | වංගීස තෙරුන් වහන්සේගේ වත ... ... | 1139 |
| 309. | ධම්මදින්නා වහන්දැගේ වස්තුව ... ... | 1142 |
| 310. | අඞ්ගුල්මල් මහ තෙරුන් වහන්සේගේ වත ... | 1143 |
| 311. | දේවංගික බමුණානන් පැන විචාළ වත ... | 1144 |
| 312. | මඞ්ගල සූත්‍ර අටුවා ආදී වූ කථාන්තර වත ... | 1145 |
| 313. | දීපඞ්කර නම් බුදුන්ගෙන් නිවන් දුටුවාහු ... | 1153 |
| 314. | කොණ්ඩඤ්ඤ ,, ,, ... | 1154 |
| 315. | මඞ්ගල ,, ,, ... | 1155 |
| 316. | සුමන ,, ,, ... | 1156 |
| 317. | රේවත ,, ,, ... | 1157 |
| 318. | සෝභිත ,, ,, ... | 1157 |
| 319. | අනොමදස්සි ,, ,, ... | 1158 |
| 320. | පදුම ,, ,, ... | 1158 |
| 321. | නාරද ,, ,, ... | 1159 |
| 322. | පියුමතුරා ,, ,, ... | 1161 |
| 323. | සුමෙධ ,, ,, ... | 1162 |
| 324. | සුජාත ,, ,, ... | 1163 |
| 325. | පියදස්සි ,, ,, ... | 1163 |
| 326. | අත්‍ථදස්සී ,, ,, ... | 1167 |
| 327. | ධම්මදස්සී ,, ,, ... | 1168 |

පිටුව


328. සිද්ධාර්ථ නම් බුදුන්ගෙන් නිවන් දුටුවාහු ... 1168
329. තිස්ස ,, ,, ... 1169
330. ඵුස්ස ,, ,, ... 1169
331. විදර්ශී ,, ,, ... 1170
332. සිඛී ,, ,, ... 1170
333. වෙස්සභූ ,, ,, ... 1171
334. කකුසඳ ,, ,, ... 1171
335. කෝණාගමන ,, ,, ... 1172
336. කාශ්‍යප ,, ,, ... 1172
337. ගෞතම බුද්ධ චරිතය ... ... ... 1173
338. මඞ්ගල කාරණා ... ... ... 1179
339. දානානිශංසාදී අනුශාසනා ... ... 1205
340. සංක්ෂිප්ත ගෞතම බුද්ධ චරිතය ... ... 1212
341. කාශ්‍යපාදී සූවිසි බුදුවරුන්ගේ සංක්ෂිප්ත ජීවන චරිත 1215
342. බුද්ධරශ්මි ප්‍රමාණය ... ... ... 1220
343. දුෂ්කරක්‍රියා කාල ප්‍රමාණය ... ... 1220
344. අනාගත වංශ දෙශනාව (මෛත්‍රෙය බුද්ධ චරිතය) 1220
345. ග්‍රන්ථාවසානය ... ... ... 1246

# සද්ධර්මරත්නාවලිය

නමෝ තස්ස භගවතෝ අරහතෝ
සම්මා සම්බුද්ධස්ස.

## 1. පූර්විකාව

මහ පොළොව සේ තුන් ලොවට පිහිට ගුණ ඇති, මහ මුහුද සේ ගැඹුරු ගුණ ඇති, ආකාශය සේ අනන්ත ගුණ ඇති, මහ මෙර සේ සාර ගුණ ඇති, ඉරු මඬල සේ තේජස් ගුණ ඇති, සඳ මඬල සේ සෞම්‍ය ගුණ ඇති, කරුණාවෙන් සිහිල් වූ සිත් ඇති, අප ති ලෝ ගුරු බුදු රජාණන් වහන්සේ, මෙ තැනට සාරාසංඛ්‍ය කප් ලක්ෂයෙකින් යට දීපඞ්කර නම් බුදුන් සමයෙහි සිවු පදෙන් යුත් ගාථා මාත්‍රයක් අසා, සව් කෙලෙස් නසා ගෙවා රහත් වන්නට නිසි පින් කම් ඇතත් සියල්ලවුන් කෙරෙහි කළ කරුණාවෙන්, ''සායෙහි ලද බතක් බොහෝ දෙනා බලබලා සිටිය දී තනි ව වැද හිඳ කන්නා සේ'' නුවණ නැමැති පදුරු[1] නැති ව, කුසල් නැමැති නැව් නට කල්හි සසර නැමැති මුහුදු ගැලී දුක් ගන්නා මඳ දෙනකු නො ව, සූවිසි අසඞ්ඛ්‍යයක් සත්ත්වයන් ඇර ලා තනි ව නිවන් දක්ම අප වැන්නවුන්ට තරම් නො වත්, මම ද මේ ති ලෝ ගුරු බුදු රජාණන් වහන්සේ මෙන් බුදු ව, සසර නැමැති සයුරින් ඔවුන් ගොඩ ලන පිණිස සාරාසඞ්ඛ්‍ය කප්ලක්ෂයක් මුළුල්ලෙහි මා විසින් කම සේ ව ඉදි කරන ලද නුවණ නැමැති රුවල් පදුරු[2] ඇති, සමාධි නැමැති කුඹක් ඇති, සත් තිස් බොධි පාක්ෂික ධර්ම නමැති මහ නැවට නංවා, දෙශනා නමැති හස්තයෙන් පැද ගෙන නිවන්පුර[3] නමැති පර තෙරට පමුණුවම්' යන අදහසින් බුදු බව පතා, යටැත් බ්‍රහ්මදේව නම් බුදුන් සමයෙහි මනෝප්‍රණිධිය හා (පුරාණ) ගෞතම නම් බුදුන් සමයෙහි වාක්ප්‍රණිධිය ඇති හෙයින් පූර්ව හේතුවත් ඇති ව, මිනිසත් බව පිහිටා ස්ත්‍රීත්වයත් නැති ව, තවුස් වෙස් ගෙන මහණ ව අභිඥලාභී ව කෘතාධිකාර මහ පිනැති ව, බුදු විමෙහි බලවත් අදහස් ඇති ව, දිවමනු[4] බුදුන්ට දිවි පුද, ඔබගෙන් විවරණ පතුල් ලදින් සම තිස් පැරුම් පිරීමට නියත වීමෙන් අධිගතයන් පූරවන්නා සේ සියලු අකුසලින් දුරු වැ එමැ

---

1 පැදුරු 2 පැළුරු 3 නිවන් පරතෙරට-නිවන්පුර තෙරට
4 දිමනු-

අධිගතයන් ආර්‍ය්‍ය භූමියෙහි පිහිටියා සේ කුසල්හි පිහිටා, එ ම අධිගතයන් මාර්ග ඥාන නැමැති ජලයෙන් රාගාදි කෙලෙස් කිලුටු සෝධා, සිත් සතන් නිර්මල කළා සේ පවිත්‍ර වූ සිත් ඇති ව අනුන්ට අනුශාසනා කරන කලැත් යහපත් තරම් ඇති දෙ මවු පියන් තමන් දරුවන් තමන් තරමෙ හික්මවන්නා සේ, සියලු අකුසලින් දුරු ව, සියලු කුසල්හි පිහිටා, සිත් සතන් පවිත්‍ර කොටගෙන පවිත්‍ර වූ සිත් ඇති අදහසින් පින් කමැ හැසිර ලොව් ලොව්තුරා[1] සැපත් සිද්ධ කරනු නිසා ය.

එ සේ හෙයින් ඔබගේ අනුශාසනයෙහි පිහිටා නිවන් දහම් පසක් කරන්නවුන් විසින් යම් සේ වැසි ඇති කල සුභික්ෂ ද, වැසි නැති කල දුර්භික්ෂ ද, එ හෙයින් සුභික්ෂ - දුර්භික්ෂ දෙකට වැසි ම මුල් ද, එ සේ ම අකුසලින් දුරු ව කුසල්හි පිහිටා සිත් සතන් පවිත්‍ර කරන්නවුන්ට ධර්මාභියෝග ය මුල.

ධර්මාභියෝග ය නම් නිශ්ශරණාද්ධ්‍යාශයෙන් බණ ඉගැන්ම ය. හෙ ද වැළිත් කෘතාධිකාර මහ පිනැති කෙනකුන්ට මුත් විදුරු පර්වත විදින්ට කුහුඹුවන්ට බැරියා සේ, සෝවාන් පුහුලන් අපායගාමිනී අකුසල්හි හැසිරෙන්ට බැරියා සේ, සියලු ලෙසින් ම කෘත පුණ්‍යතා නැති ව ජාත්‍යන්ධයන්ට අන්ධ යෂ්ටිය නැති ව ගමන් බැරියා සේ, ලක්ෂණය දැන ලක්ෂණානුසාරයෙන් ඉගෙන දැන ගැන්ම නුවණ මඳවුන්ට බැරි ය.

එ සේ හෙයින් යම් කෙනෙක් නුවණ මඳ වත් කුසලච්ඡන්දය ඇති ව ධර්මාභියෝගයට උපදෙස් ලදින් බණ දැන පින් කමැ හැසිර නිවන් සාද ගනිත් නම් එ සේ වූ සත් පුරුෂයන්ට වැඩ සඳහා **සද්ධර්මරත්නාවලිය** නම් වූ ප්‍රබන්ධයක් කරම්හ.

පාලි ක්‍රම ම හැර අර්ථ පමණක් ගෙන අප කළා වූ ප්‍රබන්ධයෙහි ක්‍රම විලඞ්ඝනාදී වූ අඩු වැඩි ඇතත් ඒ නොසලකා, පැන් හා කිරි මුසු වුවත් කිරි පමණක් තෝරා හැරගන්නා හංසයන් මෙන් ද, ශාස්ත්‍ර දන්නවුන් ගේ ජාති අඩු වුවත් උන් ගේ තරම් නො සලකා ශාස්ත්‍ර පමණක් සලකා ශාස්ත්‍ර උගන්නවුන් මෙන් ද, ප්‍රයෝජන පමණක් සිතා නුවණ නැමැති ඇස්හි මෝහ නැමති පටලය වැසී අකුසල් මහවලට වැද නිවන් පුරයට ගොසින් තුබූ කුසල් මහ වත නො දක්නවුන් **සද්ධර්මරත්නාවලි** නැමති බෙහෙදින් මොහ නැමති පටලය නැති කොට නුවණැ'ස අඳුරු හැර, කුසල් මහ වතට නිවන් පුරයට සුවයෙන් යා යුතු.

1 ලොව්-ලොව්තුරා ලොවි-ලොවුතුරා

අකුසලින් දුරු ව වසන්නවුන් කවරත් අකුසලට පෙරදැරි ව සිටිනා සිත තණ බිම් තිබිය දී විෂම ස්ථානයට ගොසින් නස්නා ගෙරි සරක් තණ බිමට නමා රක්නා සේ, තමා ගේ සිතට අනික් ඉසුරු කෙනකුන් නැති හෙයින් අකුසලින් වෙන් කොට කුසල්හි පිහිටුවන්නා ම ප්‍රාණවධාදි වූ ඒ ඒ අකුසලින් වෙන් ව දුරු වන්නට කරන ව්‍යායාම නැති හෙයින් තමා තමා සිත් සතන් ම හික්මැවීම යහපතැ.

'වදන දරුවන් ගේ මුණ දකුම්හ' යන මෙ විතර ආස්වාදයෙකින් කවර තරම් වුත් ප්‍රසව වේදනා ඉවසන ස්ත්‍රීන් පරිද්දෙන් ලබන නිවන් රස සලකා ඇස පහරනා රුජාවෙන් වන් දුක් නොසැලකූ චක්ඛුපාල මහ තෙරුන් වහන්සේ ගේ වස්තුවෙහි පටන් නිවන් මහ වත් ව සිටිනා තුන් සියයක් වත් නැමැති මහුල් සැරහීමෙන් නිවන් පුර වදනවුන් අතුර සැතපෙන්නට සද්ධර්මරත්නාවලිය නැමැති ශාලාව සරහමු.

---

# 2. සුවිසි විවරණය

කෙ සේ ද යත්:-

අප ගේ ති ලෝ ගුරු බුදුහු මෙයින් සාරා සැකි කප් සුවහස් මතුයෙහි දඹදිව:

**'නගරෙ අමරවතියා – සුමේධො නාම බ්‍රාහ්මණො,**
**අනේක කෝටි සන්නිචයො – පහූත ධන ධඤ්ඤවා'**

යනු හෙයින් දඹ දිව අමරවතී නම් නුවර සුමේධ නම් බමුණු කුමාර ව–ඉපැද බොහෝ වූ ධන ධාන්‍ය සම්පත්තීන් සමෘද්ධ ව, උගත මනා ශිල්ප ඉගෙන මා පිය දෙ දෙනා ගේ අයාමෙන් උපයා රැස් කළ වස්තු රාශි ය දැක:

**'ධනං සන්නිචයං කත්වා – අහො මය්හං පිතාදයො,**
**ගතා මාසකමෙකම්පි – නේවාදය දිවං ඉති'**

යනු හෙයින් ''අනේ! අපගේ දෙ මවු පිය ආදීහු මෙ තෙක් වස්තු උපයා, මී බැඳ පියා බැඳී මීයෙන් කිසිවකුත් නොගෙන යන මී මැස්සන් මෙන් මියැ පර ලොව යන්නාහු මස්සක් විවරත් නො ගෙන ගියහ. උන් හැම හැර ගෙන යන්නට නිසි උපදෙස් නො දැන නො ගෙන ගියත් උපදෙස් දන්නා මා ඒ වස්තුව මා හා කැටි ව ගෙන යන්නට වුව මැනව. මේ හැම එල්ගු සහිත හෙයින් මෙ ලෙසින් ගෙන යන්නට බැරි වුවත්, ධර්මයෙහි සාරය නම් ධර්ම තත්වය වන්නා සේම, මෙ වස්තුවෙහි සාරය නම් මේ වස්තුව දන

**විෂයෙහි** පරිත්‍යාග කිරීම වසයෙන් පැවති කුසල ය. මේ කුශලය තෙමේ ලසු වී නමුත්, තිබබටුවකටත් කුඩා මැණික් ගලින් සමහර මැණික් ගලෙක අගයක් ම නැත්තා සේ විපාක විසින් පමණ නැත්තේ ය. එ හෙයින් දන් දෙමි'' සිතා නුවර බෙර ලවා

**'භේරිනාද සුගන්ධන - යාචකාලි සමාගතෙ,**
**දනකිඤ්ජක්ඛ ඔසෙන - සත්තාහං පීතයී තතො'.**

යනු හෙයින් භේරි නාද නමැති සුවඳින් රැස් වූ, යාචක ජන නැමැති බඹරුන්[1], දන නැමැති රොනින් සතප්වා, එ සේ දීත් වස්තුව නොනිමන නියාව දැක, ''ඉතිරිය අත පුරා සිත පුරා හැර ගනුව'යි විධාන කොට ලා හිමවු පියෙසට ගොසින්:

**'හිමවන්තස්ස අවිදූරෙ - ධම්මිකො[2] නාම පබ්බතො,**
**අස්සමො සුකතො මය්හං - පණ්ණසාලා සුමාපිතා'**

යනු හෙයින් **සක්** දෙවිඳු ගේ විධානයෙන් **විස්කම්** දෙව් පුත් හු **දහම්** නම් ගල් බඩ මැවූ පන්සලට වැද මහණ ව, මහණ වූ සතිය ඇතුළත පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති උපදවා, එක් දවසක් නිල් වූ ගුවන් කුසින් නොමැකී පවත්නා විදු ලියක් මෙන් දෙ-හෝ නොහොත් දකුණු මුහුද නික්මුණු රන් නැවක් මෙන් නොහොත් නිල් බිමක් රන් හූ ගසා බෙදන කලක් මෙන් එක් තරා දසාවකට යන දූ, එ සමයෙහි පුරා නිමියා වූ පැරුම් ඇති හෙයින් **තුසී** පුරෙන් චුත ව අවුත් **රම්මවතී** නම් නුවර, **සුදෙව** නම් නම් රජුන් නිසා **සුමෙධා** නම් බිසොවුන් කුස පිළිසිඳගෙන, මැණිකෙක අවුණා ලූ පලස් හුයක් මෙන් දස මසක් වැස, ආකාශයෙන් නිකුත් ශරත් චන්ද්‍රයා මෙන් මවු කුසින් බිහි ව වැඩී විය පැමිණ, දිව සැපත් වැනි මනු සැපත් විඳිමින් දස දහසක් හවුරුදු මුළුල්ලෙහි රජ සැපත් වළඳා ස්ත්‍රීන් ලක්ෂයකට ප්‍රධාන වූ **පදුමා** නම් බිසොවුන් **උසභක්ඛන්ධ** නම් පුත් කුමරුවන් වැදූ කල්හි, දස දහසක් සක්වළ දෙව් බඹුන් තමන් ගේ අයදමෙන් නොපමා ව මිනිස් ලොව ඉපිදත් එහි කල් යවන නියාව දැන වහා බුදු වන්ට නික්මවන්ට මෙහෙවර එවා ලූ දිව්‍යකුමාර කෙනකුන් වැනි පුත් කුමරුන් දැක මහබිනික්මනට ඉක්මන් ව, **ඓරාවත** නම් හස්තිරාජයා නැඟී අසුර මථනයට නික්මුණු ලෙසටත් වඩා සුවාසූ ඇතුන් පිරිවැරූ ඇත් වාහනයෙකින් මහල් උයනට ගොසින් ඒ උයන්හි දී කෙලෙස් සතුරන් හා යුද්ධයට නොවතත් තමන් දැ පිරිවරා ඇවිදිනා ලෙසට

---

1 බඹරුනි. 2. ධම්මකො.

පුරුෂයන් කෙළක් හා සමහ මහණ ව, පැරුම් බිම දී කළ වීය්‍ය්‍ය නොමඳ ව ඇතත්, බුදුවන ජාතියේ එ විතරකුත් ඇත මනා බැවින් දස මසක් ප්‍රධන් වීය්‍ය්‍යයෙහි හැසිර:-

කවරත් බුදු කෙනකුන් වහන්සේ වෙසඟ මැදි පොහෝ දවස් බුදු වන හෙයින් බුදු වන දවස් මහණ ගණ පිරිවරා එක් නුවරෙක සිඟා වැඩ, උත්පත්ති දෙවියන්ට ඉදි කළ කිරි බත විසුද්ධි දෙවි ව පිළිගෙන, තමන් වහන්සේට පැමිණි කොට-සෙහි දෙවියන් දිව ඕජස් බහා ලූ හෙයින්, සෙසු දවස් වළඳන භොජනය එ සේ මෙ සේ සතියක් විවර ආහාරජ රූප ප්‍රසන්න කරත් මුත් වැඩියකට බල නැති හෙයින් එ දවස් ඒ කිරි බත බුදු වූ සතළිස් නව දවසක් සිඟන ගමනුත් නැති ව කළ මනා බුද්ධ කෘත්‍යය ඇති හෙයින් දවසකට ආලොපයක් වන නියා-යෙන් සතළිස් නව පිඩක් කොට වළඳා නිල් දලා හෝ බඩ සල් උයන්හි දවල් දවස් යවා සවස සූනන්‍ද නම් ආජීවකයන් දුන් හී තණ හැර ගෙන, බොධි වන්නේ පුළිල ගසක් හෙයින් ඒ පුළිල බොධීන් වහන්සේ කරා එළඹ, අනූ රියන් උස ඇති බෝ රුක් මුල්හි වැඩ හිඳ බුදු ව සත් සති යවා බ්‍රහ්මාරාධනා-වෙන් දහම් සක් පවත්වා, සූවිසි අසඞ්ඛ්‍යයක් සත්ත්වයන් එක තැන වැඩ හිඳ නිවන් දක්වන්ට බැරි හෙයින් දඹදිව සැරි සරනු නිසා දීපඞ්කර බුදුරජාණන් වහන්සේ රඹ ගම් නුවරට වැඩ සුදසුන් වෙහෙර වසන කල්හි රඹ ගම නුවර ඇත්තවුන් බුදුන්ට ආරාධන කොට ලා සිඟා වඩනා මහ සතුටු සතුටු ව ඉදි කරන්න-වුන් දැක අහසින් යන ගමන් තබා සක්විති රජ්ජුරු කෙනකුන් අහසින් යන ගමනේ කතින් ගැලවී වැටෙන රුවන් තෝඩුවක් මෙන් බිමට බැස, උන් හැම අතින් විචාරා, බුදු කෙනකුන් වහන්සේ වඩනට ඉදි කරන මහක් නියාව අසා, තමන් දැත් මං ඉදි කිරීමට සහාය වීමටත් වඩා කුසල් නැමැති බිජුවට වපුරන්ට තුනුරුවන් නැමැති කෙත විනා අනික් කෙතක් නැති බැවින් කරන්ට සිතන කුසලයට කෙත් වූ මං පෙත් ඉල්ලාගෙන සෙස්සවුන් තමන් තමන් පමණක් නිවන් පුර වදනට කුසල් මං කරන හෙයින්:-

'යා පලාලමයං මාලං – නාරී දත්‍වාන චෙතියේ,
අලත්‍ථ කඤ්චනමයං මාලං – සත්තබොජ්ඣඞ්ගිකඤ්ච සා'

යනු හෙයින් ද ගබකට පිදුරු කැටියක් මාලාවක් කොට සිතා පුද ලූ පමණෙකින් පසු ව ලක්ෂයක් අගනා රන් මාලාවකුත් අගයක් ම නැති නිවන් නැමැති මහ ලිය පළඳනාවත් කුමාරිකා කෙනකුන්

ලත් හෙයින් ළං තැනකට කරන හරසර මහක් සේ ලසු වූත් ප්‍රයෝගයෙන් කුසල් මං පෙති හැම[1] සාදන්නා සේ, ඒ ඒ දෙනාට නියම වූ මං පොලු නිමා ගියත් ඒ මහා පුරුෂයා බුදු බව පතා සූ විසි අසඞ්ඛ්‍යයක් පමණ දෙනාත් හැර ගෙන නිවන් පුර වදනට සොයන කුසල් මහ, සාරා සැකි කප් සුවහස් ගිය කලට මුත් අතුර මුළුලු නොවන නියාවට දෘෂ්ටාන්තයා සේ ඉදි කරන්ට පටන් ගත් මං කපොල්ල නොනිමන තෙක් ම වැඩියා වූ තිලොගුරු බුදු රජුන් වහන්සේට 'කෙලෙස් වතුරින් පිරුණු සසර නැමැති මහ මුහුදින් චතුර්විධ විනේය ජනයන්[2] එ තර වන්ට ලූ හෙයක් වැනි මම ද නුඹ වහන්සේට හෙයක් වෙමි'යි දෙඹ මල් ඇතිරියක් වැනි වූ අඳුන් දිවි, සම කළල් මඩ මත්තෙහි අතුට:-

**'කිමඤ්ඤාතකවෙසෙන - ක්ලෙස නිබ්බාපනෙන මෙ,**
**අයං බුද්ධොව'හං බුද්ධො - හුත්වා ලොකෙ අනුත්තරො,**
**ජනතං ධම්මනාවාය - තාරෙත්වාන භවණ්ණවං,**
**නිබ්බානපුරමානෙත්වා - සෙය්‍යා මෙ පරිනිබ්බුතං'.**

යනු හෙයින් සසරට පිටි පානා පමණක් මුත් බුදු බවට මුහුණ ලා මූණින් වැද හෙව ඒ තිලෝගුරු බුදුන් ගෙන් ද 'මේ තෙමේ මතු එන දවස සිල් නැමැති පොළොවැ, ප්‍රඥා නැමැති මුල් ඇති, සිහි නුවණ නැමැති තෝතැන්නක් ඇති, කරුණා නැමැති පැනින් ඇති වූ, සමාධි නැමැති කඳක් ඇති, මෙත් නැමැති ලියෙකින් වළඳනා ලද පඤ්ච විධ විමුක්ති නැමැති අතු පතර ඇති, ත්‍රි විධ-වශී නැමැති පල්ලව ඇති, අභිඥා නැමැති මල් ඇති, බොධි සම්භාර කප් රුක සර්වඥතාඥාන නැමැති අමා එල ගන්වයි හෙවත් බුදු වෙයි. මොහු බුදු වන ජාතියෙහි උපදනා නුවර කිඹුල්වත් නම් නුවර ය. මුන්ගේ මෑණියෝ **මහාමායා** බිසෝ ය. පියාණෝ **සුදෙවුන්** මහ රජාණෝ ය. මූ තුමූ **ගෞතම** නම් හ. **සැරියුත්-මුගලන්** ය යන තෙර සඟළෙක් අග සවු වෙති. **ආනන්ද** නම් තෙර කෙනෙක් අග්‍ර උපස්ථායක වෙති. **ඛෙමාවෝ** ය. **උප්පලවණ්ණාවෝ** ය. යන මෙහෙණින්නෝ දෙදෙනෙක් අග්‍ර ශ්‍රාවිකා වෙති. බොධි වන්නේ **ඇසතු** ගසෙක'' යනාදීන් ඔබ ගෙන් විවරණ ලදින්:-

නැවත ඔබට ඉක්බිති ව කප් අසඞ්ඛ්‍යයක් ගිය කලට තුන් අසඞ්ඛ්‍යයක් කප් හා තවත් කල්ප ලක්ෂයක් තිබිය දී, පැරුම් පුරා නිමවා සිටි **කොණ්ඩඤ්ඤ** බෝසත්හු තුසී පුරෙන් චුත ව අවුත් දඹදිව **රම්මවතී** නම් නුවර **සුනන්ද** නම් රජ්ජුරුවන්

1 කුසල් මං පෙනියාම. 2 විනේ ජනයන්.

නිසා සුජාතා නම් බිසොවුන් කුස පිළිසිඳ ගෙන දසමස් අයා-මෙන් මවු කුසින් බිහි ව, ශක්‍ර සම්පත් විඳැ කුසීත ව මිනිස් ලොව රජ සැපත් විඳිනා සක් දෙව්ඳු ලෙසින් දස දහසක් හවුරුදු ගිහි සැපත් වළඳා, තුන් ලක්ෂයක් පමණ පුරහනන්ට ප්‍රධාන වීමෙන් අග මෙහෙසුන් වූ **රුචි** නම් බිසොවුන් **විජිතසෙන** නම් පුත් කුමරුවකු වැදූ කල්හි, මහබිනික්මනට සිතා, රථ වාහනයෙකින් නික්ම දස කෙළක් පමණ මිනිසුන් හා සමඟ මහණ ව, දස මසක් **මුළුල්ලෙහි** ප්‍රධන් වීර්‍ය්‍ය කොට, බුදු වන දවස් **සුරින්‍ද** නම්-ගම **යශෝදරා** නම් සිටු දියණියන් දුන් කිරි බත වළඳා, සවස් වේලෙහි **සුවණ්ණක** නම් ආජීවකයන් දුන් හී තණ හැර ගෙන, **කොණ්ඩඤ්ඤ** නම් බුදුන්ට බොධි – බුදුන් සමයෙක හා සක්විත්තන් සමයෙහි මුත් සෙසු කලෙක පහළ නොවන – කලණ ගස හෙයින් ඒ සල් කලණ නම් බෝධීන් වහන්සේ කරා එළඹ, තණ බිම සලා වගුරුවා අට පනස් රියන් තණ ඇතිරියෙහි වැඩ හිඳ බුදු ව සත් සති යවා, බ්‍රහ්මාරාධනාවෙන් බණ දෙසා, කෙළ ලක්ෂයක් පමණ රහතන් පිරිවරා දනවු සැරිසරන සේක් **චන්ද්‍රවතී** නම් නුවරට වැඩි සේක.

එ කල අපගේ බෝසත්හු **විජිතාවි** නම් සක්විති ව බුදුන් ඒ නුවරට වැඩි නියාව අසා, දහම් සක පැවති කලට සක් රුවනෙහි අනුභව[1] නැති හෙයින් දහම් සක ම අසනුවන්ට බුදුන් කරා එළඹ වැඳ පවරාගෙන වස් සාර මස මහදන් දී නිකම් වැසි තරමටත් වඩා දහම් වැසි වස්වා ඔබ ගෙනුත් විවරණ ලදින්:

ඔබට ඉක්බිති ව තවත් කප් අසඞ්ඛ්‍යයක් බුද්ධ ශූන්‍ය වූ කල්හි දෙ අසංඛ්‍ය කප් ලක්ෂයක් තිබිය දී **මඞ්ගල** නම් බෝසත්හු **තුසී පුරෙන්** සැව දඹදිව සියලු නුවරවලට උතුම් ව සිටිනා හෙයින් උත්තරා නම් වූ නුවර යස සම්පත්තීන් වඩනා රජ්ජුරු කෙනකුන් නැති හෙයින් **උත්තර** නම් වූ රජුන් නිසා රූප-ශොභාදීන් වැඩි සිටිනා බිසෝ කෙනකුන් නැති හෙයින් **උත්තරා** නම් බිසොවුන් කුස පිළිසිඳගෙන දස මස් අයාමෙන් බිහි ව වැඩි විය පැමිණ දහසක් පුරහනන්ට ප්‍රධානවූ **යසවතී** නම් බිසොවුන් **සීලව** නම් පුත් රුවන වැදූ කල්හි මහණ වන්ට, නික්මෙන ද, **වලාහක** නම් අශ්වරාජයා පිටට පැන නැඟී දික් විජය[2] කරන සක්විත්තන්ට අපහාස කෙරෙමින් මෙන්[3] අස් වාහනයෙකින් නික්ම තුන් කෙළක් පමණ පුරුෂයන් හා සමඟ මහණ ව, අට මසක්

1 ආනුභාව. 2 දිග්විජ ය. 3 කෙයරමිනි.

බුදු වන්ට වීයඹී කොට, බුදු වන දවස් **උත්තරා** නම් ගම **උත්තර** **නම්** සිටුදියණියන් දුන් කිරි බත වළඳා, සල් උයන්හි[1] දවල් දවස් යවා **උත්තර** නම් ආජීවකයන් දුන් හී තණ අට මිට හැර ගෙන, ඔබට බොධි – නා ගස හෙයින් **නා** බෝධීන් වහන්සේ කරා එළඹ ගෙන ගිය හී තණ සලා බිම වගුරුවා අට පනස් රියන් තණ ඇතිරිය මත්තෙහි වැඩ හිඳ, බුදු ව සත් සති යවා මහබඹහුගේ අයදමෙන් දහම් සක පවත්වා දනවු සැරිසරන සේක්– දඹදිව **මෙඛලා** නම් නුවරට වැඩී සේක. එ කල අප ගේ බෝසත්හු **සුරුචි** නම් බ්‍රාහ්මණ ව බුදුන් ඒ නුවරට වැඩී නියා අසා බුදුන් කරා එළඹ මියුරු වූ බණ අසා බුදුන් කෙරෙහි පැහැද, බුදුන් ප්‍රධාන වූ කෙළ ලක්ෂයක් මහ සඟනට ආරාධනා කොට වඩා ගෙන ගොසින්, සක් දෙව්ඳුහු මවා ලූ අට සාලිස් ගවු පමණ දිග-පළල ඇති රුවන් මඩුවෙහි වඩා හිඳුවා, සතියක් මුළුල්ලෙහි අසාගත්, කෙලෙස් කසල නුමුසු බණ සේ ම, පැන් නුසුමු කිරි බත් දන් දී, කෙළවර දවස කෙළ ලක්ෂයක් පමණ පාත්‍රා පුරවා ශක්‍කීරා-ගිතෙල්-උක් සකුරු-මී ආදී වූ බෙහෙත් බඩුත් හැමටත් අඩු තරම් සිවුරු පිරිකර ලක්ෂයක් වටිනා තරමේ කෙළ ලක්ෂයක් පමණ සිවුරු පිරිකරත් දන් දීලා, බුදු බව පතා ම කළ පරිත්‍යාගයක් හෙයින් ඔබගෙනුත් විවරණ ලදින්:–

ඔබට ඉක්බිති ව එම කප **සුමන** නම් බෝසත්හු පුරා නිමියා වූ පැරුම් ඇති හෙයින් තුසී පුරෙන් චුත ව දඹ දිව් නැමැති ඔටුන්නෙහි ඔබා ලූ මැණිකක් වැනි වූ **මෙඛලා** නම් නුවර **සුදත්ත** නම් රජුන් නිසා, **සිරිමා** නම් බිසොවුන් කුස පිළිසිඳ ගෙන, දස මස් අයාමෙන් මවු කුසින් බිහි ව වැඩී විය පැමිණ නව දහසක් හවුරුදු රජ සැපත් වළඳා තෙ සැට දහසක් පුරඟනන්ට ප්‍රධාන වූ **වටංසකා** නම් බිසොවුන් **අනුපම** නම් පුතවණුවන් වැදූ කල්හී මහබිනික්මන් නික්මෙන කල ඇත් වාහනයෙකින් නික්ම තිස් කෙළක් මිනිසුන් හා සමඟ මහණ ව, මහණ ගණා පිරිවරා දස මසක් මුළුල්ලෙහි ප්‍රධන් වීයඹී කොට බුදු වන දවස් **අනුපම** නම් නියන් ගම **අනුපමා** නම සිටු දියණියන් දුන් කිරි බත වළඳා, සවස් වේලෙහි **අනුපම** නම් ආජීවකයන් දුන් හී තණ හැර ගෙන, ඔබ-ටත් බෝධි නා ගස හෙයින් **නා** බෝධීන් වහන්සේ කරා එළඹ ගෙන ගිය හී තණ සලා බිම වගුරුවා, තිස් රියන් තණ ඇතිරිය මත්තෙහි වැඩ හිඳ බුදු ව සත් සති යවා බ්‍රහ්මාරාධනාවෙන් බණ දෙසා දනවු සැරි සරන සේක.

---

1 සල් වෙනෙහි.

එ කල අප ගේ බෝසත්හු අතුල නම් දිව්‍ය නාග ව බුදුන් ලොව උපන් නියාව අසා, නාග භවනයෙන් අවුත් කෙළ ලක්‍ෂයක් පමණ වූ බුදු පාමොක් මහ සඟනට මහ පුද කරවා, මහ වතුරක් මෙන් මහ දන් දී කෙළ ලක්‍ෂයක් පමණ සළු සහළවලුත් දන් දී, ප්‍රතිසන්ධිය අහෙතුක වුවත් කරන කුසලයෙහි අහෙතුක කමක් නැති හෙයින් ඔබගෙනුත් විවරණ ලදින්–

ඔබට ඉක්බිති ව එම කප පැරුම් පුරා නිමවා සිටි රෙවත නම් මහ බෝසත්හු කුසී පුරෙන් සැව සියලු ධන ධාන්‍ය සම්පත්තීන් සමෘද්ධ වූ සුධඤ්ඤවතී නම් නුවර සව් බරණින් සැරහුණු ශුචි පවිත්‍ර වූ පිරිවර ඇති සම්පත්තිනුත් විපුල වූ, විපුල නම් රජුන් නිසා සියල්ලන් ගේ නෙත් නැමැති බඹරුන් විසින් ගැවසී ගත් නෙත් නැමැති මහනෙලින් හා මුව නැමැති පියුමෙන් හා බබළන පියුම් විලක් සේ ශෝභාවත් වූ ආයු ශක්තිය විපුල නුවුවමනා හෙයින් විපුල නුවූවත් සම්පත් ආදීන් විපුල වූ විපුලා නම් බිසොවුන් කුස පිළිසිඳ ගෙන දස මස් අයාමෙන් සිත් කුළු පවු-වෙන් බස්නා රන් වන් හංසයකු මෙන් මවු කුසින් බිහි ව වැඩී විය පැමිණ ස දසක් හවුරුදු ගිහි සැපත් වළඳා තෙ තිස් දහසක් පුරඟන්ට ප්‍රධාන වූ සුදසුන් නම් බිසොවුන් වරුණ නම් පුත් රුවන වැදූ කල්හි මහණ වන්ට නික්මෙන ද දෙ දෙව් ලොව දෙවියන් පිරිවරා විජයොත්[1] රථයට නැඟී නඳුන් උයනට නික්මුණු සක් දෙව්දු ලෙසින් සිවුරඟ සෙනඟ පිරිවරා රථයෙකින් නික්ම, කෙළක් පමණ මිනිසුන් හා සමඟ මහණ ව, සත් මසක් මුළුල්ලෙහි බුදු වන්ට වීය්‍ය කොට බුදු වන වෙසඟ මැදි පොහෝ දවස් යසෝධරා නම් බිසොවුන් දුන් කිරි බත් වළඳා සල් වෙනෙහි දවල් දවස් යවා සවස් වේලෙහි තරුණින්ධර[2] නම් ආජීවකයන් දුන් හී තණ හැරගෙන ඔබටත් බොධි නා ගස හෙයින් නා බෝධීන් වහන්සේ කරා එළඹ තණ සලා වගුරුවා, තෙ පනස් රියන් තණ ඇතිරිය අතුට එහි වැඩ හිඳ බුදු ව සත් සති යවා බ්‍රහ්මාරාධනාවෙන් බණ දෙසා සත්ත්වානුග්‍රහ නිසා දනවූ සැරිසරන සේක.

එ කල අප ගේ බෝසත්හු අතිදේව නම් බ්‍රාහ්මණ ව බුදුන් කරා ගොසින් ඔබ ගේ බණ අසා, තමන් ගේ වේද වේදඞ්ගයෙහි නො පිහිටා සරණ ශීලයෙහි පිහිටාගෙන තමන් සක්කතයෙහි අභ්‍යාස බලවත් හෙයින් සිලෝ[3] දහස් ගණනින් බුදුන් ගේ ගුණ කියා ලක්‍ෂයක් අගනා උතුරු සළුවක් පුද, ඒ රේවත නම් බුදුන්ගෙනුත් විවරණ ලදින්–

---

1 විජයොත් 2 තරුණින්ධ. 3 සොලෝ.

ඔබට ඉක්බිති ව එම කප **සෝභිත** නම් බෝසත්හු **තුසී** පුරෙන් චුත ව **සුධර්මා** නම් නුවර **සුධර්ම** නම් රජුන් නිසා **සුධර්මා** නම් බිසොවුන් කුස පිළිසිඳ ගෙන, දස මස් අයාමෙන් මවු කුසින් මෙඝ මුඛයෙකින් නිකුත් පූන් සඳක් මෙන් නිකුත් ව වැඩිවිය පැමිණ නව දහසක් හවුරුදු ගිහි සැපත් වළඳා, සැත්තෑ දහසක් පුරඟනන්ට ප්‍රධාන වූ **මඛිලා** නම් බිසොවුන් **සීහ** නම් පුතණුවන් වැදූ කල්හි, එ දවස් ම මහණ වි ය යුතු හෙයින් දුර නො ගොසින් මාළිගාවේ දී ම මහණ ව, සතියක් මුළුල්ලෙහි මාළිගාවේදී ම ප්‍රධන් වීර්‍ය්‍ය කොට බුදු වන දවස් **මඛිලා** නම් බිසව දුන් කිරි බත මාළිගාවේ දී ම වළඳා මහබිනික්මන සිතූ දූය, සිතන්නා ම මාළි-ගාව නිල් වූ ගුවන් කුසට එ දවස් මැදි පොහොයේ නැඟෙන සඳට අපහාස්‍ය කෙරෙමින් නැඟෙන අනික් සඳක් මෙන් පැන නැඟීලා සියලු අහස[1] බබුළුවමින් ගොසින් අටාසූ රියන් උස ඇති, සුදු වූ කඳක් ඇති, මලින් පල්ලෙන් සැදුම් ලත් **නා** බෝධිය මද්ධ්‍ය කොට ලා බිම පිහිටා ගත. නළු ගැනුත් කිසි කෙනකුන් ගෙනුත් විධානයක් නැති ව ම මාළිගාවෙන් බැස පියා නැඟී ගියහ. මහ බෝසත්හු ද බුදු ව සත් සති යවා බ්‍රහ්මාරාධනාවෙන් දහම් සක පවත්වා ජන සංග්‍රහ සඳහා දනවු සැරි සරන සේක.

එ කල අප ගේ බෝසත්හු **රම්‍යවතී** නම් නුවර **සුජාත** නම් බ්‍රාහ්මණ ව බුදුන් ගෙන් බණ අසා, ශරණ ශීලයෙහි පිහිටා බුදු පා මොක් මහ සඟනට තුන් මසක් මහ දන් දී තිවට නසන්නට හෙතු කොට ගෙන ඒ සෝභිත බුදුන් ගෙනුත් විවරණ ලදින්-

තව ද ඔබට ඉක්බිති ව කප් අසඞ්ඛ්‍යයක් ගිය කලට මෙ කපට ඒකාසඞ්ඛ්‍ය කප් ලක්ෂයෙක දී පූන් පැරුම් ඇති **අනෝම-දස්සී** බෝසත්හු තුසී පුරෙන් සැව දඹ දිව **සඳවත්** නම් නුවර **යසවත්** නම් රජුන් නිසා රන් වන් හංස යුග්මයක් වැනි පයෝධර ඇති **යසෝධරා** නම් බිසවුන් කුස පිළිසිඳගෙන දස මස් අයාමෙන් මවු කුසින් බිහි ව, වැඩි විය පැමිණ, දස දහසක් හවුරුදු ගිහි සැපත් වළඳා, තෙ විසි දහසක් පුරඟනන්ට ප්‍රධාන වූ **සිරිමා** නම් බිසොවුන් **උපවාන** නම් පුතණුවන් වැදූ කල්හි රන් සිවිගෙයෙකින් මහබිනික්මන් නික්ම මිනිසුන් තුන් කෙළක් හා සමඟ මහණ ව, දස මසක් ප්‍රධන් භූමි යෝග කොට බුදු වන දවස් **අනුපමා** නම් බමුණු ගම **අනුපමා** නම් සිටු දියණියන් දුන් කිරි බත වලඳා සල් වෙනෙහි දවල් දවස් යවා, සවස් වෙලෙහි **අනෝපම** නම් ආජීවකයන් දුන් හී තණ හැර ගෙන **ඔබට**

---

1 ආස.

බෝධි කුඹුක් ගස හෙයින් කුඹුක් බොධීන් වහන්සේ කරා එළඹ හී තණ බිම සලා වගුරුවා අට තිස් රියන් තණ ඇතිරියේ හිඳ බුදු ව සත් සති යවා, මහ බඹහු ගේ අයැදමෙන් බණ දෙසා, සත්ත්වානුග්‍රහ නිසා දනවු සැරිසරන සේක.

එ කල අප මහබෝසත්හු මහානුභාවසම්පන්න යක් සෙනෙ-වි ව බුදුන් කරා අවුත් සඳ මඩල දෙ හෝ යි සිතන තරම් රුවන් මඩුවක් මවාලා සතියක් මුළුල්ලෙහි බුදු පාමොක් මහ සඟනට මහ දන් දී **අනෝමදස්සී** බුදුන් ගෙනුත් 'දැන් මූ තුමූ යක් සෙනෙවි වූවෝ වෙත් ද, මතු එන දවස දහම් සෙනෙවි කෙනකුන් ඇතිව දහම් සක් පවත්වති' විවරණ ලදින්–

ඔබට ඉක්බිති ව එම කප පුන් පැරුම් ඇති **පදුම** නම් බෝසත්හු තුසී පුරෙන් සැව චම්පා නුවර සරි සාමාන්‍ය[1] අනික් රජ්ජුරු කෙනකුන් නැති හෙයින් **අසම** නම් රජ්ජුරුවන් නිසා රූප ශෝභාදීන් අනන්‍ය සාධාරණ බැවින් **අසමා** නම් බිසොවුන් කුස පිළිසිඳ ගෙන දස මස් අයාමෙන් මවු කුසින් බිහි ව වස් වන දහම් වැස්සට පෙරාතු ව[2] මුළු දඹදිව පියුම් වැසි වස්වා වැඩි විය පැමිණ දස දහසක් හවුරුදු ගිහි සැපත් වළඳා, තිස් තුන් දහ-සක් පමණ පුරඟනන්ට ප්‍රධාන වූ **උත්තරා** නම් බිසොවුන් **රම්‍ය** නම් පුත් කුමරුවන් වැදූ කල්හි, මහබිනික්මන් නික්මෙන ද රථ වාහනයෙකින් නික්ම කෙළක් පමණ මිනිසුන් හා සමග මහණ ව, අට මසක් මුළුල්ලෙහි ප්‍රධන් වීයඹ් කොට බුදු වන දවස් **ධඤ්ඤවතී** නම් නියම් ගම ඒ නමැති සිටු දියණියන් දුන් කිරි බත වළඳා සල් වෙනෙහි දවල් දවස් යවා සවස් වේලෙහි **තිත්‍ථක**[3] නම් ආජීවකයන් දුන් හී තණ හැර ගෙන ඔබට බෝධි හුණ ගස හෙයින් හුණ බෝධින් වහන්සේ කරා එළඹ හී තණ සලා බිම වගුරුවා, අට තිස් රියන් තණ ඇතිරිය මත්තෙහි හිඳ බුදු ව, සත් සති යවා සද්ධර්මවර චක්‍රවර්ති වූ නියාවට දහම් සක පවත්වා එක් කලෙක හිමවු පියසට වැඩි සේක.

එ කල අප මහ බෝසත්හු නරසිහ වීමට පූර්ව නිමිත්තයා සේ **සිංහ** ව ඉපැද හිමවු පියසට වැඩි **පදුම** නම් බුදුන් දැක බුද්ධාලම්-බන ප්‍රීතිය උපදවා බුදු වූ කල සති සතක් ම සිහා ඉොයන්නා සේ සතියක් මුළුල්ලෙහි සොයා ලබන ගොදුරට බුද්ධාලම්බන ප්‍රීති ගොදුරු ඉතා රසවත් හෙයින් ගොදුරට නො ගොස් නො ලත් ගොදුරු සරියට ඔබ ගෙනුත් විවරණ ලදින්—

---

1 සමාන– 2 පෙරත්තු – පරෙත්තු. 3 තත්‍ථක.

ඔබට ඉක්බිති ව එම කප **නාරද** නම් මහ බෝසත්හු පැරුම් පූරා නිමි හෙයින්, තුසී පුරෙන් චුත ව දඹදිව **ධඤ්ඤවතී** නුවර සංවෘත්ති වෙද්‍යන්ට උතුම් හෙයින් **සුදේව** නම් රජුන් නිසා ලාමක කමක් දුස්නායෙන්[1] නැත හෙයින් අනෝමා නම් බිසවුන් කුස පිළිසිඳ ගෙන දසමස් අයාමෙන් බිහි ව වැඩි විය පැමිණ, නව දහසක් හවුරුදු ගිහි සැපත් වළඳා එක් ලක්ෂ විසි දහසක් පුරඟනන්ට ප්‍රධාන වූ **විජිතසේනා** නම් බිසවුන් **නන්දුත්තර** නම් පුතණුවන් වැදූ කල්හි මහබිනික්මනට ඉක්මන් ව, වාහන සෙවීම කල් යන්නා සේ මහ සෙනඟ පිරිවරා පයින් ම උයනට ගොසින් ලක්ෂයක් දෙනා හා සමඟ මහණ ව සතියක් ප්‍රධන් වීර්‍ය්‍ය කොට ලා බුදු වන දවස් **විජිතසේනා** නම් බිසොවුන් දුන් කිරි බත වළඳා, ඒ උයන දවල් දවස් යවා, සවස සුදස්සුන් නම් උයන් පල්ලා දුන් හී තණ හැරගෙන ඔබට බෝධි මුරුත ගස හෙයින් මුරුත බෝධීන් වහන්සේ කරා එළඹ හී තණ සලා බිම වගුරුවා අට පනස් රියන් තණ ඇතිරිය පිට හිඳ බුදු ව සත් සති යවා, බ්‍රහ්මාරාධනාවෙන් බණ දෙසා ජනානුග්‍රහ නිසා දනවු සැරිසරන සේක.

එ කල අප මහ බෝසත්හු තවුස් වෙස් ගෙන මහණව අභිඥා ලාභී ව හිමවු පියෙසැ වසන දූ ය. නාරද බුදුහුත් බෝසතුන් කෙරෙහි අනුකම්පාවෙන් අසූ කෙළක් රහතන් ද, අනැගැමි උපාසකවරුන් දස දහසක් ද හැර ගෙන හිමවු පියසට වැඩි සේක මහ බෝසත්හු ද බුදුන් දැක පැහැද මහතට පතන හෙයින් පන්සලක් මහත් කොට මවාලා තුන් යම් රාත්‍රිය මුළුල්ලෙහිත් බුදු වූ කල නන්ද මහ තෙරුන් වහන්සේ ගේ බණ තුන් යම් රාත්‍රියෙහි අසන්නා සේ ම–අසා දෙ වන දවස් උතුරු කුරු දිවයිනට ගොසින් සිඟාගෙනවුත් අසූ කෙළක් රහතුන් පිරිවරා වැඩි බුදුන් වළඳවා, අනැගැමි උපාසක වරුනුත් අනුභව කරවා, මේ නියායෙන් සතියක් උපස්ථාන කොට රත් සඳුන් ගෙනවුත් ඉන් බුදුන්ට පූජා කොට ඔබ ගෙනුත් විවරණ ලදින්—

තව ද ඔබට ඉක්බිති ව කප් අසඞ්ඛ්‍යයක් ගිය කලට මෙ කපට ලක්ෂයක් වන කප පුන් පැරුම් ඇති **පියුමතුරා** නම් බෝසත්හු තුසී පුරෙන් සැව දඹ දිව **හංසවතී** නම් නුවර ආනන්ද නම් රජුන් නිසා **සුජාතා** නම් බිසොවුන් කුස පිළි-සිඳ ගෙන දස මස් අයාමෙන් මවු කුසින් බිහි ව වැඩි විය පැමිණ දස දහසක් හවුරුදු ගිහි සැපත් වළඳා, එක් ලක්ෂ විසි දහසක්

---

1. දුස්නායෙන්, දූෂණයෙන්, දූෂණායෙන්, දශිතයෙන්, තෘෂ්ණයෙහි. 2 මහණට.

රහතුන්ට ප්‍රධාන වූ වසුදත්තා[1] නම් බිසොවුන් **උත්තර** නම් නිරුත්තර පුත් රුවන වැදූ කල්හි මහණ වන්ට නික්මෙන්ට සිතන්නා ම, **වසවත්** නම් පහය අහසට පැන නැඟී ලා මහබිනික්මන් කරන දවස් රාත්‍රියට එක සඳ මඳ හෙයින් අනික් සඳක් නැඟි කලක් මෙන් අහසින් ගොසින් බෝ මැඩ මධ්‍ය කෙරෙමින් බට. මහ බෝසත්හු ද මාලිගාවෙන් බැස ලා කැටි ව ගියවුන් ගෙන් ගැනුන් පමණක් සිටිය දී මහණ වුවමනා සෙස්සවුන් හා සමඟ මහණ වූ ද ය. මාලිගාවත් අවුත් ආදි තිබූ තැන ම පිහිටි ය. මෙ සේ මහණ ව ලා සතියක් ප්‍රධන් වීර්‍ය්‍ය කොට බුදුවන දවස් **උජ්ජේනි** නම් නියම් ගම **රුචිනන්ද** නම් සිටු දියණියන් දුන් කිරි බත වළඳා, සල් වෙනෙහි දවල් දවස් යවා, සවස් වේලෙහි සුචිත්ත නම් ආජීවකයන් දුන් හී තණ හැර ගෙන, ඔබට බෝධි සළල ගස හෙයික් **සළල** බෝධීන් වහන්සේ කරා ගොසින් තණ සලා බිම වගුරුවා අට තිස් රියන් තණ ඇතිරිය මත්තෙහි හිඳ, බුදු ව සත් සති යවා බ්‍රහ්මාරාධනාවෙන් බණ දෙසා ජන සංග්‍රහ සඳහා දනවූ සැරසරන සේක.

එ කල අප ගේ බෝසත්හු **ජටිල** නම් රටි ව බුදු පාමොක් සඟනට මහ දන් දී සිවුරු පිරිකරත් පිළිගන්වා, ඔබ ගෙනුත් විවරණ ලදින්—

ඔබට ඉක්බිති ව කප් ලක්ෂයෙන් සැත්තෑ දහසක් කප් ගිය කලට මෙ කපට තිස් දහසක් කපින් ඔබ්බෙහි පුන් පැරුම් ඇති **සුමේධ** නම් බෝසත්හු තුසී පුරෙන් චුත ව, **සුදසුන්** නම් නුවර **සුදත්ත** නම් රජුන් නිසා, **සුදත්තා** නම් බිසොවුන් කුස පිළිසිඳ ගෙන, දස මස් අයාමෙන් මවු කුසින් බිහි ව වැඩි විය පැමිණ නව දහසක් හවුරුදු ගිහි සැපත් වළඳා, අට සාළිස් දහසක් පුරඟනන්ට ප්‍රධාන වූ **සුමනා** නම් බිසොවුන් **පුනබ්බසුමිත්ත** නම් පුතණුවන් වැදූ කල්හි, මහබිනික්මන් නික්මෙන ගමනේ, ඇත් වාහනයෙකින් නික්ම කෙළ සියයක් විතර මිනිසුන් හා සමඟ මහණ ව අට මසක් බුදුවන්ට වීර්‍ය්‍ය කොට බුදු වන දවස් **නකුල** නම් නියම් ගම **නකුලා** නම් සිටු දියණියන් දුන් කිරි බත වළඳා සල් වෙනෙහි දවල් දවස් යවා, සවස **සිරිවඩ්ඪන**[2] නම් ආජීවකයන් දුන් හී තණ හැර ගෙන ඔබට බෝධි බක් මී ගස හෙයින් **බක් මී** බෝධීන් වහන්සේ කරා එළඹ ගෙන ගිය තණ සලා බිම වගුරුවා, විසිරියන් තණ ඇතිරිය මත්තෙහි හිඳ බුදු ව සත් සති යවා, දහම් සක පවත්වා ජන සංග්‍රහ සඳහා දනවූ සැරි සරන සේක.

---

1 වසුදත්තා. 2 සිරිවඩ්ඪ.

එ කල අප මහ බෝසත්හු සියලු ලෙසින් නිරුත්තර වූ **උත්තර** නම් දරු ව[1], අසූ කෙළක් වස්තුව බුදු සස්නට ම වියදම් කොට සසුන් වැද මහණ ව ලොවුතුරා ගුණ නොලදත් ඔබ ගෙනුත් විවරණ ලදින්—

ඔබට ඉක්බිති ව එම කප **සුජාත** නම් බෝසත්හු පැරුම් පුරා නිමි හෙයින් තුසී පුරෙන් සැව **සුමඞ්ගල** නම් නුවර සියලු ලෙසින් උද්ගත හෙයින් **උද්ගත** නම් රජුන් නිසා. **ප්‍රභාවතී** නම් බිසොවුන් කුස පිළිසිඳ ගෙන දසමස් අයාමෙන් මවු කුසින් බිහි ව, වැඩී විය පැමිණ දස දහසක් හවුරුදු ගිහි ගෙයි වැස, තෙ විසි දහසක් පුරඟනන්ට ප්‍රධාන වූ **සිරිනන්ද** නම් බිසොවුන් **උපසේන** නම් පුතණුවන් වැදූ කල්හි මහබිනික්මන් නික්මෙන ගමනේ **හංස වසභ** නම් අස් වාහනයෙකින් නික්ම කෙළක් පමණ මිනිසුන් හා සමඟ මහණ ව, නව මසක් බුදු වන්නට වීර්‍ය්‍ය කොට බුදු වන දවස් **සිරිනන්‍ද** නම් නුවට **සිරිනන්‍ද** නම් සිටාණන් ගේ දියණියන් දුන් කිරි බත වළඳා සල් වෙනෙහි දවල් දවස් යවා සවස **සුනන්ද** නම් ආජීවකයන් දුන් හී තණ හැර ගෙන ඔබටත් බෝධි හුණ ගස හෙයින් ඒ **හුණ** බෝධීන් වහන්සේ කරා ගොසින් හී තණ සලා'බිම වගුරුවා, තෙ තිස් රියන් තණ ඇතිරිය මත්තෙහි වැඩ හිඳ බුදු ව සත් සති යවා **උතුම්** වූ දහම් සක පවත්වා, ජන සංග්‍රහ සඳහා දනවු සැරි සරන සේක.

එ කල අප මහ බෝසත්හු **සක්විති** රජ ව ඉපැද බුදුන් කරා ගොසින් ආයර්‍ය ධනය[2] ලබන්ට රුවන් සතත් බුදු වන්ට පුදු චතුස්සත්‍ය ප්‍රතිවේධය නිසා කොදිව් සහිත සතර මහ දිවයිනත්[3] පුද, රටින් උපන් අයෙක් ඇත් නම් නම් ඉන් බුදු පාමොක් මහ සඟනට උපස්ථාන කරන්නට රට වැස්සන්ට නිල කරවා ලා මහණ ව ඒ සුජාත නම් බුදුන්ගෙන් ද විවරණ ලදින්—

ඔබට ඉක්බිති ව මේ අප ගේ බුදුන් බුදු වූ කපට එක් සිය අටළොස් කප් තිබිය දී එක් කපෙක **පියදස්සි** නම් බෝසත්හු පුරා නිමියා වූ පැරුම් ඇති හෙයින් තුසී පුරෙන් සැව **සුධඤ්ඤ** නම් නුවර **සුදත්ත** නම් රජුන් නිසා පුන් සඳක් වැනි සොම් මුහුණක් ඇති හෙයින් **චන්ද්‍රා** නම් බිසොවුන් කුස පිළිසිඳ ගෙන දස මස් අයාමෙන් මවු කුසින් බිහි ව නව දහසක්[4] හවුරුදු ගිහි සැපත් වළඳා තෙ තිස් දහසක් පුරඟනන්ට ප්‍රධාන වූ **විමලා** නම් බිසොවුන් **කඤ්චනාවේළ** නම් පුත්රුවන වැදූ කල්හි රථ වාහන - යෙකින් මහබිනික්මන් නික්ම කෙළක් පමණ මිනිසුන් හා සමඟ මහණ ව, ස මසක් බුදු වන්ට වීර්‍ය්‍ය කොට, බුදු වන දවස් **වරුණ** නම් බමුණු ගම **වසභ** නම් බමුණාණන් ගේ දියණියන් දුන් කිරි

1 ළදරු. 2 ආර්‍ය ධනව්‍ය. 3 කොදෙව්. 4 දස දසක්.

බත වළඳා, සල් උයන්හි දවල් දවස් යවා, සවස **සුජාත** නම් ආජීවකයන් දුන් හී තණ හැර ගෙන තමන් වහන්සේට බෝධි කුඹුක් ගස හෙයින් **කුඹුක්** බෝධීන් වහන්සේ කරා එළඹ, ගෙන ගිය හී තණ සලා බිම වගුරුවා, තෙ පනස් රියන් තණ ඇතිරියෙහි හිඳ බුදු ව සත් සති යවා බ්‍රහ්මාරාධනාවෙන් බණ දෙසා සත්ත්වානුග්‍රහ පිණිස දනවු සැරිසරන සේක.

එ කල අප මහ බෝසත්හු කාශ්‍යප නම් බ්‍රාහ්මණ ව බුදුන් කරා ගොසින් ඔබ ගෙන් බණ අසා ති ලකුණු මෙනෙහි කිරීමෙන් ත්‍රිවෙදය අත් හැර තිසරණ පිහිටා, කෙළ ලක්ෂයන් පමණ ධන වියදම් කොට විහාරයකුත් කරවා දන් දී ඔබ ගෙනුත් විවරණ ලදින්—

ඔබට ඉක්බිති ව එම කප **අත්ථදස්සී** නම් බෝසත්හුපුන් පැරුම් ඇති ව, තුසී පුරෙන් චුත ව **ශොභන** නම් නුවර **සාගර** නම් රජුන් නිසා **සුදෙවුන්** නම් බිසොවුන් කුස පිළිසිඳ ගෙන දස මස් අයාමෙන් මවු කුසින් බිහි ව වැඩී විය පැමිණ දස දහසක් හවුරුදු ගිහි සැපත් වළඳා තිස් දහසක් පුරඟනන්ට ප්‍රධාන වූ **විශාඛා** නම් බිසොවුන් **සෙල** නම් පුතණුවන් වැදූ කල්හි, අස් වාහනයෙකින් මහබිනික්මන් නික්ම නව කෙළක් පමණ මිනිසුන් හා සමඟ මහණව අට මසක් ප්‍රධන් වීර්‍ය්‍ය කොට බුදුවන දවස් සුවින්දිරා[1] නම් නාග මාණවිකාවන් දුන් කිරි බත වළඳා, සල් වෙනෙහි දවල් දවස් යවා සවස් වේලෙහි මහා රුචි නම් නා රජහු දුන් හී තණ හැර ගෙන තමන් වහන්සේට බෝධි සපුගස හෙයින් **සපු** බොධීන් වහන්සේ කරා එළඹ[2] හී තණ සලා බිම වගුරුවා තෙ පනස් රියන් තණ ඇතිරිය මත්තෙහි හිඳ බුදු ව සත් සති යවා බ්‍රහ්මාරාධනාවෙන් ධම් සක් පවත්වා, ජන සංග්‍රහ සඳහා දනවු සැරි සරන සේක.

එ කල අප මහ බෝසත්හු **චම්පක** නම් නුවර **සුසීම** නම් බ්‍රාහ්මණ ව, කෙළ ගණන් සැපත් යාචකයන්ට දන් දී හිමවූ – පියසට ගොසින් මහණ ව අභිඥලාභී ව **අත්ථදස්සී** නම් බුදුන් ලොව පහළ වූ නියාව අසා ඔබ කරා ගොසින් ඔබ වස්වන දහම් වැසි දැක තමන් දැගේ අනුභාවයෙන් සතර මහා දිවයින එක පැහැර වස්වන වැස්සක් පරිද්දෙන් පරසතු-මඳාර ආදී වූ දිව මල් වැසි වස්වා, මට මල් තොරණ ආදිය මවා, මදරා මලක් බුදු වන්ට කුඩයක් කොට සිට 'මේ මට කළ මල් කුඩයට තුන්ලොව පතළ කීර්ති නමැති හෙළ කුඩ ලදීන් බුද්ධ රාජ්‍යය[3] සාධා ගෙන සද්ධම් වර චක්‍රවර්ති වෙයි' කියා ඔබ ගෙනුත් විවරණ ලදින්—

---

1 සුවින්දරා- සුවින්ධරා. 2 එළඹ ගොසින් 3 බුද්ධරාජ්‍යය.

ඔබට ඉක්බිති ව එ ම කප **ධම්මදස්සී** නම් බෝසත්හු පුන් පැරුම් ඇති හෙයින් තුසී පුරෙන් සැව **සරණ** නම් නුවර සියලු ලෝ වැස්සන්ට සරණ ව සිටිනා **සරණ** නම් රජුන් නිසා **සුනන්ද** නම් බිසොවුන් කුස පිළිසිඳ ගෙන දස මස් අයාමෙන් මවු කුසින් බිහි ව, වැඩි විය පැමිණ අධිකරණ ශාස්ත්‍ර පොත්වල යුක්ති පමණක් තිබිය දී අයුක්ති නැති කරවා අට දහසක් හවුරුදු රජ සිරි විඳ, එක් ලක්ෂ විසි දහසක් පුරඟනන්ට ප්‍රධාන වූ **විචිකොලි**[1] නම් බිසොවුන් **පුඤ්ඤවඩ්ඪන** නම් කුමාරයන් වැදූ කල්හි 'මහණ වන්ට නික්මෙමි'යි සිතූ සිතුවිල්ල හා සමඟ සුදසුන් නම් මහ පාය තෙමේ ම වාහන ව අහසට නැඟී එක් අතකට ගමන් ගත් බඹ විමනක් පරිද්දෙන් සියුරඟ[2] සෙනඟ හා සමඟ අහසින් ගොසින් **රත් කරවූ** බෝධියට ආසන්න ව ලා බිම පිහිටා සිටි ය. මහා පුරුෂයාණෝ ද ඇතුළු මාළිගාවේ දී ම මහණවැ ලා මාළිගාවෙන් බැසලා සිටියහ. මාළිගාව පෙරළාත් අහසින් ගොසින් **රත්කරවූ** බෝධිය මධ්‍ය කෙරෙමින් බෝධි ගෙවල් කරන්නවුන්ට ආදර්‍ශ වන්නා සේ පිහිටා සිටි ය. බිසෝ වරුන් පටන් ගෑනු මුළුල්ල මාලිගාවෙන් බැස පියා ගවු සමාරක් විතරට පලා ගොසින් සිටියහ. මහාපුරුෂයාණන් මහණ වන විට පිරිමි කෙළ ලක්ෂයක් විතර මහණ වූ හ. මෙ සේ මහා පුරුෂයාණෝ මහණ ව ලා සතියක් ප්‍රධන් වීර්‍ය්‍ය කොට බුදු වන දවස් විචි-කෝලි බිසොවුන් දුන් කිරි බත වළඳා ඩෙබර වෙනෙහි දහවල් දවස් යවා සවස් වේලෙහි **සිරිවඩ්ඪ** නම් යව පල්ලා දුන් හී තණ හැර ගෙණ **රත්කරවූ** බෝධින් වහන්සේ කරා ගොසින් හී තණ සලා බිම වගුරුවා, තෙ පනස් රියන් තණ ඇතිරියෙහි හිඳ බුදු ව සත් සති යවා බඹහු ගේ අයදමෙන් බණ දෙසා, ජනානුග්‍රහ පිණිස දනවූ සැරි සරන සේක.

එ කල අපගේ බෝසත්හු **සක්** දෙවිඳු ව දෙ දෙව් ලොව දෙවියන් පිරිවරා අවුත් දිව්‍ය තූර්යයෙන් පූජා කරවා ඔබ ගෙනුත් විවරණ ලදින්—

ඔබට ඉක්බිති ව එ තැනින් එක් දස් සත් සිය කප් සයක් විතර ගි ය කලට මෙ කපට අනු සතරවන කප **සිද්ධාර්ථ** නම් බෝසත්හු පැරුම් පුරා නිමි හෙයින් තුසී පුරෙන් චුත ව **වෙභාර** නුවර **උදේනී** නම් රජුන් නිසා, **සුඵස්සා** නම් බිසව කුස පිළිසිඳ ගෙන දස මස් අයාමෙන් වලා ගැබකින් නිකුත් වන පුන් සඳක් මෙන් බිහි ව වැඩි විය පැමිණ දස දහසක් අවුරුදු මුළුල්ලෙහි ගිහි සැපත් වළඳා අට සාළිස් දහසක් පුරඟනන්ට ප්‍රධාන වූ **සොමනස්** නම් බිසොවුන් අනුපම නම් පුතණුවන් වැදූ කල්හි

---

1 විචකොලි. 2 සිව්රඟ – සිවුරඟ

රන් සිවි ගෙයෙකින් මහබිනික්මන් නික්ම කෙළ ලක්ෂයක් පමණ පුරුෂයන් හා සමඟ මහණ ව දස මසක් ප්‍රධන් වීර්‍ය කොට බුදු වන දවස් **අසදිස** නම් බමුණු ගම **සුනෙත්තා** නම් බැමිණිය දුන් කිරි බත වළඳා ඩෙබර වෙනෙහි දහවල් දවස් යවා සවස **වරුණ** නම් යව පල්ලා දුන් හීතණ හැරගෙන ඔබට බෝධි කිණිහිරිගස හෙයින් කිණිහිරි බෝධීන් වහන්සේ කරා ගොසින් ගෙන ගිය හී තණ සලා බිම වගුරුවා සතළිස් රියන් තණ ඇතිරියෙහි හිඳ බුදු ව සත් සති යවා බ්‍රහ්මාරාධනාවෙන් බණ දෙසා සත්වෝපකාර සඳහා දනවු සැරි සරන සේක.

එ කල අප ගේ බෝසත්හු **සූරසේන** නම් රට **මංගල** නම් නුවර **මංගල** නම් බ්‍රාහ්මණ ව මහ සම්පත් දුක්පතුන්ට දන් දී තවුස් වෙස් ගෙන මහණ ව අභිඥාලාභී ව **සිද්ධාර්‍ථ** නම් බුදුන් උපන් නියාව අසා බුදුන් කරා අවුත් නිවන් රසයෙන් රසවක් කොට වදළ බණ අසා පැහැද දනක් දෙන්ට වස්තුව ආදි ම නිම් හෙයින් යම්-හෙයකින් "යම් දඹයක් නිසා මේ දිවයිනට දඹ දිව" ය යි කියද් ද ඒ දඹ ගස කරා ගොසින් දඹ ගෙනවුත් අනූ කෙ-ළක් මහණ ගණයා හා සමඟ **සිද්ධාර්‍ථ** බුදුන් වළඳවා සර්‍වඥතා-ඥන නැමැති අමා රස ලබන නියාවට ඔබ ගෙනුත් විවරණ ලදින්-

තව ද ඔබට ඉක්බිති ව මෙ කපට දෙයානූ වන කප පුන් පැරුම් ඇති **තිස්ස** නම් බෝසත්හු තුසීපුරෙන් සැව **ඛේම** නම් නුවර **ජනසණ්ඩ** නම් රජුන් නිසා **පියුම්** නම් බිසොවුන් කුස පිළිසිඳගෙන දස මස් අයාමෙන් මවු කුසින් බිහි ව වැඩි විය පැමිණ සත් දහසක් හවුරුදු රජසැපත් වළඳා තෙතිස් දහසක් පුරඟ-නන්ට ප්‍රධාන වූ **සුභද්‍රා** නම් බිසොවුන් **ආනන්ද** නම් පුතණුවන් වැදූ කල්හි අස් වාහනයෙකින් මහබිනික්මන් නික්ම මිනිසුන් කෙළක් හා සමඟ මහණ ව අට මසක් ප්‍රධන් වීර්‍ය කොට බුදු වන දවස් **වීර** නම් නියම් ගම **වීර** නම් සිටාණන් ගේ දියණියන් දුන් කිරිබත වළඳා සළල වෙනෙහි දහවල් දවස් යවා සවස **විජිත සංගාම** නම් යව පල්ලා දුන් හී තණ ගෙන තමන් වහන්සේට බෝධි පියා ගස හෙයින් ඒ බෝධීන් වහන්සේ කරා එළඹ[1] ගෙන ගිය හී තණ සලා බිම වගුරුවා සතළිස් රියන් තණ ඇතිරියෙහි වැඩ හිඳ බුදු ව සත් සති යවා උතුම් වූ දහම් සක බ්‍රහ්මාරාධනා-වෙන් පවත්වා '**බුද්ධො බොධෙය්‍යං**' යන පිළිණ ලෙසට දඹ දිව සැරි සරන සේක.

එ කල අප ගේ බෝසත්හු **යසවත්** නම් නුවර **සුජාත** නම් රජ ව ඉපැද රජ සම්පතටත් වඩා නිවන් සම්පත් උතුම් හෙයින් රජ සැපත් හැර මහණ ව අභිඥාලාභි ව බුදුන් ලෙව්හි

1 එළැඹැ, එළඹ.

පහළ වූ නියාව අසා ඒ **තිස්ස** නම් බුදුන් කරා අවුත් 'ඔබට පූජාවක් කෙරෙමි'යි සිතා දෙව් ලොවට පලා ගොසින් සිතුලිය වන ආදියෙහි ඇවිද ගවුවක් සා රුවන් කරඬුවක නො එක් පෑ ඇති මල් පුරා ගෙන අහසින් අවුත් පුදු ලා ඉඳු නිල් මිණි මුවා දණ්ඩක් ඇති රන්මුවා පියුම් කෙමියක් ඇති රත් වූ පියුම් කෙසරු ඇති පියුම් සතක් බුදුන් මුදුනට කොට ඔබ ගෙනුත් විවරණ ලදින්—

තව ද ඔබට ඉක්බිති ව එම කප පුන් පැරුම් ඇති **ඵුස්ස** නම් බෝසත්හු තුසී පුරෙන් චුත ව **කසී** නුවර ජයසේන නම් රජ්ජුරුවන් නිසා **සිරිමා** නම් බිසොවුන් කුස පිළිසිඳ ගෙන දස මස් අයාමෙන් මවු කුසින් බිහි ව වැඩි විය පැමිණ සදසක් හවුරුදු ගිහි සම්පත් වළඳා තිස් දහසක් පුරඟනන්ට ප්‍රධාන වූ **කිසා ගෝතමි** නම බිසොවුන් **අනුපම** නම් පුතණුවන් වැදූ කල්හි ඇත් වාහනයෙකින් මහබිනික්මන් නික්ම කෙළක් පමණ මිනිසුන් හා සමඟ මහණ ව ස මසක් බුදු වන්ට වීර්‍ය්‍ය කොට බුදු වන දවස් එක්තරා නුවරෙක සිටු දියණි කෙනකුන් දුන් කිරි බත වළඳා හිංසලු වෙනෙහි දවල් දවස් යවා. සවස **සිරිවඩු** නම් තවුසාණ කෙනකුන් දුන් හී තණ හැර ගෙන තමන් වහන්සේට බෝධි ඇඹුල ගස හෙයින් **ඇඹුල** බොධීන් වහන්සේ කරා එළඹ, ගෙන ගිය හී තණ සලා වගුරුවා අට තිස් රියන් තණ ඇතිරිය මත්තෙහි හිඳ බුදු ව සත් සති යවා බ්‍රහ්මාරාධනාවෙන් උතුම් වූ දහම් සක පවත්වා ජන සංග්‍රහ නිසා දනවු සැරි සරන සේක.

එ කල අප මහ බෝසත්හු **විජිතාවි** නම් රජ ව ඒ බුදුන්ගේ බණ අසා මහ දන් දී රජ සැපත් හැර සසුන් වැද මහණ ව තෙවළා බුදු වදන් ඉගෙන එ වක ප්‍රසිද්ධ වූවා සේ ම පසු ව බුදු වත් ප්‍රසිද්ධ වන නියාවට ඔබ ගෙනු ත් විවරණ ලදින්—

තව ද ඔබට ඉක්බිති ව මේ කපට එකානූ වන කප පුන් පැරුම් ඇති **විපස්සී** නම් බෝසත්හු **තුසී** පුරෙන් සැව **බන්ධුමතී** නම් නුවර නොයෙක් බන්ධූන් ඇති **බන්ධූමා** නම රජුන් නිසා **බන්ධූමතී** නම් බිසොවුන් කුස පිළිසිඳගෙන දස මස අයාමෙන් මවු කුසින් බිහි ව වැඩි විය පැමිණ අට දහසක් හවුරුදු ගිහි සැපත් වළඳා එක් ලක්‍ෂ විසි දහසක් පුරඟනන්ට ප්‍රධාන වූ **සුතනු** නම් බිසොවුන් **සමවත්තක්ඛන්ධ** නම් පුතණුවන් වැදූ කල්හි රථ වාහනයෙකින් මහබිනික්මන් නික්ම සුවාසූ දහසක් පමණ පුරුෂයන් හා සමඟ මහණ ව අටම **සක්** මුළුල්ලෙහි බුදු වන්ට දුෂ්කර ක්‍රියා පුරා බුදු වන දවස් **සුදසුන්** නම් සිටු දියණියන් දුන් කිරි බත

වළඳා සල් වෙනෙහි දවල් දවස් යවා සවස් වේලෙහි **සුජාත** නම් යව පල්ලා දුන් හී තණ හැර ගෙන ඔබට බෝධි **පළලු** ගස හෙයින් ඒ බෝධීන්වහන්සේ කරා එළඹ, ගෙන ගිය හී තණ සලා වගුරුවා තෙ පනස් රියන් තණ ඇතිරිය මත්තෙහි හිඳ බුදු ව සත් සති යවා උතුම් වූ දහම් සක පවත්වා සත්ත්වානුග්‍රහ සඳහා දනවු සැරි සරන සේක.

එ කල අප මහ බෝසත්හු **අතුල** නම් දිව්‍ය නාග ව[1] ඉපැද සහපිරිවරින් බුදුන් කරා අවුත් සඳ මඬල බිම තුබුවා සේ මනහර රුවන් මඩුවක් මවා සතියක් මුළුල්ලෙහි මහ දන් දී බුදු බැවින් පිහිට ලබන්නට සත් රුවන් මුවා පුටුවක් දන් දී ඔබ ගෙනුත් විවරණ ලදින්—

තව ද ඔබට ඉක්බිති ව එයින් එකුන් සැටක් කප් ගිය කලට මෙයට එක් තිස් වන කප වියළි දරින් ඇවිළී ගිතෙල් ඉස්-මෙන් සතුටු වූ වහ්නි ශිඛාවක් වැනි තේජස් ඇති **ශිඛී** නම් බෝසත්හු පැරුම් පුරා නිමි හෙයින් තුසී පුරෙන් චුත ව සම්පත්තීන් අරුණක් නැතත් නමින් **අරුණවතී** නම් නුවර ගුණෙන් අරු-ණක් නැතත් නමින් **අරුණවතී** නම් රජුන් නිසා රන් පිඩු රැස් වළල්ලක්[2] සේ ශොභාවත් බැවින් **ප්‍රභාවතී** නම් බිසොවුන් කුස පිළිසිඳ ගෙන දසමස් අයාමෙන් මවු කුසින් බිහි ව වැඩී විය පැමි-ණ සත් දහසක් හවුරුදු ගිහි ගෙයි වැස සූ විසි දහසක් පුරඟනන්-ට ප්‍රධාන වූ **සබ්බකාමා** නම් බිසොවුන් **අතුල** නම් පුතණුවන් වැදූකල්හි ඇත් වාහනයෙකින් මහ බිනික්මන් නික්ම සැත්තෑ ලක්ෂ-යක් පුරුෂයන් හා සමඟ මහණ ව අට මසක් මුළුල්ලෙහි බුදුවන්ට වීරිය කොට බුදු වන දවස් **සුදසුන්** නම් නියම් ගම **සුදසුන්** නම් සිටු දියණි ශකනකුන් දුන් කිරි බත වළඳා ඩෙබර වෙනෙහි දවල් දවස් යවා සවස් වේලෙහි **අනෝමදස්සී** නම් තවුසාණන් දුන් හී තණ හැර ගෙන ඔබට බෝධි ඇටඹ ගස හෙයින් **ඇටඹ** බෝධිය කරා එළඹ, ගෙන ගිය හී තණ සලා බිම වගුරුවා සූවිසි රියන් තණ ඇතිරිය මත්තෙහි හිඳ බුදු ව සත් සති යවා බ්‍රහ්මාරාධනා-වෙන් දහම් සක පවත්වා සත්ත්වානුග්‍රහ පිණිස දනවු සැරි සරන සේක.

එ කල අප මහ බෝසත්හු **අරින්දම** නම් රජ ව ඉපැද බුදුන් ලොව පහළ වූ නියාව අසා බුදුන් කරා එළඹ, බුදුන් පවරා ගෙන සතියක් මුළුල්ලෙහි මහ දන් දී කෙළවර දවස් මාහැඟි පිළිත් දන් දී බුද්ධනාගත්වය පතා නැඟී ගෙන ගිය ඇතුත් දන් දී ඇතු උස පමණ කැප පිරිකරත් දන් දීලා දුන් පිරිකරට වඩනා තරමේ ඔබ ගෙනුත් විවරණ ලදින්—

---

1 දිව්‍ය නාගරාජ ව.
2 රත් පිඩ වල්ලක් සේ හෝ පිඩ රැස් වල්ලක් සේ.

නැවතත් ඔබට ඉක්බිති ව එම කප සියලු ලෝ වැස්සන් මැඩ පවත්වන්නා වූ **වෙස්සභූ** නම් බෝසත්හු පැරුම් පුරා **නිමි-යෙන්** තුසී පුරෙන් චුත ව උපමා රහිත හෙයින් අනුපම නම් නුවර ඉතා ප්‍රසිද්ධ හෙයින් **සුප්පතීත** නම් රජුන් නිසා **යසවතී** නම් බිසොවුන් කුස පිළිසිඳ ගෙන දස මස් අයාමෙන් මවු කුසින් බිහි ව වැඩි විය පැමිණ ස දහසක් හවුරුදු ගිහි සැපත් වළඳා තිස් දහසක් පුරඟනන්ට ප්‍රධාන වූ **සුචිත්තා** නම් බිසොවුන් **සුප්පබුද්ධ** නම් කුමරුවන් වැදූ කල්හි මහබිනික්මන් නික්මෙන කල රන් සිවි ගෙයෙකින් නික්ම ස තිස් දහස් දෙනා හා සමඟ මහණ ව ස මසක් මුළුල්ලෙහි බුදු වන්ට වීර්‍ය්‍ය කොට බුදු වන දවස් **සුචිත්ත** නම් නියම් ගමදී **සිරිවැඩි** නම් නැයින්න[1] දුන් කිරි බත වළඳා සල් වෙනෙහි දහවල් දවස් යවා සවස් වේලෙහි **නරින්ද** නම් නා රජුන් දුන් හී තණ හැර ගෙන ඔබට බෝධි **සල්** ගස හෙයින් ඔබ කරා එළඹ ගෙන ගිය හී තණ සලා වගුරුවා සතළිස් රියන් තණ ඇතිරිය මත්තෙහි වැඩ හිඳ බුදු ව සත් සති යවා දහම් සක පවත්වා ජන සංග්‍රහ සඳහා දනවු සැරි සරන සේක.

එ කල අප මහ බෝසත්හු සුදසුන් නම් රජ ව බුදු පාමොක් සඟනට මහ දන් දී එපමණෙක නො සිට සිවුරු පිරිකරත් දන් දෙවා බුදුන් වසනු පිණිස ගඳකිළියකුත් කරවා ඒ වටා විහාර දහසකුත් කරවා සියලු සම්පත් බුදු සස්නට ම වියදම් කොට ඔබ ළඟ මහණ ව අවිශේෂ කොට ශීල පාරමිතා ම පුරා ඔබ ගෙ-නුත් විවරණ ලදින්—

ඔබට ඉක්බිති ව ඒ කපත් නිමා ගොසින් මධ්‍යයෙනුත් විසි නව කපක් ගිය කලට සර්වඥවරයන් වහන්සේ පස් නමක ගෙන් හෙබි හෙයින් **භද්‍ර කල්ප** නම් වූ මේ කප **කකුසඳ** නම් බෝසත්හු තුසී පුරෙන් සැව **ඛේමවතී** නම් නුවර **ඛේම** රජ්ජුරුවන්ට පුරෝ-හිත වූ **අග්ගිදත්ත** නම් බමුණාණන් නිසා, **විශාඛා** නම් බ්‍රාහ්මණීන් කුස පිළිසිඳ ගෙන දසමස් අයාමෙන් මවු කුසින් රන් ගුහාවෙකින් නික්මෙන රන්වන් හංසයක්හු මෙන් බිහි ව වැඩි විය පැමිණ සාර දහසක් හවුරුදු ගිහි සැපත් වළඳා **රෝචිනී** නම් බ්‍රාහ්මණීන් **උත්තර** නම් කුමාරයන් වැදූ කල්හි රථ වාහනයෙකින් මහ-භිනික්මන් නික්ම සතළිස් දහසක් දෙනා හා සමඟ මහණ ව අට මසක් වීර්‍ය්‍ය කොට බුදු වන දවස් **සුචින්දර** නම් නියම් ගම **වජිරින්ද** නම් බමුණාණන් ගේ දියණියන් දුන් කිරි බත වළඳා ඩෙබර වෙනෙහි දවල් දවස් යවා, සවස් වේලෙහි **සුභද්ද** නම් යව පල්ලා දුන් හී තණ හැර ගෙන තමන් වහන්සේට බෝධි

1 නා මෙනෙවිය.

**මහරි** ගස හෙයින් ඒ බෝධීන් වහන්සේ කරා එළඹ ගෙන **ගිය** හී තණ බිම සලා වගුරුවා **සූ** තිස් රියන් තණ ඇතිරිය මත්තෙහි හිඳ බුදු ව **සත් සති** යවා බ්‍රහ්මාරාධනාවෙන් දහම්සක **පවත්වා** ජන සංග්‍රහ සඳහා දනවු සැරි සරන සේක.

එ කල අප මහ බෝසත්හු **ඛේම** නම් රජ ව බුදු පාමොක් සඟනට සිවුරු පිරිකර සහිත වූ මහ දන් දී බෙහෙත් බඩුත් පිළිගන්වා ඔබගෙනුත් විවරණ ලදින්:

තව ද ඔබට ඉක්බිති ව මෙම කප **කෝනාගමන** නම් බෝසත්හු තුසී පුරෙන් සැව **ශෝභාවතී** නම් නුවර **යඥදත්ත** නම් බමුණු උතුමාණන් නිසා **උත්තරා** නම් බ්‍රාහ්මණීන් කුස පිළිසිඳ-ගෙන දස මස් අයාමෙන් මවු කුසින් බිහි ව වැඩි විය පැමිණ තුන් දහසක් හවුරුදු ගිහි සැපත් වළඳා සොළොස් දහසක් බ්‍රාහ්මණීන්ට ප්‍රධාන වූ **රුචිගත්තා** නම් බ්‍රාහ්මණීන් සත්‍ථවාහ නම් පුතණුවන් වැදූ කල්හි මහබිනික්මන් නික්මෙන ද ඇත් වාහනයෙකින් නික්ම තිස් දහසක් දෙනා හා සමඟ මහණ ව සමසක් බුදු වන්ට වීය්‍ය කොට බුදු වන දවස් **අග්ගිසේන** නම් බමුණාණන් ගේ දියණියන් දුන් කිරි බත වළඳා ඩෙබර වෙනෙහි දවල් දවස් යවා සවස් වේලෙහි **තින්දුක** නම් යව පල්ලා දුන් හී තණ හැරගෙන තමන් වහන්සේට බෝධි දිඹුල් ගස හෙයින් **දිඹුල්** බෝධීන් වහන්සේ කරා එළඹ ගෙන ගිය හී තණ සලා බිම වගුරුවා විසි රියන් තණ ඇතිරිය මත්තෙහි හිඳ බුදු ව සත් සති යවා මහ බඹහු ගේ ඇයැදුමෙන් බණ දෙසා සත්ත්වෝපකාර සඳහා දනවු සැරිසරන සේක.

එ කල අප මහ බෝසත්හු මිළිඳු නුවර **පර්වත** නම් රජ ව **කෝනාගමන** බුදුන් මිළිඳු නුවරට වැඩි නියාව අසා බුදුන් කරා එළඹ ආරාධනා කොට මහ දන් දී වසත් පැමිණි හෙයින් වසුත් වස්වා, තුන් මස මුළුල්ලෙහි මහා ප්‍රවාහයක් මෙන් හෙවත් මහ වතුරක් මෙන් මහ දන් දී වස් අන්තයෙහි සළු පිළි ආදිය කප්වා සිවුරු ද දන් දී ඔබගෙනුත් විවරණ ලදින්—

තව ද ඔබට ඉක්බිති ව මෙම කප **කසුප්** නම් බෝසත්හු පැරුම් පුරා නිමි හෙයින් තුසී පුරයෙන් සැව බරණැස් නුවර **බඹ-දත්** නම් බ්‍රාහ්මණ උතුමාණන් නිසා **ධනවතී** නම් බ්‍රාහ්මණීන් කුස පිළිසිඳ ගෙන දස මස් අයාමෙන් මවු කුසින් බිහි ව වැඩි විය පැමිණ දෙදහක් හවුරුදු ගිහි ගෙයි වැස අට **සාළිස් දහසක් බ්‍රාහ්ම-ණීන්ට** ප්‍රධාන වූ **සුනන්ද** නම් බ්‍රාහ්මණීන් **විජිතසේන** නම් පුතණුවන් වැදූ කල්හි මහබිනික්මන් නික්මෙන්ට සිතූ ද ය.

---

1. යඤ්ඤදත්ත

සිතූ සිත්විල්ල හා සමඟ ම වැද හුන් මාළිගාව වාහන සරසා ගෙනෙන කල කල් යවන්නා සේ අහසට පැන නැඟිලා තරු කැල පිරිවැරූ පුන්සඳක් මෙන් නො එක් දෙනා පිරවරා අහස් නැමැති වියනෙහි වියන් සිත්තමක් මෙන් ද කුසලානුභාවය හඟවන්නාක් මෙන් ද, සත්ත්වයන් ගේ ඇස් තමා කරා නම්වන්නාක් මෙන් ද ගස් කොළ අක් පොළඹන්නාක් මෙන් ද ගොසින් නුග බෝධිය මද්ධ්‍ය කොට ලා බෝධි ගෙයක් ව පිහිටා සිටි ය. කැටි ව ගියවුන් ගේ ගැනු මිනිසුන් හැර සෙස්සවුන් හා සමඟ මහණ වූ දෑ ය. නළු ගැනුත් මාළිගාවෙන් බැස පියා ගවු සමාරක් විතර පලා ගොසින් රඳා හුන්හ. මහා පුරුෂයාණෝ ද මෙ ලෙසින් මහණ ව ලා සතියක් ප්‍රධන් වීර්‍ය්‍ය කොට වෙසඟ මැදි පොහෝ දවස් සුනන්ද නම් බැමිණියන් දුන් කිරි බත වළඳා **ඩෙබර** වෙනෙහි දවල් දවස් යවා සවස් වේලෙහි **ඝොම** නම් යව පල්ලා දුන් හී තණ හැර ගෙන තමන් වහන්සේට බෝධි **නුග** ගස හෙයින් ඔබ කරා එළඹ ගෙන ගිය හී තණ සලා බිම වගුරුවා පසළොස් රියන් තණ ඇතිරියෙහි හිඳ බුදු ව සත් සති යවා මහ බඹු ගේ අයදමෙන් දහම්සක් පවත්වා ජන සංග්‍රහ සඳහා දනවු සැරිසරන සේක. එ කල අප මහ බෝසත්හු **ජෝතිපාල** නම් බ්‍රාහ්මණ ව **ඝටීකාර** නම් අනාගාමී කුඹල් උපාසකයාගේ සමවායෙන් බුදුන් කරා එළඹ බණ අසා බණ ලෙස පිළිපැදීම ශාසනික ව මුත් බැරි හෙයින් මහණ ව තිවට දුක් නසන නිසා තෙවළා බුදු වදන් ඉගෙන ඔබගෙනුත් විවරණ ලදිනැ යි—

මෙ සේ විසිදහසක් හවුරුද්දට ආයු ඇති වඩු රියනින් විසි රියන් උස ඇති **කසුප්** නම් බුදුහු ය. තිස් දහසක් හවුරුද්දට ආයු ඇති තිස් රියන් උස ඇති **කෝනාගමන** නම් බුදුහු ය. සතළිස් දහසක් හවුරුද්දකට ආයු ඇති සතළිස් රියන් උස ඇති **කකුසඳ** නම් බුදුහු යැ යි මෙ ම කප තමන් වහන්සේට පෙරාතු ව බුදු වූ තුන් තුන් දෙනා වහන්සේ ගෙන් ද, නැවත සැට දහසක් හවුරුද්දට ආයු ඇති සැට රියන් උස ඇති **වෙස්සභූ** නම් බුදුහු ය. සැත්තෑ දහසක් හවුරුද්දට ආයූ ඇති සැත්තෑ රියන් උස ඇති **සිඛී** නම් බුදුහු යැ යි. එක කප උපන් දෙදෙනා වහන්සේ ගෙන් ද, තව ද අසූ දහසක් හවුරුද්දට ආයු ඇති අසූ රියන් උස ඇති **විපස්සි** නම් බුදුන් ගෙන් ද, නැවත අනූ දහසක් හවුරුද්දට ආයු ඇති අට පනස් රියන් උස ඇති **ඵුස්ස** නම් බුදුහු ය, හවුරුදු ලක්ෂයකට ආයු ඇති සැට රියන් උස ඇති **තිස්ස** නම් බුදුහු යැ යි එක කප උපන් දෙදෙනා වහන්සේ ගෙන් ද, තව ද හවුරුදු ලක්ෂයකට ආයු ඇති

---

1 ගියවුන් ගෙන්

සැටරියන් උස ඇති **සිද්ධාත්ථ** නම් බුදුන් ගෙන් ද, තව ද හවුරුදු ලක්ෂයකට ආයු ඇති අසූ රියන් උස ඇති **ධම්මදස්සී** නම් බුදුහු ය. හවුරුදු ලක්ෂයකට ආයු ඇති අසූරියන් උස ඇති **අත්ථදස්සී** නම් නම් බුදුහු ය, අනූ දහසක් හවුරුද්දට ආයු ඇති අසූරියන් උස ඇති **පියදස්සී** නම් බුදුහු යැ යි එක කප උපන් තුන්දෙනා වහන්සේ ගෙන් ද, තව ද අනූ දහසක් හවුරුද්දට ආයු ඇති පනස් රියන් උස ඇති **සුජාතා** නම් බුදුහු ය. අනූ දහසක් හවුරුද්දට ආයු ඇති අටාසූ රියන් උස ඇති සුමෙධ නම් බුදුහු යැ යි එක කප උපන් දෙනම ගෙන් ද—

තව ද හවුරුදු ලක්ෂයකට ආයු ඇති අට පනස් රියන් උස ඇති උර දෙක හස්ස අටළොස් රියන් පළල ඇති පස් රියන් නළ ලක් ඇති එකළොස් රියන් අතුල් පතුල් ඇති හවුරුදු ලක්ෂයක් මුළුල්ලෙහි ඔබා ලූ පයට පොළොව පළාගෙන නැඟෙන අනූ රියන් පමණ මහ පෙති ඇති, තිස් රියන් පමණ කෙසරු ඇති නව කළයක් පමණ රෙහෙණු ඇති, රත් පියුමෙන් හෙළ පියුමෙන් ප්‍රසිද්ධ වූ **පියුමතුරා** නම් බුදුන් ගෙන් ද, තව ද, අනූ දහසක් හවුරුද්දට ආයු ඇති අටාසූ රියන් උස ඇති **නාරද** නම් බුදුහු ය, හවු-රුදු ලක්ෂයකට ආයු ඇති අට පනස් රියන් උස ඇති **පදුම** නම් බුදුහු ය. හවුරුදු ලක්ෂයකට ආයු ඇති අට පනස් රියන් උස ඇති **අනෝමදස්සී** නම් බුදුහු යැ යි එක කප උපන් තුන් දෙනා වහන් සේ ගෙන් ද, තව ද අනූදහසක් හවුරුද්දට ආයු ඇති අට පනස් රියන් උස ඇති **සෝභිත** නම් බුදුහු ය, සැට දහසක් හවුරුද්දට ආයු ඇති අසූරියන් උස ඇති **රේවත** නම් බුදුහු ය, අනූ දහසක් අවුරුද්දට ආයු ඇති අට අසූ රියන් උස ඇති **මඞ්ගල** නම් බුදුහු යැ යි එක කප උපන් තුන් දෙනා වහන්සේ ගෙන් ද, තව ද හවුරුදු ලක්ෂයකට ආයු ඇති අට අසූ රියන් උස ඇති **කොණ්ඩඤ්ඤ** නම් බුදුන්ගෙන් ද, හවුරුදු ලක්ෂයකට ආයු ඇති **දීපඞ්කර** නම් බුදුන් ගෙන් දැ යි සූ විස්සක් පමණ බුදුවරුන් වහන්සේ ගෙන් විවරණ ලදින් සම තිස් පැරුම් පුරා වෙසතුරු අත් බැව්හි සිට:

# 3. බුද්ධ චරිතය

**"අචේතනායං පඨවී – අවිඤ්ඤාය සුඛං දුඛං,**
**සාපි දානබලා මය්හං – සත්තක්ඛත්තුං පකම්පථ."**

යනු හෙයින් මහ පොළොව ගුගුරුවා මහ දන් දීමෙන් පැරුම් කුළු ගෙන, ආයු කෙළවර තුසී පුරෙහි ඉපැද සත් පනස් කෙළ සැට ලක්ෂයක් හවුරුදු දිව සැපත් වළඳා, දසදහසක් සක් වළ දෙවි බඹුන් අවුත් මෙ එක සක්වළට රැස් ව—

**"කාලෝයං තේ මහාවීර — උප්පජ්ජ මාතු කුච්ඡියං,**
**සදේවකං තාරයන්තෝ — බුජ්ඣස්සු අමතං පදං."**

යන හෙයින් බුදු වන්ට කල් දැන්වූ කල්හි කල් දෙස් ආදිය බලා බුදු වන්ට කල් නියාව දැන, උපදනට දඹදිවින් මධ්‍ය දේශයත් නියම කොට එ කලට රජ කුල ය උතුම් නියාවත් සලකා **මහා මායා** බිසොවුන් දස මස් සත් දවසකට ආයු ඇති නියාවත් දැන ඇසළ පුර පසළොස්වක් ලද අඟහරුවාද උතුරුසළ නැකතින් මධ්‍යම රාත්‍රි වේලෙහි තුසී පුරෙන් චුත ව, දඹදිව මැදුම් පියස කිඹුල්වත් නුවර **සුද්ධෝදන** රජ්පුරුවන් නිසා **මහාමායා** බිසො-වුන් කුස පිළිසිඳ ගෙන දස මස් මුළුල්ලෙහි දැවාණ කරඬුවකට වඩා ලූ රක් පිළිමයක් මෙන් වැස දස මස් අයාමෙන්—

**විභූසිතා බාලජනාතිවාලිනී**
**විභූසිතඞ්ගී වනිතේ ව මාලිනී**[1]
**තදා ජනානං නයනාලිමාලිනී**
**විලුම්බිනීවාති විරෝචි ලුම්බිනී**

යන තරමට සැරහී සිටි **ලුම්බිනී** වන නම් උයන්හි දී බිහි ව කලා-වෙන් කලාවට වඩනා සඳ පරිද්දෙන් වැඩි විය පැමිණ පුරා පිරු-වා වූ[2] ත්‍රිවිධ සුචරිතානුභාවයෙන් ත්‍රිවිධ ඍතුවට නිසි ව පහළ වූ මාළිගා තුනෙහි **බිම්බා** බිසොවුන් ප්‍රධාන කොට ඇති සතළිස් දහසක් පුරඟනන් පිරිවරා ශක්‍ර සම්පතට අපහාස්‍ය කරන්නාක් වැනි වූ රජ සැපත් විඳින දැ උයන් කෙළියට යන තුන් දවසෙක ජරා පිළිකුල් රුවක් — රෝගී රුවක් හා මළ රුවක් ද දැක සසර කලකිරී සතර වැනි මුරයේ සන්හුන් පියෝ ඇති මහණ රුවක් දැක මහණ වීමෙහි රුචි උපදවා එ දවස් උයනට ගොසින් උයන් කෙළියෙන් දවස් යවා මඟුල් පොකුණු බඩ සලවට මත්තෙහි හුන් දැ කපු වෙස් ගෙන ආ **විස්කම්** දෙව් පුත්හු විසින් සරහන ලදු ව—

**සුද්ධෝදන නරිනේද් – පේසිතං සාසනුත්තමං,**
**පුත්තෝ තෙ පුත්ත ජාතෝ'ති - සුත්වා තං දිපදුත්තමෝ.**

---

1 පාලිනී     2 පුරා පිවාවූ

යනු හෙයින් බිම්බා බිසොවුන් රහල් කුමරුවන් වැදූ නියා මහ-බිනික්මන් වහා නික්මෙන්ට කියා එවාලූ මෙහෙවරක් මෙන් **සුදෙවුන්** රජ්ජුරුවන් ගෙන් කියා යැවූ හස්න අසා ''දරු පෙම් නම් බලවත් දෙයක. පුත්‍ර ප්‍රතිලාභයට වඩා ශ්‍රමාණ්‍ය ඵල ප්‍රතිලාභය උතුම. තව ද මූ එක ම පුතණු කෙනෙක් වේද් ද? මහබිනික්මන් නික්ම බුදු වූවොත් අසඞ්ඛ්‍ය ගණන් දරුවන් ලද හැක්කැ'යි වැඩි යුරුවක් සිතා කරන යත්නයක් සේ එ දවස් ම මහබිනික්මන් නික්මෙන්නට සිතා ගෙන සවස් වේලෙහි දෝ නො හොත් සූර්ය නැමැති වල්ලහයා ගේ වියෝගයෙන් විල් නැමැති අඞ්ගනාවන් බඹර වැළ නැමැති වළලු ගලවන්ට පියුම් නැමැති අත් හකුළුවන්ට පටන් ගත් කල්හි මහ පෙළහරින් ඇතුළු නුවරට වඩනා දැ—

**'නිබ්බුතා නූන සා මාතා - නිබ්බුතෝ නූන සෝ පිතා,**
**නිබ්බුතා නූන සා නාරී – යස්සා'යං ඊදිසෝ පති.'**

යනු හෙයින් බැදැණි කෙනෙකුන් තුන් විටක් කොට ම 'නිවී ගියේ ය. සැනහී ගියේ ය''යි කියා ලූ යහපත් මුවට, හාරය අනඝ වුවත් පෙනී තුබූ ලක්ෂයක් අගනා මුත් හර ගලවා සතුටු හඟ-වන්ට යවා ලා තමන්දූ ගේ මාළිගාවට ගොසින් ශ්‍රී යහනේ හොත් දූ නිදන නළු ගැනුන් ගේ දත් කැම් ආදී වූ නො එක් විකට දැක තමන්ටදැට විවරණ දුන් සූ විස්සක් පමණ බුදුවරුන් වහන්සේ බුදු වන ජාතියෙහි උඩත් පිරිසෙයින් දස දහසක් හවුරුදු හා යටත් පිරිසෙයින් දෙ දහසක් හවුරු ගිහි සැපත් අනුභව කළත් විසිනව හවුරුද්දෙකින් ම ගිහි සැපතෙහි ඇලුම් හැර සසර තරයේ කලකිරී ගොසින් එක දවස් උපන් **සන්** නමැති ඇමති, රුවන් හිණි පා මුල හොත්තවුන් කැඳවාලා කන්ථක නම් අස් රජහු ගෙන්වා-ගෙන බුදු වූ කල ප්‍රඥ නැමැති සෛන්ධව අශ්වයා පිටට පැන නැඟී විෂය ව තුබූ අනන්තාප්‍රමාණ සක් වළවල ඥන ගතින් යන්ට අභ්‍යාස කරන්නාක් මෙන් ඒ අස් රජු පිටට නැඟී මිනිසුන් ගෙන් සන් ඇමැත්තන් හැරගෙන දස දහසක් සක්වළ දෙවි-බඹුන් පිරිවරා අනන්ත වූ පූජා සත්කාර ඇති ව මහබිනික්මන් නික්ම බුදු වන වේලෙහි සර්වඥතාඥන නමැති අසු පිටින් තෘෂ්ණා නමැති මහ ගඟ පැන නිවන් පරතෙරට පැමිණෙන්නා සේ ම **අනෝමා** නම් ගඟින් එ තෙර ව **සවීකාර** නම් මහ බඹු ගෙනා අට පිරිකරින් මහණ ව ගෙන සතියක් මුළුල්ලෙහි මහණ සුවෙන් දවස් යවා අට වැනි දවස් **රජගහා** නුවරට සිඟා ගොසින් ලද්ද වූ කෙණෙසි අහර **පාණ්ඩව** නම් ගල් තල්ලෙහි දී වළඳා අන්තයෙහි දී **බිම්සර** මහ රජුන් රාජ්‍යය කරන්නට ආරාධනා කළත්—

**'මා නික්ඛම මහාවීර - ඉතො තේ සත්තමෙ දිනෙ,**
**දිබ්බන්තු චක්ක රතනං - අද්ධා පාතුභවිස්සති '**

**කියා වසවත්** මරහු කළ ආරාධනාත් නො ඉවැසූ හෙයින් නො ඉවසා 'එසේ වී නම් බුදු වැ ලා අනික් නුවරකට නො වැඩ ආදියෙන් අප ගේ නුවරට වැඩිය මැනැ වැ'යි කළ ආරාධනාව එයින් උත්ට වන වැඩ බුදු නුවණින් නුදුටත් දම්සක් පවතුන් සූත්‍ර දෙශනාව බරණැස දී ම වුවමනා හෙයින් ඒ ගමන හැර ඉවසා ඉක්බිත්තෙන් **ආලාරක** නම් වූත් **උද්දක** නම් වූත් තවුසන් දෙන්නා කරා ගොසින් උන් දෙන්නා ගේ උපදෙසින් උපදවාගත් සමවත් පමණෙක නො සිටි විවරණ දුන් බුදුවරුන් වහන්සෙ උඩත් පිරිසෙයින් දස මසක් හා යටත් පිරිසෙයින් සතියක් බුදු වන්ට වීර්‍ය කළත් තමන් දැ සාවුරුද්දක් මුළුල්ලෙහි කරන්නා තබා සිතන්ටත් සෙස්සවුන්ට නො පිළිවන් මහා වීර්‍ය කොට එයින් බුද්ධත්‍ව ය සාදගත නොහී විරේචනයෙන් දුර්වල වූ ශරීරයක් ස්නේහ පානයෙන් සතපන්නා සේ දුෂ්කර ක්‍රියායෙන් මිරිකී ගිය ශරීරය උරුවෙල් දනවු ගොසින් මධුරාහාරයෙන් පිනවාගෙන බුදු වන කල් සමෘද්ධ හෙයින් වෙසඟ මැදි පොහෝ දවස්: —

**'තතො සේනානි නිගමෙ - සුජාතා නාම දරිකා,**
**වහමපාතිං ස පායාසා - සීසේනාදය ඕණතා.'**

යනු හෙයින් සෙනානී නම් නියම්ගම **සෙනානී** නම් සිටාණන් ගේ දුව **සුජාතාවන්** දුන් කිරි පිඩු බුදු ව එක් තැනකට පිරිනැමුණු ලාභයක් අනික් තැනක් නො ඉවසන්නට සිඛ පද පනවතත් මේ දේවතාවාට පිරිනැමුවා වේ දැ' යි සංශය කරන කෙනකු ඇත් නමුත් කප් ලක්ෂයක් මුළුල්ලෙහි තමන් වහන්සේට ම පිරිනැමුණු නියාව හඟවා සංශය හරවන්නාක් මෙන් නොහොත් එ දවස් බුදු වන තැනකට මුත් කවුරුන් කෙලෙස සිතා කළත් අනික් කෙනෙකුන්ට නො නිසි හෙයින් පිළිගෙන වළඳා අන්තයෙහි බුදු වන නියාව විමසන්ට තළිය උඩු ගං බලා යවා ඒ තළියත් සියලු ම බුදු වරුන් වහන්සේ බුදු වන්ට මහණ වන දවස් ලබන සිවුරු පිරිකර ලබන්නාට පෙරාතු බඹ ලොව තිබෙන්නා සේ සියලු ම බුදුවරුන් වහන්සේ බුදු වන දවස් වැළඳූ තළි නාග භවනයෙහි තිබෙන නියාව වේ ද? මෙ කප බුදු වූ **කකුසඳ** ආදී වූ තුන් දෙනා වහන්සේ ගේ තළි නාග භවනයෙහි තුබූ හෙයින් මා ත් ඔබ ගියමනා වේ දැ'යි ගිය කලක් මෙන් නාග භවනයට බට කල්හී නොහොත් මේ මහා පුරුෂයා බුදුව විවරණ දුන් බුදු වරුන් වහන්සේ උඩත් පිරිසෙයින් හවුරුදු ලක්ෂයක් හා

යටත් පිරිසෙයින් විසි දහසක් හවුරුදු ජීවත් වුවත් තමන් වහන්සේ පන් සාළිස් හවුරුද්දක් ජීවත් ව හවුරුදු ලක්ෂයෙනුත් සුවිසි අසඞ්ඛ්‍යයක් ම නිවන් දක්වන හෙයින් ඊට අඩු නො කොට නිවන් දක්වීම් ආදී විසින් සියලු බුද්ධකෘත්‍ය නිමවා පිරිනිවී කල්හි ඔබ ගේ ශරීර ධාතු නම් පැළ ගණනින් ලාසු ගණනින් කෙතෙක් වත් කිම? නැළි ගණනින් එක් සිය අට විසි නැළියෙක.

ධාතු බෙදන ගමනේත් **අජාසත්** රජ්ජුරුවන් පටන් රජ දරුවන් අට දෙනකුට සොළොස් සොළොස් නැළි බෙදී පසු ව- පියා ගිය **මෝරිය** රජ දරුවෝ ආදහනයෙන් අඟුරු පමණක් ලැබෙති. ධාතු මැන දුන් බමුණාණෝත් සඟවා ගත් දළදා වහන්සේත් උන්ට තරම් නොවන නියාව දන ශක්‍රයන් හැර ගන්නා හෙයින් ධාතු නැති ව කුරුණී ය පමණක් ලැබෙති.[2] නයින්ට එදත් ධාතු නැත. නැවත **රාම** නම් ගම් පිහිටී දාගැබ ගඟට ආසන්න හෙයින් ගඟ වතුරු අවුත් ඉවුරු ගසා දාගැබත් බිඳී කරඬුව පිටින් නාග භවනයට ගිය ධාතු සොළොස් නැළි ය ම සම්භවුවත් පසු ව ලක් දිව **අනුරාධ පුර** නුවර දුටුගැමුණු රජ්ජුරුවන් ශක්‍රයන් ගේ විජ ය තුරා සක සා කොට කර වූ **රුවන් මැලි දා ගැබ** පිහිටන හෙයින් සම්භ වූ ධාතුයෙනුත් ප්‍රයෝජන මඳ. නැවත මේ මහ පුරුෂයාණන් මහණ වන දවස් දෙවියන් තකා දෝ අහසට දමා ලූ කෙස් වැටිය—

> **'ජෙත්වාන මොලිං වර ගන්ධවාසිතං**
> **වෙහාසයං උක්ඛිපි සක්‍යපුඞ්ගවෝ,**
> **සහස්සනෙත්තෝ සිරසා පටිග්ගහී**
> **සුවණ්ණචඞ්ගෝටවරේන වාසවෝ'**

යනු හෙයින් සක් දෙවිඳු හැරගෙන ගොසින් මෙර මුදුනෙහි සතර ගවුවක් පමණ රන් දා ගබට වඩා ලා පුදති. හැඳගෙන ගිය සළු සහළ මහණ ව ලා බඹුන් තකා දෝ අහසට දමාපීවා **ඝටීකාර** නම් මහ බඹාණෝ ගෙනා සිවුරු පිරිකරට මිලක් මෙන් බඹ ලොවට ගෙන ගොසින් අට සාළිස් ගවුවක් උස රන් දා ගබකට වඩාලා පුදති. බත් තලිය සෝධා පියා උඩු ගං[3] බලා යැවූයේනම්[4] නයින් නිසා යැ'යි ගිය කල් මෙන් නාග භවනයට ගි ය කල්හි නො හොත් 'සර්වඥ නැමැති සූර්‍ය්‍යයා අද පහළ ව ජාතික්ෂෙත්‍ර වූ දස දහසක් සක් වළත් ආඥක්ෂෙත්‍ර වූ කෙළ ලක්ෂයක් සක් වළත් විෂයක්ෂෙත්‍ර වූ අනන්ත සක් වළත් මට අපභාස්‍ය කරන්නාක් මෙන් ඥානාලෝකශරීරා ලෝක පවත් ව යි. මා ආලෝක පවත්වන්නේ

---

1 බමුණාණෝත්. 2 ලැබෙති. 3 ගම්. 4 යැවූයෙම්.

එක සක්වළෙක. එහිත් එකවට දිවයින් තුනකට මුත් වඩා පවත්වාලි ය නො හෙම්, තමා එ තරම් කල එ සේ කරන නිහර සර[1] දක්නා බලාත් සැහවී යාගැන්ම යහපතැ'යි තාලි ව්‍යාජයෙන් පියෙවී හිර නැඟී භවනයට බැස පී කල මෙන්, ඒ සුජාතාවන් දුන් තලිය නාග භවනයට බට කල්හි වළඳා අන්තයෙහි පටන් සවස් වේලා ආසන්න වන තෙක් නිල්දල[2] හෝ බඩ සල් උයන්හි දවල් දවස් යවා සවස් වේලෙහි සොත්‍ථිය නම් බමුණාණන් දුන් හී තණ හැරගෙන මහ පෙරහරින් කාල නම් නා රජහු විසින් වනන ලද නව අරහාදී ගුණ ඇති ව බෝ මැඩට වැඩ, හිතණ සලා බිම වගුරුවා එ තැන්හි පොළොව පළා ගෙන පැන නැඟි තුදුස් රියන් විදුරස්නෙහි හිඳැ 'බුදු ව මුත් නැඟී නො සිටිමි' යන තර අදහස් ඇති ව හිර ගලා නොහෙන තෙක් ම බුදු බව උගුළුවන්නට ආ වසවත් මරු හා සෙනඟ—

'ගජම්මාරෝ සමාරුළ්හෝ -යුද්ධායච්චන්තමුන්නතං,
මග්ගමන්වේසති නූනං-ජිනභීතෝ පලායිතුං'

යනු හෙයින් වසවත් මරහු නැඟී ගෙන ආ යෙළ සියයක් යොදුන් දිග ඇති අනූ යොදුන් උස ඇති ගිරිමෙබලා බිඳී යන්ට මං සොයන්ට නැඟී ගල් කන්දක් වැනි කොට පියා සමතිස් පැරුම් නැමැති යෝධ භටයන් තිස් දෙනා පමණෙකින් බිඳ පලවා පෙර යම් දස පැයින්, පෙර විසූ කඳ පිළිවෙළ දන්නා නුවණ උපදවාගෙන, මැදියම්[3] දස පැයින් දිව ඇස් උපදවාගෙන අලුයම් දස පැය නිමන ආසන්නයෙහි මහ පොළොව ගුගුරුවා බුදු ව වදුරා බෝ මඩට ආසන්නයෙහි සතළිස් නව දවස යවා වදුරා අට වැනි වූ සතියෙහි අජපල් නුගය මුල වැඩ හිඳ ධර්මය ගැඹුරු නියාව සැලකීමෙන් රෝග තර නියාව දූන දන්නා පිළියම මුත් නොකරන්ට සිතන වෙද වරුන් සේ නො දෙසන්ට සිතාත් නො ව මහ බඹහු ලවා ආරාධනා කරවා ගෙන බ්‍රහ්ම ගරුක ලෝ වැස්සන්ට බණ දෙසනු නිසා මැළි ලෙසක් ඇති ව ලා පසු ව මහ බඹහුගේ අයදමෙන් බණ දෙසනු කැමැති ව බුදු ඇසින් ලොව බලා පළමු කොට කවුරුන්ට බණ කියම් දෙහෝ යි බලන සේක්—

ආලාරක-උද්දක තවුසන් දෙන්නා මළ නියාව දූන පස් වග වහන්දූ උපකාරී නියාව සලකා දූන් කොයි දෙහෝ යි බලන සේක් බරණැස ඉසිපතන නම් උයන්හි වසන නියාව දූන ඔබ වඩනා සේක් අතුරු මහ දී පසු ව තමන් වහන්සේ ගේ බණ අසා අනාගාමී ව ඒ ඇසිල්ලෙහි ම මිය ගොස් අවිහ නම් වූ ශුද්ධාවාස බඹ ලොව ඉපැද උපන් ඇසිල්ලෙහි ම රහත් වන පින් ඇති උපක නම් ආජීවකයන් හා කථා කොට ඇසළ

---

1 නිහසර. 2 නිල්දරා – නිල් තරා. 3 මැදයම්.

මැදි පොහෝ දවස් පස් වග වහන්දෑ වසන ඉසිපතන නම් උයනට වැඩ බුදු වූ නියාව නො දැන නො නිසි ලෙසින් කතාකරන්ට වන් වහන්දෑට තමන් වහන්සේ බුදු වූ නියා ව වදරා ගිවිස්වා ගෙන, තුන් පෙරළියක් ඇති, දෙළොස් ආකාරයක් ඇති, දහම් සක් පවතුන්[1] සුත් දෙසා වදරා අටළොස් කෙළක් බඹුන් හා සමඟ පස් වග වහන්දෑ ගෙන් කොණ්ඩඤ්ඤ මහ තෙරුන් වහන්සේ සෝවන් කරවා අව පෑලවිය පටන් ජලවක් දක්වා අනික් සතර නම දවස නමක් ඔවා දියෙන් සෝවන් කරවා, අව විසේනිය දවස් පස් වග පස්දෙනා වහන්සේ ම රහත් කරවා, එ දවස් ම යස නම් සිටු පුත්‍රයාණන් සෝවන් කරවා, දෙවන දවස් රහත් කරවා රහත් වූ පසු ගිහි ව සිටී ම යුක්ත නො වන හෙයින් මහණ කරවා යස තෙරුන් වහන්සෙ ගිහි අවස්ථාවෙහි මිත්‍ර වූ අනික් සූ පනස් දෙනකු මහණ කොට රහත් කරවා, මෙ සේ ලෙව්හි තමන් වහන්සේ ඇතුළු ව එක් සැටක් පමණ රහතන් ඇති වූ කල්හි විසූ වස් පවරාලා ඒ සැට වහන්සේ—

''අඤ්ඤාකොණ්ඩඤ්ඤපමුඛෙ – භික්ඛු බිණාසවෙ ජිනෝ,
විධාතුං ධම්මදූතෙයාං – විස්සජ්ජේසි තහිං තහිං.''

යනු හෙයින් තුනුරුවන් ලොව පහළ වූ නියාව හඟවන්නට ඒ ඒ දිග යවා වදරා තමන් වහන්සේ උරුවෙල් දනවුවට වඩනා සේක් අතුරු මඟ කපු වනයෙහි දී- තුණ්ඩිල ජාතකයෙහි හූරු ව උපන් බෝසතුන් ගේ තුඩින් කියා ලූ බණ අසා සැට දහසක් හවුරුදු පන් සිල් රැකි රා සොඬුන්-තිස භද්දවග්ගිය රජ කුමරුවන් නිවන් දක්වා ඒ තිස් නම ත් 'මහණෙනි, මෙ සේ එව'යි වදාළ බස් පමණකින් මහණ මාලු පැවිදි කොට රහත් කරවා, ඒ ඒ දිග යවා වදරා තමන් වහන්සේ උරුවෙල් දනවුවට වැඩ තුන් දහස් පන්සියයක් විතර පෙළහර දක්වා දහසක් දූළල්ලන් පිරිවැරූ තුන් බෑ දූළල්ලන් ගේ දෘෂ්ටි නැමැති අඳුරු පෙළහර නැමැති හිරු රැසින් දුරු කොට, නැවත සර්වඥ නැමැති සූර්ය තෙම උරුවෙල් කසුප් ආදී වූ දූළලු නැමැති පියුම් ආදිත්‍ය පර්‍යාය සුත් නැමති හිරු රැසින් ප්‍රබුද්ධ කරවා හෙවත් රහත් කරවා, සත්තිස් බොධි පාක්ෂික ධර්‍ම නැමැති සට පටාදී වස්තුන් ද ප්‍රකාශ කෙරෙමින් තුන් බෑ දූළල්ලනු දු පිරිවර දහසක් මහණ කොට ගෙන ඒ රහතන් වහන්සේ දහස පිරිවරා බිම්සර මහ රජුන් ආදි ම කළ ආරාධනාවෙන් රජගහා නුවරට වැඩ සල් උයනෙහි වැඩ හිඳ, වැඩ හුන් නියාව අසා එක් ලක්ෂ විසි දහසක් පමණ පිරිස් පිරිවරා ආ බිම්සර මහ රජුන්ට බණ වදරා රජ්ජුරුවන් ඇතුළු වූ එක්ලක්ෂ දස දහසක් දෙනා සෝවන්

---

1 පැවැතුම්

කරවා දස දහසක් දෙනා නුවණ මුහුකරන තෙක් තනතුරට බාලයන් තකා සිටුවන්නා සේ ශරණ ශීලයෙහි පිහිටුවා දෙ වන දවස් ළදරු වෙස් ගත් ශක්‍රයන් ලවා මිනිසුන් ඉවත් කරවමින් රජගහා නුවරට වැඩ රජ ගෙයිදී වළඳා වෙළුවන විහාර ය පිළි-ගෙන එහි විසූ සේක.

බුදුන් එහි වසන නියාව පරම්පරා කථාවෙන් සුදෙවුන් රජ්ජුරු-වන් අසා බුදු වූ පුතණුවන් වහන්සේ දක්නා කැමති ව නව වාර-යෙක දහස දහස පාවා දී ඇමැත්තන් නව දෙනකු බුදුන් කරා යවා ගිය ගියවුන් රාජ නියෝගයෙන් අනික් කෙනකුන් කරා මෙහෙවරෙක ගියවුන් අත්ලස් හැර ගෙන ගිය මෙහෙවර පෙරළා ගොසින් නො කියන්නා සේ අර්හත් ඵල නැමති මහා අත්ලස් හැර ගෙනැ ගිය මෙහෙවර නො කියා කල් යන හෙයින්; දස වෙනි වාර-, යෙහි බුදුන් හා එක ද උපන් කාළුදයි ඇමැත්තන්ට දහසක් පාවා දී යවා උන් බුදුන් ගේ බණ අසා රහත් ව මහණ ව රාජ පක්ෂ-පාත කෙනකුන් අත්ලස් ලොභයෙන් අත්ලස් හැර ගෙනත් රාජ පක්ෂපාත කමින් ගිය මෙහෙවරත් නො වරදවන්නා සේ රජ්ජුරුවන් ගේ මෙහෙවර කාළුදයි මහ තෙරුන් වහන්සේ බුදුන්ට දන්වූ කල්හි, බුදුහු ඒ අසා විසි දහසක් පමණ රහතුන් පිරිවරා කිඹුල්වත් නුවරට වැඩ 'මේ සිද්ධාර්ථ කුමාරයෝ වයසිනුත් නෑ කමිනුත් අපට බාලයෝ ය. වයස බාල වුවත් නෑ කම හෝ මුකුරා සිටිය මැනව, එ ලෙසකුත් නැති කලට අපි නො වඳුම්හ. තෙපි වඳුව යි' බාල බාල නෑයන් ලවා වන්දවා තමන් හැම නො වැඳ මන් කොට හුන් නෑයන් ගේ මන් මඩනා නිසා කිඹුල්වත් නුවර අහස්හි රුවන් සක්මන මවා යමා මහ පෙළහර කොට ශරීරයෙන් නිකුත් ගිනි කඳෙහි තේජසෙක් ඇත් නම් ඒ නිවන්ට වට කළාක් මෙන් දෙහෝ නොහොත් සඤ්ජය-ජුසති ය-විශ්වන්තර ය-මද්‍රී ය-ජාලි ය-කෘෂ්ණජිනා ය යන රජ දරුවන් ස දෙනා පමණක් රැස් වූ තන්හි වට කළ එක් ලක්ෂ සැට දහසක් ශාක්‍ය රජ දරුවන් රැස් වූ තැන වටමනා බැවින් වටුවා සේ පොකුරු වැසි වට කල්හි ඒ වැස්ස අරහයා වෙසතුරු ද වදරා, මී පැණියෙන් පිපාසා නොසන්සිඳෙන්නවුන්ට ශකීරා පැන් වක්කරන කලක් පරිද්දෙන් රුවන් සක්මන වැඩ සිට බුද්ධ වංශත් දෙසා වදරා, උපන් දවස් කලදෙවළ නම් අභිඥා-ලාභි වූ තවුසන්ගෙන් වැඳුම් ලත් මහා පුරුෂයන් බුදු ව යමා මහ පෙළහරින් නෑයන් ගේ මන් බිඳ වන්දවාගැන්ම විස්මය නො වෙ යි. එතකු දු වුවත් නෑයන් ලවා වන්දගෙන ප්‍රබන්ධ වාසය එකතැනක වී නම් සත්තෝපකාර ය මඳ හෙයින් සැරිසරා

ඒ ඒ තන්හි වඩනා සේක් එක් සමයෙක්හි සැවැත් නුවරට වැඩ අනේපිඬු මහ සිටුහු විසින් සියුපනස් කෙළක් ධන වියදම් කොට කරවා පිළිගැන්වූ දෙව්රම් වෙහෙර වැඩ වසන සේක.

ඒ එසේ මැ යි: බුදුහු මවු පක්ෂයෙන් අසූ දහසක් හා පිය පක්ෂයෙන් අසූ දහසක් හා එක්ලක්ෂ සැට දහසක් පමණ නෑයන් කරවා පිළිගැන්වූ නුග අරම එක ම වසක් විසූ සේක. දෙව්රම් වෙහෙර දස නව වසක් විසූ සේක. විශාඛාවන් සත් විසි කෙළක් පමණ ධන වියදම් කොට කරවා පිළිගැන්වූ දෙව්රමට නැහෙනහිර වෙහෙර වස් සයක් විසූ සේක. මෙ සේ උන් දෙපක්ෂයේ ඇත්තවුන් ගේ ගුණ මහත්ත්වය නිසා, සැවැත් නුවර නිසා විහාර දෙකෙයි කැටි ව පස් විසි වසක් විසූ සේක.

උන් ගේ ගුණ මහත්ව ය කවරේ ද යත්—

අනේපිඬු මහ සිටාණෝත් විශාඛාවෝත් දවස දෙ විටෙක විහාරයට යෙති. යන කලත් අලුත මහණ වූ වහන්දෑ කිරි බොන දරුවන් මෑණියන් දුටු කල කිරට එලෙන්නා සේ 'ගෙනා යේ කිම්දැ'යි විචාරන සේක් ම ය යි සි'සතින් නො ගිය විරූහ. පෙරවරු යන කල අවුළු පත් ආදී වූ පෙරවරු වළඳන්ට නිස්සා ගෙන්වා ගෙන යෙති. පස්වරු යන කල ශර්කරා ගිතෙල් ආදිය හා පාන වර්ග ගෙන්වාගෙන යෙති. මුන් දෙන්නාගෙන් එකී එකී කෙනකුන් ගේ ගෙයි දී ම සඟ දෙ දසක් වළඳන සේක. හිඳිනා ආසන දෙ දසක්[1] නුගුළුවා ම තිබෙ යි. යම් යම් කෙනකුන් වහන්සේ යමක් යමක් වළඳන්ට කැමති සේක් වී නම් ඒ අනාථපිණ්ඩික කප් රුකින් හා විශාඛා කල්ප ලතාවෙන් සමෘද්ධ වෙයි.

උන් දෙන්නා ගෙන් අනේපිඬු සිටාණෝ බුදුන් ගෙන් එක දවසකුත් ප්‍රශ්නයක් නො විචාළෝ ය. කුමක් නිසා නොවිචාළෝ ද යත් – 'මුන් වහන්සේ බුදු සිවු මැළි සේක. රජ සිවු මැළි සේක. උපකාරි සිටාණෝ ය යි මට බණ වදරා ම විඩා වන සේකැ'යි සිතා මුත් 'වදරා ලිය නො හෙති'යි සිතා නො වෙ යි. එතකුදු වුව ත් බුදුහු 'මේ සිටාණෝ මා නො රක්ක මනා තන්හි රක්නට සිතති. මම් වැළිත් පැරුම් බිම දී ඉස්-ඇස්-මස්-ලේ දන් දෙන්නෙම් අනිකක් නිසා නුදුන්නෙමි. බුදු ව නිවන් දක්වමි යන අදහසිනි. නිවන් දක්වන්නේත් බණ නො කියා නො වෙයි. බුදු–පසේ බුදු දෙ පක්ෂය හැර පරතොඝොෂ ප්‍රත්‍යය නැත්තේ කාට ද?

1 සඟ දස දස ආසන ද දස දස,

"ගණ්ඩුප්පාදෝ කිකීචෙව — කුන්තෝ බ්‍රාහ්මණ ධම්මිකෝ
ඒතෙ අභායා භායන්ති — සම්මූල්භාවතුරෝ ජනා."

යනුවෙන් පොළොව පස් බොහෝ කොට බඩ පුරා කැව හොත් පසු ව සැඟ වී වැද හෝනා තැනුත් නැතැ යි යන විරුද්ධ කල්පනා-වෙන් ගැඩවුලුන් පස් සුඟ කොට කන්නා සේ, නැවත අහස වැටී ගියත් එ විතරක රඳුණ මැනැවැ යි යන විරුද්ධ කල්පනාවෙන් කිරළුන් පා උඩුකුරු කොටලා වැද හෝනා සේ, නැවත කොස්වා ළිහිණියන් නො සැලී සිටිනා කලට පොළොව ධරා ලිය නොහෙතී යන විරුද්ධ කල්පනාවෙන් පෙද සලන්නා සේ මූගේ විරුද්ධ කල්පනාව ත් බලවත් නියා ය"යි ගිය ගිය විටක ම උන් නො කීවත් බණ කථාවක් වදරන සේක.

---

## 2. චක්ඛුපාල තෙරුන් වහන්සේගේ වස්තුව

එ කල්හි සැවැත් නුවර මහ සම්පත් ඇති මහාසුමන නම් කෙළඹියාණන් කෙනෙක් වෙසෙති සම්පත් ඇති පමණ මුත් පල ගන්නා ගස් තමා පල ගන්නා අවධියේ මුත් අතුරෙක පල නො ගන්නා සේ, පුත ප්‍රතිලාභයට නිසි කුසලය නුමුකුරා ගිය හෙයින් දෝ සම්පත් ප්‍රයෝජන විඳ පියන්ට නිසි දරු කෙනෙකුත් නැත. ඒ කෙළෙඹි පුත්‍රයාණෝ එක් දවසක් ගඟට ගොසින් නා පියා එන තැනැත්තෝ අතුරු මහ අතු පතරින් ගැවසී ගත් මී දෙව් දුව[1] ඉසට පැන් නහන්ට මුණින් නමා ලූ ඉඳු නිල් මිණිමුවා කළයෙකින් වැම්මෙන ජල ධාරාවක් සේ සුදු කඳක් ඇති, නැවත ඒ මී දෙව් දුව ඉසට කළ පිල් සතක් වැනි සෙසු ගස් කොළට උස් හෙයින් දෝ හෝ නොහොත් මල් නැති ව පල ගන්නා හෙයින් වනස්පතී නම් නුග ගස් ආදියෙන් එක්තරා ගසක් දක, මේ ගස ඉතා ශෝභාවත. මෙ සේ වූ ගසෙක අනුභාව සම්-පන්න දේවතා කෙනකුන් ඇත මැනවැ'යි දෙවතා ආරාධනා-යෙනු ත් දරු කෙනකුන් ලදිම් නම් යෙහෙකැ යි සිතා ගස මුල තණ හරවා කසලත් හමඳ වා බෝධිකොටුවක් සේ වට පවුරකු ත් බඳ වා ඒ ඇතුළත මුතු පට සමාන වැලි ලවා වට කොට ධජ පතාක නංවා ගස කඳත් පට කඩ ආදියෙන් සරහා අතුපතරත් මල් වඩම් ආදියෙන් සරහා ලා 'තව මෙ විතරෙක් නො වෙයි. දෙවතාවාණෙනි, තොප ගේ අනුභාවයෙන් දරු කෙනකුන් ලදිම් නම් කළ උපකාරයට ප්‍රත්‍යුපකාර කොට මහත් සත්කාර කරවම්' කියා දරුවන් පතාගෙන නුවරට ගියෝ යැ.

---

1 මී දේ දුව

Non-Commercial Distribution

වත් කරණ පැන් නැති ව පලද පමා ව සිටි ගසක් පැන් ලදින් සාර ව උදවූ ව පල ගන්නා සේ දෙවතා ආරාධනා කළ නො බෝ කලකින් ම උන් ගේ කෝළෙම්බි දූවණියන් බඩ දරු කෙණෙක් ඇතිවූහ. ඇති ව ගබ පෙරහර ලදින් දස මස් අයාමෙන් දෙවතා ආරාධනාවෙන් ලබන දරුවන් අල්ප පුණ්‍යයන් නො වන හෙයින් කළ පින් ඇති පුතණු කෙණෙකුන් වැදූහ. උපන් පුතණුවන්ට නම් තබන කෙළෙඹියාණෝ ගස දෙවියාට කළ රක්‍ෂාව නිසා උපන් හෙයින් **පාලිත** නම් තුබූහ. ආදි නො පල ද ගසක් පිට පිට හෙළා පල ගන්ට වන්නා සේ අනික් පුතණු කෙණෙකුන් වැදූහ. උන්ට **චුල්ලපාලිත** නම් තබා ලා වැඩි මාලු පුතණුවන්ට බණවා ලන්ට සුව ලද ය නිසා **මහාපාලිතයෝ** ය යි මහා යන්නකින් වෙසෙසා නම තබා ලූහ. මෙසේ නම් තබා වැඩි විය පැමිණි දරුවන්ට සුදුසු තැනින් සරණ ගෙන්වා පාවා දී වෙන් කළහ.

සැවැත් නුවර ද වැළි ත් නිවන් දුටුවන් ගෙන් පස් කෙළක් හා නිවන් නො දුටුවන් ගෙන් දෙ කෙළක් හා එක් වසත් කෙළක් විතර මිනිස්සු ඇත. උන් ගෙන් නිවන් දුටුවෝ නිවන් නුදුටුවෝ කුමක් කෙරෙත් ද යි නිවන් දුටුවන්ට කට යුතු නම් තමන් මාර්‍ගගත අචල ශ්‍රද්ධාවෙහි පිහිටි හෙයින් පෙර වරු වේලෙහි දන් දෙති. දන් දී ලා පස්වරු වේලෙහි සුවඳමල් ආදී වූ පූජා භාණ්ඩ නැමැති පඬුරු හැර ගෙන සම්‍යක් සම්බුද්ධ නැමැති සක්විත්තන් වහන්සේ කරා ගොසින් ගෙන ගිය පඬුරු පාවා දී අනුශාසනා ත් අසා අඩු ව තුබූ මාර්‍ග ඵල නැමැති සංග්‍රහ ලබති.

එක් දවසක් මහා පාලිත කුමාරයෝ පස් වරු වේලෙහි උපාසකවරුන් සැදී පැහැදී ගෙන තමන් අනුභව කළ නිවන් රසයට නො එක් ලෙසින් අඩු වුව ත් තමාට ඇති දෙයක් වේ දැයි ඉක්ෂු–මධු–ගුළ–ශර්කරාදි ය ත් පාන වර්‍ග ත් ගෙන්වා ගෙන බුදුන් කරා බණ අසන්ට යන්නවුන් දැක 'මඟුලකට–පූජාවකට යන්නවුන් මෙන් සැරහී පියා කොයි යෙත් ද'යි විචාරා සම්‍යක් සම්බුද්ධ නැමති සක්විති රජ්ජුරුවන් වහන්සේ දම්සක් පවතුන් සූත් නැමති සක්රුවනෙහි ආනුභාවයෙන් පස් මරුන් නැමැති සතුරන් සාධා ගැන්ම නිසා කෙළ ලක්‍ෂයක් සක්වළ ලැබගෙන ඒ සක්වළ තුබූ මුක්තා–මාණික්‍ය–ශඞ්ඛ–ශිලා–ප්‍රවාලාදි වස්තුව වේදබ්භ ජාත කයෙහි වේදබ්භ නම් මන්ත්‍රය දන්නා බ්‍රාහ්මණයාණන් මන්ත්‍රානු භාවයෙන් වස්වා ලූ සත් රුවන් එක් දහස් පන්සිය එක්



Non-Commercial Distribution

කෙනෙකුන්ගේ විනාශයට කාරණ වූවා සේ සොපද්‍රව සෙයින් පෙළ දම් නැමැති මුහුදින් නවලොව්තුරා දහම් නැමැති රුවන් නංවා තබන සේක. ඒ සොයා යෙති' කී කල්හි එ සේ වී නම් ''මම ත් ඔබ යෙමි. ඒ ති ලෝ ගුරු බුදු රජාණන් වහන්සේ තොප හා අප පුරුදු කමෙක් නැත. තොපට බණ කියන්නෝ කවුරුදැ යි නො වදරත්. එ සේ හෙයින් මම ද බණ අසා ලා ලොව් තුරා සැප ත් සාධා ගතිමි නම් යහපත, ලොවී සැපත් ලැබීම අරුම නැත. පදපරම වුවො ත් මත්තට හෝ උපකාර වුව ත් යහපතැ''යි ගොසින් බුදුන් වැඳ තමන් අමුතු ව ලා ගිය හෙයින් බුදුන් ගෙන් එ සේ අමුත්තක් නැත ත් පණීත් කෙළවර හුන්හ.

බුදුහු ද වැළි ත් බණ දෙසන කළ පණීත් ගේ අදහස් බලා මාර්ගාධිගමයකට උපනිශ්‍ර ය දැක වයත්‍ථ ලෙසින් බණ වදරණ සේක. එ සේ හෙයින් එ දවස් මහාපාලිත කුමාරයන් ගේ ත් නිවන් දක්නට උපනිශ්‍රය බලා උපනිශ්‍රය ඇති සේ දැක දී ලූ දෙයින් ප්‍රයෝජන විඳිනට බාල හෙයින් නොනිසි දරුවනට භුක්ති විඳිනා අවස්‍ථා වෙහි භුක්ති විඳිනා නියායෙන් සම්පත් නියම කොට තබන පියාණ කෙණකුන් පරිද්දෙන් වයසින් මුකුරා සිටිය ත් ඉන්ද්‍රිය පරිපාක ය තව නු වූ හෙයින් අදහසින් බාල වූ ජාතිශුද්ධි ය නිසා පුත්වන්ට ගිය මහාපාලිත කෙළෙඹියන්ට පසු ව ප්‍රයෝජන විඳිනා ලෙසට ධර්ම දයාද දෙන බුදුහු පිළිවෙළ කථාව වදළ සේක.

පිළිවෙළ කථා නම් – දන ය නම් දිව සැපත් ආදියට උතුම් වූ කාරණයෙක. නැවත සියලු සම්පතට පිහිට තිබෙයි. සියල්ල වුන්ට ම බන්ධුකෙණෙකුන් හා සරි ය. දුකට පැමිණිය වුන්ට සහායව සිට දුකින් මුදයි. දනය නම් දුක් මුහුදින් එ තෙර කරණ හෙයින් නැවක් හා ත් සරි ය. පැමිණි භයින් රැක ලන හෙයින් සුරක්ෂිත සුගොපිත නුවරක් හාත් සරිය. මසුරු සිත් සිතන්නවුන් විසින් ලං වන්ට බැරිහෙයින් විෂ ඝොර සර්‍පයන් වැනි ය. මසුරු සිත් හා එක් ව හැසලීම් නැති හෙයින් දිය හා එක් නොවන පියුම් වැනි ය. දන් දීමට වඩා අනික් පිහිට නිවන් හැර නැතැ යි යන බැවින් නුවණක් ඇති කවර නම් කෙණෙක් දන් නො දෙත් ද? යම් කෙණෙක් නො මැළි ව දන් දුන්නු නම් දහස් ගණන් දෙවඟනන් පිරිවරා බොහෝ කලක් දෙව් සැපත් වළඳති. දන් දෙන්නා වූ සත්‍වයෝ කිසි ලෙසකිනු ත් විපිළිසරක් නැති බැවින් හැම වේලේ ම සතුටු වෙති. සියල්ලවුන් විසින් සම්භාවනීය ත් වෙති. බොහෝ දෙනා කෙරෙහි ප්‍රසිද්ධ ත් වෙති. බොහෝ සාද සාමීචියනු ත් ලැබෙති. තව ද මේ දනය නම් සොරුන්ට වත් සතුරන්ට වත් රජදරුවන්ට වත් සාමාන්‍ය නොවන කල කළවුන් තම තමන්ට ම ආවෙණික

1 සාධු

Non-Commercial Distribution

ධනයෙක. උපනිශ්‍රය ව සිට ත්‍රිවිධ බෝධීන් එක් තරා බෝධියකු ත් අධිමුක්ති වූ ලෙසින් සාධා දී ලයි. යනාදීන් දන් දීමෙහි අනුසස් වදරා ලා ඊට ඉක් බිති ව යුද්ධ කාලයෙහි පර සතුරන් විදිනා ශර නිවාරණ ය නිසා ලන සන්නාහයක් මෙන් දෙන දනට බාධා කොට කෙලෙස් සතුරන් විදිනා අකුසල් නැමැති ශර නිවාරණ ය නිසා සිල් නැමැති සන්නාහ ය ලිය යුතු ය. දන් දෙන්නවුන් විසිනු ත් දන් දීමට නියැළී නො හිඳ යට ත් පිරිසෙයින් පන් සිල් පමණක් වුව ත් රැක්ක යුතු ය.

ශීල ය නම් මෙ ලොව පර ලොව වැඩට මුල ය. පැළඳ ගෙන කෙ තෙක් ආභරණ ලූ ව ත් සිල් නැමැති ආභරණයට වඩනා ආභරණයක් නැත. සුවඳ විලවුන් ගන්නවුන්ට සිල් නැමැති සුවඳට වඩනා සුවඳකුත් නැත. කෙළෙස් කුණු සෝධා හරනට සිල් නැමැති ජලයට වඩනා පැනකුත් නැත. කෙළෙස් ගිම් නිවා ලීමෙහි සිල් නැමැති පවන හා සම පවනකු ත් නැත. ශීල ය වැනි වූ කීර්ති එළවා දී ලන දෙයකුත් නැති. දිව්‍ය ලෝකයට නැඟෙන්ට හිණෙක් වේ නම් සිල් නැමැති හිණ ම ය. නිවන් පුර වදනවුන්ට මේ ශීල ය වාසලක් වැන්න. තම හට හිත කැමත්තවුන් විසින් අවශ්‍ය යෙන් දවස දවස පන් සිල් වේ ව යි' පොහොය අට සිල් වේ ව යි, වීය ඈත දස සිල් වේ ව යි අධිමුක්ති වූ ලෙසින් හෙරණ ව ලා රැක්ක යුතු සතලිස් අඟෙකින් යුක්ත දස සිල් වේ ව යි, මාලු පැවිදිව රැක්ක මනා විනය පිටක පර්‍ය්‍යාපන්න ශික්ෂා පද ශීල ය වේ ව යි රැක්ක යුතු ය යනාදීන් සිල් රක්‍ෂාකිරීමෙහි අනුසස් දක්වා ලා ඉක් බිති ව යම් කෙණෙක් සිල් රක්‍ෂා කොළෝ වූ නම් ශීල විශුද්ධියෙහි පිහිටා ධ්‍යාන වශයෙන් ලොවී ගුණයක් වේව යි මාර්‍ග ඵල වශයෙන් ලොව්තුරා ගුණයක් ලද නුහුනු වූ නමුත් සිව් මහ රජ ය පටන් සදෙව් ලොව ඉපැදඒ ඒ දිව්‍ය ලොකයෙහි ආයු පමණින් දිව සැපත් වළඳති.

දෙව් ලොව දී වුවත් වර්‍ණ කිසිණු ලැබෙන හෙයින් ඒ බලා ධ්‍යාන උපදවා ගත්තු නම් බඹ ලොව ඉපැද බඹ සැපත් විඳිති. ඉදින් ධ්‍යාන පාදක කොට භාවනා කෙරෙමින් අනැගැමි වූ නම් අනගැමි යන්ට ම ප්‍රතිනියත වූ ශුද්ධාවාසයෙහි ඉපැද මහා කපින් කප් දහස කුත් කප් දෙ දහසකුත් කප් සාර දහසකුත් කප් අට දහසකුත් කප් සොළොස් දහසකුත් නිවන් රස මුසු වූ බඹ සැපත් වළඳති. එ හෙයින් ස්වර්‍ග සම්පත් නම් වුවමනා දෙයකැ යි වදරා ලා ස්වර්‍ග සම්පත් ම ඇලුම් කරණ කෙණෙක් ඇත් නම් නිවනට පැමිණ ගත නොහෙන හෙයින් ඊට ආලයහරවනුනිසා ඒස්වර්‍ගය නම් නිවන් සේ

නොනස්නා දෙයක් නො වෙ යි. ගින්නෙන් කප නස්නා කලට ආභස්සරයෙන් පාත මුළුල්ල නස්සී සුළඟින් නස්නා කලට වෘහත්ඵල නම් බඹලොවින් පාත මුළුල්ල නස්සී. කල්ප විනාශයෙන් නො නස්නා කල බඹ ලොව ත් ව්‍යය සවභාව ය ඉක් ම නො පවත්තී ඒ හෙයින් ඊ ත් ඇලුම් කටයුතු නො වෙයි යනාදීන් වදාරණ කථා ය.

පාලිත නම් සිටු පුත්‍රයාණෝ ද මේ පිළිවෙළ කථා ආද්‍යන්ත කොට අසා මෙසේ වූ මූ කළ[1] සිතිවිල්ලක් සිත ත් සත්වයන් මිය පර ලොව යන කලට උපයා ගත් සම්පත් වේ ව යි ඇති කළ නෑ සිය කෙණෙක් වේ ව යි කැටු ව යන්නෝ නැත. සෙස්ස තබා තමා ගේ ම ය යි මමායන කොට පිරිමැසූ ශරීර ය පමණකුත් ගමන් පසු කොට ලා රඳා ගන්නා සේ තෙමේ පමණකුත් කැටි ව නො යෙ යි. මේ තිලෝ ගුරු බුදුන් ගේ ධෞත ශඞ්ඛයක් සේ නිර්මලවූ ධර්මය නො එක් ලෙසින් සකිලිටු වූ ගිහි ගෙයි රඳා නො වරදවා කට නොහැක්ක වස්තුයෙහි සාරය දන් දීමෙන් හැර ගත හැක්ක. ආත්ම සාරය ශීල සංරක්‍ෂණ යෙන් මුත් ගත නො හැක්ක. ආත්ම සාරය නැති කලට හුදක් භොග සාරය ම නිවන් සාධා ලිය නො හෙයි. ඒ සේ හෙයින් ගිහි ගෙයි රැඳීමෙන් ප්‍රයෝජන නැත. මහණ ව ගනිම් යි සිතා බණ වදරා අන්තයෙහි බුදුන් කරා එළඹ මහණ කරන්ට ආරාධනා කළහ. එකලට බුදුහු තොප විසින් අවසර ගත මනා නෑ සිය කෙණෙක් නැද්දැ'යි විචාළ සේක. ඒ අවධියට දෙ මවු පියන් නැති හෙයින් ඇවැස්ස නෑයන් ගෙන් මලණු කෙණෙකුන් ඇති නියාව කිවු ය. ඒ අසා බුදුහු එ සේ වී නම් උන් පමණකට වත් කියව යි වදළ සේක. රොගයක් බලවත් කෙණෙකුන් සපයා දෙන්ට කී යම් ම දෙයක් සපයා දී රොග සන්හිඳුවන්නට කරණ යත්නයක් සේ කෙළෙස් ලෙඩින් මිදෙනු නිසා අනුමැති බෙහෙත් සපයා දීම යහපතැ යි ගිවිස බුදුන් වැද ගෙන ගෙට ගොසින් මලණුවන් කැඳවා ලා ''මලණ්ඩ, මේ ගෙයි ඇති සියලු සැපතෙක් ඇත් නම් තොපට හළිමි. තෙපි ම ප්‍රයෝජන විඳුව'' යි කිවු ය. මළණුවෝ ද ඒ අසා මා ම උත්සාහ කොට, මට ගත මනා ය යි කො ට ද නො සිතා හැයි? නුඹ හැනැ'යි විචාළෝ ය.

මම බුදු සසුන් වැද මහණ ව ගන්නා කැමැත්තෙමි. මහණ වන්නවුන්ට තුන් සිවුරු පාත්‍ර විනා ගිහි සැපතින් ප්‍රයෝජන නැත්තේ වේ ද ඒ නියා ය'යි කිවු ය. 'බෑණන් වහන්ස, කුමක් කියන නියා ද? දෙ මවු දෙ දෙනා නැත ත් නුඹ වහන්සේ

1 මුහු කළ

Non-Commercial Distribution

වැඩි මාලු බෑණන් වහන්සේ හෙයින් දෙ මව් පිය තරමෙ ම සිටි සේක. එක් ව ප්‍රයෝජන විදින්නට මැළි වූව ත් සම්පත මහත් හෙයින් බෙදු ගණිත ත් පිළිවන. එ බඳු පින් ඇත් නම් චුල්ල-සෙට්ඨි ජාතකයෙහි එක මීයා ගෙන් මසු දෙ ලක්ෂයක් උපදවා ගෙන සිටු සම්පතට ත් හිමි වූ චුල්ලන්තෙවාසිකයා මෙන් සම්-පත් ලද හැක්ක. නැවත ගිහිගෙයි රඳා ත් පින් කට හැක්ක. මහණ වන්නට නො කැමැත්තේ ය.යි කිවු ය. මහාපාලිත කෙලෙඹියා-ණෝ ද 'මලණ්ඩ, විහාරයට ගිය ගමනේ බුදුන් ගෙන් බණ ඇසීමි. සිංහතෙලට රන් වළන් මුත් අනික් වළඳක් නිසි නො වන්නා සේ සර්වඥ නැමැති සිංහයාණන්ගේ සදහම් නමැති සිංහ තෙලට ශ්‍රාවක සඞ්ඝ නැමැති රන් වළන් විනා අගාරික ජන නැමැති සෙසු වළ-දෙක් නිසි නො වෙ යි. එ සේ හෙයින් ගිහි ව සිට ඒ බණ පුරා ලිය නො හැක්ක. එසේ හෙයින් මහණ වෙමි'යි කිවු ය. ඒ අසා කුඩා පාලිත කෙලෙඹියාණෝ 'තව නුඹැ ළ දරුදෑ ය. අවශ්‍යයෙන් අපගේ පෙරත්තත් නොගෙන මහණ වුවමනා වී නම් ළ දරු වයස ගිහි සැප ත් වළඳා මාලු වයස මහණ වුවමැනවැ'යි කිවු ය.

ඒ අසා මහා පාලිත කෙලෙඹියාණෝ 'එම්බා මලණ්ඩ, මාලු කල මහණ දම් කරන්නට බැරි ය. වත් පිළිවෙත් කළ මැනව. ඒ නො කොළොත් වෙළඳම් නො කළ කලට වස්තුව නැත්තා සේ සිල් නො පිරෙයි. සිල් නො පිරුණු කලට සසර දික් වෙයි. සසර දික් වීමෙන් නිවන් දුරුවෙ යි. නිවන් දුරු කලට මහා අලා භ ය. ජරායෙන් මිරිකි පියා සිහා ගන්නා පමණකු ත් නැති ව අශක්ති ව කරණ සපන් කම් බලා ත් සියල්ලකට සමර්ථ අවස්ථා වෙහි මහණ වීම යහපත. එ සේ හෙයින් තොප කුමක් කීව ත් වසවත් මරහු නැවතුව ත් නො නැවත ගොසින් මහණ ව බුදු ව වදලේ මහලු අවස්ථාවෙක නො වේ. විසි නව හවුරුද්දේ ගොසින් මහණ ව පන් තිස් ඇවිරිද්දේ බුදු වූ හෙයින් මහණ වූ යේ ත් සග වයස දී ය. සග කල් ම මහණ ව බුදු ව වදළ බුදුන් කරා මම ද සග කල ම ගොසින් මහණ ව රහත් වෙමි'යි කියා බුදු සසුන් වැද මහණ ව මාලු පැවිද්ද ත් ලදින් ආචාර්ය්‍ය උපාද්ධ්‍යායයන් වහන්සේ ළඟ පස් වසක් වැස ස වෙනි වස වෙන් ව වසන්ට නිසි ව ගෙන බුදුන් කරා ගොසින් 'ස්වාමීනි, නුඹ වහන්සේගේ මේ ශාසනයෙහි ධුර කීයෙක්දැ'යි විචාරා ග්‍රන්ථ ධුර ය විදර්ශනා ධුර ය හා ධුර දෙක ය'යි වදළ කල්හි තමන් වහන්සේ ආධුනික හෙයින් නොදන්න ග්‍රන්ථ ධුර ය කවරේ ද, විදර්ශනා ධුරය කවරේ දැ යි විචාළ සේක.

Non-Commercial Distribution

එ සේ විචාළ ඔබට බුදුහු ග්‍රන්ථ ධුරය නම් තෙවලා බුදු වදන් උගැන් ම ය. ඒ තෙමේ ප්‍රතිපත්ති-ප්‍රතිවෙධ දෙකට මුල් ව සිටී. විදර්ශනා ධුර ය නම් ශීල විශුද්ධි-චිත්ත විශුද්ධි ආදී වූ ෂඩ් විශුද්ධි පරම්පරාවෙන් ගොසින් සත් වැනි වූ ඥාන දර්ශන විශුද්ධි ය සපයන්ට කලාප සම්මර්ශනාදීන් විසින් පැවැති විදර්ශනා ධුර ය නම් වෙ'යි බුදුහු වදාළ සේක. ඒ අසා පාලිත තෙරුන් වහන්සේ 'ස්වාමීනි, මා වැඩි මාලු ව මහණ වූ හෙයින් ග්‍රහණ ධාරණාදි ය කරන්ට ඥාන ශක්ති ය අඩු හෙයින් ග්‍රන්ථ ධුර ය පුරා ගත නො හෙමි. ග්‍රන්ථ ධුර පුරත ත් භව ක්ෂය කොට ගන්ට අවශ්‍යයෙන් විදර්ශනා භාවනාව ඇත මනා හෙයින් දෙකට කැටි ව ම විදර්ශනා ධුර ය පුරමි. කමටහන් වදාළ යහපත'යි දන් වූ සේක. ඒ අසා බුදුහු අර්හත්ත්ව ය දක්වා කමටහන් උගන්වා වදාළ සේක. ඔබ ඒ කමටහන් ඉගෙන ගෙන අනික් තැනකට ගොසින් මුත් එ තැන් හි දී භාවනාභියොග ය බැරි හෙයින් අනික් තැනකට වඩනා කැමති ව බුදුන් වැඳ ගෙන 'භාවනා කරම්හ'යි කියා තනි ව නැඟී යෑම කරණ භාවනාවට අනුරූප වන මුත් ශාසනානුරූප නොවන හෙයින් සමඟ වඩනා තරම් ඇති වහන්දෑ සොයා සැට දෙනෙකුන් වහන්සේ ලැබ ගෙන වැඩ හුන් විහාරයෙහි ගම්ක වත් සපයා ලා සැට දෙනා වහන්සේ හැර ගෙන නික්ම ආවාස එාසු තැනක් සොයන සේක් සාර සිය අසූ ගව්වක් ගෙවා ගොසින් එක් පසල් ගමකට පැමිණ සැට දෙනා වහන්සේ ම **ගැටවටු ගන්වා සිවුරු වැළඳ ගෙන** පාත්‍ර ය පටවා ගෙන සන්හුන් පියෙව් ඇති ව වියදඬු පමණකින් වඩා නො බලා සපදන චාරික ව ගෙ පිළිවෙළින් ම එ ගම සිඟන සේක. ඒ ගම මිනිස්සු ද නව කෙළ දහස් එක්සිය අසූ කෙළ පනස් ලක්ෂ ස තිසක් විතර ආභරණ ලා සැරහීමෙන්—

**'සොභන්තෙවං න රාජානො – මුත්තාමණි විභූසිතා,**
**යථා සොභන්ති යතිනො – සීල භූසණ භූසිතා.'**

යනු හෙයින් වොටුනු ආදී වූ සූ සැට රාජාභරණ ලා සැරහු ණා වූ රජ දරුවන්ට ත් වඩා ඉතා සොභාමත් වූ ඒ වහන්දෑ දැක ආකල්ප සමෘර්ධීන් ම ඉතා ඉතුටු ව ආරාධනා කොට පාත්‍ර හැර ගෙන හසුන් පනවා වඩා හිඳුවා අති මධුර වූ නිවන් රස ලබනු සඳහා මධුරාහාර ය වළඳවා වදාළ අන්තයෙහි ස්වාමිදරුවෝ කොයි වඩනා සේක් ද'යි විචාළෝ ය. එ සේ විචාළවුන්ට'වස් වැස පියන්ට එාසු තැනකට යම්හ'යි වදාළ සේකැ. නුවණැති මිනිස්සු ආකාර යෙන් ම වස් වැස ගන්නා විහාර ලැබ ගන්නා නිසා ඇවිදිනා සේක්

Non-Commercial Distribution

වනැ යි සිතා 'ඉදින්, ස්වාමී දරුවෙනි, මේ තුන් මස නුඹ වහන්සේ හැම මෙහි විසූ සේක් වී නම් අපි හැම දෙන වැඳ පුදු ත් ගනුම්හ. පිළිවන් ලෙසකින් දනු ත් දී ගනුම්හ. පොහෝ දවස් පෙහෙ ව ගනුම්හ. ප්‍රත්‍යන්ත ව තිබෙන හෙයින් අමාරු ව කියවන බණ ත් අසම්හ. දවස් පතා පන් සිල් ගෙන පන් සිලු ත් රකුම්හ. මෙහි ම වැස වදළ යහපතැ'යි ආරාධනා කොළෝ ය.

වහන්දෑ ද, මේ උපාසක වරුන් ආරාධනා කළ බැවින් මී ම රදා අප ගේ සදහම් නමැති අමා ගඟට තමන් ගේ කන් නැමැති පිලි තබා ගෙන සදහම් නැමැති දිය ගෙන ගොසින් සිත් නැමැති කුඹුරු තෙමා ගෙන සැදැහැ නැමැති බිජුවට වපුට ගෙන ලොවී ලොවුතුරා සැපත් නැමැති වී මිරිකා ගන්නට අවසර ත් පාම්හ. අපි ද ඒ උපාසකවරුන් ගේ චතුර්විධ ප්‍රත්‍යය නැමැති රුවල් ඇති, සමාධි නැමැති කුඹක් ඇති, විවසුන් නැමැති නැව් නැගී, මාර්ගඥාන නැමැති ගල් වත බලයෙන් අනන්ත කාලයකිනු ත් එතෙර විය නො හැකි සසර නැමැති මුහුදින් මේ එක වස් තුන් මසින් එ තෙර ව නිවන් පරතෙරට පැමිණෙම්'යි ආරාධනා ඉවසූ සේක. උපාසකවරු ද ආරාධනා ඉවසූ නියාව දන රෑ වසන තැන් දවල් වසන තැන් ඇති ව විහාරයක් කොට දුන්හ. එ වක් පටන් වහන්දෑ ද නිරන්තර ව ම ඒ ගම සිඟන සේක. උපාසකවරු ද ඒ වහන්දෑ සකසා කරණ මහණධම් සේ ම සකසා උපස්ථාන කෙරෙති. එ ගම හිඳිනා එක් වෙද උපාසක කෙණෙක් ඒ වහන් දෑ කෙරෙහි පැහැද ඒ තමන් ගෙනු ත් වහන්දෑට ප්‍රයෝජනයක් කරනු සඳහා එක් දවසක් වහන්දෑට 'ස්වාමීනි, බොහෝ තැන් එක් ව රඳා හිඳිනා කලට ලෙඩක් දුකක් පෙනී යන තැනු ත් ඇත. එ බන්දෙක් ඇති වී නම් මා ගෙන් වුව මනා දෙයක් වදරන්ට ආරාධනා කළ නියා ය. වදළො ත් යහපතැ'යි කිවු ය.

පාලිත තෙරුන් වහන්සේ ද වස් වසන දවස් ඒ සැට දෙනා වහන්සේ බණවා ලා 'ඇවැත්නි, අද වස් වසන දවස් වේ ද? මේ වස් තුන් මස සතර ඉරියවුවෙන් ඉරියවු කීයකින් දවස් යවු දැ'යි විචාළ සේක. ඒ වහන්දෑ ද ඔබ ගේ රුචි ය දත නොහී 'හිඳීමෙන් සිටීමෙන්-වැද හෙවීමෙන්- සක්මන් කිරීමෙන් යන මේ සතර ඉරියවුවෙන් දවස් යවම්හ'යි වදළ සේක. ඔබ ඒ අසා 'ඇවැත්නි! වැදහොත් කල නම් නිදි තර වෙයි. නිද පීමෙනු ත් පිරෙන මහණ ධම් ඇත් ද? නොපමා වුවමනා වේ ද? අප ත් තකා පතකා

මෙ තෙක් තැන් භාවනාවට එන්නමෝ ත් බුදු කෙණෙකුන් වහන්සෙ ගෙන් කමටහන් ඉගෙන ආම්හ. බුදුවරුන් හුන් තැන වැඩ හිඳ ම අප හැම කරණ කියන සිතන දෙයක් ඇත් නම් බඩු සහිත කොට සොරුන් අල්වන්නා සේ ම දැන ගන්නා සේක. පදමානවක ජාතකයෙහි චින්තාමණි නම් මන්ත්‍රානුභාවයෙන් දෙළොස් හවුරුද්දකින් යට කළ සොර කම් කළවුන් ඔබ ඔබා ගිය පියවර ඔස්සේ ගොසින් දැන ගන්නා කල දැන් බුදු ව සර්‍වඥ තා ඥනානුභාවයෙන් කවර කෙණෙකුන් කළ කවර නපුරෙක් දත නො හැකි ද? එ සේ හෙයින් බුදුන් සිත් ගත මනා වී නම් සම්‍යක් ප්‍රතිපදවකින් මුත් බැරි ය. පමා වසන්නවුන්ට සතර අපාය නම් තමා ගේ ගෙවල් හා සරි ය. සතර අපායට යන මං වල්කර තො ත් නො පමාව යි වදළ සේක. ඒ අසා වහන්දෑ 'ස්වාමීනි, නුඹ වහන්සේ කෙලෙස කරණ සේක් දෑ'යි විචාල සේක. 'අපි හිඳී මෙන් හා සිටීමෙන් හා සක්මන් කිරීමෙන් දවස් යවා ත් මුත් වැද හෝනා ඉරියවුවෙන් දවස් නොයවන්ට සිතම්හ. වැද හොත් කලට අප විපස්සනා නැමැති අඞ්ගනාව හා විවාදයට නිද්‍රා නැමැති අඞ්ගනාව තමන් පිළිබඳ හෙයින් එවා ලා උන් දෙන්නා ඔවුනොවුන් හා විවාද කොට දී පඤ්ච නීවරණ නැමැති සොරු පස්දෙන පමාවක් ම වී බලා හිඳිනවුන් හෙයින් උන් ගේ විවාදය නිසා අප ගේ පමාව දැක සිත් සතන් නැමැති ගෙයි තුබූ ශීල සමාද්ධ්‍යාදි ගුණ රුවන් පැහැර ගනිත් නමුත් උන්ට අවසර නොවනු නිසා පිට දික් කොට වැද හෝනේ නැතැ'යි වදළ සේක. ඒ අසා වහන්දෑ ත් යහපත, නොපමා වුව මැනව'යි කියා ලා මහණ ධමට පටන් ගත් සේක.

පාලිත තෙරුන් වහන්සේට නෙසජ්ජික ධුතාඞ්ගයෙහි උත් කෘෂ්ට ය පිරීම් වසයෙන් හිඳීම්-සිටීම්-සක්මන් මුත් වැද හෝනා ඉරියවුව නැති හෙයින් ධුතාඞ්ගයෙහි තුන් තරමින් ශරීර පොහොනා පමණකුත් හැර ගන්ට නො ව ආයාස මහත් ව වස් විසූ මසක් ගිය කල්හි ඇස රුජා පහරනට පටන් ගත. රාගාදි කෙලෙසුන්ගේ ද්‍රව අවස්ථාවෙක් ඇත් නම් විවසූන් යතින් මඩනා ලදු ව පෙරී වැගිරෙන්නා සේ ඇස් දෙකින් ම දිය ධාරා සිදුරු ඇති කෙළවලින් පැන් ධාරා වැගිරෙන්නා සේ වැගිරෙයි. නොහොත් ධ්‍යාන ස්නෙහ රහිත වීමෙන් විවසූන් වියලෙන්නා සේ ශරීර ගත ජලය වගුලො ත් වේ ද, සමාන ගුණ ව ශරිරය ත් වියලෙත් ය යි ශරීරය වියලවන්ට වැගිරෙන්නාක් මෙන් වැගිරෙ යි. උන් වහන්සේ ද තුන් යම් රාත්‍රියෙහි භාවනා කොට පියා අරුණු නැහෙන වේලේ

ගබඩාවට වැද ලා වැඩ හුන්සේක. සෙසු වහන්දෑ සිඟා නික්මෙන වේලෙහි පාලිත තෙරුන් වහන්සේ ළඟට අවුත් 'ස්වාමීනි, සිඟා නික්මෙන වේලා ය'යි කීසේක. ඒ අසා එ සේ වී නම් ඇවැත්නි, සඟළ සිවුරු හා පාත්‍ර ය හැර ගනුව'යි වදරා පාසිවුරු වහන්දෑ ලවා ගෙන්වා ගෙන ඇස රුජා පහරිතත් සිඟා නික්මුනු සේක. වහන්දෑ ද ඔබ ගේ ඇසින් දිය වැගිරෙන්නා දැක 'මේ කිම් ද ස්වාමීනි'යි කී සේක. විචාළ වහන්දෑට ඇස රුජා පහරන නියාවත් ඒ වේදනාවෙන් ඇසින් දිය වැගිරෙන නියාව ත් කී සේක. ඒ අසා වහන්දෑ එක් වෙද උපාසක කෙණෙක් ආරාධනා කොළෝ වේ ද? ආරාධනා නො කළත් අනුදත්තන් තබා සෙස්සන්ට පිළියම් කිරීමෙන් වන විනය විරොධයක් මුත් විචාළ යි වන විනය විරොධයක් නැති හෙයින් ඇස රුජාව පහරින නියාව වෙදණන්ට කිව මනා වේ ද'යි විචාරා ඔබ ත් යහපතැ යි ගිවිසි කල්හි වෙදණන්ට කී සේක. උඹ තමන් අතින් ම බෙහෙත් බඩු ලා බෙහෙත් තෙලක් පිස යවු ය.

තෙරුන් වහන්සේ සැතපී වැද හෙව නස්‍ය කළ මනා තෙල ධූතාඞ්ග හෙද හෙයින් හිඳ ම නස්‍ය කොට ලා ඇතුලු ගමට සිඟා වැඩි සේක. වෙදණෝ දැක 'ස්වාමීනි, ඇස රුජා පහරිද'යි විචාරා 'එ සේ ය, උපාසකයෙනි, වදළ කල්හි තෙලක් පිස යැවුයෙම් වේ ද? නස්‍ය කොට වදළේ ඇයි ද'යි විචාළෝ ය. එ සේ ය, නස්‍ය කළම්හ'යි වදළ සේක. 'නස්‍ය කළ පසු ගුණ කුමක් ද'යි විචාළ කල්හි 'ගුණයක් පෙනුණේ නැතැ'යි කියා වදළ සේක. ඒ අසා වෙදණෝ මගේ නුවණ නැමති ඇසට කෙලෙස් නැමැති රුජා ඇති නොවන්ට එක විට කළ නස්‍යයෙන් ම රුජා සන් හිඳෙන තරම් තෙලෙක පිස යැවූයේ-නොසන් හිඳෙන්ට කාරණාකිම් ද? හිඳ නස්‍ය කළො ත් තෙල ඉඳුරා හිසට නැඟෙන්ට නැති වන්නාය. චිධි වැරදි කලට බෙහෙදේ අඩු ව කියන්ට බැරි වේද'යි සිතා 'ස්වාමීනි! නස්‍ය කෙළේ හිඳ ද, සැතපී වැද හෙව ද'යි විචාළෝ ය. තෙරුන් වහන්සේ හිඳ ය යි කීවො ත්, ශාසන සමය ත් වෙද කම් දන්නා සේ ම දනිත් නම් නෙසජ්ජික ධූතාඞ්ග පූරක නියාවත් දනිති. ධූතාඞ්ගප්පිච්ඡතාව නිසා දෝ නොහොත් හිඳ ය යි කී කලට වැද හෙව නස්‍ය කළ මනා වී නම් වැද හෙව නස්‍ය කරන්ට කියති. උන් කෙ සේ කීව ත් මම මගේ අධිටන් බිඳ එ සේ නො කෙරෙමි. නො කළ කලට උඹ මුසුප්පුව පිළියම ආලෙස්සම් ව ගනිති'යි සිතා දෝ බැණ නො නැගි සේක. බැණ නොනැගෙන්නා විචාරා ආයාස ගැන්මෙන් කිම් ද? විහාරයට ගොසින් සැතපෙන තැන් බලා සැක

හරිමි'යි රොග නිදන් දන්නා සේ ම කාරණා දන්නා හෙයින් සිතා ගෙන 'ස්වාමීනි! වඩනා බව යැ'යි තෙරුන් වහන්සේ විහාරයට යවා පසු ව තුමූ විහාරයට ගොස් වසන තැන් බලා සක්මන් කරණ තැන් හා වැඩහිඳිනා තැන් පමණ මුත් වැද හෝනා තැන් නො දක සැතපෙන තැනක් නැති නියාව දක විචාළ කලට වදරතී සිතා පෙරළා ත් නස්‍ය කෙළේ වැද හෙව ද, හිඳ දැ'යි විචාළෝ ය. ඒ තෙරුන් වහන්සේ එ විට ත් බැණ නොනැඟි සේක.

වෙදණෝ සැක නැති ව ම හිඳ නස්‍ය කළ නියාව දන 'ස්වාමීනි, තෙල ලෙස විධි වරදවා නො කළ මැනව. භාවනා විධි වරදවා කෙලෙස් පිළියම් කළ කලට මාර්‍ගඥාන නැමැති අස් ලැබ ගත නො හැක්කා සේ මේ ඇස් පිළියම ත් විධි වැරදි කලට ඇස් ලබා ගත නොහැක්ක. විධි නො වරදවා මේ පිළියමින් ප්‍රසාද චක්‍ෂුස ලත් සේක් වී නම් මාර්‍ග ය හා සමග අභිඥා නම් දිවැසු ත් ලද හැක්ක ශුෂ්ක විදර්‍ශක වුවොත් මාර්‍ගඥාන නැමැති ඇස් පමණකු ත් ලැබිය හැක්ක යන අවවාද ලෙසට අවවාද කියා පැරැත්ත ගත්හ. තෙරුන් වහන්සේ 'උපාසකයෙනි, තෙපි යව. තවත් කථා කොට ලුව මනා කෙණෙක් ඇත. උන් හා ත් කථා කොට ලා කළ මනා ලෙසක් කරම්හ'යි වදළ සේක. කථා කරන්නේ කවුරුන් හා ද යත්:- කැටි ව ආ වහන්දැලා හා ත් නො වෙ යි. නෑ සිය කෙණෙකු ත් එ තැන නැති හෙයින් උන් හා ත් නො වෙ යි. වැළි කවුරුන් හා ද යතහොත් තමන් වහන්සේ ගේ ශරීය හා ය. ශරීරය හා කථා කරණ සේක් 'ඇවැත්වූ පාලිත යෙනි, කියව. කුමක් ද ඉෂ්ට වූ රූ දක්වා ඊ අනුන ය උපද වන්නා වූ, අනිෂ්ට වූ රූ දක්වා ඊ ප්‍රතිඝ උපද වන්නා වූ, අනිෂ්ට වූ රූ දක්වා ඊ ප්‍රතිඝ උපදවන්නා වූ ඇස් ම වුවමනා ද? බුදු සස්න ත් වුව මනා ද? අක් මුල් නැතිව සසර ඇස් නැතිව උපන් වාර ගණන් නැත. ඇති ඇස් නැති වූ වාර ත් ගණන් නැත. සාරා සැකි කප් සුවහස් ඇතුළත බුදුවරුන්වහන්සේ සත් විසි නමෙක් බුදු ව උකුත් වූ සේක. මුන් වහන්සේ අට විසි ගණන පුරා උපන් සේක. යට ත් බොහෝ බුදුවරුන් වහන්සේ බුදු වූ සේක් ම ය. ඉන් එක නමක් ගෙනු ත් ගුණ විශෙෂයක් නො ලදුව. ඇස් ම සිතවු නම් මුන් වහන්සේ ගෙනු ත් ගුණ විශෙෂයක් නො ලබ ව. මේ වස් තුන් මස පිට දික් කොට වැද හෝනේ නැතැ යි අධිෂ්ඨානයකු ත් කළව. එ සේ හෙයින් 'ඇස් තිබේ වයි, යේ ව'යි කළ ප්‍රතිඥා ලෙසට බුදු සසුන් නැමැති ඇස් ම ලබව'යි මාලු කම් වශයෙන් කථා කළ සේක.

Non-Commercial Distribution

මෙ සේ කථා කොට ශරීරයාණන් ඊට පිටි පෑ කළ කථාවක් නැති හෙයින් හිඳ ම බෙහෙත් තෙල නස්‍ය කොට ලා ගමට සිඟා වැඩි සේක. වෙදුණෝ දැක ආදී විචාළ ලෙසින් ම නස්‍ය කළ නියාව විචාරා 'නස්‍ය කළම්හ'යි වදාළ කල්හි ගුණා ගුණ විචාරා පෙනුණ ගුණයක් නැති නියාව වදාළ කල්හි වෙදුණෝ නස්‍ය කළ ලෙස විචාළෝ ය. තෙරුන් වහන්සේ රැස් වූ තැන කළ මනා නම් ධර්‍මෝපේත කථාව හෝ තුෂ්ණීම්භාව ය හෙයින් මුයෙන් නොබිණූ සේක. වෙදුණෝ විධි වූ ලෙස ම කරවනු නිසා නැවත නැවත ත් විචාරා මුයෙන් බැණ නො නැහෙන හෙයින් ''ස්වාමීනි! නුඹවහන් සේ ගේ ශාසන විධි ය වෙන. අප ගේ පිළියම් විධිය ත් වෙන. අප කියා ලූ ලෙස කොට නොවදරන පසු නුඹ වහන්සේ කරණ ලෙස මා ත් බැඳෙන්ට බැරි ය. මෙ වක් පටන් මා අතවස කොට අසවල් වෙදුණන් පිස දුන් තෙලින් ඇස පහරනා රුජා ගුණ නුවූයේ යැ'යි නුඹ වහන්සේ වදරන්ට ත් නො කැමැත්තේ ය. මමත් කැල ම මා ගේ අශක්ති ය හඟවා කියා නො ඇවිදිමි කිවු ය. ඒ බස් ඇසූ පාලිත තෙරුන් වහන්සේ විහාරයට වැඩ–

''පටික්ඛිත්තො තිකිච්ඡාය-වෙජ්ජෙනාසි විවජ්ජිතො,
නියතො මච්චුරාජස්ස-කිං පාලිත පමජ්ජසි''

යනු හෙයින් තමන් වහන්සේ තමන් වහන්සේට මාලුකම් කියන සේක් 'වෙදුණෝ තමන් කෙරෙමින් සිටි ඇස් පිළියම් අසාද්ධ්‍ය යැයි හළවූ ය. පිළියම් දෙකක් එක් ව කරණ කලට එකකට කළා, එකකට නො අසන හෙයින් ආයාස වන බව මුත් එකක් පිට තබා ගත් කළ පිළිවන් වේ ද කෙලෙස් පිළියම් වූ විවසුන් වඩව'යි වදරා විවසුන් වඩන්නට පටන් ගත් සේක.

''චක්ඛූනි හායන්ති මමායිතානි
සොතානි හායන්ති තථෙව දෙහො,
සබ්බම්පි'දං හායති කායනිස්සිතං
කිං කාරණා පාලිත ත්වං පමජ්ජසි''

යනු හෙයින් 'කෙ සේ මමායන කළ ත් ඇසු ත් නස්සී. ඇස් කන් තබා සියල් සිරුර ත් නස්සී.මෙ හැම නොනස්නා තෙක් තම හට පිහිට වුවමනා වේද'යි තර ව භාවනාවට පටන් ගත් දවස් රාත්‍රියෙන් විසි පෑ විතර ගිය කලට පුරාකෘත අකුසල් නැමැති සතුරා සර්‍වඥ රූප ය දක්වා ලන්ට තර ව සහාය ව සිටි ප්‍රසාද චක්ෂුස් නැමැති මිතුරන් දෙන්නා නො නැවත නස්නා ලෙසට ප්‍රයොගයක් කෙළේ ය. ඔවුන් ගේ නැසීම හා සමඟ පසු ත් පෙරාතු ත් නොව මාර්‍ග ඥාන නැමැති මිත්‍රයාණෝ පුරා කෘත අකුසල් සතුරා ඇතුළු වූ සියලු අකුසල් සතුරනු ත් ඌද්ධම්භාගිය සංයොජන නැමැති

Non-Commercial Distribution

ප්‍රධාන සතුරනු ත් පසු ව වියවුලක් නො කරණ ලෙසට නැසූ ය. මෙ ලෙසින් පාලිත තෙරුන් වහන්සේ ශුෂ්ක විදර්ශක ක්ෂීණාශ්‍රව ව ඒ ජාතිය විනා අනික් ජාතියක් නැති බැවින් මවු ගබට වැදීම් නැත ත් වෙහෙර ගබට වැද ලා වැඩ හුන් සේක. වහන්දෑ ත් සිඟා නික්මෙන වේලේ අවුත් සිඟා යන වේලා යැ'යි කී සේක. ඒ අසා තෙරුන් වහන්සේ එ සේ වී නම් තමන් හැම ගිය මැනැවැ'යි වදාළ සේක. 'හැයි ! නුඹ වහන්සේ නැ'යි වදාළ කල්හි තමන් වහන්සේ ගේ ඇස් නට හෙයින් ගමන බැරි නියා කී සේක. එවේලෙහි වහන්දෑ ඔබ ගේ නට ඇස් බලා දැක ඇසින් කඳුලු ගෙන 'ස්වාමීනි, මුසුප්පු නුවූ ව මැනව. නුඹ වහන්සේ ගේ ඇස් දෙක නටුවා අප සැට නම ගේ ඇස් එක් සිය විස්සෙක් කොට නො ලා ද? අපි නුඹ වහන්සේ හුන් තැන ම වැඩ හිඳුවා ලා අත් පා මෙහෙවර කරම්හ'යි අස්වසා ලා ගෙය මලුව හැමදීම ඇතුලු වූ වත් පිළිවෙත් සපයා ලා තමන් වහන්සේ ත් සැතපෙන තැන වත් සපයා ගෙන ගමට සිඟා වැඩී සේක.

ඒ ගම මිනිස්සු පාලිත තෙරුන් වහන්සේ හැම තැනට ම ප්‍රධාන හෙයිනු ත් තමන් හැම දෙනා උන්වහන්සේ කෙරෙහි ආවේණික සම්භාවනා ඇති හෙයිනු ත් ගිය වහන්දෑ අතින් අප ගේ අනික් ස්වාමී කොයි දැ යි විචාරා ඇස් නට හෙයින් නොවැඩී නියාව අසා කැඳ-අවුලු පත් විහාරයට යවා තුමූ හැම දවාලට දන් ගෙන්වාගෙන ගොසින් තෙරුන් වහන්සේ වැද ඇස් නැති නියාව දැක හඬා පියා 'ස්වාමීනි! අප හැම දෙනමෝ නුඹ වහන්සේ සිඟා නො ඇවිද්දදී උපස්ථාන කරම්හ. නුඹ වහන්සේට ඇසින් අලාභ වූ බව මුත් අපට පරලොවින් වූයේ බලවත් වූ ලාභයෙක. නුඹ වහන්සේ මුල් ව බොහෝ කුසල් පිරෙන හෙයින් ඇස් නැත්තමෝ වේ දැ'යි මුසුප්පු නුවූ ව මැනැවැ'යි අස්වසා ලා ගියෝ ය. එතැන් පටන් කැඳ-බත් ආදිය වෙහෙරටම යවති. තෙරුන් වහන්සේ ද සෙසු වහන්දෑට බසින් කියන බව මුත් ඇසින් බලා පානා දෙයක් නොවන හෙයින් නිරන්තරයෙන් ම අවවාද කරණ සේක. ඒ වහන්දෑ ඔබ ගේ අවවාදයෙහි පිහිටා වස් නිමන ආසන්නයෙහි හැම දෙනා වහන්සේ ම සුප්පාරක ජාතකයෙහි අන්ධ බොධිසත්ත්වයන් ගේ අවවාදයෙහි පිහිටියවුන් වඩබා මුඛයට නො පැමිණ ගොඩ දුටුවා සේ පාලිත තෙරුන් වහන්සේ අන්ධ වූව ත් නුවණැසින් බලා දුන් උපදෙස් අන්ධ නොවන බැවින් සසර නැමති වඩබා මුඛයට නො ගොස් සිවු පිළිසිඹියා නැමැති මහ දිවයින් සතරක් ඇති නිවන් නැමති මුළු සක්වල සාධා ගත් නියාවට අර්හත් ඵල නැමැති චොටුනු පලන් සේක.

Non-Commercial Distribution

මෙ ලෙසින් රහත් ව විසූ වස ත් විශුද්ධි පවුරුණෙන් පවරා වස් නිමවා ලා වස් අන්තයෙහි කළ මනා සිරිතක් බැවින් බුදුන් දක්නා කැමති ව පාලිත තෙරුන් වහන්සේට බුදුන් දක්නට යනු කැමැත්තම්හ'යි කී සේක. එ බස් අසා තෙරුන් වහන්සේ 'මම ඇස් නැත්තෙමි. අතුරු මඟ ත් යක්ෂොපද්‍රව ඇති. වලු ත් ඇති. මා මුන් හැම එක් ව යන කලට හැම දෙන හට ම මා නිසා අට්ටල සිඟා වළඳන්ට නො පිළිවන. මුන් හැම දෙන පෙරාතුව යවන්නා මා නිසා අට්ටලු ත් නැති ව උපද්‍රව ඇති තැනු ත් වළඟා සුව සේ සිඟා වළඳා යෙති'යි සිතා වදරා තමන් හැම පෙරාතුව ගිය මැනව'යි කී සේක. 'නුඹ වහන්සේ නැ'යි කී කල්හි තමන් වහන්සේ සිතා වදළ ලෙස ම'යි වදළ සේක. ඒ අසා වහන්දෑ එ සේ නො කැමැත්තෝ 'ආයේ ත් කැටි ව වුව, පෙරාතුව ආ ගමනක් නො වත් නුඹ වහන්සේ හා කැටි ව ම යම්හ'යි කී සේක. එ සේ කී කල්හි තෙරුන් වහන්සේ 'අපට එ සේ අවාසු ය. අපගේ මල් උපාසකයාණෝ තමන් හැම අතින් මා විතාරති. මා ගේ ඇස් අඹ නියාව කියන බව ය. ඒ අසා මා ලඟට යම්කෙණෙකුන් එවති. එසේ ආවවුන් හා කැටි ව මම එමි. තමන් හැම ගොසින් ති ලෝ ගුරු බුදුනු ත් අසූ මහ සවුවන් වහන්සේ ත් මාගේ වැදීමෙන් වැන්දමැනවැ යි විධාන කළ සේක. ඒ වහන් දෑ ත් තෙරුන් වහන් සේ ගේ සිත ත් තමන් වහන්සේ ගේ සිත ත් කමල පත්‍ර ගත ජල බින්දු සේ අනගැමි මගින් ම සුන් හෙයින් කෝප ලව නැත ත් සිරිත් විසින් වැඳ ක්ෂමා කරවා ගෙන සිඟා නික්මෙන වේලාව හෙයින් ඇත් ගමට සිඟා වන් සේක. මිනිස්සු ද වඩා හිඳුව ලා වළඳවා 'කිමෙක් ද ස්වාමීනි, වඩනා ගමනෙක් ඇද්දැ'යි ආකාරයෙන් ම දැන ගෙන විචාළෝ ය.

උපාසකවරුනි, එසේ ය, බුදුන් නොදක්නේ නැතක් දවස, ගොසින් දක්නා කැමැත්තම්හ'යි කී සේක. උඹ හැම රඳවන්ට ආරාධනා කොට ත් නො රඳන හෙයින් පසු ගමන් කොට ගොසින් හඬමින් වලපමින් නැවැත්තාහ. ඒ වහන් දෑ ද සාර සිය අසූ ගවු වක් විතර මඟ ගෙවා දෙවුරම් වෙහෙරට ගොසින් තෙරුන් වහන් සේ ගේ වැදීමෙන් බුදුනු ත් අසූ මහ සවුවන් වහන්සේ ත් වැඳ දෙ වන දවස් තෙරුන් වහන්සේ ගේ මලණුවන් හිඳින වීථියට පව තු ත් කථා කරණු නිසා සිඟා වැඩි සේක. කෙළෙඹි පුත්‍රයාණෝ ද බැණන් වහන්සේ කැටි ව ගිය වහන් දෑ නියාව දැන ගෙන සිඟ මින් සිටිය දී කථා කිරීම යුක්ති නො වන හෙයින් කථා නො කොට ගෙට කැඳවා ගෙන ගොසින් වඩා හිඳුවා ලා වළඳන තෙක්

Non-Commercial Distribution

සාද සාමීචි කථාකොට පසු ව බෑණන් වහන්සේගේ පවත් විචා-
ළහ. එ සේ විචාළ සිටු පුත්‍රයාණන්ට ඇස් නට නියාව කී සේක.
ඒ අසා හඬා පියා දූන් කළමනා කිම් ද යි විචාරා 'තෙරුන් වහන්
සේ අප හා කැටි ව නො වැඩි බව මුත් මුබින් යමකු යන්නා උන්
හා කැටි ව වඩනා සේකැ'යි කී කල්හි එ සේ වී නම් මේ අපගේ බෑ
ණනුවන් පාලිත කුමාරයන් යවුව මැනවැ'යි කිවු ය. 'මහණ කොට
ලා යවතොත් මුත් මෙ ලෙසින් යවන්නට අතුරු මඟ උවදුරු
ඇතැ'යි වදාළ සේක. 'මහණ කොට වුව ත් යවන්නා ශාසනාභිරතිය
ඇත් නම් රඳාපියති. නැත් නම් ඔබ මුබ වැඩි කලට උන් අභි-
ප්‍රාවෙකැ'යි උන්ගේ දුර්වල අදහස දන්නා සේ ම කීහ.

වහන්දෑ ත් උන් කතර මගින් එතර වනු සඳහා මහණ කොට
ලා දෙපෝයක් විතරිත් ආභිසමාචාරික ශික්ෂාවෙහි යොදු ලා මඟ
කියා ලා යවූ සේක. ඒ හෙරණුන්දෑ ද මයිලණුවන් වහන්සේ සිහා
වළඳා වැඩ හුන් ගමට ගොසින් ගම්දෙර දී එක් යාලු උපාසක
කෙණෙකුන් දැක 'ගමට වැඩි ආරණ්‍යක වහන්දෑ හිඳිනා වන වාස
යෙක් ඇද්දැ'යි විචාරා ඇතැයි කී කල්හි එහි වැඩ හිඳිනා සේක්
කවුරුන් වහන්සේ දැ යි විචාරා පාලිත තෙරුන් වහන්සේ ය යි
කී කල්හි ඔබ නියාව දන ඊට යන්ට මං විචාරා මුබ වහන්සේ කවු
රුන් වහන්සේ දැ'යි විචාළ කල්හි තමන් දෑ බෑන නියාව කී දෑ ය.
උපාසකයෝ කැඳවා ගෙන ගොසින් විහාරයෙහි ලා ලූහ. ඒ පාලිත
හෙරණුන් වහන්සේ ත් මලණුවන් වහන්සේ වැඳ ගෙන දෙපෝයක්
විතර වතින් පිළිවෙතින් තෙරුන් වහන්සේට සකසා පිළිපැද ලා
පසු ව 'ස්වාමීනි, අපගේ මයිල් උපාසකයෝ නුඹ වහන්සේ දක්නා
කැමැත්තෝ ය. වැඩිය මැනව, යම්හ'යි කී දෑ ය. 'එ සේ වී නම්
තෙල යට කෙළවර අල්වා ගනුව යි වදරා ලා යට කෙළවර අල්වා
ගත් කල්හි ඇතුළු ගමට සිහා වැඩි සේක. ඒ ගම මිනිස්සු වඩා හිඳුවා
වළඳවා ලා ස්වාමීනි, මෙතෙක් දවස් විහාරයෙ ම රඳා වැඩහිඳු ත් අද
මොබ වැඩියේ ගමනක් ඇති නියාදැ'යි හෙරණ නම ආ ගමනිනු ත්
සැක ඇති ව විචාළෝ ය. 'එසේ ය, බුදුන් වඳිනට යම්හ'යි වදාළ
සේක.

ඒ අසා උපාසකවරු ත් රඳනා ලෙසට නො එක් ලෙසින්
ආරාධනා කොට වඩනට ම තර හෙයින් දෙ සිය සතළිස් ගවුවක්
විතර දක්මෙහි සමාධි බලවත් හෙයින් පසු ගමන් කොට ගොසින්
අනික් දෙසිය සතළිස් ගවුව ගෙවා ගිය ත් ති ලෝ ගුරු බුදුන්ගේ
රුව බලා පය ඇද ගෙන එත නොහෙන්ට ඇස් නැත ත් බණ

Non-Commercial Distribution

අසන්ට කන් ඇති හෙයින් සදහම් නැමැති මළ බැඳී ගොසින් පය ඇද ගත නො හෙන සේක් ම වේ ද? ගිය ත් කම් කිම් දැ යි නැවත තමන් ගේ ගමට නැඟී අවු ය. හෙරණුන් වහන්සේත් අන්ධ යෂ්ටිය අල්වා ගෙන යන දැ අතුරු මඟ මහවල තෙරුන් වහන්සේ ගේ කුලූපග ගමකට පැමිණි දැ ය. එ සේ පැමිණ සුවඳේ උන් මැස්සන් කිසි කලෙක අමේද්ධ්‍යයෙහි හිඳිනා සේ එ වැනි රහත් කෙණෙකුන් වහන්සේ කැටි ව ලී කෙළවර අල්වා ගෙන යෙමින් සිට ත් එ ගමින් අවුත් වල දර බිඳිනා ගැනියක කෙලෙස් මරහු කියා ලූ මෙ හෙවරක් හඬ ගා කියන්නා සේ කියන ගීයක් අසා. එක්තරා කමටහනක යෙදී බුදු සස්නෙහි මුල් බැඳීගන්ට නො වූ හෙයින් හා ස්ත්‍රීන් ගේ ශබ්දයට වඩා පුරුෂයන් පොළඹා[1] ගන්නා අනික් ශබ්දයක් නැති බැවින් සම්ප්‍රාප්ත විරති වශයෙන් ගැල වී ගත නො හී ඒ ගීතිකා නාදයෙහි ඇලුම් කොට ලී කෙළවර අතින් හැර ලා 'ස්වාමීනි, මඳක් වැඩසිටිය මැනව, කටයුත්තෙක් ඇතැ'යි කියාලා ඈ ලඟට ගියහ. හෙ ද වැළි ත් කුණු කසළට කසළ ගොඩ ආධාරයා සේ කෙලෙස් කුණු කසලට තමා ආධාර ව සිටිනා බැවින් අපායොත්පත්තියට උපදෙශක බැවින් ළං වූවා ය. ඌ තුමූ ත් තමන් සැදූහැයකින් මහණ නො වූව ත් ශාසනානුරූපී නො වන නියාව ත් නො සලකා අතුරු මඟ දී තෙරුන් වහන්සේට සහාය නැති නියාව ත් සලකා ගත නො හී–

"බලවන්තො දුබ්බලා හොන්ති – ථාමවන්තො'පි හායරෙ,
චක්ඛුමා අන්ධිකා හොන්ති - මාතුගාම වසං ගතා"

යනු හෙයින් නුවණ නැති ව ඈ විෂයෙහි විපන්න ව සිල් නැමැති ගුණ බඩු කෙලෙස් නැමැති වල් සොරුන්ට දී පියා අත මිට සැහ වෙන කිසිවකුත් නැති වූ හ. තෙරුන් වහන්සේ ත් 'මෙ තැන්හි ගෑනු කෙණෙකුන් ගීයක් කියන හඬකු ත් ඇසිණ. ගිය හෙරණුන් ට ත් කල් ගියේ ය. කුමක් දෝ ? විපන්න වූ නියා දෝ හෝ යි ? දිවස් නැති හෙයින් අනුමානයෙන් සිතූ සේක. ඒ සංසාර බාණුක වූ පාපී තැනැත්තෝ ද කුණාල ජාතකයෙහි අහෙතුක ප්‍රතිසන්ධික වූ කොවුලු ව උපන් බෝසතුන් ස්ත්‍රීන් ගෙන් සැළකුණු ගුණ තුමූ මනුෂ්‍ය ව සිට ත් සලකා පිය නො හී සිත් ඔස්සේ ගොසින් ඒ සා මහත් හානියකට ගැනියක නිසා පැමිණ, ගොයම් කළ කෙණෙකුන් ගොයම් මිය පිදූරු පමණකු ත් නො ලද්ද සේ ශාසනික ව ත් ගුණ දහමක් ලැබීමට නො නිසි ව ගොසින් තෙරුන් වහන්සේ වැඩ සිටි තැනට අවුත් 'ස්වාමීනි' යම්හ'යි-වැඩිය මැනවැ'යි කිවුය. තෙරුන්

---

1 පොළඹා

Non-Commercial Distribution

වහන්සේ ත් ලී කෙළවර නො ගන්වා ම සාමණේර ය, කෙළෙස් සොරුන් අත ගැසී ගුණ බඩු දීපු ද'යි විචාළ සේක. උ තුමූ තමන් ගේ නො සපන් කම් ප්‍රකාශ වන හෙයින් බැණ නො නැංගෝ ය. බැණ නො නැඟි ගමනින් ම උන් ගේ මොහ නැමති පටල ය වැඩී නුවණැස් නට නියා ව දැන ගෙන 'ඇස් නැත්තවුන්ට සහාය වුව මනා ඇස් ඇති කෙණෙකුන් වේද ?[1] තොප ගේ ප්‍රසාද චක්ෂුස් ඇත ත් නුවණැස් නැති බැවින් සග-මොක් දෙකට මඟ දැක ගත නො හේ. එ සේ වූ තොප මා අල්වා ගත් ලී කෙලවර අල්වන්ට ත් අල්වා ගෙන අඩියක් වුව ත් මා හා කැටි ව එන්ට ත් යුක්ති නැතැ'යි වදාළ සේක.

වදාළ බසින් බලවත් වූ මුසුප්පු ඇති ව හඳින්ට නිසි පිළියක් නැති හෙයින් හන් පෙරෙව් සිවුරු ගිහි පිළි සේ හැඳ ගෙන 'සවාමිනි! සුදු පිළි ලෙසට සිවුරු හැඳ ගත් හෙයින් ගිහි වීමි. මහණ වී ම ත් සැදැහැයෙකින් වූ මහණක්[2] නො වෙයි. සොර භයින් වූ මහණ ය. ගොසිනු ත් හරනා ම සිවුරු ය. වඩනේ යහපතැ'යි කිවු ය. ඒ අසා තෙරුන් වහන්සේ 'හෙම්බල? ගිහි පවිටු ත් පවිටු ය. මහණ පවිටු ත් පවිටු ම ය. තෝ ශාසනික ව රඳා සිටිනා දවස් ගණනේ ත් නාන්ට බැස ඇඟ මඩ ගෑවා සේ සසුන් පිළිවෙත් නසා ගත්ති. ගිහි ව සිට කවර තරමෙක් කෙරෙයි ද? තා වැන්නවුන් ලවා ලී කෙළවර ගන්වා යැමට වඩා තපුරු කොට කිරීමට ත් වඩා නො කිරීම යහපත් සේ මේ වල මිය යැම යහපතැ'යි වදාළ සේක. ඒ අසා සිවුරළු, සිරුර ද ගිය කෙණෙකුන් මහ අවුවේ ලූවා සේ බලවත් සෝ දුකට පැමිණ හඬමින් වලපමින් කටයුත් තක් සේ සිතා කළ බව මුත් ඉතා ම නො කටයුතු හෙයින් මියි ලණුවන්ට ත් පෙනෙන්ට මැළි ව අනික් අතක ම ගියහ.

තෙරුන් වහන්සේ ගේ ද ගුණානුභාවයෙන් තුන්ලක්ෂ සත ළිස් දහසක් ගවුවෙන් උඩ තවුතිසා දෙව් ලොව දෙ සිය සතළිස් ගවුවක් විතර දිග ඇති, ගවු දෙ සියයක් පමණ පළල ඇති, සැට ගවුවක් විතර බොල ඇති, බඳු වද මල් ගොඩක් සේ රතු වූ ශක්‍ර යන් වැද හුන් කලට මොළොක් ලෙසින් පෙකණිය දක්වා ගැලෙන, නැඟී සිටි කල සම තල වන පඬු ඇඹුල් සල හස්න උන් නො කමැති කරවා හුණු වී ය. එ කල්හි සක් දෙව්ඳු හස්න හුණු වීමට කාරණා දිවැසින් බලා තෙරුන් වහන්සේ ගේ ගුණ නැමැති අවු රැස් ගැසී හුණු වූ නියා ව දැන 'එ සේ වන්නේ ත්

---

1. කෙණෙකුන් වේ ද? කෙණෙක් වේ ද? 2 මහණ

Non-Commercial Distribution

එක් තරා කාරණයකින් වේ ද? මෙ තමා මා දත මනා වේ ද? උපෙක්ෂා වීම් නම් මා හිස සත් කඩක් ව පැළී ගියේ වී නමුත් නපුරු, යි සිතා–

''සහස්සනෙත්තො දෙවින්දො -දෙවරජ්ජසිරිධරො,
ඛණෙන උපගන්ත්වාන – චක්ඛුපාලමුපාගමී''

යනු හෙයින් තෙරුන් වහන්සේ ළඟට ගොසින් තමන් ගිය නියාව ඔබට හඟවා පතුල් බිම ගැසූ හ. ඒ අසා තෙරුන් වහන්සේ කවුරු ද යි විචාරා ශක්‍රයන් 'මම ස්වාමීනි! මගී එකෙකිමි' කී කල්හි 'උපාසකයෙනි, කොයි යවු දැ'යි විචාල සේක. 'සැවත් නුවරට යෙමි' කී කල්හි ඉක්මන් ව යන කෙණෙක් වූ නම් උන්ට කල් යන්නේ වේ දැයි සිතා, එ සේ කල යව, යි වදළ සේක. මම වන්නා යන්නෙම් වේ ද? ස්වාමීන් වඩනේ කොයි දැ'යි විචාළෝ ය. 'අපි ත් සැවත් නුවරට යම්හ'යි වදළ සේක. 'එ සේ වී නම් කැටි ව යම්හ'යි කිවු ය. 'උපාසකයෙනි, අප ගේ ඇස් නැති හෙයින් එක් ව යන කලට තොපට කල් යන්නේ වේදැ'යි වදළ සේක. 'ස්වාමීනි, මා ගේ ඉක්මන් කට යුත්තෙක් නැත. ස්වාමීන් හා කැටි ව යෙම් නම් යන ගමනේ දස පින් කිරිය වතින් වෙයියා වත් පමණක් සිද්ධ වූ වත් එ ම විතර කිනු ත් සමාධි වෙමි. එ සේ හෙයින් කැටිව යෙමි' කිවු ය. තෙරුන් වහන්සේ ද 'මූ සත් පුරුෂයාණ කෙණෙකැ'යි සිතා වදරා 'එ සේ වී නම් තෙල යට කෙළවර අල්වා ගනුව'යි වදළ සේක. සක් දෙවිඳු ද ලී කෙළවර අල්වා ගෙන–

''සබ්බිපිංසු පථං යක්ඛා – අනුකම්පාය දාරකෙ.
නික්ඛන්තදිවසෙ යෙව – වෙතිරට්ඨමුපාගමුං''

යනු හෙයින් වෙස්සන්තර ජාතකයෙහි වෙස්සන්තර රජ්ජුරුවන් හිමවත වක් ගල් කුසට නික්මුණු ගමනේ කුමාරවරුන් කෙරෙහි අනුකම්පාවෙන් ජයතුරා නුවර පටන් සෑ රට වැදි රජ දරු වන් ගෙ මයිල් නුවරට එක් සිය විසි ගවුව හකුළුවා සවසට යා හැකි කළා සේ ම යෙමින් සිට දෙ සිය සතලිස් ගවුව හකුළුවා සවස් වේලාවට දෙවු රම් වෙහෙරට ආසන්න කොට සිටුවා ලූ හ. තෙරුන් වහන්සේ සක් පඤ්වයේ[1] හඬ අසා තෙල ගසන්නේ, පිඹින්නේ කො තැන්හි දැ'යි විචාළ සේක. 'සැවැත් නුවර ය'යි කිවු ය. 'යන කල නැතක් දවසින් ගියම්හ. අද උදවු වීය'යි වදළ සේක. මගී වෙසින් ගිය සක් දෙවිඳු හු ''මම ළං මගක් දනිමි'' කිවු ය. නිවන් පුරයට ළං මං දත් තෙරුන් වහන්සේ 'මූ මට සහාය වන්ට ආ දෙවතාන කෙණෙකැ'යි සිතූ සේක. සක් දෙවිඳු ද තෙරුන් වහන්සේ ගේ මලණුවන් කැරැ වූ පන් සලට තෙරුන්

---

1. සක් පනාදියේ

Non-Commercial Distribution

වහන්සේ කැඳවා ගෙන ගොසින් හස්නෙහි වඩා හිඳුවා ලා මිත්‍රයාණ කෙණකුන් ගේ ලෙසින් තෙරුන් වහන්සේ ගේ මළ-ණුවන් ළඟට ගොසින් නම කියා හඬ ගා ලා, 'කුමක් ද'යි විචාළ කල්හි 'මුඹ ගේ බෑණන් වහන්සේ වැඩි නියාව නො දන්නෙහි ද? වැඩි සේක. මුඹ කරවා ලූ පන් සල වැඩ හුන්නා බල බලා ආමි' කියා නැගී ගියෝ ය. තෙරුන් වහන්සේ ගේ මල් කෙළෙණි පුත්‍රයාණෝ ද පන්සලට ගොසින් තෙරුන් වහන්සේ දැක මහ හඬින් හඬමින් වලපමින් 'මහණ වන්ට නො කැමැත්තේ ය'යි මා කීව ත් නො නැවත ගොසින් මහණ ව මෙ බන්දක් වූ නියා ද'යි කියා හැඬීමෙන් ප්‍රයෝජන කිම ද? ඔබට එසුවක් කළ මනා වේ ද'යි කොලු සුහුන් දෙන්නකු නිදහස් කොට ඔබ සමීපයෙහි මහණ කරවා ලා 'ඇතුළු ගමින් කැඳ බත් ගෙනවුත් අඑසු නො කොට රක්ක මැනවැ'යි තෘෂ්ණා දසත්‍වයෙන් මිදී නිදහස් වූ තෙරුන් වහන්සේට නිදහස් දෙන්නා පාවා දුන්නාහ. ඒ පැවිදි වහල් දෙ නම ද තෙරුන් වහන්සේට කළ මනා දෙය නොපමා ව කෙරෙති.

එ කල එක් දවසක් බුදුන් වඳින්නට ඒ ඒ දිගින් ආ වහන්දෑ දෙවුරම් වෙහෙරට අවුත් පළමු බුදු රජුන් වහන්සේ වැඳ, ඉක් බිති ව අසූ මහ සවුවන් වහන්සේ ත් වැඳ, ඒ ඒ විහාර බලා ඇවිදිනා සේක් ඇස් නට හෙයින් එ ලෙසින් ප්‍රසිද්ධ වූ චක්ඛුපාල තෙරුන් වහන්සේ වසන තැනට ගොසින් ඒ විහාරය ත් බලම්හ යි නික් මුණු සේක. ඒ වේලාවට සවසු ත් ව ගියේ ය. මහත් කොට වැස්සකුත් නැගී ය. ඒ වහන්දෑ ද සවස් වූ හෙයිනු ත් වැසි හෙයිනු ත් 'උදසන යම්හ'යි සිතා රඳා පී සේක. වැසි ත් පෙරයම වැස පියා සිටුවා පී ය. චක්ඛුපාල තෙරුන් වහන්සේ ද වඩනා ලද වීය්‍ය්‍යී ඇති හෙයින් සක්මන් කිරීම බොහෝ කලක් ම අභ්‍යාස වූ හෙයින් සක්මන් කරනු නිසා අලුයම සක්මනට වැඩි සේක. එ දවස් ද වැළි ත් වැසි වැස පී හෙයින් සක්මන් කරණ තැන බොහෝ රතිඳු ගොවුවෝ ඇතිවූ හ. තෙරුන් වහන්සේ ඇස් නැති ව කරණ සක්මන් හෙයින් මැඩී බොහෝ දෙන මළෝ ය. වෙලින් වෙලා පස සක්මන් වත් දැන හැමදි තැනු ත් නැත. විහාර ය බලන්ට ය යි අවුත් සවස් ව ගිය හෙයින් නැවතී වහන්-දෑ ත් දෙවන දවස් අවුත් සක්මන් කළ තැන මැඩුනු ප්‍රාණීන් දැක 'මෙ තැන සක්මන් කළ සේක් කවුරුන් වහන්සේ ද'යි විචාළ සේක. තෙරුන් වහන්සේගේ පැවිදි වාල් දෙනම 'අප ගේ උපාද්ධ්‍යායයන් වහන්සේ සක්මන් කළ තැන ය'යි කී කල්හි 'මුන් වහන්සේ ගේ කට යුත්තක් ඉතා නපුරු නියා ය. ඇස් ඇති අවධියේ නිදා පියා පිළිවෙත නො හැසිර දැන් අඬ අවස්ථාවෙහි 'සක්මන් කරම්හ'යි කියා ලා මේ තෙක් ප්‍රාණීන් නසා බොහෝ

අවැඩ කරණ සේක. ප්‍රාණීන් නැති තැනක් විචාරා ලා ත් සක්මන් කරන්ට නොහැකි නියා ද? මෙ පවත් බුදුන්ට දැන්වුව මනාවේ ද'යි බුදුන් කරා ගොසින් 'ස්වාමීනි, චක්ඛුපාල තෙරුන් වහන්සේ සක්මන් කරම්හ'යි බොහෝ ප්‍රාණීන් මරණ සේකැ'යි දැන් වූ සේක.

බුදුහු ඒ අසා 'කුමක් ද? තෙපි උන් ප්‍රාණීන් මරණ නියාව දුටුහු ද'යි විචාරා දුටුයේ නැතැ යි කී කල්හි යම් සේ තෙපි නුදුටුහු ද උයි ත් සක්මන් කරණ ගමනේ උන් නුදුටු වූ ය. රහතන්ට වධක චෙතනාව නැතැ'යි උන් වහන්සේ රහත් නියාව වදළ සේක. ඒ අසා වහන්දෑ 'ස්වාමීනි, රහත් වන්ට නිසි පින් ඇති කලට අඹ වූයේ හැයි ද? අර්හත්ත්‍ව ය සාධා දී ලන තරම් කුශලයා එ විතරක් නවතා ලිය නොහෙන නියා දැ'යි කර්‍ම විෂය බුදුන්ට මුත් තමන් වහන්සේ ලාට අවිෂය හෙයින් විචාළ සේක බුදුහු ඒ අසා 'හෙම්බා මහණෙනි, රහත් වන්ට නිසි පින් කම් ඇත ත් බලී අකුශලයක් කළ හෙයින් අනිවාර්‍ය්‍ය වී ය'යි වදරා ලා ඒ අසා ත් එ බඳු අකුසලින් නො නවත්නා නිසා චක්ඛුපාල තෙරුන් වහන්සේ කළ අකුශල කර්‍ම ය වදරණ සේක් 'මහණෙනි, යට ගිය දවස බරණැසැ බඹදත් නම් රජකු රජ කරණ කල්හි ඇස් වෙද කම් දන්නා කෙණෙක් ගම් නියම් ගම් රාජධානිවල ඇවිද වෙද කම් කරන්නෝ එක් තැනක ඇස් ඇදිරිය ඇති ස්ත්‍රියක දැක 'තොපට ලෙඩ දුක් කිම් දැ'යි විචාරා ඇස් ඇදිරිය ඇතැ'යි කී කල්හි 'බෙහෙදක් කෙරෙම් දැ'යි විචාළෝ ය.

ඒ අසා උයි ත් තමන් පත පතා ත් හිඳිනා එ ම හෙයින් යහපතැ යි කිවූ ය. වෙදණනු ත් පිනට කරණ දෙයක් නොවන හෙයින් මිල කිම් ද යි පිළියමින් ඇදිරිය ගුණ වූ කලට දෙන මිළ විචාළ කල්හි, ඇදිරිය නැති කරවා ගන්නා රුචින් වෙදණන් වෙද කමට තරයේ ලබ්බවා ගන්නා නිසා 'මේ ඇදිරිය නැති කරවා ලූවොත් සෙසු කුමක් ද? දරු මලු පුඩුවෙන් මම නුඹට මිඩි වෙමි'යි කිවූ ය. වෙදණෝ ඒ අසා මෙ විතරක් කී කලට ප්‍රයෝජන ය වැඩි යුරුවක් කරන්නේ වේ ද යි සිතා බෙහෙදක් ඉදි කොට දුන්හ. එක බෙහෙදින් ම ඇස ඇදිරිය නැති ව පියවි ඇස් සේ විය. ඇස් ගුණ වුව ත් ලෙටි කම ගුණ නු වූ හෙයින් දීමන් දී ලන්ට ලෙටි වත් නැවත 'මම මුන්ට මිල ගිවිස්නෙම් ඇස් ආසාවෙන් මිඩි වෙමි යි කියාලිමි. තමන්ට අත් වූ කල නම් තකන්නෝ නැත. එක් උපදෙසක් කළ මනා වේ දැ'යි සිතා වෙදණන් අවුත් ගුණාගුණ විචාළ කල්හි 'ආදි

Non-Commercial Distribution

ඇස් තරමෙක පෙනෙයි. දූන් බෙහෙත් ගෑවක්[1] පටන් තර ව ම නො පෙනෙ'යි කිව. වෙදණෝ ද ඒ අසා තමන් ගේ බෙහෙදේ තරම තමන්ට ම හැඟෙන හෙයින් 'මෝ මට කිසිවක් දී ලන්ට, කොට ලන්ට මැළි ව කියන වන ම. දෙන මිලයෙන් මට කම් නැත. වස්තු වුව මනා වී නම් යහපත් පිළියම් දන්නා බැවින් ඔබ්බකට ත් පිළි යම් කොට සංග්‍රහ ලබමි. දී ලන්ට අදහස මුන්ට නැති වූවා සේ ම ඇසූ ත් නැති කෙරෙමි' සිතා පර ලොව සිතා ගත නොහී ගෙට ගොසින් ඇඹෙණියන්ට ත් එ පවත් කිවු ය. උයි ත් ඒ අසා නවතා නුලූවෝ ය. කරව යි කියා තමන්ට ත් පව් පිරෙන ලෙසට විධානයකු ත් නො කළෝ ය.[2] වෙදණෝ එක් විෂම බෙහෙදක් යොදා ලා ගෙන ගොසින් 'ඇස් ඇදිරිය තර වී නම් තෙල බෙහෙත් ගාලව'යි දූන්හ.

උයි ත් තමන් ගේ බසින් ඇදිරිය තර ය යි සිතා අවිෂම ව දූන් බෙහෙදෙකැ'යි සිතා ගෙන ඇස ඇදිරිය නැත ත් කර්ම ඇදිරිය බලවත් හෙයින් විෂම බෙහෙද ඇස ගෑවූ ය. බෙහෙද ගාලන්නා ම කර්ම ඇදිරියට නිසි බෙහෙත් හෙයින් පාන් දෙකක් නිවී ගිය කලක් මෙන් ඇස් දෙක ම නැසී ගොසින් බැලුම් නැති වී ය. කර්ම ඇදිරිය ත් තුනී වන්නෙක් හෝ නැති වන්නෙක් වී ය. වෙදණෝ ත් අනුන් දමා පූ දෙයක් හැර ගන්නා සේ ම උන් ගෙන් ගෙවුණු අකුශල ය තමන් කෙරෙහි පිහිටුවා ගත්හ. 'මහණෙනි, එ කල වෙද්දූ නම් දූන් ඇස් පිළියමෙහි තර නොවන කෙලෙස් පිළියමට තර ව මාර්ග ඥාන නමැති ඇස් ලත් චක්ඛුපාල තෙරහු ය. පුතණුවන් එ කල්හි කළ අකුශල කර්මය දුවන එකකු හඹා දුවන එකක්හු මෙන් මෙ වක දක්වා ම අවසර බල බලා හඹා පසු පස්සෙහි දිවී ය. යම් කෙණෙක් තුන් දෙරින් සිද්ධ වන අකුශලින් දුරු විය නුහුණු වූ නම් ඒ අකුශල ය ගැල් අදනා ගොන් ගිය ගිය සේ ගැල් සක් ගොන් ගේ පයට ළං වන්නා සේ සසර නමැති ගැළ යෙදුනු සත්ව නමැති ගොන් ගේ විපාක දන කාල නමැති පයට අකුශල් නමැති ගැල්සක—

"සන්ධිමෙකන්තු කම්මෙකං-ජනෙති න තතො පරං,
අනෙකානි විපාකානි-සඤ්ජනෙති පවත්තියං"

යනු හෙයින් ප්‍රතිසන්ධි විපාක ය එක කර්ම ය. එක වරෙක මුත් නො එක් වර නොදෙන බව මුත් ප්‍රවෘත්ති විපාක නො එක් වර දෙන හෙයින් අපරාපර්‍ය්‍යා වෙද්‍ය වශයෙන් අනුපධිශෙෂ නිර්වාණ ධාතුව දක්වා ළං ළං ව දිවෙයි. ම පුතුන් රහත් වූ හෙයින් මෙ තැන්හි දී නැවති පිය"යි වදරා මේ දෙශනාව නිමවා වදළ සේක.

---

1. ගෑවක් 2. කොළෝ ය.

Non-Commercial Distribution

තිලෝ ගුරු බුදුරජාණන් වහන්සේම මේ ධර්ම දෙශනා නමැති බෙහෙදින් තිස් දහසක් දෙනා වහන්සේ භවොත්පත්ති ලෙඩින් අර්හත් ඵල නමැති ගොඩට නැඟී සිත් සතන් සැනැහුණා සේ සත් පුරුෂයන් විසින් අප ගේ සද්ධර්මරත්නාවලී නමැති බෙහෙදින් දුශ්චරිත නමැති (ලෙඩින්) ගොඩ නැඟී විෂ්කම්භන - සමුච්ඡේද දෙක මෙ වක බැරි වුව ත් තදඞ්ග වසයෙන් ක්ලෙශ කාලුෂ්‍යාප ගමයෙන් පවිත්‍ර වූ අදහස් ඇති ව ලොව් ලොවුතුරා සැපත් සිද්ධ කට යුතු.

---

## 5 මට්ටකුණ්ඩලී වස්තුව

තව ද සැදෑ ඇත්තවුන් ගේ සැදෑ වඩනට නිසි වූ අනිකුත් කථාවක් දක්වන්නමෝ යම් සේ චක්ඛුපාල තෙරුන් වහන්සේ වෙද ව උපන් ජාතියෙහි නුවණ නමැති ඇස මොහ නමැති පටලය වැඩීමෙන් කුශල් නමැති ඉඳුරා මග නො දැක අකුසල් නමැති විෂම මගට පැමිණ ලසු වූ ත් අකුශල ය නිසා රහත් වූ ජාතියෙහි අන්ධ වීමෙන් මේ සා හාණියක් වී ද එ සේ නො ව යම් කෙණෙක් නුවණ නමැති පහන් ඇසින් කුශල් මගට බැස ලසු වූත් කුශලයෙහි හැසිරෙත් නම් ඒ නිසා ලබන ලොව් ලොවුතුරා සැපත් මට්ටකුණ්ඩලී වස්තුවෙන් දක්වම් හ.

හේ කෙ සේ ද යත්:—

සැවැත් නුවර අදින්නපුබ්බක නම් බමුණාන කෙණෙක් වෙසෙති. උෟ' තුමූ සුධා භොජන ජාතකයෙහි කෙළ ගණන් වස්තු ඇති පියාණන් සක් දෙව්ඳුගේ උපදෙසින් දන් දීමෙහි අදහස් ඇති වන තෙක් කිසි කෙණකුන්ට කිසිවක් දී ලන්ට මැළියා සේ, ඉල්ලීස සිටාණන් ඉල්ලීස සිටු වෙස් ගත් සක් දෙවි-ඳුහු සම්පත් විසුරුවා දන් දෙන තෙක් තමන් දී ගත නුහුණුවා සේ, බුදුන් ගෙන් බණ අසා නිවන් දැක මසුරු සිත් තුනීවන තෙක් තණ අග ගලා තෙල් බින්දුවක් විතර ත් අනුන්ට නුදුන් විරූ ය. එ සේ හෙයින් ''අදින්නපුබ්බක'' ය යන නම අන්වර්ථ නමය. උන් ගේ එක ම පුතණු කෙණෙක් ඇත. ජීවිතය සේ ඉතා ප්‍රිය යෝ ය. ඒ ප්‍රිය පුතණුවන්ට ආභරණයක් කරවන්ට සිතා කෙළ ගණන් සම්පත් ඇති තැනැත්තෝ නුග ගස මහත් වත් නුග ඵලය කුඩා වන්නා සේ සම්පත් මහත් වුව ත් අදහස කුඩා බැවින් ආභරණ කරවන්ට බඩාල් කෙණකුන් ගෙනාවොත්

Non-Commercial Distribution

කර්මාන්ත කරවණ තෙක් දවස් උන්ට බතු ත් දිය යුතු ය. එ සේ කලට නැතක් වී සාල් වියදම් වෙයි. නැවත කර්මාන්තය නිම වා දුන් කල මිල ත් දිය යුතු ය. එ සේ කලට ආභරණ මෙන් හා කළ මිලය ත් කැටි ව බොහෝ වස්තු ත් වියදම් වෙයි. දන්නා නො දන්නා තමා ම කරණ කලට වියදම් වන දෙයක් නැත්තේ වේ දැ'යි බොහෝ සිතිවිලි සිතා තුමූ ම රත්රන් හැර ගෙන අකුරු ලියන සේ නො දන්නා කෙණෙකුන් පත්වල හිරි හදනා සේ කුණ්ඩලාභරණ සේ තලා පියා දුන්හ. ඒ කුණ්ඩලාභරණය උරුට්ටු ආදී වූ සූක්ෂම කර්මාන්ත නැති හෙයින් මට සිළුටු වී ය. එ සේ හෙයින් කුමාරයන්ට නම් තබන්නෝ මට්ටකුණ්ඩලී නම් තුබූ හ.

ඒ කුමාරයන් සොළොස් හැවිරිදි අවස්ථාවෙහි පාණ්ඩුරෝග ඇති වි ය. එක් දවසක කුමරුන් ගේ මෑණියෝ බමුණානන්ට වස්තු ලොභයෙන් ඊ අවස්ථාවක් නැත ත් තුමූ පුතණුවන් ගේ සැටි දැක බමුණානන් බනවා ලා තොපගේ පුතණුවන් ගේ හැටි පෙවෙත් තාපුර. උන් තමන් නොකිය ත ත් ලෙඩක් දුකක් ඇත්තා සේ ය. ඊට නිසි පිළියම් දන්නා කෙණෙකුන් ගෙනවුත් පිළියමක් කරව'යි උන්ගේ අදහස් ආභරණ ය කළ ලෙසින් ම නො නැහුණා සේ කිවු ය. බමුණානෝ ඒ අසා පින්වත් බැමිණිය කුමක් කියයි ද, පිළියමට වෙදවරුන් ගෙනා කල වෙද කම් නිමන තෙක් බතු ත් දුන මැනව. මං කුලී ත් දුන මැනව. කෙළ වර මිළත් දුන මැනව. බලවත් ව තිබෙන ව්‍යාධි හෙයින් මිළ ත් මඳකින් සෑහී නො යෙයි. හී දඬු මිටියකින් හී දණ්ඩක් හයා ගත් කලට අඩු ව පෙනෙන්නා සේ කවර තරම් වස්තුයෙක ත් දවසක් වුව ත් ප්‍රයෝජන උන කලට අගය අඩුවන්නා සේ සම් පත් අඩු වන නියාව කලන්‍දක ජාතකයෙහි ලේනාණන් නගුට වැද ගත් පැන් ඉසි පමණකින් මූද පැන් අඩු වූ නියාවෙනු ත් දත මනා වේදැ'යි යන්න තමන් නොදත් හෙයින් දෘෂ්ටාන්ත කොට නො කීව ත් සෙසු ලෙස කථා කීමෙන් තමන් ඉතා ලාමක නියාව හැඟ වූ හ.

ඒ අසා බැමිණියෝ බමුණානෙනි, එ සේ කල කළ මනා කිම් දැයි විචාළෝ ය. 'යම් ලෙස කළ කල මගේ වස්තුවට හානියෙක් නො වේ නම් ඒ ලෙස ත් කෙරෙමි'යි කියා ලා වෙදවරුන් ළඟට ගොසින් පාණ්ඩුරෝග ඇත්තවුන්ට කුමන පිළියම් කරවු දැ'යි විචාළෝ ය. වෙදවරු ඒ අසා රෝග ඇති කෙණෙකුන් කරා කැඳවා ගෙන ගොසින් නිදන් දන්නා ලෙසට රොගිනු ත් බලා

Non-Commercial Distribution

පිළියම් නො කරවා දුර තබා විචාරන කල රෝගීන් නියම නො කළා සේ ම අපි ත් කියන බෙහෙද නියමක් නැති ව කියම් හ'යි සිතා ගෙන බමුණානන් විචාළ ලෙසින් ම මුන් තමුන් ගේ පුතණුවන්ට පාණ්ඩු රොග ඇති වන. තමන් ලොභී හෙයින් වෙද වරුන්ට යමක් දී ලන්ට මැලි ව විචාරන වන්නැ'යි සිතා ලා චක්ඛුපාල තෙරුන් වහන්සේ වෙද ව උපන් අවධියේ ඇස් නස්නට දුන් බෙහෙත් සේ ම අනික් අනික් ලෙඩකට ම නිසි බෙහෙදක් විධි ත් නො කියා පාණ්ඩුරොග ය විෂම වන ලෙසට ම කියා ලති. බමුණානෝ ඒ අසා සුඹුළු ආදි ය ගෙන ගොස් කකාරා පෙරා දෙති.

පය බරවායට පිටකර බෙහෙත් බඳිනා සේ ම, ඇස් සර–හන්ට තොල අඳුන් ගානා සේ, වරදවා කරණ පිළියම් හෙයිනු ත් අවස්ථා දැන නිදන් බලා කරණ පිළියමක් නො වන හෙයිනු ත්, බෙහෙත් කෙරෙමින් සිටිය දී, ඒ ඒ විෂයට ප්‍රතිනියත මන්ත්‍රා දිය තිබිය දී, අනික් මන්ත්‍රාදියකින් විෂ බාමින් සිටිය දී, වඩා ගෙන යන විෂයක් මෙන් රොග ය බලවත් ව ගොසින් මරණින් මුත් පිළියමින් අසාද්ධ්‍ය බවට පැමිණියේ ය. එ කල බමුණානෝ ආදා යවා තබා ලා වල්පත ගත්තා සේ, වෙද වරුන් ගෙන්වන අවස්ථාවේ රෝග හානියට ත් වඩා වස්තු හානි ය නො කැමති ව නො ගෙන්වා අතෙකිච්ඡ අවස්ථාවෙහි වෙදුණ කෙණකුන් ගෙන් වූ ය. ඌ අවුත් රොග බලා සන්සිඳුවන්ට බැරි නියා ව දැන 'මා අවසර නැත. අනික් වෙද කෙණෙකුන් ගෙන්වා පිළියම් කර වන බව ය'යි කියා ලා ගියෝ ය. උන් ගිය ගමනින් ම බමුණානෝ පුතණුවන් මියන නියාව නියම කොට දැන මූ මළ කල ඉළවුවට[1] ආ කෙණෙක් ඇතුළු ගෙයි පුරා තුබූ සම්පත් දැක මෙ තෙක් සම්පත් තබා ගෙන හිද දුප්පතා සේ පුතුට පිළියම් පමණකු ත් නො කරවා නසා පී ය. අනේ මේ මහා ලොභි එකෙක් වනැ'යි මා ලොභී කොට ත් සිතා ගනිති''යි සිතා නො මියන තෙක් ම පුතු පිටත් කරවා ගෙන් පිටත පිළ පිට ලවා පූ හ.

බුදුහු එ දවස් අලුයම් වේලෙහි මහ කුළුණු සම වතට සම වැද එයින් නැඟී පෙර බුදු වූ බුදුවරුන් වහන්සේ සමයෙහි මහත් සේ කොට පුරා පී පින් කම් ඇති හෙතු සම්පන්න පුද්ගලයන් දක්නා පිණිස බුදු ඇසින් ලොව බලන සේක් දස දහසක් සක්වළ නැමැති මහ මුහුද වසා නුවණ දැල දැමූ සේක් මට්ටකුණ්ඩලී නැමැති කුඩ මසු, පිළ නැමැති දිය කෝල් බඩ හොත්තේ බුදුන් ගේ නුවණ

1. එළවූවට.

දැළට තමා සම්භ වුව මනා හෙයින් චැද හොත් ලෙසින් ම නො සෙල් වී නො පෙරළී නුවණ දළ බැඳිණ. බුදුහු ඔහු දැක මා එතැනට යාමෙන් වන ප්‍රයෝජන කවරේ දෝ හෝ යි පරීක්‍ෂා කරණ සේක් ‘මා එ තැනට ගිය කල මට්ටකුණ්ඩලියා මා කෙරෙහි සිත පහදවා ගෙන කොට ගත් අනික් පින්කමක් නැත ත් සිත පහදවා ගත් පමණකින් මිය ගොස් තවුතිසා දෙව්ලොව එක් සිය විසි ගවුවක් විතර උස ඇති රන් විමනෙක උපද්දී ඔහු පිරිවරා දෙවඟනෝ දහසක් දෙන පහළ වෙති.

“බමුණු මිය ගිය පුතු දවා පියා මළ පුතු අරභයා අඬමින් දවා පූ සොහොනෙහි ඇවිද්දී. දෙව් ලොව උපන් මට්ටකුණ්ඩලී දෙව් පුතුන් ද තුන් ගවුවක් පමණ උස හා ගවුමක් විතර පළන් ඔවුන්න හා එක් ව සතර ගවුවක් උස ඇති ව ගැල් සැටෙක පිරෙන ආභරණයෙන් සැරහුණු දහසක් දෙවඟනන් විසින් පිරිවරන ලද ඉතා ශෝභාමත් වූ ආත්ම භාව ය දැක “මේ දෙව් සැපත නිකම් හුන් පමණකින් ලද හැක්කේ නො වෙ යි. එක් තරා පින් කමකින. කෙ සේ වූ පින් කමෙක් දෝ හෝ යි තමා කළ පින් සලකන්නේ ආසන්න කර්‍ම ව සිටි අනික් පින් කමක් නැති හෙයින් මා කෙරෙහි සිත පහදවා ගත් පමණකින් නියාව දැන ‘අනේ! අදින්නපුබ්බක නම් බමුණු ඒ සා මහත් වස්තුව මඳ ව යෙ යි’ යන මසුරු අදහසින් මට බෙහෙත් පමණකුත් නොකර මා මියන්ට අත්හැර දැන් ආදහණ භූමියට ගොසින් වසා ලූ කඩ රෙද්දට ලොභයෙන් හඩන්නා සේ හඬ යි. හඩින්නහු දිවන්නන් ලුහු බඳවන්නා සේ තරයේ ම හඬාපුව මනා වේ දැ’යි පියා කෙරෙහි මුසුප්පුවෙන් මට්ට කුණ්ඩලී ලෙසින් අවුත් සොහොන් බිමට නුදුරු තැනක සිට හඬ යි.

“බමුණු ඔහු දැක තමාගේ පුතු මළ නියාව දන්නා බැවින් ‘තෙපි කවුරු දැ’යි විචාරා ‘මම තොපගේ පුත් මට්ටකුණ්ඩලියා වේ දැ’යි කී කල්හි ‘කො යි උපනු දැ’යි විචාරා ඔහු තවතිසා දෙව් ලොව උපනිමි’යි කී කල්හි ඔහු පින් කමක් කරණ නියාවක් තමා නුදුටු හෙයිනු ත් පර සිත් දන්නා නුවණක් තමාට නැති හෙයිනු ත් බුදුන් කෙරේ කළ චිත්තප්‍රසාද ය නො දත් හෙයිනු ත් බුදුන් දුටු නියා දුටත් එ විතරකින් දෙව් ලොව ඉපැද ඒ සා සම්පතක් ලබන නියාවකට බමුණු තමා ගේ වෙදයෙහි නැති බැවිනුත් ‘කුමන පින් කමක් කොට ද, ඒ දෙව් ලොව උපන්නේ’ය යි විචාර යි. ඒ අසා දෙව් පුත් ‘මා කෙරෙහි සිත් පහදවා ගත් පමණකිනැ’යි විචාළ බමුණාට කිය යි. බමුණා ඒ අසා හදහ

Non-Commercial Distribution

ගත නො හී මා කරා අවුත් 'නුඹ වහන්සේ කෙරෙහි සිත් පහදවා එ පමණකින් අනික් පින් කමක් නො කොට දෙව් ලොව උපදින් නෝ ඇද්ද'යි විචාර යි. විචාළ ඕ හට 'හෙම්බල බමුණ, මා කෙරෙහි සිත් පහදවා එ පමණකින් දෙව් ලොව උපන්නවුන් සිය ගණනිනුත් දහස් ගණනිනු ත් ලක්ෂ ගණනිනු ත් පුඩු කොට කියන්නට බැරි ය'යි කියා ලා ඒ සාධන්ට නො වක ත් ධම්පියා වෙන් ගාථාවක් කියමි. ඒ ගාථාව කියා ලූ අන්තයෙහි සූවාසූ-දහ සක් දෙන කෙලෙස් සතුරන් ගෙන් කිසි කෙණෙකුන් මරා නිම වා, කිසි කෙණෙකුන් එඩි දර්ප රහිත කොට ලා නිවන් පුර වදිති. නිවන් පුර වැද පසු ව කලෙක දී කෙලෙස් සතුරන් මරා නිම වති. මට්ටකුණ්ඩලී නම් දෙව් පුත් ද කළා වූ චිත්ත ප්‍රසාදයෙහි විපාක දෙව් සැප ත් ලත් පමණකින්-කෙතෙක් බත් කැව ත් පැන් පූවො ත් මුත් පිපාස සන් නො සිඳෙන්නා සේ – නිවන් දුටු වොත් මුත් නො නිමන හෙයින් දහසක් නයින් සැදුම් ලද සෝවන් පෙලෙහි පිහිටා ලද දිව සැපත තර කොට ගෙන අපා යොත්පත්ති නැති කෙරෙති. ඉතා ලෙටි වූ අදින්න පුබ්බක බමුණු ද සෝවාන් ව ඇඹුලකින් තඹ මළකඩ නැතිවන්නා සේ ලොභ සිත් මඳ ව තමා ගේ වස්තු නිධාන ගත ව තුබූ නියාව නො සේ ම හෙයින් උගුළුවා හැර ගෙන කවර ලෙසිනු ත් නො නස්නා ලෙසට අනුගාමික නිධාන කොට බුදු සසුන් නැමැති ක්ෂෙම තැන ලයි.

මෙ සේ මේ කුල දරුවාණන් නිසා බොහෝ ප්‍රයොජන වෙ යි – දූන වදුරා දෙවන දවස් උදසන අලතා පිඩෙක ඇති වූ පබලු දළු වැනි වූ හෝ නොහොත්, ලා රසෙහි ගලා ඔසො වා ගත් කොබෝලීල මල්දමක් වැනි වූ තමන් වහන්සේ ගේ හඳනා සිවුර පත් කොට ගෙන ත්‍රි මණ්ඩල පටිච්ඡාදන වසයෙන් පෙකණිය ත් දන මඩුලු ත් වසා පුන් සඳ මඬලෙන් බාගයක් රත් වලා යෙකින් වසන කලක් පරිද්දෙන් වැළඳ ගෙන ඊ මත්තෙහි පබළු දළු සමූහයක් රන් පවුවකින් වෙළන කලක් පරිද්දෙන් විදුලි යක් හා සමාන වූ පටී ධාතුන් වහන්සේ බැඳ ගෙන, ඉක්බිති නුග පක් සමූහයක් වැනි වූ දෝ හෝ නො හොත් බඳු වද මල් ඇති රියක් වැනි වූ සුගත් පොරෝනා සිවුර රත් පළසකින් ඇත් කුඹක් වසන්නාක්හු මෙන් ද, නො හොත් සියක් රියන් උස ඇති රන් ඇගෑයක් පබළු දලකින් වසන්නාක්හු මෙන් ද නොහොත් රන් ද ගබක් රත් පලසකින් පිළිගත් සේ ලන කලක් මෙන් ද, නොහොත් යන පුන් සඳ රත් වලායෙකින් වසන්නාක්හු මෙන් ද, නො හොත් රන් පර්වත මුදුනකින් පර්වත ය වසා ලා රස වගුරු වන්නාක් මෙන් ද, නො හොත් සිතුකුළු පව්ව බඳු වද මල් දමින්

1 රත්.

Non-Commercial Distribution

වේන කලක් මෙන් ද සකසා වැළඳ ගෙන රන් ගුහාවකින් නික්මෙන සිංහයක්හු පරිද්දෙන් ගඳ කිළියෙන් නික්ම වඩනා නියාව දස දිග කියා යවන මෙහෙවර කරන්නවුන් මෙන් සකල ශරීරයෙන් සවනක් රස් විහිදුවමින් මහා කාශ්‍යප ස්ථවිර ප්‍රමුඛ භික්ෂු සඞ්ඝයා වහන්සේ පිරිවරා සැවත් නුවරට වැඩ ගෙ පිළිවෙළින් සිඟා වඩනා සේක් බතක් නිසා සිඟා වඩනා ගමනක් නො වත ත් අදින්නපුබ්බකයන්ගේ ගෙට ත් වැඩි සේක.

එ වේලාවට මට්ටකුණ්ඩලී භිත්ති ය දිසාවට මූණ ලා වැද හොත්තේ ය. බුදුහු තමන් වහන්සේ නො දක්නා නියාව දැන ශරීර ප්‍රදෙශයකින් රස් කඳක් විහිදුවා වදළ සේක. ඒ රස් කඳ ගොසින් බිත ත් වැද ගත. මට්ටකුණ්ඩලී ත් බුදු රස් දැක මියන වේලක – රුවන් සක්මන මුනි පෙත්තක් ගෙන ගොස් සිටුවා ලා පෙත්ත දසාවට නමා ලූ කලක් මෙන් මිදුල දිසාවට නැමී ලා වැදහොත් තැනැත්තෝ දෙතිසක් විතර මහා පුරුෂ ලක්ෂණ යෙන් හා අශීත්‍යනුබ්‍යඤ්ජනයෙන් හා බ්‍යාම ප්‍රභා කෙතුමාලා යෙන් හා දස දිග පතළ සවනක් බුදු රසින් හා කප් ගිනි ගත් රුවන් මෙරක් මෙන් බබලමින් වැඩ සිටි, බැලූ බැලූවන් ඇස් සනහන, සිතූ සිතූවන් සිත් සනහන, ඇසූ ඇසූවන් කන් සන හන, අනල්ප කල්ප කොටි ශත සහශ්‍රයෙහි පිරූ සුචරිත ය එක් කොට හඹා සිටුවා ලූවක් වැනි බුදු රුව දැක 'නුවණ නැති පියා ණන් ගේ සමවාය නපුරු හෙයින් බුදුන් කරා ගොස් වැද පියන්ට වේව යි දනක් දී පියන්ට වේව යි බණක් අසා පියන්ට වේව යි මේ සොළොස් අවුරුද්දෙන් අට හවුරුද්දක් විතර ත් නො වී ය.

දැන් ළඟට ගොසින් වැද ගන්ට පය ත් අවසඟ ය. වැද හෙවත් අත ඔසොවා නළල තබා වඳින්ට අත ත් නො නැමෙ යි. අනික් කළ මනා දෙයකුත් නො පෙනෙ යි. සිත පහදවා ගැන් මෙහි අදහස් ලැබෙන බැවින් ආයාස නැත. මේ අවස්ථාවට පිළිවන් ව තිබෙන සිත පැහැදී ම ම කෙරෙමි'යි සිතා පිළියමට දෙව නැත ත් බුදුන් දකින්ට දෛව ඇති බැවින් දැක සිත පහදවා බුදුන් වැඩි ගමන සාර්ථක කළ හ. බුදුහු ත් බර එසවී ය නොහෙන්නවුන්ට ශරීර භාර ය ම සැහෙන්නා සේ 'මෝහට මෙ විතරෙක් ම සැහෙ යි–සිතා වදරා ලා ශරීර ගත වූ පාණ්ඩු රොගයට පිළියම් නො ලැබ මියන මට්ටකුණ්ඩලීන්ට පර ලොව දී කාය පීඩා නැමැති රෝග හට නොගන්ට චිත්තප්‍රසාද නැමැති පිළියම් කරවා වැඩිසේක. බුදු රජුන් වහන්සේ නො පෙනෙන තැනට වැඩ පියන්නා ම පහන් සිත පසු නො බස්වා හොත් තැනැත්තෝ

---

1 සක්තියෙහි.

මිය නිද පුබුත්[1] කෙණකුන් පරිද්දෙන් දුක් මුහුද සියල් ලෙසින් ගෙවන්නට නු වුව ත් එක් ලෙසකින් ගෙවා තව්තිසා දෙව් ලොව එක් සිය විසි ගවුවක් උස ඇති රන් විමනෙක දිව්‍ය පුත්‍ර ව උපන් හ.

බමුණානෝ ද මළ පුතණුවන් දවා පියා උරග ජාතකයෙහි මහ බෝසතුන් මෙන් තමන් ශොක නැති වන කාරණ නො දන්නා බැවින් දවස් පතා ම සොහොනට ගොසින් 'අනේ එක පුතණුවෙනි! යනාදි ය කිය කියා හඬති. මට කොඩොල් දෙව් පුත් ද තමාගේ දෙව් සැපත් බලා ලබන්ට නිසි ව දෙ වන ජාතියෙහි කළ පින්කම් විමසනු යේ බුදුන් කෙරෙහි කළ චිත්ත ප්‍රසාද පමණකින් වූ නියාව දැන 'මේ බමුණු තෙම තමා ගේ වස්තු හානි තකා මාගේ ජීවිත හානියට නිස්ස ම සිතනුයේ බෙහෙත් පමණකු ත් නො කරවා ගොයම් කරණ අවධියේ නො කොට හිඳ පියා, වී අවධියේ නො ලැබ්බ හැකි වියට හඬන්නා සේ එයි ත් එක් දරු පෙමක් සේ සිතාගෙන සොහොන්හි හඬා ඇවිද්දී. මට මේ සා මහත් හානි යක් කළ තැනැත්තවුනට මෙ විතරෙක් මඳ, තවත් මුසුප්පු උපදව මි'යි මට්ටකුණ්ඩලී වෙස මවා ගෙන සොහොන් බිම කරා ගොසින් අත හිස තබා ගෙන වැත්තෑ දන්නට ආ නෑ කෙණකුන් මෙන් හඩ හඬා සිටියේ ය. බමුණානෝ හඬන්නා වූ ඕහු දැක 'මම වන්නා දරු ශොකයෙන් හඬමි. මූ කුමට හඬන නියා දෝ හෝ'යි චූල්ලධනුග්ගහ ජාතකයෙහි දෙ මව් පියන් ගෙන්වා පාවා දෙවාලූ සමණන් සොරකු දැක උඵ කෙරෙහි ආලයෙන් උඵ ලවා සමණන් මරවා උන් ගෙනු ත් නො ව, පසු ව සොරුගෙනු ත් නොව, ඒ හැම තබා පළන් අභරණින් හා හන් පිළියෙනු ත් නො වතු ව කැළ යක් යට හිඳ තමා ම වෙහෙසන්ට කැණහිල් වෙසක් මවා ගෙන ආ ශක්‍රයන් හා ලජ්ජා නැති ව ශොක කාරණ විචාරා කථා කළ ස්ත්‍රිය මෙන් තමන් ගේ ශොක කාරණ තිබ්බ ය දී විචාරනු නිසා උන් කරා ගොසින් 'සකල ශරීරයෙහි සඳුන් කල්ක තවරා ගෙන සව් බරණ ලා සැරහී මල් පැළඳ මට්ටකුණ්ඩලී ලෙසින් අවුත් මේ වල් මැද අත හිස තබා ගෙන හඬව. මම වන්නා දරු ශොකයෙන් හඬමි. තෙපි කුමක් නිසා හඬා දැ'යි විචාළෝ ය. මට්ටකුණ්ඩලී ඒ අසා 'මාගේ රථ මැදිරියෙක් ඇත. ඒ තෙමේ ත් ගන රන් මුවා ය. ඊට නිසි වූ සක් සහළෙක් නො ලැබෙමි. ලදෙ ත් ජීවත්වන්නා මුත් නො ල දෙ ත් ජීවිතය හරිමි'යි කියා ශොකහරවන්ට කාරණ වූ ශොක කාර ණ ය කී ය. ඒ අසා බමුණානෝ පුතණුවන් මිය යා දීම ත්‍යාග අදහස බලවත් වූ වා සේ 'ළදරුවාණෙනි, තොප ඉල්වන සක් සහළ මාගේ සම්පත් බොහෝ ඇති බැවින් රත්රනින් වුව ත් රිදියෙන් වුව ත් මුතු මැණික් ආදියෙන් වුව ත් තොප කියා ලූ තරමෙක කරවා දෙමි

1 පුබුදුන්.

Non-Commercial Distribution

වුව මනා තරමක් කියව' යි බත් පමණකින් හා යන්තම් මිලය කින් කරවා දී ලිය නො හී කුණ්ඩලාභරණ ය තුමූ ම කොට දුන් තැනැත්තෝ 'සත් රුවනින් සක් සහළක් කරවා දෙමි'යි කි වූ ය. ඒ අසා මට්ටකුණ්ඩලී දෙව් පුත් 'මේ තෙමේ තමා ගේ පුතුට බෙහෙත් පමණක් වුව මනා ලෙස නො කරවා පැන් වත් කළ මනා ගසට හුණු පැන් වත් කරන්නා සේ නො බෙහෙද් බෙහෙත් කොට මරා තබා ලා දූන් පුතණුවන් සැටියේ ආ මා කී දෙයක් කරවා දෙමි'යි කිය යි. තරයේ ම මූචකිත කරවා ලමි. කෙසා විතර සක් සහලක් කරවා දෙව් ද'යි විචාළහ. 'තොප කී විතරෙකැ'යි කී කල්හි මාගේ රථ මැදිරිය[1] ගනරන් මුවා ය. එ සේ හෙයින් ඊට තරම් වතොත් හිර හා සඳ ය. ඒ දෙක සම්හ වී නම් ගමන් බලා ලූ කලට ජවන හංස ජාතකයෙහි හංසරාජ ව උපන් බෝ සතුන්ට කිසි විටෙක පසු බට ත් සෙස්සවුන්ට පසු බැස්මක් නැති හෙයින් ඉතා බලවත. එ සේ හෙයින් හිර හා සඳ සම්හ වී නම් ඒ මාගේ රථ ය හොබබී. සෙසු සක්වලින් ප්‍රයෝජන නැතැ'යි කිව.

බමුණු ඒ අසා 'ළදරුව, තෝ ඉතා ම නුවණ නැත්තෙහි ය. පැතුව මනා දෙය තබා පොල් ගසින් තල් පක් පතන්නා සේ, ගින් නෙන් සිහිල පතන්නා සේ, අකුසලින් සැපත් පතන්නා සේ, නො පැතුව මනා දෙය පතහි. තා හඬා මියත ත් ඒ දෙක ලබන්ට බැරි ය'යි කි වූ ය. ඒ අසා මට්ටකුණ්ඩලී දෙව් පුත් 'බමුණානෙනි, තෙපි මා නුවණ නැතැ යි කිය ව. හැඬීමෙන් තොප ත් මා ත් සරි පසු නුවණ ඇත්තවුන් නැත්තවුන් වේ ද තේරුව මනා. යම් කෙණෙක් යමක් දූක ඒ ලබන්ට හඬත් නම් උං නුවණ නැත්තෝ ද? නොහොත් නො දක්නා දෙයට හඬන්නෝ නුවණ ඇත්තෝ ද? ඒ දෙ පක්ෂයෙන් නුවණ නැත් තවුන් තෝර ලා තව ත් සිතට නො නැංගොත් හඬව'යි කී ය. ඒ අසා බමුණානෝ කියා ලූ කාරණ ඝෂාත්ඝෂාත් කාරණ හෙයින් තුමූ ත් සලකා පියා 'ළදරුවාණෙනි, තොප කියන්නේ යුක්ති ය. තොප කීවා සේ පෙනෙන හිර සඳ ඉල්වව. පෙනෙන දෙය ඉල්වන හෙයින් තොප ගේ අඥන කමෙක් නැත. මම මිය පර ලොව ගිය පුතණුවන් අරහයා හඬමි. හඬන පමණකින් ඇසින් වැගිරෙන කඳුලු දකු ත් මුත් උන් දක්නට නැත. මා දිවිහිමියෙන් හඬා ඇවිදිත ත් ඒ උන් දක්නට නැත. නිෂ්ප්‍රයෝජන වූ හඬ හඬන්නා වූ මට වඩා නුවණ නැත්තෝ නැත. මූ මා ගේ ශොක හර වන නියා කීවෝ වනැ'යි සිතා උන්ගේ බසින් ශොක හැර උන් ගේ ගුණ කියන්නාහු:-

---

1 රථය

Non-Commercial Distribution

"ආදිත්තං වත මං සන්තං – ඝතසිත්තං ච පාවකං,
වාරිනා විය ඔසිඤ්චං – සබ්බං නිබ්බාපයෙ දරං

අබ්බහී වත මෙ සල්ලං – සොකං හදය නිස්සිතං,
යො මෙ සොකපරෙතස්ස – පුත්තසොකං අපානුදි

ස්වාහං අබ්බූළ්හසල්ලො'ස්මි – සීතිභූතොස්මි නිබ්බුතො,
න සොචාමි න රොදමි – තව සුත්වාන මාණව."

යනු හෙයින් ළදරුවාණෙනි, යම් සේ මහත් ව ඇවිලෙන ගින්නක් දැක සත්පුරුෂ කෙණෙක් මේ ගිනි මෙ සේ ඇවිළ ඇවිළ තිබ්ලා ගම්වල ගෙවල වැද ගෙන ගම් ගෙවල් දවා පියා නමුත් බල බලා යාම තරම් නො වන්නේ වේ දැ යි පැනක් හිස නිවා පිය ත් ද එ පරිද්දෙන් මා ගේ සන්තානයෙහි දරු සෝක නැමැති ගින්න වැද ගෙන අදහස් නමැති ගම් ගෙවල් දවනුවා තෙපි තොප ගේ අනුශාසනා නැමැති පැනින් නිවා පූව. නැවත ශොක නැමැති ශර යෙන් විත් කා පූ මා තෙපි තොප ගේ නුවණ නැමති අතින් සෙමෙන් සෙමෙන් ශොක ශර ය හරා පියා අනුශාසනා නැමැති බෙහෙදින් අදහස් නමැති සැර පහරට බෙහෙත් කොට සුව කළව. එ සේ හෙයින් තොප ගේ මාලු කම පිහිටා මෙ වක් පටන් දරු සෝක නො කෙරෙමි. වියොග ය සරි වූව ත් උන් ශොක නො කරණ කල මා කරණ ශොකයෙන් වන්නේ ශරීර ය වියැළෙන පමණෙක; කථාව කරණ කල කාරණ නො සැළකෙත ත් පසු ව සලකන කලට නුවණැත්තවුන්ට යහපත් ව හැමෙ යි. මට ත් අනුශාසනා අසා හැම ම සැලකිණ. යම් කෙණෙක් පෙර පුරුදු කමක් නැති ව අමුතු ව ලා සහායක් වූ නම් උන් හැඳින්න මැනව එ සේ හෙයින් 'තෙපි කවුරු දැ'යි විචාළෝ ය. ඒ අසා දෙවතාවාණෝ 'යම් කෙණෙකුන් අරභයා තෙපි හඬවූ නම් ඒ තොප ගේ මළ පුතණු වෝ නම් මම ය. ගොසින් දෙව් ලොව උප නිමි'යි කිවූය. ඒ අසා බමුණාණෝ 'තොප මිය වෙන් වන තෙක් අප ගේ ගෙන් වෙන්වූ වා නැති. එ දැතුරේ දනක් පිනක් කරන්නා නුදුටුම් හ. දෙව් ලොව උපන්නේ කුමන පින් කොට ද? තොප දෙව් ලොව උපදනා කල දෙව් ලොව නූපදනවුන් නැති නිසා වේ දැ'යි විචාළෝ ය.

ඒ අසා දෙවතාණෝ 'මෙ තැනට අවුත් මා මෙතෙක් කථා කොට ත් බමුණාණෝ තුනුරුවන්හි පැහැද පින් කොට නොහොත් නම්, කළ පිට වට වැස්සෙන් කළ ය ඇතුළට ප්‍රයෝජන නැත්තා සේ මාගේ කථාවෙනු ත් ප්‍රයෝජන නැත. කරණ මේ කථාවෙන් මුන් ඇතුළු වූ සියල්ලන් සිත පහදවා ගත් පමණකින් දෙව් ලොව

Non-Commercial Distribution

සැප ත් සිද්ධ කරණ ලෙසට කියමි' සිතා බමුණානෙනි, තොප කී වා සේ වැඩිමාලු ව සිටි තොප ගෙන් එ ලෙස විධානයකු ත් නැති හෙයින් දනා දී වූ සෙසු පින් කමක් කට නුහුණුම් හ. එතෙකු දු වුව ත් අහෙතුක ප්‍රතිසන්ධික වූ බකමූණන් පවා සර්වඥ ප්‍රමුඛ භික්ෂු සඞ්ඝයා වහන්සේ කෙරෙහි සිත් පහදවා ගත් පමණකින් කල්ප ලක්ෂයක් දුගතියට නො ගොස් කෙළවර සොමනස්ස නම් පසේ බුදු වන කල ඒ චිත්ත ප්‍රසාද ය අපට කැල ම පිහිට වන්නේ වේ ද යි මියන ආසන්නයෙහි පිල් කඩ හොත්තා වූ මම බොහෝ දෙනාට දෙන දෙයක් තෝරා ලා එක් කෙණෙකුන්ට ම දෙවන කලක් පරිද්දෙන් මා ම කෙරෙහි කළ කරුණාවෙන් එ තැනට වැඩි බුදුන් දක ඉඳුරා සිතක් ඇති කෙණෙකුන් දක නො පහදින්ට බැරි හෙයින් සිත ඉඳුරා පහදවා චිත්ත ප්‍රසාද නමැති හිණින් දෙව් ලොවට නැංගෙමි 'යි කිවු ය.

දෙවතාවාණන් කථා කෙරෙමින් සිටිය දී ම උන්ට පෙරත්ත පමණකු ත් එ තෙක් උපකාර ඇත ත් නො කියා එන දවස දිර වා ගන්ට බල ඇති වන හෙයින් ආභස්සර බඹුන් ගේ බඹ බොජුන් නුපුස්නා පමණ පුරා කා ගෙන සිතිවිල්ලට අවසර ගෙන 'අනේ බුදුන්ගේ ආශ්චර්‍ය්‍ය තරමක මහත. කළා වූ අතික් එක ද පින් කමක් නැති ව සිත් පහන් පමණකින් මේ සා මහත් දිව සැපතක් මුන් ලත් කල ඒ කුශල ම කවුරුන්ට ත් නපුරු නොවන පහන් සිත් ඇති ව මම ත් බුදුන් සරණ යෙමි' සිතා තමන් සිතූ ලෙස දෙවතාවාණන්ට කිවු ය. දෙවතාවාණෝ ද බතින් සාද විඳ සිටී ය වුන්ට බුලත් දෙවා සාද ය නිමවන්නාසේ තමන් ගේ බසින් ශොක ය හැර බුදුන් සරණ යන්නවුන්ට අඩු ව තුබූ අවවාදයකින් කියන්නෝ 'බුදුනු ත් සරණ යව. නැවැත බුදුන් විසින් සම්භාවනී වූ ධර්‍මය ත් සරණ යව. තදධාර වූ සඞ්ඝයා වහන්සේ ත් සරණ යව. මෙ සේ ත්‍රි විධ වෘත්තයට හකුල් වූ ති සරණ පිහිටා කාරුණික වීමෙන් ප්‍රාණ වධයෙන් වැළක අදත්තා-දනයත් කාමමිථ්‍යාචාරයත් මෘෂාවාදයත් සුරාපානය ත් විෂ ඝොර සර්‍පයන් මෙන් සිතා ඉනු ත් දුරු ව පිළිවන් පිළිවන් ලෙසින් පින් කම් හැසිර වසව'යි අවවාද කොළෝ ය. බමුණානෝ ද දෙවතා-වාණන් එ ලෙස කළ අවවාද බුදුන්ගේ අවවාද පිළිගැන්මට පූර්‍ව නිමිත්ත යා සේ පිළිගත්හ. දෙවතාවාණෝ මෙ සේ අවවාද කොට-ලා තමන් ගේ දෙව් ලොවට ම ගියහ. බමුණානෝ ගෙට ගොසින් බැමිණියන් බණවා ලා ''පින්වත, මහණ ගොයුම්හු පවරා ගෙණවුත් දන් වළඳවා ලා ප්‍රශ්න විචාරමි. දන් සරසව' කියාලා සම්මත කොට ලා වෙහෙරට ගොසින් බුදුන් නො වැඳ ම සාද සාමිචි[3] ලෙස කථා ත්

1. පිළිකඩ පිළකඩ 2. තරමක තරමකය 3. සාධු සාමිචි

Non-Commercial Distribution

නො කොට ම එකත් පස් ව සිට, "භවත් ගෞතමයෙනි, භික්ෂු සඞ්ඝයා හා සමග අද අප ගේ ආරාධනා නිසා අප ගේ ගෙයි දී වැළඳුව මැනව'යි කී වූ ය. බුදුහු ත් බොහෝ ප්‍රයෝජන සලකා ආරාධනාවේ අරුමයක් නැත ත් ඉවසා වදළ සේක. බමුණානෝ බුදුන් ඉවසා වදළ නියාව දැන වහා ගෙට ගොසින් නැත ක් දවස් නියඟ කොට තබාලා බිම තෙමා වස්නා මහ වැස්සක් මෙන් නැතක් කලක් ම තමන් කළ විරූ දෙයක් නො වන හෙයින් අරුම යක් සේ දෙන දන යහපත් කොට ම සැරහූ ය, බුදු රජුන් වහන්සේ ද නකත් තරු පිරිවරා නික්මුණු සඳ පරිද්දෙන් මහණ ගණා පිරිවරා බමුණානන් ගේ ගෙට වැඩ පනවන ලද බුදු හස්නෙහි යුග ඳුරු මුදුනෙහි වොරජනා ළහිරු මඩලක් මෙන් වැඩහුන් සේක. භික්ෂු සඞ්ඝයා වහන්සේ ද රන් නැවක් මද්ධ්‍ය කොට පිපී වැනී ගිය රත් නෙළුම් වනයක් මෙන් වැඩ හුන් සේක. බමුණානෝ ද බුදු පා මොක් සංඝයා වහන්සේ සිය අතින් සකස් කොට වැළඳ වූ ය. එ දවස් මිථ්‍යා දෘෂ්ටිකයන් ගෙනු ත් සම්‍යක් දෘෂ්ටිකයන් ගෙනු ත් බොහෝ දෙන රැස් වූ හ.

මේ දෙ පක්ෂයෙන් මිථ්‍යා දෘෂ්ටිකයෝ 'මේ බමුණානන් ආරා ධනා කොට ශ්‍රමණ භවත් ගෞතමයන් ගෙට ම කෙළේ නම් හුදෙක් දන් දෙන්ට මතු නොවෙ යි. ප්‍රශ්න විචාරා වෙහෙස දෙන්නට ය. ශ්‍රමණ භවත් ගෞතමයන්ට වන සිලඟු බලම්හ'යි රැස් වූ හ. සම්‍යක් දෘෂ්ටිකයෝ ද අද වූ කලී 'මේ සම්‍යක් සම්බුද්ධ නැමැති සූය්‍යී තෙමේ සැදැහැ නැති බමුණානන් ගේ මිථ්‍යාදෘෂ්ටි නැමැති අඳුරු හරවනු නිසා දෙශනා නැමැති ආලෝකය ත් ශරීරාලොකයත් එක් කොට යහපත් පැයක් ගන්නට වයිති හතන්නා සේ, අද ආලොක දෙකක් විහිදුව යි. අපි ත් ගොසින් ඒ ආලොකයෙන් කෙලෙස් අඳුරු දුරු කරම් හ. සර්වඥ විලාස නමැති රසාඤ්ජනය ඇස ගාම් හ'යි රැස් වූ හ. බමුණානෝ ද වළඳවා අන්තයෙහි බුදුන් කරා එළඹ මිටි ඇස්නෙක හිඳ ප්‍රශ්න විචාරන්ට පටන් ගත් හ. කෙ සේ ද යත්-

'මහණ ගොයුමාණෙනි, සරලුවක් පමණ කැද වේ ව යි, සැන් දක් පමණ බත් වේ ව යි, අන් කිසිවක් වේ ව යි, තොපට වේ ව යි තොප ගේ සවුවන්ට වේ ව යි, දන් නොදී පේ ත් නොව බණ ත් නො අසා හුදක් තොප කෙරෙහි සිත් පහදවාගත් පමණකින් දෙව් ලොව ඉපැද දිව්‍ය සම්පත් ලබන්නෝ ඇත් ද'යි විචාළ හ. බුදු රජුන් වහන්සේ ඒ අසා වදරා 'බමුණ, හඳුනන මහ යෙමින් සිට මං විචා රන්නා සේ මා අතින් කුමක් නිසා විචාරයි ද? තා ගේ පුතු මට්ටකු ණ්ඩලියා මා කෙරෙහි සිත් පහදවා එ පමණකින් තමා දිව්‍ය සම්පත් ලත් නියාව තට කීයේ වේ ද'යි තමන් වහන්සේ දිව

1. සාලුවක්

Non-Commercial Distribution

කතින් අසා වදාළ කට යුත්ත බමුණානන්ට වදාළ සේක. බමුණානෝ කථා කළ දෙවතාවා මට්ටකුණ්ඩලී ලෙසින් ආ මුත් අනික් කෙණෙකුනැ යි සිතා 'භවත් ගෞතමයෙනි, කවර දව සෙක අවුත් කොයි දී මා හා කථා කෙළේ දැ'යි විචාළහ. බුදුහු ඒ තෝරා වදරණ සේක් 'යම් දවසෙක තෝ සොහොනේ හඩ හඬා සිටියේ ආභරණ ලා මල් පැළඳ මට්ටකුණ්ඩලී ලෙසින් සොහොන ළඟට අවුත් හඩ හඬා සිටි එකකු දැක ඔහු අතින් ශොක කාරණ විචාළේ වේ ද? තා පුත් මට්ටකුණ්ඩලියා නම් ඒ ය'යි හඟවන පිණිස මේ මට්ටකුණ්ඩලී වස්තුව වදාළ සේක.

ලියන්නන් ලියාලූ පත් කඩෙහි රජ්ජුරුවන් ලූ ඔප්පුව නිසා ඒ තෙමේ සන්හස් වී ද, එ පරිද්දෙන් මේ වස්තුව ත් බුද්ධ භාසිත නම් වී ය යි මෙ සේ මට්ටකුණ්ඩලී වස්තුව වදරා ලා, 'හෙම්බල බමුණ, අසන දෙයට ත් වඩා දුටු දෙය ප්‍රත්‍යක්ෂ ය. එතෙකුදු වුව ත් අත් දුටු බෙහෙත් තිබිය දී ඔබ්බේ බෙහෙත් විචාරන්නා සේ ම මා අතිනු ත් විචාරනු, පසු මා කෙරෙහි සිත් පහදවා දෙව් ලොව උපන්නවුන් සිය ගණිනු ත් දහස් ගණිනුත් ලක්ෂ ගණ-නිනුත් නියම කරන්ට බැරි ය. අසඞ්ඛ්‍ය ගණනට ඇති හෙයිනැ'යි වදාළ සේක. ඒ අසා ආයර්‍යයන් හැර සෙස්සෝ මුළුල්ල ම 'මේ කිම් දැ'යි බුදුන් ගේ තරම නො දන නොහදහන්ට වන් හ. උන් හැම දෙනා ගේ නො හැදහිල්ල හරවන නිසා ත් දෙස් කීව වුන්ට දෙන අත්ළසක් සේ උන්ට ලොවුතුරා සම්පත් දෙවනු නිසා ත් 'මට්ටකුණ්ඩලී දෙව් පුත් තමා ගේ දිව සැපතින් පිරුණු මාළිගාව හා සමඟ එව'යි සිතා වදාළ සේක. බුදුන් එ සේ සිතා වදාළ සිතිවිල්ල හා සමඟ ම දෙව් බරණින් සැරහුණා වූ තුන් ගවු පමණ අත් බැවින් අවුත් විමනින් බැස පියා බුදුන් වැඳ එකත් පස් ව සිටියේ ය. බුදුහු දෙස් කියවන්නා සේ ඔහු ලවා කියවා ඔහු ලත් සම්පත ත් පැ සැක ත් හරවනු පිණිස 'දෙවතාව, කුමන පින් කමක් කොට මේ දිව සැප ත් ලද දැ'යි විචාළ සේක. දෙවතාවා ද 'අනික් පින් කමක් නොදනිමි. නුඹ වහන්සේ කෙරෙහි සිත පහදවා ගත් පින්කමින. එයි ත් ලසු පින් කමක් නො වන හෙයින් මේ සම්පත් ලදිමි'යි බොහෝ දෙනාට අස්වා කීවු ය.

බොහෝ දෙනා දිව්‍යපුත්‍රයා ත් ඔහු ගේ සම්පත ත් දැක 'අනේ බුදුන් ගේ පින් කෙත් ලෙසක් ඉතා විස්ම ය නියා ය. අනික් පින් කමක් නො කළ මට්ටකුණ්ඩලියා පවා බුදුන් කෙරෙහි සිත් පහදවා ගත් පමණකින් මේ සා සම්පත් ලැබ පී ල'යි සතුටු ව පින් කම් කිරීමෙහි උත්සාහ ඇති වූ හ. බුදුහු යම් සේ රජ්ජුරු

Non-Commercial Distribution

කෙණෙක් මහ සම්පත් යමෙකුට දෙන කල තමන් ගේ තැගි කම දක්වනු නිසා සම්පත් වට්ටෝරුවක් කරවා ලා දෙන සම්පත් මෙතෙකැ යි වට්ටෝරුව කියවා ලා දෙත් ද, එ පරිද්දෙන් ම එ තැනට පැමිණි පිරිසට ත් බමුණානන්ට ත් දෙවතාවන්ට ත් නිවන් සම්පත් දෙනු නිසා බණ දෙසන සේක් "හෙම්බල බමුණ, යම් සේ සියලු පවෙහි ම හැසිරෙන්නවුන්ට යම් සේ සිය ගණිනු ත් එක් ව සොර කම කරණ කල එක් ව කරණ සොර කමින් සරි වුව ත් එක් කෙණෙකුන්ට සොර දෙවුවා ය යි ප්‍රධාන කොට කියා ගන්නා සේ අකුසල් සිත පෙරදැරි වේ ද එ සේ ම සියලු ම පින් කම් හැසිරෙන්නවුන්ට එක් ව කෙතෙක් දෙනා පින් කම් කරත ත් එක් කෙණකුන් ඊට මුල් වන්නා සේ කුසල් සිත ම මුල් වෙයි.

යම් සේ ප්‍රධාන වූ අකුසල් සිතින් කළ අකුශල ය ගැළ යොදු ගත් ගොන් ගිය ගිය සේ උන් පයට ගැල් සක් ළං වේ ද, එ මෙන් පහන් සිතින් කළ කුශලය ත් තමා ගේ ඡායාව තමා හැර නො පවත්නා සේ අනුව පවත්ති. අත් නො හරනේ ය. රහත් වීමෙන් වඳ නො වී නම් පිළිසිඳ[1] දෙන්ට නිසි කුශලයක් සුගති භූමියෙහි පිළිසිඳ දී ප්‍රවෘත්ති විපාක දයක කුශල ය ඇස නො වන බිජුවටක් පැළ නැඟී මුත් නො නවත්නා සේ ප්‍රවෘත්ති විපාක දී මුත් නො නවත්ති. එ සේ හෙයින් සියලු ම පින් කමට ප්‍රධාන වූ සිත පහදවා පින් කරව'යි වදරා මේ දෙශනාව නිම වූ සේක.

දෙශනාව කෙළවර සුවාසූ දහසක් දෙන ධර්මස්කන්ධ ගණිතින් අමා මහ නිවනට පැමිණිය හ. මට්ටකුණ්ඩලී දෙව් පුත් දහසක් නය නමැති රුවන් ඔබා කළ සෝවාන් ඵල නැමැති මිණි කොඩොල් ලා සැරහිණ. ත්‍යාග අදහස් මඳකුත් ඒ අවධියට නැති අදින්න පුබ්බක නම් බමුණු ද සෝවාන් පෙලෙහි පිහිටා ත්‍යාගී වී ය. ඔහු ගේ සම්පත් ද නළපාන ජාතකයෙහි වඳුරු ව උපන් බෝසතුන් ගේ උපදෙසින් රාක්‍ෂස පරිගෘහිත විල පැන් අසූ දහසක් වඳුරන්ට ප්‍රයොජන වූවා සේ බුදු සස්නට ම ප්‍රයොජන වී ය. එ සේ හෙයින් සත් පුරුෂයන් විසින් සද්ධර්ම රත්නාවලී නමැති කැට පතින් සදහම් නමැති මුණු බලා ශීල – සමාද්ධ්‍යාදී ගුණ ශොභාවෙන් හොබනේ මැනවි.

---

1 පිළිසිඳ



Non-Commercial Distribution

# 6. නාගසේන මහ තෙරුන් වහන්සේ ගේ කථාව

චිත්ත ප්‍රසාද පමණකින් මට්ටකුණ්ඩලීන් ලත් සම්පත් ප්‍රකාශ කොට සැදැ ඇත්තවුන් ගේ සැදැ වඩනා නිසා මට්ටකුණ්ඩලී වස්තුව දක්වූවා සේ ම යන් තම් කුශල විශෙෂයකින් බුද්ධි සම්පන්නව ප්‍රශ්න විසඳීම් වශයෙන් තෙවළා බුදු වදන් නිරවුල් කළ නියා කියා ධර්මාභියොගයෙහි සත් පුරුෂයන්ගේ උත්සාහ වඩනු පිණිස **නාගසේන** මහ තෙරුන් වහන්සේ ගේ කථාව කියමු. හේ කෙ සේ ද යත්:

යට ගිය දවස අප ගේ බුදුන්ට පෙරාතු ව බුදු වූ කසුබ් බුදුන් පිරිනිවිය ත් ඔබ ගේ සස්න වතින් පිළිවෙතින් පමණක් නො නැසී පවත්නා අවධියෙහි ගඟක් බඩ කළ එක් වෙහෙරක වත් පිළිවෙත් සරු වූ බොහෝ වහන්දෑ රඳා හිඳිනා සේක. එ සේ හිඳිනා වහන්දෑ වත් පිළිවෙත නොපමා බැවින් උදෑසන ම නැඟී සිට හමදනා මුසුන් හැර ගෙන ස්වර්ග – මොක්ෂ දෙකට බාධා කථා හැර නාව අරහාදී බුදු ගුණ සලකමින් සකස් කොට මළු හැමද කසළ එක් තැන් කොට ලා තමන් වහන්සේ හැමදී කසළ තමන් වහන්සේ ත් දමා නො පියා එක් කෙණෙකුන් වහන්සේ සාමණෙර නමක් බනවා ලා හැමදි කසල අනුන් ලවා වුව ත් දම්මවා නොපීම වත් නොවන හෙයින් 'හෙරණෙනි, තෙල කසළ දමා පිය'යි වදළ සේක. හෙරණුන්දෑ අසා ත් නොඇසූ කන් ව ලා යන දෑ ය. නො කීකරු නියා වේ දෑ'යි දෙ විටක් කොට තුන් විටක් කොට කීව ත් යන නියා ම ය. කැඳවූව ත් නො එන හෙයින් 'මේ හෙරණුන්දෑ නොකීකරු නියා වේ දෑ'යි උරණ ව හික්මවීම් මුඛයෙන් මුසුන් දණ්ඩෙන් පහරක් ගැසූ සේක.

කිපී කල කාරණ නො සැලකෙන නියාව තිලින් ම දත යුතු ය හෙරණුන්දෑ ද පහර කා ලා හඬන දෑ නොදමූවොත් තවත් ගසන සේක් දෝ හෝ යි යන භයින් සිතින් නොසිතින් කසළ හැර ගෙන දමන්ට යනදෑ දමන කල කසළ වුව ත් කසළ දැම්මෙන් සිද්ධ වන කුශල ය නිකසළ හෙයින් ඔබ්බේ විධානයෙන් වුව ත් මේ කසළ දමා පී පිනින් නිවන් දක්නා ජාති දක්වා මෙ දැතුරේ උපනුපන් තැන මුදුන් පැමිණි හිර පරිද්දෙන් තේජස් ඇතිවෙම් ව යි – පහර කෑයේ තේජස් නැති හෙයින් වේ දෑ යි – පළමු කොට පැතූ දෑ ය. කසළ දමා පියා අත සෝධන්ට ත් පැන් සනහන්ට ත් ගඟට යනදෑ ගඟ රළ ගසන්නා දැක 'මේ ජාතියෙහි පටන් නිවන් දක්නා ජාති දක්වා මේ ගඟ බොහෝ රළ දිවන්නා සේ ම මාගේ ත් නුවණ නමැති ගඟින් ප්‍රශ්න නමැති බොහෝ රළ නිම්මයක්

නැති ව මුඛ නැමැති ගහස් බඩට[1] දිවේ ව යි හෙවත් බොහෝ කොට වාද කට හෙම් ව'යි අභිමාන පර ව දෙවෙනි ව පැතූදෑ ය.

පහර ගැසූ තැනැත්තන් වහන්සේ ද හැමැදි මූස්න මුසුන් හල තබා ලා පැන් සනහන්ට ගඟට යන සේක් හෙරණුන් දෑ ගේ ප්‍රාර්ථනාව අසා 'මේ මාගේ විධානයෙන් මා ම හැමැදි කසළ සිතින් නොසිතින් දමා පී පමණකට මෙ සේ පතයි. මූ කළ ප්‍රාර්ථනාව සමෘද්ධ වේ නම් මුලින් කසළ හැමැදි මා පැතූ දෙයක් කැල ම සිද්ධ වේ'යි සිතාත් සිල්වතුන් ගේ ප්‍රාර්ථනාව සමෘද්ධ වෙයි, කියා සිතා ගත් හෙයිනු ත් ඔබ ත් පතන සේක් 'මේ ජාතියෙහි පටන් නිවන් දක්නා ජාති දක්වා උපනූපන් ජාතිවල මේ ගඟ රළ ගැස්ම සේ නොගෙවෙන්නා වූ වැටහීම් ඇතිව වාද විසින් මූ විවාළ විචාළ දෙයක් පැකිළීමක් නැති ව කියා ලිය හෙම් ව යි. මූ ගේ වාදයෙක් ඇත් නම් මා ක්‍රරා පැමිණ මේ ගඟ රළ වෙරලාන්තයට පැමිණ බිඳෙන්නා සේ බිඳේව'යි. මූ ගේ මුඛ නමැති මුහුද වාද නමැති දිය සිඳුවා පියන්ට මා ගේ ප්‍රතිවාද ය යුගාන්ත සූර්යයා වේව'යි පැතූ සේක. මෙ සේ පතා ඒ දෙ පක්ෂය කසුබ් බුදුන් සමයේ පටන් අප ගේ බුදුන් දක්වා මේ අතුර දෙව් ලෝ මිනිස් ලෝ දෙක්හි යවූහ.

අප ගේ බුදුහු සැවත් නුවර දී යමා මහ පෙළහර කොට තිර්ථකයන් ගේ මත් බිඳ ලා ත්‍රි පද වික්‍රමයෙන් තව්තිසා දෙව් ලොවට වැඩ පඬු ඇඹුල් සලස්නෙහි වැඩ හිඳ මාතෘ දිව්‍ය පුත්‍ර ප්‍රමුඛ දෙවියන්ට විජම් පිටක ය දෙසන ගමනේ 'මම ධම් සඟුණු–විභඞ්ග – ධාතු කථා– පුද්ගල ප්‍රඥප්ති – යමක – පට්ඨාන දෙසමි. මා පිරිනිවි කල ධර්මාශොක රජ්ජුරුවන් සහාය කොට ගෙන මහානුභාව සම්පන්න රහතන් දහසක් තෝරා හැර ගෙන අශෝකාරාමයෙහි දී තුන් වන සඞ්ගායනාව කොට ලා මොග්ගලී පුත්තතිස්ස මහ තෙරහු:

''යා සට්ඨී තිත්‍ථිය සහස්සනිසාගතං තං
දුල්ලද්ධි සොරතිමිරං විනිහච්ච සම්මා,
සා තිස්සතෙර රවිනා ගමිතා විකාසං
සඞ්ගීති චාරු නලිනී අපි දස්සිතා මෙ.

යනු හෙයින් සැට දහසක් පමණ තිර්ථක මථන ය නිසා සකවාද යෙන් සූත්‍ර පන් සියයක් හා පරවාදයෙන් සූත්‍ර පන් සියයක් හා සූත්‍ර දහසකින් උපලක්ෂිත වූ කථා වස්තුව දෙසති යි යම් සේ වදළ සේක් ද–එසේ ම මේ දෙපක්ෂය ත් දූක ''මා පිරිනිවි පන් සිය-යක් හවුරුදු ගිය කලට මූ දෙන්නා මිනිස් ලොව ඉපැද මා විසින් සියුම් නුවණ ඇති කෙණෙකුන් මුත් මඳ බුද්ධීන් දූන ගන්ට බැරි සැටියේ සියුම් කොට දෙසන ලද ධර්මය තමන්ගේ

1 ගඟ හස බඩට – ගඟ අස බඩට

Non-Commercial Distribution

සියුම් නුවණින් ප්‍රශ්න විචාරීමෙන් හා ප්‍රශ්න විසඳීමෙන් හා ප්‍රශ්න ගිවිස්වා විසඳන්ට උපමා කීමෙන් හා අවුල් වියවුල් නැති කොට දිරා හෙන්නට තුබූ ගෙයක් සොයා තර කොට නැතක් කල් පවත්නා ලෙස කරන්නා සේ පස්වා දහසක් මුළුල්ලෙහි පවත්නා ලෙස කෙරෙති' වදාළ සේක.

ඒ වදාළ අවධියෙහි පැතූ පැතීම් ඇති දෙ නමින් සාමණේර නම උපන් තැනින් චුත ව අවුත් දඹදිව සාගල නුවර කවර තරමකට ත් පමුණුවා ලන්ට නිසි කොට විසි දහසක් හවුරුදු මුළුල්ලෙහි සකසා රක්‍ෂා කළා වූ ශීල ප්‍රාර්ථනාව කෙ සේ දෝ වැරද ගිය හෙයින් හීන ව ගොසින් ගුණෙන් හීන ව සිටි ස්ත්‍රීන් ධ්‍යාන පස උපදවා ගත ත් පාත බඹ ලොව උපදනා සේ මිළිඳු නම් යොන් රජ ව උපන්හ. ප්‍රාර්ථනා බලයෙන් විදුරු සමාන නුවණැත්තෝ ය. එ සේ හෙයින් බඩු මිල ඇත්තවුන් බොහෝ-වස්තු හැර ගන්නා සේ බොහෝ ශාස්ත්‍ර සකසා උගත් හ. ඒ උගත් ශාස්ත්‍ර ත් ගණිත ගාන්ධර්වාදී වසයෙන් එකුන් විස්සෙක. රජ සම්පතින් ඉතා ආඪ්‍යයෝ ය. තෙජසින් – නුවණින් – බල-යෙන් – රූපශොභාදියෙන් මුළු දඹදිව අනික් රජ්ජුරු කෙණෙක් සරි වන්නෝ නැත.

එක් දවසක් ඒ මිළිඳු රජ්ජුරුවෝ යුද්ධයෙක් පැමිණියේ වී නමුත් රුස් පිරිස තරම දත මනා වේ දූ යි රුස් පිරිස් දක්නා නිසා මහත් වූ රජ පෙරහරින් අසුර මථනයට නික්මුණු දෙව් පිරිසක් සේ යහපත් ව සැරහුණු සියුරඟ සෙනඟ පිරිවරා තව්තිසා දෙව් නුවරට අපහාස කරන්නාක් වැනි වූ නුවරින් පිටත් ව පිටි නුවර දී සේනාව පුඩු ගස්වා[1] සේනාවේ පමණ දැන තමන් ගොෂ්ඨී කිරීමෙහි ලොල් බැවින් හිර තුබූ තැන් බලා පියා 'තව හිර නැතක් තැන සිටියේ ය. එ සේ හෙයින් තව නුවරට යන්ට වේලා ඇත. දැන් ම නුවරට ගොසින් කුමක් කරමෝ ද? අප හා කථා කරන්ට තරම් වූ නුවණැති කෙණකුන් ගේ සවරූප ඇමැත්-තන් අතින් විචාරා උන් කරා ගොසින් කථා කරම්හ'යි සිතා තමන් හා සම තර්ක ලෙසින් කථා කරන්නට නිසි කෙණකුන් ඇමැත්තන් අතින් විචාළෝ ය. එ සේ විචාළ රජ්ජුරුවන්ට ඇමැත්තෝ සිංහයන් සවරූප විචාළ කෙණකුන්ට තිරිසන් යෝනින් හා සිව් පා ලෙසින් සරි කොට සිතා ගෙන කැණහිලුන් ගේ[2] සවරූප කියන්නවුන් මෙන් පන් සියයක් පමණ යොන් ඇමැත් තෝ තමන් හැම තකා ගත් පමණකින් මිනිස් කොට සිතා ගෙන "රජ්ජුරුවන් වහන්ස, බුද්ධ කාලයෙහි වූ පූරණකාශ්‍යපාදී වූ

1 දූවු ගසවා, 2 කැනවිළුන්ගේ, කැණවිලුන්ගේ.

Non-Commercial Distribution

ශාස්තෘන් ගේ පරම්පරායෙහි වූ පූරණකාශ්‍යප ය, මක්ඛලීගොසාල ය, නිගණ්ඨනාථ පුත්‍ර ය, සඤ්ජය, බෙලට්ඨි ය, අජිතකෙශකම්බලී ය, කකුධකාත්‍යායන ය යන මේ නමින් ප්‍රසිද්ධ වූ බොහෝ පිරිවර ඇති උපදනා දවස් යම් ලෙසකින් උපන්නු නම් එ ලෙස ම ඇවිදිනා වූ සදෙනෙක් ඇත. උන් කරා ගොසින් තර්ක කොට වදාළ මැනව, ඔවුහු නුඹ වහන්සේ ගේ සැකයෙක් ඇත්නම් තමන් ගේ ශාස්තෘ පරම්පරාවෙන් දන්නා වූ තර්ක හෙයින් ඒ සැකය හරවා ලති' කිවූ ය.

ඒ අසා මිළිඳු රජ්ජුරුවෝ පන්සියයක් පමණ යොන් ඇමැත්තන් පිරිවරා විජයත් රථයට අපහාස කරන්නාක් වැනි වූ සුදු අසුන් යොදන ලද රථයට නැඟී නඳුනුයනට නික්මුණා වූ ශක්‍ර දෙවෙන්ද්‍ර ලීලාවෙන් එකකු ගේ එකකුට නායක කමක් නැතත් නම් පමණකුත් පෙරාතු[1] හෙයින් පූරණ කාශ්‍යපයන් කරා ගොසින් පාපයෙහි භය ලජ්ජාවක් නැති නියාව මෙලෙසින් දනුව'යි දක්වන්නාක් මෙන්, පිළි නො හැඳ හුන්නාහු දැකැ නුවණැති රජ්ජුරුවන් හෙයින් හන් පිළියක් නැත්තා සේ ම සන්තානයෙහි ගුණ නැති නියාව දැන නො වැඳ 'ගුණ නැතත් නුවණ ඇති වැ විචාරා ලූ දෙයට නිසි කොට කථා කොට ලත් නම් ඉන් ප්‍රයෝජන නම් දසවෙඩියා[2] හා කුඩු හැර සාල් පමණක් සේ අපට ප්‍රයෝජන නම් කථා සාර ම ය'යි කථායෙහි ප්‍රයෝජන පමණක් සලකා කන්ට එන බල්ලන්ට අසුරු ගසා සාද කරවන්නා සේ, සාද සාමීචි ලෙස කථා කොට ලා එකත් පස් ව හුන්හ. එකත් පස් ව හුන් රජ්ජුරුවෝ කථාවට ලබ්බවා ගෙන 'පිරුණු කසුප් වහන්ස, මේ ලොව රක්නෝ කවුරු දැ'යි විචාළෝ ය. ඒ අසා ගුණෙන් නො පිරුණත් නම් පමණකින් පිරුණු කසුප්හු තමන් ගේ මතයෙහි එ සේ වූ ව්‍යාපාරයක් නැති හෙයින් දෝ හෝ නොහොත් විචාළ බසට පැකිළ පියා හුන් කල තැකිවිල්ල[3] අඩුවන්නේ වේ දැ යි සිතා 'මහරජ, මෙ ලොව අනික් කවුරු රකිත් ද? ලොව රක්නේ පොළොව ය'යි කීහ.

රජ්ජුරුවෝ ඒ අසා 'ඉදින් වහන්ස, පොළොව ලෝ වැස්සන් රකී නම් නරක ය නම් පොළොව යට වුව, ඊ උපදින්නෝ පොළොව ඉක්ම ගෙන කෙසේ ඊ උපදිත් ද? මධ්‍යයේ අවුරා සිටි පොළොව තමා පැන ගෙන යන නියා පෙනෙත් සැපයක් විඳිනට යන ගමනෙක් වී නම් බාධා නො කරවතත් දුක් විඳිනට යන ගමන් හෙයින් නො නවතා ඉවතකින් යන ගමනකුත් නො ව. තමා පැනගෙන යන කල ලොව රක්නට නියලී හිඳිනා කල,

1 පෙරන 2 දහසෙයියා 3 තැකිල්ල

Non-Commercial Distribution

පුතකු වළෙක හෙන නියා ව බල බලා ඔසවා නො ගෙන සිටිනා මවක මෙන් නරකයට යන නියා ව බල බලා සිටිනට ම කාරණ කවරේ ද? තමා ගේ දරු කෙණෙකුන් නො වන හෙයිනැ යි කිය තත් සියලු පොළොව සියලු ලෝ වැස්සන්ට පිහිට වන නියාවක් මුත් ලෝ වැස්සන් ගෙන් භාගයකට පොළොවින් භාගයක් පිහිට වෙති යන්නක්, වහන්ස, මුඹ ගේ බසින් නො හැඟෙන හෙයින් විචාළ බසට මුඛාපන්න ලෙස කියා ලූ පමණක් මුත් යුක්තියක් නො වත් පිළි නො හැදීමේ තපුර නො දන්නා සේ ලොව රක්නා වුනුත් නො දත මේ කිවු ද? පිළි නොහඳනෝ නම් බාල දරුවෝ ය. වයස් කුමක් වුවත් තරම එ තරමට ම ඇතැ'යි රජ්ජුරුවෝ නිරායුධ වත් සපත් ව සටනට ගිය කෙණෙකුන් නො සපන් එකකු අත වූ ආයුධය උදුරා ගෙන උහු ම මැරුවා සේ, උහු කී බස ම හැර ගෙන උහුට උත්තර කියා උහු පසු බස්වා ලූ ය.

පූරණකාශ්‍යපයෝ ද කියා ලූ දෙය සාධාලිය නො හෙන හෙයින් ගැල පියත් නො හී අනික් උත්තරයක් කියාලන්ට නැති හෙයින් වමාරා පියත් නොහී ගැල ගත වමාරා ගත නො හෙන හෙයින් ගෙලෙයි ගෙන පියා කියා ලිය හැකි උත්තරයත් නැති හෙයින් මුසුප්පුව පියා, බත් කත තැත බලා හිඳත් උළක් පමණක් නො ලත් බල්ලකු පරිද්දෙන් හුන්නේ ය. ඉක්බිති මිළිඳු රජ්ජුරුවෝ පූරණකාශ්‍යපයන් බත කාලි ය හෙන්නා සේ උත්තර කියා ලිය නො හෙන හෙයින් සෙස්සවුන් ගේ ශක්තියත් එ තරම් නියාව දනිතත් 'සෙස්සවුන් ගෙනුත් විචාරා ම බිඩලු ගළව ලා කෙහෙල් ගස්වල හර නැති නියාව දන්නා සේ නුවණ හරක් නැති නියාව දනිම්'යි සිතා මක්ඛලි ගොසාලයන්ට 'මක්කලි ගොසාල වහන්ස, පින්-පව් දෙකෙක් ඇද්ද? පිනෙහි යහපත් විපාක ය හා පවෙහි නපුරු විපාකත් ඇද්ද'යි විචාළෝ ය. මක්ඛලි ගොසාලයෝ ද උමංදයෙහි දික්පිටියා දික්තල ගේ දෙ මවුපියන් ගේ නමුත් දික්තල දික්පිටියා ගේ දෙ මවුපියන් ගේ නමුත් විචාරා දන්ට නුවූ හෙයින් නො දත්තා සේ තමා පින්-පව් කවරේ බවත් පරමාර්ථයේ නො හසල හෙයින් නො දන්නා හෙයිනුත් නැවත දික්පිටියා දික්තල ගේ නමුත් දික්තල දික්පිටියා ගේ නමුත් නො දත්තා සේ තමාත් තමා කවුරුන් බවත් නො දන්නා හෙයිනුත් ඒ දූන් ම නම රූ පමණක් වුවත් පරමාර්ථ දන්න වුන්ට මුත් සෙස්සන්ට අවිෂය හෙයිනුත් විචාළ රජ්ජුරුවන්ට අඹ විචාළවුන්ට දෙල් කියන්නා සේ කිවමනා ලෙස හැර අනික් ලෙසක් කියන්නෝ 'මහ රජ' කුසල්-අකුසල් දෙක නැත. බිජුවට තමා ම නැති කලට නැඟෙන පැළ නැත්තා සේ කුසල්-අකුසල්

Non-Commercial Distribution

කර්‍මය ම නැති හෙයින් ඊ විපාකත් නැත. දනාදී වූ පින් කමැ යි යන දෙය නුවණ නැත්තවුන් කියා ගත් දෙයෙක. නුවණැත්තෝ ඒ කට යුත්තක් කොට නො කියති. කුසල්-අකුසල් නැති නියාවටත් ඊට විපාක නැති නියාවටත් දෘෂ්ටාන්තයක් කියම්හ.

දූන් රජ කම් කළ කෙණෙක් ඇත් නම් තමන්ට ම නියම ව තිබී ආ හෙයින් පර ලොව දීත් රජ කම් කෙරෙති. ඒ උන්ට ස්‍වභාව සිද්ධ ය. දූන් බ්‍රාහ්මණ වූ කෙණෙක් ඇත් නම් උන්ට ම ඒ නියම හෙයින් පර ලොව දී ත් බ්‍රාහ්මණ වෙති. දූන් ව්‍යාපාරයෝ හැම දවස් ම තමන්ට නියම දෙයක් හෙයින් පරලොව දී ත් ව්‍යාපාර වෙති. දූන් ගොවි ව උපන් කෙණෙක් ගොවි කර්‍මාන්ත හැම කල ම තමන්ට තිබී ආ හෙයින් පරලොව දී ත් ගොවි වෙති. දූන් හීන ජාති ඇති කෙණෙක් ශුඩයන් අශුඩ වීමටත් අශුඩයන් ශුඩවීමටත්, යුක්ති නැති හෙයින් පර ලොව දී ත් ඔහු ම හීන ජාති ඇති වෙති. කුසල් අකුසල් හා ඊ විපාක ඇත් නම් අකුසල් කළ රජ දරුවන් ඒ අකුසලින් හීන ව උපන මැනව. හීන ව සිටියවුන් පින් කළ කල ඒ පින් කමින් උතුම්ව උපන මැනව. එ සේ නොව රජ-බමුණු ආදී ඒ ඒ ලෙසින් මෙ ලොව ත් පරලොවත් වන්නේ ස්‍වභාව සිඩ හෙයින. පිනින් පවින් වන දෙයෙක් නො වෙයි. කාරණ කියා ලා ම කියම්හ. කිණිහිරි මල් රන්වන් වූයේ කවර පිනකින් ද? යට රන්වන් මල් පිදූ නියා ද? කසා මල් කළු වූයේ කවර පවකින් ද? ස්‍වභාව සිඩ හෙයිනි. එ සේ ම දූනු ත් ලොක ස්‍වභාව ලෙසින් පවත්නා බව මුත් කුසලින් හා අකුසලින් වන දෙයෙක් නො වෙයි. කැණවිල් බල්ලන් සිංහ නාද කරන්ට සිතා ත් කැණවිල් හඬ ම හඬන්නා සේ උත්තර කියන්ට සිතාත් නිකම් නිෂ්ප්‍රයෝජන කථා ම කීහ.

ඒ අසා රජ්ජුරුවෝ මක්ඛලිගොසාලයන් 'ඉදින්, වහන්ස, රජ-බමුණු ආදි ව උන්නෝ පෙරළාත් එ සේ ම වෙත් නම් දූන් මෙ ලොව අත් කොට කෙණෙක් පර ලොව දීත් අත් කොට වෙති. මෙ ලොව පා කොට කෙණෙක් පර ලොව දීත් පා කොට වෙති. මෙ ලොව නාසා කොට්වූ පර ලොවත් නසා කොට්වූ වෙති. පර ලොව නමුත් මිනිස් ලොවින් ම කැබෙල්ලෙක් නො වෙයි. දෙව් ලොව බඹ ලොවත් පර ලොව ම ය. එ සේ වන්නා, වහන්ස, මුඹ ගේ බසින් දෙව් ලොවත් බඹ ලොවත් අත් පා කොටුන් හා කන් නාසා කොටුන් හා ඇත මැනවැ'යි කිවු ය. ඒ අසා මක්ඛලිගොසාලයෝ කියා ලිය හැකි උත්තරයක් නැති වන්නා නිරර්‍ථක කථා කී පවින් ගොළු වූවා සේ මුයෙන් බැණ නො නැගුණාහු ය. ඉක්බිත්තෙන් මිළිඳු රජ්ජුරුවන්ට මෙ සේ වූ අදහසෙක් වි ය. අනේ මේ දඹදිව සිස් නියා ය. මා හා කැටි ව

Non-Commercial Distribution

කථා කොට මා විචාළ දෙය සැක හැර කියා ලන කෙණෙකුන් තව ලද නුහුණු යෙමි'යි සිතූහ. එ සේ සිතා ලා මිළිඳු රජ්ජුරුවෝ ඇමැත්තන් බණවා ලා 'තොප හැම ගේ බසින් තර්ක කථා කරන්ට ගොසිනුත්, වෙළඳාමේ ගොසින් සිස් ව නැඟී ආ කලක් මෙන් ලැබ ගත් කථා සාරයෙක් නැත. අද රාත්‍රිය අන්ධකාර දෝෂ රහිත වීමෙන් ඉතා යහපත. මෙ සේ වූ රාත්‍රියෙහි කවර නම් නුවණැති මහණ - බමුණු කෙණෙකුන් කරා ගොසින් කර්ණ රසායන වූ කථාවක් ලබමෝ දෝ කවර නම් කෙණෙක් තර්ක වශයෙන් අප විචාළ දෙයක් කියා ලද්දූ'යි විචාළෝ ය.

ඒ අසා යොන් ඇමැත්තෝ පූරණ කාශ්‍යපාදීන් හැර අනික් කෙණෙකුන් හා තමන් නුපුරුදු හෙයින් හෝ පුරුද්දවූන් ඇත ත් උන් හැම ගේ ත් කථා ශක්තිය ආඥා සම්පන්න රජ්ජුරුවන් දුටු කලට මෙ තෙක් ම වේ ද යි සිතා මුයෙන් නො බැණ කන් ඇසී ත් බස් ගොළුවනට යමක් කියා ලූ කල මූණ බලන්නා සේ රජ්ජුරුවන් ම මූණ බල බලා සිටියහ. එ කල සාගල නුවර ද රජ්ජුරුවන් තර්ක කෙරෙති' යන හයින් නුවණැත්තන් දුර නැඟී යාමෙන් බොල් විනා වියක්[1] නැති කළවිටක් මෙන් නුවණැත්තන් ගෙන් සිස් වි ය. නැඟී පලා යා හැකි තැන් නැති හෙයින් රඳා ගිය කෙණෙක් කථාවට එලෙන්ට නිසි කථා නො කෙරෙති. වහන්දෑ බොහෝ සේ හිමවු පියසට වඩනා සේක. එ කල්හි හිමවත රත්ගල් තලාවේ[2] කෙළ සියක්[3] පමණ රහතන් වහන්සේ වසන සේක. එ සේ වසන රහතන් වහන්සේ ගෙන් අස්සගුත්ත මහ තෙරුන් වහන්සේ, 'මා හා කැටි ව කථා කරන්ට නිසි මහණ බමුණු කෙණෙක් ඇත් නම් කියව'යි යොන් ඇමැත්තන්ට කී කථාව දිව කතින් අසා වදරා සත් කුල[4] පව්වෙන් යුගඳුරු මුදුනට කෙළ සියයක් පමණ රහතන් වහන්සේ රැස් කරවා ලා 'මිළිඳු රජ්ජුරුවන් කියන්නේ මෙ ලෙසක. උන් හා කැටි ව තර්ක කථා කරන්ට ශක්ති ඇති තැන් ඇද්දූ'යි විචාළ සේක.

එ සේ විචාළ බසට එක නමකුත් බැණ නො නැඟි සේක. දෙවෙනි ව තුන්වෙනි ව විචාළ ත් අශක්ති හෙයින් ම බැණ නො නැඟි සේක. බැණ නො නැහෙන්නා අස්සගුත්ත මහ තෙරුන් වහන්සේ භික්ෂු සඞ්ඝයා වහන්සේට වදරණ සේක් 'තමන් හැම දෙනා බැණ නො නැඟෙන බැවින් මෙ සේ ම තුබූ කලට පස් වා දහසින් පන් සියයක් හවුරුදු පමණ ගිය කල ශාසන බල ය මෙ තරම් වූ කලට හවුරුදු ඒ දෙ දහසත් ගිය කල කවර තරම්

---

1 වී ටිකකි, 2 රත්තලවු ගල, 3 කෙළ සියයක්, 4 සත්කුල,

Non-Commercial Distribution

ද? මෙ තැන දී රහතන් ගෙන් ම කෙළ සියයක් විතර ඇති කලට ශාසන බලය ත් පෙනුණ නො වේ ද? ඒ නියාවට තවුතිසා දෙව් ලොව විජයොත් පායට නැගෙන හිර කෙතුමති නම් විමනෙක් ඇත. ඊ මහසෙන නම් දෙව් පුත්හු වෙසෙති. ඌ මිළිඳු රජ්ජුරුවන් හා සිත් හුයකින් සීන් හූ ගළනන කලක් පරිද්දෙන් සාමෝපමා වෙන් සිත් ගෙන කථා කොට ලිය හෙති' වදාළ සේක.

ඒ අසා කෙළ සියයක් පමණ රහතන් වහන්සේ යුගඳුරු පව්වේ දී අතුරුදහන් වූ සේක් තවුතිසා දෙව් ලොව පහළ වූ සේක. එ කල සක් දෙවිඳු ද වඩනා රහතන් වහන්සේ දුර දී ම දක පහන් සිත් ඇති ව ප්‍රධාන ව වඩනා අස්සගුත්ත මහ තෙරුන් වහන්සේ කරා ගොසින් වැඳ ලා එකත් පස් ව සිටිය හ. සිට ත් 'මෙ තෙක් දෙනා වහන්සේ අරුමයක් සේ දෙව් ලොවට වැඩි හෙයින් නො කරුණෙක නොවඩනා සේක. එක් තරා කට යුත්තෙකැ'යි සලකා අස්සගුත්ත මහ තෙරුන් වහන්සේට 'ස්වාමීනි, කවර ප්‍රයෝජනයක් නිසා වැඩි නියා ද? වදළො ත් යහපතැ'යි කිවු ය. අස්සගුත්ත මහ තෙරුන් වහන්සේ ද එ සේ විචාළ ශක්‍රයන්ට සිතා වදරණ ශාසනොපකාරයට දෙවතාවනුභාවය ත් ඇති වන පිණිස 'හෙම්බා ශක්‍රයෙනි, තොපි නො විචාළ ත් කියන්ට ම සිතා ආ ගමනේ විචාළ බැවින් කිව මනා වේ ද? තෙපි තොප ගේ දිව ඉසුරු නිසා නොදතු නමුත් මෙ වක දඹදිව සාගල නුවර මිළිඳු නම් යොන් රජ්ජුරු කෙණෙක් තර්කවාදී ව වහන්දෑ කරා අවුත් වාද ලෙසින් කථා කොට බොහෝ පීඩා කෙරෙති. උන් හා කථා කරන්ට නිසි කෙණෙක් මිනිස් ලොව නැත. දුමුවා කසළ බව මුත් උන්ට සම්භ වූ නුවණ නිකසළ ය. එ වක තෙජස් නැති ව කසළ දුමුව ත් දූන් අනුන් ගේ නුවණ බැවුම් හරවන ලෙසට තෙජස් ඇත්තෝ ය. උන් හා කථා කරන්ට තරම් කෙණෙක් දෙව් ලොව ඇත් නම් විමසා කියව'යි ශක්‍රයන් ලවා ත් එවා ගන්නා පිණිස වදළ සේක.

ඒ අසා සක් දෙවිඳු "ස්වාමීනි, ඒ මිළිඳු රජ්ජුරුවෝ නමුත් ඔබ්බකින් මිනිස් ලොවට ගිය කෙණෙක් නොවෙති. මෙම දෙව් ලොවින් මිනිස් ලොව උපන්හ. තෙල පෙණෙන කෙතුමතී නම් විමන වසන මහාසෙන නම් දෙව් පුත් මල්ලව පොරට මල්ලවයන් ම තරම් වන්නා සේ, යකඩ මොළොක් වන්ට ගිනි ම තරම් වන්නා සේ මිළිඳු රජ්ජුරුවන් හා කථාවට තරම. මිනිස් ලොව ඉපැද උන් හා තර්ක වාද කරන්ට යාච්ඤා කරම්භ'යි කිවු ය. ඉක්බිත්තෙන් එ සේ කී සක් දෙවිඳුන් හැර ගෙන කෙළ සියයක්

පමණ රහතන් වහන්සේ යම් සේ බුදුන් පිරිනිවි හවුරුදු සියයක් ගිය කල විසල් මහ නුවර අලදිවැදි[1] මහණුන් දස දහසක් දෙනා නො දහම් දහම් කොට ගෙන වත් දසයක් පහළ කිරීමෙන් සසුන් මහ විල්හි සදහම් නමැති පැන් නසා අධර්ම නමැති වස ලන නියාව දැක යස මහ තෙරුන් වහන්සේ ප්‍රධාන සඞ්ඝයා වහන්සේ කාලාශෝක රජ්ජුරුවන් ගෙන් බල ලදින් වාලුකාරාමයෙහි වැඩ හිඳ පස්වා දහස් මුළුල්ලෙහි ධර්මය පවත්නා ලෙසට:

"එත්තාවතා දසසහස්සසු පාප භික්ඛූ
නිද්ධූය ධූත දසවත්ථුමලා අකංසු,
යං තෙ සුනිම්මල යසෙන යසෙන සද්ධිං
සඞ්ගීතිමුජ්ඣිතමලා අපි දස්සිතා සා"

යනු හෙයින් පවිටු මහණුන් තෙරූ දෙවන දම් සභා කොට ලා 'මේ අප කළ ශාසන කාරියට මත්තෙහි වන උවදුරු ඇද්දෝ හෝ'යි දිවසින් බලා බිඳුසාර රජ්ජුරුවන් ගේ පුත් ධර්මාසෝ රජුන් සමයෙහි සැට දහසක් පමණ තීර්ථකයන් සිංහ සම් පෙරවී කැනවිලුන්ට[2] සිංහ තරම් නැත්තා සේ යහපත් තරම් නැත ත් ලාභ ය නිසා සසුන් වැද මහණ ව මැණික් තිබිය දී කිරිවාණ පොඩි ගන්නා සේ, තම තමන් ගේ ම ලබ්ධි ම පිරිමැසීමෙන් කරණ ශාසන විලොප ය දැක එ කල්හි ඒ උපදනා අර්බුද ය සන්සිඳුවා-ලන්ට නිසි කෙණකුන් මිනිස් ලොව ත් ස දෙව් ලො ත් නැති නියාව දැන බඹ ලොව බලා තිස්ස නම් මහ බඹාණන් තුන් වන දහම් සභා කොට මධ්‍ය දෙශයෙහි තබා පසල් දනවුවල ත් ශාසන ය පිහිටුවා ලන්ට බල ඇති නියාව දැන දෙ වන ධර්මසභා කළ වහන්දෑ බඹ ලොවට වැඩි සේක් ද, එ පරිද්දෙන් ම කෙතුමතී විම නට වැඩ පළමු සක් දෙවිඳු ලවා මිනිස් ලොව සිපදනට පැරැත්ත ගැන්වූ සේක. ඒ අසා මහාසෙන දෙව් පුත් අරුම නො දත් දෙයෙක ඇල්ම නැත්තා සේ ප්‍රයෝජන නො දත් බැවින් ශක්‍ර යන් ගේ පැරැත්ත පමණකින් මිනිස් ලොව උපදනට මැළිවූ ය. මැළිවූ නියාව ත් දැන අස්සගුත්ත මහ තෙරුන් වහන්සේ 'නිදුකා ණෙනි, මැළි නො වව. තොප නිසා බලවත් ශාසනොපකාරයෙක් ඇත. අපි ත් වැළිත් මුළු ලොව බලා ඒ ශාසන සංග්‍රහයට තොප තරම් නියාව දුටුම්හ.' එ සේ හෙයින් මෙ තෙක් රහතන් ගේ ආරාධනාවෙන් දෙවි – බඹුන් ගේ අයදමෙන් බෝසත් කෙණ-කුන් මිනිස් ලොව ඉපැද සත්‍වොපකාරය කරන්නා සේ කෘත පුණ්‍ය හෙයින් මෙ තැන්හි රඳා කරණ භවක්‍ෂයෙක් ඇත් නමුත් එයි ත් ඔබ දී ම කරණ ලෙසට මිළිඳු රජ්ජුරුවන් තර්ක වාද

---

1 අල වාදී    2 කැණවිලුන්ට

Non-Commercial Distribution

කිරීමෙන් භික්ෂු සංඝයා වහන්සේට කරණ පීඩාව සන්හිඳු වන පිණිස ත් මිනිස් ලොව උපදුව'යි හැම තැන් ගේ අදහස් ගෙන ආරාධනා කළ සේක.

එ කල්හි මහාසෙන නම් දෙව් පුත්හු ''මම වැලි ත් මිළිඳු රජ්ජුරුවන් හා තර්ක වාද කොට උන් පරදවා පිය හෙම් ල. මා නිසා සසුන් මහ විල සදහම් පැන් ලැබීම කසළින් නිකසළ වේල. ශාසන සංග්‍රහ බලවත් කොට කට හෙම් ල''යි සතුටු ව අප නිසා සසුන් වැඩක් වන කල ඒ මුල් ව මිනිස් ලොව උපදිමි යි රහතන් වහන්සේ කළ ආරාධනා ගිවිස්සෝ ය. ඒ රහතන් වහන්සේ ද, මහාසෙන දෙව් පුත් මිනින් ලොව උපදනා ලෙසට ගිවිස්වා ගෙන දෙව් ලොවින් අවුත් හිමවත රක්ගල්තලාවට වැඩි සේක. එ සේ වැඩ අස්සගුත්ත මහ තෙරුන් වහන්සේ රහතන් වහන්සේ බණවා ලා 'ඇවැත්නි, මේ සඟ රැසැ අප ගේ මේ සසුන් පිළිබඳ කටයුත්තට මුසු නුවූ කෙණෙක් ඇද්දැ'යි විචාරා රොහණ මහ තෙරුන් වහන්සේ නිරොධ සමාපත්තියට සම වන් හෙයින් මුසු නුවූ නියාව අසා සඟ ව හිඳ ඔබ කැඳවා යවු සේක. උන් වහන්සේ ද නිරෝධයෙන් නැගීමට එයි ත් එක් කාරණයක් හෙයින් සති ය ඉකුත් නුවූ වත් නිරොධයෙන් නැගී රක්ගලතලා වැඩි සේක. වැඩියා වූ රොහණ මහ තෙරුන්වහන්සේට අස්සගුත්ත මහ තෙරුන් වහන්සේ 'ඇවැත්නි, මිළිඳු රජ්ජුරුවන් හා තර්ක ලෙසින් කථා කොට හෙන තෙනක් නැති ව බුදු සස්න පසු බසිමින් සිටි නියාව නො පෙනේ ද. මේ තමා උදසීන වුව මනා කලෙක් ද? ශාසනයට පිටිවහල් වුව මනා වේ මනා වේ දැ'යි වදාළ සේක.

ඒ අසා රොහණ මහ තෙරුන් වහන්සේ ''දෙව් ලෝ වඩනා ගමනට සහාය වන්ට නුහුණු වූයේ ය[1]. ඉතිබ්බ අප විසින් කළ මනා කිම් දැ'යි විචාළ සේක. 'ඇවැත්නි, එ සේ නිරොධයට සම-වදනට පෙරාතුව ම සස්න පසු බස්නා නියාව අප හැම දක්නා පසු නුදුටුවා නොව ත් වූවා දැක දැක ත් උදසීන වූවාට දඬුවම් කළ මැනවැ'යි වදළ සේක. වදරා ලා 'කවර දඬුවමෙක් දැ'යි විචාළ කල්හි 'ඇවැත්නි, සෙසු දඬුවමෙක් නො වෙයි. හිමාල ආසන්නයෙහි කජඞ්ගල නම් බමුණු ගමෙක් ඇත. ඒ ගම උභයකුල පරිශුද්ධ වූ බමුණාන කෙණෙක් වෙසෙති. උන්ට පුතණු කෙණෙක් ඇති ව නාග සෙන කුමාරයෝ යැ යි ප්‍රසිද්ධ වෙති. තෙපි ඇවැත්නි, සත් හවුරුදු දස මසක් ම ලබන කිසිවක් ඇත ත් නැත ත් සිහා උන් ගේ ගෙට යව. සිහා ඇවිදීමෙන් හත් හවුරුදු දස මස ගිය කලට ඒ නාගසෙන කුමාරයන් තොප කරා හැර ගෙන මහණ

1. නුවූයේ ය.

Non-Commercial Distribution

කළා නම් මුන් නිසා වන ශාසනෝපකාරයට තොප මුල් හෙයින් ඒ දඬුවමින් මිදෙව'යි දඬුවම පිට තබා මහණ කරවන්ට විධාන කළ සේක. මුසුන් දණ්ඩෙන් ලූ පහර ත් දණ්ඩ කර්මයක් ම හෙයින් තදනුරූප කොට වදාළ සේ තුබූයේ ය. ඔබ ද ඒ අසා යහපතැ යි ශිව්ස ආදි සුමු ව ගත නුහුණත් ඊටත් වඩා පසු ව මුහු වූ සේක.

මහාසෙන නම් දෙව් පුත්හු[1] ද දෙව් ලොවින් චුත ව සොණුත්තර නම් බමුණානන් නිසා උන් ගේ බැමිණියන් කුස උපන් හ. උපන් ඇසිල්ලෙහි තේජස් ඇති වීමට කාරණා ව ඒ ගම ආයුධ මුළුල්ල දිළිහී ගියේ ය. නුවණට පළමු වීමට කාරණා ව අග'ස් බතු ත් ඇති වී ය. පීඩා නමැති ගිම් නිවීමට කාරණා ව මහත් වැස්සකු ත් වට.

රොහණ මහ තෙරුන් වහන්සේ ද ඒ මහාසෙන දෙව් පුතුන් මවු කුස පිළිසිඳ ගත් දවස පටන් පුරා සත් හවුරුදු දස මසක් ඒ ගෙට සිහා වැඩ බත් සැන්දක් වේවා යි හුළුකැන් සරළුවක්[2] වේව යි නො ලත් සේක. ඔබ්බෙ තුබූ බත් තබා මුබ්බෙ තුබූ වැඳීම් පිදීම් පමණකු ත් ලබන්නට නැත. එ සේ කල සිහා ගොසින් ලබන්නේ කිම්දැ'යි යත හොත් දෙඩීම් බිණීම් පමණෙක. මෙ ලෙසින් සත් හවුරුදු දස මස ගොසින් නාගසෙන කුමාරයන් මහණ වන වයසට පැමිණි කල්හි එක් දවසක් රොහණ මහ තෙරුන් වහන්සේ ඒ ගෙට සිහා වැඩි ගමනෙහි ''අරුණු''ය යි යන බස් පමණක් ලදින් ඔබ්බෙ ගෙවලට සිහා වඩනා සේක. ඒ ගෙයි බමුණානෝ ත් පෙර මග එන තැනැත්තෝ මහ තෙරුන් වහන්සේ දැක 'කිමෙක් ද පින්වත් වූ මහණ, අප ගේ ගෙට ත් සිහා ගියෙහි දැ'යි විචාරා 'එ සේ ය, ගියම්හ'යි වදාළ කල්හි ලත් කිසිවක් ඇද්දැ'යි විචාළහ. බත් කුම් වුව ත් බස් පමණක් සඳහා 'එසේ ය, ලදුම්හ'යි වදාළ සේක. උෟ තුමූ තමන් සැදෑ ගුණයක් නැති හෙයින් බලවත් හානියකට පැමිණියා සේ මුසුප්පු ව ගෙන ගෙට ගොසින් මේ 'අප ගේ ගෙට සිහා ආ මහණාට දුන්නේ ඇද්දැ'යි විචාරා 'නැතැ'යි යනු අසා 'එ සේ වී නම් කිසිවක් නො ලත් විරූ හෙයින් රුහැණි ව නැත්තක් කී නියා වේ ද? බොරුවෙන් හසු කෙරෙමි' දෙ වන දවස් බැරකට නො ගොසින් ගෙයි ම රඳා හුන්හ.

මහ තෙරුන් වහන්සේ ද ඒ ගෙට සිහා ගොසින් ලද මනා අරුණු පමණක් ම නොවන හෙයින් තව ත් ලද මනා දෙයක් ම ඇති වන්නා දෙ වන දවස් ඒ ගෙට ම සිහා වැඩි සේක. බමුණා

1. දෙව් පුත් ද 2. සාළුවක්

Non-Commercial Distribution

නෝ මහ තෙරුන් වහන්සේ දැක "ඊයේ දවස් අප ගේ ගෙන් කිසිවකු ත් නො ලදින් 'ලදුම්හ'යි කියා බොරු කීවා ද? ඒ බොරු කීම යහපත්දැ'යි විචාළහ. එ සේ විචාළ බමුණානන්ට 'හෙම්බා බමුණානෙනි, මෙ තෙක් කල් මුළුල්ලේ තොප ගේ ගෙන් බස් පමණකු ත් නො ලදින් ඊසේ දවස් 'අරුණු' යන බස් පමණක් ලදුම්හ. එ විතරකු ත් ලත් දේ[1] ලත් නියා වේදැ'යි සිතා 'ලදුම්හ. බමුණානෙනි, කීම්හ'යි වදාළ සේක. එ බස් අසා බමුණානෝ 'අනේ මූ මෙ විතරකුත් ලදුම්හ'යි කියන්නෝ මෙසනාද පමණ කින් දරු සම්පත් ලදින් කෙකින්නන් බලවත් ව සතුටු වන්නා සේ මෙ විතරකට සතුටු වූවාහු මේ ගෙන් කන බොන දෙයක් ලද්දු නම් බලවත් ව සතුටු වෙති'යි මහ තෙරුන් වහන්සේ කෙරෙහි පැහැද තමන් අනුභව කරන්ට ඉදි කළ බතින් ම බත් සැන් දක් හා ඊට සෑහෙන තරමේ මාළුවකුත් තබා නිල කරවා ලා 'තෙල හැම දවස් ම ලැබේ'යි කි වූ ය. මහ තෙරුන් වහන්සේ ද බත් සැන්ද පිට ලා කුමාරයන් මහණ වන වයස් පිරෙන තෙක් සිහා ඒ ගෙට වඩනා සේක. බමුණානෝ ද එක් වන් වඩනා මහ තෙරුන් වහන්සේ ගේ සන් හුන් තරම දැක පාන් තුඩ ගෑ තෙල් පමණකින් බලවත් ව සතුටු වන්නා සේ තර ව පැහැද, නිරන්තරයෙන් තමන් ගේ ගෙයි දී ම වළඳන්නට ආරාධනා කොළෝ ය.

මහ තෙරුන් වහන්සේ ආරාධනා ඉවසා දවස් පතා අවුත් වළඳා ලා වඩනා කල වැළඳූ බතට දෙන මිලයක් පරිද්දෙන් යම් තම් බණකු ත් වදරණ සේක. මේ ලෙස කරණ කලට බැමිණියෝ ද මහ පිනැති පුතණු කෙණෙකුන් වැදූහ. උපන් කුමාරයන්ට නාග-සෙන නම් තුබූහ. නාගසෙන කුමාරයෝ ද කලාවෙන් කලාවට වඩනා සඳ පරිද්දෙන් වඩනෝ සත් හැවිරිදි වූහ. ඒ අවසථා වෙහි දී බමුණානෝ පුතණුවන් බණවා ලා 'පුත නාගසෙන කුමාරයෙනි, ශිල්ප උගැන්ම[2] නම් මේ අවසථාවෙහි මුත් මූකුරා ගිය කලට අනිකකට ම සිත යන හෙයින් ඉගෙන ගත නොහැක්ක. බමුණු කුලයෙහි උපන්නවුන් උගතමනා ශිල්ප උගනුව'යි කි වූ ය. කුමාරයෝ ත් ඒ අසා උගත මනා ශිල්ප කවරේ දැ යි විචාරා වේද තුන නම් අවශ්‍යයෙන් ම උගත මැනව. බත් කන්නවුන්ට මාළු ඇත මනා සේ ම සෙසු ශිල්ප ත් දත මැනැවැ'යි කී කල්හි 'යහපත. ඉන් අඩුවක් පායිම් ද? උගනිම්' කිවූ ය. එ කල්හි සොණුත්තර නම් පිය බමුණානෝ ඇදුරු ව ශිල්ප උගන්වා ලන තරම් බමුණාන කෙණකුන් ගෙන්වා ගෙන ගුරු පූජා කොට උන්ට මසු දහසක් දෙවා ලා පිටතට යවා ශිල්ප ඉගැන්වීමට මැලි ව මාළි-ගාව ඇතුළේ ම එක් ගබඩාවෙක යානක් පනවා ලා ඇදුරු බමුණානන්ට 'තෙල යානෙහි හිඳ ශිල්ප උගන්ව'යි කිවූ ය.

1. ලද්දේය. 2. ඉගැන්වීම.

Non-Commercial Distribution

එ සේ කී ඉක් බිත්තෙන් ඇදුරු බමුණානෝ නාගසේන කුමාරයන්ට වේද මන්ත්‍ර තමන් ගේ ශාස්ත්‍රයට මුල් ව තිබෙන හෙයින් ඒ උගන්ට කිය ලා කියති. නාගසේන කුමාරයෝ දෙවි ටක් නො කියවා එක විට කියවා ලූ ගමනින් ම අනඳ මහ තෙරුන් වහන්සේ එක ශ්‍රැතීන් ගාථා පසළොස් දහසක් උගත්තා සේ ම අථර්වන වෙදය හා සමග වේ ද සතර ත් නිඝණ්ටු කෙටුභාදී වූ සෙසු ශාස්ත්‍ර ත් කසුප් බුදුන් සමයෙහි හමඳනා මළුව කසළ ත් නොතබා හැමැන්ද සේ උගන්නා ශිල්පයක් සැකයක් නො තබා දිවග ලෙළෙන පරිද්දෙන් කසළ දමන්ට දෙ තුන් විටක් කී බව මුත් මේ එ සේ නොකොට එක විටින් ම ලක්‍ෂ ගණන් ග්‍රන්ථ ජාත වණ පොත් කළහ. එ සේ වන පොත් වූ පසු පියාණන් ළඟට ගොසින් මේ බමුණු කුලෙහි උපන්නවුන් උගත මනා ශිල්ප මෙ තෙක් ම ද? තව ත් ඇද්දැ'යි විචාරා අටුවෙක කොටුවෙක ලා ලූ දෙයක් කා නිමි කලට ඒ අටු-කොටුවේ තිබෙන දෙය එ තෙක් ම වන්නා සේ ඔබ්බෙ පවත්නා ශිල්ප නො දැනෙන බැවින් 'අප කෙරෙහි පවත්නා ශිල්ප මෙ තෙක් ම ය'යි කී කල්හි ශිල්ප ඉගැන් වූ ආචාරීන්ට උගත් ශිල්ප වන පොත් දී ලා මාළිගාවෙන් බැස පූර්ව ප්‍රාර්‍ථනා නැමැති අඩගනාව් ගේ කැණිය ලින් ඇට කිසිවක් දී පියන්ට උගත් ශිල්ප නැමැති ගෙය මුළුල්ල ප්‍රඥ නැමැති අඩගනාව ලවා සමන්වා බලවා ත් ශිල්ප නැමැති ගෙය මුළුල්ලෙන් ප්‍රයෝජනවත් නො වන දෙයක් විනා ප්‍රයෝජනවත් කිසිවක් නො දැක පූර්ව ප්‍රාර්‍ථනා නමැති අඩගනාව ත් සිත් ගත නොහී 'මේ මා උගත් වේදදී වූ ශිල්ප ජාත ය බොල් පරිද්දෙන් ඉතා සිස් ව, සිස් හැඳ පුටු සේ සාරයක් දක්නට නු වූ නිසා ය'යි තුමූ ත්නොසතුටු වූ හ.

එ කල්හි රොහණ මහ තෙරුන් වහන්සේ වත්තනිය නම් සෙ නස්නෙහි වැඩ හුන් සේක් කජඞගල නම් බමුණු ගම හුන් නාග සේන කුමාරයන් ගේ නො සතුටු වූ සිතිවිල්ල තමන් වහන්සේ ගේ පරසිත් දන්නා නුවණින් දැන පා සිවුරු හැර ගෙන රදා වැඩ හුන් වත්තනි ය නම් සෙනස්නෙන් නික්ම කජඞගල නම් බමුණු ගමට වැඩි සේක. නාගසේන කුමාරයෝ ද තමන්ගේ ගෙදොර දෙරටුවේ සිටි තැනැත්තෝ වඩනා මහ තෙරුන් වහන්සේ දුර දී ම දැකහුන් තෙනට ගොසින් වුව ත් මා උගත් ශිල්පයෙහි සාර විශෙෂය විචාළමනා තැන–සොයා යන බෙහෙද පෙර මහ මදුටුවා සේ සම්භ වූ නිසා යහපතැ'යි සතුටු ව පිපාසා බලවත් කෙණෙකුන් පැන් ගෙනෙන්නා දැක පෙර මහට ම ගොසින් පැන් ඉල්වා බොන්නා සේ මහ තෙරුන් වහන්සේ කරා එළඹ ඒ ජාතියට තමන් මහණ රුවක් නුදුටු හෙයින් 'මුසු ව සිවුරු පෙරවී තෙපි කවුරු දැ'යි

Non-Commercial Distribution

විචාළෝ ය. විචාළ කුමාරයන්ට 'අපි එක්තරා පැවිදි කෙණෙකුම් හ'යි වදාළ සේක. ''පැවිදි වූ යේ කුමක් නිසා දැ''යි විචාළ කල්හි රාගාදී කෙලෙසුන් දුරු කරන්ට ය'යි වදාළ සේක. ඒ අසා කුමාර යෝ ඒ වන්නාට ය. තෙල හිස කේ සෙස්සන් ගේ හිස කේ සේ දික් නො වෙයි විචාළෝ ය. ඒ අසා මහ තෙරුන් වහන්සේ කපන හෙයිනැ යි යන මෙ විතරක් නො වදරා මුන් අවුත් මහණ වන ලෙසට කථාව පැවතුව මනා කැලැ යි හිස කේ දෙ පෝයෙන් දෙ පෝයේ මසින් මස කපන හෙයින් දෑඟුල් විතරට දික් නො වේ යි කීවොත් මෙ පමණකින් ගිහි කම් කටුලේ ආයාසය ම දත නො හැක්ක. විචාළ බසෙහි ම පිහිටා ගිහිකම් කටුලේ දුක් හඟවම් සිතා 'මෙම්බා කුමාරයෙනි, මේ හිසකේ වඩා පිරි මසන්න වුන්ට අට්ටාල් සොළොසෙක් ඇත. ඒ සොළොස නම් කවරේ ද යත්? හිස කේ සිටුවන්නාහු මුර නො වරදවා සේධු ව මැනව. පැන් නො සිටුවා හිණිගැන්නුව මැනව. බදිනට පෙරාතු හිස කේ තැනුව මැනව. තෙල් ගා පන්ති කළ මැනව. හිස සෝධා පී කලට මල් සෙවව මැනව. මීල දී වුව ත් සුවඳ සෙවුව මැනව. සුවඳ ගැල්වුව මැනව. පණා ගැසුව මැනව. අවුල් කඩා පීරුව මැනව. උකුණන් හැරවුව මැනව. නර පෙනෙන කලට කරුප්පු ලුව මැනව. හිස කේ වැගිරෙන නියාව දුටු කල මුසුප්පු වුව මැනව. මෙ කී අට්ටාල් නිසා මෙ සේ කලට ඒ හැම නැති හෙයින් හිස කේ කපම්හ'යි වදාළ සේක.

ඒ අසා නාගසේන කුමාරයෝ 'ඒ එ සේ ම ය. අපි ත් ගිවි සුම්හ. හන් පෙරෙවි පිළි සෙස්සන් ගේ පිළි සේ නො වෙ නැ'යි විචාළෝ ය. ඔබ ත් ඒ අසා සිවුරු ඇවිටි කරවනු නිසා 'එම්බා කුමාරයෙනි, මෙ පිළි නො කැපීම නිසා අගය ත් පිරි නොහී නො රැඳීම නිසා පැය ත් නො නැසීම සිටී. එ සේ කලට ලොභ කට යුතු වස්තු හෙයින් සොරු ආදීන් ගෙන් උපද්‍රව මහත. නැවත නට කල ශොක ත් උපද්දී. ඇපිල්වීම් ආදී වූ අට්ටාලූ ත් ඇත. මේ සිවුරු කපා ගොතා කරණ හෙයිනු ත් අගය ත් අඩු ව රැඳී මෙන් පැය ත් අඩු ව තිබෙයි. එ හෙයින් ඊ ලොභ කරන්නෝ නැත. අප ගේ පිළි වෙනස් වන්ට කාරණ මේ'ය යි වදාළ සේක. ඒ අසා නාගසේන කුමාරයෝ හිස කෙසේ හා පිළියේ හා වෙනස දැක මා විචාළ කාරණා කියා ගිවිස්වා ලූ නියා යහපත. මේ කාරණා දන් නෙ ත් එක්තරා ශිල්පයකින් වේ ද? එ සේ දන්නා ශිල්පයෙක් ඇත් නම් ඒ විචාරම්'යි සිතා දන්නා ශිල්පයෙක් ඇද්ද නැද්ද'යි විචා ළෝ ය. එසේ ය, කුමාරයෙනි, ශිල්ප දනුම්හ'යි වදාළ සේක. වදර ලා මුන් තමනු ත් ශිල්ප දන්නා හෙයින් සාමාන්‍ය කොට සිතා

ආලය නො කෙරෙත් නමුත් ආලය උපදවනු පිණිස 'හස්ත සාර ශිල්පයක් සේ බලවත් ව තිබෙන ශිල්ප ත් අපි දනුම්හ'යි වදාළ සේක. ඒ අසා නාගසෙන කුමාරයෝ ඔබ දන්නා ශිල්ප ත් දන්නා කැමති ව 'මිහිරි දෙයක් ලත් කල සඟවා තබා ගෙන කන්නෝ මසුරු කෙණෙක. පර වැඩ නො හැසිරෙන කෙණෙක. ත්‍යාගී කෙණෙක් අනුන්ට ත් දෙති. එ සේ ම නුඹ වහන්සේ දන්නා බලවත් ශිල්ප අප ත් උගන්වාලන්ට පිළිවන් ද'යි ශාස්ත්‍රලොභි හෙයින් විචාළෝ ය.

ඒ අසා මහ තෙරුන් වහන්සේ 'මුන් කළ ප්‍රාර්ථනාව කවර දෙයකු ත් උගන්ට අශක්ති ලෙසකට නො වත් බොධිසත්ව චරිත යක් සේ උදරතර අදහස් ඇති හෙයින් නිසිවුව යි සිතා වදරා යෙදුණු දඩුවමින් මිදෙන නිසා ත් 'තෙපි උගනු නම් උගන්වන්ට පිළිවැනැ'යි වදාළ සේක. කුමාරයෝ ඒ අසා කවර ලෙසක සිටුවා කවර ලෙසකින් උගන්වන ශිල්පයක් බවක් නො දන 'යහපත, ඒ දන්නා ශිල්ප ය දුන මැනවැ'යි කිවූ ය. සිඟා වඩනා වේලාව හෙයින් දූන් අවසර නැතැ'යි වදාළ සේක. ඒ අසා නාගසේන කුමාරයෝ ආරාධනා කොට පාත්‍ර ය හැරගෙන තමන් ගේ ගෙට වඩාගෙන ගොසින් සිය අතින් සකස් කොට වළඳවා ලා වළඳා අන්තයෙහි මෙ විට අවසර ඇත්තේ වේ ද'යි ශිල්ප දෙවා වදාළ මැනවැ'යි කිවූ ය. එ සේ වී නම් කුමාරයෙනි, මෙ ලෙසින් සිටියා වූ තොපට ශිල්ප උගන්වන්ට නොපිළිවන. දෙ මවු-පියන් අනුදන් වා ගෙන අවුත් අප සේ ම මහණ ව ගතු නම් උගන්වා ලම්හ'යි වදාළ සේක. නාගසේන කුමාරයෝ ද දෙ මවු–පියන් කරා ගොසින් දෙ මවු-පියෙනි. මේ තපස්වියානෝ තමන් බලවත් ශාස්ත්‍රයක් දන්නා නියා ව කියා මා ඉල් වූ හෙයින් මහණ වුවහොත් මුත් දෙන්ට බැරිය යි කිවූ ය.

මහණ නුවූවො ත් ශාස්ත්‍ර ය සම්භ වන්නට නැත. අරුම නො වන මහණක් නිසා අරුම වූ ශාස්ත්‍ර ය අපවත් කරන්ට ත් බැරි ය. මා මහණ ව ගෙන ශාස්ත්‍ර ය ඉගෙණ ගන්නා ලෙසට අනුදත මැනවැ'යි කිවූ ය. දෙ මවු-පියෝ ඒ අසා මූ තුමූ ත් ශාස්ත්‍ර යෙහි නියම ය ත් අප අතින් විචාළෝ ය, අප ගෙන් දත් නිහඬක්. නැති බැවින් ඊ නිහඬකු ත් මුත් දත මනා පසු ශාස්ත්‍ර ය ඉගෙන ලා සිවුරු හැර එත ත් බාධාවක් නැති පසු අනුදනුම්හ'යි සිතා 'යහපත මහණ වව'යි විධාන කොළෝ ය. රොහණ මහ තෙ රුන් වහන්සේ ද නාගසේන කුමාරයන් කැඳවා ගෙන වත්තනිය නම් සෙනස්නට වැඩ රැ සැතපී ලා හිමවත රක් ගල තලා

වැඩ කෙළ සියයක් පමණ රහතන් මැද කුමාරයන් මහණ කළෙ සේක. මහණ වූ පසු 'අප මහණ වූයෙත් ශිල්පයෙහි කළ ලොභයෙන. කල් ගිය කල ත් කිම ද? ශිල්ප එවා ගත මනා වේ දූ යි ඉතිකින් නුඹ වහන්සේ ගේ වෙස් ගත්තමෝ වේ ද? ශිල්පය උගන්වා වදළ මැනැවැ'යි කිවූ ය. මහ තෙරුන් වහන්සේ 'මුන් සාමණෙර භූමියෙහි සිටි හෙයින් විනය උගන්වන්ට බැරි ය. මූ මහා නුවණැත්තෝ ය. සියුම් දෙය කපන්ට සියුම මුවාත් ඇති යකඩ නිසි වන්නා සේ මුන් ගේ සියුම් නුවණට සියුම් බණක් නිසි ය. එ හෙයින් විජම් පිටකය උගන්වමි. ශීල නම්: ශීල යෙන් ආදියෙන් කළණ වූ විනය පිටක ය. සමාධි නම් මද්ධ්‍ය යෙන් කළණ වූ සූත්‍ර පිටකය. ප්‍රඥාව කෙළවර කළණ වූ විජම් පිටක ය. එ හෙයින් අප දන්නා ශිල්පයේ ආදිය ත් ඇත, මද්ධ්‍ය-යත් ඇත, කෙළවර ත් ඇත. තුන ම කලණ ය. තොප දන්නා ශිල්ප මෙ තරමට ඇත් නම් එ ම පමණය. එ සේ නැත් නම් මෙ අප කියා ලූ තුන හැරගෙන පිරිමසව. විනය හැර ගැන්මෙන් හා ඔප් නහන රත්රනක් මෙන් පිරිය යුතු සිල් නිර්මල කොට ගෙන සූත්‍ර උගැන්මෙන් උපචාර සමාධි අර්පනා සමාධි උපදවා ගෙන අභිධර්ම උගැන්මෙන් විවසුන් වඩා මාර්ග ප්‍රඥාව උපදවා ගත හැක්ක. මේ ත්‍රිපිටකය උගැන්මෙන් පර්‍ය්‍යාප්ති ශාසනය ද එ සේ ම පිළිපැදීමෙන් ප්‍රතිපත්ති ශාසනය ද අධිගමය කිරීමෙන් ප්‍රතිවෙධ ශාසනය ද සිද්ධ වෙයි.

ශීල පූරණයෙන් අධිශීල ශික්‍ෂාව ත් සොපචාර ධ්‍යානයෙන් අධිචිත්ත ශික්‍ෂාව ත් මාර්ගාධිගම ඵලාධිගමයෙන් අධිප්‍රඥ ශික්‍ෂා-වත් පිරෙයි. විනය උගන්නා අවසථාවට තව නො පැමිණි හෙයින් විනයත් තිබිය දී සූත්‍රයෙන් තොප ගේ නුවණ සියුම් වන්ට නැති හෙයින් එයි ත් පසුකොට විජම් උගනුව''යි වදරා යටත් ව තුබූ නැයින්නකට යොමු වූ ජල ප්‍රවාහයක් මෙන් ශිල්ප උගන්ට යොමු වූ සිත් සතන් ඇති නාගසෙන සාමණෙරයන්දෑ විජම් උගන්වන මහ තෙරුන් වහන්සේ කුශල ත්‍රිකාදී ත්‍රික වශයෙන් හා හෙතු දුකා දී දුක වශයෙන් හෙබියාවූ ධර්ම සඟුණු ද, ස්කන්ධ විභඞගාදී විභඞග අටළොසකින් හෙබියා වූ විභඞගය ද, සංග්‍රහාදී වශයෙන් තුදුස් පරිද්දෙකින් විභාග කරණ ලද ධාතු කථාව ද, ස්කන්ධ ප්‍රඥප්තිය ද සව සමයෙන් සූත්‍ර පන් සියයක් හා පර සමයෙන් සූත්‍ර පන් සියයක් හා එක් කොට සූත්‍ර දහසකින් හොබවා දෙසා වදළ කථා වස්තුව ද, මූල යමකය-ස්කන්ධ යමකය යනාදි දස පරිද්දෙකින් දෙසා වදළ යමකය ද, හෙතු ප්‍රත්‍යය. ආලම්බන ප්‍රත්‍යය ය, අධිපති ප්‍රත්‍යය ය, අනන්තර ප්‍රත්‍යය'ය,

Non-Commercial Distribution

සමනන්තර ප්‍රත්‍යය ය, සහජාත ප්‍රත්‍යය ය, අන්‍යෝන්‍ය ප්‍රත්‍යය ය, නිශ්‍රය ප්‍රත්‍යය ය, උපනිශ්‍රය ප්‍රත්‍යය ය, පූරෙජාත ප්‍රත්‍යය ය, පශ්චාත්ජාත ප්‍රත්‍යය ය, ආ සෙවන ප්‍රත්‍යය ය, කර්ම ප්‍රත්‍යය ය, විපාක ප්‍රත්‍යය ය, ආහාර ප්‍රත්‍යය ය, ඉන්ද්‍රිය ප්‍රත්‍යය ය, ධ්‍යාන ප්‍රත්‍යය ය, මාර්ග ප්‍රත්‍යය ය, සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය ය, විප්‍රයුක්ත ප්‍රත්‍යය ය, අස්ති ප්‍රත්‍යය ය. නාස්ති ප්‍රත්‍යය ය, විගත ප්‍රත්‍යය ය, අවිගත ප්‍රත්‍යය ය යන සූ විසි ආකාරයෙන් දෙසූ පට්ඨානය ද යි විජම් පිටකය වදරන්නා ම රාහු අසුරිඳු සේ, කට මහත් කෙණෙකුන් නො එක් බත් පිඩින් එක විට ම ගැල පියන්නා සේ දෙ විටක් නො කියවා එක විට ම ඉගෙන ගෙන 'සවාමීනි, ඉතිකින් වදරා ආයාස ගන්ට නො කැමැත්තෙමි. වන පොත් දෙමි' කියා ලා කෙළ සියයක් පමණ රහතන් කරා රක් ගල් තලා වැඩ 'මම මේ සියලු විජම් පිටකය දෙ විටක් නො කියවා එක විටින් උග නිමි. ඒ මා උගත් විජම් පිටකය ධම් සඟණෙහි කුශල ත්‍රිකයෙහි එක් තඹ වළදෙක බොහෝ දෙයක් පටවන්නා සේ බහා ලා පිරි වසයෙන් පිරිවහම්හ''යි කී සේක.

ඒ අසා රහතන් වහන්සේ 'තෙල ඉතා අරුම දෙයක් වේ ද, අසනු කැමැත්තම්හ. පිරිවාලව'යි වදළ සේක. ඉක් බිත්තෙන් නාගසෙන හෙරණුන්දෑ ද ප්‍රකරණ සත විස්තර වශයෙන් සත් මසකින් පිරිවූ සේක. නොහොත් නුවණ නමැති තුඩින් ඕත් නමැති උගුර තෙමා එක විට බීපූ විජම් නමැති පැන් නොමඳ නියාව හඟවන්නට සත් මසකින් වමාරා නිමවූ සේක. ඒ ආශ්චය්‍ර්‍යයට අනික් මහත් කොට සාධු කාර දී ලන්ට නිසි කෙණෙකුන් නැති හෙයින් බස මහත් කෙණෙකුන් මහත් කොට සාධු කාර දෙන කලක් මෙන් මහ පොළොව ත් ගුගුරුවා පී ය. නොහොත් ආකාශස්ථ දෙවියන් දෙන සාධු කාරයට පෙරාතු මී දෙව දූ සාධු කාර දුන. නොහොත් 'මෙතෙක් දවස් මේ ශාසන භාරය උසුලා ලන තරම මහ බර ඇති තෙනක් නැති වීමෙන් මට සැල්ලුව පියා තුබූයේය. දූන් බර මහතැ'යි බර ව ගිය නියාවට ගුගුරන්නාක් මෙන් පොළොව ගුගුරවා පී ය. ඉක් බිත්තෙන් දෙව් බ්‍රහ්ම නා ගුරුළු ආදිහු ත් සාධු කාර දුන්හ. නැවත නාගසේන හෙරණුන්දෑ වහන්සේ හා තර්ක වාද කරණ කෙණකුන් අව මැනැවැ යි ඔබට මාරුවේ අපොළන කලක් පරිද්දෙන් මහ බඹු අපොළා පී ය. නැවත සාමණේරයන්දෑ වස්වා ලූ විජම් වැස්සෙන් නැගී පෙණ පිඩු මෙන් දෙවියෝ දිව මල් වැස්වූහ.

ඉක් බිත්තෙන් කෙළ සියයක් පමණ රහතන් වහන්සේ නාග සෙන හෙරණුන්දෑට විසි හවුරුද්ද පිරෙන්නා ම මත්තෙහි වන

ශාසනාභිවෘද්ධියට යොග්‍ය කොට රක් ගල් තෙලෙහි දී උපසම්පන්න කළ සේක. උපසම්පන්න වූ පසු එක් දවසක් රොහණ මහ තෙරුන් වහන්සේ හා එක් ව සිහා වඩනා නාගසේන තෙරුන් වහන්සේ 'අනේ අපගේ උපාද්ධ්‍යායයන් වහන්සේ නොදන්නා නිසා ය. විනය හා සූත්‍ර තිබියදී පළමු කොට මා විජම්[1] උගන්වාපු සේක. ඒ කුමක් කළ නියා දැ'යි සිතූ සේක. රොහණ මහ තෙරුන් වහන්සේ ද උන් වහන්සේ සිතූ සිතුවිල්ල තමන් වහන්සේ ගේ සිතින් දැන ගෙන 'ඇවැත්නි, තොප සිතනා අයුරු[2] නපුර. තෙල සේ වූ සිතිවිලි පිරිමින්ට ගැනු පළඳනා තරම් නොවන්නා සේ, ගැනුන්ට පිරිමි වෙස් තරම් නොවන්නා සේ තමන් තරමුන්ට තරම් නොවන්නේ වේ දැ'යි වදාළ සේක. ඒ අසා 'අනේ අප ගේ උපාද්ධ්‍යායයන් වහන්සේ බලවත් සේක. ළඟ සිට කියා පී බසක් පියවි කනින් අසා දැන ගන්නා සේ මා සිතාපු සිත බඩු සහිත කොට සොරකු අල්වා ගත් කලක් මෙන් දැන ගත් සේකැ'යි සමාධි ව මෙ බඳු තෙනට මෙ සේ සිතූ යේ වරද ය. ක්‍ෂමා කරවා ගනිමි යි සිතා 'ස්වාමීනි, මෙ බන්දක් මෙ වක් පටන් නො සිතමි. වැරද ගිය දෙයට ක්‍ෂමා කොට වදාළ මැනැවැ'යි කී සේක.

ඒ අසා රොහණ මහ තෙරුන් වහන්සේ 'හෙම්බා, අපි තෙල විතරකින් - ක්‍ෂමා කළ මැනැවැ යි කී බස් පමණකින් - ක්‍ෂමා නො කරම්හ. ක්‍ෂමා නො කරන්නේ සෙස්සකට නො වෙ යි එක්තරා කට යුත්තක් නිසා ය. කලින් තෙපලින් කළ කී වරදක් නො වන බැවින් සිතා පු සිතිවිලි පමණක් හෙයින් සෙස්සකින් ප්‍රයොජන නැත. වැඩි වරදක් වුව ත් වරද පිළිගෙන සිටියව. තොප සිත තෙලේ ගැවුනා සේ ම අප සිත ත් ගැවෙන දෙයක් ඇත. කවරේ ද යත හොත්? දඹ දිව සාගල නම් නුවරෙක් ඇත. ඊ මිළිඳු නම් යොන් රජ්ජුරු කෙණෙක් රජ කෙරෙති. උෘ තමන් තර්කවාදී හෙයින් ප්‍රශ්න විචාරා වහන්දෑට බොහෝ පීඩා කෙරෙති. තෙපි ඉදින් ඔබ ගොසින් ඒ රජ්ජුරුවන් හා වාද කොට උන් ගේ වාද නමැති මහ ගල් තොපගේ වාද නමැති ය කුළින් බිඳ පියා කිසි වකට ත් නො ගත හැකි කොට උන් බුදු සස්නෙහි පහදවා ගතු නම්-තව ද සක් විති රජ්ජුරුවන් ගේ කුශලානුභාවයෙන් විසිර තුබූ රුවන් එක්වන්නා සේ තොප ගේ ඥනානුභාවයෙන් දුරු ව පලා ගිය වහන්දෑ ත් එක් තැන් වූ සේක් නම්–එ කල්හි ක්‍ෂමා කරණෙමි යි වදාළ සේක.

ඔබ ඒ අසා නුවණට බෑවුම ත් කරණ සේක් 'ස්වාමීනි, එක මිළිඳු රජ්ජුරු කෙණෙකුන් නො කැමැත්තෙමි. සියලු දඹ

1. විදම්. 2. අළුව.

Non-Commercial Distribution

දිව රජ්ජුරුවෝ අවුත් මා අතින් ප්‍රශ්න විචාළ නමුත් හමදනා මළු බොහෝව යි නාළුවා සේ ම ප්‍රශ්න බොහෝ ය යි නො හරිමි. රන් කතුරකින් පියුම් පෙති සමූහයක් කපා වගුරුවා ලන කලක් පරිද්දෙන් විසඳා ලමි. ක්‍ෂමා කිරීම ඊ ගැසී තුබූ දෙයක් නො වන බැවින් ක්‍ෂමා කරන්නෝ යහපතැ'යි වදාළ සේක. එ සේ වදාළ ත් කෙණෙක් අනභිප්‍රාය දෙය ලදත ත් අභිප්‍රාය දෙය නො ලත් කලට නො යැපෙන්නා සේ 'එ සේ ක්‍ෂමා නො කරම්හ'යි රොහණ මහ තෙරුන් වහන්සේ වදාළ සේක. එ සේ කලට ක්‍ෂමා කරවා ගන්නා තෙක් ළඟ විසීම ත් නො පිළිවන් වුව. වස් පිරෙන්ට නොවීම නිස පිළිබඳ හෙයින් නිස නොගෙන විසීම ත් යුක්ත නොවත්. මේ වස් තුන් මස කවුරුන් වහන්සේ ළඟ වසමෝ දෝ යි නිහතමාන බැවින් හා ශික්‍ෂාකාමී බැවින් විචාළ සේක.

ඒ අසා රොහණ මහ තෙරුන් වහන්සේ ''හෙම්බා, එ සේ වී නම් අස්සගුත්ත මහ තෙරුන් වහන්සේ වත්තනිය නම් සෙනස්නෙහි වසන සේක. තෙපි ඔබ කරා ගොසින් අප ගේ වැඳීමෙනු ත් වඳුව. එ විතරකිනුත් තබා නො පියා තෙපි ත් වැඳ ගනුව. සුව දුක් විචාළ නියා ත් සැළකරව. ආයේ ඇයි දෝ යි විචාළොත් මේ වස් තුන් මස ඔබ ළඟ වසන්ට එවූ සේකැ යි කියා ලව. 'තොප ගේ උපාද්ධ්‍යායයෝ කි නම්හු දෝ'යි විචාළ සේක් වී නම් 'රොහණ මහ තෙරුන් වහන්සේ ය'යි කියා ලව. තොප ආචාර ශික්‍ෂාවෙහි හික්මුණු නියාව විමසන්ට 'මම කි නම් දෝ'යි විචාළ සේක් වී නම් ඔබ ළඟ සිට ඔබ ගේ නම කියා ව්‍යවහාර කිරීම ගරුතර නොවන හෙයින් නුඹ වහන්සේ මෙ නම් සේකැ යි නො කියා 'ඔබ ගේ නම දන්නා සේක් අප ගේ උපාද්-ධ්‍යායයන් වහන්සේ ය'යි කියව'යි පටිපජ්ජන ක්‍රම ය වදාළ සේක. ඒ නියෝග ලත් ඔබ ද රොහණ මහ තෙරුන් වහන්සේ වැඳ සමු ගෙන පා සිවුරු හැර ගෙන වත්තනිය නම් වෙහෙරට ගොසින් අස්සගුත්ත මහ තෙරුන් වහන්සේ වැඳ ගෙන එකත් පස් ව සිටි සේක. එ සේ සිට උපාද්ධ්‍යායයන් වහන්සේ වැඳ එවූ නියාව ත් සුව දුක් විචාරා එවූ නියාව ත් කී සේක. ඔබ ත් ඒ අසා රොහණ මහ තෙරුන් වහන්සේ ගේ සුව දුක් විචාරා කුමක් නිසා මුඹ එවු දෝ'යි විචාළ සේක.

'නුඹ වහන්සේ ළඟ වස් වසන්නට ය'යි කී කල්හි 'යහපත වසව'යි නොවදරා 'තෙපි කිනම් දෝ'යි නම විචාළ සේක.'නාගසෙන නම්' කී කල්හි, උපාද්ධ්‍යායයන් වහන්සේගේ නමුත් විචාළ මනා බැවින් තොප ගේ උපාද්ධ්‍යායයෝ කී නම්හු දෝ'යි විචාළ සේක.

Non-Commercial Distribution

උන් වහන්සේ සම්මුඛ නොවන හෙයින් රොහණ මහ තෙරුන් වහන්සේ ය යි කී සේක. ඉදින් වරදවා අවු නමුත් 'අපි කි නම්මෝද්ද'යි තමන් වහන්සේ ගේ නම විචාළ සේක. ගුරුන් වහන්සේ ගේ නම සම්මුඛයෙහි සිට කීම අවිචාර නොවන හෙයින් ඔබ ගේ නම අප කියන්නේ කිම් ද? අපගේ උපාද්ධ්‍යායයන් වහන්සේ ම දන්නා සේකැ'යි කී සේක. යහපත, තොප ත් තොප ගේ උපාද්ධ්‍යායයනු ත් බැහැර නො වන හෙයින් පා සිවුරු හැර ගෙන තබා ලන්ට නිසි කෙණෙකුන් ළඟ නැති හෙයින් තෙපි ම තැන්පත් කොට තබව'යි වදළ සේක. උන් වහන්සේ ත් පා සිවුරු තැන්පත් කොට තබා ලා රැ සැතැපී ගෙන දෙ වන දවස් උදසන ම ගෙය ත් මළුව ත් හැම ද පියා දූවටී පැන් ගෙනවුත් තබා ලූ සේක. අස්සගුත්ත මහ තෙරුන් වහන්සේ ද ඔබ ගේ සුශික්ෂිත තරම පරීක්‍ෂා කරණ නිසා කසුප් බුදුන් දවස ත් හැමද පුරුදු තැන ගේ හැමදීම් නපුරු නොවත ත් හැමදි තැන් පෙරළා හැමඳ ගෙනවුත් තබා ලූ දූවට පැන් හැර පියා අනික් ම දූවටි පැනක් හැර ගෙන දූවටි වැළඳූ සේක. එ වක මුසුන් දණ්ඩෙන් පහර කා බැන නො නැඟි තැනැත්තන් හින්ද දී තමන් වහන්සේ ත් හැමදි මළුව පෙරළා හැමැන්දට ත් ගෙනා දූවටි පැන් නොවැළඳුවාට ත් බැණ නො නැඟි සේක.

මෙ ලෙසින් සතියක් විතර හික්මුණු තරම විමසා පියා අවවා-දක්‍ෂම නියාව දන සත් වන දවස් නැවත ත් ආද්‍යන්ත විචාරා ප්‍රාර්ථනා නො වැරැද්ද සේ එ ලෙසින් ම නො වරදවා කී කල්හි ''යහපත, එ සේ වී නම් වසව''යි වස් වසන්ට අවසර දුන් සේක. එ කල වැළි ත් එක් වැඩි මාලු උපාසිකා කෙණෙක් අස්සගුත්ත මහ තෙරුන් වහන්සේට තිස් අවුරුද්දක් විතර උපස්ථාන කොළෝය. ඒ වස් තුන් මස ත් උපස්ථාන කොට ලා වස් අන්ත-යෙහි මහ තෙරුන් වහන්සේ ගේ විහාරයට ගොසින් 'ස්වාමීනි, නුඹ වහන්සේ ළඟ තවත් වහන්දෑ ඇති සේක් දැ'යි විචාළෝ ය. 'අමුතු ව ආ නාගසේන නම් නමෙක් ඇතැ'යි වදළ සේක. 'එ සේ වී නම් දෙ දෙනා වහන්සේ ම සෙට අප ගේ ගෙයි දී වළඳනා බව ය'යි ආරාධනා කළෝය. මහ තෙරුන් වහන්සේ ද ඒ ආරා-ධනාව ඉවසා දෙවන දවස් නාගසේන තෙරුන් වහන්සේ ත් කැදවා ගෙන මැලි උපාසිකා වන්දෑ ගේ ගෙට ගොසින් වළඳන්ට වැඩ හුන් සේක. උපාසිකාවෝ ද දෙ දෙනා වහන්සේ සිය අතින් වැළඳ වූ ය. මහ තෙරුන් වහන්සේ වළඳා අන්තයෙහි උපාසිකාවන්ට බණ කියන්ට නාගසේන තෙරුන් වහන්සේට විධාන කොට ලා විහාරයට වැඩි සේක. උපාසිකාවෝ ද බණට ආරාධනා කරන්නෝ 'මම වැළි ත් වැඩි මාල්ලෙමි. කුඩා කුඩා බණින්

Non-Commercial Distribution

කම නැත. මහා බණක් වදරන්ට වුව මැනවැ'යි කිවූ ය. උන් වහන්සේ ත් මහත් බණක් සලකන සේක් අර්ථ වශයෙන් මහත් වූ ආත්මශූන්‍යතායෙන් යුත් විජම බණ කී සේක. ඒ බණ අසා මැලි උපාසිකාවෝ එ වකට වයස් ලෙසින් තමන් මැහැලි වුව ත් කෙ තෙක් කලිනු ත් මැලි නො වන සෝවාන් වූහ.

උන් වහන්සේ ත් එක් කෙණෙකුන්ට බතක් ලා ලා 'මෙ-තෙක් බත් මුන්ට ම හැයිද? මම ත් කමි' අත පොවා හැර ගෙන කන්නා සේ තමන් වහන්සේ වදාළ ධර්මය ම සලකන සේක් විවසුන් වඩා සෝවාන් ව ශාසනසට මුල් බැස ගත් සේක. වෙහෙර වැඩ හූන් අස්සගුත්ත මහ තෙරුන් වහන්සේ දෙ දෙනා ම සෝවාන් වූ නියාව දැන වදරා තුන් විටක් සාධු කාර දී බන්ධුල මල්ලයන් විදි එක හීයෙන් ලිච්ඡවි රජුන් පන් සියය විත් කැවා සේ එක කියාලු බණින් දෙ පක්ෂයෙන් කැපි ව අපායගාමිනී වූ බොහෝ කෙළෙ-සුන් නසා පිව යි ගුණ වදාළ සේක. බොහෝ දෙවියෝ ත් සාධු-කාර දුන් හ. නාගසෙන තෙරුන් වහන්සේ ද වෙහෙරට වැඩ මහ තෙරුන් වහන්සේ වැඳ ලා එකත්පස් ව වැඩ හුන් සේක. එ සේ වැඩ හුන් කල්හි අස්සගුත්ත මහ තෙරුන් වහන්සේ 'හෙම්බා ඇවැත්නි, පැළලුප් නුවර අශොකාරාමයෙහි ධර්මරක්ෂිත මහ තෙරුන් වහන්සේ වසන සේක. ශාසන ප්‍රතිපත්තියට මුල් පර්‍ය්‍යාප්තිය ය. පර්‍ය්‍යාප්තිය නැත් නම් ප්‍රතිපත්තිය නැති ප්‍රති-පත්ති නැති කලට ප්‍රතිවෙධය නැති. ප්‍රතිවෙධය නැති කලට අද්ධ්‍යාශය සම්පන්නයන් නැති හෙයින් ශාසනය ත් නො පවත්තී. තොප තරම් බුද්ධිසම්පන්නයන් පර්‍ය්‍යාප්තිය පවත්වා නො ලත-හොත් එන දවස පවත්වාලන්නෝ කවුරු ද? තෙපි ඔබ ගොසින් තෙවලා බුදු වදන් උගනුව'යි වදාළ සේක.

ඒ අසා 'මෙ තෙනට කෙ තෙක් තැන්ද'යි විචාළ සේක. යොදුන් ගණිනින් වී නම් තුන් සියයක් යොදුන. ගවු ගණිනින් වී නම් එක් දහස් දෙ සිය ගවුවක් තිබෙ'යි වදාළ කල්හි 'සවාමීනි, ඉතා දුරු වත් තිබෙ'යි. නුපුරුදු හෙයින් අතුරු මග සිහමනු ත් බැරි ය. ගමන කෙ සේ ද'යි විචාළ සේක. තෙපි ඒ හැම නො සිතව, අතුරු මහදී අති පවිත්‍ර වූ හැල් සාලේ බත් ම ලබව. එක ද යන ගමනෙක් නොව සැතපි සැතපී යන ගමන් හෙයින් ගම-නේත් ආයාස නො සිතව,යි වදාළ සේක. ඒ අසා නාගසේන තෙ රුන් වහන්සේ ද මහතෙරුන් වහන්සේ වැඳ සමු ගෙන පා සිවුරු හැරගෙන පැළලුප් නුවරට යන්ට නික්මුණු සේක.

එ කල පැළලුප් නුවර සිටාණෝ ද ගැල් පන් සියයකින් බඩු ගෙන්වා ගෙන අවුත් වෙළදාම් කොට ගෙන පෙරළා පැළලුප්

නුවර යන්ට එ ම මගට පිළිපන් තැනැත්තෝ නාගසේන තෙරුන් වහන්සේ දැක ගැල් රඳවා ලා ඔබ කරා ගොසින් වැඳ සුව දුක් කථා කොට ලා වඩනේ කොයට දැ යි විචාරා 'පැළලුප් නුවරට යම්හ'යි කී කල්හි දැක ම පුත්‍ර ප්‍රේමය උපන් හෙයින් 'යහපත පුතණුවන් වහන්ස, මම ත් ඔබ ම එමි. මා හා කැටි ව සුව සේ වැඩිය මැන වැ'යි කිවු ය. මෙ ලෙස කිය ලා සිය අතින් සකසා දන් වළඳවා ලා වළඳා අන්තයෙහි එකත් පස්ව හිඳ නුඹ වහන්සේ කි නම් සේක් දැ'යි විචාළෝ ය. 'නාගසේන නම්'යි වදාළ කල්හි 'කල් දෙස් බලා මහණව ගත් පමණෙක් ම ද? දන්නා බණෙකුත් ඇද්දැ'යි විචාළෝ ය. 'හෙම්බා සිටාණෙනි, තව අසා පිරිවරා ගුරු මුඛයකින් දැන ගන්ට නුවූ හෙයින් විනය හා සූත්‍ර නො දනුම්හ. සාමණේර භූමියේ දී ම අසා ගත් හෙයින් විජම් බණ දනුම්හ'යි වදාළ සේක.

සිටාණෝ ඒ අසා 'ඉතා යහපත. මම ත් විජම් බණ දනිමි. දෙමළ දන්නා කෙණෙකුන්ට දෙමළුවෙන් කථා කොට ලිය හෙත කෙණෙකුන් සම්බ වූවා සේ සම්භ වූ නියාව යහපත. දූන් ම නම් එක තරමැ'යි නැති බැවින් වැඩි යුරු ව දන්නා දෙයෙක් උගත හැකි බැවින් විජම් බණ වදාළ යහපතැ'යි කිවූ ය. උන්වහන්සේ ද ඒ අසා විජම් බණ දනුම්හ'යි කී හෙයිනුත් තමන් වහන්සේ ගේ ශක්තිය හඟවත් මේ වරෙහි අඩු වැඩි දන්නා කෙණෙකුන්ට කියන මේ වරක් මෙන් භාවාර්ථයත් නො හැර විජම් බණ වදාළ සේක. සිටාණෝ ද බණ අසා ලොවී සැපත් පිටට ලොවුතුරා සැපත් ලබන්නෝ සෝවාන් වූ හ. සෝවාන් ව ලා පැළලුප් නුවර ආසන්නයේ දෙ මං සන්ධියෙහි දී ගැල් පෙරාතු කොට ලා තුමූ පසුව ලා ගෙන නාගසේන තෙරුන් වහන්සේට 'තෙලෙ අශොකාරාමයට ගිය මහ ය. ඔබ වඩී නා බව ය. පෙර හැඳින්මක් පුරුදු කමක් නැති ව දුටු ගමනේ නුඹ වහන්සේ දූන් ලොවුතුරා සැපතට තරම් සංග්‍රහයක් කට නො හෙතෙ ත් මා අත මා හැඟි පලසෙක් ඇත. ඒ පලස දිගින් සොළොස් රියන. පළලින් අට රියන. පුතණුවන් වහන්ස, ඒ පිළිගත මැනැවැ'යි කියා පිළිගැන් වූ හ. පිළිගන්වා ලා වැඳ පැදකුණු කොට ලා පැළලුප් නුවරට ගියෝ ය.

උන් වහන්සේ ද අශෝකාරාමයට වැඩ ධර්මරක්ෂිත මහ තෙරුන් වහන්සේ වැඳ ලා තමන් වහන්සේ අසා පිරිවාගන්නා කැමති ව වැඩි නියාව කී සේක. කියා ලා ඔබ ළඟ තෙ වළා බුදු වදන් තුන් මසකින් විතර එකවිට කීඃවා ගත් පමණෙකින් පෙරළානො කියවා පාළි උගත් සේක. අනිත් තුන් මසකින් උගත් පාළි යෙහි අර්ථ සමන්වා ගත් සේක. තෙවළා බුදු වදන් මෙ ලෙසින් අසා නිමවා ගත් කල්හි නිශ්ශරණ පර්‍යාප්ති ප්‍රතිවෙධ කොට බණ උගත් හෙයින්

Non-Commercial Distribution

උපදෙස් පමණෙකින් ප්‍රතිපත්ති ප්‍රතිවේධ දෙකක් කොට ගනිති සිතා ධර්මරක්ෂිත මහ තෙරුන් වහන්සේ 'හෙම්බා ඇවැත්නි, යම් සේ ගොපල්ලන් ගෙරි සරක් බලත ත් දී කිරින් ප්‍රයෝජනය අනික් කෙණෙකුන්ට ම වේද? සරක් ඇත්තවුන්ට ම හෙයින. එ සේ තොප ත් තෙවළා බුදු වදන් රන් වළදෙක වත් කළ සිංහ තෙලක් මෙන් ධරණ පමණක් මුත් තොප ත් මේ ධර්මයට හිමි නො ව ගොපල්ලන් රක්නා ගෙරි පරිද්දෙන් රක්නා පමණෙක. මේ ධර්මය අනික් කෙණෙකුන් ම සන්තක ය'යි වදළ සේක. ඔබ ද එ පමණක් අසා වදළ බසෙහි තත්ත්වය දැන ගෙන 'තෙලෙ විතරෙක් ම ඇත. ඔබ්බක් ම නො කැමැත්තේ ය'යි කියා ලා හැම දීමේ තර ව අභ්‍යාස ඇති. කෙණෙකුන් මහා මළුවකු ත් මහකු ත් සෙස්සන් හමදින්ට සරහන කලට ම වහා හැම ද පියන්නා සේ එක දවසින් ම විවසුන් නමැති හිරටමුස්තෙන් කෙලෙස් කසළ හැමද සිත් සතන් නැමැති මළු මං පෙත් පවිත්‍ර කළ සේක. සිවු පිළිසිඹියා පත් රහත් වූ සේක.

රහත් වන්නා ම කෙලෙස් සතුරන් හා යුද්ධ කොට නිවන් රට සුහකුත් නො හැර සාධා ගත් නියාවට දෙවියෝ ආ වැඩූහ. ජයසක් පිඹී කලක් මෙන් පොළොව ගුගුරා පී ය. ජයලත් රජක් හු සම්මැට යත[1] යොධයන් පටාළ ඇළයේ එළුවාක් මෙන් මහ බඹුහු අත් පොළසන් දුන්හ. ජය ලත් සතුටින් පඬුරු ගෙනවුත් දමා ඉස්නා කලක් මෙන් මල් වැසි වැස පී ය. එ කල කෙළ සියයක් පමණ රහතන් වහන්සේ හිමවත රක් ගල් තලාවේ වැඩ හුන් සේක් නාගසෙන තෙරුන් වහන්සේ ළඟට 'තමන් දක්නා කැමැත්තම්හ. අව මැනමැ'යි කියා යවූ සේක. ඒ අසා අශොකාරාමයෙහි දී අතුරුදන් ව රක් ගල් තෙලෙහි කෙළ සියයක් පමණ රහතන් මැද පෙණුනු සේක. රක් ගල්තෙලෙහි රැස් ව වැඩ හුන් රහතන් වහන්සේ ද එ තනට වැඩී නාගසෙන මහ තෙරුන් වහන්සේට 'හෙම්බා ඇවැත්නි, මිළිඳු රජ්ජුරුවන් තර්ක වාද කොට වහන්දැට කරණ පීඩා මහත. තිස් දහසක් රහතන් කරා උපස්ථානයට ගිය නයාණ කෙණකුන් ගසාගන්ට අහසින් බස්නා ගුරුළකු දැක ඒ ඇසිල්ලෙහි පර්වතයක් මවා ලා නාග මාණවකයා අත අල්වා ගෙන පර්ව ය පිරා ගෙන නයි රැක පූ සේක් එක් නමෙක. එ සේ හෙයින් පැන් එක පැන් වුව ත් රසයේ සේ රහත් ගුණෙන් එක ගුණ වුව ත් වෙනස ඇත්තා ආනුභාවයෙන් වෙනස් ඇති හෙයින් කියන නියා ය. තමන් ඔබ ගොසින් උන් හා වාද කොට උන්ගේ වාද බිඳ එඩි දර්ප රහිත කළ මැනැවැ'යි වදළ සේක.

---

1. සම්මැටයන්

Non-Commercial Distribution

ඒ අසා නාගසේන මහ තෙරුන් වහන්සේ 'එක මිලිඳු රජ්ජුරු කෙණකුන් තබා දඹ දිව සියලු රජ දරුවෝ මා කරා අවුත් ප්‍රශ්න විචාරත් නමුත් පසු නොබැස විසඳමි. ඒ මට භාර ය. හැම දෙනා වහන්සේම වාද කට හෙත්දෝ හෝයි නො හෙත් දෝ හෝයි නො සිතා උන් ගේ සාගල නුවරට වැඩිය මැනව'යි කී සේක. ඒ අසා රහතන් වහන්සේ සාගල නුවරට වැඩි සේක. එ කල ආයුපාල නම් තෙරුන් වහන්සේ සඞ්ඛෙය්‍ය නම් පිරිවෙණ වසන සේක. මිලිඳු රජ්ජුරුවෝ එක් දවසක් ඇමැත්තන් බණවා ලා 'අඳුරු දෙස් නැති වීමෙන් මේ රාත්‍රිය ඉතා සිත්කලු ය. මේ නියා වූ රාත්‍රියෙහි කවර කෙණකුන් කරා ගොසින් වාද කරමෝ ද? කවර කෙණෙක් අප හා වාද කට හෙත් දෑ'යි විචාළෝ ය. විචාළ රජ්ජුරුවන්ට යොන් ඇමැත්තෝ 'ආයුපාල නම් තෙර කෙණකුන් වහන්සේ සඞ්ඛෙය්‍ය නම් පිරිවෙණ වසන සේක. ඔබ ත්‍රි පිටකධර සේක. එ සේ හෙයින් බහුශ්‍රැත කමත් ඇත. ඔබ ගොසින් උන් වහන්සේ හා කථා කළ මැනැව'යි කිවු ය.

රජ්ජුරුවෝ ද ඇමැත්තන් ගේ බසින් ඔබ දක්නා කැමැති නියාව ඔබට කියා යවා ලා ඔබ ත් 'යහපත. එන්ට ය'යි වදාළ කල්හි රජ්ජුරුවෝ රථයකට නැඟී ඇමැත්තන් පිරිවරා සඞ්ඛෙය්‍ය පිරිවෙණට ගොසින් ඔබ හා සමග කථා කොට ලා එකත් පස් ව හිඳ 'ස්වාමීනි, මහණ වන්නේ කුමක් නිසා ද? මහණ වීමෙන් ලැබ ගන්නා ප්‍රයෝජනය කවරේ දෑ'යි විචාළෝ ය. 'මහරජ, මහණ වන්නේ නම් ධර්මයෙහි හැසිරෙන්ට ය'යි වදාළ සේක.

ඒ අසා රජ්ජුරුවෝ 'ස්වාමීනි, ධර්මයෙහි හැසිරෙන ගිහි ත් ඇද්දෑ'යි විචාළෝ ය. 'ඇත මහ රජ, බුදුන් බරණැස දී දම්සක් පැවතුන් සූත්‍රය දෙසූ දවස් අට ළොස් කෙළක් බඹහු අධිගමය කොළෝ ය. ශාසනික තැනින් කොණ්ඩඤ්ඤ මහ තෙරුන් වහන්සේ පමණෙක. නැවත මහරජ, දික් සඟිය–මහාසමය සූත්‍රය දෙසූ දවස් ද, කුදු ගොත් සඟිය, මහා මඞ්ගල සූත්‍රය දෙසූ දවස් ද, මැඳුම් සඟිය, සමචිත්තපරියාය සූත්‍රය දෙසූ දවස් ද, එම මැඳුම් සඟිය, රාහුලොවාද සූත්‍රය දෙසූ දවස් ද, කුදුගොත් සඟි පරාභව සූත්‍රය දෙසූ දවස් ද අසඞ්ඛ්‍ය අසඞ්ඛ්‍ය ම නිවන් දුටු වූ ය. ඌ හැම දෙන ම ගිහි වෙද්දෑ' වදාළ සේක.

ඒ අසා රජ්ජුරුවෝ 'ස්වාමීනි, එසේ වී නම් මහණ වීමෙන් ප්‍රයෝජන නැත. බෙහෙත් නොකා ම සන් හිඳෙන ලෙඩට බෙහෙත් කා දුග්ගන්නා සේ හිණි දඬු නැති ව නැංග හැකි තෙනට හිණි බැඳ දුග්ගන්නා සේ නො මිළයේ ලද හැකි බඩුවට මිළ

සොයා දුග්ගන්නා සේ මහණ නොවත් ලද හැකි නිවන් නිසා මහණ ව විදිනා දුක් නම් යට කළ පවිත. දූවහ පිරීම් නමුත් ප්‍රයෝජනවත් නො වෙ යි. යම් තෙනක් එකාසනිකය පුරත සේක් නම් යට ගිය දවස අනුන් කන බොත් දෙය උදුරා ගත් නියා ය. අනික් කෙණෙක් නො වෙති. දූන් එ සේ හෙයින් කන්නට බොන් නට රිසි ඇති වත් දෙ වේලේ සම ව බත් පැන් නො ලබති. එ සේ හෙයින් ධුතාඞ්ග පූරණයෙන් පෙණෙන අකුශල විපාකයෙක් මුත් කුශල විපාකයෙක් නැත. යම් තැනක් අබ්භොකාසිකය පුරතොත් ඒ තැන් යට ගිය දවස අනුන් ගේ ගෙවල් උදුරා ගත් නියා ය. ඒ පව් කමින් ආදී තෙරනා ලද්දවුන් රුප්පාවල හිදිනා සේ දූන් රුප්පාවල හිදිනා නියා ය. නෙසජ්ජිකය පිරීම නම් ගිය දවස මං පැහැරි නියා ය. මං පහරිනා කල මහ යන්න වුන් බැඳ හිඳුවා ලා අත මිට කුබු දෙය උදුරා ගත් හෙයින් දූන් හැඳ ඇති වත් උන්වන ම හිඳ පාන් කරණ නියා ය. එ සේ හෙයින් ශාසනික ව පූරණ පිළිවෙතින් ප්‍රයෝජන නැත. නිවන් නිසා මුත් අනිකක් නිසා වන හෙයින් ඒ නිවන් ඒ හැම නොකළ ගිහින් ව ත් සිද්ධ වන හෙයින් සියලු ලෙසින් ම දූවහ පිළිවෙතින් කිසිත් ප්‍රයෝජන නැතැ'යි කම් පල හැදහිල්ලක් නැති ව දමු කසළ සේ ම බුදු සස්නෙහි හැදහිල්ලක් නැති ව බුදු සස්නට පහර දෙන්නාක් හු මෙන් වාද ලෙසින් උපවාද කොට කිවු ය.

ඒ හැම අසා ආයුපාල මහ තෙරුන් වහන්සේ දූවහ පිරීම් නම් කෙලෙසුන් පෙළීම නිසා ය යි මෙ විතරකුත් වදුරා ගත නොහී තමන් වහන්සේ නිරුත්තරයා සේ නිරුත්තර ව වැඩ හුන් සේක. ඇමැත්තෝ මෙ පමණකින් මුන් වහන්සේ උත්තරයක් නො කීවාට ශාසන බලය නො නැසුව මනා වේ දෑ යි යන අදහසින් දෝ රජ්ජුරුවන් වහන්ස, තෙරුන් වහන්සේ නුවණැති සේක. උත්තර දත ත් කියන්ට ශක්ති නැති සේක. සීන දුටුවන් දුටු සීනය ගොළු කල කියා ලන්ට බැරියා සේ දන්ම ඇත ත් වාක් ශක්තිය නැති නියා ය. එ සේ හෙයින් උත්තර දත ත් කියා ගත නුහුණු සේකැ'යි කිවු ය. ඒ අසා මිළිඳු රජ්ජුරුවෝ මුන් කුමක් කියත ත් මදකු ත් බැණ නො නැංග මනා ද[2] අනේ මෙ දඹ දිව පැන් නැති ගඟක් සේ රජුන් නැති රටක් සේ නුවණැත්තවුන් ගෙන් සිස් නියා ය'යි කිවු ය. රජ්ජුරුවන් මෙ සේ කියතත් එ බස් නො ගිවිස හුන් ඇමැත්තන් මුහුණ බලා මුන් මෙ ලෙසින් හිඳිනේ පොර ගෙන කෙළවරට බලී කෙණෙකුන් තබන්නා සේ තවත් නුවණැති

---

1 වාත්තාය 2 නො නැඟ මනා

Non-Commercial Distribution

කෙණෙකුන් ඇති නියා ය යි සිතා 'මා හා තර්ක වාදයට නිසි තෙනක්[1] කියා පැනුලු පමණක් විනා තවත් ඇති නියා ද' යි විචාළෝ ය.

එ කල්හි නාගසෙන මහ තෙරුන් වහන්සේ වැඩි මහලු තෙනින් සතළිස් දහසක් හා බාල තෙනින් සතළිස් දහසක් හා එක් කොට අසූ දහසක් පමණ වහන්දෑ පිරිවරා විසිතුරු නුවණ ඇති ව චිත්‍ර කථික ව[2] මුහුදක් මතින් අළලාලිය නොහැක්කා සේ වාද නමැති මතින් අළලාලිය නො හැකි නුවණ නමැති මුහුදු ඇති ව පියවි පවනින් සොලවා ලිය නොහැකි මහ මෙරක් සේ වාද නමැති පවනින් සොලවා ලිය නොහැකි නුවණ නමැති මහ මෙර ඇති ව රුවණින් පිරුණු සක් වළක් සේ ගුණෙන් නුවණින් පිරුණු සිත් සතන් ඇති ව ලාභයෙන් යසසින් අග පැමිණ අපාය මහ හකුල් හෙළා සග මොක් මං පාමින් මොහ නමැති අඳුරු ගෙවල සදහම් නමැති පාන් නහමින් කෙලෙස් සතුරන් දිනූ හෙයින් සදහම් නමැති ධජ නංවා සිවු වනක් පිරිස් රැස් වන්ට සදහම් නමැති සක පිඹිමින් විධානයෙහි පවත්වන්ට සදහම් නමැති අණ බෙර ලවමින් මියුරු වූ කට හඬ නමැති මෙඝ නාද ඇති සියුම් නුවණ නමැති විදුලියෙන් වෙළනා ලද කරුණා නමැති දියෙන් පිරුණු සදහම් නමැති වැසි වස්වමින් ගම් නියම් ගම් රාජධානිවල සැරි සරණ සේක් සාගල නුවරට වැඩ සඞ්ඛෙය්‍ය පිරිවෙණ වසන සේක. ඔබ එහි වසන නියාව දෙවමන්තිය[3] නම් ඇමැති දැන ''රජ්ජුරුවන් වහන්ස, මදක් ඉවසාපුව මැනව. ත්‍රි මද ගලිත හස්තීන්ට එ ඔබ්බු ඇත් කෙණකුන් ම සම්භවූවා සේ ම වාද නමැති දළෙහි ප්‍රතිවාද නමැති දළ ඇණ ගන්ට ආ ලෙසක් සේ මහ පොළොව හා සමාන මහ නුවණැති නාගසෙන නම් තෙරුන් වහන්සේ භික්ෂු සෙනාව පිරිවරා මේ නුවරට වැඩි සේක. ඔබ කරා ගොසින් තර්ක වාද කොට හඳුපුව මැනවැ'යි කීය.

නාගසෙන යන නම අසා ම මිහිඳු රජ්ජුරුවන්ට බලවත් භය ඇති විය. එතකුදු වුව ත් රාජ ධෛර්‍ය්‍යයෙන් භය ඇති ලෙස නොහඟවා ''උන් වහන්සේ මා හා කථා කොට හෙන සේක්ද''යි නැවත් දෙවමන්තිය නම් ඇමැත්තාණන් අතින් විචාළෝ ය. උහු ඒ අසා 'මුඹ වහන්සේ තබා ශක්‍ර බ්‍රහ්ම මහෙශ්වරාදී වූ කවර තරම් කෙණකුන් හාත් කථා කොට හිරු නැඟි කලට කදෝපැණියන් මෙන් වාද කළවුන් නිෂ්ප්‍රභාකරන්ට බල ඇති සේක. විදුරු පළා පියන දෙය දවසේ ගල නවතී ද? මහ මෙර සොලවා පියන තරම් සුළඟ හිමුල් පුළුනේ නවතී ද? නමින් කුඩා පමණක් මුත් නුවණින්

1 කෙනෙක් 2 චිත්‍රකථිව 3 දෙවමන්ත්‍රී

Non-Commercial Distribution

බලාලූ කලට මහ මෙරට ත් වඩා උස් හෙයින් මුඹ වහන්සේ හා කථා කරන්ට උන්වහන්සේට බැරි කිම් දැ'යි කිවු ය. ඒ අසා පී පමණ කින් ම පසු බැස්ම බැවී හුන් නියාවට තරම් නො වන හෙයින් 'එ සේ වී නම් මා දක්නා කැමැති නියාව ඔබ කියා යව'යි කිවු ය. රාජ නියොග ලත් දෙවමන්තිය නම් ඇමැත්තාණෝ කියා යවු ය. නාගසෙන මහ තෙරුන් වහන්සේ ත් 'යහපත එත්ව'යි කියා යැවූ සේක. ඒ අසමින් මිළිඳු රජ්ජුරුවෝ පන් සියයක් පමණ යොන් ඇමැත්තන් පිරිවරා උතුම් රථයකට නැඟී නාගසෙන මහ තෙරුන් වහන්සේ දක්නා නිසා සඞ්ඛෙය්‍ය පිරිවෙණට නික්මුණාහු ය.

ඒ වේලාවට නාගසෙන මහ තෙරුන් වහන්සේ ද අසූ දහසක් වහන්දෑ පිරිවරා විහාරයේ වට මළුවේ වැඩ හුන් සේක. මිළිඳුරජ්ජු-රුවෝ ඔබ ගේ මහණ පිරිස දැක 'දෙවමන්තියෙනි, මේ මහණ පිරිස කවුරුන් වහන්සේ ගේ දැ'යි විචාරා 'නාගසෙන මහ තෙරුන් වහන්සේ ගේ මහණ පිරිස ය'යි කී කල්හි මුසුන් දඬු පහර කෑ දවස් බා ගිය තරමට ත් වඩා එ දවස් සිංහයකුට ළං වූ ඇතක්හු මෙන් ද, ගුරුළකුට ළං වූ නයකු මෙන් ද, පිඹුරෙකුට ළං වූ සිවලෙකු මෙන් ද, නයෙකුට ළං වූ මඩුවෙකු මෙන් ද, දිවියකුට ළං වූ මුවකු මෙන් ද, බළලකුට ළං වූ මීයකු මෙන් ද, යකදුරන්ට ළං වූ පිසා චයකු මෙන් ද, රාහු අසුරිඳුට ළං වූ සඳ මෙන් ද, මැදිරියකට අසු වූ පක්ෂියකු මෙන් ද, දැළකට අසු වූ කුඩ මස්සකු මෙන් ද, මීය යන්ට ආසන්න ව සිටි දෙව් පුතක්හු මෙන් ද, බා ගොසින් බා ගිය නියාව නො හඟවා 'තෙපි හැම දෙන ම තෙල අසූ දහසක් පමණ වහන්දෑ ගෙන් නාගසෙන මහ තෙරුන් වහන්සේ මට නොකියව. මම ම දැන ගනිමි'යි කියා ලා සතළිස් දහසකට පසු ව ලා සතළිස් දහසකට පෙරාතු ව ලා මැද[1] වැඩහුන් නාගසෙන මහ තෙරුන් වහන්සේ මුසුන් දණ්ඩෙන් පහර කෑ දවස් හැඳින්නා සේ ම හැඳින ගෙන, 'දෙවමන්තියෙනි, සතළිස් දහසක් වහන්දෑට පසු ව සතළිස් දහසක් වහන්දෑට පෙරාතු ව ලා වැඩ හුන් සේක් නාගසෙන මහ තෙරුන් වහන්සේ වේ දැ'යි කිවු ය.

දෙවමන්තියයෝ ද 'දැන වදළ නියාව යහපත ඔබ ම ය'යි කිවු ය. රජ්ජුරුවන්ට ත් අනික් කෙණකුන් නොවිචාරා ම දැන ගත් නියාව යහපතැයි කියන්නා ම සිත සතුටු ව පාන ඇති කලට අඳුරු නැති වූවා සේ භය නැති වී ය. භය නැති ව ගොසින් සිති විල්ලට අවසර ගෙන 'තර්ක වාද කරණ තැන් පටන් මෙ වක දක්වා බොහෝ වාදීන් දැක ත් අද මුන් වහන්සේ හා මුන් වහන්සේ ගේ මහණ පිරිස දැක උපන් භය තරම් භයෙක් නූ වූ විරූ ය. පැරදී

1 මැදි

Non-Commercial Distribution

කල වුව මනා භය පෙරාතු ව වූ හෙයින් මා පැරදී තියා ම ය. සටනට පවා ගිය කල සතුරු පිරිස් නොදක ත් සටන් බෙරහඬ ඇසූ පමණකින් ම බිඳී පලා ගිය ත් බුන් තියා ම ය. ජය වූ කලී කෙවට්ට යන්ට දමා ලූ මැණික මහෞෂධ පණ්ඩිතයන් කරා ගියා සේ මුත් වහන්සේ කරා ම යෙ යි. දිනන සේක් නාගසේන මහතෙරුන් වහන්සේ ය'යි කියා කරණ වාදයට පෙරාතු ව ජය ඔබ ම ලැබබ වූ ය.

එ සේ හෙයින් අනුන් හැමැදි කසළ හුදක් සැඳහැයෙනු ත් නො ව බලාත්කාරයෙන් දමා පී පමණෙකින් මිළිඳු රජ්ජුරුවන්ට සම්භව වූ යස තෙද ත්, මළු හැමැදි පින් කමින් නාගසෙන මහ තෙරුන් වහන්සේට සම්භව වූ නුවණ ත් දැන මෙ පමණකිනු ත් ලසු වත් කුශලයෙන් සිද්ධ කරණ ඉෂ්ට විපාක ය මහත් තියාව සලකා කුසල්හි හැසිරීමෙන් අකුසලින් දුරු ව සිත් සතන් පවිත්‍ර කට යුතු.

# 7. චූල්ලතිස්ස තෙරුන් වහන්සේ ගේ කථාව

තව ද යම් කෙණෙක් කීකරු නො වෙත් නම් කීකරු නො වීමෙහි දෙෂ මිළිඳු රජ්ජුරුවන් එක් ජාතියක දමන්ට කියා ලූ කසළ පසු ව දමත ත්, කළ නොකීකරු කම නිසා එ වක හැමද එක් කළ කසළ මුසුන් දඬු පහරින් දැම්ම වූ නාගසෙන මහ තෙරුන් වහන්සේ දක ගුරුළුන් දක නයින් ගේ ආනුභාව නැති වූවා සේ අනුභාව නැති ව මිළිඳු රජ්ජුරුවන් බා ගිය ගමනින් ම දනෙත ත් අනිකුත් කථාන්තරයකින් ඊ ම දොෂ දක්වනු පිණිස **චූල්ලතිස්ස** තෙරුන් වහන්සේ ගේ වස්තුව දක්වමු.

කෙ සේ ද? යත්:

චූල්ලතිස්ස තෙරුන් වහන්සේ නම් සුද්ධොදන රජ්ජුරුවන් ගේ නැගණි කෙණෙකුන් ගේ පුතණුවන් වහන්සේ ය. ඔබ වැළි ත් ගොයම් කළ මනා වක තබා පියා කල් පසු කොට කරණ ගොයමක් සේ පිළිවෙත් පිරීමට යොග්‍ය වූ බාල අවස්ථාව ගිහි ගෙයි ම රඳා වැඩි මාලු කල මහණ ව රූක්ෂ ප්‍රතිපත්ති නැමැති රළු පරළු දෙය හැර බුදුන්ට උපන් මියුරු ආහාර සුව සේ වළඳා පිළිවෙතින් සීන් වුව ත් මසින් ලෙයින් මහත් ව ඉස ත් බඩ ත් මහත් හෙයින් චූල්ලතිස්ස තෙරුන් වහන්සේ ය යි ප්‍රසිද්ධ ව මට සිලුටු වූ සීන් සිවුරු වැළඳ පියා ආඪ්‍ය තරම් හඟවනු නිසා විහාර මධ්‍යයෙහි බොහෝ තැන් රැස් වන හෙයින් උස් ව තිබෙන හස්නකට නැඟී පියා බොහෝ සේ හිඳිනා සේක. බුදුන් දක්නට යන එන වහන්දෑ බුඪ්ඪ පබ්බජිත තෙරුන් වහන්සේ දක වැඩි මාලු කල මහණ වූ නියාව නො දැන මහ තෙර කෙණෙකුන් වහන්සේ

වනැ'යි සිතා ළඟට ගොසින් කළ මනා වත් පිළිවෙතු ත් විචාරණ සේක. එ සේ විචාළ කලට බසක් කියා ලූවොත් බාල නියාව කියා ලන ව්‍යවහාර ලෙසින් හැහෙති'යි බැණ නො නැහෙන සේක.

එක් බාල නමෙක් කරණ ලෙසින් ම සැක ඇති ව විමසනු නිසා වස් ගණන් විචාරා වස් ගණන් කියන්ට නැත. වැඩි මාලු කල මහණ වූමහ'යි කී කල් හි 'හැයි නො හික්මුණු මාල්ලණුවෙනි, වයසින් වැඩි මාලු වුව ත් පැවිද්දෙන් තමන් බාල නියාව නො-දන්නා නියා ද? වැඩි මාලු වහන්දෑ දුටු කල බිම හස්නෙක හුන ත් නැඟී සිටිනා ආකාර දක්වා අවසර ලදින් හුන මනා තැන සසර බැඳ රඳවන්නට හිඳවා ලූ කණුවක් සේ නැඟී නොසිට හිඳින්-නේ ත් හැයි ද? විචාළ දෙයට බැණ නොනැහෙන්ට යුක්තියකු ත් මේ බුදු සස්නෙහි ඇද්ද? සෙසු වහන්දෑ කරණ ලෙස තමන් ඇසට නො පෙනෙන නියා ද? උසින් මහතින් මහත් බව මුත් කට යුත්තෙන් මහත් නො වන්ට කාරණ කිම් ද'යි සකාරණ කොට බොහෝ දෑ කී සේක. එ කල්හි පුල්ලතිස්ස තෙරුන් වහන්සේ ගුණයක් නිසා සැබෑ ගුණයක් වී නම් උපදනා අභිමාන නැති හෙයින් රජ කුලෙහි උපන් හෙයින් ජාති ය නිසා අභිමානයක් උපදවා තමන් හැම යන්නේ කවුරුන් ළඟට දැ'යි විචාරා බුදුන් ළඟට ය යි කී කල්හි එ සේ කල තමන් හැම මා ගේ තරම් නො-දන්ට කාරණ කිම් ද, මම තමන් හැම දෙනා ගේ බුදුන්ට අවශ්‍ය යෙමි. තමන් හැම ගේ ත් අවශ්‍ය කමෙක් ඇද්ද? තමන් ගේ බුදුන් ගේ පිය රජ්ජුරුවෝ ත් අපගේ මැණියෝ ත් දෙ බින්නෝ ය. අප ගේ තරම් නො දන තමන් හැම අපට දෙඩූ සැටියට බුදුන් ගේ නෑ කම් සැබෑ වී නම් අද කියටි කියවමි'යි බුදුන් කුමක් වදරණ බවත් නොදන ම නියං සමයේ හඬන ආසක් මෙන් ගර්ජන කොට ගෙන හඬමින් වලපමින් බුදුන් කරා ගිය සේක.

හඬන හඬ ත් අවශ්‍ය බන්ධු ව සිටි නන්ද මහ තෙරුන් වහන්-සේ ත් අනුරුද්ධ මහ තෙරුන් වහන්සේ ත් ආනන්ද මහ තෙරුන් වහන්සේ ත් රාහුල මහ තෙරුන් වහන්සේ ත් ඇතුළු තැන් අධිග ම ත් ලැබ ඒ ඒ ලෙසින් ප්‍රසිද්ධ වූවා සේ තමා එ තරමක් එවා ගන්ට නුවූ හෙයින් වී නම් තව ත් යහපත. එ සේ නො ව හැඬීම උන් වහන්සේට ම තරම් වත් මුත් තරම් නැති තැනකට කවර කලෙක ත් තරම් නො වෙ යි බුදුහු හඬන කාරණ දනිත ත් හැයි තිස්ස යෙනි, හඬ වූ නැ'යි විචාළ සේක.

වහන්දෑ ත් 'මූ පෙරාතු ගොසින් ආලෝහළයක් උපදවා පියත් නමුත්'ය යි කැටි ව ම ගොසින් බුදුන් වැඳ ලා හුන් සේක. තිස්ස තෙරුන් වහන්සේ ද? විචාරා වදළ බුදුරජුන් වහන්සේට 'ස්වාමීනි,

Non-Commercial Distribution

මූ හැම දෙන මා ගේ තරම කුමක් වුව ත් සවාමීන් ගේ තරමු ත් නොසලකා මට බිණූ ය'යි කී සේක. 'හැයි තොප හුන්නේ කොයි ද? කොයි හුන්නවුන්ට බිණූ දැ'යි විචාරා 'බොහෝ වහන් දැ රැස්වන ගෙයි හුන්නෙමි'යි කී කල්හි 'තෙපි මුන් එන්නවුන් දුටු දැ'යි විචාළ සේක. එ සේ ය දිටිමි' කී කල්හි 'දැක නැඟී සිට පෙර ගමන් කළා ද, පා සිවුරු ඉල් වූ ද? හිදිනා අසුන් පනවා ලා සේධූ ද? පැන් පවස් විචාළා ද? ඇඟට පත් සැලූ ද? පය තෙල් ගැවූ දැ'යි විචාරා වදරා ඒ හැම ම නැතැ යි කී කල්හි 'හෙම්බා තිස්සයෙනි, මා ගේ ශාසනයට ජාතියෙන් හා ගොත්‍රයෙන් හා වයසින් හා තරමින් හා ප්‍රයෝජන නැත. තෙල සියල්ල ම තොප කළ මනා දෙය ය. නො කෙළේ වැරැද්ද වත් නො පිරූ කලට සිල් කෙසේ පිරේ ද? සිල් නො පිරුණු කලට නිවන් සැධෙන් නේ කෙසේ ද? කළ වැරැද්දට තුලුන් හැම ක්‍ෂමා කරවා ගනුව. සබ්‍රම්සරුන් කෙරෙහි ආදර ගෞරව ත් ඇති ව වත්පිළිවෙත ත් නො පමා ව හැසිරෙව'යි වදාළ සේක.

'සවාමීනි, මුන් හැම මට බැණ ලූ නියාව තරම. මම බිණ-මුත් අසා මම ම ක්‍ෂමා ත් කරවමි දැ'යි බුදුන්ව ත් පටහැණි ව ම සිටි සේක. වහන් දැ 'මූ අපට කීකරු වන්නේ කෙසේ ද? බුදුන්-ව ත් නො කීකරු ව සිටිති. අනේ මුන් ගේ නො කීකරු කමක් බලවත් නියා ය. මුන් තමන් සේ ම නො කීකරු කම ත් මහතැ'යි වදාළ සේක. බුදුහු ඒ අසා වදරා 'හෙම්බා මහණෙනි, මූ නො කී කරු වූ යේ දැන් මතු නො වෙයි. යටගිය දවස ත් නො කීකරු ම ය'යි වදරා ලා එ තතට රැස් වූ වහන් දැ 'දැන් සවාමීනි, මුන් නො කීකරු නියාව මුඹ වහන්සේ අතින් නො අසා ත් අපි ම දතුම්හ. යටගිය දවස මුන් නො කීකරු පරිදි වදාළොත් යහ-පතැ'යි කී කල්හි ඉකුත් වත් ගෙනහැර දක්වන සේක් –

යට ගිය දවස බරණැස් නුවර බඹදත් නම් රජ්ජුරු කෙණෙ-කුන් රජ කරණ කල්හි දෙවළ නම් තවුසාණ කෙණෙක් හිම ත් ගිමන් අට මස හිමවත වැස පියා වස් සාරමස ලුණු-ඇඹුල් මුසු දෙයක් අනුභව කරණු නිසා බරණැස් නුවර වසන පිණිස හිමාල-යෙන් අවුත් නුවර වාසල ළඟ සිටි කුඩා සුහුන් අතින් සැතපෙන්-නට නිසි කෙණෙක් විචාරා කුඹල් හල එාසු ය යි කී කල්හි ඔබ ගොසින් කුඹලාණන් අතින් සැතපෙන්ට අවසර ඉල්වූ ය. රෑ දවස් කරණ කර්මාන්ත නැති බැවිනු ත් කුඹල් හල මහත ඇති බැවි-නුත් සැතපුණ මැනවැ'යි අවසර දුන්හ. අවසර ලදින් ගොස් හුන් කල්හි නාරද නම් වූ අනික් තවුසාණ කෙණෙක් එ දවස් ම හිමාල-යෙන් අවුත් එම කුඹල් හලින් සැතපෙන්ට අවසර ඉල්වූ ය-

Non-Commercial Distribution

කුඹලාණෝ තවුසන් දෙන්නා එක් ව සැතපෙන බව ත් නො සැතපෙන බව ත් නො දන පසු ව විවාදයක් වුව ත් අපවාදයෙන් තමන් මිදෙන පිණිස ආදී ත් තවුසාණ කෙණකුන් ද අවුත් කුඹල් හල උන් සේක. ඔබ ත් රුචි නම් මා ගෙ ත් පින් පිරෙන සෙයින් අමුතු නැත. සැතපුන මැනව'යි කිවු ය.

පසු ව පියා ගිය නාරද තවුසෝ ද කුඹල් හල ඇතුළට වැද දෙවළ තවුසන්ට 'ඉදින් අභිප්‍රාය ඇත් නම් අපි ත් මෙහි සැත පෙම්හ'යි කිවු ය. කුඹල් හල කුඩා නො වත් එක් තෙනක සැතපෙව යි දෙවළ තවුසන් කී කල්හි පසු ව ලා ගිය නාරද තවුසෝ මැත් ව ලා හිඳ සාද සාමීචි කථා ත් කොට පියා වැද හෝනා වේ ලෙහි තමන් සඤ්ඤතකාරි බැවින් පළමු සැතපෙන්ට සැලසුන දෙවළ තවුසන් වැද හොත් තැන ත් දෙර කඩක් සලකා ලා ම නො මැඩ නැඟී යන ලෙසට සැතපුණාහු ය. පළමු ගිය දෙවළ තවුසෝ සැතපෙන ගමනේ තමන් තපසට වන් බව මුත් ඉතා අසඤ්ඤත බැවින් උන් තැනින් අවුත් දෙරකඩ ම වැද හොත්හ.

පසු ව ගිය නාදර තවුසෝ රෑ නැඟී සිට දෙරට යන්නෝ අවුරා වැද හොත් දෙවළ තවුසන් ගේ හිස මැඩපූ ය. 'මා හිස මැඩුවෝ, කවුරු'ද විචාළ කල්හි දෙර මැත් නො වන්ට අවුරාලා ලූ දඬු කඩක් සේ දෙර කඩ අවුරා වැද හොත් නියා ව නො දත් හෙයින් 'ආචාරිනී, මම ය'යි කිවු ය. ඒ අසා දෙවළයෝ කාය සඤ්ඤමය නැත්තා සේ වාක් සඤ්ඤමය ත් නැති බැවින් හැයි සොර දූළුල්ල, වල සිට එන්නෙහි මා ගේ හිස මඩිනට ඇයි ද'යි කිවු ය. 'ආචාරිනී, මා දන කළ දෙයක් නො වෙයි. ක්‍ෂමා කළ මැනවැ'යි කියා ලා උන් දෙඩිය දී ම නාරද තවුසෝ පිටතට ගියෝ ය. දෙවළ තවුසෝ යන ගමනෙන් මිරිකුවා මඳින් උදවූ වනු නිසා එන ගම-නෙ ත් මිරිකා පී නම් නපුරැ යි පා මුලට හිස ලා ලා හිස් දෙරට පය ලා වැද හොත්තෝ ය.

නාරද තවුසෝ පෙරළා ගෙට වදනා ගමනේ 'ආදී මෙ කන්-නෙන් අවුත් හිස මිරිකා පිමි. මෙ විට පා මුලින් යෙමි. එ සේ කලට මැඩී ගියේ නමුත් අතින් වුව ත් මැඩිය යුතු වූ පය මැඩියෙ යි හිස් දෙරින් ගොසින් පෙරළා ත් හිස මැ - ගියේ නම් ක්‍ෂමා කරවන්නට ත් බැරි ලෙසින් කොපය තර වෙයි. පා මුලින් යෙමි'යි සිතා යන්නෝ තමන් ද නො වරදනා බව මුත් අර මුත් කොට වරද්දන හෙයින් වර පෙරැළි ව වැද හොත්තා වන්නා බැණ නැඟ නො දෙන්ට කළාක් මෙන් බොටුව මැඩ පියා කවුරුද යි විචාළ කල්හි 'ආචාරිනී, මම ය'යි කිවු ය. 'හැයි සොර දූළුල්ල, පළමු දෙරට නික්මෙන ගමනේ ත්, හිස මිරිකා

Non-Commercial Distribution

ගෙන ගොසින් පෙරළා එන ගමනේ ත් නිමවන්ට කරන්නාක් මෙන් බොටුව මිරිකා ගෙන යෙ යි. සැතපෙන්ට අවසර දුන්නේ වරද වී නම් ඒ හැර මා ගේ අනික් වරද කවරේ ද? තෙල ලෙස ම දුෂ්ට කම් කරණ කල තට හැවිල්ලක් හවමි'යි දෙවළ තවුසෝ කිවූ ය.

ඒ අසා නාරද තවුසෝ 'ආචාරීනි, මා ගේ වරදෙක් නැත. මෙ සේ වර පෙරළි ව වැද හෝනා නියාව නො දන පා මුලින් යන ගමන ක්‍ෂමා කළ මැනව. තවුස්වරු නම් ක්‍ෂමා වෙත් දැ'යි කිවූ ය. මෙහ් 'ක්‍ෂමා කරවන්නේ හිස පයින් ඇන පියා වේ ද? ක්‍ෂමා කොට වුව ත් හවිමි' කී ය. නාරද තවුසන් 'මා දැන කළ දෙයෙක් නො වෙ යි. හවන්ට නො කැමැත්තේ' ය කිවත් තවුසෝ තමන් ඉතා නො කීකරු හෙයිනු ත් අනික් තාපස-යන් ගේ ආනුභාවය නො දත් හෙයිනුත් දැන කළ දෙයෙක් නො වෙයි කිවත්–

"සහස්සරංසි සතතෙජො – සූරියෙං තමවිනොදනො
පාතොදයන්තෙ සූරියෙ – මුද්ධා තෙ ඵලතු සත්තධා"

යනු හෙයින් 'මා හිස දෙ විටක් කොට පයින් මිරිකුවාට සෙට නැඟි හිරින් තා හිස සත් කඩක් ව පැළී යේව' යි හැවූ ය. නාරද තවුසෝ ද 'ආචාරීනි, මා ගේ වරදෙක් නැත. නැතැ යි කීව ත් නො හදහා හැවූ බැවින් වරද යම් කෙණෙකුන් කෙරෙහි වී නම් දෙනුන් හැදින වස්සන් යන්නා සේ ඒ හැවිල්ල උන් කරා ම යේව'යි කියා ලා තමන් අභිඥලාභී ව අතීතයෙන් සතළිස් කපක් හා අනාගතයෙන් සතළිස් කපක් හා එක් ව අසූ කපක් බලන්ට සමර්ථ හෙයින් මේ හැවිල්ල කවුරුන්ට පැමිණේ දෝ හෝ යි දිවැසින් බලා උඩු සුළඟ සිට දමූ රඬු දමුවන් කරා ම යන්නා සේ ආචාරීන්ට ම පැමි-ණේ යි දැන සියලු ලෙඩ ම සන්හිඳුවන දිව බෙහෙදක් සේ එක ද කෙණෙකුන් නො නෝරා තවුසන් කෙරෙහි කරුණා-වෙන් තමන් ගේ ආනුභාවයෙන් රාත්‍රියේ තිස් පැ ඉකුත් ව නැගෙත හිර, නැංග නුදුන්හ.

නුවර ඇත්තෝ ත් හිර නො නැගෙන්නා ම රජ්ජුරුවන් කරා ගොසින් 'මුඹ වහන්සේ රජ කමට පටන් ගෙන මෙ තෙක් දවස් නැඟෙන හිර අද මෙ තෙක් වේලා වන තෙක් නො නැඟෙයි. රට තොටවලින් හවුරුදු නො ඉක්මවා බද්ද නංවන්නා සේ ම අද ත් දවස ඉකුත් නො කර හිර නැංගුව මැනැවැ' යි කිවූ ය. රජ්ජුරුවෝ ඒ අසා තමන් ගේ නො මැදහත් කමක් නිසා වූ



Non-Commercial Distribution

දෙයෙක් දෝ හෝ යි තමන් ගේ වැරදි විමසන්නෝ කිසි වැරැද්දකුත් නැති හෙයින් ම නො දක කාරණ සලකන්නෝ තාපසවරුන් ගේ විවාද නිසා ත් වෙ යි- දූන 'කිමෙක් ද, මේ නුවර තාපසවරු ඇද්ද? එ සේ වූ කෙණෙක් ඇත් නම් උඟු තමන්ගේ ආනුභාවයෙන් හිරු නැංග නො දෙන සේ ත් දනිති. එ බඳු කෙණෙක් ඇද්දැ' යි රජ්ජුරුවන් විචාළ කල්හි නුවර කුඹල් හල තවුසන් දෙන්නකු ලැගි නියාව කිවු ය. රජ්ජුරුවෝ එ වේලේ ම විලක්කු ලවා ගෙන ගොසින් නාරද තවුසන් වැදලා එකත් පස්ව හිඳ 'තපස්වීන් වහන්ස, මෙ තෙක් දවස් හිර නැහෙන වේලාවට අද හිර නො නැහෙයි. තවත්-

> "කම්මන්තා නප්පවත්තන්ති - ජම්බුදීපස්ස නාරද,
> කෙන ලොකො තමො භූතො-තම්මෙ අක්ඛාහි පුච්ඡිතො"

යනු හෙයින් සී-වප් ආදී කර්මාන්ත ත් කරන්ට නැතැ යි අඳුරු වත් තිබෙ යි. කාරණ කිම් දැ' යි කිවු ය. නාරද තවුසෝ ආද්‍යන්ත මුළුල්ල ම කියා ලා 'නිරපරාධ වූ මට හවා ලූ හැවිල්ල මුල් ව ම පැමිණ හිර නැඟි කලට මේ තවුසන් ගේ හිස සත් කඩක් ව පැළෙන නියාව දූන මා ම මුල් ව පැළෙන හිස මහ මෙර පරයා ඉස් දන් දෙන මා උන් ගේ ම හිස උන්ට දූන මනා හෙයින් උන් කෙරේ කරුණාවෙන් පාන් විය නො දෙන්නෙම් මම ය'යි කිවු ය. රජ්ජුරුවෝ තමා ම ලා ලූ ගිනි තමා ම නිවන්නට බැරියා සේ සමහරෙක් නසන්ට පිළිවන් වුව ත් වවන්ට බැරි ය. එ සේ හෙයින් හිර නංවා ලන්ට ත් පිළිවන් ද? තෙල තවුසන් ගේ හිස ත් නො පැළේ දැ' යි විචාළෝ ය. 'ආචාර්යෝපවාද දෙසා ගත් කල සග මොකට ඩහක් නැත්තා සේ මා ක්ෂමා කරවා ගත්තු නම් හිර ත් නැගෙයි. මුන් ගේ හිසට වන හානි ත් නැතැ'යි කිවුය.

ඒ අසා රජ්ජුරුවෝ දෙවළ තවුසන් කරා ගොසින් 'සමහර විෂයක් බානා කල දෂ්ට කළ සර්පයා ලවා ම උරවා ගන්නා සේ මේ වියවුල ත් මුඹ වහන්සේ මුල් ව මැ වූ හෙයින් අනික් කෙණෙකුන් හළ හැක්කේ නො වෙ යි. ගුණ සම්පන්න තවුසාණන් ක්ෂමා කරවා මේ අවුල පසුන යහපතැ'යි කිවු ය. පිස නපුරු වූ බතක් සාලීන් ම තිබී නො ගොස් පිස ගන්ට බැරි වන්නා සේ නො කීකරු ම තැනැත්තවුන් හෙයින් මෙ සා වියවුලක් බල බලා ත් ක්ෂමා කරන්ට මැළියෝ ම ය. උන් හිස සත් කඩක් ව පැළෙත ත් සිත සත්කඩක් ව නො පැළෙන හෙයින් නො පැළෙන සිත තර කොට ගෙන ක්ෂමා නො කරවන්ට තර නියාව දූන මුන් නිෂ්කර්මික තෙනත්තන් හෙයින් මුන්ට හිර නැඟීමෙන් ප්‍රයෝජන නැත ත් අප ගේ

Non-Commercial Distribution

රට පාළු වන හෙයින් අපට හිර නැංග මනා වේ දැ' යි නොකැමැති කරවා ම අල්වා ගෙන නාරද තවුසන් කරා ගෙන ගොසින් වඳවා හොවා ලූ ය.

නාරද තවුසෝ ද මහෞෂධ පණ්ඩිත අවස්ථාවෙහි ධර්ම යුද්ධයට ආ කෙවට්ටයන් මැණිකක් පෑ ලා පා මුලට නැඹුරු කරවා ගෙන පිටි කර හා පිටි මුල අල්වා ගෙන නළල බිම උලා පියා 'ආචාරීනි, නැඟී සිටුව'යි කියන වහන්සේ කෙණෙකුන් හෙයින් ''ආචාරීනි නැඟී සිටිය මැනැවැ යි, ක්‍ෂමා කෙරෙමි'යි කියා ලා ''මහරජ මුන් තමන් ගේ සෑදැයකින් කැරවූ ක්‍ෂමාවක් නොවන හෙයින් හිරු නැඟි කලට හිස පැළෙන්ට බාධා නැත. අවශ්‍යයෙන් හිස නො පැළුණ මනා වී නම් මෙතනට ම නුදුරු එක් විලෙක් ඇත. ඊ ගෙන ගොසින් කර වටක් පමණ දියෙහි සිටුවා ලා හැනූ මැටි පිඩක් හිස තබවා ලව'යි කිවු ය. රජ්ජුරුවෝ ත් එ ලෙස ම කැරවූ ය. නාරද තවුසාණෝ ද දෙවළ තවුසන්ට 'මා සෘඩිය හළ කල්හි හිරු නැගෙන්නා ම දිය කිමිඳ පියා අනික් තෙනකින් හිස ඔසවා පිව මැනැවැ'යි කිවු ය. කියා ලා සෘඩිය හරනා ම හිරු නැඟි නැඟී හිරු රසින් හිස් මුදුනේ තිබූ මැටි පිඩ සත් කඩක් ව පැළී හිස වුව ත් මේ තරමෙ ම පැළී යෙ යි හඟවා නාරද තවුසන් අර්හත් මාර්‍ගඥාන නමැති පොරොවින් අවිද්‍යා නමැති බොහෝ හිස් පලන්ට බල ඇති නියාවත් හඟවා රජ්ජුරුවන් ඇතුළු වූ බොහෝ දෙනාගේ බය අඳුර ත් නිකම් අඳුර ත් දුරු කළ හ.

බුදුහු මේ ජාතක දෙශනාව ගෙන හැර වදරා ලා 'මහණෙනි, එ කල රජ්ජුරුවෝ නම් දැන් අනඳ මහ තෙරහු ය. ඒ සා මහත් නො කීකරු කමුත් කොට කුඹල් හල සැතපුණාට තරම් ව මැටි පිඩ හිස තබා ගෙන දෙවළ තවුසා නම් මැටි පිඩෙකින් සරි නුව ත් නො කීකරු කමින් සරි වූ චූල්ලතිස්ස තෙරහු ය. නාරද තවුසාණෝ නම් සම තිස් පැරුම් පුරා නිමවා බුදු වූ මම් ම ය' යි වදරා 'මුහු ගේ මේ නොකීකරු කම් එවක පටන් අභ්‍යාස ය' යි වදරා ලා ඉක් බිති තිස්ස තෙරුන් වහන්සේ බණවා ලා ''හෙම්බල මහණ, යම් කෙණෙක් තමන්ට දෙඩාපු ව යි බැණපු ව යි කියා හෝ, මැරුව යි තැළු ව යි කියා හෝ වාද විවාද කොට පරදවා පි ය යි කියා හෝ, වරදවා තමන් සතු දෙයක් හැර ගත්ත යි කියා හෝ, එකක් මුල් ව වෛර කොට ගෙන තමන්ට සාර වූ ඒ වෛර නමැති වස්තුව ඒ ඒ පුද්ගල සන්තාන නමැති වළඳ ලා සිත් නමැති ලණුවෙන් තර කොට බැඳ තබා ගත්තෝ වී නම්, උන්ට ම සාර වූ භය කාරණය බුඩාදී වූ නුවණැති කෙණකුන් විසින්

Non-Commercial Distribution

එක විට ම ඇද හසුරුවා නො පියා සෙමෙන් සෙමෙන් උනා අතට හැර ගෙන අත නො පෙවෙන තෙනට දමා පීමෙක් නො වී නම් බැඳ ලූ බැම්ම තර හෙයින් නැති ව යන්ට නො ව ඒ බැම්ම ත් දිරා ඒ වළන් බිඳුන ත් අනික් වළන්වල ලා අනික් ලණුවකින් බැඳ තර කොට තබන හෙයින් නො නසී'යි වදරා ලා 'යම් කෙණෙක් මෙ ලෙස නො කොට අනුන් මට දෙඩන්නෙ ත් බණන්නෙ ත් තළන්නෙ ත් සෙසු සෙසු ත් මට අපාසු දෙය කරන්නෙ ත්, යට ගිය දවස මා උන්ට කළ දෙයක් නිසා ය. වන්නාට උන් හට කර්මාරොපණය වුව ත් පැළය නැඟී මූකුරන කලට බිජුවට ඇට දිරා නැති වන්නා සේ මාගේ කර්මය ගෙවී නැති වේ'යි යනාදීන් සිතා වෛරය නො බඳිත් නම් උපනුපන් වෛරය ඒ ඒ විට ම කාරණ සලකා සන්හිඳුවා පියත් නම් සිදුරු ඇති කළයක වත් කළ පැන් නො රඳන කලක් මෙන් උන් කෙරෙහි වෛර නො සිටී'යි වදළ සේක.

මෙ බණ අසා ලක්‍ෂයක් දෙනා වහන්සේ ගෙන් කිසි කෙණෙකුන් වහන්සේ මුල් ව සිටිනා කෙලෙස් සතුරන් දස දෙනා ගෙන් නිවන් පුර වදනා සෝවාන් නමැති මහ වාසලට වැද්ද නො දෙන්ට දපී සිටි සත්කාය දෘෂ්ටි ය, විචි-කිත්සා ය, යන සතුරන් දෙන්නා තැන ම මරා සෝවාන් නමැති මහ වාසලින් නිවන්පුර වන් සේක. කිසිකෙණෙක් උන් දෙන්නා මරන්ට ත් සහාය ව ලා එම වාසල නො සෑහෙන හෙයින් කාම රාග, ව්‍යාපාද යන සතුරන් දෙන්නා අවුරා සිටී සෙද ගැමි නමැති මහ වාසල් කරා ගොසින් උන් දෙන්නා පැන නො යන විතරකට මරා හොවා ඒ වාසලින් නිවන් පුර වන් සේක. කිසි කෙණෙක් උන් දෙන්නා දුර්වල කිරීමට ත් සහායව ලා සතුරන් ඇති ව වැඩක් නැති හෙයින් උන් දෙන්නා එතන මරා ඒ වාසල ම මඳ හෙයින් අනගැමි නමැති මහ වාසලින් නිවන් පුර වන් සේක. කිසි කෙණෙක් තමන් වහන්සේ හැම ඉතා සපත් හෙයින් තුන් වාසල ම සවන් කොට ඉනු ත් ලද මනා ජය ලැබ තව අර්හත් මාර්ග නමැති මහ වාසල තුබූ හෙයිනු ත් ඒ අවුරා ඉතිරි කෙලෙස් සතුරන් සිටි හෙයිනු ත් උනු ත් මරා කෙලෙස් සතුරන් මුල් සිඳ ඒ වාසලින් නිවන් පුර වන් සේක.

තිස්ස තෙරුන් වහන්සේ ද වයසින් හා නොකීකරු කමින් මූකළ වුව ත් නුවණ නුමූකළ හෙයින් අධිගමයකට එ දවස් නො පැමිණියත් නො කීකරුකම හැර කීකරු ව ඉදිරියෙහි ලබන ලොව් ලොවුතුරා ගුණ විශෙෂයට භාජන වූ සේක.

එසේ හෙයින් සුජනයන් විසින් තිස්ස තෙරුන් වහන්සේ හළ මනා නො කීකරු කම හැර වුව මනා සුවච කම හැර ගෙන ලබන

Non-Commercial Distribution

ගුණ විශෙෂයට නිසි වූවා සේ ම හළ මනා ම අකුසල් හෙයින් ඒ හැර වුවමනා කුසල් පමණක් ගෙන එහි හැසිර ලොවී ලොවුතුරා සැපත් සාධනු සඳහා සිත් සතන් පිරිසිදු කට යුතු.

---

## 8. කාළි යකින්නගේ වස්තුව

තව ද වෛර බැන්දවුන් ගේ වෛර ය නිවා ගන්ට බැරි ව ද ගෙන යන ගින්නක් බොහෝ පැන් ඇති තෙනකට පැමිණ නිවෙන්නා සේ කරුණා නමැති දියෙන් පිරුණු සව්ඥ නමැති මුහුදට පැමිණ නිවෙත් මුත් සෙසු ලෙසකින් නො නිවෙන නියාව දක්වන පිණිස කාළි නම් යකින්නගේ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්:

යට ගිය දවස එක් කෙළෙඹි පුත්‍රයාණ කෙණෙක් පියාණන් නට කල ගෙයි දඬ කර්‍මාන්ත විධාන කරන්ට අනික් කිසි කෙණෙකුන් නැති හෙයින් හෝ නොහො ත් තමන් ම කළ මනා හෙයින් ගෙය දඬ ත් විචාරමින් කණවැන්දුම් මෑණියන්ට ත් උපස්ථාන කෙරෙති. මෑණියෝ ද පුතණුවන් විඳිනා දුක් බලා 'වන්නාට දඬ කර්‍මාන්ත විධාන කරන්ට කෙ සේ වුවත් විධාන කොට කැරවීම මුන්ට ම වේ ව යි ගෙයි කර්‍මාන්ත විචාරා කරවා ලන්ට කොට ලන්ට තරම් කෙණකුන් විචාරා මුන්ට සරණක් ගෙනවු ත් පාවා දී ලීම් නම් මුන්ට සැතපිලිත් ඇත. මම ත් මුන් ගෙන් ප්‍රයෝජන විඳිනා ලෙසට මුන් ගේ සුව දුක් දත්තා නම් වෙමි'යි සිතා එක් දවසක් පුත තොපට සරණක් ගෙනවු ත් නිල කරමෝ ද'යි විචාළෝ ය. ඔහු ඒ අසා 'මෑණියන් වහන්ස, ඒ නො කැමැත්තෙමි. එ සේ වූ අවුලක් කර නො ලා දිවි පමණින් ම මම මුඹ වහන්සේට උපස්ථාන කෙරෙමි. මා ගේ ඒ පින් කමට බාධා නුවුව මැනවැ'යි කිවු ය. 'පුත එ සේ නො කියව. තොප ගෙයි දඬ ගන්නා දුක් දුටු කලට මා සිතට සැප නො වෙ යි' මෑණියන් එක් වත් කිය ත් කිය ත් පුතණු වන්නාට ය යි සිතා පසු ව කී විට බැණ නො නැංගෝ ය.

ගිවිසි නියාව දන මෑනියෝ ද එක්තරා තැනකට ගොසින් පුතණුවන්ට නිසි කෙණකුන් විතාරන්ට යන්ට ගමන් සරහා පුතණුවනු ත් 'කවර කොතනකට යන සේක් ද'යි විචාළ කල්හි අසවල් තැනට ය යි කිවු ය. එතනින් ගෙනෙන්නවුන් තමන්ට අනභිප්‍රාය හෙයින් ඔබ යන ගමන් නවතා ලා තමන් අභිප්‍රාය තෙනක් කිවු ය. මෑණියෝ ද ඔබ ගොසින් සරණ විචාරා නිල කොට කැඳවා ගෙන යන්ට නිසි නැකතකු ත් විචාරා ලා නිසි නැකතකින් ගෙන වුත් පුතණුවන්ට පාවා දුන්හ. ඒ සරණ ආ

Non-Commercial Distribution

කුමාරිකාවෝ ද තමන් දරුවන් ලබන්ට නිසි පිණක් නැති හෙයින් පල ගත මනා ගස් නො පලගන්නා සේ වඳ වූ ය. මෙ සේ උන් වඳ කලට මැණියෝ පුතණුවන් බණවා ලා 'පුත තොප ගේ අභිප්‍රා ය තැනින් සරණ ගෙන්වා ඵල ප්‍රතිලාභ ය නිසා ලවා ලූ ගස කොළෙහි පලද නැත්තා සේ වර්ග පරම්පරාව පවත්වා ලන්ට නිසි දරු කෙණකුන් වුව මනා තැන දූන් මූ වඳ යෝ ය. අප දූන් තොප නිසා නිදුකින් ජීවත් වන්නා සේ දරු කෙණකුන් නැති ව ඔබ ලත් අවසථාවෙහි තෙපි කෙසේ ජීවත් වවු ද? අනික් සරණක් ගෙන්වා දෙමෝ දැ'යි විචාළෝ ය. පුතණුවෝ 'නො කැමැත්තේ ය'යි කිවූ ය. තව කීව ත් නිස්සාර ලෙසක් හැඟී යෙති දෝ තව තව ත් නො කැමැත්තේ ය'යි ම ව්‍යාජ ලෙසින් නො ව නො කැමැති ව ම කිවූ ය.

වඳ තැනැත්තෝ මේ අසා දරුවෝ නම් දෙමවු පියන් කියා ලූ දෙයක් දෙ තුන් මුරයක නො කළෝ නමුත් පසු ව පටහැණිවීම ත් නපුරු හෙයින් නො කරන්නෝ නො වෙති. ඉදින් මූ තුමූ ම වදනා පොදනා තෙනකින් සරණක් ගෙන වුත් දරු කෙණකුන් ලද්දු නම් මා කෙල්ලක කොට ත් නො තකති. මා ම ගෙනවුත් නිල කළ කලට එ සේ ම නො වන්නේ වේ දැ'යි යන අදහසින් මායාව නම් අකුසල් විසයට කුසල් විසයෙහි ප්‍රඥව සේ වුවමනා බැවින් හා නැවත ඒ මායාව තමා නිකෘෂ්ට බැවින් නිකෘෂ්ට භජනය කරන ලෙසට ගුණෙන් නිකෘෂ්ට වූ ස්ත්‍රීන් ම භජන ය කළාක් මෙන් ස්ත්‍රීන් කෙරෙහි ම බොහෝ කොට පවත්නා හෙයින් හා නැවත කරණ කියන සිතන යම් දෙයක් බොහෝ සේ මායම් මුසු කොට කරණ කියන සිතන හෙයින් උන්ට ළෙන් ගතු ව කරණ දෙයක් මෙන් තමාට ම ළෙන් ගතු ව උන්ට කී කලට බාධාවක් පෙනී ගියේ නමුත් නපුරැ යි උන් හැමට ම නොකියා ම එක් තරා තැනකට ගොසින් කුමාරිකා කෙණකුන් නිල කොට උන් ගේ දෙ මවු පියන් කට යුත්තක් ම නො වන හෙයින් නො ගිවිසි කල්හි කියා ගිවිස් වන්නෝ 'මම වඳ යෙමි. මුබ ගේ දුවණියෝ දරුකෙණෙකුන් ලද්දු නම් ඌ සම්පතට හිමි වෙති. මා වඳ කුළු තැනැත්තියට සම්පත්තින් කම් කිම් දැ'යි වෙස් බැඳ පානා රුවක් මෙන් සිතින් එකක් සිතා වුව ත් බසින් එ ලෙසක් කියා ගිවිස්වා ගෙන වුත් සමුණන්ට පාවා දී ලා නැවත 'මෝ දරුකෙණකුන් වදු ලූ නම් මෝ මගේ හිමි වන් නී ය. එ සේ කලට යමක් සිතා කෙළෙම් නම් ඒ නැති ව නිල කොට ගන්නා නිසා මැ ගේ දෙ මාපියන්ට මා බසින් කියා ලූවා ම වෙ යි. එ සේ කලට මායම් උගත්තේ නම් කිම් ද? යම් ලෙසකින් මෝ දරු කෙණකුන් නො වදු නම් එ ලෙසක් කෙරෙමි' සිතා පව්වූ අදහස් ඇති ව එක් දවසක් අමුතු ව ගෙනාතෙනැත්තවුන් බණවා ලා 'යම් දවසක් තොප බඩ දරු කෙණකුන් ඇති වූ නම් මට කියව'යි කිවූ ය.

Non-Commercial Distribution

උයි ත් ඒ යහපතැ යි සිතා දරු කෙණකුන් බඩ පිහිටා ගත් කල්හි උන්ට කිවු ය. එ දවස් පටන් කන බොන දෙය ඉදි කොට දෙන්නී එක් දවසක් කන බතට මුසු කොට ගබ් සා වන්ට නිසි බෙහෙදක් තමා උගත ත් එ සේ වූ දෙයක් ම හෙයින් දී ලා ගබ් සා කරවා පිව. ඈට දරුවන් නැති කළා සේ ම තමාට සසර දික් කළා ය. දෙවෙනි වර ත් දරු කෙණෙකුන් බඩ පිහිටා ගන්නා අත් දුටු බෙහෙද හෙයින් එ ම බෙහෙත් ම දී පෙරළා ත් ගබ් සා කැර වූහ. ඉක් බිති ගෙවල ඇත්තෝ 'දෙ මුරයක් කොට ම තොප ගබ් සා වන්නේ හැයි ද? තොප ගේ බූනාණියන් සපත්නී රොෂයෙන් කළ දෙයකින් ද? කිම්දැ'යි විචාළෝ ය. එ සේ විචාළ කල්හි දරු කෙණෙකුන් බඩ ඇති වූ කල්හි තමන් කී නියා ත් තමන් කියා ලූ තැන් පටන් ආවෙණික ව බත් මාළු ඉදි කොට දෙන නියා ත් කෑ බතින් හා මාළුවෙන් ගබ් සා වන නියාව ත් කිවු ය.

උඹ හැම ඒ අසා 'බොළඳ තැනැත්තිය, මුරයක ඈ ඉදි කොට දුන් දෙය කා ගබ් සා වූ කල දෙවෙනි මුරයේ බඩ දරුවන් නියාව කියන්නේ හැයි ද? ඉදින් කියා පීව ත් තෝ උයා පලා ගන්නා පමණකුත් නො දැන ඈ පිස දුන්නා කයි ද? ගැනුන්ට නම් සපත්නී රොෂයට වඩනා දුකෙක් නැති නියාව ත් තී නොදන්නා නියාදැ'යි කියා ලා 'මෙවක් පටන් තෝ කුමකු ත් නො කියව'යි ඉගැන්වූ ය. උයි ත් තුන් වන මුරයේ නො කීවෝ ය. වඳ තැනැත්තී ඈ බඩදරු කෙණෙකුන් ඇති ව බඩ මහත් ව ගෙන යන නියාව දැක තමන් කා බී ගත නොහෙන්නවුන් අනුනු ත් කනු බොනු නො කැමැත්තා සේ තමා වඳ හෙයින් වදන්නවුනුත් නොකැමැති ව මේ තරම් වන තුරු මට නො කීයේ හැයි ද යි කියා උන් ඒ අසා තෙපි ම මා කැඳවා ගෙන අවුත් සමුණන්ට පාවා දෙවා ලා රඳනු නොකැමැති කල අප ගේ දෙ මවු පියන් ගේ ගෙට යවා ත් නො පියා කොට බෙහෙත් දී ගබ් සා කරවා පිව. කවර ළෙන්ගතු කමක් පෙනෙන හෙයින් කියම්දැ'යි කී කල්හි කෙ තෙක් කුමක් වුව ත් මෙ විට මැ ත් දත් හෙයින් නටුයෙම්-වේ දැ'යි සිතා වදන අවසථා වෙහි දී අවසරයක් බලා අවසරයක් ලදින් බෙහෙදක් දුන.

දරු ගැබ මූ කුරා ගිය හෙයින් නො හී දරුවෝ සරස් ව ගිය හ. ප්‍රසව වේදනාව ත් බලවත් ව ජීවත් වෙද්දෝ නො වෙද්දෝ හෝ යි යන තරමට පැමිණියා ය. මිය යන වේලේ දී 'අනේ! තොප කළ මුළාව බලවත. දරු තුන් දෙණකු ත් මා ත් මිය යනු නියම හෙයින් අප සතර දෙනකු නසා පිව. මම ත් මිය ගොසින් යකිනි ව ඉපිද තොප වැදූ දරුවනු ත් තොප ත් කන්ට සමර්‍ථ

Non-Commercial Distribution

වෙම් ව'යි පතා ගෙන මිය ගොසින් එ ම ගෙයි බැළල් ව උපන. අනික් තෙනැත්තිය සමණෝ අල්වා ගෙන 'තී නිසා මේ ද මට මේ සා මහත් අලාභයෙක් වූයේ'යැ යි අතින් පයින් සම්භ වූ යම් දෙයකිනැ යි තළා මරා ඉතික්න් මැරීමෙන් ප්‍රයෝජන නැති හෙයින් අත හළවු ය. උයි ත් මිය ගොසින් එ ම ගෙයි කිකිළි ව උපන් හ. මූ කුරා ගත් කිකිළිය බිජුවට ලා ලන්නා ම බැළලි ත් අවුත් ලා තුන් වාරයක් කොට ඇ ලා ලූ බිජුවට තොමෝ කෑව. කිකිළි ඒ දැක 'තුන් වාරයක් ලූ බිජුවට වියක්[1] කන කෙණකුන් බිජුවට වී නිමි කලට එ ම රැක නො හිඳ ඇසා වියක්[2] කන්නා සේ බිජුවට ලීම් නැති තෙනක දී මා ත් කන්නී ව ද? එ සේ හෙයින් මම ත් මිය ගොසින් තොප ත් තොප ගේ දරුවනු ත් මේ ලෙසින් ම කැ හෙම්ව'යි පතා කිකිළි මිය දිවි දෙන් ව උපන. බැළල් මිය ගොසින් මුව දෙන් ව උපන. මුව දෙන් වදා ලන්නා ම දිවි දෙන අවුත් තුන් වාරයක් කොට ම වැදූ දරුවන් කෑව. පසු ව තමා ත් කන්ට අල්වා ගත් තැන මියන ගමනේ ආදි තුන් වාරයක් මා වැදූ දරුවන් කෑව. දැන් මා ත් කයි. මම මිය ගොසින් යකිනි ව ඉපිද තොප වැදූ දරුවනු ත් තොප ත් කෑව හෙම් ව'යි පතා අප ගේ බුදුන් සමයට මුව දෙන් යකිනි ව උපන.

දිවි දෙන් සැවැත් නුවර කුල ගෙයක එක් තරා කෙණකුන්ට දූ ව උපන. වැඩි විය පැමිණ වාසලින් පිටත ආසන්න ගමකට සරණ ගියා ය. සරණ ගොසින් පුතණු කෙණකුන් වැදූ ය. යකිනි උපන් දරුවන් වැදූ නියාව තමා ත් පරීක්ෂා කොට ඇවිදිනා එ ම ගෙයින් දැන, යෙහෙළි ලෙසින් අවුත් 'අප ගේ යෙහෙළිණියෝ කොයි දැ'යි විචාරා වදා හොත්තෝ ය යි කී කල්හි 'වැදූවේ දියණි කෙණකුන් ද පුතණු කෙණකුන් ද? මා ත් දකින්ට වුව මනා වේ දැ'යි ව්‍යාජයෙන් ඇතුළු ගෙට වැද බලන්ට වඩා ගත් ගමනේ ම කා පියා නැඟී ගියා ය. දෙ වන වාරයෙ ත් වදා ලන්නා එ සේ ම අවුත් කෑව. තුන් වන මුරයේ දී ඒ දැරී දැරී ඇති ව සමුණන් බණවා ලා 'මෙ තන දී දරුවන් දෙ වාරයක වදා යකින්නක් කා පියා ගියා ය. සුව දුක් දන්නට නිස්සෝ දෙ මවු පි යෝ වේ ද? ඔබ ගොසින් වදමි' කියා ඔබ ගොසින් ජීවත් වන්ට නිසි මහ පිණැත්තාණ කෙණකුන් වැදූහ.

එ කල ඒ යකින්නී තමාට පැමිණි මුරය හෙයින් වෙසවුණු රජ්ජුරුවන්ට අනවතප්ත විලින් පැන් අදිනට ගියා ය. එ සේ අදනා පැන් සාර මසකුත් පස් මසකුත් අදිති. සමහර යකින්නෝ අද වීඩා ව මිය යෙති.

---

1. විකක් 2. වීතාක්

Non-Commercial Distribution

ඒ යකින්න තමා අදිනා තෙක් කල් ඇද නිමවා පියා කළ මිඩියක පැන් කළය ගෙයි තබා පියා බඩ දළ දූඩී හෙයින් වහ වහා වලන් මුළුල්ල සමනා පියන්ට යන ගමනක් සේ අර මුන් මෙතෙක් දවස් වදන ගෙට වහ වහා ගොසින් උන් ගේ යෙහෙළි ලෙසින් සිට කොයි දැ යි විචාරා ''මේ තැනදී වැදූ දරුවන් දෙ මුරයක් කොට යකින්නක කෑපී හෙයින් එ සේ ත් රැක ගත නො හැක්කැ යි දෝ දෙ මව්-පියන් ගෙට ගියහ'යි කී කල්හි උඃ කොයි යෙත්ව යි තරු පෙනෙන දෙව්-ලොව විතරට ඒ දුරු නො වන බැවින් වද පූ නම් පිස තුබූ බතක් ලා ගෙන කන්ට ආයාස නැත්තා සේ අල්වා ඉගන කා පියන්ට ත් බැරි නො වෙ යි. නැතක් කලෙක බැඳ ගත් වෛර නමැති යක්‍ෂයා ත් කැඳවා ගෙන ඇතුළු නුවරට යන්නට නික්මුණ. දෙ මුරයක් කොට ත් වද දරුවන්ගෙන් නුවූ තැනැත්තෝ ද තමන් ගේ පුතණුවන්ට නම් තබන දවස් නම් තබා ලා ඉතිකින් අප ගේ ගමට ගිය මනා වේ ද යි පුතණුවන් වඩා ගෙන සමුණන් කැඳවා ගෙන දෙව්රම් වෙහෙර මැදින් යන තැනැත්තෝ පුතණුවන් සමුණන්ට වඩා ලා මහා විහාරයෙහි නුදුරු ව තිබෙන පොකුණෙන් තුමූ නා පියා ගොඩට නැඟී සමුණන් නාන තෙක් පුතණුවන් කිරි පොව පොවා සිටි තෙනැත්තෝ යකින්න එන නියාව දැක ආදි ත් දෙමුරයක් දුටු හෙයින් හැඳින ලා සමුණන්ට 'වහා ගොඩට නැංග මැනව, දරුවන් කන යකින්නිය එන්නී ය'යි කියා ලා උන් ගොඩට එනතුරු ත් රඳා සිට පිය නොහී දෙරටුවෙන් ඇතුළට දිව ගත්හ.

එ වේලාවට බුදුහු ත් සිවු වනක් පිරිස් පිරිවරා වැඩහිඳ, බණ වදරණ සේක. හයින් වන් තැනැත්තවුන් හෙයින් පිරිස් පීරා ගෙන බුදුන් ළහට ම ගොසින් දරු සිහිත්තා වෛවර්ණ කඩෙකින් විදි මාවුලාවක් මත්තේ තබා ලන කලක් පරිද්දෙන් බුදුන්ගේ අට තුරා සියක් පමණ මඟුල් ලකුණෙන් විසිතුරු වූ ශ්‍රීපාදය පිට කුමාර යන් ගේ හිස තබා වැද හොවා ලා 'මා බුදුවන්ට නො පත ත් තෙල දරුවන් නුඹ වහන්සේට දන් දෙමි. උන්ට බලවත් උවදුරෙක් පෙනිණි. අළවු කුමරුන්ට එක් සිය විසි හවුරුද්දකට ආයු දුන්නා සේ ම තුලුන්ට ත් ආයු දෙවා ලා අළවු යකුන්ගෙන් රැකගත් ලෙසට උවදුරු කරණ යක්‍ෂින්නගෙන් රැක ගත මැනැ'යි හය වේගයෙන් බලවත් ව බුද්ධ වල්ලහයා සේ ම කිවු ය. විහාර දෙරටුවේ රැකවල සිටි සුමන නම් දෙව් පුත් නමින් සුමන වුවත් යකින්න කෙරෙහි දුම්මන ව වෙහෙර ඇතුළට වැද්ද නුදුන්නේ ය. බුදුහු අනද මහ තෙරුන් වහන්සේ බණවා ලා වළඳන තෙනට අවුත් පිළි පමණෙක ත් සකසක් නැති හෙයින් ළඟිට එන නො හී

දූරු ව ලා සිට සිඟන්නියක ළඟට කැඳවා ලා බත් දෙන්නාක් මෙන් මිනී මස් කා ඇවිදි තැනැත්තවුන් ලවා නිවන් රස අනුභව කරවනු පිණිස 'ආනන්දයෙනි, දොරටුවෙන් පිටත සිටි යකින්න මුඛ කැඳවා ගෙන එව'යි වදාළ සේක. අනඳ මහ තෙරුන් වහන්සේ වහා ගොසින් කැඳවා ගෙන ආ කල්හි දරු පැටවුන් ඇති තෙනෙත්තෝ බුදුන් ශ්‍රීපාද ය පිට හිස තබා ගෙන හොත් දරු පැටවුන් හැර ගෙන කාපියා දෝ හෝ යි යන භයින් බුදුන් ගේ ආනුභාව නො දන 'ස්වාමීනි, අර එන්නී ඒ යකින්නී ය'යි කිවු ය.

බුදුහු ඒ අසා බතට ඇවිටි ව හඬන දරු කෙණෙකුන් බත් උදවුවන තෙක් බසින් ම නළවන්නා සේ බණ වදරන තෙක් අරුන් අස්වසනු නිසා 'ඈ එති තෙපි නො බව. තොපි බැව මනා මෙ තන සම්හ නුවුවොත් වේ ද'යි උන් අස්වසා සිටුවා ලා යකින්නට "හැයි තොප මෙසේ කරන්නේ? තොප දෙ පක්‍ෂය මා කරා සම්හ නො වූ නම් යුක්ති දන්නවුන් කරා සම්හ නො වීමෙන් කල් පලා යන යුක්තියක් සේ, මේ තොපගේ වෛරය ත් එඬක ජාතකයෙහි කප මුළුල්ලෙහි නොසිඳී පවත්නා කෝම ගස් හා වලසුන්ගේ වෛර ය මෙන් ද, උදක ජාතකයෙහි කපුටන් හා බකමූණන් ගේ වෛරය මෙන් ද, කප මුළුල්ලෙහි පැවත යන දෙය ය. අනේ මොබ සම්හ වූ නියා ව යහපත, හෙම්බල යකින්න යම් සේ කෙළ–සෙම්–සොටු ආදියෙන් තමා ගේ ශරීරය අපවිත්‍ර වූ කල පෙරලා ත් ඒ කෙළ ආදියෙන් පවිත්‍ර කොට නො හැකි ද වඩ වඩා ලා අපවිත්‍ර වේ ද–එසේම ආක්‍රොශ, පරිභව බිණුවන්ට තමා ත් බිණීමෙන් හා මැරුවන් තැලුව ත් තමා ත් පෙරළා මැරීමෙන් තැළීමෙන් හා නො එක් අපරාධ කළවුන්ට ගිනි පිට ගිනි ලන්නා සේ තමා ත් නො එක් අපරාධ කිරීමෙන් පැවැති වෛරය දෙපක්ෂයට ම සන් නො හිඳෙයි. යකඩ වානේ තුබූ කල දිවුණ ලා කැපෙන්නා සේ වෛරය දියුණු වෙයි. ඒ වෛරය දර නිමා ගිය ගින්නක් මෙන් සන්හිඳෙන්නේ එක සේ ද යත්.

"යම් සේ කෙළ-සෙම් ආදිය පවිත්‍ර ජලයකින්, සෝධා පී කලට ජල තමා පවිත්‍රයා සේ අපවිත්‍ර ව තුබූ ශරීරය ත් පවිත්‍ර කෙරේ ද එ සේ වෛර කාරණ නමැති දරෙහි ඇවිළ සිටි. වෛර නමැති ගින්න එම වෛර කාරණ නමැති දර නො ලා මෙත් නමැති පැන් ඉසලන්නා මෙත්තාව නම ධර්ම හෙයින් අව්‍යාපාද හෙයින් සියලු කුශලයට මූල කාරණ ය. ඒ කාරණ වූ මෙත්තාව නිසා පැවැති කුශල ය අකුශල් නසන හෙයින් වෛර නමැති ගින්න නිවා පිය යි නිවා ලන්ට බැරි මහ ගින්න නිවී කලට අනික් ගිනි දසය ඒ ඒ ගින්නට කාරණ ව සිටනා ලොභ කටයුතු වස්තුවෙහි ලොභ නො කිරීම ආදි වූ දර නැති වේ. දර නැති වන්නා ම ආදි ඇවිළ තුබුව ත් නිවී යෙයි. එකොළොස් ගිනි ම නිවී කලට

දිය කෑ කුඹුර ගොයම් නැගීමට නිසි වන්නා සේ මෙත් නමැති දිය කවා මොලොක් කළ සිත් නමැති කුඹුර ශීල සමාද්ධ්‍යාදි ගුණ ධර්ම නැමැති බිජුවටින් ලොවී ලොවුතුරා සැප ත් නැමැති වී සම්පත් සාධා දීල'යි කියා වදරා ප්‍රාණවධාදි වූ බැරෑරුම් කර්මාන්ත කොට විඩා වූ හෙයින් නිවන් පුර යන්ට ශක්ති නැති යකින්නට යන්ට බල කොට ශ්‍රොත ආපත්ති නමැති මාර්ග ය බල කරවා ලා මතුමත්තෙහි මාර්ගාධිගම ඵලාධිගම නමැති බතක් සාලක් සසර කතරින් එ තර වන්ට කොට ගන්නා තෙක් ශ්‍රොත ආපත්ති ඵල නමැති සාල් සුහක් විවසුන් මහට ලවා ලූ සේක. ඒ යකින්නි ද තමා යකින්නි හෙයින් ප්‍රතිනියත වාසස්ථානයක් නැති වන්නා නව ලොවුතුරා දහම් නමැති නව මාල් මාළිගා-වෙන් සෙසු ත් හිඳිත වුත් ඇති හෙයින් ගබඩාවක් පමණ ලදින් ආයර්‍ය ජාති නමැති දිව අත්බැවු ලැබීමෙන් එහි වසන්ට නිසි ව නො එක් ලෙසින් පිළිකුල් වූ මිනී මස් හැර නිවන් රස ලද.

බුදු රජාණන් වහන්සේ ගේ ශ්‍රී පාද ය පිට වැද හොත් කුමාර-යන් ගේ මෑණියන් බණවා ලා පයට බර ව ගත්තා සේ 'තෙල කුමාරයා යකින්නට වඩා ලව'යි වදාළ සේක. ඔහු "ස්වාමීනි, ඇට වඩා ලන්ට බම්" කිවූ ය. 'තෙපි නොබව. දහසක් ඇඟිලි කපා ගුරු පූජාව කෙරෙමි'යි කියා බොහෝ දෙනා මරා වියවුල් කළ අඟුල් මල් මහ තෙරුන් දූන් කුහුඹුවකු පමණට ත් හානි නො කරණ ලෙස කෙළෙමි. උන් පිරිත් බණන්නට හුන් අස්න සොධා හැර ගත් පැන් සියලු උවදුරු නස යි. පිරිත් බිණූ පිරිත් පැන් බී ප්‍රසව වෙදනා නැතිව දරුවන් වදති. මහෞෂධ පණ්ඩිත කල මෙ සේ ම යකින්නක් කන්ට අල්වා ගත් කුමාරයා කෑ ත්[1] නො දී ඒ ජාතිය මුළුල්ලෙහි පස් පවින් දුරු කරවන්නෙම් හුදෙක් මා ගේ ප්‍රඥනුභාවයෙන් දුරු කරවාලීමි. බුදු වූ මා තෙල යකිනි මිනී මස් කන ලෙස තබා ලා වඩන්ට කියති සිතවු ද? ඇගෙන් කුමාරයන්ට වන හානි නැති. මාගේ ශ්‍රී පාදයෙහි ගැවුණු තෙනැත්තේ යකින්නකට නො ගැවෙ'යි වදරන්නා ම වඩාලුව, වදරන්නා ම බුදුන් ගේ ශ්‍රී ශරීරයෙන් කුමාරයා ලත් ශොභාව තමාට ත් එවා ගන්නාක් මෙන් කුමරුන් සනා පියා මෑණියන් අත වඩා ලා ශොභා තෙජස් ඇස වැද ගෙන ඇසින් දිය වැගිරෙන්නා සේ හඬන්නට වන.

බුදුහු අඬන නියාව දැක 'මා කරා ආ කෙණෙකුන් නිවන් සම්පත් ලදින් සතුටු ව යන කෙණකුන් මුත් අඬා ගෙන යන්නෝ නැත. ලොවුතුරා සැපත මඳ හෙයින් හඬන්නා හඬනැ'යි

1 කන්ට,

Non-Commercial Distribution

වදාළ සේක. යකිනි ඒ අසා 'ස්වාමීනි, මම පෙර එක බඩ නිසා ප්‍රාණ වධ කොට ත් කුස පුරා නො ලැබෙමි. අද පටන් ප්‍රාණ වධයක් නො කරණ. හෙයින් හා ලද්දු වූ නිවන් රසයෙන් සිත පිනවීම පමණක් මුත් ශරීරගත ඕජාවට උපස්තම්භක වන්ට නිවන් රස ය අසමර්ථ හෙයින් ජීවත් වීම කෙසේ දෝ යි සිතා හඬමි'යි කිව. බුදුහු ඒ වේලෙහි යකින්න අස්වසා ලා උපාසිකාවට වදාරන සේක් 'තුලුන් කැඳවා ගෙන ගොසින් භය නො කොට තොප ගේ ගෙයි රඳවා ලා පිසූ දෙයකින් පළමු කොට තුලුන්ට දී රකුව'යි වදාළ සේක.

ඔහු ද උන් කැඳවා ගෙන ගොසින් ගෙයි වස් යට හිඳුවා ලා ඉදි කළ දෙයින් ආදි කොට උන්ට දී පසු ව තුමූ කති. බීම්වල වී ලා ගෙන පහරිනා කලට ඔසවා ලූ මෝල් යකින්ණියන් ඇඟ වැද ගන්ති. ඉන් මුළා විඳ පියා තමන් දැමිටු හෙයින් අනිකක් කට නො හී යෙහෙළි ව සිටි උපාසිකාවන්ට 'මෙතන රඳා හිඳිනට අපාසු ය. අනික් තෙනක ලව'යි කියා එතනින් ගෙන ගොස් පැර අන්තයෙහි මෝල් තබන ගෙයි ලා ලූ ය. එ තන රඳා උන් කලට කළ අකුසලෙහි අපායගාමි අවස්ථාව නට ත් ඒ නට හෙයින් ප්‍රතිසන්ධි විපාක නැත ත් ප්‍රවෘත්ති විපාක ඇති හෙයින් දම දමා ලූ මෝල් හිස වැද ගන්නා–එ තැනැත් අපාසු නියාව කියා එතැනින් ගෙන ගොසින් පැන් නහන සැළ මුල හිඳුවා ලූ කල්හි කුඩා කොල්ලන් අත කට සෝධන කල දමන ඉඳුල් පැන් හිසට දමන හෙයින් ඒ අපාසුව ත් කියා එ තැනින් ගෙන ගොස් ළිප් පිටි පස හිඳුවා ලන්නා එ තැනට ඇඟට කිලි පොළ පොළා අනික් සමවායක් නැති හෙයින් සමවායට වැද හෝනා සේ බල්ලන් වැද හෝනා ඒ අපාසුව ත් කියා එතැනින් ගෙන ගොස් සේනන්කන හිඳුවා ලන්නා කුඩා කොල්ලන් මූ වස් කිස කරණ හෙයින් ඒ අපාසුව ත් කියා එ තැනින් ගෙන ගොස් බොහෝ දෙනා කසළ දමන කසළ ගොඩ රඳවා ලූ කල්හි කුලු පුරා කසළ ගෙන වුත් හිස වසා දමන හෙයින් ඒ ගහට ත් කියා එ තැනින් ගෙන ගොස් ගම් දෙරකඩ ලා ලූ කල්හි විදමන් උගන්නා කුඩා කොල්ලන් කෙළියට මුන් ම නිල කොට විදිනා හෙයින් ඒ ගහය ත් කී කල්හි එ තැනින් ගෙන ගොසින් ගමින් පිටත ජන සඤ්චාර ය මඳ තැනක රඳවා ලා කැඳ බත් දී රකිති.

ඌ එ තැන හිඳ එ තැනට ගිය තැන් පටන් කිසි ත් අපාසු-වක් නැති හෙයින් කැඳ බත් දෙන ගෙට 'මේ හවුරුදු වැසි

1 කිස මුව පස්,

Non-Commercial Distribution

දිය සුලභ ය. මඩ වප් කුණු වේ. නමුත් ගොඩ මානාවාරි තණ වපුර ව. මේ හවුරුදු වැසි දිය නැත. ගොඩ ගොයම් මිය යේ. නමුත් මඩ ගොයම් කරව'යි කියති. උන් ගේ උපදෙසින් උන් කළ ගොයම් කල් දූන කරණ හෙයින් නො නස්සී. සෙස්සවුන්ට එ සේ නැති හෙයින් උං හැම අවුත් 'මුබ කළ කළ දෙ යක් නො නස්නට ත් අප කළ දෙයෙහි ශ්‍රෙයස් නැති වන්ටත් කාරණ කිම් දැ'යි විචාරති.

උං හැම ඒ අසා 'හැයි අපනිරන්තර ව කැද-බත් හැර ගෙන ගමින් පිටත යන නියාව නො දකු ද? අප ත් ඒ ගෙන යන්නේ එක් යකින්නණි කෙණෙකුන්ට ය. උං වැසි ඇති නැති අවධිය කියා ලති. උන් නිසා අප කළ දෙයෙක් නො වරද්දී. තෙපි හැම ත් අප කරණ ලෙස ම කරව් නම් තොපට ත් අමුතු මුසුප්පුවක් නැති හෙයින් එ සේ ම කියති' කීහ. නුවර ඇත්තෝ මුළුල්ල ත් එ ලෙස ම සත්කාර කොට උන් ගේ සමවායෙන් ගොයමින් බතින් අඩුවක් නැති වූහ. උයි ත් මහත් වූ ලාභ සත්කාර ඇති ව කාළිබරාඞි ය යි ප්‍රසිද්ධ ව ලාබත් අටකු ත් තබා ලූ ය. ඒ ලාබත් අටුවා කරණ කල් දක්වා පැත්තේ ය.

එ සේ හෙයින් වෛර නම් මහා ආදීනව කරණ අකුසලක් හෙයින් ඒ හැර මෙත් සිත් නම් බලවත් අනුසස් එකොළොසක් සාධා දී ලන කුසල් හෙයින් එහි:-

**"මෙත්තා රහිත පොසෙන – නත්‍ථි පාපං අකාරියං,**
**මෙත්තා සහිත පොසෙන – නත්‍ථි පුඤ්ඤං අකාරියං"**

යනු හෙයින් එහි පිහිටා සිත් සතන් පිරිසිදු කළමනා බැවින් බුදුන් කරා පැමිණෙන්ට ඒ බුදුන් පිරිනිවිය ත් මේ සද්ධර්මරත්නා-වලී බුදුන් කරා පැමිණ ආදීනව අසා දත් වෛර හැර අනුසස් ඇසූ මෙත් සිත පිහිටා ලොවී ලොවුතුරා සැපත් සිද්ධ කට යුතු.

---

## 9. කොසඹෑ නුවර වහන්දෑගේ වස්තුව

තව ද කලහ කිරීමෙන් අසමඟි නිසා වන බොහෝ ආදීනව ද කලහ නොකිරීමෙන් සමඟ වීම නිසා වන බොහෝ අනුසස් දැ, හඟවන පිණිස කොසඹෑ නුවර වහන්දෑ ගේ වස්තුව කියමු.

හේ කෙ සේ ද? යත්:-

කොසඹෑ නුවර ඝොෂක සිටාණන් කරවා පිළිගැන් වූ එ නමින් ම ප්‍රසිද්ධ වූ වෙහෙර හඳුළ විනයෙහි පිරිමැස්ම ඇති

හෙයින් විනයාභියොග ය ඇති විනයධර නමක් හා හදළ විනයෙහි අභ්‍යාස මඳ ව බණ කීම් පමණක් ඇති ධර්ම කථික නමක් හා දෙනම පිරිවර වහන්දෑ පන් සිය-පන් සිය හැර ගෙන වසන සේක. ඒ දෙ නමින් ධර්ම කථික නම එක් දවසක් අත් පස් ගෙට ගොස් සිරුර කිස සපයා ගෙන උදක කෘත්‍ය ය කොට ඉතිරි පැන් වළඳ ම රඳවා විනයාභියොග නැති නියාවට ම පැන් නමා පියා ව ත් වළඳ නමත්නක් වත් වසා තබන්නක් වත් නො කොට නික්මුණු සේක. පසු ව විනයධර නම අත් පස් ගෙට වැඩි සේක් වළඳ නො වසා තුබූ පැනිත්ත දැක අත් පස සිට අවුත් ධර්ම කථික නම අතින් ඉතිරි පැන් නො දමා තබා වත් වැරැද්දුවෝ තුමූ දැ'යි විචාළ සේක. 'එ සේ ය අපි' යයි කියා කී කල්හි 'ඇවැත් ඇති නියාව දන්නේ නැද්දැ'යි විචාරා 'එ සේ ය. නො දනුම්හ'යි කී කල්හි 'එ සේ නො දනිතො ත් ඊට ඇවතක් නැතැ'යි කී සේක. ඒ අසා ධර්ම කථික නම 'සාපත්තික කලට අපායොත්පත්ති වන හෙයින් එ ලෙස හිඳිනට කාරණ කිම් ද? දෙසනාගාමිනී ඇවතක් බැවින් අවන් ඇවැත් දෙසමි. දෙසා මට පිරිසිදු එළව'යි කී සේක. විනයධර නම පෙරළා 'නො දැන කළො ත් සිහි නැති ව කළ හෙයින් ඇවැත් නැතැ'යි කී සේක.

ඒ අසා ධර්ම කථික නම බණ ම කියා ගිය පමණක් මුත් එ පමණක් තමන් වහන්සේ දන්නාට නැති හෙයින් 'විනයධර නමගේ බසින් නිරැ වතිමී' යන අදහස ඇති වූ සේක. විනයධර නම එ ලෙස ත් කියා ලා තමන් වහන්සේ නිසා වසන වහන්දෑට 'මේ ධර්ම කථිකයාණෝ කෙ සේ දෝ ඉගෙනගත් හෙයින් අනුන්ට බණ කියා ඇවිදිනා පමණක් මුත් පාන් කන්ද මුල අඳුරැ නො හැරෙන්නා සෙ තමන් ආපත්තියට අවදනා නියා ත් නොදනිතී'යි කියා ලූ සේක. ඒ ඇසූ වහන්දෑ ධර්ම කථික නම ගේ වහන්දෑ දැක 'තමන් හැම ගේ උපාද්ධ්‍යායයෝ ඇවැතට ඇවද ත් ඇවැත් අවන් තියාව නො දනිත් ල'යි කී සේක. ඒ වහන්දෑ එ පවත් තමන් වහන්සේ ගේ උපද්ධ්‍යාය වූ ධර්ම කථික නමට කී සේක. ඔබ ඒ අසා 'මේ විනයධරයාණෝ එ සේ ඒ පැන් තබා පීමෙහි නො දැන වී නම් ආපත්ති නැතැ යි ආදි කියා ලා දැන් ආපත්ති ඇතැ'යි කියත් ල. උන් කියන්නේ බොරු ය. විනය දනුම්හ'යි කියා මෙ සේ ත් බොරු කියත් ද? උගත් විනයෙහි බොරු කියන් නට කී තැනු ත් ඇති නිසා ද? බොරු කීව වුන්ව සියලු ම පාප ය සිද්ධ වන නිසා ත් නොදන්නා නිසා ද? ඒ හැම නො දන්නා කල වින ය දන්නේ කෙ සේ දැ'යි කිය ලූ සේක.

Non-Commercial Distribution

ඒ වහන්දෑ ගොසින් විනයධර නම ගේ වහන්දෑ හට තමන් හැම ගේ උපාද්ධ්‍යායයෝ බොරු කියත් ල යි කියා අතළොස්සක් පමණ පැන් නිසා බුදුනු ත් සන්හිඳුවා ලන්ට බැරි තරම් කලහය වඩා ගත් සේක. ඉක්බිති විනයධර නම අවසරයක් ලැබ ගෙන පක්ෂ බල ආදී ම ඇති බැවින් ධර්‍ම කථික නමට අවන් ඇවැත් නො දක්ම නිසා උක්ඛෙපනී කර්‍ම කොට ලා දෙ පක්ෂ වූ සේක. මෙ තැන් පටන් උපස්ථාන කරණ උපාසකවරු ත් තම තමන් ගේ පක්ෂවලට නැමීමෙන් දෙ පක්ෂ වූ ය. අවවාද පිළිගන්නා මෙහෙණින්නෝ ද දෙ භාග වූ හ. නැවත අරක් ගත් දෙවියෝ ද උන් ගේ වසයෙන් තලාටු - බූමාටු දෙවියන් පටන් බඹ ලොව දක්වා පෘථග්ජන යම් කෙණෙක් ඇත් ද දෙ පක්ෂ වූහ. සිවු මහ රජයෙහි පටන් අකනිටා බඹ ලොව දක්වා මහා කොලහල වී ය. කොලහල තරවත් වත් එක් නමෙක් බුදුන් කරා ගොසින් ''ස්වාමීනි, උක්ඛෙපනී කර්‍ම කළ විනයධර නම ගේ පක්ෂයෙහි වහන්දෑ 'කෙළේ ධර්‍ම කර්‍ම ය'යි සිතා වෙන පක්ෂ වූ සේක. උක්ඛෙපනී කර්‍ම ලත් නම ගේ වහන්දෑ 'කෙළේ අධර්‍ම කර්‍ම ය'යි සිත කර්‍ම ය ලත් නම අනු ව පිරිවරා ඇවිදිනා සේකැ'යි දන්වූ සේක.

බුදුහු ධර්‍ම කර්‍ම නියාවකු ත් අධර්‍ම කර්‍ම නියාවකුත් නො වදරා සමඟ වෙත්ව යි දෙ වාරයක් කොට වදරා යවා සමඟ නොවන නියාවක් ම අසා වදරා තුන් වන වාරයේ ''සඟභූ බුත්හ''යි ඒ දෙ පක්ෂය ළඟට කොසඹෑ නුවරට වැඩ උක්ඛෙපනී කර්‍ම කළ පක්ෂයට ආදී ඇවැත් නැතැ යි කියා පසු ව කර්‍ම කිරීමෙහි දෝෂ ත් අනික් පක්ෂයට ආදී විනයධර භික්ෂූන් ගේ බසින් නිරාපත්ති යම්හ යි සිතා ගත ත් පසු ව අර ලෙස කී කල විමති කොට ගෙන වෙමතිකා පත්ති වූව ත් දෙසා නො ගැන්මෙහි දෝෂ ත් වදරා දෙ පක්ෂයෙහි ලබ්ධි වෙන් හෙයින් එක සීමාවේ වෙන වෙන පොහෝ ආදිය ත් අනුදන වදරා අසුන් හල් ආදියෙහි හිඳිනා කල අස්නකට අවසර තබා හින්ද යුතු ය යි බත ගැතැ වත් පනවා ලා එ සේ කලහය නොසන්හුන් නියාව අසා පෙරළා ත් කොසඹෑ නුවරට වැඩ 'මහණෙනි, මේ කලහ ය නම් ඉතා නපුරු දෙයක. අනික් සාධාගන්නා දෙයක් නිසා නො ව කලහය මුල් ව ඉතා දුර්‍වල වූ කැටකිරිල්ලෝ, පවා,—

''කාකඤ්ච පස්ස ලටුකිකං - මණ්ඩූකං නීලමක්ඛිකං,
එතෙ නාගං අඝා තෙසුං - පස්ස වෙරස්ස වෙරිනං''

යනු හෙයින් උපදෙස් බලයෙන් ඇතුන් පවා මරාගත්තෝ වෙද; නොදීන් ලටු කික ජාතකය වදරා ලා යම් තාක් සමඟ ව සමඟ

Non-Commercial Distribution

නො වීම නිසා නො එක් දහස් ගණන් වටුවෝ වසා දමා ලූ දල 'තෙපි ඔසවා තෙපි ඔසව'යි උන් උන්ට පෙරත්ත කීමෙන් ම නො ඔසවා මර දුන්හ' යනාදීන් වට්ටක ජාතකය වදාළ සේක. එ සේ වදාළ අවවාද ත් නො ගිවිස එක් නමක් අවුදින් 'ස්වාමීනි, බැණ නො නැඟී වැඩ හුන මැනව.

"යානි කරොති පුරිසො – තානි අත්ත නි පස්සති,
කල්‍යාණකාරී කල්‍යාණං – පාපකාරී ච පාපකං;
යාදිසං වපතෙ බීජං – තාදිසං හරතෙ ඵලං"

යනු හෙයින් හමු වපුළවුන් හමු දක්නා සේ අපි ම අප ගේ කට යුත්තෙන් පෙනෙන්නමෝ වේ ද'යි කී කල්හි නැවතත් දීඝිති කොසල නම් පිය රජ්ජුරුවන් ගේ රට ත් උදුරා ගෙන දුක් පත් ව ගිය රජ්ජුරුවන් පෙරළා මරා පිට ත් දීඝායු කුමාරයන් තමන් ගේ ගේ පියාණන් 'දිගක් බලව, ලුහුඩක් නො බලව'යි අවවාද ලෙස කියා ලූ බස සිත තබා බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ට අනිකක් නො සිතා සමඟි ව විසූ නියා ව දක්වන සේක් දීඝිති කොසල ජාතකය වදරා 'ගිහි ව සිටියවුන් ගේ පවා අබුද්ධොත්පාද කාලයෙහි එ තරම් ක්‍ෂමා වෙක. තොප හැම මා ගේ කරුණා ශාසනයෙහි මහණ ව ක්‍ෂමා වට ම නියම ව හිඳිනාවුන් මෙ සේ නො සන්හිඳෙන්ට කාරණ කවරේ ද, යනාදීන් අවවාද නමැති බෙහෙත් දෙවා වදරාත් ඒ වහන්දැගේ නලහ නමැති රෝග පීඩාව සන්හිඳුවා ගත නොහී ඒ වහන්දෑ ගේ නොසන්හුන් තරම් බල බලා එ තන රදා වැඩ හිදි නට මැළි ව කොසඹෑ නුවර සිඟා වළඳා වහන්දෑ එක් නමකට ත් නො වදරා හුදකලාව ම පා සිවුරු තමන් වහන්සේ ම හැර ගෙන බාලක ලොණකාරාමයට වැඩ එහි වැඩ හුන් භගු තෙරුන් වහන්සේට හුදෙකලාව හැසිරීමෙහි වත් වදරා, පාචීනවංස නම් උයනට වැඩ අනුරුද්ධාදීතුන් දෙනා වහන්සේට සමඟ ව විසීමෙහි ඵාසු ව වදරා අඹ–දඹ–කෙහෙල් ආදී වූ ගසින් කෙලින් ගැවසී ගත් ඇස්–අස් වලස්–තරස් ආදී වූ සිවුපා සමූහයන් ඇති ගිරා – මොණර–කෙවිලි–ආදී වූ පක්ෂීන් විසින් ගැවසී ගත් සිද්ධ–විද්‍යා-ධරාදීන් විසින් සෙවුණ ලද දෙවහණන් ගේ තන කලසයෙන් අලළන ලද පැනින් පිරුණු සිය ගණන් විල් ඇති පාරලිය නම් වනයට වැඩ ඒ වල තමන් වහන්සේ සේ ම ගණ සංගණිකාවෙහි ඇලුම් නැති ව වෙන් ව වසනු කැමැති ව ඇත් මුළින් තේරී ආ පාරලීය නම් ඇතාණන ගෙන් උපස්ථාන ඇති ව ඒ වල්හි වස් විසූ සේක.

Non-Commercial Distribution

කොසඹෑ නුවර උපාසකවරු ද වෙහෙරට අවුත් බුදුන් නො දක 'බුදුහු කොයි දැ' යි විචාරා 'පාරිලෙය්‍ය වනයට වැඩ පී සේකැ'යි යනු අසා 'හැයි එ සේ වැඩ පියන්ට කාරණ කිම් දැ'යි විචාළෝ ය. විචාලවුන්ට අපි හැම ගේ කලහ ය බලවත් හෙයින් ඒ සන්හිඳුවන්ට අවවාද වදරා ඒ අවවාද අප හැම නො ගිවිස්නා හෙයින් වැඩ පී සේකැ'යි - කලහ නම් හයක් ලජ්ජාවක් ඇති ව කරණ දෙයක් නො වන හෙයින් ලජ්ජා නැති ව ම කී සේක. උපාසකවරු 'නුඹ වහන්සේ හැම බුදු සස්නෙහි මහණව පොළොව පැකිළී ගියවුන්ට එම පොළොව පිහිට වන්නා සේ සියලු ලෙසින් පිහිට ව සිටි බුදුන් ගේ අවවාද ත් නො පිළි ගත් නියාදැ'යි විචාරා එ සේ ය යි කී කල්හි උපාසකවරු 'මේ වහන්දෑට උපස්ථාන කොට බුදුන් වැඩි ගමනේ දක්නට වත් වැඳ ගෙන උපස්ථාන කොට ගන්නා පමණකට වත් නැත. ඔබට කරණ උපස්ථානය මේ වහන්දෑ නිසා නුවූ පසු මේ වහන්දෑට බත් පැන් තබා හිඳිනා පමණකු ත් නො දෙම්හ. වඳිනා පමණකු ත් නො කරම්හ'යි තර ව ගෙන එ වක් පටන් ඒ හැම නොකරන්නට වන්හ.

පාත්‍ර පය්‍ර්‍යාපන්න ව රැකෙන හෙයින් සිඟා ගොසින් ලබන බතක් විනා අනික් ජීවනොපායක් නැති හෙයින් බත් නො ලදින් වියැළී කීප දවසකින් ම කය වියැළුණ ත් නුවණ වියැළෙන දෙයක් නොවන හෙයින් කාරණ සලකා මොළොක් සිත් ඇති ව ගෙන ක්ෂමා නොකරවා නිහඬක් නැති හෙයින් ඔවු නොවුන් වහන්සේ ක්‍ෂමා කරවා ගෙන උපාසක වරුන් කරා ගොසින් 'උපාසකවරුනි, බුදුන් ගේ අවවාදයෙන් සමඟ නො වූව ත් තොප හැම කියා කළ දෙයින් අපි හැම සමඟ වූම්හ. අප පෙර සැටි වූ කල තොප ත් පෙර සැටි වුව මනා වේ දැ'යි කී සේක. ඒ අසා උපාසකවරු 'බුදුන් ක්‍ෂමා කරවා ගන්නා ම අපි ත් පෙර සැටි වම්හ'යි කිවු ය. ඒ වහන්දෑ ද ඇත වසන හෙයින් බුදුන් ළඟට යෑම වත් නොවන හෙයින් වස් දෑතුර දුකින් ම දවස් යවන සේක. කාරිය නො දන්නා වහන්දෑට ඒ වස දුක්වූ බව මුත් ඒ සා මහත් ව කට වැඩි බුදුන්ට කිසි දුකෙක් නැත.

ඒ ඇතාණෝ ද බුදුන් දක ළඟට ගොසින් වැඳ ලා කැටි ව ආ අනික් තෙනක් නැති නියාව දක වැඩ සිටි රුප්පයේ ම තණ පයින් උදුරා පියා අත්තක් කඩා ගෙන අවුත් හැමඳ පියා බුදුන් වස් වැස වැඩ හුන් කල්හි වස් තුන් මස ම කළ ය සොඬින් හැර ගෙන ගොසින් බොන පැනු ත් ගෙනවුත් තබා ලති. නහන පැනු ත් ගෙන තබා ලති. හුණු පැන් වුව මනා විට දණ්ඩක්

කඩා ගෙන ගිනි ගා හෙළා පියා දර ලා ලා ගිනි මොළවා ලා ගලක් පෙරළා ගෙන අවුත් ගින්නේ ලා රත් කොට දණ්ඩකින් ගල පෙරලා ගෙනවුත් කුඩා ගල් කෙමෙක හෙළා ලා පැනිත්ත හුණු වූ කල්හි සොඩ ලා විතර හුණු දූන බුදුන් කරා ගොසින් වැද ලති. බුදුහු 'පාරලෙයාායෙනි, පැන් හුණු කළා දැ'යි විචාර ලා එ තපාට වැඩ පෙර වරු පැන් සනහන සේක. පැන් සනහා අන්තයෙහි වළට වැද ලා නො එක් ඵලාඵල ගෙනවුත් පිළිගන් වති. බුදුහු ඒ වළඳා වදරණ සේක.

යම් දවසෙක බුදුහු ළං ව තිබෙන ගමකට සිඟා වඩනා සේක් වී නම් පාත්‍ර ධාතූන් වහන්සේ හැර ගෙන හිස මුදූනේ තබා ගෙන බුදුන් හා කැටි ව යෙති. බුදුහු ගම් හිමට වැඩ ලා 'පාරලෙයාායෙනි, තොප ඇතුළු ගමට එන්ට නො පිළි වනැ'යි පාත්‍ර ධාතූන් වහන්සේ අතට හැර ගෙන ගමට සිඟා වඩනා සේක. ඇතාණෝ ද වඩනා තෙක් එ තන රඳා සිට ලා ගම සිඟා පියා වැඩි කලට පෙර ගමන් කොට ගොසින් පාත්‍ර ධාතූන් වහන්සේ හා සඟළ සිවුරු හැර ගෙන ඇත් රජ කමට මුඩු වොටුන්නක් පළඳිනා කලක් මෙන් හිස මුදුනෙහි තබා ගෙන වැඩ හිඳිනා තෙනට ගොසින් ආදියෙහි පටන් වත් පිළිවෙත් ම උගත්තා සේ පා සිවුරු තැන් පත් කොට තබා ලා පා සේදීම් ආදි වූ වත් සපයා ලා ගිම් නිමනට අත්තක් කඩා ගෙන ඇඟට සල සලා සිට ලා වළඳා අන්තයෙහි ත් කළ මනා වත් කොට ලා රෑ දවස් බුදුනට රැකවල් ගෙන මහා දණ්ඩක් සොඩින් අල්වා ගෙන තුන් යම් රාත්‍රිය මුළුල්ලෙහි වනය සිසිරා ඇවිද පාන් කෙරෙති. එසේ හෙයින් ඒ වනය රක්ඛිත වන ය යි ප්‍රසිද්ධ විය. පාන් වූ කලැ දූහැටි–පැන් දෙමින් මළුව හමදිමින් කළ මනා වත් සපයති.

එම වල වසන එක් රිළවෙක් ද ඒ ඇතාණන් කරණ උපස්ථාන දූක ''මම ද උපස්ථානයක් කෙරෙමි'යි සිතා ඇවිදිනේ එක් දවසක් නිමැසි දඬුවෙල්බැයක් දූක කඩා ගෙන කෙහෙල් පතක් කඩා ඒ මත්තේ තබා ලා ගෙන ගොස් බුදුන්ට පිළිගැන් වි ය. බුදුහු ත් කුඩු කැවුම් වුව ත් නො මැළි ව පිළිගන්නා හෙයින් පිළිගත් සේක. රිළවාණෝ ද බලා සිටියෝ අල්වා ගෙන නො වළඳා ම වැඩ හුන්නා දූක කුමක් සිතාදෝ හෝ යි සිතා මූල ප්‍රතිසන්ධි ය ජඩ හෙයින් ඥානසම්ප්‍රයුක්ත විපාක සිත් තමන්ට නැත ත් ඥාන සම්ප්‍රයුක්ත කුසල් සිත් තමන්ට පවත්නා හෙයින් පිළවුත් ඇති නියා ය යි සිතා දඬුවෙල්බැය අල්ලා ගෙන

Non-Commercial Distribution

පිළවුන් දැක සියුම් මෙහෙවරට නිසි ව සීන් වූවා සේ සීන් වූ ඇඟිල්ලෙන් නොගටා පිළවුන් හවුලා හැර ලා පිළිගන්වා ලූ ය. දෙවියෝ එ වේලෙහි සක් වළ ගබ ඇති රස ය දඹුවෙල්බෑයෙහි මැස්සන් බහා ලූ නො එක් දෙය රස වූ බව මුත් රසයක් බහා ලූවා නැත ත් බහා ලූහ. බුදුහු වළඳා වදළ සේක.

රිළවාණෝ ද සතුටු කුල්මත් ව නට නටා අත්තක එලී ගෙන අත්තක් පයින් මැඩ ගෙන සිටියේ ය. අකුසල් නම් කුශලට ඉතා ප්‍රතිපක්‍ෂ හෙයින් අවසරයක් පෙණෙන තුරු කැටි ව ඇවිදිමින් සිට අතුරු පැවත ගිය කුශලයට අප්‍රිය ව කොට ලූවාක් මෙන් පුරා කෘත අකුසලින් අල්වා ගත් අත්තක් පයින් මැඩ ගත් අත්තක් බිඳී කඩා ගෙන හෙන්නේ එක් කණු වෙක ඇණී ඇවිණ දත් විශයෙහි පැවති පහන් සිතින් යුක්ත ව මිය තව්තිසා දෙව් ලොව එක් සිය විසි ගවුවක් උස ඇති රන් විම නෙ ක කඩ රෙද්දකින් වසා ලූ මැණිකක් උස් තෙනකට නො වරදවා දමා ලූ කලට දමාලූ වේගයෙන් කඩ රෙද්ද බිම හී මැණික උඩ ම රඳා ගියා සේ රිළා අත් බැවු පාත හෙළා තුන් ගවුවක් විතර ආත්ම භාවයකින් යුක්ත ව දහසක් දෙවඟණන් පිරිවරා දෙවියන් දඹුවෙල්බෑයෙහි බහා ලූ බොහෝ රස සේ බොහෝ සම්පතින් යුක්ත වදුන් මී රසයට නිවන් රස ලබන්නට ත් නිසි ව උපන.

බුදුනු ත් පාරලෙය්‍ය ඇතාණන් ගෙන් උපස්ථාන විඳ ඒ වල වසන නියාව දඹ දිව ප්‍රසිද්ධ වී ය. සැවත් නුවරින් අනේපිඬු මහ සිටාණෝ ය, විශාඛාවෝ ය, යනාදි ප්‍රසිද්ධ කුලවලින් බුදුන් දක්නා කැමැත්තම්හ යි අනඳ මහ තෙරුන් වහන්සේට කියා යැවූ ය. ඒ ඒ දිගින් පන් සියයක් පමණ වහන්දෑ ද අනඳ මහ තෙරුන් වහන්සේ කරා ගොසින් 'ඉතිකින් වසු ත් අන්ත වී ය. බුදුන් ගෙන් බණක් නො අසන්නේ ත් නැතක් දවසෙක. දක්නා කැමැත්තම්හ' යි කී සේක. අනඳ මහ තෙරුන් වහන්සේ ඒ වහන්දෑ කැඳවා ගෙන ගොසින් වස් තුන් මස තනි ව වැඩ හුන් බුදුන් ළඟට මෙ තෙක් වහන්දෑ ත් කැඳවා ගෙන යෑම යුක්ති නො වෙ යි සිතා ඒ වහන්දෑ පිටත රඳවා ලා තනි ව ම බුදුන් කරා ගිය සේක. පාරලෙය්‍යයෝ අනඳ මහ තෙරුන් වහන්සේ දැක ලා විපක්‍ෂ තෙනෙකැ යි සිතා මරන්ට දණ්ඩක් හැර ගෙන නික්මුණාහු හ.

බුදුහු දැක 'පාරලෙය්‍යයෙනි, මූ මට අග්‍ර උපස්ථායක ව උපස්ථාන කරණ තැනැත්තෝ ය. මා මරන්ට ය යි දෙවිතුන්ගේ නියෝගයෙන් නාළාගිරි නම් ඇතු ගුගුරා පියා ආ දවස් මා පසු

කොට පියා මූ පෙරාතු වූ කෙණෙක. නැවත සුවණ්ණකක්කටක ජාතකයෙහි දී මූ තුමූ කකුළු ව උපන් තැනැත්තෝ මා ගේ ඇස් සාරන්ට හුන් කපුටුවා ත් අල්වා ගෙන ඌට සහාය ව ආ නයා ත් අල්වා ගෙන නායි ලවා දෂ්ට කළ මුඛයෙන් විෂය උරවා මා ත් නිර්විෂ කොට පසු ව ත් මට අවැඩ නොවන ලෙසට කපුටුවා ත් නායි ත් මරා පී ය. නො එක් ජාතිවල උන් මට වූ උපකාර බොහෝ ය. උන් එන්නවුන් තෙපි නොවළක්ව'යි වදාළ සේක. ඇතාණෝ ද දඬු කඩ දමා පියා සඟළ සිවුර හා පත්‍ර ය ඉල්වූ හ. මහ තෙරුන් වහන්සේ බුදුන් ළඟදී එ සේ දීම වත් නො වන හෙයින් නුදුන් සේක. දඬු හැර ගෙන මරන්ට ගිය හෙයින් මුසුප්පුවකින් නො වෙයි. ඇතාණෝ ත් මා අතට පාත්‍ර සිවුරු නුදුන් හෙයින් බුදුන් වැඩ හිඳිනා ගල් පෝරුව මත්තේ පා සිවුරු තබා වත් වරදවා නොගත් සේක් නම් යහපතැ'යි සිතූ ය.

ඇතාණන්ට වඩා කප් ලක්‍ෂයක් මුළුල්ලෙහි බුදු කෙණකුන් වහන්සේට වත් කරන්නට පතා ආ මහ තෙරුන් වහන්සේ වත් දන්නා ම හෙයින් පා සිවුරු බිම තබා ලූ සේක. වත් දන්නා තැන් ගුරුන් වහන්සේ සැතපෙන හැඳවල පුටුවල පා සිවුරු ආදි ය නො තබන සේක. එ සේ හෙයින් අනඳ මහ තෙරුන් වහන්සේ ත් පා සිවුරු තැන් පත් කොට තබා ලා බුදුන් වැඳ එකත් පස් ව හුන් සේක. බුදුහු තනි ව නො වැඩි නියාව දැන වදාළ ත් තනිය ම අවුදැ යි විචාළ සේක. "පන් සියයක් දෙනා වහන්සේ ආ සේක. නුඹ වහන්සේගේ රුචි නොදැන පිටත රඳවා ලා ආමි' කී කල්හි 'එසේ වී නම් මුඛ කැඳව'යි වදාළ සේක. වදාළ විධානයෙන් මහ තෙරුන් වහන්සේ ත් කැඳවා ගෙනා සේක. බුදුහු ඔබ හා ත් කථා කොට ලා වැඩ හුන් සේක. ඒ වහන්දෑ ද "ස්වාමීනි, නුඹ වහන්සේ ඉතා ම සියුමැළි වූව. මේ තුන් මස හුදකලාව වැඩ හුන්නේ ත් කෙ සේ ද? අනඳ මහ තෙරුන් වහන්සේ පමණකු ත් නො ආ හෙයින් පැන් පරහා දීම් පමණකුත් කොළෝ කවුරු ද? බලවත් ව ම අඵාසු වුනැ යි සිතුම්හ'යි කී සේක. බුදුහු ඒ අසා 'මහණෙනි! එ සේ නො සිතව. තෙල පාරලෙය්‍ය නම් ඇතාණෝ කළ මනා සියල්ලක් අඩුවක් නැති ව ම කොළෝ ය මෙ බඳු සහායක් ලදෙ ත් උන් හා එක් ව විසීම යහපත. එ සේ නො ලදෙත් රට හැර වල ගිය රජ්ජුරු කෙණකුන් රජ නියාව නො හභවන්ට තනි ව වසන්නා සේ තනි ව වැස කළ මනා ලෙස ත් කිරීම යහපත' යනාදී බණ වදාළ සේක.

Non-Commercial Distribution

ඒ වදළ බණ අසා පන් සියයක් දෙනා වහන්සේ දෙ තුන් මසක විතර බී පියන්ට තිසි පැනක් නො ලදින් පිපාසා බලවත් ම ලත් පැනක් සැතපී බී පියන්නා සේ බුදුන් ගෙන් ම බණක් අසන්ට සිතා තුන් මසක් විතරින් ලත් බණක් හෙයින් කන් නමැති දහසක් ගොටු වල වත් කරවා ගෙන, සිත් නමැති තුඩුවලින් පුරා බී සව් කෙලෙස් නමැති පැන් පවස් සදහම් නැමැති පැනින් සන්හිඳුවා රහත් වූ සේක. අනඳ මහ තෙරුන් වහන්සේද අනාථපිණ්ඩික සිටාණන්-විසාඛා උපාසිකාවන් පටන් ඒ ඒ දෙනා කියා යවූ හසුන් ධර්මාන්විත හසුන් හෙයින් වදරා "ස්වාමීනි, අනාථපිණ්ඩිකාදිවූ පස් කෙළක් විතර නිවන් දක සිටි උපාසක වරු මාර්ග ගත වූ අවල ශ්‍රද්ධාවෙහි තමන් පිහිටි හෙයින් මුඹ වහන්සේ දක්නට පත පතා හිඳිති'යි වදළ සේක.

බුදු හු ත් කොසඹෑ නුවර වහන්දෑ සෙසු ලෙසකින් හැද නො හැරෙන දඬු ගින්නට පෑ තවා ලූ කල හැරෙන්නා සේ කොසඹෑ නුවර උපාසකවරුන්ගේ ක්‍රම නමැති ගිනි රැසින් කලහ නමැති ඇද හැරී සමඟ වීමෙන් කම් පසට ගිය නියාව දන වදරා එ සේ වී නම් සඟළ සිවුරු පාත්‍ර ය හැර ගනුව'යි අනඳ මහ තෙරුන් වහන්සේ ලවා පා සිවුරු ගෙන්වා ගෙන සදත් දයෙ හි ඡද්දන්ත නම් ඇත් රජ ව ඉපද පසේ බුදු වරුන් වහන්සේට කළ උපස්ථාන සේ ම පාරලෙය්‍යයන් ගෙන් උපස්ථාන විඳගෙන නික්මුණුසේක. ඇතාණෝ ද වඩනා නියාව බලා පියා පෙරාතු ව ගොසින් ඒ ජාතියෙහි තමන් නිවන් මහට අවුරා සිටියා සේ ම බුදුන් වඩනා මඟ අවුරා සිටියෝ ය. පන් සියයක් දෙනා වහන් සේ ද "මේ හස්ති නාගයා බුද්ධ නාගයන් වහන්සේට මඟ අවුරා සිට ගෙන කුමක් කරණ නියා ද'යි විචාළ සේක.

'මහණෙනි, අනිකක් නිසා නො වෙ යි. වස් තුන් මස මට කළ උපස්ථාන මුදුන් පමුණුවා තොප හැමට ත් උපස්ථාන යක් කරනු කැමැත්තෝ ය. මට කළ උපස්ථානයට ත් වඩා සර්වගත හෙයින් තොපට කළ උපස්ථානයෙහි උන්ට විපාක ත් මහත. අද පමණකු ත් නොරඳා ගියො ත් වේගවත් ව පැවති ප්‍රසාදය ත් අඩු ය. ප්‍රසාද ය අඩු වූ කලට ලබන විපාක ත් අඩු ය. කවර ලෙසිනු ත් මූට අඩුවක් නුවමනා වෙ ද'යි සිතා වදරා මරන්ට දිව ගෙන ආ නාළාගිරි නම් ඇතා කෙරෙහි ත් මුන් කෙරෙහි ත් අදහස සම වුව ත් මුන් කෙරෙහි අමුතු මමායන යක් ඇත්තා සේ මේ තරම් කෙණකුන් අනික් ජාතියක වුව ත් ලොවුතුරා සැපත් ලබන හෙයින් ආමිස ගරුක නො වත ත් ධර්ම

Non-Commercial Distribution

ගරුක ව සහපිරිවරින් රඳා පි සේක. ඇතාණෝ ද වලට වැද ලා අඹ-දඹ කෙසෙල්-වැල-වරකා ආදී වූ එලා එල ගෙන වුත් ගොඩක් කොට පියා දෙවන දවස් වහන්දෑට පිළිගැන් වූහ. ඒ වහන්දෑ ත් පන් සියයක් දෙනා වහන්සේ වළඳා ත් කෙලෙසුන් නිමවා ගත්තා සේ මේ නිමවා ගත නුහුණු සේක. ඒ නිමවා ගත නුහුණ ත් පමණක් මේ නිමවා ගෙන බුදුන් කැඳවා ගෙන නික්මුණු සේක. ඇතාණෝ ද වහන්දෑ හසු හස්නෙන් ගොසින් පෙරාතු ව ලා අවුරා ගෙන සිටියෝ ය. එ දවස් එ සේ සිටි නියාව ත් දැක වහන් දෑ විචාළ සේක.

බුදුහු වදාරණ සේක් 'තොප හැම දෙනා යවා පියා මා පම ණක් රඳවනු කැමති ව මේ ලෙස කෙරෙති' වදාරා ලා 'හෙම්බා පාරලෙය්‍යයෙනි, මේ ගමන අවශ්‍යයෙන් යා යුතු ගමන. රඳා ත් තොප අභාජන හෙයින් ලෞකික විෂයෙන් ධ්‍යාන වේ ව'යි ලොව්තුරා විෂයෙන් මාර්‍ග එල වේ ව යි උපදවා ලන්ට බැරි ය. තෙපි රඳව'යි වදාළ සේක. ඇතාණෝ ද ඒ අසා සොඬ කට ලා ගෙන හඬමින් වලපමින් පසු පස්සෙහි ගියෝ ය. ඉදින් බුදුහු රඳුණු සේක් වී නම් දිවි හිමියෙන් තෙල ලෙස ම උපස්ථාන කෙරෙති. බුදුහු ගම් හිමට වැඩලා ඇතාණන්ට 'මෙතන පටන් මිනිස් සඤ්චාරය ඇති හෙයින් තොප එන්ට බැරි ය. තෙපි රඳ ව'යි රඳවා වදාළ සේක. උයි ත් රඳා සිටි තෙනැත්තෝ බුදුන් නො පෙනෙන තෙනට වැඩ පී කල්හි ශොකයෙන් වියළී මිය ගොස් තවුතිසා දෙව් ලොව එක් සිය විසි ගවුවක් උස ඇති රන් විමනෙක දහසක් දෙවඟනන් පිරිවරා ඉපිද පාරලෙය්‍ය නම් දිව්‍ය පුත්‍රයාණෝ ය යි ප්‍රසිද්ධ වූ ය. වළඳා නිමවා ලිය නුහුණු එලා එල ගොඩ සේ ම කියා නිමවා ලිය නො හැකි දිව සැපත් ද පහළ වි ය.

බුදුහු ත් මහණ ගණා පිරිවරා දෙව්රමට වැඩි සේක, කොසඹෑ නුවර වහන්දෑ ද බුදුන් දෙව්රම් වෙහෙරට වැඩි නියාව අසා දුක්බුප නිසා ශ්‍රද්ධාවෙන් බුදුන් වැඳ ක්‍ෂමා කරවන්ට ගිය සේක. කොසොල් රජ්ජුරුවෝ ඒ වහන්දෑ එන නියාව අසා බුදුන් කරා ගොසින් 'ස්වාමිනි' ඒ දුෂ්ට වහන්දෑ මාගේ විධාන පවත්නා තෙනට එත නො දෙමී' කිවු ය. 'මහරජ තමන් හැම දෙනාගේ කලහ ය මහත් හෙයින්.

**'කුද්ධො අත්‍ථං න ජානාති-කුද්ධො ධම්මං න පස්සති,**
**අන්ධං තමං තද හොති- යං කොධො සහතෙ නරං'**

Non-Commercial Distribution

යනු හෙයින් කාරණය සලකා ගත නොහීමගේ අවවාද නො කළ බව මුත් සිල්වත්හ. තෙල විතරෙකින් හළ යුත්තෝ නො වෙති. තුමූ හැම ත් තැති ගෙන මා ත් ක්‍ෂමා කරවන්ට එති. නො නවත්ව'යි වදාළ සේක. අනේපිඩු මහ සිටාණෝ ත් 'සසුන් පිළිවෙත් මහට නොබැස තමන්දෑ හැම මීරිකන වල් මද හෙයින් දෝ බුදුන් වහන්සේ ත් වලව යවා පී වහන්දෑ ය. මා ගේ විහාර යට වැද්ද නො දෙමි' හිඳ බුදුන් ගේ පෙරැත්තයෙන් ඉවසා පීහ. ඒ විහාරයට ගිය වහන්දෑට ත් බුදුහු කළහ ය නිසා අදහස් වෙන් වූවා සේ ම සැතපෙන තැනු ත වෙන් ව නිල කරවා වදාළ සේක. සෙසු වහන්දෑ ඒ වහන් දෑ හා එක් ව හිඳිනෙ ත් සිටිනෙ ත් නැත. අමුතු ව ගිය වහන්දෑ ඇත් නම් කොසඹෑ නුවර කලහකාරී වහන්දෑ කොයිද්දෑ'යි බුදුන් විචාරණ සේක. බුදුහු තුමූ 'එක මුළු ව ලා හිඳින්නෝ උඹ ය'යි වදරණ සේක. වහන්දෑ ත් 'මූ උඹ ද, මූ උඹ දෑ'යි ඇඟිලි ඇසට පානා සේක. ඒ වහන්දෑ ත් ආදී වූ ලජ්ජාව ට ත් වඩා ලජ්ජාව ගොසින් බුදුන් වැදලා ක්‍ෂමා කරවූ සේක.

බුදුහු ද 'හෙම්බා මහණෙනි, යම් කෙණෙක් කලහයෙහි ආදී නව නො දනිත් නම් උඹ තමන් කරණ කලහ ය ම දන්නා සේ පමණක් මුත් 'අපි මරහු කරා යම් හ. කෙ තෙක් දවස් ජීවත් වූව ත් කෙළවර නිමන්නේ මරණින් ම වේදෑ'යි යන්න ත් සෙසු පිළිවෙත් හළුවා සේ මරණ සී භාවනා ත් කළ හෙයින් නො දනිති. ඉදින් යම් කෙණෙක් නුවණැත්තෝ වූ නම් කාරණා කාරණ දනිත් නම් උඹ 'මේ කලහ ය නම් කරණ කල ත් දුක, පසු ව අනිෂ්ට විපාක විඳිනා කල ත් දුක, කිඹුල් වත් නුවර එක් ලක්‍ෂ සැට දහසක් විතර රජ දරුවන් සටන් කොට ලෙහෙ ගඟක් කරන්ට සිතා ගත්තේ ත් දිය ඩබරක් මුල් ව ය. සියලු ලෙසින් ම කළ මනා දෙයක් නොවෙ'යි සිතා යම් ලෙසකින් පිළිපන් කල ඒ කලහ ය සන්හිඳේ නම් එ ලෙස ම පිළිපදිති. එ සේ පිළිපන් කලට මට ත් සන්හිඳුවා ලන්ට බැරි ව තුබූ මේ කලහ ය සන්හුන්නා සේ ම කවර ත් කලහයක් නොසන්හිඳේ දෑ'යි වදාළ සේක.

මේ බණ අසා ද හේතු සම්පන්න තැන් සසර නමැති මුහු දින් මාර්‍ග ඵල නමැති නැව් නැඟී නිවන් පර තෙරට පැමිණි සේක. එ සේ හෙයින් සත් පුරුෂයන් විසින් කලහ නමුත් කුසල් සිතකින් කරණ දෙයක් නොවන බැවින් අකුසල් නියාව දැන රෑ දුටු වළ දවල් පැන හෙන්නා සේ නො ව කුසල්හි ම හැසිරී මෙන් චිත්ත ශුද්ධිය කට යුතු.

———

Non-Commercial Distribution

# 10. මහාකාල තෙරුන්වහන්සේගේ වස්තුව

තව ද යම් කෙණෙක් තදඞ්ගාදි විමුක්ති නමැති කෘෂිවණික් ආදී වූ කර්මාන්තයෙන් ශීල සමාද්ධ්‍යාදී ගුණ නමැති සම්පත් ඇති කොට ගෙන ඇති කළ සම්පත් රැක ගන්ට නිසි උපදෙස් නො දන හෝ දන ත් ආලෙස්සම් ව රැක ගත නුහුණුව නම් උන්ට වන හානි ද සීල සමාද්ධ්‍යාදි ගුණ නමැති සම්පත් ඇති කරණ සේ දන රූපාදී ෂඩාලම්බන නමැති වල්හි හිඳ ලා චක්ෂුරාදී දොර වල් හැර ලා තුබූයේ වී නම් එයින් වැද කෙලෙස් සොරු සිත් සතන් නමැති නුවර තුබූ ගුණ බඩු හැර ගනිත් නමුත් ය යි චක්ෂු රාදි ස දොර සිහි නමැති දොර පියා ලා නුවණ නමැති අගුළු ලා ලා හුන්නවුන්ට වන අනුසසු ත් දක්වනු සඳහා ශීල සමාද්ධ්‍යාදී අවශිෂ්ට ගුණ ධර්ම නමැති කෙ තෙක් ආභරණ ලා සිටිය ත් සද-හම් නමැති රුවන් වැළ ය නැත් නම් නොහොබනා හෙයින් යම් කෙණෙක් එයින් ලා සැරහෙන්ට සිත ත් නම් ඔවුන් පළඳින්ට අප ගේ කථා ප්‍රබන්ද නමැති රන් කෙන්දෙහි මහාකාළ තෙරුන් වහන්සේ ගේ වස්තු නමැති රුවණ ත් අවුනමු.

හේ කෙ සේ ද යත්:

දඹ දිව **සෙතව්‍ය** නම් නුවර කෙළෙඹි පුත්‍රයෝ තුන් බෑ කෙණෙක් ඇත. ඉන් වැඩි මාලු තැනැත්තෝ **මහා කාළ** නම් හ. මැදි බෑ තැනැත්තෝ **මජ්ඣිමකාළ** නම් හ. කුඩා තැනැත්තෝ **චුල්ලකාළ** නම් හ. ඒ තුන් දෙනා ගෙන් මැදි බෑ තෙනැත්තන් නුවර රඳවා ලා වැඩි මාලු තෙනැත්තෝ බාල මලණුවන් කැඳවා ගෙන වෙළඳාමෙහි යෙති. ගෙනා දෙය රඳා හුන් මැදි බෑ මලණුවෝ බඩුවට බඩු ගැන්මෙන් වෙළඳාම් කෙරෙති. ඉක්බිත්-තෙන් එක් සමයෙක වෙළඳාමේ යන දෙ බෑයෝ ගැල් පන් සියය කින් නො එක් බඩු ගෙන්වා ගෙන සැවැත් නුවර බොහෝ මිනිසුන් ඇති හෙයින් ගෙන ගිය බඩු ඔබ්බකට නොගොස් විකවා ගන්නා නිසා ඔබ ගොසින් සැවැත් නුවරට ත් දෙව්රමට ත් මද්ධ්‍යයේ ගැල් රැඳ වූ හ. දෙ බෑයන් ගෙන් වැඩි මාලු මහා කාළ නම් කෙළඹියාණෝ සවස් වේලේ සැදි පැහැදී ගෙන සුවඳ මල් ආදිය ත් හැරගෙන බණ ඇසුම නිසා බොහෝ දෙනා යන්නවුන් දක තමන් හිඳිනා තැන පසල් දනවුව තිබෙන හෙයින් නොදන "මුන් හැම යන්නෝ කොයි ද" යි විචාරා බණ අසන්නට විහාරයට යන නියාව උන් හැම අතින් ම අසා කෘත පුණ්‍ය-හෙයින් සිත නැමී 'මම ත් යෙමි' සිතා ලා මලණුවන් කැඳවා 'මල, ගැල් බිය පත්ව ව, මම බණ අසන්ට මුන් හැම හා කැටි ව යෙමි' කියා ගොසින් බුදුන් වැඳ අමුතු ව ලා ගිය හෙයින් මුල හිඳිනට නැති ව පිරිස් කෙළවර හුන් හ.

Non-Commercial Distribution

බුදුහු එ දවස් බණ වදරණ සේක් රත්රන් රිදී මුතු මැණික් ආදී වූ සෙසු බඩුවෙහි ඇලුම් හැර දහම් බඩුවෙහි ඇවිටි වන ලෙසට දුක්ඛක්ඛන්ධ සූත්‍රාදී සූත්‍ර බණ එළවා ගිහි සම්පතෙහි බොහෝ ආදීනව වදාළ සේක. බණ අසා මහා කාළ උපාසකයෝ ලෙඩක් ඇති කෙණෙකුන් පිළියම් දන්නා වෙද කෙණකුන් කරා ගොසින් පිළියම් විචාරා මේ ලෙඩට මේ මේ දෙය නපුර. මේ මේ දෙය යහපත යි කියා ලූ දෙයක් කා පියන්ට බී පියන්ට ඉතා බැරි වුව ත්, කා පියන්ට බී පියන්ට පිළිවන් අපථ්‍ය දෙයෙහි ආල ය හැර පථ්‍ය දෙයෙහි ම කරණ ආලයක් මෙන් ප්‍රතිපත්තිය රූක්‍ෂ වුව ත් කෙලෙස් ලෙඩ නැති ව යන්නා සේ අති මධුර වූ නිවන් රස අනුභව කට හැක්කේ මහණ වූ කල ය. මම ද මහණ වෙමි සිතා ලා හැම දෙනා වැඳ සමු ගෙන නික්මුණු කල්හි තමන් මහණ කරන්ට බුදුන්ට ආරාධනා කළ හ.

බුදුහු 'තොප විසින් මහණ වන නියාව කියා ලන්ට නිසි ව සිටි නෑයෝ නැද්දෑ'යි විචාරා ළඟ හුන් මලණුවන්ගේ ස්වරූප කී කල්හි උන් පමණකට ත් කියව යි වදාළ සේක. උයි ත් ගොසින් 'මල, මේ සම්ප ත් මුළුල්ල ම තොපට ය. තෙපි පිළිපදුව'යි කිවු ය. 'නුඹ දූනැ'යි කියා මලණුවන් විචාළ කල්හි තමන් මහණ වන්ට සිතන නියාව කිවු ය. ඒ අසා නො එක් ලෙස බාධා කොට ත් මූදට නැමුණු මහ ගඟක් සේ මහණ වීමෙහි සිතාග ත් සිතිවිල්-ලට බාධා කොට නොහී යහපතැ'යි ගිවිස්සෝ ය. මහාකාළ උපාසකයෝ මලණුවන් ගෙන් අනුමැති ලැබ ගොසින් බුදුන් ළඟ මහණ වූහ. චුල්ලකාළ උපාසකයෝ ත් එක් ව හිඳ එක් වන කථා කිරීමෙන් මහණ වීමට නැමුණු සිත පෙරළා සිවුරු හැරීමට ත් නම්වා ගෙන එක් ව සිවුරු හළ හැක්කැ යි යන සිතිවිලි සිතා උන් වහන්සේ සිවුරු හරිත ත් නො හරිත ත් තමන් සිවුරු හරින්ට ම සිතන හෙයින් වස්තුයෙහි ප්‍රයෝජන ලෙස කම් පිළිපැද ලා තුමූ ත් මහණ වූ ය.

මහණ වූ මහා කාළ තෙනත්තන් ද පසු ව උපසම්පදව ත් ලැබ උපසම්පන්න වූ පසු බුදුන් කරා ගොසින් ශාසනික තෙනට වුවමනා ධුර විචාරා ග්‍රන්ථ ධුර-විදර්ශනා ධුර දෙක වදාළ කල්හි 'ස්වාමීනි, අප වැඩි මාලු කල මහණ වූ හෙයින් බාල අවස්ථාවට වුව මනා දෙයක් හෙයින් ග්‍රන්ථ ධුර ය බැරි ය. විදර්ශනා ධුරය පුරමී' කියා ලා රහත් වීම දක්වා සොසානිකාදි ධූතාඞ්ගයෙහි සමාදන විධාන ප්‍රභෙදනිංස සකසා සැක හැර බුදුන් ගෙන් ඉගෙන ගෙන පෙර යම දස පැය ගිය කල්හි මධ්‍යම රාත්‍රි වේලාවට

හැම දෙනා නිද වැතිර ගිය කල්හි අසුබ අරමුණු දක්නා නිසා සොහොන් බිමට ගොස් දුටු අරමුණක් විෂ ය කොට ගෙන භාවනා කොට අළු යම් වේලේ හැම දෙනා නැගී නොසිටිනා තෙක් වෙහෙරට වඩනා සේක.

එ කල මිනී දවා ඇවිදිනා කාළී නම් සොහොන් ගොවු දුවක් තොමෝ ත් තෙරුන් වහන්සේ වඩනා සොහොන් බිමට මිනී දවනු නිසා එළඹෙන්නී, තෙරුන් වහන්සේ භාවනා කොට කොට වැඩ සිටි බිම හෙළි වූ නියා ද, වැඩ හුන් තෙන ද, සක්මන් කරණ තැන ද, දැක 'මු කවුරුදෝ හෝ'යි පරීක්ෂා කෙරෙමි සිතා නො එක් ලෙසින් පරීක්ෂා කොට දවස් මැද වඩනා හෙයින් වඩනා නියා වක් ම දැන ගත නො හී නියම කරණු ම පිණිස එක් දවසක් කිසි විටෙක රඳනු නිසා සොහොන්හි කරණ ලද කිළියෙක පානක් නභා තබා දුන් පුතුනු ත් කැඳවා ගෙන ගොසින් සැඟවී වැද හිඳ එ දවස් මැද මෙ තෙක් දවසුත් වඩනා වේලාවට වැඩියා වූ තෙරුන් වහන්සේ දැක වැඳ ලා 'ස්වාමීනි, මෙහි වසන සේක් මුඹ වහන්සේ දැ'යි විචාළෝ ය. 'එ සේ ය. උපාසිකාවෙනි'යි වදළ කල්හි 'ස්වාමීනි, සොහොන්හි වසන කල නම් නො එක් ලෙසින් සොපද්‍රවස්ථාන හෙයින් උගත මනා වතෙක් ඇතැ'යි කිවු ය. තෙරුන් වහන්සේ ත් 'තෙපි අප වත් උගන්ව වූ දැ'යි නො වදරා විනා ය පිළි වෙතක් වී නමුත් මේ තමා සූත්‍ර පිළිවෙත හෙයින් අභ්‍යාස නැති හෙයිනු ත් කළ මනා කෙසේ දැ යි:

"තදහු පබ්බජිතො සන්තො – ජාතියා සත්තවස්සිකො,
සො 'පි මං අනුසාසෙය්‍ය – සම්පටිච්ඡාමි මුද්ධනා"

යනු පැවිදි ලකුණු හෙයින් විචාළ සේක. උෟ ඒ අසා 'ස්වාමීනි, සොහොන වසන කල තමා සොහොන්හි වසන නියාව සොහොන් ගොවුවන්ට ද, ගණ දෙටු මහ තෙරුන් වහන්සේට ද, යම් ගමක බුදු සොහොනෙක් වී නම් ඒ ගම ගම්මුදළියාට ද, වදරන්ට වුව මැනවැ'යි කිවු ය, එ සේ කී කල්හි 'යහපත, කියම්හ'යි ම නො වදරා 'උන් හැම තැනට කියන්ට කාරණා කිම් දැ'යි විචාළ සේක. 'ස්වාමීනි, සොරු සොර කම් කොට ගෙන වස්තු ස්වාමීන් ලුහුබඳවා ගත් කල්හි සොහොන්හි හැසිරෙන තැන් පිට ලන්ට දෝ සොහොන් බිමට දමා පියා යෙති. වස්තු ස්වාමිහු එ තන තුබුවා දැක සොහොන්හි හැසිරෙන මුඹ වහන්සේලාට ගහට කෙරෙති. ඒ ඒ තෙනට කියා තබා ලූ කලට 'අද මෙ තන පෙනුණු ගමණක් නොව ත් මේ මේ අවධියෙහි පටන් මුන් වහන්සේ මෙහි වසන නියාව දනුම්හ. තොපට මෙ තැන

Non-Commercial Distribution

කෙරෙහි සැක කරන්ට කාරණ නැතැ'යි කළ සැක හරවති. එ සේ හෙයින් ඒ තුන් පක්ෂයට ධුතාඞ්ගප්පිච්ඡතාවට හානි නැති හෙයින් කිව යුතු ය'යි කිවූ ය.

මෙ ම අවසරයේ තව ත් කළමනා දැ ඇත් නම් විචාරමි සිතා 'අනික් කළමනා කිම් දැ'යි විචාළ සේක. සවාමීනි, සොහොන්හි වසන කල නම් අමනුෂ්‍යයන්ට ප්‍රිය වූ දඩ මස්, කුඩමස්, පිටි, කැවුම්, තල මුරුවට ආදිය අනුභව නො කට යුතු ය. දවල් නො නිදිය යුතු ය. කුසී නො විය යුතු ය. ශඨ ප්‍රයොග නැත මැනව. අදහස ත් යහපත් වුව මැනව. රෑ සොහොන් බිමට වඩනා කල හැම දෙනා නිදා වැතිර ගිය වේලාවට වැඩිය මැනව. වෙහෙරට වඩනා කල නිදා නැඟී නොසිටිනා තෙක් වෙහෙරට වැඩිය මැනව.

"සවාමීනි, යම් සේ කොටඑවක් කසළ ගොඩ වුව ත්, වීථී කොන්වල වුව ත්, තුන් මංසල වුව ත්, ගම්දෙර වුව ත් දසවේ ගොඩ වුව ත්, යම්කිසි තෙණෙක සැතපේ ද, සැතප ගන්නා පමණක් විනා බොහෝ කොට වැද නො හො වී ද, ඔහු මෙන් මුඹ වහන්සේ ත් තණ ඇතිරියක වේව'යි, කොළ ඇතිරියක වේව'යි, දඹු මැස්සක වේව'යි, යම් කිසි තෙනක සම් කඩ අතුට ගෙන බොහෝ නො කොට මදක් සැතපී ශරීර ය සතපා ගෙන මෙ තැන්හි රදා මීට ඇවිදපු ගමන් මුත් සසර ගමන් නැති කොට ගෙන රහත් ව ගත හුණු සේක් වී නම් මුඹ වහන්සේ මළ කල ශරීරය පලසින් සෑදූ රුවන් මඩුවකට නංවාලා මහ පෙරහරින් දවමි. එ සේ රහත් විය නුහුණු සේක් වී නම් කිසි ත් පූජාවක් නැති ව දුක්ඛිතයන්ට කරණ ලෙසින් දර ගොඩක් පිට ලා පියා වසා ත් දර ල ලා දන අවසථාවෙහි හුලින් ඇණ දර සැයෙන් පිටත හෙළා ගෙන පොරොවින් කප කපා ගින්නට දමමින් දවමි'යි කියා භාවනා ක්‍රම ය උගන්වා වදළ බව මුත් බුදුන් නො වදළ මෙ ලෙස අවවාද කිව.

ඒ තෙරුන් වහන්සේ ද, මූගපක්ඛ ජාතකයෙහි තෙමිය බෝසතුන් දෙවතා දුවණියන්ගේ අවවාද පිළිගෙන සැපතෙහි ආල ය හැර නිවන් සැප ත් පතා මහණවන්ට තර වූවා සේ ම, නිවන් රට සාධනු නිසා කෙළෙස් සතුරන් පරදවන්ට ධුතාඞ්ගායුධය තර කොට ගෙන 'පිළිකුල් මෙනෙහි කරන්ට නිසි අරමුණක් සම්භ වූ දවසෙක මට කියව'යි නමින් කැලී නම් වුව ත් අදහසින් කැලි නො වන උපාසිකාවන්ට වදළ සේක.

Non-Commercial Distribution

වදුරා ලා එ තැන් පටන් යම් සේ කුකුළෝ ගොදුරු සොයා කා ලා වෙලින් වේලාපස ම හැකිළ ගනිද්ද, එ පරිද්දෙන් වේලාපස මළුව හැමද පැන් පරහා තබා සිරුර පිළිදැග ඇඟ සිසිල් කොට පැන් සනහා මහ බෝ වැඳ මහලු සබ්‍රම්සරුන් වහන්සේත් වැඳ ගෙන හිඳ සිට සක්මන් කොට රිසියෙන කමට හනෙකින් දවස් යවා දෙ වන දවස් යම් සේ කුකුළෝ වෙලින් වේලාපස ම ගසින් බසිද්ද, එ සේ ම වේලාපස ම වත් සපයා ගෙන වැඳ පුද සිහා නික්මෙන තෙක් විජන ස්ථානයෙක භාවනායෙහි යෙදී හිඳ සිඟුව මනා වේලෙහි ගොසින් යපෙන පමණක් සිහා ගෙන ලද අහර යම් සේ කුකුළෝ පයින් සාර සාරා පරීක්ෂා කොට ලා ලත් ගොදුරක් කද්ද, එ මෙන් ම ඉණ පළිබොධයෙන් මිදෙනු නිසා පස් විකා ගෙන වළඳා නැවත යම් සේ කුකුළෝ ඇස් ඇත ත් රෑ දවස් ඇස බැලුම් නැත්තෝ ද එමෙන් ඇසට පෙනුණු ඉෂ්ටාලම්බනයෙහි ඇල්මක් නැති හෙයින් අනිෂ්ටාලම්බනයෙහි සැටීමක් නැති හෙයිනු ත් ඇස් ඇත ත් නැත්තා සේ ව, එ සේ මු කනට ඇසුණු යහපත් ශබ්දයෙහි ඇල්මක් නැති හෙයින් හා නපුරු ශබ්දයෙහි සැටීම් නැති හෙයින් කන් ඇත ත් නැත්තා සේ ව, එ සේ ම නාසයට විෂය වූ සුගන්ධ දුර්ගන්ධ දෙකෙහි ම අමුත්තක් නැති හෙයින් හා දිවට විෂය වූ යහපත් රසයෙහි ත් නපුරු රසයෙහි ත් අමුත්තක් නැති හෙයින් හා කයට විෂය වූ යහපත් පහසෙ ත් නපුරු පහසෙ ත් අමුත්තක් නැති හෙයින් හා මනසට විෂය වූ යහපත් නපුරු දෙකෙහි ම අමුතු නැති හෙයින් නාසයත් දිව ත් කය ත් සිත ත් නැත්තා සේ ම නැවත යම් සේ කුකුළෝ කෙ සේ මරා නෙරි ත ත් ආදියෙහි ලා ලූ තැන අත් නොහරිද්ද, එ මෙන් ම සිවුරු ගෙත්තම් කරත ත්, නව කර්මාන්තයක් කරත ත්, වත් පිළිවෙ ත් කරත ත් කරණ භාවනාභියොග ව ම අත් නොහැර නො පමා ව වසන සේක.

චුල්ලකාළ තෙරුන් වහන්සේ ද හුන් තෙන ත් සිටි තෙන ත් මහ සැපත් හා අඹු දරුවන් සලකුණු කොට ‘මෙසා මහත් සම්පත් අනුභව නො කොට අපගේ බෑණන් වහන්සේ කුමක් කරණ නියා දෑ’යි එක ගම දෙ වෙළඳාමක් සේ සහෝදර ව ඉපද ත් වියවුල් සිත් සිත සිතා හිඳිනා සේක. ඉක් බිත්තෙන් එක් කුල දුවක් ඉතා කල් නොගිය ලෙඩකින් මිය ගියා ය. නෑයෝ සියෝ දවන්ට ගෙන ගොසින් කැළි නම් සොහොන් ගොවු දුවට දවන්ට කියා නිල කොට ලා නැඟී ගියෝ ය. හො ද වැළි ත් මූණ වැස්ම ඉවත් කොට ලා මිය කල් නො ගිය ජීවත් වෙමින් සිටි රුවක් සේ රන්

Non-Commercial Distribution

වන් මිනි ය දක තෙරුන් වහන්සේ ට මේ මිනි ය පැමි නම් යහපතැ යි සිතා තෙරුන් වහන්සේ කරා ගොසින් වැද ලා මළ හෙයින් නපුරු වත ත් මුඹ වහන්සේ ගේ භාවනාභියොග ය නපුරු නො වන, නො ද වූ කළ කුණු වත ත් සිතට වැටහුණු ආකාර ය කුණු නො වන, මිනි ය තමා සිත් නැත ත් මුඹ වහන්සේට නිකසළ සිත් ඇති කරවා ලන, භාවනානුරූප රහිත වුව ත් කුණප භාවයට පැමිණෙන, ඔබට විෂභාග වූව ත් තමාට සභාග වූ මිනියක් දවන්ට ගෙනා නියාව කියා ලා අසුභ බලන්ට වඩනේ යහපතැ යි කිවු ය.

ඒ අසා තෙරුන් වහන්සේ ද එ තනට වැඩ, මූණු වැස්ම හරවා ලා පත්ලෙහි පටන් හිස දක්වා බලා තව මේ මිනි ය උද්ධුමාතකාදි අවස්ථාවට නො පැමිණි හෙයින් බලා සිතට වටහා ගන්නා ආකාරයෙක් නැත. එ සේ වන්නා එ ලෙසට මිනි ය ගින්නේ ලා ගිනි වැද ගත් කලට කියව යි වද රා ලා වෙහෙරට ම ගොසින් වැඩ හුන් සේක. උපාසිකාව ද වදළ ලෙසට මිනිය ගින්නේ ලා ලා ගොසින් කිවු ය. තෙරුන් වහන්සේ වැඩ බලා සිටි සේක. ගිනි දල් වැද වැද ගත් තැන් කබර ඇති ගෙරි සරක් ගේ කබර ලා තැන් සේ වි ය. පාත් ද නැමී එලෙන්ට වන. අතු ත් ද වකැටි ගැසෙන්ට වන. නළල සම ත් ද ගියේ ය.

තෙරුන් වහන්සේ ත් බල බලා වැඩ සිටී සේක් 'ආදි අප ආ වේලාවට ශොභාමත් ව තුබූ රූව දන් ම අනික් සැටියකට පැමිණියේ ය. මේ මෙ සේ වනැ'යි එ ම අරමුණු කොට විවසුන් වඩා සසර මහ මූද ට හඩා වඩනා තෘෂ්ණා නමැති ගඟ අවුරා විවසුන් වැටි බැඳ තෘෂ්ණා නමැති පැන් රදවා ලා කෙලෙස් මහ වතුරෙන් පිරුණු සසර මහ මුහුද අර්හත් මාර්‍ග ඥාන නමැති වඩබා මුඛයට වද්දා සසර මුහුද නැති කොට සසර නමැති මහ මුහුදින් එ තෙර ව තුබූ නිවන් රට ලදින් අර්හත් ඵල සමා-පත්ති නමැති රට බද්ද ලත් සේක.

මෙ සේ මහාකාළ තෙරුන් වහන්සේ සිව් පිළිසිඹියා පත් රහත් වූ කල්හි බුදුහු අත්‍යායික කට යුත්තක් ඇති දරු කෙණෙ-කුන්ගේ ඒ කට යුත්ත නිසා ගමන් බාධාවත් කටයුත්ත නිමි කලට උනු ත් කැඳවා ගෙන යන දෙ මවු පිය කෙණෙකුන් මෙන් මහා-කාළ මහ තෙරුන් වහන්සේ රහත් වන තුරු වැඩ හිඳ ලා ඔබ රහත් වූ පසු ඔබ ඇතුළු වූ භික්ෂු සඞ්ඝයා වහන්සේ පිරිවරා සැරිසරා සෙතව්‍ය නුවරට වැඩ හීන්සළු වෙනෙහි වසන සේක. චූළකාළ වහන්සේගේ පුරාණ දුතියිකාවෝ බුදුන් වැඩි නියාව අසා 'බුදුන්

Non-Commercial Distribution

වැඩී පසු අපට පූර්ව ස්වාමීව සිටි තැන ත් එන සේක. ආ පසු රඳවා ගනුම්හ'යි උන්දෑ රඳවනු නිසාම බුදුන් ට ආරාධනා කොට යවූ හ. බුදුන් නො වැඩී විරූ තෙන අසුන් පනවන ලෙස කියා ලන්ට පළමු කොට දන්නා නමක් ගිය මැනව. ආසන පනවන සැටි ය නමුත් බුදුන් වැඩ හිදිනට මද්ධ්‍යයෙහි ආසන ය පනවා ලා බුදුන්ට දකුණ ත් පස සැරියුත් මහ තෙරුන් වහන්සේට හා වම ත් පස මුගලන් මහ තෙරුන් වහන්සේ ට ආසන පණවා ලා එ තැන් පටන් දෙ ඇලයෙහි භික්ෂු සඞ්ඝයා වහන්සේ ට ආසන පැන විය යුතුය. එ හෙයින් මහාකාළ මහ තෙරුන් වහන්සේ සිවුරු වළඳිනා තෙන දී මලණුවන් වහන්සේ ට 'තොපි පෙරාතු ව ගොසින් හසුන් පනවන ලෙස කියව'යි වදළ සේක.

ඒ වහන්සේ ද එ තනට ගිය වේලේ පටන් ඒ ගෙවල මිනිස්සු ඒ වහන්සේ ගේ ත් අදහස දුර්වල නියාව දැන දෝ හෝ මුල් පාළියෙහි මිටි හසුන් පනවති. පාළි කෙළවර උස් අසුන් පනවති. චූළකාළ වහන්සේ ද තෙල සේ නො කරව. උස් අසුන් මුල් පාළියේ හා මිටි හසුන් අග පාළියේ පනව'යි කී කල් හි උන්දෑගේ පුරාණ දුතියිකාවරු 'මුඹ කරන්නේ කුමක් ද? ආසන පනවා ලූ කල නපුරු ද? කවුරුන්ට කියා මහණ වූ ගමණෙක් ද? ගියෙ ත් හැයි ද? පෙරළා ආයෙ ත් හැයි දැ'යි කියා ලා සුදු පිළි දී ලා සිවුරු උදුරා ගෙන හිස මල් වඩමක් සිසාරා ලා 'හසුන් පනවන්ට ආ බැවින් අපගේ හස්නෙන් ගොසින් බුදුන් වඩා ගෙන ව මැන ව. අපි හසුන් පනවම්හ'යි කියා ලා, කිය කියා ලූ දෙයට ම නැමෙන වහන්සේ කෙණෙකුන් හෙයින් තමන්ගේ මෙහෙවර යවූහ. සිවුරු පෙරවියා ත් බොහෝ කල් නො වන හෙයින් ලජ්ජා නැති ව, හව පෙරළියක් හඟවන්නා සේ එ ම ලෙසින් ගොසින් බුදුන් වැඳ ආරාධනා කොට ලා සහපිළිවෙළින් වඩා ගෙන ගියා හ.

වැඩ දන් වැළඳූ කල්හි, වළඳා අන්තයෙහි මහාකාළ මහ තෙරුන් වහන්සේ ගිහි අවස්ථාවෙහි ඔබගේ පුරාණ දුතියිකාවරු 'මූ හැම චූළකාළ වහන්දෑ සිවුරු හරවා ගමට හැර ගත්හ. අපි ත් මුන් වහන්සේ සිවුරු හරවා ගමට හැර ගනුම්හ'යි දෙවෙනි දවස් දන් තමන් ගෙනෑ යි බුදුන්ට ආරාධනා කොළෝ ය. එ දවස් හසුන් පනවන ලෙස කියන්ට අනික් නමෙක් ගිය සේක. උඟ හැම එ වේලෙහි අවසරයක් ලැබ ගත නොහී බුදු පාමොක් සඟ රැස වඩා හිඳුවා දන් දුන් හ. චූළකාළයන් ගේ අඹුවෝ දෙන්-නෙක. මජ්ඣිම කාළයන්ගේ අඹුවෝ අපායවල ගණනේ සතර

Non-Commercial Distribution

දෙනක. මහාකාළ තෙරුන් වහන්සේගේ පුරාණ දුතියිකාවෝ ඔබ ලත් මාර්ග ඵල ගණනේ අට දෙනක. පිටත වළඳන්ට යනු කැමැති තැන් නැඟී සිට වැඩ පී සේක. වළඳනු කැමැති තැන් හිඳ වැළඳූ සේක. බුදුහු ත් වැඩ හිඳ වැළඳූ සේක. වළඳා අන්තයෙහි මහාකාළ මහ තෙරුන් වහන්සේ ගේ පුරාණ දුතියිකාවරු 'ස්වාමීනි, මහාකාළ මහ තෙරුන් වහන්සේ රඳා අපට අනුමෙවෙනි බණ වදරණ සේක. වදරා ලා පසු ව වඩනා සේක. මුඹ වහන්සේ පෙරාතු ව වඩනේ යහපතැ'යි කිවූ ය. බුදුහු ත් ඔබට උන් හැම කට හැක්කක් නැති නියා ව දැන 'යහපතැ'යි වැඩ පී සේක.

ගම් දෙර කරා වැඩි කලට වහන්දෑ 'බුදුන් වහන්සේ දැන කළ නියාව ද? නො දැන කළ නියාව ද? චූළකාළයන් ඊයේ පෙරාතු ගිය හෙයින් බ්‍රහ්මචරියාව ට අන්තරාය වී ය. අද අනෙක් තෙනක් පෙරාතු ගිය හෙයින් මහාකාළ මහ තෙරුන් වහන්සේට වූ හානි නැත. සිල්වත් කෙණෙක. ආචාරශීලී කෙණෙක. ඔබට කුමකින් කුමක් කරත් දෑ'යි කී සේක. බුදුහු ඒ අසා 'මහණෙනි, කුමක් කියවූ දෑ'යි විචාරා වදරා එ පවත් දැන 'කුමක් ද මහණෙනි, තෙපි මහා කාළයනු ත් චූළකාළයන් සේ ම නිස්සාර කොට සිතවූ දෑ'යි විචාළ සේක. 'එ සේ ය, ස්වාමීනි, චූළකාළයන්ගේ අඹුවන් දෙන්නකු පමණ උන් රඳවා ගත් කළ මුන් වහන්සේගේ පුරාණ දුතියිකාවන් අට දෙනෙකු හෙයින් වළකිත් ද? වලු වසා ලා ගසා අල්වා ගෙන රඳවා ගනිති'යි සිතම් හ'යි කී සේක.

බුදුහු එ සේ කී වහන්දෑට ''මහණෙනි, එක විටෙක ත් එ සේ නො කියව. චූළකාළයෝ නම් තමන් ධර්ම තත්ත්ව ය නො දන්නා හෙයින් යම් රූවෙක් පුරුෂයන්ගේ සිත් ගෙන සිටින්නේ වී නම් ඒ ස්ත්‍රී රූවට වටනා[1] නැති හෙයින් එ සේ වූ ස්ත්‍රීන් දුටු කල මුන්ගේ අත යහපත, පය යහපත, ඇඟිලි යහපත, නිය යහපත, සිඟු වලඟ යහපත, හිණ බඩතුර යහපත, ඇස් කන් යහපත, මුව මුහුණු යහපතැ'යි අසුභ මනසිකාරයට අවසරයක් නො පෑ සිහි නැමැති දෙර නො පියා කෙලෙස් සතුරන්ට ම අවසර හැර සිහී මෙහි ත්, පිළි ගැන්මෙහිත්, වැළඳීමෙහි ත්, පමණ නැති වීමෙන් භොජනයෙහි ත්, පමණ නො දැන පිළිවෙත් පිරීමෙහි ත් කුසීත ව, වීර්‍ය්‍යය ත් නැති ව සස්නෙහි ත් පසු බට සිත් ඇති ව විසූය. එ සේ හෙයින් බලවත් හුළඟක් හමා ලා ඉවුරු අසෙක සිටි මුළු ගසක් හෙළන්නා සේ තුලුන් සේ වූවන් සස්නෙන් පිරිහෙළා ගනිති.

1. වඩනා – වටනා – වැඩිය

Non-Commercial Distribution

මේ මහාකාළ මහ තෙරුන් වහන්සේ කවර ලෙසකිනු ත් කෙලෙස් සතුරන්ට අවසරයක් නොපෙණෙන ලෙසට කෙස් ආදි වූ දෙතිස් කුණු කොටසු ත් පිළිකුල් විසින් මෙනෙහි කොට චක්ෂුරාදිවූ ස දෙරින් සිහි නමැති දෙර පියා ලා කෙලෙස් සතුරන් නො වැද්ද දී භොජනයෙහි ත් පමණ දැන මාගී ගත ශ්‍රද්ධාවගේ වශයෙන් සැදෑහැ ඇති ව වඩනා ලද වීයර්‍ය ඇති ව, සිවු පිරිසිදු සිල්හි පිහිටා ගෙන වෙසෙති. එ සේ හෙයින් මහා පර්‍වත ගලකට එක් තරම් පවනක් කට හෙන දෙයක් නැත්තා සේ මුන්ට කවුරු කුමක් කළ හෙද්දැ'යි වදාළ සේක.

ඒ පුරාණ දුතියිකාවරු අට දෙන ද උන් වහන්සේ වට කොට ගෙන පෙරාතු දවස් අර මූන් දෙන්නා චූළකාළයන්ට කියා ලූ විකට ය. විකා ගියා සේම මෙයි ත් වික යි සිතා සිංහ රජ්ජුරු කෙණෙකුන් පොළඹා ගනුම්හ යි සිතා කැනවිල් දෙනුන් කැණ-විල් හඩ හඩන්නා සේ නොඑක් දෑ කිවු ය. තෙරුන් වහන්සේ උන්ගේ ආකාරය සලකා ලා රහත් වීම හා සමගම ලද්ද වූ ආනුභාව ය හෙයින් හුනස්නෙන් නැඟී කැණිමඩල පලා ගෙන අහසින් ගොසින් බුදුන් වදාළ තරම හඟවා බුදුන් වැදි සේක. මේ බණ වදරා අන්තයෙහි වළඳ ලා එන ගමනේ බුදුන් දැන කළ නියා ද නො දැන කළ නියා දැ යි කීමෙන් නොදන්මේ වැවුණු වහන්දෑ සෝවාන් පමණෙකින් ම නෙලෙස් සැක නැති වන හෙයින් සෝවාන් ඵලාදියට පැමිණ නිසැක වූ සේක.

නුවනැත්තා වූ සත් පුරුෂයන් විසින් චූළකාළයන් මෙන් කෙලෙසුන් කරා නොවැද, මහාකාළ තෙරුන් වහන්සේ මෙන් කෙලෙසුන් කෙරෙන් දුරු ව තුන් සුසිරි පුරා අධිමුක්ති වූ ලෙසින් ත්‍රිවිධ බෝධීන් එක්තරා බෝධියකට පැමිණිය යුතු.

---

# 11. කාසාව පරිදහන වස්තුව

තව ද යම් කෙණෙක් භවාංග ලෙසින් වී නමුත් පිරිසුදු ව තිබෙන සිත රාගාදි කසටින් රඳා ගෙන වෙසෙත් නම් සිංහ සම කැණවිලුන්ට තරම් නොවන්නා සේ කසට පොවා රඳා ගත් කඩ උන්ට තරම් නොවන නියාව හඟවනු පිණිස කාසාව පරිදහන වස්තුව දක්වමු.
කෙ සේ ද යත්:

එක් සමයෙක අගසවු දෙදෙනා වහන්සේ තමන් වහන්සේගේ පිරිවර සහ පන් සියය-පන් සියය හැර ගෙන සැරිසරා වඩනා නියාව බුදුන්ට දන්වා ලා සැවැත් නුවර සිට එක විට පහළ වන

හිරු මඬල දෙකක් මෙන් රජගහා නුවරට වන් සේක. අමුතුව ලා වැඩි ඔබ දෙ දෙනා වහන්සේ දැක, පොහොසත්හු දෙන්න තුන් දෙන ත්, දුක්පත්තු බොහෝ දෙන ත්, එක් ව ගෙන අමුතු දන් දුන්හ. ඉක් බිත්තෙන් එක් දවසක් ධම් සෙනෙවි සැරියුත් මහ තෙරුන් වහන්සේ බණ වදරණ සේක් වදාළ බණින් භොග සම්පතු ත් පරිවාර සම්පතු ත් දෙක ම උපදවන්ට උපදෙස් දක්වා "මෙම්බා උපාසකවරුනි! සමහර කෙණෙක් දන් දෙන කල සිතිවිල්ලෙන් අමුත්තක් සිතා ගෙන තමන් සන්තක දෙය දන් දෙති. දෙන දන එක් ව දෙන්ට අනුන් සමාදන් නො කරවති. උඵ උපනුපන් තෙන තමන් සන්තක ය ම දී ගිය හෙයින් භොග සම්පත් ලැබෙති.

''කුශලයෙහි සමාදන් කරවීම නු වූ හෙයින් උන්ට පරිවාර සම්පත් නැත. සමහර කෙණෙක් නැතක් වෙලා සිට කියා ත් අනුන් ම සමාදන් කරවා යෙති. තුමූ ඇඟ හිස නසා තමන් ගෙන් දී නො ලති. උඵ උපනු'පන් තැන විධාන කොට කැර වූ හෙයින් පරිවාර සම්පත් ලැබෙති. පරිවාර තබා තමන්' රකෙන පමණට ත් භොග සම්පත් නො ලැබෙති. සමහර කෙණෙක් තුමූත් නො දෙති. තමන් ගෙන් දීම නැති හෙයින් අනුනු ත් සමාදන් නො කරවති. උන් උපනු'පන් තැන දෙක ම සම්භ නො වෙ යි. සමහර කෙණෙක් හැදහිලි සිතින් කම් පල හදහා තුමූ ත් දන් දෙති. කරුණා අදහසින් අනුනු ත් සමාදන් කරවති, උන්ට උපනුපන් තැන **ධනඤ්ජය-මෙණ්ඩක-ජොතියාදීන්** මෙන් සම්පත් පරිවාර දෙක ම සම්භවෙ යි' කියා බණ වදාළ සේක.

ළඟ සිටි නුවණැ'ති කෙණෙක් ඒ අසා ඒ සම්පත් දෙක ම මා ඇතිකොට ගන්ට වුව මැනැවැ යි සිතා දෙදෙනා වහන්සේට ම දෙ වන දවසට ආරාධනා කොළෝ ය. වහන්දැ කෙතෙක් නමට දූ යි විචාරා පිරිවර වහන්දෑ කෙ තෙක් දෙනා වහන්සේ දූ යි විචාළ කල්හි දහසක් දෙනා වහන්සේ නියාව කී සේක. සමාදනයට ත් සිතැති හෙයින් ම ඒ උපාසකයෝ හැමදෙනාට ම ආරාධනා කොළෝ ය. දෙ දෙනා වහන්සේ ත් ඉවසා වදාළ සේක. උපාසක යෝ ද ආරාධනා කොට ලා නුවරට ගොසින් හැම දෙනා ත් සහාය වන්නෝ වේ දූයි සිතා තමන්ගේ පින් කමට හැම දෙනා ත් සහාය කොට ගන්නා නිසා 'අග සවු දෙ දෙනා වහන්සේ මුල් කොට සඟ දහසකට සෙට දවසට ආරාධනා කෙළෙමි. හැම දෙනා ත් පොහෝනා පමණකින් සහාය ව දන් දුන මැනැවැ 'යි සමාදන් කැර වූ ය.

Non-Commercial Distribution

මිනිස්සු ත් තම තමන් ගේ බල පමණින් 'අපි නමකට දෙ නමකට දෙම්හ' 'අපි සතර පස් නමකට දෙම්හ' අපි සත් අට නමකට දෙම්හ' 'අපි දස විසි නමකට දෙම්හ' අපි තිස් 'හතළිස් නමකට දෙම්හ' අපි සැට සැත්තෑ නමකට දෙම්හ' 'අපි අසූ අනූ නමකට දෙම්හ' 'අපි සියයක් නමකට දෙම්හ' යි නියමවා ලා වට්ටෝරු කොට දුන්හ. එ සේ කලට ඒ ඒ දෙනා ගේ ගෙවලින් දන් පිස ගෙනෙන්නට අට්ටාල් වේ ද? එක තෙනක දී දන් ඉදි කරම්හ. දනොපකරණ එක තැන් කළ මැනව'යි කියා ලා එක තැන් කරවූහ. එක් කෙළෙඹි පුත්‍රයාණ කෙණෙක් මසු දහසක් වටිනා සුවඳැ'ති රන් වන කඩක් ගෙනවුත් දී ලා ඉදින් මේ දනට අඩු ව තිබෙන දෙයෙක් ඇත් නම් තෙල පිළි ය වියදම් කොට අඩු ව සලසව. අඩු නැත් නම් අභිප්‍රාය තැනකට පිළිගන්වා පියව' යි කිවු ය.

උන්ගේ දනොපකරණ ත් බොහෝ දෙනා එක් ව සපයන හෙයින් මඳ නො ව සැහිණ. දන් විධාන කොට සමාදන් කැරැ වූ තැනත්තෝ 'කෙළඹියාණ කෙණකුන් මෙ ලෙස් කියා දී ලූ රන් වන් කඩෙක් ඇත. ඒ ඉතිරි ව තුබුයේ ය. ඒ දුන මනා කාට දැ'යි විචාළෝ ය. සමහර කෙණෙක් ඒ අසා ගොයම් බිමක් විචාළ වුන්ට සරු කුඹුරු දූන කියන්නවුන් මෙන් එකාසඞ්ඛ්‍ය කල්ප ලක්ෂයක් මුළුල්ලෙහි අගසවු පැරුම් නමැති දිය කැමෙන් සරු කෙත් වූ සැරියුත් මහ තෙරුන් වහන්සේට දෙණ්ට කිවු ය. සමහර කෙණෙක් නිස්සාර හෙයින් ම කෙතෙක් කලෙක ත් අස් නොව ත් පුරදර ව[1] තිබෙන දෙනිකඩක් කියන්නවුන් මෙන් 'මේ සැරියුත් මහ තෙරුන් වහන්සේ බත් වන් අවධියෙක මුබ වැඩ ලා මසක් පෝයක් රඳා ලා වැඩපියන සේක. දෙව්දත් තෙරුන් වහන්සේ නිරන්තර ව වැඩ හිදිනා සේක. බෙහෙත් ගසක් පරිද්දෙන් ප්‍රයෝජනවත් ව සිටිනා සේකැ' යි කවර කලෙක ත් කවුරුනු ත් රැස් වන ගුණයක් හෙයින් ඒ ගුණෙහි පහදනෝ දෙව්දත් තෙරුන් වහන්සේට දුන මැනවැ යි කිවූ ය. දෙ ලෙසක පැවති කථාවෙන් දෙව්දත් තෙරුන් වහන්සේට දුන මැනැවැ'යි යන කථාව බොහෝ වි ය. ඔබට දෙන්ට කියන්නෝ නො බොහෝ වූහ.

එ හෙයින් ඒ රන්වන් කඩ දෙව්දත් තෙරුන් දෑ ආර්‍ය ජාති යට නොපැමිණි හෙයින් සැරියුත් මහ තෙරුන් වහන්සේට ජාතීන් අඩු වුව ත් ශීල සමාද්ධ්‍යාදී ගුණයක් තමා නැති හෙයින් ගුණෙන් අඩු වුව ත්, ශ්‍රාවක කමකට නො පැමිණි හෙයින් තනතුරෙන් අඩු වුව ත්, පස් කපක් මුළුල්ලෙහි රන් තලියක් මුල් ව බැඳි වෛර ය

---

1 පුරන් ව

Non-Commercial Distribution

නො සන්හිඳී පැවති නියාව සෙරිවාණිජ ජාතකයෙහි පෙණෙන බැවින්, ගුණෙන් ම දහමින් සිස් වූ නුගුණෙන් ම අඩුවක් ම නැති දෙව්දත් තෙරුන් වහන්සේට දුන්හ. උන්දෑ ත් ඒ කඩ කපා සිවුරු කොට ගෙන වළඳිනා දෑ ය. මිනිස්සු ත් ඒ දැක 'මේ සිවුරු කටුකරඬු මල් දමක් සේ ශරීරයත්, රන්වන් කෙලෙස් මුසු නොවන හෙයින් සිත ත් රන්වන් ධම් සෙනෙවි ස්වාමීන්ට නිසි ය. කණු-වෙක ලාපු පළඳනාවක් සේ මේ වහන්සේට නො නිසි යෙයි. දත් නැත්තවුන් කියන ගී සේ ම මේ මුන්දෑ පෙරව ගෙන හැව්දිනේ හැයි දෑ'යි කියන්ට වන්හ.

රජගහා නුවර සිට සැවැත් නුවරට ගිය කෙණෙකුන් වහන්සේ ද බුදුන් වැඳ ලා අගසවු දෙ දෙනා වහන්සේගේ පවත් බුදු රජුන් වහන්සේ විචාළ කල්හි මේ කසා කඩෙහි පැවැති කථාව දක්වා මුළුල්ල ම බුදුන්ට දන්වූ සේක. බුදුහු ඒ අසා වදරා 'මේ මුල් කොට ජාතක කථාවක් කීම් නම් පස්වාදහස මුළුල්ලෙහි බොහෝ දෙනාට බොහෝ ප්‍රයෝජන සාධා දීල'යි සිතා වදරා 'මූ තමා තමාට නො තරම් රන්වන් පිළි පෙරවියේ දැන් මතු නො වෙයි. යට ගිය දවස ත් පෙරවියේ ය'යි වදරන සේක්-යට ගිය දවස බරණැස් නුවර බඹදත් නම් රජකු රජ කරණ කල බරණැස් නුවර එකෙක් වලට ගොසින් ඇතුන් මරා ගෙන දළ ත්, ඇත් නිය ත්, ඝන ඝන තෙතින් මසු ත් ගෙනවුත් විකුට ගෙන ජීවත් වෙයි.

ඉක්බිත්තෙන් එක් වලෙක දහස් ගණන් ඇත්තු කොළ පත් කා ලා යන කල පසේ බුදුවරුන් වහන්සේ දැක දණ නමා වැඳ ලා යෙති. එක් දවසක් ඇතුන් මරා ජීවත් වන තැනැත්තේ මේ දැක 'මම මුන් මරා ජීවත්වෙමි. මූ යන එන කල පසේ බුදුවරුන් වහන්සේ වඳිති. කුමක් නිසා වඳිත් දෝ හෝ'යි සිතා බලන්නේ පෙරෙවි සිවුරු නිසා වඳින නියාව දැන මුන් ගෙන් සම්භාවනා ලබන්ට මට ත් කසා කඩෙක් ඇත් නම් යහපතැ 'යි සිතා එක් පසේ බුදු කෙණෙකුන් වහන්සේ විලකට බැස පැන් සැනහිය දී ගොඩ තුබූ සිවුරක් සොරා හැර ගෙන, පර ලොව අනන්ත කාලයක් පිළියක් නො ලබනු ව ගොසින් ඒ ඇතුන් යන එන තැන අඩයටිය අල්වා ගෙන සිවුර ඉස වසා පෙර ව ගෙන හිඳ, ඇත්තු ඔහු දැක පෙර ව ගෙන හුන් ලෙසින් පසේ බුදුහු නො වන නියාව දැන ගන්නා තරම් පිළිසඳක් තමන් නො ලත් හෙයින්, පසේ බුදු කෙණෙකුන් වහසේ ය යි සිතා වැඳ ලා යෙති. එතෙමේ බල බලා හිඳ ලා හැම ඇතුන්ට පසු ව ලා

යන ඇතු අඩයටියෙන් ඇණ මරා ගෙන දළ ආදි ය කපා හැර ගෙන ඉතිරි ව තුබූ දෙයක් ඇත් නම් සෙසු ඇතුන්ට පෙනී යෙතී සිතා දෝ බිම සාරා ලා පස් වසා පියා යෙයි.

එ කල බෝසත්හු එක් තරා අකුශල කර්ම බලයෙකින් ඇත් ව ඉපදී හැම ඇතුන්ට ම නායක වූහ. එ කල ත් ඒ අසත්පුරුෂයා එලෙස ම ඇතුන් මරා ජීවත් වෙයි. මහ බෝසත්හු ද තමන්දැගේ ඇතුන් දවසින් දවස අඩු වන නියාව ආනුභාව සම්පන්න මැණික කසළ ගොඩ තුබූවත් ආනුභාවයෙහි අඩුවක් නැත්තා සේ තිරිසන් ව උපන ත් නුවණෙහි අඩුවක් නැති හෙයින් දැන 'මේ ඇතුන් කුමක් වූ නියා ද? මඳ වුනැ'යි විචාරා 'නො දනුම්හ'යි කී කල්හි, අවස්ථා පිළියම් දන්නා වෙදවරුන් නිදන් දන්නා සේ ස්ථානෝචිත වූ නුවණ ඇති හෙයින් සිතන්නාහු-

'තමන් ඉතා සුශික්ෂිත හෙයින් කොයි යත ත් මට නො කියා නො යෙති. එක් තරා උපද්‍රවයෙක් ඇති නියා ය'යි දැන උපද්‍රව කාරණ සලකන්නෝ 'අනික් පෙනෙන උපද්‍රව කාරණයෙක් නැත. අසෝ තැන එක් මිනිස් කෙණෙක් කසා කඩක් පෙරවගෙන හිඳිති. උවදුරක් වතොත් උන් ගෙන් වුව මැනැවැ'යි සිතා විමසනු නිසා හැම ඇතුන් පෙරාතු කොටයවා ලා තමන් දැ පසු ව ගෙන ලැසි ගෙන යන දැ ය. අර මේ තෙමේ සෙසු ඇතුන් වැද ලා ගිය කල සෙමෙන් සිට එන මහබෝසතුන් දැක, උන්දැ සෙමෙන් සිට එත ත් නුවණ දුව් දුව එන නියාව නො දැන සිවුර කඩ හකුලා අල්වා ගෙන අඩයටිය මහ බෝසතුන් කරා දූමී ය. බෝසතාණෝ ද වසවත් මරහුගේ දහසක් ආයුධ වළහා පියන පින් ඇති හෙයින් පසු බැස ලා වළහා පියා 'මූ නිසා වේ ද මෙ තෙක් ඇතුන් නැසුණේ යැ'යි ලුහුබඳවා ගත් දැ ය. එ කෙමේ එක් ගසක් බඩ දී ලා මුවා වි ය.

ගසින් මුවා වුව ත් පවින් නුමුවාවූ ඔහු ගස හා එක් කොට සොඬින් බද අල්වා ගෙන බිම ගසා මරම් සිතා ත් ඔහු පැ ලූ කසා කඩ දැක දිවන කෙණෙකුන් පෙරට උස් පවුරක් සම්භ වූවා සේ කසා කඩෙහි පැකිළ 'සිවුරු කඩ බල බලා මූට අපරාධයක් සිතීම් නම් නිසි ව පොරෝනා බුද්ධ ප්‍රත්‍යෙක බුද්ධාදීන්ට ත් මා වැරදි නියා ය මැ යි' සිතා ලා මරණ මැරීම තබා පියා 'මාගේ මෙ තෙක් නෑයන් මැරූයේ තෝ දැ'යි විචාරා එ සේ ය යි කී කල්හි 'තෝ වන්නා තාගේ අදහස් නපුරු හෙයින් කුමක් කෙරෙහි නමුත් ඒ වන්නාට ය. වසුන් පයිවල දළි

විචාරන්නෝ ඇද්ද? සියලු ලෙසින් ම කසළ වූ තා ඉතා නිකසළ වූ දෙයාසඞ්ඛ්‍ය කප් ලක්‍ෂයක් පැරුම් පුරා පසේ බුදු වූ මහතුන් ඇඟ වැකි මේ සිවුරු කඩ ඇඟ ලා ගෙන මෙ තරම් අපරාධ කරණ කල කළ මනා නො කටයුත්තෙන් තා නො කළ දෙයකුත් ඇද්ද? කටයුත්තකින් කළ දෙයකුත් ඇද්ද? මේ සිවුරේ ආනුභාව ය අද තා ජීවත් වූ ගමනින් ම දැන ගනැ'යි අවවාද කළ දැ ය.

බුදුහු මේ වදරා ලා 'එ සමයෙහි ත් තමාට නො තරම් සිවුරු පෙරවියේ මේ දෙව්දත. එ සමයෙහි උන්ට අවවාද කළ ඇතානෝ නම් මම ය'යි වදරාලා 'යම් කෙණෙක් සිත රාගාදි කෙලෙස් කසට ගුණ ඇති ව අසුචි පිරුණු කළයක් පිට සිත් කම් කරන්නා සේ සිවුරු පොරොවිද්ද, එ බඳු තරමක් නැති හෙයින් ඌ ගුණ ඇත්තවුන්ට ම තරම් සිවුරු පොරෝනට නිසි නො වෙති. නිස්සෝ කවුරුද යත හොත් යම් කෙණෙක් අධිගම කාලයක වී නම් චතුර්විධ මාර්ග ඥාන නමැති මුඛයෙන් රාගාදි කෙලෙස් කසළ වමාරා පූ ද, සෙසු කළ වූව ත් ඥාන නමැති මුඛයෙන් වමාරා පෙරළා ඒ අනුභව නො කෙරෙද්ද නැවත කිරලක බිජුවට රක්නා සේ, සෙමෙරක වාලධිය රක්නා සේ එක ම පුතණු කෙණෙකුන් ඇති පියාණ කෙණෙකුන් ඒ ඒ පුතණුවන් රක්නා සේ, එක ම ඇසක් ඇති කෙණෙකුන් ඒ ඇස රක්නා සේ, රක්‍ෂා කරණට නිල වූ ශීල ය ඛණ්ඩාදි භාවයට නොපමුණුවා සකසා රකිද් ද, සක් රුවන අනික් කෙණෙකුන්ට නිසි නොව සක්විත්තන්ට ම නිසි වන්නා සේ සිවුරු ත් උන්ට ම නිසි ය' යි වදළ සේක.

ඒ බණ අසා රජගහ නුවර සිට ගොසින් මෙහෙවර කී භික්ෂූන් වහන්සේ මෙහෙවරට ලබන ප්‍රසාදයක් මෙන් සෝවාන් වූ සේක. තවත් බොහෝ දෙනා සෝවාන් ඵලාදියට පැමිණියහ.

එ සේ හෙයින් නුවණැත්තවුන් විසින් සිත්හි හට ගත්තා වූ රාගාදි කෙලෙස් කසළ අධිගමාරොගයතා නිසා විවසුන් බෙහෙත් කා ඥාන මුඛයෙන් වමාරා නිකසල වීමෙන් අකුසලින් දුරු ව ශීලාදි ගුණයෙහි පිහිටා සිත් සතන් පවිත්‍ර කට යුතු.

Non-Commercial Distribution

# 12. අගසවු වත

තව ද යහපත් අදහස් ඇති කෙණෙකුන් යහපත් අදහස් ඇත්තවුන් හා ම එක් වන නියාව ත්, නපුරු අදහස් ඇත්තවුන් ආලෝක ය හා අඳුර එක් ව ගත නො හෙන්නා සේ ගිනි හා දිය එක් නො වන්නා සේ එක් ව ගත නො හෙන නියාව ත් දක්වනු පිණිස අගසවු වත දක්වමු.
කෙ සේ ද යත් ?

බුදුන් උපදනාට පෙරාතු ව ම රජගහා නුවරට නුදුරු ව ලා **උපතිස්ස** නම් බමුණු ගම ය. **කොලිත** නම් බමුණු ගම ය යි බමුණු ගම් දෙකෙක් ඇත. ඉන් උපතිස්ස නම් බමුණු ගම **රූපසාරී** නම් බැමිණි බඩ දරු කෙණෙකුන් පිහිටි දවස් ම කොලිත නම් බමුණු ගම **මොග්ගලී** නම් බැමිණියන් බඩ ත් දරු කෙණෙක් ඇති වූහ. ඒ බමුණු කුල දෙක ද සත්වන කුලපරම්පරාව දක්වා වෙනසක් නැති ව පැවත ආ ය. ලත් දරු ගැබ් යම් ලෙසක නො නැසේ නම් එ ලෙසට ගැබ පෙරහර ත් එක දවස් ම දුන්හ. ගබ පෙරහර ලදින් උවදුරු නැති ව දස මස් අයාමෙන් බැමිණිවරු දෙන්න වදන්නෝ මහ පිනැති පුතුන් දෙන්නකු වැදූහ. උන්ට නම් තබන ගමනේ රූප සාර ගුණ සාර ධන සාරාදීන් යුක්ත හෙයින් රූපසාරී නම් බැමිණියන් ගේ පුතණුවන්ට උපතිස්ස නම් ගම නායක බමුණානන්ගේ පුතණුවන් හෙයින් **උපතිස්ස** ය යි නම් තුබූහ. අනික් තෙනැත්තවුන්ට කොලිත ගම් නායක බමුණානන් ගේ පුතණුවන් හෙයින් **කොලිත** යන නම් තුබූහ.

ඔහු දෙ දෙනා ද වැඩි ශිල්ප උගත මනා වයසට පැමිණ ලෙව්හි දත යුතු යම් ශිල්පයක් ඇත් නම් මහ නුවණැති හෙයිනු ත් උගත් දෙය වන පොත් නැති ව පෙරළා උගැන්මක් නැති හෙයිනු ත් බොහෝ කොට උගන්නෝ, වහා උගන්නෝ පටන් ගත් නොබෝ කලකින් ම ඉගෙන නිම වූ ය. උපතිස්ස කුමාරයන් දිය කෙළියට ගඟට යන කල වේ ව යි උයන් කෙළියට යන කළ වේ ව යි රන් සිව් ගෙවල් පන් සියයක් කැටු ව ගෙන යෙති. කොලිත කුමාරයන් ගඟට හෝ උයනට යන කල්හි පිට හුන්නවුන්ගේ සිත් හසර දන්නා අසුන් යෙදූ රථ පන් සියයක් ගෙන යෙති. උන් දෙන්නා පිරිවරා පන් සියයක් පන් සියයක් පමණ පුරුෂයෝ යෙති. රජගහා නුවර ද හවුරුදු පතා ගල් සෙවනැල්ල හුණු තැන බොහෝ දෙන රැස් ව බොහෝ කන බොන දැ ඇති ව කරණ උත්සවයක් හෙයින් දෝ නොහොත් පර්වත මුදුනට රැස් ව කළ මනා

උත්සවයක් හෙයින් ගිරග්ගසමජ්ජ නම් කෙළි නළුවෙක් ඇත. කුමාරවරු දෙ දෙනා ඒ කෙළි නළු බලන්ට ගියකල හිඳිනට එක තැන ම නිල කෙරෙති. එක් තැන් ව කෙළි නළු[1] බලන්නාහු සතු වුව සිනාසුන මනා තැන්හි දී සිනා සෙති. මුසුප්පු වුවමනා තැන දී මුසුප්පු වෙති. දීමන් දුනමනා තැන දී දීමන් දෙති. මෙ ලෙසින් කෙළි නළු බලන්නවුන්ට සවු පැරුම් නුවණ මු කුරා ගිය හෙයින් එක් දවසක් කෙළි නළු බලා ත් සිනායෙක් වේ ව යි මුසුප්පුවෙක් වේ ව යි නො වී ය. කෙළි නළු බලා සතුටට කළ මනා සංග්‍රහ යෙකු ත් නො වී ය. ඒ හැම නො වන්ට කාරණ කිම් ද යත් 'මී මනා[2] තන්හි හෙයින් බැලි ය යුතු කුමක් ද? කෙළි නළු බලන්න වුනු ත් පාන්නවුනු ත් හවුරුදු සියය නො පිරෙන තෙක් අතුරෙක ජරා නාටක පැ ගෙන කෙළවර වැල්ලේ කළ රූ පරිද්දෙන් මැකී නොපන ත් බවට යන හෙයින් සාරයෙක් නැත. මෙ සේ නිස්සාර වූ කෙළි නළු බැලීම් නැත ත් 'අපි දෙන්න ජාති ජරා රහිත වූ නිවන් දහම් සෙවුමෝ නම් යහපතැ' යි එකාසඞ්ඛ්‍ය කප්ලක්‍ෂයක් ම සිතා අභ්‍යාස කළ හෙයින් එ දවසු ත් සිතූහ. කොලිත කුමාරයෝ තුමූ ත් මෙ සේ සිතා එ සේ ම සිතා ගෙන හුන් උපතිස්ස කුමාර යන්ට 'සබඳ තොප ගේ අද සැටි ය මෙ තෙක් දවස් සේ නො වෙයි. එක් තරා සිතිවිල්ලක් ඇති කලට ත් ඊ සිතා පියා මෙ ලෙස වෙ යි. කුමක් ද? එ සේ වූ සිතිවිල්ලක් ඇති නිසා දැ'යි විචාළෝ ය.

'සබඳ, පිනක් වඩනට නැති මේ කෙළි නළු බලා ප්‍රයෝජන නැත. මේ තෙමේ සසර දික් කර වතො ත් මූත් සසර ලුහුඬු කරවා ලිය නො හෙ යි. සසර දික් වීමෙන් දුක් බොහෝ වන පමණක් මුත් අතිකෙක් නැත. එසේ හෙයින් සසර ලුහුඬු කරවනු නිසා නිවන් සෙවුමෝ නම් යහපත. නිවන් දුටො ත් ක්‍රම ක්‍රම යෙන් භවොත්පත්ති ය නැති වෙයි. භවයෙහි ඉපදීම නැති කලට භවය සිඳුණු නියා ය යි සිතා කෙළි නළුවෙහි ඇලුම් නැති ව හුන්නෙමි. සබඳ තෙපි කුමක් සිතා ගෙන හුනු දැ' යි විචාරා උනු ත් එ ම සිත සිතා හුන් නියා ව කී කල්හි ගඞ්ගොදක ය හා යමුනොදක ය සම වූවා සේ අදහස් සම වූ නියා දැන උප තිස්ස කුමාරයෝ 'සබඳ, අප දෙ දෙනා ගේ සිතිවිලි යහපත. නිවනක් ලද මැනවි නම් ගිහි ගෙය නම් මහා ආකුල හෙයින් ඒ හැර ගොසින් මහණක් වුව මැනව. කවුරුන් ළඟ මහණ වමෝ දැ'යි විචාළෝ ය.

---

1 කෙළි ලළු වෙර, 2 විමසා,

Non-Commercial Distribution

එ කල වැලි ත් සඤ්ජය නම් පරිබ්‍රාජක කෙණෙක් බොහෝ පිරිවැජි පිරිස් ඇති ව රජගහා නුවර වෙසෙති. උන් ප්‍රසිද්ධ හෙයින් උන් ළඟ මහණවම්හ'යි කියා කැටි ව ගිය දහසින් පන් සියයකට සිව් ගෙවල් පන් සියය හා රථ පන් සියය පාවා දී තමන් තමන් ගම් වලට යවා පියා පන් සියයක් දෙන හැර ගෙන සඤ්ජය පරිබ්‍රාජකයන් ළඟ පිරිවැජි ලෙසින් මහණ වි ය. උන් දෙන්නා මහණ වූ තැන් පටන් සඤ්ජය පරිබ්‍රාජකයෝ බොහෝ ලාභ සත්කාර ලදින් ප්‍රසිද්ධ වූහ. උන් දෙන්නත් ත් මහණ වූ දවස් ගණනෙකින් ම සඤ්ජය පරිබ්‍රාජකයන් දන්නා පරසම ය ඉගෙන නිමවා ආචාරීනි, මුඹ දන්නා දෙය මෙ තෙක් ද, තව ත් ඇත් දැ' විචාළෝ ය. 'හෙම්බා දරුවෙනි, ආචාර්‍ය්‍ය මුෂ්ටියට මා තබා ගත් දෙයෙක් නැත. හැම ම තොප උගන්වා ලීම්'යි කිවු ය.

ඒ අසා 'එ සේ වී නම් මුන්දැ ළඟ තපසින් ප්‍රයෝජන නැත. අපි යම් නිවනක් සොයමෝ නම් ඒ සාවුන් ගෙන් හං ලැබිබ නොහැක්කා සේ, දිඹුලෙන් මල් නො ලැබ්බ හැක්කා සේ, මුන්දැ ගෙන් ලද නො හැක්ක. දඹදිව මහත් බැවින් නු කුසී ව ඇවිදින්නෝ කෙ සේ වත් නිවන් දහම් පසක් කර දෙසන ඇදුරු කෙණෙකුන් ලැබ පියම්හ'යි සිතා එවක් පටන් යම් යම් තෙනක නුවණැ'ති මහණ-බමුණු කෙණෙකුන්ගේ පුවතක් ඇසූ නම් ඔබ ගොසින් උන් හා කථා කෙරෙති. කථා කොට තමන් විචාළ දෙයක් කියා ලිය හෙන කෙණෙකුන් නැති හෙයින් තුමූ උන් විචාළ දෙයක් කියා පියා එ ලෙසින් දඹදිව මුළුල්ලෙහි ඇවිද නිවන් දහම් දෙසා ලිය හෙන කෙණෙකුන් නො දැක පෙරළා සිය තෙනට ම අවුත් උපතිස්ස නම් පරිබ්‍රාජකයෝ කොලිත පරිබ්‍රාජකයන්ට සොයා ඇවිද ත් තව දක්වා අපට සම්භ වූ නිවනෙක් නැත්තේ වේ ද? නො ලත් පමණකින් නැතැ යි යන්ට බැරි වේ ද? ගිනි ඇති කල ඒ නිවන පැනු ත් ඇත්තා සේ දුක් ඇති කල ඒ දුක් නිවන නිවනු ත් අවශ්‍යයෙන් ඇත මැන ව. අප ගේ ශාස්ත්‍රවල පවා හැඟී නොගි ය අර්ථ ය සොයත ත් මුත් නැතැ යි හළ හැකි ද? තව ත් නිවන් දහම් දෙසන තැනක් සොයම්හ. අප දෙන්නා ගෙන් යම් කෙණෙක් පළමු කොට නිවන් දුටු නම් උන් අවුත් නිවන් නුදුටු තැනැත්තවුන්ට කියයුතු ය'යි කතිකා කොළෝ ය.

මෙ සේ උන් කතිකා කොට ගෙන වසන කලට බුදුහු බිම්සර රජ්ජුරුවන්ට දුන් ප්‍රතිඥාවෙන් මිදෙනු පිණිස රජගහා නුවරට වැඩ වෙළුවනාරාමය පිළිගෙන එහි වසන සේක. උරුවෙල් දනව්වට වඩන ගමනේ-

Non-Commercial Distribution

''අඤ්ඤාකොණ්ඩඤ්ඤ පමුඛෙ-භික්ඛු බීණාසවෙ ජිනො,
විධාතුං ධම්මදූතෙයාං-විස්සජ්ජෙසි තහිං තහිං''

යනු හෙයින් තුනුරුවන් ලොව පහළ වූ නියාව වදුරා මෙහෙවර යැවූ සැට දෙනා වහන්සේ ගෙන් පස් වග වහන්දැට ඇතුළත් අස්සජි මහ තෙරුන් වහන්සේ සැට දෙනා වහන්සේ ම වෙන වෙන අත වැඩි හෙයින් තමන් වහන්සේ ගිය අත මෙහෙවර නිමවා ගෙන පෙරළා රජගහ නුවරට අවුත් දෙ වන දවස් ඇතුළු නුවරට සිඟා වැඩි සේක. එ දවස් උපතිස්ස පරිබ්‍රාජකයෝ උදැසන බත් අනුභව කොට ලා පිරිවැජි අරමට යන තැනැත්තෝ අස්සජි මහ තෙරුන් වහන්සේ දක 'මා මෙයට පෙරාතු මෙ සේ වූ පැවිදි කෙණෙකුන් දුටු විරූ නැත. ඒකාන්තයෙන් මෙ ලොව රහත් කෙණෙක් වෙත් නම් හෝ රහත් වන්ට නිසි පිළිවෙත් පුරණ කෙණෙක් වෙත් නම් මුන් ගේ සැටියෙන් මුත් ඊට ඇතුළත් වුව මැනව. ගොසින් මුන් අතින් සවරූප විචාළෙම් විම් නම් යහපත. දූන් මුන් සිඟන ගමන් හෙයින් කථාවට වේලක් නො වෙ යි, පැන් වත් කරන්නවුන්ට වඩා පිපාසා ඇත්තවුන්ට ඉක්මන් සේ නිවන් පිපාසා අපට බලවත් ව තුබූ බැවින් මුන් අත් නොහැර ගොසින් මූ තුමූ කෙලෙස් පැන් පවසට නිවන් පැණ ත් සවිඥ විලකින් ලත් කෙණෙක් වූ නම් මුන් අතින් ඉල්වා ගෙන අපි ත් බී පියා කෙලෙස් පැන් පවස් සන්සිඳුවම්හ'යි සිතා පසු පස්සෙහි ගොසින් තෙරුන් වහන්සේ ත් සිඟා භොජනයෙහි පමණ දන්නා බැවින් යපෙන පමණක් ලැබ සරුප් තෙනකට වැඩ හිඳිනා ආකාරයක් දක් වූ කල්හි බුදු සස්නෙහි පිහිට ලබන්ට පූර්ව නිමිත්ත කොට පුටුව ලා ලා ඊ වැඩ හිඳ වැළඳූ කල්හි වළඳා අන්තයෙහි කුණ්ඩිකාවෙන් අත කට සෝධන්ට පැනු ත් ගෙන දී ඇදුරු වත් කොට ලා වළඳා නිමවා පාත්‍ර වත ත් සපයා ගත් කල්හි මහ තෙරුන් වහන්සේ හා මියුරු පිළිසඳර කථා කොට ලා ''තපස්වීන් වහන්ස, මුඹ වහන්සේ සිඟා ලද දෙයකින් ජීවත් වත ත් චිත්තශුද්ධියක් ඇති හෙයින් දෝ හෝ ශරීර ශොභාව යහපත. මහණ වූයේ කොයි ද? කො තැනක මහණක් ගෙන ද වසන්නෙහි'යි විචාළෝ ය.

තෙරුන් වහන්සේ ඒ අසා, මේ පරිබ්‍රාජකවරු නම් බුදුසස්නට පටහැණියෝ ය. එ සේ හෙයින් සසුන් විල ගැඹුරු නියාවත් තෙණව හැඳින මුත් බැස ලිය නොහැකි නියාව ත් හඟවා කථා කෙරෙමි'යි සිතා වදාරා 'හෙම්බා ඇවැත්නි, මම අලුතිම්-

මහණ වූයේ බොහෝ කලක් නො වෙයි. පුරා උගන්ට නුවූ හෙයින් විස්තර කොට කියා ලිය නො හෙමි'යි කී සේක. පරිබ්‍රාජකයෝ ද ඒ අසා:-

'ගඞ්ගාය වාලුකා ඛීයෙ – උදකං ඛීයෙ මහණ්ණවෙ,
මහියා මත්තිකා ඛීයෙ – ලක්ඛෙත මම බුද්ධියා'යි.

පසු ව කරණ ඥන ගර්ජනාවට තරම් කොට ඥන ගර්ජනාවක් කරන්නෝ 'උපතිස්ස පරිබ්‍රාජකයෝ ය යි කියන්නේ මට ය. මා ගේ ශක්ති නො සලකා මුඹ වහන්සේ ගේ ශක්ති විතර්රක මදක් වේ ව යි බොහෝවක් වේ ව යි වදාළ මැනව. වදාළ කල බොරු හර සැස දණ්ඩෙහි හර පමණක් හැර ගන්නා සේ නො එක් ලෙසින් සිතා පද ව්‍යඤ්ජන නමැති බොරු හර හැර අර්ථ තත්‍ව නැමැති හර ගත හැක්කැ'යි කිවු ය. ඒ අසා තෙරුන් වහන්සේ:

'යෙ ධම්මා හෙතුප්පභවා–තෙසං හෙතුං තථාගතො ආහ,
තෙසඤ්ච යො නිරොධො–එවං වාදි මහාසමණො'

යනු හෙයින් සංස්කාරාදි වූ යම් යම් ඵල ධර්ම කෙණෙක් අවිද්‍යාදි වූ යම් යම් හෙතු ධර්ම කෙණෙකුන් නිසා තල් පක්, පොල් පක් ආදිය නිසා තල් පැළ පොල් පැළ ආදිය පවත්නා සේ ද නැවත තල් ගස් පොල් ගස් ආදිය නිසා තල් පක් පොල් පක් ආදිය පවත්නා සේ ද යි හේතු ධර්මයන්ගේ වශයෙන් ඵල ධර්මයෝ, ඵල ධර්මයන් ගේ වශයෙන් හෙතු ධර්මයෝ ය යි කාරණ ව සිටියා වූ ත්, කාරිය ය යි සිටියා වූ ත්, ධර්මයෝ ත් පවතිද් ද ඉන් 'යෙ ධම්මා හෙතුප්පභවා'' යන්නෙන් ඵල ධර්මයන්ට හේතු වූ අවිද්‍යාදි හෙතු ධර්මයන් වදාළ සේක. නැවත ඒ හෙතු ධර්මයන්ගේ නිරොධයෙන් පොල් ගස් ආදි ය නැති වූ කලට පොල් පක් ආදියෙක් නැත්තා සේ ඵල ධර්මයන් ගේ නිරොධ ය ත් වදාළ සේක. යන මේ අර්ථ ය ප්‍රකාශ කරණ ගාථාව වදාළ සේක.

ගාථාවෙහි ආදි දෙ පදය පමණකින් උපතිස්ස පරිබ්‍රාජකයෝ පරතොඝොෂ ප්‍රත්‍යයට ඒ පමණකු ත් තමන් දැ වැන්න වුන්ට ඇති හෙයින් නය දහසකින් හෙබියා වූ සෝවාන් පෙලෙහි පිහිටා අනික් දෙ පද ය සෝවාන් වූ පසු අසා නිමවා ඇසූ ගාථා දෙ පද ය පමණකින් සෝවාන් වන්ට තිසි මෙ තරම් නුවණක් ඇති මට සෙසු මාර්ග ඵල සම්භ නො වන්ට කාරණයක් ඇති නියා ය යි සිතා තෙරුන් වහන්සේට 'ස්වාමීනි, වදාළ ගාථාව පමණ-ඉතිකින් වදරා ආයාස ගන්ට නො කැමැත්තෙමි. හෙතු ධර්ම ඵල ධර්මයන් ගේ උත්පාද ය හා නිරොධය වැදෑරීම නම් උන් ගේ

අනුත්පාදනිරොධ ය යම් මාර්ග ඵල නිර්වාණ ධර්මයක් නිසා මේ නම් එයි ත් ඇතුළත් ව නිරවශෙෂ ධර්ම දෙශක මා ගේ ත්‍රිලෝ ගුරු බුදුහු දැන් කොහි ද? ධර්ම කාය දුටු මා රූප කාය ත් දුට මනා වේ දැ'යි කිවු ය. ඒ අසා තෙරුන් වහන්සේ වෙළුවන විහාරයෙහි වසන නියා කී සේක. 'එ සේ වී නම් ස්වාමීනි, නුඹ වහන්සේ පෙරාතු ව වැඩිය මැනව. මාගේ එක් යාළුවාණ කෙණෙක් ඇත. ආදි ම කතිකාවක් කරන්නමෝ පළමු ව නිවන් දුටු කෙණෙකුන් කියන්ට වුව මැනැවැ යි නියමයක් කළම්හ.

එ සේ හෙයින් මා නිවන් දුටු නියාව උනු ත් නිවන් සොයා ඇවිදිනා හෙයින් උන්ට කියා ලා ඒ මාගේ යාළුවාණනු ත් කැඳවා ගෙන බුදුන් කරා එම්, කියා ලා තෙරුන් වහන්සේ පඤ්චඞ්ගයෙන් මිදෙන්ට පසඟ පිහිටුවා වැඳගෙන තිවට නිමන්ට ආසන්න හෙයින් තුන් විටක් පැදකුණු කොට ලා තෙරුන් වහන්සේ වඩා යවා පිරිවැජි අරමට අභිමුඛ ව ගියහ. කොලිත පරිබ්‍රාජකයෝ ද යාළුණුවන් දුරින් ම එන්නවුන් දැක 'අද මාගේ යාළුණුවන් ගේ ඇඟ මූණ පැහැය මෙ තෙක් දවස් සේ නො වෙයි. යහපත් ය. ඔවුන්ට සන්තොෂයෙක් ඇත. මෙ තෙක් දවස් මුළුල්ලේ සොයා ඇවිදි නිවන් අද ලත් සැටි'යි සිතා 'කුමක් ද? නිවන් ලදින් නිවී ගියේ ඇද්දැ'යි විචාළහ.

එ සේ විචාළ යාළුණුවන්ට මිහිරි දෙයක් ලදින් භාගයක් අනුභව කොටලා භාගයක් හිණ තබා ගෙන අවුත් දෙන කෙණ-කුන් මෙන් මිනිසුන්ට ගැඹුරු දිය ඇතුන්ට ගැඹුරු නො වන්නා සේ අනඳ මහ තෙරුන් වහන්සේට ම ගැඹුරු නොවන්නා සේ වැටහෙන බුදු වරුන් වහන්සේ බුදු වන දවස් පටන් අග දක්වා, අග පටන් මුල දක්වා, මැද පටන් මුල දක්වා, මැද පටන් අග දක්වා, අග පටන් මැද දක්වා මුල පටන් මැද දක්වා සැලකිය යුතු වූ දෙළොස් අඟෙකින් හා ආකාර විස්සකින් හා අධවා තුනකින් යුක්ත ප්‍රතීත්‍ය සමුත්පාද ප්‍රකාශ වූ ගාථාව ම අස්සජි මහ තෙරුන් වහන්සේ තමන්ට වදළ ලෙස ම කීහ. කොලිත පරිබ්‍රාජකයෝ ද, ගාථාව කියා නිමි කල්හි වෙළඳාමෙහි දක්ෂ කෙණෙකුන් දෙ මස්සට හැර ගත් බඩු වෙළඳාමෙහි අදක්ෂ කෙණෙකුන් තමන් වෙළඳාමෙහි අදක්ෂ හෙයින් සතර මස්සකට හැර ගන්නා සේ උපතිස්ස පරිබ්‍රාජකයන් ගාථා දෙ පදයක් අසා ලද නිවන් කොලිත පිරිවැජියෝ සතර පදය අයා නිමවා ම ලත්හ.

Non-Commercial Distribution

මෙ සේ සෝවාන් ව ලා 'සබඳ, මේ නිවන් නමැති මිහිරි පැන් ඇත්තේ සදහම් නමැති මහ ගඟ වේ ද? ඒ ගඟ වැහෙන්නේ සර්‍වඥ නමැති හිමවත කෙලෙස් අවුවෙන් අවු නො කන දළඳ නමැති පර්‍වත කුළු ඇතුළත සිටි මුඛ නමැති අනවතප්තයෙන් වේ ද? ඒ සර්‍වඥ නැමැති හිමවත දකුම්හ. ඔබ කොයි දැ'යි විචාළහ. ඒ අසා උපතිස්ස පරිබ්‍රාජකයෝ 'සබඳ, ඒ මුනි උතුමාණන් වෙළුවන වෙහෙර වැඩ හිඳිති'යි අප ගේ ඇදුරු වූ අස්සජි මහ තෙරුන් වහන්සේ වදාළ සේකැ'යි කිවු යැ. 'සබඳ, එ සේ කල ඔබ යම්හ'යි කිවු ය.

එ සේ කී කල්හි උපතිස්ස පරිබ්‍රාජකයෝ තමන් කවර කලක ත් ගුරු භක්තිය බලවත් හෙයිනු ත් සඤ්ජය පරිබ්‍රාජකයනු ත් ගුරු හෙයින් උන් සලකා 'සබඳ, අප ලත් නිවන් සඤ්ජය පරිබ්‍රාජකයන්දැට ත් කියම්හ. නුවණැ'ති හෙයින් අප සේ ම ප්‍රතිවෙධ කළ දැ වී නමුත් යහපත. එ සේ නො වී නම් අප ගෙන් ස්වරූප අසා ඔබ යන දැ ය. ගිය කල නිදන් බලා කරණ පිළියම් සේ චරිත බලා වදරන බණ හෙයින් මාර්‍ග ප්‍රතිවෙධයට නිසි කුශලයෙක් උන්දැට ඇත් නම් අප බුදු නො වන හෙයින් අප ගෙන් නු වුව ත් විදමන දක්ෂයන්ට කැළි විදමන් නො වරදනා සේ ඔබින් වරදිනට නැත. උන්දැ කරා යම්හ'යි දෙන්න ම සඤ්ජය පරිබ්‍රාජකයන් කරා ගියහ.

සඤ්ජය පරිබ්‍රාජකයෝ ද උන් දෙන්නා දැක 'කුමක් ද දරුවෙනි' අමා මහ නිවනට පමුණුවා බණ දෙසන කෙණෙකුන් ලද්දුදැ'යි විචාරා 'එ සේ ය. ආචාරීන් වහන්ස, මෙ තෙක් දවස් මුඹ හා අප නො දත් පමණක් මුත් සර්‍වඥ නමැති හිර පහළ ව සදහම් හිරු රැසින් කෙලෙස් අඳුරු දුරු කොට විනේදන පියුම් පුබුදුවමින් සිටියෝ ය. මැණික් තිබිය දී ගොමරිති පිරිමස්නා සේ නිස්සාර කට යුත්තක් හැර ගෙන සැලී ඇවිදිනා දැ ය. මින් ප්‍රයෝජන නැති. බුදුන් කරා අව මැනවැ'යි කීහ. ඔහු ඒ අසා 'තෙපි යව, මම නො යෙමි'යි කීහ. 'හැයි නොයන්ට කාරණ කිම්දැ'යි විචාළ කල්හි හෙම්බා, මෙ තෙක් දවස් මම බොහෝ දෙනාට ඇදුරු ව විසීමි. දැන් ගොසින් උන්ට අත වැසි වීම පමණ නම් ආදී සැළක් ව පියා පසු ව සාළුවක්[1] වූවා වැන්න. මා ගොසින් උන්ට අත් බා වසන්ට ප්‍රසිද්ධ ව හුන් තරමට තරම් නො වෙ යි' කීහ.

---

1. වසාලුවක්

Non-Commercial Distribution

ඒ අසා අර මූ දෙ දෙනා 'ආචාරීන් වහන්ස, සක්විති රජ්ජුරුවන් ගේ සත් රුවන පහළ වූ තැන් පටන් සක් වළ ඇතුළත යටත් නො වන කෙණෙකුන් නැත්තා සේ සර්වඥ නමැති සක්විත්තන් ගෙන් දහම් සක පැවති තැන් පටන් ආඥව කෙළ ලක්ෂයක් සක් වළ දක්වා ත් පවත්ති. මුඹ කෙ සේ කීව ත් අප නො යන්ට නො පිළිවන. සර්වඥයන් වහන්සේ ගෙන් බණක් අසන්ට නු වූ හෙයින් මුත් අප ගේ පැරැත්ත නැති ව මුඹ ම යත් නොගොසින් ලබන ප්‍රයෝජනයක් නැති නියාව අප හැම දනු ත් යන්ට ම වුව මැනැවැ'යි ලෙඩ ඇත්තවුන් බෙහෙදේ තරම නො දන බොන්ට මැළි වුව ත් බෙහෙත් පුවො ත් ලෙඩ සන්හිදෙන නියාව දන බොන්නට කන්නට පැරැත්ත කියන්නවුන් මෙන් ඔබ කොට ගතුමෝ නම් සදහම් බෙහෙත් පොවා කෙලෙස් ලෙඩ සන්හිඳුවා පියම්හ'යි කියන්නට ම තරව කිවු ය.

ඒ අසා සඤ්ජය පරිබ්‍රාජකයෝ 'මෙ ලොව නුවණැත්තෝ බොහෝ වූ ද? නොහොත් නුවණ මඳහු බොහෝ වූ දැ'යි විචාළෝ ය. ''ආචාරීන් වහන්ස, බොල් බොහෝ විකෙක. බොල් පරිද්දෙන් නුවණ මඳ වූවෝ බොහෝ ම ය. නො බොල් වී මෙන් නුවණැත්තෝ මඳ දෙනෙකැ'යි කී කල්හි 'එ සේ වී නම් නුවණ හර නැති වීමෙන් නිස්සාර කෙණෙක් මා කෙරෙහි ඇලුම් ඇති ව මා කරා එති. නුවණ හර ඇති කෙණෙක් හර හුන් තරම් ඇති මහණ ගොයුහුම් කරා යෙති. එ ලෙසිනු ත් පිරිස් බොහෝ මට ය. තෙපි තොප සේ ම සාර තැන් ලත් බැවින් ඔබ යව. මම නොයමි' කිවු ය.

උඟ දෙ දෙන නොයෙක් ලෙස පැරැත්ත කියා ත් නොගිවිස්නා ''මුඹ ගේ කටයුත්තෙන් මුඹ පෙනෙනදැ ය'යි කියා ලා බුදුන් කරා යන්ට නික්මුණා හු ය. ප්‍රසිද්ධ ව සිටි දෙ දෙනා නික්මුණු හෙයින් සඤ්ජයන්ගේ පිරිසත් උන් හා කැටි ව නික්මුණු හෙයින් අරම පාළු වි ය. ගුණෙන් සිස් වූ උඟ තුමූත් තමන් සේ ම පණිදින් සිස් වූ අරම් පාළුව දක ශොකයෙන් හුණු ලේ නැඟූහ. දෙන්නා හා කැටි ව නික්මුණු පන් සියයක් දෙනා ගෙන් සඤ්ජයයන් පිළිබඳ දෙ සිය පනසෙක් නිවන් පුරට පිටි පා සසර මහ වලට මුණ ලා රඳා පී හ. උන් රඳා ගිය ත් උපතිස්ස–කොලිත දෙ දෙන තමන් පිළිබඳ දෙ සිය පනස හැර ගෙන වෙළුවන විහාරයට ගියහ. බුදුහු සිව් වනක් පිරිස් පිරිවරා වැඩ හිඳ බණ වදරන සේක් එන දෙන්නා දුර දී ම සතර ගවුවෙක තුබූ දෙයක් දක්නට සමර්ථ වූ මසැ'ස ඇති හෙයින් දක වහන්දෑ බණවා ලා 'මහණෙනි, තෙල එන දෙන්නා දුටු ද? තුලු මට අගසවු වෙති' වදාළ සේක.

1. බොහෝ අය කල විටෙක බොල් පරිද්දෙන් නුවණ මඳ වුය.

Non-Commercial Distribution

ඔහු ද ගොසින් බුදුන් වැඩ ගෙන එකත්පස් ව සිටි තමන් මහණ මහලු පැවිදි කරවන්ට ආරාධනා කළහ. බුදුහු ඒ අසා වදුරා රත් වලා ගබකින් නිකුත් විදුලියක් මෙන් දකුණත දික් කොට 'මහණෙනි, මෙසේ පලා එව, සසර කතරින් එ තර වනු නිසා බඹසර හැසිරෙව'යි වදළ සේක. එ කල ඒ දෙ න ම සහපිරිවරින් සෘද්ධීන් පහළ වූ පා සිවුරු දැරීමෙන් මනුෂ්‍යාත්ම භාව ය හැර බ්‍රහ්මාත්මභාවයකට පැමිණියා සේ ගිහි වෙස් නැති ව ශීලසමාද්ධ්‍යාදී ගුණ නමැති ආභරණ පළන් මහණ වෙස් ඇති ව සිය වස් ගිය මහ තෙරුන් වහන්සේ මෙන් ආකල්ප ඇති වූ සේක. ඉක් බිත්තෙන් බුදුහු ප්‍රධාන කෙණෙකුන් රැසක් පිරිසක් හැර ගෙන පොහොසත් කෙණෙකුන් කරා ගිය කල කළ මනා ප්‍රපඤ්ච ඇති හෙයින් ප්‍රධානයන් සිටිය දී ම කැටි ව ගිය සෙස්සවුන්ට බත් දෙන්නා සේ අගසවු වන දෙන ම සිටිය දී ම කැටි ව ගිය පඤ්දට බණ වදළ සේක. ඒ තැනැන්දෑ මුදලි වරුන් අත් නො බලා ලා ලූ බත් කන්නවුන් මෙන් බණ අසා දෙ සිය පනස් නම ම රහත් වූ සේක.

සවු පැරුම් නුවණ මහත් හෙයින් අනුන්ට ලූ බතක් බලා සිටි පමණකින් බඩ පිරෙන්ට නැත්තා සේ පඤ්දට වදළ බණ අසා ත් අර්හත්ව ය අගසවු දෙ නමට සිද්ධ නො වී ය. ඉක් බිත්තෙන් මුගලන් මහ තෙරුන් වහන්සේ මහණ වූ සත් වන දවස මගධ රට කල්ලවාල නම් ගම දී, සසම්භාර සඞ්ක්ෂෙප ය. සසම්භාර විභක්ත ය. සලක්ෂණ සඞ්ක්ෂෙපය, සලක්ෂණ විභක්ත ය, යන මොවුන් ගේ වශයෙන් ධාතු කමටහන යෙදී විවසුන් වඩා තුබූ තුන් මග කෘත්‍ය දෙළස නිමවා සෘද්ධිමතුන් අතුරෙහි අග බවට පැමිණ මහ පොළොව පාන් කබළක් කොට, මූද දිය තෙල් කොට, මහ මෙර පහන් වැටි කොට, පහන් දැල්වීම් ආදි වූ නොයෙක් ශාස්ත්‍රමයෙහි නිපුණ හෙයින් බුදුන්ගේ සදහම් නුවර පුරෝහිත තනතුරට පැමිණි සේක.

සැරියුත් මහ තෙරුන් වහන්සේ ද මහණ වූ දෙ පෝයක් විත රින් රජගහා නුවරට ආසන්නයෙහි බුදුන් හා එක් ව හූරා කැණි ලෙණ යැ යි එ නමින් ප්‍රසිද්ධ වූ ගල්ලෙනක වසන සේක්, තමන් වහන්සේ ගේ බෑණ දික්නිය පිරිවැජියන්ට වෙදනා පරිග්‍රහ සූත්‍රය දෙසන කල්හි අනුන්ට ලා ලූ බතක් උන් හා කැටි ව කන්නවුන් අත පොවා හැර ගෙන කන්නා සේ විවසුන් නමැති අතින් සූත්‍ර දෙශනා නමැති බත් අනුභව කිරීමෙන් එක් විතර ව තුබූ

Non-Commercial Distribution

කෙලෙස් බඩ සාය නැති ව රහත් ව බුදුන් සමයෙක මුත් පොළොව සැහවී තුබූ සල් කළණ ගස පහළ නොවන්නා සේ පරමාත්‍ථ හෙයින් විද්‍යමාන වුව ත් බුදුන් සමයෙක මුත් පහළ නොවන අරී පුහුලන් පිරුණු නිවන් මහ නුවර අනන්ත පර්‍ය්‍යන්ත සක්වළ වල පැතිර සිටින්නට ත් බොහෝ වූ සදහම් නමැති මහ සෙනගට අලග්න වීම් නමැති මුණු බැල්මක් නැති ව, සසුන් රටින් නෙරිය යුතු දුශ්ශීලයන් නෙරනට ත් පිටත් ව හුන් සුශීල පුද්ගල කෙණෙක් ඇත් නම් නිවන් පුර ඇතුළත ලන්ට ත්, ලොව් ලොවුතුරා සම්පත් ලද මනාවුන්ට කොට තුබූ විධාන ඇති හෙයින් සම්පත් දෙන්ට ත්, බුදුන්ට ඉක් බිති ව දහම් සක පවත් වන්නට ත්, බල ඇති ව සවු පැරුම් පටබැද සෙනෙවිරත් වූ සේක.

හැයි! මේ දෙ නමින් සැරියුත් මහ තෙරුන් වහන්සේ මහ නුවණැති වූ ව රහත් වීමෙන් සෝවාන් වූවා සේ පෙරාතු නො ව පසු වන්ට කාරණ කිම් ද යත්: දකුණ ත් සවු වීමට පිරියම් මහත් හෙයින. යම් සේ දුක් පත් මිනිස්සු යම් තෙනකට යන්ට සිතූ කල තමන් ගේ බලවත් ප්‍රපඤ්චයක් නැති හෙයින් වහා ම සිතා ලා නැගී යෙත් ද, රජ දරුවන් නික්මෙන කල ඇතුන් සැරහීම් ආදී වූ කළ මනා දැ බොහෝ වේ ද–මෙයි ත් එ ලෙසින් දතයුතු. බුදුහු එ දවස් ම පෙර වරු වේලෙහි වහන්දෑ රැස් කරවා ලා ඒ දෙ දෙනා වහන්සේ ගෙන් සැරියුත් මහ තෙරුන් වහන්සේ නුවණැති තෙනට හා මුගලන් මහ තෙරුන් වහන්සේ සෘද්ධිමත් තෙනට තමන් වහන්සේට ඉක් බිති කොට අග තැන තබා ලා පාමොක් උදෙසා වදළ සේක.

වහන්දෑ ද ඒ දෙන ම අගසවු කළ නියාවට කිසි කෙණෙක් නො සතුටු ව බුදුන්ගේ ත් මුණු බැලුම් ඇති නියා වේ ද? මෙසේ වූ අගසවු තනතුරු දෙන කල පළමු මහණ වූ පස් වග වහන්දෑට හෝ දෙවිය යුතු ය. එ තෙනට ත් නොදෙතො ත් යස තෙරුන් වහන් සේ ඇතුළු වූ පස් පනස් දෙනා වහන්සේට හෝ දිය යුතුය. එ තෙනට ත් නොදෙතො ත් තිසක් පමණ භද්දවග්ගිය තෙරුන් වහන්සේට හෝ දිය යුතු ය. එ තෙනට ත් නොදෙතො ත් උරුවෙල් කසුප් ආදී වූ තුන් බෑ තෙරවරුන් වහන්සේට හෝ දිය යුතු ය. මෙ තෙක් තැන් පන්වා පසු ව මහණ වූ මෙ තෙනට අගසවු තනතුරු දීම නම් ඔබ කෙ සේ සිතා කරත ත් අපට මුහුණු බලා කරන්නා සේ සිතෙයි. අප තබා කාට වුව ත් කාරණ ඇසුවො ත් මුත් එ ලෙස ම සිතෙයි' කියා මුහුණු බලා නො කරණ බුදුන්ට එ ලෙස කියා ගත් සේක.

Non-Commercial Distribution

බුදුහු ත් කියන කථාව දිව කණින් අසා දනිත ත් 'කුමක් කියවු දැ'යි විචාරා වදරා 'ස්වාමීනි, අනිකෙක් නො වෙයි. මුඹ වහන්සේ මූණු බලා කරණ කට යුතු කියම්හ'යි කී කල්හි බුදුහු තොප හැම නොදන කියත ත් මා මූණු බලා පක්ෂග්‍රාහී ව කරණ දෙයක් නො වෙයි. මූ හැම දෙන යම් යම් පිණක් කොට ලා යම් යම් ලෙසක පැතූ නම්:

''එස දෙව මනුස්සානං – සබ්බකාමදදො නිධි,
යං යදෙවාභිපත්ථෙන්ති – සබ්බමෙතෙන ලබ්භති.''

යනු හෙයින් උන් උන් පැතූ ලෙසට දෙමි. මුන් හැම දෙනා ගෙන් අඤ්ඤාකොණ්ඩඤ්ඤ තෙරහු සසර සිටිනා ගමනේ එක ගොයම් මුරයේ නව අගහස් බතක් දන් දී අගසවු තනතුරක් නො පැතුවෝ ය. පැතූයේ කවරේ ද යත් – 'මේ දන් දුන් අගහස් සේ ම බුදු කෙණකුන් වහන්සේ කරා පැමිණ හැම තැනට පළමු කොට රහත් වීමෙන් නිවන් අගහස් සම්භ වේ ය යි පැතූයේ ය'යි වදරා ඒ ප්‍රාර්ථනා කෙළේ කවර කල දැ'යි වහන්දෑ විචාල කල්හි 'අසනු කැමැති නියා දැ'යි විචාරා වදරා ලා 'හෙම්බා මහණෙනි, මේ අප බුදු වූ කපට එකානූ වන කප විපස්සි නම් බුදු කෙණෙක් ලෝ පහළ වූ ය. එ කල මහාකාළ ය - චූළකාළ ය යි ප්‍රසිද්ධ වූ දෙ බෑ කෙණෙක් මහා හැල් කෙතක්[1] වැපිර වූ ය. ඉක් බිත්තෙන් එක් දවසක් චූළකාළ නම් මලණුවෝ හැල් කෙතට ගොසින් හැල් බඩයක් තළා පියා කැවූ ය. ඒ හැල් බඩ ය ඉතා ම පැණිරස යුත් වි ය.

උඹ ඊ රස බලවත් හෙයින් මෙ සේ වූ බලවත් රසය දනක් දීපුවොත් ඊට වඩනා නිවන් රස ත් ලද හැක්කැ යි බුදු පාමොක් සඟනට හැල් බඩ වළඳන්ට නිසි ලෙසක ඉදී කරවා දන් දෙනු කැමැති ව බෑණන් කරා ගොසින් 'බෑණන් වහන්ස, හැල් බඩ තළවා පියා බුදු පාමොක් මහ සඟනට නිසි කොට ඉදී කරවා දන් දෙම්හ'යි කිවූ ය. බෑණෝ ද ඒ අසා 'හැල් බඩ තළවා දන් දීමක් ගිය දවස වූයෙ ත් නැත. එන දවස වන දෙයකු ත් නො වෙයි. ගොයම් නො නසව' කියා ලා මලණුවන් හැල් බඩ දන් දෙන්ට ම තර හෙයින් 'එ සේ වී නම් සේන බෙදා පියා මා සන්තක භාගයට අළෙවි නො කොට තොප සන්තක භාගයට කැමැත්තක් කරව'යි කිවූ ය.

ඒ අසා 'යහපතැ'යි සේන බෙදා පියා බොහෝ අත් කැමියන් හැර ගෙන හැල් බඩ තළවා පියා සැළවළට නගා පැනක් නුමුසු

---

1. සේනක් 2. පැනියන් විය - පැනි බෙත් විය – පැනියන්සේ

Non-Commercial Distribution

කිරින් ම පැසවා පැසෙන අවස්ථාවේ දී ගිතෙල්-මී-සකුරු ආදිය බහා කිරි බත් පිසවා ලා එක් ලක්‍ෂ අට සැට දහසක් පමණ බුදු පාමොක් සඟනට දන් දී වළඳා අන්තයෙහි 'ස්වාමීනි, මා දුන් මේ අගහස් දන හැම දෙනාට පළමු නිවන් පුර වදනට හේතු වේව'යි පැතූහ. බුදුහු ත් එ සේ ම වන නියාව දැන 'එ සේ ම වේව'යි වදළ සේක. උඹ පෙරළා ත් සේනට ගොසින් බඩ තළා ගත් සේන් කැබෙල්ල බලා හැල් කරල් මිටි කඩා බැන්ද සේ යහපත් ව පැසී සිටි සේන් කැබැල්ල දැක සෙසු කෙත්වත් කල් යත ත් පින් කෙත් උදවු ව එන නියා ව දැන මසුරු සිත් නමැති වල් කසළ නෙළා හැර පී හෙයින් දෝ එක ද කරලකට හානි නැති ව යවක්[1] ව පැසී සිටියේ ය යි සිතා ඒ ගොයම් නො දන තෙක් දුටු සතුටේ අගහස් බතක් දන් දුන්හ. දන දවසු ත් බතක් දන් දුන්හ. උක් පිඩී කරණ දවසු ත් දනක් දුන්හ. කඳු කරණ ද ත් දනක් දුන් හ. කළ විට ලන ද ත් දනක් දුන්හ. වී මිරිකා රාසි කරණ ද ත් දනක් දුන් හ. අටුවේ ලන ද ත් දනක් දුන්හ'යි නව වාරයක නව අගහස් බතක් දුන්හ. නව වර ම හැර හැර ගත් දෙයෙහි අඩුවක් නැති ව කුසල්හි අදහස් පිරෙන්නා සේ තද්වස්තුක වූ සශාඵල ය ත් අඩු නැති වේව යි ඒ නව අගහස් දන් දී එසේ පතා මෙයට ලක්ෂයක් වන කප පියුමතුරා නම් බුදුන් සමයෙහි ත් සතියක් මුළුල්ලෙහි ම මහ දන් දී එ ලෙස ම පැතූ ය.

එ සේ හෙයින් දූන් බණ කියා නිවන් දක්වන ගමනේ ත් උන් ම පළමු කොට නිවන් දක්වා ලීමි. මුන් පසු කොට සෙස්සන් නිවන් දැක්වීම් නම් ඊට කිය යුත්තක් මුත් මිට කියන්නේ කිම්දැ'යි වදළ සේක. 'ඒ එ සේ ය, යස තෙරුන් වහන්සේ ඇතුළු වූ පස් පණස් නම කළ පින් කවරේ දැ'යි විචාළ සේක.

'හෙම්බා මහණෙනි, උඹ හැම දෙන ත් එක් බුදු කෙණකුන් සමයෙහි සාමාන්‍යයෙන් රහත් වන්ට නිසි බොහෝ පිං කොට පසුව බුදුන් නූපන් සමයෙක මූ හැම මිනිස් ලොව ඉපද අසරණ ව මියගියවුන් දවා පියන නෑ සිය කෙණෙකුන් නැති හෙයින් පින් නිසා දවා ඇවිදිති. උඹ එක් දවසක් දූරි ඇති ගැනියක මළ තැනැත්තිය දවන්ට ගෙන ගොසින් පස් දෙණකුට දවන්ට විධාන කොට ලා සෙස්සෝ ගමට නැඟී ගියෝ ය. යස දරුවෝ ඒ මිනි ය හුලින් ඇණ ඇණ දවන්නෝ පිළිකුල් මෙනෙහි කොට අනික් සතර දෙනාට ත් 'හෙම්බා මියන්නාට පෙරාතු මුන් ඇවිදි සැටිය ත්, දැන් මුන් හොත් සැටිය ත් බලව. පින් කමට අත

---

1 සක ව

Non-Commercial Distribution

වැකිටි වූවා සේ ම දුන් අත ත් දද වැකිටි වෙ යි. වැඩෙන අව-ධියේ කෙලි කොල්ලන් පයින් තළන්ට පය වක් කරන්නා සේ දුන් පය ත් වැකිටි වෙයි. කැට පත් තබා ගෙන බල බලා මැදී දත් ඇට ද ලබු ඇට සේ පැනෙන්ට වන. අඳුන් ගා සැරහූ ඇස් අඟුරු දළු හං මුසු වි ය. පිටින් කසා ගා තෙල් ගා පිරිමැසූ බඩ ඇතුළේ තුඹු කුණු රාශිය ත් බලව' යනාදීන් කියා පිළිකුල් මෙනෙහි කැරවූ ය. ඔහු සතර දෙන ගමට ගොසින් සෙසු යාළු වන්ට ත් කිවූ ය. යස දරුවෝ තමන් ගෙට ගොසින් දෙ මවු-පියන්ට ත් අඹුවන්ට ත් කිවූ ය.

ඒ අසා මොවුහු හැම දෙන ඒ ජාති ය මුළුල්ලෙහි අසුභ භාව නායෙහි යෙදුනා හු ය. මෙ සේ කොට ත් රහත් වීම පමණක් පැතූ බව මුත් අනික් තනතුරක් උන් නොපැතූ බැවින් උන්ට අගසවු තනතුරු දුන්නේ නැතැ'යි වදාළ සේක.

'ඒ එ සේ ය, භද්දවග්ගිය වහන්දෑ කවර පිණක් කළසේක් දෑ'යි විචාළ හ.

'හෙම්බාමහණෙනි, උයිත් රහත් වන්ට ම නිසි පින් කරන්නෝ මෙ කප ම එක් කලෙක මුන් තිස් දෙණකුන් දුන් රහත් වී මට ලොල් වූවා සේ ම එ වක රා පීමෙහි ලොල් ව දුන් මා බුදු ව කියන බණ පන් දහසක් හවුරුදු පවත්නා බව මුත් එ වක හුරුව කියා ලූ බණ සැට දහසක් හවුරුදු පැවැති හෙයින් ඒ තාක් කල් මුළුල්ලෙහි පස් පවින් දුරු ව පන් සිල් රැක මුන් තිස් දෙනා රහත් වීම පැතූ බව මුත් උන් පැතූ අනික් තනතුරක් නැති හෙයින් උන්ට අගසවු තනතුරු නුදුන්නෙමි' වදාළ කල්හි –

'ඒ එ සේ ය, උරුවෙල් කසුප් ආදී වූ වහන්දෑ කළ පින් කවරේ දෑ'යි විචාළ සේක.

'හෙම්බා මහණෙනි, උයි ත් රහත් වීම් පමණකට ම පින් කරන් නාහු මෙයට දෙයානූ වන කප තිස්ස නම් වූ ත් ඵුස්ස නම් වූ ත් බුදු වරහු දෙ දෙනෙක් ලොව උපනහ. ඉන් ඵුස්ස නම් බුදුන්ගේ පිය රජ්ජුරුවෝ මීඳු නම් වූ ය. ඒ බුදුන් ගිහි සැප ත් විද මහාභිනික්මන් කොට මහණ ව ප්‍රධන් වියයීයෙහි හැසිර බුදු වූ කල්හි රජ්ජුරු වන් ගේ අනිත් බිසෝ කෙණකුන්ගේ පුතණු කෙණෙක් දකුණත් සවු වූ හ. පෙරෙවි බමුණන් ගේ පුතණුවෝ වමත් සවු වූ හ. රජ්ජුරුවෝ බුදුන් ළඟට ගොසින් මාගේ වැඩි මාලු පුත් වූ නුඹ වහන්සේ බුදු වූ සේක. බාල පුතණුවන් වහන්සේ දකුණත් සවු වූ සේක. පෙරෙවි බමුණානන් ගේ පුතණුවන් වහන්සේ වමත් සවු වූ සේක. එසේ හෙයින් බුදුහු ත් මා ඇති ව වූ හෙයින් මා ගේ ම ය. ඔබ දෙසූ දහමුත් මා ගේ ම ය. ඒ ධර්මය ධරා සිටිනා

Non-Commercial Distribution

සඞ්ඝයා වහන්සේ ත් මා ගේ ම ය'යි කියා තර වූ මමායනය ඇති ව බුදුන් බැස හෙව වැද ලා 'ස්වාමීනි, දැන් මේ ගෙවා පලා ගිය කල නම් අනූ දහසක් හවුරුදු ගෙවී කෙළවර වැද හිඳ නිදන කලක් වැනි විය. මෙ තෙක් කල් කෙ සේ වුව ත් මෙ වක් පටන් අනික් ගෙදෙර කඩක සිහා නොවැඩ දිවි පමණින් මා ගේ සිවුපසය ම ඉවසා වදළ මැනවැ'යි ආරාධනා කොට ලා උපස්ථානයට පටන් ගත්හ.

රජ්ජුරුවන් ගේ තව ත් පුත්තු තුන් බෑ කෙණෙක් ඇත. ඉන් වැඩිමාලු තැනැත්තන්ගේ සේවායෝ පන් සියයක් ඇත. මැදි බෑ තැනැත්තන් ගේ සේවායෝ තුන් සියයෙක් ඇත. බාල තැනැත්තන්ගේ සේවායෝ දෙ සියෙක් ඇත. ඌ තුන් බෑයෝ ද පියාණන් උපස්ථාන කරණ නියාව බලා පියා අපි ත් අප ගේ බෑණන් වහන්සේට උපස්ථානයක් කරම්හ'යි සිතා පියාණන් අතින් අවසරයක් ඉල්වන්නාහු ත් අවසරයක් නො ලදින් පසල් දනවුව පෙරළි කළ කල්හි රජ්ජුරුවන්ගේ විධානයෙන් ඔබ ගොසින් ඒ සන්හිඳුවා ලා ළඟට අවු ය. කළ සපත් කමට රජ්ජුරුවෝ සමාධි ව සනා පියා වරයක් ගන්ට කිවු ය.

ගරුතර කරණු නිසා 'පසු ව පිළිවනැ'යි කියා තබා ලා පසුව දවසක දී සඳහන් කොට පිය රජ්ජුරුවන් 'වර ය ගන්ව'යි කී කල්හි 'ස්වාමීනි, අනින් වරයකින් අපට කම් නැත. මෙ වක් පටන් අපි ත් අපගේ බෑණන් වහන්සේට උපස්ථානයක් කරණු කැමැත්තම්හ. ඒ වර ය දුන මැනැවැ'යි කියා රජ්ජුරුවන් නො ගිවිස්නා 'එ සේ වී නම් සත් හවුරුද්දකට හළ මැනවැ'යි කියා එ සේ ත් නො ගිවිස්නා සාවුරුද්ද පටන් හවුරුද්ද දක්වා කියා ගිවිස්වා ගත නො හී හවුරුදු ඉල්වන්ට නැති හෙයින් එකොළොස් මස පටන් තුන් මස දක්වා ඉල්වා ඒ සේ ත් ලද නො හී රජ්ජුරුවන් වහන්ස, දරු කමු ත් නොසලකා තෙල ලෙස ම මැළි කල තුන් දෙනාට එක් කෙණෙකුන්ට මසක් වත නියාවෙන් තුන් මසකට අවසර දුන මැනවැ'යි කිවු ය. යහපත දරුවෙනි, තෙල විතරක ට ත් නොලැබුණු කල කුමක් සිතවූ ද? තුන් දෙනා ම මස මස ඔබාදීන් තුන් මසක් දන් දී ගනුව'යි අවසර දුන්හ.

උන් තුන් දෙනාගේ ම කොටහළුවල විධාන කොට වැය දී ලන්නො ත් අතු නතු කළ නපුරු හෙයින් එක් කෙණෙක. අය වියදම ලියා සිටින්නා ත් එක් කෙණෙක. උන් දෙන්නා හසරින් එක් ලක්‍ෂ විසි දහසක් දෙන බැඳී සිටිති. රජ කුමරුවෝ තුන් දෙන මෙ කිව වුන් හැම ගෙන්වා ලා 'අපි මෙ තුන් මස දස සිල්

Non-Commercial Distribution

සමාදන් ව රන් වන් පිළි හැඳ පෙර ව බුදුන් හා කැටි ව විහාරයේ රඳම්හ. තෙපි මෙ තෙක් දෙන වී සාල් ඇර ගෙන තුන් මස අනූ දවස් ම, අනූ දහසක් වහන්දෑට ද, බුදුන්ට ද, අපට ද, අප ගේ යොධ දහසට ද, බත් ඉදි කරවා වෙහෙරට ම ගෙන'වුත් දෙව. අද කළ විධාන පමණක් මුත් තොප හැම කුසී වන ලෙසට ත් අප විඩා වන ලෙසට ත්, නැවත කරණ විධාන නැත. විධාන නො වරදවා කරව'යි සම්මත කොට ලා පිරිවර දහසක් හැර ගෙන වෙහෙරට ගොසින් දස සිල් සමාදන් ව ගෙන රන් වන් පිළි හැඳ පෙර ව වෙහෙර ම රඳන්නාහ.

කොටගුළ තැනැත්තෝ ද, ලියන්නෝ ද, එක් ව තුන් බෑයන් ගෙන් දවස එක් කෙණෙකුන්ගේ දරුවෝ කැඳ බත් ගෙන දන් දෙති. දන් ඉදි කරන්නවුන් ගේ දරුවෝ කැඳ බත් ආදිය දකලා හඩති. හඩන නියාව දැක දන් වළඳන වහන්දෑ නො එන තෙක් ම ලෝ දිය බොන්නවුන් මෙන්, ලෝ ගුලා ගළන්නවුන් මෙන් කැඳ බත් දෙති. වහන්දෑ වළඳා අන්තයට ඉතිරි වන කිසිවකු ත් නැත. කල් යත් යත් දරුවන් පිට ලා ලා කුණු සිත යපා ගත නොහී තුමූ ත් කති. ඒ දන් වැට ගසා කෑවෝ සුවාසූ දහසක් දෙන ය. දීලුවන් දී ලූ දන් වැට බැඳී ලූ පමණකට අනූ දවසක් ගසා කා ලා කා ලූ දන් වැට දිරවන්ට ප්‍රේත ලෝකයෙහි උපන්හ.

දන් වැට කන කල උන් සැප තරමට දුකු ත් බොහෝ වී ය. තුන් බෑයෝ ද යොධ දහස හා සමඟ මිය දෙව් ලොවම ඉපද කළ පින් බොහෝ හෙයින් දෙව් ලොව ම උපදනාහු දෙයානූකපක් දවස් ගළවාපීහ. මෙ සේ ඒ තුන් දෙන ත් රහත් බැවු ම සිතා පින් කොට පතා වී වපුට, වී ම ලබන්නා සේ පැතූ ලෙසට ම ලද්ද'යි වදළ සේක. වදරා ලා 'හෙම්බා, එ සමයෙහි ලියන්නෝ නම් දැන් බිම්සර රජ්ජුරුවෝ ය. කොටගුළ තැනැත්තෝ නම් විශාඛා නම් උපාසකයෝ ය. දන් වැට ගසා කෑ සුවාසූ දහසක් දෙන ද එ වක ප්‍රේත ලෝකයෙහි ඉපද බොහෝ දුක් විඳ පියා කුමක් කෙරෙම් ද - උයි ත් සුගති-දුගති වශයෙන් දෙයානූ කප ගෙවා පියා බුදුවරුන් වහන්සේ ලා පස් නමක ගෙන් හෙබියා වූ මෙ මහා භද්‍ර කල්පයෙහි පඤ්චබුද්ධප්‍රතිමණ්ඩිත හෙයින් කප භද්‍ර වූ බව මුත් තමන් කොට ලූ භද්‍රයක් නැති හෙයින් බුද්ධාන්තර සතරක් මුළුල්ලෙහි ප්‍රේත ලොකයෙහි ම දවස් යවූහ. පවෙහි භය ඇත්තවුන් සඟ සතුයෙහි භය ඇති වන්ට මෙ තෙක් ම ඇත.

Non-Commercial Distribution

එසේ දවස් යවන ඒ ප්‍රේතයෝ ද මෙ කප පළමු උපන් හතළිස් දහසක් හවුරුද්දට ආයු ඇති කකුසඳ බුදුන් කරා ගොසින් තමන් බත් ලබන අවධි විචාළෝ ය. ඔබ ඒ අසා උන් සඟ සතු දෙය කෑමේ කළ අවධියක් නැත්තා සේ ම තමන් වහන්සේ ත් අවධි නියම නො කොට 'මා දවස බත් නො ලබව. මා ත් පිරිනිවී සස්න ත් අතුරුදන් වූ කල දහසක් අවුරුද්දෙන් අඟලක් වඩනා පොළොව සතර ගවුවක් විතර උස් වූ කලට කොණාගමන නම් බුදුහු උපදිති. උන් විචාරව'යි වදළ සේක. උයිත් එ තෙක් කල් මුළුල්ලෙහි ප්‍රෙත ලොකයෙහි රඳා පියන් පමණ කට කා ලූ දන් වැට නො මඳ හෙයින් රඳා ලා තිස් දහසක් හවුරුද්දට ආයු ඇති කොණාගමන නම් බුදුන් උපන් කල්හි ඔබ ත් විචාළෝ ය. ඔබ ත් 'මා සමයෙහි ලබන බත් නැත. මා පිරිනිවී මා ගේ සාසනය ත් අතුරුධන් වූ කල පොළොව ත් ආදි ලෙසින් ම සතර ගවුවක් වඩනා කලට කසුබ් බුදුහු බුදු වෙති. උන් අතින් විචාරව'යි වදළ සේක. උයි ත් එ තෙක් කල් මුළුල්ලෙහි ප්‍රෙත ලොකයෙහි ම දවස් යවා පියා විසි දහසක් හවුරුද්දට ආයු ඇති ඒ කසුබ් බුදුන් උපන් කල්හි දුන් දන් වැට කන්ට නො මැළි වූවා සේ ම විචාරන්ට ත් නො මැළි හෙයින් ඔබ අතිනු ත් විචාළෝ ය. ඔබ ත් ''මා සමයේ නොලබව. මට පසු ව ආදි ලෙසින් පොළොව සතර ගවුවක් වඩනා කලට ගෞතම නම් බුදුහු බුදු වෙති. උන් දවස බිම්සර නම් රජ්ජුරු කෙණෙක් බුදු පාමොක් සඟනට පින් පෙත් කොට දන් දී ලා තොපට පින් පමුණුවති. එ කල ලබව'යි අනික් බුදුවරුන් වහන්සේ දෙ නම දුටු දෙය ත් මුන් වහන්සේ වදළ සේක.

එ බස් අසා ප්‍රෙතයන්ට බුද්ධාන්තරය මුළුල්ලෙහි මිනිස් ලොවින් තරු පෙනන දෙව් ලොවට විනාඩිකා සයකින් වන්නා සේ මිනිස් ලොවින් පනස් අවුරුද්දක් එ ම දෙව් ලොවට දවසක් වන්නා සේ සෙට දවස් සේ ලුඩුකොට සිතින. අනූ දවසක් මුළුල්ලෙහි කෑවා වූ වහන්දෑ සන්තක බත මීහිරි හෙයින් මඳ සේ ම හැඟින. ඒ ප්‍රෙතයෝ ද අප ගේ බුදුන් උපන් සම-යෙහි බිම්සර මහ රජුන් පින් පෙත් දී තමන්ට පමුණුවන නියාව කසුබ් බුදුන් ගෙන් ම දත් හෙයින් විචාරන්ට අප ගේ බුදුන් කරා නො ගොසින් බිම්සර රජ්ජුරුවන් ආදී දවස් දන් දී ලා තමන්ට පින් කම් පමුණුවා නුලූ හෙයින් එ දවස් රෑ අවුත් රජජුරුවන්ට පෙනුණාහු ය.

Non-Commercial Distribution

රජ්ජුරුවෝ දෙ වන දවස් වෙළුවනයට ගොසින් බුදුන්ට දන්වූ ය. බුදුහු ඒ අසා වදරා 'මහ රජ, හෙම්බල, ඒ ප්‍රේතයෝ නම් මෙ කපට දෙයානූ කප වුස්ස බුදුන් සමයෙහි, තොප ගේ නෑයෝ ය. කරවා දී ලන්ට විධාන ලත් පමණෙකින් දන්වට ගසා කා තුන්වට නසාගත නො හී ප්‍රෙත ලොකයෙහි ඉපද අනන්ත කාලයකින් එයින් චුත ව සුගති-දුගති වසයෙන් දෙයානූ කප යවා මේ කප ත් දන් වැට කෑමෙහි විපාක වශයෙන් ප්‍රෙත ලොකයෙහි ඉපද දුක් ගෙන ඇවිදින්නෝ, මේ කප මට පෙරාතු බුදු වූ කකුසඳ-කොණාගමන දෙ නම ගෙන් තමන් බත් ලබන අවධි විචාරා නිමයක් නො දන තුන් වැනි වූ කසුබ් බුදුන් විචාර: උන් ගෙන් මා සමයෙහි තොප උන් හැමට නෑ තැනැත්තවුන් හෙයින් තොපගේ සමවායෙන් බතක් ලබන නියාව අසා මේ බුද්ධාන්තරය මුළුල්ල දෙ දවසක් කොට සිතා ගෙන මෙ ම පතා ඇවිදිනාහු තොප ඊයේ දවස් දෙන දන් පින් පෙත් කොට නුදුන් හෙයින් තෙල ලෙස පෙණුනාහු ය'යි වදරා 'දුනු ත් දුන්නො ත් ලැබෙද්ද සවාමිනි,' විචාළ කල්හි 'එ සේය. ලැබෙති. අමුතු නැතැ'යි වදළ සේක.

දෙ වන දවස් රජ්ජුරුවෝ මහ දන් දී ලා ඒ ප්‍රෙතයන්ට දිව බත් දිව පැන් සම්භ වේව'යි කළ කුශල ය පිරිනමා ලූ ය. උන්ට ත් දිව බත් හා දිව පැන් සම්භ වි ය. දෙ වන දවස් පිළි නැති ව පෙනුණාහු ය. රජ්ජුරුවෝ පිළි නැති ව පෙණුනු නියාව බුදුන්ට දන්වූහ යි. 'මහ රජ තෙපි පින් පෙත් කොට පිළි නුදුන් හෙයිනැ'යි වදළ සේක. රජ්ජුරුවෝ දෙ වන දවස් පිළි දී පින් පෙත් දෙවා ලූ ය. ඒ ඇසිල්ලෙහි ම කළ කුශල ය අනුමෝදන් වුව ත් දිවබත් ආදි ය සම්භ වන්ට අරුම නො වන හෙයින් හෝ කබලිඞ්කාරාහාර ගත ඕජාවෙන් උපස්තම්භ ලදින් ශරීර ගත ඔජාව රූ උපදවන්නා සේ ම රජ්ජුරුවන් දුන් පින් කම උපසථම්භ ව පුරාකෘත කුශලයෙන් හෝ දිව පිළි ආදි ය සම්භව ලත් සම්පතට නිසි ව ප්‍රෙතාත්මභාවයෙනුත් මිදී දිව අත් බැව් ලද්දහ. බුදුහු දිව සැපත් ලද්දවුන්ට නිවන් සම්පතු ත් තමන් වහන්සේ ගෙන් දෙනු නිසා "තිරොකුඩ්ඩෙසු තිට්ඨන්ති" යනාදින් කුදු ගොත් සඟියේ තිරොකුඩ්ඩ සූත්‍රයෙන් බණ වදළ සේක. ඒ බණ අසා සූවාසූ දහසක් දෙන නිවන් දුටහ.

මෙ සේ තුන් බෑ දුළුල්ලන්ගේ කථා වැදෑරීමෙන් ම ප්‍රස්තුත වූ ප්‍රෙතයන් ගේ කථාව ත් වදරා 'තුන් බෑ දුළුල්ලෝ ත්

Non-Commercial Distribution

තමන් කළ ප්‍රාර්ථනා ලෙසින් ම ලැබ්බ යුත්ත ලදහ. මා ගේ මූණ බැලීම නම් කුමක් දැ'යි වදළ සේක. ''ඒ එසේ ය, අග සව් දෙ නම කළ පින් කවරේ ද? ආවෙණික ව අග සවු තනතුරු ලබන්ට ය'යි විචාළ සේක. උන් කළ පින් අසනු කැමැත්තවු නම් මෙ තනට එකාසඞ්ඛ්‍ය කප් ලක්ෂයකින් යට සැරියුත් මහ තෙරහු මද්ධ්‍යයේ කෙසේ වුව ත් ආද්‍යවසාන දෙක ම එක තරම් කරන්නා සේ බමුණු මහසල් කුලයෙහි උපන්හ. නමින් සරද නම්හු ය. මුගලන් මහ තෙරහු ගොවි මහසල් කුලෙහි උපන් හ. උං තුමූ සිරිවඩු නම්හ.

සිරිවඩු නම් ලෙසට මිත්‍ර කම ත් වඩා දෙ පක්‍ෂය ම වෙසෙති. සරද නම් බමුණු කුමර දෙ මවු පියන් ගේ අයාමෙහි මහ සම්පත් හිමි ව එක් දවසක් සිතන්නෝ 'මා දන්නේ මෙලොව පමණක. පර ලොව කුමක් බව ත් නො දනිමි. උපන්නේ නියම වී නම් ජාති ය මුල් ව වන දෙයක් හෙයින් මිය යාම ත් උපන්නවුන්ට නියම ය. එ සේ හෙයින් මහණ ව ගෙන ජාති–ජරා–මරණ නැති නිවනක් සෙවුමෝ නම් යහපතැ'යි තමන් අතුරෙහි සිතා ලා සිරිවඩු කෙළෙඹියන් කරා ගොසින් 'සබඳ, සිරිවැඩිය, මම මහණ ව ගෙන නිවන් සාධනු කැමැත්තෙමි. තෙපි ත් මා හා කැටි ව මහණ විය හෙවු දැ'යි විචාරා 'මට ඒ බැරි ය. මුඹ මහණ වනැ'යි කී කල්හි 'පර ලොවට යන කල නෑයන් මිත්‍රයන් හැර ගෙන යන කෙණෙක් නැත. කැටි ව යේ නම් කොට ගත්තා වූ පවක් හා පිනෙක. එ සේ හෙයින් එද ත් නොයන මුන් හැයි දැ'යි සිතා රුවන් පත්තායම් දෙරවල් හරවා පියා වස්තු නොලබන්නා වූ දුගී ආදීන් ට මහ දන් දී හිම වූ පියසට ගොසින් මහණ වූහ. උන් මහණ වූ නියා ව අසා මේ සා මහ ත් සැපතක් හැර මහණ වන්නේ නම් කළ මනා දෙයක් ම නිසා වේවා දැ'යි කියා එක් කෙණෙක් මහණ වූ හ. දෙන්නෙක් මහණ වූ හ. තුන් දෙනෙක් මහණ වූහ. යනාදීන් වඩා ගෙන ගොස් සූ සැත්තෑ දහසක් පමණ දූළුල්ලෝ වූහ.

සරද තාපසයෝ පඤ්චාභිඥා අෂ්ට සමාපත්ති ලදින් සූ සැත්තෑ දහසක් පමණ දූළුල්ලන්ට ත් කිසුණු පිරියම් කියාලූ හා එහු හැම දෙන ත් උන් ගෙන් ලත් උපදෙසින් අභිඥා හා සමාපත්ති උපදවා ගත් හ. එ සමයෙහි වැළි ත් අනොමදස්සී නම් බුදුහු ලොව උපන් සේක. ඒ බුදුන් උපන් නුවර චන්ද්‍රවතී නම. පිය රජ්ජුරුවෝ යසවත් නම් හ. මවු බිසවු යසෝදරා නම් හ. පිට දුන් බොධි ය කුඹුක්ගස ය. නිසභ ය–අනෝම ය

Non-Commercial Distribution

යන තෙර සභල අග සව්වෝ ය. උවටා තෙරහු වරුණ නම් හ. සුන්දරා ය – සුමණා ය යන මෙහෙණින්නෝ දෙ දෙණෙක් අග්‍ර ශ්‍රාවිකාවෝ ය. හවුරුදු ලක්ෂයක් ඒ බුදුන්ගේ ආයුෂ ය. උස වූ කලී වඩු රියනින් අට පණස් රියන. ශරීරාලොක ය නිරන්තර – යෙන් අට සාළිස් ගවුවෙක පැතිර සිටී. නිත්‍ය පරිවාර භික්ෂූහු ලක්ෂයක් දෙන ය.

ඒ බුදුහු එක් දවසක් අළුයම් වේලෙහි දවස් පතා දෙළොස් කෙළ ලක්ෂයක් ඵල සමවතට හා දෙළොස් කෙළ ලක්ෂයක් මහ කුළුණු සමවතට හා එක් කොට සූ විසි කෙළ ලක්ෂයක් සම වතට සම වදනා හෙයින් සමවත් සමවතින් නැගී ලොව බලන සේක් සරද තවුසාණන් දැක 'අද මම සරද තාපසයන් ළඟට ගියෙම් නම් මහත් වූ දහම් වැස්සෙක් මා හිමාල වනයෙහි[1] ලා ලා වස්සී. සරද තාපසයෝ අගසව් තනතුරු පතති. පසු ව උන් ගේ යාළු වූ සිරිවඩු කෙළෙඹියෝ වෙළෙවි නො ව දෙවෙනි අගසවු තනතුර පතති. දහම් වැස්ස වැස නිම් කල්හි සරද තාපසයන්-ගේ පිරිවර සූ සැත්තෑ දහසක් පමණ දූළුල්ලෝ කෙළෙස් මහ ගිම් නිවා රහත් ව ෂඩභිඥදී වූ ඒ ඒ ගුණෙන් මාගේ බුදුසස්න හොබවති. මා එතනට යෑම යහපතැ'යි තමන් වහන්සේ ම පා සිවුරු හැර ගෙන යට ත් පිරිසෙයින් අග්‍රොපසථායක තෙරුන් වහන්සේ ත් නොකැඳවා එකවර සිංහ රාජයක්හු මෙන් සරද තවුසන් ගේ අතවැස්සන් මග වල් එලාවල සොයා ගිය කල්හි බුදුන් උපදනා වක මහ බමුණන් දෙ තිස් මහා පුරුෂ ලක්ෂණ වෙද මන්ත්‍රයෙහි බහා ලන හෙයින් වෙද මන්ත්‍ර බලා වුව ත් මා බුදු නියා ව දනිත්ව' යි සිතා වදරා සරද තවුසන් බල බලා සිටිය දී ම අහසින් බිමට බැස මේ ලෙව් හි සියලු ශොභාවෙක් ඇත් නම් එක් කොට හඹා පූවාක් මෙන් ශොභාමත් ව වැඩ සිටී සේක.

තවුසාණෝ බුද්ධානුභාව ය ද නැවත ප්‍රණිධි නමැති විසිතුරු කර්මාන්ත දන්නා සිත්තරාණන් විසින් තුන් සුසිරි නමැති වයිති හැර ගෙන සිත් නමැති තෙල්ලෙන් දෙ තිස් මහා පුරුෂ ලක්ෂණ හා අශීත්‍යානුව්‍යඤ්ජන හා බ්‍යාම ප්‍රභා කෙතුමාලා ඇති කොට සාරා සැකි කප් සුවහස් මුළුල්ලෙහි අනිකක් නැතිව මෙ ම කළාක් වැනි වූ මාහැඟි වූ බුදුරුව ද දැක තමන් ගේ ලක්ෂණ මන්ත්‍ර ද සලකා එයි ත් මෙයිත් දර්පණ තලයෙක පෙණෙ මුඛ බිම්බයක් සේ සම නියාව දැන මෙ බඳු ලකුණෙන් යුත් කෙණෙක් ඉදින් ගිහි ගෙයි

1 හිමාල වනයෙහි

Non-Commercial Distribution

වූ නම් තරමින් සරි නොවත ත් ගණනින් ආයු ධන හා සරි ගණන් වූ රුවන් ඇති ව මුළු සක් වළ ඉසුරු ඇති සක් විති රජ වෙති. මහණ වූ නම් එ වක අනික් බුදු කෙණෙක් නැත් නම් සියල්ල දන්නා බුදු වෙති. මේ මහා පුරුෂ තෙම සැකයක් නැතිව බුදු වී ය යි දන දැක සිට පී ම ආදර නොවන්නේ වේ දැ යි පෙර ගමන් කොට ගොසින් පන් සිල් පිහිටි පමණින් අභිඥ දී ගුණ විශෙෂ ය ලද්ද සේ ම උතුම් තනතුරු ලබනු නිසා පසහ පිහිටුවා වැඳ වැඩ හිඳිනා පරිද්දෙන් හස්නක් පනවා දුන්හ. බුදුහු ත් යුගඳුරු මුඳුනට පැමිණි දහසක් රසින් බබළන ළ හිරු මඬලක් මෙන් සවණක් රසින් බබළ බබළා වැඩ හුන් සේක.

සරද තවුසෝ ද තමන් බුදුන් ළඟ හිඳිනට නිසි හස්නක් පනවා ගෙන හුන්හ. ඒ වේලාවට සූ සැත්තෑ දහසක් පමණ දුළුල්ලෝ ද අති මධුර වූ පලා එල හැර ගෙන ඇදුරු තවුසන් කරා අවුත් බුදුන් වැඩ හුන් හස්න ත් තමන් ගේ ආචාරීන් හුන් හස්න ත් බලා ආචාරීන්ට 'අපි මුඹ වහන්සේට වැඩි තරම් කෙණකුන් තබා සරි කෙණකුනු ත් මේ ලෞවිහි නැතැ'යි සිතා හුණුම්හ. හුන් හසුන්වල සැටියෙන් සැක වී ය. මුඹ වහන්සේට වැඩියුරු ව සිටි තවුසනු ත් ඇති නියාදැ'යි කිවු ය. ඒ අසා සරද තවුසෝ 'දරු වෙනි, කුමක් කියවු ද? හබ ඇටක් පාලා මහ මෙරක් එයින් සරි කරන්නා සේ ගුණෙන් බලා ලූ කලට අනන්තාපරිමාණ සක්වළවල මෙරවල් ඊ ඊ පිට සිටුවා ලුව ත් උස් ව තිබෙන ගුණ ඇති බුදු ගුණෙන් හබයක් විතර ත් නැති ව අප බුදුන් හා සරි නො කරව'යි කිවු ය. තවුසෝ ඒ අසා 'ඉදින් මූ අඩු කෙණෙක් වූ නම් අපගේ ආචාරීහු මෙ තරම් උපමා නො කියති. හුන් හස්න උස සේ ම උසස් ගුණ ඇති නියා ය'යි හැම දෙන ම බුදුන් වැන්දහ. වැඳලා සිටි තාපස වරුන්ට සරද තවුසෝ, පෙර වරු වේලේ වැඩි බුදුන්ට බල පමණින් උපස්ථානයක් කරම්හ. ගෙනා දෙය නම් තකා පතකා ගෙනා දෙයක් නොවන බැවින් ඔබට පිළිගන්වන්ට තරම් නොව ත් ඔබගේ දහම් සේ ම මිහිරි වූ එලා එල ගෙනෙව'යි කියා ගෙන්වා ගෙන අදහස් පවිත්‍ර සේ ම අත ත් පවිත්‍ර කොට සෝද බුදුන්ගේ පාත්‍රයට එලා එල පිළිගැන් වූහ.

බුදුන් ඒ එලා එල පිළිගන්නා ම යොදු මිහිරි කරන්නා සේ දෙවියෝ දිව ඕජා බහා ඔබ ගේ අනුභවයට මුත් අනික් කෙණ කුන්ගේ අනුභවයට නො නිසි කළහ. සරද තවුසෝ තුමූ ම පැනුත් පරහා ගෙනවුත් දුන්හ. වළඳා නිමි පසු තමන්ගේ සියලු අත

Non-Commercial Distribution

වැස්සනු ත් හැර ගෙන බුදුන් ළඟ කථා කොට කොට හුන්හ: බුදුහු එ වෙලෙහි 'මාගේ දෙ අගසවුවෝ අපගේ නිත්‍ය පරිවාර ලක්‍ෂයක් පමණ සඟුන් පිරිවරා එත්ව'යි සිතා වදාළ සේක. බුදුන් ගෙන් කන්සන් නැති ව යන්නේ කෙසේ දැ'යි, පෙර මං බලා සිටි ලෙසින් බුදුන්ගේ අදහස් දැන ලා අහස ගමන් ගත් ධෘතරාෂ්ට්‍ර නම් හංස රජ්ජුරුවන්ගේ හංසයන්ට අපහාසය කරන්නාක් මෙන් අහසින් අවුත් බුදුන් වැඳ ලා එකත් පස් ව සිටි සේක.

ඉක් බිත්තෙන් සරද තවුසෝ අත වැස්සන් බණවා ලා 'දරුවෙනි, ගුණෙන් උසස් පමණක් මුත් බුදුන් වැඩවුන් හස්න ඉතා මිටි ය. ලක්‍ෂයක් දෙනා වහන්සේට ත් අසුන් නැත. මෙ තැනට පැමිණි බුදුන්ට ත් බුදු පිරිසට ත් තොප හැම දෙනා ත් සත්කාර යක් කළ මනා වේ ද? හිමාල වනයෙන් නො එක් පැහැ ඇති නො එක් සුවඳ ඇති මල් ගෙනෙව'යි විධාන කොළෝ ය. ඍද්ධි මතුන් ගේ ඍද්ධ්‍යානුභාව ය සිතිය නොහැකි හෙයින් බස කියන වෙලාව ට ත් මඳ වෙලාවකින් මල් ගෙන වුත් බුදුන් වැඩ හිඳිනට සතර ගවුවක් විතර උස ඇති මල් හස්නක් පනවා ලූ ය. අගසවු දෙනමට බුදු පැරුමට සවු පැරුම් කුඩා හෙයින් තුන් ගවු විතර හසුන් පැන වූ ය. සෙසු වහන්දෑට දෙ ගවු ගවු ඉසුබ් ආදී වූ පමණින් හසුන් පැනවූ ය. හැමට බාල නමට පැන වූ හස්න සම රියනින් එක් සිය සතළිස් රියනක් උස ය. ඊට මිටි හසුන් නැත. සූ සැත්තෑ දහසක් දෙනා වසන පමණ වූ පන්සල මෙ තෙක් ආසන පැන වූයේ කෙසේ ද? ආසන ත් කුඩා නො වන්නේ ය යි සිතතො ත් ඍද්ධි විෂයක් හෙයින් එ සේ නො සිති ය හැක්ක. මෙ සේ හසුන් පනවා නිමි කල්හි සරද තවුසෝ බුදුන් වැඳ ලා:-

'නානාපුප්ඵඤ්ච ගන්ධඤ්ච - සන්නිපාතෙත්වා එකතො,
පුප්ඵාසනං පඤ්ඤපෙත්වා - ඉදං වචනමබ්‍රැවි.

ඉදන්තෙ ආසනං වීර - පඤ්ඤත්තං තවනුච්ඡවිං,
මම චිත්තං පසාදෙන්තො - නිසීද පුප්ඵමාසනෙ.

සත්තරත්තිං දිවං බුද්ධො - නිසීදි පුප්ඵමාසනෙ,
මම චිත්තං පසාදෙත්වා - හාසයිත්වා සදෙවකෙ'.

යනු හෙයින් සසර බොහෝ දවසක් මට හිත සුව පිණිස මේ මල් හසුන් වල සහපිරිවරින් වැඩ හුන මැනව'යි කිවු ය. මෙ සේ කළ ආරාධනාවෙන් බුදුනු ත් අගසවු දෙනම ත් සෙසු වහන්දෑ ත් තමන් වහන්සේට පත් හසුන් වල වැඩ හුන් කල්හි සරද තවුසෝ

Non-Commercial Distribution

මහ මල් සතක්[1] බුදුන් හිසට කොට ගෙන සිටියහ. බුදුහු ත් තවුසුන්ගේ මෙම මල් පූජාවෙහි අනුසස් මහත් වුව මැනැවැ යි නිරොධ සමවතට සම වන් සේක. බුදුන් නිරොධයට සම වන් නියාව දැන දෙ අගසවුවන් වහන්සේ ද සෙසු වහන් දැ ද නිරොධ-යට සම වන් සේක. මෙ සේ නිරොධයට සම වැද සතියක් වැඩ හුන් කල්හි සරද තවුසාණන්ගේ අත වැස්සෝ සූ සැත්තෑ දහස එලාඑල අනුභව කළ මනා වේලෙහි ඒ අනුභව කොට ඉන් ම යපී ගත නොහී සෙසු වේලෙහි බුද්ධාලම්බන ප්‍රීති අනුභව කෙරෙති.

සරද තවුසෝ වැළි ත් ඒ සතියෙහි අනුභවයෙහි ආල ය හැර මල් සත බුදුන් හිසට කොට ගෙන සතිය මුළුල්ලෙහි ප්‍රීති නමැති මධුර එලාඑල අනුභව කළහ. සති ය ඉකුත් කල්හි බුදුහු නිරෝධයෙන් නැඟී අගසවු තනතුරට සරද තවුසන් ගේ රුචි උපදවන පිණිස දකුණත් පස වැඩ හුන් නුවණැති තෙනට අග තැන් පත් නිසභ මහ තෙරුන් වහන්සේ බණවා ලා 'මල් පුද කළ මේ තවුසන්ට මල් පිදීමෙහි අනුසස් කියව' යි වදාළ සේක. තෙරුන් වහන්සේ ද සක්විති රජක්හු ගෙන් ආවෙණික ව සංග්‍රහයක් ලත් මහා යොධයකු සෙස්සවුන් සිටිය දී තමාට ම තෝරා ලා කළ සංග්‍රහයට සතුටු වන්නාක් මෙන් සතුටු ව සවු-පැරුම් නුවණ පමණෙකින් මල් පූජාවෙහි අනුසස් ප්‍රකාශ කිරීම් වශයෙන් බණ වදාළ සේක. ඔබ බණ කියා නිම වූ කල්හි බුදුහු දෙවන අගසවු නම බණවා ලා 'තෙපි ත් බණ කියව'යි වදාළ සේක. දෙ වන අගසවු අනොම තෙරුන් වහන්සේ ද තෙවළා මහ මුහුද නුවණ මතින් අළලා සදහම් වෙඩරු කෙලෙස් කන් ලෙඩට දෙවූ සේක.

අගසවු දෙ නමගේ බණින් ම කන් ලෙඩ හැරී ත් කෙලෙස් ලෙඩ ගෙවන්නට නුවූ හෙයින් නිවන් ගොඩ නැඟීම නො වී ය. ඉක් බිත්තෙන් බුදුහු නො එක් දෙනාට බැරි බර තනි ව ඔසවන කලක් මෙන් බණ දෙසන්ට පටන් ගත් සේක. අදහස් පමණ දැන අදහස් ලෙසින් බණ වැදෑරීම බුදුන්ට මුත් ඔබට අවිෂ ය හෙයින් බුදුන්ගේ බණ අසා සරද තාපසයන් හැර ජටාධර වූ සූ සැත්තෑ දහස කෙලෙස් ජටා බිඳ දමා රහත් වොටුන්න ලදින් 'මහණෙනි, මෙ සේ එව'යි වදාළ බස් පමණෙකින් තුන් සිවුරු පාත්‍ර ලදින් නිකම් ජටා අවුල් හැර මහණ මාලු පැවිදි වූහ. සරද තාපසයන්ගේ උපදෙසින් අභිඥ සමාපත්ති උපදවා ගත් තාපස වරුන් රහත් වන්ට නුවණ ඇති කල සරද තාපසයන් රහත් නුවූයේ උන්ට ම නුවණ

---

1. සේසතක්

Non-Commercial Distribution

නැති නිසා ද යත්: නුවණ නැති හෙයින් නො වෙයි. සිත එකඟ නො වන හෙයින. සිත එකඟ නො වනුයේ සතියෙහි නිරාහාර හෙයින් ද? යත් ඉන් නො වෙයි. බුදුන්ට දෙවන අස්නෙහි හිඳ දකුණත්සවු මහ තෙරුන් වහන්සේ බණ වදරන්ට පටන් ගත් වේලෙහි පටන් 'මම ත් එන දවස් බුදු වන කෙණෙකුන් වහන්සේට දකුණත් සවු වීම් නම් යහපතැ'යි යන සිතිවිල්ලක් ඇති ව වදරන ධර්ම ය ඔස්සේ නුවණ මෙහෙයා ගත නොහී රහත් විය නුහුණ වූ ය.

රහත් ව ගත නුහුණ ත් උපෙක්ෂා නො ව බුදුන් වැඳල 'ස්වාමීනි, තුඹ වහන්සේට ඉක්බිති ව හිඳ බණ කියන්ට කියන්නා ම මඳ ද මැළි කමක් නැති ව බණ වදාළ තෙරුන් වහන්සේ මුඹ වහන්සේගේ ශාසනයෙහි කවර තනතුරකට පැමිණි නමෙක් දැ'යි විචාරා 'උෟ තුමූ ලසු කෙණෙක් නො වෙති. මා පැවැත් වූ දහම් සක තුමූ ත් පවත්වා අගසවු පැරුම් කුළු ගෙන සිටි දකුණත් සවු තෙනැත්තෝ ය'යි වදාළ කල්හි ඒ අසා සරද තවුසෝ 'එ සේ වී නම් ස්වාමීනි, සෙසු බලවත් පින් කමක් නැත ත් ස්වාමීන් හිසට මල් කුඩයක් ධරා සතියක් මුළුල්ලෙහි එලාඑල සොයා ත් නො ගොසින් ආයාස ගෙන කළ සත්කාර යෙහි මහිමයෙන් ශක්‍ර සම්පත් බ්‍රහ්ම සම්පත් ආදි වූ සම්පත් නො පතමි. එලාඑල සොයා ගමන නුවූවා සේ ම ඒකාසඞ්ඛ්‍ය කප් ලක්‍ෂයෙන් මුබ්බෙහි ත් ඔබ්බෙහි සසර ගමන් නැති ව මුඹ වහන්සේට මේ තිසහ මහ තෙරුන් වහන්සේ දකුණත් සවු වූවා මෙන් මම ත් එක් තරා බුදු කෙණකුන් වහන්සේට දකුණත් සවු වෙම්ව'යි පැතූහ.

බුදුහු ද 'මූ ගේ ප්‍රාර්ථනාව මහත. සමෘඬ වේ දෝ නො වේ දෝ හෝ යි දිව නුවණින් ම එක් භාගයක් අනාගත ය විෂය කරණ හෙයින් ඒ අනාගතාංශ ඥානයෙන් එන දවස බලා වදරා එකාසංඛ්‍ය කප් ලක්‍ෂයක් ගිය කල සමෘද්ධ වන නියාව දැන සරද තවුසන්ට 'තවුසාණෙනි, තොප පතා ලූ පැතීම අහසට දමා ලූ කැට බිම හෙන්නා සේ නියමයෙන් ම වෙයි. මතු එන දවස එකා සැකි කප් සුවහසක් ගිය කල ලෙව්හි ගිහි අවස්ථාවෙහි සිදුහත් නම්, බුදු වූ කල ගොත්‍ර ගත නාම වශයෙන් ගොතම නම් බුදු කෙණෙක් ලොව පහළ වෙති. මහාමායා නම් බිසෝ කෙණෙක් මවු වෙති. පිය රජ්ජුරුවෝ සුදෙවුන් නම්හ. රාහුල නම් පුතණු කෙණෙක් වෙති. උවටා තෙරහු අනඳ නම්හ. දෙවන අගසවුවාණෝ මුගලන් නම්හ. තෙපි ඒ බුදුන්ට

Non-Commercial Distribution

දකුණත් සවු වූ ධර්ම සෙනෙවි සැරියුත් නමුව'යි වදරා ලා මහණ ගණ පිරිවරා රන්වන් බුදුහු නිල් බිමෙක රන් වන් හිරි අඳින්නා සේ අහසට නැඟි සේක.

සරද තවුසෝ ද අත වැසි තෙරුන් වහන්සේ ළඟට ගොසින් 'ස්වාමීනි ඔබ වැඩි කල අපගේ යාළු වූ සිරිවඩු කෙළෙඹියාණන්ට මේ බුදුන් ළඟ දී මා මතු බුදු වන තෙනකට දකුණත් සවුවන්ට පැතූ නියාව ත් උඹ ත් තමන් වමත් සවුවන්ට පතන නියායෙන් ම වදළ යහපතැ'යි කියා ලා තමනු ත් ආනුභාව සම්පන්න හෙයින් තෙරුන් වහන්සේට පෙරාතු ව සිරිවඩු කෙළෙඹියන්ගේ මාළි-ගාවට ගියහ. ඔහු ද නැතක් දවසකින් වැඩි ගමණෙකැ'යි සතුටු ව හසුන් පනවා ලා හිඳුවා ලා තුමූ මිටි තෙනක හිඳ 'ස්වාමීනි, අත වැසි තවුසන් වහන්සේ කොයිද්ද'යි විචාරා 'සබඳ අප වසන තැනට අනොමදස්සී බුදුහු වැඩි සේක. අපි අපට පිළිවන් සත්කාරයක් කළම්හ. බුදුහු එලාඑල දුන්නවුන්ට බණ වදරා සූ සැත්තෑ දහසට ම රහත් එල දෙවූ සේක.

මම ඔබ ගේ දකුණ'ත් සවු නිසඟ මහ තෙරුන් වහන්සේගේ ආනුභාව දැක ඒ තනතුරු පැතිමි. තෙපි ද දෙ වන අගසවු තනතුර පතව'යි කීහ. ඒ අසා සිරිවඩු කෙළෙඹියෝ 'බුදුන් මා හා පුරුදු කමෙක් නැත. කෙ සේ ද'යි විචාළෝ ය. 'බුදුන් හා පුරුදු කම් එවා ලන්ට අප ආදි ම පුරුදු ව සිටි හෙයින් අපට පිළිවන. තෙපි දන් සරහව'යි කිවූ ය. කෙළෙඹි පුත්‍රයාණෝ ද උන්ගේ බසින් තමන්ගේ මාළිගාව ළඟ එක් යාළ දෙළ සා මුණක් වප්සන බිම සම තල කරවා සුදු වැලි ලවා ලද පස් මල් විසුරුවා සුධම් දෙව් සබය සේ මණ්ඩපයක් කරවා කෙළවර ජාතියෙහි රුව නිල් වන හෙයින් නිල් මහනෙල් පෙත්තෙන් ම සොයවා බුද්ධාසනය ත් පනවා සෙසු වහන්දෑට ත් හසුන් පනවා සෙසු ත් කළ මනා සත්කාර කරවා බුදුන්ට ආරාධනා කරන්ට සරද තවුසන්ට කිවූ ය.

තවුසාණෝ ද බුදු පාමොක් සඟ රැස් හැර ගෙන උන් ගේ මාළිගාවට ගියහ. කෙළෙඹියාණෝ ද පෙර ගමන් කොට ගොසින් ආරාධනා කොට බුදුන්ගේ පාත්‍ර ධාතූන් වහන්සේ හැර ගෙන මණ්ඩපයට වඩාගෙන ගොසින් බුදු පාමොක් සඞ්ඝයා වඩා හිඳුවා සිය අතින් සකස් කොට වළඳවා, වළඳා අන්තයෙහි සිවුරු පිළි ත් පිළිගන්වා 'මා මේ ලසුවක් පතා කරණ දෙයක් නොවන බැවින්

Non-Commercial Distribution

අනුග්‍රහ කොට සතියක් ම ඉවසා වදාළ මැනැවැ'යි ආරාධනා කොට එ ම ලෙසින් බුදු පාමොක් මහ සඟ නමැති කෙත කුසල් නමැති බිජුවට සතියක් විතරින් වපුට නිමවා එකාසැකි කප් සුවහසකින් ඊ ශස්‍ය ඵල ය ලබනුව බුදුන් වැඳ ලා 'ස්වාමීනි, මා ගේ යාළු වූ සරද තවුසන් වහන්සේ යම් බුදු කෙණෙකුන් වහන්සේට දකුණත් සවු වන්ට පැතූ සේක් නම් මම ද ඒ බුදුන්ට වම'ත් සවු වෙම්ව'යි පැතූහ. බුදුහු ද බලා වදරා ප්‍රාර්ථනාව සමෘද්ධ වන නියාව දැන 'තෙපි මෙ තනට එකාසැකි කප් සුවහසක් ගිය කලට ගොයුම් බුදුන්ට දෙ වන අගසවු වෙව'යි වදරා අගසවු කමට තකා ලී මෙන් සතුටු කරවා වදරා සහපිරිවරින් බුදුහු වෙහෙරට වැඩි සේක.

අප බුදුහු මෙ හැම වදරා ලා 'හෙම්බා මහණෙනි. මෙ මුන් දෙන්නා එ කල පැතූ ලෙස ම ය. උන් දෙන්නා මුහුණ බලා දුන් තනතුරෙක් නොවෙ'යි වදාළ සේක. එ විට අහසවු දෙනම බුදුන් වැඳලා 'අපි ස්වාමීනි, ගිහි කල ත් එක් දවසක් කෙළි නළු බලන්ට ගියම්හ' යනාදීන් අස්සජි මහ තෙරුන් වහන්සේගෙන් බණ අසා සෝවාන් වූ තැන් දක්වා වදරා, 'ස්වාමීනි, අපි සඤ්ජය පරිබ්‍රාජකයන් ළඟට ගොසින් මුඹ වහන්සේ ළඟට ගෙනෙනු කැමැති ව උන්ගේ ලබ්ධි නිස්සාර නිසා කියා පියා මීට ඊමෙ බොහෝ අනුසස් කීම්හ. එ තකුදු වුව ත් සඤ්ජය පරිබ්‍රාජකයෝ මෙම ලෙස කිවු ය'යි පරිබ්‍රාජකයන් කී කථාව කී සේක.

බුදුහු ඒ අසා 'හෙම්බා, එ සේ වී නම් සුනක්ඛත්තයන් මා හා කැටි ව යෙමින් බලු තපස් කරණ කොරක්ඛත්තයන්ගේ බලු තපස දැක ඒ සාර කොට සිතා උන් කරා ගියාසේ යම් කෙණෙක් සිවුරු පිඩු පා ආදි වූ සිව් පස ය හා දෙ සැටක් පමණ මිසදිටු හා ලාභ සත්කාර නිතර ව කියන බණ සාර කෙරෙද් ද, එ ම සුනක්ඛත්තයන් බුදුන්ගේ ශීල සමාද්ධ්‍යාදී ගුණසාර ය අසාර කළා සේ සම්‍යක් දෘෂ්ටි ය හා තදුපනිශ්‍රය වූ ධර්ම දෙශනාව අසාර කෙරෙද් ද ලඝු කොට සිතද් ද, ඔහු දන් පින් නො කිරී-මෙන් සම්පත් සාරය ද, තුනුරුවන් වැඳීම හා සිල් රක්‍ෂා කිරීම් නැති හෙයින් ආත්ම සාරය ද නො ලැබෙති. යම් කෙණෙක් උමංදයෙහි එක් වියත් සතරඟුලක් විතර ලියා සම කළ කිහිරි දඬු කඩ උපදෙසින් අගමුල දත්තාසේ ම මේ ලෙව්හි කෙලෙස් බොල් හර නැති වීමෙන් සාර ද, එ සේ වූ ශීල සමාද්ධ්‍යාදී ගුණ සාර ය සාර හෙයින් දැන මිථ්‍යාදෘෂ්ටි ආදි වූ නිස්සාර ය එ ම උමංදයෙහි රත්රන් සතර වියටක් පමණින් කෙළ ගණන් සැපත්

Non-Commercial Distribution

ඇති වෛදෙහ රජ්ජුරුවන් තමා හා සරි කළ කවුස්සාගේ නිස්සාර අදහස මහෞෂධ පණ්ඩිතයන් දත්තා සේ ම නිස්සාර නියාව දනිද්ද, ඌ තුමූ දනාදියෙහි හැසිරෙන හෙයින් ධන ධාන්‍ය සාරා දීයට ද කෙළවර නිවන් හරට ද පැමිණෙති' යි වදාළ සේක.

මේ දෙශනාවෙන් ද බොහෝ දෙන නිවන් අත් පත් කළහ. සත් පුරුෂයන් විසින් බොරු හර සේ වූ නිෂ්ප්‍රයෝජන වූ අකුසල් හැර ප්‍රයෝජනවත් වී මෙන් හර වැනි වූ කුසල්හි පිහිටා සිත් සතන් පිරිසුදු කොට ලොවී ලොවුතුරා සැපත් සෑදිය යුතු.

---

## 13. නන්ද මහතෙරුන් වහන්සේගේ වස්තුව

තව ද අනුශාසනා නැති වීමෙන් ශාසනාභි රති නැති ව පිළිවෙත පමා වීමෙන් නිවන් සාධා ගත නො හෙන්නවුන්ට ශාසනාභිරතියට උපදෙස් නිසා නන්ද මහ තෙරුන් වහන්සේගේ වස්තුව කියමු.

හේ කෙ සේ ද? යත්:-

බුදුහු බුදු ව ලා බිම්සර මහ රජුගේ අයදමෙන් රජගහා නුවර වැඩ වෙළුවන වෙහෙර වසන සේක් පිය රජ්ජුරුවන්ගේ ආරධනාවෙන් කිඹුල්වත් නුවරට වැඩ නිග්‍රොධනම් අරම සැතපී ලා දෙ වන දවස් සිඟා ඇතුළු කිඹුල්වත් නුවරට වැඩී සේක් නැතක් දවසින් දුටු පිය රජ්ජුරුවන්ට උපන්නක් දෙන්නාක් මෙන් ගාථා පමණෙකින් සෝවන් කරවා මිනිස් ලොව උපදිතො ත් සත් වරෙකින් වඩා ත් නො හොත් දෙ තුන් වරෙකින් වඩා ත් නැත. එක වරෙකින් වඩා ත් නූපදනා ලෙස කොට ලා අනිත් ගාථාවෙකින් මහා ප්‍රජාපතී ගොතමී නම් කුඩා මෑණියන්දෑගෙන් පූතන කිරෙහි කිරි මිල ගෙවා ලන්නාක් මෙන් උන්දෑ සෝවාන් කරවා, පිය රජ්ජුරුවන් තනතුරෙන් වඩා ලන්නා සේ සෙදගැමි කරවා, එ ම දවස් වළඳා අන්තයෙහි බිම්බා බිසොවුන්ගේ ගුණයෙහි තරම මහෞෂධ පණ්ඩිත අවස්ථාවෙහි ත් විම්සා තුබූ හෙයින් වදරන නිසා චන්දකින්නර ජාතකය වදරා, ඊට දෙ වන දවස් නන්ද කුමරුන්ට වොටුනු මඟුල ත් ගෙවදනා මඟුල ත් විවාහ මඟුල ත් තුන ම එක අවධියට පැමිණි කල්හි, මේ මඟුල් තුනට වඩා නිවන් මඟුල උතුම් බැවින් ඒ උන්ට පමුණුවා ල මී නුවරට සිඟා වැඩ සිඟා අන්තයෙහි නිවන් අත් පත් වන ලෙසින් පාත්‍ර ධාතුන් වහන්සේ අතට දී ලා ආදියෙන් යන ගමනට ඉෂ්ට සූචක කොට දුන් පාත්‍ර ය හෙයින් පාත්‍ර ය අතට හැර නො ගත් සේක

Non-Commercial Distribution

නන්‍ද කුමරු ද බුදුන් වහන්සේ කෙරෙහි ගෞරවයෙන් 'පාත්‍ර ය හැර ගත මැනැව'යි නො කියා රජ ගෙන් වඩනා ගමන හෙයින් හිණි හිස කෙරෙහි දී හැරගන්නා සේකැ යි සිතූහ. 'බුදුහු එ තන දී ත් පාත්‍ර ය හැර නො ගත් සේක. 'හිණි පා මුල දී හැර ගන්නා සේක් වනැ'යි සිතා යන කලට එ තන දී ත් හැර නො ගන්නා රදනු කැමැති වත් අභිප්‍රායෙන් ම නො ව බුදුන් කෙරෙහි ගෞරවයෙන් 'පාත්‍ර ය හැර ගත මැනව'යි කියා ගත නොහී මෙ තන දී හැර ගන්නා සේක. මෙ තන දී හැර ගන්නා සේක් වනැ'යි සිතා ම නො සිතින් ගිය ත් සිතින් ම සසර ගමනින් නවත්නා හෙයින් යෙත් ම ය.

ඒ වේලෙහි නන්‍ද කුමරුන්ගේ දනවු කලණ නම් වූ කුමාර යන්ට සරණ නිල වූ මුල් නෑ කම කවරේ වූව ත් රජ කම් හෙයින් බැදෑණියන් ළඟට මිනිස්සු ගොසින් 'බුදුහු පිය රජ්ජුරුවන්ගේ මාළිගාවට වැඩි ගමනෝ මුඹදෑගෙන් වෙන් කොට නන්‍දකුමරුන් වහන්සේ කැඳවා ගෙන වඩනා සේකැ'යි කිවු ය. එ බස් අසමින් ඕ ද හිස සෝධමින් සිටි තැනැත්තියෝ සෝධා නිමි හිස කේ නො බැඳ, වහා අවුත් 'ගිය ත් සුළු ගෙයි, වහා එව' යි කිවු ය. උන් කියා ලූ බස නන්‍ද කුමරුන් සිත දිවූල් ලාවු මුසු වයිති තර ව වැද ගන්නා සේ තරයේ ම වැද ගත. බුදුනු ත් පාත්‍ර ය අතින් නො ගෙන වෙහෙරට ගෙන ගොසින් 'නන්‍ද කුමරුනි, මහණ වවු දැ'යි වදළ සේක.

බුදුන් වදළ බස මහුලෙන් හෙළා ලූ කප උගුලවන්ට බැරියා සේ උගුළුවා ලන්ට බැරි හෙයින් 'මහණ නො වෙමි' නො කියා 'යහපත, මහණ වෙමි' කියා ගිවිස්සාහ. එබැවින් තුලුන් මහණ කරව'යි වහන්දෑට භාර කොට කිඹුල් වත් නුවරට වැඩි තුන් වැනි දවස් නන්‍ද කුමරුන් මහණ කොට සත් වන දවස් බිම්බා බිසොවුන් විසි දහසක් රහතුන් පිරිවරා නුවරට සිඟා වැඩි තමන් වහන්සේ පෑ ලා 'මෙම්බා පුත, තුලුන් දුටු ද? තුලුන් සිඟා ඇවිදිනා පමණක් මුත් ගවු දෙ ගවු තුන් ගවු සතර ගවු පමණ මුව විට පුළුල ඇති පොළොව බොළ විතර උස ඇති නිධාන සැළ සතරෙක් ඇත. මූන් මහණ වන්ට ගිය තැන් පටන් නො දකුම්හ. තොප සක්විති වන නියාව දෙ තිස් මහ පිරිමිනි ලකුණු නැමැති නිමිත්ත දන්නා දෙ තිස් දෙනකු කියා සිටු ත් වස්තුව ත් වූවමනා වේ ද? තෙපි තුලුන් කරා ගොසින් නිධාන පාවා ගනුව'යි රහල් කුමරුන් සරහා යවූ කල්හි කුමාරයෝ ත් දයාද ඉල්වමින් පසු පස්සෙහි ගමන් ගත්හ. බුදුහු ත් නො නැවතූ සේක. කැටි ව යන්නෝ ත් බුදුන්

Non-Commercial Distribution

හා කැටි ව යන ගමන හෙයින් නවතන්ට යුක්ති නැති වන්නා නො නැවතූහ. රහල් කුමරුහු ද් සඳ හා කැටි ව නික්මුණු තකත් තරුවක් මෙන් නික්ම වෙහෙරට ගියහ.

බුදුහු 'මේ තෙමේ මා සන්තක වස්තුවට තමා ආවෙණික ව හිමි හෙයින් ඉල්වයි. ඒ සම්පත් තරමට ත් ඒ මුල් වන ආදීනව මහත. මා සර්වඥතා ඥන නමැති එක ධනය දී ලා ලත් ධන සතෙක් ඇත. මූට ත් ඒ ධන සත ම දෙමි' යි සිතා වදරා සැරියුත් මහ තෙරුන් වහන්සේ කැඳවා ලා 'හෙම්බා ශාරිපුත්‍රයෙනි, තෙල රහල් කුමරු අප අතින් වස්තු ඉල්වති. මහණ වන්ට එන ගමනේ අප ලා ලා ආ රකවල් නැති හෙයින් මුන් ඉල්වන සම්පත් තුබූවා නැත. හැම ත් ධනයෙක් ම වේ ද? අපට ඒ ඇති ව තුබූ ධන සත ම දෙන නියායෙන් තුලුන් මහණ කරව'යි විධාන කොට මහණ කැරවූ සේක. මහණ වීමෙන් සිවුරෙනු ත් එක් වැනි වූ සේක.

රහල් කුමරුන් මහණ වන්නා ම සුදෙවුන් මහ රජ්ජුරුවන්ට ශොක බලවත් විය. රජ්ජුරුවෝ ශොක ඉවසා ගත නො හී බුදුන්ට දන්වන්නෝ 'මුඹ වහන්සේ මහණ වන්ට නික්මුණු දවස් ඇති ශොක ය නන්ද කුමර–රහල් කුමර දෙන්නා ගේ මුහුණ දක්නා හෙයින් නිවිණ. නන්ද කුමරුන් මහණ වූ ශොක ය තනි රහල් කුමරුන් මුහුණ දක්නා හෙයින් සන්හුණ. උන් මහණ වූ ශොකය අනික් සන්හිඳුවන්නෝ කවුරුද? දරු පෙම් මුණුබුරු පෙම් ඇත්තේ මට මතු නො වන්නේ වේ ද? කාටත් සරි ය. මේ කට යුත්ත මා පිළිබඳ හෙයින් කෙළේ ම ය. ඊට කිම් ද? මෙ වක් පටන් මහණ වන්ට දෙ මවු පියන් අනු නොදත් දරුවන් මහණ නො කරන්ට විධානයක් ඇත මැනැවැ'යි දන්වූ ය. බුදුහු ත් යහපතැ යි ගිවිසි සේක.

එක් දවසක් ති ලෝ ගුරු බුදුන් සුදෙවුන් රජ්ජුරුවන්ගේ රජ ගෙට වැඩ වළඳන්ට වැඩ හුන් වේලාවට සුදෙවුන් රජ්ජුරුවෝ ''ස්වාමීනි, මුඹ වහන්සේ බුදු බව සාධා ගන්ට දුක් ගන්නා සමයේ ගන්නා දුක් බලවත් හෙයින් එක් දෙවතාවෙක් මා ළඟට අවුත් මුඹ වහන්සේ මළැ යි යන්නක් කී ය. මම් ඒ අසා 'ම පුතණුවෝ කලට පිපෙන මල් පිපී මුත් නොනවත්නා සේ බුදු වුවො ත් මුත් නො මියෙති'යි කියා දෙවතාවාගේ බස් මා හදහා ගත්තේ නැතැ''යි කිවු ය.

මහ රජ දුන් තෙපි බුදු වන කෙණෙකුන්ට මුත් පහළ නොවන දෙ තිස් මහ පිරිමිනි ලකුණු දූක සිටි තැනැත්තෝ, නැවත උපන්



Non-Commercial Distribution

දවස් පහළ වූ දෙ තිසක් විතර පෙළහර ත් දක කෙ සේ හද හවු ද? යට ගිය දවස මහ දම්පල් කුමරු ව උපන් කල්හි මළ නියාව සාධන ට එවුවන්ගේ ඇට ගෙනවුත් පෑ ලා කීව ත් ‘අපගේ කුලයෙහි උපන්නවුන් ගෙන් පරමායු ගෙවා මියන්නවුන් මුත් අතුරෙක මියන කෙණෙක් නැතැ’යි නොගිවිස්සා ම ය’යි එතැන්හි මහ දම්පල් ද වදරා රජ්ජුරුවන් අනැගැම් කරවා, රහත් වීම අතුරෙක නො ව මියන දවස් ශ්‍රී යහනෙහි සැතපී හෙව රහත් වන ලෙස වූ කල්හි බුදුහු මහණ ගණා පිරිවරා නැවත කළ මනා බුද්ධ කෘත්‍ය ය නොතිමි හෙයින් අඩුව සපයනු නිසා, රජගහ නුවර වැඩ අනේපිඩු මහ සිටුහු විසින් දෙව්රම වෙහෙර කරවා නිමවා වඩනට ආරාධනා කොට යැවූ කල්හි සහපිරිවරින් සැවැත් නුවරට වැඩ දෙව්රම වසන සේක.

මෙ සේ බුදුන් දෙව්රම්හි වසන කලට ආයුස්මත් වූ නන්ද තෙරුන් වහන්සේ බැදැවත් බිසොවුන් කියා ලූ බස් නැමති වයිති පෙම් නමැති දිවුළු ලාවු මුසු කොට, සිත් නමැති බිතත ඇඳ ලූ හෙයින්, ඒ බලා ශාසනයෙහි උකටලී ව, ‘‘මා ශාසනයෙහි ඇලුම් නැත. සිවුරු හරිමි’යි හිත මිත්‍ර වහන්දැට කී සේක. බුදුහු එ පවත් අසා නන්ද මහ තෙරුන් වහන්සේ කැඳවං ලා ‘සැබෑ ද නන්දයෙනි, භික්ෂූන්ටමෙ බන්දක් කිවුදැ’යි විචාරා වදරා ‘සැබ ව ස්වාමීනි’යිඋන් වහන්සේ කී කල්හි ‘නන්දයෙනි, සිවුරු හරණේ කුමක් නිසා දැ’යි විචාරා වදළ සේක. එ සේ විචාරා වදළ බුදුන්ට ‘ස්වාමීනි, මා මහණ වන්ට සිතින් නො සිතින් එන ගමනේ දනවු කලණ බිසවු සෝධාපූ හිසකේ හිණි නො ගන්නා තෙක් අවුත් ‘වහා අව මැනැවැ’යි යන බසක් කිවු ය. මම එ බස එක් වන සඳහන් කරන්නෙමි මෙ බන්දක් සිතමි’යි කී සේක.

එ කල බුදුහු තිබී බලවත් වන ලෙඩක් බෙහෙදක් දී සන් හිඳුවන කලක් මෙන් ඔබගේ එ බඳු අනුභාවයක් නැත ත් තමන් වහන්සේගේ අනුභාවයෙන් අත අල්වා ගෙන තව්තිසා දෙව් ලොවට වඩනා සේක් අතුරු මහ නවදළි සේනක් මවා ලා ඒ සේනේ ද ගිය කණුවෙක ද වක ගැසී ගිය වැදිරි මැල්ලක මවාලා තවුතිසා දෙව් ලොවට වැඩ සක් දෙවිඳුහුගේ පන් සියයක් පමණ දෙවඟනන් පෑ ලා ‘‘කුමක් ද නන්දයෙනි, රුවින් වූ කලී මේ දෙවඟනෝ යහපත්තු ද නොහොත් දනවු කලණ බිසවු යහපත්තු දැ ’යි විචාළ සේක.

‘ස්වාමීනි, කුමක් වදරන සේක් ද? මෙ දෙවඟනන් දුටු කලට ඒ දනවු කලණ බිසවු නම් අතුරු මහ නවදළි සේනේ අප දුටු ද වක ගැසී ගිය වැදිරි මැල්ල ත් වටිත් දැ’යි කී සේක. ඒ අසා

බුදුහු 'එ සේ වී නම් නන්දයෙනි, ශාසනාභිරති ය ඇති ව සිල් රක්‍ෂා කෙළේ නම් කෙළෙසුන් ගෙවා ගන්ට නුවුවොත් දෙව් ලොව ඉපද දෙවඟනන් ලබන නියාවට මම ඇපයෙමී'යි වදාළ සේක. ඒ අසා නන්ද තෙරුන් වහන්සේ 'එ සේ වී නම් දෙවඟනන් ලබන නියාවට මෙ තරම් ඇපත් ඇති බැවින් බඹසර හැසිරෙමි'යි කී සේක. මෙ ලෙසින් සස්නෙහි ඇලුම් ඇති කරවා හැදහිලි නැති කෙණෙකුන් ප්‍රසිද්ධ ස්ථානයට ගෙන ගොස් තර ය කරවා රුවී දෙය කරවා ගන්නාසේ සිල් රක්ෂා කිරීමට දෙව් ලොවට ගෙන ගොසින් තරය කරවා ගෙන නන්ද තෙරුන් වහන්සේ හැර ගෙන දෙව් ලොව වැඩ උන් වහන්සේට ඇප වූ නියාව නොහහවන්ට කරන්නාක් මෙන් දෙව් ලොව දී අනුරුධන් ව–

"බොධනෙය්‍යං ජනං දිස්වා – සතසහස්සෙපි යොජනෙ,
ඛණෙන උපගන්ත්වාන – බොධෙති තං මහාමුනි."

යනු හෙයින් ඇසිල්ලකින් දෙව්රම පහළවූ සේක. වහන්දෑ මෙ පවත් අසා 'නන්ද තෙරුන් වහන්සේ නම් බුදුන්ගේ කුඩා මැණියන්දෑ ගේ පුත් සේක. මහණ ව කරණ සං කමුත් ගෙය කඹුරන්නා සේ දෙවඟනන් නිසා ල. එයිත් ඇපයකට නොනිසි බුදුන් ගෙන් ඇප ඇතිව ලැ'යි නන්ද තෙරුන් වහන්සේ ළඟට ගොසින් මෙ හැම කියා වෙහෙසන සේක.

නන්ද තෙරුන් වහන්සේ ද වහන්දෑගේ කථාවෙන් තරයේ ම ලජ්ජා ඇති ව දෙවඟනන් කෙරෙහි කළ ආල ය හැරී පෙරළි හේකට[1] තුබූ දෙයක් නො පෙනෙන ලෙස තනා තබා ගන්නා සේ පෙරළා මහණ ධමට ම සිත් සතන් යොමු කොට ලා රජ සිරි හැර අවුත් නිවන් සිරි නො හරණ නිසා නො පමා ව වසන සේක. යම් සේ ලේනෙක් තමා තරම් කෙණෙකුන් තමාට සතුරුව ආකල තමාගේ නඟුට කුප්පවා ලා එයින් ගසා ලා පහ කෙරේ ද, එ මෙන් ළං වූ කෙලෙස් සතුරු කෙණෙක් ඇත් නම් සතර සීවටන් නමැති මුගුරෙන් මරා පලවමින් යම් සේ දිවි දෙනෙක් කෙතෙක් වුව ත් එක වරෙක වදන පැටවුන් මුත් දෙවන මුරයේ නො වදු ද, එක මුරයෙන් ම වඳ වේ ද, එ පරිද්දෙන් උපන් ජාති විනා භවොත් පත්ති නැති වීමට අදහස් ඇති ව යම් සේ දිවියෙක් තණ කැළෑ ආදිය යට වැදලා හිඳ ගොදුරු අල්වා ගනී ද, එ සේ ම අර්හත් ඵල නමැති ගොදුරු නිසා ගම්භීරාරණ්‍ය රුක් මුල් ගල්පාවුළු[2] කඳුරැළි ගල්ගුහා සොභොන අබවස යනාදියට එළඹ, යම් සේ දිවියා ගොදුරු අල්වා ගත් කලට වමළැයෙන් හුණු ගොදුරු නො කා ද එ පරිද්දෙන්

---

1. හෙයකට, කරුවකට, හෙන්ට 2. ගල් පාමුලු

Non-Commercial Distribution

එක් විසි අන්වෙෂණ වශයෙන් වේව යි, වාග් විඥප්ති වශයෙන් වේව යි, උපන් දෙයක් ඇත් නම් විෂ මිශ්‍රයක් පරිද්දෙන් හැර විවසුන් වඩා රහත් ඵල නමැති වොටුනු පැළඳීමෙන් හැර ආ රාජාභිෂෙකයට රාජ්‍යාභිෂෙකයක් ලදින් හැර පියා ආ මඟුලට නිවන් ගෙ මඟුල් කොට හැර ආ විවා මඟුලට පල සමවත් විවා මඟුල් කොට බුදුන් සන්තක නිවන් රට තමන් වහන්සේට ත් හිමි කළ සේක.

එක් දෙවතාවෙක් රාත්‍රි වේලෙහි දෙව්රම වසන බුදුන් කරා ගොසින් වැඳ ලා 'ස්වාමීනි, මුඹ වහන්සේගේ මල් වූ නන්‍ද මහ තෙරුන් වහන්සේ රහත් වූ සේකැ'යි කිවු ය. ඔහු නො කියන තෙක් ම බුදුහු ත් දෙව් ලොව ගිය ගමනින් ම සසර ගමන් නිමවා රහත් වූ නියාව විමස විමසා හිඳිනා සේක් එසේ ම දත් සේක. නන්‍ද මහ තෙරුන් වහන්සේ ද රාත්‍රිය පාන්වූ කල්හි බුදුන් කරා ගොසින් වැඳලා 'ස්වාමීනි, මුඹ වහන්සේ දෙව් ලොව වැඩි ගමනේ දෙවඟනන් පන් සියයක් මා ලබන නියාවට වූ ඇපයෙක් ඇත්තේ වේ ද, මෙ වක් පටන් දෙවඟනන් තබා කිසිවක ත් මා ගේ ඇල්මක් නැති හෙයින් ඒ ඇප නැතැ'යි කී සේක. බුදුහු ඒ අසා වදරා 'නන්දයෙනි, තොප රහත් වූ නියාව අපි ත් දතුම්හ. දේවතාවකුත් අවුත් අපට කිව. එ සේ හෙයින් තොප කීව ත් නො කීව ත් අපි ඒ ඇපයෙන් මිදුණුම්හ' යි වදරා රහත් ව ශොභාවත් වූ මුහුණ ඊ ම තබා ශොභාමත් කරවූ සේක. වහන්දෑ ද ගොසින් රහත් නියාව නො දැන 'කුමක් ද? පෙර සිතන්නේ සිවුරු හරණට වේ ද? දැන් කුමක් දැ'යි විචාරා 'මා ගිහි වීමෙහි ආලයෙක් නැතැ'යි කී කල්හි මූ ගිහි වීමෙහි ආලයක් නැති නියාව කියති මුන් බොරු කියන නියා වේ දෑ යි බුදුන්ට එ පවත් දැන්වූ සේක.

බුදුහු ඒ අසා 'මහණෙනි, යම් සේ සෙවිලි නො දත්මෙන් නපුරු කොට සොයා ලූ ගෙය වැසි නැති විටෙක මුත් වැස්ස වට විට ම තෙමේ ද, එ පරිද්දෙන් ශමථ භාවනා-විදර්‍ශනා භාවනා නමැති සෙවිල්ල නො දන්නා හෙයින් තදඞ්ග විමුක්ති නමැති එක් තරම් සෙවිල්ලකින් සොයා ලූ සිත් නමැති ගෙයක් කෙලෙස් නමැති එක් තරම් වැස්සක් වට ත් තෙමී මුත් නො හරණේ ය. යම් සේ සෙවිල්ල දන්නවුන් යහපත් කොට සොයා ලූ ගෙය එක් තරා වැස්සකින් තබා මහත් වැස්සකිනු ත් නො තෙමේ ද එ පරිද්දෙන් ද්වි ප්‍රකාර භාවනා නමැති තර සෙවිල්ලෙන් සොයාලූ සිත් නමැති ගෙය සසර මහ මුහුදු පුරන තරම් වූ කෙලෙස් මග වැසි වට ත් නො තෙමෙ' යි වදළ සේක.

Non-Commercial Distribution

ඒ අසා නන්‍ද තෙරුන් වහන්සේගේ නුගුණ කියන්ට ගිය වහන්දෑ සෝවාන් එලාදියට පැමිණීමෙන් ලොවුතුරා ගුණය ලත් සේක. සත්‍ය අසත්‍ය නො දත් වහන්දෑ චතුස්සත්‍ය දත් සේක. ධර්‍ම සභායෙහි ද කථාවෙක් උපන. බුදු වරුන් වහන්සේ නම් ඉතා ආශ්චර්‍ය්‍ය සේක. ජනපද කල්‍යාණීන් නිසා නිවන් සම්පතින් පිරිහෙන්ට සිටි මලණුවන් වහන්සේට එක් තරම් දෙයක ඇවිටි ඇත්තවුන්ට වැඩි යුරු දෙයක් පෑ ලා ඇවිටි කළ එක් තරම් දෙයෙහි ඇවිටි හරවන්නා සේ දනවු කළණ බිසොවුන් කෙරෙහි කළ ඇවිටිය දෙව් ලොවට ගෙන ගොසින් දෙවඟනන් පෑ ලා අරවා ලූ සේක. මේ අනික් කාට පිළිවන් දෑ'යි යන කථාව ය.

බුදුහු ත් වහන්දෑ කරණ කරණ කථාව දිවූකනින් අසා වදරා, 'භික්ෂූහු නන්‍දයන් ශාසනයෙහි ඇලුම් කරවා ගත් නියාව අරභයා කථාව කෙරෙති. මම එ තෙනට ගියෙම් නම් 'හෙම්බා මහණෙනි, ඒ දූන් මතු නො වන්නේ වේ ද? යට ගිය දවසත් තෙල ලෙස ම උන්ට ඇති වූ ඇවිටියක් හැරවීමි' කියා ලා ඒ හභවන්ට ජාතක කථාවක් ගෙන හැර දක්වමි. මාගේ මේ ජාතක දෙශනාව පස්වා දහස මුළුල්ලෙහි බොහෝ දෙනාට බොහෝ ප්‍රයෝජන සාධා දෙන්නේ ය'යි සිතා වදරා ධර්‍මසභාවට වැඩ සුවිනීත ව සුශික්ෂිත ව වැඩ හුන් පර්‍ෂද බලාපියා 'රන් නැවක් මධ්‍ය කොට පිපී වැනී ගිය රත් නෙළුම් වනයක් සේ මේ භික්ෂු පර්‍ෂද ඉතා හොබිති. මම පළමු කොට කථාවට ආරම්භයක් කෙළෙම් නම් මින් පෙරාතු කොට බසක් බැණ නැගෙන යොණෙක් නැත. මම ම පළමු කොට කථාව උපදවමි'යි සිතා 'මහණෙනි, මා එන්නාට පෙරාතු කොට කෙ සේ වූ කථාවක් කොට කොට හුණු දෑ'යි විචාරා වදරා මේ කථාව නියාව දූන් වූ කල්හි 'මහණෙනි, ඒ දූන් මතු නො වෙ'යි වදරා භික්ෂූන් වහන්සේ විසින් ආරාධිත වූ තිලෝ ගුරු බුදු රජාණන් වහන්සේ භර්‍ම ප්‍රච්ඡන්න ජාත වේදයක් සේ භවයෙන් සැභවී තුබූ ඉකුත් වත් කථාව දක්වන සේක්:-

''මහණෙනි, යට ගිය දවස බරණැස් නුවර බඹදත් නම් රජකු රජ කරන කල්හි එම බරණැස් නුවර කප්පට නම් වෙළෙඳාණ කෙණෙක් වූහ. උන්ගේ එක් කොටළුවෙක් දසා'මුණක් විතර බර උසුල යි. දවසකට එ තෙක් බර උසුලා ගෙන අටවිසි ගවුවක් විතර යෙයි. එක් සමයෙක ඒ වෙළඳාණෝ කොටළුවන් උසු-ලන්නා වූ ගැල් වලින් බඩු ගෙන්වා ගෙන තක්සලා නුවර ගොසින් ගෙන ගිය බඩු විකපත් වන තෙක් කොටළුවාණන් තණ පත්

Non-Commercial Distribution

කන්ට හළවු ය. ඉක් බිත්තෙන් ඒ කොටළුවාණෝ ද අගල පිට කා ඇවිදිනා තෙනැත්තෝ එක් කොටළු දෙනක දැක ඈ ළඟට ගියහ. ඔයි ත් උන් හා සාද සාමීචි කථා කරන්නී 'කොයි සිට අවුදැ'යි විචාරා බරණැස් නුවර සිට ය යි කී කල්හි 'කුමක් නිසා මෙ තෙක් කතර අවුදැ'යි විචාළී ය.

'වෙළඳාම් පිට ආමි' කී කල්හි 'උසුලන්නේ කෙ තෙක් බර දැ'යි විචාළී ය. 'දස'මුණක් විතර බර උසුලමි' කී කල්හි 'මෙ තෙක් බර උසුලා ගෙන දවස කෙතෙක් තැන් යවු දැ'යි විචාළී ය. 'අට-විසි ගවුවක් විතර යෙමි' කී කල්හි 'ඒ වන්නා මෙ තෙක් තැන් නිකමු ත් නොව බර උසුලා ගෙන යව. ගිය තැන ගමන් ඇවිදින පය මිරිකන කෙණෙක් ඇද්ද, නැද්දැ'යි ඊට පිට ලා අනික් චිතාරන දෙයක් විචාළී ය. 'නැත'යි කී කල්හි තිරිසන් වුවත් ස්ත්‍රී කලට ස්ත්‍රී මායමෙහි අඩුවක් නැති හෙයින් තමා කෙරෙහි ඇලුම් කරවා ගන්නා පිණිස තිරිසනුන්ට පා මැඩීම නැතැ ත් 'එ විතර-කු ත් නැත් නම් දුක් නියා වේ දැ'යි තමා උන්ට සම්භ වුවො ත් ඉන් මුට්ටුවක් නැති ලෙසට උන්ට හඟවා කී ය. කොටළුවාණෝ සැබෑ බසකැ යි සිතා එ බසෙහි ම එළී ගත් හ.

වෙළඳාණෝ ද ගෙනා බඩු වීකපත් කොට ගෙන කොටළුවා ළඟට අවුත් 'ගෙනා බඩු විකපත් කොට ගතුම්හ'යි කිවු ය. 'මුඹ දැන් ගිය මැනව. මම රඳමි'යි කොටළුවාණෝ කිවු ය. නැවත නැවත පෙරැත්ත කීව ත් කොටළුවාණෝ යන්ට මැළි වූ ම ය. ඒ අනිකක් නිසා නො වෙයි, කොටළු දෙනගේ බස් නමැති මලෙහි බැඳී ය. වෙළඳාණෝ ද තොප මැළි ම බැවින්:-

'පතොදන්තෙ කරිස්සාමි – සොළසඞ්ගුලකණ්ටකං,
සඤ්ඡින්දිස්සාමි තෙ කායං – එවං ජානාහි ගද්‍රභ'

යනු හෙයින් 'කැවිටි හුල ම සොළසඟුලක් පමණ වූ කැවිටක් කර වා ලා කැවුටුවම් කොට ත් ගෙන යෙමී' කී කල්හි 'එ සේ කළො ත් පෙර පා දෙක තරයේ බිම ඔබා ගෙන, පස්සා පයින් ඇණ්ඩෙන් ගසා දත් වගුරුවා පියමී' කීහ. වෙළඳාණෝ ඒ අසා 'මුන් මෙ තෙක් කලෙක මෙ සේ වූ බසක් කී විරූ නැත. කාරණ කිම් දෝ හෝ' යි ඇත මැත බලා කොටළු දෙන දැක 'මැ නිසා ය මෙ ලෙසට කරවා ගත්තේ ය'යි සිතා අට තැනකින් චක් ව තුබූ මැණිකෙහි ලණුව අවුණා ලන්ට නිසි නුවණ ඇති වන මහා පුරුෂයාණ කෙණකුන් හෙයින් 'තෙපි රඳන්ට නො සිතව. ඔබ ගිය කල,

1. විරදම,

Non-Commercial Distribution

**'චතුප්පදිං සඞ්ඛමුඛිං – නාරිං සබ්බඞ්ගසොභිනිං,**
**හරියං තෙ ආනයිස්සාමි – එවං ජානාහි ගද්‍රභ.'**

යනු හෙයින් 'සකක් හා සමාන සොඳ මුහුණක් ඇති තමාගේ ජාතියට ඉතා රූපත් වූ කොටළු දෙනක ගෙනවුත් පාවා දෙමි'යි කීහ. එ බස් අසා බලවත් සේ සතුටු ව ගොසින් බල බලා සිටි කොටළු දෙන කෙරෙහි ආලය නැති ව, බසින් ඇසූ කොටළු දෙන කෙරෙහි ආල ය බලවත් ව 'එ සේ වී නම් පටවා ලූ බර ත් හැර ගෙන මෙ තෙක් කල් යන අට විසි ගවුවට අනෙක් අට විසි ගවුව කු ත් පිටලා ලා ස පණස් ගවුවක් යෙමී' කිවු ය.

වෙළඳාණෝ ද යහපතැ'යි ගිවිස කැඳවා ගෙන සිය තැනට ගොසින් කීප දවසකින් කොටළුවාණන් කොටළු දෙනාගේ ස්වරූප සඳහන් කරවූ කල්හි 'ආදි එ සේ කියා ලා නො ගෙනෙන්නේ නැත. ගෙනවුත් පාවා දෙමි. බල එකෙක් ඇත. උන් ඇත ත් වැටුප් වියදම් තොප පමණකට දෙමි. උන් මට කරණ මෙහෙයක් නැති හෙයින. එ සේ දුන් දෙය තොප දෙන්නාට ඇති වෙයි, මඳ වෙයි. මම ඒ නො දනිමි. ඌ පසු ව තොපට බොහෝ දරුවනු ත් වදති. දරුවන් වුව ත් අඹුවන් වුව ත් උන් බොහෝ වුව යි අප-ගෙන් රැකෙන්නන් බොහෝ හෙයින් වැටුප් බොහෝ නො කෙරෙමි. සෑහේ නමුත් මඳ වේ නමුත් සුප්පාරක ජාතකයෙහි කරනවැමියාට ද රජ්ජුරුවන් කවර තරම් දස් කමක් දැක ත් අටමස්සක ම දෙන්නා සේ තොප කෙ තෙක් දෙනා වුව ත් තොප පමණකට දෙමි'යි කිවු ය. ඒ අසා කොටළුවාණෝ කොටළු දෙනුන්ට කළ ආලය වැටුපට කොළෙෝ ය. බුදුහු මේ ජාතක දෙශනාව නිම වූ සේක.

එ හෙයින් නුවණැත්තවුන් විසින් කෙලෙස් විසින් පවත්නා අකුසලින් දුරු ව භාවනා කුසල් පිහිටා තදඞ්ගාදී වශයෙන් සිත් සතන් පිරිසිදු කට යුතු.

---

## 14. චුන්ද නම් හූරු වැද්දගේ වස්තුව

තව ද කුසලින් දුරුවන්න වුන්ට අකුසල්හි ආදීනව දක්වනු සඳහා චුන්‍ද නම් හූරු වැද්දගේ වස්තුව දක්වමු.

හේ කෙ සේ ද? යත්:–

වැදි තෙමේ පස් පණස් හවුරුද්දක් මුළුල්ලෙහි දළු පත් ආදිය ඇති කොට ගෙන හූරන් මරා කා විකොට ජීවත් වෙයි. සාය අවධි යෙහි හූරු වෙළඳාම් හැහෙන නියාව දැන වී සාල් හැර ගෙන

Non-Commercial Distribution

පිටිසරට ගොසින් නැළි ය දෙ නැළි ය දී ලා ගම් හුරු පැටවුන් හැර ගෙන වී ගෙන ගිය ගැල් පුරා ගෙනවුත් ගේ පිටි පස්සෙහි හූරු ගාලක් ගසා ලා ගාල ඇතුළත ම උන්ගේ අනුභවයට තිස්ස ත් ඇති කොට ඒ හැම කා වැඩුණු අවස්ථාවෙහි තෙමේ ත් පව් කොට වැඩුණේ, යම් යම් හූරකු මරා කනු කැමැත්තේ වී නම් ඒ හූරා තර කණුවෙක නො සැලෙනා ලෙස බැඳ සිටුවා ලා මස් බොල් වනු නිසා ත් පව් බොල්වනු නිසා ත් සිව් රැස් මුගුරකින් තළා, මස් බොල් වූ නියාව මුත් පව් බොල් වූ නියාව නො දන තමාගේ චිත්ත ශුද්ධියක් නැත ත් උගේ ශරීර ශුද්ධි ය නිසා ත්, උගේ පුරා කෘත අකුශල කර්මයෙන් භාගයක් වුව ත් සෝධන්ට අවීචි-යෙහි දී තමාගේ කට ත් දල්වන ලෙසට උගේ කට ත් දල්වා, කට නො පියන ලෙසට දඬු කඩක් ගෙන්වා ලා ලෝ සාළුවෙන් තමා කට ලෝ දිය වත් කරණ ලෙසට ඌගේ කට ත් ය සැන්ද-කින් තර ව කකියා ගිය හුණු පැන් වත් කෙරෙ යි. ඒ වත් කළ හුණු පැන් කුස ඇතුළට වැද කකියමින් කසළ ත් හැර ගෙන අධොමාර්ගයෙන් නික්මෙ යි. එ සේ නික්මෙන පැන් යම් තාක් මඳකු ත් කසළෙක් බඩ ඇතුළේ ඇත් නම් කැළඹී එයි. එහි කසල නැත් නම් ප්‍රසන්න ව බාහ්‍ය වෙයි. එ ලෙසින් ම බඩ ශුද්ධ වූ නියාව දන සෙසු හුණු පැන් හූරාගේ පිට වත් කෙරෙ යි. එ කල කළු සම දවා ගෙන වැගිර යෙ යි. ඉක්බිත්තෙන් තණ සුළකින් ලොම් දවා පියා කැපෙන යකඩෙකින් ඉස ගසා පිය යි. බොටුවෙන් වැගිරෙන ලේ වළඳක වත් කොට තබා ලා මස් කැටි ලෙහෙයේ ගල ගලා ගෙන අඹු දරුවන් පිරිවරා හිඳ කාලා ඉතිරි දෙය විකුණ යි.

මෙ ලෙසින් ජීවත් වන්නා වූ ඕ හට හවුරුදු පස් පණසෙක් පලා ගියේ ය. දෙව්රම් වෙහෙර පිටි පස්සෙහි හිඳ ගෙන මෙ තෙක් පව් කරණ මේ තෙමේ හැම දෙනා සිත් ගන්නා නිසා වුවත් එ වැනි පින් කෙතක් බල බලා මල් පිදීම් පාන් පිදීම් දන් දීම් ආදී වූ කිසි ත් පින් කමක් නො කෙළේ ය. පස් පණස් හවුරුද්දක් ගිය කලට මූට බලවත් රෝගයෙක් ඇති වි ය. නො මියෙන තෙක් ම ගති නිමිත්ත ව අවීචි නරකයෙහි ගිනි දැල් පෙනෙ යි. අවීචියෙහි ගිනිදැල් සාර සියයක් ගවු පමණ සිට බලන්නවුන්ගේ ත් ඇය් පිපි-රෙන තරම. කුළු ගෙයක් සා වූ ත් ගලක් ඒ ගින්නෙහි හෙළා ලූ වොත් හුණු ඇසිල්ලෙහි ම නැති වෙ යි. ගල් විරෙන කල ඊ උපන් සතුන් නො විරෙන්නේ හැයි ද ? යත් -මවු කුස උපන් සතුන් මවු කුස ගින්නෙන් නො විරෙන්නා සේ කර්ම බලයෙන් නො විරෙති. ඒ ගිනි දැල් පෙනෙන්ට වන් දවස් පටන් හූරන්ට කළ සැටියට ම,

Non-Commercial Distribution

"යෙන යෙන පකාරෙන යං යං පාපං කතං පුරා.
තස්ස තස්සානුරූපං ච- ඵලං හොති අසාහියං."

යනු හෙයින් දණ එ ව ලා හූරු හඬ හඬමින් ඉදිරියේ දෙර ට ත් පැළ දෙරට ත් බැරඬු ගා ගෙන දිවෙයි. ගෙයි මිනිස්සු මූ තරයේ අල්වා ගෙන මොර ගා ලන්ට දල්වූ කට පියති. හූරන් කට දඬු ගැන්වූ හෙයින් කට නො පිය හී හඬා ම ඇවිද්දී. මූගේ ගෙට දෙ කෙළවර ගෙවල් සතක් සතක් නියායෙන් ගෙවල් තුදුසෙක මිනිස්සු ද එක නින්දක් නො ලැබෙති. මූ නිසා හූරන්ට වූ ගහට සේ ම මිනිස්සුන්ට ත් බොහෝ පීඩා වි ය. වියරු හුණුබල්ලකු මෙන් ඇත මැත දිවන හෙයින් ගෙයි දෙරවල් හයා බැඳ ලා පිටත රැක ගෙන සිටිති. චුන්‍ද සූකරිකයා ත් ඇතුළු ගෙයි හඬා ඇවිද්දී. ඒ සත් දවස් හූරු මස් පලා කන්ට අවසර යක් නො වී ය. මෙ සේ සත් දවසක් මුළුල්ලෙහි හඬා මුර ගා සත් වන දවස් මිය, දිගින් - පළලින් - උසින් සාර සියයක් ගවු පමණ දිග - පළල - උස ඇති ස තිස් ගවු විතර බොල ඇති ගිනි ගෙන දිළිසෙන හිත්ති සතරක් හා ය පොළොවක් හා වසා ලූ ය කබලක් දැති අවීචියෙහි පස් පණස් හවුරුද්දෙන් නැතක් ආයු ඇති කල හෙයින් අන්තඃ කල්පයට ආයු ඇති ව උපන.

වහන්දෑ ද ඌ බැරඬු ලන සත් දවස් ඌගේ ගෙය කෙරෙන් සිහා වඩනා කල ඌ හඬන හඬ අසා හූරන් මරණ කල බැරඬු ගාවන හඬ ය යි සිතා වෙහෙරට ගොසින් බුදුන්ට ස්වාමීනි, චුන්‍ද සූකරිකයා දෙරවල් පියා ගෙන හූරන් මුර ගාව ගාවා මරන්නේ අදට සති ය ය. ඌගේ මඟුලක් ඇතැ යි සිතම්හ. මෙ තෙක් හූරන් මරණ ගමනේ එක දවසක වත් මූට මෙත් සිතක් හට ගත් නියාවක් වත් මරණ හූරන් නො මරණ නියාවක් වත් පෙනෙන්ට නැති හෙයින් නො දතුම්හ. මෙ සේ වූ තද එකකු නුදුටු විරූම හ`යි කී සේක.

'හෙම්බා මහණෙනි, මේ සත් දවසක් හූරන් මරණ නියා නො වෙ යි. තමා සේ ම පව් කරන්නවුන් පව් නො කරන්ට තමාට පෙනෙන නරක ගින්න පාන්ට කරණ යත්නයක් සේ ඌ තමා ම මරණ හයින් මොර ගානා නියා ය. අද මිය ගොසින් අවීචි නරකයෙහි උපන. එ සේ හෙයින් මහණෙනි, ගිහි වුව ත් ශාසනික වුව ත් යම් කෙණෙක් මොහු පරිද්දෙන් පවට ම නියම ව පව් කෙරෙත් නම් මියන අවස්ථාවෙහි ත් පිණක් ම කට නුහුණු යෙම් යි නො කළ පින් අරභයා ශොක කෙරෙති. පර ලොව

Non-Commercial Distribution

බලවත් දුකට පැමිණ දුක් විඳිනාහු පර ලොව ත් ශොක කෙරෙති. එ සේ හෙයින් පව් කළවුන්ට දෙ ලොව ම ශොක ය. නො එක් ලෙසින් සලකා ත් කළ පිණක් ම නො පෙනෙන හෙයින් ශොක කෙරෙති. කළා වූ නිකෘෂ්ට කට යුත්ත සලකා දූක පෙළෙන්ණෝ'යි වදළ සේක.

මේ දෙශනාව අසා බොහෝ දෙනා පාපයෙහි භය ඇති ව ඉන් දුරු ව කුසල්හි පිහිටා සසර දුක් ගෙවා සතර මහ සතර ඵලයට පැමිණියහ. එ සේ හෙයින් මේ දේශනාව ත් පස්වා දහස් මුළුල්ලෙහි බොහෝ දෙනාට ප්‍රයොජනවත් වි ය. එ හෙයින් සත්පුරුෂයන් විසින් අකුශලින් දුරු ව කුසල්හි පිහිටා චිත්තශුඬිය කට යුතු.

## 15. ධම්මික උපාසකයන්ගේ වස්තුව

ඉක්බිති කුසල්හි හැසිරෙන්නවුන්ට එහි අනුසස් දක්වන් නමෝ මහ අවුවේ ගමන් ගොසින් විඩා වූවන් පිපාසා නිවා වත් කරණ පැනක් මෙන් දෙවදූත සූත්‍රාදිය එළවා නරක දුක් බොහෝ කොට කියා ලන්ට නු වූව ත් එක දෙශයකින් දක්වා ලූ දුක් අසා ලා බා ගියවුන් අස්වසන්ට ධම්මික උපාසකයන්ගේ වස්තුව දක්වා කුසල් පිහිටවමු.

කෙ සේ ද? යත්:

සැවැත් නුවර දැහැමින් සෙමින් දවස් යවන උපාසකවරුන් පන් සියයක් ඇත. ඉන් එකි එකී දෙනාට පිරිවර ත් පන් සියය පන් සියය ඇත. ඒ නියායෙන් දෙ ලක්ෂ පනස් දහසක් විතර උපාසකවරු ය. උන් හැම දෙනාට ම මේ ධම්මික උපාසකයෝ ප්‍රධානයෝ ය. පින් කිරිමට මුල්හ. උන්ගේ පුත්තු සත් දෙනෙකු ත් ඇත. දූ සත් දෙනෙකු ත් ඇත. මූ තුදුස්දෙන ත් සඳුන් ගසින් බට අරළුවල ත් එ බඳු ම යහපත ඇත්තා සේ යහපත්හ. අදහසු ත් දෙ මවු පියන්ගේ අදහස් තරමට ය. එ සේ හෙයින් උපාසකයන් හා උපාසිකාවන්ගෙනු ත් දරු තුදුස ගෙනු ත් එක් කොට සොළොස් දෙනාගෙන් නිරන්තර ව ලා බත් සොළසෙකු ත් ඇත. දඹ දිව ඇත්තවුන් ආදියෙන් සඳ දූක ත් බතක් දන් දෙන හෙයින් එ සේ වූ බත් සොළසෙකු ත් ඇත. මෙ සේ වූ සොළොස් දෙන ම රස බිම්හි ඇති වූ ගසෙක බොහෝ සේ පලදා ත් රසවන්නා සේ යහපත්හ. ඉක් බිත්තෙන් ඒ උපාසකයන්ට

Non-Commercial Distribution

නිකැළල් ගසකට නරාවක් ඇතිවන්නා සේ රෝගයෙක් ඇති වී ය. රොග නැමැති පහන් වැටියේ ආයු තෙල ගෙවා පියා මරණ අඳුරට ආසන්න ව බණ අසනු කැමැති ව තෙවත් පිරිත් බණවනු නිසා බුදුන් කරා වහන්දෑ අට නමක් හෝ සොළොස් නමක් හෝ එවන්ට කියා යවූ ය. බුදුහු ත් යවා වදාළ සේක. ගිය වහන් දෑ ද උපාසකයන් වැද හොත් හැද වට කොට වැඩ හුන් සේක.

මියන වේලෙහි සිත පහදවන්ට වට කොට සිටුවා ලූ රත් නෙළුම් මල් කලප් සේ වැඩ හුන් වහන්දෑ දක 'ස්වාමීනි. මෙ වක් පටන් දකුම් පමණකු ත් බැරි වේ ද? දක්නා දැතුරෙහි අසන්ට එක් සූත්‍ර බණක් පිරුවා වදළ මැනැවැ'යි කිවු ය. කවර සූත්‍ර බණෙක් දැ'යි විචාළ සේක. 'ස්වාමීනි, සියලු ම බුදුවරුන් වහන්සේට ආවෙණික වූ සිහිවටන් සූත්‍ර ය වී නම් යහපතැ'යි කිවු ය. වහන්දෑ ද උගේ රුචින් මහ සිවටන් සූත්‍ර ය පිරිවන්ට පටන් ගත් සේක. එ වෙලාවට ස දෙව් ලොවින් සියලු රථාලඞ්කාරයෙන් සැරහුණා වූ ඇඹුල පෙති හා සමාන සුදු අසුන් දහස දහස යෙදූ ස සියක් ස සියක් ගවු විතර දිග ඇති රථ සමයක් අවුත් අහස සිටියේ ය. ඒ ඒ රථයෙහි සිටි දෙවියෝ ද 'නිදුකාණෙනි, මැටි වළඳක් බිඳ රන් වළඳක් ලබන්නා සේ අප අපගේ දිව්‍ය ලොක වල සම්පත් විඳිනට අප අප ගෙනා රථවල උපන මැනැවැ'යි වෙන වෙන ම කිවු ය. උපාසකයෝ අසා ගෙන වැද-හොත්තෝ බණට බාධා වෙයි යන අදහසින් දෙවියන්ට 'තව ඉවසුව මැනැ ව'යි. 'තව ඉවසුව මැනැව යි කිවු ය.

වහන්දෑ තමන් වහන්සේට කීව යි සිතා පිරිත් තබා පී සේක. උපාසකයන්ගේ දූ දරුවෝ ද 'අපගේ පියාණන් වහන්සේ අප හැමට ත් වඩා බණට ඉතා ප්‍රිය සේක. වහන්දෑ ගෙන්වා ගෙන තමන් වහන්සේ ම පිරිතට පටන්ගන්වා ලා තමන් වහන්සේ ම නවතන සේක. මරණට නො බන කෙණෙක් නම් නැතැ'යි හැඬූ ය. වහන්දෑ ත් පිරිතට අවස නැත්තේ වේ දැ'යි විහාරයට වැඩ පී සේක. උපාසකයෝ ද මඳක් කල් යවා පියා සිහි නුවණ ලදින් කුමකට හඬාදැ යි විචාළහ. පියාණන් වහන්ස, නුඹ වහන්සේ වහන්දෑ ගෙන්වා ලා පිරිත් බණවමින් සිට ලා අමාවක් බොමින් සිට පෙරළා ගෙන ගිය අමා නවතන්නා සේ බණන පිරිත් නැවතූ සේක. ඒ දක මුන් වහන්සේ පවා මෙ සේ මරණයට බන කල නො බන කෙණෙක් නැතැ යි හැඬුම්හ'යි කිවු ය. 'වහන්දෑ කොයි දැ'යි උපාසකයන් විචාළ කල්හි වැඩ පී සේකැ'යි

Non-Commercial Distribution

කිවු ය. ඒ අසා 'වහන්දෑ වැඩ පියන්ට මා කීවා නැත. වැඩ පුයේ හැයිදැ'යි විචාළෝ ය. 'තව ඉවසුව මැනැවැ'යි කියා ලූ බස අපි ත් ඇසුව. ඒ කාට කී නියා දැ'යි විචාළෝ ය.

''දෙවතාවෝ ස දෙව් ලොවින් එ ම දෙව්ලෝ ළං කොට ගෙනා වා සේ රථ සයක් සරහා ගෙනවුත් අහස රඳවා ලා තම තමන් ගේ දෙව් ලොවට යන්ට හඬ ගාති. බණ අසා පියන තෙක් තව ඉවසා පියව යි කීයේ මා උන්ට ය'යි කිවු ය. 'ගෙනා රථ ඇත් නම් නුඹ වහන්සේට ම පෙනී ගිය නියා ද, අපට නො පෙනෙන්නේ ය'යි කිවු ය. ඒ අසා ගති නිමිත්ත වශයෙන් පෙනුණු රථ සෙසු ලෙසකින් උන් හැමට දක්වා ලන්ට බැරි හෙයින් උප දෙසකින් දක්වනු නිසා 'මා අත පාරවා පුදන්ට ගෙතූ මල් දම් ඇද්දැ'යි විචාරා ඇතැ'යි කී කල්හි ස දෙව් ලොවින් කවර දෙව් ලොව සිත්කලු දැ'යි විචාළෝ ය.

'පියාණන් වහන්ස, තුසී පුර ය නම් පැරුම් පුරා නිම වූ සියලු බෝසතුනු ත් උන්ගේ දෙ මවු පියනු ත් වසන තැන ය. ඒ දෙව් ලොව යහපත. මෙතේ බෝසතුන්ගේ බණ ත් ඇසිය හැක් කැ'යි කිවු ය. 'එ සේ වි නම් තිලින් මල් දමක් හැර ගෙන ඒ රථයේ එලෙන්ට කියා ලා දමව'යි විධාන කොළෝ ය. ඔහු ත් එ ලෙස ම කියා ලා දැමූහ. මල් දම ගොසින් රථ හිස එලී ගෙන රථ ශොභාව වමාරන කලක් මෙන් එලෙන්නේ ය. බොහෝ දෙනා රථ නො දක්නා පමණ මුත් එලෙන මල් දම දකිති.

උපාසකයෝ 'තෙල එලෙන මල් දම් තුසී පුරෙන් ආ රථ හිස එලෙයි. මම මෙයින් සැව තුසී පුර යෙමි. ගිය තෙන හානි ඇත් නම් වේ ද තොප හැම මුසුප්පු වූව මනා. මුසුප්පු ත් නො ව මා ළඟ උපදනට පතා මා කළ ලෙසින් ම පින් කරව'යි කියා ලා මිය ගොසින් ඒ රථයෙහි උපන්හ. උපන් ඇසිල්ලෙහි සැට ගැළක් පමණ ආභරණින් සැදුණු තුන් ගවු පමණ උස ඇති දිව අත් බැව් පහළ වි ය. දහසක් පමණ දෙවඟ-නෝ ත් පිරිවැරූහ. උසින් සියයක් ගවු පමණ වූ රුවන් විමනකු ත් පහළ විය. සක් දෙව්දු ලෙසින් ධම්මික නම් දෙව් පුත් තෙමේ කුසල් නමැති වඩුවා විසින් මනහර කොට කරණ ලද රුවන් විමනට ගොසින් වන.

බුදුහු ද වෙහෙරට ගිය වහන්දෑ අතින් පිරිත් බැණ අවුදෑ යි විචා-රා 'එ සේ ය ස්වාමීනි, මහ සීවටන් සුත පිරිවන්ට පටන් ගතුමහ.

පිරිවා නො නිමන තෙක් ම නැවතුව. හැම දෙනා හඬන්ට පටන් ගත් හෙයින් අප හඬක් හා බණක් හා දෙකක් හැයි ද යි පලා ආම්හ'යි කී සේක. 'හෙම්බා මහණෙනි. උන් තොප හා කථා කෙළේ නැත. දෙවියෝ සදෙව් ලොව්න්රථ සයක් ගෙනවුත් තමන්ගේ රථවලට නැහෙන්ට කිවූ ය. අසා ගෙන වැද හොත් බණට බාධා වේදෝ හෝ යි යන අදහසින් මදක් ඉවසව යි දෙවියන් හා කථා කොළෝ ය'යි වදාළ කල්හි 'ස්වාමීනි, ඌ දන් කොයි උපන්නු ද'යි විචාළ සේක.

''තුසී පුරයෙහි උපන්හ'යි වදරා 'මහණෙනි, යම් කෙණෙක් පින් කම නො පමා වූ නම් පින් කරන්නා ත් සතුටු සිතින් හෙයින් මෙ ලොව පින් කරණ අවස්ථාවෙහිත් සතුටු වෙති. පරලොව දී කුශලානුභාවයෙන් අනන්ත වූ සම්පත් ලදින් සම්පත් දක ත් සතුටු වෙති. එ හෙයින් පින් කරන්නාහු මෙලෝ පරලෝ දෙක ම කළා වූ පින් සළකා ත් පින් කම් මහිමයෙන් ලත් සම්පත් බලා ත් ධම්මික නම් දෙව් පුතු පරිද්දෙන් සතුටු වෙති'යි පිරිත් බැණ ආයාස ගත් වහන්දෑට සදහම් නමැති පාන වගී දී[1] නිවන් රස අනුභව කරවා කෙලෙස් විඩා සන්හිඳ වූ සේක.

මේ දේශනාවද කල්ප වෘක්ෂ – කල්ප ලතා – භද්‍ර ඝටාදියක් මෙන් බොහෝ දෙනාට ප්‍රයෝජන වත් වි ය. එසේ හෙයින් කුසල්හි හැසිරෙන්නවුන් විසින් වී බත් කැමති වූවන් සම බොරළුවක් ලදින් අමු තෝරා හැර වී ම භාර ගන්නා සේ අකු සල් තෝරා හැර කුසල් ම හැර ගෙන කුසල් නමැති බිජුවට තුනුරුවන් කෙත වපුට ලොවී සැප ත් නමැති ධාන්‍ය හා ලොවතුරා සැප ත් නමැති ධන රැස් කට යුතු.

---

# 16. දෙවදත්ත වස්තුව

තව ද අති උග්‍ර වූ අකුසල කර්මයෙන් ලබන දුකු ත් අති උග්‍ර වූ නියා ව දක්වන්නමෝ දෙවදත්ත වස්තුව දක්වා අකුසල් අදහස් ඇත්තවුන් අකුසලින් නංවා කුසල්හි පිහිටු වමු. කෙ සේ ද? යත්:

අප ති ලෝ ගුරු බුදු රජුන් වහන්සේ කුසිනාරා නුවර මල්ල රජ දරුවන් ගේ අනුපිය නම් නියම් ගම අනුපිය නම් අඹ උයනේ වසන කල රජව ත් කිම, බුදුව ත් කිම, පිරිවරා ඇවිද්ද මනා වෙ ද'යි නිළ කළ රාජකුමාරවරුන් අසූදහස බොහෝ සේ මහණවූවත්

---

1 පූප වර්‍ගාදි

Non-Commercial Distribution

භද්දිය කුමාරයෝ ය. අනුරුද්ධ කුමාරයෝ ය. භගු කුමාරයෝ ය, කිම්බිල කුමාරයෝ ය, ආනන්ද කුමාරයෝය, දෙවදත්ත කුමාරයෝ ය යන රාජ කුමාරවරුන් ස දෙනා මහණ නුවූ නියා ව දැක 'අපි අප ගේ දරුවන් මහණ කැරවුම්හ. මුන් ස දෙනා ගේ දෙමවුපියන් බුදුන්ට නෑ නොවන නියා වේ ද ? එසේ හෙයින් වේ ද මහණ නො කරන්නේ ය'යි මහණ වූ තැන්ගේ දෙ මවු පියෝ අරුචි ලෙස කථා ඉපදවූ ය. එ ලෙස කථා ව උපන් පසු අනුරුද්ධ කුමාරයාගේ බෑණෝ මහානාම ශාක්‍යයෝ මලණුවන් අනුරුද්ධ කුමාරයන් ළඟට අවුත් 'මලණ්ඩ, අපගේ කුලෙන් මහණ වූ කෙණෙක් තව දක්වා නැත. එසේ කලට අපගේ අඩුවක් සේ තිබෙයි. ඊට ත් වඩා අපගේ නෑ උතුමාණන් වහන්සේ ගෙන් ශාසනිකව ලද මනා සංග්‍රහය ත් නො ලබම්හ. එසේ ත් මහා අලාභ ය. එ සේ ගෙයින් තෙපි ගොසින් මහණ වව. තොප මැළි වුවො ත් ශාසනය ත් සිස් නොවන නියා යෙන් මම හෝ මහණ වෙමි' කිවූ ය.

ඒ අනුරුද්ධ කුමාරයෝ නම් ඉතා සියුමැල්ලෝ ය. මහ පොහොසත් හ. මහණ ව සිඟා ගිය කල අරුණු ය යි කියා ලූ බසෙහි අර්ථ දැන ගන්නා විතර ත්, නැතැ යි යන බස් පමණකුත් ඇසූ විරූ නැත. එ සේ ඇසූ විරූ නියා නැත්තේ කෙ සේ ද යත් – එක් දවසක් භද්දිය ආදි වූ ඒ කුමාරවරු ස දෙන පළස් පූවට දම දමා ගුළ කෙළි කෙළිති. එ සේ කෙළිනා කල්හි අනුරුද්ධ කුමාරයෝ පැරැද ගොසින් ගිවිස ගත් ලෙසට කැවුම් සොයා ගෙට යැවූ ය. මවු බිසෝ කැවුමක් පන්ති කරවා යවූය. ස දෙන එක් වී හිඳ කැවුම් අනුභව කොට ලා නැවත ත් කෙළ අනුරුද්ධ කුමාරයෝ ම පැරැද හොසින් නැවත ත් කැවුම් සොයා ගෙට යවා ගෙනා කැවුම් කා ලා කෙළ තුන් වන වාරයේ ත් පැරද විටින් විට ම කැවුමට ම ගිවිස්නා හෙයින් කැවුම් ගෙන්වා කා ලා සතර වන වාරයේ ත් කෙළ පැරැද පියා කැවුම් සොයා යවූහ. තුන් වාරයක් කොට යවා ගෙයි කැවුම් නිම හෙයින් මවු බිසවු කැවුම් නැති නියා ව කියා යවූහ.

අනුරුද්ධ කුමාරයෝ තමන් නො ඇසූ විරූ බසක් හෙයින් එ නම් කැවුම් වර්ගයක් නියා ය යි සිතා ගෙන 'නැති කැවුමැ යි යන කැවුම ත් ඇති නියා වේ ද, ඒ ගෙනෙව' යි විධාන කොළෝය. මවු බිසවුන් ඒ අසා 'ම පුතුන් විසින් නැතැ යි යන බසක් ඇසූ විරූ නැත. එක් උපදෙසකින් එ බසෙහි අර්ථ ය අඟවා පියම්'යි සිස් රන් තළියක් කැවුමෙන් සිස් වුව ත් පිනින් නොසිස් වුවා

Non-Commercial Distribution

අනික් රන් තළියකින් වස්වා ලා යවූ ය. නුවර රකවල සිටි දෙවියෝ 'මේ අනුරුද්ධ කුමාරයෝ අන්නභාර නම් දුගී අවස්ථා-වෙහි තමන් කන්ට ඉදි කළ 'රස පරසරයක් නැති බත රස වත් සිතින් උපරිට්ඨ නම් පසේ බුදුන් වහන්සේට නැතැ යි නො කියා පිළිගන්වා ලූ හෙයින් නැතැ යි යන බසක් නො අසම්ව' යි කියා ත් පැතූහ. බත් උපදින්නේ අසවල් තැනිනැ'යි කියා ත් නො දනිම්ව'යි පැතූ ය. ඉදින් මූ තුමූ සිස් තළි ය දුටු වූ නම් තොප උදසීන වූ යෙ හැයි දැ යි කියා නො සතුටු ව දෙවියෝ අප දිව්‍ය සමාගමයට ත් වැද්ද නො දෙන සේ දනිති. අප ගේ ඉස් හෝ සත් කඩක් ව පැලෙ'යි සිතා තළියෙහි දිව කැවුම් පුරා ලූහ. නිමුඩු[1] සාලේ බතක් ගොසින් සිතෙහි නිමුඩු කමක් නැති ලෙසට දිව කැවුම් වී ය.

තළි ය ගෙන ගිය තෙනැත්තෝ ගෙන ගිය තළි ය කෙළනා තැන තබා ලා වසා ලූ තළි ය නැතැ යි යන බස අසා හඟවන්නට හළ වූ ය. හැරපී කලට බස්වල අසා හැඟ වීම කුමක් වුව ත් කුශලානුභාව ය. හඟවමින් දිව කැවුමේ සුවඳ මුළු නුවර පැතිරිණ. කැවුම් කැබෙල්ලක් කඩා ගෙන මුඛයෙහි තබා ලන්නා ම සත් දහසක් රස නහර පිනා ගියේ ය. කැවුම් කා ලා අනුරුද්ධ කුමාරයෝ 'අනේ! අපගේ මෑණියන් වහන්සේ මෙ තෙක් කල් මට ලෙන් ගතු කමක් නැති සේක් වන. මේ කැවුම් නො එවුයේ එසේ හෙයින් නියා වේ දැ'යි සිතා ගෙන 'මෙ වක් පටන් මේ කැවුම් විනා අනික් කැවුමක් නො කමි. නිවන් කැවුම් නො ලත් හෙයින් සිතා ගෙන ගෙට ගොසින් 'මෑණියන් වහන්ස, මම මුඹට ප්‍රියයෙම් ද, අප්‍රියයෙම් දැ'යි විචාළෝ ය. ඒ අසා බිසවු 'පුත කුමක් කියා ද? එක ඇසක් ඇති කෙණෙකුන්ට ඒ එක ඇස යම් සේ ප්‍රිය ද, එ පරිද්දෙන් තෙපි ත් මට ප්‍රියව'යි කිවු ය. 'එ සේ කල මෙ තෙක් කල් අද යැවූ නැති කැවුම් නො යැවූයෙ හැයි දැ'යි කිවුය.

බිසවු ඒ අසා කැවුම් ගෙන ගිය තෙනැත්තවුන් අතින් 'කුමක් ද දරුව, ඒ තළියෙහි කුමක් ඇද්දැ'යි විචාරා 'බිසොවුන් වහන්ස, තලිය කැවුමෙන් පිරින ඉස් වන අපට සම්භවූ හෙයින් දනෙන්නේ වේ ද? මේ තරම් කැවුමක් නුදුටු විරිමි'යි කිවු ය. බිසවු ඒ අසා 'ම පුත්තු මහ පිනැත්තෝ ය. පිණින් නො සිස් තැනැත්තවුන්ට දෙවියන් දිව කැවුමෙන් තළි ය පුරා ලූ නියා' යයි සිතා ගත්හ. අනුරුද්ධ කුමාරයෝ ද 'මෑණියන් වහන්ස, මෙවක් පටන් මට කැවුමක් එවතොත් මේ විනා අනික් කැවුමක්

---

1 නිබුද්ධ

Non-Commercial Distribution

එවන්ට නො කැමැත්තේ ය'යි කීවු ය. එ වක් පටන් බිසවු ද පුතණුවන් 'කැවුමක් කමි' කී කල, තෙල් නො දවා සාලු ත් නො නසා හිස් තලියක් අනික් තලියකින් වසා ලා යවති. යම් තාක් ගිහි ගෙයි රඳා හුන්නෝ වූ නම් ඒ තාක් දෙව්යෝ දිවස් ඇති තෙනට උතුම් වන මහතාණන්ට දිව කැවුම් දුන්හ.

බෑණන් විසින් මහණ වන්ට කී කල්හි නැතැ යි යන බසෙහි අර්‍ථ පමණකුත් නො දන්නා කුමාරයෝ මහණ වීම නම් කවර බවත් නො දැන එ තමා කුමක් දැ යි විචාරා 'හෙම්බා මලණ්ඩ, ඉසකේ කපා පිසා සිවුරු පෙරව ගෙන දඬු මැස්සෙක වෙව යි පෝරු හැඳෙක වෙව යි සැත පී මැටි පයක් ගෙන සිඟා කෑමෙක් ඇත් නම් මහණ වීම නම් ඒ ය'යි කී කල්හි 'බෑණන් වහන්ස, මම ඉතා සියුමැල්ලෙමි. පඩු පොවා බර කළ සිවුරු ධරන්ට ත් මට බැරි ය. දඬු මැසි ආදියෙහි වැදහෝනට ත් ඉතා බැරි ය. සිඟා කා ලන්ට ත් බැරි හෙයින් ම බැරිය. එ සේ හෙයින් මම මහණ නො වෙමි'යි කිවු ය. ඒ අසා බෑණෝ 'මල, එ සේ වී නම් කර්‍මාන්ත ඉගෙන ගිහි ව වස ව අප දෙන්නාගෙන් එක් කෙණකුන් මහණ නො වන්ට නො පිළිවනැ' යි කීහ. බත් පමණක් උපදනා තැන් නො දන්නා මහ පිණැත්තාණෝ කර්‍මාන්ත තමා ම නො දන්නා හෙයින් ඒ තමා කර්‍මාන්ත නම් කුමක් දැ''යි විචාළෝ ය.

බත් උපදනා තැන් පමණ ත් නො දන්නේ කෙ සේ ද යත්- එක් දවසක් කිම්බිල කුමාරයන් හා භද්දිය කුමාරයන් හා අනුරුද්ධ කුමාරයන් හා කථාවක් කොට කොට හුන්නෝ 'බත් තමා උපදනේ කොයින් දැ'යි විචාළහ. කිම්බිල කුමාරයෝ 'බඩ හලින් උපදිති' කීහ. ඒ අසා භද්දිය කුමාරයෝ 'තෙපි නො දනුව. බත් උපදනා තැන් දන්නෙම් මම ය. බත් උපදනේ සැළියෙනැ'යි කිවු ය. ඒ අසා අනුරුද්ධ කුමාරයෝ 'තෙපි දෙන්න ම නො දනුව, බත් නම් උපදනේ රියනක් උස පියුම් කැකුළක් ඇතිමුව විට හිරිසියයක් ඇති රන් තළියෙනැ'යි කිවු ය. මුන් තුන් දෙනා මෙ සේ කියන්ට කාරණ කවරේ ද? විචාළාට වැනි ව සිතට හැංගක් කී නියා ද, නො හොත් දුටු දෙයකින් ද යත්-එක් දවසක් කිම්බිල කුමාරයෝ වීකක් ගුළින් බානා දැක බත් අටුවෙන් උපද්දී සිතූහ. දඬ බිමකට නො ගිය නියා ඉන් ම හැඟෙ යි. භද්දිය කුමාරයෝ එක් දවසක් සැළියකින් බතක් ලන්නා දැක බත් උපදනේ සැළියෙනැ' සිතූ ය. දඬ බිම් තබා බඩාල් දසාවට ත් උන් නො ගිය නියා ව ඉන් හැඟෙයි. අනුරුද්ධ

Non-Commercial Distribution

කුමාරයෝ ගුළින් වී බානා නියාවක් වේව යි, සැළියෙන් බත් ලන නියාවක් වේ ව යි, තමන් නුදුටු විරූ හෙයින් තළියේ ලා ලා පෙරට තුබූ බත් පමණක් ම දක්නා හෙයින් තළියෙන් බත් උපදනේ ය යි සිතූහ.

එ හෙයින් බත් උපදනා පමණක් තමන් නොදන්නා ඒ කර්මාන්ත නම් කවරේ දැ යි විචාරා 'පළමු කොට කුඹුරු ගෙවඩි ය යුතු ය. ඉක් බිති බිම් නැඟිය යුතු ය. පසු ව දෙ සී සෑ ව යුතු ය. මියර කෙටිය යුතු ය. තුන් සී සාන්ට යුතු ය. කැට තළා පෝරු ගෑ යුතු ය. කළල්ලැම් කට යුතු ය. ඉස්නන් තෙමිය යුතු ය. දිය බැන්ද යුතු ය. ගොයම් රොගයට කෙම් කළ යුතු ය. ගොයම් පැසී ගිය කලට ද මැඩ වී අවු කොටුවල ලිය යුතු ය. පෙරළා හිපනැලි සෑ ව යුතු ය. වල්පොළ කෙටිය යුතු ය දවා හෙළි කට යුතු ය.' යනාදීන් හවුරුදු පතා කළ මනා කර්මාන්තයෙහි නියම යක් නැති කොට කීවා අසා 'සසර කෙළවරක් නො පෙනෙන්නා සේ මේ කර්මාන්තයෙහි ත් කෙළවරක් ම නො පෙනෙයි. කර්මාන්ත යෙහි ම නියමයක් නැති කල සම්පත් විඳින්නේ කවර ද ද? මුඹ වහන්සේ ම නියමයක් නැති කර්මාන්ත කොට නියමයක් නැති සසර රඳන්ට ගිහි ව විසුව මැනව. කොට ගත හුණො ත් නියමය පෙනෙන මහණ වීම මට වුව මැනවැ'යි මහණ වීමෙහි රුචි ඇති ව, මහණ වීමට අනුදන්ට මවු බිසොවුන්ට කියා උන් විසින් තුන් විටක් කොට නවතා ත් නැති කැවුමට ත් වඩා නිවන් කැවුමට අදහස තර ව නො නවත්නා හෙයින් මෙ ලෙසිනු ත් නැවතිය හැක්කැ යි සිතා 'ඉදින් තොපගේ යාළු වූ භද්දිය කුමාරයෝ මහණ වෙත් නම් තෙපි ත් මහණ වව' යි කී කල්හි උන් කරා ගොසින් 'මාගේ මහණ වීම මුඹ පිළිබඳ ය, යනාදීන් නො එක් ලෙස කියා සත් වන දවස් එක් ව මහණ වන ලෙසට ගිවිස්වා ගෙන මහණ වීමෙහි තර වූ ය.

ඉක් බිත්තෙන් භද්දිය කුමාරයෝ ය, අනුරුද්ධ කුමාරයෝ ය, ආනන්ද කුමාරයෝ ය, භගු කුමාරයෝ ය, කිම්බිල කුමාරයෝ ය, දෙවදත්ත කුමාරයෝ ය, යන මේ රාජ කුමාරයෝ ස දෙන උපාලි නම් කපුවාණනු ත් හැර ගෙන දෙවියන් දිව සැපත් විඳිනා කලක් පරිද්දෙන් සතියක් මුළුල්ලෙහි රජ සැපත් විඳ උයන් කෙළියට යන්නවුන් මෙන් සිවුරඟ සෙනඟ පිරිවරා නික්ම තමන්ගේ දෙශ ගෙවා පර දෙශට පැමිණ රජ අඟින් සෙනඟ රඳවා පියා රජ දරුවෝ ස දෙන තම තමන් පළන් ආභරණ ගළවා පොදි කොට

බැඳ ලා හිඳ 'උපාලිනි තෙල හැර ගනුව'යි ආයු පමණින් තොප ජීවත් වන්ට තෙල තෙක් දැ සෑහෙයි' කියා ලා උන්ට දුන්හ. ලඟ තුමූ ත් හඬමින් වලපමින් රජ අන සක මැඩිය නොහී නැවැත්තාහ. රජ දරුවන් ස දෙනා ත් කපුවාණනු ත් වෙන් වූ කලට මහවල ත් අඳුරු බිහිරි වීමෙන් හඬන්නා සේ වී ය. මහ පොළොව ත් වෙවුලන්නා සේ වී ය.

උපාලි කපුවාණෝ ත් මඳ තැනක් ආ පස්සේ යන්ව ගොසින් ලා 'ශාක්‍ය රජ දරුවෝ නම් මොළොක් බුදුන්ට නෑ බව මුත් මහා තදයෝ ය. මා ඔබ ගිය කලට කුමාර වරුන් නො දැක කුමාරවරුන් නො ආවේ මරා පී නියා වේ දැ'යි ආද්‍යන්ත නො සලකා මාත් මරා පී සේක් නමුත් කාරිය නො වෙ යි. මේ රාජ කුමාරවරු රාජ සම්පතු ත් හැර මාහැඟි වූ මේ ආභරණ ත් මට දී පියා ගොස් මහණ වෙති. ඒ මහණ වීම මට ත් නපුරු නොව ත් මම ත් මහණ වෙමි' සිතා ලා ඒ පොදිය මුදා පියා ආභරණ ගස්වල කප් රුක් සදන කලක් මෙන් එල්වා පියා 'කැමැති කෙණෙක් හැර ගත මැනැවැ'යි කියා ලා රජ කුමරුන් කරා ගොසින් 'අවුනැ යි විචාල කල්හි තමන්ගේ අදහස් කිවු ය. ඒ අසා උනු ත් කැඳවා ගෙන බුදුන් කරා ගොසින් 'ස්වාමීනි, අපි ශාක්‍ය කුලෙහි උපන් හෙයින් නඟුලිස් ගැළපූ පිඹුරන් මෙන් මතින් තද ව සිටුම්හ. මුන් අපගේ කපුවාණන් හෙයින් මූ අපට අඩු වූවෝ වේ ද, මුන් පෙරාතු ව මහණ කොට ලන්නා ම උන්ට වැඳීම් පිදීම් ආදී වූ ආදර සම්භාවනා කරම්හ. එ සේ කලට අපගේ මත් මිරිකී ගනී. ශාසනයට මත් නම් වුව මනා දෙයෙක් නො වන්නේ වේ දැ'යි මහල් කපුවාණන් පළමු මහණ කරවා ලා තුමූ ස දෙන පසු ව මහණ වූහ.

ඉන් භද්දිය තෙරුන් වහන්සේ නෑ උතුම් බුදු රජාණන් වහන්සේ බුදු වන දවස් රාත්‍රියෙහි පෙර යම් දස පැයින් උපදවා ගත් පෙර විසූ කඳ පිළිවෙළ දන්නා නුවණ ත්, මැද යම් දස පැයින් උපදවා ගත් දිව ඇස ත්, අළු යම් දස පැයින් උපදවා ගත් බුදු නුවණ හැර අර්හත් මාර්ග ඥනය ත් යන මේ ත්‍රි විද්‍යාව හා සෙසු ත් ශාසනික ව ලද මනා ලොවී ලොවුතුරා සැප ත් සඳහා යම් සේ ඉදුබෙක් ගොඩ ඇවිදි නමුත් තමාට පිහිට ව තිබෙන හෙබ-වළ ආදි ය අත් නො හරී ද, එ මෙන් සියල්ලවුන් කෙරෙහි පතළ මෙත් සිත් අත් නො හැර යම් සේ එම ඉදුබා දියෙහි ඉපි — ළෙන්නේ හිස මතු කොට ලා කිසි කෙණෙකුන් දැක ගැඹුරු දියෙහි ගැළී යේ ද, එ පරිද්දෙන් සසුන් මහ විල්හි පිළිවෙත් හිස් ඔසවා ඇවිදිනා සේක් කෙලෙස් සතුරකු දුටු කල භාවනාදියෙහි

Non-Commercial Distribution

ගැළෙමින් ද යම් සේ එම ඉදුබා දියෙන් ගොඩ නැඟී කබල හිඹු ගන්වා ද, එ මෙන් කෙලෙස් දියෙන් තෙමුණු සිත් නමැති කබල සම්‍යක්-ප්‍රධාන වීර්‍ය්‍ය අවුවෙන් ගිනි ගන්වා ද, තව ද යම් සේ ඒ ඉදුබා පොළොව කැණ ගෙන ගොසින් ඒ උපද්‍රව හයින් විජන ස්ථානයක වෙසේ ද, එ මෙන් ලාභ සත්කාර හැර සසර හයින් මහවල් වැද රුප්පා - කඳු රැළි-ගල් ගුහා ආදිය නිසා වැස යම් සේ ඒ ඉදුබා ඇවිදිනේ කිසි කෙණකුන් දැක හෝ අරගලක් අසා හෝ කකුල් සතර ත් හිස ත් කබල යට සඟවා ද, එ පරිද්-දෙන් චක්ෂුරාදි වූ ස දෙරට රූපාදි වූ ඉටු-අනිටු සාරමුණු හමු කල්හි සාරමුණු නමැති මහ වල්හි සැඟවී හිඳිනා කෙලෙස් සතුරන්-

"තෙ කිලෙස මහාචොරා - ආලම්බණවනාසයා,
න ධංසෙන්ති මනොගෙහං - සතාරක්ඛෙ උපට්ඨිතෙ"

යනු හෙයින් හැම වේලෙහි ම සිහි ඇති වීමෙන් චක්ෂුරාදි ස දෙරින් වැද සිත් නමැති ගෙයි තුබූ ගුණ රුවන් ගත නො දී තුන් මස ඇතුළ ම ත්‍රි විද්‍යා නමැති වේද තුන ද, ශීලාදි ගුණ දහම් නමැති වේදඬ්ග ද දැන ගෙන සූත්‍ර ප්‍රතිපත්ති නමැති සූත්‍ර ලා අර්හත් ඵල නමැති දක්ෂිණාව සිහා සම්‍යක් සම්බුද්ධ නමැති සක්විති රජ්ජුරුවන්ගේ පිරිසිදු සිල් නමැති පවුරු වළල්ලක් ඇති හිරි ඔතප් නමැති අගලක් ඇති, නුවණ නමැති වාසල් ඇති, වීර්‍ය්‍ය නමැති අට්ටාල ඇති, සදැහැ නමැති එසිකාස්තම්භ ඇති, සිහි නමැති වාසල් රක්නවුන් ඇති, නව ලොවුතුරා දහම් නමැති නව මහල් පායක් ඇති, චතුර් විධ මාර්‍ග නමැති සිව් කොන් වීථි ඇති, ති ලකුණු නමැති තුන් කොන් වීථි ඇති, විනය පිටක නමැති අධිකරණ ශාලා ඇති, සිහිවටන් නමැති රාජ වීථි ඇති, අභිඥා නමැති මල් තබා විකුණන සල් පිල් ඇති, සිවු පිරිසිදු සිල් නමැති සුවඳ සල් පිල් ඇති, චතුර් විධ ශ්‍රාමාණ්‍ය ඵල නමැති ඵලාඵල තබා විකුණන පිල් ඇති, කෙලෙස් පිළියමට ගත යුතු වූ සත් තිස් බොධ පාක්ෂික ධර්‍ම නමැති බෙහෙත් බඩු තබා විකුණන සල් පිල් ඇති, ජරා විළිපිළි නැති වීමෙහි සමර්ත්‍ථ වූ කායගියාසී නමැති අමා තබා විකුණන සල්පිල් ඇති, නිවන් ගෙන දීමෙහි සමර්ත්‍ථ වූ ශීල - සමාද්ධ්‍යාදී රුවන් පිරුණු සල් ඇති, ඒ ඒ දෙය ලබන්ට තර මුන්ට දෙන ලෙස ජාති සම්පත් භොග සම්පත් ආයු සම්පත් ආරොග්‍ය සම්පත් වර්‍ණ සම්පත් ප්‍රඥා සම්පත් මනුෂ්‍ය සම්පත් දිව්‍ය සම්පත් බ්‍රහ්ම සම්පත් නිවන් සම්පත් පිරුණු සල්. ඇති සදහම් නුවරට වන් සේක.

Non-Commercial Distribution

අනුරුද්ධ මහ තෙරුන් වහන්සේ ද විදර්ශනාවට විෂය වූ සංස්කාරයන් විෂය නොව විවසුන් වඩනා සේක් කළා වූ පාන් පූජාවෙහි මුඛ්‍ය විපාක වශයෙන් දිව ඇස් උපදවා ගෙන පසු ව රහත් වූ සේක. ආනන්‍ද මහ තෙරුන් වහන්සේ ද, යම් සේ හුණ ගසක් සුළං අතට නැමේ ද, අනික් අතකට නො නැමේ ද, එ පරිද්දෙන් පර්‍ය්‍යාප්ති සුළඟින් ප්‍රතිපත්ති සුළං පිටට නැමී රහත් වීම බුදුන් පිරිනිවි කලට තබා සෝවාන් ව නිවන් රටින් කැබලි සුහක් අත් කළ සේක. භගු - කිම්බිල දෙ දෙනා වහන්සේ ද යම් සේ නැගූ දුන්න මුල පටන් අග දක්වා නැමී තිබේ ද, එ පරිද්දෙන් බාල තෙනට ත්, මධ්‍යම තෙනට ත්, සම සම තෙනට ත් නො තද හෙයින් නැමීම ඇති ව, යම් සේ කවුඩුවෝ හැම වේලේ ම සැක ඇති ව වෙසෙද්ද, එ පරිද්දෙන් හැම වේලේ ම පාපයේ භය ඇති ව යම් සේ කවුඩුවෝ ලද දෙයක් සෙසු කවුඩුවන් හැර නො කද්ද, එ පරිද්දෙන් සිඟා ලද දෙයක් බෙදා දීම වශයෙන් සංවිභාගසීලී ව, යම් සේ වඳුරෝ වාසයක් එක් තැන කෙරෙත් නම් අතු පතරින් ගැවසී ගත් මහ ගස් ඇති තමන්ට වාසු තෙනක වෙසෙද් ද, එ පරිද්දෙන් ලජ්ජී වූ සිල්වත් වූ යහපත් තරම් ඇති බොහෝ ඇසූ විරූ තැන් ඇති බැවින් ධර්මධර වූ ගරුතර වූ සම්භාවනීය වූ දුටු වැරැද්ද කියා නවතන සත්පුරුෂොපාශ්‍රය ලදින් යම් සේ ලබු වැලක් අතරණ කල තණ වේව යි, දඬු වේව යි, යමෙක යමෙක කොන්දෙන් එලී ලා මතු පිටින් අතරා ද එ මෙන් විදර්ශනාවට විෂය වන අරමුණෙහි විවසුන් නුවණ නමැති කොන්දෙන් එලී අර්හත් මාර්ග නමැති වැලින් අතරා ඵල සම වතින් පල ගත් සේක.

උපාලි මහ තෙරුන් වහන්සේ ද සඟ දහසක් හැර ගෙන බුදුන් කෙරෙහි වින ය අසා විනයධර තෙනට අග තැන් පත් ව රහත් වූ සේක. දෙව්දත් වහන්සේ භද්දියාදි කුල දරුවන් හා එක් ව අවුදින් මහණ ව රුවන් දෙන තැනට ගොසිනු ත් රුවන් නො ලද්දා සේ නිවන් දක ගත නො හී අෂ්ට සමාපත්ති උපදවා අභිඥා ලැබ වසන දැ ය. බුදුන් කොසඹෑ නුවර වසන කලට ගං මුල්ලෙහි මුව දෙර එක් කැන් වූ කලක් මෙන් පාරමිතා භූමියෙහි දී පැරුම් පුරා අවසර නුවූ හෙයින් මෙ තැන්හි දී අවසර ලත් තෙනට ලාභ සත්කාර බොහෝ ව උපදනට වන.

සිවුරු පිළි ආදි වූ දෙය හැර ගෙන මිනිස්සු වෙහෙරට ගොසින් ගුණෙන් උතුම් වූ බුදුහු කොහි ද? දකුණ'ත් සවු ව සිටි ධර්ම සෙනෙවි සවාමි කොයි ද? වම'ත් සවු ව සිටි මුගලන් සවාමි කොයි ද, අපිස් තෙනට අග තැන් පත් මහසුප් සවාමි

කොයි ද, ත්‍රි විද්‍යාවෙන් අග තැන් පත් භද්දිය සවාමි කොයි ද? චිත්‍රකථී වූ කුමරකසුබ් සවාමි කොයි ද? දිවැස් ඇති තෙනට අගතැන් පත් අනුරුද්ධ සවාමි කොයි ද? අවවාදක්‍ෂම තෙනට අග තැන් පත් රාහුල සවාමි කොයි ද? දනලාභී තෙනට අගතැන් පත් සීවලී සවාමි කොයි ද? උපසථායී තෙනට අග තැන් පත් ආනන්‍ද සවාමි කොයි ද? යනාදීන් අසූ මහ සවුවන් වහන්සේ ම විචාරා ඇවිදිති. දෙව්දත් තෙරුන් වහන්සේ කොයි දෑ යි විචාරන තරම් ප්‍රසිද්ධ ගුණයක් නැති හෙයින් විචාරන කෙණෙක් නැත.

එ සේ නැති කලට එක් දවසක් 'මම ද වැළි ත් භද්දියාදීන් හා එක් ව ම අවුත් මහණ වීමි, මූ හැම ත් රජ කුලයෙන් ම අවුත් මහණ වූව, මම ත් රජ කුලයෙන් ම අවුත් මහණ වීමි. ජාතියෙන් රජ කුල ය නිසා සරිය මුත් ගුණෙන් අඩු ව සිතා ගත නොහී යම් යම් ලාභයක් ගෙනා කෙණෙක් මුන් හැම විචාරති. විචාරන්නා තබා මා සලකුණු කරණ කෙණෙකු ත් නැත. කවර උපදෙසකින් කවුරුන් පහදවා ගෙන ලාභයක් එළවා ගනිම් දෝ හෝ'යි සිතූහ. සිතා ලා 'මේ බිම්සර රජ්ජුරුවෝ බුදුන් ආදියෙන් දුටු දවස් ම එක් ලක්ෂ දස දහසක් හා සමග සෝවාන් වූහ. තර අදහසින් ශපථයක් කළ කෙණකුන් හා ශපථ වූ දෙය අරවා ගත නො හැක්කා සේ මුන් හා අපගේ අදහස් ලෙසට එක් කරවා ගත නො හැක්ක. මාගී ගත වූ ප්‍රසාද ය නම් රාජ හංසයන්ගේ අදහස පියුම් වලට මුත් කසළ ගොඩට නො නැමෙන්නා සේ බුද්ධාදීන් හැර අන් තැනකට නො නැමෙ යි.

'කොසොල් මහ රජ්ජුරුවන් නිවන් නුදුට ත් මල්ලිකා බිසො වුන්ගේ සමවායෙන් බුදුසස්නෙහි පහන් හෙයින් අප සිතන ලෙසට නමා ගත නො හැක්ක. රජ දරු කෙණකුන් මුත් සෙස්ස වුන්ගෙන් ප්‍රයෝජන ත් නැත. බිම්සර මහ රජ්ජුරුවන්ගේ පුත් වූ අජාසත් කුමර නූපද ම පිය මහ රජුන්ට සතුරු හෙයින් කාට වුවත් සතුරු වන්ට නිසි ය. කවුරුන්ගේ ත් ගුණ අයුණු නො ද නිති. උන් හා එක් වෙමී' සිතා කොසඹෑ නුවරින් රජගහ නුවරට ගොසින් බාල තරම් ඇති වන ලෙසින් ම කසුබු[1] වෙසක් මවා නයින් දෙන්නකු දැත වෙළා නයින් දෙන්නකු දෙ පය වෙළා එකකු කර එල්වා ගෙන එකකු එකස් කොට එල්වා එකකු හකුළුවා සුම්මැඩියක් සේ ඉස තබා ගෙන අහසින් රජ ගෙට බැසලා අජාසත් රජ්ජුරුවන්ගේ ඔර හිඳ උන් බා ගොසින් තිගැස්සී බලා තෙපි කවුරු දෑ යි විචාළ කල්හි 'මම දෙව්දතැ'යි කියා ලා අජාසත් කුමරුන්ට භය හරවනු නිසා ඒ වෙස හැර

1 කුඩාහමු

Non-Commercial Distribution

මහණ වෙස මවා ඉදිරියෙහි සිට උන් පහදවා ගෙන නිරන්තර ව බත් කත් පන් සියයක් දක්වා ත් ලාභ ය උපදවා ගෙන ලාභ ය බොහෝ වූ පමණින් 'මම බුද්ධරාජ්ජයට පැමිණ භික්ෂු සඞ්ඝයා පිරිමසමී'යි පවිටු සිතක් සිතා සසර පිහිටවනු ව ලැබ ගත් ගුණෙනු ත් පිරිහී වෙළුවන වෙහෙර බුදුන් බණ වදරන තෙනට ගොසින් වැද ලා දෙහොත් මුදුනෙහි තබා ගන ස්වාමීනි, මුඹ වහන්සේ මාලු ව ගිය සේක. ආයාස නො ගෙන වැඩ හුණ මැනව. ක්‍රම දන ගත් බැවින් මම ගණ පරිහරණය කෙරෙමි. භික්ෂු සඞ්ඝයා මට පාවා දුන මැනවැ'යි කියා බුදුන් නො ගිවිසි හෙයින් නො සතුටු ව, සේරි වාණිජ ජාතකයෙහි රන් තළි ය නිසා කළ වෛර ය මේ කපට පස් වන හෙයින් ඒ වෛර ය නවමු[1]. කරන්නාක් මෙන් බුදුන් කෙරෙහි පළමු වෛර ය බැඳ බුදු සස්නෙහි රුඳුණු පමණක් මුත් මියන්ට ආසන්න වුවන් මළා නම් වන්නා සේ ශාසනයෙන් පිටත් වූ ය. බුදුහු ත් ඔවුන් ශාසනයෙන් පිටත් කොට හළ සේක.

තුමූ ත් හළ නියාව දන 'මහණ ගොයුම්හු අප හළ වූ ය. පිටත් ව ගත් බැවින් අනර්ථයක් ම කෙරෙමි'යි බුදුන් බුදු වීමට පැතුවා සේ ම මුනු ත් බුදුන් නසන්ට ම පස් කප මුළුල්ලෙහි පතා ආ හෙයින් අජාසත් රජහු කරා එළඹ කිරෙහි මුසු ව මුසුන් කිරි රස ය හරවා, දී රස ය කරවා ලන්නා සේ උන්ගේ කිරි රසයේ තුබූ යහපත් අදහස තමන්ගේ කිලන් රසයේ නපුරු අදහස හා එක් කරවා ගන්නා නිසා 'හෙම්බා කුමාරයෙනි, පෙර උපන් මිනිසුන්ගේ ආයු ශක්ති ය ඇත. දන් මිනිසුන්ට එ සේ නො වෙයි. බිම්සර රජුන් මියන තෙක් රාජ්ජ ය තකා හිඳු නම් අතුරේ කුමක් වනු බව ත් නො දනෙයි. එ බැවින් තෙපි තොපගේ පියාණන් මරා රාජ්ජ ය ලැබ ගනුව මම මහණ ගොයුම්හු මරා බුද්ධරාජ්ජ ය ලැබෙමී' යටත් පිරිසෙයිනුත් සාරා සැකි කප් සුවහසක් පැරුම් පුරා ලැබ්බ යුත්තට ධ්‍යාන නැති ව බඹ ලොව පතන්නා සේ අහේතුක ව, දුහෙතුක ව ඒ ජාතියෙහි නිවන් පතන්නා සේ බුද්ධරාජ්ජ ය පතා තමන්ගේ නියෝගයෙන් බිම්සර මහ රජුන් මරා උන් රජ පැමිණි කල්හි බුදුන් මරවනු ලෙසට අජාසත් රජ්ජුරුවන්ගේ දුනුවායන් ඉල්වා ගෙන බුදුන් විදිනට උන් යවා ඒ ගියවුන් බුදුන් විද ගත නො හී තමන්ට පිළිවක් ව සිටි කෙලෙස් සතුරන් විද මරා සෝවාන් ව ප්‍රාණ වද තබා පස් පව් ම කරන්ට නො නිසි වූ කල්හි 'මාසේ වූ කෙණෙ-කුන් විනා අනික් කෙණෙකුන් මහණ ගොයුම්හුගේ මුහුණ දුටු වූ

1 තර ව මූ කරන්නාක් තව මූ කරන්නාක්

Non-Commercial Distribution

නම් අනතුරු කට නො හෙති. මම ම යත්නයක් කෙරෙමි'යි ගිජුකුළුවට නැගී ගලක් පෙරලා හෙළී ය.

ඒ ගල පිළිගන්ට පොළොව පළා ගෙන ගලක් නැඟී ඉන් ඊ පිට වැද ගෙන ගල් පපටිකාවක් ගොසින් බුදුන් පිටි පත්ලේ වැද ගෙන ලේ එක් තැන් ව ආනන්තර්‍ය කර්‍ම පසින් ලොහිතුප්පා ද ය සිද්ධ කිරීමෙන් අවීචි ගමණ නියම කොට එ ලෙසිනු ත් බුදුන් මරා ගත නො හී නැවත මෙ තෙක් දවස් රා අට කලයක් බොන නාළාගිරි නම් ඇතු රා සොළොස් කළයක් පොවා මත් කර වා විහිදු වූ ය. ඔහු ගුගුරා ගෙන එන්නහු දැක අනඳ මහ තෙරුන් වහන්සේ 'මා මරා නමුත් බුදුන් නො මරව'යි ජීවිත ය බුදුන්ට ම පුද ඉදිරි ව ගොසින් සිට තමන් වහන්සේගේ පක්ෂපාත කම් හැඟ වූ සේක. බුදුහු ඔබ පසු කොට ලා මොළොක් බස් නමැති බෙහෙදින් ඔහුගේ රා මත සන්හිඳුවා හික්මවා වදරා අඳුන් කුලක් සේ කළු වූ ඇතු සදත් කුලෙහි ඇතකු සේ සුදු කරවා නුවරින් නික්ම වෙහෙරට වැඩ දහස් ගණන් උපාසකවරුන් ඇද රැස් කළ මහ දන් වළඳා එ දවස් රැස් වූ ඇතුළු නුවර වසන අටළොස් කෙළක් මිනිසුන්ට බණ වදරා සුවාසූ දහසක් දෙනා නිවන් පුරයෙහි ලා වදාළ සේක.

''අනඳ මහ තෙරුන් වහන්සේගේ තරමක් බැලුව මැනව. නාළාගිරියා ගුගුරා පියා බුදුන් මරන්ට ආ කල්හි තමන් වහන්සේ පෙරටුව ලා සිටි සේකැ'යි වහන්දෑ උන් වහන්සේගේ කියන ගුණ අසා අනන්ත කාලයක පටන් ඇති ගුණ ම නියාව හඟවන පිණිස තමන් වහන්සේ ත් උන් වහන්සේ ත් හංස ව උපන් කලෙක සසර මළෙහි බැඳීම් නැත ත් නිකම් මළෙහි බැඳුණු තන්හි අත් හැර නො ගිය නියාව දක්වන්ට චූල්ලහංස ජාතක ය ද මහා හංස ජාතක ය ද, තමන් වහන්සේ සාලිත්‍ථිය නම් බමුණු ගම බමුණු ව උපන් කල මුන් වහන්සේ කකුළු ව ඉපද කැව්ඩිය ගේ දෙළ පසිදින්ට කවුඩාගේ නියෝගයෙන් නයකු තමන් වහන්සේගේ කෙණ්ඩ මස දෂ්ට කළ කල්හි ඇස් සාරන්ට ආ කවුඩා අල්වා ගෙන උඹ හඬන හඬ අසා ආ සර්‍පයා ත් අල්වා ගෙන නයි ලවා උපදෙසින් විෂ ය උරවා ගෙන උන් දෙන්නා ගේ ජීවිත ය නො නසා ත් තමන් වහන්සේගේ ජීවිත ය රැක දුන් නියාව හඟවන්ට සුවන් කකුළු ද ත් වදාළ සේක.

සෝවාන් රජ්ජුරුවන් මරා පී වත්, බුදුන් විදිනට දුනුවායන් මෙහෙයූව ත්, හිසට ගල් පෙරලුව ත්, වඤ්චා ලෙස කළ හෙයින්

---

1 ගිජුකුළට, ගිජුකුළු පව්වට,

Non-Commercial Distribution

දෙව්දතුන්ගේ කටයුත්ත ඉතා ප්‍රසිද්ධ නො වී ය. මූ ම කොළේ‍ර ය යි නො හැඟිණ. නාළාගිරින් මෙහෙයූ දවස් පටන් රජ්ජුරුවන් මැර වීමට ත් බුදුන් විදිනට දුනුවායන් මෙහෙයිමට ත් මුල් වූවෝ දෙව්දත්තු ම ය. බුදුන් හිසට ගල් පෙරලූවෝ ත් මූ ම ය. රජ්ජුරුවන් වහන්සේ ත් මුන් සේ වූවන් හැර ගෙන ඇවිදිනා සේ කැ'යි කුලප්පම් කොළේ‍ර ය. රජ්ජුරුවෝ ත් උන් හැම දෙනාගේ කථා අසා තමන්ගේ නිවන් දැක්මට හේතු ව නසා ලූ වා සේ ම, දන් ද කඩවා රක්ෂාව ත් නසා ලා ළහට ගමන ත් හළ වූ ය. සිඟා වන් කල බත් හුළක් පමණ ත් නුවර ඇත්තෝ නො ලා හළ වූ ය. ලාභ සත්කාර නැති ව ගොසින් රැකී ගන්නා මහක් නැති ව කොවුන් කමකින් ජිවත් වෙමි'යි සිතා බුදුන් කරා ගොසින් 'වහන්දෑ දිවි හිමියෙන් ම වල්හි ම වසන්ට ත්, කෙතෙක් ආරාධනා ඇත ත් සිඟා ගොස් මුත් නො වළඳන්ට ත්, පසුල් සිවුර විනා අන් සිවුරක් නොධරන්ට ත්, රුක් මුලකම මුත් සැතපෙන නිසා සෙනස්නකට නො වදින්ට ත්, දඩ මස් හා කුඩමස්සන් අනු භව නො කරන්ට ත් විධාන කළ මැනවැ'යි කියා, බුදුන් ඒ ගිවිස්ස මනා දෙයක් නො වන හෙයින් නො ගිවිසි කල්හි 'මම පිළිවෙත උත්කෘෂ්ට තරමෙක තබා කියමි. බුදුහු ඒ නොගිවිස්නා සේක. සසර දුක් ගන්නා කෙණකුන් රඳව. දුකින් මිදෙනු කැමැති කෙණෙකුන් මා හා කැටි ව අව මැනවැ'යි කියා ලා තුමූ සසර දුකට ම නියැලී තමන් හා එක් වූ කෙණෙක් ඇත් නම් උනු ත් සසර දුකට ම නියම කොට ලා නික්මුණාහ.

උන්ගේ බස් අසා අලුත මහණ වූ හෙයින් පිළිවෙත නො හසළ නුවණ මඳ සමහර තැනෙක් 'දෙව්දත් වහන්සේගේ කථාව යහපතැ'යි එක් ව නික්මුණු සේක. එ සේ නික්මුණු පන් සියය හැර ගෙණ තමන් කියා ගත් වස්තු පස පැ ලා නුවණ මඳ ලෝ වැස්සන් පහදවමින් සිඟා ලබන දෙයක් නැති ව ඉල්ලා කා ගෙන සමග සඞසයා වහන්සේ බිදිනට උත්සාහ කොට ඇවිදිති. බුදුන් ඒ අසා 'දෙව්දත්ති, එ සේ නො කරව. සඞස භෙද ය නම් මහා වරදෙකැ'යි වදළ ත් ඒ නො ගිවිස ඇවිදිනෝ එක් දවසක් අනඳ මහ තෙරුන් වහන්සේ සිඟා වඩනා ගමනේ දැක 'හෙම්බා ඇවැත්නි, මම මෙ වක් පටන් බුදුනු ත් හැර බික් සඟුනු ත් හැර පොහෝ පවුරුණු ආදී වූ, සඞස කම් කෙරෙමි'යි කිවූ ය. අනඳ මහ තෙරුන් වහන්සේ ද එ පවත් බුදුන්ට දැන් වූ සේක. බුදුහු 'අනේ දෙව්දතු කරණ දෙයක් ඉතා නපුරු නියා ය. එක ජාතියක් නිසා බොහෝ ජාති නස යි.

Non-Commercial Distribution

"සුකරං සාධුනා සාධු – සාධු පාපෙන දුක්කරං,
පාපං පාපෙන සුකරං – පාපමරියෙහි දුක්කරං"

යනු හෙයින් මේ කුශල ය සත් පුරුෂයන් විසින් සුව සේ කට හැකි පමණක් මුත් පාපීන් විසින් කොට ලිය හැක්කෙක් නො වෙයි. පාපීන්ට පාප ය නිරායාසයෙන් සිද්ධ ය. උත්තම යන්ට ඒ පාප ය සිද්ධ නො වෙයි. සෝවාන් වූවන් මුඛයෙහි රා වත් කළ ත් උගුරෙන් පාතට නො බස්නා සේ ම ය'යි වදාළ සේක. දෙව්දත්හු ද පොහෝ දවසෙක තමන්ගේ පක්‍ෂ ත් හැරගෙන එක සිමැ[1] එක් තෙනක හිඳ, යම් කෙණකුන්ට මා කියා ලූ වත් පස අභිප්‍රාය වූ නම් එ ලෙස පවති ත් නම් ළා පත් ගත මැනැවැ'යි පන් සියයක් විතර වහන්දෑ ශාසන ක්‍රම නොද ත් හෙයින් ළා පත් හැර ගත් කල්හි පෝය කිරීමෙන් සංඝ භෙද ය කොට ලා ඒ වහන් දෑ හැර ගෙන ගයා හෝ හිසට ගියහ. උන් ඊට ගිය නියා ව අසා කැටි ව ගිය වහන්දෑ තර ව එකෙක ඇලී නොයන තෙක් ගෙන් වා ගන්නා නිසා අග සවු දෙන ම යවා වදාළ සේක.

ඒ වේලාවට දෙව්දත්හු කෙමෙන[2] පිට මල් පුදන්නා සේ බණක් කියමින් හුන් තැනැත්තෝ ගිය අගසවු දෙ දෙනා වහන්සේ දැක සවිඥ ලීලා දක්වා 'ශාරිපුත්‍රයෙනි, පිට රෙදෙ යි[3]. මදක් සැතපී ගන්නා කැමැත්තෙමි. බණ කියව'යි අවසර දුන්හ. දුන් අවසරයෙන් දෙ දෙනා වහන්සේ වැඩ හිඳ කැණවිලුන් හැඩූ තෙන සිංහ නාද පවත්වන කලක් මෙන් ආනුභාව දක්වමින් බණ වදරණ සේක් සිරිංගි[4] වත් කළ වළඳ අමා වත් කරන්නා සේ අදහස් වෙන් කර වා නිවන් දක්වා ගෙන ඒ සඟ පන් සිය ය හැර ගෙන අහසින් නික්මුණු සේක.

නික්මුණු පසු උන්ගේ කොකාලික නම් අගසවුවාණෝ දෙව්දතුන් වැදහොත් තෙනට ගොසින් 'ඇවැත්නි, දෙව්දත්නි, නැඟී සිටුව. සැරියුත්-මුගලන් දෙන්නාගේ අදහස් නපුරු නියා ව අප කීව ත්, අප බණ කිය නො හෙන්නා සේ බණ කියන්ට උන්ට අවසර පෑ පක්‍ෂිත් හැර ගෙන ගියෝ ය. කීකරු කමක් නැත්තා නැ'යි කියා ලා උන් ගේ බුදු කම් ලෙසට ත්, තමන් ගේ අගසවු ලෙසට ත්, වැදහොත් දෙව්දතුන් බොරු ලජ්ජාවට බොරු පිළියමක් සේ ලපැත්ත මධ්‍යයට දණහිසින් පහරක් දුන්හ. පහර තර ව ගොසින් ඉතිරි ව තුබූ ගිය වාග් දෙෂයක් ඇත් නම් නහන කලක් පරිද්දෙන් කටින් හුණු ලේ නහාපූ ය. වහන් දෑ ද සැරියුත් මහ තෙරුන් වහන්සේ සඟ පිරිස් පිරිවරා අහසින්

1 සිම 2 කිමෙන 3 රිදෙයි 4 සිරිහි

Non-Commercial Distribution

වඩනා දැක බුදුන් ළඟට ගොසින් 'ස්වාමීනි, සැරියුත් මහ තෙරුන් වහන්සේ වඩනා ගමනේ දෙ නම පමණෙක් වැඩ, පෙරළා මොබ වඩනා ගමනේ සහ පිරිස් පිරිවරා වඩනා නියා ව ඉතා යහපතැ'යි කී සේක. බුදුහු ඒ අසා වදරා,—

"හොති සීලවතං අත්‍ථො – පටිසන්‍ථාර වුත්තිනං,
ලක්ඛණං පස්ස ආයන්තං – ඤාතිසඞ්ඝ පුරක්ඛතං,
අථ පස්සසි'මං කාලං – සුවිහීනං ච ඤාතිහි"

යනු හෙයින් "හෙම්බා මහණෙනි, ලක්ඛණ මිග ජාතකයෙහි මා ත් තමනු ත් මුව ව උපන් කල පවා කාළ නම් මුව ව උපන් මුන් තමන්ට පාවා දී ලූ මුවන් නැසී දෙසී එක මුවකු ත් නැති ව තමන් ආව ත් ලක්ඛණ නම් මුව ව උපන් මුන් තමන්ට පාවා දී ලූ මුවන් ගෙන් එකකු ත් නොනසා තමන් මුවන් හැර ගෙන ආ නියා ව තිරිසන් ව කළ හෙයින් යහපත. එ කල කාළ නම් මුවාණෝ දෙව්දත්හු ය. ලක්ඛණ නම් මුවාණෝ සැරියුත් මහ තෙරහු ය'යි වදාළ සේක. නැවත වහන්දෑ 'ස්වාමීනි, දෙව්දත්හු මුඹ වහන්සේ අගසවු දෙ නම ඇළයේ ලා වැඩ හිඳ බණ වදරන්නා සේ ම මුයි ත් තමන්ගේ කොකාලිකාදි අගසවු ව්‍යවහාර පමණක් ඇති ගැවියන් ඇවියන් ඇළයේ ලා ගෙන බණ කියන්නෝ වේ දැ'යි කී කල්හි—

"අපි වීරක පස්සෙසි – සකුණං මඤ්ජුභාණකං,
මයූරගීව සඞ්කායං – පතිං මය්හං සවිට්ඨකං.

උදකථල චරස්ස පක්ඛිනො – නිච්චං ආමක මච්ඡභොජිනො,
තස්සා'නුකරං සවිට්ඨකො – සෙවාලෙ පලිගුණ්ඨිතො මතො"

යනු හෙයින් 'දන් තබා මා දියෙහි ත් ගොඩෙහි ත් හැසිරෙන්නට සමර්ථ ව පක්ෂි ව උපන් කල මේ තෙමේ ත් සවිට්ඨක නම් පක්ෂි ව ඉප ද මා කළ කළ දෙය ම කෙරෙමී කියා සෙවෙලේ බැඳී මෙළේ වේ දැ'යි මේ ජාතක කථාව ත් වදාළ සේක. නැවත නො එක් ලෙසින් වධයට උත්සාහ කළ නියා ව කී කල්හි කුරුඞ්ගමිග ජාතක—පරන්තප ජාතකාදි නොයෙක් ජාතකවල ම තමන් වහන්සේ මරන්ට නො එක් ප්‍රයොග කළ නියාව ත් ඒ කළ ප්‍රයෝගයෙන් තමන් වහන්සේට වූ හානි නැති නියාව ත් වදරා නැවත ලාභ සත්කාරයෙන් පිරිහුණු නියාව ත් ගුණ විශෙෂයෙන් පිරිහුණු නියාව ත් කී කල්හි—

Non-Commercial Distribution

"අක්ඛි භින්නා පටො නට්ඨො-සඛී ගෙහෙ ච භණ්ඩනං,
උභතො පදුට්ඨෙ කම්මන්තො - උදකම්හි ථලම්හි ච"

යනු හෙයින් මුන් තමන් එක් ජාතියක දී කුඩ මස්සන් මරන්ට ගොසින් බිළී බෑ නියාව ත්, බිළී ය කණුවෙක ඇවිළ ගත් නියා හෙයින් මහ මසකු ය යි සිතා කඩ රෙද්ද ගොඩ තබා ලා දියැ කිමිද කණුවක් ඇස ඇණී ඇස් දෙක ම නට නියාව ත් ගොඩ තුබූ කඩ අත්පත් ගා නො දක්නා හෙයින් මහ යන කෙණකුන් හැර ගත් නියාව ත්, ගෙයි හුන් ඇඹේණියන් හා නැගණියන් ඩබරක් කොට තමන්ට ම දඩ හුණු නියාව ත්, යනාදීන් රජගහා නුවර දී බුදුහු දෙව්දතුන් අරහයා නො එක් ජාතක වදරා ගල තල පිට වට වැසි සේ උන්ට ඉන් ප්‍රයෝජන නැත ත් උන් තමන් ගෙන් තමන් වහන්සේට ප්‍රයෝජන නැත ත් වදළ බණින් බොහෝ දෙනාට බොහෝ ප්‍රයෝජන කොට වදරා රජගහ නුවරින් සැවැත් නුවරට වැඩ දෙව්රම වැඩ වසන සේක.

දෙව්දත්හු ද නව මසක් මුළුල්ලෙහි ලෙඩ ව හෙව මියන අවසථාවෙහි බුදුන් දක්නා කැමැති ව තමන්ගේ සවුවන්ට 'මම බුදුන් දක්නා කැමැත්තෙමි. මා දක්ව' යි කිවු ය. 'මුඹ තර ව හිඳිනා සමයේ බුදුන්ට වෛරී ව වැස පියා දූන් දකින්ට සිතා ගත්තෙහි ද? අපි නො ගෙන යම්හ' යි කී කල්හි 'මා නො නසව. මා කෙ සේ වෛර කළ ත් බුදුන් මා කෙරෙහි කෙසඟක් පමණ ත් වෛරයක් නැත.

"වධකෙ දෙවදත්තම්හි - චොරෙ අඞ්ගුලිමාලකෙ,
ධනපාලෙ රාහුලෙ චෙව - සබ්බත්‍ථ සම්මානසො"

යනු හෙයින් 'මේ සා මහත් අපරාධයක් කළ මා කෙරෙහි ත් මරා ඇඟිලි කපන්ට දිව ගෙන ආ අඟුල්මල් සොරහු කෙරෙහි ත්, එසේ ම මරන්ට දිව ගෙන ආ කාළගිරි පර්‍වතයක් සේ වූ නාළාගිරි නම් ඇතු කෙරෙහි ත්, රහල් කුමරුන් කෙරෙහි ත් ඒ බුදුහු සම අදහස් ඇති සේක. මාගේ වෛර ය නො කියා මා ගෙන ගොසින් දක්ව'යි නැවත නැවතත් කිවු ය. එ සේ කී කල්හි මළවුන් ගෙන යන්නා සේ ම ඇඳක බැඳ ගෙන නික්මුණාහු ය. උන් එන නියාව වහන්දෑ අසා බුදුන් කරා ගොසින් සවාමිනි, දෙව්දත්හු මුඹ වහන්සේ දක්නට එමින් සිටියෝ ය' යි බුදුන්ට දැන්වූ සේක. ඒ අසා බුදුහු 'දෙව්දත්හු ඒ අත් බැවින් මා දක්ක නො හෙති' වදළ සේක. එසේ වදරන්ට කරුණු කිම යත්— යම් කෙණෙක් පඤ්ච වස්තු යාචඤා කොළෝ වී නම් ඔහු ඒ ජාතියෙහි දක්ක නො හෙති. අසවල් අසවල් තැනට අවු ය යි කීව ත් 'කුමක්

Non-Commercial Distribution

කෙරේව යි ඌ මා දක්ක නො හෙති'යි වදළ සේක. සතර ගවුවක් තබා, දෙගවුවක් තබා අවු ය යි, පොකුණ බඩට අවු ය යි කීව ත් 'දෙව්රම් වෙහෙර ඇතුළට ආ නමුත් ඌ මා දක්ක නො හෙති' වදළ සේක. දෙව්දතුන් ගෙනාවෝ ත් දෙව්රම් පොකුණ බඩ දී හැඳ බා තබා ලා පොකුණට නාන්ට බට වූ ය. දෙව්දත්හු නැඟී සිට දෙ පය බිම තබා හුන්හ. තබා ලූ දෙ පත්ල ම පොළොවට වන. ක්‍රමක්‍රමයෙන් ගොප් මස දක්වා ය, දණ දක්වා ය, උකුළ දක්වා ය, තන මත්ත දක්වා ය, කර දක්වා ය යි මෙ සේ ගැලී නිකට දක්වා පොළොව ගැලුණු කලට—

"ඉමෙහි අට්ඨීහි තමග්ගපුග්ගලං
දෙවාති දෙවං නරදම්මසාරථිං,
සමන්තචක්ඛුං සතපුඤ්ඤලක්ඛණං
පාණෙහි බුද්ධං සරණං ගතො'ස්මි"

යනු හෙයින් 'සියලු ලොවට අග පුහුල් වූ, සිය පින් ලකුණු ධරන බුදුන් සරණ යෙමි'යි මියන කල කට හෙළා ලන පැතිත්තක් මෙන් එ විට වුව ත් සරණ සීලයෙහි පිහිටියහ. බුදුහු ත් මුන් මහණ කරණ සේක් 'ඉදින් මේ ගිහි ව සිටියේ වී නම් බොහෝ අකුසල් රැස් කෙරෙයි. මත්තට පිහිටක් කට නො හෙයි. මහණ වී නම් කෙ තෙක් අකුසල් රැස් කෙළේ වී නමුත් මත්තට පිහිටක් කොට ගනිති'යි මෙ තෙන සලකා මහණ කළ සේක. මහණ ව මාලු පැවිදිවූ කෙණෙකුන්ට වුව සඞ්ඝ භෙද ය සිද්ධ වන්නා මහණ කළ හෙයින් වේ ද සඞ්ඝ භෙද ය සිද්ධ වූයේ ය යි යත හොත් ගිහි වුව ත් ලොහිතුප්පාද කර්‍ම ය සිද්ධ වන හෙයින් සඞ්ඝ භෙද ය සිද්ධ නුවූවත් කිම ද? මත්තට කොට ගන්නා පිහිට නිසා මහණ කොට වදළ හෙයින් ඔහු ද ඒ පිහිට කොට ගෙන මෙ කපට ලක්‍ෂයක් වන කප පසේ බුදු වෙති. සරණ සීලයෙහි පිහිටි පමණකින් ම පසේ බුදු වතො ත් පසේ බුදු වීම අරුම නැති නියා වේ ද යත්-යට දෙයා සඞ්ඛ්‍ය කප් ලක්‍ෂයක පැරුම් පිරූ හෙයින් මේ ඊට නිවෙන පානෙක තෙල් වත් කළා සේ උපස්‍තම්භ වි ය.

දෙව්දතුන් ද පොළොව ගැල ගෙන ගොසින් අවීචියෙහි ලා පිය. නිශ්චල වූ බුදුන්ට කළ අපරාධ හෙයින් නිශ්චල ව පැසුණ මනා වේ දැ යි අවීචි නරකයෙහි උසත් සාර සියයක් ගවු හෙයින් දෙව්දත් අවධියේ මිටි වුව ත් අපරාධ උස් හෙයින් එ තරමට ම සාර සියයක් ගවු විතර උස ඇති වූහ. කන් සිළුව දක්වා උඩ යකබල ගැලී සිටී. පතුල් දෙක ගොප් අග දක්වා යට පොළොව ගැලී සිටි. මහ තල්-කඳක් සා ගිනි ගෙන දිළිසෙන ය හුළෙක් බස්නා හිරි හිත්තියෙන්

Non-Commercial Distribution

නික්ම අවුත් පිට දෙ මඩ ය පළා ගෙන බඩින් නික්ම නැඟෙන ගිරි දික් හිත්තියට වන. අනික් ඒ සා ම යහුළෙක් දකුණු දිග හිත්තියෙන් නික්ම අවුත් දකුණැ'ළ ය පළා ගෙන වමැ'ළයෙන් නික්ම උතුරු දිග හිත්තියට වන. අනික් ය හුළෙක් මත්තේ ය කබලින් නික්ම හිස් මුදුන පළා ගෙන බඩ ඔස්සේ බැස[1] යට පොළොවට බට මෙ සේ නිශ්චලව පැසෙති. වහන්දෑ ද 'දෙව්දත්තු මෙ තෙක් තැන් අවුදින් බුදුන් දැක ගත නො හී නරක ගිනි දකින්ට පොළොවට වන්හ'යි කථා ඉපදවූ සේක.

බුදුහු 'මට අපරාධ කොට පොළොවට වන්නේ දැන් මතු නො වෙයි. යටගිය දවස ත් මට අපරාධ කොට පොළොවට වනැ'යි හඟවනු නිසා ඛන්තිවාද ජාතක—චුල්ලධම්මපාල ජාතකාදී නො එක් ජාතක වදාළ සේක. දෙව්දතුන් පොළොවට වන් කල්හි බොහෝ දෙන සතුටු ව ධජ පතාක නංවා, කෙහෙල් ගස් හිඳුවා, පුන් කලස් තබ්බවා, මහා උත්සව කරවූහ. වහන්දෑ එ පවත බුදුන්ට දැන්වූ සේක. බුදුහු 'මූ මළ ගමනේ හැම දෙනා සතුටු වූයේ දැන් මතු නො වෙයි. යටගිය දවස මේ තෙමේ පිඞ්ගල නම් රජ ව චණ්ඩ පරුෂ ලෙසින් දවස් ගළවා මළේ ය. මළ පසු හැම දෙනා සතුටු ව උත්සව කළ දී වාසල රකිනා තැනැත්තෝ හඬති. හැම දෙන අවුත් 'අප මෙතෙක් දෙනා-ගෙන් තාම හඬන්ට කාරණ කිම් දැ'යි විචාළ කල්හි 'මා හඬන්නේ සෙස්සකට නො වෙයි. රජ ගෙන් පිටත් වන කල ටොකු තුනක් හා ඇතුළු රජ ගෙට එනකල ටොකු තුනක් හා දවස්පතා ටොකු සයක් කන හෙයින් මා හිසින් තර තෙනෙක් නැත.

'යම රජ්ජුරුවෝ ත් මුන් දැක දුෂ්ට හෙයින් ඔබ ත් නො විකන්නා පෙරළා ත් මුබ එවති. දවස් ගණනේ සැතපී ගිය හිස පෙරළා ත් සැතපෙන්ට නැති හෙයින් ඒ සිතා හඬමි'යි වාසල රකවල සිට තෙනැත්තවුගේ කථාව ප්‍රකාශ කොට පිඞ්ගල ජාතක ය වදාළ සේක. වහන්දෑ ද දෙව්දතුන් උපන් තැන් නො දැන 'ස්වාමීනි, දෙව්දතුන් උපන්නේ කොයි දැ'යි වදාළ සේක. බුදුහු අවීචියෙහි උපන් නියාව වදරා 'මහණෙනි, පව් කළාහු තමන් කළ පව් සිහි වූයේ මෙ ලොව ත් තැවෙති. පර ලොව අනන්ත දුකට පැමිණ කයිනු ත් තැවෙති. සිතිනු ත් තැවෙති. පව් කළ වුන්ට මෙ ලොව පර ලොව දෙක්හි ම දෙව්දතුන්ට මෙන් කිසිත් සැපයක් නැතැ'යි බණ වදාළ සේක.

---

1. බඳ ඔස්සේ බැස.

Non-Commercial Distribution

සමහර බෙහෙදක් බොන කල දුක මුත් බී පී කලට ලෙඩ නැති ව එසු වන්නා සේ මේ වදළ බණ ත් නරක දුක් හෙයින් අසන කලට දුක් වුව ත් අසා නිම වා බොහෝ දෙන නිවන් දුටහ.

සත් පුරුෂයන් විසින් හැම වේලේ ම මේ බණ සිත තබා තුන් දෙරින් සිද්ධ වන අකුසලින් දුරු ව, කුසල් පුරා, ලොවී ලොවුතුරා සැප ත් නිරායාසයෙන් සිද්ධ කට යුතු.

—— + ——

## 17. සමන්දේවි වත

තව ද අවු කැවන් සෙවණ කැමැති වන්නා සේ, සසර දුක් බන්න වුන් නිවන් කැමැති වන්නා සේ පවෙහි භය ඇත්තවුන් කුසල්හි කැමැති ව ඇලෙනු සඳහා සමන් දේවි වත මේ තැන්හි කියමු.

කෙ සේ ද? යත්:—

සැවැත් නුවර අනේපිඩු මහ සිටාණන්ගේ ගෙයි දී දවස් පතා සඟ දෙ දහසක් වළඳන සේක. එ සේ ම විසාඛාවන්ගේ ගෙයි දී ත් සඟ දෙ දහසෙක් ම වළඳන සේක. සැවැත් නුවර යම් යම් කෙණෙක් රජ්ජුරුවන් දක්වා ත් දනක් දෙත් නම් මුන් දෙන්නාගෙන් අව - සරයක් ලදින් මුත් අනික් ලෙසකින් දන් වුව ත් දී ලිය නොහෙති. ඊට කාරණ කිම් ද යත්:- පෝමන් නැත්තෙකින් නො වෙයි. 'තොප දන් දෙන තැනට අනේපිඩු මහ සිටාණෝ හෝ විසාඛාවෝ හෝ අවුද'යි විචාරා නැතැ යි කී කල්හි ලක්ෂ ගණන් වියදම් කොට දුන් දනක් වුව ත් ලුණු නො ලා දුවාපු මාළුවක් මෙන් ඒ දනක් කොට නො කියති. උන් දෙන්න වහන්දෑගේ රුචි ය, අභිප්‍රාය, ඉඳුරා දනිති. උන්ගේ විධානයෙන් ඉදි කළ දන් වහන්දෑ සුව සේ වළඳන සේක. එ සේ හෙයින් දන් දෙන කෙණෙක් උන් දෙ පක්ෂ ය කැඳවා ගෙන යෙති.

එ සේ හෙයින් තම තමන්ගේ ගෙවල දී වළඳන වහන්දෑ වළඳ වන්ට උන් දෙන්නාට අවසර මද. එ කල විසාඛාවෝ තමන් අව සර මද හෙයින් තමන් තරමේ සිට වළඳවා ලන කෙණකුන් විමසන්නෝ තමන් පුතණු කෙණකුන්ගේ දුවණ කෙණකුන් ඊට සමත් නියා ව දැන වැළඳවීමට උන් නිල කළහ. එ වක් පටන් ඒ සඟ දෙ දස උන් වළඳවති. අනේපිඩු මහ සිටාණෝ ද එ ලෙසට තමන්ගේ වැඩි මාලු දූ වූ මැලි සුභද්‍රාවන් නිල කළහ. උන් එ ලෙස දන් වළඳ වන්නෝ බණ අසා සෝවාන් ව ගෙන ආර්‍ය්‍ය මාර්ග ශ්‍රොත යට පැමිණි බව මුත් කෙලෙස් ශ්‍රොතස සියලු ලෙසින් සිඳින්ට

නුවූ හෙයින් සරණ ගියහ. ඉක් බිත්තෙන් කුඩා සුභද්‍රා නම් දූවණියන් දන් වළඳවන්ට නිල කළහ. උයි ත් දන් වළඳවන්නාහු සෝවාන් ව තුමූ නිවන් වළඳා විය පැමිණ සරණ ගියහ. ඉක් බිති සුමනා නම් වූ බාල දූවණියන් දන් වැළඳවීමට නිල කළහ. උඟ දන් වළඳවන්නෝ සෙදැහැමි ව ගෙන පස්කම් පා තුනී හෙයින් සරණ නො ගොසින් දන් වළඳවන්නෝ එක් තරා ලෙඩක් නිසා බත් කැවිලි නැති ව පියාණන් දක්නා කැමැති ව කැඳවා ය වූ ය.

සිටාණෝ ද එක් දන් දෙන තෙනක විධාන කෙරෙමින් සිටි තෙනැත්තෝ එ බස් අසමින් ගොසින් 'කුමක් ද පුත, සුමනා දෙවිනි' කිවු ය. එ සේ කියා ලූ බසට 'කුමක් ද? බාල මලණුවෙනි' කිවු ය. ඒ අසා සිටාණෝ 'කුමක් ද පුත නන් දෙඩන නියා දැ'යි විචාළෝ ය. 'කුඩා මලණුවෙනි, මා නන් දෙඩන්නේ නැතැ'යි කී ය. කියා ම මිය සත් පනස් කෙළ සැට ලක්‍ෂයක් හවුරුද්දව ආයු ඇති තුසී පුරෙහි ආයු පමණින් රෝගයක් නැති ව දිව අත් බවක් ලදින් උපන්හ. සිටාණෝ ද දෘෂ්ටි විචිකිච්ඡා නසා පූ බව මුත් ශොක නසා පියන්ට නුවූ හෙයින් බලවත් වූ ශොක ඇති ව දූවණියන් දවා පියා හඬමින් වලපමින් ශොකී ව නිශ්ශොක වූ බුදුන් කරා ගොසිස් 'හැයි' සිටාණෙනි, හඬතැ'යි විචාරා වදළ කල්හි 'මාගේ කුඩා දූ සුමනා දෙවී මළෝ ය. ඒ නිසා ය, ස්වාමීනි,' කිවු ය.

බුදු හු ඒ අසා ''උපන් සතුන්ට මරණ නියත නියාව විවරණ ලත් බෝසතුන්ට බුදු බව නියත යා සේ නො දනු ද? හඬන්ට කාරණ කිම් දැ' යි වදළ සේක. 'ස්වාමිනි, ඒ දනිමි. මාගේ ඒ නියා විළි ලජ්ජා ඇති දරුවෝ මියන වේලෙහි සිහි එළවාගත නො හී නන් දෙඩමින් මළෝය. ඒ නිසා මුසුප්පු වෙමි, ''ස්වාමීනි'' කිවු ය. 'සිටාණෙනි, උඟ කුමක් කිවු දැ'යි විචාරා 'ස්වාමිනි, තමන්ට පුතණ්ඩ යි යන්නා දෙ විටක් කොටම 'බාල මලණුවෙනි, මට කිවු ය. එ සේ කියන්නේ නම් සිහි එළවාගත නොහී වේ දැ යි ස්වාමීනි'' කිවුය. බුදුහුඒ අසා ''සිටාණෙනි, උඟනන්දෙඩන්නෝ නැත. තොප වයසින් හා නෑ කමින් කුම් වුව ත් ගුණෙන් බාල හෙයින් කිවු ය. තෙපි සෝවාන් වුව. තොපගේ මළ දූවණියෝ සෙදගැමි වූහ. තමන් මාර්ග ධර්මයකින් හා ඵල ධර්මයකින් තොපට වැඩි සිටි හෙයින් එසේ කිවු ය'යි වදරා 'දූන්, ස්වාමීනි, උඟ කොයි උපන්නු දැ'යි විචාළ සිටාණන්ට තුසී පුරයෙහි උපන් නියාව වදරා 'හෙම්බා සිටාණෙනි! කළ පින් ඇත්තෝ මේ ලොව ත් තමා කළ පින් සඳහන් කොට සතුටු වෙති. පර ලොව ත් අනන්ත වූ සම්ප

Non-Commercial Distribution

තම පැමිණ සතුටු වෙති. එ හෙයින් කුශල ය නම් මෙ ලෝ-පර ලෝ දෙක්හි ම යහපත් දෙයෙකැ'යි වදාළ සේක.

මේ දෙශනාවගේ කෙළවර බොහෝ දෙන නිවන් පුර වැද සැනහුණු ය. එ හෙයින් නුවණැත්තවුන් විසින් සියලු ලෙසින් අනර්‍ථාවහ වූ අකුසලින් දුරු ව බොහෝ අනුසස් ඇති කුසල්හි පිහිටා ලොව් ලොවුතුරා සැප ත් සිද්ධ කටයුතු.

---

# 18. මිත්‍ර දෙනමගේ වස්තුව

තව ද යම් කෙණෙක් සදහම් දැන ත් ඒ වූ පරිද්දෙන් පිළි නො පදි ත් නම් ආයුධ සරම නො දන්නවුන්ට ආයුධයෙන් ප්‍රයෝජන නැත්තා සේ ඒ දහමින් උන්ට ප්‍රයෝජන නැති නියාව ත්, පිළිපදින්නවුන්ට, නැව සිටිය වුන්ට පිහිට වන නැවක් සේ වලවත් ව පිහිට වන නියාව ත් දක්වන්නමෝ මිත්‍ර ව වසන දෙනමකගේ වස්තුව දක්වමු.

කෙ සේ ද? යත්:-

සැවැත් නුවර වසන කුල දරුවෝ දෙදෙනෙක් බුදුන් වසන දෙවුරමට ගොසින් බණ අසා සැප ත් හැර සසුන් වැද මහණ ව මාලු පැවිදි ව නිස පිළිබඳ ව වසන පස් වස ඇදුරු වූ තෙරුන් වහන්සේ ළඟ වැස වස්පස පිරෙන්නා ම නිස නො ගෙන වසන්ට නිසි ව බුදුන් කරා ගොසින් යෙදුන මනා ධුර විචාරා ධුරද්ව ය විස්තර සෙයින් අසා දෙ නමින් නමෙක් 'ස්වාමිනි, මා වැඩි මාලු කල මහණවූ හෙයින් ග්‍රන්ථ ධුර ය පුරා ගත නො හෙමි. විපස්සනා ධුර ය වදාළො ත් යහපතැ'යි රහත් වීම දක්වා කියවා ගෙන යම් සේ පියුමෙක් දියෙහි ඇති ව, දියෙහි වැඩී, එ ම දිය හා එක් ව නො වේ ද, එ මෙන් කුලෙහි ගෙණෙහි ඇල්මක් නැති ව යම් සේ ඒ පියුම දියට උස් ව සිටී ද, එ මෙන් රහත් වී මෙන් උස් වනු නිසා යම් සේ පියුම මද සුළඟිනු ත් වෙවුල වෙවුලා තිබේ ද, එ සේ ම ඇසිල්ලකු ත් කෙලෙසුන් ගේ පහළ වී මෙක් වී නම් හයින් වෙවුල වෙවුලා යම් සේ ඇස නොවන යහපත් බිජුවට තෙමෙ මනා වී නමුත් සරු කෙත වපුරන ලද්දේ වැසි දිය ලත් නම් අසු පැවත යහපත් ද, එ මෙන් බුදු සසුන් නමැති සරු කෙත, සිල් නමැති බිජුවට වපුට, භාවනා නමැති ඇල වලින් මාර්‍ග නමැති දිය පැ අර්හත් ඵල නමැති වී ලබනු නිසා වීර්‍ය්‍ය නමැති කර්‍මාන්ත කොට, යම් සේ සී සකස් කුඹුරෙහි වපුළ බිජුවට වපුළවුන් සතුටු

Non-Commercial Distribution

කරවා, උදවු කොට ම පි ද, පැසේ ද, එ මෙන් වීර්‍ය්‍ය කර්මාන්තයේ සකස් නිසා කෙලෙස් කුඩු මැටි නැඟ නො දී බුදු සසුන් කෙතින් රහත්ඵල නැමැති වී මිරිකා සිත් සතන් ගුළෙහි පුරා ගත් සේක.

බාල ව මහණ වූ අනික් නම 'මම ග්‍රන්ථ ධුරය පුරමි' උත්සාහ කොට තෙවලා බුදු වදන් ඉගෙන ඒ මුල් කොට පිළිවෙත යෙදී ප්‍රති වෙධයට නො සිතා අසන තැන් කීමෙහි රුචි ඇති ව පන්සියක් දෙනා වහන්සේට අසන තැන් කියන ඉක් අටළොස් ගණයකට ඇදුරු වූ සේක. වහන්දෑ ද බුදුන් ගෙන් කමටහන් ඉගෙන රහත් තෙරුන් වහන්සේ ළඟට ගොසින් උන් වහන්සේගෙනු ත් උප දෙස් ලදින් රහත් ව තෙරුන් වහන්සේ වැඳලා 'මහණුවම් මුළුලු නියාව දන්වන්නට බුදුන් කරා යම්හ'යි කියන සේක. රහත් තෙරුන් වහන්සේ ද 'යව ඇවැත්නි, මගේ වැඳීමෙන් බුදුන් වැඳ අසූ මහ සවුවන් වහන්සේ ත් වඳුව. ගිහි කල මිත්‍ර ව හුන් අපගේ තෙරුන් වහන්සේට ත් මා වැඳි නියාව කියව්'ය යි වදරන සේක. ඒ වහන්දෑ ද වෙහෙරට ගොසින් බුදුනු ත් අසූ මහ සවුවන් වහන් සේ ත් වැඳ ලා තෙවලා ධර තෙරුන් වහන්සේ කරා ගොසින් 'ස්වාමීනි, අපගේ ආචාර්‍ය්‍යීන් වහන්සේ මුඹ වහන්සේ වැඳ එවූ සේකැ'යි කියන සේක.

'තමන් හැමගේ ආචාර්‍ය්‍යීන් වහන්සේ නම් කවුරුන් වහන්සේ දැ'යි විචාළ තෙන දී 'මුඹ වහන්සේ ත් ඔබ ත් ගිහි කල මිත්‍ර තෙරුන් වහන්සේ ය'යි කියන සේක. රහත් තෙරුන් වහන්සේ එක්වන් ව වැඳ එවන කල්හි තෙවලාධර තෙරුන් වහන්සේ කීප දවසෙක ඉවසා හිඳ පියා පසු ව ඉවසා ගත නොහී 'අපගේ ඇදුරු තෙරුන් වහන්සේ මුඹ වහන්සේ වැඳ එවූ සේකැ'යි කී කල්හි 'තමන් හැමගේ ඇදුරු තෙරහු නම් කවුරු දැ'යි අරුචි සූවක ව විචාරා 'මුඹ වහන්සේගේ යාළු තෙරුන් වහන්සේ ය'යි කී කල්හි 'උන් සමීපයෙහි තමන් උගත්තේ කිම් ද? දික් සඟි ආදියෙන් එක් තරා සඟියෙක් හදාළ නියා ද? පිටක තුනෙන් එක් පිටකයක් හෝ ඇසූ නියා දැ'යි විචාරා සතර පදයෙන් යුක් ගාථා පමණකුත් නො දන පවුල් සිවුරු පෙර ව මහණ වූ ගමනේ ම අපිස්කමට වල් වැද කියන අසන තැනකු ත් නැති ව අත වැස්සන් බොහෝ කළ නියා ද? මුඹ අවුනම් ශක්ති බලන්ට ප්‍රශ්න විචාරමී' සිතූ සේක.

පසු ව කලක දී රහත් තෙරුන් වහන්සේ බුදුන් දක්නට වැඩි සේක් යහළු තෙරුන් වහන්සේගේ නපුරු අදහස ආවර්ජනය නො කළ හෙයින් නො දන පා සිවුරු ඒ විහාරයෙහි තබා



Non-Commercial Distribution

ගොසින් බුදුනු ත් අසූ මහ සවුවන් වහන්සේ ත් වැද යහළු තෙරුන් වහන්සේ වසන තෙනට පසු ව ආ සේක. තෙවළාධර ඒ තෙරුන් වහන්සේ ද කැරවුව මනා වත් කරවා ලා හිඳිනා අසුන් සමකොට පනවා ගෙන, ප්‍රශ්න විචාරමි යි සැරහී උන් සේක. ඒ වේලෙහි බුදුහු 'මේ තෙමේ කමා බහුශ්‍රැත පමණක් ඇති හෙයින් ප්‍රශ්න විචාරා ම පුතුන් පෙළා නමුත් එ සේ කොට නරකයෙහි උපන් නමුත් නපුරැ'යි උන් වහන්සේ කෙරෙහි කරුණාවෙන් වෙහෙර සැරි සරන්නාක් මෙන් දෙන ම වැඩහුන් තෙනට ම වැඩ කවර තෙනක වහන්දෑ හිඳිනා කල ත් බුදු හස්තක් පනවා තබන් හෙයින් එ තැන ත් පනවා තුබූ බුදු හස්නෙහි වැඩහුන් සේක.

වැඩ හිඳ තෙවළාධර තෙරුන් වහන්සේ අතින් ප්‍රධම ද්ධ්‍යාන විෂයෙහි ප්‍රශ්න විචාරා උන්වහන්සේගේ ආගමාභියොග ය ඇති හෙයින් ඒ කී කල්හි ද්විතීය ද්ධ්‍යානයෙහි පටන් සමාපත්ති මුළුල්ල ම විචාරා එයිත් කී කල්හි, ප්‍රථම මාර්ග විෂයෙහි ප්‍රශ්න විචාළ සේක. කෙසේ තෙවළා ධැරුව ත් අධිගත වූවොත් මුත් ඒ බැරි හෙයින් කිය නුහුණු සේක. මෙ ම ප්‍රශ්න ය රහත් තෙරුන් වහන්සේ අතින් විචාරා වදාළ කල්හි තමන් වහන්සේ අධිගත හෙයින් වහා ම වදාළ සේක. බුදුහු ඊට සාධු කාර දෙවා වදරා අනික් ත්‍රි විධ මාර්ග ය ත් අරහයා ආගම ධර භික්ෂූන් වහන්සේ අතින් ප්‍රශ්න විචාළ සේක. ප්‍රථම මාර්ග ය පමණකට ත් නො පැමිණි හෙයින් ඒ කියා ලිය නුහුණුසේක. රහත් තෙරුන් වහන්සේ එයි ත් තමන් වහන්සේ අධිගත හෙයින් සැකයක් ම නො තබා වදාළ සේක.

බුදුහු, ඒ සතර තැන්හි ම රහත් තෙරුන් වහන්සේට සාධු කාර දුන් සේක. ඒ සාධුකාර ශබ්ද ය අසා බූමාටු දෙවියන් පටන් කොට අකනිටා බඹ ලොව දක්වා සියලු දෙවියෝ ද, නාග සුපර්ණයෝ ද, සාධු කාර දුන්හ. ඒ සාධුකාර ශබ්දය අසා ත්‍රිපිටක ධර තෙරුන් වහන්සේගේ අතවැසි වහන්දෑ ද සද්ධි විහාරික වහන්දෑ ද බුදුන් කෙරෙහි නො සතුටු ව 'බුදුන් විසින් මේ කුමක් කළ නියා ද? කිසිවක් නො දන්නා මහලු තෙරුන් වහන්සේට සතර තෙනක දී සාධු කාර දුන් සේක. තෙවළා ධර වූ පන් සියයක් වහන්දෑට නායක වූ අපගේ ගුරුන් වහන්සේට සාධුකාර තබා යහපතැ යි යන බස් පමණකු ත් නො වදාළ සේකැ'යි බුදුන්ට නුගුණ කිවූ ය. ඉක්බිති බුදුහු කුමක් කියවූ ද, 'මහණෙනි'යි ඔවුන් විචාරා ඒ කාරණ ය දූන් වූ කල්හි 'මහණෙනි, තොප හැමගේ ආචාරී තෙරහු නම බැළ මේ පිණිස ගෙරින් රක්නා ගො පල්ලකු වැන්නෝ ය.

Non-Commercial Distribution

'මාගේ පුතණුවෝ අභිප්‍රාය වූ පරිද්දෙන් පස් ගෝරස අනුභව කරන්නා වූ ගෙරින් හිමි පුරුෂයකු වැන්නෝ ය'යි වදරා මත්තෙහි බණ වදරන බුදුහු 'හෙම්බා මහණෙනි, මේ සස්නෙහි ප්‍රමාදශීලී වූ යම් මහණෙක් ආචාරිවරයන් කරා එළඹ තෙවළා බුදු වදන් ඉගෙන අනුන්ට බොහෝ කොට උගන්වන්නේ ද තෙමේ වනාහි ඒ බණ අසා එලෙස පිළියම් කරන්නා වූ පුහුලක්හු විසින් යම් දහමකට පැමිණිය යුතු ද, එ බඳු පිළිවෙත්හි නො පවතී ද කුකුළකු පියා පහරන පමණ ඇසිල්ලකුදු අනිත්‍යාදි වශයෙන් නමස්කාර නො පවත්වා ද, එ බඳු මහණ තෙම යම් සේ ගොපල්ලෙක් බැල මේ පිණිස ගව මුළක් උදෑසන පාවා ගෙන දිවස භාග ය මුළුල්ලෙහි තණ-පැන් කවා-පොවා සවස ගෙණවුන් ගව සවාමීන්ට පාවා දී දවස වැටුප් මාත්‍රයක් ලැබේ ද කැමති පරිද්-දෙන් පඤ්ච ගව රස ය අනුභව කරන්ට නො ලැබේ ද, එ පරිද්දෙන් ම අත වැසි මහණුන් ගෙන් වත් පිළිවෙත් කරවා ගන්නා පමණකට හිමිවෙ යි. ශ්‍රාමණ්‍ය ඵල ය යි කියන ලද ලොකොත්තර ධර්මයට හිමි නො වෙ යි. හේ එ සේ මැ යි. ගව පාලයා විසින් රැක පාවා දුන් ගවයන්ගේ ගව රස ය ගව සවාමීහු අනුභව කෙරෙති. වීර්‍ය්‍ය වඩන්නා වූ පුද්ගලයෝ ද බුදුන් විසින් වදළ වූ දහම් අසා අනුශාසනා වූ පරිද්දෙන් පිළිපැද සමහර කෙණෙක් ප්‍රථම ධ්‍යානාදියට ද සමහර කෙණෙක් විවසුන් වඩා සතර මග සතර ඵලයට ද පැමිණෙත්. හෙවත් ගව සවාමීන් ගව රසයට හිමි වූ වා සේ ම ශ්‍රමණ භාවයට හිමි වෙත්.

මෙ සේ බුදුහු මේ සස්නෙහි සිල්වත් ව බහුශ්‍රැත ව අනිත්‍යාදී වශයෙන් කමටහන් මෙනෙහි නො කොට ප්‍රමාදශීලී ව වසන්නා වූ මහණුන්ගේ වශයෙන් පළමු ව බණ වදරා, දෙවෙනි ව අල්පශ්‍රැත වුව ද යෝනිසොමනස්කාරයෙන් යෙදී කමටහන් මෙනෙහි කරණ වීර්‍ය්‍යවත් පුද්ගලයන්ගේ වශයෙන් බණ වදරණ සේක් 'අප්‍රමාදී වූ යම් පුද්ගලයෙක් තෙම එක වර්ග ද්වි වර්ග වශයෙන් ඇති සවල්ප වූත් යම් කිසි ධර්මයක් සිත හෙළා අසා එහි අභිප්‍රාය ද එයින් ලැබිය යුතු ගුණ ධර්ම ය ද දැන නව ලොවුතුරා දහමට අනුරූප වූ පූර්වභාග පටිපදා ය යි කියන ලද චතුපාරිශුද්ධි ශීලය, තෙරස ධුතගුණ ය, දශ අශුභ කර්මස්ථාන ය යනාදී වූ ප්‍රභෙද ඇති ධර්ම ය සිත්හි පවත්නා හෙයින් ලොවී ලොවුතුරා දහම් අනු ව පවත්නේ වේ ද 'අද දවස් ම දැන් ම මග පල ලැබෙමි'යි ධර්ම ප්‍රතිවෙධයෙහි සිත් ලා හැසිරේ ද ඒ මහණ තෙම මේ සමාසයක් පිළිවෙතින් රාග-ද්වෙෂ-මොහාදී වූ කෙලෙසුන් පහ

කොට සම්‍යක් හේතු නයින් පිරිසිඳ දත යුත්තා වූ ධර්මයන් පිරිසිඳ දන්නේ තදඞ්ග ය විෂ්කම්භණ ය සමුච්ඡේද ය ප්‍රතිප්‍රශ්‍රබ්ධි ය නිශ්ශරණ ය විමුක්ති ය යන මොවුන්ගේ වශයෙන් අතිශයින් මිදුණු සිත් ඇත්තේ මෙ ලෝ පර ලෝ දෙක්හි ම අනාගීත වූ හෝ ආද්ධ්‍යාත්මික-බාහිර වූ හෝ පඤ්චස්කන්ධ ය ද්වාදස ආයතන ය අටළොරස ධාතු ය යන මොවුන් සතර උපදන රූපයන් හා සමග කිසිවක් නො ගන්නා වූ මහා ක්ෂීණාශ්‍රව තෙමේ මාර්ග ය යි කියන ලද ශ්‍රාමණ්‍ය ගුණයාගේ වශයෙන් ආවා වූ ඵල සමාපත්ති යට ද පසක් පමණ වූ අශෛක්ෂ ධර්මස්කන්ධයට ද හිමි වෙ යි-වදුරා රුවන් මඩුල්ලෙකින් නිමි ගෙයක් මෙන් අර්හත් ඵලයෙන් දෙශනාව කුළුගන්වා වදාළ සේක.

මෙ ධර්ම දෙශනාවගේ කෙළවර බොහෝ දෙනා සතර මඟ සතර ඵලයට පැමිණියහ. එ හෙයින් නුවණැත්තවුන් විසින් බුදුන් වදළා වූ ධර්ම ය ඉගෙන ඒ වූ පරිද්දෙන් පිළිපැද නිවන් දහම් පසක් කට යුතු.

---

## 19. උදේනි වස්තුව

තව ද සත්‍වයන්ට කුශලා'කුශල යන දෙදෙනාගේ ඉෂ්ටානිෂ්ට විපාක හඟවනු පිණිස සාමාවතීන් ඇතුළු වූ පන්සියයක් බිසෝවරුන් හා මාගන්දිය ඇතුළු වූ ඔවුන් නෑ පන් සියයක් දෙනාගේ කථා වස්තුව දක්වන්නමෝ මෙ තැන්හි පළමු කොට එහි ම ඇතුළත් වූ උදේනි වස්තුව දක්වමු.

කෙසේ ද යත්—

යට ගිය දවස අල්ලකප්ප නම් රට අල්ලකප්ප නම් රජ්ජුරුවෝ ය. වෙඨදීප නම් රට වෙඨදීප නම් රජ්ජුරුවෝ ය යන මොහු දෙදෙන බාල අවස්ථාවෙහි පටන් මිත්‍ර ව එක ගුරුන් කෙරෙහි ශිල්ප ඉගෙන තමන්ගේ පිය රජ්ජුරුවන් ඇවෑමෙන් දහසක් දහසක් යොදුන් රටට රජ වූහ. ඔහු පසු ව ත් අතර තුරෙහි ඔවුනොවුන් කරා එළඹ එක් ව හිඳ සිට, එක් ව, සැතපී සුදුසු කෙළි සිනාවෙන් දවස් යවන්නාහු ලොකයෙහි උපදනා වූ ද මිය යන්නා වූ ද මහා ජනයන් දැක සියල්ල ම අනිත්‍යය යි සල කනුවෝ මෙ ලොවින් පර ලොවට යන සත්‍වයා පස්සෙහි යන්නා වූ එක ද වස්තුවෙක් නැත. යටත් පිරිසෙයින් තමා සන්තක ය යි තබා ගන්නා වූ එක් ව උපන් ශරීර ය දක්වා සත්‍වයන් හා එක් ව පර ලොවට නො යෙයි. එ සේ හෙයින් සියල්ල ම හැර පියා යා

Non-Commercial Distribution

යුතු ය. එ සේ වූ මේ සංසාරයෙහි සිටි අප හැමට රාජ්‍ය සම්පත්තියෙන් ප්‍රයෝජන කිම් ද? ගිහි ගෙය හැර මහණ වම්හ'යි කියා මන්ත්‍රණය කොට තම තමන් සන්තක රාජ්‍යය අඹු දරු වන්ට පාවා දී තාපස ප්‍රව්‍රජ්‍යාවෙන් මහණ ව හිමාලයෙහි එක් ව වෙසෙමින් එක් දවසක් ඔවුනොවුන් හා එක් ව කථා කරන්නාහු 'අපි දෙ දෙන රාජ්‍ය සම්පත් හැර මහණ වන්නමෝ ජීවත් වන උපායක් නැති හෙයින් මහණ වූවමෝ නො වෙමු. සසරින් ගැළවී යන උපාය සොයා ම මහණ වූම්හ.

'එ සේ මහණ වූ අපි එක තෙන වසමෝ නම් දෙන්නකු එක තැන වසන කල්හි අල්ලාප-සල්ලාප කථා මාත්‍රයකුදු කරමෝ නම් අප මහණ වූ ව ත් මහණ නුවූවා සමාන ය. එ සේ හෙයින් අප වෙන වෙන ම විසුව මැන ව. තෙපි එක් පර්වතයෙක වස ව. අපි එක් පර්වතයෙක වසම්හ. පසළොස් දවසින් පසළොස් දවස පොහොයෙහි එක් වම්හ'යි මන්ත්‍රණය කොට නැවත කියන්නාහු 'එ සේ පොහොයෙන් පොහොයෙහි එක් වීම ගණසඞ්ගණිකාවට කාරණ ය. එ සේ හෙයින් දෙ දෙන ම එක් නො වම්හ. තෙපි තොපගේ පර්වතයෙහි ගිනි දල්වා ලව. මම මාගේ පර්වතයෙහි ගිනි දල්වා ලමි. ඒ සලකුණෙන් ඔවුනොවුන් දිවි ඇති බව දනුම්හ'යි නියත කොට එ පරිද්දෙන් ම ඔවුනොවුන්ට උවදුරු නැති බව හඟවා දවස් යවති.

මෙ සේ කලාතුරක් ගිය කල්හි වෙයදීප තාපසයෝ මිය මහෙසාඛ්‍ය දිව්‍ය රාජ ව උපන්හ. ඉක් බිති පසළොස්වක් පොහොය පැමිණි කල්හි පර්වතයෙහි ගිනි නොදක ඔවුන් මළ බව අල්ලකප්ප තාපසයෝ දත්හ. වෙයදීප තාපසයෝ දෙව් ලොව උපන් ඇසිල්ලෙහි ම තමන්ගේ අසාධාරණ වූ දිව්‍ය සම්පත් දක 'කවර කුශලයක් කොට දෝ හෝ මා මේ සම්පත් ලද්දේ ය'යි බලන්නාහු ගිහිගෙන් පිට ත් දවස් පටන් ගිය ජාතියේ තමන් රක්කා වූ ශීල ය දක 'මා හා එක් ව සිල් රක්කා වූ මාගේ යාළු තාපසයන් බලා පියා එමි' සිතා දිව්‍ය ශරීරය හැර මඟී වෙසක් මවා ගෙන අල්ලකප්ප තාපසයන් හුන් තෙනට ගොසින් වැඳ එකත් පස් ව සිටියහ.

ඔවුන් දක තාපසයෝ 'පින්වත, තෙපි කොයි සිට අවු ද'යි විචාළහ. ඒ අසා දිව්‍ය පුත්‍ර තෙම 'ස්වාමීනි, මම දුර සිට එන්නා වූ මඟී එකෙකිමි. ස්වාමීනි, මෙ තැන්හි නුඹ වහන්සේ හුදෙකලා ව[1] තපස් කරණ සේක් ද? අනික් කෙණෙකු ත් ඇද්ද'යි විචාරා

1. උදකලාව

Non-Commercial Distribution

'මාගේ එක් සභාය තාපස කෙණෙක් ඇතැ'යි කී කල්හි 'දූන් උන් වහන්සේ කොයි දැ'යි විචාරා 'ඒ අපි දෙ දෙන ඔවුනොවුන්ට උපද්‍ර ව නුවූ බව හඟවණු පිණිස පොහෝ දවසින් පොහෝ දවස ඔබුනොවුන්ගේ පර්වතයෙහි ගිනි දල් වම්හ. මේ පොහොයෙහි ඒ තාපසයෝ තමන්ගේ පර්වතයෙහි ගිනි නො දූල් වූ හ. එ සේ හෙයින් ඔවුහු මළහ යි සිතමි' කී කල්හි 'එ සේ ද, ස්වාමීනි'යි කියා ඉක් බිති 'ස්වාමීනි, මම අනිකෙක් ම නො වෙමි. නුඹ වහන්සේ ගේ යාළු තාපසයෝ නම් මම ම ය'යි කීහ.

'කොයි උපනු දැ'යි කී කල්හි 'මා රක්කා වූ ශීලයෙහි අනුභසින් දෙවු ලොව මහෙශාඛ්‍ය දිව්‍ය රාජ ව උපනිමි. දූන් නුඹ වහන්සේ දක්නා සඳහා ආමි. මෙ තැන්හි වසන නුඹ වහන්සේට කිසි උපද්‍රවයෙක් ඇද්දැ'යි විචාරා 'අපට අනික් උපද්‍රවයෙක් නැත. ඇතුන් විසින් උපද්‍රවයෙක් ඇතැ'යි කී කල්හි "ස්වාමීනි, ඇත්තු කුමක් කෙරෙද්දැ'යි විචාරා 'හැමදී තෙන බෙටි ලති. පයින් පැහැර පස් උඩ නගති. මම හැම දවස් ම ඇත් බෙටි දමමින් පස් තනමින් වෙහෙස ගනිමි' කී කල්හි 'කිමෙක් ද උන් නො එන්නා කැමති සේක්දැ'යි විචාරා 'එ සේ ය'යි කී කල්හි 'එ සේ වී නම් ඇතුන් නො එන සේ කෙරෙමී' සිතා තාපසයන්ට හස්තිකාන්ත වීණාවක් ද හස්තිකාන්ත මන්ත්‍රයක් ද දූන්හ. ඒ වීණාව දෙන්නාහු ද එහි තුන් තතක් සාද පෑ ලා තුන් මන්ත්‍රයක් උගන්වා ලා 'ස්වාමීනි, මේ තත ගසා මේ මන්ත්‍රය කී කල්හි ඇත්තු පෙරළී සිට බලන්ට ත් අසමර්ථ ව පලා යෙති. මේ මන්ත්‍රය කියා මෙ තත ගැසූ කල්හි පෙරළී ආපසු බල බලා යෙති. මේ තත ගසා මෙ මන්ත්‍රය කී කල්හි ඇත් මුළට නායක වූ ඇත් තෙමේ ම නැමී නැමී අවුත් පිට දෙ යි' කියා 'මෙයින් මුඹ වහන්සේට අභිප්‍රායක් කළ මැනැවැ'යි කියා ගියේ ය. එ තැන් පටන් තාපසයෝ ඇතුන් පලා යන්ට සුදුසු මන්ත්‍රය කියා උන් පලා යන්ට සුදුසු වූ තත ම ගසා ඇතුන් දුරු කොට කාය-චිත්ත සමාධි ලදින් යෙහෙන් පන්සලෙහි වෙසෙති.

එ සමයෙහි කොසඹෑ නුවර පරන්තප නම් රජ්ජුරු කෙණෙක් රාජ්‍යය කෙරෙති. ඔහු එක් දවසෙක දූරි ඇති බිසොවුන් හා සමඟ උදසන්හි අවුව තප්මින් ආකාශ තලයේ අබ්භ්‍යවකාශයේ සඳැල්ලේ උන්හ. ඉක්බිති බිසවු රජ්ජුරුවන් පොරෝනා ලක්ෂයක් වටනා පළසක් පෙරවාගෙන රජ්ජුරුවන් ඇඟිල්ලෙහි තුබූ ලක්ෂයක් වටනා මුන්ද ත් තමන් ඇඟිල්ලෙහි

Non-Commercial Distribution

ලාගෙන, රජ්ජුරුවන්ට නුදුරු ව කථා කෙරෙමින් උන්හ. එකල්හි හත්ථි ලිඞ්ග නම් පක්ෂියෙක් ආකාශයෙන් යන්නේ පළස පෙර ව ගෙන හුන්නා වූ බිසොවුන් දුක මස් කැටියෙක් දෝ හෝ යි යන සංඥවෙන් ගසා ගෙන යන පිණිස පියා විදහා ගෙන බස්නට වන. රජ්ජුරුවෝ ඔහු බස්නා හඬින් නැඟී සිට ඇතුළු රජ ගෙට වන්හ. බිසවු ගර්භිණී ව බඩ බර හෙයින් හා ස්වභාවයෙන් ම භය ඇති හෙයින් වහා නැඟී යන්ට අසමර්ථ වූහ. ඉක්බිති පක්ෂි තෙම අවුත් බිසොවුන් නිය අස්සේ හිඳුවා ගෙන අහසට පැන නැංගේ ය.

ඒ පක්ෂීහු නම් ඇතුන් පස් දෙනෙකුට බල ඇතියහ. එ හෙයින් කිසි යම් සතකු අහසින් ගෙන ගොසින් තමන් කැමැති තෙනක හිඳ මස් කති. ඒ බිසවු ද එ දවස් පක්ෂීහු විසින් ගෙන යන වේලෙහි මරණ භයින් භය පත් ව තමන් නුවණැ'ති හෙයින් සිතන්නාහු 'ඉදින් මම මෙ තැන්හි දී හැඬීම් නම් මිනිසුන් ගේ ශබ්දය තිරිසනුන්ට භය එළවන හෙයින් එළාපුව හොත් මම මාගේ දරුගැබ හා සමඟ බිම හී නැසෙමි. එ සේ හෙයින් යම් තෙනෙක්හි මා තබා ලා කන්ට පටන් ගනී ද එ තැන්හි දී මහත් කොට හඬ ගසා මොහු ලුහුබඳවා පියමි' සිතූහ. ඒ පක්ෂියා පළ මුත් හිමාලයෙහි මදක් වැඩී මණ්ඩලාකාර ව සිටි නුග රුකෙක්හි බැස හිඳ තමා ගෙන ගිය ඌරන්-මුවන් ආදී වූ යම් කිසි ගොදුරක් කන්නේ ය. එ සේ හෙයින් ඒ බිසොවුන් ද එ පරිද්දෙන් ම ගෙන ගොසින් ඒ නුග ගස වෙළෙප් අතුරෙහි තබා ලා ආ මඟ දසාව බැලී ය.

පක්ෂීන් ගොදුරු ගෙන ගොස් එක් තැනක බැස හුන් කල පෙරළී ආ මඟ දසාව බැලීම ස්වභාව ධර්මයෙක් ම ය. එ සේ හෙයින් ඔහු පෙරළී ආ මඟ බැලූ කෙණෙහි බිසවු 'මෙ විට මොහු නෙරපියමී'යි සිතා අතින් අත පැහැර මහත් කොට හඬ ගසා පක්ෂියා ලුහු බැඳ වූහ. ඉක් බිති එ දවස් ම හිරු හස්තයට යන වේ ලෙහි බිසොවුන්ට වීළි පහරන්ට පටන් ගත. සියලු දිශා භාග යෙහි ඝොර වූ ගර්ජනා කෙරෙමින් මහත් වූ මෙඝයෙක් නැඟී ය. සැප සේ වැඩී ගිය බිසවු 'නො බව මැනැව්'යි යන වචන මාත්‍රය කු ත් නො ලබන්නාහු දුකින් පීඩිත ව රාත්‍රිය මුළුල්ලෙහි නින්දක් නො ලදහ. ඒ රාත්‍රි ය පහන් ව ගිය කල්හි වැසි වලා පහ වීම ද අරුණු නැඟීම ද, දරුවන් වැදීම ද, එක විට ම වි ය. බිසවු මෙඝ ඍතුව ද, පර්වත ඍතුව ද, අරුණු ඍතුව ද, ගෙන උපන් හෙයින් පුතණුවන්ට උදේනි කුමාරයෝ ය යි නම් තැබූහ.

Non-Commercial Distribution

අල්ලකප්ප තාපසයන් වසන්නා වූ පන්සල ද ඒ නුග ගසට නුදුරු තැන්හි වි ය. ඔහු සවභාවයෙන් ම වැසි දවස් ශීත හයින් වනයට වැද්ද නො හී ඒ ගස මුලට ගොසින් පක්ෂීන් කා හෙලූ ඇට අවුළාගෙන තළා පියා රස කකාරා බොති. එ සේ හෙයින් එ දවස් ද ඇට අවුළා ගෙනෙමී යි-සිතා එ තැනට ගොසින් ගස මුල ඇට සොයන්නාහු ගස උඩ හඬන්නා වූ කුමාරයන් ගේ ශබ්ද ය අසා උඩ බලා බිසොවුන් දැක 'තෙපි කවුරු දැ'යි විචාරා 'මම මනුෂ්‍ය ස්ත්‍රියක්මි' කී කල්හි මෙ තැනට කෙ සේ අවු දැ යි විචාරා තමන් පක්ෂීහු ගෙනා පවත් කී කල්හි 'එ සේ වී නම් බැස පියව'යි කී ය. 'මාගේ ජාතියට විරෝධයක් වෙතී–හය ඇත්තෙමි. සවාමීනි'යි බිසොවුන් කී කල්හි 'තෙපි කවර ජාතියෙහි කෙණෙක් දැ'යි විචාරා 'මම ක්‍ෂත්‍රිය ජාතියෙහි ය'යි කී කල්හි 'මම ද ක්‍ෂත්‍රිය ජාති ඇත්තෙමි' කී ය.

'එ සේ වී නම් ක්‍ෂත්‍රිය මායම් කියව'යි කී කල්හි ක්‍ෂත්‍රිය මායම් කියා 'එ සේ වුවහොත් ගසට නැඟී මාගේ පුතණුවන් බා ගන්ව'යි කී කල්හි තාපසයෝ එක් දසාවකින් ගසට නැගෙන උපායක් ඉදි කොට උඩට නැඟී දරුවන් පළමු කොට ගසින් බහා, පසු ව බිසොවුන් බාගෙණ පංසලට ගෙන ගොසින් ශීල භෙදයක් නො කොට උන් කෙරෙහි ම අනුකම්පාවෙන් පණු පිළවුන් නො වන් මී හා සයංජාත හැල් ගෙනවුත් මැඩ කැඳ පිස දුන්හ. මෙ සේ ඔවුන් රක්නා කල්හි බිසවු සිතන්නාහු 'මම මා පක්ෂීහු ගෙන ආ හෙයින් මනුෂ්‍ය පථයෙහි සිට ආ මහත් නො දනිමි. නැවත මෙ තැන සිට යන මහ ත් නො දනිමි. මේ තාපසයන් හා මාගේ කිසි විශ්වාසයකු ත් නැත. ඉදින් මේ තාපසයෝ අප හැර පියා බැහැර කිසි තෙනකට ගියාහු වී නම් අපි දෙ දෙන මෙ තැන්හි ම මරණට පැමිණෙම්හ. එ සේ හෙයින් මොවුන් අප නො හරන පරිද්දෙන් ම මොහු ශීල භෙදයට පමුණුවා කාම පාශයෙන් බැඳ රඳවා ගත මැනව'යි සිතා—

"මුච්චයස්සතිං කා බන්ධන්ති – පෙක්ඛිතෙන මිහිතෙන ච,
අථො'පි දුන්නිවසෙනෙ – මඤ්ජුනා භණිතෙන ච".

යනු ස්ත්‍රීන්ගේ සවභාව ධර්මයක් හෙයින් සවභාවයෙන් ම රසවත් වූ රජ කුලෙහි උපන්නා වූ තාපසයන්ට හැඳි වස්‍ත්‍ර ශිථිල කිරීම ආදීන් මනහර ලොභ කටයුතු වූ ප්‍රදෙශ දක්වා තාපසයන් ශීල භෙදයට පමුණුවා එ තැන් පටන් දෙ දෙන ම සමඟ වාසයෙන් වෙසෙති.

Non-Commercial Distribution

ඉක් බිති එක් දවසක් තාපසයෝ නක්‍ෂත්‍ර යොගයන් බලන් නාහු කොසඹෑ නුවර රජ කරන්නා වූ පරන්තප රජ්ජුරුවන් ගේ ජන්ම නක්‍ෂත්‍රයට වූ පීඩාවක් දැක බිසොවුන්ට කියන්නාහු 'සොඳුර, කොසඹෑ නුවර රජකරන්නා වූ පරන්තප රජ්ජුරුවෝ මළහ'යි කීහ. ඒ අසා බිසවු 'ස්වාමීනි, කුමක් නිසා එ සේ කියන සේක් ද? ඒ රජ්ජුරුවන් හා වෛරයෙක් ඇද්දැ'යි කීහ. එ කල තාපසයෝ කියන්නාහු 'සොඳුර, එ සේ නො කියව. මා ඔවුන් හා වෛරයෙක් නැත. ඒ රජ්ජුරුවන්ගේ ජන්ම නක්‍ෂත්‍රයට වූ පීඩාවක් දැක ය මා කියන්නේ ය'යි කීහ. එ බස් අසා බිසවු මහා ශොක පත් ව හඬන්ට පටන් ගත්හ. තාපසයෝ 'කුමක් සිතා හඬවු දැ'යි විචාරා එ බිසවු තමන් කොසඹෑ නුවර පරන්තප රජ්ජුරුවන්ගේ බිසොවුන් බව කී කල්හි තාපසයෝ කියන්නාහු 'සොඳුර, ශොක නො කරව, උපන් සත්‍වයන්ට මරණ එකාන්ත ය'යි කීහ. ඒ අසා බිසවු 'උපන් සත්‍වයන්ට මරණ නියත බව දනිම් මැ'යි කී කල්හි 'එ සේ කල කුමක් නිසා හඬවු දැ'යි විචාරා 'මා හඬන්නේ ම පුතණුවන්ට පියාණන් සන්තක රාජ්‍යය ලබන කරම් පිනක් නැති හෙයිනැ'යි කීහ.

ඒ අසා තාපසයෝ එසේ වුව ශොක නො කරව. තොපගේ පුතණුවන් රාජ්‍ය ය ලබන්නා වූ උපායක් මම දනිමී'යි කියා රාජ කුමාරයන් කැඳවා 'හස්තිකාන්ත වීණාව ඔවුන්ට දී හස්තිකාන්ත මන්ත්‍රය උගන්වා නො එක් දහස් ගණන් ඇතුන් නුග රුක මුළට රැස් වන දවස් කුමාරයන් කැඳවා 'කුමාරයෙනි, තෙපි ඇතුන් එන්නාට පළමු කොට නුග රුකට නැගී වෙළෙප් මත්තෙහි හිඳ ඇතුන් මුළුල්ල රැස් වූ කල්හි මේ මන්ත්‍රය කියා මේ තත ගසව. සියලු ඇත්තු ම තොප දිසාව පෙරළී බැලිය නො හී පලා යන්නාහ. එ සේ ඇතුන් ගිය කල්හි තෙපි ගසින් බැස මා කරා එව'යි කීහ. කුමාරයෝ එපරිද්දෙන් ම කොට අවුත් එ පවත් තාපසයන්ට කීහ. ඉක් බිති තාපසයෝ දෙ වන දවස් කියන්නාහු 'අද තෙපි ගසට නැගී ඇතුන් ආ කල්හි මෙ මන්ත්‍රය කියා මේ තත ගසාලව. එ සේ කල්හි ඇතුන් තොප දසාව පෙරළී බල බලා දිවෙතී'යි කියා යවූහ කුමාරයෝ ද එ දවස් එ පරිද්දෙන් ම කොට අවුත් තාපසයන්ට කීහ. ඉක් බිති තාපසයෝ බිසොවුන්ට කියන්නාහු තොප ගේ පුතණුවෝ තමන් පියාණන් සන්තක රාජ්‍යය ගනිති. උන්ට හස්නක් කියා නික්මවා පියව'යි කීහ.

එ කල්හි බිසවු පුතණුවන් කැඳවා කියන්නාහු 'පුත තෙපි කොසඹෑ නුවර පරන්තප රජ්ජුරුවන්ගේ පුතණුවෝ ය. තොපට

Non-Commercial Distribution

මා දරු ඇති කල්හි මා පක්ෂීහු ගසා ගෙන ආ බව කියා ඒ දෙශ-යෙහි සෙනෙවි රදුන් ආදීන්ගේ නම් සලකුණු මෙ සේ කියව. ඉදින් නො අදහත් නම් තොපගේ පියාණන් අත ලන මේ මුන්ද හා පොරෝනා පළස හා දක්වා ලව'යි පළස හා පේරැස් මුන්ද දී සලකුණු අසුන් කීහ. කුමාරයෝ තාපසයන් කරා ගොසින් 'මෙ විට කුමක් කෙරෙම් ද'යි විචාළහ. තාපසයෝ 'අද තෙපි නුග ගසට නැඟී පාත අත්තේ හිඳ මේ මන්ත්‍රය කියා මේ තත ගසා ලව. එ සේ කල්හි සියලු ඇතුන්ට නායක වූ ඇත් රජ තෙම තොපට පිට දී අවුත් සිටිනේ ය. තෙපි ඔහු පිටට නැඟී ගොස් තොප පියාණන් සන්තක රාජ්‍ය ය ගනුව'යි කීහ. එ බස් අසා කුමාරයෝ මෑණියන් හා තාපසයන් වැඳ අවසර ගෙන පලා ගොස් නුග ගසට නැඟී පාත අත්ත මත්තේ හිඳ මන්ත්‍ර ය පිරිවහා වීණාවෙහි තුන් වන තත ගසා ලූහ. එ වේලෙහි ඇත් මූළට නායක වූ මහ ඇත් රජ නැමී නැමී අවුත් පිට දින. එ වේලෙහි ඔහු පිටට නැඟී 'මම කොසඹෑ නුවර පරන්තප රජ්ජුරුවන්ගේ පුතණුවෝ ය. මට පියාණන් සන්තක රාජ්‍ය ය ගෙන දෙව' කියා ඇතු කනට කොඳුරා කීහ.

ඒ ඇත් රජ එ බස් අසා නො එක් දහස් ගණන් ඇතුන් රැස් වන පරිද්දෙන් මහත් කොට ගර්ජනා කෙළේ ය. ඒ හස්ති-ගර්ජනාව අසා නො එක් දහස් ගණන් ඇත් සෙනඟ රැස් වූහ. ඉක්බිති වැඩි මහලු ඇතුන් හා බාල ඇතුන් දුරු වන පරිද්දෙන් ඊට සුදුසු හඬින් ගර්ජනා කෙළේ ය. ඒ හඬ අසා මහලු ඇතුන් හා ඉතා බාල ඇත්තු දුරු ව ගියහ. ඉක්බිති රාජ කුමාරයෝ ද හස්තීන් දහස් ගණන් පිරිවරා පසල් ගමකට ගොසින් 'මම පරන්තප රජ්ජුරුවන්ගේ පුතණුවෝ ය. සම්පත් කැමැති කෙණෙක් මා හා කැටි ව එත්ව'යි බොහෝ දෙනා කැඳවා ගෙන ආ ආ මනුෂ්‍ය-යන්ට සංග්‍රහ කෙරෙමින් රාජ්‍ය ය සමීපයට ගොස් නුවර වට කොට ගෙන මා හා සමග යුද්ධ ය හෝ කළ මැනව. රාජ්‍ය ය හෝ දුන මැනැවැ'යි කියා අසුන් යවූහ.

අමාත්‍යයෝ එ පවත් අසා 'අපි රාජ්‍යය ත් නො දෙම්හ. යුද්ධ ත් නො කරම්හ. අපගේ රජ්ජුරුවන් වහන්සේගේ බිසො-වුන් වහන්සේ ගර්භිණී අවස්ථාවෙහි ම පක්ෂියෙක් ගසා ගෙන ගියේ ය. එ බිසොවුන් වහන්සේ ඇති බව ත්, නැති බව ත්, නො දනුම්හ. එ පවත් නියම දූන පියන තෙක් අප දෙන රාජ්‍යයක් නැත. කරණ සටනු ත් නැතැ'යි කියා යවූහ. එ තෙපුල් අසා රාජකුමාරයෝ 'එ සේ වුව හොත් මම ඒ රජ්ජුරුවන්ගේ

Non-Commercial Distribution

පුතණුවෝ ය'යි කියා බිසොවුන් කී පරිද්දෙන් සෙනෙවිරත් ආදීන්ගේ නම් සලකුණු කියා යවා එ සේ ත් නුවර වාසීන් නො අදහන හෙයින් රජ්ජුරුවන් අත ලූ මුන්ද හා පොරෝනා පළස පැහ. අමාත්‍යයෝ පළස හා මුන්ද දැක හැඳින ගෙන සැබවැ යි ගිවිස ගෙන නුවර දොර හැර මහත් වූ රජ පෙරහරින් රාජ කුමාර යන් ඇතුළු නුවරට ගෙන වොටුණු පළඳවා රාජ්‍යයෙහි පිහිටු වූහ.

මේ උදේනී රජ්ජුරුවන්ගේ උත්පත්ති කථා ක්‍රමය යි.

---

# 20. සොෂක සිටාණන් ගේ කථාව

තව ද අජිත නම් රටෙක දුර්භික්ෂ සමයෙහි ජීවත් වන්ට අසමත්වූ කොතුහල නම් එක් මිනිසෙක් කාළිජි නම් ළ දරු පුතකු හා කාළි නම් අඹුවක හා දෙ දෙන කැඳවා ගෙන කොසඹෑ නුවරට පිටත් ව යෙමි සිතා මඟට සුදුසු උප කරණ ලා ගෙන නික්මිණ. අහිවාතක රෝගයෙන් මහා ජනයන් මියන්නා දැක හිත්ති බිඳ ගෙන නික්මිණෙ ද කියත් ම ය. ඔහු මඟ යන්නාහු මඟට ගෙන ගිය උප කරණ නිමා ගිය කල්හි සයින් පීඩිත ව දරුවන් වඩා ගෙන යන්ට නො පොහොසත් වූහ. ඉක් බිති ඒ පුරුෂයා අඹුවට කියනුයේ 'සොඳුර, අපි ජීවත්වමෝ නම් දරු කෙණකුන් තව ත් වදු ගනුම්හ. මූ මඟ හැර පියා යම්හ'යි කීහ. ඒ අසා මවු තොමෝ පියන්ගේ ළයට වඩා මවුන්ගේ ළය මොළොක් හෙයින් මේ මාගේ ජීවිත ය තිබැද්දී මා ගේ පුතණුවන් ඇර පියා නො යමි' කිව. 'එ සේ කල කළ මනා කිම් දැ'යි කී කල්හී 'තෙපි එක් විටෙක වඩා ගනුව. මම එක් විටෙක වඩා ගනිමි'යි කියා එක් විටෙක මවු පුතා ගෙන මල් දමක් සේ ළෙහි හොවා ගෙන යෙයි. එක් විටෙක පියා වඩා ගෙන යෙයි. ඔහු වඩා ගත් ඇසිල්ලෙහි ම කුමරු ගේ ශරීර ය පහළ පහළ තැන් බඩ සයට වඩා වේදනා බලවත් ව උපන්නේ ය.

එ තෙමේ වේදනාව ඉවසිය නො හී නැවත නැවත අඹුවට කියන්නේ 'සොඳුර, අපි ජීවත්වමෝ නම් පුතුන් ලබම්හ මොහු උසුලා ගෙන යමෝ නම් අපි ත් මේ දරුවෝ ත් හැම දෙන ම මියම්හ. මොහු හැර පියා යම්හ'යි කී ය. මවු ද විටින් විට වළකා වෙහෙසී පසු ව මුයෙන් නො බිණූහ. ඒ කුමාරයා ද පියා උරින් මව උරට, මව උරින් පියා උරට ගොස්. විඩාව නිදන්ට පටන් ගත. එ කල පියා ඔහු නිදන බව දැන මව ඉදිරි කොට යවා එක් ගසක් යට කොළ ඇතිරියෙක වැද හොවා ලා පලා ගියේ ය. මවු ද මඳ තැනක් ගොසින් පෙරළී බලන්නී පුතු නො දැක

Non-Commercial Distribution

'ස්වාමීනි, මා ගේ පුතණුවන් කොයි දමා අවු දැ'යි කිව. එ බසට පියා කියනුයේ 'සොඳුර, මම ඔහු වඩා ගෙන ආ නොහී එක් ගසක් යට කොළ ඇතිරියෙක වැද හොවා ලා පලා ආමි' කිව එ කල්හි මවු තොමෝ 'ස්වාමීනි, මා නො නසවා. මම මාගේ පුතණුවන් නැති ව ජීවත් නො වෙමි. මා ගේ පුතණුවන් වහා ගෙනෙව'යි කියමින් ළෙහි අත් පැහැර හඬන්ට පටන් ගත. ඇගේ අඩදෙඩ බලව ත් හෙයින් නැවත ගොස් කුමාරයා ගෙනායේ ය. එ තෙමේ මෙ සේ මෙ පමණ තැනෙක්හි පුතු හැර පියා ගිය අකුසලයෙන් භවාන්තරයෙහි සත් වරෙක දමන ලද්දේ වි ය. එ සේ හෙයින් අකුසල කර්ම ය නම් මඳ දෙයෙකැ යි නො සිතිය යුත්තේ ය.

මෙ සේ යන්නා වූ ඔහු දෙ දෙනා ගොස් එක් ගො පලු ගම කට පැමිණියහ. එ දවස් ම ගො පල්ලාගේ දෙනුන්ට කළ මනා මඟුලෙක් එළඹ සිටියේ ය. ඒ ගොපල්ලාගේ ගෙයි ද එක් පසේ බුදු කෙණකුන් වහන්සේ නිබඳයෙන් ම වළඳන සේක. එ දවස් ගොපලු පසේ බුදුන් වළඳවා මඟුල් කෙළේ ය. ඒ මඟුලෙහි බොහෝ කිරි බත් පිළියෙළ කරණ ලද්දේ ය. ගො පලු තෙම මඟීව ආවා වූ ඔවුන් දක කොයි සිට අවුදැ යි විචාරා සියලු පවත් අසා දක මොළොක් වූ සිත් ඇති ව ඔවුන් කෙරෙහි කරුණාවෙන් මහත් වූ අනුකම්පා උපද වා බොහෝ එළගිතෙල් හා කිරි බත් ගෙන දෙවී ය. අඹු තොමෝ කිරි බත් ගෙන, ස්වාමීනි, නුඹ ඇතො ත් මම ත් ඇත්තෙමි. බොහෝ කලක් සයින් උන් න ව. බඩ පුරා බත් කව'යි එළගිතෙල් ඌ දසාවට නමා ලා තොමෝ එළගිතෙල් මඳ දසාවෙන් බත් මඳක් කෑ ව. සැමි බොහෝ කොට බත් කා සත් අට දවසක් බඩ සා ව උන් හෙයින් ආහාර තෘෂ්ණා ව සිඳ පිය නොහිණ. ගොපලු තෙම ඔවුන්ට බත් දෙවා තෙමේ කිරි බත් කන්ට පටන් ගත. මඟී පුරුෂයා බල බලා හුන්නේ ගේ යට මැස්සෙහි හොත්තා වූ බැල්ලට ගො පල්ලා දෙන කිරි බත් පිඩ බලා 'දවසින් දවස මෙ බඳු බත් ලබන බැල්ල කුසල් කළ නියා ය'යි සිතී ය.

ඉක්බිති හෙ තෙම කිරි බත් දිරවා ගත නො හී එ ම දවස් රාත්‍රි භාගයෙහි මීය එම බැල්ලගේ බඩ උපන. එ කල ඔහුගේ අඹු තොමෝ සැමියා දවා එ ම ගෙයි බැළ මෙ කොට සාල් නැළියක් ලදින් ලත් සාල් නැළිය බත් පිස පසේ බුදුන් වහන්සේට දන් දී ස්වාමීනි, මේ පින් නුඹ වහන්සේගේ මළ ගැත්තහුට වේව'යි කියා පින් පෙත් දී සිතන්නී 'මා මෙහි ම විසුව මැනව, මාගේ

සවාමිදරු වූ පසේ බුදුන් වහන්සේ නිබඳ මේ ගෙට වඩනා සේක. පිළිගන්වන දෙයක් ඇත. පිළිගන්වා ලමී. නැත් නම් නිබඳ ම දක වැඳ පුද වතාවත් කොට සිත් පහදවා බොහෝ පින් පුරා ගනිමි'යි සිතා එ ම ගෙයි බැළ මේ කොට ජීවත් වෙමි සිතුහ.

ඒ බැලි ද සත් අට වැනි මස එක ම බලු කුකුරුවකු වදු පුව. ගොපලු තෙම ඒ බලු කුකුරුවාට නිබඳයෙන් එක් දෙනකගේ කිරි තබා දීන. කුකුරුවා කැවිල්ල සූව ලද හෙයින් නො බෝ කලකින් වැඩී මහත් වි ය. ඉක්බිති පසේ බුදුන් වහන්සේ වළඳන වේලෙහි ඒ බලු කුකුරුවාට නිබඳයෙන් එක් බත් පිඩක් තබා දෙන සේක. බලු කුකුරු තෙම බත් පිඩ නිසා පසේ බුදුන් වහන්සේ කෙරෙහි ස්නෙහ ඉපද වි ය. ගොපලු ද දවස් පතා දෙ වේලෙහි ම පසේ බුදුන් වහන්සේට උපසථානයට යන්නේ ද අතර මඟ චණ්ඩ මෘගයන් ඇති තෙන බිම ත් ගස ත් දණ්ඩෙන් ගසා මහත් කොට හඬ ගසා පියා චණ්ඩ මෘගයන් ලුහු බඳව යි. බලු ද උඟ හා කැටිව ම යෙ යි. එක් දවසක් ගොපලු තෙම පසේ බුදුන්ට දන්වනුයේ 'සවාමීනි, මම අවකාශයක් නැති දවසෙක මේ බල්ලා එවා ලමි. ඒ සලකුණෙන් වැඩි ය මැනැවැ'යි සැළ කොට එ තැන් පටන් තමාට අවකාශයක් නැති දවස් 'යව, පුත, මාගේ පසේ බුදුන් වහන්සේ කැඳවා ගෙන එව'යි කියා බල්ලා යව යි.

හෙ ද ඔහු කී එක බසින් යන්නේ තමාගේ සවාමි දරුවන් දණ්ඩෙන් ගස කොළ බිම පැහැර චණ්ඩ සත්‍වයන් දුරු කරණ තැන්හි දී තෙමේ ද මහත් කොට බුරා දිවි-වලස් ආදී වූ චණ්ඩ සත්‍වයන් දුරු කෙරෙමින් පසේ බුදුන් වසන තෙනට ගොස් උද-සන්හි ම සිරුරු පිළිදුග පන්සලට වැද හුන්නා වූ පසේ බුදුන් අභිමුඛයෙහි පන්සල් දොර සිට තුන් විටෙක බුරා තමා ආ බව සැළ කොට ඇතුළට වැද හෝනේ ය. පසේ බුදුන් වහන්සේ ද වළඳන වේලා සලකා නික්මුණු කල්හි බුර බුරා චණ්ඩ සත්‍වයන් දුරු කෙරෙමින් ඉදිරි ඉදිරිව යෙ යි. අතර තුරේ පසේ බුදුන් වහන්සේ ඔහු විමසන පිණිස අනික් මඟකින් යන්ට නික්මෙන සේක. එ කල ඒ බලු මඟ සරස ඉදිරියෙහි අවුරා සිට බුරමින් නැවත තමාගේ ගෙට යන මඟට ම පසේ බුදුන් වහන්සේ බා ගන්නේය. ඉක්බිති එක් දවසෙක අනික් මඟකට පිළිපන් සේක. ඒ බල්ලා ඉදිරියෙහි සරස සිට වැළකූ ව ද නො වැළක බල්ලා පයින් ඉවත් කොට නික්-මුණු සේක. බලු නොවැළක වඩනා පසේ බුදුන් වහන්සේ දක පස්-සෙහි දිව ගෙන ගොස් සිවුරු කන ඩැගෙන ඇද මඟට ගෙනායේ ය.

Non-Commercial Distribution

මෙ සේ බලු තෙමේ පසේ බුදුන් වහන්සේ කෙරෙහි බලවත් වූ ස්නෙහ උපදවා ගෙන වෙසෙ යි.

එ කල පසේ බුදුන් වහන්සේගේ සිවුරු ඉරී දුර්වල වූ හෙයින් ගොපලු තෙම සිවුරට පිළි දුන. ඒ පිළි ගෙන පසේ බුදුන් වහන්සේ වදාරණ සේක් 'හෙම්බා උපාසකය, තනි ව සිවුරු ගෙත්තම් කොට ගත නො හැක්ක. සහායක් ඇති ඵාසු තෙනකට ගොස් සිවුරු ගෙත්තම් කොට ගන්නා කැමැත්තෙමි'යි වදාළ සේක. ගොපලු තෙම "ස්වාමීනි, මෙ තැන්හි ම වැඩ හිඳ සිවුරු ගෙත්තම් කොට රඳා ගත මැනවැ'යි කියා 'මෙ තැන දී නො පිළිවන, උපාසක ය'යි වදාළ කල්හි 'එ සේ වී නම්, 'ස්වාමීනි, බැහැර කල් නො යවුව මැනැවැ'යි සිවුරු ගෙත්තම් කර රඳා ගෙන වහා වැඩිය මැනවැ'යි කී ය. බලු තෙම ඒ දෙ පක්‍ෂයේ කරණ කථා අසා සිටියේ ය. පසේ බුදුන් වහන්සේ 'සිටුව, උපාසක ය'යි ගොපල්ලා රඳවා අහසට පැන නැඟී ගන්ධමාදන පර්වත ය බලා නික්මුණු සේක.

එ පරිද්දෙන් නික්මුණු පසේ බුදුන් වහන්සේ දැක බලු තෙම තිරිසනුන් නම් මිනිසුන් සේ කටින් එකක් කිය කියා සිතින් එකක් සිතන වඬක කුටිල බුද්ධියක් නැති ව ඍජු බුද්ධි හෙයින් වඩනා පසේ බුදුන් වහන්සේ බල බලා බුර බුරා සිටියේ පසේ බුදුන් වහන්සේ තමාගේ චක්ෂුඃපථ ය ඉක්මවා ගිය කල්හි ශොකයෙන් ළය පැලී මිය තමා කළ අනික් කුශලයක් නැත ද පසේ බුදුන් වහන්සේ කෙරෙහි කළ ස්නෙහයෙන් තවුතිසා භවනයෙහි මහේශාඛ්‍ය දිව්‍ය පුත්‍ර ව ඉපැද දහස් ගණන් දෙවඟනන් පිරිවරා මහත් වූ දිව්‍යසම්පත් අනුභව කරන්ට පටන් ගත. එ සේ හෙයින් සත් පුරුෂයන් විසින් අනික් කරණ කුශලයක් නැත ද තුනුරුවන් කෙරෙහි ස්නෙහ මාත්‍රයක් උපදවා අසාධාරණ වූ අනුපම වූ දිව්‍ය සම්පත් අනුභව කරන්ට උත්සාහ කට යුත්තේ ය.

එ සේ උපන්නා වූ ඒ දිව්‍යපුත්‍රයා අනුන්ට කොඳුරා කථා කරණ කල්හි ඒ ශබ්දය දෙළොස් යොදුනකට ඇසෙයි. ස්වභාවයෙන් කථා කරණ කල්හි සියලු ම දස දහසක් යොදුන් තවුතිසා දෙවු ලොව පැතිර සිටිනේ ය. ඒ වැළි ත් අනික් කුසලයෙක් නො වෙයි බලු ව පසේ බුදුන් වහන්සේට ආරක්‍ෂාව පිණිස බිරූ බිරීමෙහි විපාක ය. එ හෙයින් ඔහුට ඝොෂක දිව්‍ය පුත්‍ර ය යි නම් තුබූහ. එ තෙම එ වෙනි මහත් වූ දිව්‍යසම්පත් අනුභව කරන්නේ නො බෝ කලකින් කාල ක්‍රියා කෙළේ ය.

Non-Commercial Distribution

දෙව් ලොවින් වනාහි දිව්‍ය පුත්‍රයෝ මියන කල ආයුඃ ක්ෂය වීමෙන් ද, කුශල ක්‍ෂය වීමෙන් ද, ආහාර ක්‍ෂය වීමෙන් ද, කොප වීමෙන් ද, යන මේ සතර කාරණයෙන් එක් තරා කාරණයකින් මියෙති. ඒ සතර කාරණයන් අතුරෙන් ආයුඃක්‍ෂයින් වන මරණ නම්–යමෙක් බොහෝ කුසල් කෙළේ වී නම් හෙ තෙමේ දෙව් ලොව ඉපැද එහි ආයු පරිද්දෙන් දිව සැප ත් වළඳා සිට මතු මත්තෙහි දිව්‍ය ලොකවල උපදනේ ය. එසේ වූවන්ට වන්නාවූ මරණ ආයුඃ ක්‍ෂයින් වන්නා වූ මරණ නම් වෙයි. යමක්හු විසින් ස්වල්ප වූ කුශලයක් කරණ ලද්දේ වී නම් ඔහු ගේ ඒ කුශලය මහත් කොටුවෙක ලන ලද්ද වූ සතර නැළියක් පමණ වී සුහක් මෙන් අතුරෙහි ම ක්‍ෂය වන්නේ ය. එ කල්හි ඒ දෙවතාවා ද කල් නො යවා අතුරෙහි ම කාල ක්‍රියා කරන්නේ ය. මෙ සේ වන්නා වූ මරණ කුශල ක්‍ෂයින් වන්නා වූ මරණ නම් වෙයි. අන් කිසි දිව්‍ය පුත්‍රයෙක් පඤ්ච කාම ගුණයන් අනුභව කරන්නේ සිහි – මුළා ව ආහාර අනුභව නොකොට මිරිකුණු ශරීර ඇති ව ක්ලාන්ත ව කාල ක්‍රියා කෙරේ ද–ඒ කාල ක්‍රියා ව ආහාර ක්‍ෂයින් වන්නා වූ කාල ක්‍රියා නම් වෙයි. අනිකුත් කිසි යම් දිව්‍ය පුත්‍රයෙක් අනික් දිව්‍ය පුත්‍රයෙකුගේ සම්පත් දැක ඒ සහනය කොට ගත නො හී 'අනේ මුගේ සැපතකැ'යි සිතින් ද්වෙෂ උපදවා කිපී කාල ක්‍රියා කෙරේ ද - එ සේ මියන්නා වූ මරණ කොපයෙන් මියන මරණ නම් වෙයි.

මේ සෝෂක දිව්‍ය පුත්‍ර වනාහි දිව්‍ය වූ පඤ්ච කාමයන් අනුභව කරන්නේ මේ ආහාර අනුභව වේලා ය යි නො දැන සිහිමුළා ව ආහාර ක්‍ෂයින් මිය කොසඹෑ නුවර වෙශ්‍යාවකගේ බඩ පිළිසිඳ ගත. ඕ තොමෝ වැදූ දවස් තමාගේ කෙල්ලක කැඳ වා 'මෙ මා වැදූයේ දුවක ද පුතකු දැ'යි විචාරා පුතකැ යි කී කල්හි 'එ සේ වී නම්, කෙල්ල, මොහු කුලු මාල්ලෙක ලා ගෙන ගොස් කසළ ගොඩක දමව' යි කියා දම්මවා පුව. වෙශ්‍යාවෝ වනාහි දූන් ලද හොත් වඩති. පුතුන් වැදූ කල වල දම්මවා පියති. දූන් ගෙන් ම උන්ගේ වංශය පවත්නේ ය. ඒ දමන ලද බාල දරුවා කවුඩු බලු ආදීහු පිරිවරා හිඳිති. එ කල බලු ව ඉපැද පසේ බුදුන් වහන්සේට රක්‍ෂා පිණිස බිරූ බිරීමෙහි අනුභසින් එ සේ සිසාරා හිඳින දහස් ගණන් කවුඩු–බල්ලෝ ඔහු ඇඟ තුඩක් ඔබා ලිය නො හෙති. එ සේ ඔහු කසළ ගොඩ හොත් ඇසිල්ලෙහි පිටතට යන්නා වූ එක් මිනිසෙක් වටකොට වසා ගෙන හුන්නා වූ කවුඩන් හා බල්ලන් දැක මේ කිමෙක්

Non-Commercial Distribution

දෝ හෝ යි සිතා පරීක්‍ෂා කරනුයේ කසළ ගොඩ වැදහොත් කුමාරයා දැක පුත්‍ර ස්නෙහ උපදවා 'දරු කෙණකුන් ලදිමි'යි වඩා ගෙන ගෙට ගියේ ය.

එ සමයෙහි කොසඹෑ නුවර සිටාණෝ රජ ගෙට යන්නාහු රජ ගෙයි සිට එන්නා වූ පුරෝහිතයා දැක 'ආචාරීනි, අද නකත් වක යෝග පරීක්‍ෂා කළා දැ' යි විචාරා 'එ සේ ය, පරීක්‍ෂා කළම්හ. අපට අනික් කාරිය කවරේ දැ'යි කී කල්හි 'මේ ජනපදයට කුමක් වේ දැ'යි විචාරා 'අනික් වන දෙයෙක් නැත. අද මේ නුවර උපන් කුමාර කෙණෙක් ඇත් නම් මහත් වූ සිටු සැපත් ලැබෙතී' කීහ. ඒ අසා සිටාණෝ තමන්ගේ ඇඹෑණියන්ට ත් ප්‍රසව ආසන්න නියා ව දැන ගෙට මිනිසුන් යවා වැදූ දෝ හෝ නො වැදූ දෝ හෝ යි විචාරා නො වැදූ බව අසා රජ ගෙට ගොස් රජ්ජුරුවන් දැක වහා ගෙට අවු ත් තමන්ගේ කාළි නම් කෙල්ල කැඳවා ඈට මසු දහසක් දීලා 'තෝ මේ මසු දහස ගෙන සියලු නුවර බලා අද උපන් දරු කෙණකුන් දිටි නම් හැර ගෙන වහා එව'යි කියා යවූහ. ඕ තොමෝ මුළු නුවර බලා ඇවිදිනී කසළ ගොඩ හොත් දරුවන් වඩා ගෙන ගිය ගෙට ගොස් 'මේ දරුවෝ කවර ද උපන්නු දැ'යි විචාරා අද ය යි කී කල්හි 'මොහු මට දුන මැනවැ'යි ඉල්ලා නො දෙන හෙයින් ''එක් කහවණුවක් ගෙන දෙව, 'දෙකක් ගෙන දෙව, 'තුනක් ගෙන දෙව' යනාදීන් මිළ වඩන්නී මසු දහසක් දී ඒ කුමාරයන් ගෙන'වුත් සිටාණන්ට පෑව.

සිටාණෝ සිතන්නාහු 'ඉදින් මාගේ ඇඹෑණියෝ දුවක වැදූ නම් උන් මෝ හට විවා පාවා දී රකිමි. පුතණු කෙණ-කුන් වැදූ නම් මොහු ඇර පියෙමි' සිතා වඩනට පටන් ගත්හ. ඉක්බිති සිටාණන්ගේ ඇඹෑණියෝ පුතකු වැදූහ. එ කල සිටාණෝ 'මොහු ඇතො ත් මා ගේ පුතණුවන්ට සිටු තනතුරු නො ලැබෙයි. දැන් ම දුරු කළ මැන වැ''යි සිතා ඒ තමන්ගේ කාළි නම් කෙල්ල කැඳවා ''හෙම්බල කෙල්ල, මොහු ගෙන ගොස් ගො පල්ලන් ගෙරින් පිට ත් කරණ වේලෙහි ගොවු-දෙහි ගෙරින් නික්මෙන දෙරකඩ සරස හොවා ලව. එ කල්හි ගෙරි මැඩ මරන්නාහ. මොහු මැරූ බව ද, නො මැරූ බව ද, නියම දැන එව' යි කියා යැවූහ. ඕ තොමෝ ද යහපතැ යි ගිවිස කුමාරයා ගෙන ගොස් ගොපල්ලා ගාල් දෙර අළ කල්හි නො පෙනී සිට ගාල් දෙරකඩ සරස කුමාරයන් හොවා ලුව.

Non-Commercial Distribution

එ දවස් පළමු හැම ගෙරින්ට පසු ව ලා යන වැඩි මහලු නායක ගොනෙක් හැම දෙනාට පළමු ව නික්ම කුමාරයන් සතර කකුල් හස්සෙහි ලා ගෙන සිටියේ ය. නො එක් සිය ගණන් ගවයෝ ඒ නායක ගොනාගේ දැළ ය පැහැර ගෙන නික්මුණාහ. ගො පලු තෙමෙ ගොනු සිටිනා දක '(මේ ගොනා පළමු හැම ගොනුන්ට පසුව පිටත් වෙයි. අද හැමට පළමුව පිටත් ව දොරකඩ අවුරා මද්ධායෙහි සිට ගත. මීට කාරණ කිම් දෝ හෝයි පරීක්‍ෂා කරණුයේ ළඟට ගොස් ඔහුගේ කකුල් සතර අතුරෙහි හොත්තා වූ කුමාරයන් දක දරු ස්නෙහ උපදවා 'මහ පිනැති දරු කෙණෙකුන් ලදිමි' වඩා ගෙන තමාගේ ගෙට ගෙන ගියේ ය. ඉක් බිති සිටාණන්ගේ කාළි නම් දසී ගොස් සිටාණන්ට එ පවත් කිව.

සිටාණෝ ඒ 'සවරූප ය අසා නැවත මසු දහසක් යවා එ ම කෙල්ල ලවා ඔහු ගෙන්වා ගෙන නැවත ත් එ ම කෙල්ලට කියන්නාහු 'හෙම්බා මැණියෙනි, මේ නුවර ගැල් පන් සියයක් ගෙන අද අළුයම් වේලෙහි පිටත් ව වෙළෙන්දෝ වෙළඳාමට යෙති. තෙපි මේ කුමාරයා ගෙන ගොස් ගැල් ගෙනැ යන මහ සරස හොවා ලව. මොහු ගොන් හෝ මැඩ මරති, ගැල් සකින් හෝ මිරිකී මියන්නේ ය. මූ ගේ එ පවත් දැන එව'යි කියා යවූහ. ඒ කෙළි ද 'යහපතැ'යි කියා ඔහු ගෙන ගොස් ඒ පන් සිය යක් ගැල් යන මං මධ්‍යයෙහි කුමාරයන් හොවා ලූව. හැම දෙනාට වැඩි මාලු ගැල් නායකයා පළමු ව නික්මිණ. ඉක් බිති ඔහු ගේ ගැල්හි යෙදූ ගොන් හැම දෙන ඒ කුමාරයන් හොත් තෙනට අවුත් විය කරින් හෙළා පියා වක්‍ර කම් කරන්නාහු නැවත නැවත ගැල්හි යොදු මෙහෙයුව ද එක පියවරකු ත් ඉදිරියට නො යන්නාහු ම ය. මෙ සේ ඔවුන් ගොන් විය යොදමින් සිටියදී ම අරුණු නැංගේ ය.

ඉක් බිති ගැල් දෙටුවා 'පෙර සුශික්‍ෂිත ගොනුන් අද මේ සම භූමියෙහි නො යා හී, වක්‍ර කරන්නේ කුමක් පිණිස දෝ හෝ'යි පරීක්‍ෂා කරණුයේ මහ සරස හොත්තා වූ දරුවන් දක ඉතා ආශ්චර්‍ය්‍යයෙකැ'යි සිතා 'මහාභාග්‍ය ඇති දරු කෙණෙකුන් ලදිමි' සතුටු ව තමාගේ ගෙට වඩා ගෙන ගියේ ය. ඒ කාළි නම් කෙළි තොමෝ ගොස් සිටාණන්ට එ පවත් කිව. සිටාණෝ නැවත එ ම කෙල්ලට මසු දහසක් දී යවා කුමාරයන් ගෙන්වා ගෙන ඇ අත ම කියා යවන්නාහු දැන් මොහු ගෙන අමු සොහොන කට ගොස් ගස් කොළ අතුරෙහි හොවා පියව. එ තැන්හි

Non-Commercial Distribution

මොහු කවුඩු බලු ආදීහු කා මරන්නාහ. යක්‍ෂයෝ හෝ ගසා මරන්නාහ. මොහු එ තැන්හි මළ බව ද නො මළ බව ද නියම දන එව'යි කියා යවූහ. ඒ කෙළි ද ඔහු ගෙන ගොස් අමු සොහොනට දමා පියා එකත් පස් ව සැඟ වී සිටියා ය. එ සේ හොත්තා වූ ඒ කුමාරයා ළඟට බල්ලෙක් හෝ කවුඩෙක් හෝ යක්‍ෂයෙක් හෝ ආසන්න විය නුහුණුයේ ය. ඒ තැන්හි ඔහු රක්නා මවු පිය කෙණෙක් වත් බෑ බුන් ආදි වූ කිසි බන්ධු කෙණෙක් වත් නැත්තාහු ම ය.

එ සේ කල ඔහු එ තැන්හි කවුරු රක්‍ෂා කළාහු ද යත්-පළමු බලු ව උපන් ජාතියෙහි පසේ බුදුන් වහන්සේ කෙරෙහි ස්නෙහයෙන් ආරක්‍ෂා පිණිස බිරූ බිරීම පමණෙක් ම ඕ හට රකවල් ගෙන සිටියේ ය. ඉක් බිති එක් එළු ගො පල්ලෙක් නො එක් දහස් ගණන් එළුවන් තණ බිමට ගෙන ඒ සොහොන ළඟින් නික්මිණ. එ කල්හි එක් එළු දෙනෙක් යන මඟින් ඇළ ව කොළ පත් නෙළා කකා යන්නී ගස් අතුරෙහි හොත්තා වූ කුමාරයන් දක ඔවුන්ගේ කර්ම බලයෙන් උපන්නා වූ ස්නෙහයෙන් නැමි නැමී ගොස් දෙ දණ බිම ඇණ ගෙන සිට කුමාරයන් කිරි පොවන්නට පටන් ගත්තී ය. නික්මවන්ට සිතා එළු ගො පල්ලා කොතෙක් උත්සාහ කළ ත් නොයන්නී ය. ඉක් බිති එළු ගො පලු කැවිටින් ඇණ බැණ ගෙන යෙමි සිතා එ තැනට ගොස් ගස් අතුරෙහි හොත්තා වූ කුමාරයන් කිරි පොවන්නි ය දක ඒ කුමාරයන් කෙරෙහි දරු ස්නෙහ උපදවා මහත් වූ දෛව ඇති පුතණු කෙණෙකුන් ලදිමි යි වඩා ගෙන ගෙට ගියේ ය.

ඉක්බිති සිටාණෝ එ පවත් අසා නැවත මසු දහසක් දී ඔහු ගෙන්වා ගෙන 'මෙ තෙම එ සේ මෙ සේ මරා ගත හැකි එකෙක් නො වෙයි. මොහු ගෙන ගොස් සොරුන් හෙළන පර්වත මුදුනෙන් හෙළා පියව. එ සේ කල්හි මේ පර්වතයෙහි ගැසී කඩ කඩ ව බිම හී යෙයි. මොහු මළ බව ද නො මළ බව ද නියම දන වහා අවුත් මට කියව'යි කියා එ ම කාළි නම් කෙල්ල අත යවූහ. ඕ තොමෝ ද යහපතැ යි. කුමාරයන් ගෙන ගොස් ඒ පර්වත මුදුනෝ සිට දමුව. ඒ පර්වත ය අස මහත් හුණ පඳුරෙක් පර්වතය හා එක් ව වැඩී සිටියේ ය. ඒ හුණ පඳුර මුදුනෙහි ඉතා ඝනව ඔළිඳ වැල් කැළයක් හුණ පඳුර මුදුනෙන් නො පෙනෙන්නා සේ වසා සිට ගත. පර්වත මුදුනෙන් හෙන්නා වූ කුමාරයෝ මහත් කොඳු පළසක් පිට හුණුවා සේ ඒ ඔළිඳ කැළ ය මත්තෙහි හුන්හ. එ දවස් එක් නළකාරයෙක් පුතකු හා එක් ව

Non-Commercial Distribution

හුණ දඬු කපන්ට ගියේ ඒ හුණ පඳුර කපන්ට පටන් ගත. එ කල්හි ඒ හුණ ගස් සැලෙන්ට වන් කල්හි කුමාරයෝ හඬන්ට පටන් ගත. එ කල ඒ නළකාර තෙම බාල දරු කෙණෙකුන්ගේ ශබ්දයෙකැ යි කිම් දෝ හෝ යි විමසනු පිණිස එක් දසාවකින් හුණ පඳුර මුදුනට නැගී කුමාරයන් දක දරු කෙණෙකුන් ලදිමී සතුටු ව වඩා ගෙන තමාගේ ගෙට ගියේ ය.

සිටාණෝ ද, එ පවත් අසා මසු දහසක් දී කුමාරයන් ගෙන් වූහ. මෙ සේ සිටාණන් මෙ තෙක් උපාය කරණ කල්හි ත් කුමාරයෝ වැඩුණහ. එ කල ඔවුන්ට සොෂක කුමාරයෝ ය යි නම් තුබූහ. කුමාරයෝ සිටාණන්ට ඇස ගසා ලූ කටුවක් සේ වැටහුණහ. ඇස දල්වා ඉඳුරා බලාපිය ත් නොහෙති. තව ද කුමාරයන් මරන්ට උපාය ත් සිතන්නාහු තමන්ගේ ගෙට වළන් ලන කුඹලා කරා ගොස් කවර දවස් වලන් පුළුස්සවු දැ යි විචාරා සෙට ය යි කී කල්හි 'එසේ වී නම් මේ මසු දහස ගෙන අපට එක් කට යුත්තක් කරව'යි කීහ. කවර කටයුත්තෙක් ද, ස්වාමීනි, කී කල්හි මාගේ එක් අවලක්ෂණ පුතෙක් ඇත. ඔහු තා කරා එවා ලූ කල ගබඩාවෙහි ලා ගෙන පොරොවින් කඩ කඩ කොට කපා පියා සැළියක ලා වළන් පළහන සූලයෙහි ලා පිය ව. මේ දහස තොපට නිකම් දෙන අත්ලස් පඬුරු ය. මේ කටයුත්ත සිද්ධ කොට ලූ කල්හි කරන්නා වූ උපකාර ය මම දන්නෙම් වේ දැ'යි කීහ. කුඹ ලා ද 'යහපත, ස්වාමීනි, මෙයි ත් මහා කට යුත්තකැයි සිතන සේක් ද? වහා එවා ලුව මැනවැ'යි ගිවිස්සේ ය.

ඉක්බිති සිටාණෝ දෙවන දවස් සොෂක කුමාරයන් කැඳවා 'හෙම්බා, මම ඊයේ කුඹලාට කට යුත්තක් කීමි. තෙපි ගොසින් ඊයේ කී කට යුත්ත නිහඬ ව කරන්ට කුඹලාට කියව'යි කියා යවූහ. එ කල කුඹල් හලට යන්නා වූ සොෂක කුමාරයන් දක බාල දරුවන් හා කෙළි මඬලෙහි ගුළ කෙළි කෙළිමින් සිටියා වූ සිටාණන්ගේ වැදූ පුතණුවෝ 'කොයි යවු දැ'යි විචාරා 'පියාණන් වහන්සේගේ මෙහෙවරෙක කුඹල් හලට යෙමී' කී කල්හි මේ කොල්ලෝ මා කෙළි මඬලෙහි බොහෝ කොට පරදවා පීහ. මුඹ ඔවුන් හා එක් ව කෙළ මා දිනවා දී ලන්නෙහි නම් මම කුඹල් ගෙටගොස් මුඹ යන කටයුත්ත පිරිමස්වා ගෙන එමි' කීහ. එ බසට සොෂකයෝ 'මම පියාණන් වහන්සේට බාමි කී කල්හි සිටාණන් ගේ වැදූ පුතණුවෝ කියන්නාහු ''නො බව මැනව බෑණන් වහන්ස, මමමුඹ කියන අස්න ගොස් කියමි. මා එන තෙක්

Non-Commercial Distribution

මොවුන් හා එක් ව කෙළ මාගේ පැරදුම ගෙවාලු ව මැනවැ' යි කීහ. ඒ සොෂක කුමාරයෝ 'එසේ වී නම් ගොසින් කුඹලාට අපගේ පියාණන් වහන්සේ ඊයේ දවස් නුඹට එක් කටයුත්තක් කීම් කී සේක. ඒ වහා පිරිමස්වා ලුව මැනවැ යි කියා කියන කටයුත්ත තීරණ ය කරවා ගෙන එව'යි ඔහු යවූහ. ඒ කුමාරයෝ ද කුඹලා ළහට ගොසින් එ පරිද්දෙන් ම කීහ.

ඉක්බිති කුඹලා සිටාණන් කී ලෙස කුමාරයන් මරා පියා වළන් පලහන සුලයෙහි ලා පී ය. සොෂක කුමාරයෝ දිවස භාග ය මුළුල්ලෙහි කෙළ පියා සවස ගෙට ගොසින් සිටා- ණන් විසින් 'හැයි පුත, කුඹල් ගෙට නො ගියෙහිද'යි කී කල්හි තමන් යන ගමන් වළකා මළණුවන් ගිය පවත් කීහ. එ තෙපුල අසා අනේ මට වූ හානියෙකැ'යි මහ හඬින් හඬා සියලු ශරීර- යෙහි ලේ හුණු වූවාක් මෙන් ශොකයෙන් දහ ගත් ශරීර ඇති ව 'හෙම්බල කොල, කුම්භකාර ය. මා නො නසව'යි කියා දෙ අත මුදුනෙහි තබා ගෙන හඬ හඬා කුඹල්ගේ කරා නික්මුණාහ. එ කල්හි කුම්භකාර තෙම එ පරිද්දෙන් හඬා ගෙන දිවන්නා වූ සිටාණන් දැක 'සවාමීනි, මහත් කොට නො හැඬුව මැනව. නුඹ වහන්සේ කියා ලූ කටයුත්ත ඉදුරා ම තනා ලීමි, කීය. එ කල සිටාණෝ තමන් ම කියා ලූ කට යුත්ත හෙයින් අනික් බසක් කිය නොහී මහත් පර්වතයෙක්හි ගැහැටී තැලුනක්හු සේ ශොකයෙන් දැදුරු වූ සිත් ඇති ව අපමණ වූ දෙම්නස් ව දූකට පැමිණියාහ.

තමා කෙරෙහි කිසි වෛර ද්වෙෂයක් නැත්තා වූ සත්ව- යන්ට ද්වෙෂ කරන්නවුන්ට වන විපත්ති ය වළකා ගත නො හෙන බව මේ කථාවස්තුවෙන් අසා දත් සත් පුරුෂයන් විසින් ද්වෙෂ නම් දෙයෙක් නො කට යුත්තේ ය.

මෙ සේ නො එක් ලෙසින් කුමාරයන්ගේ භාග්‍ය ය නිශ්චය වුව ද සිටාණෝ කුමාරයන්ගේ මුහුණ ඉදුරා ඇස දල්වා බලාපිය නොහී කවර උපායකින් මොහු මරා පියම්දෝ හෝ'යි සිතන්නාහු 'මා ගේ ගම් සියයක මුදළි ව සිටි ගම් මුදළියා ළහට කියා යවා මරවමි' සිතා පතක් ලියන්නාහු මේ මා ගේ අවලක්ෂණ කාල- කණ්ණි පුතෙක. මොහු මරා සොරා වළෙක ලා පියව. එ සේ ඒ කටයුත්ත පිරිමස්වා ලූ කලට කළමනා සත්කාර මම ම දන් නෙම් වේ දැ'යි පත් ලියා සොෂක කුමාරයන් කැඳවා 'පුත මේ

Non-Commercial Distribution

පත ගෙන ගොසින් අපගේ ගම් සියයකට නායක ගම් මුදලියාට දීලව යි කියා ඒ පත කුරුඟුලාකන බැඳ ලූහ. ඒ සොෂක කුමාරයෝ වනාහි අකුරු නොදන්නාහ. හේ එ සේ මැ යි. ඒ කුමාරයන් බාල අවස්ථාවෙහි පටන් මරන්ට උත්සාහ කොට ත් මරා ගත නො හී ශොක ගන්නා සිටාණෝ කෙසේ අකුරු කරවද්ද. එ සේ හෙයින් ඒ කුමාරයෝ තමන් මරන්ට තුමූ ම පත ඇරගෙන කුරුඟුලා පටෙහි බැඳ ගෙන නික්මෙන්නාහු පියාණන් වහන්ස, මට මහට බත් නැද්දැ'යි කීහ.

එ විට සිටාණෝ සැබෑ ස්නේහයකින් කියන බසක් සේ කියන්නාහු 'හැයි පුතණ්ඩ, නුඹට මගට බතුත් වුවමනා ද, අතර මහ අසවල් ගම අපගේ යාළු සිටාණ කෙණෙක් ඇත. ඔවුන් ගේ ගෙට වැදගෙන බත් කා ගෙන යව'යි කීහ. ඒ සොෂක කුමාරයෝ ද 'යහපතැ'යි ගිවිස පියාණන් වැඳ නික්ම අතරමග සිටාණන්ගේ ගමට පැමිණ එවුන්ගේ ගෙය විචාරා ගෙන ගොස් සිටාණන්ගේ ඇඹෑණියන් දැක 'කොයි සිට අවුදැ'යි විචාළ කල්හි 'ඇතුළු නුවර සිට ය'යි කියා 'තෙපි කිනම් කෙණෙකුන්ගේ දරු කෙණෙක් දැ යි විචාළ කල්හි 'මේ ගෙයි සිටාණන් වහන්සේගේ යහළු සිටාණන් ගේ පුත්‍රයෙමි'යි කියා 'සොෂක කුමාරයෝ නම් තෙපි දැ'යි විචාළ කල්හි 'එ සේ ය, මැණියනි කීහ. ඔවුන් දුටු ඇසිල්-ලෙහි ම සිටාණන්ගේ ඇඹෑණියන්ට පුත්‍ර ස්නේහ උපන. ඒ සිටාණන්ගේ ඉතා ප්‍රසාදවහ වූ විශිෂ්ට රූ ඇති සොළොස් හැවිරිදි එක ම දියණි කෙණෙක් ඇතියහ. ඒ කුමාරිකාවන්ට අත් – පා මෙහෙවර හා ආවර මෙහෙවර කරණ සේ එක ම දසියක් දී සත් මහල් පායක මතුමහල් තලයෙහි සිරි යහන් ගබඩාවෙක ලා රක්‍ෂා කෙරෙති.

ඒ සිටු දියණියන් එ කෙණෙහි තමන්ගේ එම කෙල්ල කැඳවා කිසි කටයුත්තක් පිණිස 'ව්‍යාපාරයන් වසන වීථියට යව'යි කියා යවන්නා වූ ඈ දැක සිටාණන්ගේ ඇඹෑණියෝ ඒ කෙල්ල ලඟට කැඳවා 'කොයට යෙහි දැ'යි විචාරා 'නුඹ වහන්සේගෙ දියණියන් වහන්සේ කී මෙහෙවරෙක යෙමි'යි කී කල්හි ඒ තිගේ මෙහෙවර තබා ලා මෙහෙවර ඒ මාගේ පුතණුවන්ගේ පතුල් සෝධවා යහනක් අතුට එහි සතප්වා පය තෙල් ගා පසු ව තී යන මෙහෙ-වරට යව'යි කීහ. ඒ කෙලී ද සිටු ඇඹෑණියන් කී මෙහෙවර කොට කල් යවා සිටු දියණියන් සමීපයට ගියා ය. එ කල සිටු දුවණියෝ කෙල්ල කල් යවා ආ හෙයින් 'මෙතෙක් වේලා කුමක් කොට ඇවිද්දෙහි දැ'යි හයගන්වා දෙඩූහ. එ කල්හි ඕ තොමෝ

Non-Commercial Distribution

'ස්වාමීනි, මට නො දැඩුව මැනව. සොෂක නම් සිටු පුත්‍රයාණ කෙණෙක් අවු ය. ඔවුන්ට මුඹ වහන්සේගේ මැණියන් වහන්සේ කී මෙහෙවර කොට කල් යවා වීථියට ගොසින් දූන් මේ එන නියා වේ දැ'යි කිව.

සොෂක කුමාරයෝ ය යන නම අසමින් ම සිටු දියණියන්ට මහත් වූ ස්නේහ උපන. එ සේ උපන්නා වූ ප්‍රේම ය-ඡවි-මස්-නහර-ඇට මිදුලු ආදී වූ සකල ශරීරයෙහි පැතිර සිටිගත. ඔහු වනාහි අනිකෙක් නො වෙති. ඒ සොෂක කුමාරයන් බලු ව උපන් ජාතියට පළමු කොතුහල නම් පුරුෂ ව උපන් ජාතියෙහි ඇඹෙණියෝ ම ය. පසු ව බැළ මෙහෙ කොට ලද සාල් නැළියක බත් පිස පසේ බුදුන්ට පිළිගන්වා එහි අනුසසින් අවුත් එ කල්හි ඒ සිටු කුලයෙහි උපන් හ යි දත යුතු. මෙ සේ ඒ පූර්ව ස්නෙහය භවාන්තරයෙහි දු හේතු වශයෙන් අවුත් සිටු කුමාරිකාවන්ගේ සිරුර පුරා සිටගත. හේ එ සේ ම ය. දියෙහි අටගන්නා උත්පල-කුමුද දී වූ පුෂ්ප ජාතිහු මඩ හා දිය හේතු කොට ගෙන යම් සේ උපදිද් ද, එපරිද්දෙන්ම සත්‍වයන්ට ඔවුනොවුන් කෙරෙහි උපන්නා වූ ප්‍රේමය ද පූර්ව සන්නි වාසයක් හෝ මේ ජාතියෙහි කරණ ලද උපකාරයක් හෝ හෙතු කොට ගෙන උපදනේ ය යි දතයුතු, එයින් වදළහ බුදුහු—

**පුබ්බෙව සන්නිවාසෙන - පච්චුප්පන්නහිතෙන වා,**

**එවං තං ජායතෙ පෙමං - උප්පලං 'ව යථොදකෙ'යි**

ඉක්බිති සිටු දියණියෝ 'මැණියෙනි. උඹ දූන් කොයි දැ'යි විචාරා' යහන මත්තෙහි වැද හෙව නිදති 'කී කල්හි' උන් අත යමක් ඇද්දැ'යි විචාරා කුරුගුලාකන බැඳලූ පත විනා අනික් දෙයක් නැතැ යි කී කල්හි ඒ කුමන පතෙක් දෝ හෝ යි සිතා දෙමවුපියන් ගෙන් ප්‍රමාදයක් බලා නො පැනෙන සේ සෙමින් මතු මහලින් බැස කුමාරයන් හොත් තැනට අවුත් ඔවුන් නිදියදීම පත උනා ඇරගෙන තමන් වසන ගබඩාවට වැද දෙර වසා ගෙන කවුළු දෙර හැර තමන් අකුරු දන්නා හෙයින් පත කියවා අසුන් දැක 'අනේ මේ ඉතා නුවණ මද කුඩා සුහෙක. තමා මරන්ට පත තෙමේ ම ඇරගෙන ආ ය. ඉදින් මම නුදුටිම් නම් මොහුගේ ජීවිතය නැතිවන් වි ය'යි කම්පාව ඒ පත ඉරා දමා එ ම සිටාණන් එවූ පතක් මෙන් අනික් පතෙක ලියන්නාහු 'අපගේ ගම් සියයෙහි නියුක්ත ගම් මුදළින්ට ය. මාගේ පුත් වූ සොෂක කුමාරයන් ඔබ එවා ලිමි. තෙල තොප අසර සිටි ගම් සියයෙන් පඩුරු ඇරගෙන

Non-Commercial Distribution

ජනපද වාසී වූ අප ගේ යහළු සිටාණන්ගේ දියණියන් ඔවුන්ට විවා මඟුල්කොට පාවා දී ගම් මැද දෙ මාල් පායක් කරවා වාසල් පවුරු පදනමින් හා මිනිසුන් ගෙන් ඉදුරා රකවල් ලවා ගෙ වදනා මඟුල් කොට එ ම තමන් කැරවූ සියල්ල ම මේ මේ දෑ කරවිමියි අපට කියා එවා ලූ කල අපි ත් ඊට තරම් ප්‍රසාද දෙන්නමෝ වේ දෑ'යි ලියා හකුළුවා කුරුඟුලා කනෙහි බැන්දහ.

කුමාරයෝ නිදා පිබිද නැඟී සිට බත් කා සැතපී නික්ම දෙ වන දවස් උදසන්හි ම එ ම ගමට ගොස් ගම් මුදළින් දුටහ. ඒ ගම් මුදළියා ද සොෂක කුමාරයන් දැක 'යහළුව, කුමක් නිසා අවු දෑ'යි විචාරා 'ම පියාණන් වහන්සේ මුඹට පතක් එවූ සේකැ'යි කී කල්හි 'ගෙනෙව, යහළු, කුමන පතෙක්දෑ'යි පත ගෙන කියවා සතුටු ව 'හෙම්බල කොල, මා ගේ සිටාණන් වහන්සේ මා කෙරෙහි ඇති ස්නෙහයක් බලව. තමන්වහන්සේ ගේ වැඩි මහලු ව සිටි පුතණුවන් වහන්සේට මඟුල් කරන්ට කියා මට පතක් එවූ සේක. වහා දරු සම්භාරයන් රැස් කරව'යි ගම් සියයෙහි ගොවින්ට කියා දෑව-ගෝණැස් ආදිවූ දරු සම්භාරයන් නො බෝ දවසකින් රැස් කරවා ගම් මැද මැල් මහත් පායක් කරවා ගම් සියයෙන් නො එක් පඩුරු ගෙන්වා ගෙන දනවු වැසි සිටාණන්ගේ දියණියන් මහත් වූ මඟුලින් ගෙන්වා ගෙන සොෂක කුමාරයන්ට සරණ පාවා දී ඒ තමන් කැරවූ සියල්ල ම සිටාණන්ට කියා යවූහ.

සිටාණෝ එ පවත් අසා 'අනේ මා කළ දෙයෙක ම සිද්ධ නොවෙයි. මේ කුමන නස්පතෙක් දෑ'යි මහත් වූ දොම්නසට පැමිණියහ. එ කල පළමු ඇති වූ දරු ශොක ය හා මේ ශොක ය දෙක එක් ව කුස ඇතුළෙහි මහත් වූ ඩාහ ඉපැද සිටාණන්ට අතීසාර ඇති වි ය. සොෂක කුමාරයන්ගේ ඇමඹිණියෝ ද 'සිටාණන් ගෙන් ගෙනා හස්නක් මට කියා මිස සොෂක කුමාරයන්ට නො කියව' යි විධාන කළහ. සිටාණෝ ද, ඒ දුෂ්ට පුතා දන් මාගේ සැපතට හිමි විය නො දෙමි'යි සිතා තමන් ගේ එක් නියුක්තයක්හු කැඳවා කියන්නාහු 'හෙම්බා මයිළණුවෙනි, ම පුතණුවන් සොෂක කුමාරයන් දක්නා කැමැත්තෙමි. තොප ගෙන් මිනිසකු, යවා ම පුතණුවන් වහා ගෙන්වා පියව'යි කීහ. එ තෙපුල් අසා එ තෙම 'යහපතැ'යි ගිවිස පතක් ලියා දී සොෂකයන් කැඳවා ගෙන එන සේ එක් මිනිසකු යැවී ය.

සිටු දියණියෝ ඔහු අවුත් දොර කඩ සිටි බව අසා ගෙන්වා බැණෙනි, කුමක් නිසා අවි දෑ'යි විචාරා 'සවාමීනි, සිටාණන්

Non-Commercial Distribution

වහන්සේ ගිලන් සේක. එහෙයින් පුතණුවන් වහන්සේ දක්නා කැමැති ව කැඳවා එවූ සේකැ'යි කී කල්හි අඵාසු කවර තරම් දෑ'යි විචාරා 'තව බත් පැන් කති'කී කල්හි එ පවත් සොෂක කුමාර යන්ට නො කියා ම ඔහට හිඳිනා ගෙයක් දී බත් බුලත් ඉස්තෙල් පහන් තෙල් ආදී වූ වැටුප් වියදම් දෙවා යන්ට කී කල යව'යි කියා එක් ගෙයක සුව සේ ඉන්ට සැලැස්සූහ. එ සේ ම දෙවනවර සොෂක කුමාරයන් කැඳවා එවූ පුරුෂයෙකු දූ එ පරිද්දෙන් ම රැඳ වූහ. ඉක්බිති සිටාණන්ගේ අතීසාර රොග ය බලවත් ව ගිය කල්හි එක් කබලක් තබති. එක් කබලක් බාති. එ කල්හි සිටාණෝ නැවත තමන්ගේ නියුක්තයා කැඳවා 'කිමෙක් ද මයිලණුවෙනි, ම පුතණුවන් ළහට මිනිසුන් යවූ ද නො යවූ දෑ'යි විචරා 'එ සේය, ස්වාමීනි, දූන් දෙ වරෙක මිනිසුන් යැවීමි. ඒ දෙ වාරයෙහි යවූ මිනිස්සු තව නො ආවෝ'ය කී කල්හි 'එ සේ වී නම් තව එකකු වහා නික්මවා පියව'යි කීහ. එයි ත්'යහපතැ'යි ගිවිස තුන් වන වර මිනිසකු යවී ය. සිටු දියණියෝ තුන් වන වාරයෙහි ආවා වූ මිනිසා දූක 'සිටාණන්ගේ අඵාසු කවර තරම් දෑ'යි විචාරා 'ඉතා ම ලෙඩ බලවත් වී ය. එක් කබලක් තබා එක් කබලක් පහ කෙරෙති'යි කී කල්හි මේ යන්ට සුදුසු කලැ යි සිතා එ දවස් සොෂක කුමාරයන්ට කියන්නාහු ස්වාමීනි, මුඹ වහන්සේගේ පියාණන් වහන්සේ ලෙඩ ය යි ඇසීමි'යි කීහ.

'ඊට කුමක් කරමෝ දෑ'යි කී කල්හි 'අය ගම් සියයෙන් නිමන පඩුරු ඇර ගෙන දකින්ට යම්හ'යි කීහ. එ කල සොෂක කුමාරයෝ 'යහපතැ' යි ගිවිස ගම් වලින් පඬුරු ගෙන්වා ගැල් වලින් ගෙන්වා ගෙන නික්මුණාහ. ඉක්බිති සිටු දියණියෝ 'ස්වාමීනි, මුඹ වහන්සේගේ පියාණන් වහන්සේ ඉතා දුවීල සේක. මෙ තෙක් පඬුරු ගෙන්වා ගෙන යන කල කල් යෙයි. මේ හැම තබා පුව මැනැව'යි කියා ඒ සියල්ල තමන්ගේ කුලගෙහි තබ්බවා සිටු කුමාරයන්ට කියන්නාහු 'ස්වාමීනි, මුඹ වහන්සේ ගෙට ගොස් වන්කල සිටාණන් වැද ලා පා මුල සිටිය මැනව. මම ඉස් දෙර සිටිමි' කියා උගන්වා ගෙට ගොස් වදනාහුම ගෙය සිසාරා තමන් ගෙන් රකවල් ලවා ඇතුළට වැද සිටාණන් වැඳ තුමූ ඉස් දෙර සිටියාහ. සොෂක කුමාරයෝ පා මුල සිටියාහ. ඒ වේලාවට සිටාණෝ උඩුකුරු ව හොත්තාහු ය. සිටාණන්ගේපය මැඩ මැඩ උන් නියුක්ත පුරුෂයා සිටාණන්ට කියනුයේ 'ස්වාමීනි, මුඹ වහන්සේගේ පුතණුවෝ සොෂක කුමාරයෝ අවූ ය'යි කීහ. 'දූන් කුමාරයෝ කොයිදූ'යි කී කල්හි 'තෙල පාමුල සිටිති'යිකීය.

Non-Commercial Distribution

ඉක් බිති සිටාණෝ කුමාරයන් දැක තමන්ගේ අය කැමියන් කැඳවා 'මේ ගෙයි කෙ තෙක් වස්තු දැ'යි විචාරා 'ධන රාශිය ම සතළිස් කෙළෙක. සෙසු උපභොග-පරිභොග වස්තු හා ගම් බිම් ක්ෂෙත්‍ර-වස්තු හා වහල්-සරක්-ඇත්-අස්-ඉදෝලි-කූනම් ආදිය ද මෙ තෙක් මෙතෙකැ යි වෙන වෙන කී කල්හි 'මම මෙ තෙක් වස්තු සොෂක කුමාරයන්ට නො දෙමි' කියන්ට කියනුයේ කුමාරයන්ගේ පින් බලයෙන් 'දෙමි' කියා පිහ. ඉස් දෙර සිටි සිටු දියණියෝ එ පවත් අසා පෙරළා අනිකක් කීවොත් නපුරැ යි සිතා උන්ට සිනෙහැති ව ශොකයෙන් හඬන්නා සේ හිසකේ විදු පිට මැද හෙළා ගෙන හඬමින් 'ස්වාමීනි, මේ කුමක් කියන නියා ද? මුඹ වහන්සේගේ මෙ බඳු තෙපුල් අප කන හුණුයේ ඉතා ම අප කාලකණ්ණි නියා දැ'යි කියමින් අඬා ගෙන හී සිටාණන්ගේ ළය හිසින් ඇණ නැවත අනික් බසක් කිය නොහෙන සේ ළ මැද්දේ හිසින් පහරමින් මහත් කොට හඬන්ට පටන් ගත්හ. සිටාණෝ එ කෙණෙහි ම කාල ක්‍රියා කළහ.

උදේනි රජ්ජුරුවෝ සිටාණන් මළ නියාව අසා ආදහන කරවා 'උන්ගේ දරුවෝ ඇද්ද නැද්දැ'යි විචාරා 'සොෂක නම් පුතණු කෙණෙක් ඇත. තමන් ජීවමාන කල්හි ම ඇති සියලු වස්තුව ඔවුන්ට පාවා දී මළෝ ය'යි කී කල්හි 'එවුන්ට එන්ට කියව' යි කියා සොෂක කුමාරයන් කැඳවා යවූහ. එ දවස් වැසි වැස රාජාඞගණයෙහි දිය හෙළී ය. සොෂක කුමාරයෝ රජ්ජුරු-වන් කැඳවා එවූ හෙයින් දකින්නට යන්නාහු රාජාඞගණයෙහි දියට නො බැස දිය පැන පියා ගියහ. ගොසින් රජ්ජුරුවන් දැක වැඳ එකත් පස් ව සිට 'සොෂකයෝ නම් තෙපි දැ'යි විචාළ කල්හි 'එ සේ ය ස්වාමීනි' කීහ. එ වෙලෙහි රජ්ජුරුවෝ 'හෙම්බා, සිටාණෝ මළෝ වේ දැ'යි තොපි ශෝක නො කරව. තොපගේ පියාණන් සන්තක සියලු සැපත හා සිටු තනතුරු තොපට දෙමි' කියා කුමාරයන් අස්වසා 'දරුව, දැන් තොපගේ ගෙට ම යව'යි සමු දුන්හ. සිටු කුමාරයෝ රජහු වැඳ සමු ගෙන ගෙට යන්නාහු පළමු පැන පියා ආ දිය කඩ පසු ව බැස ලා නික්මුණාහ.

සඳළු තෙලෙහි සිටි රජ්ජුරුවෝ සිටු කුමාරයන් පළමු දිය පැන ගෙන ආ නියාව ද දෙවෙනි ව එ ම දියට බැස ලා ගිය නියාව ද යන දෙක ම දැක එ තැන්හි ම සිට කුමාරයන් ගෙන්වා 'හෙම්බා දරුව, තොප පළමු මා ළහට එන ගමනේ දිය පැන ගෙන ආයේ ත් හැයි ද? පසු ව යන ගමනේ එ ම දියට බැස ලා ගියේ ත් කුමක් පිණිස දැ'යි විචාරා 'ස්වාමීනි,

Non-Commercial Distribution

මම ආදියෙන් පැන ගෙන එන්නෙමි කුඩා කොල්ලන් කෙරෙහි ඇතුළත් ව උපයුක්ත කමක් නැති ව ඇවිදිනා හෙයින් දිය පැන ගෙන ආමි. දැන් නුඹ වහන්සේ සිටු තනතුරු දෙමි වදළ හෙයින් ''උපයුක්ත වූව මනා වේ ද යි සිතා දියට බැසලා ගියෙමි'' කී කල්හි රජ්ජුරුවෝ ඉතා ධෛර්‍ය්‍ය සම්පන්න වූ කට යුතු දන්නා වූ දරු කෙණෙක. දැන් ම මුන්ට සිටු තනතුරු දෙමි' පළමු සිටාණන් සන්තක ගම් බිම් ආදිය හා නැවත තමන්ගේ එකි එකී වස්තුවෙන් සියක් සියක් බැගින් දී සිටු පට බඳවා රථ වාහනයකින් නුවර පැදකුණු කරවා ගෙට යවූහ. එ කල ඒ ඝොෂක සිටාණන් බැලූ බැලූ යම් දිශාවෙක් ම බමන්ට වන. සිටු දියණියෝ මහල් වාහල කාළි නම් කෙල්ල හා සමඟ කථා කරමින් උන්නාහු 'මැනියෙනි, කාළි ය, තොප පුතණුවන් මෙ තෙක් සම්පත් ලද්දේ මා නිසා ය'යි කිවූ ය.

එ තෙපුල් අසා කාළි දසි ඊට කාරණ කිම් ද යි විචාරා මෙ සිටාණෝ තමන් මරණට පතක් කුරුගුලා පටෙහි බැඳ ගෙන අප දෙ මවුපියන් ගෙට අවු ය. එ කල මම ඒ පත ඉරා දමා මා මේ සිටාණන්ට විවාහ මහුල් කොට පාවා දෙන සේ අනික් පතක් ලියා එ ම කුරුගුලා පටෙහි බැඳ එ පරිද්දෙන් ම මොවුන් කරා සරණ අවුත් එ තැන් පටන් මෙ තැන් දක්වා මෙ සේ ආරක්‍ෂාවෙන් රක්කෙමි' කී කල්හි 'මැණියෙනි, තොප දන්නේ මෙ පමණක් ම වේ ද? ඒ තබා මේ සිටාණන් බාල කාලයෙහි පටන් මොවුන්ගේ පිය සිටාණෝ නො එක් වාරයෙහි මරණට උත්සාහ කොට ත් මරා ගත නුහුණුවෝ ය. හුදෙක් මුන් නිසා බොහෝ වස්තු වියදම් වූ පමණෙක් ම ය'යි කිව. එ තෙපුල් අසා සිටු දියණියෝ 'මැණියෙනි, ඒ සිටාණන් කළ කට යුත්ත ඉතා නො කොට හැකි බැරි දෙයෙක් ම ය'යි කිය කියා උන්නාහු නුවර පැදකුණු කොට අවුත් ගෙට වදනා ඝොෂක සිටාණන් දැක 'මෙ තෙක් සම්පත් මුන් මා නිසා ය ලද්දේ ය'යි සිතා සිනා සී පීහ.

ඒ දැක සිටාණෝ 'තොප සිනාසුණු කාරණ කියව'යි කියා නො කියන හෙයින් 'ඉදින් තී සිනාසුණු කාරණ නොකී-යෙහි නම් දැන්ම තී දෙ කඩ කොට පොලු ගසමි' කඩුව ඔසවා ගත්හ. එ විට සිටු දියණියෝ 'මෙ තෙක් සම්පත් මේ සිටාණෝ මා නිසා ලදහ යි සිතා සී පීමි' කීහ. එකල්හි සිටාණෝ පළමු තමන් මරන්ට තමන්ගේ පියාණන් තමන්ට කළ කී උපක්‍රම කිසිවකු ත් නොදන්නා හෙයින් එ බසට කියන්නාහු 'ම පියාණන් වහන්සේ තමන් වහන්සේ සන්තක වස්තුව මට දුන් සේක,

Non-Commercial Distribution

තෙපි මට කුමක් දුනු ද'යි කීහ. ඉක් බිති සිටු දියණියෝ කියන්නාහු 'මුඹගේ පිය සිටාණන් වහන්සේ මුඹ මරණ පිණිස පතක් ලියා දී යවූ සේක.' යනාදීන් තමන් කළ උපකාර සියල්ල ම නො වළහා කීහ. එතෙකුදු වුව ත් සිටාණෝ එ බස් නො ගිවිස්සාහු ම ය.

ඒ බව දැන සිටු දියණියෝ කියන්නාහු 'ඉදින් මා කියන බස් නො ගිවිස්නා පසු කාළි නම් වූ නුඹගේ කිරි මෑණියන් අතින් විචාරා සැක ඇර ගන'යි කීහ. ඒ බස් අසා සිටාණෝ කාළි නම් දසිය කැඳවා 'සැබෑ ද, මෑණියෙනි, ම පියාණන් වහන් සේ මා මරන්ට පතක් ලියා දී යවූ සේක් දැ'යි විචාරා 'එ සේ ය, පුතණ්ඩ, තොප බාල කාලයෙහි පටන් තොප පියාණෝ තොප මරන්ට සිතා තොප නිසා ම බොහෝ වස්තු වියදම් කොට පීහ. සත්වාරයෙක තෙපි මරණින් මිදුණුව. දැන් අවු ත් එකි එකී වස්තුවෙන් සියක් සියක් බැගින් ලැබ සිටු තනතුරු ලදුව. ඒ සිටු දුවණියන් කීයේ නැත්තෙක් නො වෙයි සබා ම ය'යි කී කල්හි එ තෙපුල් අසා සිටාණෝ, කුසල කර්‍මය නම් ඉතා ආශ්චර්‍ය්‍ය දෙයෙක් ම ය. මම බඳු මරණින් මෙ සේ මා ගැළවුණේ පෙර ජාතියෙක මා කළ කුශලයකින් ම ය. එ සේ වූ මා කුසල් කිරී මෙහි ප්‍රමාද ව විසීම යුක්ත නො වෙයි. අප්‍රමාද ව කුසල් කළ මැනවැ'යි සිතා දවස දහසක් වියදම් කොට දවස් පතා අන්ධ-බධිරාදී වූ සොළොස් යාචකයන්ට දන් වැට තබ්බවා දුන්හ. ඔවුන්ගේ මිත්ත නම් කෙළෙඹි පුත්‍රයෙක් දන් විධාන කෙළේයි.

**මේ ඝොෂක සිටාණන් ගේ උත්පත්ති කථාව ය.**

---

## 21. සාමාවතීන් ගේ කථාව

මෙ සේ ම ඝොෂක සිටාණන් පහළ වූ සමයෙහි භද්‍රවතී නම් නුවර භද්‍රවති නම් සිටාණෝ ඝොෂක සිටාණන් හා එක් ව ඔවු නොවුන් නො දැක ම මිත්‍ර ව ඉඳිති. ඒ දෙ දෙන ම ඔවුනොවුන් ගේ රටින් ආවා වූ වෙළඳුන් අතින් ඔවුනොවුන්ගේ සම්පත් හා වයස් පමණ අසා ඔවුනොවුන්ට පඬුරු යවා මිත්‍ර කම ස්ථිර කොට ගෙන වෙසෙති. එ සමයෙහි භද්‍රවතිය සිටාණන්ගේ ගෙයි අහිවාතක නම් රෝගයෙක් උපන. ඒ රොග ය උපන් කල්හි පළමු ඒ ගෙයි මැස්සෝ මියෙති. එ තැන් පටන් අනුක්‍රමයෙන් ගෙයි වසන සුහුණෝ ද, මීයෝ ද, කුකුළෝ ද, බළල්ලු ද, බල්ලෝ ද, ගව, මී ආදීහු ද, දැසි දස් ආදී වූ කම් කාරයෝ ද, මියෙති.

Non-Commercial Distribution

සියල්ලවුන්ට පසු ව ගේ හිමි මනුෂ්‍යයෝ මියෙති. ඔවුන් අතුරෙන් යම් කෙණෙක් භිත්ති බිඳ ගෙන ගියාහු වී නම් ඔහු ජීවත් වෙති. එ සේ හෙයින් සිටාණෝ තමන්ගේ දසි දසාදීන් ඇතුළු ව හැම දෙන රෝගයෙන් මියන්ට වන් කල්හි ඇමෙණියන් හා දියණියන් කැඳවා ගෙන ගෙයි භිත්ති බිඳ ගෙන නික් ම 'අප ගේ මිත්‍ර වූ කොසඹෑ නුවර ඉඳිනා ඝොෂක සිටාණන් නිසා ජීවත් වම්හ'යි සිතා මඟට පිළිපන්හ.

ඔවුන්ට අන්තර මාර්ගයෙහි ම මාර්ගොපකරණ නිමා ගිය හෙයින් ඉතා දුර්වල ව අවු සුළඟින් හා සා පිපාසායෙන් පීඩිත ව ක්ලාන්ත වූ ශරීර ඇති ව මහත් වූ දුකින් කොසඹෑ නුවරට පැමිණ පැන් ඵාසු තෙනකට බැස ඉස් සෝධා නහා නුවර වාසල් දෙර සමීපයෙහි එක් ශාලාවකට වන්හ. එ තැන්හි සිටාණෝ ඇමෙණියන් කැඳවා කියන්නාහු 'සොඳුර, මෙ සේ ඉතා අනාථ වශයෙන් ගිය කල වැදූ මව වී නමුත් ප්‍රිය ව නො බලන්නාහ. එ බැවින් මෙ බඳු දුර්වල වෙශයෙන් ගොසින් අපගේ මිත්‍රයාණන් කෙ සේ දකුමෝ දැ'යි 'ඒ අපගේ මිත්‍රයාණෝ දවස් පතා දහසක් වියදම් කොට දන් දෙත් ල. ඔවුන්ගේ දන් හලට අපගේ දියණියන් යවා දන් බත් ගෙන්වා ගෙන කා බී මඳක් ශරීර ය පුෂ්ටි කොට ගෙන කීප දවසක් සැතපී ගෙන ගොසින් යහළු සිටාණන් දකුම්හ'යි කීහ. එ තෙපුල් අසා සිටු දියණියන් 'යහපතැ'යි ගිවිසි කල්හි එ දවස් එ ම ශාලාවෙහි ම වැස දෙවන දවස් දියණියන් දන් හලට යවූහ.

බොහෝ සම්පත් ඇති කුලෙහි උපන් ඒ සිටු කුමාරිකාවෝ දුකට පැමිණ ලජ්ජා ගුණය වුව ත් ලජ්ජාව කරබා ගෙන තළියක් අතින් ගෙන සිඟන මිනිසුන් හා සමග අහර සඳහා ගොස් සිඟා සිටියාහු 'තොපට කී කොටසක් වුව මනා දැ'යි කී කල්හි 'තුන් කොටසක් වුව මැනවැ'යි කියා තුන් කොටසක් ගෙන අවුත් මවු පියන් හා එක් ව බත් කන්ට බැස උන්හ. එ කල මෑණියෝ 'දුක් නම් දෙය මහතුන්ට ත් වන දෙයෙක. මුඹ වහන්සේ ජීවත් වුවහොත් අපි ත් සුව සේ ජීවත් වම්හ. අප නො බලා මුඹ වහන් සේ මෙ ආහාර ය කැව මැනවැ'යි කියා සිට සිටාණන් බඩ පුරා බත් කැවූහ. සිටාණෝ දවස් ගණනක් බත් නො කා සිස් බඩ හෙයින් බත් බොහෝ කොට කා ලා දිරවා ගත නොහී එ ම දවස් අළු යම් වේලෙහි ම මළහ. මෑණියන් හා දියණියෝ ද යන දෙන්න ශොකයෙන් හඬා වැලප මිනි ය දවා දෙ වන දවස් මෑණියෝ ශාලාවෙ හිඳ සිඟා යවූහ. එ දවස් දියණියෝ 'තොපට කී කොටසක් වුවමනා දැ'යි කී කල්හි දෙ කොටසක් වුව මැනවැ'යි

Non-Commercial Distribution

ගෙන අවුත් තමන් ගේ මැණියන් යාඥ කොට බත් කැවූ හ. මැණියෝ ද බත දිරවා ගත නො හී ඒ දවස්හි ම කාල ක්‍රියා කළහ.

කුමාරිකාවෝ උදෙකලා ව ම හඬා වැලපී දෙ මවු පියන් මළ ශොක දුක් හා ආහාර වෛකල්‍යයෙන් උපන් දුක් හා දෙ දුකින් ඉතා සය ඉවසිය නො හී දෙ වන දවස් හඬ හඬා යාචකයන් හා එක් ව අහර නිසා ගොස් සිටියාහු 'අද කී කොටසක් වුව මනා දැ'යි කී කල්හි 'එක් කොටසක් වුව මැනැවැ'යි කීහ. දන් විධාන කරණ කෙළෙඹියා පළමු දෙ දවස් දෙ පරිද්දෙකින් ගෙන තුන් වන දවස් එක් කොටසක් ගත් බව දැන 'පෙරෙව් ද තුන් කොටසක් ගතු ව. ඊයේ දෙ කොටසක් ගතු ව. අද එක කොටසක් ගන්ට කාරණ කිම් දැ'යි තොපගේ කුස පමණ දත්තේ අද දවස් දැ'යි කී ය.

ලජ්ජා සම්පන්න වූ සිටු දියණියෝ ඒ වචන ය අසා මර්මස්ථානයක පහළ ආයුධ ප්‍රහාරයක් මෙන් ද, ව්‍රණයෙක ක්‍ෂාරොදකයක් වත් කළ කලක් මෙන් ද ලජ්ජා ක්‍ෂමා කොට ගත නො හී කියන්නාහු 'ස්වාමීනි, මට ම මා ගත් තෙ කොටසෙක් නො වෙයි. මා ගේ මැණියන් හා පියාණන් හා දෙන්නා ඇති දවස් උන්ට ත් මට ත් තුන් කොටසක් ගත්මි. අද මා උදෙකලා හෙයින් එක කොටසක් ගත්මී' කියා ආදියෙහි පටන් තමන්ගේ මවු පියන්ගේ හා තමාගේ හා ස්වරූප වූ නියායෙන් ඇති සැටියේ ම කීහ. ඒ සියල්ල ම දන් විධාන කරණ කෙළෙඹි පුත්‍රයා අසා කඳුළු ධරා ගත නො හී ශොකයෙන් හඬා වැලප සිටු දියණියන් ළඟට කැඳවා සිඹ සනසා ''තොප භද්දවතිය සිටාණන් ගේ දියණියන් පසු මාගේ ම දියණියෝ ය. දෙ මවු පියෝ මළෝ වෙද්දැ යි මෙ තැන් පටන් ශොක නො කරව'යි අස්වසා ගෙට කැඳවා ගෙන ගොස් දූ තනතුරෙහි තුබූහ.

කුමාරිකාවෝ දන් හල අරගල අසා මේ අරගල සන්හිඳුවා දන් දිය නො හැකි දැ'යි විචාරා 'නො පිළිවනැ'යි කී කල්හි 'මම උපදෙසක් කියමි' කියා 'මේ දන් හල එකකු වැද පිටත් වන පමණ දෙර දෙකක් යොද එක් දෙරකින් වැද දන් ගත්තවුන් අනික් දෙරින් පිටත් ව යන්ට කිව මැනව. එ සේ කල්හි අරගල නො වෙ'යි කීහ. දන් හල විධාන කරණ කෙළෙඹියා ද 'ඒ උපාය යහපතැ'යි ගිවිස එ පරිද්දෙන් දෙර දෙකක් යොද කුමාරිකාවන් කී ලෙස ම දන් දෙමින් අරගලය සන්හිඳවි ය. ඒ කුමාරිකාවෝ

Non-Commercial Distribution

වනාහි පළමු නම් **සාමා** නම් වෙති. අරගල නො වන සේ දෙර වල් යොද වැට කර වූ හෙයින් එ **තැන් පටන් සාමාවතී** නම් වූහ. මෙ සේ එ තැන් පටන් දන් හල අරගල සන්හිඳින. ඝෝෂක සිටාණෝ පළමු යාචකයන් ගේ අරගල අසා ''මාගේ දන් හල අරගල බොහෝය' කිය කියා සතුටු වෙති. දෙ තුන් දවසක් අරගල නැති හෙයින් දන් දෙන **මිත්ත** නම් කෙළෙඹි පුත්‍රයා තමන් කරා ආ කල්හි 'මාගේ දන්හල අරගල නැත්තේ දන් නැති හෙයින් දැ'යි විචාරා 'ඇම දවස් ම දන් ඇත. යාචකයෝ දන් ගනිති' කී කල්හි 'එ සේ කල දූන් දෙ තුන් දවසක් නිශ්ශබ්ද ව තුබූයේ කුමක් නිසා දැ'යි විචාරා 'නිශ්ශබ්ද ව දන් ගන්නා සේ මම උපායක් කෙළෙමි' කී කල්හි 'පළමු එ සේ කුමක් නිසා නො කළා දැ'යි විචාරා 'නො දන්නා හෙයිනැ'යි කී කල්හි, 'දූන් තෙපි ඒ උපාය කා අතින් උගතු දැ'යි විචාරා 'මාගේ දියණියෝ උපාය කිවූ ය'යි කී කල්හි 'තොපගේ මා නො දන්නා දියණි කෙණෙක් ඇද්දැ'යි විචාළහ.

එ කල්හි ඒ කෙළෙඹි පුත්‍රයා භද්දවතිය සිටාණන් ගේ ගෙයි අහිවාතක රෝගය ය උපන් තැන් පටන් භද්දවතිය සිටාණන්ගේ සියලු ම පවත් ඝෝෂක සිටාණන්ට කියා ඔවුන්ගේ දියණියන් තමාට දූ තනතුරෙහි තුබූ බව කිව. ඉක්බිති සිටාණෝ 'එ සේ කල මට කුමක් පිණිස නො කීයෙහි දැ'යි 'මාගේ යහළු සිටාණන් ගේ දියණියෝ නම් මාගේ ම දියණියෝ වේ දැ'යි සාමාවතීන් කැඳවා පුත, තෙපි භද්‍රවතිය සිටාණන්ගේ දියණියෝ දැ'යි විචාරා 'එ සේ ය. සිටාණන් වහන්සැ'යි කී කල්හි 'එ සේ කල සැකයක් නො සිතව. තෙපි මාගේ දියණියෝ ම ය'යි කියමින් ළං කොට ගෙන සිඹ සනහා ඔවුන්ට පිරිවර කොට පන් සියයක් ස්ත්‍රීන් පාවා දී තමන්ට දූ කොට වැඩූහ.

ඉක්බිති එක් දවසෙක එ නුවර නකත් කෙළි නම් වූ සැණ-කෙළියෙක් විය. ඒ සැණ කෙළි දිනයෙහි උඩු මහලින් බිම් මහලට නො බස්න, බිම් මහලින් පිටතට නො නික්මෙන ඉසුරුමත් කුල ස්ත්‍රීහු පවා තම තමන්ගේ පිරිවර හා සමඟ පයින් ම නික්ම ගං හෝ ආදියට ගොස් සිත් සේ දිය කෙළ ඉස් සෝධා නහා මල් සුවඳ පැළඳ කෙළ ඇවිදිති. එ සේ හෙයින් එ දවස් සාමාවතී නම් කුමාරිකාවෝ ද තමන්ගේ පන් සියයක් පිරිවර ස්ත්‍රීන් පිරිවරා උත්සව කෙළියට සැරසෙන්නා සේ ඉස් සෝධා නහන පිණිස ගඟ බලා රාජාඞ්ගණයෙන් නික්මුණාහ. උදේනී රජ්ජුරුවෝ සී මැඳුරු කවුළුව සමීපයෙහි සිටියාහු ඔවුන් දැක

Non-Commercial Distribution

මොහු කවුරුන්ගේ නාටක ස්ත්‍රීහු දැ'යි විචාරා කිසි කෙණෙකුන් ගේ ත් නො වෙයි කී කල්හි 'එ සේ කල මොහු කවුරුන්ගේ දරුවෝ දැ'යි විචාරා 'ඝොෂක සිටාණන්ගේ දූ වූ සාමාවතී නම් මූ ය'යි කී කල්හි රජ්ජුරුවෝ පළමු දක්මෙහි ම උපන්නාහු ස්නෙහ ඇති හෙයින් එ පවත් අසා සිටානන්ට කියා යවන්නාහු 'තමන්ගේ දියණියන් අපගේ අන්තඃ පුරයට එවුව මැනවැ' කියා යවූහ.

සිටාණෝ 'අපගේ දියණියෝ පාවා නො දෙම්හ. කුමක් පිණිස දැ යි යත හොත් අප ගොවීන්ගේ චාරිත්‍ර නම් අප ගේ ගැහැණු දරුවන්ට නින්ද කොට වෙහෙසා කියන බසට ලජ්ජා ඇතියම්හ. එ සේ හෙයින් නින්ද බසට හයේ නො දෙම්හ'යි කීහ. එ පවත් අසා රජ්ජුරුවෝ කිපී සිටාණන්ගේ ගෙය අස් ඔබ්බවා සිටාණන් හා ඇඹෑණියන් පමණක් ගෙන් පිටත් කර වූහ. සාමාවතී ඉස් සෝධා නහා අවුත් ගෙට වදින්ට අවසර නො පෙනෙන හෙයින් මේ කිම් දැ'යි විචාරා 'හෙම්බා පුත, රජ්ජුරුවෝ තොප තමන් ගේ අන්තඃ පුරයට කැඳවා එවුව. ඒ අසා 'අපි අපගේ දරුවන් පාවා නො දෙම්හ'යි කීම්හ. එ හෙයින් රජ්ජුරුවෝ අප ගෙය අස් ඔබ්බවා අප ත් ගෙන් පිටත ලවා පූ ය'යි කීහ.

එ පවත් අසා සාමාවතී 'රජ්ජුරුවන් කී බස් නො ගිවිස්සේ නපුර. ඉදින් කියතො ත් 'මාගේ දියණියන් ඔවුන් පිරිවර හා සමඟ ගන්නා සේක් වී නම් දෙමි' කිය යුතු ය'යි කිව. එ තෙපුල් අසා සිටාණෝ 'එ සේ කල, පුත, තොපගේ අභිප්‍රාය ඇත් නම් එ පරිද්දෙන් ම කෙරෙමී'යි ගිවිස සාමාවතීන් කී ලෙස ම රජ්ජුරුවන්ට කියා යවූ ය. රජ්ජුරුවෝ ද 'යහපතැ'යි ගිවිස සාමාවතීන් හා පරිවාර ස්ත්‍රීන් පන් සියය ත් රජ ගෙට ගෙන්වා ගෙන සාමාවතීන්ට අභිෂෙක කොට තමන්ට අග මෙහෙසුන් තනතුරෙහි තබා සෙසු ස්ත්‍රීන් පළමු පරිද්දෙන් ම ඔවුන්ට පරිවාර ස්ත්‍රීන් කළහ.

මෙ සේ මවු පිය ආදී හැම දෙනා නට කල්හි ද පෙර කළ කුසල් ඇත්තවුන් තමන් ගේ කුසලානුභාවයෙන් සම්පත් ලද පරිදි ඇසූ සත් පුරුෂයන් විසින් සත්‍වයන්ට පිට් වහලෙක් නම් කුසල් ම ය යි දන තම තමා ශක්ති පමණින් පිළිවන් කුසල් කොට සසර සිටිනා තෙක් සියලු දෙව් – මිනිස් සම්පත් විඳින්ට උත්සාහ කටයුතු.

**මෙ සාමාවතීන් ගේ උත්පත්ති කථාව ය.**

Non-Commercial Distribution

# 22. වාසුල දත්තාව ගේ කථාව

තව ද ඒ සාමාවතීන්ගේ ස්වාමි පුත්‍ර වූ උදේනි රජ්ජුරුවන් ගේ **වාසුලදත්තා** නම් අනික් බිසෝ කෙණෙකුදු ඇත. ඒ බිසවු නම් උදේනියෙහි **චණ්ඩපජ්ජොත** රජ්ජුරුවන්ගේ දියණියෝ ය. ඔවුන් රජ්ජුරුවන්ට අග මෙහෙසුන් වූ පරිදි කි සේ ද යත්- උදේනියෙහි චණ්ඩපජ්ජොත රජ්ජුරුවෝ එක් දවසෙක උයන් කෙළ නුවරට එන්නාහු තමන් ගේ මහත් වූ සම්පත් බලා මනුෂ්‍ය ලෝකයෙහි අන් කිසිවක් හට මෙ බඳු සම්පතෙක් ඇද්-දැ යි විචාරා 'මෙ කවර සම්පතෙක් ද? කොසඹෑ නුවර උදේනී රජ්ජුරුවන්ගේ සම්පත් මීට වඩා ශත සහස්‍ර ගුණයෙන් අධික ය'යි අමාත්‍යයන් කී කල්හි 'එ සේ වී නම් ඔවුන් අල්වම්හ'යි කීහ. එ තෙපුල් අසා අමාත්‍යයෝ 'මහ රජ, ඒ රජ්ජුරුවන් එ සේ ඇල්විය නො හැක්කැ'යි කීහ. රජ්ජුරුවෝ 'කවර උපායකින් වුව ත් ඒ රජහු අල්වම්හ'යි කියා 'නැවත ත් නො පිළිවනැ'යි අමාත්‍යයන් කී කල්හි 'කාරණ කිම් දැ'යි විචාරා 'මහ රජ' ඒ රජ්ජුරුවෝ හස්තිකාන්ත නම් වූ ශිල්පයක් දනිති. මන්ත්‍ර පිරුවා වීණා ගායනා කොට නො කැමති ඇත් කෙණෙකුන් ලුහු බඳවා පියති. කැමති ඇත් කෙණෙකුන් අල්වා ගනිති. ඒ රජ්ජුරුවන් වැනි අනික් ඇත් වාහන ඇති රජෙක් නැතැ'යි කී කල්හි ඒ රජ්ජුරුවන් කිසියම් උපායකින් ඇල්වුව මනා ම ය යි කීහ.

මෙ සේ සාහසික ව රජහු කියන බස් අසා අමාත්‍යයෝ කියන්නාහු 'මහ රජ, ඉදින් ඒ රජ්ජුරුවන් අල්වනු කැමති වුව හොත් දණ්ඩෙන් ඇතකු ඉදි කොට ඒ රජ්ජුරුවන් ගේ නුවරට ආසන්න ස්ථානයකට යවුව මැනව. රජ්ජුරුවෝ ඇත්-වාහනයෙක, අස් වාහනයෙක, නමක් ඇසූ නම් දුරට ත් ගොසින් අල්වති. එ සේ දුරට ගිය කල්හි ඒ රජ්ජුරුවන් අල්වා ගත හැක්කැ'යි කීහ. චණ්ඩපජ්ජොත රජ්ජුරුවෝ 'ඒ උපාය සහ-පතැ'යි දණ්ඩෙන් ඇතකු ඉදි කරවා පිටත කඩ රෙදි අලවා චිත්‍රකාරයන් ලවා ජීවමාන ඇතකු මෙන් සිතියම් කරවා ඇතු කුස මිනිසුන් සැට දෙනෙකු සක්මන් කරණ පරිද්දෙන් සලසා ඒ රජ්ජුරුවන් ගේ විජිතයට ආසන්න ස්ථානයෙහි එක් විලක් අසල රඳවා ඇත් බෙටි ද ඒ ඒ තැන් හි රැස් කර වූහ.

ඉක්බිති එක් වැද්දෙක් ඒ දැක 'මෙ ඇත් අපගේ උදේනී රජ්ජුරුවන් වහන්සේට සුදුසු ය'යි සිතා නුවරට දිව ගොස්

Non-Commercial Distribution

ඇතු ගේ රූප සම්පත්තිය වර්ණනා කොට රජ්ජුරුවන්ට කියනුයේ 'මහ රජ, රිදී පර්වතයක් සේ ඉතා ධවල වූ ශරීර ඇති මනහර ඇත් රුවක් දිටිමි' කී ය. උදේනි රජ්ජුරුවෝ ඔහු ලවා ම මඟ පෑවා ගෙන උතුම් ඇත් වාහනයකට පැන නැඟී සහපිරිවරින් නික්මුණාහ. චණ්ඩපජ්ජොත රජ්ජුරුවෝ ද උදේනි රජ්ජුරුවන් නික්මුණු බව චර පුරුෂයන් අතින් අසා තුමූ ද නික්ම ගොස් මහ මද්ධ්‍යය සිස් කොට දෙ පස සේනාව සිටුවා ලූහ. උදේනි රජ්ජුරුවෝ චණ්ඩපජ්ජොත රජ්ජුරුවන් ආ බව නො දන දඬු ඇතු දක සැබෑ ඇතෙකැ යි සිතා ලුහුබඳවා ගත. ඇතුළෙහි සිටි මනුෂ්‍යයෝ යන්ත්‍රයෙන් ඇතු ඇර ගෙන දිවන්ට පටන් ගත්හ. උදේනි රජ්ජුරුවෝ මෙ තෙක් දවස් සේ මන්ත්‍රය මතුට වීණා ගායනා කළහ. රජ්ජුරුවන් වීණා ගායනා කරත් කරත් ඒ දඬු ඇත් තෙම වීණා ශබ්ද ය නො ඇසූවාක්හු මෙන් දිවන්නේ ම ය. රජ්ජුරුවෝ ඇත් වාහනයෙන් ලුහුබඳවා ගොස් ඒ ඇතු අල්වා ගත නොහී අසකු නැඟී ඇතු ලුහුබඳවන්ට වන්හ. උමං දුවෙහි අවකප්පන සැත්මෙන් සැදූ අසු රඳවන්ට කඩියාළම ඇදි ඇදි සේ බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් ගෙන උත්තර පඤ්චාල නුවර බලා දිවුවා සේ දඬු ඇත්තු ද නො රඳා ම දිවති. රජ්ජුරුවන් යුහු යුහු වත් සේනාව පසු ගියහ.

එ කල දෙ පාර්ශ්වයෙහි සිටි චණ්ඩපජ්ජොත රජ්ජුරුවන්ගේ සේනාව උදේනි රජ්ජුරුවන් මැද කොට අල්වා ගෙන රජ්ජුරුවන්ට පාවා දුන්හ. උදේනි රජ්ජුරුවන්ගේ සේනාව ද රජ්ජුරුවන් සතුරන්ට අසු වූ බව දන එ තැන්හි ම කඳවුරු බැඳ උන්හ. චණ්ඩපජ්ජොත රජ්ජුරුවෝ උදේනි රජ්ජුරුවන් ජීවග්‍රාහ කොට අල්වා ගෙන එක් සිර ගෙයක ලවා ලා දොර වස්වා රකවල් ලවා තුන් දවසක් මුළුල්ලෙහි ජය පාන ය බොන්ට පටන් ගත්හ. උදේනි රජ්ජුරුවෝ තුන් වන දවස් 'තොප ගේ රජ්ජුරුවෝ කුමක් කෙරෙද්ද'යි රකවල සිටියවුන් අතින් විචාරා සතුරු රජ්ජුරුවන් ඇල්ලීමි'යි සන්තොෂයෙන් මත් ව ජය පානය බොන සේ කැ'යි කී කල්හි 'තොපගේ රජ්ජුරුවන් කරන්නේ ගැහැණුන් විසිනු ත් නොකළ මනා කට යුත්තෙක. සතුරන් අල්වා ගත් කල මරා හෝ නොපියා නොහොත් ඇර නොපියා උන් දුක්පත් කොට සිර ගෙයි වසා හිඳුවාලා කුමන ජයපාන ද බොන්නේ ය'යි කීහ.

රකවලුන් ගෙන් එ පවත් අසා උදේනි රජ්ජුරුවන් උන් තැනට අවුත් මෙ සේ කීයේ සැබෑ දැ යි විචාරා 'සැබව මහ රජ'යි කී කල්හි එ සේ වුව හොත් තොප අරුම්හ. තොප දන්නා මන්ත්‍ර ය.



Non-Commercial Distribution

අප උගන් ව'යි කීහ. ඒ අසා උදේනි රජ්ජුරුවෝ 'යහපත, මන්ත්‍රය උගන්නා පරිද්දෙන් උගනු නම් උගන්වමි. කිමෙක් ද? තෙපි මා වඳු ද'යි කීහ. ඒ අසා චණ්ඩපජ්ජොත රජ්ජුරුවෝ 'මන්ත්‍රයක් පිණිස මම තොපට වඳිම් ද? නො වඳිමි'යි කීහ. උදේනි රජ්ජුරුවෝ 'එ සේ කල තොප මා නො වඳු නම් මම ත් මන්ත්‍ර ය නො උගන්වමි' කීහ. ඉක් බිති චණ්ඩපජ්ජොත රජ්ජුරුවෝ 'එ සේ ම තෙපි මන්ත්‍ර ය මා නුගන්වා නම් රාජාඥ කරවමි' යි කීහ. ඒ අසා උදේනි රජ්ජුරුවෝ 'යහපත, රාජාඥ කරව. තොප ගේ ආඥව මාගේ ශරීරයට විනා සිතට ත් ඇද්ද? කෙ තෙක් රාජාඥ කළ ත් මා නො වඳිනා කෙණකුන්ට මන්ත්‍ර ය නූගන්වමි' කීහ.

චණ්ඩපජ්ජොත රජ්ජුරුවෝ උදේනී රජ්ජුරුවන්ගේ නිර්භීත ශූරවීර ගර්ජනා අසා කෙ සේ මන්ත්‍ර ය උගනිම් දෝ හෝ යි සිතා මේ මන්ත්‍ර ය අනුන් උගන්වන බව සුදුසු නො වෙයි. මා දියණියන් වාසුලදත්තාවන්ට උගන්වා ගෙන උන් අතින් පසුව උගනිමි' යි සිතා ඉක් බිති 'මහ රජ, තොප වඳිනා කෙණකුන්ට සැබවින් මන්ත්‍ර ය උගන්වාදැ'යි විචාරා 'එ සේ ය. උගන්වමි' කී කල්හි 'එ සේ වී නම් අපගේ රජ ගෙයි එක් කුදක් ඇත. ඈ කඩ තුරාවක් මුවායෙහි සිටුවා ලා මන්ත්‍ර ය උගන්වව'යිකීහ. එ තෙපුල් අසා රජ්ජුරුවෝ 'කුමක් වේව යි මා වඳිනා කෙණකුන්ට මන්ත්‍ර ය උගන්වමි. හෙ ද වනාහි මා වඳිනවුන් නැති හෙයින් වැඳුම් ගන්ට ආසාවෙන් කියන දෙයෙක් නො වෙයි. වැඳීම් නම් ගුරුන්ට කළ මනා උපචාර ය. එ පරිද්දෙන් ගුරුන්ට උපචාර කොට උගත්තා වූ ශාස්ත්‍ර ය සඵල වෙයි. එ සේ හෙයිනැයි' කීහ. ඒ අසා රජ්ජුරුවෝ දියණියන් වාසුලදත්තාවන් උන් තෙනට ගොස් 'පුත, ඉතා නො බැලිය හැකි ශ්වෙත කුෂ්ඨයක් ඇති මිනිසෙක් අනඝ වූ මන්ත්‍රයක් දන්නේ ය. ඒ මන්ත්‍ර ය අනික් කෙණකුන් උගැන්විය නො හැක්ක. ඒ තෙම නොවැඳි කෙණකුන්ට මන්ත්‍ර ය නූගන්ව යි. තෙපි ගොසින් කඩ තුරාවකින් පිටත සිට ඔහු වැද ඒ මන්ත්‍ර ය ඉගෙන ගනුව. මම පසු ව තොප අතින් ඉගෙන ගනිමි' කීහ.

මෙ සේ රජ්ජුරුවෝ ඔවුන් දෙ දෙනා ඔවුනොවුන් කෙරෙහි අනුරාගයක් කෙරෙති යන භයින් තමන් දියණියන් කුදියක කොට ත් රජ්ජුරුවන් ශ්වෙත කුෂ්ඨයකු කොට ත් සඟවා කීහ. ඉක් බිති උදේනි රජ්ජුරුවෝ කඩ තුරාව ඇතුළේ හිඳ මන්ත්‍රය කියති. වාසුලදත්තාවෝ කඩ තුරාවෙන් පිටත සිට උගනිති.

Non-Commercial Distribution

දවසෙක මන්ත්‍ර ය විටින් විට කී කී සේ ම වාසුලදත්තාවන් වරදවා කියන හෙයින් උදේනි රජ්ජුරුවෝ කිපී 'එම්බල දුෂ්ට කුද, තී ගේ දිව හා දෙ තොල බොල් ව ගිය ද? දවස් පතා කියවා ත් මන්ත්‍රය වරදවා කිය යි. මෙ සේ කිය නො හෙයි දැ'යි කීහ. ඒ අසා බිසවු කිපී 'එම්බල ශ්වෙතකුෂ්ඨය, තා කියන්නේ කිමෙක් ද? අප සේ වූවෝ ත් කුදුන් කෙරෙහි ඇතුළත්හු දැ'යි කඩතුරා ව ඔසවා ඔවුනොවුන් බලා ඔවුනොවුන් ගේ ස්වරූප විචාරා තත් වූ පරිද්දෙන් දැන 'රජ්ජුරුවෝ අප දෙ දෙනා ඔවුනොවුන් හා විශ්වාස වෙති යන භයින් වළහා කී වන්හ'යි නිශ්චය කොට ඔවුනොවුන් කෙරෙහි අනුරාග ඇති ව ජවනිකාව ඇතුළෙහි දී ම ඔවුනොවුන් හා සහවාස ය කළහ.

එ තැන් පටන් මන්ත්‍ර ඉගැන්වීම් නැති විය. මන්ත්‍රය ඉගැන්වීම් තබා තමන් දියණියන් උගන්වා ගෙන යන බව නො දැන චණ්ඩ පජ්ජොත රජ්ජුරුවෝ ද නිරන්තරයෙන් ම 'පුත, මන්ත්‍ර උගතු දැ'යි විචාරා 'උගනිමින් සිටියෙමි' කී කල්හි සැබවින් ම මන්ත්‍ර ය උගනිති යි සැක නැති ව සිතති. එක් දවසක් උදේනි රජ්ජුරුවෝ වාසුලදත්තාවන් බණවා 'සොඳුර, ගැහැනුන්ට ගේ හිමියන් කරණ උපකාර මවු පියෝ සෙසු කුසෙහි හොත් මෑ බුන් ආදිහු ද කොට ගත නො හෙති. ඉදින් මාගේ ජීවිතය මට රැක දී පූ නම් මාගේ අන්තඃපුරයෙහි බිසෝවරුන් පන් සියයකට තොප ම ප්‍රධාන කොට අග මෙහෙසුන් කෙරෙමි' කීහ. ඒ අසා බිසවු 'මහ රජ, නුඹ වහන්සේ කී බස නමුත් සිත තබා ස්ථිර කළ මැනවැ'යි කියා පිය රජ්ජුරුවන් කරා ගොස් වැඳ එකත් පස් ව සිට මන්ත්‍රය උගතු දැ'යි විචාළ කල්හි 'එ සේ ය, මන්ත්‍ර ය උගතිමි. ඒ මන්ත්‍රයට උපචාර පිණිස තරු ලකුණෙන් ගන්නා එක් ඖෂධයෙක් ඇත් ල. ඒ ඖෂධ ය ඇර ගන්ට යන වේලෙහි නැඟී යන වාහනයක් වුව මැනව. එයි ත් වැඩක් සිකා යන ගමන හෙයින් කැමැති දෙරකින් යන වේලෙහි නො වළකන පරිද්දෙන් සම්මතත් කළ මැනවැ'යි කීහ. රජ්ජුරුවෝ ද ඒ අන්තරාය නො දැන මන්ත්‍ර ලොභයෙන් යහපතැ'යි ගිවිස්සාහ. ඔහු ද තමන් යන්ට කැමැති දෙරක් ම අත් ගෙන තුබූහ.

රජ්ජුරුවන් ගේ වනාහි වාහන පසෙක් වි ය. කවරේ ද යත්–දවස පනස් යොත්නක් යන්නා වූ භද්‍රාවතී නම් ඇතින්නක, සැට යොත්නක් යන්නා වූ කාක නම් දසයෙක, සියක් යොත්නක් යන්නා වූ චෙලකණ්ඨිය–මුඤ්ජකෙසිවයී යයි අශ්වයෝ දෙ දෙනක එක් සිය විසි යොත්නක් යන්නා වූ නාළාගිරි නම් ඇතෙකැ යි

Non-Commercial Distribution

මම සේ වාහන පසෙක් වී ය. එ ද වනාහි පෙර ගිය ජාතියෙහි ඒ රජ්පුරුවෝ එක් තරා ප්‍රධාන පුරුෂයක් හට උපස්ථාන කෙරෙති. එක් දවසෙක ඒ ප්‍රධාන පුරුෂයා නුවරින් පිටත් ව ඉස් සෝධා නහා නුවරට එන කල්හි එක් පසේ බුදු කෙණකුන් වහන්සේ නුවරට පිඩු සිඟා වැඩ සියලු නුවර වාසීන් ඇඟ මාරයා ආවෙශ වූ හෙයින් එක් බත් සැන්දකු ත් නො ලැබ පාත්‍ර ය සේධූ වන ම ගෙන නුවරින් නික්මුණු සේක. ඉක්බිති නුවර වාසල් දෙරට පසේ බුදුන් පැමිණි කල්හි මාර තෙම එක්තරා මිනුෂ්‍ය වෙශයකින් පසේ බුදුන් කරා එළඹ 'ස්වාමීනි, කිසිවක් ලත් සේක්දැ'යි විචාරා 'කිමෙක් ද, මාර ය, තෝ බත් ලබන ලෙසක් කෙළෙහි දැ'යි කී කල්හි 'එ සේ වී නම් නැවත නුවරට වැඩිය මැනවි. දැන් බත් ලබන සේ කෙරෙමී' කී ය.

පසේ බුදුහු එ තෙපුල් අසා 'ඉදින් මම පෙරළා නුවරට වනිම් නම් නැවත මේ මාරයා මුළු නුවර වාසීන්ගේ ශරීරයෙහි ආවෙශ ව අතින් අත් පැහැර සිනා සී කෙළනා පරිද්දෙන් කරන්නේ ය'යි ඔහු ගේ බස් නො ගිවිස ම නික්මුණු සේක. ඉක්බිති ප්‍රධාන පුරුෂ තෙම පාත්‍ර ය සේධූ වන ම ගෙන නුවරින් වඩනා පසේ බුදුන් දැක 'ස්වාමීනි, අහර ලත් සේක් දැ'යි විචාරා 'නුවර ඇවිද පිටත්වූම්හ'යි කී කල්හි කිමෙක් දෝ හෝ යි සිතනුයේ 'පසේ බුදුන් වහන්සේ මා විචාළ දෙය නො කියා අනික් පරිද්දෙකින් කියන සේක. අහර නොලත් සේක් වනැ'යි සිතා පාත්‍රය බලා සිස් පාත්‍ර ය දැක ගෙයි බත් පිසූ බව ත් නො පිසූ බව ත් නො දැන අතර මඟ දී පාත්‍රය ගත නො හී 'ස්වාමීනි, මදක් වැඩ සිටිය මැනවැ'යි කියා වහා ගෙට ගොසින් බත් පිසූ දැයි විචාරා 'එ සේ ය, බත් උදවූ විය'යි කී කල්හි උපස්ථායකයා කැඳවා 'දරුව, තොප විනා මේ වේලෙහි දිවන්ට නිසි කෙණෙක් නැත. වහා දිව ගෙන ගොස් පසේ බුදුන් වහන්සේ ගේ පාත්‍ර ය වැද පවරා ඇරගෙන එව'යි කීහ.

හෙ ද එක බසින් ම දිව ගෙන ගොස් පාත්‍රය ගෙන අවුත් දින, ඒ ප්‍රධාන පුරුෂයා තමාට පිසූ බත පාත්‍රයෙහි පුරා ලා 'මේ පාත්‍රය නො පමා ව ගෙන ගොස් පසේ බුදුන් වහන්සේට පිළිගන්වා පියව. මම මෙහි පින් තොපට දෙමී'යි කී ය. එ තෙම යහපතැ යි ගිවිස යුහු ව දිව ගෙන ගොස් පසේ බුදුන් වහන්සේට පාත්‍ර ය පිළිගන්වා පසඟ පිහිටුවා වැද 'ස්වාමීනි, මම ඉතා වේලා ආසන්න හෙයින් වළඳන වේලා ඉකුත් ව යේ දෝ හෝ යි සිතා යුහු ව පාත්‍ර ය ගෙන ගියෙමි. එ පරිද්දෙන් ම නැවත බත් පාත්‍රය ඇර ගෙන එන වේලෙහි ද යුහු ව ම ආමි. මේ දැන් මා පින් උදෙසා දිවූ දුවයෙහි අනුසසින් මතු මට දවස පනස් යොදුනක් යන්නා වූද,

සැට යොදනක් යන්නා වූ ද, සියක් යොදුන් යන්නා වූ ද, දවස එක් සිය විසි යොදනක් යන්නා වූ ද, මෙ සේ ගමනෙහි සමර්ථ වූ වාහන පසෙක් පහළ වෙව යි. යන එන ගමනෙහි මාගේ ශරීර ය සූර්‍ය්‍ය තාපයෙන් ඉතා ම තැවින. එ ද පින් නිසා ම තැවුණු හෙයින් ඒ කුසල ය හේතු කොට ගෙන මා උපනුපන් තන්හි මුදුන් පත් හිරු මඩල සේ ආඬු තේජස් ඇති වෙම්ව යි මේ ආහාර දන යෙහි පින් දයකයන් අතින් සම සිතින් අනුමෝදන් වූ කුශලයෙන් මුඹ වහන්සේ දුටු නිවන් දහම් පසක් කට හෙම්ව'යි ප්‍රාර්ථනා කළහ. පසේ බුදුන් වහන්සේ ත් 'ඒ තොප සිතූ පැතූ සියල්ල ම එ පරිද්දෙන් ම වෙව' යි වදරා–

'ඉච්ඡිතං පත්‍ථිතං තුය්හං–ඛිප්පමෙව සමිජ්ඣතු,
පූරෙන්තු සබ්බෙ සඞ්කප්පා–චන්දෙ පණ්ණරසී යථා
ඉච්ඡිතං පත්‍ථිතං තුය්හං– සබ්බමෙව සමිජ්ඣතු,
පූරෙන්තු සබ්බෙ සඞ්කප්පා– මණි ජොතිරසො යථා'යි.

අනුමෙවෙනි බණ වදරා වැඩි සේක. මේ ඔවුන්ගේ පූර්ව චරිතය යි. එ කල්හි චුල්ලූපස්ථායකයා නම් මෙ කල්හි මේ චණ්ඩ පජ්ජොත රජ්ජුරුවෝ ය. එ කල්හි පසේ බුදුන් වහන්සේට වේලා ආසන්නයෙහි බත් පාත්‍ර ය ඇර ගෙන යුහු ව ගොස් පිළිගන්වා ලූ කුශලයෙන් මෙ කල්හි මේ වාහන පස ඇති වී ය.

ඉක්බිති චණ්ඩපජ්ජොත රජ්ජුරුවෝ එක් දවසක් උයන් කෙළියට නික්මුණාහ. උදේනි රජ්ජුරුවෝ එ පවත් දැන 'අද මේ අවසරෙහි පලා ගිය මැනවැ'යි සිතා මහත් වූ සම් පසුම්බි වල රත්රන් පුරා භද්දවතී නම් ඇතින්න පිටට නංගා ගෙන වාසුලදත්තාවන් හා සමහ එ ම ඇතින්න පිටට නැගී නික්ම ගත්හ. චණ්ඩපජ්ජොත රජ්ජුරුවෝ පුර රක්නවුන් අතින් එ පවත් අසා 'කොල වහා නික්මෙව'යි පස්සෙහි බල සෙනඟ යැවූහ. උදේනි රජ්ජුරුවෝ පස්සෙහි පිරිස් එන්නා දැක ඇතින්න පිට තුබූ මසුරන් පසුම්බිය උනා විසුරුවාපූහ. සේනාව රන් අවුළා ගෙන නැවත පස්සෙහි ලුහුබඳවා ගත්හ. උදේනි රජ්ජුරුවෝ රන් පසුම්බිය උනා එළා සේනාව ධනලොභයෙන් රත්රන් ගනුම්හ'යි පමා වූ ඇසිල්ලෙහි දිව ගෙන ගොස් තමන්ගේ සේනාව කඳවුරු බැඳ ගෙන හුන් තෙනට වැද ගියහ. ඉක්බිති දුරින් එන රජ්ජුරුවන් දුටු සේනාව පෙර ගමන් ගොස් රජ්ජුරුවන් පිරිවරා මහත් උත්සවයෙන් කැඳවාගෙන නුවරට වන්හ. එ කල රජ්ජුරුවෝ නුවරට වැද පළමු තමන් කී පරිද්දෙන් ම වාසුලදත්තාවන් අභිෂෙක කොට අග මෙහෙසුන් තනතුරෙහි තුබූහ.

**මෙ වාසුල දත්තාවන් ගේ කථාව යි.**

Non-Commercial Distribution

# 23. මාගන්දිය ගේ කථාව

තව ද අනික් මාගන්දි නම් ස්ත්‍රියක් එ ම රජ්පුරුවන් සමීප යෙන් අග මෙහෙසුන් තනතුරු ලද්දී ය. ඒ කෙ සේ ද යත්:- ඕතොමෝ කුරුරට මාගන්දි නම් බමුණකුගේ දුව ය. ඈගේ මවු ද මාගන්දි නම. සුළු පියා ද මාගන්දි නම් වී ය. ඒ මාගන්දි නම් බැමිණි තොමෝ අධික වූ, රූ ඇත්තී ය. දිව්‍යාඞ්ගනාවක් සේ ශොභමාන ය. ඈගේ පිය තෙම තමාගේ ඒ දුවට සුදුසු ස්වාමි පුත්‍රයකු නො ලබන්නේ බොහෝ ධන ඇති මහත් වූ පරිවාර ඇති ඉසුරුමත් කුලවලින් තම දුව විචාරා ආ කල්හි 'තෙපි මාගේ දියණියන්ට නුසුදුස්සව'යි නින්ද බැණ නික්ම වන්නේ ය. ඉක්බිති එක් දවසක් බුදුහු අළුයම් වේලෙහි මහා කරුණා සමාපත්තීන් නැඟී ලොව බලන සේක් මාගන්දි නම් බමුණා හා අඹුව හා අනාගාමී ඵලයට පැමිණෙන උපනිශ්‍රය සම්පත් ඇති බව දැක තමන් වහන්සේගේ පා සිවුරු තමන් වහන්සේ ම ඇර ගෙන මාගන්දි බ්‍රාහ්මණයන්ගේ ගමින් පිටත ගිනි දෙවියා පුදන තෙනට වැඩි සේක.

බමුණු තෙම බුදුන්ගේ දෙ තිස් මහා පුරුෂ ලක්ෂණයෙන් හා අසූ අනු ලකුණෙන් හොබනා රූපයෙන් අග පැමිණි ආත්ම භාව ය දැක 'මෙලොව මේ පුරුෂ රත්නය හා සමාන අනික් පුරුෂ රත්නයෙක් නැත. මෙ තෙම මාගේ දුවට ම සුදුස්ස ය. මා දුව මොහට ම පාවා දෙම්'යි සිතා බුදුන් කරා එළඹ 'හෙම්බල මහණ, මාගේ දුවක් ඇත. ඈ මම මෙ තෙක් දවස් සුදුසු පුරුෂයෙකු නො දැක ගෙයි ම රක්ෂාකොට තබා ගෙන හුන්නෙමි. දැන් තොප ගේ රුව දුටු නියාවට ඕ තොපට සුදුසු ය. තෙපි ද ඈට සුදුස්ස ව. දැන් ඒ මාගේ දුව තොපට පාදපරිචාරිකා කොට පාවා දෙමි. ඈ කැඳවා ගෙන මා එන තෙක් මෙ තැන්හි ම සිටුව'යි කී ය. බුදුහු යහපත නපුර යන දෙක ම නො වදළ සේක. බමුණු තෙම ගෙට දිව ගෙන ගොසින් තමාගේ අඹු බැමිණිය බණවා 'හෙම්බල පින්වත, තී කුමක් කෙරෙයි ද? දැන් මම තීගේ දුවට සුදුසු වූ මහණ කෙණකුන් දැක මඟ සිටුවා ලා ආමි, තීගේ දුව සරහා ගෙන වෙලෙවි ව එව'යි කියා දුව සරහවා අඹුව හා සමඟ දුව කැඳවා ගෙන නික්මිණ.

මෙ සේ බමුණා නික්මෙන්නා දැක මුළු නුවර වාසීහු අසුරන් වන් දෙවු පුරයක් සේ එක පැහැර ක්ෂොභ ව 'මේ කුමන ආශ්චර්‍ය්‍යයෙක් ද? පෙර මේ බමුණු අඟ-මගධ- කාසි-කොසල- වජ්ජි-මල්ලාදී වූ ඒ ඒ දෙශයෙහි බොහෝ උත්තම පුරුෂයන් තමාගේ දුව සරණ විචාරා ආ කල උන් උන්ගේ යශො පරිවාර

භොග සම්පත් ආදි වූ විද්‍යමාන ඓශ්වර්‍ය්‍යය දැක දැක ත් 'මා දුව ගේ රූපශ්‍රිය වූ තියාවට තෙපි නුසුදුස්සව'යි සරණ නො දෙයි. අද මෙ තෙම මාගේ දුවට සුදුසු වූ සමණ කෙණකුන් දිටිම් යි ඉක්මන් ඉක්මන් ව දුව කැඳවා ගෙන යෙයි. ඒ කෙබඳු පුරුෂ රත්නයෙක් දෝ හෝ ඔවුන් බැලුව මැනවැ'යි ආශ්චර්‍ය්‍යමත් ව මහා ජනයෝ බමුණා පසු පස්සෙහි වන්හ. මෙ සේ ඔහු දුව කැඳවා ගෙන එන කල්හි බුදුහු බමුණා සිටුවා ලා ගිය තෙන නො සිට ඒ තැන්හි ශ්‍රී පාදය ඔබා පෙනෙන පරිද්දෙන් අධිෂ්ඨාන කොට ඖදක් ඉවත් ම වැඩසිටි සේක.

බුදුන්ගේ පියවර එබූ තැන්හි පෙනෙව යි යන අධිෂ්ඨානයක් ඇති ව විනා නො පෙනෙන්නේ යි. මෙ තෙක් දෙනාට පෙනෙව යි අධිෂ්ඨාන කළ කල ඔවුන්ට මුත් සෙස්සවුන්ට නො පෙනෙයි, මෙ තෙක් කල් තිබෙව යි අධිෂ්ඨාන කළ කල සතර මහ දිවයින වැසි වැස එක හෙළා වතුරු හෙළා නමු දු කෙ තෙක් ඇත් අස් ගව මහිෂාදීහු මැඩ ගෙන යෙත් නමුදු කෙසහක් පමණ තෙන-ට ත් උවදුරෙක් නො වෙයි. ඒ පියවර මකන පිණිස ඉදින් ඍද්ධි මත් කෙණෙක් වෙරම්බ වාත ය වැනි මහ සුළඟක් මවා පැවාහු වී නමුදු බුදුහු පියවර එබූ තෙතින් ලේඩික්තක සා රජස් සුඟකුත් සොල්වා පිය නො හෙති. කිසි කෙණෙකුදු පියවර මකාලිය නො හෙති.

ඉක්බිති බැමිණි බමුණා මුහුණ බලා 'ඒ තොප දුටු තෙනැත් තෝ කොයි දැ'යි විචාළී ය. එ බසට බමුණු 'උන් මෙ තැන්හි සිටු වාලා ගියෙමි. කොයි ගියේ දෝ හෝ'යි බලනුයේ වැඩ සිටි තැන එබූ ශ්‍රීපාද ය දැක මේ උන් සිටි පියවර ය යි බුදුන්ගේ ශ්‍රීපාද ය දැක්වී ය. බැමිණි පියවර බලා පියා තමා වෙදත්‍රයෙහි කෙළ පැමිණි බැවින් හා ලක්‍ෂණ මන්ත්‍ර දන්නා හෙයින් හා පියවර සල කුණු බලා, බමුණ, තෝ කුමක් කියයි ද? මේ ගැනුන්ගේ තන නැමැති මස් ගඩුවෙහි තමන්ගේ ළය පහරවා අපවිත්‍ර කරණ කෙණකුන් එබූ පියවරෙක් නො වෙයි. දෙ තිස් කුණු කොට සකින් යුක්ත වූ ගැහැණියගේ බොල් කෙළ නැමැති අසූචි පිරුණු මුට නැමැති වැසිකිළියට තමන්ගේ මුහුණ යොමු කරණ කාමා තුර කෙණෙකුන්ගේ පියවරෙක් නො වෙයි. බොහෝ කොට දෙඩීමෙන් කිම ද? එකාන්තයෙන් පඤ්ච කාම සෙවන ය කරණ කෙණෙකුන්ගේ පියවරෙක් නො වෙයි. හුදක් රාගයට දුරු වූ, දෙෂයට විෂ වූ, මෝහයට අඥශ්‍යාඤ්ජනයක් හා සමාන වූ සකල

Non-Commercial Distribution

ක්ලෙශයන් ප්‍රහීණ කොට සියල්ල දත්තා වූ උතුමාණ කෙණ කුන්ගේ පියවරෙක් ම ය යි කියා පියවර සලකුණු දක්වන්නාහු මතු කියන ගාථාව කීහ.

"රත්තස්ස හි උක්කුටිකං පදං භවෙ
දුට්ඨස්ස හොති සහසානුපීළිතං පදං,
මූළ්හස්ස හොති අවකඩ්ඪිතං පදං
විවත්තච්ඡද්දස්සිදම්දිසං පදං'යි

ඉක්බිති බමුණා කියනුයේ 'හෙම්බල බැමිණිය, තෝ තළියේ පැනෙහි කිඹුලන් දක්නා එකකු වැන්නෙහි ය. ගෙ මැද සැඟවී වසන සොරුන් දක්නා එකක් ද වැන්නෙහි ය. තෙල මැත නො දෙඩා බැණ නොනැඟී හිඳුව'යි කීය. එ බසට බැමිණි තොමෝ 'හෙම්බල බමුණ, තා බමුණු කුලයෙහි ඉපද ත් මෙ පමණ ශාස්ත්‍ර මාත්‍රයක් පවා දන්නා නො කල තා කැමැත්තෙක් ම කී ය. තෝ කුමක් කියයි නමුත් මේ පඤ්චකාම ගුණයන් සේවනය කරණ කෙණෙකුන් ගේ පියවරෙක් නො වේ ම ය'යි කිව. එ තෙපුල් අසා බමුණු ඇත මැත බලනුයේ අමා පිඩක් සේ වැඩ සිටි බුදුන් දැක 'අර මා කී තෙනැත්තෝ මූ වෙද්දැ'යි කියමින් බුදුන් කරා එළඹ 'හෙම්බල මහණ, මා දූව තොපට සරණ පාවා දෙනු නිසා ගෙනාමි. පාවා ගන්ව'යි කී ය.

එ තෙපුල් අසා බුදුහු 'තොප ගේ දියණියන් ගෙන් අපට ප්‍රයොජන ඇත නැත' යන දෙක ම නො වදරා බමුණ, තට එක් කාරණයක් කියමි'වදරා–'කිය මහණැ'යි කී කල්හි මහාභිනික්මණ පටන් වදරණ සේක් 'එම්බල බමුණ, සසරෙහි කළ හයින් දිව්‍ය–පුරයක් හා සමාන කිඹුල්වත් පුර ය වැනි රාජධානියක් හා, යසො ධරාවන් වැනි අගබිසෝ කෙණකුන් හා රහල් කුමරුවන් වැනි පුත් රුවනක් හැර හස්තප්‍රාප්ත වූ චක්‍රවර්ති රාජ්‍යයෙහි ලොභ නො කොට සතළිස් දහසක් පමණ දෙවඟනන් බඳු වරඟනන් උන්නා වූ රාජභවනයෙන් මධ්‍යම රාත්‍රියෙහි පිටත් ව දිවන්නමෝ සැපින්නක් හොත් තුඹසෙක ලොභ නො කොට දිවන්නා සේ පසු නො බලා දිවුම්හ. සාවුරුද්දක් මුළුල්ලෙහි අප පසු පස්සෙහි ඡායාවක් සේ ඇවිදිනා මාරයා පවා අපගේ කාම විතර්කයකු දූ සොයා ගත නොහී මසැ යි සිතා කැල මල් රැක ගෙන හුන් කැණ හිලකු සේ සිට වෙහෙසී පියා පලා ගියේ ය. සාවුරුද්දක් මහා වීර්‍ය්‍ය කොට ඉක්බිති බෝ මැඩ විදුරසුන් නැඟී මාර පරාජය කොට වා පොළොවෙහි පටන් අකනිටා බඹ ලොව දක්වා දස දහසක් සක්වළ එක පැහැර වෙවුල් පියා බුදු වූම්හ.

Non-Commercial Distribution

පසු ව පියාට වූ පරිභව පසිඳුම්හ යි කියා වහසි බැණ ගෙන ආවා වූ අරතී ය, රතී ය, රගා ය, යන මාර ස්ත්‍රීන් තුන් දෙනාගේ එ වැනි තුන් මුහුණට අනිත්‍ය ය, දුඃඛ ය, අනාත්ම ය යන තුන් ලකුණු ම යෙදූ බව මුත් රාගයක් නො යෙදුම්හ. කාමයෙහි අග පැමිණි ස වැනි දෙව් ලොව එ වැනි දිව්‍ය ස්ත්‍රීන් දැක පවා රාග චිත්තයක් නො ඉපද වූ අපි දූන් තාගේ දුව ය යි කියන ලද අසුචි හා මූත්‍ර පිරූ නව සිල් බඳනෙහි ලෝභ කරමෝ ද? එ සේ වූ තාගේ දුව අතින් ළං කොට සිප ගන්නා තබා පා පිස්නා බිස්සක් සේ පය පිස්නට පවා කැත ඇත්තම්හ'යි වදරා ඒ බව ගාථාවකින් දක්වන සේක්:

'දිස්වාන තණ්හං අරතිං රගඤ්ච,
නාහොසි ඡන්දෙ අපි මෙථුනස්මිං,
කිමෙවි දං මුත්තකරීසපුණ්ණං,
පාදපි නං සම්ඵුසිතුං න ඉච්ඡෙ'' යි.

මේ ගාථාව වදාළ සේක. ගාථාවගේ අවසන්හි බමුණා හා අඹුව හා දෙ දෙන අනාගාමි වූහ. බමුණාගේ දූ තොමෝ බුදුන් වදරණ බස් අසා 'නො කැමැති කල නො කැමැත්තෙමි නො කියා අපිස්කම් පානේ, අප වැන්නවුන් අසුචි බඳනක් කොට බැණ ලා ද? කුමක් වේ ව යි මට සුදුසු වූ කුල, පෙදෙස්, වයස්, භොග, සම්පත් ඇති සමණ කෙණකුන් කෙරෙහි උන් දවසේක මට බිණූ පරිභවයට සුදුසු සේ වෛර පා කොට මහණ භවත් ගොයුම් හට කියැටියක්[1] කියවමී' බුදුන් කෙරෙහි වෛර බැන්දී ය.

කිමෙක් ද? බුදුහු ඈ තමන් වහන්සේ කෙරෙහි වෛර බඳිනා බව දන්නා සේක් ද, නොහොත් නො දන්නා සේක් ද යත්:- දන්නා සේක් මැ යි. ඉදින් දන්නා කල කුමක් පිණිස ගාථාව වදාළ සේක් ද යත්' ඇගේ මවු පිය දෙ දෙනාට වන්නා වූ වැඩ සඳහා වදාළ සේක. හේ එසේ මැ යි. සර්වඥවරයෝ ඒ ජාතියෙහි අධිගම ලබන්ට හේතු නැති අභව්‍ය පුද්ගලයන් වෛර බැඳ අපා යෙහි උපදිතෝතිනු ත් ඔවුන් නො බලා ම මාර්ග ඵලාධිගමයට සුදුස්සවුන්ගේ වශයෙන් බණ දෙසන්නාහු මැයි.

ඉක් බිති මවු පිය දෙ දෙන ඈ කැඳවා ගෙන ගොසින් සුළු පියාණන් අතට පාවා දී තුමූ බුදු සසුන් වැද මහණ ව රහත් වූහ. එ කල ඇගේ සුළු පියා සිතනුයේ 'මා ගේ දියණියෝ එ සේ මෙ සේ ලාමක සත්ත්ව කෙණකුන්ට සුදුසු කෙණෙක් නොවෙති. එක් රජ්ජුරු කෙණකුන්ට ම සුදුස්සහ' යි සිතා ඈ කොසඹෑ නුවරට කැඳවා ගෙන

1. කියටියක්.

Non-Commercial Distribution

ගොසින් පා මුදු-පාඩගම් ආදී වූ සියලු ආභරණයෙන් දෙව්හනක සේ සරහා මේ ස්ත්‍රී රත්න ය මුඹ වහන්සේට සුදුසු ය යි උදේනී රජ්ජුරුවන්ට පාවා දින. රජ්ජුරුවෝ ඇගේ රූපශ්‍රී බලා උපන්නා වූ ස්නෙහ ඇති ව අභිෂෙක කොට පන් සියයක් ස්ත්‍රීන් පරිවාර කොට දී අග මෙහෙසුන් කළහ.

මෙ සේ රජ්ජුරුවන්ට පන් සිය පන් සිය ස්ත්‍රීන් විසින් පරිවරණ ලද අග මෙහෙසුන් බිසෝවරු තුන් දෙනෙක් වූහ. එ සමයෙහි ඝොෂක සිටාණෝ ය, පාවාරිය සිටාණෝ ය, කුක්කුට සිටාණෝ ය යි කොසඹෑ නුවර සිටුවරු තුන් දෙනෙක් වූහ. ඔහු වස් වසන කාලය ආසන්න වූ කල්හි පන් සියයක් තාපසවරුන් හිමාලයෙන් අවුත් නුවර පිඬු සිඟා ඇවිදිනවුන් දැක පැහැද තම තමන්ගේ ගෙවලට කැඳවා ගෙන ගොස් වඩා හිඳුවා මියුරු අහර වළඳවා එහි ම වසන පරිද්දෙන් ප්‍රතිඥා කරවා ගෙන ගොස් වස් සාර මස තමන් හැම කෙරෙහි වස්වා වස් අන්තයෙහි නැවත වස් වසන සමයෙහි එන පරිද්දෙන් ප්‍රතිඥා කරවා ගෙන යැවූහ. තාපසවරු එ තැන් පටන් අට මසක් හිමාලයෙහි වැස සාර මසක් ඔවුන් සමීපයෙහි වෙසෙති. ඔහු මෑත භාගයෙහි හිමාලයෙන් එන්නා වූ අතර මඟ එක් වල් කඩක මහත් වූ නුග රුකක් මුල සැතපී උන්හ.

ඔවුන් අතුරෙන් වැඩි මහලු තාපසයෝ සිතන්නාහු 'මේ සා මහත් නුග ගස වසන දේවතාවා මහෙශාඛ්‍ය දෙවතාවකු වූව මැනව. ඔහු දූන් අප හැම වළඳන පැනක් දුන හොත් යහපතැ'යි සිතූහ. ඔවුන් සිතූ සිත දැන දේවතාවා තාපසවරුන්ට වළඳන පැන් දින. නැවත නහන පැන් දුන හොත් යහපතැ යි සිතූහ. දේවතාවා නහන පැන් ද එළවී ය. ඉක් බිති වළඳන ආහාරයක් දුන හොත් යහපතැ යි සිතූහ. දේවතාවා ආහාරය ද එළ වී ය. ඉක් බිති තාපසයෝ සිතන්නාහු 'මේ දේවතාවා අප සිතූ සිතූ සියල්ල ම දෙයි. ඔහු දුටුමෝ නම් යහපතැ යි සිතූහ. එ කල්හි දේවතාවා ගස කඳ පළා ගෙන තමාගේ දිව්‍ය වේශ ය දැක්වී ය. තාපසයෝ දේවතාවා දැක 'තොපගේ සම්පත්තිය ඉතා මහත. කවර කුශලයක් කළා දැ'යි විචාරා 'ස්වාමීනි, මුඹ වහන්සේලාට ඉන් ප්‍රයෝජන කිම ද? ඒ නො විචාරා තිබා පුව මැනැවැ'යි කී කල්හි 'දිව්‍ය රජ්ජුරුවෙනි, තොපගේ රූප සම්පත් හා ආනුභාව දැක ඉතා පහන් සිත් ඇතියම්හ. තොප පූර්ව භාගයෙහි කළ කුශලය ද අසන්නා කැමැත්තම්හ'යි කීහ.

ඒ දේවතාවා ද තමා කළ කුශල ය යන්තමක් හෙයින් ලජ්ජා වෙන් කියන්ට මැළි ව නැවත නැවත තාපසයන් ගත් හැඟි ව

Non-Commercial Distribution

විචාළ කල්හි එ සේ වී නම් ඇසුව මැනවැ'යි කියා තමා කළ කුශල ය පළ කොට කීය. ඒ දේවතාවා වනාහි පළමු ජාතියෙහි දිළිඳු ව බැළ මෙ සොයා ඇවිදිනේ අනේපිඬු සිටාණන් කරා ගොස් එ පවත් කියා සිටාණන්ට බැල මෙ කොට ජීවත් වෙයි.

ඉක්බිති එක් පොහෝ දවසක් පැමිණි කල්හි අනේපිඬු සිටාණෝ විහාරයට ගොසින් අවුත් ගෙට වැද 'එම්බා, මෙ ගෙයි බැළ මෙ කරණ තැනැත්තවුනට අද පොහොය බව කී කෙණෙක් ඇද්දැ'යි විචාර නැතැ යි කී කල්හි 'එ සේ වී නම් ඔහු පමණකට රෑට බත් පිසව'යි කියා සාල් නැළියෙක බත් පිසවා තුබූහ. ඉක්බිති ඒ තෙම දිවා භාගයෙහි වල කළමනා මෙහෙවර කොට සවස අවුත් බත් ලා දුන් කල්හි බඩ සා වේ දැ යි යුහු ව බත් කා නොපියා සිතනුයේ "මෙ තෙක් දවස් මේ ගෙයි මේ වේලාවට බත් ලව, කොමු ලව, මාළු ව'යි මහා කෝලාහල කෙරෙති. අද හැම දෙන ම නිශ්ශබ්ද ව වැද හොවිති. මා එක තැනැත්තවුට බත් ලූහ. කාරණ කිම් දෝ හෝ'යි සිතා 'මේ ගෙයි සෙස්සෝ බත් කැවුද්දැ'යි විචාරා නො කැවූ ය යි කී කල්හි කුමක් නිසා බත් නො කැවූ දැ යි විචාර 'මේ ගෙයි පොහෝ දවස් සවස බත් නො කති. සියල්ලෝ ම පෙහෙ වෙති. යටත් පිරිසෙයින් කිරි බොන දරුවන් දක්වා ත් මුඛ සෝධවා චතුමධුර මුඛයෙහි බහා පෙහෙ කරවති. සුවඳ තෙල් පහන් දැල් වූ කල්හි කුඩා මහත් බාල දරුවෝ පවා තම තමන් හෝනා ඇඳ ආදියට නැඟී හිඳ ද්වත්තිංසාකාර කමටහන පිරිවහති. අපි තොපට අද පොහෝ දවස නියාව සිහි මඳ ව නො කීමහ. එ සේ හෙයින් තොප විචරකට බත් පිසුම්හ බත් කව'යි කීහ.

එ තෙම එ වෙලෙහි 'ඉදින් දැනු ත් පෙහෙ වීම යහපත් වී නම් මම ත් පෙහෙ වෙමි' කියා ඒ යහපත-නපුර සිටාණන් වහන්සේ දන්නා සේක. අපි නො දනුම්හ'යි කී කල්හි 'එ සේ වී නම් සිටාණන් වහන්සේ අතින් විචාරව'යි කියා යවී ය. ඔහු ද ගොසින් සිටාණන් අතින් එ පවත් විචාළහ. එ කල සිටාණෝ 'දැන් බත් අනුභව නො කොට මුව ශුද්ධ කොට පෙහෙවුව හොත් අඩාළ පොහොයෙහි අනුසස් ලැබෙ'යි කීහ. එ තෙපුල් අසා එ තෙම මුඛ ය සෝද එ වෙලෙහි ම පෙහෙ වි ය. එ කල දහවල් මුළුල්ලෙහි ම මෙහෙවර කොට සයින් පීඩිත වූ ඔහුගේ ශරීරයෙහි එක පැහැර රුජා පහරන්ට වන. එ කල්හි ම එ තෙම රුජාව ඉවසිය නොහී රැහැණක් බැඳ යොත් කෙළවර අතින් අල්වා ගෙන පෙරළෙන්නට වන. අනේපිඬු සිටාණෝ එ පවත් අසා

Non-Commercial Distribution

මිණි දඬු වැට පහන් අවුළුවා ගෙන, චතුමධුර ගෙන්වා ගෙන ඔහු ළඟට ගොසින් 'දරුව, මේ කිමෙක් දැ'යි විචාරා ස්වාමීනි, ශරීරයෙහි රුජාවක් පහරන්නේ'යි කී කල්හි 'එ සේ වී නම් නැඟී සිට මේ බෙහෙත් අනුභව කරව'යි කීහ. එ තෙපුල් අසා ඔහු 'ස්වාමීනි, මුඹ වහන්සේ බෙහෙත් රෑ දවස අනුභව කරණ සේක් දැ'යි විචාළ කල්හි සිටාණෝ 'අපට ශරීර අප්‍රාසුවක් නැති වුව අප ගේ ස්වරූප නො විචාරා තෙපි බෙහෙත් කව'යි කීහ. එ තෙපුල් අසා 'ස්වාමීනි, පෙහෙවස් රක්නා වූ මම දවස පුරා ත් පෙහෙ ව ගත නුහුණු වෙමි'යි. යන පණ යේ නමුත් මේ අඩාල පෙහෙවසට වියවුලක් නො කෙරෙමි'යි කියා නැවත සිටාණන් කිව ද පෙහෙවසට අන්තරායෙක් වේ දෝ හෝයි යන භයින් බෙහෙත් අනුභව නො කොට දෙ වන දවස් අරුණු නැගෙන වේලෙහි මළා ගිය මල් දමක් සේ කාල ක්‍රියා කොට ඒ නුග ගස දිව්‍ය පුත්‍ර ව උපන.

එ සේ හෙයින් ඒ දිව්‍ය පුත්‍ර තෙම මේ කාරණ ය කියා 'එකල මට පිටි වහල් වූ අනේපිඩු මහ සිටාණෝ බුද්ධරත්න ය, ධර්මරත්න ය, සංඝරත්න ය යන තුනුරුවන්හි මමත්ව ය ඇතියහ. ඒ සිටාණන් නිසා රක්කා වූ අඩාල පොහොයෙහි අනුසසින් මම මේ සම්පත් ලදිමි'යි කීහ. බුදුහු යන නම අසමින් රත්නත්‍රයෙහි භක්ති ප්‍රෙමයෙන් පිරී ගියා වූ සිත් ඇති ව පන් සියක් තාපසවරු හැම දෙන ම හුනස්නෙන් පැන නැඟී දේවතාවා දිසාවට නැමී දෙහොත් මුදුනෙහි තබා ගෙන 'තොප කියන්නේ බුදුහු ය යි යන නමෙක් දැ'යි විචාරා එ සේ ය යි කී කල්හි එ පරිද්දෙන් ම තුන් විටෙක විචාරා තුන් විට ම 'එ සේ ය, බුදුහු ලොව උපන් සේක. ධර්ම රත්න ය ද පහළ වී ය. ඒ වූ පරිද්දෙන් පිළිපදනා සඞ්ඝ රත්නය ද ලෝකයෙහි පහළ වී ය'යි කී කල්හි:—

'ඝොසො'පි සො දුල්ලභො ලොකස්මිං,
ඝොසො'පි සො දුල්ලභො ලොකස්මිං.'

යනාදීන් තුන් විටෙක උදන් පවත්වා 'බුද්ධ' යන ශබ්ද ය පවා ලෝකයෙහි ඉතා දුර්ලභ ය. එ සේ වූ බුදුන් දක්මෙක, වද රණ බස් ඇසීමෙකැයි කී කල අතිශයින් ම දුර්ලභයහ. එ සේ හෙයින්, දේවතාවාණෙනි, තොප නිසා නො එක් කප් සුවහසෙ කිනු ත් ඇසි ය නො හැකි ඉතා අපූර්ව වූ තුනුරුවනැ යි යන ශබ්ද යක් ඇසුම්හ'යි කීහ.

ඉක්බිති අත වැසි තාපසවරු වැඩි මහලු තාපසයන්ට කියන්නාහු 'මේ බඳු වූ ඉතා දුර්ලභ වූ තුනුරුවන් ලෝකයෙහි පහළ වූ බව අස අසා ප්‍රමාද වීම යුක්ත නොවෙ යි. දැන් ම වහා බුදුන් දකින්ට යම්හ'යි කීහ. එ තෙපුල් අසා වැඩි මහලු තාපසයෝ

Non-Commercial Distribution

හෙම්බා දරුවෙනි, කොසඹෑ නුවර සිටුවරුන් තුන් දෙන අපට බොහෝ උපකාරයහ. සෙට ඔවුන්ගේ ගෙයි දී වළඳා ලොව තුනුරුවන් පහළ වූ බව ඒ සිටුවරුන් තුන් දෙනාට ත් කියා ගෙන යම්හ. ඒ තාක් ඉවසව'යි කියා අත වැසි තාපසවරුන් ගිවිස්වා ගෙන එ දවස් රැඳුනාහ. දෙ වන දවස් සිටුවරුන් තුන් දෙන කැඳ-බත් පිළියෙළ කරවා, හිඳිනා අසුන් පනවා අද අපගේ තාපසවරුන් වහන්සේ වඩනා දවස ය යි නියම දැන පෙර ගමන් කොට ගොසින් තාපසවරුන් දැක වැඳ කැඳවා ගෙන තම තමන්ගේ ගෙවලට ගොසින් පනවන ලද ආසනවල්හි වඩා හිඳුවා අහර වැළඳවූහ. ඒ තාපසවරු අහර වළඳා ඉක් බිති 'අපි යම්හ'යි සිටුවරුනට කීහ. සිටුවරුන් තුන් දෙනා 'ස්වාමීනි, වැසි සාර මස මෙහි ම වස් වසන ලෙස අපි හැම දෙනා වහන්සේ ගෙන් ප්‍රතිඥ ගතුමෝ වේ ද? දැන් කොයි වඩනා සේක් දැ'යි විචාළහ. එ කල්හි තාපසවරු කියන්නාහු ''බුද්ධ රත්න ය, ධර්ම රත්න ය, සඞ්ඝ රත්න ය යන ත්‍රිවිධරත්න ය ලෝකයෙහි පහළ වි ය. එ සේ හෙයින් බුදුන් දකින්ට යම්හ'යි කීහ.

එ බස් අසා සිටුවරු 'ස්වාමීනි, මුඹ වහන්සේලා බුදුන් දකින්ට යන ගමනෙක් වී නම් අපි ත් ඒ බුදුන් දකින්ට යම්හ' යි කීහ. එ කල තාපසවරු 'එම්බා උපාසකවරිනි, තොප හැම ගමනට සැරසී නික්මෙන කල කල් යෙයි. අපි පළමු ව ගොස් බුදුන් දකුම්හ. තෙපි හැම පස්සෙහි එව'යි කියා තුමූ හැම පළමු කොට ගොස් බුදුන් දැක මහත් වූ ප්‍රීති ප්‍රසාදයෙන් ස්තුති කොට රත් මලසුන් පෙළෙක රත් නෙළුඹු කැකුළු පුදනු වන් සේ දෙහොත් මුදුනෙහි තබා වැඳ එකත් පස් ව උන්හ. ඉක්බිති බුදුහු ඔවුන්ගේ අදහස් බලා චරිතානුකූල පරිද්දෙන් දාන කථා ය, සීල කථා ය යනාදී වූ අනුපූර්වී කථා දක්වා බණ වදාළ සේක. ඒ ධර්ම දේශනාව කෙළවර ඇම දෙන ම සිවුපිළිසිඹියාපත් රහත් ව බුදුන් සමීපයෙහි පැවිදි ඉල්වා ඉක් බිති බුදුන් විසින් දකුණත දිගු කොට 'මෙ සේ එව, මහණෙනි, වදාළ බස හා සමග සෘද්ධිමය පා සිවුරු ධර ව ඒහි භික්ෂු භාවයෙන් මහණ ව බුදු සසුන් බැබළවූහ.

ඉක් බිති කොසඹෑ නුවර සිටුවරුන් තුන් දෙන ද පන් සියයක් ගැල් පුරා ගිතෙල්, මී, සකුරු, බත්, සාල්, පිළි ආදීවූ දනොපකරණ ගෙන්වා ගෙන සැවැත් නුවරට අවුත් බුදුන් දැක වැඳ බණ අසා තුන් දෙන සෝවාන් පෙලෙහි පිහිටා ගෙන්වා ගෙන ගිය දනොපකරණයෙන් දන් දෙමින් අඩ මසක් පමණ

Non-Commercial Distribution

කල් බුදුන් කෙරෙහි වැස කොසඹෑ නුවරට වඩනා පරිද්දෙන් බුදුන්ට ආරාධනා කොට ඉක් බිති බුදුන් විසින් 'හෙම්බා ගෘහපතිනි! ශූන්‍යාගාරයෙහි සර්වඥවරයෝ සිත් අලවති' වදළ කල්හි 'ස්වාමීනි, වදළ අභිප්‍රාය හැඟින. වඩනට ආරාධනා කොට එවූ කල වැඩිය මැනැවැ'යි සැළ කොට පෙරළා කොසඹෑ නුවරට ගොස් ඝොෂක සිටාණෝ **ඝොෂකාරාමය** කැරවූ ය. කුක්කුට සිටාණෝ **කුක්කුටාරාමය** කැරවූ ය. පාවාරිය සිටාණෝ **පාවාරිකාරාමය** කැරවූ ය යි මෙසේ සිටුවරුන් තුන් දෙන තුන් මහා විහාරයක් කරවා බුදුන් වඩනට අසුන් යවූහ. බුදුහු ඒ අසුන් අසා ඔවුන් කෙරෙහි කරුණාවෙන් කොසඹෑ නුවරට වැඩි සේක. ඉක් බිති සිටුවරු තුන් දෙන බුදුන් වැඩි පවත් අසා මහත් වූ පූජා සත්කාර කෙරෙමින් පෙර ගමන් කොට විහාරයට වඩා ගෙන ගොස් වෙන වෙන මුර සලස්වා ගෙන බුදුන්ට උපස්ථාන කෙරෙති. බුදුහු ත් ඔවුන් කෙරෙහි කරුණාවෙන් එ කි එ කී දවස් එ කි එ කී විහාරයෙහි වසන සේක් උන් උන්ගේ විහාරයෙහි ලැගි දවස් උන් උන්ගේ ගෙට ම වඩනා සේක.

ඒ සිටුවරුන් තුන් දෙනාට උපස්ථාන කරන්නා වූ සුමන නම් මාලා කාරයෙක් සිටුවරුන් කරා එළඹ 'ස්වාමීනි, මම බොහෝ කලක පටන් මුඹ තුන් දෙනා වහන්සේට උපස්ථාන කොට සිටියෙමි. ඊට මට අනික් ප්‍රත්‍යුපකාරයක් නොකළ මැනව, එක දවසක් දන් දී ගන්නා පරිද්දෙන් බුදුන් වහන්සේ මට අළ මැනව. එසේ කළ සේක් වී නම් ඊට වඩා උපකාර නැතැ'යි කීහ. සිටුවරු තුන් දෙන ඔහුගේ බස් අසා 'එ සේ වී නම් සෙට එක දවසට අවසර දෙම්හ. දන් දෙව'යි කීහ. එ තෙපුල් අසා මාලා කාරයා සක් රුවන ලද සක්විති රජකු සේ මහත් වූ සන්තොෂයෙන් පිනා යහපතැ යි ගිවිස බුදුන්ට ආරාධනා කොට දනොපකරණ සැපයී ය.

—— + ——

## 24. සාමාවතී මරණ පරිදීපන කථා

එ සමයෙහි උදේනී රජ්ජුරුවෝ දවස් පතා සාමාවතීන් පළදින්ට මල් ගන්නා පිණිස අට මස්සක් තබා දෙති. ඒ රන් ගෙන සාමාවතීන් ගේ ඛුජ්ජුත්තරා නම් දසියක් සුමන නම් මාලා කාරයා ළහට ගොසින් දවස් පතා මල් ගෙනවුත් සාමාවතීන්ට දෙයි. එ දවස් සුමන මාලා කාර තෙම සාමාවතීන් ළහ සිට මල් ගන්ට ආවා වූ ඛුජ්ජුත්තරාව දැක 'අද මම බුදුන්ට ආරාධනා කෙළෙමි. වළදා ඉක්බිති සුවඳ මලින් බුදුන්ට පූජා කෙරෙමි. තෝ සිට වළදන තෙන සභායව වතා වත් කොට බණ අසා ඉතිරි මලක් ඇත, ඇරගෙන ය'යි කී ය. හෝ ද 'යහපතැ'යි ගිවිස්සා ය.

Non-Commercial Distribution

සුමන මාලා කාර තෙම බුදු පාමොක් මහ සඟ පිරිස වළඳවා අනුමෙවෙනි බණ පිණිස පාත්‍ර ය ගෙන සිටියේ ය. ඒ වේලෙහි බුදුහු මිහිරි කට හඬින් අනුමෙවෙනි බණට පටන් ගත් සේක. ඛුජ්ජුත්තරා තොමෝ බුදුන් වදරණ බණ අසා සිටියා ම දහසක් නයින් හෙබියා වූ සෝවාන් පෙලෙහි පිහිටියා ය.

ඕ තොමෝ සෙසු දවස් අටමස්සෙන් සතර මස්සක් සඟවා ගෙන සතර මස්සෙක මල් ගෙන ගියා ය. එ දවස් සොර සිත් සහ මූලයෙන් සුන් හෙයින් අට මස්සෙහි ම මල් ගෙන ගියා ය. සාමාවතී ඒ මල් බොහෝ නියාව දැක 'මැණියෙනි, අද අපට රජ්ජුරුවන් වහන්සේ මල් මිල බොහෝ කොට දී පූ සේක් දැ'යි විචාළා ය. ඛුජ්ජුත්තරා තොමෝ 'නැත සවාමිනි කිව. 'එ සේ කල අද මල් බොහෝ වන්ට කාරණ කිම් දැ'යි කී කල්හි 'සවාමීනි, මම මෙතෙක් දවස් මලට ගෙන යන අට මස්සෙන් සතර මස්සක් සොරා ඇර ගෙන සතර මස්සෙක මල් ගෙනාමි. එ සේ හෙයින් මේ තෙක් දවස් මල් බොහෝ නො වේ'යි කිව. අද කුමක් නිසා නො ගත්තෙහි දැ' යි විචාළ කල්හි ඛුජ්ජුත්තරාවෝ මා මල් ගෙනෙන්ට ගිය මාලාකාරීන්ගේ ගෙයි පන් සියයක් පමණ මහ සඟ පිරිවරා වැඩ හිඳ වැළඳූ ගනරන් කඳක් සේ දිලියෙන ශරීරයක් ඇති සියල්ල ගෙවා දත් බුදුරජාණ කෙණෙකුන්ගේ පෙර මා නො ඇසූ විරූ මිහිරි බසක් අසා සක්කාදිට්ඨි-විචිකිච්ඡා-සීලබ්බත පරාමාස යන තුන් දෙස් හා සමඟ සියලු පව් දුරු කොට සෝවාන් පෙලෙහි පිහිටි හෙයින් අද අට මස්සෙහි ම මල් නො වළහා ගෙනාමි' කිවූ ය.

ඉක්බිති 'හෙම්බල කෙල්ල, මෙ තෙක් තී සොරා හැර ගත් ඇම මසුරන් ම වහා ගෙනෙව'යි නො දෙඩා එ බස් අසා සාමාවතී ප්‍රීතීන් පිනා ගොසින් 'මැණියෙනි, ඒ තොප පූ දහම් අමා අප විසිනු ත් පිය හැකි දැ'යි කිව. ඒ තෙපුල් අසා ඛුජ්ජුත්තරාවෝ 'එ සේ ය, පිය හැක්කැ'යි කියා 'එ සේ වී නම් ඉස් සෝධා නහවා පියව'යි කී ය. එ කල සාමාවතී ඛුජ්ජුත්තරාවන් සුවඳ පැන් සොළොස් කළයකින් ඉස් සෝධා නාවා යහපත් සුදු පිළී සහළක් දුන්නු ය. ඛුජ්ජුත්තරාවෝ එයින් එක් සුදු වතක් හැඳ එක් සුදු වතක් එකස් කොට පෙර ව ගෙණ පනවන ලද විසිතුරු ධර්මාසනයකට නැඟී විසිතුරු විජිනි පතක් ගෙන්වා අතින් අල්වා ගෙන පන් සියයක් ස්ත්‍රීන් හා සමග සාමාවතීන් කැඳවා බුදුන් වදාළ පරිද්දෙන් ම බණ කීහ.

Non-Commercial Distribution

ඒ බණ අසා සාමාවතීන් ඇතුළු වූ පන් සියයක් ස්ත්‍රීහු හුනස්නෙහි ම හිඳ සෝවාන් ව ඛුජ්ජුත්තරාවන් වැඳ ගෙන ‘හෙ ව මෙ වෙනි නිවන් රසයක් දුන්නා වූ තෙපි අද පටන් අපගේ මෑණියෝ ය. මෙ තැන්හි මින් සෙසු මෙහෙයක් නො කරව. අපට මවු තනතුරෙහි සිට දවස් පතා බුදුන් සමීපයට එළඹ දෙසූ දෙසූ බණ අසා ධරා ගෙන අවුත් අපට කියව’යි කිවූ ය. ඛුජ්ජුත්තරාවෝ එ පරිද්දෙන් ම දවස් පතා බුදුන්ගෙන් බණ අසා අවුත් කියමින් පසු ව තෙවලා ධැරූ ය. ඉක්බිති බුදුහු ත් ‘එතදග්ගං භික්ඛවෙ මම සාවිකානං උපාසිකානං බහුස්සුතානං යදිදං ඛුජ්ජුත්තරා’යි යනාදීන් ‘බහුශ්‍රැත ව බණ කියන මාගේ ශ්‍රාවිකා උපාසිකාවන් කෙරෙහි ඛුජ්ජුත්තරාවෝ අග්‍රයෝ ය’යි එතදග්‍ර පාලියෙහි තබා වදාළ සේක.

ඉක්බිති ඒ පන්සියයක් ස්ත්‍රීහු ඛුජ්ජුත්තරාවන්ට කියන්නාහු ‘මෑණියෙනි, අපි හැම බුදුන් දක්නා කැමැත්තම්හ. දන්නා යම් පරිද්දකින් බුදුන් අපට දක්වා පියව. සුවඳ මල් ආදීන් බුදුන්ට පූජා කරණු කැමැත්තම්හ’යි කිවූ ය. ඒ අසා ඛුජ්ජුත්තරාවෝ ‘ආයඝ්‍ාවෙනි, රජ ගෙයි කටයුතු නම් ඉතා බැරි දෙයෙක. තොප ඇම කැඳවාගෙන පිටතට යන්ට නො පිළිවනැ’යි කිවූ ය. ඒ අසා සාමාවතීන් ඇතුළු වූ පන්සියයක් දෙන ‘මෑණියෙනි, බුදුන් නො දක්මෙන් අපගේ ජීවිත ය නිෂ්ඵල කොට නොනසව. කිසියම් උපායකින් බුදුන් දක්වා පියව’ කීහ. ඒ අසා ඛුජ්ජුත්තරාවෝ ‘එසේ වුවහොත් තෙපි තොප වසන්නා වූ ගබඩාවල බිතත දෙ දෙනකු බැලිය නො හැකි පරිද්දෙන් ඡිද්‍ර කොට තබා ලා ගඳ දුම් මල් පහන් ආදිය සපයා ගෙන සිවුවරුන් තුන් දෙනාගේ ගෙවලට බුදුන් වඩනා වේලෙහි දක වැඳ පුද ගන්ව’යි කීහ. ඔහු ද එපරිද්දෙන් ම සිට බුදුන් සිටුවරුන්ගේ ගෙට වඩිනා වේලෙහි ද වළඳා විහාරයට නික්මෙන වේලෙහි ද දක වැඳ පුද ගනිති.

ඉක්බිති එක් දවසෙක මාගන්දි තොමෝ තමාගේ ප්‍රාසාදයෙන් නික්ම සක්මන් කරන්නී ඔවුන්ගේ ප්‍රාසාදයට අවුත් වෙන වෙන ගබඩාවල තුබූ සිදුරු දක මේ කිමෙක් දැ යි විචාළා ය. ඔහු ඈ බුදුන් කෙරෙහි වෛර බැඳි බව නො දන ‘බුදුහු නුවරට වැඩි සේක. අපි මෙ තැන සිට බුදුන් වැඳ පුද ගන්නා පිණිස සිදුරු කළම්-හ’යි කීහ. ඒ අසා මාගන්දි තොමෝ ‘මාගේ ශත්‍රැ වූ මහණ භවත් ගෞතමයන් මීට ආ පසු දන් ඔවුන්ට හා ඔවුන්ට උපස්ථාන කරන්නා වූ මේ පන්සියයක් දෙනාට කටයුතු දනිමි’යි සිතා රජ්ජුරු වන් කරා එළඹ ‘මහරජ, සාමාවතීන් ඇතුළු වූ පන් සියයක් දෙන

Non-Commercial Distribution

පිටත අනාචාරයක් ඇති නියා ය. දෙ තුන් දවසකින් තොප දිවි ගනිති' යි කිව. ඒ අසා රජ්ජුරුවෝ 'ඔහු එ සේ නො කෙරෙති' ඇගේ බස් නො ඇදවූහ. මෙ පරිද්දෙන් ම තුන් වරෙක කියා රජ්ජුරුවන් නො අදහන හෙයින් 'එ සේ වී නම් මා ගේ බස් නො අදහන පසු, මහ රජ, තෙපි ම ගොසින් උන් වසන්නා වූ ගබඩාවල් පරීක්‍ෂා කරව'යි කීහ. එ තෙපුල් අසා රජ්ජුරුවෝ ගොස් බලන්නාහු වසන ගබඩාවල සිදුරු දක 'මේ කිමෙක් ද'යි විචාරා එ පවත් ඇති සැටියේ ම කී කල්හි ඔවුන්ට නොකිපී කිසිවකුට නො කියා සිදුරු වස්වා සියලු ම ගබඩාවල උඩින් ජාල කවුළු ලැවූහ. උඩින් සිදුරු ඇති සී මැදුරු[1] කවුළු එ තැන් පටන් ඇති විය.

එ කල්හි මාගන්දී තොමෝ ඔවුන්ට කිසිවකුත් කරවා ගත නො හී 'මොවුන්ට මා කිසිවක් කොට ගත නොහෙත්. මහණ භවත් ගෞතමයන්ට ම කට යුත්තක් කෙරෙමී' සිතා නුවර වැස්-සන්ට අත්ලස්දී 'මහණ භවත් ගෞතමයන් නුවරට සිහා වන් කල්හි තෙපි හැම තොප තොපගේ කෙලි - කොල්ලන් හැර ගෙන ඒ ඒ තැන්හි සිට ආක්‍රොශ පරිභව බැණ ලුහුබඳවා පියව'යි කීහ. ඒ අසා තුනුරුවනෙහි අප්‍රසන්න වූ මිථ්‍යාදෘෂ්ටි ගතුවෝ ඇතුළු නුවරට සිහා වන් බුදුන් දක පසු පස්සෙහි ගොස් ගොස් 'තෝ සොරෙක, අඥනයෙක, මූඪයෙක, ඔටුවෙක, ගොනෙක, කොටළුවෙක, තිරිසනෙක. තිරශ්චීනයෙක, තට සුගතියක් නම් නැත. දුගතිය ම තට අභිමත වේව'යි යනාදී දශ විධ ආක්‍රොශ පරිභව වස්තුවෙන් ආක්‍රොශ පරිභව බණන්ට පටන්ගත්හ. ඒ අසා අනඳ මහ තෙරුන් වහන්සේ බුදුන්ට දන්වන සේක් 'ස්වාමීනි, මේ නුවර වැස්සෝ ඉතා තුනුරුවන්හි ප්‍රසාද නැතියහ. ආක්‍රොශ පරිභව බෙණෙති. මේ නුවර හැර අනික් නුවරකට යම්හ'යි දන්වූ සේක.

ඒ අසා බුදුහු 'ආනන්‍ද ය, අප ගිය ඒ නුවර ඇත්තෝ ත් මෙ සේ ම පරිභව බෙණෙත් නම් අනික් කොයි යමෝ ද'යි වදළ සේක. 'ස්වාමීනි, දඹදිව කුඩා නො ව ත් එසේ වුව එයින් අනික් නුවරකට යම්හ'යි දන් වූ සේක. 'ඒ නුවර මනුෂ්‍යයෝ ත් එ සේ ම බෙණෙත් නම් කොයි යමෝ ද යි, ආනන්‍දයෙනි' විචාළ සේක. 'ස්වාමීනි, ඒ නුවරවාසීහු ත් එ සේ ම පරිභව බෙණෙත් නම් අනික් නුවරකට යම්හ'යි කී සේක. එ කල බුදුහු 'හෙම්බා ආනන්‍දය, ඒ යාම යුක්ත නො වෙයි. යම් තෙනෙක්හි අධිකරණ-යෙක් උපන් නම් එ තැන්හි ම ඒ අධිකරණ ය සන්හිඳී ගිය කල අනික් තෙනකට යන බව සුදුසු ය'යි වදරා 'ආනන්‍දයෙනි, කවුරු

1 සිවු මැදුර

Non-Commercial Distribution

ආක්‍රෝශ බෙණෙත් දෑ'යි විචාළ සේක. එ බසට අනඳ මහ තෙරුන් වහන්සේ 'ස්වාමීනි, දශ – කර්මකාරයන් පටන්ගෙන සියල්ලෝ ම බෙණෙති. දෑන් වූ කල්හි 'හෙම්බා ආනන්‍දයෙනි, මම නම් සටන් බිමට වන්නා වූ ඇතකු වැන්නෙමි. සංග්‍රාම භූමියට වන්නා වූ ඇතු සතර දිශාවෙන් එන්නාවූ ශර ප්‍රහාරය ක්‍ෂමා කරන්නා සේ බොහෝ දුශ්ශීලයන් බණන පරිභව ක්‍ෂමා කිරීම මට සුදුසු ම ය'යි තමන් වහන්සේ, තමන් වහන්සේ ම අරභයා බණ දෙසන සේක් නාග වර්ගයෙහි මේ මතු කියන ගාථා තුන වදාළ සේක.

"අහං නාගොව සඞ්ගාමෙ – චාපාතො පතිතං සරං,
අතිවාක්‍යං තිතික්ඛිස්සං – දුස්සීලො හි බහුජ්ජනො.

දන්තං නයන්ති සමිතිං – දන්තං රාජාභිරූහති,
දන්තො සෙට්ඨො මනුස්සෙසු– යො'තිවාක්‍යං තිතික්ඛති.

වරමස්සතරා දන්තා – ආජානීයා ච සින්ධවා,
කුඤ්ජරා ච මහානාගා – අත්තදන්තො තතො වරං"

මෙහි අභිප්‍රාය මතු කියන නාග වග පළමු වන කථා වස්තුමෙහි ප්‍රකාශ වන්නේ ය. එ සේ හෙයින් මෙ තැන්හි නො දක්වන ලද මේ ගාථා තුනින් වදාළ බණ එතැන්හි පැමිණි ජනයන්ට බොහෝ වැඩ සෑදී ය. මම සේ බණ වදරා 'ආනන්‍දයෙනි, නහමක් සිතව. මොහු සත් දවසක් පමණ බෙණෙති. අට වන දවස් ගොළුවන් සේ තුෂ්ණීම්භූත ව හිඳිත්. බුදුන් විෂයෙහි උපන් අධිකරණයෙක් ඇත් නම් සත් දවසකින් මත්තෙහි නො පවත්නේ ය'යි වදාළ සේක.

ඉක් බිති මාගන්දි තොමෝ බුදුන්ට ආක්‍රොශ පරිභව බණවා එ නුවරින් නික්මවා පිය නො හී කුමක් කෙරෙම් දෝ හෝ යි සිතා බුදුන්ට උපස්ථාන කරන්නා වූ පන් සියයක් ගෑනුන්ට ව්‍යසනයක් කළ මැනැවැ යි කල්පනා කොට එක් දවසෙක රජ්ජුරුවන් රා බොන තෙන සිට උපස්ථාන කරන්නී තමාගේ සුළු පියා උන් තෙනට අස්නක් කියා යවුව. කෙ සේ ද යත්:— නො මළ කුකුළන් අට දෙනකු හා මළ කුකුළන් අට දෙනකු ඇර ගෙන එව. ඇවිදිනු ත් හිණි හිස සිට තමන් ආ බව රජ්ජුරුවන්ට දන්වා රජ්ජුරුවන් ඇතුළට කැඳවා එවුව ත් ඇතුළට නො වැද පළමු කොට නො මළ කුකුළන් අට දෙන එවා මළ කුකුළන් අටදෙනා පසු ව එවුව මැනැව'යි කියා අසුන් යවා චුල්ලූපස්ථායකයාට ද තමා කීවාක් කරණ පරිද්දෙන් අත්ලස් දුන්නී ය.

Non-Commercial Distribution

මාගන්දී බ්‍රාහ්මණයා ද ඈ කී පරිද්දෙන් අවුත් හිණි හිස සිට රජ්ජුරුවන්ට කියා එවා එන්ට කියව යි කියා යවූ කල්හි රජ්ජුරුවන් රා බොන තැනට නො වදිමි' කියා පිටත ම සිටියේ ය. මාගන්දි තොමෝ පළමු කොට අත්ලස් දුන් චුල්ලුපස්ථායකයා කැඳවා 'මාගේ සුළු පියාණන් සිටි තෙනට යව'යි කියා යවූ ය. හෙ තෙම ගොස් උන් දුන්නා වූ නො මළ කුකුළන් අට දෙනා ගෙනවුත් 'ස්වාමීනි, පුරොහිතයන් එවූ පඩුරෙකැ'යි රජ්ජුරුවන්ට දක්විය. රජ්ජුරුවෝ කුකුළන් දැක 'අපට යහපත් අවුළෙක් උපන. කවුරුන් ලවා පිසවමෝ ද'යි විචාළහ. මාගන්දි තොමෝ 'මහ රජ, සාමාවතීන් ඇතුළු වූ පන් සියයක් ගෑනු වූ කලී නිකම් ම හිඳිති. ඔවුන් ලවා පිසවා පියා ගෙන්වුව මැනවැ'යි කිව. ඒ අසා රජ්ජුරුවෝ 'යව, තෙල ගෙන ගොස් ඔවුන්ට දී තෙල කුකුළන් අනික් කෙණකුන්ට නො දී තමන් ම මරා පිස එවන්ට කියව'යි මෙහෙවර කියා යවූහ. චුල්ලුපස්ථායක තෙම 'යහපත, දෙවයන් වහන්සැ'යි ගිවිස කුකුළන් අට දෙන ගෙන ගොස් රජහු කී පරිද්දෙන් කියා ඔවුන් විසින් 'අපි ප්‍රාණ වධ නො කරම්හ'යි 'ඉදින් මළ කුකුළු වී නම් කී පරිද්දෙන් ම පිස එ වන්නමෝ වේ ද'යි ප්‍රතික්‍ෂෙප කළ කල්හි රජ්ජුරුවන් කරා අවුත් එ පවත් කී ය.

මාගන්දි එ පවත් අසා 'මහ රජ, එ සේ කල දුන් ඔවුන් ප්‍රාණ වධ කරණ නියාව ත් නො කරණ නියාව ත් පරීක්‍ෂා කළ මැනව. තුඹ වහන්සේට ය'යි කී හෙයින් නො පිසූ බව මුත් 'මහණ භවත් ගෞතමයන්ට පිස දෙව යි කියා යවුව හොත් දුන් ම තෙලේ කුකුළන් තුමූ ම මරා පියා ඇසිල්ලකින් පිස දෙති' කිවු ය. රජ්ජුරුවෝ එ සේ වී නම් එ පරිද්දෙන් ම කියා යවූ ය. එ කල පළමු අත්ලස් ගත් චුල්ලුපස්ථායකයා ඒ කුකුළන් ගෙන යන්නක්හු මෙන් මඳක් තැන් ගොස් ඒ නොමළ කුකුළන් පුරොහිතයා අතට දී පියා මළ කුකුළන් අට දෙනා ඇර ගෙන සාමාවතීන් ළඟට ගොස් ''මේ කුකුළන් මස් කොට ඉඳුරා පිස පියා බුදුන් වළඳව'යි රජහුගේ මෙහෙවර බව කීයේ ය.

ඔහු ඒ උපක්‍රම නො දන සැබවින් සැදැහැයෙන් කියා එවූ බසෙකැ යි සිතා මළ කුකුළන් හෙයින් ''මේ අපට සුදුසු මෙහෙවරෙක් ම ය'යි කියමින් ඉදිරියට ගොස් කුකුළන් ඇර ගත්හ. චුල්ලපස්ථායකයා රජ්ජුරුවන් ළඟට ගොස් 'කිමෙක් ද, සග ය'යි විචාළ කල්හි 'මහ රජ, 'මහණ භවත් ගෞතමයන්ට මේ කුකුළන් පිස දන් දෙව'යි කී ඇසිල්ලෙහි ම මා ඉදිරියට

Non-Commercial Distribution

අවුත් ඇර ගත්හ'යි කීහ. එ කල්හි මාගන්දි තොමෝ 'මහ රජ, නුඹ වහන්සේට ය'යි කී 'කල ප්‍රාණවධ නො කරමහ'යි දැමි කම කියා ගෙන නො පිසන නියාව ත්, ශ්‍රමණ භවත් ගෞතමයන්ට ය යි කී කල පිසන නියාව ත් දුන් ම දුටුසේක් වේ ද? උන් ඇම ගේ තරම දන මා නො එක් වාරයෙහි පිටත අනාචාර ඇති ව වසන බව කීව ත් මා ගේ බස නො ගිවිස්නා සේක් වේ ද? දුන් දැනී ගියේ දැ'යි කිව. ඈ එ සේ කිව ද රජ්ජුරුවෝ පොරොත්තුව කිසිවකු ත් නො කීහ.

ඉක් බිති මාගන්දි තොමෝ මෙ තෙක් උපාය කොට ත් අන්තරායක් පමුණුවා පිය නො හී අනික් කවර උපායකින් මූන් හැම නසා පියම් දෝ හෝයි සිත සිතා වෙසෙ යි. එ සමයෙහි රජ්ජුරුවෝ සාමාවතී ය, වාසුලදත්තා ය, මාගන්දි ය, යන තුන් දෙනා ගේ ප්‍රාසාද තුනෙහි මුරයෙන් මුර තබා ගෙන එ කී එ කී මුරයෙහි සත් සත් දවස් වෙසෙති. එ කල්හි මාගන්දි තොමෝ සෙට හෝ අනිද්ද හෝ රජ්ජුරුවෝ සාමාවතීන්ගේ ප්‍රාසාදයට යෙති, නියම දන තමාගේ කුඩා පියාට කියා යවා දළෙහි ඖෂධ ගල්වා විෂ නැති කළ නයකු ගෙන්වා ගෙන තබා ගත. රජ්ජුරුවෝ යන යම් ම තැනකට තමන්ගේ හස්තිකාන්ත වීණාව ඇර ගෙන ම යෙති. ඒ වීණා පොකුරෙහි ද සිදුරෙක් ඇත.

මාගන්දි තොමෝ ඒ සිදුරෙන් නයා ඇතුළෙහි ලා පියා මල් වටකින් සිදුර වසා තබා සජීයා දෙ තුන් දවසක් නිරාහාර කොට හොවා ලා රජ්ජුරුවන් යන දවස් නියම දන ළඟට ගොස් 'දෙවයන් වහන්ස, අද කාගේ ප්‍රාසාදයට වඩන සේක් දැ'යි විචාරා 'සාමාවතීන්ගේ ප්‍රාසාදයට ය' යි කී කල්හි 'සවාමීනි, ඊයේ රෑ නපුරු සිනයක් දිටිමි. ඔබ නො වැඩිය මැනැවැ'යි තුන් විටෙක වළකා රජ්ජුරුවන් නො වැළැක ම යන්නා දැක 'එ සේ වී නම් දුටුවක් දකිමි. මම ත් නුඹ වහන්සේ හා එක් ව ම එමි'යි පිටත් ව රජ්ජුරුවන් වැළකුව ද නො වැළැක ම කුමක් වී නමුත් කැටු ව ම දකිමි කිය කියා රජ්ජුරුවන් හා එක් ව ම ගියා ය. රජ්ජුරුවෝ සාමාවතීන් දුන් මල් ආභරණ පැළඳ ඇඟ සුවඳ ගල්වා සළු පෙරළා සළු හැඳ මියුරු වූ රාජභොජන ය අනුභව කොට හස්ති කාන්ත වීණාව ඉස් දෙර තබා ගෙන ශ්‍රී යහන මත්තෙහි වැද හෙව නිදන්ට පටන් ගත්හ.

එ වේලෙහි මාගන්දි තොමෝ සක්මන් කරණ ලෙසින් ඇවිද සිට ලා වීණා සිදුරෙන් මල් වට අයා ගත. එ කෙණෙහි දෙ තුන්

Non-Commercial Distribution

දවසක් නිරාහාර ව හොත්තා වූ සර්පයා වීණා සිදුරෙන් නික්ම සුස්මමින් පෙණය කොට ගෙන ශ්‍රී යහන් මත්තෙහි වැටුන. එ කෙණෙහි මාගන්දි තොමෝ සර්පයා දැක ආදි නො දන්නා එකක සේ 'හෙම්බල, මහ රජ, සර්පයෙකැ'යි කියමින් මහත් කොට මුර ගා හඬා සසලා පියා රජහු පුබුදුවා පියා 'මේ අන්ධ බාල කාළකණ්ණි රජ්ජුරුවෝ මා කී බස් නො ගිවිසිති'යි රජ්ජුරුවනට ආක්‍රොශ පරිභව බැණ 'හෙම්බල නිශ්‍රීක වූ නො කීකරු වූ දුෂ්ට කෙල්ලෙනි, තොප හැම මේ රජ්ජුරුවන්ගෙන් නො ලද්දේ කිම් ද? මේ රජ්ජුරුවන් මළ කල තෙපි හැම සුවසේ රැකෙම්හ යි සිතවු ද? එක විටෙක ත් එ සේ නොසිතව' යනාදීන් සාමාවතීන් හා පිරිවර ගැහැණුන්ට නො එක් පරිභව බැණ පියා "මම අද නපුරු සීනයක් දිටිමි'යි සාමාවතීන්ගේ ප්‍රාසාදයට නො ගිය මැනවැ'යි මා වැනි හිතකාමි බිසොවක නො එක් ලෙස කාරණ කියා මුර ගාමින් සිටිය දී එ බස් නො ගිවිස මේ දුෂ්ට ස්ත්‍රීන් කෙරෙහි ම සිත් අලවා ඉක්මන් ඉක්මන් ව ආ සේක් වේ ද? මඳකින් එහි විපාක දුටු සේක් වේ දැ'යි යනාදීන් නො එක් පරිද්දෙන් බස් කියා රජ්ජුරුවන් කුප්පවා පුව.

රජ්ජුරුවෝ ද සර්පයා දැක මරණ භයින් භය පත්ව 'මෙබන් දක් කරන්නෝ ත් ඇද්ද? අනේ! ඉතා මොවුන්ගේ අදහස පවිටු නියා ය. මම මොවුන්ගේ ලාමක අදහස දැන කියන්නා වූ මේ මාගේ මාගන්දි බිසොවුන්ගේ බස් පවා නො ගිවිස්සෙමි. මූ හැම පළමු තමන් හිඳිනා ගබඩාවල කවුළු තබා ගෙන එයින් නික්ම කැමැත්තක් කොට ඇවිදීයහ. පසු ව මා මාළු පිස එවන්ට කියා තමන් ළඟට යවු කුකුළන් පෙරළා එවා පූහ. අද මා වැද හෝනා යහනෙහි නයින් ගෙන ලවා මරන්ට උපාය කළහ'යි කෝපයෙන් දිළිහුණහ.

එ කල සාමාවතී තොමෝ රජ්ජුරුවන් කිපි බව දැක පන් සියයක් පරිවාර ස්ත්‍රීන් කැඳවා 'හෙම්බා නැගණියෙනි, රජ්ජුරුවන් වහන්සේ නිෂ්කාරණයෙහි අප කෙරෙහි කිපුණු සේක. මෙ තැන්හි අපට අනික් සරණෙක් නැත. අපගේ බුදුහු තමා කෙරෙහි ද්වේෂ කළ වුන්ට මෛත්‍රී කරණ බව ම සියලු උපද්‍රව වැද්ද නො දෙන දිව්‍ය ඖෂධයකැ'යි වදළ සේක. එ සේ හෙයින් අප කෙරෙහි ද, මේ රජ්ජුරුවන් කෙරෙහි ද, අපට බොරුවෙන් වරද සලසන්නා වූ මේ මාගන්දින් කෙරෙහි ද, සම ව මෛත්‍රී සිත් පතුරුව යි, කිසි කෙණකුන් කෙරෙහි ත් ද්වේෂයෙක් නූපදව'යි අවවාද දුන්නු ය.

Non-Commercial Distribution

ඉක්බිති රජ්ජුරුවෝ කෝපාග්නියෙන් නැඟී සිට දහසක් දෙනා නහාලන මැඩහඟු දුන්න නහා දුනුදිය අත පොළා පියා බලා විෂ පෙවූ ශරයක් නිය පිට ලෙළවා ඇද මැඩ පියා හැර ගෙන සාමාවතීන් ඇතුළු වූ ගැහැණුන් පන් සියය පිළිවෙළින් සිටුවා හීය පතකඩ අවුළුවා ගෙන සාමාවතීන්ගේ ළයට අභිමුඛ කොට උර පුරා ඇද අත ඇර පූහ. එ කල්හි ඒ ශර ය සාමාවතීන් ගේ මෛත්‍රියෙහි ආනුභාවයෙන් ආපසු හැරී පගිළිය සාමාවතීන් දසාවට අභිමුඛ ව රජහු ළය පළා පිටත් වන්නක්හු මෙන් සිට ගත.

ඒ දුක රජ්ජුරුවෝ සිතන්නාහු 'මෙ තෙක් දවස් මා විදි ශර ය පර්වතයක් වී නමුත් ගසා ගෙන නික්මෙන බව මිස අතුරෙහි නොරඳ යි. අද මෙ ශර ය අතුරෙහි සිස් හෙයින් වැදගත් දෙය කූ ත් නැත. එතකුදු වුව ත් දුන් මුණ ය පෙරළී මා දසාවට අභි මුඛ වි ය. මෙ සිත් පිත් නැති ශර ය පවා සාමාවතීන්ගේ ගුණ දන්නේ ය. මිනිස් ව ඉපද ත් ඔවුන්ගේ ගුණ නො දන්නෙම් මම ම ය යි අත තුබූ දුන්න හෙළා පියා දෙහොත් මුදුනෙහි තබා ගෙන සාමාවතීන්ගේ පා මුල උක්කුටුකයෙන් හිඳ 'සාමා- වතීනි, සිහි මුළා ව කටයුතු නො කටයුතු සලකා ගත නුහුණු අඥාන වූ මා රැක ගනුව තෙපි ම මට පිළිසරණ වව. මෙ තැන් පටන් තොප සරණ යෙමි'යි මේ මතු කියන ගාථාව කීහ—

'සම්මුය්හාමි පමුය්හාමි – සබ්බා මුය්හන්ති මෙ දිසා,
සාමාවති මං තායස්සු – ත්වඤ්ච මෙ සරණම්භව'යි.

මෙ සේ රජහු කී තෙපුල් අසා සාමාවතී තොමෝ 'යහපත, මහරජ, මම මුඹ වහන්සේට සරණ වෙමි'යි නො කියා 'දෙවයන් වහන්ස, මා සරණ යන්නේ කුමක් පිණිස ද? තමන් සරණ ගියා වූ මාගේ ළයට විදි ශර ය පවා පෙරළා විදි මුඹ වහන්සේ දසාවට මුණ ය සිට ගන්නා පරිද්දෙන් කරවන තරම මහානුභාව ගුණ ඇති උත්තමයාන කෙණකුන්ගේ සරණ ගියෙම් ද, ඒ උත්තමයාණෝ නම් ලෝකයෙහි කිසි කෙණකුන් හා අසාධාරණ ගුණ ඇති බුදු රජාණන් වහන්සේ ම ය. එ වෙනි ඒ බුදුන්ගේ සරණ යව. මෙ තැන්හි වඩ වඩා තෙපි ම මට සරණ වව'යි කියා මෙ මතු කියන ගාථා දෙක කීහ.

'ඉදං වත්වා සාමාවතී–සම්මාසම්බුද්ධ සාවිකා,
මා මං ත්වං සරණං ගච්ඡ -යම'හං සරණං ගතා.
එස 'බුද්ධො මහාරාජ – එස බුද්ධො අනුත්තරො,
සරණං ගච්ඡ තං බුද්ධං – ත්වං ච මෙ සරණං භව'යි.

Non-Commercial Distribution

මෙ සේ සාමාවතීන් කියන තෙපුල් අසා රජ්ජුරුවෝ 'දූන් මම පළමු තරමට ත් අධික ව බා ගියෙමි'යි ගාථාවකින් කියන්නාහු:

''එස හීයෙයා පමුය්හාමි – සබ්බා මුය්හන්ති මෙ දිසා,
සාමාවති මං තායස්සු – ත්වඤ්ච මෙ සරණං භව''යි

යන මේ ගාථාව කීහ. ඉක්බිති සාමාවතී තොමෝ පළමු පරිද්දෙන් ම නැවත ත් ප්‍රතික්ෂෙප 'කොට එ සේ වී නම් තොප සරණ ත් යෙමි. තොප කියන බුදුන්ගේ සරණ ත් යෙමි. තොපට කැමති වරයක් ද දෙමි' කී කල්හි 'මුඹ වහන්සේ දූන් වර ය මා විසිනු ත් ගන්නා ලද්දේ ම ය'යි කිවු ය. එ කල්හි රජ්ජුරුවෝ බුදුන් කරා එළඹ තිසරණ පිහිටා සපිරිවර බුදුන්ට ආරාධනා කොට සත් දවසක් මහ දන් දී සාමාවතීන් කැඳවා 'මට මේ සා ලාභයක් වූයේ තොප නිසා ය. වහා නැඟී සිටුව. තොප කැමැති වරයක් ගන්ව'යි කීහ. එ කල සාමාවතී තොමෝ 'මහරජ, මට රත්රන් – අමුරන් ආදියෙන් ප්‍රයෝජන නැත. ඉදින් මට වරයක් දෙන සේක් වී නම් පන්සියයක් සඟ පිරිස හා සමඟ බුදුන් මා ගේ ගෙට වැඩ අහර වළඳා බණ දෙසා වදරණ පරිද්දෙන් ආරාධනා කළ මැනැවැ'යි කීහ.

එ තෙපුල් අසා රජ්ජුරුවෝ බුදුන් වැඳ 'ස්වාමීනි, පන් සියයක් මහණුන් හා සමග නිබඳයෙන් මේ ගෙට වැඩිය මැනව. සාමාවතීන් ඇතුළු වූ පන් සියයක් ගෑනු බණ අසනු කැමැත්තෝ ය'යි දූන්වූහ. එ කල බුදුහු 'හෙම්බල, මහරජ, සර්වඥවරයෝ නම් සියල්ලවුන් කෙරෙහි අනුකම්පා ඇතියහ. මහා ජනයෝ ද සර්වඥවරයන්ගේ දක්ම ම ප්‍රාර්ථනා කෙරෙති. එ සේ හෙයින් එක තෙනකට නිබඳ ව ගිය කල සෙසු මහා ජනයෝ කෙ සේ පින් කොට ගනිද්දැ'යි වදාළ සේක. එ තෙපුල් අසා රජ්ජුරුවෝ 'එසේ කල, ස්වාමීනි, සාමාවතීන් ඇතුළු වූ ස්ත්‍රීන් පන් සියයට බණ කියන සේ එක්කෙණකුන් වහන්සේ නිළ කල මැනවැ'යි කිවු ය. බුදුහු එපවත් අසා අනඳ මහ තෙරුන් වහන්සේ කැඳවා ආනන්දයෙනි, මෙ වක් පටන් තෙපි මේ උදේනී රජුගේ අන්තඃපුරයට බණ කියව'යි අනඳ මහ තෙරුන් වහන්සේ බණ කියන ලෙස සලස්වා වදාළ සේක.

අනඳ මහ තෙරුන් වහන්සේ ද පන් සියයක් මහණුන් පිරිවරා රජ ගෙට වැඩ නිබඳයෙන් බණ වදරණ සේක. ඒ ස්ත්‍රීහු පන් සියය ද නිබඳයෙන් ඒ පන් සියයක් දෙනා වහන්සේ වළඳවා අනඳ මහ තෙරුන් වහන්සේ අතින් බණ අසති. ඉක්බිති එක්

Non-Commercial Distribution

දවසෙක තෙරුන් වහන්සේ වදරණ බණ අසා පැහැද ඒ පන් සිය යක් බිසෝවරු පන්සියයක් උතුරු සළු පිදූහ. එයින් එකි එකී උතුරු සළුවෙක් පන්සියයක් පන් සියයක් අගනේ ය. දෙ වන දවස් රජ්ජුරුවෝ ඒ බිසෝවරුන් පන් සිය ය උතුරු සළු නො ලා සිටියා දැක 'තොපගේ උතුරු සළු කොයි දැ'යි විචාළ හ. ඔහු 'ස්වාමීනි, අපි අනඳ මහ තෙරුන් වහන්සේගෙන් බණ අසා ඔබට ධර්ම පූජා කළම්හ'යි කීහ. ඒ අසා රජ්ජුරුවෝ ඒ පන්සියයක් සළු අනඳ මහ තෙරුන් වහන්සේ ම පිළිගත් සේක් දැ'යි විචාරා 'එසේ ය. සළු පන් සියයම පිළිගත් සේකැ'යි කී කල්හි රජ්ජුරුවෝ අනඳ මහ තෙරුන් වහන්සේ කරා එළඹ පසඟ පිහිටුවා වැඳ එකත් පස් ව හිඳ විචාරන්නෝ 'ස්වාමීනි, අපගේ බිසෝවරු මුඹ වහන්සේ ගෙන් බණ පමණක් ම අසද් ද? නොහොත් ධර්ම පූජා ත් කෙරෙද්දැ යි විචාළහ.

එ කල මහ තෙරුන් වහන්සේ 'එ සේ ය, මහ රජ, බණ ත් අසති. ඊයේ දවස් උන් තමන්ගේ උතුරු සළු පන් සියයක් පිදූහ'යි වදාළ සේක. ඒ අසා රජ්ජුරුවෝ 'ස්වාමීනි, පිළි ඉතා බෙහෙව. මෙ තෙක් පිළි කුමක් කරණ සේක් දැ'යි විචාළහ. තෙරුන් වහන්සේ 'මහ රජ, අපි අපට ප්‍රයෝජන විචරක් ඇර ගෙන සෙසු පිළි සිවුරු දුර්වල ව තිබෙන වහන්දෑට දෙම්හ'යි වදාළ සේක. ඔහු තමන්ගේ පොරණ දිරාගිය සිවුරු කුමක් කෙරෙද්දැ'යි විචාළහ. ''ඒ සිවුරු ඉතා දුර්වල සිවුරු ඇති වහන්දෑව දෙති.' වදාළ සේක. 'ඔහු තමන්ගේ ඉතා දිරුණු සිවුරු කුමක් කෙරෙද් දැ'යි විචාළහ. 'පසතුරුණු කෙරෙති' වදාළ සේක. 'පොරණ පසතුරුණු කුමක් කෙරෙද් දැ'යි විචාළහ. 'සාංඝික බිම බුමු තුරුණු කෙරෙති' වදාළ සේක. 'පොරණ බුමු තුරුණු කුමක් කෙරෙද් දැ'යි විචාළහ. 'පාපිස්නාබිසිකෙරෙති'වදාළ සේක. 'පරණ පා පිස්නා බිසි කුමක් කෙරෙද් දැ'යි විචාළහ. 'සැදැහැ ඇත්ත වුන් දුන් දේයධර්ම ය නිෂ්ඵල නුවූව මැනවැ'යි කඩ කඩ කොට කොටා මැටි හා එක් ව හනා භිත්තිකර්මාන්ත කෙරෙති' වදාළ සේක.

එ තෙපුල් අසා රජ්ජුරුවෝ 'ස්වාමීනි, පිළිවෙළින් මෙ තෙක් තැන ගොසිනු ත් ආයර්‍යයන් වහන්සේට දුන් දන් නො නස් නේ ය'යි කීහ. මහ තෙරුන් වහන්සේ ද 'එ සේ ය, මහරජ, බුද්ධ ශාසනයට දුන්නා වූ දෙය්‍යධර්ම ය නො නස්නේ ය'යි වදාළ සේක. එ වෙලෙහි අතිප්‍රසන්න වූ රජ්ජුරුවෝ අතිකුත් සළු පන් සියයක්

ගෙන්වා ගෙන මහ තෙරුන් වහන්සේගේ පා මුල තබා දුන්හ. අනඳ මහ තෙරුන් වහන්සේ වනාහි මෙ පරිද්දෙන් ම පා මුල තබා දෙන ලද එකක් එකක් ම පන් සියයක් පන් සියයක් අගනා දහස් සළු ලක්‍ෂයක් වාරයෙහි ලත් සේක. දහසක් දහසක් අගනා දහසක් සළු දහසක් වාරයෙහි ලත් සේක. ලක්‍ෂයක් ලක්‍ෂයක් අගනා දහසක් සළු සියක් වාරයෙහි ලත් සේක. එකෙක දෙකෙක තුනෙක සතරෙක පසෙක දසයෙක යනාදී වසයෙන් ලත් සළු මෙතෙකැ යි පමණ ගණන් නැත. බුදුන් පිරිනිවි කල්හි ඒ අනඳ මහ තෙරුන් වහන්සේ මුළු දඹ දිව තලෙහි ඇවිද සියලු විහාරවල වසන වහන්දෑට තමන් වහන්සේගෙන් ම සිවුරු දුන් සේක.

මාගන්දි තොමෝ සිතන්නී 'මා කළ දෙයක් ම මා සිතූ ලෙස නො වී අනික් පරිද්දෙකින් ම වෙයි. මෙ විට කුමක් කෙරෙම් දෝ හෝයි සිතා එක් උපායක් කල්පනා කොට දව සෙක රජහු හා සමඟ උයන් කෙළියට නික්ම තමාගේ සුළු පියා ළඟට කියා යවන්නී 'සාමාවතීන්ගේ ප්‍රාසාදයට වහා ගොස් පිළි තිබෙන ගබඩා හා තෙල් තිබෙන ගබඩාවල දෙරවල් හරවා පිළි ගෙන තෙල් සැළවල ගලා තෙමා කප්වල තෙල් කඩ සිසාරා සාමාවතීන් ඇතුළු වූ ගෑනුන් පන් සියය මාළිගාවට එක් කොට දෙර වසා පිටතින් යතුරු එලා විලක්කුවක් ගෙන මාළිගාවට ගිනිලමින් මතු මහල් තෙලෙන් බැස පියා පලා ගිය මැනැවැ'යි කියා යවූ ය. ඒ අස්න අසා ඇගේ සුළු පියා ද 'යහපතැ'යි ගිවිස සාමාවතීන්ගේ ප්‍රාසාදයට නැඟී ගබඩා ගෙවල දෙර හැර පිළි ගෙන තෙල් සැළවල ගලා තෙමා කප්වල කඩ සිසාරන්ට පටන් ගත.

ඉක් බිති සාමාවතීන් ඇතුළු වූ පන් සියයක් ස්ත්‍රීහු එ පවත් දැක 'මෙ කිමෙක් ද, සුළු පියාණන් වහන්සැ'යි කියමින් සමීපයට එළඹියහ. එ කල එ තෙම 'හෙම්බා දරුවෙනි, රජ්ජුරුවන් වහන්සේ කප් නොදිරා මහත් ව තිබෙන සේ තෙල් කඩ සිසාරන්ට කී සේක. රජ ගෙයි නම් යහපත-නපුර දත නො හැක්ක. දරුවෙනි, මා සමීපයෙහි නො සිටුව'යි කියමින් ළඟට ආවවුන් ගබඩාවලට නික්මවා දෙරවල් වසා පිටතින් යතුරු ලා උඩු මාලෙහි පටන් ඒ ඒ තැන ගිනි ලමින් මාළිගාවෙන් බැසපි ය. එ කල සාමාවතී සෙසු බිසෝවරුන්ට අවවාද දෙන්නාහු 'අප හැම ආදි කෙළවරක් නැත්තා වූ සසර ඇවිදිනා කල්හි මෙ පරිද්දෙන් ගින්නෙන් ද මළා වූ ජාති වෙන වෙන බලතොත් බුදුන් විසිනු දු

Non-Commercial Distribution

පිරිසිඳ දත නො හැක්ක. එ බැවින් මේ සා අනර්‍ථයක් කරණ මේ බමුණා කෙරෙහි ද, මේ වධ යෙදූ මාගන්දි කෙරෙහි ද මෛත්‍රී කරව. පමා නො වව'යි අවවාද කිවූ ය.

එ තෙපුල් අසා බිසෝවරු හැම දෙන ම මාළිගාව දන වේලෙහි වේදනා පරිග්‍රහ කර්‍මස්ථාන ය මෙනෙහි කරන්නාහු සම හරෙක් සෙදගැමි වූහ. සමහරෙක් අනගැමි වූහ. ඉක් බිති බොහෝ වහන් දෑ නුවරට සිහා වන් සේක්, වළඳා පස් වරු බුදුන් කරා එළඹ පත් කඩ තබා වැඳ එකත් පස් ව හිඳ බුදුන්ට දන්වන සේක් 'ස්වාමීනි, මෙ නුවර උදේනි රජ්ජුරුවන් උයන් කෙළියට යාදී මාළිගාව ගිනි ගත. සාමාවතීන් ඇතුළු වූ පන් සියයක් බිසෝවරු ද මළහ. ඒ බිසෝවරුන්ට නරකගති ආදි වූ පඤ්ච ගතියෙන් කවර ගතියෙක් වී ද? පර ලොව කවර වැඩෙක් වී දූ'යි විචාල සේක. එ තෙපුල් අසා බුදුහු 'හෙම්බා මහණෙනි, එයින් සමහරෙක් සෝවාන් වූවාහු ත් ඇත. සෙදගැමි වූවාහු ත් ඇත. අනගැමි වූවාහු ත් ඇත. මහණෙනි, ඒ සියලු උපාසිකාවරු ම නිෂ්ඵල නො වී සඵල ව කාල ක්‍රියා කොළෝ වේ දූ'යි වදාළ සේක. ඉක් බිති බුදුහු මෙ කාරණ ය අරහයා උදන් අනන සේක්—

"මොහසම්බන්ධනො ලොකො – භබ්බරූපො 'ව දිස්සති,
උපධිසම්බන්ධනො බාලො – තමස්ස පරිවාරිතො;
සස්සති විය ඛායති – පස්සතො නත්‍ථි කිඤ්චනං" යි.

මෙ සේ උදන් අනා වදුරා 'හෙම්බා මහණෙනි, සසර ඇවිදිනා සත්‍වයෝ ඇම කල්හි ම අප්‍රමාද ව කුසල් කෙරෙති යනු නියම නැත. ප්‍රමාද ව අකුසලු ත් කෙරෙති. එ සේ හෙයින් සසර ඇවිදිනාහු සුව දුක් දෙක අනුභව කෙරෙති' යි බණ වදාළ සේක.

උදේනි රජ්ජුරුවෝ සාමාවතීන්ගේ ප්‍රාසාද ය ගිනි ගත් බව අසා දිවන්නාහු ද ගෙය නො දන තෙක් ආ නුහුණහු ය. අවු දින් වනාහි ගෙයි ගිනි නිවා උපන්නා වූ බලවත් ශොක ඇති ව ඇමැතියන් පිරිවරා හිඳ සාමාවතීන්ගේ ගුණ සිහි කෙරෙමින් මෙ කවුරුන් කළ දෙයක් දෝ හෝ යි සිතා මාගන්දි විසින් කළ කට යුත්ත බව දැන 'මෑ අතින් භය ගන්වා විචාළො ත් නො කියන්නී ය. උපායෙන් සෙමෙන් වීචාරමි' යි සිතා අමාත්‍ය වරුන්ට කියන්නාහු 'හෙම්බා පින්වත්නි, මම මීට පළමු එකා වන් ව මෝ මට කවර අවැඩක් කෙරෙද් දෝ හෝ යි සැක ඇතිව ම හිඳිමි. උයි ත් මට අවසරයක් ම සොයයි. දැන් මා සිතට සැප වී ය. මෙ තැන් පටන් සැප සේ වෙසෙමී' කිවු ය.

Non-Commercial Distribution

එ තෙපුල් අසා ඇමැතියන් 'දෙවයන් වහන්ස, මේ කොළෙත් කවුරුදැ'යි විචාළ කල්හි 'කවුරුන් විසින් වී නමුත් මා කෙරෙහි ස්නේහයෙන් ම කළ දෙයෙක් මැ'යි කිවු ය. සමීපයෙහි සිටි මාගන්දී තොමෝ රජහු කී බස් අසා 'දෙවයන් වහන්ස, අන් කවරෙක් මෙ සේ කරන්ට සමර්ථ වේ ද? මම මාගේ සුළුපියාට කියා ගිනි දල්විමි'යි කීහ.

එ තෙපුල් අසා රජ්ජුරුවෝ 'තොප හැර මා කෙරෙහි අතික් ස්නේහ ඇති කෙණෙක් නම් නැත. තොප කෙරෙහි දැන් ඉතා සතුටු වීමි. මා සිත සතුටු කරවූවා වූ තොපට කැමති වර යක් දෙමි. තොපගේ නෑයන් වහා කැඳවා ගෙන එව'යි කිවු ය. උයි ත් 'යහපතැ' යි ගිවිස නෑයන්ට කියා යවන්නී 'මා කෙරෙහි රජ්ජුරුවෝ සතුටු ව දැන් වර දෙමැ'යි කිවු ය. හැම දෙනා ම තොලස් ව වහා අව මැනවැ'යි කියා යවූ ය. එ බස් අසා ආවා වූ මාගන්දියගේ නෑයන්ට මහත් සත්කාර කළහ. එ පවත් අසා මාගන්දියගේ නො නෑයෝ ද අත්ලස් දී අපි මාගන්දියගේ නෑයෝ ය'යි කියමින් අවුත් වන්නු ය. රජ්ජුරුවෝ හැම දෙනා ම අල්වා රාජාඞ්ගණයෙහි පෙකිණි වට පමණ වළ කණවා ඔවුන් එහි බහා හිඳුවා වටින් පස් පුරවා මත්තෙහි පිදුරු ඉස්වා ගිනි ගසා ඔවුන් ශරීරයෙහි සම් පමණක් දැ කල්හි නඟුලින් සාවා කඩ කඩ කොට හිර හිරා වධ කොට මැරූ ය. මාගන්දිය වනාහි ඇගේ ශරීරය ය තියුණු මුවහත් ඇති ශස්ත්‍රයෙන් සන බොල් තෙත මස් උපුටා තෙල් ඇතිලියක් උදුනෙහි තබා පූප ජාතියක් මෙන් බැද බැද ඇ ම කැවූ ය.

ඉක්බිති ධම් සෙබෙහි රැස් වූ වහන්දෑ ඔවුනොවුන් හා කථා කරණ සේක් 'ඇවැත්නි, මෙ වෙනි ශ්‍රද්ධාසම්පන්න උපාසිකා-වරුන්ට මෙ වෙනි මරණ ඒකාන්තයෙන් ම සුදුස්සෙක් නො වේ'යි යනාදීන් කථාවක් ඉපද වූ සේක. එ කල බුදුහු එ තැනට වැඩ 'මහණෙනි, දැන් මා එන්නාට පළමු කවර කථාවකින් යුක්ත ව මෙ තැන්හි හුනුදැ'යි විචාරා මෙ පවත් දැන් වූ කල්හි 'මහණෙනි, මේ ජාතියෙහි සාමාවතීන් ඇතුළු වූ ගැහැනුන්ට මේ මරණ යුක්ත නො වෙ යි පෙර ජාතියෙහි ඔවුන් කළා වූ අකුශල කර්මයට මේ පැමිණියා වූ මරණ සුදුස්සේ ම ය'යි වදරා 'කිමෙක් ද ස්වාමීනි, මොවුන් හැම විසින් පෙර කුමක් කරණ ලද ද? ඒ විස්තර වශයෙන් අපට වදළ මැනවැ'යි ආරාධිත වූ බුදුහු ඉකුත් වත් දක්වා වදළ සේක.

Non-Commercial Distribution

මේ කෙසේ ද යත්:-

'යට ගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙණකුන් රාජ්‍ය කරණ සමයෙහි ඒ රජහුගේ ආරාධනා වෙන් පසේ බුදුන් අට දෙනෙක් රජ ගෙයි දී නිබඳ ම වළඳති. එ කල රජහුගේ පන් සියයක් ස්ත්‍රීහු පසේ බුදුවරුන්ට උපස්ථාන කෙරෙති. පසේ බුදුන් අට දෙනා අතුරෙන් සත් දෙනෙක් හිමවතට යෙති. එක් පසේ බුදු කෙණෙක් ගං අස තණගබෙක ධ්‍යානයට සම වැද හිඳිති. ඉක්බිති එක් දවසෙක රජ්ජුරුවෝ පසේ බුදුවරුන් වළඳවා රජගෙන් ගිය කල්හි ඒ තමන්ගේ පන් සියයක් ස්ත්‍රීන් කැඳවා ගෙන දිය කෙළියට ගඟට ගියෝ ය. එ කල්හි ඒ ස්ත්‍රීහු දවස භාග ය මුළුල්ලෙහි ගඟ දිය කෙළ දියෙන් ගොඩ නැඟී ශීතයෙන් පීඩිත ව ගිනි තපනා කැමැති ව 'අප ගිනි මොළවා ගන්නා තැනක් බලව'යි ඔබමොබ ඇවිදින්නාහු තණ ලැහැබ දැක හුදක් තණ රැසෙක් ම ය යි සිතා වට කොට සිටි යාහු ගිනි ලූහ.

තණ ද වගුළ කල්හි ඒ පසේ බුදුන් දැක 'අනේ අපට වූ යේ අපරාධයෙක. රජ්ජුරුවන්ගේ පසේ බුදුන් වහන්සේ දන සේක. මේ බව රජ්ජුරුවෝ දැකපු නම් අපට නිග්‍රහ කෙරෙති. එ බැවින් රජ්ජුරුවන් නො දක්නා පරිද්දෙන් මේ පසේ බුදුන් වහන්සේ ඉඳුරා ම දවාපුව මැනව'යි සිතා ඒ ස්ත්‍රීහු හැම දෙන එක් ව වටින් දර ඇද ලා පසේ බුදුන් වසා මහත් දර රැසක් කොට ගිනි දල්වා මෙ විට පසේ බුදුන්ගේ ඇට පමණකු ත් නො තිබී ද යන්නේ ය යි සැක නැති ව ගියහ. ඒ ස්ත්‍රීහු පන්සියය පළමු නො දැක වධක චේතනාවක් නැති ව ගිනි ලූවාහු වී නමුත් පසු ව වධක චෙතනාවෙන් ම කළ උපක්‍රම හෙයින් අකු ශල කර්මයෙන් බැඳුනාහ. පසේ බුදුන්ගේ චනාහි සමාපත්ති ඇතුළත දහස් ගණන් ගැල් පුරා දර ගෙනවුත් ලමින් ගිනි ගැසුවාහු වී නමුත් ශරීර ය දවන්නා තබා ලෝමකූප මාත්‍රය කුත් හුණු කොට ගත නො හැක්ක. එ සේ හෙයින් ඒ පසේ බුදුහු එයින් සත්වන දවස් කිසි පීඩාවක් නැති ව හුනස්නෙන් පැන නැඟී සැප සේ ගියහ.

ඒ පන් සියයක් ස්ත්‍රීහු එ ම අකුශල කර්මයාගේ විපාකයෙන් බොහෝ ලක්ෂ ගණන් හවුරුදු නරකයෙහි පැසී ශේෂ ව සිටි එ ම අකුශල කර්මයාගේ විපාකයෙන් සියක් ජාතියෙහි මෙ පරිද්-දෙන් ම තමන් වසන ගෙය දන කල්හි එක් ව ද මළාහු ය. මේ උන් පෙර කළ අකුශල කර්ම ය'යි වදාළ සේක.

Non-Commercial Distribution

මම සේ බුදුන් වදාළ කළ වහන්දෑ බුදුන් අතින් නැවත විචාරන සේක් 'ස්වාමීනි, ඛුජ්ජුත්තරාවෝ කවර අකුශලයකින් කුදු වූ ද? කෙසේ වූ කුශලයකින් මහ නුවණ ඇති වූ ද? කවර හේතුවකින් සෝවාන් වූ ද? කුමන අකුශලයකින් අනුන්ට දසි වූ ද'යි විචාළ සේක. එකල 'බුදුහු හෙම්බා මහණෙනි, එම බරණැස රජ්ජුරුවන් රජ කරණ සමයෙහි එම යට කී පසේ බුදුවරුන් අතුරෙන් එක් පසේ බුදු කෙණකුන් මඳක් කුදු ශරීර ඇතියහ. එම පසේ බුදුන්ට උපස්ථාන කරණ එක්තරා ස්ත්‍රියක් රත් වූ කම්බිලියක් පෙරව රන් තැටියක් අතින් ගෙන 'අප ගේ පසේ බුදුන් වහන්සේ මෙ සේ ඇවිදිනා සේකැ'යි කිය කියා නැමුරු ව වක ගසා ගෙන ඒ පසේ බුදුන් ඇවිදිනා ආකාර ය දක්වුව. ඒ අකුශලයෙන් දූන් ඈ කුදු ව ගියා ය.

එම පසේ බුදුවරුන් පළමු වන දවස් රජගෙයි වඩා හිඳුවා පාත්‍ර ය ගෙන්වා ගෙන රජ්ජුරුවෝ උණු කිරි බත් පුරා පිළිගැන් වූහ. ඒ කිරි බත් පිරූ පාත්‍ර ය පසේබුදුවරහු අත දන හෙයින් පිටින් පිට පෙරළ පෙරළා අතින් ගනිති. එම ස්ත්‍රී තොමෝ එ පරිද්දෙන් පෙරළ පෙරළා පාත්‍රය අල්වන පසේ බුදුවරුන් දූක තමා සන්තක දළ කඩ වළලු අටක් දී 'මෙහි තබා ගත මැනැවැ'යි කී ය. ඒ පසේ බුදුවරයෝ ද එ පරිද්දෙන් ම දළ වළලු මත්තෙහි පාත්‍ර ය තබා එහි ආල ය ඇද්දෝ හෝ යි ඒ ස්ත්‍රිය මුහුණ බලා 'ස්වාමීනි, මෙයින් අපට ප්‍රයෝජන කවරේ ද? මුඹ වහන්සේලා ම ඇර ගෙන වැඩිය මැනැවැ'යි කී කල්හි පසේ බුදු වරයෝ රැගෙන නන්‍දමූලපබ්භාරයට ම ගියහ. අද දක්වා ඒ දළ කඩ වළලු නො නැසී එහි ම තිබෙයි. ඕ තොමෝ එහි විපාකයෙන් දූන් මහ නුවණ ඇතියහ. තෙවළාධර වුව. එ කල පසේ බුදුවරුන්ට උපස්ථාන කළ කුශලයෙන් සෝවාන් ඵලයට පැමිණියා ය. මේ ඈ බුද්ධාන්තරයෙහි කළ කුශලාකුශල කර්‍මය ය.

කාශ්‍යප බුදුන් සමයෙහි වනාහි බරණැස් නුවර සිටාණ කෙණකුන්ගේ එක් තරා දුවක් හිර මුඳුනෙන් නැමූ පසු කැට පතක් අතින් ගෙන තමාගේ ශරීර ය සරහමින් හුන්නී ය. ඉක් බිති ඇගේ විශ්වාසික වූ එක්තරා රහත් මෙහෙණින්නක් ඒ සිටු දුව දක්නට ගියා ය. භික්ෂුණීහු රහත් වූවාහු වී නමුත් සවස උපස්ථාන කරණ කුලයන් දක්නා කැමැති වෙති. එ කෙණෙහි සිටු දියණියන් ළඟ යමක් ගෙන්වා ගන්ට කිසි කෙණකු ත් නැත. ඒ සිටු දියණියෝ මෙහෙණින්න දූක 'වඳිමි ස්වාමීනි, තෙල මාගේ ආභරණ ලන කරඬුව ගෙනවුත් දූන මැනැවැ'යි කිවූ ය. එ වේලෙහි

Non-Commercial Distribution

මෙහෙණිනී සිතන්නී 'ඉදින් මම මේ සිටු කුමාරිකාවට පළඳනා කරඬුව ගෙනවුත් නුදුන්නෙම් වී නම් මා කෙරෙහි වෛර බැඳ ගෙන නරකයෙහි උපදිනී ය. ඉදින් දුනිම් නම් අනුන්ට මෙහෙ-වර කරණ සේ දසි ව උපදිනී ය. එ බැවින් නරකයෙහි ඉපැද දුක් ගැන්මට වඩා අනුන්ට දසී වීම යහපත් වේ ද'යි සිතා ඈ කෙරෙහි අනුකම්පාවෙන් ඒ පළඳනා කරඬුව ගෙනවුත් සිටු දියනියන්ට දුන. ඒ මෙහෙණින්න අතින් එ පමණ මෙහෙවර ගත් තා වූ අකු-ශලයෙන් අනුන්ට මෙහෙ කරණ සේ දසී ව උපනැ යි වදළ සේක.

නැවත දවසෙක දම් සෙබෙහි රැස් වූ වහන්දෑ ඔවුනොවුන් හා කථා කරණ සේක් 'හෙම්බා ඇවැත්නි, සාමාවතීන් ඇතුළු වූ පන් සියයක් ස්ත්‍රීහු තමන්ගේ ගෙයි ම ද මළහ. මාගන්දියගේ පන් සියයක් නෑ යෝ මුදුනෙහි පිදුරු ගිනි ලා ය නඟුලින් හිරා බිඳිනා ලද ශරීර ඇති ව මළහ. මාගන්දි තොමෝ ලොහො දිය සේ කකියවන ලද තෙලෙහි බැද මරණ ලද්දී ය. මොවුන් අතුරෙන් කවුරු ජීවත් වූවාහු වෙද් ද? කවුරු මළාහු නම් වෙද්දෑ'යි කියමින් හුන් සේක. එ කල එ තැනට බුදුහු වැඩ මහණෙනි, මා එන්නාට පළමු කුමන කථාවක් කෙරෙමින් හුන්නු දෑ'යි වදරා මෙ පවත් දැන්වූ කල්හි 'මහණෙනි, යම් කෙණෙක් කුසල් කිරී-මෙහි පමා වූ නම් ඔවුහු අවුරුදු සියයක් ජීවත් වෙත් නමුදු මළා නම් වෙති. යම් කෙණෙක් කුසල් කිරීමෙහි නො පමා වූ නම් මළාහු වූ නමුත් නො මළා නම් වෙති. එ සේ හෙයින් මාගන්දි නො මළ ත් මළා නම් වෙයි. සාමාවතීන් ඇතුළු වූ පන් සියයක් ස්ත්‍රීහු මළාහු වූ නමුත් නො මළා නම් වෙති.

''මහණෙනි, කුසල් කිරීමෙහි නො පමා වූවාහු නො මළාහු නම් වෙති'යි වදරා මත්තෙහි දු බණ දෙසන බුදුහු 'හෙම්බා මහ-ණෙනි, නිරන්තර ව සිහි නුවණින් යෙදී නො පමාව කුසල් කිරීම නම් නිවන් පුර වදනා මඟ ය. සිහි මුළාව නුවණින් මෙනෙහි නො කොට සැපතෙහි ලොල් ව කුසල් කිරීමෙහි පමා වීම නම් මරණට මඟ ය. කාරණ කිම යත්:- කුසල් කොට නිවන් දුටු උත්තමයන් නැවත නුපදනා හෙයින් මරණ ත් නැත්තේ ම ය. කුසල් නො කොට අකුසල් කළ අඥාන ජනයන් සසරින් මිදී යා නො හී නැවත නැවත උපදනා හෙයින් මරණ ත් ඇත් ම ය. කුසල් කිරීමෙහි නො පමා වූ නුවණැති සත්ත්වයෝ පමා ව අකුසල් කරණ අඥාන ජනයන් පරිද්දෙන් නො මියෙති. කුසල් කිරීමෙහි පමා වූ සත්ත්වයන්ට සසර දුකෙහි කෙළවරක් නො පෙනෙයි. නො පමා වූ සත්ත්වයන්ට සසර දුකෙහි කෙළවර පෙනෙයි. කුශල කරණයෙහි

පමා වූ සත්‍වයෝ ජාති ආදීන් නො මිදුණු හෙයින් ජීවත් වෙත්, නමුත් මළවුන් වැනියහ. නො පමා වූවාහු වනාහි කුසල් මුහු කුරුව වහා මාර්ගඵල උපදවා දෙවන තුන්වන ජාතියෙහි නූපදනා හෙයින් මළ ද නො මළා නම් වෙති. පමා ව කුසල් නො කළ සත්‍වයෝ මළවුන් මෙන් කිසි පිළිසරණක් කොටගත නො හෙන හෙයින් නො මළාහු වූ නමුත් මළාහු නම් වෙති.

මේ කාරණ ය නුවණැත්තෝ විශෙෂයෙන් දැන බුදු පසේ බුදු මහ රහතන්ගේ ගොචර ය යි කියන ලද සතර සතිපට්ඨානාදී වූ ප්‍රභෙද ඇති සත් තිස් බොධි පාක්ෂික ධර්මයෙහි හා නව විධ ලොකොත්තර ධර්මයෙහි ඇලුම් කෙරෙති. එ සේ නො පමා බැවිහි පිහිටියා වූ නුවණැති සත්‍වයෝ අෂ්ටසමාපත්ති ය යි කියන ලද ආලම්බනූපනිඣ්‍යානය, විදර්ශනා මාර්ග ය යි කියන ලද ලක්‍ෂණොප නිඣ්‍යානය යන දෙ වැදෑරුම් වූ ධ්‍යානයෙන් යුක්ත ව ගිහි ගෙන් පිටත් වූ තැන් පටන් අර්හත් ඵලයට පැමිණෙන තැන් දක්වා නිරන්තරයෙන් පැවැත් වූ කායික-චෛතසික වීර්‍ය්‍යයෙන් යුක්ත ව අනවරතයෙන් කළමනා පුරුෂ වික්‍රමයෙන් යම් ගුණ ධර්මයකට පැමිණිය යුතු ද-ඒ ගුණ ධර්මයට නො පැමිණ හෙවත් වීර්‍ය්‍ය කිරීමට ස්ථාන නොවන්නේ ය යි-අතුරෙහි වීර්‍ය්‍ය පසු නො බස්වා නිරන්තරයෙන් පැවැත්තා වූ තද වීර්‍ය්‍යයෙන් යුක්ත ව ආර්‍ය්‍යඵලය යි කියන ලද සතර ඵලයෙන් නිවන් දහම් පසක් කරන්නා වූ නුවණැත්තාහු විපාක වූසන ය යි කියන ලද ආර්‍ය්‍ය ඵලයෙන් නිවන් දහම් අත් පත් කෙරෙති-හෙවත් කාමයොගාදී වූ සතර යොගයෙන් නිර්භය වූ උතුම් නිවන් අත් පත් කෙරෙති' වදළ සේක.

මේ ධර්ම දෙශනාව කෙළවර බොහෝ දෙනා සෝවාන් ආදී වූ සතර මග සතර ඵලයට පැමිණියහ. එ සේ හෙයින් නුවණැති සත් පුරුෂයන් විසින් සැදැහැ වඩා නො පමා ව කුසල් කොට අජර වූ අමර වූ අතෘප්තිකර වූ නිවන් සම්පත් අත්පත් කරන්ට උත්සාහ කටයුතු.

——— + ———

## 25. කුම්භ ඝොෂක සිටාණන් ගේ කථාව

තව ද බොහෝ සම්පත් ඇත ත් සැපත් මදයෙන් උඩඟු නො ව අනුන්ට යටත් ව විසීම නුවණැති සත් පුරුෂ බොහෝ දෙනාගෙන් හා නිසම්මකාරී රජුන්ගෙන් ගුණ ඇසීමට ද තමන් සැප ත් සස්ථිර කරවා ගැන්මට ද ඒකාන්ත කාරණ වන බව හඟවන පිණිස කුම්භඝොෂක සිටාණන්ගේ වස්තුව දක්වමු.

Non-Commercial Distribution

කෙසේ ද යත්—

රජගහා නුවර ධන සිටාණ කෙණකුන්ගේ ගෙයි අහි-වාතක නම් රෝගයෙක් උපන. ඒ රෝග ය ඇති වූ කල ගෙයි මැස්සන් ආදි කොට ගවයන් දක්වා තිරිසන්නු පළමු කොට මියෙති, ඉක්බිති දාසි දස් ආදීහු මියෙති. ඒ සියල්ලවුන්ට පසු ව ගෙ හිමියෝ මියෙති. එ කල්හි ද එ පරිද්දෙන් ම අහිවාතක රොග ය සියල්ලවුන්ට පසු ව සිටාණන් හා ඇඹෙණියන් ගත. රෝගයෙන් පීඩිත වූ ඔහු දෙදෙන සමීපයෙහි සිටි පුතණුවන් මුහුණ බලා කඳුළු පිරුණු ඇස් ඇති ව ඒ පුතණුවන්ට කියන්නාහු 'පුතණ්ඩ, මෙ රෝග ය ඇති වූ කල ගෙයි භිත්ති බිඳ ගෙන ගියාහු ජීවත් වෙති. තෙපි අප නො බලා ගොස් ජීවත් ව ගෙන පසු ව අවුත් අසවල් තෙන නිධාන කොට තුබූ සතළිස් කෙළක් වස්තුව ඇත. ඒ හැර ගෙන සැප සේ රැකෙව'යි කීහ. එ තෙම ඔවුන්ගේ බස් අසා හඬා වැලප දෙ මවු-පියන් වැඳ මරණ භයින් බිය පත් ව ගෙයි බිත්ති බිඳ ගෙන නික්ම පර්වත ගහනයකට පලාගොස් දෙළොස් අවුරුද්දක් එ තැන්හි වැස පසු ව ආයේ ය. ඔහු බාල කල ගොස් දූළි රවුළු ඇති කල ආ හෙයින් කිසිවකු ත් හැඳින ගත නුහුණු වූ ය.

ඒ තෙම දෙ මවු-පියන් කී සලකුණෙන් වස්තුව තුබූ තැනට ගොස් ධන ය නො නැසුණු බව දැක සිතනුයේ 'මා අඳුනන කිසි කෙණෙක් නැත. ඉදින් මම මේ ධන ය උගුළුවා ප්‍රයෝජන වින්දෙම් වීම් නම් එක් දුඃඛිතයෙක් නිධානයක් උදුරා ගතැ යි මා අල්වා ගෙන බොහෝ සේ වෙහෙස දෙති. එ බැවින් බැළ මෙහෙ කොට ජීවත් වීම නම් යහපතැ'යි සිතා එක් දවසෙක කඩ රෙද්-දක් ඇඳගෙන බැළ මෙහ කරවන කෙණෙක් ඇද්දැ යි විචාරමින් බැළයන්ගේ වීථියට පැමිණියේ ය. ඉක්බිති ඔහු බැළයෝ දැක කියන්නාහු 'ඉදින් තෙපි අපට එක් කාරියක් කර වූ නම් තො පට බත් මිල පමණක් දෙම්හ'යි කිවූ ය. 'කුමන මෙහෙයෙක් ද'යි කී කල්හි, අපගේ මිනිසුන් ඒ ඒ කටයුත්තෙහි යොද විධාන කිරීම පමණෙක. ඉදින් පිළිවන් වී නම් උදසන්හි ම නැඟී සිට 'එම්බා මල්බැයෙනි, වහා නැඟී සිටුව. ගැල් ගෙනෙව, ගොන් යොදව. ඇත්-අස් ආදීන්ට තණ ගෙනෙන්ට යන වේලා ය'යි පිරි-මින්ට විධාන කරව. ගැහැනුන්ට ද එ සේ ම 'මෑණියෙනි, නැහ ණියෙනි, බූණෑණියෙනි, තෙපි හැම ත් නැඟී සිටු ව. කැඳ පිසව. බත් පිසව යි යනාදීන් ඒ ඒ තැන ගොස් විධාන කරව'යි කිවූ ය. උයි ත් 'යහපතැ'යි ගිවිස්සෝ ය. ඉක්බිති උන් වසන්ට ගෙයක් දුන්නු ය. උයි ත් ඒ ගෙයි හිඳ සැතපී ඇම දවස් ම උදසන්හි නැඟී සිට ඒ පරිද්දෙන් මිනිසුන්ට විධාන කොට ඇවිදිති.

Non-Commercial Distribution

ඉක්බිති එක් දවසෙක බිම්සර රජ්ජුරුවෝ විධාන කොට ඇවිදිනා උන්ගේ ශබ්ද ය ඇසූ ය. ඒ බිම්සර රජ්ජුරුවෝ නම් සියල්ලවුන්ගේ ශබ්දයෙහි විභාග දනිති. එ සේ හෙයින් උන්ගේ ශබ්ද ය අසා බොහෝ වස්තු ඇති මිනිසකුගේ ශබ්දයෙකැ යි කිවු ය. ඉක්බිති රජු ළඟ සිටි එක් පුර ස්ත්‍රියක් සිතන්නී 'මේ රජ්ජුරුවන් වහන්සේ එ සේ මෙ සේ වූ නිකම් බසක් නො කියන සේක. මේ කාරණ ය මා විමසනු මැනැව'යි සිතා උන් බලා පරීක්‍ෂා කොට එන සේ මිනිසකු යැවී ය. ඒ මිනිසා වහා දිව ගෙන ගොසින් ඔහු දැක නැවත අවුත් කියන්නේ ඒ විහවී එකෙක් නො වෙයි. බැළයන්ට බැළ මෙහෙ කරණ එක් දුප්පත් මිනිසෙකැ'යි කී ය. රජ්ජුරුවෝ ද මුන්ගේ බස් අසා මුයෙන් නො බැණ හිඳ දෙ වන තුන් වන දවස්හි ද ඔහුගේ ශබ්ද ය අසා පළමු පරිද්දෙන් ම මහ සම්පත් ඇති මිනිසකුගේ ශබ්දයෙකැ'යි කිවු ය.

ඒ පුර ස්ත්‍රී පළමු පරිද්දෙන් ම සිතා නැවත නැවත ත් මිනිසුන් යවා දුක් පත් මිනිසෙකැ' යි කී කල්හි තොමෝ සිතන්නී 'ඔහු දුක් පත් මිනිසෙකැ'යි කිව ත් රජ්ජුරුවෝ නො අදහති. කෙ තෙක් කිව ත් බොහෝ ධන ඇති මිනිසෙකුගේ ශබ්දයෙකැ යි කියා ම කියති. රජ්ජුරුවන් කියන්නේ කාරණයක් ම ය. දැන් මා ම විමසුව මැනව'යි සිතා රජ්ජුරුවන්ට කියන්නී 'දෙවයන් වහන්ස, භාණ්ඩාගාරයෙන් මසු දහසක් ලදිම් නම් මාගේ දුව කැඳවා ගෙන ඔහු වසන ගෙට ගොස් ඒ වස්තුව රජ-ගෙයි ලවා ලම්'යි කිව. රජ්ජුරුවෝ මසු දහසක් දෙවාලූ ය. උඃ ඒ හැර ගෙන දුක් පත් සැටියට දුවණියන් කෙලෙසී ගිය මාලු කඩක් හඳවා ලා උන් හැර ගෙන නික්ම මගී බඳු ව බැළයන් හිඳිනා වීථියට ගොසින් එක් ගෙයකට වැද 'අපි දෙ පුතු මවු ගමනිම්හ.[1] එක් දෙ දවසක් මේ ගෙයි රඳාපියම්හ'යි කිවු ය. 'මේ ගෙයි මිනිසුන් බොහොව. මෙ තැන අවසර නැත. තෙල කුම්භඝොෂකයනගේ ගෙය උන් තමන් පමණක් හෙයින් අවසර ඇත. ඔබ ගිය මැනැව'යි කිවු ය.

ආදි කොට ම එ තැනට යා ම තමන් සිතා ආ කටයුත්තට නො නිසි හෙයින් නො ගිය බව මුත් යා යුතු එ ගෙට ම හෙයින් ගොසින් 'ස්වාමීනි, අපි මගී දුප්පත් මිනිස් කෙණෙකුම්හ. එක් දෙ දවසක් මෙ තැන රඳා පියම්හ'යි කියා උන් බැරි ය යි කීව ත් 'අද එක දවසක් රඳා පියා උදසන යම්හ'යි කියා ලා එ දවස් රඳා ගෙන, දෙවන දවස් උන් තමන්ගේ මෙහෙවර යන්නවුන්ට 'සාල් සුණෙක් ඇත් නම් දුන මැනව. නිකම් හිඳිනා ගමනේ දවාලට

1 ගමනින් මිරිකී ගියම් හ, අපි දෙපුද ම වුම්හ.



Non-Commercial Distribution

බත් පිස තබා ලම්හ'යි බත් පිසීම පිට ලාලා එ දවසු ත් රඳන්ට සිතූහ. කුම්භඝෝෂකයෝ වස්තුව එළිබසිති යන භයින් එ සේ නො කැමැත්තෝ 'මෙ තෙක් දවස් මට පිසන්නෝ අනික් කෙණෙක් ද? මම ම පිස ගෙන කමි'යි කිවු ය. උන් එ සේ කීව ත් හුරු තුඩ සිවැල් තුඩ තුබුවා සේ රජ ගෙයක ත් වැඩී ගත් හෙයින් නො එක් ලෙසින් කියා ගිවිස්වා ගෙන උන් දුන් දෙය නො අල්වා ම තබා ලා වළන් විකුණන තෙනින් කුඹල් වළඳකුත් අංගානියට[1] යවා කැකුළු සාලකු ත් ගෙන්වා ගෙන රජ ගෙයි දී පිසන ලෙසට ම සුදුසුවක් කොට බත් ද ඉති පත් කඩ ලාලා[2] මාළු දෙකක් තුනක් ද පිස ලා වල සිට ආ බැළයාණන්ට බත ලාලූ ය. බත් කා ලා කෑ බතින් ම ආදි වෙග ය නැති ව අදහස මොළොක් වූ කලට 'ස්වාමීනි, ගමන් ඇවිද මිරිකී ගියම්හ. එක් දෙ දවසක් දෙපුතු මවු කැටි ව කපු කැට ලා මෝල් කොවා ලා ත් පය සතපා ගන්නා කැමැත්තම්හ'යි කිවු ය.

උයි ත් උන් ගේ බසු ත් මිහිරි හෙයින් ලාලූ බත් ඊට වඩා මිහිරි හෙයින් 'යහපතැ'යි කිවු ය. රෑ දවස ත් දෙවන දවස ත් බත් මාළුව යහපත් කොට ම දිවි හිමියෙන් වුව ත් රඳන්ට කියන ලෙස ම ඉදි කොට දුන්හ. තරයේ ම තමන් කෙරෙහි නැමුණු නියාව දන 'පය සතපා දවස් ගණනක් ම රඳම්හ'යි කියා ලා රඳා හුන්නෝ මුවාත් යකඩෙකින් බැළයාණන් වැද හෝනා හැදෙහි හැඳ පත් තමන් සිතන ලෙසට හැඳ වියමන් නපුරු හෙයින් දෝ හෝ යි හැඳ වැළ යටි පිටින් කීප තැනකින් හැඳපත් කපා ලූ ය. උන් අවුත් හැඳ බැස හිඳිනා ම හැඳ බොකු පහරින්ට වන. 'හැයි මේ හැඳ මෙ සේ විනැ'යි විචාළෝ ය. 'ස්වාමීනි, මෙ තැනට එන කුඩා බාලයන් නවතා ලන්ට අපට බැරි ය. අවුත් අවුත් ලා මේ හැඳට ම නැඟිලා මොළ කම් කෙරෙති'යි කිවු ය. ඒ අසා බැළයාණෝ 'ඒ එ සේ වී නම් මුඹ හැම නිසා වූ මුළා ය. මෙ තෙක් කල් මම පිටතට යන කල දෙර බැඳ ලා යෙමි'යි කිවු ය. 'මම පුතණ්ඩ කුමක් කෙරෙම් ද මා කීව යි ඒ කුඩා කොල්ලෝ වළකිද්දූ යි කිය කියා දෙ තුන් දවසක් විතර හැඳපත් ක්‍රම ක්‍රමයෙන් කපා හැඳ බොකුරු පැහැරි පැහැරි සේ උන් මුසුප්පු වුව ත් එළී ගෙන තිබෙන ලෙසට අතරතුරෙන් හැඳ පත් දෙකක් තුනක් විතර තිබිය දී සෙසු හැඳ පත් කපා ලූ ය.

එ දවස් රෑ අවුත් හැඳ වැද හෝනා ම හැඳ පත් කඩා ගෙන බිම හිණ. හිස ත් දණ ත් එක් ම වැද ගත. එ වේලෙහි නැඟී සිට වැද හිඳ මා වැදහෝනට යන්නේ ත් කොයි ද, මුඹ හැමට නවා තැන් දී වැද හෝනා හැදිනු ත් නූයෙමි[3]. අනේ මා කරන්නේ

1 ආගානියට 2 ඉතිරි පත් කඩලා 3 හුනුයෙමි

Non-Commercial Distribution

කිම ද'යි කිවු ය. 'පුතණ්ඩ, අපි කුමක් කරමෝ ද? කුඩා කොල්ලන් වළකා ලන්ට කාට පිළිවන් ද? නො කරන්ට කීවොත් කරන්නා ම වූ ය. වන්නාට ය. මුසුප්පු වත් ප්‍රයෝජන කිම ද? මේ වේලේ යා හැකි තැනක් නැති බැවිනු ත් ගිය ත් ඉඩ වගාවක් පෙනෙන්ට නැති බැවිනු ත් අවසරයක් කොට ගෙන වුවත් සැතපුණ මනා වේ දැ 'යි කියා ලා දියණියන් බණවා ලා 'පුත, තොප ගේ බෑණන් වැද හෝනට අවසරයක් පෑ ලව'යි කිවු ය. එයි ත් මෑණියන් කියන්නා ම එක් ඇළයකට නැමී ගෙන 'මෙ සේ අවුත් වැද හොත මැනැවැ'යි කිවු ය. කුම්භඝෝෂකයන් මැළි ව හිඳිනා ම 'රෑ දෙ වරු නො නිඳා හිඳිනට පිළිවන් ද? තුලුන් පෑ ලූ අවසරයේ ගොසින් වැද හොවිද්ද මැනැවැ'යි කිවු ය.

උයි ත් එ දවස් ගොසින් උන් හා සමග එක තැන හෙව මෑණියෝ යම් අදහසකින් හැද පත් කැප්පවූ නම් හැද පත් කැප්පවූයේ මේ නිසා ය යි තමන් නො දත් හෙයින් උන්ගේ ඒ අදහස ම සිද්ධ කළහ. තමන්ගේ අදහස වරදවා පීහ. ඒ නියාවක් වූ නියාව මෑණියන්ට හඟවන්ට කුමාරිකාව හඬා පුව. 'හැයි කුමක් දැ'යි විචාළ කල්හි මෙ බන්දෙක් වී යයි කුමාරිකාවෝ කිවු ය. 'වන්නාට යහපත, කරන්නේ කිම ද? ඒ දරුවන්ගේ ත් තොපගේ ත් කවර වරදෙක් ද? සංසාර දෝෂයක් වුව, තොප ත් හැම දවස් ම මෙ ලෙසින් හිඳිනට බැරි බැවින් එක් තැනෙක රකුණ මැනව. තෙල දරුවන්ට ත් පිස ලා ලන කෙණකුන් ඇත මැනව. උනු ත් හැම දවස් ම මෙ ලෙසින් දවස් යවන්නට බැරි ය. පිස ලාලන කෙණකුන් ඇත මැනවැ'යි කියා ලා බැළයාණන්ට කියා ගෙන හුන් දරු කම එ වක් පටන් හැර බැන කළහ.[1] උභ දෙපක්ෂය ත් එ වක් පටන් සමඟ ව විසූ ය.

කීප දවසක් ගිය කලට බැළයන් හිඳිනා වීථියෙහි උත්සවයක කරන්ට ත් විධාන අසා ත් යම් කෙණෙක් උත්සව නොකොළෝ නම් උන්ට දඩ ත් නිළ කරන්ට විධාන කර එවන්ට ත් කුම්භඝෝෂකයන්ට නො හැඟෙන ලෙස රජ්ජුරුවන්ට පුර වඩු කියා යවු ය. කියා යවු ලෙසට ම රජ්ජුරුවෝ ත් විධාන කොළෝ ය. එ කල කුම්භඝෝෂකයන්ගේ නැන්දණියෝ බෑනණුවන්ට 'මේ වීථියෙහි රදෙල් විධානයෙන් උත්සවයෙක් ඇති වී ය. කළ මනා කුමක් දැ'යි කිවු ය. 'නැන්ද, මම බැළ මේ කොට ත් ඉඳුරා ජීවත් ව ගත නො හෙමි. කුමක් කෙරෙම් දැ' යි කිවු ය. 'හෙම්බා බෑන, ගිහි ව රකෙන කල නයක් නො ගෙන බැරි ය. නො පමා වූවො ත් දරන නය ගෙවන්ට ත්

බැරි නො වෙයි තමා ම පෙර පින් නො කළ කල රජදරුවන්ගේ විධාන නො කරන්ට බැරි ය. හැර ගත් නය නම් පිරිමි කල කවර ලෙස ත් ගෙවිය හැක්ක. යව, ගොසින් ලැබෙන තැනකින් මස්සක් වුව ත්, දෙ මස්සක් වුව ත්, ගෙනෙව'යි කිවු ය. උයි ත් මහා අධනි කෙණකුන් සේ මුසුප්පු ව ගෙන සතළිස් කෙළක් වස්තු තුබූ තෙනින් දුක සේ එක මස්සක් ගෙනවු ය.

පුර වධූ ද ඒ මස්ස අතට හැර ගෙන ඒ රජ ගෙට යවා පියා තමන් අත රන් ඇති හෙයින් ඉන් වියදම් කොට උත්සව කොට ලා නැවත දෙ තුන් දවසකින් රජ්ජුරුවන්ට කියා යවා ආදී ලෙස ම උත්සව කරන්ට ත් නො කළවුන්ට දඩ ත් නියම කරවා ගෙන පළමු කී ලෙස ම බැනණුවන්ට කීහ. උයි ත් බලවත් මුසුප්පු ඇති වත් දඬෙක් වී නම් තුන් මස්සෙකින් නො යන හෙයින් පලා ගොස් දර දියට බඳුව ලා[1] සතළිස් කෙළින් තුන් මස්සක් ගෙනවුත් දුන්හ. පූර වධූ ඒ රනුත් රජ්ජුරුවන්ට යවා පියා තමන්ගේ රනෙකින් උත්සව කොට ලා කීප දවසක් ගිය කල මිනිසුන් එවා ලා බැළයාණන් ගෙන්වුව මැනැවැ'යි රජ්ජුරුවන්ට කියා යවු ය. රජ්ජුරුවෝ උන් සොයා මිනිසුන් යවු ය. ගිය මිනිස්සු කුම්භඝොෂකයෝ නම් කවුරුන් දැ'යි විචාරා සොයා යන්නාහු දැක ගෙන 'එව, පින්වත, රජ්ජුරුවන් වහන්සේ තොප කැඳවා වදළ සේකැ'යි කිවු ය. උයි ත් බා ගොසින් 'මා රජ්ජුරුවන් හඳුනන්නේ නැතැ'යි කියා ලා යන්නට මැළියෝ ය. ඉක් බිත්තෙන් බලයෙන් ම අත අල්වා ගෙන ඇද්දෝ ය.

නැන්දණියෝ ත් උන් දැක නො හඳුනන්නා සේ 'හැයි, කොළ, තොප වැන්නෝ ත් මා'ගේ බැනණුවන් මා ත් බල බලා සිටිය දී අත අල්වා අදිනට නිස්සෝ දැ'යි කියා ලා බැණ 'තෙපි රජ්ජුරුවන් වහන්සේ ළඟට එව. ගුණෙන් කැඳවා ගෙන යාම තිබැද්දී තොප ඇද පැද මෙ ලෙස කළවුන්ගේ අත් කප්පවම්'යි කියා ලා දියණියන් කැඳවා ගෙන පෙරාතු ව පලා ගොසින් රජ ගෙට වැද ලා කොට ගෙන ගිය වෙස හැර ලා සව් බරණ ලා සැරහී දවස් ගණන විසූ ලෙසට දෙවතා දූන් දෙන්නකු පරිද්දෙන් එකත් පස් ව සිටියහ. කුම්භඝොෂකයනු ත් ඇද ගෙන ගියහ. ගොසින් වැද ලා සිටියවුන්ට රජ්ජුරුවෝ 'පූර්ණකුම්භාකෘති වූ කුම්භඝොෂකයෝ නම් තෙපි දැ'යි විචාරා 'එ සේ ය'යි කී කල්හි මෙ තෙක් වස්තු නො නසා පිරිමසා තබා ගෙන අපට ත් භාග නො දී තොප ම ප්‍රයෝජන විඳින්නේ හැයි දැ'යි විචාළෝ ය.

---

1 බඳු පිටලා

Non-Commercial Distribution

'ස්වාමීනි, මට වස්තු කොයින් ද? බැළ මේ කොට රැකෙන් නෙම් වේ දැ'යි කිවු ය. 'අපට හඟවන්නේ හැයි ද? නො හඟවා කියව' යි කිවු ය. 'ස්වාමීනි, මා සඟවන්ට කාරණ කිම් ද? වස්තු ඇත්නම් මේ සා මහත් ආයාසයක් ගත මනා ද? මාගේ වස්තු-වෙක් නැතැ'යි කිවු ය. රජ්ජුරුවන් තමන් ගෙන්වා ගත් දෙතුන් මස්ස උන්ට පෑ ලා 'මේ රන් කා ගේ දැ'යි විචාරා උනු ත් ඒ රන් හැඳින ගෙන 'ඉතිකින් නටිමි. රජ්ජුරුවන් වහන්සේට කෙසේ සම්භ වූ නියා දැ'යි ඇත මැත බලා අර මුන් දෙ පුතු මවුන් වස්තු ඇති නියාවට දෙස් කියන්ට සැරහී සිටියා සේ යහපත් ව සැරහී ගෙන සිටියවුන් දැක 'අනේ කට යුත්තක් බැරි නියා ය. රජ්ජුරුවන් වහන්සේ ම මුන් යවු නියා වේ දැ'යි සිතා ලා 'කුමක් කියම් දෝ හෝයි කුමක් කෙරෙම් දෝ හෝ'යි සිත සිතා සිටි-යෝ ය. රජ්ජුරුවෝ 'කිය, පින්වත, කුමක් නිසා මෙ ලෙස කෙළෙහි දැ'යි කිවු ය.

'රජ්ජුරුවන් වහන්ස, මට පිහිටෙක් නැතැ'යි කියා ලා 'මට ත් වඩා පිහිටක් වුව මනා දැ'යි කී කල්හි 'එ සේ පිහිට වන සේක් වී නම් යහපත් වේදැ'යි කිවුය. 'පිහිට වෙමි. තොපගේ වස්තුව කෙතෙක් ඇද්දැයි' විචාරා 'වඩා නැත, සතළිස් කෙළක් විචර ය'යි කී කල්හි 'වුව මනා කුමක් දැ'යි විචාරා 'ගැල් වුව මැනැවැ'යි කී කල්හි නො එක් සිය ගණන් ගැල් යවා වස්තු ගෙන්වා ගෙන සෙණ්ඩුවාලුවෙහි රැස්කරවා ලා නුවර වැස්සන් ගෙන්වා ලා 'මේ නුවර මෙ තෙක් වස්තු ඇත්තේ කා ගේ දැ'යි විචාළෝ ය.

'කාගේ ත් නැත, වියදම් බොහෝ හෙයින් තව මුඹ වහන්සේ ගෙ ත් මෙ තෙක් වස්තු ඇත් නම් වේ දැ'යි කී කල්හි 'මෙ තෙක් වස්තු ඇත්තවුන්ට කළ මනා කිම් දැ'යි විචාරා 'තනතුරක් දුන මනා වේදැ'යි කී කල්හි මහ පෙරහරින් සිටු තනතුරු දීලා උන් කෙරෙහි රැකුණු දුවණියනු ත් ඒ තරම් සරුසාර මිනිසුන් අපවත් නො කළ මනා හෙයින් උන්ට ම පාවා දෙවා ලොව් සම්පත් දී නිමි කල්හි උන් කැඳවා ගෙන බුදුන් කරා ගොසින් වැඳ ලා 'ස්වාමීනි, මුන් දැක වදළේ ඇත්තේ වේ ද? මුන් තරම් සරු සාර කෙණෙක් නැත. සතළිස් කෙළක් විතර වස්තු ඇති වත් ඉපිල්ලාවාසි කමෙක් වේ ව' යි අභිමානයෙක් වේව යි නැත. කිසිවක් නැති දුක් පත් එකක්හු මෙන් රෙදි කඩක් හැඳ ගෙන බැළ වීථියෙහි බැළයන්ට බැළ මේ කොට ලා ඉඳිති. මම මුන් හඬ ගා ඇවිදිනා කට හඬින් ම සධනි නියාව දැන මෙ සේ වූ උපදෙසින් ගෙන්වා ගෙන වස්තු ඇති නියාවට ඉන් එවා ගත් රන් පෑ ලා උන් ම

Non-Commercial Distribution

ගිවිස්වා ලා ඒ වස්තුව ගෙන්වා ගෙන සිටු සේ සත් දෙවා ලා උන් ගේ සම්පත උන්ට ම නිල කරවා ලා මුන්ගේ තරම් දැන අප ගෙන් දියණි කෙණකුන් මුන්ට පාවා දෙවා ලා බන්ධූන් කොට ගතිමි. මෙ සේ වූ පුරුෂ රත්නයක් දුටු විරූ නැතැ'යි කිවු ය.

බුදුහු ඒ අසා වදාරා 'මහ රජ, යම් කෙණෙක් මෙ සේ මෙ ලෙස කියවා ගෙන ජීවත් වෙත් නම් ඒ යහපත. සොර කම් ආදිය කොට කරණ ජීවිකා නම් මෙ ලොව ත් වධබන්‍ධන ආදියට පැමිණීමෙන් දුක් එළවයි. පර ලොව ත් ඒ මුල් ව වන සැපයෙක් නැත. සම්පත් නැත ත් චතුර් විධ වූ සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍ය ඇති ව සිහි නුවණින් යෙදී කරණ දෙයකුත් යහපත් කොට කියන දෙය කුත් කුසල් වඩනා ලෙස ම යහපත් කොට සිතා නැවත නිදන් බලා කරණ පිළියමක් සේ කළ කල මෙ බන්දෙක් වෙයි කියා මෙ සේ හැමයෙහි ම පරීක්ෂාකාරිව තමා ගෙන් තොරතුරක් අනුන්ට නො පෑ ගිහි වූවො ත් තුලා කූට-මාන කූටාදිය හැර කෘෂි වණික් ආදී වූ නිරවද්‍ය ජීවිකාවෙන් ද ශාසනික වූවොත් කුහනා-ලපනාදී වූ මිථ්‍යාජීව ය හැර දැහැමෙන් සෙමෙන් නො පමාව වසන්නාහට යස ඉසුරු වඩනේය'යි වදාළ සේක.

බණ වදාරා නිමි කල්හි කුම්භඝොෂක සිටාණෝ විසූ ලෙසට සංග්‍රහ ලත් හෙයින් නම් කියවාලා පස් පැණි තකවන්නා සේ[1] රජ්ජුරුවන් ම කොට ලූ සභායෙන් සතළිස් කෙළක් වස්තුවට ත් වඩා සාරව රැක්ක යුතු වූ සෝවාන් පෙලෙහි පිහිටීමෙන් බුදුන් ගෙන් ලොවුතුරා සැපත් ලදහ. සෙසු බොහෝ දෙන නිවන් මහ මුහුදින් එල සමවත් රුවන් ලදහ. මෙ දේශනාව ත් පස්වා දහස මුළුල්ලෙහි බොහෝ දෙන හට බොහෝ ප්‍රයෝජන සාධන්නේ විය.

එ සේ හෙයින් සත් පුරුෂයන් විසින් යම් සේ ධම් සෙනෙවි සාමීන්ගේ සද්ධි විහාරික කෙණකුන් වහන්සේ උපාධ්‍යායයන් වහන්සේ ගෙන් උගත් කා ගියා සී කමටහන තමන් වහන්සේ ගේ චරිතයට අනුකූල නො වන හෙයින් චරිත දැන්ම සියලු ලෙසින් බුදුන්ට මුත් සෙසු තැනට බැරි නියාව හඟවා සාර මසක් මුළුල්ලෙනු ත් රහත් වන්ට නිසි වත් රහත් විය නො හී පසු ව බුදු රජුන් වහන්සේ භවොත්පත්ති නිමන්ට මවා දී ලූ රත් නෙළුම් මලක් දැක රහත් වන ජාති ඇතුළු ව පිට පිට හෙළා පන් සියක් ජාතියෙහි බඩාල් ව උපන් හෙයින් දවා ඇණ වැඩූ රත්රන් දැක අභ්‍යාසයට දුටු රත්නෙළුම් මල වර්ණ කසිනයක් කොට ගෙන ධ්‍යාන උපදවා ගෙන ඒ ම නෙළුම් මල පර වූ නියාව ත් නැති වූ නියාවත් දැක

1. පස් පැනිත්තක් එවන්නා සේ

Non-Commercial Distribution

'භූත්වා අභාවතො නිච්චං – උදයව්‍යය පීළිතා,
දුක්ඛා අවසවත්තිත්තා – අනත්තාති තිලක්ඛණං'

යනු හෙයින් ඉපැද ලා නැති වන හෙයින් අනිත්‍යයහ. උදව් යෙන් පෙළෙන හෙයින් දුක්හ. තමා විසිය නො පවත්නා හෙයින් අනාත්ම ය යි තිලකුණු මෙනෙහි කිරීමෙන් රහත් වූ සේක් ද, ඒ රහත් වීමට රත්රන් දක්මෙ කළ අභියොගය නිසා රත් නෙළුම් මලෙහි වර්‍ණය මුල් වී ද, එ පරිද්දෙන් කුසල්හි තර ව අභ්‍යාස කිරී මෙන් අකුසලින් දුරු ව ලොවී ලොවුතුරා කුසල් සිතින් සිත් සතන් පවිත්‍ර කට යුතු.

———x———

## 26. චූල්ල පන්ථක තෙරුන් වහන්සේ ගේ වස්තුව

තව ද යම් තම් විතර වුව ත් භාවනාමය කුසලය භවක්‍ෂයට මහා ප්‍රයෝජන නියාව දක්වන්නට චූල්ලපන්ථක නම් තෙරුන් වහන්සේගේ වස්තුව කියමු.
කෙ සේ ද යත්:

රජ ගහා නුවර මහා සම්පත් ඇති සිටාණ කෙණකුන්ගේ දුවණි කෙණෙක් වැඩී විය පැමිණි කල දෙ මවු පියන් විසින් සත් මාල් පායෙක උඩු මාලේ ලා රක්නා ලබනුව ත් සිතට ලූ රකව ලක් නැති හෙයින් යෞවන මදයෙන් මත් ව පුරුෂයන් කෙරෙහි ලොල් ව කුලජ කෙණකුන් නො ලදින් තමන්ගේ ම ගෙයි කොල්ලකු හා සහවාස ය කොට 'මෙ තැන රඳා හිඳ මේ අප ගේ අකාරිය අනික් කෙණෙක් දත්තු නම් යහපත් නො වේ'යි සිතා කොල්ලණුවන්ට 'අප මෙ තැන රඳා හිදිනට නො පිළිවන. ඉදින් අපගේ මවු පිය දෙ දෙන මේ දත්තු නම් තමන් කළ තරමට මේ පිටි පෑ තිබෙන හෙයින් දරු කමු ත් වාල් කමු ත් පසු කොට කළ වරදට තරම් ලෙසින් කඩ කඩ කොට කපා දමා පියති. දුරකට පලා ගොසින් වසහම්' යි කීවු ය. කියා ලා තමන් නිස්සාර වුව ත් සාරවස්තු ගෙන යන විතරක් හැර ගෙන ආදි හළ වාසලින් නික්ම දුරු බාම පලා ගොසින් එක් තැනෙක රඳා හුන්හ.

එ සේ වසන කල කොල්ලණුවන්ට දව සිටු දුවණියන් බඩ ක්‍රියා දෝෂයෙන් උන් තමන් නපුරු වුව ත් මුතු බෙල්ලන් බඩ මාහැඟි මුතු ඇතිවන්නා සේ දරු කෙණෙක් ඇති වූහ. ඒ සිටු දුවණියෝ ද දරු ගැබ මුහුකුරා ගොසින් වදනට අවස්ථාවෙහි අර මූට කියන්නෝ 'දරු ගැබ ත් මුහුකුරා ගියේ ය. නෑයන් සියන් නැති තෙන දී දරුවන් වැදීම නිසා තොපට ත් අටවාල. අපට ත්

දක. දෙ මවුපියන්ගේ ඔබට ම යම්හ' යි කුස උපන් දරුවන් ක්‍රියා විරොධි නැති කළාක් මෙන් කිවු ය. දරු ඒ අසා 'ඉදින් මම මුන්දැගේ බසින් ඔබ ගියෙම් නම් ජීවිත ය නැතැ'යි යන හයින් 'අද යම්හ, සෙට යම්හ'යි කියා ම කල් යවයි. සිටු දූවණියෝ 'මේ තමාගේ වරද මහත් සෙයින් යන්ට මැළි ය. දෙ මවුපියෝ නම් දරුවන්ගේ කෙ තෙක් නුගුණ වුව ත් හිත කමින් අඩුවක් නැත්තෝ ය. මේ යේව යි නො යේව යි මම යෙමි' සිතා ලා උන් ගෙන් බැහැරක් ගිය කල ගෙයි ඉද්ද රීල යහපත් කොට තබාලා තමන් දෙමවුපියන්ගේ ඔබ යන නියාව ඉක්බිති ගෙවලට කියාලා නික්මුණාවූ ය. බැහැර ගිය දරු ද ගෙට අවුත් සිටු දූවණියන් නො දැක ඉක් බිති ගෙවල ඇත්තවුන් විචාරා 'දෙ මවු පියන්ගේ ඔබ ගියෝ ය'යි කී කල්හි ගිය දූවණියන්ගෙන් සාරාවන අසා ගෙන් වා ගණිත් දෝ හෝ යි යන හයින් උන් රඳවනු නිසා වහා ලුහු-බඳවා ගෙන ගොසින් අතර මහදී ම දිට.

සිටු දියණියෝ ත් එ තැනදී ම වදපු ය. වැදූ යේ ත් කප්ලක්‍ෂ යක් මුළුල්ලෙහි ශ්‍රාවක බොධියට පිරූ පැරුම් ඇති සසර දුක් ගෙවා නිවන් පුර වදනට ආසන්න ව සිටි මහ පිණැති පුතණු කෙණ කුන. කොල්ලණුවනු ත් 'දරුවන් වදන නිසා ම වේ ද ඔබ නික්මුණේ. සොයා යන බෙහෙද පෙර මහ සම්හවූවා සේ ඒ අතුරු මහ දී ම සිද්ධ වූ පසු මෙ විට කළ මනා කුමක් දැ'යි ගමනේ ම රුචි නැති ව විචාළ කල්හි ඉතිකින් ඔබ ගොසිනු ත් කුමක් ද? කවර යහපතක් අසන්ට යමෝ ද? රඳා හුන් තෙනට යම්හ' යි දෙන්න ම එක් සිත් ව නැවත රඳා ගියහ. උපන් කුමාරයන්ට ද මහ දී උපන් සෙයින් මහට ත් පන්ථ යනු මගධ ව්‍යවහාර හෙයින් පන්ථක ය යි නම් තුබූහ. ඒ කුමාරයන් පිය ඔසවා ඇවිදිනා කලට පෙරළා ත් දරු කෙණෙක් සිටු දූවණියන් බඩ පිහිටියහ. ඒ දරු ගබ ත් මුකුරා ගිය කලට ගමන් සැරූ නියාත් අර මූ මැළි ව කල් යවූ නියා ත් සිටු දූවණියන් නික්ම අතුරු මහදී ම ආදි සේ ම තමන්:

'නිහීයති පුරිසො නිහීන සෙවී
න ච හායෙථ කදචි තුල්‍යසෙවී,
සෙට්ඨමුපනමං උදෙති ඛිප්පං
තස්මා අත්තනො උත්තරිං භජෙථ.

යන්නෙහි නො පිහිටා තෙල ලෙස වුව ත් පෙරළා ත් මහපිණැති පුතණු කෙණකුන් වැදූ නියා ත් දෙමවු-පියන්ගේ ඔබ නො ගොසින් පෙරළා රැඳුණු නියා ත් ආදි ලෙසින් ම දත යුතු. මුන් නො ගොසින් රැඳුණු ලෙස නම් උපන් දරුවන් දෙන්නා ත් සසර ගමන් නැති ව නිවන් පුරෙහි රඳන ලෙසට ය. ඒ කුමාරයනු ත්

Non-Commercial Distribution

මගදී ම උපන් හෙයින් පළමු උපන් තැනැත්තවුන්ට **මහාපන්ථක** ය යි නම් තබාලා පසු උපන් තැනැත්තවුන්ට **චූල්ලපන්ථක** නම් තබා ලූ ය. මෙ සේ නම් තබාලා දරු දෙන්නා ත් හැර ගෙන ඓපර රඳා හුන් තැනට ම ගියහ.

එ සේ ගොසින් වසන කල මහා පන්ථක කුමාරයෝ එක් ව කෙළන කුඩා සුහුන් සිළිපිය, මාලුපිය,[1] මයිල්, මුතුන් ආදීන්ගේ පවත් කියනු අසා මෑණියන්ට 'සෙසු කුඩා කොල්ලෝ තමන් තමන්ගේ නෑයන් සියන්ගේ පවත් කියති. මුඹ දෙන්නා මුත් අපගේ නෑ කෙණකුන් නැති නියා ද'යි විචාළෝ ය. 'පුත, එ සේ ය. තොපගේ නෑයෝ මොබ නැත. රජගහ නුවර මහා ධන සිටාණෝ තොප දෙන්නාගේ මුත්තණුවෝ ය. ඔබ තොපගේ නෑයෝ බොහෝ යයි කිවු ය. කුමාරයෝ ඒ අසා පින් කළ නියාව මහත් හෙයින් 'එ සේ කළ ඔබ නො යමෝ'නැ'යි විචාළෝ ය. නො යන කාරණ ය තත්ව වශයෙන් මෑණියන් කීව ත් බිජුවට මූ- කුරා ගිය කලට කුකුළු පැටවුන් මැත් වන්ට සිතන්නා සේ අර් හත්වයට උපනිශ්‍රයක් මුකුරන හෙයින් කුමාරයෝත් ඔබ ම යන්ට තරයෝ ය. මෑණියෝ ද තමන්ගේ නිකෘෂ්ට අකුශල කර්‍මයට පුතුන්ගේ උත්කෘෂ්ට කුශල කර්‍ම ය බල හෙයින් අදහස් මිරිකා ගත නො හී කොල්ලණුවන්ට කියන්නෝ 'මේ දරුවෝ මුතුන් මිත්තන් ළහට යම හ යි, එක්වන් කියති. අප ඥ මවු-පියෝ අප කළ වරදට උරණ වත් මුත් මරා-පියා මස් කාපිය ත් ද, අප ගේ වරද ඇති හෙයින් අපට කුමක් කෙරෙත් නමුත් තමන් ගේ මුණුබුරන්ට කුමක් කෙරෙද්ද, එව, මේ දරුවන් ඔබ ගෙන යමහ'යි කිවු ය.

ඒ අසා එ තෙම 'මම ඒ මුදළිවරුන් මූණ නො පෙනෙමි. මුඹ හැම කැඳවා ගෙන යන්ට පිළිවනැ'යි කිවු ය. කවර ලෙසකින් වෙව යි මුන් මුන්ගේ මුතුන් මිත්තන් දක්නට වුව මැනවැ'යි කියා ලා දෙන්න ම කුමාරවරුන් දෙදෙනා හැර ගෙන රජගහා නුවර කරා ගොසින් නුවරින් පිටත ශාලාවෙක සැතපී ලා සිටු දුවණියෝ තුමූ ම ආදි කොට තොගොසින් දරු දෙන්නා ත් කැඳවා ගෙන තමන් ආ නියාව දෙ මවු-පියන්ට කියා යවු ය.

දෙ මවු-පියෝ ද ඒ අසා තමන් ඉතා ව්‍යවස්ථිත හෙයින් 'සසර ඇවිදිනාවුන්ට කිසි කලෙක දෙ මවු-පිය ව හා කිසිකලෙක දරුව නුවූ කෙණෙක් සසර අක් මුල් නැත්තා සේ ම නැත. අප ගේ තරමට තමන් කළ කට යුත්ත තමන්ට ම තරම් වත් මුත් අපට තරම් නො වෙයි. තුමූ අපගේ මූණ දකින්ට ආදි ම නැති වූ ලජ්ජාව හෙයින් එත් නමුත් අප හැම ලජ්ජාවට හිඳිනාවුන්

1. සුළු පිය

Non-Commercial Distribution

හෙයින් තමන් මූණ දකින්ට බැරි ය. බල[1] එකෙක් නම් දරු වූ පමණකට ගිය තැනක රකෙන නියායෙන් වස්තුවක් එවාලම්හ. ඒ හැරගෙන තමන්ගේ නිකෘෂ්ට අදහස් ලෙසට සම්හ වූ තැනැත්තහු හැරගෙන ගොසින් කැමැති ලෙස රකෙන බව ය. දරුවන් දෙන්නා ද තැන්[2] තපුරු වුව ත් ධෙනු න්‍යායෙන් උපන් තැන් යහපත් හෙයින් ඒ භාග ය හැරගෙන වුව ත් වඩම්හ. උන් පමණක් අපට එවා පිව මැනැවැ'යි වස්තු දී ගළවා ගන්නා සේ වස්තු යවූහ. උයි ත් අසා යවූ සම්පත් තුමූ හැර ගෙන දරු සම්පත ගියවුන් හා කැටි ව දෙ මවූ-පියන්ට යවූහ.

කුමාරවරු දෙන්න ත් මුතුන් මිත්තන් අතුරෙහි වැඩෙති. ඉන් චූල්ලපන්ථක කුමාරයෝ ඉතා බාලයෝ ය. මහා පන්ථක කුමාරයෝ මුත්තණුවන් ලා කැටි ව ගොසින් බුදුන් ගෙන් බණ අසති. එක් වන් යැමෙන් බණ අසා බුදුනු ත් දක සසර දුකින් මිදෙනු නිසා මහණ වන්ට සිතාපි ය. සිතාලා මුත්තණුවන්ට 'මුඹ වහන්සේ අනුදතොත් මහණ වනු කැමැත්තෙමි'යි කිවූය. මුණුබුරු කුමක් කියවු ද, කොට ගත හෙවු නම් රට ඇත්තන් මුළුල්ලගේ මහණ වීමට ත් වඩා තොපගේ මහණ වීම මට යහපතැ යි කියලා බුදුන් ළඟට ගෙන ගොසින් 'සිටාණෙනි, දරු මුණුබුරු කෙණෙකුන් ලැබ පුදූ' යි විචාරා වදළ කල්හි 'ස්වාමීනි, මූ මාගේ මුණුබුරාණෝ ය. මුඹ වහන්සේ ළඟ මහණ වනු කැමැත්තෝ ය'යි කිවූ ය. බුදුහු එක්තරා භික්ෂු කෙණකුන් වහන්සේ කැඳවා ලා තුලුන් මහණ කරව යි වදළ සේක. උන් වහන්සේ ත් තචපඤ්චකය කියවාලා මහණ කළ සේක.

උන් වහන්සේ ද බොහෝ බුදු වදන් ඉගෙන විසි හවුරුදු පිරෙන්නා ම මාලු පැවිදි ව ගෙන ග්‍රන්ථ ධුර ය ඉගෙන නිමි හෙයින් විවසුන් ධුර ය පුරන සේක් රහත් ව ආයර්‍ය ජාතියට පැමිණ පිය පක්‍ෂයෙහි අඩුවත් හැර තෘෂ්ණා දශකටයෙනුත් මිදුණු සේක. ධ්‍යාන සමාපත්ති සුවෙන් හා ඵල සමාපත්ති සුවෙන් හා දවස් යවන සේක් එක් දවසක් 'මේ මා ලත් නිවන් රස[3] අපගේ මලණුවන් චූල්ලපන්ථකයන්ට ත්, දෙන්ට පිළිවන් දෝ හෝ යි සිතා මුතුන් සිටාණන් ළඟට ගොසින් 'මහ සිටාණෙනි, කැමැත්තහු නම් මම චූල්ලපන්ථක කුමාරයන් මහණ කෙරෙමි'යි කී සේක. සිටාණෝ තමන් සස්නෙහි පැහැද වසන හෙයිනුත් මූ පුතණුවෝ ද'යි විචාළවුන්ට 'රටින් ගිය දුවණියන්ගේ පුතණුවෝ ය'යි කියන්ට ලජ්ජා ඇති වත් සුව සේ ම මහණ වන්ට අනුදත්හ.

මහාපන්ථක තෙරුන්වහන්සේ ද චූල්ලපන්ථක කුමාරයන් මහණ කළ සේක. මහණ වන්නා ම බත් කෑ කලට බඩ සාය

---

1 බලි 2 ධාතුර 3 නිවන් සැප

Non-Commercial Distribution

නැති වන්නා සේ, පැන් පූ කලට පැන් පවස් නැතිවන්නා සේ වැසි වට කලට ගිම් නැතිවන්නා සේ, ගොයම් ද ගෙන කුඹුරු සේන් හළ කලට වැට-කොටු නැතිවන්නා සේ, නියඟ තර කලට හෝ. ආදියෙහි පැන් නැති වන්නා සේ, ත්‍රි හෙතුක හෙයින් ඇති නුවණ පසු ව කලෙක දී ඇති වත ත් අකුශල කර්‍ම බලයකින් නුවණ නැති විය. එ සේ හෙයින් පදයෙන් වී නම් සතර පදයක් පමණ වූත් අකුරු ගණනින් වී නම් ගාථාව තමා වංශසථ වෘත්තයෙහි ගාථාව හෙයින් අටසාළිසක් පමණ වූත්—

> "පදුමං යථා කොකනදං සුගන්ධං
> පාතො සියා ඵුල්ලමවීතගන්ධං,
> අඞ්ගීරසං පස්ස විරොචමානං
> තපන්තමාදිච්චමිවන්තලික්ඛෙ"

යන ගාථාව සාර මසකිනු ත් උගත නො හෙන දැ ය. කවර කල වුව ත් නුවණ මඳ තැනට වෙහෙසෙන්ට පිළිවන් බව මුත් කවර කුමකුත් තෙලෙ උගන්ට බැරි සැටි ය.

මුන්දෑ මහණ වෙලා මෙසේ නුවණ නැතිවන්ට කාරණ කව රේ ද යත්:— මේ චුල්ලපන්ථක සාමණේරයන් දෑ කසුප් බුදුන් සමයෙහි මහණ ව මහා නුවණැති ව නුවණ මඳ නමෙක් පාළි උගන්නා නියාව අසා සමහර නුවණැති කෙණකුන්ට ඇති නුවණ නිසා මී හං වලින් දුනුකේ ගස් නැගෙන්නා සේ දී ලාපු තැනින් හී තණ නැගෙන්නා සේ, තල මුරුවට ලූ තැනින් හත් තන ගස් නැගෙන්නා සේ, එබඳු උද්දම ගුණයක් ඇතිවන හෙයින් අන්ධ ගතික නම් ලජ්ජා වන තරම් ව සිනාසී වේසා ලූ දැය. ඒ නම ත් කරමින් සිටි අකුරු වේසීම නිසා තබා පී සේක. ඒ අකුශල ය ද අවසරයක් බලා ඇවිදින්නේ මේ තැනට සම්භව ගොසින් නුවණ නැති කරවාපී ය. එ සේ හෙයින් ගාථාව උගන්නා ගමනේ මුල පද ය ඉගෙන දෙවන පදයට ගිය කල මුල පද ය සලකුණු නැති වෙයි. තුන් වන පදයට ගිය කල දෙවන පද ය සලකුණු නැති වෙයි. සතර වන පදයට ගිය කල තුන්වන පදය සලකුණු නැති වෙයි. පෙරළා මුල පදයට යන කල සතර පදය ම සලකුණු නැති වෙයි. මෙ ලෙසින් එක ගාථා උගන්ට සාර මසක් ගියේ ය.

මහා පන්ථක තෙරුන් වහන්සේ ද ගාථාව පමණකු ත් මලණුවන් වහන්සේට උගන්වා නො හී එක ගාථාව සාර මසකින් උගත නො හෙන තෙපි ලක්‍ෂ ගණන් පමණ වූ තෙවළා බුදු වදන් කෙතෙක් කලිනු ත් උගත හෙවු ද? හෙම්බා, මේ ග්‍රන්ථ ධුර පූරණ ය නම් පද වසයෙන් සැට දහසක් පද හෝ ගාථා වසයෙන් ගාථා

පසළොස් දහසක් එක ශ්‍රැතින් ධරන්ට සමර්ථ වූ අනඳ මහ තෙරුන් වහන්සේ සේ ම මහා නුවණැති තෙනට මුත් බැරි ය. ප්‍රතිපත්තියට ත් ප්‍රති වෙධයට ත් මූල කාරණ වූ පර්‍ය්‍යාප්තිය උගත නො හෙන කල පිළිවෙත් පුරන්නේ ත් කෙසේ ද? පිළිවෙතින් ලද මනා මාර්ග ඵල උපදවන්නේ ත් කෙසේ ද? ඒ හැම නැති කල ශාසනයේ රඳා ත් ප්‍රයෝජන කවරේ ද? ශාසනයෙන් යව'යි වදළ සේක. උන් වහන්සේ ද ශාසනයෙහි ඇලුම් ඇති බැවින් බෑණන් වහන්සේ එලෙස කීව ත් යන්ට මැළි සේක.

එ කල මහා පන්ථක තෙරුන් වහන්සේ වෙහෙරට ගෙනවුත් දුන් බත් හැම තෙනට බෙදා දෙන සේක. අභය රාජ කුමාරයන් විසින් වඩා වර්ධන ය කරණ ලද ජීවකයෝ පිදිය යුතු සුවඳ මල් ආදිය ගෙන්වා ගෙන තමන්ගේ අඹ උයන වැඩ හුන් ත්‍රිලෝගුරු බුදු රජාණන් වහන්සේ කරා එළඹ බුදුන් වැඳ පුදා සදහම් අසා ගෙන මහාපන්ථක තෙරුන් වහන්සේ කරා ගොසින් බුදුන් ලඟ වහන් දෑ කෙතෙක් දෙනා වහන්සේ දැ යි විචාරා පන්සියයක් දෙනා වහන්සේ යැ යි කී කල්හි 'සෙට, ස්වාමීනි, බුදු පාමොක් සඟ පන්සියය හැරගෙන අපගේ මාළිගාවට සිඟා වඩනේ යහපතැ'යි කිවු ය. 'උපාසකයෙනි, චූල්ලපන්ථකයන් නුවණ මඳ හෙයින් ශාසනයට යොග්‍ය නොවන්නා උන් හැර සෙසු තැනට කළ ආරාධනා ඉවසම්හ'යි වදළ සේක.

චූල්ලපන්ථක හෙරණුන්දෑ ද ඒ අසා 'අපගේ බෑණන් වහන්සේ මෙ තෙක් දෙනා වහන්සේට කළ ආරාධනාව මා හැර ඉවසන සේක. එ සේ වන්නේ මා කෙරෙහි සිත බිඳී තිබෙන හෙයින. බෑණන් වහන්සේගේ අදහස් පමණකු ත් පසුබැස තිබෙන කල ශාසනයෙහි රැඳීමෙන් ප්‍රයෝජන කිම ද? ශාසනික ව කටයුතු වූ ශීල සංරක්ෂණ ය බැරි වුව ත් ගිහි ව දනාදී වූ පින්කම් කෙරෙම් සිතා හරනට සිතන සිවුරු ත් පින් කමෙහි ම යොදා දෙවන දවස් උදසන ම සිවුරු හරනට නික්මුණු සේක.

බුදුහු ද දවස් පතා දෙළොස් කෙළ ලක්‍ෂයක් අර්හත් ඵල සමාපත්තියට හා දෙළොස් කෙළ ලක්‍ෂයක් මහාකරුණා සමාපත්තියට හා සම වදනා හෙයින් දවස මුළුල්ලෙන් කැටි ව සුවිසි කෙළ ලක්‍ෂයක් පමණ සමවතින් නැගී අලුයම ලොව බලන සේක් මේ කාරණ ය දැක පළමු කොට ම වැඩ චූල්ලපන්ථක හෙරණුන් දෑ සිවුරු හරනට නික්මුණු මහ දෙරටුව කෙරේ සක්මන් කොට කොට වැඩ සිටිසේක. චූල්ලපන්ථක හෙරණුන් දෑ ද බුදුන් දැකලා සිවුරු හැරීමට බලවත් බාධා හෙයින් ගොසින් බුදුන් වැඳලා

Non-Commercial Distribution

සිටි සේක. බුදු රජුන් වහන්සේ නො දත් බඳු ව වලා 'හැයි, චූල්ල පන්ථකයෙනි, සිහා යන වේලකුත් නො වත් අරාධනා ත් ඇත. මේ වේලේ කොයි යවු දැ'යි විචාරා වදාළ කල්හි 'ස්වාමීනි, අප ගේ බෑණන් වහන්සේ ශාසනයෙන් නෙරනා හෙයින් සිවුරු හරනට නික්මුණු නියා ය'යි වදාළ සේක.

ඒ අසා බුදුහු 'හැයි, චූල්ලපන්ථකයෙනි, තොපගේ මහණ වීම කවුරුන් මහණ කළ ත් මා මුල් ව වුව. ශාසනය ත් මාගේ බව මුත් තොපගේ බෑණන්ගේ නොව ත් උන්ගේ කීමෙන් මාගේ කීමක් නැති ව තොප යන්නේ හැයි ද? ශක්‍ර සම්පත්තීන් බ්‍රහ්ම සම්පත්තීන් පිරිහෙන්නා සේ සිවුරු හැරීමෙන් ප්‍රයෝජන නැත. එක් බමුණකු තමාගේ දූව සරණ දෙන ගමනේ වෙළෙඹියන් වෙහෙසන්ට කියා ලූ බස බස් කොට සිතා ගෙන අනුන් නො පැළඳි මල් පළඳවන්ට සිතා කිසි කලෙක ත් නැති ව තිබෙන දිඹුල් මල් සොයා ඇවිද ආයාස ගත් කල බුදුන් නුපන් කලෙක නැති ව තිබෙන බව මුත් බුදුන් ඇති සමයේ ඇති ව තිබෙන නිවන් නිසා ගන්නා ආයාස ය යහපත් බැවින් උන් ළඟ රඳන්ට බැරි වුව ත් තෙපි මා ළඟ රඳව. උගන්වා ලන ක්‍රම නො දත එක ගාථාව සාර මසකින් උගන්වා ගත නුහුණුවා මම අද පෙර වරු ඇතුළත තෙවළා බුදු වදන් උගන්වා ගත නො හිණිම් නම් එ ද යා නො හැකි ද? තෙපි රඳව යි මොළොක් බසු ත් වදරා ලා බස මොළොකට නො අඩු ඉතා මොළකැටි අතින් උන් වහන්සේගේ හිස ත් පිරිමැද කැඳවා ගෙන ගොසින් ගඳ කිළි පෙර මාලේ නිවන් පුර යන්ට ආදියෙන් යන ගමනේ නැහෙනහිරට මූණ ලා හිඳුවා ලා අතිශුභ්‍ර වූ කඩ සිහිත්තක් මවා ලා ''චූල්ලපන්ථකයෙනි, තෙපි තෙල කඩරෙද්ද අල්වා ගෙන හිඳ 'රජොහරණං' යන විවරක් කියව'යි මුදු මලක් හා සමාන සුදු කඩරෙද්ද දෙවා ලා සිහා වඩනට කල්වූ කල්හි මහණ ගණ පිරිවරා ජීවකයන්ගේ මාළිගාවට වැඩ පනවන ලද බුදු හස්නෙහි වැඩ හුන් සේක.

චූල්ල පන්ථක හෙරණුන්දෑ ද සසුන් අදහස රහත් මහ නුවණ ආලොක පතුරුවමින් පහළ වීමට කාරණ ව නැහෙන හිරට මූණ ලා හිඳ කඩරෙද්ද පිරිමැද මැද චාරිත්‍රානුකූල කොට වදාළ රජොහරණ භාවනාවට පටන් ගත් සේක. පිරිමදිමින් හින්ද දී ම ධාදිය වැද ගෙන කඩ රෙද්ද කිලුටු විය. හෙරණුන්දෑ ද සිතන දෑ 'දුක් පත් වුව ත් ජාතිමතුන්ගේ ජාතිය යහපත් සේ මේ තමා රෙදි වුව ත් පැයෙන් යහපත් ව තිබී මේ කුණු අත් බැව නිසා ආදි ලෙස හැර අනික් ලෙසට පැමිණියේ ය. ප්‍රත්‍යයසමුත්පන්නය නම් කවරේ වුව ත් මෙ තෙක් ම ය යි භාවනාවට පටන් ගත් සේක.

Non-Commercial Distribution

බුදුහු චුල්ල පන්ථකයන්ගේ සිත විවසුන් වැඩීමට පැමිණි ය යි දැන වදරා අවශ්‍ය කට යුත්තකට මිනිසුන් යවා නිහඬ නැති හෙයින් තමා ම යන්නා සේ ශරීරයෙන් රස්කඳක් උන්වහන්සේ වැඩ හුන් තෙනට විහිදුවා තමන් වහන්සේ ම වැඩියා කොට හඟවා 'හෙම්බා, චූල්ලපන්ථකයෙනි, තෙපි මේ කඩ රෙද්ද පමණක් කිලුටු වූවා කොට නො සිතව. තොපගේ සිත් සතන රාගාදී වූ කසළ බෙහෙව. රජ ය'යි කියා ධූලි පමණකට නම් නො වෙයි. රාග ද්වෙෂ, මොහ තුනට ත් නම් ම ය. යම් කෙනෙක් ඇඟ වැද ගත් ධූලි සෝධා පී කලට නිකසළයෝ ද, එ මෙන් ම සන්තාන-වර්ති වූ කෙලෙස් ධා කුණු මාර්ග ඥාන ජලයෙන් සොධා පූ නම් බුදු සස්නෙහි නිකසළ ව වසන්නාහු යයි මේ අර්ථ ය හඟවා—

"රාගො රජො න ච පන රෙණු වුච්චති,
රාගස්සෙතං අධිවචනං රජොති;
එතං රජං විප්පජහිත්‍වා භික්ඛවො,
විහරන්ති තෙ විගතරජස්ස සාසනෙ.

දොසො රජො න ච පන රෙණු වුච්චති,
දොසස්සෙතං අධිවචනං රජොති;
එතං රජං විප්පජහිත්‍වා භික්ඛවො,
විහරන්ති තෙ විගතරජස්ස සාසනෙ.

මොහො රජො න ච පන රෙණු වුච්චති,
මොහස්සෙතං අධිවචනං රජොති;
එතං රජං විප්පජහිත්‍වා භික්ඛවො,
විහරන්ති තෙ විගතරජස්ස සාසනෙ."

යන ගාථා තුන වදළ සේක. ගාථා කෙළවර දෝ හෝ නො හොත් ගාථා වදරා අන්තයෙහි එක ගාථාව සාර මසකිනු ත් උගන්ට නැති නුවණ තෙවලා බුදු වදන් දිවග ලෙළෙන සේ වන පොත් වන තරම් නුවණ ත් ඇති ව, සිවුපිළිසිඹියා පත් රහත් වීමෙන් චුල්ලපන්ථක තෙරුන් වහන්සේ අසූ මහ සවුවන් වහන්සේට ඇතුළත් වූ සේක.

මෙ සේ උදවූ චුව භාවනා වැටහෙන්ට ත් රහත් වන්ට ත් හේතු කවරේ ද යත්:- මුන් වහන්සේ පෙර එක් සමයෙක රජ ව ඉපැද නුවර පැදකුණු කරණ ගමනෝ නළලින් ඩා වැගිරෙන හෙයින් සළු පටින් නළල පිස පී සේක. සළුව දූළි වස්නක් සේ කිලුටු වී ය. ඒ දැක 'මේ කුණු ශරීරයක් නිසා මෙ සේ වූ සළුව මෙ ලෙස වීය. අනිස-දුක-අනාත්‍ම යි අනිත්‍යතාව සිතට නැඟූ

Non-Commercial Distribution

සේක. ඒ භාවනාව ම හළු යට සැඟ වී තුබූ ගිනි හඟුරක් හළු ඉවත් ව පෙරළා ත් ගිනි ඇති වීමට කාරණ වන්නා සේ දනු ත් රහත් වීමට කාරණ වි ය.

ජීවකයෝ ද බුදුන්ට දක්ෂිණෝදක ය එළවා ලූහ. බුදුහු 'හැ යි ජීවකයෙනි, වෙහෙර සඟහු ඇත්තෝ වෙත් දැ'යි වදරා අතින් පාත්‍රය වසා ගත් සේක. එ වේලෙහි මහා පන්ථක තෙරුන්-වහන්සේ මලණුවන් වහන්සේ සිවුරු හරනට ගිය ගමනේ කාරණ නමැති නකත් නැති හෙයින් විහාරයේ රඳුණු නියාවත් සිවුරු නො හළ නියාව ත් ආවර්ජන ය නො කළ හෙයින් නො දන වෙහෙර වහන්දෑ නැති සේක් වේ දැ'යි කී සේක. බුදුහු අසාත් 'ඇත, ජීවකයෙනි'යි වදළ සේක. ජීවකයෝ එ විට එක් කෙණකුන් බණවා ලා 'වෙහෙර වහන්දෑ ඇති නැති නියාව විමසා එව'යි කිවු ය. එ වේලෙහි චුල්ලපන්ථක තෙරුන් වහන්සේ 'බුදුන් වෙහෙර වහන්දෑ ඇතැ'යි වදළ ත් තමන් වහන්සේ සලකා නො බලා වෙහෙර වහන්දෑ නැතැ යි අපගේ බෑණන් වහන්සේ වදළ සේක. බෑණන් වහන්සේ වදළ ලෙසට නැති ලෙසක් නො හඟවා බුදුන් වදළ ලෙසින් ඇති නියාව හඟවමි'යි:-

**'සහස්සක්ඛත්තුමත්තානං – නිම්මිනිත්වාන පන්ථකො,**

**නිසීදි අම්බවනෙ රම්මෙ – යාවකාලප්පවෙදනා.'**

යනු හෙයින් සඟ දහසක් මවා සියලු අඹ උයන වහන්දෑ-ගෙන් පුරා ලූ සේක. ඉන් සමහර තැන් සිවුරු ගෙත්තම් කරණ සේක. සමහර තැන් පඩු කකාරා සිවුරු රදන සේක. සමහර තැන් හදරන සේක. ඒ ගිය තැනැත්තෝ ද වෙහෙර රැස් ව හුන් බොහෝ වහන්දෑ දැක ගොසින් වෙහෙර බොහෝ වහන්දෑ වැඩ උන් නියාව ජීවකයන්ට කිවු ය. ඉක් බිත්තෙන් බුදුහු වෙහෙරට ගිය තැනැත්තවුන් ම බණවා ලා චුල්ලපන්ථක තෙරුන් වහන්-සේගේ සෘද්ධ්‍යානුභාවය පහළ කරන්ට 'චුල්ලපන්ථකයන්ට අප කැඳ වූ නියාව කියව'යි වදළ සේක. උයි ත් ගොසින් 'බුදුහු චුල්ලපන්ථක සවාමීන් කැඳවා එවූ සේකැ'යි කිවු ය. උන් වහන්සේ ගේ ම සෘද්ධ්‍යානුභාවය හෙයින් 'අපි චුල්ලපන්ථක යමහ'යි දහසක් දෙනා වහන්සේ ම බෑණ නැඟී සේක. ගිය තැනැත්තෝ ද පෙරළා ගොසින් හැම තැන ම චුල්ලපන්ථක නම් සේකැ'යි බුදුන්ට දන් වූ හ.

Non-Commercial Distribution

'එසේ වී නම් තොපි ගොසින් පළමු කොට යම් කෙනෙක් 'මම චුල්ලපන්ථක යෙමි'යි කිවු නම් උන් අත අල්වා ගනුව. සෙස්සෝ අතුරුදන් වෙති'යි වදාළ සේක. උයි ත් එ ලෙස ම කළහ. සහ දහස ම අතුරුදන් වූ සේක. චුල්ලපන්ථක තෙරුන් වහන්සේ ගිය තැනැත්තවුන් ලා කැටි ව වැඩි සේක. බුදුහු වළඳා අන්තයෙහි ජීවකයන් බණවා ලා 'ජීවකයෙනි, අනුමෙවෙනි බණට චුල්ලපන්ථකයන් ආරාධනා කරව. උං බණ කියති'යි වදාළ සේක. ජීවකයෝත් ඔබට ම ආරාධනා කළහ. ඔබ ද සිංහ-නාද කරණ සිංහ පැටවක්හු මෙන් පෙරවරු පමණෙක උගත් ධර්ම ය, බොහෝ නියාව හඟවා බොහෝ බණ වදාළ සේක.

බුදුහු හුනස්නෙන් නැඟී සඟ ගණ පිරිවරා වෙහෙරට වැඩ ගඳ කිළි කෙළවර පෙර මාලේ වැඩ සිට භික්ෂූන් වහන්සේට සුගතොවාද දී කමටහනු ත් වදරා ඒ ඒ තැනට යවා වදරා නො එක් සුවඳින් සුවඳ ගන්වන ලද ගඳ කිළියට වැඩ දකුණැලයෙන් සැතපී වදාළ සේක.

ඉක්බිත්තෙන් සවස් වේලාවෙ වහන්දෑ ද අවුත් රැස් ව රත් පළසකින් කළ තිරයක් අඳනා කලක් පරිද්දෙන් ධර්ම සෙබෙහි වැඩ හිඳ බුදුන්ගේ ගුණ කථාවට පටන් ගත් සේක. 'ඇවැත්නි, මහා පන්ථක තෙරුන් වහන්සේ චුල්ලපන්ථක තෙරුන් වහන්-සේගේ අදහස් පමණකු ත් දැන ගත නො හී එක ගාථාව සාර මසක් විවරකිනු ත් උගත නො හෙති යි නුවණ නැත්තෝ ය යි විහාරයෙන් නෙරපී සේක. බුදුහු තමන් වහන්සේ නෙරිය මනා කෙණකුන් මුත් නො නෙරිය මනාවුන් දන්නා හෙයින් පෙර වරු ඇතුළත සිවු පිළිසිඹියා පත් රහත් කැරවූ සේක. සිවුපිළිසිඹියා පත් එවා ලීමෙන් ම තෙවළා බුදු වදනු ත් පෙරවරුයෙන් ම උගන්වා ලූ සේක. අනේ සර්වඥවරයන්ගේ තරමක් ඉතා බලවත් නියා ය'යි කී සේක. බුදුහු ධර්ම සෙබෙහි පැවැති මේ කථාව දිව කනින් අසා වදරා මා ඔබ යාම යුතු ය යි බුද්ධ සෙයාාවෙන් නැඟී අලතාපිඬෙක නැඟී පබළු දළුවක් වැනි ව ඉතා රතු වූ හඳනා සිවුර තිමඬුලු වසා වැලැඳ රන් පර්වතයක් විදුලියකින් වෙළනා කලක් මෙන් පටී ද බැඳ මහ මෙර රත්වලාවෙකින් වසන කලක් පරිද්දෙන් සුගත් පවුල් සිවුරු පෙර ව, ගඳකිළියෙන් නික්ම උතුම් වූ මතැතක්හුගේ දෝ හෝ නොහොත් සිංහරාජයකුගේ ගමන් බඳු වූ ලීලොපෙත ගමනින් හා නො එක් බුද්ධානුභාවයෙන් යුක්ත ව ධර්ම සබයට වැඩ නො එක් ලෙසින් සදනා ලද වට මළු

Non-Commercial Distribution

මධ්‍යයෙහි පනාවන ලද බුදු හස්නට නැඟී සවනක් රස් විහිදවීමෙන් මුහුදු කුස අළලමින් යුගඳුරු මුඳුනෙහි වොරජනා ළහිරු මඩලක් මෙන් වැඩ හුන් සේක.

බුදුන් එ තැනට වඩනා ම බුදු වන දවස් මූද රළ නැති වූවා සේ ම වහන්දෑගේ කථාව ත් තිබිණ. බුදුහු ත් කරුණාවෙන් මොළොක් සිතින් වැඩ හුන් සඟ පිරිස බලා පියා 'මේ පිරිස ද රන් නැවක් මැදි කොට පිපී වැනීගිය රත් නෙළුම් වනයක් සේ ඉතා හොබනී. එක කෙණකුන්ගේ ත් අත සොලවා ලීමෙක් වේව යි පය සොලවා ලීමෙක් වේව යි කැස පීමෙක් වේව යි නැත. හැම දෙන ම මාගේ තෙදින් හැකිළ හිඳිති. මාගේ බුද්ධානුභාවයෙන් මුන්ගේ ගුණානුභාව ය වැසිණ. මම ආයුඃ කල්ප ය මුළුල්ලෙහි ත් බසක් බැණ නො නැහෙම් නම් පළමු කොට කථාවක් උපදවා ලන කෙණෙක් නැත. නිවණටත් මා ම පළමු වූවා සේ බණ කීමට ත් මා ම පළමු වූවා සේ කථාවට ත් මම ම පළමු වෙමි'යි සිතා වදරා බ්‍රහ්ම නාද ය සේ මනහර වූ කට හඬින් වහන්දෑ බණවාලා 'මහණෙනි, මෙ තැනට මා එන්නාට පළමු කුමන කථාවක් කොට කොට හුනු ද යි අඩාළ ව තුබුයේ කවර කථාවෙක් ද නිමවා දී ලන්ට ය'යි වදරා චුල්ල පන්ථක තෙරුන් වහන්සේ පිළිබඳ කථාව නියාව කී කල්හි 'මහණෙනි, චුල්ල පන්ථකයන් නුවණ නැති වූයේ ත් උන්ට මා පිහිට වූයේ ත් දැන් මතු නො වෙයි. යට ගිය දවස ත් මෙයට ත් වඩා නුවණ නැති වූ ය. දැන් ලොවුතුරා සැපතට හිමි කෙළෙමි. පෙර ලොවි සැපතට හිමි කෙළෙමී' වදරා ඒ කට යුත්ත විස්තර කොට අසනු කැමැති වහන්දෑගේ ආරාධනාවෙන් ඉකුත් වත් ගෙන හැර දක්වන සේක්:

යට ගිය දවස බරණැස වසන එක් කුල දරුවාණ කෙණෙක් ශිල්ප උගන්නා නිසා තක්සලා නුවර ගොසින් සිල්ප උගන්වන්නා වූ ගුරුන්ට මිළයක් දී ලා ශිල්ප උගන්ට තමන් බල නැති හෙයින් ගුරුන්ට දවල් දවස මෙහෙවර කොට ලා ලද ලද අවසරයෙහි ශිල්ප උගණිති. ආචාරීන්ට මෙහෙයෙන් උපකාරී කම මහත. මෙහෙයට උපදෙස් මුත් ශිල්පයට නුවණ නැති හෙයින් ශිල්ප උගත නො හෙති. ආචාරීහු ද මූ මට හිත පක්‍ෂයෝ ය. මාගේ හිත කමුත් පෙනෙන්නෙ ශිල්පයක් උගන් වාලූවෝතිනැ'යි. බොහෝ උත්සාහ කොට ත් උගන්වා ගත නො හෙති. උයි ත් බොහෝ දවස් වැස පියා කිසි දෙයකුත් උගත නො හී මුසුප්පු ව පියා යෙමි' කියා ආචාරීන්ට කිවු ය.

Non-Commercial Distribution

ආචාරීන් කිසිවක් උගන්වා ගත නුහුණු හෙයින් තුමූ ත් මුසුප්පු ව පියා 'අවශ්‍යයෙන් මුන්ට මා පිහිටක් වන්ට වුව මැනැවැ' යි ලුහුඬු කොට මන්ත්‍රයක් බැඳ ලා වලට කැඳවා ගෙන ගොසින් 'ගැසිණ, ගැසිණ, කුමක් නිසා සැලෙයි ද? මම වැළි ත් තා දනිමි. යන මේ මන්ත්‍ර ය උගන්වා ලා නො එක් වාරයෙහි ආසෙවන ය කරවා වන පොත් ද යි විචාරා 'එසේ ය, වන පොතැ'යි කී කල්හි නුවණ නැත්තවුන් උත්සාහයෙන් උගත් දෙය වන පොත් නො හැරෙන්නේ ය'යි සිතා මහට සාලක් බතකුත් ලවා ලා ''යව, ගොසින් පෙල මන්ත්‍රයෙහි ආනුභාවයෙන් රැකෙව. වන පොත් නො වැගිරෙන්ට එක් වන් 'පිරිවාව'යි විධාන කොට ලා යවූහ. උන් බරණැසට ගිය කල ම පුතු ශිල්ප ඉගෙන අවු ය යි මෑණියෝ බොහෝ සාද කොළෝ ය.

එ කල බරණැස් රජ්ජුරුවෝ තමන්ගේ නො මැදහත් කමෙක් ඇද්දෝ හෝ යි පරීක්ෂා කරන්නෝ කිසිත් අඩුවක් නො දැක 'තමාගේ වරද තමාට නො දැනෙයි. දැනෙන්නේ අනුන්ට ය. නුවර විමසමි' සිතා අප්‍රසිද්ධ සැටියෙකින් නික්ම ''බත් කා ලා වැද හෙව, මිනිසුන් කරණ කථා අසමි. ඉදින් අධර්මිෂ්ඨයෙන් රාජ්ජය කෙරෙම් නම් 'රජ්ජුරු කෙණකුන්ගේ අධර්මිෂ්ඨ කමෙක. බොහෝ ගහට වුණුමහ'යි නුගුණ කියති. ඉදින් දැහැමින් රජ ය කෙරෙම් නම් 'අනේ අපගේ රජ්ජුරුවන් වහන්සේට ආයු බොහෝ වන සේක්ව'යි කියා ආ වඩති. ඒ මා දත මනා වේදැ'යි ඒ ඒ දෙනාගේ බිතක් කන්වල ඇවිද කියන-බණන කථා අසති.

ඒ වේලාවට උමං සොරු ගෙය දෙකකට මැදින් එක උමගින් දෙ ගෙට ම වැද්ද හැකි කොට උමං බිඳිති. රජ්ජුරුවෝ උන් දැක මුවා ව ලා සිටියෝ ය. උන් උමඟ බිඳ පියා ගෙට වැද බඩු සමන්වන[1] කල මන්ත්‍ර ය ඉගෙන ආ තැනැත්තෝ පිබිද පියා 'ගැසෙවුණ,[2] ගැසෙවුණ, කුමක් නිසා ගැසෙවු ද? කෙ සේ සහවා කළ ත් මම තොප දනිමි' යන මන්ත්‍ර ය පිරිවාති, සොරු ද ඒ අසා 'මූ අප දත්හ. වූයේ විකාශයෙකැ'යි මන්ත්‍ර ය දන්නා තැනැත්තෝ මන්ත්‍රයෙහි අර්ථ ය දනිත්ව යි නො දනිත්ව යි තුමූ මන්ත්‍රයෙහි අර්ථ ය සොයා සොර කම් දත්තා සේ ම දැන ගෙන ඇඳ ගෙන ආ පිළි පමණකු ත් දමා පියා ඉස් ලූ අත ගියහ.

රජ්ජුරුවෝ එ ගෙන් කිසිවකුත් නො ගෙන සොරුන් යන්නවුන් දැක සොරුන් හසු කරන්නට නො නවත ත් මන්ත්‍ර ය පිරිවූ නියාව ත් අසා මන්ත්‍රයෙහි අර්ථ තමන්ට හැඟුණු

---

1. සමන්නන්  2. ගැසෙවන

Non-Commercial Distribution

හෙයින් නුවර ත් විමසා නිමවා පියා රජ ගෙට ම ගියහ. රාත්‍රි ය පාන් වූ කල්හි එකකු කැඳවා ලා 'අසවල් වීථියේ යම් ගෙයකට උමගෙක් බිඳලා තුබූ යේ ද, ඒ ගෙයි තක්සලා නුවරින් ශිල්ප ඉගෙන ගෙන ආ එකෙක් ඇත. උඹ කැඳවා ගෙන එව'යි කියා විධාන කොළෝ ය. එයි ත් ගොසින් රජ්ජුරුවන් වහන්සේ කැඳ වූ සේකැ'යි කියා ලා කැඳවා ගෙන ගියේ ය.

රජ්ජුරුවෝ උන් දක 'තෙපි තක්සලා නුවරින් ශිල්ප ඉගෙන ගෙන අවුදූ'යි විචාරා 'එසේ ය'යි කී කල්හි 'අපට ත් ඒ ශිල්ප ය දෙව'යි කිවු ය. 'යහපත, සරි හස්තෙක හිඳ උගත මැනැවැ'යි සැඩොල් ව උපන් බෝසතුන් සොරා අඹ කඩන්ට රජ්ජුරුවන්ගේ මඟුල් උයන අඹ ගසකට නැඟී අඹ කඩමින් සිට රජ්ජුරුවන් සල වට මත්තෙහි හිඳ පුරෝහිතයන් බිම හිඳුවා ලා ශිල්ප උගන්නා දක ඒ අධර්ම ය ඉවසා ගත නොහී සොර කම ත් ප්‍රකාශ කොට ගසින් බිමට පැන පියා රජ්ජුරුවන්ට කී බණ අසා දත්තා සේ කිවු ය.රජ්ජුරුවෝ ත් එ ලෙස ම කොට මන්ත්‍ර ය ඉගෙන ගෙන මේ ගුරු පූජා ය යි මසු දහසක් දුන්හ. මන්ත්‍රානුභාව ය ත් එ කලට එ වීතරෙක් පෙනිණ.

එ කල සෙනෙවිරද්දු රජ්ජුරුවන්ගේ අන්දම් තබන කර නැවැමියාට අන්දම් තබන්නේ කවරද ද යි විචාරා සෙට හෝ අනික්ද ය යි කී කල්හි මසු දහසක් අත්ලස් කොට දීලා 'මාගේ කටයුත්තෙක් ඇතැ'යි කිවු ය. 'කුමක් දූ'යි විචාළ කල්හි 'රජ්ජුරුවන් අන්දම් තබන ගමනේ කර ය යහපත් කොට අත පැස පියා බොටුව කපාපූ නම් තෙපි සෙනෙවිරත් වව, මම රජ වෙමි'යි කිවු ය. උයි ත් ජාතින් කුම් වුව ත් නපුරු අදහසින් සරි හෙයින් ගිවිස්සෝ ය. රජ්ජුරුවන් අන්දම් තබන දවස් සුවඳ පැනින් දළි තෙමා පියා කර ය අත පැස පියා නළල් කෙළවර අල්වා ගෙන දළි මඳක් කපා බහා 'කරයේ කැපීම තව නපුර. එක විටින් ම බොටුවේ නහර කපා පියමි'යි නැවත ත් කරයේ මුවා ත් නහ'යි. එ වේලේ රජ්ජුරුවෝ තමන් උගත් මන්ත්‍ර ය සලකුණු කොට පියා 'සැලෙයින[1], සැලෙයින, කුමක් නිසා සැලෙයි ද? මම වැළි ත් දනිමි' කිවු ය. ඒ කියන්නා ම කරනැවැමියා ඇඟින් ඩා බිඳ ගෙන ලා රජ්ජුරුවන් වහන්සේ ත් අපගේ දුර්මන්ත්‍රණ ය දත් සේකැ'යි බා ගොසින් කර ය බිමට දමා පියා වැඳ ගෙන හොත්තේ ය.

---

1. සැලෙයි.

Non-Commercial Distribution

රජ්ජුරුවන් නම් බොහෝ සේ පින් පමණ නුවණ හෙයින් 'හැයි, කොල, මා රජ නියාව ත් නො දනී දැ'යි භය ගන්වා කියා ලූහ. එ යි ත් තරයේ භය ගෙන පියා 'ස්වාමීනි, අභය දෙවුව මැනැවැ'යි කිවු ය. රජ්ජුරුවෝ 'තෝ නො බා කියව'යි කිවු ය. අභ ය ඉල්වා ගැන්මෙන් භය නැති ව සෙනෙවිරදුන් අත්ලස් දුන් නියා ව ත් කළ කථාව ත් මුළුල්ල ම කිවු ය. රජ්ජුරුවෝ ඒ අසා ආචාරීන් නිසා දිවි ලදිමි සිතා, සෙනෙවිරදුන් ගෙන්වා ලා 'හැයි, සෙනෙවිරදිනි, අපගෙන් තොප නො ලත් සංග්‍රහ කවරේද? ධර්මිෂ්ඨ ව රජකම් කරණ හෙයින් මම තොප නො මරවමි. මාගේ රට නො ඉඳුව'යි රටින් නෙර පියා ආචාරීන් ගෙන්වාගෙන 'මුඹ නිසා දිවි ලදිමි. සෙනෙවිරදුන් කරනැවැමියාට නිළ කළ සෙනෙවිරත් පට ආචාරීන්ට දෙවා මහ පෙරහරින් සෙනෙවිරත් කළහ. ඒ සෙනෙවිරත් වූ තැනැත්තෝ දැන් චූල්ලපන්ථක තෙරණු ය. දිසා පාමොක් ආචාරී නම් මම ය.

'එ සේ හෙයින් එ වක ත් මුන්ට පිහිට වීමි'යි වදරා නැවත එක් දවසක් මේ චූල්ලපන්ථක තෙරුන් වහන්සේගේ කථාව පැවැති කල්හි තමන් වහන්සේ චූල්ල නම් සිටු ව උපන් කල්හි මුන් වහන්සේ චූල්ලන්තෙවාසික ව තමන් වහන්සේගේ කථාවෙන් මළ මීයකු හැර ගෙන පිළි පිරිමසා තබා විකුණන්නාවුන් බළලුන් ඇති කරණ හෙයින් බළලුන් ඇති ගෙයකට ඒ මීයා දීලා හූ මල් කෙන්දක් හැර ගෙන සරඹු අඹරා මූණු මල් ගොතා ගෙන ඒ දීලා උක් පැණි හැර ගෙන උක් පැණි ලා පැන් වත් කොට දීලා මාලා කාරීන්ගෙන් ඉද්ද මල් හැර ඒ දීලා දෙ තුන් මස්සක් හැර ගෙන ඒ දෙ තුන් මස්සෙනු ත් මල් හැර ගෙන ඉන් දස විසි මස්සක් හැර ගෙන යනාදීන් ක්‍රම ක්‍රමයෙන් දෙලක්‍ෂයක් විතර සම්පත් එක මීයා මුල් ව ලදින් කෙලවර සිටුතනතුරු ත් ලත් නියාව හඟවමින් චූල්ලසෙට්ඨි ජාතක ය වදරා චූල්ලන්තෙවාසිකයා නම් චූල්ලපන්ථක තෙරුන් වහන්සේ නියාව වදළ සේක.

නැවත එක් දවසක් මෙ ම කථාව උපන් කල්හි බණ වදරන බුදුහු කසුප් බුදුන් සමයෙහි ලාබත් පාත්‍ර විස්සක් විසි දහසක් හවුරුදු මුළුල්ලෙහි දන් දී ඒ පින් කමින් දෙව් ලොව ඉපැද අපගේ බුදුන් දක්වා බුද්ධාන්තරයක් මුළුල්ලෙහි දිව සැපත් වළඳා අපගේ බුදුන් සමයෙහි වෛදෙහ රට සද්ධම්මකොස නම් නුවර සිටු කුලෙහි ඉපැද පුතුන් සත් දෙනකු හා දූන් සත් දෙනකු හා යේළීන් සත් දෙනකු ත් ඇති ව පොවන දෙනුන් සත් විසි දහසක් හා ගොන් තුන්දසක් හා එක් ව ගෙරි සරක් තිස් දහසක් විතර ඇති

Non-Commercial Distribution

ධනිය සිටාණන් මෙන් යම් කෙණෙක් තමන්ගේ සරක් සම්පතක් ඇති හෙයින් උන් බිය පත් ව රැක ගන්නා නිසා ලිහිණි ආදි වූ පක්ෂීන් ගස් අක්වල කැදලු බඳනා නියා ත් කකුළුවන් දිය ගාවා බිල ඇස් වාලා ගොසින් ගොඩත බිල කරණ නියාව ත් දැක ඒ තමා වැසි ලකුණු හෙයින් වතුරු ගහට නැති ගොඩ රටවල ගාල් ගස්වා සරකුන් රඳවා තුමූත් ගොඩරට ම රඳත් ද වළ රට හළුවා සේ අකුසල් හැර උන් ගොඩ රට පිහිටියා සේ කුසල්හි පිහිටා—

තව ද උන් පක්ෂීන් බිම්බා කැදලු බඳිනා නියා ත් කකුළුවන් ගොඩත බිලවල් ඇස්වා දිය කෝල්බඩින් බිල තබන්නා නියාත් දැක, ඒ තමා නියන් ලකුණු හෙයින් විල් බඩ වැව් බඩ හෝ.බඩ ගං බඩ ය යි ජලාශ්‍ර ය තැන ගාලු ත් ගස්වා සරක් එහි රඳවා තුමූ ත් පැන් ඇති තැනකට, ළං ව වෙසෙත් ද උන් ගොඩ තැන් හළුවා සේ අකුසල් හැර උන් පැන් ඇති තැන් ඇසිරු කළා සේ කුසල්හි පිහිටා උන් පස්ගෝ රස සුව සේ අනුභව කළා සේ පර්‍ය්‍යාප්ති සහිත වූ චතුර්විධ මාර්‍ග නමැති දෙනුන් පස් දෙනාගෙන් නිවන් සහිත වූ චතුර්විධ ඵල නැමැති පස්ගෝ රස යම් කෙණෙක් අනුභව කරණු කැමැත්තා වූ නම් උන් වීර්‍ය්‍ය ඇති ව නො පමා ව පිරිසිදු සිල්හි පිහිටා එ බඳු පිළිවෙත් ඇති ව මුත් පිහිටක් නො ලද හැකි සසර මහ සයුරෙහි කෙලෙස් වතුරෙන් නො නස්නා වූ අර්හත් ඵල නමැති පිහිට කෙරෙති' යි වදාළ සේක. නුවණැත්තවුන් විසින් මිථ්‍යා ප්‍රතිපදවෙන් දුරු ව සම්‍යක් ප්‍රතිපදාවෙහි පිහිටා චූල්ලපන්ථක තෙරුන් වහන්සේ සසර සයුරෙන් එතර වන්ට කළ පිහිට තමන් කටයුතු.

---

## 27. බාලනක්ඛත්ත වත

තව ද නුවණ නැත්තවුන් තමන්ගේ නුවණ නැතිකම නිසා පමා ව වසන නියාව ත් නුවණැත්තවුන් තමන්ගේ නුවණ නිසා නො පමා ව වසන නියාව ත් දක්වන්ට බාලනක්ඛත්ත වත දක්වමු.

කෙසේ ද යත්:—

එක් සමයෙක සැවැත් නුවර නුවණ නැති අඥාන ජනයෝ එක් ව ගෙන හළු ත් ගොම ත් දූලි ත් ඇඟ ගා ගෙන සතියක් මුළුල්ලෙහි ගෙයක් ගෙයක් පාසා ගොසින් අසභ්‍ය[1] තෙපුල් කියා ඇවිදිනාහ. එ සේ බණන්නාහු මවු–පියන් පටන් නෑයන් කෙරෙහි වෙව යි සිල්වත් ගුණවත් තැන් කෙරෙහි වෙව යි ලජ්ජාවක් නො කෙරෙති. ඒ සතිය මුළුල්ලෙහි නො කා නො බී බැරි හෙයින්

---

1. අසබ්භ

Non-Commercial Distribution

කන-බොන වේලාව හැර සෙසු හැම වේලෙහි ම ගුණ ඇත්තවුන් කන වැකෙන්ට ම නො තරම් බස් ම කියා ඇවිදිති. යම් කෙණෙක් පින් වඩනා දෙයක් නො වන හෙයින් අසනු නො-කැමැත්තෝ වූ නම් මිල යවති. ඒ මිල හැර ගෙන උන් උන්ගේ ගෙවල් ළඟින් ඔබ්බට පලා යෙති. සැවැත් නුවර පස් කෙළක් විතර ආර්‍ය්‍ය ශ්‍රාවක උපාසකවරු බුදුන් කරා ගොසින් 'ස්වාමීනි, මේ සතියෙහි සහපිරිවරින් නුවරට සිහා වඩනට නො කැමැත්තේ ය. වෙහෙර ම රඳා වැඩ හිඳිනා බව ය, අපි දන් එවම්හ'යි ආරාධනා කොට ලා දනු ත් ගණයට බාවති. තුමූ තුමූ ත් ගෙවලින් පිටත් නො වෙති.

ඒ කෙළි වියරු සතියකින් නිමි කල්හි අටවැනි දවස් බුදුන් පවරා සහපිරිවරින් නුවරට ගෙන ගොස් මහදන් දීලා එකත් පස්ව හිඳ 'ස්වාමීනි, මේ සත් දවස උන් හැමට කෙසේ ගියත් අපට ගිය නියාව ඉතා දුක. නපුරු වියරු බණන්නවුන් කට එළෙන විවර ය. අසන්නවුන් කන් පැළී යන විතර ය. බණන්නෝ බිණූ මෙහි ත් අසන්නෝ ඇසීමෙහි ත් ලජ්ජාවක් ම නැත්තෝ ය. මුඹ වහන්සේලා ත් නුවරට සිහා වැඩිය නුදුන්නේ අමා තුබූ වළඳ වස ඕනා සේ නපුරු බස් කන හී යෙති'යි සිතා ය. අපි ත් ලජ්ජාවෙන් ම ගෙන් පිට ත් නුවූම්හ'යි කිවු ය.

බුදුහු උන්ගේ බස් අසා 'අඥනයෝ මෙ ලෝ නො දන ගිනි තැපීමෙන් වන අචාසු නො සලකා යම්තම් චාසුවක් පිණිස ගිනි තපිනවුන් මෙන් පමා වෙති. පමා ව අකුසල්හි හැසිර ආස්වාද වුන් කලට වඩා බොහෝ කලක් අපාය දුක් විඳිති. නුවණැත්තෝ තුමූ අපි ත් රැකෙම්හ යි ඇසුරු කළවුනු ත් රකුම්හ යි වස්තුවක් තබා රක්නා සේ ප්‍රථමද්ධ්‍යාන ප්‍රථම මාර්‍ගාදි වූ ලොවී ලොවුතුරා ගුණ ලබම්හ යි නො පමා වීමෙහි අනුසස් දක්නාහු උතුම් ධනයක් මෙන් පින් කම්හි නො පමා බව රකිති' වදාළ සේක.

චුල්ලපන්ථක වස්තුව අසා ත් මේ වස්තුව අසා ත් බොහෝ දෙන නිවන් පුර වැද සැනහුණාවූ ය. එ සේ හෙයින් නුවණැත්ත වුන් විසින් ඇත් පියෙහි සියලු පියවර ඇතුළත් ව සිටිනා සේ සියලු කුශල ය අප්‍රමාද පදයෙහි ඇතුළත් බැවින් පින් කම අප්‍රමාද ව අකුසලින් දුරු ව කුසල් සෙවුනාවුන් විසින් සිත් සතන් පිරිසිදු කට යුතු.

Non-Commercial Distribution

## 28. දික්සඟි අටුවායෙහි කථාව

සියලුම කුශලය අප්‍රමාද පදයෙහිම ඇතුළත් නියාව සාධන්ට මෙ තැන්හි **දික් සඟි අටුවායෙහි** කථාවක් දක්වමු.

කෙ සේ ද යත්:

යට ගිය දවස බරණැස බඹ දත් නම් රජ්ජුරු කෙණෙක් රජ කෙරෙති. සමහර අවධියේ දඹ දිව සුවාසූදහසක් විතර නුවර පහළ වෙයි. සමහර කලෙක සැට දහසක් විතර පහළ වෙයි. සමහර කලෙක සතළිස් දහසක් විතර පහළ වෙයි. සමහර කලෙක විසි දහසක් විතර පහළ වෙයි. ඒ රජ්ජුරුවන් සමයට ත් විසි දහසක් නුවර ය. විසි දහසක් පමණ මාළිගා ත් ඇත. විසි දහසක් පමණ ඇත්තු ත් ඇත. විසි දහසක් පමණ වූ ම අස්සු ත් ඇත. රථ ත් විසි දහසක් පමණ ඇත. විසි දහසක් පමණ යෝධ සේනාව ත් ඇත. විසි දහසක් පුරඞ්ගනා ත් ඇත. විසි දහසක් පමණ නළු ගැනු ත් ඇත. විසි දහසක් පමණ ඇමැත්-තෝ ත් ඇත. ඒ තරම් සම්පත් ඇති ව රාජ්ජය කරණ ඒ රජ්ජුරුවෝ තමන් පින් කම[1] නො පමා බැවින්–

**"ඉද්ධිවිධං දිබ්බසොතං – පරචිත්තවිජානනං,**
**පුබ්බෙනිවාසානුස්සති – දිබ්බචක්ඛුති පඤ්චධා"**

යනු හෙයින් ඍද්ධිවිධාදි වූ අභිඥාවන් පස් දෙනා ත් රූපා-වචර සමාපත්ති සතර හා අරූපාවචර සමාපත්ති සතර ත් උපදවා ගත්හ. රාජ්‍ය ය කිරීම නම් ප්‍රමාද ස්ථාන වුව ත් තමන් නො පමා හෙයින් වොටුනු පළන් රජවරුන් අධිකරණයෙහි හුන මනා බැවින් එක් දවසක් උදැසන ම බත මේ නිමවා ලා අධිකරණයෙහි හුන්හ. එ තැන ත් බොහෝ දෙනා ගැණිසැහිනිය කියන තැනක් බැවින් මහ අරගල ඇති වි ය. රජ්ජුරුවෝ ද 'මේ ශබ්ද ය නම් ඇසට කටුවක් සේ ධ්‍යානයට විරුද්ධ ය. මාළිගාවට නැඟී ලා ධ්‍යානයට සමවදිමි' සිතා ගෙන හිඳ ත් වික්ෂෙප ය බලවත් ව ගොසින් ධ්‍යානයෙන් පිරිහී ධ්‍යානයට සම වැද ගත නුහුණු වූ ය. ධ්‍යානයෙන් පිරිහී පියා 'රාජ්‍ය සම්පත් යහපත් දෝ හෝ මහණ ධම් යහපත් දෝ හෝ'යි සිතා 'මේ රාජ්‍ය සම්පත් නම් ප්‍රයෝජන සැලකූ කලට සවල්පයෙක. ඒ නිසා වන ආදීනව බලා ලූ කලට සම්පත් නො පමණ ය. ඒ බෙහෙව, මහණ ධම් තෙමේ මඳක් වී නමුත් අනුසස් බොහෝව, කළ මනා එ ම ය'යි සිතා තුමූ අවසර ගන්නා නිසා 'රාජ්‍යය යහපත් කොට දැහැමින් සෙමින් විචාරව' යි එක් ඇමැත්තාණ කෙණකුන්ට සම්මත කොට ලා තුමූ මාළිගාවට නැඟී ලා අපවත් දෙයක්

1. තමන් කම

Non-Commercial Distribution

සොයා ගත්තා සේ නටුවා වූ ධ්‍යාන ය උපදවාගෙන සමවත් සුවෙන් දවස් යවති. බත් ගෙන යන පැන් ගෙන යන කෙණකුන් මුත් අනික් කෙණෙක් ළඟට නො යෙති.

මෙ සෙයින් දෙ පෝයක් විතර ගිය කලට රජ්ජුරුවන්ගේ අගමෙහෙසුන් බිසවු 'රජ්ජුරුවන් වහන්සේ කොයි ගිය නියා ද? දවස් ගණනෙක පටන් නුදුටුම්හ'යි කිවු ය. රජ්ජුරුවන් මහණ ධම් කරණ නියාව බිසොවුන්ට කිවු ය. බිසවු ඒ අසා රාජ්‍යය විචාරන්ට විධාන ලත් ඇමැත්තාණන්ට 'රාජ්‍ය ය තමන්ට භාර වූ පසු මා හැර රාජ්‍යය ත් නො වන හෙයින් මා ත් භාර වූ නියා ය. අප හා සහ වාසයට අව මැනවැ'යි යහපත් අදහස් ඇත්ත වුන් කෙරේ වැසත් තමන්ගේ අදහස් නපුරු බැවින් කියා යවී ය. උහු ඒ අසා ඇසිය යුත්තක් ම නො වන හෙයින් දැතින් කන වසා ගත්හ. බිසවු දෙ තුන් වාරයක් කොට කියා යවා පියා නො ගිවිස් නා හෙයින් භය ගන්වා 'තනතුරු හෝ උදුරා ගනිමි. මරවා හෝ පියමි'යි කියා යවූහ. ඇමැත්තණුවෝ ත් බා ගොසින් 'ගෑනු නම් සිතා ගත් දෙයක තරයෝ ය. එක් සිය විසි හැවිරිදි වයස් ඇති ව පුරුෂයන් පතා වැදූ පුතණුවන් මරන්ට සිතා කඩ වසා ලා තුබූ දිඹුල් දණ්ඩෙහි පොරෝ බැ කෙණෙක. මා නස්වාපුව ත් නපුරැ'යි සිතා එක් දවසක් සොරා ගොසින් උන් හා සහවාසය කොළෝය. ඒ බිසොවුන් මහ පිනැති හෙයින් සුව පහස් ඇත්තාහ.

ඇමැති ත් උන් හා බැඳුණු තැනැත්තේ සැක ඇති ව ඇති ව ත් එක් වන් උන් කරා යෙයි. පසු වකල් යාමක දී ගෙ හිමියක්හු මෙන් පිට බඩ සැකයක් නැති ව බිසෝ ගෙට යෙයි. රජ ගෙයි නියුක්තයෝ ත් එ පවත් රජ්ජුරුවන්ට කිවු යැ. රජ්ජුරුවෝ ත් තමන්ගේ අදහස පවිත්‍ර හෙයින් අදහා නොගණිති. දෙ වැනි වත් තුන් වැනි ව ත් කීහ. රජ්ජුරුවෝ සැඟවී සිට තුමූ ම දැක ඇමැති විසි දස ගෙන්වා ලා එ පවත කිවු ය. ඒ ඇමැත්තෝ ද 'මෙ රාජ ද්‍රොහියා මෙ ද, අත් පා හෝ කැපුව මැනව. හුළ හෝ නැඟුව මැනැවැ'යි කිවු ය. රජ්ජුරුවෝ 'මූට අඩග හානි ය වුවත් මට පව ය. ජීවිත හානි ය වුව ත් මාගේ ප්‍රයෝගයෙන් වූහෙයින් මට ප්‍රාණවධ සිද්ධ වෙයි. සම්පත් හැර ගතො ත් මට අයිනාදන් සිද්ධ වෙයි. ඒ හැම නොකමැත්තෙමි, මූ ත් සාපරාධ තැනැත්තහු රටින් නෙරිය යි වරද නැත. රටින් නහව' යි කිවු ය. ඇමැත්තෝ ත් ඔහු රටින් නැඟූහ. ඒ තෙම තමාගේ සම්පත් හා අඹු දරුවන් හැර ගෙන අනික් රටෙක අනික් රජ්ජුරු කෙණකුන් කරා පලා ගියේ ය.

Non-Commercial Distribution

ඒ රජ්පුරුවෝ ද ඔහු දැක කුමක් නිසා අවු දැ යි විචාළෝ ය. මුඹ වහන්සේට සේවා කම් කරන්නට ය'යි කී කල්හි ගිවිස්සෝ ය. එයි ත් දවස් ගණනකින් ම රාජ වල්ලභ ව ගෙන ඒ රජ්පුරුවන්ට 'ස්වාමීනි, නිමැසි මීයක් දිටීමි. ඒ කන කෙණෙක් නැතැ'යි කිවු ය. රජ්පුරුවෝ වෙහෙසන්ට කියති සිතා දෝ ඒ මීයෙක් වී නම් නපුරෙක් ම ඇතැ යි සිතා හෝ උගේ බස් නො අදහති. තවත් අවසරයක් ලදින් අදහා ගන්නා ලෙසට තරව කී ය. රජ්පුරුවෝ නිමැසි මී නම් කවරේ දැ යි විචාරා බරණැස් නුවර යැ යි කී කල්හි 'මා ඔබ කොට ගෙන මරණු කැමැත්තෙහි දැ'යි කිවු ය. 'එ සේ සිතා නො වෙයි මාගේ බස් නො අදහතො ත් මිනිසුන් යවා උන්ගේ බසින් අදහාගත මැනවැ'යි කිවු ය. රජ්පුරුවෝ රාජ්‍ය ලොභ ය බලවත් හෙයින් මිනිසුන් යවු ය. ගිය මිනිස්සු ත් වාසල කෙරේ පටන් උමං බිඳ ගෙන ගොසින් රජ්පුරුවන්ගේ ශ්‍රී යහන් ගබඩාවට වන්හ. රජ්පුරුවෝ උන් දැක 'කුමට අවු දැ'යි විචාළෝ ය.

'අපි සොරුම්හ'යි කී කල්හි උන්ට වස්තුව දෙවා ලා 'මෙයින් මතු මෙ ලෙසක් නො කරව'යි කියා ලා යවා පීහ. උයිත් ගොසින් රජ්පුරුවන්ට එ පවත් කීහ. එක වරින් අදහා ගත නොහී දෙ තුන් වරකට මිනිසුන් යවා ආදි ලෙසින් ම විමසා පියා 'බරණැස් රජ්පුරුවෝ නම් තද කෙණෙක් නො වෙති. මොළොක් කෙණෙක් ය. ඒ නුවර හැර ගත හැක්කැ'යි සිවුරඟ සෙනඟ සරහා ගෙන බරණැස් නුවර සන්තක වූ එක් නුවරකට ගොසින් ඒ නුවර ඇමැත්තාණන්ට 'නුවර හෝ දෙව. සටන් හෝ කරව'යි කියා යවූහ. ඌ එ පවත් බ්‍රහ්මදත්ත රජ්පුරුවන්ට කියා යවා ලා 'වදරා එවන බව ය. සටන් කරමෝ ද නුවර දී පියමෝ ද? කළ මනා කිම් දැ'යි විචාරා යවූ ය. 'සටන් කිරීම නම් පව් පිරෙන දෙයක් බැවින් සටනෙන් ප්‍රයෝජන නැත. උන් කැමති නුවර උන්ට ම හැර පියා තමන් මුඹ නැඟී අව මැනවැ'යි කියා යවූ ය. උයි ත් එ ලෙස ම කළහ. සතුරු රජ්පුරුවෝ ද හැරපී එ නුවර හැර ගෙන තව තව ත් බරණැස් නුවර සන්තක නුවරවල සිටියවුන්ට එ ලෙස කියා යවූ ය. ඒ ඒ ඇමැතිවරුන් බරණැස් රජ්පුරුවන්ට කළ මනා කිම් දැ යි විචාරා යවා 'සටන් නො කැමැත්තේ ය. නුවරවල් උන්ට ම හැර පියා අව මැනවැ'යි කී කල්හි ඌ හැම ත් බරණැසට ම ගියහ.

ඒ සෙ ගිය ඇමැතිවරු 'රජ්පුරුවන් වහන්ස, සෙසු නුවරවල්, හළ ත් මේ නුවර උන්ට නො හරුම්හ. උන් හා සටන් කරම හ'යි කිවු ය. රජ්පුරුවෝ සටන් කරන්ට කීවොත් ප්‍රාණ වධ ය සිද්ධ වෙයි සිතා ලා නවතා පුව. ඇමැත්තෝ රජ්පුරුවන් වහන්ස

Non-Commercial Distribution

අපි ඒ රජ්ජුරුවන් නො මරා ම අල්වා ගෙනවුත් දී ලම්හ'යි නො එක් ලෙසින් කියා ගිවිස්වා ගෙන රජ්ජුරුවනු ත් කැඳවා ගෙන යන්ට වන්හ. රජ්ජුරුවෝ 'මිනිසුන් නො මරවු නම් කොල්ල නොකවු නම් එමී' කිවු ය. 'අපි මුඹ වහන්සේ තෙල සේ වදළ කල සටනු ත් නො කරම්හ. කොල්ල ත් නො කම්හ. හය ගන්වා පලවා පියම්හ'යි කියා ලා සිවුරඟ සෙනඟ සරසා ගෙන රෑ කොට ලා කළ වල පහන් තබා ගෙන ගියහ. සතුරු රජ්ජුරුවෝ එ දවස් 'බරණැස හා නුවර ගෙන ඉතිකින් කුමක් ද? බරණැස හැරගන්ට පිළිවන් වේ දැ'යි ආලෙස්සම් ව ලා සන්නාහ ය ත් උනා පියා වැද හෙව නිද පීහ. බරණැස් රජ්ජුරුවන්ගේ ඇමැත්තෝ බ්‍රහ්මදත්ත රජ්ජුරුවනු ත් හැර ගෙන සතුරු රජ්ජුරු-වන් කඳවුරු බැඳ ගෙන හුන් තෙනට ගොසින් ලක්ෂ ගණන් කළ වලින් පාන් මැ ත් කොට ලා හිර නැඟී පාන් වූවා සේ එක් හෙළි වූ කල්හි හඬ ගසා ලූහ.

සතුරු රජ්ජුරුවන්ගේ ඇමැත්තෝ තමන් නො පහන් බව මුත් පහන් රජ්ජුරුවන්ගේ පහන් ආලෝකයෙන් මහ බල ඇණි දැක තමන්ගේ රජ්ජුරුවන් ලඟට ගොසින් 'වැද හෙව නිදන්නේ හැයි ද? නැඟී සිට නිමැසි මී කව මැනවැ'යි කිවු ය. රජ්ජුරුවෝ ත් නැඟී සිට සේනාව බලා පියා බා ගියහ. තරයේ ම බවන්ට කොල් වර හඬක් ගසා ලූහ. එ වේලෙහි ද ඌ තුමූ එක සාවාගේ බසින් බොහෝ සිවුපාවුන් මූදු බත් වන්ට ආසන්න වූවා සේ ය යි උන් නො සිතුව ත් සැටි ය. එ සේ හෙයින් 'අනුන්ගේ බසින් සතුරන්ට සම්භවූම්හ'යි රෑ නිදි නැති ව හුන් වන ම හිඳ පාන් කොට පියා දෙ වන දවස් 'මෙ රජ්ජුරුවෝ මැදහත් කෙණෙකි. ළඟට ගිය යි කියා මරවා නො පියති. ක්ෂමා කරවා ගනිමි'යි සිතා රජ්ජුරුවන් කරා ගොසින් බැස හෙව වැඳ ලා 'රජ්ජුරුවන් වහන්ස, නො දැන කළ වරද ක්ෂමා කළ මැනව'යි කිවු ය. රජ්ජුරුවෝ ත් අවවාද කියා ලා 'නැඟී සිටිය මැනව, ක්ෂමා කෙරෙමී' කිවු ය. රජ්ජුරුවන් එ සේ කියන්නා ම හය ත් හැරී ගොසින් බරණැසට නුදුරු තෙනකින් ම රටකු ත් ලදින් මිත්‍ර ව එහි විසූ ය.

බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ ද සතුරු සෙනඟ ත් තමන්ගේ සෙන ඟ ත් සමඟ ව සිටි නියාව දැක 'මා එක තැනැත්තවුන්ගේ මෙත් බලයෙන් මෙසා මහත් රැසක් පිරිසක් සටනට අවුදිනු ත් මැස්සකු බී පියන ලේ විතරකු ත් ඇති නුවූයේ ය. ඉතා යහපතැ, සියලු සත්හු නිදුක් වෙත්ව'යි යනාදීන් මෙත් උපදවා ගෙන ධ්‍යාන පාදක කොට විවසුන් වඩා නො පමා ව විසීම නිසා ඇත් කඳ මත්තේ හිඳ ම පසේ බුදු වූ සේක. විසි දහසක් පමණ ඇමැත්තෝ ද පසේ

Non-Commercial Distribution

බුදු වූ නියාව නො දන වැදලා 'රජ්ජුරුවන් වහන්ස, වඩන බව ය. සතුරන් කවර ලෙසින් වුව ත් සාධාලු සෙනගට ප්‍රසාද දෙවන්ට වුව මැනව. පිට පුරා සිටියවුන්ට වැටුප් වියදම් දෙන්ට වුව මැනැවැ'යි කිවු ය. 'ඒ හැම තොප කිව මනා රජ්ජුරු කෙණකුන්ට වේ ද? ක්‍ෂත්‍රිය ජාති ය නො හැරුණ ත් රාජ කෘත්‍ය ය නැති ව පසේ බුදු වූ තැනට ඉන් ප්‍රයෝජන නැත්තේ වේ දැ'යි පසේ බුදුහු වදළ සේක. ඇමැත්තෝ ද ඒ අසා 'කුමක් වදරණ නියා ද? වොටුනු පැළඳ සූ සැට රාජාභරණ ලා ඇතුන් පිට හිඳිනා පසේ බුදුන් ඇති නියා දැ'යි කිවු ය.

'එ සේ කල පසේ බුදුවරු කෙ සැටියෝ දැ'යි විචාළ සේක. හිස කේ දැහුල් පමණ ව තුන් සිවුරු පාත්‍ර ධර ව සිටිනා සේකැ'යි කිවු ය. එ වේලෙහි දකුණතින් ඉස පිරිමැද ලූ සේක. එ වේලෙහි ම සෘධ්‍යනුභාවයෙන් මවා ගත් රුවක් මෙන් ගිහි වෙස් අතුරු ධන් ව පැවිදි වෙස් පහළ විය. දෙ අහුල් පමණ හිස කෙස් ඇති ව තුන් සිවුරු පාත්‍ර ඇති ව අංගමවිත ව සියවස්[1] ගිය මහ තෙර නමක් වැනි වූ සේක. එ වේලෙහි දී අභිඥවට පිහිට වූ චතුර්‍ත්ථ ධ්‍යානයට සම වැද ලා අභිඥ චිත්තයෙන් අහසට නැඟී ලාපියුමක් මවා ගෙන පියුම මත්තේ වැඩ හුන් සේක. එ වේලෙහි ඇමැත්තෝ වැඳ ලා 'ස්වාමීනි, පසේ බුදු වූයේ කෙසේ දැ'යි විචාළෝ ය. ඔබ ද යමක් මුල් කොට පසේ බුදු වූ සේක් නම් ඒ විභාග කොට වදරන සේක්:

"පබ්බතූපත්ථරෙ රම්මෙ – ජාතා පොක්ඛරණී සියා,
තං සිගාලො අපාපාසි – ජානං සීහෙන රක්ඛිතං"

යනු හෙයින් පර්‍වත මුදුනෙක සිංහයෙකු ගෙන් රකවල් ඇති පොකුණකට සිංහයා පිළිබඳ නියා දන කැණහිලකු ගොසින් පැන් බොන්නා සේ මට නො එක් තරමින් අඩු ව සිටි ඇමැත්තකු පුර ද්‍රොහි නියාව මා ම දක ත් සැටුණු මනා තෙන ඔහු කෙරෙහි මෙත් සිත් පැතිරවීමි. ඔහුගේ බසින් මා මරන්ට ආ සතුරු රජ්ජුරුවන් කෙරෙහි ත් මෙත් සිත් පතුරුවා ඉන් ම ජය ගෙන විවසුවන් අතින් මාර්‍ග ඥන නමැති කඩුව ගෙන කෙලෙස් සතුරන් නසා පසේ බුදු වන්නා ම මම මෙත් සිත් මුල් කෙළෙමි. ඒ සියල්ල ම මා නො පමා ව පිළිපන් හෙයිනැ'යි කී සේක.

'සබ්බෙසු භූතෙසු නිධාය දණ්ඩං,
අවිහෙඨයං අඤ්ඤතරම්පි තෙසං,
න පුත්තමිච්ඡෙය්‍ය කුතො සහායං,
එකො චරෙ ඛග්ගවිසාණකප්පො."

යනු හෙයින් ම වදරණ ලදී.

---

1. සිය වයස්

Non-Commercial Distribution

# 29. අනිත්ථිගන්ධ කුමාරයන් ගේ කථාව

තව ද එක් කුල දරුවාණ කෙණෙක් කසුප් බුදුන් සමයෙහි විසි දහසක් හවුරුදු මුළුල්ලෙහි නො පමාව මහණ ධම් කරන්නාහු කිසුණු පිරියම් කොට ධ්‍යාන උපදවා ගෙන චිත්ත ශුද්ධි ය ඇති බැවින් ලක්‍ෂණ රසාදි විසින් නාම රූප ව්‍යවස්ථාව කිරීමෙන් දෘෂ්ටි ශුද්ධිය ත් ඇති ව විවසුන් වඩා ත් අධිගමය කට නො හී ධ්‍යාන බලයෙන් බඹ ලොව උපන්හ. පසු ව කලෙක දී බඹ ලොවින් චුත ව බරණැස් රජ්ජුරුවන්ට පුත් ව ඉපැදී වැඩී වර්ධන වන්නාහු යම් අවධියෙක පටන් මෝ ගැනි ය, මේ පිරිමියා ය යි විභාගය දනිද් ද එ තැන් පටන් කිරි මවුන්නු ත් ළං වනු නො කැමැත්තෝ ය. නැවීම් ආදිය ත් නො ඉවසති. ඒ සියල්ල ම පිරිමින්ට ත් පිළිවන් හෙයින් උන් ම කෙරෙති. කිරි පොවන කල කිරි මවු ඇඟ මුළුල්ල වසා සැට්ට ලා ගෙන පිරිමි වෙස් ගෙන තන පුඩු පමණක් පිටත් කොට ලා කිරි පොවති. ඒ කුමාරයෝ තුමූ නො පෙනෙන තෙනට වුව ත් ස්ත්‍රී කෙණෙක් ළං ව අවු නම් හෝ ස්ත්‍රී කෙණ-කුන්ගේ බසක් ඇසූ නම් හඬති. වැඩී විය පැමිණි කල ත් බඹ ලොව රඳනා කල නුදුටු විරූ හෙයින් දක්ම නො කැමැත්තෝ ය.

එසේ හෙයින් අනිත්ථිගන්ධ කුමාරයෝ ය යි නම් තබා ලූහ. සොළොස් හැවිරිදි කල්හි පිය රජ්ජුරුවෝ කුල පරම්පරාව පැවැත්ත මනා වේ දෑ යි ජාති සම්පන්න නො යෙක් කුලවලින් ස්ත්‍රීන් ගෙන්වා තුලුන් කෙරෙහි කුමාරයන් ඇලුම් කරව යි එක් ඇමැත්තකුට විධාන කළහ. ඇමැති ත් උපදෙසකින් ඇලුම් කරවනු කැමති ව කුමාරයන් ළඟ තිරයක් අද්දවා ලා රහ මඬුලු කරවී. කුමාරයෝ නටන ගී කියන බෙර ගසන හඬ අසා මේ කුමන අරගලයක් දෑ යි විචාළහ. ඇමැත්තණුවෝ 'ස්වාමීනි, නුඹ වහන්සේගේ නළුවන් රහ මඬුලු බැඳ ගෙන කෙළි නළු[1] පානා නියා ය. තෙල ඇති වන්නේ මහ පිණැති තැනට ය. නුඹ වහන්සේ ත් මහ පිණැති සේක. කෙළි නළු[1] බැලුව මැනැවැ'යි කිවු ය. කුමරයෝ ඒ අසා ඇමැත්තණුවන් මරා නෙරපීහ. උයි ත් ගොසින් එ පවත් රජ්ජුරුවන්ට කීහ. රජ්ජුරුවෝ බිසවුන් කැඳවා ගෙන අවුත් කුමාරයන් ක්‍ෂමා කරවා ලා පෙරළා ඇමැත්තවුන් ක්‍ෂමා වූ හෙයින් පාවා දුන්හ. කුමාරයෝ රජ්ජුරුවන්ගේ ඊට කරණ උත්සාහ හරවනු පිණිස බඩාලුන් ගෙන්වා ගෙන යහපත් රත්රනක් ලවා ලා ස්ත්‍රී රුවක් කරවා ලව'යි විධාන කළහ. උයි ත් විශ්වකර්ම නිර්මිතියක් සේ ශොභා මත් වූ ආභරණ ලා සරහන ලද ස්ත්‍රී රූපයක් කොට පැවූ ය.

1. කෙළිලල

Non-Commercial Distribution

කුමාරයෝ දැක විස්ම ව ඉස සලා පියා 'ඉදින් මෙ බඳු ස්ත්‍රී කෙනෙක් සම්භ වෙත් නම් ඉවසමී' රන් රුව දෙ මවු පියන් ළහට යවූහ. දෙ මවු පියෝ ද 'අප ගේ පුතණුවෝ මහ පිණැති වූවෝ ය. අවශ්‍යයෙන් මුන් හා එක් ව පින් කළ කෙනෙක් ඇති වෙති' යි ඒ රන් රුව රථයක සිටුවා ලා ඇමැත්තන්ට පාවා දී ලා 'යව, ගොසින් රුවින් තෙල රන් රුව තරම් රූ ඇති කෙණකුන් විමසව'යි කීවු ය. උයි ත් ඒ රන් රුව ඇර ගෙන සොළොස් මහ දනවුවෙහි ඇවිදින්නාහු ඒ ඒ ගම්වලට පැමිණ පැන් තොට ආදි වූ යම් තෙනක දී බොහෝ දෙන දකිත් නම් ඒ තැන දේවතා දූවක මෙන් ඒ රන් රුව සිටුවා ලා මා හැඟි පිළි හඳවා ලා ආභරණ ලා මල් පළඳවා ලා එ තැන විතයක් බඳවා ලා තුමූ මුවා වෙලා සිටිති. මෙ ලෙස කරන්නේ කුමක් නිසා දැ යි යත හොත් – මේ තරම් රුවක් දුටු කෙනෙක් ඇත් නම් මූ අසවල් තැනැත්තෝ ය යි කියති. මෙ ම ලෙසින් මද්‍ර රට සාගල් නුවර හැර සෙසු රටවල ඇවිද ඒ කුඩා රට වේද යි ආලිස්සම් කොට සිතා තමන් ඈත මෑත ඇවිදිනා ගමන් පළමු කොට ඔබ ත් ගොස් නො පියා ආ පස්සේ නික්මුණාහ. නික්ම සිට සිතන්නාහු 'මද්‍ර රට සාගල් නුවර රූ ඇත්තන් ඇතැ'යි අසම්භ. ඔබ නොගොසින් ම ගිය කලට රජ්ජුරුවන් වහන්සේ පෙරළා එවන සේක. ඔබ ත් ගොසින් යම්හ'යි සිතා මද්‍රරට සාගල් නුවරට ගියාහ.

සාගල් නුවර මද්ද නම් රජ්පුරු කෙනෙක් ඇත. උන්ගේ ත් සොළොස් හැවිරිදි දූවණි කෙනෙක් උතුම් රූ ධරති. උන්ගේ කම්මිත්තෝ ද නහන පැන් සොයා තොටට ගියාහු එ තැන සිටි රන් රුව දැක 'අප පැනට එවා ලා ළද අවසරයේ පැන් තොටට පලා ආ නියා වේ දෑ' යි කියමින් ළහට අවුත් 'මුන්දෑ අප ගේ ස්වාමි දූවණියන් දෑ නො වෙති. උන් වහන්සේ රුවින් වඩනා සේකැ' යි කුසල් නමැති බඩාලුන්ගේ කර්මාන්ත ඉතා විසිතුරු හෙයින් කීහ. ඇමැත්තෝ ද ඒ අසා මද්ද රජ්ජුරුවන් කරා ගොසින් සුදුසු ලෙසින් ඒ කුමාරිකාවන් අනිත්ථිගන්ධ කුමාරයන්ට සරණ විචාරා නිල කළහ. මද්ද රජ්ජුරුවෝ ත් යහපතැ යි ගිවිස්සාහ. ඇමැත්තෝ ද 'එවූ රන් රුවට වඩනා තරම් කුමාරිකා කෙණකුන් දෑ මද්‍ර රට සාගල් නුවරින් සම්භ වූ සේක. තමන් වහන්සේ අවුත් කැඳවා ගෙන වඩිනේ ඇද්ද? අපි කැඳවා ගෙන එම්මෝ දැ' යි විචාරා බරණැස් රජ්ජුරුවන් ළහට මිනිසුන් යවූහ. රජ්ජුරුවෝ මා එන කලට ජන පීඩාව

Non-Commercial Distribution

මහත. තමන් ම කැඳවා ගෙන එන බව ය' යි කියා යැවූහ. ඇමැත්තෝ ත් කුමාරිකාවන් කැඳවා ගෙන යන්නාහු ම රන් රුව ට ත් වඩනා තරම් කුමාරිකා කෙණකුන් දෑ සම්භ වූ දෑ ය යි අනිත්ථිගන්ධ කුමාරයන්ට කියා යවූහ. කුමාරයෝ ද අසා රාගයෙන් මඩනා ලදු ව උපදවා ගත් ප්‍රථම ධ්‍යානයෙන් පිරිහුණාහ. 'වහා ගෙනෙව' යි 'වහා ගෙනෙව' යි කියා යවති.

උයි ත් දෙ රැයක් එක් තෙනක නො රැඳීමෙන් බරණැසට පැමිණි නුවරින් පිටත රඳා හිඳ 'අද ම කැඳවා ගෙන එමෝ ද? නුවර සරහා ලා කැඳවා ලා එවූ විටෙක එම්මෝ දෑ' යිකියා යවූහ. රජ්ජුරුවෝ 'මහ පොහොසතුන්ගේ දරුවෝ ය. මඟුල් පෙරහර කරවා වුව මනා ලෙසින් ගෙන්වන තෙක් උයන රඳව' යි කියා යවූහ. උයි ත් විධාන ලෙස ම කළහ. කුමාරිකාවෝ ද තමන් ඉතා සියුමැලි බැවින් උසුලා ලීමෙන් ආයාස ඇති ව ලා රුජා ඇති ව මිරිකා පි මල් දමක් සේ ම වෙලා එ දවස් රෑ ම මළහ. ඇමැත්තෝ සංග්‍රහයෙන් පිරිහුණම්හ යි කියා හැඬූහ. රජ්ජුරුවෝ ත් නුවර වැස්සෝත් ආදියෙන් ම නිල කොට ගෙනා කුමාරිකාවන්දෑ නට හෙයින් පසු එවන්නෝ ඇද්ද නැද්ද? කුල පරම්පරාව සිඳෙන නියා ය' යි හැඬූහ. නුවර ත් මහා කොලාහල වී ය. අසමින් ම පෘථග්ජන දෙෂ ය නිසා කුමාරයන්ට ත් ශොක බලවත් විය.

ශොක ය බලවත් වුව ත් ඊට ම දැපී නො හිඳ ශොකයට මූල සොයන්නෝ 'මේ ශොක ය නම් නූපන් කෙණකුන්ට ආධාර නැති බැවින් සිස් අහස මල් නො පිපෙන්නා සේ ඇති නො වෙයි. උපන් කෙණකුන්ට ම වෙයි. එ හෙයින් ශොකයට මුල් වන්නේ ජාතිය ය. ඒ ජාතියට මුල කවරේ දෝ හෝ යි ඊ මුල් සොයන්නාහු ජාතියෙක් වේ නම් කුශලාකුශල චෙතනා සඞ්ඛ්‍යාත කර්ම භව ය නිසා වෙයි. ඒ භව ය දෘෂ්ටිග්‍රාහ සඞ්ඛ්‍යාත උපාදන ය නිසා වෙයි. උපාදන ය අෂ්ටොත්තරශත ප්‍රභෙද වූ තෘෂ්ණාව නිසා වෙයි. තෘෂ්ණාව වෙදනාව නිසා වෙයි. ඒ වෙදනාව චක්ඛුසම්ඵස්සාදි ඵස්ස ය නිසා වෙයි. ඒ ඵස්ස ය ෂඩායතන නිසා වෙයි. ඒ ෂඩායතන නාම රූප ය නිසා වෙයි. ඒ නාම රූප ය ප්‍රතිසන්ධිවිඥාන සඞ්ඛ්‍යාත විඥානය නිසා වෙයි. ඒ විඥානය පුඤ්ඤාභිසඞ්ඛාරාදි වූ සංස්කාරය නිසා වෙයි. ඒ සංස්කාරය භවාදීනව ප්‍රච්ඡාදක වූ අවිද්‍යාව නිසා වෙයි. ඒ අවිද්‍යාවට ආශ්‍රව සමුදය මුල් වෙයි. අවිද්‍යාව නැති වන්නා ම ශොකය තබා කුමකු ත් නැතැ'යි පූර්ව භාවනාභියොගය මුල් ව අනුලොම විසින් ප්‍රත්‍යයාකාරය සලකා විවසුන් වඩමින් එ තැන

Non-Commercial Distribution

හිඳ ම පසේ බුදු වූ සේක. කුමාරිකාවන්ගේ මිය යාම දෙ මවු පිය ආදීන්ට අලාභ වුව ත් මුන් වහන්සේට භවොත්පත්තිය නු වූ හෙයින් මහා ලාභ ය.

මාර්ග සුවෙන් ඵල සුවෙන් නියුක්ත ව වැඩ හුන් පසේ බුදුන් දැක, සැටියෙන් පසේ බුදු සැටි නැති හෙයින් ඇත්තෝ වැදලා 'රජ්ජුරුවෙනි, ශොක නොකළ මැනව. දඹදිව මහත් බැවින් නොගිය තැනට ගොසින් රන් රුව සේ ම රූපත් කුමාරිකා කෙණකුන් දැ ගෙනවුත් පාවා දෙම්හ'යි කිවු ය. 'මට ශොක නැත. නිශ්ශොක ව පසේ බුදු වීම්'යි කී සේක. කුමක් අරමුණු කොට ද පසේ බුදු වූයේ ය යි විචාළ කල්හි —

**සංසග්ග ජාතස්ස භවන්ති ස්නෙහා**
**ස්නෙහන්වයං දුක්ඛමිදං පහොති,**
**ආදීනවං ස්නෙහජං පෙක්ඛමානො**
**එකො චරෙ ඛග්ග විසාණකප්පො.**

යනු හෙයින් යම් කෙණකුන්ට ලක් දිව කළු දික් නම් ගම වසන කෙළෙඹි දුවක් කැලණියේ සිට ගොසින් සිහමින් සිටි කිසි ත් පුරුදු කමක් නැති ළදරු කෙණකුන් වහන්සේ දැක පිළිබඳ සිත් ඇති ව දුටු පමණක් මුත් අනික් දෙයක් නැති ව රාග නැමැති වහ්නීන් ද මළා මෙන් ද, මළ කෙළෙඹි දුවණියන් හැඳි පිළිය දැක මෙබඳු ස්ත්‍රියක හා සහවාස ය නොවී ය'යි ආදා යවා තබා ලා වල් පත ඇල්ලුවා සේ උන් නො මියන අවධියේ ත් තෙල සේ ම දුර්වල අදහස් එකක් නො ව පසු ව ශොකයෙන් මළ ළදරු තැනැත්තන් වහන්සේ මෙන් දැකීම පමණකින් ම ඇල්ම ඇද්ද මෙ සේ ම මෙම ලක් දිව ගල්ගමුවෙ[1] හිඳිනා කැඹිරි දුවක තමා සේ ම කුඩා කොල්ලන් පස් දෙනකු හා කැටිව පියුම් විලකට ගොසින් නා පියා මල් පැළඳ ගෙන ගොඩ නැඟී ලා ලීලොපෙත කොට ගීයක් කියන්නා අසා පසහුළු ලෙණ වසන අභිඥාලාභී තිස්ස නම් භික්ෂූන් වහන්සේ අහසින් යන ගමනු ත් නැති ව ගුණ විශෙෂයෙන් පිරිහුණුවා කැඹිරි දුව කියා ලූ ගීය අසා ලූ හෙයින් ඇසූ බස් පමණෙක ත් ඇලුම් ඇද්ද?

එ සේ ම මෙම ලක් දිව අනුරාධපුර නුවර රුවන්වැලි මළුවෙ හිඳී බණ කියමින් හුන් බාල නමක් බණ අසන්ට ගිය රාජකුමාරිකාවක් දැක කර්මානුරූප ව මියත ත් එපමණකින් ම නැවත නොපියා සිඹ පද විකුම් කොට හස්තග්‍රාහාදී විසින් කාය සංසර්ගයට පැමිණ පෙරළා තිර ය ඉවත් කොට බැලූ කලට මිය පියා හොත් බාල

1 හල්ගමුවේ

Non-Commercial Distribution

භික්ෂූන් දැ හා රාජකුමාරිකාව මෙන් ඇඟ අල්වා පීමෙනු ත් ඇලුම් ඇද්ද, එ සේ ම මෙම ලක් දිව මිරිසවැටිය පූජාවෙහි දී හුණු කැඳ වළඳන ගමනේ අත දන නියාව බලා හැම තැනට බාල වූ සාම ණේරනමට දළකඩ වළල්ලක් දීලා කථා කළ සාමණේරී කෙණ-කු ත්, ඒ වළල්ල පිළිගත් මෙරණුන් දැ ත් දෙපක්ෂය පසු ව මාලු පැවිද්ද ත් ලදින් මාලු පැවිද්දේ පටන් සැට වයස් පලා ගොසින් යම් කිසි ආපදවකින් රට පලා ගොසින් රට දී ඔවුනොවුන් හා කථා කොට හැඳින ගෙන එ පමණ කථාවකින් හා එ පමණ ප්‍රයොජ නයකින් ඔවුනොවුන් විෂයෙහි විපන්න වූ බැවින් කථා පමණෙක ත් සංග්‍රහ පමණෙක ත් ඇලුම් ඇද්ද, ඒ ඇලුම් මෙ ලෝ පරලෝ දෙක්හි බොහෝ දුකට ආයාසයට පමුණුවාලව යිඒ ආදීනව සලකා ඉන් මිදෙන්ට පසේ බුදු වූ නියාව වදළ සේක.

තව ද එක් කුල දරුවාණ කෙණෙක් කසුප් බුදුන් සමයෙහි විසි දහසක් හවුරුදු මහණ ධම් කොට ත් භවොත්පත්ති ය නැති කට නුහුණු හෙයින් සසර ඇවිදින්නාහු එක් සමයෙක බරණැස් නුවර මහා සම්පත් ඇති සිටු කුලයෙක උපන්හ. කුසල්හි හැසිරෙන්ට නො ව පින්හි අනදර සිතින් පරදර කම්හි හැසිර මිය ගොසින් නර කයෙහි පැසී පරදර කම්යෙහි තම විපාක ය නො නිමි හෙයින්, සිටාණ කෙණකුන්ට දූව උපන්හ. උන් මවු කුස පිළිසිඳ ගත් ගමනේ නරකයෙන් ආ හෙයින්, ඇඟ හුණු හෙයින් සිටු දූවණියෝ බොහෝ දුක් ගෙන දුකින් ම වැදූය. කුමාරිකාවෝ ද උපන් දවස් පටන් දෙ මවු පියන්ට වුව ත් සෙසු නෑයන්ට වුව ත් පරදර හැසි-රෙන සමයේ කාට ත් අප්‍රියයා සේ ම අප්‍රියයෝ ය. වැඩි විය පැමිණ සරණ ගිය කල ත් සමණන්ට වුව ත් නැඳි මයිල් ආදීන්ට වුව ත් ඉතා අප්‍රියයෝ ය. උත්සව දවසකදී සිටු පුත්‍රයාණෝ උන් හා එක් ව උත්සවයට මැළි ව වෙශ්‍යාවක ගෙන්වා ගත්හ.

සිටු දූවණියෝ කෙල්ලන්ගෙන් එ පවත් අසා සිටු පුත්‍රයාණන් කරා ගොසින් නො එක් ලෙසින් පයිලි කම් දක්වා 'ස්වාමීනි, ස්ත්‍රීහු නම් රජ දරුවන් දශදෙනකුට නෑ ව සිටියෝ නමුත්, සක් විති කෙණකුන්ට දූ වූ නමුත්, ස්වාමි ව සිටි තැනැත්තවුන් දුක් පත් වුව ත් උන්ට යටත් ව සිටිති. රක්ෂා කළ ස්වාමීන් බැණ නො නැගෙන කලට උන්ට මහා දුක. මා ත් කැමැත්තො ත් රඳවන බව ය. නැත් නම් හැරපියන්නා දෙමවුපියෝ නො දමන්නෝ වේද? ඔබ යෙමි'යි කිවු ය. ඒ අසා සිටු පුත්‍රයාණෝ අනුකම්පා ඇති ව ලා 'වන්නාට ය, මුසුප්පු නො ව උත්සවයට සැරහී ගනුව. එක් ව

Non-Commercial Distribution

උත්සව කෙළිමි'යි කිවු ය. සිටු දුවණියෝ එ පමණකිනු ත් වහා සතුටු ව 'සෙට නකත් කෙළි කෙළිමි'යි බොහෝ කන බොන දෑ ඉදි කරවු ය. සිටු පුත්‍රයාණෝ ද දෙ වන දවස් නො කැඳවා ම උත්සවයට ගියහ. සිටු දුවණියෝ ත් කැඳවා එති කියා රැක හිඳ වෙසී පියා කල් යන හෙයින් එ පවත් දන්නට මිනිසුන් යවු ය. ගිය මිනිස්සු පෙරලා අවුත් සිටු පුත්‍රයාණන් උත්සවයට ගිය නියාව කිවු ය.

උයි ත් සියලු උත්සවෝපකරණ ගෙන්වා ගෙන රථයකට නැඟීලා උයනට යන්ට නික්මුණාහු ය. ඉක්බිත්තෙන් ගඳ මහන්[1] පව්වෙහි නන්‍ද මූලක නම් ලෙන වසන පසේ බුදු කෙණකුන් වහන්සේ සත් දවසක් නිරොධ සමවතට සම වැදලා සත්වන දවස් නිරොධයෙන් නැඟී අනවතප්ත විල දී නාලිය දැවැටි[2] වළඳා ලා සිහා අද කොයි යෙම් දෝ හෝ යි සලකන සේක් ඒ සිටු දුවණියන් දැක 'මෝ මට යමක් පිළිගන්වාපු නම් ශෙෂ ව සිටි පාප ය ගෙවෙන්නේ ය'යි දැන ගල්ලෙන ආසන්න ව දෙසිය ශතළිස් ගවුවක් උස ඇති රත් සිරියෙල් ගලෙක් ඇත. ඊ වැඩ සිට ගැට වටු ගන්වා සිවුරු වැලඳ ගෙන පාත්‍ර ය හැර ගෙන ඍද්ධ්‍යනුභාවයෙන් අහසින් වැඩ සිටු දුවණියන් එන පෙර මග බරණැස් නුවරට මූණ ලා වැඩසිටි සේක. ඔබ දැක සිටු දුවණියන්ගේ කෙල්ලෝ සිටු දුවණියන්ට කිවු ය.

උයි ත් රථයෙන් බැස පියා පසඟ පිහිටුවා සකස් කොට වැඳ ලා පාත්‍ර ය හැර ගෙන මධුරාහාරයෙන් පුර ලා පියුමෙකින් වසා ලා පියුමක් මත්තේ තබාගෙන මල් කළඹක් අතින් හැරගෙන පසේ බුදුන් වහන්සේ ළහට ගොසින් පාත්‍ර ය පිළිගන්වා ලා වැඳ ගෙන මල් කලඹ අල්වා ගෙන සිට 'මේ මල් කලඹ දුටු යම් කෙණකුන්ට ප්‍රිය ද එ පරිද්දෙන් උපනු'පන් ජාතිවල දුටු දුටුවන්ට ප්‍රිය වෙම්ව'යි පළමු කොට පැතූ ය. නැවත 'සවාමීනි, මවු කුස විසීම නම් නරක දුකට නො අඩු ලෙසින් දුක. එ සේ හෙයින් උපදනා යම් ජාතියෙක පියුම් ගැබෙක ම උපදිම්ව'යි දෙවෙනි ව පැතූ ය. තුන් වෙනි ව 'සවාමීනි, ගැනු ව ඉපදීම නම් මිනිස් ලොව ඉපද ත් හීන වූවා සේ ඉතා ලාමක ය. එ සේ හෙයින් නිවන් දක්නා ජාති දක්වා විවරණ ලත් මහ බෝසතුන් මෙන් ගැනි නො වෙම්ව'යි පැතූ ය. සතර වැනි ව 'මුඛ්‍ය විපාක විසින් නිවන් දකිම්ව'යි පැතූ ය. මෙ සේ පැතීම් සතරක් පතා ලා ඒ මල් කළඹ පසේ බුදුන්ට පිළිගන් වා ලා පෙරළා ත් වැඳ ලා 'මාගේ ශරීරයෙහි සුවඳ ත්' පැය ත්

---

1 ගඳ මහත් 2 දැවැයි



Non-Commercial Distribution

මේ මල් කලඹ සේ ම වේව' යි පැතූ ය. පසේ බුදුහු ත් පාත්‍රය ත් මල් කලඹ ත් හැර ගෙනඅහසට පැන නැඟී ලා ප්‍රත්‍යෙක බුද්ධ ගාථා දෙකකින් අනුමෙවෙනි බණ වදරා 'සිටු දුවණියෝ මා නික්මෙන නියාව දකිත්ව'යි ඉටා ලා ගඳ මහන් පව්වෙහි නන්‍ද මූලක ලෙණට ම වැඩි සේක.

සිටු දුවණියන්ට ත් ඒ දැක බලවත් ප්‍රීති උපන. තුන්වන ජාතියෙහි කළා වූ පරදර කර්මයෙන් නරකයෙහි පැසී ශෙෂව තුබූ වා යම්තම් ව තුබූ පැනක් මහ අවු පැහැර සුන්නා සේ ගෙවිණ සිනිඹලා යුෂයකින් තඹ මල නැති වූවා සේ පූරාකෘත පාප ය ගෙවී පිරිසුදු වූහ. එ වෙලේ ම නැදිමයිලන්ගේ මිනිස්සු ත් දෙ මවු-පියන්ගේ මිනිස්සු ත් හිත පක්‍ෂ ව ගෙන පඩුරු එවන්ට පටන් ගත්හ. ආදි නො කැමැති සිටු පුත්‍රයාණෝ ත් 'මම එන ගමනේ සලකුණු නැති ව නැඟී අයිමි. වහා කැඳවා ගෙන එව'යි මිනිසුන් යවූ ය. එවක් පටන් ළෙයි ගල්වා ලූ සඳුනක් මෙන් ද, කර පළන් මුත් හරක් මෙන් ද, මල් දමක් පරිද්දෙන් ද සිතා පිරි මසති.

සිටු දුවණියෝ ත් ආයු පමණින් සැපත් වළඳා පින්කම් බෙහෙදින් ස්ත්‍රී වන්ට නිසි අකුසල් ලෙඩ සන්හිඳුවා ගත් හෙයින් ස්ත්‍රී ලෙඩ නැති ව දෙව් ලොව උපදනා තැනැත්තෝ පියුම් ගබක් ඇතුළත දිව්‍ය පුත්‍ර ව උපන්හ. ඒ දෙවතාවාණෝ යම් තෙනකට යෙත් නමුත් පියුම් ගබින් ම යෙති. සිටිත් නමුත් පියුම ඇතුළේ ම සිටිති. හිඳිත් නමුත් පියුම මත්තේ ම හිඳිති. වැදහොවිත් නමුත් පියුම මත්තේ ම වැද හොවිති. මහ පියුම් දෙව් පුත්හු ය යි නම තබා ගත්හ. මෙ සේ ඒ දෙව් පුත්හු මෙ බඳු ශොභා ඇති ව ස දෙව් ලොව ම පාත දෙව් ලොව පටන් උඩ දෙව්ලොව දක්වා ත් ඒ ඒ දෙව් ලොව ආයු පමණින් දෙව් සැප විඳිති.

මෙ සේ උන් දෙව් ලොව සැපත් විඳිනා කලට බරණැස් රජ්-ජුරුවන්ගේ විසි දහසක් පමණ පුරහනෝ ඇත. ඉන් එක කෙණකු ත් මහ පියුම් දෙව් පුත්හුගේ නියෝගයෙන් මෙන් දරු කෙණකුන් නො ලැබෙති. දරුවන් නැති නියාව දැක ඇමැත්තෝ 'ස්වාමීනි, පුරවධූන් බිසෝවරුන් වදනා දරුවන් නැති පසු ප්‍රවෙණි රක්නා නිසා දරු කෙණකුන් නිසි තෙනකින් හැරගෙන වඩන්ට වුව ත් වුවමනා වේද'යි සරුප් ලෙසකින් කීහ. රජ්ජුරුවෝ ඒ අසා එ සේ වී නම් අග මෙහෙසුන් බිසොවුන්ට එ ලෙස තරම නො වන හෙයින් උන් හැර සෙසු විසිදහසක් පුරහනන් ම වෙශ්‍යා ලෙසට රජ ගෙන් පිටත් කරව'යි කිවූ ය. සත් දවසක් විතරට එලෙස කොට ත් පිරිමි තල්ගස තල් නො ගන්නා සේ සතියක්

Non-Commercial Distribution

මුළුල්ලෙහි ත් පුත්‍ර ප්‍රති ලාභයකට නිසි පින් නැති හෙයින් දරුවන් නො ලත්හ. නැවත ඇමැත්තෝ රජ්ජුරුවන්ට කියන්නෝ 'ස්වාමීනි, මුඹ වහන්සේගේ අග මෙහෙසුන් බිසොවුන් වහන්සේ නුවණින් පිණින් ස්ත්‍රීන් මුළුල්ලට ම වඩනා සේක.

'ධර්ම නාටක වීම ඕ හට තරම් නො වත ත් මුඹ වහන්සේ මුල් ව පුතණු කෙණකුන් වහන්සේ ලත් සේක් නම් යහපතැ'යි කිවුය. රජ්ජුරුවෝ එ පවත බිසොවුන්ට තුමූ කිවු ය. බිසවු 'මහ රජ, යම් ගෑනු කෙණෙක් බොරු නො කියත් නම් ආචාර සීලී වූ නම් දරු කෙණකුන් වදත ත් උං වදති. විළි ලජ්ජා නැත්තවුන්ට එයි ත් පිණින් වන දෙයක් හෙයින් දරුවන් ඇති වන්නේ කෙසේ ද? විළි ලජ්ජා ඇති ව වසන්නවුන්ට දරුවන් සම්භ වන නියාව බැලුව මැනවැ'යි මතුමාලට පැන නැඟීලා පන් සිල් සමා දන් ව ගෙන ආනුභාව සම්පන්න මන්ත්‍රයක් ලක්‍ෂ දෙන කලක් මෙන් තමන් සමාදන් වූ පන් සිල් එක්වන් සලකන්ට වන්හ. එසේ සලකා ලා දරු කෙණකුන් පතන්නා ම ඒ බිසොවුන්ගේ ගුණානුභාවයෙන් සක් දෙව්දුහුගේ හස්න හුණු වි ය. සක් දෙව්දු ද හස්න හුණුවන්ට කරුණු විමසනුයේ මේ කරුණු දැක 'ගුණ සම්පන්න බිසොවුන්ට දරු කෙණකුන් දෙමි යි අහසින් අවුත් ඉදිරි ව ලා සිට 'බිසොවෙනි, කුමක් පතවු දැ'යි විචාළේය.

'දරු කෙණකුන් පතමි' කී කල්හි මුසුප්පු නො වව. දරු කෙණකුන් දෙමි'යි කියා ලා දෙව් ලොවට ගොසින් ආයු ගෙවී ගිය දෙවතා කෙණෙක් මේ දෙව්ලොව ඇද්දෝ හෝ යි බලනුවෝ මහ පියුම් දෙව්පුත්හු මේ දෙව් ලොවින් චුත ව උඩ දිව්‍යලොකයෙහි උපදිති යි දැන උන්ගේ විමනට ගොසින් 'මහ පියුම් දෙව් පුත, මිනිස් ලොව උපදුව'යි කිවු ය. දෙව් පුත්හු ඒ අසා 'මිනිස් ලොව නම් කාම ස්වර්ග ව තිබෙන පමණක් මුත් ඉතා පිළිකුල. ඊ උපද න්ට කියන්ට නො කැමැත්තේ ය'යි කිවු ය. පුත, තොප මුඹ උපන්නෙ ත් මිනිස් ලොව දී පින් කොට ය. මහ බෝසත්හු පවා දෙව් ලොව බඹ ලොව දී පැරුම් නො පිරෙන හෙයින් ඊ ආයු පමණින් නො සිට මිනිස් ලොව උපදිති. තෙපි ත් එහි ඉපැද ප්‍රත්‍යෙක බොධියට පැරුම් පූරව'යි පැරුම් පිට ලා කීහ. මහරජ, මිනිස්ලොව කුණිනු ත් මවු කුස නම් ඉතා කුණු ය. අඳුරු බලා ලූ කලට ලෝ ඇදිරි නරකයක් වැන්න. වෙනසෙක් නම් කුඩා පම ණක. දුගඳ පිළිකුල් සැටියට අත්පස් නරක ය වැන්න. වෙනස නම් නරකායු පමණට ඊ දසමසක් හෝ දස්මස් දෙපෝයක් හෝ

හිඳිනා විතරෙක. එ සේ හෙයිනු ත් මිනිස් ලොව උපදනට බැරි ය'යි කිවු ව. 'පුත, තොප මවු කුස ඉපදීමෙන් ප්‍රයෝජන කිම ද? යම ලෙසකින් පියුම් ගබ උපදිතොත් එ ලෙසට තෙපි පින් කළුව. දෙව් ලොව පහළ වන පියුම් ඔබ දී පහළ නො වේ ද? එ හෙයින් මිනිස් ලොව උපදුව'යි නො එක් කාරණ කියා ගිවිස්වා පී ය.

මහ පියුම් දෙව් පුත්හු ද සක් දෙවිඳුගේ නියෝගයෙන් දෙව් ලොවින් සැව බරණැස් රජ්ජුරුවන්ගේ උයන ගල් පොකුණෙහි පියුම් ගබෙක සංසේදජ ව උපන්හ. දරුවන් පතා හොත් බිසවු ද එ දවස් රැ අලුයම් වේලෙහි සිනෙන් විසි දහසක් විතර පුරහනන් පිරිවරා උයනට ගොසින් සල වට හිඳ මඟුල් පොකුණෙහි පියුමෙ කින් පුතණු කෙණකුන් ලද්දු නම. සිනය පාන් වමින් දුටු හෙයින් උදවුව විපාක දෙන්නා, රාත්‍රිය පාන් වූ කල්හි බිසවු සිනෙන් ගිය ලෙසට ම උයනට ගොසින් එක් පියුමක් ගොහාමත් ව ප්‍රබුද්ධා-සන්න ව සිටියා දුටු වූ ය. පියුම ඉතා ගැඹුරෙ ත් නො වෙයි. ගොඩට ආසන්නයෙ ත් නො වෙයි. පියුම දකිමින් ම ඇතුළේ හොත් කුමාරයන් නුදුට ත් දරු පෙම් හට ගත. දූකලා අනික් කෙණකුන් නො යවා තුමූ ම ගොසින් ලා පියුම හැරගන්නා ම පිපී වැනී ගිය ලෙස නම බිසොවුන්ගේ මුබ පද්මයෙහි නෙත් නමැති නිල් මහනෙල් මල් දූක පියුමෙහි පෙති එ තමා අරුම දෙයක් හෙයින් එම විස්ම ය දූක සමාධීන් සිනාසී පූවාක් වැන්න.

පිපී ගිය පියුම ඇතුළෙහි තුත්තෙක තුබූ රන් පිළිමයක් මෙන් වැද හොත් කුමාරයන් දුටුවූ ය. දූකලා ම පුතණු කෙණ-කුන් ලදීමි' හඬ ගා පිහ. බොහෝ දෙන ත් අභිමතාර්ථය සැධීගිය හෙයින් සමාධි ව සාධුකාර දුන්හ. රජ්ජුරුවන්ට ත් කියා යවූහ. රජ්ජුරුවෝ අසා 'ලද්දේ කොඩිදී දූ'යි විචාරා ලත් තැන් අසා උය න ත් පොකුණ ත් පියුම ත් ඇම අප සන්තක හෙයින් අපගේ ම පුතණුවෝ ය'යි කියා ලා නුවරට ගෙන්වා ගෙන විසි දහසක් පුරහනන් ලවා කිරි මා කම් කැරවූහ. යම යම පුරවධූ කෙණෙක් කුමාරයන්ගේ අදහස් දූන කැවූ නම් පෙවූ නම් මසු දහසක් ලැබෙති.

සියලු බරණැස මූළුල්ල ම අසුරයන් වන් දෙවු පුරයක් මෙන් ද, දෙවියන් වන් අසුර පුරයක් මෙන් ද ඇලලී ගියේ ය. මුවදෙර වල් මූළුල්ල එක්තැන් වූවාක් මෙන් පඬුරු පාක්කුඩමුත් අවුත්

1 පියුම්

Non-Commercial Distribution

ලක්‍ෂ ගණන් කෙළ ගණන් උපදනට පටන් ගත. කුමාරයෝ ද ඒ ඒ දෙය ගෙනවුත් 'මේ කැව මැනව, මේ පුව මැනැවැ'යි කීමෙන් ම තමන් පසේ බුදුන්ට බත් පාත්‍ර ය පිළිගන්වා ලා පැතුව මනා දෙය පතා ගත් පමණක් මුත් ගත් පැරැත්තයක් නැති හෙයින් දෝ පැරැත්ත අසා කුසී ව ගොසින් වාසල කරා පලා ගොසින් ලා හූ වටක් දම දමා කෙළිති.

එ කල එක් තරා පසේ බුදු කෙණකුන් වහන්සේ බරණැස් නුවර නිසා ඉසිපතන නම් උයන් හි වසන සේක. උන් වහන්සේ ද වේලා පස ම වත් පිළිවෙත් සපයා ගෙන එල සම වතින් නැඟී සේක් අහර සිඟා කො තැනකට යමෝ දෝ හෝ'යි සිතා පදුම කුමාරයන්ගේ හේතු සම්පන්න නියාව දැක මුන් ගිය දවස කළ පින් කවරේ දෝ හෝ යි විමසන සේක් 'මා බඳු වූ පසේ බුදු කෙණකුන්ට බත් පාත්‍රයත් පිළිගන්වා ලා ප්‍රාර්ත්‍ථනා පසක් පැතුහ. ඉන් සතරෙක් සමෘද්ධ විය. එකක් තව සිද්ධ වූයේ නැත. ඒ සිද්ධ නො වී නම් සෙස්සෙන් ප්‍රයෝජන නැත. ඊට ත් උපදෙසක් කෙරෙමි' සිඟා වඩනා බඳු ව කුමාරයන් ළඟට වැඩි සේක. කුමාරයෝත් ආදර්‍ශයක් බඳු වූ පසේ බුදුන් දැක ශාසනික බැවහාර නො දන්නා බැවින් 'මහණ, මුඹ නො එව මුඹ අවු නම් මේ කව, මේ බොව යි කියා මහ ගහට කෙරෙති. තෙල ලෙසින් මම බොහෝ ගහට විඳ පීමි'යි කිවුය. ඔබ ද එක බසින් ම නැවත පියා කුමාරයන් තමන් වහන්සේ වසන තෙනට ගමන නො නවතනා ලෙස කොට ලා විහාර-යට ම වැඩි සේක.

පදුම කුමාරයෝ ද ළඟ සිටියවුන්ට 'මේ මහණ මා නො එන්ට කියන්නා එක බසින් ම නැවැත්ත. මට උරණ ව දැ'යි විචාළෝ ය. හැම දෙන 'ස්වාමීනි, තෙල තරම් තැන් උරණ නො වන සේක. ක්‍ෂමාව නම් ඔබට ලා ආභරණයක් වැනි ය. සැදෑ ඇති ව යම් කෙණෙක් යමක් දුන්නු නම් ඒ වළඳා ලා මහණ ධම් පුරණ සේක. එ විතරක් මුත් මැරුවවුන් මැරීම හා බිණූවවුන් බිණීම හා ඒ හැම ඔබට නැතැ'යි කිවු ය. එ සේ කීව ත් කුමා-රයෝ තමන් සසරින් නැවත්ත මනා හෙයින් නො නැවත 'මහණ මට උරණ ම ය. උරණ නැත හොත් අව මනා වේ ද? ඔහු ක්‍ෂමා කරවමි' දෙ මවු පියන්ට කියා ලා ඇතකු නැඟී ගෙන මහ පෙර හරින් ඉසිපතනයට ගොසින් උයන සිටි මුව රළක් දැක මූ කවුරුදැ යි විචාළෝ ය. මුවෝ ය යි කී කල්හි 'මේ කැව මැනව, මේ පුව මැනවැ'යි කිය කියා මුනු ත් කුසීත කරවන්නෝ ඇද්දැ'යි විචාළෝ ය. ස්වාමීනි, ඒ හැම ලබන්ට පින් කළ මනා

වේ ද? එ බඳු පිනක් මුඹ වහන්සේ ලා සේ නො කළ හෙයින් උන්ට ඒ හැම නැත. යම් තෙනක තණ පැන් ඇත් නම් එ සේ වූ තැනෙක රඳති' කිවූ ය. කුමරහු ඒ අසා මුත් දවස් යවන නියාව යහපත. කවර දවසෙක දෝ මට එ බන්දක් වන්නේ ය'යි සිතූහ.

පසේ බුදුහු ත් තමන් වහන්සේ කරා උන් එන නියාව දැන ලා පෙත් මඟ ත් මළුව ත් සක්මන ත් හැම ද පියා සක්මනට නැඟී එක් දෙ විටක් සක්මන් කොට පියවර සටහන් දක්වා ලා දවල් වැඩ හිඳිනා තැන ත් පන් සල ත් හැමද පියා ඇතුළට වන් පිය වර සටහන් දක්වා ලා පිටතට නික්මුණු පියවර සටහන් නොපා අනික් තෙනකට වැඩ පී සේක. කුමාරයෝ එ තැනට ගොසින් පවිත්‍ර වූ අදහස් ඇති පසේ බුදුන් පවිත්‍ර කොට හැමදි මං පෙත් දැක ඒ පසේ බුදුන් වහන්සේ වසන්නේ මෙ තැන ය යි හැම දෙන අතිනු ත් අසා 'උදසන ත් ඒ මහණ මා කියා ලූ බසට උරණ ව ගෙන ආ ය. දැනු ත් රැස් පිරිස් අවුත් වැද පියා හැමද පියා තුබූ මළු මැඩ කසළ කළො ත් කැල ම උරණ වෙති. තෙපි හැම මෙ තන රඳව' යි පිරිස පිටත රඳවා ලා තුමූ ඇතු පිටින් බැස පියා තනි ව ම විහාරය ඇතුළට වැද ලා හැමදි තැන්හි ඔබා ලූ පියවර සටහන් දැක 'එ කාන්ත ව මේ මහණ මෙ තැන වසනුයේ නවාම් වෙළඳාම් කරනුයේ නො වෙයි. තම හට වැඩක් ම සිත සිතා හිඳිනා වන. දැන් උං තුමූ කොයි දෝ හෝ' යි විමසනු නිසා දවල් වැඩ හිඳිනා තැනට ගියහ. එ තැන ත් පියවර සටහන් දැක ආදි සිතූ ලෙස ම සිතා රැ වසන පන් සලට ගොසින් නැවත දෙර හැර ලා ඇතුළු පන්සලට වැද පසේ බුදුන් නො දැක ඇත මැත බලා උන් වහන්සේ වැඩ හිඳිනා ගල් පෝරුව දුටු වූ ය.

එයි ත් දැක ආදි සිතූ ලෙස ම සිතා එ තැන්හි හිඳ ධ්‍යාන උපදවා ගෙන විවසුන් වඩා පසේ බුදු වූ සේක. පසේ බුදු ව ලා පෙරළා නුවරට ගමන නුවුව මනා හෙයින් එ තැනින් නො වඩනා සේක. ඇමැත්තෝ රජ දරුවන්ගේ අණ සක් මැඩ ලිය හැක්කේ නො වෙයි. 'ම පුතුන් හැර ගෙන මෙ තෙක් වේලා වල කල් යවන්ට කාරණ කිම් දැ'යි මරවා තළවා දඬු මුඬු ගත් සේක් නමුත් නපුර. කුමාරයන් වහන්සේ කැඳවා ගෙන යම්හ'යි පන් සලට වැද ලා පසේ බුදු වූ කුමාරයන් දැ ම දැක 'මුන්දැ පසේ බුදුන් නො දැක සිත්විලි ගෙන හුන් සේක් වනැ'යි සිතා ලා 'ස්වාමීනි, පසේ බුදුහු නිරන්තර ව මෙහි වසන සේක. දුරකට වැඩ පියන්නේ නැත. සෙට වුව ත් අවු ත් ක්‍ෂමා කැරවිය හැක්ක

පසේ බුදුන් අද නුදුටුවම්හ'යි මුසුප්පු නො කැමැත්තේ ය. තුව රට යම්හ'යි කිවු ය. 'මට එසේ මුසුප්පු සිතිවිලි නැතැ'යි කී කල්හි කුමක් නිසාද යි විචාළ කල්හි පසේ බුදු වූ නියාව කී සේක. 'මෙසේ පසේ බුදු වතොත් පසේ බුදුවන්ට බැරි නැති නියා වේ ද? එ සේ කුමක් අරමුණු කොට ද පසේ බුදු වූයේ'යි විචාළෝ ය.

'මිගො අරඤ්ඤම්හි යථා අබද්ධො,
යෙනිච්ඡකං ගච්ඡති ගොචරාය,
විඤ්ඤූ නරො සෙරිතං පෙක්ඛමානො
එකො චරෙ ඛග්ගවිසණකප්පො'

යනු හෙයින් වල තණ පැන් අනුභව කොට ලා වසන සිවුපාවුන්ගේ සප්‍රධාන වාස ය දැක ඒ අරමුණු කොට පසේ බුදු වූ නියාව වදාළ සේක. එ හෙයින් නුවණැත්තවුන් විසින් ප්‍රත්‍යෙක බොධිසත්‍ව චරිත ත් අසා පින්කම නො පමාව භවක්‍ෂයට ම උත්සාහ කට යුතු.

---

## 30. මහසුප් තෙරුන් වහන්සේ ගේ වස්තුව

තව ද උපදනාවුන් හා මියන්නාවුන් හා දැක ජාති දුක්, ජරා දුක්, ව්‍යාධි දුක්, මරණ දුක්, අප්‍රිය සම්ප්‍රයොග දුක්, ප්‍රිය විප්‍රයොග දුක් ආදී වූ දුක් තමා හැර වන දුක් නොවන හෙයින් තමාකෙරෙහි සත් සලකා දැක ඒ දුකින් මිදෙනු නිසා පින් කම හැසිරෙනු පිණිස අපිස් තෙනට අගතැන් පත් වූ-තව ද විසුද්ධි කැමැත්තන්ට පිහිට වීමෙන් පොළොව හා සමාන වූ කෙලෙස කිලුටු සෝධා හැරීමෙන් පවිත්‍ර පැනක් හා සරි වූ සියලු කෙලෙසුන් දවා හැරීමෙන් ගින්නක් හා සම වූ සියලු කෙලෙස් කසළ දුරු කිරීමෙන් පවනක් හා සම වූ සියලු කෙලෙස් ලෙඩ සන්සිඳවීමෙහි දිව ඉබෙහෙතක් වැනි වූ කෙලෙස් විස බා පීමෙහි ආනුභාව සම්පන්න මන්ත්‍රයක් වැනි වූ ශීල සමාද්ධ්‍යාදී ගුණ බීජුවට හට ගන්ට සරු කෙතක් වැනි වූ අභිමතාර්ථ සාධා දීමෙහි සිතුම්ණි රුවනක් වැනි වූ විසුද්ධි කැමැත්තවුන් සසර සයුරෙන් එ තර කිරීමට නැවක් වැනි වූ සියලු කෙලෙස් කසළ හා එක් නොවීමෙන් පියුමක් වැනි වූ කෙලෙස් දුගඳ පැසි කිරීමෙහි සිවු දැ සුවඳක් වැනි වූ අෂ්ට ලොක ධර්ම නමැති සුළඟින් වෙවුලීමක් නැති හෙයින් මහ මෙර වැනි වූ ප්‍රත්‍යය සමුත්පන්න ධර්මයන්ගේ සවභාව ය දැක්වීමෙහි මැදි කැඩ පතක් වැනි වූ කෙලෙස් පහර වැළැකීමෙහි එලකායුධයක් වැනි වූ කෙලෙස් අවු හා වැසි හා නවතාලීමෙහි කුඩයක් වැනි

Non-Commercial Distribution

වූ මොහඳුරු දුරු කිරීමෙහි හිරු හා සමාන වූ නො එක් ගුණ රුවනට ආකර වී මෙන් මහ මුහුද හා සරි වූ කෙලෙස් දුවහ පුරන මහසුප් මහ තෙරුන් වහන්සේ ගේ වස්තුව කියමු.

ඒ කෙ සේ ද? යත්:

එක් සමයෙක මහසුප් තෙරුන් වහන්සේ රජගහා නුවරට ආසන්න ව තිබෙන පුළිල ලෙණ ය යන ගල් ලෙනක වසන සේක් රජගහා නුවර සිහා ගෙන පුළිල ලෙණේ දී වළඳා ලා අන්ත යෙහි ආලොක කිසුණ ත් ප්‍රතිභාග නිමිත්ත වූවා වඩා ලා ඊට ඇතුළත් වූ පමාව වසන්නා වූ ත් නො පමාව වසන්නා වූ ත් මියන්නා වූ ත් උපදනා වූත් සතුන් දිවසින් බල බලා වැඩහුන් සේක.

බුදුහු එ තැනට එක් සිය අසූ ගව්වක් විතර ව තිබෙන දෙවුරම වැඩ හිඳ 'අද ම පුත් මහසුප් මහතෙරහු කුමක් කෙරෙද්දෝ හෝ' යි දිවසින් බලා වදරා මියන්නවුනු ත් උපදනවුනු ත් දිවසින් බලතී දැන වදරා 'සතුන්ගේ චුති උත්පත්ති දෙක බුදු නුවණින් මුත් දත නො හැක්ක. මවු කුස පිළි සිඳ ගෙන මවුපියන් නො දන්වා ම මියන්නවුන්ගේ ගණන් නැත. එ සේ හෙයින් තොපට අවිෂ ය ය. තොපට විෂය වන්නේ මුහුදින් ඇසට විෂ ය තෙන සේ ය. 'චුති උත්පත්ති දෙක සවාරෙන් දනිතො ත් බුදු වරුන්ට මුත් තොපට බැරිය'යි බුදුරසක් විහිදුවා ළඟ වැඩ උන්නා සේ ම 'හෙම්බා, කාෂ්‍යපයෙනි, යම් පොකුණකට වදනා වතුරු දියෙක් පරණ ව තුබූ පැන් අළලා ගෙන ඊට අවසර නො පෑ තම තමා මතු මත්තෙහි පලවා පියා ද, එ මෙන් නුවණැත්තෝ තුමූ තමන්ගේ අප්‍රමාද නමැති වතුරු පැනින් සිත් සතන් නමැති පොකුණෙහි ප්‍රමාද නමැති පරණ පැන් පලවා අප්‍රමාද නමැති අලුත් දිය ම රඳවති. රඳවා ලා ඉන් නිරන්තර ව නහා පිරිසිදු ව දිවස් නමැති මාළිගාවට තදනුරූප පිළිවෙත් නමැති හිණින් නැඟී එහි සිට හෝ අනාවරණඥාන නමැති මහ මෙර උඩට පැරුම් නමැති මහ හිණින් නැඟී සිට හෝ මාළිගාවෙක උඩු මාළක සිටි කෙණෙක් මාළිගාවෙන් පාත සිටියවුන් සුව සේ දකිද්ද, එ මෙනුත් පර්වතයක් මුදුනේ සිටි කෙණෙක් ගල් පාවුල සිටියවුන් සුවසේ දකිද්ද එ මෙන් උපදනවුනු ත් මියන්නවු ත් සුව සේ දකිති' වදළ සේක. මේ දෙසනා කෙළවර ත් බොහෝ දෙන නිවන් පුර වන්හ.

එ සේ හෙයින් නුවණැත්තවුන් විසින් ජාති දුක් ආදිය එළ වන අකුසලින් දුරු ව ජාති දුක් ආදී වූ දුක් නැති නිවන් එළ වන කුසල්හි පිහිටන්ට උත්සාහ කට යුතු.

Non-Commercial Distribution

# 31. ද්විසහායක වස්තුව

තව ද පමා ව වසන්නවුන්ට නිවන් දුරුවන නියාව ත් නො පමාව වසන්නවුන්ට නිවන් ළං වන නියාව ත් දක්වා නො පමා වීමෙහි යොදන්ට ද්විසහායක භික්ෂු වස්තුව කියමු.

ඒ මෙක සේ ද යත්:-

එක් දෙ දෙනකුන් වහන්සේ රහත් වනු නිසා බුදුන් ගෙන් කමටහන් ඉගෙන ගෙන භාවනා කරනු නිසා ගම් පැල් ඊට අයොග්‍ය හෙයින් යටත් පිරිසෙයිනු ත් දුනු පත් සියයක් පමණ දුර ඇති වනවාස විහාරයට ගිය සේක. එ සේ වැඩි දෙ දෙනා වහන්සේ ගෙන් එක් කෙණකුන් වහන්සේ වේලා පස ම දර ගෙනවුත් වග්ගිනි කබලේ [1] ගිනි මොළවා ගෙන එයි ත් එක් භාවනා විධියක් සේ හෙරණුන් පිරිවරා ගෙන ස්වර්ග-මොක්ෂ බාධක වූ කථා කෙරෙමින් ගිනි තැප තැප පෙර යම් දස පැය යවන සේක. අනික් විසි පැය නිදන සේක. අනික් තෙනැත්තවුන් වහන්සේ නො පමා ව මහණ ධම් පුරන සේක් 'ඇවැත්නි, තෙල ලෙස නො කළ මැනව. පමා ව වසන්නවුන්ට සතර අපාය නම් නිරන්තර ව හිඳිනා ගෙවල් හා සරි ය. බුදුවරුන් වහන්සේ ත් වඤ්චාවෙන් සිත් ගන්ට බැරි ය. නරක ගිනි බතො ත් ගිනි තැපුම ත් හැරලා පිඹුරු ව උපන් අවධි වල නිදා පූ නිදි ත් නො මද බැවින් නිදි ත් හැර කරණ කථාවට අල්පෙච්ඡ කථාදිය ඇති බැවින් නිෂ්ප්‍රයෝජන කථා ත් හැර මහණ ධම් කළ මැනැවැ'යි වදරන සේක.

ඔබ වදරන අවවාද පමා ව වසන තැනැත්තන් වහන්සේ කරන්ට සිත් නො යන හෙයින් නො ගිවිස්නා සේක. නො ගිවිස්නා නියාව දැන ලා උන් වහන්සේ කියන මාලු කම් තබා පියා තමන් වහන්සේ නො පමා ව මහණ ධම් පුරන සේක. මැළි තෙරුන් වහන්සේ ද පෙර යම් දස පැය ද බිඳ ලා ගත් දර ඇති බැවින් ගිනි තැප පියා මහණ ධමට නො මැළි වූ තෙරුන් වහන්සේ පෙර යම්හි හිඳීමෙන් හා සිටීමෙන් හා සක්මන් කිරීමෙන් හා දවස් යවා මැදිම් [2] යම සැතපෙන්ට ගබඩාවට වන් කල්හි තමන් වහන්සේ ත් ගබඩාවට වැද ලා තමන් වහන්සේගේ මැළි කම ඔබ පිට ලා ලා 'මහ මැළියාණෙනි, වැද හෙව නිදන්ට දවු ද? කුමක් ද? බුදුන් ගෙන් කමටහන් ඉගෙන ආ කල වීර්‍ය්‍ය කළ මනා වේ ද'යි කියා ලා තමන් වහන්සේ වසන තෙනට ගොසින් අනික් විසි පැය ගිනි තැපීමු ත් කථා ත් නැති ව සුව සේ නිදන සේක. මහණ ධම නො පමා තෙරුන් වහන්සේ ද මැදිවූ යම සැතපිලා දළු යම නැඟී සිට මහණ ධම් කරණ සේක.

---

1 ගිනි කබල් 2 මැදින්

Non-Commercial Distribution

මෙ සේ නො පමා ව වසන සේක් නොබෝ දවසකින් ම සිවු පිළිසිඹියා පත් රහත් ව ගත් ආයාස සප්‍රයෝජන කළ සේක. පමා ව විසූ අනික් තෙරුන් වහන්සේ ගිනි තැපීමෙන් හා නිදී-මෙන් රෑ දවස යවා වැළඳීමෙන් හා දෙඩීමෙන් දවල් දවස් යවා වස් අන්තයේ වෙළඳාමේ ගොසින් නිකම් ම ආ ගමනක් සේ බුදුන් කරා ගොසින් වැඳ ලා එකත් පස් ව හුන් සේක. බුදුහු ත් පිළිසඳර කථා කොට ලා ''කුමක් ද? නො පමා ව මහණ ධම් සැළා ද? පැවිදි ව කළ මනා කාරිය මුදුන් පැමිණියේ දෑ''යි විචාළ සේක.

පමා ව විසූ තෙරුන් වහන්සේ බුදුන්ට දක්වන සේක් 'ස්වාමීනි, මුන් වහන්සේ සැරහී සෑසී භාවනාවට ගිය බව මුත් නො පමා බවෙක් නම් කොයි ද? ගිය තැන් පටන් ගිනි මොළවා ගෙන ගිනි තැපීමක් වේව යි සුව දුක් කථා කිරීමෙක් වේව යි නැති ව නිදීමෙන් දවස් හළ සේකැ'යි කියා නුගුණ කියම්හ යි සිතා ගුණ කී සේක. 'තෙපිනැ'යි වදාළ කල්හි 'මම, ස්වාමීනි, මුන් වහන්සේ වේලා පස ම අභියුක්ත පිරිමැස්ම නැති හෙයින් ගිනි දර ගෙනවුත් මොළවා ගෙන පෙර යම දස පැය ගිනි තැප පියා නො නිදා ම දවස් යවමි. මෙ සේ පෙර යම දස පැය සිස් ව නො ගොසින් ගිනි තැපී මෙන් යෙයි. නිද ත් නමු ත් අනික් විසි පැය පමණෙක නිදමි. පෙර වරු දවස් සිඟන හෙයින් හා වළඳන හෙයින් නිදන්ට අවසර වූවො ත් ඒ හැම නැති හෙයින් නො නිදමී පස් වරු ත් වළඳා අන්තයේ සුහක් නිදා පීමි නමුත් දර දණ්ඩක් පැනිත්තක් සපයා තබන්ට වුව මනා හෙයින් එ සේ ත් නැතක් වේලා නො නිදමි' භාවනාවක් ම ඊ මුසු කොට පිළිපදිනා ලෙස කියා ලූ සේක.

බුදුහු ත් ඒ අසා 'නොප මා ව දවස් යවා ගොයම් කොට ත් මීවුන් හූරන් කාපී හෙයින් ලත් විකක්[1] නැත්තා සේ කිසි ගුණයක් නො ලැබ අවුත් නො පමා ව විසූවන් පමා ව විසූව යි කිය'යි වදරා 'යමෙක් ශාසන ධර්මයෙහි නො පමා වී නම් එ තෙමේ පමා තැනැත්තහු ශීඝ්‍ර ගමන් ඇති අසකු අස් කුඩයකු පසු කොට පියා දුවන්නා සේ ආගමාධිගම දෙකින් ම පසු කෙරෙයි. එ සේ මැයි, නුවණ මඳවුන් එක සූත්‍රයක් උගන්නා කලට නුවණැත්තෝ වගක් හෝ සභියක් හෝ වඩා උගනිති. එ සේ ආගමයෙනු ත් පසු කෙරෙති. නුවණ නැත්තවුන් භාවනාවට රෑ වසන තැන් දවල් වසන තැන් ආදි ය කට දී ම උගත් කමටහන් වන පොත් කරවමින් සිටියදී ම නුව ණැත්තෝ අනුන් ඉදි කළ තැනකට වුව ත් වැද ලා කමටහන්

---

1 වී ටිකක්

Non-Commercial Distribution

මෙනෙහි කොට සව් කෙලෙසුන් ගෙවා රහත් වෙති. මෙ සේ අධිගමයෙනු ත් පසු බස්වති' වදළ සේක. මේ දෙශනා කෙළවර ත් බොහෝ දෙන සෝවාන් ඵලාදියට පැමිණියහ.

සත් පුරුෂයන් විසින් ආගමාධිගම දෙකට ගමනේ දක්‍ෂ නො වන කුඩා අසුන් ගමනට පසුවන්නා සේ නො ව ශීඝ්‍ර ගමන් ඇති සින්ධු දෙශයෙහි අසුන් මෙන් ·හෙවත් උන් ගමනේ දක්‍ෂයා මෙන් ආගමාධිගම දෙක්හි ශීඝ්‍ර වූ ඥාන ගති ඇති ව විසීමට තැත් පිරිය යුතු.

# 32. මහාලී ප්‍රශ්න වස්තුව

තව ද කුසල්හි නො පමා වූ මඝ මාණවකයන් ලත් ශක්‍ර සම්පත්තිය සත්‍වයන් කුසල්හි අසුරුවනු පිණිස මහාලී ප්‍රශ්න වස්තුව කියමු.

කෙ සේ ද යත්:

විසල් මහ නුවර මහාලී නම් ලිච්ඡවි රජ්ජුරු කෙණෙක් ඇත. උඹ බුදුන් සක් පැන සූත් දෙසා වද ළා අසා 'බුදුහු සක් දෙවිඳුහුගේ සම්පත බෝ නියාවක් වදරන සේක. සම්පත දැක ම වදරන නියා දෝ හෝ නොහොත් සම්පත් මහත් නියාව ඔබ්බකින් අසා වදරන නියා දෝ හෝ ශක්‍රයන් හඳුනන නියා දෝ හෝ නො හඳුනන නියා දෝ හෝ විචාරමි'යි සිතා මහාලී ලිච්ඡවීහු බුදුන් කරා ගොසින් වැඳ එකත් පස් ව හිඳ බුදුන්ට 'ස්වාමීනි, ශක්‍රයන්ගේ සම්පත් වදරන නියාව ඉතා විස්තර ය. උන් දුටු විරූ ඇද්දූ'යි කිවු ය. 'එ සේ ය, මහාලීනි, දුටු විරූම්හ'යි වදළ සේක. ඒ අසා මහාලීහු 'ස්වාමීනි, උන් එක් වැනි කෙණකුන් නියා·ය. එක් වන්නවුනු ත් ලොව ඇති හෙයින. ශක්‍රයන්ගේ අත් බැව දිව අත් බැව් හෙයින් දක්නට බැරි ය'යි තමන්ට බැරි හෙයින් ඔබට ත් බැරි දෝ හෝ යි සිතා කිවු ය. 'හෙම්බා මහාලීනි මා උපන් දවස් පටන් මෙ වක් දක්වා මහල් මෙහෙ කොට සිටි හෙයින් මම ශක්‍රයන් හඳුනමි. දැන් හැඳිනීමෙහි විස්ම කිම් ද? මහෞෂධ පණ්ඩිත කල ත් වෙස් වළා සිටියවුන් හැඳින ගතිමි. ශක්‍රයන් තබා යම් පිණක් කොට ශක්‍ර වූ නම් ඒ ශක්‍ර සම්පත් සාධා දී ලූ පින්කමුත් දනිමි' වදළ සේක.

එ සේ වදරා ලා 'හෙම්බා මහාලීනි, සක් දෙවිඳු පෙර මිනිස් ලොව දී මඝ නම් වී ය. එ හෙයින් මඝ ය යි කියති. නැවත මේ සක් දෙවිඳු පෙර මිනිස් ලොව දී දනක් දේ නම් හැම දෙනාට පෙරාතු ව දෙයි. එ හෙයින් දැන් පුරින්‍ද ද ය යි කියති. නැවත

Non-Commercial Distribution

මේ සක් දෙවිඳු මිනිස් ලොව දී දෙන දනක් යහපත් අදහසින් සකස් කොට දෙයි. එ හෙයින් ශක්‍ර ය යි කියති. නැවත මේ සක් දෙවිඳු මිනිස් ලොව දී මාවත යන එන්නවුන් සැතපෙනු සඳහා ගෙයක් කරවා දින. එ හෙයින් වාසව ය යි කියති. නැවත මේ සක් දෙවිඳු දහසක් කාරණා ඇසිල්ලෙකින් සිතයි. රූ දක්මෙහි සමත් ඇස් දෙක වුව ත් නුවණැස් දහසක් හෙයින් සහස්‍රාක්ෂ ය යි කියති. තව ද, මහාලිනි, සක් දෙවිඳු හට සුජාතා නම් අසුර කන්‍යාවක් වුව. එ හෙයින් සුජම්පති නම කියති. මහාලිනි, මේ ශක්‍රයෝ දෙ දෙව් ලොව දෙවියනට නායකය හ. එ හෙයින් දෙවිඳු ය යි කියති. යම් පින් කමක් කොට මූ ශක්‍ර වූ නම් එ සේ මුන් කළ පින්කම් සතෙක් ඇත. ඒ කවරේ ද යත්:

"මාතාපෙත්තිභරං ජන්තුං – කුලෙජෙට්ඨාපචායිනං,
සණ්හං සඛිලසම්භාසං – පෙසුණෙය්‍යප්පහායිනං.
මච්ඡෙරවිනයෙ යුත්තං – සච්චං කොධාභිභුං නරං,
තං වෙ දෙවා තාවතිංසා – ආහු සප්පුරිසො ඉති"

යනු හෙයින් දෙමවු පියන් නැවීම් ඉස් සේදීම් කැවීම් පෙවීම් ආදි විසින් ද:

"බ්‍රහ්මාති මාතාපිතරො – පුබ්බාචරියා ච වුච්චරෙ
ආහුණෙය්‍යා ච පුත්තානං – පජාය අනුකම්පකා;
තස්මාහි තෙ නමස්සෙය්‍ය – සක්කරෙය්‍යාථ පණ්ඩිතො"

යනු හෙයින් දිවි හිමියෙන් උපස්ථාන කොට ලා දිවි හිමියෙන් නැඳි මයිල් බෑබුන් ආදි වූ කුල දෙටුවන්ට ආදර සම්භාවනා කළහ. දිවි හිමියෙන් ම කවුරුන් වුව ත් අනුන්ට බස් මොළොක් කොට ම කිවු ය. දිවි හිමියෙන් ම භෙදාභිප්‍රායෙන් වෙච යි පිය කම්මතාව නිසා වෙච යි කේළාම් නො කීවෝ ය. දිවි හිමියෙන් ම දන් දීමෙහි මසුරු සිත් නැත්තෝ ය. දිවි හිමියෙන් ම බොරුවක් නො කීහ. දිවි හිමියෙන් ම අනුන් කෙරෙහි ක්‍රොධ නො කළා හ. පෘථක් ජන සන්තාන හෙයින් ක්‍රොධයක් හට ගත් නමුත් වහා ම සන්හිඳුවති. ඒ ක්‍රොධ නො කළා හා ම සරි ය. මෙ සේ, හෙම්බා මහාලිනි, මඝ මාණවකයන් මේ කළ පින් කම ය'යි වදරා ලා මහාලි රජ්ජුරුවන් විස්තර කොට ම අසනු කැමැති හෙයින් 'එ සේ වී නම් අවික්ෂිප්ත ව අසව'යි වදරා ලා ඉකුත් වත් කථාව දක්වන සේක්:-

යටගිය දවස මගධ රට මචලනම් ගම මඝ නම් ළදරු වාණ කෙණෙක් ගම කර්මාන්ත කරණ තෙනට ගොසින් තමන් සිටින තෙන පයින් කසළ ඉවත් කොට පියා පවිත්‍ර කොට ගෙන සිටියහ.

Non-Commercial Distribution

අනික් කෙණෙක් එ තැනට අවුත් එතැන පවිත්‍ර නියාව දැක මසයන් සිටියවුන් බලා උන් උරවටින් ගසා ඉවත් කොට ලා තුමූ එ තැන සිටියාහු ය. ඉනු ත් ප්‍රකාශ වන්නා ක්‍ෂමා ව ම හෙයින් මසයෝ ඊට නො කිපී ම එ තැන උන්ට ම හැර ලා අනික් තෙනක් පවිත්‍ර කොට ගෙන සිටියහ. අනික් කෙණෙක් එ තැනට අවුත් එ තැන පවිත්‍ර නියාව දැක මසයන් උරවටින් ගසා ඉවත් කොට ලා තුමූ එ තැන සිටියහ. මසයෝ උන්ට ත් නො කිපී අනික් තෙනක් ඉදි කොට ගෙන ගියහ. තම තමන් ගෙවල සිට එ තැනට ආ කීප දෙණෙක් මඝ නම් ළදරුවාණන් උරවටින් ගසා ඉවත් කොට ලා උන් ඉදි කළ තෙන තුමූ සිටියහ.

මඝ මාණවකයෝ 'මා ඉදි කළ කළ තැන් මුන්ට ප්‍රිය වූවා සේ ම මුන් හැම අවුත් සිටි නියාව මට ත් ප්‍රිය ය. මේ එක් තරා පින් කමක් විය යුතු ය. පින් කමෙහි ඉෂ්ට විපාකයක් මුත් අනිෂ්ට විපාකයක් වන්ට නැතැ'යි සිතා දෙ වන දවස් එන්නෝ උදැල්ලක් ගෙනවුත් කළ විටක් විවර[1] තැන් සැස පියා හැමද පවිත්‍ර කළහ. ඊයේ දවස් එක් තැන් වූවෝ හැම අවුත් ඒ සැස පී තෙන සිටියෝ ය. උන්ට සීත වේලෙහි ගිනි ත් මොළවා දුන්හ. ඉක් බිත්තෙන් 'සිත් කලු තැන් කවුරුන්ට ත් ප්‍රිය නියා වේ ද? මෙ වක් පටන් යන්ට එන්ට දුර්‍ග මං පෙත් ඉදි කෙළෙම් නම් ඒ මහ නිසා පැවැති කුසල් මගින් දෙව් ලොවට යා හැක්කැ'යි සිතා උදසන ම අවුත් මං තනමින් කපා හළ යුතු කැල කපා හරිමින් ඇවිදිති. උන් කරණ දැ දැක අනික් කෙණෙක් 'සබඳ කුමක් කරව්දැ'යි විචාරා 'දිව්‍ය ලොකයට යන්ට මහක් ඉදි කෙරෙමි' කී කල්හි 'මම ත් තොපට සහාය වෙමි'යි කීහ. 'යහපත, සබඳ, ස්වර්‍ග සම්පත් නම් කවුරුන් ට ත් යහපත් වේදැ'යි කියා ලා එ වක් පටන් දෙන්නෙක් වූ ය. තවත් එ සේ ම විචාර ත් අනික් කෙණකු ත් සහාය වූ ය. අනික් කෙණකු ත් සහාය වූ ය යි එක් ව තෙතිස් දෙණෙක් මුළු වූහ. ඌ හැම දෙන ම කැති- පොරෝ - හුදලු හැර ගෙන මං ඉදි කෙරෙමින් සතර ගවු අට ගවු පමණට ත් යෙති.

උන් හැම මෙ ලෙස කරන්නවුන් දැක එම ගම ගම් මුදලියා 'මූ හැම මං ඉදි කරම්හ යි කියා ලා නො කළ මනා දෙයක් ම කෙරෙති. මූ හැම දෙන වලට ගොසින් දඩ මස්සන් කුඩ මස්සන් ගෙනවු නම් හෝ රායක් බොත් නම් හෝ අනිකුත් එ බන්දක් කෙරෙත් නම් හෝ ඉන් ගම් පිඩි ආදි ය මමත් ලබමි' සිතා උන් හැම ගෙන්වා ලා කුමක් කොට ඇවිදිනා නියා ද යි විචාළෝ ය.

1. විවර

Non-Commercial Distribution

‘අපි දෙව් ලොව යන්ට මං ඉදි කරම්හ’යි කී කල්හි ‘ගිහි ව රැකෙන්නවුන් තෙලේ කළ මනා දෙයෙක් නො වෙයි. දඩ යම් කොට දඩ මස් හෝ ගෙනව මැනව කුඩ මස්සන් හෝ මරා ගෙන ගෙනව මැනව. රා හෝ පුව මැන ව. තව තවත් රැකෙන්ට මහක් කළ මැනව. තෙල කරන්නේ නො මහක් මුත් මඟෙක් නො වෙ’යි කිවු ය. ඌ ඒ නො ගිවිස්සෝ ය. තව තවත් කීව ත් නො ගිවිස්සෝ ම ය. එ තෙමේ තමා කී ලෙස නො කරත් හෙයින් කිපී පියා ‘ඊට නිහඬ දනිමි’ රජ්ජුරුවන් ළඟට ගොසින් ‘මුළු ව ගෙන සොර කම් කොට ඇවිදිනා සොරුන් මුළක්[1] දිටිමී’ කියා ලා ‘පිරිස් ඇර ගෙන ගොසින් අල්වාගෙන එව’යි විධාන ලදින් එන්ට කියා ලූ පමණින් එන ඇත්තවුන් ගෙනවුත් රජ්ජුරුවන්ට පෑ ය. රජ්ජුරුවෝ ද ආද්‍යන්ත නො සලකා ‘ඇතුන්ට ලවා පියව’යි විධාන කළහ.

මඝ මාණවකයෝ ඒ අසා සෙස්සවුන්ට ඔවා[2] දෙන්නෝ ‘සබඳිනි, අපට මෙ තැන්හි දී මෙත් පිහිටට වඩා අනික් පිහිටෙක් නැත. තෙපි කිසි කෙණකුන් කෙරෙහි ත් නො සටා රජ්ජුරුවන් වහන්සේ කෙරෙහි ත් විෂම කම් යෙදූ ගම් මුදලියා කෙරෙහි ත් නියොගයෙන් මඩ නා ඇතු කෙරෙහි ත් තොප හැම දෙනා කෙරෙහිත් සම ව මෙත් පවත්වව’ කිවු ය. උයි ත් එ ලෙස ම කළහ. උන් හැම දෙනාගේ මෙත්තානුභාවයෙන් මඩනා තබා ගිනි වැටක් ළඟට මැස්සකු පරිද්දෙන් ළං විය නො හිණ. රජ්ජුරුවෝ ඒ අසා බොහෝ දෙනා හෙයින් මැඩ ගත නො හෙන නියා යැ යි කළාල් කඩ වලින් වසා මඩවාපියව යි කිවු ය. කළාලෙන් පැදූරෙන් වසා ලා මඩවන්ට මෙහෙයූව ත් ක්‍රොධ-යෙන් නො වැසුනු හෙයින් හා උන් තෙ තිස් දෙනාට පිට පුරා මෙත් නැමැති යොධයන් ඇති හෙයිනුත් මිරිකන්ට ගිය ඇතා දුර ම රඳා පී ය. රජ්ජුරුවෝ එයි ත් අසා කාරණයක් ඇත මැනැවැ’ උන් හැම ගෙන්වා ගෙන ‘ඇයි සගයෙනි, මා නිසා කුමක් නො ලබවු ද? මෙ සේ කරන්නේ හැයි දූ’යි විචාරා ‘කුමක් ද රජ්ජුරුවන් වහන්සැ’යි විචාළ කල්හි ‘තොප වල් සොර ව ගෙන සොර කම් කෙරෙති අසමී’ කිවු ය. ‘කීවෝ කවුරු දූ’යි විචාළ කල්හි ගම් මුදලියා කී නියාව කිවු ය.

ඔහු හැම දෙන ඒ අසා ‘ස්වාමීනි, අප කරණ සොර කම් නැත. සොර කම් නම් අපායට මහක් සෙයින් බුදු හමුවක් නො වන හෙයින් දෙව් ලොවට යන්ට අනික් මහක් නො දක නිවන් පුර යන්ට මං පානවුන් නැති හෙයින් නිකම් හිඳිනා ගමන් දෙව්

1. බුදක් 2. ඔවාද

Non-Commercial Distribution

ලොවට යන්ට මං ඉදිකරම්හ'යි කියා ලා 'ගම්මුදලි නො එක් පව් කම් යොදා අප නො යෙදෙන හෙයින් අපට විනාස කමට කිවු ය'යි කීහ. රජ්ජුරුවෝ ඒ අසා 'අනේ තිරිසනුන් පවා තොප හැමගේ තරම දත. මම දන්නා තරමේ සිට ත් නො දත්තෙමි. නො දැන කළ දෙයට ක්‍ෂමා කරව' යි කියා ලා අඹු දරුවන් පිටින් ම ගම් මුදලියා උන්ට ප්‍රසාද වහල් කොට දෙවා පියා ඇතු ත් නැඟී ඇවිදින්ට දී ලා මචලගම ත් පමුණු කොට දුන්හ. උඃ හැම දෙන ත් 'අප කළ පිණෙහි විපාක ය කුසල් ජවන් සතින් පළමු ජවන ය දෘෂ්ට ධර්ම වෛද්‍ය විපාක දයි හෙයින් මේ ලොව ම ලදුම්හ'යි බලවත් ව සතුටු ව ලද්ද වූ ඇතා දවස එක් කෙණකුන් ඔබාදීන් නැගී ඇවිදිනාහු 'මේ තරම් පිණෙකින් මේ තරම් ලෙසක් ලත් කල වැඩියුරුවක් ලබනු නිසා වැඩියුරු පින් කම් කරන්ට වුව මනා වේ ද, කුමක් කර මෝද්ද'යි කථා කොට මා වත් බඩෙක යන එන්නවුන් සැතපෙන ලෙස තර පාරු කොට ලා සිවුරැස් ගෙයක් කරම්හ යි නියම ව වඩුවකු ගෙන්වා ගෙන උඃ ලවා ශාලාව කරවන්ට පටන් ගත්හ.

තමන් හැම දෙනා රජ්ජුරුවන් කරා ගෙන යන නියාව දැන්වූ සේ යහපතැ යි සතුටු වූ හෙයින් විරක්ත වූ සිත් ඇති ව පසු වත් එක් ව යෙද් දේ හෝ යි ගැනු කෙණකුන් ම එ තමන් කරණ පින්කම මුසු නො කොට ශාලාව කරවන්ට සිතති. මඝ මානවක-යන් ගේ ගෙයි ත් නන්දාවෝ ය, චිත්‍රාවෝ ය, සුධර්මාවෝ ය, සුජාතාවෝ ය යි අඹුවෝ සතර දෙණෙක් ඇත. උන් සතර දෙනා ගෙන් සුධර්මාවෝ ඒ පින් කම තමන් එක්ව නො කරණ හෙයින් වඩුවාට සංග්‍රහයක් කොට උඃ සිත් ගෙන ලා 'අයිය' මේ පින් කමට තොපගේ බලයෙන් මා ත් මුසු කරව'යි කිවු ය. උයි ත් අත්ලස් බලයෙන් යහපතැ යි ගිවිස පළමු කොට කැණි මඬලට නිසි දණ්ඩක් කපා දිය බස්වා ගෙන සැස විද කැණි මඬල නිමවා ලා කැණි මඬල පත්ලෙහි 'මේ ශාලාව සුධර්මාවන්ගේ ශාලාව ශ'යි අකුරු කොට ලා කඩෙකින් වසා ලා තබා ලූ ය.

ඉක් බිත්තෙන් ඒ ශාලාව නිමවා ලා කැණි මඬල නඟන දවස් 'හැයි සවාමිවරිනි, සලකුණු නො කළ දෙයෙක් ඇතැ'යි කියා කුමක් ද යි විචාළ කල්හි කර්ණිකා මණ්ඩලයෙකැ යි කියා ගෙනෙම්හ යි කී කල්හි 'දැන් ගෙනා දඬු දිය බස්නට නැති හෙයින් ගෝණැස් පුරවා ලූ කලට සිපීල වෙයි. එ සේ හෙයින් ඉන් කට නො හැක්ක. කොට නිමවා තුබූ කැණි මඬලක් ලදෙත් යහපතැ'යි කිවු ය. 'එසේ වන්නා, කළ මනා කුමක් දැ'යි විචාළහ. ඉදින්, කිසි කෙණකුන්ගේ ගෙයි විකුණන්ට තිබෙන කැණි මඩුල්-

Non-Commercial Distribution

ලෙක් ඇත් නම් ඒ සෙවිය යුතු ය'යි කිවු ය. උයි ත් සොයන් නාහු සුධර්මාවන්ගේ ගෙයි තුබූ කැණි මඬල දැක මසු දහසකට ඉල්ලා ත් පින් මිල මුත් රන් මිලයෙන් කම් නැති හෙයින් උන් ගෙන් නො ලත්හ. 'ඒ පින් කම මුසු කරතො ත් දෙමි'යි කී කල්හි කැණි මඬලක් පමණකට මුසු නොකරම්හ'යි කිවූ ය.

වඩුවාණෝ කියන්නෝ 'මුඹ දැ හැම කියන්නේ කුමක් ද? බඹ ලොව හැර ගැනුන් නැති තැනකු ත් ඇද් ද? කැණි මඬල පමණ කින් ම මුසු වන්නේ ත් කිම් ද? කැණි මඬල ගත මැනව. අපගේ කර්මාන්ත ය නිමවා යන්ට වුව මනා වේ දැ'යි කිවු ය. උයි ත් යහ පතැ යි කැණි මඬල හැර ගෙන මඬුලු නංවා ශාලාව නිමවා ලා එක් භාගයෙක පොහොසතුන් සැතපී හිඳිනා ලෙස හා එක් භාගයෙක දුක්පතුන් හා එක් භාගයෙක ගිලන් මිනිසුන් හා සැතපී හිඳිනා ලෙසට තුන් භාගයෙක් කොට බෙද ලූ හ. තෙ තිස් දෙන පුවරු තෙ තිසකු ත් ලා ලා ඇතුට 'ආගන්තුක කෙණෙක් අවුත් යම් කෙණකුන් ලූ පෝරුව පිට හුන්හු නම් උන් පිට හිඳුවා ගෙන අවුත් පෝරුව ලූ තෙනැත්තන්ගේ ගෙයි ලාලව'යි විධාන කළහ. ඇතා ත් එ ලෙස ම කෙරෙයි. එ දවස් උන්ට කළ මනා යම් සාදයෙක් ඇත් නම් පෝරුව ඇති තැනැත්තෝ ම කෙරෙති.

මඝ මාණවකයෝ ශාලාවට නුදුරු කොට කොබෝලීල පැළයක් හිඳුවා ලා ඒ පැළ ය මුල ගල් ලැල්ලක් ලවා ලූ ය. ශාලාවට වන් කෙණෙක් කැණි මඬලෙහි අකුරු කියවා පියා සුධර්මා නම් ශාලාව ය යි කියති. වෙහෙර කළවුන් පිටත ඇන්දූ සේ තෙ තිස් දෙනාගේ ම නමෙක් නො පෙනෙයි. නන්දාවෝ සිතන්නෝ 'මූ ශාලාව කරණ ගමනේ අප මුසු නො කොළෝ ය. සුධර්මාවෝ තමන් නුවණැති හෙයින් මුසු වූහ. මා ත් මුසු වුව මැනව. කුමක් කෙරෙම් දෝ හෝ'යි සිතා 'මේ ශාලාවට ආවවුන් බී පියන්ට පැනු ත් නා පියන්ට පැනු ත් ඇත මැනව. පොකුණක් කරවමි' එ ලෙස පොකුණක් කරවා ඒ පින් කමට මුසු වූ ය.

චිත්‍රාවෝ 'සුධර්මාවෝ කැණි මඬලක් ලැවූ ය. නන්දාවෝ පොකුණක් කැණ වූ ය. මා ත් එකක් කරවා පින් කමට මුසු වුව මැනැවැ'යි ශාලාවට ආවවුන් නහා පැන් බී යන කල මල් පැළැන්ද මනා වේ ද, මල් වත්තක් කරවමි'යි සිතා මල් වත්තක් කැරවූ ය. බොහෝ සේ මල් වත්තේ මල් පල ගන්නා ගසින් නැති ගසෙක් නො වී ය. සුජාතාවෝ 'මම් මේ මඝ මානවකයන්ට සෙස්සවුන් සේ නො වෙමි. නැඳි මයිල් සරණ ය. උන් කළ පින් කමෙක් ඇත් නම් මා කෙළේ ය. මා

Non-Commercial Distribution

කළ පින් කමෙක් ඇත් නම් උන් කෙළේ ය'යි සිතා පිණෙක පහළ දෙයක් ම නො කොට දෙතිස් කුණු කොටසින් පිරුණු අත් බැව ම පිරි මැසූහ.

මඝ මානවකයෝ ද දෙ මවු පියන්ට උපස්ථාන කිරීම් ආදි වූ පින් කම දිවි පමණින් හැසිර ආයු කෙළවර තව්තිසා දෙව් නුවර සක් දෙව් රජ ව උපන්හ. එක් ව පින් කළ දෙ තිස ද එම දෙව් ලොව ම උපන්හ. වඩුවාණෝ ද විස් කම් දෙව් පුත් ව උපන්හ. එ කල තව්තිසා දෙව් නුවර අසුරයෝ වෙසෙති. ඔහු ද අලුත් දෙවියෝ උපන්හ යි දිව රායක් සැරහූ ය. ශක්‍රයෝ තමන්ගේ පරිසදින් කවුරුනු ත් නො බොන්ට විධාන කළහ. අසුරයෝ තුමූ ම බීලා මත් වූහ. ශක්‍රයෝ 'මුන් හා එක් ව කරණ දිව්‍ය රාජ්‍ය යෙන් ප්‍රයෝජන කිම් ද 'යි පඬිදට කියා ලා පා අල්වා ගෙන මහ මුහුදට දම්මවා පීහ. ඌ ත් ඉස් බිම් බලා මුහු ද හුණුවාහු ය. උන්ගේ කුශලානුභාවයෙන් මහ මෙර පත්ලෙහි ශක්‍ර පුර ය සා ම අසුර විමන පහළ වි ය. පරසතු මඳාරා ගස් විතර ම සිත් පළොල් ගසකු ත් ඇති විය.

දෙවියන් අසුරන් හා සටන් කොට අසුරන් පැරදි කල මෙර මුදුනෙහි සතළිස් දහසක් ගවු පමණ දිග–පළල ඇති ව ගවු එක් ලක්‍ෂ විසි දහසක් පමණ වට ඇති ව තව්තිසා දෙව් නුවර පහළ විය. ඒ නුවර නැගෙන හිරි වාසල පටන් බස්නා හිරි වාසලට අතුර සතළිස් දහසක් දහසක් ගවු ය. දකුණු දිග වාසල පටන් උතුරු දිග වාසලට ත් එ පමණ ය. එ නුවර වටා සිටි රුවන්මුවා පවුරෙහි සත් රුවන් මුවා ම දෙරටු දහසෙක් ඇත. එ නුවර උයන් වලිනු ත් පොකුණු වලිනු ත් සැදී සිටී. එ නුවර මැද ශාලාවෙහි අනුසසින් එක් දහස් දෙ සියයක් ගවු පමණ උස ඇති ධජයකින් මහබියා වූ දෙ දස් අට සියයක් පමණ ගවු උස ඇති ධජ හා එක් වී නම් ගවු සාර දහසක් පමණ උස ඇති විජයත් නම් පායෙක් පහළ විය.

ඒ මාළිගාව වට ත් පවුර ගාව ත් රන් ලී අග මැණික් ධජ එළෙයි. මැණික් ලී අග රන් ධජ එළෙයි. පබළු යටග මුතු ධජ එළෙයි. මුතු යටග පබළු ධජ එළෙයි. සත් රුවන් ලී අග සත් රුවන් ධජ එලෙයි. කොබෝලීල පැළ ය ලා ලූ අනුසසින් මුල පටන් අග දක්වා සාර සියයක් ගවු උස ඇති වටින් එක් දහස් දෙ සියයක් වට ඇති පරසතු මඳාරා ගස ඇති විය. ගල් ලැල්ලෙහි අනුසසින් පරසතු

Non-Commercial Distribution

රුක මුල දෙ සිය සතළිස් ගවුවක් පමණ දිග ඇති ගවු දෙ සියයක් පමණ පළල ඇති සැට ගවුවක් පමණ බොල ඇති බඳු වද මල් ගොඩක් සේ රත් වූ පඬු ඇඹුල් සලහස්න පහළ විය. ඇත් ඓරා වණ නම් දෙව් පුත් ව උපන.

දෙව් ලොව තිරිසනුන් නැති හෙයින් සක් දෙවිඳු උයන් කෙළි යට යන කල ඓරාවණ නම් දිව්‍ය පුත්‍රයා තමාගේ දිව අත් බැව හැර ලා දිගින් ගවු සියයක් විතර දිග ඇති තුන් සිය සැට ගවුවක් විතර උස ඇති ඇත් වෙසක් මවයි. ශක්‍රයන් ඇතුළු වූ තෙ තිස් දෙනාට කුඹ තෙ තිසක් මවයි. එක් ව පින් කළ දෙ තිස් දෙනාට[1] මැවූ කුඹ දෙතිසට මධ්‍යයෙහි ශක්‍රයන්ට මැවූ කුඹ දිගින් පළලින් එක් සිය විසි ගවුවක් විතර දිග-පළල ඇත්තේ ය. සෙසු කුඹ ගවු දෙ ගවු පමණ ය. ශක්‍රයන්ට මැවූ එක් සිය විසි ගවුවක් පමණ විතර කුඹ මුඳුණෙහි අට සාලිස් ගවුවක් විතර දිග-පළල ඇති රුවන් මණ්ඩපයක් මවයි. ඒ මණ්ඩප ය ඇතුළත අතරතුරේ රුවන් මුවා සතර ගවුවක් පමණ උස ඇති ධජ සිටියි. මණ්ඩපය කෙළවර මඳ මඳ සුළඟින් සැලුණු කලට මනහර නාද පවත්වන රන් රසු දැලෙක් එළෙයි. මණ්ඩප මැද ශක්‍රයන් හිඳුනට සතර ගවුවක් උස ඉඳුනිල්මිණිමුවා හස්නෙක් පැනවී තිබෙයි. ශක්‍රයෝ එහි හිඳිති.

කුඹ තෙ තිසින් එකි එකී කුඹ දළ සතක් සතක් වන නියා යෙන් ඇත් දළ දෙ සිය එක් තිසක් මවයි. ඉන් එකි එකී දළෙක් දෙ සියයක් ගවු විතර දිග ඇත්තේ ය. එකි එකී දළ පොකුණු සතක් සතක් වන නියායෙන් එක් දහස් ස සිය දස සතක් පොකුණු මවයි. එකි එකී පොකුණේ නෙළුම් පඳුරු සතක් සතක් වන නියායෙන් නෙළුම් පඳුරු එකොළොස් දහස් තුන් සිය දස නවයක් මවයි. එකි එකී පඳුරේ නෙළුම් මල් සතක් සතක් වන නියා යෙන් නෙළුම් මල් සැත්තෑ නව දහස් දෙ සිය තෙ තිසක් මවයි. එකි එකී නෙළුම් මල් පෙති සතක් වන නියායෙන් මල් පෙති පස් ලක්‍ෂ සිවු පනස් දහස් ස සිය එක් තිසක් මවයි. මෙ සේ එකි එකී පෙත් තක නටන දෙව් දූන් සත් සත් දෙණකු බැගින් ප්‍රධාන දෙව් දූන් අට තිස් ලක්‍ෂ දෙයාසූ දහස් සාර සිය දස සත් දෙණකු මවයි. එකි එකී දෙවතා දූවට පිරිවර දෙවතා දූන් සත් සත් දෙනා බැගින් පිරි වර දෙව් දූන් දෙ කෙළ එක් සැත්තෑ ලක්‍ෂ සැත්තෑ දහස් නව සිය දස නව දෙණකු මවයි. මෙ සේ වටින් දෙ සියයක් ගවු විතරේ ඇත් දළ වල ම රඟ මඩුලු වෙයි. මෙ සේ මහා සම්පත් විඳිමින් ශක්‍රයෝ පොළඹති.

---

1. තෙ තිස් දෙනාට

Non-Commercial Distribution

සුධර්මාවෝ මිය එම දෙව් ලොව ම සුධර්මා නම් දිව්‍යාඞ්ගනා ව උපන්හ. රියනක් උස කැණි මඩලෙහි අනුසසින් දිගිනු ත් පළලි නු ත් එක් දහස් දෙ සියයක් ගවු විතර දිග-පළල ඇති උසින් දෙ දසක් ගවු විතර උස ඇති වටින් තුන් දස් ස සියක් ගවු විතර වට ඇති සුධර්මා නම් වූ ඊට වඩා අනික් සිත් කලු තෙනක් නැති දිව්‍ය මණ්ඩපයෙක් පහළ විය. මසකට අට දවසක් බණෙකුත් එහි පවත්වති. අද දක්වා ත් සිත් කලු වූ තෙනක් දුටු විට සුධර්ම දෙව් සබය සේ ය යි කියති.

නන්දාවෝ ත් මිය එ ම දෙව් ලොව නන්ද නම් දිව්‍යාඞ්ගනා ව උපන්හ. උන් ගේ කුශලානුභාවයෙන් දිගින්-පළලින්-ගැඹුරෙන් දෙ දසක් ගවු පමණ දිග-පළල-ගැඹුරු ඇති නන්ද නම් පොකු ණෙක් පහළ විය. චිත්‍රාවෝ ත් මි ය එ ම දෙව් ලොව ම චිත්‍රා නම් දිව්‍යාඞ්ගනා ව උපන්හ. උන්ගේ කුශලානුභාවයෙන් ගවු දෙ දසක් පමණ දිග - පළල ඇති සිතු ලිය නම් උයනෙක් පහළ විය. මෙ සේ උන් තුන්දෙනා මිය ත් ශක්‍රයන්ට ම අඹු වූ කල්හි සුජා තාවෝ ත් මිය තමන් කොට ඇවිදි ලෙසට හිමාල වනයේ එක් කඳු රැළියක කණ කෙකිනි ව උපන්හ.

ශක්‍රයෝ ත් තමන් මඝ මානවක අවස්ථාවෙහි අඹුවන් සතර දෙනා උපන් තැන් විමසන්නෝ 'සුධර්මාවෝ ත් නන්දාවෝ ත් චිත්‍රාවෝ ත් මා ළඟ උපන්හ. සුජාතාවෝ කොයි උපන්නුදැ'යි බලා කණ කෙකිනි ව උපන් නියාව දැන 'නුවණ නැති තෙනැත්තී කිසි පිණක් නො කොට තිරිසන් ව උපන්හ. දැන් වී නමුත් පිණෙක යොද මෙයට එන ලෙසක් කෙරෙමි' ශක්‍රාත්මභාව ය හැර ලා අප්‍රසිද්ධ ලෙසකින් උන් ළඟට ගොසින් කුමක් කොට ඇවිදී දැ යි විචාරා 'මුඹ කවුරුදැ' යි විචාළ කල්හි 'මම තොප ගේ පූර්ව ජාතියෙහි ස්වාමි ව සිටි මඝ මාණවකයෝ ය'යි කිවූ ය. කොයි උපන් සේක් දැ යි විචාළ කල්හි 'තව්තිසා දෙව් ලොව ශක්‍ර ව උපනිමි. තොපගේ බුහුනණියන් උපන් තැන් දනු ද'යි විචාළෝ ය. 'නො දනිමි' කී කල්හි ''උඹ ත් මා ළඟ ම උපන්හ. උන් දක්නා කැමැත්තෝ දැ' යි විචාළෝ ය 'මම වන්නා දක්නා කැමැත්තෙම් වෙ ද? යන්නේ කෙසේ දැ'යි විචාළී ය. ශක්‍රයෝ දිව්‍ය ලොකයට ම ගෙන යනු කැමැති බැවින් එහි ඇලුම් කරවා පින් කම හසුරුවන්ට 'මම තොප කැඳවා ගෙනයෙමි'යි විලෙකින් කඩා ගත් හෙළ නෙළුම් මලක් මෙන් කණ කෙකින්න අත්ලෙහි හිඳුවා ගෙන දෙව් ලොවට ගෙන ගොසින් නන්ද නම් පොකුණ බඩ හිඳුවාලා දෙවඟණන් තුන් දෙනාට ගොසින් තොපගේ නැඟණියන් සුජාතාවන් බලන්ට යව' යි කිවූ ය.

උඟ තුන් දෙන ත් කොයි දූ යි විචාරා නන්ද නම් පොකුණබඩ නියාව කී කල්හි තුන් දෙන ම එ තැනට ගොසින් 'අනේ අපගේ නැගණියන්ගේ රුවක් බලව. කැට පත් තබා ගෙන සැරහුණු ලෙසට මේ කුමක් ද? දත් මැද බුලත් කා සැරහූ කට ත් කකුරු තුඩක් සේ තිබෙයි. පා මුද්‍ර පාඩගම් ලා සැරහූ පා මූකුරා ගිය රත්තම් පලා දඬු සේ කොරළ හිඳී තිබෙයි. අඳුනක් නො ගා නො තබන ඇස්වල අඳුනක් ගානා සැටි ම නැත. අතක් නමා පිණක් නො කළ හෙයින් අතු ත් නැත. මස මාණවකයන් කළ පින් රැක උන් බව මුත් ඉනු ත් සම්භ වූ දෙයෙක් ඇති සැටි නො වෙයි-යනාදීන් වෙහෙසා පුරා පියා නැඟ ගියහ. සක් දෙව්දු නැවත අවුත් 'තොප ගේ බූන් දුටු ද'යි විචාරා 'දුටුම්හ. ආ වේලේ පටන් සුව දුක් කිම් ද යි යන බස් පමණකු ත් නැති ව පිණක් නො කළ ලෙසටම වෙහෙසුවෝය. මා ඔබම ලන්ට වුව මැනැවැ'යි කීකල්හි ඔබ ම ගෙන ගොස් ලා ලා 'තොපගේ බූනුන්ගේ සම්පත් දුටු ද'යි විචාළෝ ය. 'දිටිමි' කී කල්හි 'තොප ත් ඔබ උපදින්නට නිස්සක් කළ මනා වේ ද'යි කිවූ ය. 'කුමක් කෙරෙම් ද'යි විචාළ කල්හි 'මා කියා ලූ ලෙසක් කරව් ද'යි විචාරා කෙරෙමි කී කල්හි පන් සිල් දීලා 'නො පමා ව පන් සිල් රකුව'යි කියා ලා නැඟී ගියෝ ය.

උයි ත් එවක් පටන් තමන් තමන් ම මිය ගිය කුඩ මස්සන් සොයා කති. සක් දෙව්දුද දවසක් පන්සිල් රැකීමෙහි තරම විමසනු නිසා අවුත් වැලි තලාව පිට මළ කුඩ මස්සකු සේ හොත්හ. කෙකිනී ත් ඔහු දැක මිය ගිය යි සිතා ඩැ ගෙන ගලන්ට වන් කල කුඩ මස්සා නඟුට සොලවා ලී ය. නො මළ නියා වේ ද යි දියට දමා පීහ. මඳක් කල් යවා ලා නැවත ත් 'මළ කුඩමසුලෙසින් උන්ට ඉදිරි ව ලා වැද හොත්හ. නැවත ත් මළ කුඩ මස්සකු ය'යි සිතා ඩැ ගෙන ගලන්ට වන් වෙලෙහි නඟුට සොලවා ලන්නා හැර පුව. මෙ සේ තුන් වරක් කොට විමසා පන්සිල් රක්‍ෂා කරණ නියාව යහ පත් නියාව දැන ශක්‍රයෝ තමන් නියාව හඟවා ලා 'තොප විම සනු නිසා අයිමි. සිල් රක්‍ෂා කරණ නියාව යහපත. මෙ ලෙස ම වී නම් නොබෝ කලෙකින් මා ළඟ උපදුව'යි කියා ලා ගියහ.

උයි ත් එ වක් පටන් තමන් තමන් මළ කුඩ මස්සන් ලබන දවසට ත් වඩා නො ලබන දවස් බොහෝ ව ගිය හෙයින් නිරා හාර ව මිය රක්‍ෂා කළ පන්සිල්හි බෙලෙන් බරණැස කුඹලාණ කෙණකුන්ට දූ ව උපන. උපන් පසළොස් හැවිරිදි අවස්ථාවෙ කොයි උපන්නු දූ යි ශක්‍රයෝ බලන තැනැත්තෝ කුඹල් ගෙයක

උපන් නියාව දන 'ඔබ ගොස් වුවමනා වේ ද'යි කැකිරි සේ පෙනෙන සත් රුවනින් ගැලක් පුරා ගෙන ගැල පැද ගෙන බරණැසට ගොසින් 'කැකිරි ගනුව, කැකිරි ගනුව'යි කිය කියා වීථියෙහි ඇවිදිති. උඳු–මුං–කලත් ආදිය ගෙනවුත් ඉල්වූවන්ට මිලයට නොදෙමි කියා දෙන්නේ කුමකට ද යි විචාළවුන්ට 'සිල් රක්‍ෂා කරණ ගැනු කෙණකුන්ට දෙමි'යි කිවු ය. ඒ අසා හැම දෙන සිල් නම් තමා කළු ද, සුදු ද, වට ද, දික් ද, ලුහුඬු ද, කෙ සේ දැ'යි විචාල කල්හි 'රකිනා ගෙරි සරක්ගේ පැය පමණක් නම් පමණක් නො දන්නවුන් ගෙරි සරක් රක්ම නැත්තා සේ සිල් නම් කවර බවක් නො දන්නා තොප හැම සිල් රක්‍ෂා කරන්නේ කෙ සේ දැ'යි උන්ට නො දී සිල් රකින කෙණකුන්ට දෙමි'යි කිවු ය. 'එ සේ වී නම් මෙ ගම කුඹල් දුවණි කෙණෙක් පන් සිල් රකිමී' කියා ඇවිදිති. උන්ට දුන මැනැවැ'යි කිවු ය.

කුඹල් දුවණියෝ ත් 'එ බඳු කෙණකුන්ට දෙතො ත් මට දුන මැනැවැ'යි කිවු ය. 'තෙපි කෙ සේ කෙණෙක් ද'යි විචාළ කල්හි දන්නා තැන් පටන් තමන් පන් සිල් නො කඩ කොට රකිනා නියාව කිවු ය. 'එ සේ වී නම් මා ත් ගෙනායේ තොපට ම ය'යි කියා ගැල පැද ගෙන උන්ගේ ගෙට ගොසින් අනික් කෙණකුන් හැර ගත නො හැකි කොට ලා කැකිරි ලෙසින් ගෙන ගිය සත් රුවන් උන්ට දී ලා තමන් ශක්‍ර නියාව ත් දන්වා ලා 'තොප දිවි හිමියෙන් රැකෙන්ට තෙල විචරක් ඇත. පන් සිල් නො කඩ කොට රකුව'යි සම්මත කොට ලා ගියහ.

උයි ත් දිවි පමණින් පන් සිල් රැක එයින් මිය අසුර භවන යෙහි ශක්‍රයන්ට වෛරී වූ නායක අසුරයාණන්ට දූ ව උපන්හ. ජාති දෙකක පන් සිල් යහපත් ව රැකි හෙයින් රූපත් වූහ. රන් වන් වූ හ. වෙපචිත්ති නම් අසුරිඳු දුවණියන් විචාරා ආ අසුර කෙණෙක් ඇත් නම් 'තෙපි අපගේ දුවණියන්ගේ රූපින් තරමට තරම් නොව'යි කිසි කෙණකුන්ට ත් පාවා නො දී 'ම දූ තමාට තරම් කෙණකුන් තොමෝ ම නිල කරන්නී ය'යි අසුරයන් රැස් කොට ලා 'තොපට තරම් කෙණකුන් තෝරා ලව'යි උන් අතට මල් දමක් දුන්හ. එ වේලෙහි සක් දෙවිඳු කුඹල් දුවණියන් උපන් තැන් විමසා එ පවත් දන 'දැන් ඔබ ගොසින් කැඳවා ගෙන එන්ට වුව මැනැවැ'යි මාලු අසුර වෙසක් මවා ගෙන ගොසින් පිරිස් කෙළවර සිටියහ. අසුරාඞ්ගනාවෝ ද ඇත් මැත් බලා පෙර ඇති පෙම් බලයෙන් මහ වතුරක් එක් අතකට වඩනා සේ මහලු ලෙසින් සිටි ශක්‍රයන් සැටියෙන් මාලු වුව ත් උන් තමන් මාලු නො වන හෙයින් උන් කැමැති ව මල් වඩම උන් මුදුනට දමා ලූහ.

අසුරයෝ ද ඒ දැක 'අනේ අපගේ අසුර රජ්ජුරුවන් වහන්සේ මෙ තෙක් කල් මුළුල්ලෙහි දුවණියන්ට තරම කෙණකුන් නො ලද ත් අද ලත් සේක. මුන් දැගේ දුවණියන්ට සවාමි කමට කුමක් වුව ත් මුතුන් කමට හෝ මී මුතුන් කමට හෝ සම්භ වූ නියා යහපතැ'යි සරණ සොයා ගිය තුමූ හැම ම ලජ්ජාව ගෙන ගියහ. ශක්‍රයෝ ද උන් අත අල්වා ගෙන 'කොල, මම අසුරයෙක් නො වෙමි. ශක්‍රයෝ ය'යි කියා ලා අහසට පැන නැංගෝ ය. අසුරයෝ ද 'ජරා ශක්‍රයා අප ද රවටා පි ය'යි ලුහු-බඳවා ගත්හ. මාතලී නම් රියැදුරු ද දිගින් ස සියක් යොදුන් වූ පමණ විජයත් රථ ය ගෙනවුත් අතුරු මඟ සිටියේ ය. ශක්‍රයෝ සුජාතා-වන් රථයේ ලා ගෙන දෙව් නුවර බලා නික්මුණාහ. ගුරුළුන්ගේ හිඹුල් වනයට ආසන්න වී රථය ගිය කල්හි රිය හඬ අසා ගුරුළු පැටවු හඬන්ට වන්හ. උන් හඬන හඬ අසා ශක්‍රයෝ මාතලීන් අතින් තෙල කුමක් දැ යි විචාරා රිය හඬට බිය පත් ව ගුරුළු පැටවුන් හඬන නියා ය යි කී කල්හි 'මා එක තැනැත්ත වූ නිසා මෙතෙක් දෙනා රථයෙන් මිරිකී නස්නට කාරණ කවරේ දැ'යි සිතා රථය ආපසු කොට නවතා ලව'යි කිවු ය. මාතලී ත් අසුන් දහසට සැම්වියෙන් ගසා රථය නවතා ලී ය. රථය ආ පස්සට නැවති නියාව දැක අසුරයෝ 'ජරා ශක්‍රයා යන්නේ ආ පස්සේ රථය නවතා ලී ය. පිට පුරා එන දෙව් පිරිසක් ඇති නියා ය'යි බිඳී ගොසින් අසුර භවනයට ම වැද නැවත ඉසක් ඔසවා ලන්ට බල නැති වූ හ.

සක් දෙව්ඳු ද සුජාතාවන් දෙව් නුවර ගෙන ගොසින් අඩුතුන් කෙළක් සුරඟනන්ට නායක කළහ. උයි ත් වරක් ඉල්වන්නෝ 'සක් දෙව් රජ්ජුරුවෙනි. මේ දෙව් ලොව අපගේ නෑ සිය කෙණ-කුන් නැති හෙයින් යම් තෙනකට වඩිතො ත් අනික් තුන් දෙන කුමක් වුව ත් මා කැඳවා ගෙන යන්ට වුව මැනැවැ'යි කිවු ය. ශක්‍ර-යෝත් යහපතැ යි ගිවිස්සෝ ය. එ තැන් පටන් අසුර භවනයෙහි සිත් පළොල් ගස මල් පිපෙන්නා 'අප ගේ මඳාර ගස මල් පිපෙන කලැ'යි අසුරයෝ සටනට නික්මෙති. ශක්‍රයෝ නයින් දියට සමත් හෙයින් මූද ගාවා නයින් රැකවල ලූ ය. ඉන් උඩ ගුරුළුන් හා ඉන් උඩ කුම්භාණ්ඩයන් හා ඉන් උඩ යකුන් රැකවල ලා ලා උඩ රැකවලට වරමුන් සතර දෙනා නිල කොට ලා වාසල් දහසෙහි හිත්තිවල වජ්‍රායුධ ගත් ශක්‍ර රූප කරවා ලා සිටුවූහ. අසුරයෝ ද නාග, ගුරුළු, රකුස්, යක් සෙනග පරදවා උඩ නැංගෝ නමුත් ශක්‍ර රූ දැක ශක්‍රයන් ආ නියා ය යි බිඳී පලා යෙති.

Non-Commercial Distribution

මෙ සේ මඝ මාණවකයෝ නො පමා ව කුසල්හි හැසිර මචල ගම ගම්මුදළියා හසර සිට ත් එම ජාතියේ ඌට මුදළි ව පසු ව දෙ දෙව් ලොව දෙවියන්ට නායක වූව. පින් කම නො පමා ව විසීමට බුද්ධාදීහු ත් ප්‍රශංසා කෙරෙති. අකුසල්හි හැසිරීමෙන් පමාව වසන්නෝ නිඳා ලබති. පමා ව විසීම සියලු පවට කාරණ හෙයිනැ'යි බණ වදළ සේක. බණ කෙළවර මහාලි ලිච්ඡවි රජ්ජුරුවෝ ශක්‍රයන් හඳුනන සේක් ද, කිම් දෝ හෝ යි යන සැකයෙක් ඇත් නම් එයින් බුද්ධාදී අට තැන්හි උපදනා සැක ත් නැති ව සෝවාන් වූහ. සෙසු ත් බොහෝ දෙන නිවන් පුර වන්හ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් මඝ මාණවකයන් ගම්මුදළියා කුමක් කීව ත් අකුසලට නො නැමී කුසල්හි හැසිර දෙව් සැප ත් සිද්ධ කළා සේ අකුසලින් දුරු ව කුසල්හි පිහිටා උභය සමෘද්ධිය සිද්ධ කටයුතු.

## 33. එක්තරා භික්ෂු කෙණකුන් ගේ වස්තුව

තව ද නො පමා බව ම අනුසස් දක්වනු සඳහා එක්තරා භික්ෂු කෙණකුන් ගේ වස්තුව මෙ තැන්හි දක්වමු.

කෙසේ ද යත්:

එක්තරා භික්ෂු කෙණකුන් වහන්සේ බුදුන්ගෙන් රහත්වීම දක්වා කමටහන් ඉගෙන ගෙන වලට ගොසින් බොහෝ යත්න කොට ත් නුවණ මුහුකුරා නො ගිය හෙයින් ගුණ විශේෂයක් ලද නොහී 'කමටහනෙහි අවුල් හැර කියවා ගනිමි' බුදුන් ළඟට එන සේක් අතුරු මඟදී මහත් ලැව් ගින්නක් දැක වහ වහා එක් ගස් කොළ නැති මුඩු ගලකට නැඟී ලා උන් සේක. වල දවන්නා වූ ලැව්ගින්න දැක 'යම් සේ මේ ගින්න කුඩු මහත් දෙය දවමින් දිවේ ද, එ සේ ම අර්හත් මාර්‍ගඥාන නමැති ගින්න ත් බොල් වීමෙන් මහත් වූ ත් තුනී වීමෙන් කුඩා වූ ත් කෙලෙසුන් දැවිය යුතු ය'යි සිතූ සේක.

බුදුහු ගඳ කිළියේ වැඩ හිඳ ම ඔබගේ අදහස දැන රස් කඳක් විහිදුවා උන් වහන්සේ ලවා ළඟට වැඩියා කොට සිතවා ගෙන එම්බල මහණ, තා සිතූ නියාව යහපත. යම් සේ වල වැදගත් ගින්න නිවාලිය හැකි ගින්නක් නො ව ලැව් ගිනි හෙයින් දන්නට නිසි සියල්ලක් නො තෝරා දවා නිමවා ද? එ පරිද්දෙන් අර්හත් ඵල මාර්‍ගඥාන නැමැති ගින්න ත් සව් කෙලෙස් නමැති කසළ දවාපිය'යි වදළ සේක. ඒ බණ කෙළවර ගල් මුදුනේ

Non-Commercial Distribution

වැඩහුන් භික්ෂූන් වහන්සේ ද ලැව් ගින්නෙන් ගල් පාවුල වූ කසළ දැවා සේ රහත් මඟ නුවණ නමැති ගින්නෙන් කෙලෙස් කසළ දවා නිකෙලෙස් ව සිව් පිළිසිඹියා පත් රහත් ව ආසින් වැඩලා ත් රහත් ගුණට බුදු ගුණයෙන් වැඩී සිටි බුදුන් වැඩ වසන තැනට නික්මුණු සේක.

සත් පුරුෂයන් විසින් නරක ගින්නෙන් දන කුඩු මහත් සතුන්ගේ දුක් අසා මේ ජාතියෙහි සිද්ධ කොට නො හෙත ත් අන් භාවයෙහි උපසම්භ වනු නිසා භාවනාභියොග කටයුතු.

---

# 34. නිගම තිස්ස තෙරුන් වහන්සේගේ වස්තුව

තව ද ඒ ඒ දෙය කැමැති වීමෙන් වන අත්‍රිච්ඡතාව ද බොහෝ කොට කැමති වීමෙන් වන මහිච්ඡතාව ද අසන්ත ගුණ සම්භාවනා වශයෙන් පැවැති පාපිච්ඡතාව ද හැර චීවරාදී වූ චතුර්විධ ප්‍රත්‍යයෙහි ද්වාදස විධ ආර්‍ය්‍ය සන්තොෂයෙන් සන්තුෂ්ට ව අපිස් ව විසීමෙහි අනුසස් දක්වනු පිණිස නිගම තිස්ස තෙරුන් වහන්සේගේ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්-

සැවැත් නුවරට නුදුරු ව එක් නියම් ගමෙක උපන් වැඩිකුල දරුවාණ කෙණෙක් බුදු සස්නෙහි ළ දී මහණ ව උපසම්පදාව ත් ලදින් වස් පිරී නියම් ගම් තිස්ස තෙරුන් වහන්සේ ය යි ප්‍රසිද්ධ ව අපිස් සතොස් ව වසන සේක. උන් වහන්සේ එක්වන් නෑයන් ගේ ගම ම සිඟා වළඳා වැඩ හිඳිනා සේක. අනේපිඬු මහ සිටු ආදීන් මහ දන් දෙන කල ත් කොසොල් මහ රජ්ජුරුවන් නුවර ඇත්තවුන් වඩන්ට ය. නුවර වැස්සන් කොසොල් රජ්ජුරුවන් වඩන්ට ය යි මෙ සේ දන් දෙන කල ත් ඔළ ගොසිනු ත් යැපෙන පමණක් ම වේ දූ යි සැවැත් නුවරට නො වඩනා සේක. වහන්දෑ ද මුන් වහන්සේ නො වඩනා ම හෙයින් 'නිගමතිස්ස තෙරුන් වහන්සේ සිවුරු පෙරවා ත් නෑයන් හා ම හැදී වසන හෙයින් කෙසේ වූ විට ත් සැවැත් නුවරට නො වඩනා සේකැ'යි කථාව ත් ඉපද වූ සේක.

බුදුහු ඒ අසා ඔබගේ අදහස යහපත් නියා ව දනිත ත් ඔබ ගෙන්වාලා 'සැබෑ ද තෙපි නෑයන් අත්හැර නො යවුදැ'යි විචාරා 'ස්වාමීනි, මා නෑයන් හා එක්වීමෙක් නැත. මා උන්ගෙන් යැපෙන පමණෙකින් වඩා ලබන දෙයක් නැත. යහපත් වත්

කිම ? නපුරු ත් කිම ? යැපෙන පමණක් ලත් කල නැවත සිඟීමෙන් කම් කිම් දැ යි සිතා නො යෙමි' කී කල්හි අනල්ප කල්ප කොටි ශත සහශ්‍රයෙක පූරන ලද වාක් සුචරිතානුභාවයෙන් පැරුම් ජල හරිත සර්‍වඥ විල්හි හට ගත් ජිව්හා නමැති පද්ම කර්ණිකාවක් ඇති, දන්ත ශ්‍රෙනි නමැති කුඩා පෙති ඇති, ඔෂ්ඨ යුග්ම නමැති මහ පෙති ඇති, සර්‍වඥතා ඥාන නමැති හිරු රැස් ගැසී ප්‍රබුද්ධ වූ සද්ධර්‍ම මධු ඇති, බිඳුන් වහනය කරණ චතුර් විධ විනෙය ජන නමැති බමරුන් විසින් ගැවසී ගත් මුඛ පද්ම ය විවෘත කොට තුන් විටක් සාධුකාර දෙවා වදරා ම 'මා බඳු වූ ඇදුරකු ලදින් මූ අපිස් වීම විස්මය නො වෙයි.

''මේ අපිස් බව නම් මා ගේ ම ප්‍රවේණි ය'යි වදරා භික්ෂූන් වහන්සේ ඒ කෙ සේ දැ යි විචාළ කල්හි 'යට ගිය දවස හිමවු පියස ගඟක් බඩ එක් දිඹුල් වනයෙක නො එක් දහස් ගණන් ගිරවු වෙසෙති. ඉන් ගිරා රජ්ජුරුවෝ තමන් හිඳිනා දිඹුල් ගස එල නිමි කල්හි දළු වේව යි සුඹුළු වේව යි ඒ කාලා ගඟින් පැන් බීලා අපිස් ව අනික් තෙනකට නො යෙති. උන්ගේ ගුණ මහිම- යෙන් පඬු ඇඹුල් සල හස්න හුණු වී ය. ශක්‍රයෝ ද විමසන්නෝ එ පවත් දැන උන් විමසන පිණිස තමන්ගේ ආනුභාවයෙන් ගිරා රජ්ජුරුවන් වසන දිඹුල් ගස මරා පූ ය. ගස ත් කණු පම- ණෙක් ව සිදුරු ව ගොසින් සුළං පහළ කල හඬ හඬා සිටී. ගස් සිදුරෙන් සුණු වැගිරෙයි. ගිරා රජ්ජුරුවෝ ඒ සුණු ත් කා ලා ගඟින් පැන් බී ලා අනික් තෙනකට නො ගොසින් අවු සුළං නො සලකා දිඹුල් කණුව මත්තේ හිඳිති. ශක්‍රයෝ ගිරවාණන් ඉතා අපිස් නියාව දැන මිත්‍ර ධර්‍මයෙහි ගුණ කියවා ගෙන වර ද දී ලා දිඹුල් ගස අමා එල ගන්වා එම් සිතා ගොසින් කථා කොට වර දුන් නියාව ත් අමා එල ගන්වා එම් සිතා ගොසින් කථා කොට අමා එල ගැන්වූ නියාව ත් වදරා 'එ කල ශක්‍රයෝ නම් අනඳ මහ තෙරහු ය. ගිරා රජ්ජුරුවෝ නම් මම ය.

''එ හෙයින් අල්පෙච්ඡතාව නම් මාගේ ප්‍රවේණි ය' යි වදරා අනික් උපදෙශක කෙණකුන් නැති ව ගිරා ව උපන් මා එ ලෙස කළ කල මාගේ උපදෙශයෙන් මුන් මෙ ලෙස කිරිම විස්මය නො වෙයි. මෙ වැන්නෝ ලැබ ගත් ගුණ විශෙෂයෙන් පිරි හෙන්නෝ ත් නො වෙති. නො පැමිණියා වූ මාර්‍ග ඵලයට නො පැමිණෙන්නෝ ත් නො වෙති. යම් සේ. සත් පුරුෂයෝ කෙ තෙක් දුර හුණ ත් බුදුන්ට ළඟ ද එ මෙන් මොහු ත් නිව- නට ළං ව සිටිති' වදාළ සේක. බණ නිමි කල මෙ ම ලබනු නිසා මම තෙක් කල් නො ගියා සේ නිගම තිස්ස තෙරුන් වහන්සේ

Non-Commercial Distribution

අත්ථ පටිසම්භිදා ය, ධම්ම පටිසම්භිදා ය, නිරුත්ති පටිසම්භිදා ය, පටිභාණ පටිසම්භිදා ය, යන මේ හා සමඟ රහත් වූ සේක. සෙසු ත් බොහෝ දෙන සෙදගැමි, අනගැමි, රහත් වූහ.

එ හෙයින් සත් පුරුෂ තැන් විසින් අධිගමප්පිච්ඡතාව ඇති-වන්ට අධිගම කාලයක් නො වන හෙයින් එ කුම් වූව ත් ආගමප්පිච්ඡතා-ධුතඞ්ගප්පිච්ඡතා-පච්චයප්පිච්ඡතා ඇති ව කුසල් පුරා ලොවි ලොවුතුරා සැප ත් සිද්ධ කට යුතු.

## 35. මේඝිය තෙරුන් වහන්සේ ගේ වස්තුව

තව ද යම් කෙණෙක් කයින් සිද්ධ වන පණිවා ආදී වූ පව් තුනිනු ත් දුරු ව තෙපුලෙන් සිද්ධ වන බොරු ආදි වූ පව් සත-රිනු ත් දුරු ව මනසින් සිද්ධ වන අභිද්‍යාදී වූ පව් තුනිනු ත් දුරු ව ගත නො හෙත් නම් උන්ට උපදෙස් දක්වනු සඳහා මේඝිය තෙරුන් වහන්සේ ගේ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්:

ඒ මේඝිය තෙරුන් වහන්සේ ප්‍රධන් වීර්‍ය්‍ය කෙරෙමින් බුදුන් හා කැටි ව යන ගමනු ත් තබා අඹ උයන රදා කාම විතර්කාදී වූ අකුශල විතර්කයෙන් මඩනා ලදුව වීර්‍ය්‍ය කොට ගත නො හී තමන් වහන්සේ කරා ආ මේඝිය තෙරුන් වහන්සේට බුදුහු 'මේඝිය-යෙනි, 'මම හුදකලා ය. අනික් භික්ෂු කෙණකුන් එන තෙක් රඳා පියව' යි මා වැනි වූ ත්‍රිලෝ ගුරු බුදු කෙණකුන් කියව කියවා ගොසින් තෙල ලෙස සිතීම යහපත් නො වන්නේ වේ ද? මේ සිත නම් ඉතා ලඝු ය. සුළඟෙක බැඳි අහස් පතක් මෙන් සැලෙන සුලු ය. එක සැටියෙන් හිඳ නො හෙන බාල දරු කෙණකුන් මෙන් එක අරමුණෙක නො පවත්නා හෙයින් සැලගත් ය. ගොයම් කුඹුරෙක ගොයම් කා පුරුදු ගොනකු ගොයම් කෑමෙන් ඊක ලිය නො හැක්කා සේ ඉටු වූත් අනිටු වූ ත් රූපාදි සාරමුණට නුදුව මනා ලෙසින් දුවන්නහු දිවිය නො දී ඊක ලිය නො හැක්ක. පඤ්චානන්තර්‍ය්‍යාදියට පැමිණ අපාය භාග් වේ නම් නවතා ලියත් නො හැක්ක.

"එ සේ වූ සිත යම් සේ හී වඩුවෙක් වලින් දණ්ඩක් කපා ගෙන වුත් සුඹුලු ත් බොරු හර ත් හැර පියා තෙල් ගා ගින්නට පෑ තවාලා ගස් හස්සෙක ලා හැද මැඩ ලා වක් ගුණ හැද ගුණ හැර ලා බැඳ පත් සඳු හී දඬු ඉදි කොට ගෙන රජ යුව රජ මහ ඇමැති ආදීන්ට දක්වා

1. සැලගතු ය

Non-Commercial Distribution

දී සංග්‍රහ ලැබේ ද, එ පරිද්දෙන් නුවණැත්තෝ ත් මායා සාඨෙය්‍යා දියෙන් ඉතා වක් වූ සිත වක හරණ පිණිස දුවහ පිළිවෙත් නමැති යකඩින් ඕලාරික කෙලෙස් නමැති සුඹුළු සැස හැර සාර ගුණයට පැමිණීමෙන් හර දැක සැදෑ නමැති තෙල් ගාලා වීර්‍ය්‍ය නමැති ගින්නට පෑ තවා ශමථ – විදර්ශනා නමැති බලහස් සේ ලා හැද මිරිකා වංක–කුටිලාදි භාවයට කාරණ වූ මායා–සාඨෙය්‍යාදීන් නැති කිරීමෙන් සිත ඉදුරා කෙරෙති. කොටත් ප්‍රත්‍යයසමුප්පන්න ධර්‍මයන් කලාප සම්මර්‍ශනාදීන් විසින් සමනා අවිද්‍යාව නසා ත්‍රිවිද්‍යා අෂ්ටවිද්‍යාවන් ද සැබවින් නව ලොවුතුරා දහම් ද යි මේ ගුණ විශෙෂය සිද්ධ කොට ගෙන මාගේ අනුශාසනා වූ ලෙස කළා නම් වෙති වදළ සේක. මේ දෙශනා කෙළවර මෙඝිය තෙරුන් වහන්සේ පීඩා කළ විතර්කයන් තුන් දෙනාට මාරු මරන්නා සේ සත්කායදෘෂ්ටි ය, විචිකිත්සාය, ශීලව්‍රතපරාමර්‍ශ ය යන දෙස් තුන නසා සෝවාන් වූ සේක. සෙසු ත් බොහෝ දෙන නිවන් පුර වන්හ.

එ සේ හෙයින් නුවණැත්තවුන් විසින් මේ උපදෙසින් තුන් දෙරින් සිද්ධ වන අකුසලින් දුරු ව කුසල් පිරිය යුතු.

## 36. එක්තරා භික්ෂු කෙණකුන් වහන්සේ ගේ වස්තුව

තව ද මෙ ම සිත හික්මවා පනත් කිරීමෙහි අනුසස් දක්වන්නමෝ **එක්තරා භික්ෂු කෙණකුන් වහන්සේගේ** වස්තුව කියමු.

කෙ සේ ද යත්—

කොසොල් රජ්ජුරුවන්ගේ විධාන පවත්නා රට ගල් වල් මුසු තෙනක සියල්ලෙන් ම සමෘද්ධ වූ **ඇළගමු** නම් වූ ගමෙක් ඇත. එ කල සැට දෙණකුන් වහන්සේ බුදුන් ගෙන් ම රහත් වන්ට කමටහන් ඉගෙන එ ගමට වැඩ පෙරවරු වේලාව හෙයින් සිඟා වන් සේක. එ ගමට නායක **මාතික** නම් උපාසකයන්ගේ මෑණියෝ වහන්දෑ දැක පැහැද ගෙයි වඩා හිඳුවා ලා උදෑසන ම වැඩි හෙයින් කැඳ අවුළු පතු ත් වළඳවා ලා දවල් බතුත් වළඳවා ලා 'ස්වාමීනි, වඩනේ කොයිදැ'යි විචාළෝ ය. 'උපාසිකාවෙනි, ඵාසු තැනකට යම්හ'යි වදළ සේක. උපාසිකාවෝ ද වයසින් මූකළ පමණක් නො ව නුවණිනු ත් මූකුරා සිටි හෙයින් වස් වසනා තැන් සොයා යන නියා ය යි බස කියා ලූ ලෙසින් ම දැන බැස හෙව වැද ලා 'ස්වාමි දරුවෝ ඉදින් මේ වස් තුන් මස මෙහි විසූ සේක් නම් මම ද වැළි ත් තිසරණ පිහිටා පන් සිල් සමාදන් ව පොහොයෙන් පොහොය උපෙහෙවස් ද රකිමි' කිවූ ය. වහන්දෑ ද 'අපි ත් මුන් මුල්

කොට සිවු පසයෙන් අපාසු ත් නැති ව සසර මුහුද ගෙවා නිවන් පරතෙරට පැමිණෙම්හ'යි ආරාධනාව ඉවසූ සේක. උපාසිකාවෝ ද විහාරයක් කරවා දුන්හ. සැට දෙනා වහන්සේ ත් එහි වසන සේක් එක් දවසක් රැස් ව ලා ඔවුනොවුන් වහන්සේට ඕවාද දෙන සේක් ඇවැත්නි, අප හැමට පමා වී ම නපුරි.

"න පිතා න ච තෙ මාතා – න ඤාති න ච බන්ධවා,
කරොන්තා ඊදිසං කිච්චං – සීලවන්තස්ස කාරණා."

යනු හෙයින් මේ උපාසිකාවෝ අප සැට නමින් එක් නමකට වුව ත් මේ ජාතියෙහි නෑ කමක් නැත්තෝ ය. හඳුනන්නේ ත් මේ ආ ගමනේ ය. එතකුදු වුව ත් සිල්වත් සේක. ගුණ ඇති සේක යන අදහසින් තමනු ත් සසර දුකින් මිදෙන ලෙසට නෑ සිය තෙනකට ත් වඩා උපස්ථාන කෙරෙති. උන්ගේ අදහස් තරමට විසූව මැනව. එ ලෙසට නො වසමෝ නම් උන් කරණ උපස්ථානයෙහි අදහස් පවිත්‍ර හෙයින් උන්ට විපාකයෙහි අඩුව නැත ත් අප ගේ පිළිවෙත් අඩු වීමෙන් අපට අඩු ව ඇත. සැතපෙන ගෙවල දෙර පියා ලිය හෙමෝ ද පමා ව කළ මනා ලෙස තිබිය දී අනික් ලෙසක් කරමෝ නම් නරක දෙර වසා ලිය නො හෙම්හ. කමටහන් උගන්නමෝ ත් කරුණා නිධාන වූ මනා පිළිවෙත යහපත් ව හසල මනා පිළිවෙතකින් මුත් වෘද්වා ප්‍රවෘත්තීන් මඳකු ත් සිත් ගෙන ලිය නො හැකි හිතොපදෙශක වූ ශුද්ධොදනීය වූ දෙවාතිදෙව වූ ශක්‍රාතිශක්‍ර වූ බ්‍රහ්මාතිබ්‍රහ්ම වූ වන්‍දනීයාභිවන්‍දනීය වූ බුදුරජාණන් වහන්සේ ගෙන් ම උගතුම්හ. බුදුවරහු නම් ඡායාවක් සේ විසූව ත් ඉඳුරා අදහසකින් මුත් වෘද්වාවෙන් සිත් ගත නො හෙන සේක.

"නො පමා වුව මැනව, දෙ නමක් එක් තැනක නො සිටිය යුතු ය. සවස වත් පිරිත් වේලේ හා උදසන සිහා යන වේලේ එක් තැන් වම්හ. සෙසු වේලක දෙ නමක් එක් තැන් නො වම්හ. බල එකෙක් නම් ලෙඩ තෙනක් ඇත හොත් වෙහෙර මැද බැඳ එල්වා තිබෙන ගෙඩිය ගසා ලන්නා ඒ සලකුණෙන් අවුත් බෙහෙත් කරම්හ'යි මෙ සේ කතිකාව තර කොට ගෙන වසන කල එක් දවසක් උපස්ථාන කරණ උපාසිකාවෝ තෙල්, මී, සකුරු ආදිය ගෙන්වා ගෙන කෙලි-කොල්ලන් පිරිවරා සවස් මාන[1] වෙහෙරට අවුත් විහාර මද්ධ්‍යයෙහි වහන්දෑ නො දැක වහන්දෑ කොයි වැඩි සේක් දැ යි මිනිසුන් අතින් විචාරා තමන් වහන්සේ රැ වසන තැන නියා ය' යි කී කල්හි දක්නට පිළිවන් සේක් දැ යි විචාළෝ ය

1. සවස් මාන වේලෙහි

Non-Commercial Distribution

ඉක් බිත්තෙන් වහන්දෑගේ කතිකා වත දන්නා මිනිස්සු ගෙඩි දණ්ඩ ගසා ලන්නා රැස් වන සේකැ යි කිවු ය. උයි ත් ගෙඩි දණ්ඩ ගස්වා ලූ ය. වහන්දෑ ගෙඩි දණ්ඩ ගසාලූ හඬ අසා සිතන සේක් ලෙඩ නියා ය යි වැඩ හුන් තෙතින් නික්ම විහාර මද්ධ්‍යයට රැස්වූ සේක. දෙ නමක් එක් මහකින් වැඩියේ නැත. උපාසිකාවෝ ඒ ඒ තෙනින් එකී එකී නම ම වඩනා දැක 'මා ගේ දරුවන් වහන්සේ ඔවුනොවුන් වහන්සේලා ඩබරක් ඇති නියාවනැ'යි සිතා වහන්දෑ වැඳ ලා 'සවාමීනි, ඩබරයක් නියා ද'යි විචාළෝ ය.

'ඩබරෙක් නැත, උපාසිකාවෙනි' වදාළ සේක. ඩබරයක් නැති කල්හි සිහා වඩනා කල එක් ව වඩනට ත් දූන් වෙන වෙන වඩනට ත් කාරණ කිම් ද යි විචාළෝ ය. 'උපාසිකාවෙනි, වෙන වෙන වැද හිඳ මහණ ධර්ම කරම්හ' වදාළ සේක. උපාසිකාවෝ මහණ ධම් නම් කුමක් ද යි විචාළෝ ය. දෙ තිස් කුණු කොටසුන් මෙනෙහි කිරීමෙන් කා ගියා සී කමටහන යෙදෙම්හ'යි තිලකුණු මෙනෙහි කරම්හ'යි වදාළ සේක. උපාසිකාවෝ මහණ ධම් අසා දරුවන් වැදීමේ දුක් නිසා වද බෙහෙදක් කන්ට සිතන්නා සේ ගර්භාවක්‍රාන්ති දුක් සලකා තුමූ ත් භාවනාභියොගයකට යෙදෙනු කැමැති ව 'සවාමීනි, ඒ හැම නුඹ වහන්සේලාට ම ප්‍රතිනියත ද? අපට ත් නිසි දැ'යි විචාරා 'කාට වුව ත් සියලු රොගයට බෙහෙදක් සේ විහිත ය'යි වදාළ කල්හි 'එ සේ වී නම් ඒ ක්‍රම ය මට ත් වදාළො ත් යහපතැ'යි කිවු ය. වහන්දෑ ත් යහපතැ යි භාවනා ක්‍රම ය මුළුල්ල ම තමන් වහන්සේ දන්නා තරමින් වදාළ සේක.

උපාසිකාවෝ ද භාවනාභියොගයෙහි යෙදී භාවනා ක්‍රම ය ඉගැන් වූ වහන්දෑ ට පෙරාතුකොට අනාගාමී වූහ. අනාගාමී මහ හා සමඟ ම සිවු පිළිසිඹියාවෝ ද ලෞකික වූ අභිඥවෝ ද සම්භ වූ ය. උෟ සමවත් සුවෙන් නැඟී 'මා ගේ දරුවන් වහන්සේ මේ ගුණ විශෙෂයට කවර කලෙක පැමිණෙන සේක් දෝ හෝ'යි දිවසින් බලා අධිගම තබා ධ්‍යාන පමණකු ත් නැති නියාව දැන රහත් වන්ට නිසි හේතු ඇද්දෝ හෝ යි නැද්දෝ හෝ යි බැලූ තැනැත්තෝ රහත් වන්ට නිසි පින් ඇති නියාව ත් දැක සෙනසන එාසු දෝ හෝ යි අඵාසු දෝ හෝ යි බැලුවෝ එයි ත් එාසු නියාව දැන ආහාර එාසුව කුමක් දෝ හෝ යි දිවසින් බලනුවෝ අභිප්‍රාය ලෙස ම සම්භ නො වන හෙයින් ඒ එාසු නො වන නියාව දැන එ වක් පටන් නො එක් සැටි ඇති කෑද ද නො එක් අවුළු පත්

Non-Commercial Distribution

එගී ද ඉදි කරවා තමන්ගේ ගෙයි ම වඩා හිඳුවා 'ස්වාමීනි, අභිප්‍රාය දෙයක් වැළඳුව මැනවැ'යි ආරාධනා කෙරෙති. උන් වහන්සේලාත් අභිප්‍රාය දෙයක් හැරගෙන වළඳනා සේක.

සත්ප්‍රාය වූ බොජුන් ලදින් කාය ඵාසු ඇති වත් විල යහපත් කලට පැනු ත් යහපත් වන්නා සේ සිත ත් එකඟ වි ය. එකඟ සිතින් විවසුන් වඩා සිවු පිළිසිඹියාපත් රහත් ව පියා 'අනේ මේ උපාසිකාව මියන ගසකට පැන් වත්කරන්නා සේ අපට මහා උප කාරී වූ හ. ඉදින් අපි භොජනයෙන් ඵාසුවක් නො ලදමෝ නම් මාගී ප්‍රතිවෙධ-ඵල ප්‍රතිවෙධ දෙක නො වෙයි. දැන් වස් පවරා ලා බුදුන් දකුම්හ. කෘතකෘත්‍ය ව ගෙන බුදුන් දැක්ම මුන් නිසා විය. යන්නමෝ මුන්ට කියා යම්හ'යි 'බුදුන් දකින්ට යනු කැමැත් තම්හ. මහා උපාසිකාවෙනි'යි වදාළ සේක. උපාසිකාවෝ තමන් කළ උපස්ථාන ය සප්‍රයෝජන හෙයින් සමෘධි ව 'යහපත, වැඩිය මැනවැ'යි පසු ගමන් කොට ගොසින් 'ස්වාමීනි, තව තවත් මොබ වඩනේ යහපත'යි ආරාධනා කොට ලා රුඳුණාහ. ඒ සැට දෙනා වහන්සේ ද සැවැත් නුවරට වැඩ බුදුන් වැඳ එකත් පස් ව හුන් සේක් 'සුව දුක් කිම් ද, මහණෙනි, වදාළ සේක 'කිසි ත්, ස්වාමීනි, අඵාසුවෙක් නැත. අප ගිය තෙන මාතික නම් උපාසකයන්ගේ මවු උපාසිකාවෝ අපගේ අදහස් දැන මෙබඳු භොජනයෙක් දුන්නු නම් යහපතැ යි සිතූ කලට සිතූ ලෙසින් ම සපයා දෙති, උන්ගේ ගුණ කථාව වදාළ සේක.

එක්තරා භික්ෂු කෙණකුන් වහන්සේට උන්ගේ ගුණ කථා අසා ඔබ යනු කැමැති ව බුදුන්ගෙන් කමටහන් ඉගෙන ගෙන 'ස්වාමීනි, මම ත් තෙල වහන්දෑ වදාළ ගමට යෙමි'යි කියා ලා දෙවුරමින් නික්ම අතුරේ සැතපි සැතපි එ ගමට වැඩ විහාරයට වැඩි දවස් 'මේ උපාසිකාවෝ ත් සිතූ සිතූ දෙයක් දනිත් ල. මම ත් වැළි ත් ගමන් විඩායෙමි. විහාර ය හැමඳ ගන්ට ආයාස ඇත. හැමඳ පියන්ට නිසි කෙණෙක් එවූ නම් යහපතැ'යි සිතූ සේක. උපාසිකාවෝ තමන්ගේ ගෙයි හිඳ ම දිවැසින් බැලූ තැනැත්තෝ ඒ කාරණ ය දැන 'යව, ගොසින් විහාර ය හැමඳ එව'යි මිනිසකු යවූ ය. භික්ෂූන් වහන්සේ ද පැන් පිපාසා ඇති ව 'පැන් පිපාසා බලවත. උපාසිකා වෝ ශක්රා පැනක් එවූ නම් යහපතැ'යි සිතූ සේක. උපාසිකාවෝ ශක්රා පැනු ත් යවූ ය. දෙවන දවස් දුවාපු දිය කැඳ ඬැහැගෙන වළඳන්ට අවුළුපතක් එවූ නම් යහපත'යි සිතූ සේක. උපාසිකාවෝ එ ලෙස ම යවූහ. කැඳිත්ත වළඳා ලා අතරු වළඳන් ට ත් අවුළුපතක් එවූ නම් යහපතැ යි සිතූ සේක.

Non-Commercial Distribution

උපාසිකාවෝ ද බාල දරුවන් ඇවිටි වූ දෙයක් දෙන මෑණි කෙණකුන් මෙන් ඒත් යවූ ය. භික්ෂූන් වහන්සේ 'මේ උපාසිකාවෝ අප සිතූ සිතූ සියල්ල ම ගොසින් ම ඉල්වූ දෙයක් මෙන් එවූ ය. 'දවාලට සකස් කොට ඉදිකරවා දනක් ගෙන්වා ගෙන තුමූ ත් අවු නම් යහපතැ'යි සිතූ සේක. උපාසිකාවෝ ද 'ම පුතණුවන් වහන්සේ මා දක්නා කැමැති සේකැ'යි දන් ගෙන්වා ගෙන විහාරයට ගොසින් දන් පිළිගැන්වූ ය. දන් වළඳා අන්ත යෙහි මාතිකමාතාවෝ නම් මූ ද'යි විචාළෝ ය, ''එ සේ ය, පුතණු වන් වහන්සැ'යි කිවූ ය. තුමූ පරසිත් දනිද්දැ'යි විචාළ සේක. කුමක් නිසා ද, එ සේ විචාළේ ය'යි කිවූ ය. 'මා සිතූ සිතූ සියල්ලක් ම එ ලෙසින් ම වූ හෙයිනැ'යි වදළ සේක.

'පරසිත් දන්නා වහන්දෑ බොහෝ සේක් වෙ දැ'යි කිවූ ය. 'මම ඔබ්බෙක පරසිත් දන්මක් විචාළෙම් නො වෙමි. තමන් පර සිත් දන්නා නියා ය මා විචාළේ ය'යි වදළ සේක. එ සේ වු ව ත් අධිගතයන් එබඳු කරුණක් ඇතො ත් මුත් තමන් ලත් ගුණ විශෙෂ ය අනුන්ට නො හඟවන හෙයින් 'මම පරසිත් දනිමි'යි නො කියා 'පරසිත් නො දන්නෝ මෙ සේ කෙරෙද් ද, පුතණුවන් වහන්සැ'යි කිවූ ය. භික්ෂූන් වහන්සේ 'පෘථක්ජනයෝ නම් යහපතු ත් සිතති. නපුරු ත් සිතති. ඉදින් 'මම නපුර ක් සිතිම් නම් වස්තුව හා සමඟ සොරුන් අල්වන්නා සේ මා සිතුවා දන මුළාවකට පමුණුවා පියති. පලා ගියෙම් නම් යහපතැ'යි සිතා 'උපාසිකාවෙනි, අපි යම්හ'යි වදරා කොයි දැ යි විචාළවුන්ට බුදුන් සමීපයට ය යි වදළ සේක. ඔබ පෘථක්ජන හෙයින් ඔබට කුමක් සිතෙත ත් තමන්ට නපුරු සිත් නැති බැවින් 'ස්වාමීනී, රඳන බව ය'යි රඳන්ට ආරාධනා කළහ. රඳන්ට බැරිම ය යි වදරා බුදුන් ලඟට වැඩි සේක. බුදුහු 'හැයි මහණ, එ තැන නොරඳා අයිනැ'යි වදළ සේක. 'එ සේ ය, එ තැන රඳන්ට බැරි ය'යි වදළ සේක. කරුණු කිම් දැ'යි විචාරා වදළ කල්හි 'ස්වාමීනි, උපාසිකාවෝ පරසිත් දනිති. අපි පෘථක්ජන හෙයින් කුමකු ත් සිතන්නා ලද්දම්හ. එ සේ හෙයින් නපුරු සිතක් සිතාපුමෝ නම් උන් අනගැමි නියාව තමන් වහන්සේ නො දන්නා හෙයින් පර සිත් දැනීම පෘථක්ජනයන්ට ත් ඇති හෙයින් සිතූ සිත දැනගෙනා මුළාවකට පමුණුවද්දෝ හෝ යි සිතා අයිමි'යි වදළ සේක.

'මහණ, තා ඔබ යන්ට බැරිදැ'යි විචාරා බැරිය යි කී කල්හි 'කුමක් ද, මහණ, බොහෝ දෑ තබා එකක් රැකගත නො හෙයිදැ'යි වදරා කුමක් දැ යි විචාළ කල්හි 'තාගේ සිත පමණක් රැක–යම්

Non-Commercial Distribution

කෙණෙක් කුළුගොන් පරිද්දෙන් නිගා කට නො හැකි වූ හසුරු සතකට කෙළ ලක්ෂයක් පමණ චිත්තප්‍රවෘත්ති වෙයි. යනු ඕඳු රික වශයෙන් කී හෙයින් ලදු වූ පැවතුම් ඇති ලබන තැන් වේව යි නො ලබන තැන් වේව'යි නිසි තැන් වේව යි නො නිසි තැන් වේව යි ජාති වේව යි ගොත්‍ර වේව යි වයස් වේව යි නො සලකා යම් යම් තෙනක පවත්නා කැමැත්තේ වී නම් එ තැන ම පවත්නා සුළු වූ සිත යම් සේ මහ මුහුද මළකුණක් හා එක් ව නො පැ සේ ද එ මෙන් රා දෙස් ඈ කෙලෙසුන් හා එක් නො කොට, යම් සේ මහ මුහුද මැණික් ආදී වූ නො එක් රුවන් ධරන්නේ ත් පිටතට උතුරුවා නො හරී ද. එ මෙන් ශීල සමාධ්‍යාදී ගුණ රුවන් කෙතෙක් වුව ත් බොහෝ ය යි නො හැර නැවත මහ මුහුද තමා කෙරෙහි වසන මහ සතුන් ඇත්තේ ද එ මෙන් ම ලජ්ජී පෙසල වූ සත් පුරුෂයන් භජන කොට යම් සේ මහ මුහුද චතුරු පිරුණු ගඞ්ගා යමුනාදී වූ දහස් ගණන් ගං වල පැනිනු ත් වැසි පැනිනු ත් පිරි මුද කෙළවර නො ඉක්මේ ද එ මෙන් ලාභ සත්කාරාදි ය නිසා ත් ජීවත් වීම පිණිස ත් පවිහි නො හැසිර යම් සේ මහ මුහුද ගං ආදියෙන් නො පිරේ ද, එ මෙන් උද්දෙස පරිපුච්ඡාදියෙන් පිරීමක් නැතිව ය යි මෙ ලෙසින් දැමීම යහපත.

එ සේ දමාගත් සිත මෙලෝ පරලෝ-වැඩ සාධ'යි වදරා මහණ, තෝ අනිකක් නො සිතා ගොසින් එහි ම වසව'යි වදාළ සේක. උන් වහන්සේ ද බුදුන්ගේ අවවාද අසා අනික් සිතක් ම නැති ව ඒ ඔවා සිතමින් වැඩි සේක.

උපාසිකාවෝ ද දිවසින් බලනුවෝ වැඩියා වූ තෙරුන් වහන්සේ දැක 'ඔවා දුන් ඇදුරු තෙනක් ඇති ව පුතණුවන් වහන්සේ ආ නියා ය'යි තමන්ගේ නුවණින් ම දැන අදහස ලෙසට කමටහන් බුදුන්ගෙන් ලද ත් රුචි ලෙසට දනක් තුමූ ඉදි කරවා දුන්හ. උන් වහන්සේ ද භොජන සත්ප්‍රාය ලදින් කීප දවසකින් ම රහත් ව රහත් ඵල සුවෙන් දවස් යවන සේක් 'අනේ මේ උපාසිකාවන් භව සයුරෙන් එතරවීමට නැවක් පරිද්දෙන් පිහිට වූ නියාව යහපත. මේ ජාතියේ වන්නා පිහිට වූවෝ ද සසර ඇවිදිනා කල අනික් ජාතියෙක ත් මෙ සේ පිහිට වූ දෝ හෝ'යි සලකන සේක් ජාති එකුන් සියයක් සිහි කළ සේක. ඒ ජාති එකුන් සියයේ ම උපාසිකාවෝ මුන් වහන්සේට පාද පාරිචාරිකාව අනික් කෙණකුන් හා බැදි මුන් වහන්සේ එකුන් සියයක් ජාතියේ ම මරවා පීහ. තෙරුන් වහන්සේ මෙතෙක් නුගුණ රාසිය දැක අනේ මේ උපාසිකාවන් කළ දෙයක් ය'යි අමා මුදුනේ වසක් තබා පුවා සේ නුගුණ ය සිතූ සේක.

Non-Commercial Distribution

උපාසිකාවෝ ත් ගෙයි හිඳ ම "කුමක් දෝ ම පුතනුවන් වහන්සේට මහණ ධම් මුළු ලූ දෝ හෝ'යි දිවසින් බලනුවෝ රහත් වූ නියාව දැන තව ත් බලනුවෝ ම පුතණුවන් වහන්සේ රහත් ව මා වූ උපකාර සිතා වදුරා යට ගිය දවස ත් වූ උපකාර ඇද්දෝ හෝ යි බැලූ සේක් ජාති එකුන් සියයක් පෙර විසූ කඳ-පිළිවෙළ දන්නා වූ නුවණින් සිහි කළ සේක. මම වැළි ත් ඒ ජාති එකුන් සියයේ ම අනික් කෙණකුන් හා බැඳි මුන් වහන්සේ මරවා පීමි. මුන් වහන්සේ නුගුණ රූස දැක 'අනේ මුන් කළ දෙයක් ය'යි සිතූ සේක. 'වන්නාට සසර සිටිනා කල මා කළ අනික් උපකාරයෙක් නැද්දෝ හෝ'යි තුමූ බලන්නෝ සියක් වන ජාතියෙහි දී මුන් වහන්සේ ට පාදපරිවාරිකාව මුන් වහන්සේ මරණ තෙනක ගලවා පූ නියාව දැක ඒ උපකාරය එකුන් සියයක් අනුපකාර වසා ලන්ට ඇතැ යි ගෙයි හිඳ ම 'වළඳන්ට රුචි මඳ වුව ත් ආරාධනාවෙන් සුභක් වළඳන්නා සේ සුභක් ඔබ්බෙනු ත් සිහි කළ මැනව, පුතණුවන් වහන්සැ'යි කිවු ය. උන් වහන්සේ ත් දිව කතින් අසා වදුරා ඔබට බලන සේක් සියය ක් වන ජාති ය දැක ඊ දි ජීවිත රැක දුන් නියාව සලකා 'අනේ උපකාරිහු ය'යි සතුටු ව වදළ සේක.

සත් පුරුෂයන් විසින් එක ජාතියෙහි ම ආගන්තුක ව ගිය වෙහෙර මළු හමදිනවුන් සිතා මළු හැමදීමෙන් වූ ආයාසයක් නැත ත් පාත වගී සිතා දෙ වන දවස් උදසන කැඳ අවුළු පත් සිතා දවල ට බත් සිතා නො එක් ලෙසින් අපන ත් සිතා බුදුන්-ගේ අවවාදයෙන් පනත් කොට සිතුව මනා ලෙසක් ම සිතා රහත් බව ම සාධා ගෙන ජාති සියයෙක පැවැති දෙය ත් ප්‍රයෝජනය ත් පෙනුණ. තව වැඩියක් වුව ත් දන්නට සමත් වූ නම් ගොත් සෙයින් අප්‍රසිද්ධ වුව ත් රහත් ගුණෙන් ප්‍රසිද්ධ තෙරුන් වහන්සේ මෙන් සිත් සතන් පනත් කොට සසර දුක් ගෙවිය යුතු.

## 37. එක් භික්ෂු කෙණකුන් ගේ වස්තුව

තව ද යම් කෙණෙක් වස්තු සොයා වෙළඳාමෙ ගියවුන් වෙළඳාමට මැළි ව සියතින් එන්නා සේ නව ලොවුතුරා බඩු නිසා පිළිවෙත් වෙළඳාම් කළ මනා තෙන ඊට මැළි ව නව ලොවුතුරා බඩු නො ලදින් සිස් වෙත් නම් මේ උපදෙසින් එයින් උන් නො සිස් වනු නිසා නම් ගොත් හෙයින් ප්‍රසිද්ධ කමක් නැති එක් භික්ෂු කෙණකුන් ගේ වස්තුව කියමු.



Non-Commercial Distribution

**මක සේ ද යත්:**

බුදුන් සැවැත් නුවර වසන කල්හි එක් සිටු පුත්‍රයාණ කෙණෙක් කුලුපග ව වැඩ හිඳිනා තෙර කෙණකුන් වහන්සේ කරා ගොසින් 'ස්වාමීනි මම සිර ගෙයකින් ගැළවෙනු කැමැත්තා සේ සසර දුකින් මිදෙනු කැමැත්තෙමි. දුකින් මිදෙන්ට නිසි ලෙසක් වදාළ යහපත'යි කිවූ ය. 'යහපත, සිටු පුත්‍රයෙනි, දුකින් මිදෙනු කැමැත්තා නම් සඟනට ලා බත් දෙව. සිවූ පස ය දෙව, තොපගේ සම්පත් තුන් කොටසක් කොට ලා එකක් වියදම් කොට කෘෂි වණික් ආදි කර්මාන්ත කරව. එකක් වියදම් කොට එයි ත් අභිවෘද්ධි කාරණයක් හෙයින් අඹු දරුවන්. රකුව. එකක් මත්තට තබනු නිසා අනුගාමික නිධි කොට දන් දෙව'යි වදාළ සේක. උයි ත් වදාළ ලෙස නො වරදවා කොට අනික් කුමක් කෙරෙම් දැ යි තවත් ඔබ අතින් විචාළෝ ය. එ සේ වී නම් තුන් භවයෙහි දුක් හැරෙනු නිසා තිසරණ පිහිට ව. පඤ්ච ගති නිවෘත්ති ය නිසා පන් සිල් පිහිටව'යි වදාළ සේක.

එ ලෙස ත් කොට ලා අනික් කළ මනා කිම් දැ'යි විචාරා 'වීරිය ඇතො ත් දස සිල් රකුව'යි වදාළ කල්හි දස සිල ත් පිහිටා ගත්හ. මෙ සේ තෙරුන් වහන්සේ වදාළ පිළිවෙළ නො ඉක්මවා එලෙසින් ම කළ හෙයින් පිළිවෙළ සිටාණෝ ය යි ප්‍රසිද්ධ වූහ. තව ද තෙරුන් වහන්සේ කරා ගොසින් සසර දුකින් මිදෙන්වුන් කළ මනා මෙ තෙක් ම ද? තව ත් කළ මනා දැ ඇද්දැ'යි විචාරා 'එ සේ වී නම් නිවන් පුර වදනාවුන්ට වාසල් වැනි වූ සසුන්වැද මහණ වව'යි වදාළ කල්හි සැප ත් හැර අවුත් මහණ වූ ය. මහණ වන ගමනේ විදම් හදාළ කෙණකුන් වහන්සේ සිවුරු හඳවා පොරවා ආචාරි වූ සේක. විනය ධර කෙණකුන් වහන්සේ සිල් දීමෙන් හා නිස දීමෙන් උපාද්ධ්‍යාය වූ සේක.

උන් වහන්සේ උපසම්පන්න වූ පසු ආචාරීන් වහන්සේ විදම් විෂ ය වදරා ලා බුදු සස්නෙහි මේ කළ මනා දෙය ය. මේ නො කළ මනා දෙය ය යනාදීන් වදරණ සේක. උපාද්ධ්‍යායයන් වහන්සේ තමන් වහන්සේ ළඟට ගිය කල වින ය පිළිවෙත් පැ ලා අවවාද වදරන සේක. දෙ පක්ෂයේ අවවාද අසා 'දුකින් මිදෙනු පිණිස මහණ වීමි. පිළිවෙත වැරදි නම් දුකට කාරණ ය. කරණ ලෙසක වී නම් චතුසම්පජඤ්ඤ ලෙසින් වී නම් අත පය දික් කරන්ට බැරි ය. මේ අට්ටාල් බලා ත් ගිහි ව පින් කිරීම යහපත'යි සස්නෙහි උකටලී ව භාවනා ත් නො කොට ග්‍රන්ථ ධුර ය ත් නුපුරා වැර ගොසින් කයිනු ත් දුර්වල ව පිළිවෙත පිරීමෙහි අදහස් මඳ වීමෙන් සිතිනු ත් දුර්වල ව හිඳිනා සේක. යාළු මිත්‍ර වහන්දෑ ද

Non-Commercial Distribution

ඇවැත්නි, මේ කිම් ද? ශාසනික තැන් කළ මනා ධුරද්ව ය විය දමාපූ ගොන් පරිද්දෙන් දමා පියා ඉතා මැළි ව සිටි තැන සිට ම පියා හුන් තෙන ම හිඳ පියා දවස් යවව. කුමක් නිසා දැ'යි විචාරා ශාසනයෙහි ආල ය මඳ නියා අසා උන් වහන්සේ ගේ ඇදුරු තෙරුන් වහන්සේට ත් උපාධ්‍යායතෙරුන්වහන්සේට ත් කී සේක.

ඒ අසා ඒ දෙ පක්ෂ ය උන් වහන්සේ කැඳවා ගෙන බුදුන් කරා ගෙන ගිය සේක. බුදුහු 'හැයි, මහණෙනි, අවුනු'යි විචාරා වදරා ආචාර්‍ය්‍ය උපාද්ධ්‍යාය දෙනම එ පවත් දැන් වූ කල්හි බුදුහු උන් වහන්සේ අතිනු ත් දෙසුන් දෙස් කියා සිටිය ත් වරද ඇත්තවුන් අතිනු ත් විචාරන්නා සේ 'එ සේ ද? ශසනාභිරති නැත්තෙහි දැ'යි විචාරා 'එ සේ ය' යි කී කල්හි 'තෝ, මහණ, එකක් රැක ගත හෙයි නම් සෙස්ස රකින්ට ආයාස නො ගත මැනැවැ'යි වදරා රැක්ක මනා කවරේ දැ යි විචාළ කල්හි 'තමා ගේ සිත පමණෙක. යම් කෙණෙක් ගැඹුරු දියට වන් කුඩමස්සකු සේ තෙමී එක බඳ අකුරු සේ සොයා ගත නො හැකි. එ සේ හෙයින් ඉතා සියුම් වූ ජාති ආදි ය බැලීමක් නැති ව යම් කිසි ලෙසකින් ම පවත්නා සුලු වූ සිත ගොයම් කුඹුරට සරක් වැද්ද නො දෙන්නාසේ අකුසල් විෂයට වැද්ද නො දී රැක්කෝ වූ නම් එ සේ රැකි ඒ සිත ඓහලෞකික පාරලෞකික වූ ත් ප්‍රයෝජන සාධා දෙව'යි වදළ සේක.

දෙශනා කෙළවර පිළිපදින්ට බැරිය යි ගිහි වන්ට සිතා ඉතා දුර්වල ව නිශ්ශොභා වූ භික්ෂූන් වහන්සේ සෝවාන් ව චිත්ත පුෂ්ටිය ත් ඇති ව සෝවාන් ඵල නමැති ආභරණ පැළඳ ලා ශොභාවත් වූ සේක. තවත් බොහෝ දෙන ශ්‍රද්ධාදි ඉන්ද්‍රියයන් ගේ අපාටවාදි අවස්ථා වශයෙන් සෝවාන්, සෙදැගැමි, අනැගැමි, රහත් වූහ.

නුවණැත්තා වූ සුජන තැන් විසිනු ත් නව කෙළ දහස් එක්සිය අසූ පනස් ලක්ෂ සතිසක් විතර ව තිබෙන බොහෝ දෙය රක්නට බැරි වුව ත් රක්නට පිළිවන් ව තිබෙන සිත් පමණක් රැක ලොවි ලොවුතුරා සැපත් සිද්ධ කට යුතු.

## 38. භාගිනෙය්‍ය සඞ්ඝරක්ඛිත තෙරුන් වහන්සේ ගේ වස්තුව

තව ද සිත් ඔස්සේ ම ගොසින් කුසල් මං වරදනවුන්ට වන ආයාස දක්වනු සඳහා භාගිනෙය්‍ය සඞ්ඝරක්ඛිත තෙරුන් වහන්සේ ගේ වස්තුව දක්වමු.

Non-Commercial Distribution

සැවැත් නුවර එක් කුළ දරුවාණ කෙණෙක් බුදුන් ගෙන් බණ අසා ගිහි ව සිට බණ වූ ලෙස පිළිපැදීම බැරි හෙයින් ගිහි ගෙන් නික්ම මහණ ව උපසම්පද ලදින් සඞ්ඝරක්ඛිත තෙරුන් වහන්සේ ය යි සසුනඹර පුන් සඳ මෙන් ප්‍රසිද්ධ ව රහත් වූ සේක. උන් වහන්සේගේ නං උපාසිකාවෝ ද පුතණු කෙණකුන් වදු උන්ට නම තබන්නෝ තෙරුන් වහන්සේගේ නමම තුබූ ය. භාගිනෙය්‍ය සඞ්ඝරක්ඛිත කුමාරයෝ ය'යි ප්‍රසිද්ධ ව මහණ වුව මනා වයසට පැමිණ මයිලණුවන් වහන්සේ කෙරෙහි ම මහණ ව විසි හවුරුද්ද පිරෙන්නා ම මාලු පැවිදි ව එක් තරා ගමෙක වස් වැස වස් අන්ත යෙහි වස් වාසික ලාභ වශයෙන් සත් රියන් ඉණ කඩක් හා අට රියන් ඉණ කඩක් ලදින් අට රියන් ඉණ කඩ උපාද්ධ්‍යායයන් වහන්සේට දෙමි යි සිතා සත් රියන් හිණ කඩ තමන් වහන්සේට සිවුරු කර ගන්ට සිතා ගෙන වස් අන්ත වූ පසු උපාද්ධ්‍යායයන් වහන්සේ දක්නට වඩනා සේක් අතුරු මග සිහා වළදා අවුත් තෙරුන් වහන්සේ ත් සිහා වළදා නො වඩනා තෙක් විහාරයට වැඩ තෙරුන් වහන්සේ දවල් හිඳිනා තෙන හැමද පියා පා දෝනා පැනු ත් එළවා තබා වැඩ හිඳිනා ආසනයකු ත් පනවා ලා පෙර මං බල බලා වැඩ උන් සේක.

ඉක් බිත්තෙන් වඩනා තෙරුන් වහන්සේ දුක පෙර මහට ගොසින් පාත්‍රය ත් සහළ ත් හැර ගෙන තෙරුන් වහන්සේ වඩා හිඳුවා ලා ගිම් නිවා පත් සලා ගිම් නිවී කල්හි වළඳනට පැන් දෙවා ලා පය සෝධා දිය සිඳ පියා වැඳ ගෙන අට රියන් හිණ කඩ ගෙනවුත් උභතොසුද්ධික වසයෙන් පා මුල තබා ලා 'ස්වාමීනි, තිලින් ප්‍රයෝජන වුන මැනැවැ'යි ආරාධනා කොට ලා පත් සල සලා සිටි සේක. තෙරුන් වහන්සේ ද තමන් වහන්සේ අපිස් හෙයින් 'සඞ්ඝරක්ඛිතයෙනි, අපගේ තුන් සිවුරු ම තර ය. තෙපි ම ප්‍රයෝජන විඳුව'යි වදළ සේක. 'ස්වාමීනි, ලත් තැන් පටන් නුඹ වහන්සේට දෙමි'යි නියම කෙළෙමි. ප්‍රසාද හානි ය නො කොට ප්‍රයෝජන වුන මැනැවැ'යි දෙවෙනි ව ත් ආරාධනා කළ සේක. දෙ වෙනිව ත් තෙරුන් වහන්සේ නො ඉවසූ සේක. තුන් වෙනි වත් 'ස්වාමීනි, ප්‍රතික්‍ෂෙප නො කළ මැනව. මුඹ වහන්සේට ප්‍රයෝජන වුනො ත් අපට මහා ලාභ ය'යි වදළ ත් තෙරුන් වහන්සේගේ ඊට සිත් ගන්නා ව්‍යාජ අපිස් කමක් නොවන හෙයින් හා කමල පත්‍ර ගත ජල බින්දුවක් සේ කිසිවෙක ඇල්මක් නැති හෙයින් නො ඉවසූ ම සේක.

නො ඉවසන්නා ම ඔබ සිතන සේක් 'මම මුන් වහන්සේට ගිහි අවස්ථාවෙහි බෑනණු වෙමි. මහණ වත් සද්ධි විහාරිකයෙමි. මම ලෙසින් ම අවශ්‍යව සිටිය ත් මා සන්තකය ප්‍රයෝජන විඳිනට

Non-Commercial Distribution

මැළි සේක. එ සේ මැළි කල මා මහණ ව සිටීමෙන් කම් කිම ද? ගිහි වෙමි. ගිහි කම කවුල් බලා ලූ කලට ඉතා ගහට ය. කෙලෙසින් ජීවත් වෙම් දෝ හෝ, යි සිතන සේක් 'සිවුරු හැර පියන පමණකට සත් රියන් පමණ හිණ කඩ ඇත. අට රියන් හිණකඩ දී පියා එළියන් වහා වදන හෙයින් එළියක හැර ගනිමි. ඕ වදයි. වැදූ වැදූ එළුවන් විකොට ධනී ව වෙමි. ධනී ව ගෙන ලා ගෙදර ඇති කෙරෙමි. ගෙදර විචාරන්ට නිසි තෙනකින් සරණක් විචාරා ගනෙමි. ගෙනා කල දරුවන් වදන්නන් එළියන් ම නො වන හෙයින් උයි ත් පුතණු කෙණකුන් වදති. උපන් කුමාරයන්ට මාගේ මයිලණුවන් වහන්සේ ගේ නම තබමි. ඉක් බිත්තෙන් ගැලක් ඉදි කරවා ගෙන දරුවනු ත් අඹුවනු ත් ඒ ගැල ලා ගෙන අපගේ මයිලණුවන්වහන්සේ වඳිනට යම්හ යි යන ගමනේ අතුරු මගදී දරුවන් මට වඩා ලව'යි උන්ගේ මෑණියන්ට කියමි. 'එයි ත් මම වඩා ගෙන යමි. නුඹ ගැල පදිනැ'යි කියා ලා මට ත් නො වඩා තමාට ත් පසු ව බර විට දී දරුවන් බිම හෙළා පියයි. වැටීහිය දරුවන් ගැල්සක් මීරිකා ගෙන යෙයි. මම 'මට ත් වඩානුලූ යේ යි. තොයි ත් වැඩිය නො හී හෙළා මට මේ සා මුළාවක් කෙළේ ය'යි ඉපල් සොයා ඉපල් නැති වන්නා කැවිටි ලීය බා ලා පිට අවුරා පහරක් ගසමී''යි සිතූ සේක් සලමින් සිටි තල් වටින් තෙරුන් වහන්සේගේ ඉසට පිළී 'පිළි නො ගත් රොස ත් පලවන්නා සේ පහරක් පහළ සේක.

තෙරුන් වහන්සේ ත් සඞ්ඝරක්ඛිතයන් තල් වැටින් මා ඉස පහරින්ට කාරණ කිම දෝ හෝ'යි පර සිත් දන්නා නුවණින් බලා උන් වහන්සේ සිතූ සියල්ල ම හෙළියේ හිඳ කරණ දෙයක් උන්ට නො පැනී බලා දක්නා සේ දැක 'සඞ්ඝරක්ඛිතයෙනි, ගෑනුන් මැරිය නොහී ද අප මාල්ලන් මරන්නේ ය'යි වදළ සේක. ඒ අසමින්'මට වූයේ කුමන මූළාවෙක් ද? මා සිතූ සියල්ල ම මා ගේ උපාද්ධ්‍යායයන් වහන්සේ දත් බැවින් ශාසනයෙහි රැඳීමෙන් ප්‍රයොජන කිම් දැ'යි සලමින් සිටි තල් වැට දමා පියා සිවුරු හරිනට යන්ට නික්මුණු සේක. යාළු මිත්‍ර වහන්දෑ ලුහුබඳවා අල්වා ගෙන බුදුන් කරා ගෙන ගිය සේක. බුදුහු ත් ඒ වහන්දෑ දැක 'හැයි, මහණෙනි, කුමකට අවුදැ'යි විචාරා වහන්දෑගෙන් එ පවත් අසා එ සේ ද තෙපි සිවුරු හරනට යන්ට නික්මිණි දැ'යි විචාළ සේක. එ සේ ය යි කී කල්හි 'ඇයි, මහණ, තා එසේ කරණට කාරණ කවරේ ද? තා අල්ප සවල්ප එකකු නො වත් වීරිය ඇති බුදු කෙණකුන්ගේ පුතකු වුව. පියන්ට ඇති වියසිය පුතුන්ට නැත මනා ද? එ බඳු බුදු කෙණකුන්ගේ සස්නෙහි

Non-Commercial Distribution

මහණ ව සෝවාන් යි හෝ සෙද ගැමි ය යි හෝ අනාගැමි ය යි හෝ රහත් යි හෝ කියවා ගත නො හී ද? මෙ සේ ම කළේ නැ'යි වදළ කල්හි වස් වාසිකය ලත් තැන් පටන් තල් වැටින් මයිලණුවන් වහන්සේට පහර පහළ තැන් දක්වා වදරා මයිලණුවන් වහන්සේ ඒ සිතිවිල්ල දත් හෙයින් ලජ්ජා බලවත් ව නික්මුණු නියාව කී සේක.

බුදුහු එ විට 'තෙපි ඊට අනිකක් නො සිත ව. සිත නම් කෙසගක් පමණ තෙනට නො යන මුත් පාත අජටාකාශ ය පටන් උඩ අජටාකාශ ය දක්වා දුර වූ ත් දෙය අරමුණු කරණ හෙයින් දුරට යන සුලු ය. එ සේ හෙයින් තොප මෙ තෙක් සිතිවිලි සිතන්ට අරුම නැත. නැවත මේ සිත කැණක් බැන්ද සේ එක විට දෙ තුන් සිතක් පවත්නට නැති හෙයින් සොරුන් හා ත් එක් නො වන මහ සොරකු සේ තනි ව ම හැසිරෙයි. එ සේ හෙයිනු ත් මූ හසුකරන්ට බැරි ය. මේ සිත දක හැඳින ගන්ට ශරීරව ත් සැටියකුත් නැත්තේ ය. අරූප ධර්‍මයා හෙයින් එක් තරා පැයකුත් මූට නැත. එ සේ හෙයින් මේ ය යි බුදු නො ව දන්ට ත් බැරි ය. නැවත නියං සමයේ ගෙරි සරක් කොයි ත් කා ලා පැනිත්තෙක හෙව වැද හෝනා සේ හෘත්වස්තු වේ[1] අඩුකුළුඳුල්ලක්[2] ලේ නිසා[3] පවත්ති[4] මෙ සේ වූ සිත යම් සේ පිරිමි කෙණෙක් වෙත්ව යි, ගැනු කෙණෙක් වෙත්ව යි, ගිහි කෙණෙක් වෙත්ව යි, පැවිදි කෙණෙක් වෙත්ව යි, දෙවි කෙණෙක් වෙත්ව යි, බඹ කෙණෙක් වෙත්ව යි, සෙසු ත් කවුරු වේව යි, නූපන් කෙලෙසුන් නො ඉපැද දී සිහි මඳ ව උපන් කෙලෙසුන් දුරු කෙරෙමින් සිත පනත් කෙරෙත් නම් කම් වටිනු ත් විවා වටිනු ත් කෙලෙස් වටිනු ත් මිදෙති' වදළ සේක. දෙශනා කෙළවර භාගිනෙය්‍ය සඞ්ඝරක්ඛිත තෙරුන් වහන්සේ සෝවාන් වූ සේක. සෙසු ත් බොහෝ දෙන සතර මහ සතර ඵලයට පැමිණියහ.

එ සේ සුජනයන් විසින් වපට පෙරාතු කුඹුර කම් පස් කරන්නා සේ සිත් සතන් පිරිසුදු කොට ගෙන සසර දුක් ගෙවන්ට තැත් පිරිය යුතු.

# 39. චිත්තහත්‍ථ තෙරුන් වහන්සේ ගේ වස්තුව

තව ද එකෙක තර අදහස් නැත්තවුන්ට ඇසීම පිරිවීම නැත්තවුන්ට ශ්‍රුතම ය ප්‍රඥව ත් නැත්තා සේ නුවණක් වඩනට නැති නියාව චිත්තහත්‍ථ තෙරුන් වහන්සේ ගේ වස්තුවෙන් දතයුතු.

1 ගෘහන්වස්තුවේ 2 කුළුඳිල්ලක් 3 ලෙසින් 4 සා පවත්ති

Non-Commercial Distribution

ඒ කෙසේ ද යත්-

සැවැත් නුවර වසන එක් කුල දරුවාණ කෙණෙක් වල් වන් ගොන් සොයා වලට ගොසින් පෙරවරු මුළුල්ලේ සොයා වල ඇවිද හිර මුඳුනේ සිටි වේලාවට ගොන් දැක ගොන් ගෙරි සිටි තැනට බැස ලා උදුසන පටන් ඇවිදි හෙයින් බඩසා බලවත් ව 'වහන්දෑ ළඟට ගියෙම් නම් වළඳන වේලේ සම්හ වූ තෙනකට ඇති ව තිබූවොත් අවශ්‍යයෙන් ම බත් දෙන හෙයින් මට ත් බත් සම්භ වෙයි සිතා වෙහෙරට ගොසින් වහන් දෑ වැඳ ලා එකත් පස් ව සිටියේ ය. එ සමයෙහි ද වැළි ත් අවක්කාර පාත්‍රවල[1] ඉතිරි බත් තබා ලා[2] සයින් ආවවුන්ට තිලින් බත් හැර ගෙන කව යි වදරණ සේක. බුදු සමයෙහි වහන්දෑට උපදනා බත් නම් එ වක මිනිසුන්ගේ අදහස පරිද්දෙන් අති පවිත්‍ර ව නො එක් සූප ව්‍යඤ්ජන ඇති ව උපද්දි. උපාසකයෝ ද වහන්දෑගෙන් විධාන ලදින් ඉන් යැපෙන පමණක් හැරගෙන අනුභව කොට ලා පැනු ත් බී පිපාස සන් හිඳුවා අත සෝධා පියා 'කුමක් ද, සවාමීනි, අද ආරාධනාවක් කොට දන් දුන්නෝ ඇද්දැ'යි විචාරා 'නැත, උපා සකයෙනි, සිහා ගිය ත් නිරන්තර ව මෙ සේ ම උපද්දී' වදළ කල්හි අප හී පිරිහී හවුරුද්ද මුළුල්ලෙහි කර්මාන්ත කොට ත් මෙ බඳු බතක් ලද නො හෙම්හ. වහන්දෑ සිහා ගොසින් පියන ගමන විනා කිසි ත් ආයාසයක් නො ගෙන මේ බත් ලබන කල මා දුන් ගිහි ව සිට ආයාස ගැන්මෙන් ප්‍රයෝජන කිම් ද ? මහණ ව ගනිමි' සිතා අදහසෙහි පවිත්‍රාවක් නැත ත් තමන් මහණ කරන්ට වහන් දෑට කීහ.

වහන්දෑ ත් 'යහපතැ'යි ගිවිස මහණ කොට ලා මහලු පැවිදි කළ සේක. වත පිළිවෙත ත් හැසිර බුද්ධානුභාවයෙන් උපන් දෙය සුව සේ වළඳා මස්-ලෙය ඇති ව ගෙන මා දුන් සිහා කා ත් ප්‍රයෝජන කිම් ද ? සිවුරු හරිමි'යි සිතා ගෙට ගොසින් සිවුරු හැර නිකම් හැසිල්ලෙකු ත් හින්නට[3] නැති ව කර්මාන්ත කිරීමෙන් හා ඉඳුරා බතක් නො ලැබීමෙන් හා දුර්වල ව 'මේ දුකින් ප්‍රයෝජන කිම් ද ? මහණ වෙමි'යි සිතා පෙරළා අවුත් මහණ ව ලී බන් හුත්තියෙක මැටි ගසා ලී වසාලූවා සේ ඇට පිපී ගිය ශරීර ය සුව සේ වළඳා මස්-ලෙස් ඇති ව තව ත් උකටලී ව සිවුරු හළ වූ ය. නැවත ත් කීප දවසකින් ගිහි ගෙයි කළකිරී වෙහෙරට අවුත් මහණ කරන්ට කිවූ ය. වහන්දෑ ත් සිටි තෙක් දවස් මුන් සුවච කීකරු හෙයින් කී සේ ම මහණ කරවණ සේක. මෙ සේ

1 ආහාර පාත්‍රවල 2 තිබිමින් 3 හිඩ

Non-Commercial Distribution

ස මුරයක් මහණ ව ස මුරයක් සිවුරු හළවු ය. වහන්දෑ ද උන් සිත් වසඟ ව ඇවිදිනා හෙයින් ගුණ විශෙෂයක් දිය නුහුණ ත් චිත්තහත්‍ථ ය යන නම දුන් සේක.

මෙ සේ සිවුරු පොරවා සිවුරු හැර ඇවිදිනා කලට ඇඹෙ-ණියන් බඩ දරු කෙණෙක් ඇති වූහ. සත් වෙනි වාරයේ සී සා පියා නඟුල් විය දඬු හැරගෙන ගෙට අවුත් නඟුල් වියදඬු තබා පියා හිණ කෝනමයෙන් කළු දෑ රෙද්ද හැරගන්ට වැද හෝනා කුස් සියට වන්හ. එ වෙලාවට ඇඹෙණියෝ ත් මෝල් කොටා විඩාව පියා හන් පිළි කොයි යනු බව ත් නො දැන නිදති. දෙ කොළින්[1] කුණු කෙළ ත් වැගිරෙයි. බවා පලවන්ට ම කරන්නා සේ නාස ය ත් හඬව යි. නිඳන හෙයින් ඇස පී තිබෙත ත් කට ත් දල් වී තිබෙයි. ගෙට ගිය තැනැත්තවුන්ට අසුභ දසයෙන් දුරි ඇති බව නිසා උද්ධුමාතක අසුභයක් සේ වැටහිණ. දැක අනිත්‍යය සලකා මෙ තෙක් කල් මම නිකසළ බුදු සසුන් වැද මහණ ව මේ මාගම් කසළ නිසා ඒ නියා බුදු සස්නෙහි රඳාගත ත් නො හී මේ තරම් දුකකට පැමිණියෙමී' කළු දෑ කඩ බඩ ගන්ව ගන්වා ම ගෙන් නික්මුණා වූ ය.

ඉක්බිති ගෙයි සිටි නැන්දණියෝ බෑනණුවන් දැක 'කුඹුරේ සිට දැන් ම අවුත් ගෙයි මඳකු ත් රඳා නො පියා හිණ කඩ එක තින් ගෙන වෙහෙර බලා යෙති. කුමක් දෝ හෝ'යි දුවණියන් වැද හොත් ගෙට ගොසින් නිඳන දූවණියන් දැක ලා 'මෑ වැදහෙව අසඤ්ඤත ව නිඳන ලෙස බලා කළකිරී යන වනැ'යි සිතා ගෙන දූවණියන් ගසා පුබුද්ද පියා 'කාලකණ්ණිය, නැඟි සිට. තී සැමි අවුත් තී වැද හොත් ලෙස බලා කළකිරී පලා ගියේ ය. මෙ වක් පටන් තිට ඒ නැත්තේ වේ දැ'යි කිවූ ය. ඕ ඒ අසා ආදි සේ ම දෝ හෝ යි සිතා 'අම්ම, මුඹ නො දෙඩන්නේ උන්ට ගමනෙක් කොයින් ද? කීප දවසකින් පෙරළා එති උන්ගේ අදහස මට දැනෙන්නේ වේ'යි කිවූ ය.

උයි ත් සිතට වැටහුණු අසුභ විෂ ය කොට තිලකුණු මෙනෙහි කෙරෙමින් මහණ වන්ට යෙමින් සිට ම තමන්ට ම ප්‍රයෝජන වත් ලෙස නිඳූ නිදි හෙයින් සෝවාන් වූහ. සෝවාන් ව ලා වහන්දෑ ළඟට ගොසින් මහණ කරන්ට ආරාධනා කළහ. වහන්දෑ උන් සෝවාන් වූ නියාව නො දත් හෙයින් තොප මහණ කරන්ට අපට බැරි ය. මහණ ය යි යන්නා තොපට ලසු හෙයින් ලසු තරම නැති තැනට ත් ලසු නියා ද? තොපගේ

1 දෙ කොණින්

Non-Commercial Distribution

හිස නම් අපගේ කර මුවා ත් තබන ගලක් හා සරි වුව කර ත් චිතරෙක ගා මුවා ත් තබ ත් මුත් එක් වන් ගෑ කල ත් යහපත් ද? යව'යි වදළ සේක. ලෙඩ සන්හිඳෙන නියාව දැන බෙහෙත් අනුභව කරන්ට තරයා සේ 'ස්වාමීනි, මේ එක මුරයට මහණ කළ මැනැව'යි තත්පර ව කීහ. වහන්දෑ ත් තමන් වහන්සේට අත් පා මෙහෙයෙන් උපකාරී හෙයින් මැලි වුව ත් කරුණා කරවා ගන්ට හෙයින් මහණ කළ සේක. මහණ වූ දවස් ගණනකින් ම සිව්පිළිසිඹියා පත් රහත් වූ සේක. වහන්දෑ ද රහත් වූ නියාව නො දැන 'හැයි, යන කල් නො දත් නියා ද? මෙ වක් කල් ගිය නියා වේ ද'යි විචාළ සේක. 'ස්වාමීනි, මෙ තෙක් කල් සසර කල් ගිය හෙයින් ගමන කල් නො ගියේ ය. දැන් සසර කල් නො ගිය හෙයින් ගමන කල් ගියේ ය.

"යෙන දෙවූපපත්‍යස්ස – ගන්ධබ්බො වා විහඞ්ගමො,
යක්ඛත්තං යෙන ගච්ඡෙය්‍යං – මනුස්සත්තඤ්ච අබ්බජෙ;
තෙ මය්හං ආසවා ඛීණා – විද්ධස්තා විනළීකතා"

යනු හෙයින් සිවුරු හරණට ගමන් තබා භව ගමනුත් නැති වී ය'යි රහත් වූ නියා ව හැඟවූ සේක. වහන්දෑ ඔබ බුදුන් කරා කැඳවා ගෙන ගොසින් 'ස්වාමීනි, අප මෙ ලෙස කී හෙයින් මූ මෙ ලෙසක කියා තමන් රහත් නියාව කිවූ ය. නැත්ත වේ දැ' යි කී සේක. ඒ අසා වදරා බුදුහු 'එම්බා මහණෙනි, යම් කෙණකුන්ගේ සිත අසුන් පිට තබා ලූ පුසුලක් මෙන් දෝ හෝ නොහොත් දවසේ ගොඩක හිඳුවා ලූ කණුවක් මෙන් ද නැවත තළ ඔළුවෙක තබා ලූ කැණහිල්ල මලක් මෙන් තර නො වේ ද, නැවත සත් තිස් බොධි පාක්ෂික ධර්‍මය යම් කෙණෙක් නොදනිද් ද, සැදෑ නැත්තෝ ද නො හොත් මඳකින් ම ඉපිළ යන තරම් වූ තර නො වන සැදෑ ඇත්තෝ ද එ සේ වූවන්ට කාමාවචර නුවණ පමණකු ත් සම්භ නො වෙයි. රූපාවචර වූ ත් අරූපාවචර වූ ත් ලොකොත්තර වූ ත් ප්‍රඥ කැල ම නො පිරෙයි.

එ සේ කල ඒ චතුර් විධ වූ ප්‍රඥව ඇති වන්නේ කාට ද යත්-යම් කෙණකුන්ගේ සිත රාගාදියෙන් රැඳී නො තිබේ නම්, ද්වෙෂයෙන් කැළඹී නො තිබේ නම්, එ සේ වූ රහත් මහින් නටුවා වූ පින්-පව් ඇත්තවුන්ට ය ම පුත් වූ චිත්තහත්ථි තෙරහුද තමන්ගේ සිත තරයක් නැති අවධියේ ඇවිද්දෝ ය. දැන් විවසුන් නමැති එනුවළ ඇති නිවන් නමැති ගල අර්හත් ඵල නමැති කණු ගසා සිත් සතන් නමැති ලණුව බැඳ ලූ හෙයින් ගමන් හළ ව ය'යි වදළ සේක. මේ දෙශනාවෙන් බොහෝ දෙනාට වැඩ සැධිණ.

Non-Commercial Distribution

නැවත එක් දවසක් වහන්දෑ ඔවුනොවුන් වහන්සේ ලා කථා වක් කරණ සේක් 'ඇවැත්නි, මේ කෙලෙස්හු නම් පොරව කුඩා වුව ත් මහත් ගසු ත් පැහැර ගන්නා සේ කුවර තරමුන්ටත් පීඩා කෙරෙති. මෙ සේ රහත් වන්ට නිසි කුල දරුවාණෝ පවා සවා රෙක සිවුරු හැර සත් වරෙක මහණ වූ ය. රහත් වූ හෙයින් මුත් තව සිවුරු නො හරිද්දෑ'යි කියා කථාව කළ සේක.

බුදුහු දිව කනින් ඒ කථාව අසා වදරා ඒ වේලාවට නිසි ගමනෙකින් ධර්ම සභාවට වැඩ බුදු සස්නෙහි වැඩ හුන් සේක් 'මහණෙනි, මා එන්නාට පෙරාතු කුමන කථාවක් කොට හුනුදෑ'යි විචාරා මේ කථාව නියාව දන්වූ කල්හි 'හෙම්බා මහණෙනි, කෙලෙස් සතුරෝ යම් තෙනකට පැමිණියෝ නම් ගෙවල් අත් ගානා සොරු වස්තු ඇති වීමෙන් තරම් ගෙවල් සලක ත් නමුත් මූ තරම් සලකන්නෝ වෙති. ඉදින් මුන් මූර්තිමත් ව එක් තැනෙක ලතොත් සක් වළ ත් සරසින් හක ය. බඹ ලොව ත් උසින් මිටි ය. මූ ම බොහෝ වූ ය. පැරුම් බිම දී අප වැන්නන් පවා සලා පෙළා පියන්නෝ අනික් කවුරුන් බලද්ද? මම පවා වරා මනාවක් හා උදලු කෙටියත් නිසා ස වාරෙක මහණ ව ස වාරෙක ගිහි වීමි' වදරා කවර කල ද 'ස්වාමීනි' විචාළ කල්හි අසනු කැමැති නියා වේ දැයි වදරා එ සේ ය යි දන්වූ කල්හි ඉකුත් වත් ගෙන හැර දක්වූ සේක.

යට ගිය දවස බරණැස බඹදත් නම් රජකු රජ කරණ කල්හි කුද්දල නම් කෙණෙක් හිමවතට ගොසින් වල් කලා සිවුරු හැඳ පෙරව මහණ ව හිමත් ගිමන් අට මස හිමවු පියස වැස වැසි සමයේ බිම තෙමුණු කල්හි 'අප ගේ ගෙයි වරා මනාවක් හා උදලු කෙටියක් ඇත. මෙ වක නො වපුළො ත් වරා බිජුවට නපුරු වෙයි' තවුස් වෙස් හැර ගිහි ව එක් බිම පියසක් හුදල්ලෙන් කොටා වරා බිජුවට වපුට පියා වරා පැසුණු කල ද ගෙන ගොයම් ගොඩ නහා වරා බිජුවට නැළියක් තබා ලා සෙස්ස කා පියා 'මෙ වක කර්මාන්තයක් නැති ව ගිහි ව රැඳීමෙන් කම කිම් දෑ'යි නික්ම මහණ වූ ය. මෙ ම ලෙසින් නැළියක් විතර වරා හා හුදලු කෙටියක් නිසා සක් වරෙක ගිහි ව සත් වරෙක මහණ ව සිතන්නෝ 'මෙම වරා බිජුවට නැළිය හා උදලු කෙටියක් නිසා සත් වරෙක මහණ වීමි. ඒ මෙ තෙක් වර ගිහි වීමි. මූ තමා කෙටි බව මුත් කරවා ලන කට යුත්ත කෙටි නො වෙයි. තුබූ තුබූ පමණින් අවැඩක් මුත් වැඩක් නො කෙරෙයි. දමමී' සිතා ලා ගඟ බඩට ගෙන ගොස් හුණු තැන් දිටිම් නම් පෙරළා ත් හැර ගන්ට සිතෙයි සිතා යම් සේ හුණු තැන් නො පෙනෙ ත් නම් එ ලෙසට දමමී සිතා ලා වරා බිජුවට නැළිය ඵපාට්ටනියෙක

Non-Commercial Distribution

බැඳ ලා හුදලු තැටිල්ලේ බැඳ ලා සතුරන් දෙන්නකු එක්කොට බැඳලා ගලින් පාතට දමන කලක් මෙන් හුදලු මිට අගින් අල්වා ගෙන ගඟ බඩ සිට ඇස පියා ගෙන තුන් විටක් ඉස වට සිසාරා පියා ගඟ දියට දමා පියා නැවත බලා හුණු තැන් නො දැක 'දිනා ගියෙමි' තුන් විටක් කොට කිවු ය.

එ වේලාවට බරණැස් රජ්ජුරුවෝ පසල් දනවුවේ සොරුන් හකුළුවා ලා අවුත් ගඟ බඩ කඳවුරු බැඳ ගෙන නාන්ට ගඟට බටුවෝ 'දිනා ගියෙමි' යන බස අසා ලා තමන්ට එසේ වූ බස් අප්‍රිය හෙයින් කුද්දල පණ්ඩිතයන් ළඟට ගොසින් 'මම සතුරන් පරදවා දිනා අයිමි. තෙපි ත් දිනා ගියෙමි කිව. ඒ කිම් දැ යි විචාළෝ ය. කුද්දල පණ්ඩිතයෝ 'රජ්ජුරුවන් වහන්ස, මුඹ වහන්සේට පැරදී පිට පුම්බා 'සතුරෝ බලයක් ලද්දු නම් පෙරළා මුඹ වහන්සේ ත් පරදවති. එ හෙයින් තෙල සේ වූ දිනීම් දිනී-මට ගත නො හැක්ක. මම මසුරු සොරුන් පරදවාපීමි. උඹ මා පෙරළා පරදවා නො හෙති. එ සේ වූ දිනීම යහපතැ'යි කියාලා ගඟ දිය බල බලා සිටියෝ දිය පීරා යමක් හැර ගන්නා සේ ධ්‍යාන උපදවා අභිඥා ලාභී ව අහස පළක් බැඳ ගෙන හුන්හ. රජ්ජුරුවෝ කුද්දල පණ්ඩිත තවුසන් ගෙන් බණ අසා පැහැද මහණ කරන්ට ආරාධනා කොට පිරිස හා සමග මහණ වූහ. තවුස් පිරිස සතර ගවුවක් විතර ගලා ගෙන සිටියහ.

අනික් රජ්ජුරු කෙණෙක් බඹදත් රජුන් මහණ වූ නියාව අසා 'රට හැර ගනිමි'යි අවුත් ධන ධාන්‍ය සම්පත්තීන් පිරී තුබූ නුවර දැක මෙ සේ වූ නුවරක් හැර ගොස් මහණ වන්නේ ඊ නපුරක් නැති බැවින. මම ත් මහණ වෙමි'යි සිතා ගොසින් මහ සතුන් ළඟ සහපිරිවරින් මහණ වූ ය. මෙම ලෙසින් රජ දරුවන් සත් දෙණෙක් රජ සැපත් හැර අවුත් මහණ වූ ය. මුන් හැම දෙනා වසන පන් සල ත් දිගින් පළලින් අට විසි ගවුවෙක. මූ හැම දෙනම ධ්‍යානයෙන් නො පිරිහී බඹ ලොව උපන්හ. එ වක කුද්දල පණ්ඩිතයෝ නම් මම ය. අප වැන්න වුන්ට තෙල ලෙසක් කරන්නෝ මහ මෙර සොලවා පියන සුළඟ හිඹුල් පුළුනේ නො නවත්නා සේ මුන් බලද් දැ''යි වදාළ සේක.

නුවණැත්තවුන් විසින් මේ අනුශාසනා සිත තබා කිසි ලෙස-කිනු ත් කෙලෙස් සතුරන්ට අවසරයක් නො පැ කුසල් ධම් පුරා ත්‍රිවිධ බොධීන් එක් බොධියකට පැමිණිය යුතු.

1. කුම්බා—ඇතැම්,

Non-Commercial Distribution

# 40. ආරබ්ධ විදර්ශක භික්ෂූන් වහන්සේ ගේ වස්තුව

තව ද විදර්ශනා ධුරයෙහි යෙදී වසන තැන් එහි රුචි කරවනු සඳහා ආරබ්ධ විදර්ශක භික්ෂූන් වහන්සේ ගේ වස්තුව දක්වමු. කෙසේ ද යත්:

සැවැත් නුවර වසන පන් සියයක් දෙනා වහන්සේ බුදුන් ගෙන් අර්හත්ත්‍ව ය දක්වා කමටහන් ඉගෙන ගෙන මහණ ධම් කරම්හ යි සාර සියයක් ගවු විතර දුරු බා ගොසින් එක් බොහෝ මිනිසුන් ඇති ගමකට වැඩි සේක. පෙර වරු වේලේ වැඩි හෙයින් එ ගම මිනිස්සු පවරා ගෙන වඩා හිඳුවා මධුරාහාර වළඳවා වළඳා අන්තයෙහි වඩනේ කොයි දැ යි විචාරා වස් වැස ගන්නා තෙනකට යම්හ යි වදළ කල්හි 'මේ අත වැස මෙහි ම විසුව මැනව. අපි මුඹ වහන්සේ මුල් ව තිසරණ පිහිටා පන් සිල් පමණක් වුව ත් රැක ගනුම්හ'යි ආරාධනා කොට ආරාධනාව ඉවසූ කල්හි 'ස්වාමීනි, නුදුරු තැනක වන ලැහැබෙක් ඇත. ඊ වැස වදළ මැනැවැ'යි කියා ලා ඔබ යවූහ. වහන්දෑ ද ඒ වන ලැහැබට වැඩි සේක. ඒ වල වසන දෙවියෝ සිල්වතුන් වහන්සේ මේ වලට වැඩි සේක. ස්වාමි දරුවන් මෙහි වසන කල දරු මල්ලන් හැර ගෙන ගස් උඩවල 'සිටින්ට බැරි ය'යි බිමට බැස පියා 'ස්වාමි දරුවෝ අද එක දවසක මෙ තැන රඳවා ලා සෙට . වඩනා සේකැ යි සිතූහ. වහන්දෑ ද දෙ වන දවස් ඇතුළු ගම සිඟා වළඳා ලා නැවත ඒ වනයට ම වැඩි සේක. දෙවියෝ සිතන්නාහු 'සෙටට ආරාධනාවක් ඇති නියා ය. එසේ හෙයින් වඩනේ ය. සෙට දවස් වඩනා සේකැ'යි සිතූහ.

මෙ ලෙස ම සිතා-දෙ පෝයක් විතර බිම ම රඳා උන්හ. බිම ඉඳ වෙසී පියා සිතන්නාහු 'මුන් වහන්සේලා මී ම රඳනා සේක් වී නම් අප ගස් උඩවල හිඳිනට ත් රිලවුන් – වඳුරන් නො වන හෙයින් බැරිය. ඊට වඩා බිම විසීම ත් අනභ්‍යාස හෙයින් දුක. යම් කිසි ලෙසකින් මේ වහන්දෑ මෙ තැනින් යවා පුවොත් යහපතැ'යි ඒ ඒ රෑ වසන තැන්වල ද දවල් වසන තැන්වල ද සක්මන් කෙළවර ද තමන්ගේ ආනුභාවයෙන් මිනී හිසු ත්, හිස් නැති කොටවලු ත් මවා දක්වන්ට වන්හ. භය ජනක වූ යක් හඬක් ගසති. වහන්දෑට ද කැසි කිඹිසි ආදී වූ ලෙඩ දුකු ත් ඇති කළහ. ඔවුනොවුන් වහන්සේ අතින් ලෙඩ දුක් විචාරා 'අපට කැසි ඇත. අපට කිඹිසි ඇතැ'යි කියා 'ඇවැත්නි, අද සක්මන් කෙළවර මිනී හිසක් දුටුම්හ. රෑ වසන තෙන හිස් නැති

Non-Commercial Distribution

මිනියක් දුටුම්හ. අපි දවල් රඳා හුන් තැන යකුන් ගසා පූ හඬ කු ත් ඇසුම්හ'යි කියා ලා 'එසේ හෙයින් මෙ තැන හළ යුතු ය. බුදුන් ළඟට ම යම්හ'යි නික්ම බුදුන් කරා ගොසින් වැඳ එකත් පස් ව හුන් සේක.

බුදුහු 'කුමක් ද, මහණෙනි, එ තැන රඳා ගත නුහුණු ද'යි විචාරා 'එසේ ය, ස්වාමීනි, මේ මේ ලෙස උවදුරු ඇති හෙයින් රඳා ලිය නො හී මුහුදුළිහිණියා සේ මුඹ ආම්හ' යි දන්වූ කල්හි 'මහණෙනි, තෙපි ඔබ යෑම ම යහපතැ'යි වදළ සේක. 'එසේ බැරි ය, ස්වාමීනි, කී කල්හි 'මහණෙනි, තෙපි නිරායුධ ව ගියහ. ආයුධ අත ඇත් නම් බූමාටු දෙවියන් තබා කවර කෙණකුන් තොපට කුමක් කටහෙද්ද'යි වදරා 'දූන් ආයුධ ඇති ව යව'යි වදළ කල්හි 'අප ගෙන ගිය මනා ආයුධ කවරේ ද'යි විචාළ සේක. 'ආයුධ හඳුනන්නෝ ආයුධ ශ්‍රම දන්නෝ ය. තොපට නො දනෙයි. කරණීය මෙත් සූත් චක්‍රා යුධ ය ගෙන යව. එ සේ ගොසින් තෙල සූත්‍ර ය උවසර හිම පටන් පිරිවාමින්[1] ඇතුළු විහාරයට යව'යි වදරා ලා කරණීය මෙත් සුත් උගන්වා ලා යවා වදළ සේක. ඒ වහන්දෑ ද බුදුන් වැඳ ගෙන නික්ම එ තැනට වැඩ විහාරයෙන් පිටත සිට ම කරණීය මෙත් සූත් පිරිවමින් වන ලැහැබට වන් සේක.

සියලු වනයේ දෙවියෝ සූත්‍රානුභාවයෙන් මෙත් සිත් ලදින් වහන්දෑ දක්මින් ම පෙර ගමන් කොට ගොසින් ව්‍රත සම්පන්නයන් මෙන් පා සිවුරු ත් ඉල්වූහ. අතපත රුජා ඇත් නම් මඩිමෝ දැයි විචාළහ. වසන තෙක් කල් උවදුරු නැති ලෙසට රක්‍ෂාවක් තබාලූහ. හුණු දෙයක් පැනක ලා පු කලක් මෙන් සන්හුන්හ. ඒ වහන්දෑගේ සිතු ත් ලබන නානා විකෂෙප ය නැති ව එකඟ වි ය. රෑ වසන තෙන ත් දවල් වස්න තෙන ත් හිඳ විදර්ශනා-වට ම සිත යොමු කොට මේ අත් බැව බිඳෙන බැවින් හා තර නොවන බැවින් කුඹල් වළඳක් වැනි ය යි සිතා විවසුන් වඩන්ට පටන් ගත් සේක. බුදුහු ත් ගඳ කිළිසේ වැඩ හිඳ සාර සියයක් ගව්වෙන් ඔබ්බෙහි හුන් වහන්දෑගේ සිත විදර්ශනාවට නැඟී තියාව දූන රස් කඳක් විහිදුවා ළඟ වැඩ හුන් සේ 'හෙම්බා මහණෙනි, දුර්වල හෙයිනු ත් බොහෝ කලක් නො පවත්නා හෙයිනු ත් යම් තාක් පවතී නම් ඒ තාක් මුත් වඩා නො පවත්නා හෙයිනු ත් මේ දෙ තිස් කුණු කොටසින් ගැවසී ගත් මේ ශරීර ය බිඳෙන සුලු ලෙසට කුඹල් වළඳක් මෙන් සිතා යම් සේ නුවරෙක් ගැඹුරු අගල් හා උස් පවුරු ඇති හෙයිනු ත් මහ වාසල් පැන් වාසල්

---

1. පිරිවහමින්

Non-Commercial Distribution

අට්ටාල් ආදි ය ඇති හෙයිනු ත් පිටතිනු ත් තර ව මනා කොට විභාග කරණ ලද වීථි හා වීථි සන්ධි හා සල් පිල් ආදිය ඇති හෙයින් ඇතුළෙනු ත් තර ව පිටතින් ආ සොරුන්ට පිළිවන්ව නො තිබේ ද, එ මෙන් ම විවසුන් සිත ත් තර පාරු නුවරක් මෙන් තර කොට තබා ගෙන නුවර ඇතුළත සිටියවුන් ආයුධ අත ලා අවුත් සොරුන් අල්වා ගන්නාක් මෙන් විදර්ශනා සම්ප්‍රයුක්ත වූ ත් ආර්‍ය්‍ය මාර්ග සම්ප්‍රයුක්තවූ ත් ප්‍රඥ නමැති ආයුධයෙන් ඒ ඒ මාර්ගයෙන් මැරිය යුතු කෙලෙස් සොරුන් මැරිය යුතු ය.

නැවත යම් සේ යෝධයෙක් සටන් බිම බල කොටුවක් කොට ගෙන සතුරන් හා සටන් කරන්නේ බඩ සා වී නම් හෝ පිපාසා වී නම් හෝ සන්නාහ ය ලිහිල් වී නම් හෝ ආයුධ ය හෙළා පී නම් හෝ බළ කොටුවට වැද ලා මඳක් සැතපී ලා බතු ත් කා පැනු ත් බී ගෙන සන්නාහය ත් තර කොට බැඳ ගෙන ඇතු ළෙන් ආයුධයකු ත් හැර ගෙන පිටත් ව ලා සටන් කොට සතුරන් පරදවා ද, ජය නො ගත් සටන ජය ගනිද් ද, ලත් ජය තර කෙරේ ද, වන් ගමනේ ඉදින් බළ කොටුවේ ම රඳා පී නම් රට සතුරනට ම හරී ද, එ මෙන් ලැබ ගත් තරුණ විදර්ශනාව ත් ආවාස සත්ප්‍රාය ය, ඍතු සත්ප්‍රාය ය, භොජන සත්ප්‍රාය ය, පුද්ගල සත්ප්‍රාය ය, ධර්‍ම ශ්‍රවන සත්ප්‍රාය ය යනාදිය අත් නො හැර සෙවුණේ අතරතුරේ ලද මාර්ගයේ ඵල සම වතට සම වැද ත් එයින් නැඟී විවසුන් සිතින් සංස්කාරයන් සමනමින් තරුණ විපස්සනාවන් රක්නේ ය. එලෙස ම ඵල සමවත් ඹ සම වදී නම් මතු මත්තෙහි මාර්ග ඵල උපදවන්ට අසමර්ත්‍ථ ය'යි වදාළ සේක. මේ දෙශනා කෙළවර පන් සියයක් දෙනා වහන්සේ හුන් තෙන ම හිඳ සිවු පිළිසිඹියා පත් රහත් ව බුදුන්ගේ රන් වන් ශරීරයට ස්තුති කෙරෙමින් වඳිමින් ආ සේක.

එ සේ හෙයින් ශාසනික වූ යොගාවචර කුල දරුවන් විසින් ග්‍රන්ථ ධුරය පුරතත් බත් කා අන්තයෙහි බුලත් කා කපුරු තකුල් ආදිය කන්නා සේ හැසිල්ලක වුව ත් විදර්ශනාභියොග ය කට යුතු.

# 41. පූතිගත්ත තිස්ස තෙරුන් වහන්සේගේ වස්තුව

තව ද ජීවිත ය විදුලියක් මෙන් චිරස්ථිතික නො වන නියා ව ද හවුරුදු අසඞ්ඛ්‍යයක් සිටිය ත් දිය බුබුලක් මෙන් බිඳෙන සුලු නියාව ද තණ අග පිනි බින්දු මෙන් ආයුඃක්ෂයෙහි සිඳෙන නියාවද දියෙහි ඇඳි හිරක් මෙන් මැකෙන නියාව ද දක්වන්නමෝ පූතිගත්තතිස්ස තෙරුන් වහන්සේ ගේ වස්තුව දක්වමු.

Non-Commercial Distribution

කෙ සේ ද යත්—

සැවැත් නුවර වැසි කුල දරුවාණ කෙණෙක් බුදුන් වදරණ බණ අසා සස්නෙහි ළැදී මහණ ව උපසම්පද ව ලදින් තිස්ස තෙරුන් වහන්සේ ය'යි ප්‍රසිඬ වූ සේක. කල් යැමකින් ඔබගේ ඇඟ මරණින් මුත් පිළියමින් අසාධ්‍ය ඉතා බලවත් රොගයෙක් ඇති විය. කෙ සේ ඇති වී ද යත් – හබ සා විතර සීන් කස් ඇති ව ලා පසු ව මුං සා ව, පසු ව මෑ ඇට සා ව, පසු ව ඇඹුල සාව, පසු ව බෙල් සා ව, ලා පැසී ගොසින් පැළී සිල් වන්ට වන. සියල් සිරුර වෙියන් කෑ පරඬල් පතක් මෙන් සිදුරු විසිදුරු වි ය. එවක් පටන් පූතිගත්ත තිස්ස තෙරුන් වහන්සේ ය යි ප්‍රසිද්ධ වූ සේක. පසු ව දවස් ගණනෙකින් ඇට ත් බිඳින. බැලීමට ත් අක්‍ෂම වූ සේක. හඳනා පොරෝනා සිවුරු පූයා හා ලේයෙන් වැකී පුස් කා ගිය පැණි කැවුම් සේ වීය. ශිෂ්‍ය වහන්දෑ ත් බැලිය නො හී අත්හල සේක. උන් වහන්සේ ද කිසි පිහිටක් නැති ව මඤ්ච පරායණ ව හොත් සේක.

බුදුවරුන් වහන්සේ ත් දවසකට දෙ විටක් ලොව බලන සේක. අළුයම ලොව බලන කල සක්වළ මෝ විට පටන් වැඩ හිඳිනා ගඳ කිළියට නුවණ පතුරුවා බලන සේක. සවස බලන කල ගඳ කිළියේ පටන් සක්වළ මෝ විට දක්වා නුවණ පතුරුවා බලන සේක.

එ කල බුදුන්ගේ නුවණ දැළ ඇතුලට ඇඟින් කුණු වුව ත් රහත් වන්ට නිසි පිණක් කුණු නො වන පූතිගත්ත තිස්ස තෙරුන් වහන්සේ පෙනුණු සේක. බුදුහු උන්වහන්සේගේ සන්තානයෙහි මඬක තුබූ මැණිකක් මෙන් රහත් වන්ට නිසි හෙතු දැක 'මුන් සබ්‍රම්සරහු ත් පිළිදඟින්ට බැරි ම හෙයින් අත්හළ වූ ය. කෙලෙස් ලෙඩට පිළියම් දන්නා මා සෙසු ලෙඩට ත් දන්නා හෙයින් මා විනා මුන්ට අනික් පිහිටෙක් නැත. තනා මැටියෙන් ගොමින් පිරියම් කට නො හැක්කා සේ මුන්ට තුබූ රෝගයට ප්‍රතිකාර නො කොට කෙලෙස් පිළියම් කට නො හැක්ක. සෙසු කරන්නවුන් නැති කල මා වී නමුත් කළ මනා වේ දෑ'යි ගඳ කිළියෙන් නික්ම වෙහෙර ඇවිදිනා සේක් ගිනි හල්ගෙට වැඩ පැන් හුණු කරණ සැළි ය කුස රජ කලත් වළන් සෝධා පුරුදු බැවින් සෝධා පියා, උදුනේ පුරුදු හෙයින් තබා ලා පැන් නභා ලා පැන් හුණු වන තෙක් ගිනි හල් ගෙයි පුක්කුසාති නම් කුල දරුවාණන් නිසා කුඹල් හල වැඩ හුන්නා මෙන් වැඩ සිටි සේක. සිට ලා පැන අත ගාලා පැන් හුණු වූ නියාව දැන තෙරුන් වහන්සේ වැඩ හොත් තෙනට වැඩ හැඳින් ම මැත් කරන්ට හැඳ එක් දිසාවක් අල්වා ගත් සේක.

Non-Commercial Distribution

එ වේලෙහි වහන්දෑ ‘ස්වාමීනි, වැඩ සිටිනා බව ය. අපි අල් වමහ’යි හැඳ පිටින් ම ඔසවා ගෙන ගිනි ගල් ගෙට ගෙනා සේක. බුදුහු හොරුවක් ගෙන්වා ගෙන හුණු පැන් වත් කරවා ලා වහන්දෑ ලවා, පොරෝනා සිවුරු මැ ත් කරවා හුණු පැන් මඩවා වදරා මඳ අවුවෙක රළු ව නො වියළෙන්ට ලවා ලූ සේක. කෙළෙස් කුණට කැත ඇති පමණක් මුත් තෙල සේ වූ කුණට කැතයක් නැති හෙයින් උන් වහන්සේ ළඟ ම වැඩ සිට මතු ඇති වන තැනට දෘෂ්ටානුගතිය නිසා තමන් වහන්සේගේ ශ්‍රී හස්තයෙන් උණු පැන් වත් කොට උළා නැවූ සේක. උන් වහන්සේ ද ආරොග්‍යතාවට පින් නැත ත් ශක්‍ර බ්‍රහ්මාදීන් ගෙන් අත් පා මෙහෙ ලබන බුදුන් ගෙන් අත් පා මෙහෙ ලබන්ට පින් ඇති හෙයින් බුදුන් නාවන නැවීම ලැබී වැඩ හොත් සේක. නාවා පී කලට පොරෝනා සිවුරු වියළිණ. ඒ ගෙනවුත් හඳවා ලා හඳනා සිවුරු හුණු පැණින් සෝධවා අව්වේ ලවා ලූ සේක. නෑ ඇඟ දිය සිඳී ගත් කලට හඳන ය ත් වියළිණ. උන්වහන්සේ ද හඳනයත් වැළඳ ගෙන පොරෝනයත් පෙර ව පූයා කුණු හැරී ශරීරය ත් ලසු ව එකඟ සිතින් හැඳ වැද හොත් සේක.

බුදුහු ඉස් දෙර වැඩ සිට හුණු පැන් නහා ඉක් බිත්තෙන් භොජනානු භවයක් කර වන්නා සේ ‘එම්බල, මහණ, යම් සේ දඬු පතින් ප්‍රයෝජන ඇති මිනිස්සු වලට වැද ලං හැඳ නැති දඬු හැද නැති සැටියේ හා වක් දඬු වක් සැටියේ කපා ගෙණ සිදුරු ඇති තැන් දිරා ගිය තැන් ගැට තැන් කපා එ තැන්හි ම හැර පියද්ද, පසු ව ත් දඬු පත් සොයා ආ කෙණෙක් නිසි දණ්ඩක් පතක් කපා ගෙන යත් මුත් කපා හළ දඬු කැබලි එ මේ හැර නො ගනිද් ද තවත් ඉන් පා අළු ආදියකට ප්‍රයෝජනයෙක් වී නමුත් මේ අත් බැව දෙ තිස් කුණු කොටසින් එක් කොටසකු ත් පා අළු ආදි වූ කිසිවකට ගත නො හැකි බැවින් කපා හළ දඬු කැබැලි ආදිය ත් වඩා නිෂ්ප්‍රයෝජන ද එ හෙයින් මේ ශරීරය ද අරූ දිවිදු නැති වන්නා ම ශ්‍රී යහන්වල හොත ත් දැවීම් ආදි ය පොළොවට ම වන හෙයින් නොබෝ කලකින් ප්‍රයෝජන නැති හෙයින් හළ දඬු කඩක් මෙන් පොළොවට ම පැමිණෙයි.

සියල්ලකට ශරීරය ක්‍ෂම නො වත ත් සිත තරව තුබූ බැවින් මෙ බඳු කුණු අත් බැවු තබාලා තව පඤ්චක පමණක් මුත් වඩා කුණු කොටස් නැති දිව අත් බැව් හා බඹ අත් බැවු ත් නැති ව ම නිසා භව ක්‍ෂයට උත්සාහ කට යුතුය යි වදාළ සේක. මේ දේශනාව

Non-Commercial Distribution

කෙළවර පූතිගත්ත තිස්ස තෙරුන් වහන්සේ සිවු පිළිසිඹියා පත් රහත් ව කෙලෙස් ලෙඩින් ගොඩ නැඟී ආයු ශක්ති ය එ තෙක් ම හෙයින් පිරිනිවන් පෑ සේක. සෙසු ත් බොහෝ දෙන නිවන් දුටුවූ ය. බුදුහු ඔබ ආදහන කරවා පියා ධාතු ගෙන ද ගබක් කරවූ සේක.

වහන්දෑ 'ස්වාමීනි, තෙරුන් වහන්සේ මේ සා දුකකින් පෙළී ශරීර වේදනාව බලවත් වූ හෙයින් චුති සුද්ධිය කෙ සේ ද? කොයි උපන් සේක් දැ'යි විචාළ සේක. බුදුහු පිරිනිවි නියාව වදාළ සේක. රහත් වූ නියාව අසා 'ස්වාමීනි, රහත් වන්ට නිසි මේ තරම් පින් ඇති ව ශරීර ය කුණු වූයේ ත් හැයි ද? ඇට මුළුල්ල බිඳී ගියේ ත් හැයි ද? රහත් වූයේ ත් කෙ සේ දැ'යි විචාළ සේක. 'එම්බා මහණෙනි, මේ මුළුල්ල ම අනික් කෙණකුන් කළ දෙයක් නො වෙයි. මුන් තමන් තමන් ම කළ ලෙස ය'යි වදරා කර්ම ස්වරූප ය අසනු කැමැති වහන්දෑට 'එ සේ වී නම්, මහණෙනි, අසව, මේ තෙමේ කසුප් බුදුන් සමයෙහි පක්ෂීන් බඳ විකුට ජීවත් වන වැදි කුල යෙක ඉපැද මොනර කුකුළු ආදී වූ පක්ෂීන් බඳ ගෙන නො මරා වඩනු නිසා බොහෝ දෙනාට ත් දෙයි. ඉතිරි පක්ෂීන් ඇත් නම් මරා කන්නවුන්ට ත් විකිණෙයි. විකුට ත් ඉතිරි පක්ෂීන් මරා තුබූ කලට කුණු වෙති. පියාසර නො කොට හැකි ලෙසට කකුල් ඇට ආදිය බිඳ තබා ලා විකුණෙයි. ඉතා බොහෝ කොට ලත් නම් තෙමේ ත් පිසවා කයි.

මූ එක් දවසක් මස් රසයක් පිසූ කලට රහත් කෙණෙක් සිඟා ඇවිදිනෝ මුගේ ගෙ දෙරට ගියෝ ය. තෙමේ උන් දැක පැහැද 'අනේ බොහෝ ප්‍රාණ වධ කෙළෙමි. මුන් වහන්සේ මා ගේ ගෙ දෙරට සිඟා වැඩි සේක. ගෙයි මස් රසයකු ත් ඇත. මසවු ළෙන් යුක්ත කොට බතක් දන් දෙමී' ආරාධනා කොට පාත්‍ර ය හැර ගෙන මස් රසයෙන් යුත් බත් පාත්‍රය පිළිගන්වාලා රහත් තෙරුන් පසහ පිහිටුවා වැඳ ගෙන 'ස්වාමීනි, නුඹ වහන්සේ ලත් නිවන් රස මා දුන් මස් රසයෙහි මුඛ්‍ය විපාකයෙන් මට ත් වේව'යි පැතූයේ ය. රහත් මහ තෙරහු ත් ඒ එ සේ ම වේව'යි කීහ. මහණෙනි, එ කල පක්ෂීන් ගේ ඇට බිඳ ලූ ලෙසින් මු ගේ ශරීරය ත් කුණු වි ය. ඇට ත් බුන. රහතුන්ට දුන් බතෙහි අනුසසින් නිවන් රස ලදැ'යි වදාළ සේක.

සත් පුරුෂයන් විසින් සද්ධර්ම රත්නාවලියෙහි ඇවිණි. මේ සදහම් රුවන පමණිනු ත් පින් කම් නමැති බඩු සොයා ගෙන ලොවි ලොවුතුරා සැපත් සිද්ධ කට යුතු.

Non-Commercial Distribution

# 42. නන්දගෝපාල වස්තුව

---

තව ද කළා වූ අකුශලයෙහි අනිෂ්ට විපාක දෙන නියාව හඟවන්ට නන්ද ගෝපාල වස්තුව දක්වා සතුන් අකුසලින් දුරු කරවමු.

කෙ සේ ද යත් :—

සැවැත් නුවර මහා සම්පත් ඇති නන්ද නම් කෙණෙක් මහා සම්පත්තීන් යුක්ත කේණිය නම් දුළුල්ලන් සම්පත් රැක ගන්නා නිසා තවුස් ලෙසින් ඇවිදිනා සේ, තුමූ ත් සම්පතට හානියක් නො වන ලෙසට අනේ පිඩු මහ සිටාණන් ගේ ගෙරි සරක් රකිති. නන්ද ගෝපාලයෝ ය යි ප්‍රසිද්ධ වූ හ. ඌ තුමූ කලින් කලට අනේ පිඩු සිටාණන්ට පස් ගෝ රස ගෙනවුත් දී ලා බුදුනු ත් දැක බණ ත් අසා සිටාණන් ගෙන් ලබන සංග්‍රහ නැත ත් බුදුන් ගෙන් සද්ධර්ම සංග්‍රහ ලැබෙති. සද්ධර්ම සංග්‍රහ ලදින් බුදුන් තමන්ගේ ඔබ වඩනට ආරාධනා ත් කෙරෙති. බුදුහු ත් උන් කිරෙයි මුසුන් ගසා දී වන තෙක් හිඳිනා සේ උන් කෙ සේ ආරාධනා කළත් නුවණ මුහුකුරණ තෙක් නො වැඩ නුවණ මුහු කළ නියාව දැන එක් දවසක් බොහෝ භික්ෂු සඞ්ඝයා වහන්සේ පිරිවරා සැරිසරා වඩනා සේක් මගින් ඉවත් ව උන් පට්ටි කොට වසන තැනට ආසන්නයේ ගසක් මුල වැඩ හුන් සේක. නන්ද ගොපල්ලෝ ත් බුදුන් ළඟට අවුත් වැඳ ගෙන පිළිසඳර කථා ත් කොට ලා ආරාධනා කොට සතියක් මුළුල්ලෙහි මහා ප්‍රවාහයක් මහ වතුරක් මෙන් පස් ගෝ රස ඇතුළු ව මහ දන් දුන්හ. සත් වෙනි දවස බුදුහු අනු මෙවෙනි බණ වදළ සේක.

බණ කථා කෙළවර නන්‍ද ගොපල්ලෝ සෝවාන් ව සියලු ම අකුශලයෙහි අපායගාමී අවස්ථාව නසා බුදුන්ගේ පාත්‍ර ය හැරගෙන පසු ගමන් කොට යන්නෝ නැතක් තැන් ගොසින් කැටි ව යත ත් උන්ට ඒ මරණ නො නවත්නා හෙයින් 'සිටුව, උපාසකයෙනි, බුදුන් වදළ කල්හි වැඳ ලා රඳා පූහ. එක් වැද්දෙක් විද නන්‍ද ගොපල්ලන් මරා පී ය. බුදුන්ට පසු ව යන වහන්දෑ නන්‍ද ගොපල් ලන් මිය හොත්තවුන් දැක බුදුන්ට දන්වන සේක් 'ස්වාමීනි, මුඹ වහන්සේ මොබ වැඩි හෙයින් නන්‍ද ගොපල්ලෝ මහ දන් දී ගමන් පසු කොට අවුත් මර දුන්හ. ඉදින් මුඹ නො වැඩියොත් නො මියන් නෝ වේ දැ'යි ධර්ම ස්වරූපය නො දත් තැන් වදළ සේක.

Non-Commercial Distribution

කර්‍ම නියාම ය බුදුන්ට ම විෂ ය හෙයින් බුදුහු වදාරණ සේක් 'මහණෙනි, මා ආව ත් නො ආව ත් සතර දිගට වුව ත් සතර අනුදිගට වුව ත් ගොසින් මූට ගැළවීමෙක් නැත. සතුරෙක් සතුරකු දක වෙව යි වෛර ඇති එකෙක් තමා කෙරෙහි වෛර ඇති එකකු දක වෙව යි යම් අනර්‍ථයක් අවැඩක් කෙරේ නම් එයින් අනර්‍ථ ය ලබන තැනැත්තේ පූරාකෘත අකුශල කර්‍ම බල යෙන් ලැබෙයි. උන්ගේ කර්‍මය ගෙවෙන පමණක් නො ව අකුශලයෙහි ඇසිරී අනර්‍ථය කරණ තැනැත්තවුගේ ත් අදහස නපුරු හෙයින් දෘෂ්ට ධර්‍ම වේද්‍ය විපාක වශයෙන් මේ ලොව ත් බොහෝ දුකට පැමිණ පරලොව ත් ලක්‍ෂ ගණන් ජාති නසයි. අරුන්ගේ අකුශල කර්‍ම ය ගෙවුණු යි අර මූන්ට අකුශල ය සිද්ධ වීමේ අඩුව නැතැ'යි වදාළ සේක. උන් කළ අකුශල කර්‍ම ය වහන්දෑ නො විචාළ හෙයින් බුදුහු නො වදාළ සේක. මේ දෙශනාවෙනු ත් බොහෝ දෙන නිවන් පුර වන්හ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් සියලු ලෙසින් අකුසලින් දුරු ව කුසල් පුරා චිත්ත සුද්ධි ය කටයුතු.

---

## 43. සොරෙය්‍ය වස්තුව

තව ද සිතින් සිතාපී පමණකිනු ත් අකුශලයෙහි එ තරම් ම නපුරක් ඇති නියාව හඟවනු පිණිස සොරෙය්‍ය වස්තුව දක්වමු.

කෙසේ ද යත්—

ති ලෝ ගුරු බුදුන් සැවැත් නුවර වසන කල දඹදිව සොරෙය්‍ය නම් නුවර සොරෙය්‍ය නම් සිටු පුත්‍රයාණ කෙණෙක් යාළුවාණ කෙණකුන් හා සමග වාහනයකට නැඟී මහ පිරිවරින් ගඟට නාන්ට යන්ට නුවරින් නික්මුණාවූ ය. එ වේලාවට කසයින් මහ තෙරුන් වහන්සේ සොරෙය්‍ය නුවරට සිඟා වඩනා කැමැති ව නුවරින් පිටත සිට ගැටවටු ගන්වන සේක. මහ තෙරුන් වහන්සේගේ ශරීරය ද රූපත් වන පින් බොහෝ කොට කළ හෙයින් රන් කඳක් පරිද්දෙන් ඉතා ශොභමාන. සොරෙය්‍ය නම් සිටුපුත් ඔබ දක 'මුන් වහන්සේගේ ගුණ ශොභාව මට වී නම් යහපතැ යි නො සිතා රාගයෙන් රැදී මුන් වහන්සේ මට පාදපරිචාරිකා වූ සේක් නම් යහපත. නොහොත් මුන් වහන්සේගේ රූප ශොභාව අපගේ සිටු දියණියන්ට සමහ වී නම් යහපතැ'යි සිතන සිතු ත් නපුරු ලෙසින් සිතීම බාල ලක්‍ෂණ හෙයින් තමනු ත් එවකට එහි ඇතුළත් හෙයින් සිතූහ. සිත සිත හා සමග ම

Non-Commercial Distribution

මිය ම උපන් කලක් මෙන් පුරුෂත්ව ය නැති වැ ස්ත්‍රී ව ගියෝ ය. උෟ ලජ්ජා ව වාහනයෙන් බැස පියා පලා ගියෝ ය.

පිරිවර ඇත්තෝ ත් හැඳින ගත නො හී මේ කිම් ද, මේ කිම් ද යි කිවු ය. සොරෙයා නම් සිටු පුත්‍රයෝ ද සසර වියවුල හඟ වන්නාක් මෙන් ගෑනු ව පියා දිසා පාමොක් ආචාරීන්ගෙන් සූප ශාස්ත්‍ර උගන්ට යන කෙණකුන් මෙන් තක්සලා නුවරට යන මඟට නික්මුණාවු ය. කැටි ව ආ යාළු සිටාණෝ ද ඇත මැත බලා ත් නුදුටුවාහු ය. හැම දෙන ම න හා පියා ගෙට නැඟී ගියහ. සිටු පුත්‍රයාණෝ කොයි ද යි විචාළවුන්ට 'නහාපියා අපට පෙරාතු පලා ආව යි සිතා පලා ආම්හ'යි කිවු ය. ඉක්බිත්තෙන් උන්ගේ දෙ මවු පියෝ ත් සොයා නො දැක හඬා පියා වැලප පියා මළ නියා ව නැ යි පින් පෙත් දුන්හ.

සිටු දියණියෝ ත් තක්සලා නුවරට යන සත්වා මුළක් දැක පසු පස්සෙහි යන්ට ගත්හ මිනිස්සු ද දැක අප පසු පස්සේ ත් එව. තොප කාගේ දරු කෙණකුන් බව ත් නො දනුම්හ. මේ කෙසේ වූ ගමනෙක් දැ'යි විචාළෝ ය. මා නොවිචාරා ගැලපදනා බව ය. ගැල පස්සේ මම එමි'යි කියා ලා නැතක් තැන් ගිය කලට පයක් රිදෙන්නේ[1] ඇඟිල්ලේ ලූ මුන්ද දීලා තමන්ට ත් ගැලින් අවසර යක් කරවා ගත්හ. මිනිස්සු ත් සිතන්නෝ තක්සලා නුවර අපගේ සිටු පුත්‍රයාණන්ට අඹුවෝ නැත. උන්ට මුන්ගේ පුවත කියා උන් ගෙන් සංග්‍රහ විඳුම්හ'යි සිතා ගෙන තක්සලා නුවරට ගොසින් සිටු පුත්‍රයාණන්ට 'මුඹට තරම් ගෑනු බාලකෙණකුන් ගෙනාම් හ'යි කිවු ය. උයි ත් ගෙන්වා ගෙන තමන්ගේ අදහස් ලෙසට ම උන් තරම් නියා ව දැක තමන්ට පාදපරිචාරිකා කළහ.

සසර ඉතා දික් හෙයින් පිරිමින් ගෑනු නො වූ විරූ ත් නැත. ගෑනුන් පිරිමි නො වූ විරූ ත් නැත. පිරිමි පරදර කර්මයෙහි හැසිර අවුරුදු ලක්ෂ ගණන් නිරව දුක් ගෙන එයින් මිදී මිනිස් ලොව උප දී ත් නම් ගෑනි ව සියක් වර උපදිති. කප් ලක්ෂයක් පිරූ පැරුම් ඇති අනඳ මහ තෙරුන් වහන්සේ පවා සසර සිටිනා කල බඩාල් කුලයෙක උපන් ගමනේ පරදරයෙහි හැසිර නැතක් කල් නිරා දුක් ගෙන තව ඒ අකුශල ය ගෙවී නො ගිය හෙයින් තුදුස් ජාතියෙක ගෑනි ව උපන් සේක. ජාති සතෙක බීජොද්ධරණ ය ලත් සේක. ගෑනු මිනිස්සු දනාදී පින් කම් කොට ගෑනු වීමෙහි ඇලුම් නැති ව පිරිමි වීම පතා පුරුෂත්වය ලැබෙති. සෙසු පින්කම් නැත ත් පති

1 රිදෙන්නා

Non-Commercial Distribution

ව්‍රතා ව විසීමෙන් මිථ්‍යාචාරය නැති වත් පිරිමි ව උපදීති. සොරෙය්‍ය නම් සිටු පුත්‍රයාණෝ ද කසයින් මහ තෙරුන් වහන්සේ විෂයෙහි නො සිතුව මනා ලෙස සිතා ඒ ම ජාතියෙහි ඔබ්බකට නො ගොස් ගැනු වූ ය.

තක් සලා නුවර සිටාණන් හා සහවාස ය නිසා සොරෙය්‍ය නම් සිටු දුවණියන් බඩ දරු කෙණෙක් ඇති වූ ය. දස මසකින් පුතණු කෙණකුන් වද පියා උන් පියවර ඔසවං ඇවිදිනා අවධියට අනික් පුතණු කෙණකුන් වැදූ ය. මෙ සේ තුමූ ගැනු ව දස මසක් කුසිනු'සුලා දරුවන් දෙන්නකු ලද්ද හ. පිරිමි ව සිටි අවධියේ තමන්ට උපන් දරුවන් දෙන්නෙකැ යි පුත්තු සතර දෙනෙක් වූ ය.

එ කල සොරෙය්‍ය නුවර සිට උන්ගේ යාළු සිටු පුත්‍රයාණෝ ගැල් පන් සියයකින් බඩු ගෙන්වා ගෙන තක් සලා නුවරට ගොසින් යන්ට සැප වාහනයෙකින් නුවරට වන්හ. සොරෙය්‍ය සිටු දියණියෝ ද මතු මාලේ කවුළු දෙර හැරලා වීථිය බල බලා සිටි තැනත්තෝ සිටු පුත්‍රයාණන් හැඳින ගෙන කෙල්ලක යවා කැඳවා ගෙන්වා ගෙන සැඳැල්ලේ හිඳුවා ලා සත්කාර සම්මාන කළහ. සිටු පුත්‍රයාණෝ ද සාද විඳ ගෙන 'සිටු දියණියෙනි, නුඹ අපි පෙර හඳුනන්නෝ නැත. සාද සාම්විය ත් බලවත. කුමක් නිසා දැ'යි විචාළෝ ය. නො හඳුනන්නේ හැයි ද? මම හඳුනමි. නුඹ හිඳිනේ සොරෙය්‍ය නුවර වේ දැ'යි කී වූ ය. එ සේ ය යි සිටු පුත්‍රයාණන් කී කල්හි දෙ මව් පියන් දෙන්නාගේ ද පිරිමි අවධියේ ඇඹෙණියන්ගේ ද දරුවන් දෙන්නාගේ ද සුව දුක් විචාළා හ. සිටු පුත්‍රයාණෝ ද උන් හැම සුව සේ හුන් නියාව කියා ලා හඳුනන්නෝ ඇද්දැ යි විචාළෝ ය.

''එ සේ ය, දනිමී. උන්ගේ එක් පුතණු කෙණෙක් ඇත්තෝ වේ ද, ඌ දූන් කොයි දැ'යි විචාරා 'මා අතින් උන් විචාරන්ට නො කැමැත්තෝ ය. එක් දවසක් උන් හා මා හා වාහනයෙක හිඳ නාන්ට ගොසින් උන් කොහි ගිය බව ත් නුදුටු වම්හ. නො දැක ගොසින් දෙ මවු පියන්ට කිවු ය. උයි ත් සොයා නො දැක හඬා පියා මළ නියා යැ යි සිතා පින් පෙත් දුන්හ'යි කිවු ය. ඒ සිටු දියණියෝ ඒ අසා 'එ සේ වී නම් ඒ සිටු පුත්‍රයාණෝ මම ම ය'යි කිවු ය. 'කුමක් කියවූ ද? මා ගේ යාළුවාණෝ දිව්‍ය කුමාරයක්හු මෙන් පුරුෂයාණ කෙණෙකැ'යි කියා ලා නො ගිවිස් සෝ ය. 'නුඹ කුමක් කියත ත් මම ඌ මැ යි'කිවුය. 'එ සේ කල මේ කුමක් වූ නියා දැ'යි විචාළෝ ය. එ දවස් කසයින් මහ තෙරුන් වහන්සේ දුටුයේ දැ යි විචාරා 'එ සේ ය දිටිමි' කී කල්හි ''එ දවස්

මම ඔබ දක මෙ සා මහත් අකුශලයක් සම්භ ව 'මුන් වහන්සේ හෝ මට අඹු වූ සේක් නම් යහපත. අප ගේ සිටු දියණියන්ට හෝ මේ රූප ශොභාව වී නම් යහපතැ'යි සිතිමි. සැරහී සිටි කෙණකුන් ඇඟට කසළක් දමන්නා සේ කෙළෙස් කසළින් නිකසළ වූ ඒ ස්වාමි දරුවාණන් වහන්සේට එ තරම් කට යුත්තක් සිතා උඩු සුළඟ සිට දමා ලූ දෙයක් තමා ඇඟ වැද ගන්නා සේ මම ම ගැනු වීමි. ලජ්ජා බලවත් ව ගොසින් නුඹ පමණකට ත් කිසිවක් නො කියා පලා ගොසින් මීට නැඟී ආමි'යි කිවු ය. 'කළ දෑ ඉතා නපුර කාට ත් නො කියත ත් මට නො කියන තරමෙක් ද? මිත්‍ර කම් නම් මෙසේ වූ තැනකට නො වේ ද? මහ තෙරුන් වහන්සේ ක්ෂමා කරවා ගන්නා පමණෙක් වී නම් මෙ ලෙසක් නො වන්නේ වේ ද? ක්ෂමා කරවීම වී ද, නො වී දෑ'යි විචාළෝ ය.

ස්වාමීනි, එ සේ වූ යහපත් කට යුතු ත් ඇති නියා ද? එ සේ වූ දෙයෙක් කෙළේ නැත. ඔබගේ පුවතක් දන්නෝ ඇද්දෑ'යි විචාරා මෙ ම නුවර ය යි කී කල්හි 'සිහා වඩනා ගමනෙක මෙ සේ වැඩි සේක් වී නම් දන් දෙන්නමෝ' වේ දෑ'යි කිවු ය. 'එ සේ වී නම් මහ දන් සරහා ලන්නේ. මම ක්ෂමා කරවා ලම්'යි කසයින් මහ තෙරුන් වහන්සේ ළඟට ගොසින් වැඳ ලා එකත් පස් ව හුන්නෝ 'ස්වාමීනි, සෙට ආරාධනා මා ගෙනැ යි කිවු ය. 'තෙපි ආගන්තුකවා දෑ'යි වදළ සේක. 'එ සේ වදරන්නට නො කැමැත්තේ ය. සෙට දවස් දන් මා ගෙන් ම ය' යි කී කල්හි මහ තෙරුන් වහන්සේ ත් ඉවසා වදළ සේක. ගෙයිත් දන් සැරහු ය මහ තෙරුන් වහන්සේ ඒ ගෙට සිහා වැඩී සේක. ඉක්-බිත්තෙන් වඩා හිඳුවා ලා වළඳා අන්තයෙහි සිටු පුත්‍රයාණෝ සිටු දුවණියන් කැඳවා ගෙණ ගොසින් මහ තෙරුන් වහන්සේ වැඳ හොවා ලා 'ස්වාමීනි, මුන් කළ වැරැද්දකට ක්ෂමා කොට වදරන්නේ යහපතැ'යි කිවු ය. 'කුමක් දෑ'යි විචාළ කල්හි ආද්‍යන්ත මුළුල්ල ම සැල කළෝ ය. 'එ සේ වී නම් නැඟී සිටුව. ක්ෂමා කෙරෙමී' වදළ සේක.

මහ තෙරුන් වහන්සේ ක්ෂමා කෙළෙමි යි වදරන්නා ම ස්ත්‍රීත්වය නැති ව පිරිමි ව ගිය හ. පුරුෂත්වය පහළ වන්නා ම තක්සලා නුවර සිටාණෝ 'සබඳ, මේ දරුවන් දෙන්නා තොප කුසින් උපන් හෙයිනු ත් මට ද හෙයිනු ත් අප දෙ පක්‍ෂයට ම භාරයෝ ය. එක් ව ම වසම හ'යි කිවු ය. ඒ අසා සොරෙයා නම් සිටු පුත්‍රයාණෝ 'සබඳ, කුමක් කියවු ද? මම මේ එක ජාතියෙහි

Non-Commercial Distribution

පළමු සිටු පුත්‍ර ව, දෙවෙනි ව සිටු දූ ව, තුන් වැනි ව සිටු පුත්‍ර වීමි, තව ත් රඳා හිඳ සිටු දූ වන්ට ද? පෙර මා නිසා මට ද වූ දරු දෙන්නෙක. දැන් නුඹ නිසා මාගේ කුසින් වැදූ දෙන්නෙක. එක ජාතියෙක මේ තරමක් වන්නා තබා වෙති යන්නකු ත් නො දැන දැන් වූ කලී ගිහි ගෙයි නො රඳන්ට මෙ විතරකු ත් මඳ නියා ද? මා මේ හීන තරමින් උත්තර තරමෙහි තබා ලූ උත්තමයාණන් වහන්සේ ළඟ මහණ ව යම් තරමෙක් හැමට ම වැඩි සිටි නම් එ සේ වූ තරමු ත් ලබනු නිසා මහණ වෙමි. මේ දරුවන් දෙන්න නුඹට බාරයෝ ය. උන් රැක්ක මැනැවැ'යි කියා ලා දරුවන් දෙන්නා සතා පියා පියාණන්ට ම පාවා දී ලා නික්ම මහ තෙරුන් වහන්සේ ළඟ මහණ වූ ය.

මහ තෙරුන් වහන්සේ ද මහණ ත් මහලු පැවිදි ත් කොට ලා කැටි ව හැර හෙන සැරිසරා වඩනා සේක් සැවැත් නුවරට වැඩි සේක. උන් වහන්සේ ත් ආදි සොරෙය්‍ය සිටාණෝ ය යි ප්‍රසිඬ ව පසු ව සිටු දූවණියෝ ය යි ප්‍රසිඬ ව පසු ව සිටාණෝ ය යි ප්‍රසිඬ නො ව සොරෙය්‍ය තෙරුන් වහන්සේ ය යි ප්‍රසිඬ වූ සේක. දනවූ වැස්සෝ ද මෙ පවත් අසා විස්ම ව අවුත් මෙ සේ වූ පවතෙක් ඇසිණ. ඒ එ සේ ම දැ'යි විචාරා එ සේ ම ය යි වදාළ කල්හි 'මෙ සේ ත් වන නියා වේ ද? නුඹ වහන්සේ එක නොබෝ කල කින් කැටි ව පුත්තු සතර දෙනෙක් ඇත්තෝ වෙත්ද? ඉන් කවු රුන් කෙරෙහි ප්‍රේම බලවත් දැ'යි විචාරති. 'ගැනි අවස්ථාවෙහි කුසින් උපන් දරුවන් දෙන්නා කෙරෙහි පෙම් බලවතැ'යි වදරන සේක. ආ ආ යම් කෙණෙක් ම එම විචාරන්ට තබා ගත්හ. තෙරුන් වහන්සේ ද එක්වන් ව ම වදරා ලජ්ජා ව ගොසින් පසු ව කථාවට නො ලැබී විවේක වාසයට පැමිණ විවසුන් වඩා පිළි-සිඹියා සතර ත් මාර්ග සතරත් ඵල සතර ත් නො බෝ කලකින් ලැබ රහත් වූ සේක.

රහත් වූ පසු ත් ආ ආ කෙණෙක් පුතුන් සතර දෙනා ගෙන් ප්‍රේම ය මහත් කවුරුන්ට දැ'යි විචාරති. එ සේ විචාළවුන්ට 'මා කවුරුන්ට ත් ප්‍රේම නැතැ'යි වදරන සේක. වහන්දෑ ද ඒ අසා 'මූ මෙ තෙක් දවස් තමන්ගේ කුසින් උපන් දරුවන්ට පෙම් මහ තැ' කියා ලා දැන් රහත් නියාව ත් හඟවන්ට දෝ කවුරුන්ට ත් ප්‍රේම නැතැ' යි කියති'යි බුදුන්ට දැන් වූ සේක. බුදුහු ඒ අසා 'මහණෙනි, ම පුත්තු එ බන්දක් කියන්නෝ නොවෙති. රහත් වූ තැන් පටන් කිසි කෙණකුන් කෙරෙහි ත් ප්‍රේමයක් නැත. අකුශල විෂයට නො හැර කුශල විෂයෙහි යොද යහපත් කොට ගත්තා වූ

Non-Commercial Distribution

සිත යම් ස්නෙහයක් කොට ලා නම් ඒ ස්නෙහය දෙ මවු පිය නැදි මයිල් බෑබුන් ආදීන් අතුරෙන් කිසි ද කෙණෙක් කොට ලිය නො හෙති. එ සේ හෙයින් කවර ලෙසකිනු ත් පන ත් කොට සකස් කළ මනා නම් තමාගේ සිත ම ය.

දෙ මවු පියෝ දරුවන්ට සම්පත් දෙත් නම් එක ජාතියක රැක ගන්නා තරමට මුත් වඩා දී ලිය නොහෙති. විසාඛාවන්ගේ දෙ මවු පියෝ පවා එ තෙක් ම සම්පත් ඇති ව එක ජාතියෙක රැකෙනා පමණට මුත් වඩා දී ලිය නුහුණු වූ ය. දරුවන්ට සක්විති සැපත් දී ලිය හෙන දෙ මවු පියෝ නැත. දිව සැපත් කැල ම දී ලිය නො හෙති. දන් සඤවත් ආදී වූ ලෞකික ගුණ යක් වේව'යි මාගී ඵලා දී වූ ලොවුතුරා ගුණයක් වේව යි දී ලිය නො හෙත් ම ය. පිරිසුදු කළා වූ මෙකී සිත සියල්ල ම දී ල'යි වදළ සේක. මේ දෙශනා කෙළවර ත් බොහෝ දෙන සෝවාන් ඵලාදියට පැමිණිය හ.

එ හෙයින් සත් පුරුෂයන් විසින් යම් උත්සාහයකිනු ත් සිත ම පනත් කොට ගෙන නිවන් පුර වැද සැතහෙන්ට උත්සාහ කට යුතු.

## 44. පෘථිවි සන්නිශ්‍රිත කථාකරණ

## භික්ෂූන්වහන්සේ ගේ වස්තුව

තව ද සප්‍රයෝජන වූ සවගී මොක්‍ෂ බාධක නො වන කථා මුත් බාහ්‍ය කථාවෙන් කිසි ත් ප්‍රයෝජනයක් නැති නියාව හඟවන්ට පෘථිවි සන්නිශ්‍රිත කථා කරණ භික්‍ෂූන් වහන්සේ ගේ වස්තුව දක්වමු.

ඒ කෙසේ ද යත්—

බුදුන් හා සමඟ දනවු සැරිසරා ගිය පන් සියයක් දෙනා වහන්සේ සැවැත් නුවර දෙවුරමට අවුත් සවස් වේලෙහි සන්නි පාත ශාලාවෙහි හිඳ 'මේ පොළොව නම් පස් පොළොව ය, දිය පොළොව ය, වා පොළොව යි තුනෙක. ඒ පොළොවල දිග සඞ්ඛ්‍යාවක් නියමයක් නැතිහෙයින්මනැතත්පස්පොළොවබොළ-

"ද්වෙ සතසහස්සානි—චත්තාරි නහුතානි ච,
එත්තකං බහලත්තෙන—සඞ්ඛාතායං වසුන්ධරා"

යනු හෙයින් යොදුන් ගණනින් දෙ ලක්‍ෂ හතළිස් දහසක් යොදුන. ගවු ගණනින් නව ලක්‍ෂ සැට දහසක් ගවු ය. දිය පොළො

Non-Commercial Distribution

වෙහි ගැඹුර යොදුන් ගණනින් සාර ලක්‍ෂ අසූ දහසක් යොදුන. ගවු ගණනින් දහ නව ලක්‍ෂ විසි දහසක් ගවු ය. වා පොළොවෙහි ඝන ය යොදුන් නව ලක්‍ෂ විසි සැට දහසක් යොදුන. ගවු ගණනින් අට තිස් ලක්‍ෂ සතළිස් දහසක් ගවු ය. බුදු නුවණින් දැන.වදළ හෙයින් මුත් කවුරුන්ට මේ දැන ගැන්ම පිළිවන් දැ'යි යන මේ කථාව තබා පියා තමන් වහන්සේ ගිය ගිය තෙන 'අසවල් ගමට යන්නා වූ මඟ සෙල් බැවින් නැති බැවින් සැප ය. අසවල් තෙන සෙල් ඇත. අසවල් තෙන මඩ බොර දැඩි ය. අසවල් තෙන බොරලු බොහෝ ය. අසවල් තෙන බිම මැටි කළු ය. අසවල් තෙන තඹ වනැ'යි මෙ සේ වූ කථාවක් කරණ සේක.

බුදුහු වැඩ විචාරා වදරා කරමින් හුන් කථාවේ ලෙස දැන් වූ කල්හි 'එම්බා මහණෙනි, තෙල පොළොව ගොයම් කිරීම ආදී වූ බාහ්‍ය කාරියට ආධාර වත් මුත් විවසුන් සී සා මාර්‍ග නමැති බිජුවට වපුට ඵල සමවත නමැති බත් කොට ගන්ට ආධාර නො වෙයි. තොප විසින් සිත් සතන් නමැති පොළොව පිළිබඳ දෙයක් ම කිය යුතු ය'යි වදරා ඒ වහන්දැ තදනුරූප වූ කථාවෙන් විචාරන්ට අසමර්‍ථ හෙයින් තමන් වහන්සේ ම 'කවර කෙණෙක් මේ අත් බැව් නමැති පොළොව තමන්ගේ නුවණින් දනිද්ද, දෙව් ලොව මිනිස් ලොව හා සමග මේ සතර අපාය කවුරු දනිද්ද, මල් කැඩීමෙහි දක්‍ෂ මාලා කාරයකු ගොතන්ට නිසි මල් හැඳින නෙළා ගන්නා සේ සත් තිස් බොධ පාක්ෂික ධර්‍ම ය කවර කෙණෙක් දනිද්දැ'යි වහන්දැ විචාරණ ලෙසින් තමන් වහන්සේ විචාරා විභාග කොට වදරන සේක්– 'අරි පුහුලන් අට දෙනා ගෙන් අට වැනි තැනත්තන් ත්‍රිවිධ ශික්‍ෂාවෙහි හික්ම නිමා සිටි හෙයින් උන් හැර අනික් සත් දෙන මේ අත් බැව් නමැති පොළොව රහත් මගින් එහි ඇලුම් හරණාහු අනුන්ට දෙන දෙයක් ගැන නියම දැන දෙන්නා සේ හරණාවුනු ත් තත්‍ව ය දැන හරනා හෙයින් දනිති. සියලු ම ආයර්‍යයන් අපාය භූමි-අසඥ්ඥ භූමියෙහි නූපදනා හෙයිනු ත් රහතන්ගේ සෙසු භූමිවල ත් උත්පත්ති නැති හෙයිනු ත් දෙව්ලොව මිනිස් ලොව සහිත වූ සතර අපාය ක්‍රම ක්‍රමයෙන් භව නිකාන්තිය හැර ගෙන ගොසින් රහත් මඟ දී සියලු ලෙසින් හරණ හෙයින් එයි ත් ඔහු ම දනිති.

මල් ගෙතීමේ දක්‍ෂ මල් කරුවා මල් වත්තට ගොසින් ලා ලා කැකුළු ත් පණුවන් කෑවා ත් පර මලු ත් හැකිළීමෙන් ගොතන්ට

Non-Commercial Distribution

බැරි වූවා ත් හැර යහපත් මල් ම තෝරා කඩා ගන්නා සේ ශෛක්ෂයෝ සත් දෙන ම බොධි පාක්ෂික ධර්මයෙන් සත් තිස් දෙනා නො එක් ලෙසින් විභාග වත් කොට තමන්ගේ නුවණින් දනිති. එ හෙයින් තෙපි හැම ත් මේ හැම දනු නම් ශෛක්ෂ වන්ට උත්සාහ කරව. මේ පොළෝ කථාවෙන් ප්‍රයෝජන නැතැ'යි වදළ සේක. මේ දෙශනා කෙළවර පන් සියයක් දෙනා වහන්සේ පොළෝ පිළිබඳ කථාව තබා බිම ත් උඩ ත් උත්පත්ති නැති ව සිවුපිළිසිඹියා පත් රහත් වූ සේක.

එ සේ හෙයින් සත් පුරුෂයන් විසින් නිෂ්ප්‍රයොජන කථා නම් හස්සාරාමතාවෙහි ඇතුළත් බැවින් හැර අල්පෙච්ඡතාදී වූ සප්‍රයෝජන කථාවෙන් යුක්ත ව සුචරිත පුරා භව ක්ෂයට උත්සාහ කටයුතු.

## 45. මිරිඟු කමටහන් කළ භික්ෂූන් වහන්සේ ගේ වස්තුව

තව ද පින් කිරිය වත සැබවින් දන ශීල භාවනා තුන ඇතුළත් හෙයිනු ත් දන් දීත්, සිල් රක්ෂාකොට ත්, ති ලකුණු පමණ වුව ත් භාවනායෙකින් මුත් මාර්ගාධිගම ඵලාධිගම ය නො වන හෙයින් භාවනාමය කුශල ම අත්‍යන්තොපකාරී නියාව හඟවනු පිණිස මිරිඟු කමටහන් කළ භික්ෂූන් වහන්සේගේ වස්තුව දක්වමු.

ඒ කෙසේ ද යත්—

භව ක්ෂය කිරීමෙහි බලවත් රුචි ඇති එක් තරා භික්ෂු කෙණකුන් වහන්සේ බුදුන් ගෙන් කමටහන් ඉගෙන ගෙන 'මහණ ධම් කෙරෙමි' කියා මහ වලට ගොසින් බොහෝ වූ උත්සාහ-යෙනු ත් රහත් විය නො හී 'බුදුන් වදළ ලෙසින් අඩුවක් ඇති නියා ය'යි නිර්ජට කොට නිරාකුල කොට පෙරළා ත් කමටහන් කියවා ගනිමි' යි බුදුන් ළඟට වඩනා සේක් අතුරු මහදී මහ අවුවේ පෙනෙන මිරිඟු දැක 'යම් සේ මේ ගිම් අවධියේ පෙනෙන මිරිඟු දුර සිටිය වුන්ට සැලෙන්නා සේ පෙනේ ද, මුවන්ට පැන් පරිද්දෙන් වැටහේ ද, ළඟට එ ත් එ ත් නො පෙනේ ද එ පරිද්දෙන් මේ අත් බැව ත් ඉප දීමෙන් හා උපන්නා සේ ම නස්නා හෙයින් මේ මිරිඟු සේ ම ය යි ද දුර සිටිය වුන්ට පෙනෙන ලෙස ඉපදීම හා ළඟට ගිය කලට නො පෙනෙන නියාව නස්නා සැටියට සිතා ගෙන භාවනා කොට කොට එන සේක් ගමන් විඩා ව අචිරවතී ගඟට බැස නහා පියා

Non-Commercial Distribution

හැළි බඩෙක රුප්පායෙක හුන් සේක් මහත් පෙණ පිඬු නැගි නැගී බිඳෙන්නා දැක මේ අත්බැව ත් ඉපැද ලා නැති වීමෙන් මෙවැනි ය යි සිතා ගත් සේක.

බුදුහු ගඳ කිළියේ වැඩ හුන් සේක් ම සතර ගවුවෙක තිබූ දෙය ම'සැසට පෙනෙන හෙයින් ගහක් බඩ වැඩ හුන් තෙරුන් වහන්සේ දැක 'මහණ, ඒ එ සේ ම ය. නුවණින් සලකන්න වුත්ට මේ අත් බැව අතිදුර්වල ලෙසින් පෙණ පිඩක් හා සරි ය. ඇති ව නැති වන හෙයින් මිරිඟු හාත් සරිය'යි වදරා, යම් කෙණෙක් මෙ ලෙස දත්තු නම් තදනුරූප වූ පිළිවෙතින් රහත් බැව්හි පිහිටා නිරුපධිශෙෂ නිර්වාණ ධාතුයෙන් පිරිනිවන් පාතී වදළ සේක. දේශනා කෙළවර මිරිඟු ත් දැක පෙණ පිඬු ත් දැක භාවනා කෙරෙමින් හුන් තෙරුන් වහන්සේට කැඩ පත නිර්මල කලට රූප ගාත්‍රය ත් ප්‍රසන්න ව පෙනෙන්නා සේ භාවනා ව ත් විහූත ව ලා ති ලකුණු ත් සකස් ව වැටහී සිවු පිළිසිඹියා පත් රහත් ව සටන ජය ගත් යොධයාණ කෙණකුන් කුළ දස් කම රජ්ජුරුවන්ට කියන්ට යන කලක් මෙන් සිවුරහ සෙනඟිනු ත් ජය ගත නො හැකි කෙලෙස් සතුරන් තනි ව ජය ගත් හෙයින් බුදුන් කරා ගොසින් වැද තමන් වහන්සේගේ ජයලත් නියාව ත්, තමන් වහන්සේට පටහැණි වූ කෙලෙස් සතුරන් අර්හත් මාර්ග ඥාන නමැති කඩුවෙන් පොලූ ගැසූ නියාවත්, බුදුන්ට හැඟවූ සේක.

සාධු ජනයන් විසින් තිලකුණු පමණ වූ ත් භාවනාමය පින් කම හැසිර අවශ්‍යයෙන් භව ක්ෂයට උත්සාහ කට යුතු.

# 46. විඩූඩභ වස්තුව

තව ද යුගාන්ත කාලයෙහි සත් හිර පහළ ව හැම මූදු නැති කළා සේ බුදු හමු නමැති යුගාන්තයෙහි නව ලොවුතුරා දහම් නමැති නව හිර පහළ ව මහ ගඟු ත් සසර මුහුද ත් වියැළීයෙත් මුත් යම් තාක් කෙලෙස් මහ ගං ඇත නම් සසර මුහුද නුසුන් නම් කළ කුශලයෙහි ඉෂ්ට විපාකය ත් අකුශලයෙහි අනිෂ්ට විපාකය ත් නො සිඳී පවත්ති. ඉන් අකුශලයෙහි අනිෂ්ට විපාක ය නො නවත්නා නියාවට විඩූඩභ වස්තුව ගෙන හැර දක්වා සතුන් අකුශලින් මුදමු.

ඒ කෙ සේ ද යත්:—

සැවත් නුවර මහ කොසොල් රජ්ජුරුවන් ගේ පුත් වූ පසේනදී කුමාරයන් හා විසල් මහ නුවර මහාලී නම් ලිච්ඡවි කුමාරයන් හා

Non-Commercial Distribution

කුසිනාරා නුවර රජ්ජුරුකෙණකුන්ගේ පුත් වූ බන්ධුල කුමාරයන් හා, තුන් දෙන දිසා පාමොක් ආචාරීන් ගෙන් ශිල්ප උගන්නා පිණිස තමන්ගේ නුවර ශිල්ප උගන්වා ලිය හෙන්නවුන් ඇත ත් දෙශකීර්ති දන්නා පිණිස ත් තමන්ගේ ශරීරක්‍ෂම කරණු නිසා ත් තක්සලා නුවරට ගොසින් නුවරින් පිටත් ව තිබෙන ශාලාවකට සම්භව ඔවු නොවුන්ගේ නැයන් සියනු ත් රට බිමු ත් ජාති ගොත්‍ර ත් ආ කාරණ ත් විචාරා තුන් පක්‍ෂය ම රජ නියාව දන මිත්‍ර ව එක් ව ම ආචාරීන් කරා ගොසින් ගිය නොබෝ කලකින්ම පින් පමණ නුවණ ඇති බැවින් ශිල්ප ඉගෙන නිමවා ගෙන ආචාරීන්ට කියා ලා තේරෙන තැන් දක්වා එක් ව ගොසින් තමන් තමන්ගේ නුවර වලට ගියහ. ඉන් පසේනදී කුමාරයෝ තමන් උගත් ශිල්ප පියාණන්ට දක්වා පහන් පිය රජ්ජුරුවන් ගෙන් රාජ්‍ය සම්පත් ලදහ. මහාලී කුමාරයෝ විසල් මහ නුවර ලිච්ඡවි රජුන්ට ශිල්ප දක්වන්නෝ මහත් වූ උත්සාහයෙන් දක් වූහ. ආයාස ය නිසා උන්ගේ ඇස් දෙක ම නටහ. ලිච්ඡවි රජ්ජුරුවෝ ද 'උන් ඇස් නැත ත් නුවණැස් ඇති හෙයින් අත් නො හරුම්හ, රකුම්හ'යි සිතා ගෙන සුංගම් රනින් ම ලක්ෂයක් නිමන වාසලක් දුන්හ. උයි ත් ඒ වස්තුව නිසා ජීවත් වන්නෝ පන් සියයක් ලිච්ඡවි කුමාරවරුන් ශිල්ප උගන්වති.

බන්ධුල කුමාරයෝ ද එකි එකී මිටියට හුණු දඬු සැටක් සැටක් ගෙණ හුණු දඬු මද්ධ්‍යයෙහි ය නාරාව ලා හුණු දඬු සැට මිටියක් සිටුවා ලා මල්ල රජ දරුවන් 'තෙපි කඩු සරම උගත්තෝ නම් තෙල හුණු දඬු සැට මිටි ය පොලු ගසා වගුරුවා පු කල ය'යි කී කල්හි කඩුව අත ලා ගෙන අහසින් අසූ රියනකට පැන පියා බිමට බැස කඩුවෙන් හුණ දඬු මිටි පොලු ගසා ගෙන යන්ට වන්හ. කෙළවර මිටියෙහි දී කඩුව ය නාරාවයේ වැද ගත් හඩ අසා මේ කිම ද යි විචාරා හුණු දඬු සැට මිටියේ හුණ දණ්ඩක් පාසා ය නාරා-ව ලූ නියාව අසා කඩුව දමා පියා මුසුප්පුව ගෙන 'මාගේ මෙ තෙක් නැයන් සියන් අතුරෙහි එක ද කෙණකුන් මට හිත ව මෙ පවත් කියාලුවෝ නැත. ඉදින් මම දනිම් නම් ය නාරාව ය නොහඬවා ම ගසා පියම්. මුන් හැම දෙන ම මා මරා රාජ්ජ්‍යය කරණ නියා වේ ද'යි දෙ මවු පියන්ට කිවු ය. උඹ ඒ අසා අදහස දන 'පරම්පරා-වෙන් පැවත ආ රාජ්ජ්‍යය එ සේ හැරගන්ට බැරිය'යි කිවු ය. උන් කෙ සේ කීව ත් කුසිනාරා නුවර රඳන්ට මැළි හෙයින් එ සේ වී නම් තොපට මිත්‍ර ව හිඳිනා කොසොල් රජ්ජුරුවන් ළඟට යව'යි කී කල්හි සැවත් නුවරට ගිය හ. පසේනදී රජ්ජුරුවෝ ද බන්ධුලමල්ල කුමාරයන් එන නියාව අසා පෙර

ගමන් කොට ගොසින් මහ පෙරහරින් නුවරට ගෙන ගොසින් සෙනෙවිරත් තනතුරු දෙවා සංග්‍රහ කළහ. බන්ධුලමල්ල සෙනෙවි රද්දූ තුමූ තරව පිහිටා ගෙන දෙ මවු පියනු ත් කුසිනාරා නුවර රැඳීමෙන් වන උවදුරෙක් ඇත් නමු ත් ඒ නිසා ගෙන්වා ගෙන සැවත් නුවර ම රැඳ වූ ය.

එක් දවසක් කොසොල් රජ්ජුරුවෝ මාලිගාවේ මතු මාලේ සිටි තෙනැත්තෝ වීථි ය බලා අනේ පිඩු සිටාණන්ගේ ගෙට ද සුළු අනේ පිඩු සිටාණන්ගේ ගෙට ද, විශාඛාවන් හා සුප්පියා වන්ගේ ගෙට ද, නොයෙක් දහස් ගණන් වහන්දෑ වඩනා දැක 'මේ වහන්දෑ කොයි වඩනා සේක් දැ'යි' විචාරා 'රජ්ජුරුවන් වහන්ස! අනේ පිඩු මහ සිටාණන්ගේ ගෙට ත් නිති බත්, ගිලන් බත් නිසා සඟ දෙදසෙක් වඩනා සේක. සුළු අනේ පිඩු සිටාණන්ගේ ගෙට ත් සඟ පන් සියයක් වඩනා සේක. විශාඛාවන්ගේ ගෙට ත් සුප්පියාවන්ගේ ගෙට ත් එ සේ ම සඟ පන් සියයක් වඩනා සේක. උන් හැම බලවත් ම සැදැහැ ඇති හෙයින් නිබඳ වඩනා නියා ය'යි කි වූ ය. රජ්ජුරුවෝ ත් ඒ අසා තුමූ ත් වහන්දෑට උපස්ථානයක් කරනු කැමැති ව වෙහෙරට අවු ත් බුදු පාමොක් සඟ දහසකට ආරාධනා කොට සතියක් මුළුල්ලෙහි දන් දී සත් වන දවස් වැඳ ලා නිත්‍ය පරිවාර සඟ පන් සියය හා සමඟ බුදුන් රජ ගෙයි නිරන්තර ව සිඟන්ට ආරාධනා කළහ.

බුදුහු වදරණ සේක් 'මහරජ, බුදුවරු එක් තෙනකින් ම නිබඳ නො වළඳන්නාහ'යි වදළ සේක. 'එ සේ වී නම් සඟ පන්-සියය හැර ගෙන අසූ මහ සවුවන් වහන්සේ ගෙන් එක් කෙණකුන් වහන්සේ නිරන්තර ව වඩනා ලෙස විධාන කොට වදළ යහපතැ'යි කිවූ ය. බුදුහු අනද මහ තෙරුන් වහන්සේට භාර කළ සේක. රජ්ජුරුවෝ ද 'මුන් වහන්දෑ වළඳවා ලුව මැනවැ'යි එක් කෙණ-කුන්ට භාර නො කොට සතියක් මුළුල්ලෙහි තුමූ ම සිට දන් වළඳවා ලා අට වැනි දවස් විධාන කළ මනා රාජ කාරිය ඇති බැවින් ජමා වූ ය. රජ ගෙවල ත් රාජ විධානයක් ඇති ව මුත් තමන් ම සිතා ගෙන හිඳිනා අසුන් පනවා වඩා හිඳුවා වළඳවන කෙණකුන් නැති හෙයින් වහන්දෑ රැක සිට වෙහෙසී පියා බොහෝ තැන් වැඩපී සේක. රජ්ජුරුවෝ දෙ වන දවසු ත් එන තෙනැත්තෝ කල් යවා පිහ. දෙවන දවසු ත් ඊයේ දවස් රැඳුණු වහන්දෑ ගෙන් බොහෝ වහන්දෑ වැඩපී සේක. තුන් වන දවසු ත් කල් යවා පිහ. එ දවස් අනද මහ තෙරුන්.. වහන්සේ පමණ සිටියදී සෙසු වහන්දෑ වැඩපී සේක.

Non-Commercial Distribution

මහ පිනැති තැන් නම් පින් බරින් බර හෙයින් ලඝු නො වන සේක. කාරණ සිතිය හෙන සේක. ශීල සංරක්ෂණය සේ ම උපාසක කුලයාගේ අදහසු ත් රක්නා සේක. අපගේ බුදුන්ට ත් සැරියුත් - මුගලන් දෙ අගසවුවන් වහන්සේ හා මෙහෙණි සස්නෙහි අග්‍රශ්‍රාවිකා දෙ නම හා උපාසකවරුන් අතුරෙහි චිත්ත නම් සිටාණන් හා හත්‍ථාලවකයන් හා උපාසිකාවරුන් අතුරෙහි වෙළු කණ්ඩකී නන්‍ද මාතාවන් හා ඛුජ්ජුත්තරාවෝ ය යි මේ අව පක්ෂය පටන් ඒ ඒ තනතුරට පැමිණි සියලු ම සවුවන් වහන්සේ දස පැරුමෙන් සම්භරක් වුව ත් පිරූ හෙයින් මහ පිණැති සේක. අනඳ මහ තෙරුන් වහන්සේ ත් ඊට ම ඇතුළත් හෙයින් මහ පිණැති සේක. කාරණ සලකා උදක ප්‍රසාද මාණික්‍යයක් මෙන් රජ්ජුරුවන්ට උපන් ප්‍රසාදය අඩු නො වන නිසා වහන්දෑ හැම යෙත ත් තමන් වහන්සේ පමණක් රඳාපී සේක. ඔබ පමණක් වඩා හිඳුවා වැළඳ වූ ය.

රජ්ජුරුවෝ වහන්දෑ වැඩපී කලට අවුත් 'සඟ පන් සියයට සපයාලූ දන් එක නමක් වැළඳූ පමණෙකින් අඩුවක් නැති ව තුබුවා දැක 'වහන්දෑ අද නො වැඩි නියා දෑ'යි විචාරා අනඳ මහ තෙරුන් වහන්සේ පමණක් වැඩි නියාව අසා සෙසු වහන්දෑ ආරාධනාව ඉවසා ලා නො වැඩි නියාවට මුසුප්පුව බුදුන් ළඟට ගොසින් 'ස්වාමීනි, මම සඟ පන් සියයකට දන් ඉදි කරවා ලීමි. ඉදි කළ දන් වළඳන්නට එක අනඳ මහ තෙරුන් වහන්සේ පමණක් වැඩි සේක. රජ ව සිටි මා කළ ආරාධනාවට මා ගෙන් අඩුවක් නො දැක මෙ ලෙස කරන්ට කාරණ කවරේ දෑ'යි කිවූ ය.

බුදුහු වහන්දෑගේ වරද නැති හෙයින් ම වරද නො වදරා රජ්ජුරුවන්ගේ වරද කථා ලෙශයකින් වදරණ සේක් "මහ රජ, මාගේ සවුවන් තොප හා පුරුදු කමෙක් නැත. එ සේ හෙයින් නො ගිය නියාවනැ යි වදරා වහන්දෑ බණවා ලා, කුලවලට එළඹෙන්ට කාරණා ත් නො එළඹෙන්ට කාරණා ත් වදරණ සේක්: මහණෙනි, යම් කුලයකට එළඹි කල දැක ඉඳුරා නැඟී නො සිටිද්ද, ලා හෙළා කරණ ලෙස මුත් ඉඳුරා වැද නො ගනිද්ද, ඉදිනා අසුන් පමණකුත් පනවා නො දෙද්ද, විද්‍යමාන වූ දෙය ධර්‍මය ත් දෙන්ට මැළි ව නො එක් දුප්පත්කම් කියා හඟවද්ද, බොහෝ ව ඇත ත් සිත කුඩා හෙයින් මඳක් දෙද්ද, මිහිරි දෙය තෝරා තබා ගෙන තමන්ට ත් ප්‍රයෝජන නැති නපුරු දෙයෙක් දෙද්ද, දෙන දෙය ත් නිහරසර ව දමන දෙයක් මෙන් දෙද්ද, අනුමෙවෙනි අසන්ට නො රඳද්ද, රඳාපු නමුත් නැති යම් කථාවක්

Non-Commercial Distribution

ලා ගෙන හෝ කෙළියක සිනාවෙක ඇවිස පියා හෝ අනිකුත් යම් යම් ලෙසකින් ඉඳුරා අසා නො ගනිද්ද, එ සේ වූවන්ගේ කුලයට ආදී නො එළඹුනො ත් එළඹෙන්ටත් තරම් නො වෙයි. නො සලකා එළඹුනො ත් හිඳින්න ත් තරම් නො වෙයි. එළඹෙන් ට ත් එළඹ හිඳිනට ත් තරම් කුල කවරේ ද? යත්:

දූක අනාදර හයින් වහා නැඟී සිටිද්ද, පෙමු ත් ආදරය ත් උපයා වැද ගනිද්ද, හිඳිනා නියායෙන් හසුන් පනවා දෙද් ද, ඇති ව තුබූ දෙය ත් ආදි එළියේ තුබුවා කොල්ල හයින් සඟවන්නා සේ සඟවා නො තබද්ද, බොහෝ ව තමන්ට ඇත් නම් අදහස් මහත් බැවින් අදහස් ලෙස ම බොහෝ කොට දෙද්ද, මිහිරි දෙය මිහිරි කොට දෙද්ද, දෙන දෙය ත් කම් එල අදහා සකස් කොට දෙත් මුත් නිහරසර ලෙසින් නො දෙද් ද, අධිගතය ත් නව ලොවුතුරා දහම්හි රුචි ඇත්තා සේ බණ ඇසීමෙහි රුචි ඇත්තෝ ද, ඇසූ දෙය ත් ගල කොටා පූ අකුරු මෙන් සිත තබ ත් ද, එ සේ වූ කුලවලට ආදි නො ගිය විරු වුව ත් එළඹෙන්වත් තරම හැසිල්ලක් වුව ත් හිඳිනට ත් තරම'යි වදරා 'මහ රජ, මාගේ සවුවනු ත් තොපගේ එ බඳු තරමක් නැති හෙයින් නොගිය නියා ය'යි වදරා නිකම් කියා ලුව යි නො ගිවිස්සවුන්ට කාරණා කියා ගිවිස්නා සේ අතීත කථාවක් එළවා ගිවිස්වනු පිණිස 'එම්බල මහ රජ, පෙර නුවණැත්තෝ පුරුදු කමක් නැති තෙන කරණ උපස්ථානය කවර තරමෙක බලවත් වුව ත් මරණාසන්න තරම් ලෙඩ ඇති ව පුරුද්දවුන් ඇති තෙනට ම ගියෝ වේ ද'යි වදරා එ පමණෙක ම නො රඳා 'ඒ කෙ සේ ද, ස්වාමීනි, විචාළ රජ්ජුරුවන්ට හස්ම ප්‍රච්ඡන්නජාත වෙදයක් ප්‍රකාශ කරණ කලක් පරිද්දෙන් දෝ හෝ නො හොත් වලාවෙන් සැඟවී තුබූ සඳ වලා පිරා පානා කලක් පරිද්දෙන් දෝ හෝ නොහොත් සිත්තම් කොට හකුළුවා තුබූ පෙත්තක් විදහා පානා කලක් පරිද්දෙන් ඉකුත් වත් දක්වන සේක.

යට ගිය දවස බරණැස් නුවර බඹදත් නම් රජකු රජ කරණ සමයෙහි දඹ දිව එක් නුවරෙක **කෙශව** නම් රජ්ජුරු කෙණෙක් රජ සැපත් හැර මහණ වූ ය. උන් මහණ වන ගමනේ කැටි ව පන් සියයක් දෙන මහණ වූ ය. රජ ව ප්‍රසිද්ධ වූ වා සේ ම මහණ වත් කෙශව තාපසයෝ ය යි ප්‍රසිද්ධ වූ ය. මහල් කපුවාණෝ ත් මහණ ව **කප්ප** නම් අතවැසි වූ ය. කෙශව තවුසෝ තවුස් පිරිස් හා සමග අට මසක් මුළුල්ලෙහි හිමවත වැස වස් අවධියෙහි

Non-Commercial Distribution

ලුණු ඇඹුල් අනුභවය වූවො ත් මුත් රෝග හට ගන්නා හෙයින් ලුණු ඇඹුල් සෙවුනා නිසා බරණැසට අවුත් නුවර ඇතුළට සිඟා වන්හ. රජ්ජුරුවෝ සන්හුන් පියෝ ඇති තවුසන් දැක පැහැද වස් සාර මස තමන් ළඟ වසන ලෙසට ආරාධනා කොට උයන වස්වා සවස ත් උදෑසන ත් තවුසන් වඳින්නට පුදන්ට යෙති. සෙසු තවුසෝ ත් කීප දවසක් රඳා ලා ගම් ආසන්න ව රඳා හිඳි හෙයින් නො එක් අරගල අසා උකටලී ව 'ආචාරීන් වහන්ස, මෙ තැන රඳන්ට කාය ඵාසුව ඇත ත් චිත්ත ඵාසුව නැත. චිත්ත ඵාසු ව නැති කල හුදක් කාය ඵාසුවෙන් කම් නැත. යම්හ'යි කිවු ය. 'යන්නේ කොයි දැ'යි විචාළ කල්හි 'මිනිස් අරගල නැත්තේ හිමවත වේ ද, ඔබ යම්හ'යි කීහ.

'රජ්ජුරුවෝ අප හැම ආ දවස් ම වස් සාර මස රඳන්ට ආරාධනා කොළෝ ය. අපි ත් ආරාධනා ගිවිස්සම්හ. මසක් විතර ත් රඳා නො පියා නැඟී යන්නේ කෙසේ ද? උන්ගේ ප්‍රසාද හානිය වන්නේ වේ දැ'යි කිවු ය. 'ආරාධනා කරන්නා ම අප හැම නො විචාරා ආරාධනා ඉවසූ සෙක්හු ත් මුඹවහන්සේ ය. ප්‍රසාද හානිය නොවන්නට රඳත ත් ඔබ ම රඳන බව ය. රජ දරුවන්ගේ අදහස් පුරන මුඹ වහන්සේගේ අදහස් පුරා අප රඳන්ට බැරි ය. දුර ත් නො ගොසින් පව ත් ඇසෙන තැනෙක රඳා පවතු ත් දැන ළඟක හිඳුම්හ'යි වැඳ ගෙන නික්මුණාවු ය. කපු කුලෙන් මහණ වූ කප්ප නම් තවුසාණෝ පමණෙක් ආචාරීන් හා සමග රැඳුණා වූ ය. රජ්ජුරුවෝ අවුත් 'තවුසන් වහන්සේ කොයි දැ' යි විචාළෝ ය. 'රඳනු අභිප්‍රාය නැත්තම්'යි කියා ලා හිමවතට ම ගියෝ ය''යි කප්ප නම් තවුසාණෝ ද කීප දවසක් රඳා ලා උකටලී ව ආචාරීන් රඳන්ට කීව ත් නො රඳා ම නික්මුණා වූ ය. සෙසු තවුසන් ළඟට නො ගොසින් ආචාරීන්ට නුදුරු ව රඳා හුන්හ. කල් යැමක දී අත වැස්සන් කෙරෙහි ශොක ඇති ව ආචාරීන් බඩ රොගයෙක් ඇති වි ය. රජ්ජුරුවෝ වෙදවරුන් ලවා පිලියම් කරවති. විපිළිසර මුල් ව ඇති වූ රොගය හෙයින් පිළියමින් සන් නො හිඳෙයි.

කෙශව තාපසයෝ විචාරන්ට ආ රජ්ජුරුවන්ට 'මහ රජ, මාගේ රොග පීඩා සන්හිඳුවනු කැමැත්තාදැ'යි විචාරා 'ඉදින් පිළිවන් වී නම් දැන් ම සන්හිඳුවනු කැමැත්තෙමී'යි කී කල්හි 'ඉදින් මහ රජ, එ ලෙසක් කැමැත්තා නම් මා අපගේ අතවැස් සන් ළඟ ලවා පියව'යි කීහ. රජ්ජුරුවෝ ත් යහපතැයි ගිවිස දෝළි සැල්ම ආයාස වෙ දැ යි හැඳක් පත්ති කරවා ලා එහි සතප්ප

Non-Commercial Distribution

වා ලා නාරද නම් ඇමැත්තන් ඇතුළු වූ ඇමැත්තන් සතර දෙනකුට 'තෙපිත් කැටි ව ගොසින් මුන් වහන්සේගේ ලෙඩෙහි පවත් දැන මට කියා එව' යි කැටි ව යවූහ. කප්ප නම් තවුසාණෝ ඇදුරු තවුසන් එන නියාව අසා පෙර ගමන් කොට ගොසින් සෙස්සෝ කොයි ද යි විචාළ කල්හි අසවල් තෙන වෙසෙතී කීහ. එ බස් අසමින් ම කායික රොගයට ඒ තමා බෙහෙදක් නො වන හෙයින් ඒ පසු කොට චෛතසික රොග වූ ශොක ය සන්හුණ. සෙසු තවුසෝ මුළුල්ල ත් ඇදුරු තවුසන් ආ නියාව අසා එ තැනට ම අවුත් ආචාරීන්ට පැන් හුණු කොට දී ලා ඔජා සම්පන්න එලා එල ගෙනවූ ත් දුන්හ. රොග කාරණ ය තවුසන් දුටු ගමනින් ම සන්හිඳී එලා එල අනුභව කරන්නා ම බඩ රොගය ත් සන්හුණ. කීප දවසකින් ම දුර්වල කම ත් හැරී ගොස් නහා පී රන් පිළිමයක් මෙන් රන් වන් වූ හ.

නාරද නම් ඇමැත්තෝ ද—

"මනුස්සින්‍දං ජහිත්‍වාන-සබ්බකාම සමිද්ධිනං,
කථන්නු භගවා කෙසි-කප්පස්ස රමති අස්සමෙ"

යනු හෙයින් අපගේ රජ්ජුරුවන් වහන්සේ ගෙන් එ තරම් උපස්ථානයක් ඇතත් උයන වාසු වුව ත් කප්ප නම් තවුසන් වහන්සේගේ පන්සල සිත ඇලෙනැ'යි විචාළහ.

"සාදූනි රමනීයානි-සන්ති රුක්ඛා මනොරමා,
සුභාසිතානි කප්පස්ස-නාරද රමයන්ති මං"

යනු හෙයින් 'උන්ගේ පන්සල බඩ සිටියා වූ ගස් කොළ ත් උන්ගේ මියුරු කථා ත් මා සිත අලව යි' කිවු ය. ඒ අසා නාරද ඇමැත්තෝ—

"සාලීනමොදනං භුත්‍වා-සුචිං මංසූපසෙචනං,
කථං සාමාකනීවාරා-අලොණා ඡාදයන්ති තං"

යනු හෙයින් 'අපගේ රජ්ජුරුවන් වහන්සේගෙන් දෙවන රස මසවුලෙන් යුක්ත හැල් සාලේ බත වළඳා හිඳ එලා එලයෙන් යපෙන්නේ කෙසේ ද'යි විචාළෝ ය. තවුසෝ ඒ අසා—

"අසාදුං යදි වා සාදුං-අප්පං වා යදි වා බහුං,
විස්සත්‍ථො යත්‍ථ භුඤ්ජෙය්‍ය-විස්සාසා පරමා රසා"

යනු හෙයින් 'යහපත් වේව යි නපුරු වේව යි මඳ වේව යි බොහෝ වේව යි ප්‍රේම ඇත්තවුන් දුන් දෙයෙහි ම රස යහපතැ'යි කිවු ය.



Non-Commercial Distribution

බුදුහු මේ දෙශනාව ගෙනවුත් දක්වා 'එ කල රජ්ජුරුවෝ නම් මුගලන් මහ තෙරහු ය. නාරද ඇමැත්තෝ සැරියුත් මහ තෙරහු ය. කප්ප නම් තවුසෝ අනඳ මහ තෙරහු ය. කෙශව තවුසෝ මම ය'යි වදරා 'මහ රජ, මෙසේ පෙර නුවණැත්තෝ බලවත් ලෙඩට පැමිණ ත් පුරුදු තෙනට ම ගොසින් පිළියම්න් නො සන්හුන් ලෙඩ සෙසු ලෙසින් නො සන්හුන් කෙලෙසුන් මාර්‍ගයෙන් සන්හිඳවූවා සේ ගුණ කළහ. මාගේ සවුවන් තොප හා එ බඳු පුරුදු කමෙක් නැති නියා ය'යි වදළ සේක.

රජ්ජුරුවෝ වහන්දෑ හා පුරුදු ව ගන්නා කැමැති ව කෙ සේ කළහො ත් පුරුදු විය හැකි දෝ හෝ යි සිතා 'බුදුන්ට නෑ වන ශාක්‍ය කුලයෙහි බිසෝ කෙණකුන් ගෙන්වා අග මෙහෙසුන් කෙළෙම් නම් බුදුහු මට නෑ වන සේක. එ සේ කලට බාල වහන්දෑ ත් වැඩි මහලු වහන්දෑ ත් බුදුන්ගේ නෑ රජ්ජුරුවෝ ය යි එක් වන් මා ළහට වඩනා සේකැ'යි සිතා ශාක්‍ය රජදරුවන්ට දූ දරු කෙණකුන් සරණ එවන්නට කියා ය වූ ය. යවන්නෝ ම 'අසවල් ශාක්‍ය රජ්ජුරුවන්ගේ දූවණි-යෝ ය යි නියම දැන අවුත් කියව'යි විධාන කළහ. ඔහු ද ගොසින්, ශාක්‍ය රජ්ජුරුවන්ට එ පව ත් කි වූ ය. ශාක්‍ය රජ්ජුරුවෝ ද රැස් ව 'පක්‍ෂ බල ඇති රජ්ජුරුවෝ ය. ජාති මදෙන් මත් ව දූ දරු කෙණකුන් සරණ නුදුන්නමෝ නම් එයි ත් කාරණ නො වෙයි. තමන් බලී හෙයින් අප දුර්වල වන්නා නසා පියති. රජ පමණක් මුත් ජාති අපගේ ජාති ය හා සම නො වෙයි. කළ මනා කිම් දෝ හෝයි' කථා කළෝ ය.

මහානාම ශාක්‍ය රජ්ජුරුවෝ 'අපගේ කෙල්ලකගේ දූවක් අපට ද ය. රුවින් බැලූ කලට මිඩි තරමක් නැත්තී ය. ඇ සරණ දෙම්හ'යි නියම කොට ලා ආ මෙහෙවර කරන්නවුන්ට 'යහපත, තොපගේ රජ්ජුරුවන්ට අප ගෙන් දූ දරුවන් සරණ දෙම්හ'යි කිවූ ය. 'කවර රජ්ජුරු කෙණකුන් වහන්සේගේ දූවණි කෙණකුන් දැ'යි විචාළ කල්හි 'බුදුන්ට කුඩා පිය වූ අමිතොදන නම් ශාක්‍ය රජ්ජුරුවන්ගේ පුත් වූ අනුරුද්ධ මහ තෙරුන් වහන්සේට බෑණ වන මහානාම ශාක්‍ය රජ්ජුරුවන්ගේ දූ වූ වසභඛත්තියාවෝ ය' යි කී කල්හි උයි ත් ගොසින් එ පවත් රජ්ජුරුවන්ට කිවූ ය.

කොසොල් රජ්ජුරුවෝ ද ඒ අසා 'එ සේ වී නම් ඔබ්බකට නිල නො වන තෙක් වහා ගෙනෙව. රජ දරුවෝ නම් බොහෝ

Non-Commercial Distribution

මායම් දනිති තමන්ගේ දූ ය යි කියා ලා කෙල්ලකගේ දූවක් වත් එවා ලන සේ දනිති. බුදුන්ට නෑ වන්ට සිතා කොල්ලන්ට නෑ වූවො ත් නපුර. පියාණන් හා කැටි ව හිඳ බත් කෑ කෙණකුන් ගෙනෙව' යි විධාන කොට යවූහ. උයි ත් ගොසින් මහානාම රජ්ජුරුවන්ට 'රජ්ජුරුවන් වහන්ස, මුඹ වහන්සේ හා කැටි ව කන කෙණකුන් දක කැඳවා ගෙන යන්ට වදළ සේකැ' යි කිවූ ය. මහානාම රජ්ජුරුවෝ ත් තමන් මෙ නිමවා නිමන වේලාට වාසභඛත්තියාවනු ත් ආභරණ ලා සරහා ගෙන්වා ලා එක් ව කෑම නැත ත් එක පාවාඩයේ හුන් පමණකිනු ත් කැටි ව කෑ ලෙසක් ගියවුන්ට හඟවා ලා කැඳවා ගෙන යන්ට නිළ කළහ. උයි ත් කැඳවා ගෙන සැවැත් නුවරට ගොසින් එ පවත් රජ්ජුරුවන්ට කිවූ ය. රජ්ජුරුවෝ සතුටු ව උන් පන් සියයක් ගෑනුන්ට නායක කොට අකුශලක් පැමිණ මිඩි වුව ත් බිසෝ වන්ට නිසි පින් ඇති හෙයින් අග මෙහෙසුන් කළහ.

උයි ත් නො බෝ කලකින් ඔවුනු පළඳනා පින් ඇති රන් වන් වූ පුතණු කෙණකුන් වද පූ ය. උන්ට නම් තබන දවස් රජ්ජුරුවෝ තමන්ගේ නැදි මයිලන් ළඟට 'ශාක්‍ය රජදරුවන්ගේ දූ වූ වාසභඛත්තියාවෝ පුතණු කෙණකුන් වැදූ ය. උපන් කුමාරයන්ට තුබූ ව මනා නම් කියා එවන්ට වුව මැනව'යි කියා යවූ හ. මෙහෙවර ගිය තැනැත්තවූ කන් මඳක් බීරි ය. ඒ ගොසින් කොසොල් රජ්ජුරුවන් කී පවත් නැදි මයිල් රජ දරුවන්ට කීය. ඌ ඒ අසා 'වාසභඛත්තියාවෝ පුතුන් නො වද ත් රජ්ජුරුවන්ට වල්ලභයෝ ය. දරුවන් වැදූ පසු වල්ලභ කම් කියනු කිම් දූ' යි කිවූ ය. බීරි ඇමැති ත් 'වල්ලභ' ය යන බස වරදවා අසා ගෙන 'විඩූඩභ' ය යි සිතා ගෙන රජ්ජුරුවන් කරා අවුත් 'රජ්ජුරුවන් වහන්ස, කුමරුන්දෑට විඩූඩභ යන නම තබා ලුව මැනැවැ'යි කීය. රජ්ජුරුවෝ ද ඒ උන්ට පැවත ආ නමක් නියා ය යි සිතා විඩූඩභ ය යි නම් තබා ලූහ. උන් බාල කල්හි ම බුදුන්ගේ නෑ තෙනැත්තවුන් හෙයින් ඔබට සතුටක් කළ මනා වේ ද යි සෙනෙවිරත් පට බඳිනට වයසක් නො වත ත් ඇති ව ගත නො හෙන ගස් බාල කල ම පල ගන්නා සේ සෙනෙවිරත් කළහ.

උයි ත් කුමාර පෙරහරින් වඩනෝ සත් හැවිරිදි වයස දී සෙසු කුමාරවරුන්ගේ මුතුන් පක්ෂයෙන් ඇත් රූ අස් රූ ආදි ය ගෙනෙන්නා දක මෑණියන්ට කියන්නෝ 'සෙසු කුමාර වරුන්ගේ

Non-Commercial Distribution

මුතුන් පක්ෂයෙ නො එක් පඬුරු ගෙනෙති. අපට ගෙනෙන කිසි කෙනෙක් එවන කෙණකුන් නැති හෙයින් දෝ නැත. කුමක් ද? මුඹගේ දෙ මවු පියන් නැති නියා දැ' යි විචාළෝ ය. පුත, කුමක් කියවු ද? ශාක්‍ය රජ දරුවෝ තොපගේ මුතුන් පක්‍ෂ ය. දුර වසන හෙයින් කිසිවක් නො එවති' කියා පුතණුවන් යවා ලූ ය. නැවත ත් උඹ සොළොස් හැවිරිදි අවස්ථා වෙහි 'මුතුන් මිත්තන් දක්නා කැමැත්තෙමි' යි කියා නො කැමැත්තේ 'පුත, එ තෙක් කතර ගොසින් ප්‍රයෝජන කිම් දැ'යි නො එක් ලෙසින් බාධා කොට කීව ත් කුමාරයෝ යන්ට ම තත්පර යෝ ය. තත්පර කලට රැඳවීම යුක්ති නො වන්නේ වේ දැ යි යහපතැ යි ගිවිස්සෝ ය. උඹ පිය රජ්ජුරුවන්ට කියා ලා මහ පෙරහරින් නික්මුණාවූ ය.

වාසභඛත්තියාවෝ තමන්ගේ පුතණුවන්ට කුමක් වුව ත් තමන්ට දැනෙන හෙයින් පතක් පෙරාතු කොට යවන තෙනැත් තෝ 'මම මෙ තැන සුව සේ රැකෙමින් සිටියෙමි. ස්වාමි දරුවන් කිසි ලෙසකිනු ත් තෙල ගියවුන්ට තොරතුරක් නො පැව යහ පතැ'යි යවඤ කොට කියා යවූ ය. ශාක්‍ය රජ දරුවෝ ද විඩූ ඩභයන් එන නියාව දැන 'වයසින් බාල වුව ත් අප ගෙන් කිසි කෙණකුන් උන් වඳිනට තරම් නො වන්නෝ වේ දැ'යි බාල කුමරුවන් දනවුවලට යවා පියා වයසින් වැඩි සිටියාහු තේරී ගෙන උන් කිඹුල්වත් නුවරට වන් කල්හි හැම දෙන රැස්වන්නා වූ ශාලාවට රැස්වූහ. කුමාරයනු ත් ගොසින් සිටියවුන්ට 'තුලූ තොපගේ මුත්තණුවෝ ය. තුලූ තොපගේ මයිලණුවෝ ය' යනා දීන් ඒ ඒ දෙනා තෝරා කිවු ය. උඹ තුමූ නැ කම් නැත ත් වැන්ද මනාවුන් හෙයින් ම වැද වෙහෙසී පියා තමන්ට වඳිනා එක කෙණකුනු ත් නො දැක 'මා මෙතෙක් දෙනා වැන්ද ත් මා වඳිනා එක කෙණකුනු ත් නැති නියා දැ'යි විචාළෝ ය. ශාක්‍ය රජ දරුවෝ 'පුත, තොපගේ මල්බෑයෝ කිසි කට යුත්තෙක දනවු වට ගියහ'යි කිවු ය. කියා ලා උන්ට මහත් කොට සත්කාර කොළෝ ය. උයි ත් කීප දවසක් රඳා ලං මහ පිරිවරින් නික්මුණා වූ ය.

එක් කෙල්ලක් උන් හුන් පුවරුව සෝධන තෙනැත්තී 'මිඩියගේ පුතු හුන් පුවරුව ය'යි බැණ බැණ කිරි පැන් සඳුන් පැනින් සෝධ යි. එක් හේවායෙක් තමාගේ ආයුධ ය සලකුණු නැති ව තබා පියා ගොසින් පෙරළා ආ තෙනැත්තෝ කෙල්ල විඩූඩභයන්ට බණන හඬ අසා ඒ තොරතුරු ඈ අතින් විචාරා

Non-Commercial Distribution

ගෙන සේනාවට කියාලී ය. 'වාසභඛත්තියාවෝ බිසෝ බවට වත් බව මුත් කෙල්ලගේ දුවණියෝ ල. විඩූඩභයෝ රජ කමට ගැසෙන මුත් මිඩියගේ පුතණුවෝ ල'යි මහා කොලාහල වී ය. විඩූඩභයෝ ඒ අසා 'මා හුන් පුවරු ව මුත් කිරි පැන් සඳුන් පැනින් සේධ වූ පසු මා රජ පැමිණි කල මුන්ගේ බොටුවල ලෙහෙයෙන් මා හුන් පුවරුව සෝධවමී' සිතා ගත්හ. උන් සැවැත් නුවරට ගිය කල්හි ඇමැත්තෝ ඒ සියලු පවත් රජ්ජුරුවන්ට කිවු ය. කොසොල් රජ්ජුරුවෝ 'තමන්ගේ මිඩියගේ දුව අපට බිසෝ කමට පාවා දුන් නියා වේ ද'යි ශාක්‍ය රජ්ජුරුවන්ට මුසුප්පු ව දුර හුන්නවුන්ට කට හැක්කක් නැත ත් වාසභඛත්තියාවන්ට දුන් බිසෝ තනතුර ත් පුතණුවන්ට දුන් සෙනෙවිරත් තනතුර ත් උදුරා ගෙන කෙළි කොල්ලන් ලැබ්බ යුතු විතරක් ම දෙවා උන් වහල් නියාවට ප්‍රසිද්ධ කළහ.

කීප දවසකින් බුදුහු රජ ගෙට වැඩ පනවන ලද බුදු අස්නෙහි වැඩ හුන් සේක. රජ්ජුරුවෝ ත් අවුත් වැඳ ලා 'සවාමීනි, මුඹ වහන්සේගේ නැයෝ මා තමන්ට නෑ කමට නො තරම් හෙයින් දෝ තමන්ගේ කෙල්ලකගේ දුවක් තමන්ගේ දූ ය යි කියා ලා මට පාවා දුන්හ. මා උන් මිඩි නියාව ඔබින් දත් පමණෙකින් ම තරම් නො දන දෙ පුතු මවුන්ට දුන් තනතුරු හැර ගෙන කෙළි කොල්ලන් ලද මනා විතරක් ම දිනිමි'යි කිවු ය.

බුදුහු ඒ අසා 'මහ රජ, මාගේ නැයන් වුව ත් කෙළේ අයුත්-තිය. නො දෙතොත් නො දෙත් නමුත් දෙන කල සරි සමානා කෙණකුන් දිය යුතු ය. මහ රජ, තොපට එකක් කියමි. මෙ වාසභඛත්තියාවෝ මවු පක්‍ෂ ය කුම් වුව ත් රජ්ජුරු කෙණකුන්ට දුයෝ ය. නැවත රජ්ජුරු කෙණකුන්ට අග මෙහෙසුන් වූ ය. විඩූඩභයෝ ද රජ්ජුරු කෙණකුන්ට දු ව උපන්හ. මවු පක්ෂ-යෙහි යාපතින් නපුරින් ප්‍රයෝජන කිම් ද, පිය පක්‍ෂ ය යාප ත් කල ය? පුරාතන රජදරුවෝ දිලිඳු ව දර විකුට කන කෙල්ලට අග මෙහෙසුන් තනතුර දුන්හ. ඈ කුස උපන් කුමරු අට සාලිස් ගවු පමණ දිග පළල ඇති බරණැස් නුවර ඔටුනු පැළඳ කට්ඨවාහන නම් රජ වී ය'යි කට්ඨහාරි ජාතක ය වදාළ සේක. රජ්ජුරුවෝ ද දහම් නැමැති මියුරු පැන් බී කෝප නැමති ගිම් නිවා ගෙන පිය පක්ෂය ම උතුම් ල යි සතුටු ව උදුරා පී පැළ දෙකක් නො මියන තෙක් හිඳුවා ඇති කරන්නා සේ දෙ පුතු මවුන්ට ආදී දී ලා හැර ගත් තනතුරු පෙරළා දුන්හ.

Non-Commercial Distribution

බන්ධුල සෙනෙවි රදුන්ගේ ත් කුසිනාරා නුවරම උපන් වැඩි මල්ලිකා නම් දේවී බොහෝ කලක් උන් කෙරේ රදා හිඳ ත් දරු කෙණකුත් නො ලත්හ. බන්ධුල සෙනෙවිරද්දු දේවීන් වඳ හෙයින් මුසුප්පු ව 'තොපගේ දෙ මවු පියන්ගේ ඔබ යව'යි කුසිනාරා නුවරට ම යවා පීහ. උයිත් ඔබ යන්නෝ ''බුදුන් වැඳ ගෙන යෙමි'යි දෙවුරමට ගොසින් වැඳ ලා සිටියෝ ය. බුදු රජුන් වහන්සේ කොයි යවු දූ යි විචාරා වදාළ කල්හි බන්ධුල සෙනෙවි රදුන් නෙරනා හෙයින් දෙ මවු පියන්ගේ ඔබ යන නියාව දන්වා කාරණ කවරේ දූ යි විචාරා වදාළ කල්හි තමන් වඳ නියා හෙයින් ය යි දූන් වූ ය. 'එ සේ වී නම් යාමෙන් ප්‍රයොජන නැත. රදා ප්‍රයෝජන ඇති වන බැවින් රදව'යි වදාළ සේක. උඹ තුමූ බුදුන් වදාළ බස ම දරුවන් ලද්ද සේ සිතා සතුටු ව බුදුන් වැඳ ගෙන ගෙට ගොසින් 'රඳා පියේ හැයි දූ'යි විචාළ කල්හි 'බුදුන්ගේ පැරැත්තට වඩනා පැරැත්ත නැත්තේ වේ ද, ඔබ වදාළ හෙයිනැ'යි කිවු ය.

බන්ධුල සෙනෙවිරද්දු 'රැඳීමෙහි ප්‍රයොජන නු බුදු හෙයින් මා නො දත ත් ඒ මුනි උතුමාණන් වහන්සේ දත් නියා ය'යි සිතා රැඳීම තුමූ ත් ගිවිස්සෝ ය. දේවී ත් නො බෝ කලකින් දරු කෙණකුන් උපන් සිටි හෙයින් දොළක් ඇති ව තමන්ට දොළ දුක් ඇති නියාව සමුණන්ට කිවු ය. කෙසේ වූ දොළෙක් දූ'යි විචාළ කල්හි විසල් මහ නුවර රජ කරණ සත් දහස් සත් සිය සත් දෙනකු පමණ රජදරුවන්ගේ අභිෂෙකයට පැන් හැර ගන්නා මඟුල් පොකුණට බැස නා පියන්ට ත් පැන් බී පියන්ට ත් දොළ ඇති නියාව කිවු ය. බන්ධුලයෝ ත් යහපතැ යි කියා ලා දහසක් දෙනා ඇද ලන තර ය ඇති දුන්න හැර ගෙන රථයකට පැන නැඟි ලා සැවත් නුවරින් නික්ම රථ ය පදිනා තෙනැත්තෝ මහාලී නම් ලිච්ඡවි රජ්ජුරුවන්ට දුන් වාසලින් විසාලා නුවරට වන්හ. මහාලී ලිච්ඡවින්ගේ ගෙය ත් වාසල ගාවා ය. උඹ රථ ය එළි පත වැද ගත් හඬ අසා 'බන්ධුල මල්ලයන්ගේ රථය හඬ ය. ලිච්ඡවීන්ට අද භයෙක් ඇති වෙයි' කිවු ය. පොකුණ වසා ලෝ දැලක් හැද තිබෙන හෙයිනු ත් පිටත ත් රැකවල් ඇති ව තිබෙන හෙයිනු ත් මිනිසුන්ට තබා පක්ෂීන්ට වුව ත් වැද ගන්ට බැරි ය. බන්ධුල සෙනෙවි රද්දු රථයෙන් බැස පියා රකවල සිටියවුන් වේ වැළින් ගසා පලවා පියා කඩුවෙන් ලෝ දැල කපා පියා ඇතුළු පොකුණෙන් ඇඹෙණියන් නාවා පැනු ත් පොවා පියා තුමූ ත් දොළ දුක් නැත ත් නා පියා නැවත රථයට පැන නැඟී නුවරින් නික්ම ආපස්සෙ නික්මුණාවූ ය. රකවල සිටියෝ ත් ලිච්ඡවීන්ට ගොසින් කිවු ය. ලිච්ඡවී ත් කිපී ගොසින් පන් සියයක් දෙන පන් සියයක්

Non-Commercial Distribution

රථවිලට නැඟී බන්ධුල මල්ලයන් අල්වම්හ යි නික්මුණාවූ ය. ඒ බව මහාලි රජ්ජුරුවෝ අසා උන් හැම කැඳවා ලා 'අපි බොහෝ දෙන ය. උන් තනි තෙනැත්තවුන් කිමැ'යි සිතා යවු නමුත් තමන් සමත් හෙයින් තොප හැම ම මරති. උන් සමත් නියාව තොප මෙ තෙක් දෙනා හුන් තෙනට තනි ව නැඟී ආ ගමනින් ම නො දුනේද ? නො යව'යි තමන් උන්ගේ තරම ඉඳුරා ම දන්නා හෙයින් නැවතූහ. උඹ හැම දෙන යන්ට තරයෝ ය. ගමන නවතා ගත නො හී 'අර්පී ව යව නම් උන්ගේ රථ සක සක් නැබ දක්වා පොළෝ ගැලී ගිය තෙනක් දුටු නම් එ තැන දී නැවත පියව. එ සේ ත් නො නැවත ගියහු නම් ඉදිරියේ දී සෙණක් ගසා පීවා සේ මහත් හඬක් ඇසූ නම් එ තැන දී රඳා පියව. එ සේ ත් නො රඳා ගියා නම් තොපගේ රථ පන් සියයේ විය ම එක එල්ලට සිටියා දුටු නම් එ තැන පටන් නවතුව. ඉදිරියට යන්ට නො කැමැත්තේ ය'යි කිවු ය. උන් කෙසේ කීව ත් ක්‍රොධ වේගයට වඩා කම් වෙගය බලවත් හෙයින් මහාලීන් කීව නො ගිවිස ලුහුබඳවා ගත්හ. මල්ලිකාවෝ රථයේ පසු කෙළවර හුන්නෝ එන්නවුන් දක 'රථ සමූහයෙක් පෙනෙන්නේ ය. ස්වාමීනි, කිවු ය. එ සේ වී නම් බලා හිඳ ලා එක රථයක් සේ පෙනෙන කලට කියාලව'යි කිවු ය. උයි ත් බලා ඉඳ ලා එක රථයක් සේ පෙණෙන කලට 'ස්වාමීනි, එක රථයක් සේ පෙනෙ'යි කිවු ය.

'එ සේ වී නම් තෙල රැණ අල්වා ගනුව'යි රැන උන් අතට දී ලා රථයේ සිට දුන්න නහා ලූ ය. රථසක නැබ දක්වා පොළොව ගිලිණ. ලිච්ඡවීහු එ තැන දක ත් කම් ස්වරූපය නො දක නික්මුණෝ වූ ම ය. බන්ධුලමල්ලයෝ මඳ තැනක් ගොස් ලා දුනු දිය අත පොළාලූ ය. ලිච්ඡවීන් පන්සියයට වන හානි නිසා සෙණ ගසා පීවා සේ මහත් ව හඬා පී ය. ඒ අසා ත් උඹ නො නැවැත්තෝ ය. ලුහු බඳවා දිවෙත් ම ය. බන්ධුල මල්ලයෝ රථයේ සිට ම විෂ පෙවූ පළල් හීයක් විද පූ ය. ඒ හීය ත් පන්සියක් රථවල රිය හිස් සිදුරු කොට ගෙන සන්නාහ ලා සිටි රජ දරුවන් පන් සියයක් විදගෙන කළ අපරාධ ය බලවත් හෙයින් සැහවෙන්නා සේ පොළොවට වන. උඹ හැම තමන් විත් කැ නියාව සන්නාහ බැඳ ගත් වේගයෙන් නො දන 'කොල සිටුව, කොල සිටුව යි කිය කියා ලුහුබඳවත් ම ය.

බන්ධුලයෝ රථ ය රඳවා ලා 'තෙපි හැම දෙන ම මේ මුරයට මිය ගියව. මළවුන් හා මා හා කුමන සටන් දැ'යි කිවු ය. රජ පන් සියය ඒ අසා කොල, මළවුනු ත් අප සේ ම දිවන නියා දැ'යි කිවුය. එ සේ වී නම් මළ නො මළ නියාව දන්ට පෙරාතු සිටි තෙනැත්තන්

Non-Commercial Distribution

ගේ සන්නාහය උනව'යි කිවු ය. ඒ අසා සන්නාහය උනා පියන්නා ම මිය හුණුවු ය. 'තෙපි හැම දෙන ත් තෙල තෙක්ම ය. ගෙවලට පලා ගොසින් විධාන කළමනා දෙය ත් විධාන කොට ලා අඹු දරුවන්ට ත් කිවමනා මාලු කම් කියා ලා සන්නාහ උනව'යි කිවු ය. උයි ත් එ ලෙස ම කොට මහාලි ලිච්ඡවීන්ගේ අවවාද මැඩ ත් මරු මැඩ පිය නුහුණුවු ය.

බන්ධුලමල්ලයෝ ද මල්ලිකාවන් සැවැත් නුවරට ම කැඳවා ගෙන අවු ය. උයි ත් සොළොස් වරකින් නිමුන් පුතුන් දෙතිසක් වද ලූ ය. හැම දෙන ම උගත මනා ශිල්ප ත් ඉගෙන නිමවා බොහෝ දවසක් ජීවත් වීමට අසමර්ථ වුව ත් සෙසු ලෙසින් සමර්ථ වූ හ. එ කි එ කී දෙනාගේ ආණ්ඩුව දහස දහස ය. මුන් තිස් දෙනා දෙ තිස් දහස පිරිවරා නික්මුණු කලට රජ්ජුරුවන්ගේ සෙණ්ඩුවාලුව උන්ගෙන් ම පිරෙයි.

ඉක්බිත්තෙන් එක් දවසක් යුක්තියක් බැණ පැරදි එකෙක් බන්ධුලමල්ලයන් හුන්නවුන් දැක අධිකරණ නායකයන් අත්ලස් කා ලා කරණ අයුක්තිය කිව. උහු ඒ අසා අධිකරණයට ගොසින් යුක්තිය තරාදියක් සේ මැදහත් ව විචාරා හිමි තැනැත්තවූ ම හිමි කොළෝ ය. බොහෝ දෙන ත් යුක්තිය තමන් සිතට ත් නැඟී හෙයින් සාධුකාර දුන්හ. රජ්ජුරුවෝ ත් මේ කිම් දැ'යි විචාරා එ පවත් අසා සතුටු ව අධිකරණ නායක සියල්ලවුන් ම හැර බන්ධුල මල්ලයන්ට ම අධිකරණ කටයුත්ත නිළ කළහ. එ වක් පටන් අයුක්ති නැති ව ඒ නැති වීමෙන් ම අල්ලසු ත් නැති ව පෙර අධිකරණ නායක වරු දුක්පත් ව ගොසින් බන්ධුල මල්ලයන් නසා පියන්ට උපදෙස් බලන්නෝ රජ්ජුරුවන් කරා ගොසින් 'රජ්ජුරුවන් වහන්ස, මේ බන්ධුල මල්ලයෝ පුතුන් දෙතිසකු ත් ඇති ව සමර්ථ හෙයින් මුඹ වහන්සේ මරා රාජ්‍යය ගන්ට සිතා යුක්ති පිට ලා ලා හැම දෙනා සිත් ගනිති' කිවු ය.

රජ්ජුරුවෝ ත් මුන් සමර්ථ නියාව ත් හැම දෙනා මුන්ට ලැබෙන නියාව ත් දැන උන් තරම් නො දත් හෙයින් සැබව'යි සිතාගෙන මෙ තනදී ම මරවා පිවො ත් පෙනී සිටි ද්‍රොහයක් නැති හෙයින් රට වැස්සෝ කළකිරෙති යන සිතින් කාටත් නො හඟවා තමන්ගෙන් ම මිනිසුන් යවා පසල් දනවුව පහරවා ලා බන්ධුල මල්ලයන් කැඳවා ලා 'පසල් දනවුව පෙරළි වූයේ ල. පුතුන් කැඳවා ගෙන ගොසින් සොරුන් අල්ව'යි විධාන කොට යවා ලා ගිය තෙන දී පුතුන් දෙතිස හා සමඟ බන්ධුලමල්ලයන් මරා ඉස් ගෙනව යි සමර්ථ වූ බලවත් යෝධයන් උන් හා කැටි ව ම

Non-Commercial Distribution

යවූහ. උන් පසල් දනවුවට යන්නා ම නො සොර සොරහු පලා ගියෝ ය. ඌ එ තැන සොරුන් හකුළුවා ලා ගියවුන් ගෙන්වා සලස්වා ලා නුවරට එන්ට අවු ය. නුවරට නුදුරු තෙනකට ආ කලට විධාන ලත් යොධයෝ පුතුන් දෙ තිස හා සමඟ බන්ධුලමල්ලයන් මරා පියා ඉස් කපා ගත්හ.

එ දවසට වැලි ත් බන්ධුල මල්ලිකාවෝ පන් සියයක් දෙනා වහන්සේ හා සමඟ අග සවු දෙ දෙනා වහන්සේට ආරාධනාවක් කොළෝ ය. පෙර වරු වේලේ ම සමණනු ත් පුතුනු ත් මරාපී නියාව කියා පතකු ත් ගෙනවුත් මල්ලිකාවන්ට දුන්හ. ඌ එ පවත් දැන කාට ත් කුමකු ත් නො කියා පත එකුරුත්තේ බැඳ ගෙන වළඳවන වැළඳීම වළඳවති. කැටි ව වළඳවන්නෝ බත් පිළිගන්වා ලා කන තෙල් සැළක් ගෙනෙන්නාහු තෙරුන් වහන්සේ ළඟ දී බිඳ පූ ය. ධම් සෙනෙවි සැරියුත් මහ තෙරුන් වහන්සේ 'බිඳෙන සුලු දෙය බිඳෙයි. මුසුප්පු වියයුතු නො වෙ යි' වදළ සේක. ආදි ම තමන් ඒ බණ සැලකූ නියාව හඟවන්ට දෝ හෝ නොහොත් තමන්ගේ සාර ගුණ ය හඟවනු පිණිස එකුරුත්තේ තුබූ පත මැ ත් කොට ලා 'පුතුන් සමඟ බන්ධුල මල්ල සෙනෙවි රදුන් වහන්සේගේ පෙනෙන වරදක් නැත ත් මරාපී නියාවට මේ ගෙනා පත ය. මම් මෙ පවත් අසා පවා අමුත්තක් නොසිතුයෙම් තෙල් සැළකට කුමක් සිතම් දැ'යි කිවු ය. ධම් සෙනෙවි සැරියුත් මහ තෙරුන් වහන්සේ ද ශොක තුනී වන්ට කාරණ වූ බණ වදරා ලා විහාරයට වැඩ පී සේක.

බන්ධුල මල්ලිකාවෝ ද යේළින් දෙතිස බණවා ලා තොප හැම දෙනාගේ සවාමීහු නිරපරාධයෝ ය. එතකුදු වුව ත් කම්ා-පරාධ ය බලවත් හෙයින් මේ තරමකට පැමිණියෝ ය. ශෝක කිරීමෙන් ප්‍රයෝජන නැති හෙයින් තෙපි ශෝක ත් නො කරව. රජ්ජුරුවන් වහන්සේ කෙරෙහි ත් මුසුප්පු නො වව'යි අවවාද කොළෝ ය. රජ්ජුරුවන්ගෙන් හැර, මුන් හැම මරවා පී හෙයින් නුවර වැස්සන් කියන බණන කථා අසන්ට නිල කළ චර පුරුෂයෝ ඒ කථාව අසා උන් නිවරද නියාව ගොසින් රජ්ජුරුවන්ට කීහ. රජ්ජුරුවෝ ත් නො විමසා කළ කට යුත්තක් හෙයින් මුසුප්පු ව පියා බන්ධුල මල්ලිකාවන්ගේ ගෙට තුමූ ම ගොසින් උනු ත් උන්ගේ යේළියනු ත් ක්‍ෂමා කරවා ගෙන මල්ලිකාවන්ට වරයක් දෙමි කිවු ය. 'ඌ පසු ව පිළිවනැ'යි කියා ලා රජ්ජුරුවන් ගිය කල මළවුන්ට පින් පෙතු ත් දෙවා ලා

ඉස්සෝධා නා පියා රජගෙට ගොසින් 'රජ්ජුරුවන් වහන්ස, වරයක් දෙවා වදාළේ ඇත්තේ වේ ද? මට අනික් වරයකින් ප්‍රයෝජන නැත. අපගේ යේළියනු ත් අප ත් දෙ මවුපියන්ගේ ඔබම යන ලෙස සමු දෙවු ව යහපතැ'යි කිවු ය. රජ්ජුරුවෝ ත් 'යහපතැ'යි ගිවිස්සෝ ය. යේළියන් උන් උන්ගේ දෙ මවු පියන් ළඟට යවා පියා තුමූ කුසිනාරා නුවර තමන්ගේ දෙ මවු පියන් ළඟට නැඟී ගියහ.

රජ්ජුරුවෝ ත් බන්ධුලමල්ල සෙනෙවි රදුන්ගේ දීඝකාරායණ නම් වූ බෑනණුවන්ට සෙනෙවිරත් පට දුන්හ. ඌ සෙනෙවිරත් තනතුර ලද ත් මයිලණුවන් මරවා පී හෙයින් ඒ වෛර ය සිත තුබා ගෙන විපාක දී පියන්ට අවසරයක් බලන කුසල් අකුසල් පරිද්දෙන් අවසරයක් ම බලති. රජ්ජුරුවෝ ද නිරපරාධ වූ බන්ධුල මල්ලයන් මරවා පු තැන් පටන් බලවත් වූ විපිළිසර ඇති ව සිතට සැපයක් නො ලැබෙති. රජ ඉසුරු ත් නො විඳිති. එ කල බුදුහු ශාක්‍ය රජ දරුවන්ගේ උලුම්ප නම් නියම් ගම වසන සේක.

රජ්ජුරුවෝ ඔබ ගොසින් වෙහෙරට නුදුරු තෙනක කඳවුරු බඳවා පිරිස රඳවා ලා මද දෙනකු හැර ගෙන බුදුන් වඳිනට වෙහෙරට ගොසින් මඟුල් කඩුව පටන් පඤ්චරාජ කකුධභාණ්ඩය දීඝකාරායණයන්ට දී ලා තන් ව ම ගඳ කිළි ඇතුළට වන්හ. සෙසු කිය යුතු සියල්ල ම ධම්මචේතිය සූත්‍රයෙහි කියා ලූ ලෙසින් දත යුතු. රජ්ජුරුවන් ගඳ කිළියට වන් කලට දීඝකාරා-යණයෝ අතට සම්භ වූ මඟුල් කඩුව ය, හෙළ කුඩ ය, තළල් පට ය, රන් මිරිවැඩි සඟළ ය, වල් විදුනාව ය යන මේ රජ පෙරහර ඇති ව විඩූඩභයන්ගේ රජ කමට යම්තම් පිණක් ඇති හෙයින් උන් ඔවුනු පළඳවා ගෙන රාජ සම්පත් ඇති රජ්ජුරුවන්ට අසකු හා ගැනියක රඳවා ලා සැවත් නුවරට ගියහ.

රජ්ජුරුවෝ ද බුදුන් හා මියුරු කථා කොට ලා පිටත් තෙනැත්තෝ සේනාව නො දක රඳා සිටි ගැනි ය. අතින් විචාරා එ පවත් අසා 'මාගේ බෑන අජාසත් රජ්ජුරුවන් කැඳවා ගෙන අවුත් විඩූඩභයා අල්වමි' රජගහ නුවරට යන තෙනැත්තෝ සවස් ව ගොසින් නුවර වාසල් යතුරු ලාපී හෙයින් නුවරින් පිටත ශාලාවක ලැග ගමන් අවුත් මිරිකී ලා එ දවස් රෑ ම මළහ. පාන් ව ගිය කල 'අනේ රජ්ජුරුවනි, තිසරණ ව මළ සේකැ' යි කොසොල් රජ්ජුරුවන්ගේ පවත්

Non-Commercial Distribution

කියා හඬන ගෑනියගේ හැඬීම අසා අජාසත් රජ්ජුරුවන්ට කීහ. උයි ත් අවු ත් මහ පෙරහරින් කොසොල් රජ්ජුරුවන් මළ වුන්ට කළ යුතු දෙය සිරි ත් විසින් එ තෙක් ම හෙයින් දවා පීහ.

විඩූඩභයෝත් රජ පැමිණ ශාක්‍ය රජදරුවන් කෙරෙහි බැඳ ගත් වෛර සලකුණු කොට පියා 'ශාක්‍යයන් මරමි 'සෙනඟ සරහා ගෙන කිඹුල් වතට යන්ට නික්මුණාවු ය. බුදුහු එ දවස් අලුයම ලොව බලන සේක් නෑයන්ට වන විනාශ ය දැක ඥාත්‍යර්ථචර්‍ය්‍යාව ත්‍රිවිධ චර්‍ය්‍යාවෙන් එකක් වන හෙයින් නෑයන්ට සංග්‍රහයක් කෙරෙමී සිතා පෙර වරු සිඟා වළඳා අන්තයෙහි ගඳ කිළියෙහි සිංහ ශය්‍යාවෙන් සැතපී ලා සවස් වේලේ අහසින් වැඩ කිඹුල් වත් නුවර බඩ තුනී සෙවණ ඇති එක් ගසක් මුල වැඩ හුන් සේක.

විඩූඩභයන්ගේ රටෙහි මැ ද ඝනච්ඡායා ඇති මහ ත් නුග ගසෙක් ඇත. විඩූඩභයෝ බුදුන් දැක ගොසින් වැඳ ලා 'ස්වාමීනි, මේ ගිම් වේලේ සෙවණ සකස් නැති මේ ගස මුල වැඩ හුන්නේ හැයි ද? තෙල ඝන වූ සෙවණ ඇති ගස මුල වැඩ හිඳිනේ යහපතැ'යි කිවු ය. 'වන්නාට, මහරජ, නෑ සෙවණ සිහිල් වේ ද'යි වදාළ කල්හි නෑයන් පිණිස වැඩි නියා ය යි සිතා ලා බුදුන් වැඳ ලා පෙරළා සැවැත් නුවරට ම ගියෝ ය. බුදුහු ත් අහසින් දෙව් රමට වැඩි සේක.

විඩූඩභයෝ වෛර ය සිත තබා දෙවනුව ත් නික්ම ආදි ලෙසින් බුදුන් දැක රඳාපීහ. තුන් වන වර ත් නික්ම බුදුන් දැක ම රඳුණාවු ය. සතර වන වර විඩූඩභයන් නික්මුණු කලට බුදුහු 'මේ මා දැක තුන් වාරයක් ගමන් තබා පියා සතර වනුව ත් නික්මිණ. අර මුන් හැම සසර සිටිනා කල කළ අකුසල් කවරේ දෝ හෝ'යි බලන සේක. ගඟෙක කුඩ මස්සන්ට වසයක් ලා මැරූ පව් කම වැළැක්විය නො හැකි බව දැන සතර වැනි වර බුදුහු නො වැඩි සේක. විඩූඩභයෝ ත් ශාක්‍යයන් මරමි. මහ සෙනඟ හැර ගෙන නික්මුණාවු ය. බුදුන් නෑයෝ වැළි ත් තුමූ මියෙත් නමු ත් අනුන් නො මරණ හෙයින් ප්‍රාණ වධ නො කරත ත් විදමන දක්‍ෂ හෙයින් 'අපගේ ධනුශ්ශිල්පයෙහි අරුමය පෑ පලවම්හ' යි සන්නාහා ලා නික්ම සටනට පටන් ගත් හ. උන් විදි හී දඬු විඩූඩභයන්ගේ පිරිස් හසු හස්සෙන් ශාක්‍ය රජ දරුවන්

Non-Commercial Distribution

ප්‍රාණ වධ නො කරණ නියාව හඟවන්නාක් මෙන් එක් කෙණකුනු ත් ඇඟ වැද නො ගෙන සිස් ව ම යෙයි. මිනිසුන්ට ළං වී නමුත් පටාල හස්සෙන් හෝ ඔවා ගත් අත් හස්සෙන් හෝ කන් සිදුරෙන් හෝ පලා යෙයි.

විඩූඩභයෝ හී දඬු විදිනා නියාව දැක "හැයි;ශාක්‍යයෝ ප්‍රාණ වධ නො කරම්හ'යි කියා හිඳු ත් තෙලෙ කුමක් කරණ නියා දැ'යි කිවු ය. එ තැන සිටි එකෙක් පවිටු අදහස් ඇත්තවුන් හැම කල්හි ම ඇති බැවින් 'මුඹ වහන්සේ කියන්නේ කිම් දැ'යි විචාරා 'ශාක්‍යයෝ විද මාගේ පිරිස් නසති' කී කල්හි 'මුඹ වහන්සේ ගෙන් මළ එක් කෙණකු ත් නැත. මාගේ බස් නො අදහතොත් පිරිස් ගණවා පිව මැනැව'යි කිවු ය. දුටු ගැස්වීමෙන් ගණවා පියා එක් කෙණකුන් ගෙනු ත් අඩුවක් නුදුටුවූ ය. යන්ට ගොසින් තබා ලා නැවත අවුත් 'කොල, යම් කෙණෙක් ශාක්‍යම් හ යි කිවු නම් නො තෝරා මරව. යම් කෙණෙක් අපගේ මුතුන් මහානාම ශාක්‍ය රජ්ජුරුවන් වහන්සේ ළඟ සිටියෝ වී නම් උන් නො මරව' යි විධාන කොළෝ ය. ශාක්‍යයෝ ත් දිවි රක්නා උප දෙසක් නො ලදින් සමහර කෙණෙක් තණ ගස් ඩැ ගෙන සිටියෝ ය. සමහර කෙණෙක් හුණු දඬු අල්ලා ගෙන සිටියෝ ය. 'තෙපි ශාක්‍යයෝ ද නො වෙ දැ'යි විචාළ කල්හි පණ යේ නමුත් තමන් බොරුවක් නො කියන හෙයින් තණ ඩැ ගෙන සිටියාහු 'මේ ශාක්‍යයෝ නො වෙයි. තණ ය'යි තණ ය'යි කියති. හුණ දඬු ගෙන සිටියාහු, 'මේ ශාක්‍යයෝ නො වෙයි. හුණ දඬු ය'යි කියති.

ශාක්‍ය නො වෙයි කී බසින් ශාක්‍යයෝ නො වෙති සිතා ගෙන උනු ත් මහානාම රජ්ජුරුවන් ළඟ සිටියවුනු ත් හැර සෙසු කිරි බොන දරුවන් දක්වා ත් නො තෝරා මරවා ලේ ගඟක් කරවා උන්ගේ බොටුවල ලෙහෙයෙන් තමා හුන් පුවරුව සෝදවා පියා පුවරුව ශුද්ධ නු වූවා සේ ම තෙමේ ත් ශුද්ධ ව ගත නො හීණ. ඉන් යම් කෙණෙක් තණ ඩැ ගෙන සිටියෝ වූ නම් උඟ ජාති අඩු ව එ වකට ඒ ක්‍රියා දෙෂයක් හෙයින් දෝ තෘණ ශාක්‍ය වූහ. යම් කෙණෙක් හුණ දඬු අල්වා ගෙන සිටියෝ වූ නම් උඟ නළ ශාක්‍ය වූහ. මෙසේ ශාක්‍ය වංශ ය විඩූඩභයෝ නැසූ හ.

උඟ මහානාම ශාක්‍යයන් කැඳවා ගෙන යන්නෝ පෙරවරු වේලේ බත් කන්ට හිඳ පොහොසත් කම මුත් තරම නො සලකා කැටි ව කන්ට නො පෙහොසත් තරම දත ත්, තරම් ඉන් වී නමුත් සිටුවන්ට කැටි ව කන නියායෙන් මහානාම ශාක්‍යයන්

කැඳවා යවූහ. ශාක්‍ය රජ්ජුරුවෝ මියෙත් නමුත් වාල් කැටි ව නො කති. එයින් මහානාම ශාක්‍යයෝ ‘ඇඟ කුණු ය. තෙල විලට බැස නාන්ට වුව මැනවැ’යි විඩූඩභයන්ට කියා යවූහ. රජ කමට පැමිණි බව මුත් තමන් උභයකුල පරිශුද්ධ වන්ට මවු පක්ෂ ය යහපත් නො වන හෙයින් රජ මායම් සිතිය නො හී ‘යහපත, අපගේ මුත්තණුවන් වහන්සේ නාවව’යි විධාන කළහ. මහානාම ශාක්‍යයෝ ද ‘මේ තමා හා කැටි ව නො කැවොත් මරව යි උඃ අත මියනු නො තරම්, මා ම මිය යැම යහපතැ’යි හිසකේ හුනා පියා අග දී ගැට ගසා ලා දියට බැස ලා පය මා පටැහිලි හිසකේ අග ගසා ලූ ගැටෙහි අවුළුවා ගෙන දියෙහි ගිලුණා වූ ය.

උන්ගේ ගුණානුභාවයෙන් නාග භවන ය. විල පත්ලෙහි හෙයින් හුණුවි ය. නා රජ්ජුරුවෝ කුමක් දෝ හෝ යි විමසන්නෝ එ පවත දැන දවුත් මහානාම ශාක්‍ය රජ්ජුරුවන් මුචලින්ද නම් නා රජ්ජුරුවන් දරණ ගැබ වැඩහුන් බුදුන්ගේ මලණු කෙණකුන් හෙයින් මුනු ත් පණයෙහි හිඳුවා ගෙන නාග භවනයට ගෙන ගියහ. උයි ත් ගිය දෙළොස් අවුරුද්දක් නාග සම්පත් විඳ නාග භවනයේ හුන්හ.

විඩූඩභයෝ ත් ‘මාගේ මුත්තණුවන් දුන් එන සේක. දුන් එන සේකැ’යි වේසී පියා ඉතා ම කල් යන්නා විල පරීක්ෂා කරවා පියා තව ත් බැලුව මනා තැන් විමසවා බලවා නො දැක නැඟී ගිය නියා ය යි තුමූ ත් නික් ම සවස් වේලාවට අචිරවතී ගඟ කරා අවුත් ගඟ බඩ කඳවුරු බැඳ ගත්හ. සමහර කෙණෙක් ඇතුළු ගඟ වැලි තලා මත්තෙහි නියං සමය හෙයින් වැද හොත්හ. සමහර කෙණෙක් ගොඩ වැද හොත්හ.

ගඟ ඇතුළ වැද හොත්තවුන් ගෙන් එද මියන්ට නිසි පෙර කළ පව් නැත්තවුන් වැද හොත් තැන කඩියෝ නැඟී ලා උන් කා උගුළුවා ලූ ය. උඃ පලා ගොසින් ගොඩ වැද හොත්තෝ ය. ගොඩ වැද හොත්තවුන් ගෙන් එද මියන්ට කළ පව් ඇත්තවුන් වැද හොත් තෙන ත් කඩියෝ නැඟි ලා කා උගුළුවා ලූ ය. උයි ත් ගොසින් ගං වැල්ලේ වැද හොත්හ. මෙසේ කළ පින් ඇත්තවුන් තේරී ගොඩට වූ කලට කළ පව් ඇත්තවුන් තේරී ගං වැල්ලට වූ කලට වැස්සෙක් නඟා ගෙන ගං හිස පාණ වැස්සෙක් වැස ගඟ මහ වතුරු අවුත් ගං වැල්ලට පැමිණි පිරිස් හා සමග විඩූඩභයන් සසර මුහුද නැතක් කල් පීනන්නවුන් හෙයින් අතුරෙක නො රඳා මුහුදු ලා පී ය. මුහුදට පැමිණි හැම දෙන ම ‘මුහුදු බත් වූහ’ යනු ව්‍යවහාර පමණක් හෙයින් මස් කැස්බන්ට බත් වූහ.

Non-Commercial Distribution

බොහෝ දෙන ත් 'අනේ ශාක්‍ය රජ දරුවන්ට තමන්ගේ ආවා වූ මරෙක මිය ත් මුත් මෙ ලෙසින් ආයුධ ලා කොටා මැරිය යුත්ත නොවෙ'යි කථා ඉපදවූහ. බුදුහු ඒ අසා වදරා 'කි සි සේ ත් මේ ජාතියෙහි තෙල ලෙස මිය යෑම යහපත් නො වෙයි. පෙර කළ පව් ලෙසට තෙලේ තරම ම ය'යි වදරා පෙර කළ පව් කවරේ දැ යි විචාළවුන්ට හැම දෙන ම එක් ව ලා ගඟ කුඩ මස්සන් මියන්ට විෂයක් ලූ නියාව වදාළ සේක.

නැවත එක් දවසක් ධර්ම සෙබෙහි රැස් ව හුන් වහන්දෑ 'විඩූඩභ යෝ එක් ලක්ෂ සැට දහසක් විවර ශාක්‍ය රජ දරුවන් බොහෝ සේ මරා එන තැනැත්තෝ තමන්ගේ මන දෙළ මුදුන් නො පැමිණෙන තෙක් මෙ තෙක් දෙනා සමග වතුරේ ගොසින් මස් කැස්බන් බත් වූහ'යි කථාවක් ඉපද වූ සේක. බුදුහු ත් ඒ අසා 'මහණෙනි, යම් සේ මාලා කාරයෙක් මල් වත්තකට වැද ලා මල් කඩා ගනිම් යි ගසෙක මල් කඩා නිමවා ගෙන අනික් ගසෙක මල් කඩනු නිසා යන්නේ මල් වත්ත මුළුල්ල ම සිත හෙළා ද මල් කඩන තැනැත්තේ කඩන මල් මුත් අනිකෙක සිත නො හෙළා ද මල් කැඩීමෙහි ගෙන සෙසු ත් කළ මනා දෙයෙහි පමාවේ ද එපරිද්දෙන් සමහර කෙණෙක් නො එක් මල් ගසින් යුත් මල් වත්තක් වැනි වූ පස්කම් ගුණයට පැමිණ සිත්කලු වූ රුවක් ලදින් එ පමණෙක නො සිට යහපත් ශබ්දයක් අසනු කැමති වෙද්ද, යහපත් සුගන්ධයක් අගනු කැමති වෙද්ද, යහපත් රසයක් ලබනු කැමති වෙද්ද, යහපත් පහසක් ලබනු කැමැති වෙද්ද, නොහොත් ඒ පසින් එකක් ලදින් අනික් නො පතා ලද දෙයෙහි ම මමායන ය කෙරෙද්ද, නැවත කෙත් වත් ලදින් ගම් බිම් හා ගම් බිම් ලදින් රට තොට හා, රට තොට ලදින් සෙසු සියල්ලක ඇලුම් කෙරෙද්ද, අනගාරික කෙණෙක් වූ නම් වෙහෙර පිරිවෙන් පා සිවුරු ආදියෙන් යම් කිසිවෙක ඇලුම් කෙරෙද්ද, එ ලෙස දෙ පක්ෂය ම ඇලුම් කරමින් සිටියදී ම මර සොර අවුත් ලා නිඳන ගම් වැස්සන් තිඳමින් සිටිය දී වතුරක් අවුත් ලා ගෙන යන්නා සේ හැර ගෙන ය යි' වදාළ සේක.

මේ වන්නා ශාක්‍ය වංශ ය නට ලෙස ය. මුන් හැම මුලින් පහළ වූ සැටි කෙසේ ද යත්--

මේ කප ආදියෙහි රජකම් කො ළෝ මහා සම්මත නම් රජ්ජුරු කෙණෙක. උන්ට ඉක්බිති ව උන්ගේ පුත් වූ රෝජ රජ්ජුරු වෝය. උන්ට ඉක්බිති ව උන්ගේ පුත් වූ වරරෝජ රජ්ජුරුවෝ ය.

Non-Commercial Distribution

උන්ට ඉක් බිති ව උන්ගේ පුත් වූ කල්‍යාණ රජ්ජුරුවෝ ය, උන්ට ඉක් බිති ව උන්ගේ පුත් වූ වර කල්‍යාණ රජ්ජුරුවෝ ය, උන්ට ඉක් බිති ව උන්ගේ පුත් වූ උපොසථ රජ්ජුරුවෝ ය. උන්ට ඉක් බිති ව උන්ගේ පුත් වූ මහාමන්ධාතු නම් සක් විති රජ්ජුරුවෝ ය, උන්ට ඉක් බිති ව වර රජ්ජුරුවෝ ය, උන්ට ඉක් බිති ව උපවර රජ්ජුරුවෝ ය, උන්ට ඉක් බිති ව මඛාදෙව රජ්ජුරුවෝ ය:

"අසඞ්ඛෙය්‍යායුකා එතෙ-අට්ඨවීසති භූමිපා.
කුසාවතිං රාජගහං – මිථිලඤ්චාපි ආවසුං"

යනු හෙයින් මූ හැම දෙන වෙන වෙන අසඞ්ඛ්‍යායුෂ්ක ව කුසාවතී ආදි වූ නුවර තුනෙහි රදා හිඳ රජ කම් කළහ. ඉන් කෙළවර මඛාදෙව රජ්ජුරුවන්ගේ පරම්පරාවෙහි අසූ දහසක් රජ දරුවෝ වූහ. උන්ට මෑත ඔක්කාක පරම්පරා තුනෙක් විය. ඉන් තුන් වන ඔක්කාක රජ්ජුරුවන්ගේ අග මෙහෙසුන් බිසෝවරු පස් දෙණෙක් වූහ. මේ බිසෝවරුන් පස් දෙනාගෙන් එ කී එ කී තැනැත්තන්ට පන් සියය පන් සියය වන නියායෙන් පිරිවර ගැනු ත් දෙ දස් පන් සියයෙක් ඇත. බිසෝවරු පස් දෙනා ගෙන් හැම බිසෝවරුන්ට වැඩි මාලු බිසොවුන්ගේ පුත්තු සතර බෑකෙණෙක් ඇත. දූ පස් දෙණෙක් ඇත. ඉන් එක් දුවණිකෙණෙක් ඇම දෙනාට ම වැඩි මාල්ලහ. අනික් දූ සතර දෙන පිරිමි පුතුන්ට බාලයහ. මෙ සේ ඒ වැඩිමාලු බිසවු දරුවන් නව දෙනකු වද ලා මළහ. රජ්ජුරුවෝ ද ප්‍රධාන බිසොවුන් මියන්නා ම පස් දෙනා පුරා අනික් බිසෝ කෙණකුන් ගෙන් වා අග මෙහෙසුන් කළහ. උයි ත් රජ්ජුරුවන්ට පුතණු කෙණකුන් වද දරු දස දෙනා පුරා ලා උපන් පස් දවසින් කුමාරයන් සරහා ලා රජ්ජුරුවන්ට පෑවූ ය. රජ්ජුරුවෝ සතුටු ව වරයක් හැර ගන්ට කිවූ ය. උයි ත් රජ්ජුරුවන්ගේ ආදි උපන් පුතුන් සතර දෙනකු හින්ද දී පසු ව උපන් තමන්ගේ පුතණුවන්ට රාජ්‍ය ය ඉල්වා තමන් ගේ නො දන් ම හැඟවූහ.

රජ්ජුරුවෝ රාජ්ජ්‍ය ය ඉල්වූ බිසොවුන්ට බැණ පියා 'හැයි මාගේ වැඩි විය පැමිණි සිටි පුතු නැ'යි කිවූ ය. අපෝ කොට ලා තව තව ත් තමන්ගේ පුතණුවන්ට රාජ්‍ය ය ඉල්වත් ම ය. රජ්ජුරුවෝ රාජ්‍ය ලොභයෙන් ම පුතුන්ට විනාශයක් කොට පූ නමුත් නපුරැ'යි පුතුන් සතර දෙනා කැඳවා ලා 'එම්බා දරුවෙනි, මම තෙල පසු ව ගෙනා බිසොවුන් වැදූ කුමාරයන් දැක උන්ගේ මෑණියන්ට යුහු ව වරයක් දිනිමි. උඹ තමන්ගේ පුතණුවන්ට

Non-Commercial Distribution

රාජ්‍යය කරණු කැමැත්තෝ ය. උන් කැමැත්ත ත් මම නො කැමැත්තෙමි. තොප සතර දෙනා මුඛ හුන් පමණින් නසා පූ නමුත් නපුර. යම් කිසි තැනකට පලා ගොසින් රඳා හිඳ ලා මා අයාමෙහි අවුත් රට ගනුව'යි විධාන කොට ලා ඇමැත්තන් අට දෙණකු පාවා දී ලා යවූහ.

ඌ සතර බෑයෝ ත් බූනණියනු ත්, නඟුන් සතර දෙනා ත් කැඳවා ගෙන සිවුරඟ සෙනඟ හා සමඟ නුවරින් නික්මුණාහ. රට වැස්සෝ ද 'මේ කුමාරවරුන් වහන්සේ පියාණන් වහන්සේගේ අයාමෙහි මේ රට කරණ සේක. මෙ වක් පටන් ම අත් නො හැර සිටුම්හ'යි බොහෝ දෙන කැටි ව නික්මුණාහ. පළමු දවස් සතර ගවුවක් විතරේ පුරා ගත්හ. දෙ වන දවස් අට ගවුවක් විතරේ පුරා ගත්හ. තුන් වන දවස් දෙළොස් ගවුවක් විතරේ පුරා ගත්හ. කුමාරවරු රැස් පිරිස් බොහෝ නියා ව බලා පියා 'සටන් කොට එක් විවර රටක් හැර ගත ත් මුන් මෙ තෙක් දෙනාට නො සෑහෙයි. අනුන්ට ගහට කොට ත් දූන් උදුරා මතු දෙන බව වේ ද? දඹ දිව රට කුඩා නො වත ත් වල් පාළු ව තිබෙන තෙනක නුවරක් මවම්හ'යි හිමවු පියස බලා නික්මුණා වූ ය.

නික්ම හිමවු පියසට ගොසින් වසන තෙනක් බලා ඇවිදිති. එහි හිමවු පියස ත් කපිල නම් තවුසාණ කෙණෙක් වෙසෙති. උන් වසන්නේ ත් පොකුණක් බඩ ය. ඌ හැම දෙනා ත් උන් වසන තෙනට ගියහ. තවුසාණෝ ත් උන් හැම දූක ආද්‍යන්ත විචාරා සියලු පවත් දූන ජීවිතාශාවෙන් විජිතාශාව හැර වල් වන් නියාවට කම්පා වූහ. ඒ තවුසාණෝ ද වැළි ත් යම් විද්‍යාවෙක බල යෙන් පොළොවින් අසූ රියනක් හා අහසින් අසූ රියනෙක දෙෂා දෙඝ දූනෝ නම් එ සේ වූ භූම්මාජාල නම් වූ විද්‍යාවක් දනිති. එ සේ හෙයින් තවුසාණන් පන්සල කළ තැන නම් ජය භූමියෙක.

ජය භූමි වූයේ කෙ සේ ද යත්—එ තැන හුන් හූරු කෙණෙක් මුව කෙණෙක් එ තැනට ආ සිංහ-ව්‍යාඝ්‍රාදීන් ලුහුබඳවා ගනිති. මඩුවන් හා මීයෝ සර්පයන් භය ගන්වති. එ හෙයින් ජය භූමි ය.

තවුසාණෝ රජ කුමරුවන් බණවා ලා 'ඉදින් මෙ තැන මා ගේ නමින් නුවරක් කරවු නම් දෙමි' කිවු ය. උයි ත් ගිවිස්සෝ ය. තවුසාණෝ එතැන තරම කියන්නෝ: 'මෙ තැන සැඩොලෙක් රඳා හුන් නමුත් සක් විති සෙනඟක් ආ මුත් පරදව'යි කියා ලා 'මෙ පන්සල රජ්ජුරුවන්ට ගෙය කොට ලා වට කොට නුවර ඉදි

Non-Commercial Distribution

කරව'යි කියා අවසර කොට ලා තුමූ ඊට නුදුරු තෙනක ගල් පාවුලක් බඩ පන්සලක් කොට ගෙන විසූ ය. කුමාරවරු ත් තවුසන්ගේ විධාන ලෙස ම නුවර කරවා ලා කපිල නම් තවුසාණන් විසූ තැන්හි වූ හෙයින් කිඹුල්වත් නුවර ය යි නම් තබා ලා විසූහ. ඇමැත්තෝ අට දෙන හා කුමාරයන් වහන්සේ ද වැඩී ගිය සේක.

'පියාණන් වහන්සේ මුබ වූවෝ ත් බිසෝවරුන් වහන්සේ නිල කරණ සේක. මෙ විට අපට භාර වේ ද'යි සිතා ලා කුමාර වරුන් හා කථා ත් කළහ. කුමාරවරු 'රටවල් තබා ලා වලට පලා ආ හෙයින් සරි සමාන කුලවලින් බිසෝවරුන් නො ලබම්හ. ජාති සම්භෙදයක් වී නම් නපුරු'යි බුන් බිසොවුන් මවු තනතුරෙහි තබා ලා සතර බෑයෝ නඟුන් සතර බින්නන් අග මෙහෙසුන් කළහ. බුන් බිසොවුන්ට කුෂ්ඨ රොගයෙක් ඇති වි ය. ඇඟ මුළුල්ල ම කොබෝලීල මල් සේ විය. රාජ කුමාරවරු 'මුන් වහන්සේට මේ ඇති වූ කුෂ්ඨ රොග ය එක් ව රඳා හිඳීමෙන් අපට ත් ආ නම් නපුරු'යි සිතා ලා උයන් කෙළියට යන බඳු ව බිසොවුන් වාහනයෙක ලවා ගෙන මහ වලට ගොසින් ගැඹුරු කොට වළක් කණවාලා දුව සිටුවා පෝරු අතුරුවා ලා ඇතුළේ ම බත් පැනු ත් නිළ කරවා ලා මතුපිට පස් වස්වා පියා නැඟී ගියහ.

එ සමයෙහි ඊට පෙරාතු ව රාම නම් රජ්ජුරු කෙණෙක් කුෂ්ඨ ඇති ව නුවර රඳන්ට ලජ්ජාවෙන් වැඩි මාලු පුතණුවන්ට රාජ්‍ජය දී පියා වලට ගොසින් වන මුල් පකා පැකී අනුභව කරන්නාහු කිසි බෙහෙතක් සම්භ ව කුෂ්ඨ නැති ව රන්වන් ව ගොසින් හිම වූ පියස ඇවිදිනා තෙනැත්තෝ සිදුරක් ඇති මහ ගසක් දැක ඒ ඇතුළත සොළොස් රියන් උස ගස් සිදුර පිරඹූ කසළ හැර පල්ලෙන් පුවරු උස් කොට අතුට ගෙන ඇතුළත් වන්ට ත් පිට ත් වන්ට ත්, දෙරකු ත් ලා ගෙන කවුළු දෙරකු ත් තබාගෙන හිණ කු ත් බැඳ සිටුවා ගෙන ඒ ගස් සිදුරේ හිඳිති. රෑ දවස් වක් ගිනි කබලෙක ගිනි මොළවා තබා ගෙන වැද හොවිති. යම් තෙනක සිංහ කෙණකුන්-ව්‍යාඝ්‍ර කෙණකුන්-දිවි කෙණකුන් හැඬූ නියාවක් ඇසූ නම් පාන් වූ කල ඔබ ගොසින් කා ව ඉරුවා පු මස් ගෙනවුත් කකාරා ගෙන කති. එක් දවසක් අලුයම් වේලෙහි ගිනි මොළවා ලා හුන්න. එ කල ව්‍යාඝ්‍රයෙක් ඉව බලවත් හෙයින් බිසොවුන් ඇඟ මනුෂ්‍ය ගන්ධ ය අසාලා වසා ලා ලු පස් පීරාපියා පුවරු ත් උගුළුවා සොලවා පී ය. යට හුන් බිසවු පෝරු හස්සෙන් ව්‍යාඝ්‍රයා දැක හඬා මුර ගෑවූ ය. මනුෂ්‍ය ශබ්ද ය භය ජනක හෙයින් ව්‍යාඝ්‍රයා ත් පලා ගියේ ය.

Non-Commercial Distribution

රජ්ජුරුවෝ ත් ඒ හඬ අසා ගැනු කෙණකුන්ගේ හඬ ය යි කියා ත් දන උදසන එ තැනට ගොසින් ‘තෙල තැන කවුරු දැ’යි කිවු ය. බිසවු ඒ අසා ‘ගැනියකමි, ස්වාමිනි’ කිවු ය. මෑත පලා එව’යි කිවු ය. ‘එ සේ නො එමි’ කී කල්හි ‘නො එන්ට කාරණ කිම දැ’යි කිවු ය. තමන් මුළාවට පැමිණිය ත් අභිමානයට වූ හානි නැති හෙයින් තමන් බිසෝ නියාව කිවු ය. රාම රජ්ජුරුවෝ ද ආද්‍යන්ත මුළුල්ල ම විචාරා දන ‘මම ත් වලට ආ බව මුත් රජ්ජුරු කෙණෙකිමි. කිරට හෙළහිතෙල් සම්භ වූවා වැන්න. පලා එව’යි කිවු ය. රජ නියාව ත් තත්ත්‍ව හෙයින් ම දන ගෙන මා ඇඟ කුෂ්ඨ රොගයෙක් ඇත. පිට ත් වන්ට බැරි ය’යි කිවු ය. ‘මට ත් කුෂ්ඨ නැති වූ බෙහෙත් ඇති බැවින් බෙහෙත් පිළිවන, මෑ ත් වව’යි හිණක් සිටුවා මෑත් කොට ගෙන තමන් අනුභව කළ බෙහෙත් ම දී නො බෝ කලෙකින් ම කුෂ්ඨ ය නැති කොට උන් තමන්ට බිසෝ කළහ. උයි ත් දූරි ඇති ව ලා වගී පරම්පරාව මහත් වුවමනා හෙයින් සොළොස් වාරයකින් දෙන්න දෙන්නා ඔබාදීන් පුතුන් දෙ තිසක් වද පූහ. උන් ශිල්ප උගන්නා අවස්ථා-වෙහි දී පියාණෝ ශිල්ප ඉගැන්වූහ.

එක් දවසක් රාම රජ්ජුරුවන්ගේ නුවර වසන එකෙක් ආකරවල රුවන් සොයා ඇවිදිනන් එ තැනට අවුත් රජ්ජුරුවන් දක හැඳින ගෙන තමා හඳුනන නියාව කියා කොයි සිට අයි දැ යි විචාළ හෙයින් නුවර සිට ආ නියාව කිවු ය. උන් කථා කරමින් හින්දදී කුමාරවරු අවු ය. කුමාරවරුන් දක ‘මූ කවුරු දැ’යි විචාළහ. දරුවන් නියාව කී කල්හි ‘ස්වාමිනි, මෙ තෙක් රජ පෙර හැර ගෙන වල හිඳිනේ හැයි ද? නුවරට වැඩිය මැනැවැ’යි කී ය. ‘දරුව, ඔබ හැයි ද? මෙ ම සැප ය’යි කිවු ය. එ තෙමේ මා ගරා පෙරා ඇවිදින්නේ ත් රුවන් ම වේ ද? මේ ගොසින් කී කලට ඔබින් ද රුවන් මිතු ද නො වෙයි. බිම් පමුණු ත් ලබමි’යි නුවරට ගොසින් රාම රජ්ජුරුවන්ගේ පුතණුවන්ට කී ය. උයි ත් පියාණන් කැඳවා ගෙන යන ලෙසට අවුත් නො එක් ලෙසින් කැඳවා ත් යන්ට මැළි හෙයින් ‘එ සේ වී නම් මෙ තැන ම නුවරක් ඉදි කරවමි’යි සිතා ඒ ගෙය කොට ගෙන හුන් ගස උදුරුවා දමවා පියා එ තැන මාළිගාවක් ඉදි කරවා ලා වට නුවරක් කරවා ලා කොලොම් ගස උදුරුවා එ තැන්හි කළ හෙයින් එ නුවරට කොළිය නුවර ය යි නම් තබා ලා පලා ගියහ.

කුමාරවරුන් දෙතිස වැඩි විය පැමිණි කල්හි මවු බිසවු ‘කිඹුල් වත් නුවර හිඳිනා රජ දරුවෝ මාගේ මලුන් හෙයින් තොපගේ

Non-Commercial Distribution

මයිලෝ ය. උන්ගේ දූ ඇත්නම් තොපට බිසෝ කරව'යි කිවූ ය. කුමාරවරු ත් ඒ අසා රාජ කුමාරිකාවරුන් දිය කෙළියට එන වේලාවට තුමූ පලා ගොසින් සැහවී සිට ලා දෙන පිළී නම්, බුලත් නම්, තමන් නියා ව හඬ ගා කියා ලා තමන් අභිප්‍රාය කෙණකුන් හැර ගෙන යෙති. රජ දරුවෝ ත් අසා 'උන් සිතක් ය. අවශ්‍ය බැණන් හෙයින් ගෙන්වා ත් පාවා දුන මනා තෙන කළ දෑ ම යහපතැ'යි කියා ලා හිඳිති. මේ කොලිය රජ දරුවන් ඇති වූ ලෙස ය.

කිඹුල් වත පහළ ව නුවර කොට ගෙන හුන් නියා ව අසා ඔක්කාක රජ්ජුරුවන් සමජ්ජියෝ ය යි කියා ලූ බස නිසා ශාක්‍ය රජ දරුවන් ඇති වූ ලෙස ය. සුද්ධොදන ය, අමිතොදන ය, ධොතොදන ය, සුක්කොදන ය, සක්කොදන ය යි යන පස් බෑ රජුන් දක්වා පැවැති එක් ලක්‍ෂ සැට දහසක් පමණ රාජ කටක ය පහළ වූ ලෙස යැ. තෙල විඩූඩභයන්ගේ වශයෙන් නට ලෙස ය.

එ සේ හෙයින් නුවණැත්තවුන් විසින් මර සොර නො එන තෙක් අනිත්‍යතාවට මේ සැහෙන හෙයින් අනිත්‍යතාව සලකා පින්හි හැසිර නිවන් අත් පත් කටයුතු.

## 47. පතිපූජිකා වස්තුව

තව ද මිනිස් ලොව ආයු හවුරුදු අසංඛ්‍යයකට වුව ත්, සමහර නරකවල ආයු දුටු කලට මකුළු හුයක් යටි පිටින් ද උඩු පිටින් කළු වන් වන විතරට ත් මඳ සේ හෙයින්, මිනිසුන්ට පතුල් තෙමෙන්ට ත් මඳ පැන් කුඹුවනට මහ වතුරු වන්නා සේ ජීවත් ව සිටිනා හවුරුදු ගණන ත් වස් දවස් ගණන ත් අජරාමර සේ සිතා ගෙන පිණ හැසිරෙන්ට මැළියවුන් පිණෙහි හසුරුවනු සඳහා පතිපූජිකා වස්තුව දක්වමු.

ඒ කෙ සේ ද යත්:—

තවුතිසා දෙව් ලොව මල් පළඳනා දෙව් පුතෙක් දෙවඟනන් දහසක් පිරිවරා උයනට මල් පළඳින්ට වන. ඉන් පන් සියයක් පමණ දෙව් දූ ගස්වලට නැඟී මල් කඩා වගුරුවති. දෙවඟනෝ පන් සියයක් කඩා වගුරුවා ලූ මල් ගෙන ගොස් දෙවතාවා සරහති. මල් කඩා වගුරුවන දෙව් දූන් අතුරෙන් එක් දෙවතා දූවක් ආයු ගෙවුණු හෙයින් හෝ නොහොත් පින් ගෙවුණු හෙයින් මල් ගසදී ම මළා ය. තුන් ගවු උස සිරුර ත් පහණක් නිවා පූ කලක් මෙන් නැති වි ය. උයි ත් සැවැත් නුවර එක් කුලයෙක ඉපැද උපන් ඇසිල්ලෙහි ම ඉකුත් ජාති සිහි කරණ නුවණ

ඇති ව තමා මාලාභාරී දෙව් පුත්හුගේ දෙවඟනක නියාව දන වැඩි විය පැමිණ මල් පුදා, පාන් පුදා, බණ අසා, මාලාභාරී දෙව් පුත්හු ළඟ ම උපදනට පැතුව. උයි ත් තමන් සොළොස් හැවිරිදි කල සරණ ගොසින් ලා බත් ආදි ය දන් දී ත් මාලාභාරී දෙව් පුත්හු ළඟ ම ඉපදීමට පතති. ඉක් බිත්තෙන් වහන්දෑ 'මූ පින් කමක් කොට ලා පූර්ව ජාතියෙහි ස්වාමී ව සිටි දෙවතාවාණන් පතති. එ හෙයින් පතිපූජිකාවෝ ය'යි නම් තබා ලූ සේක.

දෙ මවු පියන් තබා ලූ නම් අප්‍රසිද්ධ ව එ නමින් ම ප්‍රසිද්ධ වූහ. උයි ත් නිරන්තර ව තමන් ස්වභාවයෙන් ම සැදැහැ ඇති හෙයිනුත් මාලාභාරී දෙව් පුතුන් ළඟ උපදනට පතා ත් භොජන ශාලාව ත් හමදිති. පැන් පරහා ගෙනවුත් තබති. හසුනු ත් පනවා ලති. මුන් සැදැහැ ඇති නියාව දන සෙසු සෙස්සෝ ත් මාළු ගෙනවුත් දී ලා 'පුත, තෙල ඉදි කොට වහන්දෑට දෙව'යි විධාන කෙරෙති. උයි ත් ඒ විධාන ලදින් දන් සකස් කොට ඉදි කොට ලා ගෙන වුත් දෙති. මෙ ලෙසින් මූ විහාරයට යන එන ගමනින් කුසල් සිත්හි උපදනා සවිභක්තික අවිභක්තිකයන්ගේ වශයෙන් චිත්ත ය හා සමඟ කුසල් ධර්ම සූ පණසෙක් ලැබෙති.

උන්ගේ කුස දරු කෙණෙක් ඇති වූ ය. දස මස් අයාමෙන් පුතණු කෙණකුන් වදා උන් පියවර ඔසවා ඇවිදිනා කලට අතික් කෙණකුන, උන් පියවර ඔසවන කලට අතික් කෙණකුනැ'යි පුතුන් සතර දෙනකු ලද්දා.

උෟ එක් දවසක් දන් දී ලා පූජා සත්කාර ත් කොට බණ අසා පන් සිල් සමාදන් ව සවස් ව ගිය කලට එ වේලේ ම ඇති වූ රොගයකින් මිය ගොසින් මාලාභාරි දෙව් පුතුන් මල් පළඳිමින් උන් තෙන ම උපන්හ. සෙසු දෙවඟනෝ පන් සිය ය මෙ තෙක් කල් මුළුල්ලෙහි මල් පළඳවත් ම ය. මල් කඩන දෙවඟනෝ මල් කඩත් ම ය. මාලාභාරි දෙව් පුත් ද එ විට උපන් දෙවඟණන් දක 'උදසන පටන් මෙ තෙක් වේලා වන තුරු නුදුටුවමෝ කොයි ගියා දැ'යි විචාළෝ ය. 'මළෙම් වේ දැ'යි කී කල්හි 'කුමක් කියා ද, හදහා ගත නො හී විචාළෝ ය. මළ නියාව ම නියත කොට කියා 'කොයි උපනු දැ'යි විචාළ කල්හි සැවැත් නුවර කුල ගෙයක උපන් නියාව කිවූ ය. 'තොප ඔබ රඳුණේ කෙ තෙක් කල් දැ'යි විචාළ කල්හි 'මිනිස් ලොව මස් ගණනින් දස මසක් මවු කුස විසූ නියාව ත් දස මස් අයාමෙන් මවු කුසින් බිහි ව එ වක් පටන් සොළොස් හැවිරිදි වන තුරු දෙ මවු පියන් අතුරෙහි රඳා එ වකට සරණ හිඳිනා

Non-Commercial Distribution

වයස් හෙයින් සරණ ගොසින් ආදී උපන් දරුවන් පියවර ඔසවා ඇවිදිනා කලට අනික් දරු කෙණකුනැ'යි පුතුන් සතර දෙනකු වද දනාදී වූ පින් කම් කොට මුඹ වහන්සේ ම පතා පතිපූජිකා නමින් ප්‍රසිද්ධ ව මුඹ වහන්සේ ළඟ ම උපනිමී' කිවූ ය.

'මෙ වක මිනිසුන්ට ආයු කෙ තෙක් ඇද්දැ'යි විචාරා හවුරුදු සියයෙකැ යි කී කල්හි එ තෙක් ම ද'යි විචාරා ආයු ශක්ති ය බොහෝ ව ඇති බක්කුල මහ තෙරුන් වහන්සේ පවා එක් සිය සැට අවුරුද්දක් ම ජීවත් වූ හෙයින් අවුරුදු සියයට මඳක් වඩා හෝ අඩු ව මුත් ජීවත් වීම නැතැ යි කී කල්හි 'මෙ තෙක් ආයු හැර ගෙන උපන් මිනිසුන් පව් කම සෙදී පමා ව වෙසෙද් ද නො හොත් මසු දහසක් ඇති කෙණකුන් අනික් දහස් ගණනක් උපදවා ගන්ට උපදෙස් කරන්නා සේ පින් කමු ත් කෙරෙද්දැ'යි විචාළෝ ය. 'ස්වාමීනි, කුමක් කියන සේක් ද? මියන්නන් දෙන් නන් බල බලා ත් හවුරුදු අසඞ්ඛ්‍යයක් ආයු ඇත්තා සේ ජරා පමණක් ම නැත්තා සේ ඇවිදිනා බව මුත් පින් කරන්නා තබා උත්සාහ පමණකු ත් ඇත්තෝ බොහෝ නොවන්නෝ වෙත් ද'යි කිවු ය මාලාභාරී දෙව් පුත් හට 'මෙ තෙක් ආයු හැර ගෙන මිනිසුන් දන් පින් පමා නියා ය'යි බලවත් මුසුප්පු ඇති වි ය.

මිනිස් ලොවින් හවුරුදු සියයෙක් තවුතිසා වැසි දෙවියන්ට දව සෙක. එ සේ වූ දවසින් තිස් දව සෙක් මසෙක. ඒ දෙවියන්ට මස නම් මිනිසුන්ට තුන් දහසක් හවුරුදු ය. ඒ නිසා මසින් දෙළොස් මසෙක් ඒ දෙවියන්ට හවුරුද්දෙක. ඒ දෙවියන්ගෙන් හවුරුද්දෙක් මිනිසුන් ට හවුරුදු තිස් දහසෙක. ඒ නියා හවුරුද්දෙන් ඒ දෙවියන්ට ආයු හවුරුදු දහසෙක. මිනිසුන්ට තුන් කෙළ සැට ලක්ෂයක් හවුරුදු ය. එ සේ හෙයින් පතිපූජිකාවන් හවුරුදු සිය ය පුරා නුහුන් හෙයින් මාලාභාරී දෙව් පුත් හට දවසක් පුරා නො ගියේ ය. ඇසිල්ලක් විතර ය එසේ හෙයින් දෙවතාවාණෝ මුසුප්පු වූ ය.

දෙ වන දවස් වහන්දෑ ද ගමට සිඟා වන් සේක් අසුන් හල නො හැමඳ පු නියාව ත් හසුන් පනවා නු තුබූ නියාව ත් පැන් පරහා නු තුබූ නියාව ත් දැක, පතිපූජිකාවෝ කොයි ද'යි විචාළ සේක. 'ස්වාමීනි, ඊයේ මුඹ වහන්සේ ලා වළඳා ලා වැඩ පී කලට සවස් වෙලා වන තුරු කිසි ද ලෙඩක් නැති ව හිඳ ලා සවස් වෙලාට එ විට ම ඇති වූ ව්‍යාධියකින් මළෝ ය'යි කිවු ය. ඒ අසා පෘථක් ජන වහන්දෑ උන්ගෙනු ත් ලත් උපකාර සලකා කඳුළු රඳවා ගත නො හී වැලපී සේක. රහත් වහන්සේට හඩන්ට කාරණා

වූ ශොක ය නැති හෙයින් සියලු ප්‍රත්‍යය සමුත්පන්න ධර්මයන් කෙරෙහි භයාකාරයෙන් පවත්නා නුවණ ඇති වි ය. ඒ වහන්දෑ වළඳා ලා වෙහෙරට ගොසින් 'ස්වාමීනි, පතිපූජිකාවෝ කවර ත් පිණක් සොත්සාහ ව කොට ලා තමන්ගේ සමුණන් ම පැතූ ය. උඹ දූන් පර ලොව ගියහ. උන් උපන්නේ කොයි දෑ'යි විචාළ සේක. 'තමාගේ ස්වාමීහු ළඟ ම උපන්හ'යි වදාළ සේක.

'උන් ළඟ නැති වුව, ස්වාමීනි,' කී කල්හි 'තෙල ස්වාමීහු පතා කළ පින් කමෙකු ත් නො වෙ යි. තුලු පැතුයේ ත් නැත. පතිපූජිකාවගේ මීට පෙරාතු ජාතියෙහි තවුතිසා දෙව් ලොව මාල භාරී නම් දෙව් පුතෙක් ස්වාමි වූයේ ඇත. උඹ මල් පලඳනා වේලෙහි මිය මේ මිනිස් ලොව ඉපැද පෙරළා ත් මල් පළඳිමින් හුන් තෙන ම උපන. අනික් දවසෙක මල් පළඳිමින් හුන් විටෙක ත් නො වෙයි. තමා මළ දවස් ම මල් පළඳිමින් හුන් දවස ය'යි වදාළ සේක. ඒ අසා වහන්දෑ 'අනේ ස්වාමීනි, මේ මිනිසුන්ගේ ආයු ශක්ති ය ලඝු ය. පෙර වරු දවස් අප වළඳවා ලා සුව සේ ම හුන් තෙනැත්තෝ සවස් වේලාට මළෝ ය'යි මරණ සි භාවනාවට එ යි ත් අරමුණු කළ සේක. බුදුහු ද 'හෙම්බා මහණෙනි, මල්වත්තෙහි මල් කඩන මාලාකාරයා කඩමින් සිටි මල් කඩා නො නිමන තෙක් ම මල් ගෙතීම ආදී වූ අත්‍යායික කටයුත් තෙක කැඳවා ගෙන යන සේ නො ලද සම්පත් පතා නො ලබන තෙක් ලද සම්පත් ප්‍රයොජන විඳ නො නිමන තෙක් මර අවුත් වැද ලා හඩමින් වලපමින් සිටියදී ම කවුරුන් කෙරෙහි ත් අවස්ථා වක් නො කොට හැර ගෙන යෙයි' වදාළ සේක. මේ දෙශනා කෙළ වර ත් බොහෝ දෙන සෝවාන්-සෙදගැමි-අනගැමි රහත් වූහ.

එ සේ හෙයින් සත් පුරුෂයන් විසින් මිනිස් ලොව එක දවසක් රඳා හිඳිත ත් නො පමාව පින් කොට භව සම්පත් වළඳා කෙළවර නිවන් සම්පත් සැධිය යුතු.

---

## 48. මච්ඡරිය කෝසිය සිටාණන් ගේ වස්තුව

තව ද මාලුවා ලිය වැළඳි ගස් කොළවල වැඩියුරුවක් නැත් තා සේ තද මසුරු සිත් ඇත්තවුන් පිණට නො ලැගෙන නියාව හඟවනු පිණිස මච්ඡරිය කොසිය සිටාණන්ගේ වස්තුව දක්වමු.

ඒ කෙ සේ ද යත්:-

රජගහ නුවරට නුදුරු තෙන සක්ඛර නම් නියම් ගමෙක් ඇත. ඒ නියම් ගම මච්ඡරිය කොසිය නම් සිටාණ කෙණෙක්

Non-Commercial Distribution

වෙසෙති. සම්පත් බලා ලූ කලට අසූ කෙළක් විතර ය. තණ අග ගලා තෙල් බිඳුවක විතරක් අනුන්ට දීල ත් නම් සිතට දුක් බලවත් හෙයිනු ත් නො ලබන දුක් පතුන් සේ ම තමන් ප්‍රයෝජන විඳිනට නැති හෙයිනු ත් දුක් පත් කම සම්පතට වඩා මහත අනුන්ට දී නො ලන හෙයිනු ත් තමන් ප්‍රයොජන නො විඳිනා හෙයිනු ත් උන් ලද සම්පත නම් රකුස්සන් තමන් නො බොන හෙයිනු ත් අනුන් බිය නො දෙන හෙයිනු ත් රකුසු රකවල තුබූ විලක් වැන්න.

බුදුහු එක් දවසක් අළු යම් වේලෙහි මහ කුලුණු සම වතින් නැඟී ගඳ කිළියේ පටන් සක්වළ මුව විට දක්වා නුවණ දැළ පතු රවා නිවන් දක්වන්ට නිසි සත්ත්වයන් බලන සේක් සැවැත් නුවරට එක් සිය අසූ ගවුවකින් ඔබ්බෙහි වසන මච්ඡරිය කෝසිය සිටාණන්ගේ හා සිටු දුවණියන්ගේ හා සෝවාන් වීමට නිසි හෙතුව දුටු සේක.

පෙරාතු දවසක දී සිටාණෝ රජ ගෙට ගොසින් එන තෙනැත් තෝ එක් සාකුස් ඇති දනවූ මිනිසකු කුම්මාසයන් පිරුණු කබලු පූවක් කන්නවුන් දක සම්පත් මහත් වූව ත් අදහස කුඩා හෙයින් ඒ කබලු පූවෙහි රුචියක් ඇති ව ගෙන තමන්ගේ ගෙට ගොසින් 'ඉදින් කබලු පූවක් කනු කැමැත්තෙම් කීම නම් මා කැමති වූවා සේ ම බොහෝ දෙන ත් කන්ට සිතා ගනිති. එ සේ කලට මා ගෙන් බොහෝ සාල් හා කිරි පැණි සකුරු ආදි වූ බොහෝ දෙයට අළවි පෙනෙයි. කිසි කෙණකුන්ට ත් නො කියම්'යි සම්පත් ඇති නියා ව කාට ත් නො හඟවන්නා සේ ම කබලු පූවට කළ ආලය ත් සිටු දුවණියන් පමණකට ත් නො හඟවති. නො හැඟවීමෙන් කල් යත් යත් කසා යුස වත් කොට පිසූ කබලු පූ සේ පඬුවන් පැහැ ඇති විය. නො තර මාලු කඩෙක වැල් පැද ලූ කලක් මෙන් ඇඟ නහර වැලුත් ඉපිළ ගියේ ය.

කබලු පූවට රුචි බලවත් වත් ශ්‍රී යහන් ගබඩාවට වැද ලා, යහනට පැන නැඟී ලා, වස්තුව ප්‍රබල වූව ත් සිත දුර්වල හෙයින් වක ගසා ගෙන කබලු පූවෙන් මුත් නො සන්හිදෙන තරම් සිත ව්‍යාධි ය ඇති ව වැද හොත්තේ ය. එ සේ වූව ත් වස්තු හානිය ම සලකා ලජ්ජා සම්පන්න කෙණකුන් අසථානයෙහි ඇති ලෙඩක් අනුන්ට කියන්ට මැළි වන්නා සේ කියන්ට මැළි ව කිසි කෙණකුන්ට ත් නො කියති.

ඉක් බිත්තෙන් ඇමෙණියෝ හැඳ බඩට ගොසින් පිට පිරිමැද පියා 'ඇඟට නුසුව කුමක් දැ'යි විචාළහ. 'මට කිසි ත් අපාසුවෙක් නැතැ'යි කී කල්හි 'රජ්ජුරුවන් වහන්සේ ගෙන් උදහසක් වූ නියා දැ'යි විචාරා 'එ සේ ත් නැතැ'යි කී කල්හි 'දූ දරුවන් ගෙන් හෝ ගෙයි කෙලි කොල්ලන් ගෙන් මුසුප්පු වන්ට නිස්සක් කළ නියා දැ'යි විචාරා එ සේ ත් නැතැ'යි කී කල්හි ගෙයි දඩ විචාරීමෙහි කුසී කමක් නැත්තා සේ ම විචාරීමෙහි නූ කුසීත ව 'එ සේ කල කිසි දෙයක් කන්ට රුචි ඇති නියා දැ'යි විචාළහ. එ සේ වුවත් වස්තුව අගිදම් වෙයි යන හයින් කිසිවකු ත් නො කියා ම වැද හොත්හ. ඉක් බිත්තෙන් සිටු දූවණියෝ මට කියන දෙයට මැළි වන්නේ හැයි ද? කිව මැනැවැ'යි තරව කිවූ ය. එ වෙලෙහි දී රළු දෙයක් සපා දූක සේ ගලන පරිද්දෙන් කිසිවක් කන්ට ආලයෙක් ඇතැ'යි කිවූ ය. 'කුමකට දැ'යි විචාළ කල්හි සිත හා උනු ත් ගෙන කබලු පූවකට ය'යි නැතක් වෙලකින් කෙසි විදට මහත් දෙයක් කෙසි විදකුන් අදනා කලක් පරිද්දෙන් දූක සේ කියා පිහ.

සිටාණන්ගේ අදහස පටු වුව ත් තමන්ගේ අදහස විශාරද හෙයින් 'ඇයි මෙ විතරක් කියන්ට මැළි වූයේ, අසූ කෙළක් වස්තු ඇති ව ත් දුක්පත් හෙයින් ද? සියලු ම මේ සක්ඛර නම් නියම් ගම් ඇත්තවුන්ට සෑහෙන ලෙස කබලු පූ පිසම්[1] දැ'යි එ තෙක් කල් උන් ළඟ වැස ත් උන්ගේ අදහස සිතට නො නැංගා සේ විචාළෝ ය. ඒ අසා සිටාණෝ 'උන් අපට හැයි ද? උං රුචි ඇත්ත වූ නම් තම තමන් ගෙන් කතී' කිවූ ය. 'එ සේ වී නම් මේ නියම් ගම එක් වීථියක ඇත්තවුන්ට සෑහෙන ලෙස පිසෙම් දැ'යි කිවූ ය. 'හැයි තොප මා ඇතුන් නියා ව අපි දන්නමෝ වේ දැ'යි කියා ඊට ත් මැළි වූ ය. එ සේ වී නම් මේ මාළිගාව ඇතුළත වසන්නවුන්ට සෑහෙන ලෙස පිසම් දැ'යි කිවූ ය. උන් තමන්ගේ අදහස් ලෙසින් විචාරන්නා 'තොපගේ අදහස විශාරද නියා ව ආදි නො හැඟුණ ත් දූනු ත් නො හැඟේද? එ සේ ත් නො කැමැත්තේ ය'යි කිවූ ය. එ සේ වී නම් මූඹගේ අඹු දරුවන් පමණකට සෑහෙන සේ පිසම් දැ'යි කිවූ ය. 'සෙසු වුව මනා දවස් නැති හෙයින් අද ම වුම මනා ද? උන් හැම හැයි දැ'යි කිවූ ය. 'එ සේ කළ මේ සා මහත් සම්පත් ඇති මූඹ ම තනි ව තබා ගෙන අනුභව කරන්නේ කෙ සේ ද? මූඹට ත් මට ත් අප දෙන්නා පමණකට යට ත් පිරිසෙයින් සාල් එක් නැළි මනාවක් විතර වන හෙයින් එ පමණක් පිසමෝ දැ'යි විචාරා 'තෙපි කා

1. පිසෙම

Non-Commercial Distribution

කුමක් කරා දැ'යි කී කල්හි උන්ගේ මසුරු අදහස සියලු ලෙසින් දැන ලා 'එ සේ වී නම් මුඹ පමණකට කබලු පිසෙම් දැ'යි විචාළෝ ය.

ඒ ගිවිස ලා 'මෙ තැනදී පිසතොත් බොහෝ දෙන ආල ය කෙරෙති. සාල් ඇර ගන්නා කලත් නො කඩ සාල් හැර නො ගෙන කඩ සාල් හැර ගෙන ඉදින්නකුත් කබල් පූ කිරිත් හැර ගෙන කිරි පැණිත් මීත් කබලුව කා ගන්නා විවර මුත් වඩාත් හැර නො ගෙන සත් මාල් මාලිගාවේ උඩු මාලට නැඟී ලා පිසව. මමත් උඩු මාලේ දීම කම්'යි තමන්ගේ මසුරු කමෙහි තරම සුහකුත් පසුව භගවත්ට නො තබා හඟවා පූ ය. උයිත් යහපතැ යි ගිවිස කබලු කැවුමට වුව මනා දෙය ගෙන්වා ගෙන මාළිගාවට නැගෙන්නෝ කෙල්ලනුත් සිටුවා පියා සිටාණන් පමණක් හැර ගත්හ. උයිත් මාලින් මාලේ අගුළු ලා ගෙන සත් වන මාලට නැඟී ලා සත් වන මාලේ කවුළු දෙරත් පියා පූවොත් අඳුරු හෙයින් කවුළු දෙර හැර තබා ලා මහ දෙර අගුළු ලා ගෙන කබලු කන්ට දැපී උන්හ. සිටු දියණියෝත් උදුනෙහි ගිනි මොළවා ලා කබල උදුනේ තබා ලා පාත දීම කොටා සලා ගත් පිටි හෙයින් කබලු පිසන්ට පටන් ගත්හ.

ඉක් බිත්තෙන් බුදුහු උදසනම සෘද්ධිමත් තැනට අග පත් මුගලන් මහ තෙරුන්වහන්සේ බණවා ලා ''හෙම්බා මුගලන්නි'' රජගහ නුවරට නුදුරු සක්ඛර නම් නියම් ගම මසුරු සිටාණන් කබලු කමින් 'මී අනික් කෙණෙක් දැක ආල ය කෙරෙත් දෝ හෝ'යි යන භයින් සත් වන මාළිගාවේ උඩු මාලේ වැද හිඳ කබලු පිසවයි. තෙපි ඔබ ගොසින් තොපගේ ආනුභාවයෙන් මසුරු සිත් හරවා තොප කෙරෙහි පහදවා ගෙන උන් දෙ මාල්ලන් ලවා පිසූ කබලු පූත් පැණි ආදියත් ගෙන්වා ගෙණ තොපගේ ආනුභාවයෙන් එක් සිය අසූ ගවුව ගෙවා වළඳන වේලාවට මේ දෙව්රමට එව, නිති පිරිවර පන් සියයක් භික්ෂූන් හා සමඟ වෙහෙර ම රඳා තනි සිටාණන් පමණකට ඉදි කළ කබලු ම සහපිරිවරින් හිඳ වළඳම් හ''යි වදළ සේක.

මුගලන් මහ තෙරුන් වහන්සේ 'යහපතැ'යි ගිවිස බිමින් යන ගමන් කල් යන හෙයින් අහසින් ඒ නියම් ගමට වැඩ මාළි-ගාවේ සිවු මැදුරු කවුළුව ගාවා ගැටවටු ගන්වා අහස ඉඳුනිල් මිණි රුවනක් මෙන් වැඩ සිටි සේක. සිටාණෝ ද තෙරුන් වහන්සේ දැක, ''මමත් වැළිත් මෙ තැනට එන්නෙම් පාත වී නම් යමෙක්

එ තැනට සම්භ වෙති. සම්භ වූ නම් මා පවා පිලිණි කබලු කෑමට ආල ය කළ කල උඹ තුමූ මෙ තරම් දෙයකට කැල ම ආල ය කෙරෙති යි උන් කෙරෙහි ම සැකයෙන් මෙ තැනට අයිම්. සිනෙන් සැඟවෙන්නට බැරියා සේ මුයි ත් අවුදින් මෙ තැනට සම්භ වූ ය. ආදි ම කවුළු දොර ත් මෙසේ වූ අවුල් තකා වසා-ලන්නට නුවූ හෙයින් මුන් අවුත් සිටිය දී වසා ලන්ට ත් තරම් නො වෙයි. කළ මනා කිම් දෝ හෝ''යි සිත ත් කබලු කන්ට සිතා ගත් උපදේශ මුත් පරලොවින් ගැළ වෙන්නට උපදෙස් පමණකු ත් තමන් නො දත් හෙයින් එ සේ වූ තැනට සිතන්ට නිස්සක් සිතා ගත නොහී ගින්නට දමා ලූ ලුණු මෙන් ත තනමින් 'මහණ, මෙ අහස සිටිනා තබා සක්මන් කෙළෙහි නමු ත් මින් ලබන දෙයෙක් නැතැ'යි කී ය. ඒ අසා මහ තෙරුන් වහන්සේ උන්ට ඒ බැරෑරුම් වුව ත් තමන් වහන්සේට බැරෑරුම් නො වන නියාව හෙයින් නිරාලම්බන වූ අහස සක් මන් කරන්ට පටන් ගත් සේක.

සක් මන් කරණ නියාව දුටු කල හිඳිනට පිළිවන් ම නියා වෙ ද යි සිතා ගත නොහී 'සක්මන් කරන්නා තබා අහස පලක් බැඳ හුන්න ත් මින් ලබන දෑ නැතැ'යි කිවු ය. මහ තෙරුන් වහන්සේ ද මුන් කී කී දෙයක් ම කළ මනා වේ ද යි කාය චිත්ත ගතිය ලඝු කොට ගෙන අහස වැඩ හුන් සේක. 'තෙල ලෙසින් හිඳ කුමක් ද? අහසින් අවුත් කවුළු දොර කෙරේ සිටිය නමුත් මින් ලබන දෙයෙක් නැතැ'යි කිවු ය. මහ තෙරුන් වහන්සේ ත් වැඩ කවුළු දොර එළි පත වැඩ සිටි සේක. 'එ තන සිටියා තබා දුමා ගිය ත් මින් ලබන දෙයෙක් නැතැ'යි කිවු ය.

මහ තෙරුන් වහන්සේ කබලු පිසන උදුනෙන් නැඟෙන දුමට ත් වඩා දුමා ගිය සේක. සියලු මාළිගාව දුම් ගෙයක් සේ විය. සිටාණන්ගේ ඇසට දුම් වැද ලා කබලු මඳ හෙයින් හඬන්නා සේ ඇසින් දිය වැගිරෙන්ට වන. 'දුමන්නා තබා දිළිහී ගිය නමු ත් නො ලබව'යි කිව මනා බස ගෙය ද යේ දෝ හෝ යි යන හයින් නො කියා 'මේ මහණ මට ත් වඩා කැවුමට රුචි ඇති වන. නො ලද හොත් මේ තරම් තරයක් ඇති තැනැත්තෝ නො යෙති. එක් කබලු කැවුමක් දෙවම්'යි පිස නිමියායෙන් දෙත හොත් එක් කබලු කැවුම මහතැ යි සිතා සිටු දුවණියන්ට 'කුඩා ම කොට ලා කබලු කැවුමක් පිස ලා තුලුන්ට දී උන් මෙ තැනින් නික්මෙන ලෙසක් කරව'යි කිවු ය.

Non-Commercial Distribution

සිටු දුවණියෝ ද හැඳි අගින් පිටි සිහිත්තක් හැර ගෙන කබලු පිසන කබලේ වත් කොට ලූ ය. සූධා භොජන ජාතකයෙහි මෙ ම මසුරු සිටාණන් කිරි බත් කන්ට පත් ගෙනෙන්ට කී කල හිම වතට අත පුවා ලා අඩන්නා සා මහත ඇති මාලුවා පත් අතුළා සේ ම පිටි සුහක් වත් කළ ත් මහ තෙරුන් වහන්සේගේ ආනුභාව යෙන් ආදි පිසූ කබලු මුළුල්ලට ත් වඩා කුඩා කරන්ට සිතූ කබලු කැවුම මහත් වි ය. 'ඒ මහතැ'යි තවත් කුඩා ම කොට පිසන්ට ප්‍රයොග කළ සේ ම කැවුම මහත් වේ ම ය. සිටාණෝ මුසුප්පුව පියා සිටු දුවණියන්ට කියන්නෝ 'සොඳුර, කුඩා වත් කිම, මහත් වත් කිම? තිලින් එක් කබලු කැවුමක් දී පියව'යි කිවු ය. සිටු දුවණියනු ත් එකක් හැර ගෙන පිළිගන්වන්ට ය යි එකක් අල්-වන්නා මහ තෙරුන් වහන්සේගේ ආනුභාවයෙන් හැම කබලු කැවුම් ම එක බඳ ව ඇලිණ.

සිටු දුවණියෝ එකක් වෙන් කරන්ට උත්සාහ කොට ලා 'මේ කබලු කැවුම පිසීමෙන් වෙන් බව මුත් තිබීමෙන් එක් වි ය. වෙන් කොට ගත නො හැකි ය'යි කිවු ය. එ සේ වී නම් ඉදෙ යි කියා ලා තුමූ ත් එකක් වෙන් කරන්ට යත්න කොට වෙන් කොට ගත නු හුණුවු ය. පිසූ තැනැත්තවුන් හා පිස වූ තැනැත්තවුන් හා දෙන්න එක් ව එකක් වෙන් කොට ගන්ට යත්න කොට ත් වෙන් කොට ගත නුහුණුවු ය. ගත් ආයාසයෙන් ඇඟින් ඩා ත් වැගිරෙන්ට වන. කබලු කැවුමට රිසි ත් ගියේ ය. ඉතිකින් දෙන්ට ත් සිතා ගෙන 'අපට කබලු කැවුම් නො කැමැත්තේ ය. පැසින් ම දී පියව'යි කියා සිටු දුවණියන්ට කිවු ය. උයි ත් කබලු පැස හැර ගෙන මහ තෙරුන් වහන්සේ ළඟට ගියෝ ය. මහ තෙරුන් වහන්සේ උන් දෙන්නාට තුනුරුවන ගුණ ත් දන් දීමෙහි අනුසසු ත් විභූතකොට දක්වා බණ වදරා දෙන්න ම සතුටු කැරවූ සේක.

බණ අසා පහන් සිතැ'ති සිටාණෝ 'ස්වාමීනි, ඇතුළු මාළිගාවට වැඩ ශ්‍රී යහන් මත්තේ වැඩ හිඳ කබලු වැළඳුව මැනැ-වැ'යි කිවු ය. 'සිටාණෙනි, අප එ සේ වළඳන්නේ කෙසේ ද? බුදුහු නිති පිරිවර සඟ පන් සිය ය හැර ගෙන සිහා ත් නො වැඩ කබලු වළඳන්ට වෙහෙර ම වැඩ හුන් සේක. තොපගේ කබලු කැවුමට රුචි තැත ත් බුදුන් කරා යන්ට රුචි ඇත්තා නම් සිටු දුවණියන් හා තෙල හැම ගෙන්වා ගෙන යම්හ'යි වදළ සේක. සිටාණෝ ත් 'බුදුහු දූත් කොයි දූ'යි විචාරා 'මෙ තැනට

Non-Commercial Distribution

එක් සිය අසූ ගවු වෙකින් ඔබබේ දෙව්රම් වෙහෙර වසන සේකැ'යි වදළ කල්හි 'වේලා නො වරදවා මෙ තෙක් කතර යා හැකි දැ'යි විචාළහ.

'සිටාණෙනි, තෙපි රුවි ඇත්තා නම් මම මාගේ ආනුභාවයෙන් කැඳවා ගෙන වේලා නො වරදනා තෙක් ඔබ ලා ලමී' වදළ සේක. එ තැන තබා බඹ ලොව වැඩ හුන්න ත් ඔබ වී නමුත් ලා ලන්ට බල ඇති සේක. මෙ සේ වදරා ලා 'සිටාණන්ගේ මාළිගාවේ හිණි හිස මේ මාළිගාවේ ම වේව'යි හිණි පා මුල දෙව් රම වේව යි ඉටා ලා උන් දෙ මල්ලන් කැඳවා ගෙන උඩු මාලෙන් යට මාලට බසිනා වේලාවට ත් වහා ම දෙව්රමට වැඩි සේක. ඔහු දෙන්න ද බුදුන් ළහට ගොසින් වළඳන වේලා නියාව දන්වූහ. බුදුහු වළඳන ගෙට වැඩ පනවන ලද බුදු හස්නෙහි සඟ ගණ පිරිවරා වැඩ හුන් සේක. සිටාණෝ ද බුදු පාමොක් සඟගණ අතට පැන් දුන්හ. සිටු දූවණියෝ බුදුන්ගේ පාත්‍රයට කබලු පිළිගැන්වූ ය. බුදුහු ත් යපෙන පමණක් පිළිගත් සේක. පන් සියයක් දෙනා වහන්සේ ත් තමන් වහන්සේ යපෙන පමණක් පිළිගත් සේක. සිටාණෝ ද මී සකුරු පැණි ආදිය පිළිගැන්වූ ය. බුදුහු සහ පිරිවරින් බතට ත් කොට කබලු ම වැළඳූ සේක.

සිටාණෝ ද වළඳා ඉතිරි ව ගිය දෙය හෙයින් ඇමෙණියන් හා සමඟ බඩ පුරා ම කෑවු ය. වළඳන වේලාවට වෙහෙරට රැස් වූ සිය ගණන් සිහන්නන් පුලන්නන්ට ත් දීත් සිටාණන් පමණකට ඉදි කළ කබලු නො නිමා සිටු දූවණියන් විචාළ ලෙසින් සියලු සක්බර නම් නියම් ගම ඇත්තවුන්ට දුන ත් නො නිමන තරමේ තිබෙයි. උතුරු කුරු දිවයිනි න් ගෙනා සාල් නැළියෙකකබලු ත් නො වෙයි. වහන්දෑ ද බුදුන් ළහට ගොසින් කබලු නො නිමෙන නියාව දන්වූ සේක. බුදුහු ඒ අසා 'එ සේ වී නම් වෙහෙර දොරටුව කෙරේ ලවා පියව'යි වදළ සේක. වදළ විධානයෙන් දොරටුව ළඟ ගල් තල්ලෙක ලා පී සේක. ඒ ගලට අද දක්වා ත් 'කබලු ගල ය'යි කියති. සිටාණන් හා සිටු දූවණියෝ ද බුදුන් ළහට ගොසින් වැඳ ලා එකත් පස්ව සිටියහ. බුදුහු උන් අනුභව කළ කබලු රස ය වෘත්ත සන්නිශ්‍රිත හෙයින් විවෘත්ත සන්නිශ්‍රිත රසයක් දෙවනු නිසා බණ වදළ සේක. බණ අසා දෙන්න ම සෝවාන් ව බුදුන් වැඳ ගෙන වෙහෙර දොරටුවෙහි පිහිටා තුබූ හිණට නැඟී ලා තමන්ගේ මාළිගාවට ම ගියහ. සිටාණෝ ද එ වක් පටන් අසූ කෙළක් වස්තු මසුරු සිත් නැති වූ හෙයින් දන් විධානයට ම නිල කළහ.

Non-Commercial Distribution

දෙ වන දවස් සවස ධම් සෙබෙයි රැස් ව හුන් වහන්දෑ 'ඇවැත්නි, මුගලන් මහ තෙරුන් වහන්සේගේ ආනුභාවයක් බලව, මසුරු සිටානන්ගේ සැදැ ත් නො නසා සම්පතට ත් හානියක් නො කොට ඇසිල්ලකින් ම උන් පහදවා ගෙන පාත්‍රයට පිළිගෙන ගෙනෙන්ට පිළිවන් කබලු උන් ලවා ගෙන්වා ගෙන අවුත් බුදුන්ට ළං කොට ලා සෝවාන් කරවා ලූ සේක. අනේ ඔබගේ ආනුභාවයක් බලවත් නිසා ය'යි ඔබගේ ගුණ වදළ සේක.

බුදුහු එ තැනට වැඩ කෙරෙමින් හුන් කථාව විචාරා වදරා මුගලන් මහ තෙරුන් වහන්සේගේ ගුණ කථාව නියාව දන් වූ කල්හි 'මහණෙනි. කුල පහදවන්නවුන් විසින් සැදැවට ත් භොගයට ත් හානියක් නො කොට මල් රොන් ගන්නා මී මැසි බඹර මැසි ආදීන් මලෙහි පැයට ත් සුවදට ත් හානියක් නො කොට වුව මනා රොන් පමණක් හැර ගෙන මී රස කරණු නියා වලට ගොසින් ගස් සිදුරු ආදියෙහි මල් රොන් ලා ලා සෙසු ත් වුව මනා දෙය ත් ලා ලා මී බැඳ මී රස අනුභව කරන්නා සේ ගම්වල සිඟා ඇවිද ලද දෙයක් ගමින් පිටත පැන් ඵාසු තැනක දී හිඳිනා කඩ ලා ගෙන වැද හිඳ පිළිකුල් විසින් මෙනෙහි කොට බත අනුභව කොට ලා වලට වැද කමටහන යෙදී මාගීඵල උපදවා ගෙන නිවන් රස අනුභව කරන්නෝ ය'යි වදරා බොහෝ දෙන නිවන් දක්වා මුගලන් මහ තෙරුන් වහන්සේ ගිය දවස ත් ශක්‍ර ව ඉපැද මසුරු සිටාණන් දන් පින්හි යෙදූ සැටි ය දක්වන්ට -

"උභො ඛඤ්ජා උභො කුණී - උභො විසමචක්ඛුලා,
උභින්නං පිළකා ජාතා - නාහං පස්සාමි ඉල්ලිසං"

යනාදීන් ඉල්ලීස ජාතකය ත් වදළ සේක.

එ සේ හෙයින් නුවණ ඇත්තවුන් විසින් මසුරු සිත නම් දියෙහී හට ගත් සෙවෙලක් මෙන් කුසල් සිතට පිළිපක්[1] හෙයින් කළ පිටින් සෙවෙල් ඉවත් කරන්නා සේ තදඞ්ග වශයෙන් වුව ත් මසුරු සිත නැති කොට කුසල්හි යෙදී නිවන් අත් කට යුතු.

---

## 49. පාථෙය්‍යකාජීවක වස්තුව

තව ද සුචරිත පූරණයට නම් අනුන් අත් බලා හිඳීමෙන් ප්‍රයෝජන නැති නියාව දක්වන්නමෝ පාථෙය්‍යකාජීවක වස්තුව දක්වමු.

---

1. පිළිවක්

Non-Commercial Distribution

කෙසේ ද යත් —

සැවැත් නුවර හිඳිනා එක් උපාසිකාවක් පාථෙයාක නම් ආජීවකයකු තමාගේ වද[1] පුතකු නො වන හෙයින් පුත් තරමේ තබා උගෙන් කිසි ද ප්‍රයෝජනයක් නැත ත් පිළිදග්ගි ඉක් බිති ගෙවල මිනිස්සු බුදුන් කරා ගොසින් බණ අසා අවුත් 'අනේ බුදුන්ගේ බණක් ඉතා මධුර නිසා ය'යි විස්තර කොට කියති. ආජීවකයාට මවු ව හිඳිනා උපාසිකාවෝ ද බුදුන් ගෙන් බණ අසනු කැමැති ව එ පවත් ආජීවකයාට කියා ලා යම්හ යි කිවූ ය. ඒ යන්ට නො කැමැත්තේ ය යි වැළකී ය. උපාසිකාවෝ 'තෙමේ තමා සැදෑවක් නැති හෙයින් කා ගත නො හෙන්නවුන් අනුනු ත් කනු නො කැමැත්තා සේ විහාරයට ගොසින් බණ අසා ගත නො දෙයි. ආරාධනා කොට බුදුන් මුබ ගෙන්වා ගෙන මුබ දී ම බණ අසමී' සවස් වේලේ පුතනුවන් බණවා ලා 'යව, විහාරයට ගොසින් සෙට දවස් බුදුන් මුබ දී වළඳන්ට වඩනා නියායෙන් නිල කොට ගෙන එව'යි කිවූ ය.

උයි ත් විහාරයට යන තැනැත්තෝ පළමු කොට ආජීවකයා ළඟට ගොසින් වැඳ ලා හුන්හ. ආජීවකයා 'කොයි යවු දැ'යි විචාරා 'මෑණියන්ගේ විධානයෙන් බුදුන්ට ආරාධනාවට යෙමී' කී කල්හි, 'තෙපි ආරාධනාවට විහාරයට නො යව'යි කී ය. 'මම අපගේ මෑණියන් වහන්සේ කියා ලූ මෙහෙවර වරද්ද නො පියහෙමි'යි කිවූ ය. 'එ සේ නො කැමැත්තේ ය. උන්ට ඉදිකළ දන් දෙන්න එක් වලා කම්හ නො යව'යි කී ය. 'මුඹගේ විධානයට වඩා අපගේ මෑණියන් වහන්සේගේ විධානය ම අපට වැටෙන හෙයින් යෙමි ම'යි කිවූ ය. 'එ සේ තොප තත්පර පසු ගොසින් සාමාන්‍යයෙන් ආරාධනා කොට ලා 'තොප හිඳිනා ගෙය අසවල් වීථියේ ය. අසවල් තැන ය යි නො කියා අසවල් මහ වැඩිය මැනැවැයි නො කියා එව යි. තමා කුසල් මං අකුසල් මං නොදන්නා සේ ම බුදුනු ත් උන්ගේ ගෙය පමණට ත් මං නො දනිති සිතා එයි ත් නො කියන්ට කී ය.

එ ලෙස කියා ලා කළ මනා ලෙස කියන්නේ 'තොප ආලෙද ත් නො කියා මදක් සිට ලා අනික් මගෙක එව'යි කිවූ ය. එයි ත් ඒ ගිවිස ගෙන බුදුන් ළඟට ගොසින් ආරාධනා පමණක් කොට ලා අසවල් මහින් අසවල් වීථියේ අසවල් ගෙට වඩනා

1. වැඳූ, වඳපු

Non-Commercial Distribution

බව ය යි නො කියා මදක් සිට ලා ආ ලෙ ද තබා ලා අනික් මෙහෙකින් ආජීවකයා ළඟට අවුත් කියා ලූ ලෙසට නො වරදවා කළ නියාව කී ය. ආජීවකයා ද ඒ අසා 'කළ දෑ යහපත ඉදි කළ දන දෙන්නී කම්හ'යි කියා ලා දෙවන දවස් උදසන ම ආජීවකයා එ ගෙට ගියේ ය. උඟ කැඳවා ගෙන පිටි පස්සේ ගෙයක හිඳුවා ලා ඒ උපාසිකාව තමන් බුදුන්ට දන් දී නුපුරුදු හෙයින් අසුන් පනවන ලෙස නො දන්නා ඉක් බිති ගෙවල මිනිස්සු එ ගෙයි ගොම පිරි බඩ ගෙන ලා ලද පස් මල් විසුරුවා ලා බුදුන් වැඩ හිඳිනට මාහැඟි කොට හස්නක් පනවා ලා කළ මනා පිළියෙළ කොළෝ ය.

බුදුවරුන් වහන්සේ එක් කෙණකුන් මඟ කිව මැනවැ යි නැත. පැරුම් පුරා නිමවා බෝ මැඩ වැඩ හිඳ බුදු වන දවස් ම තව බුදු නො වන තුරු 'මේ නරකයට යන මග ය, මේ තිරිසන් යෝනි යට යන මග ය, මේ ප්‍රේත ලෝකයට යන මග ය, මේ මිනිස් ලොකයට යන මග ය, මේ දෙව් ලොවට යන මග ය, මේ බඹ ලොවට යන මග ය, මේ නිවන් මග ය'යි සියලු ම මං දැක වදළ හෙයින්, ගම් නියම් ගම් ආදියට මං කැල ම දැන වදළ හෙයින්, බුදුහු උදසන ම තමන් වහන්සේ පමණකට කළ ආරාධනා හෙයින් පා සිවුරු තමන් වහන්සේ ම හැර ගෙන උපාසිකාවන්ගේ ගෙදෙරට වැඩි සේක. උයි ත් පෙර මගට අවුත් බුදුන්ට පසඟ පිහිටුවා වැඳ ගෙන ඇතුළු ගෙට වඩා ගෙන ගොසින් හස්නෙහි වඩා හිඳුවා සස්නෙහි පහන් ව අතට පැන් වඩා ලා තමන් තමන්ගේ බල පමණෙක ඉදි කළ ත් දෙවියන්ගේ වසයෙන් අති මධුර වූ ආහාර වළඳවා ලා වළඳා අන්තයෙහි අනුමෙවෙනි බණට ආරාධනා කොට පාත්‍ර ය ගත්හ.

බුදුහු මියුරු කට හඬින් බණ වදරන්ට පටන් ගත් සේක. උපාසිකාවෝ ද සාධුකාර දි දී බණ අසති ආජීවකයා ද පිටි පස්සේ ගෙයි හුන් තැනැත්තේ උපාසිකාවන් බණ අසා සාධුකාර දෙන හඬා අසා හිස රුජා ව ඇති කෙණකුන් මහත් කොට දෙඩන බස් ඉවසි ය නො හෙන්නා සේ කන මී වත් කරන්නා සේ ඇසෙන සාධුකාර සැදැහැ නැති හෙයින් කන හුල් ගසන්නා සේ තෙමේ ඉවසා ගත නො හී ගෙ පිටි පස්සෙන් අවුත් 'කාලකණ්ණි තැනැත් ති ය, තුලුන්ට තෙල ලෙස සත්කාර කොට බණ ත් අසා මෙ තෙක් දවස් ගරුතර ව හුන් තරම ත් නසා ගත්ති ද, ඉතිකින් තිට වැඩෙක් නම් නැත' යනාදීන් උපාසිකාවන්ට ත් දෙඩා ගෙන කළ ආරාධනාවෙන් දන් වළඳන්ට වැඩ හුන් බුදුන්ට ත් දන් වළඳා බණ වදළ පමණකට බැණ ගෙන නිරා වදිනට පලා ගියේ ය.

Non-Commercial Distribution

උපාසිකාවෝ ද උගේ දෙඩීම් බිණීමෙන් බලවත් ලජ්ජා ඇතිව සිත එකඟ නො වී බණ දෙසුම් ලෙසට නුවණ මෙහෙයා ගත නුහුණු වූ ය, බුදුහු ඒ දැන 'කුමක් ද, උපාසිකාව, කෙතකට පැන් ඇළත් යොමු කරන්නා සේ බණට සිත යොමු කොට ගත නො හේද්ද' යි විචාරා 'එ සේ ය, ස්වාමීනි, වැඩෙමින් සිටි දළුවකට නියඟක් කළ වියවුලක් මෙන් තුලුගේ කථාවෙන් වික්ෂෙපයට පැමිණ සිත එකඟ නො වෙ' යි කිවු ය. බුදුහු ද ඒ අසා තෙල සේ වූ වන්ගේ බස් නම් වැසි නැති ව හඬන අහසක් මෙන් නිෂ්ප්‍රයෝජන හෙයින් සිත් හෙළා ඇසි ය යුතු නො වෙ යි. ඇසී ගිය ත් සිත තිබි ය යුතු නො වෙ යි. කවුරුන් කුමක් කීව ත්, කුමක් බිණුව ත්, දෙඩීම් බිණීම් ලබන්ට වරදක් නැති පසු ඒ උන්ට ම නැගෙ යි. සිතාගෙන ගිහි වූ වො ත් 'අසවල් තැනැත්තෝ සැදැහැ නැත්තෝ ය, දන් පින් නො කෙරෙති' කියා ත් ශාසනික වූ වොත් 'අසවල් වහන්දෑ සැදෑ නැති සේක.

'ඇදුරු වතෙක් වේව යි, තෙර වතෙක් වේව යි, ආගන්තුක වතෙක් වේව යි, ගමික වතෙක් වේව යි. මහ බෝ වතෙක් වේව යි, පොහො'ග වතෙක් වේව යි, බොජුන් හල වතෙක් වේව යි, ගිනි හල් ගෙයි වතෙක් වේව යි, වතෙකැ යි කියා කරණ දෙයෙක් නැත' යනාදීන් එයි ත් නො සලකා තමා ම කළ නො කළ දෙය සලකා කළ දෙය කළාට ම හැර නො කළ වත් පිළිවෙත් ශාසනිකයන් විසින් කොට ගිහින් විසිනු ත් තුන් සුසිරි පුරා නිවන් අත් පත් කට යුතු ය යි වදාළ සේක. ඒ බණ අසා උපාසිකාවෝ සෝවාන් ව ආජීවක භක්ති සත්කාය දෘෂ්ටි නැති වීමෙන් ම හළ වූ ය. මේ දෙශනාව බොහෝ දෙනාට ත් ප්‍රයොජන වි ය.

එ සේ හෙයින් සැදෑ ඇති කුල දරුවන් විසින් කවුරුන් කුමක් කීව ත් ඒ සිතට නො නහා තුන් දුසිරින් දුරු ව තුන් සුසිරි පුරා නිවන් දහම් පසක් කට යුතු.

---

## 50. ඡත්තපාණී උපාසක වස්තුව

තව ද තුනුරුවන් විෂයෙහි ආදර ගෞරව ඇති ව විසි ය යුතු තරම ඡත්තපාණි උපාසක වස්තුවෙන් දක්වමු.

ඒ කෙ සේ ද යත් :–

සැවත් නුවර තෙවළා බුදු වදන් දන්නා අනාගාමි ඡත්තපාණි නම් උපාසක කෙණෙක් අනැගැමියන් පොහෝ දවසින් පොහෝ දවසට පොහො'හ සමාදන් වුව මැනැවැ යි නැති හෙයින් සමහර

Non-Commercial Distribution

රජ දරු කෙණකුන්ට අභිෂෙක ය හා සමඟ පහළ වන රාජර්ධිය සේ පහළ වන අනාගාමී මඟ හා සමඟ ම පහළ වූ පොහො අඟ ඇති හෙයින් පෙහෙ ව බුදුන් කරා ගොසින් වැඳ ලා බණ අස අසා හුන්හ. එ වේලාවට කොසොල් රජ්ජුරුවෝ බුදුන් දක්නට අවු ය. ඡත්තපාණි උපාසකයෝ රජ්ජුරුවන් එන නියාව දැක නැඟී සිටිය යුතු දෝ කිම් දෝ හෝ යි සිතා ගණන් නැති සක්වළවලට අග රජ වූ බුදුන් ළඟ හිඳ සියලු දඹ දිව තබා දඹ දිවින් භාගයක් විතරට ත් නායක කම් නැති රජ්ජුරුවන් දැක නැඟී සිටියෙම් නම් බුදුන්ට ආදර කළා නම් නො වෙයි. රජ්ජුරුවෝ තමන් දැක නැඟී නො සිටියාට මුසුප්පු වෙති. උන් සිත් රක්නා නිසා නැඟී සිටි යො ත් බුදුන්ට ත් වඩා උන් උසස් කළ නිසා ය.

''උසස් කළ මනා බුදුන් වැඩ හින්ද දී මෙ රජ්ජුරුවන් උසස් නො කෙරෙමි' යි දැක නැඟී නො සිටියහ. නුවණැති කෙණෙක් වූ නම් ගරුතර තැන් ළඟ හිඳ නැගී නො සිටිය යි මුසුප්පු නො වෙති. මෙ රජ්ජුරුවෝ තමන් නුවණ මඳ හෙයින් කාරණ සලකා ගත නො හී මුසුප්පු වූ ය. උන් කෙරේ මුසුප්පු ඇත ත් බුදුන් කෙරෙහි මුසුප්පු නැති හෙයින් වැඳ ලා එකත් පස් ව හුන්හ. බුදුහු රජ්ජුරුවන් උපාසකයන් කෙරෙහි මුසුප්පු නියාව දැන ලා මේ මුසුප්පුව සිත තබා ගෙන තමා රජ හෙයින් මුන්ට අනාඝියක් සිතා පි නමුත් නපුරු යි'මහ රජ, මේ උපාසකයෝ ත්‍රිපිටකධරය, මහා නුවණැති ය. සැවැත් පුරෙහි හිඳිනා පමණක් මුත් අනාගාමී ව නිවන් පුර අත්ගෙන හිඳිනා කාරණා ත් දන්ති' යනාදීන් උපාසක යන් ගේ ගුණ බොහෝ කොට වදළ සේක. ගුණ අස ත් අස ත් රජ්ජුරුවෝ මුසුප්පු හළවූ ය.

ඉක් බිත්තෙන් එක් දවසක් කොසොල් රජ්ජුරුවෝ මාළිගා-වෙ මතු මාලේ සිටියෝ ඡත්තපාණි උපාසකයන් බත් කා ලා කුඩ ය හැර ගෙන සෙණ්ඩුලුවෙන් යන්නවුන් දැක කැඳවා යවු ය. උ එ වේලෙහි හිසට කළ කුඩය ත් හැර පියා පය ලා ගෙන යන වහනු ත් පයින් ගළවා පියා රජ්ජුරුවන් කරා ගොසින් වැඳ ලා එකත්පස් ව සිටියහ. රජ්ජුරුවෝ 'හැයි, තෙපි හිසට කොට ගෙන ආ කුඩය ත් පය ලූ වහනු ත් හළා නැ'යි විචාරා 'මුඹ වහන්සේ කැඳවා වදළ නියා ව අසා ය'යි කී කල්හි 'අප රජ රජ නියා ව දන්නේ අද දෑ' යි කිවු ය. 'රජ්ජුරුවන් වහන්ස, අපි හැම දවස් ම දනුම් හ'යි කිවු ය. 'එ සේ කල එ දවස් බුදුන් ළඟ හුන් ගමනේ අප දැක නැඟී නො සිටියේ හැයි දෑ'යි විචාළෝ ය. 'රජ්ජුරුවන් වහන්ස, මම තුන් ලොවට උතුම් රජ්ජුරුවන් ළඟ හිඳ මුඹ වහන්සේ දැක



Non-Commercial Distribution

නැමී සිටියෙම නම් බුදුන්ට කෙළේ ආදර නො වන්නේ වේද යි දුක නැඟී නොසිටියෙමී' කිවු ය. 'පින්වත, ඒ වන්නාට ය, ඒ කෙසේ වේව යි තොප බහුශ්‍රුත ව ආගමධර බැවින් අපගේ පුරඟනන්ට බණ කියව'යි කිවු ය

'ස්වාමීනි, රජ ගෙවල කටයුතු නම් මහා බැරි ය. අපගේ පෙර රජ ගෙවල හැසිරීමකු ත් නැති හෙයින් අමුතු ව ලා ඒ බැරි ය'යි කිවු ය. 'දුක නැඟී නො සිටිය නියාවට අප මුසුප්පු ඇතැ යි නො සිතා බණ ඇසීමෙහි තර ව අභිප්‍රාය ඇත්තවුන්ට බණ කියව'යි කීව ත් 'අපට බැරි ම ය. ශාසනික තැනක් ලවා බණ කියවුව මැනැවැ'යි කිවු ය. රජ්ජුරුවෝ ත් 'යහපත, තෙපි යව'යි කියා ලා බුදුන් කරා ගොසින් 'ස්වාමීනි, මල්ලිකා බිසවු ත් වාසභඛත්තියාවෝ ත් බණ උගනුම්හ'යි කියති. පන් සියයක් දෙනා වහන්සේ හා සමඟ රජ ගෙට වැඩ උන් බණ උගන්වා වදාළ මැනැව'යි කිවු ය. 'මහරජ, සර්වඥවරයන්ගේ නිබඳ ව එක් තැනකට එළඹීම් නැත. බොහෝ දෙනාට පින් පිරෙන්ට නැති හෙයිනැ'යි වදාළ සේක. 'එ සේ වී නම් එක් භික්ෂු කෙණකුන් වහන්සේට භාර කළ යහපතැ'යි කිවු ය. බුදුහු අනඳ මහ තෙරුන් වහන්සේට භාර කළ සේක. අනඳ මහ තෙරුන් වහන් සේ ද එක් වන් රජ ගෙට වැඩ බණ උගන්වන සේක. 'මුන් දෙන්නා ගෙන් මල්ලිකා බිසවු උගන්නා කල ත් බණ සකසා ඉගෙන හදරා පිරිවා පසු ව වනපොත් පිරිවති. වාසභඛත්තියාවෝ උගන්නා කල ත් සකස් කොට නො උගනිති. නො හදරති. නො පිරිවති. වනපොත ත් කියා ලිය නො හෙති.

එක් දවසක් බුදුහු අනඳ මහ තෙරුන් වහන්සේ බණවා ලා 'කුමක් ද, ආනන්‍දයෙනි, බිසෝවරු බණ උගනිත් දැ'යි විචාරා 'එ සේ ය ස්වාමීනි' කී කල්හි 'උන් දෙන්නා ගෙන් සිත හෙළා සකස් කොට බණ උගන්නෝ කවුරු දැ'යි විචාළ සේක. ස්වාමීනි, මල්ලිකාවෝ බණ සකස් කොට උගනිති. හදරන නියාව ත් වන පොත ත් යහපත, මුඹවහන්සේගේ නෑයන්ගේ දූ වූ වාසභ-ඛත්තියාවන් බණ උගන්නා නියාව ත්, හදරන පිරිවානා නියාව ත් වන පොත් කරණ නියාව ත්, යහපත් නො වෙ'යි වදාළ සේක.

බුදුහු ඒ අසා, 'ආනන්‍දයෙනි, මා ගේ බණ නම් සකස් කොට නො උගන්නවුන්ට පැය ඇතිව ත් සුවඳ නැති මල් පැළඳීමෙන් ප්‍රයෝජන විඳිනවුන්ට ප්‍රයෝජනයක් නැත්තා සේ හදරන පිරිවානා නියාව ත් වනපොත ත් යහපත් වුව ත් ඒ වූ පරිද්දෙන්

Non-Commercial Distribution

නො පිළිපැද නව ලොවුතුරා දහම් නමැති අබරණින් නො සැර හෙන්නවුන්ට ප්‍රයෝජන නැත. යම් කෙණෙක් සකස් කොට ඉගෙන හදරා පිරිවා ඒ වූ පරිද්දෙන් පිළිපදි ත් නම් පැය නැතිව ත් සුවඳැති මල් පළඳින්නවුන්ට මහා ප්‍රයෝජන වන්නා සේ නව ලොවුතුරා දහම් නැමති මලුත් පලඳවා ලන හෙයින් මහා ප්‍රයෝජන ය. බණ සකස් කොට උගැන්ම නම් මෙලෝ පර ලෝ වැඩ සාධා දීල'යි වදාළ සේක. බණ දෙසුන් කෙළවර බොහෝ දෙන සතර මග සතර ඵලයට පැමිණියහ. පස්වා දහසක් මුළුල් ලෙහි ත් බොහෝ දෙනහට වැඩ සාධා දිනා.

එ සේ හෙයින් නුවණැත්තවුන් විසින් උගන්නා බණ දහම් සකස් කොට ඉගෙන උගන්නා පමණක් නොව සකසා පිළිපැද පර්‍යාප්ති-ප්‍රතිපත්ති දෙක මුල් ව ප්‍රතිවෙධය ත් සිද්ධ කට යුතු.

---

# 51. විශාඛා වස්තුව

තව ද හීන ජාතියෙහි උපන ත් බෝධිසත්වවරයන්ගේ ගුණයෙන් අඩුවක් නැත්තා සේ ලසු අදහස් ඇති ස්ත්‍රී ව ඉපැද ත් ජාතියෙන් සරි වුවත් අදහසින් සරි නොවන්නවුන් කරා පැමිණ ත් අදහසෙහි අඩුවක් නැති ව බොහෝ පින් කොට දික් ව තිබෙන දෙයක් කපා ලුහුඬු කළා සේ හේතුසම්පන්නයන්ට අක් ඇත ත් මුල් නො පෙනෙන හෙයින් දික්වූ සසර ලුහුඬු කළ ලෙස දක්වන්ට විශාඛා වස්තුව කියමු.

කෙ සේ ද යත්:-

පියුමතුරා නම් බුදුන් සමයෙහි එක් උපාසිකා කෙණකුන් වර අටක් ලදින් ඒ බුදුන්ට උපස්ථාන කරන්නවුන් දැක ඊ නිසා කප් ලක්‍ෂයක් මුළුල්ලෙහි ත් අග්‍ර උපස්ථායිකා වීමට පතා විශාඛාවෝ දඹදිව් තෙලෙහි අඟුරට භද්දිය නුවර මැඩ මහ සිටාණන්ගේ පුත් වූ ධනඤ්ජය සිටාණන්ට දුව උන්ගේ ඇඹෙණියන් සුමනා දේවීන් කුස පිළිසිඳ ගෙන දස මස් අයාමෙන් උපන්හ. විශාඛාවන් සත් හැවිරිදි අවස්ථාවෙහි බුදුහු හිරුරැස් ගැසී පිපෙන්ට තුබූ පියුම් සේ නිවන් දක්නට නිසි ව සිටි සෙල බ්‍රාහ්මණාදීන් නිවන් දක්වනු පිණිස බොහෝ භික්ෂූන් වහන් සේ පිරිවරා අන්තොමණ්ඩල ය මධ්‍යමණ්ඩල ය බාහ්‍ය මණ්ඩලය යන මණ්ඩල තුනින් එක් තරා මණ්ඩලයෙක සැරිසරා වඩනා සේක් භද්දිය නුවර ත් හේතුසම්පනයන් ඇති බැවින් ඊ පැමිණි සේක.

Non-Commercial Distribution

එ සමයෙහි ද වැළි ත් මැඩමහ සිටාණෝ මහ පිනැත්තන් පස් දෙනකු ගෙන් අනික් සතර දෙනාට තුමූ නායක ව සිටු කම් කෙරෙති. මහ පිනැති පස් දෙන නම්:—මේ මැඩ මහ සිටාණෝ තුමූ ය. උන් ගේ ම නායක අඹු වූ සඳපියුම් නම් දේවී ය, උන් ගේ ම පුත් වූ ධනඤ්ජය සිටාණෝ ය, උන් ගේ ඇඹෙණියෝ සුමනා දේවී ය, හැම දෙනාට ම අයති වූ පුණ්ණ නම් කොල්ලණුවෝ ය යි මොහු පස් දෙන ය.

තව ත් බිම්සර රජ්පුරුවන්ගේ විධාන පවත්නා රට ජෝතිය සිටාණෝ ය, ජටිල සිටාණෝ ය, පුණ්ණක සිටාණෝ ය, කාක-වලිය සිටාණෝ ය'යි මහ සම්පත් ඇති සිටුවරු සතර දෙනෙක් ඇත. මැඩ මහ සිටාණන් ඇතුළු වූ මහ සම්පත් ඇත්තෝ පස් දෙන ය.

ඉන් මැඩ මහ සිටාණෝ බුදුන් තමන් හිඳිනා භද්දිය නුවරට වැඩි නියාව දන තමන්ට මිණිබිරි වූ පුතණුවන්ට දූ වූ විශාඛාවන් බණවා ලා 'මිණිබිරිනි, තොපට ත් අපට ත් මහා වැඩ ය. තොපගේ පිරිවර පන් සියයක් පමණ කුඩා කෙල්ලන් හා සමඟ රථ පන් සියයකට නැඟී පූජාභාණ්ඩ ත් පිරිවර කෙල්-ලන් ලවා ගෙන්වා ගෙන බුදුන්ට පෙර ගමන් කොට යව'යි කිවු ය. උයි ත් යහපතැ යි ගිවිස නික්ම විදුර කුඩා වුව ත් කැපීමේ අඩුවක් නැත්තා සේ මැණික කුඩා වුව ත් අගය මහත් සේ තමන් බාල වුව ත් නුවණ මහත් හෙයින් හා කාරණාකාරණ දන්නා හෙයින් බුදුන් පෙනෙන තැන් දක්වා රථයෙන් ගොසින් බුදුන් දක රථයෙන් බැස පියා ළඟට ගොසින් වැඳ ලා එකත් පස් ව සිටියහ. බාල ව සිටි කල පෙර ගමනට ප්‍රසාදයක් දෙන්නා සේ අදහස් බලා බණ වදළ සේක. ලෙඩ සන්සිඳෙන්ට නිසි බෙහෙතක් පූ කල වහා ලෙඩින් ගොඩ නැඟෙන්නා සේ බණ අසා සෝවාන් වී මෙන් බලවත් ලෙඩ තුනෙකින් ගොඩ නැඟී සසර භයින් මිදුනවු ය. කැටි ව ගිය කෙළි සුඟු පන් සියය ත් කැටි ව ම සෝවාන් ව නිවන් පුර වන්හ.

මැඩ මහ සිටාණෝ ද බුදුන් කරා ගොසින් බණ අසා සෝවාන් ව දෙවන දවසට ආරාධනා කොට ලා දෙවන දවස් තමන්ගේ ගෙයි දී බුදු පාමොක් සංඝයා වහන්සේ මධුරාහාර ය වළඳවා ලා මෙම ලෙසින් දෙපෝයක් මුළුල්ලෙහි මහදන් දුන්හ. බුදුහු ත් භද්දිය නුවර නිවන් දුට මනාවුන් නිවන් දක නිමනා-තෙක් වැස ලා එ නුවරින් අනික් තැනකට වැඩ පි සේක.

Non-Commercial Distribution

එ සමයෙහි ද වැළි ත් බිම්සර රජ්ජුරුවන්ගේ නැගණියන් කොසොල් රජ්ජුරුවන් කෙරේ හෙයිනු ත් කොසොල් රජ්ජුරුවන්ගේ නැගණියන් බිම්සර රජ්ජුරුවන් කෙරේ හෙයිනු ත් එ ලෙසින් දෙන්න දෙ සුරුබඩුවෝ ය. කොසොල් රජ්ජුරුවෝ එක් දවසක් සිතන්නෝ 'බිම්සර රජ්ජුරුවන්ගේ රට මහා සම්පත් ඇති සිටුවරු ජොතිය ය, ජටිල ය, මෙණ්ඩක ය, පුණ්ණක ය, කාකවලිය යි පස් දෙනෙක් ඇත. මාගේ රට එ සේ වූ කෙණෙකු ත් නැත. බිම්සර මහ රජු ගෙන් ඉන් එක් කෙණෙකුන් ඉල්වා ගනිම් නම් යහපතැ' යි සිතා රජගහා නුවරට ගොසින් බිම්සර මහ රජු ගෙන් සාද සාමීචි විඳ ගෙන ආ කටයුතු විචාළ කල්හි මුඹගේ විධාන පවත්නා රට සිටුවරු පස් දෙනෙක් ම ඇත. මාගේ රට සිටුවරුන් ගෙන් දෙවියන් නැති කෝවිල් සේ, පැන් නැති විල් සේ, ඵල ජාති නැති ගස් සේ, වහන්දෑ නැති විහාර සේ, රජුන් නැති රට සේ සිස. එක් කෙණෙකුන් කැඳවා ගෙන යෙමී සිතා අයිමී. එක් කෙණෙකුන් මා හා කැටි ව එවන්ට වුව මැනැවැ'යි කිවු ය.

'දරු මුණුබුරු පරම්පරාවෙන් නො ගිල පැවත ආ කුල ය. වගී පරම්පරාව ත් මහත. උන් හැම මුල් බැස හුන්නවුන් හෙයින් සොලවා ලන්ට බැරි ය'යි බැරි ම හෙයින් කිවු ය. 'මහ කුලවල් සොලවා උගුළුවා ලන්ට ඔබ බැරි වී නම් නො ලදෙ ත් යන්ට මට ත් බැරි ය' යි කොසොල් රජ්ජුරුවෝ කිවු ය. 'මුඹ තත්පර වුව යි කුමක් කොට ලිය හැකි දැ'යි ඇමැත්තන් හා කථා කොට ජොතියාදී සිටුවරු පස් දෙනා උගුළුවා ලීම නම් පොළොව සොලවා ලන්ට බැරියා සේ බැරි නියා ව දැන මැඩ මහ සිටාණන්ගේ පුත් ධනඤ්ජය නම් සිටාණ කෙණෙක් ඇත. උන් හා කථා කොට ලා නිහඬ කියා ලිය හැක්කැ' යි උන් ගෙන්වා ලා 'පුත කෝසල රජ්ජුරුවෝ තකා පතකා සිටාණ කෙණකුන් තමන් රට නිල කරන්ට කැඳවා ගෙන යන්ට අවු ය. තෙපි උන් හා කැටි ව යව'යි කිවු ය. අප කෙ සේ පොහොසත් වුව ත් රජ දරුවන් අයිති හෙයින් නො යන්ට පිළිවන් ද? වදළ කල ගිය මනා වේ දැ'යි කිවු ය. 'තොප හැම ලඝු තරමුන් නො වන හෙයින් සිතා ලා යන්ට පිළිවන් ද? ගමන් සරහා ගනුව'යි කිවු ය. උයි ත් ගමන් සරහා ගත්හ.

රජ්ජුරුවෝ ද තමන්ගේ විධානයෙන් යන හෙයින් බොහෝ සංග්‍රහ කොට ලා 'අර්ථි ව ඉල්වන හෙයින් මුත් යවිය යුත්තෝ නො වෙති. මුන් කැඳවා ගෙන ගිය මැනැවැ' යි කොසොල්

Non-Commercial Distribution

රජ්ජුරුවන්ට පාවා දුන්හ. රජ්ජුරුවෝ උන් කැඳවා ගෙන උන් ම රැක හිඳ නැතක් දවස් පලා ගිය හෙයින් කල් යවන්ට බැරි වන්නා සේ එක් තැනෙක දෙ රැයක් නො ලැග වහා යන්නාහු එක් දවසක් රෑ වූ තැනක දී වාස එාසු තැනෙක නවාතැන් ගත්හ. ධනඤ්ජය සිටාණෝ 'මේ බිම කවුරුන් සන්තක ද' යි විචාරා කොසොල් රජ්ජුරුවන් තමන් සන්තක තැන් නියා ව කී කල්හි 'සැවැත් නුවර කෙතෙක් තැන් ඇද්ද'යි විචාරා 'අට විසි ගවුවක් විවර ඇතැ'යි කී කල්හි 'අපගේ රැස් පිරිස් බොහෝ හෙයින් නුවරට කිට්ටු ව ගිය කලට අඑාසු ය. දුර කලට එාසු ය'යි සිතාලා 'රජ්ජුරුවන් වහන්ස, අභිප්‍රාය ඇති සේක් වී නම් මෙ තැන ම රඳනු කැමැත්තම්හ' යි කිවු ය. රජ්ජුරුවෝ ත් 'යහපතැ'යි ගිවිස එ තැන නුවරක් ඉදි කරවා දී ලා නැඟී ගියෝ ය. එ තැන සවස් වේලෙහි නවාතැන් ගත් හෙයින් ඉදි කළ නුවර ට ත් 'සාකෙත නුවර ය' යි නම් තබා ලූ ය.

සැවත් නුවර ම ත් වැළි ත් මිගාර නම් සිටාණ කෙණෙක් ඇත. උන් ඇති ව සිටුවරුන් සොයා ගියේ හැයි ද යත හොත්-නම් පමණක් මුත් ජෝතියාදීන් තරමට උන් මහා ධන සිටු නො වන හෙයිනි. සිටුවරුන් ගෙන් රට සිස් නියා ව කීයේ ත් ධන සිටුවරුන් ගෙන් සිස් බව නියා ය. ඒ මිගාර සිටාණන්ගේ පූර්ණ වර්ධන නම් සොළොස් හැවිරිදි පුතණු කෙණෙක් ඇත. දෙ මවු පියෝ 'පුත, තොපට අභිප්‍රාය තැනකින් සිටු දුවණි කෙණ කුන් විචාරව'යි කිවූ ය. 'එ සේ වූ අවුලෙන් මට ප්‍රයෝජන නැතැ'යි නො කැමැති වූ ය. 'පුත, ඒ සේ නො කර ව, දරුවන් නැති කුල වර්‍ග පරම්පරා ව නො පවත්ති. ජාති සරි තැනකින් විචාරා ගෙනෙව'යි කිවූ ය.

දෙ මවු පියන් ගෙන් විධාන බොහෝ වත් බැරි ලෙසක්කියා ලූ කලට කන්සන් නැති වෙයි සිතා 'එ සේ වී නම් රන් පර්‍වත මුඳු නෙකින් හුණු කළු ගහක් මෙන් දෝ හෝ නො හොත් මුඛපද්ම යෙහි ශෝභා කිඤ්ජල්ක ය නිසා අවු ත් රැස් වූ බමර වැලක් වැනි ව නිල් වූ උනා හෙළා ලූ කලට විළුඹ දක්වා හී ලා බිම නො ගැවී අක් බඹුරු ව තිබෙන හිස කේ ඇති, නැවත රූප නැමැති සාගරයෙහි ගමන් ගත් පබළුම ය නැව් සහලක් වැනි වූ තොල් සහළක් ඇති, තව ද පබළු දළුවෙක හිඳුවා ලූ විදුරු පෙළක් වැනි වූ දෝ හෝ නොහොත් චන්ද්‍රයාගේ සොළොස් කලාවෙන් සොළොස් වන කලාව දන්තශ්‍රෙණි ව්‍යාජයෙන් මුඛ ප්‍රවිෂ්ට වූවා සේ ඉතා ශොභාවත් වූ දත් ඇති, තව ද කැළියෝ වී නම් නිල් මහනෙල්

Non-Commercial Distribution

මලක ඡවියක් සේ ඡවි ඇති, හෙළිල්ලෝ වී නම් කිණිහිරිපෙත්තක ඡවියක් සේ තල කැළල් ආදීන් මුසු නො වන ඡවි සමෘද්ධියක් ඇති, දරු දස දෙනකු ලද ත් හැම කල ම සොළොස් හැවිරිදි කෙණකුන් තරමේ ම සිටිනා වූ කෙණෙක් සම්භ වූ නම් එ සේ වූ කෙණකුන් කෙරේ අභිප්‍රාය ඇත්තෙමි'යි කී කල්හි–

දෙ මවු පියෝ අටෝරාසියක් බමුණන් ගෙන්වා ගෙන කිරි බත් අනුභව කරවා ලා මුන් කියා ලූ තරම් ස්ත්‍රීහු මිනිස් ලොව වෙසෙත් ද'යි විචාරා තමනු ත් නුදුටු විරූ හෙයින් වේදශාස්ත්‍ර බලා 'වෙසෙති' කී කල්හි 'එ සේ නම් එසේ වූ කෙණකුන් විමසා ගෙනෙන්ට වුව මැනැව'යි අටෝරාසියෙන් අට දෙනකු තෝරා ලා බොහෝ වස්තු දී ලා එ සේ වූ කෙණකුන් ලදින් අවු නම් ආ කල ත් බොහෝ සංග්‍රහ කරම්හ' යි කියා ලා එ සේ වූ කෙණකුන් දුටු කල බත් බුලත් කවන ලෙසට තෙලේ පළඳවා ලව'යි ලක්ෂයක් වටනා රන් මාලාවක් දී ලා යවූහ.

උයි ත් ප්‍රසිද්ධ ප්‍රසිද්ධ නුවරවලට ගොසින් විමසා ත් එ සේ වූ කෙණකුන් නො දැක නැවත පෙරළා එන්නාහු කවුරුනු ත් එළි බස්නා නකත් කෙළි දවසෙක සාකේත නුවරට අවුත් වැද 'අද අප ආ කට යුත්ත සමෘද්ධ වන්නැ'යි සිතූහ. එ නුවර ද වැළි ත් අවුරුදු පතා ඒ උත්සව ය පවත්ති. එ කල හිර සඳ නො හැඳින හින්නවුන් සහපිරිවරින් ගෙන් නික්ම නො සැංගී නො පැට වී පයින් ම ගං බඩට යෙති. එ දවස් රජ–බමුණු–වෙළෙඳ–ගොවි ආදි ප්‍රසිද්ධයන්ගේ දරුවෝ 'තම තමන් හා සරි සමාන කුල දූරියන් දැක මල් දමා ලා නිල කොට ගනුම්හ'යි මහ ඒ ඒ තැන සිටිනාහ.

බමුණෝ අට දෙන ත් ගඟ බඩ එක් ශාලාවකට වැද ලා සිටි යෝ ය. එ වේලාවට සොළොස් හැවිරිදි වයස් නමැති සොළොස් කලාවෙන් පිරුණා වූ විශාඛා නමැති පුන් සඳ ද ආභරණ නමැති රශ්මීන් යුක්ත ව පන් සියයක් කුමාරිකා නමැති තරු කැළ පිරිවරා ගඟට ගොස් නා පියමී යි ගං බඩට ගියහ. එ වේලාවට ම වැස් සෙක් නහා ලා වස්නට පටන් ගත. පන් සියයක් කුමාරියෝ වහා දිවගෙන ගොසින් ශාලාවට වන්හ. ශාලාවේ හුන් බමුණෝ බලා ඉන් එක් කෙණකුනු ත් සිටු පුත්‍රයාණන් කියා ලූ තරම් ඇති නියාවක් නො දැක තවත් එන කෙණකුන් බල බලා හුන්හ. එ කල විශාඛාවෝ ද සසරින් නික්මෙන්නට ඉක්මන් බවක් මුත් නිකම් ගමනේ ඉක්මනක් නැති හෙයින් සෙමෙන් සිට ම ශාලාවට වන්හ. එ දැක බමුණෝ 'අනේ, දරුවෝ මැළි කෙණෙක.

Non-Commercial Distribution

මෙ සේ වූවන් රක්‍ෂා කළ කෙණකුන්ට කාඩි පමණකු ත් සම්භ නො වේ'යි කීහ. එ කල විශාඛාවෝ 'කුමක් කියවුද්‍ද'යි විචාරා උන් කළ කථාව කී කල්හි 'කවර කාරණයකින් එ සේ කියවුද්‍ද'යි විචාළහ. එ බසට බමුණෝ කියන්නාහු 'මුඹගේ පිරිවර කුමාරිකාවෝ හැම දෙන ම නො තෙමී ශාලාවට දිව ගත්හ. මුඹ වහා එක පමණකු ත් නැති ව තෙමී ගෙන ආ දැය. එ සේ හෙයින් මෙ සේ කිය කියා උනුම්හ'යි කීහ.

'එ සේ එක විටෙක ත් නො කිව මැනව. දිව ගෙන එත ත් මම උන්ට වඩා බල ඇත්තෙමි. කාරණයක් තකා දිව ගෙන නො ආමි'යි කිවු ය. 'කාරණ ය කවරේ දැ'යි විචාළ කල්හි 'සතර පක්‍ෂයක ඇත්තෝ දිවෙන කල නො හොබිති. අනිකු ත් කාරණයෙක් ඇතැ'යි කිවු ය. 'දිවෙන කල නොහොබිනා සතර පක්‍ෂය කවුරු දැ'යි බමුණෝ විචාළෝ ය. 'එ තරමකු ත් මු ඹ හැම නො දත් බැවින් කිව මනා වේ ද? ඔටුනු පළන් රජ්ජුරුවෝ සව් බරණ ලා සැරහී ගෙන අමුඩක් ගොතා පියා දිවෙත් නම් ඉතා නො හොබිති. 'මෙ රජ ගොවියකු මෙන් දිවේ'යි කියා දුටුවන්ගෙන් නිඳා ලැබෙති. සෙමෙන් සිට යෙත් නම් හොබිති. රජ්ජුරුවන්ගේ මඟුලැතා ත් ආභරණ ලා සරහන ලද්දේ දිවේ නම් නො හොබී. හස්ති ලීලායෙන් සෙමෙන් සිට යන්නේ ම හොබී. තපස්විවරු ත් සමාහිත ව යන ගමන් හැර දිවෙත් නම් නො හොබිති. දුටු යම් කෙණකුන්ගෙන් ම 'ශ්‍රමණ ලීලා නැති ව ගිහින් පරිද්දෙන් දිවෙති' යි නිඳා ලැබෙති. සෙමෙන් සිට යෙත් නම් හොබිති. මුන් හැමට ත් වඩා ගැනු මිනිස්සු දිවෙත් නම් ඉතා නො හොබිති. 'කිමෙක් ද? මෝ පිරිමියකු මෙන් ගැනු ලීලාවක් නැති ව දිවේ' යි කියා නින්දා ලැබෙති. සෙමෙන් සිට යෙත් නම් හොබිති. ගැනුන්ට නො හොබනා දෙය කරන්නේ කෙසේ දැ යි කියා වහා නො ආයෙමි' කිවු ය.

බමුණෝ ඒ අසා 'පුත, එ වන්නා ඒ කාරණ ය ගිවිස්සම්හ. අනික් කාරණ කවරේ දැ'යි මද බණක් අසන්ට සිතා ත් බණ කියා ලන නියා යහපත් හෙයින් බොහෝ කොට බණ අසන්නා සේ දත් පෙළ දක්නා තරමට යම් තම් කථාවක් කරුණු කැමැති බමුණෝ කථා කරණ නියාව යහපත් හෙයින් අනික් කාරණය ත් විචාළෝ ය. 'මවු පියෝ දූන් වඩනා කල වද පියා හූරන් සේ හැර නො පියති. අත පය හඹා, කන් නාසා හඹා උන්ගේ ත් ප්‍රයෝජන විද ගන්නා සෙයින් කෙරෙති. අපි නම් විකිණි බඩු වක් හා සරියම්හ. විකිණි බඩුවක් මැසී තුබුවො ත් විකපත් වන

Non-Commercial Distribution

බව මුත් යම්කිසි ලෙසකින් නපුරු වී නම් විකපත් නො වෙයි. අපි ත් තෙමෙන්ට මැළි ව දිව වැටී හුණුමෝ නම් අත හෝ කොර වෙයි. පය හෝ කොර වෙයි. එ සේ කලට සරණ ගෙණ යන කෙණකුන් නැති ව දෙ මවු-පියන්ට ම භාර වම්හ. තෙමී ගිය යි වන හානි කවරේ ද? ගෙට ගිය කල තෙමී ගිය පිළි වනා පියන්නා වියළී යෙයි. ආභරණ ත් ගළවා තබා පියන්නා හිණි ගැනී යෙයි. මේ හැම සලකා වහා නො ආයෙමි'යි කිවු ය.

බමුණෝ උන් කථා කරණ වේලේ සක්පත් සහළක් වැනි ඉතා ශොභාමත් වූ දත් පන්ති දැක 'මෙ සේ වූ රූප ශොභාව මුඹට ම තරමැ'යි කියා ලා ගෙන ගිය රන් මාළාව කර පළඳවා ලූහ. මාලාව පළඳවා ලූ ලෙසින් ම එක් තැනකට විවාළ නියා ව දැන ගෙන 'කවර නුවරක සිට ද ආවෝ'යි විචාරා 'සැවැත් නුවර සිට ය'යි කී කල්හි විචාරා එවූ සිටු පුත්‍රයාණන්ගේ පියාණෝ කි නම් ද'යි විචාරා මිගාර සිටාණෝ ය යි කී කල්හි, සිටු පුත්‍රයාණන්ගේ නමත් විචාරා පූර්‍ණවර්ධන කුමාරයෝ ය යි කී කල්හි ජාති සරි නියාව දැන ඉවසා එන කල පයින් ආව ත් යන කල නැඟීගෙන යන්ට රථ එවුව මැනවැ යි පියාණන්ට කියා යවු ය.

යන කල රථයෙන් යන්ට කාරණ කවරේදැ යි යතහොත්- පරිග්‍රහ ය නිසා මාලාව පළඳවා ලූ තැන් පටන් පයින් ගමන බැරි හෙයින් පොහොසතුන්ගේ දරුවෝ ඉදෝළි-කූනම් රථ ආදි වූ යාන වාහනයෙන් යෙති. එක් තරම් වූ කුඩයක් හෝ තල් වැටක් හෝ ඉසට කොට ගෙන යෙති. එයි ත් නැත්නම් හැඳගත් කඩින් පටක් හැඳගෙන පටකින් දසරුව වසාගෙන යෙති.

විශාඛාවන්ගේ පියාණෝ පන් සියයක් රථ එවාලූ ය. විශාඛා වෝ ද සහ පිරිවරින් රථවලට නැඟීලා ගියහ. බ්‍රාහ්මණයෝ අටදෙන ත් කැටිව ම ගියහ. සිටාණෝ ත් දූවණියන් පළන් මාළාව දැක දැන ගෙන බමුණන් අතින් කොයි සිට අවුදැ යි විචාරා සැවැත් නුවර සිට ය යි කී කල්හි සිටාණන්ගේ ත් සිටු පුත්‍රයාණන්ගේ ත් නම් විචාරා, පියාණන් මිගාර සිටාණන් නියා ත් පුතණුවන් පූර්‍ණවර්ධන නම් නියා ත් අසා වස්තු කෙතෙකට ඇද්දැ යි විචාළහ. සතළිස් කෙළෙකැ යි කී කල්හි අපගේ සම්පත් තරමට මහමෙර ළඟ හබ ඇටක් තබා ලූවා සේ සම්පත් ඉතා ම මඳ සිටු කුලයක් බැවින් රන් මාලාවකුත් පළඳවා ලූ පසු සෙස්සෙන් කම් කිම්දැ'යි ඉවසා පූහ. ධනඤ්ජය සිටාණෝ ද මෙහෙවර ගිය බමුණන්ට සාද කොට එක් දෙ දවසක් රඳවා ලා යවාපූහ.

Non-Commercial Distribution

උයි ත් සැවත් නුවරට ගොසින් යම් තරම් කෙණකුන් විම සන්ට යවූ නම් එ තරම් ම කෙණකුන් නිලකළ නියා ව මිගාර සිටාණන්ට කීහ. මිගාර සිටාණෝ ත් කවුරුන්ගේ දරු කෙණෙක් ද යි විචාරා ධනඤ්ජය සිටාණන්ගේ දුවණියන් නියාව කී කල්හි 'එ තරමුන්ගේ දරුවෝ රූ නැත ත් පින් ඇත්තෝ ය. වහා ගෙන් වූවමනා වෙ දැ'යි සරණ ගෙනෙන්ට ඔබ යන නියාව කොසොල් රජ්ජුරුවන්ට කීහ. රජ්ජුරුවෝ ඒ අසා බිම්සර රජ්ජුරුවන්ගෙන් උන් ලදින් කැඳවාගෙන අවුත් එ තැන රඳවා ලූයෙම් මම ම ය. මම ත් එමි' කිවු ය. උයි ත් යහපතැ යි ගිවිස ධනඤ්ජය සිටාණන්ට කියා යවන්නෝ —

අප ඔබ එන කළ රජ්ජුරුවන් වහන්සේ ත් වඩනා සේක. රජ සෙනඟ ත් මහත. මෙ තෙක් දෙනාට බත් දෙන්ට පිළිවන් වූ වො ත් කියා එවන බව ය'යි කියා යවූහ. ධනඤ්ජය සිටාණෝ සම්පතට ත් වඩා සිත ත් උදරතර හෙයින් 'එක රජ්ජුරු කෙණ-කුන් තබා රජ දරුවන් දස දෙනකු වුව ත් අමුතු ව අවුත් මෙ තැන රඳා හුන්නැ යි නො සිතා කැඳවා ගෙන අව මැනවැ'යි කියා යවූ ය. මිගාර සිටාණෝ ද ඒ සා මහත් නුවර ගෙවල් දෙරවල් බලන පමණක් මිනිසුන් රඳවා ලා සෙසු සත් කෙළක් විතර මිනිසුන් කැඳවා ගෙන ගොසින් සාකෙත නුවරට දෙ ගවුවක් පමණේ සිට රජ්ජුරුවනු ත් තමනු ත් ආ නියාව කියා යවූහ.

ධනඤ්ජය සිටාණෝ රජ්ජුරුවන්ට ත් සිටාණන්ට ත් පඬුරු යවා ලා දුවණියන් විශාඛාවන්ට කියන්නෝ 'පුත, තොපගේ මයිලණුවෝ කොසොල් රජ්ජුරුවන් වහන්සේ ත් කැඳවා ගෙන අවු ය. තොපගේ මයිලණුවන්ට නවාතැනට කවර ගෙයක් නිලකරමෝ ද? රජ්ජුරුවන් වහන්සේට කවර ගෙයක් නිල කරමෝ ද? යුව රජ්ජුරුවන්ට කවර ගෙයක් නිල කරමෝ ද? සෙනෙවි රදුන්ට කවර ගෙයක් නිල කරමෝ ද? ලඞ්කා අධිකාර– දෙමළ අධිකාර මුදල් පත් ආදි වූ ඒ ඒ දෙනාට කවර කවර ගෙවල් නිල කරමෝ දැ'යි විචාළෝ ය.

කප් ලක්‍ෂයක් පිරූ පැරුම් ඇති විදුරු සේ සියුම් නුවණ ඇති සිටු දුවණියෝ 'අසවල් ගෙය අප ගේ මයිලණුවන් වහන්සේට නිල කළ මැනව. අසවල් මාළිගාව රජ්ජුරුවන් වහන්සේට නිල කළ මැනව. යුව රජ – සෙනෙවිරත් ආදීන්ට මේ මේ ගෙවල් නිල කළ මැනවැ'යි සියලු ගෙවල් ම නිල කරවා ලා කර්මාන්ත කරන්නවුන් බණවා ලා 'රජ්ජුරුවන් වහන්සේට කළ මනා මෙ හෙවර මෙතෙක් දෙන කරව, යුව රජ-ඇමැති ආදීන්ට කළ මනා

මෙහෙවර මෙ තෙක් දෙන කරව'යි විධාන කොට ලා ඇත් ගොවු අස් ගොවු ආදි වූ සියල්ලෝ ම 'විශාඛාවන්ගේ සරණ මඟුලට ගොසිනු ත් ඇත් අස් ආදීන් ම රැක ඇවිදි බව මුත් අප මඟුල වුන් සැප කවරේ දැ'යි කිය ත් නමුත් එ සේ ත් නො කියවා ඇතුන් බැලීම් ආදිය ත් මෙ තැන රඳා හිඳිනා තෙක් දවස් තෙපි ම කරව'යි තමන්ගේ මිනිසුන්ට ම විධාන කළහ.

එ දවස් ම විශාඛාවන්ගේ පියාණෝ දුවණියන්ට මහ ලිය පළඳනාව කරවනු පිණිස කර්මාන්තයෙහි දක්ෂ බඩාල් පන් සියයක් ගෙන්වා ගෙන ශුද්ධ රත්රන් පස් විසි දහසක් හා හුයින් කළ මනා මෙහෙවර රිදියෙන් කරණ ලෙසට රිදී ත් මැණික් සතළිස් නැළියකු ත් විදුරු සතර නැළියකු ත් දෙවා ලූහ. බඩාල්ලූ ත් කර්මාන්තයට පටන් ගත්හ.

රජ්ජුරුවෝ දවස් ගණනක් රඳා ලා ධනඤ්ජය සිටාණන්ට කියා යවන්නෝ 'අප මෙ තෙක් දෙනා හෙයින් කල් යවා රැඳුණු කලට තමන්ට ම ආයාස ය. සිටු පුත්‍රයාට දුවණියන් පාවා දෙවා ගමන උදවු කරවුව මැනැවැ'යි මෙහෙවර කියා යවූ ය. සිටාණෝ ඒ අසා රජ්ජුරුවන්ට කියා යවන්නෝ 'දැන් මේ වැසි කල ය. වැසි මස හෙයින් මෙ සාර මස ගමන් බැරි ය. කැටි ව ආ රැස් පිරිස් නම් සුත් කෙළක් විතර වේ ද? උන්ට වුව මනා සියල්ලෙක් ඇත් නම් මට භාර ය. මා දන්වා ලූ විටෙක වඩනා බව ය'යි තමන්ගේ ප්‍රභුශක්ති තෙල තරම්නු ත් හැඟවූ ය.

එ වක් පටන් සාකේත නුවර නිරන්තරයෙන් ම මඟුල් ගෙයක් මෙන් සැරහී සිටි. වෙන වෙන ම තම තමන්ට කරණ සාදයක් සේ සිතන ලෙසට බත් දෙවන්ට පටන් ගත්හ. මෙ ලෙසින් තුන් මසක් පලා ගියේ ය. පලඳනාවේ කර්මාන්ත ත් විශාඛාවන් කළ පින් බොහෝවා සේ ම බොහෝ හෙයින් නොනිමෙයි. බත් මාළු ඉදි කරවා දෙන්නෝ ද අවු ත් සිටාණන්ට 'වී සාල් ආදී වූ සෙස්සෙන් අඩුවෙක් නැත. බත් මාළු පිසන්ට දර නැතැ'යි කිවු ය.

'තෙල විතරකින් බත් නො දෙන්ට පිළිවන් ද? මෙ නුවර මාළු ඇත් හල්, අස් හල් ද. මාළු ගෙවල් ද, බිඳ දර හැර ගෙන බත් පිසවා දෙව'යි විධාන කොළෝ ය. එ සේ ත් කරන්නවුන්ට දෙ පෝයක් ගියේ ය. නැවත ත් ගොසින් දර මුට්ටු නියාවක් ම කිවු ය. 'සන වැසි හෙයින් දර සොයා දුර යන්ට ත් බැරි ය.

Non-Commercial Distribution

බත නො දෙන්ට ත් බැරි ය. පිළී පත්තායම්වල යතුරු හැර දළ දළ පිළී හැර ගෙන වැටි කොටා පියා තෙල් සැළවල ගලා දරට මොළවා බත් මාළු උදව'යි විධාන කළහ. එ ලෙස ත් කරන්න වුන්ට දෙ පෝයක් විතර ගොසින් සාර මස නිමිණ. පළඳනාව ත් කොට නිමියේ ය.

ඒ පළඳනාවෙහි හුයින් කර්මාන්ත නො කළහ. හුයින් කළ මනා කර්මාන්ත රිදී කෙන්දෙන් ම කළහ. ඒ ආභරණය ත් පළන් කල ඉස්මුදුනෝ පටන් පිට් පත්ල ගසා සිට්ටි. ඒ ඒ තැන ගැට මනාලෙසට මුදු ත් යොද කළහ. ගන්වා ලන කොකු රත්රන් මය ය. ම ළ රිදීම ය ය. ඉස් මුදුනෙහි දී කොක්කක් හා මළෙක. කන් සිළු දෙක කෙරේදී දෙකක. ගලවළුව කෙරේදී එකෙක. දසරුවේදී දෙකෙක. වැළමිටි දෙක කෙරේදී දෙකෙක. උකුළු කෙරේදී දෙකෙක. එ තැන පටන් පාත ප්‍රයෝජනා නැති හෙයින් නැත.

ඒ පළඳනායෙහි මුදුන නටන මොනරකු කළහ. ඔහුගේ දකුණු පියායෙහි රත්රන්මය වූ තඹවන් පත් පන් සියයෙක. වම් පියායෙහි ත් එ සේ ම රන්මුවා තඹවන් පත් පන් සියයෙක. තුඩ පබළුමුවා ය. ඇස් නිල්මිණිමුවා ය. ග්‍රීවය ත් පිලු ත් එ සේ ම නිල් මිණිමුවා ය. තඹවන් තටු රිදීමුවා ය. පා සහල ත් එ සේ ම රිදීමුවා ය. ආභරණ ය පළන් කලට විශාඛාවන්ගේ ඉස් මුදුනෙහි පෙනෙන මොනරා රන් ගල් මුදුනෙක නටන මොනරකු මෙන් පෙනෙයි. තඹවන් තටු දහසේ හඬ දිව්‍ය ගීතිකා නාදයක් මෙන් ද පසඟතුරු හඬක් මෙන් ද ඇසෙයි. ළඟට ගිය කෙණෙක් ම උෟ ජීව මොනර නො වන නියාව දනිති. පළඳනාව රන් අගයෙන් නව කෙළක් අග්ගි. කළ මිල ලක්‍ෂයක් දුන්හ.

විශාඛාවෝ ඒ පළඳනාව කුමන පිනක් කොට ලද් දූ ද ය ත්- උෟ තුමූ කසුප් බුදුන් සමයෙහි විසි දහසක් රහතන්ට සිවුරට පිළී දන් දී ලා ගෙත්තම් කරන්ට හූ ඉදිකටු ත් දුන්හ. කොට නිමි සිවුරු රදන්ට විටියල ත් තමන් ගෙන් ම පසුන්හ. එහි අනුසසින් මෙ මහලිය පළඳනාව ලත්හ. ගෑනු ව යම් කෙණෙක් අට පිරිකර දන් දුන්නු නම් මෙහෙල පළඳනාවෙන් ලෞකික සැපත් මුදුන් පමුණු ව යි. පිරිමි ව දුන් අට පිරිකරෙහි විපාක බුදු කෙණෙකුන් වහන්සේ කරා පැමිණ 'මහණෙනි, මෙ සේ එව'යි වදළ බස් පමණින් ම පළන් ආභරණ හා හන් පිළී අතුරුධන් ව ඍද්ධිමය වූ තුන් සිවුරු පාත්‍ර පහළ වීමෙන් මුදුන් පමුණුව යි.

Non-Commercial Distribution

සිටාණෝ ද සාර මසක් විතරින් මඟුල් පෙරහර සරහා ලා දුවණියන්ට දයාද දෙන තැනැත්තෝ ගැල් පන් සියයෙක පුරා මසුරන් දුන්හ. රන් තළි රන් මණ්ඩා රන් මුණ්ඩම් ආදි වූ රන් වළන්වලින් පුරා ගැල් පන් සියයක් දුන්හ. රිදී තළි රිදී මණ්ඩා රිදී මුණ්ඩම් ආදි වූ රිදී වළන් පුරා ගැල් පන් සියයක් දුන්හ. තඹ සැළ තඹ කටාර ආදි වූ තඹ වළන් හා ලෝකඩ තළි මණ්ඩා මුණ්ඩම් ආදි වූ ලෝ වළන් පිරුනු ගැල් පන් සියයක් දුන්හ. සළු සොළී පිළී ආදි වූ නො එක් පිළියෙන් පිරුණු ගැල් පන් සියයකු ත් දුන්හ.

ගිතෙල් තල තෙල් ආදි වූ තෙල් කළවලින් හා තෙල් සැල වලින් පිරුණු ගැල් පන් සියයක් දුන්හ. හැල් සාල් පිරූ ගැල් පන්සියයකු ත් දුන්හ. කැති හුදලු වෑ පොරෝ නියන් ආදී වූ යහාවුද ත් පිරූ ගැල් පන් සියයකු ත් දුන්හ. නඟුල් විය දඬු ආදි වූ සියල්ල ත් ගිය තැන ගෙවලට ඉල්වා නො යවුව මනා වේ ද'යි එ පමණකු ත් දෙවූහ. උන් ගිය තැන නාවා, ඉස් සෝධ වා පිරිමැසුව මනා වේ ද'යි පා මුදු පාඩගම් නුරුවලා ආදි වූ ආභරණ ලා සැරහුණු කම්මිත්තන් එ කි එ කී රථයේ තුන් දෙනා ඔබාදීන් කම්මිත්තන් යෙළ දසකු ත් පාවා දුන්හ.

ඉක් බිත්තෙන් සරක් දයාද දෙන සිටාණෝ මිනිසුන්ට විධාන කොට 'කුඩා ගොවුදේ හිදි හැර ලා ගෙරි සරක් සැලසී සිටි විතර දන්නා පිණිස දිගින් තුන් ගවුවෙක. ගවුවකට බෙරක් ඔබාදීන් බෙර තුනක් අල්වා ගෙන සිටුව. පළලින් සම රියනින් එක් සිය සතළිස් රියනක් දිගින් තුන් ගවුවෙක. අතුරු හැර ලා දේවනාත බෙර අල්වා ගෙන සිටුව. දිගින් තුන් ගවුව ගොසින් පිරෙන තෙක් නො නවතව. පළලින් එක් සිය සතළිස් රියනින් වඩා යා නො දෙව. දිගින් තුන් ගවුව හා පළලින් එක් සිය සතළිස් රියන පිරුණු කල ගොවුද ඉදි ලව'යි විධාන කොට ලා එ ලෙස ම කළ කල්හි එ තෙක් තැන් පිරුණු ගෙරි සරක් දයාද කොට දුන්හ.

විශාඛාවන්ගේ කුශලානුභාවයෙන් රකිනා මිනිසුන් නැවතු ව ත් ඉදිවරු පැන ගෙන සැට දහසක් දෙනුන් හා සැට දහසක් ගොන්නු පැන වැගුරුණාවු ය. නවත් ව නවත්වා ත් එක් ලක්‍ෂ විසි දහසක් ගෙරි පැන වැගිරෙන්ට කළ පින් කවරේ ද යත්- වළක් ව වළක්වා ත් දුන් දනෙහි විපාකයෙන. විශාඛාවෝ වැළි ත් කසුප් බුදුන් සමයෙහි කිකී නම් රජ්ජුරුවන්ගේ දූන් සත් දෙනා ගෙන් හැම දෙනාට බාල සඞසදසි නම් ව විසි දහසක් දෙනා

වහන්සේට පස් ගෝ රස දන් දුන්නාහු වළක් ව වළක්වා ම දන් දුන්හ. ඊ අමුඛ්‍ය විපාකයෙන් ගෙරි සරකු ත් නවත් ව නවත්වා ම පැන වැගුරුණාහු ය.

සිටාණන් මෙ තෙක් දයාද දුන් කල්හි සිටු දියණියෝ 'මුඹ වන්නා සම්පත් මුඛ්‍ය ව ඇති හෙයින් මෙ තෙක් දැ දුන්නෝ වේ ද? ගිය තැන තුමූ තමන්ට මෙහෙ කොට ගෙන කත් ද? කෙලි කොල්ලන් නුදුන්නෝ හැයි දැ'යි විචාළෝ ය. ඒ අසා සිටාණෝ 'නො දෙන නියා නො වෙයි. හිත පක්‍ෂයන් දන්නා පිණිස ය. මම උන් ලා කැටි ව නො යන කෙණකුන් බලයෙනු ත් නො යවමි. යන කෙණකුන් රඳවන්නෙ ත් නැත. මුන් නික්මුණු කල මුන් හා කැටි ව යනු කැමති කෙණකුන් ගිය මැනවැ යි විධාන කොට ලමි. යනු කැමැති කෙණෙක් එක බසින් ම නික්මෙති. උන් හිත පක්‍ෂ නියාව දනෙයි. යමෙක් එ සේ කියා ත් නො ගියවු නම් උන් අහිත අපක්‍ෂ නියාව දනෙයි. අහිතයන් අපක්‍ෂයන් යවා ත් ප්‍රයෝජන නැති බැවින් මුන් මුන් දෙමි' යි නියමයක් නො කළ නියාව කිවු ය.

කියා ලා සෙට වෙනි දවස් සරණ නික්මෙති යන කලට ම අද දවස් ම ගබඩාවලට කැඳවා ලා' හෙම්බා පුත, සරණ ගොසින් රැකෙන්නවුන් විසින් මෙ ම ලෙස කළ මැනැවැ'යි දුවණියන්ට මාලු කම් කිවු ය. මිගාර සිටාණෝ ද ආසන්න ගබඩාවෙක හුන් තැනැත්තෝ ධනඤ්ජය සිටාණන් දුවණියනට කියන මාලු කම් ඇසූහ. උයි ත් අවවා ද කරණ තැනැත්තෝ 'පුත, නැඳිමයින්ගේ ගෙයි රඳා හිඳිනා කල නම් ඇතුළෙන් ගිනි පිටතට ත් නො දිය යුත්තේ ය. පිටතින් ගිනි ඇතුළට ත් නො ගත යුත්තේ ය. දෙන්නවුන්ට ම දිය යුත්තේ ය. නො දෙන්නවුන්ට නො දිය යුත්තේ ය. දෙන්නවුන්ට ත් නො දෙන්නවුන්ට ත් දිය යුත්තේ ය. සුවයෙන් හින්ද යුතු ය. සුව සේ අනුභව කට යුතු ය. සුව සේ වැද හොත යුතු ය. ගිනි පිරිමැසි ය යුතු ය. ඇතුළත දෙවියෝ වැන්ද යුත්තාහු ය'යි මේ මාලු කම් දස ය කියා ලා දෙ වන දවස් කැටි ව යන්නවුන් රැස් කරවා රාජ පර්ෂද් මධ්‍යයෙහි කෙලෙඹි පුත්‍රයන් අට දෙනෙකුට-

'ඉදින් ගිය තැන නුවණින් මුහුකුරා සිටිස ත් වයසින් බාල දරුවන්ගේ වරදෙක් පෙණිනි. නමුත් තොප අට දෙනා ඒ විචාරන්නට වුව මැනැවැ'යි කියා ලා නව කෙලක් අගනා මහලිය පලඳනා වෙන් දුවණියන් සරහා ලා ඇඟ උළන්ට කසා

Non-Commercial Distribution

සුණු හැර ගන්නා පිණිස සිවූ පනස් කෙළක් වස්තු දෙවා ලා විශාඛාවන් සැවැත් නුවරට යන්ට රථයට නැඟි කලට සාකෙත නුවර තමන් සන්තක මහතින් ලක්දිව අනුරාධපුර නුවර සා බත්ගම් තුදු සෙ හිදිනා පරිවාරයට ම දූන් හා කැටි ව යනු කැමැති කෙණකුන් ගිය මැනැවැ'යි විධාන කළහ. ඔහු හැම දෙන ඒ අසා සිටාණන්ගේ විධානයට ත් වඩා විශාඛාවන්ගේ කුශල කම් විධාන ය බලවත් හෙයින් ආදි ම යනු කැමැත්තාහු ගම් තුදුසෙහි කිසි කෙණෙකුන් නො රඳා නික්මුණාවූ ය. පින් කම් කරණ කල සමාදන් කැර වූ නියාවට තව උඹ බොහෝ නො වෙති.

ධනඤ්ජය සිටාණෝ ද කොසොල් රජ්ජුරුවන්ට හා මිගාර සිටාණන්ට ආදී නො කළ සේ ම සත්කාර සම්මාන කොට මද තැනක් පසු ගමන් කොට ගොසින් දුවණියන් නික්මවා ලා තුමූ රඳුණාවූ ය. මිගාර සිටාණෝ ද හැමට පස්සේ යන්නෝ රැසක් පිරිසක් සේ පස්සෙහි එන බොහෝ දෙනා දැක 'මූ හැම කවුරු ද යි විචාරා 'යේළණියන්දූගේ දයාද වහලැ'යි කී කල්හි කළ පින් ලෙසට සම්භව වූ පටු අදහස හෙයින් 'මෙ තෙක් දෙනාට බත් කොයින් ද? මරා තළා රඳවව. අර්පී ව එන කෙණකුන්ට එන්ට ය'යි විධාන කළහ.

යම් සේ රජ දරුවෝ කෙතෙක් රට ලද ත් බොහෝ ය යි නො සිතත් ද, මුහුද කප මුළුල්ලෙහි කෙතෙක් ගං වන ත් උතුරුවා නො පියා ද, ගිනි කෙ තෙක් දර වුව ත් නො හරි ද එ මෙන් විශාඛාවෝ ත් තමන් උදරතර අදහස් ඇති බැවින් 'උන් නො වළකව. සොයා උපයා වුව ත් බැළ මෙ කොට ආයු පමණින් ජීවත් වුවමනා හෙයින් තුමූ ම තමන්ට බත් සොයා ගනිති' කිවු ය. එ සේ කීව ත් මිගාර සිටාණෝ 'යේළිනි, මෙ තෙක් දෙනා ගෙන් ප්‍රයෝජන නැත. තෙපි තත්පර නොව'යි කියා ලා නො රඳන හෙයින් මරා තළා රඳවා පියා තමන් අදහස් විතරක් කැඳවා ගෙන නික්මුණාවූ ය.

විශාඛාවෝ සැවැත් නුවර වාසල කරා ගිය කලට දෝළි කූනම් ආදි වූ වාහනයෙන් යෙම් දෝ හෝ නොහොත් රථයෙන් යෙම් දෝ හෝ යි සිතූහ. 'ඉදින් දෝළි ආදියෙන් යෙම් නම් මහලියපළඳනාවේ බලවත නුවර වැස්සන්ට පෙනෙන්ට නැතැ'යි අධිගත ගුණ විශෙෂ ය හභවන්ට මැළි වුව ත් ආභරණ ශොභාව හභවනු පිණිස රථයකින් නුවර ඇතුළට වන්හ. සැවැත් නුවර

Non-Commercial Distribution

ඇත්තෝ මහලිය පළඳනාවෙන් ඉතා හොබනා රුවක් ඇති ලොව් ලොවුතුරා ගුණ විශෙෂයෙන් හැනී අති පවිත්‍ර වූ සිත් ඇති විශාඛාවන් දැක . සාකෙත නුවර දී ඒ තරමුන් දැක්ම නියම නැති හෙයින් 'විශාඛාවන් නම් පරසතු රුක ශාඛාවක් සේ මුන්දැ ද? මුන්දැගේ රූප ශෝභාව මුන්දැට ම තරමැ'යි ආ වැඩූහ. මෙසේ මහ පෙරහරින් මිගාර සිටාණන් ගේ ගෙට සුදු වලා ගබකට වදනා විදුලියක් මෙන් වන්හ.

ගිය දවස් ම සියලු නුවර ඇත්තෝ 'ධනඤ්ජය සිටාණන් දැ තරමුන්ගේ නුවරට ගිය ගමනේ අප හැමට බොහෝ සාද කළ සේකැ' යි බල පමණින් මඟුල් පඬුරු දුන්හ. විශාඛාවෝ ද එ සේ ලත් පඬුරු එක් කොට නො තබා මුන් ගෙන් එවා ලූ දෙය තුලුන්ට යවා, තුලුන් ගෙන් එවාලූ දෙය මුන්ට යවා, යවන ගම නෙ ත් තරමුන්ගේ තරම් ලෙසට තෙල 'අපගේ මෑණියන්දැට දෙව, තෙල අප ගේ පියාණන්දැට දෙව, තෙල අප ගේ බෑණන්දැට දෙව, තෙල අප ගේ බූනණියන්ට දෙව, තෙල අප ගේ මලණු-වන්දැට දෙව, නැඟණියන්දැට දෙව'යි පඬුරු ගෙන්වා ගෙන ගියවුන් ගෙන් ම තරම් විචාරා දුන ප්‍රිය තෙපුලෙන් ම සිත් ගෙන ගිය දවස් ම නුවර වැස්සන් නෑයන් සියන් මෙන් කොට ගත්හ.

ගිය දවස් රෑ ම එ ගෙයි වෙළඹක් වද පුව. විශාඛාවෝ කෙල්ලන් ලවා දඬු වැට පහන් ගෙන්වා ගෙන එ තැනට ගොසින් වැදූ වෙළඹ හුණු පැනින් නාවා පියා ඇඟ තල තෙල් ගල්වා ලා සැතපෙන ගෙට ම ගියහ.

මිගාර සිටාණෝ ද පුතණුවන්ට විවා මඟුල් කරණ තැනැත්තෝ ආසන්න විහාරේ වැඩ හිඳිනා බුදුන් තබා ලා ගිනි තිබිය දී කනමැදිරියන් පිඹිනා සේ, මැණික් තිබිය දී බොරලු අවුළන්නා සේ, පාපයෙහි භය ලජ්ජා නැති ලෙස පිළී නො හැඳීමෙන් ම හඟවන නිවටුන් කෙරෙහි තමන් බලවත් භක්ති ඇති හෙයින් 'මේ මඟුලේ අපගේ රහතන්ට ත් උපස්ථානයක් කෙරෙ මි'යි එක් දවසක් නො එක් සිය ගණන් අලුත් සැළවල පැන් නුමුසු කිරිබත් පිසවා පන් සියයක් නිවටුන් පවරා ගෙට ගෙන්වා ගෙන අපගේ යේළණියන් අවුත් රහතන් වැන්ද මැනැවැ'යි විශාඛාවන්ට කියා යවූ ය.

විශාඛාවෝ ද තමන් මාර්ග ගත අචල ශ්‍රද්ධාවෙහි පිහිටි හෙයින් රහතන් වහන්සේ ය යි කියන බස අසා ම බලවත් සතුටු ව උන් බත් කන තැනට අවුත්, දඩයම් බලු මුළක් රැස් ව වැඩ හිඳ

Non-Commercial Distribution

තළා සපා බත් කන්නා සේ නො සන්හුන් සැටි යෙන් වැද හිඳ බත් කන්නවුන් දැක 'විළියක් ලජ්ජාවක් නැති මෙ සේ වුන් ළඟට අප වැන්නවුන් කැඳවා එවන්ට අපගේ තරම නො දත් නියා වේ ද, අනිස'ය යි කියා ගෙන තමන් වසන තැනට ම ගියහ.

නිවටෝ ද ඒ දැක බලු මුළක් බුරා වන්නා සේ එක විට ම සිටාණන්ට දෙඩා වැද ගියාහු 'කුමක් ද, සිටාණෙනි, මේ සා මහත් රටින් තොපගේ පුතණුවන්ට නිසි කෙණකුන් නැති හෙයින් ද, මහණ ගොයුම් හට පක්‍ෂ ව හිඳිනා මේ කාලකණ්ණි කෙල්ල ගෙනායේ? තොපගේ පුතණුවන්ට යහපතක් වුව මනා වී නම් තෙල කාලකණ්ණිය වහා මෙ ගෙන් නෙරැ'යි කිවුය. සිටාණෝ ඒ අසා 'මූ මහා පෝසතුන්ගේ දරුවෝ ය. මෙ පමණකට නෙරපීම යුක්ත නො වෙ'යි සිතා කියන්නාහු 'බාලයෝ නම් කට යුතු නො දන්නෝ වේ ද?. මුඹ වහන්සේ ලා ක්‍ෂමාකරණ පක්‍ෂයේ හෙයින් ක්‍ෂමා කළ මැනැවැ'යි කියා උන් යවා පියා මාහැඟි කොට අතුළ හස්නෙක වැද හිඳ රන් තළියෙක ලවා ගෙන පැන් නුමුසු කිරි බත් කති. එ වේලෙහි එක් තෙර කෙණකුන් වහන්සේ ගෙ පිළිවෙළින් සිඟන සේක් එයි ත් ගෙයක් වන්නා ඊට ත් සිඟා වැඩි සේක.

විශාඛාවෝ ද බත් කන මයිලණුවන්ට පත් සල සළා සිටියෝ ''දෙර වහන්දැ ය'යි කීම යුක්ත නො වන්නේ වේ දැ''යි යම් ලෙසකින් තෙරුන් වහන්සේ දකි ත් නම් එ ලෙසට ඉවත් ව ලා සිටියෝ ය. සිටාණෝ තුමූ තෙරුන් වහන්සේ දැක ත් කැමෙහි ලොභයක් මුත් පිණෙක ලොභයක් නැති හෙයින් නුදුටු බඳු ව ලා කරබා ගෙන හිඳ කති. විශාඛාවෝ ද, ඒ බව දැන ලා 'ස්වාමීනි, අනික් ගෙවලකට සිඟා වඩනා බව ය. අපගේ මයිලණුවන් වහන්සේ පුරාණ ය අනුභව කරණ සේකැ'යි කිවු ය.

සිටාණෝ නිවටුන් ගෙන් නෙරන ට විධාන කළ ත් ඉවසා හුන් තැනැත්තෝ කියා ලූ බසෙයි සාරාර්ථ ය දැන ගත නො හී දුෂ්ටාර්ථ-යක් සිතා ගෙන බතින් අත ඔසවා ගෙන 'තෙල තළියේ බතු ත් ඉවත් කරව. මේ නියා මඟුල් දවසෙක මා අනුභව කරණ බත අශුචි නො වන තෙක් ම අශුචි කොට කිය'යි. අප වැන්නනු ත් තමා අශුචි කන්නවුන් කෙරේ ද, තෙලුන් මේ ගෙන් නෙරුව'යි විධාන කළහ.

Non-Commercial Distribution

උන් එ සේ කීව ත් එ තැන සිටිනවුන් විශාඛාවන් සන්තක මිනිසුන් ම හෙයින් කවර නම් කෙණෙක් උරණ ව ලා උන් ඇඟ අල්වත් ද? විශාඛාවෝ ද මයිලණුවන්ගේ කථාව නිස්සාර වුව ත් තමන් සාර භාව හෙයින් කියා ලූ බසට ම නො ඉගිළ 'අප තමා පැනට ආ කළ මිඩියන් ගෙනෙන්නා සේ ගෙනා ගමනක් නො වන හෙයින් තෙල විතරකින් නැඟී නො යම්හ. මවු පියන් නැති කෙණකුන් මුත් මවු පියන් ඇත්තෝ කියා ලූ බසට ම නැඟී නො යෙති. අපගේ පියාණන් වහන්සේ ත් මා මුඹ එවන ගමනේ ගිය තැන වරදක් පෙණිති. නමුත් විචාරා ලව යි කෙළෙඹි පුත්‍රයන් අට දෙනකු මෙ බඳු කට යුතු නිසා ම එවූ සේක් වේ ද? උන් කැඳවා ලා අපගේ වරදෙක් ඇත් නම් විචාළ මැනැවැ'යි කිවු ය.

සිටාණෝ ත් මුන් කියන්නේ කට යුතු ය යි තමන්ගේ කාය්‍ය ශක්ති ය නැත ත් වෙළෙවි නො වන හෙයින් කෙළෙඹියන් අට දෙනා ගෙන්වා ලා 'එම්බා, මේ දරුවෝ අද මා බත් කන ගමනේ පත සල සලා සිටි තැනැත්තෝ පැන් නුමුසු කිරි බත් කන මා අශුචි කතී කිවු ය. තෙලේ උත්තුඞ්ග දෙෂ වේ ද, තෙමේ වරද ඇති නියාව ගිවිස්වා ලා මෙ ගෙන් නෙරුව'යි කිවු ය. උයි ත් ඒ අසා සැබෑ දෑ යි විචාරා ''මුන්දෑ සිතූ ලෙසට මා සිතා කීයේ නැත. එක් තෙර කෙණෙකුන් වහන්සේ දෙරකඩ සිහා සිටියදී පාත්‍ර ය හැර ගන්ට වේව යි බත් පිළිගන්වන්ට වේව යි නො කියා කරබා ගෙන හිඳ කන බත් ම කන දෙස මා බලා සිට පියා 'අපගේ මයිලණුවන් වහන්සේ පර ලොව නිසා මෙ ලොව පින්-කමක් නො කරණ සේක. පෙර කළ පිණින් ලද දෙය ම අනුභව කරණ සේකැ'යි සිතා පුරාණ කුශල ය සලකා එ සේ කීමි. ඊ වරද කවරේ දෑ''යි කිවු ය.

කෙළෙඹි පුත්‍රයෝ ඒ අසා 'එක අර්‍ථයට නො එක් ශබ්ද ඇති හෙයිනු ත්, එක ශබ්දයෙන් නො එක් අර්‍ථ ප්‍රකාශ වන හෙයිනු ත් තෙල අර්‍ථය ත් තෙල බස ඇති හෙයින් එ ම සලකා කී පසු අපගේ දරුවන් ගෙන් වරද කවරේ දෑ'යි විචාළෝ ය. 'වන්නාට ය. ඒ වන්නා මම් ම සිතා වරදවා පීමි. තව ත් දත් දෙයෙක් ඇත. මූ එක් දවසක් මධ්‍යම රාත්‍රි වේලේ කෙල්ලන් විටක් පිරිවරා ගෙන ගෙ පිටි පස්සට ගියෝ ය. අපට කියා ලා ගිය ගමනක් නො වන හෙයින් අපි මුන් කුමට ගිය බව ත් නො දනුම්හ'යි චූලනී රජ්ජුරුවන් කෙවට්ටයන්ගේ වරද කියන ගමනේ 'ඇස් ගෙඩි දල්වා ගෙන බලති' කීවා සේ ම උන් නො වරදවා කළ ත් තුමූ ම වරදවා සිතා ගෙන එයි ත් වරදක් කොට කිවු ය.

Non-Commercial Distribution

'ඒ කුමක් දැ'යි කෙළෙඹියන් විචාළ කල්හි 'අනික් අකාරියෙක මා ගිය ගමනෙක් නො වෙයි. 'මෙ ගෙයි වෙලඹක් එදා රැ වදපුව. මෙහෙ ත් ඒ දන්නා කෙණකුන් නැති හෙයින් මා ත් නො දත් කල නපුරැ යි කෙල්ලන් ලවා දඬු වැට පාන් ගෙන්වා ගෙන වැදූ වෙළඹට කළමනා දෙය කෙළෙමි. වරදෙක් ඇත්නම් කිව මැනවැ'යි කිවු ය. ඒ අසා කෙළෙඹියෝ 'හැයි, වහන්ස, අපගේ දරුවන් මෙ තරම් තරමෙක සිට ත් මුඹ ගෙයි කොල්ලනු ත් නො කරණ නිකෘෂ්ට කටයුත්ත කළාට යම් වරදක් වතොත් මුත් සෙසු වරද කවරේ දැ'යි ඒ වරද ත් සිටාණන් කෙරේ ම ලූ ය.

ඊට ත් කිය හැකි උත්තර නැති ව 'එයි ත් නිවරද නියාවට ගිවිස්සම්හ. මුන්ගේ පියාණෝ මුන් එන ගමනේ අග ත් මුල ත් නො කියා මාලුකම් දසයක් සඟවා කිවු ය. මුනු ත් ඒ විභාග කොට නො විචාළ හෙයින් කුමට කියා ලූ බව ත් නො දනිමි. ඊ අභිප්‍රාය ත් අපට කියන්ට වුව මැනව. ආදි කොට ම 'ඇතුළත ගිනි පිටතට නොහළ යුතු ය'යි කිවු ය. උන් එ සේ කීවත් ඉක්බිති ගෙවල ඇත්තවුන් ගිනි සොයා ආ කල තමාගේ ගෙයි ගිනි ඇති ව එයි ත් වස්තුවක් සේ නො දෙන්ට පිළිවන් දැ''යි කිවු ය. කෙළෙඹියෝ 'ඒ කිම් දැ'යි විචාළෝ ය. අපගේ පියාණන් වහන් සේ මෙ තෙක් සම්පත් දෙන දැ ගිනි නො දෙන්ට කුමකට කියන සේක් ද? මා දැනගත නොහැකි හෙයින් සඟවා කියා ලූ බව මුත් ගිනි නො දෙන්ට කී දෙයෙක් නො වෙයි. 'හෙම්බා පුත, තොප ගේ නැදි මයිලන්ගේ චෙව යි, සමණන්ගේ චෙව යි නුගුණයක් දැක පිටත ඒ ඒ තැන නො කියව. කේළමට වඩා ගින්නෙක් නැතැ යි මෙ සඳහා කී සේකැ'යි කිවු ය.

'මා සිතා ගත නුහුණු පමණක් මුත් ඒ එ සේ ම ය. ඒ එ ලෙසට ම ගිවිසිමි. මුන්ගේ පියාණෝ පිටතින් ගිනි ඇතුළට ගෙනා යුතු නො වෙයි කිවු ය. තමාගේ ගෙයි ගිනි නිවී ගිය විටෙක පිටතින් ගිනි නො ගෙනෙන්නට පිළිවන් දැ''යි කිවු ය. 'තෙලෙ කිම් දැ'යි කෙළෙඹියන් විචාළ කල්හි 'අපගේ පියාණන් වහන්සේ තෙලෙ මෙ තෙක් ම වී නම් අපට ම තෝරා ලා කියන සේක් ද? කැටි ව එන්නවුන්ට කීව ත් පමණ ම වේ ද? උන් වහන්සේ කී යේ 'හෙම්බා පුත, ඉක්බිති ගෙවල ඇත්තෝ තොප ගේ නැදි මයිලන් ගේ ත් සමණන්ගේ ත් නුගුණයක් කිවු නම් උන් කී දෙය සිත තබාගෙන අවුදින් බිඳුවන නිසා චෙව යි යමක්

Non-Commercial Distribution

ලබනු නිසා වෙව යි නො කියව. එ සේ කිවු නම් පිටතින් ගිනි ඇතුළේ ලූ නියා ය. තෙල පිටත නුගුණ ඇතුළට කියන ගින්නට වඩනා ගින්නෙක් නැතැ යි' මේ සඳහා කී සේකැ'' කිවු ය.

තෙල විතරකින් ම ඔබ නො විචාරා තබා පුව මනා තැන තමන්ගේ නො පණ්ඩිත කම ත් හඟවා 'බොහෝ දෙය කී කලට වරදෙක් සම්භ වේ නමුත් ය' යි තෙලෙ ත් නිවරද ගිවිස්සම්හ. මුන්ගේ පියාණෝ 'දෙන්නවුන්ට ම දිය යුතු ය'යි කිවුය. කෙලි කොල්ලන්ට දෙන දෙයක උන් ගෙන් යමක් ලැබ දුන මනා ද? ඒ කිම් දැ'' යි විචාළෝ ය. කෙළෙඹියෝ ඒ අසා ඒ කුමක් දැ යි විචාළෝ ය. ''අප ගේ පියාණන් වහන්සේ ත් තෙල ලෙස කියා ලූයේ 'යම් කෙණෙක්, පුත, තොප ගෙන් ණයක් ගනිත් නම් පරීක්‍ෂා කොට ලා පෙරළා දී ලිය හෙන කෙණකුන්ට දිය යුතු ය. ණය දීමෙන් වන වියවුල් මහතැ' යි මේ නිසා කී සේකැ'' යි කිවු ය.

''නො දෙන්නවුන්ට නො දිය යුතු ය' යි කීවෝ වේ ද ඒ කුමක් නිසා දැ'' යි විචාළ කල්හි 'හැර ගන්නා කල නො එක් පයිලි කම් කියා හැර ගෙන දිය යුතු අවස්ථාවෙහි නො එක් වඤ්චා ලෙසින් නො දෙත් නම් එ සේ වූවන්ට දීලූ කල තමා ගේ වස්තුව ත් නස්සි. හිත මිත්‍ර කම ත් නස්සි. එ සේ වූවන්ට නො දීමෙන් වන හානි නැතැ යි මේ සඳහා කී සේකැ'යි කිවු ය.

''දෙන්නවුන්ට ත් නො දෙන්නවුන්ට ත් දිය යුතු ය'යි කිවු ය. දෙන්නවුන්ට දිය යුතු ය යි යන භාව ය විසඳා කියා ලූ හෙයින් ඒ ගිවිසුම්හ. 'නො දෙන්නවුන්ට නො දිය යුතු ය'යි ආදි කියා ලා දූන් 'නො දෙන්නවුන්ට ත් දිය යුතු ය' යි කී කල ඒ ගිවිස්නේ කෙ සේ ද? එයි ත් කියන්ට වුව මැනැව''යි කිවු ය. 'ඒ කියා ලූයේ දුක් පත් ව පියා නෑයන් - සියන් තමා කරා ආ කල උන් දී ලිය හෙය කිම - නො හොත් කිම? උන්ට දියයුතු ම ය යනු සඳහා කී සේකැ'යි කිවු ය.

''වන්නාට එයි ත් කාරණය. 'සුව සේ හින්ද යුතු ය'යි මුන්ගේ පියාණෝ කිවු ය. හැම දවස් ම ආසන පනවා තිබෙන්ට නැත. ඒ කෙ සේ දැ'' යි විචාළ කල්හි එයි ත් තෙල ලෙසට සිතා කී දෙයක් නො වෙයි. නැඳි මයිලනු ත් සමණනු ත් දුටු කල නො ඉගිළී ම හිඳිනා ලෙසට කී නියා ය. උන් හැම දුටු කල ඉගිළෙ-තොත් ඒ සුව සේ හුන් නියා නම් නො වන්නේ වේ දැ' යි කිවු ය.

Non-Commercial Distribution

"එයි ත් යුක්ති ය. එයි ත් ගිවිසුම්හ. 'සුව සේ කෑ යුතු ය'යි කිවු ය. රජ දරුවන්ට පවා කිසි කලෙක බත් මුට්ටු ය. එ සේ වන්නා හැම ද ම සුව සේ කන්නේ කෙ සේ දූ''යි විචාළෝ ය. "එයි ත් තෙල සිතා ගත් ලෙසට ඔබ කීයේ නැත. 'හෙම්බා පුත බත් කන කල නැඳි මයිලනු ත් සමණනු ත් බත් කවා ලා තව ත් බත් ලද්දවුන් නො ලද්දවුන් විචාරා එයි ත් පිරිමසා ලා පසු ව තමා වැද හිඳ කතො ත් සුව සේ කෑවා නම් වෙයි'' කියා මේ සඳහා කී සේකැ'' යි කිවු ය.

එයි ත් ගිවිස ලා "සුව සේ වැද හොත යුතු ය'යි කිවු ය. හැම දවස් ම යාන් පනවා තිබේ ද? ඒ කිම දූ'' යි විචාළෝ ය. "එයි ත් තෙල ලෙස සිතා නො වෙයි. 'හෙම්බා පුත, බත කා ලා හැම දෙනාට පෙරාතු හැදට නැඟී ලා වැද හොත යුතු නො වෙයි. නැඳි මයිලන්ට ත් සමණන්ට ත් කළ මනා සිරිත් කොට ලා තමා පසු ව වැද හොත යුතු ය' යනු සඳහා කී සේකැ'' යි කිවු ය. එයි ත් ගිවිස නැවත "ගිනි පිරිමැසිය යුතු ය යි කිවු ය. හැම දවස්හි ම ගිනි නො නිවා තබා ගන්නා සේරු නැත. ඒ කෙ සේ ද'යි විචාළ කල්හි 'මුඹ දූනගත නො හෙන්නාට කුමක් කරමෝ ද? නැඳි මයිලනු ත්, රක්‍ෂා කළ ස්වාමීහු ත් ගිනි කඳක් මෙන් ද සර්‍පයන් මෙන් ද දැක්ක යුතු ය යි මේ සඳහා කී සේකැ'යි කිවු ය.

කියන යම් දෙයක් ම සකාරණ කොට කියා ලූ හෙයින් එයි ත් ගිවිස ලා "ඇතුළත දෙවියෝ වැන්ද යුත්තාහ'යි කිවු ය. විෂ්ණු ඊශ්වරාදී දෙවියන් ළං කොට තබා ගන්ට ත් පිළිවන් ද? ඒ කෙ සේ දූ යි විචාළ කල්හි 'පින් පමණ නුවණ ය' යනු ව්‍යවහාර හෙයින් බොහෝ සේ පින් ඇත්තවුන්ට නුවණකු ත් ඇත. වඩා නැත ත් මෙ පමණක් දන්නා නුවණ නැති වන්ට කාරණ කිම ද? එ බඳු පිණක් නො කළ හෙයින් ස්වාභාවික නුවණ ත් සත් පුරුෂොපාශ්‍ර යෙක් ඇත් නම් උන් හා කථා ව නිසා ඇති වන ශ්‍රුතමය ප්‍රඥා ත් ඇත්තේ වේ ද? එයි ත් නැත්තේ සත් පුරුෂොපාශ්‍රය ත් නැති නියා වේ ද? අවවාද දසයෙන් නවයෙක අර්‍ථ කියා ලූ බැවින් දස වන අවවාදයේ අර්‍ථ ත් අප ම කීවො ත් මුත් කියා ලූ දෙයෙහි එල්බ තදුපදෙශයෙන් දත නො හෙන පසු කියා ම සිතට නං වම්හ. 'ඇතුළත දෙවතාවෝ ය යි නැඳි මයිලන් හා සමණන් හා දේවතාවන් ලෙස තැකි ය යුතු ය'යි මේ සඳහා කී සේකැ''යි කිවු ය.

මිගාර සිටාණෝ ද මේ අවවාද දශයේ අර්‍ථ අසා පියා අනික් කියා ලියා හැකි වරදක් නැති ව වරද කොට සිතා ගත හැකි නිව

Non-Commercial Distribution

රදකු ත් නැති ව සිරිමඬු ප්‍රශ්න ය උගත් විතරක් කියා නිමවා පියා කිය යුතු උත්තර නැති ව සේනක පණ්ඩිතයන් හුන්නා සේ ම කර බා ගෙන හුන් හ.

කෙළෙඹි පුත්‍රයෝ අට දෙන 'කුමක් ද, සිටාණෙනි, තව ත් අප ගේ දරුවන්ගේ වරදක් ඇත් දැ'යි විචාරා නැතැ යි කී කල්හි 'එ සේ කල නිවරද තැනැත්තවුන් ගෙන් නෙරනට කාරණ කිම්දැ' යි විචාළෝ ය. විශාඛාවෝ එ විට කියන්නෝ, මම මුන් වහන්සේ යන්ට කී වීට ම නික්මිණිම් නම් හික්මුණු නියාව නොවන්නේ වේද? අප ගේ පියාණන් වහන්සේ ත් මුඹ අට දෙන මා හා කැටි ව මොබ එවා ලූයේ මෙ ම නිසා වේද? විචාරා නිවරද නියාව ත් දන්නෝ ඇත්තෝ වේ ද, ආදි යන්ට ත් යුක්ති නො වෙයි. දැන් රැඳෙන්ට ත් යුක්ති නො වෙයි. එ සේ හෙයින් ගිය මැනැවැ'යි මිනිසුන්ට යාන වාහන සරහා ගමනාරම්භ කරව' යි විධාන කළ හ.

මිගාර සිටාණෝ ද ඒ කෙළෙඹියන් සහාය කොට ගෙන "යේළි, මා නො සලකා කියාපි දෙයට ක්‍ෂමා කරව. මා මෙ ලෙස ක්‍රියා කොට ත් තොප ගේ ඥාන ශක්තිය ම වේ ද ප්‍රකාශ වූ යේ ය'යි කිවූ ය. විශාඛාවෝ ඒ අසා 'මා ගේ අක්‍ෂමාවක් නැති හෙයින් ක්‍ෂමා කෙරෙමි. මම වැළි ත් බුදු සස්නෙහි තර ව පැහැද හිඳිනා කුලවලට දරු මුනුබුරු වීමි. එ සේ හෙයින් තුනුරුවණින් වෙන් ව විසිය නො හෙමි. මහලිය පළඳනාවේ මෙ තෙක් රුවන් විතර ට ත් මට ප්‍රිය නම් බුද්ධාදි වූ රුවන් තුන ම ය. ඉදින් මා ගේ අදහස් ලෙසින් බුදු පාමොක් සඟනට උපස්ථාන කට හෙම් නම් රඳමි'යි කිවූ ය. සිටාණෝ එ වකට තමන් සැදෑ නැත ත් විශාඛා වන්ගේ රැඳීම නිසා 'මුඹ රුචි ලෙස මුඹගේ රහතන්ට උපස්ථාන කරන්නැ"යි කිවූ ය.

විශාඛාවෝ බුදුන්ට ආරාධනා කරවා දෙ වන දවස් තමන් ගේ මාළිගාවට වළඳන්ට වඩා ගෙන්වූ ය. නිවටෝ ද බුදුන් මිගාර සිටාණන්ගේ ගෙට සිඟා වඩනා නියා ව අසා ගොසින් ගෙය වට කොට ගෙන හුන්හ. විශාඛාවෝ ද බුදුන් අතට පැන් වඩා ලා 'දන් සපයා ලීමි. අවුත් වළඳන බව ය'යි මයිලණුවන්ට කියා යවූ ය. උන් යන්නවුන් නිවටෝ යා නු දුන්හ. තමන්ගේ ගම නට බාධා වූ හෙයින් 'අපගේ යේළණියන්ට තමන් ම වළඳවන්ට කියව'යි විධාන කොට යවූහ.

විශාඛාවෝ ද කසුප් බුදුන් සමයෙහි විසි දහසක් දෙනා වහන්සේ වළඳවා පුරුදු හෙයින් වළඳවන සේ දන්නා බුදු

Non-Commercial Distribution

පාමොක් සඞසයා වහන්සේ වළඳවා ලා වළඳ අනතයෙහි බත් වළඳ වන්ට නො ආව ත් දහම් රස වළඳන්ට තමන් දැ අව මැනවැ'යි කියා යවූහ. සිටාණෝ ද 'දෙ විටක් කැඳවා ත් නො යාම යුක්ති නො වෙ'යි නික්මුණවු ය. නිවටෝ නැවත ත් රදවා ලා නො නැවත යන හෙයින් 'ගිය නමුත් මහණ ගොයුම්හු ළහට නො ගොස් තිරයෙන් පිටත හිඳ අසව'යි කියා ලා පෙරාතු පලා ගොසින් බුදුන්ට අවුරා තිරයක් බැඳ ගත්හ. උයි ත් ගොසින් නිවටුන්ගේ බස් නො කරණ තරමක් තව නුවූ හෙයින් තිරයෙන් පිටත හුන්හ.

බුදුහු 'තෙපි තිරයෙන් පිටත වුව ත් හිඳුව. පවුරකින් පිටත වුව ත් හිඳුව. පර්වතයෙකින් පිටත වුව ත් හිඳුව. මේ සක්වළ හැර ලා පිළිවන් වී නම් පලා ගොසින් අනික් සක් වළෙක වුව ත් හිඳුව. මෙ ලොව බුදු කෙණෙක් වෙත් නම් මම ම ය. අනික් බුදු කෙණෙක් නැත, තොප කොයි හුන ත් අස්වා බණ කියා ලන්ට මට පිළිවනැ'යි සිතා වදුරා මුල පටන් කඳ වෙළෙප් තේරුණු තැනට ගවු දෙ සියක් උස ඇති, එ තැන පටන් අතු අගට ගවු දෙ සියයක් උස ඇති එක් කොට සාර සියයක් ගවු විතර උස ඇති, නැඟෙන හිර අතු අග පටන් බස්නාහිර අතු අගට සාර සියයක් ගවු පමණ වූ, දකුණු දිග අතු අග පටන් උතුරු දිග අතු අගට සාර සියයක් ගවු පමණ වූ, වටින් එක් දහස් දෙ සියයක් පමණ ගවු වට ඇති දඹ ගස අල්වා ගෙන සොල්වා දඹ වගුරුවන කෙණකුන් මෙන් ද, අමා වැස්සක් වස්වන කෙණකුන් මෙන් ද, බණ දෙසන්ට පටන් ගත් සේක. බුදුවරුන් වහන් සේ බණ දෙසන කල—

"සද්ධම්ම දෙසනාකාලෙ - පිට්ඨිභාගාදිනිස්සිතා,
පුණ්ණචන්දං ව ගගනෙ - මුඛං පස්සන්ති සත්තුනො."

යනු හෙයින් ඉදිරියෙහි සිටියාහු ත් පස්සෙහි සිටියාහු ත් දෙ ඇළයෙහි සිටියාහු ත් සිය ගණන්, දහස් ගණන්, ලක්‍ෂ ගණන් සක්වළවලින් ඈත සිටියාහු ත් උඩින් අකණිටා බඹ ලොව සිටියාහු ත්, 'බුදුදු මා මූණ බලා මට ම බණ වදරණ සේකැ'යි වෙන වෙන ම කියති. නො දැක නො බලා බුද්ධානුභාවයෙන් කියන්නෝ නො වෙති. බුදුහු උන් උන් ම මූණ බලන්නා සේ උන් උන් හා ම කථා කරන්නා සේ වන සේක.

බුදුහු නම් සඳ වැනි සේක. යම් සේ සඳ අහස් මැදට පැමිණියේ කො තැනක සිටියවුන්ට ත් මධ්‍යව ම පෙණේ ද, එ පරිද්දෙන් බුදුවරහු ත් කොයි සිටියවුන්ට ත් අභිමුඛයෙහි සිටියා සේ ම

Non-Commercial Distribution

පෙනෙන්නෝ ය. මේ වැලි ත් ඔවුන්නෙන් සරහන ලද හිස් කපා දීමෙන්, පස් පෑ දිස්නා ඇස් දන් දීමෙන්, මස් දන් දීමෙන් ජාලිය කුමාරයන් වැනි පවිත්‍ර අදහස් ඇති පුතුන් හා එ සේ ම පවිත්‍ර අදහස් ඇති කෘෂ්ණජිනාවන් වැනි දූන් දැසි දස් කොට දන් දීමෙන්, මද්‍රී බිසොවුන් වැනි අඹුවන් දන් දීමෙන් පුරා මුදුන් පත් කළ සම තිස් පැරුමෙහි අනුසස.

මිගාර සිටාණෝ ත් බුදුන් බණ දෙස ත් ඇසට මුවා වන පම ණක් මුත් තිරය කනට මුවා නො වන හෙයින් බණ අසා දහසක් නයින් සැදුම් ලද සෝවාන් පෙලෙහි පිහිටා අචල ශ්‍රද්ධාවෙන් යුක්ත ව තුනුරුවනෙහි සැක නැති ව තිර ය ඔසවා පියා ගොසින් විශාඛාවන්ගේ ප්‍රයොගයෙන් ලත් නිවන් හෙයින් පළමු කොට බුදුන් කරා නො ගොස් ලත් නිවන් රස ය ත් සෝවාන් පමණක් ම හෙයින් මඳ වූ යෙන් විශාඛාවන් ලත් නිවන් රසයෙන් මඳක් බොනු කැමැති ව රන් තැටියක් කට තබා ගත්තා සේ විශාඛා වන්ගේ තන පුඩුව කට ලා ගෙන 'මෙ වක් පටන් මුඹ මා ගේ මෑණියන් වහන්සේ ය'යි මවු තනතුරේ තබා ලා බුදුන් කරා ගොසින් රත් නෙළුම් මල් පලඳනා සේ ශ්‍රී පාද ය හිස තබා වැද ගත්හ. විශාඛාවෝ ත් එ වක් පටන් මිගාරමාතාවෝ ය යි ප්‍රසිද්ධ වූ ය. පසු ව, පුතණු කෙණකුන් වදා උන්ට මිගාර නම තබා ඒ නම තර කළහ.

සිටාණෝ ද 'මම, ස්වාමීනි, මිගාර සිටා ය'යි නම තුන් විටක් අස් වා ලා—

"සොහං අජ්ජ පජානාමි–යත්‍ථ දින්නං මහප්ඵලං,
අත්‍ථාය වත මෙ භගවා - සුණිසා ඝරමාගතා."

යනු හෙයින් 'ස්වාමීනි, මා මෙ තෙක් කල් මුළුල්ලෙහි තුනු රුවන් විෂයෙහි කළා මේ තරමෙකැ'යි නිවටුන් ළං කිරීමෙන් දත නුහුණුයෙමි. අද වූ කලි වැඩකරු මාගේ යේළණියන් නිසා දතිමි. සසර දුකින් භාග තුබූ ව ත් අපාය දුකින් මිදිණිමි. මාගේ යේළණියෝ මුබ එන තැනැත්තෝ මට ම වැඩ පිණිස, අවු ය' යනාදීන් විශාඛාවන්ට ආ වැඩූ ය. විශාඛාවෝ දෙ වන දවසට ත් බුදුන්ට ආරාධනා කොට දෙ වන දවසු ත් දන් දුන්හ. දෙ වන දවස් නැන්දණියෝ සෝවාන් වූ ය. එ වක් පටන් එ ගෙයි සැපත් බුදු සස්නට ම පිරිනැමිණ.

Non-Commercial Distribution

ඉක් බිත්තෙන් සිටාණෝ සිතන්නෝ 'අපගේ යේළියන්ගේ අපට උපකාරි කම මහත. උන් කළ උපකාරයට ප්‍රත්‍යුපකාරයක් කළ තරමට කට නො හැකි වුව ත් තරමෙක කළ මැනාව. උන් පලඳනා මහලිය පළඳනාව බර හෙයින් හැම වේලේ පලඳනට නො පිළිවන. හැම වේලේ ම පලඳනා ලෙසට ලඝු සැහැල්ලු කොට ආභරණයක් කරවා පලඳවමි' සිතා ලක්ෂයක් වටනා නියායෙන් **ඝනමට්ටක** නම් ආභරණයක් කරවා ලා ආභරණ ය කොට නිමි කල්හි බුදු පාමොක් සඞසයා වහන්සේට ආරාධනා කරවා සකස් කොට දන් වළඳවා ලා විශාඛාවන් සුවඳ පැන් සොළොස් කළයක් විතරින් නාවා පියා බුදුන් ළඟ දී ම ආභරණ ය පලඳවා ලා බුදුන් වැන්දවූ ය. බුදූහු උන්ට ඝනමට්ටක නම් පලඳනාව පිටට සදහම් නමැති ආභරණය ත් දෙවා ලා වෙහෙරට ම වැඩී සේක.

විශාඛාවෝ ත් එ වක් පටන් දනා දී වූ පින් කරන්නෝ කැඳ දීම්, ආගන්තුක වහන්දෑ වැඩි දවස් දන් දීම්, අනික් තැනකට වඩනා දවස් දන් දීම්, ගිලන් තැනට බෙහෙත් පස දීම්, ආදී වූ වර අටක් බුදුන්ගෙන් ලදින් ශාසනාකාශයෙහි චන්ද්‍රලේඛාකාර යෙන් ප්‍රසිද්ධ ව දූන් පුතුන්ගෙන් වැඩියුරු බවට පැමිණියහ. ඒ එ සේ මැ යි. විශාඛාවෝ පුතුන් දස දෙනකු හා දූන් දසදෙනකු එක් කොට දරු විස්සක් වැදූ ය. ඉන් එකි එකී කෙණෙක් ම දරුවන් විස්ස විස්ස ලත්හ. ඉනු ත් එකි එකී කෙණෙක් විස්ස විස්ස ලත්හ යි දරු මුනුබුරු මී මුනුබුරු පරම්පරාවෙන් අට දහස් සාරසිය විස්සක් විතර දරු මුනුබුරු මී මුනුබුරු වූහ. තුමූ ත් දරු මුනු බුරු මී මුනුබුරෝ ත් එක් සිය විසි හවුරුද්දක් ම ජීවත් වූහ. ආරෝග්‍යතාවට ත් පින් කළ හෙයින් හැම දෙන ම නිරොගියහ.

එ තෙක් කල් මුළුල්ලෙහි ජාත්‍යන්තරයෙහි ලූවා වූ කුසල් නමැති කරුප්පු නිසා නර ත් මුන් හැම දෙනාට ම ඇති නොවී ය. මූ හැම දෙන ම නිරන්තරයෙන් අටළොස් හැවිරිද්ද සේ ම සිටිති. දරු මුනුබුරන් පිරිවරා විහාරයට හෝ එක් තැනකට නික්මුණු කලට මින් විශාඛාවන්දෑ කවුරුන්දෑ දූ යි විචාරණ තරමෙ ම එක් වැනි දරුමුනුබුරන් ලත්හ. යම් කෙණෙක් විශාඛාවන් යන්නවුන් දුටු වූ නම් 'මඳක් වුව ත් යන දෑ ව යි. ගමන් ම යහපතැ'යි කියති. යම් කෙණෙක් සිටියවු දුටුවූ නම් 'පය එළෙත ත් සිටිය ද වී නම් යහපතැ යි සිටි නියාව ම යහපතැ යි කියති. යමෙක් හුන්නවුන් දුටුවූ නම් හිඳිනා ලෙස ම යහපතැ'යි කියති. යම් කෙණෙක් වැද හොත්තා දුටුවූ නම් මදක් වුව ත් වැදහොත්තෝ යහපත. වැද

හෝනා ලෙස යහපතැ' යි කියති. සතර ඉරියවුවෙන් අසෝ ඉරියවුවක් නපුරැ යි කියන්ට බැරි ය. නැවත සසර ගමන් නැති වූ හෙයිනු ත් සසර රඳා හිඳී ම නැති හෙයිනු ත් සසර නමැති මකුණු හැඳ වැළඳ හෙවීම් නැති හෙයිනු ත් මෙ ලෙසින් සතර ඉරියවුව ඉතා යහපත.

ගැනු පමණක් මුත් බල දයක පින් බොහෝ කොට කළ හෙයින් ඇතුන් පස් දෙනකුට බල ඇත්තෝ ය. කොසොල් රජ්ජුරුවෝ ඒ නියා ව අසා විමසනු කැමැති ව බණ අසා එන ඉව්ලාවට ඇතු මෙහෙයාලූ ය. ඒ ඇත් සොඬ ඔසවා ගෙන අඳුන් පවුවක් මෙන් විශාඛාවන්ට අභිමුඛ ව නික්මිණ. පිරිවර පන්සියයක් ගෑනුන් ගෙන් සමහර කෙණෙක් ළෙන් ගත්තෝ වී මුත් හය බලවත් ව ආත්මප්‍රෙම බලවත් හෙයින් පලා ගියෝ ය. සමහර කෙණෙක් උන් වැලද ගෙන සිටියහ.

'මෙ කුමක් දැ'යි විශාඛාවන් විචාළ කල්හි 'රජ්ජුරුවන් වහන්සෙ මුඹදෑගේ බල බලන්ට ඇතු විහිදුවූ සේකැ'යි කිවූ ය. විශාඛාවෝ මූ දක පලා යැමෙන් ප්‍රයෝජන කිම් ද? ඉදින් තරයේ අල්වා ගතිම් නම් මේ ඇත් මිය යෙයි. කවර ලෙසක අල්වමෝ දෝ හෝ'යි දැහිලි හස්සකින් සොඬ බද මොළොකෙක අල්වා ගෙන මදක් නමා ලූ ය. ඇත් සිටිය නො හී සෙණ්ඩුලූයෙහි[1] එළිල්ලෙන් හිණ. බොහෝ දෙන සාධුකාර දුන්හ. විශාඛාවෝ ත් සුව සේ ම ගෙට ගියහ. රජ්ජුරුවන්ට ත් සැක හැරිණ.

විශාඛාවන්ගේ එ තෙක් දරු මුනුබුරන් ගෙන් ලෙඩ රෝගී එක කෙණකු ත් නැත. එ වක ආයු පමණින් සිට මුත් අතුරේ මළ කෙණකු ත් නැත. ඒ ප්‍රාණ වධ නො කිරීමෙහි අමුඛ්‍ය විපාක ය. සැවැත් නුවර ඇත්තෝ ත් මඟුලෙහි උතුළායෙහි විශාඛාවනු ත්, අට දහස් සාර සිය විස්සක් විතර දරු මුනුබුරනු ත් තමන් තමන්ගේ ගෙවලට කැඳවා ගෙන ගොසින් කරණ මඟුලෙන් වැඩ සඳහා පළමු කොට කවා පොවා ලා පසු ව මඟුල් කෙරෙති. එක් මඟුල් දවසෙක නුවර ඇත්තෝ සැදී පැහැදී ගෙන වහන්දෑගේ දක්ම ත් එක් මඟුලක් හෙයින් විහාරයට යෙති. විශාඛාවෝ ත් මහලිය පළඳනාවෙන් සැරහී ගෙන විහාරයට යන්නෝ අතුරු මඟ දී විහාර ය ආසන්න කලට තමන්දෑ සේ ම ඇතුන් පස් දෙනකුට බල ඇති කෙල්ල බණවා ලා 'හෙම්බල කෙල්ල, ගුරුන් වහන්සේ ළඟට යන කලට කෙළි පානට යන

1. සෙණ්ඩුවාලයෙහි - සෙණ්ඩුවාලුවෙහි ඇතැම්.

Non-Commercial Distribution

විද්දත් දූන් සේ හිස පටන් පිටි පත්ල දක්වා සිටින ආභරණ ලා ගෙන යෑම අප වැන්නවුන්ට තරම් නොවේ'යි කියා ලා ආභරණ ය ගළවා ලා කඩක බැඳ ලා කෙල්ල අතට දී ලා 'විහාර යට ගොසින් එන අත පළඳින්ට දී ල'යි සම්මත කොළෝ ය.

ඒ කෙල්ල විනා උන්ගේ ගෙයි ඒ පළඳනාව ඔසවා ලිය හෙන කෙලි කෙණෙක් නැත. ඒ පළඳනාව ඈ අතට දීලා ඝන-මට්ටක පළඳනාව පැළඳගෙන බුදුන් කරා ගොසින් බණ අසා ගෙන අන්තයෙහි බුදුන් වැඳ ගෙන ගෙට යන්ට නික්මුණාවූ ය. ඒ කෙලි ත් යන ගමනේ සලකුණු නැති ව ආභරණ ය ගණයේ ම තබා පුව. බණ අසා යන්නෝ යම් කිසිවක් සිහි නැති ව තබා පූ නම් අනඳ මහ තෙරුන් වහන්සේ තැන් පත් කොට තබන සේක. එ දවස් මහලිය පළඳනාව දූක 'විශාඛාවෝ මහලිය පළඳනාව සිහි නැති ව තබා පියා ගියහ'යි බුදුන්ට දන්වූ සේක. බුදුහු ඒ අසා 'එක් පසෙක තබව'යි ඔබට ම විධාන කළ සේක. තෙරුන් වහන්සේ ත් කාය බලයෙන් ඇතුන් පස් දෙනකුට බල ඇති සේක. එ සේ හෙයින් ඔසවා ගෙන හිණ කෙරේ එල්වා තබා පී සේක.

විශාඛාවෝ ද සුප්පියා නම් උපාසිකාවන් හා සමඟ අමුතු ව ආ තැන්, බැහැර යන තැන්, ගිලන් තැන් ඇත් නම් විචාරණ පිණිස යන අතර විහාර වලට යෙති. උන් විහාරවලට ගිය කලට බාල වහන්දෑ තළු-තැටි හැර ගෙන ගිතෙල්-මී-ශර්කරාදිය නිසා බොහෝ සේ පිරිවරණ සේක. එ දවසු ත් එ සේ ම පිරිවරා ගත් සේක.

සුප්පියාවෝ එක් ගිලන් නමක් දූක 'රුචි පිපාසා කුමකට දූ'යි විචාරා ආර්‍ය ශ්‍රාවිකාවන් හෙයින් ප්‍රාණවධ නොකරණ නියාව දූන තො වළහා 'දඩ මසකට රුචි ඇතැ'යි කී කල්හි 'යහපත, එවමී' කියා ලා ගොසින් දෙ වන දවස් කැප සරුප් මසක් නො ලදින් සිඹ පද නො පැන වූ සමය හෙයින් තමන්ගේ කළවයේ මස ලියා ගෙන ඉදි කොට යවා ගිලන් නමගේ දඩ මසෙහි රුචිය ත් සන්හිඳුවා බුද්ධානුභාවයෙන් තුමූ ත් පියවි වූහ. දෙ වන දවස් ම පය වණය ත් සුව වී ය.

විශාඛාවෝ ත් ලෙඩ දූක් වහන්දෑ විචාරා පියා අක් දෙරටුයෙ කින් නික්ම වෙහෙර සිම සිට 'කෙල්ල, ආභරණ ය පළඳින්ට ගෙනැ'යි කිවු ය. එ වේලෙහි කෙලි සිහි නැති ව තබා පියා ආ නියාව දූන 'ස්වාමීනි, සිහි නැති ව තබා පීමි'යි කිවු ය. 'එ සේ

Non-Commercial Distribution

වී නම් ගොසින් තබා ලූ තැන ම තුබූයේ නම් හැරගෙන එව. අනඳ මහ තෙරුන් වහන්සේ එක් තැනක තබා වදාළ සේක් වී නම් නො ගෙනැ'යි ඔබ එ සේ තිබී ගිය දෙය තබන නියා ව දූන කිවු ය.

තෙරුන් වහන්සේ ද ඒ කෙල්ල දූක 'කුමකට අයි දූ'යි විචාරා 'පළඳනා ව සොයා ය'යි කී කල 'තෙල හිණ ගාවා එල්වා ලූයේ ගොසින් හැර ගනැ'යි වදාළ සේක. 'මුඹ වහන්සේ ඒ ආභරණ ය අතින් අල්වා වදාළ හොත් නො ගෙන යන්ට කී සේකැ'යි කියා ලා සිස'තින් ම ගොසින් 'කුමක් දූ'යි විශාඛාවන් විචාළ කල්හි එ පවත් කිව. 'මා ගේ සවාමිදරු වූ අනඳ මහ තෙරුන් වහන්සේගේ ශ්‍රී හස්තයේ ගැවුණා මම නො පළඳිමි. ඒ ඔබ ම සන්තක ය. එතකුදු වුව ත් ඒ පිරිමසන්ට ඔබට බැරි ය. ඒ වියදම් කරවා කැප බඩුවක් ගෙන දෙමී' කියා 'ගොසින් ගෙනැ'යි කිවු ය. ඔයි ත් ගෙනවුත් දූන.

විශාඛාවෝ ත් නො පැළඳ ම ගෙට ගෙන ගොසින් බඩාලුන් ගෙන්වා ගෙන අගය කරවා 'නව කෙළක් අග ය. කළ මිළ ලක්ෂයකැ'යි කී කල්හි පළඳනා ව ගැලෙක තබ්බවා ලා 'තෙල ගෙන ගොස් විකුණව'යි විකුණන්ට යවා සියලු නුවර එ තෙක් මිළ දී ලා හැර ගත හෙන කෙණකුන් නැති හෙයින් විශාඛාවෝ තුමූ ම නව කෙළක් හා තව ත් ලක්ෂයක් දී ලා හැර ගත්හ. මිළ දී හැර ගන්නා තබා පළඳින්ට ත් මුළු පොළොව විශාඛාවන් හා බන්ධුල මල්ලිකාවන් හා බරණැස් සිටාණන්ගේ දූවණියන් හා මුන් තුන් දෙනා විනා නැත.

විශාඛාවෝ ද පළඳනාවෙහි මිළ ය ගැල් ලවා ගෙන වෙහෙරට ගෙන්වා ගෙන ගොසින් බුදුන් වැඳ ලා 'අනඳ මහ තෙරුන් වහන්සේ අල්වා වදාළ මහලිය පළඳනා ව පළඳින්ට මැළි ව විකුණුවා කැප දෙයක් පවත් කරවමී-විකුණන්ට යවා එ තෙක් මිළ දී ලා හැර ගත හෙන කෙණකුන් මෙ නුවර නැති හෙයිනු ත් හැර ගත ත් පළඳන්ට නිසි කෙණකුන් මා විනා මෙ නුවර නැති හෙයිනු ත් මම ම ඊට මිළ දී පළඳනා ව හැර ගෙන මිළ ගන්වා ගෙන අයිමි. 'සිවු පසයෙන් කවර පසයක් හෙළවම් ද, සවාමීනි' කිවු ය. බුදුහු ඒ අසා 'එ සේ වී නම් නැගෙන හිර දෙරටුව කෙරේ සාඩසික කොට ගෙයක් කරව'යි වදාළ සේක. විශාඛාවෝ විහාර කරවා දීමෙහි අනුසස් බලවත් නියා ව ආදි ත් දන්නා හෙයින් සතු වු ව බිම ඇත්තවුන් ගෙන් නව කෙළක් දී ලා බිම ඉල්වා ගත්හ. අනික් නව කෙළක් දී ලා විහාර ය කරවන්ට පටන් ගත්හ.

එක් දවසක් බුදුහු අළුයම් වේලෙහි ලොව බලන සේක් දෙව් ලොවින් සැව අවුත් භද්දිය නුවර සිටු කුලෙහි උපන් භද්දිය සිටාණන්ට රහත් වන්ට නිසි පින් ඇති නියාව දැන අනේපිඩු සිටාණන්ගේ ගෙයි දී වළඳා ලා නුවර උතුරු වාසල බලා නික්මුණු සේක. පියවින් ම බුදුහු විශාඛාවන් ගේ ගෙයි දී වළඳා ලා දකුණු වාසලින් නික්ම දෙව් රම වසන සේක. පූර්වාරාමය ඇති වූ පසු අනේපිඩු සිටාණන් ගේ ගෙයි දී වළඳා ලා නැගෙනහිරි වාසලින් නික්ම පූර්වාරාමයෙහි වසන සේක. උතුරු වාසල බලා බුදුන් නික්මුණු කලට සැරිසරා පිටත වඩිනා සේකැ'යි දනිති. විශාඛාවෝ උතුරු වාසල බලා වඩනා නියා ව අසා වහ වහා අවුත් වැඳ ලා සැරිසරා වඩනා නියා දැ' යි අසා 'එ සේ ය'යි වදාළ කල්හි 'මෙ වකට අටළොස් කෙළක් වියදම් කොට මුඹ වහන්සේට විහාරයක් කරවීමි. රඳා වදාළ යහපතැ'යි කිවු ය. 'නො නවත්වන ගමන, විශාඛාවෙනි'වදාළ සේක. 'නිවන් දක්වන්ට නිසි කෙණෙකුන් දැක වදාළ නියා ය'යි සිතා ලා 'නො නැවත වඩනා පසු කළ නො කළ මෙහෙවර දැන නො කළ දෙයට විධානයට එක් කෙණකුන් වහන්සේ රඳවා ලා වදාළ යහපතැ'යි කිවු ය. 'යම් කෙණකුන් රඳවනු කැමැත්තාහු වී නම් උන්ගේ පාත්‍ර ය හැර ගනුව'යි වදාළ සේක.

උඹ කිසි සේ ත් අනද මහ තෙරුන් වහන්සේ කෙරෙහි මමායනය ඇත්තෝ ය. එතකුදුවුව ත් මුගලන් මහ තෙරුන් වහන්සේ සෘද්ධිමත් හෙයින් උන්වහන්සේගේ ආනුභාවයෙන් කර්මාන්ත වහා නිමවනු පිණිස ආරාධනා කොට ඔබගේ පාත්‍ර ය හැර ගත්හ. තෙරුන් වහන්සේ බුදුන් මුහුණු බැලූ සේක. බුදුහු 'තොපගේ පිරිවර පන් සියයක් භික්ෂූන් හැර ගෙන රඳව'යි වදාළ සේක, බුදුන්ගේ විධානයෙන් ඔබ ත් රඳා වදාළ සේක. උන් වහන්සේගේ ආනුභාවයෙන් දඬු පත් ආදි ය නිසා ගවු දෙ සියයකු ත් දෙ සිය හතළිස් ගව්වකුත් වඩා ත් ගියාහු කවර තරම් දෙයක් හැර ගෙන ත් එ දවස් ම එති. ගැල්වලට දඬු පත් නඟන කල ත් ගල් නඟන කල ත් මිනිසුන්ට කිසි ත් ආයාස නැත. කො සා බරක් නැඟුව ත් ගැලු ත් නො බිඳෙයි. නො බෝ කලකින් ම දෙ මාල් පායක් කළහ. යට මාලේ ගබඩා පන් සියයෙක උඩු මාලේ ගබඩා පන් සියයෙක. එ හෙයින් ඒ පාය ගබඩා දහසකින් හෙබියේය.

බුදුහු මහා මණ්ඩලයට වැඩි හෙයින් නව මසක් සැරිසරා වදරා පෙරළා සැවත් නුවරට ම වැඩි සේක. විශාඛාවන් කරවණ දෙ මාල් පායේ කර්මාන්ත ත් නව අවුරුද්දකිනු ත් නොනිමත

Non-Commercial Distribution

තරම් වූව මුගලන් මහ තෙරුන් වහන්සේගේ ඍද්ධ්‍යානුභාවයෙ-නුත්, විශාඛාවන්ගේ කුශලානුභාවයෙනු ත්, බුදුන්ගේ බුද්ධානු-භාවයෙනු ත්, නව මසකින් නිමියේ ය. පායෙහි කොත පැන් සැට කළයක් ගන්නා වීතර මහත් කොට රත්රනින් ම කැරවූහ. බුදුන් දෙව්රමට වඩනා නියා ව අසා පෙර ගමන් කොට ගොසින් තමන් කැරවූ විහාරයට ම වඩා ගෙන ගොස් "ස්වාමීනි, මේ සාර මස ම ඔබ්බකට නො වැඩ අලුත කළ විහාරයේ ම වැඩ හිඳිනා බව ය. විහාර නිමි පූජා ව කරවමි'යි කිවූ ය. බුදුහු ත් ඉවසා වදාළ සේක. උයි ත් එ වක් පටන් සිහා නො යවා බුදු පාමොක් සඟනට වෙහෙරට ම දන් බාවති.

විශාඛාවන්ගේ එක් යෙහෙළි කෙණෙක් දහසක් අගනා එක් කඩක් හැර ගෙන අවුත් විශාඛාවන්දෑට 'මම මේ හිණ කඩ මුඹගේ පායේ බුමතුරුණු කොට අතුරනු කැමැත්තෙමි. එක් අවසරයක් පැව මැනැවැ'යි කිව. 'යෙහෙළි. මම ඉදින් අවසර නැතැ යි කීම නම් තෙපි අවසරයක් පාන්ට මැළි ව ය'යි සිතව. තෙපි ම උඩු මාල ත් යට මාල ත් ගබඩා දහස ත් බලා පියා නිසි තැනක් දනුව'යි කිවූ ය. උයි ත් දහසක් වටනා කඩ හැර ගෙන ගොසින් බලා අතුළ පිළියෙන් ඊට අඩු තරම් පිළියක් නො දැක මේ පින් කම මුසුවන්ට නැති නියා වේ දෑ'යි මුසුප්පුව ගෙන එක් තැනක හඩ හඩා සිටියෝ ය.

අනඳ මහ තෙරුන් වහන්සේ උන් හඬන නියා ව දැක සත්තු භත්ත ජාතකයෙහි බමුණු ව උපන් තමන් වහන්සේ හඬන කාරණ සේනක පණ්ඩිත ව උපන් මහ බෝසතුන් විචාළ සේ ම 'කුමකට හඬවූ දෑ'යි විචාළ සේක. ඒ අසා හඬන්ට කාරණය කී කල්හි 'තෙපි මුසුප්පු නො වව. මම නිසි තැනක් කියාල මී වදරා ලා 'හිණට ත් සදකඩ පාණට ත් අතරෙහි බිස්සක් සේ හකුළු වා ලා තබා ල ව. වහන්දෑ පය සෝධා පියා තිලි පය පිය පියා ඇතුළු ගෙට වඩනා සේක. එ සේ කලට තොපට අනුසස් මහතැ'යි විශාඛාවනු ත් සලකා ගත නුහුණු තැන වදරා එ ලෙස උන් ලවා කරවා පින් කම උනු ත් මුසු කළ සේක.

විශාඛාවෝ ද සාර මස මුළුල්ලෙහි ඇතුළු වෙහෙරදී ම බුදු පාමොක් සඟනට දන් දුන් හ. කෙළවර දවස් කසුප් බුදුන් සම යෙහි විසි දහසකට දී ඉතිරි ය තබා ගෙන හිඳ ලා ඒ වහන්දෑට දෙන කලක් මෙන් තුන් සිවුරට සෑහෙන ලෙස සිවුරු පිළි දුන්හ. හැම තැනට බාල තැන ලත් සිවුරු පිළි රන් එ වකට

Non-Commercial Distribution

අරුම නො වන හෙයින් දෝ මසු දහසක් වටී. හැම දෙනා වහන්සේගේ ම පාත්‍ර පුරා එ තෙක් සරක් ඇත්තවුන්ට ගිතෙල් අරුම නො වන හෙයින් හෙළගිතෙලු ත් ශර්කරා අදිා වූ බෙහෙත් බඩු ත් පුරා දුන්හ.

දන් දීමට ම අග ය කළ කලට නව කෙළක් වියදම් වී ය. විහාරයට බිම හැරගන්ට නව කෙළෙක. වෙහෙර කරවන්ට නව කෙළෙක. විහාර ය කරවා නිමි පූජාවෙි දන් දීමට නව කෙළෙකැ යි සත්විසි කෙළක් බුදු සස්නට වියදම් කළහ. ගෑනු ව සිට මිථ්‍යා දෘෂ්ටික ගෙවලට පැමිණ ත් පින් විෂයෙහි මෙ බඳු වියදමෙක් විශාඛාවන් විනා අනික් කෙණකුන් ගෙන් එ වක නො වී ය. උෟ විහාර පූජාව නිමි දවස් පස්වරු වේලේ දරු මුනු බුරන් පිරිවරා යමක් තුමූ පැතුවෝ වී නම් සියල්ල ම අඩුවක් නැති ව මුඳුන් පැමිණි හෙයින් කරවා ලූ පාය වට කොට ඇවිද ඇවිද –

කදහං පාසාදං රම්මං – සුධාමත්තික ලෙපනං.
විහාරනං දස්සාමි– සඞ්කප්පො මය්හ පූරිතො.

කදහං මඤ්චපීඨං ච–භිසිබිම්බොහනානි ච,
සෙනාසනභණ්ඩං දස්සාමි–සඞ්කප්පො මය්හ පූරිතො.

කදහං සලාකභත්තං-සූචිං මංසූපසෙචනං,
භොජනදනං දස්සාමි-සඞ්කප්පො මය්හ පූරිතො.

කදහං කාසිකං වත්‍ථං–ඛොමකොටුම්බරානි ච
චීවරදනං දස්සාමි සඞ්කප්පො මය්හ පූරිතො.

කදහං සප්පි නවනීතං – මධු තෙලඤ්ච ඵාණිතං
භෙසජ්ජදනං – දස්සාමි–සඞ්කප්පො මය්හ පූරිතො'

යනු හෙයින් 'කෛලාශකූට ප්‍රතිභාග ව සුණුවමින් බබළන මිනිස් ලොවට විජයත් පායක් හා සමාන වූ පායක් කරවා කවර කලෙක දන් දෙම් දෝ හෝ යි සිතා ඒ අදහස ත් සමෘද්ධ වී ය. නැවත හැඳ බිසි කන්වයින් ආදි වූ සෙනසුන් පිරිකර කරවා ලූ පහයට කවර කලෙක ලම් දෝ හෝ යි සිතා එයි ත් දූන් සමෘද්ධ වී ය. නැවත අති පවිත්‍ර රස මසවුළෙන් යුක්ත ආහාර ය ත් සපයා කවර කලෙක සඞ්ඝයා වහන්සේට ලා බත් කොට දෙම් දෝ හෝ යි සිතා එයි ත් දූන් සමෘද්ධ වී ය. නැවත සළු සොළී පිළී ආදි වූ පිළී කප්පවා සිවුරු කරවා සිවුරු දනක් කවර

කලෙක දෙම් දෝ හෝ යි සිතා එයි ත් සමෘද්ධ වී ය. නැවත ගිතෙල් මී සකුරු ආදි වූ දෙය පාත්‍ර පුරා කවර කලෙක සඞ්ඝයා වහන්සේට දෙම් දෝ හෝ යි සිතා එයි ත් අද සමෘද්ධ වී ය'යි මේ හඟවා තෙල ගාථා පස කිවු ය.

වහන්දෑ ඒ අසා බුදුන් කරා ගොසින් 'ස්වාමීනි, මේ විශාඛාවන් මෙ තෙක් කල් මුළුල්ලෙහි ගීයක් කියන්නා ඇසූ විරූ නැත. අද දරු මුනුබුරන් පිරිවරා ගෙන තුමූ කුඩා කෙල්ලක සේ ගී කිය කියා පාය සිසාරා ඇවිදිති. කුමක් ද? විහාරයේ කර්මාන්ත විධාන නිසා වාග්ව්‍යායාමයෙන් පිත් කිපි නියා ද? නොහොත් යක්‍ෂොන්මාදයක් නියා ද' යි විචාළ සේක. බුදුහු ඒ අසා 'මහණෙනි, ම දූ ගී කියන්නී නො වෙ යි. තමා පැතූ පැතීම මුදුන් පැමිණි හෙයින් සතුටු ව උදන් අනන්නී ය' යි වදරා 'උන් පැතූ ප්‍රාර්ත්‍ථනාව කවර කලෙක ද'යි විචාළ කල්හි අසනු කැමැති නියා ද යි විචාරා 'එ සේ ය, ස්වාමීනි'යි කී කල්හි ''මහණෙනි, මෙ මා බුදු වූ පඤ්චබුද්ධ ප්‍රතිමණ්ඩිත භද්‍රකල්පයට ලක්‍ෂයක් වන කප ජීවත් ව සිටිනා හවුරුදු ලක්‍ෂ ය මුළුල්ලෙහි අහසින් යන ගමන් හැර පොළොවින් යම් තැනකට යන කලට අනූ රියන් පමණ පියුම් පෙති ඇති, තිස් රියන් පමණ කෙසුරු ඇති, නව කළයක් පමණ රේණු ඇති, දොළොස් රියන් පමණ පියුම් කෙමි ඇති, හෙළ පියුමෙන් රත් පියුමෙන් නික්මෙන හෙයින් හෙවත් ඒ පියුම් මැඩ ගෙන නික්මෙන හෙයින් පියුම තුරා නම් බුදු කෙණෙක් ලොව උපන් හ.

උන් උපන් නුවර හංසවතී නම. පියාණෝ ආනන්ද නම් රජ්ජුරුවෝ ය. මෑණියෝ සුජාතා නම් බිසවු ය. නිත්‍ය පරිවාර භික්ෂූහු ලක්‍ෂයෙක. ගෑනු ව සිට යම් කෙණෙක් ඒ බුදුන්ට උපස්ථාන කෙරෙත් නම් උන්ට උතුම් ව වර අටක් ලදින් එක් උපාසිකා කෙණෙක් උන්ට උපස්ථාන කෙරෙති. සවසත් උද සන ත් බුදුන් වදනට යෙති. උන්ගේ එක් යෙහෙළි උපාසිකා කෙණෙක් උන් හා කැටි ව එක්වන් විහාරයට යන්නෝ අර මුන් බුද්ධවල්ලභ නියාව දැක 'මෙ සේ බුද්ධවල්ලභ වන්නේ කුමන පිණක් කොට දෝ හෝ'යි සිතා බුදුන් කරා ගොසින් 'ස්වාමීනි, මෙ අප ගේ යෙහෙළි තැනැත්තෝ මුඹ වහන්සේට කුමක් වෙත් ද'යි විචාරා 'අග්‍ර උපස්ථායිකාවෝ ය'යි වදළ කල්හි 'ස්වාමීනි, කුමන පිණක් කොට මේ තනතුර ලද හැකි ද'යි විචාරා 'කප් ලක්‍ෂයක් මුළුල්ලෙහි පින් කම් කොට පතා ය'යි වදළ කල්හි 'මෙ වක පතා ලද හැකි ද'යි විචාළෝ ය. බුදුවරුන් නමුත් මා ම නො වත් අග්‍ර උපස්ථායිකාවරුනු ත් මුන් ම නො ව ත් දූන් පතා ත් ලද හැක්කැ'යි වදළ සේක.

Non-Commercial Distribution

'ස්වාමීනි, එ සේ වී නම් ලක්‍ෂයක් දෙනා වහන්සේ හා සමග සතියක් මාගේ ආරාධනාව ඉවසා වදාළ යහපතැ'යි කීවු ය. බුදුහු ත් ඉවසා වදාළ සේක. උයි ත් මහ වතුරක් මෙන් සතියක් දන් දී ලා කෙළවර බුදු පාමොක් සඟනට සිවුරුපිළි දන් දී ලා බුදුන් වැඳ ගෙන හෙව 'ස්වාමීනි, මේ සා මහත් දන් දී ලා ශක්‍ර සම්පත්, බ්‍රහ්මසම්පත් ආදියක් නො පතමි. මුඹ වහන්සේ වැනි බුදු කෙණකුන් වහන්සේ කරා පැමිණ වර අටක් ලදින් මවු තනතුරෙහි සිට සිවු පසයෙන් උපස්ථාන කරණ ගැනු ජාතියට අග්‍ර වෙම්ව'යි පැතූ ය.

බුදුහු ත් 'මුන්ගේ ප්‍රාර්ත්‍ථනාව මුන් දුන් දන සේ ම උදාරතර ය. සමෘර්ධවේ දෝ හෝ'යි මතු එන දවස් අනාගත ඥානයෙන් බලන සේක් සමෘර්ධ වන නියාව දැන 'මෙයට ලක්‍ෂයක් වන කප ගොතම නම් බුදු කෙණෙක් ලොව පහළ වෙති. උන් උපදනා නුවර කිඹුල් වත් නම. පිය රජ්ජුරුවෝ සුදෙවුන් නම්හ. මවු බිසවු මහාමායා නම්හ. දකුණ ත් සවු නම සැරියුත් නම්හ. වම ත් සවු නම මුගලන් නම්හ. ඛෙමා නම් උප්පලවණ්ණා නම් මෙහෙණින්නෝ දෙදෙනෙක් අග්‍ර ශ්‍රාවිකා වෙති. ආනන්‍ද නම් මහ තෙර කෙණෙක් අග්‍ර උපස්ථායක ව අත් පා මෙහෙ කෙරෙති. අනාථ පිණ්ඩික නම් සිටාණ කෙණෙක් අග්‍ර උපස්ථාන කෙරෙති. තෙපි එ කල අභිමතාර්ත්‍ථ දයක වූ කල්පවෘක්‍ෂ ශාඛාවක් සේ විශාඛා නම් ව ඒ බුදුන් ගෙන් වර අටක් ලදින් මවු තනතුරැ සිට සිවු පස යෙන් උපස්ථාන කොට උපාසිකාවරුන්ට අග්‍ර නියාවට එතදග්‍ර පාළියට නැඟී උපස්ථාන කරව'යි වදාළ සේක.

කප් ලක්‍ෂයකින් වන දෙය උන්ට අවධි නියම වූ හෙයින් සෙට දවස් ලබන දෙයක් සේ සිතින. උෟ ත් ආයු පමණින් තව තව ත් පින් කම් කොට එයින් සැව දෙව් ලොව ඉපැද ච්‍යුති ප්‍රතිසන්ධි වශයෙන් ඇවිදින්නෝ කසුප් බුදුන් සමයෙහි කිකී නම් කසී රජ්ජුරුවන්ගේ දූන් සත් දෙනාට බාල ව සඞසදසී නම් ව තුනුරුවන් සරණ විනා අනික් සරණකට නො ගොස් බූන් හා සමග විසි දහසක් හවුරුදු මුළුල්ලෙහි බොහෝ පින් කම් කොට කසුප් බුදුන් සමයෙහි ත් මෙම තනතුර ම පැතූහ. එ වක් පටනු ත් කළ පින් බොහෝ හෙයින් අපායට නො ගොස් දෙව් ලොව මිනිස් ලොව සැප ත් විඳිනාහු මෙ වක මැඬ මහ සිටාණන් ගේ පුත් වූ ධනඤ්ජය සිටාණන්ට දූව ඉපැද මාගේ සස්නෙහි බොහෝ පින් කොළෝ ය. එ සේ හෙයින්, 'මහණෙනි, ම දූව ගී කියන්නේ නැත. තමා සිතූ පැතූ දෙය සමෘද්ධ හෙයින් උදන් අනයි'



Non-Commercial Distribution

වදරා මෙසේ හවර කියා ගියවුන්ට ප්‍රමාද දෙන්නා සේ 'සෙම්බා මහණෙනි, යම් සේ මල් ගෙතීමෙහි දක්ෂ මාලා කාරයෙක් බොහෝ මල් රැසකින් නො එක් පැ ඇති මල් තෝරා හැර ගෙන එක් දසාවකට නටු තබා ය. දෙකෙළවරට නටු තබා ය. සතර අතට නටු තබා ය යනාදීන් නො එක් ලෙස මල් වඩම් ගොතා ද, එ පරිද්දෙන් සත්ත්වයන් විසින් දන් දීම්, සිල් රක්ෂා කිරීම්, භාවනා කිරීම්, පින් දීම්, පින් අනුමෝදම් වීම්,[1] බණ ඇසීම්, ගුරුන්ට සිල් වතුන්ට මෙහෙ කිරීම් ආදී විසින් බොහෝ පින් කටයුතු ය.

යම් සේ මල් ගොතන මාලාකාරයා දක්ෂ වී නමු ත් මල් මඳ වී නම් සිත් ලෙසට මල් ගොතා ලිය නො හේ ද, මල් බොහෝ ව ත් මල් ගෙතීමෙහි අදක්ෂ වී නම් ගොතා ලිය නො හේ ද. මලු ත් බොහෝ වී නම් මාලා කාරයා ත් දක්ෂ වී නම් මල් ගොතා ද- එ පරිද්දෙන් යම් කෙණෙක් පින් කිරීමෙහි දක්ෂයෝ වූ නමු ත් සම් පත් නැත්තෝ වූ නම් උයි ත් දිළිඳු හෙයින් සැදැ ඇත ත් පින් කොට ගත නො හෙති. සම්පත් බොහෝ වුව ත් සැදැ නැති ව පින් කිරීමෙහි අදක්ෂයෝ වූ නම් උයි ත් පින් කොට ගත නො හෙති. යම් කෙණෙක් විශාඛාවන් මෙන් සම්පත් ඇති ව පින් කිරීමෙහි අදහසු ත් ඇත්තෝ වූ නම් කුශල ය සිඩ වන්නේ උන්ට ය. සැදැ නැත්තවුන්ට සම්භව වූ සම්පත් නම් රකුසු රකවලින් තුබූ විල් වන්නැ'යි වදළ සේක.

එ සේ හෙයින් සෞජන්‍යයෙහි පිහිටි නුවණැත්තවුන් විසින් අකුසලින් දුරු ව කුසල්හි පිහිටා සිත් සතන් පිරිසුදු කට යුතු.

## 52. අනඳ මහ තෙරුන් වහන්සේ ගේ පැන විසඳීම් වත

තව ද යම් සේ මහ පොළොව කපුරු-කළු වැල්-සඳුන් ආදිය ලීමෙහි ත් කෙළ සොටු ආදී වූ අපවිත්‍ර ය ලීමෙහි ත් සම ද, එ පද්දෙන් ලාභ යශස් ප්‍රශංසා සුඛයෙහි උඩඟු කමු ත් අලාභ අයස් නින්‍දා දුක්හි කලකිරුමුත් නැති, තව ද යම් සේ මහ පොළොව සුවඳ විලවුන් ආදී වූ සැරහීම් නැති ව ත් ශුද්ධාෂ්ටක විනිර්මුක්ත පොළොවක් නැති හෙයින් කලාපගත ගන්ධයෙන් සුවඳවත් ද එ මෙන් සුවඳ විලවුන් නැත ත් සිල් නමැති සුවඳින් සුවඳවත් වූ-

තව ද යම් සේ මහ පොළොව කඩ නොව, සිදුරු නො ව, බොල් ව ඝන ව පැතිර සිටී ද එ මෙන් ඛණ්ඩාදී භාවයට නො පමුණුවා ධොත සඞ්ඛයක් සේ නිර්මල කොට සීල පූරණ ය ඇති-

1 අනුමෝදන් වීම

Non-Commercial Distribution

තව ද යම් සේ මහ පොළොව, නුවර දනවු ගම් ආදි ය උසුලා නමුත් පසු බැස්ම නැත්තී ද, එමෙන් අවවාද අනුශාසනාදියට පසු බැස්මක් නැති, තව ද යම් සේ මහ පොළොව ක්‍රොධානුනයක් නැත්තී ද, එමෙන් සියල්ලවුන් කෙරෙහි සම අදහස් ඇති සත්පුරුෂයන්ගේ ගුණ ශොභා ව හැම තැන පවත්නා ලෙස හඟවන්ට අනඳ මහ තෙරුන් වහන්සේගේ පැන විසඳීම් වත දක්වමු.

කෙ සේ ද යත්:—

එක් දවසක් අනඳ මහ තෙරුන් වහන්සේ 'සඳුන් ආදි වූ හර සුවඳ ත්, හිරිවේරිය ආදි වූ මුල් සුවඳ ත්, දෑ සමන් ආදි වූ මල් සුවඳ ත් බුදුහු උතුම් කොට වදළ සේක. එහි සුවඳ ත් යටි සුළඟට යන්නක් මුත් උඩු සුළඟට යන්නක් නැත. යමෙක සුවඳ උඩු සුළඟට ත් යේ නම් එ සේ වූ දෙයකු ත් ඇත් දෝ හෝ'යි සිතා 'මෙ ම සේ සිතා ප්‍රයෝජන කිම් ද? තරාදිය තිබිය දී අතින් කිරන්නා සේ ය. බුදුන් ම විචාරමි'යි සිතා බුදුන් කරා ගොසින්, 'ස්වාමීනි, සඳුන් ආදි වූ සාර ගන්ධයෙහි ත්, හිරිවේරිය ආදි වූ මූල ගන්ධයෙහි ත්, චම්පක පුෂ්පාදි වූ පුෂ්ප ගන්ධයෙහි ත්, සුවඳ යටි සුළඟට හමත් මුත් උඩු සුළඟට නො හම යි. යටි සුළඟට ත් උඩු සුළඟට ත් හමන සුවඳ ඇත් දැ'යි විචාළ සේක. විචාළ ප්‍රශ්න ය විසඳන බුදුහු 'හෙම්බා ආනන්දයෙනි, තොප විචාළ යටි සුළඟට උඩු සුළඟට තබා දස දිගට ම හමන සුවඳ ඇත.

''ඒ කවරේ ද යත්–හෙම්බා ආනන්දයෙනි, යම් ගමෙක වේව යි, නියම් ගමෙක වේව යි, තොටෙක වේව යි, ගෑනු කෙණෙක් වෙත්ව යි, පිරිමි කෙණෙක් වෙත්ව යි, කවුරු වෙත් ව යි, තිසරණ පිහිටා වෙසෙත් ද, පස් පවිනු ත් දුරු ව වෙසෙත් ද, දස පින්කිරිය වත පුරත් ද, මසුරු සිත් නැති ව දන් දෙත් ද, උන්ගේ ගුණ ඒ ඒ දිග මහණ බමුණෝ ත් කියති. ඒ ඒ දිග වසන දෙවියෝ ත් කියති. එ සේ හෙයින් උන්ගේ ගුණ සුගන්ධ ය දස දිග ම හම යි. සෙසු මල් තබා සාර සියයක් ගවු විතරට සුවඳ හමන පරසතු–මඳාරා මල්හි සුවඳ පවා යටි සුළඟින් සාර සියයක් ගවු හමන පමණක් මුත් උඩු සුළඟින් අඟලක් විතරට ත් නො හම යි. සඳුන් තුවරලා ආදියෙහි සුවඳ ත් යටි සුළඟින් තමා හමන විතරක් හම ත් මුත් උඩු සුළඟින් කෙසඟක් විතරක් නො හම යි. ඒ එ සේ වුව ත් බුඩාදී වූ සත් පුරුෂයන්ගේ ගුණ සුවඳ උඩින් අකනිටා බඹ ලොව දක්වා ත් සරසින් අනන්තා පරිමාණ සක්වල ත් පාතින් නාග භවන

Non-Commercial Distribution

ගරුඬ භවනාදියෙහි ත් හමයි. උන්ගේ ගුණ ශොභා ව මහත් ව පැතිරීමෙන් මහත් වූවා සේ ම උන්ට දුන්නා වූ ලසු දනය ත් විපාක වසයෙන් මහත් වෙ'යි වදාළ සේක. මේ දෙශනා කෙළවර ත් බොහෝ දෙන නිවන් දුටුවූ ය.

එ සේ හෙයින් නුවණැත්තවුන් විසින් පුණ්‍ය ක්‍ෂෙත්‍ර හැම කල ලද නො හැකි හෙයින් ලත් අවධියෙහි කුසල් පුරා අනුශාසනා ලෙසින් අකුසලින් දුරු ව ත්‍රිවිධ බොධීන් එක් තරා බොධියකට පැමිණිය යුතු.

---

## 53. සක්දෙවිඳු බත් දුන් වත

තව ද උපදෙස් දන්නවුන්ට කුසල් නිරායාසයෙන් සිද්ධ වන නියා ව හඟවනු පිණිස මහසුප් තෙරුන් වහන්සේට සක් දෙවිඳු බත් දුන් වත දක්වමු.

කෙ සේ ද යත්—

එක් දවසක් මහසුප් මහ තෙරුන් වහන්සේ සතියක් මුළුල්ලෙහි නිරොධයට සම වැද වැඩ හිඳ එයින් නැඟී රජගහා නුවර ගෙපිළිවෙළින් සිඟන්ට නික්මුණු සේක. එ කල සක් දෙවිඳුහුගේ අඩු තුන් කෙළක් පුරඟනන් ගෙන් පරෙවියන්ගේ පා සේ රත් වූ පතුල් ඇති දෙවඟනෝ පන් සියයෙක් 'මහසුප් මහ තෙරුන් වහන්සේට දනක් දෙම්හ' යන බලවත් අදහසක් ඇති ව බත් වසුන් පන් සියයක් ගෙන්වා ගෙන අවුත් අතුරුමඟ සිට 'ස්වාමීනි, අපට කරුණා කොට මේ බත් පිළි ගත මැනවැ'යි ආරාධනා කළහ. 'තෙපි යව, තෙල් කෑ වළදේ ම තෙල් වත් කළ යි සෙසු වළන් තෙල් කා ද? පැන් පිරුණු වළන් ම උතුරුවා පැන් වත් කළ කලට සිස් වළන් සිස් ම වේ ද, එ සේ ම තොපට සංග්‍රහ කළ යි සෙසු සංග්‍රහ ලද මනා වුන්ට සංග්‍රහ කෙ සේ ද? දියෙහි වස්නා වැස්සට වඩා ගොඩ වස්නා වැස්සෙන් ප්‍රයෝජන බොහොව. මම දුක් පතුන්ට සංග්‍රහ කෙරෙමි' වදාළ සේක.

ස්වාමීනි, අපට වන වැඩට බාධා නො කළ මැන ව. අනුග්‍රහ කරන්ට ම වුව මැනැවැ'යි කිවූ ය. මහ තෙරුන් වහන්සේ නැවත ත් ප්‍රතික්‍ෂෙප කොට වදරා ඉවත් නො ව ආරාධනා කරන්නවුන්ට 'තොපගේ පමණ ත් නො දනු ද? ඉවත් වව'යි කෝප ලවයක් නැත ත් ඒ ආකාරයෙන් අසුර ගසා ලූ සේක. අසුර ගසා ලූ හඬින් හයින් තැති ගෙන පියා සිටි ය නො හී පලා ගොසින්

Non-Commercial Distribution

දෙව් ලොවට ම ගියාහු 'කොයි ගියාදැ'යි සක් දෙවිඳුන් විචාළ කල්හි මහසුප් මහ තෙරුන් වහන්සේට බතක් පිළිගන්වන්ට ගෙන ගිය නියාව කිවු ය. 'පිළිගන්වා ගතුදැ'යි විචාළ කල්හි 'නො පිළිගත් සේකැ'යි කිවු ය. 'කුමක් වදරා ලා නො පිළිගත් සේක් දැ'යි ශක්‍රයන් විචාළ කල්හි 'දුප්පතුන්ට සංග්‍රහ කරම්හ'යි වදරා ලා ය'යි කිවු ය.

'බත් ගෙන්වා ගෙන තෙපි කවර ලෙසින් ගියා දැ'යි විචාරා 'දෙවතා වෙසින් ම ය' කී කල්හි, 'තොප වැන්නෝ ත් ඔබට බත් පිළිගන්වා ගත හෙත් ද? බලා සිටුව, මම බත් පිළිගන්වමී' කියා ලා ජරා ව දිරා ගොසින් මාලු වූ දැකැත්තෙක දැති වැගිර ගියා සේ දත් වැගිර ගියා වූ ශරීර නමැති දර ගොඩෙහි ජරා නමැති ගිනි වැද ගෙන ද අළු ව ගියාක් වැනි වූ නරකෙස් ඇති වූ, වක බිඳී ගියා වූ, දුටු කල ඉතා කම්පා කරණ තරම් මාලු සාලි වෙසක් මවා ගෙන සුජාතාවනු ත් එ සේ මැලි සාලි දූ වෙසක් මවා ලා හූ වත් කොට කොට සිටියෝ ය.

මහ තෙරුන් වහන්සේ ද 'දුක්පත් කෙණකුන්ට සංග්‍රහ කෙරෙමී' නුවරට වඩනා සේක. නුවරින් පිටත ම වීථී ය දැක ලා වීථිය ඇතුළත බලන සේක් මාලු මැලි දෙන්නා දුටු සේක. එ වේලාවට ජරා ශක්‍රයෝ යන නම තරමට මාලු-ලෙසින් සිටි ශක්‍රයෝ හූ වත් කෙරෙති. මැලී ලෙසින් සිටි සුජාතාවෝ දඩු හඹරති. මහ තෙරුන් වහන්සේ එයි ත් දැක සැබෑ කට යුත්තෙකැ යි සිතා මෙ තරම් අවසථාවේ ත් කර්මාන්ත කෙරෙති. නො පැදෙන හෙයින් මුත් වැද හෝනා තරම්හ. මෙ නුවර මුන්ට වඩා දුක් පත්තු ඇත්තා සේ නො වෙයි. මුන් දී ලූ බත් සරළුවෙක් ඇත් නම් ඒ පිළිගෙන මුන්ට මෙ ලෝ පර ලෝ දෙකින් ම සංග්‍රහ කෙරෙමී'යි උන්ගේ ගෙය බලා නික්මුණු සේක.

ශක්‍රයෝ ද ඔබ වඩනා දැක සුජාතාවන්ට 'සොඳුර, මාගේ සවාමි දරුවාණන් වහන්සේ මුබ වඩනා සේක. තෙපි නුදුටු බඳු ව ලා බැණ නො නැගී හිඳුව. නො හඟවා ඇසිල්ලෙකින් බතක් පිළිගන්වා ගනුම්හ'යි කිවු ය. මහ තෙරුන් වහන්සේත් පද්දෙර,[1] සිහා වැඩ සිටි සේක. උඹ දෙන්නා ත් නුදුටු බඳු ව ලා තමන් කරණ කර්මාන්ත ම දත් සමයේ සමහර කෙණකුන් සේ කෙරෙති. මෙ ලෙසින් මඳක් කල් යවා ලා එ විට දුටු ලෙසට 'දෙර වහන්දැ සැටි ය, ගොසින් බලගැ'යි මැල්ලන්ට පැරත්ත ගත්හ. 'මෙයට සොයා ගත් නියා යහපත. දුක් සුවත්[2] නො දත මනා ද? ගත්

1. බත්දෙරපත් – දෙර 2. දුක්පත්වත්

Non-Commercial Distribution

බලයක් නැති හෙයින් මම මා ගෙන නැඟී හින්ද නොහෙමි. මුඹට මේ කරන්නා තබා ය. මුඹ ගොසින් බලන්නැ'යි මාලන්ට කිවු ය.

උයිත් අබලම් හඟවා ඇදී පැදී ගෙන් නික්ම වෙවුලා වෙවුලා පසඟ පිහිටුවා වැඳ ලා ආයාස මහත් නියාව හඟවන්ට සුස්ම සුස්මා දණ අත ඔබා ගෙන වැඳ සිට පියා කෙළින් නැඟී සිට සිහා සිටි සේක් කවුරුන් වහන්සේ දෝ හෝ යි ඇස් බමණ හෙයින් දූන ගත ත් නො හෙමී' කියා ලා ඇස ගෙන අවු ව වසා ලා අත නළල තබා ගෙන මූණ බලා පියා 'අනේ දුකක් නැතත් කලෙකින් මහ සුප් සවාමීන් වන, සිහා මෙයට වැඩි සේක් ඇස් ඇදිරි බලවත් හෙයින් හැඳින්නේ ත් දුකින. මෙ ගෙයි හුයා පළා තුබූ යමක් ඇත්ද'යි මැල්ලන් අතින් විචාළෝ ය. මැල්ලෝ ත් දූන් සමයේ ම පිට ගැසී පියා ලැටී ව එළිනෝ 'කුමක් සේ දෝ කිසිවක් ඇතෙ'යි කියා දුක්පත් කම් හැඟවූ ය.

එවෙලෙහි මාලු ලෙසින් සිටී ශක්‍රයෝ සවාමීනි, යහපත නපුර නො සලකා අපට අනුග්‍රහ කළ මැනවැ'යි ආරාධනා කොට ලා පාත්‍ර ය හැර ගත්හ. මහ තෙරුන් වහන්සේ 'මුන් දුන් පළා කො ළක් වුව ත් කුඩු වුව ත් මුන් මේ දුකින් මුදනු පිණිස වළඳ මී' සිතා ලා ම පාත්‍ර ය දුන් සේක. උයි ත් ඇතුළු ගෙට වැද ලා වකගැසූ පමණක් මූත් තමන් දුක්පත් කෙණෙක් නො වන හෙයින් දිව්‍ය භොජනයෙන් පාත්‍ර ය පුරා ලා මහ තෙරුන් වහන්සේ අතට පාත්‍ර ය පිළිගන්ලූවා ය. අනුරුද්ධ කුමාරයන්ට දෙවියන් දුන් කැවුම් තළියේ සුවඳ කිඹුල්වත් නුවර පැතුරුණා සේ ම මේ බත් පාත්‍රයේ සුවඳ ත් දෙවියන් ම දුන් හෙයින් රජගහා නුවර මුළුල්ලෙහි පැතිරිණ. ශක්‍ර නියා ව නො හඟවන්නට දෙවරු[1] කළ වඤ්චා කෙ සේ දෝ වි ය. මහ තෙරුන් වහන්සේ ත් 'මූ ඉතා දුක්පත්හ. දීලූ බත දුක්පත් තරමට නො වෙයි. සක් දෙවිඳුහුගේ සුධාභොජන ය හා සම ය. කවුරු දෝ හෝ'යි එ විට පරීක්‍ෂා කරණ සේක් ශක්‍රයන් නියා ව දූන 'දුක්පතුන්ට වන ප්‍රයෝජන උදුරා ගත් සේ නපුර. ඉතා දුක් පත් කෙණෙක් අද මට දනක් දුන්නු නම් සෙනෙවිරත් තනතුරු හෝ සිටු තනතුරු ලැබෙති. තොප මේ කුමක් කළ නියා දැ'යි වදුරා 'මට ත් වඩා දුක්පතුන් ඇති නියා දැ'යි කී කල්හි ශක්‍ර සම්පත් ලැබ ත් දුක්පත් කම් නොහැරේ දැ'යි වදළ සේක.

---

1 දෙවුරු

Non-Commercial Distribution

ඒ අසා ශක්‍රයෝ 'ස්වාමීනි, මා ශක්‍ර වන්ට පින් කෙළේ බුදුන් නූපන් සමයෙක. බුදු හමුයෙහි පින් කළ චූලරථ ය මහාරථ ය අනන්ත වර්‍ණ ය යන දිව්‍ය පුත්‍රයෝ තුන් දෙන මට ආසන්න ව උපන්හ. මට නො එක් ලෙසින් බලවත්හ. උන් තුන් දෙන උත්සවයට සහපිරිවරින් වීථියට බට කලට මම ලජ්ජාව පලා ගොසින් විජයත් පායට වැදයෙමි. උන්ගේ ශරීර ශෝභාව අවුත් මා වසා පිය යි. මා ගේ ශරීර ශොභාව උන් කරා යා නො හෙයි. එ සේ හෙයින් මට වඩා දුක් පත්තු කවුරුදැ'යි කියා ගත් දුක් පත් කම එ ලෙසින් ම සැධූ ය. 'එ සේ වුව ත් මෙ වක් පටන් මෙ සේ වළහා දන් නො දෙව'යි වදළ සේක. 'වළහා ත් මුඹ වහන් සේට දුන් දනෙහි ඉෂ්ට විපාක වැළහේ දැ'යි විචාරා 'සොරා කාපු බතිනු ත් බඩ පිරෙන්නා සේ ම පින් තොපට ඇතැ'යි වදළ කල්හි 'සොරා වේව යි පෙනී වේව යි මට උවමනා පින් ම වේ දැ'යි කියා ලා මහ තෙරුන් වහන්සේ වැඳ පැදකුණු කොට ගෙන සුජාතාවන් හා සමඟ සක් දෙවිඳු ලෙසින් අහසට පැන නැඟී ලා 'මහසුප් සාමීන් කෙරෙහි පිහිටි දන උතුම් දනැ'යි උදන් ඇනී ය.

බුදුහු ත් වේළුවනාරාමයෙහි වැඩ හුන් සේක් දිව කතින් ශක්‍රයන්ගේ උදන් අසා වහන්දෑ බණවා ලා 'ශක්‍රයන් උදන් අනා ගෙන අහසින් යන්නවුන් බලව'යි වදළ සේක. කුමක් කොට පියා උදන් අන ත් දැ'යි විචාළ කල්හි 'වඤ්චා ලෙසකින් තමන් ශක්‍ර නියාවක් ම නො හඟවා මහසුප් මහ තෙරුන්ට බතක් දී පියා සොර සටනක් කොට ලත් ජයක් සේ සමාධි ව උදන් අනමින් යෙති' වදළ සේක. 'තෙර ලා මහ තෙරුන් වහන්සේට දන් දීම යහපතැ'යි කෙ සේ සිතා ගත් නියා දැ'යි විචාළ සේක.

'මහණෙනි, ම පුතණුවන් මහා කාශ්‍යපයන් වැන්නවුන් දෙවියෝ ත් කැමති වෙති. ශක්‍රයෝ ද ම පුතුන්ගේ ගුණ සුගන්ධ ය අසා අවුත් දන් දුන්හ. සඳුන් තුවරලා ආදියෙහි සුව දෙක් ඇත් නම් බුද්ධාදීන්ගේ ගුණ සුවඳ වූ නියාවට මහ මෙර ළඟ හබ ඇටක් තබා ලූ වා සේ ඉතා ම ලසු ය. මිනිස් ලොව තුබූ තුවර ලා ආදියෙහි සුවඳ දෙව් ලොව හමන්ට නැත. ගුණ ඇත්තවුන්ගේ ගුණ සුවඳ බඹ ලොව දක්වා හම යි' වදළ සේක. මේ දෙශනා කෙළවර ත් බොහෝ දෙන නිවන් දුටහ.

එ සේ හෙයින් නුවණැත්තවුන් විසින් කෙලෙස් මල හරන පිණිස සිල් නැමැති සුවඳ විලවුන් ගෙන නව ලොවුතුරා දහම් නමැති අබරණ ලා සැරහී ගෙන නිවන් පුරට යා යුතු.

Non-Commercial Distribution

# 54. ගොධික තෙරුන් වහන්සේ ගේ වත

තව ද කුල දරුවන් ජීවිතයට ත් වඩා උපදවා ගත් ගුණ විශෙෂයෙහි ම ඇලුම් ඇති නියාව හඟවනු පිණිස ගොධික තෙරුන් වහන්සේ ගේ වත දක්වමු.

කෙ සේ ද යත්:—

ගොධික තෙරුන් වහන්සේ ඉසිගිලි පවුව ගාවා කළුගල වසනා සේක් නොපමා ව භාවනා කොට ධ්‍යාන උපදවා ගෙන විෂ්කම්භන වසයෙන් මු ත් සමුච්ඡෙද වසයෙන් කෙලෙසුන් නසන්ට නුවූ හෙයින් කෙලෙස් නමැති සොරු වැද ලා ධ්‍යාන නමැති වස්තු සඟවා ගත්හ. එ සේ හෙයින් ධ්‍යානයෙන් පිරිහී නට නට ධ්‍යාන ය පිරිහුණු පිරිහුණු සේ ස වාරයක් දක්වා උපදවා පියා ස වන වාරයේ ත් ධ්‍යානයෙන් පිරිහී සත් වන වර ධ්‍යාන උප දවා ගෙන සිතන සේක් 'ස වාරයක් විතර ම ධ්‍යානයෙන් පිරිහිණිමි. ධ්‍යාන ලාභී වූ වො ත් බඹලොව උපදනා බව මුත් ධ්‍යාන යෙන් පිරිහුණන්ගේ ගති අනියම ම ය. උපදවා ගත් ධ්‍යානයෙන් පෙරළා ත් පිරිහිණීම් නම් නපුර. නපුරු සිත් සිත සිතා හිඳී ම ට වඩා මිය යාම යහපත. බොටුව කපා ගෙන මිය යෙමි' හිස කේ බානා කර ය හැර ගෙන බොටුව කපන්ට හැඳ වැද හොත් සේක.

වසවත් මර ඔබගේ අදහස දැන මේ මහණ බොටුව කපන්ට කර ය හැරගෙන වැද හොත්තේ ය. බොටුව කපන්ට සිතන් නාහු ජීවත් වීමෙහි ත් ඇලුම් නැත්තාහ. එ සේ කලට බොටුව කපා හෙව නො මියන තෙක් විවසුන් වඩා රහත් වන සේ ත් දනිති. ඉදින් මම ගොසින් වැළකීම් නමුත් නො නවතිති. බුදුන් ලවා ම වළක්වමි, අප්‍රසිද්ධ වෙශයකින් බුදුන් කරා ගොසින්-

''මහාවීර මහාපඤ්ඤ – ඉද්ධියා යසසා ජලං,
සබ්බවෙර භයාතීත – පාදෙ වන්දමි චක්ඛුම.

සාවකො තෙ මහාවීර – මරණං මරණාභිභූ,
ආකඞ්ඛති චෙතයති – තං නිසෙධ ජුතින්ධර.

කථන්නු භගවා තුය්හං – සාවකො සාසනෙ රතො,
අප්පත්තමානසො සෙඛො – කාලං කයිරා ජනෙසුත.''

යනු හෙයින් 'මහත් වූ වීර්‍ය්‍ය ඇති, මහා නුවණැති ගුණ ශොභා වෙන් අගපත් වූ බුදුරජුන් වහන්ස, මුඹ වහන්සේගේ පත්ල වැඳ

Non-Commercial Distribution

දන්වමි. මුඹ වහන්සේගේ සවු කෙණෙක් මියනු කැමැති ව මරණ ප්‍රයෝග කෙරෙති. ඒ වළකා වදාළ මැනව. 'ස්වාමීනි, මුඹ වහන්සේගේ සවුවන් රහත් නො ව මළ කල හේ කවරේ ද? නො මියන තෙක් වළකා වදාළ යහපතැ'යි කී ය. වළකා ලිය හැක්කේ වී නමුත් ශාක්‍යයන්ගේ කර්‍මය සේ අනිවාර්‍ය්‍ය කර්‍මයට මාරයා කිව යි වඩනා සේක් ද? තෙරුන් වහන්සේ ත් එ වේලාට බොටුව කපන්ට පටන් ගෙන කැපුණු කැපුණු පමණින් වේදනා පරිග්‍රහ ය කොට බොටුව කැපීම් පසාරයෙන් ඊ පිට ලා ලා කෙලෙසුන් කපන්නට තර හෙයින් විවසුන් වඩා නිකම් කරයෙන් බොටුව ත් අර්හත් මාර්‍ගඥාන නැමැති කරයෙන් සියලු කෙලෙස් බොටුව ත්, කපාපි සේක. බොටුව කපා නිමාව ත් රහත් වීම ත් එක විට වි ය. බුදුහු ත් ඔහු මරහු නියාව දැන ලා—

"එවං හි ධීරා කුබ්බන්ති-නාවකඞ්ඛන්ති ජීවිතං,
සමූලං තණ්හං අබ්බුය්හ-ගොධිකො පරිනිබ්බුතො"

යනු හෙයින් 'හෙම්බල මාර ය, නුවණැත්තෝ ජීවිතයට ත් වඩා භවක්‍ෂයෙහි ඇලුම් ඇත්තෝ ය. එ සේ හෙයින් බොටුව කපමින් සිට ම රහත් වූහ'යි වදාළ සේක. මෙ සේ වදරා ලා බුදුහු බොහෝ වහන්දෑ කැඳවා ගෙන ගොධික තෙරුන් වහන්සේ පිරිනිවි තැනට වැඩි සේක. එ වේලේ වසවත් මර—

"උද්ධං අධො ච තිරියං ච—දිසං ච විදිසං තථා,
අන්වෙසං නාධිගච්ඡාමි—ගොධිකො සො කුහිං ගතො"

යනු හෙයින් ඔබ ගේ පිළිසඳ සිතක් නැති නියාව තමා නො දත් හෙයින් ඒ පිහිටියේ කොයි දෝ හෝ යි විමසනු නිසා දුම් රැසක් සේ අඳුරු පිඩක් සේ ව පියා ඒ ඒ තැන සොය යි. බුදුහු උඹ දුම් වූ නියාව ත් අඳුරු වූ නියාව ත්, ආදි ම මූ තමාගේ තරම් දන්නා හෙයින් ම දැන වදරා වහන්දෑට පෑ ලා 'හෙම්බා මහණෙනි, මාරයා දුම් ව පියා අඳුරු ව පියා හැම තැන පැතිර ගොධික තෙරුන්ගේ පිළිසඳ සිත පිහිටි තැන් සොය යි. උන් පිරිනිවි හෙයින් මූට පෙනෙන්නට නැතැ'යි වදාළ සේක. මාරයා ත් බලා වෙහෙසී ගොසින් සිට දැක ගත නො හී කුඩා කොලු වෙසක් මවා ගෙන වීණාවක් හැර ගෙන බුදුන් කරා ගොසින් 'සියලු දස දිග බලා ත් නුදුටුයෙමි. ගොධික තෙරුන් වහන්සේ කොයි දැ'යි විචාළ. බුදුහු රහත් ව පිරිනිවි නියාව වදාළ සේක. ඒ අසා තමාගේ මනොරථ ය නුවූ හෙයින්—

Non-Commercial Distribution

**"තස්ස සොකපරෙතස්ස – වීණා කච්ඡා අභස්සථ,**
**තතො සො දුම්මනො යක්ඛො – තත්ථෙවන්තරධායථ."**

යනු හෙයින් මුසුප්පු ව වීණාව ත් හෙළා ගෙන අතුරුධන් වි ය. බුදුහු ඔහු සැඟවී සිටි තැනැත්තවුන්ට "නමිනු ත් අන්තක නම් වූ ගුණෙනු ත් අන්ත වූ මාරය, තට ගොධික තෙරුන් ගේ උත් පත්ති ස්ථාන විමසීමෙන් ප්‍රයෝජන කිම් ද? ඒ විමසා එ ලෙසක් කොට ගන්නා කෙණකුන්ට වී නම් තවත් යහපත. තවත් දකිත් නම් නවලොවුතුරා දහම් නමැති නව මාල් පායෙන් අට වන මාලට නැඟී කෙණෙක් බලා උත්පත්ති ඇත් නම් එයි ත්, නැත් නම් එයි ත් දකිති.

'මම ත් ඒ නව මාල් පායේ අට වන මාලට නැඟ බලමි' සිත යි නම් ඒ පාය මේ තා සේ වූවන්ට පෙනෙන පායෙක් නො වෙයි. උපසම්පද මාලකයෙහි පටන් ආපාණකොටික ව රක්‍ෂා කළා වූ සිවු පිරිසුදු සිල් ඇති, හබ ඇටකට ත් කුඩා වූ වරද මහ මෙරට ත් මහත් කොට සිතන කිසි කලෙක ත් පමා ව විසීමක් නැති, තදඞ්ගවිමුක්ති ආදි වූ පඤ්චවිධ විමුක්තීන් විශෙෂයෙන් මිදී සිටි, භවොත්පත්ති ය සුන්නවුන්ගේ උත්පත්ති ස්ථානයක් නැති හෙයින් ම තා වැන්නෝ දැක ගත නො හෙති" වදාළ සේක.

චක්‍රවර්ති භොජනයෙන් චණ්ඩාලයන්ට ප්‍රයෝජනයක් නැත් තා සේ වදාළ බණින් මාරයන්ට ප්‍රයෝජනයක් නූ බව මුත් බොහෝ දෙන විවසුන් නමැති හිණින් නව ලොවුතුරා නමැති නව මාල් පායට පැන නැංගෝ ය. එ හෙයින් මේ දේශනාව ත් බොහෝ දෙනා හට ප්‍රයෝජනවත් වි ය.

එ හෙයින් නුවණැත්තන් විසින් මාරයන් සේ අවඡන්දික නො ව කුශලච්ඡන්ද ය ඇති ව කුසල් හි හැසිරිය යුතු.

## 55. සිරිගුත්ත වස්තුව

තව ද බුද්ධානුභාව ය නො දන මහ[1] තිබ්බ දී මං මුළා ව වල් වදනවුන් මෙන් තීර්ථක භක්ති ගෙන කුසල්හි නො හැසිරෙන් නවුන්ට බුද්ධානුභාව දක්වා මිථ්‍යාදෘෂ්ටි හරවා කුසල්හි හසුරු වනු නිසා සිරිගුත්ත වස්තුව[2] දක්වමු.

කෙ සේ ද යත්—

1. මහවත් මඟ. 2 ධම්මපදට්ඨකථාහි මෙ කථාවස්තුව "ගරහදින්න වත්ථු" නාමයෙන් දක්වන ලදී.

Non-Commercial Distribution

සැවැත් නුවර සිරිගුත්තයෝ ය, ගරහදින්නයෝ ය යන දෙන්නෙක් යාළු මිත්‍ර ව වෙසෙති. ඉන් සිරිගුත්ත නම් තැනැත්තෝ රාජ හංසයන් පියුම් විල ඇලෙන්නා සේ තමන්ගේ පවිත්‍ර අදහස සේ ම පවිත්‍රයන් කෙරෙහි ත්, ගරහදින්නයෝ ගම් හූරන් කසළ ගොඩ ඇලෙන්නා සේ තමන්ගේ අදහස් ලෙසට කුණු අදහස් ඇති නිවටුන් කෙරෙහි ත් ඇලී වෙසෙති. තමන්ට උපාසක ව සිටි ගරහදින්නයන්ට නිවටුන් කියන කල 'තොපගේ යාළු වූ සිරිගුත්තයන් මහණ ගොයුම්හු කරා ගොසින් ප්‍රයොජන කිම් ද? ඔහු කරා නො ගොස් අප කරා එන ලෙස ත් ඕ හට දෙන කරණ දෙයක් ඇත් නම් අපට දෙන්ට කරන්ට ත් කථා කොට කරවා ලිය නො හැකි දෑ'යි එක් වන් ව කියති. ගරහදින්නයෝ ඒ අසා එක් වන් ව සිරිගුත්තයන් කරා ගොසින් හුන් තැන ත්, සිටි තැන ත්, කන තැන ත්, බොන තැන ත්, සිරිගුත්තයන්ට 'සබඳ සිරිගුත්තයෙනි, තොප මහණ ගොයුම්හු කරා යාමෙනු ත්, ඕ හට දන් දීමෙනු ත් කම් කිම් ද? අපගේ රහතන් කරා අවුත් වැඳ පුදා ත් ගෙන ඔබට දන් දූන් කල නපුරු ද' යි කිවු ය.

සිරිගුත්තයෝ උන් එ සේ කියත ත් නැතක් දවස් බැණ නො නැඟී හිඳි ලා එක් වන් ව කියන හෙයින් මුසුප්පු ව ලා 'සබඳ, එක් වන් ව ම තෙපි මේ කථාව කට නො හැර කියන්නා සේ කියව. බඩුවක් පවා හැර ගන්නා කල මිල විචාරති. කරණ උපස්ථාන ත් ස්ථානයෙක කළ මනා වේ ද? මා පුරුදු කමක් නැති හෙයින් විචාරණ නියා ය. තොපගේ රහත්හු කුමක් දනිත් දෑ'යි විචාළෝ ය. 'සබඳිනි, එ සේ ආලිස්සම් කොට කියන්ට නො කැමැත්තේ ය. අපගේ රහතන් නො දන්නා දෙයක් නැත. යට ගිය දවස පැවැති දෙය ත් දූන් පවතමින් සිටින දෙයක් මතු එන දවස පවතිනා දෙය ක් සියල්ල ම හස්තාමලක න්‍යායයෙන් දන්නා සේක. ඒ හැම නො දනිතො ත් රහත් නම් කිම් දෑ'යි කිවු ය. සිරිගුත්තයෝ ඒ අසා 'අනේ, එ සේ කල මෙ තෙක් කල් මට නො කීයේ හැයි ද? මිත්‍ර කමට පිටත ඔබ හැමගේ නුවණේ තරම මා දත්තේ අද ය. යන්නේ, ගොසින් මාගේ ආරාධනාවෙන් ආරාධනා කරන්නැ'යි කිවු ය.

ගරහදින්නයෝ නිවටුන් කරා ගොසින් වැඳ ලා 'ස්වාමීනි, අපගේ යාළු සිරිගුත්තයෝ සෙටයට ආරාධනා කොට එවු ය' යි කිවු ය. සිරිගුත්තයෝ තුමූ ම කිවු දැ යි විචාරා එ සේ ය යි කී කල 'හැයි මෙ තෙක් දවස් මුන් කීව ත් තමන් නො අවුත් මුන් අත කියා එවන්ට කාරණ කිම් ද? යන මේ විතරකු ත් නො සලසා

Non-Commercial Distribution

පියා ඇසූ බස් පමණෙකින් ම විද ගත් සාදයක් නැත ත් සතුටු ව 'අප කළ ප්‍රයොග ය සමෘර්ධ වී ය. සිරිගුත්තයන් අපට නැමුණු තැන් පටන් කුමකින් අඩු ඇත් ද'යි කිවු ය.

සිරිගුත්තයනු ත් පොහොසත් හෙයින් ගෙවලු ත් මහත. උ තුමූ මහ ගෙට ත් මඩු ගෙට ත් මධ්‍යයෙහි රැ ම දික් කොට වලක් කණවා පියා බබුරන් ගෙන්වා ගෙන අත් පස් ගෙවල පෝරු උගුළුවා කණවා ලූ වළ අත් පස පුරවා ලා වළ ඒ කෙළවර ත්, මේ කෙළව ර ත් කණු දෙකක් ගස්වා ලා, ඒ කණු දෙකෙයි රුණක් බඳවා ලා, හිදිනට ලන ආසනවල පා මුල දසාවේ පා වළ ඉවුරු අස තබ්බවා ලා ඉස් දෙර දසාවේ පා රුණ පිට තබ්බවාලා, ලූ ය. එ සේ කෙළේ ආසනවල හුන් කල රුණ මැඩි ලා ආසනවල පා පාත් ව බැස ගොසින් නිවටුන් හිස බිම බලා පා උඩු කොට හෙන නිසා ය. එ සේ කොට ලා වළ යම් ලෙසක නො පෙනේ නම් එ ලෙසට අසුන් වසා ත්, වළ මුව විටි වසාත් ඇතිරි අතුරුවා ලූ ය.

හිදිනා අසුන් මෙ ලෙසින් පනවා ලා දන් සරහන තැනැත්තෝ මහ ත් සැළවල් සෝධවා පියා ඇතුළේ කැඳ බතක් නැත ත් කැඳ අවුළු, බත් හුළු ත් සැළ පිට ඉස්වා ලා කෙහෙල් පත් වසා බඳවා ලා කුඩා සැළි හා හැඳි හා සෝධවා ලා ඒ ඇතුළෙ ත් කුමක් නැත ත් අවුළු පත් පොඩි වළන් පිට ඉස්වා ලා, ඊ ත් අළු ත් වළඳ කඩ වසුන් බඳවා ලා, පරණ වළඳ පත් බඳවා ලා අක් පතළා ත් සෝධවා පියා ඇතුළේ කුමක් නැත ත් මත්ස්‍ය මාංස තෙල් ආදි වූ 'දෙය වළන් පිට ඉස්වා ලා ඊ ත් පත් බඳවා ලා ගෙන් පිටි පස දසාවේ තබ්බවා ලූ ය.

ගරහදින්නයෝ ත් උන්ගේ ගෙට උදසන ම අවුත් 'දන් සරහා පූයේ ඇද්ද'යි විචාරා එ සේ ය'යි කී කල්හි කොයි ද'යි විචාරා දන් වෙ වා, කුමක් වේ වා' සරහා තුබූ තැනට ගොසින් මෙ තෙක් සැළ වල කැඳ, මෙ තෙක් සැළ වල බත, මෙ තෙක් වළඳ අවුළු පත, මෙ තෙක් අක්පතළාවල ලාලූ ය'යි සිරිගුත්තයන් කී කල්හි රහතන්ගේ නුවණ සේ ම නුවණ හෙයින් සැබවැ යි සිතා සමාධි ව ගෙන ගියහ.

උන් ගිය කල පන් සියයක් නිවටෝ අවු ය. සිරිගුත්ත යෝ ත් ගෙන් මැතට අවුත් නො සිතින් වුව ත් පසහ පිහිටුවා වැඳ ගෙන දෙහොත් මුදුනේ තබා ගෙන ඉදිරියේ සිට වාග්භෙද කොට නො කියා සිතින් ම සිතන්නෝ 'මුඹ හැම තුන් කල් දන් නා දැ ල, මුඹගේ උපාසකයන් මට කීයේ එ සේ ය. තුන් කල් දන්නේ සැබෑ වී නම් මතු තබා මෙ කල් දනිතො ත් අපගේ ගෙය ඇතුළට වදිනට නො කැමැත්තේ ය. ඉදින් ආ මුත් කැඳ

අතලොස්සක් විතර ත් නැත. වළන් පිටත ගෑවුණු දෙයක් මුත් අවුළු පත් පොඩියකු ත් නැත. බතෙක් මාළුවෙක් තමා ම නැත. බතට කළ ආලයෙන් ගෙට ගියෝ ත් කණවා ඉදි කළ අත් පස් පිරුණු වළ එළවා ගෙන තැළුම් වරක් ලවමි'යි සිතා ලා මිනිසුන්ට විධාන කරන්නෝ, 'තුලුන් හැම හිදිනා වේලාට පිටි පස්සේ සිට ලා අතුළ ඇතිරි හැර ගනුව. තුබුවො ත් අත් පස් වැකෙයි' කිවූ ය.

ඉක් බිත්තෙන් නිවටුන් ගෙට කැඳවූ ය. කැඳවන්නා ම ගොසින් තුන් කල් තබා එක කලකු ත් නො දන්නා හෙයින් හසුන්වල හිදිනට ආරම්භ කළහ. මිනිස්සු සිට ලා කියන්නෝ 'එ සේ තව හිදිනට නො කැමැත්තේ ය. වත් දූන ය හුන මනාය'යි කිවූ ය. අභිනව ප්‍රසාද තර කරන්ට කී කීවක් ම කරණ හෙයින් නටන්ට කීව ත් නටන හෙයින් 'කුමක් කරමෝ දූ'යි විචාළ කල්හි 'තම තමා පැමිණි ආසන ගාවා සිට ලා එක විට ම හින් ව වුව මැනවැ'යි පෙරාතු එක් කෙණකුන් හිඳ උන් හුනු නියා ව බලා ලා සෙස්සවුන් නො හිදිති'යි සිතා කිවූ ය.

උයි ත් යහපතැ යි ගිවිස තම තමන්ට පැමිණි හසුන් ගාවා පන්තින් සිටියෝ ය. 'ඉතිකින් නමකට පෙරාතුත් නො ව පසු ත් නො ව හුන මැනැවැ'යි කිවූ ය. කිසිවක් ම නො දන්නවුන් හිදිනට නැමුණු නියා ව දූන ලා ඇතිරිලි එක විට ම හැර ගත්හ. නිවටෝ කා වටයක් සේ එක විට ම හුන්හ. හසුන්වල රැණ පිට තුබූ පා පාත බටුයේ ය. නිවටෝ හිස් බිම බලා පා උඩුකුරු කොට ලා, අශුචි නිරයට පූර්ව නිමිත්ත සේ අත් පස් වළ හුණුවූ ය. උන් හුණු කල්හි සිරිගුත්තයෝ දෙරවල් පියවා ගෙන ගොඩට නැගි නැගියවුන් 'ඔබ්බෙ තුබූ දෙ කල් තබා මෙ කලු ත් නො දත්තෝ ය. මේ කල් දන්නා නියා ද? මෙයට එන්ට ම කාරණ කවරේ දූ' යි මරවා තළවා මෙ තෙක් මුත්ට ඇතැ යි දෙරවල් හරවාපු ය. උයි ත් නික්ම යන්ට පටන් ගත්හ. හුන් ගමනේ ගහට වූන්නවුන්ට යන ගමනෙ ත් ගහටයක් කළ මනාවේදූ'යි යන මග සුණුවම් කළ බිම නානු බෙළසුල් වත් කරවා පීහ. පය පලා පලා හුණු හුණුවන් පෙරළා ත් තළවා 'තොපට දන් නම් තෙල තෙකැ'යි කියා ලා යවා පීහ. උයි ත් 'දන් කන්ට අවුත් ගෙඩි කැම්හ'යි කියා හඩා මුර ගා ගෙන මඩ වැකී ගිය හුරු මුළක් මෙන් තමන්ගේ උපාසකයන්ට පමුණන්ට ගියහ.

ගරහදින්නයෝ ත් ගාලේ වැද හොවා ලා ගේට හඩා ගෙන ආ වසු මුළක් මෙන් එ තැනට අවුත් හඩා හුණු තමන්ගේ රහතන්ගේ මේ ලෙස දූක 'අනේ සිරිගුත්තයන් මට කළ මුළා ය.

Non-Commercial Distribution

'අත නමා වැන්දවුන්ට ස දෙව් ලොව සම්පත් සාධා දෙන්ට සමර්ථ වූ පින් කෙත් වූ මාගේ රහතන් මරා තළා මේ සා මහත් මුළාවක් කොට පූ ය'යි සිරිගුත්තයන්ට තරයේ ම මුසුප්පු ව රජ ගෙට ගොසින් රජ්ජුරුවන්ට කියා 'උන් ගෙන් දඩ දහසක් ගන්ව'යි නිල කැරවූහ. රජ්ජුරුවෝ ද දඩ යොදා ලා දඩ ගන්ට කැඳවා යවූ ය. සිරිගුත්තයෝ ත් ගොසින් රජ්ජුරුවන් වැඳලා 'උභය පක්ෂයෙන් ම ආද්‍යන්ත අසා ගන්නා දඬෙක් ද? උන්ගේ බස් පමණෙකින් ම ගන්නා දඬෙක් දෑ'යි විචාරා ගත මනා ම දඩ හෙයිනැ යි කී කල්හි 'ගත මනා දඬෙක් ඇති වී නම් ගෙන වදරති.

එතෙකුදු වුව ත් මාගෙනු ත් අසා වදරාලා ය'යි කියා 'ගරහදින්නයන් හුන් තැන සිටි තැන බුදුන් කරා නො එළඹෙන්ට ත් ඔබට දන් නො දෙන්ට ත් උන් හැම කරා යන්ට ත් උන්ට දන් දෙන්ට ත් උන් හැම තුන් කල් දනිති' කී කථා ත් තුන් කල් දන්නා නියා ව විමසන්ට තමන් කළ දෑ සියල්ල ත් කියා ලා ගත මනා දඬක් වුවො ත් ගත මැනව'යි කිවු ය. රජ්ජුරුවෝ ගරහදින්නයන් මූණ බලා 'තොපි තෙල ලෙස කීයෙහි දෑ'යි විචාරා සැබැවැ යි කී කල්හි 'මෙ විතරකුත් නො දන්නවුන්ට රහත්තු ය'යි කියා ගෙන තොප ම තකා ගෙන හිඳිනා මඳින් සර්වඥ ශ්‍රාවකයාණන්ට කුමක් නිසා කිවු ද? තුලුන්ට කී වරද තොප කෙරෙහි පිහිටන හෙයින් තොපි ම දඩ දෙව'යි උන්ට ම නිල කළහ. උන්ගේ නිවටුන්ට ම ගහට ත් විය.

ඌ තරයේ ම මුසුප්පු ව එවක් පටන් දෙ පෝයක් විතර සිරිගුත්තයන් ලා බැණ ත් නො නැගී 'මා මෙ ලෙස හිඳීම යුක්ත නො වෙයි. උන්ගේ රහතන්ට ත් මුළාවක් කෙරෙමි' සිරි-ගුත්තයන් කරා ගොසින් බැණවු ය. 'කුමක් දෑ'යි කී කල්හි 'නෑයන්ගේ ත් මිතුරන්ගේ ත් හාද ත් වෙයි. ඩබර ත් වෙයි. මා හා බැණ නො නැංගේ හැයි දෑ'යි විචාළෝ ය. 'තොප බැණ නො නැඟෙන හෙයිනැ'යි කී කල්හි 'වන්නාට ඒ ගියේ ගියේ ම ය. මෙ වක් පටන් සමඟ ව හිඳුම්හ'යි බොහෝ සේ එක් ව ම හිඳිනාහ.

එක් දවසක් සිරිගුත්තයෝ මුන් තොරතුරක් සොයා හිඳින නියා ව නො දන 'සබඳ, තොපට කුමකු ත් නො දන්නා නිවටුන් හැයි ද? උන් කුමකු ත් නො දන්නා නියා ව තව ම නො හැඟිණි ද? උන් කරා ගොසින් කුමක් ලබවු ද? අපගේ බුදුන් කරා අවුත් ඔබ ත් දක පියා රා පූ කටින් අමා බොන්නා සේ ඔබට ත් දන් දුන් කල නපුරු දෑ'යි කිවු ය. ගරහදින්නයෝ ත් සිරි ගුත්තයන්ට නැමුණේ මෙ විතරකට ම හෙයින් කණ්ඩුති තැනක් කසා පුවා සේ

Non-Commercial Distribution

බස අසමින් ම සමාධි ව ‘සබඳ සිරිගුත්තයෙනි, තොපගේ බුදුහු කුමක් දනිත් දැ’යි තමන් අතින් සිරිගුත්තයන් විචාල ලෙසට ම විචාළහ. ‘පින්වත, මාගේ බුදුන්ට තෙල ලෙස නො කිය. හෙම් බල, ඔබ අද දන්නා දෙයක් නො වෙයි. බෝ මැඩ වැඩ හිඳ මහ පොළොව ගුගුරුවා බුදු වූ දවසේ ම සියල්ල ම දත් සේක. ඔබගේ දැන්ම කියතොත් අපට තබා ඔබ සේ ම බුදු කෙණකුන් වහන්සේට නිමවා කියන්ට ත් බැරි ය. බුදු වූ අවස්ථාවෙහි තබා පැරුම් බිම දී සම්භව කුමර කල සත් හැවිරිදි වයස් වූව ත් මුළු දඹ දිව අනික් කෙණකුන් කියා ලිය නො හෙන ධර්ම යාග ප්‍රශ්න යෙහි අර්ථ දැන බුදු වූ ලෙසින් සුචිරත නම බමුණන්ට කී සේක. විස්තර කොට කියතො ත් පන් සිය පනස් ජාතකයෙන් ප්‍රඥාපාර මිතාව අරභයා වදළ නො එක් ජාතක කථා කිව මැනව. සෙස්ස තබා බණ වදරන කළ කෙ තෙක් පර්ෂද් වූව ත් එකි එකී තැනැත්තවුන්ගේ අදහස සොළොස් ලෙසකින් පරීක්‍ෂා කොට ලා බණ වදරන සේක. නැවත සාරා සැකි කප් සුවහස් මුළුල්លෙහි නිකම් නුහුන්නා සේ බුදුව ත් දිනචර්‍ය්‍යා වශයෙන් දවස් පතා උදසන ම නැඟී සිට උවටා තැනට අනුග්‍රහ නිසා ත් ශරීර ඵාසුව පිණිස ත් මුව සේදීම් ආදී වූ සිරුරු පිළි දැගීම කොට සිඟා වඩනා වේලාව එන තුරු විවේක ව වැඩ හිඳ සිඟා වඩනා වේලේ දී ගාමප්ප වෙසන නීහාරයෙන් හඳන ය වැළඳ, පටි ද බැඳ, ගැටවටු ගන්වා සිවුරු වැළඳ පාත්‍ර ධාතූන් වහන්සේ හැර ගෙන කිසි දවසෙක තනි ව ත් කිසි කලෙක වහන්දෑ පිරිවරා ත් ගම් නියම් ගම් රාජධානි වලට සිඟා වඩනා සේක.

‘කිසි දවසෙක සවනක් රස් සහවා ගෙන වඩනා සේක. කිසි දවසෙක නො එක් පෙළහර දක්වමින් වඩනා සේක. ඒ කෙසේ ද ? යත්-බුදුන් සිඟා වඩනා කලට ඔබගේ අදහස සේ ම මොළොක් වූ පවන් පෙරාතුව ලා ගොසින් වඩනා මහ කසළ ඉවත් කෙරෙයි. සුදු වලා පටල මඳ මඳ කොට පොද වස්වා බිම ධූලි පැවි කොට ලා වඩනා අතුර මුළුල්ලෙහි වියනක් පරිද්දෙන් සිට්ටි. අනික් පවනෙක් සුවඳ මල් ගෙනවුත් ලා මහ දිගට අතුර යි. තව ද—

**‘‘නින්නං ඨානං උන්නමති—ගච්ඡන්තෙ ලොකනායකෙ,**
**උන්නතං ච සමං හොති—පඨවී ච අචෙතනා’’.**

යනු හෙයින් උස් ව තුබූ බිම් පියෙස් මිටි වෙ යි. වළ තැන් පැරුම් පිරුවා සේ ම පිරෙයි. පත්ල බිම තබා ලූ කලට බිම හෝ සුව පහස් ඇති වෙ යි. පියුමතුරා බුදුන්ට හැම දවස් මෙන් පොළොව

Non-Commercial Distribution

පළා ගෙන පියුම් හෝ නැඟී ලා පතුල් පිළිගනිති. වාසල එළිපතින් ඇතුළේ ශ්‍රී පාදය තබන්නා ම සියල් සිරුරෙන් සවනක් රස් විහිද දකුණු දිග මුහුදින් ගසන රළ පරිද්දෙන් නිල් රස් ද, උතුරු දිග මුහුදින් ගසන රළ පරිද්දෙන් රන්වන් රස් ද, බස්නාහිර මුහුදින් ගසන රළ පරිද්දෙන් රත් වන් රස් ද, නැඟෙන හිර මුහුදින් ගසන රළ පරිද්දෙන් සුදු රස් ද, උතුරු මුහුද රළ-හා බස්නාහිර මුහුද රළ ත් එක් වූවාක් මෙන් මදට වන් රස් ද, මුදු සතරේ රළ ම එක් වූ වාක් මෙන් පැහැසර රස් ද, දස දිග දිවෙයි. ඇත් අස් ආදීහු සිටි සිටි තැන ම සිට ලීලොපෙත වූ නාද පවත්වති. පසඟතුරුහු ත් තුමූ ම නාද පවත්වති.

'මිනිසුන් පලන් ආභරණ ත් එ සේ ම නාද පවත්වති. මිනිස්සු ඒ සලකුණෙන් බුදුහු මෙයට සිහා වැඩි සේකැ යි දනිති. දන ලා යහපත් ව සැරහී ගෙන සුවඳ මල් ආදි ය ගෙන තම තමන්ගේ ගෙවලින් නික්ම වීථියට බැස ලා එ තැනට පැමිණ බුදුන් ගඳින් මලින් පුද ලා වැඳ ගෙන තම තමන්ගේ බල පමණින් 'අපට දස නමෙක, 'අපට විසි නමෙක' යනාදීන් උපස්ථාන කිරීමට වහන්දෑ ත් නියම කොට ගෙන බුදුන්ට ත් ආරාධනා කොට පාත්‍ර ය හැර ගෙන හසුන් පනවා වඩා හිඳුවා දන් වළඳවති. බුදුහු වළඳා අන්තයෙහි අනුමෙවෙනි බණ වදරා-

**"සරණාගමනෙ කෙචි-නිවෙසෙති තථාගතො,**
**කෙචි පඤ්චසු සීලෙසු-සීලෙ දසවිධෙ පරෙ.**

**කස්සචි දෙති සාමඤ්ඤං-චතුරො ඵලමුත්තමං,**
**කස්සචි අසමෙ ධම්මෙ-දෙති සො පටිසම්භිදා.**

**කස්සචි වරසමාපත්තියො-අට්ඨ දෙති නරාසභො,**
**තිස්සො කස්සචි විජ්ජායො-ඡළභිඤ්ඤායො පවෙච්ඡති."**

යනු හෙයින් බොහෝ දෙන සරණ සීලයෙහි පිහිටුවා හුනස්නෙන් නැඟී විහාරයට වැඩ වහන්දෑ වළඳා ලා වත් සපයා ගෙන එන තෙක් වට මළුවෙහි පනවා තුබූ බුදු හස්නෙහි වැඩ හිඳිනා සේක. වහන්දෑ ආ කලට උපස්ථායක තෙරුන් වහන්සේ ගොසින් දන්වන්නා ගඳකිළියට වඩනා සේක. මේ හැම දවස් ම පෙරවරු පසළොස් පැය ඇතුළත ලෝ වැඩ හැසිරෙන ලෙස ය.

'පස් වරු පසළොස් පැය ඇතුළත ගඳ කිළි පෙරමාලේ වැඩ හිඳ පය ඇලෙන ධූලි නැත ත් පය සෝධවා ගෙන ගඳ කිළි ඇතුළට වඩනා අතුරෙහි වහන්දෑට 'මහණෙනි, නො පමා වව. බුදු හමු ව ත් ලද නොහැක්ක. මිනිස ත් බව ත් ලද නො හැක්ක. මහණ මහලු පැවිදි ත් ලද නො හැක්ක. බණ ඇසීම ත් ලද නො හැක්ක.

Non-Commercial Distribution

''ලද අත් බැව් සඵල කරව''යි අවවාද කරණ සේක. වහන්දෑ ත් බුදුන් වැද ලා කමටහන් විචාරන සේක. බුදුහු ත් චරිත බලා කමටහන් දෙන සේක. කමටහන් ඉගෙන ගෙන බුදුන් වැද ලා තම තමන් වහන්සේ වසන රුක් මුල්-ගල් ගුහාදියට වඩනා සේක.

'ඉක් බිත්තෙන් බුදුන් ගඳකිළි ඇතුළට වැඩ ලා අභිප්‍රා ය ඇත් නම් හැසිල්ලක් කෙළක් වටනා රිදී යානෙහි දකුණැලයෙන් සැතපෙන සේක. සැතපී ලා පස් වරු ඇතුළත ම ලොව බලන සේක. ඉක් බිති සම්ප්‍රාප්ත පෂ්ඞට සවස් නො කොට බණ වදරන සේක. එ සේ ධම්සෙබෙයි වැඩ හිඳ බණ වදරා ලා පෂීදට සමුදී යවා පියා පැන් සනහනු කැමැත්තො ත් ධර්මාසනයෙන් නැඟී සිට උපස්ථායකයන් පැන් සපයා තුබූ තැනට වැඩ උපස්ථායක තැන අතින් ජල ශාටිකාව හැර ගෙන නහන කොටුවට වදිනා සේක. උපස්ථායක තැන ත් ගඳ කිළි පිරිවෙන බුදු හස්නක් පන වන සේක. බුදුහු ත් පැන් සනහා පියා සිවුරු වැලඳ ගෙන ගඳ කිළි පෙර මාලට අවුත් වැඩ හිඳිනා සේක. පස්වරු පසළොස් පැය ත් මෙ ලෙසින් ම යෙයි.

'හැසිල්ලක් එ තැන වැඩ හුන් කලට වහන්දෑ ත් අවුත් එ තැනට රැස් ව සමහර කෙණෙක් ප්‍රශ්න විචාරන සේක. සමහර කෙණෙක් කමටහන් විචාරන සේක. සමහර කෙණෙක් බණක් ම නො ඇසූවා සේ ම බණට ආරාධනා කරණ සේක. බුදුහු ත් පැන විසඳමින්, කමටහන් උගන්වමින්, බණ කියමින්, පෙර යම් දස පැය යවන සේක.

'මැදි යම් දස පැය දී දස දහස් සක්වළ දෙවි බඹහු එ වේලේ අවසර ලදින් බුදුන් කරා අවුත් ප්‍රශ්න විචාරති. බුදුහු ත් උන්ට පැන විසඳන සේක් මැඳ යම් දස පැය යවන සේක.

'අළුයම් දස පැය සතර භාගයක් කොට පියා දෙ පෑ සමාරක් සක්මන් කරණ සේක. දෙ පෑ සමාරක් ගඳ කිළියට වැඩලා දකුණැළ යෙන් සැතපෙන සේක. දෙ පෑ සමාරක් විචරෙහි දෙළොස් කෙළ ලක්‍ෂයක් පමණ වූ ඵල සමවතට සම වදනා සේක. දෙ පෑ සමාරක් විවරෙහි දෙළොස් කෙළ ලක්‍ෂයක් පමණ වූ මහ කුලුණු සමවතට සම වැද එයින් නැඟි සත්‍වොපකාර නීසා ලොව බලා බොහෝ දෙන නිවන් දක්වන සේක' යනාදීන් දල්වා ගත් කටින් බොහෝ ගුණ කීහ.

Non-Commercial Distribution

'එ බඳු ගුණ ඇති නියා ව මෙ තෙක් කල් මට නො කීවා නෑ, යව, ගොසින් මාගේ ආරාධනාවෙන් බුදුන්ට ආරාධනා කරව. සෙට දවස් මම දන් දෙමී' කී ය. සිරිගුත්තයෝ බුදුන් කරා ගොසින් වැඳ ලා 'ස්වාමීනි, අපගේ යාළු වූ ගරහදින්නයෝ සෙට යට මුඹ වහන්සේට ආරාධනා කොට එවූය. පන් සියයක් දෙනා වහන්සේ හා සමඟ සෙට උන්ගේ ගෙට සිඟා වඩනා බව ය. බල එකෙක් ඇත. එක් දවසෙක උන්ගේ නිවටුන්ට මා කළ දෙයෙක් ඇත. ඒ සිත තබා ගෙන කළාට පෙරළා යමක් කරන්ට සිතා කළ ආරාධනාවක් බව ත් පර සිත් දන්නා නුවණක් මට නැති හෙයින් නො දනෙ යි. ඉඳුරා සිතින් කරණ දෙයක් බව ත් නො දනෙයි. තෙල සේ වූ දෙය දකිනා ඇසු ත් ඔබට ඇති බැවින් බලා වදරා ඉවසිය යුතු වී නම් ඉවසා වදරන බව ය. ඉවසිය යුතු නො වේ නම් තව ත් සිඟන්ට ගෙවල් ඇති බැවින් නො ඉවසන බව ය'යි තමන් කළ උපාශ්‍ර ය යහපත් හෙයින් ඒ වූ නියාවට ම දන්වා ලූ ය.

බුදුහු ත් උගේ අදහස් කවරේ දෝ හෝ යි බුදු නුවණින් බලන සේක් 'දෙ ගේ මැද මහ වළක් කණවා පියා ගැල් අසූවක් විතරින් කිහිරි දර ගෙන්වා ගෙන ඒ වළ පුරා ලා ගිනි කොට අඟුරු බා ගෙන සඟ පන් සියය ත් මා ත් අඟුරු වළ හෙලන්ට සිත යි' දැන වදරා නැවත කුමක් දෝ මා එ තැනට යාමෙන් ප්‍රයෝජන ඇත් දෝ නැත් දෝ හෝ'යි බලන සේක් 'මම ද වැළි ත් සහපිරිවරින් ගොසින් වසා ලා තුබූ අඟුරු වළට පය දික් කෙරෙමි. වසා ලා තුබූ කළාල් පැදුරු කඩවල් නැති වෙයි. අඟුරු වළ පීරා ගෙන රථසක් සා මහ පියුම් නැඟෙයි. මම පියුම් කෙමි මැඩ ගෙන ගොසින් බුද්ධාසනයේ හිඳිමි. පන් සියයක් පමණ භික්ෂූහු ත් මා මැඩි පියුම් කෙමි තුමූ ත් මැඩ ගෙන ගොසින් තම තමන්ට පත් හසුන් වල හිඳිති. බොහෝ දෙන ත් එ තැනට රැස් වන්නාහ. මම ගාථා දෙකකින් බණ කියමි. ඒ බණ අසා සුවාසූ දහසක් දෙන නිවන් දකිති. සිරිගුත්ත-ගරහදින්න දෙන්න ත් සෝවාන් වෙති. සෝවාන් ව ලා තමන්ගේ සම්පත් බුදු සස්නට ම නතු කෙරෙති. ඒ කුල දරුවන් නිසා යෑම යහපතැ'යි ඉවසා වදළ සේක. සිරිගුත්තයෝ ද බුදුන් ආරාධනාව ඉවසූ නියා ව ගරහදින්නයන්ට කියා ලා 'ලෝ උතුමාණන්ට සත්කාර යහපත් කොට කරව' යි විධාන කළහ.

ගරහදින්නයෝ ද පිළිවන් වේ දැ'යි කියා ලා දෙ ගේ මධ්‍යයෙහි දිග ත් ගැඹුර ත් ඇති කොට පියා වළක් කණවා ගැල් අසූවකින්

1. නො කිව නෑ

Non-Commercial Distribution

ගෙනා කිහිරි දර පුරවා ලා රාත්‍රියෙහි බොහෝ වේලක් ම සම් මැඩ අඟුරු බස්වා ලා වළ මුඳුනෙහි නො පෙනෙන ලෙසට පුවරු අතුරු වා ලා පුවරු කළාලින්, පැදුරෙන් වස්වා ලා පුරුව අතුරන ගමනේම එක් දසාවෙක දිරා ගිය පුවරු අතුරුවා ලා ඒ මැඩ ගෙන වඩනා ලෙසට ඉදි කැරවූ ය. අඟුරු පීරා ගෙන පියුම් නැගෙන තරම් ආනුභාව ඇති නියා ව නො දන මැඩ ලූ කලට පෝරු බිඳී ලා අඟුරුවළ හෙන සේකැ යි යන අදහසින් දිරා ගිය පෝරු ඇතිර වූ ය. පිසන ගේ දසාවෙහි සිරිගුත්තයන් කැර වූ ලෙසට ම කරවා දන් වළන් තබ්බවාලූ ය. ආසන ත් වැඩ උන් කල අඟුරු වළ හෙන ලෙසට ම පනවා ලූ ය.

සිරිගුත්තයෝ ද උදසන ම ගරහදින්නයන්ගේ ගෙට ගොසින් 'දන් සරසා කළ මනා දෙය කළා දැ'යි විචාරා 'එ සේ ය'යි කී කල්හි 'සපයා තුබූ දන් කොයි දැ'යි විචාළෝ ය. ගරහදින්න යෝ ත් කැඳවා ගෙන ගොසින් සිරිගුත්තයන් පෑ ලෙස ම පෑවූ ය. සිරිගුත්තයෝ ත් ඇතුළත නො සිසැ යි සිතා සමාධි වූහ. බොහෝ දෙන ත් රැස් වූහ. කුමක් නිසා ද යත්:– මිථ්‍යා දෘෂ්ටිකයන් ආරාධනා කළ කල 'මහණ ගොයුම් හට කරණ ගහට බලම්හ'යි මිථ්‍යා දෘෂ්ටිකයෝ ත් බොහෝ රැස් වෙති. සම්‍යග් දෘෂ්ටිකයෝ ත් 'අද බුදුහු මෙ තෙක් දවසට ත් වඩා සවිශෙෂ කොට බණ වදරන සේක. බණ ත් අසම්හ. සර්‍වඥ ලීලා ත් බලම්හ'යි රැස් වෙති. එ සේ හෙයින් ජන සන්නිපාත ය එ සේ වූ දවස් බොහෝ වෙයි.

ආරාධනා කළ දවසට දෙ වන දවස් බුදුහු නිත්‍ය පරිවාර පන්සියයක් දෙනා වහන්සේ ත් සමඟ සකල ශරීරයෙන් සවනක් රැස් විහිදු විහිදුවා කුළ පවු පිරිවරා මහ මෙර එක් දසාවකට ගමන් ගත් කලක් මෙන් ගරහදින්නයන්ගේ ගෙ දොරට සිහා වැඩි සේක. ගරහදින්නයෝ ත් ගෙන් අවුදින් පසඟ පිහිටුවා වැඳ ලා දෝත මුඳුනේ තබා ගෙන ඉදිරි ව ලා සිට සිතන්නෝ 'ස්වාමීනි, මුඹ වහන්සේ තුන් කල් දනිති'යනාදීන් මුඹ වහන්සේගේ බොහෝ දනුම් සිරිගුත්තයෝ කිවු ය. උන් කීයේ තථ්‍ය වී නම්[1] ගෙට ගිය කල වන උවදුර ත් දනෙන බැවින් නො වනු මැනවි. වනො ත් උන් කියා විස්තර කළ පමණෙක් මුත් දනුමු ත් නැති නියා ය. කළ ආරාධනා සැබවැ'යි සිත ත් මා ඉදි කැර වූ දනෙකු ත් නැත.

'ඉදි කැර වූ දේත් ගේ ඇතුළට ම වනො ත් දනෙ'යි සිතා ලා බුදුන් අතින් පාත්‍ර ය හැර ගෙන වැඩි ය මැනැවැ'යි කියා ලා නැවත යන කලට පෙරාතු ව යන තැන අඟුරු වළ හුණු නියා ව බලා ලා

---

1. තථ්‍ය වී නම්–ඇතැම්.

Non-Commercial Distribution

සෙසු තැන් පසු බස්නා සේක' යන සිතින් 'ස්වාමීනි, අපගේ ගෙට මෙතෙක් දවසෙක නො වැඩි හෙයින් වත් දක වදරන්ට නැත්තේ වේ ද, ඒ නො කැමැත්තේ ය. එක් වට එක් තමක් වඩනා බව ය'යි කිවු ය. බුදුහු ත් යහපතැයි වදරා ලා වහන්දෑ සිටිය දී තමන් වහන්සේ ම නික්මුණු සේක. අඟුරු වළ කරා වැඩි කලට ගරහදින්නයෝත් තමන් ඉදි කැරවූ වළට තමන් නො වදනා සේ ඉවත් වූහ. බුදුහු අටෝරාසියක් මඟුල් ලකුණෙන් හොබනා ශ්‍රීපාද ය අඟුරු වළට පොවා ලූ සේක. නැඟි හිරට වැසි වලා ඉවත් වන්නා සේ අතුළ පුවරු ත් වසා ලූ කළාල් පැදුරු ත් නැති විය. අඟුරු වළින් රථසක් සා පියුම් පැන නැංගේ ය. ඒ නැඟි සැටි නම්—

"කප්පක සායෙ කලියුගෙ-බුද්ධුප්පාදෙ අහො මහච්ඡරියං,
හුතාවහ මජ්ඣෙ ජාතං – පමුදිත මකරන්දම්වාරවින්දං."

යනු හෙයින් 'යටත් පිරිසෙයින් අවුරුදු සියයෙන් මැත හා උඩ ත් පිරිසෙයින් හවුරුදු ලක්‍ෂයෙන් ඔබ්බ බුදු වීමට කල් නො වන බව මුත් අතුරු කල් හෙයින් දස දහසක් හවුරුද්දට ආයු ඇති අවධියෙක උපන මනා තැන කලි යුග වූ හීන කාලයෙහි මුන් වහන්සේ පහළ වූ නියාව අප ගිනි අඟුරු පීරා ගෙන පැන නැංගා වන්නැ'යි බුද්ධොත්පාදයෙහි අරුම ය හඟවන්නට කළාක් වැන්න.

බුදුහු ත් පියුමේ පියුම් තබන කලක් මෙන් පියුම් කෙමි පිටින් වැඩ යුගඳුරු මුඳුනෙහි වොරජනා අභිනව සූර්‍ය්‍යයා මෙන් පන වන ලද බුද්ධාසනයෙහි වැඩ හුන් සේක. වහන්දෑ ත් පියුම් කෙමි මැඩ ගෙන ගොසින් පත් හසුන්වල වැඩ හුන් සේක. කළ ලෙසට පිටි පෑ තුබූ හෙයින් ගරහදින්නයන් ඇඟ දහයක් මෙන් විය. ඌ සිරිගුත්තයන් කරා ගොසින් 'ස්වාමීනි, මට පිහිට වුව මැන වැ'යි කිවු ය. 'කුමක් දැ'යි විචාළ කල්හි සපයා ලූ දනක් නැති නියා ව කිවු ය. 'දන් සරහා නූ ලූ කල තොප කෙළේ කිම් දැ'යි විචාළෝ ය. 'මා කළ කට යුතු අඳුන ව කළ පමණක් මුත් කරන්නා තබා සිතූ ව මනා දෙයකු ත් නො වෙයි. ගහටයක් කරන්ට සිතා දෙ ගේ මැද වළක් බිඳුවා අඟුරු බාවා කෙළෙමි. අඟුරු වළට බුදුන් පය පොවාලන්නාම අඟුරු පීරා ගෙන රථ සකක් විතර පියුමෙක් පැන නැගේ ය. ඒ අඟුරු වළ නම් එ වේලාට පැන නැඟී පමණක් මුත් පියුම් විලක් සේ වි ය. පියුම් කෙමි මැඩ ගෙන සහපිරිවරින් බුදුහු වැඩ පැන වූ හසුන්වල වැඩ හුන් සේක.

Non-Commercial Distribution

මෙ තරම් විස්මයක් දුටු විරූ නැත. ඔබට ගහට කරන්ට සිතා මට වූ ගහට මහත. ඇඟ මුළුල්ලේ දහයක් සේ වැද ගත. ගිනි කරවා අඟුරු බාවන කල ත් මෙ තරම් ආයාසයෙක් නො වී ය. මට සහායක් වුව මැනැවැ' යි කී ය. 'හැයි, මා ගොසින් විචාළ ගමනේ සපයා තුබූ දන් පැවා ව ද? මාගේ සවාමිදරු වන් කළ පිනින් නැති දෙය ඇති වත් මුත් ඇති දෙය නැති වන තරමට නො වත්. ඒ කිම්දැ'යි විචාළ කල්හි 'ඒ නිකම් බොරු ය'යි කිවු ය. 'යව, ගොසින් බලව. බැලූ කල නැත් නම් නැති නියා ය. ඇත් නම් ඇති නියා ය. බුද්ධානුභාව ය ඉන් ම දනුව'යි කියා ලා බලන්ට යවු ය. ගොසින් බැලූ කලට ඒ සියල්ලෙහි කැඳ සැළැ යි කී සැළ හඹු කැඳ, කිරි කැඳ, දිය කැඳින් පිරිණ. අවුළු පතැ යි කී වළඳ අතිරස, පුලුබ්බදනා, මුං, ලාලූ ආදී වූ අවුළුපතින් පිරිණ. බත් සැළ යි කී වළඳ හැල්සාලේ බත් ආදී වූ බතින් පිරිණ. මාළු යැයි කී වළඳ මත්ස්‍ය මාංස තෙල් ආදී වූ මාළුවෙන් පිරිණ. ඒ දැක රස උළු කැඳක් පූවා සේ ගරහ දින්නයන් ඇඟ දහ නැති වි ය. සිත ත් යම් තරමෙක සතුටු වි ය.

සිය අතින් සකස් කොට ම දන් වළඳවා ලා අන්තයෙහි අනුමෙ වෙනි බණ ට ආරාධනා කළහ. බුදුහු බණ වදරන සේක් 'මෙ සත්හු නම් නුවණැස් නැති හෙයින් මාගේ ත් සවුවන්ගේ ත් ගුණ නො දනිති. කෙ සේ ඇස් ඇත ත් නුවණැස් යම් කෙණ කුන්ට නැත් නම් උ අන්ධයෝ ය. ඇස් ඇත්තා නම් වන්නෝ නුවණැස් ඇත්තෝ ම ය. යම් සේ මාවතෙක හෝ ගම් දෙරෙක හෝ රැස් කළ කසළ ගොඩක් පීරා ගෙන පවිත්‍ර වූ සුවඳ ඇති ඉන්තෙන් හා කෙසුරෙන් හා රේණුයෙන් හොබනා වූ පියු මෙක් නැංගේ වී නම් කසළ කසළට යත ත් පියුමක් කසලට නො හරින පරිද්දෙන් කෙලෙස් කුණින් පිරුණු හෙයින් ඉතා කසළ වූ, නුවණැස් නැති හෙයින් අන්ධ වූ, පෘථග්ජනයන්ට බුදු සවුවෝ නුවණින් වඩිති' වදළ සේක. දෙශනා කෙළවර සුවාසූ දහසක් දෙන පෘථග්ජන කසළ හැර නිවන් දැක්මෙන් නික සළ ව ලොවුතුරා නුවණින් බබළා ගියහ. සිරිගුත්ත-ගරහදින්න දෙ දෙන ත් සෝවාන් වූහ. බුදුහු ත් විහාරයට වැඩ පී සේක.

සවස් වේලෙහි ධම් සෙබෙයි රැස් ව වැඩ හුන් වහන්දෑ 'අනේ බුදුන්ගේ ආනුභාවයක් බලවත් නියා ය. ඒ සා මහත් අඟුරු පීරා පියුම් නැඟි නියාව විස්ම ය'යි කථාව ඉපැද වූ සේක. බුදුහු ඒ දිව කනින් අසා වදරා එ තැනට වැඩ කෙරෙමින් හුන් කථාව විචාරා පියුම් නැඟි කථා නියාව කී කල්හි 'මහණෙනි, මා බුදුහු

Non-Commercial Distribution

අවස්ථාවෙහි අඟුරු පිරා පියුම් නැඟි නියාව විස්ම නොවෙයි. බොධි සත්ව අවස්ථායෙහි ත් පසේ බුදු කෙණකුන්ට මා දෙන දන කට බාධා කොට වසවත් මරු මැවූ ගිනි වළිනු ත් පියුම් නැංගේ ය'යි වදරා විස්තර කොට අසනු කැමැති වහන්දැට ඛදිරඞ්ගාර ජාතක ය වදළ සේක.

එසේ හෙයින් නුවණැත්තවුන් විසින් විෂ්කම්භනය ත් සමුච්ඡෙදය ත් බැරි වුව ත් තදඞ්ග වසයෙන් වී නමුත් කෙලෙස් කසළ සෝධා හැරීමෙන් නිකසළ ව කුසල් පුරා සිත් සතන් පිරි සුදු කට යුතු.

## 56. කුමුදුප්පලානීත දුග්ගත සේවක වස්තුව

තව ද බණ දහම් නො දන්නවුන් කුසල්හි නො හැසිර සසර දික් කරණ නියාව ත් ව්‍යතිරෙකයෙන් බණ දහම් දැන පින් කර හැසුරුනන්ට සසර ලුහුඩු වන නියාව ත් දක්වනු පිණිස කුමුදුප්පලානීත දුග්ගත සේවක වස්තුව කියමු.

කෙසේ ද යත්—

පසේනදි කොසොල් රජ්ජුරුවෝ එක් උත්සව දවසෙක චන්ද්‍රකාන්ති පුඤ්ජයක් සේ හැළි වූ හස්ත්‍යාභරණයෙන් සරහන ලද පුණ්ඩරීක නම් ඇතු පිට හිඳ මහ පෙරහරින් නුවර පැදකුණු කෙරෙති. 'ඇළ වව'යි ඇළ වව'යි කිය ලා ලී හැර ගෙන මරා ඉවත් කරත ත් දුවන ගමනෝ වුව ත් කර නමා රජදරුවන්ගේ ශ්‍රී විභූති බලන්නෝ බොහෝ වෙති. ඒ රජ දරුවන් සසර සිටිනා කල සකසා කල පිණෙයි මහිම ය.

එක් තරා දුක් පත් එකකුගේ අඹුවක්-දුක් පත් බව මිස මාළිගාවක් ඇති නියා වේ ද-සත් මහල් මාලිගාවේ උඩු මාලේ සිටි තැනැත්තී කවුළු දෙර මදක් හැර ලා රජ්ජුරුවන් නික්මෙන ශොභාව බලා පියා ඉවත් ව ගියා ය. රජ්ජුරුවන්ට ත් උන් ඉවත් කොට ගත් මුහුණ නුවණින් සිතන්ට නුවූ හෙයින් පුන් සඳක් වලා ගබට වන්නා සේ සිතින. රජ්ජුරුවෝ උන් කෙරේ පිළිබඳ සිත් ඇති ව ගෙන ඇත් කඳ පිටින් කාමොන් මාදයෙන් හෙන්නා සේ ව ගොසින් වහා නුවර පැදකුණු කොට පියා රජ ගෙට පිවිස ලෙන් ගතු ඇමත්තකු බණවා ලා 'අසවල් තැන දී මා බලා සිටි මාළිගාව දිටි දැ'යි විචාරා එ සේ ය යි කී කල්හි 'ඒ මාළිගාවේ සිටි ගැනියක දිටි දැ'යි විචාරා 'දිටිමි'යි කී කල්හි'යා ගොසින් උන් සස්වාමික- අස්වාමික නියාව දැනැ'යි කිවූ ය.

Non-Commercial Distribution

උයි ත් ගොසින් විචාරා සස්වාමික නියා දැන ගොසින් රජ්ජුරුවන්ට සස්වාමික නියාව කිවු ය. එ සේ වී නම් උන්ගේ සමණන් කැඳවා ගෙන එව' යි කී කල්හි ගොසින් රජ්ජුරුවන් කැඳවූ නියාව කිවු ය. උයි ත් තමන් නුවණැති හෙයින් කැඳ වූ ලෙසින් ම අඹුවන් නිසා ඇති වූ භයෙක් නියා වේ දැ යි දැන ගෙන රාජාඥව මැඩ ගත නො හී ගොසින් රජ්ජුරුවන් වැඳ ලා සිටියහ. රජ්ජුරුවෝ 'සේවා කමට නිල කොට ගෙන වරදක් ලා ලා මරවා පියා අඹුව හැර ගනිමි' සිතා පර ලොව ම නො සලකා 'අපට සේවා කම් කරව'යි කිවු ය. 'රජ්ජුරුවන් වහන්ස, සේවා කම නම් පැදෙන[1] කෙණකුන්ට වේ ද? නැවත මම මා රැකෙන ලෙසකින් රැකි රට හුන්නාට නුඹ වහන්සේට බද්දක් දී ලා හිඳිමි' කිවු ය. 'තොපගේ බද්දෙන් අපට ප්‍රයෝජන නැත. මෙ වක් පටන් සේවා කම් කරව'යි කියා ලා කඩුවක හා පලහක්[2] දුන්හ. උයි ත් ආයුධ ලදින් සේවාකමට කළ නිලයක් නො වන නියාව දැන භය බලවත් ව ඇති ව නො පමාව රාජ සේව ය කෙරෙති.

රජ්ජුරුවෝ උන්ගෙන් වරදක් සොයා ගත නො හී කාම තෘෂ්ණාව වඩු ත් වඩු ත් වරදක් ලා ලා මරවා පියා ස්ත්‍රි ය හැර ගනිමි'යි සිතා කැඳවා ලා 'හෙම්බා දරුව, මෙ තැනට සතර ගවුවකින් ඔබ්බෙබ් ගඟ බඩ අසවල් තැනට ගොසින් සවස මා නහන වේලාට කඩුපුල් මල් හා අරුණුවන් මැටි ගෙනවුත් දෙව. එ වේලාට නාවූ නම් ආඥ කරවමි'යි කිවු ය. සේවා කම නම් ගෙයි ද වඩා ගත මහල් වහල, මිල දී හැර ගත් වහල,' කොල්ල වහල, රැකී ගත නො හී තුමූ ම වහල් වූවෝ ය. යන සතර පක්‍ෂයේ වහලට ත් අඩු හෙයින් හා ඒ වාල් ස්වාමිදරුවන් මෙහෙයක් කී කල්හි ඇහට නු සුව ය යි කියා ලා රඳන්ට පිළිවන් වුව ත් සේවායන් එ සේ රඳනට බැරි හෙයින් හා තමා අවශ්‍යයෙන් ම මෙහෙවර ගිය මනා හෙයින් 'කඩුපුල් මල් හා සමඟ අරුණුවන් මැටි ඇත්තේ නාග භවන ය. මම එය කොයින් ලබම් දැ යි සිතා මරණ භයින් තැති ගෙන ගෙට ගොසින් ඇඹෙණි යනට 'සොඳුර, බත් උදවූ දැ'යි කිවු ය. 'උදුනේ ය'යි කී කල්හි බත් බා තබන තුරු ත් රඳන්ට බැරි හෙයින් 'සරළුවෙන් පැන් නිමවා හැර පියා දිය සිඳී නො ගිය බත් ම පෙට්ටියෙක ඔබා ගෙන උදවු වූ මාළුවකු ත් ලවා ගෙන ඒ හැර ගෙන සතර ගවුවෙ යන්ට නික්මුණාවු ය.

යමින් සිටියදී ම බත් පෙට්ටියේ ඔබා ලූ හෙයින් පැසිණ. නොයිඳුල් කොට බත සුහක් හැර තබා ලා බත කන තැනැත්තෝ

---

1 පැරදෙන 2 පලිහක්

Non-Commercial Distribution

එක් මඟී කෙණකුන් දක නොයිඳුල් කොට තුබූ බත් උන්ට කන්ට දී ලා තුමූ ත් බත් කා ගෙන දියෙහි කුඩ මස්සන්ට බත් මිටක් දමා පියා අත කට සෝධා පියා හඬ ගා කියන්නෝ 'මේ ගඟ වසන දේවතාවෙනි, නයිනි, කොසොල් රජ්ජුරුවෝ මා මරවනු කැමති ව කොට ලිය නො හැකි මෙහෙවරක් හෙයින් කඬුපුල් මල් හා සමඟ අරුණු වන් මැටි ගෙනෙන්ට මට විධාන කළහ. බත් කන ගමනේ ඉඳුල් නො කොට තබා ලා මඟී කෙණකුන්ට බත් දිනිමි. ඊ විපාක දහස් ගණන් ඇත. කුඩ මස්සන්ට ත් බත් ලීමි. ඊ විපාක සිය ගණන් ඇත. ඒ පින් කම් දෙවියන් නයින් අනුමෝ ව ඇති තැනකින් මට කඬු පුල් මල් හා සමඟ අරුණුවන් මැටි ගෙනවුත් දුන මැනැව'යි තුන් විටක් අඬ ගා කිවූ ය. එ ගඟ පත්ලේ වසනා නා රජ්ජුරුවෝ ඒ අසා මාලු වෙසකින් උන් ළඟට අවුත් 'කුමක් කියවූ දෑ'යි විචාරා ආදී කී ලෙස ම කී කල්හි 'තොපි එ පින් දෙවූ දෑ'යි විචාරා 'දෙමි' කී කල්හි තව ත් තව ත් විචාරා තුන් විටක් කොට ම දෙමි කියවා ගෙන කඬුපුල් මල් හා සමඟ අරුණු වන් මැටි ගෙනවූ ත් දුන්හ.

උන් මෙ වර යවා ලා රජ්ජුරුවෝ ත් සිතන්නෝ 'මිනිස්සු නම් බොහෝ උපදෙස් දනිති. යම් කිසි ලෙසකින් ඒ ලද්දු නම් මාගේ අභිමතාර්ථ ය සිද්ධ නො වෙ යි. ඊට උපදෙසක් කළ මනා වේ දෑ'යි ආවොතිනු ත් තමා කරා නො එන ලෙසට වේලා පස ම වාසල්වල යතුරු ලවා ලා යතුරු මුද්‍ර ත් තමන් ළඟ තබ්බවා ගත්හ. සේවාණෝද රජ්ජුරුවන් නහන වේලාට ම වාසල කරා ගොසින් වාසල්වල යතුරු ලූ හෙයින් වාසල් රක්න වුන්ට යතුරු හරින්ට කිවූ ය. 'අප යතුරු හරින්නේ කෙසේ ද? වේලා පස ම යතුරු ලවා පියා යතුරු මුද්‍ර රජ ගෙට ම ගෙන්වා ගත් සේකැ'යි කිවූ ය.

'මම රජ්ජුරුවන්ගේ මෙහෙවර ගියෙමි. දොර හරුව'යි කියා ත් හරවා ගත නොහී ඉතිකින් රජ්ජුරුවෝ මා නො තබති. කුමක් කෙරෙම් දෝ හෝ'යි සිතා වාසල උඩෙළියේ මැටි පිඩ තබා ලා ඊ පිට කඬුපුල් මල් ගන්වා තබා ලා මහත් කොට හඬ ගා කියන්නෝ, 'මුළු නුවර ඇත්තෙනි, රජ්ජුරුවන් වහන්සේ වදළ මෙහෙවර කඬුපුල් මල් හා අරුණු වන් මැටි හා මා ගෙනවුත් වාසල උඩෙළියේ තබා ලූ නියා ව දනුව. රජ්ජුරුවෝ නිවරද මා මරවති' තුන් විටක් හඬ ගා කියා පියා මෙ වේලේ කොයි යෙම්දෝ හෝ යි සිතා 'වහන්දෑ නම් මෙළෙක් අදහස් ඇති සේක. විහාරයට

Non-Commercial Distribution

ගොසින් වැද හෝමී'යි සිතින් ම සනිටුහන් කොට—පැදෙන කල වහන්දෑ ඇති නියාව ත් නො දන, දුකකට පැමිණි කල විහාරයට යනු කැමැති වෙති—එසේ හෙයින් උයි ත් විහාරයට ගොසින් ඵාසු තැනෙක සැතපී ගත්හ.

රජ්ජුරුවෝ ඇවිටි කළ ස්ත්‍රී ය කෙරෙහි සිත්විල්ලෙන් රෑ නිදි නැති ව කාම තෘෂ්ණාව ත් බලවත් ව 'පාන් වන්නා ම හුන් තැනකින් අර මූ ගෙන්වා ගෙන මරවා පියා ස්ත්‍රී ය ගනිමී' සිතූහ.

එ ම රාත්‍රියෙහි දෙ සිය සතළිස් ගවුවක් විතර උස ඇති ලෝ කුඹු නරකයේ උපන් නිරැ වැස්සෝ සතර දෙනෙක් සැළියෙක පැසෙන සාලක් මෙන් සිසැරි සිසැරි පැසෙන්නාහු සැළ මුව විට පටන් තිස් දහසක් හවුරුද්දෙන් පැසී සැළ පත්ලට බැස නැවත තිස් දහසක් හවුරුද්දෙන් සැළ මුව විට කරා පැමිණ පැන නැංගෝ ය. ඔහු සතර දෙන සැළ මුව විටින් හිස ඔසවා පියා ඔවුනොවුන් දැක එකි එකී ගාථාවක් කියනු කැමති ව ගාථා පුරා කියනට කල් නැති හෙයින් ගාථා සතරේ මුල මුල අකුරු පමණක් කියා ලා පෙරළා පැසී බසින්ට වන්හ.

නො නිදා හුන් කොසොල් රජ්ජුරුවෝ ත් මධ්‍යම රාත්‍රී වේලෙහි නාරකික සත්‍වයන් ගේ ශබ්ද හෙයින් භයානක වූ ඒ ශබ්දය අසා බා ගොසින් 'මට වන දෙයෙක් දෝ, අග මෙහෙසුන් බිසොවුන්ට වන දෙයෙක් දෝ, රටට වන දෙයක් දෝ'යි සිතා ඇස පිය බානට නැති ව නො නිදා හිඳ පාන් වන වේලාට පුරෝ-හිත බමුණන් ගෙන්වා ගෙන 'ආචාරීනි, මධ්‍යම රාත්‍රියෙහි භයානක ශබ්ද සතරක් ඇසීමි. කුමකින් කුමක් වන බව ත් නො දැක තොප ගෙන්වීමි'යි කිවු ය. 'රජ්ජුරුවන් වහන්ස, ඇසූ ශබ්ද කවරේ දැ' යි විචාළෝ ය. රජ්ජුරුවෝ ''දු'' යන හඬෙක. 'ස' යන හඬෙක. 'න' යන හඬෙක. 'සො' යන හඬෙක. මින් වන වැඩ අවැඩ සලකව''යි කිවු ය.

බමුණානෝ ඒ අසා අඳුරු ගබකට වන්නා සේ හැඟුණු කුමකු ත් නැති ව 'හැඟුණු දෙයෙක් නැතැ යි කීම් නම් ලාභ සත්කාර නැති වෙයි' සිතා තුමූ ත් බා ගියා සේ වලා 'රජ්ජුරු-වන් වහන්ස, කාරණා යහපත් නො වේ යි' කිවු ය. කුමක් දැ යි විචාළ තැන 'මුඹ වහන්සේට උවදුරෙක් පෙනේ' යි කිවු ය. රජ්ජුරුවෝ දියුණ ලා බා ගොසින් 'ආචාරීනි, ඒ දෙසන්ට නිසි දෑ ඇත් දැ' යි විචාළෝ ය. 'රජ්ජුරුවන් වහන්ස, මම වේද දනිමි. වේදයේ තෙල සේ වූ දෙයට නිස්ස ඇතැ'යි කියා ලා

Non-Commercial Distribution

කුමක් කළ මනා දැයි විචාළ කල්හි 'තෝරා ලා මස් කෑ යුතු සත්ත්වයන්ගේ ම පවත් කියා ලීම් නම් දඩ මස් කනු කැමැති වනැ යි සිතාගත ත් නපුරැ'යි සිතා 'ඇත් සියයක්, අස් සියයක්, ගොන් සියයක්, දෙන් සියයක්, තිරෙළුවන් සියයක්, පලෙළුවන් සියයක්, කුකුළන් සියයක්, හූරන් සියයක්, මුවන් සියයක්, කුඩා කොල්ලන් සියයක්, කිඩෑ කෙල්ලන් සියයක් ය යි සියල්ලවුන් ගෙන් සිය ය සිය ය මරා යාග කිරීම යහපතැ'යි කිවු ය. රජ්ජුරුවෝ ද 'මාගේ ජීවිතයට වඩා ත් ඇත්දැ'යි සියල්ලවුන් ගෙන් ම අල්වන්ට විධාන කළහ. විධාන ලද්දෝ වඩ වඩා ලා බැන්දෝ ය. බොහෝ දෙන තමන්ගේ නෑයන් සියන් බඳනා හෙයින් හඬා නැංගෝ ය. පොළොව පැළී යන්නා සේ වී ය.

මල්ලිකා බිසවු රජ්ජුරුවන් ළඟට ගොසින් විචාළ තැන 'සියල්ලවුන් ගෙන් සිය ය සිය ය මරා යාගයක් කළො ත් මුත් ජීවිත හානියක් කිවු ය. මළො ත් නපුරැ යි යන අදහසින් මුන් හැම ඇල්ලවීමි' කිවු ය. මල්ලිකා බිසව ඒ අසා 'රජ්ජුරුවන් වහන්ස, මගධ නැළියෙන් සොළොස් නැළියක් සාලේ බත් කන සේ දන්නා බව මුත් කට යුත්තක් ම නො දන්නේ හැයි ද? එක් කෙණකුන් මරා එක් කෙණකුන් ජීවත් වූ නියාවක් කැරුණේ පුවත ත් ඇසූ විරූ ඇත් ද? ප්‍රාණ වධ කළවුන් අල්පායුෂ්ක නියා ව බණිනු ත් නො ඇසූ නියා ද? නුවණ නැති බමුණාගේ බස් ගිවිස මෙ තෙක් දෙනාගේ ප්‍රාණ හානි කරන්ට කාරණ කවරේ ද? තුන් කල් දන්මෙහි නො පැකිළ පවත්නා නුවණ ඇති සියලු ලෝ වැස්සන්ට අග පුහුල් වූ බුදු රජාණන් වහන්සේ ශරීරාලොක – ඥනාලෝක දෙකින් බබළ බබළා ළඟ විහාරයේ වැඩ හිඳිනා සේක. ගොසින් ඔබ විචාරා ඔබ වදළ ලෙසක් කළ මැනැවැ'යි කිවු ය.

රජ්ජුරුවෝ එ සේ කියන්නා ම පිළිවන් වාහනයෙකින් මල්ලිකාවනු ත් කැඳවා ගෙන විහාරයට ගොසින් වැද ගත් භය බුදුන් කරා ගොසිනු ත් නො හැරුණු හෙයින් කිසිවකු ත් කියා ගත නො හී වැද ලා එකත් පස් ව හුන්හ. බුදුහු නො දත් ලෙසින් 'රජ්ජුරුවෙනි, වෙලින් වේලා පස ම කොයි සිට කුමක් නිසා ආ නියා දැ'යි කථා උපදවනු පිණිස ම විචාළ සේක. කට කෙළ සිඳිලා ඇද් රජ්ජුරුවෝ බැණ නො නැංගෝ ය. මල්ලිකා බිසවු "රජ්ජුරුවන් වහන්සේ මධ්‍යම රාත්‍රි වේලෙහි භය ජනක ශබ්දයක් අසා පාන් වූ කල පුරොහිත බමුණාණන්ට කී සේක. උඹ ඒ අසා 'මුඹ වහන්සේට උපද්‍රවයෙක් පෙනෙයි. සියල්ලවුන් ගෙන් සිය ය

Non-Commercial Distribution

සිය ය මරා යාගයක් කළො ත් ඒ උපද්‍රව ය නැති වෙයි' කිවු ය. රජ්ජුරුවන් වහන්සේ ඇත්-අස්-මිනිස් ආදී වූ බොහෝ දෙනා බන්දවා ගෙන් වූ සේක. දෙඩා බැණ මම මුඹ කැඳවා ගෙන අයිමි'යි කිවු ය.

බුදුහු 'සැබෑ ද, මහරජ'යි විචාරා 'සැබව'යි කී කල්හි 'තොප ඇසූ ශබ්ද ය කවරේ ද'යි විචාළ සේක. රජ්ජුරුවෝ ඇසූ ලෙස ම කිවු ය. බුදු රජුන් වහන්සේට අසමින් ම එහි අර්‍ථ දැනිණ. මහ රජ, තෙපි නො බව. තොපට ත් කාට ත් මේ නිසා වන උපද්‍රව නැත. නිරැ වැසි සත්‍වයෝ නරක දුක් විඳිමින් එ විතරකු ත් කියා පියන්ට යන්තම් අවසරයක් පෙනී ගොසින් තමන් ගන්නා දුක් කියන්ට කිවු ය'යි වදාළ සේක.

'ස්වාමීනි උන් කළ පව් කවරේ ද'යි විචාළෝ ය. අසනු කැමැති නියා වේ ද'යි විචාරා වදරා 'එ සේ ය' යි කී කල්හි 'මහ රජ යටගිය දවස දඹදිව් වැස්සන්ට විසි දහසක් හවුරුද්දට ආයු ඇති සමයෙහි කසුප් බුදුහු ලොව ඉපැද විසි දහසක් රහතන් පිරිවරා දඹදිව් තෙලෙහි සැරිසරන්නාහු බරණැස් නුවරට වැඩි සේක. බරණැස ඇත්තෝ දෙන්න ත් – තුන් දෙන ත් – දසයකු ත් – විස්සකු ත් – සියයකු ත් වඩා ත් එක් ව ගෙන අමුතු ව ලා ගිය බුදුන්ට අමුතු දන් දුන්හ. එ කල බරණැස සතළිස් කෙළක් ධන ඇති සිටු පුත්‍රයෝ සතර දෙනෙක් මිත්‍ර ව වසන්නාහු එක් දවසෙක කථාවක් කරන්නෝ 'අප අපගේ බොහෝ වස්තු ඇත. ඒ කුමක් කරමෝ ද'යි කිවු ය. ඉන් එක් කෙණකු ත් 'බුදුන් මෙ නුවරට වැඩි පසු දන් දෙම්හ. පින් කරම්හ'යි නො කීහ.

එක් සිටු පුත්‍රයාණ කෙණෙක් මෙ. වස්තුව වියදම් කොට රා හැරගෙන බොම්හ. කුඩමස් ගෙන කම්හ. තව ත් තව ත් රුචි ඇති දෙයක් ගෙන කා සුව සේ ඇවිදුම්හ. එ සේ කලට සම්පත වල නො යෙ'යි කිවු ය. අනික් සිටු පුත්‍රයාණ කෙණෙක් 'තුන් හවුරුදු සුවඳ හැල් සාල් හැර ගෙන රස මසවුළෙන් යුත් හැල් සාලේ බත් කම්හ'යි කිවු ය. තුන් වන සිටුපුත්‍රයාණෝ 'අප මෙ තෙක් වස්තුව ඇත්තවුන්ට ත් බත් අරුම ද? තෙලු ත් පැණි ත් ආදිය මිල දී හැර ගෙන නො එක් වර්‍ගයේ කැවුම් ඉදි කරවා කම්හ'යි කිවු ය. සතර වන සිටු පුත්‍රයාණෝ කියන්නෝ 'සබඳිනි, ඒ කුමකු ත් නො කැමැත්තේ ය. වස්තු දෙම්හ'යි කී කල කැමැති නො වන කෙණෙක් නම් නැත. වස්තු දී පියා පරදර කර්‍මයෙහි හැසිරෙම්හ'යි කිවු ය. හැම දෙන ම උන්ගේ කථාව ගිවිස්සෝ ය.

Non-Commercial Distribution

උයි ත් එ වක් පටන් විශිෂ්ට රූ ඇති ස්ත්‍රීන්ට වස්තු දෙවා ලා විසි දහසක් හවුරුදු මුළුල්ලෙහි පරදර කර්මයෙහි හැසිර මිය ගොසින් අවීචි නරකයෙහි ඉපැද අනන්ත කාලයක් අවීචියෙහි පැසී ඉන් චුත ව තව ත් අකුසල් නො ගෙවුණු හෙයින් සැළමුව විට පටන් සැළ පත්ලට දෙසිය සතළිස් ගවුවක් උස ඇති ලෝ දියෙන් පිරුණු ලෝ කුඹු නරකයෙහි ඉපැද තිස් දහසක් හවුරුද්දෙන් සැළ පත්ළට බැස නැවත තිස් දහසක් හවුරුද්දෙන් සැළ මුව විට කරා නැඟී තමන් විඳිනා දුක් කියන්ට එකී එකී ගාථාවක් කියනු කැමැති ව පුරා කියන්ට අකුසල කර්මයාණන් අවසර නො පානා හෙයින් ගාථා සතරින් මුල මුල අකුරු ම කියාලා නැවත පෙරළා සැළ ඇතුළට ම වන්හ. මහරජ, මෙ සේ ඇසූ පළමු වන ශබ්ද ය කවරේ දැ'යි විචාරා 'දු' යන ශබ්ද ය යි කී කල්හි ඔහු පුරා නො කී ගාථාව කවි පදයක් පුරා පදලන්නා සේ ම–

''දුජ්ජීවිතං අජීවිම්හ – යෙ සන්තෙ න දදම්හසෙ,
විජ්ජමානෙසු භොගෙසු – දීපං නාකම්හ අත්තනො''යි

පුරා වදරා ලා 'යම් බඳු වූ අපි කැමැති විතරකට සම්පත ඇත ත් අපට පිහිටක් කට නුහුණුමෝ ද, එ සේ වූ අප විසි දහසක් හවුරුදු දවස් යවූ නියා වනැ'යි පළමු වන ගාථාර්ථය ත් වදරා ලා දෙ වන ශබ්ද ය කවරේ දැ යි විචාරා 'ස' යන ශබ්ද ය යි කී කල්හි ඔහු පුරා නො කී ගාථාව—

''සට්ඨිං වස්සසහස්සානි – පරිපුණ්ණානි සබ්බසො,
නිරයෙ පච්චමානානං – කදා අන්තො භවිස්සති''යි

පුරා වදරා ලා 'මේ නරකයෙහි පැසෙන්නා වූ අපට පැසී බස්නා කල ත්, නැඟෙන කල ත්, සැට දහසක් හවුරුදු පිරිණ. කෙළවරෙක් කවරේ දැ'යි අර්ථ ත් වදරා ලා තුන් වන ශබ්ද ය විචාරා 'න' යන ශබ්දය යි කී කල්හි ඔහු අඩාළ කළ ගාථාව—

''නත්ථි අන්තො කුතො අන්තො–න අන්තො පතිදිස්සති,
තදහි පකතං පාපං – මම තුය්හං ච මාරිස''යි.

ගාථාව පුරා වදරා ලා අප විසිනු ත් තොප විසිනු ත් විසි දහසක් හවුරුදු මුළුල්ලෙහි කරණ ලද අකුශලයෙහි විපාක දී නිමවා පිමෙන් කෙළවරෙක් නැත. කෙළවරෙක් කොයින් ද? මින් මිදීමෙක් නැතැ'යි තුන්වන ගාථාවේ අර්ථ ය ත් වදරා ලා සතර වන ශබ්ද ය කවරේ දැ'යි විචාරා 'සො' යන ශබ්ද ය යි කී කල්හි ඔහු අඩාළ කළ ගාථාව—

Non-Commercial Distribution

''සොහං නූන ඉතො ගන්ත්වා - යොනිං ලද්ධාන මානුසිං,
වදඤ්ඤූ සීලසම්පන්නො - කාහාමි කුසලං බහුං''යි.

පුරා වදරා ලා, ඉදින් මම මෙයින් චුත ව මිනිස් ලොව උපනිම් නම් බොහෝ පින් කෙරෙමි' සතර වන ගාථාවේ අපි ත් වදරා ලා 'මෙ සේ මහ රජ ඔහු සතර දෙන එකි එකී ගාථාවක් කියනු කැමැති ව ත් කියා ගත නොහී මුල මුල අකුරු ම කියා ලා නැවත ලෝකුම්බු නරකයට ම වන්හ යි වදළ සේක. පසේනදි කොසොල් රජ්ජුරුවන් ඒ ශබ්දය ඇසූ තැන් පටන් උන් සතර දෙන සැළ පත්ල බලා පසු බසිති. ඒ අද ව ත් නරකයෙහි ආයු කාල ය වෙන් හෙයින් හවුරුදු දහසකට ත් නැත.

රජ්ජුරුවන්ට ත් උපයොගි බණක් ම සම්භ ව වූ හෙයින් ඒ බණ අසා බලවත් ව භය ඇති වී ය. 'අනේ පරදර කර්ම ය නම් මහා සාවද්‍ය ය, එක ජාතියෙක කළ පරදර කර්ම බලයෙන් බුද්ධාන්තරයක් මුළුල්ලෙහි අවීචියෙහි පැසී එයින් චුත ව තව කර්ම ය නො ගෙවුණු හෙයින් ලෝ කුම්බු නිරයේ ඉපැද ඊ ත් සැට දහසක් හවුරුදු පැසී එයින් මිදෙන කලක් තව පෙනුණේ නැත. මම ද එ සේ වූ අදහසින් රාත්‍රි ය මුළුල්ලෙහි නිදි නැති ව මේ භය ජනක ශබ්ද ත් ඇසීමි. ඒ ඇසූ සේ ම යහපත. මෙ වක් පටන් පරදර කර්මයෙක නො හැසිරෙමි'යි කියා ගෙන බුදුන්ට දන්වන්නෝ 'මෙ තෙක් දවස් නිදා පාන් කරණ හෙයින් නො දත් බව මුත් රෑ දවස බොහෝ නියාව නො නිදා හුන් හෙයින් ඊයේ රෑ දතිමි'යි කිවු ය. මේ වර ගිය සේවාණෝ ත් නුදුරෙක හුන්නෝ ඒ කථාව අසා 'මට ත් කථා කොට ගන්ට අවසර පෙනිණැ'යි බුදුන්ට දන්වන්නෝ 'ස්වාමීනි, රජ්ජුරුවන් වහන්සේට රෑ දවස දිග යි දැනුණා සේ ම සතර ගවුව පමණකු ත් දුරු නියාව මට ත් දැනිණැ'යි කිවු ය.

බුදුහු උන් දෙපක්‍ෂයෙහි කථාව එක් කොට ගෙන බණ වදරන සේක්, 'රාත්‍රිය තමා තිස් පැය වුව ත් මකුණන්ට බත් ව හිර නැහෙන තෙක් ඇළයෙන් ඇළයට පෙරළි පෙරළී නිද්‍රා පුරන මහ මැළි යන්ට දික් ව නො වැටහෙත ත්, නැවත සුව සේ අනුභව කොට ලා කයට සිතට ඵාසු ඇති ව ශ්‍රී යහන්වල වැද හෙව නිදන්නවුන්ට දික් ව නො දැනෙත ත් තුන් යම් රාත්‍රි ය මුළුල්ලෙහි ප්‍රධාන වීර්‍ය්‍යයෙන් හෝ බණ කීමෙන් හෝ බණ ඇසීමෙන් හෝ, එක්තරා රෝග දුකෙකින් පෙලීමෙන් හෝ නො නිදන්නවුන්ට දෙ තුන් රෑයක් මෙන් දික් ව වැටහෙයි.

Non-Commercial Distribution

සතර ගවුවක් වුව ත් ගමන් ගොසින් විඩා වූවන්ට සෙමින් සිට යන ගමන හෙයින් පෙර මඟ එන්නවුන් දැක අසවල් ගම කෙතෙක් තැන් දැ'යි විචාරා සතර ගවුවෙකැ යි කී කල්හි තව ත් මඳක් ගොසින් විචාරා උනු ත් එ සේ ම සතර ගවුවක් විතර ඇතැ යි කී කල්හි මඳ තැනක් ගොසින් ලා එන්නවුන් අතින් විචාරා සැබ වැ යි කී කල්හි සතර ගවුවෙක් වී නම් නො වේ ද බොහෝ වතැ යි වැට හෙයි. සසර ලුහුඩු කරවා ලන සත් තිස් බොධි-පාක්ෂික ධර්‍ම ය නො දන්නා නුවණ නැත්තවුන්ට සසර ත් භවක්‍ෂය කට නො හෙන හෙයින් දික් වෙ'යි වදාළ සේක.

මේ දෙශනා කෙළවර හයින් වෙහෙරට වන් සේවාණෝ ත් සෝවාන් වූහ. සෙසු ත් බොහෝ දෙන තිවන් දැක සසර නැති කරන්නෝ නැති කොට, ලුහුඩු කරන්නෝ ලුහුඩු කළහ. එ සේ හෙයින් භව ක්‍ෂයට ම තැත් පිරිය යුතු.

රජ්ජුරුවෝ ත් බුදුන් වැඳ ලා යන්නෝ යාගාවාටයෙහි බැන්ද වුන් ඉන වූහ. ගැළවී ගෙන ඉස් සෝධ නා පියා තම තමන් ගෙවලට යන ගැනු පිරිමි 'මල්ලිකා බිසොවුන් වහන්සේ බොහෝ කලක් ජීවත් වන සේක්වා'යි මල්ලිකා බිසොවුන්ට ආ වැඩූහ. සවස් වේලෙහි ධර්‍ම සෙබෙයි රැස් ව හුන් වහන්දෑ ත් 'අනේ, මල්ලිකාවෝ ඉතා නුවණැත්තෝ ය. තමන් නුවණැති හෙයින් මෙ තෙක් දෙන රැකපූ ය'යි කථාව ඉපැදවූ සේක. බුදුහු ඒ අසා වදරා 'මහණෙනි, මල්ලිකාවන් තමන්ගේ නුවණින් බොහෝ දෙනා රැක්කේ දැන් මතු නො වෙයි. යට ගිය දවස ත් මෙ ලෙස ම රැක්කෝ ය'යි වදරා අසනු කැමැති වහන්දෑට ඉකුත් වත ගෙන හැර දක් වූ සේක.

'යට ගිය දවස බරණැස් රජ්ජුරුවන්ගේ පුතණුවෝ එක් නුග ගසක් කරා ගොසින් ඒ ගස දෙවියාට ආරාධනාවක් කරන්නෝ 'දෙවි රජ්ජුරුවෙනි, මුළු දඹ දිව රජ දරුවෝ සිය-යෙකු ත් ඇත. අග මෙහෙසුන් බිසෝවරු සියයෙකු ත් ඇත. ඉදින් මම අප ගේ පියාණන් වහන්සේ ගේ අයාමෙන් රාජ්‍යය ලදිම් නම් උන් හැම දෙනාගේ බොටුවෙ ලේයෙන් තොපට බිලියම් කෙරෙමි'යි කිවූ ය. එ සේ කියා ලා පියාණන් මළ පසු රාජ්‍යය ලදින් 'දෙවතානු භාවයෙන් රාජ්‍යය ලත් පසු බිලියම් කෙරෙමි'යි සිතා මහ සෙනඟ පිරිවරා ගොසින් එක් රජ්ජුරු කෙණකුන් වසඟ කොට ගෙන ඒ සෙනඟ ත් තමන්ගේ සෙනඟ ත් හැර ගෙන ගොසින් අනික් කෙණකුනැ'යි සියලු රජදරුවන් ම වසඟ කොට ගෙන අග මෙහෙසුන් බිසෝවරුනු ත් හැර ගෙන

Non-Commercial Distribution

හැම රජුන්ට බාල උග්ගසේන රජ්ජුරුවන්ගේ අගමෙහෙසුන් දින්නා නම් බිසවුන් දූරි ඇති හෙයින් උන් රඳවා පියා අවුත් මෙ තෙක් දෙනා විෂ පොවා මරම්'යි ගස මුල පවිත්‍ර කැරවූ ය.

දේවතාවාණෝ සිතන්නෝ 'මේ රජ මෙ තෙක් රජදරුවන් අල්වා ගෙන විෂ පොවා මරන්නේ මට බිලියම් කෙරෙමි සිතා මා නිසා ය. මා ගෙන් ප්‍රයෝගයක් නැති හෙයින් මට පව් නැත ත් මේ රජදරුවන් නටකල දඹදිව රජ පරපුර නස්සි. මා ගේ ගස මුල ත් කුණු වෙයි. මුන්ගේ මේ අකාරි ය මම නවතා ගත නො හෙමි. මට බැරි පසු අනික් සමවායකින් වූව ත් නැවතුව මනා වේ දැ'යි අනික් දෙවතාවකු කරා ගොසින් 'තොපට මේ නව ත්ට පිළිවන් දැ'යි විචාරා උනු ත් තමන්ට බැරි ය යි කී කල්හි අනික් දේවතා කෙණකුන්, අනික් දේවතා කෙණකුනැ යි සියලු මේ සක්වළ දෙවියන් කරා ගොසින් උන් හැම ත් බැරි ය යි කී කල්හි සතරවරමුන් කරා ගියෝ ය. අපට ත් මේ නවතා ලන්ට බැරි ය. සක් දෙවිඳු තෙමේ නුවණ පින් දෙකින් ම අපට වැඩි සිටිනේ ය. ඔබ කියව'යි කිවු ය.

ඒ දේවතාවා ශක්‍රයන් කරා ගොසින් එ පවත් කියා 'ඉදින් මුඹ වහන්සේ උපෙක්ෂා වූ සේක් නම් රජ මහ වංස නස්සී. උන්ට පිහිට වුව මැනැවැ'යි කිවු ය. ඒ අසා සක් දෙවිඳු 'මම ත් ඒ නව තාලිය නො හෙමි. තොපට උපදෙසක් කියා ලමි. තොපි ගොසින් රජ්ජුරුවන් බල බලා සිටිය දී ම රත් පිළියක් හැඳ ගෙන තොපගේ ගසින් මැත් ව ලා නික් ම යන ලෙසක් හඟවා ලව. රජ්ජුරුවෝ ද දේවතාවාණෝ යෙති. රඳවම්'යි නො යෙක් ලෙසින් පැරුත්ත ගනිති. තොපි කියන කල 'රජ දරුවන් සියය ත් බිසෝවරුන් සියය ත්, ගෙනවු ත් උන් බොටුවල ලේයෙන් මට බිලියම් කෙරෙමි යැද ලා උග්ගසෙන රජ්ජුරුවන්ගේ බිසොවුන් හැර පියා නැමී අව. තොප සේ වූ බොරු දන්නවුන්ගේ බලි විධාන-යෙන් මට ප්‍රයෝජන නැතැ'යි කියව. එ සේ කී කලට රජ්ජුරුවෝ බිසොවුනු ත් ගෙන්වති. ඒ බිසවු රජ්ජුරුවන්ට බණ කියන්නෝ මෙ තෙක් දෙනාට ත් මට ත් බැරි වුව ත් එ තෙක් දෙනා රැක පියති' කිවු ය. දේවතාවා ත් ශක්‍රයන් කියා ලූ ලෙසම කොට ලී ය.

රජ්ජුරුවෝ ත්, 'මෙ තෙක් දෑ කොට මෙ පමණක් වරද්දන්නේ කිම්දැ'යි බිසොවුනු ත් ගෙන් වූ ය. අවුත් හැමට ම කෙළවර හුන් තමන්ගේ උග්ගසෙන රජ්ජුරුවන් ම වැන්දෝ ය. ප්‍රධාන ව සිටි බරණැස් රජ්ජුරුවෝ තමන් නො වැඳ හැම දෙනාට බාල

Non-Commercial Distribution

තැනැත්තවුන් වන්දෑ යි බිසොවුන්ට මුසුප්පු වූ ය. බිසවු උන් මුසුප්පු නියාව දැක ලා කියන්නෝ 'මුන් වහන්සේ මට ඉසුරු සේක. සම්පතු ත් දුන් සේක. මුන් වහන්සේ නො වැඳ මුඹ කුමට වදිම් දෑ'යි කිවු ය. ගස්හි වසන දේවතාවාණෝ 'කී නියාව යහපත් ම ය'යි කියා ලා මල් මිටක් දමා ලා දත් ගුණයට පූජා කළහ. බරණැස් රජ්ජුරුවෝ එ විට 'මා වන්නාට නො වැන්දව. මේ සා මහත් රාජ්‍ය සම්පතක් මට සාධා දුන් දේවතාවාණන් කුමක් නිසා නො වැන්දු දෑ'යි විචාළෝ ය.

'රජ්ජුරුවෙනි, මුඹගේ රාජ්ජය ලැබීමට නිසි පිණින් රාජ්ජය ලත් බව මුත් දේවතාවාණෝ රාජ්ජය දුන්නෝ දෑ'යි කිවු ය. එයි ත් අසා දේවතාවාණෝ 'කිවු නියා යහපත් ම ය. මා මුන්ට රාජ්ජයක් දෙන්ට සිතුවා ත් නැතැ'යි නැවතු ත් මල් මිටත් දමා පූජා කළහ. නැවත ත් බිසවු රජ්ජුරුවන්ට කියන්නෝ 'මේ රාජ්ජය දේවතාවාණන් ගෙන දුන්නැ'යි කියා වේ ද කියන්නේ. ඒ එ සේ ම ආනුභාව ඇති කල තමන් වසන ගසට උඩු සුළඟ සිටි ගස ගිනි වැද ගෙනදු ගියේ ය. ඒ නිවා ගත නුහුනැ'යි කිවු ය. නැවත ත් දේවතාවාණෝ ඒ එ සේ ම ය යි කියා ලා ආදි සේ ම පූජා කළහ. බිසවු කථා කෙරෙමින් සිට ම ජාති සිහි කරණ නුවණ ත් ඇති ව ගන්නා හඬා ත් පූ ය. සිනාවකු ත් සී පූ ය. 'සෙතො ත් සිනා ම හා හඬතො ත් හඬා ම මුත් එක විට ම සෙන්නෙ ත් හඬන්නෙ ත් වියරුවක් සේ ඇති නියා දෑ'යි විචාළ කල්හි 'රජ්ජුරුවෙනි, වියරු ඇති වුව මැනවුන් හින්දදී අප වැන්නවුන්ට ත් වියරු ඇතිවේ දෑ'යි කිවු ය. එ සේ කල හඬන් ට ත් සිනා සෙන්ට ත් කාරණ කිම දෑ'යි කිවු ය.

'රජ්ජුරුවෙනි, එ සේ වී නම් ඇසුව මැනව. මම යටගිය දවස කුල දූ ව ඉපැද සරණ හිඳ රැකෙන්නෙම් අමුතු කෙණකුන් ගෙට ආවුන් දැක උන්ට අමුතු බතක් දෙනු කැමති ව කෙල්ලක අත අංගාණියට රන් යවා ත් දඩ මසක් නො ලදින් ගෙ පිටි පස් සේ හොත් නො බොහෝ ඇසිල්ලකින් මියන එළියක හිස කපා පියා දඩ මස් ඇති ව බත් දිනිමි. මම එළියගේ හිස කපා අනන්ත කාලයක් නරකයෙහි පැසී තව කර්ම ගෙවන්නට නැති හෙයින් ඇගේ ලොම ගණනින් හිස් කැපීම් ලදිමි. මෙතෙක් දෙනා මරවා ගැළවෙන්නේ කවර කලෙක දෑ'යි මුඹ විදිනා දුක් සලකා හඬා පීමි'යි කිවු ය. හැඩුයේ වන්නා ඒ නිසා ය. සීපූයේ හැයි දෑ'යි විචාළෝ ය. ''කර්ම ගෙවුණු හෙයින් ඒ දුකින් මම මිදිණිමි'යි සමාධි ව සී පීමි'යි කිවු ය. නැවත ද දේවතාවාණෝ ඒ එ සේ ම ය යි කියා ලා මල් මිටක් දමා ලා පූජා කළහ.

Non-Commercial Distribution

රජ්ජුරුවෝ 'අනේ පව් කමක් ඉතා උග්‍ර නියා ය. මූ එක එළියක මරා නරකයෙහි අනන්ත කාලයක් පැසී ශෙෂ ව සිටි විපාකයෙන් ඇඟේ ලොම් ගණනින් හිස් කැපුම් ලද්දු ල. මම මෙ තෙක් දෙනා මරා කවර කලෙක ගැළවෙම් ද'යි සියලු ම රජ දරුවන් හැර පියා වයසින් තමන්ට වැඩි මාලු රජ්ජුරුවන් වැද ලා බාල රජ දරුවන් සිප ගෙන ක්‍ෂමා කරවා ගෙන උන්ගේ නුවර වලට යවූහ.

බුදුහු මේ ජාතක කථාව ගෙන හැර වදරා, 'මහණෙනි, මල්ලිකාවන් තමන්ගේ නුවණින් බොහෝ දෙන ගැළවූයේ දැන් මතු නො වෙයි. ගිය දවස ත් ගැළවූ ය'යි වදරා ලා ජාතක ය නිම වූ සේක. එ කල බරණැස් රජ්ජුරුවෝ නම් දැන් කොසොල් රජ්ජුරුවෝ ය. දින්නා බිසවු මල්ලිකා දේවී ය. රුක් දෙවියා ණෝ මම ම ය'යි කියා එයි ත් වදළ සේක.

එ සේ හෙයින් නුවණැත්තවුන් විසින් තමන්ගේ ප්‍රාණයට විනාශයක් වත ත් ශාක්‍ය රජදරුවන් මෙන් අනුන් ගේ ප්‍රාණයට විනාශ නො සිතීමෙන් පණිවායෙන් දුරු ව ඉන් දුරු වූවා සේ ම අනික් සතරිනු ත් දුරු ව ත්‍රිවිධ සුචරිත ය පුරා නිවන් දහම් පසක් කට යුතු.

## 57. මහා කාශ්‍යප සද්ධිවිහාරික එක නමකගේ වස්තුව

තව ද අදහස් විෂමයන් හා එක් ව විසීමට ත් වඩා තමාගේ අදහස් යහපත් වී නම් තනි ව විසූ ව ත් වරද නැතැ යි හඟවනු පිණිස මහසුප් තෙරුන් වහන්සේ ගේ සද්ධිවිහාරික දෙ නමින් අනුන් කළ දෙය තමා ඇඟ ලා ගෙන වඤ්වා ලෙසින් දවස් යවූ නමකගේ වස්තුව දක්වමු.

ඒ කෙ සේ ද යත්—

මහසුප් තෙරුන් වහන්සේ රජගහා නුවර නිසා පුළිල ලෙණ වසන කලට සද්ධිවිහාරික දෙ නමෙක් අත් පා මෙහෙ කරණ සේක. ඉන් එක් නමෙක් සැදැහැ ඇති ව නො පමා ව වත් පිළිවෙත් කරණ සේක. අනික් නම අනුන් කළ දෙය තමා ඇඟ ලා ගෙන දැවිටි පැන් වත් සපයා ලූ නියාව දැන ලා මහ තෙරුන් වහන්සේ කරා අවුත් 'දැවිටි පැන් සැපයීණ. දැවිටි වළඳා වදාළ යහපතැ'යි කියන දැ ය. පය සෝධන පැන්, නහන පැන් තබා ලූව ත් තමන්දැ තබා ලූවා සේ ම අවුත් කියන දැ ය. අනික් නම සිතන සේක් 'මූ නිතර ම මා කළ දෙය ම තමන් කළා සේ හඟව



Non-Commercial Distribution

ඇවිදිති. එන්නාට ඊට නිස්සක් කෙරෙමි යි' ඒ නම වළඳා ලා නිදි ය දීම නහන පැන් හුණු කොට අනික් වළදෙක වත් කොට ලා නහන කොටුවට පිටි පස්සේ සඟවා තබා ලා පැන් හුණු කරණ සැළ හුණුසුම් නැඟෙන පැන් නැළියක් මනාවක් වත් කොට ලා උදුනේ තබා ලා වැද හුන් සේක.

කෑම් හා නිදීම් මුත් එතක් ම නො කරණ අනික් නම සවස් වෙලාට නිදා නැඟී සිට පැන් සැළින් හුණුසුම් නැඟෙන්නා ම දැක ළඟට ගොසින් බලා පියන්ට වත් නො ව පැන් හුණු කොට නහන කොටුවෙ තුබූ නියා ය යි වහා ම ගොසින් මහ තෙරුන් වහන්සේ වැද ලා 'සවාමීනි, පැන් හුණු කොට ලා නහන කොටුයේ ය. වඩනේ යහපතැ'යි කියා ලා මහ තෙරුන් වහන්සේ ලා කැටි වම නහන කොටුවට එන්හ. මහ තෙරුන් වහන්සේ ත් පැන් නො දැක පැන් කොයි දැ යි විචාළ සේක. නො කළ වත් ම කීමෙන් කරණ නම පැන් පළට ගොසින් සාළුව සැළට බා බලා සිස් නියාව දැන 'සොරුන්ගේ සොර කම් බලව. සිස් සැළ ම උදුනේ තබා පැන් හුණු කරණ ලෙසට හඟවා ලා කොයි ගිය නියා ද? මෙ තෙක් දවසු ත් එ සේ ම හෙයින් පැන් හුණු කළැ යි සිතා කියා පිම්''යි තතනමින් කළය හැර ගෙන මෙහෙ කොට කුසී ව ගිය කළ මීඩියක මෙන් පැන් තොට ට නික්මුණහ. අනික් නම ත් තමන් සඟවා ලා තුබූ තැනින් පැන් ගෙනවු ත් නහන කොටුවෙ තබා ලූ සේක.

මහ තෙරුන් වහන්සේ සිතන සේක් ''මේ බාලයාණෝ පැන් හුණු කොට නහන තැන තබා ලූයේ ය. වඩනේ යහපතැ'යි කියා ලා දැන් කෙඳිරි ගා මින් කළ ය හැර ගෙන පැන් තොටට යෙති. කුමක් දෝ හෝ යි'' දිවසින් බලන සේක් 'මෙ තෙක් කල් මුළුල්-ලෙහි මුන් කළ දෙය තමන් කළා කොට හඟවා ඇවිද්දෝ ය'යි දැන ලා සවස අවුත් හුන් නමට ''හෙම්බා ඇවැත්නි, වහන්දෑට තරම් නම් තමා ම කළ දෙයක් කළා කොට කීම ය. අනුන් කළ දෙය තමා කළ ලෙස කීම නපුර. දැන් තෙපි 'පැන් හුණු කොට තිබූ යේ ය. නහන්ට වඩනේ යහපතැ'යි කියා ලා මා එන්නා ම කළ ය හැර ගෙන නික්මුණව. පැවිදිවරුන් තෙල ලෙස කිරීම නපුරැ''යි අවවාද වදළ සේක. ඒ වහන්සේ ත් 'මහ තෙරුන් වහන්සේ ගේ තරමක් බැලුව මැනව. පැන් පමණකට මට මෙසේ කියන සේකැ'යි මුසුප්පු ව දෙවන දවස් කැටි ව සිඟා ත් නො ගිය දැ ය. මහ තෙරුන් වහන්සේ ත් අනික් නම කැඳවා ගෙන එක් ගමකට සිඟා වැඩි සේක.

Non-Commercial Distribution

කැටි ව නො ගිය නම බතු ත් වුවමනා හෙයින් මහ තෙරුන් වහන්සේ ගේ උපාසක කුලයන් ගේ ගෙට ගොසින් 'සවාමී කොයි දැ'යි විචාළ කල්හි 'ඔබ ඇඟට අපාසු හෙයින් වෙහෙර ම රඳා වැඩ හුන් සේකැ'යි කී දෑ ය. 'වුව මනා කුමක් දැ'යි විචාළවුන්ට 'මෙබඳු බතක් දෙව'යි තමන්දැගේ තරම් කුමක් වුව ත් ඔබගේ තරම් නිසා කී දෑ ය. උයි ත් කී ලෙස ම සපයා දුන්හ. සිතක් මතක් සේ ම කියා ලා කරවා ගත් බත අතුරු මඟදී සිතක් මතක් සේ ම අනුභව කොට ලා විහාරයට ම ගිය දෑ ය.

මහ තෙරුන් වහන්සේ සිඟා වැඩි තැන දී දිග-පළල ඇති සින් පිළියක් ලදින් තමන් වහන්සේ ලා කැටි ව ගිය නමට දෙවා පී සේක. උන් වහන්සේ ත් ඒ කඩින් තමන් වහන්සේට සිවුරක් කොට ගත් සේක. මහ තෙරුන් වහන්සේ දෙවන දවස් තමන් වහන්සේ ගේ උපාසක කුලයට වැඩ 'මුඹ වහන්සේ ලෙඩ ව විහාරයේ ම රඳා වැඩ හුන් නියාව අසා මුබ ආ බාල නම කියාලූ ලෙසට බතක් ඉදි කරවා යවුමෝ වේ ද, ඒ වළඳා ගුණ ඇත් දැ'යි විචාළ කල්හි බැණ නො නැඟී සේක. විහාරයට වැඩ සවස ළඟට අවුත් හුන් නමට 'ඇවැත්නි, තොප ඊයේ මෙ බන්දක් කළා ද? පැවිදි වරුන්ට නම් සිඟා උපන් දෙයක් මුත් විනවා අනුභව කිරීම තරම් නො වේ'යි වදළ සේක.

දුර්ජන නම කිපී පියා මහ තෙරුන් වහන්සේ කෙරෙහි නිෂ්කාරණයේ වෛර බැඳි දෑ ය. 'පෙරාතු දවසෙක පැන් පමණකට මා බොරු කියති කී සේක. අද තමන් වහන්සේගේ උපාසකවරුන් ගෙන් බත් පිඩක් කා පූවාට ඉල්ලා කෑම නො වටී ය යි කියන සේක. ලත් කඩ පොල්ල[1] පමණකුත් කැටි ව ගිය නමට ම දෙවා පී සේක. අනේ මුන් වහන්සේ ගේ තරමක් ය. වන්නාට ඊට නිස් සක් දනිමී'යි දෙ වන දවස් මහ තෙරුන් වහන්සේ ගමට සිඟා යා දී තමන් ද, විහාරයේ ම රඳා සිට දණ්ඩක් හැර ගෙන පැන් වළන් සපා බිඳ පියා මහ තෙරුන් වහන්සේ ගේ පන්සල ගිනි ත් ලා පියා යමක් නො දෑ නම් එය මුගුරෙන් ගසා බිඳ පියා ගොසින් මිය අවීචියේ උපන්හ.

බොහෝ දෙන ත් 'මහසුප් සවාමීන් ගේ නමෙක් අවවාද ඉවසා ගත නො හී පන්සල ගිනි ලා ගෙන ගිය දෑ ය'යි කථා ව ඉපැදවූහ. පසු ව එක් තරා භික්ෂු කෙණකුන් වහන්සේ ත් බුදුන් දක්නට රජගහා නුවරින් නික්ම දෙව්රමට ගොසින් බුදුන් වැඳ ලා සාමීචි කොට ලා කොයි සිට අවුදැ යි විචාරා වදළ කල්හි රජගහා නුවර

1. කඩ මාල්ල—ඇතැම්.

Non-Commercial Distribution

සිට ආ නියාව කී සේක. 'අපගේ පුතණුවන් මහසුප් මහ තෙරුන් වහන්සේට සුව දුක් කිම දැ'යි විචාළ සේක. 'අනික් ලෙඩෙක් දුකෙක් නැත. එක් සද්ධිවිහාරික නමෙක් අවවාද කළ තැන මුසුප්පු ව ලා පන්සල ගිනි ලා ගෙන ගියහ'යි වදාළ සේක. 'හෙම්බා මහණෙනි, උහු අවවාදක්‍ෂම නො වන්නේ දැන් මතු නො වෙයි. පෙර ත් අවවාදක්‍ෂම නො වෙයි. ගිනි ලූයෙ ත් දැන් මතු නො වෙ යි. පෙර ත් කැදලු බිඳ ආ කෙණෙකැ'යි වදරා ගමන් අවුත් විඩාව හුන් නමට පැනක් දෙවන කලක් මෙන් ඉකුත් වත් ගෙන හැර දක්වන සේක්:-

බරණැස බඹදත් නම් රජකු රජ කරණ කල්හි හිමවු පියස එක් පක්ෂියාණ කෙණෙක් කැදල්ලක් ඉදි කොට ගෙන වෙසෙති. එක් දවසක් වැස්සක් වස්නා කල්හි එක් වඳුරෙක් ශීතයෙන් වෙවුල වෙවුලා කැදල්ල කරා ගියේ ය. පක්ෂියාණෝ ද ඔහු දැක-

"මනුස්සස්සේව තෙ සීසං-හත්‍ථපාදා ච වානර,
අථ කෙන නු වණ්ණෙන-අගාරං තෙ න විජ්ජති"

යනු හෙයින් 'වඳුරාණෙනි, තොපගේ හිස ත් අත් පතු ත් මිනිසුන් සේ ම ය. එසේ වූ තොපට අපගේ පවා ගෙවල් ඇති කල ගෙවල් නැත්තේ හැ යි දැ'යි විචාළෝ ය. වඳුරාණෝ ඒ අසා—

"මනුස්සස්සෙව මෙ සීසං-හත්‍ථපාදා ච සිඞගිල,
යාහු සෙට්ඨා මනුස්සෙසු-සා මෙ පඤ්ඤා න විජ්ජති".

යනු හෙයින් මාගේ හිස ත් අත් පතු ත් මිනිසුන් සේ ම බව නියත ය. මිනිසුන්ට යම් නුවණෙක් ඇත්නම් ඒ නුවණ මට නැත. ගෙවල් නමුත් නුවණින් කළ මනා දෙයක් බැවින් මට ගෙවල් නැතැ'යි කිවු ය. ඒ අසා ඔහට බණන පක්ෂියාණෝ-

"අනවට්ඨිතචිත්තස්ස-ලහුචිත්තස්ස දුහිනො,
නිච්චං අද්ධුවසීලස්ස-සුඛභාවො න විජ්ජති".

යනු හෙයින් 'මඬෙහි ඇණි හිරටයක් සේ ලඝු සිත් ඇති, සුළං දැඩි තැනෙක තුබූ දෙයක් මෙන් වහා පෙරළෙන සුලු වූ, තොප සේ වූවන්ට සැප කොයින් ද? තමා සිතා ගෙන කරන්ට නුවණ නැතත් අනුන් කළා බලා ත් කට නො හැකි ද? සුව සේ හිඳිනා ලෙසට මා කළා සේ ගෙයක් කොට ගනුව'යි පක්ෂියාණෝ කීහ. වඳුරු තෙමේ අවවාද ලෙස කියා ලූ වා ඉවසා ගත නො හී 'දැන් සුව සේ වසන ලෙසක් කෙරෙමි'යි කැදල්ල බිඳී ය. පක්ෂියාණෝ ත් එක්

Non-Commercial Distribution

කන්නෙකින් පලා ගියහ. එ වක වඳුරු නම් මෙ වක පන්සල ගිනි ලූ තැනැත්තෝ ය. පක්ෂියාණෝ නම් මහසුප් මහ තෙරහු ය'යි ජාතක ය නිමවා ලා 'හෙම්බල මහණ, කාශ්‍යපයන් වැන්නවුන් මෙ සේ වූවන් හා එක් ව විසීමට ත් වඩා තනි ව විසීම යහපත.

'ශීලාදී ගුණෙන් තමාට වඩනා කෙණකුන් වේව'යි සරි කෙණකුන් වේව'යි ලද නො හැකි වී නම් වඩනා කෙණකුන් සම්භ ව නො වීමෙන් ශීලාදි ගුණෙන් වඩනට නැති හෙයිනු ත් සරි කෙණකුන් සම්භ ව නො වීමෙන් ලද ගුණෙන් නො පිරිහෙන්ට නැති හෙයිනු ත් එ සේ ඒ දෙ පක්‍ෂයෙන් එක පක්‍ෂයකු ත් සම්භ ව නො වතො ත් තමාට නො එක් ලෙසින් අඩු තරමුන් හා එක් ව විසීමට ත් වඩා වැඩියුරු ගුණ ලබන්ට වැඩියුරු තැනක් ලබන තෙක් ලද ගුණ පමණක් පවත්වා ගන්ට සරි කෙණකුන් ලබන තෙක් තනි ව වුව ත් සිත තර කොට ගෙන විසීම යහපත. ..ාලයන් හා එක් ව විසීම කවර ලෙසිනු ත් නපුරු'යි වදාළ සේක. මෙ දෙශනා කෙළවර ආගන්තුක ව ගිය භික්ෂූන් වහන්සේ සෝවාන් වූ සේක. සෙසු ත් බොහෝ දෙන නිවන් දුටහ.

එ සේ හෙයින් නුවණැත්තවුන් විසින් ගුණින් නුවණින් වඩනා කෙණකුන් හෝ සරි කෙණකුන් හෝ අත් නො හැර වැඩි තරමුන්ගේ වසයෙන් ලද ගුණෙන් නො පිරිහී පිළිවෙත් පුරා නිවන් පුරයට පැමිණිය යුතු.

## 58. ආනන්ද සිටාණන් ගේ වස්තුව

තව ද කෙ තෙක් සම්පත් ඇත ත් ඒ සම්පත සාර ය හැර ගත නො හෙන්නවුන්ට ඒ සම්පත්තින් මෙ ලොව කෙ සේ වුව ත් පාරලෞකික ප්‍රයොජන නැති නියා ව දක්වන්ට ආනන්ද සිටාණන් ගේ වස්තුව කියමු.

කෙ සේ ද යත්—

සැවැත් නුවර අසූ කෙළක් පමණ වස්තුව ඇති වීමෙන් මහා සම්පත් ඇති ඊට වැඩියුරු තරම් මසුරු සිතු ත් ඇති ආනන්ද නම් සිටාණ කෙණෙක් ඇත. උ තුමූ දෙ පෝයෙන් දෙ පෝයට නෑයන් රැස් කරවා ලා මූල ශ්‍රී නම් වූ පුතණුවන්ට මාලු කම කියන කළ 'මේ අසූ කෙළක් වස්තු ව බොහෝව යි නො සිත ව. ඇති ව තුබූ වස්තු ව කිසි ලෙසකිනු ත් වියදම් නො කර ව. වඩ වඩාලා ත් උපයා රැස් කරව. දවස දවස එක මස්සක් වුව ත් වියදම් කරතො ත් නො බෝ කලෙකින් ම ගෙවී යෙයි. එ හෙයින්

Non-Commercial Distribution

අඳුන් පුරා ලා තුබූ කරඬුවේ දවස් පතා අඳුන් ගානා කලට අඳුන් නිමන නියා ව දැක වස්තුව වියදම් කරන්නට ත් නො සිතා තුඩු කුඩා වුව ත් නො මැළි වීමෙන් වෙයන් බැඳ නහන තුඹසේ මහත දැක උපයා රැස් කිරීමෙහි නො මැළි වන්ට සිතා මී මැස්සන් මල් රොන් ආදීන් මී බැඳ ගන්නා ලෙස බලා උපයා ගන්නා උපදෙසු ත් දැන සම්පත් ඇති කෙරෙති'යි තුන් වේලේ ම කියති.

අනුන්ට උපදෙස් කියා ගිය පමණක් මුත් තමන්ට උප දෙසක් ම නො දත් හෙයින් තමන් ගේ මහා නිධාන පමණකු ත් මසුරු සිත් බලවත් හෙයින් පුතණුවන් පමණකට ත් කියා ගත නො හී කුණු මසුරු සිතින් ඉතා කුණාටු ව මිය ගොසින්—එ ම නුවර වාසලක් ගාවා එක් ගමෙක සැඩොල් කුල දහසක් වෙසෙති—ඉන් එක සැඩොල් කෙල්ලක බඩ පිළිසිඳ ගත්හ. කොසොල් රජ්ජුරුවෝ උන් මළ නියා ව අසා මූලශ්‍රී නම් පුතණු වන් ගෙන්වා ලා සිටු තනතුරු උන්ට දුන්හ.

ඒ සැඩොල් කුල දහස ත් එක් ව බැළ මෙහෙ කරන්නාහු උං පිළිසිඳ ගත් තැන් පටන් බැළ තබා බත් පිඩක් පමණ ත් නො ලැබෙති. ඔහු 'අපට මෙ තෙක් කල් මෙ සේ නැති ව දැන් මෙ සේ වන්ට කාරණ කිම් ද? අප අතුරේ කාලකණ්ණි කෙණකුන් ඇති නියා ය'යි දෙ භාගයක් ව උන්ගේ දෙ මවුපියන් පමණක් වෙන් වන තුරු දෙ භාග වූහ. දෙභාග වීමෙන් උන් තේරී ගියේ කෙ සේ ද යත්—ආදී දෙ භාග වූ ගමනේ ම යම් භාගයකට නො පැදේ නම් උයි ත් දෙ භාග වූහ. ඉනු ත් යම් භාගයකට නො පැදේ නම් උයි ත් දෙ භාග වූහ යි මේ ලෙසින් උන්ගේ දෙ මවු පියෝ තේරී ගියහ. උන් තේරී ගිය කළ කාලකණ්ණියා ත් උන් කෙරෙහි නියා ව දැන උන් දෙන්නා තමන් ගෙන් පිට ත් කළහ.

දරුවන් කුස වසන තෙක් එක් දවසෙක යපෙන පමණක් නො ලදින් දුක සේ වැදූ ව. උපන් කුමරහුගේ අත පය කන් නාසා ඇස මුහුණ විකාර ලෙස මුත් පනතක් ව නො තුබුනේ ය. රූපත් වන පිණක් ම නො කළ හෙයින් විරූප ව පාංශුපිශාචයක්හු මෙන් අප්‍රිය වූයේ ය. එ සේ වුව ත් වදපු දරුවන්ට ප්‍රෙමය බලවත් හෙයින් මැණියෝ දමා පියා නො යෙති. මූ කැඳවා ගෙන ගිය දවස් කිසිවකු ත් නොලැබ ගෙයි රඳවා ලා ගිය දවස් බැළ මෙහෙ ලැබෙති. ඉක් බිත්තෙන් උං සිහා ගෙන කන්ට බල ඇති ව ගත් කල දී ලන්ට තැටි පත් නැති හෙයින් කබලක් අතට දී ලා

Non-Commercial Distribution

'පුත, තොප නිසා මහත් දුකට පැමිණියම්හ. ඉතිකින් තොප රැකලන්ට නොපිළිවන. හෙම්බා, මේ නුවර සිඟන්නන් පුලන් නන්ට තබා දෙන බත් ඇත. සිඟා ගෙන කව'යි කියා හැරපූ ය.

උයි ත් ගෙයක් පාසා සිඟා ඇවිදිනෝ ආනන්ද නම් සිටු කල උපන් වැඩී ස්ථානයට ගොසින් ජාති සිහි කරණ නුවණ ඇති ව තමන්ගේ ගෙට ගියහ. වාසල් තුනෙක කවුරු ත් සලකා ගත නුහුණු වූ ය. සතර වන වාසල දී මූල ශ්‍රී සිටාණන්ගේ දරුවෝ දැක නො දුටුවිරූ ලෙසක් හෙයින් හඩන්ට වන්හ. සිටාණන් ගේ මිනිස්සු මර මරා නෙරනාහු කසළ ගොඩ ලා පූහ.

බුදුහු අනඳ මහ තෙරුන් වහන්සේ කැඳවා ගෙන සිඟා වඩනා සේක් තෙරුන් වහන්සේ බණවා ලා මූලශ්‍රීන් කැඳවා වදාළ සේක. ඒ අමුත්ත දක්නා නිසා බොහෝ දෙන ත් රැස් වූහ. බුදුහු මූල ශ්‍රීන් බණවා ලා 'තුලුන් හඳුනා දැ'යි වදාළ සේක. නො දනිම්'යි කී කල්හි 'තොපගේ පියාණෝ ආනන්ද සිටාණෝ ය'යි වදරා ලා ධර්ම ස්වරූපය නො දන නො හඳුනන හෙයින් 'ආනන්ද සිටාණෙනි, තොපගේ පුතණුවන්ට මහා නිධාන පස කියව'යි කියවා ලා දෙ වන ජාතියේ පිය නියා ව සිතට නංවා ලූ සේක. මූලශ්‍රී ත් ඒ ජාතියෙහි නිවන් දක්නට හේතුවක් නැති හෙයින් දෝ නො හොත් නුවණ, ලා හෙයින් සරණ සීලයෙහි පිහිටියහ.

පැමිණි පර්ෂදට බුදුහු බණ වදරණ සේක් 'නුවණ නැති සත්හු දරු පෙමින් හා වස්තු ලොභයෙන් 'අපගේ දරුවෝ ඇත. අපගේ සම්පත් ඇතැ'යි ඇවිද මහිමයෙන් මෙ සේ ත් පෙළෙති. දරු වෝ ත් නටවු ය. නස්මින් සිටියෝ ය. ඉදිරියෙ ත් නසිති'යි 'වස්තුව ත් එ සේ ම ය'යි මෙ ලෙසිනු ත් පෙළෙති. නැවත ද දරු මල්ලන් රැකගනුම්හ'යි, සම්පත් උපදවම්හ'යි රෑ ත් දවලු ත් නො එක් දුක් ගෙන ත් පෙළෙති. පෙළෙන පමණක් මුත් මියනට හැඳ වැදහොත් කලට මරණ දුක් ඇති ව ලා නහර බාන් සිඳී ඇට සන්ධි ගැළවෙන කලට-පියා ලූ ඇසට පරලොව ත් දල්වා ලූ ඇසට මෙ ලොව ත් පෙනෙන වේලෙහි දවස තුන් විටක් නාවා තුන් විටක් වුව ත් වඩා වුව ත් කවා සුවඳ මල් ආදියෙන් සරහා කෙ සේ පිරිමැසුව ත් තමාට තෙමේ ත් සහාය ව ගත නොහෙන හෙයින් නැත.

ආනන්ද සිටුහු කිසි කෙණකුන්ට කිසිවක් නො දී දරුවන්ට ය යි වස්තුව රැස් කොට ඒ ජාතියෙහි මියයන්ට වැදහොත්තා

Non-Commercial Distribution

හට ත් දුන් මේ සා මහත් දුකකට පැමිණියා හට ත් යම් සේ දරුවෝ ත් නැත් ද, වස්තුව ත් නැත් ද, එ සේ ම තමාට පිහිටක් කොට ගෙන යතොත් දරුවන් කුම් වුව ත් වස්තුව ඇති හෙයින් එ සේ පිහිට නො කළවුන්ට දරුවෝ ත් කොයි දැ'යි වදාළ සේක. මේ දෙශනා කෙළවර සුවාසූ දහසක් දෙනා නිවන් දැක දරුවන් නිසා ත් සම්පත් නිසා ත් ඇලුම් හළවු ය. එ හෙයින් මේ දෙශනා වත් බොහෝ දෙනාට සප්‍රයොජන වි ය.

නුවණැත්තවුන් සම්පතට ත් ජීවිතයට ත් වඩා පිණෙහි මමායන ය ඇති ව කරණ දෙය ත්, කියන දෙය ත්, සිතන දෙය ත්, පින් වීෂයෙහි ම යොදා සිත් සතන් පිරිසුදු කොට ගෙන ලොවී ලොවුතුරා සැප ත් සිද්ධ කට යුතු.

---

## 59. ගණ්ඨිභෙදක චෞර වස්තුව

තව ද ප්‍රපාතාසන්න එක් පියවර මඟ ගමනක් මෙන් ද, අත් වැල් නැති පෙතැලි නො ව වට ව තිබෙන කුඩා හෙයක ගමන් මෙන් ද, වික්ෂෙප රහිත ව බණ ඇසීමෙහි යහපත ද, අසන්නට හුන් වේලෙහි පටන් අසන බණෙහි සිතිවිල්ලක් නැති ව නො එක් සිතිවිලි සිත සිතා බණ ඇසීමෙහි නපුර ද දක්වනු පිණිස ගණ්ඨි භෙදක චෞර වස්තුව දක්වමු.

හේ කෙසේ ද යත්—

සැවත් නුවර වසන සොරු දෙදෙණෙක් බණ අසන්ට යන්නවුන් හා සමග දෙව්රමට ගොසින් එක් කෙණෙක් ජීවත් වනු නිසා සොරකම් කරණ පමණක් මුත් අදහස ඉතා නපුරු නො වන හෙයින් ඉඳුරා බණ ඇසූහ. අනික් තැනැත්තෝ බණ අසන්ට ආවවුන්ගෙන් සොරා හැරගන්ට නිස්සක් ම විමසා බණක් අසා ගත නුහුණ වූ ය. ඉන් ඉඳුරා බණ ඇසූ තැනැත්තෝ නිසොර ව සෝවාන් වූහ. අනික් තැනැත්තෝ රුවන් සොයා ගොසින් කිරි චාණා ලද්දසේ, වී සොයා ගොසින් දඩසෙයියා ලද්දසේ, එක්කෙණකුන් හිණ ගැට ගසා ලා තුබූ රත්රන් ඇ අකක් ලද්දහ. ඉන් උන් ගේ ගෙයි බතට නිලයෙක් දවස් ගණනකට වුව ත් පෙණිනා. සෝවාන් වූ තැනැත්තවුන් ලැබගත් නිවන් රුවන වික්ක හැක්ක ක් නො වන හෙයින් උන්ගේ ගෙයි බතකට නිලයෙක් නොවීය. උන් තමන්ගේ ඇඹෙණියන් තොප ඉතා නුවණ නැති හෙයින් හුළු කැන් පමණකට ත් ගෙයි විදි කිදි නැත. අනික් තැනැත්තවුන්

Non-Commercial Distribution

නුවණැති හෙයින් උන්ට බතින් අඩුවෙක් නො වී ය'යි කියා වෙහෙසූ කල්හි සෝවාන් තැනැත්තෝ දෙව්රමට ගොසින් එ පවත බුදුන්ට දන්වූහ.

බුදුහු බණ වදරණ සේක් "යම් කෙණෙක් තමන් නුවණ නැති නියා ව එක් වන් සලකත් ද එ පමණකු ත් සැලකීම නිසා ත් නුවණැත්තවුන් කරා එළඹ උන් හා කථා කිරීම ආදි උපදෙසිනු ත් පසු ව පණ්ඩිත හෝ පණ්ඩිත සමාන හෝ වෙති. යම් කෙණෙක් මීවින්නන්ට නගුටු නැත්තා සේ, සාවුන්ට අං නැත්තා සේ, තමන් නුවණ නැත ත්, ගුණ නැත ත් 'නුවණින් ගුණෙන් අප හා සරි අනික් කවුරු දැ'යි ආත්ම ගර්‍වයක් කොට ගෙන සඤ්ජය පරිව්‍රාජකයන් බුදුන් කරා යන්ට මැළි වූවා සේ, නුවණැත්ත වුන් කරා නො ගොසින් නුවණ වඩනා ලෙසක් නො කෙරෙත් නම් කළුවර දෙ පෝයේ සඳ පරිද්දෙන් ගුණෙන් නුවණින් අඩු වෙති"යි වදාළ සේක. මේ දෙශනා කෙළවර ත් ආදි බත් කා බඩ පිරුණවුන් තමන් රිසි නැති හෙයින් නො කත ත් බඩ සාය ඇත්තවුන් කන බතක් සේ ආදි නිවන් නුදුටු බොහෝ දෙන නිවන් දුටහ.

එ සේ හෙයින් සත්පුරුෂයන් විසින් අවික්ෂිප්ත ව බණ ඇසීම සොරුන්ට පවා යහපත් වන හෙයින් යහපත් නියා ව සලකා සකසා බණ ත් අසා සෙසු ත් පින්කම හැසිර නිවන ත් අත් පත් කට යුතු.

## 60. ලාළුදායි තෙරුන් වහන්සේ ගේ වස්තුව

තව ද නුවණ නැත්තවුන් ගේ සියලු ලෙසින් අඩු ව අභවනු පිණිස ලාළුදායි තෙරුන් වහන්සේ ගේ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්—

රට හුන්නාට සසුන් වැද මහණ වූ පමණක් විනා දත මනා දෙයින් කිසිවකු ත් නො දන්නා ඒ ලාළුදායි තෙරුන් වහන්සේ එක් දවසක් මහ තෙරුන් වහන්සේ රැස් ව හිඳ ලා වැඩ පී කල්හි ධර්‍ම සබයට ගොසින් දන්මක් හඟවමී සිතා නො දන් ම හඟවන්ට බණ හස්නෙහි හුන් සේක. එ සේ හුන් කලට අමුතුව ලා ආ හෙයින් තරම් පදම් නො දන්නා වහන්දෑ පෙනුම් මහත් ව බණ හස්නෙහි හුන්නා දැක නුවණිනු ත් පෙනුම් වනැ යි සිතා සූත්‍ර හා විනය ත් නො දන්නා තෙරුන් වහන්සේ ගෙන් විදම් විචාරා හර නැති ගස් කපා ගෙන ගොසින් හර නැති නියා ව

Non-Commercial Distribution

දුටුවා සේ නුවණ හරක් නැති නියා ව විචාළ දෙය කියා ලිය නුහුණු හෙයින් ම දන 'බුදුන් හා එක් ව හිඳ ත් මෙ පමණක් දන්ට නැතැ'යි දෙඩා ගෙන ගොසින් බුදුන්ට එ පවත් දන්වූ සේක.

බුදුහු ඒ මුල් කොට ගෙන බණ වදරන සේක් ''නුවණ නැති කෙණෙක් දිවි හිමියෙනු ත් නුවණැත්තවුන් කරා එළඹ උන් කෙරේ වැස මේ බුදු වදනැ'යි කියා වෙව යි 'බුදු වදන් නම් මෙ තෙකැ'යි කියා වෙව යි පයර්‍ය්‍යාප්ති ධර්‍මය ත් නො දනිත් ද, ඒ නො දන්මෙන් ම සූත්‍ර-ප්‍රතිපත්ති දෙක ත් නො දනිත් ද, පිළිවෙත් නො දන්මෙන් මං නො දන්නවුන් ගමන් නො දන්නා සේ පිළිවෙතින් ලද මනා නිවනු ත් නො දනිති. කුමක් මෙන් ද යත්: කෙ තෙක් දවසු ත් බත් මාළු පෙරළූ සැන්ද බත් මාළුවේ රස නො දන්නා මෙනි. යම් සේ සැන්ද කෙ තෙක් දවස් බත් පැන ගැවී තමා කෙටි වන තෙක් 'මේ මාළුවේ ලුණු ඇත, ලුණු නැත, මී ඇඹුල් දැඩි ය, මී ඇඹුල් මොළක, මේ මාළුව තිත්ත රස ය, මේ මාළුව කට ද යි, මේ මාළුවේ දුවීම නපුර, දුන යහපතැ'යි යනාදී ය නො දනී ද එ මෙන් නුවණ නැත්තෝ කෙ තෙක් දවස් නුවණැත්තවුන් හා එක් ව ගැවුණ ත් දත මනා දෙයින් කුමකු ත් නො දනිති''යි වදළ සේක. දෙශනා කෙළවර අමුතු ව ගිය වහන්දෑ පරණ ව තුබූ සක්ලෙශි කම හැර වදරා නික්ලෙශි ව රහත් වූ සේක.

එ සේ හෙයින් නුවණැත්තවුන් විසින් ඇති නුවණ ම රැක නො හිඳ නුවණැත්තවුන් කරා ගොසින් අඩු වැඩි විචාරා දන ගෙන මනා පිළිවෙත හැසිර ගස් කොළ ලා ලා ඊ ප්‍රයොජන විඳිනා සේ ප්‍රතිපත්තියෙන් ලද මනා අනුසස් ලැබිය යුතු.

## 61. භද්‍ද වග්ගිය තෙරුන් වහන්සේ ගේ වස්තුව

තව ද නුවණැත්තවුන්ට ධර්‍ම ප්‍රතිවෙධය නිරායාස නියා ව හඟවනු පිණිස භද්‍දවග්ගිය තෙරුන් වහන්සේ ගේ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්—

භද්‍දවග්ගිය රජ කුමරුවන් තිස් දෙනා-නොසෙවුව මනා දෙය සොයා ඇවිදිනවුන්ට සෙවිය යුතු නව ලොවුතුරා දහම් සොයනු පිණිස බණ වදළ සේක. ඒ බණ අසා හැම දෙනාට වැඩී මාලු තැනැත්තෝ අනගැමි ව හැමට බාල තැනැත්තෝ සෝවාන් ව තිස් දෙනා ගෙන් රහත් කෙණකු ත් පුහුදුන් කෙණකු ත් නැතිව මෙ සේ එව, මහණෙනි' වදළ බස් පමණින් ම ඍර්ධීන් උපන්

Non-Commercial Distribution

පා සිවුරු ධරා මහණ මහලු පැවිදි ව තෙළෙස් ධුතඟ සමාදන් ව වසන සේක් කල් යැමෙකින් බුදුන් කරා එළඹ අනමතග්ග සූත්‍ර ය අසා අක් මුල් ඇති සසරෙහි තමන් වහන්සේට අක් ඇති ව රහත් වූ සේක.

සෙසු වහන් දැ ද 'සමහර කෙණකුන් රහත් වන්ට දවස් ගණන් මාස් ගණන්, හවුරුදු ගණන් දුක් ගන්නා තරමට ත් මේ තිස් නම රහත් වූ නියාව උදවු ය'යි කථාව ඉපැදවූ සේක. බුදුහු ඒ අසා 'මහණෙනි, මුන් උදවු වූයේ මෙ වක මතු නො වෙයි. යටගිය දවස ත් මූ තිස් දෙන ධූර්ත ව රා බී ඇවිදිනෝ තුණ්ඩිල ජාතකයෙහි දී මා හුරු ව හුරු තුඩින් කියා ලූ බණ අසා පැයක් විතරට ත් කල් නො යවා පන් සිල් සමාදන් ව රක්ෂා කරණ පන් සිල් කල් යවා සැට දහසක් හවුරුදු රැක එ ම හේතුවෙන් දූත් පලඟ නූගුළුවා හුන් හස්නෙහි ම හිඳ එ කල රා බීම හළුවා සේ ම දූන් සව් කෙලෙසුන් හැර රහත් වූහ'යි වදරා බණ වදරන සේක් 'කළ පින් ලෙසට නුවණැත්තෝ හැසිල්ලෙක ත් නුවණැත්තන් කරා ගොසින් පාලි ඉගෙන අර්ථ විචාරා පයර්‍යාප්ති යෙහි නියම දූන උන් ගෙන් කමටහනු ත් කියවා ගෙන, පිළිවෙත් පුරා යම් සේ ජිහ්වාප්‍රසාද ය නො නට කෙණෙක් රස ය දන්නා පිණිස ඒ අනුභව කට යුත්ත දිවග තබා ලා ලුණු ඇඹුල් ආදිය දනි ත් ද, කල් නො යවත් ද, එ මෙන් නුවණැත්තෝ සදහම් නමැති අමාව සිත් නමැති තුඩ තබා ලා ම නිවන් රස ය දූන ගනිති'යි වදළ සේක. මේ දෙශනා කෙළවර ත් බොහෝ දෙන රහත් වූහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් ඇති නුවණ දියුණා යම් සේ මඩ බොර නැති ව වැලි බොරලු ඇති තන්හි උනා ඇති වූ පැන් සවභාවයෙන් පිරිසුදු ද, එ සේ ම සවභාවයෙන් පිරිසුදු අදහස ආගන්තුකොපක්ලේශයෙන් නො කළඹා, නැවත යම් සේ ඒ පැන් හුණු වූ විටෙක මුත් සවභාවයෙන් ම සිහිල් ද එ මෙන් කොධූපනාහාදි අවු ගිනි දෙකින් හුනු නො කොට අදහස සිහිල් ලෙස ම තබවා ලා සියල්ලවුන් කෙරෙහි කරුණා ඇති ව, තව ද යම් සේ පැනින් අපවිත්‍රයක් පවිත්‍ර කොට ලා ද එ මෙන් නපුරු තරම් ඇත්තවුන්ට ත් අවවාද කියා තරම් යහපත් කරවා, තව ද යම් සේ ඒ පැන් බී පියන්ට නා පියන්ට බොහෝ දෙනා විසින් ආල ය කට යුතු ද එ පරිද්දෙන් තමාගේ යහපත් තරමින් බොහෝ දෙනා විසින් ප්‍රාර්ථනීය ව, තව ද යම් සේ පැන්

Non-Commercial Distribution

කවුරුන්ට ත් වැඩ කරු ද එ මෙන් සියල්ලවුන්ට ම ප්‍රයෝජන වත් ව කුසල්හි හැසිරීමෙන් ලද අත් බැව සඵල කොට භවක්ෂ යට ම තැත් පිරි ය යුතු.

## 62. සුප්පබුද්ධ කුෂ්ඨ වස්තුව

තව ද අධිගතයන් නම් ප්‍රථම මාර්ගයෙන් ම සංශ ය ලක්‍ෂණ වූ විචිකිත්සාව නසා පී හෙයින් තුනුරුවන්හි විමති නැති නියාව හඟවන්ට **සුප්පබුද්ධ කුෂ්ඨ වස්තුව** දක්වමු.

කෙ සේ ද යත්—

රජගහ නුවර වසන ඇඟ කුෂ්ඨයක් ඇතු ව **සුප්පබුද්ධ** නම් කෙණෙක් ඇඟ කුෂ්ට හෙයින් තමන් පිරිස් මැදට වැද්ද නො දෙන්නා පිරිස් කෙළවර හිඳ බණ අසා සෝවාන් වීමෙන් බණ අසන විට බණ පිරිසට පිටත හුන ත් ආර්‍ය්‍ය ජාතියට ඇතුළ ත් ව තමන් ලත් ගුණ දහම් බුදුන්ට දන්වන්ට පිරිස් ඇතුළට යනු කැමැති වත් වැද ගත නො හී නුවර ඇතුළේ දී බණ වදරා ලා විහාරයට වඩනා ගමන හෙයින් බොහෝ දෙනා බණ අසා බුදුන් වැඳ ගෙන පසු ගමන් කොට ගොසින් ලා හැම දෙනා නැවත පී කල්හි තුමූ විහාරයට නික්මුණාවු ය.

එ වෙලෙහි සක් දෙවිඳු මෙ සුප්පබුද්ධ නම් කුෂ්ටයාණෝ තමන් බුදුන් ගෙන් ලත් ගුණ ය 'මඳක් ලත් කෙණකුන් තමන් ලත් දෙය මඳ නියාව අප ලද්දේ මෙ තෙකැ යි දුන්නවුන්ට පානා සේ බුදුන්ට හඟවනු කැමැත්තෝ ය'යි දැන තමන් අධිගත නො වන හෙයින් විමසා පියම් සිතා අවුත් අහස සිට "සුප්ප-බුද්ධයෙනි, තෙපි මිනිස් දිළිඳාණ කෙණෙක් වූව. මම තොපට බොහෝ වස්තු දෙමි. 'බුදුහු බුදු නො වන සේක. දහම් දහම් නොවෙයි. සඟහු සඟහු නො වෙති. බුදුන්ගෙනු ත් මට කම් නැත. දහමිනු ත් මට ප්‍රයෝජන නැත, සඟුන්ගෙනු ත් මට කම් නැතැ'යි කියව"යි කිවුය.

ඔහු ඒ අසා 'තෙපි කවුරු දැ'යි විචාරා 'මම සක් දෙවිඳු ය'යි කී කල්හි 'දෙව් සැපත් ලබන්ට පින් ඇති පමණක් මුත් නුවණ නැති, ලජ්ජා ත් නැති, සැදැ ත් නැති, ශක්‍රයෙනි, තෙපි මා හා කථා කරන්ට තරමමු ද? තෙපි මා දිළිඳු ය යි දුක් පතැ යි කියව යම් කෙණකුන්ට ශ්‍රද්ධාදී වූ සප්තවිධ ආර්‍ය්‍ය ධන ය ඇත්තේ වී නම් උන් කබලක් හැර ගෙන දෙර දෙර සිඟා කත ත් දිළිඳු

Non-Commercial Distribution

එනා වෙති කියා ත් එ සේ ම ඔවුන්ගේ ජීවත් වීම යහපතැ'යි කියා ත් බුද්ධාදීන් ම වදාළ හෙයින් සත් රුවන් ආදී වූ සත් රුවන් ඇති සක්විත්තනූ ත් වුවමනා වස්තුවෙන් මා හා සරි වී ය නො හෙන හෙයින් ආයඞ ධන සත ම මට ඇති හෙයින් මම දිළිඳු නො වෙමි'යි තමන් අධිගත නියාව ශක්‍රයන්ට හැඟ වූ ය.

ශක්‍රයෝ උන්ගේ කථාව අසා උන් පසු කොට පියා බුදුන් කරා ගොසින් තමන් කී කථා ත් උන් කී කථා ත් බුදුන්ට දැන්වූහ. බුදුහු 'හෙම්බා ශක්‍රයෙනි, තොප වැන්නෝ සියයෙකු ත් දහසෙකු ත් වඩා ත් උන් ලවා එ ලෙසක් කියවා පිය නො හෙති. උන්ගේ මාර්‍ගගත ශ්‍රද්ධාවත් සුනිඛාත සනම්භයක්[1] සේ නිශ්චලය'යි වදාළ සේක.

සුප්පබුද්ධ කුෂ්ඨීහු ත් බුදුන් ළඟට අවුත් රූ නපුරු වුව ත් මිනිසුන් තමන් ද දරුවන් හා ප්‍රිය වූ තෙපුලෙන් කථා කරන්නා සේ බුදුනු ත් සාද සාමීචි කළ කල්හි තමන් සෝවාන් වූ නියාව බුදුන්ට කියා ලා යන්ට නික්මුණුවූ ය. උන් මඳ තැනක් ගිය කලට අලුත වදු පියා සිටි දෙනක් දෝ හෙවත් එ ලෙසින් සිටි යකින්නක් සුප්පබුද්ධ කුෂ්ඨීන් ඇන මරා පිව.

මෙ යකින්න මෙ ලෙසින් ම මැරුයේ මුන් මතු ත් නො වෙයි. මේ එක මුරයෙ ත් නො වෙ යි. මේ යකිනි ඒ ඇසිල්ලෙහි අනාගැමි වූ පුක්කුසාති රජ්ජුරුවනු ත්, රහත් ව ලා මහණ වන්ට සිවුරු සොයා ඇවිදිනා බාහිය නම් වූ දරුචීරිය තෙරුන් වහන්සේ ත්, ඒ ඇසිල්ලෙහි සෝවාන් වූ තඹදාළි නම් සොර මරුවාණනු ත්, මුහු ත් ය යි මුන් සතර දෙනා වෙන වෙන සියක් අත් බැව දෙන් වෙස් මවා ගෙන මැරුව.

මෙ සේ මරන්ට පූර්‍ව වෛර කවරේ ද? යත්-ඔහු සතර පක්‍ෂය යට ගිය දවස සිටු පුත්‍ර ව ඉපැද එක් වේසා දුවක උයනට කැඳවා ගෙන ගොසින් ප්‍රහෙණක ය දී ඈ හා සහවාසය කොට සවස් වේලෙහි දී 'මෙ තැන අප සතර දෙනා මුත් අනික් කවුරු ත් නැත. මැට දුන් මසු දහස ත්, මැ පළන් ආභරණ ත්, මැ මරා පිය හැර ගෙන යම්හ'යි කථා කොළෝ ය. ඔයි ත් ඒ කථාව අසා 'අනේ මූ ලජ්ජා නැත්තෝ ය. මා හා සමඟ සහවාස ය ත් කොට පියා වස්තු ලොභයෙන් මා මරති. මළ ත් මම ත් මුන්ට නිස්සක් කෙරෙමි'යි සිතා ගෙන මරණ වේලෙහි දී 'මම යකිනි ව ඉපැද පියා මුන් මා මැරුවා සේ ම මාත් මුන් මැරි ය හෙමව'යි පැතුව. එ සේ පතා ගත් ම නිසා මෙ ලෙසින් මුන් මැරුව.

---

1. ශූනිකා ස්තම්භයක්.

Non-Commercial Distribution

බොහෝ වහන්දෑ සුප්පබුද්ධ කුෂ්ඨීන් මළ නියා ව බුදුන්ට දන්වා ලා 'ස්වාමීනි, උන් මිය උපන්නේ කොයි ද? උන්ට කුෂ්ඨ ඇති වූයේ ත් කුමක් නිසා දැ'යි විචාළ සේක. බුදුහු ත් සෝවාන් ව උන් තව්තිසා දෙව් ලොව උපන් නියා ව ත් එක් ජාතියෙක තගර ශිඛී නම් පසේ බුදුන් දැක කාරා කෙළ දමා ඒ පවින් බොහෝ කලක් නිරා දුක් විඳ විපාකාවශෙෂයෙන් කුෂ්ඨ ඇති වූ නියා ව ත් වදරා ලා බණ වදරන සේක් 'නුවණ නැති සත්වයෝ තුමූ තමන්ට සතුරන් පරිද්දෙන් යමක් කළ කල මෙ ලෝ පර ලෝ දෙකින්ම වැඩෙක් නැත් නම් එසේ වූ ඉතා තදපද වූ දුක් ඇති පව් කම් කොට ඇවිදිති. කරණ අවස්ථාවෙහි සතුටු සතුටු ව කෙරෙති. නරකාදී වූ සතර අපායට පැමිණි කල මුසුප්පු මුසුප්පු ව හඬ හඬා දුක් විඳිති'යි වදාළ සේක. මේ දෙශනාව අසා ත් බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් ආදියෙහි දී ම පව්කම අනිෂ්ට විපාක සලකා විෂ නියා ව දත් කල විෂානුභවයට මැළි වන්නා සේ පව් කිරීමට මැළි ව සියලු ලෙසින් පින්කම හැසිර සසර මුහුදු ගෙවා නිවන් පර තෙරට පැමිණිය යුතු.

## 63. එක්තරා කර්‍මිකයක්හු ගේ වස්තුව

තව ද කවර ලෙසකිනු ත් නපුරු දෙයක් නො කට යුතු නියා ව හඟවන්ට එක් තරා කර්‍මිකයක්හු ගේ වත කියමු.

කෙ සේ ද යත්—

ඒ සී සානා තැනැත්තේ සැවැත් නුවරට නුදුරු තැනෙක එක් කුඹුරක් කසෙයි. පෙරාතු දවස් රෑ සොරු නැසින්නෙන් නුවරට වැද ලා එක් පොහොසත් කෙණකුන් ගේ ගෙට උමඟක් බිඳ පියා බොහෝ රත්රන් ආදි ය හැර ගෙන එම නැසින්නෙන් පිටත් වූහ. ඉන් එක් සොරෙක් සෙසු සොරුන්ට සොරා දහසින් බැඳි පියල්ලක් හිණ තබා ගෙන අර මුන් දෙ වන දවස් සානා කුඹුරට ගොසින් සොර කම් කළ දෙය එක් ව බෙද ගෙන කක්කු වික්කු ව ලා[1] යන ගමන හෙයින් සොරුන්ට සොරාගත් දහසින් බැඳි පියල්ල තබා හිණින් හෙන නියා ව නො දැන ම සොරා නැඟී ගියේ ය.

බුදුහු එ දවස් අළුයම් වේලෙහි ලොව බලන සේක් සෙට දවස් සැවැත් නුවර ළඟ කුඹුරේ සී සානා තැනැත්තවුන් නුවණ දැළට හසුවූ නිසා ව දැන ඕ හට වන්නේ කුමක් දෝ හෝ යි සලකනසේක්

1 තක්කු වික්කුවලා

මේ කෂිකයා උදසන ම සාන්ට යෙයි. වස්තු ඇත්තො ත් සොරුන් විමසන්ට ගියාහු දහසින් බැඳි පියල්ල මූ ලඟ තුබූ වා දැක මොහු අල්වති. මූ සොරකම් නොකළ නියාවට මා විනා අනික් කෙණෙක් දෙස් විය නො හෙති. සෝවාන් වන්ට පිනු ත් ඕ හට ඇතැ'යි දුටු සේක. දැක ලා 'මාත් ඒ කුඹුරට යා යුතු ම'යි සිතා වදළ සේක. සී සානා තැනැත්තෝ උදැසන ම සාන්ට ගියහ. බුදුහු අනඳ මහ තෙරුන් වහන්සේ කැඳවා ගෙන එතැනට වැඩි සේක. කෂිකයාණෝ ත් බුදුන් දැක 'ස්වාමීනි, මේ බන්දෙක් මට වෙයි. එ තැන දී මට සහාය වුව මැනවැ'යි සහාය වන්ට වදනා කලක් මෙන් වැද ලා නැවත ත් සාන්ට පටන් ගත්හ.

බුදුන් උන්ට කුමකු ත් නො වදරා රන් පියල්ල තුබූ තැනට වැඩ ප්‍රසාද චක්ෂුසිනු ත් දැක වදරා අනඳ මහ තෙරුන් වහන්සේට 'ආනන්‍දයෙනි, සර්පයා දුටු දැ'යි වදළ සේක. ඔබත්, ස්වාමීනි, සර්පියා දිටිමි'යි වදළ සේක. ඒ අසා ලා කෂිකයාණෝ මෙ තැන නම් වේලෙ ත් නො වේලෙ ත් මා අවුත් සානා තැන ය. මෙ තැන නයකු ඇති නියා වේ දැ'යි සිතා ලා බුදුන් වැඩපී කල්හි ඒ සර්පයා මරා පිය මි යි කැවිට හැර ගෙන ආ තැනැත්තෝ රන් පියල්ල දැක ලා තමන් නුවණැති හෙයින් 'සර්පයන් පරිද්දෙන් ළං නො විය යුතු හෙයින් මේ සලකා වදළ නියා ය'යි සිතා ගෙන ගොසින් තමා සොර කම් නො දන්නා හෙයින් ඉතා මුවාවෙක ත් නො තබා ළඟ තබා ලා පස් සුහකින් වසා ලා නැවත ත් සාන්ට වන්හ.

මිනිස්සු ත් පාන් ව ගිය කලට උමං බිඳ පියා සොරුන් සොර කම් කළ නියා ව දැක ලුහුබඳවා ගෙන යන්නාහු ඒ කුඹුරට ගොසින් සොරුන් ඒ කුඹුරෙහි දී, වස්තු ව බෙද ගත් නියා ව මඩ ලා තුබූ ලෙසිනු ත් හරනට නිස්සක් හළුවා ත් දැක දැන ගෙන සී සානා තැනැත්තන් එ තැනට ආ පිය ත් දුටුවහ. දැක ලා ඒ හොස්සේ ගොසින් ඉදුරා වසාලන්ට නු වූ හෙයින් පස් ඉවත් කොට ලා පියල්ල ත් හැර ගෙන තෙපි සොරකම් කොට ලා කුඹුරු සා ඇවිදුදැ'යි කියා ලා මරන්ට වන. මරා පියා බැඳ ගෙන ගොසින් රජ්ජුරුවන්ට පැවූ ය. රජ්ජුරුවෝ ද එ පවත් අසා පියල්ලෙන් ම නො නිම ත් තවත් වස්තු ඇති බැවින් විචාරව'යි නො කියා මරා පියව යි විධාන කළහ. මිනිස්සු ත් උන් හැර ගෙන සැමිටි බාලා මර මරා සොරුන් මරණ තැනට ගෙන යන්ට වන්හ.

උයි ත් මර ත් මර ත් අනිකක් නො කියා 'ආනන්‍දයෙනි, සර්ප යා දුටු දැ'යි බුදුන් වදළ බස ත් මහ තෙරුන් වහන්සේ 'එ සේ ය, ස්වාමීනි, සර්පයා දිටිමි'යි වදළ බස ත් කිය කියා යෙති. ගෙන යන

Non-Commercial Distribution

මිනිස්සු ත් 'බුදුන් ගේ හා අනද මහ තෙරුන් වහන්සේ ගේ ත් කථා වක් කියති. ඒ කිම් දැ'යි විචාරා 'රජ්ජුරුවන් වහන්සේ දිටිම් නම් කියමි' කී කල්හි පෙරළා ත් රජ්ජුරුවන් ලඟට ගෙන ගොසින් රජ්ජුරුවන්ට එ පවත් කිවු ය. රජ්ජුරුවෝ ත් කුමක් නිසා කිවුදැ'යි විචාරා තමන් සොර නො වන නියාව ත්, සාන්ට ගිය නියාව ත් බුදුන් ඒ කුඹුරට වැඩ නයෙකැ යි වදළ බසින් නයි මරන්ට ගොසින් දුටු රන් පියල්ල ගෙනවුත් තබා ලූ පමණක් නියාව ත් සියල්ලම කිවූ ය.

රජ්ජුරුවෝ ඒ අසා 'මේ තෙමේ බුදුන් දෙස් කොට පායි. කියන ලෙසින් මුත් ගේ වරදක් කිය නො හැක. මෙයට කළමනා දෙය මම දනිමි'යි ඔහු කැඳවා ගෙන සවස බුදුන් කරා ගොසින් "සවාමීනි, අනද මහ තෙරුන් වහන්සේ කැඳවා ගෙන පෙරවරු මූ සානා තැනට වැඩියේ ඇත්දැ'යි විචාරා 'එ සේ ය, ගියම්හ'යි වදළ කල්හි 'එ තැන දැක වදළේ කුමක් දැ'යි විචාළෝ ය. 'දහසින් බඳ පියල්ලක් දුටුම්හ'යි වදරා 'ඒ දැක වදළේ කුමක් දැ'යි විචාළ කල්හි ඔහු රජ්ජුරුවන්ට කී ලෙස ම වදළ සේක. 'සවාමීනි, මේ තෙමේ දෙස් බවට මුඹ වහන්සේ වැනි තැනක් නො ලද්දේ වී නම් අද මූ ජීවත් වන්ට කොයින් ද? මුඹ වහන්සේ වදළ බස කියා මරණ නො වී ය'යි කිවූ ය. බුදුහු ඒ අසා 'මහරජ, මම ත් විතරක් ම කියා ලා ගියෙමි. ඉදින් මේ තෙමේ මා කියා ලූ බසින් දහසින් බඳ පියල්ල නායකු කොට සිතා ගෙන නො ඇල් වී නමුත් යහපත. ඇල්වුව ත් මේ වන ප්‍රයෝජන ය'යි වදරා 'මොහු කළ සොර කමෙක් නැත. සොරකම් කොළෝ අනික් කෙණෙක් ම ය'යි කියා නො වදරා බණ වදරණ බුදුහු 'සත්වයෝ තුමූ යමක්, කොට පියා 'අනේ අප කෙළේ කිම් දැ'යි පසුතැවුලි වෙත් නම්, කළා වූ අකුශලයෙහි කටුක වූ විපාක ය කඳුළු වැකුණු මුහුණු ඇති ව හඬ හඬා විඳි ත් නම්, මියෙත ත් එ සේ වූ කටුක කටයුත්ත කිරීම නපුරැ'යි වදළ සේක.

මේ දෙශනා කෙළවර කවුරුන් දෝ ගෙන ගිය රන් පියල්ලක් ගෙන ගොස් ළඟ තබා ලූ පමණකට බුදුන් වදළ බස මුත් මැරීමට නියත වූ කර්ෂිකයාණෝ සෝවාන් වූහ. එ වක් පටන් එ සේ තුබූ දෙයකු ත් සොර සිත්හින් ගෙන යන්ට නො නිසි වූහ. එ තැනට පැමිණි බොහෝ වහන්දෑ ත් නිවන් දුටු සේක. කොසොල් රජ්ජුරුවන් මෙතේ බුදුන් සමයෙහි නිවන් දකිනා හෙයින්දෝ කිසි තැනෙක ත් උන්ගේ අධිගමයෙක් නො පෙනෙයි. අසදිස දන ය වැනි දනක් දුන්නවුන්ට මෙතේ බුදුන් සමයෙහි වුව ත් අධිගම නැති වන්ට කාරණ නැත.

Non-Commercial Distribution

එ සේ හෙයින් සත් පුරුෂයන් විසින් දූන් අධිගම බැරිවේ දූ යි නො සිතා මත්තෙහි ලබන අධිගම නිසා ත් ත්‍රිවිධ සුචරිත ය පිරිය යුතු.

# 64. සුමන මාලාකාර වස්තුව

තව ද මල් පූජාවෙහි මැළියවුන් මල් පිදීමෙහි ඇවිටි වන්ට **සුමන මාලාකාර වස්තුව** දක්වමු.

කෙ සේ ද යත්:-

රජගහා නුවර වසන ඒ මාලාකාරයෝ දවස් පතා උදසනම දෑ සමන් මල් අට නැළියක් බිම්සර මහරජුන්ට දී ලා දවස් පතාම මල් නැළියකට මස්සක් බැගින් අට කළඳක් ලැබෙති. ඉක් බිත්තෙන් එක් දවසක් සමන් මල් කරුවන් මල් අට නැළි ය හැර ගෙන රජගෙට යන්ව නුවරට වන් කල්හි බුදුහු භික්ෂු සඞ්ඝයා වහන්සේ පිරිවරා රන් විමනෙක රුවන් ගොනැස්[1] උරවන කලක් මෙන් දස දිග සවනක් රස් විහිදුවමින් තවත් අනන්ත වූ බුද්ධානුභාවයෙන් යුක්ත ව ඇස් ඇත්තවුන්ගේ ඇසට රසාඤ්ජනයක් මෙන් නුවරට සිහා වන් සේක.

බුදුහු සමහර දවසෙක අඟුල්මල් මහ තෙරුන් වහන්සේට පෙර ගමන කොට දෙළොස් ගවුවක් වැඩිය ගමන් සේ ම නො එක් පෑ ඇති රුවන් කඩෙක ලා ලා බදිනා සේ සවනක් රස් සිවුරු හස්සේ ම සහවා ගෙන සිහා වඩනා එක් තරා භික්ෂු කෙණකුන් වහන්සේ මෙන් වඩනා සේක. සමහර දවසෙක කිඹුල් වත් නුවරට වැඩි ගමන සේ ම සවනක් රස් විහිදුවමින් වඩනා සේක. එ දවසු ත් බුදුහු සවනක් රස් විහිදුවමින් රජගහා නුවරට සිහා වන් සේක.

මාලාකාරයෝ ද බුදුන්ගේ දෙ තිසක් විතර මහ පිරිමිනී ලකුණෙන් හා අශීත්‍යානුව්‍යඤ්ජනයෙන් රන් ඇගෑයක් රුවන් ඇගෑයක් වැනි වූ පිණින් ම හඹා පූවාක් වැනි වූ වඩු රියනින් දෙළොස් රියන් උස ඇති බ්‍යාම ප්‍රභා සතර රියන් හා කෙතුමාලා දෙ රියන් හා එක් කොට අටළොස් රියන් පමණ වූ දිව්‍ය ලොකයෙහි නාහා ලූ රුවන් කොරණට අපහාස්‍ය කරන්නා වූ අත් බැව් දූක පහන් සිත් ඇති ව 'මෙ නියා වූ බුදුන්ට කවර නම් සත්කාරයක් කෙරෙම දෝ හෝ'යි සිතා පුද පිය හැකි අනිකක් නුදුටු වන්නා ම 'මෙ මල් පුද කෙරෙමි'යි සිතූ ය. නැවත 'මෙ මල් වැළි ත් විකුණන්ට ඒ මෙ ගෙන යන මල් නො වෙයි. රජ්ජුරුවන්ට දවස් පතා වඩනට ගෙන යන ඒවා ය. රජ්ජුරුවන් වහන්සේ ත් මෙ මල් නො ගෙන ගිය

1. ගෝනැස්

Non-Commercial Distribution

කලට මා සිර ගෙයි හෝ ලවා ලන සේක. මරවණ සේක. නැත් නම් රටින් හෝ නෙරනා සේක. කළ මනා කුමක් දෝ හෝ'යි සිතූහ. එ සේ සිතා ලා නැවත සිතන්නෝ 'රජ්ජුරුවන් වහන්සේ කළ දෙය වැටහෙන හෙයින් මරණ සේක්ව යි, තළන සේක්ව යි, රටින් නෙරපා ලන සේක්ව යි, කුමක් කරත ත් කිම? ඉදින් යමක් දෙවත ත් මෙ ලොව ජීවත් වීම් පමණකට යමක් දෙවා පියන සේක.

'ඉදින් බුදුන්ට මේ මල් සුහිත්ත පුද පිම් නම් ඛණ්ඩ සුමන මහ තෙරුන් වහන්සේ සසර සිටිනා කල එක් පෙත්තක් පණුවන් කෑ තුන් පෙති දෑසමන් මලක් පුද ලා හවුරුදු අසූ කෙළක් දිව සැප ත් වළඳා කෙළවර නිවන් සම්පතත් ලත් හෙයින් මේ දෑසමන් මල් අට නැළියක් හෙයින් නො එක් කප් කෙළ ගණනේ ලොවී සැප ත් සාධා දී ලා කෙළවර ලොවුතුරා සැපත ත් සාධා දී ලන්නේ ය'යි සිතා ''තමන්ගේ ජීවිත ය මළ ත් සාජීක වුව මනා වේ දෑ' යි බුදුන්ට ජීවිත ය පිදූ ය. පුද ලා 'යම් තාක් මා ගේ පහන් සිත පසු නො බසී ද, ඒ තාක් කරන්ට සිතූ පූජා කෙරෙමි'යි සතුටු සිතින් කුල් මත් ව පියා පළමු කොට මල් දෙ මිටක් බුදුන්ගේ ඉස් මුදුන දසාවට දමූ ය. ඒ මල් දෙ මිට මුදුනෙහි හී මල් වියනක් ව සිටියේ ය. තව ත් මල් දෙ මිටක් බුදුන් දසාවට දමූ ය. ඒ මල් දෙමිට දකුණ ත් පස මල් තිරයක් ව සිට ගත. අනිකුත් දෙ මිටක් දමූ ය. ඒ මල් දෙමිට බුදුන්ගේ ත් පිටි පස්සෙහි මල් තිරයක් ව සිටි ය. තවත් මල් දෙ මිටක් දමූ ය. ඒ මල් දෙ මිට වම ත් පස මල් තිරයක් ව සිටියේ ය.

මෙ සේ අට නැළියක් විතර දෑ සමන් මල් අට මිටක් ව ඉස් මුදුනේ ය, දැළයේ ය, පිටි පස්සේ ය' යි සතර දසාවකින් වටා සිටි ය. ඉදිරි දසාවෙනු ත් වඩනට අවසර පමණක් හැර ලා දෙ ඇළ ය දසාවෙන් ආ මල් සැරහී සිට ගත. දෑ සමන් මලෙහි නටු ඇතුළත් ව ලා පෙති පිටතට බලා සැලසිණ. බුදුහු ද සුදු මල් වට සැලසී සිට ගත් හෙයින් සවණක් රශ්ම ත් මල් හස්සෙහි ලා වෛවර්ණ පට කඩ අතර තුර ලා විදි සුදු පට කඩ තිරයක් වට අද්ද ගත් කලක් මෙන් නික්මුණු සේක. සිත් පිත් නැති මල් වුව ත් බුදුන්ගේ බුද්ධානුභාවයෙන් නො බිදී නො විසිරී බුදුන් හා සමහ යෙයි. බුදුන් රඳා සිටි තැන දී සිටිනේ ය.

බුදුන්ගේ ශ්‍රී ශරීරයෙන් සිය රැළි විදුලි ය කලප් දුවන්නා සේ රස් නික්මෙන්ට පටන් ගත. ඉදිරි දසාවෙන් ද, පිටිපස දසාවෙන් ද, දකුණැළ ය දසාවෙන් ද, වම් ඇළය දසාවෙන් ද, ඉස් මුදුන දසා-වෙන් ද නික්මුණා වූ රශ්මි අතුරෙන් එක රශ්මියකු ත් ගිය ගිය අතින් නො ගොස් සියලු රශ්මි ම බුදුන් තුන් වටක් පැදකුණු

Non-Commercial Distribution

කොට ලා නාඹ තල් කඳ සා ව ඉදිරි දසාවෙන් ම දිවෙයි. අසුරන් වන් දිව්‍ය පුර ය මෙන් සියලු නුවර මුළුල්ල ම ඇළලී ගියේ ය.

රජගහ නුවර ද පවුරෙන් ඇතුළත මිනිස්සු නව කෙළෙක, පවුරෙන් පිටත නව කෙළෙකැ යි අටළොස් කෙළක් මිනිසුන් අතුරෙහි එක ද ගෑනු කෙණකු ත් පිරිමි කෙණකු ත් පිළිගත් වන්ට බතක් ගෙනා කෙණෙක් නැත. බොහෝ දෙන ඔල්වර හඬ ගසා ගෙන බුදුන්ට පෙරදැරි ව ලා යෙති. බුදුහු ත් මාලාකාරයන්ගේ ගුණ පළ කරවනු නිසා තුන් ගවුවක් විතර නුවර රාජ වීථියේ ම වඩනා සේක. මාලාකාරයානන්ගේ සකල ශරීරය ත් පස් වනක් ප්‍රීතීන් පිනා ගියේ ය. උෟ මඳ තැනක් ම බුදුන් හා කැටි ව ගොසින් ලා සිරියෙල් කල්කයෙක හැලී ගියාක් මෙන් බුදු රැස් ඇතුළට වැද ලා බුදුන් වැඳ සිස් පෙට්ටිය හැර ගෙන ගෙට ගියෝ ය.

ඇඹෙණියෝ මල් කොයි දෑ යි විචාරා 'බුදුන්ට පුදා පිමි' කී කල්හි 'තෙපි වන්නා පුදව, රජ්ජුරුවන් වහන්සේට කුමක් කරා දැයි කිවු ය. 'රජ්ජුරුවන් වහන්සේ මර ත් කිම ? නෙරූ ත් කිම ? මල් තබා ජීවිතය ත් බුදුන්ට ම පුදා පියා මලු ත් පුදා පිමි. මල් අට නැළි ය අට මිටෙක් වී ය. අටමිට ත් මුදුනට මල් වියනක් ව ඉදිරි දසාවෙන් වඩනට අවසර පමණක් තබා වටින් මල් තිරයකු ත් වී ය. බොහෝ දෙන ත් ඔල්වර හඬ ගසා ගෙන බුදුන් හා කැටි ව ම යෙති. මෙ තැනට යම් අරගලයෙක් ඇසේ නම් ඒ එ තැන ය'යි කිවු ය.

එ බස් අසමින් නුවණ නැත්තා වූ ඔ තොමෝ එ බඳු පෙළ හරෙක පැහැද ගත නො හී ආ වැඩුව මනා මාලාකාරයන්ට බැණ පියා 'රජ දරුවෝ නම් තදයෝ ය. මුරයෙක කිපිය ත් අත් පා කැපීම් ආදි වූ බොහෝ අනර්ථ කෙරෙති. කළ අකාරිය නිසා මට ත් අවැඩක් වේ නමුත් ය'යි තමාගේ දරුවනු ත් කැඳවාගෙන රජ ගෙට ගොසින් රජ්ජුරුවන් දැක මේ කිමදැ යි විචාළ කල්හි 'ස්වාමීනි, අපගේ සමණෝ නුඹ වහන්සේට වඩනට ගෙනෙන මල් බුදුන්ට පුදා පියා සිස් පෙට්ටි ය හැර ගෙන ගෙට ගොසින් මල් කොයි දෑ'යි මා විචාළ තැන බුදුනට පිදූ නියාවක් කිවු ය.

'මම උන්ට දොඩා ගෙන බැණ ගෙණ 'රජදරුවන් වහන්සේ නම් තද සේක. සිතා ගත් කල කවර තරම් අනර්ථයකු ත් කරවා ම නවත ත් මුත් උපකාරී කම් එ මේ දන්ට නැත. තොප කළ දෙයින් මට ත් මුළාවෙක් වේ නමුත් ය'යි උන් අත්හැර නැඟී අයිමි. උන් කළ දෑ යහපත් වත් කිම ? නපුරු වත් කිම ? ඉන් වන දෙයක් උන්ට ම ය. මා ඊ සබඳකම් නැති ව නැඟී ආ

Non-Commercial Distribution

නියාව දනා වදරන බව ය''යි සඳුන් තුබූ තැනින් අමෙද්ධ්‍යයක් දුරු කළා සේ තමා දුරු වූ නියාව කිව.

බිම්සර මහ රජහු ද බුදුන් ආදියෙන් දුටු දවස් ම තමන් සෝවාන් ව අචල ශ්‍රද්ධාවෙහි පිහිටි හෙයින් 'අනේ මේ කෙලී නුවණ නැති එකක. මාලාකාරයාට මේ මුල් ව අනර්‍ථයෙක් වේ නමුත් බුදුන්ට කළ පූජාවෙහි තමා සිත පහදවා ගත මනා තැන කුමක් වේ දෝ හෝ යි සිතාපුව'යි තමන්ට ගෙනෙන මල් පිදූ නියාවට මුසුප්පු වූවා සේ වලා ත් 'තොප කියන්නේ කුමක් ද? මට ගෙනෙන මල් ඒ පිදී දූ'යි විචාළෝ ය. 'එ සේ ය, ස්වාමීනි, කී කල්හි 'උඹ හැර පියා නැඟී ආ බව යහපත. මට ගෙනෙන මල් පිදූවවුට කළ මනා දෙය මම දනිමි'යි කියා ඈ යවා පියා වහා ම බුදුන් කරා ගොසින් වැද ලා බුදුන් හා කැටි ව ම පූජා බල බලා න්ක්මුණුවූ ය.

බුදුහු රජ්ජුරුවන්ගේ ත් චිත්තප්‍රසාද ය දනා රාජ වීථියෙන් වැඩ රජ්ජුරුවන්ගේ රජ ගෙට ම වැඩි සේක. රජ්ජුරුවෝ පාත්‍ර ය හැර ගෙන ලා ඇතුළු රජ ගෙට වඩා ගෙන යන්ට ආරම්භ කළහ. බුදුහු සෙණ්ඩුලුයෙහි ම වැඩ හිඳිනට කැමැති වූ සේක. රජ්ජුරුවෝ ඒ අදහස් දනා මඩුවක් කරව යි විධාන කොට ලා වහා ම මඩුවක් ලැවූහ. බුදුහු ත් භික්ෂු සඞ්ඝයා වහන්සේ හා සමඟ මඩුවෙහි වැඩ හුන් සේක. රජ ගෙය ඇතුළට නො වැඩ එ තැන ම වැඩ හුන්නේ කුමක් නිසාද යි යත හොත්—

'ඉදින් මම ඇතුළු රජ ගෙයි උනිම් නම් බොහෝ දෙන මා දක ගත ත් නො හෙති. මාලාකාරයාගේ ගුණ ත් පහළ නො වෙයි. සෙණ්ඩුලුයෙහි උන් කලට බොහෝ දෙන ත් මා දකිති. මාලාකාරයාගේ ගුණ ත් පහළ වෙයි' කියා ය. ගුණ ඇත්තවුන්ගේ ගුණ බුදුවරුන් වහන්සේ සඟවන්ට මැළි සේක. සෙස්සෝ කියන්ට ත් මැළියෝ ය. මල් පට සතර සතර අත සිට ගත. බොහෝ දෙන ත් බුදුන් පිරිවරා සිට ගත්හ. රජ්ජුරුවෝ බුදු පාමොක් සඞ්ඝයා වහන්සේ වැළඳවූ ය. බුදුහු වළඳා අන්තයෙහි අනුමෙවෙනි වදරා ලා මල් පට පිරිවරා බොහෝ දෙනා හා සමඟ විහාරයට වැඩි සේක.

රජ්ජුරුවෝ ද බුදුන් හා කැටි ව ගොසින් ලා නැවත රජ ගෙට අවු ත් මාලාකාරයන් ගෙන්වා ලා 'මට ගෙනෙන මල් කුමක් සිතා කුමක් කියා බුදුන් ට පිදූද'යි විචාරා තමන් සිතා කළ සැටි ය මුළුල්ල ම කී කල්හි රජ්ජුරුවෝ තෙපි ජාතින් කුමක් වුව ත්

අදහසින් හා තරමින් සවල්ප කෙණෙක් නොවෙ'යි කියා ලා ඇතුන් අට දෙණකු ය, අසුන් අට දෙණකු ය, කොල්ලන් අට දෙණකු ය, කෙල්ලන් අට දෙණකු ය, අට දහසක් පමණ රනැයි කියා මෙයි ත් දෙවා ලා නැවත පළඳනට තරම් ආභරණ ත් දෙවා ලා ආභරණ ලා සැරහුණු ගෑනුන් අට දෙණකු ත් දෙවා ලා යහපත් ගම්වර අටකු ත් දුන්හ. පිදූ මලු ත් අට මිටෙක. එ ම ජාතියෙහි ලද්දෙ ත් සියල්ලෙන් අටෙක අටෙක. මල් පුදන්ට මැළි පමණක් විනා තෙල සැප ත් ලබන ලෙස ය.

අනඳ මහ තෙරුන් වහන්සේ සිතන සේක්, 'අද උදෑසන පටන් බොහෝ විස්ම පැවැත්තේ ය. මාලාකාරයාණන්ට වන අභිවෘද්ධි ය කවරේ දෝ හෝ'යි සිතා ගොසින් බුදුන් අතින් විචාළ සේක. බුදුහු 'ආනන්දයෙනි, මූගේ මල් පූජාව ලසු ය යි නො සිතව. මේ තෙමේ තමාගේ ජීවිතය ත් මට ම පුද මල් පූජා ත් කෙළේ ය. මෙ ම කෙරෙහි සිත පහදවා මේ කළා වූ පූජාවෙන් කප් ලක්ෂයක් මුළුල්ලෙහි දුගතියකට නො ගොස් දෙව් ලොව දෙව් සැප ත් මිනිස් ලොව මිනිස් සැප ත් වළඳා කෙළවර මෙයට ලක්ෂයක් වන කප සුමන නම් පසේ බුදු වෙ යි' වදළ සේක.

බුදුන් වෙහෙරට වැඩ ගඳ කිළියට වඩනා කලට ඒ මල් දෙරටු වේ වැගිරිණ සවස ධම් සෙබෙයි රැස් ව හුන් වහන්දෑ ද 'අනේ මාලාකාරයාගේ කටයුත්තක් බලවත් නියා ය. බුදුන්ට දිවි පුද මල් පූජා ත් කොට ඒ ඇසිල්ලෙහි සියලු ප්‍රයෝජන වස්තුවෙන් අටක් අටක් ලද් දූ'යි කථාව ඉපැදවූ සේක. බුදුහු ගඳ කිළියෙන් ගොචරාශායෙන් ගුහායෙකින් පිටත් වන සිංහරාජයකු මෙන් සියල්ලවුන්ගේ අභීමතාභීසාධනාශායෙන් නික්ම තුන් තරා ගමනින් එක්තරා ගමනෙකින් ධම් සබයට වැඩ බුද්ධාසන මස්තකස්ථ ව 'මහණෙනි, මා එන්නාට පෙරාතු කෙ සේ වූ කථාවක් කොට කොට හුන්නු දූ'යි විචාරා, මේ නියා ව කී කල්හි 'එ සේ ය, මහණෙනි, යමක් කළ කල සත්‍වයෝ පසු තැවිලි නො වෙත් ද, යමෙක විපාක ය කුඩු කැවුම් දී ලා මාලාකර දුවණියන් බිසෝ පට බැඳ සතුටු සතුටුව රජ සිරි වුන්නා සේ සතුටු සතුටුව විඳිත් ද, එ සේ වූ දිව්‍ය ලොකයෙහි උපදවා ශක්‍ර සම්ප ත් ආදී සම්පතු ත් මිනිස් ලොව උපදවා සක්විති රජ සැප ත් ආදී මිනිස් ලොව සම්පතු ත් සාධා දී ලන්ට නිසි වූ සිහි කළ විට බලවත් ප්‍රීති ය උපදවා ලන පින් කම් ම කිරීම යහපතැ'යි වදළ සේක. මේ දෙශනා කෙළවර ත් සුවාසූ දහසක් දෙනා මාර්ග ඵල නමැති ආභරණ ලා සැරහී ගෙන නිවන් පුර වන්හ.

Non-Commercial Distribution

එ හෙයින් නුවණැත්තවුන් විසින් සැදැ ඇත්තවුන් හැර මිළ දී ගෙන පුදන මල් හෙයින් නො මිලයෙන් ලැබෙන මල් පුද සෙසු ත් පින් කම හැසිර සුමන මාලාකාරයන් ලත් ලොවී සැප ත් ලැබ කෙළවර උන් ලබන නිවන් සම්පතු ත් ලද යහපති.

# 65. උත්පලවර්ණා වස්තුව

තව ද උග්‍ර වූ අකුශලයෙහි උග්‍ර වූ විපාක ය දක්වනු පිණිස **උත්පලවර්ණා වස්තුව** කියමු.

**කෙ සේ ද යත්:-**

ඒ උත්පලවර්ණා මහා ස්ථවිරීහු, මෙහෙණනි අග්‍රශ්‍රාවිකාවන්ට පැරුම් බිම එකාසංඛ්‍ය කප්ලක්‍ෂයක් නොව කප් ලක්‍ෂය ම හෙයින් පියුමතුරා බුදුන් සමයෙහි එක් තරා බුදු කෙණකුන් වහන්සේට අග්‍රශ්‍රාවිකා වීම පතා බුදුන් ගෙන් විවරණ ලදින් කප් ලක්‍ෂයක් මුළුල්ලෙහි පින් කරන්නෝ දෙව් ලොව මිනිස් ලොව උපදනාහු මේ අපගේ බුදුන් සමයෙහි දෙව් ලොවින් සැව සැවත් නුවර සිටු කුලයක උපන්හ.

දෙ වන අගසවු වන පිරිමි නම ත් ගැනු නම ත් නිල් වුව මනා හෙයින් මුනු ත් ඒ තනතුර ලබන හෙයින් නිල් මහ නෙල් මල් දමක් සේ නිල් වූහ. එ හෙයින් උන්ට උත්පලවර්ණා නම තුබූහ. උන් වැඩි විය පත් කල්හි දඹදිව සියලු රජදරුවෝ ද සිටුවරු ද 'තමන්ගේ දූවණියන් අපට පාවා දුන මැනැවැ'යි කි ය කියා යවති. දඹ දිව රජ දරුවන් ගෙනු ත් සිටුවරුන් ගෙනු ත් උන් සරණ විචාරා නො යවු කෙණෙක් නැත. සිටාණෝ සිතන්නෝ 'විචාළවුන් ගෙන් එක් කෙණකුන්ට සරණ දිණීම් නම් සෙස්සෝ කළකිරෙති. එ සේ හෙයින් උපායක් කෙරෙමි' යි සිතා දූවණියන් ළඟට කැඳවා 'මැණියෙනි. මහණ වවු දැ'යි විචාළහ. පශ්චිම භවික හෙයින් පියාණන් කී වචනයට සතුටු ව 'පැවිදි වෙමි, පියාණන් වහන්සැ'යි කියා උයි ත් ගිවිස්සෝ ය. සිටාණෝ මහා පූජාවෙන් මෙහෙණවරට ගෙන ගොස් මෙහෙණිනි කැර වූ හ.

අලුත මහණ වුව ත් පොහෝ ගෙයි වත උන්ට පැමිණියේ ය. උයි ත් පහන උදසන ලා පොහෝ ගෙය හැමඳ පියා ඇවිළෙන පහන බල බලා සිටි තැනැත්තෝ තෙජො කසින ධ්‍යාන ය උපදවා එ ම පාදක කොට විවසුන් වඩා රහත් වූහ. අර්හත් මාර්ග ය හා සමඟ ම සිවු පිළිසිඹියාව ත් අභිඥාව ත් සමඟ විය. එ දෙකට වෙන කළ උත්සාහ නැත.

Non-Commercial Distribution

ඒ උපුල්වන් මහා සඞ්විරීන්දෑ ද එක් සමයෙක දනවු සැරිසරා පියා පෙරලා අවුත් සැවැත් නුවරට ළං ව තිබෙන අන්ධ වනයට තමන් අනන්ධ හෙයින් වන්හ. එ කල මෙහෙණින් වල්හි විසීම ව්‍යාභිචාරයක් නො පෙනුණු හෙයින් නවතා වදළේ නැත. උත්පලවර්ණා වහන්දෑ ත් ඒ වෙනෙහි කිළිපැළක් කොට ගෙන වසනු කැමති හෙයින් කිළියක් ඉදි කොට ලා හැඳක් ලා ලා තිරයක් ඇදලූ ය. උන්දෑ ත් සැවැත් නුවරට සිඟා ගොසින් පියා පෙරලා නික්මුණු දෑ ය.

මයිලණු කෙණකුන්ගේ පුත් වූ නන්ද නම් ළදරුවාණ කෙණෙක් කාමයෙන් මත් ව මෙහෙණින් දෑ ගිහි කල පටන් පිළිබඳ සිත් ඇති ව ඊට ආ නියා ව අසා සඞ්විරීන්දෑ සැතපෙන කුටියට උන්දෑ එන්නාට පෙරාතුව ඇවිදින් ඒ කිළි ය ඇතුළට වැද ලා හැඳ යට සැඟවී හිඳ ලා සඞ්විරීන්දෑ අවුත් කිළියට වැද දොර පියා ලා හැඳ වැද හුන් කලට දොර අවුවේ සිට ලා ගෙට වන් හෙයින් ඇස බමන ලෙසක් සන් නො හිඳෙන තෙක් මෝහ පටල ය වැසී කිසි වකු ත් සලකා ගත නොහී යට හැදින් මෑ ත් ව ලා හැඳට පැන නැඟි ලා 'නුවණ නැති තැනැත්ත ව 'නො නැසෙව, නො නැසෙව'යි සඞ්විරීන්දෑ කියා දී ම අසංඥයන්ට කවරක් අදහසක් නැත්තා සේ උන්දෑට ත් එ බඳු පවිටු අදහසක් නැත ත් ඍද්ධි බලයක් කරන්ට ත් නු වූ හෙයින් නිවට තරම ඇති තැනැත්තේ තමාගේ පවිටු අදහස පුරාගෙන මෙ ලෝ පර ලෝ දෙක ම නසාගෙන නික්මිණ. භික්ෂුණීන්දෑ ගේ ගුණානුභාවයෙන් ගුණ ය ධරාලන්ට බැරියා සේ පොළොව දෙකක් ව පැළී ගියේ ය. එයි ත් පැළුණු පොළොවින් ගොසින් කළ ලෙසට ලද මනා හෙයින් අවීචියෙහි උපන.

සඞ්විරීන්දෑ එ පවත මෙහෙණිනි වහන්දෑට කී දෑ ය. ඒ වහන්දෑ භික්ෂූන් වහන්සේට කී දෑ ය. භික්ෂූන් වහන්සේ බුදුන්ට දන් වූ සේක. බුදුහු භික්ෂූන් වහන්සේ බණවා ලා 'භික්ෂු කෙණෙක් වෙත්ව'යි භික්ෂුණී කෙණෙක් වෙත්ව'යි උපාසක කෙණෙක් වෙත්ව'යි උපාසිකා කෙණෙක් වෙත්ව'යි සර්වඥනුශාසනාව මැඩ පවත්වා හැසිරෙත් නම් කළා වූ පවු මෙ ලොව වේව යි පරලොව වේව යි යම්තාක් විපාක දී ගත නො හේ ද ඒ තාක් මී සකුරු ආදී වූ මිහිර අනුභව කරන්නවුන් සතුටු සතුටු ව අනුභව කරන්නා සේ කරන්නා වූ පව ත් සතුටු සතුටු ව ඔද වඩ වඩා කෙරෙති. යම් කලෙක වධ බන්ධනාදියට පැමිණීමෙන් මෙ ලොව දී වේව යි නරකාදියට පමුණුවා ලා පර ලොව දී වේව යි

Non-Commercial Distribution

විපාක තබා ගත් කල නම් පමෙහි තරම එ කල දන්නේ ය'යි බණ වදාළ සේක. මේ දෙශනා කෙළවර ත් බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් සත්පුරුෂයන් විසින් උග්‍ර පාපය මුත් ලඝු පාප යෙන් කිමෙදැ යි ගිනි පුපුර ලඝු කොට සිතිය යුතු නො වන්නා සේ ම පාප ය ලඝු කොට නො සිතා මහත් කොට ගන්නා පින් කමක් මුත් ලඝු වූ පිණිනු ත් කිමෙදැ යි කුශලය ත් ලඝු කොට නො සිතා ලඝු වූ පවිනු ත් දුරු ව කුශල ය ලඝු වුව ත් එහි හැසිර සසර දුක් ගෙවන්ට ම උත්සාහ කටයුතු.

බුදුහු කොශල රජ්ජුරුවන් ගෙන්වා 'මහරජ, මාගේ ශාසනයට යම් සේ කුල දරුවෝ අවුත් වැද මහණ වෙත් ද එ පරිද්දෙන් ම කුලදූනු ත් බොහෝ නෑයන් - සියන් හැර බොහෝ සැප තුත් හැර අවුත් මෙහෙණනි ව වල්හි වෙසෙති. එ සේ වසන කලට රාගයෙන් රැඳුණු පව්ටු පුහුලෝ උන් දුක සේ රැක ගන්නා බඹසරට බාධා කෙරෙති. එ සේ හෙයින් මෙහෙණිනන්ට ඇතුළු නුවර ම වසන තැනක් කරව'යි වදාළ සේක. රජ්ජුරුවෝ ත් යහපතැ'යි ගිවිස නුවර එක් ඇළමයක මෙහෙණවර කැරවූහ. එ වක් පටන් මෙහෙණෙනි වහන්දෑ ඇතුළු ගම ම වසන දෑ ය.

---

## 66. ජම්බුකාජීවක වස්තුව

තව ද කුල මාත්සය්‍යාදියෙහි ආදීනව දක්වනු සඳහා ජම්බුකා ජීවක වස්තුව කියමු.

කෙ සේ ද යත්—

යට ගිය දවස කසුප් බුදුන් සමයෙහි එක් ගමෙක හිඳිනා කෙළෙඹියාණ කෙණෙක් එක් තෙර කෙණකුන් වහන්සේට විහාරයක් කොට දී ලා එහි වසන තෙරුන් වහන්සේට සිවු පසයෙන් උපසථාන කෙරෙති. තෙරුන් වහන්සේ එක් වන් උන්ගේ ගෙයි දී වළඳන සේක. එක් රහත් කෙණකුන් වහන්සේ වේලා ආසන්නයෙහි උන්ගේ ගෙට සිහා වැඩි සේක. කෙළෙඹියාණෝ ඔබ දැක ඔබගේ ඉරියවුවෙහි ම පැහැද ගෙට වඩා ගෙන ගොසින් මධුරාහාර ය සකස් කොට වළඳවා ලා 'සවාමීනි, මාගේ මේ හිණකඩින් සිවුරක් කොට ගෙන රඳා වැළැන්ද මැනවැ'යි සිවුරට සෑහෙන තරම් කඩකු ත් පිළිගන්වා ලා 'සවාමීනි, නුඹ වහන්සේගේ හිස කේ දිග, හිසකේ බාන්ට කරනැවැමියකු කැඳවා ගෙන විහාරයට එමි. නැවත සැතපෙන්ට හැඳකු ත් ගෙන්වා ගෙන එමි' කිවූ ය.

Non-Commercial Distribution

එක්වන් උන්ගේ ගෙයි දී වළඳන තෙරුන් වහන්සේ උපාසක යන් කොට ලූ සාදය ත් කියා ලූ සාදය ත් දැක ත් අසා ත් සිත පහදවා ගත නුහුණු සේක් 'මූ මේ ඇසිල්ලෙහි දුටු තැනට මේ තරම් සාදයක් කෙරෙති. තමන්ගේ ම විහාරයෙහි රඳා තමන් ගෙන් ම උපස්ථාන විඳිනා අපට බත් අරුමයකින් හිඳිනා සේ අමුත්තක් නැත්තෝ ය'යි සිතා ගෙන වසන විහාරයට ගිය සේක. රහතන් වහන්සේ ත් උපාසකයන්ගේ ආරාධනාවෙන් උන්වහන්සේ හා කැටි ව ම ගොසින් සිවුරු කොට රඳා ගෙන වැළඳ ගත් සේක. කෙලෙඹියාණෝ ද කරනැවැමියා කැඳවා ගෙන ගෙංසින් රහතන් වහන්සේගේ හිස කේ බාවා පියා හැඳක් අතුට ලා සවාමීනි, තෙල, හැඳ සැතැපුණ මැනැවැ'යි කියා ලා දෙ දෙනා වහන්සේට ම සෙට දවසට ආරාධනා කොට ලා ගියෝ ය.

නෙවාසික නම ත් එක් කොට කළ ආරාධනාව ත් තමන් වහන්සේ පමණකට නො ව ඔබට ත් කළ හෙයින් එයි ත් ඉවසා ගත නුහුණු සේක. සවස් වේලෙහි රහතන් වහන්සේ සැතපුණු තැනට ගොසින් ලා 'ආගන්තුකයාණෙනි, තොප අපගේ උපාසක යන් ගෙන් දෙන බත් අනුභව කිරීම බලා ත් අමේද්ධ්‍යානුභව ය යහපත. උන් කැඳවා ගෙන ආ කරණැවැමියා ලවා හිස කේ බැවීමට වඩා තල් ඇටින් හිස කේ උදුරා පී ම යහපත. උපාසක යන් දුන් සිවුරු වළඳිනා ගමන් උපන් වනින් ම ඇවිදීම යහපත. උපාසකයන් ගෙනා හැඳ හිඳීම් විතරට බිම හෙවීම යහපතැ'යි රහතන්ට තබා දෘෂ්ටිගතික කෙණකුන්ට වුව ත් නො බණන තරමේ මේ සතර කියා බිණුදැ ය. රහත් තෙරුන් වහන්සේ ත් මේ කාළකණ්ණි තැනැත්තන් බල බලා ත් මා නිසා නො නටමනා වේ දැ'යි කළ ආරාධනාව ත් හැර උදසන ම වැඩ පී සේක.

නේවාසික වහන්සේ ද වේලා පස ම වෙහෙර වත් සපයා ලා සිහා යන වේලෙහි 'තව දක්වා ත් ආගන්තුකයාණන් නිදන නියා වේ ද? ගෙඩි ය ගසා ලූ හඬ අසා පුබුදිත් නමුත් ය'යි ගැසුයේ ය'යි පමණට නිය පිටින් ගෙඩි ය ගසා ලා හීන කාලයෙක උපන්නවුන්ට ත් ඇති වන්ට නො තරම් කුණු අදහස් ඇති ව සිහා ගමට වන්දැ ය. කෙලෙඹියාණෝ ද දන් සරහා ලා පෙර මහ බල බලා හුන්නෝ ගුණෙන් අතැන් වැසි වූ තැන් වැසි නම දැක 'සවාමීනි, අනික් සවාමි කොයි දැ'යි විචාළෝ ය. තැන්වැසි නම ඒ අසා 'උපාසකයෙනි, කුමක් කියවුද? තොපගේ කුලුපගයාණෝ ඊයේ තොප නැගී එන්නා ම ගබඩාවට වැද ලා නිදන්ට පටන් ගත් තැනැත්තෝ උදසන පටන් විහාර ය හමදනා හඬ ත්

Non-Commercial Distribution

බොන පැන් නහන පැන් තබන වළඳ පැන් වත් කරණ හඬත් සිහා එන වේලෙහි ගෙඩි ය ගසා ලූ හඬ ත්, පරමත් ව නිදන හෙයින් නො දනිති. අපි උදසන ම කළ මනා වත් සපයා ලා නැඟී ආම්හ'යි කී දැ ය.

උපාසකයෝ ඒ අසා තමන් සැදැ මතු නො ව නුවණ ත් ඇති හෙයින් 'මෙ බඳු සත්හුන් පියොවක් ඇති ස්වාමීන් මේ වේලා වනතුරු නිදන්ට කාරණ නැත. මා ඔබ කෙරෙහි ආවේණික මමායන ය ඇති නියා ව දැන ලා ලාභ–දෙභාග වෙති යන නපුරු අදහසින් මුන් වහන්සේ කියා ලූ දෙයක් ඇති නියා ය'යි සිතා ගෙන සිත කෙ සේ නො සකස් වුව ත් සකස් කොට වළඳ වා ලා පාත්‍ර ය යහපත් කොට සෝධා පියා නො එක් අග්‍ර රසයෙන් යුත් බත පුරා ලා 'ස්වාමීනි, ඉදින් ඔබ දුටො ත් තෙල බත් පිළි ගන්වා ලුව මැනැවැ'යි කිවු ය. ඒ වහන්සේ ද ඒ හැර ගෙන 'ඉදින් උඹ තුමූ මෙවෙනි බත අනුභව කොළෝ වූ නම් මෙ තැන රඳා ගෙන නො යෙති. උපාසකයෝ ත් ගුණ ප්‍රසන්න හෙයින් රඳවා ගෙන උපස්ථාන කෙරෙති. එ සේ කලට මා ගේ මෙ තැන වාස ය වේ හෝ 'ය, නො වේ හෝ ය. එ ලෙසක් නො වන ලෙස කෙරෙමි'යි අතුරු මහ දී ඒ බත් දමා පියා වෙහෙරට ගොසින් විහාර ය මුළුල්ල ම බලා ත් රහතන් වහන්සේ නුදුටුයේ ය.

උඹ තුමූ මේ අකුසල ය නිසා විසි දහසක් හවුරුදු මුළුල්ලෙහි කළ මහණ ධම රැක ලිය නුහුණ. ආයු කෙළවර අවීචියෙහි ඉපැද බුද්ධාන්තරයක් මුළුල්ලෙහි පැසී මේ බුදුන් සමයෙහි රජ ගහා නුවර එක් බොහෝ බත් පැන් ඇති කෙණකුන් ගේ ගෙයි උපන්හ.

පියවර ඔසවා ඇවිදින තැන් පටන් ඇදෙක වැද හෝනට ත් බත් කන්ට ත් නො කැමැත්තෝ ය. තමන්ගේ මුවා පස ම බතට අනුභව කෙරෙති. බාල ගෙයින් නො දැන කෙරෙති සිතා උන් වඩ ත් ම ය. වැඩී ගත් කල ත් පිළි ත් නො හදිති. බිම ම හොවිති. අත් පස ම කති. දෙ මවු පියෝ 'මූ අපට තරම් නො වෙති. පිළි නො හැඳ ඇවිදිනා නිවටුන්ට තරම්හ'යි උන් කරා ගොසින් 'මුන් මහණ කළ මැනැවැ'යි කීහ. උයි ත් ස්වභාව- යෙන් ම පිළි නො හදිනා හෙයින් නො මැළි ව ම මහණ කළහ. මහණ කරණ ගමනේ ත් කරවටක් පමණ වළෙක සිටුවා ලා දෙ දසරුව මත්තෙහි පෝරු ලාගෙන ඊමත්තේ වැඩ හිඳ තල් ඇටින් හිසකේ උදුරා හළවු ය. ඉක් බිත්තෙන් උන්ගේ දෙ මවු පියෝ සෙටයට ආරාධනා කොට ලා ගියහ.

Non-Commercial Distribution

දෙවන දවස් ආජීවකයෝ 'ගමට දන් කන්ට යම්හ, එව'යි කීහ. 'මුඹ හැම ගිය මැනව. මම රඳමි'යි කියා නැවත නැවත කීව ත් නො යන හෙයින් හැර පියා ම ගියහ. උයි ත් උන් ගිය නියාව දැන අත් පස් වළ පුවරු උගුළුවා ලා බැස දැතින් ම උකා ගෙන අත් පස් අනුභව කළහ. ආජීවකයෝ ඇතුළු ගමින් බතු ත් එවූ හ. කො තැනට කන්ට ද? එයි ත් නො කැමැති ව පැරැත්ත බොහෝ වත් වත් 'මම බතක් ලදිමි' කියා කොයින් දැ යි විචාළ කල්හි මින් ම යයි කිවූ ය. දෙ වන දවසු ත් තුන්වන දවසු ත් සතර වන දවසු ත් උන් හැම කෙ සේ තත්පර ව කැන්දූ ව ත් 'මම මොබ රඳමි'යි කියා ලා රැඳුණාවූ ය.

ආජීවකයෝ සිතන්නාහු 'දවස වස කැඳවූව ත් ගමට එන්ට ත් මැළියෝ ය. අප එවූ බතු ත් නො කති. මුබින් ම බත් ලදිමි යි ත් කියති. කුමක් දෝ විමසම් හ'යි ගමට යන ගමනේ ඒ විමසනු නිසා එකකු දෙන්නකු රඳවා ලා ගියහ. ඌ එක් දෙ දෙන ත් අරුන් හැම හා කැටි ව යන බඳු ව ගොසින් ලා සැඟවී සිටියහ. උයි ත් උන් හැම ම ගියහ යි සිතා ආදි ලෙසින් ම වැසි කිළියට බැස අත් පස හැර ගෙන කර්මානුරූප ව අනුභව කළහ. විමසනට සිටියාහු එ දැක ආජීවකයන්ට කීහ. ආජීව-කයෝ ඒ අසා ''මූගේ කටයුත්ත නො කට යුතු වත් මුත් කට යුත්තෙක් නො වෙයි. මහණ ගොයුම්හුගේ සවුවෝ දත්තු නම ආජීවකයෝ අත් පස් කා ඇවිදිති'යි අපට අපකීර්ති පමුණුවති. මේ අපට තරම් එකෙක් නො වෙ'යි තමන් ලඟින් නෙරපූහ.

උයි ත් එතැනින් පලා ගොසින් බොහෝ දෙන අත් පසට යන එක් ගල් පොත්තෙක් ඇත. ඒ ගල් පොත්තේ ම මහත් වූ ගල් කෙමෙක් පැතින් පිරී සිට්ටි. ඌ එ තැනම ගොසින් රෑ දවස් අමෙද්ධ්‍යානුභව ය කොට ලා බොහෝ දෙන අත් පසට එන වේලාවට එක් පයක් ඔසවා අනෙක් පය දණ කෙරේ තබාගෙණ එක් අතකින් පය එල්බ ගෙන උඩු සුළඟට මූණ ලා සිට කට දල්වති. බොහෝ දෙන ඒ විකට ය දැක ගොසින් වැඳ ලා 'ස්වාමීනි, මුඹ වහන්සේ කට දල්වා ගෙන සිටිනේ කුමක් නිසාදැ'යි විචාරති. 'මම හෙම්බා, සුළං අනුභව කෙරෙමි. අනික් මා අනුභව කරණ දෙයෙක් නැත'යි කිවූ ය. 'එ සේ කල එක් පයක් ඔසවා අනෙක් පය දණ තබා ගෙන සිටිනේ හැයි දැ'යි විචාළෝ ය. 'මම බලව ත් වූ තපස් ඇත්තෙමි. මම දෙ පය ම සමයේ පොළොව තබා ලීම් නම් පොළොව ධරා ලිය නො හෙයි. එ හෙයින් සිටිත

ඉරියව්ව විනා වැද හිඳීමක් වැද හෙව්මක් නැති හෙයින් එක් අතකින් පය එල්බ එ විතරකු ත් වුව මනා වේ දෑ යි සිටිමි' කිවූ ය.

මිනිස්සු නම් බොහෝ සේ කොහොන් [1] කමෙහි පහදනා හෙයින් ඒ අසා 'ඉතා ආශ්චර්‍ය්‍ය ය. මෙ සේ වූ තපසු ත් ඇති නියාව මෙතෙක් කල් අප දුටු විරූ නැතැ'යි අඟු රට-මගධ රට ඇත්තෝ ඉතා පැහැද ගොසින් මසින් මසට අවුත් මහත් සත්කාර එළවති. 'මම සුළං මුත් අනිකක් අනුභව නො කෙරෙමි. මා දුක සේ රැක ගන්නා වූ තපස් නස්සි'යි කවුරුන් ගෙනා කුමකු ත් අනුභව නො කෙරෙති.

මිනිස්සු ත් 'ස්වාමීනි, අප නො නැසුව මැනව. නොහො ත් අපට පර ලොවින් වන වැඩ නො නැසුව මැනව. මුඹ වහන්සේ වැනි ගුණසම්පන්න තැන් අප ගෙනා දෙය අනුභව කළ කල අපට බොහෝ කලක් හිත සුව පිණිස වෙයි' බොහෝ කොට පෙරත්ත කියති. උන් හැම කෙ සේ කීව ත් අනුභව කරණ අමේද්ධ්‍ය ය මුත් උන්ට අනික් දෙයකට රුචි නැත. එතකුදු වූ වත් හැමගේ අදහස් මිරිකෙයි සිතා උන් හැම ගෙන ආ තෙල් උක් පැණි ආදි ය හී තණයක් අග ගලා ගෙන මඳක් දිවග ගාලා 'තොපට පිණට මෙතෙක් සෑහෙයි යව'යි කියා සමු දී යවති. මෙ සේ මූ පස් පනස් හවුරුද්දක් පිළී ත් නො හැඳ අමේද්ධ්‍යානුභව ය කෙරෙමින් නැඟි නැඟි සේ කෙස් උදුරුවමින් බිම වැද හෙව දවස් ගළවති.

බුදුවරුන් වහන්සේ අළුයම ලොව බැලී ම නම් අත් නො හරනා දූයෙක. එ සේ හෙයින් එක් දවසක් අළුයම් වේලෙහි බුදුන් ලොව බලන කලට ජම්බුකාජීවකයෝ නුවණ දළ ඇතුළේ පෙනුණවූ ය. බුදුහු ඕ හට වන්නේ කුමක් දෝ හෝ යි සලකා උන් පිළිසිඹියා සමඟ රහත් වන්ට තිසි පින් කළ නියාව දැන 'මම මුන් මුල් ව එක් ගාථාවක් කියමි. ගාථාව කෙළවර සුවාසූ දහසක් දෙන නිවන් දකිති. මුන් නිසා බොහෝ දෙනාට ත් වැඩ වන්නේ ය'යි දෙ වන දවස් රජගහා නුවර සිහා වළඳා අන්තයෙහි අනඳ මහ තෙරුන් වහන්සේ 'ආනන්දයෙනි, ජම්බුකා ජීවකයන් ළඟට යම්හ'යි වදළසේක 'ස්වාමීනි. කුමක් ද? මුඹ වහන්සේ ම ම වඩනා සේක් දූ'යි විචාළ කල්හි 'එ සේ ය, අපි යම්හ'යි වදරා ලා බුදුහු සෙවණ වඩන වෙලේ උන් ළඟට වඩනට නික්මුණු සේක.

---

1. කොවන්

Non-Commercial Distribution

දෙවියෝ 'බුදුහු ජම්බුකාජීවකයන් ලඟට වඩනා සේක. ඌ ද වැලි ත් අශුචින් ම ගැවසී ගත් හෙයින් ඉතා අපවිත්‍ර වූ ගල් පොත්තෙක හිඳිති. ගල් පොත්ත සෝධනු නිසා වැසි වස්වම් හ' යි තමන්ගේ ආනුභාවයෙන් ඒ ඇසිල්ලෙහි වැසි වැස්වූහ. ගල තල ත් සෙ යි ගොසින් ඉතා පවිත්‍ර වි ය. පවිත්‍ර වූ ගල තල මත්තෙහි මලස්නෙක මල් පුදන කලක් මෙන් පස් වනක් මල් වස්වාපීහ.

බුදුහු සවස් වේලෙහි ඒ තැනට වැඩ 'ජම්බුක ය' යි හඬ ගා වදාළ සේක. මට ජම්බුක ය යි කියන්නෝ කවුරු දෑ'යි සිතා ලා 'කවුරු දෑ' යි කී ය. අනන්ත කාලයෙක මොළොක් කොට කීම පුරුදු හෙයින් මොළොකෙකින් 'මම ය ජම්බුක ය' යි වදාළ සේක. 'කුමක් ද, මහණැ' යි කී ය. 'අද එක රැයට මා සැතපී ගන්ට අවසරයක් පෑ ලව'යි වදාළ සේක. ගල් පොත්ත කුඩා නොවත ත් තමා කරණ කටයුත්ත ප්‍රකාශ වෙයි යන සිතින් 'මහණ, මෙ තැන අවසර නැතැ'යි කියා අවසර නැත්තා කොට කී ය. 'ජම්බුකයෙනි, එසේ නො කරව. එක රැයක් ලැග පිය දෙව. පැවිදිවරු පැවිදිවරුන් කැමැති වෙති. මිනිස්සු තමන් සේ ම මිනිසුන් කැමැති වෙති. සිවු පාවෝ සිවු පාවන් කැමැති වෙති. තොප මා කැමැති නො වන්ට කාරණ කිම් දෑ' යි විචාළ සේක.

ජම්බුකයෝ ඒ අසා 'තෙපි පැවිදි කෙණෙක් දෑ' යි විචාළෝ ය ඒ සේ ය යි වදාළ කල්හි 'ඉදින් තෙපි පැවිදි කෙණෙක් වූ නම් තොප ගේ කමණ්ඩා ව ත් කොයි ද? දුම් කෙණෙස්ස ත් කොයි ද? යාගසූත්‍රය ත් කොයි දෑ'යි තමා දන්නා පැවිදි වරුන් ගේ ඒ හැම ඇති හෙයින් විචාළෝ ය. 'හෙම්බල, ඒ හැම ම මට ඇති වෙන වෙන හැර ගෙන ඇවිදීම දුක් හෙයින් සිරුර අබතුරෙහි ලා ගෙන ඇවිදිමි' වදාළ සේක. 'තෙපි ත් මෙ හැම හැර ගෙන ඇවිදු දෑ'යි කිපුනවු ය. බුදුහු අමුතු ව හඟවන සන්හුන් කමක් නො වන බැවින් සන්හිඳී 'ජම්බුකයෙනි, නො කිපෙව. රෑ ව පියා ආ මා වසන තැනක් ම කියව'යි වදාළ සේක. පෙරළා ත් වසන තැන් නැතැ යි කිවු ය. ඔහු වසන තැනට ආසන්නයෙහි ගල් තල්ලෙක් ඇත. බුදුහු ඒ පැලා 'ජම්බුක ය, තිලි හිඳින්නෝ කවුරු දෑ'යි විචාළ සේක. 'වසන කෙණෙක් නැතැ'යි කී කල්හි 'එ සේ වී නම් ඒ තැන මට දෙව'යි වදාළ සේක. 'මහණ, තෝ ම දනැ'යි කී ය. බුදුහු ඒ ගල් තල්ලේ හිඳිනා කඩ ලා ලා වැඩ හුන් සේක.

Non-Commercial Distribution

පෙර යම් වේලේ සතර වරම් මහ රජ දරුවෝ ශරීරාලෝක යෙන් බබළමින් සතර දිගින් බුදුන් දක්නට අවු ය. ජම්බුකයෝ රාත්‍රි වේලේ සඳ පානකු ත් නො ව මහා ආලෝක ය දැක මේ කෙ සේ වූ ආලෝකයක් දැ යි සිතූ ය. මධ්‍යම රාත්‍රි වේලේ දස දික් බබුළුවමින් සක් දෙවිඳු අවු ය. ජම්බුකයෝ උනු ත් දැක කවුරු දෝ හෝයි සිතූ ය. අළු යම් වේලේ එක් ඇඟිල්ලකින් එක් සක් වළක් හා ඇඟිලි දෙකකින් සක් වළ දෙකක් හා දස ඇඟිල්ලෙන් දස සක් වළක් බබුළුවන්ට තරම් ආනුභාව ය ඇති මහ බඹහු වන ය බබුළුවමින් අවු ය. ජම්බුකයෝ උනු ත් දැක කවුරු දෝ හෝ යි සිතා උදසන ම බුදුන් කරා ගොසින් සාද සාමීචි කොට ලා එකත් පස් ව සිට 'මහණ, පෙර යම සතර දිගුන් බබුළු වමින් තොප කරා ආ සතර දෙන කවුරු දැ' යි විචාරා, වරම් රජුන් නියා ව වදළ කල්හි කුමට අවුදැ යි විචාරා තමන් වහන්සේ දක් නට ආ නියා ව වදළ කල්හි 'කුමක් ද? තෙපි සතර වරමුන්ට ත් වඩු දැ'යි විචාළහ.

'එසේ ය, බුදු වූ කල තබා මා බුදු වන්ට ය යි දෙව් ලොවින් චුත ව මවු කුස පිළිසිඳ ගත් තැන් පටන් මවු කුසින් බිහි වන තෙක් මුන් සතර දෙනා ශ්‍රී යහන් ගබඩාවේ සතර මුල්ලේ කඩු හැර ගෙන රකවල සිටි හෙයින් හා දස දහසක් සක් වළ ගල සත ළිස් දහසක් වරමුන් ගබඩාවේ එළිපත පටන් සක් වළ ගල දක්වා රකවල් ගත් හෙයින් ද මම උන්ට වඩිමි' යි වදළ සේක. 'මධ්‍යම රාත්‍රි වේලෙහි ආ තැනැත්තෝ කවුරු දැ' යි විචාරා සක් දෙවිඳු ය යි වදළ කල්හි කුමකට අවුදැ යි විචාරා දක්නට ය යි වදළ කල්හි තොප ශක්‍රයන්ට ත් වඩනා නියා දැ'යි විචාළහ. 'එ සේ ය. ජම් බුකය, ඒ ඒ බුදු මඟුලෙහි මට සක පිඹ සිටි හෙයිනු ත් මා ලෙඩ දුක් විටෙක කැප කරු හෙරණ කෙණකුන් මෙන් මා බලා ලන හෙයිනු ත් මම උන්ට ත් වඩිමි'යි වදළ සේක. 'පාන්දර වේලේ සියලු වන ය බබුළුවා ගෙන ආ තැනැත්තෝ කවුරු දැ'යි විචාරා ''මෙ ලොව බමුණු ආදීහු කිඹිස පියා ත් 'මහාබ්‍රහ්මයා වඳුම් හ'යි යමක්හට කිය ත් නම් ඒ මහ බඹ ය''යි වදළ කල්හි 'තොප මහ බඹුන්ට ත් වඩනා නියා වේ දැ' යි කිවූ ය. 'එ සේ ය, ජම්බුකය, මා බිහි වන වේලේ මූ තමා අවුත් රන් දැළකින් පිළිගත් හෙයිනු ත් ඒ ඒ බුදු මඟුලෙහි දී මට කුඩ ලා සිටිනා හෙයිනු ත් මම ඕ හට වඩිමි'යි වදළ සේක. 'මහණ, තෝ මහානුභාව ඇත්තෙහි. පස් පනස් හවුරුද්දේ මෙ තැන මා රඳා හිඳිනා ගමනේ ත් මින් එක කෙණකු ත් මා දක්නට නො ආවෝ ය. මම මෙ තෙක් කල්

Non-Commercial Distribution

මුළුල්ලෙහි සුළං අනුභව කොට ලා සිටිනා ඉරියවුවෙන් ම දවස් යවා පීමි. මේ තරම් මා ගුණයක් ඇත ත් මින් මට නැමුණු කෙණෙක් නැතැ'යි බුදුන් එ විතරක් තබා වඩා වුව ත් දත හෙන නියාව නො දැන පෙනී පෙනී සිට ම 'මා සොයා ගනුව' යි කියන්නා සේ උගුරට සොරා කන බෙහෙදක් සේ කී ය.

බුදුහු 'ජම්බුක ය, තෝ නුවණ නැත්තවුන් නළවා බද පුරුද් දට මට ත් වළහන්ට සිතයි ද? තෝ පස් පනස් හවුරුද්ද මුළුල්ලේ බතට වඩා අමෙද්ධ්‍යානුභව ය ම කෙළෙහි වේ ද? නැවත බිම හොත් තෙහි වේ ද? මෙ දැතුරෙහි පිළි නො හැන්දෙහි ත් වේ ද? තල් ඇට පළුවෙන් හිස කේ ත් උදුරුවා හළුයෙහි වේ ද? ලෝ වැස්සන් නළවා බැඳුවා මදින් 'සුළං අනුභව කෙරෙමි. එක් පයින් සිටිමි'යනා දිය කියා මා ත් වළහයි ද? අකුසල් බලයෙන් දෘෂ්ටියකු ත් ලාගෙනා මේ පස් පනස් හවුරුද්දෙහි අමෙධ්‍යානුභව ය ත් කොට පිළි ත් නො හැඳ තල් ඇටි න් හිස කේ ත් උදුරුවා බිම ත් වැද හෙව ඇවිද පූවා මදින් තව ත් එ ම කරන්ට සිතයි දැ' යි වදළ සේක. තමනු ත් සිතා පී නියා වේ ද? මා කෙළේ කුමක් ද, මහණැ'යි විචාළ කල්හි කසුප් බුදුන් සමයෙහි කළා වූ පාප ය හකුළුවා තුබූ පෙත්තක් විදහා පියා පානා කලක් පරිද්දෙන් ප්‍රකාශ කොට වදළ සේක.

බුදුන් ඒ වදර ත් වදර ත් කම් බලයෙන් වූ නියා ව දැනෙ ත් දැනෙ ත් හය ලජ්ජා ඇති වී ය. එළිල්ලෙන් හුන්නවුට බුදු රජාණන් වහන්සේ නහන කඩ දෙවා වදළ සේක. ඔහු ඒ හැඳ ගෙන බුදුන් වැඳලා එකත් පස් ව හුන්හ. බුදුහු ත් පිළිවෙළ කථා ව වදරා ලා චාරිත්‍රානුකූල බණ ත් වදළ සේක. දෙශනා කෙළවර රහත් ව ලා නැඟී සිට බුදුන් වැද ලා මහණ කරන්ට ත් මහලු පැවිදි කරන්ට ත් ආරාධනා කළ සේක. එ වකට පෙර කළ පවු ත් ගෙවිණ. එ සේ මැ යි. මුන්දෑ රහතන් වහන්සේට ආක්‍රොශ සතරකින් බිණු හෙයින් දහසක් අවුරුද්දෙන් අහලක් වඩනා පොළොව යම්පමණ කලෙකින් සත් ගවුවක් පමණ උස් වී ද ඒ තාක් අවීචියෙහි පැසී තව පාප ය නො ගෙවුණු හෙයින් පස් පනස් හවුරුද්දක් මේ සා මුළාවකට පැමිණි දැ ය. එ සේ හෙයින් ඒ පාප ය ගෙවිණ. විසි දහසක් හවුරුදු පිරූ මහණ ධම් වද කට නො හැකි හෙයින් හා එහිභික්ෂුභවයට හෙතු ත් දැක බුදුහු ත් දකුණත දිගු කොට ලා 'මහණ, මෙ සේ එව'යි වදළ සේක. බස වදරන්නා ම ගිහි සැටි නැති ව අට පිරිකර හැඟ පහළ ව සැට වස් ගිය මහ තෙර නමක් මෙන් ආකල්ප සම්පන්න වූ සේක.

Non-Commercial Distribution

අඟු රට මගධ රට ඇත්තවුන් උන් වහන්සේට සත්කාර ගෙන ආ දවස දෙ රට ඇත්තෝ උන් වහන්සේ දැක කුමක් දෝ? අපගේ ජම්බුකාජීවකයන් වහන්සේ වඩනා සේක් දෝ නො හොත් මහණ ගොයුම්හු වඩිත් දෝ හෝ'යි සිතා 'ඉදින් මහණ ගොයුම්හු වඩිත් නම් ජම්බුකාජීවකයන් වහන්සේ ඔබ යන සේක. ජම්බුකාජීවකයන් වහන්සේ වඩනා බැවින් මහණ ගොයුම්හු මූබ අවු ය'යි සිතූහ. බුදුහු ත් බොහෝ දෙනාගේ අදහස් දැන 'ජම්බුකයෙනි, තොපගේ උපාසකවරුන්ගේ සැක ය හැර ලව'යි වදාළ සේක.

උන් වහන්සේ ත් 'වදාරන තෙක් ම හුනිමි' වදාරා ලා අර්හත් මාර්ග ය හා සමඟ ම පිළිසිඹියා ත් අභිඥා ත් පහළ වූ හෙයින් අභිඥා වට පිහිට වූ චතුර්ථධ්‍යානයට සම වැද ලා එයින් නැඟී තලක් පමණ අහසට පැන නැඟී ලා ස්වාමීනි, මුඹ වහන්සේ මට ශාස්තෘ සේක. මම මුඹ වහන්සේ ගේ සවු වෙමි' වදාරා ලා බිමට බැස වැඳ ලා නැවත දෙ තලක් පමණකට නැඟ ය, තුන් තලක් පමණට නැඟ ය, යනාදීන් සත් තලක් පමණ විතර අහසට පැන නැඟී ලා බැස තමන් වහන්සේ බුදු සවු නියා ව රැස් වුවන්ට දක්වා ලූ සේක. ඒ විස්ම ය දැක බොහෝ දෙන 'අනේ බුදුවරුන් වහන්සේ නම් මහානුභාව සම්පන්න සේක. මෙ තරම් තැනට පවා මෙ විතරක් කළ කල ය'යි සිතූහ.

බුදුහු ත් රැස් වූවන්ට බණ වදාරන සේක් ශීල සමාද්ධ්‍යාදී ගුණ රහිත තීර්ථායතනයෙහි උන්ගේ ලබ්ධි ගෙන මහණ වූ අඥානයෝ තපස් කරම්හ යි කියා ලා බණෙක දහමෙක ආ දෙයක් නො ව තමන් ම සිතා ගත් ලබ්ධියක් හෙයින් මසකට එක් දවසක් හී තණ ගලා පැණි ආදි ය දිවග තබා මෙ ලෙසින් කරණ තපස හවුරුදු සියයක් කෙළේ වී නමුත් ඒ තපස කුශල සන්නිශ්‍රිත නො වන හෙයින් යටත් පිරිසෙයින් සෝවානුනට හෝ උඩ ත් පිරිසෙයින් රහතන්ට වේලාව ඇත ත් නොපෙනේනම් වේලායෙහි වෙව යීවින වීම් ආදි විසින් උපන් බතක් වී නම් එ බත වෙව යි කුකුස් ඇති ව යට ත් පිරිසෙයින් සොවානුන් හා උඩ ත් පිරිසෙයින් රහත්හු අනු භව කෙරෙත් නම් සුන් බත් වීම් විසින් පැවැති එක ම චේතනාව සොළසක් සොළසක් බැගින් සොළොස් වරෙක කොටස් කළ කල සොළොස් වන කොටසින් සොළොස් වන භාගයට ත් හවුරුදු සිය යක් මුළුල්ලෙහි අනුරෙක බත් අනුභවයක් නැති ව මසකට එක් දවසක් හීතන අග ගලා පැණි ආදි ය දිවග තබා කරණ තපස

Non-Commercial Distribution

බත් නො කෑම් වසයෙන් හවුරුදු සියයේ පැවැති බොහෝ චෙතනා කුසල සන්නිශ්‍රිත නො වන හෙයින් නො අග්ගි වදළ සේක. මේ දෙශනා කෙළවර ත් සුවාසූ දහසක් දෙන නිවන් දුටහ.

එ සේ හෙයින් සෞජන්‍යයෙහි පිහිටියවුන් විසින් ආයෙෂ්‍යාප වාදය ත් මහා සාවද්‍ය නියාව දැන සෝවාන් ආදී වූ ආය්‍යීයන්ට වේව යි ආය්‍යී ගුණ ඇත්තවුන්ට වේව යි තමාට වරදනා ලෙස වරදවා නො බැණ නො දැන වැරද ගිය ත් බණෙහි කියා ලූ ලෙසින් ආයෙෂ්‍යාපවාද ය දෙසා ගෙන මෙතේ බුදුන් නො වරද දක්නා ලෙසක් සිතූ ව යහපති.

# 67. කාක ප්‍රේත වස්තුව

තව ද මදකු ත් හයක් නැති ව සඟ සතු කෙත් වත් ආදී වූ ස්ථාවර වස්තුවක් වේව යි පාත්‍ර චීවරාදියක් වේව යි යටත් පිරිසෙයින් වහන්දෑ සන්තක බත් වූ ව ත් සඞ්ඝ ලාභයට යම් කෙණෙක් අලාභ කෙරෙත් නම් බුදුන් සන්තකයට ත් අලාභ කෙරෙ ත් නම් උන්ට වන හානි ය දක්වන්ට කාකප්‍රේත වස්තුව ත් අහිප්‍රේත වස්තුව ත් දෙක කියමු.

කෙ සේ ද යත්—

එක් දවසක් උරුවෙල් කසුප් ආදි තුන් බෑ තෙරුන් වහන්සේගේ දුළුලු දහසට ඇතුළ ත් වූ ආයු බොහෝ වූ ලක්ෂණ මහ තෙරුන් වහන්සේ හා බුදුන්ට වම ත් සවු වූ මුගලන් මහ තෙරුන් වහන්සේ හා දෙ දෙනා වහන්සේ රජගහා නුවර සිඟම්හ යි ගිජුකුළු පවුවෙන් බස්නා සේක. ඒ දෙ දෙනා වහන්සේ ගෙන් මුගලන් මහ තෙරුන් වහන්සේ එක් කාක ප්‍රේතයකු ගිජුකුළු පවු මුදුනෙහි ගිනි කඳක් සේ පැසෙන්නාහු දැක ඔහු කළ පව් විචාරන සේක් 'හෙම්බල ප්‍රේතය, තාගේ දිව විසි ගවුවක් විතර ය. හිස මහත ස තිස් ගවුවක් විතර ය. තා ගේ බඳ දිග ත් ගවු සියයක් විතර ය. කෙ සේ වූ පවක් කොට මේ සා දුකකට පැමිණියෙහි දැ'යි විචාළ සේක.

ඒ අසා කාක ප්‍රේතයා තමා කළ පවු කියන්නේ 'ස්වාමීනි, ගිය දවස කසුප් බුදුන් සමයෙහි බොහෝ වහන්දෑ එක් ගමකට සිඟා වැඩි සේක. එ ගම මිනිස්සු අසුර යුද්ධයට සැරහී ආ දෙවතා සමූහයක් සේ කෙලෙස් සතුරන් හා සටනට සිල් නමැති සන්නාහ ලා නිරන්තරයෙන් සැරහී සිටිනා ඒ වහන්දෑ දැක පැහැද



Non-Commercial Distribution

අසුන් හල වඩා හිඳුවා ලා කැඳ ඉදි කරවා කැඳ අවුළු පත් වළඳ
වා ලා වහන්දෑගේ පා සෝධා පියා පාවල තෙල් ගල්වා දත් උදවූ
වන තෙක් බණ අසා හිඳ ලා වේලාසන්නයෙහි පාත්‍ර හැර ගෙන
තම තමන්ගේ ගෙවල දී නො එක් අග්‍ර රසයෙන් යුත් බත්
පුරා ලා පිළිගන්වන්ට ගෙන යෙති.

එ කල මම කවුඩු ව ඉපැද අසුන් හල පළ ය පිට හුන්නෙමි
ඒ ගෙනෙමින් සිටි බත් දැක කෑ කල වන ආදීනව ය තිරිසන්
හෙයින් නො දන එක් කෙණෙකුන් ගෙනෙන පාත්‍රයෙන් කට ත්
පුරා පවු ත් පුරා අදහස පිරෙන්ට නැත ත් බත් තුන් කටක් විතර
හැර ගෙන කැමි. එ බත ත් වැළි ත් තව පිළිගන්වන්ට නු වූ
හෙයින් වහන්දෑ සන්තක ත් නො වෙයි. නියම කොට වෙන
වෙන ම පිළිගන් වා පූයේ ත් නැත. පාත්‍ර ය පුරා ගෙන ගිය බත්
හෙයින් මා කාපු බත් තුන් කට නම් වළඳා ඉතිරි කලව ගෙනාව
උන් ම තම තමන්ගේ ගෙවලට ගෙන ගොසින් කන්ට ත් ඇත.
හුදෙක් වහන්දෑට පිරිනැමී ගිය පමණෙක. වහන්දෑ සන්තක
ගමක් බිමක් හැර ගත්තෙ ත් නැත. ගසක් කොළක් හැර ගත්
තෙ ත් නැත. වාලක් සරකක් හැර ගත්තෙ ත් නැත. සෙසු
කිසිවක් හැර ගත්තෙ ත් නැත. වළඳා ත් ඉතිරි වන බතින් තුන්
කටක් කාපු පමණෙක. ඒ තුන් කට කා ලා පුරා අන්තඃ කල්පයට
ආයු ඇති අවීචියෙහි ඉපැද එහි ආයු පමණින් පැසී පියා තව
කර්ම ය නො ගෙවුණු හෙයින් දැන් මේ ගිජු කුළු පව්වෙහි කාක
ප්‍රේත ව ඉපැද මේ දුක් විඳිමි'යි කී ය.

**මේ කාක ප්‍රේත යා කළ පව් ය.**

---

## 68. අහි ප්‍රේත වස්තුව

එ සේ ම එක් දවසක් මුගලන් මහ තෙරුන් වහන්සේ
ලක්ෂණ මහ තෙරුන් වහන්සේ හා සමඟ රජගහා නුවරට සිඟා
වඩනට ගිජු කුළු පව්වෙන් බස්නා සේක් සර්පයකු වැනි ප්‍රේතයකු
දැක 'අනේ මූ විඳිනා දුකක් ය'යි ඔහු කෙරෙහි අනුකම්පාව
ඇත ත් තමන් වහන්සේ ඒ දුකින් මිදුණු නියාව සලකා සිනා
පහල කළ සේක. ලක්ෂණ මහ තෙරුන් වහන්සේ සිනා පහළ
කළ නියාව දැක 'සී පිය යුත්තෙක ත් බුදුන් වදළේ සතුටු පමණක්
වුව. සිනා පහළ කිරීමට කාරණ කිමදැ'යි විචාළ සේක. 'දැන්
සිඟා යන ගමන හෙයින් කියන්ට අවසර නැත. බුදුන් ළඟ දී
විචාළ මැනැවැ'යි කී සේක. එ සේ වදරා ලා රජගහා නුවර සිඟා

Non-Commercial Distribution

ගෙන බුදුන් ළඟට ගිය කල්හි ලක්‍ෂණ මහ තෙරුන් වහන්සේ මුගලන් මහ තෙරුන් වහන්සේට 'ඇවැත්නි, ගිජුකුළු පවුවෙන් බස්නා ගමනේ සිනාවක් පහළ කොට සිනා පහළ කිරීමට කාරණ විචාළ හෙයින් බුදුන් ළඟ දී විචාරන්ට කීයේ ඇත්තේ වේ ද, ඒ කාරණය දැන් කිව මැන වැ'යි කී සේක.

'මම, ඇවැත්නි, නො කරුණෙක සිනා පහළ කෙළෙම් නො වෙමි. එක් ප්‍රෙතයකු දුක ය. ඌගේ හිස නම් මිනිසුන්ගේ හිස වැනි ය. ඌගෙ බඳ ත් සියක් ගවු විතර ය. සෙසු අත් බැව නයකු වැනි ය. ඌගේ හිසින් නැඟී ගිනි දූල් නඟුට දක්වා දවා ගෙන යෙ යි. මැදින් නැඟී ගිනි දූල් දෙ දිසාවට දවා ගෙන යෙ යි. දැලයෙන් නැඟී ගිනි දූල් පිට දවා ගෙන යෙ යි' වදළ සේක. බුදුහු ත් දෙස් ව වැඩ සිට 'මහණෙනි, ඒ ප්‍රෙතයන් දුටුවෝ මූ මකු නො වෙති. බුදු වූ දවස් බුදු නුවණින් මම ත් දිටිමි. මේ තෙක් කල් නො වදළේ හැයි දැ යි සිතවු නම් මා කියා පූ කලට හදහා ගත හැකි තරමක් නො වන්නා යමෙක් හදහා නො ගත්තෝ වූ නම් උන්ට බොහෝ පවු පිරෙන හෙයින් නො කීමි. දැන් මා මුන්ට දෙස් ව සිටි හෙයින් මුන් ම දෙස් කොට සිටුවා ගෙන කියමි'යි වදළ සේක.

වහන්දෑ ද කාක ප්‍රෙතයාගේ අකුශල ය ඌ ගෙන් ම ප්‍රකාශ හෙයින් අහිප්‍රෙතයාගේ අකුශල ය විචාළ සේක. බුදුහු ඒ වදරන සේක් ''යට ගිය දවස බරණැස නිසා ගඟ බඩ පසේ බුදුකෙණෙකුන්ට පන්සලක් කළහ. උයි ත් එහි රඳා එක් වන් නුවරට සිඟා යෙති. නුවර ඇත්තෝ ත් උදසන ත් කැඳ අවුළු පත් ආදි ය ගෙන්වා ගෙන දවස දවස සුවඳ මල් ආදි ය ගෙන්වා ගෙන පසේ බුදුන් වඳින්ට පුදන්ට හා උපස්ථාන කරන්ට ත් යෙති. බරණැස වසන එකෙක් එම ගඟ බඩ කුඹුරක් සාන විට බොහෝ දෙන ක් පන්සලට යන කල ඒ කුඹුර මැඩ ගෙන යෙති. කුඹුර සානා තැනැත්තෝ 'මාගේ කුඹුර නො මඩුව'යි කියා ත් වළකා ගත නො හීණ. බොහෝ දෙනාට කුසල් මං කොට පිටි මහකුත් තබා නො ලී ය. සී සානා තැනැත්තේ 'ඉදින් මෙ තැන පසේ බුදුන්ට පන් සැලක් නො වී නම් මාගේ කුඹුර නො මඩිති'යි නුනුවණින් සිතා ගෙන පසේ බුදුන් සිඟා නැඟී ගිය කල කළ-කොතලා-සැළ-තාලි-එක් ගිනි කබල් ආදී වූ වළඳු ත් සපා බිඳ පියා පන්සැල ත් ගිනි ලා දවා පී ය. පසේ බුදුහු ත් පන්සල ද ගියා දැක අනික් තැනකට ගියහ. බොහෝ දෙන සුවඳ මල් ආදි ය හැර ගෙන අවු ත් පන්සල ද ගියා දැක 'අනේ, ස්වාමී කො යි වැඩ පී සේක් දෝ හෝ'යි තමන් අතුරේ කිවු ය.

අර කාළකණ්ණියා ත් හැම දෙනා හා කැටි ව අවුත් සපන් කමක් සේ 'මම ය පන්සල ගිනි ලූයෙමි'යි කීහ. බොහෝ දෙන 'තෙල පව්ටා අල්වව. තුලු නිසා පසේ බුදුන් වහන්සේ දක්නට ත් නැතු'යි ගසා අල්වා ගෙන මරා පිහ. එයි ත් අවීචියෙහි උපන් තැනැත්තේ අන්තඃ කල්පයක් නරකයෙහි පැසී පියා තව ම අකුසල් ගෙවී නො ගිය හෙයින් ප්‍රෙත ව උපනැ''යි වදරා ලා බණ වදරන බුදුහු 'මහණෙනි, යම් සේ දෙව ගත් කිරි මුසුන් නො ගැසූ නම් හෝ දී තුබූ කිලන් තුබූ වළදෙක දෙව ගත් වළදින් නොව ත් කොළෙෝ නම් ඒ තාක් ම තමාගේ කිරි අවස්ථාව නෝ හරී ද ඒ හැම කළ කල පසු දී බවට පැමිණීමෙන් කිරි අවස්ථාව හරී ද, එ මෙන් පව්කමු ත් කෙරෙමින් සිටිය දී ම විපාක බවට පෙරළී නො යෙයි. ඉදින් එ සේ පෙරළී යේ නම් කිසි කෙණකු ත් පව් කට නො හෙන්නාහු ම ය. යම් සේ හළුවෙන් වැසී තුබූ අඟුරු මැඩ ගත ත් හළුවෙන් වැසී තුබූ හෙයින් තව පය නො දද, කල් යවා සිට පී කලට වැසී තුබූ හළු ත් හුණු කොට ගෙන සම් මස් ආදිය දැවීම් වශයෙන් හිස් මුල් දක්වා දවා ගෙන යේ ද, එ පරිද්දෙන් පව් කමු ත් දෙවන අත් බැව හෝ නරකාදි වූ සතර අපායෙහි උපදවා පියා දවා ගෙන යෙයි. කල් ගිය පමණින් නිවන් දුට ත් ප්‍රතිසන්ධි විපාක නැති වූ නමුත් ප්‍රවෘත්ති විපාක වුව ත් දී මුත් නො නවත්ති'යි වදාළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ.

එ සේ හෙයින් නුවණැත්තවුන් විසින් තුනුරුවන් සතු දෙය විෂයකට ත් විෂ ඝොර සර්පයන්ට ත් ගින්නට ත් වඩා දුක් දෙන නියාව සලකා ජීවිත විනාශයක් වත ත් තුනුරුවන් සතු දෙයකට විනාශයක් නො සිතා කාක ප්‍රෙත යා හා අහිප්‍රෙත යා මසැසින් නුදුට ත් බණින් අසා දුටු බැවින් එ වැනි දුකින් මිදෙනු කැමැත් තො ත් තුනුරුවන් සතු දෙයෙහි ඇලුම් නො කොට පින් කම හැසිර නිවන් අත් කට යුතු.

---

## 69. සට්ඨිකූට ප්‍රේත වස්තුව

තව ද කියන්ට පටන්ගත් ගමනේ අකුසල කර්මයෙහි අනිෂ්ට විපාක දක්වන්නමෝ සට්ඨිකූට ප්‍රෙත වස්තුව කියමු.

කෙ සේ ද යත්:-

ආදි කී ලෙසින් ම මුගලන් මහ තෙරුන් වහන්සේ ලක්‍ෂණ මහ තෙරුන් වහන්සේ හා සමහ ගිජු කුළු පව්වෙන් බස්නා සේක් එක් තැනක දී සිනා පහළ කොට කාරණ විචාළ කල්හි බුදුන් ළඟ දී

කාරණ විචාරන්ට කියා ලා සිහා නිමවා ලා බුදුන් ළඟට ගොසින් සිනා පහළ කිරීමට කාරණ විචාළ කල්හි 'මම, ඇවැත්නි, තුන් ගවුවක් විතර උස ඇති ප්‍රේතයකු දිටිමි. ගිනි ගෙන දිළියෙන යකුළු සැට දහසක් ඔසවා ගෙන එක විට ම හිසට බා ලති. එසේ බැලූ කල හිස පැළී ලා කම් බලයෙන් පෙරළා ත් හට ගන්නේ ය. ඔහු දැක 'අනේ මේ සංසාර දෙෂ ය මට නැතැ'යි සිතා සිනා පහළ කෙළෙමි''යි වදළ සේක. බුදුහු ත් අසා වදරා තමන් වහන්සේ ත් බුදු වූ දවස් දුටු නියා ව වදරා මුගලන් මහ තෙරුන් වහන්සේට දෙස් වූ සේක. තමන් වහන්සේ ත් දුටුවා මුගලන් මහ තෙරුන් වහන්සේ දැක කී හෙයින් ඔබ ත් තමන් වහන්සේට දෙස් කළ සේක. වහන්දෑ අසා පාපයෙහි භය ඇති වනු නිසා ඔහු කළ පව් විචාළ සේක.

බුදුහු වදරණ සේක් ''යට ගිය දවස බරණැස අතකුරු ගැසී-මෙහි දක්‍ෂ එක් පිළෙක් ඇත. එ තෙමේ නුවර වාසල් දෙර කෙරෙහි සිටි නුග ගසක් යට වැද හිඳ කුඩා කොල්ලන් එ තැනට අවුත් 'අපට තෙලෙ නුග පතින් අතකුරු ගසා ඇත් රූ ආදි ය පැව මැනැවැ'යි කී කල්හි අතකුරෙන් ම ඇත් රූ අස් රූ ගොන් රූ ආදියෙන් කැමැති රුවක් ම කප්පවා පෑ ලා උන් ගෙන් කන බොන දෑ ලැබෙයි. එක් දවසක් රජ්ජුරුවෝ උයනට යන ගමනේ එ තැනට අවුත් වන. කුඩා කොල්ලෝ පිළා අරළු හස්සේ ලා ලා දිව පූ ය. හිර මුදුනේ සිටි වේලේ රජ්ජුරුවන් නුග ගස යටට වන් හෙයින් නුග පත්වල සිදුරුවලින් ඇත් රූ ආදි ආකාර ඇති අවුව ඇඟ හිණ. මේ කිම්දෑ යි උඩ බැලුවා නුග පතෙහි ත් ඇත් රූ ආදි ය කැපී සිදුරුවා දැක මේ කොළෙෝ කවුරුදෑ යි විචාරා පිළා නියා ව අසා පිළු ගෙන්වා ගෙන 'දරුව, අපගේ පුරෝහිත බමුණාණෝ දෙඩන්ට සූරු වූහ. මා එක බසක් කියා පී ව ත් අකුරු මුළුල්ලක් සෙ දෙඩා වගුරුවා පියති. උන් දෙඩන විට එළු බෙටි නැළියක් විතර උන් කටට ගසන්ට පිළිවන් දෑ'යි විචාළෝ ය.

'රජ්ජුරුවන් වහන්ස, ඒ පිළිවන. ඒ එළු බෙටි නැළියක් ගෙන්වා මට දෙවා ලා පුරොහිතයන් හැර ගෙන මුඹ වහන්සේ තිර ය ඇතුළේ හුන මැනව. සෙස්ස මට පිළිවනැ'යි කිවු ය. රජ්ජුරුවෝ ත් එ ලෙස ම කරවා ලූහ. පිළාණෝ ද කතුරු අගින් එළු බෙටි ය විතරට තිරයෙහි සිදුරක් කොට ලා පුරෝහිතයන් රජ්ජුරුවන් හා කථා කරන්ට කට දල්වා ලූ කලට එකි එකී එළු බෙටියක් අතකුරු කොට ගසා ලති. පුරෝහිතයෝ ත් කටට වන්

Non-Commercial Distribution

වන් එළුබෙටි සැම තමන් කරණ කථාවෙහි ම හී ගෙන ගිලෙති. පිළාණෝ ද එළු බෙටි නිම් කල තිර ය සොලවා ලූ ය, රජ්ජුරුවෝ ඒ සලකුණෙන් එළු බෙටි නිම් නියා ව දන 'ආචාරීනි, මා මුඹ හා කථා කොට පය ඇද ගෙන නැඟී යන්ට බැරි ය. මුඹ වැළි ත් එළු බෙටි නැළියක් විතර ගල ත් දෙඩීම් තබා පියා නො හෙ ත් දැ' යි කිවු ය. පුරොහිතයෝ ත් ලජ්ජා ව එ වක් පටන් රජ්ජුරුවන් හා එළු බෙටි බොහෝ ව යේ නමු ත් ය යි බොහෝ කොට කථා නො කෙරෙති. රජ්ජුරුවෝ ත් පිළා ගෙන්වා ගෙන 'තොප නිසා නැතක් දවස් පටන් කන් කෙටුවීම් නැති ව සුව සේ හුන්නෙමි' සතුටු ව ප්‍රයොජනවත් වූ සියල්ලෙන් අටක් අටක් දෙවා ලා නුවර සතර දිගින් ගම් සතරක් දුන්හ.

ඉක් බිත්තෙන් එක් මිනිසෙක් පිළාණන් ලත් සම්පත් දැක සිතන්නේ 'මේ පිළා පවා මේ සිල්ප ය නිසා මේ සා මහත් සම්පතක් ලද මා ත් මේ ශිල්ප ය උගත්තො ත් යහපතැ' යි සිතා උන් කරා ගොසින් වැඳ ලා 'ආචාරීනි, තෙල සාලිත්තක ශිල්ප ය මා ත් උගන්වා ලුව මැනැවැ'යි කී ය. උයි ත් ඒ ශිල්ප ය ලසුව යෙතී යන අදහසින් උගන්වන්ට බැරි ය යි මැළි ව කිවු ය. වන්නාට ය, සිත් ගෙන ඉල්වා ගනිමි' සිතා උන්ට කීකරු ව කී යම් දෙයක් ම කොට සිත් ගෙන ලා ශිල්ප ය ඉල්වි ය. උයි ත් උපකාරී ව සිටි හෙයින් ශිල්ප ය උගන්වා ලා ශිල්ප ය ඉගෙන නිමියේ. ඉතිකින් කුමක් කරවු දැ'යි විචාළෝ ය. 'පිටතට පලා ගොසින් ශිල්පය අතට ආ නියාව විමසමි' කී ය. 'විමසන්ට කරන්නේ කිම් දැ' යි කී හෙයින් ගෙරි සරකක් හෝ මිනිස් කෙණකුන් හෝ පැහැර මරමි' කී ය. කුඩෙනි, සරකක් මරා පීවො ත් දඩ සියයෙක් ඇත. මිනිස් කෙණකුන් මරා පීවො ත් දඩ දහසෙක. තොප දුප්පත් හෙයින් ඒ පසිඳලන්ට බැරි ය. ශිල්ප විමසම්හ යි තො නසුව. යම් කෙණකුන් මළ කල දඩෙක් මුඩෙක් නැත් නම් මවු පියන් නැති සෙසු නෑ සිය කෙණකු ත් නැති එ බඳු කෙණකුන් මැරුව මැනැවැ'යි කිවු ය.

උයි ත් 'යහපතැ'යි ගිවිස කිරිවාණ හකුරු ඉන ලා ගෙන එ බඳු කෙණකුන් බලා හැව්දිනේ දෙනක දැක ඇට ත් නො ගසා මිනිසකු ත් දැක දඩ දහස දී ලන්ට බැරි හෙයිනු ත් ඌ ගේ දෙ මවු පියන් ඇති හෙයිනු ත් ඌට ත් නො ගසා තව ත් බලා ඇවිද්දී. එ කල සුනෙත්ත නම් පසේ බුදු කෙණෙක් නුවර නිසා පන්සලෙක වෙසෙති. සිඟා එන්නවුන් නුවර වාසල කෙරේ දී දැක ලා 'මුන්ගේ මවු පියෝ නැත. මුන් මළ යි දඩ ත් නැතැ'යි සිතා උගත් ශිල්ප

Non-Commercial Distribution

යෙන් ලබන ප්‍රයෝජන ත් නැති ව බොහෝ අකුසල් රැස් කෙරෙමින් පසේ බුදුන්ගේ දකුණු කන් සිදුර කරා අතකුරක් ගසා ලී ය. උන්ගේ ත් එ බඳු අකුශල කර්මයක් පැමිණ ගසා ලූ හකුර දකුණු කන සිදුරෙන් වැදී ලා වම් කන් සිදුරෙන් නික්මිණ. බලවත් දුක් වි ය. පසේ බුදුහු සිඟාගත නො හී අහසින් පන්සලට ගොසින් පිරිනිවියහ. මිනිස්සු දෙ වන දවස් පසේ බුදුන් නො ආ හෙයින් අජාසුවක් නියා ය යි සිතා පන්සලට ගොසින් පිරිනිවියා දැක හැඬූහ.

ඒ කාලකණ්ණියා ත් බොහෝ දෙනා යන්නවුන් දැක තෙමේ ත් ගොසින් පසේ බුදුන් හැඳින ගෙන 'මූ සිඟා යන ගමනේ වාසල කෙරේදී මට ළං වූ ය. ශිල්ප ය විමසන්ට ය යි අතකුරක් ගැසූ යෙම් මම ය'යි කීය. මිනිස්සු ත් 'පසේ බුදුන් වහන්සේ මැරුයේ තෙලෙ ල. තුලූ අල්වව'යි කියා ලා අල්වා ගෙන මරා පීහ. නිරවද්‍ය ශිල්ප උගත්තෝ මෙහ ලෞකික වූ ත් පාර ලෞකික වූ ත් ප්‍රයෝජන ලැබෙ ත්. මේ තමා උගත්තා සාවද්‍ය ශිල්ප ය හෙයින් මරණ ලද. මිය ත් අධොමුඛ නකකින් ශාස්ත්‍රයට පටන් ගත්තා සේ අවීචියෙහි ඉපැද අනන්ත කල්පයක් පැසී තව අකුසල් නො ගෙවුණු හෙයින් ගිජු කුළු පවුවෙහි ප්‍රේත ව උපනැ යි වදුරා ලා 'මහණෙනි, අඥනයෝ යම් ශිල්පයක් දනි ත් නම් එයි න් යම් සම්පතක් ඉසුරක් ලද්දු නම් එයින් වැයෙන් පොරොවෙන් කොටන සේ නො දන කොටන්නවුන්ට අනර්ථ එළවන්නා සේ යම් තාක් ම අනර්ථ එළවයි. කුමක් මෙන් ද? යත්—සාලිත්තක ශිල්ප ය උගත්තා මෙනි. එ සේ වූවන්ගේ නුවණෙක් ඇත් නම් එයි ත් නසමින් කුසල් කොටසු ත් නස යි'' වදළ සේක. මේ දෙශනා කෙළවර ත් බොහෝ දෙන සෝවාන් ඵලාදියට පැමිණ නිවන් පුර වන්හ.

නුවණැත්තවුන් විසින් උගන්නා ශිල්පය ත් අනර්ථාවහ නො වන නිරවද්‍ය දෙයක් ම ඉගෙන ලබන සම්පතුන් දැහැමෙන් සෙමෙන් ම ලැබ ශිල්ප හා සම්පත් හා දෙකින් ම මෙ ලෝ පර ලෝ වැඩ සාධනු මැනවි.

## 70. සුධර්ම තෙරුන් වහන්සේ ගේ වස්තුව

තව ද අනුශාසනා මුඛයකින් නො ව සැටුණු සිතින් සටා බිණීමෙහි නපුර හඟවනු නිසා සුධර්ම තෙරුන්වහන්සේගේ වස්තුව දක්වමු.

Non-Commercial Distribution

එක සේ ද යත්—

මච්ඡිකාසණ්ඩ නම් නුවර චිත්ත නම් සිටාණෝ පස් වග වහන්දෑට ඇතුළත් මහානාම තෙරුන් වහන්සේ සුපිළිසන් ලෙසින් සිඟා වඩනා දැක ඔබගේ පියොවෙහි පැහැද පාත්‍ර ය හැර ගෙන ගෙට වඩා ගෙන ගොසින් වළඳවා ලා, වළඳා අන්තයෙහි බණ අසා සෝවාන් වීමෙන් තුමූ නිවන් වළඳා ගෙන මහ මෙර සැලි යේ නමුත් නො සැලෙන සැදෑ ඇති ව තමන්ගේ අම්බාටක වන නම් උයන වහන්දෑට පිළිගන්වනු කැමැති ව මහානාම තෙරුන් වහන්සේ අත පැන් වත් කොට උයන පිළි-ගැන්වූහ. එ වේලෙහි බුදුසස්න පොළව ත් පිහිටි ය යි දිය පොළොව දක්වා මහ පොළොව වෙවුලා ගියේ ය. මහ සිටාණෝ උයන විහාරයක් කරවා ලා සියලු දිගින් වඩනා වහන්දෑට සාඞ්සික කොට පිළිගැන්වූහ.

මච්ඡිකාසණ්ඩ නම් නුවර ත් සුධර්ම නම් තෙර කෙණකුන් වහන්සේ නෙවාසිකව හිඳිනා සේක. පසු ව කලෙක දී චිත්ත නම් සිටාණන්ගේ යහපත් තරම් අසා දෙ අග සවුවන් වහන්සේ උන්ට සංග්‍රහ කරණු කැමැති ව ඒ සිටාණන් වසන නුවරට වැඩි සේක. චිත්ත නම් සිටාණෝ ත් ඔබ දෙ දෙනා වහන්සේ වැඩි නියාව අසා දෙ ගවුවක් විතර පෙර ගමන් කොට ගොසින් වඩා ගෙනවු ත් විහාරයේ ලා ලා ආගන්තුක සාද කොට ලා බණ සුහක් අසනු කැමැත්තෙන් ධම්සෙනෙවි සවාමීන්ට ආරාධනා කොළෝ ය. ඔබ ත් 'ගමන් ආයාස ඇත. මඳක් අසව'යි වදරා ලා යත් තම් බණක් වදළ සේක. උං ඔබ ගෙන් බණ අසා අනාගාමී වූ ය. අනාගාමී ව ලා දෙ දෙනා වහන්සේ නිත්‍ය පරිවාර දහසක් දෙනා වහන්සේ හා සමඟ දෙ වන දවස් තමන්ගේ ගෙයි දී වළඳනට වඩනට පෙරාතු ආරාධනා කොට ලා පසු ව නෙවාසික සුධර්ම නම් තෙරුන් වහන්සේ ත් දෙ දෙනා වහන්සේ ලා කැටි ව ම සිඟා යන්ට ආරාධනා කොළෝ ය. පසු කොට ලා ආරාධනා කළ හෙයින් මුසුප්පු ව ලා කිප විටක් කොට උපාසකයන් ආරාධනා කළ ත් නො ඉවසූ සේක.

උපාසකයෝ ද 'මුඹ වහන්සේගේ නො දූන් ම නිසා මුඹ වහන් සේ ම පෙනෙන සේක් වේද'යි කියා ලා පලා ගොසින් දෙ වන දවස් තමන්ගේ ගෙයි මහ දන් සැරහූ ය. සුධර්ම තෙරුන් වහන්සේ ත් සිටාණන් අගසවු වහන්දෑහට දන් සැරහූ සැටි ය. මාගේ වැළඳීම් නැත ත් සෙට ගොසින් බලා පියමි' සිතා ලා උදසන ම පා සිවුරු හැර ගෙන උන්ගේ ගෙට වැඩි සේක. 'සවාමීනි, වැඩහුන

Non-Commercial Distribution

මැනැවැ'යි සිටාණන් කීව ත් නො රදා ම 'සිහා යෙමි'යි කියා ලා යන ගමන් නැඟී ත් නො ගොසින් සිටාණන්ගේ දත් බලා පියා ආදි මුසුප්පු ඇත ත් දත් මා හැඟි නියාව දක සමාධි වුව මනා තැන රොෂ සිතින් සිටාණන්ට තල කුලයක් කියා බණනු නිසා 'සිටාණෙනි, තොපගේ දත් යහපත. එකක් නැති හෙයින් අඩු ව ඇතැ'යි කියා ලා 'කුමක් ද? නැත්තේ ය'යි විචාළ කල්හි 'සුණ්ඩැහි ය'යි කියා සිටාණනු ත් කවුඩන් වැනි කොට දෙඩූ කල්හි ආරාධනා පසු කළාට ත් වඩා උරණ ව 'තෙල තොපගේ විහාර ය පාවා ගනුව. යෙමි'යි කියා තුන් විටක් දක්වා රඳන්ට සිටාණන් කීව ත් නො රදා බුදුන් ළඟට ගොසින් උන් කී බස ත් තමන් වහන්සේ කී බසු ත් බුදුන්ට දැන්වූ සේක.

බුදුහු සැදෑ ඇති උපාසකයන් තබා සැදෑ නැති කෙණකුන්ට වූ වත් ජාත්‍යාදීන් සටා බිණීම් නපුර. මුන්ට ත් ජාතීන් සටා බිණූ බව නපුරැ'යි වරද තෙරුන් වහන්සේ කෙරෙහි ම නඟනු පිණිස පටිසාරණීය කර්‍ම යත් කරවා කර්‍ම ය ලදින් ගිය ත් සිටාණන් ක්‍ෂමා නො කරණ නියා ව දැන වදරත ත් 'මුන්ගේ මන් අධික ය, එක් සිය විසි ගවුවක් ඇවිදුවා ලීමෙන් මන් හරවා ලිය හැක්කැ'යි සිතා වදුරා ක්‍ෂමා කරවන උපදෙස නො වරදවා ම 'යව, සිටාණන් ක්‍ෂමා කරව'යි යවූ සේක. උන් වහන්සේ ත් ඔබ ගොසින් 'සිටාණෙනි, වරද අපගේ ම ය. ක්‍ෂමා කරව'යි වදළ සේක. කළ මනා දෑ තව ඇති හෙයින් 'ක්‍ෂමා නො කෙරෙමි' සිටාණන් කියන්නා ක්‍ෂමා කරවා ගත නො හී පොළොව පැකිළ ගියවුන්ට පොළොව ම පිහිට වන්නා සේ පිහිට නම් බුදුන් ම හෙයින් පෙරළා ත් බුදුන් ම කරා ගිය සේක.

යැමෙන් ඊමෙන් දෙ සිය සතළිස් ගව්වක් ඇවිද මන් හැර ගත් කලට අනික් නමකට 'තෙපි ගොසින් ක්ෂමා කරවා ලව'යි වදරා ලා 'මහණුන් විසින් නම් අපගේ විහාර ය, අප වසන තැන ය, අපගේ උපාසකයෝ ය. අපගේ උපාසිකාවෝ ය, යනාදීන් සිතා මනක් වේව යි ඊෂ්‍යාවක් වේව යි කිරීම නපුරැ'යි වදරා ලා බණ වදරන සේක් ''හෙම්බා සුධර්‍මයෙනි, නුවණ නැති මහණ තෙමේ සැදෑ නැතිව ත් සිල් නැතිව ත් ඇසූ පිරුවූ තැන් නැතිව ත් විවේක වාස ය නැති ව ත් සියල්ලෙහි ම මැළිව ත් සිහි නැතිව ත් රහත් නොව ත් සත්‍වයෝ තුමූ 'මුන් වහන්සේ සැදෑ ඇති සේක. සිල්වත් සේක. ආගමධර සේක. විවේක වාස ය ඇති සේක. වඩනා ලද වීර්‍ය්‍ය ඇති සේක. එළඹ සිටියා වූ සිහි ඇති සේක. එකඟ වූ සිත්

Non-Commercial Distribution

ඇති සේක. නුවණැති සේක. රහත් සේකැ'යි මා දනිත්ව'යි අවිද්‍යා මාන ගුණෙන් ම සම්භාවනා කැමැති වන්නේ ය. නැවත තමාගේ කිසි දැන්මක් නැත ත් 'සියළු වෙහෙර වහන්දැ මා ම පිරිවරා ඇවිදිනා සේක් නම් යහපතැ'යි, ප්‍රශ්න විචාරත ත් මා අතින් ම විචාරතො ත් යහපතැ'යි නපුරු අදහසින් භික්ෂූන් පිරිවරා ඇවිදීම ත් කැමැති වෙයි.

නැවත සාඞ්ඝික විහාරවලට පලා ගොසින් යහපත් සෙනසුන් හිතමිත්‍ර භික්ෂූනට පමුණුවා පියා තෙමේ ත් යහපත් සෙනස්නක් පමුණුවා ගෙන කසළ ව තිබෙන, දුරු ව තිබෙන, උවදුරු ඇති ව තිබෙන, සෙනස්නෙක් ඇත් නම් 'තමන් තිලි විසුව මැනැවැ'යි ආගන්තුක තැනට පමුණුවමින් මෙ සේ විහාරවල ත් තමාගේ ඉසුරු පවත්වනු කැමැති ය. නැවත දෙ මවු පිය කමක් වේව'යි සෙසු නෑ සිය කමක් වේව යි නැති ව උපාසක වරුන් සාමාන්‍ය අදහසින් කරණ ලද උපස්ථාන අනුන්ට නො කොට මට ම කෙරෙත් නම් යහපතැ'යි සිතයි. තව ද 'ගිහින් වුව ත් වහන්දෑ වුව ත් විහාරවල යම් යම් කර්මාන්තයෙක් ඇත් නම් මා ම කරවූ වා කොට සිත ත් මුත් ඒ දෙ පක්‍ෂයට ම අනික් කෙණකුන් කරවූව යි යන අදහසෙක් නො වේව'යි යන මෙ සේ වූ පවිටු අදහසු ත් ඇති වෙයි.

තව ද ගිහි වුව ත් වහන්දෑ වුව ත් විහාර කර්මාන්තයෙහි දඬු පත් ගෙනෙන්ට ගැල් හා ගොන් වුව ත් දඬු පත් කොටන්ට යකඩ යසැත් වුව ත් ලැබ්බ යුතු වී නම් එයි ත් යටත් පිරිසෙයින් කර්මාන්ත කරන්නවුන්ට උළුකැන් පමණක් බත් පමණක් වුව ත් කුඩා මහත් කවර ත් කට යුත්තෙක මා ම මුල් කොට මා විචාරා කරත් මුත් අනික් විධානයෙක නො පවත්ව'යි යන මෙ සේ වූ අදහසෙකු ත් ඇති වෙයි. යමක් හට මෙ බඳු ඉච්ඡා හා මේ බඳු අදහස් ඇති වූ නම් උන්ට භාවනායෙන් එක් තරා භාවනාවෙකු ත් ඇති නො වෙයි. හෝ හිස වැසි නැති කලට හොය පැන් නැත්තා සේ විවසුන් නැති හෙයින් ම මාර්ගාධිගම-ඵලාධිගම ත් නැත. සඳපානට මූද වඩ නා 'දිය සේ' හුදක් ස දෙර උපදනා තෘෂ්ණාව හා නව විධ මාන ය ම වඩ'යි වදළ සේක. හුදක් සුධර්ම තෙරුන් වහන්සේට ම වදළ බණක් නො වන හෙයින් බොහෝ දෙන සෝවාන් ඵලාදියට පැමිණ ඉච්ඡාව ත් මානය ත්, දුරු කළහ.

සුධර්ම තෙරුන් වහන්සේ ද මේ අවවාද අසා බුදුන් වැඳ පැද කුණු කොට ලා පාවා දීලූ වහන්දෑ නම කැඳවා ගෙන ගොසින් ගිහි

---

1 මූද බඩ දිය සේ, මූද වඩ (නා) දිය සේ

Non-Commercial Distribution

පටිසංයුක්ත හෙයින් උපාසකයන්ට පෙනෙන තැන හිඳ ඇවැත් දෙසා ගෙන උපාසකයන් ක්ෂමා කැර වූ සේක. උපාසකයනු ත් 'මම ක්ෂමා කෙළෙම්. මාගේ වරදෙක් ඇත් නම් ඔබ ත් ක්ෂමා කළ මැනැවැ'යි කී කල්හි සුධර්ම තෙරුන් වහන්සේ ද ක්ෂමා කිරී-මෙන් සර්වඥ අනුශාසනාවෙහි සර ව පිහිටා කීප දවසකින් පිළිසිඹියා පත් රහත් වූ සේක.

චිත්ත නම් සිටාණෝ ත් 'මම ත් බුදුන් නො දැක ම සෝවානු ත් වීමි. තව ත් නො දැක ම සෙදගැමි ත් වීමි. අනගැමි ත් වීමි. බුදුනු ත් දිටිම නම් යහපතැ'යි සිතා දනොපකරණ වූ උඳු මුඟු සාල් තල ගිතෙල් මී සකුරු යනාදීන් හා සිවුරු පිළි ආදි වූ මහ පිරිකරින් ගැල් පන් සියයක් පුරා ගෙන 'බුදුන් දක්නට වඩනා තැනක් වඩනා බව ය. යාදී ත් බතින් අඑාසුවක් නො කෙරෙමි'යි භික්ෂූන් වහන්සේට ත් භික්ෂුණීන් වහන්දැට ත් උපාසක උපාසිකා වරුන්ට ත් කියා යැවූහ.

උන් හා කැටි ව සහ පන් සියයෙක් ද, මෙහෙණින් පන් සියයෙක් ද, උපාසක පන් සියයෙක් ද, උපාසිකා පන් සියයෙක් දැ යි දෙ දහසක් විතර පිට ත් අය ත් නික්මුණාහ. සිටාණෝ ඒ දෙ දහසට ද තමන් ගෙන් දහසකට දැ යි තුන් දහසකට එක් සිය විසි ගවුවක් විතර මහ යම් සේ බතින් බුලතින් අඩුවෙක් නො වේ නම් එ ලෙසට විධාන කළහ. සිටාණන් සැවැත් නුවරට යන නියා ව අසා දෙවියෝ සතර ගවුවෙන් සතර ගවුවට කඳවුරු බැඳ ගෙන දිව බත්, දිව කැඳ, දිව අවුළු පත් ආදියෙන් සිටාණන් හා කැටි ව යන එ තෙක් දෙනාහට සංග්‍රහ කළහ. කිසි කෙණකුන්ට කිසිවකිනු ත් අඩුවෙක් නො වී ය. මෙ සේ දෙවියන් ගෙන් සාද විඳිමින් දවසකට සතර ගවුවෙකින් වඩා නො යන සිටාණෝ මසකින් සැවැත් නුවරට ගියහ. ගැල් පන් සිය ය පිරුණු වන ම තුබූයේ ය. දෙව් මිනිසුන් ගෙනා දෙය ම වියදම් වී ය.

බුදුහු අනඳ මහ තෙරුන් වහන්සේ බණවා ලා 'ආනන්දයෙනි, අද පස් වරු චිත්ත නම් සිටාණෝ පන් සියයක් උපාසකවරුන් පිරිවරා අවුත් මා වඳිති'යි වදාළ සේක. වදාළ ලෙසින් ම අදහස දැන 'කුමක් ද ස්වාමීනි, උන් අවුත් වඳනා කල වන පෙළහරෙක් ඇත් දැ'යි විචාරා 'එ සේ ය, ඇතැ'යි වදාළ කල්හි කුමක් දැ යි විචාළ සේක. 'උන් අවුත් මා වඳනා කලට එක් යාළ දෙළොස මුණක් වපයන බිම ඔබා ලූ කලට දණ පමණ ලෙසට පස් වනක් මලින් ඝන වැස්සක් සේ මල් වැස්සෙක් වස්සී'යි වදාළ සේක. ඒ කථාව

Non-Commercial Distribution

අසා නුවර වැස්සෝ 'මෙ බඳු ආනුභාව ඇති චිත්ත නම් සිටාණ කෙණෙක් අවුත් අද බුදුන් වඳිත් ල, මෙ බඳු පෙළහරෙකුත් වේ ල. අපි ත් ඒ මහා පිණැත්තාණන් දකුම්හ'යි දුවු කල දෙන්ට පඬුරු හැර ගෙන මහ දෙවනත සිටියහ.

විහාර ය ළඟට ගිය කලට පන් සියයක් වහන්දෑ උන් හා කැටි ව ම බුදුන් කරා යාම් කිම් දූ යි පෙරාතු ගිය සේක. චිත්ත නම් සිටාණෝ උපාසිකාවරු පන් සිය ය පසු ව ලා එන්ට සම්මත කොට ලා පන් සියයක් උපාසකවරුන් පිරිවරා බුදුන් ළඟට ගියහ. බුදුන් ඉදිරි ව ලා අවුරා ගෙන එ සේ මෙ සේ හිඳිනා කෙණෙකු ත් නැත. සිටිනා කෙණෙකු ත් නැත. ඉදිරි දසාවෙන් කෙ තෙක් තැන් වුව ත් බුද්ධ වීථිය හාර ලා දෙවන ත් ව දෙ පෙළේ සිටුවා ලූ ගල් රූ පරිද්දෙන් නිශ්චල ව සිටිති. සිටාණෝ ත් හැර තුබුවා වූ බුද්ධ වීථියට බටවූ ය. අනැගැම් සිටාණන් බැලූ බැලූ අත ම උන්ගේ ගුණානුභාවයෙන් වෙවුලන්නා සේ වි ය. බොහෝ දෙන ත් ගුණ ශොභාව ත් වැද ගොසින් ඉතා හොබනා උන්ගේ රූප ශොභාව බලති. උයි ත් බුදුන් කරා ගොසින් සවනක් බුදු රස් හස්සට වැද ලා අඩු ව තුබූ ශොභාවෙක් ඇත් නම් ඉන් අඩු ව හැර බුදුන්ගේ දෙ පය වළලුකර දී අල්වා ගෙන වැඳ ගත්හ. එ වේලෙහි යට කියා ලූ ලෙසට බුදුන් කෙරෙහි හැදහිලි නැත්තවුන්ට හැදහිලි උපදවමින් මල් වැස්ස වැස පී ය. බොහෝ දෙන සාධු කාර දුන්හ.

මසක් මුළුල්ලෙහි ම බුදුන් ළඟ ම රඳා හුන්හ. හිඳිනා ගමනේ ත් ඒ මස ම බුදු පාමොක් වහන්දෑ සිඟා නො යවා වෙහෙර ම රඳවා ලා මහ දන් දුන්හ. තමන් හා කැටි ව සෙසු ආවුනු ත් ඇතුළු වෙහෙර ම රඳවා බත් පසුන්හ. එක දවසෙක ත් තමන්ගේ ගැල්වලින් වියදම් වූ දෙයෙක් නැත. කරණ වියදමට දෙව් මිනි සුන් ගෙනා දෙය ම ඇති වි ය. සිටාණෝ තුමූ බුදුන් වැඳ ලා 'ස්වාමීනි, මම මුඹ වහන්සේට දන් දෙන්ට එන්නෙම් අතුරු මහ මසක් ම රැඳිණිමි. මුබ ත් මසෙක් ගියේ ය. ගැල් පන් සියයෙන් ගෙනා දෙයින් කිසිවකට ත් අඩුවෙක් නො පැනිණ. මේ දෙ මස දනට ත් සෙසු වියදමට ත් දෙව් මිනිසුන් ගෙනා දෙය ම සැහිණ. ඉදින් මම මී හවුරුද්දක් රඳා හුනිම් නමුත් කළ පින් නො ගෙවෙන්නා සේ ම සම්පතු ත් නො ගෙවෙයි. ගැල් අවසර කොට ගෙන යනු කැමැත්තෙමි. දනොපකරණ ය ලවා පියන තැනක් වදළ යහපතැ'යි කිවු ය. බුදුහු තමන් වහන්සේ ඒ වදරන්ට තරම් නො වන හෙයින් අනඳ මහ තෙරුන් වහන්සේට 'ආනන්ද

Non-Commercial Distribution

යෙනි, එක් නිසි තැනක් අවසර කරවා දී ලව'යි වදාල සේක. ඔබ ත් එක් තැනක් අවසර කරවා දුන් සේක. බුදුහු ත් කැප කිළි චිත්ත නම් සිටාණන් මුල් ව අනු දත් සේක.

සිටාණෝ තමන් හා කැටි ව ආ තුන් දහසක් කැඳවා ගෙන සිස් ගැලු ත් ගෙන්වා ගෙන යන්ට නික්මුණවු ය. දෙව් මිනිස්සු 'හැයි, ස්වාමීනි, මුඹ කළ පින් සිස් ගැල් ගෙන්වා ගෙන යන තරමට දැ'යි ගැල් පන් සිය ය සත් රුවනින් පුරා ලූ ය. අබුද්-ධොත්පාද කාලයෙහි දනක් දෙන්ට සිතූ අඞකුර රජ්ජුරුවන්ගේ ගැල් පන් සිය ය සත් රුවනින් පුරා ලූ කල බුදු පාමොක් සඟනට දන් දී යන සිටාණන්ගේ ගැල් පිරී ම විස් ම නො වෙයි. ගැල් පුරා සත් රුවන් තිබිය දී ම මුදල සිටිය දී පොලියෙන් ම ප්‍රයෝජන විඳිනා සේ පෙරළ පෙරළා ත් ගෙනෙන පඬුරෙන් ම කැටි ව යන තැනට බත් පසිඳුවති.

අනඳ මහ තෙරුන් වහන්සේ බුදුන් වැඳ ලා ''ස්වාමීනි, චිත්ත නම් සිටාණෝ මුඹ වහන්සේ ළඟට එන ගමනේ ත් මසක් විතරින් අවු ය. අවුදිනු ත් මසක් රඳා හුන්න. මෙ තෙක් දවස් මුළුල්ලෙහි ගෙන්වා ගෙන ආ දෙය තිබියදී දෙව් මිනිසුන් ගෙන් ලත් පඬුරෙන් ම දන් දුන්හ. දුන් ගැල් අවසර කරවා ගෙන මසක් විතරින් ම සිය නුවරට යෙති. දෙව් මිනිස්සු ගැල් සිස් නියාව දැක 'කොට පුරා පී පින් කම් විපාකයෙන් සිස් නො වත් ගැල් සිස් වන්ට කාරණ කිම්දැ'යි සත් රුවන් පුරා ලූ ය. තවත් තවත් ලත් පඬුරෙන් කැටි ව යන තැනට බත් දෙවති. කුමක් ද? 'ස්වාමීනි, මුඹ වහන්සේ ළඟට එන කල ම බුද්ධානුභාවය ත් එක් ව ලා මේ සත්කාර උපද්දීද? නොහොත් අනික් තැනකට යන ත් මෙ ලෙස ම වේදැ'යි විචාළ සේක. 'ආනන්දයෙනි, මා කරා එත ත් කොයි යෙත ක් තෙල සත්කාර ය, තුලුන්ට වන ලෙස ම ය'යි වදාළ සේක.

ඒ අසා අනඳ මහ තෙරුන් වහන්සේ උන් පෙර කළ පින් කම් විචාළ සේක. බුදුහු වදරන සේක් ''හෙම්බා ආනන්දයෙනි, මූ පියුමතුරා නම් බුදුන් සමයෙහි 'උපාසකවරුන් ගෙන් අග්‍ර උපස්ථායක ව එක් තරා බුදු කෙණකුන් වහන්සේට උපස්ථාන කට හෙම්ව'යි පතා කප් ලක්‍ෂයක් මුළුල්ලෙහි දෙව් සැප ත් මිනිස් සැප ත් වළඳා කසුබ් බුදුන් සමයෙහි වැදි කුලයෙක ඉපැද වැසි වට දවසෙක මුවන් මරණු නිසා තෙබ හැර ගෙන වලට ගොසින් මුවන් බලන්නෝ එක් ගල් තල්ලෙක හිස් වසා පෙරව ගෙන එක් භික්ෂු කෙණකුන් හුන්නා දැක 'මුන් වහන්සේ මෙ තැන වැඩ හිඳ මහණ ධම් පුරන නියා වන.

Non-Commercial Distribution

මුන් වහන්සේට බතක් ගෙනෙමි'යි 'වහා ගෙට ගොසින් ඊයේ ගෙනවු ත් තුබූ දඩ මසකු ත් ඇති හෙයින් එයි ත් බතු ත් පිසවා ලා සිහා ආ භික්ෂු කෙනකුන් දැක උන්ගේ පාත්‍ර ය හැර ගෙන ගෙයි හිඳුවා ලා දන් ඉදි කොට මුන්වහන්සේ වළඳව'යි අනික් කෙනකුන්ට විධාන කොට ලා ගෙන යන බත නිසි වළ-දෙක ලා ගෙන යන්නෝ අතුරු මහ දී වන පස මල් කඩා මුළෙක බැඳ ගෙන ගල් තල්ලේ හුන් භික්ෂූන් කරා ගොසින් 'ස්වාමීනි, කරුණා කළ මැනවැ'යි කියා ලා පාත්‍ර ය පුරා ලා භික්ෂූන්ට පිළි-ගන්වා ලා වන පස මල් පුද ලා 'යම් සේ මේ මල් පූජාව හා ඇමහ මස් රසයෙන් යුක්ත වූ මේ බත මා සතුටු කරවා ද, එ පරිද්දෙන් මා උපනුපන් තැන දහස් ගණන් ලක්ෂගණන් පඬුරු ගෙනවු ත් මා සතුටු කෙරෙත් වා යි, උපනුපන් තැන පස් වනක් මල් වැසි ත් වසීව'යි පැතූ ය.

උඃ ආයු පමණින් දඩ මස් මැරීමට නො හිඳ පින් කොට දෙව් ලොව උපන්හ. දෙව්ලොව උපන් දණ පමණට මල්වැසි වට මේ ජාතියෙහි ත් උපන් දවස් මල් වැසි වැසීම ත් මෙ තැනට ආ දවස් මල් වැසි වැසී ම ත් මහ වතුරක් මෙන් පඬුරු ගෙනීම ත් සත් රුවනින් ගැල් පිරී ම ත් වැදි ව උපන් සමයෙහි කළ පින් කමෙහි අමුබාය විපාක ය'යි කියා වදාළ සේක.

නුවණැත්තවුන් විසින් එක බත් පාත්‍ර ය ලා එක මල් මුළෙක විපාක මෙ තරම් කල බොහෝ බත් පාත්‍රවල බෝසේ මල් මුළුවල විපාක කියනු ම කිම් දැ'යි පිළිවන් ව පෙනෙන මලු ත් ඉඳුරා ම පුද අභිඳු මල් පැළඳ නිවන් පුරට යා යුතු.

## 71. වනවාසික තිස්ස තෙරුන් වහන්සේ ගේ වස්තුව

තව ද ලසු වූ ම කුශලයෙහි විපාක ය මහත් නියාව හඟවන්-නට වනවාසික තිස්ස තෙරුන් වහන්සේ ගේ වස්තුව දක්වමු—

කෙ සේ ද යත්—

සැරියුත් මහ තෙරුන් වහන්සේට පිය වූ වඩගන්ත නම් බමුණා-නන්ට යාළු වූ මහාසේන නම් බමුණාන කෙණෙක් රජගහ නුවර හිඳිති. සැරියුත් මහ තෙරුන් වහන්සේ එක් දවසක් සිහා වඩනා ගමනේ 'මහා සේන නම් බමුණානන්ට පර ලොවින් වැඩක් කෙරෙමි'යි උන්ගේ ගෙ දොරට වැඩි සේක. බමුණානෝ ද වැළි ත් සම්පත් නැති ව දුක් පත් වූහ. සිහා වැඩි මහ තෙරුන් වහන්සේ දැක, 'ම පුතණුවන් වහන්සේ මා ගේ ගෙට සිහා වැඩි සැටියට මම ත් ඉතා දුක් පත් වීමි. මා දුක් පත් නියාව ත් දත් සැටි නො

Non-Commercial Distribution

වෙයි. දූක අරුණු' යි කීම බලා ත් නො දක්වීම යහපතැ'යි සැඟවී ගත්හ. මහ තෙරුන් වහන්සේ උන් ගෙන් ලබන බතකට ත් වඩා තමන් වහන්සේ මුල් ව පරලොවින් උන් ලබන ප්‍රයෝජන ය ම සලකා තව ත් දවසක් එ ගෙට සිහා වැඩි සේක. බමුණා නෝ ත් තමන්ට පිළිවන් එ ම හෙයින් සැඟවී ගත්හ. 'කිසිවක් ලදිම නම් පිළිගන්වමි' සිතා ත් නො ලැබෙති.

ඉක් බිත්තෙන් එක් දවසක් බමුණන් හෝම කරණ තැනින් දළ හිණ කඩක් හා කිරි බත් තළිය ත් ලදින් ගෙට ගෙනවුත් තබා ලා මහ තෙරුන් වහන්සේ සලකුණු කළහ. මහ තෙරුන් වහන්සේ ත් එ වේලෙහි ධ්‍යානයට සම වැද ලා ධ්‍යානයෙන් නැඟී ඒ බමුණන් දිවසින් දූක 'බමුණානෝ දිය යුත්තක් ලදින් මා දක්නා කැමැති වූ ය. මා එ තැනට ගිය මනා වේ දැ'යි ගැටවටු ගන්වා ගෙන පාත්‍ර ය පටවා ගෙන ගෙ දෙර සිහා සිටි සේක. මහ තෙරුන් වහන්සේ දූක බමුණානන්ගේ සිත ඉතා පහන් වි ය. පහන් සිතින් ගොසින් වැද ලා සාදසාමීචි කොට ලා ඇතුළු ගෙයි වඩා හිඳුවා ලා බත් තළිය හැර ගෙන ගොසින් මහ තෙරුන් වහන්සේගේ පාත්‍රයට පිළිගන්වන්ට වන්හ. භාගයක් විතර පිළිගන්වා ලන්නා උන්ට ත් භාග වූව මනා වේ දැ'යි අතින් පාත්‍රය වසා ගත් සේක.

බමුණානෝ ද 'සවාමීනි, මේ බත එක කෙණකුන්ට මුත් දෙන්නකුට සැහෙන්නේ නො වෙයි. මෙ ලොවින් කරණ සංග්‍රහ-යට ත් වඩා මට කළ මනා නම් පරලොව සංග්‍රහ ම ය. මත්තෙහි ලබන සම්පතු ත් කැබැලි නො වූව මනා වේ ද, හැම ම පිළිගන්-වමි' කියා ලා පිළිගන්වා පූ ය. මහ තෙරුන් වහන්සේ ත් වළඳන නියා ව බලා සිත පහදවනු පිණිස එ ගෙයි වැඩ හිඳ ම වැළඳූ සේක. වළඳා අන්තයෙහි ඒ කඩ ත් පිළිගන්වා ලා වැද ගෙන 'සවාමීනි, අපට සෙස්සකින් ප්‍රයෝජන නැත, නිවන් සම්පත් ම ලදිම නම යහපතැ'යි නිවන් ම පැතූහ. නිවන් පතා පින් කළ කල සියල්ල ම සමෘද්ධ වන හෙයින් පතා ගත් නියා ව ගැටවා ය. මහ තෙරුන් වහන්සේ ත් ඒ එ සේ ම වේව'යි වදරා ලා අනු-මෙවුනි බණ ත් වදරා ලා නික්මුණු සේක් රඳා කළ මනා ප්‍රයෝජන නිමි හෙයින් දෙව්රම් වෙහෙරට ම වැඩි සේක.

දුක් පත් ව කළ පින් කම නම් ඉතා ම සිත සතුටු කරවා ලන හෙයින් බමුණානෝ ද ඒ දන් දී ලා පහන් සිතින් ආදි චෙතනා සේ ම, මධ්‍ය චෙතනා සේ ම, අපර චෙතනා ත් යහපත් කොට

Non-Commercial Distribution

ගෙන මහ තෙරුන් වහන්සේ කෙරෙහි ප්‍රේම ත් බලවත් කළහ කළ ප්‍රේම නො පිරිහෙලා ම මිය ගොසින් කළ යන්තම් උපකාරයට බලවත් ප්‍රත්‍යුපකාර විදිනා කැමැති ව රට බිම් විචාරා ගෙන යන්නා සේ මහ තෙරුන් වහන්සේ වැඩි සැවැත් නුවර ම ඔබගේ ම උපාසක කුලයෙක පිළිසිඳ ගත්හ. මුන් තමන් මහ පිණැති හෙයින් මෑණියෝ ත් තමන් බඩ දරු කෙණකුන් පිහිටි ජියා ව දූන සමණන්ට කිවු ය. උයි ත් උන්ට ඇඹුල් අධික දෙය හැරීම, ලුණු අධික දෙය හැරීම, ඉතා හුණු දෙය හැරීම, ඉතා සිහිල් දෙය හැරීම, යනාදී වූ ගබ පෙරහර දුන්හ. ගබ පෙරහර ලදින් සුව සේ දරු ගැබ පිරිමසන්නා වූ උන්ට මෙ බඳු දොළෙක් ඇති වි ය.

කෙසේ වූ දොළෙක් ද යත්—'සැරියුත් සවාමීන් ප්‍රධාන කොට ඇති පන් සියයක් දෙනා වහන්සේට ආරාධනා කොට ගෙයි වඩා හිඳුවා පැන් නුමුසු හුදෙක් කිරින් පැසවා ගත් කිරි බතක් දන් දී ලා මම ත් රන් වන් පිළියක් හැඳ පෙර ව, රන් තැටියක් හැර ගෙන පාළී කෙළවර හිඳ එ තෙක් වහන්දෑ හළ බතක් අනුභව කෙළෙම් නම් යහපතැ'යි යන දොළෙක. උන් තමන් රන් වන් පිළි හඳිනට පොරෝනට දොළ ඇති වූයේ බඩ උපන් දරුවන් බුදු සස්නෙහි මහණ වීමට පූර්ව නිමිත්ත ය. උපාසිකාවන්ගේ දෙ මවු පියෝ ත් 'අපගේ දුවණියන්ට ඇති වූ දොළ දුක ඉතා ම යහපතැ'යි සැරියුත් සවාමීන් මුල් කොට පන් සියයක් දෙනා වහන්සේට පැන් අමිශ්‍ර කිරිබත් ඉදි කරවා දුන්හ. උපාසිකාවෝ ත් රන් වන් කඩක් හැඳ රන්වන් කඩක් පෙර ව රන් තැටියක් හැර ගෙන පෙළ කෙළවර හිඳ ඉඳුල් බත් අනුභව කළහ. දොළ ත් සන්හුන්හ. උන් දරුවන් වදන තෙක් සත් මසින් සුණු ගෑම් ආදී වූ මඟුලෙහි ත්, දස මස් අයාමෙන් පුතණුවන් වද පී කළ කරණ හිරු වඳ වන මඟුල් ආදි වූ මඟුලෙහි ත් ආදි ලෙසින් ම පන්සියයක් දෙනා වහන්සේට කිරි බත් දුන්හ. මේ සියල්ල ම කුමාරයන් දෙවන ජාතියෙහි මහාසේන නම් බමුණු ව දී ලූ එක කිරි බත් තළියේ විපාක ය.

උපන් මඟුල් කරණ දවස් ඒ කුමාරයන් උදසන ම නාවා පියා සරහා ලා ශ්‍රී යහනෙහි ලක්‍ෂයක් වටනා පලසක් මොළොකට අතුට ලා වැද හොවා ලූ ය. එහි වැද හොත් කුමාරයෝ ධර්මසෙනෙවි සවාමීන් බලා පියා ජාති සිහි කරණ නුවණින් 'මුන් වහන් සේ මට ආචාරී සේක. මා මේ සා මහත් සම්පත් ලද්දේ මුන් වහන්සේ නිසා ය'යි සිතා ගෙන තවත් 'මුන් වහන්සේට මේ

Non-Commercial Distribution

සම්පතට වඩා වැඩියුරු සම්පතක් ලබන්ට යමක් දෙමී' සිතා නම් තබන්ට ගෙනෙන ගමනේ වැද හොත් ඒ පලස සුළැඟිල් ලෙන් වෙලා ගත්හ. ඉක්බිත්තෙන් පලස ඇඟිල්ලේ ඇවිණ ගතැ යි ඇඟිල්ලෙන් ගළවන්ට පටන් ගත්හ. කුමාරයෝ හඬන්ට වන්හ. දෙ මවු පියෝ දරුවන් නො හඬව'යි කියා ලා පලස හා එක් කොට ම ගෙනවු ය. කුමාරයෝ ත් මහ තෙරුන් වහන්සේ වඳවන වේලේ පලස ඇඟිල්ලෙන් ගළවා ඔබගේ පාමුල හෙළා ලූ ය.

දෙ මවු පියෝ තමනු ත් සැදැ ඇති හෙයින් 'බාල දරුවෝ නො දන කොළෝ ය'යි නො කියා 'දරුවන් දීපු දෙය දීපු යේ ම ය'යි කියා ලා 'ස්වාමීනි, ලක්‍ෂයක් වටනා පලසක් දී ලූ වන්ට නම් තබා වදළ යහපතැ'යි කිවු ය. 'කුමන නමක් ද වුවමනා ය'යි වදළ කල්හි ඔබ ගිහි සමයෙහි උපතිස්ස නම් හෙයින් ඉන් නම් කැබැල්ලක් සලකා 'ස්වාමීන්ගේ නම වී නම් යහ පතැ'යි කිවු ය. 'එ සේ වී නම් මෙවක් පටන් මූ තිස්ස කුමාර යෝ ය'යි නම් තබා වදළ සේක. මැණියෝ ත් පුතණුවන්ට යම් අදහසෙක් ඇති වී නම් ඒ අදහස මිරිකා නො පියමි'යි සිතූහ. මෙ සේ කුමාරයන්ට නම් තබන මඟුල ත් කොට ලා නැවත බත් කවන මඟුලේ ද කන් විදිනා මඟුලේ ද පිළී හඳවන මඟුලේ ද කුඩුම්බ තබනා මඟුලේ ද ධම් සෙනෙවි ස්වාමීන් මුල් කොට පන් සියක් දෙනා වහන්සේට එක කිරිබත් තළියක් නො ගෙවෙන නියාවට පැන් නුමුසු කිරි බත් ම දුන්හ.

කුමාරයෝ ත් වැඩී වර්ධන ව සත් හැවිරිදි අවස්ථාවෙහි 'මැණියන් වහන්ස, තෙරුන් වහන්සේ ළඟ ම මහණ වෙමි'යිකීහ. 'යහපත, පුතණ්ඩ, මම ආදි ම මුඹගේ අදහස මිරිකා නො පියමි' සිතිමි. මහණ වන්නැ'යි කියා ලා මහ තෙරුන් වහන්සේට ආරාධනා කොට ගෙන්වා ගෙන දන් දී ලා 'ස්වාමීනි, මුඹ වහන්සේ ගේ කොලු පැටවා මහණ වෙමි යි කිය යි. මුන් කැඳවා ගෙන සවස් වේලාවට එම්හ'යි විහාරයට මහ තෙරුන් වහන්සේ යවා පියා සවස් වේලෙහි මහණ වන්නවුන්ට කළමනා පූජා කරවා ගෙන වෙහෙරට ගෙන ගොසින් පාවා දුන්හ.

මහ තෙරුන් වහන්සේ ද පාවා දී ලන්නා ම මහණ කොට නො පියා 'තිස්ස කුමාරයෙනි, මහණ වීම් නම් ඉතා බැරි ය. හුණු කැමැත සිහිල් ලැබෙ යි. සිහිල් කැමැත හුණු ලැබෙ යි. අනුභව කරන්නෙ ත් එක වේලේ ය. තෙපි ත් ඉතා සිවුමැල්ල ව. දුකට පැමිණ 'ආදී නො වදළේ හැ යි දෑ'යි කියවු නමුත් ය යි කී නියා ය.

Non-Commercial Distribution

කළ මනා කිම් දූ'යි විචාරා මහණ වන්ට ම තර ව 'වදාළ ලෙසක කෙරෙමි' කී කල්හි මහ තෙරුන් වහන්සේ ත් ගිවිස උන් පිළිකුල් මෙනෙහි කරණ ලෙසට තවපඤ්චක ය පමණක් උගන්වා ලා මහණ කළ සේක.

පඨවි කොටස් විස්ස හා ආපෝ කොටස් දෙළොස හා එක් කොට දෙ සොළොස ඉගැන්වුව ත් යහපත. ඒ හැම කියා ගත නොහෙ ත් නම් තව පඤ්චක ය පමණකු ත් කිය යුතු. මේ කා ගියා සී කමටහන් නම් සියලු බුදුවරුන් වහන්සේ ම අත් නො හැර පිරිමසන දෙය ය. යම් කෙණෙක් කා ගියා සී නැමැති බෙහෙත් වළඳා ශරීර ශුද්ධියකට නුහුණු වූ නම් නිවන් නමැති අමා රස උන්ගේ සතන ධරාගත නො වෙති. කෙස් ආදී වූ දෙතිස් කොටසින් එ කී එකී කොටසක් ම අරමුණු කොට විවසුන් වඩා රහත් වූ මහණ-මෙහෙණන්ගේ ත් උපාසක-උපාසිකා වරුන්ගේ ත් ගණ නෙක් නැත. අව්‍යක්ත තැන් කුල දරුවන් මහණ කරණ කල තව පඤ්චක ය පමණකු ත් නො කියා මහණ කිරීමෙන් රහත් වන්ට නිසි හේතු ව නසන සේක. එ සේ හෙයින් මහ තෙරුන් වහන්සේ තව පඤ්චක ය වදරා ලා මහණ කළ සේක.

දෙ මවු පියෝ ත් පුතණුවන් මහණ වූ පූජා කරන්නාහු බුදු පා මොක් සඞසයා වහන්සේට සතියක් ම විහාරයේ රඳවා ලා පැන් නුමුසු කිරිබ ත් ම දුන්හ. වහන්දෑ ත් සතියක් මුළුල්ලෙහි ම වළඳා දෙන්නවුන් නුකුසී ව දෙත ත් වළඳන්නට කුසී සේක. දෙ මවු පියෝ ත් සත් දවසක් දන් දී ලා සත්වන දවස් ගෙවලට ගියහ. තිස්ස සාමණේරයන්දෑ ත් මහණ වූ අට වන දවස් වහන්දෑ කැටි ව සිඟා ගිය සේක. සැවැත් නුවර ඇත්තෝ 'හෙරණුන් වහන්සේ අද සිඟා එන සේක. සාද කරම්හ' යි පිළි පන් සියයක් හා සමඟ බත් වසුන් පන් සියයක් ඉදි කරවා ගෙන පෙර මඟ සිටියෝ ය. සිට ලා හෙරණුන්දෑ දක පිළිගැන්වූහ. දෙ වන දවස් බත් වසුන් පන් සියයකු ත් පිළි පන් සියයකු ත් විහාරාසන්නයට ම ගෙන ගොසින් දුන්හ. මෙ සේ හෙරණුන්දෑ දවස් දෙකකින් පිළි දහසකු ත් බත් වසුන් දහසකු ත් ලැබ වහන්දෑට දෙවා පූ සේක. බත් වසුන් දහස වන්නා බමුණු කල දුන් බත් තළියේ අනුහසින. පිළි දහස ලද්දේ කවර පිණකින් ද? යත්-බත් තළි ය හා එක් කොට දුන් දළ ව තිබුන කඩ පොල්ලේ අනුහසින. ඉක්බිත් තෙන් වහන්දෑ පිණ්ඩපාත දයක තිස්සයෝ ය යි නම් තබා ගත් සේක.

Non-Commercial Distribution

නැවත එක් දවසක් මෙහෙරණුන්දෑ සීත වේලෙක විහාරවල ඇවිදිනා දෑ වහන්දෑ ගිනිහල් ගෙවල් ආදියෙහි සිට ගිනි තපිනා දැක 'ඇඟ අළු නංවා ඇසට දුම් වද්ද මේ ගිනි තපිනේ හැයි දෑ' යි විචාළ සේක. 'තොප නම් සඟ බාල හෙයින් සීත නැත. අප මාලු ව ගිය හෙයින් අපට සීත ඇත්තේ වේ දෑ යි සීත හෙයින් ගිනි තපුම්හ' යි කී කල්හි 'ස්වාමීනි, සීත වේලට කම්බිලි යහපත් වේ දෑ' යි කී සේක. 'මෙහෙරණෙනි, තෙපි මහ පිණැති හෙයින් කම්බිලි ලබව. අප තොප සේ පිණක් කට නුහුණ. අපට කම්බිලි කොයින් ද? එ බඳු පින් නො කොට කම්බිලියට ආල ය කරමෝ දෑ' යි කී සේක.

'එ සේ වී නම් කම්බිලි වුව මනා තැනක් මා හා කැටි ව එන බව ය' යි ගණ ය මුළුල්ලට කියා ලූ සේක. වහන්දෑ ත් මෙහෙරණුන් ලා කැටි ව ගොසින් කම්බිලි ලබම්හ'යි පින් කමින් මුහුරා සිටිය ත් වයසින් සත් හැවිරිදි මෙහෙරණුන්දෑ ලා කැටි ව වහන්දෑ දහසක් විතර නික්මුණු සේක. මෙහෙරණුන්දෑ ත් බත් තළි ය පිළි ගන්වන ගමනේ බොහෝ ය'යි භාගයක් රඳවා නො ගත් සෙයින් 'වහන්දෑ බොහෝ ව. මෙ තෙක් වහන්දෑට කම්බිලි කොයින් දෑ'යි යන්නක් ම නො සිතා වහන්දෑ දහස පිරිවරා නුවර බලා නික්මුණු සේක. කම් පල අදහා යහපත් අදහසින් දන් දුන්නවුන්ට මේ වන තරම් ය. මෙහෙරණුන්දෑ ත් කම්බිලියේ දෙයක් ම නො කියා ගෙ පිළිවෙළින් නුවරින් පිටත සිඟන ගමනේ කම්බිලි පන් සියයක් ලදින් ඇතුළු නුවරට වන් දෑ ය. මිනිස්සු ත් මෙහෙරණුන්දෑ ගෙන් කන්සන් නැත ත් උන්දෑ කළ කුශලයාගෙන් කැනියල් දැඩි හෙයින් ඇතින් මැතින් කම්බිලි ගෙනෙන්ට පටන් ගත්හ.

එකෙක් තෙමේ සල්පිලක් ළඟින් යන්නේ පන් සියයක් විතර කම්බිලි විකුණන්ට තබා ගෙන හුන් කම්බිලි වෙළෙඳකු දැක තමා යන ගමන් තබා ලා 'හෙම්බා, එක් මෙහෙරණ කෙණකුන් දෑ කම්බිලි එළවා ඇවිදිනා දෑ ය. තොපගේ කම්බිලි සඟවා ලව'යි කී ය. උඹ ඒ අසා 'කුමක් ද? උන්දෑ දුන් දෙයක් හැරගන්නා දෑ ද? නොං හොත් උදුරා ත් හැර ගන්නා දෑ දෑ' යි විචාරා 'දුන් දෙයක් මුත් කම්බිලි තබා දඹු වැලයකු ත් නුදුන්නා ගන්නේ නැතැ'යි කී කල්හි 'එ සේ වී නම් දෙම් නම් දෙම්. නො දෙම් නම් නො දෙම්. ඒ භාර මට ම වේ ද? තොප යන ගමන් යව'යි කී ය. නුවණ නැති තද මසුරු සත්තු තමන් ගෙන් දෙන දෙයකු ත් නො ව අනුන් ගෙන් දෙන දෙයට මසුරු ව කොසොල් රජ්ජුරුවන්ගේ අසදෘශ දානයෙහි සිත පහදවා ගත නො හී කාල නම්

Non-Commercial Distribution

සෙනෙවි රදුන් නරකයේ උපන්නා සේ නරකයෙහි උපදිති. අනික් පවක් කළ මැනැවැ' යි නැත. කම්බිලි වෙළෙඳාණෝ සිතන්නෝ "මේ තෙමේ තමා යන ගමන් තබා ලා මාගේ කම්බිලි සඟවා ලන්ට කී ය.

දුන් දෙයක් ගන්නා දැ වී නම් දෙම් නම් දෙමි. නො දෙම් නම් නො දෙමි' කීමි. ලබන්ට නිසි තැනක් දුටුවොත් නුදුන් කල ලජ්ජා ත් කෙරෙයි. තමා සතු දෙය සඟවා ලූ ය' යි වරද නැත. මේ කම්බිලි පන් සියයෙන් කම්බිලි දෙකක් ලක්‍ෂ ය ලක්‍ෂය වටී. ඒ දෙක සඟවා ලීම් නම් යහපතැ"යි කුම්බිලි දෙකෙහි දවලු එක් කොට ගැට ගසා ලා කම්බිලි හස්සේ සඟවා ලූහ. හෙරණුන්දැ ත් සඟ දහස පිරිවරා ගෙන එ තැනට ගිය දැ ය. කම්බිලි වෙළෙඳාණන් හෙරණුන්දැ දුක ම මහාසේන නම් බමුණු කල ධර්ම සෙනෙවි සැරියුත් සවාමීන් කෙරෙහි තමන්දැ කළ ප්‍රේම ය මෙන් හෙරණුන්දැ කෙරෙහි පුත්‍ර ප්‍රෙම ය උපන. උඹ තුමූ සිතන්නෝ 'මුන්දැ දුටු කල කම්බිලි ය තබා ළෙහි මස් වත් වුව මනා වී නම් දිය යුතු ය' යි සඟවා තුබූ කම්බිලි දෙක ඔබට දෙන්ට තුබූවා සේ මැත් කොට ලා හෙරණුන්දැ පා මුල තබා ලා වැඳ ගෙන 'සවාමීනි, මුඹ වහන්සේ ලබන නිවන් මම ත් ලබම්ව' යි පැතූ ය. 'ඒ එ සේ ම වෙව' යි කී දැ ය. හෙරණුන්දැ ඇතුළු නුවරින් කම්බිලි පන් සියයක් ලත් දැ ය. මෙ සේ එක දවසින් ම කම්බිලි දහසක් ලැබ ගෙන කැටි ව ගිය වහන්දැ ත් එ ම කැමැති ව ගිය හෙයින් දහස දහසට දෙවූ දැ ය. කම්බිලි දන් දී කම්බිලි දයක තිස්සයෝ ය' යි නම ලත් දැ ය.

කවර ත් කුශලයක ජවන් සිතින් ප්‍රථම ජවන චෙතනාව මේ ජාතියෙහි විපාක දෙත් මුත් පසු ව ජාත්‍යන්තරයෙහි විපාක දෙන්ට සමර්ථ නො වන හෙයින් නම් තබන දවස් ධර්මසෙනෙවි සවාමීන්ට දන් දුන් ලක්‍ෂයක් වටිනා කම්බිලි ය සත් හැවිරිදි අවස්ථාවෙහි දී කම්බිලි දහසක් දෙවාලී ය. යම් තැනකට මඳක් දී ලා විපාකාවස්ථාවෙහි මල්ලිකාදීන් මෙන් බොහෝ සම්පත් ලැබෙත් ද, බොහෝ කොට දී ලා විශාඛාවන් මෙන් ඉතා බොහෝ සම්පත් ලැබෙත් ද, එ සේ වූ තැනෙක් බුදු සස්නට වඩා නැත. වෙළඳාමෙහි දක්‍ෂ කෙණකුන් ම එක මස්සකින් මසු දහසක් කොට ගන්නා සේ තමන්දැ ත් කුසල් වෙළඳාමෙහි දක්‍ෂ හෙයින් එක කම්බිලියෙන් කම්බිලි දහසක් ලත් සේක. සසර සිටියොත් තව තෙල විතරකින් නො නිම යි.

Non-Commercial Distribution

හෙරණුන්දෑ ත් දෙව්රම් වෙහෙර රඳා හිඳිනා හෙයින් ළං ව තිබෙන්නා නෑසුහු අවුදින් කථා කෙරෙති. එ කල හෙරණුන් දෑ සිතන දෑ 'මා මී රඳා නෑසුහුන් අවුදින් කථා කරණ කල උන් හා කථා කිරීමෙන් මට පිහිටක් කට නො හැක්ක. කරණ කථා ත් අල්පේච්ඡ කථාදියක් නො වන හෙයින් හස්සාරාමතාවෙහි ඇතුළත් වත් මුත් සාපේක කථාවෙකු ත් නො වෙයි. මෙ ලෙසින් දවස් යවන කල මහණ ව ලබන ලොව් ලොවුතුරා ගුණ විශෙෂ කවරේ ද? බුදුන් විචාරා කමටහන් ඉගෙන ගෙන වලකට ම නැඟී ගියෙම් නම් යහපතැ'යි සිතා ලා බුදුන් කරා ගොසින් වැඳ ලා රහත් වීම දක්වා කමටහන් විචාරා ගෙන උපාද්ධ්‍යායයන් වහන්සේ ත් වැඳ ලා පා සිවුරු හැර ගෙන 'ඉදින් ළහෙක රඳා හුණ නෑයෝ සියෝ අර කන්නවුවට මේ කන්නවුවට මා කැඳවති'යි සිතා ලා සාර සිය අසූ ගවුවක් විතර දුරු ව ගිය දෑ ය.

එ සේ ගොසින් එක් ගම් දෙරකින් යන දෑ එක් මාලු උපාසක කෙණකුන් දක 'කුමක් ද උපාසකයෙනි, මේ ගමට සමීහ වූ වහන්දෑ ඇත් නම් රඳා හිඳිනා වනවාස විහාරයෙක් ඇත් දෑ'යි විචාළ දෑ ය. ඇතැ යි කී කල්හි ඊට මං විචාළ දෑ ය. මහාසේන නම් බමුණු මහල්ලන්ට සේ ම මාලු උපාසකයන්ට උන්දෑ දක පුත්‍ර ප්‍රෙම ඇති වි ය. එ තැන සිට ම මග නො කියා 'වැඩිය මැනව, මහ පෑ ලමි' කියා ලා කැඳවා ගෙන නික්මුණවු ය.

හෙරණුන්දෑ ත් උන් හා කැටි ව යන අතුරු මග නො එක් මලා මැල්ලෙන් හා නො එක් ඵලාඵලයෙන් ගැවසී ගත් ගසින් කොළින් සැදුණු සතර පස් තැනක් දක 'මෙ තැන කිම් ද, මෙ තැන කිම්දෑ'යි විචාළ දෑ ය. උයි ත් ඒ ඒ විචාළ තැන නම් කියමින් වනවාස විහාරයට ගොස් 'සවාමීනි, මෙ තැන එාසු ය. මෙ තැන විසුව මැනවැ'යි කියා ලා 'සවාමීනි, කිනම් සේක් දෑ'යි නම ත් විචාරා ගෙන සෙට අපගේ ගමට සිහා වඩනේ යහපතැ'යි කියා ලා තමා වසනා ගමට ගොසින් 'වනවාසික තිස්ස නම් තෙර කෙණකුන් වහන්සේ විහාරයට වැඩි සේක. ඔබට කැඳ අවුළු පතු ත් දනු ත් ඉදි කරව'යි මිනිසුන්ට විධාන කෙළේ ය.

හෙරණුන්දෑ ත් පළමු දෙමවු පියන් තුබූ නමින් 'තිස්ස' නම් ව දෙ වනු ව 'පිණ්ඩපාතදයක තිස්ස' නම් ව, තුන් වනු ව කම්බලදයක තිස්ස' නම් ව, සතර වනු ව 'වනවාසිකතිස්ස' නම් ව යයි නම් සතරෙන් ආදි නම් තුන හැරී පසු නමින් ප්‍රසිද්ධ වූ දෑ ය.

Non-Commercial Distribution

හෙරණුන් දෑ ද දෙ වන දවස් උදසන ම ගමට සිඟා වැඩි සේක. මිනිස්සු බත් පිළිගන්වා ලා වැන්දහ. 'සුවපත් වව, දුකින් මිදෙව, යන බස් දෙක පමණක් මුත් බහුභාණී නො වන හෙයින් බසක් නො වදළ සේක. එක කෙණෙකු ත් බත් පිළිගන්වා ලා පිටි පෑ නැඟී යා නො හෙති. බල බලා ම සිටිනාහ. හෙරණුන්දෑ ත් කෙ තෙක් දෙනා කෙ සේ බත් ගෙනාව ත් තමන්දෑ යැපෙන පමණක් පිළිගත් දෑ ය. ගම ඇත්තෝ මුළුල්ල ම වැඳ පෙරළී පියා 'ස්වාමීනි, මුඹ වහන්සේ මේ වස් තුන් මස මෙ තැන වැඩහුනො ත් තුන් සුසිරි පුරමහ. අප ත් සසරින් ගළවා මෙහි සුව සේ විසුව මැනැවැ' ආරාධනා කළහ. උන්දෑ ත් ආරාධනාව ගිවිස නිරන්තරයෙන් එ ගම සිඟන සේක. වැදි කළ ත් 'සුවප ත් වව, දුකින් මිදෙව' යන බස් දෙක ම කියා ලා 'ලෙඩ දුක් කිම ද?' යනාදීන් අනික් කථාවක් නො කියා ම යන දෑ ය. මෙ ලෙසින් වස් තුන් මසින් දෙ මසක් යවා පියා තුන් වන මස නිම ත් නිම ත් සතර වන මසට නො යවා පිළිසිඹියාපත් රහත් වූ සේක.

වස ත් නිමි කලට ධම් සෙනෙවි ස්වාමි බුදුන් කරා ගොසින් 'ස්වාමීනි, තිස්ස හෙරණුන් විචාරන්ට යෙමී' කී සේක. 'යහපත යව'යි වදළ කල්හි තමන් වහන්සේගේ පිරිවර පන් සියයක් දෙනා වහන්සේ හැරගෙන වඩනා සේක් මුගලන් මහ තෙරුන් වහන්සේට ත් තමන් වහන්සේ ඔබ වඩනා නියාව කී සේක. ඔබ ත් 'අපිත් එමහ'යි කියා ලා පිරිවර පන් සියයක් දෙනා වහන් සේ හැර ගෙන නික්මුණු සේක. මෙ ලෙසින් අසූ මහ සවුවන් වහන්සේම සහ පිරිවරින් නික්මුණු සේක. අසූ මහ සවුවන් වහන් සේ හැර පිරිවර වහන්දෑ ම සතළිස් දහසෙක. සතළිස් දහස පිරිවරා අසූ මහ සවුවන් වහන්සේ සාර සිය අසූ ගවුව ගෙවා ගොසින් හෙරණුන්දෑගේ ගොදුරු ගමට ගිය කල්හි හෙරණුන්දෑට නිරන්තර උපස්ථාන කරණ උපාසකයාණෝ ගම් දෙරකඩ දී දක පෙර ගමන් කොට ගොසින් වැඳ ලා සිටියාහ. සැරියුත් මහ තෙරුන් වහන්සේ 'උපාසකයෙනි, මේ ගම වනවාසයෙක් ඇත් දැ'යි විචාරා ඇතැ'යි කී කල්හි 'වහන්දෑ ඇත්දැ'යි විචාළ සේක.

ඇතැ යි කී කල්හි කි නම සේක් දැ යි විචාළ සේක් 'වනවාසී තිස්ස තෙරුන් වහන්සේ ය'යි කී කල්හි එ සේ වී නම ඒ වන වාසයට මහ කියව'යි වදළ සේක. මුඹ වහන්සේ හැම කවුරුන් ගෙ දෙර අවුදැ'යි විචාරා හෙරණුන් දෑ ළඟට ආම්හ'යි කී කල්හි එ විට උපාසකයා ත් බලා පියා ධම් සෙනෙවි ස්වාමීන් ලා අප්‍රසිද්ධ තැන් නො වන හෙයින් ආදි ත් හඳුනන හෙයින් හැඳින ගෙන

බලවත් සමාධි ව 'ස්වාමීනි, මදක් වැඩ සිටිය මැනැවැ'යි රඳාවා ලා ගමට දිව ගෙන ගොසින් 'ධම් සෙනෙවි ස්වාමීන් පටන් අසූ මහ සවුවන් වහන්සේ සතළිස් දහසක් වහන්දෑ පිරිවරා හෙරණුන් වහන්සේ විචාරන්ට වැඩි සේක. අප තකා ගෙන උන් තැනගේ තරම යහපත් නියාව මින් ම දනුව. හැඳ-කළාල්-කොට්ට–මාවුළා-පැන් වළන් ආදී වූ දෙය හැර ගෙන වහා නික්මෙව'යි විධාන කළහ. මිනිස්සු ත් ගම ත් නු කුඩා හෙයින් මිනිසුනු ත් බොහෝ හෙයින් වහන්දෑ හැමට සෑහෙන ලෙස කළාල් ආදි ය සපයා ගෙන හඹා ගොසින් තෙරුන් වහන්සේලා කැටි ව ම විහාරයට ගියහ.

හෙරණුන්දෑ ද වහන්දෑ හැඳින ලා ධම් සෙනෙවි සාමීන් පටන් ගණනක් දෙනා වහන්සේගේ පා සිවුරු හැර ගෙන තැන් පත් කොට තබා ලා පා සේධීම් ආදි ය ත් සෙසු තැනට ත් කළ මනා දෑ කරවන කලට අඳුරු දූඩි වි ය. ධම් සෙනෙවි සාමි උපාසකවරුන් බණවා ලා 'උපාසකවරිනි, අඳුරු දූඩි වෙයි, යව'යි වදාළ සේක. 'ස්වාමීනි, මෙ තෙක් දවස් බණක් අසා ගන්ට නුවුයේ ය. බණ නො ලත් සිත් නම් පැන් නො ලත් ගොයම් හා සරි ය. අද වෙනි දවස් මෙ තෙක් දෙනා වහන්සේ රැස් වූ තැන, බණෙක් පැවැත්තේ නම් යහපතැ' යි කිවු ය. මහ තෙරුන් වහන්සේ ත් 'එ සේ වී නම්, හෙරණෙනි, පහන් පුදා ලා බණට හඬ ගාව'යි වදාළ සේක. ඔබ ත් එ ලෙස ම කළ සේක. ඉක් බිත්තෙන් ධම් සෙනෙවි සාමී ''තිස්සයෙනි, තොපගේ උපාසකවරු 'බණ අසම්හ''යි වදාළ සේක. උපාසකවරු එක විට ම නැඟී සිට 'ස්වාමීනි, අපගේ 'ස්වාමි 'සුවපත් වව, දුකින් මිදෙව' යන බස් දෙක ම තබා අනික් බණක් නො දන්නා සේක. බණ කියන්ට අනික් තැනකට විධාන කළ යහපතැ'යි කිවු ය. හෙරණුන් දෑ රහත් වත් බණට කළ ආරාධනාවක් නැති හෙයිනු ත් තමන්දෑ සිතා ගෙන ත් උන්ට බණක් නො කී දෑ ය.

ධම් සෙනෙවි ස්වාමී ද ''හෙරණෙනි, තෙපි සුවපත් වව, දුකින් මිදෙව' යි කියන්නාවාද ? වඩා බණ නො කැමැත්තේ සුවපත් වන්නේ ත් කෙ සේ ද ? දුකින් මිදෙන්නේ ත් කෙ සේ ද ? තෙල පද දෙකෙහි අර්ථ කියව''යි වදාළ සේක. උන්වහන්සේ ත් යහපතැ'යි වදරා ලා බණ අස්නට පැන නැඟි ලා විජිනි පත්‍ර ය හැර ගෙන සඟි පසින් අර්ථ ත් කාරණා ත් උපමා ත් හැර ගෙන සතර මහ දිවයින එක පැහැර වස්නා වැස්සක් පරිද්දෙන් අභිධම් කථාව

Non-Commercial Distribution

එළවා ගෙන සත් තිස් බොධිපාක්ෂික ධර්මයන් විදහා කියා ලා ගෙවල් කොට නිමවා ලා කොත් පළඳවන්නා සේ අර්හත්ඣයෙන් දෙශනාව කුළු ගෙන රහත් වූ කෙණෙක් සුවපත් වෙති. උඹ ම සියලු දුකින් මිදෙති. සෙස්සෝ ජාති දුක් ආදීන් ද නරක දුක් ආදීන් ද නො මිදෙති''යි කී දෑ ය. මෙ සේ මේ පද දෙකෙහි අර්ථ තුන් යම් රාත්‍රියෙහි ම කී දෑ ය. පාන් වත් ම හෙරණුන්දෑගේ උපාසකවරු දෙ භාග වූහ. එක් භාගයෙක් 'අනේ මෙ සේ වූ තද නමක් නුදුටුවිරූම්හ. මවු පිය තරමේ සිට උපස්ථාන කළ අපට මෙ සේ බණ දැන ත් නො කී සේකැ 'යි මුසුප්පු වූහ. එක් පක්‍ෂයෙක් 'ගුණා ගුණ නො දැන ම උපස්ථාන ත් කළම්හ. නැතක් දවස් නො වැස තබා ලා මහත් වැස්සක් වස්නා සේ දැන් බොහෝ බණ ත් වදළ සේක. අපට වූයේ ලාභයෙකැ'යි සතුටු වූ ය.

බුදුහු එ දවස් අළුයම් වේලෙහි නුවණ දැළ පතුරුවා ලොව බලන සේක් වනවාසික තිස්ස තෙරුන් වහන්සේගේ උපාසකවරුන් නුවණ දැළෙහි බැඳුණවුන් දැක කුමක් වේ දෝ හෝ යි බලන සේක් උන්ගේ උපාසකවරුන් ගෙන් සමහර කෙණෙක් සතුටු වූ ය. සමහර කෙණෙක් නො සතුටු වූ ය. යම් කෙණෙක් ම පුතණුවන්ට නො සතුටු වූ නම් උඹ අපායට පැමිණෙති. උන් නිසා ත් මා ඔබ යා යුතු ය. ගිය කල මාගේ ගමන් නිසා ම නො සතුටු ව හුන්නෝ ත් උන් කෙරෙහි මෙත් සිත් ඇති ව උන් කියන බස ලෙසට දුකින් මිදෙති. මෙ තෙක් ප්‍රයෝජන මාගේ ගමන් නිසා වෙ යි' සිතා වදළ සේක.

ඒ උපාසකවරු ද සතළිස් දහසක් වහන්දෑට ත් අසූ මහ සවුවන් වහන්සේට ත් ආරාධනා කොට ලා ගමට පලා ගොසින් මහත් කොට මඩුවකුත් කරවා ලා කැඳ බත් සපයා අසුනු ත් පණවා ලා පෙර මඟ බල බලා හුන්හ. වහන්දෑ ද වත් සපයා ගෙන සිඟා නික්මෙන වේලෙහි ගමට සිඟා වඩනා සේක් හෙරණුන්දෑ බණවා ලා 'කුමක් ද, තිස්සයෙනි, තෙපි අප හා කැටි ව සිඟා එවු ද? නොහොත් පසු ව එවුදැ'යි විචාරා 'මා මෙ තෙක් දවස් එන වේලාට ම එමි. වඩනා බව ය'යි කී කල්හි වහන්දෑ සහළ සිවුරු හා පාත්‍ර හැර ගෙන කොයි වඩිත ත් එ තෙක් ම හෙයින් නික්මුණු සේක.

**භික්ඛාය උපගතං දිස්වා—සකත්තානං පරිච්චජී,**
**දනෙන මෙ සමො නත්‍ථි—එසා මෙ දනපාරමී.**

Non-Commercial Distribution

යනු හෙයින් සස ජාතක සිවි ජාතකාදී නො එක් ජාතකවල දන්පැරුම් පිරුව ත්—තව ද:

**සූලෙහි විජ්ඣයන්තොපි-කොට්ටයන්තොපි සත්තිහි,**
**භොජපුත්තෙන කුප්පාමි-එසා මෙ සීලපාරමී.**

යනු හෙයින් සඞ්ඛපාල ජාතක භූරිදත්ත ජාතකාදී නො එක් ජාතකවල සිල් පැරුම් පිරුව ත්—තව ද:

**මහාරජ්ජං හත්ථගතං-ඛෙළපිණ්ඩං ව ඡඩ්ඩයිං,**
**චජතො න හොති ලගනං-එසා මෙ නෙක්ඛම්මපාරමී.**

යනු හෙයින් චූලසුතසොම ජාතකාදී නො එක් ජාතකවල මහ සැපත් හැර මහණ ව නෛෂ්ක්‍රම්‍ය පාරමිතාව පිරුව ත්-තව ද:

**පඤ්ඤාය පටිමායන්තො-බ්‍රාහ්මණං මොචයිං දුඛා,**
**පඤ්ඤාය මෙ සමො නත්ථි-එසා මෙ පඤ්ඤා පාරමී.**

යනු හෙයින් සත්තුභත්ත ජාතක-උම්මග්ග ජාතකාදී නො එක් ජාතක වල ප්‍රඥාපාරමිතාව පිරුව ත්—තව ද:

**අතීරදස්සී ජලමජ්ඣෙ-හතා සබ්බෙව මානුසා,**
**චිත්තස්ස අඤ්ඤථා නත්ථි-එසා මෙ විරිය පාරමී.**

යනු හෙයින් මහාජනක ජාතක-කලන්දක ජාතකාදී නො එක් ජාතක වල වීර්‍ය්‍ය පාරමිතාව පිරුව ත්—තව ද:

**අචෙතනං ව කොට්ටෙන්තො-තිණ්හෙන ඵරසුනා මම,**
**කාසිරාජෙ න කුප්පාමි-එසා මෙ ඛන්ති පාරමී.**

යනු හෙයින් ක්ෂාන්තිවාදි ජාතක-ධම්පාල ජාතකාදි නො එක් ජාතක වල ක්ෂාන්ති පාරමිතාව පිරුව ත්—තව ද:

**සච්චවාචං අනුරක්ඛන්තො-චජිත්වා මම ජීවිතං,**
**මොචයිං එකසතං ඛත්තියෙ-එසා මෙ සච්චපාරමී.**

යනු හෙයින් මහා සුතසොම ජාතකාදියෙහි සත්‍යපාරමිතාව පිරුව ත්—තව ද:

**මාතා පිතා න මෙ දෙස්සා-නපි මෙ දෙස්සං මහා යසං,**
**සබ්බඤ්ඤුතං පියං මය්හං-තස්මා වතමධිට්ඨහිං.**

යනු හෙයින් මූගපක්ඛ ජාතකාදී නො එක් ජාතකවල අදිටන් පැරුම් පිරුව ත්—තව ද:

**න මං කොචි උත්තසති-නපිහං භායාමි කස්සචි,**
**මෙත්තාබලෙනුපත්ථද්ධො-රමාමි පවනෙ සදා.**

යනු හෙයින් එකරාජ ජාතිකාදී නො එක් ජාතකවල මෙත් පැරුම් පිරුව ත්—තව ද:

Non-Commercial Distribution

**සුසානෙ සෙය්‍යං කප්පෙමි-ඡවට්ඨිකං උපනිධාය'හං,**
**ගොමණ්ඩලා උපාගන්ත්වා-රූපං දස්සෙන්තානප්පකං.**

යනු හෙයින් ලොමහංස ජාතකාදී නො එක් ජාතකවල උපෙක්ෂා පැරුම් පිරුව ත්—නැවත ඒ හැම නො කළා සේ ත්‍රිවිධ චර්‍ය්‍යාවෙහි හැසුරුණු ත් පඤ්චවිධ පරිත්‍යාග ය කළ ත් මෙ සේ වූ තැන දී උදාසීනවන්ට නො වන හෙයින් එ තෙක් දෙනා අපාය භාග්වීම අලාභ හෙයිනු ත් තමන්වහන්සේගේ බණ අසා නිවන් දක්නවුන් ඇති හෙයිනු ත් බුදුහු දෙව්රම දී ම ගැටවටු ගන්වා ගෙන පාත්‍ර ධාතූන් වහන්සේ ත් හැරගෙන ඇසිල්ලකින් වැඩ වහන්දෑට පෙරාතුව ලා වැඩසිටි සේක.

බුදුහු වැඩසිටි සේකැ යි ගම මුළුල්ල ම ඇසිණ. මිනිස්සු ත් රජ සැපතක් පිට සක්විති සැපතක් සම්භ වූවාක් මෙන් බලවත් සේ සතුටු ව බුදු පාමොක් වහන්දෑ වඩා හිඳුවා කැඳ-අවුළු පත් පිළි ගැන්වූහ. වහන්දෑ කැඳ වළඳා ලා හුන් කලට හෙරණුන් දෑ ත් ගමට සිඟා වන්දෑ ය. ගම ඇත්තෝ ත් මෙ තෙක් ද ලෙසට ගෙන් ගෙන් ගෙනවුත් බත් පිළිගැන් වූහ. යපෙන පමණක් පිළිගෙන බුදුන් ළඟට ගොසින් උපන්නක් දික්කළා සේ සිඟා ගෙන ගිය පාත්‍ර ය බුදුන්ට දික්කළ සේක. බුදුහු ත් 'මෙ සේ ගෙනෙව, තිස්ස යෙනි'යි වදරා ජාල ලක්ෂණයෙන් විසිතුරු වූ හස්ත ය දිගුකොට පාත්‍ර ය අතට හැර ගෙන 'ශාරීපුත්‍රයෙනි, තොපගේ හෙරණුන්ගේ පාත්‍ර ය බලව'යි වදරා පාත්‍ර ය ඔබට පෑ සේක. ඔබ බුදුන් අතින් පාත්‍ර ය ගෙන හෙරණුන්දෑට දී ලා 'යව' තොපට යහපත් හස්නෙක හිඳ වැළඳූ කැඳ ත් නැති බැවින් වළඳව'යි වදළ සේක.

ගම්වැස්සෝ ද බුදු පාමොක් වහන්දෑ වළඳවා ලා අනු-මෙවෙනි බණට ආරාධනා කළහ. බුදුහු ත් අනුමෙවෙනි බණ වදරණ සේක් 'උපාසකවරිනි, කුලුපග හෙරණුන් නිසා සතළිස් දහසක් පිරිවර සහිත අසූමහ සවුවනු ත් දුටුව. උන් හැම තබා මා ත් දුටුව. තොපට වූයේ ලාභයෙකැ'යි වදළ සේක. මිනිස්සු ත් ඒ අසා 'බුදුනු ත් වහන්දෑ ත් සිත් ගෙන හිඳිනා තැනක් ම ලැබ ඔබට උපස්ථාන කළම්හ. අපට වූයේ බලවත් ලාභයෙකැ'යි නො සතුටු ව හුන් යම් කෙණෙක් වූ නම් සතුටු වූහ. සතුටු ව හුන්නෝ වඩ වඩා ම සතුටු වූහ. අනුමෙවෙනි බණ කෙළවර සෝවාන් ඵලාදියට බොහෝ දෙන පැමිණියහ. බුදුහු හුනස්නෙන් නැඟී වැඩි සේක. මිනිස්සු ත් ගමන් පසු කොට ලා නැවැත්තාහ.

Non-Commercial Distribution

බුදුහු හෙරණුන්දැ ත් කන් සරියේ කොට වඩනා සේක් 'හෙර ණෙනි, මෙ තැන කිනම්දැ'යි විචාරන සේක. හෙරණුන් දැ ත් ආදි ම තමන් විචාරා දත් හෙයිනු ත් විචාරා නො දත්ත ත් දන්ට බල ඇති හෙයිනු ත් ඒ ඒ තැන නම් කිය කියා ම යන දැ ය. බුදුහු උන් දැ වසන තැනට ගොසින් ගල් මුදුනකට නැඟි සේක. එ තැනට නැඟි කලට මහ මුහුද ත් පෙණෙයි. බුදුහු හෙරණුන් දැ අතින් විචාරන සේක් 'තිස්සයෙනි, මේ ගල් මුදුනේ සිට ඈත මෑත බලා කුමක් දකුම්දැ'යි විචාළ සේක. 'මහ මුහුද දකිමි'යි කී දැ ය. 'මුහුද දැක කුමක් සිතවූ දැ'යි විචාළ කල්හි ''මා දුකට පැමිණි කල හැඬූ කඳුළු මුහුදු සතරේ පැනට ත් වඩා බොහෝව'යි සිතමි, සවාමීනි''යි කී දැ ය.

'යහපත, තිස්සයෙනි, ඒ එ සේ ම ය'යි වදරා නැවත 'තිස්ස යෙනි, තොප සැතපෙන්නේ කොයි දැ'යි විචාරා තෙල ගල් තෙලේ ය'යි කී කල්හි 'එහි වසන තොප සිතන්නේ කිම් දැ'යි විචාරා 'ජාති බොහෝ හෙයින් මෙ තැනදී මිය ගිය වාර ගණන් නැතැ'යි සිතමි' කී කල්හි 'යහපත, යහපතැ'යි තිස්සයෙනි, ඒ එ සේ ම ය. පමණක් නැති සතුන් අතුරෙන් එක සත්කු ම මේ පොළොව වැද හෙව නො මළ තැනක් නැතැ'යි වදරා 'අනුන් නො දැවූ තැනක් සොයන ගමනේ පර්වත මුදුනෙක ගල් තුනක් හස්ස දැක මෙ තැන දවන්නෝ නැත්තෝ වෙත් දැ'යි සොහොන් බිම කරන්ට වන් තැන සෙසු නමින් ප්‍රසිද්ධ ව මළ කල දැවුවා හැර උපසාළ්හක නමින් ප්‍රසිද්ධ ව මළ කල දැවූ වාර ම තුදුස් දහසෙක' යනාදීන් දුක නිපාතයෙහි උපසාළ්හක ජාතක ය ත් වදාළ සේක. මෙ සේ පොළොව ආදී නො මළ තැනෙක මියන කෙණෙක් නැත.

අනද මහ තෙරුන් වහන්සේ වැනි තැන් නො මළ විරූ තැන තමන් මියන සේක. ඒ එ සේ මැ යි. අනද මහ තෙරුන් වහන්සේ එක් සිය විසි හැවිරිදි අවස්ථාවෙහි දී ආයු ශක්තිය බලන සේක් ආයු ගෙවී ගිය නියා ව දැන මෙයින් සත් වන දවස් පිරිනිවන් පාමී'යි වදාළ සේක. ඒ අසා රෝහිණී නම් ගඟ එ තෙර මිනිස්සු 'අපි මහ තෙරුන් වහන්සේට උපකාරීම්හ. අපට ළංව පිරිනිවන් පානා සේකැ'යි කියති. මෙ තෙර මිනිස්සු 'අපි උප කාරීම්හ. අපට ළංව පිරිනිවන් පානා සේකැ'යි කියති. මහ තෙරුන් වහන්සේ ඒ අසා 'දෙ තෙර ඇත්තෝ ම උපකාරී වූ ය. මූ උපකාරීහ, මූ උපකාරීහ, මූ අනුපකාරීහ'යි කියන්ට බැරි ය. ඉදින් මම මෙ තෙරදී වුව ත් එ තෙරදී වුව ත් පිරිනිවියෙම් නම්

Non-Commercial Distribution

ධාතු නිසා දෙ තෙර ඇත්තෝ ම කළහ කෙරෙති. කලහයෙක් උපදී නම් තමුත් මා නිසා ම උපද්දී. සන්හිඳේ නමුත් මා නිසා ම සන්හිඳෙ'යි වදරා ලා 'මෙ තෙර ඇත්තවුන් මෙ තෙරට ම රැස් වුව මැනව. එ තෙර ඇත්තවුන් එ තෙරට ම රැස් වුව මැනැවැ'යි වදළ සේක.

ඉක් බිත්තෙන් සත් වන දවස් ගං මැද සත් තලක් පමණ අහස පලක් බැඳ ගෙන වැඩහිඳ බොහෝ දෙනාහට බණ වදරා 'මගේ ශරීර ධාතු භාගයෙක් මෙ තෙර වැගිරේව යි, භාගයෙක් එ තෙර වැගිරේව'යි සිතා ලා වැඩ හුන් සේක් ම තෙජො ධාතුවට සමවන් සේක. පිරිනිවෙන්නා ම ශරීරයෙන් නැගී ගිනි දැලින් ම සම් මස් නහර ද ධාතු පමණක් වෙන් ව මැන ලූවාක් මෙන් ඉද්ද මල් රැසක් සේ ධාතු භාගයෙක් මෙ තෙර වැගිරිණ. භාගයෙක් එ තෙර වැගිරිණ. බොහෝ දෙන ත් හඬා වැගුරුණවු ය. පොළොව පැළී යන කලක් මෙන් වි ය. බුදුන් පිරිනිවි දවසට ත් වඩා වලප් වලාම් මහත් වි ය. මිනිස්සු ත් 'බුදුන් පිරිනිවිය ත් අනඳ මහ තෙරුන් වහන්සෙ ජීවත් ව සිටි සේක් වී නම් බුදුන් ජීවත් වූවා හා සරි ය. බුදුන් පිරිනිවියේ අද'යි කිය කියා සාර මසක් මුළුල්ලෙහි ම හැඬූ ය. එ සේ හෙයින් අනඳ මහ තෙරුන් වහන්සේ පිරිනිවියේ අතික් කෙණකුන් මළ තැනෙක නො වෙයි.

නැවත බුදුහු හෙරණුන්දෑ අතින් විචාරන සේක් 'තිස්සයෙනි, මේ වල දිවි ආදීන්ගේ හඬ අසා බවු ද, නො බවුද'යි විචාළ සේක. 'මට භයෙක් නැත. උන් හැමගේ හඬ ඇසූ පමණෙකින් මේ වල ඇලුම ඇති වෙයි' කියා ලා ගාථා සැටක් විතරින් වන වර්ණනා ව කළ දෑ ය. ඉක් බිත්තෙන් බුදුහු 'තිස්සයෙනී'යි බණවා ලා 'අපි යම්හ. අප හා සමහ තෙපි එවු ද, රඳවු දෑ'යි විචාළ සේක. 'අපගේ උපාධ්‍යායයන් වහන්සේ කැඳවා වදළ සේක් වී නම් රඳම්'යි ශික්‍ෂා ගරුකාර හෙයින් බුදුන්ට ත් වඩා උපාධ්‍යායයන් වහන්සේ ම ගරු කළ සේක. බුදුහු භික්ෂු සඞසයා වහන්සේ හැර ගෙන වැඩ පී සේක. හෙරණුන්දෑගේ අදහස නම් ඒ තැන වාස ඵාසු ව ඇති හෙයින් රඳන්ට ම ය. ධම් සෙනෙවි සවාමි ද අදහස දැන 'රඳනු කැමැත්තා නම් රඳව'යි වදළ සේක. හෙරණුන්දෑ ද බුදුනු ත් වහන්දෑ ත් වැඳගෙන රැඳුණු දෑ ය. බුදුහු දෙව්රමට වැඩී සේක.

'මහණ වූ කල බුදු පාමොක් වහන්දෑ වෙහෙර ම රඳවා ලා සති යක් කිරිබත් ම දුන් හ. මහණ වූ අට වෙනි දවස් හා නව වෙනි දවස් හා දෙ දවසින් පිළි දහසක් හා බත් වසුන් දහසක් ලත්හ. නැවත එක් දවසක් පලස් දහසක් ලත්හ. මෙ සේ මෙ තැන රඳා

හිඳිනා කල ත් ලාභ සත්කාර මහත. එ සේ වුව ත් ඒ හැම හැර වලට ගොසින් සැඳි බත් පමණෙකින් යපෙති. කරණ දෑ ඉතා ම යහපතැ'යි කථා උපන.

බුදුහු අවුත් විචාරා මේ කථාව නියාව කී කල්හි 'එ සේ ය, මහණෙනි, ලාභ නිසා පිළිපැදීම අනිකෙක, නිවන් නිසා පිළිපැදීම අනිකෙක, ලාභ නිසා පිළිපදනෝ නිවන් ලද ත් නො හෙති. නිවන් නිසා පිළිපදනෝ ලාභයෙහි නො ඇලෙති. ලාභයක් උපදවා ගන්නා කල පවෙහි හැසුරුණ මැනව. කොවුන් කමු ත් කළ මැනව. කොවුන් කමෙක් නැත් නම් ලාභයෙක් නැත. කිරි බත් පාත්‍රයට පවා ඉඳුරා ඇහිල්ල බා ලූව යි ගැලෙන කිරි බතෙක් නැත. මඳක් වුව ත් වක් කොට ලා ඇඟිල්ල බා ලන්නා කිරි බත් ගැලෙන්නේ ය. එ සේ ම ලාභයක් වුව මනා වී නම් අවශ්‍යයෙන් කොවුන් කම ත් ඇත මැනව. එ සේ උපදනා ලාභ ය ධාර්මික නො වෙයි. ධුතඞ්ග පූරණාදි මූලික ව උපදනා ලාභ ය ධාර්මික ය. ධුතඞ්ග පූරණාදිය ත් ලාභ නිසා නො වන හෙයින් නිවන් නිසා පිළිපැදීම ය. බුදු සවුවෝ තුමූ ලාභ සන්නිශ්‍රිත ප්‍රතිපදාව හැර නිවනට පමුණුවා ලන ප්‍රතිපදාවෙහි හැසිර වෙසෙත් නම් ලාභ සත්කාරයෙහි ඇලුම් හැර ඇලුම් කළ මනා නිවනෙහි ම ඇලෙති'යි වදාළ සේක. මේ දෙශනා කෙළවර බොහෝ දෙන සෝවාන් ඵලාදියට පැමිණියහ.

## 72. රාධ තෙරුන් වහන්සේ ගේ වස්තුව

තව ද මනාවුන් කරා ගොසින් කරණ හජන ය නො සිස් නියාව හඟවන්ට රාධ තෙරුන් වහන්සේ ගේ වත දක්වමු.

කෙ සේ ද යත්—

ඒ රාධ තෙරුන් වහන්සේ ද වැළි ත් ගිහි අවසථාවෙහි සැවත් නුවර ලොවී සැපතට පින් නැති දුක් පත් බමුණාන කෙණෙක. උඹ තුමූ සෙසු ලෙසකින් ජීවත් විය නො හී වහන්දෑ ළඟ රැකෙමි'යි සිතා වෙහෙර තණ කසළ හරිමින් ගෙ මලු හමදිමින් දැහැටි පැන් දීම ආදී වූ අත් පා මෙහෙවර කරමින් ගමට නො ගොසින් විහාරයේ ම රඳති. වහන්දෑ ත් මෙහෙවර කොට ලන හෙයින් බත් දෙවන සේක. උන් තමන් මහණ වීමෙහි රුචි ඇත ත් මෙහෙවර නැති වෙයි යන සිතින් දෝ මහණ නො කරණ සේක. බමුණා-නෝ ද මහණ වීමෙහි සිත්විල්ල බලවත් හෙයින් එයි ත් නැති වත්නා සිත්විලි ගෙන දුර්වල වූහ. බුදුහු එක් දවසක් ලොව බලන සේක්- බුදු නුවණින් මේ බමුණානන් දැක ඔ හට කුමක් වේ දෝ හෝ යි බලන සේක් රෙදි කඩෙකින් වසා තුබූ මැණිකක් මෙන්

Non-Commercial Distribution

රහත් වන්ට නිසි පින් ඇත්තෝ ය යි දැන දෙවන දවස් සවස් වේලෙහි වෙහෙරවල සැරිසරන්නාක් මෙන් බමුණානන් ළඟට වැඩ 'බමුණ,, කුමක් කොට ඇවිදිදැ'යි විචාළ සේක.

'වහන්දෑට වත් පිළිවෙත් කොට ඇවිදිමි'යි කී ය. එ සේ මෙහෙ කොට ත් සංග්‍රහ ත් ලැබෙයි දැ' යි විචාරා වදරා 'බත් පමණක් ලැබෙමි. මහණ කරන්ට මැළි සේකැ' යි කී කල්හි කාරුණික වූ බුදු රජුන් වහන්සේ වහන්දෑ රැස් කරවා ලා 'කුමක් ද, මහණෙනි, මේ බමුණු කළ උපකාරයක් සඳහන් ඇති කෙණෙක් ඇත් දැ'යි විචාළ සේක. ඒ අසා සැරියුත් මහ තෙරුන් වහන්සේ 'ස්වාමීනි, එක් දවසක් රජගහා නුවර මා සිඟන ගමනේ මූන් තමන්ට ගෙනා බත් සැන්දක් මට ලවා පී නියාවෙක් මා සිත ඇතැ'යි වදළ සේක. බුදුහු ඒ අසා 'හැයි, ශාරිපුත්‍රයෙනි, තොපට දුන් දෙයෙහි අනුසස් නම් පමණෙක් නැත. තෙල තරම් උපකාරයක් සිත ඇති වැ තුලුන් සසර දුකින් නුමුදන්නේ හැයිදැ'යි විචාළ සේක. 'යහපත ස්වාමීනි, එ සේ වී නම් මහණ කෙරෙමි'යි වදරා ලා මහණ කළ සේක.

උන් වහන්සේ වළඳන්ට හිඳුනා කල අලුත මහණ වූ හෙයින් පාළි කෙළවරට පැමිණෙ යි. එ සේ හෙයින් කැඳ බත් ආදියෙන් එාසුවෙක් නැත. ධර්ම සෙනෙවි ස්වාමී ද ඒ බව දැන උන් වහන්සේ කැඳවා ගෙන සැරි සරා වැඩ පී සේක් එක් වන් 'තොප විසින් මේ කළ මනා දෙය ය. මේ නො කළ මනා දෙය'යි සරි ත් වරි ත් සිඛයෙහි හික්මවන සේක. උන් වහන්සේ ද සුවච කීකරු ව අනුශාසනා ලෙස පිළිපදිනා සේක් කීප දවසකින් භාවනාවට ගන්නා දුක් ආදි ම ගෙන නිමවා පූවා සේ රහත් වූ සේක. කළ භජනය ත් ඉතා යහපත් විය. මහ තෙරුන් වහන්සේ ද උන් වහන්සේ කැඳවා ගෙන සටන් ජය ගත් කෙණෙකුන් රජදරුවන්ට පාන්ට ගෙන යන්නා සේ බුදුන් කරා ගෙන ගොසින් වැඳ ලා වැඩ හුන් සේක. ඉක් බිත්තෙන් බුදුහු 'ශාරිපුත්‍රයෙනි, 'තොපගේ සද්ධි විහාරිකයාණෝ සුවච කීකරුවෝ දැ'යි විචාරා 'එ සේ ය. ස්වාමීනි, ඉතා ම කීකරුවෝ ය. කවුරුන් කුමක් කීව ත් කිපෙන්නෝ නැතැ'යි වදළ කල්හි 'මෙ සේ වූවන් ලබතො ත් කෙ තෙක් විතර රඳවවු දැ'යි විචාළ සේක. 'මේ සේ වූවන් කෙ තෙක් දෙන වුව ත් රැඳවීමෙහි ආයාස මඳ හෙයින් රඳවන්ට පිළිවනැ'යි කී සේක.

ධර්ම සෙබෙහි ත් කථාවෙක් උපදනේ 'කළ දෙයෙහි උපකාර දැන් ම සැරියුත් මහ තෙරුන් වහන්සේ ගේ ඉතා යහපත. බත්

Non-Commercial Distribution

සැන්දක් පමණින් කළ උපකාර සලකා දුක්පත් බමුණානන් මහණ කළ සේක. ඌ තුමූ ත් අවවාදක්‍ෂම ව අවවාදක්‍ෂම තැන් ම ආශ්‍රයට ත් ලත් දෑ'යි යන කථාව ය. බුදුහු ඒ අසා වදරා 'මහණෙනි, ශාරිපුත්‍රයන් කළ දෙයෙහි උපකාර දන්නේ දැන් මතු නො වෙ යි. යට ගිය දවස ත් තමන් ඇත් ව උපන් කල කැලෑවල දඹු පත් කපා ගිය වඩුවන් තමන් පය ඇනුණු හුල් කඩ තමන් කෙරෙහි හයක් නැති ව හැර ලා පය සුව කොට ලූ හෙයින් සුදු ඇත් පැටවකු වඩුවන්ට ගෙනවුත් දුන්හ. එ කල එකවාරී ඇතාණෝ නම් සැරියුත් මහතෙරහු ය' යනාදීන් අලීන චිත්ත ජාතක ය වදරා ලා—

"හෙම්බා මහණෙනි, භික්ෂූන් විසින් නම් රාධයන් මෙන් විය යුතු ය. වරද දක්වා කවර තරමෙක අවවාද කරත ත් උරණ නො විය යුතු ය. යම් කෙණෙක් තුමූ බාල ව සිට ත් අවවාද කෙරෙත් නම් උන් බාල වුව ත් කරණ අවවාද ය බාල නො වන බැවින් ආලෙස්සම් කොට සිතිය යුතු නො වෙ යි. යම් සේ දුප්පත් කෙණෙක් මරා තළා පියා ත් තෙලෙ හැර ගනුව'යි වස්තුවෙන් පිරුණා වූ නිධානයක් පවිත් නම් කෙසේ මරත ත් තළත ත් උන් කෙරේ මුසුප්පු නැති ව සමාධි වෙත් ද, එ මෙන් වරදක් සොයා ගෙන සහ මැද නුගුණ පතුරුවම්හ'යි යන කුලුණු අදහසින් දක්නා වරදක් නො ව 'මේ වැරැද්ද කියා නො දත් දෙය දන්වා ලම්හ. දත් දෙය පිරිමස්වා ලම්හ. සීල සමාධ්‍යාදී ගුණෙන් වසා ලම්හ' යන අදහසින් දුටු වරද කියා අවවාද කරන්නවුන් නිධාන කියන්නවුන් කොට සිතා, නැවත යම් කෙණෙක් සද්ධි විහාරිකාදීන්ගේ අසාරුප්පයක් දැක දැක 'මූ අපට සකස් කොට අත් පා මෙහෙවර කෙරෙති. ඉදින් මේ අසරුප කියා ලූ මෝ නම් කෙරෙමින් සිටි දෙය තබා පියති' යන සිතින් බැණ නො නැගෙත් නම් ඌ මේ සස්නේ කසළ ලන්නා නම් වෙති. එ සේ වූවන් හැර යම් කෙණෙක් කළ වරද ලෙසට තර්ජනය කෙරෙමින් දඬුවම් කරවා වැඩි වරදට විහාරයෙන් නෙරා හික්මවත් නම් එ ලෙස නිග්‍රහ කරන්නා වූ නැවත ධර්මෝප ප්‍රඥාවෙන් යුක්ත වූ සත් පුරුෂයන් භජන ය කටයුතු ය. එ බන්දවුන් භජන ය කරන්නවුන්ට වැඩෙක් ම වත් මුත් අවැඩෙක් නො වේ'යි වදළ සේක. මේ දෙශනා කෙළවර ත් බොහෝ දෙන නිවන් දුටුහ.

එ සේ හෙයින් සාධු ගුණයෙන් යුක්තයන් විසින් හීනොපාශ්‍රය නො කොට සත් පුරුෂොපාශ්‍ර ය කොට උන්ගේ අනුශාසනායෙහි

Non-Commercial Distribution

පිහිටා යම් සේ ගිනි දඬු පත් ආදි වූ සියල්ල ම දවා ද - එ මෙන් සන්තානයෙහි පවත්නා වූ කෙලෙස් නැමැති මහ කසළ තදඞ්ග විමුක්ත්‍යාදී වූ විමුක්ති නමැති ගින්නෙන් දවා ද, නැවත එ ම ගිනි කා කෙරෙහි ත් දයාවක් කරුණාවක් නැත්තේ ද, එ මෙන් කෙලෙසුන් කෙරෙහි දයාවකු ත් කරුණාවකු ත් නැති ව, තව ද ඒ ගිනි යම් සේ ශීත නසා ද එ මෙන් වීර්‍ය්‍ය නමැති ගින්නෙන් කෙලෙස් නමැති ශීත පීඩා නසා. තව ද ඒ ගිනි අනුනයක් ප්‍රති-ඝයක් නැත්තේ ද එ මෙන් ප්‍රතිඝානුන ය නැති ව, තව ද ඒ ගිනි අඳුරු නසා ද, එ මෙන් මොහ නමැති අඳුරු නසා. තව ද ඒ ගිනි ආලොක පතුරුවා ද එ මෙන් මාර්‍ග ඥාන නමැති ආලොක පැතිර වීමෙන් ලෝ සසුන් බැබළවි ය යුතු.

---

## 73. අස්සජි-පුනබ්බසුක වස්තුව

තව ද ගිවිසිත ත් නො ගිවිසිත ත් ගොඩ ත් දියෙහි ත් වසිනා වැසි පරිද්දෙන් අවවාද කට යුතු නියාව ම හඟවනු පිණිස අස්සජි-පුනබ්බසුක වස්තුව දක්වමු.

කෙ සේ ද යත්:-

මේ දෙශනාව කීටාගිරි නම් දනවුවෙහි දී උපන. සවග වහන්දෑ කෙරෙහි ඇතුළත් වූ ඒ අස්සජි - පුනබ්බසුවෝ ද අග සවුවන් වහන්සේට සද්ධිවිහාරික වත් ජාතිසම්පන්නයන්ට ද වත් තරම් නපුරු සේ ඉතා අලජ්ජීහ. පව්වූ තරම් ඇත්තෝ ය. තමන්ගේ පිරිවර හා සමඟ බුදුන්ට දුරු ව කළ යම් දෙයක් විකනු නිසා කීටාගිරියෙහි වසන්නාහු කුල සංග්‍රහ සඳහා මල් ගස් රොපණ ය කිරීම් ආදී විසින් නො එක් අනාචාර කොට කුලදූෂණයෙන් ලද දෙයින් ජීවත් වන්නාහු තමන් වසන තැන මාලුවා ලිය ය නැඟි ගස් පරිද්දෙන් සිල්වත් තැන්ගේ විසීම නැති කළහ බුදුහු ත් ඒ අසා වදරා පබ්බාජනීය කර්‍ම ය නම් කුල දූෂකයන්ට නියම හෙයින් ඔවුන්ට ඒ කර්‍ම ය කරණු නිසා පිරිවර සහිත අග සවු දෙන ම බණවා ලා ‘ශාරිපුත්‍ර-මෞද්ගල්‍යායනයෙනි, ඔබ ගොසින් යම් කෙණෙක් තොප කීවා නො කෙරෙත් නම් උන්ට පබ්බාජනීය කර්‍ම ය කරව. යම් කෙණෙක් තොප කී ලෙස කෙරෙත් නම් අවවාද අනුශාසනා කරව.

මෙහි අවවාද නම් උපන් වස්තුව දැක කියන දෙය හෝ ය, හමු-යෙහි කියන මාලු කම හෝ ය, එක විට කියා ලන දෙයක් හෝ ය, අනුශාසනා නම් වරදක් නුදුටුව ත් මත්තෙහි අයසෙක් උපදී.

Non-Commercial Distribution

නමුත් ය' යි දුර තබා කියන දෙය හෝ ය, නො හමුයේ ම කියා යැවීම් හෝ ය, පෙරළ පෙරළා ත් මාලු කම් කීම හෝ ය. නොහොත් අවවාදය ම අනුශාසනා නමුත් වෙයි. මෙ ලෙස කොට අකුසලින් දුරු කරවා කුසල්හි හසුරුවව'. මෙසේ කරණ අවවාද ත් යහපත් අදහස් ඇත්තවුන්ට ප්‍රිය ය. නපුරු අදහස් ඇත්තවුන්ට අප්‍රිය ය. යහපත් අදහස් ඇත්තෝ රහල් තෙරුන් මෙන් අසා පිළිගනිති. නපුරු අදහස් ඇත්තෝ කණී කණ්‍යර්ර දෙයක් මෙන් අසනු කැමැති නො වෙති. ඒ කෙ සේ වුව ත් අනුශාසක ව සිටියවුන් විසින් අනුශාසනා කට යුත්තේ ය' යි වදළ සේක. මේ දෙශනා කෙළවර බොහෝ දෙන මාර්ගාධිගම - ඵලාධිගම කළහ. අග සවු දෙ දෙනා වහන්සේ ද ඔබ ගොසින් අවවාද කළ සේක. සමහර තැන් අවවාද පිළිගෙන සම්‍යක් ප්‍රතිපදවට පැමිණි සේක. සමහර තැන් සිවුරු හළවු ය. සමහර තැන් පබ්බාජනීය කර්ම ය ලද්දහු ය.

එ සේ හෙයින් නුවණැත්තවුන් විසින් යම් සේ සුළඟ සුපිපි වන ලැහැබට හමා ද එ පරිද්දෙන් අර්හත් ඵල විමුක්ති නමැති මල් ඇති, අර්හත් මාර්ග නමැති ගසින් යුත් නිවන් නමැති මහ වනයෙහි ඇලුම් ඇති ව, යම් සේ මහ සුළඟ තර ව හමා ලා ගස් කොළ වගුරුවා ද එ පරිද්දෙන් රාගාදි කෙලෙසුන් වගුරුවා තව ද ඒ සුළඟ අහස ම හැසිරේ ද - එ මෙන් ලොවුතුරා දහම් ම අහස සේ උස හෙයින් එහි ම හැසිරෙන්ට උත්සාහ කොට නැවත ඒ සුළඟ යහපත් තැනකට හැමී නම් සුවඳ අනුභව කෙරේ ද, එ මෙන් යහපත් තැනට පැමිණීමෙන් සිල් නමැති සුවඳ විලවුන් ගෙන, නැවත ඒ සුළඟ ප්‍රතිනියත වාසස්ථාන නැත්තේ ද එමෙන් කිමෙක ත් ඇලුම් නැති ව, ගුණ දහම් පුරා නිවන් පුර අත් කර ගත යුතු.

## 74. ඡන්න තෙරුන් වහන්සේ ගේ වස්තුව

තව ද අවවාදක්ෂම නො වීමෙහි ආදීනව දක්වන්නමෝ ඡන්න තෙරුන් වහන්සේ ගේ වත දක්වමු.

කෙ සේ ද යත්—

ඒ ආයු බොහෝ වූ සන් තෙරුන් වහන්සේ "මම මේ බුදුන් මහණ වන්ට එන දවස් කෙ තෙක් දෙනා ඇත ත් අත් නො හැර අයිමි. එ දවස් කැටි ව ආ එක කෙණකුනු ත් නුදුටුයෙමි. අද මෙ වක 'සැරියුත් මහ තෙරහු නම් අපි ය' යි කියා ලා සමහර



Non-Commercial Distribution

තැන් පෙනෙන සේක. 'මුගලන් මහ තෙරහු නම අපි ය' යි කියා ලා සමහර තැන් පෙනෙන සේක. මේ කිම් දැ'යි දෙ අග සවු තැන් අරහයා බැන ඇවිදිනා සේක. බුදුහු එ පවත් අසා සත් තෙරුන් වහන්සේ කැඳවා ලා අවවාද කරණ සේක. අවවාද කළ වේලේ මදක් තබා ලා මුබර ව දෙඩන්ට සුරු හෙයින් නැවත ත් බණන සේක් ම ය.

මෙ ලෙසින් බණන කලට තුන් වාරයක් දක්වා කැඳවා ගෙන්වා ගෙන අවවාද වදරා 'සත් තෙරීනි, තෙල අග සවු දෙ දෙන තොපට කලයාණමිත්‍ර ව සිටිති. උතුම් ගුණයෙන් ඉතා උතුම් ව ත් සිටිති. භජන ය කළ මනා එ බන්දවුන් ම ය. අකුසල්හි හැසිරෙන පවිටු මිත්‍රයන් භජන ය නො කළ මැන ව. ගිහි වූවො ත් උමං බිඳීම් ආදියෙහි හෝ ශාසනික වූවො ත් එක් විසි අන්වෙෂණයෙහි හෝ යෙදෙන නිකෘෂ්ට සත්‍වයනු දු ළං නො කරන්නේය. එ සෙ කල භජන ය කළ මනා ත් ළං කළ මනාත් කවුරුන් ද යත්-මෙ ලෝ පර ලෝ දෙකින් වන්නා වූ වැඩෙහි අසුරුවන බුද්ධාදී වූ සත්පුරුෂයන් ම භජන ය කට යුතු ය. සත් පුරුෂයන් ම ළං කළ යුතු ය' යි වදාළ සේක. දෙශනා කෙළවර ආධාන ග්‍රාහී හෙයින් සත් තෙරුන් වහන්සේ හැර බොහෝ දෙන නිවන් දුටහ.

සත් තෙරුන් වහන්සේ මෙ තෙක් අවවාද අසා ත් මුණින් නමා ලූ කළයක් වස්නා පැනට ආධාර නො වන්නා සේ බුදුන් වදාළ අවවාදයට ත් ආධාර ව ගත නො හී නිරපරාධ තැනට බිණීමෙන් වදනා පාපයට ම ආධාර ව නැවත ත් බණන සේක් ම ය. පෙරළා ත් බුදුන්ට දන්වූ කල්හි 'මා ඇති තෙක් කල් උන් හික්මවන්ට බැරි ය. මා පිරිනිවි කලට පිළිවනැ'යි වදරා ලා පිරිනිවන් පානා දවස සත් තෙරුන් වහන්සේ කෙරෙහි පිළිපත මනා තරම කවරේ දැ' යි අනඳ මහ තෙරුන් වහන්සේ විචාළ ගමනේ 'ආනන්‍දයෙනි, සත් තෙරුන්ට බ්‍රහ්ම දණ්ඩය දිය යුතු ය'යි මුබර තැනට නිල ව තිබෙන කර්‍මය කරන්ට වදාළ සේක.

බුදුන් පිරිනිවි පසු අනඳ මහ තෙරුන් වහන්සේ වදරා යවූ බ්‍රහ්ම දණ්ඩ ය අසා තුන් විටක් විතර මූර්ච්ඡාව 'මා නො නැසුව මැනැවැ'යි පැරැත්ත ත් ගෙන යහපත් ව පැවත නො බොහෝ කලකින් ම පිළිසිඹියා පත් රහත් වීමෙන් හැම කර්‍මයෙන් ම ගොඩ නැඟි හෙයින් බ්‍රහ්ම දණ්ඩයෙනු ත් මිදුණු සේක.

Non-Commercial Distribution

එ හෙයින් සුජනයන් විසින් කට නම් ඇති වූයේ කවුරුන් හා ත් දෙඩන්ට වේ දැ යි සිතා මුඛර නො ව, යම් සේ පර්වතයෙක් නිශ්චල ද එ මෙන් කා කුමක් කීව ත් නිශ්චල ව, තව ද ඒ පර්වත ගල තද බැවින් කිසිවක් හා නො ඇලේ ද එ මෙන් කිසිවෙක ත් නො ඇලී, නැවත ගල මත්තේ බිජුවට හට නො ගනී ද, එ මෙන් සිත් නමැති කුඹුරේ කෙලෙස් නමැති බට තල් හට ගත නො දී, තව ද ඒ පර්වත ගල සෙ තෙක් දැ ලා පුව ත් නො නැමේ ද, ඒ හැම හැර ගත් කලට ඉපිළ ත් නො යේ ද, එ මෙන් ලාභයෙහි දී උඩඟු ත් නො ව අලාභයෙහි දී මදකු ත් නො බා හැමයට ම එක තරමේ දවස් යවා, චිත්තසුද්ධිය කටයුතු.

# 75. මහාකප්පින තෙරුන් වහන්සේ ගේ වස්තුව

තව ද කුශලයෙහි අනුසස් දක්වා සතුන් පිණෙහි ම යොදනු නිසා මහා කප්පින තෙරුන් වහන්සේ ගේ වත දක්වමු.

එහි ලා මේ පිළිවෙළ කථාව ය:-යට ගිය දවස ආයු බොහෝ වූ මේ මහා කප්පින මහ තෙරුන් වහන්සේ මහ සවු තනතුරට පියුම තුරා බුදුන් සමයෙහි පතා එ වක් පටන් සසර හැසිරෙන සේක් එක් කලෙක බරණැසට නුදුරු එක් සාලි ගමෙක එ ගම සාලින්ට මුදලි ව උපන් සේක. එ කල දහසක් පමණ පසේ බුදුවරුන් වහන්සේ අට මසක් මුළුල්ලෙහි හිමවු පියස වැස පියා වැසි සාර මස දනවුවට බැස ලුණු-ඇඹුල් මුසු දෙය වළඳනු පිණිස එහි වසන සේක. එක් වස් අවධියෙක බරණැස් නුවරට නුදුරු තැනකට බැස ලා වස් වසන ගෙවල් ඉදි කරවා දෙන නියායෙන් හසන කර්‍ම ය නම් එක්තරා ද්‍රව්‍යයක් නො වන හෙයින් ඒ ඉල්වා රජ්ජුරුවන් ළඟට යව යි පසේ බුදුවරුන් වහන්සේ අට නමක් යවූ සේක. එ කල රජ්ජුරුවන්ගේ වප් මඟුලෙක් ඇත. පසේ බුදුවරුන් වහන්සේ වැඩි නියාව අසා වප් මඟුල් විධාන තිබැදී ම අවුදින් වැඩි කරුණු විචාරා 'සෙට වප් මඟුල් හෙයින් අද ත් සෙට ත් අවසර නැත. අනික් දවස් කරවමි'යි කියා ලා පසේ බුදුවරුන් වහන්සේට ආරාධනා නො කොට ම රජ ගෙට ගියහ. පසේ බුදුවරුන් වහන්සේ අට නම ත් 'අනික් ගමකට සිහා යම්හ'යි නික්මුණු සේක.

එ වේලෙහි සාලි මුදලියාණන්ගේ ඇමෙණියෝ කිසි කට යුත් තෙක බරණැසට යන්නෝ ඒ පසේ බුදුවරුන් වහන්සේ දැක වැඳ ලා මෙ වේලේ වැඩියේ කුමක් නියා දැ යි විචාරා ආදියේ පටන්

Non-Commercial Distribution

වැඩි පවත කී කල්හි සැදැහැත් ඇති එ තරමට නුවණ ත් ඇති උපාසිකාවෝ 'ස්වාමීනි, සෙට දවසට මිඩියට කරුණා කොට වදාළොත් යහපතැ'යි ආරාධනා කොළෝ ය. 'උපාසිකාවෙනි, අපි බොහෝ දෙන ය'යි වදාළ සේක. 'කෙතෙක් දෙනා වහන්සේ දැ'යි විචාරා 'දහසක් දෙනම්හ'යි කී කල්හි තමන් නුවණැති නියාවට 'ස්වාමීනි, මේ සාලි ගම ත් සාලි දහසෙක් ඇත. එකි එකී කෙණෙක් එකි එකී නමට දත් දෙති. එ සේ හෙයින් මට ම භාර වන්ට නැත. ඉවසා වදරන බව ය. මාගේ බලයෙන් මම ම හැම දෙනා සමාදන් කරවා වස් වසන තැනු ත් කරවා දෙමි'යි කිවු ය. පසේ බුදුන් වහන්සේ අට නම ද ආරාධනා ඉවසූ සේක.

උපාසිකාවෝ ද ගමට ගොසින් සිහි නැති ව වැද නො හිඳ ගම මධ්‍යයෙහි සිට හඬ ගා කියන්නෝ 'මම මුඹ හැම ත් සලකා දහසක් පමණ පසේ බුදුවරුන් වහන්සේට ආරාධනා කොට සෙට මුබ දී වළඳන්ට වඩනට නිල කෙළෙමි. මට ම හැර නො ලා අා කල වැඩ හිඳිනා තැනකු ත් ඉදි කළ මැනව. කැඳ-බත් ආදි වූ දෙය ත් සපයා ලූ ව මැනැව'යි කිවු ය. උන්ගේ විධාන අසා තමන් හැම ත් සැදැ ඇති හෙයින් හැම දෙන ම ලැබුණවු ය. ලැබුණවුන් හැම හැර ගෙන තුමූ මුල් ව මඩුවකුත් ලවා ලා හසුනු ත් පනවාලා දෙ වන දවස් පසේ බුදුන් වහන්සේ දහස වඩා හිඳුවා ලා මධුරාහාර ය වළඳවා ලා වළඳා අන්තයෙහි එ ගම වසන ගැනු මිනිසුන් කැඳවා ගෙන ගොසින් පසේ බුදුවරුන් වහන්සේ වැද ලා වස් වසනට ආරාධනා ත් කොට නැවත ගමට වැද ලා හඬගා කියන්නෝ 'දෙ මවු පියෙනි, මල් බෑයෙනි, එ කි එකී ගෙන් එ කි එ කී පිරිමි දරුකෙණෙකුන් ම පොරෝ ආදි වූ යකඩ හැර ගෙන වලට පලා ගොසින් දඬු පත් ගෙන'වුත් ස්වාමි දරුවන් වස්වසන තැන් කළ මැනව'යි කිවු හ.

ගම් වැස්සෝ ත් තමන් සීතා ගෙන කරණ දෙයක් නො වන බැවින් උන්ගේ විධානයේ සිට එ කි එකී කෙණෙක් එකක් බැගින් පන් සල් දහසක් කොට ලා තමන් තමන්ගේ පන් සල්වල වස් විසූ පසේ බුදුන්ට වෙන වෙන ම සැරහී දන් දුන්හ. වස් අන්තයෙහි 'තමන් තමන් උපස්ථාන කළ පසේ බුදුන්ට සිවුරු පිළි දෙන්ට වුව මැනවැ'යි සමාදන් කොට එකි එකී නමට දහස දහස නියායෙන් දශ ලක්ෂයක් වටනා සිවුරු පිළි දුන්හ. පසේ බුදුවරුන් වහන්සේ ත් වස් අන්තයෙහි බණ වදරා ලා වැඩි ප සේක.

නායක සාලි දුවණියන් පටන් ගම් වැස්සෝ ත් මේ පින්කම් කොට එයින් මිය තව්තිසා දෙව් ලොව ඉපැද සමූහ ව ලා උපන් හෙයින් ගණ දෙවතාවෝ ය යි ප්‍රසිද්ධ වූහ. ඒ දිව්‍ය ලොකයෙහි ආයු පමණින් දෙව් සැප ත් වලඳා කසුප් බුදුන් සමයෙහි බරණැස් නුවර කෙළෙඹි කුලවල උපන්හ. එ වක නායක සාලියාණෝ නායක කෙළෙඹියාණන්ට පුත් ව උපන්හ. එ වක පින්කමට නායක වූ සාලි දුවණියෝ අනික් කෙළෙඹි මුදලියාණ කෙණෙකුන්ට දූ වූ හ. වැඩි විය පැමිණ සරණ යන්නෝ ත් සාලි අවධියේ ස්වාමි වූ කෙළෙඹි පුත්‍රයාණන් කරා ම සරණ ගියහ. සෙසු සෙස්සෝ අනික් අනික් කෙළෙඹි කුලවල ඉපැද වැඩි විය පැමිණ සරණ යන්නෝ සාලි අවධියේ යම් යම් කෙණෙක් තමන් තමන්ට ස්වාමි වූ නම් උන් උන් කරා ම සරණ ගියහ.

එක් දවසක් වෙහෙර බණට හඬ ගෑ ය. 'බුදුහු බණ වදරන සේකැ'යි යනු අසා සියලු කෙළෙඹියෝ තමන් තමන්ගේ කෙළෙඹි දූන් හා සමඟ බණ අසම්හ යි විහාරයට ගියහ. උන් වෙහෙරට යන්නා ම එ වක දහම් වැස්සෙන් තෙමී පිය නො හෙන හෙයින් තෙමෙන්ට වන්නා සේ වැස්සෙක් වස්නට වන. යම් කෙණකුන්ගේ නෑ වහන්දෑ වේව යි පුරුදු වහන්දෑ වේව යි ඇත් නම් උඹ ඒ ඒ වහන්දෑගේ පිරිවෙන් ආදියට වන්හ. මූ හැම තමන් අමුතු ව ලා ගිය හෙයින් එ බඳු තැනක් නැති ව වෙහෙර මැද ම තෙමී තෙමී සිටියහ. තෙමී පියා කෙළෙඹි මුදලියාණෝ කියන්නෝ අප හැමට ම වූ දෑ දුටු වූ ද? කුල දරුවන් ලජ්ජා වන්ට මෙ තෙක් මඳ දෑ'?යි කිවූ ය. හැම දෙන ම ඒ ලජ්ජා වන්ට වන්නා මෙ තෙක් ඇත. ලජ්ජාව පියා කුමක් කරමෝ ද'යි කිවූ ය. නො තෙමී සිටිනට නිසි තැනක් ලබන්ට පෙර පිණක් නො කළ හෙයින් දූන් නො ලද ත් මතු ත් වී නම් ලබන්ට හැම දෙනමෝ රනක් එක් කොට බා ඒ දී පිරිවෙණක් කරම්හ'යි කිවූ ය. උයිත් 'යහපතැ' යි ගිවිස්සහ.

නායක තැනැත්තෝ රනින් නායක වූවා සේ ම සෙස්සනු ත් නායක වන්ට මසු දහසක් දුන්හ. සෙසු කෙළෙඹියෝ පන් පන් සිය ය දුන්හ. ගැනු දහස දෙ සිය පනස දෙ සිය පනස දුන්හ. මෙ සේ සත් ලක්‍ෂ පනස් දහසක් රන් එක් කොට ගෙන කරවා බුදුන්ට ම පිළිගන්වනු නිසා කුළු ගෙවල් දහසකින් හොබනා මහ පායක් කරවන්ට පටන් ගත්හ.

කර්මාන්ත ය මහත් හෙයින් ආදි එක් කළ රන් මඳ නියාව බලා ආදි පන් සිය ය දුන්නවුන් ගෙන් දෙ සිය පනස හා දෙසි ය

Non-Commercial Distribution

පනස දුන්නවුන් ගෙන් එක් සිය පස් විස්ස වන නියායෙන් තුන් ලක්‍ෂ පන් සැත්තෑ දහසක් එක් කොට ලා දෙමුරයෙන් කැටි ව එක් වූ එකොළොස් ලක්‍ෂ පස් විසි දහස් සත් සියයක් පමණ රනින් ගඳ කිළිය කරවා ලා කරවා නිමි පූජාව කරවන්නාහු බුදු පාමොක් විසි දහසක් රහතන්ට සතියක් මුළුල්ලෙහි මහ දන් දී සිවුරු පිරිකර ත් දී ආදි දහසක් දී ඇති වූ පොහොසත් කමින් එ වක විසි දහසක් දුන්හ. කෙළෙඹි මුදලින්ගේ ඇඹෑණියෝ කරණ පින්කම හැම දෙන හා සරියේ ත් කොට ලා තමන් නුවණැති හෙයින් වඩා ත් පිණක් කරණු කැමති ව අනෝජා මල් සමූහයක් සේ රන් වන් වූ දහසක් වටනා හිණ කඩකුත් අනෝජා මල් සුමුගකුත් ගෙන්වා ගෙන බුදුන් බණ වදරන වේලේ අනෝජා මල් පුදු ලා රන්වන් හිණ කඩ ත් රන් වන් බුදුන් පා මුල තබා ලා 'ස්වාමීනි, මා උපනුපන් තැන මාගේ ශරීර ය ත් අනෝජා මල් දමක් සේ රන්වන් වේව'යි නම ත් අනික් නමක් නො ව අනෝජා නම් ම වේව යි පැතූ ය. කසුප් බුදු රජුන් වහන්සේ ත් වන නියා ව දැක 'ඒ එ සේ ම වේව'යි වදාළ සේක.

ඔහු හැමදෙන ත් ආයු පමණින් සිට එයින් සැව දෙව්ලොව ඉපැද මේ අපගේ බුදුන් සමයෙහි දෙව් සැපතින් ම සතුටු නො ව නිවන් සැපතු ත් ලබනු සඳහා දෙව් ලොවින් සැව නායක කෙළෙඹියාණෝ දඹදිව කුක්කුටවතී නම් නුවර රජ කුලෙහි උපන්හ. ඉපැද කප්පින රජ්ජුරුවෝ ය යි ප්‍රසිද්ධ වූහ. කැටි ව පින් කළ සෙස්සෝ ඇමැති කුලවල උපන්හ. නායක කෙළෙඹියාණන්ගේ ඇඹෑණියෝ මද්‍ර රට සාගල නුවර රජ කුලයෙහි උපන්හ. උන්ගේ ශරීරය ත් අනෝජා මල්දමක් සේ රන්වන් වි ය. නම ත් අනෝජා නම ම තුබූහ. ඌ වැඩිවිය පැමිණ කප්පින රජ්ජුරුවන්ට ම සරණ ගොසින් අනෝජා බිසවු ය යි ප්‍රසිද්ධ වූහ. සෙසු ගෑනු දහස ත් ඇමැති කලවල ඉපැද වැඩිවිය පැමිණ යම් යම් කෙණෙක් පූර්ව ස්වාමී ව සිටියෝ නම් උන් උන් කරා ම සරණ ගියහ.

කප්පින රජ්ජුරුවන් හා එක් ව පින් කළ හැම දෙන ම රජකම මුත් සෙසු සැප ත් සරියේ ම අනුභව කෙරෙති. යම් දවසෙක රජ්ජුරුවෝ සූ සැට රාජාභරණ ලා සැරහී ගෙන ඇතකු නැඟී ගෙන ඇවිදිත් නම් එ කල ඌ හැම ත් එ සේ ම ඔටුන්න හැර සෙසු ආභරණ ලා සැරහී ගෙන ඇතුන් නැඟී ගෙන ඇවිදිති. රජ්ජුරුවන් අසු නැඟී හෝ රථය නැඟී හෝ යන කල උන් හැම දෙන ත් එ සේ ම අසුන් නැඟී ගෙන හෝ රථ නැඟී ගෙන හෝ යෙති.

Non-Commercial Distribution

මෙ සේ ඔහු හැම දෙන කරණ පින්කමු ත් සම සිත් ව එක් ව කළ හෙයින් සම්පතු ත් එක් ව ම එක සරියේ විඳිති.

රජ්ජුරුවන්ගේ ත් වාල ය, වාලවාහන ය, පුෂ්ප ය, පුෂ්පවාහන ය, සුපත්ත ය යි බලවත් අස්සු පස් දෙනෙක් ඇත. රජ්ජුරුවෝ තුමූ සුපත්ත නම් අසු නැඟෙති. අනික් අසුන් සතර දෙන සතර දිග ගොසින් මුවම්රි හසුන් ගෙනවුත් කියන ලෙසට අසරුවන් සතර දෙනකුට දුන්හ. රජ්ජුරුවෝ උන් සතර දෙනා උදසන ම බත් කවා ලා 'තෙල අසුන් නැඟී ගෙන දස දෙළොස් ගවු විතර සතර කඩ ගොසින් තුනුරුවන් ලොව පහළ වූ නියාවක් දැන ගෙන මා කන අමා ඕනාක් මෙන් කියව'යි විධාන කොට ලා යවති. උඵ සතර දෙන සතර වාසලින් නික්ම අසුන් පිටින් යන ගමන හෙයින් දස දෙළොස් ගවු විතර ගොසින් පියා හස්නක් නො ලදින් ම පෙරළා එති.

එක් දවසක් රජ්ජුරුවෝ සුපත්ත නම් අසු නැඟී ලා ඇමැති දහස පිරිවරා උයනට යන්නෝ වෙළඳුන් පන් සියයක් දුර සිට ආ හෙයින් ගමන් විඩාව නුවරට වදිනවුන් දැක 'මූ ගමන් විඩාව එන කෙණෙක. මුන්ගෙන් එක් යහපත් අස්නක් අසන්ට වුව මැනැවැ'යි උන් ගෙන්වා ලා 'කොයි සිට අවුදැ'යි විචාළෝ ය. රජ්ජුරුවන් වහන්ස, මෙ තැනට සාරසිය අසූ ගවුවක් විතරින් ඔබ්බෙහි සැවැත් නම් නුවරෙක් ඇත. ඊ සිට ආම්හ'යි කිවූ ය. 'ඒ තොපගේ රට අමුතු පවත් කිම් දැ'යි විචාළෝය. 'අනික් අමුත්තෙක් නැත. සව්නෝ ගෙවා දත් පස් මරුන් ජය ගෙන සිටි නිවන් පතා පින් කළවුන්ට නිවන් මං පානා තිලෝගුරු බුදු රජුන් වහන්සේ පියවි හිර එක් සක්වළෙක ම ආලෝක පතුරුවන හෙයින් දේශනා ලෝක ය හා ශරීරාලෝක ය අනන්තාපර්‍යන්ත සක්වළවල පතුරුවන්ට පහළ වූ හිරක් මෙන් පහළ වූ සේක'යි කිවූ ය.

රජ්ජුරුවෝ එ බස් අසමින් කප් අසඞ්ඛ්‍යයෙකු ත් කන හෙන බසක් නො වන හෙයින් හා තමන් බලවත් සැදැ ඇති හෙයින් පස් වනක් ප්‍රීතින් පිනා ගොසින් කිසිවකු ත් සලකා ගත නො හී මදක් කල් යවා පියා 'සගයෙනි, කුමක් කියවු දැ'යි දෙ වැනි ව ත් තුන් වැනි ව ත් විචාරා, දෙ වැනි ව ත් තුන් වැනි ව ත් බුදුන් උපන් නියාව කී කල්හි ප්‍රීතින් පිනා ගොසින් කිසිවකු ත් සලකා ගත නො හී සතර වෙනි වාරයේ විචාරා 'බුදුහු ලොව උපන් සේකැ'යි කී කල්හි එ විට සලකා පියා 'සගයෙනි, තොප තෙල කියා ලූ බසට මසු ලක්‍ෂයක් දෙමී' කියා ලා 'අනිකුත්

Non-Commercial Distribution

අමුත්තෙක් ඇත්ද'යි විචාළෝ ය. පිටක වසයෙන් තුනක් පමණ වූ, නිකාය වසයෙන් පසක් පමණ වූ, අඞ්ග වසයෙන් නවයක් පමණ වූ, දහම් කඳ විසින් සුවාසූ දහසක් පමණ වූ පෙළ දහම් හා සමඟ නව ලොවුතුරා දහම් පහළ වූ නියාව කී කල්හි ආදි ලෙසින් ම තුන් වාරයෙක කුල්මත් ව ගොසින් සලකා ගත නො හී සතර වෙනි වාරයේ අසා සලකා පියා 'තෙල බසට ත් මසු ලක්‍ෂයක් දෙමි' කියා ලා තව ත් අමුත්තෙක් ඇත් ද' යි විචාළෝ ය. ඒ ධර්ම ය දරා සිටිනා වූ සුප්‍රතිපන්නතාදි ගුණ ගණාඞ්ගසඞ්ගත අෂ්ටාර්‍ය්‍යපුද්ගල සඞ්සයා වහන්සේ ලොව පහළ වූ නියාව කී කල්හි රජ්ජුරුවෝ ආදි ලෙසින් ම තුන් වාරයෙක කිසිවකු ත් සලකා ගත නො හී සතර වෙනි වාරයේ අසා සලකා පියා 'මේ බසට ත් මසු ලක්‍ෂයක් දෙමි' කියා ලා ඒ අසුන් තුනට වඩනා අනික් හස්නක් සමස්ත ලෝකයෙහි නැති හෙයින් තව ත් අමුතු ඇත් ද යි නො විචාරා ඇමැති දහස මූණු බලා 'සඟයෙනි, කුමක් කරවු ද'යි විචාළෝ ය.

රජ්ජුරුවන් වහන්ස, මුඹ වහන්සේ කරන්නේ කිම්ද'යි විචාළ කල්හි 'සඟයෙනි, මම තුනුරුවන් ලොව පහළ වූ නියාව අසා නිස්සාර වූ රාජ්‍ය සම්පතක් නිසා පෙරළා ඇතුළු නුවරට නො යෙමි. බුදුන් උදෙසා ගොසින් යන ගමන ත් සාර්‍ථක කොට ඔබ ළඟ මහණ වෙමි' කීහ. 'රජ්ජුරුවන් වහන්ස, පින් ම රැක නො හිඳ බොහෝ ආයාසයෙන් ලද මනා රජ සැපත් හැර මුඹ වහන්සේ මහණ වන්ට යන කල ඇමති සැපතින් අපට කම් කිම් ද? අපි ත් කැටි ව එම්හ'යි කිවු ය. රජ්ජුරුවෝ බිසොවුන්ට කියා යවන පවත් රන් පටෙක හිඟුලෙන් ලියා යවාලා වෙළඳුන්ට කියන්නෝ 'අපගේ අනෝජා බිසවු මසු තුන් ලක්‍ෂයක් තොපට දෙති, එයි ත් හැර ගනුව. බිසොවුන්ට ත් කියන කල රජ්ජුරුවන් වහන්සේ රජ සැපත් මුළුල්ල ම මුඹ වහන්සේට හළ සේක. බිසෝවරුනු ත් රජ කමට හැකි හෙයින් රජ සිරි විඳුව මැනැවැ'යි කියව. ඉදින් 'රජ්ජුරුවන් වහන්සේ කොයි ද'යි විචාළෝ නම් බුදුන් ළඟ මහණවන්ට ගිය නියාව කියව'යි කිවු ය. ඇමති දහසත් තම තමන් ගේ අඹුවන්ට තම තමන් කියා යවන හසුන් කියා යවූහ.

රජ්ජුරුවෝ වෙළඳුන් යවා ලා ඇමැති දහස පිරිවරා ලා ඒ ඒ ඇසිල්ලෙහි ම නික්මුණවු ය. බුදුහු පෙරාතු දවස් අලුයම ලොව බලන සේක් පිරිවර සහිත වූ කප්පින මහ රජුන් දැක 'මේ මහා කප්පින රජ වෙළඳුන්ගෙන් තුනුරුවන් ලොව පහළ වූ නියාව අසා බස් තුනට තුන් ලක්‍ෂයක් පුද රජ සැපත් හැර ඇමැති දහස

Non-Commercial Distribution

පිරිවරා මහණ වනු කැමැති ව මා උදෙසා සෙට නික්මෙයි. අවු ත් මාගේ බණ අසා සහපිරිවරින් පිළිසිඹියා පත් රහත් වෙයි. මම ද ඕ හට පෙර ගමන් කොට යෙමි'යි දෙ වන දවස් සක් විති රජ කෙණකුන් කුඩා රජකුට පෙර ගමන් කරණ කලක් මෙන් අනද මහ තෙරුන් වහන්සේ පමණකු ත් නො කැඳවා තමන් වහන්සේ ම තමන් වහන්සේගේ සහළ ත් පාත්‍ර ධාතුව ත් හැර ගෙන සාර සිය අසූ ගවුවක් වැඩ චන්ද්‍රභාගා නම් ගං බඩ නුග ගසක් මුල සවනක් රස් විහිදුවමින් වැඩ හුන් සේක.

රජ්ජුරුවෝ ත් එන්නෝ එක් ගඟක් කරා පැමිණ මේ ගඟ කි නම් දැ යි විචාරා ආරවච්ඡා නමැයි කී කල්හි ගැඹුර—පළල විචාරා 'ගැඹුරෙන් ගවුවෙක, පළලින් දෙ ගවුවෙකැ'යි කී කල්හි මින් ඇත් වන්ට හොරු–අහුළු ඇත් දැ'යි විචාරා 'නැතැ'යි කී 'කල්හි 'හොරු—අහුළු බලා හිඳුමෝ නම් ආයු ගෙවන නියාව උදවූ හෙයින් මේ ජාති ය අප ජරාවට පමුණුවයි. ජරාව අවු ත් වැද ලා තමා නො කැමැති දෙයක් අනුන්ට දෙන්නා සේ අප මරණ ට පමුණුවාල යි. පසු ව මහණ වන්ට යන්නෝ කවුරු ද? මම තුනු රුවන් අරහයා විමති නැතු ව මහණවන්ට අයිම් නම් එහි ආනුභාවයෙන් මේ පැන් පැන් නොවෙ'යි කියා සාමාන්‍යයෙනු ත් තුනුරුවන් ගුණ සලකා ආවෙණික වූ මේ කාරණයෙනු ත් 'බුදුහු නිකෙලෙස් සේක යනාදිනව අරහාදී බුදු ගුණ සඳහන් කෙරෙමින් අසුන් දහස දිය පිටට පැන්න වූ ය. වඤ්චා අදහසක් නො ව සැබෑ ම අදහස් හෙයින් අස්සු දහස ගල තලෙක නික්මුණු කලක් මෙන් නික්මුණවූ ය. කුරවල අක් පමණක් ම තෙමිණ.

රජ්ජුරුවෝ ඒ ගඟින් එ තෙර ව ලා ඔබ්බෙ යන තැනැත්තෝ අනිකු ත් ගඟක් දැක 'මේ ගඟ කි නම් දැ'යි විචාරා නීල වාහිනී නැමැයි කී කල්හි ගැඹුර-පළල විචාරා ගැඹුරෙනු ත් පළලිනු ත් දෙ ගවු-දෙ ගවු ය යි කී කල්හි හොරු-අහුළු ආදි ය විචාරා එයි ත් නැතැ යි කී කල්හි සෙස්ස ආදි ලෙසින් ම සලකා ඒ ගඟින් එ තෙර වන රජ්ජුරුවෝ පෙළ දම් සහිත නව ලොවුතුරා දහම් ගුණ සලකමින් ඒ ගඟින් නික්ම ඉදිරියෙහි යන්නෝ අනික් ගඟක් දැක 'මේ ගඟ කිනම් දැ'යි විචාරා චන්ද්‍ර භාගා නමැ යි කී කල්හි ගැඹුර-පළල විචාරා ගැඹුරෙනු ත් පළලිනු ත් සතර ගවු–සතර ගවු පමණ ය යි කී කල්හි සෙස්ස ආදී කී ලෙස ම විචාරා සලකා පියා ඒ ගඟින් එ තෙර වන රජ්ජුරුවෝ 'බුදුන්ගේ සවුවන් වහන්සේ මධ්‍යම ප්‍රතිපදවට පැමිණි හෙයින් මනා ව පිළිපන් සේක' යනාදීන් සඞ්ඝ

Non-Commercial Distribution

ගුණ සලකමින් ඒ ගහිනු ත් එ තෙර ව ඉදිරියෙහි යන්නාහු වැඩ හුන් නුග ගස කඳ වෙළෙප් ආදී ය නො එක් පැ ඇති කෙරෙමින් දිවන සවනක් රස් දක රජ්ජුරුවෝ සිතන්නෝ:

'මේ අප දුටු ආලොක ය නම් හිරු ආලොකයකු ත් නො වෙයි. රුදවසක් නො වන හෙයිනු ත් මෙ සේ වූ ශොභාවෙක් ඊ නැති හෙයිනු ත් සඳෙක ආලොකයකු ත් නො වෙයි. දිව්‍ය බ්‍රහ්ම නාග සුපර්ණාදීන් අතුරෙන් එක්තරා කෙණකුන්ගේ ශරීරාලොකයකු ත් නො වෙයි. මම එකාන්තයෙන් ම බුදුන් අරහයා අයිමි. ඒ බුදු රජාණන් වහන්සේගේ ශරීරාලොක ය නියා ය'යි බුදු රස් දකිමින් ම අසු පිටින් බැස පියා බුදු රස් දිවන අතින් ම බුදුන් ළඟට ගොසින් සිරියෙල් කල්කයෙක ගැලෙන කෙණකුන් මෙන් බුදු රස් ඇතුළට වැද බුදුන් වැඳ එකක් පස් ව හුන්හ. බුදුහු පිළිවෙළ කථාව වදළ සේක.

බණ දෙසුන් කෙළවර රජ්ජුරුවෝ සහපිරිවරින් සෝවාන් ව අසු පිටින් ආ ගමන් හෙයින් ගමන් විඩා මඳ වුව ත් බොහෝ ව තිබෙන කෙලෙස් විඩා මඳ කළහ. ඉක් බිති හැම දෙන ම මහණ කරන්ට ආරාධනා කළහ.

බුදුහු ත් මුන්ට සෘද්ධිමය වූ පා සිවුරු පහළ වෙ දෝ හෝ යි බලා 'මේ කුලදරුවෝ පසේ බුදුවරුන් දහසකට පිරිකර දහසක් දුන්හ. කසුප් බුදුන් සමයෙහි විසි දහසක් රහතන්ට විසි දහසක් පිරිකර දුන්හ. එක පිරිකරක්—දෙ පිරිකරක් පවා දුන්නන්ට පහළ වන කල මුන්ට පහළ වීම විස්ම නො වේ'යි දන රන් වලා ගබෙකින් විදුලියක් මැත් වන කලක් මෙන් දකුණත දික් කොට වදරා 'මහණෙනි, සසර දුක් නසන නිසා බඹසර හැසිරෙන්ට එව්'යි වදළ සේක. ඒ ඇසිල්ලෙහි තුන් සිවුරු පාත්‍රා දීවූ අට පිරිකර දරා සිය වස් ගිය මහ තෙරවරුන් මෙන් ආකල්ප සම්පන්න ව අහසට පැන නැඟි ලා බැස බුදුන් වැඳ ගෙන වැඩ හුන් සේක.

ඒ වෙළෙන්දෝ ද රජ ගෙට ගොසින් රජ්ජුරුවන්ගේ මෙහෙ වර ගිය නියාව කියා යවා බිසොවුනු ත් 'යහපත, එ ත් ව'යි කී කල්හි ගොසින් වැඳ ලා එකත් පස් ව සිටියහ. බිසවු 'කුමකට අවු ද'යි විචාරා 'රජ්ජුරුවන් වහන්සේ මොබ එවා වදළ සේක. මසු තුන් ලක්‍ෂයක් දෙවා වදළ මැනැවැ'යි කී කල්හි 'සගයෙනි, ඉල්වා ලන නියාව බොහොව. රජ්ජුරුවන් වහන්සේට තොප කළේ කුමක් ද? කුමක් නිසා එක පැහැර මෙ තෙක් වස්තු දෙවූ සේක් ද'යි

Non-Commercial Distribution

විචාළෝ ය. 'බිසොවුන් වහන්ස, අනික් අප කී කළ දෙයෙක් නැත. එක් අමුතු හස්නක් කියම්හ'යි කිවූ ය. බිසවු ඒ අසා 'ඒ හස්න අපට ත් කියන්ට පිළිවන් දෑ'යි විචාළෝ ය. 'බිසොවුන් වහන්ස, පිළිවන'යි කිවූ ය. 'එ සේ වී නම්, සගයෙනි, කියව'යි 'කී කල්හි බිසොවුන් වහන්ස, බුදුහු ලොව උපන් සේකැ'යි කිවූ ය.

බිසවු ත් අසා රජ්ජුරුවන් පරිද්දෙන් ප්‍රීතීන් පිනා ගොසින් කිසිවකු ත් තුන් විටක් කොට සලකා ගත නො හී සතර වෙනි වාරයෙහි සලකා පියා 'මේ බස අසා රජ්ජුරුවන් වහන්සේ කුමක් දුන් සේක් දෑ'යි විචාරා මසු ලක්‍ෂයක් දුන් නියා ව කී කල්හි බිසවු ත් 'මේ නියා වූ හස්නක් අසා රජ ව සිට ලක්‍ෂයක් දුන් බව රජ කමට තරම් නො වෙ යි. මම උන් වහන්සේ තරමට දුක් පත් නියාවට තුන් ලක්‍ෂයක් දෙමි'යි කීහ. 'අනික කුමක් කිවූ දෑ'යි විචාරා ධර්‍ම ය පහළ වූ නියාව ත් සඞ්ඝයා වහන්සේ පහළ වූ නියාව ත් කීම්හ'යි කී කල්හි තුන් වාරයක් සලකා ගත නො හී සතර වෙනි වාරයේ සලකා පියා තුන් තුන් ලක්‍ෂයක් දෙවූහ. වෙළඳු පන් සියය ත් ගිය වෙළදාම තිබියදී ම රජ්ජුරුවන්ගෙන් තුන් ලක්‍ෂයක් හා බිසොවුන්ගෙන් නව ලක්‍ෂයක් හා එක් කොට දෙළොස් ලක්‍ෂයක් තුනුරුවන් ආනුභාවයෙන් ම ලත්හ. බිසවු ද මසුරන් දෙළොස් ලක්‍ෂයක් දී ලා 'රජ්ජුරුවන් වහන්සේ කොයි දෑ' යි විචාළහ. බුදුන් ළඟ මහණ වන්ට ගිය සේකැ'යි කිවූ ය. 'අපට කියා එවුයේ කුමක් දෑ'යි විචාරා 'රාජ සම්පත් ඔබ වහන්සේට ම හැර රජ සිරි විඳින්ට කියා එවූ සේකැ'යි කිවූ ය.

'ඇමැත්තෝ කොයි දෑ යි විචාරා 'උයි ත් රජ්ජුරුවන් වහන්සේ හා කැටි ව ම ගියෝ ය'යි කී කල්හි උන් හැම දෙනාගේ අඹුවන් කැඳවා යවා ලා උන් හැම ආ කල 'එම්බා' තොප හැම සවාමීහු කප්පින රජ්ජුරුවන් වහන්සේ හා බුදුන් ළඟ මහණවන්ට ගියෝ ල. තෙපි හැම කුමක් කරවු දෑ' යි විචාරා 'මහණ වන්ට යන ගමනේ උන් හැම අපට කියා ලා එවූයේ කුමක්දෑ'යි විචාළ කල්හි 'තම තමන් ගේ සම්පත් තොප තොපට ම හළ නියාව ත් අභිප්‍රාය ලෙස සම්පතින් ප්‍රයොජන විඳින්නට ත් කියා එවූ ය'යි බිසවු කිවූ ය. ඒ එ සේ ම ය 'මුඹ වහන්සේ කරන්නේ කිම් දෑ'යි විචාළෝ ය. 'හෙම්බා, උන්දෑ රජ ව සිට මහ සිට ම තුනුරුවන්ට ත් තුන් ලක්‍ෂයක් පුද ලා මෙසා මහත් රජ සැපත් කාරා දමා පු කෙළක් කොට ත් නොසිතා මහණ වන්ට ගිය සේක් ම ය. මම ද තුනුරුවනේ පවත් අසා නව ලක්‍ෂයක් පිදීමි. ඒ සම්පත වැළි ත් රජ්ජුරුවන්ට ම දුක් එළ වන්නේ නො

Non-Commercial Distribution

වෙයි. මම ත් ඇලුම් ඇති ව රැඳිණීම් නම් මට ත් දුක් එළව යි. රජ්ජුරුවන් වහන්සේ කාරා දමාපු කෙළක් නො වළහා කටින් හැර ගන්නා සේ උන් වහන්සේ හළ සම්පතෙහි මම ආල ය කෙරෙම් ද? උන් වහන්සේට ඉන් ප්‍රයොජනයක් නැත්තා සේ මට ත් ප්‍රයොජන නැත. මම ද බුදුන් ළඟට ගොසින් මහණ වෙමි'යි කිවු ය.

'බිසොවුන් වහන්ස, මුඹ වහන්සේ සිතූ සිතිවිලි අප ත් සිතූ කල නපුරු ද? අපි ත් මුඹ වහන්සේ ලා කැටි ව අවු ත් මහණ වම්හ'යි කිවු ය. අදහස් නම් එක තරමේ නො තිබෙන හෙයින් ඉනු ත් ගැනු අදහස් හෙයින් 'එ ලෙස කටහැකි වී නම් යහපත් වේ දැ' යි කියා ලා උන් හැම තර ව සිටි කල්හි 'එ සේ වී නම් එව'යි කියා ලා රථ දහසක් යොදවා ලා රථවලට නැඟී උන් හැම හා සමඟ නික්ම අතුරු මඟ දී ගං තුන ම දැක රජ්ජුරුවන් විචාළ සේ ම නම් වෙන වෙන ම අසා දැන ගං වල ගැඹුර හා පළල ත් විචාරා ගංතුනෝ ප්‍රමාණය ත් රජ්ජුරුවන් දත්තා සේ ම දැන හොරු ආදි ය විචාරා එයි ත් නැති නියාව දැන ගං තුන දී ම ,අපි හොරු ආදි ය ලබන තෙක් හිඳුමෝ නම් ජාති තොමෝ තමා මූල කාරණ හෙයින් සෙසු ත් ප්‍රත්‍යය ජාත ය හැර ගෙන ජරාවට පමුණුවයි. ජරාව මරණට පමුණු වයි. මළ කල මහණ වන්ට යන්නෝ කවුරු දැ' යි 'මේ ගං තුන නම් රජ්ජුරුවන් වහන්සේගේ ත් අපගේ ත් තුනුරුවන් විෂයෙහි විමතියක් නැති ව ම නික්මුණු නියාව හඟවන්ට පහළවූවා සේ වුව. තුනුරුවන් නැමැති හොරු අඟුළු නම් සත්ත්ව යන් සසර නමැති මහ මුහුදින් වුව ත් එ තෙර කරත්. බොහෝ දෙනා සසර නමැති ඒසා මුහුදකින් පවා ඇත් කොට නිවන් පර තෙරට පමුණුවන්නේ පළලින් ගවු දෙ ගවු පමණ පළල ඇති ගං දෙකක් හා සතර ගවුවක් පමණ පළල ඇති ගඟක් හා ගං තුන පමණකින් අප දහසක් දෙනා එ තෙර කොට බුදුන් කරා පමුණුවා නො ලා ද? අපි තුනුරුවන් ගුණ නමැති හොරු අඟුළු-කරම්හ'යි තුනුරුවනෝ ගුණ සලකා තුන් ගඟින් එ තෙර වූහ.

බුදුහු ත් උන් එන නියාව දැන තමන් වහන්සේ ළඟ හුන් සඟ දහස යම් සේ උන්ට නො පෙනෙන සේක් වී නම් ඒ ලෙසට අධිෂ්ඨාන බලයෙන් සඟවා ලූ සේක. උයි ත් යන තැනැත්තෝ අමුතු පැයක් එවන්ට නොඑක් පැ ඇති වයිති යොදන්නා සේ බුදුන්ගේ ශරීරයෙන් දිවෙන සවනක් රස් දැක කප්පින රජ්ජුරුවන් සිතූ ලෙස ම සිතා බුදුන් ළඟට ගොසින් වැඳ ලා එකත්පස සිටියාහු 'ස්වාමීනි, කප්පින රජ්ජුරුවන් වහන්සේ මහණ වන්ට මොබ ආ සේක් වේ ද, උන් වහන්සේ කොයි ද? අපට පැ වදළ යහපතැ'යි කිවු ය. 'තව

Non-Commercial Distribution

සිටුව. හොබ්බකට නො ගොස් මෙ තැ න දී ම දක්ක හැක්කැ'යි වදාළ සේක. ඌ හැම දෙන ත් මෙ තැන දී ම දකුමෝ ල'යි සතුටු වූ හ. බුදුහු ත් උන් හැම දෙනාගේ අදහස් බලා බණ වදාළ සේක. බණ අසා අනෝජා බිසවු සහ පිරිවරින් ශ්‍රොත ආපත්ති මාර්ග ඥාන නමැති මිහිරි පැන් අනුභව කොට සත්කාය දෘෂ්ට්‍යාදි දෘෂ නමැති පිපාසා සන්සිඳුවා ගෙන ශ්‍රොත ආපත්ති ඵලාලඞ්කාර ලා සැරහුණාහු ය. මහා කප්පින තෙරුන් වහන්සේ උන් හැමට වදාළ බණ අසා අනුන්ට ලා ලූ දෙයක් කන කලක් පරිද්දෙන් සැහවී උන් ගමනේ ම ධර්මප්‍රතිවෙධ කොට සහපිරිවරින් පිළිසිඹියා පත් රහත් වූ සේක.

එ වේලෙහි බුදුහු ඒ වහන්දෑ බිසවුන්ට පැ වදාළ සේක. ආ වේලේ නො දක්කුවේ හැයි ද යත්–ආ විට ම හිස කේ කපා සිවුරු පෙරවා සිටියා දුටු කලට බිසොවුන් ලා ත් ඒ වේලාවට පෘථග්ජන හෙයින් ආදි වෙන සැටියෙක දකිනවුන් දූන් වෙන සැටියෙක දුටු කලට සිත එකඟ නො වන කලට අධිගමයක් කරවා ලිය නො හැක්ක'යි සිතා වදරා සෝවාන් ව නිසල සැදෑවෙහි පිහිටි කලට රහත් වූ වහන්දෑ දක්වා වදාළ සේක. ඔහු ද ඒ වහන්දෑ දැක පසඟ පිහිටුවා වැඳ ගෙන 'ස්වාමීනි, මුඹ වහන්සේ හැමට මහණ ධර්ම මුදුන් පැමිණියේ'යි කියා ලා බුදුන් වැඳ එකත් පස් ව සිටියාහු සෝවාන් පමණෙකින් ශාසන සමය දන්ට නුවූ හෙයින් හෝ දත ත් ආරාධනා කළ මනා හෙයින් මහණ කරන්ට ආරාධනා කළහ. බුදුහු ඒ අසා 'සැවැත් නුවරට ගොසින් මෙහෙණවර මහණ වව'යි වදාළ සේක.

ඌ හැම දෙන ත් ඔබ යන්නාහු අතර මඟ දී බොහෝ දෙනා ගෙන් සාද සාමීචි විදිමින් පයින් ම සාර සිය අසූ ගවු ව ගෙවා ගොසින් මෙහෙණවර මහණ ව රහත් වූහ. බුදුහු ත් වඩනා ගමනේ තනි ව වැඩිය ත් එක දවසින් ම මහණ මහලු පැවිදි කොට රහත් කරවා ගත් සඟ දහස පිරිවරා දෙව්රම් වෙහෙරට වැඩි සේක. කප්පින මහ තෙරුන් වහන්සේ ද රෑ වසන තැන් දවල් වසන තැන් ආදියෙහි දී ඉතා සැප ය'යි උදන් අනන සේක. ඒ අසා වහන්දෑ ත්, ස්වාමීනි, කප්පින තෙරුන් වහන්සේ ඉතා සැප ය. ඉතා සැප ය'යි කියන සේක. රජ සැප ත් අරභයා දෝ හෝ'යි සිතම්හ'යි කී සේක.

බුදුහු ඔබ කැඳවා ලා 'සැබෑ ද තෙපි කප්පිනයෙනි, රජ සිරි අරභයා උදන් අනවු දෑ'යි විචාරා 'ඒ අරභයා උදන් අනන නියා ත් නො අනන නියා ත් ස්වාමීන් ම දන වදර ත් වු වව. මා අතින් විචාරා වදරන්නේ හැයි දෑ'යි කී කල්හි බුදුහු 'මහණෙනි, මා පුතණුවෝ රජ සැපතක් අරභයා උදන් අනන්නෝ නො වෙති. මා පුතු තමන්

Non-Commercial Distribution

මාගෙන් ලත් නිවන් රස අරහයා උදන් අනති' වදරා ධර්ම ය නම් හඹු-උළු-කැන් තැටිවල, මුඩම් වල වත් කොට ගෙන බොන්නා සේ බී පියන්ට බැරි වුව ත් යම් කෙණෙක් පෙළ දහම් ඉගෙන අර්ථ රස ය නුවණ තුඩින් බොත් නම් නව ලොවුතුරා දහමින් මාර්ග ධර්ම ය හවත් නම්, ඵල ධර්ම ය සාක්ෂාත් කෙරෙත් නම් නිවන් දහම් අරමුණු කෙරෙත් නම්, ඌ ධර්ම ය බොන්නා නම් වෙති. කෙලෙස් කිලුටු නැති වීමෙන් ඉතා පහන් සිතින් මෙ සේ ධර්ම ය බොන්නා වූ සත්ත්වයෝ සතර ඉරියව්වෙන් සුව සේ දවස් යවති. නුවණැත්තෝ තුමූ බුද්ධාදීන් විසින් දෙසන ලද සත් තිස් බොධි පාක්ෂික ධර්මයෙහි හැම කල ම ඇලෙතී'යි වදළ සේක. මේ දෙශනා කෙළවර ත් බොහෝ දෙන නව ලොවුතුරා දහම් යථොක්ත ලෙසින් පූහ. එ හෙයින් නුවණැත්තවුන් විසින් පෙළ දම් අර්ථ ප්‍රතිවෙධ වශයෙන් බී නව ලොවුතුරා දහම් මාර්ග භාවනාදීන් පීම්ට උත්සාහ කටයුතු.

## 76. පණ්ඩිත සාමණේර වස්තුව

තව ද යම් කෙණෙක් ඉතා දුක් පත් වත් පින් කෙරෙත් නම් උන් කෙසේ දුක් පත් වුව ත් කර්ම භවයෙහි දී පැවැති කුශල චෙතනා ත් විපාක භවයෙහි දී සම්භ වන සමෘර්ධිය ත් දුක් පත් නො වන නියා ව හඟවන්ට **පණ්ඩිත සාමණේර** වස්තුව දක්වමු.

කෙ සේ ද යත්—

යට ගිය දවස කසුප් බුදුහු විසි දහසක් රහතන් පිරිවරා බරණැස් නුවරට වැඩි සේක. මිනිස්සු තමන්ගේ පෝමන් සලකා දසයකු ත් විස්සකු ත් වඩා ත් එක් ව ගෙන අමුතු ව ලා වැඩි බුදුන්ට අමුතු දන් දුන්හ. එක් දවසක් බුදුහු වළඳා අනුමෙවෙනි බණ වදරන සේක් "උපාසකවරිනි, මෙ ලොව සමහර කෙණෙක් තමා සතු දෙය දීම ම යහපත. අනුන් පින් කම සමාදන් කරවා කිම් ද'යි තුමූ තමන් සතු දෙයින් දන් දෙති. අනුන් සුහකු ත් සමාදන් නො කරවති. උන් උපනුපන් තැන උන්ට ධන ධාන්‍ය සම්පත් බොහෝ ව ඇති වෙයි. පරිවාර සම්පතට හේතු වූ සමාදන ය නුවූ හෙයින් කෙලි-කොලු පමණෙක ත් පරිවාර නැත. සමහර කෙණෙක් බණ දහම් කියා අනුන් සමාදන් කරවති. තමන් දෙය වෙයන් බඳ නා තුඹස් සේ උපයා රැස් කර ත් මුත් දනක් දී නො ලති. ඌ උපනුපන් තැන පරිවාර සම්පත් ලැබෙති. භොග සම්පතට හේතුව නුවූ හෙයින් පරිවාරයට ත් වඩා තමන්ට බත් පමණකු ත් ඇත් නම් ඇත.

සමහර කෙණෙක් මසුරු සිත බලවත් හෙයින් තුමූ ත් නො දෙති. පිනකට අදහස් නැති හෙයින් අනුන් සමාදනු ත් නො කර

Non-Commercial Distribution

වති. උන් උපනුපන් තැන දෙක ම උන්ට නො උපද්දි. සිඟා කා ජීවත් වෙති. තමන් කළ ලෙස සලකා ගත නො හී අනුන්ට මැසෙති. සමහර කෙණෙක් දෙක ම කෙරෙති. උන් උපනුපන් තැන උභය සමෘර්ධි ය ම ඇතැ''යි වදළ සේක. ඒ බණ අසා එක් ළඟ සිටි නුවණැති කෙණෙක්'යම් ලෙසක කළ කල සම්පත් දෙක ම මට සම්භ වේ නම් බුදුන් ම උපදෙස් වදළ ඒ ලෙස කෙරෙමී'යි උෟ තුමූ බුදුන් වැඳලා 'ස්වාමීනි, සෙට දිනයට කරුණා කොට වදළ යහපතැ'යි කිවු ය. 'වහන්දෑ බොහෝ වුව. කෙ තෙත් විතර වුව මනා දැ'යි විචාරා නිත්‍යපරිවාර වහන්දෑ කෙ තෙක් දෙනා වහන්සේ දැ'යි උපාසකයන් විචාළ කල්හි 'විසි දහසෙකැ'යි වහන්දෑගේ ගණන වදළ සේක. 'ස්වාමීනි, එ සේ වී නම් එක නමකු ත් නො හැර කැඳවා ගෙන සිඟා වඩනේ යහපතැ'යි කිවු ය. බුදුහු ත් ඉවසා වදළ සේක.

උෟ ගමට වැදලා තමන් තකා ම කළ ආරාධනාවක් නො වන හෙයින්'දෙමවුපියෙනි,නෑයිනි,සියෙනි,සෙට දවසට බුදු පාමොක් සඞ්ඝයා වහන්සේට නුඹ හැම ත් තකා ආරාධනා කෙළෙමි. මාගේ ම බලයකට හෝ පොහොසත් කමකට නොවෙයි. යම් විතරකට දන් දෙන්ට පිළිවන් වී නම් එ තරමකට නුඹ නුඹගෙන් දන් දුන මැනැවැ'යි කියා ඇවිදිනෝ තමන් තමන්ගේ බල ය සලකා අපි නමකට දෙම්හ. 'අපි විසි නමකට දෙම්හ'යි, අපි සඟ සියයකට දෙම්හ, අපි පන් සියයකට දෙම්හ, යනාදීන් කී කල 'දන් දෙම්හ'යි නිල වූවනු ත් දන් දෙන වහන්දෑගේ සඞ්ඛ්‍යාව ත් වට්ටෝරු කොට ගත්හ. එ සමයෙහි වැළි ත් ඒ බරණැස් නුවර ඉතා දුක් පත් හෙයින් මහ දුගියා ය යි ප්‍රසිද්ධ වූ කෙණෙක් ඇත. උනු ත් එ තැනට ආවවුන් දැක 'සබඳ මහදුගිය, බුදු පාමොක් වහන්දෑට සෙවයට ආරාධනා කෙළෙමු. නුවර ඇත්තෝ හැම එක් ව සෙට දන් දෙති. තොපි කී නමකට දන් දී ලිය හෙවු දැ'යි විචාළෝ ය.

'ස්වාමීනි, මට වහන්දෑ හැයි ද, වහන්දෑ වුව මනා නම් දන් දීලිය හෙන කෙණකුන්ට වේ ද? මාගේ සෙසු පැදීම් තබා සෙට උළු කැන් බී පියන්ට සාල් නැළියකට විදි කිදි ත් නැත. මම බැළ මෙහෙ කොට ලා ජීවත් වෙමි. වහන්දෑගෙන් ලබත් මුත් ඔබ දී ලන්ට මාගේ බලයක් නැති පසු මට වහන්දෑ හැයි දැ'යි කිවු ය. පින් කම සමාදන් කරවන්නවුන් විසින් නුවණැති ත් විය යුතු ය. නුකුසි ත් විය යුතු ය. එ සේ හෙයින් නැතැ'යි කී ව ත් පලා නො ගොසින් 'සබඳ මහ දුගි ය, මෙ ම නුවර ඉස් සෝධා නා පියා සුවසේ බත් කා ගෙන සළු සොළී පිළී හැඳ පියා නො එක් ආභරණ ලා සැර හී ශ්‍රීයහන්වල සැතපෙමින් බොහෝ දෙන කළ පින් ලෙසට සම්පත්

Non-Commercial Distribution

විදිති. තොපි රහමඩුල්ලෙක පුරමාට්ටු පානා කෙණකුන් මෙන් කුණු රෙද්දකින් අමුඩක් ගොතා ගෙන උදසන පටන් සවස් වෙලා වන තුරු බැළ මෙහෙ කොට ත් කුස පිරෙන පමණක් නො ලැබෙ යි. එ සේ වුව ත් 'දුන් මා නො ලබන්නේ පෙර දනෙහි යොදු යමක් නුදුන් හෙයිනැ'යි නො දත් නියා දැ'යි කිවු ය. 'දනිමි, ස්වාමීනි'යි කිවු ය. 'දන්නා කල දුන් දනට පිණට මැළියෙයි න. තොප දුක් පත් බව මුත් වයස් පලා නො ගිය හෙයින් දැඩිතර වුව. කුමකු ත් කොට ලිය හෙත් බැළ මෙමෙහෙ කොට වුව ත් පොහෝනා පමණෙක දන් සුහක් දුන් කල නපුරු දැ'යි තර ව කිවු ය.

දුගියාණෝ ත් උන් තර ව කියත් කියත් තුමූ ත් කාරණ සිතා පියා අදහස දුගී කම නැති ව 'එ සේ වී නම් මට ත් නමක් වට්ටෝරුවේ ලියා ගත මැනව. බැළ මෙහෙයක් කොට ලත් දෙයකින් නම කට දන් දෙමි'යි කිවු ය. දන් විධාන කොට සමාදන් කරවන තැනැත්තෝ ත් දස නම-විසි නම-සඟ සිය ය-පන් සිය ය ලී වට්ටෝරුවල එක නම ලියන්නේ කිම දැ යි නො ලිවුවෝ ය. එයි ත් මහ දුගියාණන්ගේ ම එ වක සැපතට දෛව නැත ත් නිසි ම තැනක් ලබන්ට වූ නිලයෙක. මහ දුගියාණෝ ද ගෙ පැල් පතට ගොසින් ඇමෙණියන්ට කියන්නෝ 'සොඳුර, නුවර ඇත්තෝ හැම දෙන එක් ව සෙට මහ දන් දෙති. දන් විධාන කොට සමාදන් කර වන තැනැත්තෝ දුක්පත්මි කීව ත් කර බඳිනා දෙයක් මෙන් නමක් මට ත් නිල කොළෝ ය. අපි ත් නමකට සෙට දවස දන් දෙමහ'යි කිවු ය. උන්ගේ ඇමෙණියෝ ද 'අප දුක් පත් වුව ගිවිස් සේ ඇයි දැ'යි නො කියා 'කළ දෑ ඉතා ම යහපත. පෙර ත් කිසිවක් නො දී දුන් දුක් පත් වූමහ. දුන් යමක් කට නුහුණුමෝ නම රැවත් අඳුර දැඩි වන්නා සේ වඩ වඩා ලා ම දුක්පත්කම ම ය. අපි දෙන්න කැටි ව බැළ මෙමෙහෙ කොට ඉන් ලද දෙයකින් නමකට දන් දෙමහ'යි කියා දෙන්න ම බැළ මෙහෙ සොයා ගියහ.

එ නුවර මහ සිටාණෝ ද මහ දුගියාණන් දැක 'කුමක් ද, සබඳ මහ දුගිය, බැළ මෙහෙ කෙරෙර් දැ'යි විචාරා 'එ සේ ය'යි කී කල්හි 'කවර කර්මාන්තයක් කෙරෙ යි දැ'යි විචාළෝ ය. 'කුමක් වේව යි වදළක් කෙරෙමි'යි කී ය. 'එ සේ වී නම වහන්දෑ දෙතුන් සිය ය කට සෙට අපගෙන් දන් දෙම්හ දන් පිසන්ට දර පළා දෙව'යි කියා ලා ගැට පැස පියන්ට වැයකු ත් දෙවා ලා දර පළන්ට පොරව කු ත් දුන්හ. මහ දුගියාණෝ ද මහා උත්සාහයෙන් වැයෙන් කැපුව මනා තැන් වැයෙන් කපමින් පොරොවින් පැළ ව මනා තැන් පොරොවින් පළමින් වහ වහා දර පළති. සිටාණෝ දැක 'සබඳ, තොපි

Non-Commercial Distribution

මේ තෙක් ද සේ නො වව. අද මෙහෙ කොට ලන නියා ව බලවත. කාරණ කිමෙ'යි විචාළෝ ය. ''මින් ලද දෙයක් හැර ගෙන නම කට දන් දෙමි සිතා ය''යි කිවු ය. සිටාණෝ ඒ අසා සතුටු ව ''අනේ මුත් කරණ දෑ යහපත. ''මම දුක් පත්මි' කියා ලා වැද නො හිඳ එක් නමකට දන් දෙත් ල''යි සිතූ ය. සිටු දුවණියෝ ද බැළ-මෙහෙයට ගිය දුගී අඹුවන් දැක 'කුමණ මෙහෙවරක් කරවු දැ'යි විචාරා 'කැමැති මෙහෙවරකැ'යි කී කල්හි වත්-මොහොල් තිබෙන ගෙට ගොසින් වනු ත් මොහොලු ත් දෙවා ලා දන් වී පාරින්ට නිල කළහ.

උෟ ත් තුමූ සතුටු ව නටන කෙණකුන් මෙන් වී පැර පැර වී පූ කෙරෙති. සිටාණන්ගේ ඇඹෙණියෝ ද 'සතුටු සතුටු ව වී පැරපුව. මිල ආසාවෙන් පාරිනා පමණක් මු ත් මහ දුක් වුව. සතුටු වන්ට කාරණ කිමෙ'යි විචාරා එක් නමකට දන් දෙන්ට සිතන නියාව කී කල්හි සිටු දුවණියෝ ත් 'දුක් පත් ව සිට කරණ දෑ යහපතැ'යි සිතූහ. සිටාණෝ ද දුගියාණන් දර පළා ලූ කල මේ 'තොප කළ මෙහෙයට මිල ය'යි හැල් වී සතර නැළියක් දෙවා ලා අනිකු ත් හැල් වී සතර නැළියක් මිලයෙන් පිටත් ව සතුටු ව දෙන දේ ය'යි දෙවූහ. උෟ ගෙට ගොසින් ඇඹෙණියන්ට 'මම බැළ මෙහෙ කොට හැල් වීකක් ලදිමි. ඒ බතට ඇත. තොප ලබන දෙයට සරි කර දී තෙල් දුරු මිරිස් ආදි ය හැර ගනුව'යි කිවු ය. සිටු දුවණියෝ ත් උන්ට කත තෙල් මුට්ටියකු ත් දී අත් පතළයකු ත් දුරු මිරිස් ආදිය ත් ඇල් සාල් නැළියකු ත් දෙවූහ. දෙන්නා ගෙන් කැටි ව සාල් පස් නැළියක් මුළුලු වී ය.

උන් දෙන්න ම දනෝපකරණ මුළුලු වූ නියාවට සතුටු ව පාන්වන්නා ම නැඟී සිට පලා කඩා ගෙනෙව'යි දුගියන්ට ඇඹෙ-ණියෝ විධාන කොළෝ ය. උයි ත් අංගාණියට ගොසින් බොහෝ දෙනා ම මිල දී හැරගත් හෙයින් පළා කොළක් නො දැක ගඟ බඩට ගොසින් 'අද නමකට දන් දෙම්හ' යන අදහසින් සතුටු සතුටු ව තමන් දුක්පත් තරමේ උගත් ගීයකු ත් කිය කියා පලා සොයා ඇවිදිති. මහ දැල් දමා ලා සිටි කෙවුළෝ මහ දුගියා දෙඩු හඬෙකැ'යි සිතා කැඳවා ලා කඩන පලා තිබිය දී සතුටුසතුටු ව ගී කියන්ට සිතට ඇති සුව ය කවරේ දැ'යි විචාළෝ ය. 'පලා කඩමින් සිටියෙමි' කිවු ය. 'පලා කුමට දැ'යි විචාළ කල්හි එක් නමකට දන් දෙමි. දනට මාළුවට ය'යි කිවු ය. 'අනේ තොපගේ පලා කොළ වළඳන වහන්දෑ ත් තොප සේ ම පින් නැති නියා වේ' දැ යි කිවු.ය. සබඳිනි, කුමක් කියා ද? දන් දී ලා වන සුවපත් කමක්

Non-Commercial Distribution

මුත් දන් දෙනු නිසා සුවපත් වන්ට ත් බැරි වේ ද? මට උපන් සැටියෙක දෙමි' කිවු ය.

එ සේ වී නම් මෙ සේ එව'යි කැඳවා ලා තෙල අප දූල් ගසා ලා ලූ කුඩ මස්සන් අකක් අගනා ලෙසට ත් දෙ අකක් අගනා ලෙසට ත් කහවණුවක් අගනා ලෙසට ත් වැල්වල අවුණාලව'යි කිවු ය. උයි ත් එ සේ ම කොළෙෝ ය. ඇවුණු ඇවුණු කුඩමස්සන් නුවර ඇත්තෝ තම තමන්ගේ දනට හැර හැර ගෙන ගියෝ ය. උනු ත් කුඩමස්සන් වැල්වල අවුණන්නවුන්ට වහන්දෑ සිඟා වඩනා වේලා ආසන්න විය. උයිත් වේලාව සලකා ලා වහන්දෑ සිඟා වඩනා වේලාව ය. මම යෙමි'යි කිවු ය. ඇල්වල අවුණා තුබූ කුඩමස්සෝ ඇත් දූ යි විචාරා නැත, නිමම ය යි කී කල්හි 'එ සේ වී නම් රේමස් සතර දෙනකුන් යන කල ගෙන යම්හ'යි වැලිසාරා ලා සඟවා තබාලුම්හ. ඉදින් නමකට දන් දෙවූ නම් උන් ගෙන යව'යි කිවු ය.

එ දවස් වැළි ත් බුදුහු අළුයම ලොව බලන සේක් ගහ කුඩ මස්සන් කෙවුළු දූලට හසුවන්නා සේ මහ දුගියාණන් තමන් වහන්සේගේ විනෝජන නමැති කුඩමස්සන් හසුකරවන්නට සක් වළ ගබ් නමැති මුහුදට දැමූ, නුවණ දූල බැඳුණවුන් දැක ඕ හට වන්නේ කුමක් දෝ හෝ යි බලන සේක් 'මහ දුගියාණෝ ත් නමක් පමණට දනක් දෙමි' අඹුව හා දෙන්න බැළමෙහෙ කොළෙෝ ය. දන් වළඳන්නට කවර නමක් ලැබේ දෝ යි සිතා 'වට්ටෝරු ලූ ලෙස සඟුන් බෙදී ඒ ඒ ගෙවලට වළඳන්ට ගිය කලට මා විනා අනික් නමක් නොලබන්නේ ය'යී දැක වදළ සේක.

සර්වඥවරයෝ නම කරුණා පුඤ්ජයක් සේ හෙයින් දුක්පතුන් කෙරෙහි අනුපම්පා බලවත් ව ඇති සේක. එ සේ හෙයින් බුදුහු උදසන ම සිරුරු කිස සපයා ගෙන මහ දුගියාට කරුණා කෙරෙමින් හුදකලාව ම කථාකරන්ට වෙන්වූවා සේ ගඳකිළියට වැද ලා වැඩහුන් සේක. මහ දුගියාණන්දෑ කුඩමස්සන් ද හැර ගෙන ගෙට එත් එත් සක්දෙව්දුගේ පඩු ඇඹුල් සලහස්න හුණු වි ය. හුණු වන්ට කාරණ කිම්දෝ හෝ යි විමසන්නෝ 'ඊයේ දවස් මහදුගියා වහන්දෑ නමකට දනක් දෙමි'යි තමාගේ අඹුව හා සමඟ බැළ මෙහෙ කෙළේ ය. ඉන් ලද දෙයින් අද දන් දෙයි. ඌගේ දනට නිලවන නම කවුරුන් වහන්සේ දෝ හෝ යි සිතා අනික් නමක් ඕහට සම්භ වන්ට නැත. බුදුහු ඕහට කරුණා කෙරෙමි යි සිතා ගඳ කිළියේ වැඩහුන් සේක.

Non-Commercial Distribution

මහදුගියා ත් තමන්ට පිළිවන් තරමෙක කැඳ බත් ඉදී කරවා දෙයි. මම මහ දුගියාගේ ගෙට ගොසින් ඌ ගෙන් කරණ දූය ම සකස් වන ලෙසට අරක්කැමි කමක් කෙළෙම් වී නම් යහපතැ'යි සක් දෙවිඳු වෙස හැර ලා අනික් වෙසකින් මහ දුගියාණන්ගේ ගෙය ළහට ගොසින් බැළ මෙහෙයකින් ප්‍රයෝජන කාටදැ'යි විචාළෝ ය. මහ දුගියා ද උන් දූක 'සබඳ, තොපි කුමන කර්මාන්තයක් කරවූ දැ'යි විචාරා මා නො දන්නා ශිල්පයක් නැත. සෙස්ස තබා සූප ශාස්ත්‍ර ලෙසින් කැඳ බත් ආදි ය පිසන සේ ත් දනිමී'යි කිවූ ය. 'සබඳ අපි වන්නා අපගේ දන් ඉදී කිරීමකු ත් ඇති හෙයින් මෙහෙ කරවා ගන්නා කැමැත්තම්හ. මෙහෙය කරවා ගෙන දී ලන්ට මිල නැතැ'යි කිවූ ය. 'තොපට කළ මනා කුමක් දැ'යි විචාරා 'එක් නමකට දනක් දෙන හෙයින් පිසමනු ත් දන්නා පසු ඒ ඉදී කොට දී ලීම කැමැත්තෙමි' කී කල්හි 'ඉදින් වහන්දෑ නමකට දනක් දෙවූ නම් තොපගේ මිලයෙන් මට කම නැත. තොප දුක් පතුන්ට පින් යහපත් කළ මා ත් දුක් පත් තැනැත්තවුට පින් නපුරු දැ'යි කවර කල ත් දුක් පත් කම ම කියා එන ශක්‍රවරුන් හෙයින් එ ලෙස කිවූ ය.

ඒ අසා මහ දුගියාණෝ 'එ සේ වී නම් පලා එව'යි කැඳවූහ. උයි ත් උන් ගෙට ගොසින් සාල් මාළු ගෙන්වා ගෙන 'තොපි ගොසින් තොපට පැමිණි තැනක් කැඳවා ගෙන එව'යි කියා ලා යවූහ. දන් විධාන කොට සමාදන් කැර වූ තැනැත්තෝ ද වට-ටෝරු වූ ලෙසින් වහන්දෑ ඒ ඒ ගෙවලට යවූහ. මහ දුගියාණෝ ද උන් ළහට ගොසින් 'මට නිල කළ වහන්දෑ නම දුන මැනැවැ'යි කිවූ ය. ඌ එ වේලේ සලකුණු කොට පියා සලකුණු නො වී ය'යි කිවූ ය. මහ දුගියාණෝ ද තමන් දූක සේ සපයා ගත් දනක් හෙයින් සැර පහරක් සේ බස් පහර ලදින් වහා මුසුප්පුව 'සබඳ, මා කුමට නසයි ද? තර ව කියා නිල කළ හෙයින් දෙ මහල්ලන් ම දවස මුළුල්ලේ ම බැළ මෙහෙ කොට එ සේ ත් විඩා ව අද උදසන ම පලා සොයා ගොසින් ගං බඩ ඇවිද එ සේ ත් විඩා ව පියා අයිමි. එ සේ මෙහෙ කොට ඇවිද වූ කාය පීඩා විතරට ත් දූන් ඇති වූ චිත්ත පීඩා විතර මහත. දන්නා යම් ලෙසකින් වහන්දෑ නාමක් නිල කළ මැනවැ' යි කියා ලා හඩන්නට වන්හ.

මිනිස්සු ත් රැස් ව පියා 'මෙ කිම ද, මහ දුගිය'යි විචාළෝ ය. දුගියාණෝ ද එ පවත් කිවූ ය. තෙල සැබෑ දැ'යි විචාරා සැබැව'යි කී කල්හි මෙ තෙක් දෙනාට මෙ තෙක් වහන්දෑ නිල කරණ-

Non-Commercial Distribution

ගමනේ වහන්දෑ විසි දහසක් සෙයින් මඳ නො වත් නමක් පමණ නිල නො කෙළේ නපුරැ'යි සමාදන් කරවා ඇවිදි තැනැත්ත වුන්ට කිවු ය. උයි ත් ඒ අසා මහා මුසුප්පු ව 'සබඳ මහ දුගිය, මා නො නස ව, තොප නිසා ත් මට වූයේ මහා මුසුප්පු ය. මිනිස් සු ත් වටවෝරු ලෙසට වහන්දෑ නිල කොට ගෙන තම තමන් ගේ ගෙවලට වඩා ගෙන ගියහ. එක නමක් කිම් දැ'යි වටවෝරු කරවන්ට ත් නො වී ය. තම තමන්ගේ ගෙවලට වළඳන්ට ගිය වහන්දෑ මා ඉල්ලුව'යි කියා මට හරින්නේ ත් නැත. බුදුහු වැළි ත් තව දක්වා වහන්දෑ ලා කැටිව ත් නො වැඩ ගඳ කිළියට ම වැද ලා වැඩ හුන් සේක.

රජ, යුව රජ, සෙනෙවි ආදීහු බුදුන් ගඳ කිළියෙන් මැත් වන තෙක් පෙර මඟ බලා හිඳිති. බුදුන්ගේ පාත්‍ර ය හැර ගන්නා නිසා ය. උන් කෙ සේ හුන ත් බුදුවරුන් වහන්සේ දුක් පතුන් කෙරෙහි අනුකම්පා ඇති සේක. තොපි වෙහෙරට ගොසින් 'ස්වාමීනි. මම දුක් පතිමි. කරුණාව නම් දුක්ඛිත සත්වයන්ගේ දුක්ඛාපගමයකට වේ ද, මට කරුණා කළ මැනැවැ'යි කියා ලා වැඳ ගෙන වැද හෙව. ඉදින් තොපගේ පිණෙක් ඇත් නම් බුදුන් ම ලබව'යි සක් දෙවිඳු අවුත් ඇඟ ආවෙස වූවා මෙන් කිවු ය.

උයි ත් ඒ අසා වෙහෙරට යන්ට නික්මුණාවු ය. මේ තෙක් දවසු ත් විහාරයට සිහා කන්ට යන හෙයිනු ත් රජ යුව රජ ආදීහු 'හැයි, මහ දුගිය, තව වළඳන වේලාවක් නො වත් කුමට යෙහි දැ'යි කිවු ය. 'වළඳන වේලාව නො වන නියා ව දනිමි. බුදුන් වඳින්ට යෙමි' කියමින් ගොසින් ගඳ කිළියේ එළි පත ඉස තබා ලා පසඟ පිහිටුවා වැඳ ගෙන 'ස්වාමීනි, මේ නුවර මට වඩා දුක් පත් කෙණෙක් නැත. බුදුවරුන් වහන්සේ දුක් පතුන් කෙරෙහි කරුණාව ඇත්තේ නියම වී නම් මට කරුණා කරණ බව ය'යි කිවූ ය. බුදුහු ගඳ කිළියේ දොර හැර ලා සම්පතක් ඉල්වා අත දික් කළ කෙණකුන්ට මහත් නිල් මැණිකක් දෙන කලක් මෙන් පාත්‍ර ධාතුන් වහන්සේ ඔහුගේ අත තබා ලූ සේක. උයි ත් පාත්‍ර ධාතුන් වහන්සේ ලදින් සක් විති රජ සැපතකට පැමිණි කෙණකුන් මෙන් වූහ. රජ යුව රජ ආදීහු උනුන් මූණු බලා පිහ. මහ දුගියාණන්ට බුදුන් දෙවා ලූ පාත්‍ර ය පොහොසක් කම්න් ඇරගන්ට සමර්ථ කෙණෙක් නැත. ඔවුහු මෙ සේ කිවු ය.

''සබඳ මහ දුගිය, බුදුන්ගේ පාත්‍ර ය අපට දිනි නම් තට බොහෝ සම්පත් දෙම්හ. තෝ ඉතා දුක්පත්ති, තට වුවමනා

Non-Commercial Distribution

සම්පත් මිස මේ පාත්‍රයෙන් ප්‍රයෝජන කිම් ද' යනාදීන් ගුණෙන් කීහ.

දුගියාණෝ 'කිසි කෙණකුන්ට ත් පාත්‍රය නො දෙමි. මට වස්තුවෙන් කම් නැත. බුදුන් වළඳවමි' කීහ. පාත්‍ර ය. ඉල්වා නො ලදින් සෙසු හැම දෙන ම රඳා පිහ. රජ්ජුරුවෝ සිතන්නෝ 'මේ මහ දුගියා වස්තු දෙම්හ'යි කීව ත් බුදුන්ගේ පාත්‍ර ය නො දෙයි. බුදුන් වහන්සේ ත් තමන් වහන්සේ ම දෙවා වදළා වූ පාත්‍ර ය කිසි කෙණකු ත් හැර ගත නො හෙති. මූ ඉතා දුක් පත් හෙයින් දී ලන දෙය කවර තරමක් බව ත් නො දනෙයි. මූ තමා දෙය දෙන සැටියක දී පූ කල්හි බුදුන් වඩා රජ ගෙට ගොසින් මට සපයා තුබූ අහර දෙමි' සිතා බුදුන් හා කැටි ව ම නික්මුණා හ.

සක් දෙව් රජ ද කැඳ බත් ඉදි කොට ලා බුදුන් වැඩ හිඳිනා ලෙසට හසුනකු ත් පනවා ලූහ. මහ දුගියාණෝ බුදුන් වඩා ගෙන ගොසින් 'ස්වාමීනි, ගෙය ඇතුළට වැඩිය මැනැව'යි බුදුන්ගේ උස තරමට තමන් ගෙය මිටි වුව ත් කිවු ය. උන් දුක් පත් හෙයින් හිඳිනා ගෙය ත් මිටි ය. නැඹුරු නො ව වදනට නො පිළිවන. බුදුවරුන් වහන්සේ ත් ගෙවලට වදනා කල කරණ පින් කම් මිටි නො කළ මනා හෙයින් කර බා හෙන නො වදිනා සේක. ඒ එ සේ මැයි ගෙවලට වදනා කළ පොළොව හෝ පාත බස්සි. ගෙය හෝ උඩ පැන නැහෙයි. පින් කරණ කල කරණ පින් සකස් කොට කිරිමෙහි අනුසස ය. නැවත වැඩ පී කලට ආදි ලෙසට ම වෙයි. ඒ කාරණයෙන් බුදුහු කර නො බා ම වැද සක් දෙවිඳු පැනවූ හස්නෙහි වැඩ හුන් සේක.

බුදුන් වැඩ හුන් කල්හි රජ්ජුරුවෝ 'දුගියාණෙනි, තෙපි අප හැම ඉල්වා ත් බුදුන් ගේ පාත්‍ර ය නුදුන්නු ය. තොප ඉදි කරවා තුබූ දන් බලන්ට වුව මැනව. අපට පාව'යි කිවූ ය. ඉක් බිත්තෙන් දුක් පත් වෙස් ගත් සක් දෙවිඳු කැඳ බඳුන් ආදියෙහි වැසුම් හැර ලා පැවූ ය. ඒ බඳුනෝ සුවඳ සියලු මුළු නුවර පැතිර සිටියේ ය. රජ්ජුරුවෝ කැඳ ත් අවුළු පතුත් මාළු ත් බලා පියා බුදුන්ට දන්වන්නෝ 'ස්වාමීනි, මම මේ දුගියා දෙන දන් කවර තරම් හෝ යි බලා මූ දෙන දෙය දී පී කලට මුඹ වහන්සේ රජ ගෙට කැඳවා ගෙන ගොසින් මට ඉදි කළ බත වළඳවන්ට සිතා අයිමි. මා මේ බඳු බතක් කන්නා තබා දුටු විරූ ත් නැත. මා මේ තැන රඳා පී කලට මහ දුගියාට ගහට වේ ද'යි බුදුන් වැඳ ගෙන නික්මුණාවූ ය.

Non-Commercial Distribution

ශක්‍රයෝ ද තමන් සකසා ඉදි කළ දෑ සකසා ම වළඳවා ලූ ය. බුදුහු ත් වළඳා අන්තයෙහි අනුමෙවෙනි බණ වදරා ලා වැඩ පී සේක. සක් දෙව්ඳු ද මහ දුගියාණන්ට 'බුදුන්ට ගමන් පසු කොට යව'යි විධාන කළහ. මහ දුගී ත් බුදුන් ගේ පාත්‍ර ය එන ගමනේ ත් තමන් ම ගෙනා හෙයින් වඩනා ගමනේ ත් හැර දෙන්ට පාත්‍ර ය තුමූ ම හැර ගෙන නික්මුණවු ය. සක් දෙව්ඳු මඳ තැනක් ගොසින් ලා රදා බුදුන් එක් තරමෙක සංග්‍රහ කළ මහ දුගීන්ට තුමූ මහා සංග්‍රහයක් කරණු කැමැති ව මහ දුගියාණන්ගේ ගෙදෙර සිට අහස බලා ලූ ය. අහස සිස් වුව ත් කළ පින් නො සිස් හෙයින් සත් රුවන් වැසි වැස ලා උන්ගේ ගෙට රට බත් පිස කන විතරට ත් අවසර නො කොට සියලු වළඳු ත් පුරා ලා සිටිනා පමණකට ත් අවසර නො තබා රුවන් ගෙයක් පුරා ලූ ය. දුගියාණන්ගේ අඹුවෝ ද පින් කොට ත් මේ තරම් නපුරු ගෙවල හිඳුමෝ දෑ යි මැත්වූවා සේ තමන්ගේ දරු පැටවුනු ත් කැඳවා ගෙන මැත් ව ලා සිටියෝ ය.

දුගියාණෝ ත් බුදුන් කැටි ව ගොසින් ලා පෙරලා ආ තැනැත්තෝ අඹු දරුන් පිටත සිටියවුන් දැක මේ කිම් දැයි විචාරා ගෙය මුළුල්ලේ සත් රුවන් ගෙයින් සිටිනා පමණකට ත් අවසර නැති නියාව කී කල්හි 'මා දුන් දනෙහි විපාක ය පර ලොව ලබනවා තිබිය දී මෙ ලොව ත් පෙණුණැ'යි සිතා ලා රජ්ජුරුවන් ළඟට ගොසින් දැක ලා 'කුමක් නිසා අවු දැ'යි විචාළ කල්හි 'අපගේ ගෙය සත් රුවනින් පිරිණ. ඒ වස්තුව ගෙන්වා වදළ මැනැවැ'යි කිවු ය. රජ්ජුරුවෝ ගුණයෙන් මුදුන් පත් බුදු රජුන්ට දුන් දන් අද ම මුදුන් පැමිණියේ ය යි සිතා සමාධි ව 'තොපට වුව මනා කුමක් දැ'යි විචාරා 'ගැල් දහසක් දෙන්ට වුව මැනැවැ'යි කී කල්හි ගැල් දහසක් දුන්හ. ඉක්බිත්තෙන් ගැල් දහස පුරවා ගෙන වස්තුව සෙණ්ඩුළුයෙහි ලූ කලට වීටප ලා ගිය තල් ගසක් පමණ ගොඩ විය. රජ්ජුරුවෝ නුවර වැස්සන් එක් කරවා ලා 'මේ නුවර මෙ තෙක් වස්තු කවුරුන්ගේ ඇත් දැ'යි විචාරා රජ ගෙයක ත් මෙ තෙක් වස්තු ඇත් නම් වේ ද සෙස්සවුන්ට ය'යි කී කල්හි 'මේ සා මහත් වස්තුවක් ඇත්තවුන්ට දුන මනා තනතුර කවරේ දැ'යි විචාළෝ ය. 'සිටු තනතුර වේ දැ'යි කී කල්හි රජ්ජුරුවෝ උන්ට පෙරහර කොට සිටු තනතුරු දුන්හ.

ඉක් බිත්තෙන් පෙර එක් සිටාණ කෙණකුන්ගේ බිමක් පාවා ලා "තෙල තැන වල් හරවා පියා ගෙයක් නංවා ලා

Non-Commercial Distribution

ගෙණ වසව''යි කිවු ය. උනු ත් එ තැන වල් හරවා පියා තලවුව කරන්ට බිම් කණන කල්හි සැළින් සැළ ගැසී නිධාන සැළවල් නැංග. රජ්ජුරුවන්ට කී කල්හි 'තොපගේ පිණින් උපනුවා තෙපි ම හැර ගනුව' යි කීහ. උයි ත් ගෙය කරවා ලා එ ම ජාතියේ ආදි එක නමකට දවසෙක දූක සේ දන් දූන් · තැනැත්තෝ එ වක බුදු පාමොක් විසි දහසක් රහතුන්ට සතියක් මුළුල්ලෙහි දන් දූන් හ.

එයින් මත්තෙහි ආයු පමණින් පින් · කම් කොට ආයු කෙළවර දෙව් ලොව ඉපැද එක් බුද්ධාන්තරයක් මුළුල්ලෙහි දෙව් සැප ත් වළඳා මේ බුදු හමුයෙහි දෙව් ලොවින් චුත ව සැවත් නුවර සිවු කුලයෙක සිටු දූවණියන් කුස පිළිසිඳ ගත්හ. ඒ සිටු කුලයෝ ද වැළි ත් ධම් සෙනෙවි සවාමීන්ට උපාසක ව හිඳිති. ඒ සිටාණෝ ද සිටු දූවණියන් බඩ, දරුවන් පිහිටි නියා ව දූන ගබ පෙරහර දූන්හ. සිටු දූවණියන්ට දෙළෙක් ඇති වන්නේ 'ධම් සෙනෙවි සවාමීන් මුල් කොට පන්සියක් දෙනා වහන්සේට රේමස් හා සමහ බතක් දන් දී ලා රන්වන් පිළී හැඳ පෙර ව පාළි කෙළවර හිඳ වහන්දෑ වළඳා හළ බතින් බත් සුහක් හැර ගෙන කැම් නම් යහපතැ'යි මෙ බඳු දෙළෙක් උපන. උයි ත් සිටාණන්ට එ ලෙස කියා ලා එ සේ කළහ. දෙළ ත් සන්හුන. ඉන් මැත සත් මසින් සුනු ගැබ ආදි මඟුල් සතෙහි ත් රේමස් රංසෙන් යුත් බත් ධම් සෙනෙවි සවාමීන් මුල් වූ පන් සියක් දෙනා වහන්සේට දූන්හ. මෙහි නො කී සියල්ලෙක් ඇත් නම් වනවාසී තිස්ස තෙරුන් වහන්සේ ගේ වත කී ලෙසින් දතයුතු.

මේ කුමරුන් මහ දූගී සමයෙහි දූන්නා වූ දූගී නො වන දනෙහි විපාක ය. නම් තබන දවස් වළඳවා ලා 'සවාමීනි, මුඹ වහන් සේගේ කොලු පැටවුට නම් තබා වදළ මැනව යි කී කල්හි මුන්ට කුමන නමක් වුවමනාදැ'යි විචාරා 'සවාමීනි, මේ දරුවන් මවු කුස උපන් වක පටන් මේ ගෙයි නුවණ නැති කෙළ කොලු මිනිස්සු ත් මහා පණ්ඩිත වූහ. එ හෙයින් මේ දරුවන්ට පණ්ඩිත නම වී නම් යහපතැ'යි කිවු ය. මහ තෙරුන් වහන්සේ ත් ඒ නම ම තබා වදළ සේක. කුමාරයෝ ත් සත් හැවිරිදි වයස දී මැණියන්ට 'තෙරුන් වහන්සේ ළඟ මහණ වෙමි'යි කිවු ය. 'මහණ වත ත් කුමක් කරත ත් බාධාවක් නො කෙරෙමි'යි සිතා හිඳිනා ම නුඹ දූන් අනිකක් නො කියා මා ත් සස්නෙහි ඇතුළත් ව මහණවෙමි'යි කියන්ට බාධා කිමිදැ'යි කියා ලා ධම් සෙනෙවි සවාමීන් දන් වළ දවා ලා 'සවාමීනි, මේ දරුවෝ අපගෙන් කීමක් නැති ව මහණ

Non-Commercial Distribution

වෙමි යි කියති. මුන් මහණ කළ මැනවැ'යි කියා ලා මහ තෙරුන් වහන්සේ වඩා යවා පියා නෑයන් රැස් කරවා ලා 'අපගේ දරුවන් ගිහි ව වුව මනා යම් සැපතෙක් ඇත් නම් අද ම කරම්හ'යි මහත් වූ සත්කාර කොට උන් කැඳවා ගෙන වෙහෙරට ගොසින් මහ තෙරුන් වහන්සේට මහණ කුරවන්ට පාවා දුන්හ.

මහ තෙරුන් වහන්සේ ද මහණ වූ කල වන අට්ටාල් වදරා 'ස්වාමීනි' සිතා ගෙන කිරීම කුමක් වුව ත් මුඹ වහන්සේ වදාළ ලෙස කෙරෙමි' කී කල්හි 'එ සේ වී නම් මෙ සේ එව'යි හිසකේ තෙමා පියා කපා වදරා තවපඤ්චකය පමණක් උගන්වා ලා මහණ කළ සේක. දෙ මවු-පියෝ ද සතියක් මුළුල්ලෙහි ම වෙහෙර බිම මහත් හෙයින් වෙහෙර ම රඳා බුදු පාමොක් සඟනට රෑමස් රසෙන් යුත් දන් දී සත්වන දවස් ගම් ගෙවලට ගියහ. මහ තෙරුන් වහන්සේ අටවෙනි දවස සිඟා වඩනා ගමනේ වහන්දෑ හා කැටුව සිඟා නො වැඩි සේක. කුමක් නිසා ද යතහොත්-අලුත මහණ වූ පණ්ඩිත සාමණේරයන් දෑ ගැටවටු ගන්වා සිවුරු වළදිනා සේ තව දන්ට ත් නැත. පාත්‍ර ය පටවා ගන්නා සේ දන්ට ත් නැත. ආධුනික හෙයින් ආකල්ප සමෘද්ධිය ත් තව නො ආයේ ය. තව ද මහ තෙරුන් වහන්සේ වෙහෙර කළමනා වතු ත් ඇත. මෙ තෙක් දවසු ත් වහන්දෑ සිඟා නැඟී ගිය කලට වෙහෙර මුළුල්ලේ ඇවිද නො හැමදි තැන් හැමඳ පියා සිස් ව තුබූ පැන් වැළඳේ, පැන් පෙරහා වසා තබා ලා නපුරු ව තුබූ හැඳෙක් – පුටුවෙක් ඇත්නම් එයි ත් තැන් පත් කොට තබා ලා සිස් ව තුබූ වෙහෙරට අවුදින් නපුරු ව තුබූවක් දැක මහණ ගොයුම්හුගේ සවුවන් හුන් තැන සැටි බලව'යි තීර්ථකයන් කියන ලෙසට නො තබා වත් මුළුල්ල සපයා ලා පසු ව පියා සිඟා වඩනා සේක. එ හෙයින් එ දවසු ත් හෙරණුන් දෑ ලවා සහල සිවුර හා පාත්‍ර ය ගෙන්වා ගෙන දවල් කොට සිඟා වැඩි සේක. හෙරණුන් දෑ උපාද්ධ්‍යායයන් වහන්සේ ලා කැටි ව යන දෑ අතුරු මහ කුඹුරට දිය ගෙන යන ඇළක් දැක 'ස්වාමීනි, මෙ කිමදෑ'යි විචාළ දෑ ය. 'හෙරණිනි, මීට ඇළ ය යි කියති' වදාළ සේක.

'මින් කරන්නේ කුමක් දෑ'යි විචාරා කැමති තැනකට පැන් ගෙන ගොසින් කෙත් වලට නමා ගොයම් කෙරෙති' වදාළ කල්හි 'ස්වාමීනි, මෙ පැනෙයි සිත් ඇත් දෑ'යි විචාරා නැතැ යි වදාළ කල්හි 'මෙසේ සිත් නැති පැන් තමන් කැමැති තැනකට ගෙන යෙත් දෑ'යි කී සේක. 'එ සේ ය, ඇවැත්නි'යි වදාළ කල්හි 'අනේ

Non-Commercial Distribution

මේ සිත් නැති පැන් පවා සිත් ඇති මිනිස්සු අමුණු බැඳීම් ආදි වූ නො එක් උපදෙස් කොට ගෙන තම තමන් කැමති තැනකට ගෙන ගොසින් ගොයම් කෙරෙත් ල. සිත් ඇත්ත වූන් සිත් නැති පැන් පවා පනත් කොට ගන්නා කල තමාගේ සිත් පමණක් පනත් කොට නො හෙන්ට කාරණ කිම් දෑ'යි එයි ත් සිත තබාගෙන ඉදිරියේ යන දෑ හී වඩුවන් හී දඬු ගින්නෙහි තව තවා ඇස් කෙළවරින් බල බලා හැද මඩිනවුන් දැක 'මූ කවුරු දෑ'යි විචාරා හී වඩුවෝ ය යි වදළ කල්හි 'මුන් කරන්නේ කිම් දෑ'යි විචාරා 'ගින්නේ තව තවා හී දඬු ඇද මඩති' වදළ කල්හි 'හී දඬුවල සිත් ඇත් දෑ'යි විචාරා නැතැ යි වදළ කල්හි සිත් නැති දඬු පවා හැද හැර ගන්නා කල සිත් ඇත්තවුන් සිතෙහි ම ඇද හැර ගත නො හෙන්ට කාරණ කිම් ද? දණ්ඩට ත් වඩා සිත් ම ඇද නියා දෑ'යි සිතා ඉදිරියෙහි යන දෑ දූවි ය, නිම් වළලුය, නැඹ ය යනාදි ය සසිනවුන් දැක 'මූ කවුරු දෑ'යි විචාරා වඩුවන් නියාව වදළ කල්හි 'උන් කරන්නේ කිම් දෑ'යි විචාරා 'ගැල් ආදියට සක් ආදිය කෙරෙති' යි වදළ කල්හි 'එයි ත් සිත් ඇත් දෑ'යි විචාරා 'ඊ සිත් නැතැ'යි වදළ කල්හි 'සිත් නැති දඬු කඩවල් පවා කපා තමා කැමැති ලෙසට කරණ කල තමාගේ සිත් පමණක් තමාට නම්මවාගෙන සිත් ඇත්තවුන් මහණ ධම් නො කරන්ට කාරණ කිම් දෑ'යි මේ කාරණ තුන තර ව සිත තබාගෙන 'ස්වාමීනි, ඉදින් මුඹ වහන්සේගේ පා සිවුරු මුඹ වහන්සේ ම හැර-ගත් සේක් නම් මම රඳා පියමි'යි කී සේක.

මහ තෙරුන් වහන්සේ ද කාරණ දන්නා හෙයින් 'මේ අලුත මහණ වූ හෙරණ අනුබුද්ධ ව සිටි මට මෙ ලෙස කියන්නේ ය'යි නො සිතා 'මෙ සේ දෙව'යි වදරා ලා තමන් වහන්සේගේ සහළ හා පාත්‍රය හැර ගත් සේක. හෙරණුන් දෑ ද උපාද්ධ්‍යායයන් වහන්සේ වැඳ ලා රඳන දෑ 'ස්වාමීනි, ඉදින් මට බත් ගෙනෙන සේක් වී නම් රෝමස් රස හා බත් ගෙනව මැනවැ'යි කී දෑ ය. 'ඇවැත, කෙ සේ කොයින් ලබමෝ දෑ'යි විචාළ සේක. 'ස්වාමීනි, මුඹ වහන්සේගේ පිණෙකින් නො ලබත ත් මාගේ පිණෙන් ලබන සේකැ'යි කී දෑ ය. මහ තෙරුන් වහන්සේ ද හෙරණුන් දෑ ඉතා බාලවත් හෙයින් පිටත හූන් කලට උපද්‍රවයෙක් වේ නමුත් ය යි උන්දෑ එ දවස් රහත් වන නියාව ය යි නො සලකා හෝ සැලකුව ත් එ ලෙසක් කළ මනා හෙයින් ගබඩාවේ දෙර හරනා කෙස්ස දෙවා ලා 'මා සැතපෙන ගබඩාවේ දෙර හැර ලා ගබඩාවේ ඇතුළට වැද ලා හිඳුව'යි කී සේක. උන්දෑ ත් එ ලෙස ම කොට ලා තමන්දෑ ආදි තචපඤ්චක ය උගත්

Non-Commercial Distribution

බැවින් නුවණැති බව හේතු කොටගෙන අඩුව ත් පුරාගෙන කා ගියා සී කම්ටහන් මෙනෙහි කරමින් හුන් දැය. උන්දැගේ ගුණානුභාවයෙන් ශක්‍රාසන ය හුණු විය.

කාරණ කිම් දෝ හෝ යි ශක්‍රයෝ සලකා 'පණ්ඩිත හෙරණුන්දැ මහණ ධම් කිරීමට සිහා නො ගොස් රැඳුණු දැ ය. මා ත් ඔබ ගිය මැනවැ යි සිතා ලා සතර වරමුන් බණවා ලා 'විහාරයට ආසන්න යෙහි හඬා අරගල කරන්නා වූ සමන් කුකුළු ආදි වූ පක්ෂීනු ත් දුර පලවා පියා වට රකවල් ගනුව'යි කියා ලා චන්ද්‍ර දිව්‍ය පුත්‍රයනු ත් සූර්‍ය්‍ය දිව්‍ය පුත්‍රයනු ත් දෙන්නා ම බණවා ලා 'තොප දෙන්නා මගේ වීමන් දෙක නො යා දී රඳවා ලව'යි විධාන කොට ලා තුමූ පලා ගොසින් අගුළු කණුව කෙරේ රකවල් ගෙන සිටියාහ. විහාරයේ පරඬලක් සෙලවෙන හඬෙක් නැත. හෙරණුන්දැගේ භාවනාව කරන්ට සිත එකඟ වි ය. උන්දැ පෙරවරු ම විවසුන් වඩා අනාගැමි වූහ. මහ තෙරුන් වහන්සේ ද 'හෙරණානෝ මහණ ධමට වෙහෙර ම රඳා හුන්හ. උන් රුචි ලෙසට බතක් අසවල් තැනින් ලදහැක්කැ'යි සිතා තමන් වහන්සේට ආවෙණික මමායන ඇති එක් ගෙයකට වැඩි සේක.

ඒ ගෙයි මිනිස්සු ද එ දවස් රේමස් ලදින් මහ තෙරුන් වහන්සේ වඩනේ කවර විටෙක දෝ හෝ'යි පෙර මං බල බලා හුන්හ. මහ තෙරුන් වහන්සේ වඩනා දැක ඇතුළු ගෙට වඩා ගෙන ගොසින් ආදිම සපයා තබා ලා හුන් හෙයින් දෝ හෝ නොහොත් ඇසිල්ලෙක සපයා කැඳ අවුළු පත් පිළිගන්වා ලා රේමස් හා බත් වළඳින්ට පිළිගැන්වූ ය. මහ තෙරුන් වහන්සේ ගෙන යන ආකාර දක් වූ සේක. 'වළඳා වදරණ බව ය. ගෙන යන බතු ත් පිළිගන්වම්හ'යි කියා ලා මහ තෙරුන් වහන්සේ වළඳා අන්තයෙහි රේමස් හා බත් පාත්‍ර ය පුරා ලා දුන්හ.

මහ තෙරුන් වහන්සේ ද 'නිවන් රස වළඳා සිත් පුරා ගෙන හුන ත් මේ වේලාට බඩ සා වේ දැ'යි සිතා වදරා වහ වහා නික්මුණු සේක. බුදුහු එ දවස් වේලා ඇති ව තිබැදී ම වළඳා ලා විහාරයට ගොසින් 'පණ්ඩිත සාමණේරයෝ උපාද්ධ්‍යායයන්ට පා සිවුරු දී පියා මහණ ධම් කරන්ට නැවැත්තෝ ය. මහණ වූව වුන් සිද්ධ කළ මනා ප්‍රතිපත්ති සාර ය සිද්ධ වී දෝ හෝ'යි නො වී දෝ හෝ'යි විමසන සේක් තුන් මහ තුන් ඵලයට පැමිණි නියා ව දැන පලඟ නුගුළුවා රහත් වේ දෝ හෝ නො වේ දෝ හෝ'යි බලන සේක් පෙරවරු ම රහත් වන නියා ව දැන වදළ සේක.

Non-Commercial Distribution

ඉක්බිත්තෙන් මෙ සේ වූ අදහසෙක් වි ය. 'සැරියුත් මහතෙරහු පිටත කිසි කටයුත්තෙක ගොසින් කල් යවා පී මැණිකෙණකුන් කිරි බොන දරු පොවන්ට වහ වහා දිවෙන කලක් මෙන් බත් හැර ගෙන වහ වහා එති. උන්ගෙ ඊම නිසා රහත් වීමට බාධා වි නමුත් නපුර. දොරටුවෙ රකවල් ගෙන හිඳ ලා ශාරිපුත්‍රයන් අතින් ප්‍රශ්න සතරක් විචාරමි. ඒ පැන විසඳන කලට හෙරණෝ පිළිසිඹියා පත් ව රහත් වෙති. එ සේ හෙයින් මා ගෙනුත් රකවල් ඇත මැනැවැ'යි ගොසින් දොරටුවෙ වැඩ සිට එ තැනට වැඩි මහ තෙරුන් වහන්සේ අතින් ප්‍රශ්න විචාරන බුදුහු 'ශාරිපුත්‍රයෙනි, තොප ගෙනෙන්නේ කිම් දැ'යි විචාරා 'අහර ය'යි කී කල්හි 'ඒ අහර කුමක් එළවා දැ'යි විචාළ සේක.

'වේදනා උපදව'යි උන් වහන්සේ කී කල 'වේදනාව කුමක් එළවා දැ'යි විචාරා 'රූ උපදව'යි කී කල්හි 'රූ කුමක් එළවා දැ'යි විචාරා වදාළ සේක. එ සේ විචාළ බුදුරජුන් වහන්සේට 'රූ පස උපදව'යි කී සේක. එ සේ මැ යි. බඩ සාය උපදව යි. බඩ සාය ඇත්තවුන් අනුභව කළ ආහාර ය සා දුක් නසා සැප වූ ශරීර වේ ද නාව එළව යි. ආහාරානුභවය නිසා සැපයට පැමිණිය හට ශරීර ශොභාව ඇති වෙයි. එ හෙයින් වේදනාව රූ එලව යි. ආහාරජ රූපයන්ගෙ වසයෙන් උපන් සුව සොම්නස් ඇත්තේ හිඳිත ත් හොවිත ත් සුවපස ලැබෙ යි. මෙ සේ මේ පැන සතර විසඳා නිමි කලට හෙරණුන් දැ රහත් වූ දැ ය. රහත් වීම හා සමඟ ම පඤ්ච ප්‍රකාර අර්ථයෙහි ප්‍රභෙද ගත ඥාන ය ය, පඤ්ච ප්‍රකාර ධර්මයෙහි ප්‍රභෙද ගත ඥාන ය ය, ඒ දෙක හඟවා සිටිනා නිරුක්තියෙහි ප්‍රභෙද ගත ඥාන ය ය, ඒ නුවණ තුනෙහි ප්‍රභෙද ගත ඥාන ය ය යන පිළිසිඹියා ත් ආ ය.

බුදුහු සැරියුත් මහ තෙරුන් වහන්සේට 'තොපගේ හෙරණුන් ට බත් ගෙන ගොස් දෙව'යි වදාළ සේක. මහ තෙරුන් වහන්සේ ද ගොසින් දොර නිය පිටින් ගසා ලූ සේක. හෙරණුන් දැ අවුත් මහ තෙරුන් වහන්සේ අතින් පාත්‍රය හැර ගෙන එක් තැනෙක තබාලා තල් වැටක් හැර ගෙන මහ තෙරුන් වහන්සේට පවන් සැලූ සේක. 'හෙරණනි, පත් සැලීම් පසු කොට වළඳව'යි වදාළ සේක. 'ස්වාමීනි, මුඹ වහන්සේනැ'යි විචාළ කල්හි 'අප වළඳා ලා ආම්හ. තෙපි වළඳව'යි වදාළ සේක.

සත් හැවිරිදි වයස මහණ ව අට වෙනි දවස් ඒ ඇසිල්ලෙහි පිපි පියුමක් මෙන් මුබ ශෝභා ඇති ව අහර පිහිටනා තැන් පිළිකුල් විසින් සලකා වැළඳූ සේක. වළඳා අන්තයෙහි පාත්‍ර ය

Non-Commercial Distribution

සෝධා පියා දිය සිඳ තැන් පත් කොට තබා පී කලට සඳ දෙව් පුත් රදවා ගෙන සිටි සඳ මඬල හළ රිවි දෙව් පුත් රදවා ගෙන සිටි හිරු මඬල ත් හළ. සතර වරම් රජහු සතර දිග රකවල් හළහ. සක් දෙව්දුහු අගුළු කණුව කෙරේ තමන් ගත් රකවල් හළහ. ඉර ත් මුදුනෙන් ඉවත් වි ය. වහන්දෑ ත් ඒ දැක 'අඩු වුව මනා ඡායාව පස් වරු සෙයින් බෝ වි ය. පණ්ඩිත හෙරණුන්දෑ ත් වළඳා නිමවූ ය. වේලාට වැළඳු දෝ හෝ' කිම් ඉදෝ හෝ යි කුකුස් කළ සේක.

බුදුහු ඒ පවත් දැන කුකුස් හරවනු නිසා ඒ තැනට වැඩ 'තොප හැම කියන්නේ කිම්දැ'යි විචාළ සේක. ඒ පවත් දැන් වූ කල්හි 'මහණෙනි, පින් කරන්ට සතුන් මැළි බව මුත් මහා පිණත්තැන් මහණ ධම් පුරන කල–මහ බෝසතුන් පැරුම් පුරා නිමවා බුදු වන කල යම් සේ දස දහසක් සක් වළ පොළොව බුදු වන නියාව හඬ ගා කියන්නා සේ ගුගුරා ද, නැවත දස දහසක් සක්වළ දෙව් බඹහු බරණැස වැඩ හිඳ ධම් සක් පැවතුන් සූත දෙසන දවසු ත් නො රදා බණ අසන්ට එම්හ'යි හඟවන්නාක් මෙන් මේ මඟුල් සක්වළට රැස් වූ ද, තව ද 'අපි යම් රූපාවචර ධ්‍යාන බලයකින් බඹ ලොව උපනමෝ ද මුඹ වහන්සේ ත් ඒ රූපාවචර ධ්‍යාන ලබන සේකැ'යි හඟවන්නාක් මෙන් මවු කුසින් බිහි වන්නා ම පළමු කොට බඹු පිළිගත්හු ද, ඉක්බිති ව වරම් රජහු පිළි ගත්හු ද, තුන් වැනි ව රූපාවචර ධ්‍යාන ලැබීමට කාරණ ව මිනිස්සු පිළිගත්හු ද–

තව ද බුදු වූ කල මියුරු කට හඬින් බණ කියන්නේ මෙයට වඩා ය යි හඟවන්නාක් මෙන් ඒ ඒ දෙනා පළන් ආභරණ හා ආතත විතතාදී වූ තූර්‍ය්‍යභාණ්ඩ තෙමේ ම නාද පැවැත් වී ද, තව ද සියල්ලන්ගේ මන් බිඳෙන්නේ ත් මෙ ම ලෙස ය යි, හඟවන්නාක් මෙන් බන්ධන ගත සත්‍වයෝ බැම්මෙන් මිදුනා වූ ද. කෙලෙස් ලෙඩ හරණ නියාව හඟවන්නාක් මෙන් සත්‍වයන්ගේ රෝග පීඩා හැරිණි ද, දිවැස් ලැබීමට කාරණ ව අන්ධයෝ ඇස් ලද්දු ද, දිව කන් ලැබීමට කාරණ ව බිහිරි ශබ්ද ඇසූ ද, සතර සිහිවටන් ලැබීමට කාරණ ව නුවණ නැත්තෝ නුවණ ලද්දු ද, තව ද ඍද්ධිපාද ලැබීමට කාරණ ව පිළී වූ සත්තු පයින් ගමන් ලද්දු ද, සිවු පිළිසිඹියා ලැබීමට කාරණ ව පටුන් වැරද ගියා වූ නැව්–පඬවු බට මනා තොටවලට ම අවුත් බට ද, තව ද හස්තාමලක න්‍යායයෙන් සියල්ල දැක්මට කාරණ ව බිම වූ ත් උඩ වූ ත් රුවන් බබළා ගියේ ද, එකොළොස් ගිනි නිවීමට කාරණ ව නරක ගිනි

Non-Commercial Distribution

නිවිණ ද, හැම තැන නිශ්චල නියාවට කාරණ ව ගං වල පැන් නිශ්චල ව සිටයේ ද—

තව ද මොහඳුරු නැසීමට කාරණ ව ලෝ ඇදිරි නරකවල ආලොක පහළ වී ද, නො එක් ජාති ඇත්තවුන් ආයඎ ජාතින් සරි වීමට කාරණ ව මුහුදුවල පැන් ලුණු රස නැති ව මිහිරි පැන් වී ද, තව ද දෙ සැට මිථ්‍යාදෘෂ්ටි ය හැරීමට කාරණ ව තද සුළං නො හැමී ද, පඤ්චවිධ විමුක්ති නැමැති මලින් බුද්ධොත්පාද නමැති කප් රුක සදන නියාවට කාරණ ව දස දහසක් සක් වල ගස් තුරු ලිය ආදියෙහි මල් පිපිණි ද, බොහෝ දෙනාට සිත්කලු වීමට කාරණ ව සඳ ඉතා බබළා ගියේ ද, කයට සිතට පීඩා දුරු වීමට කාරණ ව හිරු රස් මොළොක් වී ද, තව ද බොහෝ දෙනා අනුශාසනාවෙහි පිහිටා සරණ යෑමට කාරණ ව පක්ෂීන් ගේ අහස ගමන් හැර බිම ගමන් වී ද, සදහම් වැසි වැස්වීමට කාරණ ව සතර මහා දිවයින මිහිර පැන් ඇති ව සිටී ද, තව ද බුදුන් බුදු ව ලා උදන් ඇනීමට කාරණ ව දෙවියන් තම තමන් ගේ විමන්වල සිට කෙළි නළු පැවැත්වී මු ත් වී ද, නිවන් පුර වදනා අෂ්ටාඞ්ගික මාර්‍ග වාසල් හැරීමට කාරණ ව දෙරවල් තෙමේ ම තමාට හැරිණ ද, තව ද කා ගියා සී නමැති අමා ලැබීමට කාරණ ව සත්‍වයන්ට සා දුක් පිපාසා දුක් නැති වී ද, තව ද බ්‍රහ්ම විහාර සතර ලැබීමට කාරණ ව කවුඩු බකමූණු ආදීන්ට ඒ වේලාට වූව ත් ඔවුනොවුන් කෙරෙහි මෙත් සිත් ඇති වී ද. එ පරිද්දෙන් සඳ දෙව් පුත් සඳ මඩල රඳව යි. හිරි දෙව් පුත් හිරු මඩල රඳව යි. සතර වරම්මු වෙහෙර සතර දිග පවත්නා අරගල සන්සිඳුවා රකවල් ගනිති. සක් දෙවිඳු අගුළු කණුව කෙරේ රකවල් ගත.

මම ද 'සම්‍යක් සම්බුද්ධයෙම් වේ ද'යි නො සිතා ම පුතුන්ට දෙරටුවේ රකවල් ගතිමි. මෙ ලෙස රකවල් ගත් කලට ම පුත්තු පොළොව උස් තැන් කැපීමෙන් හා මිටි තැන් පිරවීමෙන් ඇළ වල් හෝ ඉදි කොට ගෙන පිළි හෝ තබා ගෙන තමන් කැමැති තැනකට පැන් ගෙන යන දියාළුවෝ සිත් පිත් ඇති දෙයක් මෙන් තමන් කැමැති තැනට ගෙන ගොසින් තමාගේ ගොයම් කෙරෙති. හී වඩුවෝ ත් සිත් පිත් නැති දඬු ගින්නෙන් තවා හැද මැඩ ගෙන විද ලූ කලට දුර යන ලෙසට ඉදි කෙරෙති. වඩුවෝ වල් විටියල ගෙනවු ත් ලා ලූ කලට නිම වළලු

Non-Commercial Distribution

ආදි ය නිසා සසිනෝ තමන් රුචි ලෙසට වක් වුව මනා වී නම් වක් කෙරෙති. හැද වුවමනා වී නම් එ ලෙසට කෙරෙති.

මෙ පමණක් අරමුණු කොට තමන්ගේ සිත ත් කෙතට පැන් ගෙන යන දියාළුවන් මෙන් විවසුන් නැමැති ඇළි අමුණු කෙතට නම්මා ගෙන, භාවනා නමැති ගොයම් කොට, හී වඩුවන් හී දණ්ඩේ හැද හරනා සේ තමන්ගේ සිත ඇති මායා සාඨෙය්‍යාදී වකු ත් හැර වඩුවන් නිම් වළලු ආදියට දඬු සසිනා සේ තදඞ්ගාදි වශයෙන් කෙලෙසුන්ගේ ඖදරිකාවසථා සැස අෂ්ටාඞ්ගික මාර්ග නමැති රථාවයවයෙන් අර්හත් ඵල නැමැති රථය කොට ගෙන සසර කතරින් එ තෙර වන්ට ඒ රථයට නැංගෝ ය''යි වදාළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටුවු ය.

එ සේ හෙයින් නුවණැත්තවුන් විසින් මේ අරමුණු පණ්ඩිත සාමණෙරයන්දැට ම තිබී ආ දෙයක් නොවන බැවින් තම තමා ත් එ ම අරමුණු කොට භාවනා කර කාල විපත්ති ආහාර-විපත්ති ආදිය නිසා දූන් එක් තරා ගුණ විශෙෂයක් උපදවා ගත නො හෙත ත් මත්තට වුව ත් හේතු කට යුතු.

## 77. ලකුණ්ටක භද්දිය තෙරුන් වහන්සේගේ වස්තුව

තව ද යම් කෙණෙක් අනුන් මහත් කොට කරණ පින් කමක් කුඩා කරව ත් නම් හෝ බොහෝ කොට කරණ දෙයක් මඳ කරව ත් නම් ඉන් වන නපුර දක්වනු පිණිස **ලකුණ්ටක භද්දිය තෙරුන් වහන්සේ ගේ වස්තුව** කියමු.

කෙ සේ ද යත්—

ඒ තෙරුන් වහන්සේ ගේ ශීල සමාධ්‍යාදි ගුණෙන් මහ මෙරට ත් වඩා උස් බවක් මුත් අනුන් මහත් කොට කරණ පින් කමක් කුඩා කරවා පි හෙයින් පස්වා දහස අන්ත අවධියෙක උපන් කෙණකුන් මෙන් මිටි සිරුරු ඇති ව ඉතා කුඩා බුඩා සේක. ඔබගේ තරම නො දන්නා පෘථග්ජන බාල වහන්දෑ ත් සාමණේර වහන්දෑ ත් ඔබ දුටු කල කන් රොඹුව ත් අල්වා ගෙන ''කුමක් ද, කුඩා පියාණන් වහන්ස, සස්නෙහි උකටලී නැත් ද''යි උන් වහන්සේ රහත් නියාව නො දන්නා හෙයින් වෙහෙසනු නිසා මෙ සේ කියන දෑ ය.

තෙරුන් වහන්සේ එ තැන් හැම කුමක් කියත ත් අල පත නෙළුම් පත ඔත් දියත්තක් මෙන් සිත උරණක් තමා නැති

Non-Commercial Distribution

හෙයින් මුසුප්පු නො වන සේක. ධර්ම සෙබෙහි ත් කෙළිවෙළඹී වහන්දෑ මේ කරණ ලෙස ත් ඔබ ත් ඊට මුසුප්පු නැති නියාව ත් කියා කථා උපන. බුදුහු එ තැනට වැඩ 'කුමක් කියවූ ද, මහණෙනි' යි විචාරා මේ නියා ව දන 'එ සේ ය, මහණෙනි, රහත්තු නො කිපෙන්නෝ වෙත් දෑ'යි වදරා 'යම් සේ සිදුරක් නැති වීමෙන් ඝන වූ ගලෙක් සතර දිගින් හමන මහ සුළඟින් වෙවුලා නො යේ ද එ පරිද්දෙන් නුවණැත්තෝ අෂ්ට ලොක ධර්ම නැමැති සුළඟින් වෙවුලා නොයෙති'යි වදළ සේක. මේ දෙශනා කෙළවර ත් බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් යම් සේ ගලතල මත්තෙහි පස් බිම් තැන් නම් ගොයම් නො නැඟේ ද එ මෙන් තමාගේ සිත් සතන් කෙලෙසුන් හට නො ගන්නවා, තව ද යම් සේ අහස අල්වා ගත නො හැකි ද, එ මෙන් කෙලෙසුන් විසින් අල්වා ගත නො හැකි ව, තව ද ඒ අහස යම් සේ සිද්ධ විද්‍යාධරාදීන් විසින් හැසිරෙන ලද්දු ව තිබේ ද, එ මෙන් ති ලකුණු නැමැති අහස සිත හසුරුවා, තව ද ඒ අහස යම් සේ නිරාලම්බන හෙයින් භය කරවා ද, එ මෙන් භවොත්පත්තියෙහි භය ඇති ව, තව ද ඒ අහස යම් සේ අනන්ත ද එ මෙන් අනන්ත ශීල සමාධ්‍යාදි ගුණ ඇති ව චිත්ත ශුද්ධිය කට යුතු.

# 78. කාණමාතා වස්තුව

තව ද නුවණැත්තවුන් විසින් තුමූ සලකා ගත නො හෙත් නමුත් කාරණ දන්නවුන් කී කාරණ අසා සලකන නියාව හඟවනු පිණිස කාණමාතා වස්තුව දක්වමු.

කෙ සේ ද යත්—

කාණ නම් වූ උපාසිකාව සමණන්ගේ ඔබ යන්නී 'සිසතින් නො ගිය මනා වේ දැ යි මෑණියන් ඉදි කළ කැවුම්, සතර වාරයකින් කැටි ව සතර නමකට දුන් කල්හි කාණාවන්ගේ ගමන් කල් යන හෙයින් රක්ෂා කළ සමණන් අනික් අඹු කෙණකුන් ගෙනා කල්හි කාණාවෝ එ පවත් අසා 'හැයි, මේ වහන්දෑ එක් වරෙක හෝ වැඩි ගියේ නම් දෙ වාරෙක හෝ ඉදි කළ කැවුම් පමණක් පිළිගනො ත් කැවුම් ඉදි කිරීමෙන් කල් යන්ට නැති ව ලා ඔබ ගියො ක් උන් ඔබ්බෙන් ගෙනෙන මිනිස්සු නැත්තෝ වෙත් ද, මේ සා හානියක් කළ දෑ වහන්දෑ වේ දැ'යි දුටු දුටු වහන්දෑට කාරණ

Non-Commercial Distribution

සලකා පිය නො හී දෙඩන්ට බණන්ට වන්හ. වහන්දෑ ත් බිණුම් ඇසිය නො හී ඒ වීපියට සිහා එන්ට මැළි සේක. බුදුහු එ පවත් දැන කාණාවන්ගේ ගෙ දෙරට වැඩි සේක. කාණාමාතාවෝ ද අවුත් වැඳ ලා සැදෑ ඇත්තවුන්ගේ ගෙ දෙර හසුන් පනවා ම තිබෙන හෙයින් පනවන ලද බුදු හස්නෙහි වඩා හිඳුවා කැඳ අවුළු පත් පිළිගැන්වූහ. බුදුහු කැඳ වළඳා ලා 'කාණාවෝ කොයි දෑ'යි විචාළ සේක. මැණියෝ කියන්නෝ 'සිත මුසුප්පු බලවත් හෙයින් මුඹ වහන්සේ දැක ත් අවුත් නො වැඳ හඬ හඬා සිටින්නෝ තුලු වේ දෑ' යි කිවුය. 'හඬන්නේ කුමට දෑ'යි විචාරා වදාළ කල්හි මැණියෝ ම කියන්නෝ 'ස්වාමීනි, මූ තුමූ වහන්දෑ දුටු කල දෙඩති, බෙණෙති. එ සේ හෙයින් තමන්ගේ අපරාධ ය සලකා දෝ හඬති' කිවු ය.

බුදුහු උන් කැඳවා ලා 'හැයි, කාණාවෙනි, මා දැක සතුටු වුව මනා නැත. හඬන්ට කාරණ කිම ද? හඬන්නේ ශොකයෙක් ඇතු ව වේ ද? ශොකයට මුල් වන්නේ ජාතිය වේ ද? ඒ ජාතිය පවා නැති කරවන්නෙම් ශොක ය නැති කරවා ලිය නො හෙම් ද? කියව'යි වදාළ සේක. එසේ වුව ත් උන් කියා ගත නො හී සිටිනා මැණියෝ 'සමණන්ගේ ඔබ මුන් යන ගමනේ සිසතින් යැම නපුරු වේ දෑ'යි තමන් කැවුම් ඉදි කළ නියාව ත් සිහා ආ නමකට ඒ පිළිගන්වා පියා දෙ වැනි ව ඉදි කොට අනික් නමකට එයි ත් පිළිගන්වා තුන් වැනි ව ත් සතර වැනි ව ත් ඉදි කොට එයි ත් ආ ආ දෙනමකට පිළිගන්වා කැවුම් නැති ව මුන් තමන්ගේ ගමන පමා හෙයින් රක්‍ෂා කළ සමණන් අනික් මිනිස් කෙණකුන් ගෙන්වා ගත් නියාව අසා මුසුප්පු බලවත් ව මේ වූයේ වහන්දෑ නිසා වේ දෑ යි වහන්දෑට දෙඩති, බෙණෙති' කිවූ ය. බුදුහු ඒ අසා වදරා 'කුමක්ද, කාණාවෙනි, මාගේ සවුවෝ තොප දුන් දෙයක් පිළිගත්තු ද? නොහො ත් නො කැමැති කරවා නුදුන් දෙයක් අරගත්තු දෑ''යි විචාරා 'දී ලූ දෙය ය, ස්වාමීනි'යි කී කල්හි 'ඉදින් මාගේ සවුවෝ සිහා ආ ගමනේ සිහා සිට තොප දී ලූ දෙය පිළිගත්තු නම්, උන්ගේ වරද කවරේ දෑ'යි විචාළ සේක. 'ස්වාමීනි, වහන්දෑගේ කිසි ත් වරදෙක් නැත. නිරපරාධ වහන්දෑට බිණුවන්ගේ ම වරද යැ'යි මැණියෝ කිවු ය.

බුදුහු කාණාවන්ට වදරණ සේක් 'මා ගේ සවුවෝ ගෙ පිළිවෙළින් සිහන ගමනේ ඒ ගෙය ත් සිඟුව මනා ගෙයක් හෙයින් සිහා සිටියෝ ය.

Non-Commercial Distribution

තොපගේ මැණියෝ කැවුම් පිළිගැන්වූ ය. මාගේ සවුවන්ගේ වරද කවරේ දැ'යි වදාළ සේක. කාණාවෝ ත් 'ස්වාමිනි, වහන්දැගේ වරදෙක් නැත. සිතා වරද්දපු මාගේ වරද ය'යි කියා ලා බුදුන් වැඳ ක්‍ෂමා කරවා ගත්හ. බුදුහු ත් තමන් වහන්සේ වැඩි කටයුත්ත තුබූ සේ තුබූ හෙයින් කාණාවන්ට පිළිවෙළ කථාව වදාළ සේක. කාණාවෝ ත් සෝවාන් ව ශොක දුක් දුර ගෙවූහ.

බුදුහු ත් හුනස්නෙන් නැඟී වෙහෙරට වඩනා සේක් වඩනා තව ත් මං ඇත ත් රජ්ජුරුවන්ගේ සෙණ්ඩුළුවෙන් ම නික්මුණු සේක. රජ්ජුරුවෝ ත් දක 'බුදුහු වඩනා සේක් ය'යි විචාරා එ සේ ය'යි කී කල්හි 'යව, ගොසින් මා වඳිනට එන නියා ව කියව යි කියා යවා ලා වැඩ සිටි බුදුන් කරා ගොසින් වැඳ ගෙන 'ස්වාමීනි, වැඩියේ කොයිදැ'යි විචාරා 'කාණමාතාවන්ගේ ගෙට ය'යි වදාළ කල්හි 'වැඩි කටයුතු කවරේ දැ'යි විචාළෝ ය.

'කාණා තොමෝ කාරණ නො සලකා භික්ෂූන්ට බණෙ'යි වදාළ කල්හි 'ස්වාමීනි, නො බණන ලෙසක් කොට වදළේ ඇත් දැ'යි විචාරා 'එ සේ ය, මහරජ ලොවුතුරා සැපතින් යන්තම් සැපතක් දෙවා ලා මෙ වක් පටන් නො බණන ලෙසක් කරවා ආම්හ'යි වදාළ කල්හි 'ස්වාමීනි, මුඹ වහන්සේ ලොවුතුරා සැපත් දෙවූ සේක් නමුත් ලොවී සම්පත්තීන් පිරිහී මුදුප්පු වූ තැනැත්තවුට මම ලොවී සැපත් දෙමි' කිය ලා රුදුණු තැනැත්තෝ වාහනයක් දෙවා, උන් ගෙන්වා ගෙන ශ්‍රොත ආපත්ති ඵලාලඞ්කාර ය සිත සරහා ලත බව මුත් ශරීර ය සරහා ලිය නො හෙන හෙයින් ගැනුත්ට වුවමනා පා මුදු - පාඩගම් ආදී වූ ආභරණයෙන් සරහා ලා නායක දූ තරමේ තබා ලා 'ම දූන් පාවා ගෙන යන්ට තරම් කෙණකුන් අවුත් කැඳවා ගෙන ගිය මැනවැ'යි විධාන කළහ. රට තොට විචාරා සිටි එක් ඇමැත්තාණ කෙණෙක් මම කැඳවා ගෙන ගොසින් රකිමි'යි කියා ලා තමන්ගේ ගෙට කැඳවා ගොසින් සියලු ඉසුරු ම අතට හැර ලා කැමති ලෙසකින් පින් කරව'යි විධාන කොළෝ ය.

කාණාවෝ ද එ වක් පටන් සතර වාසල මිනිසුන් සිටුවා භික්ෂු වහන් දැ වේව යි, භික්ෂුණී වහන්දෑ වේව යි තමන්ගේ ගෙදෙරට ම එත් මුත් තමන් ඔබ යා යුතු තරමට නො කොළෝ ය. උන්ගේ ගෙදෙර මහ දන් මහ වතුරක් මෙන් පවත්ති. ධම් සෙබහි ත් කථාවෙක් උපදනේ වැඩිමාලු කල මහණ වූ සතර නමෙක් කැවුම් පිළිගැන්ම ම දත් බව මුත් කාණාවන්ගේ අදහස් නො දත මුසුප්පු කැර වූ සේක. බුදුහු

18

Non-Commercial Distribution

කැවුම් පිළිගන්නා පමණක් වදරාලීමෙන් මතු-මත්තෙහි මෙලෙසින් උපදනා මුසුප්පු ත් හරවා වදාළ සේක. උන්ගේ අදහස දූන බණ ත් වදරා සෝවාන් කරවා ලීමෙන් මතු නො දෙඩන ලෙසට සැදෑ ත් ඇති කරවා ලා භික්ෂු වහන්දෑ වුව ත් මෙහෙණින්නන් වුවත් ආරාධනාවට වේව යි උපස්ථාන කරන්ට වේව යි හුන් හුන් තැනට කාණාවන් තමන් නො ඇවිදුවා භික්ෂු-භික්ෂුණී දෙ පක්ෂය ම උන්ගෙන් උපස්ථාන විඳ උන්ගේ ගෙට එළඹෙන ලෙසක් කරවා ලූ සේක. අනේ බුදුන්ගේ ආනුභාවයක් ඉතා යහපත් නියා ය'යි කියා කථා කළ සේක.

බුදුහු වැඩ කෙරෙමින් හුන් කථාව විචාරා මේ නියා ව දූන යටගිය දවස කාණාවන් මී ව උපන් නියාව ත් කැවුම් පිළිගෙන මුසුප්පු කැර වූ මාලු වහන්දෑ සතර නම එ තැන එ වක බළල් ව ඉපැද මීව උපන් කාණාවන්ට මුසුප්පු කැර වූ නියාව ත්, ගල් වඩු ව උපන් තමන් වහන්සේ පිළිවහණ මුවා ගෙයක් කොට මීයාට දී මීයාට ඇති වූ මුසුප්පු ව බළලුන්ට පමුණුවා, ඈට ඒ මුසුප්පු හැර වූ නියාව ත් බබ්බු ජාතකයෙන් විස්තර කොට වදරා 'මහණෙනි, දූන් බුදු ව හැම දෙනාගේ මුසුප්පු හරවන්ට පොහොසත් අවධිය තබා පැරුම් බිමදී ත් හරවා ම ආයෙම් වේ දූ'යි වදරා ලා—

යම් සේ මහ මුහුද පාතින් සතළිස් දහසක් යොදුන් කුඩ මස් සන්ගෙන් කැළඹෙන හෙයින් හා මුදුනෙන් සතළිස් දහසක් යොදුන් පමණ තැන් සුළඟින් ඇළලෙන හෙයින් පාතින් හා උඩින් අසූ දහසක් යොදුන් පමණ තැන් හැර මැදින් සාර දහසක් යොදුන් පමණ ගැඹුර ඇති මුහුදු භාග ය නොහොත් සිවුරඟ සෙනඟ ට ත් කැළඹී නො යන තරම් ගැඹුරු විල නො කැළඹී ප්‍රසන්න ව තිබේ ද, එ පරිද්දෙන් නුවණැත්තෝ තුමූ බණ අසා යම් සේ ඒ විල නො කැළඹෙන හෙයින් ප්‍රසන්න ද නො සැලෙන හෙයින් ඇළලීම් නැත් ද, එ මෙන් සෝවාන් - සෙදගැමි - අනාගැමි වීමෙන් උපක්ලෙශ රහිත වූ සිත් ඇති බවට පැමිණ පහදිති. රහත් වූවෝ වැළි ත් විශෙෂයෙන් පහදිති' වදාළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන සෝවාන් ඵලාදියට පැමිණියහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් යම් සේ සඳ තෙමේ පෙර දෙ පෝයෙහි කලා පූරණ වසයෙන් වඩී ද එමෙන් සීලසමාද්ධ්‍යාදී ගුණයෙන් දිවි පමණින් වැඩී තව ද යම් සේ සඳ තරු මූළුල්ලට ම අධිපති ද එ මෙන් උදරතර වූ ඡන්‍දාධිපති ආදිය ඇති ව තව ද යම් සේ සඳ ජන සඤ්චාර රහිත රාත්‍රියෙහි හැසිරේ ද

Non-Commercial Distribution

එ මෙන් විවේකාධ්‍යාශ ය ඇති ව, තව ද යම් සේ සඳ-හිර-තරු-පෙනෙන දෙව් ලොව විමන්වලින් ඉතා ප්‍රසිද්ධ ද, එ මෙන් සීලාදී ගුණෙන් ප්‍රසිද්ධ ව, තව ද යම් සේ සඳ ආදියෙන් දක්නා කලට මහෝත්සාහයෙන් බලා දකිත් ද එමෙන් ම බොහෝ දෙනා විසින් ප්‍රාර්‍ථනීය ව කුසල්හි හැසිර භවභොග සම්පත් සාධාගෙන කෙළවර නිවන් සම්පත් ලැබිය යුතු.

# 79. පන්සියක් දෙනා වහන්සේ ගේ වස්තුව

තව ද සුව පත් වූ කල ගුණ හීන අසත්පුරුෂයන් උඩඟු ව පවතු ත් මුත් දුක් පත් වූ කල එක් තරමෙක වී නමුත් තමන් දවස් යැවිය හෙන බව හා බඩ සායෙහි නපුර දක්වනු නිසා සිහන්නන්ගේ දෙස් වදාළ **පන්සියක් දෙනා වහන්සේ ගේ වත** දක්වමු.

කෙ සේ ද යත්—

බුදුහු පළමු විසි හවුරුදු ඇතුළත වේරඤ්ජාවට වැඩ වේරඤ්ජ නම් බමුණානන්ගේ ආරාධනාවෙන් පන් සියක් දෙනා වහන්සේ හා සමඟ වේරඤ්ජාවෙහි විසූ සේක. වස් වසන්ට ආරාධනා කළ වේරඤ්ජ නම් බමුණානෝ ද මාරයා ඇඟ ආවිෂ්ට ව තමාගේ දිව්‍ය ලොකයෙන් ඇසිල්ලක් හා මිනිස් ලොවින් තුන් මසක් කුට්ටල ව ඇඟින් පහ නු වූ හෙයින් වස් තුන් මස මුළුල්ලෙහි එක දවසක ත් ආරාධනා කළ නියාවක් වේව' යි බුදුන් එහි විසූ නියාවක් වේව'යි සඳහන් නො කොළෝ ය. වේරඤ්ජාවෙ ත් බත් නැත. වහන්දෑ ත් නුවර ඇතුළ පිටත සිඟා ත් බත් නො ලදින් මිරිකුණු සේක. එ නුවරට අසුන් විකුණන්ට ගිය අස් වෙළෙන්දෝ යව සාල් නැළිය නැළිය ඔබාදීන් දවස් පතා පන් සියක් නැළි පමණ යව සාල් දෙවූහ.

යව සාල් නමුත් නීරස දෙයක් හෙයින් ඒ වළඳා වැර ගිය වහන්දෑ දැක මුගලන් මහ තෙරුන් වහන්සේ පොළොව පත්ලෙහි තුබූ රස ඕජාවක් වළන්දනු කැමැති වූ සේක. තමන් වහන්සේගේ ආනුභාවයෙන් උතුරුකුරු දිවයිනට සිඟා හෝ ගෙන යනු කැමති වූ සේක. බුදුහු එක් ව කළ අනිවාර්‍ය්‍ය කර්‍මයක් නියාව දැන නැවැත් සේක. ඒ වහන්දෑට ත් අනඳ මහ තෙරුන් වහන්සේ විනා හැම තැන් ම රහත් හෙයින් රස තෘෂ්ණාව සුන් හෙයිනු ත් තදඞ්ග වසයෙන් වුව ත් අනඳ මහ තෙරුන් වහන්සේට රස තෘෂ්ණාව සුන් හෙයින් බතක් පැනක් නිසා චිත්ත පීඩා නොවී ය. බුදුහු එහි වස් වැස නිම වා ලා ආරාධනා කළ වුන්ට වස් අන්ත නියාව කීම

Non-Commercial Distribution

පනකක් හෙයින් කළ උපස්ථානයක් නැත ත් වෙරඤ්ජ නම් බමුණාණන්ට වදරා ලා උන් ගෙන් වස් තුන් මසින් වූව මනා උපස්ථාන එක දවසින් ම විඳ ගෙන උන් සරණ සීලයෙහි පිහිටුවා මත්තට හේතු ඇති කරවා ලා එයින් නික් ම පිළිවෙළින් සැරි-සරණ සේක් එක් සමයෙක සැවැත් නුවරට පැමිණ දෙව්රම වසන සේක.

සැවැත් නුවර වැස්සෝ අමුතු ව ලා වැඩි බුදුන්ට අමුතු දන් දෙන්ට පටන් ගත්හ. එ කල පන් සියයක් පමණ සිහන්නෝ වහන්දෑ ගෙන් සිහා කා ලා විහාරේ ම රඳා හිඳිති. ඔහු වහන්දෑ වළඳා ඉතිරි මියුරු ආහාර ය කා ලා වැද නිදා නැගී සිට ගං තොටට ගොස් මහත් කොට හඬ ගසමින්, ඒ ඒ තන්හි පනිමින් පොර මල්ලව අල්ලමින් කෙළ ඇවිදිති. විහාරයෙහි ඇතුළත ත් පිටත ත් අනාචාර ම කෙරෙති. ධර්ම සෙබෙයි රැස් වූ වහන්දෑ 'බලව ඇවැත්නි, මේ සිහන්නෝ දුගටියා අවධියේ වෙරඤ්ජා-වෙහි දී කිසි විකාරයක් නො කළවූ ය. දැන් මෙ බඳු මියුරු ආහාර කා ලා නො එක් විකාර දක්වමින් ඇවිදිති. වහන්දෑ වෙරඤ්ජා වෙහි දී ත් උපශාන්ත ව වැස දැනු ත් උපශාන්ත ව ම වසන සේකැ'යි කථාවක් ඉපැදවූ සේක.

එ කල බුදුහු ධර්ම සභා මණ්ඩපයට වැඩ 'මහණෙනි, මා එන් නාට පළමු කුමක් කියමින් හුනු දැ'යි විචාරා මෙ පවත් කී කල්හි මොහු පෙර ත් ගද්‍රභ යොනියෙහි පන් සියයක් පමණ කොටළු ව උන්නාහු පැන් නුමුසු රසවත් වූ මිදි පැන් මිරිකා පන් සියක් අසුන් පොවා පිටත දමන ලද ඉඳුල් මිදි සප ගෙන පැනෙහි මැඩ නියඳ වැහැරියෙන් පෙරා පෙවූ රස නැති ලාමක වූ කසට මිදි පැන් බී මී බී මත් වූ බමරුන් මෙන් නාද කෙරෙමින් ඇවිද්දහු වෙත් දැ'යි වදරා ආරාධිත වූ බුදුහු—

'එම්බා මහණෙනි, රස නැති ලාමක වූ පැන් මුසු මිදි පැන් බී පවා එ කල කොටළුවන්ට සත්කාර මදය උපන්නේ ය. අසුන්ට වනාහි පැන් නුමුසු රසවත් වූ සිය දෑ මිදි පැන් පූව ත් සත්කාර මදයෙක් නූපන්නේ ය. එ සේ හෙයින් හීන ජාතියෙහි උපන්-නාහු යත් තම් රස යක් බී ත් එයින් මත් ව උඩඟු වෙති. උතුම් කුලයෙහි උපන් ආචාර සීලයෙන් යුක්තවූවාහු අග්‍ර රස ය පාන ය කොට ත් එයින් මත් ව උඩඟු නොවෙති' යනාදීන් වාලොදක ජාතක ය විස්තර වසයෙන් ගෙන හැර දක්වා 'සත්පුරුෂයෝ මෙ සේ ලොභ ය දුරු කොට සුව පත් කල්හි ද, දුප්පත් කල්හි ද අන් විකාරයකට නො පැමිණෙන්-නාහු ය'යි පූර්වාපරසන්ධි ගළපා මත්තෙහි ද බණ වදරන බුදුහු ''සත්සුන් ගුණෙන් යෙදුණු සත්පුරුෂ වූ බුද්ධාදී

Non-Commercial Distribution

නුවණැත්තෝ පඤ්චස්කන්ධාදී සියලු උපාදාන ධර්මයන් කෙරෙහි අන්තර්ගත වූ ඡන්දරාග ය අර්හත්මාර්ග ඥානයෙන් පහ කොට අදනාහු දුරින් දුරු කෙරෙති. පඤ්ච කාම ගුණයන් හේතු කොට ගෙන තුමූ ත් කථා නො කෙරෙති. අනුන් ලවා ත් කථා නො කරවති.

'යම් කිසි මහණ කෙනෙක් අහර සොයා ගම් වදනාහු ලොභාභිභූත ව කිමෙක් ද, උපාසකයෙනි, තොපගේ අඹු දරුවන්ට ගව-මහිෂාදීන්ට උපද්‍රව නැත් දැ'යි යනාදීන් කියන්නාහු වී නම් ඔහු පස ය පිළිබඳ කථා කරන්නාහු නම. යම් කෙනෙක් එ පරිද්දෙන් කියා 'එ සේ ය, ස්වාමීනි, අපට කිසි දුකෙක් නැත. දැන් අපට බතින් බුලතින් සැප ය. මෙ තැන ම විසුව මැනවැ'යි තම හට ආරාධනා කරවන්නාහු වී නම් ඔහු පස ය නිසා කථා කරවන්නාහු නම. බුද්ධාදිහු වනාහි දෙක ම නො කෙරෙති. අෂ්ටලෝක ධර්ම-යෙන් පහරන ලද්දහු වූ නමුත් සතුටු-නො සතුටු වීම් වශයෙන් හෝ ගුණ නුගුණ ඇස්වීම් වශයෙන් හෝ උසස්- යටත් වූ ආකාර යක් නො දක්වති'යි වදාළ සේක. මේ දෙශනා කෙළවර බොහෝ දෙන සෝවාන් ආදී වූ සතර මග සතර ඵලයට පැමිණ අමා මහ නිවන් දුටහ.

එ හෙයින් සත් පුරුෂයන් විසින් අෂ්ට ලෝක ධර්මයෙන් අනභිභූත ව සියලු අකුශලයන් දුරු කොට කුශල කර්මයන් පුරා නිවන් සැප සැධිය යුතු.

---

# 80. ධම්මික තෙරුන් වහන්සේ ගේ වස්තුව

තව ද සත්ත්වයන් අධර්මයෙන් වළකා දහම්හි පිහිටුවනු සඳහා ධම්මික තෙරුන් වහන්සේ ගේ වස්තුව දක්වමු.
කෙසේ ද යත්:-

සැවැත් නුවර එක් උපාසක කෙනෙක් දැහැමින් සෙමින් ගිහි ගෙයි වෙසෙති. උහු තුමූ පැවිදි වනු කැමැති ව එක් දවසෙක ඇඹෑණියන් හා සමඟ හිඳ කථා කරන්නෝ 'සොඳුර, මම මහණ වනු කැමැත්තෙමි' කිවූ ය. එ බසට උන්ගේ ඇඹෑණියෝ කියන්නාහු 'ස්වාමීනි, මා බඩ දරුවන් වදා පියනා තෙක් බැලුව මැනවැ'යි කිවූ ය. උපාසකයෝ ද යහපතැ'යි ගිවිස ඒ දරුවන් බිහි ව පියවර ඔසවන කාලයෙහි නැවත ත් ඇඹෑණියන් විචාරා පළමු පරිද්දෙන් ම 'ස්වාමීනි, මේ දරුවන් වැඩී ගන්නා තෙක් බැලුව මැනවැ'යි කී කල්හි 'මුන් විචාරා යැම්මෙන් ප්‍රයෝජන කිම් ද, නො විචාරා වී නමුත් ගොසින් මට දුකට පිළිසරණක් කෙරෙමී'යි ගෙන් නික්ම ගොස් මහණ වූ ය.

Non-Commercial Distribution

උන් තුමූ තමන්ට සුදුසු වූ කමටහනක් ඉගෙන ගෙන උත්සාහ වීර්‍ය්‍ය කරන්නෝ තමන්ගේ පැවිදි වීමෙන් වන කාර්‍ය්‍ය ය නිමවා නැවත ඒ දෙ පුතු මවුන් දක්නා පිණිස සැවැත් නුවරට ගොසින් පුතණුවන්ට ගිහි ගෙයි ආදීනව දක්වා බණ කීහ, ඒ පුත් කුමර ගිහි ගෙන් නික්ම මහණ ව නොබෝ දවසකින් රහත් බවට පැමිණියේ ය. තෙරුන් වහන්සේ ගේ පොරණ ඇබෑණියෝ ද 'යම් කෙණකුන් පිණිස මම ගිහි ගෙයි විසීම් ද ඒ දෙ දෙන ම මහණ වූ ය. දැන් ගිහි ගෙයි විසීමෙන් මට ප්‍රයෝජන කිම් ද? මම ත් මහණ වෙමී'යි ගිහි ගෙය හැර ලා ගොස් මහණ ව ලා ම නො බෝ දවසෙකින් රහත් වූ ය.

ඉක්බිති එක් දවසෙක ධම් සෙබෙහි රැස් ව හුන් වහන්දෑ 'ඇවැත්නි, ධම්මික උපාසකයෝ තුමූ දහම්හි පිහිටි හෙයින් ගිහි ගෙන් නික්ම මහණ ව රහත් ව ලා අඹු දරුවන් ද ගිහි ගෙට වඩා ශාසනයෙන් පිහිට වූ ය'යි කථා කළ සේක. බුදුහු එ තැනට වැඩ කෙරෙමින් සිටි කථාව විචාරා වදුරා කථා පුවත දැන 'මහණෙනි, නුවණැත්තෝ තුමූ තමන් නිසා වේව යි පණිවා ආදී වූ පව් නො කෙරෙති නැවත දරුවන් වේව යි වස්තු වේව යි රට තොට වේව යි, කැමැතිව ත් පව් නො කෙරෙති. තමන්ට වන්නා වූ මේ ප්‍රයෝජනයක් ඇත් නම් එයි ත් නුවණැත්තෝ අධර්මයෙන් උපදවන්ට පර ලොවින් ප්‍රයෝජන ලවයක් නැති හෙයින් නො කැමති වෙති. යම් කෙණෙක් යුථොක්ත වූ මේ ගුණ ඇත්තෝ වූ නම් සිල්වතු ත් උන් ම ය. නුවණැත්තෝ ත් උන් ම ය. මැදහත්තු ත් උන් ම ය. අනික් කෙණෙක් නොවෙති'යි වදළ සේක. මේ දේශනා කෙළවර ත් බොහෝ දෙන මාර්‍ග ඵලා-ලඞ්කාරයෙන් සැරහී නිවන් පුරයට වන්හ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් යම් සේ සක් දෙවිඳු ශක්‍ර සම්පත ඇලී වෙසේ ද, එ මෙන් නිවන් සම්පත ඇලී – තව ද යම් සේ සක් දෙවිඳු දෙවියන් දැක සංග්‍රහ කෙරේ ද, එමෙන් කුසල් විෂයෙහි පසු නො බස්නා සිතට බල ලබ්බා දීමෙන් හා තෙපුලෙන් සිද්ධවන කුසලයට තෙපුල් ලබ්බා දීමෙන් හා සිතින් සිද්ධ වන කුසලයට සිත ලබ්බා දීමෙන් සංග්‍රහ ශීලී ව – තව ද යම් සේ සක් දෙවිඳු හට දිව සැපතෙහි උකටලී නැත ද, එ මෙන් කුසල් විෂ-යෙහි උකලී නො ව ත්‍රිවිධ දුශ්චරිතයෙන් දුරු ව ත්‍රිවිධ සුචරිත පුරා ස්වර්‍ග සම්පත් අනුභව කොට කෙළවර නිවන් සම්පතු ත් සාධා ගත යුතු.

Non-Commercial Distribution

# 81. ධම්ශ්‍රවණ වස්තුව

තව ද බණ අසා ඒ වූ පරිද්දෙන් පිළිපදු ත් මුත් නොපිළි පැදීමෙන් ප්‍රයෝජන නැති නියාව දක්වන්ට ධම්ශ්‍රවණ වස්තුව කියමු.

කෙ සේ ද යත්—

සැවැත් නුවර එක් වීථියෙක මිනිස්සු එක් ව ගෙන සෑහෙන තරමේ දන් දී ලා රාත්‍රි බණ ත් අසන්ට පටන්ගෙන සියලු රාත්‍රි යෙහි අසා ගත නො හී සමහර කෙණෙක් කෙලෙස් සිතින් රැඳී පියා බණ සඞ නො වන තෙක් ම තමන්ගේ ගෙවලට ගියහ. සමහර කෙණෙක් බොහෝ දෙන රැස් වූ තැන හෙයින් අඬ දබර කොට ගෙන ගියහ. සමහර කෙණෙක් සිත හෙළා අසන්ට නැති හෙයින් ඇසට නිදි එන්නා නිදා වැතිර ගියහ. දෙ වන දවස් වහන්දෑ එ පවත ධම් සෙබෙයි දී කී සේක. බුදුහු ත් වැඩ එ පවත් දැන 'මහණෙනි, සත්‍වයන් අතුරෙන් යම් කෙණෙක් නිවනට පැමිණෙත් නම් උඹ බොහෝ දෙනෙක් නො වෙති. බොහෝ සර්‍වඥවරයන් වැඳ ත් නිවන් දැක ගත නුහුණු සත්හු ම බොහෝ වූ ය. යම් කෙණෙක් බුදුන්ගේ බුදු වදන් අසා මනා ව පිළිපදි ත් නම් එ බඳු තරමක් ඇති වූ කෙණකුන් විසින් මුත් එ තෙර විය නො හැකි කෙලෙස් මරහු වසනු තැනක් වැනි සසර හැර උඹ තුමූ නිවන් පරතෙරට පැමිණෙති' වදාළ සේක. මේ දෙශනාව කෙළවර බොහෝ දෙන සෝවාන් ඵලාදියට පැමිණ නිවන් පුර වන්හ.

එ හෙයින් සත්පුරුෂයන් විසින් යම් සේ සක්විති රජ්ජුරු කෙණෙක් සතර සංග්‍රහ වස්තුවෙන් ජන සංග්‍රහ කෙරෙත් ද එ මෙන් සිවු වනක් පිරිසගේ අදහස් ලෙසට ධම්දානයෙන් කණ් කඅයාර නො වන ප්‍රිය තෙපුල් ම කියන බණිනු ත් කීමෙන් වැඩෙහි හැසිරීමෙන් අනුශාසනා ලෙස පවත්නවුන්ට ආත්ම සමානතාව ඇති වීමෙන් ද මෙ සේ සතර සංග්‍රහ වස්තුව ත් ඇති ව, තව ද යම් සේ සක්විත්තන් සන්තක සතර මහ දිවයින සොරු නැත් ද, එ මෙන් තමා සතන්හි කෙලෙස් සොරුන් විසිය නො දී, තව ද, යම් සේ සක්විත්තෝ දවස් පතා මුළු පොළොව සිසාරා ඇවිද යහපතු ත් නපුරු ත් දකිත් ද, එ මෙන් දවස් පතා තුන් දෙරින් වැරදි සලකා වැරදි දෙයට නිසි වූ ප්‍රතිකාර කොට අකුසලින් දුරුව කුසල් පුරා ත්‍රිවිධ බොධීන් එක් බොධියකට පැමිණිය යුතු.

Non-Commercial Distribution

# 82. ආගන්තුක පන්සියක් දෙනා වහන්සේගේ වස්තුව

තව ද සාමාන්‍යයෙන් සියලු ම අකුසලින් දුරු ව සාමාන්‍යයෙන් සියලු ම කුසල්හි යෙදෙනු සඳහා ආගන්තුක පන්සියක් දෙනා වහන්සේ ගේ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්—

පන් සියක් පමණ වහන්දෑ කොසොල් රට වස් වැස ලා අනතයෙහි බුදුන් වඳනට යෑම අවශ්‍යයෙන් ම කළ මනා හෙයින් දෙව්රම් වෙහෙරට ගොසින් බුදුන් වැඳ එකත් පස් ව හුන් සේක. බුදුහු ඒ වහන්දෑගේ තරමට අනුකූල ලෙසට බණ වදරන සේක් 'මහණෙනි, නුවණැත්තෝ තුමූ සත්ව ප්‍රාණහර විෂ මෙන් සලකා සියලු ම ලඝු තරම් වුව ත්, බලවත් තරම් වුව ත් අකුසල ය නො කිරීම වසයෙන් හැර මහණ වන්ට අවුත් මහණ වූ තැන් පටන් රහත් වන තැන් දක්වා කාය සුචරිතාදි සියලු ම කුසල ය වඩන්නෝ ය. ඒ කුසල ය වඩන්නේ කුමක් නිසා ද යත්—තෘෂ්ණාව නම් සියලු ම දුකට මුල් කාරණ හෙයින් ඒ හැර නිවන් නම් ලොවී ලොව්තුරා සැපයට කාරණ හෙයින් නිවන් පතා ඊට පැමිණෙන පිණිස කුසල් කරන්නෝ ය. කුසල් කරණ කල ත් රූප ශබ්දාදි වූ වස්තු කාම සැප ත් තත් තත් විෂය වූ කෙලශකාමය ත් හැර යම් දෙයෙක්හි ඇල්ම කරවා ම මුත් කට නොහැක්කේ වී නම් එ සේ වූ නිවන්හි ඇලුම් කොට නිවන් පතා කළ කුසලින් සියල්ලක් ම සිද්ධ වන හෙයින් තර ව නිවන් කැමැති වන්නාහ.

නැවත නුවණැත්තෝ තුමූ යම් කෙලෙස් සිතෙක් ඇති නම් ඒ කෙලෙස් සිත් සතන් කෙලෙසන හෙයින් තදඞ්ගාදි වසයෙන් පස් නීවරණයන් දුරු කිරීමෙන් සිත ත් නිර්මල කෙරෙති. එ සේ නිර්මල කොට ගත් සිත යම් කෙණකුන් විසින් මාර්ගෝත්පාදන-ඵලෝත්පාදනයට කාරණ වූ ස්මෘති ආදි වූ ධර්මයන් සත් දෙනා විෂයෙහි මනා-කොට භවන ලද්දේ වී නම් එ සේ හැවීම හේතු කොට චතුර්විධ වූ උපාදානයෙන් කිසිවකු ත් නො ගෙන භවෝත්පත්තිය හැරීමෙහිත් ඇලෙති. මෙ ලෙසින් ක්ෂය කරණ ලද ආශ්‍රවයන් ඇති මාර්ගඥාන ශොභාවෙන් ශොභාවත් වූ ඔහු රහත් වූ තැන් පටන් කෙලෙස් වට කර්මවට ගෙවා පී හෙයින් හා චුති චිත්ත නිරෝධයෙන් විපාක වෘත්තය ගෙවා පී හෙයින් නිර්වාණ ධාතු දෙකින් ම පිරිනිවියාහු නම් වෙති' වදළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් පුර වන්හ.

Non-Commercial Distribution

එ හෙයින් නුවණැත්තවුන් විසින් යම් සේ වෙයෙයෝ තමන් වසා පස්කඳු බැඳ ගෙන තුමූ සැඟ වී ගොදුරු සොයා එත් ද, එ මෙන් අකුසල් නො වදනා ලෙසට පින්කම් සෙවින්නෙන් වැසී ගෙන, තව ද යම් සේ බළලෙක් කොතැනට ගිය ත් මීයන් ම සොයා ද එ පරිද්දෙන් කොතැනට පැමිණ ත් සසරින් මිදෙන්ට උපදෙස් ම සොයමින්, තව ද, යම් සේ බළලා දුර නො ගොස ආසන්න යෙන් ම ගොදුරු සොයා ද - එ මෙන් මිනිස් ලොව ආයු දෙව් ලොව ආයු දුටු කලට ඉතා බොහෝ නො වන හෙයින් මරණාසන්න කොට සිතීමෙන් මරණ සී භාවනායෙහි ත් හැසිර කාය ජීවිත නිරපෙක්‍ෂ ව සුචරිත පුරා නිවන් සිද්ධ කටයුතු.

## 83. ජීවකයන් පැන විචාළ වත

මෙ තැන්හි රහතන්ගේ රහත් ගුණ හඟවනු නිසා ජීවකයන් පැන විචාළ වත ද, මහසුප් සවාමීන්ගේ වත ද, බෙලට්ඨිසීස තෙරුන් ගේ වත ද, අනුරුද්ධ තෙරුන් වහන්සේගේ වත ද, කසයින් මහ තෙරුන් වහන්සේගේ වත ද, කොසඹෑ නුවර වසන තිස්ස තෙරුන් වහන්සේගේ වත ද, සැරියුත් මහ තෙරුන් වහන්සේගේ වත ද, නැවත ඔබ පැන විසඳූ වත ද, කිහිරි වෙ නෙහි රෙවත මහ තෙරුන් වහන්සේගෙ වත ද නම ගොත් හෙයින් ප්‍රසිද්ධ නො වන එක්තරා ස්ත්‍රියකගේ වත ද කියමු.

කෙසේ ද යත්—

එක් සමයෙක දෙව් දත්තු මවු කුසින් බිහි නො ව ම පියාණන්ට සතුරු වූ හෙයින් අජාතසත්තු නම් වූ රජ්ජුරුවන් හා එක් ව ගෙන උන් ලවා උන්ගේ පියාණන් මරවා පියා තුමූ උනු ත් සහාය කොට ගෙන බුදුන් මරමි සිතා ගිජු කුළු පව්වට නැඟී ගල් පාදූල සක්ලන් කරණ බුදුන් හිසට ගලක් පෙරළා ලූ ය. බුදුන් ගේ ආනුභාවයෙන් දෙකන්නෙන් ගල් කුළු දෙකෙක අවුත් ලා උඩින් පෙරළෙ ගල මැද කොට ලා පිළිගත. ගලින් ගල වැද ගෙන නැඟි ගල් පොඩියෙක් ගොසින් බුදුන් පිටි පත්ලෙ වැද ගෙන අකුශල කර්මයෙහි ප්‍රවෘත්ති විපාක ය බුදුන්ට වුව ත් නො නවත්නා නියා ව හඟවමින් මහ මෙටින් ගැසුව ත් ඡවි ය කැඩෙන්ට නැති හෙයින් ලෙයක් එකතැන් කරවා පී ය. වෙදනා ව බලවත් වී ය. වහන්දෑ බුදුන් මද්දකුච්ඡි නම් තැනට ගෙන ගිය සේක. බුදුහු පයට පිළියමක් ලවනු කැමති ව බුදු කෙණකුන් වහන්සේට පිළියමක් කරන්ට කප් ලක්‍ෂයක් පනා ආ ජීවකයන් ගේ අඹ උයනට ගෙන යන්ට වදළ සේක. වහන්දෑ බුදුන් වඩා හැරගෙන ජීවක වනයට වැඩි සේක.

Non-Commercial Distribution

ජීවකයන්ගේ ප්‍රවෘත්ති කථාව ත් පිළියම් උන් උගත් ලෙසුත් කියතො ත් කරණ ග්‍රන්ථ ය බර වන හෙයින් හළම්හ. අර්ථි තැනක් කඳුව ත් බලා දත යුතු ය. ජීවකයෝ ද බුදුන් පිටී පත්ලේ ගල් පොඩියක් වැදගත් නියා ව අසා බුදුන් ළඟට ගොසින් එක තැන් වූ ලෙය සිඳෙනු නිසා එ තැන බෙහෙදක් තබා ලා වසා බැඳ ලා බුදුන්ට දන්වන්නෝ 'ස්වාමීනි, මම ඇතුළු නුවර එක් මිනිසකුට බෙහෙදක් කෙරෙමින් සිටියෙමි. එ හෙයින් උඹ ළඟට ත් ගොසින් පියා එමි. මේ බැඳ ලූ බෙහෙද ත් මා එන තෙක් නූනා තිබෙන්ට වුව මැනවැ'යි කියා ලා ගොසින් උන්ට කළමනා දෙයක් කොට ලා වාසල් වල යතුරු එළන්නාට පෙරාතු වන්ට එන තැනැත්තෝ එ වේලාවට නැඟී එත නුහුණුවූ ය. වාසල් වල ත් යතුරු ලවාලූව. ජීවකයෝ 'අනේ මා කළ දෑ නපුර. සෙසු වණ ඇත්තවුන්ට බඳනා බෙහෙත් සේ බුදුන් පය ත් ලෙය සුන මනා හෙයින් රූක්ෂ බෙහෙදක් තබා බැඳලීමි. ඒ බෙහෙද මුදන වේලා ය. මේ වේලේ උනා නුපුවො ත් රාත්‍රි ය මුළුල්ලෙහි ම බුදුන්ට ආයාස මහත් වී නම් මා පිළියම් උගත්තේ කිම් ද? අනේ මට වූ දෙයෙක් ය'යි සිතූ ය.

එ වේලෙහි බුදුහු ජීවකයන් නිදන් දන්නා සේ ම පරසිත් බල වත් ව දන්නා හෙයින් ජීවකයන් සිතූ සිතිවිල්ල දැනගෙන අනඳ මහ තෙරුන් බණවා ලා 'ආනන්දයෙනි, ජීවකයෝ සවස බෙහෙත් මුදන්ට එන තැනැත්තෝ වාසල්වල යතුරු එලා පී හෙයින් නැඟී ආ නුහුණුවූ ය. අවුදින් උනාපිය නුහුණ ත් උනන්ට හඬ ගෑවා සේ සිතූ ය. බෙහෙත් මුදා පියව'යි වදරා ලා තෙරුන් වහන්සේ ලවා උනවා පී සේක. එක තැන් වූ ලෙය ත් සිඳී වණය ත් නැති වි ය ජීවකයෝ ද අරුණු වේලාවට පෙරාතු ම බුදුන් ළඟට වහා අවුත් 'ස්වාමීනි, කුමක් ද, වනයෙහි දුහ ඇත් දූ'යි විචාළෝ ය.

බුදුහු 'ජීවකයෙනි, බෝ මැඩ දී ම සියලු දුහ සන්හුන. දූන් සන් හිඳෙන්නේ කිම් දූ'යි විචාරා ලා උන්ට රහත් ගුණ හඟවා බණ වදරණ සේක් සසර යම් ගමනෙක් ඇත් නම් ඒ ගමන ගොසින් නිම වා පී ශොක කාරණ වූ ජාති නැති හෙයින් කිසි ද ශොකයක් නැති, කාමභවාදී වූ සියලු භවයනු ත් අණ්ඩජ ජලාබුජාදී වූ සියලු ම යෝනියෙනු ත් දිව්‍ය ගති ආදී වූ සියලු ගතියෙනු ත් එකත්ත කාය එකත්තසඤ්ඤී ආදී වූ විඥාන ස්ථිතීනු ත් ඒ සත ම මත්තෙහි නෙවසඤ්ඤානාසඤ්ඤායතන හා අසඤ්ඤය ලා ලන්නා සත්වාවාස නවයෙනු ත් මිදී සිටි අභිජ්ඣාකායග්‍රන්ථාදි ග්‍රන්ථ රහිත වූ රහතුන්ට ශීතොෂ්ණාදි වශයෙන් උපදනා ශාරීරිකාබාධ ය

Non-Commercial Distribution

ඇත ත් චෛතසිකාබාධ ය කෙලෙසුන් නැති හෙයින් නැතැ'යි වදාළ සේක. දේශනා කෙළවර බොහෝ දෙන සෝවාන්-සෙදගැමි-අනැගැමි රහත් වූහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් ශාරීරිකාබාධ ය රහත් වුව ත් නො නවත්නා හෙයින් ඊට කරණ ව්‍යායාමම හැර චෛතසිකාබාධ වූ කෙලෙසුන් නසන්ට යත්න කට යුතු.

---

# 84. මහසුප් මහතෙරුන් වහන්සේගේ වත

එක් සමයෙක බුදුහු රජගහා නුවර වස් වැස ලා වස් අන්ත වූ දෙ පෝයක් විතරින් සැරිසරා වඩනා සේක් කැටි ව වඩනට සිතන වහන්දෑට සිවුරු රැඳීම් ආදී වූ කායයී සපයනු නිසා සැරිසරා වඩනා නියාව අනඳ මහ තෙරුන් වහන්සේ ලවා කියවන සේක. ඒ කවරද ත් තිබී ආ පනතෙක. වහන්දෑ සිවුරු රැඳීම් ආදියට පටන් ගත් කලට මහසුප් මහ තෙරුන් වහන්සේ ත් තමන් වහන්සේගේ ඝන බොල් වූ පවුල් සිවුරු සෝධන්ට පටන් ගත් සේක. වහන්දෑ ද ඔබ සිවුරු සෝධන්නා දැක 'මුන් වහන්සේ සිවුරු සෝධන්නේ හැයි ද? මෙ නුවර ඇතුළත කැටි ව පිටත මිනිස්සු අටළොස් කෙළක් වෙසෙති. උන් හැම දෙනා ගෙන් යම් කෙණෙක් මුන් වහන්සේට නො නැයෝ වූ උපාසකවරු ය. යම් කෙණෙක් උපාසක නො වෙත් නම් උං නෑ යෝ ය. එ සේ හෙයින් ඒ දෙපක්‍ෂය ම මුන් වහන්සේට සකසා උපස්ථාන කෙරෙති. මෙ තෙක් උපස්ථාන තිබිය දී මුන් වහන්සේ කො යි යන සේක් ද, සිවුරු සෝධන්නේ රට සැරි සරන නිසා ය. ඉදින් වඩනා සේක් වී නමුත් බුදුහු යම් හොයක් බඩ සිට රැඳවී ය යුතු තැන් රඳවා නො පමාව යි වදරා ලා රඳවන සේක් වී නම් ඒ නො පමා නම් හොය කරා ගොසින් ලා නවත්නා සේකැ'යි කී සේක.

බුදුහු ත් සැරිසරා වඩනා සේක් 'මෙ නුවර ත් අටලොස් කෙළක් මිනිස්සු වෙසෙති. උන් හැමගේ මඟුලේ අවමඟුලේ භික්ෂූන් එළඹිය මැනව. එ හෙයින් වෙහෙර සිස් කරන්ට ත් බැරි ය. කවුරුන් රඳවමෝ දෝ'යි සිතා වදරා 'මහසුප් මහ තෙරුන් වහන්සේගේ නෑයන් හා උපාසකවරු බොහෝ ය. උන්ට එ සේ හෙයින් සිවු පසයෙන් හානි නැත. උන් රඳවම්'යි සිතා මහසුප්නි, වෙහෙර සිස් කරන්ට බැරි ය. මිනිසුන්ගේ මඟුලේ අවමඟුලේ දී භික්ෂූනු ත් අනුමෙවෙනි ආදි ය නිසා ඇත මැනව. තොපි තොපගේ පිරිස ත් හා සමග රඳව'යි වදාළ සේක. 'යහපත, ස්වාමීනි' කියා ලා පිරිවර හා සමඟ රැඳුණු සේක. වහන්දෑ ද

ඔබ රැඳුණා දක 'ඇවැත්නි, දුටුවු ද? යමක් අපි කීමෝ නම් ඒ ම විය. සිවුරු සෝධන්ට වන්නේ ත් සෝධන සිවුරෙක් නො වන නියා වේ දැ'යි කී සේක.

බුදුහු වහන්දෑගේ කථාව අසා කුමක් ද තොප හැම කියන්නේ'ය යි විචාරා මහසූප් ස්වාමීන්ගේ පවත් නියාව කී කල්හි 'මහණෙනි, තෙපි මහසූප් මහ තෙරුන් කුලෙහි ගෙණෙහි ඇලී වෙසෙති කියවු ද? උන් තමන් රඳන්ට සිතා රැඳුණු ගමනෙක් නො වෙ යි. මාගේ බසින් රැඳුණු ගමන. හෙම්බා, මූ පෙර ඉම් තනතුරට පතන්නෝ ත් සඳ යම් සේ රස් පතුරුවන පමණක් මු ත් කුමක ත් නො ඇලේ ද. එ මෙන් සිවු පසෙහි ඇලුම් නැති ව කුලවලට එළඹෙන්ට සම්සී වෙව යි පැතූ ය. එ හෙයින් මූන්ගේ කුමක ත් ඇලුම් නැත. චන්‍ද්‍රපමා පටිපදව ත් ආයර්‍යවංශ පටිපදව කියන්නා වූ මම ද මූන් මුල් කොට කීමි' වදාළ සේක. වහන්දෑ මේ තනතුරට මූන් වහන්සේ පැතූ කල් විචාරා අසනු කැමැත්තෝ දැ'යි වදාළ කල්හි 'එ සේ ය, ස්වාමීනි' කී සේක.

බුදුහු 'මෙයට ලක්‍ෂයක් වන කප පියුමතුරා නම් බුදු කෙනෙක් ලොව උපන්හ' යනාදීන් පියුමතුරා නම් බුදුන් සමයෙහි පැතූ පැතීම ආදි කොට මහ තෙරුන් වහන්සේගේ දූව් චරිත ය මුළුල්ල ම වදාළ සේක. ඒ ථෙරගාථා පෙළ විස්තර හෙයින් ආයේ ය. මෙ සේ වදරා ලා 'මහණෙනි, ම පුත් මහසූප් මහ තෙරහු කුඩා විලකට බැස ගොදුරු කා ලා විල වෙව යි කුමක වෙව යි ඇල්මක් නැති ව යන රාජහංසයක්හු මෙන් කිසිවෙක ත් ඇලුම් ඇත්තෝ නො වෙති' වදරා තව ත් රහතන්ගේ ම ගුණ වදරා රහත් වීමට උත්සාහ කරවන බුදුහු 'සෙස්සවුන්ට සිහි ඇත ත් සිහි විපුල කොට ඇත්තේ රහතන්ට හෙයින් සිහිමත් වූ රහත්හු තමන් ලද්දා වූ ලොවුතුරා ගුණෙහි ත් ධ්‍යානාදී වූ ලොවී ගුණෙහි ත් ආවර්ජනාදීන් යෙදී වෙසෙති. කිසිවෙක ත් උන්ගේ ඇල්මෙක් නැත.

යම් සේ ගොදුරු බොහෝ විලකට බැස පක්‍ෂීහු ගොදුරු අවුළා කාලා යන කල 'අපගේ විල ය, අපගේ පැන ය, අප ගෙ පියුම ය, අපගේ ඉපුල ය, අපගේ තැන ය'යි කිසි ඇල් මෙක් නො කොට හැර පියා උඩ නැඟී අහස කෙළනාහු තමන් රුචි තැනකට යෙත් ද, එ පරිද්දෙන් රහත්හු ද යම් කිසි තැනෙක කිසිවෙක ත් නො ඇලී යන කල ත් මාගෙ වෙහෙර ය, මාගේ පිරිවෙණ ය, අපගේ උපාසක වරු ය'යි සියල්ලෙහි ම

Non-Commercial Distribution

ඇලුම් හැර යෙති'' වදාළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් සත් පුරුෂයන් විසින් සියල්ලක් ම ඇල්ම නම් තෘෂ්ණාව තමා ධර්‍ම හෙයින් එකතු බව මුත් අවස්ථාව හෙයින් එක් සිය අට සැටියක් ඇති හෙයින් ක්‍රමක්‍රමයෙන් තුනී කොට ගෙන ගොසින් රහත් මගින් තුනී අවස්ථාවක් නසන ලෙසට උත්සාහ කට යුතු.

# 85. බෙල්ලට්ඨිසීස තෙරුන් වහන්සේ ගේ වස්තුව

ඒ තෙරුන් වහන්සේ ඇත්ගම එක් වීථියෙක සිඟා ගෙන ඒ වළඳා ලා නැවත අනික් වීථියක සිඟා ලත් රළු බත් වෙහෙරට ගෙන ගොස් පිරිමසා තබා ලා දවස් පතා සිඟීම් නම් දුකැ'යි කීප දවසක් ධ්‍යාන සුවයෙන් දවස් යවා ලා ආහාරානුභව ය ධ්‍රුව මනා කලට පිළිගත් දවස් පෙරවරු පමණකුත් ඉක්මා පූ හෙයින් සන්නිධි වූවා සිබ පද නො පැන වූ හෙයින් වළඳන සේක. වහන්දෑ දැන බුදුන්ට එ පවත් දැන් වූ සේක. බුදුහු එ බන්ද හරනා ලෙසට සිඛ පද පනවා ලා තෙරුන් වහන්සේ ආදිකර්‍මික හෙයින් ඔබ නිරාපත්ති කෙරෙමින් විනය සන්නිධි හරවා ලා බණ වදරණ බුදුහු ''මහණෙනි, යම් කෙණකුන්ට මත්තෙහි භවොත්පත්තියෙක් නැත් නම් විපාක දනයෙහි සමර්‍ථ වූ කර්‍ම-සන්නිචය හෙවත් පුරාකෘත කුශලාකුශල කර්‍මයන් රහත් මඟින් නසා පී හෙයින් නැත් ද–

නැවත වෙහෙර වසන භික්ෂූන්ට එක් උක් සකුරු කැටියක් හා උක් සකුරු පිඩි සතරක් කළ කල ඉන් භාගයක් විතර ගිතෙල් හා සාල් නැළියක් විතර බෙහෙත් නිසා තබන්නවුන්ට ප්‍රත්‍යය සන්නිචය නැති හෙයින් ඊට වඩා නො තිබීමෙන් ප්‍රත්‍යය සන්-නිචය ත් නැත් ද, යම් කෙණෙක් අනුභව කරණ දෙය 'මේ කැඳ ය, මේ අවුළුපත ය, මේ බත ය, මේ මාළු ය'යි දැන පිළිකුල් මෙනෙහි කොට දිවි රැක සිල් රැකෙන හෙයින් දිවි රක්නා සඳහා රස තෘෂ්ණාව හැර අනුභව කෙරෙද්ද, නැවත යම් රහත් කෙණ-කුන්ට රාගාදී කෙලෙසුන් නැති හෙයින් හා ඉන් මිදෙනු හෙයින් ශූන්‍යතා විමොක්‍ෂ නම් වූ ද රාගාදීන් නිමිත්ත රහිත හෙයින් හා ඉන් මිදුණු හෙයින් හා අනිමිත්තවිමොක්‍ෂ නම් වූ ද රාගාදී ප්‍රණිධි නැති හෙයින් හා ඉන් මිදුණු හෙයින් අප්‍රණිහිත විමොක්‍ෂ නම් වූ ත් නිවන් ඵල සමවතට සමවැදීම් වශයෙන් අරමුණු කරන්නවුන්ට

Non-Commercial Distribution

ගෝචර ද, ඒ ඔවුන්ගේ භව යොනි ගති ආදියෙහි ගමනක් නැති හෙයින් අහස යන පක්ෂීන්ගේ ගමන ඇත ත් පියවර ඔබා ගිය තැනක් නො පෙනෙන්නා සේ අසෝ අත ගියහ යි ගමනක් ම අනුපධිශෙෂ නිර්වාණ ධාතුවේ පටන් නැති හෙයින් දත නො හැක්කැ''යි වදළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටුහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් වස්තුසන්නිචය නැති ව කුශල සන්නිචය කොට ගෙන භව සැපත් වළඳා කෙළවර රහත් වීමෙන් කුසල සන්නිචය ත් හළ යුතු.

---

# 86. කාෂ්ඨවාහන රජ්ජුරුවන් ගේ කථාව

සව් කෙලෙසුන් නසා රහත් වූ තැනගේ උතුම් තරම් භගවන්ට කාෂ්ඨවාහන රජ්ජුරුවන් ගේ කථාව මෙ තැන්හි කියමු.

කෙ සේ ද යත්—

යට ගිය දවස බරණැස් නුවර වසන එක් දඬු වඩුවාණ කෙණෙක් වඩු ශිල්පයෙහි ඉතා දක්ෂය හ. වඩුකමින් උන් හා සරි කෙණෙක් එ වක දඹ දිව නැත. උන්ගේ අතවැසි වඩුවෝ සොළොස් දෙනෙක් ඇත. ඉන් එකී එකී කෙණෙකුන්ගේ ම අතවැස්සෝ දහස දහස ඇත. මෙ සේ ආචාරීන් ඇතුළු ව වඩුවෝ සොළොස් දහස් සතළොස් දෙනෙක. හැම දෙන ම බරණැස් නුවර හිඳ වඩු කමෙන් රැකෙන්නාහු වලට පලා ගොසින් දඬු පත් කපා ගෙන ඒ වල දී ම මාළිගා ආදියට නිසි කොට දඬු පත් සැස නිමවා ගෙන ඒ දඬු පත් පසුරු බැඳ ලා ඊ ලා ගෙන ගඟින් බරණැසට ගෙනවු ත් රජ්ජුරුවෝ කැමැත්තෝ නම් උන්ගේ අදහස් ලෙසට මාළිගා කොට දෙති. ඉදින් උන්ට ප්‍රයෝජන නැත් නම් විකොට පියා ඉන් ලත් දෙයකින් අඹු දරුවනු ත් රැක ගෙන තුමූ ත් රැකෙති.

එක් දවසක් වඩු ආචාරීහු 'මෙ වඩු කම නම ශක්ති ඇති අවස්ථාවට මුත් මාලු ව ගිය කලට පිළිවන් නො වෙයි. මාලු වුව ත් ආයු පමණින් රැකෙන ලෙසට වුව මනා වේ ද'යි අතවැස්සන් බණවා ලා 'දරුවෙනි, දිඹුල් දඬු ආදී වූ හර නැති දඬු ගෙනෙව'යි විධාන කළහ. උයි ත් ගොසින් සුලභ ව ලැබෙන හෙයින් ගෙනාවු ය. වඩු ආචාරීහු ඉන් ගුරුළු යන්ත්‍රයක් ඉදි කොට ලා ඒ ඇතුළට වැද ලා යන්ත්‍ර ය මිරිකා ලූ ය. මිරිකා ලන්නා ම ගුරුළකු පරිද්දෙන් අහසට නැඟී ලා සියැරි ඇවිද ලා අතවැස්සන් ඉදිරියට බට.

Non-Commercial Distribution

වඩු ආචාරීහු මෙ සේ වූ යන්ත්‍ර ය ඉදි කොට ගත්තෝ 'අප ත් නැතක් දෙනා හෙයින් දඹ දිව මුළුල්ල වුව ත් හැර ගන්ට පිළිවන. තෙපි ත් තෙල ලෙස යන්ත්‍ර ඉදි කරව. හැම දවස් ම වඩු කමින් රැකෙන්ට බැරි ය. රටවල් හැර ගෙන තුබූ කැබැල්ලේ රාජ්‍ය ය කරම්හ'යි කිවු ය. උයි ත් යන්ත්‍ර ඉදි කොට ලා ආචාරීන්ට කීහ. ආචාරීහූ 'අහසින් ගොසින් කවර නුවරක් හැර ගනුමෝ දෝ' යි විචාළෝ ය. ආදියෙහි පටන් පුරුදු ව ගිය හෙයින් අත හැර යා නොහී 'මේ බරණැස් නුවර ම හැර ගනුම්හ' යි කිවූ ය. 'ඒ නො කැමැත්තේ ය. අප කවර තරමකට පැමිණිය ත් වඩු යුව රජ්ජුරුවෝ ය, වඩු සෙනෙවිරද්දු ය, යනාදීන් මෙ තැන රඳා හුන්නො ත් වඩු කුල ය හැරී නො යෙයි. දඹ දිව මහත. අනික් තැනකට යම්හ'යි කිවූ ය.

එ සේ කියා ලා අඹු දරුවනු ත් හැර ගෙන ගුරුළු යන්ත්‍රවලට නැඟී ලා ආයුධ සන්නද්ධ ව අහසට නැඟී ලා හිමවු පියස බලා ගොසින් හිමාලය ගාවා එක් නුවරකට බස්නාහු එ නුවර රජ්ජුරු-වන්ගේ මාළිගාවට බැස ලා එ නුවර ත් රටත් හැර ගෙන ආචාරීන් ඔටුනු පළඳවා ලා රජ කළහ. උඃ තුමූ කාෂ්ඨවාහන රජ්ජුරුවෝ ය යි මෙ නමින් ප්‍රසිද්ධ වූහ. එ නුවර ත් කාෂ්ඨවාහන නුවර ය යි මෙ නමින් ප්‍රසිද්ධ වී ය. රට ත් ඒ නම ම වී ය. කාෂ්ඨ වාහන රජ්ජුරුවෝ රාජ්‍යලොභයෙන් අනුන් මරා අනුන් සන්තක රට ගත් බව මුත් කෘතපුණ්‍ය හෙයින් ධර්මිෂ්ඨයහ. යුවරජ සෙනෙවිරත් ආදීහු ත් එ සේ ම මැදහත්හ. උන් මැදහත් හෙයින් උන්ගේ රට ත් සියල්ලෙන් ම සැදී සිටටි. නුවර වැස්සෝ ත් රට වැස්සෝ ත් රජ්ජුරුවන් කෙරෙහි ත් රාජ අමාත්‍යයන් කෙරෙහි ත් පැහැද හිඳිති.

ඉක් බිත්තෙන් එක් දවසක් මැඳුම් පියස හිඳිනා වෙළෙන්දෝ රන් රිදී ආදී වූ බඩු හැර ගෙන හිමාලයාසන්න වූ කාෂ්ඨවාහන නුවරට ගොසින් පඬුරු දී ලා කාෂ්ඨවාහන රජ්ජුරුවන් දුටුවූ ය. රජ්ජුරුවෝ 'කොයි සිට අවු ද' යනාදීන් සියලු පවත් විචාළෝ ය. බරණැස සිට ය'යි කී කල්හි 'තොප ගේ බරණැස් රජ්ජුරුවන් හා අප හිත කරවා ලව'යි කිවුය. උයි ත් යහපතැ' යි ගිවිස්සාහ. රජ්ජුරුවෝ ත් වෙළඳුන්ට ප්‍රසාද දෙවා ලා උන් හැම යන කල ත් සාද සාමීචි කොට ලා මඳක් පසු ගමනු ත් කොට ලා උන් යවූහ. උයි ත් බරණැසට ගොසින් කාෂ්ඨවාහන රජ්ජුරුවන් කී කළ ලෙස බරණැස් රජ්ජුරුවන්ට කිවු ය. ඒ අසා බරණැස් රජ්ජුරුවෝ කාෂ්ඨවාහන රට සිට ආ වෙළඳ කෙණෙක් ඇත් නම් උන්ට නුවර සුංගම හරනා ලෙසට බෙර ලවා සුංගම් හරවා ලා ඒ රජ්ජුරුවනු ත්

නො දැක ම මිත්‍ර වූ හෙයින් තුමූ ත් නො දැක ම මිත්‍ර වූහ. කාෂ්ඨ වාහන රජ්ජුරුවෝ ත් තමන්ගේ නුවරට බරණැසින් ගියවුන්ට තමන්ගේ නුවර සුංගම් හරනා ලෙසට ත් සාද සාමීචි කරන්ට ත් බෙර ලවා විධාන කළහ.

ඉක් බිත්තෙන් බරණැස් රජ්ජුරුවෝ කාෂ්ඨවාහන රජ්ජුරුවන්ට තමන් ගේ රට දක්ක තරම් යහපත් දෙයක් ඇති වී නම් අපට බලන්ට එවන්ට වුව මැනව. කන් නමැති රන් තැටිවල චිත් කොට සිත් නමැති තුඩින් බී පියන්ට නිසි යහපත් හස්නෙක් ඇත් නම් එයි ත් කියා එවුව මැනැවැ' යි සන්දෙශපත්‍ර යවූහ. කාෂ්ඨවාහන රජ්ජුරුවෝ ඒ සන්දෙශ පත්‍ර ය බලා දැක දක්නට නිස්සක් අසන්ට නිස්සක් යවා ලන්ට නැති හෙයින් තුමූ ත් පෙරළා එලෙස ම සන්දෙශ පත්‍රයක් යවූහ. මෙ සේ කථා කොට ගෙන හුන් කලට කලෙක දී කාෂ්ඨවාහන රජ්ජුරුවන්ට ඉතා මාහැඟි වූ පලස් සම්භ වි ය.

ළ හිරු මඩල සේ ඉතා ශොභාවත. කාෂ්ඨවාහන රජ්ජුරුවෝ ඒ පලස් දැක 'මාගේ යාළු වූ බරණැස් රජ්ජුරුවන්ට ත් මින් පලස් යවමී'යි මාහැඟි වූ වා අයොග්‍ය කොට යවන්ට මැළි ව දළ කඩ ලියන්නවුන් ලවා දළ කඩ කරඬු අටක් ලියවා ලා ඒ කරඬු අටෙහි පලස් අට ලවා ලා කරඬු පිධාන ගැළවී නො යන ලෙසට හී වඩුවන් ලවා කරඬු මුළුල්ල වසා බඳවා ලා ඒ කරඬු අට ම එක් කරඬුවෙක ලා ලා කංචුකින් වස්වා බඳවා ලා හස් මුන්දකින් ඔබ්බවා ලා 'බරණැස් රජ්ජුරුවන්ට දෙව'යි ඇමැත්තන්ට සම්මත කොට යන ඇමැත්තන් අත ම 'තෙල අපගෙන් යවා ලූ පඬුරු නුවර මැද දී අස් කඩවා පියා බැලුව මැනැව'යි බරණැස් රජ්ජුරුවන්ට කියා යවූහ. බරණැස් රජ්ජුරුවෝ ද නුවර මැද දී අස් කඩවා පියා වසා ලූ කඩ වස්නෙන් මෑත් කොට ගෙන මහ කරඬුව හැර ලා කඩ වටවල් අට දැක 'බොහෝ දෙනා රැස් කරවා ලා නුවර මැඳ දී හස් කඩන්ට කියා එවා ලූ නියාව කෙ සේ දෝ? අපගේ යාළුවෝ කුඩා කොල්ලන් ලා ලී ලන්ට එවා ලූ ලා ලී වට මෙන් මෙ තෙක් තැන් සිට මෙ තෙක් කලකින් මාගේ රට ලාකඩ අරුම ය'යි සිතා සෙසු කඩවට උවූ ය' යි මුසුප්පු ව පියා එක් ලාකඩයක් උරණ නියාව හඟවන්ට කරන්නා සේ හුන් හස්නෙහි ගසාලූ ය.

එ වෙලෙහි ලා වටත කැඩී පියා කරඬුව හැරී ගොසින් දෙ පියන වෙන් විය. ඇතුළු කරඬුවෙහි තුබූ පලස දැක අනික් ලා වට සත ත් බිඳුවා කරඬු හැරඇතුළේ තුබූ පලස් දුටුවූ ය. එකි එකී

Non-Commercial Distribution

පලසෙක් ම දිගින් සොළොස් රියන. පළලින් අටරියන. පලස් මැ ත් කොට ලා විදලන්නා ම හිරු අටක් එකවට නැගී කලක් මෙන් නුවර මුළුල්ල ම බබළා ගියේ ය. රජ්ජුරුවෝ පිළී පලස් ආදියෙහි අග ය කරන්නවුන් ගෙන්වා ගෙන පලස් අට ම අගය කැරවූහ. අටෙහි ම අගයෙක් නැත. බරණැස් රජ්ජුරුවෝ උන්ට ත් මා පඩුරක් යැවිය යුතු ය. පසු ව යවාලන පඩුරු නම් පෙරාතු එවූ පඩුරට වැඩී සිටිය මැනව මාගේ යාළුවන්ට කුමක් යවම් දෝ හෝ'යි සිතූහ. එ කල ද වැළි ත් කසුප් බුදුහු ලෙව්හි ඉපැද බරණැස වැඩ වසන සේක. බරණැස් රජ්ජුරුවෝ ද මේ ලෙව්හි ලා රුවනෙක් වී නම් තුනුරුවන්ට වඩා නැත. තුනුරුවන් ලොව පහළ වූ නියා ව මාගේ යාළු වූ කාෂ්ඨවාහන රජ්ජුරුවන්ට කියා යවම්'යි කියා ලා:-

**බුද්ධො ලොකෙ සමුප්පන්නො-හිතාය සබ්බපාණිනං,**
**ධම්මො ලොකෙ සමුප්පන්නො සුඛාය සබ්බපාණි නං;**
**සඞ්ඝො ලොකෙ සමුප්පන්නො-පුඤ්ඤක්ඛෙත්තං**
**අනුත්තරං.**

යන මේ ගාථා පෙළ ද මනා ව පිළිපදනා තැන් මහණ වූ තැන් පටන් රහත් වන තෙක් පිළිපදනා ප්‍රතිපත්ති ක්‍රමය ත් රන් පත දැහිඟුලෙන් ලියවා ලා ඒ රන් පත රුවන් කරඬුවෙක ලවා ලා ඒ රුවන් කරඬුව ඉඳු නිල් මිණිමුවා කරඬුවෙක ලා ලා ඒ කරඬුව මැ සිරිගල් මැණික් කරඬුවෙක ලා ලා ඒ කරඬුව රත් මැණික් කරඬුවෙක ලා ලා ඒ කරඬුව රන් කරඬුවෙක ලා ලා ඒ කරඬුව රිදී කරඬුවෙක ලා ලා මුළු කරඬුව වසා සිටි සඳුන් කරඬුව පෙට්ටගමෙක ලා ලා ඒ පෙට්ටගම කඩෙකින් වසා බඳවා ලා හස් ඔබ්බවා ලා ඇතකු යහපත් කොට සරහා ලා උඹ පිට හස්නක් පනවා ලා ඒ හස්නෙහි පෙට්ටගම තබ්බවා ලා හෙළ කුඩයක් නංවා නො එක් පෙරහර ඇති ව තමන් සන්තක රට බද මානයේ මහ ක් සරහවා ලා එ දැතුරෙහි තුමූ ම වඩා ගෙන ගියහ. තමන්ගේ රට හිම සිට අතුරු රටවල රජ දරුවන්ට ත් පෙල ලෙස ම දූජා කරවමින් ඔබ කාෂ්ඨාවාහන රටට යවන්ට කියා යවූහ.

ඒ අසා රජ දරුවෝ ත් පෙර මහට ම අවුත් කාෂ්ඨවාහන රාජ්‍ය සීමාව දක්වා තම තමන්ගේ රටවලින් මහා පෙරහරින් වඩා ගෙන ගියහ. කාෂ්ඨවාහන රජ්ජුරුවෝ ත් පෙර මහට අවුත් ඒ ලෙසින් ම පූජා කෙරෙමින් තමන්ගේ නුවරට ගෙන ගොසින් ඇමැත්තන් සොළොස් දෙනා ත් නුවර වැස්සනු ත් රැස්කරවා ලා නුවර මැද දී වසා බැඳ ලූ කඩවසන උනවා පියා පෙට්ටගම තුබූ

Non-Commercial Distribution

කරඩු දැක ආදි සඳුන් කරඬුව හැර ලා ඒ ඇතුළේ තුබූ දළ කර ඬුව ත් හැර ඒ ඇතුළේ තුබූ රිදී කරඬුව ත් හැර ලා ඒ ඇතුළේ තුබූ රන් කරඬුව ත් හැර ලා, ඒ ඇතුළේ තුබූ රත්මිණි මුවා කර ඬුව ත් හැර ඒ ඇතුළේ තුබූ ඉඳුනිල් මිණිමුවා කරඬුව ත් හැර ඒ ඇතුළේ තුබූ මැසිරි ගල්මිණිමුවා කරඬුව ත් හැර ඒ ඇතුළේ තුබූ සත් රුවන් මුවා කරඬුව ත් හැර ඒ ඇතුළේ තුබූ රන් පත සංදේශ ය දැක 'අනේ මාගේ යාළුණුවෝ බිම ලා පුවොත් දිරා පස්ව යන, ගින්නේ ලා පුවොත් ද නැති ව යන, සොර සතුරු ආදීන් ගෙන් භය උපදවන පලස් අටක් යවුව ට කප් අසඞ්ඛ්‍යයකිනු ත් ලද නො හැකි පඬුරක් එවූ ය'යි බලවත් ව සතුටු ව එ පවත් ඇසූ පමණකින් ප්‍රයෝජන කිම ද? ගොසින් බුදුනු ත් දැක බණ ත් ඇසීම් නම් යහපතැ'යි සිතා ලා ඇමති සොළොස් දෙන බණවා ලා තුනුරුවන් ලොව පහළ වූව කළමනා කිම්දැ'යි කිවු ය. මුඹ වහන්සේ මුබ ම රදා හුන මැනව. අපි ගොසින් තව ත් දනුම්'යි ඇමැත්තෝ සොළොස් දෙන පිරිවර සොළොස් දහස ත් හැරගෙන රජ්පුරුවන් වැඳලා 'ඉදින් බුදුහු ලොව උපන් සේක් වී නම් ඔබ ගෙන් බණ ත් ඇසුමෝ නම්—

**බුද්ධො සබ්‍රහ්මකෙ ලොකෙ— කරවීකස්සරො වත,**
**වීණාය හත්‍ථිකන්තාය—තන්තියා දෙව කුඤ්ජරා.**

යනු හෙයින් හස්තිකාන්ත වීණා නාදයෙහි ඇලුණු ඇතුන් ඔබ්බට යා නො හෙන්නා සේ අපි ත් ඔබ ම රඳන්නා මුත් මුඹ නො එම්හ. නුපන් සේක් වී නම් එම්හ'යි කියාලා නික්මුණාහ.

රජ්පුරුවන්ගේ බෑනණුවෝ ත් රජ්පුරුවන් වැඳ ලා 'හැම දෙනා යන කල මම ත් යෙමි'යි කීහ. යහපත, තොපි පලා ගොසින් බුදුන් උපන් නියා ව තත්‍වයෙන් දැන ලා සෙස්සවුන් සේ නො ව තොපි අවුත් මට කියාලව'යි කීහ. උයි ත් යහපතැ'යි ගිවිස්සාහ. ඔහු හැම දෙන ම කල් යන හෙයින් දෙ රැයක් එක තැනක නො ලැග බරණැසට ගියහ. උන් හැම නො යන තෙක් ම සර්වඥ නැමැති සූර්‍ය්‍යයා ත් අනුපදිශෙෂ නිර්වාණ ධාතු නැමැති අව රන් පත් වීමෙන් අනන්ත අප්‍රමාණ සක්වළවල් එක පැහැර රෑ වි ය. ගියා වූ ඔහු හැම ත් බුදුහු කොයි දැ'යි විහාර ය මුළුල්ලෙහි සොයා ඇවිදිනාහු බුදුන් හඳුනන වහන්දෑ දැක විචාළෝ ය. ඒ වහන්දෑ බුදුන් පිරිනිවි නියා ව කී සේක.

උහු හැම දෙන ත් මෙ තෙක් තැන් අවුත් ඇසට රොග නො වන ලෙසට දැක පිය නුහුණුම්හ. කෙළෙස් විඩා සන්හිඳුවා දහම් පැනු ත් නො ලදුම්හ'යි හඬන්නාහු 'සවාමිදරුවනි, බුදුන් පිරිනිවිය ත් ඔබ වදාළ දෙයෙක් ඇත් නම් එයි ත් එකවිට ම නැති වන්ට නැති බැවින් ඒ ඇත්තේ වේ ද, ඒ කිම දැ'යි

විචාළෝ ය. 'එ සේ ය, උපාසකවරිනි, තිසරණ පිහිටිය යුතු ය. පන් සිල් සමාදන් ව ඒ රක්ක යුතු ය. පොහොය අටසිල් රක්ක යුතු ය. දන් දිය යුතු ය. සෙසු සෙසු ත් පින් කට යුතු ය. ඇහස් ලැබේ නම් ගිහි කම් කටොළු හැර මහණ විය යුතු ය. යනාදි ය වදළ අවවාද ය යි කී සේක.

ඔහු ඒ අසා කාෂ්ඨවාහන රජ්ජුරුවන්ට බැන වූ ඇමැත්තණු වන් සිටිය දී සෙසු ඇමැත්තෝ ත් පිරිවර ත් මහණ වූහ. රජ්ජුරුවන්ගේ බැන ඇමැත්තණුවෝ බුදුන්ගේ පාරිභොගික ධාතු වූ ඩබරාව ත් හැර ගෙන තෙවළාධර තෙර කෙණකුන්-වහන්සේ ත් කැඳවා ගෙන කාෂ්ඨවාහන නුවරට ගොසින් බුදුන් උපන් නියාව ත් විසි දහසක් හවුරුදු ජීවත් ව වැඩ හිඳ ලා පිරිනිවි නියාව ත් රජ්ජුරුවන්ට කියා ලා වදළ අවවාද ත් තමන් අසා ගත් ලෙස ම කියා ලූ ය. රජ්ජුරුවෝ තෙරුන් වහන්සේ ළහට ගොසින් බණ අසා පැහැද විහාරයකු ත් කරවා ලා ධාතු වඩා දගබකු ත් බඳවා ලා බොධි කෙණකුන් වහන්සේ ත් පිහිටුවා ලා දිවි හිමියෙන් තිසරණ ත් පන්සිලු ත් පිහිටා මස සතර පොහොය නො වරදවා පේ වෙමින් වැඩී තෙරුන් වහන්සේ මුල් ව ඇති වූ වහන්දැට දන් දෙන්නාහු, ආයු පමණක් සිට කළ කාමාවචර පින් හෙයින් කාමාවචර දෙව් ලොව උපන්හ. මහණ වූ ඇමැත්තන් හා පිරිවර ත් ගුණ විශෙෂයක් ලද නුහුණු හෙයින් කාමාවචර දෙව් ලොවදීත් නායක ව සිටි තැනැත්තවුන් පිරිවරා උපන්හ. ඉපැද කසුප් බුදුන් පිරිනිවි තැන් පටන් අපගේ බුදුන් නූපදනා තෙක් දෙව් ලොව ම රඳා අපගේ බුදුන් උපදනාට පෙරාතු දෙව් ලොවින් සැව නායක තැනැත්තෝ පසේනදී කොසොල් රජ්ජුරුවන්ගේ පිය වූ මහ කොසොල් රජ්ජුරුවන්ගේ පුරෝහිත බමුණන්ට පුත් වූහ.

උපන් බමුණු කුමරුන්ට බාවාරිය නම තැබූහ. දෙ තිස් මහා පුරුෂ ලක්‍ෂණයෙන් ලක්‍ෂණ තුනකු ත් ඇත. වේද තුනකු ත් ඉගෙන නිමවා පියා පියාණන් මළ පසු පුරෝහිත තනතුර ලත්හ. සොළොස් දහස් සොළොස් දෙනකු පමණ වූ සෙස්සෝ ත් එ ම සැවැත් නුවර බමුණු කුලවල උපන්හ. වඩු ව උපන් සමයෙහි ත් ප්‍රධාන වූ වඩු ආචාරීන් කෙරෙහි වඩු කම් උගත් බමුණෝ සොළොස් දෙන බාවාරී නම් වූ පුරෝහිත බමුණන් කෙරෙහි ම ශිල්ප උගත්හ. අනික් සොළොස් දහස ද ඒ සොළොස් දෙනා කෙරෙහි ශිල්ප උගත්හ. මෙ සේ උගෙ හැම දෙන ම වඩු අවධියේ ත් දේවතා අවධියේ ත් එක තැන් වූවා සේ ම බමුණු අවධියේ ත් එක තැන් වූහ.

Non-Commercial Distribution

මහ කොසොල් රජ්ජුරුවෝ ත් මළහ. පසේනදි කුමාරයන් ඔටුනු පළඳවා රජ කළහ. බාවාරි සරි වයස් හෙයින් උන්ට ත් පුරොහිත වූහ. පසේනදි කොසොල් රජ්ජුරුවෝ පිය රජ්ජුරුවන් බාවාරි පුරොහිතයන්ට දුන් පෙරහර ත් දුන්හ. තමන් ගෙනු ත් වඩා සංග්‍රහ කළහ. කළ සංග්‍රහ නො සිස් ලෙසට බාවාරීන් අතුරෙහි ම ශිල්ප ඉගෙන රාජ ගුරු කළහ.

බාවාරි ද නුවණ මුහුකුරු ත් මහණ වීමෙහි රුචි ඇති ව 'රජ්ජුරුවන් වහන්ස, මහණ වෙමි'යි කීහ. රජ්ජුරුවෝ ඒ අසා 'ආචාරීන් වහන්ස, 'මහණ වෙමි'යි යන්නක් නො කිය මැනව. මුඹ මා ළඟ රඳා හුන්නො ත් අපගේ පිය රජ්ජුරුවන වහන්සේ මළ ත් නො මළා හා සරි ය. සම්පතෙහි අඩු ඇත් නම් සම්පත් පුරා දෙමි. මහණ නුව මැනැවැ''යි කිවු ය. 'ඇති සම්පතෙහි ඇලුම් නැත්තෙම් වඩා සම්පත් කැමැති වෙම් ද? ඒ නො කැමැත්තෙමි. මහණ වෙමි'යි කීහ. රජ්ජුරුවෝ නවතා ගත නො හී එ සේ වී නම් නො නැවත මහණ වන පසු උදසන ත් සවස ත් ගොසින් දක්නා ලෙසට මාගේ උයන්හි දී මහණ වුව මැනැව'යි කීහ. ආචාරීහු ද සොළොස් දහස් සොළොස් දෙනා හා සමහ තව බුදුන් නුපත් හෙයින් හෝ උපන ත් උපන් නියාව නො දැන තවුස් වෙසින් දළ මඬුලු වල්කලා ආදී ය ඇති ව මහණ ව රාජොද්‍යානයෙහි විසූහ. රජ්ජුරුවෝ ත් සිවු පසයෙන් උපස්ථාන කෙරෙති. උදසන සවස දක්නට ත් යෙති.

එක් දවසක් අතවැසි තවුසෝ නායක තවුසාණන්ට 'නුවර ආසන්න ව විසීම මහා නපුර. සිත එකහ වන්ට නැත. තපසට නිය එණ කල ගම් බඩවලු ත් වුව මනා ද? නුවරට මඳක් දුරු ව තිබෙන තැනකට යමහ'යි කිවු ය. නායක තවුසාණෝ ද යහපතැ යි ගිවිස එ පවත රජ්ජුරුවන්ට කිවු ය. රජ්ජුරුවෝ තුන් වර දක්වා ත් දුරු බා නො යන්ට කියා නවතා ගත නො හී ඇමැත්තන් දෙන්නකුට මසු දෙ ලක්‍ෂයක් දෙවා ලා 'මේ තවුසන් වහන්සේ යම් තැනක වසන සේක් වී නම් එ තැන තෙල දෙ ලක්‍ෂය වියදම් කොට විහාර කරවා දෙව'යි කීහ නායක තවුසාණෝ ද අතවැසි තවුසන් හැර ගෙන ඇමැත්තන් දෙන්න කැටි ව උතුරු දනවුවෙන් දකුණු දණවුව බලා නික්මුණාහ. එ සේ නික්ම හිම වතින් ආ ගොධාවරී නම් ගඟ යම් තැනක දී දෙකක් ව බෙදී ගොසින් අතුර දෙළොස් ගවුවක් විතර දිග පළල ඇති දිවයින් ගොඩක් කොට ලා පාත දී එක් වේ ද, යම් තැනෙක සරභඞ්ගාදි

Non-Commercial Distribution

මහා පුරුෂයෝ තපස් කොට විසූ ද-ඒ ගිවුළු වනයට පැමිණ 'මෙ තැන සරුප, සිත ඇලෙ යි' කියා කැටි ව ගිය ඇමැත්තන්ට කී ය. උයි ත් ඒ බිම අනුන් සන්තක හෙයින් උන්ට දෙ ලක්‍ෂ ය දී ලා ඒ බිම ත් හැර ගෙන ඒ බිම මද හෙයින් තවත් අට ගවුවක් විතර හා එක් කොට විසි ගවුවක් විතර හැර ගෙන පන්සල් කරවා ලා සැවැත් නුවරින් තවත් වස්තු ගෙන්වා ගෙන කැරූ වූ පන්සල් වලට ගමකු ත් ගෙන ලා ලා දන් විධාන කොට ලා ගියහ. සොළොස් දහස් සතළොස් දෙනකු පමණ වූ ඒ තවුසෝ ද ඒ ගම නිසා ත් වන මුල්-පකා-පක්කෙනු ත් රැකී ඒ පන්සල් වල වෙසෙති.

ඒ තවුසන් එ තැන රඳා හුන් අට හවුරුද්දක් විතර ගියකලට බුදුහු ලෙව්හි පහළ වූ සේක. බුදුන් පහළ වූ නියා ව අසා බාවාරිය තවුසන් රඳවා ලා උන්ට ප්‍රධාන ශිෂ්‍ය වූ දූළුල්ලන් සොළොස් දෙනා නික්මුණු කලට සූ විසි ගවුවක් විතරේ පැතිර සිටිනා පිරිස් වූහ. දෙව්රම වසන බුදුහු ද 'බාවාරියන්ගේ අතවැසි දූළුල්ලෝ බොහෝ දෙනා පිරිවරා මා කරා එති. තව උන්ගේ ඉඳුරෝ ත් මූකුරා නොගියෝ ය. මෙ තැන ත් සැප ස්ථාන නො වෙ යි. මධ්‍ය මණ්ඩලයෙහි පාෂාණක චෛත්‍යස්ථාන ය යහපත. එ තැන දී බණ කී කල බොහෝ දෙන නිවන් දකිති. මෙ තැනින් නික්මුණු කලම මුන් හැම නුවරින් නුවර වැද මා විචාරා ගෙන එන කලට බොහෝ දෙනා ත් උන් හා එක් ව එති. නුවණ ත් එතකට මුහුකුර යි' සිනා වදරා බොහෝ වහන්සේ පිරිවරා සැවැත් නුවරින් රජගහා නුවර බලා නික්මුණු සේක. බාවාරිය තවුසන්ගේ අතවැසි දූළුල්ලෝ ද සැවැත් නුවරට අවුත් බුදුහු කො යි දැ'යි සොයමින් ගඳ කිළිය කරා ගොසින් බුදුන් ඔබා ලූ පදලස දැක වේද මන්ත්‍ර සලකා බුදුන් නියා ව නියම කොට ගෙන සතුටු වූහ. බුදුහු ත් කිඹුල් වත් ආදී වූ බොහෝ නුවරවලට වැද ගෙන බොහෝ දෙනාට වැඩ සඳහා පාෂාණක චෛත්‍ය ය කරා වැඩි සේක.

ඒ පාෂාණක චෛත්‍ය ය නම් කෙසේ වූ තැනෙක් ද යත්- බුදුන් නුපන් අවධිවල ගල් මුදුනේ දෙවොල් ව තිබෙ යි. බුදුන් උපන් කලට විහාර ව තිබෙ යි. විහාර වුව ත් නම පළමු ලෙසින් ම පවති දූළුල්ලෝ ත් බුදුන් සැවැත් නුවර නැති හෙයින් ඉන් නික්ම ධාතු නිධානයෙහි ධාතු තිබිය දී දම්සෝ රජුන් දගැප් මුළුල්ල විදහා බැඳවූවා සේ බුදුන් ගල් දහගබ් වෙහෙර වැඩ ඉන් දදී සියලු නුවරවලට වැද ගෙන පසුව බුදුන් වැඩ හුන් ගල්දහගබ් වෙහෙරට ගියහ. ගොසින් සක් දෙව්දු මවා ලූ මණ්ඩපයෙහි වැඩ හුන් බුදුන් දුටහ.

බුදුහු ත් සාද සාමීචි කොට ලා හැම දෙනාගේ අදහස් සරි නො වන හෙයින් එක ම දෙශනාවක් අනුකූල නො වන නියාව දැන ප්‍රධාන දූළුල්ලන් සොළොස් දෙනාගෙන් අජිත තාපසයන්ට කුදුගොත් සඟිය සූත්‍ර නිපාතයෙහි පාරායණ වග අජිත සූත්‍ර ය වදළ සේක. දේශනා කෙළවර පිරිවර දූළුල්ලන් දහස හා සමග අජිත තෙරුන් වහන්සේ රහත් වූ සේක. සෙසු ත් බොහෝ දෙන නිවන් දුටහ. ඉක්බිති ව තිස්සමෙත්තෙය්‍ය තවුසාණන් හා පිරිවර දූළුලු දහසට තිස්සමෙත්තෙය්‍ය සූත්‍ර ය දෙසූ සේක. දේශනාව කෙළවර පිරිවර දහසක් දූළුල්ලන් හා සමඟ තිස්ස මෙත්තෙය්‍ය තෙරුන් වහන්සේ රහත් වූ සේක. සෙසු ත් බොහෝ දෙන නිවන් දුටහ. ඉක්බිති පුණ්ණක නම් තවුසාණන් හා පිරිවර දූළුල්ලන් දහසට පුණ්ණක සූත්‍ර ය දෙසූ සේක. දේශනා කෙළවර පුණ්ණක තෙරුන් වහන්සේ ත් පිරිවර දහස ත් රහත් වූ සේක. සෙසු ත් බොහෝ දෙන නිවන් දුටහ.

ඉක්බිති මෙත්තඟු[1] තවුසාණන් හා පිරිවර දහසට මෙත්තඟු සූත්‍ර ය දෙසූ සේක. දේශනා කෙළවර පිරිවර දහස හා සමඟ මෙත්තඟු තෙරුන් වහන්සේ රහත් වූ සේක. සෙසු ත් බොහෝ දෙන නිවන් දුටහ. ඉක්බිති ව ධොතක තවුසාණන් හා පිරිවර දහසට ධොතක සූත්‍ර ය වදළ සේක. දේශනා කෙළවර ධොතක තෙරුන් වහන්සේ ත් පිරිවර දහස ත් රහත් වූ සේක. සෙසු ත් බොහෝ දෙන නිවන් දුටහ. ඉක්බිති ව උපසීව තවුසාණන් හා පිරිවර දහසට උපසීව සූත්‍ර ය වදළ සේක. දේශනා කෙළවර උපසීව තෙරුන් වහන්සේ හා පිරිවර දහස රහත් වූ සේක. සෙසු ත් බොහෝ දෙන නිවන් දුටහ. ඉක්බිති ව නන්‍ද තවුසන්ට නන්‍ද නම් සූත්‍ර ය දෙසූ සේක. දේශනා කෙළවර පිරිවර දහස හා සමඟ නන්‍ද තෙරුන් වහන්සේ රහත් වූ සේක. සෙසු ත් බොහෝ දෙන නිවන් දුටහ. ඉක්බිති ව හේමක තවුසාණන් හා දූළුල්ලන් දහසට හේමක සූත්‍ර ය දෙසූ සේක. දේශනා කෙළවර පිරිවර දහස හා සමඟ හේමක තෙරුන් වහන්සේ රහත් වූ සේක. සෙසු ත් බොහෝ දෙන නිවන් දුටහ.

ඉක්බිති ව තෝදෙය්‍ය තවුසාණන් හා පිරිවර දහසට තෝදෙය්‍ය සූත්‍රය දෙසූ සේක. ඒ සූත්‍ර දේශනා කෙළවර පිරිවර දහස හා සමඟ තෝදෙය්‍ය තෙරුන් වහන්සේ රහත් වූ සේක. සෙසු ත් බොහෝ දෙන නිවන් දුටහ. ඉක්බිති ව කප්ප නම් තවුසන් හා පිරිවර දහසට කප්ප සූත්‍රය දෙසූ සේක. ඒ සූත්‍ර දේශනා කෙළවර පිරිවර දහස හා සමග කප්ප තෙරුන් වහන්සේ ත් රහත්

---

1 මෙත්තගු–සමහර

Non-Commercial Distribution

වූ සේක. සෙසු ත් බොහෝ දෙන නිවන් දුටහ. ඉක් බිති ව ජතු කණ්ණි නම් තවුසාණන් හා පිරිවර දහසට ජතුකණ්ණි සූත්‍ර ය දෙසූ සේක. ඒ බණ අසා ජතුකණ්ණි තෙරුන් වහන්සේ ත් පිරිවර දහස හා සමග රහත් වූ සේක. සෙසු ත් බොහෝ දෙන නිවන් දුටහ. ඉක් බිති ව භද්‍රායුධ තවුසාණන් හා පිරිවර දහසට භද්‍රායුධ සූත්‍රය දෙසූ සේක. දෙශනා කෙළවර බොහෝ කෙලෙස් සතුරන් නැසීමෙහි වජ්‍රායුධයක් ව භද්‍රායුධ තෙරුන් වහන්සේ ත් පිරිවර දහස ත් රහත් වූ සේක. සෙසු ත් බොහෝ දෙන නිවන් දුටහ. ඉක් බිති ව උදය තවුසාණන් හා පිරිවර දහසට උදය සූත්‍ර ය දෙසූ සේක. දෙශනා කෙළවර උදය තෙරුන් වහන්සේ හා පිරිවර දහසත් රහත් වූ සේක. සෙසු ත් බොහෝ දෙන නිවන් දුටහ.

ඉක්බිති ව පෝසාල තවුසාණන් හා පිරිවර දහසට පෝසාල සූත්‍රය දෙසූ සේක. දෙශනාව කෙළවර සහපිරිවරින් පෝසාල තෙරුන් වහන්සේ රහත් වූ සේක. සෙසු ත් බොහෝ දෙන නිවන් දුටහ. ඉක් බිති ව මොඝරාජ තවුසාණන් හා පිරිවර දහසට නමින් කුමක් වුව ත් තමා අමෝඝ වූ මෝඝරාජ සූත්‍රය දෙසූ සේක. මෝඝරාජ තෙරුන් වහන්සේත් පිරිවර දහසත් රහත් වූ සේක. සෙසු ත් බොහෝ දෙන නිවන් දුටහ. ඉක් බිති ව පිංගිය තවුසාණන් හා පිරිවර දහසට පිංගිය සූත්‍රය දෙසූ සේක. බණ අස අසා ම බාවාරි නම් වූ මයිල් තවුසාණන්ට මේ සදහම් නැමැති අමා රස සම්භ වේ දෝ නො වේ දෝ හෝ'යි යන සිතිවිලි නිසා සිත තර ව යොමු කරන්ට නු වූ හෙයින් පිංගිය තෙරුන් වහන්සේ රහත් වන්ට නො ව අනැගැමි වූ සේක. පිරිවර දහස එ බඳු වික්ෂෙපයක් නැති හෙයින් රහත් වූ සේක.

පිංගිය තෙරුන් වහන්සේ තමන් වහන්සේ ඇසූ බණ ගොස් මයිල් වූ බාවාරි තවුසන්දැට කියන කලට බුදුහු වැඩ හුන් ගල් සෑ වෙහෙරින් බොහෝ වහන්දෑ පිරිවරා දෙව්රම් වැඩි සේක. ඊ වැඩ හිඳ ම රස් කඳන් විහිදුවා පියා පිංගිය තෙරුන් වහන්සේ හා බාවාරිය තවුසන්දෑ හුන් තැන වැඩ හුන්නා සේ ව ලා බණ වදළ සේක. බණ කෙළවර පිංගිය තෙරුන් වහන්සේ මයිලණුවන්දෑ හැර අනුභව කරණ දහම් අමා හෙයින් ආදි සිත සේ අනුභව කරන්ට නු වුව ත් එ විට සිත සේ අනුභව කොට රහත් වූ සේක. බාවාරි තවුසන්දෑ අනාගැමි වූ දෑ ය. බාවාරියන්දෑගේ අතවැසි පන් සිය ය සෝවාන් වූහ.

Non-Commercial Distribution

මෙ සේ—

"තතො පාසාණකෙ රම්මෙ–පාරායණ සමාගමෙ,
අමතං පායයී බුද්ධො-චුද්දසා පාණකොටියො"

යනු හෙයින් ගල් සෑ වෙහෙරදී තුදුස් කෙළක් නිවන් දක් වූ සේක.

එ හෙයින් නුවණැත්තවුන් විසින් මෙත් සිත්හි තබා අධිගම ව්‍යක්තියට උත්සාහ කට යුතු.

## 87. අනුරුද්ධ මහ තෙරුන් වහන්සේගේ වත

එක් දවසක් අනුරුද්ධ මහ තෙරුන් වහන්සේ සිවුරු දුර්වල හෙයින් කසළ ගොඩ ආදි වූ තෙ විසි තැනින් තමන් වහන්සේ උත්කෘෂ්ට පාංශුකූලික හෙයින් කඩ රෙදි සොයන සේක. උන් වහන්සේගේ මේ ජාතියට තුන් වන ජාතියෙහි පාදපරිචාරිකා වූ එකෙණෙක් තව්තිසා දෙව් ලොව ඉපැද ජාලිනී නම් දිව්‍යාඞ්ගනා වූහ. ඕ මහ තෙරුන් වහන්සේ ආදි සම්පත් විදි ලෙසට දූන් කඩ රෙදි සොයන්නා දැක දිගින් තෙළෙස් රියන් වූ පළලින් සතර රියන් දිව සළු තුනක් හැර ගෙන ඉදින් මම මෙ ලෙසින් ගෙන ගොස් දෙම් නම් අපිස් ව හැර නො ගන්නා සේකැ'යි සිතා කඩ රෙදි සොයා ඇවිදිනා තැනට ඉදිරියේ එක් කසළ ගොඩක දවලු පමණක් පෙනෙන ලෙසට තබා ලූහ. මහ තෙරුන් වහන් සේ ද ඒ මඟින් කඩ රෙදි අවුළා ඇවිදිනා සේක් දිව සළුවෙ දවලු පමණක් දැක දවලු අල්වා ගෙන අදනා සේක. කියා ලූ පමණ ඇති දිව සළු දැක පංසුකූල ධූතඞ්ගයෙහි උත්කෘෂ්ට තරමට ඇතැ'යි හැර ගෙන වැඩ පී සේක.

ඉක් බිත්තෙන් සිවුරු කරණ දවස් බුදුහු පන් සියක් දෙනා වහන්සේ හැර ගෙන උන් වහන්සේගේ විහාරයට ගොසින් වැඩ හුන් සේක. අසූ මහ සවුවන් වහන්සේ ත් ගොසින් වැඩ හුන් සේක. සිවුරු ගෙත්තමට මහසුප් තෙරුන් වහන්සේ මුල වැඩ හුන් සේක. සැරියුත් මහ තෙරුන් වහන්සේ මැද වැඩ හුන් සේක. අනඳ මහ තෙරුන් වහන්සේ අග වැඩ හුන් සේක. ඔබට අග සෙසු වහන්දෑ වැඩ හුන් සේක. එ සේ ම වැඩ හුන් සෙසු වහන්දෑ හූ අඹරා දෙන සේක. බුදුහු සර්වඥකමට වැඩ නො හිඳ දුන් දුන් හූ ඉදි කටුවල අවුණා දෙන සේක. ගෙත්තමට නියම ව හුන් මහසුප් සැරියුත් – අනඳ තුන් දෙනා වහන්සේ සිවුරු ගෙත්තම් කරණ සේක මුගලන් මහ තෙරුන් වහන්සේ ඒ ගෙත්තමට යමක් යමක් වුවමනා වී නම් ඒ පසිදිනා සේක.

Non-Commercial Distribution

සිවුරු පිළි දුන් දෙවු දූවණියෝ ද ඇතුළු ගමට වැද ලා අනුරුද්ධ මහ තෙරුන් වහන්සේගේ සිවුරු ගෙත්තමට බුදුහු අසූ මහ සවුවන් වහන්සේ හා සමහ නිත්‍යපරිවාර පන් සියක් දෙනා වහන්සේ ත් රැගෙන වෙහෙර වැඩ හුන් සේක. කැඳ බත් ගෙන්වා ගෙන විහාරයට යව'යි විධාන කොළෝ ය. මුගලන් මහ තෙරුන් වහන්සේ බත් වළඳන්ට දතුරෙහි මහ දඹයක් ගෙනවු ත් දුන් සේක. පන් සියක් දෙනා වහන්සේ එක දඹ ය වළඳා ත් නිමවා-ගත නුහුණු සේක. සක් දෙවිඳු තෙමේ සිවුරු ගෙත්තම් කරණ තැන හිඟුල් පිරිබඩ ගත. ඒ බිම් අලතාවෙන් තෙමා ලූවාක් මෙන් රත් වි ය. දෙනා දනු ත් එ තෙක් ගෙනා වහන්සේ ත් වළඳා බොහෝ ව ඉතිරි වි ය. ඉන් සමහර වහන්දෑ 'මෙ තෙක් වහන්දෑට මෙ සේ බොහෝ කොට රැස් කෙළේ හැයි ද? වහන්දෑගේ ගණන සලකා මෙ විතරක් ගෙනෙව යි නෑයන්-සියන්ට කිය යුතු වේ ද? අනුරුද්ධ මහ තෙරුන් වහන්සේ තමන් වහන්සේගේ නෑයන්-සියන් බොහෝ නියාව හඟවන සැටි ය'යි කී සේක.

බුදුහු ඒ අසා 'කුමක් කියවු ද, මහණෙනි'යි විචාරා වදරා මේ නියාව දන 'කුමක් ද, මහණෙනි, තෙපි මේ අනුරුද්ධ මහ තෙරුන් වහන්සේගේ විධානයකින් උපන්නා කොට සිතූ ද' යි විචාරා 'ඔබට කරණ ගෙත්තම හෙයින් එ සේ සිතුම්හ' යි කී කල්හි 'හෙම්බා මහණෙනි, උඹ තුමූ මෙ බත්දක් නොකියති. රහතන්ගේ පස පිළිබඳ කථා නැත. මේ කැඳ බත් දෙවියන්ගේ ආනුභාවයෙන් උපනැ'යි වදරා බණ වදරණ බුදුහු-

යම් කෙණකුන්ට කාමාශ්‍රවාදී චතුර්විධ ආශ්‍රවයෝ ක්‍ෂය වූ ද මුල් ව සිටිනා අවිද්‍යාශ්‍රව ය ක්‍ෂය වීමෙන් සියලු කෙලෙස්හු නට වූ ද. නැවත තෘෂ්ණා දෘෂ්ටි වසයෙන් ආහාර සන්නිශ්‍රිත නො වෙද්ද, රස තෘෂ්ණාව සියලු ලෙසින් ම නැද්ද සුඤ්ඤත විමොක්ඛාදී නමින් පැවති නිවන් යම් කෙණකුන්ට රහත් ඵල සම වත් සුව විඳීමෙන් ගොදුරු ද, එ සේ වූ රහතන්ගේ යම් සේ අහස යන පක්ෂීන්ගේ මේ තැන පසුර ඔබා ලූ තැන ය, මෙ තැන බඩ වැද ගත් තැන ය, මෙ තැන හිස වැද ගත් තැන ය, මෙ තැන පියා වැද ගත් තැන ය යි දක්නට නො පිළිවන් ද, එ මෙන් මොහු මේ නරකයට ගිය පිය ය. මෙ තිරිසන් යෝනියට ගිය පිය ය, මේ ප්‍රේත ලොකය ගිය පිය ය, මේ අසුර නිකායට ගිය පිය ය යි මෙ සේ දුගති වසයෙනු ත්, තව ද මේ මිනිස් ලොවට ගිය පිය ය, මේ දෙව් ලොවට ගිය පිය ය, මේ බඹ ලොවට ගිය පිය ය යි මෙ සේ සුගති වසයෙනු ත් ගිය පියයක් ම නැති හෙයින් දත නො හැක්කැ'යි වදළ සේක.

Non-Commercial Distribution

දේශනා කෙළවර බොහෝ දෙන නිවන් පුර වන්හ. එහෙයින් නුවණැත්තවුන් විසින් රහත් වන්ට නිසි පින් කොට රහත් ව මෙ ගුණ තමා කෙරෙහි ත් ඇති කරවන්ට උත්සාහ කට යුතු.

## 88. කසයින් මහ තෙරුන් වහන්සේ ගේ වත

එක් සමයෙක බුදුහු වස් පවරන දවසෙක විශාඛාවන් කැරූ වූ පායෙහි යට මාලේ අසූ මහ සවුවන් වහන්සේ පිරිවරා වැඩ හුන් සේක. එ කල කසයින් මහ තෙරුන් වහන්සේ අවන්ති නම් රට වසන සේක. උන් වහන්සේ කොයි වැඩ හිඳ ත් බණ වදරන වේලේ දී අවුත් බණ අසන සේක. එ හෙයින් මහ තෙරුන් වහන් සේ හිඳිනා ගමනේ ඔබ වඩනා නියාව දන්නා හෙයින් ඔබට අවසර තබා ලා වැඩ හුන් සේක. සක් දෙවිඳු ද දෙ දෙව් ලොව දෙවියන් හා සමඟ අවුත් ගඳින් — මලින් බුදුන් පුද වැඳ එක ත් පස් ව සිටියාහ. සිට කසයින් මහ තෙරුන් වහන්සේ නො දක තමන් ඔබ කෙරේ ආවෙණික මමායන ඇති හෙයින් 'හැයි' කසයින් ස්වාමි, මෙ තැන නැත් නම් ඔබ ත් වැඩිය යහපතැ'යි සිතූහ. උන් වහන්සේ ත් ඒ ඇසිල්ලෙහි ම අවුත් තමන් වහන්සේට නිළ වූ හස්නෙහි ම හිඳ පෙනුණු සේක.

සක් දෙවිඳු ත් මහ තෙරුන් වහන්සේ වැඳ පය අල්වා ගෙන 'වැඩිනියා වේ ද? මම ත් වඩනා කැමති වීමි'යි කියා ලා ආවෙණික ව ඔබ ත් පුද වැඳ ගෙන එක ත් පස් ව සිටියහ. සමහර වහන්දෑ ඒ දැක 'සක් දෙවිඳු ත් කරණ දෙයක් මූණ බලා ම කරණ වන. බුදුන් විනා සෙසු තැනකට මෙ සේ නො කොට කසයින් මහ තෙරුන් වහන්සේ දැක ලා ගොසින් පය අල්වා ගෙන 'වැඩි සේ ම යහපත. මම ත් වඩනා කැමති වීමි'යි කියා ලා මලින් ගඳින් පුද එක ත් පස් ව සිටියෝ ය''යි ගුණමකු ව කී සේක.

බුදුහු ඒ කථාව අසා 'මහණෙනි, ම පුත්හු කසයින් මහ තෙරහු තමන්ගේ යහපත් තරමින් ම දෙව් මිනිසුන්ට ප්‍රිය වෙති'යි වදරා රහතන්ගේ අනන්‍ය සාධාරණ ගුණ වදරණ සේක් 'අසුන් හික්මවීමෙහි දක්ෂ වූ රිය ඇදූරක්හු හික්මවා ගත් අසුන් මෙන් යම් කෙණකුන් ගේ චක්ෂුරාදි ෂඩින්ද්‍රියයෝ දෝ හෝ නොහොත් සදෙරින් නික්ම රූපා දී සාරම්මණෙහි පවත්නා සව් කෙලෙස්සු විවසුන් බෙලෙන් ක්‍රමක්‍රමයෙන් සන්හිඳී රහත් වීමෙන් සියලු ලෙසින් ම සන්හුන්නාහු ද උන්නති ලක්ෂණ වූ නව විධ මාන ත් නසා පීවා වූ චතුර්විධ ආශ්‍රවයෙන් කිසි ද ආශ්‍රවයක් නැති අෂ්ට ලොක ධර්මයෙහි අකම්ප්‍ය වූ ඒ රහතන්ගේ දැක් ම දෙවියෝ ත් කැමති වෙති. මිනිස්සු ත් කැමති වෙති' වදළ සේක.

Non-Commercial Distribution

දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ. එ සේ හෙයින් නුවණැත්තවුන් විසින් යම් තරමක් ඇති කලට දෙව් මිනිස්සු දක්නා කැමැති වෙත් නම් එ තරම් එවා ගන්නා නිසා කුසල්හි හැසිරෙන්ට උත්සාහ කට යුතු.

# 89. සැරියුත් මහ තෙරුන් වහන්සේ ගේ වස්තුව

එක් සමයෙක්හි සැරියුත් මහ තෙරුන් වහන්සේ වස් වැස වස් පවරා ලා සැරිසරා වඩනා කැමැති ව බුදුන්ට දන්වා ලා බුදුන් වැඳ ගෙන පන් සියක් පමණ පිරිවර වහන්දෑ හා සමග නික්මුණු සේක. ගමන් පසු කොට ත් බොහෝ වහන්දෑ නික්මුණු සේක. මහ තෙරුන් වහන්සේ ද නම් ගොත් හෙයින් ප්‍රසිද්ධ තැන් නම් ගොත් කියා බණවා ලා සමු දී රඳවන සේක. නාම ගොත්‍රයෙන් අප්‍රසිද්ධ වූ පසු ව නුගුණයෙන් ප්‍රසිද්ධ වන එක් නමෙක් ඔබගේ වසයෙනු ත් ප්‍රසිද්ධ වනු කැමැති ව මා ත් නම් ගොත් කියා බණවා ලා රඳවා පී සේක් වී නම් යහපතැ'යි සිතූ සේක ප්‍රසිද්ධ වන තරමට ප්‍රසිද්ධ ව තිබෙන පිණක් නො කළ හෙයිනු ත් සියලු ලෙසින් අදහස දන්ට බුදුන්ට මුත් ඔබට අවිෂ ය හෙයිනු ත් මහ තෙරුන් වහන්සේ බොහෝ වහන්දෑ හෙයිනු ත් ඒ නමගේ අදහස සලකා ගත නුහුණු සේක. එ පමණෙකින් ම ඒ නම ත් මහ තෙරුන් වහන්සේ කෙරෙහි වෛර බැඳි දෑ ය.

මහ තෙරුන් වහන්සේ වඩනා ගමනේ ඔබගේ සඟළ කෙළවර අර නමගේ ඇඟ ගැවිණ. ඒ කම් ය කළ නම එ පමණකිනු ත් වෛර ය තර කළ දෑ ය. වෛර බලයෙන් මහ තෙරුන් වහන්සේ වෙහෙර ඉම පැන වැඩ පූ නියාව දැන ලා බුදුන් කරා එළඹ 'ස්වාමීනි, සැරියුත් මහ තෙරුන් වහන්සේ මුඹ වහන්සේගේ අගසවු යෙමි යි කියා ලා මා කන්සක ගසා ලා රෙදවා පියා ත් ක්‍ෂමා කරවා නො ගෙන පිටිසර ගිය සේකැ'යි කී දෑ ය. බුදුහු ත් මහ තෙරුන් වහන්සේ කැඳවා යවු සේක. එ වේලෙහි මුගලන් මහ තෙරුන් වහන්සේ ත් අනඳ මහ තෙරුන් වහන්සේ ත් දෙ දෙනා වහන්සේ සිතන සේක් 'අපගේ වැඩි මාලු බෑණන් වහන්සේ ඒ නමට නො ගැසූ නියාව බුදුහු නො දන්නා සේක් නො වන සේක. දන්නා සේක් ම ය. ඔබ ලවා සිංහ නාද කරවනු කැමැති නියා ය. වහන්දෑ රැස් කරම්හ'යි කෙසි මුඳු හැර ගෙන පිරිවෙන්වල දෙරවල් හැර 'දූන් දූන් සැරියුත්මහ තෙරුන් වහන්සේ සිංහ නාද කරණ සේක. ඒ සිංහ නාදය අසන්ට වහා අව මැනැවැ'යි කැඳවා රැස්කළ සේක. මහ තෙරුන් වහන්සේ ත් අවු ත් බුදුන් වැඳ ලා වැඩ හුන් සේක.

Non-Commercial Distribution

බුදුහු ගැසූ නො ගැසූ නියාව විචාළ සේක. ඔබ ද 'මම නො ගැසූයෙමි' නො වදරා තමන් වහන්සේගේ ගුණ වදරන සේක් 'ස්වාමීනි, යම් කෙණෙක් කා ගියා සී කමටහන පිරිමැසීම නැත්තෝ නම් උඹ තුමූ ආත්ම ප්‍රත්‍යවෙක්‍ෂාව නැති හෙයින් සබ්‍රම්සරුන් ගසා ක්‍ෂමා කරවා නො ගෙන පිටිසර යෙති'යි වදරා ලා ගුණ අයුණු ඉවසීමට තමන් වහන්සේ පොළොව හා සම නියා ද, එ සේ ම ක්‍රොධ නැමැති ගිනි නිවීමට පැන් හා සම නියා ද, එ සේ ම කෙලෙස් කුණු දෑවීමෙහි ගින්නක් හා සම නියා ද, කෙලෙසුන් දුරු කිරීමෙහි සුළඟක් හා සම නියා ද, නිහතමානී කමට පා පිස්නා බිස්සක් හා සම නියා ද, අගවී කමට සැඬොල් කුමරකු වැනි නියා ද උඩඟු නො වීමට හං බුන් ගොන් වැනි නියා ද, සර්පකුණපාදියක් මෙන් තමන් වහන්සේගේ ශරීර ය පිළිකුල් කොට දක්නා නියා ද, මනුෂ්‍ය ශරීර ය බැවින් තමන් වහන්සේගේ ශරීර ය අසුචි පුරා ලූ කළයක් මෙන් පිළිකුල් නියාව ද මේ උපමා නවයෙන් වදරා නව වාරයෙක මහ පොළොව ගුගුරුවා පී සේක. පා පිස්නා බිසි උපමාව හා සැඬොල් කුමර උපමාව හා අසුචි පිරූ කළ උපමාව කී කල්හි පෘථග්ජන වහන්දෑ කඳුළු රඳවං ගත නුහුණු සේක. රහතන්ට සියලු ප්‍රත්‍ය ය සමුත්පන්නධර්ම විෂයෙහි භයාකාරයෙන් උපදනා නුවණ උපන.

මහ තෙරුන් වහන්සේ තමන් වහන්සේගේ ගුණ වදර ත් වදර ත් ඔබගේ ගුණ දරා ලිය නො හී ත් කම්පා වූ කළක් මෙන් මහ පොළොව වෙවුලා ගිය කලට නැත්ත කියා දෙඩූ නමගේ සකල ශරීරයෙහි දහ වැද ගත. උන්දෑ එ විට බුදුන් පා පිට ම හී පියා තමන්දෑගේ වරද කියා ලා ක්‍ෂමා කරවවුදෑ ය. බුදුහු මහ තෙරුන් වහන්සේ බණවා ලා 'තෙපි තොපගේ අක්‍ෂමාවක් නැත ත් බස කියා නුලූ නම් තෙල නිකමාගේ හිස සත් කඩ ව පැළී ගිය ත් නපුර. උඹගේ ජීවිත රක්‍ෂණ ය නිසා තෙපි ත් ක්‍ෂමා කරව' යි වදාළ සේක. මහ තෙරුන් වහන්සේ ද බුදුන්ගේ ළඟ එළිල්ලෙන් හිඳ දෝත මුදුනේ තබා ගෙන 'ස්වාමීනි, ඒ ආයුෂ්මතුන්ට ක්‍ෂමා කෙරෙමි. ඉදින් මාගේ වරදෙක් ඇත් නම් ඒ ආයුෂ්මත්හු ත් ක්‍ෂමා කෙරෙත්ව'යි වදාළ සේක. වහන්දෑ ද ඒ අසා 'ඇවැත්නි, මුන් වහන්සේගේ බුද්ධකල්ප වූ ගුණයෙක තරම් බලව මේ තරමක් කියා ලූ මුන් කෙරෙහි මුසුප්පුවක් නො ව තමන් වහන්සේම එළිල්ලෙන් හිඳ ක්‍ෂමා කරවන සේක. ඔබ කළ සිංහ නාද ඔබට ම තරමැ'යි කී සේක.

බුදුහු ඒ අසා වදරා 'මහණෙනි, කුමක් කියවු දෑ'යි විචාරා පෙරළා ත් කියවා ගෙන 'මහණෙනි, සැරියුත් වැන්නවුන්ට ගල්

Non-Commercial Distribution

තියෙන් කා නිය රෙදව ත් මුත් ගල් රෙදවන්ට බැරියා සේ මුසුප්පු උපදවන්ට බැරි ය'යි වදරා මහණෙනි, යම් සේ පොළොව සුවඳ මල් ආදි වූ සුවඳ ත් ලත් ද, කෙළ සෙම් ආදි වූ අපවිත්‍ර ත් ලත් ද, එ සේ ම නුවර වාසල කෙරේ හිඳු වූ ඉන්ද්‍රඛීලයට බාල දරුවෝ කුණු කසළ දමා අපවිත්‍ර කෙරෙත් ද, දන්නෝ සුවඳ මල් ආදි ය පුදත් ද, පොළොවට ත් ඉන්ද්‍රඛීලයට ත් අපවිත්‍ර ය ලීම දැමීම නිසා කොපයෙක් වේව යි, පවිත්‍ර ය ලීම පිදීම නිසා ප්‍රෙම යෙක් වේව යි නැද් ද, සුචි–අසුචි නික්‍ෂෙප ය. නිසා දියට වේව යි ගින්නට වේව යි සුළඟට වේව යි ලූ ලූ යම් දෙයක් ගෙන යෑම දැවීම හැමදවීම කරත් මුත් සුචි දෙයෙහි අනුනයක් හා අසුචි දෙයෙහි ප්‍රතිඝයෙක් දියට ත් ගින්නට ත් සුළඟට ත් නැත් ද, එ පරිද්දෙන් අෂ්ට ලෝක ධර්මයෙන් අකම්ප්‍ය වූ සොඳුරු වූ ව්‍රත-සමාදන ඇති රහත්හු 'මොහු අපට සිවුපසයෙන් උපස්ථාන කෙරෙති. උන් කෙරෙහි අනුනයක් වේව යි 'මූ අපට උපස්ථාන නො කෙරෙති. උන් කෙරෙහි ප්‍රතිඝයක් වේව යි නො කෙරෙති. කුමක් සේ වේද් ද යත්–යම් සේ මඩ බොර නැති විලෙක පහන් පැන් ඇත්තේ ද එ මෙන් පහ වූ කෙලෙසුන් ඇති බැවින් රා දෙස් ආදී වූ මඩ බොර නැති ව පහන් සිත් ඇති වෙති. එ බඳු වූ වන්ට සුගති දුර්ගති දෙක්හි හැසිරීම් නැති හෙයින් සසර නැතැ' වදළ සේක.

මේ දේශනා කෙළවර උපමා නව ය විතරට ම නව දහසක් වහන්දෑ පිළිසිඹියා පත් රහත් වූ සේක. එ සේ හෙයින් නුවණැත්තවුන් විසින් ධම්සෙනෙවි ස්වාමීන් තමන් වහන්සේ කෙරෙහි පිහිටුවා වදළ උපමා නව ය ඔබට ම තිබී ආ දෙයක් නො වන බැවින් තම තමා කෙරෙහි ත් ඇති කොට ගෙන ඔබ සිංහ නාද කළ ලෙස ම සිංහනාද කරන්ට උත්සාහ කට යුතු.

## 90. කොසඹෑ නුවර තිස්ස තෙරුන් වහන්සේ ගේ වස්තුව

කොසඹෑ නුවර වසන කුල දරුවාණ කෙණෙක් බුදුසස්නෙහි මහණ ව උපසම්පදව ලදින් කොසඹෑ නුවර වසන තිස්ස තෙරුන් වහන්සේ ය යි ප්‍රසිද්ධ වූ සේක. උන් වහන්සේ වස් වැස් වූ උපා-සක කෙණෙක් සිවුරු පිරිකරකු ත් තෙල්-මී-සකුරු ආදියත් ගෙන වුත් සිවුරු පිරිකර පා මුල තබාලූ ය. 'මේ කිම් ද උපාසකයෙනි' යි විචාරා 'මුඹ වහන්සේ වස් වැස්සූයෙම්වේ ද – අපගේ විහාරයේ ත් විසූ කෙණෙක් මේ ලබන සේක. එ හෙයින් වස්සාවාසික ලාභය'යි කී කල්හි 'උපාසකයෙනි, වන්නාට ය මින් අපට ප්‍රයෝජන නැතැ'යි වදළ සේක. 'එ සේ වදරන්ට කාරණ කිම්දැ'යි විචාළ

Non-Commercial Distribution

කල්හි 'අප ළඟ කැපකරුවූ මෙහෙණ කෙණෙක් නැත. එ හෙයි නැ'යි වදාළ සේක. 'එ සේ වී නම් ම පුතු සවාමීන් ළඟ මහණ වෙති'යි කිවු ය. ඔබ ත් ඉවසූ සේක.

උපාසකයෝ ත් තමන්ගේ සත් හැවිරිදි පුතණුවන් කැඳවා ගෙන ගොසින් 'තුලුන් මහණ කළ මැනැවැ'යි පාවා දුන්හ. ඉක් බිත්තෙන් තෙරුන් වහන්සේ හිසකේ තෙමා පියා ශාසන යෙහි ඇලී වසකට නළවා යමක් දෙන කලක් මෙන් තවපඤ්චක කමටහන් දී ලා මහණ කළ සේක. ක්ෂුරකර්ම ය නිම වනකලට ම පිළිසිඹියා පත් රහත් වූ දැ ය. තෙරුන් වහන්සේ ත් උන්දැ මහණ කොට ලා ගෙන දෙ පෝයක් එහි වැස ලා බුදුන් දක්නා නිසා හෙරණුන් දැ ලවා පාත්‍ර ය ගෙන්වා ගෙන වඩනාසේක් අතර මහ එක් විහාරයකට වන් සේක. හෙරණුන්දෑ ද උපාධ්‍යායයන් වහන්සේට සෙනස්නක් හැර ගෙන හැමද ඉදි කළ දැ ය. ඒ ඉදි කරණ ගමනින් ම රෑ ව ගොසින් තමන්දැ සැතපෙන තැනක් ඉදි කරන්ට නො වී ය. වත් පිරිත් වේලේ අවුදින් හූන් හෙරණුන් දැට 'තොප සැතැපෙන තැනක් ඉදි කළා දූ'යි විචාරා අවසර නො වූ හෙයින් ඉදි කරන්ට නුවූයේ ය යි කී කල්හි 'අමුතු ව ලා ආ කල පිටත සැතපෙන්ට බැරි ය. අප සැතපෙන තැන ම සැතපෙව' යි කියා ලා කැඳවා ගෙන සැතපෙන්ට වැඩි සේක. වැඩ ලා සැතපෙන ගෙට වන් සේක.

තෙරුන් වහන්සේ පුහුදුන් ව සිටි හෙයින් ගමන් ආයාසත් ඇති වන්නා වැද හොත් ගමනේ ම පිරිත් පමණක් බිණු ව නො බිණුව නිදන්ට පටන් ගත් සේක. හෙරණුන් දැ ද 'මුන් වහන්සේ ත් අප ත් එක ගෙයි ම සැතපෙන්නේ ඔබින් කැටි ව තුන් රැයක ඉදින් කාය ගෙලඤ්ඤ නිසා නිද පීම් නම් මුන් වහන්සේ සහසෙය්‍යාපත්තියට වදනා සේකැ යි හිඳ ම පාන් කෙරෙමි' ඔබ සැතපුණු හැඳ බඩ අකුසල ය ආසන්න වූ හෙයින් අත පෙවෙන තැනින් මඳක් දුරුවන්ටක් නොව පලක් බැඳ ගෙන හුන්දැ ය. තෙරුන් වහන්සේ අළුයම නැඟී සිට හෙරණුන්දැ සහසෙය්‍යාවට සැහෙන කල ගෙන් පිට ත් කළ මනා වේ දූ යි හැඳ බඩ තුබූ පවන් පත ත් හැරගෙන පත් නවු අගින් හෙරණුන්දැ සැතපුණු කළාලේ ගසා පියා පත් මිට ඔසවන සේක් 'හෙරණෙනි, පිටතට යව'යි වදාළසේක. ඔසවන පත් මිට අග ත් හෙරණුන්දැගේ ඇස ඇනිණ. ඒ ඇසිල්ලෙහි කළ කුසල් නො වරදවා රහත් කරවා ලූවා සේ ම අකුසලු ත් නො වරදවා ම ඇස සිල් කරවා ලී ය.

Non-Commercial Distribution

හෙරණුන් දෑ ද 'කුමක් ද, ස්වාමීනි, කියා පිටතට යව'යි කී කල්හි 'ස්වාමීනි, මාගේ ඇසෙක් නට යි නො කියා ම එක් අත කින් ඇස වසාගෙන පිටතට නික්මුණු දෑ ය. වත් වේලෙහි ඇස නැත්තේ වේ ද යි වැද නො හිඳ ඇස්නැත ත් ශික්ෂා ගෞරව ඇති හෙයින් හා නුවණැසට වූ හානි නැති හෙයින් එක් අතකින් මුස්න හැරගෙන වැසිකිළිය ද දැවටි වළඳින තැන් ද හැම ද පියා දැවටි පැනු ත් තබා ලා පිරිවෙණ ත් හැමඳී දෑ ය. වත් විසින් තෙරුන් වහන්සේට දැවටි – පැන් දෙන කල ත් එක් අතින් ම දුන් දෑ ය. තෙරුන් වහන්සේ ද 'හෙරණානෝ නො හික්මුණු කෙණෙක. දැවටි – පැන් එක අතින් දෙති' වදාළ සේක. ස්වාමීනි, ඒ වත් නො වන නියා ව දනිමි. අතික් අත අවසර නැති හෙයිනැ'යි කියා ලා 'අවසර නැත්තේ කුමක් නිසා ද'යි විචාළ කල්හි ආදියෙහි පටන් තමන් දෑ සිතා කළ සැටි ත්, වන් සැටි ත් මුළුල්ල ම කී දෑ ය. තෙරුන්වහන්සේ ත් අසා බලවත් ව මුසුප්පු ව 'අනේ මා කළ දෑ ඉතා නපුර, සත්පුරුෂයාණෙනි, ක්ෂමා ත් කරව, මට ත් පිහිට ව ව'යි දෝත මුදුනේ තබා ගෙන සත් හැවිරිදි හෙරණුන් දෑ පා මුල එළිල්ලෙන් හුන් සේක. වයසින් හා පැවිද්දෙන් බාල වුව ත් ගුණෙන් වැඩි සිටි හෙයින් තෙරුන් වහන්සේ ත් කෙළේ කට යුතු ය.

හෙරණුන් දෑ ද 'ස්වාමීනි, ක්ෂමා කරවීමක් නිසා කීයෙම් නො වෙමි. එ ලෙස නො කී කලට මුඹ වහන්සේගේ සිත කුමක් සේ තිබේ දෝ හෝ යි සිත රක්නා පිණිස කීමි. දැන කළ දෙයක් නො වන හෙයින් මුඹ වහන්සේගේ වරදෙක් නැත. දැන් වරදක් නැත ත් යටගිය දවස වැරැද්දකින් වන හෙයින් වැරදි මාගේ ම ය'යි කී දෑ ය. එ සේ කියා ලා 'මුඹ වහන්සේ මුසුප්පු නො වන්ට කීමි' කී දෑ ය. තෙරුන් වහන්සේ හෙරණුන් දෑ කෙසේ අස්වසා කීව ත් ඇස්වැස ගත නො හී තෙරණුන්දෑගේ පා සිවුරු ත් තමන් වහන්සේ ම හැර ගෙන බුදුන් ලඟට නික්මුණු සේක. බුදුහු ත් පෙර මං බල බලා වැඩ හුන් සේක. ඔබ ත් ගොසින් බුදුන් වැඳලා තොපගේ සුව දුක් කිමැද' යි බුදුන් වදාළ කල්හි 'ස්වාමීනි, අපට චිත්ත පීඩාවක් විනා කාය පීඩාවෙක් මැද. මේ හෙරණුන්දෑ තරම් ගුණසම්පන්න කෙණකුන් දුටු විරූ නැතැ'යි කී සේක. තො දන් බඳු ව 'මූන් ගුණයට කෙළේ කිමැද'යි විචාළ කල්හි ආදියෙහි පටන් පවත මුළුල්ල ම දන්වා ලා ''ස්වාමීනි'' දැන වුව ත් නො දැන වුව ත් මා නිසා ඇස නට හෙයින් ක්ෂමා කරන්ට කී තැන 'මුඹ වහන්සේගේ වරදෙක් නැත, සංසාර දෝෂ ය මාගේ ම ය'යි යනාදිය කියා ලා මා ම අස්වැසූ ය. මට මැදකු ත් මුසුප්පු නුවූ ය. මූන් තරම් කෙණකුන් අප දුටු විරූ නැතැ'යි කී සේක.

Non-Commercial Distribution

බුදුහු ඒ අසා හෙරණුන්දෑ රහත් වූ නියාව හඟවන සේක් රහතන්ට මුසුප්පු නැත්තේ මැ දැ යි වදරා හේතු 'හෙයිනු ත් කාරණ හෙයිනු ත් ප්‍රත්‍යය සමුත් පන්න ධර්මයන්ගේ අනිත්‍යාදි වූ ස්වභාව ය දැන කෙලෙසුන් කෙරෙන් පඤ්චවිධ විමුක්ති වසයෙන් වෙන් වූ සන්තානයෙහි පවත්නා වූ රාගාදීන් රහත් මඟින් නට හෙයින් අවුපසම ලක්ෂණ වූ කෙලෙසුන් නැති හෙයින් සන්හුන් තරම් ඇති එ බඳු රහතන්ගේ සිත අභිද්‍යාදි ය රහිත වීමෙන් සන්හිඳී තිබෙයි. වචනය ත් මෘෂාවාදදි ය රහිත බැවින් සන්හිඳී තිබෙයි. කායික වූ ක්‍රියාව ත් ප්‍රාණ වධාදිය රහිත බැවින් සන්හිඳී තිබෙයි. තුන් දෙරින් ම වදනා පවක් නැති කලට මුසුප්පු කොයිදැ'යි වදාළ සේක. දේශනා කෙළවර කොසඹෑ නුවර වැසි තෙරුන් වහන්සේ සිවු පිළිසිඹියා පත් රහත් වූ සේක. සෙසු ත් බොහෝ දෙන නිවන් දුටහ.

එ සේ හෙයින් නුවණැත්තවුන් විසින් ඇස නැසී ත් කළ මනා වතෙහි නො පමා වූ හෙරණුන්දෑ පරිද්දෙන් ජීවිත හානි ය වත ත් කළ මනා සුචරිතෙහි හැසිර නිවන් සිද්ධ කටයුතු.

---

## 91. සැරියුත් මහ තෙරුන් වහන්සේ පැන විසඳූ වත

එක් දවසෙක ආරණ්‍යක වහන්දෑ තිස් නමෙක් බුදුන් ළඟට අවුත් වැඳ ලා වැඩහුන් සේක. බුදුහු ඒ වහන්දෑ පිළිසිඹියා හා සමඟ රහත් වන්නට නිසි පින් ඇති නියා ව දැන සැරියුත් මහ තෙරුන් වහන්සේ බණවාලා 'ශාරිපුත්‍රයෙනි, වඩන ලද ශ්‍රද්ධෙන්ද්‍රියාදි පඤ්චෙන්ද්‍රියයන් නිවනට ඇතුළත් වන නියා ව හදහවු දැ'යි වීචාළ සේක. ඔබ ඒ අසා ස්වාමීනි, යම් කෙණෙක් තුමූ ශ්‍රද්ධාදී පඤ්චෙන්ද්‍රියයන් වඩාගත නුහුනු වූ නම් උඹ ඔබබෙහි ශ්‍රද්ධාවෙන් හදහති. මා ම සාක්ෂා ත් කළ හෙයින් වදළ අසා හදහන්නේ කිම් දැ'යි කී සේක. වහන්දෑ ඒ කතාව අසා බුදුන් විචාළ අදහස ත් ඔබ විසඳූ අදහස ත් දත නො හී වදළ බසින් හදහන්නෝ කිම්දැ'යි කියා ලූ බස ගෙන 'සැරියුත් මහ තෙරුන් වහන්සේ බුදුන් විචාරා වදළ ප්‍රශ්න ය විරුද්ධ ලෙසින් ම විසඳූ සේක. අද දක්වා ත් බුදුන් කෙරෙහි ඇදහිලි නැති නියා වනැ'යි කී සේක.

බුදුහු ඒ අසා 'මහණෙනි, කුමක් කියවු ද? මම උන් අතින් විචාරන්නෙම් පඤ්චෙන්ද්‍රියයන් නො වඩා, භාවනායෙහි නො හැසිර, මාර්ගඵල උපදවන්නට සමත්හයන් ඇද්දැ'යි විචාළෙම්. උඹ තුමූ 'එ සේ නො කොට මාර්ගඵල උපදවා ගනිති, හදහා නො ගනිමි' යි කිවු ය. ඒ විනා දුන් දෙයක, කළ දෙයක විපාක ඇති නියාව ත්

Non-Commercial Distribution

බුද්ධාදීන්ගේ ගුණ ත් නො දන්නෝ නො වෙති. තමන් උපදවා ගත් ධ්‍යාන ය විදර්‍ශනා ය, මාර්‍ග ය, ඵල ය යන මේ ස්‍වභාව ය අනුන්ගේ කීමෙන් හදහන්නෝ ත් නො වෙති.

එ හෙයින් 'නිරවද්‍යයහ'යි වදරා ලා බණ වදරන සේක් යම් කෙනෙක් තුමූ තමන් පිළිබඳ ගුණ අනුන්ගේ බසින් නො අදහද්ද එක් කෙණකු න් විසින් නො කරණලද නිවන් දැක සිටියෝ ද, නැවත අවිද්‍යාදී වූ හෙතු පරම්පරාව ත් සංස්කාරාදි ඵල පරම්පරාව ත් සුන් හෙයින් වෘත්ත සන්ධීන් සිඳ සිටියෝ ද කුසල් අකුසල් දෙක ම නැති හෙයින් බිජුවට නැති කලට ගොයම් නැත්තා සේ භවොත්පත්ති නැත්තෝ ද, චතුර් විධ මාර්‍ගයෙන් ෂොඩෂ විධ කෘත්‍ය ය කොට නිමි හෙයින් සියලු ලෙසින් ම තෘෂ්ණාශාව හළවූ ද, එ සේ වූවෝ තුමූ උත්තම ගුණ යෝගයෙන් උත්තම පුරුෂයෝ ය'යි වදාළ සේක. දෙශනා කෙළවර තිසක් පමණ ආරණ්‍යක වහන්දෑ සිවු පිළිසිඹියා පත් රහත් වූ සේක. සෙසු ත් බොහෝ දෙනාට සප්‍රයෝජන වි ය.

එ හෙයින් නුවණැත්තවුන් විසින් සැදෑ ත් ඇති ව කෘතොපකාරී ව තුන් සුසිරි පුරා අධිමුක්ති වූ ලෙසින් නිවන් දහම් පසක් කාට යුතු.

---

## 92. ඛදිර වනිය රේවත තෙරුන් වහන්සේ ගේ වස්තුව

ආයු බොහෝ වූ සැරියුත් මහ තෙරුන් වහන්සේ බමුණු මහසල් කුලයෙහි උපන් හෙයින් මහත් වූ භොගරාශි ය හැර මහණ වන ගමනේ සතාසූ කෙළක් පමණ වස්තුව හැර මහණ ව චාලා ය- උපචාලා ය- සීසපචාලා ය යන නඟුන් තුන් දෙණකු මෙහෙණි සස්නෙහි මහණ කරවා ලා චන්‍ද ය- උපසෙන ය යන මලුන් දෙන් නාකු ත් මහණ කොට ගත් සේක. රෙවත කුමාරයෝ ය යන එක ම මලණු කෙණෙක් රඳා ගියහ. සැරියුත් මහ තෙරුන් වහන්සේ ගේ ළ මන්දු සිතන්නෝ ම පුතණුවන් වහන්සේ මෙ තෙක් වස්තු හැර ගොසින් තමන් වහන්සේ ත් මහණ ව ගෙන ලද නිවන් රස දෙන පිණිස දෝ නඟුන් තුන් දෙනා ත් මලුන් දෙන්නා ත් මහණ කරවා ගත් සේක්, අපට රඳුණෝ එක රේවත කුමාරයෝ ය. ඉදින් සිතා පියා උනු ත් මහණ කළ සේක් වී නම්.මේ අපගේ වස්තු නස්සී. කුල පරම්පරාව ත් සිඳී යෙයි. උන් තව බාල වුව ත් සරණකු ත් ගෙන්වා ගෙන පාවා දීලා ගිහි සම්පත තර කරවම්හ'යි සිතූ ය.

මහ තෙරුන් වහන්සේ ද පෙරාතු කොට ම වහන්දෑට සම්මත කරණ සේක් 'ඉදින් රෙවත කුමාරයෝ මහණ වන්ට අවු නම් මා



Non-Commercial Distribution

බද්ධ වුව ත් නුවූව ත් ආ කල ම කල් නො යවා මහණ කරණ බව ය. අපගේ දෙ මවු පියෝ නම් මිථ්‍යා දෘෂ්ටිකයෝ ය. උන් අනු නො දත්තෙන් කිම් ද? වැඩි මාලු මා සිටි හෙයින් උන්ට දෙ මවු පියෝ නම් මම් ම ය'යි කියා තබා ලූ සේක.

ඔබගේ ළ මන්දුදෑ ද රෙවත කුමාරයන් සත් ඇවිරිදි කල ම ගිහි කම් කටුලේ යොදවනු කැමැති ව ජාති සරි තැනකින් සරණක් විචාරා දවස් නියම ත් කරවා කුමාරයන් සරහා ලා මහ පෙරහරින් කුමාරිකාවන්ගේ ගෙට ගියහ. ගොසින් විවා මඟුල් කොට සරණ පාවා දෙවා ලා දෙ පක්ෂයේ නෑයන් රැස් වූ කල්හි රන් තළියකට අත බාලා 'මේ රන් තළියේ පැන් යම් සේ නො බිඳී තිබේ ද, එ මෙන් තොප දෙ පක්ෂය ත් නො බිඳී වසව' යි කියා ලා කුමාරිකාවන්ට වැඩ කැමැති ව 'තෙල තොපගේ මුත්තණියන් සුව සම්පත් ලෙස සුව සම්පතු ත් ලබා උන් සේ ම බොහෝ දවස් ජීවත්ව' යි නෑයෝ කීහ. රෙවත කුමාරයෝ 'මුන්ගේ මුත්තණිය වූයේ කවරේ දෝ හෝ'යි සිතා මුන්ගේ මුත්තණියන් කවුරු දැයි විචාරා 'පුත, කුමක් ද? එක් සිය විසි ඇවිරිදි වූ දත් වැගිර ගියා වූ, හිස නියඳ කෝටුවක් සේ විළිස්සා ගියා වූ, ඇඟ සම් වැරැලි ගෙන තිබෙන්නා වූ තල කැළලින් ගැවසී ගත් සිරුරු ඇති ගොණැස් වකක් සේ වක ගසා ගෙන සිටිනා කෙණකුන් දුටු නම් උඹ තුලුන්ගේ මුත්තණියෝ ය'යි කීහ.

ඒ අසා රෙවත කුමාරයෝ 'මේ කුමාරිකාවෝ ත් තෙල ලෙසම වෙද්දැ'යි විචාරා 'අතුරෙක නො මළෝ නම් එ සේ ම වෙති' කී කල්හි කුමාරයෝ සිතන්නෝ 'මෙසේ වූ ශරීරය ත් ජරාව ඇවිත් ලා වියවුල් කෙරේ වන. මුන්ට වන දෙය මට නො වන්ට කාරණ කිම් ද? මගේ බෑණ වූ උපතිස්සයන් වහන්සේ මේ දූක ලා වන ගියෝ ය. කල් යවන්ට බැරි ය. සරා ලූ මඟුලේ අද ම පලා ගොසින් ලා මහණ වෙමි' සිතූහ. නෑයෝ ත් කුමාරිකාවන් හා දෙන්නා එක වාහනයකට නංවා ලා හැර ගෙන නික්මුණාහ. කුමාරයෝ මඳ තැනක් ගොසින් ලා ශරීර කෘත්‍යයකට යන නියා වක් කියා ලා වාහන ය රඳවා ගොස් ලා එම්'යි කියා ලා වාහන යෙන් බැස එක් කැලෑ හස්සකට වැද මඳක් කල් යවා ලා අවු ය. තව ත් මඳක් තැන් ගොස් ලා එ ලෙස ම කොළෝ ය. තව ත් එ ලෙස ම කොළෝ ය. මෙ සේ ශරීර කෘත්‍යයට ගමන් බොහෝ කලට නෑයෝ 'ඔබට නුසු ව නියා (වේ) දැ'යි රකවල් තුනී කළහ. උඹ තුමූ තව ත් මඳ තැනක් ගොසින් ලා ආදී කළ ලෙස ම වංචා කොට 'තෙපි වාහන ය හැර ගෙන ඉදිරියේ පලා යව. මම සෙමින්

Non-Commercial Distribution

සිට එමි. වහා ගමන ආයාස ය'යි කියා ලා කැළෑ හස්සට ගියහ. නැයෝ ත් සෙමින් සිට පලා එති යි සිතා වාහන ය හැරගෙන නික්මුණවූ ය.

කුමාරයෝ ද කැළෑ හස්සට වන් ගමනේ ම පලා ගොසින් එක් තැනෙක තිස් දෙනකුන් වහන්සේ වසන සේක— ඒ වහන්දෑ ළඟට ගොසින් වැඳ ලා 'ස්වාමීනි, මා මහණ කළ මැනවැ'යි කිවූ ය. වහන් දෑ ත් 'තෙපි සැරහී ගෙන සිටුව. අපි තොප රාජ කුමාර කෙණ කුන් බව ත් නො දනුම්හ. අමාත්‍යපුත්‍ර කෙණකුන් බව ත් නො දනුම්හ. මහණ කරන්නේ කෙසේ දැ'යි කී සේක. 'ස්වාමීනි මා නො හඳුනන සේක් දැ'යි විචාරා එ සේ ය යි කී කල්හි 'මම උප- තිස්සයන් වහන්සේ ගේ බාල මලණු වෙමි'යි කීහ. 'ඒ උපතිස්ස නම් කවුරුදැ'යි විචාළ කල්හි 'එ සේ ය' වහන්දෑ බෑණන් වහන් සේට ශාරි පුත්‍ර ය යි කියන සේක. එ හෙයින් උපතිස්ස ය යි කී කල නො දන්නා සේක් ය'යි කීහ. 'කුමක් ද? තෙපි සැරියුත් මහ තෙරුන් වහන්සේ ගේ මළණුවෝ දැ'යි විචාරා එ සේ ය යි කී කල්හි 'එ සේ වී නම් මෙ සේ පලා එව. අංදි ම ඔබ අපට සම්මත කළ සේකැ'යි කියා ලා ආභරණ ගළවා එක තැනෙක තබ වා පියා කුමාරයන් මහණ කොට ලා මහ තෙරුන් වහන්සේට කියා යවූ සේක.

ඔබ ඒ අසා බුදුන්ට දන් වූ සේක. දන්වා යවන සේකුත් ස්වාමීනි, ආරණ්‍යක වහන්දෑ රේවත කුමාරයන් මහණ කළසේක් ල'යි දන්වා යවූ සේක. දන්වා යවා ලා මහණ වූ මලණුවන් බලන්ට යනු කැමැති නියාව ත් බුදුන්ට දන් වූ සේක. බුදුහු 'ශාරි පුත්‍රයෙනි, තව ඉවසව'යි වදරා ගමන එවකට නවතා ලූ සේක. මහ තෙරුන් වහන්සේ දවස් ගණනක් ගිය කලට තව ත් බුදුන්ට දන් වූ සේක. ශාරිපුත්‍රයෙනි, තව ඉවසව, අපි ත් එම්හ'යි ඒ ගමන ත් පමා කළ සේක. රේවත හෙරණුන්දෑ ද, ඉදින් මම මී ම රඳා හුනිම නම් නෑයෝ මාගේ පවත් දන කැඳවා එවතී. ඒ වහන්දෑගෙන් රහත් වීම දක්වා කමටහන් ඉගෙන ගෙන පා සිවුරු හැර ගෙන සැරිසරන දෑ එ තැනට එක් සිය විසි ගවුවක් ව තිබෙන කිහිරි වනයට ගොස් වස් තුන්මස ඇතුළත ම පිළිසිඹියා සමග රහත් වූ දෑ ය. සැරියුත් මහ තෙරුන් වහන්සේ ත් වස් පවරා ඔබ වඩනා කැමැති නියා ව බුදුන්ට දන් වූ සේක.

බුදුහු 'අපි ත් එම්හ'යි වදරා ලා පන්සියයක් දෙනා වහන්සේ හැර ගෙන නික්මුණ සේක. මඳ තැනක් වැඩි කලට අනඳ මහ තෙරුන් වහන්සේ දෙ මං සන්ධියක සිට බුදුන්ට වදරන සේක්

Non-Commercial Distribution

'ස්වාමීනි, රේවත තෙරුණුවන් වසන තැනට යන මං වලින් මෙ මග දුරු ව තිබෙයි. දෙසිය සතළිස් ගවුවෙක. මග දිගට ගම් ගහණ හෙයින් මිනිස්සු ත් ඇත. මේ මග ලඟ. එක්සිය විසි ගවුවෙක. ඒ මග යක්‍ෂොපද්‍රව ඇත. කවර මඟෙකින් යමෝ දැ යි විචාළ සේක. ආනන්‍දයෙනි, සීවලි තෙරහු අප හා කැටි ව අවුදැ'යි විචාරා එ සේ ය යි කී කල්හි 'ඉදින් උහු තුමූ අවු නම් ලං මග යම්හ'යි වදළ සේක. බුදුහු වැළි ත් තොපට කැඳ බත් උපදවා දෙම්හ. ලං මග යව'යි නො වදරා සීවලි මහ තෙරුන් වහන්සේ ගේ කුශල විපාක දෙන්ට අවසර ලත් නියා ව දැන ඉදින් සීවලි තෙරහු එත් නම් ලං මග යම්හ'යි වදළ සේක.

බුදුන් මගට නික්මුණු කලට දෙවියෝ අපගේ ස්වාමිදරු වූ සීවලි මහ තෙරුන් වහන්සේට සත්කාර කරම්හ'යි සිතා සතර ගවු සතර ගවු විතරේ විහාර මවා ලා සතර ගවුවෙන් වඩා ත් වැඩිය නො දී උදෑසන ම දිව කැඳ හා දිව අවුළු පත් හැරගෙන අපගේ සීවලි මහ තෙරුන් වහන්සේ කොයිදැ'යි විචාරා ඇවිදිති. තෙරුන් වහන්සේ තමන් වහන්සේට උපන් දෙය බුදු පාමොක් සඟනට දෙවන සේක. මෙ සේ බුදුහු සහ පිරිවරින් එක විසි ගවුවක් විතර මග සීවලි මහ තෙරුන් වහන්සේගේ කුශලානුභාවයෙන් උපන් දෙය ම වළඳමින් වඩනා සේක.

රේවත තෙරුන් වහන්සේ ද බුදුන් වඩනා නියා ව දැන බුදුන්ට ගඳකිළියක් හා කුළු ගෙවල් පන් සියයක් හා පන් සියයක් සක්මන් හා රෑ වසන තැන් ඵන්සියයක් හා දවල් වසන තැන් පන් සියයක් ද මවා ලූ සේක. බුදුහු උන්වහන්සේ ලඟ මසක් විතර රැඳුණු සේක. එහි රඳා ත් සීවලි මහ තෙරුන් වහන්සේ ගේ කුශලානුභාවයෙන් උපන් දෙය ම වළඳන සේක. කැටි ව ගිය වහන්දෑ ගෙන් යම් තෙනක දීත් කටයුතු නො දැන්මට බොහෝ සේ මුල් ව සිටිනා හෙයින් මාලු දෙ නමෙක් 'බුදුන් ඛිහිරිවනයට වඩනා කල මෙ මහණ මෙතෙක් නව කර්මාන්ත කරවන්නේ මහණ ධමක් කෙ සේ කෙරේද? බුදුහු සැරියුත් මහ තෙරුන් වහන්සේ ගේ මලණුවෝ යයි මූණු බලා මූන් ළඟට ආ සේකැ'යි සිතූහ.

බුදුහු එ දවස් අළුයම ලොව බලන සේක් ඒ වහන්දෑ දැක ඒ වහන්දෑ සිතූ සිත ත් දැන ගෙන එහි මසක් විතර රඳා ලා වඩනා දවස් යම් සේ මාලු දෙ නමගේ තෙල් ගුළා ත්, ඩබරා ත්, වානු ත් සඟවන් ඒ දෙ නමට නො වේ නම් එ ලෙසට ඉටා ලා වැඩ පී සේක. වැඩ ලා විහාර සීමා ගෙවා පී කලට රේවත තෙරුන්

වහන්සේ ද සෘද්ධිය හළ සේක. ඉක්බිත්තෙන් මහලු වහන්දෑ ත් අපි මේ මේ දෙය සලකුණු තුහුම්හ'යි පෙරළා ගොසින් බුදුන් වැඩ පියන්නා ම අර ඒ හැම නැති වූ හෙයින් එ තැන සලකා ගත නො හී කිහිරි කටු පය ඇන ගෙන ගුළා මුළාවෙ ඇවිද එක් කිහිරි ගසක එල්වා තුබූ තෙල් ගුළා ඩබරා ආදි ය දැක හැර ගෙන නික්මුණු සේක.

බුදුහු ත් වහන්දෑ පිරිවරා නැවත මසක් විතරින් සීවලී මහ තෙරුන් වහන්සේ ගේ කුශලානුභාවයෙන් උපන් දෙය වළඳමින් පූර්වාරාමයට වැඩි සේක. ඉක්බිත්තෙන් ඒ මාලු දෙනම ද උදුසන දාවැටි වළඳා ලා ආගන්තුක බත් දෙන විශාඛාවන්ගේ ගෙට කැඳ වළඳනු නිසා ගොසින් කැඳ අවුළු පත් වළඳා ලා හුන් සේක. විශාඛාවෝ ද 'ස්වාමීනි, මුඹ වහන්සේ ලා දෙ නම බුදුන් හා කැටි ව රේවත ස්වාමීන් වසන තැනට වැඩි සේක්දෑ'යි විචාරා එ සේ ය යි කී කල්හි 'ස්වාමීනි, උන්වහන්සේ වසන තැන් ඵාසු දෑ'යි විචාළහ. සෘද්ධ්‍යානුභාවයෙන් එ ලෙසක් ව ලා සෘද්ධිය හැර ලූ කලට පෙර සැටිය වූ නියාව සලකා ගත නො හී වයසින් මුකුරා ගිය බව මුත් නුවණ ලා හෙයින් 'එ තැන ඵාසුවක් කොයි ද? සුදු කටු ඇති කිහිරි ගසින් ම සැදී සිටි යක්‍ෂයන් වසන තැනක් වැන්නැ'යි වදළ සේක. ඒ දෙ නම ගිය කලට බාල දෙ නමක් ඒ ගෙට වළඳන්ට ගිය සේක.

උපාසිකාවෝ දැජ් දෙ නමට ත් කැඳ අවුළු පත් පිළිගන්වා ලා රේවත තෙරුන් වහන්සේ වසන තැන පවත් විචාරා ඒ දෙ නම එ තැන සැටි කියා ලන්ට නොපිළිවන සුධර්ම දෙව් සභාවට ත් වැඩි යන තරම සෘද්ධීන් මවා ලූ දෙයක් වැන්නැ'යි කී සේක. උපාසිකාවෝ සැදෑ මතු නො ව නුවණ ත් බලව ත් හෙයින් සිතන්නෝ 'ආදි වහන්දෑ එක් ලෙසක කී සේක. මෙ වහන්දෑ මෙ ලෙස කී සේක. පළමු ආ වහන්දෑ කිසිවක් සලකුණු නැති ව තබා පියා සෘද්ධි ය හළ කලව ගොසින් ආ නියා ය. මේ වහන්දෑ සෘද්ධි ය නො හරනා තෙක් ආ නියා ය'යි සිතා ගෙන බුදුන් වැඩි කලට විචාරමි' සිතූ ය. නො බෝ ඇසිල්ලෙ-කින් ම බුදුහු ත් මහණ ගණා පිරිවරා විශාඛාවන්ගේ ගෙට සිහා වැඩ පනවන ලද බුදු හස්නෙහි වැඩ හුන් සේක.

විශාඛාවෝ ද බුදුපාමොක් වහන්දෑ වළඳවා ලා වළඳා අන්ත-යෙහි බුදුන් අතින් විචාරන්නෝ 'ස්වාමීනි, මුඹ වහන්සේ ලා කැටි ව ගිය වහන්දෑ ගෙන් සමහර වහන්දෑ රේවත තෙරුන්

වහන්සේ වසන තැන කිහිරි ගසින් ගැවසී ගත් මහ වලෙකැ'යි කී සේක. සමහර තැන් ඉතා සිත්කලු ය යි කී සේක. ඒ කිම් දැ'යි කිවු ය. බුදුහු 'විශාඛාවෙනි, ගම වුව ත් වල වුව ත් යම් තැනෙක රහත්හු වෙසෙ ත් නම් උන්ගේ අදහස රමණීය ගුණෙන් සිත් කලු වන්නා සේ එ තැන ත් සිත්කලු ය'යි වදරා බණ වදරණ සේක් 'කිසි සේ ත් රහත්හු ග්‍රාමාන්තයෙහි දී කාය විවේක ය නොලබ ත් නමුත් චිත්ත විවේක ය ලබති. දෙවියන්ගේ රූ වැනි රූ වුව ත් උන්ගේ සිත සොලවා ලිය නො හෙයි. එ හෙයින් කුමක් වුව ත් වල වුව ත් ගම වුව ත් වළෙක වුව ත් ගොඩක වුව ත් යම් තැනෙක රහත්හු විසූ නම් ඒ බිම් පියස කවු වේ ව යි කුමක් වේවයි සිත් කලු ය යි වදාළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ.

අනික් දවසක දී වහන්දැ කථාවක් කරණ සේක් 'ඇවැත්නි, සීවලී මහ තෙරුන් වහන්සේ කවර කාරණයකින් සත් අවුරුදු සත් මස් සත් දවසක් මවු කුස විසූ සේ ක් ද? කවර කාරණයකින් නරකයෙහි පැසුණු සේක් ද? ලාභී වූයේ කවර කාරණයකින් දැ'යි කියා කථාවක් ඉපැද වූ සේක. බුදුහු ඒ අසා 'කුමක් කියවු දැ'යි විචාරා කරමින් හුන් කථාව දැන් වූ කල්හි ආදි කොට ලාභී වීමට නිසි ව කළ පින් කම වදරන සේක් 'මහණෙනි, මා බුදු වූ මෙ කපට එකානූ වන කප විපස්සී නම් බුදුහු ලොව ඉපැද එක් සමයෙක දනවූ සැරිසරා බොහෝ වූ සත්‍වොපකාර කොට පිය රජ්ජුරුවන් හිඳිනා නුවරට පෙරළා අවු ය. රජ්ජුරු-වෝ ද බුදු පාමොක් සඟනට අමුතු දනක් සරහා ලා අපගේ දනට මුසු වුව මැනැවැ'යි නුවර වැස්සන්ට කියා යවුහ. උයි ත් විධාන ලෙසින් මුසු ව ලා 'එක රජ්ජුරු කෙණකුන් තනි ව ම මෙ සේ දුන් කළ අපි හැම දෙන ම එක් ව මෙයිට වඩා දෙම්හ'යි බුදුන් පවරා ගෙන දෙ වන දවසට දන් සරහා ලා දන් බලන්ට එන්ට රජ්ජුරුවන්ට කියා යවු ය.

රජ්ජුරුවෝ ත් අවුත් උන් හැමගේ දන් බලා එ සේ වූ දෙයෙහි උපදනා දනට අභිමාන ය නම් සෙවිතව්‍ය මානයක් හෙයින් 'මුන් ඇමගේ දනට වඩා මම දන් දෙම්'යි තුන් වන දවසට ආරාධනා කොට දන් දී ත් රජ්ජුරුවෝ නුවර ඇත්ත-වුන්‍ ත් නුවර ඇත්තෝ රජ්ජුරුවනු ත් පරදවා ගත නො හෙති. නුවර ඇත්තෝ ස වැනි දවස් 'සෙට දවස් අප දෙන දන මේ මේ දෙය නැතැ'යි කියා ලන්ට බැරි වී නම් එ ලෙසට දනක් දෙම්හ'යි සිතා ගෙන සත් වන දවසට දන් සරහා ලා මේ දනෙහි නැත්තේ කුමක් දෝ හෝ යි බලන්නෝ කකාළ මී බොහෝ ව ඇත ත් අලුත සලා ගෙනා නො කකාළ මීයක් නැති නියාව දුටුවු ය.

Non-Commercial Distribution

ඔහු හැම දෙන අලුත් මී නිසා නුවර සතර වාසල සාර දහසක් රන් හැර ගෙන සිටියහ.

ඉක් බිත්තෙන් එක් දනවු වැසි මිනිසෙක් ගම මුදලින් දක්නට එන්නේ අතුරු මඟ මීයක් දැක මී මැස්සන් එළවා පියා දඬුවෙල්බෑ මීයක් හෙයින් අත්ත පිටින් ම කඩා ගෙන 'ගම මුදලින්ට දෙමි' කියා ලා ගම්මුදලිනු ත් නුවර හෙයින් නුවර ඇතුළට වද්දී. මී පිණිස වාසල කෙරෙහි සිටියාහු ඔහු දැක 'පින්වත, විකුණන මීයෙක් ද'යි විචාරා 'විකුණන මීයෙක් නො වෙ'යි කී කල්හි 'හිඳ පින්වත, මේ මස්ස හැර ගෙන දෙව'යි කිවු ය. අරේ, සිතන්නේ මේ දඬුවෙල්බෑ සතළිස් වියටකු ත් නො වට්ටි. මූ වියට ගණිතින් වී නම් එක් සිය සැට වියටක් විතර දෙම්හ'යි කියති මුන්ගේ රන් බොහෝ නියා වේ ද? මම ත් අග ය වඩමි'යි සිතා ලා 'මස්සකට නොදෙමි'යි කී ය. 'එසේ වී නම් දෙ මස්සකට දෙව'යි කියා 'එ සේ ත් නො දෙමි' කී හෙයින් රන් අග ය වඩ වඩා කියාගෙන ගොසින් මේ දහස හැර ගෙන දෙව'යි කියා ලා දහසින් බඳ පියල්ල ම දික් කළහ. දඬුවෙල් බෑය ඇති තැනැත්තෝ ''තොපට නුසුවයෙක් ඇති නියා ද? නොහොත් රන් තොපගේ බොහෝ හෙයින් ලන ඕනා[1] තැන් නැති නියා ද? සතළිස් වියටකු ත් නො වටනා මීයට 'මසු දහසක් දෙමි' කියව. මේ කිම්දැ'යි විචාළහ.

'අපි ත් එ විතරෙකින් වඩා නො වටනා නියාව දනුම්හ. තෙලේ එ විතරෙකින් වඩා නො වටිත ත් තිලින් අප සිද්ධ කොට ගන්නා ප්‍රයෝජනයෙක අග ය නැත. විපස්සී බුදුන් ප්‍රධාන ව අවසැට ලක්‍ෂයක්[2] රහතන්ට දනක් සරහා ලූම්හ. ඒ දනෙහි අලුත් මී පමණක් විනා සෙස්ස මුළුල්ල ම ඇත. තිලී අගයක් ම නො සිතා තිලින් සිද්ධ කුසලයෙහි නිවන් අගය ම සිතා ඉල්ලුම්හ'යි කිවු ය. අර මුන් තමන් පිටිසර වැසි වුව ත් තමාගේ සැදෑ ව පිටිසර වැසි නො වන හෙයින් එ සේ වී නම් මම මිළයට නො දෙමි. එ පින්කම හෙරී වෙම් නම්[3] දෙමි' කිවු ය. නුවර ඇත්තෝ ද උන් බලවත් ව සැදෑහැ ඇති නියාව කියා ලූ බසින් ම දැන ගෙන 'හබළුවෙකින් මුහුද පැන් උකා ගන්නා සේ උන් මුසු වූ පමණෙකින් අපගේ කුසල් මුහුද අඩුවෙක් ඇද්ද? යහපත ඒ දී ලා හෙරි වන්ට[4] කියව'යි කිවු ය.

ඒ උපාසකවරුන් බුදු පාමොක් වහන්දෑ වඩා හිඳුවා ලා බත් වළඳවන වේලෙහි දී මහ රන් තළියක් ගෙන්වාගෙන දඬුවෙල්බෑ මීය මිරිකවාපු ය. මී ගෙනා තැනැත්තන් ම ගෙනා දී සැළියකු ත් ඇත. ඒ දීත් මී වත් කළ තළියේ ම ලවා පියා එක් කොට මිරිකා

---

1 ලන මනා තැන් 2 අට සැට දහසක්

3 සරි වෙම් නම්. සහාය වෙම් නම්–ඇතැම්. 4 සරිවන්ව

Non-Commercial Distribution

පියා බුදු පාමොක් වහන්දෑට දුන්හ. ඒ මී දී ද බුදුන්ට ත් අට සැට ලක්ෂයක් රහතන්ටත් කැමති විතරට සෑහිණ. තව ඉතිරිත් වී ය. තමා මදක් වුව බොහෝ තැනට කෙ සේ සෑහිණි දෑ යි නො සිතිය යුතු ය. බුදුන්ගේ බුද්ධානුභාවයෙන් සෑහිණ. සර්වඥවරයන්ගේ බුද්ධ විෂය ත් සත්වයන්ගේ කර්ම විෂය ත් ඍද්ධිමතුන්ගේ ඍද්ධි විෂය ත්, ලොක විෂය ත්, මේ සතර යම් කෙණෙක් සිතත් නම් සිතා ලිය නො හී වියරු හීමට කාරණ හෙයින් එක දඬුවෙල්බෑ මීය හා දී සැළි ය හා මෙ තෙක් දෙනා වහන්සේට සෑහුණේ කෙ සේ දෑ'යි නො සිති ය යුතු ය. බුදුන් කෙරෙහි ශ්‍රාද්ධාවෙන් කවුරුන් විසිනු ත් හදහා ගත යුතු ය.

මී දී දුන් තැනැත්තෝ මෙ විතර පින් කමක් කොට ආයු කෙළවර දෙව් ලොව ඉපැද සසර ඇවිදිනාහු එක් කලෙක බරණැස රජ කුලයෙහි ඉපැද පියාණන්ගේ ඇවෑමෙන් රජකමට පැමිණියහ. රජ දරුවන්ට නම් රාජ්‍යලොභ ය බලවත් හෙයින් පැමිණි රට ඇති ව අනික් නුවරක් ගනිමි යි ගොසින් නුවර වට කළහ. වට කොට ලා නුවර ඇත්තවුන්ට රට හෝ දුන මැනව, සටන් හෝ කළ මැනැවැ'යි කියා යවූහ. ඌ තුමූ 'අප කරණ සටනු ත් නැත. දෙන රටකු ත් නැතැ'යි කියා යවා ලා සතර වාසල ඇතුළු ලවා ගෙන කුරුබිලියෙන් පිටත්ව ලා දර පැන් ආදිය ගෙන යෙති. සටනට ගිය රජ්ජුරුවෝ ත් සතර මහ වාසල රක්නෝ අවසරක් නො ලදින් සත් හවුරුදු සත් මසක් රැකගෙන හුන්හ. රජ්ජුරුවන්ගේ මෑණියෝ'ම පුතුන් කරන්නේ කිම දෑ'යි විචාරා එ පවත දැන තමනු ත් ඒ කර්මයෙහි මුසු වුව මනා හෙයින් 'ම පුතු නුවණ නැති නියාව ය, කුරුබිලියෙනු ත් පිටත් විය නො දී එයි ත් රකින්ට කියව'යි කියා යවූහ. ඌ මෑණියන්ගේ විධාන ලෙසට ම කළහ. නුවර ඇත්තෝ පිටත් විය නො හෙන්නෝ අවාසු බලව ත් හෙයින් සත් වැනි දවස් තමන්ගේ රජ්ජුරුවන් මරා පියා රැක හුන් රජ්ජුරුවන්ට රාජ්‍ය ය දුන්හ.

ඌ මෙ කර්ම කොට මිය ගොසින් අවීචියෙහි ඉපැද දහසක් අවුරුද්දෙන් අඟලක් වඩනා පොළොව සත් ගවුවක් වඩනා තෙක් නරකයෙහි පැසී එයින් චුත ව යම් කෙණෙක් කුරුබිලිය ත් රැක සඤ්චාරය සියලු ලෙසින් සිඳු වන්ට කිවු නම් උන්ගේ කුස ම ඉපැද නුවර වට කළ සත්අවුරුදු සත් මස මවු කුස වැස කම්ම සරික්ඛකවිපාක මෙ ලෙස ය'යි හඟවා කුරුබිලි සතර සඤ්චාර ය හැරවූ තැනැත්තවුන්ගේ අකුසලයෙන් සත් දවසක් ම ගර්භමූඪ ව

Non-Commercial Distribution

බිහි ව යෑ නොහී වදන තැනැත්තවුන්ට දුක් ඉපැද වූහ. මෙ සේ මහණෙනි, සීවලී මහ තෙරහු නුවර වට කොට තමන්ගේ ප්‍රයෝග යෙන් රජ්ජුරුවන් මරවා පී පවින් එ තෙක් කල් මුළුල්ලෙහි නිරා දුක් විඳ කුරුබිලි නැවත් වූ තැනැත්තවුන් මවු කුස ඉපැද එ තෙක් කල් මවු කුස විසූ ය. අලුත් මී දුන් හෙයින් ලාභයෙන් හා යසසින් අග්‍ර බවට පැමිණියහ' යි වදළ සේක.

එ හෙයින් නුවණැත්තවුන් විසින් කවර ලෙසිනු ත් අකුසල නොෑ හැසිර කුසල්හි ම හැසිර භවභොග සම්පත් සාධා කෙළවර නිවන් සම්පත් සාධා ගනු මැනවි.

---

## 93. එක්තරා ස්ත්‍රියකගේ වස්තුව

එක් භික්ෂු කෙණකුන් වහන්සේ බුදුන්ගෙන් කමටහන් ඉගෙන ගෙන ගස් කොළ මාලු වූ එක් උයනකට වැද ලා මහණ ධම් කරණ සේක. ඒ නුවර එක් වෙශ්‍යා දුවක් එක් පුරුෂයකුට 'මම අසවල් තැනට එමි. තොප එ තැනට එව'යි සලකුණක් කියා ලා ගියහ. පුරුෂයා නායෙ ය. ඈ රැක සිට පියා ඔහු නො දක ලජ්ජාව ඇත මැත ඇවිදිනී උයනට ගොසින් භික්ෂූන් වහන්සේ වැඩහුන්නා දක ඇත මැත බලා පියා ඔබ විනා අනික් කෙණකුන් නො දක 'මේ ත් පිරිමියෙක් ම ය. මොහු වසඟ කෙරෙමි' ඔබ ඉදිරියෙහි සිට ගෙන හැඳ ගත් හිණ කඩ ලිල් නො වත ත් පෙරළ පෙරළා ත් හඳී. ඉස කේ ත් උනා පියා බඳී. මහත් කොට සිනාවකු ත් සෙයි. භාවිත සිත් ඇති භික්ෂූන් වහන්සේ හෙයින් ඈ කරණ විකට බලා මුසුප්පු වූ සේක. ප්‍රේතියකගේ විකාරයක් කොට මුත් අනිකක් කොට නො සිතූ සේක.

බුදුහු ත් 'මාගෙන් කමටහන් ගෙන ගිය භික්ෂුහුගේ පවත් කිම දෝ හෝ'යි බලන සේක් සොරකමට ගිය සොරකමින් අරුන් වහන්සේ ගේ ගුණ රුවන් හැර ගත හැකි දෝ හෝ යි සිටී තැනත්තිය දක ඈ කළ දෑ ත් භික්ෂූන් වහන්සේ සිතූ දෑ ත් දන වදරා ගඳකිළියේ වැඩ හිඳ ම උන් වහන්සේ කරා රස් කඳක් විහිදුවා ලා ළඟ වැඩ හුන්නාසේ ම 'මහණ, සක්ලෙශීන් නො ඇලෙන තැන නික්ලෙශීහු ඇලෙතී' වදරා ඔසවා ගන්ට මඳක් බර දෙයකට වත්තම් වන කලක් මෙන් කඳ බර බා තබා ගුණ බර නගන පිණිස බණ වදරණ සේක් 'පියුම් විලෙක ගම්වල මැස්සන් නො ඇලෙන්නා සේ යම් වලෙක සක්ලෙශී වූ සත්තු නො ඇලෙත් නමුත් ඒ වල නෙමේ සුපිපි මල් රුක්වලින් ගහබී හෙයින් හා වීල් තටාක ආදියෙන් යුක්ත හෙයින් නික්ලෙශීන්ට

Non-Commercial Distribution

සිතකලු ම ය. එ බඳු වල පියුම් විල්හි ඇලෙන බඹරුන් මෙන් නික්ලෙශීහු තමන් තමන්ගේ භාවනාභියොගයට නිසි හෙයින් ඇලෙති. කුමක් නිසා ඇලෙද් ද යත හොත්-තමන් පස් කම් ගුණෙහි නො ඇලෙන හෙයිනැ'යි වදාළ සේක.

දේශනා කෙළවර ඒ භික්ෂූන් වහන්සේ පිළිසිඹියා පත් රහත් ව අහසින් වැඩ ස්තුති කෙරෙමින් බුදුන් වැඳ ගෙන වැඩි සේක.

එහෙයින් නුවණැත්තවුන් විසින් වීතරාගීන් වල්හි ඇලුම් කරන්නා සේ පින් කම ඇලුම් කොට අකුසල් ගෙවා නිවන් සාක්‍ෂාත් කට යුතු.

---

# 94. තඹදාලි නම් වූ සොරාගේ වස්තුව

මෙ සේ වස්තු දශයකින් රහතන්ගේ රහත් ගුණ සැකෙවින් කියා ලා ඉක් බිති පව හැසිර ත් කිසි කලෙක සත් පුරුෂ සමවා යෙන් යම් තම් පිණෙකැ හැසුරුණොත් ගොඩ යන පරිදි දක්වන්ට තඹ දාලි නම් වූ සොරා ගේ වස්තුව කියමු.

කෙ සේ ද යත්-

එකුන් පන් සියක් විතර සොරු මිනිස් ලොව අනික් ජීවත් විය හැකි නිරවද්‍ය කට යුත්තක් ම නැත්තා සේ ගම් පැහැරීම් ආදි වූ සොර කමින් ජීවත් වෙති. ඉක් බිත්තෙන් බඳ බැම ඇති, පිඟු වන් ඇස් ඇති, තඹ වන් දාළි රැවුළු ඇති, ජූජකයන් මෙන් තව ත් තව ත් අව ලක්‍ෂණ තරම් ඇති එකෙක් සොරුන් ළඟට ගොසින් 'මම ත් මුඹ හැම හා කැටි ව රඳා ජීවත් වෙමි' කීය. ඔහු සොර දෙටුවාට පෑ ලා 'මේ ත් අප හැම ලඟ රඳමී යි කිය'යි කිවු ය. සොර දෙටුවා ඔහු බලා පියා සාමුද්‍රිකා ලක්‍ෂණ ලෙසින් මුවුව මනා ලකුණු නැති නියා ව දැක සැටියෙන් ම අව ලක්‍ෂණ හෙයින් 'මේ තමාගේ මවගේ තන ය කපා පියත ත්, පොවා ලූ කිරෙහි රසක් නො දනී. පියාගේ බොටුව කපා පියා ලේ බොත ත් මූට මුසුප්පු නැත. ඉතා තද එකෙකැ'යි සිතා ලා 'මූ අප ලඟ රඳන්ට නො කැමැත්තේ ය'යි කිවු ය. ඒ එ සේ කීව ත් නො ගොසින් ජීවත් වන ජීවිකාව මුත් පර ලොව නො සලකා සොර කම් ම නිසා සොර දෙටු වා හසර එකකු සම්මැට ව උං ලඟ රැදිණ. රඳා තමා සිත් ගත් හෙයින් ඔහු කැඳවා ගෙන සොර දෙටුවා කරා ගොසින් 'ස්වාමීනි' නුඹ වහන්සේ' තරම් නො දත් පමණක් මුත් ඉතා යහපත්හ. මූන් රඳන්නට ම වුව මැනැවැ'යි කියා සොර දෙටුවා ත් ගිවිස්වා ගෙන රැඳවී ය.

Non-Commercial Distribution

එක් දවසක් නුවර වැස්සෝ සොරුන්ගෙන් ගහට බලවත් හෙයින් රජ්ජුරුවන්ට ත් කියා ලා පිරිසකු ත් හැරගෙන සොරුන් පන්සිය ය ම හඹා අල්වා ගෙන යුක්ති දන්නවුන් කරා ගෙන ගියහ. අධිකරණ නායකයෝ උන් පොරෝ බා ලා හිස් කපන්ට නියෝග කළහ. මුන් හැම මරණෝ කවුරු දැ යි සොයා ත් එබඳු දුෂ්ට අදහස් ඇති කෙණකුන් නො දැක සොර දෙටුවාට 'තොපි මුන් හැම දෙන ම මරා පියා තොපි ත් රැකෙව, සත්කාර ත් ලබව'යි කිවූ ය. එ තෙක් කල් මුළුල්ලෙහි තමන් නිසා වීසූ හෙයින් ජීවිතයක් හා සංග්‍රහයක් නිසා කළ මනා දෙයක් නො වෙයි සිතා මරන්ට මැළි වි ය. මෙ ම ලෙසින් තම්බදයීකයා හැර සෙස්සන් විචාරා උන් හැම ත් මැළි හෙයින් හැමයට පසු ව තඹදාලියා විචාළහ.

ඒ යහපතැ යි ගිවිස උන් හැම දෙන මරා ජීවිතය ත් ලද, සත්කාර සම්මාන ත් ලද, මෙ ම ලෙසින් දකුණු දිගින් ගෙනා සොරුන් පන්සියයකු ත්, බටහිර දිගින් ගෙනා සොරුන් පන්සියයකුත් උතුරු දිගින් ගෙනා සොරුන් පන්සියයකු ත් නැගෙනහිරි දිගින් ගෙනා සොරුන් පන්සියයකු ත් සොර දෙටුවන් පටන් වෙන වෙන විචාරා මරන්නවුන් නැති හෙයින් මේ තෙමේ විධාන ලැබ දෙ දහසක් විතර සොරුන් මරා එ තැන් පටන් දවස් පතා එකකු දෙන්නකු ඔබාදීන් ගෙනා සොරුනු ත් මරමින් හවුරුදු පස් පනසක් සොරුන් මැරීම ම කෙළේ ය.

ඒ තෙමේ මාලු අවස්ථාවේ දී එක පහරින් හිස් ගසා පිය නො හෙයි. දෙ තුන් පහර ගසා මිනිසුන්ට දුක් බොහෝ කෙරෙයි. එ නුවර ඇත්තෝ සිතන්නෝ මූ මිනිසුන් මරණ ගමනේ මිනිසුන්ට දුක් මහත. මූ හැර පියන්නා අනිකෙක් පෙනී යෙ යි සිතා ඌගේ ඒ තනතුරු හැර ගත්හ.

ඒ පෙර සොරුන් මරණ කල හා පිළී හඳින්ට වේව යි, ගිතෙල් හා සමග කිරි උළු කැන් බොන්නට වේව යි, දැ සමන් මල් පළඳින්ට වේව යි, සුවඳ විලවුන් ගන්නට වේව යි, නො ලැබෙයි. ඒ හැම ඌට නැත. තනතුරෙන් පිරිහුණු දවස් කිරි උළු කැන් පිස ව යි කියා ලා පිළී ත්, දැ සමන් මලු ත්, සුවඳ විලවුනු ත්, ගෙන්වා ගෙන ගහට ගොසින් නහා පියා, පිළී හැඳ. සමන් මල් පැළඳ, සුවඳ ඇඟ ගා ගෙට අවුත් හුන. ඉක් බිත්තෙන් අලුත් ගිතෙල් මුසු කොට ඉදි කළ කිරි උළු කැඳක් ගෙනවුත් තබා ලා අතට පැන් ගෙනාවු ය. එ වේලාව සැරියුත් මහ තෙරුන් වහන්සේ සමාපත්තීන් නැඟී 'අද කො තනට යෙම් දෝ හෝ'යි තමන් වහන්සේ සිහා වඩනට නිසි තැන් බලන සේක් ඔහුගේ

Non-Commercial Distribution

ගෙයි කිරි උළු කැන් දැක 'මට සංග්‍රහයක් කෙරෙත් දෝ හෝ' යි බලන සේක් 'බොහෝ නිකම් සොරුන් මරා සිටියා වූ තඹදාළියා බොහෝ කෙලෙස් සොරුන් මරා සිටියා වූ මා දැක සංග්‍රහ කෙරෙයි, කොට ත් මහ සැප ත් ලැබෙයි, දැන වදරා සිවුරු ගැටවටු ගන්වා ගෙන පාත්‍ර ය පටවා ගෙන උන්ගේ ගෙදර සිහා සිටි සේක.

උයි ත් මහ තෙරුන් වහන්සේ දැක පහන් සිත් ඇති ව බොහෝ කලක් සොරුන් මැරීමෙන් බොහෝ පව් පිරිණ. ආයු ත් ගෙවී ගොසින් මියන්ට ත් ආසන්න වී කෙළවර අවස්ථාවෙහි වුව ත් පිණෙක් පිරිණි නම් යහපත. දැන් මෙ ගෙයි කිරි උළු කැඳකු ත් ඇත. මහතෙරුන් වහන්සේ ත් සිහා සිටි සේක. කළ පාප ය ගෙවාපියන්ට වැඩියාක් වැන්න. 'දනක් දෙමි'යි සිතා ලා බොන්නට තබාලූ හුළු කැන් ඉවත් කොට තබා ලා ගොසින් වැද ලා පවරා ගෙන ගොස් වඩා හිඳුවා ලා පාත්‍රයට උළු කැන් පිළිගන්වා ලා අලුත් හෙළ ගිතෙලු ත් වත් කොට ලා වළඳන්නට වැඩහුන් මහ තෙරුන් වහන්සේගේ ඇඟට පතක් සල සලා සිටියෝ ය. පස් පනස් හවුරුද්දක් ම කිරි උළු කැඳ ත් බොන්නට නුවූ හෙයින් කැඳ බී පියන්ට අදහස ත් බලවත. මහ තෙරුන් වහන්සේ ඒ බව දැන ලා 'උපාසකයෙනි, බොන්නට තබා ලූ උළු කැන් බොව' යි වදළ සේක.

උෟ පත සලන්ට අනික් කෙණකුන් අතට දී ලා උළුකැන් බොන්නට හුනහ. මහ තෙරුන් වහන්සේ පත් සලා සන්හිඳුවා ලිය නො හැකි කෙලෙස් ගිම් තමන් වහන්සේට සන්සුන් හෙයින් සෙසු ගිම් නිසා සලන පවන් පත අපට නොකැමැත්තේ ය. තෙල උපාසකයන්ට ම සලව'යි වදළ සේක. උයි ත් ඇඟට පත් සලව සලවා බඩ පුරා ම කැඳ බීලා අවුත් මහ තෙරුන් වහන්සේට පත් සල සලා සිට වළඳා නිමි කලට බණට ආරාධනා කළහ. මහ තෙරුන් වහන්සේ ත් කිරි උළු කැඳ වළඳා ලා දහම් රස ය දෙවන පිණිස බණ වදරන්ට පටන් ගත් සේක. උපාසකයෝ තමන්ගේ සිත බණට යොමු කොට නො හෙති. මහ තෙරුන් වහන්සේ දැන ලා, 'උපාසකයෙනි, බණට සිත යොමු කොට නො හෙවුනැ' යි වදළ සේක. තමන් බොහෝ කලක් ප්‍රාණවධ කළ හෙයින් සිත එකඟ වී බණට සිත යොමු කොට නො හැකි නියා ව කිවූ ය.

මහ තෙරුන්වහන්සේ මුන්ගේ ඒ අදහස පෙරළවා පියමහ'යි සිතා වදරා 'කුමක් ද? ඒ පව් තොපි ම සිතා ගෙන කළා ද, අනික් කෙණකුන්ගේ විධානයෙන් කළා දැ'යි විචාරා රජ්ජුරුවන්ගේ විධානයෙනැ යි කී කල්හි අනුන්ගේවිධානයෙන් කළ කල තොපට

Non-Commercial Distribution

කුමන පව් දැ'යි වදාළ සේක. මිනී මරණ සේ දැත් පමණක් මුත් කුසල් අකුසල් නොදන්නා වූ මුග්ධ ධාතුක ගැහැවි, මහ තෙරුන් වහන්සේ එ සේ වදාරන්නා ම තමංට පව් නැතැ යි සිතා ගෙන 'ස්වාමීනි, එ සේ වී නම් බණ වදාළ මැනැවැ'යි කිවූ ය. මහ තෙරුන් වහන්සේ බණ වදාර ත් වදාර ත් එකඟ ව බණ අසා විදර්ශනාවට එක් ව සිටිනා සෝවාන් මහට ආසන්න ව සිටිනා අනුලොම ඥාන ය උපදවා ගත්හ. සෝවාන් නු වූ පමණක් මුත් ආසන්න වූහ. මහ තෙරුන් වහන්සේ ද අනුමෙවෙනි බණ වදාරා ලා වැඩ පී සේක. උපාසකය නු ත් මහ තෙරුන් වහන්සේට පසු ගමන් කොට ලා රැඳුනවුන් පුක්කුසාතිය-දරුචීරිය-සුප්පබුද්ධ කුෂ්ටිය යන තුන් පක්ෂය මැරූ යකිනි ම දෙන් වෙස් මවා ගෙන අවු ත් මරා පීව. උයි ත් මිය ගොසින් තුසී පුරයෙහි උපන්හ.

ධම් සෙබෙහි ත් කථාවක් උපදනේ 'තඹදාළි නම් සොර මරුවා පස් පනස් හවුරුද්දක් සොරුන් මැරීමෙන් අද ම මිදී අද ම මහ තෙරුන් වහන්සේට දනු ත් දී අද ම මෙළේ ය. උන් උපන්නේ කොහේ දෝ හෝ'යි කථාව ඉපද වූ සේක. බුදුහු ඒ අසා වදාරා ලා මහණෙනි, තුසී පුරයෙහි උපනැ'යි වදාළ සේක. 'ස්වාමීනි, කුමක් වදාරන නියා ද? මෙ තෙක් කල් මුළුල්ලෙහි මෙ තෙක් මිනී මරා පියා ත් තුසී පුරයෙහි උපන් ද? වදාළ හෙයින් මුත් හදහා ගත හැකි දැ'යි කී සේක. 'එ සේ ය, මහණෙනි, කෙළවර අවස්ථාවෙහි වුව ත් මියන්ට තුබූ ගොයමට වට වැස්සක් මෙන් බලව ත් කල්‍යාණමිත්‍ර කෙණකුන් ලද, සැරියුත් මහ තෙරුන් වහන්සේ ගේ බණ අසා අනුලොම් නුවණ උපදවා ගෙන අනුලොම් නුවණ ත් තමා කාමාවචර හෙයින් කාමාවචර-යන්ට ත් ලොකොත්තරයන් ආසන්න බැවින් උන්ට ත් අනු-ලොම් ව ඊ දී මාර්ග උපදවත ත් ආයාස නැති හෙයින් තුසී පුරයෙහි උපනැ'යි වදාළ සේක.

'ස්වාමීනි, අනුමෙවෙනි බණ නම් පමණ දෙයක් වුව. උන් කළ පව් මහත් වුව. එ පමණෙකින් ගුණ විශෙෂය උපදවා ගත්තේ කෙ සේ දැ'යි සේක. 'මහණෙනි, මා දෙසූ බණ මදෙක, බොහෝවෙකැ'යි කුමක් නිසා පමණ කරා ද? මහණෙනි, යම් බසෙක් නිවන් ප්‍රකාශ නො කොට ආකාශ වර්ණනා ය, පර්වත වර්ණ-නා ය, වන වර්ණනා ය යනාදී නිෂ්ප්‍රයෝජන දෙයින් යුක්ත වී නම් එ සේ වූ දහස් ගණන් බසිනු ත් ප්‍රයෝජන නැත. යම් වචනයක් අසා සත්‍වයෝ අවබොධ ය කොට ගනිත් නම්, නිවන් සාධා ගනි ත් නම් චතුස්සත්‍යය යොද කියන්නා වූ එක බසෙකු ත් වේ නම්

Non-Commercial Distribution

එ ම යහපතැ'යි වදාළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙනා නිවන් දුටහ.

එ හෙයින් සත් පුරුෂයන් විසින් කාව්‍ය නාටකාදි නිෂ්ප්‍රයෝජන කථා හැර නිවනට පමුණුවා ලිය හෙන්නා වූ - බණ කථා ම ගොදුරු කොට වසන්ට උත්සාහ කටයුතු.

## 95. දාරුචීරිය තෙරුන් වහන්සේ ගේ වස්තුව

තව ද නිෂ්ප්‍රයොජන වචනයෙන් ප්‍රයොජන නැති නියාව ම හඟවන්ට දාරුචීරිය තෙරුන් වහන්සේ ගේ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්—

එක් සමයෙක බොහෝ මිනිස්සු නැව් නැඟී මුහුදු පිට ගොසින් මුහුදු මැද දී නැව් නට කල්හි මස් කැස්බන්ට බත් වූහ. ඉන් එක් කෙණෙක් පෝරුවක් බඩ තබා ගෙන පිනන්නෝ සුප්පාරක පටුන් කරා පැමිණියෝ ය. උන් හැඳ ගන්නා පෙරව ගන්නා දෙයෙක් නැත. ඌ අනික් දෙයක් නො ලදින් වියළී ගිය දරු ලැලි පටයන් වැළින් ගොතා ගෙන හැඳ පෙරව ගෙන දෙවොල කින් කබලක් හැර ගෙන සුප්පාරක නම් පටුන් ගමට ගියහ. මිනිස්සු උන් දැක කැඳ බත් ආදිය දී ලා මුන් වහන්සේ එක් රහත් කෙණෙකැ'යි සම්භාවනා කොට තකා ගත්හ. ඉදින් පිළියෙක් සමහ වී නම් මෙ හැන්දෙ ත් පෙරවියො ත් ලාභ පිරිහෙන්නේ ය'යි සිතා ගෙන උන් දෙන පිළි ත් නො ඉවසා දර සිවුරු ම හැඳ පෙරව ඇවිදිති. රහත් බැවහැර බොහෝ දෙනා කියත් කියත් 'මෙ ලෝ රහත් කෙණෙක් වෙත් නමුත් රහත් වන්ට නිසි පිළිවෙත් පුරන කෙණෙක් ඇත් නමුත් මම උන්ට ඇතුළත් වෙමි'යි සිතූහ.

මෙ සේ පව්වු අදහස් සිතූ කලට එක් කලෙක බන්ධු වූ දෙවතාවාණ කෙණෙක් දෝ හෝ නොහොත් පෙර එක් ව මහණ ධම් පිරූ කෙණෙක්—පෙර කවර කල ද යත්—කසුප් බුදුන්ගේ අස්න පසු බස්නට වන් කල්හි මෙහෙණ ආදීන්ගේ ශාසනානුරූප සනා වන කටයුතු දැක සත් දෙණකුන් වහන්සේ බලවත් මුසුප්පු ඇති ව 'ශාසන ය අන්තර්ධාන වන්නාට පෙරාතු අපට පිහිටක් කරම්හ'යි කසුප් බුදුන්ගේ ධාතු වඩා කළ සතර ගවුවක් උස ඇති රන් දාගැබ බුදුන් තරමෙ තබා වැඳ වල් වන් සේක. එක් පර්වත යක් දැක 'ජීවත් වීමෙහි ආලය ඇති කෙණකුන් තවත්නා බව ය. කාය ජීවිත නිරපෙක්‍ෂා තැනක් මෙ පර්වත මුදුනට නැඟෙන්ට වුව මැනැවැ' යි කියා ලා—හිණක් බැඳ ගෙන සත් නම ම පර්වතයට

Non-Commercial Distribution

නැඟී ලා හිණ පාත හෙළා පියා උඩ යන ගමනෙක මුත් පාත ගමනට ආල ය හැර මහණ ධමට පටන් ගත් සේක. ඒ සත් දෙනා වහන්සේ ගෙන් හැම තැනට වැඩි මාලු තෙරුන් වහන්සේ දෙ වන දවස් රහත් වූ සේක. උන් වහන්සේ හිමවත අනවතප්ත විලට වැඩ නා ලිය දැවැටි වළඳා ලා උතුරුකුරු දිවයිනට වැඩ සිඟා බත් ගෙනවුත් සෙසු ස නමට 'ඇවැත්නි, මේ දැවටි වළඳා ලා කට සෝධා පියා මින් බත් වළඳන බව ය'යි වදාළ සේක.

ඒ අසා සෙසු තැන් කුමක් ද? එන ගමනේ යම් තෙනක් පළමු රහත් වූවොත් උන්වහන්සේ සිඟා ගෙන බත් වළඳා ලා මහණ ධම කරම්හ'යි අප හැම කළ කතිකාවෙක් ඇද්දැ'යි විචාරා නැතැ යි වදාළ කල්හි 'එ සේ වී නම් අපි ත් මුඹ වහන්සේ සේ ම ගුණ විශෙෂයක් උපදවා ගත හුනුමෝ නම් අපි ම ගොසින් සිඟා ගෙන වළඳම්හ'යි කියා ලා නො ඉවසූ සේක. අරුන් වහන්සේ රහත් වූ දවසට දෙ වන දවස් රහත් වූ නමට ඉක්බිති තෙරුන් වහන්සේ අනගැමි වූ සේක. අනගැමි වෙ ලා—එ සේ ම බත් සිඟා ගෙනවුත් සෙසු තැනට පෙරත්ත කී සේක. ඒ අසා ''වැඩි මාලු තෙරුන් වහන්සේ ගෙනා බත් නො වළඳා කුඩා තෙරුන් වහන්සේ ගෙනා බත් වළඳම්හ'යි අප කළ කතිකා ඇද්දැ යි විචාරා නැතැ යි කී කලට 'එසේ වී නම් මුඹ වහන්සේ සේ ම ගුණ විශෙෂයක් ලදුමෝ නම් වළඳන දෙයක් අපි ම සිඟා ගෙන ගොසින් වළඳම්හ. නැත නො වළඳම්හ'යි නො ඉවසූ සේක. ඉන් රහත් නම පිරිනිවී සේක. අනගැමි නම බඹ ලොව උපන්දැ ය. අනික් පස් දෙනා වහන්සේ ගුණ විශෙෂයක් උපදවා ගත නො හී වියළී ගොසින් සත් වන දවස් මිය දෙව් ලොව ඉපැද මේ අපගේ බුදුන්ගේ සමයෙහි දෙව් ලොවින් චුත ව ඒ ඒ කුලවල උපන් සේක. ඉන් එක් නමෙක් පුක්කුසාති නම් රජ වූහ. එක් කෙණෙක් කුමාර කාශ්‍යප තෙරුන් වහන්සේ ය. එක් නමෙක් දබ්බමල්ල පුත්ත තෙරුන් වහන්සේ ය. එක් නමෙක් සභිය නම් පරිව්‍රාජකයා-ණන්දැ ය. එක් නමෙක් දරුචීරියයන්දැ ය.

එ කල යම් නමෙක් අනගැමි ව බඹ ලොව උපන්දැ නම් කලෙක බන්ධු වූ දේවතාවාණෝ ය'යි කීයේ උන්ට ය. ඒ බඹාණන්ට ත් සිතෙන්නේ මූ මා හා කැටි ව හිණක් බැඳ ගෙන පර්වතයකට නැඟී මහණ ධම් කළහ. එ කල එසේ කොට ලා මෙ කල නො රහත් ව ම රහතිමී කියා ගෙන එ ම තර කොට දෘෂ්ටිගතික වීමෙන් නට වූ නම් නපුර. උන්ගේ ඒ ලබ්ධි ය හරවා ලිය මනා වේ දැ'යි දරුචීරියයන්

කරා අවුත් 'බාහියයෙනි, තෙපි රහතු ත් නො වව. යම් පිළිවෙත කින් රහත් වතො ත් ඒ පිළිවෙත තොපට ත් නැත. මේ කුමන විය වුලෙක් ද ඇඟ ලා ගත්තේ ය'යි කිවු ය. බාහියයෝ ද අහස සිට කථා කරණ මහ බඹුන් දැක 'නො රහත් ව ම රහත් වීමි යි මා සිතූ නියාව නපුර. මුයි ත් මා නො රහත් නියාවක් ම කියති. ලෙව්හි රහතන් ඇති නැති නියාව මුන් අතින් විචාරමි. මා නො රහත් නියාව දත්තා සේ ම රහතන් ඇතොත් දනිති' සිතා ලා 'කුමක් ද? දේවතාවාණෙනි, මේ ලොව රහත්තු ඇද්දැ'යි විචාළෝ ය. දේවතාවාණෝ රහතන් ඇති නියාව කියන්නෝ 'හෙම්බා බාහියයෙනි, තොප මේ සිටි තැනට උතුරු දිග සැවැත් නම් නුවරෙක් ඇත. භාග්‍යවත් වූ බුදු රජුන් වහන්සේ එහි වසන සේක.

ඒ බුදුහු කෙලෙස් සතුරන් නැසූ හෙයින් හා පූජාසත්කාරාදි-යට නිසි හෙයින් හා අසාධූන්ට දුරු හෙයින් යනා දී නොයෙක් අර්‍ථයෙන් රහත් නම් වන සේක. වදරන බණ ත් ප්‍රතිවෙධ කරන්න-වුන් තමන් තමන්ගේ බල පමණකින් ප්‍රතිවෙධ ය කරත ත් ප්‍රති-වෙධ ය කරවන හෙයින් සම්‍යක් සම්බුද්ධ වන සේක' යනාදීන් මුව නො පොහොනා පරිද්දෙන් බුදු ගුණ හඟවා කථා කීහ. බාහියයෝ ද රෑ දවස් බ්‍රහ්මයාණන්ගේ කථාව අසා බලවත් ව භය ඇති ව ඒ ඇසිල්ලෙහි ම ඒ පටු ගමින් නික්ම දෙ රැයක් එක් තැනෙක නො ලැග සාර සිය අසූ ගවුව ගියහ. බ්‍රහ්මයාණන්ගේ ආනුභාව-යෙන් හෝ නොහොත් බුද්ධානුභාවයෙන් නික්මුණු දවස් හැර ලා අනික් දවස් දෙව්රම් වෙහෙරට ගියහ. බුදුහු ඒ වේලාවට සැවත් නුවරට සිඟා වැඩි සේක. බාහියයෝ බත් වළඳා ලා කායාලස්‍ය ය හරන නිසා අබ සක්මන්වල සක්මන් කරණ වහන් දැ කරා ගොසින් බුදුහු කොයි දැ'යි විචාළහ. සිඟා වැඩි ගමනේ තව වැඩියේ නැතැ'යි කියා ලා 'තෙපි කොයි සිට අවුදැ'යි විචාළ සේක. සුප්පාරක නම් පටුන් ගම සිට ය යි කී කල්හි 'කවරද අවු දැ'යි විචාරා ඊයේ සවස අයිමි'යි කී කල්හි 'ආයේ දුර සිට ය, වැද හිඳ පය සෝධා ගන තෙලු ත් පය ගහා ගෙන මදක් සැත පී ගනුව, බුදුන් වැඩි කල දකුව'යි වදාළ සේක.

'මම, ස්වාමීනි, බුදුන්ගේ වේවා'යි මාගේ වේව'යි ජීවිතයට වන උපද්‍රව නො දනිමි. එක රැයින් ම කිසි තැනක ත් නොසිට-නොහිඳ සාර සිය අසූ ගවුව ගෙවා ආයිමි. බුදුන් දැක මුත් සැත පී නො හිඳිමි' කිවු ය. එ සේ කියා ලා වඩනා තෙක් ඉවසා පියා නො හී වහ වහා නුවරට ගොසින් අනන්‍යසාධාරණ වූ බුද්ධශ්‍රීන් යුක්ත ව කප් ගිනි ගත් රුවන් මෙරක් මෙන් ද්වාත්‍රිංශ ත් මහා පුරුෂ ලක්‍ෂණයෙන් හා

Non-Commercial Distribution

අශීත්‍යනුව්‍යඤ්ජන බ්‍යාමප්‍රභා කෙතුමාලාවෙන් හා ඔරජනා බුදුන් සිහා වඩනා ගමනේ ම දැක 'නැතක් කලෙකින් ගොතම බුදුන් දිටිමි' ගොසින් ඇතුළු වීථියෙහි දී ම පසඟ පිහිටුවා වැඳගෙන පය වළලු කරදී අල්වා ගෙන 'යම් බණෙක් මට බොහෝ දවසක් සිත සුව එළවා නම් එ සේ වූ බණක් වදාළ යහපතැ'යි කිවු ය. බුදුහු සිඟන වේලා හෙයින් 'බණක් කියන්ට වේලෙක් ඇද් දැ'යි වදාළ සේක.

බාහියයෝ ද ඒ අසා 'සවාමීනි, සසර හැසිරෙන කල බත් නො ලත් විරූ කල් බොහෝව. ඊට ත් වඩා කප් අසඞඛ්‍යයක ත් බණක් ලබන්ට නැත. මුඹ වහන්සේගේ ජීවිතයට හානි බව ත් මාගේ ජීවිතයට හානි බව ත් නො දනිමි. බණ අසනු නිසා ත් මුඹ වහන්සේ දක්නා නිසා ත් රැයකින් හා අද පෙර වරුවෙන් සාර සිය අසූ ගවුවක් අයිමි. ඒ ගමන් ලුහුඬු වූවා සේ ම සසර ගමනු ත් ලුහුඬු වන්ට බණ වදාළ මැනවැ'යි දෙවෙනි වත් කිවු ය. දෙවෙනි ව ත් බුදුහු මැළි වූ සේක. එ සේ මැළි ව වදරන්ට කාරණ කවරේ ද යත්–'මූ මා දුටු වේලේ පටන් මොහට ප්‍රීති බලවත. බණ අසා ත් ප්‍රීති වෙගයෙන් ප්‍රතිවෙධ ය කට නො හෙ යි. ප්‍රීතිය ත් තුනී ව මාගේ මැළි වීම ත් නිසා උපෙක්‍ෂා ව සිටිව යි, නැවත රැයකින් හා පෙරවරුවකින් හා සාර සිය අසූ ගවුවක් ආ හෙයින් මූට අද්ධාන පරිශ්‍රමය ත් ඇත. එයි න් සන් හිඳේව'යි සිතා වදරා දෙවිටක ම මැළි වලා තුන් වන විට ආරාධනා කළ කල්හි 'එ සේ වී නම්, බාහියයෙනි, තොප විසින් දුටු දෙයෙහි දැකුම් පමණක් විය යුතු ය.' යනාදීන් බණ වදාළ සේක. ප්‍රීති වෙග ය ත් තුනී ව අද්ධාන පරිශ්‍රමයත් මඳ ව බණ අසා සව් කෙලෙසුන් නසා පිළිසිඹියා හා සමඟ රහත් වූ දැ ය. රහත් ව ලා ගිහි ව සිට රහත් වූ කල පිරිනිවී ම හෝ මහණ වීම හෝ වුව මනා හෙයින් මහණ කරන්ට ආරාධනා කළ දැ ය.

බුදුහු 'තොප මහණ වන්ට පා සිවුරු ඇද්දැ'යි විචාරා නැතැ'යි කී කල්හි 'එ සේ වී නම් පා සිවුරු සපයව'යි වදරා ලා වැඩි සේක. උන්දැ ද වැළි ත් කසුප් බුදුන් සමයෙහි විසි දහසක් හවුරුදු මහණ ධම් කරණ ගමනේ භික්ෂූන් විසින් නම් උපන් සතර පස ය අනික් කෙණකුන්ට නො දී තමා ම අනුභව කිරීම යහපතැ යි එක නමක ට ත් පාත්‍රයකින් වේව යි සිවුරකින් වේව යි සංග්‍රහයක් නො කළ දැ ය. එ හෙයින් බුදුහු සෘඩියෙන් පා සිවුරු සම්භ නො වන නියා ව දැන එහි භික්ෂුභාවයෙන් මහණ මාලු පැවිදි නො කොට සිවුරු සොයන කල වන උපද්‍රව ය දුට ත් අනිවාර්‍ය්‍ය කර්‍ම්‍ය ය හෙයින් සිවුරු සොයන්ට වදාළ සේක. සිවුරු සොයා ඇවිදිනා ගමනේ වෙරි.

Non-Commercial Distribution

යකිනී දෙන් වෙසක් මවා ගෙන අවු ත් ඇන මරා පිව. බුදුහු සිඟා වළඳා ලා බොහෝ වහන්දෑ පිරිවරා වඩනා සේක් බාහිය තෙරුන් වහන්සේගේ සිරුර කසළ තැනක හුණුවා දැක වහන්දෑ බණවා ලා 'මහණෙනි, තෙල ගෙයකින් ඇඳක් ඉල්වා ගෙන තෙල ශරීර ය හැඳ ලා ගෙන නුවරින් පිටත දවා පියා එ තැන උන්ගේ ධාතු ලා ද ගබක් කරව'යි වදාළ සේක.

වහන්දෑ ත් එලෙස කොට ලා විහාරයට ගොසින් බුදුන් කරා එළඹ තමන් වහන්සේ බුදුන් වදාළ ලෙස ම ආදහන කෘත්‍ය ය කළ නියා ව කියා ලා බාහියන් උපන්නේ කොයිද යි විචාළ සේක. බුදුහු ඔබ පිරිනිවි නියා ව වදරා ලා 'මාගේ ශාසනයෙහි වහා අවබොධ කරන්නවුන්ට මූ අග්‍ර ය' යි එතදග්‍රපාළියට දරුචීරිය තෙරුන් වහන්සේ නැඟූ සේක.

වහන්දෑ එ විට වදරන සේක් 'ස්වාමීනි, මුඹ වහන්සේ බාහිය යන් රහත් වූව' යි වදරන සේක. උන් රහත් වූයේ කවර කල ද' යි විචාරා 'මාගේ බණ ඇසූ විට ය'යි වදාළ කල්හි, බණ වදාළේ කවර විට ද'යි විචාළ සේක. 'සිඟා යන ගමනේ ඇතුළු නුවර දී ය'යි වදාළ කල්හි, 'ස්වාමීනි, මුඹ වහන්සේ අතුරු මඟ දී වදරන බණ නම් මඳක් වුව. එ පමණෙකින් රහත් වූයේ කෙසේ ද'යි විචාළ සේක. මහණෙනි, මාගේ බණ මඳයැ යි කියා ත් බොහෝ යැ යි කියා ත් කුමක් නිසා පමණ කරා ද? මේ ලොවින් පරලොවින් ප්‍රයෝජන නැති පුරවර්‍ණනාදී වූ අත්‍ර්ථාවහ නො වන දෙයින් යුක්ත වූ දහස් ගණන් කථාවෙනු ත් ප්‍රයෝජන නැත. එක කථාවක් වුව ත් ඇසූවන්ට නිවන් සාධා දී ලා නම් එ ම යහපතැ'යි වදාළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් උගන්නා අවස්ථාවෙහි ත් රාම-සීතාහරණාදි විතණ්ඩ ශාස්ත්‍ර නුගෙන තෙවලා බුදු වදන් ම උගෙන අනුන්ට කියත ත් සප්‍රයෝජන කථා ම කියා ත් තමා ත් යහපත් ව වැස අනුනු ත් යහපත් කොට වස්වා මෙ ලෝ පර ලෝ වැඩ සාධනු මැනවි.

---

## 96. කුණ්ඩලකේසි ගේ වස්තුව

තව ද නිෂ්ප්‍රයෝජන කථාවෙන් ප්‍රයෝජන ලවයකු ත් නැති නියා ව හඟවන්ට කුණ්ඩලකේසි ගේ වස්තුව දක්වමු.

Non-Commercial Distribution

කෙ සේ ද යත්—

රජගහ නුවර එක් සොළොස් හැවිරිදි විතර වූ සිටු දුවණි කෙනෙක් විශිෂ්ට වූ රූප ශොභාවක් ඇත්තාහ. ඉතා ප්‍රාසාද-වහයෝ ය. ඒ වයස පිරී සිටි ස්ත්‍රීහු ද යෞවන මදයෙන් මත් හෙයින් පුරුෂයන් කෙරෙහි ලොල් කම් ඇත්තෝ ය. උන්ගේ දෙ මව් පියෝ ද උන් මිථ්‍යාචාරයෙන් නවතනු නිසා එක කෙල් ලක මෙයට පාවා දී ලා සත් මාල් මාලිගාවේ උඩු මාලේ ශ්‍රී යහන් ගබඩාවෙක රූපත් ව උපන්නාට පාටොපයට සිර ගෙයක ලූවා සේ ලූහ. එක් කුල දරුවකු සොර කමක දී අල්වා ගෙන පිටි තල හයා බැඳ ගෙන සැමිටිවලින් මර-මරා මිනී මරණ තැනට ගෙන යෙති. ඒ සිටු දුවණියෝ ද මහත් වූ කොලාහල නිසා මේ කිම් දෝ හෝ' යි මතු මාලේ සිට බලන්නෝ මරණට ගෙන යන තැනැත්තවු දැක ඔහු කෙරෙහි පිළිබඳ සිත් ඇති ව ඌ ම පතා බතු ත් නො කා යහනට නැඟීලා වැද හොත්තෝ ය.

මුසුප්පු ව වැදහොත් නියා ව මෑණියෝ දැක කුමකට දැ'යි විචාරා මරන්ට ගෙන යන තැනැත්තවුන් දැක උන් කෙරෙහි ඇලුම් ඇති නියාව ත් උන් ලදෙ ත් මුත් නො ලදෙත් ජීවත් වීම නැති නියාව ත් කී කල්හි 'පුතණ්ඩ, එ සේ සිතන්නේ හැයි ද? මුඹ වර්ධන ව සිටියවුන් හෙයින් ගෙයි තබා ගෙන හිඳුමෝ ද? ජාති ආදීන් සරි සමාන තැනකට පාවා දිය හැක්කැ'යි කිවු ය. අපට 'අනික් කවුරුනු ත් නො කැමැත්තේ ය. මුන් නො ලදෙ ත් මියමී' කිවු ය. මෑණියෝ නො එක් ලෙස කියා ත් ගිවිස්වා ගත නො හී පියාණන්ට කිවු ය. උයි ත් කියා ගිවිස්වා ගත නො හී කළමනා කිම් දෝ හෝ යි සිතා ඒ සොරු මරන්ට ගෙන යන තැනැත්තවුන්ට මසු දහසක් සොරා යවා 'තෙලේ හැර ගෙන තුලු නො මරා අපට එවනු මැනව'යි කියා යවූ ය. එයි ත් ගිවිස ඌ සිටාණන්ට හැර ලා අනිකකු මරා පියා 'සොරු මරා පීමහ'යි රජ්ජුරුවන්ට කිවු ය. සිටාණෝ ත් තමන්ගේ දුවණියන් අර්පී ව ඌ ම කැමති හෙයින් මරණින් ගැළවුණු තැනැත්තවුන්ට සරණ-පාවා දුන්හ.

සිටු දුවණියෝ ත් එවක් පටන් ඔහු සිත් ගන්ට සව්බරණ ලා සැරහී ගෙන තුමූ ම ඕ හට බත් මාළු පිසති. කවති. පොවති. ඉස සෝධවති. නාවති. සොරාණෝ ද කීප දවසෙකින් කළ උපකා රත් නො සලකා 'මූ මරා පියා මූගේ ආභරණ හැර ගෙන රා බී ඇවි දිනවුන්ට විකොට පියා අභිප්‍රාය දෙයක් හැර ගෙන කා පියන්නේ

Non-Commercial Distribution

කවර දවසෙක දෝ හෝ යි සිතී ය. සිතා ලා එක් උපදෙසක් සලකා ලා බත් නොකා හැඳට නැඟී ලා වැද හොත්තේ ය. සිටු දුවණියෝ ගොසින් ලෙඩක් නිසාදෑ යි විචාරා නැතැ යි කී කල්හි 'අපගේ දෙ මවු පියන් ගෙන් මුසුප්පුවක් ඇති නියා දෑ'යි විචාරා 'එයි ත් නැතැ'යි කී කල්හි 'එ සේ කල මුසුප්පු හැයි දෑ'යි කිවු ය.

'සොඳුර, එ දවස් මරන්ට ගෙන යන ගමනේ සොරුන් හෙළන ගල වසන දෙවියන්ට යාදිනියක් කොට දිවි ලදිමි. දිවි තබා උන්ගේ ම ආනුභාවයෙන් මා ගෙන් කිසි ත් වියදමක් නැතිව තොප ත් ලදිමි. උන්ට පිදේනියක් දෙන්ට නැති හෙයින් මුසුප්පු-යෙමි'යි කිවු ය. 'එ විතරෙක් වී නම් මුසුප්සු වන්ට නො කැමැත්තේ ය. පිදේනි ය පුදමි. වුව මනා කිම් දෑ'යි විචාරා 'ලද පස් මල් හා සමග පැන් නුමුසු කිරි බත් වුව මැනැවැ'යි කී කල්හි 'යහපතැ යි මුළුල්ල ම සපයා ලා 'එන්න, යම්හ'යි කිවු ය. 'එ සේ වී නම් මාහැඟි පිළී ත් හැඳ ගෙන මාහැඟි වූ ආභරණ ත් ලා ගෙන කෙළ ගෙන, සී ගෙන යන ගමන හෙයින් තොපගේ නෑයනු ත් රඳවා ලා යම්හ'යි කිවු ය. උයි ත් තර ව සිත් ගන්ට ම සිතන හෙයින් එ ලෙස ම කළ හ.

ගල් පාවුලට ගිය කලට 'සොඳුර, මෙ තැන් පටන් තොප හා මා හා යත් මුත් සෙස්සන් ගෙන යන්ට බැරි ය. බොහෝ දෙනා ගෙන ගිය කල කසළ ත් කෙරෙති. නවතා ලියත් නො හැක්ක. දෙන්න පමණෙක් යම්හ. දෙවියන් පුදන්ට ගෙන යන දෙය බැවින් පිදේනිය තොප ම අල්වා ගනුව'යි කිවු ය. උයි ත් එ ලෙස ම කළහ. සොරු ත් උන් කැඳවා ගෙන සොරුන් හෙළන ගල උඩට නැංගේ ය. ඒ ගලට ත් එක් දසාවෙකින් මිනිස්සු නැඟෙති. එක් දසාවක් ප්‍රපාත ව තිබෙන හෙයින් ගල් මුඳුනෙහි සිට ලා එ තැනින් සොරුන් හෙළති. උඹ කඩ කඩ ව බිම හෙති. එ හෙයින් ඒ ගලට 'සොර පව්ව ය'යි කියති. සිටු දුවණියෝ ද ගල මුඳුනේ සිට 'බිලියම් කරන්නැ'යි කිවු ය. ඒ බැණ නො නැඟෙන්නේ ය. 'බැණ නො නැඟෙන්නේ හැයි දෑ'යි විචාළ හෙයින් 'මට බිලියමින් කම නැත. බිලියම් පිට ලා ලා තොප මෙ තැනට ගෙනෙන පිණිස ය'යි කිවු ය. 'ගෙනා යේ හැයි දෑ'යි විචාළ කල්හි 'තොප මරා පියා ආභරණ හැර ගෙන පලා යන්ට ය'යි කිවු ය.

උඹ තුමූ බා ගොසින් 'ස්වාමීනි, මා ත් අභරණ ත් මුඹ සන්තක වුව. මරන්නේ හැයි ද? ආභරණ ත් හැර ගත මැනව. මා අතිනු ත් මෙහෙ හැර ගත මැනැවැ'යි කිවු ය. ඒ කෙ සේ කීව ත් නො

Non-Commercial Distribution

ගිවිස ම මරන්ට ම තත්පර ව ගත. හිඟුනුව[1] මැනව මා මිය යාමෙන් ප්‍රයෝජන නැත. ආභරණ හැර ගෙන මාගෙනු ත් මිඩි කම හැරගත මැනවැ යි කිවු ය. ඒ අසා සොරා 'එ සේ කළ කලට තෙපි ගොසින් දෙ මවු-පියන්ට කියාල ව. එ සේ කලට අපට විනාස ය කරත් ම ය'යි කිවු ය. සිටු දුවණියෝ සිතන්නෝ මූ ගේ කටයුත්තක් ඉතා නපුරු නියා ය. නුවණ නම් ඇති වන්නා පළ හාගෙන කන්ට නො වත් ප්‍රයෝජන නිසා වුව. ආදි කුමක් සිතා කුමක් කෙළෙම් නමුත් තට ත් කළමනා දෙය දැන් තරයේ කෙරෙමි සිතා ලා 'ස්වාමීනි, එ දවස් මරන්ට ගෙන යන නියා ව දැක දෙමවු-පියන්ට කීමි. උඹ මසු දහසක් යවා ලා මැරිය නො දී ගෙන්වා ගෙන මට නිළ කොළෝ ය. මම එ වක් පටන් පක්ෂ පාත ව ම විසීමි. දැන් මරතී කියා මුසුප්පු වන්ව පිළිවන් ද? බල එකෙක් නම් මියන ගමනේ මා සිතක් මතක් සේ වැඳ ගත දුන මැනවැ'යි කිවු ය. 'යහපත, සොඳුර, වඳුව'යි කියා කවර තරමෙක වඳනා වැඳීමක් බව ත් නො දැන අවසර දී ලා ගල් කෙළවර සිටියේ ය.

සිටු දුවණියෝ ත් තුන් විටක් පැදකුණු කොට ලා සතර තැනෙක සිට වැඳ ලා 'ස්වාමීනි, මේ කෙළවර දැක්ම ය. මෙ වක් පටන් මුඹ වහන්සේ ගේ මා දැක්මකු ත් මාගේ මුඹ වහන්සේ දැක්මකු ත් නැත'යි කියා ලා ඉදිරිය දිගාවේ සිට ත් සිප ගෙන පියා පිටි පස්සේ සිට ත් සිප ගෙන පියා කුමක්දෝ සිතමින් ගල් කෙළවර පමා ව සිටියහු තුමූ පිටි පස් ව ලා එක් අතෙකින් බොටුව අල්වා ගෙන එක් අතෙකින් පිටුමුල අල්වා ගෙන උඹගේ කායබල තරමට තමන්ගේ ඥනකෘති වූ මායා බලය මහත් හෙයින් ගල් මුදුනෙන් දැමුව. හෙතෙම කඩ කඩ ව ගලින් හී මිය තෙමේ ම බිලි වි ය. සොර පව්වේ වසන දේවතාවාණෝ උන් දෙන්නාගේ ම කටයුත්ත දැක 'හැම තැන දී ම පිරිමින් උපදෙස් දනිතී නැත. සමහර තැනක ගෑනු ද උපදෙස් දනිතී'කිවු ය.

සිටුදුවණියෝ ද සොරුගේ අකුසල් නැමැති සතුරා ත් සහාය කොට ගෙන සොරු ගලින් හෙළා ලා තමන්ගේ කුසල් නමැති මිත්‍රයාණන් සහාය කොට ගෙන තුමූ ගැළවී ගෙන සිතන්නාහු 'ඉදින් මම ගෙට ගියෙම් නම් තොපගේ ගෙහිමියෝ කොයි දැ'යි විචාරති. විචාළවුන්ට මරා පිමි යි කීම නම 'හැයි නො හික්මුණු තැනැත්ති ය, දහසක් යවා ගෙන්වා ගෙන දැන් මරාපී දැ'යි එ සේ ත් දෙඩති. ඒ ත් මා මරන්ට ගෙන ගිය යි කීම නම එයි ත් තොප මරන්ට කාරණ කවරේ දැ'යි නො හදහති. කවර ලෙසින් වුව ත් ගෙට යෑමෙන් ප්‍රයෝජන නැතැ'යි සිතා ලා ආභරණ පැළඳ

---

1 හැඟිනුව–ඇතැම

Non-Commercial Distribution

ගෙන තනි ව යාමෙහි ආදීනව සලකා එයි ත් එ තැන ම දමා වල් වැද අනුක්‍රමයෙන් ඒ ඒ තැන ඇවිදිනී පරිව්‍රාජිකාවරුන් වසන පන්සලකට ගොසින් වැද ලා 'ස්වාමීනි, මා මහණ කළ මැනවැ'යි කිවු ය. උයි ත් තමන් මහණ වූ ලෙසින් මහණ කළහ. මහණ ව ලා ම ප්‍රව්‍රජ්‍යාව නම් පුරන ලද ගුණමූලික ව වන හෙයින් ගුණ විශෙෂයක් ලබනු කැමැති ව 'ස්වාමීනි, තුඹ වහන්සේගේ අනුශාසනාවෙහි උතුම් කවරේ දැ'යි විචාරා—

පරිබ්‍රාජිකාවෙනි, කිසුණු පිරියම් කොට ධ්‍යාන හෝ ඉපදවිය යුතු ය. වාද දහසක් හෝ උගත යුතු ය. අපගේ සමයෙහි තෙල දෙක උතුම් ව තිබෙ යි කිවු ය. 'ස්වාමීනි, ධ්‍යාන උපදවන්ට මට නො පිළිවන වාද දහස උගනිමි'යි කිවු ය. ඉක්බිති පරිබ්‍රාජිකාවරු ද වාද දහස උගන්වා ලා 'අප දන්නා වාද ඉගෙන නිමවුව. දූන් තොපි දඹදිව් තලෙහි ඇවිද තොප හා වාද කරන්ට සමත් කෙණකුන් බලව'යි උන් අතට දඹ අත්තක් දී ලා 'පරිබ්‍රාජිකාවෙනි, යව'යි අවසර දී කියන්නෝ 'ඉදින් ගිහි කෙණෙක් තොප හා වාද කටහුන වූ නම් උන්ට පාදපරිවාරිකා වව. ඉදින් පැවිදි කෙණෙක් වාද කිරීමට සමත් වූ නම් උන් ලඟ මහණ වව'යි උගන්වා යවූ ය. උයි ත් දඹ අත්ත අතින් ගෙන ඇවිදිනා හෙයින් ජම්බුපරිබ්‍රාජිකා නම් ව එයින් නික්ම දුටු දුටු කෙණකුන් හා වාද කෙරෙමින් ඇවිදිති. උන් හා වාද කට ගෙන කෙණෙක් සම්හනු වූ ය. ඒ ඒ තැන මිනිස්සු ජම්බුපරිබ්‍රාජිකාවෝ එති බසක් ඇසූ කල ම උන්ගේ නමට ම දුරු බා පලායෙති. ඌ තුමූ ගමකට හෝ නියම් ගමකට හෝ සිඟා වදනා කල ගම් දෙර එක් තැනෙක වැලි රැසක් කොට ලා අත්ත ඊ හිඳුවා ලා මා හා වාද කට ගෙන කෙණකුන් දඹ අත්ත මිරිකන බව ය'යි කියා ලා ගමට සිඟා වදිති. වාද තබා දඹ අත්ත ලඟට ත් යා හෙන්නෝ නැත. පරිබ්‍රාජිකාවෝ ද ඒ අත්ත මළානික වූ කල අනික් දඹ අත්තක් හැර ගනිති.

මෙ ලෙස ම කොට ඇවිදිනෝ සැවත් නුවරට ගොසින් නුවර වාසල කෙරේ දඹ අත්ත සිටුවා ලා ආදි ලෙස ම සම්මතයක් කොට ලා සිඟා නුවරට වන්නාහු ය. ගම් දරුවෝ දඹ අත්ත වට කොට ගෙන සිටියහ. සැරියුත් මහ තෙරුන් වහන්සේ සිඟා වළඳා ලා නුවරින් නික්මෙන සේක් දඹ අත්ත පිරිවරා සිටි සුහුන් දැක 'මේ කිම් දැ'යි විචාළ සේක. කුඩා සුහු මහ තෙරුන් වහන්සේට එ පවත් කීහ. ඔබ ත් 'එ සේ වී නම් දඹ අත්ත මඩුව'යි වදරා 'බම්හ'යි කී කල්හි වාද කිරීම අපට භාර ය. තෙපි මඩුව'යි වදළ සේක.

Non-Commercial Distribution

මහතෙරුන් වහන්සේගේ බසින් තුමූ උපන් උත්සාහ ඇති ව අත්ත මැඩ හඩ ගසමින් ධූලි උඩ නංවා පීහ. පරිව්‍රාජිකාවෝ අවුත් සුහුන් ම කළ දෙයකැ'යි සිතා බැණ දෙඩා 'තොප හා අප කරණ වාද නැත. කුමක් නිසා අපගේ දඹ අත්ත මැඩියා දැ'යි කිවු ය. කුඩා සුහු 'මහ තෙරුන් වහන්සේගේ බසින් අත්ත මැඩුම්හ. අපි කුමට මිරිකමෝ දැ'යි කිවු ය. ඔබ ත් එ තැන ම වැඩ සිටි හෙයින් 'ස්වාමීනි, මුඹ වහන්සේ ද මැඩ වූ සේක් ය'යි විචාළෝ ය.

ඔබ ද එ බසට වදරන සේක් 'නැහණියෙනි, අත්ත මැඩ වූවෝ එ සේ ය, අපි ය'යි වදාළ සේක. 'දඹ අත්ත මැඩ වූවා සේ ම අප හා වාද ත් කළ මැනවැ'යි කිවු ය. 'යහපත, වාද කරම්හ'යි වදාළ සේක. පරිබ්‍රාජිකාවෝ ප්‍රශ්න විචාරන්ට පස් වරු සැරියුත් මහ තෙරුන් වහන්සේ ලඟට වැඩ හිඳිනා තැනට ගියහ. නුවර මුළුල්ල අසුරන් වැද ගිය දිව්‍ය පුරයක් මෙන් ඇලලී දෙ පක්‍ෂයේ කථා අසම්හ'යි නුවර වැස්සෝ පරිබ්‍රාජිකාවන් හා කැටි ව ම ගොසින් මහ තෙරුන් වහන්සේ වැඳ ලා එකත් පස් ව හුන්හ. පරිබ්‍රාජිකාවෝ මහ තෙරුන් වහන්සේට 'ප්‍රශ්නයක් විචාරමි'යි කිවු ය. 'තබන්නේ කවර දවසකට ද? විචාරව'යි වදාළ සේක. උඹ තමන් උගත් වාද දහස ම විචාළෝ ය. මහ තෙරුන් වහන්සේ විසඳා ලූ සේක. විසඳා නිමවා ලා 'තොප විචාරන ප්‍රශ්න මෙ තෙක් ද? තවත් ඇත් ම දැ'යි විචාළ සේක. උගත් වාද එ තෙක් ම හෙයිනු ත් එ ම පිරිමසා ඇවිදි පමණක් මුත් ඔබබෙන් උගත් දෙයක් නැති හෙයිනු ත් පුරාතනයන් සිතා උපදවා ලූවා තමන් සිත ගෙන කියා ලන්ට බල නැති හෙයිනු ත් එතෙකැ'යි කිවු ය.

'තොපි අප අතින් බොහෝ ප්‍රශ්න විචාළා වේ ද? අපි ත් ඒ විසඳා කීමෝ වේ ද, තොප අතින් අපි බොහෝ කොට නො විචාරම්හ. එක සුහක් විචාරම්හ. ඒ කියවු දැ'යි විචාළ සේක. 'විචාළ මැනව, ස්වාමීනි'යි කිවු ය. 'එකක් විචාරම්හ' යි කී හෙයින් එ ම අල්වා ගෙන 'එකෙක් නම් කිම් දැ'යි විචාළ සේක. උඹ තමන් පිට ත් ශාස්ත්‍ර උගත් බව මුත් ශාසන සම ය නො දන්නා විචාළ ලෙසට විසඳන ලෙස නො දන 'ඒ කිම දැ'යි විචාළෝ ය. 'හෙම්බා පරිබ්‍රාජිකාවෙනි, තෙලේ බුදුන්ගේ පැනයෙකැ'යි කී සේක. තමන් ශාස්ත්‍රලොභී හෙයින් 'මා ත් ස්වාමීනි, ඒ උගන්වා වදාළ මැනැව'යි කිවු ය. ''බුදුහු පවා දයා ද ඉල් වූ රහල් කුමරුන්ට 'අප සේ ව ගෙන හැර ගතුව'යි වදාළ සේක. තෙපි ත් අප සේ වූ නම දෙවම්හ'' යි වදාළ සේක. 'එ සේ වී නම මා මහණ කළ

Non-Commercial Distribution

මැනව'යි කීවු ය. මහ තෙරුන් වහන්සේ ත් මෙහෙණින්නන්ට කියා ලා මහණ කැරවූ සේක. උයි ත් මහණ ව මාලු පැවිදි ව කුණ්ඩලකෙසී නම් ස්ථවිරී ව කීප දවසකින් සිවු පිළිසිඹියා පත් රහත් ව එවක මරණ දුකින් ගැළවුණාසේ ම සසර දුකිනු ත් ගැළවූහ.

ධම් සෙබෙහි ත් රැස් ව හුන් වහන්දෑ ද කුණ්ඩලකෙසීන් ඇසූ බණකු ත් බොහෝ නො වෙයි. එතකුදු වුව ත් රහත් වූ ය. එක් සොරකු හා ත් යුද්ධ කොට උයි ත් පරදවා අවු ය'යි ස්වර්ග-මොක්‍ෂ බාධක කථාවක් නො වන හෙයිනු ත් රැස් වූ තැන් විසින් තුෂ්ණීම්භූත වීම හෝ ධර්මෝපෙත කථාවෙන් යුක්ත ව ඉඳීම හෝ යුක්ත බැවින් මේ කථා කෙරෙමින් හුන් සේක. බුදුහු වැඩ විචාරා වදරා මේ නියාව දැන 'මා දෙසූ බණ මදෙකැ'යි කියා ත් බොහෝ වකැ'යි කියා ත් නො කියව. යමෙක් තෙමේ ස්ත්‍රීවර්ණනා ආදී වූ අනර්ථාවහ නො වන දෙයින් යුක්ත වූ සිය ගණන් කථා ත් තමා දෙඩන්ට සුරු හෙයින් කියා නමු ත් කිසි කෙණෙකුන්ට කිසිත් ප්‍රයෝජනයෙක් පර ලොවින් නැත. යම් කථාවක් අසා සත්‍වයෝ නිවන් දකි ත් නම් ඒ ම යහපත.

'යම් කෙණෙක් තුමූ දස දහසක් පමණ වූ ත් සතුරු සෙනඟ හා සටනට ගොසින් සටන් බිම දී තමන් යොධ හෙයින් අරුන් හැම පරදවා තුමූ ම ජය ලැබෙත් ද, සිතන්නවුන්ට යහපත සේ සිතන බව මුත් ඒ සටන උතුම් නො වෙයි. යම් කෙණකුන් රෑ වසන තැන ත් දවල් වසන තැන ත් කමටහන් මෙනෙහි කිරීමෙන් දහස් ගණනට ත් වඩා සිටිනා රා දෙස් ආදි වූ කෙලෙස් සතුරන් පරදවා නිවන් රට ලැබ සිටි ත් නම් සටන ජය ගත්තවුන් මුළුල්ලට ම උ‍ඉ උතුම්හ'යි වදළ සේක. දෙසනා කෙළවර බොහෝ දෙන සෝවාන්—සෙදගැමි-අනගැමි-රාත් වූහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් ලැදි සටන් ආදී වූ සෙසු සටන් හැර විවසුන් නමැති අතින්, මාර්ග ඥන නමැති කඩු ගෙන කෙලෙස් සතුරන් හා සටනට ම නියැළී හින්ද යුතු.

## 97. අනර්ථ විචාල බමුණන් ගේ වස්තුව

තව ද අනර්ථයෙහි හැසිරීම නපුරු වුව ත් අනර්ථාවහ ය දත යුතු නියාව හඟවනු පිණිස අනර්ථ විචාළ බමුණන් ගේ වස්තුව දක්වමු.

Non-Commercial Distribution

ඒ බමුණානෝ 'කුමක් දෝ? බුදුහු වැඩට නිස්ස ම දක්නා සේක් දෝ හෝ නො හොත් අවැඩට නිස්ස ත් දක්නා සේක් දෝ? කි ම පෙනෙන්නේ වැඩට නිස්සෙක් ම ය. අරෙ ත් විචාරමි' සිතා බුදුන් කරා ගොසින් 'ස්වාමීනි, මුඹ වහන්සේ වැඩට නිස්ස දන්නා සේක. ඒ බොහෝ දෙනාට වැඩ කරණ හෙයින් ලොකප්‍රසිද්ධ ය. අවැඩක් කළ නියාවක් පෙනෙන්ට නැත. එයි ත් දන්නේ ඇද්ද' යි විචාළහ. 'බමුණ, වැඩට නිස්ස ත් අවැඩට නිස්ස ත් දෙක ම දනිමී' වදරා ලා 'එ සේ වී නම්, අවැඩට නිස්ස මට කියන්ට වුව මැනැවැ'යි කී කල්හි 'එ සේ වී නම්, බමුණ, මෙ වක් පටන් අවැඩට නිස්ස තට වුව මනා වී නම් මා ඉතා යොදන නියා නො වෙයි. හිරු නැඟෙන තුරා ත් වැද හෙව නිඳ, සියල්ලෙහි ම මැළි ත් වව, යක්‍ෂ ගතියක් මෙන් රළු පරළු වව, කරණ දෙයක් ඇත්නම් අද ය–සෙට ය–අනිද්ද ය-නැඟෙන මස ය එන හවුරුද්ද ය යි කිය කියා දික් දූරඞ්[1] කර. මංවල උදකලාව ත් යා, පරදර ත් හැසිර—තෙලෙ ලෙස කළ කල තට වැඩෙක් වී නම් මා සියල්ලක් නො දනිති සිතා ගෙනැ'යි වදාළ සේක.

ඒ අසා බමුණානෝ 'යහපත, ගණ දෙටුවාණන් වහන්ස, ඒ දෙක ම මුඹ වහන්සේ දන්නා බව නියත ය' යි කියා ලා සාධුකාර දුන්හ. 'එම්බල, ඒ දෙක දන්නට මට වඩා කෙණෙක් නැතැ'යි වදරා ලා බුදුහු උන්ගේ අදහස් පරීක්‍ෂා කොට ලා 'බමුණ, තෝ කුමක් කොට ජීවත් වෙහි ද'යි විචාරා වදරා ලා 'දූ කෙළියෙනැ'යි කී කල්හි 'කුමක්ද, බමුණ දූ කෙළ දින යි ද, පරදී ද යි විචාරා 'සමහර විටෙක පරදිමී' කී කල්හි 'බමුණ, තෙල ලෙස අනුන් පරදවා ලබනා දෙය යහපත් නො වෙ'යි වදරා 'යම් කෙණෙක් දූ කෙළ හෝ පොර ගෙන හෝ සටන් කොට හෝ යුක්ති බැණ හෝ අනුන් පරදවා තුමූ ජය ලැබෙ ත් නම් එ සේ වූ ජය යහපත් නො වෙයි.

'යහපත් කවරේ ද යත්—කෙලෙස් සතුරන් හා විෂ්කම්භනාදී වශයෙන් සටන් කොට තමා ලබන ජය යහපත. නිකෙලෙස් බැවින් තමා දූමුණා හට නිරන්තර ම කාය වංක් සඤ්ඤම ඇති හෙයින් යම් සේ යුක්ති ආදියෙන් පැරදි කෙණෙක් පක්‍ෂබල ඇති ව ගෙන පරදවා සිටියවුන් පෙරළා පරදවා පියත් නමුත් දිව්‍ය බ්‍රහ්මාදීන් අතුරෙන් කිසි කෙණකු ත් මාර්ග භාවනායෙන් නට කෙලෙසුන් පෙරළා උපදවා මාර්ග භාවනා කළ වුන් පරදවා ලිය නො හෙති. එ හෙයින් සත් පුරුෂයන් සියලු ජය විතරට කෙලෙස් සතුරන් සාධා නිවන් රට ලදින් ලබන ජය ම යහපතැ'යි වදාළ

---

1. දූරඞ්

Non-Commercial Distribution

සේක. දෙශනා කෙළවර බොහෝ දෙන සතර මග සතර ඵලයට පැමිණියහ.

එ හෙයින් සත් පුරුෂයන් විසින් බුදුහු යම් දෙයක් උතුමැ යි වදළ සේක් වී නම් බාල කල පටන් ආයුධ ශ්‍රමයට කරණ අභ්‍යාස ය සේ කෙලෙස් සතුරන් හා සටනට සමථාදියෙහි තර ව අභ්‍යාස කොට කෙලෙස් සතුරන් හා රට සාධා නිවන් ගත යුතු.

---

## 98. සැරියුත් මහතෙරුන් වහන්සේ ගේ මයිල් බමුණානන්ගේ වත

තව ද සම්‍යක් ප්‍රතිපද ව විනා සෙස්සක් අපායට මං වත් මුත් නිවණට මං නො වන නියා ව හඟවනු පිණිස සැරියුත් මහ තෙරුන් වහන්සේ ගේ මයිල් බමුණානන්ගේ වත දක්වමු.

කෙ සේ ද යත්—

සැරියුත් මහ තෙරුන් වහන්සේ එක් දවසක් මයිල් බමුණානන් කරා වැඩ 'කුමක් ද බමුණානෙනි, කිසි පිණක් කරවු දැ' යි විචාරා 'කෙරෙමි' කී කල්හි 'කුමන පිණෙක් දැ' යි විචාළ සේක. 'මස් පතා දහසක් වියදම් කොට දන් දෙමි' කිවු ය. දන් දෙන්නෝ කාට දැ යි විචාරා නිවටුන්ට ය යි කී කල්හි කුමක් පතා දැ යි වදළ සේක. අනික් කුමක් පතමෝ ද බ්‍රහ්මයාණන්ට අප දරු හෙයින් බඹ ලොව පතා ය'යි කිවු ය, 'කුමක් ද? තෙලෙ බඹ ලොවට යන මං දැ' යි විචාරා 'එ සේ ය' යි කී කල්හි 'කීවෝ කවුරු දැ'යි විචාළ සේක. 'කීවෝ අපගේ ආචාරිවරයෝ ය' යි කිවු ය. 'තෙපි ත් තොපගේ ආචාරිවරු ත් බඹ ලොවට මං නො දනුව. උඩ තුබූ බඹ ලොවට තබා පාත තුබූ දෙව් ලොවට ත් මං නො දනුව. ඊට තබා නිවණට මඟ ත් නො දනුව. ඒ හැමයට ම මං දන්නා සේක් බුදුහු ය. මා හා කැටි ව එව, බඹ ලොවට වුව ත් ඔබ්බකට වුව ත් මං කියවා ලමි'යි උන් කැඳවා ගෙන බුදුන් ලඟට ගොසින් 'ස්වාමිනි, මෙ බමුණානෝ කියන්නෝ මෙ සේ වෙ දැ'යි උන් කී පව ත් වදරා ලා 'උන් කැමති තැනකට මං වදළ යහපතැ'යි වදළ සේක.

බුදුහු ත් 'එ සේ ද බමුණ'යි වදරා ලා 'හව ත් ගෞතමයෙනි, එ සේ ය' යි කී කල්හි බඹ ලොවට මං තබා තුන් ලොව රට තව මං දන්නා බුදුහු 'බමුණ, තා මෙ ලෙසින් හවුරුදු සිය ගණනෙක දුන් දනට ත් වඩා හැසිල්ලෙක ත් පහන් සිතින් මාගේ සවුවන් මුණ බලා පි වත් උන්ට බත් සැන්දක් පමණ දුන ත් එම උතුමැ'යි වදරා ලා පූර්වාපර සන්ධි ගළපා බණ වදරන

සේක් 'යම් කෙනෙක් මස් පතා දහස් ගණන් වියදම් කිරීමෙන් ලෞකික ජනයන්ට දන් දෙත් නම් එ සේ උන් දෙන්නා වූ දනට යම් කෙනෙක් ගුණෙන් වැඩී සිටි, යට ත් පිරිසෙයින් සෝවාන් කෙණකුන්ට වේව යි, උඩ ත් පිරිසෙයින් රහත් කෙණකුන්ට වේව යි, ගෙ දෙරට සිඟා ආවවුන්ට බත් සැන්දක් පමණ වුව ත් යපෙන පමණක් වුව ත් දළ වුව ත් කඩපොල්ලක් පමණ දීමෙන් එක දවසෙක ත් උපස්ථාන කළෝ වූ නම් ලෞකිකයන්ට දෝ නොහොත් ගුණරහිතයන්ට හවුරුදු සියයෙක දුන් දනට ත් ක්ෂෙත්‍ර සමෘර්ධිනු ත් අධ්‍යාශ ය සමෘර්ධිනු ත් එ ම උතුමැ'යි වදළ සේක. දෙශනා කෙළවර බමුණානෝ අපාය මහ හැර සග මොකට මං වූ ආවේණික ව නිවණට මං වූ සෝවාන් වූහ. සෙසු ත් බොහෝ දෙන සෝවාන් ඵලාදියට පැමිණියහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් නො එක් ලබ්ධි නමැති නො එක් මං හැර සම්‍යක් දෘෂ්ටියෙහි පිහිටා නිවන් මං නො වැරැද්ද වි ය යුතු.

---

# 99. සැරියුත් මහ තෙරුන් වහන්සේ ගේ බෑන බමුණානන් ගේ වස්තුව

තව ද මී අඹ හා එක සැටි හෙයින් ඒ ය යි සලකා කිම් ඵල නම් වූ ඵල ජාති ය අනුභව කළවුන්ට මරණ මුත් මී අඹයෙන් වන ප්‍රයෝජන නැත්තා සේ බිජුවට ය යි සිතා ඇසා වපුළවුන්ට ගොයමින් ප්‍රයෝජන නැත්තා සේ බතැ යි කියා වස කැවවුන්ට බතින් වන ප්‍රයෝජන නැත්තා සේ පිණැ යි සිතා පවෙහි හැසිර වසන්නවුන්ට අනිෂ්ට විපාකයක් විනා ඉෂ්ට විපාකයක් නැති නියාව හඟවන්ට සැරියුත් මහ තෙරුන් වහන්සේ ගේ බෑන බමුණාන කෙණකුන් ගේ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්–

සැරියුත් මහ තෙරුන් වහන්සේ සියල්ලවුන්ට වැඩ පිණිස හැසිරීම නෑයන් හැර නො වන හෙයින් එක් දවසක් තමන් වහන් සේගේ බෑන බමුණානන් කරා ගොසින් 'බමුණානෙනි, පින් කරවු දැ'යි විචාරා එ සේ ය කරමී' කී කල්හි 'කුමන පින් කම් දැ'යි විචාළ සේක. 'පසු ඝාත ය කොට වහ්නි දෙවතාවාට පූජා කෙරෙමී'යි කිවූ ය. 'කුමක් පතා දැ'යි විචාරා 'එයි ත් බඹ ලොවට යන මඟක් හෙයින් බඹ ලොව පතා ය'යි කී කල්හි 'තෙලෙ බඹ ලොවට යන මං නියාව තොපට කීවෝ කවුරු දැ'යි විචාළ සේක. තමන් නටවුන් අනුනු ත් නසන හෙයින් දිගට ම නැසී ආ තමන්ගේ

ඇදුරන් නියාව කී කල්හි 'ගමට නුවරට යන්නා වූ මහමාවත තිබිය දී වල යන්නා සේ බඹ ලොවට යන්නා වූ ධ්‍යාන මාවත තිබිය දී තෙලෙ දූයේ නරකයට මහෙක. බඹ ලොවට මං තෙපි ත් නො දනුව. තොප තබා තොප ගේ ඇදුරෝ ත් නො දනිති. දන්නෝ කවුරුද'යි සිතවූ නම් බුදුවන්නාට පෙරාතු වප් මඟුලට ගෙන ගොසින් හින්නට බල නැති කොම්බු අවසථාව හෙයින් දඹ රුප්පයේ යහනක් පනවා ලා සතප්පවා ලූ ගමනේ කැටි ව ගිය කිරි මවුන් වප් මඟුල් බලන්ට ගොසින් එ තැන අවසර නියාව දුන නැඟී සිට පලක් බැඳ හිඳ ධ්‍යාන ඉපැදවීමෙන් හා මහණ වූ පසු ආලාර-උද්දක දෙන්නා ලඟ සම වත් අට ම ඉපැදවූ හෙයින් හා බුදු වන දවසු ත් ආනාපානසති චතුර්ධ්‍යාන ය උපදවා ධ්‍යාන පාදක කොට විවසුන් වඩා බුදු වූ හෙයින් බඹ ලොවට මඟ ත් ඒ තබා නිවන් මඟ ත් දන්නා සේක් බුදුහු ය.

බුදුන් කරා වරෙ'ය යි කැඳවා ගෙන ගොසින් 'ස්වාමීනි, මූ තුමූ බඹ ලොවට යන මඟ ය යි කියා ලා මඟ තිබිය දී ම මඟ වල් ඉරති. බඹ ලොවට මඟ ත් අදහසු ත් බලා ඔබබට මඟ ත් වදාළ යහපතැ'යි වදාළ සේක. බුදුහු ත් බමුණානන් ගෙන් ආද්‍යන්ත විචාරා දූන මං කීම මුඛයෙන් බණ වදරන සේක් 'හෙම්බල බමුණ, යම් කෙණෙක් තුමූ සිතා ගෙන හෝ අනුන්ගේ බසින් හෝ බඹ ලොව පතා පසු ඝාත ය කොට වල තබා ගෙන හවුරුදු සියයක් මුළුල්ලෙහි ත් ගිනි දෙවියා පිදූ නම් එයිත් යම් කෙණෙක් ඇසිල්ලක ත් බුද්ධ ප්‍රත්‍යෙක බුද්ධාදී වූ ගුණ ඇත්තවුන්ට මල් පහන් පමණකු ත් පූජා කොළෝ වූ නම් එයි ත් දෙක එක් කළ කලට අර මුන් හවුරුදු සියයක් මුළුල්ලෙහි ගිනි දෙවියාට කළ පූජාවෙන් පිරෙන කිසි ත් පිණක් නැති හෙයින් ඇසිල්ලෙක ත් බුද්ධාදීන්ට කළ පූජා ව ම දැ සමන් මල් අට මිටක් ඇසිල්ලෙක පුද ලූ සමන් මල් කරුවන් කප් ලක්‍ෂයක් දුගතියකට නො ගොස් සැපත් වළඳා කෙළවර පසේ බුදු වන හෙයින්—එ ම උතුමැ'යි වදාළ සේක. බණ කෙළවර ගිනි දෙවියා පිදූ බමුණානෝ සෝවාන් ව එ වක් පටන් ගිනි දෙවියා හැර දෙවාතිදෙව වූ බුදුන් පිදූහ.

එ හෙයින් සුජනයන් විසින් විෂ්ණු - මහෙශ්වරාදී භක්ති නැති ව තුනුරුවන්හි ම භක්ති ඇති ව සුචරිත පුරා නිවන් දහම් පසක් කට යුතු.

## 100. සාතාගිර - හේමවත දෙදෙනා ගේ උත්පත්ති කථාව

තව ද නපුරු ව කෙ තෙක් දවස් ජීවත් වීමට ත් වඩා එක දවසක් වුව ත් යහපත් ව විසීම ම යහපත් නියාව හඟවන්ට සාතාගිර - හෙමවත දෙදෙනා ගේ උත්පත්ති කථාව කියමු.

Non-Commercial Distribution

කෙ සේ ද යත්—

බුදුවරුන් වහන්සේ පස් නමක ගෙන් හෙබියා වූ මේ භද්‍ර කල්පයෙහි විසි දහසක් හවුරුද්දට ආයු ඇති ව ඉපැද පරමායු කාලය පස් කොටසක් කළ කල කොටසක් තිබියදී සතර කොටසක් නිමවා පිරිනිවෙන හෙයින් සාර දහසක් හවුරුදු තිබිය දී ම සොළොස් දහසක් හවුරුදු ජීවත් ව වැඩ සිට ලා කසුප් බුදුන් පිරිනිවි කල්හි මහ පෙරහරින් ආදහන පූජා ව කළහ. අපගේ බුදුන් මෙන් අල්පායුෂ්ක නොව දීඝායුෂ්ක වූ බුදුවරයන් වහන්සේගේ ධාතු නො විසිරෙන හෙයින් කසුප් බුදුන්ගේ ධාතු නො විසිර රන් කඳක් මෙන් සිටි සේක.

අල්පායුෂ්ක බුදුවරුන් වහන්සේගේ ධාතු විසිරෙන්ට කාරණ කිම ද යත්—තමන් වහන්සේ බොහෝ කලක් ජීවත් නුවූ හෙයින් ධාතු පූජා නිසා ත් සත්ත්වයන්ට වැඩ සඳහා ඉසිරෙන්ට ඉවා වදරන හෙයිනි.

කසුප් බුදුන්ගේ ධාතු වඩා සතර ගවුවක් විතර උස ඇති රන් දා ගැබක් කළහ. රන් දා ගැබ කරණ ගමනේ ත් මැටියට සිරියෙල් හැර ගෙන නිකම් මැටි නො ගෙන, පැනට සුවඳ තෙල් හැර ගෙන නිකම් පැන් නො ගෙන, එකි එකී උළ මසු ලක්ෂයක් වටනා වූ රන් උළින් එක් මුණක් කිකී රජ්ජුරුවන් හා, එක් මුණක් එ ම රජ්ජුරුවන්ගේ පුත් වූ පඨවින්ධර නම් කුමාරයන් හා, එක් මුණක් සෙනෙවි රදුන් පටන් ඇමැත්තන් හා, එක් මුණක් සිටාණන් පටන් දනවු වැස්සන් හා, තම තමන්ට නිළ කොට ගෙන බඳවා නිම වූහ. සතර ගවුව ම මිනිස්සු බැඳපූ ද යත්—මිනිස්සු තමන්ට පිළිවන් විතරක් බැන්දහ. සෙස්ස දෙවියෝ බැඳ නිමවූහ.

මෙ සේ රන් දා ගැබ බැඳ නිමවා පූජාව ත් කරවා නිමි කල්හි කුල දරුවෝ දෙ යාළු කෙණෙක් ගිහි ගෙන් නික්ම බුදුන් ළඟ මහණ වූ වහන්දෑ කෙරෙහි මහණ වූ ය. එ සේ මැ යි, මහණ කරත ත් මාලු පැවිදි කරත ත් නිස දෙත ත් බුදුන් ළඟ මහණ ව මාලු පැවිදි වූ කෙණෙක් මේ තුන කරණ සේක. පසු පසු ව මහණ වූ තැනට මහණ කිරීම මාලු පැවිදි කිරීම නිස දීම බැරි ය. ඒ කුල දරුවෝ දෙ දෙනා ද මහණ ව ලා ශාසනික තැන් පිරිය යුතු වූ ධුර කීයෙක් දැ යි විචාළ සේක. ග්‍රන්ථ ධුර ය හා විවසුන් ධුරය හා දෙක නියා ව වදාළ සේක. එයි ත් තෝරා විචාළ කල්හි මහණ වූ කුල දරුවන් විසින් ඇදුරු තෙර වත් තෙර තැන් ළඟ නිසපිළිබඳ හෙයින් පස්වසක් මුළුල්ලෙහි

Non-Commercial Distribution

රඳා හිඳ වත් පිළිවෙත් පුරා පාමොක් ද දෙ තුන් බණවරක් පමණ සූත්‍ර ද උගෙන චරිත ලෙසට කමටහනු ත් ඉගෙන කුලෙහි ගෙණෙහි ඇල්මක් නැති ව වලට පලා ගොසින් රහත් වන්ට භාවනා කිරීම විවසුන් ධුරය ය. තමාගේ බල පමණින් සඟියක් හෝ සඟි දෙකක් තුනක් හෝ පස ම හෝ පාළි හෙයිනු ත් අර්ථ හෙයිනු ත් ඉගැන් ම ග්‍රන්ථ ධුර ය යි කී සේක.

ඒ කුල දරු දෙ දෙනා වහන්සේ ත් 'අපි තව බාලයම්හ. මාලු වූ කල විවසුන් පුරම්හ. මෙ අවස්ථාවේ දී ග්‍රන්ථධුර ය පුරම්හ'යි සිතා ගෙන අකුරට පටන් ගත් සේක. දෙ දෙනා වහන්සේ ම මහ නුවණැති හෙයින් නො බෝ කලකින් ම තෙවළා ධර ව විනය විනිශ්වයෙ ත් දක්‍ෂ වූ සේක. ඇසීම් පිරිවීම් නිසා කැටි ව වහන්දෑ ත් බොහෝ වූ සේක. ගණ කම නිසා ලාභය ත් බොහෝ වී ය. එකි එකී තෙරුන් වහන්සේගේ පිරිවර වහන්දෑ පන් පන් සිය ය. ශාසනාකාශයට හිර සඳ වැනි සේක. එක බුදුන් පිරිනිවියාට සර්වඥ දෙ නමක් ලොව පහළ වූවාක් වැන්න.

එ කල ලජ්ජී පෙශල ශික්‍ෂාකාමී නමෙකු ත්, අලජ්ජී නමෙකු ත් ගම්පල් වෙහෙරක එක් ව වසන සේක. ඉන් අලජ්ජී නම ගුණ ස්නෙහ රහිත වීමෙන් තෙල් හැර ගත් මුරුවටක් මෙන් රළු පරළු දෑ ය. අකුරු පුළුල්ලක් මෙන් මුබරි දෑ ය. උන්-දැගේ නපුරු තරම ලජ්ජී තැනැත්තන් වහන්සේට එක් ව හිඳිනා හෙයින් හැඟී තිබෙයි. උන් වහන්සේ ත් දන දන නො කීම නපුරු වේ ද යි සිතා 'තෙල ලෙස කිරීම සර්වඥ අනු-ශාසනාවට පිටි පා තිබෙන්ට නො කළ මැනැවැ'යි මාලු කම් කියන සේක. එ සේ කී කලට 'තෙල ලෙස කියන්ට අප ගෙන් දුටුයෙ කිම ද? ඇසුයෙ කිම දෑ'යි කියන දෑ ය. ලජ්ජී තැනැත්තන් වහන්සේ ත් අපට ඒ දනෝ ද? ඒ දන්නා සේක් වී නම් විනය-ධරයන් වහන්සේ වේ දෑ'යි කී සේක.

අලජ්ජී නම ඒ අසා 'ඉදින් විනයධර තැනක් මේ කට යුත්ත විචාළ සේක් වී නම් සතෙකිච්ඡ ලෙසට කළ දෙයක් නැති හෙයින් මෙ ශාසනයෙන් අපට පිහිටෙක් කොයි ද– සිතා විනයධරයන් වහන්සේ තමන්ට පක්‍ෂ කරණු කැමැති ව සිවුරු පිළී හැර ගෙන ඒ තෙර දෙ දෙනා වහන්සේ විනයධර කමට ප්‍රසිද්ධ ව සිටිනා හෙයින් පෙරාතු කොට ම ඔබ ගොසින් ගෙන ගිය පිරිකර දෙ දෙනා වහන්සේට දී සිත් ගෙන ලා ඔබ අතුරෙහි ම රඳා හිඳ සැදෑ ඇති වත් පිළිවෙත් සරුකෙණකුන් මෙන් අත් පා මෙහෙයට ත් පටන් ගත්හ. එක් දවසක වත් පිරිත් අන්තයෙහි

Non-Commercial Distribution

සැතපෙන්ට යව යි කීව ත් නො ගොස් ම සිටිති. තෙර දෙදෙනා වහන්සේ ත් 'කුමක් ද? කියයුත්තක් ඇති නියා ද'යි විචාළ සේක. 'එසේ ය, ස්වාමීනි, මාගේ නපුරක් දැක එක් කෙණකුන් වහන්සේ මා හා විවාදයෙක් ඇත. ඉදින් උන්වහන්සේ අවුත් මුඹ වහන් සේලාට කී සේක් නම් ධර්‍මවිනයානුකූල ලෙසට විචාරන්ට නො කැමැත්තේ ය'යි කීහ. තෙර දෙ දෙනා වහන්සේ 'සඟ මැදට එවා ලූ කටයුත්ත නො විචාරන්ට යුක්ත නො වෙයි' කී සේක. 'ස්වාමීනි, ඉදින් ඒ කටයුත්ත විචාරන ලෙසට විචාළො ත් මට ශාසනයෙන් පිහිටෙක් නැත. වන පවෙක් මට ම වන්නාට ය, මුඹ වහන්සේලාට ඉන් කිම් ද, නො විචාරන බව ය'යි කිවු ය. තෙර දෙ දෙනා වහන්සේ ත් යහපතැ'යි ගිවිසි සේක.

උයි ත් ඒ ලෙස ගිවිස්වා ගෙන තමන් රඳා හුන් විහාරයට ගොසින් විනයධර දෙ දෙනා වහන්සේගේ පක්‍ෂ කමක් නිසා ලජ්ජී තැනැත්තන් වහන්සේ හෙළා දකින්ට වන්හ. ලජ්ජී තැනැත්තන් වහන්සේ ත් 'මූ තුමූ නිරාශංකයෝ ය. විනයධර තැන් පක්‍ෂ වූ නියා ය'යි ඒ ඇසිල්ලෙහි ම ගොසින් තෙර දෙ දෙනා වහන්සේ හා කථා නො කොට පිරිවර සඟ දහස කරා ගොසින් 'හැයි ඇවැත්නි, සඟ මැදට නො පැමිණියේ නමුත් පැමිණි පසු විචාළ මනා වේ ද? ඉදින් සඟ මැදට නො පැමිණියත් ගෙන්වා විචාරා දුටු වරදකට නිස්ස කරවා ලා සමහ හෝ කැරවිය යුතු ය. තෙරවරුන් වහන්සේ දෙක ම නො කළ සේක. මේ කිම්දැ' යි කී සේක.

ඒ වහන්දෑ ත් 'අපගේ, ගුරුවරයන් වහන්සේ එකක් සිතා වේ ද උදාසීන වූයේ ය'යි තමන් වහන්සේ ත් උදාසීන වූ සේක. අලජ්ජී තැනැත්තො ත් අවසර ය ලදින් 'හැයි, ආදි විනයධර තැන් දනිති නො වේ ද කීයේ. ඒ කියන විනයධර තැනු ත් සමහ වුව. කිවමැනවැ'යි කියා ලා ලජ්ජී තැනැත්තන් වහන්සේ ම බොහෝ කලක් විසූ වෙහෙරට නො වදින්ට කියා ලා පලා ගියහ. උන් වහන්සේ ත් තෙර දෙ නම කරා ගොසින් 'මුඹ වහන්සේ උගත් බණ නියාවට කුමක් කළ නියා ද? සිත් ගත් පමණකට පවිටු පුහුලන් මුහුණු බැලූ බව මුත් ශාසන ය නො බැලූ සේක.

''ඡන්ද දොසා භයා මොහා – යො ධම්මං අතිවත්තති,

නිහීයති තස්ස යසො – කාළපක්ඛෙව චන්දිමා

යන පක්‍ෂයෙහි සිටි බව මුත්--

Non-Commercial Distribution

**"ඡන්ද දොසා භයා මොහා – යො ධම්මං නාතිවත්ත ති,**

**ආපූරති තස්ස යසො – සුක්කපක්ඛෙ ව චන්දිමා"**

යන පක්‍ෂ ය බැලූයේ ම නැත. මෙ වක් පටන් විනය විනිශ්චයක් නො කළ මැනව. කසුප් බුදුන් පිරිනිවියේ ත් අද ය. ඔබගේ සස්න නැති වූ යේ ත් අද ය'යි අඬාගෙන පලා ගිය සේක.

තෙර දෙ දෙනා වහන්සේ ත් මුසුප්පුව ගොසින් 'අනේ අපි පුද්ගලයන් මුහුණු බලා පවතිමින් සිටි සසුන් රුවන මෙබක හෙළා පූම්හ'යි කුකුස් උපදවාගෙන එ ම කුකුසින් වැඩිමහලු තෙ රුන් වහන්සේ මිය ගොසින් දෙව් ලොව ඉපැද ගත නොහී හිම වත හෙම්වත නම් පර්වතයෙහි හෙමවත නම් යක්‍ෂ ව උපන්හ. දෙ වන තෙරුන් වහන්සේ මිය ගොසින් මධ්‍ය දෙශයෙහි සාත නම් පර්වතයෙහි සාතාගිර නම් යක්‍ෂ ව උපන්හ. පිරිවර සහ දහස ත් ධර්ම් වින ය ලෙසට නො කොට ඒ දෙ නමගේ රුචි විලසට කළ හෙයින් දෙව් ලොව ඉපැද ගත නොහී යක්‍ෂ ව ඉපැද පියා සාතා ගිර–හෙමවත දෙ දෙනාහට පරිවාර වූහ. එ තෙක් දවස් කරණ දෙයක් කළමනා ලෙස කරන්ට නු වූ හෙයින් තෙලේ වූ තරම. එ තැනට උපසථාන කළ උපාසකවරු කළ මනා ලෙස කළ හෙයින් දෙව්ලොව උපන්හ.

හෙමවත–සාතාගිර දෙ දෙන ත් මහානුභාව සම්පන්න ව සක් දෙවිඳුගේ අටවිසි යක් සෙනෙවියන්ට ඇතුළත් වූහ. යක් සෙනෙ වියෝ අට විස්ස ද වැළි ත් 'මසකට අට දවසක් ගැණි සැභිණි නිසා හිමවත රත් ගල් තෙලෙහි භගලවති නම් මණ්ඩපයට දෙවි- යෝ රැස්වෙති. එ තැනට අප යා යුතු ය'යි කතිකාවක් කළහ. එ- හෙයින් සාතාගිර–හෙමවත දෙන්න ත් සෙසු පුණ්ණකාදී යක් සෙනෙවියන් හා සමග ඒ දෙවතාසමාගමයට ගොසින් ඔවුනොවුන් දක හැඳින ගෙන 'තොපි කොයි උපනු ද තොපි කොයි උපනුදැ'යි ඔවුනොවුන් උපන් තැන් විචාරා කළ කම් වූ නියාවට මද වැරැද් දකින් වූ අඩු ව දන 'අපි, සබඳිනි, විසි දහසක් හවුරුදු මුළුල්ලෙහි මහණ ධර්මකොට පාපී කෙණකුන් නිසා උන්ගේ නපුරු සමවා- යෙන් යක්‍ෂ ව උපනුම්හ. අපට දන් දුන්නෝ දෙව්ලොව උපන්හ. අපි විසි දහසක් හවුරුදු ජීවත් ව කුමක් වූ මෝ ද, ඒ උපාසකවරු එක දවසක් ජීවත් වූ නමුත් ඒ ම යහපතැ'යි තමන්ට වූ හානි නිසා මුසුප්පු වූහ.

ඉක්බිත්තෙන් සාත නම් පවුවෙහි වසන සාතා ගිර නම් යක් සෙනෙවියෝ හිමවත–හෙමවත නම් පව්වෙහි වසන හෙමවත නම්

Non-Commercial Distribution

යක් සෙනෙවියන්ට 'සබඳ, හිමවත බොහෝ ආශ්චර්‍ය්‍ය ඇත. ඉන් ආශ්චර්‍ය්‍යයක් දක හෝ අසා හෝ මට ත් කියව'යි කිවු ය. හේමවත නම් යක් සෙනෙවියෝ ද සාතාගිර නම් යක් සෙනෙවියන්ට 'සබඳ, මධ්‍ය දෙශයෙහි බොහෝ ආශ්චර්‍ය්‍ය ඇත. ඉන් ආශ්චර්‍ය්‍යයක් දක හෝ අසා හෝ මට ත් කියව'යි කිවූ ය. මෙ සේ ඒ යක් සෙනෙවියන් දෙන්නා කථා කොට ගෙන ඒ යක්‍ෂ ආත්ම භාවයෙන් තොාමි දී වසන කලට බුද්ධාන්තරයෙක් ඉක්මිණ. දහසක් හවුරුද්දෙන් අඟලක් වඩනා පොළොව සත් ගවුවක් විවර වැඩිණ. එ කල අප බෝසත්හු දිවකුරු බුදුන් සමයෙහි බුදු වන්ට පැතූ පැතීම් ඇති ව වෙසතුරු අත් බැව් දක්වා පැරුම් පුරා නිමවා තුසී පුරෙහි ඉපැද එහි ආයු පමණින් සිට දෙව් බඹුන් විසින් බුදු වීම නිසා මිනිස් ලොව උපදනා ලෙසට අයදනා ලදු ව කල් දෙස් ආදි ය බලා දෙව් බඹුන්ගේ ආරාධනා ඉවසා මිනිස් ලොව මවු කුස පිළිසිඳ ගත්හ.

එ වේලෙහි දී පොළොව ගිගිරීම් ආදි වූ දෙ තිසක් විතර ආශ්චර්‍ය්‍ය පහළ වි ය. ඒ දක මේ යක් සෙනෙවියෝ දෙන්න මේ කාරණයෙන් මේ පහළ වූ ආශ්චර්‍ය්‍ය නියාව නො දත්හ. මවු කුසින් බිහි වූ දවස් ආශ්චර්‍ය්‍ය පහළ වූ ගමනෝ ත් නො දත්හ. මහභිනික්මන් නික්මෙන දවස් පහළ වූ ආශ්චර්‍ය්‍ය දක ත් කාරණ නො දත්හ. බුදු වූ දවස් පහළ වූ අශ්චර්‍ය්‍ය දක ත් බුදුන් බුදු වූ නියාවට පහළවූ ආශ්චර්‍ය්‍ය නියාව නො දත්හ. දහම් සක බරණැස දී පවත්වන දවස් පහළ වූ ආශ්චර්‍ය්‍ය දක යක් සෙනෙවියන් දෙන්නා ගෙන් සාතාගිර නම් යක් සෙනෙවියෝ ම පළමු කොට දුටුවු ය. දක කාරණා ත් දන ගෙන සහ පිරිවරින් බුදුන් කරා ගොසින් බණ ඇසූ ය. බණ අසා ත් නිවන් එ දවස් දකගත නුහුණුවු ය. කුමක් නිසා ද යත්—උ බණ අස අසා සිට ම හෙමවතයන් සිහි කොට පියා රැස් වූ යක් පිරිස් බලනුවෝ නො දක 'එන ගමනෝ මාගේ යාළුවාණන්ට ත් සැළ නො වී ය. උ සම්හනුවූවෝය'යි සිත සිතා බණට නුවණ යොමු කරන්ට නො වී ය. බුදුහු ත් හිර ගළ හෙන්නා ම බණ ත් සන්ධි කළ සේක.

සාතාගිර නම් යක් සෙනෙවියෝ ද බණ නම් අද වදාළ බණ ම නොව ත් තවත් තවත් වදර ත් මාගේ යහළු වූ හෙමවතයනු ත් කැඳවා ගෙන අවුත් උන් හා එක් ව බණ අසම්'සිතා ඇත් වාහන අස් වාහන ගුරුළු වාහනාදිය මවා ගෙන පන් සියයක් සෙනඟ පිරිවරා හිමවත බලා නික්මුණවු ය. එ කල හෙමවත නම් යක් සෙනෙවියෝ ද බුදුන් මවු කුස පිළිසිඳ ගන්නා දවසු ත්, බිහි වන දවසු ත්, මහභිනික්මන් දවසු ත්, බුදු වන දවසු ත්, පිරිනිවන් පානා දවසු ත්, පහළ වූ දෙ තිසක් පමණ ආශ්චර්‍ය්‍ය ඇසිල්ලෙහි නැති



Non-Commercial Distribution

වත ත් ධම සක් පැවතුන් සූත් දෙසන දවසූ ත්, පස්වා දහසක් පවත්නා බණ හෙයින් ආශ්වය්‍ය දෙ තිසක් නැතක් වෙලා පවත්ති. හිමවත ත් පහළ වූ බොහෝ ආශ්වය්‍ය දක 'මා මෙහි උපන් වක් පටන් මේ හිමවුපියස මෙ ලෙස සිත්කලු වූවා දුටු විරූ නැත. මාගේ යහළු වූ සාතාගිරයනු ත් කැඳවා ගෙන අවුත් වනසිරි විඳිමි'යි සිතා හිමවත සිට මද්ධ්‍ය දෙශ ය බලා එ තැනට එති. ඔහු දෙ පක්‍ෂය ම රජගහා නුවරට උඩ අහස දී එක් තැන් ව ඔවුනොවුන්ගේ ඊමට කාරණ විචාළහ.

හේමවතයෝ 'නිදුක, මා උපන් වක් පටන් මේ හිමවු පියස රුවන් වොටුන්නක් මෙන් මෙ සේ ශොභාව ත් වූ කලක් නුදුටු විරිමි. එක් ව වන සිරි විඳින නිසා තොප කැඳවා යන්ට ආමි'යි කීහ. සාතාගිර නම් යක් සෙනෙවියෝ 'මෙ සේ හිමවත ශොභාවත් වන්ට කාරණ දනුද'යි විචාළෝ ය. 'නො දනිමි' කී කල්හි හෙම්බා නිදුකාණෙනි, මේ ආශ්වය්‍ය හුදෙක් තොපගේ හිමවත නො වෙයි. හුදෙක් දඹ දිව ම නො වෙයි. හුදෙක් මේ සක්වළ ම නො වෙයි. දස දහසක් සක් වළ මුළුල්ලෙහි ම මේ සැටි ම යමෙයට කාරණ අනිකෙක් නො වෙයි. බුදුහු ලොව පහළ ව අද ධම සක් පැවැත්වූ සේක. ඒ නිසා පහළ වි ය' යි කීහ. මෙ සේ සාතාගිරයෝ හෙමවතයන්ට බුදුන් උපන් නියාව කියා ලා 'සබඳ හෙමවතයෙනි, අද දවස ඇසළ මස පුර පසළොස්වක් දවස ය. අද රාත්‍රිය ත් පිරී නැඟී සඳෙහි සඳරසින් හා දස දහසක් සක්වළින් රැස් වූ දෙවි බඹුන්ගේ ශරීරාලොකයෙන් හා රැඳී ගියාක් මෙන් ඉතා හොබබි. ඒ හැමට ත් වඩා බුදුන්ගේ සකල ශරීරයෙන් නිකුත් සවනක් රස් සියලු ශොභාව මඩිමින් රාත්‍රි ය ඉතා හොබවයි. එ හෙයින් මෙ තරම් රාත්‍රියක් ලබන්ට බැරි ය. මේ නිසා රාත්‍රි ය සිස් නොයවා බුදුන් දක්නට යම්හ'යි හෙමවත යන්ට කිවූ ය.

හෙමවතයෝ ඒ අසා 'සාතාගිරයෝ බුදු කෙණකුන්ගේ පවත් කියති. පූරණ කාශ්‍යපාදී වූ ස දෙනෙකු ත් බුදුම්හ'යි කියා ඇවිදිති. සර්‍වඥවරයන්ගේ ලොව පහළ වීම ත් අරුම ය. ලද්ද වූ ගුණ විශෙෂ ය දතො ත් බුදු නියාව දත හැක්ක. ඒ විචාරමි' සිතා 'කුමක් ද? තොපගේ බුදුන්ගේ සිත මඩෙයි ඇති කුරක් සේ නොවළහා ලාභාදි ය නිසා වෙව් ලා නො යාමෙන් ගැඹුරු වන වළෙක හිඳුවා ලූ ටැඹක් මෙන් නිශ්චල ද? හිත අහිත සියල්ලවුන් කෙරෙහි ම මැදහත් වූ ද? ඉෂ්ට රූපාදියෙහි ඇලුම් නැත්තෝ ද?

Non-Commercial Distribution

අනිෂ්ට රූපාදියෙහි සැටීම් නැත්තෝ ද ඒ කියව. ඒ කී කල ම බුදු නියාව දත හැක්කැ'යි කිවු ය.

ඒ අසා සාතාගිරයෝ බුදුන්ගේ ගුණ විචාළ හෙමවතයන්ට තමන් දත් විවර ගුණ කියන්නෝ 'නිදුකාණෙනි, මම ඒ බුදුන් ගේ ගුණ විස්තර කොට කියන්ට කවරෙක්මි ද? මඳක් වුව ත් කියමි. තෙපි නුවණැත්තහු වී නම් බොහෝ කොට සිතා ගනුව. දෙ ලක්ෂ සතළිස් දහසක් යොදුන් බොල ඇති පස් පොළොවට පාතින් දිය පොළොව හෙයින් උඩින් සිස් හෙයින් සැලී යේ නමුත් දිය පොළොවට පාත වා පොළොව හෙයින් සාර ලක්ෂ අසූ දහසක් යොදුන් ගැඹුර ඇති දිය පොළොව සැලී යේ නමුත් නව ලක්ෂ සැට දහසක් යොදුන් බොල ඇති වා පොළොව සැලෙන හෙයින් ම සැලේ නමුත්, ඒ මාගේ ස්වාමි දරු වූ බුදු රජුන්ගේ සිත කෙලෙස් පවනින් සෙලවී යන්ට නැති හෙයින් නිසල ය. බුදු වූ අවස්ථාවෙහි නිසල වී මෙහි අරුම කිම් ද? ඡද්දන්ත ජාතක යෙහි සදත් ව උපන් කල පවා විෂ පොවා පී පළම් හීයෙන් විත් කා ත් විදි තැනැත්තවුට පර ලොවින් වූ හානි හා තමන් වහන්සේගේ ශරීරයට වූ හානි මුත් සිත වෙවුලා නො ගියේ ය. සිත අනිකක් නැති නියාව සවනක් රස් විහිදිනා දළ දෙක කපා දුන් ගමනින් ම දැනෙයි. මහාකපි ජාතකයෙහි වඳුරු ව උපන් කල පවා වළ හුණු මිනිසා ගොඩ ලා ඔළුව පළවා ගෙන ත් උඹ සිරු තැන ලූවා බුදු වන්ට සිතූ සිත ම තර කරන්ට වුව.

විධුර පණ්ඩිත ව උපන් සමයෙහි පය අල්වා ගෙන දෙ සිය සතළිස් ගවුවක් උස ඇති කාල ගිරි පර්වතයෙන් හෙළුවන්ට ත් සාධුනරධම්ම නම් බණ කියා උන්ගේ සිත මොළොක් කැරවූවා ත් තමන් වහන්සේගේ සිත සියල්ලවුන් කෙරෙහි ම මැදහත් හෙයින් වුව. තව ද ඒ බුදුහු සුව එළවනු කැමැති බැවින් හා දුක් පහ කරණු කැමැති බැවින් සියල්ලන් කෙරෙහි ම සම අදහස් ඇති සේක. තමන් වහන්සේ කෙරෙහි යම් අදහසක් ඇති සේක් වී නම්-සෙස්සවුන් කෙරෙහි ත් එ තෙක් ම ය. මහමායා බිසොවුන්ට යම් අදහසෙක් වී නම් චිඤ්චා මානවිකාවන්ට ත් එ තෙක් ම ය. සුදොවුන් රජ්ජුරුවන් කෙරෙහි යම් අදහසෙක් වී නම් අත්‍යන්ත විරොධී වූ මයිල් සුප්පබුද්ධ ශාක්‍ය රජ්ජුරුවන් කෙරෙහි ත් එ තෙක් ම ය. රාහුල තෙරුන් වහන්සේ කෙරෙහි අදහස යම් සේ වී නම් දෙවදත්ත-ධනපාල-අඞ්ගුලිමාලාදීන් කෙරෙහි ත් එ තෙක් ම ය. තව ද කවර තරම් යහපත් දෙයක ත් ඇලුම්

Non-Commercial Distribution

නැති සේක. කවර තරම් නපුරු දෙයක සැටි මුත් නැති සේක. තව ද ඒ බුදු රජුන් වහන්සේ දූන් බුදු වූ සම ය තබා අනන්ත කාලයක ත් පවින් දුරු සේක. ඒ නිසා දෙ තිස් මහා පුරුෂ ලක්ෂණ සම්භ වි ය. නැවත සියලු ලෝ වැස්සන් ගෙන් සම්භාවනා ත් ලබන සේකැ' යි කිවු ය.

හෙමවත නම් යක් සෙනෙවියෝ ද තමන් කසුප් බුදුන් සමයෙහි කළ ධර්මාභියෝග ය නො මඳ හෙයින් තුන් දෙරින් සිද්ධ වන අකුසලින් බුදුන් දුරු නියා ව විචාරීම් තබා වැඩි තරම් බුදු ගුණ විචාරන්ට බල ඇති හෙයිනු ත්, සාතාගිරයන් වැඩියුරු බුදු ගුණ කියන්ට බල ඇති හෙයිනු ත් තව ත් තව ත් විචාළහ. විචාළ විචාළ දෙය උයි ත් තමන් දත් තරමෙකින් කියන්නෝ 'තොප විචාරන්නේ ත්‍රිවිද්‍යාදියෙන් යුක්ත නියාවක් වේ ද? එ සේ ය.

'ඒ බුදුහු කෙ තෙක් කල් වුව ත් පෙර විසූ කඳ පිළිවෙළ දන්නා නුවණ ත් ඇති සේක. දිවසින් බලා දක්නට නිස්ස දිවැසිනු ත් දක්නා සේක. සව් කෙලෙසුන් ම රහත් මඟින් නැසූ සේක. මාර්ග භාවනා නිසා නො වත ත් ඵල සමවත් සම වැදීම් නිසා ඊවසුන් නුවණ ත් ඇති සේක. සිරුරු අබතුරේ දී ම රුවක් මවා මුඛයෙන් පිටත් කරණ සේක. එකක් ව බොහෝවීම් ආදීන් විසින් විකුර්වන සෘද්ධීන් ඇති සේක. අනන්ත අප්‍රමාණ සක් වළින් එ පිට වුව ත් පැවැති ශබ්ද ය අසන තරම් දිව කන් ඇති සේක. එ කී එ කී කෙණකුන්ගේ සිත සොළොස් සොළොස් ලෙසකින් දක්නා හෙයින් පර සිත් දන්නා නුවණ ත් ඇති සේක. මේ සෙසු තැනට ත් වේ ද යත්-බුදුන් තරමේ සෙසු තැනට නැත. සිවු පිරිසුදු සිල් ආදි වූ පසළොසක් පමණ චරණ ධර්මයෙනු ත් සමන්විත සේකැ'යි සාතාගිරයෝ කිවු ය.

හෙමවත නම් යක් සෙනෙවියාණෝ ත් සාතාගිරයන් හකුළුවා කියා ලූ බුදු ගුණ තුමූ විස්තර හෙයින් සිතා ගෙන සිස් වූ අහස සිටත බුදුන්ගේ නො සිස් ගුණයට සමාධි වූහ. සාතාගිරයන් කෙරෙහි ත් වඩ වඩා ම සමාධි වූහ.

එ දවස් ද වැළි ත් රජගහා නුවර ඇසළ මස හෙයින් නාක ත් කෙළියෙක් ඇත. නුවර ත් දෙව් නුවරක් මෙන් සරහා හැම දෙනා උත්සව කරණ කලට කාලී නම් වූ උපාසිකා කෙණෙක් මාළි-ගාවට නැඟී ළා සී මැදුරු කවුළු දෙර හැර ලා ඇඟට පවන් ගස්වනු නිසා කවුළු දෙර ගාවා සිටි තැනැත්තෝ යක් සෙනෙවි

Non-Commercial Distribution

යන් දෙන්නා කියන බුදුගුණ ඇසූ ය. ඒ අසා බුද්ධාලම්බන ප්‍රීති ය උපදවා ගෙන ප්‍රීතිවෙග ය විකඹමින් භාවනා කොට මාළිගාවේ සිටි තැනැත්තෝ සෝවාන් වූ හ.

ඒ යක් සෙනෙවියෝ දෙන්න ත් දහසක් යකුන් පිරිවරා මධ්‍යම රාත්‍රි වේලාට ධම් සක් පැවතුන් සූත්‍රයේ බණ අසන්ට ගිය දෙවි බඹුන් බණ නිමි හෙයින් අධිගමය ත් නිමවා ඉගිළ ගිය ත් පළඟ නුගුළුවා වැඩ හුන් බුදුන් ලඟට ගොසින් වැඳ ලා සිටියහ. වැඳ සිටි දෙන්න ගෙන් නුවණින් හා තෙජසින් වැඩි සිටියා වූ හෙමවත නම් යක් සෙනෙවියෝ 'කුමක් ඇති කල ලොව ඇති වේ ද' යනාදීන් ප්‍රශ්න විචාළහ. බුදුහු ත් 'චක්‍ෂුරාදි වූ ආධ්‍යාත්මිකායතනයන් ස දෙනා හා රූපාදි වූ බාහ්‍යායතනයන් ස දෙනා ඇති කලට ලෝ වැස්සෝ ඇත්තෝ නම් වෙති' යනාදීන් උන් කවර ලෙසින් අධිගම ය කරත ත් අර්හත්ව ය කුළු ගෙන දෙශනා නිමවූ සේක. දෙශනා කෙළවර පිරිවර යකුන් හා සමග සාතාගිර-හෙමවත දෙන්නා සෝවාන් වූහ.

එ හෙයින් සත් පුරුෂයන් විසින් මදෙකින් වැරද යෑම මුත් දෙන්නාට ම නො වන හෙයින් තම තමන් කෙරෙහි ත් වන හෙයින් ජීවිත් වන හැසිල්ලක ත් නිෂ්ප්‍රයෝජන නො කළ යුතු.

සද්ධර්ම රත්නාවලියෙහි ශාසනික තැනට ම ආවේනික කොට ලියා ලූ හෙමවත කථාව නිමි.

---

# 101. සැරියුත් මහ තෙරුන් වහන්සේ ගේ මිත්‍ර බමුණානන් ගේ කථාව

තව ද මවු දෙන සිටිය දී අනික් දෙන කරා කිරට ගිය වස්සාට ඇන්ඩෙන්[1] පාර විනා කිරක් ම නැත්තා සේ බඹ ලොවට යන මං තිබිය දී අපාය මාර්ගයෙහි හැසිරෙනවුන්ට අපාය විනා අනිකක් සම්භ නො වන නියා ව භගවන්ට සැරියුත් මහ තෙරුන් වහන්සේ ගේ මිත්‍ර බමුණානන්ගේ කථා ව දක්වමු.

කෙ සේ ද යත්—

මහ තෙරුන් වහන්සේ උන් කරා ත් ගොසින් කථාව එළවනු නිසා 'කිම ද, බමුණානෙනි, පින් කරවු ද'යි විචාළ සේක. 'එ සේ ය, සවාමීනි'යි කිවු ය. 'කුමණ පිණෙක් ද'යි විචාළ කල්හි 'බොහෝ දෑ වියදම් කොට යාග කෙරෙමි' කිවු ය. මහ තෙරුන් වහන්සේ උනුත් බුද්ධ වෙනෙය්‍ය හෙයින් බුදුන් කරා ගෙන ගොසින් බඹ ලොවට

---

1. ඇගෙන්–ඇඩෙන

Non-Commercial Distribution

යන මඟ තබා ලා වල් හිරන නියා ව වදරා බඹ ලොවට යන මඟ ත් නිවන් මඟ ත් වදළ යහපතැ'යි දැන්වූ සේක.

බුදුහු ත් බමුණානන්ට 'බඹ ලොව පතා යාග කරවු ද'යි වදරා එ සේය යි කී කල්හි 'හෙම්බා බමුණානෙනි, පන් සිල් පමණෙක ත් නො පිහිටි ලෞකික ජනයනට තෙපි ත් පින් කම් හවුරුද්දක් මුළුල්ලෙහි කරන්නාහු බොහෝ සේ මඟුල් දවස් දිය යුතු වූ දන් වුව ත්, සරහා දෙන අමුතු බත් වුව ත්, කම් පල හදහා දෙන දන් වුව ත් දෙවූ නම් ඒ මුළුල්ල ම මාගේ ශාසනයෙහි යට ත් පිරිසෙයින් සෝවාන් කෙණකුන් වේව යි, උඩ ත් පිරිසෙයින් රහත් කෙණකුන් වේව යි 'යම් කෙණෙක් පහන් සිතින් වැඳීම් පමණකු ත් කොළෝ වූ නම් උන්ට උපන් කුශල චේතනා මුළුල්ල තිබිය දී ඒ කුශලචේතනාවෙන් සිද්ධ වූ විපාක ය සතරක් කළ කල ඉන් එක් භාගයක් විතරට ත් සෙස්ස නො අග්ගී. නිස්සාර බිම් ගොයම් සේ විපාක සමෘර්ධිය නැත. තමා කාමාවචර හෙයින් බඹ ලොව ත් උපදවා ලිය නො හෙයි. බඹ ලොව උපන මනා වී නම් සිල් රැක සමථ භාවනායෙහි යෙදී ධ්‍යාන උපදවා තත්පාදක වූ මාර්ග උපදවා ගත නො හී නම් බඹ ලොව උපදව'යි වදළ සේක. දේශනා කෙළවර බමුණානෝ රූපාවචර කුසල් පසු කොට ලොවුතුරා කුසල්හි පිහිටා සෝවාන් වූහ. සෙසු ත් බොහෝ දෙන සෝවාන් ඵලාදියට පැමිණියාහ.

එ හෙයින් සත් පුරුෂයන් විසින් යම් සේ සක් විති රජ්ජුරුවෝ සතර සංග්‍රහ වස්තුවෙන් ජන සංග්‍රහ කෙරෙද්ද, එ මෙන් සිවුවනක් පිරිස් සිත් ගෙන, යම් සේ සක් විත්තන්ගේ රට සොරු නැද්ද, එ මෙන් තම තමා සතන්හි කෙලෙස් සතුරන් හින්ද නො දී, යම් සේ සක් විත්තෝ දවස් පතා මුළු සක් වළ සිසාරා ඇවිදිද්ද, එ මෙන් දවස් පතා තම තමන්ගේ ගුණ අයුණු විමසා ගුණ පක්ෂය ගෙන නුගුණ පක්ෂ ය හැර, යම් සේ සක් විත්තන්ට ඇතුළ පිටත රකවල් තර ද, එ මෙන් රූපාදි ෂඩාලම්බන විෂයෙහි පවත්නා කෙලෙස් සතුරන් රදවනු නිසා සිහි රකවල් තර කොට ලොවී ලොවුතුරා සැප ත් සිද්ධ කට යුතු.

---

## 101. දීඝායු කුමාරයානන්ගේ වත

තව ද වැඳීමෙහි අනුසස් දක්වනු සඳහා දීඝායු කුමාරයන්ගේ වත දක්වමු.

Non-Commercial Distribution

කෙ සේ ද යත් —

දිඝලම්බික නම් නුවර වසන බමුණෝ දෙන්නෙක් ශාසන යෙන් පිටත මහණ ව අට සාළිස් හවුරුද්දක් තපස් කොළෝ ය. උන් දෙන්නාගෙන් එක් කෙණෙක් 'කලත්‍රපරිග්‍රහ ය නැති කලට අපගේ කුල පරම්පරාව නස්සී'යි සිතා තමා රැකි තපස් අනුන්ට විකුට දෝ හෙවත් එහි පින් දී ගෙරි සියයකු ත් මසුරන් සියයකු ත් පාදපරිචාරිකා කෙණකුනු ත් ලදින් පුත්‍ර ප්‍රතිලාභ ය තකා කලත්‍ර පරිග්‍රහ ය කොළෝ ය. උන්ගේ ඇඹේණියෝ ත් දරු කෙණකුන් වැදූහ.

තපසේ ම සිටි යාළුවාණෝ දුරෙක රඳා ලා එ ම නුවරට පෙරළා අවු ය. උන් ආ නියාව අසා අඹු දරුවන් කැඳවා ගෙන දක්නට ගොසින් පුතණුවන් මැණියන්ට වඩා ලා තුමූ වැන්දෝ ය. මැණි යෝ ද පුතණුවන් පියාණන්ට වඩා ලා තුමූ වැන්දෝ ය. උන් දෙපක්‍ෂයට ම 'බොහෝ කලක් ජීවත් වව'යි කිවු ය. පුතණුවන් වඳවා ලූ කලට නුපුරුදු හෙයින් බැණ නො නැහෙන්නා සේ ආයු- ශක්ති ය මඳ නියාව දැන බැණ නො නැංගෝ ය. ''අප දෙන්නා වැදි ගමනේ වයස් ඇති ව සිටිය වුන්ට 'බොහෝ කලක් ජීවත්වව'යි කියා ලා මුන් බොහෝ කලක් ජීවත් වන්ට නිසි නැනැත්තන් බලා නියම දත් බව මුත් කාල චක්‍ර ය නො දත් හෙයින් බැණ නො නැඟී නියා දැ'යි විචාළෝ ය. 'මුන්ට එක් උවදුරෙක් පෙනෙ'යි කිවු ය. කෙ තෙක් දවස් ජීවත් වෙද් දැ'යි විචාළ කල්හි 'සත් දවසක් ජීවත් වෙති' කිවු ය. 'උවදුරු දුරලන්ට කාරණ ඇද්දැ'යි විචාරා නැතැ යි නො කියා 'මම නො දනිමි' කී හෙයින් 'අනික් කාරණ දන්නෝ ඇද්දැ'යි විචාළෝ ය.

'මහණ ගොයුම්හු ඊට කාරණ දනිති. ඉන්ද්‍රශාල ගුහාවෙහි දී ශක්‍රයන් වැඳ ගෙන හොත් ගමනේ ම මළවුන්ට 'ජීවත්වව'යි වදළ බස් පමණකින් මිනිස් ලොව ආයුගණනින් තුන් කෙළ සැට ලක්‍ෂ යක් අවුරුද්දට ශක්‍රයන්ට ආයු දුන් කල මුන්ට ත් මෙ වක පවත්නා ආයු දෙන්ට කාරණ ය දනිති, ඔබ යව'යි කිවු ය. 'ඔබ ගියො ත් තපසට හානි වේ දෝ හෝ යි බමි' කිවු ය. ඉදින් තොපට දරු පෙමෙක් ඇත් නම් තපස් හානි නො සලකා මහණ ගොයුම්හු කරා ගොසින් ඊට උපදෙස් විචාරව'යි කිවු ය. උයි ත් බුදුන් ළඟට ගොසින් බුදුන් ගෙනු ත් කථාව එවා ගන්නා පිණිස වැඳ ලා සිටියෝ ය. බුදුහු 'බොහෝ කලක් ජීවත් වව'යි වදළ සේක. කුමාරයන්ගේ මැණියන් වැඳ ලා සිටි කල ත් එ ලෙස වදළ සේක.

Non-Commercial Distribution

පුතණුවන් වඳවා ලූ කල මුවෙන් බැණ නො නැඟෙන්නට කාරණ ඇති නියාව බුදු නුවණින් ම දත් හෙයින් බැණ නො නැඟි සේක. බැණ නො නැඟෙන්ට කාරණ බුදුන් අතිනු ත් විචාළහ.

බුදුහු ත් තවුසාණන් බුදු නුව ත් ශිල්පානුභාවයෙන් දන කියා ලූ ලෙසට ම වදාළ සේක. වෙනස නම් පිළිබඟන්ට නිසි කාරණ උන් නො දත් බව ය. බමුණානෝ ද මේ උවදුරු සන්හිඳුවන්ට නිසි උපදෙස් ඇද්ද යි විචාරා ඇතැ යි වදාළ කල්හි 'උපදෙස් කව රේ ද'යි විචාළෝ ය. 'ඉදින් තොපි තොපගේ ගෙදර මඩුවක් ලවා ලා මඩුව මැද පිළක් ලවා ලා ඒ වට කොට ආසන අටක් හෝ සොළසක් හෝ පනවා ලා මාගේ සවුවන් එහි හිඳුවා ලා සතියක් මුළුල්ලෙහි අවිච්ඡින්න කොට පිරිතක් බණවා ගත හුනු නම් ඒ උවදුර නැති වෙ යි' වදාළ සේක. 'මම වන්නා වදාළ ලෙස සෙස්ස කරවා ලමි. වහන්දෑට මාගේ විධාන නැත. කෙ සේ ලැබෙම් ද'යි කිවු ය. 'තොප සෙස්ස කරවා ලන්නා මම වහන්දෑ එවමි' වදාළ සේක. යහපතැ යි ගිවිස තමන්ගේ ගෙ දොර කැර වුවමනා දෙය වදාළ සේ ම කරවා බුදුන් ලඟට ගියහ. බුදුහු වහන්දෑ යවූ සේක. වහන්දෑ ගොසින් හසුන්වල වැඩහුන් සේක. කුමාරයනු ත් බිම් පිළ වැද හොවා ලූ ය. වහන්දෑ ද සතිය මුළුල්ලෙහි විච්ඡේදයක් නැතිව පිරිත් බිණූ සේක.

සත් වන දවස් ත්‍රි විධොපද්‍රවයන් සන්සිඳුවන්ට විශාලාවට වැඩියා සේ ම බුදුහු ත් වැඩි සේක. බුදුන් වඩනා ම මුළු සක්වළ දෙවියෝ ත් රැස් වූහ. ගුණයට විරුද්ධ වූ අවරුද්ධක නම් යක්‍ෂයෙක් දෙළොස් හවුරුද්දක් වෙසවුණු රජ්ජුරුවන්ට සේව ය කොට උන්ගෙන් සංග්‍රහ ලබන්නේ එ දවසට සත් වන දවස් ඒ කුමාර යන් කන්ට ලද හෙයින් එහි සිටියේ ය. බුදුන් වැඩ මහෙශාක්‍ය දෙවියනු ත් රැස් වූ හෙයින් අල්පෙශාක්‍යයෝ පසු බැස අවසර පානාහු අට සාළිස් ගවුවක් විවර පසු බටහ. අවරුද්ධකයෝත් වෙස වුණන්ට කළ සේව ය මුත් බුදුන්ට කළ සේවයක් නැති හෙයින් එ සේ ම පසු බටහ. බුදුහු ත් තුන් යම් රාත්‍රියෙහි පිරිත් බිණූ සේක. සතියක් ඉකුත් ව කාල නියම ය වැරදි හෙයින් අවරුද්ධකයන්ට බිලිය ත් විරුද්ධ වි ය. අට වන දවස කුමාරයන් ගෙන වුත් බුදුන් වඳවා ලූහ. බුදුහු එ දවස් 'බොහෝ කලක් ජීවත් වව'යි වදාළ සේක. බමුණානන් කෙ තෙක් කල් ජීවත් වේ ද'යි විචාළ කල්හි 'එක්සිය විසි හවුරුද්දක් ජීවත් වෙති' වදාළ සේක. ඒ නියාවට ආයුවර්ධන කුමාරයෝ ය යි නම් තැබූහ.

Non-Commercial Distribution

උයි ත් වැඩී වර්ධන ව පන් සියයක් උපාසකවරුන් පිරිවරා ගෙන ඇවිදිති. එක් දවසක් වහන්දෑ ධම් සෙබෙයි දී 'ඇවැත්නි, සත් වන දවස් මර ළං ව සිටි ආයුවර්ධන කුමාරයෝ දැන් එක් සිය විසි හවුරුද්දට ආයු ඇති ව පන් සියයක් උපාසකවරුන් පිරිවරා ගෙන ඇවිදිති. මේ ලොව ගෙවී ගිය ආයු පෙරළා වඩන්ට ත් කාරණ ඇති නියා වේ දෑ'යි කථා ඉපැද වූ සේක. බුදුහු එ තැනට වැඩ අඩාල ව තුබූ කථාව විචාරා වදරා මේ නියාව දන 'මහණෙනි, ගුණ ඇත්ත වුන්ට වදනෝ ආයු පමණකින් ම වඩනෝ නොවෙති. අනිකු ත් තුනෙකින් වඩිතී' වදරා 'නිරන්තරයෙන් තුනුරුවන් වඳනාසුලු වූ දෙමවු පිය නැදිමයිල් බෑ බූන් ආදී වූ වෘද්ධයන්ට ආදර සම්භාවනා ඇති ගිහින්ට ද ශාසනික වූවො ත් ප්‍රව්‍රජ්‍යාවෙන් උපසම්පදාවෙන් වැඩි සිටියවුන් කෙරෙහි ආදර ඇත්තවුන්ට ද ඒ ඒ තැන්හි ප්‍රති නියත වූ ආයු ද ශරීර වර්ණය ද ශරීර ඵාසු ද ශරීර බල ය ද යන සතර වඩිඩි.

'යම් කෙණෙක් සියක් හවුරුදු ජීවත් වන තරම් පින් කම් කොළෙෝ වී නම් පතස් ඇවිරිදි අවස්ථාවෙහි දී උන්ට පෙනුණු උව දුරු වැදීම නම් බලී බලවත් කුශලයක් හෙයින් එහි බලයෙන් උව දුරු සන්හිඳී මියන්ට ආසන්න ගසක් පැන් ලදින් බොහෝ කලක් පවත්නා සේ උ තුමූ ආයු නිමන තෙක් සිටිති. ශරීරවර්ණාදී වූ අනික් තුන ත් ආයු හා සමග වඩිඩි. ඒ වඩනට වෙන පිණක් කළ මැනැව'යි නැත. සියක් හවුරුද්දෙන් ඔබ්බෙහි හවුරුදු දහසක් වුව ත් වඩා වුව ත් එ තෙක් ම ය. ආයු වැඩීම නම් මේ ලෙසින් වත් මුත් විබන්ධ නැති ව පවත්නා ආයුෂයෙහි වැඩී වීමෙක් නැතැ'යි වදළ සේක. දෙශනා කෙළවර ආයුවර්ධන කුමාරයෝ පන් සියක් දෙනා හා සමග දෘෂ්ටධර්මවෙද්‍ය විපාක වශයෙන් මේ ජාතියෙහි ආයු වැඩිය ත් සසර ආයු ගෙවා සෝවාන් වූහ. සෙසු ත් බොහෝ දෙනා සෝවාන් ඵලාදියට පැමිණියහ.

එ හෙයින් සත් පුරුෂයන් විසින් වැඳීම නම් ආයාස දෙයක් නො වන හෙයිනු ත් ලොභ උපදන්ට වියදම් වන දෙයක් නො වන හෙයිනු ත් එයින් ජනිත වූ කුශලයෙන් විපාක සතරක් ලබන හෙයිනු ත් ලොවුතුරා විපාක ත් නිරායාසයෙන් සිද්ධ වන හෙයිනු ත් වැඳීමෙන් සිද්ධ වන කුශල ය සිද්ධ කට යුතු.

## 103. සංකිච්ච සාමණේර වස්තුව

තව ද කළ පින් ඇත්තවුන්ට කවර තරම් හානියක් වුව ත් ප්‍රහායක-ප්‍රහාතව්‍ය දෙකින් ප්‍රහායකයාගේ ම බලී කම දක්වන්ට සංකිච්ච සාමණේර වස්තුව දක්වමු.

Non-Commercial Distribution

කෙ සේ ද යත්–

සැවත් නුවර කුලදරුවෝ තිස් දෙනෙක් බුදුන්ගේ අතිමධුර බණ අසා සස්නෙහි ළ දී මහණ ව මාලු පැවිදි ව පස් වස් ගිය කලට වෙන වසන්ට නිසි ව ගෙන භාවනා උගන්නා නිසා බුදුන් කරා ගොසින් රහත් වීම දක්වා කමටහන් කියවා ගෙන භාවනා කරන්ට එක් වලකට යම්හ යි බුදුන්ට දැන් වූ සේක. බුදුහු ත් 'කොතැනකට යවුද'යි විචාරා 'අසවල් තැනට ය'යි කී කල්හි 'එ තැනට මුන් ගිය කලට එක් සිහන්නකු නිසා භයෙක් උපද්දී. ඒ උපන් භය ත් සැරියුත් මහ තෙරුන්ගේ සද්ධිවිහාරික වූ සත් හැවිරිදි වයස් වූ සංකිච්ච සාමණේරයන් ගිය කලට උන්ගේ ගුණානුභාවයෙන් සන් හිඳෙයි' දැන වදාළ සේක.

ඒ සාමණේරයන්දෑ ගේ උත්පත්ති කථාවකවරේ ද යත්–උන් දෑගේ මෑණියෝ නම් සැවත් නුවර පොහොසත් කෙණකුන්ගේ දුවණි කෙණෙක. උයි ත් උන්දෑ බඩ කල එක් බලවත් ව්‍යාධියක් ඇති ව ලා ඒ ඇසිල්ලෙහි ම මළහ. මළවුන් දවන ගමනේ ත් දරුවන් පිහිටි බඩ මස් තිබිය දී සෙසු මස් ද ගියේ ය. බඩ මස් නො ද තිබෙන්නා දවන පිණිස දර සැයෙන් මැත් කොට ගෙන විසුරුවනු නිසා හුළකින් දෙ තුන් තැනකට ඇන ලූ ය. හුල් කෙළවර වැදෑ මසින් වැසී හොත් දරුවන්ගේ ඇතුළු ඇස නො ඇනී ඇස් කෙළවර ඇනිණ. මෙ සේ ගබ්මස ගිනි වදිනා ලෙසට සිදුරු කොට ලා අඟුරු ගොඩ මත්තේ ලා අඟුරෙන් වසා ලා පලා ගියෝ ය. තව ඇණ ආදි වූ රත් රනෙක රිදී භාග ය ද නැති ව යන්නා සේ ගබ් මස ත් දෑ ය. අඟුරු මත්තෙහි ගිනිවර කළ රන් පිඩවැල්ලක්[1] වැනි දරුවෝ රත් පියුම් ගබකට වන් හංස පැටවකු මෙන් වැද හොත්තෝ ය. රහත් වන පින් ඇත්තවුන් රහත් වන ජාතියේ මහ මෙර බා ලා ගැසුව ත් රහත් නො ව මිය යාමෙක් නැත.

දෙ වන දවස් අළු හස් කරන්ට ආ මිනිස්සු කොට නිමි පිළියක් ඔප් ලනු නිසා හුණුවන්ට අඟුරු මත්තේ තබා ලූ වා සේ අඟුරු මත්තේ හොත් දරුවන් දැක විස්ම පත් ව ගොසින් මෙතෙක් දරින් මිනිය දන ගමනේ ත් මේ දරුවෝ ද නො ගියහ. කුමක් නිසා දෝ හෝ'යි නො දන්ව කාරණ ය දැන ගත නො හී දරුවන් හැර ගෙන ඇතුළු ගමට ගොසින් නිමිත්ත දන්නවුන් අතින් විචාළෝ ය. ඔහු තමන්ගේ ශාස්ත්‍රයෙහි එ බන්දක් ඇති හෙයින් හෝ නොහොත් විචාළ දෙයට එකක් කිව මනා හෙයින් ඉදින් මේ දරුවෝ ගිහි ගෙයි රඳා හුන්නෝ වී නම් සත් වන කුල

1. රන් පිඩැල්ලක්

Non-Commercial Distribution

පරම්පරාව දක්වා නෑයෝ දුප්පත් වෙති. මහණ වූ නම් පන් සි යයක් මහණුන් පිරිවරා ඇවිදිති' කිවු ය. රහත් වන නියාව තමන් නො රහත් හෙයින් දත නුහුනු වූ ය. හුළ ඇස් කෙළවර ඇති කැළැල් වූ හෙයින් සංකිච්ච ය යි නම් තුබූහ. උයි ත් ඒ නමින් ප්‍රසිද්ධ වූහ. නෑයෝ ත් වැඩී ගත් කල සැරියුත් මහ තෙරුන් වහන්සේ ලඟ මහණ කරම්හ'යි වඩා වර්ධන ය කළහ.

කෙළි මඩලේ දී කුඩා කොල්ලන් මුන් තමන් සත් ඇවිරිදි අවස්ථාවෙහි 'තොප බඩ කල තොපගේ මෑණියෝ මළෝ ය. උන් දවන ගමනේ ත් තොපි ද නො ගියෑව'යි කී කථාව අසා 'මම මෙ සේ වූ දුකෙකින් ගැළවිණිම් ල. ගිහි ව සිටී මෙන් කම් නැත. මහණ වෙමි' නෑයන්ට කිවු ය. උයි ත් තමනු ත් සිතන්නා ඒ ම හෙයින් යහපතැ යි ගිවිස සැරියුත් මහ තෙරුන් වහන්සේ ලඟට ගෙන ගොසින් මහණ කරන්ට පාවා දුන්හ. මහ තෙරුන් වහන්සේ තචපඤ්චක ය උගන්වා ලා මහණ කළ සේක උන්දෑ ද පිපෙන්ට මෝරා තුබූ පියුමක් හිරු රැස් ගැසී ලා වහා පිපෙන්නා සේ කරගෙයි දීම සිවුපිළිසිඹියා පත් රහත් වූහ. සංකිච්ච හෙරණුන් දෑ නම් මුන්දෑ ය.

බුදුහු ද මේ තිස් දෙනා හා කැටි ව ගියොත් රහත් වීමෙන් කෙලෙස් ගිනි නිවුවා මෙන් සිහන්නහු ගෙන් වන හය ත් සන් හිදෙයි දැන 'මහණෙනි, තොපගේ වැඩි මහලු බෑණන් වූ සැරියුත් මහ තෙරුන්ට ත් කියා ලා යව'යි වදළ සේක. ඒ වහන්දෑ ත් යහ පතැ යි ගිවිස මහ තෙරුන් වහන්සේ ලඟට ගොසින් 'කුමක් ද, ඇවැත්නි'යි කී කල්හි 'අපි බුදුන් ගෙන් කමටහන් ඉගෙන භාව නාවට වලට යනු කැමැත්තම්හ. බුදුහු නුඹ වහන්සේට ත් කියා යන්ට වදළ සේක. එ හෙයින් අපි ආම්හ'යි කී සේක. මහ තෙරුන් වහන්සේද, යහපත, ගිය මැනැවැ'යි නො වදරා බුදුන් කරු ණක් නිසා මුබ එවූයේ ය යි ඒ කාරණ ය කිම් දෝ හෝ යි සලකන සේක් කියා ලූ මංහක යන්නා සේ බුදුන් දුටුවා ම දැක 'කුමක් ද, ඇවැත්නි, කැටි ව හෙරණ කෙණෙක් ඇත්තා දැ'යි විචාරා 'නැතැ'යි කී කල්හි 'කැපකරු කෙණකුන් නැති ව යන්නේ කෙ සේ ද? තෙල සංකිච්ච හෙරණුන් කැඳවා ගෙන ගිය මැනැවැ'යි කී සේක. 'තෙල පැටවාණන් ගෙන ගිය කලට අට්ට ල ය. අප වල වසන් නවුන්ට හෙරණුන් හැයි දැ'යි කී සේක.

'ඇවැත්නි, තමන් හැම නිසා මුන්ට අට්ටල් වතො ත් මුන් මුන් නිසා තමන් හැම දෙනාට අට්ටලෙක් නැත. බුදුහු ත් මා

Non-Commercial Distribution

ලඟට තමන් හැම එවන සේක් මේ හෙරණුන් තමන් හැම හා කැටි ව යවනු පිණිස එවූ සේක. කැඳවා ගෙන ගිය මැන වැ'යි කී සේක. 'වහන්දෑ ත් යහපතැ'යි ඉවසා හෙරණුන් දෑ හා එක් ව එක් තිස් නම ම තෙරුන් වහන්සේ ගෙනු ත් සමු ගෙන වෙහෙරින් පිටත් ව සැරිසරන සේක් සාර සිය අසූ ගවුවකින් ඔබ්බෙබ් එක් ගෙවල් දහසක් ඇති ගමකට පැමිණි සේක. ඒ ගම මිනිස්සු ත් ඔබ හැම දැක ආකල්ප සමෘද්ධීන් ම පැහැද ආරාධනා කොට දන් වළඳවා ලා 'ස්වාමීනි, කොයට වඩනා සේක් දෑ'යි විචාරා 'ඵාසු තැනකට යම්හ'යි කී කල්හි බැස හෙව වැඳ ලා ඔබ හැමට ශරීර ඵාසු කොට ලා තමන්ට පර ලොව වැඩ සාදනු නිසා වස් විසීමට ආරාධනා කළහ. ඔබ හැම ත් ඉවසූ සේක. උපාසකවරු ද වස් වසන්ට විහාර කරවා දී ලා අද අපි උපස්ථාන කරම්හ. හෙට අපි උපස්ථාන කරම්හ'යි නියම කොට ගෙන සැරහී ම උපස්ථාන කෙරෙති.

තෙරුන් වහන්සේ ත් වස් වසන දවස් 'ඇවැත්නි, බුදුන්ගෙන් කමටහන් උගෙන භාවනාවට නියැළී මෙ තෙක් තැන් ආ බැවින් එ බඳු පිළිවෙතක් නැති ව බුදුන් සිත් ගත නො හැක්ක. සසර ත් ලුහුඬු කළ නො හැක්ක. එන ගමනේ ආ සාර සිය අසූ ගවුව මෙන් සසර ලුහුඬු වුවමනා වී නම් සිඟා නික්මෙන වේලාව හා වත්-පිරිත් වේලාවේ මුත් දෙ නමෙක් එක් තැන් නො වම්හ. යම් කෙණකුන්ට ලෙඩෙක් දුකෙක් ඇත් නම් උන් අවුත් ගෙඩිය ගසා ලන්නා ම උන් ලඟට අවුත්-ගිලන් වත් පුරා බෙහෙත් කරම්හ. මෙ වක් පටන් රෑ-දවල් නො පමා ව භාවනාවෙහි යෙදී වසම්හ' යි කතිකා කළ සේක.

මෙ සේ කතිකා කොට ගෙන වසන කලට එක් දුප්පත් එකෙක් දුවක දී ලූ දෙයක් කාලා රැකෙන්නේ එ තැන බත් නැති කලට අනික් දුවක නිසා ජීවත් වනු කැමති ව ඒ ගමට යන්ට මඟට පිළිපන. තෙරුන් වහන්සේ ද ගම සිඟා පියා වසන තැනට වඩනා සේක් අතුරු මඟ එක් ගහක දී පැන් සනහා පියා වැලි තලා මත්තේ වැඩ හිඳ වළඳන සේක. ඒ වේලාවට දුක්පතියා වළඳන තැනට අවුත් එකත් පස් ව සිටියේ ය. තෙරුන් වහන්සේ ත් කොයි යවු දෑ'යි විචාරා දුවකගේ ගමට රැකෙනු නිසා යෙමි' කී කල්හි කරුණාව නම් දුඃඛිත සත්ත්වයන්ගේ දුඃඛාපගම ය කටැටි හෙයින් ඔහු කෙරෙහි කරුණාවක් උපදවා 'උපාසකයෙනි, තොප බඩ සා ය. ගොසින් පතක් ගෙනෙව. නමකට,

ආලොපයක් දෙම්හ'යි කියා ලා උනු ත් නො මැළි ව පතක් ගෙනා කල තමන් වහන්සේ වළඳන ලෙසින් ම හනා ලා එකි එකී ආලොපය දුන් සේක. දන් වුව ත් වළඳන තැනට ආවවුන්ට බත් දෙන කල අනුදත්තන්ට මුත් සෙස්සන්ට අගින් නො දී හෙවත් නො වළඳන තුරු නො දී තමා වළඳන ලෙසින් මඳක් වත් බොහෝ වත් බත් දීම වත. එ හෙයින් ඔබ හැම ත් වත් පිරෙනු නිසා දුන් සේක.

දුගියා ද බත් කාලා 'ස්වාමීනි, ආරාධනා කොට දන් දුන් කෙණෙක් ඇද්දැයි' විචාළෝ ය. 'උපාසකය, ආරාධනාවෙක් නැත. මිනිස්සු දවස් පතා සිහා ගිය කල මෙ ලෙස ම දෙති' වදාළ සේක. ඒ තෙමේ සිතන්නේ 'අපි දවස් පතා ඇඟ වැර සිඳ සොයා උපයා ත් ලබන්ට නිසි දෛව නැති හෙයින් මෙ සේ වූ නිරායාස බතක් නො ලබම්හ. ඔබ ත් ගොසින් මෙ ලෙස ලබන්ට නැති පසු මේ වහන් දෑ ළඟ ම රදමි, සිතා ගෙන 'ස්වාමීනි, පිළිවත් අත් පා මෙහෙයක් කොට ලා ස්වාමිදරුවන් ළඟ ම වසනු කැමැත්තෙමි' යි කිවු ය. "යහපත, උපාසක ය'යි වදාළ සේක. එහෙත් ඔබ හැම වසන තැනට ගොසින් යහපත් කොට ම වත් පිළිවෙත් කෙරෙමින් වහන්දෑ සිත් ගෙන සුව සේ ම රැකී ලා දෙ මසක් විතර ගිය කලට දුව දක්නා කැමැති ව "ඉදින් මේ ස්වාමි දරුවන්ට ඔබ යන නියා ව කීම් නම් තමන් වහන්සේට මා සුව ලද හෙයින් යා නො දෙන සේකැයි සිතා සුබිත ගුණය නැත්තා සේ ම සූජන ගුණ ය ත් නැති හෙයින් නො කියා ම නික්මිණ. එ තැනට ආ දෙමසට නො කියා පලා ගිය ගමන් විනා අතික් අඩුවක් නො පැවසී ය.

ඔහු යන මහ ත් පන් සියයක් සොරුන් රඳා හිඳිනා අඩවි වලෙක් ඇත. ඒ සොරු ත් තමන්ට ලාභ ය මඳ හෙයින් යම්, කෙණෙක් මේ වලට අවුත් සම්භ වූ නම් උන් මරා පියා උන්ගේ මස් ලෙයෙන් තොපට බිලියම් කරම්හ'යි ඒ වල දෙවියන්ට ආරාධනා කොළෝ, ඒ දවසට සත් වන දවස ය. එ හෙයින් සොර දෙටුවා ගසට නැගී ලා යන එන්නවුන් බලන්නේ ඔහු දැක සොරුන් කියා ලී ය. උයි ත් ඔහු වල් මධ්‍යයට ආ නියා ව දැක ගසා අල්වා ගෙන තරයේ ම බැඳ ගෙන ගිනි ගා හෙළා ගෙන දර කඩා රැස් කොට පියා ගිනි මොළවා ලා හුල් හසිති.

එයි ත් ඒ හැම දැන 'ස්වාමීනි, මෙ තැන පලහා ගෙන කන්නට හුරු කෙණකුත් මුව කෙණකුත් නැති. මේ කුමක් නිසා කරණ

Non-Commercial Distribution

නියා දැ'යි විචාළහ. 'තොප මරා තොපගේ මසින් හා ලෙහෙයෙන් වන දෙවියන්ට බිලියම් කරම්හ'යි කිවු ය. ඒ මරණ භයින් තැති ගෙන ගැළවෙන්ට උපදෙස් මුත් වහන්දෑගේ උපකාර නො සලකා 'ස්වාමීනි, මම සිහන්නෙක්මි. ඉඳුල් උළු ගසා කා වැඩිණිමි. සිහන්නෝ නම් කාළකණ්ණිහු ය. සශ්‍රීක වූ දෙවියන්ට නිශ්‍රීකයන් ගෙන් කම් නැත. වහන්දෑ නම් කොයින් අවුත් මහණ වුව ත් උත්තම ගුණ යොගයෙන් උතුම් සේක. අසවල් තැන එක් තිස් නමෙක් වසන සේක. දෙව පූජාවෙන් අභිමතාර්ථ ය සිද්ධ වුවමනා වී නම් ඒ වහන්දෑ මරා බිලියම් කළ මැනව. දෙවියෝ ඉතා පහදිති' කිවු ය.

සොරු ත් ඒ අසා කට යුත්තක් කොට සිතා ගෙන මූ කියන්නේ කට යුතු ය. මූ සිහන්නවුගෙන් ප්‍රයෝජන නැත. උත්තමයන් මරා බිළි දෙම්හ'යි සිතා ඒ වහන්දෑ වසන තැන් කියව'යි මූ කියන්ට උහු නිළ කොට ගෙන එ තැනට ගොසින් වෙහෙර මැද වහන්දෑ නො දක 'වහන්දෑ කොයි දැ'යි උහු අතින් විචාළෝ ය. එයි ත් දෙ මසක් විවර එ තැන රඳා උන් හෙයින් වහන්දෑගේ කතිකා වත දන්නේ 'මේ වේලාට වහන්දෑ ගණ සඞගණිකාවාස ය නැති හෙයින් තම තමන් වහන්සේ රෑ වසන තැන හිඳිනා සේක. එක කෙණකුන් වහන්සේ තෙල ගෙඩි ය ගසන්නා රැස්වන සේකැ'යි වළඳන තැන බලා සිට වහන්දෑට අවාසු කරණ මනුෂ්‍ය ප්‍රෙතයකු මෙන් කී ය. සොර දෙටුවා ම ගෙඩි ය ගසාලන ක්‍රමය ත් අරුගෙන් ම දැන ගෙන ගෙඩි ය ගසාලී ය. වහන්දෑ ත් ගෙඩියේ හඬ අසා ගෙඩි ය ගැසුව මනා වේලෙක ගැසූ ගෙඩියක් නො වෙයි. කිසි තැනකට අවාසුවක් ඇති නියා දෝ හෝ'යි වෙහෙර මැදට අවුත් පන්තින් ම පනවා තිබෙන ගල් ලෑලි වල වැඩ හිඳ වැඩි මහලු තෙරුන් වහන්සේ සොර දෙටුවා ගෙන් 'මේ ගෙඩි ය, ගැසුවෝ කවුරු දැ'යි විචාළ සේක. සොර දෙටුවා 'ස්වාමීනි, මම ය'යි කීයේ ය. කුමක් නිසා දැ'යි විචාළ කල්හි 'සම්භ වූ කෙණකුන් මරා උන්ගේ මස් ලෙහෙයෙන් වන දෙවියනට ත් පූජාවක් කරම්හ'යි කළ ආරාධනාවෙක් ඇත. ඒ නිසා එක් වහන්දෑ නමක් ගෙන යම්හ යි සිතා ය''යි කිවු ය.

ඒ අසා වැඩි මහලු තෙරුන් වහන්සේ සෙසු වහන්දෑට කියන සේක් – 'ඇවැත්නි, බාල මල් බෑයන්ට පැමිණි කටයුතු වැඩි මහලු බෑණන් විසින් පිරිමසා ලිය යුතු ය. මම මාගේ ජීවිත ය තමන් හැමට ම පරිත්‍යාග කොට මුන් හා කැටි ව යෙමි. හැම දෙන ම නො පමා ව මහණ ධම් කළමැනවැ'යි කී සේක. ඔබට ඉක්බිති ව

Non-Commercial Distribution

තෙරුන් වහන්සේ 'ස්වාමීනි, වැඩි මාලු බෑණන්ට පැමිණි කට යුත්ත බාල මල් බෑයන් විසින් පිරිමසා ලිය යුතු ය. මම මුන් හා කැටිව යෙමි. මුඹ වහන්සේ හැම නො පමා වූව මැනව. මම ගියෙම් නම් වැඩි මාලු බෑණන්ගේ ත් බාල මලුන් ගේ ත් කට යුතු පිරිමැසුවා වෙමි'යි කී සේක.

මේ ලෙසින් 'අපි යම්හ, අපි යම්හ' යි පිළිවෙළින් හුන් තිස් දෙනා වහන්සේ ම නැඟී සිටි සේක. මේ ලෙස කරන්ට ඒ තිස් දෙනා වහන්සේ බුදු සස්නෙහි මහණ වූ හෙයින් බුදුන් මවු පිය පමණක් මුත් සෙසු ලෙසකින් එක මෑණි කෙණකුන්ගේ එක පියාණ කෙණකුන්ගේ දරුවන් සේ නො වන සේක. එතකුදු වූව ත් ඒ තරමට ත් වඩා ඔවුනොවුන් වහන්සේ කෙරෙහි මමායන ය කළ සේක. මෙයි ත් සලකා සමඟ වාස ය අවශ්‍යයෙන් ම කට යුතු ය. ඒ තිස් දෙනා වහන්සේ ගෙන් එක නමෙකු ත් 'තමන් වහන්සේ ගිය මැනව, තමන් වහන්සේ ගිය මැනැවැ'යි කියා ගත නුහුනු සේක. කවර කලෙක ත් එක් ව වසන තැන් තෙල ලෙස විසීම යහපත.

සංකිච්ච තෙරණුන්දැ වහන්දෑගේ කථාව අසා 'ස්වාමීනි, මුඹ වහන්සේ රඳුණ මැනව, මාගේ ජීවිත ය. මුඹ වහන්සේට පුදු මම යමී' කී දැය. 'ඇවැත්නි, අපි හැම මිය මෝ නමුත් තොප නො යවම්හ'යි වදාළ සේක. 'නො යවන්ට කාරණ කිම්දැ'යි විචාළ හෙයින් 'තෙපි අනුබුද්ධ ව සිටි ධම් සෙනෙවි ස්වාමීන්ගේ හෙරණයෝ ය. අපි තොප සොරුන්ට පාවා දුනුමෝ නම් ඔබ ඒ අසා කැප කරු කමට යවා ලූ හෙරණුන් සොරුන්ට පාවා දුන්නේ කවුරුන්ගේ සම්මතයකින් දැ'යි යනාදි ය වදරා අප හැමට නින්ද කරණ සේක.

'එ සේ කරණ නින්දවෙන් ගැළ වෙන්ට බැරි හෙයින් නො යවම්හ'යි වදාළ සේක. සංකිච්ච හෙරණුන් දෑ ද 'ස්වාමීනි, එ සේ වී නම් බුදුහු මුඹ වහන්සේ අපගේ උපාධ්‍යායයන් වහන්සේ ලඟට එවන සේකු ත්, අපගේ උපාධ්‍යායයන් වහන්සේ මා මුඹ වහන්සේ ලා කැටිව එවන සේකු ත් මේ දැක එවා වදාළ සේක. අනිකක් නිසා නො වෙයි. හැම තැන් ම රඳන බව ය. මම මුන් හා කැටි ව යෙමි' හැම තැන ම වැදගෙන ක්ෂමා කරවා ගෙන නික්මුණු සේක.

වැඩි මාලු තෙරුන් වහන්සේ ද අධිගත ගුණ විශෙෂය එබඳු කරුණක් ඇති කල මුත් නිධාන ලත් සාර පුරුෂයන් නිධාන

Non-Commercial Distribution

රක්නා සේ අනුන්ට නො හඟවන හෙයින් හෙරණුන් දෑ රහත් නියා ව නො දන සොර දෙවුවාට 'තුලු බාලයෝ ය. තොප ගොසින් ගිනි මොළවන නියාව ත්, උල් සසිනා නියාව ත්, කොළ අකුරන නියාව ත්, දක බා යෙති. උන් මුවා තැනෙක හිඳුවා ලා ඒ ඇම කරව'යි වදළ සේක. වදළ පමණක් මුත් කැඳවා ගෙන නික්මෙන්නා ම වහන්දෑට බලවත් මුසුප්පු ඇති විය. ඇස්වල කඳුළු ත් පිරිණ. මොර ගා නො හැඬූ පමණෙක.

සොරු ත් හෙරණුන් කැඳවා ගෙන ගොසින් මුවා තැනෙක හිඳුවා ලා බුදු වන්ට මවු කුස උපන් දවස් පවා නරක ගිනි නිවූ බුදුන්ට පුත් වූ සෘද්ධ්‍යානුභාවයෙන් එ ම නරක ගිනි ඇසිල්ලෙක නිවා ලන්ට බල ඇති මුගලන් මහ තෙරුන් වහන්සේට බෑණ වූ, හෙරණුන්දෑ සැරියුත් මහ තෙරුන් වහන්සේගේ පුත් වූ නියාවත් නො දන, නැවත මාර්ග ඥාන නමැති පැනින් ද්වේෂ ගින්න ආදී වූ බලවත් එකොළොස් ගින්න නිවා සිටි තැනට මේ ගිනි ගිනි නො වන නියාව නො දන ගිනි ත් මොලවා ලා, කෙලෙස් හුල් ඇඟ නො ඇනෙන තැනට මේ හුලින් ප්‍රයෝජන නැති නියාව නො දන හුලු ත් සැස ලා, සෙසු ත් කළමනා දෙය කොට ලා සොර දෙටුවා කඩුව කොපුවෙන් හයා ගෙන හෙරණුන්දෑ ලඟට ගියේ ය. හෙරණුන්දෑ ද උපාද්ධ්‍යාය වූ ධර්ම සෙනෙවි ස්වාමීන් රජ ව උපන් කලෙක ඇන ලූ ඔළුවේ ටොක්කක් නිසා පූර්ව වෛරයක් ඇති යක්ෂයකු ඔබ අලුත හිස කේ බාපු දවසෙක ඔළු වේ ඇන වෛර ය තුනී කරන්ට එන්නහු දක අවුත් ඔළුවෙ අන්නට පෙරාතු නිරොධයට සම වන්නා සේ හිඳිනා හෙරණුන් දෑ ද අධිෂ්ඨානාදි ය කොට ලා නිරොධයට සම වන් සේක.

සොර දෙටු ද කඩුව සලා දී ලා හෙරණුන් දෑ කරට පහරක් ගැසී ය. ගසා ලූ කඩුව දෙ මුවාත එක් ව නැමී ගියේ ය. පහර ලෙස වත් නො වී ය යි සිතා නැවත මුවාත හැද හැර ලා ගැසී ය. එ විට තෝඩුව කන තබන්ට හකුළු වනා තුඹ පතක් මෙන් හැකිළී කඩු මිට දක්වා හැකිළිණ. කඩුවකින් තබා මහ මෙරෙන් වුව ත් ගසා ඔබට එ වේලෙහි අමුත්තක් කට නො හැක්ක. මැණියන් දෑව ත් මුන් දෑ නො දෑ ගමන ම ඊට දෘෂ්ටාන්ත ය.

සොර දෙටු ද ඒ පෙළහර දක 'පෙර මාගේ කඩුව ගල් ටැඹක් වුව ත් කිළිල් කඩක් මෙන් කපා පළවා පිය යි. දන් ආදී විට ගසා ලූ ගමනේ දෙ මුවා ත් එක් ව නැමිණ. පසුව විට කල් පතක් හකුළු-වන්නා සේ අග සිට මුලට හැකිළිණ. මේ සිත් පිත් නැති යකඩ

කැටි ය පවා මුන් වහන්සේගේ ගුණ දත. සිත් ඇති ව ත් අහෙතුක ද්‍රුහෙතුකයන් නිවන් දත නො හෙන්නා සේ මම දත නුහුනුයෙමි. අනේ මා කළේ කිම් දැ'යි කඩුව බිමට දමා පියා වැද ගෙණ වැද හෙව 'ස්වාමීනි, ජීවත් වන්ට නිසි නිරවද්‍ය බොහෝ උපදෙස් ඇත ත් සාවද්‍ය වූ සොර කම හැසිර වස්තු නිසා තපසට නියම වලට අවුත් වනුම්හ. අප දුර දුට ත් දහස් ගණන් වුව ත් හයින් වෙවුලා යෙති. දෙ තුන් දෙනෙක් වී නම් කියනු ම කිම් ද?

''තාසො තෙ නත්‍ථි න භයං – භීයයා වණ්ණො පසීදති,
කස්මා න පරිදෙවෙසි – එවරූපෙ මහබ්භයෙ.

යනු හෙයින් මුඹ වහන්සේට භයෙක් මුසුප්පුවෙක් නැත. දවා ගිනි වර කළ රත්රනක් මෙන් ද, ස වක් ව පිපී ගිය කිණිහිරි මලක් මෙන් ද මුඹ වහන්සේගේ මූණ ඉතා ම හොබ්බී. කාරණ කිම දැ'යි විචාළහ. හෙරණුන්දෑ ද නිරොධයෙන් නැඟී—

''නත්‍ථි චෙතසිකං දුක්ඛං – අනපෙක්ඛස්ස ගාමිණි,
අතික්කන්තෙ භයා සබ්බා – ඛීණසංයොජනො ඉසි.

ඛීණාසවස්ස භවනෙත්ති – දිට්‍ඨා ධම්මා යථා තථං,
නිබ්භයං මරණං හොති – භාරවොරොපනං යථා''

යනු හෙයින් 'හෙම්බල සොර දෙටුව, කිසිවෙක ඇලුම් නැති රහතන් සිතට දුක් නැත. සියලු ම භය ත් නැත. රහතන්ගේ අත් බැව් නම් හිස තුබූ බර අවශ්‍යයෙන් එක් තැනෙක තබන හෙයින් හිස තබා ගෙන ම නොහිඳිනා හෙයින් ඒ හා සරි ය'යි බණ වදළ සේක. සොර දෙටුවාණෝ ද ඔබගේ බණ අසා පන්සියයක් මූණු බලා 'තෙපි හැම කුමක් කරවු දැ'යි විචාළහ. 'මුඹ දෑ කුමක් කරන්නේ දැ'යි විචාළ කල්හි 'මෙ බඳු පෙළහරක් දැක තව ත් සොරකමට ගිහිගෙයි රැඳීමෙන් ප්‍රයොජන නැත. මුන් වහන්සේ ළඟ මහණ වෙම්'යි කිවු ය. උඹ හැම ත් ඒ පෙළහර තමනු ත් දුටු හෙයින් සොරකමට එක් වුව ත් මහණ වීමට එක් වූව යි වරද නැති හෙයින් ගිවිස පන් සියක් දෙනා ම සාමණේරයන්දෑ වැඳ මහණ කරන්ට ආරාධනා කළහ.

වයස අවුරුදු සතක් ම හෙයින් මාලු පැවිදි වස් දසයක් යන්ට නුවුව ත් ස්ථිර වූ සීලසමාද්ධ්‍යාදි ගුණයෙන් යුක්ත හෙයින් තෙර කමු ත් කරණ සේක් හී තල බා ලා හිස කේ ත් කප්පා පිළියෙහි දවළු ත් කප්පවා ගුරු මැටියෙන් පිළි පො වා පියා ඒ සිවුරු හඳවා පොරවා ලා දස සීල පිහිටුවා ලා සාමණේර පන් සියය හැර

ගෙණ යන සේක් 'ඉදින් මම තිස් දෙනා වහන්සේ නො දැක ගියෙම් නම් ඒ වහන්දෑ මහණ ධම් කට නො ෙහන සේක. මේ සොරුන් ගෙන් වන උවදුරට සභාය වූ කල කෙලෙස් සොරුන් ගෙන් වන උවදුරට ත් මා සභාය වුව මනා වේ ද? සොරුන් මා හැර ගෙණ නික්මුණු වේලේ පටන් කඳුළු ධාරා නුහුණු එක නමකු ත් නැත. මා නුදුටුමෙවා ත් ශොක කාරණයක් මුත් භාවනා වැටහෙන්ට කාරණ නැත. එ හෙයින් මා ආ කට යුත්තෙන් එකක් සිද්ධ වූ බැවින් අනික ත් සිද්ධ කරවමි' පන්සියයක් දෙනා වහන්සේ පිරිවරා ඒ තිස් දෙනාවහන්සේ කරා ගොසින් දැක ම අර්හත්ව ය ලත් කල වන සතුටට පූර්ව නිමිත්තයා සේ සතුටු වූ වහන්දෑ 'සත් පුරුෂයාණෙනි, දිවි ලත් නියා වේ දෑ'යි කී කල්හි 'එ සේ ය, ස්වාමීනි, මූ මා මරණු කැමති ව ත් මා මරා පියන්ට නිසි කර්මාපරාධ යක් බාහිය – දරුවිරියාදි තැනට මෙන් මා කෙරෙහි නැති බැවින් මරා ගත නො හී මාගේ ගුණයෙහි පැහැද මහණ වූ ය.

'මම ද යන ගමනෙහි මුඹ වහන්සේ හැම දැක යෙමි'යි අයිමි. වල් සොරුන් ගෙන් ගැළවුණුම්හ යි පමා නො ව කෙලෙස් සොරුන් ගෙනු ත් ගැළවෙන්ට යත්න කළ මැනව. මම බුදුන් ළඟට යෙමි' කියා ලා ඒ වහන්දෑ වැද ගෙන සහපිරිවරින් උපාද්ධ්‍යාය යන් වහන්සේ ළඟට ගොසින් 'කුමක් ද? සංකිච්චයෙනි, අනුන්ට අතවැසි ව ගොසින් අතවැසි කෙණකුන් ලැබ අවු දෑ'යි විචාළ කල්හි 'එ සේ ය, ස්වාමීනි'යි ඒ පවත ඔබට සැළ කළ සේක. මහ තෙරුන් වහන්සේ ත් 'යව, සංකිච්චයෙනි, බුදුන් දකුව'යි වදාළ කල්හි යහපතැ යි ගිවිස මහ තෙරුන් වහන්සේ වැද ලා සහපිරිවරින් බුදුන් ළඟට ගොසින් බුදුනු ත් 'සංකිච්චයෙනි, අතවැසි කෙණකුන් ලදු දෑ'යි විචාළ කල්හි ඔබට ත් අතවැසි තැන් ලත් ලෙස වදාළ සේක. බුදුහු ත් 'එ සේ ද, මහණෙනි, විචාරා වදරා 'එ සේ ය'යි කී කල 'යම් කෙණෙක් සොර කම් ආදී වූ පව් කොට හවුරුදු සියයක් ජීවත් වෙත් නම් උන් එ සේ ජීවත් වන ජීවත් වීමට යම් තම් පමණෙක ත් පින් කම හැසිරෙන්නවුන්ගේ එක හවුරුද්දක වුව ත් එක මසෙක වුව ත් එක දවසෙක වුව ත් එක දවාලෙක වුව ත්, එක රැයෙක වුව ත්, එක වේලෙක වුව ත් ජීවත් වීම ධර්ම ජීවිකා හෙයින් යහපතැ'යි වදාළ සේක.

දේශනා කෙළවර සංකිච්ච හෙරණුන්දෑගේ අතවැසි පන් සිය ය පළමු සොර ව විසූ හෙයින් කෙලෙස් සොරුන් හා එක් වුවත් එ දවස් ඒ එක්ක ම හැර බුදුන් බළ කොටු කොට කෙලෙස්

Non-Commercial Distribution

සොරුන් මරා නිමවා සිවු පිළිසිඹියා පත් රහත් වූ සේක. තව ත් එ තැනට පැමිණි බොහෝ දෙන නිවන් සාධා ගත්හ. අර තිස්—දෙනා වහන්සේගේ අධිගම ය අටුවායෙහි නො ආව ත් සංකිච්ච හෙරණුන්දැගේ බලයෙන් වල් සොරුන් ගෙන් ගැළවී මාර්ග භාවනා බලයෙන් කෙලෙස් සොරුන් නසා රහත් වුව යි ම දත යුතු.

පසු ව කල් යැමක දී සංකිච්චයන්දැ උපසම්පන්න ව දවස් ගොසින් අතිමුත්තක නම් බෑනණු කෙණකුන් මහණ කොට ගෙන මාලු පැවිද්දට වයස් ඇති තැන දී බණවා ලා 'තොප මාලු පැවිදි කරම්හ. තොපගේ නෑයන් ලඟට ගොසින් හවුරුදු ගණන උන් ගෙනු ත් විචාරා ගෙන එව'යි යවූ සේක. උන්දැ ත් දෙ මවු පියන් ලඟට යන ගමනේ අතුරු මඟ දී සොරුන් පන් සියයක් වන දෙවියන්ට බිලියමට මරන්ට අල්වා ගත් කල්හි උන්ට බණ කියා උනු ත් පැහැද 'අප මෙ තැන සිටි නියාව කාට ත් නො කිය මැනවැ'යි කියා ගිවිස්වා ලා හළ කල්හි පෙර මඟ දෙ මවු පියන් එන්නවුන් දැක දෙ මවු පියන් රැක්මට ත් වඩා බස රැක්මෙහි තර ව එ ම මඟ යන දෙ මවු පියන්ට ලෙශයෙනු ත් නො කී දැ ය. සොරු ත් උන් අල්වා ගෙණ මරා තළා ගහට කරන්ට පටන් ගත්හ. දෙ මවු පියෝ ත් 'අනේ පුත, අතිමුත්තකයෙනි, තෙපි ත් සොරුන් හා එක් ව ගෙණ අපට ම ගහට කරවූ දැ'යි කිය කියා හඬති. සොරු ඒ අසා දෙ මවු පියන් පමණකට ත් නො කී නියාවේ දැ'යි පැහැ ද 'දෙ මවු පියන් තරමට ත් වඩා පිළිවෙත් ගරු කළ ඔබ ලඟ ම මහණ වම්හ'යි සිතා ගෙන මහණ කරන්ට ආරාධනා කළහ.

උන්දැ ත් සංකිච්ච තෙරුන් වහන්සේ, සාමණේර භූමියෙහි සිට සොරුන් පන් සිය ය මහණ කළ ලෙසින් ම මහණ කොට ලා සංකිච්ච තෙරුන් වහන්සේ ලඟට ගොසින් ඔබගේ විධානයෙන් බුදුන් ලඟට පැමිණ සියලු පවත් සැළ කළ සේක. බුදුහු ත් 'එ සේ ද මහණෙනි, වදරා එ සේ ය'යි දැන් වූ කල්හි වස්තු දෙක ම එක ලෙස පැවැති හෙයින් සංකිච්ච වත වදළ බණ ම වරිත ත් එක ම හෙයින් වදළ සේක. ඒ දෙශනා කෙළවර ත් අතිමුත්තකයන් දැගේ අත වැසි පන් සිය ය රහත් වූ සේක.

එ හෙයින් නුවණැත්තවුන් විසින් එක දවසක් ජීවත් වත ත් පින් කම ම හැසිර ජීවත් විය යුතු.

Non-Commercial Distribution

# 104. ඛාණු කොණ්ඩඤ්ඤ වස්තුව

තව ද නපුරු තරම් ඇති ව කෙ තෙක් කල් ජීවත් වීමට ත් වඩා යහපත් තරම් ඇති ව හැසිල්ලෙක ත් ජීවත් වීම ම යහපත් නියාව හඟවන්ට ඛාණු කොණ්ඩඤ්ඤ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්—

ඛාණුකොණ්ඩඤ්ඤතෙරුන්වහන්සේබුදුන් ගෙන් කමටහන් උගෙන භාවනා කරණු නිසා වල වසන සේක් රහත් ව බුදුන් ගෙන් උගත් කමටහනින් සිද්ධ කළ මනා දෙය සිද්ධ වූ නියාව බුදුන්ට දන්වනු නිසා ඒ වලින් එන සේක් අතුරු මහ දී විඩා ව, මඟින් ඉවත් ව ගල තලක් පිට උන් සේක. පැන් වළඳා විඩා සන්හිඳු වන්නා ධ්‍යානයට සම වන් සේක. සොරුන් පන් සියයෙක් එක් ව ගමක් පැහැර පියා තමන් ගෙණ යා හෙන තරමට පොදි බැඳ ගෙණ හිස තබා ගෙණ පිට බැඳ ගෙණ යන්නාහු බර ත් දැඩි හෙයින් විඩා ව ගොසින් 'බර ත් දැඩි ය. ගමන ත් බොහෝ වි ය. තෙල තැන ගල තෙලෙක් ඇත්තේ වේ ද සැතපෙම්හ'යි ගම්වලට නුවර වලට දුරු හෙයින් නිරාශඞ්ක ව මඟින් ඉවත් ව ගල තල කරා ගොසින් තෙරුන් වහන්සේ දැක 'මෙ තැන මේ වේලාට මිනිස්සු කොයින් ද? කණුවක් නියා ය'යි සිතා ගෙන එක් කෙණෙක් තමන් ගෙණ ගිය පොදිය ඔබ හිස පිට තබා ලූ ය.

අනික් කෙණෙක් ඊ පිට තුබූ ය'යි පන් සියයක් දෙන පන් සියයක් පොදි ඔබ වසා තබා පියා තුමූ ත් ඊ වැතිර නිදා පියා පාන් වන වෙලෙහි පිබිද තම තමන්ගේ පොදි ගන්නාහු තෙරුන් වහන්සේ දැක කඳබර බා තබා පූ තෙරුන් වහන්සේ එ තෙක් බර ඔසවා ත් ධ්‍යාන බලයෙන් නො සෙල්වුණු හෙයින් යක් කෙණකු නැයි සිතා ගෙණ හැර ගන්නා කල උත්සාහවත් ව හැර ගත්තා සේ ම දමන ගමනේ ත් උත්සාහවත් ව ඔබගේ ගුණයට පූජා කොට දමන්නවුන් මෙන් දමා පියා දිවන්ට පටන් ගත්හ. තෙරුන් වහන් සේ ද 'උපාසකවරිනි, නො බව. අපට ත් භය නැත්තා සේ ම අනුන්ට ත් භය උපදවන පක්ෂයෙක නො වම්හ. බුදු සවු වම්හ'යි වදළ සේක. ඌ හැම ත් තෙරුන් වහන්සේ වැඳ ගෙන හෙව 'කණු වෙකැ'යි සිතුම්හ. මුඹ වහන්සේ නියාව නො දතුම්හ. ක්‍ෂමා කරණ බව'යි කියා ක්‍ෂමා කරවා ගෙණ සොර දෙටුවාණන් ඔබ කෙරෙහි පැහැද 'මහණ වෙමි'යි කී කල්හි සෙස්සෝ ත් ගිවිස මහණ වන්ට සිතා ගෙණ පව් කමට එක් වූවා සේ ම පින් කමට ත් එක් සිත් ව පන් සියයක් දෙනා ම පළමු කොණ්ඩඤ්ඤ නම් වුව ත් කණුවෙකැ'යි

Non-Commercial Distribution

සිතූ ද? එ තැන් පටන් බාණ්ඩු කොණ්ඩඤ්ඤ නම් වූ තෙරුන් වහන්සේට තමන් මහණ කරන්ට ආරාධනා කළහ.

තෙරුන් වහන්සේ ද අටපිරිකර පමණකට හිස කේ බානා එක් කරයක් ම හෙයින් හී තලවලින් හිස කේ බා පඬුවෙන් රදනට පඬු නැති හෙයින් වර්ණ භේද ය නිසා ගුරු මැටියෙන් රඳා සංකිච්ච තෙරුන්වහන්සේ මෙන් මහණ කොට ලා අතවැසි පන්සිය ය හැර ගෙණ තමන් වහන්සේ ලත් ගුණවිශෙෂ ය බුදුන්ට හඟවා ලා බුදුන් ගෙන් ඒ පන්සියයට ත් ගුණ විශෙෂ ය දෙවනු නිසා බුදුන් කරා වැඩි සේක. බුදුහු ත් මේ තැන රඳා ලබන පෂී ත් නැති හෙයින් පෂීත් සොයා ගියා සේ පෂීත් ලදු දෑ'යි විචාරා තෙරුන් වහන්සේ ත් ආද්‍යනත මුළුල්ල වදාළ කල්හි බුදුහු ත් ඒ අසා 'එ සේ ද මහණෙනි, විචාරාස්වාමීනි, මෙසේ වූ ආනුභාවසම්පන්නතැනාක් නුදුටු වීරුම්හ. ඔබ කෙරෙහි පැහැද මහණ වූම්හ'යි කී කල්හි බුදුහු ත් ඒ අසා 'මහණෙනි, උන් එ බඳු වූයේ තමන්ගේ නුවණින් වේ ද? යම් කෙණෙක් නුවණ නැති ව හවුරුදු සියයක් වේව යි වඩා වේව යි ජීවත් වෙත් නමුත් ඉන් ප්‍රයෝජන නැත. එක දවසක් වුව ත් නුවණ නම් එ බඳු තරමක් ඇති හෙයින් නුවණින් යෙදී විසීම ම යහපතැ'යි වදාළ සේක. දෙශනා කෙළවර බාණ්ඩු කොණ්ඩඤ්ඤ තෙරුන් වහන්සේගේ අතවැසි පන් සියයක් දෙනා වහන්සේ මහණ වන දවස් ම වස්තුකාම වූ පොදි හළ හෙයින් එ දවස් කෙලෙස් කම් හැර පිළිසිඹියා පත් ව රහත් වූ සේක. තව ත් බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් සත් පුරුෂයන් විසින් කෙ තෙක් කල් ජීවත් වත ත් නුවණින් යෙදී විසිය යුතු.

---

# 105. සප්පදාස තෙරුන් වහන්සේ ගේ වත

තව ද නූපන් අකුසල් නූපදනා පිණිස හා උපන් කුසල් වැඩි යුරු වීම නිසා වීර්‍ය වැඩීමෙහි අනුසස් දක්වන්නමෝ සප්පදාස තෙරුන් වහන්සේ ගේ වත දක්වමු.

කෙ සේ ද යත්—

සැවැත් නුවර කුල දරුවාණ කෙණෙක් බුදුන්ගෙන් බණ අසා ශාසනාභිරති ය ඇති ව මහණ ව උපසම්පදාව ත් ලදින් කල් යැමකින් සස්නෙහි උකටලී ව ගිහි වියටි ව 'අප වැනි කුල දරුවන් ශක්‍රාත්ම භාවයකින් බ්‍රහ්මාත්මභාවයකින් වුත–

Non-Commercial Distribution

වන්නා සේ ගිහි වීම රජව සිට ඇඟ මඩ ගා සී සාන්නා සේ තරම් නො වෙයි. මෙසේ සිතන්නේ ජීවත් ව සිටිනා හෙයින් වේ ද ? ගිහි බවට නො පැමිණ මේ ලෙසින් ම මෙළෙම් නම් යහපතැ'යි සිතා මියන්ට උපදෙස් සිත සිතා ඇවිදිනා සේක. එක් දවසක් වහන්දෑ සිඟා වළඳා ලා විහාරයට අවුත් ගිනි හල් ගෙයි හොත් නයකු දැක ඔහු ඔබා අල්වා ගෙණ එක් කළයෙක ලා ගෙණ දුර ලන්ට ය යි කළ ය පිටින් නයි හැර ගෙණ වෙහෙරින් නික්මුණු සේක. උකටලී තැනන් වහන්සේ ද සිඟා වළඳා ලා විහාරයට එන සේක් ඒ වහන්දෑ දැක 'කුමක් ද ?, ඇවැත්නි'යි විචාරා නයෙකැ'යි කී කල්හි 'මූ කුමක් කරන්ට දැ'යි විචාළ සේක.

'දමන්ට ගෙණ යමහ'යි කී කල්හි ඔහු ලවා තමන් වහන්සේ කවා ගෙණ මියෙමි සිතා මෙ සේ දෙවන[1] බව ය. මම දමමි'යි කියා ලා ඒ වහන්දෑ අතින් කළ ය හැර ගෙණ එක් තැනක හිඳ උඟු ලවා කවන්ට උත්සාහ කළ සේක. සර්පයා ඔබ කන්නා තබා කළයෙනු ත් මැත් නො වෙයි. උන්වහන්සේ කළයට අත බා ලා අත ඇත මැත ත් ඇවිදුවන සේක. නයින්ගේ කට දල්වා ලා බිළිඳු[2] නො වත ත් නයින් කටට අත් දෙන සේක. ඔබ කෙ සේ කළ ත් ඩෑ පියන්ට කාරණයක් නැති හෙයින් මෙ තෙමේ ඩෑ නො පිය යි. 'මේ නයෙක් නො වෙ යි. විෂ නැති එකෙකැ'යි ඔහු හැර පියා විහාරයට වැඩි සේක. වහන්දෑ ත් සර්පයා හැරපූ දැ'යි විචාරා 'ඒ සර්පයෙක් නො වෙයි. විෂ නැති එකෙකැ'යි කී කල්හි 'ඇවැත්නි, ඒ නයා ම ය. අල්වන වේලේ පෙණය ත් කෙළේ ය. සුස්මන ත් හෙයින් අල්වා ගත්තෙ ත් දුකින ''නයකු නොවෙති'' කුමක් නිසා කියවූ දැ'යි විචාළ සේක. 'ඇවැත්නි'' උඟු ලවා මා කඩා කවා ගන්ට නො එක් ප්‍රයොග කළ ත් ඒ නො කැයේ ය. එ සේ හෙයිනැ'යි කී සේක. ඒ අසා වහන්දෑ මුඛයෙනු ත් නො බිණූ සේක. බුදුන්ට ත් දැන්වූයේ නැත.

එක් දවසක් කරනවෑමියෙක් කර සහලක් හැර ගෙණ විහාරයට අවුත් එක් කරයක් බිම තබා ලා අනික් කරයෙන් වහන් දෑගේ හිස කේ බායි. සසුනේ උකටලී තැනැත්තන් වහන්සේ බිම තිබූ කර ය අතට හැර ගෙණ 'මින් බොටුව කපා ගෙණ මිය යෙමි' එක් ගසෙක හිස ඔබා ගෙණ කර ය බොටුව තබා ගෙණ සිටි සේක් උපසම්පද මාලකයෙහි පටන් තමන් වහන්සේ රක්‍ෂා කරණ දැරහ මිණක් වැනි වූද පඤ්චොපක්ලෙශයෙන් විනිර්මුක්ත

1. දෙන බව ය 2. බිළිඳු

Non-Commercial Distribution

සඳ මඬලක් වැනි වූ ද අත්‍යන්ත පරිශුද්ධ ශීලය සිල් බැලීමෙන් දුටු සේක. නිර්මල වූ ශීල ය දකු ත් දකු ත් සක් විති රජ්ජුරු කෙණකුන් සක් රුවනෙහි ආනුභාවයෙන් අහසට නැඟී හෙළ පියුම් විල් සේ කො දිව පිරිවැරු මහ දිවයින් බලන්නවුන්ට උපදිනා ප්‍රීතියට ත් වඩා බලවත් ප්‍රීති උපන. උපන් ප්‍රීති පමණෙක නො රඳා ප්‍රීති ය විකඹමින් විවසුන් වඩා සිවු පිළිසිඹියා පත්. රහත් ව කර ය හැර ගෙණ විහාරයට ආ සේක.

වහන්දෑ ද 'කොයි ගියා දූ'යි විචාරා 'මේ කරයෙන් බොටුව කපා ගෙණ මියන්ට ගියෙමි' කී කල්හි නො මලේ හැයි දූ' යි විචාළ සේක. 'එ ලෙසක් කරන්ට අයොග්‍ය විමි. මේ කරයෙන් බොටුව කපන්ට ගොසින් අර්හත් මාර්‍ගඥන නමැති කරයෙන් කෙලෙස් සතුරන්ගේ බොටුව කැපීමි' යි වදළ සේක. වහන්දෑ ඒ අසා 'මූ උත්තරිමනුෂ්‍යධර්‍මාරොචන ය කෙරෙති'යි බුදුන්ට දූන් වූ සේක. බුදුහු වහන්දෑගේ බස් අසා 'මහණෙනි, රහත්තු සියතින් අනුන්ගේ ජීවිත ය නො නස්නා සේ තම තමන්ගේ ජීවිත ත් නො නසති' යි වදළ සේක. 'ස්වාමීනි, රහත් වන්ට නිසි ව සිට සස්නෙහි උකටලී වූයේ හැයි ද? රහත් වන්ට නිසි පිණු ත් කවරේ ද? කුමක් නිසා ත් සම්‍රියා නො කෑ දැ'යි විචාල සේක. 'මහණෙනි, ඒ නයා නම් මෙයට තුන් වන අත් බැව දී මුන්ගේ කොල්ලෙක. ස්වාමි පක්‍ෂපාත ව කා පිය නො හිනැ'යි විචාළ කාරණයෙන් එකක් වදළ සේක. එ තැන් පටන් ඒ තෙරුන් වහන්සේ සප්පදස තෙරුන් වහන්සේ ය යි ප්‍රසිද්ධ වූ සේක.

"උකටලී වන්ට කාරණ කවරේ ද යත්—කසුප් බුදුන් සමයෙහි එක් කුල දරුවාණ කෙණෙක් බුදුන්ගේ කර්ණරසායන වූ බණ අසා සසර කළකිරී මහණ ව උපසම්පන්න වූ සේක් උකටලියක් උපන් තැන දී එක් යාළු මිත්‍ර නමකට කී සේක. උන් වහන්සේ ද ඒ අසා එක් වන් ම ගිහි වීමෙහි ආදීනව කියන සේක. උකටලී නම ද ඒ අසා ශාසනාභිරති ය ඇති ව සිට සස්නෙහි ඇලුම් නැති අවධියේ පිරිමැස්මක් නැති වූ පුස් කා ගිය සිවුරු ආදී වූ මහණ පිරිකර ගල් කෙමක් බඩ තබා ගෙණ පවිත්‍ර කෙරෙ මින් හුන් සේක. යාළු මිත්‍ර නම ත් ලඟ ම හුන් සේක. ආදි උකටලී වපසු ව ශාසනාභිරති ය ඇති වූ නම 'මම සිවුරු හලිම් නම් මේ මහණ පිරිකර විකොට නො කා මුඹ වහන්සේට දෙන්ට සිතීමි' කී සේක.

Non-Commercial Distribution

උන් වහන්සේ ද ඒ අසා මුන් ශාසනයෙහි සිට ත් ගිහි වත් මට ප්‍රයෝජන කිම ද? තව ත් සිවුරු හළ වූ නම් මේ පිරිකර මට ලැබේ'යි සිතා පිරිකර ම සලකා පර ලොව නො සලකා එ වක් පටන් මඟුලට ගැසූ බෙර මිනී බෙර කොට ගසන්නා සේ ආදී වැඩට කියා ලූ අවවාද අවැඩෙහි යොදු කියන සේක් 'ඇවැත්නි, සුව සේ උපයා සොයා කා ලා අඹුවන් දරුවන් ඇති ව වසන විසීම් තබා පියා කබල් හැර ගෙන දෙර දෙර සිඟා කා රැකෙනු සැහෙනු කිම ද' යනාදීන් ගිහි වීමෙහි ගුණ කියන සේක. අර මුන් වහන්සේ ද ඒ අසා පෙර ත් උකටලී ව පියා නැවත සිතන සේක් 'පළමු මා උකටලී වීම් කී කල්හි ගිහි වීමෙහි ආදීනව කියා දූන් මා එ බන්දක් නො කීව ත් එක් වන් ගිහි වීමෙහි ගුණ කියන සේක.

'කාරණ කිම දෝ හෝ'යි සිතා 'මේ මහණ පිරිකරෙයි ලෝභ යෙන. අනිකකින් නො වෙ යි' දූන තමන් වහන්සේ ම අනික් කෙණකුන්ගෙන් මහලු කම් නැති ව උකටලී වීමෙන් නැවති සේක. මහණ පිරිකර නිසා උකටලී ඉපැදවූවෝ අනික් කෙණෙක් නො වෙති. මෙ සප්පදස තෙරහු ය. කසුප් බුදුන් දවස නිස්සාර පිරිකරක් නිසා උකටලී හැර උන්නවුන්ට උපදවා ලූ උකටලිය නිසා දූන් උකටලී ඇති වී ය. මුන්ගේ බසින් අරුන් ශාසනයෙන් නො පිරිහුණුහෙයින් මුනු ත් ශාසනයෙන් පිරිහෙන්ට නු වූයේ ය. විසි දහසක් හවුරුදු මුළුල්ලෙහි කළා වූ මහණ ධම් රහත් වීමට මුල් වී ය'යි වදාළ සේක.

වහන්දෑදසපීයා මුන් වහන්සේ දෂ්ට නො කරන්ට කාරණය ත් උකටලී වන්ට කාරණ ය ත්, රහත් වන්ට කාරණ ය ත් බුදුන්ගෙන් අසා ශෛව තුබූ සුහක් ඇති හෙයින් ඒ විචාරණ සේක් 'ස්වාමීනි, මුන් වහන්සේ කර ය බොටුවේ තබා ම නො කැපෙන තෙක් රහත් වූ සේක. මෙ විතර උදවුවෙක ත් රහත් විය හැකි දූ'යි විචාළ සේක. 'එ සේ ය. මහණෙනි, වඩනා ලද වීර්‍ය්‍ය ඇත්තවුන් යන්ට ඔබා ලූ පය බිම නො තබන තෙක් අර්හත්ව ය සිද්ධ වෙ යි' වදරා ගිහි ව කළ මනා නිරවද්‍ය කෘෂි වණික් ආදියෙහි ද ශාසනික ව පිරූව මනා විත ය ප්‍රතිපත්ති සූත්‍ර ප්‍රතිපත්තියෙහි ද කුසීත ව කිසියම් කෙණෙක් අවුරුදු සියයක් ජීවත් වත් නමුත් ඉන් ප්‍රයෝජන නැත. උභය පක්ෂ ය ම එක දවසක් වුව ත් සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍ය වශයෙන් වඩනා ලද වීර්‍ය්‍ය ඇති ව විසීම යහපතැ'යි වදාළ සේක. දේශනා කෙළවර බොහෝ තැන් සෝවාන් ඵලාදියට පැමිණි සේක.

Non-Commercial Distribution

එ හෙයින් සත් පුරුෂයන් විසින් වීයඞී වඩා අකුසලින් දුරු ව කුසල් පුරා ත්‍රිවිධ බොධියෙන් එක් තරා බොධියකට පැමිණිය යුතු.

---

# 106. පටාචාරා මහන්දැගේ වස්තුව

තව ද කළ පින් ඇත්තවුන්ට ත් අවසර ලත් අකුශලයාගේ වශයෙන් වන ආපද් දක්වනු නිසා **පටාචාරා මහන්දැගේ වස්තුව** කියමු.

කෙ සේ ද යත්—

සැවත් නුවර සතළිස් කෙළක් විවර වස්තු ඇති සිටාණ කෙණකුන්ගේ දූවණි කෙණෙක් ඇත. මනහර වූ රූ ධරති. උන් සොළොස් හැවිරිදි වයස දී මිථ්‍යාචාරයෙන් නවතනු නිසා සත් මාල් පායේ උඩු මාලේ ශ්‍රී යහන් ගබඩාවෙක ලා රකිති. එ සේ වූව ත් උඹ තුමූ තමන්ගේ ම ගෙයි කොල්ලකු හා බැඳී වෙසෙති. උන්ගේ දෙ මවු පියෝ ජාතීනු ත් සම්පත්තීනු ත් සම තරම් වූ සිටු පුත්‍රයාණ කෙණකුන්ට සරණ දෙන්ට නියම ව දවස් නියම කළහ. නකත් දවස් උදවු කලට සිටු දූවණියෝ බැඳී වසන කොල්ලාට කියන්නෝ 'මා අසවල් දවස් අසවල් සිටු පුත්‍රයාණන්ට සරණ දෙති. මා උන් කරා සරණ ගිය කල පඬුරක් හැර ගෙන ගිය නමුත් ඔබිනු ත් වෙන ම රකවල් හෙයින් දක්නා පමණකට ත් නො ලබව. ඉදින් මා කෙරෙහි ප්‍රේමයෙක් ඇත් නම් ඔබ නො යන තෙක් දූන් ම මා කැඳවා ගෙන කැමති තැනකට යව'යි කිවූ ය. උයි ත් යහපතැ යි ගිවිස 'එ සේ වී නම් මම සෙට දවස් නුවර වාසල කෙරේ අසවල් තැන සිටිමි. මුඹ ත් එක් උපදෙසකින් කාට ත් නො හැහෙන ලෙස එ තැනට අව මැනැවැ'යි කියාලා දෙ වන දවස් කියා ලූ තැන ම සිටියහ.

සිටු දූවණියෝ ද දෙ වන දවස් කිලුටු අදහස් සේ ම කිලුටු කඩරෙද්දක් කොයින් දෝ සොයා හැඳ ගෙන මිඩියන්ගේ ලෙසට ලීල් කොට හිස කේ බැඳ ගෙන රැ දෙ වරු වී පැරියා සේ ඇඟ මුළුල්ලේ ධූලි ගා ගෙන කළයක් හැර ගෙන පැනට යන කෙල්ලක මෙන් කෙල්ලන් හා එක් ව මගන් පිටත් ව මිඩි වෙස් ගත් ලෙසට කොල්ලා සිටින තැනට ගියහ. ඒ කොලූ ද ක්‍රියාවෙන් කුමක් වුව ත් ජාතීන් හා සම්පත්තීන් උතුම් තරම් ඇති සිටු දූවණියන් රෙදි කඩකින් වසා ලූ මැණිකක් පරිද්දෙන් කැඳවා ගෙන දූරට ගොසින් එක් ගමෙක රඳා හිඳ අයට අදයට සී සා

Non-Commercial Distribution

ගෙන, වප් වපුට ගෙන දර පලා ගෙනවු ත් ජීවත් වෙති. සිටු දූවණියෝ ද කුස රජව උපන් බෝසතුන් ප්‍රභාවතියන් නිසා නිකෘෂ්ට ලෙසින් හැසුරුණු නියාවට හුදෙක් පිරිමිහු ම ගැනුන් නිසා නිකෘෂ්ට ලෙස ඇවිදිනෝ නො වෙති. ගැනු ත් පිරිමින් නිසා නිකෘෂ්ට ලෙසින් හැසිරෙති යන්න හඟවන්නාක් මෙන් කළයෙන් පැන් ගෙනවු ත් තබමින් සිය අතින් ම පරමන් පිසමන් ආදි ය කෙරෙමින් තමන් යට කළ අකුශලයෙහි අනිෂ්ට විපාක ය වී බත් කමින් සිට, හමු බත් කන්නා සේ අනුභව කරන්ට පටන් ගත්හ.

ඉක් බිත්තෙන් උන්ගේ බඩ දරු කෙණෙක් ඇති වූ ය. වදන අවසථාවෙහි දී 'මෙ තැන අපගේ නෑසිය කෙණෙක් නැත. දෙ මවු පියෝ නම් දරුවන් ගේ කවර තරම් වරදක් ඇත ත් තමන් දරුවන්ට පදමාණවක ජාතකයෙහි තමන් යකිණි වුව ත් අත හැර යන පුතණුවන් කෙරෙහි කළා වූ ශොකයෙන් ළය පැළී මළ හෙයින් මොළොක් අදහස් ඇත්තෝ ය. දරුවන් වදන්ට මා ඔබ ගිය මැනැවැ'යි සමුණන්ට යාච්ඤා කොළෝ ය. උඹ ඒ අසා 'කුමක් කියන නියා ද? මුඹ දූවණියන් හෙයින් මුඹට කරණ කියන දෙයක් නැත ත් මා අයති හෙයින් කළ අපරාධ තරමට මරවා පියන සේක.

'මා ඔබ යන්ට බැරි ය'යි කී ය. සිටු දූවණියෝ තව ත් තව ත් කියා ත් උන් මැළි හෙයින් උන් කර්මාන්තයට ගිය දී ඉක් බිති ගෙවල ඇත්තවුන්ට 'ඉදින් අවුත් මා නො දක විචාළෝ නම් දෙ මවු පියන්ගේ ඔබ මා ගිය නියාව කියා ලුව මැනැව'යි කියා ලා ගෙයි දෙර පියා නික්මුණවු ය. ඒයි ත් අවුදින් සිටු දූවණියන් නො දක ඉක් බිති ගෙවල ඇත්තවුන් විචාරා එ පවත් අසා රඳවන්ට ය යි ලුහුබඳවා ගොසින් දක නො එක් ලෙස යාච්ඤා කොට ත් රඳවා පිය නුහුනුවූ ය. යන ගමනේ දී එක් තැනක දී විළි පහරන්ට වන. උඹ එක් කැලෑ හස්සකට වැද ලා සමුණනු ත් එ තැන දක්වා ගිය හෙයින් විළිපහරන නියාව කියා ලා ප්‍රසව වෙදනා බලව ත් හෙයින් හැසී වැසී දුකින් පුතණු කෙණකුන් වදා පියා 'යම් කටයුත්තෙක දෙ මවු පියන් ළඟට යමෝ නම් ඒ සමෘර්ධ වී ය'යි නැවත ත් රඳා හුන් තැනට ගොසින් රඳා හුන්හ.

කල් ගිය සේ තව ත් බඩ දරු කෙණෙක් ඇති වූ ය. දෙවන වරෙහි ද වදන අවසථාවෙහි දී දෙ මවු පියන් ළඟට කැඳවා ගෙන යන්ට පැරැත්ත කියා පියා උන් නො ගිවිස්නා හෙයින් ආදී

උපන් දරුවන් පයින් යන්ට අබල හෙයින් උනු ත් වඩා ගෙන බඩ දරුවනු ත් බඩින් හැර ගෙන නික්මුණාහ. සමුණන් ලුහුබඳවා ගෙන ගොසින් රඳවන්ට උත්සාහ කොට ත් නොරඳා නික්මුණ වූ ය. සමුණෝ ත් කැටි ව නික්මුණවූ ය. මෙ සේ එක් ව යන කලට නො කල් නො වේලා කොට ලා මහ වැස්සෙක් නැඟී ය. ඒ වේලාට ගසන විදුලියෙන් හා මෙස නාදයෙන් හා වස්නා වැස්සෙන් ආකාශ ය අතුරු සිදුරු නැති වි ය. ඒ වේලාවට ම පිට පිට හෙළා විදුලිය ගසන්නා සේ විළි ත් පහරනට වන. ආස ගුගුරන්නා සේ හඬ ගසන්ට ත් වන. වස්නා වැසි බෝවා සේ ම ප්‍රසව දුකු ත් බෝ වී ය. සමුණන් බණවා ලා විළි ත් පහරනට වන. ශීත පීඩා බලවත් හෙයින් ඇල් වැද පියා විළි ත් ලා ගත නො හෙමි. නො තෙමී වද පියන තැනක් ඉදිකරව'යි කිවු ය. උයි ත් දණ්ඩක් පතක් කපා ගන්ට නිසි යකඩක් හැරගෙන දඬු පත් බලා ඇවිදිනෝ තුඹසක් පිට සිටි කැලයක් දැක දණ්ඩක් පතක් කපන්ට වන්හ. කපන සොල්මනට තුඹසින් නයෙක් අවුත් ලා දඬු කපන තැනැත්තවු කාපී ය.

එ වේලෙහි ම මරා ලූ ගසෙක වැද ගත් ගින්නක් මෙන් දෂ්ට මුඛයේ පටන් විෂ ය නැඟි ලා ලේ ගුණ ය නැවත ලා, ගත නිල් ව ගොසින් මිය වැටී ගියේ ය. සිටු දූවණියෝ ද මහත් දුක් විඳිමින් දඬු කපා ගිය තැනැත්තවුන් නහන ගෙවල් තබා උන් තමනු ත් නො ලැබ අනිකුත් පුතණු කෙණකුන් වද පූ ය. දරුවෝ දෙන්න සුළං ශීත ඉවසා ගත නො හී හඬති. සිටු දූවණියෝ ද දරුවන් දෙන්නා බඩතුරෙහි ලා ගෙන දෙ දණ ත් දෙ වැළ මිට ත් බිම ඔබා ලා නැඹුරු ව ගෙන සිට තුන් යම් රාත්‍රි ය ගෙවා පීහ. රාත්‍රි ය මුළුල්ලේ තෙමී ලා සුදුමැලි ව පාන් වූ කලට එ දවස් උපන් දරුවන් උකුළෙහි හිඳුවා ගෙන වැඩි මාලු පුතණුවන් ඇඟිල්ල අල්වා ගෙන 'වරෝ දරුවෙනි, තොපගේ පියාණෝ තෙල සේ ගියෝ ය' යි කියා ලා තුඹස දක්වා ගොසින් තුඹස් බඩ මිය පියා හොත්තවු දැක, 'මා නිසා සමුණෝ අතුරු මහ දී මළෝ ය' යි හඬමින් වලපමින් දෙ මවු පියන්ගේ ඔබ යන්ට නික්මුණවූ ය.

රෑ වැසි වැස ලා අචිරවතී නම් ගඟ දණ පමණ, තන මතු පමණ වතුරු යන්නා දැක තමන් මඳැබුද්ධි හෙයින් සිතා ගත නො හී දරුවන් දෙන්නා ම බර නොවත ත් වඩා ගෙන එක විට ම ගෙන යන්ට හැකිව ත් ජීවත් වන්ට උන්ගේ දෛව නැති හෙයින් වැඩි මාලු පුතණුවන් මෙ තෙර සිටුවා ලා බාල දරුවන් වඩා ගෙන

Non-Commercial Distribution

එ තෙරට ගොසින් කොළ අතු බිඳ ලා ලා ඒ දරුවන් ඊ මැද හොවා ලා මෙ තෙර සිටි දරුවන් කැඳවා එම් කියා ත් සිතා ත් බාල දරුවන් හැර පියා යත් නො හී ගොසිනු ත් බලා සිට ත් බලා මෙ තෙර දරුවන් ළඟට යන්ට නික්මුණාවූ ය. ඉක් බිත්තෙන් දෙ දරුවන්ට ම නුදුරු ව ගං මැදට ගිය කලට එක් උකුස්සෙක් ලේ මස් ගඩුවක් සේ අතු මත්තේ හොත් දරුවන් දැක මස් වැදූල්ලෙකැ'යි සිතා අහසින් බට.

සිටු දූවණියෝ ත් පුතණුවන් ගසා ගන්ට බස්නා උකුස්සා දැක අත්ලෙන් අත්ල ගසා අරගල කළහ. උකුස්සා ත් අරගල අසා ගත නො හී අලුත උපන් කුමාරයන් ගසා ගත. ඔබින් දරුවෝ ත් නැත. මෙ තෙර සිටි කුමාරයෝ මෑණියන් ගං මැද සිට අත ඔසවා ලා අරගල කළා දැක අසා තමන් කැඳවති යන්නක් කම් බලයෙන් සිතා ගෙන මෑණියන් එන තුරු ත් නො රඳා වහා දියට බටවූ ය. බැස ත් තමන්ට, දිය බොහෝ හෙයින් වතුරේ ගිය හ. එලෙසින් මෙ ගොඩ සිටි පුතණුවෝ ත් නැත. සිටු දූවණියෝ ද අතුරු මඟ දී රක්‍ෂා කළ සමුණෝ මළෝ ය. බාල දරුවන් උකුස්සෙක් ගසා ගත වැඩි මාලු දරුවෝ දියෙන් ගියෝ ය'යි හඬමින් වලපමින් යන තැනැත්තෝ සැවත් නුවර සිට එන කෙණකුන් දැක කොයි සිට එවු දැ'යි විචාරා සැවැත් නුවර අසවල් වීදියේ මෙ නම සිටු කුල-යෙක් ඇත. හඳුනන්නේ ඇද්දැ'යි විචාරා ලා 'උන්දැ ලා හඳුනෙමි. අනික් පවතක් විචාර ත් මුත් උන්දැගේ පවත් මා අතින් විචාරන්ට නො කැමැත්තේ ය'යි කී කල්හි 'සෙසු පවතින් මට ප්‍රයෝජන නැත. මට වුව මනා ඒ පවත ම ය'යි කිවූ ය.

'මුඹ තත්පර ව විචාරන පසු කිව මනා වේ ද? ඊයේ රෑ දෙවරු වැසි වට නියාව දුටුවේ ඇද්දැ'යි විචාළෝ ය. 'එ සේ ය, ඒ වැස්ස අනුන්ට වට වැස්සෙක් ද? මට ම වට වැසි වේ ද? ඒ කාරණය පසු ව කියා ලමි. මා විචාළ සිටාණන් වහන්සේගේ පවත කථාවෙන් වසා ලූ පමණක් මුත් කියා ලූයේ නැත්තේ වේ ද, ඒ කියන්ට වුව මැනැවැ'යි කිවූ ය. එ සේ වී නම ඊයේ රෑ සිටාණනු ත් සිටු දූවණියනු ත් සිටාණන්ගේ පුතණුවනු ත් තුන් පක්‍ෂ ය තනා ගෙන හිඳිනා මාළිගාව හුණු හෙයින් මිය ගියවුන් එක දර සෑයට නඟා ලා දවති. තෙල පෙනෙන දුම ඒ ය'යි කිවූ ය. උෟ එ වේලෙහි ශොක ය බලවත් ව සැලී පෙළෙන්නෝ තමන් හන් පිළි හෙන නියා ත් නො දැන උමතු බවට පැමිණ—

"උභො පුත්තා කාලකතා – පන්ථෙ මය්හං පතී මතො
මාතා පිතා ච භාතා ච – එකචිතකස්මිං ඩය්හරෙ"

Non-Commercial Distribution

යනු හෙයින් ‘දරු දෙන්න ත් මළෝ ය. සමුණෝ ත් මළෝ ය. මුඹ රැකෙන්ට අවු ත් මවු පිය දෙ දෙනා ත් බෑණෝ ත් එක සෝනේ දවති’යි හඬමින් වලපමින් හුණු පිළී ත් අඳිනට නැති හෙයින් උපන් වතින් ම හඬා ඇවිදිති. මිනිස්සු උන් දැක සසර දෝස නො සලකා වියරු හුණු එකෙකැ’යි කියා ගෙන කසල ත් පසු ත් හැර ගෙන හිස ඔනෝ කැට කැබලිති බාලා ගසති.

බුදුහු දෙවරම් වෙහෙර දී උපාසක පර්ෂද ය-උපාසිකා පර්ෂද ය-භික්ෂු පර්ෂද ය භික්ෂුණී-පර්ෂද ය යි සිවු වනක් පිරිස් ද තවත් සවු මහ රජයෙහි පිරිස-තව්තිසා පිරිස-රජ පිරිස-බමුණු පිරිස-මාර පිරිස-ගොවි පිරිස-මහණ පිරිස-බඹ පිරිස යන අට වනක් පිරිස් පිරිවරා බණ වදරණ සේක් එන සැටි ය නපුරු වුව ත් කප් ලක්ෂයක් පෙරුම් පුරා ආ හෙයින් ඒ ලෙසින් යහපත් ව එන හිරි ඔතප් සළු නො ලදින් උපන් වතින් එන සිටු දුවණියන් පෘථග් ජන ලෙසින් තව බිළිඳී තැනැත්තවුන් දුටු සේක. උඹ වැළි ත් පියුමතුරා නම් බුදුන් සමයෙහි ඒ බුදුන් එක් විනයධර මෙහෙණී කෙණකුන් උඩ ඔසවා නඳුනුයන සිටු වන්නා සේ විනයධර මෙහෙණීන්නන්ට අග තැන් තබන්නා දැක ‘මම ත් මුඹ වහන්සේ වැනි බුදු කෙණකුන් වහන්සේ සමයෙක මේ තනතුරු ලැබෙම්ව’යි පැතූහ. පියුමතුරා බුදුහු ත් එන දවස බලා පැතීම සමෘර්ධ වන නියාව දැන ‘මතු එන දවස ගොයුම් බුදුන් සමයෙහි විනයධර මෙහෙණීන්නන්ට අග්‍ර ව පටාචාරා ස්ථවිරි ය යි ප්‍රසිද්ධ වව’යි වදළ සේක.

මෙ සේ පැතූ පැතීම් ඇති මහ පිණැති තැනැත්තවුන් එන්නන් දුර දී ම දැක ‘මුන්ට මා විනා අනික් පිහිටි විය හෙන කෙණෙක් නැත. පිහිට ත් වුව මිනා වේ දැ’යි යම් ලෙසක ඉවත නො ගොසින් වෙහෙරට ම එත් නම් එ ලෙසට කළ සේක. පර්ෂදත් උන් එන්නවුන් දැක ‘තෙල වියරු හුණු තැනැත්තිය මෙයට වැද්ද නො දෙව’යි කිවු ය. බුදුහු ත් ‘උන් නො නවතව’යි වදරා ලා ලහට ආ කලට ‘තොප ශොක මහත් ව මෙ ලෙසක් වූ බව මුත් සිහි නුවණ නැති කෙණකුන් නො වත් සිහි ලබව’යි වදළ සේක. උයි ත් ඒ ඇසිල්ලෙහි බුදුන්ගේ ආනුභාවයෙන් සිහි නුවණ ලත්හ. හිණ පිළී නැති නියාව එ වේලෙහි සලකා හිරි ඔතප් එළවා ගෙන එළිල්ලෙන් හුන්හ. එක් කෙණෙක් තමන් පෙර ව සිටි උතුරු සළුව දමා ලූ ය.

උඹ ඒ හැඳගෙන බුදුන් ලහට ගොසින් පැමිණ බොහෝ අවමඟුලෙන් මිදී මඟුල් නිසා අටතුරාසියක් මඟුල් ලකුණෙන්

Non-Commercial Distribution

විසිතුරු වූ ඇඟිලි නමැති පෙත්මතන් හා තඹවන් නිය නමැති කෙසුරෙන් හොබනා වූ සක් නමැති පියුම් කෙමි ඇති බුදුන්ගේ පා පියුම් පසඟ පිහිටුවා වැඳීමෙන් හිස පැළඳ 'සියල්ලවුන්ට පිහිට ව සිටි ස්වාමි දරුවාණන් වහන්ස, රක්‍ෂා කොට ගෙන හුන් සමුණන් ගෙන් නො ව අසරණ වූ වද ගත් දරුවන් ගෙන් නූ වූ හෙයින් දරු පිහිටකු ත් නැති. දෙ මවු පියනු ත් නො ලත් හෙයින් මවු පිය සහායක් නැති, මල් බෑයන් නො ලත් හෙයින් බන්ධු සහාය කුත් නැති වාසය නිකෘෂ්ට වූ හෙයින් ක්‍රියා දෙෂ ය නිසා ජාතීන් නසා ගත් මා උතුම් වූ ආර්‍ය්‍ය ජාතියෙහි පිහිටුවා ලොව් සැපතින් පිරිහුණු මිඩිය ලෞවතුරා සැපතෙහි පිහිටුවා සහාය ව වදාළ යහපතැ'යි කිවු ය.

බුදුහු උන්ගේ බස් අසා පට ය යි කියා වස්ත්‍රයට නම් හෙයින් වස්ත්‍ර නැති වීමෙන් නට ආචාර එ ම වස්ත්‍ර ය නිසා පෙරළා ත් ඇති වූ හෙයින් පටාචාරාවෝ ය යි පසු ව ප්‍රසිද්ධ වන හෙයින් පටාචාර නම තමන් වහන්සේ ගෙන් ම උන්ට දෙන සේක් 'පටා-චාරාවෙනි, තෙපි මුසුප්පු නො වව. ආයේ ත් පිහිට වන්ට බල ඇති තැනක් කරා ම ය. යම් සේ මේ ජාතියෙහි තොපගේ බාලදරු වන් උකුස්සා ගසා ගත් ද, අනික් දරුවෝ දියෙන් ගියෝ ද, මහ දී සමුණෝ ත් මළෝ ද, මවු පියෝ ත් බෑණෝ ත් හිඳින ගෙය කඩා ගෙන හී මළෝ ද, එ පරිද්දෙන් මේ සසර සිටිනා තෙක් කල් දෙ මවු පියන් ආදීන් නට කල හඬා වගුළ කඳුළු—

"චතුසු සමුද්දෙසු ජලං පරිත්තකං,
තතො බහුං අස්සුජලං අනප්පකං;
දුක්ඛෙන ඵුට්ඨස්ස නරස්ස සොචනා,
කිං කාරණා සම්ම තුවං පමජ්ජසි."

යනු හෙයින් සතර මහ මුහුද පැන් විතරට ත් බොහෝ ව යනා දීන් අනමතග්ගපරියාය සූත්‍ර ය වදර ත් වදර ත් මුවහත් තබන යකඩෙක මල කඩ ඉගිලෙන්නා සේ සොක දුක්ඛ ය තුනී විය. සොක දුක්ඛය තුනී නියාව දැන ලා බුදුහු පටාචාරාවන් බණවා ලා 'හෙම්බා පටාචාරාවෙනි, දෙ මවු පිය ආදීහු මිය පර ලොව යන්න වුන්ට තුමූ ජීවත් ව හිඳ ත් පිහිට විය නො හෙති. නුවණැත්ත වුන් විසින් සීල විසුද්ධි ය කොට ගෙන තම තමන්ට පිහිට විය යුතු ය'යි වදරා විසි වන මග්ග වග කෙළවර ගාථා දෙකින් බණ වදාළ සේක. දේශනා කෙළවර පටාචාරාවෝ පොළව පස් විතර

Non-Commercial Distribution

ච ත් බොහෝ කෙලෙසුන් ගෙවා සෝවාන් වීමෙන් ආයර්‍ය ජාති යෙහි පිහිටා ජාතීන් ශුද්ධ කළහ. සංසාර දෙෂ ය නිසා ඇති තුගු ණ ත් හළහ. නටුවා වූ ලොව් සැපට ලොවුතුරා සැපතු ත් යන් තම් විතරක් ලත්හ. සෙසු ත් බොහෝ දෙන සෝවාන් ඵලාදියට පැමිණියහ.

පටාචාරාවෝ ද සෝවාන් ව ලා ගිහි ගෙයි රදා හිඳ දුටු සැප-යක් ම නැති හෙයින් මහණ කරන්ට ආරාධනා කළහ. බුදුහු උන් මහණ කරන්ට මෙහෙණින්නන් ලඟට යැවූ සේක. මෙහෙණින් නෝ ත් මහණ මාලු පැවිදි කළහ. ආචාර්‍ය උපාධ්‍යාය තැන් ඇති ව මහලු පැවිද්ද ලත් හෙයින් නැති වූ දෙ මවු-පියන්ට ශාසනයෙන් දෙ මවු- පියනු ත් ලැබ පටාචාරා සථවිරී ය යි ප්‍රසිද්ධ වූහ.

එක් දවසක් කළයකින් පැන් හැර ගෙන පය සෝදන්නාහු පයට පැන් වත් කළහ. ඒ පැන් බිම මඳ තැනක් ගොසින් ලා බී ගියේ ය. දෙ වන දවස් පය සේධූ පැන් ආදී දවස් පැන් ගිය තැන පැන් බී යන්ට මඳ හෙයින් ඒ පන් වා මඳක් දුරු වැ ගොසින් ලා බී ගියේ ය. තුන් වන දවස් පය සේධූ පැන් දෙ දවස ගිය තරමින් වඩා ගොසින් ලා බී ගියේ ය. පටාචාරා මහන්දැ අ විවසුන් වැඩීමට අනික් අරමුණක් නො සොයා තුන් දවස් පය සේධූ පැන් ගොසින් සුන් ලෙස ම අරමුණු කරණ දැ ආදියෙ ත් දවස් මඳක් ගොසින් ලා සුන් පැන් සේ මේ සත්තු ආදි වයස උපන් තැන් පටන් තෙ තිස් අවුරුද්ද ඇතුළත ත් මියෙති. දෙ වන දවස් මඳක් දුරට ගොසින් සුන් සේ මධ්‍යම වයස් වූ තෙ තිසේ පටන් සත් සැට දක්වා මේ අතුරෙ ත් මියෙති. තුන් වන දවස් සුන් පැන් මෙන් කෙළවර වයස් වූ සත් සැට පටන් සියේ දක්වා මේ අතුරෙත් මියෙති. එ හෙයින් උපන් සතුන්ට මරණ නියත ය යි සිත සිතා හුන්දැ ය.

බුදුහු ගඳ කිළියේ වැඩ හිඳ රස් කඳක් විහිදුවා ලා ලඟ වැඩහිඳ කථා කරන්නාක් මෙන් 'එම්බා පටාචාරාවෙනි, යම් කෙණෙක් රූ අරූ පස් කඳින් අවිද්‍යා ප්‍රත්‍යයයෙන් රූ උපද්දී, තෘෂ්ණා ප්‍රත්‍යය යෙන් රූ උපද්දී කර්ම ප්‍රත්‍යයයෙන් රූ උපද්දී, ආහාර ප්‍රත්‍යය යෙන් රූ උපද්දී, උත්පත්ති ලක්ෂණය නම් උදය ය, අවිද්‍යා ය, තෘෂ්ණා ය, කර්ම ය, ස්පර්ශ ය යන චතුර්විධ ප්‍රත්‍යයෙන් වෙද නා ය, සංඥ ය, සංස්කාර ය යන ස්කන්ධයෝ තුන් දෙන වෙති. මුන් තුන් දෙනාගේ උත්පත්ති උදය ය, අවිද්‍යා ය, තෘෂ්ණා ය, කර්ම ය, නාමරූපය ය යන චතුර්විධ ප්‍රත්‍යයයෙන් විඥාන ස්කන්ධය

Non-Commercial Distribution

වෙයි. මොහුගේ උත්පත්ති උදය ය යි මෙ සේ පඤ්චස්කන්ධ විෂයෙහි එකකට එකකට ආකාර පසක් පසක් වතු නියායෙන් ආකාර පස් විස්සෙකින් උදය ලක්ෂණය ද, එ සේම අවිද්‍යා නිරොධයෙන් රූප නිරොධය වෙයි යනාදීන් යොද නිරොධය දක්නේ ව්‍යයය දක්කි යි කියා සලකා පඤ්චස්කන්ධ විෂයෙහි පස් විස්සක් විතර මේ ආකාරයෙන් ව්‍යය ද යි සම පණස් ලකුණෙන් උදවිය[1] නො දකිත් නම් එ සේ වූවන් අවුරුදු සියයක් ජීවත් වත ත් ප්‍රයෝජන නැත. සම පනස් ලකුණෙන් උදවිය[1] දක්නවුන් එක දවසක් ජීවත් වත ත් එ ම යහපතැ'යි වදළ සේක. දෙශනා කෙළ වර පටාචාරා විහන්දෑ පිළිසිඹියා පත් රහත් ව සෝක දුක් නැති වූවා සේ ම සසර දුක් නැති කළ දැ ය.

එ හෙයින් සත්පුරුෂයන් විසින් අකුසලින් දුරු ව කුසල්හි පිහිටා හැම දුකට මුල් වූ ජාති දුක ම නසන්ට උත්සාහ කටයුතු.

---

## 107. කිසාගොතමීන්දෑ ගේ වස්තුව

තව ද කවරේට ත් නුවණම පිහිට වන නියාව හඟවන්ට කිසාගොතමීන්දෑ ගේ වස්තුව දක්වමු.

කෙසේ ද යත්—

සැවැත් නුවර එක් සිටාණ කෙණකුන් ගේ ගෙයි සතළිස් කෙළක් පමණ වස්තුව උන්ගේ එ බඳු අකුශල කර්ම ශෙෂයකින් අඟුරු ව පියා සිටියේය. සිටාණෝ ඒ දැක මුසුප්පු බලවත් ව ගොසින් බත් කෑමුත් නැති ව හැදට නැඟී ලා වැද හොත්තෝ ය. උන්ගේ යාලුවාණ කෙණෙක් උන්ගේ ගෙට අවුත් 'සබඳ, මුසුප්පු හැයිදැ'යි විචාරා එ පවත් අසා 'සබඳ, ඒ නිසා මුසුප්පු නො වව, අඟුරු වූයේ ත් සම්පත් ම වේද, උපදෙසකින් සම්පත් ම වේ නමුත් එ ම අඟුරු වේ ද, ඒ අඟුරු සම්පත් වන්ට නිසි උපදෙසක් දනිමි රත්රන් රිදී නො වන දෙය පවා උපදෙස් බලයෙන් රත්තරනු ත් කෙරෙති. රිදී ත් කෙරෙති. තොපි ත් මා කී උපදෙස කරව'යි කිවූ ය. කුමක් කෙරෙම දැ'යි විචාළ කල්හි 'තොපගේ සල්පිල්වල කළාල් පැදුරු අතුරුවා ලා ඒ අඟුරු ගෙන්වා ගොඩ කරවා ලා අඟුරු විකුණන කෙණකුන් මෙන් හිඳුව එතැනට ආ ආ කෙණෙක් සෙස්සෝ තෙල් මී සකුරු පිළී ආදිය තබා ගෙන විකුණති. තෙපි අඟුරු තබා ගෙන විකුණව'යි කියත් නම් තොපි උන්ට 'මට ඇති දෙය නො වීකාට කුමක් විකුණෙම් දැ'යි කියව.

1. උදය ව්‍යය - ඇතැම්

Non-Commercial Distribution

යම් කෙණෙක් ආ කල ‘සෙස්සෝ පිළී ආදි ය තබා ගෙන විකුණති. තෙපි රන් රිදී තබා ගෙන විකුණව’යි කිවු නම් ‘රන් රිදී කොයි ද’යි උන් අතින් විචාරා මේ මේ ය යි කී කල්හි ‘ඒ මෙ සේ දෙව’ යි උන් ලවා ගෙන්වා තොප අතට ඇර ගනුව. එ සේ උන් දෙන දෙන දෙය තොප අතට පැමිණ ත් තරයේ ප්‍රසිද්ධ විය නො හෙන්නා සේ රත්රන් රිදී ම වෙයි. ඉදින් තොප අතට දුන් තැනැත්තෝ කුමාරිකා කෙණෙක් වූ නම් උන්ගේ වස- යෙනු ත් සම්පත තර වනු නිසා උන් ගෙන්වා තොපගේ පුතණු- වනට පාවා දෙවා ලා සතළිස් කෙළක් වස්තුව ත් ඒ කුමාරිකා- වන්ට ම නතු කොට දෙවා ලා උන් දුන් දෙයක් ප්‍රයෝජන විඳුව. ඉදින් තොපට රත්රන් ආදි ය දුන් තැනැත්තෝ කුමාර කෙණෙක් වූ නම් තොපගේ වැඩිවිය පැමිණි දුවණියන් උන්ට පාවා දෙවා ලා සතළිස් කෙළක් වස්තුව ත් යේළණියන්ට පාවා දුන්නා සේ බෑණනුවන්ට ත් පාවා දෙවා ලා උන් දී ලූ දෙයක් හැර ගෙන ප්‍රයෝජන විඳුව. මෙ ලෙසින් මු ත් තොප සන්තක කොට තබා ප්‍රයොජන විඳිනට නො සිතව’ යි කිවු ය.

උයි ත් උපදෙස් යහපතැ යි සල් පිළ පිට අඟුරු ලවා ලා විකු ණන බඳු ව ලා හුන්න. එ කල ශරීර ය අතිදුර්වල හෙයින් නමින් කිසා ගොතමී නම් වුව ත් පිණින් දුර්වල නො වන ඉතා දුප්පත් කුමාරිකා කෙණෙක් එක් තරා කට යුත්තක් නිසා සල් පිළ කරා ගිය තැනැත්තෝ සිටාණන් දැක ‘සෙස්සන් පිළී ආදි ය තබා ගෙන විකුණන කල මුඹ දුන් රත්රන් තබා ගෙන විකුණන්නේ හැයි ද? සෙස්ස විකොට ත් එවා ගත මනා දෙය වේ දැ’යි කිවු ය. ‘පුතණ්ඩ, රත්රන් කොයි දැ’යි විචාළ කල්හි ‘මහ යෙමින් සිට ම මහ කොයි දැ යි තමන් විචාරන්නා සේ තෙලෙ තබා ගෙන හිඳිනා ගොඩවල් රත්රන් වේ දැ’යි කිවු ය. ‘එ සේ වී නම්, පුත, ඉන් යමක් ගෙනවුත් මා අතට දෙන්නැ’යි කිවු ය.

ඉන් අඟුරු මිටක් කුමාරිකාවන් අතට හැර ගන්නා ම පිළින්දිවච්ඡ සාමීන්ගේ ඍර්ධ්‍යානුභාවයෙනු ත් ආරාමිකයන්ගේ කුශලානුභාවයෙනු ත් ඈ තමා අතට හැරගත් සුමමාඩිය රත්මාලා වූවා සේ ම කුමාරිකාවන්ගේ කුශලානුභාවයෙන් රත්රන් විය. සිටාණන් අත ලූව ත් අඟුරු නො ව රත්රන් විය. සිටාණෝ ද ‘පුත, තොපගේ ගෙය කොයි දැ’ යි විචාරා ලා අසවල් ගේ ය යි කී කල්හි සරණ විචාළවුන් ඇති නැති නියාව ත් විචාරා විචාළවුන් නැති නියාව ත් දැන අය වියදම් කරවා උන් තමන්ගේ පුතණු



Non-Commercial Distribution

වන්ට ගෙන්වා පාවා දී සතළිස් කෙළක් වස්තුව ත් දයාද කොට උන්ට ම දුන්හ. අඟුරු ගොඩවල් රත්රන් රිදී ගොඩවල් වී ය.

සරණ ආ නො බෝ කලකින් උන් බඩ අල්පායුෂ්ක දරු කෙණෙක් පිහිටා දස මස් අයාමෙන් දවස් ගත ව ආ කෙණකුන් මෙන් පුතණු කෙණෙක් උපන්හ. උෟ පියවර ඔසවා ඇවිදිනා අවධියේ මළෝ ය. කිසාගොතමීන් තමන් පෙර මළ කෙණකුන් නුදුටු විරූ හෙයින් දවන්ට හෝ වළලන්ට හෝ ගෙන යන පුතණු වන් රඳවා ලා 'ම පුතුන්ට බෙහෙදක් විචාරමී' මළ දරුවන් කර හොවා ගෙන 'කුමක් ද? ම පුතුන්ට බෙහෙත් දනු දැ'යි ගෙයක් ගෙයක් පාසා විචාරා ඇවිදිති. 'මළ දරුවන්ට බෙහෙත් විචාරන් නේ පුත තොපට විකාර ඇති නියා දැ' යි ඇසූ ඇසූවෝ විචාරති. කවුරුන් කුමක් කිව ත් උෟ තමන් විචාරන බෙහෙත් ම විචාරති.

එක් නුවණැති කෙණෙක් මුන් දැක 'කුළුඳුල් දරුවන් ම හෙයින් දෝ මුන් මළ දරුවන් නුදුටු විරූ නියා ය. මා මුන්ට පිහිට වුව මනා වේ දැ' යි සිතා 'මම, පුත, එ බඳු බෙහෙත් නො දනිමි. බෙහෙත් දන්නා තැනක් දනිමී' කිවු ය. 'පියාණන් වහන්ස, බෙහෙත් දන්නෝ කවුරු දැ'යි විචාළෝ ය. 'පුතණ්ඩ, ති ලෝ ගුරු බුදු රජාණන් වහන්සේ සියල්ල දත්තෝ බෙහෙත් පිළියම් හැර නො වන්නෝ වේ ද? ඔබ සියල්ලකට ම බෙහෙත් දන්නා සේක. ඔබ ගොසින් විචාරව' යි කිවු ය. යහපතැ යි කියා බුදුන් කරා එළඹ වැඳ ලා එකත් පස් ව සිට 'ස්වාමීනි, මුඹ වහන්සේ ම පුතුන්ට බෙහෙත් දෙන්නා සේක් දැ'යි විචාළෝ ය. 'සියලු ලෙසින් නො මියන ජාති ජරා ව්‍යාධි නැති වන බෙහෙත් දන්නමෝ තෙල විතරක් නො දනුමෝ ද? දනුම්හ'යි වදළ සේක.

වුව මනා කුමක් දැ යි විචාරා 'හබ අඩ කුළුඳුල්ලක් විතර වුව මැනැවැ'යි වදළ කල්හි'ඒ වන්නා සෙවිය හැක්කේ වේ ද? කෙ සේ වූ තැනෙකින් ගෙනෙම් දැ'යි විචාළෝ ය. මුන්ගේ ඥාන ශක්ති ය හබ ගෙනෙන්ට වදළ බස් පමණකින් ම හබ සොයා නො ගොසින් ආද්‍යන්ත විචාල ගමනින් ම දත යුතු ය. 'හෙම්බා ගොතමීනි, දුටු පාඩු ගෙවලින් නො කැමැත්තේ ය. යම් කෙණකුන්ගේ ගෙයි දූවණි කෙණෙක් වත් පුතණු කෙණෙක් වත් නො මළෝ නම් එ සේ වූ ගෙයකින් ගෙනෙව'යි වදළ සේක. උයි ත් යහපතැ'යි ගිවිස බුදුන් වැඳ ලා මළ දරුවන් කර හොවා ගෙන ඇතුළු ගමට වැද ලා පළමු වන ගෙ දොර සිට 'මේ ගෙයි හබ ඇද්ද? ම පුතුන්ට

Non-Commercial Distribution

ඉන් බෙහෙත් ඇතැ'යි කියා ඒ ගෙයි ඇත්තවුනු ත් ඇතැ'යි කී කල්හි 'එ සේ වී නම් දුන මැනැවැ'යි කිවු ය. උන් හබ ගෙනා කලට 'මේ ගෙයි පුතණු කෙණකුන් වත් දුවණි කෙණකුන් වත් මළ විරූ නැද්දැ'යි විචාරා 'පුත, කුමක් කියවු ද? ජීවත් වූවන් විතරට මළෝ ම බොහෝ වෙත් දැ'යි කී කල්හි 'එසේ වී නම් තෙල හබ ම පුතුන්ට බෙහෙත් නො වෙයි' කියා ලා පෙරළා දූන්හ.

මෙ ලෙසින් ගම මුළුල්ලේ ම විචාරා ඇවිද එක ගෙයකිනු ත් වදළ ලෙසට හබ නො ලදින් සවස් වේලේ දී 'අනේ කට යුත්තක් බැරි නියා ය. මම, ම පුත් තූ ම මළෝ ය'යි සිතා හිදිමි. ගම මුළුල්ලේ ම හුන් දූන් පිතුන්ට වඩා මළෝ ම බොහෝ ල'යි සිතන කලට ඒ ලෙඩට බෙහෙද විනා අනික් බෙහෙදක් නැති බැවින් පුත්‍ර ස්නේහ නැමැති ලෙඩත් යන් තම විතරක් තබා සන්හුණ. ප්‍රෙම මූලික වූ ශොක සන්හිඳෙ ත් සන්හිඳෙ ත් ළය ත් තද වී ය. ඌ තුමූ උද්ධු මාතක පිළිකුල ඒ අවස්ථාවෙන් පැන පු කලට හරනා යොගාවචරයන් මෙන් පුතණුවන් වල දමා පියා බුදුන් ලඟට ගොසින් වැඳ එකත් පස් ව සිටියෝ ය. බුදුහු ත් නො ලැබෙන නියාව දූනෙත ත් 'හබ සුහක් ලදු දැ'යි විචාළ සේක. 'සවාමීනි, නො ලද්දෙමි. ගම මුළුල්ලේ ම නො මළ දූන් පුතුන් විතරට මළෝ ම බොහෝ ය'යි කිවු ය.

'අප කියා ලූ බෙහෙත් බඩු සපයා දී ලිය නො ගෙන කල අප කරන්නේ කිම් ද? යම් සේ එ බඳු හබයක් ලද නො හැකි ද-එ ලෙසින් මළවුන්ට ත් කළ මනා බෙහෙත් නැත. කරතොත් කළ මනා තමා නො මියන්ට බෙහෙදෙකැ'යි වදරා වීසි වන මග්ග වගින් ගාථාවක් වදළ සේක. ගාථා කෙළවර කිසාගොතමී සෝවාන් වීමෙන් නිවන් බෙහෙත් අනුභව කොට සත්කායදෘෂ්ට්‍යාදි වූ ලෙඩ තුන ත් නැති කළහ. සෙසු ත් බොහෝ දෙනා සෝවාන් ඵලාදියට පැමිණියහ. සෝවාන් ව ජාතිදුක්ඛාදි රොග පිළියම් ශාසනික ව කරණු කැමති ව මහණ කරන්ට ආරාධනා කළහ. බුදුහු මෙහෙණින්නන් ලඟට යවා මහණ මහලු පැවිදි කැරවූ සේක. මාලු පැවිදි ලදින් කිසාගොතමී ස්ථවිරින්දෑ ය යි ප්‍රසිද්ධ වූ දෑ ය.

උන්දෑ එක් දවසක් පොහෝ ගෙයි වත් මුර ය පැමිණ පාන් පුද ලා හුන්දෑ පහන් දල් සිඳෙන නියාව ත් ප්‍රබන්ධොත්පත්ති වශයෙන් උපදනා නියාවත් දැක 'මේ සත්‍වයෝ ත් භවොත්පත්තිය නවතා ගක තුහුනු නම් උපදිති. උපන්නවුන්ට මරණ ඒකාන්ත භාවී හෙයින් මියෙති. අනුපධිශෙෂ නිර්වාණ ධාතුයෙන් නිවියාහු ම

Non-Commercial Distribution

නො පෙනෙති. ඇවිළෙන පහන ම පෙවූ අතට සම්භ වූ ආයුධයක් මෙන් අරමුණු කළහ.

බුදුහු ත් ගඳ කිළියේ වැඩ හිඳ ම රස් කඳක් අභිමුඛයට විහිදුවා ලා ළඟ වැඩ හිඳ කථා කරන්නාක් මෙන් 'ගොතමීනි, ඒ ඒ සේ ම ය ''මේ සත්වයෝ නම් විඥප්තිරූප හා ලක්ෂණරූප හැර සෙසු රූපයන් චිත්තක්ෂණ සතළොසකට මුත් වඩා ආයු නැති හෙයිනු ත් අරූප ධර්මයන් උත්පාද, ස්ථිති, භඞ්ග සඞ්ඛ්‍යාත ත්‍රිලක්ෂණයෙහි මුත් වඩා නො පවත්නා හෙයිනු ත් ක්ෂණික මරණිනු ත් සන්තති මරණිනු ත් මියෙති. මළාහු උපදිති. නිර්වාණට පැමිණියන්ට කලෙක දී වුව ත් ඒ නැත. එ හෙයින් යම් කෙණෙක් නිවන් නො දක මෙ වක පරමායු වශයෙන් සියක් හවුරුදු ජීවත් වත් නමුත් ඉන් ප්‍රයෝජන නැත. එක දවසක් වුව ත් නිවන් දැක ජීවත් වීම ම අපාය භය නැති හෙයින් සංසාර භය තුනී හෙයින් එ ම යහපතැ'යි වදාළ සේක. දේශනා කෙළවර කිසාගොතමීන්දැ හුන් තැන හිඳ ම පිළිසිඹියා පත් රහත් ව ශරීර ය කිස වුව ත් ගුණ පුෂ්ටි ය එවා ගත් දැ ය.

එ හෙයින් සත් පුරුෂයන් විසින් ශරීර පුෂ්ටි ය නැත ත් චිත්ත පුෂ්ටි ය ඇති ව අකුසලින් දුරු ව කුසල්හි පිහිටා ගුණපුෂ්ටි ය එවා ගත යුතු.

## 108. බහුපුත්තික ස්ථවිරීන්දැ ගේ වස්තුව

තව ද ප්‍රතිපත්ති පූරණයෙහි උත්සාහ වඩනු නිසා බහුපුත්තික ස්ථවිරීන්දැ ගේ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්—

සැවැත් නුවර එක් කුල ගෙයක පුතුන් සත් දෙනකුන් හා දූන් සත් දෙනෙක් ඇත. උඹ හැම දෙන ම වැඩි විය පැමිණ ගෙවල් දොරවල් ඇති ව සුවෙන් ජීවත් වෙති. කල් යැමක දී පියාණෝ මළෝ ය. මෑණියෝ තුමූ සම්පත බෙදා නො දෙති. දරුවෝ තුදුස් දෙන 'මෑණියන් වහන්ස, අපගේ පියාණන්දැ නට පසු මේ සම්පත මුඹ දැ ම තබා ගෙන හිඳීමෙන් ප්‍රයෝජන කිම්ද? සම්පත බෙදා දුන ත් ගිනි පිඹගෙන පෙනෙල්ල දැමූවා සේ කරමෝ ද? නො රකුමෝ දැ'යි කිවු ය. උඹ උන් හැමගේ කථා අසා ත් බැණ නො නැඟී හිඳ එක්වන් ම බෙදීමේ දැ කියන හෙයින් සම්පත නො බෙදා තබා ජීවත් වන්ට ගන්නා ආයාස බලා ත් බෙදා දී ලා දරුවන්

Non-Commercial Distribution

නිසා ම ජීවත් වෙමි සිතා සියලු සම්පත් දෙකක් කොට බෙද ලා එක් කොටසක් පුතුන්ට දී ලා, එක් කොටසක් දූන්ට දුන්හ.

කීප දවස ක් ගිය කලට කරණ සංග්‍රහ දක්නා නිසා වැඩි මාලු පුතණුවන්ගේ ගෙට ගියහ. ගිය නැන්දණියන්ට යේළණියෝ 'අපගේ නැන්දණියන් දෑ වැඩි මාළු පුතණුවෝ ය යි වඩා දීලූ දෙයක් ඇති සැටියේ තෝරා ලා මේ ගෙට ම එන්නේ ඉන් වේ දෑ'යි කිවු ය. සෙසු පුතුන්ගේ අඹුවෝ ත් තම තමන්ගේ ගෙවලට ගිය කල කථා කොට ගත්තා සේ එ සේ ම කිවු ය පුතුන්ගෙන් ලද සාද එ පමණක් හෙයින් දූන්ගෙන් සාද විදිනා නිසා දූන් සත් දෙනාගේ ගෙවලට ගොසිනු ත් මූණු ගසා කියන බස මු ත් සංග්‍රහයක් නො ලත්හ. ඌ තුමූ ලත් සංග්‍රහ නැත ත් ලජ්ජා ඇති ව 'මුන් ලඟ රඳා කිම් ද? මෙහෙණි ව ජීවත් වෙමි' සිතා මෙහෙණවරට ගොසින් තමන් මහණ කරන්ට කිවු ය. උයි ත් උන් මෙහෙණි කළහ. උපසම්පදව ත් ලදින් බහුපුත්තික ස්ථවිරී යි ප්‍රසිද්ධ වූහ.

මෙහෙණිණිව ත් 'මම වැඩිමාලු කල මහණ වීමි. නො පමා වුව මනා වේ දෑ යි වත පිළිවෙත ත් නො පමාව තුන් යම් රාත්‍රි ය මුළුල් ලෙහි ත් මහණ ධම් කෙරමි' කියා යට මාලේ ටැඹක් අතින් අල්වා ගෙන වට කොට ඇවිද මහණ ධම් කරණ දෑ ය. සක්මන් කරණ කල ත් රුක්වල ඉස ඇනී යේ දෝ හෝ යි රුක අතින් අල්වා ගෙන සිසාරා ඇවිද ථීනමිද්ධයට අවසර නො පා භාවනා කරණ දෑ ය. බුදුන් වදළ පිළිවෙත් ම කරණ ඇල්මක් මිස ශරීර ඵාසුවට ආල ය නැති ව මහණ ධම් කරණ දෑ ය. බුදුහු ත් ගඳ කිළියේ වැඩ හිඳ ම භාවනාවෙහි පවත් විචාරන්ට යවන කෙණකුන් මෙන් රැස් කඳක් විහිදුවා ලා ලඟ වැඩ හිඳ කථා කරන්නාක් මෙන් 'බහුපුත්ති කාව, යම් කෙණෙක් පර්‍ය්‍යාප්ති - ප්‍රතිපත්ති - ප්‍රතිවෙධ වශයෙන් ත්‍රි විධ ධර්‍ම ය නො සලකා ඒ වූ ලෙසින් නො පැවත හවුරුදු සිය යක් ජීවත් වත් නමුත් ඊට වඩා එක ඇසිල්ලෙක වුව ත් සියල්ලක් ම මුල් එ ම හෙයින් ම ධර්‍මය වූ ලෙස පවති ත් නම් එ ම යහපතැ'යි වදළ සේක. දෙශනා කෙළවර බහුපුත්තික ස්ථවිරීන්දෑ පිළිසිඹියා පත් රහත් ව පුත්‍ර ධන ය හැර අවුත් ආර්‍ය්‍ය ධන ය ලත් දෑ ය.

එ හෙයින් නුවණැත්තවුන් විසින් කෙතෙක් ධන ධාන්‍ය සම්පත් වුව ත් උපද්‍රවයක් විනා නිරුපද්‍රතාවක් ඉන් සම්භ නො වන හෙයින් එහි ඇලුම් හැර යම් සේ වෙයෝ ගොදුරු සොයා යන කල තමන් වසා වේ පස් බැඳීමෙන් සැඟවී ගෙන හෙද්ද–එ මෙන් දන ශීලාදී සුචරිතයෙන් අකුසල් වසා–තව ද යම් සේ බළල්ලු,

Non-Commercial Distribution

කො තැනකට ගියත් මියන් ම සොයද්ද උන්ට සිතිවිලි නම් ඒ ම ද, එ පරිද්දෙන් කවර කො තැනක දී ත් කුසල් අදහස් ඇති ව, තව ද යම් සේ ගෝනුස්සෝ තමන්ගේ නඟුට ම ආයුධ කොට තකත් ද, එ මෙන් නුවණ ම අත ආයුධයක් සේ සිතා ගෙන, තව ද යම් සේ මුගටියෝ නයින් කරා වදනා කල ඔබෙහෙත් ගස්වල ගෑවී පියා යෙත් ද, එ මෙන් ක්‍රොධ නමැති සර්පයන්ට මෛත්‍රී නමැති බෙහෙත් ඇති ව, තව ද යම් සේ කැණහිල්ලු කුමන අපවිත්‍රයක් ලදත් පිළිකුල් නැත්තෝ ද එ මෙන් කවුරුන් කෙරෙහි ත් හීලන ය නැති ව—

තව ද යම් සේ මුවෝ අඩ යටි ආදී ය දමා ලූ කළ වලහා පියත් ද එ මෙන් අවුත් වදනා අකුසලින් වැළැහී, තව ද යම් සේ මුවෝ මඳ දෙයකට ත් බත් ද, එ මෙන් මඳ වරදට ත් භය ඇති ව, තව ද යම් සේ ගෙරි සරක් තමන්ගේ පට්ටිය නො හරිත් ද, එ මෙන් හැසිරිය යුතු කුසල් අත් නො හැර, තව ද යම් සේ එ ම ගෙරි සරක් යත යොදු ලූ කල උනා හරනා තෙක් අත් නො හරිත් ද, එ මෙන් මිය සැව වන තෙක් ශීල සංරක්‍ෂණ ය අත් නො හැර, තව ද යම් සේ හූරෝ ගිම් තද වේලේ ඇඟ සීල් කරන්ට පැන් ඇති තැනකට යෙත් ද, එ මෙන් ක්‍රොධ නමැති ගිම් දූඩි වී නම් මෛත්‍රී නමැති පැන් කරා එළඹ ක්‍රොධ ගිම් සන්හිඳුවා, තව ද යම් සේ ඇත්තු යන ගමනින් පොළොව දදුරු කෙරෙත් ද, එ මෙන් අකුසල් මැඩ මිරිකා, තව ද ඇත්තු බලන බලන දෙයක් ඉදුරා ම බලත් ද, එ මෙන් දක්නා යම් දෙයක් නුවණින් ම බලත් මුත් නුනුවණින් නො බලා, තව ද යම් සේ ඇත්තු නෙළුම්-ඉපුල් මහනෙල් ආදී ය ඇති විල්වලට බැස පියා කෙළිත් ද, එ මෙන් අති පවිත්‍ර වූ සදහම් දියෙන් පිරුණු විමුක්ති නමැති පස් පියුමෙන් සුසන් සිහිවටන් පොකුණට බැස නුවණ කෙළි කෙළ, තව ද යම් සේ ඇත්තු සිහි ඇති ව ම පා තබත් ද සිහි ඇති ව ම පා උදුරත් ද, එ මෙන් හැම වේලෙහි ම සිහි නුවණ ඇති ව ම—

තව ද යම් සේ සිංහයෝ පවිත්‍රශීලීහු ද එ මෙන් නිරන්තර යෙන් ම, පවිත්‍ර වූ අදහස් ඇති ව, තව ද යම් සේ සිංහයෝ තුමූ නසිත් නමුත් අනුන්ට යටත් නො වෙත් ද, එ මෙන් කවර ලෙසිනු ත් අකුසලයට යටත් නොව, තව ද යම් සේ සිංහයෝ ගොදුරු නිසා යම් තැනකට පිනූ නම් කුමක් වුව ත් එ තැනින් සම්භ වූ දෙයක් අනුභව කෙරෙත් මුත් තුල් තුල් දෙයක් නිසා එ දවස් අනික් තැනට නො යෙත් ද, එ මෙන් දෛවානුරූප ව නිර වද්‍ය ව සම්භ වූ දෙයකින් ජීවත් වත් මුත් අත්‍රිච්ඡතාදී ය නිසා අකු

Non-Commercial Distribution

සල්හි නො හැසිර, තව ද යම් සේ සක්වා ළිහිණියෝ දිවි හිමියෙන් දෙන්නෙක් මුත් තනි ව නො ඇවිදි ත් ද එ මෙන් දිවි හිමියෙන් කුසලින් වෙන් නො ව, තව ද යම් සේ එ ම සක්වා ළිහිණියෝ ප්‍රාණ වධ නො කෙරෙ ත් ද එ මෙන් ප්‍රාණ වධ මුඛයෙන් පස් පව්හි නො හැසිර, තව ද යම් සේ පරවියෝ කවර ගෙයක හුන්න ත් ඒ ගෙයි සම්පත ඇලුම් නැත්තෝ ද, එ මෙන් අනුන් සන්තක දෙයෙහි ආල ය නැති ව, තව ද යම් සේ බකමූණෝ කවුඩන් හා වෛර ඇති ව රෑ දවස් කවුඩන් කරා ගොසින් බොහෝ කවුඩන් මරත් ද, එ මෙන් නුවණින් නුනුවණ නසා, තව ද යම් සේ කෑරලු හැඬීමෙන් අනුන්ට වන වැඩ අවැඩ හඟවත් ද එ පරිද්දෙන් ලාභ සත්කාර නිරත නො ව බණ කියා පින් පව් හඟවා, තව ද යම් සේ වවුලෝ ගෙවලට වන් කල ඇවිද පියා නැඟී යෙත් ද, ඒ ගෙයි කිසිවෙක ඇලුම් නැත්තෝ ද, එ මෙන් දුටු දෙයක් දුටු පමණකින් හරුත් මුත් එහි ගෙධ නූපදවා–

තව ද යම් සේ වවුලෝ අනුන්ගේ ගෙවල හිඳිනා කල ඊට හානි නො කෙරෙත් ද එ මෙන් ඇසිරු කළවුන්ට හානි නො සිතා, තව ද යම් සේ පූඩැල්ලෝ යම් තැනක ඩෑ ගත්තු නම් ඒ තැන ම ඩෑ ලේ බොත් මුත් ඒ ඒ තැන් නො ඩාත් ද, එ මෙන් යම් යම් තැනක් භජන ය කළොත් නො නිසි තරමක් දුටොත් මුත් අන් භජන ය නැති ව, තව ද යම් සේ සර්පයන් ගමන් යන කල බඩගා යෙත් ද අන් ගමණෙක් නැද්ද එ මෙන් නුවණින් යන ගමන් මුත් අන් ගමන් නැති ව, තව ද යම් සේ සර්පයන් යන කල බෙහෙත් වළහා යෙද්ද එ මෙන් සතර ඉරියවුවෙන් ම පව් වළහා, තව ද යම් සේ සර්පයන් මිනිසුන් දුටු කල බත් ද එ මෙන් පාපයෙහි ආදීනව දැක පවු බා, තව ද යම් සේ පිඹුරෝ මහකුස් ඇති හෙයින් කුස පුරා ලබන්ට නැති වන්නා මදෙකින් ම යැපෙත් ද, එ මෙන් තෘෂ්ණාව නුපුරා, තව ද යම් සේ දිවි මකුළුවෝ මඟ අවුරා දැල්බැඳ ලා මැසි මදුරු ආදීන් ඊ බැඳුණවුන් ම කත් ද එ මෙන් චක්ෂුරාදි වූ ස දෙර සිහිවටන් නැමැති දැල බැඳ ලා කෙලෙස් නමැති මැසි–බුවණු ආදීහු බැඳුණ වු නම් භාවනා මුඛ යෙන් සපා කා නිමවා කෙළවර නිවන් රස අනුභව කට යුතු.

---

# 109. සුළු එක්සළු බමුණන් ගේ වත

තව ද කරණ පින් කම් ලැසි ගෙන ගෙන කෙරෙත් නම් දන් හල් වලට යන ගමන ලැසි ගත් කල ලබන දෙයක් මද වන්නා

Non-Commercial Distribution

සේ ලබන විපාක ත් ලැසි ගන්නා නියාව හඟවනු නිසා සුළු එක් සළු බමුණන් ගේ වත දක්වනු.

කෙ සේ ද යත්—

විදර්ශී නම් බුදුන් සමයෙහි මහ එක්සළු බමුණාන කෙණෙක් වූ ය. දූන් මේ අපගේ බුදුන් සමයෙහි සැවැත් නුවර සුළු එක් සළු නම් බමුණාන කෙණෙක් ඇත. උන්ට එ සේ කියන්ට කාරණ කිම් ද යත්—ජාති යහපත් වුව ත් දුක් පත් හෙයින් උන් තමන් හඳනට එක් කඩක් හා බැමිණියන් හඳනට එක් කඩක් ඇත. පිටත යන කල දසරුව වසා ගෙන යන්ට දෙන්නාට කැටි ව එක උතුරු සළුවෙක් ඇත. පිටත යන කල බමුණානන් ගෙයි රඳවා බැමිණියෝ හෝ යෙති. බැමිණිණියන් ගෙයි රඳවා බමුණානෝ හෝ යෙති. එක් දවසක් වෙහෙර බණ අසන්ට හඬගෑ කල්හි සුළු එක් සළුවෝ බැමිණිණියන්ට 'පින්වත, වෙහෙර බණ අසන්ට හඬ ගෑ හඬ ය. කුමක් ද? රෑ ත් දවලු ත් පවත්නා බණ හෙයින් බණ අසන්ට දවල් යවු ද නොහොත් රෑ යවූ දැ'යි විචාළෝ ය.

බැමිණිණියෝ ත් උතුරු සළුව එක ම හෙයින් දෙන්නා එක විට ගමන බැරි නියාව දූන 'බමුණානෙනි, රෑ දවස් බණ අසන්ට ගමන මට බැරි ය. දවල් යෙමි' කියා ලා උතුරු සළුව පෙරව-ගෙණ යන්නවුන් හා කැටි ව දවල් ගියහ. බමුණානෝ උන් බණ අසා ලා ආකලට දවල් දවස යවා පියා රෑ දවස් ගොසින් බුදුන් ඉදිරි ව ලා කො තැන හුන ත් පෙනෙන මුහුණක් හෙයින් මුහුණ බල බලා ඉඳ බණ අසති. සොඳ මුහුණ ත් දූක, මිහිරි බණ ත් අසා සියල් සිරුරු පිනවමින් ප්‍රීති උපන. උපන් ප්‍රීතින් පෙරව ගෙන ගිය උතුරු සළුව පුදනු කැමති ව 'ඉදින් පුදපිම්-නම් මට ත් බැමිණියන්ට ත් උතුරු සළු නැතැ'යි සිතූ ය.

එ සේ සිත ත් සිත ත් පුදන්ට සිතා ගත් කුසල් සිත පසු-බස්වමින් දහස් ගණන් මසුරු සිත් ඇති විය. නැවත එ ම අතුර පුදන්ට ත් සිතෙක් සිතිණ. නැවත එයි ත් පසු බස්වා මහ යතා කෙණකුන් ලුහුබඳවා වල් නංවන්නා සේ 'මේ එශ්වයර්‍ය ය අනුන්ට නො වේව යි මට ම වේව'යි යන ආකාරයෙන් පවත්නා දහස් ගණන් මසුරු සිත් ඇති විය. නැවත බලසම්පන්න කෙණකුන් දුර්වලයන් කෙනෙක් දෙනා පටහැණි ව ලා ආව ත් පසු නො බස්නා සේ පුදනු කැමති ලෙසින් සැදෑහැ සිතෙක්

ඇති ව ලා මසුරු සිත් මුළුල්ල ම තනි බුදුන් මර සෙනඟ පසු බැස් වූවා සේ පසු බස්වයි. දෙමි දෝ නො දෙමි දෝ හෝ යි ඔහු සිතිය දී ම පෙර යම් දස පැය පලා ගොසින් මධ්‍යම රාත්‍රි ය පැමිණියේ ය. දෙමි දෝ නො දෙමි දෝ හෝ යි සිත සිතා හින්ද දී ම මධ්‍යම රාත්‍රිය ත් ඉකුත් ව අලුයම් දසපැය පැමිණියේ ය. අළුයම දස පැය සුළු එක් සළු බමුණානෝ සිතන්නෝ 'මා ගේ සැදැ සිත ත් මසුරු සිත ත් උනුන් හා දබර වැදගත් හෙයින් ඒ දෙපක්‍ෂයේ ඇත්තවුන්ගේ තරම් බල බලා විසි පැ විතර පලා ගියේ ය.

රැයින් තුබූයේ දස පැයෙක. ඒ දෙපක්‍ෂයේ ඇත්තවුන්ගේ විවාද කවර කලෙක සන්හිඳුවිය හැකි ද? මා තර ව එකක් කොට පී කලට උනුන් කැණිවිලි සන්හිඳෙත් මුත් තුමූ තමන් ම කවර කලෙක සන්හිඳෙත් ද? උන් දෙපක්‍ෂයෙන් දෙනු කැමති ව පවත්නා තැනැත්තෝ ඉතා යහපත්හ. මට කවර තරම් වැඩකු ත් සාධා දී ලති. නො දෙනු කැමති ව පවත්නා තැනැත්තෝ නම් මහා නපුරු කෙණෙක. උන්ට ආශ්‍රය ව සිටිනා ප්‍රතිස චිත්තයාණෝ නම් උන්ට ත් වඩා නපුරු වූ ය. මා මුන්ට නැමුණොත් දෙ පක්‍ෂ ම එක් ව සතර අපායේ හෙළා ලා මා ඉස් නහාලිය නො දෙති. එ හෙයින් උන්ගෙන් මට ප්‍රයෝජන නැත. දෙනු කැමති ව පැවති සැදැ සිතට ම නැමී කෙරෙමි. දහස් ගණන් මසුරු සිත් පරදවමින් ආදියෙන් පැවැති සැදැ සිත ම පළමු කොට ලා උතුරු සළුව හැරගෙන බුදුන් පා මුල තබා ලා මසුරු සිත් පැරදි නියාවට 'දිනා ගියෙමි'යි තුන්විටක් කිවූ ය.

කොසොල් රජ්ජුරුවෝ බණ අස අසා හුන්නෝ එ බස් අසා එ සේ වූ බස් රජ ව සිටියවුන්ට අප්‍රිය හෙයින් දිනා ගියේ කාට ද'යි විචාරව'යි කිවූ ය. රාජ පුරුෂයන් ගොසින් විචාළ කල්හි මසුරු සිත් පරදවා සිටි හෙයින් ඒ නිසා කී නියා ව කිවූ ය. රජ්ජුරුවෝ ඒ අසා තමන් අරුම ය දන්නා හෙයින් කළ දෙයට සතුටු ව සංග්‍රහ කෙරෙමින් පිළී සහළක් යවූහ. උඹ ඒ පිළී සහල ත් බුදුන්ට ම දුන්හ. පැරද සිටි මසුරු සිත් තරයේ ම පැරද ගත් හෙයින් ඊට අවුලක් කට නුහුනු වූ ය. රජ්ජුරුවෝ ඒ අසා පිළී දෙ සහළක් යවූහ. බමුණානෝ එයි ත් බුදුන්ට ම දුන්හ. ඒ අසා සතර සහළක් යවූහ. ඒ ත් බුදුන්ට ම දුන්හ. නැවත අට සහළක් යවූහ. එයි ත් බුදුන්ට ම දුන්හ. රජ්ජුරුවෝ නැවත සොළොස් සහළක් යවූහ. දෙනු කැමති ව පවත්නා චිත්තයාණන් බලී ව මසුරු සිත් වැදගත නො හෙන හෙයින් ඒ සොළොස් සහළ ත් බුදුන්ට ම දුන්හ.

Non-Commercial Distribution

රජ්ජුරුවෝ බමුණානන් ගේ දනමය කුශලයෙහි දෘෂ්ට ධර්මවෙද්‍ය විපාක බලවත් නියාව හඟවන්නාක් මෙන් අජාසත් රජ්ජුරුවන් ධාතු නිධානයෙහි හැම කරඬුත් හැම ද ගබුත් වසා දැවාණ දහගබ සිටුවූවා සේ ම දුන් හැම සහළවලට මහත් කොට දෙතිස් සහළක් යවූහ. එක උතුරු සළුව දන් දී බමුණානෝ එම ජාතියෙහි සහළ ගණතින් මත සැට සහළක් හා පිළී ගණතින් එක්සිය විසි සයෙක් පමණ පිළී ලත්හ කෙළවර දෙ තිස් සහළ ලැබ ලා යවා ලූ දෙය තුමූ මඳකුත් නො ගෙන දන් ම දෙති. වැඩියුරුවක් ලබන්ට නියා දෝ හෝ යි කියන උපවාදයෙන් මිදෙනු නිසා තමන්ට පිළී සහළක් හා බැමිණියන්ට පිළී සහළක් තබා ගෙන අනික් තිස් සහළ බුදුන්ට ම දුන්හ. එක් සිය ස විසි පිළීයෙන් බුදුන්ට එක් සිය දෙ විස්සක් හා තමන්ට සතරෙක් විය. රජ්ජුරුවෝ ද බමුණානෝ තුමූ හැර නො ගෙන සියක් වර දෙත් නමුත් දියුණා සියක් වර වුව ත් දෙති. දෙ තිස් සහළින් බමුණන් දෙ සහළක් හැර ගත් හෙයින් රජ්ජුරුවෝ දීමෙන් නැවත්තාහ. විදර්ශී බුදුන් සමයෙහි දී මහ එක් සළු බමුණානෝ කෙළවර වාරයේ පිළී සූ සැට සහළක් ලදින් දෙ සහළක් හැරගත්හ. මූ දෙතිස් සහළක් කෙළවර දෙ සහළක් හැර ගත්හ.

රජ්ජුරුවෝ රාජ පුරුෂයන් බණවා ලා 'දුක් පත් ව සිට බමුණාණන් කළ දෑ යහපත. රජ ගෙයි දී මා සඳහන් කරව'යි කිවූ ය. උයි ත් සඳහන් කැරවූ ය. රජ්ජුරුවෝ ලක්‍ෂ වටිනා පලස් දෙකක් බමුණාණන්ට දෙවූහ. බමුණානෝ ද දන් දීමට ම සිත නැමී ගොසින් 'මේ පලස් මාගේ කුණු ශරීරයෙහි ගාන්ට තරම නො වෙයි. බුදුන්ගේ සුගන්ධ ශරීරයට ම තරමැ යි එක් පලසක් ගඳ කිළිය ඇතුළේ වියනක් කොට බඳවා ලූ ය. එකක් තමන්ගේ ගෙයි දී නිරන්තර වළඳන තැනැත්තන් වහන්සේ වළඳන්ට හිඳිනා තැන වියනක් කොට බඳවා ලූ ය. රජ්ජුරුවෝ සවස් වේලේ බුදුන් ලඟට අවුත් පලස හැඳින ගෙන 'ස්වාමීනි, මේ පලස පිදූවෝ කවුරුද'යි විචාරා එක් සළු බමුණානන් නියා ව වදළ කල්හි 'බමුණානෝ මා පහන් තැන ම පහන්නු ය' යි උන් කෙරේ පැහැද ඇතුන් සතර දෙණකු ය, අසුන් සතර දෙණකු ය, මසුරන් සාර දසෙක, පාදපරිචාරිකා කොට ගැහුන් සතර දෙණකු ය, කෙල්ලන් සතර දෙණකු ය, කොල්ලන් සතර දෙණකු ය, ගම්වර සතරෙකැ යි යමෙක් යමෙක් මිනිසුන්ට ප්‍රයොජන වී නම් ඒ සියල්ලෙන් සතරක් ඔබාදීන් දෙවූහ.

Non-Commercial Distribution

ධම් සෙබෙහි රැස් ව හුන් වහන්දෑ ත් 'සුළු එක් සළුවන්ගේ කට යුත්තක් ඉතා ආශ්වයඞ් නියා ය. එක් උතුරු සළුව දී ලා පිළි එක් සිය ස විස්සක් ලදින් ඉන් එක් සිය දෙ විස්සක් බුදුන්ට දී ලා ගණනින් මද වුව ත් අගයෙන් බොහෝ ව තිබෙන පලස් දෙකක් ලදින් එය ත් ශාසනයට ම නිල කොට දී ප්‍රයොජනවත් සියල්ලෙන් සතරක් සතරක් ලත්හ. තැන කොට ගත් කුසල හෙයින් අද ම විපාක දිනැ' යි කථාව ඉපදවූ සේක. බුදුහු එ තැනට වැඩම කොට නො නිමි කථාව විචාරා වදරා මේ කථාව නියාව දන 'ඉදින් මේ එක් සළු බමුණු දෙන්ට සිතූ ගමනේ ලැසි නො ගෙන පෙර යම දී පි නම් සියල්ලෙන් සොළොස සොළොස ලද්දේ ය. එ සේ දී ගත නො හී ඉන් පිරිහිණ. ඉදින් මධ්‍යම රාත්‍රියෙහි දී පි නම් සියල්ලෙන් අටක් අටක් ලද්දේ ය.

එ සේ දී ගත නො හී ඉන් පිරිහිණ. අළුයම ත් ගෙවා පාන්-දඩ දී ලූ හෙයින් රාත්‍රි ය ගෙවුණා සේ අරත් ගෙවී සියල්ලෙන් සතර සතර ලද පින් කරණ කළ නම් උපන් අදහස නො පිරිහෙළා එ විට ම කටයුතු ය. ගිහි වුවො ත් ලාබ ත් දීම් ආදි වූ පින් කම් සෙසු කෙණකුන් පෙරාතු නො වන ලෙසට මම පෙරාතු වෙමි' යි වහ වහා කට යුතු ය. ශාසනික වුව ත් අන් තැනකට අවසර නො පැ උපාද්ධ්‍යාය වත් ආදි ය වහා කට යුතු ය. පිණට මතු නො හිඳ පවකට නැමෙන සිත ත් වැට කොට ගොයම් බිමින් සරක් නවතන්නා සේ නවතා කුසල්හි පිහිටවිය යුතු. සෙවෙල් ගලක යන ගමණක් සේ දෙම් දෝ නො දෙම් දෝ කෙරෙම් දෝ නො කෙරෙම් දෝ හෝ' යි ලැසි ගෙන පින් කරන්නවුන්ගේ සිත නම් ගෙවල් ඉදී කරණ කල ආයාසය සේ පිණට සිත නමන්ට ආයාස බව මුත් නහා ලූ ගෙයක් ගිනි ලන්ට පිළිවන් වන්නා සේ පවට සිත නමා ලීම නිරායාස හෙයින් වහා පවට සිත නැමෙයි. එ සේ හෙයින් පිණක් කරන්ට සිත නැමුණු කල එ සිත නො පසුබස්වා—

> "අජ්ජෙව කිච්චං ආතප්පං-කො ජඤ්ඤා මරණං සුවෙ,
> නහි නො සඞ්ගරන්තෙන-මහාසෙනෙන මච්චුනා"

යතු හෙයින් එ ම එක් වත් සදහන් කෙරෙමින් ලැසි ගැන්-මෙන් පවට නැමෙන සිත ත් පිණට නමා පින් කට යුතු ය' යි වදළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් කරණ පින් කමට ලැසි ගැන් මෙක් ඇත් නම් ඒ එක් පවක් කොට සිතා ගෙන ඒ පවිනු ත් සෙසු

Non-Commercial Distribution

පව්නු ත් දුරු ව පින් කම් හැසිර ලොව් ලොවුතුරා සැප ත් සිද්ධ කට යුතු.

## 110. සෙය්‍යසක තෙරුන් වහන්සේ ගේ වස්තුව

තව ද පව් කම්හි හැසිරීම මෙ ලෝ පර ලෝ දෙකෙහි ම අනභිවෘර්ධි කාරණ වත් මුත් අභිවෘර්ධි කාරණ නො වන නියා ව දක්වන්නට සෙයාසක තෙරුන් වහන්සේ ගේ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්—

ලාලුදයී තෙරුන් වහන්සේගේ සද්ධි විහාරික වූ සෙයාසක තෙරුන් වහන්සේ තුන් මසක් මං මුළා වූ කෙණකුන් ස මසක් මං මුළා වූ කෙණකුන් ගෙන් මං විචාරන්නා සේ කෙලෙස් පිළියම් විචාරා රාග ප්‍රතිපක්‍ෂ වූ අසුභ භාවනා තිබිය දී හුණ ඇත්තවුන්ට තියඹරා කන්ට කියන්නා සේ, සෙම් ඇත්තවුන්ට උක් සකුරු කන්ට කියන්නා සේ, මෙහ ඇත්තවුන්ට තෙල් අනුභව කරන්ට කියන්නා සේ, වණ ඇත්තවුන්ට මීවිනි මස් අනුභව කරන්ට කියන්නා සේ, රාග වර්ධනයට නිසි වූ පළමු සඟ වෙසෙස් සමාදන් කැරවූ හෙයින් අනභිරතියක් උපන් කල ම මෙවුන් ධම් හා සම කොට දක්වූ ඒ විකුම් කරණ දැ ය. බුදුහු එ පවත් අසා ඒ වහන්සේ ගෙන්වා ලා 'තෝ එ බන්දක් කෙරෙයි ද' යි විචාරා බුදුන් හමුවෙහි දී වළහාලීම බැරි හෙයින් 'සැබවැ' යි කී කල්හි මාගේ නිර්මල වූ ශාසන ය කෙලෙසා, සිස් තැනැත්ත ව, තෙල ලෙස කෙලෙසින.

'තා ආදිකර්මික හෙයින් තට ඇවැත් නැත ත් මෙ වක් පටන් යම් භික්ෂු කෙණෙක් මෙ බන්දක් කොළෝ නම් උන්ට සඟවෙසෙස් වන්නේ ය' යි සිඛ පද පනවා ලා 'මෙ බන්ද නම් මෙ ලොව නින්දවට ත් කාරණ ය. පර ලොව අපාය දුකට ත් කාරණ' ය යි වදරා 'ඉදින් යම් කෙණෙක් අනන්ත කාලයක් පුරුදු කොට ආ හෙයින් එක විටක ත් පවක් කොළෝ නම් කල් යවා නො තබා එක විට ම සලකා පියා බුදුන්ගේ අනුශාසනාවෙහි පාපයෙන් වැලැක්මක් මුත් පවෙහි හැසිරීමක් කිසි තැනෙක ත් නො ආ හෙයින් වැරද වුව ත් මෙවක් පටන් කළ මනා දෙයක් නොවෙයි සිතා පාප ය හළ යුතු පව් කිරීම තබා පව් කිරීමට මුල් ව සිටිනා අදහසු ත් විෂ ඵල පලගන්නා ගස මුලින් ම කපා දවා නැති කරන්නා සේ හළ යුතු ය. කුමක් නිසා ද යත් – පව් විෂය සිතින් සිතීම ත් මැරු කුඩ මසු කෙණකුන් නැතත් මරා රැස් කළ

Non-Commercial Distribution

කුඩ මස්සන් දැක සතුටු වූ පමණකින් බුදු වුව ත් ප්‍රවෘත්ත විපාක ය නැති වන්ට නො ව හිසරුජා ඇති හෙයින් මෙ ලොව ත් පර ලොව ත් දුක් එළව'යි වදාළ සේක. දේශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් සත් පුරුෂයන් විසින් ගඟක් බැඳ රඳවන්ට කරණ යත්නයක් සේ පවින් දුරු වන්ට උත්සාහ කට යුතු.

# 111. ලද දෙව් දුව ගේ වත

තව ද යමෙක් තෙමේ නිරවද්‍ය වී නමුත් ඒ නිසා පරුපවාද ඇති වේ නම් එයි ත් නො කළ මනා නියාව දක්වන්ට ලද දෙව් දුවගේ වත කියමු.

කෙ සේ ද යත්—

මෙහි වත්මනු කථාව රජගහා නුවර පහළ වි ය. ආයුබොහෝ වූ මහසුප් මහ තෙරුන් වහන්සේ රජගහා නුවර ගාවා පුළිල ලෙණ වසන සේක් නිරෝධ සමාපත්තියට සම වැද සත් දවසක් නිරාහාර ව වැඩ හිඳ ලා සත් වන දවස් බත් නො ලැබීම යුක්ත නො වන හෙයින් හා යම් කෙණෙක් තමන් වහන්සේට යමක් දුන්නු නම් උන් මහා සම්පත් ලබන හෙයින් බතක් දී ලන්ට නිසි කෙණකුන් දිවසින් බලන සේක් එක් ගැල් සේනක් රක්නා ගැනියක හැල් කරල් කඩා ගෙන වී හැර ගෙන විළඳ බඳනා නියාව දැක සිහා ගිය කල දී ලන්ට නිසි සැදැ ඇත්තෝ දෝ හෝ යි විමසා සැදැ ඇති නියාව ත් දැන 'මට සංග්‍රහ කට හේ දෝ නො හේ දෝ යි විමසා 'ඒ කුල දූ තොමෝ මට සංග්‍රහ කෙරෙයි. සංග්‍රහයක් කොට මෙම ජාතියෙහි සම්පත් ලබන්ට ආයු ශක්ති ය නැත ත් දෙ වන ජාතියෙහි බොහෝ සම්පතුත් ලබන්නීය'යි දැන ගැටවවු ගන්වා සිවුරු වැළඳ ගෙන පාත්‍ර ය පටවා ගෙන හැල් සේන බඩ සිටි සේක.

කුල දුවණියෝ ද මහ තෙරුන් වහන්සේ දැක පහන් සිතැති ව පස්වනක් ප්‍රීතීන් පිනා ගොසින් 'වැඩ සිටිනේ යහපතැ'යි කියා ලා විළඳ හැර ගෙන වහා අවු ත් මහ තෙරුන් වහන්සේට පිළිගන්වා ලා පසඟ පිහිටුවා ලා වැද ගෙන 'ස්වාමීනි, මේ විළඳ ඇට බැදී සැහැල්ලු වූවා සේ ම කෙලෙස් බරින් සැහැල්ලුව නිවන් දකිමව'යි පතා ගත්හ. මහ තෙරුන් වහන්සේ ද දනමය කුශල ය තොපට සිද්ධ වූවා-සේ ම භාවනාමය කුශලය ත් සිද්ධ වේවා'යි වදරා අනු මෙවනි බණ වදාළ සේක.

Non-Commercial Distribution

උයි ත් මහ තෙරුන් වහන්සේ වැද ගෙන තමන් දුන් දන් සලකමින් පූර්ව චෙතනා මධ්‍ය චෙතනා සේ ම අපරචෙතනා ත් ශුද්ධ කොට ගෙන රැඳුණාවූ ය. ඒ සේනෙ ත් යන එන මහ එක් බිලයෙක නයෙක් ඇත. ඒ මහ තෙරුන් වහන්සේගේ සිවුරෙන් වැසී තුබූ කෙණ්ඩ මැඩ පිය නො හිත. කුල දූවණියෝ ද තමන් දුන් දන් සලකමින් එ තැනට පැමිණියහ. සර්පයා ද බිලයෙන් නික්ම දුන් දන අනුහසින් දෙව් සැප උදවූ කොට ලබ්බවන්ට කරන්නාක් මෙන් දෂ්ට කොට එ තැන ම හෙළා පී ය. උං ද විෂ වෙගයෙන් අන්‍යථාත්වයකට නොපැමිණ පහන් සිතින් මිය ගොසින් තවුත්සා දෙව් ලොව එක් සිය විසි ගවුවක් පමණ රන් විමනෙක නිඳ පුබුද් කෙණකුන් මෙන් සව් බරණින් සැදුණු තුන් ගවුවක් පමණ දිව අත් බවකින් යුක්ත ව දෙවතා දූව උපන්හ.

උං තුමූ අට සාළිස් ගවුවක් පමණ දිග ඇති හකුළුවා ලූ කලට තුඹ මලක් සා හෝ පෝටා මලක් සා මහත ඇති සළුවක් හැඳ එ සේ ම සළුවක් පෙරව දහසක් පමණ දෙවඟනන් පිරිවරා පූර්ව-ජාතියෙහි කළ කුශල ය හඟවනු නිසා රන් විළඳින් පුරා මුතු සාළුවල තබන ලද රන් තැටිවලින් හොබනා විමන් දොර කඩ සිට තමන්ගේ දිව සැප ත් බලා පියා 'කුමන පිණක් කොට මේ සැප ත් ලදිම් දෝ හෝ' යි දිවසින් බලන්නෝ මහසුප් මහතෙරුන් වහන්සේට දුන්නා වූ විළඳෙහි අනුහසින් දිව සැප ත් ලත් නියා වත් දිවස් ඇති තැනට දුන් හෙයින් දිවස් ලත් නියාව ත් දැන 'ලසු කුශලයෙන් මෙ සා මහත් සම්පතක් ලදින් මේ දෙව් ලොව තුන් කෙළ සැට ලක්ෂයක් හවුරුදු පමණ නො ව සසර ඉතා දික් ව තිබෙන හෙයින් පමා වීම නපුර. මහසුප් ස්වාමීන්ට වත් පිළිවෙත් කිරීම නම් ලසු පින් කමක් නො වන හෙයින් බැරෑරුම් වූ ඒ පින් කම කොට උගත් ග්‍රන්ථයක් ප්‍රගුණ කොට තර කරන්නා සේ තවත් තවත් පින් කිරීමෙන් සම්පත ත් තර කෙරෙමී' සිතා උදෑසන ම දෝ නොහොත් පාන්දර ම මවා ගන්නා දේ හෙයින් රන් මුස්නක් ද කසළ ගොටුවක් ද ගෙනවූ ත් මහ තෙරුන් වහන්සේගේ වෙහෙර මළු හැම ද පියා කසළ ත් දමා පියා නහන පැන් බොන පැන් පරහා තබා ලූ ය.

මහ තෙරුන් වහන්සේ ඒ හැම දැක වත් පිළිවෙත් සරු කෙණ කුන් වේලා පස ම අවුත් වත් සපයා ලා ගිය නියා ය යි ආවර්ජනා නො කළ හෙයින් සිතු සේක. දේවතා දූවණියෝ දෙ වන දවසු ත් වත් පිළිවෙත් එ ලෙස ම කළහ. මහ තෙරුන් වහන්සේ ත් ආදි ද සිතු ලෙස ම සිතූ සේක. තුන් වන දවස් මහ තෙරුන් වහන්සේ

Non-Commercial Distribution

උන් හමදනා හඬ ත් අසා. කෙසිවීත්[1] ආදියෙන් ඇතුළු ගෙට වන් ශරීරාලෝක දැක දෙර වැරලා[2] හමදනේ කවුරුද'යි විචාළ සේක. 'සවාමීනි, මුඹ වහන්සේට උවැසි ව සිටි ලද දෙව් දූ නම් මම ය'යි කිවු ය. 'අපගේ එ නම් උවැසි කෙණෙක් ඇද්ද'යි විචාළ සේක. ''මම, සවාමීනි, මීට පෙරාතු ජාතියෙහි හැල් සේනක් රක්නෙම් කන්ට බැද ගෙන හුන් විළඳ සුහක් තමා සුහ වුව ත් බොහෝදවස කට වුවමනා වේද'යි මුඹ වහන්සේට දන් දී ලා සිත පහදවා ගෙන නැවත එන්නෙම් 'තොප කළ පින් රකවල් පළට වදනා තරම් ද? දෙව් ලොව රන් විමන්වලට එව'යි කැඳවා ආ මේ වර කරන්නකු වැනි නයකු අත මිය තව්තිසා දෙව් ලොව උපනිමි. සවාමීනි, මේ සම්පත මුඹ වහන්සේ නිසා ලදිමි. දනු ත් මුඹ වහන්සේට වත්පිළිවෙත් කොට සම්පත් තර කරන්ට සිතා අයිමි' කිවු ය.

'ආදී දෙ දවසු ත් වත් පිළිවෙත් කොළෝ තෙපි ද'යි විචාරා 'එසේ ය, සවාමීනි'යි කී කල්හි 'දේවතා දුවණියෙනි, තොප කළ වත් පිළිවෙත් කෙළේ ය. මෙ වක් පටන් එ බන්දක් නො කරව'යි වදළ සේක. සවාමීනි, එ සේ නො වදළ මැනව. මුඹ වහන්සේ වැනි පින් කෙතත් ලබන්ට බැරි වුව සිද්ධ වන කුශලය ත් ලසු නො ව ත්, ලසු නො වන කුශලයෙන් ලබන සම්පතු ත් ලසු නො වත් මා ලබන වැඩියුරු සම්පතට හානි නො කොට වදළ මැන වැ'යි කිවු ය. ඔබ ඒ අසා 'දේවතා දුව, සම්පත් තර කරණ උපදෙස් මේ විනා නැද්ද? නස්නා සම්පත් කෙ සේ තර කරන්ට සිත යි නමුත් ඒ තර නො වෙයි. තර නම් නො නස් නා බැවින් නිවන. නිවන් පතා අනික් කරණ යම් පිණක් කරව. මතු එන දවස් වීජිනි පත්‍ර හැර ගෙන ධර්‍මාසනවල වැඩ හිඳ බන කියන්නවුන් ලවා බුදුන් සමයෙහි මහසුප් මහ තෙරුන් වහන්සේට එක් දෙව් දුවණි කෙණෙක් අවුත් මළු හැමද පැන් පරහා තුබූ ය යි නො කියවව. එ බන්දෙක් ඇසිණි නම් බුදුන් ගෙන් අප ලත් ප්‍රශංසාවට ඒ පිටි පෑ තිබෙ යි. මෙ වක් පටන් පිළිවෙත් තබා මේ දසාවෙ ත් නො එව' යි වදළ සේක.

එ සේ වදළ ත් දේවතා දුවණියෝ තමන්ට සිද්ධ වන කුශලය මුත් මුඹ වන්නා වූ අසාරුප්පය ය සැදෑ වේගයෙන් සලකා ගත නො හී තවත් නො ගොස් සිටිත් ම ය. මහ තෙරුන් වහන්සේ ද මෝ අප කියත ත් සිටිම ය'යි කිපි ලෙසක් මෙන් 'තිගේ තරම් නො දන්නී ද'යි වදරා ලා අසුර ගසා ලූ සේක. උෟ එ වේලෙහි එ තැන රඳා සිටිය නො හී අහසට පැන නැඟී ලා දෝත් මුදුනේ

---

1 කෙසිබීත 2 ඇරලා–හැරලා.

Non-Commercial Distribution

තබා ගෙන 'ස්වාමීනි, මා ලත් සැපත තර කොට ගත දුන මැනවැ'යි කිය කියා හඬමින් වලපමින් අහස සිටියහ.

බුදුහු රජගහා නුවරට එක් සිය අසූ ගවුවක් විතර තිබෙන දෙව් රම ගඳ කිළියේ වැඩ හිඳ ම දෙව් දුවණියන් හඬන හඬ අසා රස් කඳක් විහිදුවා එ තැන වැඩහුන්නාක් මෙන් පැලා 'හෙම්බා දෙව් දුව, ම පුත් මහසුප් මහ තෙරුන්ට තෙල ලෙස කරණ දෙය අසරුප් බැවින් නැවතීම යහපත. පින් කරණු කැමැත්තවුන්ට තව ත් තව ත් පින් ඇති බැවින් අපට ප්‍රයෝජන නම් මෙ ම වේදැ'යි සලකා පින් කිරීම වලක් ව වලක්වා ත් කන බතින් බඩ පිරෙන්නා සේ යහපතැ'යි වදරා 'හෙම්බල දේවතා දුව, පින් කරණ කල නම් 'එක් වරෙක පින් කෙළෙමි. එ තෙක් මට සෑහෙයි' ඒ පින් කම නො පසු බැස වඩ වඩා පින් කළ මනා ම ය. 'පින්කම් කරණට ඉදින් විභව නැත් නමුත් කවර විටෙක ය පින් කමක් කොට ගන්නේ ය යි හැම වේලේ ම උත්සාහ කටයුතු. කුමක් නිසා ද යත්- කිරීමෙන් වුව ත්, සිතීමෙන් වුව ත් කුශල ය රැස් කිරීම මෙ ලෝ - පරලෝ දෙකට ම යහපත, ඒ හෙයිනැ'යි වදළ සේක.

දෙශනා කෙළවර දෙව් දුවණියෝ එක් සිය අසූ ගවුවකින් ඈත සිටියෝ ත් සෝවාන් ව ලොව් සැපත් කුම් වුව ත් අනුපධි ශෙෂ නිර්‍වාණ ධාතුව දක්වා තිබෙන හෙයින් ලොවුතුරා සම්පත් තර කොට සසර දුක් අත් හළහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් කරණ බාධා කළ කෙණෙක් ඇත් නමුත් කළ කුශලයෙන් සිද්ධවන ඉෂ්ට විපාකයන්ට උන් බාධා කොට නො හෙන හෙයින් එ ම සිත්හි තබා කුශලයෙහි හැසිර අස්ථිර වූ සැප ත් හැර ස්ථිර වූ නිවන් සාධා ගත යුතු.

―――――

## 112. අනාථපිණ්ඩික සිටාණන් ගේ වස්තුව

තව ද දඬු පතින් හා ගලින් කර්මාන්ත කළ කල දඬුපත් දිරා ගිය ත් ගල් තිබෙන්නා සේ සැදැ ඇත්තවුන්ගේ සම්පත් නට ත් සැදැ සිතෙහි අඩුවක් නැති නියාව දක්වන්ට අනාථ පිණ්ඩික සිටාණන්ගේ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්—

අනේපිඩු මහා සිටාණෝ දෙව්රම් වෙහෙර නිසා සූ පනස් කෙළක් ධන වියදම් කළහ. මේ සිටාණන්ගෙන් අටළොස් කෙළක්

Non-Commercial Distribution

විතර නයට හැර ගෙන දෙන විටක දෙන තෙක් උන් ගෙන් එළවීමක් නු වූ හෙයින් නුදුන්න. තව ත් මුන් සන්තක අටළොස් කෙළක් වස්තුව ගං බඩ නිධාන කොට තුබුවා චතුර ඊමෙන් ගං ඉවුර බිඳී සැළ පිටින් ම මුහුදට වන. මෙ සේ කල් යැමකින් වස්තුව මඳ විය. යමල ගැවෙ ත් ගැවෙ ත් මුවාත් බලවත් වන්නා සේ වස්තු ගෙවෙත් ගෙවෙත් කුසල් අදහස නයට නුදුන් හෙයිනු ත් මූදට නො වන් හෙයිනු ත් බොහෝ වෙයි. එ හෙයින් දන් දෙත් ම ය. දෙත ත් අදහස් පවිත්‍රයා සේ විභව ය නැති හෙයින් පවිත්‍ර කොට දිය නො හෙති.

එක් දවසක් බුදු රජාණන් වහන්සේ 'සිටාණෙනි, තොපගේ නිරන්තර දෙන දනු ත් පවතීද්ද'යි විචාරා වදළ කල්හි පවතී ම ය. හෙ ද වැළි ත් නිමුඩු සාලේ බත් හා කාඩි ම ය'යි කිවු ය. බුදුහු ඒ අසා-

"නත්‍ථි චිත්තෙ පසන්නම්හි - අප්පිකා නාම දක්ඛිණා,
තථාගතෙ වා සම්බුද්ධෙ - අථ වා තස්ස සාවකෙ"

යනු හෙයින් 'සිටාණෙනි, සිත ප්‍රසන්න වී නම් පරිත්‍යාග චෙතන ය ත් ප්‍රසන්න හෙයින් දෙය්‍ය ධර්ම ය කුමක් වුව ත් කිම? අපර චෙතනාව නපුරු වෙ නමුත් දන් නපුරැ යි නො සිත ව. තෙපි තව ත් දන් නපුරු වුව ත් යහපත් වූ අරි අට පුහුලන්ට දෙන්නා ව ද? එ හෙයින් සරු කෙතක නැඟී ගොයම් අසුපැවත ද වන සේ[1] විපාක බලවත් වේ ද? මා වෙලාම නම් බමුණු සමයෙහි නගුල් උඩ බඳවා දඹ දිව වැස්සන්ට බොහෝ කලක් දන් දෙන ගමනේ ත් අරි අට පුහුලන් තබා සරණ සීලයෙහි පිහිටි කෙණකුන් පමණ ත් සම්භ නුවූවෝ ය. එ හෙයින් ප්‍රතිග්‍රාහක සමෘර්ධි ය හැම කල ම සම්භ නො වෙයි. සම්භ වූ අවධියෙහි දෙන්නා වූ දන් අදහස්-සේ ම යහපත් කොට සිත ත් මූත් ලසු කොට නො සිතව. වෙලාම බ්‍රාහ්මණ සමයෙහි දන් දෙන්නා වූ මම ද මට ශිෂ්‍ය ව සිටි රජ දරුවන් ගෙනු ත් වස්තුවක් එක් කොට ගන්නා නිසා ආදශී කොට පාත්‍රයක් කරවන්නෙම් පාත්‍ර පත්ලේ සිට මුව විට නියමයට උසින් වඩුයෙන් අට රියනක්, මුඛ පළල නව රියනක් හා ඝන ය අටඟුල් කොට පාත්‍ර පත්ල බිජුවට අමුණක් වපයන තැන් වැසෙන විතර කොට පාත්‍ර මුවවිට අසුන් තුන් දෙනකු යෙදූ රථ ය සිසාරා යා හැකි ලෙසට කරවා සුවාසූ දහසක් රජුන් කරා යවූයෙමි.

උනු ත් එ පමණ වූ රන් පාත්‍ර කරවා රිදී පුරා, රිදී පාත්‍ර කරවා රන් පුරා, තඹ පාත්‍ර කරවා සත් රුවන් පුරා, එ කී එකී රජ්ජුරු

1. අසු පැ වන සේ – අසු පැවත් වන සේ.

Non-Commercial Distribution

කෙණකුන් ගෙන් රිදී පිරූ රත්රන් පාත්‍රයක් හා රන් පිරූ රිදී පාත්‍රයක් හා සත් රුවන් පිරූ තඹ පාත්‍ර තුනක් වන නියායෙන් සුවාසූ දහසක් රජුන් ගෙන් එවා ලූ දෙ ලක්ෂ දෙ පනස් දහසක් පාත්‍ර හා සුවාසූ දහසක් ඇතුන් හා සුවාසූ දහසක් අසුන් හා සුවාසූ දහසක් රථ හා සුවාසූ දහසක් ස්ත්‍රීන් හා වස්තුව දැක ලොභ සිත් නූපදවා දඹදිව් වැස්සන්ට දන් දුනිමි. ඒ මාගේ දනට එක ද සිල් වත් කෙණෙක් සම්භ නුවූවෝ ය. මාගේ ඒ සා මහත් පරිත්‍යාග ය තොපගේ නිමුඩු සාලේ බත් හා කාඩි වටී ද? යනාදීන් දන් දීමෙහි උත්සාහ වඩනු නිසා වේලාම සූත්‍ර ය ප්‍රතිග්‍රාහක ශුද්ධියෙන් විපාක ම සමෘද්ධි ය වන නියා ව භගවන්ට වදාළ සේක.

ඉක් බිත්තෙන් සිටාණන්ගේ වාසල වසන දේවතා දූවක් බුදුනු ත් බුදු සවුවනු ත් එක් වන් දන් වළඳන්ට සිටාණන්ගේ ගෙට වඩනා හෙයින් බුද්ධ තෙජසිනු ත් සඞ්ඝ තෙජසිනු ත් තමාගේ විමන හින්ද නො හී 'යම් ලෙසකින් මූ හැම ඉම් ගෙට නො එත් නම් ඒ සිටාණන්ට එ ලෙසක් කියා බිඳුවා පියමී' සිතා ත් සිටාණන් පොහොසත් අවධියෙ මුහුද පැන් ඉස නිමවා ලිය නො හැක්කා සේ උන්ගේ අදහස ත් පසු බස්වා ලිය නො හැකි හෙයින් කුමකු ත් කියා ගත නො හී, දූන් සම්පත් නැති ව දුක් පත් ව ගත්හ. මාලු කම් පිට ලා කියා ලූ දෙයක් ගිවිස ගනිති'යි රෑ දවස් සිටාණන් සැත පෙන ශ්‍රී යහන් ගබඩාවට වැද අහස සිටියා ය. සිටාණෝ ත් දැක 'තොප කවුරු දූ'යි විචාරා 'සතර වන දොරටුවේ වසන දේවතා දූ නම් මම ය. දේවතා ව ඉපැද ත් මුඹගේ නවාතැනෝ ඉන්නා බැවින් ආපද ත් නො සලකා වරදවා කරණ දෙයට මාලු කමක් කියන්ට අයිමී' කිවු ය. 'එ සේ කල කියව'යි සිටාණන් කී කල්හි 'මහ සිටාණෙනි, මුඹ එන දවස නො සලකා ම මහණ ගොයුම්හුගේ සස්නට බොහෝ දෙය වියදම් කළ දෑ ය.

'පෝසත් අවදියේ කුමක් කළ ත් දුක් පත් අවසථාවෙහි ත් කට යුතු නො දන්ට කාරණ කිම් ද? මහණ ගොයුම්හු හා ඔහුගේ සවුවන් අනුන්ගේ දූක් මුළා නො දනිත ත් තමා ජීවත් වන ලෙසක් දතමනා වේ ද? මෙ ලෙස දන් දෙතො ත් දවස් ගණනකින් සෙසු සම්පත් තබා බත් පිළී පමණකු ත් ඇති වන්ට කාරණ නැත. මහණ ගොයුම්හුගෙන් ප්‍රයෝජන කිම් ද? ඔ හට දෙන දෙයක් කර්මාන්තයෙක යොද සම්පත් ඇති කරවන බව ය. දනවිෂයෙහි වියදමක් නො කරණ බව ය'යි කිවු ය. සිටාණෝ ද කියා නිමවන තෙක් අසා පියා මෙ අපට කරණ අවවාද දූ'යි විචාරා 'එ සේ

Non-Commercial Distribution

ය'යි කී කල්හි 'තොප සේ වූ එක දේවතා දුවණි කෙණකුන් තබා දේවතා දූ ලක්‍ෂයකු ත් වඩා ත් එ බඳු තර අදහසක් ඇති හෙයින් මා දෙන දන් නවතා ලිය නො හෙති. කියා ලූ ලෙස යහපත් නො වෙයි. තොප වැන්නවුන් අප ලඟ රඳන්ට බැරි ය. තොපි මහලු කම් ලෙස කීවා ව ද? අප මාලු කම් ලෙස කියන දෙයක් නො වෙයි. වහා අප ගෙන් නික්ම යව'යි කිවු ය. සෝවාන් සිටාණන්ගේ බස් අසා රඳා ගත නො හී දරුවන් වඩා ගෙන අනුන්ගේ සම්පත් රකින්ට කියා තුමූ තමන්ගේ සම්-පතු ත් තබා ලා නික්මුණවු ය.

ගොසින් ඔබ්බෙන් නවාතැන් පමණකුත් නො ලදින් සිටාණන් ක්‍ෂමා කරවා ගෙන සිය පළ ම හිදිමි' සිතා නුවර රකවල සිටි දෙවියන් කරා ගොසින් තමන්ගේ වැරැද්ද කියා ලා 'සිටාණන් ලඟට මා කැඳවා ගෙන ගොසින් ක්‍ෂමා කරවා ලා වසන තැන ඉල්වා දෙවුව මැනැවැ'යි කිවු ය. 'තොප මාලු කම් කියා ලූ ලෙස බුදුනු ත් බුදු සවුවනු ත් සිටාණන්ගේ ගෙට වැද්ද නො දෙන ලෙසට කී හෙයින් තොප තොපගේ ගෙට වැද්ද දෙන්ට අප මාලු කම් කී කල නපුරු ලෙසින් තොපගේ මාලු කම ත්, අපගේ මාලු කම ත් වෙනස නැත. ඉදින් තොපි බුදුන්ට ත් බුදු සවුවන්ට ත් වඩනා තරමක් ඇත් නම් තවත් අප මාලු කම් කිය හැක්ක. තොපගේ වඩනා තරම් තබා තමා ම තරමක් නැත. අපි උන් ලඟට මේ නිසා නො යම්හ'යි කිවු ය.

දේවතා දූ ද නවාතැන් මුට්වූ බලවත් හෙයින් සතර වරම් රජුන් කරා ගොසින් උනු ත් බැරි ය'යි කී කල්හි සක් දෙවිඳු තමන් හැමට ම නායක හෙයින් උන් කරා ගොසින් තමන්ගේ වැරැද්ද කියා ලා 'මම, ස්වාමීනි, වසන තැනක් නැති ව දරුවන් වඩා ගෙන මුළාව ඇවිදිමි. මා වසන තැනක් එ ම වේව යි අනික් තැනෙක් වුව ත් දෙවුව මැනවැ'යි තමාට සහාය කට හැකි ඔබ්බක් නැති හෙයින් තර ව කීව. සක් දෙවිඳු ත් ඒ අසා 'තොප තරමුන් නිසා ඒ සා තරමුන් ලඟට අප තරමුන් යන්ට නො පිළිවන. බල, තොපට එක් උපදෙසක් කියමි' කිවු ය. 'යහපත, වඩිනට මැළි බැවින් උපදෙස වුව ත් යහපත, වදාළ මැනැවැ'යි කිවුය. 'තොපි පලා ගොසින් සිටාණන්ගේ ගෙයි ලියා සිටිනා ලියනා වෙස ගෙන—සිටාණන් ගෙන් අටළොස් කෙළක් වස්තු පත් ලා ලා නයට හැර ගත්තෝ ඇත—තොපි තොපගේ ආනුභාවයෙන් එයි ත් එළවා ගෙන—නිධාන ගත ව තුබූ අටළොස් කෙළකු ත් චතුරේ ගොසින් මූදට වන්නා ඇත. තව ත් අසවල් තැන හිමියන්

Non-Commercial Distribution

නැති ව තිබෙන අටළොස් කෙළක් පමණ වස්තු ඇත—මෙ සේ තුනින් කැටි ව සූ පනස් කෙළක් හැරගෙන පෙර වස්තු තිබෙන ගබඩාවල් පුරා ලීමෙන් දඬුවම් කොට ගෙන ක්‍ෂමා කරවා ගනුව'යි කිවූ ය.

උයි ත් 'යහපතැ'යි ගිවිස සක් දෙව්ඳු කී ලෙස ම කොට ලා සිටාණන්ගේ ශ්‍රී යහන් ගබඩාවට වදනට ශක්ති ඇති ව වැද අහස බබළ බබළා සිට 'කවුරු දූ'යි විචාළ කල්හි 'ස්වාමීනි, සතර වන දෙරටුයෙහි හිඳිනා නුවණක් නැති පිණු ත් නැති දේවතා දූ නම් මම ය. නුවණ නැති ව එ බන්දක් මුඹ වහන්සේ ලඟ දී කියා පීමි. එයි ත් ක්‍ෂමා කරණ බව ය. සක් දෙව්ඳුගේ බසින් සිවූ පනස්කෙළක්වස්තුගෙනාමි. ඉන් අටළොස් කෙළක් මුඹ වහන්සේ ගෙන් නයට ගත් දෑ ය[1]. අටළොස් කෙළක් මුඹ වහන්සේ ගෙන් ම අපවත් ව මූද තුබූවා ය. අටළොස් කෙළක් හිමියන් නැති දෙයෙක. ඒ හැම ගෙන භාණ්ඩාර පුරා දඬුවමූ ත් මුඹ වහන්සේගේ අදහස් කුම් වුව ත් මාගේ බල තරමට කෙළෙමි. දරුවනු ත් ඇති හෙයින් හිඳිනා තැන් මුළා මහතැ'යි කිවූ ය. අනේ පිඩු මහ සිටාණෝ ද ''ශක්‍රයන් ලඟට ගොසින් කන්නලවු කියා ගත හෙන දේවතා දූවණියෝ 'දඬුවමූ ත් කෙළෙමී' කියති. වරද ත් ගිවිස සිටිති. දඬුවමට ත් සිවූ පනස් කෙළක් පමණ වස්තු ගෙනවුත් දූන්හ. ලොවී සම්පත් දූන් තැනැත්තවුන් බුදුන්ට දක්වා ලා ලොවුතුරා සම්පතු ත් දෙවමී'' සිතා ලා බුදුන් කරා කැඳවා ගෙන ගොසින් දේවතා දූවණියන් කියා ලූ වරදත් තමන්ව දඬුවම් පිට ලා ලා කළ යහපත ත් කිවූ ය.

දේවතා දූවණියෝ ද බුදුන් වැඳ ලා 'ස්වාමීනි, මුඹ වහන්සේ ගේ ගුණානුභාව ය නො දූන කියා ලූ දෙයට ක්‍ෂමා කරණ බව ය'යි බුදුන් ක්‍ෂමා කරවා ගෙන පසු ව සිටාණනු ත් ක්‍ෂමා කරවා ගත්හ. බුදුහු කුසල් අකුසල් දෙකෙහි ඉෂ්ටානිෂ්ට විපාක දක්වීම් වසයෙන් සිටාණන්ට ත් දේවතා දූවණියන්ට ත් බණ වදාරණ සේක් 'පව් කම හැසිරීමෙන් පවිටු සත්වයෝ තුමූ කළා වූ පාප ය යම් තාක් අනිෂ්ට විපාක දීලන්ට අවසරයක් ලද නුහුනු යේ වී නම් ඒ තාක් පුරාකෘත සුචරිතානුභාවයෙන් සිද්ධ වූ ඉෂ්ට විපාකය ම දකිති.

යම් කලෙක අනිෂ්ට විපාක දී ලන්ට අවකාශයක් ඒ තෙමේ ලැබ පී නම් එ කල පවිටු පුහුලෝ හමු වපුටවුන් හමූ ම දක්නා

1. ගත්තාය.

Non-Commercial Distribution

සේ අනිෂ්ට විපාක ම දකිති. පින්කම් කරන්නා වූ සත්‍වයෝ ත් යම් තාක් කළා වූ කුශල ය ඉෂ්ට විපාක දී ලන්ට අවසරයක් නො ලද්දේ වී නම් ඒ තාක් ම පුරාකෘත දුශ්චරිතානුභාවයෙන් අනිෂ්ට විපාක ය ම, 'සිටාණෙනි, සම්පත් නැති වී මෙන් තොප දුක් දුටුවා සේ දකිති. යම් දවසෙක කළ කුශල ය ඉෂ්ට විපාක දනයට අවසරයක් ලත් නම් තොප දූන් පෙරළා ත් සිවු පනස් කෙළක් වස්තු ලද්දු මෙන් යහපතක් ම දකිති'යි වදාළ සේක. දෙශනා කෙළවර දේවතා දුවණියෝ සෝවාන් ව බුදුන්ගේ දක්මෙහි ආදි අප්‍රිය තැනැත්තෝ පසු ව දක්මෙන් තෘප්තියක් නැති වූ ය.

එ හෙයින් සත් පුරුෂයන් විසින් නො සලකා කියා ලූ දෙයට දේවතා දුවණියන් ගත් අට්ටල් සලකා බුද්ධාදීන් කෙරෙහි ආදර භක්ති ඇති ව ඓහලෞකික වූ ත් පාරලෞකික වූ ත් ප්‍රයෝජන සාධා ගත යුතු.

---

## 113. අසඤ්ඤත භික්ෂූන් වහන්සේ ගේ වස්තුව

තව ද සඤ්ඤතකාරි නො වීමෙහි ආදීනව හඟවන්නට අසඤ්ඤත භික්ෂූන් වහන්සේ ගේ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්—

එක් භික්ෂු කෙණකුන් වහන්සේ හැඳ පුටු බිසි කන්වයින් ආදි ය පිටත තබා ප්‍රයෝජන විඳ ලා තැන් පත් කොට නො තබන සේක. ඒ සෙනසුන් පිරිකර ත්, වැස්සෙනු ත් තෙමී දිරා නස්සි. අවු ත් කා, කරාවු ත් කා නස්සි. වේයෝ මීයෝ ත් කා නස්සි. සෙසු එ ලෙස නො කරණ වහන්දෑ ඒ දැක 'මෙ ලෙසින් මේ නස්නේ හැයි දෑ'යි කී කල්හි 'මේ හැඳ පුටු ආදි ය සිත්පිත් ඇති දෙයක් නොව ත්, මෙයින් සිද්ධ වත ත් යම් තම් පවෙක් වේ දෑ'යි කියා ලා වෘද්ධ ගෞරව ය නැති ව ඒ ලෙස ම කරණ සේක. වහන්දෑ තමන් වහන්සේට නො නවත්නා හෙයින් 'ඔබ ත් කියා නවතම්හ'යි බුදුන්ට දන්වූ සේක.

බුදුහු ත් ඒ නම ගෙන්වා ලා 'සැබෑ ද, මහණ, එ ලෙස තා කරන්නේ ය'යි විචාළ සේක. 'ස්වාමීනි, එ විතරෙකින් කුමක් ද? එ විතර පවත් පවු වේ නම් පව් නොවන්නේ කිම් ද? හැඳ පුටු ආදි ය තෙමී ගිය යි දිරා ගිය යි ඒ ප්‍රාණඝාත වස්තුවක් නො වන බැවින් අපට වන පව් කවරේ ද? යනාදීන් අකාරණ ම කාරණ කොට කියා වෘද්ධ ගෞරව ය නැත්තා සේ ම බුද්ධ ගෞරව ය නැති නියාව ත් හැඟ වූ සේක. බුදුහු ඒ අසා 'හෙම්බල, භික්ෂූන් විසින්

Non-Commercial Distribution

තෙල ලෙස කිරීම නපුර. පව් නම් ප්‍රාණ වධාදි ය ම ය යි සිත ගත්තු ද? යමක් යමක් කරන්ට කීම නම් ඒ චාරිත්‍ර ශීල ය ත් නො කළ කල පව් ය. යමක් මම නො කරන්ට කීම් නම් ඒ චාරිත්‍රයන් කළ කල නපුර. මේ පාප ය ලඝු වුව. මේ කවර කලෙක මා කරා ඒ ද'යි පාප ය හෙළා දක්ක යුතු නො වෙයි.

"මුනිඥණමතික්කම්ම—කුසග්ගච්ඡේදමත්තකං,
එරපත්තෙන යං ලද්ධං—තාදිසං දීපයිස්සති"

යනු හෙයින් එරුපත කැඩෙන නියාව දන දන අත නො හළ පමණකින් එරුපත කැඩී විසි දහසක් අවුරුදු කළ මහණ ධර්මෙහි විපාක ය දෙ වන ජාතියෙහි දී ලිය නො හී ඒරපත්ත නම් නාග ව උපදවා පියා අධිගම අන්තරාය ත් කළ නියාව නො ඇසී ද? යම් සේ වැසි වේලේ යම් කිසි වළඳක් මුණින් නො නමා තබා ලූ කල එක පෙදෙසකින් ම නො පිරේ ද? එක විට ම නො පිරේ ද, නො එක් විට වට නොයෙක් පොදින් පිරේ ද, එ මෙන් මද ඔද පවු ත් එක් වන් කිරීමෙන් ආසෙවන ලාභයෙන් බොහෝ වෙයි' වදළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ. අසඤ්ඤත නමගේ සඤ්ඤම ය නොපෙනුණා සේ අධිගමයකු ත් නො පෙනිණ. රක්‍ෂා කල ශීල ය වාසනාභාගිය වන ත් වන්නා ම ය.

එ හෙයින් සත් පුරුෂයන් විසින් අගාරික වුව ත් අනගාරික වුව ත් අජව්‍රත ගොව්‍රත වශයෙන් බැණ නො නැඟීම් නො ව වාක් සඤ්ඤමය ත් ඇති ව අසන්ත ගුණසම්භාවනිච්ඡා වසයෙන් කරණ කාය සඤ්ඤම නො ව සම්‍යක් ප්‍රතිපත්ති වශයෙන් කාය සඤ්ඤමය ත් ඇති ව ශ්‍රද්ධාදී වූ සෙසු ත් ගුණයෙහි පිහිටා අධිගම සිද්ධි ය කට යුතු. ————

## 114. බිළාල පාදක සිටාණන් ගේ වස්තුව

තව කුශලයන් ලඝු කොට සිතා යමෙක් පින්කම පමා වෙත් නම් ඔවුන් නො පමා වනු නිසා බිළාල පාදක සිටාණන් ගේ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්—

එක් සමයෙක සැවත් නුවර ඇත්තෝ මුළු මුළු ව ගෙන තමන් හැමට ආයාස ත් නොවනු නිසා වහන්දෑට ත් අපාසු නො වන ලෙසට දශෙසන් විස්සෙසන් පනසෙසන් සියෙන් එක් ව

Non-Commercial Distribution

දන් දෙති. බුදුහු එක් දවසක් අනුමෙවෙහි බණ වදරණ සේක් 'උපාසකවරිනි, යම් කෙණෙක් තමන් සන්තක යමක් දන් දෙත් මුත් අනුන් සමාදන් නො කරවත් නම් උන්ට හොග සම්පත් විනා පරිවාර සම්පත් නැත. තමන්ගෙන් දීමක් නැති ව අනුන් ම සමාදන් කරවා ඇවිදිත් නම් උන්ට පරිවාර සම්පත් මුත් හොග සම්පත් නැත. යම්කෙණෙක් දෙක ම නො කෙරෙත් නම් සම්පත් දෙක ම නැත. තමන්ගෙනු ත් දන් දී අනුනු ත් සමාදන් කරවන්නවුන්ට සම්පත් දෙක ම ඇතැ'යි පණ්ඩිත සාමණේර වත කසුප් බුදුන් වදළ ලෙස ම පරම්පරාගත ව පැවති කථාවක් වදරන්නා සේ ම වදළ සේක.

එක් නුවණැති කුල දරුවාණ කෙණෙක් ඒ බණ අසා වදළ ලෙස ඉතා ම යහපත. සම්පත් ඇති ව පරිවාර නැත ත් නපුර. පරිවාර ඇති ව සම්පත් නැත ත් නපුර. දෙක ම නැති කලට ඊ ම තබා නපුර. සම්පත් ඇති ව පරිවාර ත් ඇත් නම් පරිවාර ඇති පමණින් යසස් වඩී. මම දෙක ම නො වරදවමී'යි සිතා බුදුන් වළඳා ලා වඩනා වේලේ 'ස්වාමීනි, සෙට දවස මට කරුණා කොට වදළ යහපතැ'යි කිවු ය. 'කෙ තෙක් භික්ෂූන් වුවමනා දැ'යි විචාළ කල්හි 'හැම තැන්ම ය'යි කිවු ය. බුදුහු ත් උන්ගේ ශක්ති ය දැන ඉවසා වදළ සේක.

උයි ත් නුවර ඇතුළට වැද ලා 'මවු පියෙනි, නං මල් බෑයෙනි, සෙට දවසට බුදු පාමොක් වහන්දෑව ආරාධනාවක් කෙළෙමි. යම් කෙණෙක් යම් විතරකට දන් දී ලිය හෙත් නම් කැඳව අවුළු පතට බතට සාල් එක් කළ මැනව. එක් කොට ලා එක් තැනක දී පිසවා දෙම්හ'යි හඬගා කියති. ඉක් බිත්තෙන් එක් සිටාණ කෙණෙක් එ ලෙස කිය කියා තමන්ගේ සල්පිළ කරා ආ තැනැත්තන් දැක 'මූ තුමූ තමන්ට පිළිවන් විතරෙක දනක් දී නො ගෙන ගම මුළුල්ලේ හෝ ගා [1] ඇවිදිති'යි කිපී පියා තොප සාල් සොයා ගෙනා වළන් මුබ ගෙනෙව'යි කියා ලා ඇඟිලි තුනක් අගින් වෙන විතර සාල් සුහක් ගන්වා ගෙන දුන්හ. මුං සුහකු ත් උඳු සුහකු ත් එ සේ ම දුන්හ. එ වක් පටන් ඇඟිලි අක් තුන එක් වූ තැන් බළල් පියක් වැනි හෙයින් දෙන දීමන ඉන් දුන් හෙයින් බිළාල පාදක සිටාණෝ ය යි ප්‍රසිද්ධ වූහ. ගිතෙල් උක් පැණි ආදිය ත් දෙන්නෝ සිත ලෙසට ම කුඩා වූ කරඬු සුහක් කළ ඇතුළට බාලා එක් කෙළවරකින් උකා ගන්වමෙතා ත් බොහෝ වෙයි යන සිතින් පෙතින් පෙතින් කරඬුවට වගුරුවා සුහ සුහ ම දුන්හ. විධාන කළ තැනැත්තෝ ත් සෙස්සවුන් දුන් දෙය

1 ඔ ගා– ඇතැම්

Non-Commercial Distribution

එක් කොට ලා ගෙන බිළාලපාදක සිටාණන් දුන් දෙය වෙන වෙන ම හැර ගත්හ.

සිටාණෝ ත් එ ලෙස දැක 'මා දී ලූ දෙය වෙන් කොට හැර ගන්ට කාරණ කිම්දැ' යි සිතා උන් පසු පස්සෙහි 'තුලුන් තෙලෙට කරණ ලෙසක් දැන ගෙන එව'යි බුලත් කවන්නාහු යවූ ය. උයි ත් ගොසින් දී ලූ දෙය මඳ වුව ක් ලබන විපාක බොහෝ වුව මනා වේ දැ යි සාලට දෙක තුන ඔබාදීන් හා මුං උඳු ත් බොහෝ කොට ලන්ට මඳ හෙයින් දෙක තුන ඔබාදීන් හා ගිතෙල් සකුරු ආදිය ත් සෑහෙන ලෙසින් කැඳ අවුළු පත් බත් පිසන වළන් මුළුල්ලෙහි ලූව මනා ලෙසින් ලවා ලූ ය. බුලත් කවන්නෝ ද ගොසින් සිටාණන්ට එ පව ත් කිවූ ය. ඒ අසා සිටාණෝ 'තෙල ලෙස කොටා ලා බොහෝ දෙනා මැදයේ මාගේ මසුරුකම සුරු කම සේ කියා නම් මා හෙළි බා කී කලට කොටා මරා පියමී' කලවයේ සිරියක් බැඳ ගෙන දෙවන දවස් ගොසින් වළඳන තැන සිටියෝ ය.

උයි ත් බුදු පාමොක් වහන්දෑ වළඳවා ලා බුදුන්ට 'ස්වාමීනි, මම බොහෝ දෙනා සමාදන් කරවා දන් දෙවීමි. විධාන ලත් මිනිස් සුන් තමන් බල වූ පරිද්දෙන් මඳ වුවත් බොහෝ වුව ත් හාල් ආදිය දුන්හ. මඳ කොට දුන්නවුන්ට ත් බොහෝ කොට දුන්නවුන්ට ත් විපාක බොහෝ ම වෙව' යි කිවූ ය. ඒ අසා බිළාල පාදක සිටාණෝ 'මම මෙ තැනට එන්නෙම් 'අසවල් තැනැත්තෝ අසුරු මිටි ලූ ය'යි මා තෝරා ගතු කිවූ නම් මරමී සිතා අයිමි. මූ සාමාන්‍යයෙන් නැළිය පත දුන්නවුන්ට ත් අසුරු මිටි දුන්නවුන්ට ත් උමං දයෙහි ඵලක ප්‍රශ්න ය සියලු ලෙසින් දත් මහෞෂධ පණ්ඩිතයන් වහන්සේට ත් උන්දෑ ගෙන් උගෙන කියා ලූ සේනකාදී පණ්ඩිතවරුන්ට ත් ලාභ ය සම වූවා සේ ම විපාකයෙන් සම වන්ට කියති. ඉදින් මම මෙ තරම් කෙණකුන් ක්‍ෂමා නො කරවීම් නම් මා හිස සෙණ හිණි නමුත් නපුරැ''යි පා මුල වැඳ ගෙන හෙව 'ස්වාමීනි, ක්‍ෂමා කළ මැනැවැ'යි කිවූ ය. 'කුමක් දැ'යි විචාළ කල්හි සියලු පවත් ම කිවූ ය. බුදුහු ත් උන් දෙන්නා කියන කරණ දෙය අසා මේ කිම දැ යි දන් විධාන කළ තැනැත්තවුන් අතින් විචාළ සේක. උයි ත් ඊයේ පටන් පැවැති සියල්ලක් ම නිශ්ශෙෂ කොට කිවූ ය.

බුදුහු ත් 'එ සේ ද, සිටාණෙනි' විචාරා එ සේ ය යි කී කල්හි ''සිටාණෙනි, පින් කම් නම් මඳ දෙයෙකැ යි නො සිතිය යුතු ය. නුග ඇට ය කුඩා වුව ත් ඉන් නැඟි ගස මහත් වන්නා සේ විපාක

Non-Commercial Distribution

මහත. එ හෙයින් පින් කරණ කල 'මා කළ පින් කම බොහෝ නො වත් කුඹුවකු තමාගේ ආයු පමණින් නැඟී ත් මහ මෙර උඩට නැඟ නො හෙන්නා සේ මේ ලසු කුශලයක් කවර කලෙක විපාක දී පිය හේ ද'යි හෙළා නො සිතිය යුතු ය. යම් සේ එක් වන් වැසි වැසීමෙන් මුණින් නො නමා වැස්සේ තුබූ වළන් පිරේ ද, එ මෙන් නුවණැත්තෝ එක විට කොට ගන්ට නැත ත් වෙයන් බඳනා තුඹස් සේ සුහින් සුහින් පින් කෙරෙ ත් නම් අඞ්ගුලිමාලයන් පළමු කැපූ ඇඟිලි කුණු වන්නා සේ ආදි ආදි කළ පින් නැති නො වන හෙයින් හැම පින් එක් ව කුශල ය බොහෝ වෙයි'' වදළ සේක. දෙශනා කෙළවර බිළාලපාදක සිටාණෝ සෝවාන් ව පළමු ලොවී සැපතට ලෙටි වූවා සේ ම දූන් නො ලෙටි ව සියලු සැප ත් බුදු සස්නට වියදම් කළහ.

එ හෙයින් නුවණැත්තන් විසින් සැපතෙහි ලෙටි වීමට වඩා ත් පින් කමෙහි ලෙටි ව පින් පුරා ලොවී ලොවුතුරා සැප ත් සිද්ධ කට යුතු.

## 115. මහධන වෙළඳාණන් ගේ වස්තුව

තව ද උපද්‍රව සහිත මහක් සියලු ලෙසින් හළ යුතු වන්නා සේ අකුසලු ත් අවශ්‍යයෙන් හළ යුතු නියාව දක්වන්නට මහධන වෙළඳාණන්ගේ වස්තුව කියමු.

මහධන වෙළඳාණන් ගෙන් යමක් පැහැර ගන්ට සොරුන් පන් සියයක් අවසර බලා කුසල් සිතින් අතුරු නැත්තවුන් ගෙන් අවසරයක් ලැබ ගත නුහුණුවු ය. එක් සමයෙක වෙළඳාණෝ පන් සියයක් ගැල්වල බඩු පුරාගෙන වහන්දැට කියා යවන්නෝ 'මම අසවල් තැනට වෙළඳාමට යෙමි. යම් කෙණකුන් වහන්සේ ඔබ වඩනා කැමැත්තෝ ත් වැඩිය මැන ව. මහ දී සිවු පසයෙන් අඵාසුවක් නො කෙරෙමි'යි කිවු ය. ඒ අසා පන් සියක් දෙනා වහන්සේ උන් හා එක් ව නික්මුණු සේක. පළමු අවසර බලා ඇවිදි සොරු වෙළඳාමට නික්මුණු නියාව අසා ගොසින් අඩෙවි[1] මහ වල[2] පහරින්ට සිටියහ. වෙළඳාණෝ ද ගොසින් වන දෙර කඩ එක් ගමෙක රඳා දෙ තුන් දවසක් තුමූ ත් සැත පී ගොනු-නු ත් සතපා ගත්හ. කැටි ව ගිය සඟ පන් සියයට ත් නිරන්තර දන් දෙති. සොරුන් ගෙන් වන උපද්‍රවයට රකවල් හා සරි ය සොරු පන් සියය ත් වෙළෙඳාණන් කල් යවන්නා 'යව, ගොසින් නික්මෙන දවස දන ගෙන එව'යි එක් සොරකු යවූ ය. එයි ත් ඒ ගමට ගොසින් 'වෙළඳාණෝ කවරද යෙත් ද'යි යාළුවකු අතින් විචාළහ.

1. අටවි 2. මහවල

Non-Commercial Distribution

උයිත් යුහු ව, දෙ තුන් දවසකිනැ'යි කියා පියා පසුව සලකා පියා 'කුමක් නිසා විචාළා දැ'යි විචාළෝ ය. එයි ත් ඔහු තමාට මිත්‍ර හෙයින් 'අපි පන් සියයක් විතර සොරුම්හ. උන් අත මිට තුබූ දෙය උදුරන්ට අඩෙවි මහ වල සිටියම්හ'යි කී ය. ගම් වැසි තැනැත්තෝ ත් 'එ සේ වී නම් යව. වහා යෙති' කියා ලා ඔහු යවා පියා 'කුමක් දෝ සොරුට සහාය වෙම් දෝ නොහොත් වෙළඳ ණන්ට සහාය වෙම් දෝ හෝ'යි සිතා 'සොරුන් ගෙන් මට ප්‍රයොජන කිම් ද? වෙළඳාණන් නිසා පන් සියයක් දෙනා වහන්සේ ජීවත් වන සේක. වෙළඳාණන්ට සහායක් වීම් නම් වහන්දැට ත් සහාය වූ නියා ම ය. වන සහායක් වෙළඳාණන්ට ම වෙමි' කියා වෙළඳාණන් ලඟට ගොසින් 'යන්නේ කවර ද දැ'යි විචාරා 'අනික් ද ය'යි කී කල්හි 'මා කියා ලූ දෙයකු ත් කළ මැනව. අඬෙවි වල සොරු පන් සියයක් මුඹ ගෙන් කොල්ල නිසා රැක සිටියෝ ය. තව යන්ට නො කැමැත්තේ'යි කිවු ය. 'මුඹ දත්තේ කෙ සේ දැ'යි විචාළ කල්හි සොරුන් ලඟ අප මිත්‍රයාණ කෙණෙක් ඇත. උන්ගේ කථායෙන් දතිමී' කිවු ය. එ සේ වී නම් මා ඔබ යැමෙන් කම් කිම් ද? වෙළඳාම් තබා සිය රට ම යෙමී' සිතූ ය.

දෙ තුන් දවසකිනැ'යි කියා තව ත් කල් යවන හෙයින් නැවත සොරුන් ලඟ සිටී ආදී එකා ම අවුත් ආදි විචාළ මිත්‍රයා අතින් ම විචාළහ. උයි ත් ගමන බාධා ව සිය රටට නික්මෙන නියාව කිවු ය. ඒ ගොසින් සොරුන්ට කී ය. සොරු ඒ අසා අඬෙවියෙන් නික්ම සිය රටට යන මඟ රැක ගත්හ. උඹ තුමූ සොරුන්ට වඩා සැදැහැ ඇති හෙයින් වෙළඳාණන්ට ම පක්ෂ ව ඒ උන්ට පක්ෂ නියාව සොරුන්ට ත් නො හඟවා සිය රට යන මඟ ත් සොරුන් රැකි නියාව ත් වෙළඳාණන්ට කිවු ය. වෙළඳාණෝ නො පෙනී සිට ගුණ බඩු පහරිනා කෙලෙස් සොරුන්ට පවා නුවණැත්තෝ වැළහෙති. පෙනී සොර කම් කරණ සොරුන්ට වැළහෙන්ට බැරි කිම් ද? මෙ තැන ත් මට අඩුවක් නැත. එ හෙයින් ඔබ ත් නො යමි. මෙ තැන ම රඳමි, සිතා ගෙන වහන්දෑ ලඟට ගොසින් 'ස්වාමීනි, මා වෙළඳාමේ යන නියාව අසා සොරු ඒ මඟ රැක ඒ දැනි ලා නැවත සියරට යන නියාව අසා ඒ මඟ ත් රැකිත්ල. මම ඔබ ත් මොබ ත් නො ගොසින් අපෝ කොට මී ම රඳමි. ස්වාමීන්ලා ත් රඳනු කැමැති තැන් මෙහි ම රඳන බව ය. වඩනා කැමැති තැනක් වඩනා බව ය'යි කිවු ය. වහන්දෑ 'එ සේ වී නම් අපි යම්හ'යි වෙළඳාණන්ට කියා ලා නැවත සැවත් නුවරට ගොසින් බුදුන් වැඳ ගෙන වැඩ හුන් සේක.

Non-Commercial Distribution

බුදුහු ත් කුමක් ද, මහණෙනි, මහධන වෙළඳා හා කැටි ව නො ගියා ද'යි විචාරා, එ සේ ය, 'සවාමීනි, උන් අත මිට තුබූ දෙය උදුරන්ට යන මහ ත් එන මහ ත් සොරු සිටියෝ ය. එ හෙයින් උඹ ඔබට ත් නො ගොසින් මොබ ත් නො අවුත් හුන් මහ රුඳුනාහ. අපි පෙරළා ආම්හ'යි වදාළ කල්හි, මහණෙනි, යම් සේ මහධන වෙළඳා ජීවත් වනු කැමැති ව උවදුරු සහිත මහ වළහා ද, තව ද යම් කෙණෙක් ආදීනව සලකා ජීවත් වීමේ රුචි ඇති ව විෂද හරිත් ද, එ පරිද්දෙන් නුවණැත්තෝ ත් නිවන් පුර වැද ජීවත්වනු නිසා සවල්ප වුව ත් පව් හරනාහු ය'යි වදාළ සේක. දෙශනා කෙළවර පන් සියක් දෙනා වහන්සේ මහධන වෙළ-දාණන් හා කැටි ව ගොසින් ලැබ්බ යුත්තෙන් ලත් කිසිවක් නැත ත් පිළිසිඹියාව හා සමහ රහත් ඵල නැමැති මහධන ලත් සේක.

එ හෙයින් නුවණැත්තවුන් විසින් වල් සොරුන් පිහිටි මං හළුවා සේ කෙලෙස් සොරුන් පිහිටි අකුසල් මං හැර නිරුපද්‍ර වූ නිවන් මහට පැමිණිය යුතු.

---

## 116. කුක්කුට මිත්තයන් ගේ වස්තුව

තව ද සෝවාන් වුව ත් සංසාර දෙෂ ය රහත් වීමෙන් මුත් නො නිමෙන නියාව දක්වනු පිණිස කුක්කුට මිත්තයන් ගේ වස්තුව කියමු.

කෙ සේ ද යත්—

රජගහා නුවර සිටු දූවණි කෙණෙක් විය පැමිණ සත් මාල් මාළිගාවේ සත්වන මාලේ ශ්‍රී යහන් ගබඩාවේ ලා ලා රකවලට කෙල්ලක ත් පාවා දෙවා ලා දෙ මවු පියන් විසින් රක්නා ලබනුව වෙසෙති. එක් දවසක් සවස් වේලෙහි සී මැදුරු කවුළුවෙන් ඇතුළු වීථිය බලන්නෝ පන් සියයක් මළ ද පන් සියයක් හුල් ද හැර ගෙන මුවන් මරා ජීවත් වන කුක්කුට මිත්ත නම් මුව වැද්දහු පන් සියයක් මුවන් මරා මස් කොට ගෙන ඒ මසින් ගැලක් පුරා-ගෙන ගැල් හිස හිඳ ගෙන මස් විකුණනු නිසා නුවරට එන්නාහු දක කාම තෘෂ්ණා ව මුත් ජාති නො සලකා උන් කෙරෙහි පිළිබඳ සිත් ඇති වූ බැවින් කෙල්ල අත රනක් යවා ලා තුලු මස් විකුට පියා යන වේලාව දන ගෙන එව'යි විධාන කළහ. උයි ත් ගොසින් ගෙන ගිය රන් දී ලා යන වේලාව විචාරා 'අද දඩ මස් විකොට ගෙන උදසන ම අසවල් වාසලින් පිටත් ව ලා යෙමි' කී කල්හි කෙළි ත් ඒ අසා ගෙන ගොසින් සවාමි දූට කීව.

Non-Commercial Distribution

සිටු දූවණියෝ ද තමන් ගෙන යා යුතු වූ පිළි හා ආභරණ ආදි ය නිල කොට ගෙන උදසන ම කිළිටි කඩක් හැඳ ගෙන පැනට යන කළ මිඩියක මෙන් කළයක් හැර ගෙන අර මුන් කියා ලූ ඉද්දට ගොසින් පෙර මං බලා සිටියෝ ය. උයි ත් උද සන ම ගැල පැද ගෙන නික්මුණුවූ ය. සිටු දූවණියෝ ත් පසු පස් සේ නික්මුණුවූ ය. කුක්කුට මිත්තයෝ ත් සිටු දූවණියන් පසු පස් සේ එන්නවුන් දැක පෙරාතු දවස් දුටු කෙල්ල ත් යන වේලා විචාළා පමණක් මුත් මුන්ගේ ගමන කියා නූ ලූ හෙයින් 'මම් මුඹ කා-ගේ දූවණි කෙණකුන් බව ත් නො දනිමි. මා හා කැටි ව එන්ට නො කැමැත්තේ ය'යි කිවු ය. මුඹගේ විධානයකින් මා එන ගමනක් නො වත් සිත් හොස්සෙ යන ගමන් වුව. මුඹ නො දෙඩා මුඹගේ ගැල ම පදිනැ'යි කිවු ය. එ සෙ කීව ත් කුක්කුට මිත්තයෝ රදන්ට ම කියති. එ සෙ කියන කලට සිටු දූවණියෝ—

'හත්‍ථගතං පත්තගතං–සබ්බං තං ඛාදිතුං වරං,
මාදණ්ඩෙන සිරිං පත්තං–කාමාසා තං පිහීයසෙ'

යනු හෙයින් 'තමා කරා එන ශ්‍රී කාන්තාව ගසා පලවන්නෝ ඇද්ද? නො දෙඩා නො බැණ තමා යත ගමන් ම යන්ට බැරි නියා ද'යි කිවු ය. උන් එන්ට තර නියාව දැන ගැලට නංවා ගෙන නික් මුණුවූ ය. සිටු දූවණියන්ගේ දෙ මවු පියෝ ත් ඒ ඒ තැන බලා නො දැක මළ නියා වනැ'යි සිතා පින් පෙත් දුන්හ. උයි ත් කුක්කුට මිත්තයන් හා බැඳී හිඳ පිට පිට හෙළා පුතුන් සත් දෙණකු වද වැඩි විය පැමිණියවුන්ට සරණ ගෙන්වා දුන්හ.

ඉක් බිත්තෙන් දවසක් බුදුහු අලුයම් වේලේ කුක්කුට මිත්තයන් අනුන්ට දැල් ගසන්නවුන් පුතුන් හා යෙළින් හා සමහ තමන් වහන්සේගේ නුවණ දැළ ඉස් වසා ලා ගත්තවුන් දැක 'උන් හැමට වන්නේ කුමක් දෝ හෝ'යි සලකන සේක් මේ ජාතියෙහි සතුන් මැරුව ත් නිවන් පතා පින් කළ හෙයින් පුතුන් සත්දෙනා ත් යෙළින් සත් දෙනා ත් කුක්කුට මිත්තයනු ත් පසළොස් දෙනා සෝවාන් වන්ට නිසි නියාව දැන දෙවන දවස් උදසන ම සහළ සිවුරු හා පාත්‍ර ය හැර ගෙන කුක්කුට මිත්ත යන් මළ ලූ තැනට බුදුහු වැඩි සේක. එ දවස් තෘෂ්ණා නමැති මළ නො බැඳෙන බුදුන්ගේ ආනුභාවයෙන් එක ද සත් කෙණෙක් මළ නොබැඳුණුවූ ය. බුදුහු ත් උන්ගේ මළ ඇළයෙ පදලසක් දක්වා ලා ඔබ්බට වැඩ ලා කුක්කුට මිත්තයන් මුවන් රැක හිඳිනා සේ ම එක් කැලයක් යට වැඩ හුන් සේක.

Non-Commercial Distribution

කුක්කුට මිත්තයෝ ද උදෑසන දුන්න හැර ගෙන මළ ලූ තැනට අවුත් මළ ත් පන් සියයක් හෙයින් මළ මුළුල්ල ම බලන්නෝ මළ වල බැඳුණු එක ද සත් කෙණකුනු ත් නො දැක මුවන්ගේ පිය නුදුට ත් බුදුන්ගේ පදලස දැක කිසි කෙණකුන් බැඳුණු සතුන් ගළවා ඇවිදිනා නියා වේ දැ'යි බුදුන් කෙරෙහි වෛර කොට ගෙන යන තැනැත්තෝ කැළ ය යට වැඩ හුන් බුදුන් දැක 'මාගේ මළ බැඳුණු සතුන් ගළවා හළුවෝ මූ වන. සතුන් විදිනට නුව ත් මුන් විදිමි' දුන්න ඇද ගත්හ. බුදුහු ත් දුන්න අදනා තෙක් හිඳ ලා හී දණ්ඩ අතින් නො හැරෙන්ට ඉටා වදළ සේක. උඹ තුමූ විද ගත ත් නො හී. නො විදගතත් නො හී පතු ඇට බිඳී යන කලක් මෙන් ඇඟ ත් තද ව දඩ මස් කන්නට උනන කෙළක් මෙන් කටින් කෙළ වගුරුව වගුරුවා මතු විදමනකට රිසි යන තරම් ව සිටියෝ ය. බුදුහුත් බැණ නො නැගී ම වැඩ හුන් සේක.

උන්ගේ පුත්තු ගිය තැනින් අවුත් පියාණන්ට කල් යන හෙයින් මේ කිම් දෑ යි කියා මෑණියනු ත් පවත් දන්නට යන්ට විධාන කළ හෙයින් දුනු හැර ගෙන ගොසින් පියාණන් ඇද-ගත ත් විද ගත ත් නො හී නිශ්චල බුදුන් වැඩ හුන් සේ ම නිශ්චල ව සිටියවුන් දැක 'මුන් අපගේ පියාණන්ට සතුරු නියා වේ දැ'යි සත් දෙනා ම දුනු ඇද ගෙන බුද්ධානුභාවයෙන් විද ගත නො හී පියාණෝ යම් ලෙසක සිටියෝ වී නම් උන්ට ද දරුවන් හෙයින් උන් සිටී ලෙස ම කටින් කෙළ පෙර පෙරා සිටියහ. පියාණන්ට කල් යන හෙයින් පවත් දන්නට ගිය පුතුන්ට ත් කල් යන්නා පුතුන්ගේ පවත් දන්නා නිසා මෑණියෝ යේළින් කැඳවා ගෙන තුමූ ත් ගොසින් එ ලෙස සිටියවුන් දැක මුන් දුනු ඇද ගෙන සිටිනේ කාට දැ'යි ඈ ත් මෑ ත් බලා රුවිනු ත් ගුණෙනු ත්, බබළ බබළා වැඩ හුන් බුදුන් දැක 'මා ගේ පියාණන් වහන්සේ නො නසව'යි මහ හඬින් මුර ගෑවූ ය.

කුක්කුට මිත්තයෝ ඒ අසා 'මුන් වහන්සේ අපගේ මයිලණු වත් වහන්සේ ල. නැදි මයිලන් දැක ගෙනා සරණක් නො වන හෙයින් ආදි හඳුනන්ට නුවූ හෙයින් අද දැක ලා හැදින ගන්නේ ත් කෙසේ ද? ආද්‍යන්ත නො සලකා කළ දෙය වැරද ගියේ ය'යි කෝප වේග ය හැර මොළොක් සිත් ඇති වූහ. කුක්කුට මිත්තයන් ගේ පුත්තු ත් 'අපගේ මුත්තණුවන් වහන්සේ නියා වේ දැ'යි උඹ හැම ත් නැඟූ දුනු සේ තද නො ව මොළොක් වූහ. මොළොක් සිත් ඇති ව ලා කුක්කුට මිත්තයෝ ත් පුත්තු ත් නො නැ කමෙහි නැ කම් සිතා මෛත්‍රී ඇති වූහ. සිවු දුවණියෝ ද

Non-Commercial Distribution

'වහා දුනු දමා පියා මාගේ පියාණන් වහන්සේ ක්‍ෂමා කරව'යි විධාන කොළෝ ය. බුදුහු ත් උන් හැමගේ අදහස් මොළෙක් නියාව දැන දුනු බා ගත දුන් සේක. උඹ හැම දෙන ම බුදුන් වැඳ ක්‍ෂමා කරවා ගෙන එකත් පස් ව හුන්හ. බුදුහු ත් බෙදදීලුව මනා දෙයක් ලැබ්බ යුත්තන් එක් තැන් කොට ගෙන දී ලතොත් එාසු බව මුත් සිටි සිටි තැනට ගොසින් දෙන කලට අට්ටල් සේ ම ඒ ඒ දෙනා සිටි තැනට—

''බොධනෙය්‍යං ජනං දිස්වා - සතසහස්සෙපි යොජනෙ,
ඛණෙන උපගන්ත්වාන - බොධෙති තං මහාමුනිං ''

යනු හෙයින් කරවන අවබොධ බල ත් හැම දෙන ම එක් තැන් කරවා ගෙන උන් හැම දෙනාගේ අදහස් බලා බණ වදළ සේක. බණ කෙළවර කුක්කුට මිත්තයෝ පුතුන් සත් දෙනා හා ත් යේළින් සත් දෙනා හා ත් සමඟ තමන් ඇතුළු ව පසළොස් දෙන සෝවාන් ව සිතා ගෙන උන් නෑ කම් කුම් වුව ත් බුදුන්ට දරු වූහ. බුදුහු ත් සිහා වළඳා ලා පස්වරු විහාරයට වැඩි සේක.

අනඳ මහ තෙරුන් වහන්සේ 'ස්වාමීනි, වැඩියේ කොයි දැ'යි විචාළ සේක. බුදුහු ත් 'කුක්කුට මිත්තයන් ලඟට ගියම්හ'යි වදළ සේක. නො කරුණෙක වධනට කරුණු ත් නැති බැවින් 'ප්‍රාණ වධ ය හරවා වදළ නියා වේ දැ'යි කී සේක. 'එ සේ ය. ආනන්‍ද යෙනි. උඹ තුමූ ත් උන්ගේ පුත්තු සත් දෙන ත් යේළියෝ සත් දෙන ත් එක් ව පසළොස් දෙන ප්‍රාණ වධ ත් හළහ. ඒ තබා අයිනා දුනු ත් හළහ. පරදර පරිග්‍රහ ය හා පරපුරුෂ සේවා ත් හළවූ ය. බොරු කීමු ත් හළහ. සියලු ම අකුශලයෙන් අපායගාමී බව ත් හළවූ ය යි වදරා සෝවාන් වූ නියාව හැඟ වූ සේක. කුක්කුට මිත්තයන් සෝවාන් වන්ට පෙරාතු දඩ ගිය කල සමහර දවසෙක ලා නො යත ත් බුදුන්ගේ ගමන නො ලා යැමෙක් නැති හෙයින් වධනා යම් ගමනෙක් ම සිස් නො වෙයි බුදුන් වදළ බස් අසා වහන්දෑ 'හැයි 'ස්වාමීනි, කුක්කුටමිත්තයන්ගේ ඇඹේණියෝ ත් ඇත්තෝ වේ ද? උන් නිවන් නුදුටු නියා දැ'යි විචාළ සේක.

'උඹ තුමූ අද නිවන් දක්නට හුන්නෝ නො වෙති. දෙ මවු පියන් ගේ ගෙයි දී බාල අවස්ථාවෙහි ම සෝවාන් වූහ'යි වදළ සේක. ඒ අසා කුක්කුටමිත්තයන්ගේ ඇඹේණියෝ බාල කල ම සෝවාන් ව උන්ගේ ගෙට සරණ ගොසින් පුතුන් සත් දෙණකු ලද. උඹ මෙ තෙක් කල් මුළුල්ලෙහි සමුණන් 'දුන්න ගෙනෙව, හී තල

Non-Commercial Distribution

ගෙනෙව, අඩයටි ගෙනෙව, හුල් ගෙනෙව, මළ ගෙනෙව'යි කී කල ගෙන ගොස් දෙති. උයි ත් උන් දී ලූ දෙය ගෙන ගොස් පණිවා කෙරෙති. කුමක් ද? සෝවාන්නු ත් පණිවා කෙරෙත් දැ'යි කථා ඉපැදවූ සේක.

බුදුහු ඒ අසා 'මහණෙනි, සෝවාන්නු පණිවා තබා පස් පව් ම නො කෙරෙති. එතකු දූ වුව ත් ඒ සිටු දූ තොමෝ 'සමුණන් කියා ලූ දෙය කෙරෙමි'යි සිරිත් විසින් කළා ය. මේ හැර ගෙන ගොසින් මුන් ප්‍රාණ වධ කළ මැනැව'යි යන අදහස් උන්ට නැත. ඉදින් යම් කෙණකුන්ගේ අත වණයෙක් නැත් නම් හැර ගත් වස ය වණ මුඛයෙන් වැද ඇඟ ව්‍යාප්ත වන්ට නැති හෙයින් ඒ අතින් වස ය අනුභව කිරීම් නැත ත් අනික් ප්‍රයෝජනයකට වුව ත් හැර ගන්ට පිළිවන් ද, වණ නැත්තවුන් ඇඟ විෂ ය නො පැතිරෙන හෙයින් ඒ සේ ම පවු අදහස් නැති ව විෂ අනුභව යෙහි අදහස් නැති ව අල්වන විෂයක් මෙන් දුනු ආදි ය දුනැ'යි කී කල සුශික්ෂිත තරම ප්‍රකාශ නො වන හෙයින් ඒ ප්‍රකාශ කරන්ට හෙයින් පවු නැතැ'යි වදළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන සෝවාන් ආදියට පැමිණියහ.

තව ත් කලක දී වහන්දෑ 'කුක්කුටමිත්තයන් හා පුතුන් හා යේළීන් හා සමඟ සෝවාන් වන්ට කාරණ කිම ද? එබඳු පින් ඇති කල වැදි කුලේ ඉපැද සත්ව මාරණ කාරණ ත් කිමි දැ'යි කථාවක් ඉපැද වූ සේක. බුදුහු ඒ අසා 'මහණෙනි, ගිය දවස කසුප් බුදුන් ගේ ධාතු වඩා ද ගැබක් කරණ ගමනේ මිනිස්සු කථා කරන්නෝ 'මේ දගබට මැටියට කුමක් ගනුමෝ ද? නිකම් මැටි හා නිකම් පැන් හැර ගත් කලට අමුත්ත කවරේ ද? මැටි වන් කලට යහ පත ත් කවරේ දැ'යි කියා ලා මැටියට සිරියෙල් හැර ගෙන පැනට බද්ධයකු ත් ඇති ව ජිබෙන හෙයින් තල තෙල් හැර ගෙන සිරි යෙල් සුණුකොට ගෙන තල තෙලින් හනා ගෙන උළු ගසා වියලා ගෙන රන් ගාවා පියා ඇතුළ බදිති. පිටත ඝන රත්රන් උළින් ම බදිති. එකි එකී උළෙක් ම ලක්ෂයක් අග්ගි. තුන්මාලේ පිය වස බැඳ නිමවා පුෂ්කල විධි කරණ තැන් දක්වා බැදි කල්හි 'ධාතු පිහිටුවන කල බොහෝ වස්තු ඇත මැනව. කවුරුන් නායක කරමෝ දැ'යි හැම එක් ව කථා කළහ. ඉක්බිත්තෙන් පිටිසර වසන සිටාණ කෙණෙක් 'මම නායක වෙමි' කියා ලා ධාතු පිහිටු වන තැන මසුරන් කෙළක් ලූ ය. ඒ දැක රට වැස්සෝ 'මේ

Non-Commercial Distribution

නුවර හිඳිනා සිටාණෝ තෘෂ්ණාවට ගැති ව පියා වස්තු රැස් කරණ පමණක් මුත් මෙ බඳු පින් කමෙක නායක විය නො හෙති.

'පිටිසර සිටාණෝ මසුරන් කෙළක් විතර ධාතු නිධානයෙහි ලා එයි ත් අනුගාමික නිධි කොට කරණ පින් කමට නායක වූහ'යි කී ය. නුවර සිටාණෝ සෙව්තව්‍ය මාන යක් හෙයින් මන් වඩා සකෙළක් දුන්හ. පිටිසර සිටාණෝ සත් කෙළක් දුන්හ. නුවර සිටාණෝ ඊට වඩන්ට අට කෙළක් දුන්හ. පිටිසර සිටාණන්ගේ ගෙයි වස්තුව අය මුඛය ත් පිටිසර ව හිඳිනා හෙයින් බොහෝ නො වන්නා නව කෙළකින් වඩා නැත. නුවර සිටාණන්ගේ ගෙයි නිධාන ගහ වස්තු ව සතළිස් කෙළක් ඇත. එහෙයින් පිටිසර සිටාණෝ තමන් පිටිසර වුව ත් නුවණ පිටිසර වැසි නො වන හෙයින් 'ඉදින් මුන්ට වඩන්ට ඇති නව කෙළක් දිනිම් නම් මූ දස කෙළක් දෙති. මා එකොළොස් කෙළක් දී ලන්ට නැති වන්නා පින් කම නිසා ත් මාගේ අධනීකම ත් පෙනෙයි. කවර කල ත් සධනී කම ම හඟවා සිටිනා පින් කම් මාගේ නො දන්මෙන් එ ලෙසක් හඟවන්ට කාරණ කිම් ද? යනා දී නො එක් දැ සිතා 'මම තෙල සිටාණන් ගෙන් දී ලූ තරමට වස්තු දී නො වඩමි. දුන් සත් කෙළක් දුන්නේ යි. එයි ත් දගබ සන්තක ම ය මම ත් අඹුදරුවන් සහිත ව දගබ සන්තක වෙමි' කියා ලා පුතුන් සත් දෙන ත් යෙළින් සත් දෙන ත් ඇඹෑණියනු ත් හැර ගෙන තුමූ ත් එක් ව සොළොස් දෙන චෛත්‍ය සන්තක වූ ය.

රට වැස්සෝ ත් 'වස්තු නම් පිළිවන් දෙයෙක. මේ සිටාණෝ අඹු දරුවන් පිටින් වාල් වූහ'යි උන්ම නායක කළහ. දේවතා බලයෙනු ත් උන් ගේ සභායෙනු ත් බැඳ නිමි කලට සතර ගවුවක් උස රන් දගබ් වහන්සේට අයිති වූ ය. 'බුදුන්ට, අයිති නො වන් නෝ කවුරු ද? මුන්ට අඩුනැතැ'යි උන් ම නායක කළ හ. මෙ සේ ඒ සොළොස් දෙන දගබ සන්තක වූහ. රට වැස්සෝ දගබ් වහන් සේට උන් වටනා මිල දී ගළවා ගෙන නිදහස් කළහ. එ සේ වුවත් ද ගබ ම පිළිදගු ආයු පමණින් රඳා සිට ලා එයින් සැව දෙව් ලොව ඉපැද දහසක් හවුරුද්දෙන් අගලක් වඩනා පොළොව සත් ගවුවක් වඩනා තෙක් දෙව් ලොව රඳා හිඳ මේ අපගේ බුදුන් සමයෙහි ඇඹෑණියෝ දෙව් ලොවින් චුත ව රජ ගහා නුවර සිටාණන් පින් කරණ අවධියේ ත් සිවු දුව දූනු ත් දූ ව උපන්හ. බාල කල සරණ යන්ට පෙරාතු ව සෝවාන් වූහ. පෘථග්ජන ගති ය නම් අනියත හෙයින් දගබට වාල් වීම හැම කලට නියත

නුවූවා සේ ජාති නියමයක් නැති හෙයින් ඒ සිටු දුවණියන් ගේ තුන් වන ජාතියෙහි සවාමියාණෝ ද දෙව් ලොවින් චුත ව වැදි කුලයෙක උපන්හ. එ හෙයින් සිටු දුවණියන්ට ත්—

"පුබ්බෙ ව සන්නිවාසෙන – පච්චුප්පන්න හිතෙන වා
එවං තං ජායතෙ පෙමං – උප්පලං'ව යථොදකෙ"

යනු හෙයින් කුක්කුටමිත්තයන් දැක ම ප්‍රේම ය උපන. උභ තුමූ සිටු කුලයෙහි ඉපැද ත් වාසනා බලයෙන් වැදි කුලයට ම සරණ ගියෝ ය. තුන් වන ජාතියෙහි පුතුන් දෙව් ලොවින් චුත ව අවුත් උන්ට ම පුත් වූහ. යේළියෝ ත් උන්ට ම යේළි වූහ. එක් වූ මොහු හැම ම ද ගබට කළ මනා මෙහෙ කොට ඒ පින් කමින් සෝවාන් වූහ'යි වදාළ සේක. වැදි කුලයෙහි ඉපදීමට කාරණ අටුවායෙන් නො පෙනේ. යම් කිසි අකුසල විපාක යෙකිනැ යි දත යුතු.

එ හෙයින් නුවණැත්තවුන් විසින් කුක්කුටමිත්තයන් බුද්ධා යත්ත ව ත් පින් කමට නායක වූවා සේ ම කවර කෙණකුන් කරණ කවර පින් කමට ත් නායක ව පින් කම් හැසිර එයින් ජනිත කුශලානුභාවයෙන් භව සැප ත් වළඳා කෙළවර නිවන් සම්පත් අත්පත් කටයුතු.

---

## 117. කෝක නම් වැද්දහු ගේ වස්තුව

තව ද යම් කෙණෙක් නිරපරාධයන් කෙරෙහි සාපරාධ වූ නම් ගොන් මැස්සන් දැමූවන් කරා යන්නා සේ ඒ අපරාධ ය අප රාධ කළවුන් කරා ම යන පරිදි දක්වන්නට කෝක නම් වැද්ද හු ගේ වස්තුව කියමු.

කෙසේ ද යත්—

ඒ වැදි තෙම එක් දවසක් පෙරවරු වේලේ දුන්න හැරගෙන තමා තරමට ම බලු මුළක් පස්සෙ ලා ගෙන දඩයමට වල යන්නේ අතුරු මඟ දී සිඟා වඩනා කෙණකුන් වහන්සේ දැක කිපී ගොසින් කාළකණ්ණි කෙණකුන් දැක පීමි. අද මා ලබන කිසිවකු ත් නැතැ යි සිතා නික්මිණ. උන් වහන්සේ ද මහ සිඟා වළඳා පියා විහාර යට නික්මුණු සේක. වැදි ත් වල මුළුල්ලේ ඇවිද ත් කුමකු ත් නො ලදින් පෙර ලා එන්නා ම තෙරුන් වහන්සේ දැක දඩ යන ගමනේ ත් මේ කාළකණ්ණියා දැක ගිය හෙයින් ගෝ වළක් පමණකු ත් නොලද්දෙමි. දැනු ත් ගෙට ගිය කල බතකු ත් නො



Non-Commercial Distribution

ලබන්ට දෝ අවුත් පෙනිණ. බල්ලන් ලවා කවමි' සිතා බල්ලන් උනා හළහ. තෙරුන් වහන්සේ ද 'එ සේ නො කරව, උපාසක-යෙනි'යි පැරැත්ත ගත් සේක. උදෑසන දූක දඩ ගොසින් කුමකු ත් නො ලද්දෙමි. ගෙන් යමක් නො ලබන්ට දෝ දූනු ත් පෙනී ගියව. පැරැත්තයෙක නො නවතිමි, බල්ලන් ලවා කවමි' කියාලා බල්ලන් මෙහෙයාලී ය. තෙරුන් වහන්සේ ද වහ වහා ගසකට නැඟී ලා ජීවිත සංරක්‍ෂණයට ත් වඩා ශික්‍ෂා සංරක්‍ෂණ ය බලවත් හෙයින් බඹයක් පමණින් වඩා නො නැඟී වැඩහුන් සේක.

බල්ලෝ ත් නැඟී ගස වටකොට ගත්හ. බලු වැදි ත් ගසට නැඟ ත් තොපව ගැළවීමෙක් නැතැ'යි බිම හෙළනු පිණිස හී තල ය අගින් යට පත්ලට අනිති. තෙරුන් වහන්සේ ආපද්දමෙහි දී කෙතෙක් උස් වූව ත් ගස් නැඟීමෙ වරද නැත ත් හීතලයෙන් කෙටීම ආපද වත ක් බඹයෙන් වඩා නො නැඟී 'එ සේ නො කරව'යි පෙරැත්ත ම ගත් සේක. බලු වැදි තෙම ඔබ කුමක් කීව ත් ඒ නො අසා තමා කරණ දෙය ම කෙරෙයි. තෙරුන් වහන්සේ ද කොටන පත්ල උඩ ඔසවා ගෙන අනික් පත්ල පාත් කරණ සේක. එයි ත් උන් වහන්සේගේ අකුසල් කැමැති ලෙස ත් ගසා හර නක්හු මෙන් ඔබගේ අකුසල් ගෙවෙන හෙයින් එල්වා ලූ පය කොට යි. ඒ පත්ල කොටන නියා තර කලට උඩ ඔසවා ගෙන අනිත් පය පාත් කරණ සේක. ඒ ත් හී තල අගින් විද්ද වණ මුඛයෙන් ලේ උරා බොන්නා සේ අකුසලු ත් උන් වහන්සේගෙන් ගෙවුණා තමා ඇඟ ලයි. ඔබගේ බස් නො ගිවිස කිසි වරදක් නැති සිල්වතුන් වහන්සේගේ පතුල් දෙක ම තමා විදිනා විතරක් විද්ද. උන් වහන්සේගේ සකල ශරීර ය මුළුල්ල ගිනි ගසා ලූවාක් මෙන් දහ වැද ගත. වේදනා බලවත් ව සිහි එළවා ගත නො හී පොරෝනා සිවුර හෙන නියාව ත් නො දත් සේක.

ඒ සිවුර ද හෙන්නේ 'වැද්ද, තෝ මුන් වහන්සේගේ සීල මහිම ය නො දත් නමු ත් මම ත් නො දනිම් ද? අපරාධ කළවුන්ට අපරාධ නො කරණ බුදුන්ගේ පුත් හෙයින් මුන් වහන්සේ තට කරණ දෙයක් නැත ත් තෝ බල්ලන් ලවා යම් සේ මුන් වහන්සේ කවන්ට උත්සාහ කෙළෙහි නම් එ ම බල්ලන් ලවා තා කවන්ට මට ත් පිළිවනැ'යි බස්නා කලක් පරිද්දෙන් බැස ලා බලු වැද්දහු හිස පටන් වසා ගෙන සිටි සේ ය. බල්ලෝ ද තෙරුන් වහන්සේ වැටී ගිය යි සිතා සිවුරු හස්සට වැද ලා මුදලියා ඇඟ මස් ලියා කන්නාහු මුදලියාගේ ඇඟ මස් තිත්ත රසයක් නැති බැවින්

Non-Commercial Distribution

ඇට සැකිල්ල තබා ලා සතුන් මරා ලූ කල බඩපුරා ලබන දඩ මසක් නැත ත් මුදලියාගේ ඇඟ මස් බඩ පුරා කැවූ ය. කා නිමවා ලා සිවුර හස්සෙන් පිටත් ව ලා සිටියෝ ය. තෙරුන් වහන්සේ ද මළ දණ්ඩක් කඩා ගෙන දමා ලූ සේක.

බල්ලෝ තෙරුන් වහන්සේ දක පදමානවක ජාතකයෙහි නැන්දණියන් දවන්ට සිතා තමන් ම ද ගිය යේළිණියන් මෙන් නිරපරාධ තෙරුන් වහන්සේට අපරාධ කොට මුදලියා ම නට නියාව දන වලට පලා ගියහ. තෙරුන් වහන්සේ ද 'මගේ සිවුර නිසා වැදි නට. මාගේ සීලයට හානි ඇද්දෝ නැද්ද හෝ' යි කුකුස් කොට ගෙන ගසින් බැස පියා බුදුන් ලඟට ගොසින් සියලු පවත ම වදරා ලා 'මාගේ සිවුර නිසා උපාසකයෝ නටවූ ය. මාගේ සීලයට හානි ත් නැද් ද? භික්ෂුභාව ය මට ඇත් දැ'යි විචාළ සේක. බුදුහු ත් ඔබගේ බස් අසා 'මහණ, තාගේ සීලයට වූ හානි ත් නැත මිනිස් වීකා පරිද්දට ත් ආපත්‍යඞ්ග මනුෂ්‍ය ප්‍රාණියකු බව හා ප්‍රාණියෙක යන සංඥ ඇති බව හා වධක චෙතනාව හා තදනුරූප ප්‍රයෝග ය හා ඉන් මිය යෑම ය. ඉන් එකකු ත් සිද්ධ නුවූ ය. කුකුස් නො කළ මනා තැන කුකුස් කිරීමෙන් වන දෙයක් විනා තොපගේ මහණ ධමට හානි නැති. බල එකෙක් නම්—ඒ වැදි තෙමේ තොප නිරපරාධයන්ට අපරාධ කොට විනාශ යට පැමිණියේ ය. හුදක් දුන් මතු විනාශයට පැමිණියේ නො වෙයි. යට ගිය දවස ත් නිරපරාධයන්ට අපරාධ කොට විනාශයට පැමිණියේ ය'යි වදරා ඒ කට යුත්ත විභූත කරණ සේක්—

යට ගිය දවස එක් වෙදෙක් වෙද කම් සොයා ගම්වල ඇවිද වෙද කමක් කරවා ගන්නා කෙණකුන් නො ලදින් සාකුස් ඇත්තේ නික්ම ගම් දෙර කඩෙක බොහෝ කුමාරවරුන් කෙළිනවුන් දක 'මුන් සපියකු ලවා දෂ්ට කරවා පියා විෂ ය බා පියා බතක් ලැබෙමි' සිතා එක් ගස් සිදුරෙක හිස පිටත් කොට ලා හොත් සපියකු දක කුඩා සුහුන්ට ඔහු පෑ ලා 'හෙම්බා කුඩා කොල්ලනි, තෙලේ සැළළිහිණි පැටවෙක. ඌ අල්වා ගනුව'යි කී ය. එක් කුඩා කොල්ලෙක් සපියා සැලිය නො හැකි[1] ලෙසට බොටුව මිරිකා අල්වා මැත් කොට ගෙන ඌ සපියා නියාව දන හය ගෙන හඬමින් ලං ව සිටි වෙද ඇඟට දමී ය. නිරපරාධයන්ට කළ අපරාධයෙක් ඇත් නම් එයි ත් අපරාධ කළවුන් කරා යන්නේ

1. ඩැලිය නො හැකි—ඇතැම.

Non-Commercial Distribution

මෙ ම ලෙස ය'යි හගවන්නාක් මෙන් නයා ගොසින් එ තෙක් දෙනා ගෙන් වෙද දසරුවේ ම හීන. එ සේ හීලා ත් වෙදුගේ කරටිය ම කඩා කා එ තැන ම මරා හෙළා පී ය. එ වක ඒ වෙද මෙ වක මේ වැදි ය. එ වක එ සේ විනාශයට පැමිණ මෙ වක මෙ සේ විනාශයට පැමිණියේ ය.

යම් කෙණෙක් තමන්ට වෙව'යි අනුන්ට වෙව'යි කිසි ත් වරදක් නැත්තවුන්ට එහි ආදීනව සලකා ගත නොහී හෝ සැල-කුණ ත් තිරසළු ව ද්‍රෝහි කෙරෙත් ද, ඒ අපරාධ ය කළවුන් කරා ම එයි. කුමක් මෙන් ද යත්—තමා යට සුළඟ සිට උඩු සුළඟ සිටි කෙණකුන් ඇඟට දමා ලූ සියුම් රජසක් වෙව'යි හළු වෙව'යි උඩු සුළඟ සිටි උන් කරා නො ගොසින් පෙරළා තමන් යට සුළඟ සිටි හෙයින් එන නියා ව දූන දූන ම දැමූ හෙයින් තමන් ඇඟ ම වැද ගන්නා මෙනැ'යි වදළ සේක. දෙශනා කෙළවර ඒ තෙරුන් වහන්සේ වැද්දවුන් ගෙන් ලත් ගහට ලෙසට කෙලෙස් සතුරන් ගෙන් ලබන ගහට නැති ව රහත් වූ සේක. සෙසු ත් බොහෝ දෙනාට මේ දෙශනාව සප්‍රයෝජන වි ය.

එ හෙයින් නුවණැත්තවුන් විසින් නිරපරාධයන්ට තබා සාප-රාධයන්ට ත් අපරාධ කිරීම් තබා සිතීමුත් මහා අපරාධ හෙයින් එයි ත් හැර සෙසු ත් අකුසලින් දුරු ව කුසල් පුරා නිවන් සාධා ගත යුතු.

## 118. මණිකාර කුලූපග තිස්ස තෙරුන් වහන්සේ ගේ වත

තව ද නිරපරාධයන් ම සලකා ගත නො හී කළ අපරාධයෙහි ම ආදීනව දක්වන්ට මණිකාර කුලූපග තිස්ස තෙරුන් වහන්සේ ගේ වත කියමු.

කෙ සේ ද යත්—

ඒ තෙරුන් වහන්සේ එක් මැණික් සැට්ටරකුගේ ගෙයි දී දොළොස් හවුරුද්දක් විවර වැළඳූ සේක. මැණික් සැට්ටර දෙ මාල් ලෝ දෙ මවු පිය තරමේ සිට තෙරුන් වහන්සේට උපස්ථාන කළෝ ය. එක් දවසක් මැණික් සැට්ටරාණෝ තෙරුන් වහන්සේ ලඟ හිඳ දඩ මසක් කපති. ඒ වේලාට කොසොල් රජ්ජුරුවෝ 'තෙලේ ගිනිවර කොට ගා විදලා එවා ලව'යි එක් මැණිකක් යවූ ය. මැණික් සැට්ටරයාණෝ ද ලේ වැකි අතින් ම මැණික හැර ගෙන පෙට්ටියක් පිට තබා ලා අත සෝධන්ට ඇතුළු ගෙට වන්හ. ඒ ගෙයි වඩන කොස්වා ළිහිණියෙක් ඇත. ඒ තෙමේ ලෙයේ

Non-Commercial Distribution

ගදින් මස් කැටියෙකැ යි සිතා තෙරුන් වහන්සේ බල බලා හින් දදී ම මැණික ගිලී ය. මැණික ගලන නියාව ඔබ ත් දුටු සේක. මැණික් සැට්ටරා අවුත් මැණික නො දක 'මැණික ගතු ද'යි අඹු වන් අතිනු ත් දූ දරුවන් අතිනු ත් පිළිවෙළින් ම විචාරා උන් දෙ පක්ෂය ම 'හැර නො ගතුම්''යි කී කල්හි තෙරුන් වහන්සේ හැර ගත් නියා ය යි සිතා ගෙන ඇඹේණියන්ට කිවූ ය. උං ඒ අසා 'එ සේ නො කිව මැනව. දෙළොස් අවුරුද්දෙක් මුළුල් ලෙහි එ බන්දෙක් ඇත් නම් හැඟී නො යෙ ද? ඔබ එ බන්දක් නො කරණ සේකැ'යි ඔබගේ තරම දන ම කිවූ ය.

එ සේ උන් කී වත් මැණික් සැට්ටරා මැණික්වල තරම් දනී. නමුත් ඔබගේ තරම් නො දන 'ස්වාමීනි, මෙ තැන තුබූ මැණික ගත්තේ ඇද්දැ'යි විචාළේ ය. 'උපාසකයෙනි, අපි නො ගතුම්හ'යි වදාළ සේක. 'ස්වාමීනි, මුඹ වහන්සේ විනා අනික් කෙණකු ත් නැත. ගනිත ත් මුඹ වහන්සේ ම ය. 'මැණික වහා දුන මැන වැ'යි කිවු ය. තෙරුන් වහන්සේ හැර නො ගත් ම හෙයින් තර ව සිටිනා ඇඹේණියන්ට තව ත් කියන්නෝ 'සොරා හැර ගත් දෙයක් 'හැර ගතුම්හ' යි කියන්නෝ ඇද්ද, නිකම් නො කියන බැවින් ගහටයක් කොට ත් විචාරමෝ දැ'යි කිවු ය. උපාසිකාවෝ තමන් සැදැහැ ඇති හෙයිනු ත් ඔබගේ එ බඳු තරමක් නැති නිසා ඉඳුරා දන්නා හෙයි නු ත් අප නො නැසුව මැනව. මැණික නිසා අපි ගැති මිඩි වමෝ නමුත් සඳ මඬල ගොම ගානා සේ මුන් වහන්සේට තෙල ලෙස කීම නපුරැ'යි කිවූ ය. 'අපි හැම දෙන ම මිල කළ ත් මැණික නො අගුම්හ'යි කියා ලා ලණුවක් හැර ගෙන තෙරුන් වහන්සේගේ හිස වෙළීමෙන් කම්යා වෙළා ගෙන දණ්ඩ කින් මිරිකා ලී ය. තෙරුන් වහන්සේගේ හිසින් ද කනින් ද නාසයෙන් ද ප්‍රවෘත්ති විපාක වශයෙන් ශෙෂ ව සිටි අකුශල විපාක යන් බාහ්‍ය වන්නා සේ ලේ වැගිරෙන්ට වන. ඇස් දෙක ත් පිටත් වන්නා සේ වි ය. වේදනා බලවත් ව බිම වැටී හුණු සේක

කොස්වා ළිහිණියා ත් ලේ ගඳින් අවුත් ලේ බොයි. මැණික් සැට්ටරා ත් තෙරුන් වහන්සේ කෙරෙහි වූ උරණින් 'තොප කරන්නේ කිම් දැ'යි කියා පයින් ම කොස්වාළිහිණියා ගසා දැමී ය. එ යි ත් එක පහරින් ම තෙරුන් වහන්සේට බිලි වූවා සේ ම මළේ ය. තෙරුන් වහන්සේ ත් පාර කා හුණුවා වූ ළිහිණියා දක 'උපා සකයෙනි. මා හිස වෙළුව ලිහිල් කොට ලා තුලූ මළ නො මළ

නියාව බලව'යි කී සේක. 'ඌ වන්නා මෙ වකට මළෝ ය. උන් තබා මුඹ ත් මැණික නො දී මියන දැ වේ දූ'යි කිවුය. 'උපාසක යෙනි, ලේ වැකි මැණික දූක ගිලූයේ තෙලේ ය.

'මැණික ගලන නියාව මම දිටිමි. තුලු මළ හෙයින් මූත් නො මළ නම් කර්මානුරූප ව මම මියෙම් නමුත් නො කියමි' වදළ සේක. එයි ත් ළිහිණියාගේ බඩ පළා පියා කහළ ගොඩක සඟවා ලූ මැණිකක් මෙන් මැණික දූක තමා කළ අකාරිය බලවත් හෙයින් වෙවුලා තෙරුන් වහන්සේ වැද ගෙන වැද හෙව ස්වාමීනි, නො දූන කළ දෙයට ක්‍ෂමා කළ මැනැවැ'යි කිවු ය. 'උපාසකයෙනි, තොපගේ වරදකු ත් නො වෙයි. මෙ වක මාගේ වරදකුත් නො වෙයි. සසර සිටිනා කල එක් වැරැද්දෙක. අක්‍ෂමාවත් තමා ම නැති හෙයින් ක්‍ෂමා කෙළෙමි' වදළ සේක. 'ස්වාමීනි, ක්‍ෂමා වී නම් ආදි ලෙසින් ම අපගේ ගෙයි දී ම නිරන්තර ව වළඳන්ට වුව මැනැවැ'යි කිවු ය. තෙරුන් වහන්සේ ත්—

''පච්චති මුනිනො භත්තං — ථොක ථොකං කුලෙ කුලෙ.
පිණ්ඩිකාය චරිස්සාමි—අත්ථි ජඞ්ඝාබලං මම''

යනු හෙයින් 'උපාසකයෙනි, මෙ වක් පටන් ගිහි ගෙයක සෙව්නක් ඇතුළතට නො වදිමි. මේ වූයේ ගෙවල හිඳ වැළඳීමෙ දෙෂ ය. පය බල ඇත් නම් සිඟා ගොසින් පත් දෙර සිට ලත් දෙයක් සරුප් තැනක හිඳ වළඳිමි යි කියා ලා තෙරුන් වහන්සේ වූ පීඩාව මුල් ව නො බෝ කලකින් සසර දුක් ගෙවා පිරිනිවි සේක. කොස්වාළිහිණියා ත් මැණික් සැට්ටරුගේ අඹුවන් බඩ පිළිසිඳ ගත. මැණික් සැට්ටරා අරහන්ත ඝාතක කර්ම ය සිද්ධ වූ හෙයින් අවීචියෙහි උපන. මැණික් සැට්ටරාණන්ගේ අඹුවෝ තෙරුන් වහන්සේ කෙරෙහි පහන් සිතින් මිය දෙව් ලොව උපන්හ. එක තැනක රඳා හිඳ ලා ඒ ඒ කට යුත්තේ වෙන වෙන කඩා ගියා සේ ඒ ඒ-තැන උපන මනා ව උපන්හ.

වහන්දෑ ද බුදුන් අතින් උන් හැම උපන් තැන් විචාළ සේක. බුදුහු ''හෙම්බා මහණෙනි, මළ සතර පක්‍ෂයෙන් කොස්වාළිහිණියා මවු කුස උපන. මැණික් සැට්ටරා නරකයේ උපන. ඔහුගේ අඹුවෝ රහත් සඟුන් කෙරෙහි කළා වූ චිත්ත ප්‍රසාදයෙන් හා දෙළොස් හවුරුද්දක් විතර කළ උපස්ථානයෙහි විපාකයෙන් දෙව් ලොව උපන්හ. ජාති කාරණ වූ භව නැසූ හෙයින්

Non-Commercial Distribution

උන් ගෙන් උපස්ථාන ත් විද ගහට ත් වූ[1] රහත් සඟුන් පිරිනිවිය හ යි වදාළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් ගර්භාවක්‍රාන්ති දුඃඛ ය බලවත් දුක් හෙයින් එයි ත් හැර, නරක දුක් නම් පමණ ඇති දුකක් නො වන හෙයින් එයි ත් හැර, දෙව් සැප ත් නම් ප්‍රමාද කාරණ හෙයින් ඊට ත් ආල ය නො කොට, සියල්ලකට ම උතුම් ව සිටිනා නම් අනුපධිශෙෂ නිර්වාණ ධාතුව හෙයින් ඊට ම උත්සාහ කට යුතු.

# 119. තුන්දෙණකුන් වහන්සේ ගේ වස්තුව

තව ද අකුශල කර්ම ය කොතැනක වුව ත් නො නවත්නා නියාව හඟවන්ට තුන් දෙණකුන් වහන්සේ ගේ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්—

බුදුන් දෙවරම් වෙහෙර වසන කල්හි බොහෝ වහන්දෑ බුදුන් දක්නට එන සේක් එක් ගමකට සිඟා වන් සේක. ගම් වැස්සෝ ද පාත්‍ර හැර ගෙන හොජන ශාලාවේ වඩා හිඳුවා ලා කැඳ අවුළු පත් පිළිගන්වා ලා වළඳන වේලා එන තෙක් බණ අස අසා හුන්හ. එ වේලෙහි එක් ගෑනියක බත් පිස තබා ලා මාළු දුමන ගමනේ අක් පතලයෙහි ගිනි ඇවිල ඒ ගින්න නැඟී ගෙයි සෙවිත්තේ වැද ගත. තණ කැරල්ලෙක ඇවිළ ලා අහසට නැංගේ ය. එ වෙලේ එක් කවුඩෙක් අහසින් යන්නේ ඒ ගිනි කැටියේ හිස ගන්වා ගින්නේ ම වෙළී ද ගොසින් ගම් මැද හිණ. වහන්දෑ ඒ දැක 'ඇවැත්නි, බලව අහසින් යන කවුඩාට වූ මුළා ය. මොහු කළ අකුශල කර්ම ය බුදුන් විනා අනික් දක්නෝ කවුරු ද? බුදුන් ම විචාරම්හ. විචාළ කල ඌ ගේ කර්මය ප්‍රකාශ කිරීම් මුඛයෙන් බණ කථාවක් වදාරණ සේක. එයි ත් බොහෝ දෙනාට ප්‍රයොජනවත් වෙ යි' සිතා ගෙන නික්මුණු සේක.

තව ත් වහන්දෑ ගණනක් දෙනා වහන්සේ බුදුන් දක්නට නැව නැඟී එන කලට නැව මුහුද මැද දී නිසල ව සිට පී ය. නැව් නැඟී මිනිස්සු ත් 'කාලකණ්ණි කෙණකුන් මේ නැව ඇති නියා වෙ ද'යි තලියෙක පැන් පුරා තබා ඒ ඒ දෙනාගේ නම් ලියා පත් කඩවල් තලියේ පැන හෙළූ ය. නැවියාණන්ගේ ඇඹෙණියෝ ත් යෞවනයෙහි පිහිටා සිටියහ. ප්‍රසාදවහයෝ ය. උන් නම පත

---

[1] ගහට ත් විදි.

Non-Commercial Distribution

ගිලිණ. අත් වැරැද්දකින් වී දෝ හෝ'යි තුන් විටක් දක්වා ම පත් හෙළා උන් නම පත ම තුන් විට ම ගිලුණු හෙයින් හැම දෙන නැවියාණන් මුණ බැලූ ය. නැවියාණෝ ද ඒ එක් තැනැත්ත වුන් නිසා බොහෝ දෙනා නස්නට පිළිවන් ද? තුලුන් දියට දමා හැම දෙනාට වැඩ කරව'යි කිවු ය. උයි ත් දියට දමන්ට වදිනු දූන හඬා පූ ය.[1]

ඒ අසා නැවියාණෝ 'මුන් හන් පළන් දෙය නැසීමෙන් කම් කිම් ද? ආභරණ ගළවා ගෙන කඩ රෙද්දක් දී ලා දියට දමව. මම වැලි ත් පැන් බී ඉපිලෙන්නවුන් බලා සිටිය නො හෙමි. එ හෙයින් දමා ලූ කල නොයිපිලෙන ලෙස වැලි කළයක් කර බැඳ ලා මුහුදට දමව''යි පුරාකෘත අකුශල කර්‍මයා ගෙන් උගන්වා ලූ සැලැස්මක් මෙන් විධාන කළහ. උයි ත් එ ලෙස ම කළහ. දමා ලන්නා ගිලුණු ගමනේ ම මස් කැස්බෝ අනුභව කළහ. වහන්දෑ ද නැව ම හෙයින් එ පවත දූන 'බුදුන් විනා අනික් කෙණෙක් මුන් කළ අකුශල කර්‍ම ය නො දනිති. බුදුන් විචාරම්හ'යි සිතා ගෙන බට මනා තොටකට බැස පී සේක.

අනිකුත් සත් දෙණකුන් වහන්සේ බුදුන් දක්නට වඩනා සේක් සවස එක් විහාරයකට වැඩ සැතපෙන තැන් විචාළ සේක. එක් ගල් ලෙනක ත් ඇඳ සතෙක් ඇත. ඒ ගල් ලෙන ම සත් දෙනා වහන්සේ සැතපුණු කලට රෑ දවස කුළු ගෙයක් සා ගලෙක් හෙන්නේ ලෙන දොරකඩ වසා ගෙන හින. නේවාසික වහන්දෑත් 'අපි ගල් ලෙන ආගන්තුක වහන්දෑට හැඳ සතක් ඇති හෙයින් පමුණුවා ලුම්හ. මේ ගල ත් ලෙන දොරකඩ වසා හින. ගල ඉවත් කර වුව මනා වේ දෑ'යි අවට ගම්වල මිනිසුන් රැස් කරවා ගල ඉවත් කරවන්ට උත්සාහ කොට ත් තව කර්‍මයාණන් ඉවත් වන්ට නැති හෙයින් ගල ඉවත් නුවූයේ ය, ඇතුළත සම්භ වූ වහන්දෑ ත් පිළිවන් යත්න කළ සේක.

උදවුව ඉවත් වන ලෙසට ආදි කළ දෙයක් නැති වන්නා සේ ඉවත් නො ව සතිය මුළුල්ලේ නිශ්චල ව සිටියේ ය. ඇතුළට හසු වූ වහන්දෑ සතිය මුළුල්ලෙහි බත් නොලදින් දුර්වල වූ සේක. ඒ සතියෙන් අකුශල කර්‍මය ත් දුර්වල වි ය. සත් වන දවස් දුර්වල වූ අකුශලයාණන් රඳවා ලන්ට බල නැති හෙයින් දොර අවුරා හුණු

1 දියට දමන්ට වදිනා හඬා පූ ය. දියට දමන්ට කරණ වග දූන හඬා පූ ය.

Non-Commercial Distribution

ගල කිසි කෙණකුන් ගෙනු ත් ප්‍රයොග නැති ව තෙමේ ම ඉවත් වී ය. වහන්දෑ ත් මැත් ව ගොසින් 'අපගේ මේ පාප ය බුදුන් විනා අනික් දන්නෝ කවුරු ද, බුදුන් විචාරම්හ'යි නික්මුණු සේක.

කවුඩා මළ පවත්, මුහුදට ස්ත්‍රී ය දැමූ පවත් දෙක විචාරන්ට නික් මෙන වහන්දෑ හා අතුරු මග දී එක් තැන් ව බුදුන් කරා ගොසින් වැඳ එකත් පස් ව හිඳ බුදුන් ගෙන් සාද සාමීචි විඳ ගෙන තම තමන් වහන්සේ දුටු කාරණ පිළිවෙළින් ම විචාළ සේක. බුදු හු ත් පිළිවෙළින් ම ප්‍රකාශ කරණ සේක් 'මහණෙනි, ඒ කවුඩා තමා කළ ලෙස ම දැන් ලද යට ගිය දවස බරණැස් නුවර සී සානා එකෙක් තමාගේ ගොන් සාන සේ කෙ සේ උගන්වා ත් උගන්වා ගත නො හින. එ සේ නො හික්මුණු ගොන් සාන්ට යොදා ගන්නා මදක් ගොසින් ලා ම වැතිරෙති. සානා සීයට වඩා වැද හෝනා වැද හෙවී මම බොහෝව. කෙ සේ නමා ත් නමා ගත නොහී උරණ ව ගොන් නො සානා නියාව සැලකූ බව මුත් තමාගේ සසර රුදී ම නො සලකා මෙ වක් පටන් සුවසේ වැද හොවිති. පිදුරු වසා පිදුරු ගොඩක් මෙන් කොට ලා පිදුරු වෙණියෙන් වෙළා ගිනි ගසා පියා කම් ය ඇඟ ලා ගත. ගොන් එ තැන ම ද මළහ.

කවුඩුවා කළ පව තෙලේ ය. ඒ තෙමේ ඊ විපාකයෙන් බොහෝ කලක් නිරා දුක් විඳ ඉතිරි ව සිටි විපාකයෙන් සියක් වරෙක කවුඩු ව ඉපැද මෙ ලෙසින් ම ගෙවල වැදගත් ගින්නෙන් අහස දී ද මළේ ය'යි කවුඩුවාගේ පවත වදරා ලා 'මහණෙනි, ඒ මුදුබත් වූ ස්ත්‍රී තමා කළ ලෙසට ම මඳ වරදකු ත් නැතු ව විපාක ලද, ඔයි ත් ගිය දවස බරණැස් නුවර එක් ගැහැවිය කුගේ අඹුවක් ව පැන් ගෙනීම්, දර ගෙනීම් ආදී සියල්ලක් ම අනික් කරණ කෙණකුන් නැති හෙයින් සියතින් ම කෙරෙයි. ඈ ගෙ ත් එක් බල්ලෙක් ගෙයි සියලු මෙහෙ කරණ නියාව බල බලා ම හිඳී. කුඹුරට-සේනට බත් ගෙන යන කල ත්, දර පලා ආදී ය නිසා වලට යන කල ත් කැටිව ම යෙයි. ඒ දැක වෙළෙඹි යෝ 'හෙම්බා, බලු වැදී දඩ නික්මිණ. අද දඩුමස් හා බත් කම්හ'යි වෙහෙසති. උයි ත් ලජ්ජා ව ගොසින් බල්ලා දඬු පත් බා ලා මරා නෙරති. බලු තෙමේ මඳක් රඳා ලා ත් පසු පස්සේ යේ ම ය.

මැරීම් තැලීම් කා ත් පසු පස්සෙ යන්ට කාරණ කවරේ ද යත්: ඒ බලු තෙමේ උන්ට ඊට තුන් වන අත් බැව සවාමී වී ය. එ හෙයින් එ වක ඇති වූ ස්නෙහ ය සිඳ ගත නො හෙයි. අක්මුල්

නැති සසර ස්ත්‍රී ව උපදිනවුන්ට ස්වාමි නු වූ කෙණකු ත් පුරුෂ ව උපදිනවුන්ට අඹු නු වූ කෙණකු ත් නැත. එ හෙයින් ඔහු උන්ට ස්වාමි වීම විස්ම නො වෙ යි. තුන් වන ජාති ය නම් මීට ආසන්න හෙයින් ප්‍රේම ය සිඳ ලිය නො හැක්ක. එ හෙයින් බලූ ප්‍රේම ය සිඳ ගත නො හෙයි.

උෟ තුමූ ඔහුගේ ස්නේහ ය තරමේ ම ඔහු කෙරේ ක්‍රොධ ය ඇති ව කුඹුරු මෙහෙ කරණ සමුණන්ට උළු කැන් ගෙනයන්නෝ ලණුවක් හිණ තබා ගෙන ගියහ බලූ ත් කැටි ව ම ගියේ ය. උෟ සමුණන් උළු කැන් පොවා ලා උළු කැන් ගෙන ගිය කළ ය හෙයින් සිස් කළ ය හැර ගෙන පැන් වළක් කරා ගොසින් වැලි කළ ය පුරා ලා ලඟ බල බලා සිටි බල්ලාට හඬ ගෑ ලූ ය. බලූ ත් ‘නැතක් දවසින් මිහිරි බසක් අසා පිම්’යි සිතා නො මිහිරි නියාව නො දැන වෙණිය සල සලා ලඟට ගියේ ය. ඒ උපාසිකාවෝ ත් බල්ලා ගේ බොටුව තරයේ අල්වා ගෙන එක් ලණු කෙළවරකින් වැලි කළ ය බැඳ ලා අනික් කෙළවරින් බල්ලාගේ බොටුව බැඳ ලා වැලි කළ ය දියට පෙරළා පූව. බලූ ත් වැලි කළ ය ලා කැටිව ම දිය යට වැද ගොසින් මිය ගියේ ය. ඒ උපාසිකාවෝ ඒ අකුශල කර්ම විපාකයෙන් බොහෝ කලක් නරකයෙහි පැසී පියා තව විපාක ඇති හෙයින් අත් බැව් සියයෙක වැලි කළ බැඳ ලා මෙලෙ සින් ම දමන ලද’යි මුහුදට දමන ලද තැනැත්තන්ගේ කර්ම ය ත් වදරා ලා ගල්ලෙණ දෙර කඩ වහසල්හි සතියක් බත් නො ලදින් දුක් වුන් වහන්දැගේ කර්ම ය ත් වදරණ සේක් ‘මහණෙනි. තෙපි ත් තොප කළ ලෙසට ම ලදුව.

යට ගිය දවස බරණැස් නුවර වසන්නා වූ එඬෙර සුහු සත් දෙනෙක් එක් වලෙක සරක් කවා ඇවිදින්නෝ එක් දිගකට නැමූ කල ඒ දිග සතියක් කවා අනික් දිගකට නැමූ කල ඒ දිග ත් සතියක් කවති. මේ නියායෙන් එක දවසක් ගෙරි සරක් තණ කවා ගෙන එන්නෝ එක් මහ තලගොයකු දැක ලුහු බඳවා ගත්හ. ගොයා ත් පලා ගොසින් තුඹසකට වන. ඒ තුඹසේ ත් සිදුරු සතෙක් ඇත. එඬෙර සුහු ද ‘අපි දැන් අල්වා ගත නො හෙම්හ. සෙට අවුත් අල්වා ගනුම්හ’යි සත් දෙන කොළ කැටි සතක් කඩා ගෙන කුසල් මහ හකුල් හෙළනුවන් මෙන් තුඹස් සිදුරු සතෙහි ම කොළ ගන්වා ලා පලා ගියෝ ය. දෙ වන දවස් ගොසින් සලකුණු නො කොට අනික් අතෙක සතියක් සරක් කවා සත් වන දවස් සරක් නමා ගෙන එන්නෝ ඒ තුඹස දැක සලකුණට ගැන් වූ

කොළ කැටියේ කොළ ත් දැක ගොයි සලකුණු කොට ගොයා කුමක් කොට හුන්නේ දෝ හෝ යි තම තමන් ගැන් වූ කොළ-කැටි හළවු ය. ගොයා ත් ඇට සම් පමණක් ව ගොසින් වෙවුල වෙවුලමින් මැත් වි ය.

ඔහු ද ගොයි දැක කරුණා ඇති ව 'ගොදුරු නැති ව දුර්වල වි ය. මරා ඇට සම් ගන්නා පමණක් මුත්, පව් ලබත් මුත් මස් ලබන්ට නැත. උඃ නො මරම්හ'යි සිතා ගෙන ගොයිගේ පිට ත් අල්වා පියා 'සුව සේ පලා යව'යි කියා හළවු ය. ගොයි මරා නූපු හෙයින් නරකයේ නො පැසුණාවු ය. සත් දවස දියුනා තුදුස්, ජාතියෙක සත් සත් දවස බත් නො ලත්හ. 'හෙම්බා මහණෙනි, එවක එඬේර ව ඉපැද තෙලේ තොප කළ පව්කමැ' යි තුන් පක්‍ෂයෙහි පව් ම ප්‍රකාශ කළ සේක.

එක් කෙණකුන් වහන්සේ 'කුමක් ද ස්වාමීනි, පව් කළවුන් අහසට නැඟී ත් මුහුදට පැමිණ ත් ගල් හස්සට වැද ලා ත් ගැලවීම නැති නියා වේ ද'යි විචාළ සේක. 'එ සේ ය. මහණ, යම් කිසි කෙණෙක් 'මේ උපදෙසින් කළ පවින් මිදෙම්හ'යි අහසට නැඟී ලා ඉඳිත් නමුත්, සුවාසූ දහසක් යොදුන් ගැඹුර ඇති මහ මුහුදට වන්නෝ නමුත්, ගල් හස්සට වැද ලා හිඳිත් නමුත් කළ පවින් මිදීමෙක් නැත. යම් තැනෙක රඳා කළ පවින් මිදෙ-නො ත් එ සේ වූ බිම් පියසෙක් දස දිග ම නැතැ'යි වදාළ සේක දෙශනා කෙළවර කම් ස්වරූප විචාරන්ට ගිය තුන් පක්‍ෂයේ වහන්දෑ ම සෝවාන්ඵලාදියට පැමිණ අකුසලින් දුරු ව ලොවි ලොවුතුරා කුසල්හි පිහිටි සේක.

එ හෙයින් සත් පුරුෂයන් විසින් ගොන් ගිනි ගසා දවා, වැලි කළ බැඳ බල්ලා දියට දමා, බොහෝ කලක් නිරැදුක් ගෙන එක මුරයේ ගින්නේ දවා සියක් වර ගින්නේ දැවුණු නියාව ත්, එක වර වැලි කළ කර බැඳ බල්ලා දියට දමා සියක් වර වැලි කළ කර බැඳ දියට දැමුම ලත් නියාව ත් සිත්හි තබා පණිවායෙන් දුරු ව සෙසු ත් පවින් දුරු ව, ගොයි නො මැරූ පමණින් නරක දුක් නැති වූ නියාව දැන පණිවායෙන් දුරු වීමේ අනුසසු ත් සලකා, තුඹස ඇතුළත් සත් දවසක් නිරාහාර ව හොත්තාට තුදුස් ජාතියෙක නිරාහාර වූ නියාව සලකා ලසු වූ පව ත් නො හැසිර පිළිවෙත් ලෙසින් පිණ ම හැසිර නිවන් පුර අත් පත් කට යුතු.

Non-Commercial Distribution

# 120. සුප්‍රබුද්ධ ශාක්‍ය වස්තුව

තව ද වැද ගත් ගිනි දරු පර්ණාදී ඉන්ධන රහිත වීමෙන් හෝ පටග්ගි දනයෙන් මුත් එක් තරම් දෙයකින් නො නවත්නා සේ කළ පාප කර්ම ක්‍ෂයයෙන් හෝ අනුපධිශෙෂ නිර්වාණ ධාතුවට පැමිණ මුත් කො තැන රඳා ත් නො නවත්නා පරිදි හඟවන්ට සුප්‍රබුද්ධ ශාක්‍ය වස්තුව දක්වම්හ.

කෙ සේ ද යත්-

ඒ ශාක්‍ය රජ්ජුරුවෝ තමන් දූ වූ බිම්බා බිසොවුන් වැන්දඹු කොට මහණ ව බුදුවන්ට ගිය හෙයිනු ත් තමන් ගේ පුත් දෙව්දතුන් මහණ කොට ලා උන්ට වෛරී ව සිටි ය යි යන්නකු ත් අස්ථානයෙහි සිතා ගෙන බුදුන් කෙරෙහි ගල් නියෙන් කනන්නා සේ වෛර කොට ගෙන එක් දවසක් ආරාධනා කළ තැන දන් වළඳා පිය නො දෙම්'යි වඩනා මඟ අහුරා හිඳ රායක් බොති. 'ශාක්‍ය රජදරුවන් පන් සිල් රකිති'කියේ හියොයා වෘත්තීන. බුදුන් ඒ තැනට මහණගණ පිරිවරා වැඩි කලට 'බුදුහු වැඩි සේකැ'යි කිවු ය. ඒ අසා සුප්‍රබුද්ධ ශාක්‍යයෝ වයසින් අපට වැඩි මාලු නො වත් වයසින් වැඩි මාලු වුව ත් නෑ කමින් බාල ව සිටි පසු ඉවත් ව ලා යන්ට කියව. මම ඉව ත් නො වෙමි' කිවු ය. තවත් තවත් ඒ ලෙස ම කියං ලා ඉවත් නො ව ම හිඳිති. අකුශල මාර්ගයෙන් ඉවත් නුවූවා ත් කුශල මාර්ග යෙන් ඉවත් වූ ම ය. බුදුහු මයිල් ශාක්‍ය රජ්ජුරුවන් ගෙන් අවසර නො ලද ත් ඊ රොසයක් නැති බැවින් නැවති සේක. උයිත් 'යව, ගොසින් කියන බණන දෙයක් ඇත් නම් අසා ගෙන එව'යි කියා ලා එකකු යවු ය. බුදුහු සසර ගමනින් නවත්නා දවස සිනා පහළ නො කළ ත් ඒ දවස් සිනා පහළ කළ සේක.

සිනා පහළ කිරීම් නම් දත් දල්වා කල බිදිනා හඬ සේ මහත් කොට සෙන සිනා නො වෙයි. සිනා සෙන්ට සිතා වදල කලට සතර දළදවෙන් සුදු රස් මැත් ව ලා ඉඳුනිල් මිණිමුවා දගබක් වටා රිදී උළින් පවුරක් බඳනා සේ තුන් විටක් පැදකුණු කොට ලා රත් පියුම් ගබකට වදනා සුදු හස් පෙළක් මෙන් ශුභ්‍ර වූ රශ්මි පුඤ්ජය මුඛ ගර්භයට ම දන්ත ශ්‍රෙණි නමැති හංසාඞ්ගනාවන්ගේ වියොග ය ඉවසිය නො හෙන්නාක් මෙන් වැද යෙයි.

අනඳ මහ තෙරුන් වහන්සේ ද 'ස්වාමීනි, සිනා පහළ කිරීමට කරුණු කිම් ද? නො කරුණෙක සිනා පහළ නො කරවු ම ය'යි වදළ සේක. කාරණ වදරණ සේක් 'ආනන්දයෙනි, සුප්‍රබුද්ධ ශාක්‍ය

Non-Commercial Distribution

යන් දුටුද්’යි විචාරා ‘එ සේ ය’ සවාමීනි, දුටුම්හ’යි කී කල්හි ‘උන් කළ දෑ නපුර. මා වැනි බුදු කෙණකුන් සිහා යන්ට අවසර නො හැර නිවන් පුර වදනා කුසල් මඟ අකුසල් හෙළා ගත්හ. මෙයට සත් වන දවස් ඒ කළ අකුශලයෙන් දෙව් ලොවට යනා මඟු ත් ඇස් සුණු හෙයින් තමන්ගේ මාළිගාවේ යට මාලේ හිණි පා මුල දී නිරමඟ අගුල් අළ හෙයින් පොළොවට වදිති’ වදාළ සේක. කියන බණනා බස් අසන්ට ගිය තැනැත්තෝ ඒ කථාව අසා ‘අපගේ බෑනණුවන් යන ගමනේ කීයේ කිමද්’යි විචාළ කල්හි බුදුන් වදාළ ලෙස අවික්ෂිප්ත ව ත් අසා ගත් හෙයින් එ ලෙස ම කියා ලී ය.

උයි ත් ඔහුගේ බස් අසා ‘අප ගේ බෑනණුවන්ගේ කථා වෙන් වරදනා දෙයෙක් නැත. යමක් උෟ කිවූ නම් වන්නේ එ ම. එ සේ වුව ත් බොරුවකින් හසු කෙරෙමි. මූ තුමූ සත්වන දවස් පොළොවට වදනා නියාව කියන තැනැත්තෝ සාමාන්‍යයෙන් නො කියා යට මාලේ හිණි මුල දී පොළොව වදිති’යි බිම් නියමය ත් කියා ලූ ය. සත් වැනි දවස ය යි දවස් නියමය ත් කියා ලූ ය. මෙ වක් පටන් සත් වන දවස ඉක්මෙන තෙක් යට මාලේට නො බසිමි. යටමාලයට නො බව කලට හිණි පා මුලත් නැත. මේ අතුරු සිතා ගත හෙන නියාව නො දත් වන. උඩු මාල්වලට පෝරු වීනා පොළෝ ත් නැති බැවින් භූමි නියම ය වැරදීමෙන් ම කාල නියමය ත් වැරද ගිය කලට උන්ගේ බස බොරු ය.

එ කල බොරුවෙන් හසු කෙරෙමි’යි සිතා තමන්ට අනුභවයට නිසි සියල්ලක් ම සත් මාල් මාළිගාවේ උඩු මාලට නංවා ගෙන හිණි ත් උගුලුවා හරවා පියා මාලින් මාලේ ම දෙරවලු ත් අගුළු ලවා ගෙන එකි එකී දෙරකඩක් පාසා මල්ලවයන් දෙදෙණකු රඳවා ලා ‘ඉදින් සිහි නැති ව යට මාලේට බසිම් නම් අල්වා රඳවව’යි මල්ලවයන්ට තර ව සම්මත කොට ලා සත් වන මාලේ ශ්‍රී යහන් ගබඩාවේ හුන්නේ ය.

බුදුහු එ පව ත් අසා ‘මහණෙනි, මාළිගාවේ මතු මාලේ තබා සුප්‍රබුද්ධයෝ ආකසට නැඟී ලා ආකස හිඳිත්ව’ පඩව් නැඟී ලා මුහුදට යෙත්ව යි ජීවත් වනු නිසා ගල් හස්සට වදිත්ව යි බුදුවරුන් විවරණ ලත් තැන් පටන් අජ්ඣ හඤ්ජක බොරුවක් නො කියන හෙයින් බුදු වූ අවසථාවෙහි දෙ බස් ම නැත. මා කියා ලූ තැනින් ම පොළොවට වද්දී. පව් කළවුන් ආස හුන්න ත් මූදට පැමිණිය ත් ගල් හස්සක රඳා ත් කළ පවින් ගැළවීමෙක් නැත. යම් තැනක සිටි කල මරණ නවතා පියා නම් එ සේ වූ බිම් පියසෙක් දස දිග ම නැත. නිවණට

Non-Commercial Distribution

පැමිණියෝ නම් ඒ නිවණ මරණ නැති හෙයින් නිවන් කරා පැමිණ ක්‍රමයෙන් මරණ නවත්ති' වදාළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙනා සෝවාන් ඵලාදියට පැමිණීමෙන් කළ පවින් මිදෙන තැන් ලත්හ.

සත් වන දවස් බුදුන් සිඟා වැඩ ලා විහාරයට වැඩ පී කල වහන්දැගේ ත් සිඟා ගමන් නිමි කලට සුප්‍රබුද්ධයන්ගේ මහලසා යට මාලේ සිටියේ මත් ව ගොසින් ඒ ඒ හිත්ති පහරණේ ය. උඩු මාලේ හුන් සුප්‍රබුද්ධයෝ ඒ අරගල අසා කුමක් දූ යි විචාළෝ ය. මඟුලසු මත් වූ නියාව කිවු ය. ඒ අසා ද වැළි ත් සුප්‍රබුද්ධයන් දක ම සන්හිඳෙ යි. ඔහු සන් හිඳුවනු නිසා හුන් තැනන් නැගිට දෙරකඩවල් කරා ගියහ.

දෙර ත් බෑනණුවන් වහන්සේ මහභිනික්මන් නික්මෙන දවස් ඔබගේ කුශලානුභාවයෙන් වාසල් දෙර ඇරුණා සේ ම මුන්ගේ අකුශලානුභාවයෙන් තෙමේ ම හැරිණ. ඉවත් කරවා පී හිණ ත් යථා ස්ථානයෙහි ම සැලසී සිටි ය. දෙර කඩවල රකවල සිටි මල්ලවයෝ උඩට යන කෙණකුන් නවත්නා සේ සුප්‍රබුද්ධයන් බොටුව අල්වා ගෙන පාත් බලා දමා පූ ය. ඉක්බිත්තෙන් යට මාලේ හිණි පා මුල කරා පැමිණි කලට ලා දූ නකතක වේලා නුගුළු වන්නාසේ මහ පොළොව නව ලක්‍ෂ සැට දහසක් පමණ ගවු බොල ඇත ත් අකුශල කර්‍ම නමැති සෙණ පහරින් පැළිණ. සුප්‍රබුද්ධයෝ ත් ඒ සිදුරෙන් ගොසින් අවීචියෙහි උපන්හ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් සුප්‍රබුද්ධයන් මරණ දුකින් වැළැහන්ට සත්මාල් මාළිගාවේ උඩු මාලට නැඟී ත් ඉන් නො මි දුණු නියාව සලකා නව ලොවුතුරා දහම් නමැති නව මාලේ පායෙන් නව වැනි වූ උඩ නිවන් මාල් තිබිය දී ම අට වැනි වූ අර්හත් ඵල සමාපත්ති මාලට නැඟෙන්නා ම, ක්‍ෂණික මරණ විනා සෙසු මරණ නැති නියාව ත් යට මාලේ වූ ශ්‍රොත ආපත්ති මාර්ගයේ පටන් මරණ තුනී වන නියාව ත් දැන මාළිගා ලබතො ත් වන මාල් වූ ලොවුතුරා මාළිගාව ම ලබන්ට උත්සාහ කට යුතු.

---

## 121. සවග වහන්දෑගේ වස්තු දෙක

තව ද අනුන්ට හිංසා පීඩා කිරීමෙහි නපුර දක්වන්ට සවග වහන්දෑ ගේ වස්තු දෙක දක්වමු.

Non-Commercial Distribution

කෙ ළෙස් ද යත්—

එක් සමයෙක සතළොස්, වග වහන්දෑ සැතපෙන තැන් ඉදි කොට ගත් කලට, සවග වහන්දෑ 'අප වැඩි මහලු වහන්දෑ සිටිය දී තොපට ත් සෙනසුන් ඇති නියා දැ'යි විනය ප්‍රතිපත්ති-සූත්‍ර ප්‍රතිපත්ති දෙක්හි ම ගෞරව නැති හෙයිනු දු දූහහ පමණකුත් නොබලා 'තෙල සෙනසුන් අපට පැමිණෙ'යි කියා ලා 'අප ඉදි කොට ගත් තැන් අපි නො දෙම්හ'යි කී කල්හි සවග වහන්දෑ උරණ ව ලා සතළොස් වග වහන්දෑ මැරූ දෑ ය. සතළොස් වග වහන්දෑ ගෙඩි කා ලා ඒ විනා අනික් කට හැකි දෙයක් නැති බැවින් හැඩූ දෑ ය. බුදුහු හඬන හඬ අසා වදරා ඒ නියාව දැන 'මහණෙනි, ආදී නො දැන කළ ත් මෙ වක් පටන් තෙල ලෙස කට නො හැක්ක. මා මෙ ලෙස කියවා ලා යමෙක් එ ලෙස කොළෙ ා් නම් උන්ට විනය විරොධ ඇතැ'යි වදළ සේක.

නැවත එක් දවසක් ඒ සවග වහන්දෑ දෙ වරු භිඳ සතළොස් වග වහන්දෑ සැතපෙන තැන් ඉදි කළ කලට 'අප වැඩි මහලු තැන් භින්ද දී තොපට ත් සැතපෙන තැන් ඇති නියා දැ'යි කියා ලා ඒ වහන්දෑ නො දෙන හෙයින් සික පදයේ පැකිළ ආදි ලෙසින් මැරිය නො හී භය ගන්වා නෙරන ලෙසට අත් එසවූ දෑ ය. සත ළොස් වග වහන්දෑ එසවීම ත් මැරුවා කොට ම සිතා ගෙන හැඬූ දෑ ය. බුදුහු එ දවසු ත් හඬන අඬ අසා මුන් හඬන්නේ හැයිදැ'යි විචාරා 'සවග වහන්දෑගේ ගහටයෙනැ'යි කී කල්හි 'මහ ණෙනි, මෙ වක් පටන් භය ගන්වා අත් සැත් ආදිය ත් එසවිය නො හැක්ක. යම් කෙණෙක් එ ලෙස කොළෙ ා් නම් උන්ට විනය විරොධ වෙයි. සෙනාසන ලොලුප්ප ය නිසා ධුතඞ්ග භෙදය ත් වෙයි. ධුතඞ්ග භෙදයෙන් සූත්‍ර විරොධය ත් වෙයි' වදරා බණ වදරණ බුදුහු 'ආජානීය අශ්වයන් හා ආජානීය හස්තීන් හා වෘෂභරාජයන් හා රහතන් හැර. යම් සේ රජ දරුවන්ගෙන් හැම දෙන රැස් වන්ට විධාන ය කළ කල රාජාමාත්‍යයන් හැර සෙස්සෝ රැස් වෙත් ද, එ මෙන් සෙසු සියල්ලෝ මැරීම තැළීම ආදි වූ හිංසා පීඩා ලබති.

එ කී සතර පක්‍ෂ ය හැර සෙස්සෝ මරණට බිති. මුන් සතර පක්ෂයෙන් රහතන් හැර අනික් තුන් පක්‍ෂ ය ඇතුළු වූ හැම දෙනාට ජීවිතය ත් ප්‍රිය ය. ආජානීය අශ්වාදී වූ සතර පක්ෂයෙන් රහතන්ට සත්ව සංඥාව ම ප්‍රහීණ හෙයින් මියන සත්ව කෙණෙක් ම නො දන්නා හිංසා පීඩාවෙක්, මරණෙක්, භයෙක් නැත. අනික් තුන් පක්‍ෂයට සත්කාය දෘෂ්ටි ය බලවත් හෙයින් තමන්ට ප්‍රතිපක්‍ෂ

Non-Commercial Distribution

සත්‍ව කෙණකුන් ම දක්නට නැති හෙයින් නො බති. තම තමා හිංසා බතො ත් පීඩා බතො ත් මරණ බතො ත් මරණ බන නො බන ජීවිතයෙහි ඇලුම් ඇති නැති සියල්ලවුන් ම තම තමා ලෙසට සිතා ගෙන මැරීම් තැළීම් ආදි ය කට යුතු නො වෙයි' වදාළ සේක. මේ දෙශනා කෙළවර ත් බොහෝ දෙන සෝවාන් ඵලාදියට පැමිණියහ.

එ හෙයින් සත්පුරුෂයන් විසින් හිංසා පීඩාදිය ත් නුවූව මනා වී නම් මරණෙහි ත් භය ඇත් නම් ජාති ජරා රහිත නිවන් ම සාධා ගන්නා ඉන් වන භය නැති බැවින් නිවණට ම උත්සාහ කට යුතු.

## 122. බොහෝ කුමාරවරුන් ගේ වස්තුව

තව ද හිංසා පීඩා කළවුන්ට පර ලොව සැප නැති නියාව ත් ඒ නො කළවුන්ට පර ලෙව්හි සැප ඇති නියාව ත් හඟවන්ට බොහෝ කුමාරවරුන් ගේ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්—

එක් දවසක් බුදුහු සැවත් නුවරව සිඟා වඩනා සේක් අතුරු මඟ දී බොහෝ කුඩා සුහුන් එක් කළු නයකු දඬු හැර ගෙන මරන්නවුන් දැක 'කුඩා කොල්ලනි, කුමක් කරවු දැ'යි විචාරා සර්පයකු මරම්හ'යි කී කල්හි 'කුමක් නිසා මරවු දැ'යි විචාරා 'ඩැපියති යි සිතා ය'යි කී කල්හි 'තෙපි තොපට සැප කරම්හ'යි සිතා මූ මරා උපනුපන් තැන මූ දූන් සැප නො ලද්ද සේ ම සැපයක් නො ලබව. තමහට සැපයක් පතතො ත් අනුන්ට සැපයක් කොට මුත් අනුන්ට දුක් කොට වැල්ලෙන් තෙල් ලද නො හැක්කා සේ ලද නො හැක්කැ'යි වදරා ලා බණ වදරන සේක් 'යම් කෙණෙක් තමන්ට සැප සිතා සැපයක් ම කැමැති වත් මුත් දුක් නො කැමැති සතුන්ට හිංසා පීඩා කෙරෙද්ද, අනුන්ට කළ පීඩාව නිසා පරලොව දී ත් පීඩාවක් ලබතො ත් මුත් හමු වපුළවුන් විකක් නො ලබන්නා සේ සැපයක් නො ලබති.

'යම් කෙණෙක් තමන්ට සැප සිතා අනුන්ට පීඩා නො කෙරෙද්ද, දුක් නො කෙරෙද්ද දුක් නො කැමැති ව සැප කැමැත්ත වුන්ට සැප කළා වූ ඒ සත්‍වයෝ වී වපුට වී ම ලබන්නා සේ, පරලොව බොහෝ සැප ලැබෙති' යි වදාළ සේක. දෙශනා කෙළවර සර්පයා තළ තළා සිටි කුඩා සුහු ඒ තැළීම හැර ලා සත්කාය දෘෂ්ට්‍යාදිවූ දෙෂයන් තළා මරා නිමවා සෝවාන් වූහ.

Non-Commercial Distribution

එ හෙයින් සත් පුරුෂයන් විසින් කරණ හිංසා පීඩාවක් කෙලෙසුන්ට ම කොට යම් සේ කිරි බොන දරු කෙණෙක් තමන් බොන කිරි මුත් මවුනට ඇති පීඩා නො සලකත් ද, එ මෙන් කෙතෙක් පීඩා වුව ත් පින් කිරීමෙහි ඇලුම් ඇති ව, තව ද යම් සේ මහ රුකෙක් පුෂ්ප ඵල පල්ලවයෙන් සමන්විත ද, එ මෙන් සීල සමාධ්‍යාදී ගුණයෙන් යුක්ත ව – තව ද යම් සේ රුකෙක් තමා කරා එළඹියවුන්ට සීල් සෙවණ ව සිටී ද–එ පරිද්දෙන් තමා කරා එළඹියවුන්ට ආමිෂ සංග්‍රහ දෙකින් සංග්‍රහ සීලී ව – තව ද යම් සේ මහ රුක පැමිණියවුන් ගෙන් උත්තමයන්ට එක් ලෙසක් හා මධ්‍යමයන්ට එක් ලෙසක් හා අධමයන්ට එක් ලෙසකැ යි වෙනසක් නැත්තේ ද, එ මෙන් සතුරු මිතුරු ආදීන් කෙරෙහි හිත අදහසින් වෙනසක් නැති ව දවස් යවා ලොවී ලොවුතුරා සැපත් සිද්ධ කටයුතු.

———

# 123. කුණ්ඩධාන තෙරුන් වහන්සේ ගේ වස්තුව

තව ද අකුසලින් දුරු වන්නවුන් විසින් එහි ආදීනව දතමනා හෙයින් ඒ දක්වන්ට කුණ්ඩධාන තෙරුන් වහන්සේ ගේ වස්තුව කියමු.

කෙසේ ද යත්—

එ තෙරුන් වහන්සේ මහණ වූ දවස් පටන් එක් ගෑනු රුවෙක් තෙරුන් වහන්සේ හා කැටි ව ම ඇවිද්දි. තෙරුන් වහන්සේ උන් නො දක්නා සේක. ඔබ හැර සෙසු හැම දෙනා ම දකිති. ඈතුළු ගමට සිඟා වැඩි කල ත් මිනිස්සු ඔබට බත් සැන්දක් පිළිගන්වා ලා ‘තෙලේ අපගේ යේළිණියන්ට ය’යි කියා ලා අනික් බත් සැන් දකු ත් පිළිගන්වති.

මෙ ලෙස වන්ට කාරණ කවරේ ද යත්; කසුප් බුදුන් සමයෙහි යාළු මිත්‍ර දෙ නමක් එක මැණියන් දරුවන් මෙන් ඉතා සමගි සේක. බොහෝ ආයු ඇති බුදුන් වහන්සේ ලා සමයෙහි හවුරුද්-දෙන් හවුරුද්දේ හෝ ස මසින් ස මස හෝ පොහොයට රැස් වන සේක. එ හෙයින් ඒ දෙ නම ත් ‘පොහොයට යම්හ’යි වසන තැනින් නික්මුණු සේක. තවුතිසා වැසි දෙවතාවාණ කෙණෙක් ඒ දෙ දෙනා වහන්සේ දැක ‘මේ දෙ නම ඉතා සමගි සේක. ඒ වහන්දෑ බිඳුවා පියන්ට පිළිවන්දෝ හෝ’යි සිතා කළ පින් ඇති ව දෙව්ලොව ඉපැද දිව සැප ත් ලත් පමණක් මුත් නුවණක් ලද නුහුනු හෙයින් සිතා පූ සිතිවිලි පමණකින් හැර නො පියා දෙ නමින් එක් කෙණකුන් වහන්සේ ‘ඇවැත්නි, මඳක් සිටිය මැනව.

'ශරීර කෘත්‍ය ය කරණට යමහ'යි වදළ කල්හි ඒ දේවතාණෝ ගැනු වෙසක් මවා ගෙන ශරීර කෘත්‍යයට වැඩි තෙරුන් වහන්සේ වලට වැඩ ලා වලින් මැත් වන වේලාට එක් අතකින් හිසකේ ගවස ගවසා එක් අතකින් හිණ කඩ හැඳ හැඳ වලින් මැත් වන තැනැත්තන් වහන්සේ පසු පස්සෙහි මැත් වූ ය. පසු පස්සේ මැත් වූව ත් ඔබ උන් නුදුටු සේක. රැක සිටි තෙරුන් වහන්සේ දේව-තාවාණන් ගැනු වෙසක් මවා ගෙන අර ලෙසින් එන්නවුන් දුටු සේක. ඒ දේවතාවා ද උන් වහන්සේ තමා දක සැක කළ නියා ව දන ලා සැක උපදවා ලීමට එ විතරක් ම සෑහෙන හෙයින් අතුරුධන් වී ය.

රැක සිටි තෙරුන් වහන්සේ ශරීර කෘත්‍යයට ගිය තෙරුන් වහන්සේ තමන් වහන්සේ ළඟට ආ කලට 'ඇවැත්නි, දුටු ලෙස නපුර. විපන්න වූ දැ'යි විචාළ සේක. 'ඇවැත්නි, එ බන්දෙක් මට නැතැ'යි තමන් වහන්සේ අර ගැනු රූව ත් නුදුටු හෙයින් උන් වහන්සේට සංශ ය නැඟි නියාව නො දන යුහු ව ම වදළ සේක. ඒ අසා අනික් තැනැත්තන් වහන්සේ "කුමක් කියන නියා ද? දන් මම මෙ තැන රඳා සිටි ගමනේ තමන් වලින් මැ ත් වන්නා ම තමන් පසු පස්සෙහි එක් අතකින් හිස කේ ගවස ගවසා ලිල් ව ගිය පිළි ත් හැඳ හැඳ සග ගැනියක එන නියාව දිටිමි. තුමූ 'එ බන්දක් නො කෙළෙමි' කියති. මා දුටු ලෙසට තෙල ලෙස කී ව යි මා හදහා ගන්නේ කෙ සේ දැ"යි කී සේක.

සිරුරු කිස සපයා ආ තෙරුන් වහන්සේ ද අර මුන් වහන්සේ කියා ලූ බස හිස හුණු සෙණක් සේ සිතා ගෙන එ බන්දක් සිනෙනු ත් වූව යි නියම නැති හෙයින් 'ඇවැත්නි, කළ දෙයක් කියා මුත් මා නො නසව'යි කී සේක. අනික් තැනැත්තන් වහන්-සේ 'අනික් කෙණකුන්ගේ කීමෙකින් මා කරණ සැකයෙක් නො වෙයි. ව්‍යභිචාරයේ හැසිර එන ලෙස මාගම සිය ඇස පුරා මම ම දිටිමි. තමන් කුමක් කියත ත් මා හදහා ගන්නේ කෙ සේදැ'යි කියා ලා අර මුන් වහන්සේ ගැනු රූවක් නුදුටු හෙයින් එ බන්දක් නැති නියාවට තර ව සිටිනා සේ ම අර මුන් වහන්සේ ත් එ ලෙසින් එන නියාව දුටු හෙයින් දිවස් ඇත්තෝ ත් දිවසින් දක සැක හරු ත් මුත් සෙසු ලෙසින් සැක ය හැර ගත නො හැකි හෙයින් නො හදහන සේක. එ සේ කියා ලා දර දණ්ඩක් බිඳී ගියා මෙන් බිඳී ගොසින් නැතක් කල් පැවති මිත්‍රකම හැර පියා නැඟී ගිය සේක.

Non-Commercial Distribution

'පොහෝ කරණ තැන දී ත් මම මුන් හා එක් ව පොහෝ නො කෙරෙමී' කියා ලා පොහෝ කරන්ට ත් මැළි වූ සේක. අනික් තෙරුන් වහන්සේ ත් 'මාගේ සීලයට හානි නැතැ'යි වහන්දෑට කී සේක. අනික් තෙරුන් වහන්සේ ද 'වරදක් කළ කෙණෙක් විචාරයෙන් එවා ගනු ත් මුත් තුමූ ම කියා ලන්නෝ ඇද්ද? තමන් කුමක් කියත ත් තමන් පසු පස්සෙහි මාගම එක් අතකින් හිසකේ ගවස ගවසා, එක් අතකින් හිත කඩ හැද හැද එන නියාව මම දිටිමී' දුටු ම හෙයින් තර සේක. උන් වහන්සේ එ ලෙසින් තර හෙයිනු ත් අරුන් වහන්සේගේ නො ගිවිස්ම නිසා ත් දෙ තැනට ම පරලොවින් හානි නැත.

දේවතාවා ත් එක් ව පොහෝ කරන්ට මැළි නියාව දූන 'මා කළ දෑ නපුරැ'යි සිතා ලා 'ස්වාමීනි, උන් වහන්සේ ගේ සීලයට හානි නැත. මුඹ වහන්සේගේ මිත්‍ර කමෙහි තරම බලන්ට මෙ ලෙ සක් කෙළෙම් මම ය. පොහෝ කළ මැනැවැ'යි කිවු ය. දේවතා වාණන් අහස සිට කියා ලූ හෙයින් හදහා ගෙන පොහෝ කළ සේක. පොහෝ කළ පමණක් මුත් දූක පූ ලෙස සිත වැද ගත් හෙයින් මෙත් සිත් ආදි ලෙසට ඇති නො වීම ය. දේවතා කළ පව මෙ විතරෙක.

සිත එකඟ කිරීම බැරි ව ගොසින් තෙල දෙනම ම මොක්ෂ-යට පැමිණ ගත නො හී ස්වර්ගයට පැමිණි සේක. දේවතාවා අවීචියෙහි ඉපැද එක් බුදු අතුරක් එහි පැසී මෙ අපගේ බුදුන් සමයෙහි සැවැත් නුවර ඉපැද මහණ වන වයස මහණ ව මාලු පැවිදි වන වයස මාලු පැවිදි වූ සේක. උන් වහන්සේ මහණ වූ තැන් පටන් ගැනු රුවක් පූරාකෘත අකුශලයෙහි වුන් අනිෂ්ට විපාක ය කර්ම සාදෘශ්‍ය විපාක වශයෙන් එ ලෙස පෙනෙයි. ආදි නම කවරේ වුව ත් කුණ්ඩධාන නම ත් තබා ගත්හ.

මේ දූක වහන්දෑ අනේපිඬු සිටාණන්ට 'සිටාණෙනි, තෙල දුශ්ශීලයාණන් තොපගේ විහාරයෙන් නෙරව. තුලුන් නිසා සාමාන්‍ය කොට සිතීමෙන් වහන්දෑට ත් අයස ඇතැ'යි කී සේක. වහන්දෑගේ දූන්ම කරමට ම තමන්ගේ දූන්ම වැඩී සිටි හෙයින් 'බුදු සස්නට ත් මාගේ විධාන ද? බුදුහු වෙහෙර නැද්දැ'යි කිව ය. 'බුදුහු වෙහෙර ය'යි කී කල්හි 'එ සේ වී නම් ඔබ දන්වන බව ය'යි කිවූ ය. වහන්දෑ ද තමන් වහන්සේගේ නො දූන්ම අනේ පිඩු මහ සිටාණන් දන්නා මදින් විසාඛාවන්ට ත් ගොසින් කී සේක. විශාඛාවෝ ත් සිටාණන් කී ලෙස ම දූන්ම එක තරම හෙයින්

Non-Commercial Distribution

කිවූ ය. වහන්දෑ ත් තව ම බුදුන්ට දන්වන්ට නො ගොසින් කොසොල් රජ්ජුරුවන් කරා ගොසින් රජ්ජුරුවන්ට 'මහ රජ' කුණ්ඩධානයෝ එක් ගැහැනියක හැර ගෙන ඇවිද වහන්දෑට අයස උපදවති. තොපගේ විධාන පවත්නා තැනින් නෙරුව'යි උන් වහන්සේගේ ම අකුශලයට සහාය වන්නා සේ කී සේක.

රජ්ජුරුවෝ බුදුන්ට ම භාර නො කොට 'උන් වහන්සේ කොයි දෑ'යි විචාරා 'වෙහෙර ය'යි කී කල්හි 'වැඩ හිඳිනා ගෙය කවරේ දෑ'යි විචාළෝ ය. වෙහෙර අසවල් ගේ ය යි කී කල්හි 'එ සේ වී නම් ඔබ හැම වඩනා බවය. මම නිස්ස දනිමි' කියා ලා සවස වෙහෙරට ගොසින් උන් වහන්සේ සැතපෙන ගෙය වට කොට රකවල් ලවා ලා තෙරුන් වහන්සේ වැඩහුන් තැනට රජ්ජුරුවෝ ගියෝ ය. තෙරුන් වහන්සේත් අරගල අසා උඩු මාලෙන් පාත බැස ලා පෙර මාලේ සිටි සේක. ඒ ගෑනු රුව ත් තෙරුන් වහන්සේ පිටි පස්සේ සිටියවුන් රජ්ජුරුවෝ දුටුවූ ය. තෙරුන් වහන්සේ රජ්ජුරුවන් ආ නියාව දැන උඩුමාලයට නැඟිලා වැඩ හුන් සේක. රජ්ජුරුවෝ තෙරුන් වහන්සේ නො වැන්දෝ ය. පසු ව බලා ගෑනු රුව ත් නුදුටුවූ ය. නො දැක උන් ගිය තැන් අඩු කරන්ට දෙර බා මුල්ල ත් යට ත් බලවා නො දැක 'ස්වාමීනි, එන ගමනේ මුඹ වහන්සේ පිටි පස්සේ ගෑනියක් සිටියා බල බලා ආමි. දැක වැද නො ගත්තේ ඉන. දැන් උඟ කොයි දෑ'යි විචාළෝ ය. 'මහ රජ නුදුටුම්හ'යි වදාළ සේක. 'මුඹ වහන්සේ පිටි පස්සේ සිටි නියාව බල බලා ආමි' රජ්ජුරුවන් කීව ත් කර්ම භවයෙහි දී ත් නො පැනීම කර්ම ය කළ හෙයින් නො දැක ම 'නුදුටුම්හ'යි කී සේක.

රජ්ජුරුවෝ ත් කර්ම ස්වරූප ය නො දන්නා හෙයින් මේ කිම දෑ යි සිතා ලා 'ස්වාමීනි, පෙර මාලේ සිටිනා බව ය'යි සැක ම හරනා නිසා කිවූ ය. ඔබ ත් ගොසින් පෙර මාලේ සිටි කලට ඒ ගෑනු රුව පිටි පස්සේ පෙනෙයි. රජ්ජුරුවෝ දැක ලා තෙරුන් වහන්සේ උඩු මාලට වඩින්ට කියා ලා උඩු මාල වට කොට ගෙන හසු කරන්ට තුමූ තෙරුන් වහන්සේලා කැටි ව ම උඩු මාලට නැංගාහ. තෙරුන් වහන්සේ ත් වැඩ හුන් සේක. රජ්ජුරුවෝ ලඟට අවුත් ගෑනු රුව නො දැක හැම තැන ම බලවා ත් නො පෙනෙන හෙයින් 'ස්වාමීනි, මෙ තැන සිටි ගෑනි කොයි දෑ'යි විචාළෝ ය. එ විට ත් 'නුදුටුයෙමි'යි වදාළ සේක. 'ස්වාමීනි, කුමක් කියන නියා ද? මුඹ වහන්සේ පිටි පස්සේ සිටි නියාව මා දුට, පාන් කන්ද මුල අඳුර

නො හැරෙන්නා සේ මුඹ වහන්සේ ම නො දකින්ට කාරණ කිම ද'යි කී කල්හි 'එ සේ ය, මහරජ, බොහෝ දෙන ත් මා හා කැටි ව ගැනියක් ඇවිදිති කියති. මා උන් දක්නේ නැත. ඊට කාරණ ත් බුදුන් ම දනු ත් මුත් මම නො දනිමි' වදාළ සේක.

රජ්ජුරුවෝ කාරණයක් වුව මැනැවැ යි සිතා 'සවාමීනි, තෙල තැන සිටිය මැනැවැ'යි කියා නැවත ත් තෙරුන් වහන්සේ පෙර මාලේ සිටි වේලාට ගෑනු රුව පිටි පස්සේ සිටියා දැක උඩු මාලට නැඟි කලට හැම වේලේ ම තෙරුන් වහන්සේ මුත් ගෑනු රුව නො දැක තව ත් තෙරුන් වහන්සේ අතින් විචාරා 'ඔබ තුඩුවු යෙමි'යි වදාළ කල්හි 'මුන් වහන්සේ පෙර මාලේ සිටි කල පෙනෙන් ට ත් මුන් වහන්සේ ත් මා ත් උඩු මාලට නැඟි වේලාට මෙ තෙක් රකවල් ඇති ව තුබූ තැන අනික් සැඟවෙන තැන ත් නැති ව නො පෙනෙන්ට ත් නැවත පෙර මාලේ සිටි වේලාට පෙනෙන්ට ත් අප දැන ගත, සොයා ගත නො හැකි කාරණයක් වුව මැනැවැ'යි සිතා ලා තෙරුන් වහන්සේට 'සවාමීනි, තෙල සේ වූ කිලිටක් මුඹ වහන්සේ කැටි ව ආ කලට තත්ව ය දත් මා විනා අනික් කෙණකුන් මුඹ වහන්සේට දන් දෙන්ට නො සිතති. එක් වන් මාගේ ගෙට ම සිඟා වඩනා බව ය. මම සිවු පසයෙන් උපස්ථාන කෙරෙමි'යි කියා ලා ගියෝ ය.

වහන්දෑ ත් 'ඇවැත්නි, රජ්ජුරුවන්ගේ පවිටු කමක් බලව. රටින් නෙරිනට කියා ලූ ගමනත් පවිටු අදහසින් සරි හෙයින් දෝ දන් දෙන්ට පවරා ගත් හ'යි රජ්ජුරුවන්ට ත් දෙඩූ සේක. කුණ්ඩ ධාන තෙරුන් වහන්සේට ත් 'දුශ්ශීල ය, තෝ දැන් රාජ කුලූපග වීදැ'යි කී සේක. කුණ්ඩධාන තෙරුන් වහන්සේ ආදි කුමක් කියා ගත නුහුන ත් රජ්ජුරුවන් ම තමන් වහන්සේ සුශීල නියාව දත් හෙයින් උනු ත් පෘෂ්ටි බලකොට ගෙන 'දුශ්ශීල වත ත්, කුමක් වත ත් තමන් වුව මැනව. තට ඒ හැම හැයි දැ'යි කියන සේක. ඒ වහන්දෑ ගොසින් බුදුන්ට එ පව ත් දැන්වූ සේක. එ පවත් නම් ගෑනු කෙණකුන් කැටි ව ඇවිදිනා නියා නො වෙයි. දුශ්ශීල වාද කියා ලා බණනා නියා ය. බුදුහු ත් ඔබ කැඳවා ලා සැබෑ දැ යි විචාරා සැබව යි කී කල්හි 'කුමක් නිසා බණවු දැ'යි කී සේක.

'මා දුශ්ශීල නො වන්නවුන්ට එ ලෙස කියන හෙයින් ආදි ඒ කීම නිසා බැණ නො නැඟී හුන ත් රජ්ජුරුවන් මගේ තතු ය දත් පසු සුශීලයන්ට එ ලෙස කීම යුක්ත නො වන හෙයින්

Non-Commercial Distribution

ඉන් නවතනු පිණිස එලෙස ම කියමී' කී සේක. 'මහණෙනි, තොප මුන්පි එසේ කියන්ට කාරණ කිම් දැ'යි විචාළ සේක. 'ස්වාමීනි, මුන් වහන්සේ පසු පස්සෙහි ගෑනු කෙණකුන් යන නියාව දැක ය'යි කී සේක. එවිට බුදුහු 'කුණ්ඩධානයෙනි, මුවන්නා තොප හා කැටිව යන එන ගෑනු කෙණකුන් දැක එබන්දක් ඇති නියා ය'යි සිතා එලෙස කියති. ඉන් උන්ට වරද කිම් ද? තොපි මුන් ගෙන් කුමක් දැක දුශ්ශීලවාදයෙන් කථා කරවු ද? පෙරත් නපුරු අදහසින් කළ කට යුතු නිසා මෙ සේ වුව. දැන් මෙ ලෙස දොඩා කුමක් වවු දැ'යි වදාළ සේක. වහන්දෑ පෙර කළ පවු විචාළ සේක.

බුදුහු කසුප් බුදුන් සමයෙහි කළාවූ ඒ පාප ය වදරා ලා 'මහණ, තා ම කළ ලෙසට මේ සා මහත් අයසකට පැමිණියෙහි. දැනුත් සිල්වතුන්ට දොඩා බැණ තවත් අයස ලබන්ට ද, මෙ වක් පටන් කවුරුන් කුමක් කීව ත් අසහන වශයෙන් බැණ නො නැගෙව'යි වදරා ලා බණ වදරන සේක් 'කිසි කෙණකුන්ට ත් සිත් සැවෙන ලෙස රළු පරළු බස් නො කියව. එ සේ කී කල උයි ත් පෙරළා එ සේ ම තොපට කියති. තෙපි ත් පෙරළා දොඩව. මෙ ලෙස කරණ කලට දෙ පක්‍ෂයට ම දුක. මුව විටි නැති තළියක් කෙ සේ ගසා ලුව ත් නො හඬන්නා සේ කවුරුන් කුමක් කීව ත් නො දොඩවු නම් එ ම යහපත. එ ලෙස කට හුනු නම් නිවන් නුදුටු නමුත් නිවණට පැමිණියා හා සරි ය. එ සේ කලට 'තෙපි දුශ්ශීල ය. අපි සුශීලයම්හ'යි පවත්නා කරණුත්තරිය කරුණ ත් නැතැ'යි වදාළ සේක. දෙසනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ. කුණ්ඩධාන තෙරුන් වහන්සේ ද බුදුන්ගේ අවවාදයෙහි පිහිටා රහත් වූ සේක. රහත් වීමෙන් කර්‍ම ය ගෙවුනා සේ ම කර්‍ම විපාක ව පෙනෙන්නා වූ ගෑනුරුව ත් නො පෙනෙ යි දත යුතු.

එ හෙයින් සත් පුරුෂයන් විසින් ක්‍රොධයෙහි ආදීනව සලකා ක්‍රොධ ය හැරීමෙන් රළු පරළු තෙපුලු ත් හැර මෛත්‍රියෙහි අනුසසු ත් සලකා සියල්ලවුන් කෙරෙහි මෛත්‍රී ත් ඇති ව කුසල් පුරා අධිමුක්ති වූ ලෙසින් තුන් බොධින් එක් බොධියකට පැමිණිය යුතු.

## 124. විශාඛාදී උපාසිකාවරුන්ගේ පෙහෙවස් විචාළ වස්තුව

තව ද නො එක් දෙනාගේ නො එක් සිතිවිල්ල කරම හඟවන්ට විශාඛාදි උපාසිකා වරුන්ගේ පෙහෙවස් විචාළ වස්තුව කියමු.

Non-Commercial Distribution

කෙ සේ ද යත්—

සැවත් නුවර බොහෝ දෙනා පෙහෙ වත දවසෙක පන් සිය යක් විතර උපාසිකාවරු පෙහෙ ව ගෙන වෙහෙරට ගියහ. විශාඛාවෝ ඒ පන් සියෙන් මැහලි උපාසිකාවරුන් කරා ගොසින් 'අම්මාවරිනි, පෙහෙ වූයේ කුමක් පතා දෑ'යි විචාළෝ ය. මැහැලි උපාසිකාවරුන් 'අපට සෙස්සෙන් කම් කිම් ද? දිව සැපත් පතා ය'යි කී කල්හි ඒ තමන් සිත් නො වන් හෙයින් මධ්‍යම තරම ස්ත්‍රීන් ලඟට ගොසින් 'නැහෙණි-බූනැණියෙනි, මුඹ හැම පෙහෙ වූයේ කුමක් පතා දෑ'යි විචාළෝ ය. උන් හැම සපත්නි රොෂයෙන් මිදෙනු නිසා ය'යි කී කල්හි එයි ත් තමන් සිත් නොවන් හෙයින් සඟ බාල ස්ත්‍රීන් කරා ගොසින් 'යෙහෙළිණියෙනි, තෙපි හැම කුමක් පතා පෙහෙ වූ දෑ'යි විචාළෝ ය.

උන් 'ආදියෙන් පිරිමි පුතුන් ලබනු නිසා ය'යි කී කල්හි ඒ ප්‍රාර්ථනාව ත් හීන හෙයින් කුමාරිකා වරුන් ලඟට ගොසින් 'දරුවෙනි, තෙපි කුමක් නිසා පෙහෙ වූ දෑ'යි විචාළෝ ය. උන් ගෙයි හිඳ ම මුකුරා නො ගොසින් බාල කල ම සරණ යැම පිණිස ය'යි කී කල්හි වයස් ගතයන්ගේ ත්, මධ්‍යම තරමුන්ගේ ත්, සඟ බාලයන්ගේ ත් කථා හැම ම අසා හැම දෙන ම කැඳවා ගෙන බුදුන් කරා ගොසින් එ පමණක් තබා වඩා වුව ත් කියා ලත්ට පිළිවන් හෙයින් පිළිවෙළින් කිවු ය.

බුදුහු ඒ අසා වදරා 'විශාඛාවෙනි, මේ සතුන්ගේ ජාති ආදීහු කෙවිටි දඬු ගත් එඬේරන් වැන්නහ. ජාතිතොමෝ ජරාව කරා පමුණුවා ලයි. ජරාව ව්‍යාධි ය කරා පමුණුවා ලයි. ව්‍යාධි ය මරණය කරා පමුණුවා ලයි. පොරොවින් කපන්නා සේ හැම එක් ව ගෙන සිඳිති. එතකු දු වුව ත් මෝහ බලයෙන් තෙමේ පතන ලෙසය. නිවන් පතන කෙණෙක් නැතැ'යි වදරා ලා 'විශාඛාවෙනි, යම් සේ ගෙරි රැකීමෙහි දක්‍ෂ වූ එඬේරෙක් ඉවත්ව යන සරක් දණ්ඩෙන් ගසා ඉවත ගමන් වලකා ලා එ ම දණ්ඩෙන් ගසා තණ පැන් ඇති තැනකට නමා ලා ද, එ මෙන් ජාති ය හා ජරාව හා එඬේරකු මෙන් ව ඒ ගෙරි සමූහයක් වැනි ජීවිතෙන්ද්‍රිය ගොදුරු බිමක් වැනි මරණට පමුණුවයි. ඉන් ජාති තොමෝ රූ අරූ දුව්දු ජරාව කරා පමුණුවා ලයි. ජරා තොමෝ ව්‍යාධි ය කරා පමුණුවා ලයි. ව්‍යාධිය ඇළින් හොයින් ගඟට පැමිණියා මුහුදට පමුණුවන්නා සේ මරණට ලං කොට ලයි. මරණ තෙමේ වඩබා මුඛයට සළිහ වූවාක් මෙන් සියලු ලෙසින් නැති කෙරෙයි. මේ භව

Non-Commercial Distribution

සම්පත් පැතුවන්ට වන දෙය ය. නිවන් පතා වී නම් යහපතැ'යි වදාළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන සෝවාන් ඵලාදියට පැමිණියහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් 'ජරාව ත් ව්‍යාධිය ත් මරණය ත් ඇති වන්නේ ජාති ය නිසා ය. මූල කාරණ වූ ජාති ය නැති වන්නේ රහත් වීමෙනැයි' රහත් වීමට උත්සාහ කට යුතු.

## 125. අජගර ප්‍රේත වස්තුව

තව ද පාපයෙහි ම ආදීනව දක්වන්ට අජගර ප්‍රේත වස්තුව කියමු.

කෙ සේ ද යත්—

එක් සමයෙක මුගලන් මහ තෙරුන් වහන්සේ ලක්‍ෂණ මහ තෙරුන් වහන්සේ හා සමඟ ගිජුකුළු පවුවෙන් බස්නා සේක් දිව සින් දකිනා සේක් ගවු සියයක් පමණ දිග ඇති පිඹුරු සටහන් වූ ප්‍රේතයකු දුටු සේක. උගේ හිසින් නැඟි ගිනි දූල් බඳ හොස්සේ ගොසින් ශරීර කෙළවරට යෙයි. ශරීර කෙළවරින් නැඟි ගිනි දූල් හිස කරා යෙයි. දෙ ඇළයෙන් නැඟි ගිනි දූල් ශරීර මධ්‍යයට යෙයි. මහ තෙරුන් වහන්සේ ඒ දැක තමන් වහන්සේ ඒ දුකින් මිදුණු නියාව සලකා සිනා පහළ කොට වදරා ලක්‍ෂණ මහ තෙරුන් වහන්සේ සිනාවට කාරණ විචාළ කල්හි 'හෙම්බා ඇවැත්නි, මට දූන් කාරණ කියා ලන්ට සිහා යන වේලාව හෙයින් බැරි ය. බුදුන් ලඟ දී විචාළ මැනව. නො කරුණෙක සිනා නැත්තේ වේ දූ'යි කියා ලා රජගහා නුවර සිඟා පියා බුදුන් ලඟට ගිය ගමනේ සිනාවට කාරණ ය ලක්‍ෂණ මහ තෙරුන් වහන්සේ විචාළ කල්හි "හෙම්බා ඇවැත්නි, මම එ තැන දී පිඹුරකු වැනි වූ ප්‍රේතයකු දිටිමි. දැක 'මෙ සේ වූ ආත්ම භාවයක් මා පෙරාතු දුටු විරූ නැත. මෙ සේ වූ ආත්මභාව පහළ වන්නේ භව ක්‍ෂය නො කළ වුන්ට ය. මේ ජාති ය හැර අනික් ජාතියක් මට නැති බැවින් මම ඉන් මිදිණිමි සිතා සිනා පහළ කෙළෙමි"යි වදාළ සේක.

බුදුහු ත් 'මාගේ සවුවෝ ඇස් ඇති ව වෙසෙති' යනාදීන් වදරනසේක්-මුගලන් මහ තෙරුන් වහන්සේගේ කථාව හදහන ලෙසට පිහිටුවා ලා 'මහණෙනි, ඒ ප්‍රේතයා බුදු වූ දවස් බෝ මැඩදී මම ත් දිටිමි. කියා ලූ කල යම් කෙණෙක් සියක් ගවු උසැති ප්‍රේතයන් ඇති නියා දූ'යි මාගේ බස් අදහා නො ගත්තු නම්

Non-Commercial Distribution

උන්ට බොහෝ අවැඩ වෙයි යන අදහසින් නො කීමි. දැන් මුගලන් මහ තෙරුන් දුටු හෙයින් උනු ත් සාක්ෂි කොට කියමි. මම ත් උන්ට සාක්ෂි වෙමි' වදරා ලා ඔහු කළ අකුසල කර්‍ම ය කවරේ දැ'යි වහන්දෑ විචාළ කල්හි ප්‍රකාශ කරණ බුදුහු:

'කසුප් බුදුන් සමයෙහි සුමඞ්ගල නම් සිටාණ කෙණෙක් ඇත. උෟ තුමූ මෙ කල අනේපිඬු සිටාණන් මසුරන් අටළොස් කෙළක් සුලසින් ඇතුව දෙව්රම වෙහෙර විහාර බිම ගත්තා සේ රන් උළු කරවා ලා ඒ උළු අතුරුවා ඉන් වැසුණු ඉසුඹ් ගණනින් විසි ඉස්බක් විතර හා යට ගණනින් සාර සියයක් යට හා රියන් ගණනින් දෙ දස් අට සියයක් රියන් විතර දිග පළල ඇති බිම වසා සිටි උළු දී ලා බිම ඇත්තවුන්ගෙන් හැර ගෙන එ තෙක් ම රන් උළු දී විහාර ය කරවා ලා නිමි පූජාව ත් එතෙක් ම රන් උළු දී කැරවූහ. ඒ උන් කරවා කසුප් බුදුන්ට පිළිගැන්වූ විහාර ය නම් මෙ ම දෙව්රම ම ය;

උෟ එක් දවසක් උදෑසන ම බුදුන් ලඟට යන්නෝ නුවර දෙර වාසල කෙරේ එක් ශාලාවෙක කළු දැකඩෙකින් ඉස වසා පෙර ව පය බොර සෝධා නො පියා වැද හොත් එක් සොරකු දැක මූ රෑ දෙ වරු ඇවිද පය මඩ ගා ගෙණ වැද හොත් මිනිසකු සැටි ය'යි කිවූ ය. සොරා ත් කර ඔසවා බැලූයේ සිටාණන් දැක 'වන්නාට ඊට නිස්ස දනිමි'යි සිටාණන් කෙරෙහි වෛර බැඳ ගෙන සත් වරෙක පැසී තුබූ ගොයම් ගිනි ලා දවා පියා දැකැත්-තෙන් දවන්ට නො තුබූයේ ය. සත් වරෙක ගොවු ත් වල සිටි ගෙරින්ගේ කකුල් කපා පී ය. සත් වරෙක හිදිනා ගෙවල් නංවා ගත් සේ ම ගිනි ලා දමා පී ය. තව මෙ විතරෙකිනු ත් ක්‍රොධ ය සන්හිඳුවා ගත නො හී උන්ගේ බුලත් කවන්නා කැටි ව සාද ව ගෙන 'තොපගේ සිටාණන්ට ප්‍රිය කවරේ දැ'යි විචාරා 'බුදුන් වැඩ හිදිනා ගඳකිළියට වඩා අනික් ප්‍රිය දෙයක් නැතැ'යි අසා 'වන්නාට ය, ගඳකිළි ය දවා නිවෙන විටෙක. ඒ ගිනි නිවියා සේ ක්‍රොධ ගින්න ත් නිවා ගනිමි'යි බුදුන් සිඟා වැඩ පි වේලාට පැන් වළන් ගසා බිඳ පියා ගඳ කිළි ය ගිනි ලා නරක ගිනි තරයේ ම අත් කෙළේ ය.

සිටාණෝ ත් ගඳ කිළි ය දන නියාව අසා නිවන්ට එන තැනැත් තෝ ද නිමා ගිය කලට අවුත් ද නිමී ගිය ගඳ කිළි ය බලා කෙස හක් පමණ ත් දෙම්නස් නූපදවා වමත හකුළුවා ගෙන දකුණතින් අපොළාපූ ය. ලඟ සිටි මිනිස්සු සවාමීනි. මෙ තෙක් වස්තු වියදම

Non-Commercial Distribution

කොට කරවාපු ගඳකිළිය ද ගිය කල තරව මුසුප්පු වත් මුත් මෙ සේ කරන්නට කාරණ කිම ද'යි කිවු ය. සිටාණෝ කියන්නෝ 'හෙම්බා මේ ගඳකිළිය දූව ත් මෙයට මා වියදම් කළ වස්තුව නිකම් දමා පූ යෙම් නො වෙමි. සොර සතුරු ආදීන් විසින් උවදුරක් කට නොහැකි බුදුසසුන් නමැති මහා ක්ෂෙම ස්ථානයෙහි පින්නැමැති පෙට්ටගම් වල, පත්තායම් වල ලා නුවණ නමැති යතුරු ලා තබා ලීමි. කෙතෙක් දෙන කුමක් කොට ත් ඒ මාගේ අනුගාමික නිධි ය නසා ගත හෙන කෙණෙක් නැත. තව ත් මෙ ම තෙක් ම වියදම් කොට විහාර ය කරවා ගනිමි සිතා සමාධි ව අපො ළා පී නියාව කිවුය. එ සේ කියා ලා දෙ දස් අටසියයක් රියන් විතර දිග පළල ඇති බිම වැසෙන විතර රන් උළු දී පෙරළා ත් බිම හැර ගෙන එ ම තෙක් ම වියදම් කොට විහාර ය කරවා ලා බුදු පාමොක් සඟනට දන් දුන්හ.

සොරා ඒ දැක, 'මම මොහු මරා මුත් මුන්ට මුසුප්පුවක් කොට නො හෙමි. කෙත් වතු දැවුව ත් ගෙවල් දැවුව ත් මුන්ට මුසුප්පු නැත. මුන් ම මරා මා සිත සතුටු කෙරෙමි'යි සිතා සිරියක් කළව යේ බැඳ ගෙන සතියක් මුළුල්ලෙහි විහාරයේ ඇවිද ත් පින් කමින් අවසර නො පෑ ඇවිදිනා සිටාණන් මරන්ට අවසරයක් ලද නො හිණ. සිටාණෝ ද සතියක් මුළුල්ලෙහි බුදු පාමොක් සඟනට මහදන් දී ලා බුදුන්ට දන්වන්නෝ 'ස්වාමීනි, එක් මිනිසෙක් සත් වරෙක මාගේ පැසී තුබූ වෙල් වරු පෙත්[1] ගිනි ලා දවා පී ය. සත් වරෙක ගෙරි සරක්ගේ පා කැපී ය. සත් වරෙක මා හිඳිනා ගෙවලු ත් දැවී ය. මේ ගඳකිළිය ත් දැවූයේ උහු ම ය. අනික් කෙණකුන් වන්ට කාරණ නැත. ඒ කෙ සේ උහු කුමක් කළ නමුත් ගිනිවිර කළ කළ පමණින් රත් රන් ඇණ වඩන්නා සේ මාගේ මෙත් සිත ත් වැඩුන මනා වේ ද ? මේ මා කළ පින් පළමු කොට උහුට දෙමි. ඒ පින් අනුමෝ ව ලා වයිර හළ නම් යහපතැ'යි කිවු ය.

ඒ අසා සොරා 'මා කළ දෑ ඉතා නපුර. මෙ සා මහත් අනර්ථයක් කළ මා කෙරෙහි කිසි ත් මුසුප්පුවක් නැත්තෝ ය. මා ලූ ගින්නෙන් වෙල් වරු පෙත් ආදි ය ද ගිය පමණක් මුත් ඒ ගිනි මූන්ගේ අදහස් නමැති රත්රන මෛත්‍රී නමැති ඇණ වඩන්ට කළ ගිනි වරක් වැන්න. තමන්ගේ මේ සා මහත් දනෙක පිනු ත් පළමු කොට මට ම දුන්හ. මම මුන් ක්ෂමා කරවා නොගතිම් නම් ගෙවල් ගිනි ගත්තා සේ ම ගිනි සෙණෙක් හී ලා මා

1 වෙල් වරුකෙත්,

Non-Commercial Distribution

හිස ත් වැදගත් නම් නපුර'යි ගොසින් සිටාණන් වැඳ ගෙන වැද හෙව, සවාමීනි, ක්‍ෂමා කළ මැනැවැ'යි කියා 'මේ කිම්දැ'යි විචාළ කල්හි 'මෙ තෙක් අනර්ථ මුළුල්ල ම කෙළෙම් මම ය. ඊට ය ක්‍ෂමා කරන්නේ'යි කියා සිටාණෝ ත් මෙ කී සියල්ල කොළෙෝ තෙපිදැ'යි විචාරා එ සේ ය යි කී කල්හි 'තොප මා දුටු විරූ නැත. කුමන මුසුප්පුවකින් කළාදැ'යි විචාළෙෝ ය. 'මුඹ වහන්සේ නුවරින් නික් මුණු දවසෙක ශාලාවෙක ඉස් වසා පෙරව ගෙන මා වැදහොත් දව සෙක රූ දෙ වරු ඇවිද පියා පය මඩ ගාගෙන වැද හෝනා එකෙ කැ යි මුඹ වහන්සේ කියා ලූ බසෙක් ඇත. ඒ නිසා වූ මුසුප්පු වෙකැ'යි සොර තැනැත්තෝ කීහ. සිටාණෝ ත් තමන් කී නියා ව සඳහන් කොට පියා 'එ සේ කීයේ සැබැව. තොපි ත් එබසට ක්‍ෂමා කරව'යි ක්‍ෂමා කරවා ගෙන එ විතර වරදට උඹ ගේ ක්‍ෂමා කිරීම විස්ම නො වත ත් උඹ කළ ඒ සා මහත් අපරාධ මුළුල්ලට ම ක්‍ෂමා කොට ගෙන නැඟී සිට 'පලායව'යි කිවු ය.

'ඉදින්, සවාමීනි, ක්‍ෂමා කළ සේක් වී නම් අඹුදරුවන් පිටින් මා මුඹ වහන්සේගේ ගෙට වාලට හැරගත මැනවැ'යි කී ය. 'කුඩෙනි, තෙපි මා කියා ලූ මෙ විතර බස් පමණකට මේ සා මහත් අනර්ථයක් කළව. ලං ව හුන් කළ නම් යමක් කියා නොලනට බැරි ය. දුර ව තුබූ ගිනි සෙණ ලං කළ මනා ද? ක්‍ෂමා ක්‍ෂමා ම ය. තෙපි යව'යි කිවු ය. සොර තැනැත්තෝ ත් ඒ පවු කොට ආයු කෙළවර මිය ගොසින් අවීචියේ ඉපැද බොහෝ කලක් පැසී පියා නරකයෙහි ආයු නිමිය ත් තව අකුශල විපාක නිමා වන්ට නුවූ හෙයින් දැන් ගිජුකුළු පව්වෙහි ප්‍රේත ව ඉපැද දුක් විඳි'යි. බුදුහු ඒ ප්‍රේතයාගේ අකුශල කර්ම ය වදරා ලා බණ වදරන සේක් 'මහ- ණෙනි, නුවණ නැති සත්තු පවු කරණ කල තමන් කරණ දෙය පවු නියාව් දනිත් නමුත් පවින් සිද්ධ වන නපුර දත නො හෙති' නො දන්ම නිසා නුවණ නැති සත්තු අනුන් කළ දෙයක් නො ව තමන් ම කොට ගත් දෙයින් නිරා දුකට ප්‍රේත දුකට පැමිණ පියා ගින්නේ පැළහී ගිය කෙණකුන් මහ අවුවේ ලා ලූවා මෙන් තැවෙති' වදළ ඝේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් පවට සිත නැමුණු කල දී පවින් සිද්ධ වන අනිෂ්ට විපාක දැන මිල බොහෝ දෙයක් මිල බොහෝ නියා ව දැන හැර ගන්ට මැළි වන්නා සේ පවෙහි ත් හැසිරෙන්ට මැළි ව පිළිවන් ලෙසින් පිණෙහි හැසිර සසර විඳ ආ දුක් නිවන් පුර වැද ගෙවිය යුතු.

Non-Commercial Distribution

# 126. මුගලන් මහ තෙරුන් වහන්සේ ගේ වස්තුව

තව ද යම් කෙනෙක් නිරපරාධයන්ට අපරාධ කළෝ නම් උන් ආදීනව දසයකට හෝ ඉන් එකකට වුව ත් පැමිණෙන නියා ව හඟවන්ට මුගලන් මහ තෙරුන් වහන්සේ ගේ වස්තුව දක්වමු.

කෙසේ ද යත්—

එක් සමයෙක තීර්ථකයෝ එක් තැන් ව පියා ඔවුනොවුන් හා කථාකරන්නාහු 'මහණ ගොයුම් හට ලාභ-සත්කාර බලවත් වන්නට කාරණ දනු ද'යි විචාළෝ ය. 'අපි නො දනුම් හ. තෙල ලෙස විචාළේ තොප හැම දන්නා නියා ද'යි කිවු ය. 'එ සේ ය, අපි දනුම්හ. එක මුගලන් තෙරුන් නිසා උපදනා ලාභසත්කාර ය. උන් නිසා උපදනේ කෙසේ ද යත්-උඹ තුමූ දෙව් ලොවට ගොසින් මිනිස් ලොව සිටිනා කල දේවතාවන්ට නිසි ව කළ පින් විචාරා ගෙන උත්සාහ වඩනා නිසා මේ මේ පින්කම් කළාහු දෙව් ලොව ඉපැද දෙව් සැපත් ලැබෙති' මිනිසුන්ට කියති.

'කලෙක නරකයට ගොසින් හැසිල්ලකට නරක ගිනි නිවා ලා නිරා දුකට කාරණ වූ පවුකම් විචාරා ගෙන අවුත් මේ පවුකම් කොළෝ නරකවල ඉපැද මේ මේ දුක් විඳිති'යි කියති. මිනිස්සු ඒ අසා පවින් දුරු ව පින්කම හැසිරෙන්නාහු බොහෝ වූ ලාභ සත්කාර එළවති. මිනිසුන් දෙව් සැපතේ ආල ය කරන්ට ඒ විස්තර කොට කියන්නෝ ත් ගොසින් බලා ආ හෙයින් උඹ ම ය. පවෙහි ආල ය හරවන්ට එයි ත් බලා ආ හෙයින් නරක දුක් කිය න්නෝ ත් උඹ ම ය. දෙලෙසින් ම ලාභයට මං කළහ. ඉදින් උන් මරා පීමෝ නම් ඒ ලාභ සත්කාර යටගං බලා යන දිය වඩදිය වේලාට උඩු ගං බලා යන්නා සේ තව ත් එ බඳු කෙණකුන් පෙනෙන තෙක් අප කරා එයි' කිවු ය.

ඒ උපදෙස යහපතැ යි හැම දෙන ම එක් සිත් ව ගෙන මරණ උපදෙස් සිතන්නාහු තමන්ගේ උපාසකවරුන් සමාදන් කරවා ගෙන මසු දහසක් ලදින් මිනී මරා ඇවිදිනා සොරුන් කැඳවා ගෙන්වා ගෙන මහ මුගලන් තෙරහු කළුගල වෙසෙති. එ තැනට ගොසින් උන් මරා පියව' කියාලා අත්ලසට මසු දහසක් දුන්හ. සොරු ත් වස්තු ලොභයෙන් නො ගිවිසි මනා දෙය ගිවිස ගෙන මහ තෙරුන් වහන්සේ මරණු නිසා ගොසින් ඔබ වැඩ හිඳිනා තැන්

වටකොට ගත්හ. මහ තෙරුන් වහන්සේ ත් උන් වට කළ නියාව දැන කෙසී සිදුරෙන් නික්ම ලා කැමති තැනකට වැඩි සේක.

සොරු ත් එ දවස තෙරුන් වහන්සේ නො දැක අනික් දවසෙක ත් අවු ත් ගල් ලෙන රැක ගත්හ. මහ තෙරුන් වහන්සේ දැන ලා ආදි දවස් ගිය මග රැක ගත්හ යි අනික් මහක යන කෙණකුන් මෙන් කැණි මඬල පලා ගෙන අහසට නැඟි සේක. මෙ ලෙසින් දෙ මසක් විතර ම මහ තෙරුන් වහන්සේට කුමකු ත් කොට ගත නුහුනු වූ ය. තුන් වන මස දී මහ තෙරුන් වහන්සේ සොරුන්ට වැළහෙන්ට පිළිවන් වුව ත් තමන් වහන්සේ කළ අකුසල කර්‍මයට වැළහෙන්ට තමන් වහන්සේ තබා බුදුන්ට ත් බැරි බැවින් එ දවස් නො ගොසින් වැඩ හුන් සේක. සොරු ත් ගසා අල්වා ගෙන සියල් සිරුරෙහි ඇට තළා පයියක පුරා ලූ සාල් මෙන් බිඳ සුණු කොට පියා මළ යි සිතා එක් කැලයකට දමා පියා ගියහ.

මහ තෙරුන් වහන්සේ 'බුදුන් දැක ම පිරිනිවන් පයිමි[1]' යි තමන් වහන්සේගේ අත් බැව බුන් වළඳක් වැලි ත් වෙළා තර කරන්නා සේ ධ්‍යානයෙන් වෙළා තර කොට ගෙන අහසින් බුදුන් ලඟට ගොසින් බුදුන් වැඳ ලා 'ස්වාමීනි, පිරිනිවන් පයිමි'යි කී සේක. පිරිනිවන් පවු දැ'යි බුදුන් විචාරා 'එ සේය, ස්වාමීනි'යි කී කල්හි කොයි දී දැ යි විචාළ සේක. ස්වාමීනි, කළු ගල් ලෙන දීය'යි කී කල්හි 'එ සේ වී නම් අපට බණක් කියා ලා යව. මෙ වක් පටන් තොප වැනි සවු කෙණකුන් දක්නට ත් නැත්තේ වේ දැ'යි වදාළ සේක. 'යහපත, ස්වාමීනි, එ ලෙස කෙරෙමි'යි කියා ලා බුදුන් වැඳ ගෙන අහසට නැඟී සැරියුත් මහ තෙරුන් වහන්සේ පිරිනිවන් පානා දවස් පෙළහර දැක්වූවා මෙන් පෙළහර දැක්වීමට තමන් වහන්සේ බුදුන්ට ඉක් බිති හෙයින් විශෙෂ කොට පෙළහර දක්වා බුදුන්ගේ ආරාධනාවෙන් බණ ත් වදරා අහසින් බැස කළුගල් ලෙනට වැඩ පිරිනිවි සේක.

සොර කෙණෙක් මුගලන් මහ තෙරුන් වහන්සේ මැරූ ය යි යන කථා ඔබ ත් ප්‍රසිද්ධ ව සිටි හෙයින් සියලු දඹදිව විස්තීර්‍ණ වී ය. අජාසත් රජ්ජුරුවෝ ත් සොරුන් හසු කරන්ට මිනිසුන් විධාන කළහ. ඒ සොරුනු ත් රා විකුණන තැනින් රා හැර ගෙන බොන කලට එකෙක් එකකුගේ රා ඔඬම ගසා හෙළා පී ය. ඒ ඕ හට කිපී ගොසින් 'හැයි කොල මාගේ රා ඔඬම ගසා කුමට හෙළී ද.

1. පාමිය, පමි යි, පාවිමි යි.

Non-Commercial Distribution

මුගලන් මහ තෙරුන්වහන්සේට පළමු කොට ගැසූයේ තෝ ද? මා ත් ගැසුව'යි කියා මෙ ලෙසින් ඔබ මැරීමට එක් වූ හැම දෙන ම තම තමන්ගේ බසින් ම පෙනෙනවූ ය.

හසු කරණට සිටියෝ ත් උන් තම තමන් ම කියා සිටිය හෙයින් සොරුන් හැම ගසා අල්වා ගෙන රජ්ජුරුවන්ට පැවූය. රජ්ජුරුවෝ ද 'මහ තෙරුන් වහන්සේ මැරුවෝ තෙපි දැ'යි විචාරා එ සේ ය යි කී කල්හි 'තෙපි ම සිතා ගෙන මැරූ ද? ඔබ්බෙව් විධානයකින් 'මැරූදැ'යි විචාළෝ ය. නිවටුන්ගේ විධානයෙනැ'යි කී කල්හි රජ්ජුරුවෝ පන් සියයක් නිවටූන් ගෙන්වා ගෙන පන් සියයක් සොරුනු ත් උනු ත් දහස සෙඩුලුවෙහි[1] පෙකිණි පමණට වළ ගස්වා ලා ඊ සිටුවා පස් තළවා ලා පිදුරෙන් වස්වා ලා උදේනි රජ්ජුරුවන් මාගන්දිය නම් බැමිණියගේ නෑයන් ලා කැර වූ ලෙසට ම ගිනි ගැස්වූහ. ගිනි ගසා ද ගත් නියාව දූනා ය නඟුල් බා ලා සාවා පියා හිරි හිරි කොට පැළුහ[2].

ධම් සෙබෙහි රැස්ව හුන් වහන්දෑ ත් 'ඇවැත්නි, මුගලන් මහ තෙරුන් වහන්සේ පිරිනිවි ලෙස ඔබට කරම් නො වෙ'යි කී සේක. බුදුහු ඒ අසා වදරා 'මහණෙනි, මෙ වක මෙලෙස මිය යාම උන්ට තරම් නො වන පමණක් මුත් සක්ලෙශී ව සිටියෝ වූ නම් පෙර උන් කළ ලෙසට තරම් ම ය 'යි වදරා පෙර කළ අකුශල ය කවරේදැ යි විචාළ කල්හි විස්තර විසින් වදරන සේක්—

'යට ගිය දවස බරණැස් නුවර වසනා එක් කුල දරුවාණ කෙණෙක් තුමූ ම පරමන්-පිසමන් ආදිය කෙරෙමින් දෙ මවු පියන් රකිති. උන්ගේ දෙ මවු පියෝ ද 'පුත, තොප තනි ව ම ගෙයි ත් දඩ ත් මෙහෙවර කොට තොපට ආයාස මහත. දීග පමණක් විතාරන්ට සුදුසු තැනකින් සරණක් ගෙන්වා දෙමෝ දැ'යි විචාරා 'මට ඉන් ප්‍රයොජන නැත. යම් තාක් මුඹ දෙන්න ජීවත්වන දැ වී නම් ඒ තාක් සිය අතින් උපසථාන කෙරෙමී'යි කියා සරණ ගෙන්වීමෙහි රුචි නැත ත් නැවත නැවත පැරැත්ත කියා කුමාරිකා කෙණකුන් සරණ ගෙන්වා දූන්හ.

කුමාරිකා ද තමා පය ඔබා ගන්නා තෙක් දවස් ගණනක් නැඳි මයිලන්ට කළ මනා උපසථාන අඩුවක් නැති ව කොට ලා පසු ව නැඳි මයිලන්ගේ දැකීම පමණකුත් නො කැමැති ව 'මුඹට ගන්නා දීග මුත් මුඹගේ දෙමවු පියන්ට මෙහෙ මට බැරි ය'යි කියා උන්

1. සෙණ්ඩුවාලයෙහි- 2. පැලූහ.-

Non-Commercial Distribution

තමන් කුමක් කීව ත් නො ගිවිස්නා හෙයින් සමුණන් පිට තට ගිය කලට හර කෙස් නියාවක් හඟවන්ට නියඳ කෙඳි ත් සොටු සෙම් මාරුවට කැඳ පෙණ ත් හැර ගෙන ඒ ඒ තැන තබා පියා සමුණන් අවුත් මේ කිම් දූ යි විචාළ කල්හි 'මේ මුඹගේ ඇස් කන් නැති දෙ මවු පියන්ගේ කට යුතු ය. හිස කේ පීරන කල කඩා ලති. සෙම් කාරා ඒ ඒ තැන ලති. සූරා සොටු දමති. කසළ කළ කළ සේ දමා කී විටෙකැ යි කියා ගේ දෙර පිසීම් ද? මුන් දැ හා මා හා එක් ව රඳා ලන්ට නො පිළිවනැ'යි එක් වන් කිය යි. මෙ සේ උන් කියන කලට එකාසඞ්ඛ්‍ය කප් ලක්‍ෂයක් වමත් සවුවන්ව පතා ආ මහා පුරුෂයාණෝ දෙ මවු පියන් කෙරෙහි බිඳී ගත්හ. බිඳී ලා 'ඊට නිස්ස දනිමි' කියා ලා දෙ මවු පියන් කවා පොවා ලා 'දෙ මවු පියෙනි, මුඹගේ අසවල් තැන හිඳිනා නෑයෝ මුඹ දක්නා කැමැත්තෝ ය.

'ඔබ යම්හ'යි කියා ලා ගැලකට නංවා ගෙන යන තැනැත්තෝ අඩෙවි මහ වලකට ගිය කලට 'මුඹ දැ හැම මේ රැහැණ අල්වා ගෙන පයින් සත් කොට ලන්නා ගොන් යෙති. මේ තැන සොරු ඇත. මම බැස ලා සොරුන්ගේ සඤ්චාර ය දැන ගෙන යෙමි' කියා ලා දෙ මවු පියන් අතට රැණ දී ලා බැස පියා මඳක් තැන් ගොසින් තබා ලා කට හඬ ත් පෙරළ ලා කෙලෙස් සොරුන් විනා අන් සොර කෙණකුන් එ තැන නැත ත් සොරුන් අවුත් වන් සැටියක් කළහ. දෙ මවු පියෝ ත් අරගල අසා ලා සොරු දෝ හෝ'යි සිතා ලා 'පුතඬ, අපි මාලු ව ගියම්හ. අප මළත් මළේ ය. ගැළවුණු ගමන් මුඹ ගැළවෙන්නේ ය'යි කිවු ය. ඌ තුමූ දෙ මවු පියන් එ ලෙස කී කල සොරුන් පලවා පියා ආ ලෙසක් සේ අවුත් ලා මොළොක් සිත් ඇති ව දෙ මවු පියන් කැඳවා ගෙන පෙරළා ගෙට යන ලෙසකු ත් නො කොට —

''බලවන්තො දුබ්බලා හොන්ති—ථාමවන්තොපි හායරෙ,
චක්ඛුමන්තොන්ධිතා හොන්ති මාතුගාම වසංගතා''

යන්නෙහි පිහිටා ඥාන ශක්තිය නැති වීමෙන් දුර්වල ව නුවණැස නැති වීමෙන් අන්ධ දෙ මවු පියන්ට වඩා අන්ධ ව රක්‍ෂා කළ ඇඹෙණියන්ගේ අදහස ම රැකී පමණක් මුත් පර ලොව නසා සොරුන් ලෙසට අරගල කෙරෙමින් අවුත් ලා තළා පියා වල දමා පියා ගෙට ගියහ.

බුදුහු ඔබගේ මේ අකුශල කර්‍ම ය වදරා ලා, 'මහණෙනි, මුගලන් මහ තෙරහු මේ පව් කම කොට නො එක් හවුරුදු ලක්‍ෂ

Non-Commercial Distribution

ගණන් නරකයෙහි පැසී පියා තව ත් අකුශල විපාක ය නො ගෙවුණු හෙයින් අත්බැව් සියයෙක මේ ලෙස ම තැළුම් කා මරණයට පැමිණියහ. මෙ සේ මුගලන් මහ තෙරුන්ට පැමිණි මරණ දුන් උන්ගේ තරමට තරම් නො වත ත් නො එක් ලෙසින් තිකෘෂ්ට අදහස් ඇති ස්ත්‍රීන්ගේ බසින් දෙ මවු පියන්ට කොට ලූ ලෙසට තරම් ම ය. සොරුන් හා නිවටුන් හා දහසක් නිරපරාධ වූ ම පුතුන්ට වැරදු ලද මනා ලෙස ලත්හ'යි වදාරා බණ වදරණ සේක් 'යම් කෙණෙක් මුගලන් මහ තෙරුන් මෙන් නිරපරාධයන්ට සොරු-නිවට දෙ පක්‍ෂ ය කළ අපරාධ ය සේ අපරාධ කෙරෙත් ද, මරත් ද, තළත් ද උෟතුමූ හිස රුජා ආදී වූ බලවත් වූ දුකට ද, දුක සේ සොයා උපයා ගත් වස්තුව යම් කිසි ලෙසකින් අත මිට නැති විමට ද, නැවත අත් පා කැපීම් ආදි වූ අඞ්ග හානියට ද, නැවත කුෂ්ඨ රොග පාණ්ඩුරොගාදී වූ අසාද්ධ්‍ය රොග ඇති වීමට ද, යක්‍ෂොන්මාද පිත්තොන්මාදදියට ද පැමිණෙති.

'නොයෙක් ලෙසින් ඒ ඒ තැන පතල කීර්තියෙක් ඇත් නම් එයි ත් පරිවාර සම්පතු ත් නස්සි. සෙනෙවිරත් තනතුරු ආදියෙන් හෝ පිරිහෙති. කරන්නා තබා නොසිතූ ත් විරු උමං බිඳීම් ආදි වූ නො කළ නොපිළිපන් දෙය ත් ඔවුන් කරා පැමිණෙයි. නොබො හෝ කලකින් ම පිහිට ව සිටිනට නිසි නෑ කෙණෙක් ඇත් නම් උෟ හෝ නසිති. නැවත ගෙයි වීකෙක් සාලෙක් ඇත් නම් නිෂ්ප්‍රයෝජන ලෙසට ඒ බොල් වෙයි. රත්රන් ඇත්නම් ඒ අඟුරු වෙයි. මසුරනෙක් ඇත් නම් කැබිලිති වෙයි. වාල් සරක් කණ පිළී වෙති. තව ද හිඳිනා ගෙවල් හවුරුද්දකට දෙ තුන් වරෙක ගිනි වැද ගෙන දයි. මෙ ලොව මේ දසයකට ම හෝ මෙයින් එකකට වුව ත් පැමිණ පරලොව බාධා නැති ව නරකයට පැමිණ බොහෝ දුක් ගනිති'යි වදළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් සත් පුරුෂයන් දුක් වේදනා නො කැමැතො ත් වස්තු හානි අඞ්ග හානි නො කැමැතො ත් රොගි වීම නොකැමැ-තො ත් යක්‍ෂොන්මාදදි ය නො කැමැතො ත් උපන් කීර්ති හා පරිවාර සම්පත ත් නො නට මනා වී නම් නැති දෙයින් අභ්‍යාඛ්‍යාන නො ලද මනා වී නම් නැවත නෑයන් සියන් නො නට මනා වී නම් වී සාල් ආදි ය බොල් නො වුව මනා වී නම් හිඳිනා ගෙවල් කවර ලෙසිනු ත් නො දැව මනා වී නම් ඒ හැමට ත් වඩා නරක දුක් නු වුව මනා වී නම් බණ වූ ලෙසින් වූ නම්

Non-Commercial Distribution

සාපරාධයන්ට ත් අපරාධ නො කළ මිනා තැන නිරපරාධයන්ට අපරාධ කරන්නට තබා සිතිනු ත් නො සිතිය යුතු යි.

## 127. බහුභාණ්ඩික නම් තෙරුන් වහන්සේ ගේ වස්තුව

තව ද ප්‍රත්‍යබාහුලික වීමෙහි නපුර හඟවන්නට බොහෝ භාණ්ඩ ඇති හෙයින් බහුභාණ්ඩික නම් තෙරුන් වහන්සේ ගේ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්—

සැවැත් නුවර වසන කෙළෙඹියාන කෙණෙක් ඇඹේණියන් මියන්නා ම මහණ වූ ය. මහණ වන ගමනේ ම තමන් වසන්ට පිරිවෙණක් ද ගිනි හල් ගෙයක් ද පිරිකර තබන්ට ගබඩා ද කරවා ලා ගබඩාවල ගිතෙල් මී සකුරු ආදී ය තබා ලා මහණ වූ කල ත් පිළිවෙත් පිරිමට ත් වඩා කුක්ෂි පූරණයට ම උත්සාහ ඇත්තා සේ මුළුල්ල ම පිරිමස්වා ගෙන මහණ වූහ. මහණ ව තමන්දැගේ කෙල්ලන් කැඳවා ලා විධාන කොට රුචි ලෙසට බත් මාළු ඉදිකරවා ගෙන වළඳනදැ ය. මහණ වූ ගමන නම් කර්මාන්තයට මැළි ව මහණ වූ ගමනක් වැන්න. පිරිකර ත් බොහෝ ව ම ඇත. රෑ දවස වෙන ම තුන් සිවුරක් වළඳන දැ ය. දවල් අත් ගා සිලුටු කළ තුන් සිවුරක් වළඳින දැ ය. දන් පිස්වා ගෙන්වා වළඳනු නිසා විහාර කෙළවර වසන දැ ය.

එක් දවසක් සිවුරු හා ඇතිරි ඒ මේ අවු ගස්වන කලට විහාර බලා ඇවිදිනා වහන්දැ රද තොටෙක පිළි වනා පියා තුබුවා සේ බොහෝ සිවුරු හා පිළි වනා පියා තුබුවා දැක 'ඇවැත්නි, මේ හැම කාගේ ද'යි විචාරා 'අතික් කාගේ ද? අපගේ ය' යි කී කල්හි 'ඇවැත්නි, බුදුන් අනුදැන වදාළේ තුන් සිවුරු පාත්‍ර පමණෙක. තුමූ වැළි ත් අපිස් සතොස් බුදුන්ගේ සස්නෙහි මහණ ව බොහෝ පිරිකර ඇති ව වෙසෙති. ඊට කාරණ කිම් ද යි නො කැමැති කර වා ම බුදුන් ලඟට ගෙන ගොසින් පිළිපදිනා ලෙස ත් පිරිකර බොහෝ ව ඇති නියාව ත් කී සේක. බුදුහු ත් සැබෑ ද'යි විචාරා 'සැබව, ස්වාමීනි'යි කී කල්හි 'මහණ, තෝ කුමක් නිසා අපිස් සතොස් වන්ට මා කියමින් සිටිය දී ලත් ලත් දෙයක් දන් නො දී පිරිකර බොහෝ කෙළෙනැ'යි වදාළ සේක.

කත මී ඕනා සේ, බුදුන් වදාළ එ විතර බස් පමණකු ත් ඉවසා ගත නො හී 'මෙ ලෙස නිෂ්පලිබොධ වීම යහපත් දූ' යි පොරෝනා ගළවා දමා පියා පඹීත් මධ්‍යයෙහි ලජ්ජා නැති නියා ව



Non-Commercial Distribution

කියා හහවා ලන්ට බැරි හෙයින් කොට හහවන්ට කළා සේ හඳනා ය පමණකින් සිටී දෑ ය. එ වේලෙහි බුදුහු හෙන ගෙට දෙන රුකුලක් සෙයින් උන්දෑට ම උපස්තම්භක ව 'හැයි' මහණ. තෝ පෙර දිය රකුසුව උපන් කල පවා හිරි-ඔතප් රැක ගෙන දෙළොස් හවුරුද්දක් විසී ය. දූන් මෙ වෙනි බුදු සස්නෙක මහණ ව සිවූ වනක් පිරිස් මැදයේ පොරෝනය ත් දමා පියා පොරෝනයෙන් වැසී තුබූ විලිලජ්ජා ත් හැර සිටියෙනැ'යි වදළ සේක. උන් දෑ ත් බුදුන්ගේ බස් අසා හිරි-ඔතප් එළවා ගෙන පොරෝන ය වැළඳ ගෙන බුදුන් වැඳ ලා එකත් පස් ව හුන් සේක. වහන්දෑ ත් දෙවධර්ම ජාතක කථා ව අසනු කැමැති ව බුදුන්ට ආරාධනා කළ සේක.

බුදුහු වදරන සේක් 'මහණෙනි, යට ගිය දවස බරණැස් රජ්-ජුරුවන්ගේ අග මෙහෙසුන් බිසොවුන් කුස මහ බෝසත්හු පිළිසිඳ ගත්හ. උපන් කුමාරයන්ට මහිංසාසක කුමාරයෝ ය' යි නම් තුබූහ. ඉක් බිති ව උපන් කුමාරයන්ට චන්ද්‍ර කුමාරයෝ ය'යි නම තුබූහ. ඒ කුමාරවරුන් දෙන්නා වද ලා ඒ බිසොවුන් මළ කලට රජ්ජුරුවෝ අතික් කෙණකුන් අග මෙහෙසුන් කළහ. උයි ත් පුතණු කෙණකුන් වැදූහ. උන්ට සූයර්‍ය කුමාරයෝ ය'යි නම් තුබූහ. ඒ පුතණුවන් දූක රජ්ජුරුවෝ සතුටු ව බිසොවුන්ට 'වරයෙක් දෙමි' කිවු ය. බිසොවුන් 'පසු ව හැර ගනිමී' කියා එ වක තබා පියා පුතණුවන් වැඩි විය පැමිණි කල්හි 'රජ්ජුරුවන් වහන්ස, ම පුතුන් උපන් කල දී වරයක් දුන්නෙ ඇත්තේ වේ ද? සෙසු වරයකින් කම් නැත. ම පුතුන්ට රාජ්‍ය ය දුන මැනැවැ'යි කිවු ය. රජ්ජුරුවෝ 'මළ බිසොවුන් ගෙන් පෙරාතු උපන් පුත් දෙ බෑයෝ තෙජසින් ගිනි කඳ පරිද්දෙන් බබළති. එ සේ හෙයින් තොපගේ පුතණුවන්ට රාජ්‍ය ය දෙන්ට බැරි ය'යි කිවු ය.

රජ්ජුරුවන් එ සේ කීව ත් බිසොවුන් පසු ව උපන් පුතණු වන්ට රාජ්‍ය ය දෙන්ට කියන හෙයින්, 'පෙරාතු උපන් පුතුන් දෙන්නකු හින්ද දී උන්ගේ මෑණියන් නැති පමණකට තමාගේ පුතුට රාජ්‍ය ය ඉල්වයි. රාජ්‍ය ලොභයෙන් ම පුතුන්ට අනර්‍ථ-යක් කළ නමුත් නපුරැ'යි පුතුන් කැඳවා ලා දරුවෙනි, මම තෙල තොපගේ වෙන මවුන් දරු මලණුවන් උපන් සමයෙහි නො සලකා වරයක් දිනිමි. දූන් උන්ගේ මෑණියෝ රාජ්‍ය ය ඉල්වති. මම ත් තොප දෙ බෑයන් හින්ද දී උන්ට රාජ්‍ය ය නො දෙමි. ගෑනු නම් අනර්‍ථකාරී හෙයින් ගස්වල වළඳිනා ලිය ගසට නො සිතා තමාට පිහිට නිසා වළඳිනා සේ කවුරුන් වුව ත් භජනා ය කෙරෙති.

Non-Commercial Distribution

"නත්‍ථීනං පියො නාම-අප්පියොපි න විජ්ජති,
ධනං තා පතිවෙල්ලන්ති—ලතාව දුම නිස්සිතා"

යනු හෙයින් වස්තු විනා අනික් තැකිවිල්ලක් නැති හෙයින් තොපට අනත්‍ථයක් කොළෝ නමුත් නපුර. තෙපි වලට පලා ගොසින් මා අයාමෙක අවුත් රාජ්‍ය ය හැර ගනුව'යි විධාන කොට ලා යැවූහ.

උයි ත් පියාණන් වැද ලා මාළිගාවෙන් බටවු ය. බට කලට සෙණ්ඩුලුවේ[1] කෙළිමින් සිටි වෙන මවුන් දරු සූය‍්‍ය් කුමරුවෝ දෙ බෑයන් වලට නික්මුණු නියාව දන උන් හා සමඟ තුමූ ත් නික්මුණාහු ය. ගොසින් හිමවතට වන් කල්හි බෝසත්තු මඟින් ඉවත් ව රුකක් මුල ඉඳ බාල ව සිටි සූය‍්‍ය් කුමාරයන්ට 'මල. තෙල විලට ගොසින් නා පියා පැනු ත් බී පියා නෙළුම් පතෙකින් පැන් මුළකු ත් අපට ගෙනෙව'යි කිවූ ය.

ඒ විල ත් වෙසවුණු රජ්ජුරුවන් ගෙන් එක් දිය රකුස්සකුට 'දෙව් දහම් දන්නා කෙණකුන් හැර සෙසු කෙණෙක් මේ විලට බටවූ නම් උන් හැර ගෙන කව'යි විධාන කොට දෙවූ විලෙක. එ වක් පටන් ඒ රකුසු ඒ විලට බට කෙණෙක් ඇත් නම් දෙව් දහම් විචාරා පියා දන්නවුන් හැර නො දන්නවුන් කයි.

සූය‍්‍ය් කුමාරයෝ ත් රාක්‍ෂස පරිගෘහිත නියාව නො දන ඒ විලට බටුවූ ය. රකුස්සා ත් දෙව් දහම් විචාළ කල්හි 'දෙව් දහම් නම් හිර-සඳ ය'යි කිවූ ය. 'තොප දන්නා දෙව් දහම් නැතැ'යි කියා ලා දිය තුළට ගෙන ගොසින් තමාගේ විමන හිඳුවා ලී ය.

බෝසත්තු ත් සූය‍්‍ය් කුමාරයන් කල් යවන්නා සඳ කුමරුන් යවූහ. උයි ත් ගොසින් විලට බැස දිය රකුස්සා දෙව් දහම විචාළ කල්හි 'දෙව් දහම් නම් සතර දිග ය'යි කිවූ ය. දිය රකුසු උනු ත් දෙව් දහම් නො දන්නා නියාව දන හැර ගෙන ගොසින් තමාගේ විමන හිඳුවා ලී ය.

බෝසත්තු උනු ත් කල් යවන්නා උවදුරක් ඇති නියා ය යි තමන්දෑ ගොසින් දෙන්නා ම බට පිය මුත් නැඟි පිය නො දක මේ විල රාක්‍ෂස පරිගෘහිත විලෙක් වනැ යි දන කඩුව කර එවා ගෙන නිර්භීත ව වසවත් මරු කෙරේ භය නැති වීමට කරණ

[1] සෙණ්ඩුවාළුවේ—ඇතැම්.

Non-Commercial Distribution

අභියොගයක් මෙන් තර ව සිටි දැ ය. රකුස්සා ත් බෝසතුන් බුදු බව නිසා සසරට බටුවා සේ විලට නො බස්නා නියාව දැන වල කර්මාන්ත කරණ මිනිසකුලෙසින් අවුත් 'පින්වත, තෙපි ගමනේ විඩාවිය. විලට බැස ගිම් නිවා නො නාන්නේ ත් හැයි ද, පිපාසා නිවා පැන් නො බොන්නේ ත් හැයි ද, බැස ලා නා ත් පියා පැනු ත් බී පියා නෙළුම්බල ත් කා ගෙන මල් පැළඳ ගෙන යව'යි කී ය. බෝසත්තු උන් දැක ම යම් රකුස්සෙක් මේ විල වෙසේ නම් මේ ඒ ම ය'යි සියල්ල ම දන්නා නුවණින් දන්නා සේ ම අනුමාන ඥානයෙන් දැන 'තෙපි මේ විල වසන රකුස්සාණෝ ද' යි නො විචාරා 'අපගේ මල් බැයන් දෙන්නා හැර ගත්තෝ තෙපි දැ'යි විචාරා 'එ සේ ය'යි කී කල්හි 'කුමක් නිසා දැ'යි විචාළහ.

'මම මේ විලට බට කෙණෙක් ඇත් නම් ලැබෙමි' තමාගේ බසින් ම රකුසු නියාව දැන ගත හෙන මහ බෝසතුන්ට හැඟවී ය. 'කුමක් ද, බට යම් කෙණකුන් ම ලබවු දැ'යි බෝසත්තු විචාරා 'දෙව් දහම් දන්නවුන් හැර සෙස්සන් ලැබෙමි' කී කල්හි 'තොපට දෙව් දහමින් ප්‍රයොජන ඇද්දැ'යි විචාරා 'එ සේ ය'යි කී කල්හි බෝසත්තු ත් 'ඒ මම දනිමි' කිවු ය. 'එ සේ කල කිව මැනැවැ'යි කී කල්හි 'ධර්ම ය නම් සත්ත්ව සන්තානයේ අපවිත්‍ර නො වත් අපවිත්‍රදෙයක් වී නම් දේ ද අපවිත්‍ර ශරීර ය හැර ගෙන කිව මනා ය. නො එක් ලෙසින් සැරහී සිටිනා ධර්ම ය ඉස් සෝධා නා සැරහී මුත් කියන්නට බැරි ය'යි බෝසත්තු කීහ. රකුසු ත් මහ බෝසතුන් ඉස් සෝධා නාවා පියා පැන් පොවා ලා මලින් ගඳින් සරහා ලා සරහන ලද රුවන් මඩුවෙක පනවන ලද හස්නෙක හිඳුවා ලා තුමූ පා මුල හුන, බෝසත්හු ද–

"හිරිඔත්තප්පසම්පන්නා—සුක්කධම්මසමාහිතා,
සන්තො සප්පුරිසා ලොකෙ—දෙවධම්මාති වුච්චරෙ"

යනු හෙයින් 'යම් කෙණෙක් අමෙධ්‍යයෙහි ග්‍රාම සූකරයා මෙන් නො ව පාපයෙහි ජුගුප්සාකාරයෙන් පවත්නා ලජ්ජාව හා වහ්නියෙහි සලභයා මෙන් නො ව පාපයෙහි භයාකාරයෙන් පවත්නා ඔතපු ත් ඇත්තෝ ද, එයින් අවශිෂ්ට වූ ත් ශීලසමාද්ධ්‍යාදී ගුණයෙන් යුක්තයෝ ද, නැවත රාගාදි එකොළොස් ගින්න තදඞ්ගාදි වශයෙන් නිවා ගත් හෙයින් සන්හුන්නු ද බුද්ධාදී වූ සත්පුරුෂයන්ගේ ස්වභාවයෙහි පිහිටි හෙයින් සත්පුරුෂයෝ ද ඒ හිරිඔතප් ආදීහු සංවෘති ආදි වූ දෙවත්වයට කාරණ හෙයින් දෙවධර්ම හ'යි කුණ්ඩල ජාතකයෙහි හූරු ව උපන් බෝසතුන් ධර්ම ය

Non-Commercial Distribution

නම් මඩ නැති විලෙක යනාදීන් කියා ලූ බණ සේ ම රකුස්සාට දෙව් දහම් කීහ.

රකුසු ද මහ බෝසතුන්ගේ බණ අසා පැහැද ගොසින් බෝසතුන්ට 'පණ්ඩිතයෙනි, මම තොප කෙරෙහි පහනිමි. පහන් මම එක් මලණු කෙණකුන් දෙමි. කවර මලණුවන් දෙම් දැ'යි විචාළහ. කායර්‍ය ශක්ති ය හඟවන බෝසත්හු බාල මලණුවන් ගෙනවුත් දෙන්ට කීහ. ඒ අසා රකුසු තෙමේ 'පණ්ඩිතයෙනි, තෙපි නුවණැති හෙයින් දෙව ධර්‍මය දනුව. දන්නා පමණක් මුත් තොප ඊ පවත්නේ නැතැ'යි කී ය. 'කාරණ කිම් දැ'යි විචාළ හෙයින් වැඩි මාලු තැනැත්තවුන් හින්ද දී බාල මලණුවන් ගෙන් වන හෙයින් කුල දෙටුවන් පිදීම නැති නියා වේ දැ'යි සිතා ය'යි කීය. ''මෙම්බා රකුස්සාණෙනි, මම දෙව ධර්‍මය ත් දනිමි. ඊ ත් පවතිමි. එතකුදු වුව ත් අපි මේ වලට එන්නමෝ ත් මුන් නිසා ආම්හ. උන් නිසා ආයේ හැයි දැ'යි යත හොත් මූ වෙන මැණි කෙණකුන්ගේ පුතණු කෙණෙක. මුන්ගේ මැණියෝ වර ඉල්වන ගමනේ මුන්ට රාජ්‍ය ය ඉල් වූ ය. අපගේ පියාණන් වහන්සේ එ ලෙස නො කොට මුන්ගේ මැණියන්ගෙන් අපට උවදුරක් වේතී සිතා අප රක්නා නිසා වලට එවූ සේක.

මේ කුමාරයෝ ත් අප නොකැඳවා ම අප හා කැටි ව අවු ය. ඔබ ගිය කල මුන් විචාළවුන්ට 'වල යකෙක් හැර ගතැ'යි කීමෝ නමුත් අප ගැළවී ගිය කුලට කිසි කෙණකු ත් හදහා නො ගනිති. රාජ්‍ය ලොභයෙන් මරා පුව යි ම සිතති. අනික් තැනත් තවුන් එක් කුසේ උපන් හෙයින් යකෙක් හැර ගතැ යි කී කල 'එ සේ ව ත් මුත් මුන් එන කල අරුන් අනික් ලෙසකට නස්නව කාරණ නැතැ'යි ඒ හදහති. නින්‍දා පරිභවයෙන් මිදෙනු නිසා මුන් ගෙන්වමී''යි කිවු ය. බෝසතුන් කෙරෙහි රකුසු තර ව පැහැද 'සත් පුරුෂයාණෙනි, දෙව් දහම් දන්නා නියා ත් එහි පවත්නා නියා ත් යහපතැ'යි දෙ බෑයන් ම ගෙනවුත් ආළවක නම් යක් සෙනෙවියා හස්තාළවක කුමාරයන් බුදු වූ අවස්ථාවෙහි දුන්නා සේ ම දුන්හ. මහ බෝසත්හු ද රකුසු වීමෙහි බොහෝ ආදීනව කියා පන්සිල් පිහිටුවා ලා ප්‍රාණ වධ හැර වූහ.

මහ බෝසත්හු ද රකුස්සාගේ සහායෙන් කිසි ත් උපද්‍රවයක් නැති ව වල රඳා හිඳ ලා පියාණන් මළ කල රකුස්සා ත් කැඳවා ගෙන බරණැසට අවුත් රාජ්‍යයෙහි පිහිටා සඳ කුමරුන්ට යුවරජ තන තුරු දීලා, සූර්‍ය කුමරුන්ට සෙනෙවිරත් තනතුරු දී ලා

Non-Commercial Distribution

රකුස්සාණන්ට ත් සිත් කළ තැනෙක දෙවොලක් කරවා ලා බොහෝ ලාභ සත්කාර ලබන ලෙසට ප්‍රසිද්ධ කළහ.

බුදුහු මේ ජාතක දේශනාව ගෙන හැර වදරා 'එ කල බොහෝ පව් රැස් කළ දිය රකුසු නම් මේ කල බොහෝ පිරිකර රැස් කළ මහණ ය. එ කල සූර්‍ය්‍ය කුමාරයෝ නම් දැන් අනඳ මහ තෙර හු ය. එ කල සඳ කුමරු නම් දැන් සැරියුත් මහ තෙරහු ය. එ කල මහිංසාසක කුමාරයෝ නම් මම ම ය'යි ජාතක ය වදරා 'මහණ, තෝ පෙර දෙව් දහම් සොයමින් හිරි-ඔතප් ඇති ව යක්‍ෂ ව පවා වැස දැන් බුදු හමුවෙහි සිවු වනක් පිරිස් මැදට පැමිණ පොරෝන ය දමා පියා හඳන ය පමණකින් සිටි නියාව යහපත් නොවේ'යි වදරා බණ වදරණ සේක් 'මෙලෙසින් සංසාර සුද්ධි ය කරම්හ'යි පිළි නො හැඳ හැව්දීමෙනු ත් දළ ඕඩුලු ධැරීමෙනු ත්, දැව්ටි නො කෑමෙන් මැලි හුන් දත් ඇති වීමෙනු ත්, නැවත කුඩු මසුරු දෙයක් මුත් බත් අනුභව නොකිරීමෙනු ත්, හැඳ කළාල් ආදියෙහි වැද හෙවීම් හැර බිම හෙවීමෙනු ත්, තව ද ඉස් සේදීම් නැම් නැති වීමෙන් තුඹස් ගොඩවල් සේ ධූලි තැවරීමෙනු ත්, එලිල්ලෙන් හිඳ ප්‍රධන් වීර්‍ය්‍ය කිරීමෙනු ත්, පිළිවෙත් නො පිරෙ යි. හුදක් මිථ්‍යාදෘෂ්ටි ය ම ප්‍රකාශ වෙ යි. තව ත් අනිකෙක් වේ නම් ශරීර පීඩා පමණෙක. මෙ සේ කළ පමණෙකින් සත්කායදෘෂ්ටි ය වඩිතො ත් මුත් ප්‍රහීණ වන්ට නැති හෙයින් මේ ලෙස කොට ඇවිද්දහු නිවණට පමුණුවා නො ලයි' වදළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ. පරිෂ්කාර බාහුලික නමට පෙනුණ අධිගමයෙක් නැත. දෙශනාව වාසනාභාගිය නො වන්ට කාරණ නැත.

එ හෙයින් සත් පුරුෂයන් විසින් ෂඩ්විශුද්ධි පරම්පරාවෙන් ගොසින් සත් වැනි වූ ඥානදර්‍ශන විශුද්ධියට පැමිණිය යුතු.

---

## 128. සන්තති ඇමැත්තන් ගේ වස්තුව

තව ද පින්කම සමාදන් කරවීමෙහි විපාක හඟවනු නිසා සන්තති ඇමැත්තන් ගේ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්-

ඒ ඇමැත්තාණෝ එක් කලෙක කොසොල් රජ්ජුරුවන්ගේ පසල් දනවුවෙ සොරුන් හකුළුවා ලා අවු ය. කොසොල් රජ්ජුරුවෝ උන් කළ සපන්කමට සතුටු ව සත් දවසකට රාජ්‍ය ය දී ලා නැටීම්, ගී කීමෙහි දක්‍ෂ වූ ස්ත්‍රියක ත් තත්විෂ ය සුඛානුභව ය

Non-Commercial Distribution

පිණිස පාවා දුන්හ. සන්තති ඇමැත්තෝ ත් සත් දවස මුළුල්ලෙහි රා බී මත් ව සත් වන දවස් සව් බරණ ලා සැරහී ඇතු පිට හිඳ ගෙන ගඟට යන්නෝ සිහා වඩනා බුදුන් වාසල කෙරේ දී දක ඇතු පිට හිඳ ම වැඳ ලා හිස සළ සළා නික්මුණාහ.

බුදුහු ත් සිනා පහළ කොට වදරා ලා අනඳ මහ තෙරුන් වහන්සේ සිනා පහළ කිරීමට කාරණ විචාළ කල්හි කාරණ වද රන බුදුහු 'ආනන්දයෙනි, සන්තති ඇමැත්තන් ඇතු පිට හිඳ ගෙන ගඟට යන්නවුන් දුටුවා ද? අද ම හත් පළන් පිටින් මා කරා අවුත් සතර පදයකින් යුත් ගාථාවක් ම ගෙන් අසා ඒ ගාථා කෙළවර තමන් ලත් රාජ්‍ය ය එ දවසින් ඔබබට නැත ත් නිවන් රට සාධා අර්හත් ඵල වොටුනු පැළඳ, ආස සත් තලක් නැඟි ලා හිඳ පිරිනිවන් පයිති. ඇසිල්ලකට තමන් කරණ කට යුතු සලකා සිනා සී ගෙන ගියා සේ ම දක සිනා පහළ කෙළෙමී'යි වදළ සේක.

බුදුන් අනඳ මහ තෙරුන් වහන්සේට වදරන කථාව බොහෝ දෙන ඇසූ ය. ඉන් මිථ්‍යා දෘෂ්ටිකයෝ 'මහණ ගොයුම්හුගේ කට යුතු බලව. කියා ලූ දෙයක් නපුරැ යි කියන්නවුන් නැති හෙයින් දෝ කටට ආ දෙයක් ම කිය යි. සන්තති ඇමැත්තෝ රා බී මත් ව පියා මොළ කම් කොට ඇවිදිනෝ හත් පළන් පිටින් තමන් කරා අවුත් තමන්ගේ බණ අසා රහත් ව වෘද්ධ නො ව පිරිනිවන් පයිත් ල. මේ කවුරුන් හැදහු ව මනා දෙයෙක් ද? බසක් නම් කියා ලන කල අනුනු ත් හදහා ගන්නා ලෙසට කිව මනා වේ ද? මුන්ගේ බසෙහි ම සැබැව බොරුව අද ම දත හැක්ක. අද ම ය යි නියම කොට කියා ලූ හෙයින් පසුව කලෙ කදී රහත් වූ නමුත් මුන්ගේ බස බොරුම ය. බොරුවෙන් හසු කරම්හ'යි කහවිසුනන්ට හං දෙකක් නැත්තා සේ බුදුන්ගේ ත් දෙ බස් නැත ත් තමන් හැම කියා කොට ඇවිදිනා බොරු ම හෙයින් එ ලෙස සිතූ ය.

සම්‍යක් දෘෂ්ටිකයෝ 'සර්වඥවරයන්ගේ ආනුභාවයක් බලව. අද බුදුන්ගේ අනන්‍යසාධාරණ වූ සර්වඥ ලීලාව ද සන්තති ඇමත් තන්ගේ ලීලාව ද දකුම්හ. බුදුන් වදළ දෙය නම් ආසට දමා ලූ කැට බිම හී නමුත් නො නවත්නා සේ වන්නේ නියත ය'යි සිතූ ය.

සන්තති ඇමැත්තෝ ද ගඟට ගොසින් කෙලෙස් ගිම් නිවන්ට පෙරාතු අවු ගිම් නිවන්නා සේ දවස මුළුල්ලෙහි දිය

Non-Commercial Distribution

කෙළි කෙළ පියා උයනට ගොයින් රා මඬුල්ලෙහි රා බොන්නට හුන්හ. නළු ගැනි ද රඟ මඬලට බැස නටන්ට ත් ගී කියන්ට ත් පටන් ගත. උනු ත් නෘත්‍ය ලීලා දක්වනු නිසා සති ය මුළුල්ලෙහි පණ නොයන විතරක් මුත් බත් බොහෝ කොට නො කෑ බැවින් නටා ගී කියා ආයාස මහත් ව ඇතුළු කුස ශස්ත්‍රක නම් රුජා ඇති ව ලෙයි මස් කැපී පොළු ගැසිණ. උෟ ඒ ඇසිල්ලෙහි ඇසු ත් කට ත් දල්වා ගෙන මළහ. සන්තති ඇමැත්තෝ ද ඒ ස්ත්‍රියගේ ආයු සන්තති ය පරීක්‍ෂා කරන්ට කියා මළෝ ය යි කී කල්හි බලවත් වූ ශොක ඇති වූහ. සති ය මුළුල් ලෙහි ම පැවති රා මත හුණු කබලෙක හිස ලූ පැන් බින්දුවක් මෙන් ඒ ඇසිල්ලෙහි ම නැති වි ය.

උෟ තුමූ 'මට මේ වූ ශොක ය නිශ්ශොකී වූ බුදුන් විනා අනික් සන්හිඳුවා ලිය හෙන කෙණෙක් නැතැ'යි මහ පිරිස් පිරිවරා සවස් වේලෙහි බුදුන් කරා ගොසින් වැඳ ලා 'ස්වාමීනි, මට බලවත් වූ ශොකයෙක් ඇති වී ය. මුඹ වහන්සේ ඒ මා ශොක නමැති ගින්න දහම් නමැති වැසි වස්වා නිවා ලති සිතා අයිමි. මට පිහිට වුව මැනැවැ'යි කීහ. බුදුහු ත් 'ශොක සන්සිඳුවා ලිය හෙන්නවුන් කරා ම ය ආයෙ. මේ ගැහැනි ය මේ ලෙසින් මළ කල තොප හැඬූ ගමනේ තොපගේ ඇසින් වගුළ කඳුළු සතර මහ මුහුද පැනට ත් බොහෝ ය'යි වදරා 'පෙර තොපගේ ඇති කෙළෙස් කුණු ත් නැති කරව. පසු ව ත් තොපට රාගාදී කිලුටෙක් නො වේ ව යි දනු ත් එ බන්දෙක් නො ගෙන ශාන්ත ව ඇවිදුව'යි වදරන බුදුහු—

"යං පුබ්බෙ තං විසොධෙහි—පච්ඡා තෙ මාහු කිඤ්චනං,
මජ්ඣෙ චෙ නො ගහෙස්සසි—උපසන්තො චරිස්සසි,,

යන ගාථාව වදාළ සේක. ගාථා කෙළවර හන් පළන් පිටින් සිටි සන්තති මහ ඇමැත්තෝ ඒ ආභරණයෙන් තමන් ලබන ගුණ විශෙෂයට ප්‍රයෝජන නැති බැවින් නව ලොවුතුරා දහම් නැමැති ආභරණ ලා සැර හී රහත් ව නිවන් පුර වන්හ.

වැඳ, නැතක් දවස් එල සම වත් සුව විඳිමින් රඳා හිඳිනට ආයු ශක්ති ය බලා එ දවස් එ වේලාට මුත් ආයු ශක්ති ය නැති නියාව දැන පිරිනිවන් පානට අනුදන්වන නියායෙන් බුදුන්ට දන් වූ සේක. බුදුහු උන්වහන්සේ කළ පින් කම් තමන් වහන්සේ දනි ත ත් 'බොරුවෙන් නිගනුමහ'යි රැස් වූ මිථ්‍යා දෘෂ්ටිකයන්ට මත්

තෙහි බසක් බැණ නහා ලන්ට අවකාශයකු ත් නො පෙනුණ මැනව. සර්වඥ ලීලාව ත් සන්තති මහාමාත්‍ය ලීලාව ත් දකුම්හ 'යි රැස් වූ සම්‍යග් දෘෂ්ටිකයන් මුන් කළ පින් කම් මුන් අතින් ම අසා දැන පින් කම ඇලුම් කළ මනා වේ ද 'යි සලකා ලා 'එ සේ වී නම් රහත් වන්ට නිසි වූ තොප කළ පින් කම් අපට කියව. කියන කල ත් එයි ත් බණක් හෙයින් බිම සිට නො කියා ආස සත් තලක් පමණට පැන නැඟී ලා උඩ හිඳ කියව 'යි වදාළ සේක.

සන්තති ඇමැත්තන්දෑ ත් 'යහපත, ස්වාමීනි 'යි කියා බුදුන් වැඳ ලා අභිඥා පාදක වූ චතුර්ථ ධ්‍යානයට සම වැද ආකාශ ගමන ඉටා ගෙන ආසට තලක් පමණ නැඟී ලා බැස තව ත් බුදුන් වැඳ ලා, ආසට දෙ තලක් විතර නැඟී ලා බැස තව ත් බුදුන් වැඳ ලා, නැවත තුන් තලක් විතර නැඟී ලා බැස තව ත් බුදුන් වැඳ ලා, නැවත සතර තලක් විතර නැඟී ලා බැස තව ත් බුදුන් වැඳ ලා, නැවත පස් තලක් විතර නැඟී ලා පාත බැස බුදුන් වැඳ ලා, තව ද ස තලක් විතර ආසට නැඟී ලා පාත බැස බුදුන් වැඳ ලා, සත් වෙනි වාරයේ සත් තලක් විතර ආසට වැඩ නහා ලූ යන්ත්‍ර රූපයක් මෙන් පැන නැඟී ලා තුසී පුරෙන් මෙතේ බෝසතුන් දිව්‍යාභරණයෙන් සැදී බණ කියන්ට අවුත් හුන් කලක් මෙන් පලක් බැඳ ගෙන හිඳ 'ස්වාමීනි, මම පෙර කළ පින් අසා වදාළ මැන වැ 'යි කියා ලා 'ස්වාමීනි, මේ මුඹ වහන්සේ බුදු වූ කපට එකානූ වන කප විදර්ශි නම් බුදුන් සමයෙහි මම බන්ධුමතී නුවර එක් තරා කුලයක ඉපැද අනුන්ට ගහටක් නැති ව තමාට ත් පින් වඩනා කට යුතු කවරේ දෝ හෝ 'යි සලකන්නෙම් බණට හඬ ගෑම එ බඳු නියා ව දැන එ වක් පටන් බණ පවත්නා විටෙක බණට හඬ ගාන්නෙම් බොහෝ දෙනා සමාදන් කරවා ගෙන පින් කම් කෙරෙමි. පොහෝ දවස් පෙහෙ ත් වෙමි. දනු ත් දෙමි. බණට හඬගෑමට ම කමසේ නොව බණ ත් අසමි. තුනුරුවන්ට වඩනා අනික් රුවනෙක් නැතැ 'යි යනාදීන් තුනුරුවන්ට සත්කාර ත් කරමි.

'එක් වන් මෙ ලෙස මා කියා කරවා ඇවිදිනා නියා ව බුදුන් පිය වූ බන්ධුමා රජ්ජුරුවන් වහන්සේ දැන මා කැඳවා ලා කුමක් කොට ඇවිදු දැ 'යි විචාරා 'රජ්ජුරුවන් වහන්ස, තුනුරුවනෙහි ගුණ මා දත් තරමෙක කියා බොහෝ දෙනා පින් කම යොද ඇවිදිමි' කී කල්හි 'කවර ලෙසින් ඇවිද කියවු දැ 'යි විචාරා පයින් ගොසින් කියා ඇවිදිමි' කී හෙයින් 'පුත, තොප තෙල තරම් කටයුතු තෙල ලෙස කියා ඇවිදිනා කලට තොපගේ අදහස තරමට

Non-Commercial Distribution

තරම් නො වෙයි මේ මල් වඩම කරලා ගෙන තෙල අසූ පිට හිඳ කියව'යි මුත් හරක් වැනි මල් දමකු ත් මට දී ලා අසකු ත් දුන් දෑ ය. එ ලෙසින් මා කියා ඇවිදිනා කලට එම බන්ධුමා රජ්ජුරුවෝ මා කැඳවා ලා 'කුමක් කොට ඇවිදූ දැ යි විචාරා ආදි කරණ දෙය මැ'යි කී කල්හි 'පුත, තොප උසස් ගුණ තරමට අසා ත් තරම් නො වෙයි. තිලී හිඳ කියා ඇවිදුව'යි සුදු අසුන් සතර දෙනකු යෙදූ රථයක් දුන් දෑ ය.

'රථයේ හිඳ ත් කියා ඇවිදිනා නියාව අසා ගෙන්වා ලා 'පුත, තොප කරන්නේ කිමැදැ'යි විචාරා එ ම නියාව කී කල්හි 'පුත, තොපගේ උසස් ගුණ තරමට රථ ය තරම් නො වෙ'යි කියා ලා පළඳින්ට ආභරණ පටන් සියලු සම්පත් මට දෙවා ලා නැගෙන්ට ඇතෙකු ත් මට දුන් දෑ ය. මම ත් අද සේ ම සව් බරණ ලා සැරහී අසූ දහසක් හවුරුදු මුළුල්ලෙහි ඇත් වාහන ය පිටින් බණට අඩ ගා ඇවිද්දෙමි. එ වක් පටන් මෙ වක දක්වා බණට අඩ ගෑ පින් කමින් උපනුපන් ජාතියෙහි මාගේ සකල ශරීරයෙන් රත් සඳුනේ සුවඳ හම යි. බණ අසන්ට අඩ ගා ලූ මුඛයෙන් උපනුපන් ජාතියෙහි මානෙල් මල් සුවඳ හම යි. මේ මා කළ පිණැ'යි මෙ කපට එ කානු වන කප කළ පින් කම කියා ලා අහස හිඳ ම තෙජො කසින ධ්‍යානයට සම වැද ලා පිරිනිවි සේක. පිරිනිවි කලට සකල ශරීර යෙන් ගිනි නැගී ලා මස් ලේ නහර දවා පියා දැ සමන් කැකුළු රැසක් මෙන් ධාතු පමණෙක් තෙරිණ. බුදුහු පාත සුදක් අතුරුවා ලූ සේක. ධාතූන් වහන්සේ ඊට බට සේක. 'බොහෝ දෙන පින් පුරා ගනිති'යි ඒ ධාතු වඩා මාවත් බඩ ද ගබක් කැරවූ සේක.

ධම් සෙබෙහි රැස් ව හුන් වහන්දෑ ත් 'ඇවැත්නි, සන්තති මහ ඇමැත්තෝ බුදුන් කරා අවුත් චතුර් විධ විනෙය ජනයන් ගෙන් තමන් උද්සවිත ඟ හෙයින් ගාථා පමණක් අසා රහත් ව හන්පළන් පිටින් ම අහස හිඳ පිරිනිවියහ. කුමක් ද? මුන්ට ශ්‍රමණ ව්‍යවහාර කට යුතු ද නොහොත් බ්‍රාහ්මණ ව්‍යවහාර කට යුතු ද, භික්ෂු ව්‍යවහාර කට යුතු දැ'යි කථාව ඉපැද වූ සේක. බුදුහු එ තැනට වැඩ කෙරෙමින හුන් කථාව විචාරා වදරා මෙ නියාව දන 'මහණෙනි, ම පුතුන්ට ශ්‍රමණ ව්‍යවහාර කළ ත් සමිතපාපී හෙයින් යහපත. බ්‍රාහ්මණ ව්‍යවහාර කළ ත් බාහිතපාපී හෙයින් යහපත. භික්ෂු ව්‍යවහාර කළ ත් යහපතැ'යි වදරා බණ වදරණ සේක් 'යම් කෙණෙක් තුමූ හැඳ පැළඳ සිට ත් තුන් දෙරින් සිද්ධ වන අකුසලින් දුරු බැවින් ලොව් ලොවුතුරා සැප ත් දෙකට ම සම ව සිටිනා

Non-Commercial Distribution

කුසල්හි හැසිරෙද්ද රාගාදී කෙළෙසුන් නැති වීමෙන් සත්හුන්නු ද රූපාදී සාරමුණු නමැති වල්හි ගැලී හිඳිනා රා දෙස් ඈ කෙළෙස් සොරුන් චක්ෂුරාදි වූ සදෙර සිහි නමැති රකවල් ලා හිඳීමෙන් කෙලෙසුන් වසඟ කොට දමුණා වූ ද, චතුර්විධ මාර්ගයට පැමිණී මෙන් බොධියට ම නියත වූ ද, බුදු-පසේ බුදු සවුවන් හා බඹුන් ගේ ලෙස හැසිරෙද්ද, හිංසා-පීඩා කිරීමට හේතු නැති බැවින් සියල්ලවුන්ට කරණ හිංසා පීඩා ත් නැත්තෝ ද, උන්ට ශ්‍රමණ ය යි කියන්ට ත්, බ්‍රාහ්මණ ය යි කියන්ට ත්, බුන් කෙළෙසුන් ඇති හෙයින් භික්ෂු ය යි කියන්ට ත්, විරොධ නැතැ'යි වදළ සේක. මේ දෙශනා කෙළවර ත් බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් සන්තති මහ ඇමත්තන් තමන් සිතින් ම සිතා ගෙන කළ පින් අසා සිත තබා ගෙන එ ලෙසින් පැවත උන් ලත් ලොවී ලොවුතුරා සැප ත් තම තමා ත් සිද්ධ කටයුතු.

---

# 129. පිලොතික තෙරුන් වහන්සේ ගේ වස්තුව

තව ද නුවණැත්තවුන් කුණු කඩරෙදි පමණක් ඇඳුරු කොට තබා තමන්ට පිහිට කරණ පරිදි දක්වන්ට පිලොතික තෙරුන් වහන්සේ ගේ වස්තුව දක්වමු.

කෙසේ ද යත්—

එක් දවසක් අනඳ මහ තෙරුන් වහන්සේ කුණු රෙද්දක් හැඳ ගෙණ කබල් කෙටියක් හැර ගෙණ සිඟා කා ඇවිදිනා කුඩා සුහකු දැක 'දරුව, තොප මෙ ලෙස සිඟා කා ඇවිදීම විතරකට මහණ වූ කල නපුරු දැ'යි වදළ සේක. 'ස්වාමීනි, මම මහණ වෙමි නමුත් අප වැන්නවුන් මහණ කරණ සේක් කවුරුන් වහන්සේ දැ'යි කීවු ය. 'මහණ වීමට දුක්පත් සුවපතැ යි නැත. උන් උන්ගේ අදහස් පමණෙක. තෙපි මහණ වවු නම් මම මහණ කෙරෙමි'වද රා ලා උන් කැඳවා ගෙන ගොසින් තමන් වහන්සේ ම කමටහන් උගන්වා පීමෙන් අර්හත්වයට බාධා ත් නැති කොට මහණ කළ සේක. උන් ආදි හන් කඩ රෙද්ද ත් සෝධා පියා යමකට ගත හැකි දෝ හෝ යි විද බලා පෙරාන්කඩක් පමණට ත් තර තැනක් නො දැක කඩරෙද්ද ත් කබල් කෙටිය ත් එක් ගසෙක අත්තක් පිට

Non-Commercial Distribution

තබා ලූ සේක. අනඳ මහ තෙරුන් වහන්සේ අස්ථාන නියෝජන යක් සෙස්සෙහි ත් නැති නියා ව තෙලේ තබාලූ තරමෙන් ම දත යුතු.

උන්දෑ ත් මහණ මාලු පැවිදි ව බුදුන්ට උපන් උදය සුව සේ වළඳන සේක් මස් ලේ ඇති ව ගෙණ බුද්ධානුභාවයෙන් ලත් මාහැඟි සිවුරු වළඳනා සේක් ආදි සැටි ය නැති ව සස්නෙහි උකටලී ව 'ශාසනාභිරති ය නැති කලට සැදෑ ඇත්තවුන් දීලූ දෙයින් ප්‍රයොජන නැත. මාගේ කුණු රෙද්ද තව තිබූයේ වේ ද, ඒ හැඳ ගෙණ සිවුරු හරිමී' එ තැනට ගොසින් කඩ රෙද්ද අතට හැරගෙන බලා පියා කඩ රෙද්ද නපුරු සේ ම සිතූ සිතිවිල්ල ත් නපුරු නියා ව දැන තමන් වහන්සේ ම තමන් වහන්සේට බණන සේක් 'අලජ්ජී තැනැත්තව, වළඳිනට යහපත් සිවුරු ලැබෙන බුදුසස්න හැර පියා මේ කුණු රෙද්ද හොතාගෙණ පාත්‍රයෙන් සිඟන සිඟමන් හැර පියා කබල් කෙටි ය හැරගෙණ සිඟා කන්නට යෙහිද? මහණ වූ දවස් කුණු රෙද්ද ත් කබල් කෙටිය ත් මාපීවො ත් කඩ රෙද්ද දිරා ගියේ නම් කබල් කෙටි ය බිඳී ගියේ නම් අද කුමක් කෙරේ ද, අනේ ලජ්ජාවක් ද නැති නියා ය'යි අනික් තැනක් මෙන් තමන් වහන්සේ ම තමන් වහන්සේට ඔවා දුන් සේක. ඔවා දෙමින් සිටියදී ම උකටලිය ත් දුරු වි ය. කඩ රෙද්ද ත් කබල් කෙටි ය ත් එතැන ම තබා ලා පෙරළා වෙහෙරට ම ගිය සේක.

කීප දවසක් ගිය කලට සිත නම් එ බඳු තරමක් ඇති හෙයින් තව ත් උකටලී ව ආදි ලෙස ම කඩ රෙද්ද තුබූ තැනට ගොසින් කඩ රෙද්ද බලා පියා උන් ම කියන මාලු කමක් මෙන් මාලු කම් කියාගෙණ නැවත විහාරයට ගොසින් ඇවිදීම් බොහෝ කලට වහන් දෑ ත් එක්වන් කොයි ගොස් එවූ දෑ'මී විචාරන සේක. එ සේ විචාළ වහන්දෑට අපගේ ආචාරීන් වහන්සේ ළඟට ගොසින් ඔබ ගෙන් අවවාද ලැබ එම්හ'යි කියා ලා මෙ ම ලෙසින් තමන් වහන් සේගේ කඩරෙද්ද හා කබල් කෙටිය භාවනා විධි උගන්වාලන්ට අශක්ති වුව ත් ශාසනාභිරති ය උගන්වාලන්ට ශක්ති ඇති හෙයින් උන්ගේ මාලු කමින් ශාසනෙන් උකටලී හැර ශාසනාභිරති ය ඇති ව විවසුන් වඩා කීප දවසකින් ම රහත් වූ සේක.

රහත් ව සසර ගමන් නැති වූවා සේ ම කඩ රෙද්ද තුබූ තැනට ත් ගමන් නැති කලට වහන්දෑ 'හැයි, ඇවැත්නි, දූන් ආචාරීන්

Non-Commercial Distribution

කරා ගමන් නැද්දැ'යි විචාළ සේක. 'යන්ට කාරණ අවධියෙහි යම්හ. දැන් ඒ කාරණ ය සුන් හෙයින් නො යම්හ'යි වදාළ සේක. වහන්දැ ද බුදුන් කරා ගොසින් 'ස්වාමීනි, පිලෝතික තෙරහු තමන් රහත් නියාවක් කියති'යි දැන් වූ සේක. බුදුහු ත් ඒ අසා 'එ සේ ය, මහණෙනි, ම පුත්තු කෙලෙස් සිතින් කිලුටු අවසථා වෙහි සසර ගමන් බොහෝ වූවා සේ ම බොහෝ කොට ඇවිද්දෝ ය. දැන් තමන් නිකෙලෙස් හෙයින් සසර ගමන් නැති වූවා සේ ම ඒ ගමන ත් නැති වී ය'යි වදරා ලා බණ වදරන බුදුහු 'යම් සේ හික්මුණා වූ අසෙක් තමා කරා හෙන සැමිටි ය වළහමින් තමා ඇඟ වැද ගත නොදේ ද, එ මෙන් ම යම් කෙණෙක් මහණ ධම් කරන්නෝ තමන්ට උපදනා නින්‍දා පරිභව තමන් කරා වැද්ද නො දී කම් බලයකින් මෙ ලොව දී වැද ගියෝ නමුත්[1] පර ලොව වළහා පියත් ද එ සේ වූ තමන්ට උපන් අකුසල් සිත් ලජ්ජාවෙන් දුරු කොට ගන්නා කෙණෙක් පිලොතික තෙරුන් මෙන් කිසි කෙණෙක් ම වෙති.

තව ද යම් සේ සොඳුරු වූ අසෙක් යම් කිසි අවලාදෙයකින් සැමිටි පහරක් කා පියා අප වැන්නහු ත් සැමිටි පාර කන නියා වේදැ'යි පසු ව උත්සාහ කෙරේ ද, එපරිද්දෙන් තෙපි හැම ත් කෙලෙසුන් තවන වීය්‍ය්‍ය ත් ඇති ව ව. සසර කළකිරීමු ත් ඇති ව ව. එ සේ වූ තෙපි ලොවී ලොවුතුරු සැදැ ත් ඇති ව සිවු පිරිසුදු සිල්හි පිහිටා කායික වූ ත් චෛතසික වූ ත් වීය්‍ය්‍ය ඇති ව ලොවී ලොවුතුරා සමාධි ත් උපදවා ගෙණ හෙවත් ධ්‍යාන පාදක වූ මාගී ඵල උපදවා ගෙණ කාරණාකාරණ දන්නා නුවණ ත් ඇති ව ත්‍රිවිද්‍යා හෝ අෂ්ටවිද්‍යා හෝ උපදවාගෙණ සීලාදී පසළොස් චරණ ධම්යනු ත් ඇති ව හැම තැන්හි ම සිහි ඇති ව සසර බොහෝ කලක් විඳ ආවා වූ බොහෝ දුක් පිලොතික තෙරුන් කඩ රෙද්ද හා කබල් මකටි ය අරමුණු කොට හළුවා සේ සසර විඳ ආ දුක් ම අරමුණු කොට හරුව'යි වදාළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් මේ දෙශනාව සිත්හි තබා කෙලෙසුන් වශහ නො ව කුසල් පුරා ත්‍රිවිධ බොධීන් එක් බොධි යක් සිද්ධ කට යුතු.

---

1. වැරදැ ගියෝ නමුත් – වැද්ද ගියෝ නමුත්

Non-Commercial Distribution

# 130. සුබ සාමණේර වස්තුව

තව ද කුසලයෙහි ම අනුසස් දක්වනු සඳහා සුබ සාමණේර වස්තුව කියමු.

කෙ සේ ද යත්—

යට ගිය දවස බරණැස සිටාණන් ගේ ගන්‍ධික කුමාරයෝ ය'යි පුතණු කෙණෙක් ඇත. රජ්ජුරුවෝ උන්ගේ පියාණන් මළ කල උන් ගෙන්වා ලා ශොක තුනී වන ලෙසට අස්වසා ලා ඒ කුමාර යන්ට මහ පෙරහරින් සිටු තනතුරු දුන්හ. උෘ එ වක් පටන් ගන්‍ධික සිටාණෝ ය'යි ප්‍රසිද්ධ වූ හ.

ඉක් බිත්තෙන් උන්ගේ භාණ්ඩාර ගෙය බලන තැනැත්තෝ වස්තු තිබෙන ගබඩාවල දෙරවල් හැර ලේකම් කියවා 'ස්වාමීනි, මෙ තෙක් වස්තු මුඹගේ දෙ මවු පියන් සන්තක දෙය ය. මේ මේ මුතුන් මී මුතුන් ආදීන් සන්තක ය' යි වෙන වෙන ම පැවූ ය. උයි ත් ඒ වස්තු රාශි ය දුක 'කුමක් ද? ඒ අපගේ දෙ මවු පිය ආදීහු නො ගෙණ ගියෝ ද'යි විචාළෝ ය. ස්වාමීනි, මිය පර-ලොව යන කල තමන් කළ කුසල් ගෙණ යත් මුත් යටත් පිරිසෙයින් කොකු මස්සක් විනර ත් ගෙන යන්නෝ නැතැ'යි කිවු ය. ගන්‍ධික සිටාණෝ සිතන්නෝ 'උෘ හැම දෙන තමන් නුවණ නැති හෙයින් උපයා රැස් කොට තබා ලා ගියහ. මම වැළි ත් මිය පර ලොව යත ත් හැර ගෙණ ම යෙමී' සිතූ ය. සිතන ගමන ත් දන් පින් විෂයක් නො සිතා 'මේ සියල්ල ම අනුභව කොට නිමවා පියමි. එ සේ කලට භාවිත කළ දෙයක් මෙන් කැටි ව ගෙණ ගියා හා සරි ය'යි සිතූහ.

එ සේ සිතා ලා උෘ තුමූ 'නුවණින් කෙරෙමි'යි සිතූ පමණක් මුත් නුනුවණින් ම මසු ලක්‍ෂයක් දී ලා පිළිවහණ මුවා නහන කොටුවක් කැරවූහ. එ සේ ම මසු ලක්‍ෂයක් දී ලා නාන්ට දැවාණමය පෝරු වක් කැරවූහ. එ සේ ම මසු ලක්‍ෂයක් දී ලා බත් කන්ට හිඳිනා පල හක් කැරවූහ. ලක්‍ෂයක් ම දීලා බත් කන්ට රන් තළියක් කැරවූ ය. තව ත් ලක්‍ෂයක් ම දී ලා හිඳ බත් කන තැන මණ්ඩපයක් කැර වූ ය. ලක්‍ෂයක් ම දී ලා බත් කන කල තළි ය තබන්ට මොරව-යක් කැරවූ ය. ලක්‍ෂයක් ම දී ලා බත් කන නියා හැම දෙනාට පෙනෙන්ට සී මැදුරු කවුළු දෙරක් කැරවූ ය.

මෙ සේ ඒ හැමයට සත් ලක්‍ෂයක් වියදම වි ය. තමන්ට දවල් බතට අංගාණි ආදී ය නිසා මසු දහසක් දෙති. රෑට

Non-Commercial Distribution

බතට ත් අංගාණියට හා සෙසු ත් වුව මනා දෙයට මසු දහසක් දෙති පුර පසළොස්වක ත් අව පසළොස්වක ත් බත් කැමට වියදමට මසු ලක්‍ෂ ය ලක්‍ෂ ය දෙවති. ඒ පොහෝ දවස් දෙකෙයි දී ලක්‍ෂයක් දී ලා නුවර සරහවා ලා 'ගන්ධක සිටාණන් බත් කන ලෙස බලන්ට හැම දෙන රැස් වුව මැනැවැ'යි නුවර බෙර ලවති. බොහෝ දෙන ත් රැස් ව බත කන ලීලා බලන්ට මැසි මත්තේ මැසි බඳිති. ගන්ධක සිටාණෝ ද නහන කොටුවේ නහන පෝරුවේ හිඳ ගෙන සුවඳ පැන් සොළොස් කළයකින් නා පියා සී මැදුරු කවුළු ව හැර ලා පළඟ පිට හිඳිති. උන් ඉදිරියේ මොරවය තබා ලා ඊ මත්තේ රන් තළි ය තබා ලා අගය කළ කලට ලක්‍ෂයක් වටනා බත බා ලති. උයි ත් නළුවන් පිරිවරා ශ්‍රී සමෘර්ධීන් යුක්ත ව බත් කති.

පසු ව කලක දී එක් පිටිසර වැසි එකෙක් තමාට වුව මනා දෙයක් හැර ගන්නා නිසා දර පළා ආදි ය ගැලෙක ලා ගෙන නුවරට අවුත් යාළුවාණ කෙණකුන්ගේ ගෙයි නවාතැන් ගත්හ. එ දවස් වැළි ත් පසළොස් වක් දවස ය. 'ගන්ධක සිටාණන් බත් කන ලෙස් බැලුව මැනැවැ'යි නුවර බෙර ලැවූ ය. අමුතු ව අවුත් නවාතැන හුන් පිටිසර වැසි තැනැත්තවුන්ට 'මිත්‍රයාණෙනි, ගන්ධක සිටාණන් බත් කන සැටි දුටු විරූ ඇද්දැ'යි විචාරා නුදුටු විරිමි'යි කී කල්හි 'තෙල බෙර ලවන්නේ ඒ බලන්ට යන්ට ය. වරෝ, යමහ'යි නුවර හිඳිනා තැනැත්තෝ පිටිසර වැසි තැනැත්තන් කැඳවා ගෙන ගියහ.

බොහෝ දෙන ත් විස්ම පත් ව බලති. පිටිසර වැසි තැනැත්තෝ ඒ බතෙහි ආලයක් ඇති ව මිත්‍රයාණන්ට 'තෙල බත් තළි-යෙන් බත් පිඩකට ආසා ඇති වී ය'යි කිවූ ය. 'සබඳ, ඊට ආලයක් නො කරව. ඒ ලද නො හැක්කැ'යි කිවූ ය. 'සබඳ, ඒ නොලදිම් නම් ජීවත් විය ත් නො හෙමි'යි කිවූ ය. නුවර වැසි තැනැත්තෝ කියා ගිවිස්වා ගත නො හී පිරිස් කෙළවර සිට 'ස්වාමීනි, මුඹ වඳිමි'යි තුන් විටක් කොට වැද හඬ ගා ලා 'කවුරුදැ'යි විචාළ කල්හි 'මම ය. 'ස්වාමීනි'යි කිවූ ය. 'කුමකට දැ'යි විචාළ කල්හි 'මේ පිටිසර වැසි එකෙක් තමාගේ පින් නො සලකා තෙල බත් තළියේ බතින් බත් පිඩකට ආල ය කෙරෙයි. එක බත් පිඩක් දෙවුව මැනැවැ'යි කිවූ ය. මෙ ලෝ කාරිය මුත් පර ලෝ කාරියෙහි සිති-විල්ලක් නැති හෙයින් දෙන්ට බැරි ය යි කිවූ ය. 'සබඳ ඇසුවෙහි වේ දැ'යි බත ආල ය කළ පිටිසර වැස්සාට කිවූ ය. ඇසීම් ම ය.

Non-Commercial Distribution

එ තකු දු වුව ත් සිටාණන් දී ලන්ට මැළියා සේ ම මම ත් ආලය හැර ලන්ට මැළියෙමි. නො ලදෙත් මියෙමි'යි කිවු ය.

නුවර වැසි තැනැත්තෝ 'ස්වාමීනි, තුලූ තිලින් බත් පිඩක් පමණ නො ලද්දෝ නම් මියෙ ත් ල. උන් රැක සසර සිටිනා තෙක් බොහෝ කලක් ජීවත් වන්ට හෙතු කළ මැනැවැ'යි කිවු ය. සිටාණෝ කියන්නෝ පින්වත, මින් බත් පිඩෙක් නම් සියයකු ත් දෙසියකු ත් වට්ටි. තුලුන්ට දුන් නියා බලා යම් යම් කෙණෙක් ඉල් වූ නම් උන් උන්ට දෙන කලට අප අනුභව කරන්නේ කිම් දැ'යි කිවු ය. කෙ සේ වුව ත් ආල ය තර වූ හෙයින් නොලද්දු නම් මූ තුමූ මියෙති. තිලින් පිඩක් දුන්නොත් උන්ට ජීවිතය ත් දුන්නා නම් වන සේක. දෙන්ට ම වුව මැනව. තුලුන් පිටිසර වැසි හෙයින් ආල ය කළ බව මූත් නුවර ඇත්තෝ ඊට කුමට ආල ය කෙරෙත් දැ'යි කියා ත් තරයේ ම කිවු ය. 'නොමිලයෙක දෙන්ට බැරී ය. නො ලදෙත් ජීවත් නො වෙත් නම් තුන් හවුරුද්දක් විනර අපගේ ගෙට බැල මෙහෙ කරන්නා බත් පිඩක් තබා බත් තළියක් ම දෙවා ලමි'යි කිවු ය.

පිටිසර වැසි ත් ඒ අසා 'සබඳ, යහපතැ'යි කියා ලා අඹුදරුව නු ත් හැර එක් බත් තළියක් වුව ත් ඉන් සිද්ධ වන ප්‍රයොජන බොහෝ හෙයින් දෝ තුන් හවුරුද්ද තුන් මසක්, තුන් දවසක්, තුන් පැයක් කොට ත් නොසි තා සිටාණන්ගේ ගෙට බැළමෙහෙ කරන්ට අවුත් කළ මනා බැළ මේ සකස් කොට ම කෙරෙති. ගෙයි වෙව, යි දඩ වෙව'යි දුවල් වෙව යි රැ වෙව යි යම් මෙයක් ඇත් නම් මුන් ගෙන් ම නිමන්නා සේ තිබෙ යි. බත් බැළයා කියා ඒ නමින් ම සියලු නුවර ප්‍රසිද්ධ වි ය. එක් දහස් අසූ දවස පිරුණු කලට බත් බෙදා දෙන තැනැත්තෝ ගන්ධක සිටාණන් කරා ගොසින් 'ස්වාමීනි, බත් බැළයාට තුන් හවුරුද්දේ එක් දහස් අසූ දවස පිරිණ. මෙ තෙක් දවසේ බැළ මේ කරණ ගමනේ එක් දවසෙක ත් අඩුවක් නො පෑ මෙහෙ කළ නියාව යහපත් ම ය'යි කිවු ය. සිටාණෝ ත් ඒ අසා තමන්ට දෙ වේල බතට පොහෝ දවස හෙයින් දෙ ලක්‍ෂයක් හා බත් බැළයන්ට දුවල් බතට තමන් කන තරමේ හෙයින් ලක්‍ෂයෙකැ යි තුන් ලක්‍ෂයත් දෙවා ලා 'අද මට කළ මනා පෙරහරෙක් ඇත් නම් බත් බැළයන්ට ම කරව'යි කියා ලා 'චින්තාමණී' නම් අපගේ සිටු දුවණියන් හැර සෙස්ස මුළුල්ල ම දද උන්ට ම කළ මනා දෙය කළ මැනැවැ'යි කියා ලා සියලු සම්පත් ම බත් බැළයන්ට නිල කළහ.

Non-Commercial Distribution

බත් බැළයාණෝ ද සිටාණන් නානා පැනින් උන් ම නහන කොටුවේ උන් ම හිඳිනා ගල්පෝරුවේ හිඳ නා පියා උන් හඳනා සළු හැඳ උන් බත් කන්ට හිඳිනා පලඟ ම හුන්හ.

ගන්ධක සිටාණෝ ද 'බත් බැළයෝ ගන්ධක සිටාණන්ගේ ගෙට තුන් හවුරුද්දක් බැළ මේ කොට බත් තළියක් ලද්ද. උන් බත් කන සැටි බලන්ට නුවර වැස්සන් අව මැනැවැ'යි නුවර බෙර ලැවූ ය. බොහෝ දෙන ත් මැසි මත්තේ මැසි ලා ගෙණ බලති. බැලූ බැලූ තැන් වෙව්ලන්නා සේ විය. නළුවෝ ත් පිරිවරා ගෙණ සිටියහ. එක් දහස් අසූ දවසේ කළ මෙහෙ බලත් බත් තරමට එක දවසක නො කළා හා සරි ය. බත් තළිය ත් ගෙනවුත් ඉදිරියේ තබාලූ ය. බත් කන්ට ය යි අත සෝදන වේලාට ගඳමහන්[1] පව්වේ නන්‍ද මූලක නම් ලෙණ වසන පසේ බුදු කෙණකුන් වහන්-සේ නිරොධ සමාපත්තියට සම වැද සත් වන දවස් නිරොධයෙන් නැඟී 'අද සිහා කොයි යෙම් දෝ හෝ' යි බලන සේක් බත් බැළ-යන් බත් කන්ට හුන්නවුන් හැම දෙනා බලන හෙයින් තමන් වහන්සේ ත් බැලුවා සේ දුටු සේක.

දූක ත් 'මූ තුමූ හවුරුදු ගණනින් තුන් හවුරුද්දක් හා මස් ගණනින් ස තිස් මසක් හා දවස් ගණනින් එක් දහස් අසූ දවසක් හා පැය ගණනින් සිවු සැට දහස් අව සියක් පැයෙහි මෙහෙ කොට ත් බත් තළියක් ලද්ද. බත් තළි ය නිසා ගත් දුක් මහත. දුක් නිසා ඇති වන සැදෑ ත් ඇත. මූට සැදෑ ඇද්දෝ හෝ' යි වීම සන සේක් සැදෑ ත් ඇති නියාව දැන 'සැදෑ ඇත ත් සමහර කෙ-ණෙක් සංග්‍රහසීලි නො වන හෙයින් සංග්‍රහ කට නො හෙති. මේ තමේ සංග්‍රහ කට හේ දෝ හෝ'යි බලන සේක් සංග්‍රහ ත් කට හෙති. කළ සංග්‍රහ ලෙසට මහා සම්පතු ත් ලැබෙ යි දැන, ගැටවටු ගන්වා සිවුරු වැළඳ ගෙණ පාත්‍ර ය පටවා ගෙණ දකුණු මූහූදු ගමන් ගත් නැවක් මෙන් අහසින් අවුත් බිමට බැස ලා උන්ට ඉදිරි ව ලා සිටි සේක.

බත් බැළයෝ ත් පසේ බුදුන් වැඩ සිටි නියාව දැක 'පෙර මා දනක් දී ලිය නුහුණු හෙයින් එක බත් තළියක් නිසා තුන් හවු රුද්දක් මුළුල්ලෙහි අනුන්ට බැළ මෙහෙ කෙළෙම්. එ තෙක් කලින් ලත් බත් තළි ය රැක ලා නම් දවසක් මුත් වඩා රැක ලිය නො හෙයි. ඉදින් මේ බත් තළි ය මුන් වහන්සේට දන් දිනිම් නම්

1 ගඳමදන්,

Non-Commercial Distribution

ඔබගේ සභායෙන් කප් කෙළ දහස් ගණන් මා රැක ලයි, මෙ සිටාණන් මෙ තෙක් දවස් කා ගිය බව මුත් තැනෙක හෙළා නුවූ ව ත් මම මේ බත් තළිය මුන් වහන්සේට දන් දෙමි' තුන් හවුරුද්දෙකින් ලත් බත් තළියෙන් එක බත් පිඩක් පමණ ත් හැර නො ගෙණ දඩු පත් සපයා නැත ත් දවසකින් ඉදි කළ ගෙයක් විද පීම කල් නො යන්නා සේ තුන් හවුරුද්ද මුළුල්ලෙහි පැවැති රස තෘෂ්ණාව ඇසිල්ලකින් සිඳ පියා නිවන් රෙසෙහි ලොභයෙන් තුමූ ම තළි ය ඔසවා ගෙණ පසේ බුදුන් ලඟට ගොසින් තළි ය එක් කෙණකුන් අතට දී ලා ලොවී ලොවිතුරා සැපත් පිහිටුවනු නිසා පසඟ පිහිටුවා වැඳ ගෙණ තළි ය වමතින් අල්වා ගෙණ දකු-ණතින් පසේ බුදුන්ගේ පාත්‍රයට බත් පිළිගන්වති. පසේ බුදුහු ත් බතින් භාගයක් දුන් කලට පාත්‍ර ය අතින් වසා ගත් සේක.

බත් බැළයාණෝ 'ස්වාමිනි, මේ එක් කෙණකුන්ට මුත් වඩා නො සෑහෙන බත දෙ භාග කරන්ට බැරි ය. මේ නිසා ලබන සම් පත් ලොවී ලොවුතුරා විසින් දෙකක් වත ත් මේ බත දෙකක් කරන්ට බැරි ය. මෙ ලොවින් සංග්‍රහයකට සිතා වදරන්ට නො කැමැත්තේ ය. කරණ සංග්‍රහයක් පර ලොවින් ම කරණ බව ය. දෙවන සම්පත් නිරවශෙෂ කොට දෙවන්නා සේ මේ බත ත් නිරව-ශෙෂ කොට පිළිගත මැනව. හැම ම පිළිගන්වමි' කියා ලා බත් තළි ය ලබන්ට ඇතිවූ උත්සාහ විතරට ත් දීමට උත්සාහ බලවත් ව නිරවශෙෂ දනයෙහි විපාක බලවත් හෙයින් සියල්ල ම දන් දී ලා පසේ බුදුන් වැඳ ලා 'ස්වාමීනි, මේ බත් තළි ය නිසා තුන් හවුරුද්-දෙක ගත් දුක් පමණ නැද්ද, මේ බත් තළි ය නිසා කප් කෙළ දහස් ගණනේ දුකෙක් නො වේ ව යි, කොට නිම් වොවුන්නේ ඔබන මැණිකක් මෙන් මේ බත් තළි ය නිර්වණින් කුළු ගනීව'යි පතා ගත්හ. පසේ බුදුහු ත් 'තොපගේ ප්‍රාර්ථනා පෙර දෙ පෝයේ සඳ පරිද්දෙන් ද චින්තාමාණික්‍යයක් මෙන් ද සමෘද්ධ වෙ ව යි වදරා 'මෙ තැන රැස්වූ බොහෝ දෙන ත් මා ගඳමහන් පව්වට යන තෙක් ම බල බලා සිටිත් ව යි ඉටා ලා අහසින් ගඳමහන් පව්වට වැඩි සේක.

බොහෝ දෙන ත් ඔබගේ අධිෂ්ඨාන බලයෙන් බල බලා ම සිටියහ. පසේ බුදුන් වහන්සේ ත් ඔබ වැඩ එක බත් තළියෙන් උන්ට සිද්ධ වන සැපතු ත් බොහෝ නියාව හඟවන්නාක් මෙන් පත් සියයක් පසේ බුදුවරුන් වහන්සේට බෙදූ දුන් සේක. හැම තැන් ම යපෙන පමණ පිළිගත් සේක.

Non-Commercial Distribution

බත මඳක් වුව එ තෙක් දෙනා වහන්සේට සෑහී ගියේ කෙ සේ ද? බත් බැළයාණෝ දෙ භාග කළොත් පසේ බුදුන්ට මඳ වෙති' දෙ භාග නො කළෝ වේ ද? එ සේ කලට මේ කෙ සේ වූ නියා ද යි සෘද්ධි විෂයෙහි අනිකක් නො සිති ය යුතු ය.

බොහෝ දෙන ත් ගිය පසේ බුදුන් වහන්සේ පන් සියයක් පසේ බුදුන්ට බත් දෙන නියා ත් සෑහුණු නියා ත් දැක මෙ තෙක් කලෙක තමන් මේ තරම් විස්මයක් නුදුටු විරූ හෙයින් සාධු කාර දහස් ගණන් දුන්හ. බත් බැළයාණන් ගේ දන් නමැති වැස්සට ජනයන්ගේ සාධුකාර නමැති මේඝ නාද ය ඇති වී ය.

ගන්ධක සිටාණෝ ත් ඒ අසා තමන් බත් කන දවස් පන් සියයකට තබා එක කෙණකුන්ට ත් දීමක් ම නො පෙනෙන හෙයින් විස්මයක් නැත්තාට ආශ්චර්‍ය්‍ය ත් නැති හෙයින් සාධු කාර කොලාහලය අසා 'බත් බැළයා මා නිල කළ සම්පත ධරා ලිය නො හෙන නියා ය. රැස්වූවන් ඒ නිසා කොක්සන් ගසන නියා ය'යි සිතා එ පවත් දන්නා පිණිස මිනිසුන් එවූ ය. උයි ත් අවුත් ඒ විස්ම ය දුන සැපත් ලබන කෙණකුන් තෙල ලෙස ලදමනා වේ දැ යි පැවති පවත විස්තර කොට කියා ලූ ය. සිටා ණෝ ද ඒ අසා පස් වනක් ප්‍රීතීන් පිනා ගොසින් අනේ උන් කළ දෑ යහපත. අද එක දවසින් මේ සා පිණක් අත බැඳ ගත්හ. මම මෙ තෙක් කල් මූළුල්ලෙහි මේ සා සම්පතෙක පිහිටා ත් පර ලොවින් කිසි ත් ප්‍රයෝජනයක් කට නුහුණුයෙමි. කැරලුන් මනොත්සාහයෙන් විද ගත් ගස් සිදුරු වලින් ගිරවුන් ප්‍රයෝජන විඳිනා සේ මා රැස් කළ සම්පතින් දුවමනා ප්‍රයෝජන විඳින්නෝ බත් බැළයාණෝ ය'යි උන් කැඳවා ගෙන්වා ලා 'තොප මෙ බත් දක් කෙළේ සැබෑ දැ'යි විචාරා 'සැබැවැ' කී කල්හි 'හිඳ, මේ දහස හැර ගෙණ තොප දුන් දනෙහි පින් අපට දෙව'යි කිවු ය. උයි ත් ගිවිස 'ඇවිළෙමින් සිටි පානින් කෙ තෙක් පාන් ඇවූළුව ත් පාන් තුඩ තෙල් ගෑවී ගොහාව බලවත් වන්නා සේ මා දුන් දනෙහි පින් කෙතෙක් දෙනා හැර ගත ත් පින් දීම ත් වස්තු පරිත්‍යාග ය සේ දීම ම වන හෙයින් යම් තාක් දෙන පින් ගත්තු නම් ඒ තාක් ම පින් වඩනා හෙයින් එක බත් තළි ය බත් තළි දෙකක් වුව ත් යහපතැ'යි මසු දහස හැර ගෙණ පින් දුන්හ.

ගන්ධක සිටාණෝ නො මැළිව පින් කම දීලූ හෙයින් සමා- ධිව තමන්ට දුන් පිණට දහස මඳ හෙයින් තමන් සන්තක සම්පත් දෙ භාගයක් කොට පියා එක් භාගයක් දුන්හ. දුන් දනෙහි

Non-Commercial Distribution

විපාක මෙ ම ජාතියෙහි ලබන්ට දන් පිළි ගත් සේක් පසේ බුදුන් හෙයින් වස්තු සම්පදව ත් ඇත. ලබන බත් තළි ය බැළ මෙහෙ කොට ලත් බැවින් ධාර්මික වුව යි ප්‍රත්‍යය සම්පදව ත් ඇත. ආදි මධ්‍යාවසාන වූ ත්‍රි විධ චේතනාව සොම්නස් සහ ගිය ඥාන සම්ප්‍රයුක්ත චේතනා හෙයින් චේතනා සම්පදව ත් ඇත. පසේ බුදුන් වහන්සේ නිරොධයෙන් නැඟී හෙයින් ගුණාතිරෙක සම්පදව ත් ඇත. නිරොධ සමාපත්තීන් නැඟී අනාගාමි තැනකට වේ ව යි රහත් තැනකට වේ ව යි දැහැමින් සෙමින් ලත් දෙයක් ත්‍රිවිධ චේතනා ශුද්ධි ය කොට ගෙන පසේ බුදුන් සමයෙක වුව ත් බුදුන් සමයෙක වුව ත් දුන් කලක දී නො නිමවන පමණක් මුත් මෙ ම ජාතියෙහි දී විපාක දෙයි දත යුතු. එහෙයින් සිටාණන්ගෙන් සැපත් ලත්හ.

පසු ව රජ්ජුරුවෝ ත් මුන් කළ පින් අසා ගෙන්වා ලා මසු දහසක් දී පින් හැර ගෙන ලත් පිණට සතුටු ව මහත් සම්පත් දී සිටු තනතුරු දුන්හ. භත්තභතික සිටාණෝ ය යි ප්‍රසිද්ධ වූ හ. උයි ත් ගන්ධක සිටාණන් හා මිත්‍ර ව ගෙන පින් කරන්නෝ ආයු පමණින් සිට එයින් සැව දෙව් ලොව ඉපැද බුද්ධාන්තරයක් මුළුල්ලෙහි දිව සැප ත් වළඳා මේ අපගේ බුදුන් සමයෙහි දෙව් ලොවින් චුත ව සැවත් නුවර සැරියුත් මහ තෙරුන් වහන්සේගේ උපාසක කුලයෙක පිළිසිඳ ගත්හ. මැණියෝ ද ගබ පෙරහර ලදින් දවස් ගණනක් ගිය කලට සැරියුත් මහ තෙරුන් වහන්සෙ ඇතුළු වූ පන් සියයක් දෙනා වහන්සේට නො එක් රසයෙන් යුත් බතක් දීලා රත් වන් පිළියක් හැඳ ගෙන රන් තැටියක් පැ ලා පන් සියක් දෙනා වහන්සේගෙන් ඉඳුල් බත් හරවා ගෙණ හසුන් කෙළ වර හිඳ අනුභව කෙළෙම් නම් යහපතැ'යි දොළ ඇති ව එ ලෙස ම කොට දොළ සන්හිඳුවූ ය.

සත් මසින් සුණු ගැම් ආදිවූ සෙසු මඟුලෙ ත් එ ලෙස ම කොට පුතණු කෙණකුන් වද-නම් තබන දහස් පුතණුවන්ට නම් දෙන්නට සැරියුත් මහ තෙරුන් වහන්සේට කිවු ය. මහ තෙරුන් වහන්සේ ත් මුන්ට නම් කවරේ ද යි විචාරා 'ස්වාමීනි, මේ දරු වන් බඩ පිළිසිඳ ගත් තැන් පටන් මේ ගෙයි කිසි කෙණකුන්ට ත් දුකෙක් නැත. එ හෙයින් සුඛ කුමාරයෝ ය යි යන නම ම වී නම් යහපතැ'යි කිවු ය. මහ තෙරුන් වහන්සේ ත් ඒ නම තබා වදළ සේක. මැණියෝ ම පුතුන්ට යම් අදහසෙක් ඇති වී නම් ඊට බාධාවක් නො කෙරෙමි'යි සිතූ ය. බත් කවන මඟුල් ආදි

Non-Commercial Distribution

යෙහි ත් ආදි ලෙස ම නො එක් රස ඇති භොජන ය සැරියුත් සවාමීන් මුල් වූ පන් සියක් දෙනා වහන්සේට දුන්හ.

කුමාරයෝ ත් සත් හැවිරිදි අවසථාවෙහි මැණියන් වහන්ස, මහ තෙරුන් වහන්සේ ලඟ මහණ වනු කැමැත්තෙමී' කිවූ ය. 'යහපත, පුතඬැ'යි මහ තෙරුන් වහන්සේ ආරාධනා කොට ගෙන්වා ගෙන වළඳවා ලා 'සවාමීනි, ම පුත්තු මුඹ වහන්සේ ලඟ මහණ වනු කැමැත්තෝ ය. සවස වෙහෙරට කැඳවා ගෙන එම හ'යි මහ තෙරුන් වහන්සේ විහාරයට යවා පියා කුමාරයන්ගේ නැයන් එක් කරවා ලා 'අපගේ දරුවන් ගිහි ව වුව මනා මඟුල් පෙරහර අද ම කරම්හ'යි කියා ලා පුතණුවන් රජවෙස් ගන්වා සරහා ලා මහ පූජාවෙන් වෙහෙරට ගෙණ ගොසින් මහණ කරවන්ට මහ තෙරුන් වහන්සේට පාවා දුන්හ.

මහ තෙරුන් වහන්සේ ද 'සිල් රක්‍ෂා කිරීම නම් ත්‍රි මද ගලිත හස්තීන් කිඳි මුලින් බැඳ රඳවන්නා සේ බැරි දෙයෙක. සිල් රක්‍ෂා කට හෙවූ ද'යි විචාරා වදාළ සේක. 'වදාළ ලෙස ම කෙරෙමි' කී කල්හි තච පඤ්චක කමටහන් දී මහණ කළ සේක. දෙ මවු පියෝ ද මහණ මඟුල් කරන්නෝ සතියක් මුළුල්ලේ තුමූ ඇතුළු වෙහෙර ම රඳා හිඳ බුදු පාමොක් සඟනට නො එක් රසැ ඇති හොජනය දී සත් වන දවස් සවස් වේලෙහි නුවරට ගියහ. අට වැනි දවස් සැරියුත් මහ තෙරුන් වහන්සේ වහන්දෑ වැඩ පී කලට වෙහෙර කළ මනා වත් කොට ලා සුබ සාමණේරයන්දෑ ලවා පාත්‍රය ත් සඟළ ත් ගෙන්වා ගෙන ගමට සිහා නික්මුණු සේක.

හෙරණුන්දෑ ත් අතුරු මහ දී ඇළ ආදිය දැක පණ්ඩිත හෙරණුන්දෑ මෙන් විචාරා පණ්ඩිත හෙරණුන්දෑට වදාළ ලෙසින් ම මහ තෙරුන් වහන්සේ වදාළ කල්හි වදාළ කාරණ අසා 'ඉදින් මුඹ වහන්සේ පාත්‍ර ය හා සඟළ හැර ගත් සේක් නම් මම රඳමි' කියා ලා මහ තෙරුන් වහන්සේ හැර ගත් කල්හි මහ තෙරුන් වහන්සේ වැඳ ලා රඳන සේක් 'ඉදින් සවාමීනි, මා වළඳන්ට බතක් ගෙනෙතො ත් උතුරුකුරු දිව බතක් සේ නො එක් රස ඇති බතක් ගෙනෙව මැනැවැ'යි කී දෑ ය. 'හෙරණෙනි, කොයින් ලබමෝ ද'යි විචාළ සේක. බත් තළි ය බාධාවක් නැති ව දුන්නා සේ ම බාධාවක් නැති ව ලැබෙන නියාව දනෙන බැවින් 'මුඹ වහන්සේගේ පිණින් නො ලබත ත් මාගේ පිණින් ලැබෙත සේකැ'යි කී දෑ ය. මහ තෙරුන් වහන්සේ ද ගෙයි දෙර හරනා කෙස්ස දෙවා ලා ගමට සිහා වැඩි සේක.

Non-Commercial Distribution

හෙරණුන් දෑ ද විහාරයට ගොසින් මහ තෙරුන් වහන්සේ සැතපෙන ගෙයි දොර හැර ගෙට වැද ලා දොර පියා වැද හිඳ භාවනාවට පටන් ගත් සේක. උන්දෑගේ ගුණානුභාවයෙන් සක් දෙවිඳුහුගේ හස්න හුණු වී ය. ශක්‍රයෝ කුමක් නිසා දෝ හෝ'යි විමසන්නෝ හස්න හුණු කැර වූ සුඛ සාමණේරයන්දෑ උපාද්ධ්‍යාය යන් වහන්සේට පාසිවුරු දී ලා මහණ ධම් කරන්ට වෙහෙංට ආ සේක. මහ පිණැත්තවුන් මහණ ධම් කරණ තැනට නො ගොස් හිඳිනා හෙයින් හින්ද නො දී යවන්ට වූවා සේ හස්න හුණු වුව. අපි ත් යම්හ'යි සිතා සතර වරමුන් කැඳවා ලා 'තෙපි ඇම ගොසින් විහාරාසන්නයෙහි හඬා අරගල කරණ රවන්[1] කුකුළු ආදි පක්ෂීන් දුර පලවාව'යි ඒ වෙහෙරට උන් යවූ ය.

උයි ත් එ ලෙස කොට ලා භාවනාවට විරුද්ධ දෑ සන්හිඳුවනු නිසා වට රකවල් ගත්හ. චන්ද්‍ර-සූර්‍ය්‍ය දෙදෙනාට ත් 'හෙරණුන් දෑගේ කුශලයාණන් කරණ දෙයක් කොට නිමවා ලන තෙක් තොප තොපගේ විමන් රඳවා ගෙන සිටුව'යි විධාන කළහ. උයි ත් මිත්‍රයාණ කෙණකුන් හඬා දිවන සතුරු කෙණකුන් ඒ මිත්‍රයාණන් නිරුපද්‍ර ව තැනකට ගොස් වැද යන තෙක් අල්වා රඳවන කලක් මෙන් තමන් තමන්ගේ විමන් නො යා දී රැඳවූහ. තුමූ ත් ගබඩාවේ අගුළු කණුව ගාවා රකවල් ගත්හ. විහාරය ත් සියලු ලෙසින් නිශ්ශබ්ද වි ය. හෙරණුන්දෑ ත් එකහ සිතින් විවසුන් වඩා අනාගාමි වූ දෑ ය.

මහ තෙරුන් වහන්සේ ත් 'හෙරණානෝ නිවන් රස වළඳා ඉක්බිති වළඳන්ට දෝ නො එක් රස ඇති භොජනයක් ගෙනෙන්ට කිවූ ය. කොයින් ලද හැකි දෝ හෝ'යි බලා සැදෑ ඇති කුලයක් දක උන්ගේ ඔබ සිහා වැඩි සේක. උයි ත් දක සමාධි ව ආරාධනා කොට පාත්‍ර ය හැර ගෙන වඩා හිඳුවා ලා කැඳ අවුළුපත් වළඳ-වා ලා ඔබ බත් වළඳන තෙක් තමන් දහම් රස වළඳන්ට බණට ආරාධනා කළහ. ඔබ ද සරිතව්‍ය වූ බණ කථා වදරා ලා වේලාව සලකා බණ වදරා නිමවූ සේක. ඔබට නො එක් රස ඇති භොජන ය දී ලා ඒ හැර ගෙණ විහාරයට වඩනා කැමැති නියාව දූන 'වළඳන බව ය. හැර ගෙන වඩනට දෙම්හ'යි කියා ලා වළඳා අන්තයෙහි නො එක් රස ඇති භොජන ය පාත්‍ර ය පුරා දුන්හ. මහ තෙරුන් වහන්සේ ද ඒ හැර ගෙන හෙරණුන් උදෑසන ත් වැළඳූ

1. සමන් කුකුළු – සපන් කුකුළු

Non-Commercial Distribution

දයක් නැති බැවින් නිවන් රස වළඳා සිත් පිරූ නමුත් බඩ සා වේ දූ යි වහ වහා වෙහෙරට නික්මුණු සේක.

බුදුහු එ දවස් වේලාපසු ම වළඳා විහාරයට වැඩ ගඳකිළියේ හුන් සේක් අද සුබ සාමණේරයෝ සිඟා ත් නො ගොසින් මහණ ධම් කරන්ට රැඳුණාවූ ය. කාරි ය සිද්ධ වී දෝ හෝ'යි බලන සේක් අනගැමි වූ නියාව දැන තව ත් පරීක්ෂා කරණ සේක් 'හුන් හස්න නුගුළුවා දූන් ම රහත් වි ය හෙති. ශාරිපුත්‍රයෝ හෙරණුන් බඩ සා යැ'යි කියා ලා වහා බත් හැර ගෙන අවුත් නිවන් රස වළඳා නිමවා පියා නො දී බත් වළඳවති. උන්ගේ ගමන මදක් පමා කර වණු නිසා මං ගොසින් දෙරටුවේ රකවල් ගත මනා වේ දූ'යි සිතා ගඳ කිළියෙන් නික් ම සර්වඥ කමට නො හිඳ දෙරටුවේ රකවල් ගත් සේක. මහ තෙරුන් වහන්සේ බත් ගෙන ආ සේක. පණ්ඩිත සාමණේර වත විචාරා වදාළ ලෙසින් ම ප්‍රශ්න සතරක් විචාළ සේක. විචාළ ප්‍රශ්න විසඳා කෙළවර හෙරණුන්දෑ සව් කෙලෙසුන් ගෙවා සිවු පිළිසිඹියා පත් රහත් වූ දෑ ය.

බුදුහු සැරියුත් මහ තෙරුන් වහන්සේට 'හෙරණුන්ට බත් ගෙණ ගොස් දෙව'යි වදාළ සේක. මහ තෙරුන් වහන්සේ ත් ගොසින් දෙර නිය පිටින් ගසා ලූ සේක. හෙරණුන්දෑ ත් අවුත් දෙර හැර ලා මහ තෙරුන් වහන්සේට කළ මනා වත් කොට ලා වළඳව'යි වදාළ කල්හි මහ තෙරුන් වහන්සේ ත් වළඳන්ට පැරැත්ත ගෙණ 'ඔබ දී ම අපි වැළඳුම්හ'යි වදාළ කල්හි සත් හැවිරිදි හෙරණුන්දෑ මහණවූ අට වැනි දවස් රහත් ව අටඟ සලකා පස් විකා ගෙණ වළඳා ලා පාත්‍ර ය සෝධා ගත් දෑ ය. පාත්‍ර ය සෝධා නිම වන්නා ම සතර වරම්මු තමන් ගත් රකවල් හල-වූ ය. චන්ද්‍ර-සූර්‍ය්‍යයෝ දෙ දෙන සිටි විමනු ත් හලවූ ය. සක් දෙවිඳුන් අගුළු කණුව මුල රකවල් හලවූ ය. ඉර ත් මුදුනෙන් ඇල වි ය. වහන්දෑ ත් හිර මුදුනෙන් ඇල වූ හෙයින් 'පස් වරු වේ ලා ය. හෙරණුන්දෑ ත් වැලඳූ ය.

වේලාව කුමක් දෝ හෝ'යි කථාව ඉපැද වූ කල්හි 'මහණෙනි, මහ පිණැත්තන් මහණ ධම් කරණ කලට මෙ ලෙස ම වෙයි. අද සතර වරම්මු වෙහෙර වට කොට හෙරණුන්ගේ අධිගමාන්තරාය වලකා රකවල් ගත්හ. චන්ද්‍ර-සූර්‍ය්‍යයෝ දෙ දෙන වේලා නො වරදනා නිසා විමන් දෙක රඳවා සිටුවූ ය. සක් දෙවිඳු අගුළු කණුව මුල රකවල් ගත්හ. අනුන් ගෙන් ම මෙහෙකරවා ආ මම පවා මහ පින් ඇත්තවුන්ට දෙරටුවේ රකවල් ගතිමි. අද සුබ සාමණේරයෝ

Non-Commercial Distribution

දියාළුවන් සිත් පිත් නැති පැන් ඇළවලින් තමන් කැමැති තැනට ගෙන යන නියා ද, හී වඩුවන් හී දඬු හැද හරනා නියා ද, දඬු වඩුවන් දඬු පත් කප කපා සැස ගෙන රථ සක් ආදිය කරණ නියා ද දූක අනිත් අරමුණක් නැති ව ලා එ ම අරමුණු කොට ගෙන රහත් වූ ය'යි වදරා අරමුණු සරි හෙයින් පණ්ඩිත සාමණෙර වත වදළ බණ ම වදළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් පුර දුටහ.

එහෙයින් නුවණැත්තවුන් විසින් අරමුණු බැඳ රඳවා ඇළ වලින් දිය ගෙනයන්නවුන් ඒ දිය ගෙන යන නියා ත් හී වඩුවන්, සිත් පිත් නැති දඬු පවා ගින්නට පෑ තවා ඇද මිරිකා සෘජු කොට ගන්නා නියා ත් දඬු වඩුවන් දඬු පත් කපා සැස ගෙන දූව වළලු ආදි ය කරණ නියා ත් දූක තම තමාගේ දෘෂ්ටි මාන්‍යාදීන් ගේ වශයෙන් තද ව වක් ව තිබෙන්නා වූ සිත් පනත් කොට ගෙණ කුශල් විෂයට මෙහෙයා ගෙන පින් කම හැසිර ඒ කුශලානුභාවයෙන් භව භොග සම්පත් වළඳා කෙළවර නිවන් සම්පත් සාධා ගත යුතු.

## 131. විශාඛාවන් යෙහෙළියන් ගේ වත

තව ද සත් පුරුෂ සමවායෙහි ම යහපත හඟවන්ට විශාඛාවන් යෙහෙළියන් ගේ වත දක්වමු.

කෙ සේ ද යත්—

සැවත් නුවර පන් සියක් පමණ කුල දරුවෝ සුවඳ වසා ලූ පතු ත් සුවඳ වහන ය කරන්නා සේ මෙ ලෙස කළ කල ත් යහපත් වෙ දෝ හෝ යි තමන් තමන්ගේ අඹුවන් යහපත යොදනු නිසා විශාඛාවන්ට පාවා දුන්හ. ඔහු පන් සිය ත් උයනට වෙ ව යි වෙහෙරට වෙව යි යන කල විශාඛාවන් හා කැටි වම යෙති. උං එක් සමයෙක සතියක් විතර සුරා උත්සවයක් පැවැත්ත මැන-වැ යි රඳෙල් විඳනයෙක් වූ කල තමන්ගේ සවාමීන්ට රායක් පිළියෙළ කළහ. ඔහු ද සතියක් සුරෝත්සව ය කොටලා අට වැනි දවස කෘෂි වණික් ආදි වූ මෙහෙයට විධාන කොට බෙරක් ලැවූ කල්හි කර්මාන්තයට ගියහ. ඒ ගැනු පන් සියය ද 'අපි අපගේ සවාමීන් ලඟ දී රායක් බී පිය නො හෙම්හ. ඉතිරි රා ත් ඇත. උන්ට නො හඟවා බොම්හ'යි විශාඛාවන් ලඟට ගොසින් විශාඛා-වන් වහන්ස, උයන බලන්ට යනු කැමැත්තම්හ' යි කියා 'යහපත, එ සේ වී නම් කළ මනා දෙය කොට ලා එව'යි කී කල්හි

Non-Commercial Distribution

සහවා රායක් ගෙන්වා ගෙණ විශාඛාවන් කැටි ව ම ගොසින් බළලුන් ඇස පියා ගෙණ දී කන්නා සේ පර ලොවට හැහෙත ත් විශාඛාවන්ට නො හහවා උයනේ දී රා බී ලා මත් වූහ.

ආදි නො දත ත් විශාඛාවෝ පසු ව දැන ලා 'මුන් හැම කළ දෑ නපුර. 'මහණ ගොයුම්හුගේ ශ්‍රාවිකාවරු රා බී ඇවිදිති'යි තීර්ථයෝ මට ත් එක් කොට ලා බෙණෙති' සිතා උන් හැම බණවා ලා තොප හැම කළ දෑ නපුර. එක් වූ පමණකින් මට ත් අයස ඉපැද වුව. තොප හැමගේ ස්වාමීහු ත් කිපෙති. දැන් කුමක් කරවූ දෑ'යි කිවූ ය. 'ලෙඩක් ගසා ගනුම්හ'යි කිවු ය. 'මා තොප රා බොන්ට කියෙ ත් නැත. ලෙඩ ගසන්ට කියන්නේ ත් නැත. වී වපුළ කෙණෙක් වී දකිති. හමු වපුළ කෙණෙක් හමු දකිති. තොප කළ දෙයින් තොප ම පෙනෙන මුත් කුණු කුඩ මස්සන් හී තණින් වසන්නා සේ මා මුසු නොං කරව'යි කිවු ය. උඹ ගෙවලට ගොසින් බොරු ලෙඩක් ගැසූ ය. උන්ගේ ස්වාමීහු ත් අවුත් කොයි දෑ යි විචාරා ලෙඩ වූ ය යි අසා 'ලෙඩ වන්ට කාරණ කිම ද? ලෙඩක් වත ත් බාගුන් මුත් හැම දෙන ම එක පැහැර ලෙඩ වෙත් ද? පවින් දුරු කරන්ට කොට ත් ඉතිරි ව තුබූ රා පූ නියා ය'යි සිතා ලා මරා තළා බොහෝ ගහට කළහ.

ඔහු එ සේ ගෙඩි කා ත් තවත් රා මුරයෙක දී එ සේ ම රා බොනු කැමැති ව විශාඛාවන් ලහට ගොසින් 'අප උයනට කැඳවා ගෙන ගිය මැනැවැ'යි කිවු ය. ''ආදි උයනට ගෙණ ගොස් අයසක් උපදවා ලුව. තවත් ගෙන ගොස් අයස ලබන්ට ද? යවු නම් තෙපි ම යව. අප තොප ගෙණ යන්නේ නැතැ'යි කිවු ය. 'එ ලෙස නො කරම්හ'යි කථා කොට ගෙණ 'බුදුන් වඳනා කැමැත්තම්හ. අප විහාරයට කැඳවා ගෙණ ගිය මැනැවැ යි කිවු ය. 'කරන්ට කරණ දෙයක් වී නම් තෙලෙ කළ මනා දෙය ය. පූජා භාණ්ඩ හැර ගණුව යි කියා ලා නික්මුණාහු ය. උඹ හැම ත් කරඬුවලින් සුවඳ මල් හැර ගෙන මල් පුද ලා පැන් ඉස්නව කෙණ්ඩිකා හැර ගත්තා සේ රා පිරුණු මුට්ටි ත් අතින් එල්වා ගෙන මහා පිළි පෙරව ගෙණ විශාඛාවන් හා කැටි ව ගොසින් විහාරයට වදිනාහු එක් මුල්ලකට පලා ගොසින් කුණු කා ගොසින් කළු ව තුබූ සක් පිඹිනට කට තබා ගත්තවුන් මෙන් මුට්ටි කට තබා ගෙන රා බී පියා මුට්ටි දමා පියා ධම් සභාවට ගොසින් බුදුන්ට අභිමුඛ ව හුන්හ.

විශාඛාවෝ 'ස්වාමීනි, මූ අප හා එක් ව ඇවිදිති. මුන්ට බණ වදළ යහපතැ'යි කිවු ය. උයි ත් රා බී මත් ව පියා පූජා අදහසක්

Non-Commercial Distribution

නැත ත් 'නටම්හ'යි 'ගී කියම්හ'යි සිතූහ. මාර පාක්ෂික දේවතාවෝ ත් මුන්ගේ ඇඟ ආවෙශ ව ලා 'මහණ ගොයුම් ඉදිරියෙහි අකව විකට දක්වම්හ'යි සිතා උන් හැම ඇඟ ආවිෂ්ට වූ ය. රා මත පිටට යක්ෂොන්මාද ත් ඇති ව ලා සමහර කෙණෙක් බුදුන් ඉදිරියෙහි අත් පිඩි ගස ගසා සිනාසෙන්ට පටන් ගත්හ. සමහර කෙණෙක් නටන්ට පටන් ගත්හ. බුදුහු ත් මේ කිම් දෝ හෝ යි සලකන සේක් ඒ කාරණ ය දැන 'මාර පාක්ෂිකයන්ට අවසරයක් නො පාමි. උන් හැමට අවසර පෙනෙන ලෙසට පිරූ පාරමිතාවක් නොවේ ත් ව යි යක්ෂොන්මාදය නිසා භය ලජ්ජා නැති ව ගිය වුන්ට භය උපදවනු පිණිස බැම ලොමින් නිල් රසක් විහිදු වූ සේක. මඞ්ගල බුදුන් පිරිනිවි කලක් මෙන් මහ අඳුරෙක් වි ය. සිනා තබා නැටීම් තබා තවත් බා ගියහ. බා යන්නා ම රා මතු ත් සුන්හ. බුදුහු ත් හුන් හස්නෙහි ම අතුරුධන් වූ සේක් මහ මෙර මුදුනේ වැඩ සිට උණ්ණලොම් දමයෙන් සුදු රස් විහිදු වූසේක.

ඒ ඇසිල්ලෙහි ම හිරු දහස් සඳ දහස් නැඟී කලක් මෙන් උන් හැමගේ මොහඳුරු තව දුරු නුව ත් නිකම් අඳුරු දුරු වි ය. ඉක්බිත්තෙන් ඒ ස්ත්‍රීන්ට මෙර මුදුනේ සිට ම බණ වදරා 'තොප හැම දෙනා අප ලඟට ආ කල පමා වීම නපුර, තොපසේ තරමින් ම මාර පාක්ෂික දේවතාවෝ ත් අවසර ලදින් අප ලඟ දී නො කළ මනා දෙය කැරවූහ. විශාඛාවන්ගේ එ බඳු තරමක් නැති හෙයින් උන් ලවා එ බන්දක් කැර වි ය නො හෙති. රා පීමට ත් වඩා සතත් දවා නැති කරණ රාගා දී ගිනි නිවන්ට ය උත්සාහ කළ මනා'යි වදරා ලා බණ වදරණ බුදුහු 'මේ ලොව නිරන්තරයෙන් රාගාදිවූ එකොළොස් ගින්න වැද ගෙන නිවා ලිය හෙන කෙණකුන් සම්භ නො වන තෙක් දමින් සිටිය දී ඒ ගිනි නිවන්ට කරණ උත්සාහයයක් මුත් සිනා ත් හැයි ද? සතුටු ත් හැයි ද?

න වට්ටති හසන්තෙන-ගන්තුඤ්චෙව නිසීදිතුං,
වත්ථුස්මිං හසනීයස්මිං-මිහිතමත්තන්තු වට්ටති.

යනු හෙයින් සිනාවට නිසි තන්හි ත් සතුටු පමණකින් වඩා සිනා යුක්ත නො වෙයි. මෝහ නමැති අඳුරෙන් වැසුණාවූ තෙපි ඒ අඳුරු දුරු කරන්ට නුවණ නමැති පහන නො සොයා කුමක් නිසා සිනා සී නටා ඇවිදු ද? තෙල ලෙස කිරීමෙන් මොඳුරු දුරු නො වෙයි, ඒ දුරු වුව මනා වී නම් පින්කම් නැමැති පාත්කඩ සැදූ නැමැති තෙල ගලා, ලොව්තුරා නුවණ නමැති පාන් දල්වා ගෙන

Non-Commercial Distribution

මොහඳුරු දුර ලව'යි වදළ සේක. දෙශනා කෙළවර පන් සියක් ගෑනු රා බොන්ට සිතන සිත්විලි තබා මුඛයට වන් රා ත් නො ගිලෙන තරම ව සෝවාන් වූහ.

බුදුහු ත් ඔහු මාර්ග ගත වූ නිසල සෑදෑවෙ පිහිටුවා ලා මෙර මුදී නෙන් බෑස බුදු හස්න වැඩ හුන් සේක. විශාඛාවෝ ස්වාමීනි, මේ රා නම් ඉතා නපුරු දෙයෙක. මා හා එක් වීමෙන් මෙ බඳු තරම් ඇති වූ හැම දෙනා පවා මුඹ වහන්සේ වැනි වූ බුදු කෙණකුන් වහන්සේ ඉදිරියේ හිඳ නොසන්හුන් තරම හභවා සිනා සෙන්ට නටන්ට ගී කියන්ට පටන් ගත්හ. රා පීම නිසා එ බන්දක් වූ බව මුත් තුමූ හැම එ තරම්මු නො වෙති' කිවු ය. 'විශාඛාවෙනි, ඒ එ සේ ම ය. රා පූවවුන් නිරාදුක් විඳ ශෙෂ ව සිටි විපාකයෙන් පන් සියයක් ජාතියෙහි යක්‍ෂ ව, පන්සියයක් ජාතියෙහි බලූ ව, අනන්ත ජාතිවල වියරු හී ඇවිදිනා හෙයින් මේ රා නම් ඉතා නිකෘෂ්ට ය. මේ නිසා බොහෝ දෙන අලා මුළාවට සෑමිණියහ'යි වදරා ලා 'ස්වාමීනි, මේ රා ඇති වූයේ කවර කලෙක දෑ'යි විශාඛාවන් විචාළ කල්හි එහි උත්පත්තිය විස්තර විසින් දක්වනු නිසා කුම්භජාතක ය වදළ සේක.

එ හෙයින් සත් පුරුෂයන් විසින් රා මෙර නම් සද්‍යප්‍රාණ හරණ විෂ තරමට ත් වඩා සිතා ඒ ඇතුළු වූ පස් පව්නු ත් සෙසු පව්නු ත් දුරු ව කුසල්හි පිහිටා චිත්ත ශුද්ධි ය කට යුතු.

# 132. සිරිමා වස්තුව

තව ද මනුෂ්‍ය දෙහයෙහී ප්‍රාතිකූල්‍ය ය කියා එහි ඇලුම් හර වනු නිසා සිරිමා වස්තුව කියමු.

කෙ සේ ද යත්—

ඒ සිරිමාවන් බුදුන් ගෙන් බණ අසා සෝවාන් වූ තැන් දක්වා විස්තර කථාව සතළොස් වන කොධ වග එයි. උණු තුමූ රජ ගහ නුවර විශිෂ්ට වූ රූ ධරන වෛශ්‍ය දුවණි කෙණෙක සෝවාන් වලා බුදුන්ට ආරාධනා කොට දෙ වන දවස් මහ දන් දී වහන්දෑට ලාබත් අටක් තබා දුන්හ. ලාබත් තැබ්බවූ තැන් පටන් නිරන්තරයෙන් ම අට නමෙක් උන්ගේ ගෙට සිහා වඩනා සේක. ගිය වහන්දෑට පාත්‍ර පුරා ගිතෙල්, මී, උක්පැණි ආදිය ත් දෙති. දවස් පතා ම.

Non-Commercial Distribution

සොළොස් කළඳක්[1] වියදම් කොට බතු ත් දෙති. ලත් සම්පත් අය වීම කවර ලෙසකින් වුව ත් වියදම් සාර්ථක ලෙසට යෙදූහ.

ඉක් බිත්තෙන් එක් දවසක් එක් කෙණකුන් වහන්සේ උන්ගේ ගෙයි දී පැමිණි ලාබත් වළඳා ලා දෙළොස් ගවුවෙකින් ඔබ්බෙබ් විහාරයකට ගිය සේක. සවස වත් පිරිත් වේලේ දී නෙවාසික තැනැත්තන් වහන්සේ 'ඇවැත්නි, කොයි දී වළඳා අවුදු'යි විචාළ සේක. 'සිරිමාවන් ගෙන් දෙන ලාබත් වළඳා ආම්හ'යි කී කල්හි 'ඇවැත්නි, බත් දෙන නියාව යහපත් දූ'යි විචාළ සේක. විචාරන්නෝ කිම් ද? ඉතා යහපත් කොට දෙති. සකස් කළා ඉතා විපුල නො වන්නේ වේ දූ'යි සිත ත් නමකට දුන්නා වූ දෙය දෙ තුන් නමකට වුවත් සෑහෙයි. දන් යහපත් කොට දෙන්නෝ තමු ත් ඇත්තෝ වේ ද, උන්ගේ දනට ත් වඩා බලා ඇස ඇද ගත නො හැකි තරම් රූ ඇත්තෝ ය'යි නො කිව මනා දෙ තිස් කථාවෙහි ඇතුළත් වත ත් උන්ගේ රූ වණීනා කොට කී සේක.

එක් කෙණකුන් වහන්සේ ඒ අසා භාවනාභියොගයක් නැති හෙයින් ම සිනා සෙන්ට නියාලු දත් පමණක් දැක සියල් සිරුර ඇටසැකිල්ලක් කොට සිතා අට්ඨික භාවනා කොට රහත් වූ මීන් තෙලෙහි තිස්ස තෙරුන් වහන්සේ මෙන් සිතු ව මනා ලෙස තිබිය දී උන් නොදැක ම උන් කෙරෙහි ස්නෙහ උපදවා ගෙන 'මා ගොසින් ලාබත් පිව ලා උන් දුට ත් යහපතැ'යි ලාබතට උදවුව පැමිණ ගන්ට තමන් වහන්සේගේ වස් ගණන වළඳා ලා ආ නමට කියා ලා උන් වහන්සේ අතින් සෙට පටන් ලාබතට යන වහන්දෑ ගේ වස් ගණනු ත් විචාරා 'ඔබ ගියො ත් සෙට දවස් අනික් නමකට පළමු ව ගොසින් ලාබත් ඉවසන්ට ඔබගේ වස් ඇති ව තිබෙ'යි කී කල්හි ඒ ඇසිල්ලෙහි ම පාන් ව යන තුරුත් ඉවසා පිය නො හී සහළ සිවුර හා පාත්‍ර ය හැර ගෙණ අශුභ දස යෙන් එක් තරා අශුභයෙක පව ත් අසා භාවනාභියොගයට යන ගමනකු ත් නො ව එක රැයින් දෙළොස් ගවුවක් ගෙවා ගොසින් පාන් වූ කලට 'ලාබත් දෙන තැනට ගොසින් සෙසු ලාබත් ගන්නා තැන ත් අව නම පුරා ආව ත් ඉන් අගින් නමක් හැර මුල් පාළියේ සිට ලාබත් ලත් සේක.

පෙරාතු දවස් අනික් නම වළඳා ලා ගිය වේලාට ම සිරිමාවන්ගේ ශරීරයෙහි අසාද්ධ්‍ය රොගයෙක් ඇති වි ය. එහෙයින් ආභරණ ගළවා පියා වැද ගොත්තෝ ය. උන්ගේ කෙල්ලෝත් ලාබත් ලබනට ආ වහන්දෑ දැක සිරිමාවන්ට කිවු ය. උඹ තුමූ තමන්

1. සොළස කහාපණ — ධම්මපදට්ඨ කථා

Non-Commercial Distribution

ගොසින් පාත්‍ර ය හැරගන්ට අශක්ති හෙයින් කෙල්ලන්ට විධාන කරන්නෝ 'කෙල්ලනි, ආරාධනා කොට පාත්‍ර ය හැරගෙන වඩා හිඳුවා ලා කැඳ අවුළු පත් වළඳවා ලා බත් වේලාව මාගේ අදහස් ලෙසින් බත් පාත්‍ර ය පුරා ලා පිළිගන්වා ලව'යි කිවු ය. උයි ත් යහපතැ යි ගිවිස කැඳ අවුළු පත් වළඳවා ලා වළඳන වේලාට බත් පාත්‍ර ය කටයුතු නියා ව සිරිමාවන්ට කිවු ය. 'ස්වාමි දරුවන් වඳනට මා කැඳවා ගෙන යව'යි කිවු ය. අත-පය එල්බවා කැඳවා ගෙණ ගිය කලට කර්‍ම නමැති සතුරා රොග නමැති යත ලා ලා මිරිකා දුර්වල කළ හෙයින් වෙවුල වෙවුලා වහන්දැ වැන්දහ. දක්නා කැමැති ව ගිය නම සිරිමාවන් දූක ලෙඩට දුර්වල ව ගියවුන් ගේ රුව මෙ තරම් කල ලෙඩක් නැති ව සව් බරණ ලා සැරහී සිටි කලට ලිපාමෙන් ම[1] ශොභාම ත් පිළිම ය රන්වන් කළ කලට ඉතා ශොභාමත් වන්නා සේ මුන් ඉතා රූපත් සැටි ය'යි සිතූ සේක.

එ ලෙස සිත ත් සිත ත් සසර අනන්ත කාලයක් පැවත ආ කෙලෙස්හු පිළිවෙත් පිරීමට නැමුණු සිත ඊට නැමිය නො දී සිරිමාවන් දසාවට නමාපීහ. මොහ නමැති පටල ය වස ත් වස ත් නුවණැස බැලුම් මඳ ව සිල් නමැති ඇඟ ඇති වූ කෙලෙස් නමැති තල කැළල් ආදීය ත් දූකගත නො හී උපන් බත් වළඳා ගත නො හී බත් පාත්‍ර ය හැර ගෙන විහාරයට ගොසින් පාත්‍ර ය වසා එක් තැනක තබා වැළඳ ගත් සිවුරෙන් එක් කෙළවරක් අතුට ගෙන වැදහොත් සේක. නො වැළඳූ නියා ව දූන යාළු මිත්‍ර නමෙක් අවුත් නො එක් ලෙස පෙරැත්ත ගෙන ත් වළඳවාගත නුහුණු සේක. පිළිවෙතට ආලෙස්සම් වූ වා සේ ම බත් වැළඳීමට ත් මැළි ව සුන් බත් වූ සේක.

එ දවස් ම සිරිමාවෝ සවස් වේලාට මලන මල් දමක් මෙන් ව මළෝ ය. රජ්ජුරුවෝ ත් ජීවකයන්ගේ නං වූ සිරිමාවෝ මළෝ ය යි බුදුන්ට දන්වා යවූහ. බුදුහු ඒ අසා රජ්ජුරුවන්ට 'සිරිමාවන් තව දූවුව මැනවැ යි නැත. අමු සොනකට ගෙන ගොසින් කවුඩු බලු ආදීන් නො කන ලෙසට උස් කොට මැස්සක් ලවා ලා ඊ ලා ලා රකවල් ලවාව'යි වදළ සේක. රජ්ජුරුවෝ ත් එලෙස ම කැරවූ ය. පිළිවෙළින් තුන් දවසක් නැඟී ගියේ ය. සතර වන දවසට දුර සිටියවුන්ට ත් පෙනෙන ලෙසට වූවා සේ ම මහත් ව ඉදිමී ගියහ. නව වණ මහදෙරින් පණුවෝ වැගිරෙති. සියල් සිරුර ත් බිඳී ගිය හැල් සාලේ බත් සැළියක් මෙන් වි ය. නො එක් ලෙසින් මිනිස ත් බව ආල ය නැතිවන තරම් වි ය.

1. ලියවීමෙන් ම නෙලීමෙන් ම

Non-Commercial Distribution

රජ්ජුරුවෝ ද 'බාල දරුවන් හා ගෙවල් රකිනවුන් පමණක් රඳවා ලා සිරිමාවන් බලන්ට නො ආ කෙණෙක් ඇත්නම් අට අට මස්සක් දඩ දුන මැනවැ' යි නුවර බෙර ලැවූ ය. නැවත 'බුදුපාමොක් වහන්දෑ ත් අසුභ බලන්ට වැඩිය මැනවැ'යි බුදුන්ට ත් දන්වා යවූහ. බුදුහු ත් 'සිරිමාවන් බලන්ට යම්හ. අප හා කැටි ව එව'යි වහන්දෑට විධාන කළ සේක. සිරිමාවන් දක්නට දෙළොස් ගවුවෙක සිට ආ බාල නම ද කෙතෙක් තැන් කෙතෙක් පෙරැත්ත කී වත් ශොකයෙන් බඩ පිරී පිරිය නැත්තා සේ සතර දවස ම ලෙඩට ලංසන කැර වුවමනා සේ ම සුන් බත් වූ සේක. පාත්‍රයේ බතු ත් සිරිමාවන් සේ ම කුණු වී ය. පාත්‍රය ත් පුස් කා ගියේ ය. යාළු-මිත්‍ර වහන්දෑ ත් අවුත් බුදුන් සිරිමාවන් බලන්ට වඩනා නියා ව කී සේක. සතර දවසක් සුන් බත් ව හුන ත් සිරිමාවනැ යි යන බස අසමින් ම බස ඇසීම ම බතක් ලද්දා සේ ම වහා නැඟී සිට බුදුහු සිරිමාවන් බලන්නට වඩනා සේක. තමනු ත් එන්නේ ඇද්දැ'යි කී කල්හි එ බස පැනක් වැළඳුවා සේ සිතා ගෙන උත්සාහ වත් ව බත් දමා පියා පාත්‍රය ත් සෝධා බැඳ ගෙන වහන්දෑ හා කැටි ව ගිය සේක.

තරු පිරිවැරූ සඳ පරිද්දෙන් බුදුහු වහන්දෑ පිරිවරා එක් පසෙක සිටි සේක. මෙහෙණින්දෑ ත් එක් පසෙක සිටි දෑ ය. රජ්ජුරුවන් හා පිරිස ත් එක් පසෙක සිටියහ. උපාසක පිරිස ත් එක් පසෙක සිටියහ. බුදුහු බිම්සර රජ්ජුරුවන්ට 'මහරජ, තුලූ කවුරු දැ'යි විචාළ සේක. සිරිමාවන් නියා ව කී කල්හි 'පෙර මුන් කරා එන කෙණකුන් මුන්ට දෙන්නේ මසු දහසෙක් වේ ද, දැනු ත් මසු දහස දී ලා සිරිමාවන් හැරගන්ට විධාන කරව' වදාළ සේක. රජ්ජුරුවෝ ත් පෙර දෙන තරමේ ම මසු දහසක් දීලා මුන් හැර ගනුව යි විධාන කොළෝ ය. එ ලෙස හැර ගන්නා තබා එ බස් අසන කෙණකුත් නැත. රජ්ජුරුවෝ එ පවත් බුදුන්ට දැන්වූහ.

බුදුහු 'මහරජ, එ සේ වී නම් අගය අඩු කරව'යි වදාළ සේක. රජ්ජුරුවෝ අගය අඩුකරන්නෝ දහසින් භාග වූ පන් සියයෙක, ඉන් භාග වූ දෙ සිය පනසෙක, ඉන් භාග වූ එක් සිය පස් විස්සෙක, ඉන් භාග වූ දෙ සැට කළන් සතර අකෙක, ඉන් භාග වූ එක්තිස් කළන් දෙඅකෙක, ඉන් භාග වූ පසළොස් කළන් පසෙක, ඉන් භාග වූ අට කළන් අකෙක, ඉන් භාග වූ සතර කළන් දස වියටෙක, ඉන් භාග වූ දෙකළන් පස් වියටෙක, ඉන් භාග වූ එක් කළන් දෙවියට සමාරෙකැ යි අග ය හෙළා එ සේ ත් හැර ගන්ට මැලි හෙයින් අසූ වියටක් දී ලා හැරගන්ට කියා, එ සේ ත් මැලි හෙයින්

Non-Commercial Distribution

සතළිස් වියටක් දී ලා හැර ගන්ට කියා, එ සේ ත් මැළි වූ හෙයින් විසි වියටක් දී ලා හැර ගන්ට කියා ලා, එ සේ ත් මැළි හෙයින් දස වියටක් දී ලා හැර ගනුව යි කියා, එ සේ ත් මැළි හෙයින් පස් විය ටක් දී ලා හැර ගන්ට කියා, එ සේ ත් මැළි හෙයින් දෙවියට සමා රක් දී ලා හැර ගන්ට කියා, එ සේ ත් මැළි හෙයින් එක් වියට යෙළ හමුවක් දී ලා හැර ගන්ට කියා, එ සේ ත් මැළි හෙයින් නො මිලයේ ම හැර ගන්ට කියා විධාන කළහ. භාවක තැනකගේ භාවනාවට ප්‍රයොජන වත් මුත් සෙස්සවුන්ට ප්‍රයෝජනයක් නැති හෙයින් හැර ගන්නා තබා ළහට වදින්ට ත් රාජවිධානයෙන් ආ පමණක් විනා කැමැත්තෙහි නැත. රජ්ජුරුවෝ බුදුන්ට එ පවත් දැන්වූහ.

බුදුහු දක්නට ඇවිටි ව ආ භික්ෂූන් වහන්සේ මුල් කොට වදා රන හෙයින් වහන්දෑ බණවා ලා 'මහණෙනි, පෙර දහසක් දී ලා දවසකට ලබන තරම් බොහෝ දෙනාට ප්‍රියකරු සිරිමාවන් නුවර වැස්සන්ගෙන් නො මිලයේ ත් හැර ගන්ට සිතන්නෝ නැත. මහණෙනි, තුලුන් මෙ ම ගම ඇවිදි සැටියට දූන් සැටිය කෙ සේ තිබේ ද? රන් පවීත මුදුනෙකින් හුණු කළු ගහක් වැනි ය. නො හොත් මුව පියුමෙහි රූප නමැති කිඤ්ජල්කයට බට බමර සමූ හයක් වැනි ය යි කවිජන වර්ණනීය වූ හිස කේ දූන් කවර ලෙසක තිබේ ද? නැවත නිල් වළාකුලක් හස්සෙන් භාගයක් මැත් වූ අඩ සඳක් වැනි ය යි වණීනී ය වූ නළල කො යි ද? දෙව් දුනු සඟ ළක් වැනි ය යි බාල ජනයන් විසින් සලකන ලද බැම ත් කොයි ද? රුවන් විමනෙක සිටි ඉඳුනිල්මිණිමුවා කවුළු දෙර වැනි ය යි වණීනී ය වූ ඇසු ත් කොයි ද? රන් හකුස්සක් වැනි ය යි වර්ණනීය වූ නාස ය දුටු කෙණකුන් නාසා හකුළුවන තරමට තිබෙ යි. රූප නමැති සාගරයෙහි ගමන් ගත් පබුළුමුවා නැව් වැනි යැ යි වර්ණනීය වූ තොලු ත් කොයි ද? චන්ද්‍රයාගේ සොළොස් කලාවෙන් එක් කලාවක් දන්තශ්‍රෙණි ව්‍යාජයෙන් මුඛගර්භයට වන්නාක් වැනි ය යි වර්ණනීය වූ දත් දූන් කවර තරමෙක තිබෙන නියා ද, යෞවන පුරුෂයන් බැඳන්ට හටවා ලූ මළ වැනි ය යි වර්ණනීය වූ කන් පණකඳු මැත් වන ලෙසට ම තිබෙ යි. රන් කලස කරක් වැනි ය යි කියන ගෙල මුල අග නො දත හැකි ලෙසට ඉදිමින. භාවනා කොට ධ්‍යාන උපදවා මෙන තත්පාදක මාර්ග ඵල උපදවා තො ත් මුත් කිසි ත් කෙණකුන්ට කිසි ත් ප්‍රයෝජන නැතැ'යි වදරා ලා බණ වදරණ සේක්.

Non-Commercial Distribution

කවා පොවා නාවා ඉස් සෝධවා ආභරණ ලා සරහන ලද අත් බැවත් බලව, කවර ලෙසට පැමිණි අත්බැවෙක් ද යත්-නව වන මහ දෙරින් වැම්මෙන පණු කැලන් ඇති තුන් සියක් ඇට සහලින් සැලසී සිටි උපන් තැන් පටන් මිය යන තුරු ඉරියවු පෙරළියෙන් පැවත්තුව මනා හෙයින් නිසාතුර වූ මේ කුණු කය මෙ සේ වුව ත් අසුචි පුරා ලූ කළ පිට සිත්තම් කරන්නා සේ බොහෝ දෙනා නො එක් ලෙසින් කල්පනා කරණ ලද්ද වූ මිනිස් ලොව කිසි කලෙක ආයු පමණින් හවුරුදු අසඞ්ඛ්‍යයක් සිටිය ත් කෙළවර නස්නා සුළු වූ, නුවණින් සැලකූ කලට කිසි ත් සාරයක් නැති, දුකට ම ආකර වූ ශරීරයේ සැටි බල බලා තෙල අවසථාවට පැමිණි ශරීරයෙන් ලැබිබ යුතු ප්‍රයෝජන ලබව. මේ අවසථාවෙහි යම් සේ අනුරාග ය නූපදී ද උපන් අනුරාග ය හළ නො හෙන්නවුන්ට මාර්ග ඵල නූපද්දී'යි වදළ සේක. දෙශනා කෙළවර සුවාසූ දහසක් දෙන කුණු මිනී බලා නුකුණු නිවන් දුටහ. සතර දවසක් සුන් බත් වූ භික්ෂූන් වහන්සේ ද සාය මරා ලූ කලට බොහෝ කොට කා ලිය නො හැක්කා සේ මාර්ග හැමයට පැමිණ නිවන් රස බොහෝ කොට වළඳන්ට නො ව පසු ව පුරා නිවන් රස වළඳනා තෙක් සෝවාන් පමණක් වූ සේක.

එ සෙයින් නුවණැත්තවුන් විසින් ආත්ම මණ්ඩනයට ත් වඩා ගුණ මණ්ඩන ය කොට අස්ථිර වූ ජීවිතයට ත් වඩා ස්ථිර වූ නිවන් ම සිද්ධ කට යුතු.

............

## 133. උත්තරා නම් ස්ථවිරීන්ද්‍රගේ වස්තුව

තව ද සෙසු භාවනා ඇතැ ත් මරණ සි භාවනාව අවශ්‍යයෙන් කළ මනා නියාව හඟවනු නිසා උත්තරා නම් ස්ථවිරීන්දැ ගේ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්—

ඒ ස්ථවිරීන්දැ ද එක් සිය විසි හවුරුදු වයස වුව ත් වක ගසා ගෙන විහාරයේ ම නො රඳා වීථියට ගොසින් සිඟා ගෙන ඇතුළු වීථියේ දී එක් භික්ෂු කෙණකුන් දැක බතින් පිළිවිස උන්වහන් සේ ත් ප්‍රතික්ෂෙප නො කළ විසින් බත් හැම ම පිළිගන්වා පියා සාරාණීය ධර්ම ය පුරන ත් වේලා ඇත් නම් තව සිඟා ගෙන වැළ දිය හැක්ක ත් වේලා මඳ හෙයින් දෝ නිරාහාර වූ දැ ය. දෙ වන දවසු ත් තුන් වන දවසු ත් බත් පිළි ගන්නා තරම වත් නො දන්නා නමක් සම්භ ව බත් පිළිගන්වා පියා නිරාහාර වූ දැ ය. සතර වන

Non-Commercial Distribution

දවස් සිඟා ඇවිදිනා දෑ පටු තැනෙක දී බුදුන් දැක ඉවත් වන දෑ එ ලෙන සිවුරු පට පැකිළ වයස් ගත හෙයින් කාය ශක්ති ය ත් නැති ව තුන් දවසක් නිරාහාර හෙයින් ආහාර ශක්ති ය ත් නැති ව රඳා සිට පිය නො හී වැටී ගිය දෑ ය.

බුදුහු ත් උන්දෑ ලඟට ගොසින් 'මෙහෙණින්න, ඉතා දුර්වල වූයෙහි. වයස් ගත හෙයින් ශරීර ය නො පවත්තී'හි වදරා ස්ථිර වූ නිවන් දක්වනු නිසා බණ වදරන සේක් 'මෙහෙණින්න, තීගේ ශරීර ය මැහැලි බැවින් දිරින. දිරා ගිය ත් පවත්නා තෙක් කල් ලෙඩ දුක් නැති ව තිබේ නම් යහපත් වේ ද, එ සේ ත් නැති ව රොගයට ම ආධාර ය. යම් සේ කැණහිලා බාල වුව ත් ජරසිගාල ය යි කිය ත් ද, නුමු කළ කිඳි වැලට ත් පූතිලතා ය යි කිය ත් ද, එ පරිද්දෙන් එ දවස් උපන ත් රන් වන් වුව ත් ශරීරයට පූතිකාය යි ම කියති. කුණු වූ ශරීර ය වුව ත් නො බිඳී තිබේ නම් යහපත් වේ ද, එ සේ ත් නැති ව ඉතා නො තර කුඹල් වළන් මෙන් බිඳෙයි. බිඳෙන්නේ කුමක් නිසා ද යත්-යම් හෙයකින් ජීවිත ය මරණ කෙළවර කොට ඇත්තේ ද එ හෙයින. ජාති මූලක වූ මරණ ය ජාති ය වූ හෙයින් නවතා ගත නො හැකි වුව ත් මුල් ව සිටිනා ජාතිය ක්ෂය කරන්ට උත්සාහ කරව'යි වදළ සේක. දෙශනා කෙළවර සථවිරින්දෑ වයස් මුකුරා සිටිය ත් ශ්‍රද්ධාදි ඉන්ද්‍රියයන් තව මුකුරා නො ගිය හෙයින් සෝවාන් වූ දෑ ය. සෙසු ත් බොහෝ දෙන ලොවී ලොවුතුරා සැප ත් ලත්හ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් යම් සේ වැස්සෙක් වැස ධූලි පැටී කෙරේ ද, එ මෙන් ජාති ක්ෂය නිසා කුසල් නමැති වැස් සෙන් කෙලෙස් ධූලි පැටී කොට, තව ද යම් සේ වැසි ගිම් නිවා ද එ මෙන් මෛත්‍රී නමැති වැස්සෙන් ක්‍රොධ නමැති ගිම් නිවා, තව ද යම් සේ වැස්සෙක් පෙර වරු වපුරන්නා වූ හැල් වී ආදි වූ ත් පස් වරු වපුරන්නා වූ උඳු මුං ආදි වූ ත් බිජුවට ඇස් පවා ද එ මෙන් සැදැ නමැති බිජු වටින් කුසල් පැළ ඇස් පවා තව ද යම් සේ වැසි වතුරු තෙමේ ත් ඉරුතුයෙන් ඉපැද ඉරුතුයෙන් ම උපන් තණ ලිය ආදිය රකී ද එ මෙන් තමා නිසා ඇති වූ ගුණධර්මයෙන් තමා රකී, තව ද යම් සේ වැස්සෙක් වස්නා කල ගං වැව් පොකුණු කඳු රැළි ආදි ය පුරා ද එ මෙන් දහම් නමැති වැසි වස්වා කුසල් නමැති පැනින් සත්‍වයන්ගේ අදහස් නමැති වැව් පොකුණු ආදි ය පුරවමින් ලද අත් බැව් සඵල කට යුතු.



Non-Commercial Distribution

තව ද කීකරු වීමෙහි යහපත දක්වන්ට මාර්ග ඵලයට නො පැමිණ ම ඊට පැමිණියම් හ යි සිතා ගත් වහන්දෑ ගේ වස්තුව කියමු.

කෙ සේ ද යත්—

පන් සියක් දෙනා වහන්සේ බුදුන් ගෙන් කමටහන් ඉගෙන ගෙණ වලට පලා ගොසින් කෙලෙසුන් නසන්ට යත්න කරණ සේක් ධ්‍යාන උපදවා ගෙන විෂ්කම්භමෙන්[1] 'එබී ගත් කෙලෙසුන්ගේ පැවැත්මක් නො දැක 'රහත් වූම්හ. බුදුන්ගේ අනුශාසනා නො සිස් නියාව බුදුන්ට හඟවම්හ'යි නික්මුණු සේක. බුදුහු ත් ඒ වහන්දෑ දෙරටුව කරා ආ කලට අනඳ මහ තෙරුන් වහන්සේට 'ආනන්‍දයෙනි, තෙල භික්ෂූන් දැනට මා ළඟට අව මැනැවැ යි නැත. අමු සෝනකට ගොසින් ලා පසු ව මා ළඟට අවු නම් යහපතැ'යි වදාළ සේක. අනඳ මහතෙරුන් වහන්සේ ත් ගොසින් ඒ වහන්දෑට එ පවත් වදාළ සේක. ඒ වහන්දෑ තමන් වහන්සේ සුශික්ෂිත හෙයින් සුවිනීත හෙයින් 'අපට අමු සෝන් හැයිදැ'යි නො කියා ම 'දීඝ දූර දන්නා බුදු රජුන් වහන්සේ ඔබ යෑමෙන් ප්‍රයෝජනයක් දුටු නියා ය'යි අමු සෝනට ගොසින් එහි තුබූ මිනී කුණු බලන සේක් එක් දෙ දවසෙක ලා පූ මිනී කුණු දැක ඊ ප්‍රතිඝ උපදවා එ විට ම ගෙනවු ත් ලූ අලුත් මිනී දැක ඊ ඇලුම් උපදවා 'රහත් වූවෝ ප්‍රතිඝානුනය නැත්තෝ වෙද්ද. ඒ හැම ඇත්තේ රහත් නුවූ හෙයින් වේ දෑ'යි එ විට ම තමන් වහන්සේ සක්ලෙශී නියාව දත් සේක.

බුදුහු ගඳ කිළියේ වැඩ හිඳ ම රස් කඳක් විහිදුවා ලා ඒ වහන්දෑ ළඟ ඉඳ කරණ කථාවක් මෙන් 'මහණෙනි, කිසි කෙණකුන්ට කිසි ත් ප්‍රයෝජනයක් නැති මේ මිනී කුණු දැක කරතො ත් අසුභ භාවනාවක් මුත් එහි ඇලුම් කිරීම තොපට තරම් දැ'යි වදරා බණ වදරණ බුදුහු 'වැසි වැස පායා පූ කල්හි අවු සුළං ගැසී ඒ ඒ තැන විසිර පියා තිබෙණ ලබු පරිද්දෙන් පරෙවියන්ගේ පැය සේ සුදු පැය ත් කළු පැය ත් එක් ව තිබෙන්නා වූ ඇට සමූහය දැක පිළිකුල් විසින් මෙනෙහි කරත් මුත් එහි ඇලුම් කිරීම යුක්ති නො වන්නේ වේ දැ'යි වදාළ සේක. දෙශනා කෙළවර ඒ පන් සියයක් පමණ භික්ෂූන් වහන්සේ ආදි සිතා ගත් ලෙසට ම රහත් ව බුදුන්ට ස්තුති කෙරෙමින් අවුත් වැදි සේක.

එ හෙයින් සත් පුරුෂයන් විසින් මිනී කුණු තබා දිව්‍ය රූපයක් වුව ත් දැක අනුනය ත් නැති ව ප්‍රේත රූපාදී වූ අනිටු අරමුණක්

1. විකුන් වී මෙන්

Non-Commercial Distribution

වුව ත් ඊ ප්‍රතිස ත් නූපදවා මැදහත් ලෙසින් පැවත යම් සේ මැණිකෙක් සියලු ලෙසින් ම නිකසල ද එ මෙන් පවිත්‍ර වූ අදහස් ඇති ව, තව ද යම් සේ මැණික කසළ හා මුසු නො වේ ද, එ මෙන් පාපීන් හා එක් නො ව, තව ද යම් සේ මැණික තව තව ත් රුවන් හා ම එක් වේ ද, එ මෙන් උතුම් ගුණ ඇත්තවුන් හා ම එක් වීමෙන් උතුම් තරම් ඇති ව පින් කමයෙදී භව සැප ත් වළඳා කෙළවර නිවන් සම්පත් සාධා ගත යුතු.

## 134. රූපනන්ද නම් ස්ථවිරීන්ද්‍ර ගේ වස්තුව

තව ද සත්වයන්ගේ අදහස් එක් තරම් නො වත ත් උන් උන්ගේ අදහස් ලෙසට බණ වදරා අවබොධ කරවා ලීමෙහි විස්ම ය හභවන්නට රූපනන්ද නම් ස්ථවිරින්දැ ගේ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්—

ඒ ස්ථවිරින්දැ ගිහි අවස්ථාවෙහි එක් දවසක් සිතන දැ 'අපගේ වැඩි මාලු බෑණන් වහන්සේ රජ සැප ත් හැර ගොසින් මහණ ව බුදු වූ සේක. ඔබගේ පුත් රහල් කුමරු ත් ගොස් මහණ වූ ය. මට සවාමී ව සිටි නන්ද කුමරු ත් ගොසින් මහණ වූ ය. අපගේ මවු වූ මහා ප්‍රජාපතී ගොතමීන් වහන්සේ ත් මහණ වූ සේක. නෑයන් මෙ තෙක් දෙනා මහණ වූ කල්හි ගිහි ගෙයි රඳා මම කුමක් කෙරෙම් ද? මම ත් මහණ වෙමි'යි මෙහෙණවරට ගොසින් මහණ වූ ය. මහණ වන ගමන ත් නෑයන් නිසා මු ත් සැදෑයකින් නො වෙයි. මුලින් ජනපද කල්‍යාණී නම් වුව ත් රුව බලවත් හෙයින් රූපනන්ද නමින් ප්‍රසිද්ධ වූ දැ ය. තමන්දැ රුවට ම බැවී හිඳිනා හෙයින් බුදුන්ගේ දෙශනාව ත් ති ලකුණෙහි යෙදූ හෙයින් ඒ තමන්දැට රුචි නො වන්නා ම 'ඔබ ගියො ත් මේ නියා රුව ජරාවක් වැද ලා කිලුටු කරණ නියාවක් හෝ මරණට පැමිණෙන නියාවක් හෝ වදරා මට මුසුප්පු උපදවන සේක් වී නමුත් ය'යි එක දවසෙක ත් බුදුන් ලඟට නො යන දැ ය.

සැවත් නුවර ඇත්තෝ උදෑසන ම පෙහෙ ව ගෙන දන් දී ලා උතුරු සළු පෙරව ගෙන සුවඳ මල් ආදිය හැර ගෙන සවස් වේලාට දෙව්රමට රැස් ව බණ අසති. මෙහෙණින්නෝ ද තමන් හැම ත් හිඳිනා ඇතුළු ගම ම හෙයින් බණ අසනු නිසා වෙහෙරට අවුත් බණ අසන්නාහ. බණ අසා ලා නුවරට වදිනා කල බුදුන්ගේ ගුණ කියන්නාහ. සතරක් පමණ කොට වසන ලෝ වැස්සන් අතුරෙන් යම් කෙනෙක් බුදුන් දැක නො පහදිත් නම් උඹ මදවූ ය. එ සේ

Non-Commercial Distribution

මැ'යි රූප ප්‍රමාණිකයෝ බුදුන්ගේ ලක්‍ෂණානුව්‍යඤ්ජනයෙන් හෙබි යා වූ රන්වන් ශරීර ය දැක එ පමණෙකින් වක්කලි මහ තෙරුන් වහන්සේ මෙන් පහදිති. ඝොෂ ප්‍රමාණිකයෝ ද නො එක් ජාතක වල පැවැති බුදුන්ගේ ගුණ ද අෂ්ටාඞ්ගයෙන් සමුපෙත බ්‍රහ්ම නාද වැනි වූ බුදුන්ගේ කට හඬ ද අසා පහදිති. ලූඛ ප්‍රමාණිකයෝ ද රූක්‍ෂ චීවර ධාරණාදී වූ රූක්‍ෂ ප්‍රතිපත්තියෙහි පහදිති. ධර්‍ම ප්‍රමාණිකයෝ ද, බුදුන්ගේ ශීල ගුණ ය මේ තරමෙක. සමාධි ගුණ ය මේ තරමෙක, ප්‍රඥා ගුණ ය මේ තරමෙක, බුදුහු සීල සමාද්ධ්‍යාදී ගුණයෙන් අනන්‍ය සාධාරණ සේකැ'යි පහදිති. උන් බුදුන්ගේ ගුණ කියන කලට මුබ නො සෑහෙන්නා සේ ම ය.

බුදුන් ලඟට යන්ට මැළි ව හුන් රූපනන්‍දා නම් භික්‍ෂුණීන් දෑ ද බණ අසා ආ භික්‍ෂුණීන්දෑ ගෙනු ත් උපාසිකාවරුන් ගෙනු ත් බුදුන්ගේ ගුණකථා අස අසා 'මූ හැම දෙන අපගේ බෑණන් වහන් සේගේ ගුණ බොහෝ කොට කියති. ඉදින් මා දැක රුවෙහි දෙෂ එක් දවසක් වදරන සේක් වී නම් කෙ තෙක් වදරණ සේක් ද? මෙහෙණිනි වහන්දෑ හා කැටි ව ගොසින් බුදුන්ට නො පෙනී හිඳ බුදුන් දැක පියා බණ ත් ඇසීම නම් යහපතැ'යි සිතූ දෑ ය. එ සේ සිතා ලා 'බණ අසන්ට එමී' මෙහෙණිනි වහන්දෑට කී දෑ ය. මෙහෙණිනි වහන්දෑ ද 'නැතක් දවසකින් රූපනන්‍දාවෝ බුදුන් දක්නා කැමැති වූහ. අද බුදුහු මුන් මුල් කොට විසිතුරු කොට බණ වදරන සේකැ'යි සතුටු ව එ දවස් උන්දෑ ත් කැඳවා ගෙන නික්මුණු දෑ ය.

උන්දෑ ත් නික්මුණු වේලෙහි පටන් 'ගිය ත් බුදුන්ට නො පෙනෙමි'යි සිත සිතා ම යන දෑ ය. බුදුහු ත් 'රූපනන්‍දාවෝ අද මා දක්නට එති. උන්දෑට කවර ලෙස බණ කීම රුචි දෝ හෝ' යි සිතා ලා 'උඹ තුමූ රූප ගරුකයෝ ය. ආත්ම ස්නේහ ය බලවත කටුවෙන් කටු ව ගන්නා සේ රුවින් ම රූ මත හරවා ලීම නිසි ය'යි සනිටුහන් සිතා වදරා ලා උන්දෑ විහාරයට එන වේලාට සොළොස් හැවිරිදි වූ විශිෂ්ට වූ රූ ඇති රන් පිළියක් හැඳ ගෙන ආභරණ ලා සැරහී පවන් පතක් හැර ගෙන තමන් වහන්සේ ඇඟට පවන් සල සලා හිඳිනා ස්ත්‍රී රුවක් මවා ලූ සේක. ඒ ස්ත්‍රී රුව ත් බුදුන් හා රූපනන්‍දාවන් හැර සෙසු දකින්නෝ නැත. උන්දෑ ත් භික්‍ෂුණී වහන්දෑ හා කැටි ව ගොසින් භික්‍ෂුණී වහන්දෑ පිටි පස්සේ සිට පසඟ පිහිටුවා බුදුන් වැඳ ගෙන ක්‍ෂත්‍රිය ජාතීන් කුම් වුව ත් ආර්‍ය්‍ය ජාතීන් ලං වන්ට නු වූහෙයින් ලජ්ජා ව මුවා වන්නා සේ

Non-Commercial Distribution

මෙහෙණින් වහන්දෑ හස්නෙහි හිඳ දෙතිස් ලකුණෙන් විසිතුරු වූ අනුව්‍යඤ්ජනයෙන් බබලන බ්‍යාමප්‍රභාවයෙන් පිරිවරන ලද බුදුන් ගේ රුව දැක රූපනන්‍දුවෝ පුන් සඳක් සේ සොම් මුහුණ ත් දැක ලඟ සිටි ස්ත්‍රී රුව ත් දුටුවූ ය.

උන්දෑ ඒ මවා ලූ මනහර රූ දැක තමන්දෑ ත් බලා පියා අර රුව තරමට තමන්දෑ රන් වන් හංස ධෙනුවකගේ ලඟ සිටි කැවි-ඩියක කොට සිතා ගත් දෑ ය. ඒ රුව දුටු වේලේ පටන් රූප නන්‍දුවන්ගේ ඇස් බමන්ට වන. 'අනේ මුන්ගේ ශරීර ශොභාව ත් යහපත් නියා ය'යි එක්වන් උන් ම බලන කලට ආත්ම ස්නෙහ ය හැරී ගොසින් උන් කෙරෙහි ස්නෙහ ය බලවත් වි ය. බුදුහු ඒ දැන උන්ගේ ඒ ඇවිටිය ත් හරවා නිවන් රුචි කරවනු නිසා වදරමින් හිඳ මවා ලූ රුවෙහි සොළොස් හැවිරිදි තරම ඉක්ම විසි හැවිරිදි තරම් ලෙස කොට දක්වා ලූ සේක. රූපනන්‍දුවන්දෑ ද ඒ බලා 'මේ රුව ආදි තරම් නො වෙයි' සිතා ඇලුම් මඳක් තුනී කළ දෑ ය. බුදුහු ත් පිළිවෙළින් ඒ රුව එක් දරු මා තරම් ද, මධ්‍යම තරම් ද, මහත් තරම් ද, ඇති කළ සේක. රූපනන්‍දුවන්දෑ ද ඒ ඒ අවස්ථා දැක උන් කෙරෙහි පැවති ප්‍රෙම ය සර්‍වාකාරයෙන් නො හැර තුනී කළ දෑ මවා පෑලූ රුව මෑලි අවස්ථාවෙහි ජරාවෙන් දිරා ජරාතුර ව කඩදත් ඇති ව හිස ත් යෞවන නමැති දර දවා හළු කළ හළු රැසක් මෙන් නර ව ගොනැසක්[1] මෙන් වක් ව ගොසින් සැරවිටි[2] දණ්ඩක් ගෙන වෙවුල වෙවුලා සිටියා දැක ඒ රුව ඉතා විරක්ත වූහ.

බුදුහු එ වේලෙහි වර්‍ණ මදයෙන් මත් වූ රූපනන්‍දුවන්දෑගේ වර්‍ණමද ය ජරාව දක්වීමෙන් හරවා ලා ආරොග්‍ය මද ය හරවනු නිසා මවාලූ රුව රොගයෙන් වැළඳ ගත් ලෙසට කළ සේක. උයි ත් ඒ ඇසිල්ලෙහි එල්බෙන්ට අල්වාගත් දණ්ඩ ත් තල් වැට ත් දමා පියා මහ හඬින් හඬමින් බිම වැටී පියා කිස මුවා පස වැකෙමින් ඇත මැත පෙරළුණාහ. රූපනන්‍දුවන්දෑ ද එයි ත් දැක ඉතා ම විරක්ත වූ දෑ ය. බුදුහු ත් මවා ලූ රුව මළ සැටි ය දක්වා ලූ සේක. උයි ත් මිය ගොසින් ඒ ඇසිල්ලෙහි ම ඉදිමී ගියහ. නව වණ මහ දෙරින් පූයා හා පණුවෝ වැගිරෙති. කවුඩු ආදීහු රැස් ව කන්ට පටන් ගත්හ.

---

1 ගෝනැසක් 2 සාරටි

Non-Commercial Distribution

රූපනන්‍දාවන්දෑ ද රුවට ම බැවී හුන් බව මුත් බුද්ධානුභාව ය දන්ට නුවූ හෙයින් බුදුන්ගේ ඍද්ධි බලයෙන් වන නියා ව නො දන ඒ හැම දක මා මේ තැනට එන වේලාට දෙවඟනක් සේ ඉතා රූපත් වූ මේ ස්ත්‍රී තොමෝ මෙ තැන දී ම ක්‍රීඩා දශකයේ පටන් අවසථා පෙරළී ජරාවට ත්, ව්‍යාධියට ත්, මරණයට ත් පැමිණි-යා ය. මේ වැන්නවුන්ට පවා ජරා ව්‍යාධි මරණ ඇත. සෙස්ස වුන්ට කියනු කිම් ද'යි අත් බැව ඇති ව ලා නැති වීමෙන් අනිත්‍ය නියා ත් උදවියෙන් පෙළෙන හෙයින් දුක් නියා ත් තමා විසිය නො පවත්නා හෙයින් අනාත්ම නියා ත් සැලකූ ය. ඉක්බිත්-තෙන් උන්දෑට භව තුන ගිනි ගෙන දන්නාක් මෙන් වැටහිණ. සිත ත් කමටහනට නැමෙන්ට වන. බුදුහු ද තුමූ ම තමන්ට පිහිටක් කට හෙද්දෝ හෝ යි බලා භාවනාභියොගයක් ආදි නු වූ හෙයින් සහායක් ලදින් මුත් තුමූ ම තමන්ට පිහිට කට නො හෙ ති යි සිතා වදරා උන්දෑට අනුකූල ලෙස බණ වදරණ සේක්—

"ආතුරං අසුචිං පූතිං—පස්ස නන්‍දෙ සමුස්සයං,
උග්ඝරන්තං පග්ඝරන්තං—බාලානමභිපත්‍ථිතං
යථා ඉදං තථා එතං—යථා එතං තථා ඉදං,
ධාතුතො සුඤ්ඤතො පස්ස—මා ලොකං පුනරාගමි;
භවෙ ඡන්‍දං විරාජෙත්‍වා—උපසන්තො චරිස්සසී"

යන බණ වදාළ සේක. රූපනන්‍ද නම් මෙහෙණින්දෑ ද ඒ බණ අසා සෝවාන් වූ දෑ ය.

ඉක්බිත්තෙන් එක විට කාගත නො හෙන බාල දරු කෙණ-කුන් තබාලා ත් කවන මැණි කෙණකුන් මෙන් මත්තෙහි මාගීඵල නිසා කමටහන් වදරන බුදුහු 'යම් සේ නුවර රක්නවූ වී සාල් උඳු මුං තල කලත් ආදි ය තබනු නිසා ගෙවල් නඟා මුවපාවත් වැලින් වෙළා මැටි ගසා කෙරෙත් ද එ මෙන් සත්‍ව සන්තාන යෙහි ත් ජරා ය මරණ ය උන්නති ලක්‍ෂණ වූ මානය අනුන්ගේ ගුණ මකන මකු කම ය යන මේ තබනු නිසා ශරීර නමැති ගෙවල් ඇට නමැති මුව පා ලා නහර නමැති වැලින් වෙළා මස් නමැති මැටි ලේ නමැති පැනින් හනා ගසා සිව් නමැති වැලි මැටි පැමැටී ගා නුවර කරණ ලදී. කායික වුව ත් චෛතසික වුව ත් පීඩා-වෙක් ඇත් නම් ශරීර නමැති නුවර ම ය. ඒ විනා අනික් ගත හැකි දෙයෙක් නැතැ යි වදාළ සේක. දෙශනා කෙළවර රූපනන්‍දාවන්දෑ රූප රාග ය තබා උද්ධම්භාගිය සංයොජන

Non-Commercial Distribution

යන් පස් දෙනා ම නසා රහත් වූ දැ ය. සෙසු ත් බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් ශරීරයෙහි සාර ය තුනු රුවනට නමස්කාර කිරීමෙන් හැර ගෙන මිනිස් ලොව ඉපැදීමෙහි සාර ය පන්සිල් පමණකු ත් රක්‍ෂා කිරීමෙන් හැර ගෙන ධන ධාන්‍ය සාර ය දන් දී මෙන් හැර ගෙන කෙළවර නිවන් සාරය ත් ලබන්ට උත්සාහ කට යුතු.

---

# 135. මල්ලිකා බිසොවුන් ගේ වස්තුව

තව ද බොරුවෙහි නපුර දක්වනු සඳහා මල්ලිකා බිසොවුන් ගේ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්—

ඒ මල්ලිකා බිසවු එක් දවසක් නහන කොටුවට වැද ලා මුව මූණ සෝධා පියා නැඹුරු ව සිට පය සෝධති. උන් හා කැටි ව නහන කොටුවට වන් රජ ගෙයි ම වැඩී බල්ලෙක් බිසොවුන් පය සෝධන්ට නැඹුරු ව සිටියවුන් දක ග්‍රාම ධර්මයෙහි යෙදෙන්ට පටන් ගත. බිසවු තමන්ට තරම් කට යුත්තක් නො වත ත් විෂයෙහි සම නො වන්නවුන් නැති බැවින් තමන්ගෙන් එ බඳු ප්‍රයොගයක් නුවූව ත් පහස ඉවසා සිටියහ. කොසොල් රජ්ජුරුවෝ ද උඩුමාලේ සිට කවුළු දෙරින් බලනුවෝ ඒ ව්‍යභිචාර ය දක බිසොවුන් රජ ගෙට ආ කල්හි 'හීන තැනැත්ති ය, තී නසින්ට මෙ බන්දක් කුමට කෙළෙහිදැ' යි කිවු ය. කළ දෙය පැටි කරන්ට 'රජ්ජුරුවන් වහන්ස, මා කෙළේ කිම් දැ'යි කිවු ය. 'අනික් කුමක් කෙරෙ යි ද? බල්ලා හා සහවාස කෙළේ වේ දැ'යි කිවු ය. තමන්ගේ ප්‍රයෝගයකින් නුවූව ත් ඉවසා සිටි හෙයින් වැරැද්ද ඇති ව ගියා වන්නා ලජ්ජාව ත් බලවත් ව එ සේ වූ දෙයෙක් නැතැ'යි කිවු ය. 'කයින් සිඬ වූ පාප ය මඳ හෙයින් බසිනු ත් පව් පුරා බොරු කියයි ද? මා ම ඇස පුරා දුටු දෙ ය පව ත් සිද්ධ කොට බොරු නො කි ය යි'යි කිවු ය.

රජ්ජුරුවෙනි, යම් කිසි කෙණෙක් තෙල නහන කොටුවට වන්නු නම් තෙල කවුළු දෙරින් බලා සිටි කෙණකුන්ට එක තැනැත්තෝ දෙන්නකු සේ පෙනෙති. පෙනෙන කල ත් අසද්ධර්මයේ පවත්නා ලෙසට පෙනෙති' යි කියා ලූ

Non-Commercial Distribution

බොරුව බොළඳ රජ්ජුරුවන් හදහා ගන්නා ලෙසට කිවු ය. 'පව්වු තැනැත්තිය, කෙ සේ කිය යි නමුත් මම හදහා නො ගන්මි' කිවු ය. 'රජ්ජුරුවන් වහ ෙස, අප කී බස් නො හදහන සේක් වී නම් මුඹ වහන්සේ නහන කොටුවට වැද ලා සිටි ය මැනව. මම මේ කවුළු දෙරින් බලා සිටිමි'යි කිවු ය. තමන් ඉතා බොළඳ හෙයින් රජ්ජුරුවෝ උන්ගේ බස් ගිවිස ගෙන නහන කොටුවට වන්හ. බිසොවුන් කවුළු දෙරින් බලනුවෝ 'නුවණ නැති රජ්ජුරුවෙනි, රජ ව සිට මෙ තෙක් බිසෝවරුන් හින්ද දී එළි ය හා මිත්‍ර සන්ථව ය කරන්නෝ රජ ව සිටි මුඹට තරම් දැ'යි කිවු ය. රජ්ජුරුවන් 'මා එ සේ කෙළේ නැතැ'යි කීව ත් 'මම ඇස පුරා දිටිමි. මුඹ කුමක් කීව ත් නො හදහමි' කිවු ය. රජ්ජුරුවෝ ඒ අසා ඒකාන්තයෙන් මේ නහන කොටුවට වන් කෙණකුන් දෙන්නකු සේ මෙ ලෙසින් පෙනෙන නියා ය'යි බිසොවුන් කෙරෙහි පැවැති කට යුත්තක් නැති වන් කොට සිතා ගත්හ.

මල්ලිකා බිසවු ද 'මේ රජ්ජුරුවෝ තමන් බොළඳ හෙයින් මා වළඳන්ට කියා ලූ දෙය හදහා ගත්හ. උඃ තිරිසනා හෙයින් පර පුරුෂ සංසේවා කුම් වුව ත් පව් පව් ම ය. ඒ එ සේ තිබිය දී හැම පව් විතරට ත් උග්‍රයා සේ තිබෙන බොරු ත් කියා පීමි. මේ මාගේ කටයුත්ත අඥන ව මා සඟවන්ට සිතූ බව මුත් තුන් කල් දන්නා බුදුහු ත් අසූ මහ සවුවන් වහන්සේ ත් දන්නා සේක. ඔබ හැම තබා දිවස් ඇති යම් කෙණෙක් ම දන්නා සේක. අනේ මා කළ දැත් නපුර. කළ දෙයට ත් කී දැත් නපුරු ම ය. ඒ පාප ය තුනී ව ගතත් යහපතැ'යි කොසොල් රජ්ජුරුවන් අසදෘස මහදන් දෙන කල ත් සහා ය වූ ය. ඒ දන ත් කෙළවර දවස දුන්නා තුදුස් කෙළක් අග්ගි බුදුන් හිසට කළ හෙළ කුඩය ත් වළඳන්ට වැඩ හිඳිනා පලඟ ත්, පාත්‍ර ය තබා ගන්නා පාත්‍රාධාරය ත් නො දෙව් පා තබන පාද පීඨය ත් ය යි මේ සතර අගයක් නැති දෙය ය.

මල්ලිකා බිසොවුන් මියන ගමනේ මෙ බඳු පරිත්‍යාගයක් සඳහන් නො කොට කළ පව් කම් ම සඳහන් කෙරෙමින් මිය අවීචියෙහි උපන්හ. රජ්ජුරුවන්ට ත් ඉතා ප්‍රියයෝ ය. ශොක ය ත් බලවත් වි ය. උන් දවා පියා 'උන් උපන් තැන් විචාරම්'යි බුදුන් ළඟට ගියහ. බුදුහු ත් යම් සේ ඒ විචාරන්ට සඳහන් නො කෙරෙත් නම් එ ලෙසට ඉටා වදළ සේක. උයි ත් අවු ත් බුදුන් හා සෙසු කථා කොට පියා රජ ගෙට ගොසින් විචාරන්ට සිටි කථාව සඳහන් කොට පියා ''මම මල්ලිකාවන් උපන් තැන්

Non-Commercial Distribution

බුදුන් අතින් විචාරන්ට ගොසින් සලකුණු නො වී ය. සෙට විචාරමී' දෙ වන දවසු ත් ගියෝ ය. බුදුහු ත් පිළිවෙළින් සත් දවසක් ම සලකුණු නො වන ලෙස ම ඉටා ලූ සේක. මල්ලිකා බිසවු ද කළ පාප ය පිණිස් තුනී කළ බැවින් නරකයෙහි ආයු නො ව මිනිසුන්ගේ ආයු පමණින් සත් දවසක් පැසී ලා අට වැනි දවස් එයින් සැව කියා ලූ බොරු ත් අපී හඤ්ජක මුසාවක් නො වන හෙයින් එ තරමට කළ පින් බොහෝ හෙයින් තුසී පුරයෙහි උපන්හ.

බුදුහු කුමක් නිසා සත් දවසක් සලකුණු නො වන ලෙසට කළ සේක් දූ යි යත හොත් ඒ බිසවු රජ්ජුරුවන්ට ප්‍රියයහ. ඒ හෙයින් නරකයෙහි උපන් නියාව අසා දූන් පින් බොහෝ කොට කළ මල්ලිකාවන් පවා නරකයෙහි උපන් කල මම දන් දී කුමක් කෙරෙම දූ'යි දූන් දන යහපත් විපාක නැතැ යි යන ලබ්ධීන් රජ ගෙන් පන් සියයක් භික්ෂූන්ට තබ්බවා ලූ දන් හරවා පියා පවු කම ම හැසිර නරකයෙහි ම උපදී නමුත් ය යි රජ්ජුරුවන් කෙරෙහි කරුණාවෙන් සතියක් ම සලකුණු නො වන ලෙසට කොට වදරා අට වැනි දවස් සිහා වඩනා ගමනේ තමන් වහන් සේ ම රජ ගෙට වැඩි සේක. රජ්ජුරුවෝ ද බුදුන් වැඩි නියාව අසා අවුත් පාත්‍ර ය හැරගෙන උඩුමාලට නැංගෙන්ට වන්හ. බුදුහු යට මාලේ රථ තිබෙන ගෙයි වැඩ හිදිනට වන් සේක.

රජ්ජුරුවෝ ත් එ තැන ම වැඩ හිඳුවා ලා කැඳ අවුළු පත් වළඳවා ලා හිඳ 'ස්වාමීනි, මල්ලිකා බිසොවුන් උපන් තැන් විචාරමී සිටා සත් දවසක් ම ඔබ ලඟට ගොසින් සලකුණු නො ව විචාරා ගත නුහුණුයෙමී 'ස්වාමීනි, උන් උපන් තැන් කොයි දූ'යි විචාළෝ ය. 'මහරජ, තුසී පුරයෙහි උපන්නැ'යි වදළ සේක. 'ස්වාමීනි, උන් තුසී පුරයෙහි නූපැනා කල උපදනෝ කවුරු ද? ගෑනු ව උපන්නවුන් ගෙන් විශාඛාදී වූ කීප දෙනකු හැර උන් හා සරි කවුරු ද, උන්ට හැම විට ම දන් පින් විධානයක් මුත් අනික් කට යුත්තෙක් ඇද්ද? ස්වාමීනි උන් මළ තැන් පටන් ශොක ය ඉවසන්ට බැරි ය'යි කිවූ ය.

මහරජ, මුසුප්පු නො වව. උපන්නවුන්ට මරණ නියම දෙයෙකැ'යි වදරා 'මහරජ. මේ රථ ය කාගේ දූ'යි විචාළ සේක. ස්වාමීනි, අපගේ මුත්තණුවන් වහන්සේගේ ය'යි කිවූ ය. අනික් රථයක් පෑ ලා 'මෙල කාගේ දූ'යි විචාරා ලා අපගේ පියාණන් වහන්සේගේ ය'යි කී කල්හි අනික් රථයක් පෑ ලා 'මේ කාගේ දූ'යි විචාළ සේක. ඒ රථ ය තමන්ගේ නියාව කිවූ ය. එ ලෙස කී කල්හි 'මහරජ, තොපගේ මුත්තණුවන්ගේ රථ ය ද එ ම ලෙසින් ම තොපගේ පියාණන්ගේ රථ ය කරා පැමිණ ගත

Non-Commercial Distribution

නොහිණ. තොපගේ පියාණන්ගේ රථය ත් එම ලෙසින් ම තොපගේ රථ ය කරා පැමිණ ගත නොහිණ. මෙ සේ වූ දඬු කඩ වලට පවා ජරාව ඇත. අත් බැවට ජරාව ඊ මෙහි කියනු කිම් දැ'යි වදරා බණ වදරන සේක්.

'රජ්ජුරුවෙනි, රථාලඞ්කාරයෙන් සරහන ලද රථයෝ ත් ඉදි කළ තැන් පටන් ක්‍රම ක්‍රමයෙන් දිරති. හුදක් රථ මතු නො වෙයි. මමායන කළ ශරීරය ත් උපන් වක් පටන් ම ජරාවට පැමිණෙයි. එ සේ කල ජරාවට නො පැමිණෙන්නේ කවරේ ද යත්—බුද්ධාදි වූ සත් පුරුෂයන්ගේ නව ලොවුතුරා දහම් කවර කලෙක ත් එක තරම් ම හෙයින් ජරාවට නො පැමිණෙයි. බුද්ධාදී වූ සත් පුරුෂයෝ කථාවක් කෙරෙත් නමුත් නුවණැත්තවුන් හා ම කථා කරණ මුත් ජරා මරණ සඳහන් නො කරණ අඥනයන් හා කථා කිරීමෙන් ප්‍රයෝජන නැති හෙයින් උන් හා කථා නො කෙරෙති'යි වදාළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් සත් පුරුෂයන් විසින් ජරාව අවුත් ලා සියල්ල කට අක්‍ෂම නො කරණ තෙක් පින් කිරීමට යොග්‍ය අවසථාවෙහි පින් කම හැසිර එයින් ජනිත වූ කුශලානුභාවයෙන් භව භොග සම්පත් වළඳා කෙළවර නිවන් සම්පත් සාධා ගත යුතු.

## 136. ලාලුදායි තෙරුන් වහන්සේගේ වස්තුව

තව ද අඥන වීමෙහි නපුර හඟවන නිසා ලාලුදායි තෙරුන් වහන්සේ ගේ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්—

ඒ තෙරුන් වහන්සේ මඟුල් කරණ ගෙවලට ගිය කල අනු මෙවෙනි බණට ආරාධනා කොළෝ ඇත් නම් මළ නෑයන් දවා හළු හස් කොට ලා පින් පෙත් දී අනුමෙවෙනි බණට ආරාධනා කළවුන්ට කිව මනා තිරොකුඞ්ඩ සූත්‍ර ය කියන සේක. අවමඟුල් දවසේ ද මඞ්ගල සූත්‍ර ය කියන සේක. මෙසේ ඒ ඒ තැන්හි දී 'එකක් කියමි' සිතා අනිකක් කියත ත් 'මා කියන්නේ සථානොචිතයක් නො වෙ'යි නො දන්නා සේක. වහන්දෑ එ පවත් දැන බුදුන් කරා ගොසින් සවාමීනි, මඟුල් අවමඟුල් දෙක ට ම ලාලු දයි සථවිරයන් යන්නේ හැයි ද? සථානොචිත ය නො දැන මඟුල් කිව මනා තැනට අවමඟුල් කියති. අවමඟුල් කිව මනා තැනට

Non-Commercial Distribution

මහල් කියති. එ සේ කල එ සේ වූ තැනට යෑමට ත් වඩා නො යෑම යහපත් වේ දැ'යි කී සේක. බුදුහු ත් 'හෙම්බා, තුලුන් තෙල ලෙස කියන්නේ දැන් මතු නො වෙයි. පෙර ත් තෙල කියන ලෙස ම ය. හැම කල ම නුවණක් ඇති කෙණෙක් නො වෙති' වදරා යට ගිය දවස ත් එ ලෙස ම කියන නියාව දක්වනු නිසා ගිය දවස පැවැති ලෙසක් දක්වන සේක්—

"ගිය දවස බරණැස අග්ගිදත්ත නම් බමුණානන්ගේ පුත් වූ සොමදත්ත නම් කුමාර කෙණෙක් රජ්ජුරුවන්ට සේව ය කෙරෙති. සොමදත්ත කුමාරයෝ ත් රජ්ජුරුවන්ට ප්‍රියයෝ ය. අග්ගිදත්ත නම් බමුණානෝ ද ගොවි කර්මාන්ත කොට ජීවත් වෙති. උන්ගේ ත් සාතා ගොන් ගෙයක් ම ය. වඩා නැත. ඉන් එක් ගොනෙක් මිය ගියේ ය. බමුණානෝ පුතණුවන්ට 'සොම-දත්තයෙනි, තෙපි රාජවල්ලභයෝ ව ද, රජ්ජුරුවන් වහන්සේට කියා ලා අපට ගොනකු ඉල්වා දෙව'යි කිවු ය. සොමදත්ත-යෝ ද 'මම ගොසින් ගොන් ඉල්වීම් නම් මාගේ ලඝු කම් පෙනෙ'යි සිතා 'පියාණන් වහන්ස. මුඹ ම රජ්ජුරුවන් වහන්සේ ගෙන් ගොන් ඉල්ලුව මැනැව'යි කිවු ය.

'එ සේ වී නම් මා කැඳවා ගෙන යව'යි කී කල්හි 'මුන්දෑ ඉතා නුවණ නැති දෑ ය. හිඳීම් සිටීම් දන්නට ත් නැත. කථා කරණ ලෙස දන්නට ත් නැත. එකක් කියන්ට සිතුවො ත් කියන්නේ ඒ තබා ලා අනිකෙක කියන බණන ලෙස උගන්වා ගෙන යෙමී' සිතා සොමදත්ත කුමාරයෝ ද, කුමාරයෝ අග්ගි දත්ත නම් පියාණන් බීරණත්‍ථම්බ නම් සෝනක් බඩට කැඳවා ගෙන ගොසින් මිනිසුන් සැටියට තණ කලප් බැඳ සිටුවා ලා 'මූන් වහන්සේ රජ්ජුරුවන් වහන්සේ ය, මූන් වහන්සේ යුව රජ්ජුරුවන් වහන්සේය, මූ සෙනෙවි රද්දු ය, යනාදීන් භය හැරෙනු නිසා පියාණන්ට පැලා 'මුඹ රජ ගෙට ගිය කල මේ ලෙස සිටිය යුතුය. රජ්ජුරුවන් වහන්සේට මෙ සේ කථා කට යුතු ය යුවරජ ආදීන් හා මෙ සේ කථා කට යුතු ය. රජ්ජුරුවන් වහන්සේට කන්නලවු කියන කළ 'රජ්ජුරුවන් වහන්ස, මුඹ වහන්සේට ජය වේ ව යි කියා ලා—

' ද්වෙ මෙ ගොණා මහාරාජ – යෙහි ඛෙත්තං කසාමසෙ,
තෙසු එකො මතො දෙව – දුතියං දෙහි ඛත්තිය''

යන මේ ගාථාව කියා ලා ගොන් ඉල්වා ගත මැනැව'යි කියා ලා ගාථාව උගන්වාලූ ය.

Non-Commercial Distribution

උයි ත් ඒ ගාථාව හවුරුද්දක් විතරින් දූක සේ වන පොත් කොට ගෙන වන පොත් නියාව පුතණුවන්ට කිවු ය. 'එසේ වී නම් යන් තම් පඩුරක් හැරගෙන අව මැනව. මම පෙරාතු ගොසින් රජ්ජුරුවන් වහන්සේ ලඟ සිටිමි'යි කිවු ය. 'යහපතැ'යි කියා ලා තමන්ගේ දූක් පත් තරමට පඩුරකු ත් හැර ගෙන උගත් ගාථාව නො වරදවා කියන ලෙසට උත්සාහ ඇති ව රජ ගෙට ගොසින් පුතණුවන් කෙරෙහි ගත් දයින් දූක සතුටු වූ රජ්ජුරුවන් 'නතක් කලෙකින් ආ ගමනෙක. තෙල හස්නෙහි හිඳුව. කන්නලවූ වෙක් ඇත් නම් එයි ත් කියව'යි කී කල්හි– උගත් ගාථාව අර්ථ නම් 'යම් ගොන් කෙණකුන් බැඳ ගෙන සී සෑම් නම් තමා ඇත්තෝ ගොන් දෙන්නෙක. ඉන් එකෙක් මිය ගියේ ය. ගොනකු දුන මැනැවැ'යි යනු ය—මු ගාථාව කියා ගෙන ගොසින් ගොනකු ඉල්වන තැන දී ''දුතියං ගණ්හ ඛත්තිය''යි කියා සිටි ගොනා ත් රජ්ජුරුවන්ට හැර ගන්ට කිවු ය.

රජ්ජුරුවෝ තව ත් ගාථාව කියව'යි කිවු ය. තව ත් එලෙස ම කිවු ය. රජ්ජුරුවෝ තමන් නුවණැති හෙයින් වරදවා කී නියාව දූන ගෙන සි පියා 'සොමදත්තයෙනි, තොපගේ ගෙයි ගොන් බොහෝ නියා වේ දූ'යි කිවු ය. එ සේ වී නම් ඔබින් දෙවා වදළ නියා ය'යි කී කල්හි රජ්ජුරුවෝ සෝමදත්තයන් කෙරෙහි පැහැද අග්ගිදත්තයන්ට ගොන් අට ගෙයක් ද බමුණන් පළඳින් නට නිසි ආභරණ ද, රඳා හුන් ගම ද පමුණු කොට දෙවා ලා මහ පෙරහරින් බමුණානන් යවු ය. සත් පුරුෂ සමවායෙන් එක ගොනකු ඉල්වා ගොසින් ගොන් සොළොසක් හා පමුණු ගමක් ලත්හ.''

බුදුහු දෙශනාව ගෙන හැර වදරා 'එ කල රජ්ජුරුවෝ නම් අනද මහ තෙරහු ය. අග්ගිදත්ත බමුණානෝ නම් ලාලුදයි තෙරහු ය සොමදත්තයෝ නම් මම් ම ය'යි ජාතක ය නිමවා වදරා ලා හෙම්බා මහණෙනි, පෙර ත් මේ තෙමේ තමා අල්පශ්‍රැත හෙයින් ගොනකු ඉල්වන්ට සිතා සිටි ගොනු ත් හැරගන්ට කී ය. අල්පශ්‍රැතයෝ නම් ගොන් වැන්නෝ ය'යි වදරා බණ වදරන සේක් 'යම් කෙණෙක් කමටහන් ඉගෙන ගෙන ඊ යෙදී වෙසෙත් නම් උඟු බහුශ්‍රැතයෝ ම ය. යම් කෙණෙක් එයි ත් නැති ව පිටකයක් පමණෙක වෙව'යි සඟියක් පමණෙක වෙව යි, මුල් පණස් ආදි වූ පණසක් පමණෙක වෙව යි, යටත් පිරිසෙයින් විනයෙන් වුවො ත් මාතෘකා පමණෙක වෙව යි, අබිදමෙන් වී

Non-Commercial Distribution

නම් සප්තප්‍රකරණ මාතෘකා පමණෙක වේව'යි සූත්‍රයෙන් වී නම් සූත්‍රයට මාතෘකා වූ සඞ්ගීති සූත්‍ර, දසුත්තර සූත්‍ර, පමණෙක ත් අභ්‍යාස නැත්තෝ වූ නම් එ ලෙසින් අල්පශ්‍රැත වූවාහු යම් සේ ගොන් වඩනා කල ත්, දිරන කල ත් තමන්ගේ දෙ මවු පියන්ට හා නෑයන් සියන්ට ප්‍රයෝජන නිසා වඩනෝ ත් නො වෙද්ද, දිරන්නෝ ත් නො වෙද්ද, එ මෙන් කිසි කෙණකුන්ට ප්‍රයෝජන නිසා වඩනෝ ත් නො වෙති. දිරන්නෝ ත් නොවෙති. අල්පශ්‍රැතයන්ගේ වැඩීමෙනු ත් දිරීමෙනු ත් කවුරුන්ට ත් කිසි ත් ප්‍රයොජන නැත.

සෙස්සවුන්ට තබා උන් තමන්ට ත් ප්‍රයොජන නැත. අල්පශ්‍රැත බැවින් ම වත් පිළිවෙත ත් නො හැසිරෙති. වත් පිළිවෙතින් වඩනට නැති කලට කුමකින් වඩිත් ද යත හොත්-යම් සේ 'ගොන් උසුලා පිය නො හෙති' තණ බිම්වලට හළ කල තණ කා පිරීමෙන් මස් වඩී ද, එ මෙන් නිෂ්ප්‍රයෝජන නියාව සලකා ඇදුරු තෙර වත් තෙර තැනින් හරන ලදු ව බුද්ධානු-භාවයෙන් ලත් සතර පස ය සුව සේ අනුභව කරන්නවුන්ගේ මස් ලෙස් වඩඩී. මස් ලෙස් වඩනා මුත් පිණක් වඩන්ට නුවූ හෙයින් ත්‍රිහෙතුක වන්ට නැති ව ප්‍රතිසන්ධි ප්‍රඥව වේව යි ඇසීම ත් පිරිවීම ත් නැති හෙයින් ශ්‍රැතමය ප්‍රඥව වේව යි සියුම් සිතිවිල්ලක් නැති හෙයින් චින්තාමය ප්‍රඥව වේව යි භාවනාභියොගයක් නැති හෙයින් භාවනා ප්‍රඥව වේව යි සෙසු ත් ලෞකික වූ ප්‍රඥවෙක් වේව යි, ලොකොත්තර ප්‍රඥවෙක් වේව යි සාවුන්ට හං ඇති වන්ට නැත්තා සේ නො වඩිඩි. තවත් වල ඇති වන ගස් තුරු ලිය ආදි ය මෙන් චක්ෂුරාදි වූ ස දෙරින් අෂ්ටොත්තරශත ප්‍රභෙද වූ තෘෂ්ණාව හා නව විධ මාන ය වඩිඩි. අකුශල පාක්ෂික හෙයින් එයි ත් නිෂ්ප්‍රයොජනය'යි වදළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් අගාරික වුව ත් අනගාරික වූ වත් සීල භූමියෙහි පිහිටා බොහෝ බණ දහම් ඇසීමෙන් බහු-ශ්‍රැත ව ගෙන අල්පශ්‍රැතයන්ට වන දෙෂයෙන් දුරු ව පින් කම හැසිර ලොවී ලොවුතුරා සැප ත් සිද්ධ කට යුතු.

---

## 137. අනඳ මහ තෙරුන් වහන්සේ ප්‍රශ්න විචාළ වත

තව ද යම් කෙණෙක් සසර ඇලුම් හැර ගත නො හෙත් නම් සියලු සර්වඥවරයන්ගේ උදන ගාථාවල අර්ථ ය දක්වා සසර ඇලුම් හරවනු නිසා අනඳ මහ තෙරුන් වහන්සේ ප්‍රශ්න විචාළ වස්තුව කියමු.

Non-Commercial Distribution

කෙ සේ ද යත්—

බුදුහු බුදුවන්ට බෝරුක් මුල වැඩ හිඳ හිර ගලා හෙන්නාට පළමු ව වසවත් මරු ලා මර සෙනඟ පරදවා පෙර යම් දස පැයින් පෙර විසූ කඳ පිළිවෙළ දන්නා නුවණ වසා සිටිනා මොහ ය නසා, මැදයම් දස පැයින් දිව ඇස් උපදවා, අලුයම ප්‍රත්‍යයා කාර ය නුවණ බහා, අනුලොම් පිළිලොම් විසින් සලකන සේක්- අරුණු නැගෙන වේලේ දී බුදු ව ලක්‍ෂ ගණන් බුදුවරුන් වහන්සේ විසින් පවත්වන ලද උදන් අනන සේක් 'යම් හෙයකින් ජරාවෙන් ව්‍යාධියෙන් හා මරණින් මුසු වූ ජාති ය කරා නැවත නැවත එළඹීම දුක් ද එ හෙයින් ජාති-ජරා-ව්‍යාධි-මරණ රඳා හිඳිනට ශරීර නමැති ගෙය කරන්නා වූ තෘෂ්ණා නමැති වඩුවා සොයන්නෙම් යම් නුවණකින් ඔහු දක්ක හැකි වී නම් ඒ සම්‍යක්සම්බොධි ඥාන ය ලබනු නිසා දිවකුරු බුදුන්ගෙන් විවරණ ලදින් එ වක් පටන් මෙ වක් දක්වා නො එක් ලක්‍ෂගණන් ජාති ඇති සසර ඒ නුවණ ලැබ ගත නො හී ච්‍යුති ප්‍රතිසන්ධි වශයෙන් දිවීමි. සම්‍යක් සම්බොධි ඥානයට පැමිණීම නො වී නම් ජාති ය කරා නො එළඹෙන්නට බැරි හෙයින් සාරා සැකි කප් සුවහස් මුළුල්ලෙහි බොහෝ දුක් ගෙන අද ඒ ඥාන ය ලදිමි.

එ සේ හෙයින් ශරීර නමැති ගෙය කළ තෘෂ්ණා නමැති වඩුව, ඇත මැත ගොසින් දක්මක් නො ව විදුරස්නෙහි හිඳ ම තා දිටිමි. සංස්කාරාදි ධර්ම නමැති යම් ගොනැසක් ලා ලා ශරීර නමැති ගෙය කෙරෙහි නම් මාගේ අර්හත් මාර්ගඥාන නමැති පොරොවින් සුණු විසුණු කොට පළා පියා අර්හත් ඵල ඥාන නමැති ගින්නෙන් දවා පීමි. අවිද්‍යා නැමැති යම් කැණි මඩලෙක සංස්කාරාදි ධර්ම නමැති ගොනැස් උරව යි නම් ඒ කැණි මඩල ත් සංස්කාරාදි ධර්ම නමැති ගොනැස් නැසුවා සේ ම නසා පීමි. එ හෙයින් මෙ වක් පටන් තෝ ශරීර නමැති ගෙය කොට ගත නො හෙයි. ගෙවල් කරන්නේ තා ඇතො ත් වේ ද? පහන ඇති වීමෙන් අඳුරු නැති වූවා සේ රහත් මග මට පහළ වීමෙන් ම, තෘෂ්ණා නමැති වඩුව. තා ත් තට අතවර කරණ මාන මායා මාත්සර්‍ය්‍යාදීනු ත් උන් මුල් කොට නසා පීමි. මාගේ සිත ත් උපක්ලෙශයන් කෙරෙන් වෙන් ව නිවන් කරා වන. වාසනා සහිත වූ කෙලෙසුන් ගෙවා බුදු වීමි' වදළ සේක.

එ හෙයින් නුවණැත්තවුන් විසින් බුදු රජාණන් වහන්සේ සිතා කොට වදළ සැලැස්ම නො සැලැස්මක් නො වන හෙයින් ජාතික්‍ෂයට ම තැත් පුරා කුසල හැසිරෙන්ට උත්සාහ කට යුතු.

Non-Commercial Distribution

# 138. මහධන සිටුපුත්හු ගේ වස්තුව

තව ද කළමනා සුචරිත විෂ ය තබා ලා නො කළමනා දෙය කරන්නවුනට වන විපත්ති භගවත්ට මහධන සිටුපුත්හු ගේ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්—

ඒ සිටුපුත් තෙමේ බරණැස අසූ කෙළක් වස්තු ඇති සිටු කුල යෙක උපන. උන්ගේ දෙ මවු-පියෝ 'අපගේ සම්පත මහත, අප ගේ පුතණුවන් කැමති පමණකට ඇත. සෙස්ස හැයි දැ'යි විද් දත් කුලයෙක උපන්නා සේ ගී – නැටුම් පමණක් ඉගැන් වූහ. එ ම නුවර අසූ කෙළක් වස්තු ඇති කුලයෙක දුවණි කෙණකු ත් උපන්හ. උන්ගේ දෙ මවු-පියෝ ත් අර මුන්ගේ දෙ මවු-පියන් සිතූ ලෙසට ම සිතා උනු ත් ගී-නැටුම් පමණක් ඉගැන්වූහ. වැඩි විය පැමිණියවුන් ඔවුනොවුන්ට ම නිල කළහ.

කල් යැමක දී දෙ පක්‍ෂයේ ම දෙ මවු පියෝ මළහ. එක්ලක්‍ෂ සැට කෙළක් පමණ වස්තුව එක ගෙට ම වි ය. සිටු පුත්‍රයාණෝ ද දවස තුන් විටක් රාජ සේවයට යෙති. ඉක්බිත්තෙන් එ නුවර රා සොඩහු ඉදින්මේ සිටු පුත්‍රයාණෝ ත් රා සොඩහු නම් අපට මහා සැප ය. උනු ත් රා සොඩ කරම්හ'යි සිතූහ. එ සේ සිතා ලා රා ත් හැරගෙන බැදි දඩ මස හා ලුණු ත් එකුරුත්තේ බැඳ ගෙන මුල පලා මුලු ත් හැරගෙන උන් රජගෙන් එන තෙක් මඟ බල බලා හිඳ ලා සිටු පුත්‍රයාණන් එන්නවුන් දැක රා බී පියා ලුණු කට ලා ගෙන මුල පලා මුල් ඩැ ඩැ 'ස්වාමීනි, සිටු පුත්‍රයාණන් වහන්ස, බොහෝ කලක් ජීවත් වුන මැනව. අපි නුඹ වහන්සේ ට පිණට කන්ට බොන්ට සමත් වූම්හ'යි කිවු ය. සිටු පුත්‍රයාණෝ ද උන් ගේ බස් අසා පස්සේ එන බුල ත් කවන්නවුන් අතින් 'තුලුන් බොන්නේ කුමක් දැ'යි විචාරා 'එක් පාන වර්‍ගයෙකැ'යි කී කල්හි 'යහපත් දෙයක් දැ'යි විචාළෝ ය. 'ස්වාමීනි, මෙ ලොව මෙයට වඩා පියයුත්තෙක් නැතැ'යි කීය. 'එ සේ වී නම් මා ත් ඒ බොන්ට වුවමැනවැ'යි මදක් මදක් ගෙන්වා ගෙන බොති. ධූර්තයෝ ද සිටු පුත්‍රයාණනු ත් රා බොන්ට පටන් ගත් නියා ව දැන ගෙන උන් ම පිරිවරා ගත්හ. කල් යත් යත් පිරිවර මහත් විය.

සිටු පුත්‍රයාණෝ ත් සියයක් යවා ලා ත්, දෙ සියයක් යවා ලා ත් රා ගෙන්වා ගෙන බොන්නෝ කල් යත් යත් හුන් තැන සිටි

Non-Commercial Distribution

තැන රන් ගොඩවල් තබ්බවාගෙන රා බොන කල පළඳිනා ලෙසට ‘මෙ තෙක් රන් දී ලා මල් ගෙනෙව. මෙ තෙක් රන් දී ලා සුවඳ සාදු ගෙනෙව. මූ දූ කෙළියට සුරු වූ ය. මූ නටන්ට සුරු වූ ය. මූ ගී කියන්ට සුරු වූ ය. මූ මද්දල ගසන්ට සුරු වූ ය. මූන්ට දහසක් දෙව. මූන්ට දෙ දහසක් දෙව’යි මෙ ලෙසින් වියදම් කරණ සිටුපුත් නො බෝ කලකින් ම තමන් සන්තක අසූ කෙළක් වස්තුව අසත් පථයේ දී නිමවා ඉක්බිත්තෙන් සිටු දුවණියන් සන්තක අසූ කෙළක් වස්තුව ත් උන් කිව නො කිව ගෙන්වා ගෙන එයි ත් එ ලෙසින් ම දී නිමවා ජීවත් වන උපදෙස් නැති හෙයින් කෙත්-වත් අරම් ආදිය ද, බත් කන රිදී වළන් ආදිය ද, යටත් පිරිසෙයින් හැඳ–කළාල්–කොට්ට-මාවුලා ආදිය ද'යි තමන් දෙපක්ෂය සන්තක සියල්ලක් ම විකොට කැවු ය. ඒ හැම විකොට කා නිමවා ලා මාලු අවස්ථාවෙහි දී හිඳිනා ගෙය ත් වික්කහ. ගෙය විකිණීව හැරගත්තවුන් ගෙයි ත් හින්ද නො දී නෙරි හෙයින් ඇඹෙණියන් කැඳවා ගෙන අනුන්ගේ බිතක් කනකට පලා ගොසින් රඳා හිඳිනාහු කබල් කෙටි හැර ගෙන සිහා ඇවිද බොහෝ දෙනා කා අන්තයේ ලූ බත් කන්ට පටන් ගත්හ. තමන් කොට ලූ පරිත්‍යාග ලෙසට ම නිකෘෂ්ට ජීවිකා වි ය.

එක් දවසක් වහන්දෑ වළඳන තැනට ගොසින් වළඳා අන්තයෙහි බාල වහන්දෑ පාත්‍රවලින් ගෙනවුත් ලන බත් නො මැළි ව ලවා ගන්නවුන් දූක පුරා දී ලූ නියාවට ලබන සැටි ය ඉතා ලඝු හෙයින් පහළ කරණ සිනාවක් මෙන් බුදුහු සිනා පහළ කළ සේක. අනඳ මහතෙරුන්වහන්සේ සිනා පහළකිරීමට කාරණ විචාළ සේක බුදුහු ත් සිනා පහළ කිරීමට කාරණ වදරණ සේක් අනඳයෙනි, මහධන සිටාණන්ගේ පුතණුවන් දුටුවා ද? තුලූ මෙ ම නුවරදී තමන් සන්තක අසූ කෙළක් හා සිටු දුවණියන් සන්තක අසූකෙළක් හා මෙලෝ පරලෝ දෙකින් ම කිසිත් ම ප්‍රයොජනයක් නැති අකාරිය නිසා වියදම් කොට නසා පියා දූන් සිගා කා ඇවිදිති. ඉදින් මූ තුමූ පළමු වයස දී වස්තුව නො නසා කෘෂි–වණික් ආදි කටයුත් තෙක යෙදූ නම් මෙ ම නුවර නායක සිටු තනතුරු ලැබෙති. ඉදින් පළමු වයස දී ලොව් සැපත් හැර මහණ වූ නම් රහත් ව ලොවුතුරා සැපත් පුරා ලද්දෝ ය. සිටු දුවණියෝ ත් නායක සිටු දූ තරමට ත් අනාගාමි ඵලයට ත් පැමිණෙති.

ඉදින් මේ සිටු පුත් මධ්‍යම වයස දී සම්පත ප්‍රයෝජන වන ලෙස යෙදූ නම් මෙ ම නුවර දෙ වන සිටු තනතුරු ලැබෙති.

Non-Commercial Distribution

මධ්‍යම වයස දී මහණ වූ නම් අනාගාමී වෙති. සිවු දූවණියෝ ද ඉදෙ වන සිටු තනතුරට හා සෙදගැමි ඵලයට පැමිණෙති. ඉදින් කෙළවර වයස දී වස්තුව ප්‍රයෝජනවත් ලෙස යෙදූ නම් තුන් වන සිටු තනතුරු ලැබෙති. ගිහි ගෙන් නික් ම මහණ වූ නම් සෙදගැමි වෙති. සිටු දූවණියෝ ත් තුන් වන සිටු දූ තරමට ත් සෝවාන් ඵලයට ත් පැමිණෙති. තුන් අවස්ථාව ම වරදවා පී හෙයින් ගිහි සම්පතිනු ත් පිරිහුණාහු ය. ශ්‍රාමණ්‍ය ඵලයෙනු ත් පිරිහුණාහු ය'යි වදරා බණ වදරන සේක් ''නූපන් භොග උපදවා ගන්ට ත් උපන් භොග රැක ගන්ට ත් සමත් අවස්ථාවෙහි තමාගේ ම නො දැන්ම නිසා වස්තූන් නො ලදින් නිෂ්ප්‍රයොජන වන වස්තුව හැර ගොසින් ශාසනික ව ශීල සංරක්‍ෂණය ත් නො කොට පැන් සිඳීමෙන් කුඩ-මස්සන් නැති විල්වල පියා පත් වගුළ කොස්වා ලිහිණියන් මෙන් සිතිවිලි ගනිති. විල පැන් නැත්තා සේ ම හිඳිනා තැනු ත් නැත. කුඩමස්සන් නැත්තා මෙන් සම්පතු ත් නැතිවෙයි. පියා පත් වගුළ කොස්වා ලිහිණියන්ගේ අහස ගමනක් නැත්තා මෙන් කෘෂි වණික් ආදි සම්භව වන වස්තු ත් නැති වෙයි.

තව ද යම් කෙණෙක් ගිහි ව සම්පතින් ප්‍රයොජන විඳිනට නිසි ව සිට සම්පත් ලබන්ට නිරවද්‍ය වූ උත්සාහ නො කෙරෙත් නම් ලද සැප ත් හැර සසුන් වැද මහණ දම් කොට මහණ දමින් ලැබිබ යුත්ත නො ලැබෙ ත් නම් 'පෙර සුව සේ කැම්හ පූම්හ. සම්පත් වුනුම්හ' යනාදී ය සිත සිතා හිඳි ත් නම් විඳ පූ හී දඬු අවූ ළත්නන් නැති ව දිරන්නා සේ තුන් වයස ම කළ මනා දෙය නො කොට ඉක්මවා පූ නම් මරණින් මැකෙති. උන් ලද අත් බැව් නිෂ්ඵල ය'යි වදළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන සෝවාන්-සෙදගැමි-අනගැමි-රහත් වූහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් පළමු වයස වරදවා පී වත් මධ්‍යම වයස දී හෝ මධ්‍යම වයස ත් වැරැද්දේ නම් කෙළවර වයස දී හෝ පිහිටන තමාට කට යුතුය. ගිහිව පිහිටක් කට නො හැකි වී නම් ශාසනිකව ව ත් ලද මනා ගුණ විශෙෂ ලබන්ට උත්සාහ කට යුතු.

## 139. බොධිරාජ කුමාරයන් ගේ වස්තුව

තව ද සත්‍වයන්ට ස්ථානොචිත ප්‍රඥව වුව මනා දෙයක් තියාව භගවත්ට බෝධිරාජ කුමාරයන් ගේ වස්තුව දක්වමු.

Non-Commercial Distribution

කෙසේ ද යත්--

ඒ බෝධිරාජ කුමාරයෝ දඹ දිව අනික් රජ්ජුරු කෙණකුන් එ තරමේ කරවා ගත නො හැකි ලෙසට අහස පියාසර කරන්ට සිටි ගුරුළකු වැනි වූ කොකනද නම් මාළිගාවක් වඩු කර්මාන්ත බලවත් කොට දන්නා වඩුවකු ලවා කරවා ලා 'තොපි අනික් කෙණකුන්ට ත් මෙ බඳු මාළිගාවක් කළා ද'යි වඩුවා අතින් විචාළෝ ය. 'පළමු කළ මෙහෙවර නම් මෙ ම ය'යි වඩුවා කී ය. 'මේ වඩුවා අනික් කෙණකුන්ට ත් ලාභ ය නිසා මෙ බඳු මාළිගාවක් කොට පී නම් මේ මාළිගාවේ අරුමයෙක් නැත. මරවා හෝ පියමි. නැත් නම් අත් පා හෝ කපවා පියමි. එ සේ කල ත් අත් පා ඇත්තවුන් ලවා කර්මාන්ත නො කට හැකි ලෙසට ඇස් හෝ උදුරුවා පියමි. එසේ කලට අනික් කෙණකුන්ට මාළිගා නො කෙරේ'යි සිතූ ය. සිතා ලා ඒ තමන් සිතූසිතූවිල්ල තමාගේ සඤ්ජිකා පුත්ත නම් යාළණු කෙණකුන්ට කිවූ ය. උඹ සිතන්නෝ 'අදහස් නපුරු ය. මේ බොධිරාජ කුමාරයෝ මහ ඇඟි කර්මාන්ත දන්නා වඩුවා නසා පූ නමුත් නපුර. මා තරම් වැඩකරු එකකු ඇති ව මුන් නසන්ට කාරණ කිම් ද? මූට මෙ පවත හඟවා පියමි'යි වඩුවා කරා ගොසින් 'මාළිගාව කොට නිමවා පූ ද'යි විචාරා එ සේ ය'යි කී කල්හි—

"රාජ කුමාරයෝ තොප මරණු කැමැත්තෝ ය. යම් කිසි ලෙසකින් තොපගේ ජීවිත ය රැක ගනුව'යි කිවූ ය. වඩුවා ත් 'ස්වාමීනි, කියා ලූ බව යහපත. මම ඊට නිස්ස දනිමි'යි කියා ලා 'කුමක් ද? වඩුව අපගේ මාළිගාවේ මෙහෙවර නිමියේ දූ'යි රාජ කුමාරයන් විචාළ කල්හි 'තව නිමන්ට කොයි ද? නැතක් කර්මාන්ත තුබුයේ ය' යි කී ය, 'තුබූ කර්මාන්ත කවරේ ද'යි විචාළෝ ය. 'තුබූ මෙහෙවර පසු ව කියාලමි. දඬු පත් ගෙන්වුව මැනැව' යි කිවූ ය. 'කෙසේ වූ දඬු පත් ද ගෙන්වුව මනා'යි විචාළ කල්හි 'හර නැති ලසු සැහැල්ලු වූ දඬු ය'යි කිවූ ය. උයි ත් ගෙන්වා දුන්හ. වඩුවාණෝ කියන්නෝ 'රජ්ජුරුවන් වහන්ස, මෙවක් පටන් කවුරුනු ත් මා ලඟට නො අව මැනව. සූක්ෂම කර්මාන්තය නම් කරණ කල අනුන් ලා කථා කොට කොට කරණ කලට සිත එකඟ නො වෙයි. එ සේ කලට වත්තීම් ආදි ය නපුරු වෙයි. බත් වේලාට බතු ත් අනික් කෙණකුන් අත නො එවා අපගේ වඩු දුව අත ම එවන්නා පමණැ'යි කිවූය. රාජකුමාරයෝත් යහපත'යි ගිවිස්සෝ ය.

වඩුවා ත් එක් ගබඩාවෙක හිඳ ඒ දඬු පත් සැස ගෙණ අඹු දරුවනු ත් තමා ත් ඇතුළත නො හෙව් හිඳිනා ලෙසට විතර කොට

Non-Commercial Distribution

ගුරුළු යන්ත්‍රයක් කොට නිමවා ලා බත් ගෙනා අඹුවට 'ගෙයි ඇති සියල්ලෙක් ඇත් නම් විකොට ලා හැර ගනුව'යි කී ය. රාජ කුමාරයෝ ත් 'වඩුවා සැකයක්[1] ලවා ගෙන පලා ගියේ නමුත් නපුරැ'යි ඉදි කරණ ගෙන් මැත් නො වන ලෙසට වට කොට රකවල් ලවා ලූ ය. වඩුවා ත් ගුරුළු යන්ත්‍ර ය නිමි කලට අද දරුවනු ත් කැඳවා ගෙන එව'යි ඇමෙණියන්ට කියා ලා පෙර වරු බත් කා ලා අඹු දරුවෝ ත් තෙමේ ත් ගුරුළු යන්ත්‍රය ඇතුළේ හිඳ කවුළු දෙරින් පිටත්ව යන්ත්‍ර ය මැඩ අහසට පැන නැඟී ලා අහසින් ශිල්පානුභාවයෙන් වඩුවා පලා ගියේ ය'යි මුර ගාව ගාවා නික්ම හිමවත බැස නුවරක් කොට ගෙන රජපට ත්[2] සොයාගෙන කාෂ්ඨවාහන නම් රජ වූ ය.

බොධිරාජ කුමාරයෝ ත් 'ගෙට වදනා මඟුල් කරමි'යි බුදුන්ට ආරාධනා කොට ලා මාළිගාව සිවු දැ සුවඳින් පිරිබඩ ගන්වා ලා මාළිගාවේ පළමු වන එළි පත පටන් පියවිළි ලවා ලා තමන්ට දරුවන් නැති හෙයින් 'දරු කෙණකුන් ලැබෙම් නම් බුදුහු පියවිළි මඩනා සේකැ' සිතා ලා ඉත් දරුවන් සම්භ වන නියාව දන්ට සිතූ ය. බුදුන් වැඩි කල්හි පසඟ පිහිටුවා වැඳ ලා පාත්‍ර ය හැර ගෙන 'ස්වාමීනි වඩනා බව ය'යි කිවු ය. බුදුහු තුන් විටක් දක්වා කීව ත් නො වැඩ අනඳ මහ තෙරුන් වහන්සේගේ මූණ බැලූ සේක. මහතෙරුන් වහන්සේ ත් බලා වදළ ලෙසින් ම පියවිළි පිටින් නො වඩනා නියා ව දැන 'රාජ කුමාරයෙනි, පියවිළි හකුළු ව ව. බුදුහු පියවිළි පිටින් නො වඩනා සේකැ'යි වදළ සේක. රාජ කුමාරයෝ විධාන කොට හකුළුවා පූය. හකුළුවා ලා බුදුන් ඇතුළු මාළිගාවට වඩා ගෙන ගොසින් කැඳ අවුළු පත් වළඳවා ලා වැඳ එකත් පස්ව හිඳ 'ස්වාමීනි, මම නුඹ වහන්සේට උපකාරීමි. මවු කුස ත් හිඳිනා කල අනුන්ගෙ වසහයෙන් වුව ත් එක වරෙක සරණ ගියෙමි. දෙ වැනි ව කිරි බොන අවස්ථාවෙහි සරණ ගියෙමි. තුන් වැනිව වැඩුණු අවස්ථාවෙහි සරණ ගියෙමි. එසේ වූ මාගේ පියවිළි මැඩ ගෙන නො වැඩියේ හැයි දැ'යි කිවු ය.

බුදුහු ත් 'කුමාරයෙනි, තෙපි කුමක් සිතා පියවිළි ලැවු දැ'යි විචාළ සේක. 'ඉදින් දරු කෙණකුන් ලැබෙම් නම් බුදුහු මාගේ පියවිළි මඩනා සේකැ'යි සිතා ය'යි කිවු ය. 'ඒ නිසා පියවිළි ය නො මැඩෙමි' කියා වදළ සේක. 'කුමක් ද? ස්වාමීනි, අප දරු කෙණකුන් නොලබන නියා[3] දැ'යි කිවුය. එ සේ ය යි වදළ සේක. ඊට කාරණ කිම් දැයි විචාරා 'එක් ජාතියක දී තොප දෙ මහල්ලන්ම කළ අකුසල් නිසා ය'යි වදළ සේක. 'දරුවන් නො ලබන්ට නිසි පාප ය අපට සිද්ධ වූයේ කවර කලෙක දැ'යි විචාළ කල්හි—

---

1. සැකයක්. 2. රජ හට ත් පිරිස්. 3 නියාව

Non-Commercial Distribution

යට ගිය දවස නො එක් සිය ගණන් මිනිස්සු මහ නැවකට නැඟි ලා මූදු නැංගෝ ය. නැව මූද මැද දී නට. දෙ මාලු කෙණෙක් එක් පෝරුවක් හැර ගෙන පීනා ගෙන දිවයිනකට සම්භව වූහ. සෙස්සෝ මුළුල්ල ම ජීවත් වන්ට නිසි කුශලයක් නැති හෙයින් මළහ. අරුන් දෙන්නා පැමිණි දිවයින ත් බොහෝ පක්ෂීහු වෙසෙති. අර මුන් දෙන්න ත් සා කුස්ඇත්තාහු අනික් කෑ යුත්තක් නො දක පක්ෂීන්ගේ බිජු වට කෑවු ය. තන්නෝ ත් අඟුරෙහි පළහා ගෙන කෑවු ය. බිජු වට නිමි කලට පක්ෂි පැටවුන් හැර ගෙන කෑවු ය. කන්නෝ ත් පළමු වයස ත් මද්ධ්‍යම වයස ත් කෙළවර වයස ත් කෑවු ය. එක වයසකත් නො කන්ට නුවූයේ ය දෙන්නා ගෙන් එක් කෙණකු ත් නැවත නූපුවෝ ය.

බුදුහු මේ අකුශල කර්ම ය වදරා බණ වදරන සේක් 'තමාගේ ආත්ම ය තමා හට ප්‍රියයා සේ දනේ නම් යම් ලෙසක රැකි කල රැක්කා වේ නම්, රාජ කුමාරයෙනි, ඒ ලෙසට යහපත් කොට රක්නේ ය. ඉදින් ගිහි කෙණෙක් තමන් රකුම්හ'යි සිතා මාළිගා වල යට මාල් හැර උඩු මාල්වලට නැඟීලා ඉනු ත් ගබඩාවලට වැද ආත්ම රක්‍ෂා ඇති ව වෙසෙ ත් නමුත් පැවිදිවරු භිත්ති හා දෙරලි දෙර බා ඇති ගල් ලෙනක වෙසෙ ත් නමුත් සිතින් සන්හුන් කමක් නැත්තෝ වූ නම් ඌ තමන් රක්නා නම් නො වෙති. ගිහි වුව ත් පව නො යෙදී බල වූ ලෙස දන් පින් කෙරෙ ත් නම් පැවිදි වුව ත් ධුරද්වයින් එක් තරා ධුරයෙක හා වත පිළිවෙත යෙදී වෙසෙත් නම් ඌ තමන් රක්නා නම් වෙති. තුන් වයස පුරා කට නො හෙත ත් නුවණැත්තෝ එක් වයසෙක වුව ත් තමන් රකිති. ඉදින් ගිහීහු පළමු වයසෙහි කෙළි ලළුවෙහි ලොල් බැවින් පින් කට නුහුණ වූ නමුත් මද්ධ්‍යම වයස වුව ත් පින් කොළෝ නම් යතපත. ඉදින් මද්ධ්‍යම වයස දී අඹු දරුවන් රකිනා නිසා පින් කට නුහුණ වූ නම් කෙළවර වයස දී වුවත් පින් කළ මනා ම ය. තුන් වයසින් එක් වයසක වුව ත් පමා වූ නම් උන් ගේ ආත්ම ය උන්ට ම සතුරු වත්මුත් ප්‍රිය වූවා නම් නො වෙයි.

මහණ වූවාහු පළමු වයස මාර්ගාධිගම ඵලාධිගම නිසා භාවනාවට පමා වූ නම් මද්ධ්‍යම වයස වුව ත් නො පමා ව මහණ ධර්ම කොළෝ නම් යහපත. ඉදින් පළමු වයස උගත් පෙළ අර්ථ ත් විනිශ්චය ත් කාරණාකාරණ ත් විචාරීමෙන් මද්ධ්‍යම වයස ගියත් කෙළවර වයස වුව ත් තමන්ට පිහිටක් සිතූ නම් යහපත. වයස් තුනෙක වුව ත් දෙකක වුව ත් එකෙක වුව ත් නො පමා

Non-Commercial Distribution

වීම කෙළවර වයසට සම්භව වී නම් තමං රක්කා නම් ම වෙති. එසේ කොට ගත නො හෙන්නවුන්ට අත් බැව ප්‍රිය නො වෙයි. තමන්ට සතුරෝ නම් තුමූ ම ය' යි වදළ සේක. දෙශනා කෙළවර බොධිරාජ කුමාරයෝ පුත්‍ර ප්‍රතිලාභයට පින් නැත ත් ශ්‍රාමණ්‍ය ඵල ප්‍රතිලාභයට පින් ඇති බැවින් සෝවාන් වූහ. උන්ගේ වයසෙන් සෙසු ත් බොහෝ දෙන නිවන් දුටහ.

එ සේ හෙයින් සත් පුරුෂයන් විසින් පමා ව වසතොත් තමා ම තමාට සතුරු බැවින් කෙලෙස් සතුරන් පරදවනු කැමැත් තො ත් තමාට හිත ව ගෙණ කෙලෙස් සතුරන්ට අවසර නො පෑ නො පමා ව වැස ලොවී ලොවුතුරා සැප ත් සිද්ධ කටයුතු.

## 140. උපනන්ද තෙරුන් වහන්සේ ගේ වස්තුව

තව ද තමා යහපත් තරම් නැති ව අනුන්ට අනුශාසනා කිරීමෙන් තමාගේ ලසුව ම ප්‍රකාශ වන නියාව හඟවන්ට උප නන්ද තෙරුන් වහන්සේ ගේ වස්තුව කියමු.

කෙ සේ ද යත්—

උපනන්ද තෙරුන් වහන්සේ පිළිවෙත් පිරීමෙහි අදක්‍ෂ වුව ත් අල්ගර්ද පයර්‍යාප්තින් උග ත් බණ කීමෙහි දක්‍ෂ සේක. තමන් වහන්සේ මහෙච්ඡ ව සිට ත් අල්පෙච්ඡතාවෙන් යුක්ත කොට කියන උන්වහන්සේගේ බණ අසා බොහෝ වහන්දෑ අධික සිවුරු පුද පියා තෙචීවරික ධුතාඞ්ගය සමාදන් වූවෝ ය. වහන්දෑ 'අධි ක ය' යි හළ පිරිකර උපනන්ද තෙරුන් වහන්සේ ම හැර ගත් සේක.

උන් වහන්සේ ම එක් වස් අවධියෙක දනවුවට වැඩි සේක. ඒක් විහාරයක හුන් ලදරු වහන්දෑට ත් සාමණෙර වහන්දෑට ත් බණ ඇසීමෙහි ලොභ ය ඇති ව ඒ විහාරයේ වස් වසන්ට කී සේක. මෙ තැන විසූ කල වස්සාවාසික ලාභ ය කෙ තෙක් විවර සම්භව වේ දැ'යි විචාරා 'එක කඩෙකැ' යි කී කල්හි එ තැන වහන් තබා ලා අනික් විහාරයකට ගොසින් මෙ තැන විසූ කල කුමක් ලැබේ දැ' යි විචාරා පිළී දෙකක් ලැබෙ යි' කී කල්හි සැර යටි දණ්ඩ තබා ලූ සේක. තුන් වන විහාරයට ගොසින් මෙ තැන විසූ කල කුමක් ලැබේ දැ' යි විචාරා 'පිළී තුනක් ලැබෙ යි කී කල්හි එ තැන ඩබරාව තබා ලූ සේක.

Non-Commercial Distribution

සතර වන විහාරයට ගොසින් 'මෙ තැන විසූ කල කුමක් ලැබේ දැ'යි විචාරා පිළී සතරක් ලැබෙයි' කී කල්හි 'යහපත, මෙ තැන වෙසෙමි' කියා ලා වැස බණ ඇසීමෙහි ලොභ ය ඇති වහන්දෑට ත් ගිහින්ට ත් බණ කියන සේක. බණ අසා ගිහි බොහෝ පිළී පිදූ ය. වහන්දෑ බොහෝ සිවුරු පිදූ සේක. උප නන්ද තෙරුන් වහන්සේ ද සතර වන විහාරයෙහි වැස ලා සෙසු විහාරවලට ත් කියා යවා ලා 'අප ඒ ඒ විහාරවල පිරිකර තබා ලා ආ හෙයින් වස්සාවාසික ලාභ ය අප ලද යුතු ය. ඒ අපට එ වුව මැනැවැ'යි සියල්ල ම ගෙන්වා ගෙණ ගැලක් පුරා ගෙණ නික්මුණු සේක.

ඉක් බිත්තෙන් එක් විහාරයක හිඳිනා බාල දෙ නමෙක් පිළී දෙකකු ත් පලසකු ත් ලැබ පිළී දෙකක් හෙයින් බෙදා ගන්ට පිළී වත් වුව ත් පලස එක හෙයින් බෙදා ගත නො හී මං බඩ හිඳ විවාද කරණ සේක. ඒ වහන්දෑ ද උපනන්ද තෙරුන් වහන්සේ දැක 'ස්වාමීනි, අපට මෙ බෙදා දුන මැනැවැ' යි කී සේක. 'තමන් ම බෙදා ගත මැනැවැ' යි කී සේක. 'අපි බෙදා ගත නො හෙම්හ. මුඹ වහන්සේ ම බෙදා දුන මැනැවැ'යි කී සේක. 'මා කියා ලූ ලෙස සිටිනේ ඇද්දැ' යි විචාරා, 'සිටුම්හ' යි කී කල්හි 'යහපත, එ සේ වී නම් බෙදා දෙමැ' යි කියා දෙ නමට පිළී දෙක දෙවා පියා 'මෙ පලස බණ කියන හෙයින් පොරෝනට අපට තරමැ' යි කියා මා ඇඟි පලස ඇර ගෙණ නික්මුණු සේක. බාල දෙ නම ත් මුසුප්පු ව බුදුන් කරා ගොසින් බුදුන්ට එ පවත කී සේක. 'මහ ණෙනි, තොප සන්තක දෙය හැර ගෙණ තොප මුසුප්පු කරවූයේ දැන් මතු නො වෙයි පෙර ත් කෙළේ ම ය' යි වදරා ඉකු ත් වත් ගෙණ හැර දක්වන සේක්—

යට ගිය දවස ගොඩස්බඩ[1] ඇවිදිනා වූ ත් ගැඹුරු තැන ඇවිදිනා වූ ත් මස්කාවෝ දෙන්නෙක් රෝ මසකු ලදින් 'හිස තොපට ය. නඟුට මට ය' යි විවාද කරන්නාහු බෙදා ගත නො හී එක් කැණහිලකු දැක 'මාම, මෙ අපට බෙදා දුන මැනැවැ' යි කිවූ ය. කැණහිලා ත් කියන්නේ 'රජ්ජුරුවන් වහන්සේ ගෙන් යුක්ති විචාරණ ලෙස අධිකරණයට නිල කළ හෙයින් නැතක් වේලා යුක්ති විචාරන්ට ඉඳ පියා පා රෙදෙනා හෙයින් මදක් ඇවිද ඉරියවු පෙරළා ගන්ට අයිමි. දැන් මා මදක් අවසර නැතැ'යි අඟ වඩන්ට[2] කී ය. 'මාම, එ සේ නො කිව මැනව. බෙදා දුන මැනැවැ' යි කිවූ ය. පසු ව අනිකක් නො කියන ලෙසට තර ය

1 ගොඩත් මඩත් 2 අඟවන්ට

Non-Commercial Distribution

කර වන්නේ, මා කියා ලූ යුක්තියෙක සිටිවූ දෑ'යි කියා 'සිටුම්හ'යි කී කල්හි හිස පොළු ගසා එක් තැනෙක තබා ලා නගුට ත් කපා එක් තැනෙක තබා ලා 'කුඩාවරිනි, යම් කෙණෙක් ගොඩස් බඩ[1] ඇවිද්ද නම් ආයාස බලවත් නො වන බැවින් නඟුටු භාග ය හැර ගනුව. යම් කෙණෙක් ගැඹුරු තැන ඇවිද්ද නම් ආයාස බල වත් හෙයින් හිස්කඩ හරගනුව. අප මැදහත් ව යුක්ති විචාරන හෙයින් මැදකඩ අපට වුව මැනවැ'යි උන් දෙන්නා ගිවිස්වනු නිසා යුක්ති ශාස්ත්‍රයෙහි තුබූ සොළෝවක් පානා මෙන්—

අනුතීරචාරී නඞ්ගුට්ඨං-සීසං ගම්භීරචාරිනො,
අථායං මජ්ඣිමො ඛණ්ඩො-ධම්මට්ඨස්ස භවිස්සති

යන මේ ගාථාව කියා ලා මැදකඩ හැරගෙන නික්මුණාවු ය. මස්කාවෝ දෙන්න මුසුප්පු ව ගෙන බල බලා සිටියහ. බුදුහු මේ දෙශනාව ගෙන හැර වදරා යටත් මුසුප්පු කැර වූ නියා ව සාධන සේක්, 'එවක මස්කාවෝ දෙන්න නම් දැන් මේ පලස නිසා මුසුප්පු වූ භික්ෂු දෙන්න ය. කැණහිලා නම් උපනන්දයෝ ය'යි වදරා ලා උපනන්ද තෙරුන් වහන්සේට නින්ද කරණ සේක් අනුන්ට අවවාද කරණ කල නම් තමා ත් කියන අවවාද ලෙසට තරම් ඇති ව වේ දෑ'යි වදරා බණ වදරන සේක්—

යම් කෙණෙක් අනුන්ට අල්පෙච්ඡතාදී ගුණෙන් හෝ ආයර්‍ය වංශ ප්‍රතිපදදීන් හෝ අවවාද කෙරෙත් නම් උන් තමනු ත් එබඳු ගුණයෙක නො පිහිටා අනුනට අනුශාසනා කෙරෙත් නම් ඒ අනුශාසනාව ගරු කරන්නෝ නැත. තුමූ ම නින්ද පරිභවයට පැමිණෙති. අනුන් පිහිටනට කියන ගුණයෙහි යම් කෙණෙක් තුමූ පළමු පිහිටා අනුශාසනා කෙරෙත් නම් පවිත්‍ර බිම නැඟී සඳුන් ගස් මෙන් අවවාද කළවුනු ත් කළ අවවාද ත් ගරුතර කොට සිතති' වදළ සේක. දෙශනා කෙළවර පලසින් පැරැදි දෙන ම ලක්‍ෂයක් හෝ ඉන් මැත හෝ වටනා පලසින් පැරැද්ද ත් අනර්ඝ වූ ලොවුතුරා ගුණින් නො පැරදි හෙයින් සෝවාන් වූ සේක. උපනන්ද තෙරුන් වහන්සේට දිරා නැති වන පලස සම්භව වූවා සේ නො දිරන නිවන් සම්භව වන්ට නො වී ය. මේ දෙශනාව සෙසු ත් බොහෝ දෙනා ට ප්‍රයෝජන වී ය.

එ සේ හෙයින් නුවනැත්තවුන් විසින් නිස්සාර වූ ලාභයෙහි ලොභ ය හැර නිවන් පතා පින් කම යෙදී විසිය යුතු.

---

1 ගොඩස් මඩ

Non-Commercial Distribution

# 141. පධානික තිස්ස තෙරුන් වහන්සේ ගේ වස්තුව

තව ද ප්‍රයොජනයෙක නො යොදා අනුන් නිදා පිය නො දී ඔවුන් නිදන නිදි ත් තමන් ම නිදන්නවුන් නිදි පමණක් විනා ලබන ගුණ විශෙෂයක් නැති නියා ව දක්වන්ට පධානික තිස්ස තෙරුන් වහන්සේ ගේ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්—

ඒ තෙරුන් වහන්සේ බුදුන්ගෙන් කමටහන් ඉගෙන පන් සියයක් වහන්දෑ ඇරගෙන කරණ භාවනා කුම වුව ත් වලට පලා ගොසින් වස් වැස 'ඇවැත්නි, නිදීම් හැර බුදුන්ගෙන් උගත් කමටහන මෙනෙහි කොට නො පමාව මහණ ධම් කරව'යි වහන්දෑට අවවාද කොට ලා තමන් වහන්සේ පලා ගොසින් සුවසේ නිදන සේක. ඒ වහන්දෑ ද පෙරයම සක්මන් කොට මැදුම් යම දී සිරුරු සතපනු නිසා සැතපෙන ගෙට වඩනා සේක. පධානික තිස්ස තෙරුන් වහන්සේ ද පිබිද පියා ඒ වහන්දෑ ලඟට අවුත් කුමක් ද? මේ වලට එනගමන නිදන්ට ආ නියා ද? වහා ගොසින් මහණ ධම් කළ මැනවැ'යි කියා වහන්දෑ යවා පියා තමන් වහන්සේ පලා ගොසින් සුවසේ නිදන සේක.

සෙසු වහන්දෑ මධ්‍යම රාත්‍රියෙහි ත් සක්මන් කොට පියා අළු යම සැතපෙන්ට ගෙට එන සේක. ඒ වහන්දෑ ගෙට එන වේලාට තෙරුන් වහන්සේ පිබිද පියා ඒ වහන්දෑ ලඟට ගොස් එවේලේ ත් සැතපි ය නො දී පිටත් කොට පියා තමන් වහන්සේ අළුයම ත් නිදන සේක. සෙසු වහන්දෑට නිදන්ට නියම මැද යම් පමණක ත් නිදි නැත. තෙරුන් වහන්සේට තුන්යම් රාත්‍රියේ ම නින්දෙන් පමාවෙක් නැත. ඒ වහන්දෑ ද නිරන්තර ව ම මෙ සේ ම කරණ හෙයින් හැදෑරීම්-පිරිවීමකු ත් කට නුහුණු සේක. සැතපෙන්නට ම නැති හෙයින් සිත එකඟ නො ව කමටහනු ත් මෙනෙහි කට නුහුණු සේක. තෙරුන් වහන්සේ නින්දට මුත් සෙස්සකට අවසර නැති හෙයින් කළමනා දෙයින් කුමකු ත් කට නුහුණු සේක.

ඒ වහන්දෑ පන්සියය ත් අපගේ ආචාරීන් වහන්සේගේ වීය්‍ය්‍ය බලවත් සැටි ය. ඒ පරීක්‍ෂා කරම'යි සිතා පරීක්‍ෂා කරණ සේක් උන් වහන්සේ නිදන්ට කරණ වීය්‍ය්‍යයක් මුත් සෙස්සකට කරණ වීය්‍ය්‍ය නැති නියා ව දැන 'අපි හැම දෙන ම ධුරද්වයින් පසු බටුම්හ. ආචාරීන් වහන්සේ නිකම් ම දෙඩා හඬා ඇවිදි සේකැ'යි කිවු ය.

Non-Commercial Distribution

රාත්‍රියෙහි තුන් යම ම නිදි නොලද්මෙන් මිරිකී ගත් විසින් පන් සියයක් දෙනා වහන්සේගෙන් එක නමෙකු ත් ගුණ විශෙෂයක් නො ලත් සේක. තෙරුන් වහන්සේ නිදා පිරිමෙන් භාවනාවට අවසරයක් නො ලදින් නො දන් ම මුල් ව ගුණ විශෙෂයක් නො ලත් සේක.

ඒ වහන්දෑ පන්සිය ය දවස් පවරා ලා බුදුන් ලඟට ගොසින් බුදුන්ගෙන් සාද සාමීචි ලදින් 'කුමක් ද, මහණෙනි, නො පමාව මහණ ධම් කළා දැ'යි විචාළ කල්හි එ පවත දන් වූ සේක. බුදුහු 'මහණෙනි, තොප ලබන ගුණ විශෙෂයට තුලුත් බාධා කෙළේ දූන් මතු නො වන්නේ වෙ ද-යට ගිය දවස තුලුත් තමන් කුකුළු ව උපන් කලෙක ත් හඬන වේලා තිබැද්දී නැතක් වේ ලේ දී ම හඬා පිරුවා පියා නිදීමෙන් සම්භව වන ඥන ශක්ති ය ත් අඩු කළේ මෙ දැ'යි වදරා –

''අමාතා පිතරි සංවඩ්ඪො – අනාචරිය කුලෙ වසං,

නායං කාලමකාලං වා – අභිජානාති කුක්කුටො''

යන මේ ගාථාවෙන් යුක්ත වූ මේ අකාලරාවි කුක්කුට ජාතක ය ත් වදරා 'එ කල නිදි මඳ ව හඬන කුකුළු නම් දූන් නිදන්ට සුරු පධානික තිස්ස තෙරුන් ය. එ කල ශිල්ප උගන්නා ලදරුවෝ නම් දූන් මේ භික්ෂු පන් සියය ය. දිසාපාමොක් ආචාරි නම් මම ම ය'යි ජාතක දෙශනාව නිමවා වදරා තව ත් බණ වදරන බුදුහු 'මහණෙනි, යම් ලෙසක කරන්ට අනුන්ට අවවාද කරතො ත් ආයුධ ශ්‍රම පානවුන් තමනු ත් කොට පානා සේ අවවාද කරණ ලෙස ම තමා ත් කළ මැනව. අනුන් හික්මවීමට ත් වඩා තමා හික්මවා ගැන්ම මහා අටවල් හෙයින් නො එක් ලෙසින් තමා ආදී හික්ම ගෙන පසු ව අනුන් හික්මවීම යහපතැ'යි වදළ සේක. දෙශනා කෙළවර නිදි නො ලැබීමෙන් මිරිකුණු පන් සියයක් දෙනා වහන්සේ සසර දුකින් නො මිරිකී සව් කෙලසුන් ගෙවා රහත් වූ සේක.

එ හෙයින් නුවණැත්තවුන් විසින් යම් සේ මුව වැද්දෙක් නිදා පී කලට දඩ මස් වරදිනා හෙයින් නිදි දුරු කෙරේ ද එ මෙන් නිදීමට ත් වඩා නිදන ඇස ත් පිණට ම නියැ ලී, තව ද, යම් සේ මුව වැදි මුවන් කෙරේ ම සිත හෙළා ද, එ මෙන් කුසල් විෂයෙහි ම සිත හෙළා, තව ද යම් සේ මුව වැදි වැදි කම් කරණ වේලාව දනී ද

Non-Commercial Distribution

එ මෙන් කුසල් කිරීමට සිතා ගත් ඇසිල්ල ම කල් නියාව දූන, තව ද යම් සේ මුව වැදි මුවන් දැක ම සතුටු වේ ද, එ මෙන් පින් කිරීමට සේරුව දැක සමාධි ව උපන් සමාධි නො පිරිහෙළා කුසල්හි හැසිර ලොවී ලොවුතුරා සැප ත් සිද්ධ කට යුතු.

---

## 142. කුමාර කස්සප් තෙරුන් වහන්සේ ගේ මෑණියන්දෑ ගේ වස්තුව

තව ද අනුන්ගෙන් පිහිට රැක නො හිඳ තමා ම තම හට පිහිට වන පරිදි දක්වන්නට කුමාර කස්සප් තෙරුන් වහන්සේ ගේ මෑණියන්දෑ ගේ වස්තුව කියමු.

කෙ සේ ද යත්—

උඹ තුමූ රජගහා නුවර සිටාණන්ගේ දුවණියෝ ය. නෑ මනා දත් තැන් පටන්[1] තුමූ ම තමන්ට පිහිට වනු නිසා මහණ කර වන්ට දෙ මවු පියන්ට යාච්ඤා කෙරෙති. යාච්ඤා කොට ත් දෙ මවුපියන්ගෙන් අදහස් නො ලදින් වැඩි විය පැමිණ සරණ ගොසින් ස්වාමීහු දේවතා තරමේ තබා පතිව්‍රතා ධර්ම ය රක්‍ෂා කෙරෙමින් වෙසෙති. සරණ ගිය නො බෝ කලකින් ම බඩ දරු කෙණෙක් පිහිටා ගත්හ. උඹ තුමූ බඩ දරුවන් පිහිටි නියාව නො දූන මහණ වීමේ සැදෑ සමණන්ට කියා උන් ලබ්බා ගත්හ. උඹ ද මහ පෙරහරින් මෙහෙණවරට ගෙන ගොසින් නො දූන දෙව්දතුන්ට පක්‍ෂ මෙහෙණින්නන් ලවා මහණ කරවූහ.

කල් යත් යත් මෙහෙණිනි වහන්දෑ අර භික්ෂුණීන් දූරි ඇති නියාව දූන 'මේ කිම් දූ'යි විචාරා 'මම නො දනිමි. මාගේ සීලයට වූ හානි නැතැ'යි කී කල්හි දෙවදත්ත පාක්ෂික මෙහෙණින් නෝ අර භික්ෂුණීන් දෙව්දතුන් ලඟට ගෙන ගොසින් 'මූ තුමූ සැදෑයෙන් මහණ වූ ය. ශාසනික ව මෙ බන්දක් කරණ තරමක් පෙනෙන්ට නැත. මූන් බඩ දරුවන් කවර කල පිහිටි බව ත් නො දනුම්හ. කුමක් කරමෝ දූ'යි විචාළෝ ය. දෙව්දත්තු තමන් බුදු නො වන හෙයින් මෙහෙණින්ට පැමිණෙන අයසස් පමණක් සලකා අර භික්ෂුණියගේ තරම් පදම් නො සලකා 'සිවුරු හරව'යි කිවූ ය. ඒ අසා සැදෑයෙන් මහණ වූ ලඳුරි මෙහෙණිනි වහන්දෑ 'මා නො නැසුව මැනව. මා දෙව්දතුන් උදෙසා මහණ වූයේ නැත. මාගේ ප්‍රව්‍රජ්‍යාව බුදුන් සන්තක ය. ගිය දවස පැවැති දෙය ත් එන දවස පවත්නා දෙය ත් දන්නා බුදුහු මෙ වක පවත්නා දෙය

---

1 නුවණැති බවට පත් තැන් පටන්.

දන්නා සේක් ම ය. බුදු නුවණින් බලා නිසි වූවො ත් හැර ගන්නා සේක. නො නිසි වූවො ත් හරනා සේක. මා බුදුන් කරා දෙව්රමට ගෙන යව'යි කිවූ ය.

උයි ත් ගිවිස දෙව්රමට ගෙන ගොසින් එ පවත බුදුන්ට දැන්වූහ. බුදුහු උන් ගිහි අවස්ථාවෙහි දරු ගැබ පිහිටි නියාව බුදු නුවණින් දත ත් පරුපවාදයෙන් මිදෙනු පිණිස කොසොල් රජ්ජුරුවන් ද මහ අනේපිඬු සිටාණන් හා කුඩා අනේපිඬු සිටාණන් ද විශාඛාවන් ද තව ත් තව ත් ප්‍රසිද්ධ කෙණෙක් ඇත් නම් උන්දෑ'යි මුන් හැම ගෙන්වා ලා විනයධර තැනට අග්‍ර උපාලි මහ තෙරුන් වහන්සේ බණවා ලා 'උපාලීනි, සිවු වනක් පිරිස් මැද තෙල මෙහෙණින්න විචාරා ශුද්ධ කරව'යි වදළ සේක. උපාලි මහ තෙරුන් වහන්සේ ද රජ්ජුරුවන් ලහට විශාඛාවන් කැඳවා ලා දරු ගැබ ගිහි අවස්ථාවෙහි පිහිටියො ත් එ ලෙස හා මහණ වූ කල වී නම් එ ලෙස හා නිශ්චය කරන්නට විශාඛාවන්ට භාර කළ සේක.

විශාඛාවෝ ද තිරයක් අද්දවා ලා තිර ය ඇතුළත දී උන්ගේ අතුල් පතුල් හා පෙකණිය ත් උදරාවසානය ත් බලා තමා දරු විස්සක් වද සිටි හෙයින් මස් දවස් ගැණ පියා මහණ වූ කලු ත් විචාරා පියා මහණ වූ කල වී නම් අතුල් පතුල් හා පෙකණිය ත් උදරාවසානය ත් මෙ ලෙස තිබන්ට කාරණ නැත. ගැබ පරිණත හෙයින් මෙ ලෙස වූ යේ ය'යි සිතා ගිහි කල ම දරු ගැබ පිහිටියේ ය'යි දැන උපාලි මහ තෙරුන් වහන්සේට එ පවත කිවූ ය. මහ තෙරුන් වහන්සේ ද සිවු වනක් පිරිස් මැදයේ 'මූ මූලාපත්තියෙන් නිරාපත්තිකයහ'යි ශුද්ධ කළ සේක. සිවු වනක් පිරිස් මැදයේ කළ ශුද්ධි ය හෙයින් 'දෙව්දතුන් අශුද්ධියට හළවුන් බුදුහු ශුද්ධියට හැර ගත් සේකැ'යි යන අපවාදය ත් නැති වි ය.

භික්ෂුණී ත් දවස් මස් පිරුණු කලට පියුමතුරා බුදුන් සමයෙහි ශ්‍රාවක බොධියට පැතූ පැතීම් ඇති මහානුභාව සම්පන්න වූ පුතණු කෙණකුන් වැදූහ. එක් දවසක් කොසොල් රජ්ජුරුවෝ මෙහෙණවරින් යන්නෝ බාල දරුවන් හඬන හඬ අසා මෙ කිම් දෑ'යි විචාරා එ පවත් දැන ඒ කුමාරයන් රජ ගෙට ගෙන්වා ගෙන වඩා වර්ධන කරන්ට කිරි මවුන්ට පාවා දුන්හ. නම් තබන දවසු ත් කාශ්‍යප නම් තබා ලා කුමාර පෙරහරින් වැඩි හෙයින් 'කුමාර කසුබැ'යි නම් තබා ගත්හ.

Non-Commercial Distribution

ඒ කුමාරයෝ ද කෙළි මඩලේ දී කුඩා සුඟුන් ගසා වසා ලා 'මවු පියන් නැති තැනැත්තහුගේ කට යුතු ය'යි මවු පියන් නැති නියාව කියා ලා දෙඩූ කල්හි රජ්ජුරුවන් කරා ගොස් ''රජ්ජුරු-වන් වහන්ස, එක් ව කෙළනා සුඟු 'මවු පියන් නැති තැනැත්තෝ ය'යි කියා ලා මට දෙඩති. පියාණන් වහන්සේ මුඹ වහන්සේ වේ ද? මැණියන් වහන්සේ කවුරු දැ'යි විචාරා රජ්ජුරුවන් කිරි මැණි කෙණකුන් පෑ ලා තුලූ ය'යි කියා ලූ කල්හි 'මූ මාගේ මැණියෝ නො වෙති. මැණියන් තව ඇත මැනැවැ'යි කිවු ය. රජ්ජුරුවෝ 'මුන්ට සඟවා ලිය නො හැක්කැ'යි 'තොපගේ මැණි-යන්දැ නම් මෙහෙණි කෙණකුන් දැ ය. මම වඩන්ට ගෙන්වා ගතිමි' කිවු ය. මහ පිණැති හෙයින් එ පමණකින් ම ගිහි සම්පත ආල ය හැර 'පියාණන් වහන්ස, මා මහණ කර වුව මැනැවැ'යි කිවු ය. රජ්ජුරුවෝ ත් ගිවිස මහ පෙරහරින් කැඳවා ගෙන ගොසින් බුදුන් ලඟ මහණ කැරවූහ.

උන් වහන්සේ ද උපසම්පදව ත් ලදින් කුමාර කසුප් තෙරුන් වහන්සේ ය'යි ප්‍රසිද්ධ වූ සේක. එ ලෙසින් ප්‍රසිද්ධ වූ තරමෙක නො තබා බුදුන් ගෙන් කමටහන් ඉගෙන ගෙන වලට පලා ගොසින් උත්සාහ කොට ත් වපුට ලූ ද ම ද ගන්ට බැරියා සේ තව නුවණ මඳක් හෙයින් ගුණ විශෙෂයක් උපදවා ගත නො හී 'තව ත් කමට හන විභූත කොට විචාරමි'යි බුදුන් ලඟට අවුත් අන්ධ වනයේ රඳුණු සේක. කසුප් බුදුන් සමයෙහි එක් ව මහණ ධම් කොට අනාගාමී ව බඹ ලොව උපන් බඹ දෙවියාණෝ අවුත් ප්‍රශ්න පසළොසක් විචාරා 'මේ ප්‍රශ්න බුදුන් විනා අනික් විසඳා ලිය හෙන කෙණෙක් නැත. ගොසින් බුදුන් ගෙන් තෙල ප්‍රශ්නවල අත් දැනගත මැනැවැ'යි කියා ලා යවූහ. උන් වහන්සේ ත් එ ලෙස ම කොට පැන විසඳා නිමි කල්හි රහත් වූ සේක.

උන් වහන්සේ ද තමන්දැ ගෙන් නික්මුණු වක්පටන් දෙළොස් හවුරුද්දක් මවු මෙහෙණින්දැ ඇසින් කඳුළු ධාරා පවත්ති. දරු ශෝකයෙන් ශොකී ව මහණ ධම ත් සිත් නො හෙළා කඳුළු වැකි මුහුණින් සිඟා යන ගමනෙහි ඇතුළු වීථියේ දී තෙරුන් වහන්සේ දැක 'පුතඩ පුතඩැ'යි කිය කියා අතින් ඇඟ අල්ලන්ට උදවුව යන ගමනෙහි කඩා ගෙන හී පියා ත් තනවලින් නිකුත් කිරි වලින් තෙත් සිවුරු ඇති ව නැඟී සිට තෙරුන් වහන්සේ අල්වා ගත්හ. උන් වහන්සේ ද 'මූ මාගෙන් මොළොක් බසක් ලද්දූ නම් ස්නෙහ සිඳ ගත නො හී වියළී නසිති. තද කොට ම බස් කියා මුන් හා

Non-Commercial Distribution

කථා කෙරෙමී' ස්නේහ නම් මහණ ධමට යහපත් දෙයක් නො වත් ගොයම් කරන්නවුන් ගොයම් වසන තණ පමණක් උදුරා ගත නො හී ශස්‍ය ඵලයෙන් පිරිහෙන්නා සේ ස්නේහ ය පමණක් සිඳ ගත නො හී මහණධම්හු ත් මහණ ධම් තබා ජීවිතයෙනු ත් පිරි හෙත නියා වේ ද 'යි වදළ සේක. භික්ෂුණීන් දෑ ද 'පුතඩ, කුමක් කියන්නෙහි ද' යි විචාරා එ ලෙස ම කී කල්හි 'මම මුන්දෑ නිසා දෙළොස් හවුරුද්දක් හඬා කා හඬා බී ඇවිද්දෙමි. අනේ මුන් දෑගේ ලය ත් තද නියා ය. සසර සිටිනා කල දරු නුවූවෝ කවුරු ද? මුන්දෑ ගෙන් මට ප්‍රයොජන කිම් ද' යි දෙළොස් හවු රුද්දක් ප්‍රබන්ධ ව පැවති ස්නෙහ ය හැසිල්ලෙකින් සිඳ පියා එ දවස් ම සසර අනන්ත කාලයක් පැවත ආ සව් කෙලෙසුන් නසා රහත් වූහ.

කලක දී ධම් සෙබෙහි ත් 'අනේ දෙව්දතුන්ගේ නොදූන්මක් බලව. හැසිල්ලෙකින් කුමාර කසුප් තෙරුන් හා මවුන් හා නසා පුවෝ ය. බුදුහු උන්න පිහිට වූ සේකැ'යි කථාව ඉපැද වූ සේක. බුදුහු ඒ අසා 'මහණෙනි, මුන් දෙන්නාට මා පිහිට වූයේ දැන් මතු නො වෙයි. පෙර ත් පිහිට වීමි. මාත්, දෙව්දතුනු ත්, මේ මෙහෙණින්න ත් කුමාර කුසුබුනු ත් මුව ව උපන් අවධියෙක එක් දවසක් මුන් ගෙන් මුවකු හා එක් දවසක් මා ගෙන් මුවකු මියනු නිසා දම් ගෙඩියේ හිස තබා ගන්ට වූ නිලයක් හෙයින් මැට පැමිණි වාරයේ දී මෑත් තමා දරි ඇති හෙයින් ඒ වාර ය රඳවා අනික් මුවකු නිල කරන්ට ම තත්පර ව කීව ත් මුන් නොගි- විස්නා හෙයින් එ දවස් මම ම පලා ගොසින් දම් ගෙඩියේ හිස තබා හෙව මැ ත් ගළවාපීමි. මැගේ පුතු කුඩා මුව පැටවා ත් ගළවාපීමි. උන් තබා සෙසු ත් මුවන් පටන් සිවුපාවුනු ත්, පක්ෂීන් කුඩ මස් සත් පටන් සියල්ලන් ම තමන් තමන් ම මියන ගමනක් මුත් නො මරණ ලෙස එ වක කරවා මෙ වක සියල්ලන් සසරින් ගළ- වන්ට ශක්ති ඇති වීමි' යි වදරා—

''නිග්‍රොධමෙව සෙවෙය්‍ය—න සාඛමුපසංවසෙ,

නිග්‍රොධස්මිං මතං සෙය්‍යො—යඤ්චෙ සාඛස්මිං ජීවිතං''

කියා මේ නිග්‍රොධමිග ජාතක ය ත් විස්තර වශයෙන් වදරා 'එ කල කොළමුවා නම් දෙව්දතා ය. ඔහුගේ පිරිස් දෙව්දත් පිරිස් ය. වාර ය පැමිණි මුව දෙන් නම් මේ මෙහෙණිනි ය. පුත් මුවපැටවා කුමාර කසුප්හු ය. දරි ඇති මුව දෙනට දිවි පිදූ නිග්‍රොධ මුවරජ නම් මම ය'යි ජාතක ය නිමවා ලා සථවිරින්දෑ දරු පෙම් සිඳ තමන්දෑ

Non-Commercial Distribution

ම තමන්දැට පිහිට කොට ගත් නියාවට ප්‍රශංසා කොට බණ වදරණ බුදුහු 'යම් හෙයකින් මිනිසත් බව පිහිටා සිටියවුන් විසින් දනාදි වූ පින් කම් කොට ස්වර්ගයට පැමිණෙන්නට ත් මාර්ග ඵල උපදවා ගන්ට ත් පිළිවන් ද, එහෙයින් තුමූ ම තමන්ට පිහිට වෙති. තමා ම තමාට කොට ගන්නා පිහිටක් මු ත් අනික් කවුරු පිහිට වෙත් ද? යම් කෙනෙක් තුමූ මනා ව හික්ම ගත්තු නම් ඉතා ලැබ ගත නො හැකි නව ලොවුතුරා දහම් පිහිට ලැබෙති' වදළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් අනුන් රැක නො හිඳ යම් සේ බිළී වැද්දෙක් බිළියෙන් කුඩ මස්සන් ගොඩ නඟා ද, එ මෙන් නුවණින් තමා ගොඩ නඟා, තව ද යම් සේ බිළී වැදි යම් තම් කුඩ මසු කෙණකුන් ගෙන් බොහෝ ලාභ ලබා ද, එමෙන් යම්තම් කුසල් විතරෙකින් බොහෝ සැපත් ලදින් නිවන් සැපතින් කුළු ගන්ට උත්සාහ කට යුතු

## 143. මහාකාළ නම් සෝවාන් උපාසකයන්ගේ වස්තුව

තව ද අපායෝත්පත්ති භවෝත්පත්ති නවතා ලිය හෙන තරම් නිවන් පුරා කෘත අකුසල ය නවතා ලිය නො හෙන නියාව හඟවන්ට මහා කාළ නම් සෝවාන් උපාසකයන් ගේ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්—

ඒ කාළ නම් උපාසකයෝ මසකට අට දවසෙක පෙහෙ ව ගෙණ වෙහෙරට ගොසින් රාත්‍රි බණ අසති. එක් දවසක් රෑ සොර කෙනෙක් එක් ගෙයක උමං බිඳ වස්තුව හැර ගෙන ලෝ වළන් හඬා නැගී හඬින් ගෙ හිමියන් පිබිද ගොසින් ලුහුබඳවා ගත් කල්හි ගත් ගත් දෙය දම දමා පියා දිව ගත්හ. වස්තුව ඇත් තනු ත් ලුහුබැඳ වුව ත් ඒ ඒ අත දිව ගත්හ. එක් සොරෙක් විහාරයට යන්නා වූ මග දිව ගෙණ ගොසින් මහාකාළ නම් උපා—සකයන් රාත්‍රි බණ අසා පියා උදසන වෙහෙර පොකුණෙන් මූණ සෝදන කලට තමන් ගෙන ගිය දෙය මහාකාළ නම් උපාසකයන් ඉදිරියට දමා පියා සොරා ඉවත් වී ය. සොරුන් ලුහුබඳවා ගිය මිනිස්සු අරුන් ලඟ තුබූ වස්තුව දැක 'තෙපි ගෙවළ සොර කම් කොට ගෙණ බණ අසන බඳු ව ඇවිදු දැ'යි මහා කාළයන් අල්වා ගෙණ මරා පියා ගියහ. උදසනම කළ කොත ලා හැර ගෙණ පැනට ආ බාල වහන්දෑ මළ උපාසකයන් දැක 'සැදෑ

Non-Commercial Distribution

ඇති උපාසකයන් බණ අසා යන්නවුන් එ බඳු වරදක් නැති ව මළ සේ නපුරැ'යි බුදුන්ට දන්වූ සේක.

බුදුහු ත් 'එ සේ ය, මහණෙනි, දැන් මළ ලෙස යහපත් නො වෙයි. පෙර මුන් තමන් කළ පව් ලෙසට කම් ය නො ගෙවෙන හෙයින් යුක්තයා සේ තිබෙයි' වදරා වහන්දැ මේ උපාසකයන් පෙර කළ පව් කවරේ දැ'යි විචාළ කල්හි 'හෙම්බා මහණෙනි, යට-ගිය දවස බරණැස් රජ්ජුරුවන්ගේ විධාන පවත්නා තැන එක් පසල් ගමකට ආසන්න වලක වල් සොරු හිඳ ගෙන ගම් පහරති. රජ්ජුරුවෝ වන දෙරකඩ යොධයාණ කෙණකුන් රඳවා ලූහ. උඹ මිල හැරගෙන මිනිසුන් වලින් ඇත්-මැත් කෙරෙති. ඉක්බිත්තෙන් එක් මිනිසෙක් රූපත් වූ තමාගේ අඹු කෙණකුන් ගැලෙක හිඳුවා ගෙන එ තැනට ආ ය. වන දෙරකඩ සොරභය නිසා සිටී යෝධ-යාණෝ ද අර ස්ත්‍රිය දැක ම ඇ කෙරෙහි ප්‍රේමයක් ඇති ව ගෙන 'අප වනින් ඈත් කළ මැනැවැ'යි කී කල්හි 'දැන් වෙලා නැත, උදසන ම ඈත් කෙරෙමි' කිවු ය. ඒ අසා අරු 'තව වෙලා ඇත. දැන් ම අප ඈත් කරවා ලුව මැනැවැ'යි යොධයාණන් නපුරු අදහසින් රඳවන නියා ව දැන ලා දෝ කිවු ය. ඒ අසා යොධයාණෝ 'අද රඳව, බතු ත් නවාතැනු ත් අපගෙන් ම දෙම්හ'යි කිවු ය. උන් කෙසේ කීව ත් ගමනී තැනැත්තෝ රඳන්ට මැළියෝ ය. යෝධ-යාණෝ ත් මිනිසුන්ට කියා ලා ගැල නවත්වා ලා උන් රඳන්ට මැළි වුව ත් වාසල ලගින්ට නිල කොට ලා රැට බතුත් නිල කළහ.

යොධයාණන්ගේ ගෙයි ත් මැණිකෙක් ඇත. උඹ ඒ මැණික අරුන්ගේ ගැල ලවා පියා පාන්දර වේලේ සොරුන් ගෙට වන් සැටියක් හඟවාලූ ය. උන්ගේ මිනිසුන් ගෙයි තුබූ දෙය, නො තුබූ දෙය සමන්තන්නෝ 'ස්වාමීනි, මැණික හැරගත්තු ය'යි කිවු ය. උඹ ගම් දෙරකඩ රකවල් ලවා ලා ගමින් පිටත් ව යන්නවුන් අත මිට සමන් ව'යි කිවූ ය. අමුතු ව ලැගි තැනැත්තෝ ද උදැ-සන ම ගැල පදවා ගෙන නික්මුණාහු ය. ඉක්බිත්තෙන් උන්ගේ ගැල ත් බලන්නාහු තමන් ම තබා ලූ හෙයින් මැණික දැක 'තෙපි බත් දී නවාතැන් දී නවතාලූවාට මැණික සඟවා ගෙන යවු දැ'යි මරා තළා පියා ඇර ගෙන 'ස්වාමීනි, සොරු අල්වා ගතුම්හ'යි ගම් මුදලියාට පැවූ ය. 'අප නවාතැන් දුන්නේ යහපත් කෙණකුන්ට නියා වේ දැ'යි කියා ලා ස්ත්‍රියක් නිසා නිවරදෙයි වරද සලසා ලා නිරපරාධ තැනැත්තවුන් මරවා තුමූ සාපරාධ වූහ. මේ මුන් කළ පවුකම ය.

උයි ත් මිය අවීචියෙහි ඉපැද බොහෝ කලක් පැසී පියා තව ත් පාප ය නො ගෙවුණු හෙයින් අත් බැව් සියයෙක මෙ ලෙසින් ම මළවු ය. පොලියට ගත් දෙයක් දී නො නිමි කලට පොලී සිටිනා සේ එක මුන්ගේ වරදක් නැත ත් එ එක කළ වරද ම වරදවා සිටී' යි වදරා 'මහණෙනි, මේ සතුන් තමන් කළ පාපය ම උන් තමන් මිරික'යි වදරා බණ වදරන සේක් 'මහණෙනි, යම් සේ ගලින් ම වූ විදුරු 'මේ අපගේ ජාතියේ ගල් වේ දැ'යි නො සිතා මැණික් ගල් සිදුරු කොට නිෂ්ප්‍රයෝජන කෙරේ ද, එමෙන් තමා ගෙන් ම සිද්ධ වූ පාප ය මුන් නිසා වේදැ යි අප ඇති වූයේ ය'යි නො සිතා නුවණ නැති සත්ත්වයන් සතර අපාය නමැති යත ලා ලා මිරික යී' වදාළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් යම් සේ වඩුවෝ කළු හූ ගසා ලා හළ මනා තැන් සැස හරිත් ද, එ මෙන් බුදුන්ගේ අනුශාසනා ලෙසින් සිල් නමැති පොළොවෙහි පිහිටා සිට සැදෑ නමැති අතින් නුවණ නමැති වැය හැරගෙන අකුසල් නමැති බොරු හර සැස හැර කුසල් හර පමණක් සිටුවා ගෙන නිවන් පුර වදනා වාසල් කරන්ට උත්සාහ කටයුතු.

---

## 144. දෙවදත්ත සඞ්ඝභෙදක වස්තු දෙක

තව ද යම් කෙණෙක් තෘෂ්ණා වශගයෝ වූ නම් අපායභාග් ව යටත් වත් මුත් උසස් වීම නැති නියා ව හඟවන්ට දෙවදත්ත වස්තුව මුත් තමාට අහිත ය කොට ගන්ට මුත් හිත ය කොට ගන්ට නො පිළිවන් නියා ව හඟවන්ට සඞ්ඝභෙදක වස්තුව ත් කියමු.

කෙ සේ ද යත්—

එක් දවසක් වහන්දෑ ධම් සෙබෙහි රැස් ව හුන් සේක් 'ඇවැත්නි, දෙව්දත්තු නපුරු වූ ය. තමන් නපුරු හෙයින් තෘෂ්ණා වශග ව අජාසත් රජ්ජුරුවන් යහපත් තැනැත්තවුන් අදහස් නපුරු කරවා පියාණනු ත් මරවා උන්ට අධිගම අන්තරාය ත් කොට තුමූ ත් උන්ගෙන් ලාභ සත්කාර උපදවන්නෝ උපදවා ගත් ලොවීගුණ විශෙෂයෙනු ත් පිරිහී තමන්ට වන අනර්ථ මදින් කොට ගත නුහුණු පමණක් මුත් බුදුන්ට ත් බොහෝ අනර්ථ කරන්ට උත්සාහ කොළෝ ය'යි වදාළ සේක. බුදුහු ඒ අසා මහණෙනි, තුලූ මට අනර්ථයට උත්සාහ කරන්නේ දැන් මතු

Non-Commercial Distribution

නො වන්නේ වේ ද? සසර සැරිසරා සිටිනා කල ත් උමංදයෙහි දී කෙවට්ට බමුණු ව ආදි මා කෙරේ අමුතු නැත ත් ධර්ම යුද්ධයෙහි දී නළල උළා වණ කළ හෙයින් වෛර කොට ගෙන චූලනී රජ්ජුරුවන් ලවා මා මරන්ට ප්‍රයොග කොට ත් කොට ගත නො හීණ. පරන්තප ජාතකයෙහි දී සතුරු රජුන් නුවර වට ලා ගත් කල්හි මා සටනට යන්ට කියා නපුරු කාරණයක් දැක මා යන්ට මැළි වුව ත් යවා ලා මරන්ට ප්‍රයොග කළ ත් මම මාගේ උපදෙසින් ජීවත් වීමි.

මේ තෙමේ සතුරන් ගෙන් ගැළවී වලට ගොසිනු ත් පරන්තප නම් කොල්ලා අත නට යනාදීන් නො එක් ජාතක වදරා සැප ත් පිරිසට බණ වදරණ සේක් 'යම් කෙණෙක් පව්වු අදහස් ඇත්තෝ වූ නම් උන්ගේ ඒ පව්වු අදහස නිසා ඇති වූ අෂ්ටොත්තර ශත ප්‍රභෙද වූ තෘෂ්ණාව යම් සේ සල් ගසකට හෝ අනික් ගසකට හෝ නැගී මාලුවා ලිය ය ගස වසා වැළඳ ගෙණ වැසි දවසෙක බොකු පත්වල පැන් සිට ගෙණ ලා ගස් බිඳ හෙළා ගෙණ ලා හැම ම වස වසා වළදී ද, එ මෙන් තෘෂ්ණාව යම් කෙණකුන්ගේ සන්තානයෙහි පැවැත්තේ වී නම් මාලුවා ලිය ය වැළඳ ගස හෙළා ගන්නා මෙන් තෘෂ්ණා නමැති මාලුවා ලිය ය ත් සත්ව සන්තාන නමැති රුක් වැළඳ විපාක දන නමැති වැස්සෙන් භව නමැති බිම හෙළා ගෙන හිසක් ඔසවා ලිය නො දී වස යි. යම් සේ අනත්‍ථක නමැති සතුරෙක් ද තමා ත් ඒ සතුරා මෙන් කෙරෙයි' වදළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන සෝවාන් ඵලාදියට පැමිණියහ.

එ හෙයින් සත් පුරුෂයන් විසින් සත්ව සන්තාන නමැති රුක් වලට තෘෂ්ණා නමැති මාලුවා ලිය ය නැඟී කුසල් නමැති දළු හට ගත නො දෙන මුත් නුවණ නමැති යකඩ සැදෑ නමැති ගල ගා ගෙන තෘෂ්ණා නමැති මාලුවා ලිය ය කපා අවිද්‍යා නමැති මුල ත් උදුරා හරණට උත්සාහ කට යුතු.

තව ද එක් දවසක් දෙව්දත්තු සංඝ භෙදයට උත්සාහ කරන්නෝ අනඳ මහ තෙරුන් වහන්සේ සිඟා වඩනා දැක තමන් ගේ අදහස කීවු ය. ඔබ අසා බුදුන්ට දැන්වූ සේක. කෙසේ දැන්වූ සේක් ද යත් ''ස්වාමීනි, මම අද පෙර වරු රජගහා නුවරට සිඟා ගියෙමි. සිඟන ගමනේ දෙව්දත්තු මා දුටුහු ය. දැක මා කර, අවුත් 'ඇවැත්නි, අද පටන් බුදුනු ත් හැර භික්ෂු සංඝයා ත් හැර පොහෝ ත් කෙරෙමි. සෙසු සඞ්ඝ කර්‍මත් කෙරෙමී' කීවු ය.



Non-Commercial Distribution

'ස්වාමීනි, අද දෙව්දත්තු දහම නො දහම යනාදීන් ගෙණ සතර දෙනකු ගෙන එක සිම පොහොය කෙරෙමින් සමඟ සඟුන් බිඳිනා නිසා පොහොය ත් කෙරෙති. සෙසු ත් සඞ්ඝ කම් කෙරෙති' කී සේක. එ සේ කී කල්හි බුදුහු—

"සුකරං සාධුනා සාධු – සාධු පාපෙන දුක්කරං,
පාපං පාපෙන සුකරං – පාපමරියෙහි දුක්කරං"

යනු හෙයින් 'ආනන්දයෙනි, යහපතක් කරන්ට යහපතුන්ට ම පිළිවන් ව ත් මුත් පාපීන්ට නො පිළිවන. පාපීන්ට පිළිවන් පාප ය ම ය. එ ම පාප ය කරන්ට නිෂ්පාපීන්ට බැරි ය' යි වදරා බණ වදරන සේක් 'යමෙක් තෙමේ සාවද්ද[1] වී නම් කළවුන් අපායෙහි උපදවා නම් සියලු ලෙසින් ම අහිතයක් එළවා නම් එ සේ වූ දෙය අනන්ත කාලයක අභ්‍යාස ය ඇති බැවින් කරන්ට පිළිවන. යමක් කළ කල මෙ ලෝ පර ලෝ දෙකින් ම අනර්ථයෙක් නො වේ ද? ස්වර්ග සම්පත්, මොක්ෂ සම්පත් සාධා දී ලා ද එ සේ වූ සුචරිත ය යට ගං බලා යන ගඟ නවතා උඩු ගං බලා කොට ලන්ට බැරියා සේ ඉතා බැරි ය. ආනන්තරික දෙකක් ම මූ කරණ තැනැත්තහු උපදවා ගත් පඤ්චාභිඥා අෂ්ට සමාපත්ති පමණකු ත් තර කොට නුහුණුයේ තමාගේ ම පව්වු කමින් වේ දැ'යි වදළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් සත් පුරුෂයන් විසින් සඞ්ඝ භෙද ය කළ දෙව්දතුන්ට වූ හානි දෙවදත්ත වතින් ම දත් බැවින් පඤ්චානන්තරිය කර්මයෙනු ත් දුරු ව ප්‍රාණවධාදීනු ත් දුරු ව තුන් සුසිරි පුරා අධිමුක්ති වූ පරිද්දෙන් ත්‍රිවිධ බොධීන් එක් තරා බොධියකට පැමිණිය යුතු.

## 145. කාළ නම් තෙරුන් වහන්සේ ගේ වස්තුව

තව ද කවුරුන් කුමක් කීව ත් මහ පිණැත්තවුන් කළ මනා දෙයක ම හැසිර වැඩ සාධා ගන්නා නියාව කාළ නම් තෙරුන් වහන්සේ ගේ වස්තුව දක්වා කියමු.

කෙ සේ ද යත්—

සැවැත් නුවර එක් උපාසිකා කෙනෙක් කාළ නම් තෙරුන් වහන්සේට මවු තරමෙ සිට උපස්ථාන කෙරෙති. උන්ගේ ගෙට ඉක් බිති ගෙවල ඇත්තෝ බුදුන් ගෙන් බණ අසා ලා අවුත් 'අනේ! බුදුන්ගේ තරමක් අරුම නියා ය. බණ වදරා පියන ලෙසකු ත්

1. සාවද්ද–ඇතැම

Non-Commercial Distribution

විස්ම නියා ය. අප මෙ තෙක් දෙනා වෙන වෙන ම සිත් ගෙන බණ වදරන සේක. ශබ්ද මාධුර්‍ය්‍ය නම් කත මී හෝනා සේ ය. යනාදීන් විස්තර කොට කියති. කාළ තෙරුන් වහන්සේට උපස්ථාන කරණ උපාසිකාවෝ ද ඒ කථාව අසා තෙරුන් වහන්සේට 'ස්වාමීනි, මම ත් බුදුන්ගෙන් බණ අසනු කැමැත්තෙමි. මියුරු දෙය නම් කාට ත් මියුරු වේ දැ'යි කිවු ය.

උපාසිකාවන්ගේ අදහස යහපත් පමණක් මුත් උන්ගේ දන් වැළඳුව'යි තෙරුන් වහන්සේගේ අදහස යහපත් නො වන බැවින් බුදුන් කරා යන ගමන ත් සිතෙනු ත් බඳ දුටු කල බාධා සේ, දී ලබන බතට හානියක් වේ දෝ හෝ යි බාධා කළ සේක. උපාසිකාවෝ ද තමන්ගේ ඔබ ගමනින් වන ප්‍රයොජනයෙක් ඇත් නම් ඊට බාධාවක් කට හෙන්නවුන් නැති හෙයින් තුන් වාරයක් දක්වා ත් බණ අසන්ට යනු කැමැති ව කියා තුන් වාරයේ ම නැවතුව ත් සැඩ ව යන දියක් බැඳ රඳා ලිය නො හැක්කා සේ ම යනු කැමති වූ ය.

තෙරුන් වහන්සේ ත් මෙ සේ ම නවත්නේ හැයි ද යත්– උන්ට වන උවදුරෙක් නිසා නො වෙ යි. බුදුන්ගේ බණ අසා ඔබ පැහැද ගත්තු නම් තමන් වහන්සේ කෙරෙහි උදාසීන වෙති යි යන අදහසින. බුදුන්ගේ බණ අසා නිවන් දක්ක අචල ශ්‍රද්ධාවේ පිහිටියෝ නම් මේ අදහස තර ව ගත්ති සිතා පිය ත් නො හී ය.

ඒ උපාසිකාවෝ ද එක් දවසක් උදෑසන ම බත් කා ලා පෙහෙව ගෙන 'පුතණ්ඩ, මේ ගෙයි දී වළඳන ස්වාමීන් සොද කොට වළඳවා ලන්නැ'යි දුවණියන්ට සම්මත කොට ලා බුදුන් දකින්ට ත් බණ අසන්ට ත් විහාරයට ගියහ. දුවණියෝ ද වළඳන්ට වැඩි තෙරුන් වහන්සේ වළඳවා ලා 'වැඩි මාලු උපාසිකාවෝ කොයි දැ'යි විචාළ කල්හි 'බණ අසන්ට විහාරයට ගියහ'යි කිවු ය. උන් වහන්සේ ත් ඒ අසා මහා බඩ ගිනි ඇති ව 'මෙ තෙකට මා කෙරේ බිඳී යෙති' වහ වහා විහාරයට ගොසින් බුදුන්ගෙන් බණ අසන්නවුන් දක්ක තමන් කා ගත නො හෙන්නවුන් අනුනු ත් කනු නො කැමැත්තා සේ උන්ගේ බණ ඇසීම ඉවසා ගත නො හී වදරන බණට බාධා කරවනු නිසා බුදුන්ට 'ස්වාමීනි, නුවණ මඳ වූ ය. තමන් නුවණ මඳ හෙයින් සියුම් බණ දන ගත නො හෙති. 'සීදම් මුසු කොට නො වදරා දන් දීම් ආදියෙහි විපාක පමණක් වදළ යහපතැ'යි පරසිත් දන්නා බුදුන්ට තමන් වහන්සේගේ අදහස් නපුරු නියාව හඟවා කී සේක.

Non-Commercial Distribution

බුදුහු ත් ඇඟිල්ල පැලූ කලට ඒ තබා ලා අත් කර අල්වන්නා සේ කියා ලූ බස තිබිය දී අදහස දැන ලා 'නුවණ නැති පාපී තැනැත්තව, කියා පියන්ට බසක් නැත්තා සේ මා කියන බණට තෙල ලෙස කුමට කියයි ද? කෙනෙක් බණ පිරිස් හුන ත් එකි එකී තැනැත්තහු සිත සොළොස් සොළොස් ආකාරයකින් බලා පරීක්ෂා කොට ලා උන් උන්ගේ අදහස් ලෙසට බණ කියන තරම් දෙසනා විලාසයක් ඇති මම දත මනා දෙයින් කුමකුත් නො දන්නා තොප වැන්නවුන් කී ලෙස බණ කියම් ද'යි වදරා ලා බණ වදරණ බුදුහු 'නුවණ නැති සත්ත්වයෝ තමන්ට වන ලාභයට හානි වේ දෝ හෝ යි යන නපුරු අදහස නිසා දෙන දනට බාධා කොට හෝ අසන බණට බාධා කොට හෝ තව තව ත් කරණ පින් කමට බාධා කොට කියත් නම් බුදු සස්නට පටහැනි ලෙස කියා මේ ලොව අයසස් හා පර ලොව අපාය දුක් ලැබෙති. එ ලෙසින් උන්ට පැවැති පව්ටු අදහස හුණ ගසින් තල ගසින් ඇති වූ හුන වී හා තල ඇට එ ම හුණ ගස් තල ගස් නසන්නා සේ පව්ටු අදහස් ඇත්තවුන් ම නස යි' වදළ සේක.

දෙශනා කෙළවර තෙරුන් වහන්සේ නැවතුව ත් නො නැවත බණ අසන්ට ආ උපාසිකාවෝ අපාය ගමනින් නැවත සෝවාන් වූහ. උන් ලද්ද වූ සෝවාන් ඵල ය කේල් කැන්-කිතුල් කැන්-හුණ-වී ආදි ය ප්‍රයෝජනවත් වන්නා මෙන් ම ක්‍රම ක්‍රමයෙන් සංසාරොත්පත්ති නැති කිරීමට හෙතු වීමෙන් මහා ප්‍රයෝජන වී ය. සෙසු ත් බොහෝ දෙනාට ප්‍රයොජන වී ය.

එ හෙයින් නුවණැත්තවුන් විසින් කුසල් විෂයෙහි කරණ බාධා, බාධා කොට නො සිතා කුසලයෙන් නැවතෙන ගමනු ත් අකුසලයෙන් ම නැවත සසර ගමන් නැවැතිය යුතු.

———

## 146. චූළකාල උපාසකයන් ගේ වස්තුව

තව ද නො කළ වරදකු ත් කළ ලෙසට සැලසී ජීවිත හානි-යට නිල ව තුබූ අකුශල කර්මයෙක් ලං ව ගත නො හීණි නම වන හානි නැති නියාව භගවන්ට චූළ කාල උපාසකයන් ගේ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්-

මහා කාළ වත කියන ලද ලෙසින් ම එක් දවසක් උමං සොරු උමං බිඳ ගෙන ගෙට වැද වස්තුව ත් හැර ගෙන වස්තු සවාමීන්

Non-Commercial Distribution

ලුහුබඳවා ගත් ගමනෙ ත් විහාරයට ගොසින් රාත්‍රී බණ අසා පියැ උදසන විහාරයෙන් නික්ම සැවත් නුවරට එන චූලකාළ උපාසකයන් ලඟට සොරා ගත් දෙය දමා පියා සොරා පලා ගියහ.

මිනිස්සු උන් දක ‘මූ රෑ සොර කම් කොට පියා පින් කරන් නා සේ ඇවිදිති. තුලුන් අල්වව’යි කියා ලා අල්වා ගෙන මරන්ට වන්හ. කළ මිඩියෝ පැන් තොටට යන්නාහු උන් දක’ තුලුන්දෑ එ බන්දක් කරණදෑ ද? මුන්දෑ එ තරමක් නො කරණ නියාව කවුරු නො දනිද්ද? මුන්දෑට ගැහැට කට නො හැක්කැ’යි නො එක් කාරණ කියා හරවා පූ ය. චූල කාළ උපාසකයෝ ද විහාරයට ගොසින් ‘කළ මිඩියන් නිසා මුත් හැසිල්ලෙකින් ම නවුයෙමි’ වහන්දෑට කිවූ ය. වහන්දෑ බුදුන්ට දන් වූ සේක. බුදුහු ඒ අසා මහණෙනි, චූල කාළයෝ කළමිඩියන් නිසා ත් මූ තමන් එ බන් දක් නො කළ හෙයිනු ත් ජීවිත ය ලද්දෝ’යි වදරා බණ වදරන සේක් යම් කෙණෙක් ප්‍රාණවධාදි වූ පව් කොළෙෝ නම් උඃ නර කාදි වූ අපායට පැමිණ තුමූ ම තමන් කෙලෙසති.

යම් කෙණෙක් පවින් දුරු ව දනාදි වූ පින්කම හැසුරුණාහු නම් උඃ සවර්ග සම්පතට ත් නිවන් සම්පතට ත් පැමිණ තුමූ තමන් ම පිරිසිදු වෙති. කළ කුශලාකුසලයෙක් ඇත් නම් කළ වුන්ට ම ය. එක් කෙණකුන් කළ අකුසලින් අනික් කෙණකුන් අපායට පැමිණෙන්නේ ත් නැත. එක් කෙණකුන් කළ කුසලින් අනික් කෙණකුන් ලොව් ලොවුතුරා සැප ත් ලබන්නේ ත් නැත. සසර රදා සිටිත ත් සසරින් ගැළ වෙත ත් තම තමා ම කොට ගත් දෙයකැ’යි වදළ සේක. දෙශනා කෙළවර චූලකාළ උපාසකයෝ තමන් කළ පිනින් තුමූ සෝවාන් වූහ. සෙසු ත් බොහෝ දෙන නම තමන් කළ පිනින් තුමූ තුමූ ම සෝවාන් ඵලාදියට පැමිණියහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් සව්ඥවරයන් පැරුම් බිම දී පිරූ දනාදි පැරුම් ඔබට ම බුද්ධත්‍ව ය සාධා දී ලන පමණක් මුත් අනික් තැනකට ප්‍රත්‍යෙක බොධි ය හා ශ්‍රාවක බොධිය සාධා දී නො ල යි. ඒ තැන්ගේ ප්‍රත්‍යෙක බොධියට හා ශ්‍රාවක බොධියට කළ පින් බුදුවරුන් වහන්සේගේ සම්‍යක් සම්බොධි ය සාධා දී ලන්නේ නො වෙ යි. එහෙයින් තමා ම කොට ගත් දෙයකැ’යි සිතා පින් කම හැසිර ලොව් ලොවුතුරා සැපත් සිද්ධ කට යුතු.

Non-Commercial Distribution

# 147. අත්තදත්ථ තෙරුන් වහන්සේගේ වස්තුව

තව ද අත් වැඩ පර වැඩ හැසිරෙත් මුත් අත්වැඩ හැර පියා පර වැඩෙහි ම හැසිරීම යුක්ත නොවන නියාව හඟවනු නිසා අත්තදත්ථ තෙරුන් වහන්සේ ගේ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්—

බුදුන් පිරිනිවන් පානා සමයෙහි වහන්දෑ බණවා ලා 'මහණෙනි, මම මෙ තැනට සාරමසක් ගිය කල පිරිනිවන් පාමී'යි වදළ කල්හි සත් සියයක් පමණ පෘථග්ජන වහන්දෑ සසර භය ඇති ව බුදුන් අත් නො හැර ම බුදුහු ත් පිරිනිවන සේක. අපි ත් අපට තව දක්වා පිහිටක් කට නුහුණුවම්හ. කුමක් කරමෝ දෝ'යි කුශල සන්නිශ්‍රිත කථා කරණ සේක. ඉන් අත්තදත්ථ නම් තෙරුන් වහන්සේ 'බුදුහුවැළි ත් සාර මසක් විතරින් පිරිනිවන් පානා සේක්ල. මම ද වැළි ත් පෘථග්ජනයෙමි. බුදුන් පිරිනිවන් නො පානා තෙක් රහත් වන්ට උත්සාහ කෙරෙමි. වහන්දෑ ලඟට ගොසින් කථා කිරීමෙන් හස්සාරාමත්‍ව ය සිද්ධ වත් මුත් භාවනාරාමත්‍වය කට නො හැක්කැ'යි වහන්දෑ ලඟට නො යන සේක. වහන්දෑ ත් තමන් අප ලඟට නො යන්නේ ත් හැයි ද? කථා නො කරන්නේ ත් හැයි දෝ'යි කියා ලා බුදුන් කරා ගෙන ගොසින් එ පවත් කී සේක.

බුදුහු ත් ඔබගේ ම අදහස හඟවනු නිසා 'කුමක් නිසා එ ලෙස කරවු දෝ'යි විචාළ කල්හි ''ස්වාමීනි, නුඹ වහන්සේ නැඟි හිර තිස් පැයකින් ගල හෙන්නා සේ සාර මසක් විතරින් පිරිනිවන් පානා සේක. දවාල වත් වත් බකමූහුණන්ට අඳුරු වන්නා සේ සර්‍වඥ සූර්‍ය්‍යයා පහළ ව පන් සාලිස් හවුරුද්දෙන් සාර මසක් විතර තුබූ හෙයින් අනුපධිශෙෂ නිර්‍වාණ ධාතු නමැති හස්ත ගිරියට පැමිණෙන්ට ත් ආසන්න වී ය. තව දක්වා ත් මාගේ මොහඳුර දුරු වන්ට නො ව අඳුරු ව ම තිබෙ යි. එ හෙයින් මුඹ වහන්සේ පිරිනිවන් නො පානා තෙක් රහත් වන්ට උත්සාහ කෙරෙමී'යි කී සේක. බුදුහු ත් සාධුකාර දෙවා වදරා 'මහණෙනි, යම් කෙණෙක් මට ලෙන් ගතු වූවාහු නම් උන් අත්තදත්ථයන් මෙන් වුව මැනව. සුවඳ මල් ආදියෙන් මට පූජා කරණ කෙණෙක් ඇත්නම් උඹ මට පූජා කළා නම් නො වෙති. මට පූජා කළා නම් ප්‍රතිපත්ති පූජා ම ය.

එ සේ හෙයින් කවුරුන් වුව ත් අත්තදත්ථයන් මෙන් විය යුතු ය'යි බණ වදරණ සේක් 'අනුන්ට දහසක් වටනා තරම් ප්‍රයොජන නිසා ත් තමහට වන්නා වූ දෙව්යට සමාරක් විතර වුව ත් ප්‍රයෝ-ජන ගිහීන් විසින් නො පිරිහෙළිය යුතු. ස්වල්ප මාත්‍රයක් වුවත්

Non-Commercial Distribution

තමහට වත් මුත් අනුන්ට වන්නා වූ ප්‍රයෝජනයෙන් තම හට ප්‍රයෝජන නැත. මෙ තැන වැලි ත් කමටහන් මුඛයෙන් කියන ලද. එ හෙයින් අත්වැඩ නො පිරිහෙළම්' කියා සඞ්ඝයා වහන්සේ පිළිබඳ කට යුතු වේව යි උපාද්ධ්‍යාය වත් ආදි ය වේව යි නොපිරිහෙළි ය යුතු ය. ආභිසමාචාරික වත්හි හැසිරෙන්නාහු ම මාර්‍ග ප්‍රතිවෙධ ය ඵල ප්‍රතිවෙධ ය කට හෙති. එ හෙයින් එ හැම ත් අත් වැඩ ම ය. යම් කෙණෙක් වඩනා ලද විදර්‍ශ ඇත්තෝ වූ නම් 'අදින් සෙටින් අධිගමය කෙරෙති'යි සිතන තරමට තිබේ නම් උන් ඇදුරු වත් ආදිය හැර ත් උදවුව සිද්ධ වන අධිගමය ම සිද්ධ කට යුතු ය. අභිසමාචාරිකවතු ත් අධිගම සිද්ධි ය නිසා ම කරණ හෙයින් අධිගම ය උදවුව සිද්ධ වේ නම් ආභිසමාචාරික ය හළ ත් වරද නැතැ'යි වදළ සේක. දෙශනා කෙළවර අත්තදත්‍ථ තෙරුන් වහන්සේ රහත් වූ සේක. සෙසු ත් බොහෝ දෙනා නිවන් දුටහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් පර වැඩ කරම්හ යි අත් වැඩ නො හැර අත් වැඩ කරම්හ යි පර වැඩ ත් නො හැර පර වැඩ හැසිරෙන්ට බැරි වී නම් අවැඩෙහි නො හැසිර පිළිවන් වී නම් අත් වැඩ පර වැඩ දෙකෙහි ම හැසිර නිවන් වැඩ සාධා ගත යුතු.

# 148. දහර භික්ෂුකෙණකුන් වහන්සේ ගේ වස්තුව

තව ද සත්ත්වයන්ගේ අදහස් දන්ම බුදුන්ට මුත් සෙස්සන්ට අවිෂ ය නියාව හඟවන්ට දහර භික්ෂු කෙණකුන් වහන්සේ ගේ වස්තුව කියමු.

කෙ සේ ද යත්—

එක් තරා කෙණකුන් වහන්සේ බාල නමක් කැඳවා ගෙණ උදසන ම විශාඛාවන්ගේ ගෙට වැඩි සේක. විශාඛාවන්ගේ ගෙයි ත් නිරන්තර ව පන් සියක් දෙනා වහන්සේට කැඳෙක් නිල ව තිබෙයි. තෙරුන් වහන්සේ එ තැන දී කැඳ වළඳා පියා බාල නම එ තැන රඳවා ලා තමන් වහන්සේ බත් වළඳන්ට අනික් ගෙයට වැඩි සේක.

එ සමයෙහි විශාඛාවන්ගේ මිනිබිරි කෙණෙක් මුත්තණියන් සේ ම වහන්දෑට මෙහෙ කෙරෙති. උයි ත් බාල නමට පැන් පරහා දෙන්නෝ සැළ පැන ඡායාවෙන් තමන්ගේ මූණ බලා සිනූ ය. බාල නම ත් කුමාරිකාවන්ගේ මූණ බලා සි නූ සේක. කුමාරිකාවෝ උන් වහන්සේ සිනූ නියාව දැක 'මේ හිස කැපූයේ මා දැක සිනා සෙයි' කිව. ඒ අසා බාල නමත් 'තෝ හිස

Non-Commercial Distribution

කැපූ වී ය. තිගේ මව ත් හිස කැපූ වී ය. තිගේ පියෝ ත් හිස කැපූවෝ ය' යි සටා බිණුදෑ ය. ඇ හඬා ගෙණ මුත්තණියන් විශාඛාවන් දන් පිසන තැනට ගොසින් හැඬී ය. 'කුමක් ද පුතඬැ' යි කී කල්හි එ පවත් කිවු ය. විශාඛාවෝ බාල නම ලඟට අවුත් ස්වාමීනි, බාල දරුවන් කියා පු දෙයට මුසුප්පු නුවූව මැනව. හිස කේ කපා පියා කපා කළ සිවුරු පෙරව ගෙණ මැටි කබලක් හැර ගෙණ සිඟා කන කල තෙල විතරයක් නො ඉවසත් දෑ' යි කිවූ ය.

ඒ අසා බාල නම 'එ සේ ය, උපාසිකාවෙනි, අප හිස මුඩු නියාව ත් පවුල් සිවුරු පොරෝනා නියාව ත් තුමූ ම දනිති. හිස කැපූයේ ය' යි කියා ලා බණන්ට ත් තමන්ගේ ම මිනිබිරියන්ට තර මැ' යි කී සේක. විශාඛාවෝ දෙ පක්‍ෂ ය ම බාල හෙයින් බාල නම ත් ගිවිස්වා ලිය නො හෙති. මිනිපිරියනු ත් ගිවිස්සා ලිය නො හෙති. එ වේලාට තෙරුන් වහන් සේ අවුත් මෙ කිම් දෑ' යි විචාරා එ පවත අසා දැන බාල නමට අවවාද කරණ සේක් 'ඇවැත්නි, නො දෙඩව. හිස කේ කපා පියා පවුල් පෙරව ගෙණ මැටි කබලක් හැර ගෙණ දොර දොර සිඟා කා ඇවිදිනා කල තෙල තරම් බිණීමු ත් බිණීම් ද? ඉවසව' යි වදළ සේක. 'එ සේ ය, ස්වාමීනි, තෙල තරමෙක මට බැණ ලූ තැනැත්තවුන්ට කුමකු ත් නො කියා මුඹ වහන් සේ ත් මට ම දොඩන සේක් ද? උන් බිණුයේ බිණුයේ ම දෑ' යි කී සේක. තෙරුන් වහන්සේ ත් විශාඛාවනු ත් බාල නමගේ අදහස් දන්ට නුවූයේ ය.

එ වේලාවට බුදුහු ත් එ තැනට වැඩ මෙ කිම් දෑ යි විශාඛාවන් විචාළ සේක් 'විශාඛාවෝ එ පවත් දැන්වූ' ය. බුදුහු ත් ඒ බාල නම සෝවන් වන්ට කළ පින් ඇති නියාව දැන යහපත් දෙයක් ලබන්ට නිසි දරු කෙණකුන් නපුරු දෙයක ඇවිටි කරණ කල ඒ ඇවිටි හරවන්නා සේ ම 'මූ මට නැමී ලුව මනා වෙයි' සිතා විශාඛාවන්ට 'කුමක් ද, විශාඛාවෙනි, තොපගේ මිනිබිරිය හිස කේ කපා පී පමණකට, පවුල් පෙරවී පමණකට, පාත්‍රයෙන් සිඟා කන පමණකට, තෙල ලෙස බිණිය හැකි ද? මහණ සරුප් නො වන හෙයින් හිස කෙමෙ නො කපන්නෝ ත් කෙ සේ ද? නො කපා කළ සිවුරට චෞරොපද්‍රව ඇති හෙයින් කපා කළ සිවුරු නොවළ—දින්නේ ත් කෙ සේ ද? පාත්‍රවලින් සිඟා කැම ත් කුල නියා ද? තොපගේ මිනිබිරියන් එ ලෙස කියන්ට වී කාරණ කවරේ දෑ' යි වදළ සේක. බාල නම ද දෝ ත් මුදුනේ තබා ගෙන 'ස්වාමීනි, මිනිසුන්ගේ තරම් පදම් අපගේ උපාද්ධ්‍යායයන් වහන්සේ හා විශාඛාවන් ම දනු ත් මුත් මුඹ වහන්සේට හැමගේ දෑ' යි කී සේක.

*Non-Commercial Distribution*

බුදුහු ත් බාල නම තමන් වහන්සේට නැමුණු නියා ව දන බණ වදරන සේක් 'යම් අකුසලයක් නරකාදියෙහි උපදවා දුක් විඳිමෙන් හා නො එක් ලෙසින් හීන ලෙසට පමුණුවා නම් එසේ වූ හීන තරමේ නො පවත්නේ ය. පමා වීම නම් සසරින් නො මිදී මට ම කාරණ හෙයින් ප්‍රමාද ව ත් නො විසි ය යුතු ය. සම්‍යක් දෘෂ්ටියට විරුද්ධ මිථ්‍යා දෘෂ්ටිය ත් දිගවියත්හුගේ බැයා මිථ්‍යා-දෘෂ්ටි බලයෙන් බුද්ධාන්තර සූ සැටක් නරක දුක් ගත් හෙයින් නො ගන්නේ ය. යමෙක් මිසදිටු ගෙන වෙසෙත් නම් සසර දික් වන හෙයින් ලොව වඩන්නා නම් වෙති. එ ලෙස නො වඩා ශීල සමාධ්‍යාදි ගුණ වඩන්නේ ය' යි වදාළ සේක. දෙශනා කෙළවර කුඩා සිහිත්ති ය කියා ලූ බසට මුසුප්පු වූ වහන්දෑ නම බුදුන්ගේ බසට සතුටු ව එකඟ සිතින් බණ අසා සෝවාන් වූ සේක. සෙසු ත් බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් සත්පුරුෂයන් විසින් හීන වූ අකුශලයෙහි නො හැසිර උතුම් වූ කුසලයෙහි හැසිර සගමොක් සිද්ධ කටයුතු.

---

## 149. සුදෙවුන් මහ රජ්ජුරුවන් ගේ වස්තුව

තව ද කත් පුඩුවලින්[1] විහාරවල ගෙන්නවා වළඳන්නාට ත් වඩා එක් විසි අන්වෙෂණයන් හැර භික්ෂාටන වශයෙන් පාත්‍ර පයර්‍යාපන්නය ම උතුම් නියාව හඟවන්ට සුදෙවුන් මහ රජ්ජුරු-වන් ගේ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්—

බුදුහු බුදු ව ලා පළමු ගමනින් කිඹුල් වත් නුවරට ගොසින් නිග්‍රොධාරාමයට වැඩ නෑ කමින් හා වයසින් මුකුරා සිටි නියාවට නො වඳුමහ' යි සිතා හුන් නෑයන්ගේ මත් බිඳිනා නිසා ගුණෙන් උසස් ලෙසට අහස්හි රුවන් සක්මන් මවා එහි සක්මන් කොට බණ වදාළ සේක. නෑයෝ ත් පැහැද සුද්ධොදන රජ්ජුරුවන් පටන් හැම දෙන ම වැන්දහ. එක් ලක්ෂ යැට දහසක් නෑයන් රැස් වූ තන්හි පොකුරු වැස්සෙක් වට. පොකුරු වැසි නම් තෙමෙනු කැමැත්තවුන් තෙමෙන හෙයින් හා තෙමෙනු නො කැමැත්තවුන් ඇඟ පොද නො වැකී නෙළුම් පත්වල වට වැසි සේ නො තෙමෙන හෙයින් හෝ ය, නොහොත් නෙළුම් පතක් සා වැසි වලාවක් ඇති ව ලා ක්‍රම ක්‍රමයෙන් මහත් ව වස්නා වැසි ය.

---

1. කත්පිඩුවලින් – ඇතැම

Non-Commercial Distribution

ඒ අරහයා කථා උපන් කල්හි 'මහණෙනි, මේ පොකුරු වැස්ස මෙ තෙක් නෑයන් රැස් වූ තැන වටුයේ දූන් මතු නො වෙයි.

යට ගිය දවස සඳ මහ රජ්ජුරුවන් හා ඵුසති බිසොවුන් හා වෙස්සන්තර රජ්ජුරුවන් හා මද්‍රී බිසොවුන් හා ජාලිය කුමාරයන් හා කෘෂ්ණජිනාවන් හා හිමවත වක් ගල් කුසට එක් තැන් වූ කල්හි දු පොකුරු වැසි වට'යි වදරා වෙස්සන්තර ජාතක ය වදාළ සේක. බණ අසා යන එක් ලක්‍ෂ සැට දහසක් විතර නෑයන් අතුරෙන් එක ද කෙණෙකු ත් ඔවුනොවුන් අත් බලා දෝ නො හොත් ආදි දවස් සුංදවුන් මහ රජාණන්ට නිල වුව මනා හෙයින් දෝ ආරාධනා නො කළහ. රජ්ජුරුවෝ ද 'ම පුතණුවන් වහන්සේ මාගේ ගෙට නො වැඩ අනික් කොයි වඩනා සේක් දෑ'යි ආරාධනා නො කොට ම ගියහ. ගොසින් විසි දහසක් රහතන්ට ත් බුදුන් ට ත් කැඳ අවුළු පත් ආදි ය සපයා ලා හසුන් පනවා ලූ ය.

දෙවන දවස් බුදුහු සිහා වඩනා සේක් 'කුමක් දෝ? පූර්ව බුද්ධවරයෝ පිය රජුන්ගේ නුවරට ගොසින් ඉඳුරා ම පිය රජ්ජුරුවන්ගේ ගෙට ම සිහා යෙත් දෝ නොහොත් ගෙ පිළිවෙළින් සිඟූ දෝ හෝ'යි බලන සේක්- ගෙ පිළිවෙළින් සිඟු නියාව දැක නුවර පළමු ගෙයි පටන් සිඟ සිහා නික්මුණු සේක. ඒ පවත රජ්ජුරුවන්ට කිවු ය. රජ්ජුරුවෝ සළු ව එකතින් ගෙන වහ වහා අවුදින් බුදුන් වැඳ ලා 'හැයි පුතණුවන් වහන්ස මා කුමක් නිසා නසන සේක් ද? මට මුඹ වහන්සේ සිඟීම නිසා ලජ්ජා බලවත. විසි දහසක් රහතන්ට තබා විසි ලක්‍ෂයක් රහතන්ට ත් මා දන් දී ලිය නො හෙතො ත් මුත් මාගේ ප්‍රභු ශක්ති ය ඇති කල මෙ ලෙස කෙළේ හැයි ද? මෙ ම නුවර රන් සිවි ගෙවල් ආදීන් ඇවිද බුදු ව පින් ගෙවුනා සෙ දූන් සිහා ඇවිදීම යුක්ත ද? මට මෙ සේ ම ලජ්ජාව උපදවා පූයේ හැයි දෑ'යි කිවු ය. 'මහ රජ, තොපට ලජ්ජාව උපදවන්ට නො වෙයි. මාගේ කුල පරම්පරාව පවත්වමී' වදාළ සේක. 'කුමක් ද, පුතණුවන් වහන්ස, අපගේ කුල පරම්පරාවෙහි සිහා කන්නවුන් ඇති නියා දෑ'යි විචාළෝ ය.

'මහ රජ, මේ කුල පරම්පරාව තොපගේ නො වෙයි. මාගේ කුල පරම්පරාව ය. නො එක් දහස් ගණන් බුදුවරහු සිහා ම ජීවත් වූ හ'යි වදරා බණ වදරන සේක් සිහා නො ගොසින් දන් ගෙනෙන තෙක් විහාරයේ ම රැක හිඳීම යුක්ත නො වන හෙයින් ගෙ පිළිවෙළින් සිහා ලබන ආහාරයෙහි නො පමා වන්නේ ය.

Non-Commercial Distribution

කුහන-ලපනාදී වූ මිථ්‍යාජීව ය හැර සුචරිත ධර්මයෙහි දෝ හෝ නොහොත් දවස දවස සිඟීමෙහි හැසිරෙන්නේ ය. මෙ ලෙස පවත්නෝ මෙ ලොව ත් පර ලොව ත් සුව සේ දවස් යවද්ද, හැසිල් ලෙක වුව ත් භික්‍ෂාචාර සඞ්ඛ්‍යාත කුශල ධර්මයෙහි ම හැසිරෙන් නාහ. වෙසියාදී අගෝචරයෙහි නො හැසිරෙති. මෙ ලෙස කළ කෙණෙක් ඇත් නම් උඟු මෙ ලොව ත් සුව සේ දවස් යවති උන්ට මෙ ලොව ත් ධර්ම ජීවිකාව හෙයින් හානි නැත. පිළිවෙත් නිසා සිඟන සිඟමන් හෙයින් පර ලොව ත් හානි නැතැ'යි වදළ සේක. දෙශනා කෙළවර රජ්ජුරුවෝ ලබන්නා වූ ධර්ම සංග්‍රහ ය ක්‍රම ක්‍රම යෙන් ලබන්නා සෙ සෝවාන් වූහ. එ තැනට තව ත් පැමිණියෝ ලොවී ලොවුතුරා සැපතින් නො සිස් වූ හ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් පිණ්ඩචාරික භික්ෂූන් භික්‍ෂාටනයෙහි නො පමා වන සේ කුසලයෙහි නො පමා ව ලොවී ලොවුතුරා සැප ත් සිද්ධ කට යුතු.

## 150. පන්සියක් දෙනාවහන්සේගේ වස්තුව

තව ද භාවනාභියොග ය යහපත් නියාව දක්වන්ට වඩනා ලද වීර්‍ය්‍ය ඇති පන්සියක් දෙනා වහන්සේ ගේ වස්තුව කියමු.

කෙ සේ ද යත්—

ඒ වහන්දෑ ද බුදුන් ගෙන් කමටහන් ඉගෙන වලට පලා ගොසින් වීර්‍ය්‍ය කොට ත් ගුණ විශෙෂයක් ලද මනා අවධිය තව නො ආ හෙයින් ලද නො හී කමටහන ඉඳුරා විචාරා ගනුමහ'යි බුදුන් ලඟට වඩනා සේක් අතුරු මඟ දී මහ අවුවෙහි පෙනෙන මිරිඟු බලා 'මෙ තෙමේ මෙ සේ පෙණෙන පමණක් මුත් ගිය ගිය සේ ඇති දෙයෙක් නො වෙයි. එ හෙයින් පෙනෙන බව මුත් නැති හෙයින් අනිත්‍ය ය යනාදීන් භාවනා කෙරෙමින් එන සේක. ඒ වහන්දෑ විහාරයට ආ කලට වැස්සෙක් වට. ඒ වහන්දෑ ත් ඒ ඒ පෙර මාල්වල සිට ධාරා වේගයෙන් නැඟී ලා බිඳෙන දිය බුබුළු ත් දැක 'මේ අත් බැව ත් උපදවා ලා බිඳීමෙන් මේ දිය බුබුළු හා ම සරි ය'යි ආදි සුභ කොට කැවවුන් පසු ව එවා ලා මදක් කා සාය යපෙන්නා සේ එයි ත් භාවනාවට අරමුණු කළ සේක.

බුදුහු ගඳ කිළියේ වැඩ හිඳ ම ඒ වහන්දෑ දැක රස් විහිදුවා ලා ළඟා වැඩ උන්නා සේ ව ලා බණ වදරන සේක් 'මහණෙනි, දිය බුබුළු දැක යම් ආකාරයකින් අනිත්‍යතා වටහා ගත් ද, නැවත

Non-Commercial Distribution

මිරිඟු දෝ නොහොත් ගෙවල් ආදි ලෙසින් සිටියා වූ ඉන්ද්‍රජාල ළඟට ගිය ගිය පමණින් ඇති දෙයක් නො වන හෙයින් නැති නියාව දනිත් ද, එ මෙන් සත්ත්ව සන්තාන ත් අනිත්‍යාදි වශයෙන් දක්නවුන් මරණ තෙමේ දැක ගත නො හෙයි. උන්ට මරණ නැති හෙයිනැ'යි වදාළ සේක. දේශනා කෙළවර ඒ පන් සියයක් දෙනා වහන්සේ පාරණයක්[1]ම ලදින් කා බඩ පුරන්නා සේ නිවන් රසින් සිත් පුරා සිටි තැන ම සිට රහත් ව සසර ගමනින් රදා ගිය සේක.

එ හෙයින් සත් පුරුෂයන් විසින් දිය බුබුළු නො තර ලෙසින් හා මිරිඟු නැති ලෙසින් සිතට වටහා පිහිට කොට ගත් පන් සියක් දෙනා වහන්සේ මෙන් සම්පත් අස්ථිර නියාව ත් ඊට වඩා ජීවිත ය අස්ථිර නියාව ත් දැන නො තර දෙයක් දී පියා තර දෙයක් හැර ගන්නා සේ අස්ථිර වූ සම්පත් දන් දී තර වූ නිවන් සාධා ගත යුතු.

## 151. අභයරාජ කුමාරයන් ගේ වස්තුව

තව ද ජීවිතයෙහි නො තර බව හඟවනු නිසා අභයරාජ කුමාරයන් ගේ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්—

අභය රාජ කුමාරයන් පසල් දනවුව සන්හිඳුවා ලා ආ දවසෙක පියාණෝ බිම්සර මහරජහු සමාධි ව නැටීමෙහි-ගී කීමෙහි දක්ෂ වූ ස්ත්‍රියක ත් පාවා දී ලා සත් දවසකට රාජ්‍යය ත් දුන්හ. අභයරාජ කුමාරයෝ ද ගෙන් පිටත් නො ව සති ය මුළුල්ලේ රජ සිරි විඳ ලා අට වැනි දවස් ගඟට ගොසින් නහා පියා උයනට වැද සන්තති ඇමැත්තාණන් මෙන් රජ්පුරුවන් ගෙන් පාවා දුන් ස්ත්‍රියගේ නැටුමු ත් බල බලා ගී ත් අස අසා උන්හ. ඒ ස්ත්‍රී ද ඒ ඇසිල්ලෙහි සන්තති ඇමැත්තාණන්ගේ ස්ත්‍රිය මෙන් රුජා වක් පැහැර ලා මළහ. අභය රාජ කුමාරයෝ ද උන් මළ හෙයින් බලවත් ශොක ඇති ව මට මේ උපන් ශොක ය බුදුන් විනා අනික් හරවා ලිය හෙන කෙණෙක් නැතැ'යි බුදුන් කරා එළඹ 'ස්වාමීනි, මට බලවත් ශොකයෙක් ඇත. මුඹ වහන්සේ නිශ්ශොකයා සේ ම මා ත් නිශ්ශොක කළ මැනැවැ'යි කිවු ය.

බුදුහු උන් අස්වසා ලා කුමාරයෙනි, තොප මෙ ම තැනැත්තිය මළ කල හඬා ඇසින් වගුළ කඳුළු විවට්ට සාගරයෙහි හෙවත් කල්ප විනාශ කාලයෙහි පාන අජටාකාශයෙහි පටන් උඩින්

1. පුරාණයක් - ඇතැම්.

Non-Commercial Distribution

නො නට බඹ ලොව දක්වා කෙළ ලක්ෂයක් සක් වළ වල් ඇතු ළත පැවති මුද පැනට ත් වඩා බොහෝ ව'යි වදරා ශොක ය තුනී නියාව දන 'කුමාරයෙනි, ශොක නො කරව'යි කියා බණ වදරන සේක් 'කුමාරයෙනි, යම් අත් බැවක් නිසා නුවණ නැත්තෝ සසර ලැසි ගනිද්ද, එ ම අත් බැව නුවණැත්තවුන්ට ඇලුම් නැද්ද, රථාලඞ්කාරයෙන් විසිතුරු රථයන් මෙන් ස්කන්ධයන් පස් දෙනා ගේ හා ආයතනයන් දෙලොස් දෙනාගේ හා ධාතුන් අට ලොස් දෙනාගේ වශයෙන් විසිතුරු වූ මේ අත් බැව නිත්‍යාදි වශයෙන් නො සලකා අනිත්‍යාදි විසින් සලකා ශොක තුනී කරව'යි වදළ සේක. දෙශනා කෙළවර අභය රාජ කුමාරයෝ සෝවාන් වූහ. ආදී කී බොධි රාජ කුමාරයන් වෙන ම රාජ කුමාර කෙණකු-නැ යි දත යුතු. සෙසු ත් බොහෝ දෙනාට මේ දෙශනාව සප්‍රයෝජන විය.

එ හෙයින් නුවණැත්තවුන් විසින් යම් සේ පැන් පිරුණු සැළෙක් නො සැලේ ද, එ පරිද්දෙන් පිරුණු ගුණ ඇති බැවින් කුමකට ත් නො සැලී, තව ද යම් සේ රත් කළ යකඩෙක් තළා පැන පොවා ලූ කලට පවතී ද, එ මෙන් පින් කම හැසිරීමෙන් තමාගේ ගුණ පවත්වා තව ද යම් සේ රත් කළ යකඩ වරෙක පොවා ලූ පැන් නො වමාරා ද, එ මෙන් තුනුරුවන් විෂයෙහි එක විටෙ ක ත් පැවති ප්‍රසාද ය නැති නො කොට චිත්තප්‍රසාද ය මුල් ව ඇති වූ ශ්‍රද්ධාවෙන් කුශල් සිත් එළවා කුසලයෙහි හැසිර නිවන් සාධා ගත යුතු.

# 152. සම්මුඤ්ජනී තෙරුන් වහන්සේ ගේ වස්තුව

තව ද පරීක්ෂාකාරී ව සලකා කරණ දෙයක් මුත් නො සලකා කිරීමෙහි නපුර හඟවන්ට සම්මුඤ්ජනී තෙරුන් වහන්සේ ගේ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්—

ඒ තෙරුන් වහන්සේ උදසන වුව ත් සවස වුව ත් මේ හම දනා වේලා ය යි නියමයක් නැති ව සිහා වඩනා ගමනෙක් නැත් නම් උදසන පටන් වළඳනා තුරු ත් වළඳා අන්තයෙහි පටන් සවස් වේලා වන තුරු ත් ඒ ඒ තැන් හැමඳ ඇවිදිනා සේක. උන් වහන්සේ එක් දවසක් හමදනා මුස්න හැර ගෙන රෙවත තෙරුන්

Non-Commercial Distribution

වහන්සේ කරා ගොසින් 'මූ මහා කුසී කෙණෙක, සැදෑ ඇත්තවුන් දී ලූ දෙය වළඳා ලා දවල් දවස් වැද හිඳිති. රෑ දවස් නිඳති. මෙ ලෙස කරන්නවුන් එක් වේලෙක වුව ත් මුස්න හැර ගෙණ මළු කඩක් පමණ හැමදි කල නපුරු දෑ'යි කී සේක. උන්වහන්සේ තමන් වහන්සේ කමසේ නැති ව භාවනා නමැති මුස්නෙන් හැමද හළ මනා කෙලෙස් කසළ හැමද නිමි හෙයිනු ත් මළු හමදනා වේලෙක මුත් සෙසු වේලේ හැමදීම යුක්ත නො වන හෙයිනු ත් මළු හැමදීමෙහි ම නියුක්ත ව කෙලෙස් කසළ හැමදීමට උත්සාහයක් මඳ තෙරුන් වහන්සේට අවවාද කරනු නිසා 'මෙ සේ අව මැනව'යි කැඳවා ලා ලඟට ගිය කලට නා පියා එන්ට වදළ සේක.

උන් වහන්සේ ත් නා පියා වැඩි සේක. ඉක් බිත්තෙන් රෙවත තෙරුන් වහන්සේ හමදනා තෙරුන් වහන්සේ එක ත් පසෙක හිඳුවා ලා 'හෙම්බා ඇවැත්නි, වත් පිළිවෙත් කරම්හ'යි කියා ලා හැම වේලේ ම මළු හැමද ඇවිදිනා කලට කෙලෙස් කසළ හමදින්ට වේලා කවරේ ද? උදසන ම හමදනා තැනක් හැමද පියා සිඟා වළඳා අවුත් රෑ වසන තැන හෝ දවල් වසන තැන හෝ හිඳ දෙ තිස් කුණු කොටස් පිළිකුල් විසින් සලකා සවස් වේලේ නැඟී සිට හැමද මැනව. හැමදුම්හ යි කියා ලා තම හට පිහිටක් නො කළ මනා දැ'යි කී සේක.

උන් වහන්සේ ද රෙවත තෙරුන් වහන්සේගේ අවවාදයෙහි පිහිටා මළු හැමදීම විතරක් මුත් බොහෝ නො කොට විෂ්කම්භන වශයෙන් හළ මනා කෙලෙස් කසළ සමථ භාවනා නැමැති හිරට මුස්නෙන් හැමද හැර සමුච්ඡෙද වශයෙන් හළ මනා කසල විවසුන් නමැති කොළ මුස්නෙන් හැමද මාර්‍ගඥාන නමැති අතින් හැර ගෙණ දමා ඵල ඥාන නැමැති පැනින් අත සෝධා, නො බෝ කල කින් රහත් වූ සේක. මෙ තෙක් දවස් නො කමසේ ව හමදනා තැන් හැමදීම නැති ව කසළ විය. කෙලෙස් කසළ නැති වී මෙන් සිත් සතන් පිරිසුදු වි ය. වහන්දෑ ද, 'ඇවැත්නි, හැමන්ද මනා මළු මං පෙත් ඉතා ම කසළ ව තිබෙයි. නො හමදන්නේ කුමක් නිසා දැ'යි කී සේක. ඔබ ඒ අසා 'ආදි පමා හෙයින් හැමද ඇවිද්දම්හ. දැන් නො පමා හෙයින් නො හමදුම්හ'යි කී සේක. වහන්දෑ ද මූ තුමූ තමන් රහත් නියාවක් හඟවති' බුදුන්ට දැන් වූ සේක.

බුදුහු ත් එ ම සාධන සේක් 'මහණෙනි, ම පුත් පෙර තමා පමා සමයෙහි හැමද ඇවිද්දේ ය. දැන් තමා නො පමා හෙයින් එල

Non-Commercial Distribution

සමවත් සුවයෙන් දවස් යවන හෙයින් හමුදනා අවසර නැති හෙයින් නො හමුදි'යි වදරා බණ වදරන සේක් 'යම් කෙණෙක් පෙර වත් පිළිවෙත් කිරීමෙන් හෝ හැදෑරීමෙන් හෝ පිරිවීමෙන් හෝ පමා ව පසු ව ඵල සමවත් සුවයෙන් දවස් යැවීමෙන් නො පමාවෝ ද උ තුමූ පඤ්චොපක්ලෙශයෙන් විනිර්මුක්ත වූ සඳ එක විට දිවයින් තුනක් බබුළුවන්නාක් මෙන් ස්කන්ධාදිවූ ලොව බබුළුවතී 'වදළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් යම් සේ කුඩ ය කවුරුන්ට වුව ත් මුදුන් ව හැසිරේ ද, එ මෙන් ගුණෙන් උස් ව, තව ද යම් සේ කුඩ ය වැස්සෙන් හා අවුවෙන් වන පීඩා ව දුරු කෙරේ ද එ මෙන් කෙලෙස් පීඩා තදඞ්ගාදී විමුක්ති නමැති සේසතින් වළහා නිවන් පුර වුන යහපති.

# 153. අඟුල්මල් තෙරුන් වහන්සේ ගේ වස්තුව

තව ද කළ පාප ය කෘත පුණ්‍යයන්ට පිණින් වැසෙන නියාව හඟවන්නමෝ අඟුල් මල් තෙරුන් වහන්සේ ගේ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්—

උන් වහන්සේගේ උත්පත්ති කථාව අඞ්ගුලිමාල සූත්‍රයෙන් අසා දතයුතු. උන් වහන්සේ බුදුන් ලඟ මහණ ව රහත් වූ සේක. රහත් වූ අඟුල් මල් තෙරුන් වහන්සේ 'යම් කෙණෙක් පෙර පමා වත් පසු ව නො පමා වූ නම් සඳ පරිද්දෙන් උ මෙලොව බබළ වතී' යනාදීන් උදන් අනා පිරිනිවි කල්හි 'ඇවැත්නි, අඟුල්මල් තෙරහු කොයි උපන්නු දැ'යි ධම් සෙබෙහි කථාව ඉපැද වූ සේක. ධම් සභයට වැඩි බුදුහු මේ කථාව අසා වදරා 'මහණෙනි, ම පුත්තු පිරිනිවියහ'යි වදළ සේක. 'ස්වාමීනි, මිනී මැරීම ත් එක් පිණක් සේ ම තෙක් මිනී මරා පියා පිරිනිවී නියා ද? එ සේ කලට, රහත් නොවන තැනක් නැති නියාවතැ'යි විචාළ සේක. 'එ සේ ය, මහණෙනි, උ පෙර කල්‍යාණ මිත්‍ර කෙණකුන් නො ලදින් මෙ තෙක් පව් කළහ. කල්‍යාණ මිත්‍ර කෙණකුන් සම්බ වීම ත් එ බඳු පින් ඇති කෙණකුට ය. දුන් කල්‍යාණ මිත්‍ර සමවා-යෙන් නො පමා වූයේ ය. එ හෙයින් ඒ කළ පාපය පිණින් වැසී තැ'යි වදරා බණ වදරන සේක් 'පඤ්චානන්තරිය කර්‍මය හැර සෙසු පාප ය යම් කෙණකුන්ට ආර්‍ය මාර්ග කුශලයෙන් වැසේ ද, උ තුමූ රහත්මගින් මොහඳුරු සියලු ලෙසින් නැසූ හෙයින් මේ

Non-Commercial Distribution

ස්කන්ධාදී වූ ලොව බබළවති' වදාළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් නො දන්නා අවස්ථාවෙහි පව හැසුරුණ ත් පින් කොට එයින් වඩා නිවන් දක්මෙන් සිද්ධ වූ කුසල් අකුසල් දෙක ම වදට බෙහෙත් දුන්නා සේ වද කරන්ට උත්සාහ කටයුතු.

---

## 154. පෙහෙර දුවණියන් ගේ වත

තව ද මරණ සී භාවනාවෙහි අනුසස් දක්වන්නමෝ පෙහෙර-දුවණියන් ගේ වත දක්වමූ.

කෙ සේ ද යත්—

එක් දවසක් අළවු නුවර ඇත්තෝ බුදුන් අළවු නුවරට වැඩි කල්හි ආරාධනා කොට දන් දුන්හ. බුදුහු වළඳා අන්තයෙහි අනුමෙවෙනි බණ වදරණ සේක් 'ජීවිත ය අස්ථිරය ය. මරණ ය නියතය ය. ජීවිත ය නම් මරණ කෙළවර කොට ඇත්තේ ය එහෙයින් මරණ සී භාවනා කරව. යම් කෙණකුන් මරණ සී භාවනා නැත් නම් උඹ කෙළවර අවස්ථාවේ දී සර්පයන් දැක බින්නවුන් මෙන් මරණව බා මුර ගා හඬමින් මියති. යම් කෙණකුන් මරණසී භාවනා හැවු නම් උඹ සර්පයන් දුර දී ම දැක දණ්ඩෙන් ඔබා ගෙන, බද ගෙන, දුරට දමා පියා සිටියවුන් මෙන් මියන වේලේත් මරණ භය නමැති සර්පයන් දුර තබා ම මරණ සී නමැති දණ්ඩෙන් ඔබා ගෙන දමා පී හෙයින් නො බිති. එ හෙයින් මරණ සී භාවනාව හැවිය යුතු ය'යි වදාළ සේක. සෙස්සෝ බණ අසා ලා මරණ සී භාවනාව කුම් වුව ත් තමන් තමන් කළ මනා දෙය කරන්ට එළී ගත්හ එක් සොළොස් හැවිරිදි පෙහෙර දුවක් බුදුවරුන් වහන්සේ නම් අවැඩට නිස්සක් නො වදරණ සේක. මරණ සී භාවනා මම ත් කෙළෙම් නම් යහපතැ'යි රෑ ත් දවාල ත් මරණ සී භාවනා ම කෙරෙති බුදුන් එයින් නික්ම දෙවුරමට වැඩි සේක. ඒ කුමාරි-කාවෝ ද තුන් අවුරුද්දක් මරණ සී භාවනා ම කළහ.

එක් දවසක් බුදුහු අලුයම් වේලේ ලොව බලන සේක් ඒ පෙහෙර දුව තමන් වහන්සේගේ නුවණ දැළට හසු වූ නියාව දැන ඒ කුමාරිකාවට වන ප්‍රයෝජන කවරේ දෝ හෝ යි සලකන සේක් 'මේ කුමාරිකාවෝ මාගේ බණ ඇසූ තැන් පටන් තුන් හවුරුද්දක් මරණ සී භාවනා හැවුව. දැන් මම ඔබ ගොසින් ප්‍රශ්න සතරක් විචාරා උන් විසඳූ කලට සතර තැනක දී සාධුකාර

Non-Commercial Distribution

දී ගාථාවක් කියමි. ගාථා කෙළවර දී ඕ තොමෝ සෝවාන් වෙයි. ඒ කුල දුව නිසා බොහෝ දෙනාට ප්‍රයෝජන වෙයි' දැක පන් සියක් දෙනා වහන්සේ පිරිවරා දෙව්රමින් නික්ම පිළිවෙළින් අග්ගාලව නම් වෙහෙරට වැඩි සේක. අළවු නුවර ඇත්තෝ බුදුහු වැඩි සේකැ'යි අසා වෙහෙරට ගොසින් ආරාධනා කළහ. සොළොස් හැවිරිදි පෙහෙර දුව බුදුන් වැඩි නියාව අසා 'මාගේ පියාණන් වහන්සේ, මාගේ ස්වාමි දරුවන් වහන්සේ, පුන් සඳක් වැනි මුහුණක් හැර ගෙන වැඩි සේක් ල'යි සතුටු ව 'මෙ තැනට තුන් අවුරුද්දකින් යට රන් වන් බුදුන් දුටු පමණෙක. දැන් වූ කලී බුදුන්ගේ රන්වන් වූ සුගන්ධ ශරීරය දක්නට ත් ලැබෙම්. මියුරු වූ බණ ත් අසමි' සිතූහ.

උන්ගේ පියාණෝ ද හලට යන්නෝ 'පුත, අනුන් සන්තක කඩක් වියන්ට අල්වා ලීමි. විය ගෙන ගොසින් වියතක් විතර තුබූයේ ය, අද ඒ වියත නිමවන්ට ය. වහා දඬු අඹරා ගෙන ව'යි කිවූය. කුමාරිකාවෝ ද 'මම බුදුන්ගෙන් බණ අසනු කැමැත් තෙමි. පියාණන්දැ ත් මෙ ලෙස කියන දැ ය. කුමක් දෝ ? ගොසින් බණ අසම් දෝ දඬු අඹරා ගෙන යෙම් දෝ හෝ'යි සිතන්නවුන්ට මෙ සේ වූ අදහසෙක් වි ය. 'දඬු අඹරා නො ගෙන ගියො ත් පියාණන් වහන්සේ මා මරණ සේක. එ හෙයින් දඬු අඹරා ගෙන ගොස් දී ලා පසු ව ගොස් බණ අසමී' සිතා පුටුවෙහි හිඳ දඬු ඇඹරූ ය. අළවු නුවර ඇත්තෝ ද බුදුන් වළඳවා ලා අනුමෙවෙනි බණට ආරාධනා කළහ. බුදුහු 'මම යම් කුමාරිකා කෙණකුන් තකා දෙළොස් ගවුවක් ගෙවා ආම් නම් අද ත් තව උන්ට අවසරයක් නො පෙනෙයි. උන් අවසරයක් ලත් විට අනුමෙවෙනි බණ කියමී' සිතා බැණ නො නැඟී හුන් සේක. බුදුන් බැණ නො නැඟී වැඩහුන් කලට දිව්‍ය-බ්‍රහ්මාදීන් අතුරෙන් කිසි කෙණකු ත් කිසිවක් කියා ලන්ට බල නැත්තෝ ය.

ඒ කුමාරිකාවෝ ද දඬු අඹරා පැස ලා ගෙන පියාණන් ළඟට යන්නාහු බුදු පිරිස් කෙළවරින් බුදුන් බල බලා ම යෙති. බුදුහු ත් කර ඔසවා ගෙන කුමාරිකාවන් දී හුණ බැලූ සේක. කුමාරිකාවෝ ද බලා වදළ ලෙසින් ම 'මෙ සා මහත් බුදු පිරිසක් බල බලා සිටිය දී ත් තෝරා ලා මා මුහුණ බලා වදරණ සේක් තමන් වහන්සේ ළඟට මා යනු කැමැති ව බැලූ සේකැ'යි දැන ලා දඬු අඹරා ලා ගත් පැස තබා ලා බුදුන් ළඟට ගියහ. බුදුහු කුමක් නිසා උන් මුහුණ බලා වදළ සේක් ද යත්- මෝ මුඹ නො අවුත් ගියා නම් තුන් අවුරුද්දක් මුළුල්ලෙහි කළ මරණ සී භාවනාවෙහි බලයෙන් මරණ භය නැත ත් පුහුදුන් ව මිය ගති නියම නැති වෙයි. මා ළඟට

Non-Commercial Distribution

අවුත් ගියේ නම් මාගේ බණ අසා සෝවාන් ව නියත ගතික ව අද දවස් මරණ නියත ම බැවින් තුසී පුරයෙහි උපද්දී' දැන වදාළ සේක. කුමාරිකාවෝ ද බලා වදාරන්නා ම බණවා ලූවා මෙන් බුදුන් ළඟට ගොසින් නිවන් ලබන්ට ආභරණ ලා සැර සෙත කෙණකුන් මෙන් සවනක් රස් අතුරට වැද බුදු රසින් සැරහී ලා වැඳ එකත් පස් ව සිටියාහ.

එ තෙක් වේලා උපාසකවරුන් කුමක් කීව ත් බැණ නො නැඟි වැඩ හුන් බුදුහු කුමාරිකාවන් වැඳ ලා සිටිනා ම 'කුමාරිකා-වෙනි, කොයි සිට අවු දැ'යි විචාළ සේක. 'නො දනිමි ස්වාමීනි'යි කිවු ය. 'කොයි යවුදැ'යි විචාරා වදාළ සේක. 'ස්වාමීනි, කොයි යන බව ත් නො දනිමි'යි කිවු ය. 'නො දනුදැ'යි විචාළ සේක් 'දනිමි, ස්වාමීනි'යි කිවු ය. දනු දැ'යි විචාළ සේක්, 'නො දනිමි 'කිවු ය. මෙසේ බුදුහු 'කොයි සිට අවු ද? කොයි යවු ද? නො දනු ද? දනු ද? යන ප්‍රශ්න සතර විචාළ සේක. බොහෝ දෙන ඒ අසා ''තෙල පෙහෙර දුවගේ තරමක් බලව. බුදුන් ලඟ දී කටට ආ දෙයක් ම කියයි. හැයි, මෑ 'කොයි සිට අයි දැ'යි විචාළ කල 'සාලි ගෙයි සිට ය'යි කිය යුතු වේ ද? කොයි යවු දැ'යි විචාළ කල 'පිළී වියන හලට යෙමි'යි කිය යුතු වේ දැ''යි කිවු ය. බුදුහු ඒ අසා බොහෝ දෙන කරණ අරගල සන් හිඳුවා 'හැයි, කුමාරිකාව, කොයි සිට අවුදැ'යි විචාළ ගමනේ 'නො දනිමි'යි කීයේ කුමක් නිසා දැ''යි විචාළ සේක.

''ස්වාමීනි, මුඹ වහන්සේ කාලත්‍රයවර්ති වූ සියලු ධර්මයන් පරෝපදෙශ රහිත ව ස්වයම්භූඥානයෙන් කර තල කලිත කොල ඵල න්‍යායයෙන් දත් හෙයින් මා සාලි ගෙයි සිට ආ නියාව දන්නා සේක. කොයි සිට අවු දැ'යි විචාළේ නම් 'කොයින් චුත ව අවුත් මුඹ උපනුදැ'යි විචාරා වදාළ නියා ය. මා කොයින් අවුත් උපන් බව ත් නො දන්නා හෙයින් නො දනිමි'යි කීමි'' කිවු ය. බුදුහු ඒ අසා තමන් වහන්සේ විචාළේ ත් එ සේ ම සිතා හෙයින් විසඳා ලූ නියාව යහපත් හෙයින් සාධුකාර දෙවා වදරා 'වන්නාට එ සේ ම ය. 'කොයි යවු දැ'යි විචාළ ගමනේ 'කොයි යන බව ත් නො දනිමි' කියා කුමක් පිණිස කිවුදැ'යි විචාළ සේක. ස්වාමීනි, මුඹ වහන්සේ මා පැස හැර ගෙන හලට පිළී වියන තැනට යන නියාව දන්නා සේක. දැන දැන ත් 'කොයි යවු දැ'යි විචාළේ නම් 'මෙයින් සැව කොයි උපනුදැ'යි විචාළ නියා ය. මම ත් මිය ගොසින් උපදනා තැන් නො දන්නා බැවින් හලට යන නියාව දැනෙත ත් 'නො දනිමි කීමි' කිවු ය. යහපත, කුමාරිකාවෙනි,

Non-Commercial Distribution

මා විචාළ ලෙසට ම ය විසඳා ලූ යේ'යි දෙ වෙනි ව ත් සාධු කාර දෙවා වදරා "වන්නාට ය, එ යි ත් යහපත. 'නො දනු දැ' යි සාමාන්‍ය කොට විචාළ ගමනේ 'දනිමී' කියා කුමක් නිසා කිවු දැ' යි විචාළ සේක. ස්වාමීනි, මා උපන් නියාව ත් මියන නියාව ත් දනිමි. ඒ හෙයින් 'දනිමි කීමි' කිවු ය. බුදුහු ඊට ත් 'විචාළ ලෙසට ම විසඳා ලූ නියාව යහපතැ' යි සාධු කාර තුන් වැනි ව ත් දෙවා වදරා 'එයි ත් යහපත 'දනු දැ'යි මා විචාළ ගමනේ නො දනිමී කීයේ කුමක් නිසාදැ'යි විචාළ සේක.

"ස්වාමීනි, මා මියන පමණක් දන්නා බව මුත් රෑයෙක වේව යි, දවලෙක වේව යි' පෙර වරුවෙක වේව යි' පස් වරුවෙක වේව යි' මියෙමි යි වේලා නියම ය නො දන්නා හෙයින් 'නො දනිමි'යි කීමි''කිවු ය. බුදුහු 'මා විචාළ ලෙසට ම විසඳා ලූ නියාව යහපතැ'යි සතර වැනි ව ත් සාධු කාර දෙවා වදරා බුදු පිරිස් බණවා ලා 'තෙපි මෙ තෙක් දෙන අනුන්ට දෙඩන සේ උග ත් බව මුත් මා කියා ලූ දෙය සොළොස් හැවිරිදි කුමාරිකාව දත් ලෙස තෙපි හැම දෙනා ත් දත නුහුණුවා ද, දැන කියා ලූ කුමාරිකාවට නො දැන් මෙම් වැටී දෙඩූ බව වේ ද? යම් කෙණකුන්ට නුවණැස නැත් නම් ප්‍රසාද චක්ෂුසින් කම් නැත. ඌ අන්ධයෝ ම ය යම් කෙණකුන්ට නුවණැස ඇත් නම් ඇස් ඇත්තෝ නම් ඌ ම ය' යි වදරා බණ වදරන සේක් 'මේ ලෞකික ජනයෝ නුවණැස නැති හෙයින් දත යුතු වූ සියල්ලක් දක්නට නැති හෙයින් අන්ධයහ. යම් කෙණෙක් අනිත්‍යාදි වශයෙන් ති ලකුණු මෙනෙහි කෙරෙ ත් නම් ඌ මඳ වූ ය.

යම් සේ වටු දැල් දැමීමෙහි දක්ෂ වූ වටු වැද්දහු නො වරදනා ලෙස දැල් දමා ලූ කල කිසි කෙණෙක් දැලට හසු නොව සෙස්සෝ දැල ඇතුළට හසු වෙත් ද එ මෙන් මරහු නමැති වටු වැද්දහු තෘෂ්ණා නමැති දැල දමා ලූ කලට අපාය නමැති දැල් හස්සට බොහෝ දෙන සම්භ වෙති. සග-මොක් දෙකට සම්භව වන්නෝ මඳෙකැ'යි වදළ සේක. දෙශනා කෙළවර පෙහෙර කුමාරිකාවෝ 'මෙ විට කොයි යවු දැ'යි විචාළොත් 'ස්වර්ගයට යෙමී කියන්ට ශක්ති ඇති ව සෝවාන් වූහ. බොහෝ දෙන හටත් මේ දෙශනාව සාර්ථක විය.

උයි ත් දඬු පැස හැර ගෙණ පියාණන් පිළී වියන තැනට ගියහ. උයි ත් හිඳ ම නිදාපූ ය. කුමාරිකාවනු ත් නො සලකා පැස තබන ගමනේ පැස වෙම් කෙළවර වැද ගෙණ ලා ශබ්ද පැවැත්

Non-Commercial Distribution

වී ය. පේරාණෝ ද පිබිද ගොසින් ආදි තබා ලූ ලෙසින් ම වෙම ඇදලූ ය. වෙම කෙළවර ගොසින් එල්ල ව සිටි කුමාරිකාවන්ගේ ඇඟ තර ව ඇනිණ. උයි ත් එතැන ම මිය හුණ වූ ය. පියා—ණෝ ත් නැඟී බැලූ තැනැත්තෝ ඇඟ මුළුල්ල ලෙයෙන් තැවරී හොත්තවුන් දක බලවත් වූ ශොක ඇති වූ ය. උයි ත් බුදුන් ළඟට ගොසින් දුවණියන් මළ නියාව ත් ඒ නිසා ශොක බල-වත් වූ නියාව ත් කිවු ය. කියා ලා 'නිශ්ශොකී වූ ස්වාමි දරුවාණන් වහන්ස, මා ත් නිශ්ශොක කළ මැනැවැ'යි කිවු ය. බුදුහු ත් උන් අස්වසන සේක් 'තෙපි ශොක නො කරව. අක් මුල් නැති සසර සෙසු දරු කෙණකුන්ට නො ව මෙ ම දූම මළ කල යතාප ඇසින් වගුළ කඳුළු සතර මහ මුහුද පැනව ත් බොහෝ වෙ'යි වදරා අනමතග්ග සූත්‍ර ය වදළ සේක. උයි ත් ශොක තුනී ව ගොසින් බුදු සස්නෙහි මහණ ව මාලු පැවිද්ද ත් ලදින් නො බෝ කලකින් රහත් ව නිශ්ශොක වූහ.

එ හෙයින් සත් පුරුෂයන් විසින් පෙහෙර දුව මෙන් නුව—ණැසින් පර ලොව හය දක ඉන් මිදෙනු නිසා කුසලයෙහි හැසිර සග මොක් සැපත් සිද්ධ කරණු මැනවි.

---

## 155. තිසක් පමණ භික්ෂූන් වහන්සේ ගේ වස්තුව

තව ද තෙල ගලා තුබූ පාන් උදවුව ඇවිළෙන්නා සේ විවසුන් නමැති තෙල ගලා තුබූ සිත් නමැති පහන් කඩ මාගී ඥන නමැති පහන් ඇවිළ ගැන්ම උදවු නියාව කියන්ට තිසක් පමණ භික්ෂූන් වහන්සෙ ගේ වස්තුව කියමු.

කෙ සේ ද යත්—

එක් සමයෙක ඒ ඒ දිග වසන තිස් දෙනකුන් වහන්සේ බුදුන් කරා වැඩි සේක. අනඳ මහ තෙරුන් වහන්සේ ත් බුදුන්ට වත් පිළි වෙත් කරණ වෙලාට අවුත් ඒ වහන්දෑ 'දක බුදුන් මේ වහන්දෑ ලාභා කථා කොට වදළ කල්හි වත් පිළි වෙත් කරමි' සිතා ලා දෙරවුවේ ම වැඩ සිටි සේක. බුදුහු ත් ඒ වහන්දෑ ලාට සාධු සාමීචි කථා කොට බණ වදළ සේක. ඒ බණ අසා ලා ඒ වහන්දෑ ද කෙලෙස් කසළ හැර දමා රහත් ව අහසින් ගිය සේක. අනඳ මහ තෙරුන් වහන්සේ ඒ වහන්දෑ කල් යවන හෙයින් බුදුන් කරා එළඹ 'ස්වාමීනි. වහන්දෑ තිස්නමෙක් මුඹ ආ සේක් වේ ද? එන නියාව දුටු බව මුත් යන නියාවක් දුටුවෙ නැත. කොයි දැ'යි විචාළ සේක. 'ගියෝ ය. ආනන්‍දයෙනි, වදළ සේක. 'කවර මඟකින් ගිය සේක් දැ'යි විචාළ

Non-Commercial Distribution

කල්හි 'ආසිනැ'යි වදළ සේක. 'කුමක් ද, ස්වාමීනි, ඒ වහන්දෑ රහත් වූ නියා දැ'යි විචාළ සේක. 'එ සේ ය, ආනන්‍දයෙනි, දුන් මුඹ ආ ගමනේ මාගේ බණ අසා රහත් වූ හ'යි වදළ සේක.

එ වේලාට ම ආසින් හංසයෝ ත් ගියහ. බුදුහු එයි ත් මුල්-කොට ගෙන බණ වදරන සේක් 'යම් සේ මේ හංසයෝ තමන්ට ජාති සිද්ධ හෙයින් ආසින් යෙත් ද? එ මෙන් නුවණැත්තෝ ත් මරුන් පරදවා මෙ ලොවින් නික්මෙති' වදළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් සිත් නමැති කුඹුරුවල කුසල් නමැති බිජුවට වපුරන්ට සැදෑ නමැති පැන් මේයා ගන්නා නියායෙන් නුවණ නමැති ඇල ඇති ව, තව ද යම් සේ කුඹුරෙක් පැන් නො හැසිර රඳා තිබෙනු නිසා මීයර ඇති ව තිබේ ද? එමෙන් සැදෑ නමැති පැන් රඳා තිබෙන්ට සිල් නමැති මීයර ඇති ව කුශල් නමැති ගොයම් කොට ගෙන සග මොක් සැප ත් නමැති ශස්‍ය ඵල සෑදිය යුතු.

---

## 156. චිඤ්චමානවිකාවන් ගේ වස්තුව

තව ද නිරුපද්දව තැන් කෙරෙහි කළ උපද්දවයෙහි ආදීනව දක්වන්නමෝ චිඤ්චමානවිකාවන් ගේ වස්තුව කියමු.

කෙ සේ ද යත්—

බුදුන් බුදු වූ කලට සවුවන් වහන්සේ ත් බොහෝ ව බොහෝ දෙනාගේ නිවන් දැකීමු ත් ඇති ව නව අරහාදී බුදු ගුණ ත් ලොව පහළ කල්හි මුහුද මුව දෙරවල් හැ ම එක් තැනට වූවා සේ ලාභ සත්කාර බොහෝ කොට උපදින්ට වන. තීර්‍ත්‍ථකයෝ හිර නැගෙත් නැගෙත් කදෝපැණියන් වැනි වූ ය. හිර නැඟී කලට යම් සේ කණමැදිරියෝ නිෂ්ප්‍රභා වූ ද, එ සේ ම තීර්‍ත්‍ථක ජන නමැති කණමැදිරියෝ ත් සර්‍වඥ නමැති සූර්‍ය්‍යයා පහළ ව ශරීරාලොක -දෙශනාලොක පහළ කරත් කරත් ප්‍රසිද්ධ ශොභා නැති වූ හ. ලාභ සත්කාර නැති ව පියා බත් නො ලබන බලු මුළු උඩු බිරුම් බුරන්නා සේ වීථි ඇතුළ ඒ ඒ තැන සිට ගෙන 'කුමක් ද? තොප හැමට බුදුහු නම් මහණ ගොයුම්හු ද? අපි බුදු නො වමෝ ද? උන්ට දුන් දෙයෙහි ම විපාක බොහෝ ද? ගැනි ව ත් දරුවන් නැත්තා සේ අපට දුන් දෙයෙහි විපාක නැද් ද? මහණ ගොයුම් හට දුන් දෙයෙහි විපාක ඇත් නම් අපට දුන් දෙයෙහි ත් විපාක ඇත. අපට ත් දෙව. සත්කාර කරව'යි හඬ ගා මොර ගා ඇවිද ත්

Non-Commercial Distribution

ලාභ සත්කාර නො ලදින් තනි ව හිඳ 'කවර ලෙසකින් මහණ ගොයුම්හුගේ නුගුණයක් උපදවා ලාභ සත්කාර නැති කරමෝ දෝ හෝ'යි සිතූහ.

එ කල සැවත් නුවර චිඤ්චමානවිකා නම් වූ පරිබ්‍රාජිකා කෙණෙක් උතුම් රූ ධරති. දෙවඟනක් මෙන් ශරීරයෙන් රස් විහිද්දී එක් මන්ත්‍රී වූ තීර්ථකයෙක් 'චිඤ්චමානවිකාවන් මුල් ව මහණ ගොයුම් හට අයසක් උපදවම්හ'යි කී ය. ඌ හැම දෙන ත් 'එ ලෙස කරම්හ'යි ගිවිස්සෝ ය. ඉක් බිත්තෙන් චිඤ්චමානවිකා ද තීර්ථකාරාමයට ගොසින් වැඳ ලා සිටියා ය. තීර්ථකයෝ ඈ හා කථා නො කළහ. උයි ත් තමාගේ වැරැද්දක් ඇතැ'යි චකිත ව තුන් විටක් දක්වා ත් 'වඳිමි, ස්වාමීනි' කියා ත් උන්ගෙන් බසක් නො ලදින් තොමෝ ම කථා උපදවන්නී 'හැයි' ස්වාමීනි කථා නො කරන්ට මාගේ වරද කවරේ දැ'යි කිව. එ විට හැයි, පිරිවැජිය, මහණ ගොයුම්හු ලොව නළවා ගෙන අපට උපදනා ලාභ සත් කාර ත් තමන්ට ම නිල කරවා ගෙන අප නිෂ්ප්‍රභා කෙරෙමින් ඇවිදිනා නියාව නො දනු දැ'යි කිවූ ය. 'ස්වාමීනි, මම මෙ තෙක් දවස් නො දනිමි. අද දත්තෙම් වේ ද? මා ඊට කළ මනා කිම් දැ'යි කිවූ ය.

'ඉදින්, පිරිවැජිය, තෙපි අපට වැඩක් කැමැත්තාහු වූ නම් තොපගේ උපදෙසකින් මහණ ගොයුම්හට නුගුණයක් උපදවා ලා ලාභ සත්කාර ය වඩදිය වෙලාට ගඟදිය උඩු ගං බලා නැමුණා සේ ම අප කරා නම්වා ලව'යි කිවූ ය. පූරිසයෙක් මූත්‍ර ජලයෙන් ගැනුණා සේ කුණු අදහසින් එක් ව යහපතැ'යි ගිවිස 'මුසුප්පුනුව මැනැවැ'යි කියා ලා පලා ගොසින් නුවණ විෂයෙහි දන්ම නැත ත් ස්ත්‍රී මායමෙහි තමා දක්ෂ බැවින් එ තැන් පටන් සැවැත් නුවර ඇත්තවුන් රැ බණ අසා පියා විහාරයෙන් නික්මෙන වෙලාට රතිඳු ගොවුවකු සේ රත් වූ පිළී හන් පෙරව ගෙන සුවඳ මල් ආදී ය හැර ගෙණ දෙව්රම් වෙහෙර බලා යෙ යි.

'මෙ වෙලේ කොයි යවුදැ'යි විචාළ වුන්ට 'මා යන තැන් තෙපි විචාරා සිටියා ද? තොපට ඒ හැයි දැ'යි තමා සේ ම පවිටු අදහස් ඇත්තවුන්ට සැක උපදනා ලෙසට ගර්භ ගන්වා බස කියා ලා දෙව්රම් වෙහෙර ළඟ තීර්ථකයන්ගේ විහාරවල ලැග ලා උදසන ම සැදෑ ඇති උපාසකවරුන් 'හැම දෙනාට පෙරාතු බුදුන් වඳුම්හ'යි විහාරයට නික්මුණු කලට දෙව්රම ලැග ලා යන එකක මෙන් නුවරට යන්නී 'ලැග්ගේ කොයි ද'යි විචාළ වුන්ට 'තොපට

Non-Commercial Distribution

මා කොයි ලැග්ග යි කිම ? තෙපි ඒ විචාරා සිටියා දැ'යි කියා ලා 'බැණ පලා ගොසින් දෙ පෝයක් මසක් ගිය කල විචාළවුන්ට 'අතික් කොයි ලගිම් ද? රූ ඇති ව වූ මුළා ය. දෙව්රම් වෙහෙරට ගොසින් මහණ ගොයුම් හා සමඟ එක ගඳ කිළියේ සැතපීලා ආමී' කියා පෘථග්ජනයන්ට සැක උපදවමින් තුන් සාර මසක් විතර ගිය කල කඩ රෙදි බහා ලා මහත් ව තිබෙන ලෙසට බඩ වෙළා ගෙණ දූරි ඇති සැටියක් හඟවමින් බඩ වසා රත් පිළි හන් පෙර ව ගෙණ 'මහණ ගොයුම් හට ද ව දරු කෙණෙක් බඩ පිළිසිඳ ගත්හ'යි නුවණ නැත්තවුන් ගිවිස්වමින් බොහෝ අකුසලු ත් ගප් ගන්නා අට නව මසක් ගිය කලට බඩ දරදඬු මැඩිල්ලක් බැඳ ගෙණ දෙවුරය ත් බඩ ත් වසා පිළියක් පෙරව ගෙණ අතුල් පතුල් ගෙරි ඇට බා ලා තළා උදම්මා ගෙණ වදන පොදන අවස්ථා තරමක් සේ ව එක් දවසක් සවස බුදුන් බණ වදරණ කල්හි ධම් සබයට ගොසින් බුදුන් ඉදිරියේ සිට ගෙණ—

''මහණ, තෝ බොහෝ දෙනාට බණ කිය යි. අසන්නවුන් අසා රිසි නො යන තරමට කඩ හඩ ත් බලවත. ඊට ත් වඩා රූප ශොභා බලවත. මා බඩ ත් මුඹට ද ව දරු කෙණෙක් ඇති වූහ. වදන පොදන අවස්ථායෙමි. වදන ගෙවලක ත් නියම නැත. තව දක්වා ම තෙලකට වේව යි, මිරිසකට වේව යි, ප්‍රයෝග ත් නැත. තමා නො කරත ත් උපාසක ව සිටිනා කොසොල් රජ්ජුරු-වන්ට වේව යි, අනාථ පිණ්ඩික සිටාණන්ට වේව සි, විශාඛාවන්ට වේව යි, 'තෙල චිඤ්චමානවිකාවෝ දූරි ඇත්තෝ ය. අපට ද දරුවන් හෙයින් අපට කළ මනා දෙය තිබැ දී තුලුන්ට කළ මනා දෙය නො පමා ව කරව'යි විධාන නො කරන්නේ ත් හැයි ද?

'අප හා වාසයට පැරැත්ත නැත්තා සේ ම තෙලේ ව ත් අප ගෙන් පැරැත්ත නැති ව විධාන කළ මනා වේ දැ'යි පවිත්‍රශීලී කෙණකුන් ඇඟට අමෙධ්‍යයක් දමන්නා සේ කිව. එ සේ කියා ලා 'අප හා බැඳී බඩ දරුවනු ත් ඇති කළ කල වදන්නවුනට කළ මනා දෙය ත් කරවා ලුව මනා වේ දැ'යි සඳ මඬලේ ගොසින් වැද නො ගනිත ත් ගොම පිඩක් අල්වා ගෙණ දමන එකක මෙන් සිවූ වනක් පිරිස් මැද සිට ගෙණ බුදුන්ට බිණුව. ඕ තොමෝ බිණිය හෙද පුරා කෘත අකුශලය තෙමේ නස්නෙන් බණන ලෙසට ඇට සම්මත කොට ලා නට. එ හෙයින් ඌ ගේ විධාන ය උගුළුවා ගත නො හී බිණු ව.

Non-Commercial Distribution

බුදුහු ත් වදරන බණ සන්ධි කොට ලා සිංහ නාද පවත්වන සිංහයක්හු මෙන් 'පිරිබ්‍රාජිකාවෙනි, තීගේ බස සැබෑ වී නමුත් බොරු වී නමුත් තී හා අපි ය වේ ද දන්නමෝ ය'යි වදාළ සේක. ඒ අසා චිඤ්චමානවිකාව 'මහණ ඒ එ සේ ය. තොප හා මා දත් බැවින් ම වේ ද, එ බන්දක් වූයේ ය'යි කිව. එ වෙලෙහි සක් දෙවිඳුන්ගේ හස්න හුණු වි ය. උයි ත් බලනුවෝ සැති මනෙවි දූ දිඹුලේ මල් නැත්තා සේ නැත්තෙන් ම බුදුන්ට බණන්නී ය'යි දැන 'මෙ බොරු නියා ව සාධා ලමි' දෙවියන් සතර දෙනකු කැඳවා ගෙණ අවු ය. දෙවියෝ සතර දෙන ද මී පැටි වෙස් මවා ගෙණ දර මඩුලු බැඳ ලූ ලණු එක විට ම කපා පූ ය. වසා පෙරවා ගත් කුඩත් සුළඟෙක් අවුත් ලා ඔසවා පිය දර මඩුල්ල ත් ඉහත්තෝ ඇගේ පිටී පත්ලේ ම හිණ. හී ලා ඇගේ අක් පතුල් දෙක ම කඩා පළවා පී ය.

මිනිස්සු ත් ඒ හැම දැක 'කාලකණ්ණි කෙල්ල, නිෂ්කලඞ්ක වූ බුදුන්ට මෙ ලෙස කරන්ට කියන්ට කාරණ කිම දූ'යි හිස කෙළ ඹමින්[1] අතින් පයින් ඇන තළා මරා විහාරයෙන් පිටත් කළහ. ඉක් බිත්තෙන් ඇ තමා බුදුන්ට පෙනෙන තැන් ගෙවා ගිය කලට මහ පොළෝ අට නව මස හිරි ලා ලා තිබී ලා පැළී ගියාක් මෙන් පැළී විවර වි ය. ඒ හස්තෙන් අවිචියෙන් ගිනි දැල් නැඟී ලා පිළී පෙරෙවියා සේ ම සැකි මනෙවිය වසා ගත. වසා ගෙණ ලා අවීචියේ හෙළී ය. තීර්‍ථකයන්ට ත් යත් තම ව උපදනා ලාභ සත්කාර ඇත් නම එයි ත් පිරිහිණ. පාන් කුඩ තෙල් ගෑ කල වඩ වඩා ම පාන බබ ළන්නා සේ බුදුන්ට ලාභ සත්කාර බලවත් වි ය.

දෙ වන දවස් ධම් සෙබෙහි රැස් ව හුන් වහන්දෑ 'ඇවැත්නි, සැති මණෙවි දූ තිලෝ ගුරු බුදුන්ට නැත්ත කියා බැණ මේ සා මහත් විනාශයකට පැමිණියහ'යි කථාව ඉපැද වූ සේක. බුදුහු ත් ඒ අසා ''මහණෙනි, නැත්ත කියා බැණ මහා විනාශයට පැමි-ණියේ දැන් මතු නො වන්නේ වේ ද? යට ගිය දවස ත් මහා පදුම කුමාර නම වූ මා හා මෝ තොමෝ බැඳී වසනු කැමැති ව සාරා සඞ්ඛ්‍ය කප් ලක්‍ෂයේ ම ජාතිවල වෙනසක් ඇත ත් ගුණෙහි වෙන සක් නැති බැවින් අපගේ මවු බිසොවුන් මළ පසු මුන් තමන් අපගේ පියරජ්ජුරුවන් කෙරෙහි රැකුණු හෙයින් මා මරණු නිසා නො එක් විකාර ත් කොට නො එක් දෑ ත් කියා මට වූ අනර්‍ථ නැත. එ වක ත් මෝ තොමෝ ම විනාශයට පැමිණියා ය.

1 හිස කෙළෙසමින්—හිසකේ ඔසවමින්

Non-Commercial Distribution

එක ත් මැ කළ දෙයෙන් වෙනස නම් මෙ වක කියා කට හුණු දෙයෙක් නැත. එ වක මැගේ බසින් අපගේ පිය රජ්ජුරුවෝ සොරුන් හෙළන ගලෙකින් මා එළවා පූ ය. ඒ ගල වසන දේවතාවා ගල ගැසී යා නො දී මා පිළිගෙන නා රජ්ජුරු කෙණ- කුන්ගේ පණ ගබ හිඳුවා ලූ ය. නා රජ්ජුරුවෝ ද මා තමන්ගේ නාග භවනයට ගෙන ගොසින් තමන්ගේ නාග භවනයෙන් භාගයක් දුන්හ.

මම ඊ අවුරුද්දක් රඳා හිඳ ලා මහණ වනු කැමති ව හිම පියසට අවුත් මහණ ව අභිඥලාභී වීමි. එක් වැද්දෙක් මා දැක අපගේ පිය රජ්ජුරුවන්ට කී ය. රජ්ජුරුවෝ මා ලඟට අවුත් මා මරණ දුකින් මිදුණු ලෙස් අසා ගොසින් රාජ්‍ය ය කරන්ට මට ආරාධනා කොට මට රාජ්‍ය ය නො කැමැත්තේ දශරාජ ධර්‍ම ය අකොප්‍ය කොට මුඹ ම රාජ්‍ය ය කරන්නැ'යි කී හෙයින් හඬමින් වලපමින් සියරට පෙරළා යන්නාහු අතුරු මහ දී මෙ තරම් පුතණු කෙණකුන්ගෙන් මා නුවූයේ කවුරු නිසා දැ'යි ඇමැත්තන් අතින් විචාරා අග මෙහෙසුන් බිසොවුන් නිසා ය යි කී කල්හි ඒ බිසො- වුන් ගලින් එළවා පියා දැහැමින් රජ කළහ. එ වක මරණට ප්‍රයොග කොට තොමෝ ම නට'යි යනාදීන් මහා පදුම ජාතක ය වදරා 'දූන් ගුණ මාරණයට ප්‍රයොග කොට නටැ'යි වදරා සම්- ප්‍රාප්ත පර්‍ෂදට බණ වදරන සේක් 'දවසක් මුළුල්ලෙහි කියත ත් සැබැවක් නැති ව බොරු ම කියන්නා වූ දිව සැප ත් වෙව යි, මිනිස් සැප ත් වෙව යි, නිවන් සැප ත් වෙව යි, ලබන්නට නැති හෙයින් පරලොව අත්හළ අසත් පුරුෂයන් විසින් නො කළා වූ පවු නැත. කවර ත් පාප ය බොරු කීවන්ට සිද්ධ වෙ ය'යි වදළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් සත්පුරුෂයන් විසින් බොරු නම් විෂ පරිද්දෙන් සලකා හැර සැබෑ බස නම් ඉෂ්ට මිත්‍ර කෙණකුන් මෙන් සිතා ගෙණ කුසලයෙහි හැසිර නිවන් සාධා ගත යුතු.

---

# 157. අසදිස දන වස්තුව

තව ද සත්‍වයන් දන් දීමෙහි යොදනු නිසා අසදිස දන වස්තුව දක්වමු.

කෙසේ ද යත්—

එක් සමයෙක බුදුහු දඹදිව සැරිසරා වැඩ පියා නිත්‍ය පරිවාර පන්සියක් දෙනා වහන්සේ හැර ගෙන දෙව්රම් වෙහෙරට වැඩි

Non-Commercial Distribution

සේක. රජ්ජුරුවෝ විහාරයට අවුත් බුදුන්ට ආරාධනා කොට ලා දෙවන දවසට අමුතු දනක් සරහා ලා අපගේ දන් බලන්ට අව මැනවැ'යි නුවර වැස්සන් කැඳවා යවූ ය. නුවර වැස්සෝ ද අවුත් රජ්ජුරුවන්ගේ දන් දැක දෙවන දවස් රජ්ජුරුවන් දුන් දනට වඩා දනක් දෙන්ට සිතා බුදුන්ට ආරාධනා කොට දනක් සරහා ලා 'රජ්ජුරුවන් වහන්සේ අපගේ ත් දන් බලන්ට වැඩිය මැනවැ'යි කැඳවා යවූ ය. රජ්ජුරුවෝ උන්ගේ දන් දැක 'මූ නො රජ ව සිට ත් මාගේ දනට වඩා පූ ය. රජ ව සිටි මා ත් වඩා පුවමනා වේ දැ'යි තුන් වන දවසට ත් දන් සරහා ගත්හ. නුවර ඇත්තෝ ඒ දන දැක 'තනි රජ්ජුරුවන් වහන්සේ මේ තරමෙක දන් දුන් කල අපි මෙ තෙක් දෙනමෝ වඩාපියම්හ'යි සතර වැනි දවසට දනක් සරහා දුන්හ.

මෙ සේ දන් දෙන ගමනේ රජ්ජුරුවෝ නුවර ඇත්තවුනු ත් පරදවා ලිය නො හෙති. නුවර ඇත්තෝ රජ්ජුරුවන් පරදවා ලිය ත් නො හෙති. පස්වැනි මුරයේ රජ්ජුරුවන් දන් දුන් කලට ස වන වාරයේ නුවර ඇත්තෝ සියක් ලෙසින් දසක් ලෙසින් වඩා යම් ලෙසකින් මේ දනට මේ මේ දෙය නැතැ'යි කියාලන්ට බැරි වී නම් එ ලෙසට දන් සැරහූ ය. රජ්ජුරුවෝ නුවර වැස්සන් තමන්ට වඩා සරහා ලූ දන දැක 'ඉදින් මම මුන්ගේ දනට වඩා දිය නුහුණිම් නම් ජීවත් වීමෙන් ප්‍රයෝජන නැතැ'යි සිතා ගෙන සැතපුණාහ. මල්ලිකා බිසවු රජ්ජුරුවන් කරා එළඹ 'මහරජ, මුසුප්පුව ගෙන වැද හොත්තේ හැයි ද, මූණ පැය ත් නැතැ'යි විචාළහ.

'බිසවුනි, මුසුප්පු වන්ට කාරණ නො දනු දැ'යි විචාරා නො දනිමි' කී කල්හි නුවර වැස්සන් දනින් වඩන හෙයින් මුසුප්පු නියා ය'යි කිවු ය. ඒ අසා මල්ලිකා බිසවු 'රජ්ජුරුවන් වහන්ස, ඒ නිසා වූවො ත් මුසුප්පු නුවූ ව මැනව. නුවර වැස්සන් කෙතෙක් දෙනා එක්ව ත් රජ්ජුරු කෙණකුන් පරදවා පූ නියා-වක් කවර කලෙක දුටු විරූ ඇත් ද? දක්නා තබා ඇසූ විරූ ත් ඇත් ද? මුඹ වහන්සේ විධාන කොට දන් වඩාගත නො හෙන සේක් නම් මම විධාන කෙරෙමි' අසදෘශ මහ දන් තුමූ විධාන කරණු කැමති ව, 'මහරජ, බුදුන්ගේ නිත්‍ය පරිවාර පන්සියක් දෙනා වහන්සේ දන් වළඳන්ට වැඩ හිඳිනට අනික් දණ්ඩක් පතක් නැතිව මඩුවෙහි මද්ධ්‍ය මණ්ඩපයේ සල් කලණ පෝරුව අතු-රුවා ලුව මැනව. බුදුන් හා ඒ පන්සියයක් දෙනා වහන්සේ හා සල් කලණ පෝරු පිට වැඩ හිඳිනා සේක. සෙසු වහන්දැ ඒ

Non-Commercial Distribution

පෝරුවෙන් පිටත හිඳිනා සේක. හෙළ කුඩ පන් සියයක් කරවා ලුව මැනව. ඇත්තු පන්සියයෙක් කුඩ පන් සියය, පන් සියක් දෙනා වහන්සේ හිසට කෙරෙති. රන් හොරු අටක් හෝ දසයක් කරවා ලා මණ්ඩපය මැද තබ්බවා ලුව මැනව.

'දෙ නමකට දෙ නමකට අතුරෙහි එකී එකී බිසෝ කෙණකුන් හිඳ සුවඳ අඹරන්ට වුව මැනව. එකී එකී බිසෝ කෙණකුන් තල් වැට චාමර හැර ගෙන දෙ නම දෙ නමට පත් සැලුව මැනව. සෙසු බිසෝවරුන් අඹරා නිමි සුවඳ ගෙනවුත් රන් හොරුවල ලුව මැනව. ඉන් ම සමහර බිසෝ කෙණකුන් මහනෙල් මල් කලප් හැර ගෙන රන් හොරුවල ලා ලූ සුවදෙහි ගල ගලා සුවඳ ගැල්වුව මැනව. නුවර ඇත්තවුන්ට එ තෙක් බිසෝවරුන් තබා එක බිසෝ කෙණකු ත් නැත. සෙනෙවිරත් ආදීන්ට කුඩ තුන සතර ඇති වත ත් හෙළ කුඩ පන් සියයකු ත් නැත. ඇතුනු ත් ඇති වතො ත් එකකු දෙන්නකු මු ත් පන් සියයක් ඇත්තු ත් නැත. එ සේ කලට ඒ හැම මුඹ ඇනි වන්නා නුවර ඇත්තෝ පරදිති. එ ලෙස කරවුව මැනැවැ'යි කිවු ය.

රජ්ජුරුවෝ ත් සතුටු ව යහපතැ'යි උන් කියා ලූ ලෙස ම සියල්ල ම රජ ව සිටින්නවුන්ට බැරි නොවන හෙයින් කරවා ලූහ. වහන්දැගේ ගණනට ඇතෙක් මඳ ව රජ්ජුරුවෝ එ පවත කීහ මල්ලිකා බිසවු 'කුමක් කියන සේක් ද? ඇතුන් පන් සියයකට ත් නැති නියාදැ'යි කිවු ය. 'පන් සියයකට වඩා ත් ඇත. සෙසු ඇත්තු මොළ නුවූ ය. එක් ඇත් පොව්වකු මොළ වූ ය. වහන්දෑ දුක ලා ම ඉගිල දිවෙති'යි කිවු ය. 'එ සේ වී නම් දුෂ්ට වූ ඇත් පොව්වකු හෙළ කුඩයක් හැර ගෙන සිටිනා තැනක් දනිමි'යි කිවු ය. 'කො තැනක සිටුවමෝ දැ'යි විචාළ කල්හි 'අඟුල් මල් මහතෙරුන් වහන්සේ ලඟ සිටුවා ලුව මැනවැ'යි කිවු ය. රජ්ජුරුවෝ ත් එ ලෙස ම කැරවූහ. ඇත් පොවුවා ද වාලධිය කළවා හස්සෙහි ගන්වා ගෙන කන්පත් දෙක ත් හෙළා ලා ඇස් දෙක ත් පියා ගෙන මහ තෙරුන් වහන්සේගේ තේජස් නමැති ඇත්කෝලින් ඇන රඳවන ලදු ව නො සැලී සිට පී ය. බොහෝ දෙනා ත් මෙ සේ වූ මොළ ඇත් පොවා අඞ්ගුලිමාල සර්වීර නමැති සිංහයාණන් කරා පැමිණ එඩි දර්ප නැති ව ගොසින් මෙ තරමක් ව ගතැ'යි ඇතු ම බලන්නාහ.

රජ්ජුරුවෝ ද බුදු පාමොක් සංඝයා වහන්සේ වළඳවා ලා බුදුන් වැඳ 'සවාමීනි, මේ මාගේ දන් දෙන තැන තුබූ කැප බඩුවකු ත්

Non-Commercial Distribution

අකැප බඩුවකු ත් ඇත් නම් ඒ සියල්ල ම මුඹ වහන්සේට දෙමි කිවු ය. ඒ දන ද වැලි ත් එක දවසට ම තුදුස් කෙළක් වස්තු වියදම් වි ය. බුදුන් හිසට කළ හෙළ කුඩ ය ද, වැඩ හිඳිනා පලඟ ද, පාත්‍ර ධාතූන් වහන්සේ තුබූ පාත්‍ර වළල්ල ද, නො දෙවි පා තබන පාද පීඨ ය ද'යි මේ සතර අග ය නැත්තේ ය. නැවත මේ තරම් දනක් දී ලිය හෙන කෙණෙක් නැත. එහෙයින් මේ දනට අසදෘශ දන ය යි කියති. එක් බුදු කෙණකුන් වහන්සේට මෙ බඳු දනක් එකක් ම වත් මුත් දෙකෙක් නැත. කවර ත් බුදු කෙණකුන් වහන්සේට මේ දන ඇත් ම ය. ඒ දන විධාන කොළෝ ත් ගෑනු කෙණෙක් ම ය.

රජ්ජුරුවන්ගේ කාල නම් වූ ත්, ජුණ්හ නම් වූ ත් ප්‍රධාන ඇමැත්තෝ දෙන්නෙක් වූහ. ඒ දෙන්නාගෙන් කාල නම් ඇමැති තමාගේ නම තරමට ම 'අනේ රජ්ජුරු කෙණකුන් වහන්සේගේ සම්පතකට වූ හානියක් ය. කෙළවර එක දවසින් ම තුදුස් කෙළක් වස්තු වියදම් වි ය. මේ වහන්දෑ ද මේ දන් වළඳා ගොසින් නිඳන සේක. රජ සම්පත ඉතා ම නට බද'යි සිතී ය. ජුණ්හ නම් ඇමැති රුවන 'අනේ රජ්ජුරු කෙණකුන් වහන්සේගේ දන බලවත, නො රජ ව සිට මේ ලෙස දී ලන්ට බැරි ය. පින් කෙරෙත් නමුත් කළ පින් දී ලන කෙණෙක් නැත. මා මේ පින් අනුමෝ වුවමනා වේ ද'යි සිතී ය.

රජ්ජුරුවෝ වළඳා අනතයෙහි අනුමෙවෙනි බණට ආරාධනා කළහ. බුදුහු ත් කළ ආරාධනාවට බණ නොවදරා තමන් වහන්සේ සම්පජානකාරී හෙයින් 'මේ රජ්ජුරුවන් මහ වතුරක් මෙන් මහ දන් දුන් නියාව බලවත. තමන් මෙලෙස දී ගත නො හෙත ත් දෙන දන් බලා බොහෝ දෙන සිත් පහදවා ගත නුහුණු වූ දෝ කිම දෝ හෝ'යි බලන සේක් ඇමැත්තන් දෙන්නා සිතූ ලෙස දූන වදරා 'ඉදින් රජ්ජුරුවන්ගේ දන ලෙසට අනුමෙවෙනි කීම් නම් කාල නම් ඇමැත්තහුගේ හිස සත් කඩක් ව පැළෙයි. ජුණ්හ නම් ඇමැති සෝවාන් වෙයි' දූන වදරා කාල නම් ඇමැත්තහු කෙරෙහි කරුණාවෙන් ඒ සා මහත් දනක් දුන් රජ්ජුරුවන්ට එක ගාථාවක් පමණ වදරා ලා හුනස්නෙන් නැඟී විහාරයට වැඩි සේක.

වහන්දෑ ද අඟුල් මල් තෙරුන් වහන්සේ අතින් කුමක් ද, ඇවැත්නි, දුෂ්ට ඇතු කුඩ ය අල්වා ගෙන සිටි ගමනේ ඌ බල බලා බා නො ගිය ද'යි විචාළ සේක. තමන් වහන්සේට ඇත් හය තබා

හැම භය ම නැති හෙයින් 'මට භයෙක් නැත'යි වදාළ සේක. වහන්දෑ ද බුදුන්ට 'ස්වාමීනි, අඟුල්මල් තෙරහු භය නැතැ යි කී මෙන් තමන් රහත් නියාවක් හඟවති' කී සේක. බුදුහු 'මහණෙනි, රහතන්ට භය නැති බැවින් මුන් තමනු ත් රහත් හෙයින් උන්ට භය නැතැ'යි වදාළ සේක.

කොසොල් රජ්ජුරුවෝ ද එක දවසින් තුදුස් කෙළක් වියදම් ව ත් මුසුප්පු නැති ව අනුමෙවෙනි බණ සුභ මද ව ගන්නා ම මුසුප්පු ව ගොසින් 'තුදුස් කෙළක් වස්තු ගෙවා මේ සා මහත් දනක් දී ලූ කල සුවාසූ දහසක් යොදුන් ගැඹුර ඇති මහ මුහුදින් හබඑවකින් උකා ගත් පැණින් මිනිසුන්ට ප්‍රයොජන මද සේ සුවාසූ දහසක් ධර්මස්කන්ධ තුබූ තැනින් එක ගාථා පමණක් වද රා ලා වැඩි සේක. මගධ නැළියෙන් සොළොස් නැළියෙක බත් කන මට සාල් පතක බත් මදවා සේ ගාථා පමණකින් කුමක් දනිම් ද? මේ සා මහත් වියදමක් කොට දෙන දන ත් බුදුන්ට නිසි ලෙසක නුදුන් නියා ය. කැප බඩු නො දී අකැප බඩු ම දුන් නියා ය. ඒ නිසා බුදුන් නො සතුටු නියා ය. විකිණී ඇර ගන්නා බඩුවක් පවා වටනා දෙයක් නොවටනා ලෙස හැයි ද? මා දී ලූ දන් තරමට බණ වදාළ මනා වේ දැ'යි සිතා වෙහෙරට ගොසින් බුදුන් වැද ලා 'ස්වාමීනි, කුමක් ද? මා දන් දෙන ගමනේ දිය යුක්තකින් නුදුන් දෑ ත් ඇත් ද? දෙත ත් අකැප දෙයක් ම දුන් නියා දැ'යි කිවු ය. 'මහ රජ, ඒ කිම් දැ'යි වදාළ සේක.

'මේ සා මහත් පරිත්‍යාගයක් කළ මට අනුමෙවෙනි බණ මඳ කොට වදාළ හෙයිනැ'යි කිවු ය. 'මහ රජ, තොප දන් දුන් නියා ව ත් බලවත. මට ම තරම් කොට දුනුව. මේ අසදෘශ දන ය නම් එක් බුදු කෙණකුන්ට එක් වරෙක මුත් දෙ වරෙක සම්බ වන්ට නැත. තෙපි පෙරළා කැර වූ නමුත් මෙයට වඩා කට නො හැක්කැ'යි වදාළ සේක. 'එසේ කල අනුමෙවෙනි බණ මඳ කෙළේ හැයි දැ'යි විචාළේ ය. 'මහ රජ' තොපගේ පර්ෂත් අශුද්ධ හෙයි නැ'යි වදාළ සේක. රජ්ජුරුවෝ 'පර්ෂද නපුර කවරේ ද, ස්වාමීනි කිවු ය. ඉක් බිත්තෙන් බුදුහු කාල– ජුණ්හ දෙ දෙන ම සිතු සිතිවිලි වදරා ලා කළු ඇමැත්තා කෙරෙහි කරුණාවෙන් රජ්ජු රුවන් සිත් පුරන්ට බණ කියා කළු ඇමැත්තහු හිස පැළුණ නපුරයි බණ නො වදාළ නියාව වදාළ සේක. රජ්ජුරුවෝ ද 'සැබෑ ද? කාලයෙනි, තෙපි එ සේ සිතුයෙහි දැ'යි විචාළහ. 'සැබෑ ය'යි කී කල්හි 'තොප සන්තක දෙයක් නො ගෙණ මා සන්තක දෙය ම මාගේ අඹු දරුවන් හා සමග දන් දුන්න යි තොපට

හානි කවරේ ද? තොපට දී ලූ සම්පත් දුන්නේ ම ය. ඒ නො ගනිමි. මාගේ රට තොප හිදිනට බැරි ය. තොප කැමැති තැනකට යව'යි සිතා පූ නපුරු සිතිවිල්ල නිසා රටින් නෙර පියා ජුණ්හයන් කැඳවා ලා 'තොප තෙල ලෙස පින් අනුමෝදන් වන්ට සිතුයේ ඇද්ද'යි විචාරා සැබෑ ය'යි කී කල්හි 'මා තොප කෙරෙහි ඉතා පහනිමි. තෙපි මාගේ පරිවාර ත් හැර ගෙණ මා දුන් ලෙස ම සත් දවසක් දන් දෙව' යි රාජ්‍ය ය සතියකට දී ලා බුදුන්ට දන්වන්නෝ 'ස්වාමීනි, නුවණ නැත්තවුන්ගේ කට යුතු බලා වදරන බව ය. මෙ සා මහත් වියදමක් කොට දන් දුන්නෙම් මම ය. වියදම් වූයේ ත් මා ගෙණ. කළු ඇමැත්තවුන්ගේ අදහස් නපුරු නියා ය'යි කිවු ය.

බුදුහු ත් 'එ සේ ය. මහ රජ'යි වදරා ලා එ දවස් වදරන බණින් දුස් සිත් වන කෙණකුන් මුත් සත් කඩක් ව හිස පැළෙන්නවුන් නැති හෙයින් බණ වදරණ සේක් 'රජ්ජුරුවෙනි, දන් දීමෙහි අදහස් නැති තද මසුරු සත්තු කොට ගත හෙන පින් කමක් නැති හෙයින් ධ්‍යාන බලයෙන් උපදනා බඹ ලෝ තබා දිව්‍ය ලො කවලට ක් පැමිණ ගත නො හෙති. නුවණ නැති සත්තු තමන් ගෙන් දෙන දන් තබා අනුන් දෙන දන ත් සිත් පහදවා ගත නො හෙති. යම් කෙණෙක් තුමූ දන් දී ගත නො හෙත් නමුත් අනුන් කරණ පින් කම සිත් පහදවා සමාදන් වූ නම් එ පමණ කිනු ත් දිව්‍ය ලොක සම්ප ත් සාධා ගෙණ සුව විඳිති' වදළ සේක. දෙශනා කෙළවර පවිත්‍ර සිතිවිලි සිතූ ජුණ්හ නම් ඇමැත්තාණෝ අති පවිත්‍ර වූ ලොවුතුරා සැපතට පැමිණෙන්නෝ සෝවාන් වූහ. එ තැනට පැමිණි කෙණකුන්ට ත් රජ්ජුරුවන්ගේ දන සප්‍රයොජන වූවා සේ ම දෙශනාව ත් සප්‍රයොජන වි ය. ජුණ්හයෝ ද සෝවාන් ව ලා සතියක් මුළුල්ලෙහි රජ්ජුරුවන් දුන් ලෙසින් ම දන් දුන්හ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් තමා සන්තක දෙය දන් දෙන්ට සිතන ගමනෙක් මුත් අනුන් දෙන දන කාල නම් ඇමැත්තා මෙන් සිත දූෂ්‍ය නො කොට සෙසු ත් අකුසලින් දුරු ව කුසල්හි ම පිහිටා නිවන් දහම් පසක් කට යුතු.

## 158. අනේපිඬු මහසිටුහුගේ පුත් කාළ නම් සිටුපුත්‍රයා ගේ වස්තුව

තව ද තමාගේ එ බඳු අදහසක් මඳ වුව ත් අනුන්ගේ වසයෙන් කළා වූ කුසලය ත් සප්‍රයොජන වූ නියාව හඟවන්ට අනේපිඬු මහ සිටුහුගේ පුත් කාළ නම් සිටු පුත්‍රයාණන් ගේ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්—

ඒ කාළ නම සිටු පුත්‍ර තෙමේ එ සේ වූ සැදැ ඇති සිටාණන්ට පුත් ව ඉප ද ත් නෙළුම් මල මොළකැටි වුව ත් නෙළුම් දණ්ඩ රළුවා සේ බුදුන් කරා විහාරයට යන්ට වේව යි තමන්ගේ ගෙට වැඩි කල දක්නට වේව යි. බණ අසා ගන්ට වේව යි, සඞ්ඝයා වහන්සේට වෙයාවච්චයක් කරන්ට වේවයි, නො කැමැත්තෝය. පියාණන් තෙල ලෙස නො කරව'යි කීව ත් උන්ගේ බසු ත් නොගිවිසති.

ඉක්බිත්තෙන් අනාථපිණ්ඩික සිටාණෝත් තමන් බාල කලත් තෙල ලෙස නො කළ විරූ හෙයින් තමන්ට ඒ අප්‍රිය හෙයින් 'මූ මෙ ලෙස ම කෙරෙත් නම් නරකොත්පත්තියක් විනා ස්වර්ගෝත්-පත්තියක් මූන්ට වන්ට කාරණ නැත. අප වැන්නවුන්ට පුත් ව ත් නරකයෙහි උපන්නු නම් උන්ට ම ඒ තරම් වත් මුත් අපට තරම් නො වෙයි. මෙ ලොව ධන ධාන්‍ය සම්පතට නො නැමෙන කෙණෙක් නැත.

එ හෙයින් සම්පත් පෑ ලා වුව ත් මට නමවා ගනිමි'යි සිතා එක් දවසක් 'පුත, පෙහෙ ව ගෙන වෙහෙරට ගොසින් බණ අසා එව. තොපට මසු සියයක් දෙමි'යි කිවූ ය. 'දෙන සේක් ද, දෙන සේක් දැ'යි තුන් විටක් ම විචාරා තුන් විටක් ම 'දෙමි' කියවා තර ය කරවා ගෙණ පෙහෙ ව ගෙණ විහාරයට ගියහ. විහාරයට ගිය පමණක් මුත් බණ ඇසීමෙන් තමනට ප්‍රයෝජනයක් නැති හෙයින් සැප තැනක වැද හෙව නිදා පුරා පියා උදසන ම ගෙට ගියහ. අනාථපිණ්ඩික සිටාණෝ ද 'ම පුත්තු ඊයේ පෙහෙ වූ ය. එ හෙයින් රැ සයින. වහා උළු කැන් හා කැවුම් ගේනෙව'යි ගෙන්වා දුන්හ. උං 'රන් නො ලද්දෙත් නො කමි' කියා ලා උළු කැන් හා කැවුමු ත්, සෙසු ත් ගෙනා දෙය ත් නො කති. සිටාණෝ ද උන්ට වන පීඩා ව ඉවසා ගත නො හී රන් පියල්ලක් දෙවාලූ ය. ඒ රන් පියල්ල අතින් අල්වා ගෙන පිණට ලොභ නැත ත් වස්තු ලොභ ය බලවත් හෙයින් ආදි නො කැව ත් රන් ලැබ අතට හැර ගෙණ බත් පැන් අනුභව කළහ.

දෙවන දවස් සිටාණෝ 'පුත, තොපට මසු දහසක් දෙවා ලමි, බුදුන් ඉදිරියේ සිට එක බණ පදයක් ඉගෙන එව'යි කිය ලා යවූ ය. උයි ත් වෙහෙරට ගොසින් බුදුන් ඉදිරියෙහි සිට එක බණපදයක් ඉගෙන ගෙණ ලා කල් යවා රදන්ට මැළි ව නික්මෙනු කැමැති වූ ය. උන්ගේ සිතිවිල්ලට බුදුන්ගේ සිතිවිලි පෙරාතු ව

Non-Commercial Distribution

ලා තමන් වහන්සේ ලඟට ගිය කලට ඒ වදළ පදය නො සැල කෙන ලෙසට කළ සේක. පද ය සලකා ගත නො හී 'අනික් පදයක් උගනිමි'යි සිට ඇසූ ම ය. උගනිමහ'යි අසන්නෝ සකස් කොට අසති. මෙ සේ අසන්නවුන් අසන දෙය සිත හෙළා අසන හෙයින් දුන විදුලු හී දණ්ඩ ඉලක්ක ය. වැද ගන්නා සේ භාවනා සිත ත් ති ලකුණෙහි වැද ගෙන නිවන් සාධා දී ලයි. උයි ත් 'උගනිමි' සිතා ම අසති. බුදුහු ත් වදළ පද ය නො සැල කෙන ලෙසට කරණ සේක. උයි ත් අනික් පදයක් උගනිමි සිට අසන් නෝ ම ආදි ආදි ඇසූ පද ත් පසු ව නො සැලකෙන බව මුත් පරතොඝොෂප්‍රත්‍ය ය ලෙසට ආදි ඇසූ හෙයිනු ත් කෙළවර පදය අසා නිමවා ම කෑ කෑ දෙයින් බඩ පිරුණා සේ ඇසූ ඇසූ දෙයින් අසී ප්‍රතිවෙධ ය වූ හෙයින් පිණට මැළි කම් පලවා සෝවාන් වූහ.

සිටු පුත්‍රයාණෝ නිවන් රස අනුභව කොට ලා දෙ වන දවස් බුදු පාමොක් සඞසයා වහන්සේ ලා කැටි ව අනාථ පිණ්ඩික සිටා ණන්ට වූ පුත් කමින් හැරී බුදුන්ට පුත් වූ නියා ව හඟවන්නාක් මෙන් සැවැත් නුවරට වන්හ. සිටාණෝ ද පුතණුවන් දැක 'අද ම පුතුන්ගේ සැටි ය යහපතැ'යි සිතූ ය. සිටු පුත්‍රයාණෝ ද 'අද අපගේ පියාණන් වහන්සේ බුදුන් ලඟ දී පදයක් ඉගෙන ආවො ත් දෙමි කී මසු දහස නුදුන් සේක් නම් යහපත. ඊයේ රන් නිසා පෙහෙ වූ නියාවක් නො කී සේක් නම් යහපතැ'යි සිතූහ. බුදුහු වැළි ත් මුත් ඊයේ රන් නිසා පෙහෙ වූ නියාව දත් සේක.

මහ සිටාණෝ බුදු පාමොක් මහ සඟනට කැඳ අවුළු පත් පිළිගන්වා ලා පුතණුවන්ට ත් කැඳ අවුළු පත් දෙවූහ. ඌ වැද හිඳ රන් නො ඉල්වා ම හුළු කැනු ත් පූ ය. කැවුමු ත් කැවූය. පසු ව බතු ත් කැවූ ය. රනින් විදිනා ප්‍රයෝජන විතරට ත් නිව නින් විඳගන්නා ප්‍රයෝජන බලවත් ව ගොසින් රනෙක නමක් ම නො කීවෝ ය. මහ සිටාණෝ ද බුදුන් වළඳා අන්තයෙහි පුතණු වන් ලඟ මසු දහසින් බඳ පියල්ල තබ්බවාලා 'පුත, තොපට මසු දහසක් දෙමි කියා ලා විහාරයට යැවීමි. සෙල ඒ දහස හැර ගනු ව'යි කිවු ය. උයි ත් බුදුන් ලඟ දී රන් හැර ගන්ට කී හෙයින් ලජ්ජාව ගොසින් 'අපට රන් නො කැමැත්තේ ය'යි කියා නැවත කීව ත් හැර නො ගත්හ. මහසිටාණෝ ද බුදුන් වැද ලා 'ස්වාමීනි අද ම පුතුන්ගේ සැටි ය යහපතැ'යි කියා 'කුමක් ද, මහ සිටාණෙනි, වදළ කල්හි 'ස්වාමීනි, පෙරාතු දවසෙක 'මසු සියයක් දෙමි විහාරයට ගොසින් 'එව'යි කියා යවා ලූ ගමනේ අවුත් රන්

අතුට ඇරගෙන සිට ය. බතක්-පැනක් අනුභව කෙළේ. අද අතින් රන් ඇරගන්ට කිව ත් ආදි සිය ය පමණක් ඇරගත් තැනැත් තෝ දූන් දසක් ඇරගන්ට මැළියෝ ය'යි කිවූ ය. බුදුහු ත් 'එ සේ ය, මහ සිටාණෙනි, එ ලෙස වන්ට කාරණ ඇතැ'යි වදරා බණවදරන සේක් - සක් රුවනෙහි ආනුභාවයෙන් මුළු සක්වල සාධා ගෙන සත් රුවනින් සමන්විත ව සක්විති රාජ්‍ය ය කිරීමෙ නු ත් කිසි කලෙක නරකාදි වූ සතර අපායට පැමිණ දුක් විඳිනා හෙයින් ප්‍රයෝජන නැත. දිව්‍ය සම්පත්තියෙනු ත් ශුද්ධාවාස බ්‍රහ්ම සම්පත් හැර සෙසු බ්‍රහ්ම සම්පතිනු ත් කලෙක උන් හැම කදෝ පැණිව ත් උපදනා හෙයින් ප්‍රයොජන නැත. හැම තන්හි සියල්ලවුන්ට ඉසුරු පවත්වා නායක වීමෙනු ත් කිසි කලෙක අනුන්ට අයිති වන හෙයින් ප්‍රයොජන නැත. ප්‍රයොජන කවරේ ද යත්-අපාය දුකින් මිදෙන හෙයින් හා කලෙක දී සසර දුකින් මිදෙන හෙයිනු ත් සෝවාන් පමණක් වුව ත් එ ම යහපතැ'යි වදළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන සෝවාන් ඵලාදියට පැමිණියහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් ශක්‍ර සම්පත් බ්‍රහ්ම සම්පත් මාර සම්පත් චක්‍රවර්ති රාජ්‍ය සම්පත් ප්‍රදෙශ රාජ්‍ය සම්පත් ආදියෙහි ඇලුම් හැර නිවන් සම්පත් ම සාධා ගත යුතු—

---

## 159. මාරදූත් තුන්දෙනා ගේ වස්තුව

තව ද සර්වඥයන් වහන්සෙ තමන් වහන්සේ කවර නම් පරිහවයක් ලබත ත් ඒ නො සලකා අනුන්ට වන ප්‍රයොජන ම සලකන පරිදි හඟවන්ට මාර දූත් තුන්දෙනා ගේ වස්තුව දක්වමු. කෙ සේ ද යත්-

කුරු රට මාගන්දිය[1] නම් බමුණානන්ගේ මාගන්දියා[2] නම් දූවණි කෙණෙක් ඇත. උඹ තුමූ උතුම් වූ රූ ධරති උන් පතා බොහෝ බ්‍රාහ්මණවරු ත් රජ දරුවෝ ත් තමන්ගේ දූවණියන් අපට සරණ එවුව මැනවැ'යි මාගන්දිය නම් බමුණන්ට කියා යවති. උඹ තුමූ මුඹ හැම සම්පතින් වඩිත ත් රුවින් අපගේ දරුවන් හා සරි නො වන දැය යි බාධා කොට කියා යවති.

ඉක් බිත්තෙන් එක් දවසක් බුදුහු අළුයම් වෙලෙහි ලොව බලන සේක්-තමන්වහන්සේගේ නුවණ දැල බැඳුණු මාගන්දිය බමුණානන් දැක උන්ට වන ප්‍රයෝජන කවරේ දෝ හෝ යි බුදු

---

1 මාගන්දියා 2 මාගන්දිය



Non-Commercial Distribution

නුවණින් බලන සේක්-ඒ බමුණානනුත් උන්ගේ බැමිණියනු ත් අනාගාමී වන නියා ව දුටු සේක. ඒ බමුණානෝ ද නිරන්තර ව ගමින් පිටතට අවුත් ගිනි දෙවියා පුදති. බුදුහු උදසන ම සඟල කර ලා ගෙන පාත්‍ර ය හැර ගෙන බමුණානන් ගිනි දෙවියා පුදන තැනට වැඩි සේක. බමුණානෝ ද බුදුන්ගේ අනන්‍යසාධාරණ වූ රූප ශොභාව දැක මේ ලොව රුවින් මුන්තරම් කෙණෙක් නැත. මූ අපගේ දුවණියන්ට තරම්හ. අපගේ දුවණියෝ ත් මුන්ට තරම්හ. මුන්ට උන් පාවා දෙම්හ'යි සිතාගෙණ බුදුන්ට 'මහණ, මාගේ ඉතා රූපත් වූ දුවක් ඇත. මම උන්ට තරම් කෙණෙක් නො ලත් හෙයින් කිසි කෙණකුන්ට ත් පාවා නුදුන්නෙමි. තෙපි තව ත් නිස්සව, මම ම දූන් තොපට සරණ පාවා දෙමි. මා උන් කැඳවා ගෙණ එන තෙක් ඔබ්බකට නො ගොස් මෙ තැන ම රඳව'යි කිවූ ය.

බුදුහු උන්ගේ කථාව අසා 'යහපතැ'යි කියා ත් නො කැමැත් තේ ය'යි කියා ත් නො වදාළ සේක. බමුණානෝ ද ගෙට ගොසින් තමන්ගේ බැමිණියන්ට 'පින්වත, අද ගිනි දෙවියා පුදන්ට ගිය ගමනේ ම දූන්ට තරම් කෙණකුන් දිටිමි. උන්ට මුන් පාවා දෙම් හ'යි දුවණියන් සරහා ලා කැඳවා ගෙන බැමිණියන් හා සමඟ එ තැනට ගියහ. බොහෝ දෙන ත් තමන් හැම ත් නුදුටු විරූ දෙයක් වන්නා විස්මපත් ව කැටි ව ම නික්මුණාහුය.

බුදුහු ද බමුණානන් කී තැන ම වැඩ නො සිට එ තැන්හි මී දෙව දූවගේ නළල තිලක දෙන කලක් මෙන් පදලස දක්වා ලා ගොසින් අනික් තැනක වැඩි සිටි සේක. බුදුන්ගේ පියවර නම මෙ පියවර අසවල්හු දකිත්ව'යි සිතා ලා ඔබා ලූ තැන ම පෙ-නෙයි. සෙසු තැන දක්නේ නැත. බමුණානෝද තමන් හා කැටිව යන බැමිණිනි ය. උන් දූන් කොයි දැ යි විචාළ කල්හි 'මෙ තැන සිටින්ට ඕ හට කීමි' කියා ලා බලන්නෝ පදලස දැක 'තෙලෙ උන්ගේ පියවර ය'යි කිවූ ය. බැමිණිනියෝ ත් ලක්‍ෂණ මන්ත්‍ර යහපත් ව දන්නා හෙයින් බමුණ, මේ පත්ල ගිහි ව සිටි කෙණ කුන්ගේ පත්ලෙක් නො වෙ යි කියා ලා බමුණා 'පින්වත, තී පැන් සැළියේ කිඹුලුන් දක්නා එකෙක් වැන්නී ය. මම ද ඕ හට ම දුව දෙමි යි කීමි. උයි ත් ගිවිස්සෝ ය. අනභිප්‍රා ය වුවො ත් නො කැමති නියාව කියන්නෝ වේදැ'යි කී කල්හි 'බමුණානෙනි, තොපි දන්නා නම් ගිනි මොළවන්නා සේ ම හෙයින් සෙස්සක් දන්ට නැති වන්නා කියව. මේ පත්ල වූ කලී බඹ ලොව ගැනු

Non-Commercial Distribution

නැත්තා සේ සන්තානයේ කෙලෙස් ලව නැති කෙණකුන්ගේ පත්ලෙකැ'යි කිවු ය.

බමුණානෝ 'පින්වත, තෝ නො දෙඩා බැණ නො නැඟී මා හා කැටි ව එව'යි කියා ලා යන්නාහු බුදුන් දැක 'මා කී තැනැත් තෝ නම් තුලූ ය'යි පෑ ලා බුදුන් කරා ගොසින් 'ම දූව තොපට සරණ පාවා දෙන්ට ගෙනාමි. උන් පාවා ගනුව'යි කිවු ය. 'තොපගේ දූවණියන් අපට නො කැමැත්තේ ය'යි නො වදරා 'එක් කාරණයක් තොපට කියා ලමි. ඒ අසවු දූ'යි විචාරා 'අසමි' කී කල්හි මහබිනික්මන පටන් සඞ්ක්‍ෂෙප කථාවක් දක්වන සේක් 'හෙම්බා, මම විසි නව හවුරුදු රජ සැප ත් හැර කන්ථක නම් අස් රජහු නැඟී ඡන්න නම් ඇමැත්තහු හා සමඟ මහණ වන්ට නික්මුණු ගම්හේ නුවර වාසලින් පිටත සිටි වසවත් මරහු 'සිද්ධාර්ථ කුමාරයෙනි, රදව, සත් වන දවස් සක් රුවන පහළ වෙයි' කී කල්හි 'මාර ය, මම දනිමි. නො නවතිමි'යි කී හෙයින් 'නො නවත්නේ කුමක් නිසා දූ'යි කී ය. බුදු වන නියා ය'යි කී කල්හි 'එ සේ වී නම් අද පටන් නපුරු සිතක් නො සිත ව. නපුරු සිතක් සිතූ නම් ඊට නිහඬ දනිමි' කියා ලා එ තැන් පටන් අවසරයක් දක්නට සත් අවුරුද්දක් උත්සාහ කෙළේ ය.

'මම ද සාවුරුද්දක් දුෂ්කර ක්‍රියා පූරා බුදු ව පස් වන සතිය අජපල් නම් නුග ගස මුල උනිමි. එ වේලාට මාරයා මම මෙතෙක් කල් මුළුල්ලෙහි ත් තොරතුරක් සොයා අත් නො හැර ඇවිද ත් තොරතුරක් දැක්ක නුහුණුයෙමි. මාගේ විෂ ය ඉක්මවා පූ ය'යි මුසුප්පු ව ගෙන මාවතක හුණ. ඉක් බිත්තෙන් ඔහුගේ තණ්හාවෝ ය, අරතී ය, රගාවෝ ය යන දූන් තුන් දෙන 'අපගේ පියාණන් වහන්සේ නො පෙනෙන සේක. දූන් කොයිදෝ හෝ'යි බලන්නාහු උන් මාවත මුසුප්පු ව ගෙන හුන්නහුන් දැක උන් කරා ගොසින් පියාණන් වහන්ස, මුසුප්පු හැයි දූ'යි විචාළෝ ය. උහු තමන් සිත ඇති මුසුප්පු ව දූන් තුන් දෙනාට කී කල්හි උහු ඒ අසා 'පියාණන් වහන්ස, මුස්ප්පු නූ ව මැන ව. අපි උන් පොලොඹා අපට වසඟ කොට ගෙන එම්හ'යි කිවු ය. 'කිසි කෙණකුන්ට ත් උහු වසඟ වන කෙණෙක් නො වෙති. දරුවෙනි, තොපට බැරිය'යි කිවු ය.

'පියාණන් වහන්ස, අපි ගැණු ජාති වේ ද, දූන් ම යෞවන පුරුෂයන් බඳන්ට නිල ව තිබෙන අපගේ කෙලෙස් නාමැති, අහර මළින් බඳගෙණ එම්හ. මුඹ වහන්සේ මුසුප්පු නූව මැනවැ'යි කියා ලා බුදුන් කරා ගොසින් 'මහණ, තොපට අඹු වම්හ'යි

කියා ලා තුන් බින්න වෙන වෙන ම ස්ත්‍රී විලාස දක්වූහ. බුදුහු උන් කියන බස් දත් වගුළ කැණහිල් දෙනුන්ගේ හඬ කොට ත් නො සිතූ සේක. උන් තමන් දවැකිටි ගැසී ගිය වැදිරි මැල්ලන් තරමට ත් නො තැකූ සේක. ඇස දල්වා උන් දසාව ත් බලා වදාළේත් නැත. ගල් පිළිමයක් මෙන් නිශ්චල ව වැඩ හුන් සේක. නැවත ත් මාරයාගේ දූන් තුන් දෙන පිරිමින්ගේ අදහස් නම් නො එක් සිතිවිලි වෙයි. සමහර කෙණෙක් දසදෙළොස් ඇවිරිදිවිවරයන් කෙරෙහි ඇලුම් කෙරෙති. සමහර කෙණෙක් සග බාල ස්ත්‍රීන් කෙරෙහි ඇලුම් කෙරෙති. සමහර කෙණෙක් මද්ධ්‍යම තරමුන් කෙරෙහි ඇලුම් කෙරෙති. සමහර කෙණෙක් මැළි ගෑණුන් කෙරෙහි ඇලුම් කෙරෙති. නො එක් ලෙසින් වුව ත් පොලොඹා ගනුම්හ'යි එ කී එ කී තැනැත්තෝ ම සරණ යන අවස්ථාව ය, දරුවන් ලබන අවස්ථාව එක් දරුමා අවස්ථාව ය, දෙ දරුමා අවස්ථාව ය; මද්ධ්‍යම තරම් අවස්ථාව ය, මැලි අවස්ථාව ය'යි මුල් අවස්ථා සයක් ඇති ව අත් බැව් සියක් සියක් මවා බුදුන් ළඟට ගොසින් 'මහණ තොපට අපි තුන් බින්න ම අඹු වම්හ'යි කිවු ය. එයි ත් බුදුහු සිත්හි නො ලා කෙ තෙක් වේලා ත් බැණ නො නැඟෙ ත් උන් එ තැනින් නොයන හෙයින් 'පාපී කෙල්ලෙනි, පලා යව්. තෙල ලෙස ම තොප ආයාස ගන්නේ හැයි ද? තෙල ලෙස කළ මනා කෙලෙස් ඇති කෙණකුන් ට ය. සර්වඥවරයන්ට රාගාදි වූ කෙලෙස්හු තොපට ගුණයක් දහමක් නැත්තා සේ නැති වූහ'යි වදරා බණ වදරන සේක්—

'යම් සර්වඥ කෙණකුන්ට ශ්‍රොත ආපත්‍යාදි ඒ ඒ මාර්ගයෙන් නටුවා වූ කෙලෙස්හු පෙරළා පැවැත්මක් නැති හෙයින් නපුරු කොට නසන ලද්දෝ නො වෙත් ද, නටුවා වූ කෙලෙසුන් ගෙන් කිසි කෙණකු ත් උන් අනු ව නො පවත්තී ද, අනන්ත වූ විෂ ය ඇති සර්වඥතා ඥන ය ලැබ සිටියා වූ රාගා දී කෙලෙසුන් නසා ඒ සර්වඥයන් කවර ලෙසකින් තොපට නම්වා ගනු ද? තව ද යම් සර්වඥ කෙණකුන්ට කවර ත් තැනකට පමුණුවා ලන්ට නිසි වූ අෂ්ටොත්තරශතප්‍රභෙද වූ තෘෂ්ණා වූ නැද්ද, තෘෂ්ණා ව සියලු ලෙසින් ම නසා සිටි සර්වඥවරයන් කවර ලෙසකින් තොප කරා නම්වා ගනු ද'යි වදළ සේක. මේ දෙශනාවගේ කෙළවර බොහෝ දෙවියෝ නිවන් දුටහ.

මාරයාගේ දූන් තුන් දෙන ත් එ තැනින් ම සැඟවී පලා ගියහ. බුදුහු ඒ දෙශනා ව ගෙන හැර වදරා 'මාගන්දියෙනි, මම පෙර තව පඤ්චක පමණක් විතා අතික් කුණු කොටස් සත් විස්ස ම දෙවතා දූන්ට නැති විසින් රන් කඳ වැනි අත් බැවූ ඇති දෙව් දූන් තුන් දෙනා දක ත් මා උන් කෙරෙහි ඇල්මෙක් ගින්නෙහි පැළ නො නැඟෙන්නා සේ හට නො ගත. තොපගේ දුවණියන්ගේ ශරීර ය නම් උන්ට ලා තොපට ම යහපත් සේ

Non-Commercial Distribution

වැටෙහෙන බව මුත් දෙ තිස් කුණු කොටසින් ගැවසී ගෙන තිබෙයි. පිරිමැස්ම නම් අසුචි පුරා ලූ කළයක් පිටත සිත්තම් කරන්නාක් වැන්න. ඉදින් මාගේ පය අපවිත්‍රයෙහි ගැවිණි නම් මැ පය පිස්නා දඬු කඩක් ලෙස සිටියා නමුත් මැගේ ඇඟ මාගේ අපවිත්‍ර ව ගියා වූ පය පමණකු ත් නො පිසිමි' වදරා ලා—

"දිස්වාන තණ්හං අරතිං රගං ච-
නාහොසි ඡන්දො අපි මෙථුනස්මිං,
කිමෙවිදං මුත්තකරීසපුණ්ණං-
පාදපි නං සම්ඵුසිතුං න ඉච්ඡෙ"

යන ගාථාව වදාළ සේක. ගාථා කෙළවර බමුණානන් හා බැමිණියන් හා දෙන්න අනාගාමී වූව. සමහරුන්ට අමා සමහරුන්ට වස වන්නා සේ ඒ බණ මාගන්දියා නම් කුඩා බැමිණියට වස වි ය. සෙසු යම් තැනකට ම සප්‍රයෝජන වි ය.

එ හෙයින් නුවණැත්තවුන් විසින් බුදු රජුන් වහන්සේ මාගන්දියා නම් බැමිණිය තමන් වහන්සේ කෙරෙහි වෛර බැඳ ගෙණ බණවන්නී හරසර නො සලකා අරුන් ද මහල්ලන්ට වන ප්‍රයොජන පමණක් සැලකුවා සේ මෙ ලොව විඳිනා ඒසු නො සලකා මත්තෙහි ලබන නිවන් සලකා නො පමා ව වසනු මැනවි.

## 160. යමාමහ පෙළහර වත

තව ද බුදුන්ගේ බුද්ධානුභාව ය දක්වනු සඳහා යමා මහ පෙළහර වත කියමු.

කෙ සේ ද යත්—

එක් සමයෙක රජගහ නුවර සිටාණෝ උපද්‍රවයෙන් මිදෙනු නිසා ගහ උඩ ත් පාත ත් කෙවුළන්ගේ මහ දැල් බඳවා ලා දිය කෙළි කෙළිති. එ සේ උඩ ත් යට ත් දැල් බැඳවූයේ හැයි ද යත්—දිය කෙළිමින් සිටිය දී ගැළවී වැටී ගිය ආභරණෙක් ඇත් නම් ඒ වැද ගෙන තිබෙනු නිසා ය. උඩතින් මහත් කඳන් අවුත් ඇඟ වැද ගනී නමුත් ය යි තව ද කිඹුලුන් දැති මෝරුන් ආදි වූ නො එක් උපද්‍රවයෙන් මිදෙනු නිසා ගහ උඩ ත් යට ත් දැල් බැන්දවිය යුතු ම ය.

එ කල එක් රත් සඳුන් ගසෙක් ගහ උඩ ත ගහ ගාවා සිටියේ වතුරු අවුත් මුල් සේදී වැටී ගොසින් හැලිවල දී ගල්වල

Non-Commercial Distribution

ගැසී විසිරිණ. ඉන් කලයක් විතර ගෙවෙක් ගල් කැටවල ත් ඉළී රළ ගැස්මෙන් සිලුටු ව සෙවෙල් වසා පියා ගහ හොස්සේ අවුත් ගහ උඩත බැදි දල ගැන්නිණ. සවස දල් හකුළන කෙවුළෝ ද සිටාණන්ට පැවු ය. සිටාණෝ මෙ කිම් ද'යි විචාරා රුක් ගැටෙක යනු අසා අසවල් ගැටෙකැ යි දන්නා පිණිස වැකන්න කින් සස්වා ලූහ. ඒ ඇසිල්ලෙහි ම අලතා පිඩක් සේ රත් පැය පෙනී රත් සඳුන් නියා ව හැඟිණ. සිටාණන්ගේ ශාසන භක්ති ය ත් තීර්ථික භක්තිය ත් නැති ව මැදහත් තරමක් ම හෙයින් 'අපගේ ගෙයි සඳුන් දඬු බොහෝව. මින් කුමක් කෙරෙම් දෝ හෝ' යි සිතූහ.

එ සේ සිතා ලා මෙ ලොව රහත් කමට ඇවිදිනෝ බොහෝ ය. මම ඉන් කවුරුත් රහත් බව ත් නො දනිම්. දඬු ලීම දන්නා කෙණකුන් ගෙන්වා ගෙන බන්දකට නභා ලා පාත්‍රයක් ලියවා පියා සාල්ලෙක තබා ලා හුණ දඬු ඊ ඊ තබා බන්ද සැට රියනක් විතර අහසට පාත්‍ර ය නංවා ලා 'ඉදින් මේ ලොව රහත් කෙණෙක් ඇත් නම් ආසින් අවුත් තෙල පාත්‍ර ය ගත මැනැවැ'යි කියමි. යම් කෙණෙක් එ ලෙසින් ඒ පාත්‍ර ය හැර ගත්තු නම් අඹුදරුවන් හා සමඟ උන් සරණ යම්හ'යි සිතූ හ, සිතා ලා සිතූ ලෙස ම පාත්‍ර ය උඩ නංවා ලා 'මේ ලොව රහත් කෙණෙක් ඇත් නම් ආසින් අවුත් තෙල පාත්‍ර ය ගත මැනැවැ'යි කිවූ ය.

පූරණ කාශ්‍යපාදී ස දෙන 'තෙල පාත්‍ර ය තරම් අපට ය. අනික් ගන්ට තරම් කෙණෙක් නැත. දුන මනා අපට මැ' යි කිවූ ය. 'අපි තරමුම් හ'යි කියා ලූ පමණකින් තරම් නියාව අපව දුනෙන් නේ කෙ සේ ද? තරම් අහවතො ත් අහසින් අවුත් හැර ගත මැන වැ'යි කිවූ ය. මෙ ලෙස කියා ත් පස් දවසක් විතර ම අහසින් අවුත් සඳුන් පාත්‍ර ය හැර ගන්නා කෙණකුන් නැති ව ස වෙනි දවස් නිගණ්ඨ නාථපුත්‍ර තමාගේ අතවැස්සන් බණවා ලා 'යව, ගොසින් සිටාණන්ට 'තෙල සඳුන් පාත්‍ර ය අපගේ ආචාරීන්ට ම තරම. නිස්සාර වූ පාත්‍රයක් නිසා අපගේ ආචාරීන්ගේ සාර ගුණ ය අහසින් ගමන් කරවා ප්‍රකාශ නො කරවුව මැන ව. සාර ගුණ හභවන්ට ආසින් ගමන් බැරි නො වෙයි. පාත්‍ර ය ඔබට ම දුන මැනැවැ'යි කියව'යි කිවූ ය. උයි ත් ගොසින් සිටාණන්ට එ පවත කියා ලූ ය. සිටාණෝ 'මා එ සේ දෙන්නේ නැත. ඇර ගත හෙන කෙණකුන් ආසින් අවුත් හැර ගත මැනැවැ'යි කිවූ ය.

නිගණ්ඨ නාථපුත්‍රයා සිටාණන් කරා තෙමේ යනු කැමති ව පෙරාතු කොට ම තමාගේ අතවැස්සන්ට උගන්වන්නේ 'මම ඔබ

Non-Commercial Distribution

ගිය කල එක් අතකු ත් එක් පයකු ත් ඔසවා ආසට නැහෙන්බ ආරම්භයක් සේ කෙරෙමි. තෙපි එ විට 'ආචාරීන් වහන්ස, නිකම දඬු කඩක් නිසා සැහවී තුබූ රහත් ගුණ ය බොහෝ දෙනාට නො පැව මැනවැ'යි කියා ලා මා අත ත් පය ත් බඳ ත් අල්වා ගෙන ඇද බිම හෙලා ගනුව'යි උගන්වා ගෙන නාථපුත්‍රයා සිටාණන්ගේ ඔබ ගොසින් 'මහ සිටාණෙනි, මේ පාත්‍ර ය අනික් කෙණකුන්ට තරම් නො වෙයි. තරම් අපට ම ය. නිකම් ලසු කටයුත්තක් නිසා අප ගේ රහත් ගුණ ය ප්‍රකාශ නො කරව. පාත්‍ර ය දෙවා පිය ව'යි කිවූ ය. සිටාණෝ ද කරණ ලෙසින් ම ආසින් අවුත් පාත්‍ර ය හැරගන්ට උන් අශක්ති නියා ව දැන ලා 'මේ කියා බොහෝ දෙඩීමෙන් කම් කිම් ද? පාත්‍ර ය තරම් වූවොත් ආසින් ආ ගමනින් ම තරම් නියා ව හඟවා ලා පාත්‍ර ය ගත මැනවැ'යි කිවූ ය.

එ කල නිගණ්ඨ නාථ පුත්‍ර 'එසේ වී නම් ඇළව ව යි අතවැස් සන් ඇළකරවා ලා 'අහසට නැහෙමි'යි එක් අතක් ඔසවා ගත. කොතැන ගැසුව ත් බල්ලන් පයක් ඔසවා ගන්නා සේ එක් පය කු ත් ඔසවා ගත. එකල අතවැස්සෝ 'ආචාරීන් වහන්ස, දඬු ගැටකින් කළ පාත්‍රයක් තබා මැණික් පාත්‍රයක් වුව ත් සැහ වී තුබූ රහත් ගුණ ය මුඹ වහන්සේ බොහෝ දෙනාට පැමෙන් ප්‍රයෝජන කිම් දැ'යි නො පැව මනා ලජ්ජාසථාන ය ප්‍රකාශ කළාට බැණ නො නැග ත් අත ත් පය ත් අල්වා ගෙන ඇද බිම හෙළා ගත්හ. නිගණ්ඨ නාථපුත්‍ර ද 'මහ සිට, මූ මා ආසට නැංග නො දෙති. මුන් හැම කට යුත්තෙක හෙළා මා නැංග නො දෙන කල මා කරන්නේ කිම් ද? උනු ත් කියන්නේ කට යුත්තෙක. පාත්‍ර ය දී පියව' යි තමන් යමක් දත නොහෙන්නා සේ උනු ත් දත නො හෙතී දෝ ඉල්වූහ. සිටාණෝ කරණ ලෙසින් ම කරන්නා වඤ්චා වූ නියාව දැන ගෙන 'ආසින් ගොසින් ම පාත්‍ර ය ගත මැනවැ'යි කිවූ ය.

මෙ සේ පූරණ කාශ්‍යපාදීහු ස දවසක් මුළුල්ලෙහි යත්න කො ට ත් බල්ලන්ට පොල් නො පළා ලූවා සේ ආසින් ගමන් තමන්ට බැරි හෙයින් පාත්‍ර ය නො ලත්හ. සත්වන දවස් මුගලන් මහ තෙරුන් වහන්සේ හා පිණ්ඩොල භාරද්වාජ මහ තෙරුන් වහන්සේ හා රජගහා නුවර සිඟමහ'යි ගොසින් එක් ගල් පොත්තෙක වැඩ සිට සිවුරු ගැටවටු ගන්වන කල්හි ධූර්තයෝ එක් ව ගෙන 'පින්වත්නි, පෙර පූරණ කාශ්‍යපාදී ස දෙන 'අපි රහතුම හ'යි කියා ඇවිද්දෝ ය. රජගහා නුවර සිටාණන් රහතුන් තෝරන්ට පාත්‍ර යක් සැටරියනක් විතරට ආසට නංවා තුබූ යේ අදට සත්

Non-Commercial Distribution

දවසෙක. 'ඉදින් රහත් කෙණෙක් ඇත් නම් ආසින් අවුත් හැර ගත මැනවැ'යි සිටාණන් කීව ත් ආසින් ආ කෙණෙක් නැත. මෙ ලොව රහතන් නැති නියා ව අද දතුම්හ'යි කථාවක් ඉපැද වූහ. ඒ කථාව අසා මුගලන් මහ තෙරුන් වහන්සේ පිණ්ඩොල භාරද්වාජ මහ තෙරුන් වහන්සේට 'ඇවැත්නි, තුලුන් කියන බස් ඇසූයේ ඇත්තේ වේ ද? තුලූ තුමූ බුදු සස්නෙහි තරම් විමසන්නා වුන් මෙන් කියති. තෙපි ත් මහානුභාව සම්පන්නයෝ ය. ආසින් ගොසින් තෙල පාත්‍ර ය ගත මැනවැ'යි කී සේක.

අපට වදරන්නේ හැයි ද, මුඹ වහන්සේ සෘද්ධිමතුන්ට අග්‍රය යි ප්‍රසිද්ධ වුව. මුඹ වහන්සේ රහතන් ලොව ඇතිනියා ව හඟවා තෙල පාත්‍ර ය ගත මැනව. මුඹ වහන්සේ ඇර නො ගනිතො ත් මම ඇරගනිමි' කී සේක. මුගලන් මහ තෙරුන් වහන්සේ තමන් වහන්සේ ගුණමකු නො වන බැවින් ඔබගේ ත් ආනුභාව ය හඟ වනු නිසා තමන් ම හැර ගත මැනැවැ යි වදළ සේක. එ සේ වදළ කල්හි පිණ්ඩොල භාරද්වාජ මහ තෙරුන් වහන්සේ සෘද්ධීන් තුන්ගවුවක් විතර දිග පළල ඇති ගල්පොත්ත කබල් ලක් උපුරන කලක් මෙන් උපුටා පුලුන් පෙදක් මෙන් නඟා රජ ගහා නුවරට උඩ ගල්ලැල්ල පය අවුළුවා ගෙන සත් විටක් සිසාරා ඇවිදි සේක. ඒ ගල්ලැල්ල ත් නුවර ත් තුන් ගවු තුන් ගවු විතර හෙයින් සැළිය කට විතර දකණ මාලාවක් මෙන් වසාගෙන සිටී ය.

නුවර වැස්සෝ ද 'තෙල ගල්ලැල්ල අප මිරිකා ගෙන වැටී යේ නමුත් ය'යි හයින් තැති ගෙණ කුලු ආදි ය ඉසට කොට ගෙණ ඒ ඒ තැන සැඟවුණාහු ය. සත් වන වාරයේ දී තෙරුන් වහන්සේ ගලතල පළාගෙන නුවර වැස්සන්ට තමන් වහන්සේ පෙනුණු සේක. හයින් තැති ගත් මිනිස්සු ද තෙරුන් වහන්සේ දැක පිණ්ඩොල භාරද්වාජ ස්වාමිනි, තෙල මුඹ වහන්සේගේ ගලතල තර කොට අල්වා ගත මැනව. අප මෙ තෙක් දෙනා නො නැසුව මැනවැ'යි කිවු ය. තෙරුන් වහන්සේ ද ගල තල පයින් ඉවත් කළ සේක. එයි ත් ගොසින් තමා තුබුව මනා තන්හි තිබිණ. තෙරුන් වහන්සේ ද සිටාණන්ගේ ගෙට උඩ අහස සිටි සේක. සිටාණෝ ද ඔබ දැක බඩින් බැස හෙව වැද ලා 'බැස වදළ මැනව, ස්වාමීනි, කියා ලා ආසින් බට තෙරුන් වහන්සේ වඩා හිඳුවා ලා පාත්‍ර ය බාවාගෙන ශර්කරා ආදි වූ චතු මධුර ය පුරා ලා පාත්‍ර ය තෙරුන් වහන්සේට පිළිගැන් වූ ය. තෙරුන් වහන්සේ ද පාත්‍ර ය පිළිගෙන විහාරයට වඩනට නික්මුණු සේක.

Non-Commercial Distribution

වලට කොළට ගිය යම් කෙණෙක් ඔබගේ පෙළහර නුදුටු වූ නම් ඔහු රැස් ව 'ස්වාමීනි, අපට ත් පෙළහර පෑ වදළ මැනැවැ'යි පසු පස්සෙහි හී ගත්හ. තෙරුන් වහන්සේ ත් ඒ ඒ දෙනාට පෙළහර දක්වමින් විහාරයට වඩිනා සේක. බුදුහු බොහෝ දෙනාගේ කොලාහල අසා අනඳ මහ තෙරුන් වහන්සේ අතින් කුමන අරගලයෙක් දැ යි විචාරා ස්වාමීනි, පිණ්ඩොල භාරද්වාජ තෙරුන් වහන්සේ ආසින් අවුත් සඳුන් පාත්‍ර ය ලත් සේක. ඒ ආශ්චර්‍ය්‍යයට පැවැති කොලාහල ය'යි කී කල්හි භාරද්වාජ තෙරුන් වහන්සේ කැඳවා ලා 'තොප මෙ ලෙස කෙළේ සැබැ දැ'යි විචාළ සේක. 'සැබැ'යි කී කල්හි 'හැයි' භාරද්වාජයෙනි, කුමක් නිසා තෙල ලෙස කළා දැ' යි වදරා ඒ පාත්‍ර ය කැබැලි කැබැලි කොට බිඳුවා පියා වහන්දෑට අඳුන් සඹන්ට දෙවා පියා විකුර්වණ ඍද්ධි ය නො කරන්ට වහන්දෑට සිඛ පද පැනවූ සේක.

තීර්‍ත්‍ථකයෝ ද 'මහණ ගොයුම් පාත්‍ර ය ත් රහත් ගුණ සඟවා ලත් හෙයින් බිඳුවා පියා මෙ වක් පටන් පෙළහර නොකරන්ට ත් තමාගේ සවුවන්ට සිඛ පද පැන වී ල. මහණ ගොයුම්හුගේ සවුවෝ ත් පනවා ලූ සිඛ පද තමන් දිවි නසිත ත් ඉක්ම නො පවත්ති. මහණ ගොයුමු ත් තමාගේ සවුවන් නො කරණ දෙය තෙමේ ත් නො කෙරෙයි. අපට වූයේ මහත් වලයෙකැ'යි නුවරට පලා ගොසින් ඒ ඒ තැන සිට ගෙණ අපි අපගේ රහත් ගුණ රකිනමෝ දඬු කඩක් නිසා අපගේ රහත් ගුණ නිධාන රක්නා සේ දප අප කෙරෙහි තබා රැකි බව මුත් අනුන්ට නො හැඟවූම්හ. මහණ ගොයුම්හුගේ සවුවෝ තමන් නිස්සාර හෙයින් බලවත් දෙයකු ත් නො ව දඬු කඩක් නිසා තමන්ගේ ගුණ ය බොහෝ දෙනාට හැඟවූ ය. මහණ ගොයුම්හු තමන් ගුණ කුම් වුව ත් නුවණැති හෙයින් ඒ පාත්‍ර ය බිඳුවා සවුවන්ට කළ දෙය කළ ත් මතු නො කරන්ට සිඛ පද පැනවූ ය. මෙ වක් පටන් අපි මහණ ගොයුම් හා සමග පෙළහර කරම්හ. පසු නො බසුම්හ'යි කියා ඇවිදිති.

බිම්සර මහරජහු ඒ කථාව අසා බුදුන් ළඟට ගොසින් 'ස්වාමීනි, මුඹ වහන්සේසවුවන් වහන්සේට පෙළහර නො කරණ ලෙසට කොට වදළ සම්මත ඇද්දැ' යි කී ය. 'එ සේ ය' යි වදළ සේක. 'දැන් තීර්‍ත්‍ථකයෝ මුඹ වහන්සේ ලා එක් ව පෙළහර කරම්හ'යි කියති. කළ මනා කුමක් දැ යි කිවූ ය. මහ රජ ඌ පෙළහර කෙරෙත් නම් අපි ත් කරම්හ'යි වදළ සේක. 'හැයි, ස්වාමීනි. සිඛ පද පනවා වදළේ ඇත්තේ වේ ද? එ සේ වන්නා කෙ සේ දැ' යි කිවූ ය.

Non-Commercial Distribution

මම, මහරජ, මට සිඛ පද නො පනවමි. මා පැන වූ සිඛ පද නම් මාගේ සවුවන්ට ම ය'යි වදාළ සේක. 'මුඹ වහන්සේ හැර ත් පන වන සිඛ පද ඇද්ද'යි විචාළහ. 'එ සේ වී නම්, මහ රජ තොප ම විචාරම්හ.

'මහරජ, තොපගේ රට අඹ දඹ ආදිය ඇති උයන් ඇද්ද'යි විචාළ සේක. 'ඇතැ'යි කිවු ය. 'ඉදින්, මහ රජ තොපගේ උයන් වලින් බොහෝ දෙනා අවුත් අඹ ආදිය කත් නම් කළ මනා කිම් දැ'යි විචාළ සේක. 'අඹ ආදිය කැවන්ට දඬ ඇත්තේ වේ දැ'යි කිවු ය. 'උයන අඹ ආදිය තොපට ලැබේ ද, නො ලැබේ දැ'යි විචාළ සේක. සවාමීනි, මට දඬ නැත. මාගේ උයන්වල අඹ ආදිය මා අනුභව කරණ කල වළකන්නෝ කවුරු දැ' යි කිවු ය. 'මහ රජ තොප එක් දස් දෙ සියයක් ගවු පමණ රටක් කරණ තැනැත්තවුන් උයන්වල අඹ ආදිය කන කල දඬ නැති කල සෙස්සන්ට දඬ ඇති කල මාගේ ආඥව කෙළ ලක්‍ෂයක් සක් වල පවතු ත්, එ හෙයින් මාගේ විධාන ය අනුන්ට මුත් මට නැත. පෙළහර කෙරෙමී තොපගේ උයන්වල අඹ ආදිය කෑ කල තොපට දඬ නැත්තා සේ ම අනුන් නො කරන්ට විධාන කළ දෙය මා කළෑ යි වරද නැතැ'යි වදාළ සේක.

තීර්ථකයෝ ද ඒ කථාව අසා ආදායත්තයක් සිතා කරණ කියන දෙයක් නො වන බැවින් සඳුන් පාත්‍රයට තරමුම්හ යි කියා ත් අපගේ ම නො තරම හැහවුම්හ. දනු ත් මහණ ගොයුම් හා සමග පෙළහර කරම්හ'යි කියා ත් වෙන ම වියවුලෙක් වද්දී. ආදි කුම් චුව ත් මෙ වක් පටන් නටුම්හ. මහණ ගොයුම්හු සිඛ පද පැනවූයේ සවුවන්ට ම ල. ඒ විධාන තමන්ට නැත් ල. තුමූ ම දන් පෙළහර කෙරෙත් ල. කුමක් කරමෝ දැ'යි ඔවුනොවුන් හා කථා කළහ. බිම්සර මහ රජ ද බුදුන් කරා ගොස් සවාමීනි, පෙළහර කවර කලෙක වේ දැ'යි විචාළහ. 'මෙ තැනට සාර මසක් ගිය කල ඇසළ මස පුර පසළොස් වක ය'යි වදාළ සේක. 'කොයි දී දැ'යි' සවාමීනි'යි රජ්ජුරුවෝ විචාළහ. 'මහ රජ, සැවැත් නුවරදී ය'යි වදාළ සේක බුදුහු කුමක් නිසා මෙ සේ ම දුර දී පෙළහර කරන්ට සිතා වදාළ සේක් ද යත්—කවර ත් බුදු කෙණකුන් වහන්සේ තීර්ථක මර්ත ය නිසා යමා මහ පෙළහර කරණ සේක් වී නම් එ තැන දීම හෙයිනුත් කව ද බොහෝ දෙනා රැස් වනු නිසා ත් දුරු බා නිල කළ සේක.

තීර්ථකයෝ ඒ කථාව අසා ''මෙ තැනට සාර මසක් විතර ගිය කලට මහණ ගොයුම්හු සැවැත් නුවර දී පෙළහර කෙරෙත් ල.

Non-Commercial Distribution

මෙ වක් පටන් උන් අත් නො හැර ම ඇවිදුම්හ. බොහෝ දෙනා ත් අප දක මේ කිම් දැ'යි විචාරති. අපි උන්ට කියන කල 'මහණ ගොයුම්හු හා පෙළහරක් කරම්හ'යි බසක් කියා පූම්හ. උඹ අප කෙරෙහි හයින් පලා යෙති. උන් ලුහුබඳවා පියා අල්වන්ට යන නියා ය'යි කියම්හ. එයි ත් එක් මිනිසා වත් කමෙකැ'[1]යි කථා කොට ගත්හ. බුදුහු ත් රජගහ නුවර සිහා වළඳා ලා නික්මුණු සේක. තීර්ථකයෝ ත් පස්සේ නික්ම බුදුන් වැළඳූ තැන තුමූ ලගිති. බුදුන් සැතපුණු තැන දී තුමූ බත් කති. දුටු දුටු කෙණකුන මේ කිම් දැ'යි විචාළ කල තමන් ආදි කියා ගෙන හුන් ලෙස ම කියති. බොහෝ දෙනා ත් පෙළහරෙයි සවරූප තිර්ථකයන් ගෙන් ම ප්‍රසිද්ධ හෙයින් පෙළහර බලන්ට නික්මුණාවූ ය.

බුදුහු සැවැත් නුවරට වැඩි සේක. තීර්ථකයෝ බුදුන් හා කැටිව ම ගොසින් තමන්ට උපාසක ව හිඳිනවුන් සමාදන් කරවා ගෙන මසු ලක්‍ෂයක් ලදින් කපට කිහිරි කප ම ලවා මණ්ඩපයක් කරවා නිල් මහනෙල් මල් පෙත්තෙන් හොයවා ලා පෙළහර මෙ තැනදී ම කරම්හ'යි හුන්හ. පසේනදි කොසොල් රජ්ජුරුවෝ බුදුන් කරා ගොසින් 'සවාමීනි, තීර්ථකයෝ තමන්ට පක්‍ෂ කෙණකුන් හැර ගෙන මසු ලක්‍ෂයක් දී ලා මණ්ඩපයක් කරවා ගත්හ. මම ද මුඹ වහන්සේට මණ්ඩපයක් කරවා දෙම්' කීහ. 'මහ රජ, නො කැමැත්තෙමි. අපට මණ්ඩප කරවන්නෙනා් ඇතැ'යි වදළ සේක. මණ්ඩපයක් කරවා දී ලන්ට මා විනා අනික් ශක්ති ඇත්තෝ කවුරු දැ'යි කිවු ය. 'මහ රජ, සක් දෙවිඳු ය' යි වදළ සේක. "සවාමීනි, පෙළහර කරන්නේ කො තැනක දී දැ'යි විචාළෝ ය. 'මහරජ, ගණ්ඩම්බ නම් අඹ ගස මුලදීය' යි වදළ සේක තීර්ථකයෝ අඹ ගසක් මුල දී බුදුන් පෙළහර කෙරෙති' පරම්පරා කථාවෙන් අසා තමන්ට පක්‍ෂ ව හිඳිනවුන්ට කියා ලා සතර ගවුවක් ඇතුළත යටත් පිරිසෙයින් එ දවස් නැඟී අඹ පැළ දක්වා ත් උදුරුවා ගණ්ඩම්බ නම් අඹ ගස තෝරන්ට කළා සේ වලට දමාපූ ය.

බුදුහු ත් ඇසළ මස මැදි පොහෝ දවස් ඇතුළු නුවරට සිහා වන් සේක. රජ්ජුරුවන්ගේ ගණ්ඩම්බ නම් වූ උයන් ගොව් ද විළිකුන් අඹ එ වකට නිමිලූ ව ත් දිඹිති කැදූල්ලක් ඇතුලේ තිබී විළික්සුණු අඹයක් රස ලොභයෙන් පිරිවරා හුන් පක්‍ෂීන්ගේ වශයෙන් දක උන් නෙර පියා අඹ ය කඩා ගෙන රජ්ජුරුවන්ට

---

[1] එක් මිනිස් කමෙකැ'යි— එක් මිනිස් වැනි කමෙකැ'යි
එක් මිනිස් වත් කමෙකැ'යි—එක් මිනිස් වන් කමෙකැ'යි

Non-Commercial Distribution

දෙන්ට යන තැනැත්තෝ අතුරු මඟ දී බුදුන් දැක 'රජ්ජුරුවන් වහන්සේ මේ අඹය මේ නිමවූ සේක්නම් සමාධිව මට අට මස්සක් හෝ සොළොස් මස්සක් හෝ දෙවා වදරන සේක. මාගේ දෛව එ පමණකට ම හෙයින් වඩා නැත. උන් වහන්සේ ගෙන් ලත් අට මස්සක් වුව ත්, සොළොස් මස්සක් වුව ත් මේ ඒක ජාතියේ පමණකු ත් මා රැක පිය නො හෙයි. ඉදින් මම මේ අඹ ය බුදුන්ට පිළිගන්වා පීම් නම් අනන්ත කාලයක් මුළුල්ලෙහි මට ලෞකි සම්පත් සාධා දීලා එක ආම්‍ර ඵලයට ශ්‍රාමාණ්‍ය ඵල සතර වුව ත් සාධා දී ලයි' සිතා උඟ ඒ අඹ ය බුදුන්ට පිළිගන්වන්ට ගෙන ගියහ. බුදුන් අනඳ මහ තෙරුන් වහන්සේ මූණ බලා වදාළ සේක. ඔබ ද වරම් රජුන් දුන්නා වූ මුං වන් සල ගල් පත්‍ර ය පිළිගන්වා ලූ සේක.

බුදුහු ත් පාත්‍ර ය පෑ ලා අඹ ය පිළිගෙන අඹ ය දුන් උයන් ගොවුවාණන්ට ලෞකි ලොවුතුරා සැප ත් නිල කරවා එ තැන් හි දී ම අඹ ය වළඳනු කැමති ව වදාළ සේක. තෙරුන් වහන්සේ සඟළ සිවුර සතර පට කොට ලා පනවා ලූ සේක. එහි වැඩ හුන් කලට තෙරුන් වහන්සේ පැන් පරහා ගෙන අවුත් අඹ ය මැඩ අඹ පැන් කොට ලා දෙවා ලූ සේක බුදුහු අඹ පැන් වළඳා ලා ගණ්ඩම්බයන්ට 'තෙල, අඹ ඇටය නිකම් දමා නො පියා මෙතැනම පස් පීරා ලා හිඳුවා ලව'යි වදාළ සේක. උයි ත් එ ලෙස ම කළහ. බුදුහු ත් හිඳුවා ලූ අඹ ඇට මත්තට අත සෝධා වදාළ සේක. බුදුන්ගේ ශ්‍රී හස්ත ය තෙමා ගෙන පැන් වැගිරෙන්නා ම අඹ කඳ නඟුලිසක් සා ව ලා උසින් පනස් රියන් ව පැන නැංගේ ය. සතර දිගට ගිය සතර කඳ ත් මුදුනට ගිය කඳ ත් පනස් පනස් රියන් පමණ ය.

එ හෙයින් ඒ අඹ ගස මුල පටන් අගට සියක් රියන් උස ය. නැගෙන හිර අතු අග පටන් බස්නා හිර අතු අගට සියක් රියන. දකුණු දිග අතු අග පටන් උතුරු දිග අතු අගට ත් සියක් රියන. සෙවන මඩුල්ලවට තුන් සියක් රියන. ඒ අඹ ගස ඒ ඇසිල්ලෙහි ම මල් පල්ලෙන් සැදී සිටි ය. විළිකුන් අඹ ත් පඩරු අඹ ත් මූකළ අඹ ත් පැසී ලන තරම් අඹ ත් මැලැසි අඹ ත් ඇති වී ය. මාගී ඵල හා සමඟ ලබන අභිඥ සේ ම මල් කැනු ත් ඇති වී ය. බුදුන්ට පසු ව ලා වඩිනා වහන්දෑ එ ගසින් විළිකුන් අඹ වළඳා ම වැඩි සේක. රජ්ජුරුවෝ ත් මෙ තරම් අඹ ගසක් ඇති වී ල, යනු අසා කපා නො පියන ලෙසට තර කොට රකවල් ලවා ලූහ.

Non-Commercial Distribution

ඒ අඹ ගස ත් ගණ්ඩම්බ නම් උයන් ගොව්වා හිඳුවා ලූ හෙයින් ගණ්ඩම්බ ය යි ප්‍රසිද්ධ වි ය. එ තැනට සම්හ වූ ධූර්තයෝ ත් අඹ ගසට රකවල් මුත් විලික්සි වැගිරෙන අඹයට රකවල් නැති හෙයින් අවුළා කා පියා 'කොල දූෂ්ට වූ නිවට කොල්ලෙනි, මහණ ගොයුම් ගණ්ඩම්බ නම් අඹ ගස මුළදී පෙළහර කරන්නේ ය'යි ඒ බොරු කරන්ට සතර ගවුවක් ඇතුළත එ දවස් නැඟී අඹ පැළ ත් උදුරා දම්මවා ඇවිද්දවු ද? හෙම්බා, ඒ කියන ගණ්ඩම්බ ය නම් තෙලේ ය. තෙලේ ගණ්ඩම්බ වූයේ හුදක් ගණ්ඩම්බ නම් උයන් ගොව්වා ඇති කළ හෙයින් ම නො වෙයි. තෙල ලෙසිනු ත් ගණ්ඩම්බ වූව මැනවැ'යි කියන්නාක් මෙන් කා කාපු ඇට බා ල මරා තීර්ථකයන් ඇඟ ගඩු නංවා පූහ.

සක් දෙව්ඳු ද වාතවලාහක දෙව් පුතුන්ට තීර්ථකයන් ඉදිකළ මණ්ඩප ය සුළඟක් හමවා ලා, කසල ගොඩට දමවා පියව යි විධාන කොළෝ ය. උයි ත් එ ලෙස ම කළහ. සූර්‍ය්‍ය දිව්‍ය පුත්‍රයා ණන්ට අවුව තද කරන්ට විධාන කළහ. උයි ත් අවුව තද කළහ. නැවත සක් දෙව්ඳුහුගේ ම විධානයෙන් වාතවලාහකයෝ මහ සුළඟක් හමවා ලා අවුව තද ව ඩා වගුරුවා හුන් තීර්ථකයන් ඇඟට ධූලි නංවා පුරා ලූ ය. උන්ට පෙළහර නම් එ ම වන්නා සේ තුඹස් ගොඩවල් මෙන් වූහ. සක් දෙව්ඳුහුගේ විධානයෙන් ම වස්සවලාහකයෝ ද දළ දළ කොට ලා පොද වස්වා ලූ හ. එ කල තීර්ථකයෝ කබර ලා ගොන් මෙන් තිත් ගැසී ගියහ. ඌ තුමූ පෙළහර තබා බොහෝ විපිළිසරට පැමිණ තමන්ගේ ආසින් ගමන් නැත ත් දූක සේ කරවා ගත් මණ්ඩප ය සුළඟේ ගිය හෙයිනු ත් තමන් තේජසක් නැත ත් හිරු තේජස මහත් ව අභිමාන ගුණ ය වැගිරෙන්නා සේ බොහෝ ඩා ත් වැගිර ගොසින් පෙරළා හමන සුළඟ ගිම් නිවන්ට ත් නො ව ධූලි ගෙනවුත් ඇඟ පුරා පී හෙයින් රහමඩලකට කොමාලින් සේ ම ව ගොසින් පසු ගසන පොද බිඳ ත් සන ව වැස පිපාසා නිවා පැනක් බී පියන තරමට දිය හෙළා වැස පියන්ට ත් නො ව දළ දළ කොට ලා තුනී නො ව වැස පී හෙයින් කබර ලා ගොන් සේ ව පියා තමන් දන්නා පෙළහර නම් එ ම හෙයින් කිසි ත් පිහිටක් නැති ව ඉස් ලූ ලූ අත දිවන්ට වන්හ.

නිවටුන් මෙ ලෙසින් නික්මුණු කලට පූරණ කාශ්‍යපයාට උපාසක ව හිඳිනා එකෙක් සීයක් සාමින් සිට 'මේ අපගේ රහතන් පෙළහර කරණ වේලා ය. සී පසුව ත් සාන්ට හැක්ක, පෙළහර බැලුව මැනවැ'යි සිතා සානා ගොන් උනා හැර පියා

Non-Commercial Distribution

උදුසන උළුකැන් ගෙනා කළය ද රැන බාන් ද හැර ගෙන එන තැනැත්තෝ පූරණ කාශ්‍යපයා තමා නො රහත් නියා ව හඟවන්නාක් මෙන් උපන් වතින් දුවන්නහු දැක 'ස්වාමීනි, මම සානා සීත් අදට දමා පියා මුඹ වහන්සේලාගේ පෙළහර බලන්ට එමි. මුඹ වහන්සේ වඩනේ කොයට දැ'යි කිවු ය. තාගේ වළාම් පෙළහර තබා මට තෙල කළය ත් රැණ ත් දී පියව'යි කියා ලා නො සිටිනා ගෙරි සරක් බැඳ ගෙන කිරි දෝනට යන එඬේරකු මෙන් කළය ත් රැණත් හැර ගෙන ගඟ බඩින් ගොසින් රැණෙන් කළ ය බැඳ ලා තමා බොටුවෙ බැඳ ගෙන දිය පිට පැන කිමිද කුඩමස්සන් අල්වන්ට බසිනා කෙවුළු කොල්ලෙකු මෙන් දියබුබුළු නංව නංවා ගිලී ගොසින් මිය ආයු පමණින් සිටිය ත් යන්නා ඔබ හෙයින් අවීචියෙහි උපන.

සක් දෙවිඳු ද ආස රුවන් සක්මනක් මැවූහ. ඒ සක්මන එක් කෙළවරක් නැගෙනහිරි සක්වළ ගල් මුව විට වි ය. එක් කෙළවරක් බස්නාහිර සක්වල ගල් මුව විට වි ය. බුදුහු ත් පෙළහර බලන්ට බොහෝ දෙන අවුත් එක්සිය සැට ගවුවෙක විතර සැලසී සිටි කලට පස්වරු වේලේ දූන් පෙළහර පානා වේලා ය යි ගඳකිළි ඇතුලතින් නික්ම පෙරමාලේ වැඩසිටි සේක. එ කල සරණී නම් අනාගැමි උපාසිකා කෙණෙක් තමන් බලවත් සෘද්ධි ඇති හෙයින් බුදුන් කරා අවුත් 'ස්වාමීනි, දරුවන්ගේ ප්‍රයෝජන නම් මෙ සේ වූ තැනට වේ ද? මා තරම් දුවක හින්ද දී මුඹ වහන්සේ ආයාස ගන්නේ හැයි ද, මුඹ වහන්සේ පෙළහර දක්වා වදාළ මනා එක අවධියේ අනිකුත් බුදු කෙණකුන් වහන්සේ ඇත්නම් ඔබ හා එක් ව වේ ද? බැලූවන්ට රිසියෙන්නෙ ත් එසේ ය. කාමරාග ව්‍යාපාද නිඃශෙෂයෙන් පැසුණු හෙයින් තෙල කොල්ලන් හා ස්පර්ධාවට මම ත් තරම නො වෙමි. එ තෙකුදු වුව ත් මුඹ වහන්සේ රඳවන නිසා මම පෙළහර දක්වමී' කිවු ය.

බුදුහු ද උන් හා සිංහනාද කරවනු පිණිස 'සරණීනි, පෙළහර කෙලෙස කරවු දැ'යි වදාළ සේක. එක් සක්වළෙක මහපොළොව මුහුදක් කොට මවා ලා මම දියකා වෙසක් මවා ගෙන කිබිස පියා නැගෙනහිර සක්වල ගල කෙරෙන් හිස නහා ලමි. එ තැනින් කිබිසි කල බස්නාහිර සක්වල ගල කෙරෙන් හිස නහා ලමි. දකුණු දිග සක්වල ගල කෙරෙන් කිබිසි කල උතුරු දිග සක්වළ ගල කෙරෙන් හිස නහමි. එ තැනින් කිබිසි කළ දකුණු දිග සක්වළ ගල කෙරෙන් ඉස නහමි. වටින් කිබිසි කල මධ්‍යයෙන් හිස නහමි. මධ්‍යයෙන් කිබිසි කල වටින් හිස නහමි.

Non-Commercial Distribution

කුලූ කවුරු දැ'යි විචාළ කල්හි සරණී නම් අනගැමි උපාසිකා කෙණෙකැ යි කියති. ගෑනු ව සිටි මුන්ගේ ආනුභාව ය මෙ තරම් කල බුදුන්ගේ ආනුභාව කවර තරම් දැ'යි තීර්ථකයෝ මුඹ වහන්සේ නො දැක ම පලා යෙති' කීහ. බුදුහු 'සරණීනි, තොප එ බඳු බල ඇති නියාව දනුමහ. එ තකුදු වුව ත් මේ තොප පිළිබඳ දෙයක් නො වෙ'යි වදළ සේක.

ඉක්බිති අනගැමි වූ සුළු අණේපිඩු සිටාණෝ 'මා වැනි අනගැමි උපාසකයෙකු ඉන්ද දී මුඹ වහන්සේ ආයාස ගන්නේ හැයි ද? මම පෙළහර දක්වමි' කියා ලා කවර ලෙස පෙළහර කරවු දැ'යි විචාරා වදළ කල්හි 'මම, ස්වාමීනි, අට සාළිස් ගවුවක් විතර උස ඇති බඹ අත් බැවක් මවා ගෙන මේ සා මහත් පිරිසක් මැද මෙස නාදයක් වැනි වූ බ්‍රහ්මනාද පවත්වමින් අත් පොළසන් දෙමි. බොහෝ දෙන මේ කුමන කොලාහලයෙක් දැ යි විචාළ කල්හි සුළු අණේපිඩු සිටාණන් බඹ වෙස් මවා ගෙන අපොළන නියා ය යි කී කල්හි තීර්ථකයන්ට හය උපදවමින් ප්‍රශංසා කෙරෙති. තීර්ථකයෝ ද 'මහණ ගොයුම් හට උපාසක ව සිටි සිටාණන්ගේ ආනුභාව මෙ තරම් කල මහණ ගොයුම්හුගේ ආනුභාව ය කියනුම කිම් දැ'යි මුඹ වහන්සේ නො දැක ම පලායෙති' කිවු ය. බුදුහු එයි ත් නො ගිවිසි කල්හි උයි ත් ඉවත්ව ලා සිටියහ.

ඉක්බිති ව චිරා නම් රහත් සාමණේරී කෙණෙක් ගුණෙන් මූකුරා සිටිය ත් තුමූ සත් හැවිරිදි වූවාහු බුදුන් වැඳ ලා 'මේ තීර්ථකයන් පමණකට මම පෙළහර කෙරෙමී' කිවු ය. පෙළහර කරන්නේ කෙ සේ දැ යි විචාළ කල්හි 'ස්වාමීනි, මම මහ මෙර ද සක්වළ ගල ද හිමාල ය පර්වත ය ද මෙ තැනට ගෙනවුත් මෙ තැන පිළිවෙළින් තබා ලා මම මෙහෙණිනි වෙස හැර ලා හංස ධෙනු වෙසක් මවා ගෙන මහමෙර ත් සක් වල ගල ත් හිමාල ය පර්වතය ත් තුන එක් කොට විද අවුණන්නා සේ මඳ පැකිළීමකුත් නැති ව විනිවිද ගෙන යෙමි. බොහෝ දෙන මා දැක මූ කවුරු දැ යි විචාරා මා නියාව දනිති. තීර්ථකයෝ ද සිත කණ වුව ත් ඇස් නො කණ හෙයින් මේ පෙළහර දැක 'මුන් මේ තරම් කල මහණ ගොයුම්හුගේ ආනුභාව බලවත් ම වේනු'යි සිතා මුඹ වහන්සේ නො දැක ම පලා යෙති' කීහ. බුදුහු එයි ත් නො ගිවිසි කල්හි තව ද පිළිසිඹියා පත් රහත් සත් හැවිරිදි වුන්ද නම් හෙරණ කෙණකුන්දැ බුදුන් වැඳ ලා දෙ මවු පියන්ට බාල දරුවන් කරණ දෙය නම් සුරතලක් සේ වේ ද, මම පෙළහර කරමී' කී සේක.

Non-Commercial Distribution

'පෙළහර කරන්නේ කවර ලෙස දැ යි විචාළ කල්හි 'මම ස්වාමීනි, දඹදිවට සලකුණු වූ මහ දඹ ගස අල්වා ගෙන සොල්වා මහ දිය කළ සා දඹ වගුරුවා ගෙණ අවුත් 'එක් සිය සිවු සාළිස් ගවුවෙක පැතිර සිටි පිරිසට බඩ පුරා කන පරිද්දෙන් දී ලමි. ඒ කා ලා සිටියවුන් පළදනා ලෙසට තව්තිසා දෙව් ලොව ගොසින් පරසතු ගසින් මල් සලා වගුරුවා ගෙනවුත් දෙමි' කී දැ ය. බුදුහු එයි ත් නො ගිවිසි හෙයින් උපුල්වන් මහා සථවිරින්දැ බුදුන් වැඳ ලා 'ස්වාමීනි, මුඹ වහන්සේගේ ගැනු දූ බව මුත් මුඹ වහන්සේගේ සෙසු ගැනු දූන් ගෙන් මට වඩා සෘද්ධිමත් කෙණෙක් නැත. මා තරම් දූවක ඇති ව මුඹ වහන්සේ ආයාස ගන්නේ හැයිදැ, මම පෙළහර කෙරෙමි' කී දැ ය. 'තොපි පෙළහර කවර ලෙස කරා දැ'යි විචාළ කල්හි 'ස්වාමීනි, මෙ වක සක් විති කෙණෙක් නැත්තෝ වේ ද, දිගින් ත් පළලින් ත් අට සාළිස් ගවුවෙක පැතිර සිටි වටින් එක සිය සිවු සාළිස් ගවුවෙක පැතිර සිටි සක් විති පිරිස් ඇති ව සක් රුවනින් සමන්විත වූ සක්විති වෙසක් මවා ගෙන අවුත් මුඹ වහන්සේ වඳිමි. බොහෝ දෙනා මා දැක විචාරති. විචාරා මා නියාව දනිති. තීර්ථකයෝ ද සියලු ලෙසින් දුර්වල ව සිටි ගැනු පක්‍ෂයෙහි ආනුභාව මෙ තරම් කල මහණ ගොයුම්හුගේ ආනුභාව නම කවර තරම් දැ'යි මුඹ වහන්සේට ලං නො වම යෙති' කී දැ ය.

බුදුහු එයි ත් නො ගිවිසි හෙයින් උපුල්වන් මහ , සථවිරින් දැ ත් ඉවත් ව ලා සිටි පස්සේ බුදුන්ට ඉක්බිති සෘද්ධිමත් මුගලන් මහ තෙරුන් වහන්සේ බුදුන් වැඳ ලා 'ස්වාමීනි, නන්දෝපනන්ද දමනයෙහි නන්දෝපනන්ද නම් නා රජහු දරණ පට සතෙකින් මහ මෙර වෙළා ගෙන ඵණයෙන් මෙර මුදුන වසා අඳුරු කළ කල්හි උගේ සත් පටට තුදුස් පටක් ලා ලා ඵණ ය මත්තෙහි ඵණ ය තබා ගෙන මැඩ මිරිකා ඌට කළ දෑය දැක වදළ මම පෙළහර දක්වමි' කී සේක. ඒ වන්නා දුටුමෝ වේ ද? තව කවර ලෙස පෙළහර කරවුදැ'යි විචාළ සේක. 'මම ස්වාමීනි, එක් ලක්‍ෂ අට සැට දහසක් යොදුන් උස ඇති සුවා සූ දහසක් යොදුන් ඝන ය ඇති මහ මෙර මාගේ දත් හස්සේ තබා ගෙන බැඳ පු උඳු පියල්ලක් මෙන් සපා කත ත් පිළිවනැ'යි වදළ සේක.

'අනික් කුමක් පිළිවන් දැ'යි විචාළ කල්හි 'ස්වාමීනි, දෙ ලක්‍ෂ සතළිස් දහසක් යොදුන් බොල් පොළොව පාන් කඩක්[1] සේ හකුළුවා ගෙන ඇඟිලි හස්සේ තබා ගනිමි' කී සේක. අනික් කුමක් කරා දැ'යි විචාළ කල්හි මේ මහ පොළොව යට පිට උඩ ත් කොට

1 කටසාරකං විය – ධම්මපදට්ඨ කථා

Non-Commercial Distribution

පෙරළා ගෙණ පොළොව රස ඕජා ව ගෙවලට ගොස් බත් පැන් අනුභව කරණ තෙක් පෙළහර බලන්ට රඳා සිටිනා ලෙසට අනුභව කරවමී වදළ සේක. 'අනික් කුමක් කරා දූ'යි විචාළ කල්හි 'මේ දඹ දිව මාගේ වමත්ලෙහි තබා ගෙණ දඹ දිව් වැස්සන් අනික් දිවයිනෙක ලා පියමී' වදළ සේක. 'අනික් කුමක් කරවු දූ'යි විචාළ කල්හි 'මහ මෙර කුඩ දණ්ඩක් කොට ගෙණ මහ පොළව කුඩ මැඩිල්ලක් සේ ඊ මත්තේ තබා ගෙණ පත් කුඩයක් හැර ගෙණ සක්මන් කරණ භික්ෂු කෙණකුන් පරිද්දෙන් මෙර දඬු පොළෝ කුඩ ය හැර ගෙණ ආස සක්මන් කෙරෙමී' කී සේක. 'තොප ත් එ බඳු ආනුභාව ඇති නියාව දනුම්හ. සුළු අනේපිඬු සිටු ආදීනු ත් තමන් තමන් කියා ලූ තරමෙම් පෙළහර දක්වන්ට බල ඇති නියාව දනුම්හ. එ තකුදු වුව ත් මේ තොප හැම දෙනා පිළිබඳ දෙයක් නො වේ'යි වදළ සේක. 'අප හැම තැන් ගේ පෙළහරට ත් වඩා බලවත් පෙළහරක් වුව මනා තැනක් නියා ය'යි සිතා ලා ඉවත් ව ලා සිටි සේක.

එ වේලෙහි බුදුහු මුහලන් මහ තෙරුන් වහන්සේ බණවා ලා 'එක් සිය සිවු සාළිස් ගවුවෙක පැතිර සිටි පිරිස් මද්ධ්‍යයෙහි 'තොප හැම දෙනාගේ ආනුභාව ප්‍රකාශ වන ලෙසට තොප හැම ලවා සිංහ නාද කරවන්ට මුත් බුදුවරුන්ට ම ආවෙණික ව පැමිණි කට යුත්ත තොප හැම දෙනාට බැරි ය. මම නම් කවුරුන් හා ත් සම නො වෙමි. මට පැමිණි බරක් මා ම උසුලා මුත් අනික් කෙ තෙක් දෙනා ත් සොලවා ලිය නො හෙති. දූන් බුදු වූ අවස්ථාවේ තබා නන්දිවිසාල නම් වූ ගොන් ව උපන් කල ත් මා තනි ව ඇද ලූ ගැල් කෙ තෙක් දෙනා ත් ඇද ලිය නුහුණු වූ ය'යි වදරා ලා—

"යතො යතො ගරුධුරං—යතො ගම්භීර වත්තනී,
තදස්ස කණ්හං යුඤ්ජන්ති—ස්වාස්සු තං වහතෙ ධුරං,
මනාපමෙව භාසෙය්‍ය—නාමනාපං කුදාචනං,
මනාපං භාසමානස්ස—ගරුං භාරං උදබ්බහි.
ධනඤ්ච නං අලබ්භෙසි—තෙන චත්තමනො අහු.

යනාදීන් නන්දිවිසාල ජාතක ය විස්තර කොට වදරා තමන් වහන්සේ කරණ යමා මහ පෙළහර තමන් වහන්සේට මුත් ඔබකට බැරි නියාව සාධා ලා රුවන් සක්මනට නැඟි සේක. බුදුන්ට පෙරටු ව ත් පිරිස අට සාළිස් ගවුවෙක සිටියහ. පිටි පස්සෙ ත් අට සාළිස් ගවුවෙක ම සිටියහ. දකුණ ත් පස වම ත් පසත්

Non-Commercial Distribution

එ සේ ම සිටියහ. එක් කොට දිගින් පළලින් සයානූ ගවුවෙක පැතිර සිටීයහ. වටින් දෙ සිය අසූ ගවුවෙක පැතිර සිටියහ. බුදුහු මැද වැඩ සිට යමා මහ පෙළහර කරණ සේක.

යමා මහ පෙළහර කෙළේ කවර ලෙස ද යත්—තෙජො කසිණයට සම වැද ලා එයින් නැඟී පෙකිණියෙන් උඩ වූ ශරීර භාගයෙන් ගිනි කඳ පවත් වන සේක. ආපො කසිණයට සම වැද ලා එයින් නැඟී පෙකණියෙන් පාත ශරීර භාගයෙන් දිය කඳ පවත් වන සේක. පෙරළා දිය කඳ පැවැති අධඃ කයින් ගිනි කඳ පවත් වන සේක. ගිනි කඳ පැවැති ඌර්ධව කයින් දිය කඳ පවත් වන සේක. බඩ දසාවේ ශරීර භාගයෙන් ගිනි කඳ පවත් වන සේක පිට දසාවේ ශරීර භාගයෙන් දිය කඳ පවත් වන සේක. දිය කඳ පැවැති පිට දසාවෙන් ගිනි කඳ පවත් වන සේක. ගිනි කඳ පැවැති බඩ දසාවෙන් දිය කඳ පවත් වන සේක. තව ද දකුණු ඇසින් ගිනි කඳ පවත් වන සේක. වම් ඇසින් දිය කඳ පවත් වන සේක. පෙරළා වම් ඇසින් ගිනි කඳක් හා දකුණැසින් දිය කඳක් පවත් වන සේක. තව ද දකුණු කන් සිදුරෙන් ගිනි කඳක් හා වම් කන් සිදුරෙන් දිය කඳක් පවත් වන සේක. පෙරළා වම් කන් සිදුරෙන් ගිනි කඳක් හා දකුණු කන් සිදුරෙන් දිය කඳක් පවත් වන සේක. තව ද දකුණු නාසා සිදුරෙන් ගිනි කඳක් හා වම් නාසා සිදුරෙන් දිය කඳක් පවත් වන සේක. නැවත වම් නාසා සිදුරෙන් ගිනි කඳක් හා දකුණු නාසා සිදුරෙන් දිය කඳක් පවත් වන සේක.

තව ද දකුණු උරයෙන් ගිනි කඳක් හා වම් උරයෙන් දිය කඳක් පවත් වන සේක. පෙරළා වම් උරයෙන් ගිනි කඳක් හා දකුණු උරයෙන් දිය කඳක් පවත් වන සේක. තව ද දකුණු ශ්‍රී හස්තයෙන් ගිනි කඳක් හා වම් ශ්‍රී හස්තයෙන් දිය කඳක් පවත් වන සේක. පෙරළා වම් ශ්‍රී හස්තයෙන් ගිනි කඳක් හා දකුණු ශ්‍රී හස්තයෙන් දිය කඳක් පවත් වන සේක. තව ද දකුණු ඇළයෙන් ගිනි කඳක් හා වම් ඇළයෙන් දිය කඳක් පවත් වන සේක. පෙරළා වම් ඇළයෙන් ගිනි කඳක් හා දකුණු ඇළයෙන් දිය කඳක් පවත් වන සේක. තව ද දකුණු පයින් ගිනි කඳක් හා වම් පයින් දිය කඳක් පවත් වන සේක. පෙරළා වම් පයින් ගිනි කඳක් හා දකුණු පයින් දිය කඳක් පවත් වන සේක. තව ද අත ඇඟිලි දසයෙන් හා පය ඇඟිලි දසයෙන් හා ඇඟිලි විස්සෙන් ගිනි කඳ දසයක් හා දිය කඳ දසයක් පවත් වන සේක. අත ඇඟිලි හසු

Non-Commercial Distribution

අටින් හා පය ඇඟිලි හසු අටින් හා ගිනි කඳ අටක් හා දිය කඳ අටක් හා සොළොසක් පවත්වන සේක. තව ද අනූනව දසක් ලොමින් එ කි එ කී ලොම් අගකින් ගිනි කඳක් හා ලොම් පිහිටි වළින් දිය කඳක් පවත්වන සේක. පෙරළා ලොම් අගින් දිය කඳක් හා ලොම් පිහිටි වළින් ගිනි කඳක් පවත්වන සේක. ගිනි කඳ දිය කඳ පවත්වමින් සිට ම රත් විමනෙක රුවන් ගොනැස් උරවණ කලක් මෙන් සවනක් රස් විහිදුවන සේක.

තව ද එක විටක හිරු දෙකක් පහළ වූවා සේ අනික් බුදු රුවක් මාව ලූ සේක. මාවා ලා තමන් වහන්සේ සතර රියන් සක්මනක එ කෙළවරින් එ කෙළවරට නිමවා ගොස් මුත් අතුරෙක නො නවත්නා සේ සක් වළ දිගට මවා ලූ රුවන් සක්මන නිමවා ම සක්මන් කරණ සේක. බුදුන් සක්මන් කරණ කලට මවා ලූ බුදුහු සිටිනා සේක් හෝ හිඳිනා සේක් හෝ වැද හෝනා සේක් හෝ ය. බුදුන් වැඩ හුන් කලට මවා ලූ බුදුහු හිඳිනා ඉරියවුව හැර ලා අනික් තුන් ඉරියවුවෙන් දවස් යවන සේක. බුදුන් සිටි සේක් වී නම් මවා ලූ බුදුහු සිටිනා ඉරියවුව ඇර ලා අනික් තුන් ඉරියවුවෙන් දවස් යවන සේක බුදුහු වැද හොත් සේක් වී නම් මවා ලූ බුදුහු වැද හෝනා ඉරියවුව ඇර ලා අනික් තුන් ඉරියවුවෙන් දවස් යවන සේක. සර්වඥවරයන්ගේ යමා මහ පෙළහර නම් මේ ය. බුදුහු වැළි ත් මේ සියල්ල රුවන් සක්මන සක්මන් කෙරෙමින් සිට ම කළ සේක. මේ හැම නිසා සක්මන් අඩු නො කළ සේක.

ශරීරයෙන් නිකුත් ගිනි කඳ බුදුන්ගේ අදහස් සේ මොළොක් ව සීලස වුව ත් දිය කඳ හා මුසු නො වෙයි. දිය කඳ ගිනි කඳ හා මුසු ත් නො වෙයි. වෙන් වෙන් ව පවතිත ත් බලා සිටිනවුන්ට එක් ව පවත්නා සේ තිබෙ යි. දනෙ යි. සෙසු තැනට අවසර නො දෙවුයෙ මේ අවිෂය හෙයින. ශරීරයෙන් නිකුත් ගිනි කඳ හා දිය කඳ ත් බඹ ලොව දක්වා නැඟී ලා සක් වළ ගල් මුව විට වැගිරෙ යි. ශරීරයෙන් නිකුත් රසු ත් යන්ත්‍රවලින් මැඩ නැඟුවාක් මෙන් විහිද ලා බඹ ලොව දක්වා නැඟී ලා සක් වළ ගල් මුව විට බස්සී. එ දවසට මේ සක් වළ ගබ මුළුල්ල ම රුවන් ගොනැස් උරවා කළ බොධි ගෙයක් මෙන් ඉතා ශොභාවත් වී ය.

එ දවස් බුදුහු යමා මහ පෙළහර දක්වමින් රැස්වූවන්ට අතරතුරෙහි බණ ත් වදරන සේක. වදරන කල ත් දෙව් මිනිසුන්

කුසී නො කරවා අවසර පෑ පෑ බණ වදරන සේක. එ වේලාට බොහෝ දෙන ත් සාධු කාර දෙති. උන් හැම සාධු කාර දෙන වේලේ දී බුදුහු ඒ සා මහත් පිරිසෙක සිත් හසර බලන සේක. එ කි එකී දෙනාගේ සිත් සොළොස් සැටියෙකින් බලන සේක. සර්වඥවරයන්ගේ සිත් නම් මෙ සේ ලඝු ව පෙරළෙයි. යම් යම් කෙණෙක් යම් යම් ධර්මයෙක, යම් යම් පෙළහරෙක පහදි ත් නම් උන් උන්ගේ අදහස් ලෙසට බණ ත් වදරන සේක. පෙළහර ත් පානා සේක. මෙ සේ වදරන බණ ත් අසා පෙළහර ත් දැක බොහෝ දෙන නිවන් දුටහ.

බුදුහු ඒ සමාගමයෙහි තමන් වහන්සේගේ අදහස් ලෙසට ප්‍රශ්න විචාළ හෙන තැනක් නැති නියාව දැන බුදු කෙණකුන් වහන්සේ මවා ලූ සේක. ඔබ විචාළ ප්‍රශ්න තමන් වහන්සේ විසඳන සේක. තමන් වහන්සේ විචාළ ප්‍රශ්න ඔබ විසඳන සේක. මෙ සේ කොට වදරන බුදු රජුන් වහන්සේගේ පෙළහර දැක බණ ත් අසා ඒ සමාගමයෙහි විසි කෙළක් නිවන් දුටහ.

බුදුහු පෙළහර කරණ සේක් ම යට ගිය දවස බුදුවරු මේ පෙළ හර කොට ලා වස් කොයි විසූ දෝ යි බලා තව්තිසා දෙව්ලොව වස් වැස මාතෘ දිව්‍ය පුත්‍ර ප්‍රමුඛ දෙවියන්ට විදම්[1] පිටක ය දෙසති දැක ඔබ වඩනට ය'යි සිතා සිතූ ඇසිල්ලෙහි ම නැමී අවුත් ලං වූ දෙ සාළිස් දහසක් යොදුන් උස ඇති යුගඳුරු මුදුනෙහි දකුණු පය ඔබා වම් ශ්‍රී පාදය එ තැනට නැමී ලං වූ දෙ සාළිස් දහසක් යොදුන් පමණ මහ මෙර මුදුනෙහි තබා වදරා එක් පියවරින් පඩු ඇඹුල් සල හස්න කරා වැඩි සේක රුවන් සක්මන පටන් සූවාසූ දහසක් යොදුන් පමණ තැන් තුන් අඩියකින් වැඩි සේක. අඩි දතුරු දෙකක් ම වි ය. සක් දෙවිඳු ද බුදුන් දැක 'බුදුන් මේ වස් තුන් මස පඩුඇඹුල් සල හස්නේ වසන ලෙස ය. බොහෝ දෙවියන්ට වැඩ ය. බුදුන් මෙහි විසූ කලට සෙසු කෙණකුන් මී හිඳිනා තබා අත් බාලන්ට ත් බැරි ය. මේ පඩු ඇඹුල් හස්න ත් දිගින් දෙ සිය සතළිස් ගවුවෙක පළලින් ගවු දෙසියයෙක.

'බුදුහු වඩු රියනින් දෙළොස් රියන් සේක. බ්‍යාම ප්‍රභාව සතර රියනෙක. කෙතුමාලාව දෙ රියනෙක. එක් කොට අටළොස් රියන් බුදුන් වැඩ හුන් කලට මේ හස්න සිස් සේ තිබෙයි' සිතූහ. බුදුහු උන්ගේ අදහස දැන තමන් වහන්සේගේ වියතින් නව වියත් දිග සවියත් පළල සහළ සිවුර සල හස්නෙහි හෙළා ලූ සේක. කුඩා

1. විජම්-බිදම්

Non-Commercial Distribution

පුටුවෙක මහ දෙ පත් වයිනක් හෙළා ලූ වා සේ හැම වසා ගිය සක් දෙව්දු ඒ දැක 'සහලින් කෙ සේ වැසුන ත් තමන් වහන්සේ වැඩ හිඳිනේ මඳ තැනෙක වේ දැ'යි සිතූ ය. බුදුහු ඒ අදහස ත් දැන ඒ සා මහත් ආසනය දණ මඩුළු හස්සේ ම සැහවෙන ලෙසට තමන් වහන්සේ ත් මහත් නො ව ආසනය ත් කුඩා නො කොට වැඩහුන් සේක.

පෙළහර බලන්ට රැස් වූ මිනිස්සු ද රුවන් සක්මන බුදුන් නො දැක මහ මුසුප්පු වූහ. හිර ගල හුණු කලක් මෙන් ද, සඳ ගල හුණු කලක් මෙන් ද, දස දහසක් සක්වළ එක පැහැර අඳුරු වී ය. බොහෝ දෙන ද—

'ගතො නු චිත්තකූටං වා-කෙලාසං වා යුගන්ධරං,
න නො දක්ඛෙම සම්බුද්ධං-ලොකජෙට්ඨං නරාසභං

යනු හෙයින් බුදුහු සිතු කුළු පව්වට වැඩි සේක් දෝ නො හොත් කෙලෙස් කුළට වැඩි සේක් දෝ යුගඳුරු පව්වට වැඩි සේක් දෝ—

පවිවෙකරතො ධීරො-නයිමං ලොකං පුනෙහිති,
න නො දක්ඛෙම සම්බුද්ධං-ලොක ජෙට්ඨං නරාසභං

යනු හෙයින් බුදුහු නම් පව්වෙක වාසයෙහි ඇලී වසන සේක. මේ සා පිරිස් මැදක මෙ වෙනි පෙළහරක් කෙළෙමී' ලජ්ජාවෙන් අනික් රටකට වැඩ පී නියා ය' යි කිය කියා හඬමින් වලපමින් මුගලන් මහ තෙරුන් වහන්සේ කරා ගොසින් 'ස්වාමීනි, බුදුන් කොයි දැ'යි විචාළහ. ඔබ බුදුන් වැඩ පී තැන් තමන් වහන්සේ දනි ත ත් අනුන්ගේ ත් ගුණ පහළ වුව මැනව යන අදහසින් අනුරුද්ධ මහ තෙරුන් විචාරව'යි වදළ සේක. උයි ත් ඔබ කරා ගොසින් විචාළහ. 'තව්තිසා දෙව් ලොව පඬු ඇඹුල් සල හස්සෙහි වස් වැස මාතෘ දිව්‍යපුත්‍ර ප්‍රමුඛ දෙවියන්ට විදම් පිටක ය දෙසන සේකැ'යි කී සේක. 'වඩනේ කවර කල දැ'යි විචාළහ. 'වස් තුන් මස විදම් දෙසා වදරා වස් පවරන දවස ය'යි කී සේක. එකී එකී අතින් අට සාළිස් අට සාළිස් ගවුවෙ හා වටින් එක් සිය සූ සාළිස් ගවුවෙක පැතිර සිටි පෙළහර බලන්ට ආ පිරිස් බුදුන් දැක මුත් නොයමහ'යි එහි ම කඳවුරු බැඳ ගත්හ. නිකම් සිස් අහස ම උන්ට ගෙවල් විය.

ඒ අහස රෑ දවසට රන් තරු රිදී තරු සහිත නිල් වියනක් මෙන් සිට්ටි දුරු ව තිබෙන පමණක් විනා සක්වළ ගලම භිත්තිව සිට්ටි. මේ සා මහත් පිරිසක් හුන් තැන පොළොව විවර ව ලා

Non-Commercial Distribution

ගියත් මුත් කිස මුවා පසක් පෙනෙන්ට නැත. පොළෝ තලය හැම ම අති පවිත්‍ර ව තිබෙ යි. බුදුහු පළමු කොට මුගලන් මහ තෙරුන් වහන්සේට 'තෙල පිරිසට තොපි බණ කියව. සුළු අනේ පිඬුසිටණෝ බත් දෙති' වදාළ සේක. එ හෙයින් ඒ සිටාණෝ මෙසා මහත් පිරිසට බත්-බුලත්-සුවඳ-විලවුන් ආදි ය පසි දිති. මුහලන් මහ තෙරුන් වහන්සේ බණ වදරන සේක. පෙළහර දකින්ට ආ ආවුන් විචාළ ප්‍රශ්න ත් විසඳන සේක.

තාවතිංසෙ යද බුද්ධො-සිලායං පණ්ඩුකම්බලෙ,
පාරිච්ඡත්තක මූලස්මිං-විහාසි පුරිසුත්තමො

චක්කවාල සහස්සෙසු-දසසවපි ච දෙවතා,
පයිරුපාසන්ති සම්බුද්ධං-වසන්තං නගමුද්ධනි[1].

න කොචි දෙවො වණ්ණෙන-සම්බුද්ධස්ස විරොචති,
සබ්බෙ දෙවෙ අධිග්ගය්හ-සම්බුද්ධො ව විරොචති,

යනු හෙයින් බුදුන් යමා මහ පෙළහර කොට ලා විදම් බණ දෙසනු නිසා තව්තිසා දෙව් ලොවට වැඩ පඬු ඇඹුල් සල හස්නේ වස් විසූ කලට දස දහසක් සක්වල දෙවි බඹහු පිරිවැරූහ. රැස් වූ දෙව් බඹුන්ගෙන් කිසි කෙණකු ත් ශරීර ශොභාවකින් බුදුන්ට වඩනෝ නැත. තරු හොබවා නැඟී සඳක් මෙන් බුදුහු ම වඩනා සේක.

මෙ සේ බුදුහු විදම් බණ දෙසන්ට දස දහසක් සක් වළ දෙවි බඹුන් පිරිවරා සුවාසූ දහසක් මැණික් මැද සක්විත්තන්ගේ කුශලානුභාවයෙන් උපන් වඩු රියනින් සතර රියන් පමණ චින්තා මාණික්‍ය ය තබා ලූ වා සේ වැඩ හුන් කලට දිව්‍ය පුත්‍ර ව උපන් මැණියන් දෑ ද තුසි විමනින් අවුත් බුදුන්ට දකුණත් පස හුන්හ. ඉන්දක නම් දෙව් පුත් ද අවුත් දකුණු පස හුන. අඞ්කුර නම් දෙව්පුත් අවුත් වම ත් පස හුන. එ සේ ත් අඞ්කුර නම් දෙව් පුත් මහානුභාව සම්පන්න දෙවියන් රැස් වත් වත් පසු බස්නේ ඇතුළත පොහොසත් දෙවියන් සැලහුණු හෙයින් අට සාළිස් ගවුවෙකින් ඔබ්බෙහි හිඳිනට අවසර ලද ඉන්දක නම් දෙව්පුත් කෙ තෙක් පොහොසත් දෙවියන් රැස් වුව ත් පසු නො බැස හුන.

1. නහමුද්ධනි-ඇතැම්.

Non-Commercial Distribution

බුදුහු ද—

'ඔලොකෙත්වාන සම්බුද්ධො-අඞ්කුරඤ්චාපි ඉන්දකං
දක්ඛිණෙය්‍යං පභාවෙන්තො-ඉදං වචනමබ්‍රවී

මහා දනං තයා දින්නං-අඞ්කුර දීඝමන්තරෙ,
සුවිදූරෙ නිසින්නොසි-ආගච්ඡ මම සන්තිකං'

යනු හෙයින් උන් දෙන්නා ම බලා පියා තමන් වහන්සේගේ ශාසනයෙහි සිල්වත් තැනට දී ලූ දෙයෙහි විපාක බලවත් නියාව හඟවන්ට 'අඞ්කුරයෙනි, තෙපි දස දහසක් හවුරුදු මුළුල්లෙහි දනට බත් මාළු පිසන්ට ම අට සාළිස් ගවුවක් විතරේ ලිප් බඳවා ගෙන මහදන් දුන්නුව. එ සේ වූ තෙපි අවුත් මා ළඟ හිඳ ලා පසු බැස ගොසින් අට සාළිස් ගවුයෙකින් පිටත හිඳිනට අවසර ලදුව. මේ ඉන්දක නම් දෙව් පුත් කවුරුන් ආව ත් මනා ඉගිළී තමා හුන් තැන ම හුන. ඌ නො ඉගිළී හිඳින්ට ත් තොප ඉගිළෙන්ට ත් කාරණ කිම් දැ'යි විචාළ සේක.

එ සේ විචාළ බුදුන්ට අඞ්කුර නම් දෙව් පුත්—

'උජ්ජඞ්ගලෙ යථා ඛෙත්තෙ-බීජං බහුකම්පි රොපිතං,
න විපුලං ඵලං හොති-න පි තොසෙති කස්සකං.

තථෙව දනං බහුකං-දුස්සීලෙසු පතිට්ඨිතං,
න විපුලං ඵලං හොති න පි තොසෙති දයකං'

යනු හෙයින් 'ස්වාමීනි, යම් සේ නිසරු කුඹුරෙක බොහෝ බිජු වට වපුළ ත් කුඹුර නිස්සාර හෙයින් හසු පැවත නපුරු ද, කුඹුර වපුල තැනැත්තවු සතුටු කරවා ලිය නො හේ ද, එ මෙන් දෙන කල ත් බුද්ධෝත්පාද කාලයක් නො ව දුශ්ශීලයන්ටම දුන් හෙයින් කවර බලවත් විපාකයක් දී මා සතුටු කරවා දැ'යි කිවු ය.

උන් එ සේ කී කල්හි බුදුහු ඉන්දක නම් දෙව් පුත් බණවා ලා 'ඉන්දකයෙනි, තොප අවුත් මට දකුණ ත් පස් ව හිඳ මහෙශාඛ්‍ය දෙවියන් කෙතෙක් දෙනා ආවත් පසු නො බැස හින්ට කාරණ කිම් දැ'යි විචාළ සේක. එ කල ඉන්දක නම් දෙව් පුත් 'ස්වාමීනි, යම් සේ සරු කෙතෙක ගොවිකමුත් දන්නා කෙණෙක් මඳ බිජුවටකු ත් වපුට ලා හසු පැවත යහපත් වීමෙන් වපුල තැනැත්තෝ සතුටු වෙත් ද, එ පරිද්දෙන් එක් බත් සැන්දක් වුව ත් මුඹ වහන්සේගේ ශාසනයෙහි දිවැස් ඇති තැනට අග පත් වූ අනුරුද්ධ මහ තෙරුන් වහන්සේට දන් දුන් පමණකින් සිල් වත් තැනට පවිත්‍ර අදහසින් දී ලූ දනෙහි මෙ බඳු

තරමක් ඇති හෙයින් පසු නො බටු වෙමි' කිවූ ය. ඉන්දක නම් දෙව් පුත්හු මෙ ලෙස කී කල්හි බුදුහු අඞ්කුර නම් දෙව් පුතුන්ට 'දනක් නම් දී ලත කල පිළි ගන්ට නිසි ගුණ ඇත්තවුන් සලකා ලා දිය යුතු ය. එ සේ දුන් කලට සරු කෙතෙක මඳ කොට ත් ගොවි කම් දන වපුල බිජුවටක් මෙන් හෙවත් ඊ ශස්‍ය ඵල ය බලවත් මෙන් අනුසස් මහත් වෙ යි. තෙපි තොපගේ සම්පත් මහත් බැවින් දී ගිය බව මුත් නිසි තැන් සලකා නුදුනු ව. එ හෙයින් විපාක ය මහත් නො වීය'යි වදාළ සේක. දෙශනා කෙළවර ඉන්දක අඞ්කුර දෙන්න සෝවාන් වූහ. මිනිස් ලොවට ත් අස්වා වදාළ බණ හෙයින් සෙසු ත් බොහෝ දෙන නිවන් දුටහ.

ඉක්බිත්තෙන් බුදුහු දෙව් පිරිස් මැද වැඩ හිඳ මෑණියන්දෑ මුල් ව විදම් පිටක ය දෙසනට පටන් ගත් සේක. මෙ සේ මිනිස් ලොව ආයු ගණනින් තුන් මසක් විතර හා දෙව් ලොව ආයු ගණනින් මස් විතරට ත් දවස් විතරට ත් පැ විතරට ත් මඳ හෙයින් නව විනාඩි ගාවක් විතර හිඳ බණ දෙසන සේක් සිඟා වඩනා වේලේ දී තුන් මසට අනූ වාරයක් සිඟා වැඩිය මනා හෙයින් තව් තිසා දෙව් ලොවින් නව විනාඩි ගාවට ම අනූ විටක් සිඟා ගිය කලට සිස් ව තිබීම ඉතා අනුචිත හෙයින් 'මා වළඳා ලා එන තෙක් බණ කියත්ව යි අනික් බුදු කෙණකුන් වහන්සේ මවා ලා තමන් වහන් සේ හිම වතට ගොසින් නාලිය දැවිටි වළඳා පැරහුව මැනවැ'යි නැති හෙයින් අනවතප්ත විලින් කට සෝධා උතුරු කුරු දිවයින සිඟා බත් ගෙනවුත් මහ විසල් මළුයෙහි හිඳ වළඳන සේක.

සැරියුත් මහ තෙරුන් වහන්සේ එතැනට වැඩ වළඳන බුදුන් ට කළ මනා වත් කරණ සේක බුදුහු වළඳා නිමවා ලා 'ශාරිපුත්‍රයෙනි, අද මම මෙ තෙක් බණ කීම් ඒ බණ තොප අත වැසි පන්සියයක් භික්ෂූන්ට කියව'යි යමා මහ පෙළහරෙහි පැහැද සැරියුත් මහ තෙරුන් වහන්සේ කෙරෙහි මහණ වූ වහන්දෑ පන් සිය ය නිසා බුදුහු වදාළ සේක. එසේ වදරා ලා දෙව් ලොවට වැඩ මවා ලූ බුදුන් දෙසූ තැන් පටන් අඩු ව තමන් වහන්සේ දෙසන සේක. සැරියුත් මහ තෙරුන් වහන්සේ ද තමන් වහන්සේට බුදුන් වදාළ බණ තමන් වහන්සේගෙ අත වැසි පන්සියයට වදාරන සේක ඒ පන් සියය ද බුදුන් දෙව් ලොව වැඩ ඉන්ද දී ම ප්‍රකරණ සත ධරා ගත් සේක. ප්‍රකරණ ධැරීමෙන් ම විදම් පිටක ය ප්‍රගුණ ය.

එ ලෙස ප්‍රගුණ වන්ට කළ පින් කවරේ ද යත්—ඒ වහන්දෑ කසුබ් බුදුන් සමයෙහි පන් සියයක් කිරි වවුලන් ව ඉපැද එක්

Non-Commercial Distribution

කවාර නැති ලෙන තල්ලෙක එ ලෙනාහු එ ම ගල් ලෙන වසන තෙර දෙ දෙනකුන් වහන්සේ විදම් බණින් සප්ත ප්‍රකරණ මාතෘකා පමණක් පිරුවාණා ගමනේ මේ බණෙක යන සිත්විලි පමණක් ඇති ව වස් තුන් මස ඇසූහ. අත් නො දත ත් ශබ්ද පමණක් ඇසූ පමණකින් එයින් සැව දෙව් ලොව ඉපැද විසි දහසක් අවුරුදු ක්‍රම ක්‍රමයෙන් පිරිහී දස අවුරුද්දට බැස දස අවුරුද්දේ පටන් කුශල ධර්‍මය සමාදන වශයෙන් අවුරුදු වැඩී අසඞ්ඛ්‍යය දක්වා ගොසින් ලා එ තැන පටන් අකුශල ධර්‍ම සමාදන වශයෙන් හවුරුදු සියයකට ආයු එන තෙක් දිව සැප ත් වළඳා මේ බුදුන් සමයෙහි සැවැත් නුවර කුලගෙවල ඉපැද යමා මහ පෙළහරෙහි පැහැද සැරියුත් මහ තෙරුන් වහන්සේ ලඟ මහණ ව මිනිසුන් ගෙන් හැම තැනට පළමු ව විදම් පිටක ය ධැරූ සේක.

බුදුහු ත් ඒ වස් තුන් මස විදම් බණ දෙවියන්ට දෙසූ සේක. දෙශනා කෙළවර අසූ කෙළක් දෙවියෝ නිවන් දුටහ. මා දෙව්[1] පුත් ද සෝවාන් වූහ. දිගින් පළලින් සයානූ ගවුවෙක හා වටින් එක් සිය සිවු සාළිස් ගවුවෙක පැතිර සිටි පිරිස් වස් පවරන්ට සතියක් තිබැදී ම මුගලන් මහ තෙරුන් වහන්සේ කරා ගොසින් 'ස්වාමීනි, බුදුන් දෙව් ලොවින් බස්නා දවස් දන්ට වුව මැනැව. බුදුන් නො දුක නො යම්හ'යි කීහ. මුගලන් මහ තෙරුන් වහන්සේ ද එ පවත් අසා එ තැනින් ම පොළොව කිමිද මෙර පල්ලට ගොසින් 'මෙර ඇතුලතින් මා නැඟෙන නියාව රැස්ව සිටියෝ දකිත්ව'යි ඉටා ලා මැණිකෙක අවුණන නිල් පලස් හුයක් මෙන් හැම දෙනාට ම පෙණෙමින් මහ මෙර මැදින් නැඟෙන සේක. මිනිස්සු ද 'සතර ගවුවක් විතර නැඟි සේක. අට ගවුවක් විතර නැඟි සේක' යනාදීන් බල බලා සිටියහ.

මහ තෙරුන් වහන්සේ ත් බුදුන්ගේ ශ්‍රී පාද ය ඉසින් ඔසවන් නාක් මෙන් මහ මෙර මුදුනට නැඟී ලා බුදුන් වැඳ 'ස්වාමීනි, පෙළ හර බලන්ට රැස් ව සිටි පිරිස් මුඹ වහන්සේ දුක මුත් නො යම්හ'යි තරයෝ ය. මිනිස් ලොවට බැස වදරන්නේ කවර ද දැ'යි විචාළ සේක. 'තොපගේ වැඩි මාලු බැණෝ සැරියුත් මහ තෙරහු දුන් කොයි දැ'යි විචාළ සේක. 'ස්වාමීනි, සකස් පුර නුවර වස් විසූ සේකැ'යි කී කල්හි 'එ සේ වී නම් මම මෙ තැනට සත් වන දවස් සකස් පුර නුවරට බස්මි. මා දක්නා කැමති කෙණෙක් එ තැනට එන්ට කියව'යි වදාළ සේක. එ සේ වදරා ලා සැවැත් නුවර සිට සකස් පුර නුවර එක් සිය විසි ගවුවෙක. මෙ තෙක් තැන් යන

1 මවු දෙව් පුත් ද

Non-Commercial Distribution

ගමනේ කිසි කෙණකුන්හට ගෙණ යන බත් සාල් නැතිව උද-සන පෙහෙව ලා ලඟ විහාරයකට බණ අසන්ට යන්නවුන් මෙන් එන්ට කියව' යි වදාළ සේක. මහ තෙරුන් වහන්සේ ත් ගොසින් එ පවත් පිරිසට වදාළ සේක.

බුදුහු වස් වැස පවරා ලා සක් දෙව්දු හට 'ශක්‍රයෙනි, මිනිස් ලොවට යම්හ'යි වදාළ සේක. ශක්‍රයෝ ද බුදුන් බසින්ට මැණික් හිණක් මද්ධ්‍යයෙයි මවා ලා දෙවියන් බසින්ට රන් හිණක් හා බඹුන් බසින්ට රිදී හිණක් දෙ පස මැවූහ. ඒ හිණිවල හිණි පා මුල් සකස් පුර නුවර පිහිටා සිටි ය. හිණි හිස් මෙර මුදුන්හි පිහිටිණ. ඉන් දකුණ ත් පස රන් හිණ දෙවියන් බස්නට ය. වමත් පස රිදී හිණ බඹුන් බස්නට ය. මද්ධ්‍යයෙහි මැණික් හිණ බුදුන්ට නියම ය. බුදුහු ත් මෙර මුදුනේ වැඩ සිට දෙවොරොහණ පෙළහර කරණ සේක් එ තැන් පටන් උඩ බලා වදාළ සේක. බඹ ලෝ නවයි ම එකාඞගණ විය. පාත බලා වදාළ සේක. අවිචි ය දක්වා එකාඞගණ විය. සරස බලා වදාළ සේක.

නො එක් දහස් ගණන් සක් වළවල් එකාඞගණ වි ය. දෙව් බඹහු මිනිසුන් දකිති. මිනිස්සු දෙව් බඹුන් දකිති. එ දවස් ඒ බුදු සිරි බලා බුදු වන්ට නො පැතූ කෙණෙක් නැත. රන් හිණින් දෙවියෝ බසිති. රිදී හිණින් බඹහු බසිති. මැණික් හිණින් බුදුන් ම බස්නා සේක. පඤ්චසිඛ නම් දෙව් පුත් බෙළුව නම් වූ වීණාව ගාමින් දකුණ ත් පසින් බුදුන්ට පූජා කරමින් බස්නේ ය. සහම්පති නම් මහ බඹු වම ත් පසින් බුදුන් සිරසට කුඩයක් කොට ගෙණ බස්සි. සුයාම නම් දෙව් පුත් වල් විදුනාව සලමින් බස්සි. බුදුහු මහ පිරිවරින් බැස සකස් පුර නුවර පිහිටි සේක. සැරියුත් මහ තෙරුන් වහන්සේ ද අවුත් බුදුන් වැද ලා—

"න මෙ දිට්ඨො ඉතො පුබ්බෙ—නස්සුතො උදකස්සචි,
එවං වග්ගුවදො සත්ථා—තුසිතා ගණිමාගතො"

යනු හෙයින් මෙ තරම් බුද්ධානුභාවයක් පෙර මා දුටු විරූ නැත. දක්නා තබා ඇසූ විරූ ත් නැත යනාදීන් තමන් වහන්සේට උපන් සමාධි ය හඟවා ලා 'ස්වාමීනි, අද සියලු ම දෙව් මිනිස්සු ආවෙණිකයක් ව මුඹ වහන්සේගේ දර්‍ශන ය පතති. කැමැති වෙති' වදාළ සේක. එ කල බුදුහු 'ශාරිපුත්‍රයෙනි, මෙ බඳු තරම් ඇති බුදු වරහු දෙව් මිනිසුන්ට ප්‍රිය වෙති' වදරා ලා බණ වදරණ සේක්,

Non-Commercial Distribution

ලක්ෂණූපනිද්ධ්‍යානය ආරම්මණූපනිද්ධ්‍යානය යන ද්වි ප්‍රකාර වූ ධ්‍යානයෙහි හෙවත් විදර්ශනාවෙහි හා සමථයෙහි ආවර්ජනාදි වශයෙන් යෙදී වෙසෙත් ද, මහා කරුණා සමාපත්තියට අරමුණු වෙන් වුව ත් ඵල සමවතට අරමුණු කිරීම් වශයෙන් නිවන්හි ඇලුම් ඇත්තෝ ද, සිහිමත් ඒ සර්වඥවරයන් නො කැමැති වන්නෝ කවුරු ද? දෙවියෝ ත් මිනිස්සු ත් කැමැති වෙති' වදළ සේක.

දෙශනා කෙළවර තිස් කෙළක් ප්‍රාණීහු සැවැත් නුවරින් සකස් පුර නුවරට අවූ ත් ඊ සිට ලා නිවන් පුර වන්හ. මෙ සේ යමා මහ පෙළහර දැක විසි කෙළක් හා විදම් බණ අසා දෙව් බඹුන් ගෙන් අසූ කෙළක් හා දෙවොරොහණයෙන් තිස් කෙළක් හා එක් කොට එක් සිය තිස් කෙළක් විතර සත්වයෝ යමා මහ පෙළ හර මුල් ව නිවන් දුටහ. ධර්ම සෙනෙවි සැරියුත් මහ තෙරුන් වහන්සේගේ සද්ධිවිහාරික පන් සියක් දෙනා වහන්සේ වවුල් ව ඇසූ විදම් බණින් දෙව් සැප ත් වළඳා බුදුන් වදළ බණ අසා රහත් වීමෙන් නිවන් සැප ත් ලත් සේක.

හැම බුදුවරුන් වහන්සේ ම යමා මහ පෙළහර කොට ලා තව්තිසා දෙව් ලොව වස් වැස සකස් පුර නුවරට බස්නා සේක. එ හෙයින් බෝ මැඩ ත්, ධර්ම සක් පැවතුන් සූත්‍ර ය දෙසන තැන ත්, දෙව්රම් වෙහෙර හැඳ පළ ත්, සකස් පුර නුවරට දෙව් ලොවින් බට තැන ත්, සෙසු තැන් නියම නැත ත් මේ සතර තැන නියම ය. දකුණු පත්ල පිහිටි තැන නිසල මහ සෑ නම් වෙයි. බුදුහු එ තැන සිටි සේක්-පුහුදුන් ආදින්ට විෂය වූ පැන විචාළ සේක. පුහුදුන්හු තමන්ට විෂ ය වූ පැන ය විසඳා ලා සෝවානුන්ට විෂය පැන විසඳා ගත නුහුණු වූ ය. සෝවාන්හු තමන්ට විෂ ය පැන විසඳා ලා සෙදෘ ගැමියන්ට විෂ ය පැන විසඳා ගත නුහුණු වූ ය. සෙදගැමියෝ තමන්ට විෂ ය පැන විසඳා ලා අනගැමියන්ට විෂ ය පැන විසඳා ගත නුහුණු වූ ය. අනගැමියෝ තමන්ට විෂ ය පැන විසඳා ලා රහතන්ට විෂ ය පැන විසඳා ගත නුහුණු වූ ය. රහතන් වහන්සේගෙනු ත් මහ සවුවන් වහන්සේ තමන් වහන්සේ විෂය පැන විසඳා ලා අග සවු දෙ නමට විෂ ය දෙය විසඳා ගත නුහුණු සේක. අග සවු දෙ නමෙනු ත් මුගලන් මහ තෙරුන් වහන්සේ තමන් වහන්සේට විෂ ය පැන විසඳා ලා සැරියුත් මහ තෙරුන් වහන්සේට විෂ ය දෙය විසඳා ගත නුහුණු සේක.

සැරියුත් මහ තෙරුන් වහන්සේ ද තමන් වහන්සේට විෂ ය ප්‍රශ්න විසඳා ලා බුදුන්ට විෂ ය දෙය විෂඳා ගත නුහුණු සේක

Non-Commercial Distribution

විසඳා ගත නො හී දස දිග බලා දස දිගින් බුදුන් විනා ඒ විසඳා ලියහෙන්නවුන් නැති ව බුදුන් ගෙන් ම නය ලදින් විසඳා වදළ සේක. සැරියුත් මහ තෙරුන් වහන්සේට විෂය ප්‍රශ්නය බුදු කෙණකුන් වහන්සේ මුත් අනික් කෙණෙක් කියා ලිය නො හෙන සේක. එ හෙයින් ම මහ තෙරුන් වහන්සේ එක් දවසක් බුදුන් ඉදිරියේ සිට 'ලොකස්වාමි වූ බුදුරජුන් වහන්ස, මා එක ප්‍රශ්නයක් විසඳූ කළ ගං පත්ලෙන් වැලි ඇටක් වේව'යි මුහුදින් පැන් බිඳුවක් හෝ පොළොවින් වැලි ඇටක් සා පස් සුහක් හෝ ගණන්ට නො තබා ප්‍රශ්න සිය ගණනින් හෝ දහස් ගණනින් හෝ ලක්‍ෂ ගණනින් හෝ විසඳූ කල්හි ඒ සමූහ ව තුබූ ප්‍රශ්නවලට වැලි ඇට හෝ දිය බිඳු හෝ පොළොවින් වැලි ඇට විතර පස් හෝ ගණන්ට තබ ත් නම් වහා ම ගං පත්ලේ වැලි වුව ත් නිම යි. මුහුද පැන් වුව ත් බිඳු හෙයින් ගෙන ත් නිම යි. පොළොව පස් වුව ත් වැලි ඇට තරම් හැර ගෙන ත් නිම යි. මාගේ ප්‍රශ්න විසඳීම නො නිම යි යන තරමේ බුද්ධි සම්පන්න මහ තෙරුන් වහන්සේ බුද්ධ විෂයෙහි ප්‍රශ්නය අසා අගක් මුලක් නො දැක බුදුන් දුන් නයයෙහි සිට ම විසඳූ සේක.

එ හෙයින් නුවණැත්තවුන් විසින් අනන්‍යසාධාරණ වූ අනොපම වූ ගුණ ඇති බුදු රජාණන් වහන්සේ කෙරෙහි සිත පහදවා එයින් ජනිත කුශලානුභාවයෙන් භව සැපත් වළඳා කෙළවර නිවන් අත්පත් කට යුතු.

## 161. ඒරකපත්ත නා රජ්ජුරුවන් ගේ වත

තව ද ලසු වූ ත් අකුශලයෙහි අනිෂ්ට විපාක ය දක්වන්ට ඒරකපත්ත නා රජ්ජුරුවන් ගේ වත කියමු.

කෙ සේ ද යත්—

ඒ ඒරකපත්ත නම් නා රජ්ජුරුවෝ පෙර කසුබ් බුදුන් සමයෙහි සසුන් වැද මහණ ව ගඟෙකින් හඟුළකට නැඟී ලා යන ගමනේ එරුපත්තක් අල්වා ගෙන හඟුලට නැඟී හඟුල යත ත් පත්ත හැර පියන්ට නො වී ය. හඟුල යත් යත් එරුපත්ත කැඩිණ. මේ යන්තමෙක් වේ දැ'යි ආපත්තියක් නො දෙසා විසි දහසක් හවුරුදු මහණ ධම් කොට ත් මියන අවස්ථාවේ දී එරුපත අවුත් කර එළී ගත්තාක් මෙන් ඇවැත් දෙසනු කැමැති ව ත් අනික් නමක් ලැබ ගත නො හී විපිළිසර බොහෝ ව ගෙ‚සින් මිය එක් දඩු හොරුවක් සා නාග රාජ ව සාපත්තික තැනට

Non-Commercial Distribution

නරක ය හෝ තිරිසන් අපාය නියම හෙයින් උපන්හ. ඒරකපත්ත ය. යන නම නියම වී ය. උඵ උපන් ඇසිල්ලෙහි නාගාත්මභාව ය දැක 'විසි දහසක් හවුරුදු මහණ ධම් කොට මඩුවන් ගණන් කන ලෙස නාග ව උපන්මි'යි මුසුප්පු වූ ය.

උඵ එක් දියණි කෙණකුන් ලදින් ගං මැද දිය පිට එණ ය. මහත් කොට මවා ගෙණ දුවණියන් පෙණ ගබ හිඳුවා ගෙණ 'බුදු කෙණකුන් වහන්සේ ලොව උපන් සේක් වී නම් මේ උපදෙසින් දනිමි'යි පෙණ ගබ සිටි දුවණියන් ලවා ගීයක් කියව කියවා නටවති. මෙ ලෙස ප්‍රසිද්ධ කොට ලා 'යම් කෙණෙක් මේ ගීයට පෙරළා ගීයක් කිවූ නම් උන්ට මුන් සරණ දෙමි' කියාත් කියති. මෙ ලෙසක් ප්‍රසිද්ධ වූ කලට නාග මානවිකාවෝ දෙ පෝ දවසින් දෙ පෝ දවසට පියාණන්ගේ පෙණ ගබ සිට—

"කිංසු ආධිපතී රාජා—කිංසු ර:ජා රජිස්සරො,
කථංසු විරජො හොති—කථං බාලොති වුච්චති"

යන මේ ගීය කියති. සියලු දඹ දිව වැස්සෝ 'නා මෙනෙවිය තිල කොට ගනුම්හ'යි ගොසින් තම තමන්ගේ නුවණ ලෙසින් උන් කී ගීයට පෙරළා ගී කියති. නාග මානවිකාවෝ ඒ ගී නො ගිවිසිති. මෙසේ නාග මානවිකාවන් දෙ පෝයෙන් දෙපෝයට පණ ගැබ සිට ගී කියන්නවුන්ට එක් බුද්ධාන්තරයෙක් ගියේ ය.

ඉක් බිත්තෙන් අපගේ බුදුහු ලොව ඉපැද එක් දවසක් අළුයම් වේලේ ලෝ වැඩ බලන සේක් එරුපත් නා රජුන් පටන් උත්තර නම් ලදරුවාණන් පටන් තමන් වහන්සේගේ නුවණ දල බැඳුණවුන් දැක කුමක් දෝ හෝ යි සලකන සේක් 'අද එරුපත් නා රජුන් දුවණියන් පණ ගැබ හිඳුවා ගෙණ නටවන දවස ය. උත්තර මානව ද උන්ට කී ලෙසට මා කියා ලූ ගාථාවක් අසමින් ම සෝවාන් ව ලා නා රජ්ජුරුවන් ලඟට යෙයි. ඔහු ඒ ගීය අසා මා උපන් නියාව දැන ලා මා ලඟට එති. මම උන් අවුත් බොහෝ දෙන රැස් වූ තැන දී ගාථාවක් කියමි. ගාථාව කෙළවර සුවාසූ දහසක් සත්‍වයෝ නිවන් දකිති' දුටු සේක.

එ සේ දැක වදරා බරණැසට නුදුරු තැනෙක මහරි ගස් සතෙක් ඇත. ඉන් එක් ගසක් මුල වැඩ හුන් සේක. දඹ දිව වැස්සෝ ද ගීයට පෙරළා ගී හැර ගෙණ අවුත් රැස් වූහ. බුදුහු ත් ලඟින් යන උත්තර නම් ලදරුවාණන් දැක 'උත්තරයෙනි' වදළ සේක

'කුමක් ද, ස්වාමීනි'යි කී කල්හි 'මෙ සේ එව'යි වදළ සේක. ගොසින් වැද ලා සිටියවුන්ට 'තොපයි යවු දූ'යි විචාරා එරූපත් නා රජුන්ගේ දූවණියන් ගී කියන තැනට ය' යි කී කල්හි කියා ලූ ගීයට පෙරළා කියන ගී දනු දූ'යි විචාරා 'දනිමි' කී කල්හි 'කියා බලග'යි වදළ සේක. උන් තමන් දත් සැටියේ කී කල 'උත්තරයෙනි, තෙල ගීය උන් ගීයට ගීයෙක් නො වෙයි. තොප උත්තර නම් වූවා සේ ම තෙල ගීයට ත් උත්තර ඇත. මම තොපට නිරුත්තර ගීයක් උගන්වා ලමි. ඒ ගීය ඉගෙන යවු දූ'යි වීචාළ සේක. 'යහපත, ස්වාමීනි'යි කිවු ය. බුදුහු උන්ට උත්තරයෙනි, තොපි නාග මාණවිකාව ඒ ගීය කී කලට—

ඡද්වාරාධිපති රාජා—රජ්ජමානො රජස්සරො,
අරජ්ජං විරජො හොති—රජ්ජං බාලොති වුච්චති.

යන මේ ගීය කියා ලව'යි වදළ සේක.

නාග මාණවිකාවන්ගේ ගීයේ අර්ථ ය නම් කුමකට අධිපති කෙණෙක් රජ වෙත් ද? කුමක් විෂයෙහි රජ ඉසුරු කෙරෙත් ද? කවර ලෙසින් විරජ නම් වෙත් ද? කවර ලෙසින් බාල නම් වෙත් දූ' යි යනු ය. උත්තර මාණවකයන් බුදුන් ගෙන් ඉගෙන කී ගීයට පෙරළා කියන ගීයෙහි අර්ථ නම් 'යම් කෙණෙක් චක්ෂුරාදී ස දොරට හමු වූ රූපාදී ෂඩාලම්බනයට යටත් නො වෙත් නම් උහු රජ නම් වෙති. යම් කෙණෙක් රූපා දී සාරමුණ එළෙත් නම් උහු රජ ඉසුරු නම් වෙති. ඊ නො ඇලෙන්නෝ විරජ නම් වෙති. එහි ඇලෙන්නෝ බාල නම් වෙති' යනු ය.

මෙ සේ බුදුහු උත්තරයන් මේ ගීය උගන්වා ලා 'උත්තරයෙනි, තොප මේ ගීය කී කලට නාග මාණවිකා තොමෝ-

කෙනස්සු වුය්හති බාලො—කථං නුදති පණ්ඩිතො,
යොගක්ඛෙමී කථං හොති තං මෙ අක්ඛාහි පුච්ඡිතො.

යන ගීය කිය යි. ඒ ගීයෙහි අර්ථ ය නම්— 'නුවණ නැත්තෝ සසර නමැති මුහුදට කුමකින් ගෙනයනු ලැබෙත් ද? නුවණැත්තෝ කවර ලෙසින් ඒ දුරු කෙරෙත් ද? කවර ලෙසින් නිරුපද්‍රව වෙත් ද? මා විසින් විචාරන ලද්දේ එය කියව' යනු ය. ඒ කී කලට තොපි-

''ඔඝෙන වුය්හති බාලො—යොගා නුදති පණ්ඩිතො,
සබ්බ යොගවිසංයුත්තො—යොගක්ඛෙමීති වුච්චති''

Non-Commercial Distribution

යන ගීය කියාලව. ඒ ගීයෙහි අර්ථය නම්– 'නුවණ නැත්තෝ කාමොසාදී කෙලෙස් වතුරෙන් සසර මහ මුහුදට ගෙන යනු ලබති. නුවණැත්තෝ සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍ය නමැති නැවෙන් කෙලෙස් වතුරෙන් එ තෙර ව නිවන් පර තෙරට පැමිණෙති. කාම යොගාදි චතුර්විධ යොගයෙන් යම් කෙණෙක් වෙන්වූ නම් උන්ට කවර ත් උපද්‍රව නැතැ'යි යනු ය.

උත්තර නම් ළදරුවාණෝ පෙරළා කියන්ට දෙවතුව උගත් වත ගීය අසා සෝවාන් වූහ. උෟ සෝවාන් ව ලා ඒ ගී දෙක ත් හැර ගෙන ගොසින් නාග මානවිකාවන් කියන ගීයට ගීයක් ඉගෙන අයිම්. මට අවසර දෙව'යි කියා ලා ගහණව සිටි බොහෝ දෙන පීරා ගෙන ගියහ. නාග මානවිකාව ද පියාණන්ගේ පණ ගැබ සිට නටන්නී ආදි කියන ගීය කිය යි. උත්තරයෝ 'ඡද්වාරාධි පතී රාජා'' යනාදීන් කිවූ ය. නැවත නාග මානවිකාවෝ 'කෙනස්සු වුය්හති බාලො' යනාදී ගීය කිවූ ය. ඊට පෙර ළා ගීය කියන උත්තරයෝ 'ඔඝෙන වුය්හති බාලො' යනාදී ගීය කිවූ ය. නා රජ්ජුරුවෝ ඒ අසා බුදුන් උපන් නියාව දන බුද්ධාන්තරයක් මුළුල්ලෙහි මෙ සේ වූ පදයක් නො ඇසූ විරිමි. බුදුන් ලොව උපන් නියා වේ ද'යි සතුටු ව නගුටෙන් දියට ගැසූහ. මහ රළ නහා ලා දෙ තෙර ම ඉවුරු බිඳිණ. එ තෙරින් එක් සිය සතළිස් රියනෙක හා මෙ තෙරින් එක් සිය සතළිස් රියනෙක මිනිස්සු ගැලෙන්ට වන්හ. නා රජ්ජුරුවෝ ද දිය බී මියන බොහෝ දෙනා පෙණෙ ගබ හිඳුවා ගෙන ගොඩ ලා පියා උත්තර-යන් කරා ගොසින් 'සවාමීනි, බුදුහු කොහි ද'යි විචාළෝ ය. තෙල මහරි ගස මුල ය'යි කීහ. 'යහපත එ සේ වී නම් අව මැනැවැ'යි උත්තරයන් කැඳවා ගෙන බුදුන් කරා නික්මුණාහ. බොහෝ දෙන ත් උන් හා කැටිව ම නික්මුණාහ.

නා රජ්ජුරුවෝ ගොසින් සවනක් බුදු රස් හස්සට වැද ලා බුදුන් වැදගෙන හඩ හඬා සිටියහ. බුදුහු 'නා රජ්ජුරුවෙනි, හඬානැ'යි වදළ සේක. 'සවාමීනි, මම මුඹ වහන්සේ වැනි බුදු කෙණකුන් වහන්සේට බුදු සවුව විසි දහසක් හවුරුදු මහණ ධම් කෙළෙමි. එ තෙක් කල් කළ මහණ ධම් නිශ්ප්‍රයෝජන වී ය. එරුපත් කැඩී ගිය පමණකට අහේතුක ව ඉපැද බඩ ගා ඇවිදිනා තැන උපනිමි. බුද්ධාන්තරයක් මුළුල්ලෙහි මිනිසත් බවකු ත් නො ලද්දෙමි. අද විනා බුදු කෙණකුන් වහන්සේ නුදුටුයෙමි. බණ ඇසීමකු ත් නො වී ය. ඒ නිසා හඩමි' කිවූ ය. බුදුහු උන්ගේ

Non-Commercial Distribution

කථාව අසා බණ වදරන සේක් 'පින් කම් කොට බොහෝ උත්-සාහයෙන් ලද මනා හෙයින් මිනිසත් බව ත් දුක සේ මුත් නො ලැබෙයි. සත්වයන්ගේ ජීවත් වීම ත් කොපමණ කලක් සිටිත ත් දුකසේ ම මුත් ජීවත් වීම බැරි හෙයින් දුක. නො එක් කප් ගණ-නෙ ත් ධර්ම දේශක කෙණකුන් නො ලද හැකි හෙයින් බණ අසා ගැන්ම ත් බැරි ය. කප් අසඞ්ඛ්‍යයක ත් සර්වඥයන් පහළ නො වන හෙයින් සර්වඥවරයන්ගේ පහළ වීම ත් දුකැ'යි වදළ සේක. දෙශනා කෙළවර සුවාසූ දහසක් දෙන නිවන් දුටහ.

නා රජ්ජුරුවෝ ද එ දවසට ත්‍රි හෙතුක වූ නම් සෝවාන් වෙති. තිරිසන් යොනියෙහි උපන් හෙයින් නිවන් සම්භව නො වීය. නාග ව උපන් කල පිළිසිඳ ගන්නා කල ත්, සැව ගලවන කල ත්, තර ව නිදන කල ත්, සජාතීන් හා මෛථුන් ධර්මෙහි ත්, චුත වන කල ත් ය'යි මේ පස් තැනේදී නයි නාග ශරීර ය පහළ වන හෙයින් ගහට විදිති. මූ තුමූ ඉන් ගහට විදීම් නැති ව ලදරු වෙසින් ම ඇවිදිති.

එ හෙයින් නුවණැත්තවුන් විසින් නො ලැබිබ හැකි මිනිසත් බව ත් ලත් පසු එ ම තරම් ම බුදුහමුව ත් ලත් බැවින් ජීවිකාව කෙ සේ වත් කිම. පින් කම් කිරීමට හේතුව සිටිනා බණ අසා ඒ වූ පරිද්දෙන් පිළිපැද ලොවී ලොවුතුරා සැප ත් සිද්ධ කට යුතු.

---

## 162. අනඳ මහ තෙරුන් වහන්සේ ප්‍රශ්න විචාළ වස්තුව

තව ද සර්වඥනුශාසනා සැකෙවින් දක්වනු නිසා අනඳ මහ තෙරුන් වහන්සේ ප්‍රශ්න විචාළ වස්තුව කියමු.

කෙ සේ ද යත්—

එක් දවසක් අනඳ මහ තෙරුන් වහන්සේ 'තිලෝ ගුරු බුදුහු විදර්ශී ආදී වූ සත් බුදුන්ගේ දෙ මවු පියන් ද ආයුපරිච්ඡෙද ය ද බොධි ද ශ්‍රාවක සන්නිපාත ද අග සවු තැන් ද උපසථායික තැන් දැ'යි සියල්ල ම වදළ සේක. පොහෝ කිරීම වදළේ නැත. කුමක් දෝ ඒ බුදුවරුන් වහන්සේට ත් පොහොය මෙ ම දෝ නොහොත් අනිකක් දෝ හෝ'යි සිතා බුදුන් කරා ගොසින් විචාළ සේක. යම් හෙයකින් ඒ බුදුවරුන් වහන්සේට ත් කාල විශෙෂයක් විනා පාමොක් උසුරුවන ගාථාවල වෙනස නැද්ද- එ සේ මැ යි. විපස්සී බුදුහු සත් හවුරුද්දෙන් සත් හවුරුද්දෙන් පොහොය කරණ සේක. එක් දවසෙක කළ අවවාදය ම සත් හවුරුද්දට ම පිරිමැස්ම යහපත් හෙයින් සෑහෙ යි. සිඛී බුදුහු හා වෙස්සභූ බුදුහු ස වන

Non-Commercial Distribution

ස වන හවුරුදු පොහොය කරණ සේක. එක ද කළ අවවාද ය සාවුරුද්දට සෑහෙයි. කකුසඳ-කොණාගමන දෙ දෙනා වහන්සේ හවුරුද්දකට එක් දවසක් පොහෝ කරණ සේක. ඒ අවුරුද්දට ඒ අවවාද ම සෑහෙයි. කසුබ් බුදුහු ස මසින් ස මසට පොහොය කරණ සේක.

එක ද කළ පොහොය ස මසට සෑහෙයි. එ හෙයින් අපගේ බුදුහු තමන් වහන්සේට ඒ සේ වූ කාල විභාගයක් නැති හෙයින් පම්ද අශුද්ධියක් දක තමන් වහන්සේ පොහෝ කිරීම හැර දෙ පෝයෙන් දෙ පෝයේ ම බණ පිරිවා පොහෝ කරන්ට වහන් දෑට ම අනුදත් හෙයිනු ත් ඒ ඒ බුදුවරුන් වහන්සේගේ කාල විභාග ය ත් වදරා කවර ත් බුදුවරුන් වහන්සේගේ අවවාද ගාථා එ ම නියාව ම වදරා ඊ සවරූප ය, වදරන බුදුහු තුන් දොරින් සිද්ධ වන සියලු අකුසල්හි නො හැසිරීම ද, අගාරික වුව ත් අනගාරික වුව ත් ආපාණ කොටික ව කුසල්හි හැසිරීම ද පස් නීවරණයන් දුරු කිරීමෙන් තම සිත් සතන් නිර්මල කිරීම ද හෙවත් මෙ ලෙස කිරීමට සර්‍වඥවරයන්ගේ අනුශාසනාව ය. තව ද ක්‍ෂමාව නම් මේ බුදු සස්නෙහි උතුම් වූ තපසෙක. බුදු පසේ බුද බුදු සවු වෝ සියල්ලකට ත් වඩා නිවන් ම උතුමැ' යි කියති. පැවිදි ව සිටි යම් කෙණෙක් අනුන්ට පීඩා කෙරෙත් නම් වෙස් ධරන පමණක් මුත් උං මහණහු නම් නො වෙති. යම් කෙණෙක් අනුන්ට උපවාද විසින් නො දොඩත් ද, අනර්‍ථාවහයක් නො කෙරෙත් ද, ප්‍රාති මොක්‍ෂ සංවර ශීලයෙහි හා ඉන්ද්‍රිය සංවර ශීලයෙහි පිහිටියෝ ද, තව ද ආජීව පාරිශුද්ධි ශීලයෙහි හා ප්‍රත්‍යය සන්නිශ්‍රිත ශීලයෙහි ත් තර ව පිහිටියෝ ද ප්‍රාණවධාදී ත්‍රිවිධකාය දුශ්චරිතයෙන් වැළකීම් වශයෙන් කායික වූ සීලයෙන් හා මුසාවාදදී වූ චතුර්විධ වාක් දුශ්චරිතයෙන් වැලකීම්වශයෙන් වාචසිකසීලය ත් පුරත්ද විවෙක වාස ය ඇති වීමෙන් ත්‍රි විධ ශික්‍ෂායෙහි හැසිරෙත් ද, සර්‍වඥවර යන්ගේ අනුශාසනාව කළා නම් වෙති' වදළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන සෝවාන් ඵලාදියට පැමිණියහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් යම් සේ කුඹුරට ගොඩ වානවාරි වුවො ත් මුත් ඇළ අමුණු ඇති ව තිබේ ද? එ මෙන් කුසල් කෙතට සැදෑ ඇළ ඇති ව, තව ද යම් සේ කෙතෙක් ලූ ලූ දිය රඳවන මියර ඇති ව තිබේ ද, එ මෙන් සිල් නමැති මියර ඇතිව, තව ද යම් සේ කෙ තෙක් තෙමේ ආදායවසථාවේ නිස්සාර වී නමුත් කොට ගන්නා ලෙසින් සරුවේ ද, එ මෙන් සාර ගුණෙයි පිහිටා ගෙන අධිමුක්ති වූ ලෙසින් ත්‍රිවිධ බෝධීන් අතුරෙන් එක් බෝධියකට පැමිණිය යුතු.



Non-Commercial Distribution

# 163. අනභිරත භික්ෂූන් වහන්සේගේ වස්තුව

තව ද ලසු දෑ නිසා ත් සස්නෙහි උකට ලී වීමෙහි නපුර හඟවන්ට අනභිරත භික්ෂූන් වහන්සේ ගේ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්-

ඒ භික්ෂූන් වහන්සේ වැළි ත් සසුන් වැද මහණ ව උපසම්පද ව ත් ලදින් 'අසවල් තැනට ගොසින් හදුරා පිරිවාව'යි උපාද්ධ්‍යාය යන් වහන්සේගෙන් විධාන ලදින් ඔබ ගිය සේක.

ඉක්බිත්තෙන් ඔබගේ පිය උපාසකයන්ට රෝගයෙක් ඇති වී ය. උන් පුතණුවන් වහන්සේ දක්නා කැමැති ව කැඳවා ගෙන එන්ට නිසි කෙණකුන් නො ලදින් පුත්‍ර ප්‍රෙම ය මුල් ව වියළී ගොසින් ජරා දුර්වල ව මියන්ට ආසන්න ව ගොසින් 'මේ ම පුතණු වන් වහන්සේට කැප පිරිකරට මිල වුව ත් යහපතැ'යි මසු සියයක් උන් වහන්සේගේ බාල මලණුවන් අතට පාවා දෙවා ලා මළෝ ය. මලණුවෝ ද උන් වහන්සේ වැඩි කල හඬා පියා වැලප පියා 'ස්වාමීනි, මුඹ වහන්සේගේ පියාණන් වහන්සේ මුඹ වහන්සේ නො දැක ශොකයෙන් නන් දෙඩමින් මළ සේක. මියන ගමනේ මුඹ වහන්සේට කැප පිරිකර ක් ගෙණ දෙන්ට මසු සියයක් දෙවාලූ සේක. ඉන් වුවමනා කුමක් දැ'යි විචාළහ. 'ඒ මට හැ යි දැ'යි කියා පියා පසු ව කලක දී 'සිඟා කා ජීවත් වීමෙන් මට කම් කිම්ද? මසුරන් සිය ය මුල්ව ජීවත් විය හැක්ක, සිවුරු හරිමී' අල්ප වූ භොග රාශි ය හැර මහණ වන්ට සිතුවමනා තැන මඟුලට ගසන බෙර අවමඟුලට පෙරළා ගසන්නා සේ සිවුරු හරින්ට සිතා ගත්හ.

සිවුරු හැරීමට සිත නමා පියා යෙදී වසන කමටහනු ත් හැර සිතිවිලි නිසා පාණ්ඩුරොග ඇත්තා සේ සුදු මැලි වූ සේක. යහළු මිත්‍ර වහන්දෑ ද 'වැරුණේ[1] කුමක් නිසා දැ'යි විචාරා උකටලී වූ නියාව කී කල්හි උන් වහන්සේගේ ගුරුවරයන් වහන්සේට කී සේක. ඒ වහන්දෑ ද බුදුන් කරා ගෙන ගොසින් බුදුන්ව කෙළෙස් සොරුන් හා එක් ව ගෙණ උන්ගේ බසින් එක මසු සියයක් නිසා බොහෝ ගුණ බඩු නසා දෙසා පියා සස්නෙන් යන්ට සිටිනා නියාව කී සේක. බුදුහු ත් 'සැබෑ දැ'යි විචාරා 'සැබැව'යි කී කල්හි කුමක් නිසා එ සේ කෙරෙයි ද? එ සේ ගිය ත් ජීවත් වන උපාය ඇත් දැ'යි විචාරා මසුරන් සියයක් ඇති නියාව කී කල්හි එ පමණකින් ජීවත් විය හැකි නියාව

---

1 වාරිනේ-

Non-Commercial Distribution

නො හැකි නියාව කියා ලූ පමණෙකින් තොපට නො හැඟුණු නමුත් පාලා ම හඟවා ලන ලෙසට එ ම රන් ගණනේ කිරිවාණා හකුරු අවුළා ගෙනෙව' යි වදළ සේක. උන් වහන්සේත් ගෙනා සේක.

බුදුහු තෙල මසු සියය ගණනේ ගෙණ හකුරෙන් සරි බලනු නිසා 'පනසක් සාල් හැර ගන්නා නිසා තබා ලව. අනික් පනසෙක් තුබුයේ වේ ද, ඉන් සූ විස්සකින් සානා ගොන් ගෙයක් හැර ගන්ට තබා ලව, තව ස විස්සක් තුබුයේ වේ ද, ඉන් භාගයක් සානා කුඹුරට බීජුවට හැරගන්ට තබා ලව. තමා වඩු කම් නො දන්නා බැවින් භාගයක් නඟුල් විය දඬු හැර ගන්ට තබා ලව. හුදැල්ල කු ත් අවශ්‍යයෙන් ඇත මනා බැවින් හුදැල්ලකට භාගයක් නිල කොට තබව. නඟුල කෙටි වූකලට වක නිසි දණ්ඩක් කපා ගන්ට පොරවකු ත් ඇත මැනව. ඒ සැස ගන්ට වෑයකු ත් ඇත මැනව. විද අවුණා ගන්ට නියනකු ත් ඇත මැනව. ඊට භාගයක් තබව' යනාදීන් වදරන කලට ඒ සිය ය තබා තව සිය ගණනකු ත් මද ව පෙනිණ.

බුදුහු 'මහණ තාගේ මසු සියය කෙතෙක් කුමක් හෙයින් රන අඩුව තෘෂ්ණාවෙන් පුසි ද? තෝ එක මසු සිය ය ඇති තැනැත්තවු තබා මහා මන්ධාතු සක්විත්තෝ ආස බලා අත් පිඩි ගසා ලූ පමණකින් අට සෘළිස් ගවුවක් විතරේ සත් රුවන් වස්වන තරම් පිණැති ව ත් මිනිස් සම්පතට ශක්‍ර සම්පත් බලවත් නියාව අසා තව් තිසා දෙව් ලොවට ගොසින් ශක්‍ර වරුන් ස තිස් දෙනකු පරමායු තුන් කෙළ සැට ලක්‍ෂ, තුන් කෙළ සැට ලක්‍ෂ ම නිමවා පියන තෙක් ශක්‍ර සම්පත් වළඳා මියන අවස්ථාවෙයි තෘෂ්ණාව පුරා ගත නොහි ම මළෝ ය'යි වදරා ඒ කෙ සේ දූ යි විචාළ වහන්දැට—

යාවතා චන්දිම සූරියා—
පරිහරන්ති දිසා භන්ති විරොචනා,
සබ්බෙ දසා මන්ධාතා—
යෙ පාණා පඨවිනිස්සිතා.

යනාදීන් මහා මන්ධාතු ජාතක ය විස්තර කොට වදරා ඉක් බිති ව සෙසු තබා සත් රුවන් වැසි වැස පුව ත් පැන් උනන තැනින් ඉතිර යත ත් උනා යැමෙහි නියමයක් නැත්තා සේ මෙ තෙක් ඇත්තේ වේ ද යි යන තෘෂ්ණාව නිවාරණයෙක් නැත.

Non-Commercial Distribution

තෘෂ්ණා ලෙසින් සැලකූ කලට සම්පතු ත් තත් විෂය වූ තෘෂ්ණාව ත් සිහිනෙන් විඳිනා දෙයක් මෙන් ආශ්වාදයකුත් මඳ අඳුනාව කෙ සේ සිතත ත් ඊ සැපයකු ත් නැත. එ සේ කලට පිළිපන් මනා කෙ සේ ද? දිව්‍ය සැප ත් වුව ත් අමෙද්ධ්‍යයක් මෙන් සිතා ඊ ඇලුම් හැර අර්හත්ත්‍ව ය ම සාධා ගන්ට සිත ත් නම් වුවමනා එ ම ය'යි වදාළ සේක. දෙශනා කෙළවර මසු සියයක් නිසා ශාසනාභිරතිය වරනට වන් භික්ෂූන් වහන්සේ ලක්ෂ ගණන් වුව ත් එහි නො ඇලී සෝවාන් නිවන්හි ඇලුණු සේක. තව ත් බොහෝ දෙන නිවන් දුටහ. ලොවී සැප ත් ලද්දවුන් කියනු ම කිම් ද?

එ හෙයින් නුවණැත්තවුන් විසින් නිස්සාර දෙයෙහි කරණ ඇලුම් හැර සියලු ලෙසින්ම සාරවූ නිවන්හි ම ඇලුම තර කටයුතු.

# 164. අග්ගිදත්ත නම් පෙරෙවි බමුණානන්ගේ වස්තුව

තව ද අසථාන භජනයට ත් වඩා සථාන භජනය ම සප්‍රයොජන නියාව හඟවන්ට අග්ගිදත්ත නම් පෙරෙවි බමුණානන් ගේ වස්තුව කියමු.

කෙ සේ ද යත්—

ඒ බමුණානෝ නම් මහ කොසොල් රජ්ජුරුවන්ගේ පුරොහිත යාණෝ ය. මහ රජ්ජුරුවන් මළ පසු පසේනදී කොසොල් රජ්ජුරුවෝ ද පියාණන්ට ත් පුරොහිත කම් කළ හෙයින් ගෞරවය ඇති ව එ ම තනතුරෙහි තබා තමන්ට රාජ සේවයට ආ කල පෙර ගමන් කොට ත් යෙති. 'ආචාරීනි. තිලී හුන මැනවැ' යි කියා ලා සරි සරියේ ම හිඳිනට අවසරය ත් පතති. පුරොහිත යෝ ද 'මේ රජ්ජුරුවන් වහන්සේ මා කෙරෙහි ගෞරව බලවත්ව ඇති සේක. රජදරුවන් නම් සිත් ගත ත් නො හැක්ක. වයසින් බාල ත් සේක. සිරි විඳිත ත් සරි වයස් ඇති රජ දරුවන් හා වී නම් යහපත. උපදවා ගත් සම්භාවනා නැති වූ නමුත් නපුර. මම ද වැළි ත් මාලු ව ගියෙමි. තුන් වයසින් එක් වයසක් වුව ත් සිස් වූ කල ත් නපුර. 'මහණ ව ගතිම් නම් යහපතැ'යි සිතා ලා රජ්ජුරුවන්ට කියා මහණ වීමට අනුදන්වා ගෙණ නුවර බෙර ලවා යදි දිළිඳුන් රැස් කරවා නැතක් කලකින් උපයා රැස් කළ සම්පත මී බඳින්ට කල් යන බව මුත් බැඳි මී සලන්ට කල් නො යන්නා සේ සතියක් විතරින් දන් දී නිමවා පියා කුමක් කරමෝ ද සිතා ඉසි වෙස් ගෙණ මහණ වූහ. උන් ප්‍රසිද්ධ තැනැත්තවුන් සෙයින් කැටි ව දස දහසක් මහණ වූහ.

Non-Commercial Distribution

අග්ගිදත්ත නම් තවුසාණෝ ද උන් හැම හා සමග මගධ රට ත් කුරු රට ත් අතුර පන්සල් කොට ගෙන රඳා හිඳ තමන් තවුස් පිරිසට 'දරුවනි, තපසට අවුත් යම් කෙණකුන්ට කෙලෙස් සිතෙක් ඇති වී නම් එකි එකී වැලි ගොටුවක් එක් තැනෙක ලා ලූව මැනවැ'යි අවවාද සෙයින් විධානයක් කළහ. උයි ත් යහපතැ යි ගිවිස එ සේ වූ සිතක් සිතුණ විට ම නිග්‍රහ නිසා වැලි ගොටුවක් ලති. කල් ගිය කලට මහවැලි ගොඩෙක් වි ය. ඒ වැලිගොඩ නා රජ්ජුරු කෙණෙක් පිහිටා ගත්හ. මගධ රට ඇත්තවුන් හා කුරු රට ඇත්තෝ ද ඒ නා රජ්ජුරුවන්ට මස් පතා මහ පෙරහර කෙරෙති. නා රජ්ජුරුවන්ට සත්කාර නිසා ගියවුන්ට අග්ගිදත්ත නම් තවුසාණෝ ලෙව්හි තුනුරුවන් නැත්තා සේ 'මෙරු යුගන්ධරාදී පර්‍වත සරණ යව. හිම වූ ආදි වනවල් සරණ යව. ගස් කොළ සරණ යව. එ සේ කොට දුකින් මිදෙව'යි ඔවා දෙති.

එ වකට බුදුහු දෙව්රම වසන සේක් අළුයම් වේලේ ලොව බලා අතවැසි දස දහස හා සමග අග්ගිදත්ත තවුසන් තමන් වහන්සේ ගේ නුවණ දළ බැඳුණවුන් දැක 'මූ හැම දෙන කළ ඇතුළේ ඇවි ළෙන පහන් මෙන් රහත් වන පින් ඇත්තෝ ය'යි දැන සවස් වේලේ දී මුගලන් මහ තෙරුන් වහන්සේට 'මෞද්ගල්‍යායනයෙනි, අග්ගිදත්තයන් ඇතුළු වූ බොහෝ දෙන සම්‍යක්ප්‍රතිපද නමැති තොට තිබියදී විරුද්ධ කල්පනා නමැති ගඟ හොස්සේ සසර නමැති මුහුදට වදනවුන් නො දකුද? තොපගේ අවවාද නමැති නැව පැ ලා ඊට නංවා ගෙන නිවන් පරතෙරට පමුණුවා නොලානැ'යි වදළ සේක. ස්වාමීනි, මුඹ වහන්සේ ත් සහාය වුවො ත් පිළිවනැ'යි වදළ සේක. තොපට ම කිය ලා මම වැදහිදිම් ද? මම ත් එමි. මා එන නියා ව කියන්ට යන්නාක් මෙන් තොපි පෙරාතු යව'යි වදළ සේක.

මහ තෙරුන් වහන්සේ ද වඩනා සේක් 'මූ බොහෝ දෙන ය. බලී කමුත් ඇත්තෝ ය. ඉදින් හැම දෙනා එක් තැන් ව හුන් තැන දී යමක් කියාලීම් නම් හැම දෙනා එක් ව ගෙන දෙඩන්ට පැන හෙති. බුදුන්ගේ මෙහෙවරින් තබා මා ම අව ත් එ තරම් නො වන්නේ වේ දෑ'යි හැම දෙනා වෙන් කරණුනිසා දළ දළ පොද ඇති කොට වැස්සක් වස්වා ලූ සේක. උං හැම දෙන ත් පොද ගස ත් ගසත් නැඟි නැඟී සිට ත් තමන් තමන්ගේ පන්සල්වලට වන්හ. මහ තෙරුන් වහන්සේ අග්ගිදත්ත තවුසන්ගේ පන්සල් දෙරකඩ සිට 'අග්ගිදත්තයෙනි'යි වදළ සේක. උං ඒ අසා

Non-Commercial Distribution

මෙ ලොව මට තෙල ලෙස කියා හඬ ගානා කෙණෙක් නැත. එ ලෙස කීවෝ කවුරු දෝ හෝ යි මනින් තදව ලා 'කවුරු දැ'යි කිවුය. බමුණානෙනි, අපි ය'යි වදළ සේක. 'බැණවූයේ හැයි දැ'යි විචාරා 'අද එක රැ සැතපී යන්ට අවසරයක් ඉල් වූ නියා ය'යි කී කල්හි මේ පන්සල එක් කෙණකුන් මුත් දෙන්නකු වැද හෝනට අවසර නැත. එ සේ වන්නා අවසර දෙන්නේ කෙසේ දැ'යි මහ තෙරුන් වහන්සේ තමන් වහන්සේ නිරවකාශයා සේ ම අවසර දෙන්ට මැළි වූහ.

මහ තෙරුන් වහන්සේ ද 'අග්ගිදත්තයෙනි, මිනිස්සු මිනිසුන් ලඟට යෙති. ගෙරි සරක් ගෙරි සරක් ලඟට යෙති. පැවිදිවරු පැවිදිවරුන් ලඟට යෙති. අපි ත් ගිහීන් කරා යන්නට බැරි බැවින් තොප කරා ආම්හ. එක රැයක් පමණට වුව ත් සැතපෙන තැනක් දෙව'යි වදළ සේක. එ කල අග්ගිදත්තයෝ කුමක් ද? තෙපි පැවිදි කෙණෙක් දැ'යි විචාරා එ සේ ය'යි කී කල්හි 'තෙපි පැවිදි කෙණෙක් වූ නම් වල් කලා සිවුරු ආදි ය කොයි දැ'යි විචාළහ. 'පිරිකර ඇත. වෙන වෙන හැර ගෙන ඇවිදින්ට තරම් නො වන හෙයින් සිරුරු අබතුරෙහි ම ලා ගෙන ඇවිදුම්හ. බමුණානෙනි' වදළ සේක. බමුණානෝ ඒ අසා ගුණෙන් වැඩියුරු තරමක් හඟවා ලූ හෙයින් කෝප කළහ. මුගලන් මහ තෙරුන් වහන්සේ 'අග්ගිදත්තයෙනි, උරණ නො ව සැතපෙන තැනක් දෙව'යි වදළ සේක. පෙරළා ත් එ තැන වසන තැන් නැතැ යි කිවු ය. තෙල වැලිගොඩ වසන්නෝ කවුරු දැ'යි විචාරා 'නා රජ්ජුරු කෙණෙකැ'යි කී කල්හි 'එ තැන දෙව'යි වදළ සේක. 'ඒ නා රජ්ජුරුවෝ යහපත් කෙණෙක් නො වෙති. දෙන්ට බැරි ය'යි කිවු ය. 'උන් යහපත් වත් කිම. නපුරු වත් කිම. එ තැන දෙව, යි වදළ සේක. 'එ සේ වී නම් තොපි ම දනුව'යි කී ය. මහ තෙරුන් වහන්සේ වැලිගොඩ කරා නික්මුණු සේක.

නා රජ්ජුරුවෝ ත් ඔබ වඩනා දැක 'මේ මහණ මෙ තැනට එයි. මාගේ තරම නො දන්නා වනැ'යි දුම් කඳක් විහිදුවමින් මොහු මරමී'යි දුමා ගියෙය. මහ තෙරුන් වහන්සේ ද තමන් වහන්සේ ට ත් පිළිවන් හෙයින් දුමා ගිය සේක. දෙ තැන ඇඟින් ම නිකුත් දුම් කඳ බඹ ලොව දක්වා නැංගේ ය. දෙදුම් එක් ව ලා නයාණන්ට ම පීඩා කෙරෙයි. මහ තෙරුන් වහන්සේට කිසි ත් පීඩා නැත. නා රජ්ජුරුවෝ ද දුම් දැඩි කලට ගිනි දල්වන්නා සේ ගිනි ගෙන දිලිහුණුවු ය. මහ තෙරුන් වහන්සේ ත් සෘද්ධීන් ගිනිගෙන දිලිහුණු සේක. දෙපක්ෂයෙන් ම නැඟි ගිනිදූල් බඹ ලොව දක්වා

Non-Commercial Distribution

නැංග. දෙ තැනින් ම නැඟි ගිනි දල් එකොළොස් ගිත්න නිවා සිටි මහ තෙරුන් වහන්සේට කුමකු ත් කොට නො හී නයාණන්ට ම පීඩා කෙරෙයි. දස දහසක් පමණ තවුසෝ දැ දූක 'නා රජ්ජුරුවෝ මහණහු දවති. යහපත් මහණ ය. අප හැම කීවා නො කොට නටහ'යි සිතූහ. නයිට ම පීඩා වූ නියාව නො දත්හ. මහ තෙරුන් වහන්සේත් නඥෙපනන්දයන් මෙන් මුනු ත් හික්මවා ගෙන වැලි ගොඩ මත්තෙහි වැඩ හුන් සේක.

නා රජ්ජුරුවෝ ද මහ තෙරුන් වහන්සේගේ බරින් වැලි ගොඩ විසිරෙන මුත් නො විසිරෙන්ට ගල් වැටියකින් තර කරන්නාක් මෙන් වැලි ගොඩ සියාරා දරණ වේළා ගෙණ කුළු ගෙයක් සා විතර එණයක් මවා ගෙණ තෙරුන් වහන්සේ ඉසට කළහ. තවුසෝ හැම ත් උදසන ම 'මහණහු මළ නො මළ නියාව දනුම්හ' යි වැලි ගොඩ කරා අවුත් බලා වැලි ගොඩ මත්තෙහි වැඩ හුන්නා දූක දෙහොත් මුදුනේ තබා ගෙණ ස්තුති කෙරෙමින් 'කුමක් ද? නා රජ්ජුරුවන් ගෙන් පීඩාවෙක් නොවී දූ' යි විචාළහ. 'මා විචාරන්නේ හැයි ද? නා රජ්ජුරුවන් මා හිසට එණ ය කොට ගෙණ සිටි නියාව නුදුටු දූ'යි විචාළ සේක. ඌ හැම ත් බලා සමාධි ව 'මෙ සේවූ නයින් පවා මෙ තරමකට පමුණුවා ගත් කල ආනුභාව ය කියනු ව කිම් දූ'යි මහ තෙරුන් වහන්සේ පිරිවරා ගෙණ සිටියහ.

ඒ වේලාට බුදුහු ත් වැඩි සේක. මහ තෙරුන් වහන්සේ බුදුන් දූක නැඟී සිට අවුත් වැදි සේක. තවුසෝ ඒ දූක 'මුන්දෑ මුඹට ත් වඩනා නියා දූ'යි විචාළහ. එ සේ විචාළවුන්ට 'හෙම්බා මුන් වහන්සේ බුදුහු ය. මම ඔබට වම ත් සවුව සිටියෙමි' වදාළ සේක. බුදුහු ත් යොධයන් සාධා ලූ රටෙක රජ්ජුරු කෙණකුන් ගොසින් හිඳිනා සේ වැලි ගොඩ මත්තෙහි වැඩ හුන් සේක. අග්ගිදත්ත ප්‍රමුඛ දස දහසක් තවුසෝ ද 'අග සවු නමගේ ආනුභාව මේ තරම් කලට බුදුන්ගේ ආනුභාව කවර තරම් දෝ හෝ' යි දෙහොත් මුදුනේ බැඳ ගෙණ බුදුන් වැඳ වැඳ සිටියහ. බුදුහු ත් අග්ගිදත්ත නම තවුසාණන් බණවා ලා 'අග්ගිදත්තයෙනි, තොපි තොපගේ තවුස් පිරිසට ත් උපාසක වරුන්ට ත් අවවාද කරණ කල කවර ලෙසක කරවු දූ'යි විචාළ සේක. ''මම සවාමීනි, පර්වත වන ආදී ය සරණ යව. එ ලෙසින් දුකින් මිදෙව යි මෙ ලෙස අනුශාසනා කෙරෙමි'' යි කිවූ ය.

බුදුහු ඒ අසා 'අග්ගිදත්තයෙනි, තෙල දුකින් මිදෙන්ට උපදෙස් නො වෙයි. උපදෙස් නම් මේ ය' යි වදරන බුදුහු

Non-Commercial Distribution

'හෙම්බා අග්ගිදත්තයෙනි, බොහෝ දෙන තමන්ට පැමිණි භයෙක් ඇත් නම් ඉන් මිදෙනු නිසා ත් පුත්‍ර ප්‍රතිලාභාදි ය නිසා ත් ඉසිගිලි වෙපුල්ල වෛභාරාදි පර්වතයන් ද මහා වන ගොසිඞ්ග සාලවනාදි වන ද වෙළුවන ජීවක අම්බවනාදී වූ ආරාම ද උදෙන චෛත්‍ය ගොතමක චෛත්‍යාදි චෛත්‍ය වෘක්ෂ ද තම තමන්ට රක්ෂා ස්ථාන ය යි සිතති. කෙ සේ සිතා කළ ත් ඒ තෙමේ රක්ෂා ස්ථාන ත් නො වෙයි. නිරුපද්‍රව කාරණ ත් නො වෙයි. සත්ත්වයෝ ඒ පර්වතාදිය නිසා ජාති ජරා මරණින් මිදෙන්නෝ ත් නො වෙති. යම් කෙනෙක් නව අරහාදී බුදු ගුණ සලකා බුත් සරණ යෙත් ද, ස්වාක්ඛාතතාදී ධර්ම ගුණ සලකා දහම් සරණ යෙත් ද, සුප්‍රතිපන්නතාදී සඞ්ඝ ගුණ සලකා සඟ සරණ යෙත් ද, තීර්ථක භජනාදි ය නිසා පෘථග්ජන ව සරණ යෑමට හානි වේ මුත් මාර්ග ගත සරණ සීල ය නිශ්චල හෙයින් මාර්ග භාවනා කොට සත්‍ය ප්‍රතිවෙධ ය කිරීමෙන් සෝවාන් පමණකු ත් වීමට උත්සාහ කෙරෙත් ද, එ ලෙසින් මාර්ග ගත ව සම්භ වූ සරණ යෑමෙක් ඇත් නම් ඒ නිරුපද්‍රව ය. ඒ උතුම ඒ සරණ යෑම නිසා සත්ත්වයෝ ජාති දුඃඛාදියෙන් මිදෙති' වදාළ සේක.

දෙශනා කෙළවර අග්ගිදත්ත ප්‍රමුඛ දස දහසක් තවුසෝ පිළිසිඹියා පත් රහත් ව මහණ කරන්ට ආරාධනා කළහ, බුදුහු ත් රත් වලා ගැබකින් නිකුත් වන විදුලියක් මෙන් දකුණු ශ්‍රී හස්ත ය දික් කොට ලා 'මෙ සේ එව, මහණෙනි' වදාළ සේක. ඒ හැම තැන් අට පිරිකර ධරා සිය වස් ගිය මහ තෙරුන් වහන්සේ මෙන් ආකල්ප සම්පන්න වූ සේක. එ දවස ද වැළි ත් ළෙ රට ඇත්තවුන් පූජා භාණ්ඩ ගෙන්වා ගෙණ නා රජ්ජුරුවන් ළඟට එන දවස ය. උයි ත් සත්කාර නිසා අංචා වූ තවුසන් හැම මහණ වූවා දැක කුමක් දෝ අපගේ අග්ගිදත්තයන් වහන්සේ බලවත් සේක් දෝ හෝ නො හොත් බුදුහු බලවත් සේක් දෝ හෝ' යි සිතා 'බුදුන් හුන් තැනට අග්ගිදත්තයන් වහන්සේ නො ගොසින් බුදුන් ම මොබ ආ හෙයින් අග්ගිදත්තයන් වහන්සේ ම බලවත් සේකැ'යි සිතා ගත්හ. බුදුහු ත් උන්ගේ අදහස දැන 'අග්ගිදත්තයෙනි, තොපගේ උපාසකවරුන්ට ඇති වූ සැක ය හරවා ලව' යි වදාළ සේක. උන් වහන්සේ ත් 'මම ද එ ලෙසක් ම සිත සිතා හුන්නෙමි' වදරා ලා ඍද්ධීන් අහසට සත් විටෙකින් සත් තල් විතර පැන නැඟී ලා සත් විටක් ම බැස බට බට විට ම බුදුන් වැඳ ලා 'ස්වාමීනි මුඹ වහන්සේ මට තබා තුන් ලෝ වැස්සන් මුළුල්ලට ම වඩනා සේක. මුඹ වහන්සේ බුදු සේක. මම බුදු සවු වෙමි' කියා රැස් වූ වන්ට උපන් සැක ය හරවා ලූ සේක.

Non-Commercial Distribution

එ සේ හෙයින් නුවණැත්තවුන් විසින් කරණ යම් භජනයක් තුනුරුවන්ට ම කොට දුකින් මිදෙන්ට උත්සාහ කටයුතු.

---

## 165. අනඳ මහ තෙරුන් වහන්සේ ප්‍රශ්න විචාළ වස්තුව

තව ද සර්‍වඥවරයන් ගේ පහළ වීම අරුම නියාව හඟවන්ට අනඳ මහ තෙරුන් වහන්සේ ප්‍රශ්න විචාළ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්—

අනඳ මහ තෙරුන් වහන්සේ එක් දවසක් ''ආජානීය හස්තීහු සදූත් කුලෙහි හෝ පෞෂධ කුලෙහි හෝ උපදිති. අශ්වයෝ වලාහක කුලෙහි උපදිති. ආජානීය වෘෂභයෝ දකුණු දික්භාගයේ උපදිති' යනාදීන් වදරන බුදුහු ආජානීය හස්ති ආදීන්ගේ උත්පත්ති ස්ථාන ම දක්වා වදාළ සේක. පුරුෂොත්තමයන් උපදනා ස්ථාන කවර දෝ හෝ යි' සිතා බුදුන් කරා එළඹ බුදුන් විචාළ සේක. බුදුහු 'ආනන්‍දයෙනි, පුරුෂොත්තමයෝ සෙස්සවුන් සේ හැම තැන උපදනෝ නො වෙති. නැගෙන හිරින් කජංගලා නම් නියම් ගමින් එ පිට සල්ගස හා අග්නි කොණයෙන් සලලවතී නම් ගඟ හා දකුණු දිගින් ශ්වෙතකර්ණික නම් නියම් ගම හා බස්නාහිරින් ථූන නම් බමුණු ගම හා උතුරු දිගින් උසීරධ්වජ පර්‍වත ය හිම් කොට දිගින් තුන් සියයක් පමණ වූ පළලින් දෙ සිය පනස් යොදුන් පමණ වූ වටින් නවසියක් යොදුන් පමණ වූ මද්ධ්‍ය මණ්ඩලයෙහි ම පුරුෂොත්තම වන ජාතියෙහි උපදිති. උපදනා බුදු පසේ බුදු සවුවන්ගෙන් බුදුවරහු එසේ මෙ සේ කුලයෙක නූපදිති.

රජ මහසල් කුලෙහි හෝ බමුණු මහසල් කුලෙහි හෝ උපදිති' වදරා ලා බණ වදරන සේක් 'පුරුෂොත්තමයන් පුරුෂොත්තම වන ජාතියෙහි ප්‍රත්‍යන්තවල නූපදනා හෙයින් හා බුද්ධ බොධිසත්‍වයන් බුදු වන ජාතියෙහි රජ ව බමුණු ව විනා අනික් තරමෙක නූපදනා හෙයින් පුරුෂොත්තමයෝ ඉතා දුර්ලභ යහ. යථොක්ත ලෙසින් හැම කල උපදනෝ ත් නො වෙති. හැම තැන උපදනෝ ත් නො වෙති. සර්‍වඥවරයෝ යම් කුලයක උපන්නු නම් ආජානීය අශ්වයන් මවුන්ගේ දකුණු ඇල ය පළාගෙණ උපදනා සේ නො ව; මවු කුස උපදනා දවස් සුදු ඇත් පැටවකු ලෙ සින් හෙළ පියුමක් හොඬින් හැර ගෙන මහාමායා බිසවුන් දකුණු ඇල ය පලා ගෙන කුස ය ඇතුලට වන් ලෙසින් සීන ය ලෙසට ත් නො ව සීනයේ අර්ථ ය ලෙසට ඒ කුසලයට ත් බොහෝ වැඩ ය'යි වදාළ සේක. දෙශනා කෙලවර බොහෝ දෙන සෝවාන් ඵලා දියට පැමිණියහ.

Non-Commercial Distribution

එ හෙයින් නුවණැත්තවුන් විසින් දුර්ලභ ව උපදනා පුරුෂොත්තමයන් මෙන් දුර්ලභ ව පහළ වන සීල සමාද්ධ්‍යාදි ගුණයෙහි පිහිටා නිවන් සාධා ගන්ට උත්සාහ කට යුතු.

---

## 166. බොහෝ භික්ෂූන් වහන්සේ ගේ වස්තුව

තව ද මේ ලෙවිහි යමෙක් ඉතා සුව වී නම් ඒ දක්වනු පිණිස **බොහෝ භික්ෂූන් වහන්සේ ගේ** වස්තුව කියමු.

කෙ සේ ද යත්—

එක් දවසක් පන් සියයක් විතර වහන්දෑ රැස් ව හිඳ 'ඇවැත්නි, මේ ලොව සුව නම් කවරේ දැ'යි කථාව ඉපැදූ වූ සේක. ඉන් රජ කුලෙන් මහණ වූ තැන් 'රජ සුව තරම් සැපයෙක් නැතැ'යි කී සේක. ගිහි අවස්ථාවෙහි ඔළමොළ ව ඇවිදි තැන් 'ලොකාසවාද රතියට වඩනා තරම් සැපයක් නැතැ'යි කී සේක. කිසි කෙණෙක් මසවුළෙන් යුක්ත බත් ආදි ය අනුභව කළ කල සැප ය'යි යනාදීන් සැප නො වන දෙයම සැප ය'යි කී සේක. බුදුහු ඒ වහන්දෑ වැඩහුන් තැනට අවුත් කෙරෙමින් හුන් කථාව විචාරා ඒ නියා ව දැන 'මහණෙනි, තොප සැප' යි සිතව නැඟූ දෙය වෘත්ත දුඃඛයෙහි අන්තර්ගත හෙයින් දුක ම ය. එ සේ කල සැප නම් කවරේ ද යත්— යම් කලෙක බුදු කෙණෙක් ලොව උපන්නු නම් සතුන් දුකින් මුදන හෙයින් බුදුන්ගේ ඉපදීම ත්, බුදුන් උපන් පමණෙකින් නො ව බණ අසා ම සතුන් දුකින් මිදෙන හෙයින් බණ දෙසීම ත් සැප කාරණ හෙයින් සැප ය.

යම් යෙයකින් බුදු වදන් උගනුත ත් ධුතඞ්ග පූරණාදි වූ මහණ ධම් කරත ත් සමඟ ව මුත් බැරි ද, එ හෙයින් සඞ්ඝයා සමඟ වූ නම් උන්ගේ තපසු ත් සැප ය. විරුද්ධ වූ අදහස් නො ව ගඞ්ගොදක ය හා යමුනොදක ය සේ සම අදහස් ඇති වීම ත් සැප ය'යි වදාළ සේක. දෙශනා කෙළවර නො සැප සැප ය'යි සිතා ගෙන හුන් පන් සියයක් දෙනා වහන්සේ රහත් ව නිවන් සැප විඳගත් සේක. දෙශනාව ත් බොහෝ දෙනාහට සප්‍රයෝජන වි ය.

එ හෙයින් සත් පුරුෂ තැන් විසින් දිවි පමණින් භික්ෂූහු සමඟ ව රැස්වෙත් ද, සමඟ ව නැඟෙත් ද, සඞ්ඝකරණීය ත් සමඟ ව කෙරෙත් ද, උන්ට අභිවෘද්ධියක් මුත් හානියක් නැත, යන අනුශාසනා ලෙසට පිළිපැද නිවන් දහම් පසක් කට යුතු

Non-Commercial Distribution

# 167. තොදෙය්‍ය බ්‍රාහ්මණ වස්තුව

තව ද තුනුරුවන් විෂයෙහි කළ පූජාවෙහි විපාක මහත් නියාව ගඟවන්ට තොදෙය්‍ය බ්‍රාහ්මණ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්—

බුදුහු සැවැත් නුවරින් නික්ම ගම් නියම් ගම් වල සැරිසරා බරණැසට වඩනා සේක් අතුරු මග තෝදෙය්‍ය නම් බමුණු ගමට ලඟ බොහෝ වහන්දෑ පිරිවරා එක්තරා දෙවොලක් බඩට වැඩ එ තැන වැඩ හිඳ දහම් බඩ ගැරි අතද මහ තෙරුන් වහන්සේ යවා තුදුරු තැනෙක සී සාමින් සිටි බමුණු කෙණකුන්ගේ අදහස් නමැති කෙතට සැදෑ නමැති බිජුවට දෙවනු නිසා සාන සී පමා කරවා ත් ගෙන්වා වදළ සේක. බමුණානෝ ද අවුත් බුදුන් නො වැඳ එ ම දෙවොල වැඳ ලා සිටියහ. බුදුහු 'අප හින්ද දී තෙලෙ තැන කුමක් නිසා වැන්දෙ යි දැ'යි විචාළ සේක. 'අපගේ පරම්පරාවෙහි වැඳ පුදු ආ දෙවොලක් හෙයින් මම ත් ඒ පනත නො පිරිහෙළා වැදිමි'යි කිවු ය. 'බමුණ, තා තෙලෙ තැනට වදිනා බව යහ-පතැ'යි බුදුහු සතුටු වූ සේක.

වහන්දෑ ද ඒ අසා 'තෙල තැන වැදීමට සතුටු වන්ට කාරණ කිම් දැ'යි කාරණයෙහි සැක වූ සේක. බුදුහු ද ඒ වහන්දෑගේ සැක ය හරවනු නිසා මැදුම් සඟි ය ඝටීකාර සූත්‍රය ත් වදරා තමන් වහන්සේගේ ආනුභාවයෙන් කසුප් බුදුන්ගේ ධාතුපරිනිර්වා ණ ය වුව ත් පොළොව සැහ වී සිටි සතර ගවුවක් උස රන් දගැබ රන් පර්වතයක් මෙන් අහස රඳවා බොහෝ දෙනාට දක්වා ලා 'බමුණ, පූජාවට නිසි වූ මෙ බඳුවන්ට වැඳීම්–පිදීම් කළමනා දෙයෙ කැ'යි වදරා දික් සඟි ය මහාපරිනිර්වාණ සූත්‍රයෙහි වදළ ලෙසින් ම බුද්ධාදී වූ පිදිය යුතු තැන් වදරා ලා ශරීර ධාතු වඩා කළ ද ගබ ද නැවත ශරීර ධාතු ද, උද්දෙසික ධාතු ද, පාත්‍ර ධාතු ආදි වූ පාරි භොගික ධාතු දැ යි චෛත්‍ය තුනක් වෙනසක් නැති කොට වදරා බණ වදරන සේක්-'යම් කෙණෙක් ආමිස පූජා ත් ප්‍රතිපත්ති පූජා ත් විදින්ට නිසි බුදු පසේ බුදු මහ රහතන්ට තමන්ගේ බල පමණින් පූජා කෙරෙත් නම් පූජා කළවුන්ට සිද්ධ වන කුශල ය මෙතෙකැ යි ලාසෙකින් නැළියෙකින් මැන පමණ දැන ගත හැක්කක් නො වන හෙයින් එ සේ වේව'යි තරාදි ආදීන් කිරා ගත හැක්කක් නො වන හෙයින් එ සේ වේ ව යි මේ මෙතෙක් වුව මැනව'යි අනුමානයකින් වේව යි, මේ මෙ තෙක, වඩා නැතැ'යි ගණන් කරන්ට දිව්‍ය බ්‍රහ්මාදීන් අතුරෙන් කිසි කෙණකුන්ට ත් බැරි ය. අනන්ත ය යන නියමය විනා සඞ්ඛ්‍යාවට ත් බැරිය' යි වදළ සේක.

Non-Commercial Distribution

දෙශනා කෙළවර දෙවොල වැද ආ බමුණෝ නො දූන වැන්ද ත් වැන්ද මනා ම ස්ථානයක් හෙයින් සෝවාන් වූහ. සතර ගවුවක් උස රන් දා ගබ ත් සතියක් මුළුල්ලෙහි ම ආස ම රඳා සිටී ය. බොහෝ දෙන ත් රැස් ව සතියක් මුළුල්ලෙහි මහ පුද කළහ. දෘෂ්ටි ගතිකයන්ගේ මිථ්‍යා දෘෂ්ටිය ත් හැරිණ. සති කෙළවර බුදුන්ගේ ආනුභාවයෙන් ඒ දා ගබ ත් ආදී තුබූ තැන ම පිහිටා සිටී ය. ඒ රන් දා ගබ පිහිටි තැන මුදුනෙහි එ වේ ලේ ම මාරුවක් ලා ලා ගියා සේ ගල් දා ගබෙක් වී ය. ඒ බණ අසා සුවාසූ දහසක් දෙන නිවන් දුටහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින්–

'තිට්ඨන්තෙ නිබ්බුතෙ චාපි–සමෙ චිත්තෙ සමං ඵලං,[1]
චෙතොපසාද හෙතුම්හි-සත්තා ගච්ඡන්ති සුග්ගතිං'.

යනු හෙයින් බුදු පසේ බුදු මහ රහතන් ඇත ත් පිරිනිවීය ත් අදහස සරි වී නම් විපාක ත් සරි වෙ යි–යනු සිත්හි තබා දැනු ත් පූජා සත්කාර කිරීමෙහි නිරුත්සාහ නො ව හව සැප ත් වළඳා නිවන් සම්පතු ත් අත් කට යුතු.

---

## 168. නෑයන් ගේ කලහය සංසිඳවූ වස්තුව

තව ද කලහයෙහි ආදීනව දක්වනු සඳහා බුදුන් තමන් වහන් සේ ගේ නෑයන් ගේ කලහ ය සන්සිඳවූ වස්තුව කියමු.

කෙ සේ ද යත්—

ශාක්‍ය රජ දරුවන් හා එ ම පක්ෂයෙහි කොලිය රජදරුවන් හා කිඹුල් වතට ත් කොලිය නුවරට ත් අතුරෙහි රොහිණී නම් ගඟ අවුණුබඳවා ලා වරුපෙත්වල ගොයම් කරවති. ඉක් බිත්තෙන් පොසොන් මස් ඉද්දෙහි නියන් තද ව ලා ගොයම් මියන්ට වන් කල්හි දෙ පක්ෂයේ රජ දරුවන්ගේ බත්ගම් පරිවාර රැස්ව ලා කොලිය නුවර රජුන්ගේ ගොයම් කළ මිනිස්සු ශාක්‍ය රජදරුවන් ගේ ගොයම් කළවුන්ට 'හෙම්බා, මේ ඇළ දිය දෙ භාගයේ වරුපෙතට එක් කොට නමතොත් තොපට ත් නො සෑහෙයි. අපට ත් නො සෑහෙයි. අපගේ ගොයම් එක පැන් මුරයකින් පැසෙ යි. තොපට ගෙණ යන්ට නො සිතා අපට හරුව'යි කීහ. ශාක්‍ය රජ දරුවන්ගේ සී වැස්සෝ 'තොප ගොයම් පැසවා ගෙන ද මිරිකා –අවු–කොටු පුරා ගත් කල අපි රත්රන් හැර ගෙන මලු පෙට්ටි

---

1 සමං චිත්තං.

Non-Commercial Distribution

හැර ගෙන තොපගේ ගෙවලට වී ඉල්වා එක නො හෙම්හ. අපගේ ගොයමු ත් එක පැන් මුරයකින් පැසෙයි. මේ පැන් මුර ය අපට දෙව'යි කීහ.

අපි එ සේ නො දෙම්හ'යි කී කල්හි තෙපි නො දෙවු නම් අපි ත් නො දෙම්හ'යි කියා කලහ වඩා ගෙන එකෙකක් නැඟී සිට එකකුට පහරක් ගැසී ය. ඒ අනිකකුට ගැසීය යි ඔවුනොවුන් හා කලහ කොට මෙගණ මුදළි ව සිටි රජ දරුවන්ට ත් බණන්ට පටන් ගත්හ. ඉන් කොලිය රජ දරුවන්ගේ බත්ගම් වැස්සෝ කිඹුල් වත රජ දරුවන්ගේ මිනිසුන්ට 'කොල, කිඹුල් වත රජ දරුවන් හැර ගෙන බැවෙවු ද? තිරිසනුන් පරිද්දෙන් තමන් තම න්ගේ නඟුන් හා සමග වාස ය කර ත් අනුන් හා ඩබර කරණ කල නම් එබඳු ගරු තරමක් ඇත මනා වේ ද? ඩබරට අවු නම් නපුරු අසා ගෙණ යන බව වේ ද? උන්ගේ සිවුරහ අපට කුමක් කෙරෙත් ද යනාදීන් දෙඩූහ.

ශාක්‍ය රජ දරුවන්ගේ මිනිස්සු ත් කොලිය 'රජ දරුවන්ගේ මිනිසුන්ට 'කිඹුල්වත ම බිසෝ කෙණකුන් ඇඟ කුෂ්ඨයක් ඇති වූ තැන කොළොම් ගස් බිලයෙක රඳා හිඳ සේරුවක් කරවා ලා ලවා ලූ තැන යම්කිසි ලෙසකින් කුෂ්ඨරොග නැති වුව ත් කිඹුල් වතට යන්ට මැළි ව කොළොම් ගස මුල ම නුවරක් කරවා ගෙන දරු මුනුබුරු පරම්පරාවෙන් රඳා හුන් පමණට එයි ත් කුලයක් කොට ගෙන තෙපි කුෂ්ඨ ඇත්තවුන්ගේ දරුවන් හැර ගෙන බැ වෙවු ද? තිරිසනුන් පරිද්දෙන් ගමක් දිවෙලක් නැති ව කො- ළොම් ගස් බිලයේ හුන්හ. උන්ගේ සේනාව ත් උයි ත් අපට කුමක් කෙරෙත් ද? අවු නම් තමන්ගේ තරම් අසා ගෙන යන බව වේද යනාදීන් බිණූහ.

තුමූ දෙ පක්‍ෂ ය ඩබර කොට ලා නික්ම උන් රජදරුවන්ට බැණ දෙඩා තමන් තමන්ට විධාන කොට සිටි ඇමතිවරුන්ට ගොසින් පැමිණියහ. උඹ ගොසින් රජදරුවන්ට කීහ. ශාක්‍ය රජ දරුවෝ ත් නඟුන් රක්‍ෂා කළවුන්ගේ බල දක්වම්හ'යි සටන් සරහා නික්මුණහ. කොලිය රජ දරුවෝ ත් ගස් බිලයේ උපන් නවුන්ගේ බල පාම්හ'යි සටන් සරහා නික්මුණහ. බුදුහු ත් අළුයම් වේලේ ලොව බලන සේක් දෙපක්‍ෂ ව හිඳිනා-නෑයන් හා සටන් සරහා නික්මුණන් දැක 'මම ඔබ නො ගියෙම් නම් මූ හැම නසිති. මුන් හැම දෙනාගේ අකුශල කර්‍ම ය මුකුරා නො යන තෙක් මුන් නස්නට කාරණ කිම් ද? මා ඔබ ගිය මනා වේ ද'යි සිතා තනි

Non-Commercial Distribution

ව ම අහසින් වැඩ රොහිණී ගං මැද අහස පලක් බැඳ ගෙන වැඩ හුන් සේක.

සටනට ආ නෑ රජ දරුවෝ බුදුන් දැක ආයුධ දමා පියා වැඳ ලා සිටියහ. බුදුහු නො දත් බඳු ව ලා 'රජ දරුවෙනි, මේ කුමන ඩබරෙක් දැ'යි විචාළ සේක. තමන් නො දත් හෙයින් 'නො දනුම්හ'යි කිවු ය. 'දන්නෝ කවුරු දැ'යි විචාරා 'සෙනෙවි රද්දු දනිති' කී කල්හි උන් විචාරා වදරා උන් 'යුව රජ්ජුරුවන් දනිති' කී කල්හි උනු ත් විචාරා මෙ ම ලෙසින් පරම්පරාවෙන් ඩබර කළ කොල්ලන් අතින් විචාළ සේක. උඹ තුමූ 'ස්වාමීනි, දිය ඩබරෙකැ'යි කිවු ය. එ වේලෙහි බුදුහු රජ දරුවන් බණ වා ලා 'රජ දරුවෙනි, තොපගේ ඩබර මුල් වූ පැන් කෙතෙක් වටී දැ'යි විචාළ සේක. ''මිලයකට ගනිතොත් වේ ද මිල දැනෙන්නේ, එතකුදු වුව ත් ඒ කුමක් වටී ද, ඉදින් වටී නමුත් මදක් මුත් බොහෝ දෙයක් නො වන්නේ වේ දැ'යි කිවු ය. 'තොප හැම දෙනාගෙන් එක් කෙණෙක් කෙ තෙක් වටු දැ'යි විචාළ සේක. 'රජදරුවන්ට අග ය නැත්තේ වේදැ'යි කී කල්හි ඉදින් අග ය කරතොත් මඳ වුව ත් අග ය ඇති පැනිත්තක් නිසා අගයක් නැති තොප හැම දෙනා නස්නට කාරණ ඇද්දැ'යි විචාළ කල්හි මුවෙන් නොබැණ සිටියහ.

ඉක් බිත්තෙන් රජ දරුවන් බණවා ලා 'රජ දරුවෙනි, කුමක් නිසා මෙ ලෙසක් කරවු ද, ඉදින් මා නො ආවොතින් මේ ගඟ ලේ ගඟක් ව ගියේ ය'යි වදරා බණ වදරන සේක් ''යම් ගිහි කෙණෙක් වත්, පැවිදි කෙණෙක් වත් පාපී ව වසන්නාහු 'සුව සේ ජීවත් වම්හ'යි කියා ඉදි ත් නම් උන්ගේ ඒ සිතිවිලි පමණෙක. අප නිෂ්පාපී හෙයින් අපි සුව සේ ජීවත් වම්හ. යම් කෙණෙක් කෙලෙස් ලෙඩින් ලෙඩ ව හිඳ ත් කන්නට බොන්නට ඇති හෙයින් 'අපි සුව සේ ජීවත් වම්හ'යි සිතා හිඳි ත් නමුත් ඒ උන් ගේ සිතිවිලි පමණෙක. අපි ඇම නිකෙලෙස් හෙයින් සුව සේ ජීවත් වම්හ. යම් කෙණෙක් ගිහි කම් කටුල් කෙ සේ දුක් වුව ත් 'සුව විඳුම්හ'යි සිත ත් නම් කපුරුහා තැඹිලි පැන් අනුභව කරණ කල විරස නැත ත් පසුව දුක් වන්නා සේ, තෙල් හුරු මස් හා කිරි අනුභව කරණ කල මීර වුව ත් පසු ව දුක් වන්නා සේ උන්ට සැප නැත්ම ය. අපට ගිහි කම් කටුලේ උත්සාහ නැති හෙයින් සුව සේ ජීවත් වම්හ''යි වදළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ.

Non-Commercial Distribution

එ හෙයින් නුවණැත්තවුන් විසින් පවිහි නො හැසිරීමෙන් නිෂ්පාපී ව කෙලෙසුන් නැසීමෙන් කෙලෙස් ලෙඩ නැතිව කුසල් විෂයට කරණ උත්සාහයක් මුත් පාපොත්සාහයක් නැති ව පිළිපැද භවක්‍ෂයට උත්සාහ කට යුතු.

# 169. මාරයා ගේ වත

තව ද වසවත් මරහු ගේ පාපී වූ අලුව දක්වන්ට මාරයා ගේ වත කියමු.

කෙ සේ ද යත්—

එක් දවසක් බුදුහු තමන් වහන්සේ එ දවස් එ ගමින් ලබන බතක් නැතත් කුමාරිකාවරුන් පන් සියයක් ලබන නිවන් රස සලකා අනුන්ට අමුතු බත් දෙන කලක් මෙන් පඤ්චසාල නම් බමුණු ගම රැඳුණු සේක. ඒ කුමාරිකාවරුන් පන් සියය ද එක් උත්සව දවසෙක ගඟට ගොසින් නා පියා ආභරණ ලා සැරහී ගෙණ ගමට එන්ට නික්මුණාහ. බුදුහු දෙ තිසක් විතර මහා පුරුෂ ලක්‍ෂණ නමැති ආභරණ ලා සැරහී ගෙණ ඒ ගමට සිඟාවන් සේක. වසවත් මර ද මිහිරි දියෙක පතළ වසක් මෙන් ගම් වැස්සන් මුළුල්ල ඇඟ ආවිෂ්ට ව බුදුහු යම් සේ බතක් නොලබන සේක් වී නම් එ දවස් එ ලෙසට කොට ලා තෙමේ අනන්ත කාලයක් බත් නොලබනු ව පාත්‍ර ය සෝධා පූ වන ම හැර ගෙණ වඩනා බුදුන් ගම් දෙරදී දැක 'කිම් ද? මහණ, සිඟා බතක් ලදී දැ'යි නො හික්මුණු සැටියට විචාළහ. බුදුහු ඒ අසා කුමක් ද, මාර ය, තෝ මා බත් ලබන ලෙසක් කෙළෙහි දැ'යි වදාළ සේක. එ විට වස වත් මර 'මාගේ බසින් පෙරළා ගමට වන්නු නම් ඇම දෙනා ඇඟ ආවිෂ්ට ව ලා සිඟු ගෙවල පෙරළා ත් සිඟන නියාවක් කියවා බත් නො ලද ත් නින්දවක් ලබ්බවමි' සිතා ගෙණ 'ස්වාමීනි, ආදි වැඩි වේලාට බත් නො පිළිගැන් වූ නමුත් පෙරළා ත් සිඟා වැඩිය යහ පතැ'යි කී ය. මාගී ඥන ය එක විටක උපදූ ත් මුත් දෙවිටෙක නූපදනා සේ සිඟා පී ගම එ දවස් පෙරළා සිඟීම නැති හෙයින් නො වැඩි සේක.

එ වේලාට කුමාරිකාවරු ද ගම් දෙරට පැමිණ බුදුන් දැක වැඳ ලා එකත් පස් ව සිටියහ. වසවත් මර ද බුදුන්ට 'කිමෙක් ද? ස්වාමීනි, බත් වළඳන්ට නුවූ හෙයින් බඩ සාය ඇත් තේ වේ දැ'යි කී ය. බුදුහු ඒ අසා 'මාර ය, අපි කුමක් නො ලද නමුත් ආභස්සර නම් බඹ ලොව බඹුන් පරිද්දෙන් ප්‍රීතිය අනුභව කොට ප්‍රීති සුවෙන්ම

Non-Commercial Distribution

දවස් යවම්හ'යි වදරා 'රස තෘෂ්ණාව යම් කෙණකුන්ට ඇත්තේ වී නම් සා දුක් උන්ට ම වේනු යි අපට එ බන්දක් නැති හෙයින් මහා කපින් අට කපක් මුළුල්ලෙහි ප්‍රීති ය ම අනුභව කොට වසන ආභස්සර බඹුන් මෙන් බත් නො ලබන්ට උපදෙස් කල තා කෙරෙහි රුෂ්ට අදහස් සඳුන් දණ්ඩෙහි පූති ගන්ධ ය නැත්තා සේ නැති බැවින් ප්‍රීති නමැති සුධා භොජන ය වළඳා මහා කරුණා සමාපත්ති ඵල සමාපත්ති නමැති පැනින් අඩු ව පුරා වළඳා දවස් යවම්හ'යි වදාළ සේක. දෙශනා කෙළවර කුමාරිකාවරු පන් සිය ය වළඳන තැනට ගොසින් හළ බත් කා බඩ පූරවන්නවුන් මෙන් සෝවාන් ව නිවන් රස අනුභව කළහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් රස තෘෂ්ණාව නම් අකුශල සන්නිශ්‍රිත හෙයින් ඒ හැර කරණ ඇල්ම ත් නිවන් විෂයෙහි ම කොට භවක්‍ෂයට උත්සාහ කට යුතු.

## 170. කොසොල් රජ්ජුරුවන් ගේ පරාජය වත

තව ද යුද්ධ ප්‍රයෝගයෙන් කෙලෙස් සතුරන් හා යුද්ධකොට උන් පරදවා තමා ජය ලැබීම් යහපත් නියා ව භගවන්ට කොසොල් රජ්ජුරුවන් ගේ පරාජය වත කියමු.

කෙ සේ ද යත්—

ඒ රජ්ජුරුවෝ ගම් පමුණක් නිසා නැහණියන්ගේ පුත් වූ අජාසත් රජ්ජුරුවන් හා සටන් කොට තුන් වරෙක පැරද තුන් වැනි මුරයේ දී 'මම වැඩියුරු ව සිට ත් බාල සුභා පමණකු ත් පරදවා ගත නුහුණුයෙමි. උන්ට පැරද පියා හිඳිනා බ්ලා ත් මිය යෑම යහපත'යි කෑම්-පීම් හැර පියා මියන්ට ම නියැළි වැද හොත්හ. ඒ උන්ගේ පවත සියලු මුළු නුවර ත් පැතිර පැවැත්ත. වහන්දෑ ත් බුදුන් කරා ගොසින් බුදුන්ට එ පවත් දන්වූ සේක. බුදුහු ඒ අසා බණ වදරන සේක් 'මහණෙනි, කෙලෙස් සතුරන් පර දවා ලබන ජය හැර සෙසු ලෙසින් ජය ලබන්නාහු සියලු ම ප්‍රයොග නපුරු හෙයින් අකුසල් රැස් කෙරෙති. අනුන් විසින් පරදවන ලද්දෝ සතුරන් සමුච්ඡෙද වශයෙන් පැරැද්දවූන් සියලු ලෙසින් තමන් නට හෙයින් කිසිවක් කට නො හෙත ත් කවර විටෙක මූන්ට කුමක් කොට පියමෝ දෝ හෝ''යි සිතා බොහෝ දුක් ගනිති. යම් කෙණෙක් සව් කෙලෙසුන් නසා සිටියෝ වූ නම් අනුන් පරදවා සිද්ධ වන අකුසලු ත් නැති හෙයින් තමා පරදවන දුකු ත් නැති හෙයින් උෟ තුමූ සතර ඉරියව්වෙන් සුව සේ දවස් යවති' වදාළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ.

Non-Commercial Distribution

එ හෙයින් නුවණැත්තවුන් විසින් යම් ජයක් නිසා අකුසල් සිද්ධ වේ නම් එයි ත් හැර කර්මානුරූප ව සෙස්සෝ කෙසේ [1]පරදත් නමුත් කෙලෙසුන්ට පැරදීමෙන් වන දෙයකු ත් වැද්ද නො දී අති මධුර වූ නිවන් රස වළඳා ජාති දුක් ආදී ය නසන්ට උත්සාහ කට යුතු.

## 171. එක්තරා කුලදරුවාණ කෙණකුන් ගේ වස්තුව

තව ද වාත පිත්තාදී තුන් දෙස් රොග එළවන්නා සේ රාග ද්වේෂාදී තුන් දෙස් සසර දුක් එළවන නියාව දක්වන්ට එක්තරා කුල දරුවාණ කෙණකුන් ගේ වස්තුව කියමු.

කෙ සේ ද යත්—

ඒ කුල දරුවාණන්ගේ දෙ මවු පියෝ පුතණුවන්ට සරණක් ගෙන්වා පාවා දී සරණ මඟුල් දවය එයි ත් වෙනම මඟුලක් හෙයින් බුදුන්ට ත් ආරාධනා කළහ. බුදුහු ද භික්ෂු සඞ්ඝයා වහන්සේ පිරිවරා මඟුල් ගෙට වැඩ, වැඩ හුන් සේක. සරණ ගෙණා කුමාරිකාවෝ ද තමන් සැදෑ ඇති හෙයින් වහන්දැට පැන් පරහා දීම් ආදි වූ මෙහෙවර කෙරෙමින් ඇවිදිති. රක්‍ෂා කළ කුල දරුවාණෝ ද දිවි හිමියෙනු ත් බලා රිසි නො යන බුදුන් නො බලා ම කුමාරිකාවන් බල බලා සිටියහ. සිනාසෙන්ට නියාලූ දත් දක පිළිකුල් විසින් මෙනෙහි කළ තිස්ස තෙරුන් සේ නො ව 'අත යහපත, පය යහපත, තනේ යහපත, නාසේ යහපත' යනාදීන් සුභාකාරයෙන් බලනුවන්ට රා සිත් පහළ වී ය. උඹ තුමූ රා සිතින් මඩනා ලදු ව බුදුන්ට වේ ව'යි අසූ මහ සවුවන් වහන්සේට වේ ව'යි උපස්ථානයක් කට නුහුණු වූහ. සසර සිටිනා තෙක් මුළුල්ලෙහි නුපුරුදු හෙයින් ඒ කට නුහුණ ත් අනන්ත කාලයක් අභ්‍යාස ය ඇත්තා ඊට ම හෙයින් බුදු පාමොක් සඞ්ඝයා කෙරෙහි භයක් ලජ්ජාවක් නැති ව ඒ කුමාරිකාවන්ට ත් සිද්ධ වන කුශල ය නවතන්ට කරන්නාක් මෙන් උන් අත අල්වා ගන්ට සිතූහ.

බුදුහු උන්ගේ අදහස් දැන ලා ඒ කුමාරිකාවන් උන්ට නො පෙණෙන ලෙස කොට වදළ සේක. උයි ත් කුමාරිකාවන් නො දැක අපවත් වූ වස්තුව නුදුට ත් සඟවා ලූවන් දක්නා සේ බුදුන් බල බලා සිටියහ. බුදුහු ද තමන් වහන්සේ බල බලා සිටි කුමාරයන්ට ත් නො පෙනී සිටි කුමාරිකාවන්ට ත් බණ වදරන

1 සෙස්සෝ කවර විටෙක ත්

Non-Commercial Distribution

සේක් 'දුමක් වේ ව යි, අළු වේ ව යි, අඟුරු වේ ව යි' දරු වේ ව' යි නො දක්වා ඇතුළත ම සිට දවා නිමවා ලිය හෙන ගින්නෙක් වේ නම් රාග නමැති ගින්නට වඩා නැත. යමෙක් මේ ලොව වරද වේ නම් ද්වේෂයට වඩා වරදකුත් නැත. රාග ය තමා ඇසුරු කළාහු ම නසා ත් මුත් අනුන් නසා ලිය නො හෙයි. ද්වේෂ ය තමා ඇසුරු කළවුනු ත් අනුනු ත් සෙසු තබා රටවල් දක්වා නසා ලයි.

මේ ලෙව්හි දුකෙක් වේ නම් රූපස්කන්ධාදී පඤ්චස්කන්ධයට වඩා නැත. උත්පත්ති කාරණ වූ තෘෂ්ණාව නම් දුඃඛ කාරණ හෙයින් මධුමෙහ ආදි මෙහ ඇත්තවුන්ට උපදනා දරුවන්ට ත් මෙහ ඇත්තා සේ උත්පත්ති කාරණ වූ තෘෂ්ණාවගේ වශයෙන් ස්කන්ධයෝ දුක් වෙති. මේ ලෙව්හි යමෙක් සැප වේ නම් නිවනට වඩනා දෙයක් නැතැ'යි රුවන් ගෙයක් කොට නිමවා ලා මැණිකින් කුළු ගන්නා සේ නිවනින් කුළු ගත් සේක. දෙශනා කෙළවර කුමාරයෝ ත් කුමාරිකාවෝ ත් තරම බරක් ඔසවන්නා සේ සෝවාන් වූහ. නිවන් දක්වා වදළ සේ ම කුමාරයන්ට කුමාරිකාවනු ත් කුමාරිකාවන්ට කුමාරයනු ත් දක්වා වදළ සේක.

එහෙයින් නුවණැත්තවුන් විසින් යම් භාවනාවෙක් රාග ප්‍රතිපක්ෂ වී නම් කා ගියා සී ආදි වූ ඒ ඒ භාවනාවෙහි යෙදී, යම් භාවනාවෙක් ද්වේෂ ප්‍රතිපක්ෂ නම් මෛත්‍රී ආදි වූ ඒ ඒ භාවනා යෙහි හැසිර ආනාපාන සතියෙහි යෙදීමෙන් මොහය ත් දුර කොට භවක්ෂයට උත්සාහයක් ම කට යුතු.

## 172. එක්තරා උපාසකකෙණකුන්ගේ වස්තුව

තව ද බුදුන් ගේ කාරුණික කම හඟවන්ට එක්තරා උපාසක කෙණකුන් ගේ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්—

එක් දවසක් බුදුහු දෙව්රම් වෙහෙර ගඳ කිළියේ වැඩ හිඳ ම අළුයම් වේලේ ලොව බලන සේක්- අළවු නුවර හිඳිනා එක් දුක් පත් කෙණකුන් ඕවන් දක්මෙහි නු දුක් පත් නියාව දැක පන් සියයක් දෙනා වහන්සේ පිරිවරා අළවු නුවරට වැඩි සේක. අළවු නුවර ඇත්තෝ ද බුදුන්ට ආරාධනා කළහ. ඒ දුක් පත් තැනැත්තෝ බුදුන් වැඩි නියාව අසා 'බුදුන් ලඟට ගොසින් බණ අසමි' සිතූහ. එ දවස් උන්ගේ ගොනෙක් දුරු බා පලා

Non-Commercial Distribution

ගියේ ය. ඌ තුමූ 'කුමක් දෝ? ගොනු සොයා යෙමි දෝ නො-හොත් බණ අසා යෙමි දෝ හෝ' යි සිතා 'ගොනු සොයා ගෙනවුත් ගෙරි අතුරේ ලා පියා පසු ව බණ ඇසීම් නම් දෙ කට යුත්ත ම වරදිනට නැතැ' යි උදසන ම ගොනු සොයන්ට ගෙන් නික්මුණාහ.

අළවු නුවර වැසියෝ ද බුදු පාමොක් සඞසයා වහන්සේ වඩා හිඳුවා දන් වළඳවා ලා බණට ආරාධනා කළහ. බුදුහු ත් 'යමක්හු නිසා මම දෙළොස් ගවුවක් මග ගෙවා අයිම් නම් ඌ තුමූ ගොනකු බලන්ට වලට ගියහ. උන් ආමොත් මුත් බණ නො කියමි' සිතා මුයෙන් නො බැණ වැඩ හුන් සේක. ඒ දුක් පත් තැනැත්තෝ ද දවල් කොට ගොනු දැක ගොනු ගෙරි අතුරට හැර පියා බඩ සාය බලවත් වුව ත් ගෙට ගොස් බතක් කන්ට නො සිතා වහා බුදුන් කරා ගොසින් බුදුන් වැඳ එකත් පස් ව සිටියහ. බුදුහු ද ඔවුන් වැඳ ලා සිටි කල්හි දවස මුළුල්ලෙහි කෙළි කෙළ විඩා ව පියා ආ පුතණු කෙණකුන්ට බත් උදවු වන තෙක් කැවුමක් පෙවුමක් දෙන මැණි කෙණකුන් මෙන් සසර දුක් ගෙණ විඩා තැනැත්තවුන්ට නිවන් රස ය දෙවා වදරනු කැමැති ව වළඳවා ලා සිටියවුන් අතින් 'වළඳා ඉතිරි බතෙක් මාළුවෙක් ඇද්දැ' යි විචාරා පත් සියයක් දෙනා වහන්සේට සපයා ලූ දෙය හෙයින් 'කැමැත්තකට ඉතිරි වී ය' යි කී කල්හි 'එ සේ වී නම් තුලුන්ට බත් දෙව' යි වදළ සේක.

උයි ත් එ තැන ම හිඳුවා ලා කැඳ ත් බතු ත් සුව සේ ම කවා ලූහ. උයි ත් බත් කාලා අත කට සෝධා පියා සිටියහ. තෙවළා බුදු වදන් මුළුල්ල ම බැලුව ත් බුදු රජුන් වහන්සේ අනික් කෙණකුන්ට බතක් දෙන්ට විධාන කළ තැනෙක් මෙ තැන විනා නො පෙනෙ යි. බත් කා බඩ පිරුණු කලට සිත ත් එකඟ වී ය. බුදුහු ඒ නියාව දැන පිළිවෙළ කථාව වදරා චතුස්සත්‍ය ය ප්‍රකාශ කළ සේක. උපාසකයෝ ද බත් මත්තෙහි පැන් අනුභව කරණ කලක් මෙන් සෝවාන් වීමෙන් නිවන් රස ත් අනුභව කළහ. ආමිෂ සංග්‍රහධර්‍මසංග්‍රහ දෙක ම එක පැහැර ලැබීමෙන් දුක් පත් කම ත් අළහ. බුදුහු ත් අනුමෙවෙනි බණ වදරා ලා වැඩ පී සේක. උපාසක වරුද බුදුන්ට පසු ගමන් කොට ලා නැවත පීහ.

වහන්දෑ ද බුදුන් හා කැටි ව වඩනා සේක් 'ඇවැත්නි, බුදුන් ගේ කට යුත්තක් බැලුව මැනව. මෙ තෙක් දවස් මෙ බන් දක් නැත. අද දුක් පත් එකකු දැක කැඳ බත් දෙවූ සේක. කුමක්

නිසා එ ලෙස කොට වදළ සේක් දැ' යි නො සතුටු ලෙස කථා ඉපැදවූ සේක. සියල්ල දන්නා වූ බුදුන් දැන වදළ දෙයට කෙල ලෙස නො සතුටු වන කල සෙස්සවුන් දැන ත් නො දැන ත් කළ දෙයට නො සතුටු වීම විස්ම නො වෙයි. බුදුහු ත් රදා වැඩ සිට කථා බොහෝ නො වන තෙක් 'මහණෙනි, කුමක් කියවු දැ'යි විචාරා වදරා එ පවත අසා 'එ සේ ය, මහණෙනි, මම වැළි ත් දෙළොස් ගවුවක් ගෙවා එන්නෙම් හෙතු සම්පන්න තැනැත්තවුන් හෙයින් උන් ම මුල් කොට අයිමි. උනු ත් වැළි ත් උදසන පටන් ගොනකු සොයා ඇවිද ගෙට ගොසින් බතක් කන්ට නුවූ හෙයින් බඩ සාය ත් උන්ට බලවති.

'බඩ සාය බලවත් තැන දී කෙ තෙක් බණ කීව ත් නිදන් වර දවා කරණ පිළියම් සේ ඒ බණින් උන්ට ප්‍රයොජන ත් මඳ. එ හෙයින් මෙ ලෙසක් කෙළෙමි' වදරා බණ වදරන සේක් 'මහණෙනි, සෙසු ලෙඩට යහපත් එක බෙහෙදක් සඹහ වී නම් ඒ එක බෙහෙදින් ම සන්හිදෙයි. එක් තරම් බෙහෙත් වී නම් බෙහෙත් කළ කල හෝ සන්හිදෙයි. නිරන්තර ව සේල් වෙති නැත. මේ ක්‍ෂුත් දුඃඛ ලෙඩට ත් අත් නො හැර නිරන්තර ව ම පිළියම් කට යුතු ය. අත් හැරී ගිය පමණකින් අසාධ්‍ය බවට පැමිණෙයි. එ හෙයින් මේ ක්‍ෂුත් දුඃඛ ය නම් බලවත් වූ ලෙඩක. කෙලෙස් පිළියමට ත් ඒ පිළියම නැති ව බැරි ය. ප්‍රත්‍ය ය සමුත්පන්න ධර්මයෝ නම් ප්‍රත්‍යයායත්ත ව පවත්නා හෙයින් ඉතා දුක්ඛ. ක්‍ෂුත් දුඃඛ ය බලවත් රොග නියා ත් පස් කඳ පිරිමැසීම ඉතා දුක් නියා ත් දැන ප්‍රත්‍ය ය සමුත්පන්න නො වන හෙයින් හා ස්කන්ධයෙහි අන්තර්ගත නො වන හෙයින් නිවන් නම් උතුම් සැපෙකැ යි නුවණැත්තෝ ඒ සිද්ධ කරන්ට උත්සාහ කෙරෙති වදළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් නුවණැත්වුන් විසින්—

''චත්තාරො පඤ්ච ආලොපෙ — අභුත්වා උදකං පිවෙ,
අලං ඵාසු විහාරාය — පහිතත්තස්ස භික්ඛුනො''

යන අනුශාසනා ලෙසින් සතරපස් ආලොපයකට අඩු ව තබා ඒ අඩු ව පැණින් පුරා නො හො ත් ප්‍රාණ ය රැකෙන පමණකට සතර පස් ආලොපයක් වුව ත් වළඳා අඩු ව පුරා පැන් වළඳා මහණ ධම කොට නිවන් සිද්ධ කට යුතු.

Non-Commercial Distribution

# 173. පසේනදී කොසොල් රජ්ජුරුවන් ගේ වත

තව ද ආරොග්‍යතාව උතුම් ලාභ නියාව හඟවන්ට **පසේනදී කොසොල් රජ්ජුරුවන් ගේ වත** දක්වමු.

කෙ සේ ද යත්—

ආද්‍යවස්ථාවෙහි දී ඒ රජ්ජුරුවෝ මගධ නැළියෙන් සාල් සොළොස් නැළියක බත්, ඒ බත් කා පියන්ට සෑහෙන තරම් මාළු වෙන් යුක්ත කොට අනුභව කෙරෙති. ඒ රජ්ජුරුවෝ එක් දවසක් පෙරවරු බත් ඹ නිමවා ලා භුක්තාලස්‍ය ය හැර නො ලා බුදුන් ලඟට ගොසින් ආහාරානුභව ය බොහෝ හෙයින් මිරිකී පියා ඇත මෑත පෙරළෙමින් ඇසට නිදි එත ත් ඉඳුරා නිද පියා ත් නො හී එකත් පස් ව හුන්හ. බුදුහු ත් ඒ දැක වදරා 'කුමක් ද? මහ රජ, මදක් සැත පි නො පියා අවු දැ'යි වදළ සේක. 'එසේ ය. 'ස්වාමීනි, බත් කෑ වේලේ පටන් දුක් බොහොම ය යි කිවු ය. බුදු රජුන් වහන්සේ ද, 'මහ රජ, ඇතැ යි කියා පමණ නො දැන බොහෝ කොට අනුභව කිරීම යහපත් නො වෙයි.

**මනුජස්ස සදා සතිමතො-මත්තං ජානතො ලද්ධභොජනෙ,**
**තනු තස්ස භවන්ති වෙදනා - සණිකං ජීරති ආයුපාලයං.**

යනු හෙයින් 'මහ රජ, පමණ දැන අනුභව කිරීම යහපතැ'යි වදළ සේක. රජ්ජුරුවෝ අනුභවයෙහි පමණ නො දන්නා සේ ම වදළ අවවාදය ත් දත නුහුණුවූ ය. ලඟ සිටි සුදසුන් නම් බෑනණුවන්ට 'අවවාද වීසින් වදළ තෙලෙ ගාථාව සිත තබා ගනුව'යි කිවු ය. උයි ත් තමන් නුවණැති හෙයින් එකශ්‍රුතීන් ගාථාව ඉගෙන ගෙණ 'ස්වාමීනි, ඉතිබ්බ කුමක් කෙරෙම් දැ'යි බුදුන් විචාළේ ය. බුදුහු ත් 'රජ්ජුරුවන් බත් කා නිමවා ගෙණ ගොසින් කෙළවර ආලොප ය කට තබන කලට තෙලෙ ගාථාව කියව. ආදි එකට කියා ලූ හෙයින් අත් ය නුහුනු ත් දෙ වෙනි ව අත් සලකා පියා කෙළවර ආලොප ය අතට ගත් වුව ත් හැර පියති. ඒ ආලොපයෙහි හුළු ගැණ ලා රජ්ජුරුවන්ට බත් පිසන වේලේ දී හළ බත් ආලොපයෙහි උළු විවරට හාලැට හරවා ලව'යි වදළ සේක උයි ත් 'යහපතැ'යි ගිවිස දවාලූ ත් රෑ ත් රජ්ජුරුවන් බත් කන වේලේ දී කෙළවර ආලොප ය අතට ගත් වේලාට ඒ ගාථාව කියාලා හළ පිඩෙයි හුළු ගණනට දවසින් දවස සාලැට හරවති. රජ්ජුරුවෝ ද ගාථාව අසා බෑනණුවන්ට දහසක් දෙවා ලති. පසුව කල් යෑමක දී එක විට නො ව ක්‍රම ක්‍රමයෙන් බොහෝ

Non-Commercial Distribution

කොට කෑම හළ හෙයින් නිරායාසයෙන් ම අල්පාහාරී ව සාල් නැළියෙක බත් පමණකින් යපෙනු ව බඩ ත් කුඩා ව ගොසින් සැහැල්ලු ව ගත්හ.

ඉක් බිත්තෙන් එක් දවසක් බුදුන් ලඟට ගොසින් බුදුන් වැඳ ලා ස්වාමීනි, දූන් මට ඉතා පහසුව. දුවාලියේ ලා ලූ අසුන් වත් ලුහුබඳ වා ගෙන ගොසින් අල්වන්ට පිළිවන. පෙර දිවන්නා තබා බඩ මහත් හෙයින් සෙමින් සිට ගමන ත් බැරි ය. පෙර මාගේ බෑන අජාසත් රජ්ජුරුවන් හා ගමක් නිසා නිති සටන. දූන් මාගේ වජිර කුමාරි නම් දුවණියන් උන්ට පාවා දෙවා ලා ඒ ගම ත් උන්ට දයාද කොට දෙවා ලීමෙන් සටනු ත් තිබී එ ලෙ සිතු ත් වූයේ පාසුව. සක් දෙව්ඳු කුස රජ්ජුරුවන්ට දුන් අට තැනකින් වක් වූ මැණික රජ පරම්පරාවෙන් නැවත අවුත් මා සමයේ ආදි අපවත් ව තිබී ලා දූන් පවත් වි ය. එයි ත් එක් පාසුවෙක. මුඹ වහන්සේගේ සවුවන් වහන්සේ හා ගණ සම්බන්ධ ය නිසා මුඹ වහන්සේට නෑ ව සිටි වාසභඛත්තියාවනු ත් අගමෙහෙසුන් කෙළෙමි. හැමයට වඩා එයි ත් එක ඵාසුවකැ'යි කීහ.

බුදුහු ද උන් පදපරම වුව ත් උන්ට බණ වදරන සේක් 'යම් කෙණෙක් රෝගීහු වූ නම් උන්ගේ කෙ තෙක් සම්පත් ඇතැ ත් ඒ ප්‍රයෝජන විඳගන්ට නැති හෙයින් ඒ ලාභ ය අලාභයක් හා ම සරි ය. යම් කෙණෙක් නිරෝගීහු වූ නම් සෙසු සම්පත් ඊ ම ආ හෙයින් නිරෝගී බව උතුම් ලාභ ය. ගිහි කෙණෙක් වත් ශාසනික කෙණෙක් වත් යහපත් වුව ත් නපුරු වුව ත් ලද දෙයකින් සතුටු වෙත් නම් අතිකක් නො පත ත් නම් ලොවී ලොවුතුරා සැප ත් සාධා දී මෙහි එ තරම් වස්තුවක් නැති හෙයින් ඒ සන්තොෂ ය උතුම් ධනයෙක. දෙ මවු පිය නෑදි මයිල් මල් බෑ නං ආදි වූ නෑයෝ හිත අදහස් නැත්තෝ වූ නම් ඌ නෑයෝ නම් නො වෙති. යම් කෙණෙක් නො නෑයන් වුව ත් හිතයෝ වූ නම් ඌ අවශ්‍යයෝ නම් වෙති. තොප කියා ලූ සැප මුළුල්ලට ම නිවන් සම්පත් ඉතා සැප ය'යි වදාළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන සෝවාන්-සෙදෑගැමි-අනැගැමි-රහත් වූහ.

එ හෙයින් සත් පුරුෂයන් විසින් ආරොගාතාව ම උතුම් ලාභ කොට සිතා ගෙණ ලද දෙයකින් සතුටු වීම් ධන කොට සිතා ගෙණ මෙ ලෝ පර ලෝ වැඩ සාධා ලීමෙහි හිතයන් ම නෑයන් කොට සිතා ගෙණ අකුසලින් දුරු ව කුසල්හි හැසිර නිවන් සාධන්ට උත්සාහ කට යුතු.

Non-Commercial Distribution

# 174. තිස්ස නම් තෙර කෙණකුන් වහන්සේ ගේ වස්තුව

තව ද විවෙක වාසයෙහි යහපත හඟවන්ට තිස්ස නම් තෙර කෙණකුන් වහන්සේ ගේ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්—

තිලෝගුරු බුදු රජාණන් වහන්සේ සාර මසක් විතරින් පිරිනිවන් පාමි යි වදාළ කල්හි ලඟ වැඩහුන් පුථුජ්ජන වහන්දෑ ගෙන් පන් සියයක් දෙනා වහන්සේ මුසුප්පු වූ සේක. රහතන් වහන්සේට භය නැති හෙයින් ප්‍රත්‍ය ය සමුප්පන්න ධර්ම විෂයෙහි භයාකාර ව උපදනා නුවණ උපන. පුථුජ්ජන වහන්දෑ හඬා පියා මුළු ව ගෙන කුමක් කරමෝ දෑ'යි කථා කළ සේක. ඉන් තිස්ස නම් තෙරුන් වහන්සේ බුදුහු සාර මසක් විතරින් පිරිනිවන් පානා සේක් ල. මම ද වැළි ත් භවක්‍ෂය කට නුහුණුයෙමි. සාර මසක් විතර හෙයින් බුදුන් ජීවත් වන අවධියේ ම රහත් වන්ට කල්‍ත් ඇත. මාගේ ප්‍රතිපත්ති සාර කම බුදුහු ත් දත මනා වේ දෑ'යි සතර ඉරියවුවෙන් එක් ඉරියවුවෙක ත් ගණසඞ්ගනිකා නැති ව විවෙකවාසයට පටන් ගත් සේක. විවෙක වාසයට ම තර හෙයින් වහන්දෑ ලඟට ගමනෙක් වේව යි කථාවෙක් වේව යි නැත. වහන්දෑ ද මුන් වහන්සේ වෙන් ව ගෙන ඇවිදිනා හෙයින් කුමක් කොට ඇවිදිනා නියා දෑ යි විචාරන් සේක. වහන්දෑ කුමක් කීව ත් කථා කිරීම කරණ භාවනාවට විබන්ධ හෙයින් බැණ නො නැහෙන සේක.

වහන්දෑ ද එ පවත් බුදුන්ට දන්වා ලා ස්වාමීනි, තිස්ස තෙරුන් වහන්සේ මුඹ වහන්සේ කෙරෙහි මමායනයක් නැති සේ කැ'යි කී සේක. බුදුහු ත් උන් වහන්සේ කැඳවා ලා 'කුමක් නිසා මෙ ලෙස කරවුදෑ'යි විචාරා උන් වහන්සේ ත් තමන් වහන්සේගේ පවිත්‍ර වූ අදහස කී කල්හි තුන් විටක් විතර සාධුකාර දෙවා වදරා 'යම් කෙණෙක් මා කෙරෙහි ස්නෙහ ඇත්තෝ වූනම් තිස්සයෝ උන්ට පිටත් නො වෙති. සුවඳ මල් ආදියෙන් කරණ තරමට පිළිවෙතින් කරණ පූජාව ම බලවතැ'යි වදරා බණ වදරන සේක්-ගණ සඞ්ගනිකාවෙන් වෙන දුක් හැර විවෙක වාස ය නිසා වන ඵාසුව දඑ ම මුල් ව ලබන නිවන් රස ය ද අනුභව කොට රහත් වූ මහණ රාගාදි පීඩා නැති ව එ හෙයින් ම නිෂ්පාපී ව නව ලොවුතුරා දහම් ප්‍රීති රස ය විඳී'යි වදාළ සේක. දෙශනා කෙළවර තිස්ස තෙරුන් වහන්සේ විවෙක වාස ය සාර්ථක කොට රහත් වූ සේක. මේ දෙශනාව බොහෝ තැනට ත් සප්‍රයෝජන වි ය.

Non-Commercial Distribution

එ හෙයින් නුවණැත්තවුන් විසින් ගණසඞ්ගනිකාවෙන් දුරු ව විවේක වත් පුරා ලොව්තුරා සැප සිද්ධ කට යුතු.

---

# 175. සක් දෙව්ඳුහු ගේ වස්තුව

තව ද ගිලන් තැනට පිරිසිදු අදහසින් උපස්ථාන කිරීමෙහි යහපත දක්වා උත්සාහ වඩනා නිසා සක් දෙව්ඳු ගේ වත කියමු.

කෙ සේ ද යත්—

බුදුන් පිරිනිවන් පානා අවධියෙහි රක්තාතිසාර ය ඇති වූ නියාව දැන සක් දෙව්ඳු තෙමෙ 'මම ගොසින් බුදුන්ට මෙහෙයක් කෙළෙම් නම් යහපතැ'යි සිතා සිතිවිලි මහත් හෙයින් අත්බැව කුඩා කරන්නා සේ තුන් ගවු පමණ අත් බැව් හැර මිනිස් ලොවට තරම් අත් බැවකින් යුක්ත ව බුදුන් කරා අවුත් වැඳ ලා පය මැඩ මැඩ හුන්හ. බුදුහු ත් නො දන්නාක් මෙන් 'තොපි කවුරු දැ'යි විචාළ සේක. 'ස්වාමීනි, මම සක් දෙව්ඳු ය'යි කිවු ය. 'කුමක් නිසා අවුදැ'යි විචාළ කල්හි 'ස්වාමීනි, මුඹ වහන්සේගේ ලෙඩ බලන්ට අයිම්'යි කිවු ය. ඒ අසා බුදුහු 'හෙම්බා ශක්‍රයෙනි, දෙවි යන්ට මිනිසුන්ගේ ශරීර ගඳ ය සාර සියයක් ගවුවේ පටන් කර බන් කුණක් මෙන් ඇසෙ යි. තොපි නැඟී යව. මට ගිලන් උවටා කුම් කරන්නෝ ඇතැ'යි වදාළ සේක.

සක් දෙව්ඳුහු 'ස්වාමීනි, මම මෙ තැනට තුන් ලක්ෂ ස තිස්දහ සක් ගවු විතරේ සිටියෙමි. මුඹ වහන්සේගේ ගුණ සුවඳ අසා අත් පා මෙහෙයක් කිරීමෙන් පින් විලෙවුන් ගන්නා පිණිස අයිමි. සසර දුක් නමැති කුණු පැටි කොට පින් විලෙවුන් ගත දූන මැනව. ඊට බාධා නො කළ මැන වැ'යි කියා ලා අනික් කෙණකුන්ට අව සරයක් නො පැ අනඳ මහ තෙරුන් වහන්සේ පමණකු ත් එ දව- සට වැද්ද නො දී ශරීර කෘත්‍යයට වැඩි විල් හිස තබා ගෙණ ගොසින් බානාහු මුණ හැකිළීම් පමණකු ත් නො කළහ. සුවඳ පුරා ලූ කරඬුවක් හිස තබා ගෙන යන කෙණකුන් මෙන් වූහ. මෙ ලෙස පිළිපැද ලා බුදුන්ට ගුණ ව ගත් කල ම ගියහ.

වහන්දෑ ද 'ඇවැත්නි, ශක්‍රයන්ගේ බුදුන් කෙරෙහි භක්තියක් බලව. මේ තරම් වූ ශක්‍රසම්පත් හැර අවුත් මුණ හැකිළීම් පමණකු ත් නො කොට සුවඳ පිරූ කරඬුවක් හිස තබා ගෙන යන් නා සේ විල් බැවූ ය'යි කථා ඉපැද වූ සේක. බුදුහු ඒ අසා වදරා 'මහණෙනි, කුමක් කියවු ද? ශක්‍රයන් මට ලෙන් ගතු වීම මා කළ

තරමට විස්ම ය නො වෙයි. මුන් තමන් තුන් කෙළ සැට ලක්‍ෂයක් හවුරුදු පමණ ආයු ත් නිමා ගොසින් මරණ භයින් තැති ගෙන පඤ්චසිඛයන් පෙරාතු කොට ලා බොහෝ දෙවියන් පිරිවරා ඉඳුහල් ලෙනට ආවවුන්ට—

"පුච්ඡ වාසව මං පඤ්හං – සං කිඤ්චි මනසිච්ඡසි,
තස්ස තස්සෙව පඤ්හස්ස – අහං අන්තං කරොමි තෙ"

යනාදීන් බණ කීමි. බණ කෙළවර තුදුස් කෙළක් දෙවියෝ නිවන් දුටහ. ශක්‍රයෝ ද සෝවාන් වීමෙන් සසර දුකු ත් ගෙවා තුන් කෙළ සැට ලක්‍ෂයක් හවුරුද්දට ආයු ලදින් ශක්‍ර සම්පත් තර කළහ. මෙ බඳු උපකාරයක් කළ මට මුන් මෙ පමණක් කිරීම විස්ම නො වෙයි. මා කළා සේ තව ත් පන් සාළිස් හවුරුද්දට ආයු ගෙණ දී ලූ නම් ඒ විස්ම ය උන් කට නුහුණු කළ අත් පා මෙහෙ පමණක් කරන්ට බැරි කවරේ දැ'යි වදරා බණ වදරන සේක්– 'මහණෙනි, බුද්ධාදි උත්තමයන්ගේ දැකීම් පමණකු ත් යහපත. යහපත් නියාව අතික් පිණක් නැති ව දුටු පමණින් ම මට්ටකුණ්ඩලීන් ලත් ලොවී ලොවුතුරා සැපතින් දනුව. හුදෙක් දැකීම් පමණක් ම යහපත් නො වෙයි. ඒ සත් පුරුෂයන් හා එක් තැන් ව විසීම ත් උන්ට උපස්ථාන කිරීම ත් කැල ම යහපත. උත්තම යන්ගේ දැක්ම යහපත් සේ ම නුවණ නැත්තවුන්ගේ නො දැක්ම යහපත. දෙවදත්ත-කෝකාලිකාදීන් මෙන. යම් කෙණෙක් නුවණ නැත්තවුන් හා එක් වූ නම් එක් වූ පමණෙකින් බොහෝ දුකට මුළාවට පැමිණෙති. සතුරු ව සිටියවුන් හා එක් ව කරණ වාසයක් මෙන් නුවණ නැත්තවුන් හා එක් ව විසීම ත් හැම දවස් ම දුක. හිත මිත්‍රයන් හා කරණ ගොෂ්ඨියක් මෙන් නුවණැත්තවුන් හා එක්වීම මෙ ලෝ පර ලෝ දෙකින් ම යහපත.

යම් හෙයකින් බාලයන් හා එක් වීමෙන් දුකක් මුත් සැපයෙක් නැත් ද, නුවණැත්තවුන් හා එක්වීමෙන් යහපතක් මුත් නපුරෙක් නැත් ද, එ හෙයින් අභස භජන ය කරණ සඳ පරිද්දෙණ් කායික චෛතසික වීර්‍ය්‍ය ඇති ලොවී ලොවුතුරා නුවණින් යුත් ආගම-අධිගම දෙකින් ම අඩුවක් නැති බොහෝ ඇසූ පිරිවූ තැන් ඇති ව අර්හත්ව ය දක්වා පමුණුවා ලන විවසුන් ධුර ය උසුලන්නා වූ සිවු පිරිසුදු සිල්හි පිහිටි ත්‍රයොදශ ධුතඞ්ග පූරක වූ කෙලෙසුන් කෙරෙන් දුරු ව වසන සත් පුරුෂයන් භජන ය කරව'යි වදළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ.

Non-Commercial Distribution

එ හෙයින් නුවණැත්තවුන් විසින් අකුසලින් දුරු වන්නා සේ අසත් පුරුෂයන් කෙරෙන් දුරු ව කුසල්හි පිහිටන්නා සේ සත් පුරුෂයන් හා එක් ව උන්ගේ අවවාදයෙහි පිහිටා නිවන් සාධා ගත යුතු.

## 176. තුන් පිය පුත් මා කෙණකුන්ගේ වස්තුව

තව ද ගෘහසන්නිශ්‍රිත ප්‍රෙමයෙහි නපුර හඟවනු නිසා තුන් පිය පුත් මා කෙණකුන් ගේ වස්තුව කියමු.

**කෙ සේ ද යත්—**

සැවැත් නුවර එක් දෙ මාලු කෙණකුන්ගේ නිවා ලූ නො වන ලෙසට එක ම පුතණු කෙණෙක් වූහ. උෟ තුමූ මවු පියන් දෙ දෙනාට රහතන්ට නව ලොවුතුරා දහම් මෙන් ප්‍රියයහ. උෟ තුමූ එක් දවසක් ආරාධනාවෙන් අවුත් තමන්ගේ ගෙයි දී වැළඳූ වහන්දෑගේ අනුමෙවෙනි බණ අසා ඇවිටියක් සේ මහණ වීමෙහි රුචි ඇති ව මද මවු පියන්ට අනුදන්ට කීහ. එක ම පුතණුවන් හෙයින් දෙ මවු පියෝ අනු නො දත්හ. කුමාරයෝ ද 'දෙ මවු පියන්ට නො කියා ම ගොසින් මහණ වෙමි'යි සිතූහ. උන්ගේ පියාණෝ ද බැරක් යන්නෝ තමන් බැර යන කල ඔබ්බට නො යා දෙන්ට මෑණියන්ට සම්මත කොට ලා යෙති. මෑණියෝ බැර යන කල පියාණන්ට සම්මත කොට ලා යෙති.

එක් දවසක් පියාණෝ බැරක් යන්නෝ මෑණියන්ට සම්මත කොට ලා ගියහ. උයි ත් පුතණුවන් ගෙය ඇතුළේ ලා ලා බා කකුලෙක වැතිර ගෙන එක බා කකුලෙක පස් ගන්වා ලා දෙර කඩ අවුරා බිම වැද හිඳ හූ කටිති. කුමාරයෝ ද, මුන්දෑට වළහා පලා යෙමි' සිතා 'අම්ම, පය මදක් ඉවත් කොට ගන්නේ. ශරීර කෘත්‍ය-යට යෙමී' කියා ලා සැබෑ දෝ'යි සිතා ලා උනු ත් පය හකුළුවා ගත් කල්හි ගෙන් පිටත් ව වහා ම විහාරයට ගොසින් වහන්දෑට 'මා මහණ කළ මැනැවැ'යි කියා දෙ මවු පියන් අනුනොදත්තවුන් මහණ නො කරන්ට විධාන ය නු වූ හෙයින් නොහොත් බොරු කියා ලා ආ තැනැත්තවුන්ට බොරු කීමෙහි බැරියක් නැති බැවින් අනුදත්ත යි බොරු කියා හෝ වහන්දෑ ලඟ මහණ වූහ. උන්ගේ පියාණෝ ද ගෙට අවුත් 'ම පුතු කොයි දැ'යි විචාරා 'තෙල සේ ගියෝ ය'යි කී කල්හි ගොසින් බලනුවෝ එ තැන්හි නො දක ආදී ම මහණ කරන්ට කී බැවින් මහණ වන්ට ගිය නියා වනැ'යි වෙහෙරට ගොසින් වෙස් වළන්ට අනික් වෙසක් ගත්තා සේ

Non-Commercial Distribution

මහණ වූවන් දැක 'පුතඬ, මේ කුමක් කළ නියා ද'යි හඬා පියා 'මා පුතුන් මහණ වූ කල මම ගෙයි රඳා කුමක් කෙරෙම් ද' යි වියොග ය ඉවසා ගත නො හී වහන්දෑට කියා ලා තුමූත් මහණ වූහ.

මැණියෝ ද දෙ පුතු පියන් කල් යවන හෙයින් 'කුමක් දෝ හෝ යි, විහාරයට ගොසින් මහණ වූ නියා දෝ හෝ' යි තුමූ ත් විහාරයට ගොසින් සැදැයෙකින් නො ව රට සරියට වුව ත් මහණ වූ දෙ පුතු පියන් දැක 'මුන් දෙන්න මහණ වූ කල මා ගිහි ව රැදීමෙන් ප්‍රයොජන කිම් ද' යි තුමූ ත් මෙහෙණවරට ගොසින් මෙහෙණිනි වූහ. ගෙවල් දෙරවල් හැර මහණ වූ බව මුත් ඔවුනොවුන් කෙරෙහි ප්‍රෙම ය අවශ්‍යයෙන් හළ මනා වූවා හැර ගත නො හී වෙහෙර වුව ත් මෙහෙණවර වුව ත් එක් ව හිඳ කථා කෙරෙමින් දවස් යවති. භික්ෂු-භික්ෂුණී දෙ පක්ෂයට ම මුන් තුන් පක්ෂයෙ තරම් නිසා මහා අට්ටල.

එක් දවසක් වහන්දෑ ඉවසා ගත නො හී මුන්ගේ මේ කට යුත්ත බුදුන්ට දැන්වූ සේක. බුදුහු ත් ඒ තුන් පක්ෂ ය ගෙන්වා ලා 'සැබෑ ද? තෙපි මෙ ලෙස කරවු ද' යි විචාරා සැබෑවැ යි කී කල්හි 'තෙල ලෙස කුමට කරවු ද? මහණ සරුප් නො වෙ'යි වදළ සේක. 'ස්වාමීනි, වෙන් ව වැස පිය නො හෙම්හ. මහණ වූයේ ත් විවේක ව වසන්ට නො වෙයි. වෙන් ව විසිය නො හී ය' යි කී කල්හි 'ගිහි අවස්ථාවෙහි කෙලෙස වුව ත් මහණ වූවන්ට තෙලෙ සරුප් නො වෙයි' වදරා උන් තුන් පක්ෂයට කුමක් වුව ත් සම්ප්‍රාප්ත පණීදට ප්‍රයොජන සඳහා බණ වදරන සේක් 'යම් කෙණෙක් තුමූ මහණ සරුප් නො වන දෙයෙහි යෙදී වෙසෙත් ද, යෙදුණ මනා සමථ විදර්ශනාදියෙහි නො යෙදෙත් ද, මහණ වූ තැන් පටන් ත්‍රිවිධ ශික්ෂා පූරණ ය හැර පියා පස් කම් ගුණ සෙවුණාහු තමන්ගේ ඒ දුෂ්ට ප්‍රතිපත්තීන් ශාසනයෙන් පිරිහී පියා ශාසනික ව මහණ ධම් සකසා කොට දෙව් මිනිසුන් ගෙන් ලාභසත්කාර ලබන තැන් දැක ආඳා යවා ලා වල් පත ඇල්ලුවා සේ 'අපි ත් මෙ බඳු වූ මෝ නම් යහපතැ' යි නො එක් ලෙසින් පිරිහී ලා සිට එ බන්දක් කැමැති වෙති. එ හෙයින් කිසි කලෙක ත් ප්‍රිය අප්‍රිය දෙ පක්ෂ ය හා ම එක් නො වව.

කාරණ කිම් ද යත්–ප්‍රිය විප්‍රයොගය ත් දුක. අප්‍රිය සම්ප්‍රයොග ය ත් දුක. යම් හෙයකින් මේ දෙක ම දුක් ද, එ සේ හෙයින් කිසිවෙක ත් ප්‍රෙම කට යුතු නො වෙයි. ප්‍රිය විප්‍රයොගය නිසා වන දුකු ත් අප්‍රිය සම්ප්‍රයොග ය නිසා වන දුකු ත් ලාමක ය. ඒ නපුරු හෙයින් කාරණ වූ ප්‍රියවිප්‍රයොග අප්‍රිය සම්ප්‍රයොග දෙක ත් ලාමක ය.

Non-Commercial Distribution

යම් කෙණකුන්ට කිසිවෙක ත් ප්‍රේම නැත් නම් උන්ට අභිද්ධ්‍යා කාය ග්‍රන්ථ ය ප්‍රහීණ ය. යම් කෙණකුන්ට සත්‍ව සංස්කාර දෙකෙහි ම අප්‍රියතාව නැත් නම් ව්‍යාපාද කාය ග්‍රන්ථ ය උන්ට නැත. මේ දෙක යම් කෙණකුන්ට නැත් නම් ලක්‍ෂණ හාර නයින් අනික් කාය ග්‍රන්ථ දෙකත් උන්ට නැත. එහෙයින් අනුනය ප්‍රතිඝ දෙක කළමනා දෙයෙක් නො වේ'යි වදාළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ.

අර මූ තුන් පිය පුතු මවු ද එ තෙක් බණ වදාළ ත් ගල තල වට වැස්සෙන් ප්‍රයොජන නැත්තා සේ එ බණින් ප්‍රයොජන නැති ව වෙන් ව වැස ගත නො හී සිවුරු හැර පියා භූරිදත්ත ජාතකයෙහි වැදි බමුණා නාග සම්පත්තීන් පිරිහී කළු දැකඩ ම හන් සේ දුඃඛ ජීවිකාවකට පැමිණියහ.

එ හෙයින් සත්පුරුෂයන් විසින් නො කළ මනා දෙය විෂ ඝොර සර්පයන් මෙන් දුරු කොට කළ මනා දෙය අධිගත ගුණ මෙන් අත් නො හැර මනා පිළිවෙත හැසිර නිවන් දහම් පසක් කට යුතු.

## 177. එක්තරා කෙලෙඹියාණ කෙණකුන් ගේ වස්තුව

තව ද ගෘහසන්නිශ්‍රිත ප්‍රෙමයෙහි ආදීනව හහවන්ට එක්තරා කෙලෙඹියාණ කෙණකුන් ගේ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්—

ඒ කෙලෙඹියාණෝ තමන්ගේ පුතණු කෙණකුන් මළ කල්හි පුත්‍ර ශොකයෙන් පෙළී පුතණුවන් දවා පී සොහොන් බිමට ගොසින් එක් වන් හඬති. එසේ කොට ත් ඒ තමා ශොක සන් හිඳෙන කාරණයක් නො වන හෙයින් ශොක ය තුනී කොට නො හෙති. නිශ්ශොක වූ බුදුහු ද ලොව බලන සේක් උන් සෝවාන් වන්ට නිසි පින් ඇති නියාව දැන සිඟා වළඳා අන්ත-යෙහි පසු මහණ කෙණකුන් වහන්සේ ඇති ව උන්ගේ ගෙ දෙරට වැඩි සේක. උයිත් බුදුන් වැඩි නියාව අසා මාගේ ශොක නමැති ගිම් සඳහම් නමැති වැසි වස්වා සන්හිඳුවනු නිසා වැඩි නියා ය' යි බුදුන් වඩා ගෙන්වා ගෙ මැද හස්නකු ත් පනවා ලා බුදුන් වැඩ හුන් කල්හි අවුත් වැද එකත් පස් ව හුන්හ.

ඉක් බිත්තෙන් බුදුහු නො දත් බඳු ව 'උපාසකයෙනි, මුසුප්පු වැනැ'යි විචාරා 'පුත්‍ර ශොක ය නිසා ය'යි කී කල්හි 'උපාසකයෙනි, ශොක නො කරව. මේ මරණ නම් මැණික් ආකරවල් මුත් සෙසු

Non-Commercial Distribution

තැන් මැණික් ආකර නො වන්නා සේ එක තැනක මුත් සෙසු තැන නැත්තෙක් නො වෙ යි. අනුපධිශෙෂ නිර්වාණ ධාතුවෙන් පිරිනිවියන්ට විනා සෙස්සන්ට නැත්තෙක් නො වෙ යි. මහා සම්මතාදී ආනුභාව සම්පන්න රජ දරුවනු ත් නො බැලී ය. කූට දන්ත-ජානුස්සොනි ආදී වෙද වෙදඞ්ගයෙහි නිපුණ බ්‍රාහ්මණ වරුනු ත් නො බැලී ය. සෙනක-මහෞෂධ-විධුරාදි නුවණැත් තවුන් නො බැලී ය. යම් තාක් භවොත්පත්ති නුසුන් නම් ඒ තාක් නො නවත්ති. නිවන් විනා නිත්‍ය දෙයක් නැත. එ හෙයින් නස්නා සුලු දෙය නට යි නුවණින් සැලකිය යුතු ය. ශෝක කටයුතු නො වෙ යි. පෙර නුවණැත්තෝ ත් පුතුන් මළ කල බිඳෙන සුලු දෙය බුනැ යි සෝක නො කොට මරණ සි භාවනා ම කොළෝය'යි වදරා 'ස්වාමීනි, එ ලෙස භාවනා කොළෝ කවුරු දෑ'යි, කවර කලෙක කොළෝ දෑ'යි කෙලෙඹියාණන් විචාළ කල්හි ඉකුත් වත භස්ම ප්‍රච්ඡන්න ජාත වෙදයක් සේ සැඟවී තුබුවා ගෙන හැර දක් වත සේක්-

'උරගොව තචං ජිණ්ණං - හිත්‍වා ගච්ඡති සංතනුං,
එවං සරීරෙ නිබ්භොගෙ-පෙතෙ කාලකතෙ සති.
ඩය්හමානො න ජානාති - ඤාතීනං පරිදෙවිතං,
තස්මා එවං න සොචාමී-ගතො සො තස්ස යා ගති'.

යනාදීන් ගාථා පසකින් හෙබියා වූ උරග ජාතක ය විස්තර කොට වදරා 'තෙපි යම් සේ කළ මනා කර්මාන්ත ත් හැරපියා කෑම් පීමු ත් නැති ව හඬවූ ද වැලපෙවූ ද පෙර නුවණැත්තෝ එ ලෙස නො කොට මරණ සි භාවනා මෙනෙහි කිරීමෙන් ශොක දුරු කළහ. තෙපි ත් එ ලෙසෙ ම කරව. තොපට උපන් මේ ශොකය නම් තොපගේ පුතණුවන් නිසා ම උපන. වෘත්තමූලක වූ ශොකයෙක් උපදී නමුත් භයෙක් උපදී නමුත් ප්‍රිය වූ සත්ව සංස්කාර දෙකින් එකක් නිසා ම උපද්දී. යම් කෙණකුන්ට කිසිවෙක ත් ප්‍රිය භාව ය නැත් නම් උන්ට ශොකත් නැත. භය ත් නැත. තන් මුඛයෙන් වෘත්තමූලක වූ ශොකයෙක් සියල්ල ම නැතැ'යි වදළ සේක. දෙශනා කෙළවර කෙලෙඹියාණෝ ශොක ත් තුනී ව සෝවාන් වූහ. තව ත් එ තැනට පැමිණියවුන්ට සප්‍රයෝජන වී ය. පස්වා දහස මුළුල්ලෙහි ත් බොහෝ දෙනාට ප්‍රයෝජනවත් වෙ යි.

එ හෙයින් සත් පුරුෂයන් විසින් පුත්‍ර ශොකාදියට ත් වඩා කුසල් පිරිහේ නම් ඊට ශොක කොට අකුසල් සිද්ධ වේ නම් ඊට භය ඇති ව සසර දුක් ගෙවන්ට උත්සාහ කට යුතු.

Non-Commercial Distribution

# 178. විශාඛාවන් ගේ වස්තුව

තව ද ශොකයෙහි ම ආදීනව හඟවන්ට විශාඛාවන් ගේ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්—

විශාඛාවෝ දත්තා[1] නම් මිනිබිරිණි කෙණකුන් තමන් තනතුර සිටුවා ගෙයි දී වළඳන වහන්දෑට උනු ත් බලවත් ව සැදෑ ඇති හෙයින් උන් ලවා වෙයාාවච ත් කරවති. ඌ කල් යැමකදී සැදෑ ඇති බව මුත් ආයු ශක්ති ය නැති හෙයින් මළහ. විසාඛාවෝ ද උන්ගේ ආදහන ය කරවා ලා තමන් නො රහත් හෙයින් ශොක ඉවසා ගත නො හී බලවත් මුසුප්පු ඇති ව බුදුන් ලඟට ගොසින් එකත් පස්ව හුන්හ. බුදුහු ත් 'හැ යි විශාඛාවෙනි, මුසුප්පු වනැ'යි වදාළ සේක. සවාමීනි, මාගේ මිණිබිරියෝ නම් මට ඉතා ප්‍රිය යෝ ය. මා සේ ම සැදෑ ඇත්තෝ ය. ආචාරසීලී කමුත් යහපත. එ තරම් කෙණකුන් ලද නො හැකි හෙයින් සෙසු බොහෝ මුනු බුරන් නො මළවුන් ඇත ත් මුසුප්පුයෙමි' කීවු ය. විශාඛාවෙනි, සැවත් නුවර මිනිස්සු කෙතෙක් ඇද්දැ'යි විචාළ සේක. 'සවාමීනි, මුඹ වහන්සේ ම සත් කෙළකැ'යි වදාළ සේක් වේ දැ යි කීවු ය. ඉදින් මෙ තෙක් දෙන තොපගේ මිනිබිරිණියන් හා සරියෝ වී නම් කැමැත්තෝ දැ'යි විචාළ සේක. 'එ සේ ය. සවාමීනි'යි කීවු ය. 'මේ සැවැත් නුවරින් දවසකට කෙ තෙක් විවර මියෙත් දැ'යි විචාළ සේක. 'සවාමීනි, මෙ තෙක් දෙන යැ යි නියම ඇද්ද? මහ නුවර හෙයින් ජනගහනය ත් බලවත් හෙයින් බොහෝ දෙන මියෙති. උපදනා වුනු ත් බොහෝ සෙයින් අඩුව නො පෙනෙ'යි කීවු ය. එ සේ වී නම්, විශාඛාවෙනි, නුවර වැස්සන් මුළුල්ල ම තොපගේ මිනි බිරිණියන් හා සරි වීම කැමැත්තා නම් උන් උන් මළ කල ත් මුසුප්පු වුවමනා වේ ද? එ සේ ම වන්නා මළ මළවුන්ට ශොක කර මුත් තොපට අනිකකට අවසර නැතැ'යි වදාළ සේක.

විශාඛාවෝ ද බුදුන්ගේ කථාව අසා සෙස්සවුන්ගේ මරණ ත් මාගේ මිනිබිරිණියන්ගේ මරණ ත් දෙක ම මරණින් සරි ය. උන් හැම මළ කල සෝක නැත්තෙ ත් මුන් මළාට සෝක ඇත්තෙ ත් මුන් කෙරෙහි ඇති ප්‍රෙම ය නිසා ය. සෙස්සවුන් මළ කල සෝක නැත්තෙ ත් උන් කෙරෙහි ප්‍රෙම නැති හෙයින. මුන් කෙරෙහි ත් ප්‍රෙම නැත් නම් සෝක ඇති වන්ට කාරණ නැතැ'යි පියාණන් සඟවා කියා ලූ අවවාදයෙහි අසී දන්නා සෙයින් බුදුන් සඟවා

1 දත්තා–ඇතැම්.

Non-Commercial Distribution

වදාළ දෙයෙහි අර්ථ විදුරක් හා සමාන නුවණින් දැන ගෙන 'ස්වාමීනි, දනිමි' කීහ. බුදුහු ත් 'එ සේ වී නම් ශෝක නො කරව'යි වදරා ලා ශොකයෙක් වේ නමුත්, භයෙක් වේ නමුත් දූ දරු ආදීන් කෙරෙහි පැවති ප්‍රෙම මුල් ව වෙ යි. යම් කෙණකුන්ට ඒ ප්‍රෙම ය නැත් නම් ලිය නැති කලට ලිය මල් නැත්තා සේ ශොකය ත් භය ත් අවිද්‍යාදී වූ හෙතු ධර්මයන් නැති කලට සංස්කාරාදී ඵල ධර්ම ය නැත්තා සේ නැතැ'යි වදාළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් වෘත්ත සන්නිශ්‍රිත ප්‍රෙම ය හැර විවට්ට සන්නිශ්‍රිත ප්‍රෙම ය ඇතිව අකුසලින් දුරු ව කුසල්හි හැසිර ත්‍රිවිධ බෝධීන් එක් තරා බෝධියකට පැමිණිය යුතු.

---

## 179. ලිච්ඡවීන් ගේ වස්තුව

තව ද ලොකාස්වාද රතියෙහි ආදීනව දක්වන්ට ලිච්ඡවීන් ගේ වස්තුව කියමු.

කෙ සේ ද යත්—

ඒ ලිච්ඡවි රජදරුවෝ එක් මඟුල් දවසෙක රන් වන් පිළී හැඳී මෙන් රන්වන් ආභරණ පැළඳීමෙන් යනාදීන් නො එක් ලෙසින් සැරහී ගෙන උයන් කෙළියට යන්ට නුවරින් නික්මුණාහ. බුදුහු ද සිඟා වඩනා සේක් උන් සැරහී එන්නවුන් දැක කැටි ව වඩනා වහන්දෑට 'මහණෙනි, තෙල ලිච්ඡවීන් දුටුවා ද? යම් කෙණකුන් තව්තිසා වැසි දෙවියන් නුදුටුවා නම් තුලුන් බලා සිත තබව'යි වදාළ සේක. වදරා ලා නුවරට සිඟා වන් සේක. උයි ත් උයනට යන්නාහු එක් වෙශ්‍යා දුවක ත් කැඳවා ගෙන ගොසින් ඇ නිසා පර සම්පත්ති අසහන ලක්ෂණ වූ ඊර්ෂ්‍යා ඇති ව විවාදයක් උපද වා ගෙන උනුන් මරා කොටා ගඟ ලේ ගඟක් කළහ. විත් කෙටීම් කැවවුන් උසුලා ගෙන එති. බුදුහු ත් ඇතුළු නුවර දී වළඳා ලා නුවරින් නික්මුණු සේක.

වහන්දෑ ද ලිච්ඡවීන් ආදි සිය පයින් ගියවුන් පසුව අනුන් පයින් එන්නවුන් දැක බුදුන්ට 'ස්වාමීනි, ලිච්ඡවි රජ දරුවෝ උදසන තව්තිසා වැසි දෙවියන් මෙන් සැරහී නික්ම දැන් එක ස්ත්‍රියක නිසා මෙ තෙක් දෙන මේ සා මුළාවකට පැමිණියහ'යි කී සේක. බුදුහු ත් 'මහණෙනි, ශොකයෙක් වේව යි භයෙක් වේ වයි සත්වයන්ට වේ නම් ගිනි ඇති කලට දුම් ඇති වන්නා සේ ලොකාස්වාද රතිය මුල්ව ඇති වෙයි. යම් කෙණෙක් අනාගැමි මඟින්

ලොකාසවාද රති ය නසා පූ නම් උන්ට තන්මූලික වූ ශොක ය හා භය නැතැ'යි වදළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් පඤ්චකාම ගුණික රාග ය ත් වධකයන් මෙන් සිතා ගෙන එයින් දුරු ව සෙසු ත් අකුසල් හැර කුසල්හි පිහිටා අර්හත්වයට පැමිණීමෙන් චිත්ත ශුද්ධි ය කටයුතු.

## 180. අනිත්ථිගන්ධ කුමාරයන් ගේ වස්තුව

තව ද වස්තුකාම ක්ලේශකාමයෙහි ආදීනව දක්වන්ට අනිත්ථිගන්ධ කුමාරයන් ගේ වස්තුව කියමු.

කෙ සේ ද යත්—

උහු තුමූ බඹ ලොවින් චුත ව අවුත් රූපාවචර චුතින් මත් තෙහි අහෙතුක ප්‍රතිසන්ධි රහිත වූ සියලු පිළිසඳ වන හෙයින් සැවැත් නුවර මහ සම්පත් ඇති කුලයෙක උපන්හ. උපන් දවස් පටන් බඹ ලොව සිට ආ ලෙසට ගෑණු කෙණකුන් ළඟට එනු ත් නො කැමැත්තෝ ය. ගෑනු මිනිසුන් ඇඟ අල්වා ලූ කලට හඬන හෙයින් කඩ කැටියකින් වසා අල්වා ගෙන කිරි පොවති.

උහු තුමූ වැඩිවිය පැමිණ දෙ මවු පියන් විසින් සරණක් ගෙන්ව දෙමෝ දැ'යි විචාළ කල්හි නො ගිවිස නැවත නැවත ත් පැරැත්ත කියන හෙයින් බඩාල් පන් සියයක් විතර ගෙන්වා ගෙන පස් විසි දහසක් විතර රත්රන් දෙවා ලා ඉතා ප්‍රසාදවහ වූ ගෑනු රුවක් කරවා ලා නැවත ත් දෙ මවුපියන් 'පුත, තොප සරණක් නො ගෙනා කල කුල පරම්පරාව නො පවත්ති. කුල දැරියක ගෙන මෝ දැ'යි කී කල්හි 'තෙල ලෙස ගත් හැකි ව[1] කියන පසු මේ සැටි ගෑනු කෙණකුන් ගෙන්වා දෙතොත් කියා ලූ ලෙස කරම්හ'යි කරවා ලූ රන් රුව පෑවූ ය. උන්ගේ දෙමවුපියෝ ද ප්‍රසිද්ධ ව හිඳිනා බ්‍රාහ්මණ වරුන් ගෙන්වා ගෙණ 'අපගේ පුතණුවෝ මහ පිනැත් තෝ ය. එකාන්තයෙන් මුන් හා එක් ව පින් කළ කුමාරිකා කෙණකුන් ඇත මැනව. මේ තරමකට ම සිත් නැමෙන්නේ එයින. තෙල රන් රුව හැර ගෙන ගොසින් දඹදිව මුළුල්ලේ ඇවිද තෙල රන් රුව වැනි කුමාරිකා කෙණකුන් ගෙනෙව'යි කිවූ ය.

උයි ත් යහපතැ යි ගිවිස දඹ දිව සැරිසරන්නාහු මද්‍රරට සාගල නුවරට ගියහ. ඒ නුවර ද වැළි ත් ගෙන ගිය රන් රුවට වඩනා තරම් වූ සොළොස් ඇවිරිදි වයසට පැමිණි කුමාරිකා කෙණෙක් වූහ.

1 ගත හැකි ව

Non-Commercial Distribution

උන්ගේ දෙ මවු පියෝ ද උන් සත්මාල් මාළිගාවේ උඩු මාලේ ලා රකිති. ඒ බමුණෝ ද ''ඉදින් මේ නුවර මෙ බඳු කුමාරිකා කෙණෙක් ඇත් නම් මේ රන් රුව දැක 'මූ අසවලුන් ගේ දූවණියන් සේ රූ ඇති කෙණෙකැ' යි කියති'' රන් රුව පැන් තොටට යන මඟ සිටුවා ලා සැඟවී ගෙණ හුන්හ. ඉක් බිත්තෙන් ඒ කුමාරිකාවන් ගේ කිරි මවු කුමාරිකාවන් නාවා පියා තුමූ ත් නා පියනු කැමති ව පැන් තොටට ගියාහු ඒ රන් රුව දැක කුමාරිකාවන් පෙරාතු ව ලා ගොසින් සිටියා සේ සිතා ගෙණ 'අනේ නොහික්මුණු තැනැත් තෙනි, නාවා පියා අප ත් නා පියනු-තිසා ආ තැන යම් කිසි පමා වෙකින් අපට පෙරාතු ව අවුත් මෙ තැන සිටියා දැ'යි අතුල් පහරක් ගසා පියා තද නියාව ත් සැලී නො නැඟි නියාව ත් දැන 'එක් වැනි හෙයින් අපගේ දූවණිය නැ'යි සිතුම්හ. මූ කවුරු දැ' යි කීහ. ඒ බමුණෝ ද 'මුඹගේ දූවණියෝ ත් මේ සැටියෝ දැ'යි විචාළෝ ය.

'අපගේ දූවණියන්ගේ රුව දුටු කලට මූ උන්ගේ කෙල්ලක තරමට ත් ඇත්තෝ දැ' යි කුමාරිකාවන් යම් තරමෙක උසස් කොට කියා ලූ ය. එ සේ වී නම් තොපගේ දූවණියන් අපට පාවා' යි කීහ. කිරි මැණියෝ ද බමුණන් කැඳවා ගෙණ ගෙට ගොසින් ස්වාමී දරු වන්ට කිවු ය. උයි ත් බමුණන් හා කථා කොට ලා දූවණියන් උඩු මාලෙන් පාතට බාවා ගෙණ යටි මාලේ රන් රූ ඇළයේ සිටුවා ලූ ය. හිරු නැඟෙ ත් නැඟෙ ත් කදෝපැණියක මෙන් රන් රුව ඉතා නිශ්ශොභා වී ය. බමුණෝ ද ඒ රන් රුව කුමාරිකාවන්ගේ දෙ මවුපියන්ට අය වැය නිසා දෙවා ලා කුමාරිකාවන් කුමාරයන්ට නිල කොට ගෙණ ගොසින් අනිත්ථිගන්ධ කුමාරයන්ගේ දෙ මවු පියන්ට කීහ.

උයි ත් සතුටු ව 'යව, වහා ගෙණෙව' යි මඟුල් පෙරහර ඇතිව බමුණන් යැවූහ. කුමාරයෝ ද 'රන් රුවට ත් වඩා කුමාරිකාවෝ රූපත්හ' යනු අසා ශ්‍රවණ සංසර්ගී වශයෙන් ස්නේහ උපදවා ගෙණ වහා කැඳවා ගෙනෙන්ට තුමූ ත් විධාන කළහ. කුමාරිකාවනු ත් වාහනයකට නංවා ලා ගෙනෙන ගමනෙහි වාහනයෙන් යැම නුපුරුදු හෙයිනු ත් සිවුමැලි හෙයිනු ත් ආයාස මුල් ව රුජා ඇතිව ලා අතුරු මඟ දී ම මළහ. කුමාරයෝ ත් එක්වන් ම විචාරති. උන් ස්නෙහී ව විචාරන හෙයින් නියාව වහා නො කියා කීප දවසක් විතර කල් යවා ලා කල් යන හෙයින් කුමක් දෝ හෝ යි සිතෙන අවස්ථාවෙහි දී නො කියා හඟවන්ට ත් බැරි හෙයින් මළ නියාව කීහ. කුමාරයෝ ද එ බඳු රූපත් කෙණකුන් දක්නා පමණ කට ත් නො ලද්දෙමි' ශොක දුක් මහත් ව පර්වතයකින් මිරිකන කලක් මෙන් ශොකයෙන් මිරිකුණා වූ ය.



Non-Commercial Distribution

බුදුහු ත් උන් සෝවාන් වන්ට හේතු ඇති නියාව දැන සිහා වඩනා සේක් උන්ගේ ගෙ දෙරට සිහා වැඩි සේක. උන්ගේ දෙමවු පියෝ ද බුදුන් ගෙට වඩා ගෙණ ගොසින් සත්කාර කොට වැළඳවූහ. බුදුහු ත් වළඳා අන්තයෙහි 'අනිත්ථිගන්ධ කුමාරයෝ කොයි දැ'යි විචාරා 'ශොකාතුර ව ඇතුළු ගබඩාවට වැද ලාහුන්නැ'යි කී කල්හි 'උන් කැඳව' යි වදාළ සේක. උයි ත් අවුත් බුදුන් වැඳ ලා එකත් පස් ව හුන්හ. 'කුමක් ද? කුමාරයෙනි, ශොක දුක් බලව ත් නියාද'යි විචාළ කල්හි ශොක බලවත් නියාව කිවු ය. 'ඒ තොපට උපන් ශොක ය කුමක් නිසා උපනැයි සිතවු දැ'යි විචාළ සේක. 'නොදනිමි'යි කිවු ය. කුමාරයෙනි, තොප නො දනු නම් අප ගෙන් අසා දැන ගනුව. ශොකයෙක් හෝ භයෙක් උපදී නම් රූප ශබ්දදි වූ වස්තු කාම ය හෝ තද්වස්තුක වූ ක්ලෙශ කාම ය නිසා උපද්දී. යම් කෙණකුන්ට රූප රාගාදි වූ උද්ධම්භාගිය සංයොජන පස නැත් නම් ශොක ය ත් භය ත් නැතැ' යි වදාළ සේක. දෙශනා කෙළවර කුමාරයෝ සෝවාන් වූහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් කසළ ව තුබූ දෙයක් ගිනි ලා දවා නැති කරන්නා සේ සියලු කෙලෙසුන් නසා ශොක ය ත් භය ත් නැති කරන්ට උත්සාහ කට යුතු.

## 181. එක්තරා බ්‍රාහ්මණයකු ගේ වස්තුව

තව ද ලොභයා ගේ නපුර හඟවන්ට එක්තරා බ්‍රාහ්මණයකු ගේ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්—

මිථ්‍යා දෘෂ්ටික වූ බමුණු ද එක් දවසක් ගඟ ගබට ගොසින් කුඹුරක් ඉදි කෙරෙයි. බුදුහු ද ඔහුගේ හේතු සම්පන්න නියාව දැන ඔහු ළඟට වැඩි සේක. ඒ තෙමේ බුදුන් දැක ත් තමා සැදැහැ නැති හෙයින් සාමීචි පමණකු ත් වියදමක් සේ සිතා ගෙණ නො කෙළේ ය. බසක් පමණකු ත් බැණ නො නැංගේ ය. ඌ බැණ නො නැංග ත් බුදුහු ඌ හා කථා කරණ සේක් 'බමුණ, කුමක් කෙරෙයිදැ'යි විචාළ සේක. 'මහණ ගොයුම, කුඹුරක් ඉදි කෙරෙමි' කිවු ය. බුදුහු ත් මෙ පමණක් වදරා ලා වැඩ දෙ වන දවසු ත් කුඹුරු කර්මාන්තයට ගිය බමුණන් ළඟට වැඩ 'කුමක් කරවු ද, බමුණාණෙනි, විචාරා 'කුඹුරු කර්මාන්තයක් කෙරෙමි'යි කී කල්හි වැඩපී සේක. පසු ව පසු ව ත් වැඩ විචාරා 'වපුරමි, නෙළමි, ගොයම් රකිමි' යනු අසා අසා වඩනා සේක.

Non-Commercial Distribution

පිට පිට හෙළා වඩනා බුදුන්ට එක් දවසක් බමුණෝ භවත් ගෞතමයෙනි, මේ කුඹුර බිම් නඟන තැන් පටන් කුඹුරු කමින් තයට මා නො පමා ව එන්නා සේ ම තෙපි ත් නො පමා ව ඇවිද්ද ව. ඉදින් මේ ගොයම් පැසිණි නම් තොපට ත් භාගයක් දෙමි. තොපට නො දී මම නො කමි. තෙපි මෙ වක් පටන් මාගේ යාළුවාණෝ ය' යි කිවු ය. කල් යාමක දී ගොයමු ත් පැසිණ. 'සෙට දවස් කුඹුර දවමී'යි දීම සරහා ගෙන හුන් කලට රෑ වැස්සෙක් වැස වතුරු හෙළා බා ගොයම් මුළුල්ල උදුරා ගෙන වතුරේ පලා ගියේ ය.

බුදුහු වැළි ත් ආදියෙන් ම වැඩි දවස් ම ගොයම් නස්නා නියා ව දත් සේක. බමුණානෝ ද උදෑසන ම කුඹුර බලන්ට ගිය තැනැත්තෝ ගොයම් නටුවා දැක ශොක බලවත් ව 'මහණ ගොයුම්, සී අවධියේ පටන් ගොයම් පැසෙන තෙක් ම ආ ය. මම ද වැළි ත් පැසුණු ගොයමින් භාගයක් ම දෙමි. මෙ වක් පටන් තොපි මාගේ යාළුවාණෝ ය'යි කියා ත් කීමි. ගොයම් තබා ඒ මාගේ අභිමතාර්ථ ය ත් සිද්ධ වන්ට නුවූයේ ය'යි සිතා මුසුප්පු ව ගෙන වැද හොත්තෝ ය. බුදුහු උන්ගේ කුඹුරට ගමන් වැළකී හෙයින් ගෙ දොරට වැඩි සේක. බමුණානෝ ද බුදුන් වැඩි නියා ව අසා මාගේ යාළුවාණන් කැඳවා ගෙන අවුත් හිඳිනා ලෙසට කරව'යි කිවු ය. පිරිවර මිනිස්සු ත් එ ලෙස ම කළහ. බුදුහු වැඩහිඳ බමුණානෝ කොයි දෑ'යි විචාරා ගබඩාවේ ය යි කී කල්හි කැඳවා ගෙන් වා ලා අවුත් එකත් පස් ව හුන්නවුන්ට 'කුමක් ද? බමුණානෙනි,' යි වදාළ සේක.

'භවත් ගෞතමයෙනි, තෙපි මා කුඹුර සානා අවධියේ පටන් කුඹුරට ඇවිද්දව. මම ත් ගොයම් පැසිණි නම් තොපට වී භාග යක් දෙමි කීමි. ඒ නො වී ය. ගොයම් නටුවාට ත් වඩා ඊට මුසුප්පු බලවත. එ ම නිසා කුමකට ත් රිසි නැති ව පියා මුසුප්පු ගෙන හිඳිමි' කිවු ය. බමුණානෙනි, ඒ ශොක ය කුමක් නිසා වී ය යි දනු ද'යි විචාරා මම නො දනිමි. තෙපි දනු දැයි කී කල්හි 'එ සේ ය, බමුණානෙනි, අපි දනුමහ. ශොක නමුත් භය නමුත් චතුරාර්‍ය්‍යසත්‍යයෙන් දුඃඛසත්‍යයෙහි ඇතුළත. දුඃඛ කාරණ වූ යේ සමුදය සත්‍යය ය. ඒ තෙමේ අෂ්ටොත්තරශත ප්‍රභෙද වූ තෘෂ්ණා ව ය. යම් කෙණකුන්ට ඒ තෘෂ්ණාව ඇත්නම් ශොක ය ත් උපද්දී, භය ත් උපද්දී, යම් කෙණකුන්ට ඒ තෘෂ්ණාව රහත් මඟින් සුන් නම් ශොක ය ත් භය ත් නැතැ'යි වදාළ සේක. දෙශනා කෙළවර බමුණානෝ සෝවාන් වූහ.

Non-Commercial Distribution

එ හෙයින් සත් පුරුෂයන් විසින් දුඃඛය ත් දුඃඛ කාරණය ත් නසන්නා වූ නිවනට යමෙකින් පැමිණිය හැකි වී නම් ඒ අෂ්ටාඞ්ගික මාර්ගය භවන්ට උත්සාහ කටයුතු.

## 182. පන්සියයක් දරුවන් ගේ වස්තුව

තව ද සර්වඥවරයන් ගේ ගුණමකු කමක් නැති නියා ව හඟවන්ට පන්සියයක් දරුවන් ගේ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්—

එක් දවසක් බුදුහු අසූමහ සවුවන් වහන්සේ ත් නිත්‍ය පරිවාර පන්සියයක් දෙනා වහන්සේ ත් පිරිවරා රජගහා නුවරට සිඟා වඩනා සේක්- එක් උත්සව දවසෙක පන්සියයක් දරුවන් පූ පැස් ගෙන්වා ගෙන නුවරින් නික්ම උයනට යන්නවුන් දුටු සේක. උයි ත් බුදුන් දැක වැඳ ගෙන නික්ම පූ පමණක් මුත් බුදුන්ට වේව යි වහන්දැට වේව යි එ තෙක් කැවුමෙන් කැවුමක් පිළිගන්වන්ට නො කීහ. බුදුහු ත් උන් පලා ගිය කල්හි වහන්දැ බණවා 'මහණෙනි, කැවුම් වළඳව'යි වදාළ සේක. 'ස්වාමීනි, කැවුම් කොයිදැ'යි විචාළ කල්හි තෙල කැවුම් පැස් ගෙන්වා ගෙන යන සුහුන් නුදුටුවා'යි විචාළ සේක. ස්වාමීනි, උන් වන්නා දුටුම්හ. කැවුම් වුව, කුඩා සුහුන් වුව, අනුන්ට දෙත් දැ'යි විචාළ සේක. මහණෙනි, මට ත් වුව ත් තොපට වුව ත් මුන් කළ ආරාධනා නැත. එතකුදු වුව ත් මේ කැවුමට හිමි තැනැත්තෝ පස්සේ එමින් සිටියෝ ය. තොප අප නො ලද ත් උඹ ලැබෙති. උන්ට මතු බොහෝ වේ ද, කැවුම් වළඳා ලා යෑම යහපතැ'යි වදාළ සේක.

බුදුන්ට වූ කලි එක් කෙණකුන් කෙරෙහි ත් ඊර්ෂ්‍යාවෙක් වේ ව යි මනොපදෙෂයෙක් වේව යි නැත. එ හෙයින් මෙ ලෙස වදරා ලා වහන්දැ හැර ගෙන රුප්පයෙක වැඩහුන් සේක. ඒ දරුවෝ ද මහසුප් මහ තෙරුන් වහන්සේ පසු ව පියා වඩනා දැක ඔබ කෙරෙහි භක්ති ඇති ව ඔබට අවුළුපත් පිළිගන්වනු කැමැති ව පැස් බා තබබවා ලා මහ තෙරුන් වහන්සේට පසඟ පිහිටුවා වැඳ ලා කැවුම් පැස් පිටින් ම ඔසවා ගෙන 'පිළිගත මැනවැ යි, ස්වාමීනි,' කීහ. මහසුප් තෙරුන් වහන්සේ ත් තිලෝගුරු බුදුරජුන් වහන්සේ මහණ ගණ පිරිවරා ගසක් මුල වැඩ හුන් සේක. තෙල කැවුම් පැසු ත් මදක් නො ව ත් ඔබ ගෙන ගොසින් බෙදා පිළිගන්ව ව'යි වදාළ සේක. උයි ත් යහපතැ යි ගිවිස ගොසින් කැවුම් බෙදා පිළිගන්වා ලා වළඳන නියා ව බල බලා එකත් පස් ව සිට සිත පහදවා ගෙන වළඳා අන්තයෙහි අතට පැනු ත් ගෙන දුන්හ.

Non-Commercial Distribution

කැවුම් වැළඳූ වහන්දෑ ගෙන් කිසි කෙණෙක් ද 'මූ හැම තමන් දෙන දනු ත් මූණ බලා ම දුන්හ. බුදුන්ට වේව යි බොහෝ සේ අසූ මහ සවුවන් වහන්සේට වේව යි කැවුම් වළඳන්ට නො කියා මහසුප් මහ තෙරුන් වහන්සේ දක ඔබට දෙන්ට ප්‍රයොග කොට ඔබගේ විධානයෙන් මුබ ගෙනවුත් දුන්හ. මුබ දී ම මූන් තමන් සිතා ගෙන කළ දෙයෙක් නො වන්නේ වේ දැ'යි කී සේක. බුදුහු වහන්දෑගේ කථාව අසා 'මහණෙනි, ම පුතුන් මහසුප් මහ තෙරුන් වැන්නෝ දෙවි මිනිසුන්ට ප්‍රිය වෙති. දෙවි මිනිස්සු ත් උන්ගේ උත්කෘෂ්ට ගුණ ය නිසා උන්ට සත්කාර කරණු කැමති වෙති වදරා බණ වදරන බුදුහු 'අඛණ්ඩාදි භාවයට පමුණුවා රක්‍ෂා කරන්නා වූ සීලයෙන් හා මාර්ග සම්ප්‍රයුක්ත වූත් ඵල සම්ප්‍ර යුක්ත වූ ත් නුවණින් සමන්විත වූ එ හෙයින් ම නව ලොවුතුරා දහම්හි පිහිටා සිටි චතුර්විධ වූ මාර්ගයෙන් ෂොඩශ විධ වූ කෘත්‍ය ය කොට අධිශීල ශික්‍ෂා ය, අධිචිත්ත ශික්‍ෂා ය, අධිප්‍රඥ ශික්‍ෂා ය යන ත්‍රිවිධ ශික්‍ෂා පූරණය ත් කරන්නවුන් දෙවි මිනිස්සු ත් කැමති වෙති. උන්ට සත්කාර ත් කරණු කැමති වෙති' වදාළ සේක. දෙශනා කෙළවර පන් සියයක් පමණ දරුවෝ සෝවාන් ව තමන් දුන් කැවුමෙ රස තරමට වඩා සිටිනා රස ඇති නිවන් රස ලත්හ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් පර සම්පත්ති අසහන ලක්‍ෂණ වූ ඊෂ්‍ර්‍යාදීනු ත් දුරු ව අනුන් ගේ ගුණ මකා සිටිනා මකු කමුත් නැති ව ඇති ව කළ මනා සීල සමාධ්‍යාදී ගුණ ම ඇති කරන්ට උත්සාහ කට යුතු.

---

# 183. අනගැමි තෙරකෙණකුන් වහන්සේ ගේ වස්තුව

තව ද අධිගතයන් අධිගත ගුණ විශෙෂ ය අඩාල හෙයින් භගවන්ට මැළි වූවා සේ ම පුරා නො ව යන්තම් ඥාන විශෙෂයක් හා ගුණ විශෙෂයක් නිසා ඥාන ගර්ජිතා ගුණ ගර්ජනාවට මැළි වනු පිණිස අනගැමි තෙර කෙණකුන් වහන්සේ ගේ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්-

එක් දවසක් ඒ තෙරුන් වහන්සේ අතින් සද්ධිවිහාරික වහන්දෑ 'විශෙෂාධිගමයෙක් වී දැ'යි විචාළ සේක. තෙරුන් වහන්සේ ගිහි වූවෝ ත් අනගැමි වෙති. අනාගාමී පමණක් කියා කිම් ද, රහත් වූවොත් මුත් කියන්නේ කෙ සේ දැ'යි ලජ්ජාවෙන් ම කිසිවකු ත් නො කියා මිය ගොසින් ශුද්ධාවාස බඹ ලොව උපන් සේක. සද්ධි

Non-Commercial Distribution

විහාරික වහන්දෑ ද හඬා පියා වැලප පියා බුදුන් ලඟට ගොසින් වැඳ ලා හඬ හඬා එකත් පස් ව හුන් සේක. බුදුහු ත් හඬා නැ'යි මහණෙනි, යි වදාළ සේක. ස්වාමීනි, උපාද්ධ්‍යායයන් වහන්සේ කළුරිය කළ හෙයිනැ'යි කී සේක. වන්නාට මහණෙනි, මුසුප්පු නො වව, මරණ නම් නියත දෙයෙක් වේද'යි වදාළ සේක. 'එ සේ ය, ස්වාමීනි, මරණ නම් ජාති මූලික හෙයින් ජාතිය වූ පසු මරණ ත් වන නියා ව දනුම්හ. එකෙක් නම් අපි අපගේ උපාද්ධ්‍යායයන් වහන්සේ අතින් ලැබ ගත් ගුණ විශෙෂ ඇද්ද යි විචාළම්හ. දස ධම්ම සූත්‍ර ය වූ නියාවට කියා ලූ දෙයක් නැති ව උන්වහන්සේ මළ සේක. මනා පිළිවෙත් නමැති වෙළඳාමෙ හැසිර ත් ගුණ විශෙෂ බඩු ලද නුහුණු නියා වේදැ'යි ඒ නිසා මුසුප්පු වම්හ'යි කී සේක.

බුදුහු 'මහණෙනි, ඒ නිසා තෙපි මුසුප්පු නො වව. තොපගේ උපාද්ධ්‍යායයෝ අනගැමි වූහ. ගිහි මිනිස්සු පවා අනගැමි වෙති. රහත් ව මුත් ගුණ විශෙෂ ය නො කියම්. ලජ්ජාවෙන් ම තොපට නො කියා මිය ශුද්ධාවාස බඹ ලොව උපන්හ'යි වදරා ලා 'මහණෙනි, යම් කෙණෙක් තුමූ නිවන් විෂයෙහි හටගත් උත්සාහ ඇත්තෝ ද, යට තුන් මහ තුන් ඵලයට පැමිණියෝ ද, අනගැමි හෙයින් කාමරාග ය නිශ්ශෙෂ වූවෝ ද, එ සේ වූ තොපගේ උපාද්ධ්‍යායයෝ මිය කප් දහසකට ආයු ඇති අවිහ නම් බඹලොව ඉපැද ඊ ආයු ගෙවා අතප්ප නම් බඹ ලොව ඉපැද කප් දෙදසක් විතර ඊ ත් ආයු ගෙවා සුදස්සයෙහි ඉපැද සාර දහසක් කප් මුළුල්ලෙහි බඹ සැප ත් වළඳා සතර වැනි වූ සුදස්සියෙහි ඉපැද, කප් අට දසක් විතර එයි ත් ආයු ගෙවා පස් වැනි වූ අකනිෂ්ඨයෙහි ඉපැද, ඊ දී රහත් ව සොළොස් දහසක් කප් විතර බඹ සැප ත් වළඳා කෙළවර පිරිනිවන් පයිති'යි වදාළ සේක. දෙශනා කෙළවර ශොකාතුර ව බුදුන් කරා ගිය වහන්දෑ නිශ්ශොකී ව රහත් වූ සේක. මේ දෙශනාව ත් බොහෝ දෙනාට සප්‍රයොජන වී ය.

එ හෙයින් නුවණැත්තවුන් විසින් සසර මඳක් කල් යවනු කැමැත්තො ත් අනගැමි තෙරුන් වහන්සේ මෙන් අනගැමි ව අවිහාදියෙහි ඉපැද කප් දහසක් දෙ දහසක් සාර දහසක් අට දහසක් සොළොස් දහසක් බඹ සැප ත් වළඳා අනුපධිශෙෂ නිර්වාන ධාතුවට කැක් පිරිය යුතු-

Non-Commercial Distribution

# 184. නන්දික උපාසකයන් ගේ වත

තව ද විහාර කරවා දන් දීමෙහි අනුසස් හඟවන්ට නන්දික උපාසකයන් ගේ වත දක්වමු.

කෙ සේ ද යත්—

දඹ දිව බරණැස් නුවර නන්දික[1] නම් උපාසක කෙණෙක් දෙ මවු පියන් තරමට ම සැදැ ඇත්තෝ ය. දෙ මවු පියන් තර මේ ම සඞ්ඝයා වහන්සේට උපස්ථාන ත් කෙරෙති. උන් වැඩි විය පැමිණි කල්හි ලං ව තිබෙන ගෙයක හිඳිනා මයිලණු කෙණකුන් ගේ දූ වූ රෙවතී නම් කුමාරිකා කෙණකුන් පුතණුවන්ට සරණ ගෙනෙනු කැමැති වූ හ. කැමැති වූ පමණක් මුත් උඟ තුමූ සැදැ නැති හෙයින් දනට පිණට මැළියෝ ය. පිදුරු පිදුරු හා එක් ව නො ගැළපෙන්නා සේ නන්දික උපාසකයෝ උන් නො කැමැත්තෝ ය. එතකුදු වුව ත් දෙ මවු පියෝ උන් ම ගෙන්වා දෙනු කැමැති ව රෙවතීන්ට 'යේළිනි, තොපි සැදැ නැත ත් අපගේ විධානයෙන් මේ ගෙයි සෙසු තැන් කුම වුව ත් වහන්දැ වළඳන්ට හිඳිනා තැන ගොම පිරිබඩ ගැනීම් හසුන් පැනවීම් ආදි ය කරව. එ ලෙස කරවු නම් අපගේ පුතණුවෝ තමන් සැදැ ඇති හෙයින් තොප කැමැති ව ගනිති' කීහ. රෙවතී තමන් සැදැ නැත ත් අරුන් කැමැති කරවා ගන්නා නිසා එ ලෙස ම කළහ. එ ලෙස කරවා සැදැ ඇති ලෙස හඟවා ලා පුතණුවන්ගේ අදහස ලබ්බවා ගෙණ සරණ ගෙනවු ත් පාවා දුන්හ.

නන්දිකයෝ ද "සඞ්ඝයා වහන්සේට කළ මනා උපස්ථාන ත් අපගේ දෙ මවු පියන් වහන්සේට කළ මනා දෙය ත් නො පමාව කරවු නම් රඳා හිඳිමෙක. පමා වූ ද ම ගිය මැනැවැ' යි තර ව විධාන කළහ. උයි ත් යහපතැ යි ගිවිස එ තැන රඳාගන්නා නිසා එ ලෙස ම කළහ. එ ලෙසින් කොට එ තැන තර ව ගෙණ දරු දෙන්නකු ත් වද ගත්හ. නන්දිකයන්ගේ දෙ මවු පියෝ ත් මළහ. ගෙයි සියලු ම ඉසුරු දරුවන් ඇති හෙයින් රෙවතී කුමරිකාවන්ට ම වි ය.

නන්දිකයෝ ද දෙමවුපියන් මළ තැන් පටන් අධිකයක් ම දනට පිණට පටන් ගත්හ. එක් දවසක් බණ අසන ගමනේ විහාර කරවා දන් දීමෙහි අනුසසක් නිසා ඉසිපතන වෙහෙර සිවුරැස් ගෙයක්

---

1 නන්දිය

Non-Commercial Distribution

කරවා ලා හැඳ කළාල් කොට්ට මාවුලා ආදි වූ සෙනසුන් පිරිකර ත් ලවා ලා වියන් බඳවා ලා තිරමසර ගෙවලු ත් අද්දවා ලා බුදු පාමොක් සඟනට දන් දෙන්නෝ බුදුන්ගේ ශ්‍රී හස්‍තයෙහි පැන් වත් කළහ. බුදුන් අත තෙමා ගෙණ පැන් බිම වැගිරෙන්නා ම තව්තිසා දෙව් ලොව අට සාලිස් ගවු පමණ දිග පළල ඇති සාර සියයක් ගවු විතර උස ඇති සත් රුවන් මුවා දහසක් පමණ වූ දෝ නොහොත් දහස් ගණන් දෙවඟනන් ඇති දිව මාළිගාවෙක් පහළ වි ය.

ඒ මාළිගාව පහළ වූ නියාව මිනිස් ලොවට ඇසුණේ කෙ සේ ද යත් — මුගලන් මහ තෙරුන් වහන්සේ සත්‍වයන් පින් කම හසුරු වනු නිසා බොහෝ සේ දෙව් ලොවට වඩනා සේක් එක් දවසක් ඒ මාළිගාවට නුදුරු තැනෙක වැඩ සිටි සේක් තමන් වහන්සේ ලඟට ආ දෙවියන් අතින් 'දෙවඟන ගැවසී ගත් මේ මාළිගාව කවර කෙණකුන්ගේ කුසලානුභාවයෙන් පහළ වී දැ' යි විචාළ සේක. දෙවියෝ ද විමන් හිමියන් කියන්නාහු 'ස්‍වාමීනි, බරණැස නන්‍දික නම් කෙණෙක් ඉසිපතන නම් වෙහෙර බුදු පාමොක් සඟනට ගෙයක් කරවා දුන්හ. කළ පින් කමෙහි විපාක මේ ලොව ම පෙනී උන් නිසා මේ විමන උපනැ'යි කීහ. දෙවඟනෝ ද මාළිගාවෙන් බැස අවුත් 'ස්‍වාමීනි, අපි නන්‍දිකයන් සන්තක ව මෙහි උපනුම්හ. උන් දක්නට නැති හෙයින් මුසුප්පු ඇත්තම්හ. මැටි තළියක් හැර රන් තළියක් හැර ගන්නා සේ මිනිස් සැපත් හැර දෙව් සැපත් අත් කරන්ට වහා එන්ට වදාළ යහපතැ'යි කිවු ය. මහ තෙරුන් වහන්සේ ද මිනිස් ලොවට වැඩ බුදුන් කරා ගොසින් 'ස්‍වාමීනි, මිනිස් ලොව සිට පින් කළවුන් නො මියන තෙක් දිව සැප ත් පහළ වේ දැ'යි විචාළ සේක. 'හැයි, තොපි ම නන්‍දිකයන් මොබ හින් ද දී ම උන් නිසා තව්තිසා දෙව් ලොව පහළ වූ දිව සැපතින් පිරුණු මාළිගාව දුටුවා වා දැ'යි වදාළ සේක.

'එ සේ ය. ස්‍වාමීනි, පහළ වේ ය'යි කී කල්හි බුදුහු ''තොපි තමා කිසිවක් නො දන්නා සේ කුමක් කියා ද? යම් සේ බොහෝ දවසක් දුරු ව වැස පියා එන අවශ්‍ය නෑ කෙණකුන් ගම් දෙර සිටි කිසි කෙණෙක් දැක වහා උන්ගේ නෑයන්ගේ ගෙට ගොසින් අඹනාය, [1]මුඹගේ අසවල් නෑයෝ අවු ය. අපි දුටුම්හ'යි කිවු නම අසමින් ම සතුටු ව නෑයෝ සියෝ පෙර මගට ගොසින් දැක සතුටු වෙත් ද, එ පරිද්දෙන් මේ මිනිස් ලොව දී පින් කොට මිය පර ලොව ගියවුන් යම් සේ වෙළදාමෙහි ගිය කෙණකුන් නො වරදවා කොට ගෙණ ආ වෙළඳාම් ද රාජ කාරියෙහි ගියවුන්

1 ඇඹනි

Non-Commercial Distribution

සාධා ගෙණ ආ රාජ කාරිය ද දක නෑයෝ සියෝ 'කළ සේ යහපතැ'යි සතුටු වෙත් ද, එ මෙන් කළ කුසලයෝ ත් දිව්‍ය වූ ආයු ද, දිව්‍ය වූ ශරීර වර්ණ ද, දිව්‍ය වූ සැප ද, දිව්‍ය වූ යසස් ද දිව්‍ය වූ ආධිපත්‍ය ය ද, දිව්‍ය වූ පස් කම් ගුණ දෑ'යි මේ පඬුරු දස ය, හැර ගෙණ මවු පියන් පරිද්දෙන් උන් කරා පැමිණ පිළිගනිති'' වදාළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන සෝවාන් ඵලාදියට පැමිණියහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් යම් කුසලයෙක් මේ ලොව ම ඉෂ්ට විපාකදැයි වී නම් විහාර කරවා දන් දීමෙන් සිද්ධ වන කුසලයට වඩා නැතැ'යි යනු සිත තබා ඊ ත් හැසිර එයින් අවශිෂ්ට වූ කුසලයෙහි ත් හැසිර භව සැප ත් වළඳා කෙළවර නිවන් සැප ත් අත් කට යුතු.

## 185. රෝහිණී බිසොවුන් ගේ වස්තුව

තව ද අසහනයෙහි ආදීනව දක්වනු සඳහා රෝහිණී බිසොවුන් ගේ වස්තුව කියමු.

කෙ සේ ද යත්—

එක් සමයෙක අමිතොදන නම් ශාක්‍ය රජ්ජුරුවන්ගේ පුත් වූ අනුරුද්ධ මහ තෙරුන් වහන්සේ කිඹුල්වත් නුවරට වැඩි සේක. ඔබගේ නෑයෝ ද වැඩි නියාව අසා විචාරන්ට ගියහ. රොහිණී නම් වූ නං උපාසිකාවෝ නො ගියහ. මහ තෙරුන් වහන්සේ ද 'රොහිණී නො ආවෝනැ'යි විචාළ සේක. 'ශරීරයෙහි කුෂ්ඨ රොගයක් ඇති ව ගත් හෙයින් ලජ්ජාවෙන් නො ආවෝ ය'යි කීහ. මහ තෙරුන් වහන්සේ ද 'කැඳවා ගෙන්ව'යි වදුරා ලා පට කඩ සැට්ටයකින් ඇඟ වසා ලා ගෙණ ආවවුන්ට 'හැයි රොහිණීනි, මෙ තෙක් දෙන අප විචාරන්ට එන ගමනේ තොපි නාවා නැ'යි වදාළ සේක. 'ස්වාමීනි, හෙළි බසින්ට ලජ්ජා වන තරම් කුෂ්ඨ රොගයෙක් සියල් සිරුරු වසා ඇති වි ය. ඒ නිසා ලජ්ජාවෙන් නො ආ බව මූත් නිහරසර ව තො වෙයි කීහ. 'දැන් කුම් වුව ත් මතු නිරෝගි වන ලෙසට දන් පින් නො කරා නැ'යි වදාළ සේක. 'කුමන පිණක් කෙරෙම් දැ'යි විචාළ කල්හි 'වහන්දෑට අසුන් හලක් කරවා ලව'යි වදාළ සේක. 'කුමක් දී ලා කරම් දැ'යි විචාළහ.

'හැයි, තොප පළඳනා ආභරණ නැත් දැ'යි විචාරා 'ආභරණ ඇතැ'යි කී කල්හි ඒ ආභරණ කෙ තෙක් වටී දැ'යි විචාළ සේක. 'දස දහසක් විවර වටී'යි කී කල්හි 'එ සේ වී නම් ඒ වියදම්

කරවා පියා ඉන් ලද දෙයකින් අසුන් හලක් කරවා ලව'යි වදාළ සේක. 'ස්වාමීනි, මා ගැනු බාල වූව. මට කරවන්නෝ කවුරු දැ'යි විචාළහ. මහ තෙරුන් වහන්සේ ලඟ සිටි නෑයන්ට 'තෙපි තුලුන්ට සහාය ව ඒ කරව'යි වදාළ සේක. ස්වාමීනි, අපි වන්නා සහාය වන්නමෝ වේ ද, මුඹ වහන්සේ සහාය වන්නේ කුමකට දැ'යි විචාළ සේක. 'එ සේ වී නම් දඬු පත් ගෙනෙව'යි විධාන කළ කල්හි දඬුපත් ගෙන්වා ලැවූහ. මහ තෙරුන් වහන්සේ ද අසුන් හල කර්මාන්තයට විධාන කරණ සේක්—රොහිණී බිසොවුන්ට 'රොහිණීනි, දෙමාල් අසුන් හලක් කරවා යට මාලෙහි පෝරු අතුළ තැන් පටන් එක්වම යට මාලේ ගොම පිරිබඩ ගැනලා හිඳිනා අසුන් පනවා ලව. නිරන්තරව වළඳන වහන්දෑට කළ කොතලාවලින් හා සැළවලින් පැනු ත් පරහා ගෙන්වා තබව'යි වදාළ සේක.

උයි ත් 'යහපතැ'යි ගිවිස ආභරණ වියදම් කරවා දෙ මාල් අසුන් හල කරවා ලා යට මාලේ පෝරු අතුළ තැන් පටන් නිරන්තර ව ගොම පිරිබඩ ගැනීම් ආදි ය කෙරෙති. නිරන්තර ව වහන්දෑත් පැනවූ හසුන්වල හිඳිනා සේක. හසුන් හල ගොම පිරිබඩ ගැන්මෙහි අනුසසින් කුෂ්ඨ රොගය ත් මලන්ට වන. උයි ත් හසුන් හල නිමි කලට බුදු පාමොක් සඞ්ඝයා වහන්සේට ආරාධනා කොට ගෙය පුරා වඩා හිඳුවා ලා ප්‍රසව දූක කියා ආවවුන් මතුට පොවන පැණක් මෙන් තමන් ඇඟ ඇති වූ කුෂ්ඨ රොග ය නැති වනු නිසා මධුරාහාර ය වැළඳවූහ. බුදුහු ත් වළඳා අන්තයෙහි නො දත් බඳු ව 'අද දන් කාගේ දැ'යි විචාළ සේක. 'ස්වාමීනි, මුඹ වහන්සේගේ නං වූ රොහිණී බිසොවුන්ගෙනැ'යි කීහ.

බුදුහු ත් 'දැන් උඹ කුමක් කෙරෙත් දැ'යි විචාරා 'ගෙයි' ය යි කී කල්හි 'උන් කැඳවා ගෙනෙව'යි වදාළ සේක. උඹ තුමූ කුෂ්ඨ රොග ය මලා ගිය ත් ඡවි සමුර්ද්ධිය තව එවා ගන්ට නූ වූ හෙයින් එන්ට මැළියෝ ය. බුදුහු උන් එන්ට නො කැමැති වූව ත් ගෙන්වූ ම සේක. අවුත් වැඳලා සිටියවුන්ට 'හැයි' රොහිණීනි, කැඳවා ගෙන්වන තෙක් නො ආව නැ'යි වදාළ සේක. 'ස්වාමීනි, මාගේ ශරීරයෙහි කුෂ්ඨ රොගයක් ඇති ව මලා ගිය පමණක් මුත් තව ඡවි ය හට ගන්ට නො වී ය. එ සේ හෙයින් ලජ්ජාවෙන් ආමි' කීහ. 'රොහිණීනි, ඒ කුෂ්ඨ රොග ය කුමක් නිසා ඇති වූව යි තෙපි දනු දැ'යි විචාරා 'නො දනිමි' කී කල්හි 'හෙම්බා, තෙලෙ අනික් කෙණකුන් කළ දෙයක් නිසා වූ දෙයෙක් නො වෙයි. තොප ම කළ දෙයකින් වී ය'යි වදාළ සේක. වදාරා ලා විස්තර කොට වදරන සේක්—

Non-Commercial Distribution

යට ගිය දවස බරණැස් රජ්ජුරුවන්ගේ අගමෙහෙසුන් බිසවු එක්තරා පුරඟනක් කෙරෙහි රොෂ ය ඇති ව 'ඇට දුක් උපදවා-පියමී' සිතා මහ කසඹිලිය පත්[1] ගෙන්වා ගෙන ඒ පුරඟනන් තමන් ලඟට ගෙන්වා ලං උන්ට නො හඟවා ම උන් වැද හෝනා හැද ත් අතුළ ඇතිරිලිවල් හසු හස්සෙ ත් කසඹිලිය පත් සුණු කරවා ලවා පීහ. කෙළියෙන් සිනාගෙන් උන් ඇඟට ත් කසඹිලිය සුණු ඉස්වූහ. ඒ ඇසිල්ලෙහි උන්ගේ සියල් සිරුරු රත් ව පියා ගඩු නැංගේ ය. කණ්ඩුති ත් බලවත් ව ඇති වි ය. උඹ කණ්ඩුති ත් බලවත් ව ඉවසා ගත නො හී යාහනේ වැද හොත්හ. ඊත් නැමුණු නැමුණු සේ කසඹිලි ය සුණු ඇඟ ගෑවී ලා දුක් මහත් වි ය.

එ කල බරණැස් රජ්ජුරුවන්ගේ අග මෙහෙසුන් බිසවු නම්, රොහිණිනි, තොපි ය. අනුන් ඇඟට කසඹිලිය දමා මෙසා අනර්ථයක් ලවා ගත්තෙ ත් ක්‍රොධ නිසා ය. එ සේ හෙයින් ඒ ක්‍රොධ ය නම් සියලු ලෙසින් ම කටයුතු නොවේ'යි වදරා 'කිපියවුන් කිපි විට දන්නා කිසිවක් ම නැති හෙයින් ඒ ක්‍රොධ ය හළ මැනව. උන්නති ලක්‍ෂණ වූ නව විධ මානය ත් සඝර කල් යවන හෙයින් සියලු ලෙසින් ම හළ මැනව. සූත්‍රාභිධර්ම දෙක්හි ම ආවා වූ සියලුම සංයෝජනයනු ත් සමුච්ඡෙද වසයෙන් නසන තෙක් අතුර තදඞ්ග වසයෙන් නැසුව මැනව. යම් කෙණකුන්ට කුමක ත් මමායන නැත්නම් උඹ කුමකු ත් නො ඇලෙති. එ සේ කුමක ත් නො ඇලෙන්නා වූ සත්වයන්ට තොපට මේ දුක් ඇති වූවා සේ දුක් ඇති නො වෙ'යි වදළ සේක.

දෙශනා කෙළවර බොහෝ දෙන ත් නිවන් දුටහ රොහිණී බිසවු ද සදහම් නමැති අමාව වළඳා කෙළෙස් ලෙඩ තුනකිනු ත් මිදී සෝවාන් ව අජරාමර වන්ට නියම වූහ. සිත් සතනාව කුසල් බෙහෙදු ත් වැද කයට වන් බෙහෙදක් නැත ත් ශරීරය ත් රන්වන් වි ය. උයි ත් පසුව කලකදී මිය තව්තිසා දෙව්ලොව දිව්‍ය පුත්‍රයන් සතර දෙනකුන්ගේ විමන් සතරකට මැද සීමායෙහි ඉපැද ලිපාම් කොට දුන පැ ගැලූ පිළිමයෙක කල් ගිය සේ පැය මූකරන්නා සේ පූර්ව ජාතියෙහි කළ කුසල ය කම් පල හදහා දුන කළ හෙයින් විපාක දෙන අවස්ථාවට පැමිණි හෙයින් ශොභාවත් වූහ. දේවතාවෝ සතර දෙන උන් දැක උන් කෙරෙහි බලවත් ප්‍රේම ඇති ව එක් කෙණකුන්ගේ සීමායෙහි නො ව සීමා මැද උපන් හෙයින් සතර දෙන ම විවාද කෙරෙමින් තුමූ ඝනිටුහන් කට නො හී සක් දෙවිඳු කරා ගොසින් 'ස්වාමීනි' මේ අපගේ

---

1. පක්

Non-Commercial Distribution

යුක්ති ය විචාරා පසිඳ දුන මැනැවැ'යි කීහ. සක් දෙවිඳු ද රොහිණී නම් දෙවඟන දැක දෙවියන් සතර දෙනාට ත් වඩා තුමූ උන් කෙරෙහි ප්‍රේම ඇති ව' 'මුන් දුටු වේලේ පටන් තොපට කෙ සේ සිතිණි දැ'යි විචාළහ.

එ සේ විචාළ සක් දෙවිඳුහට එක් දේවතාවෙක් 'මට සිතුණු සිත් සටන් බෙරක් මෙන් අනවරතයෙන් පැවැත්තැ'යි කී ය. අනික් දේවතා 'මට සිතුණු සිත් සෙල් ව තිබෙන ගලෙකින් හුණු ගඟක් මෙන් වහ වහා පවත්ති' කී ය. තුන් වැනි ව කියන දේවතාවා 'මා මුන් දුටු වේලේ පටන් එක් වන් බැලීමෙන් ඇස් කකුළුවන්ගේ ඇස් සේ වී ය'යි කීය. සතර වැනි ව කියන දේවතාවා 'මා මුන් දුටු වේලේ පටන් මාගේ සිත නම් ද ගබ් කැරැල්ලෙක බැඳ පූ පතාකයක් මෙන් නිසල ව තිබිය නො හෙයි' කීය. එ අසා සක් දෙවිඳු කියන්නාහු 'තොප හැම තව ත් කරණු දැ යහපත. ජීවත් වන්නාවාද? මම වැළි ත් මුන් නො ලදිම් නම් ජීවත් වි ය නො හෙමි. ජීවත් වීමෙක් වේ නම් මුන් ළදෝතිනැ'යි කීහ. දේවතාවෝ සතර දෙන ඒ අසා මුඹ වහන්සේ මිය යැමෙන් අපට ප්‍රයෝජන කිම් ද? ජීවත් ව හුනොත් වේ ද යහපතැ'යි රොහිණී නම් දෙවඟන සක් දෙවිඳුහට ම පාවා පියා ගියහ. උයි ත් ශක්‍රයන්ට ඉතා ප්‍රිය වූහ. 'අසවල් කෙළි ළුවකට යම්හ'යි රෝහිණී නම් දෙව් දූ කිවූ නම් ශක්‍රයෝ ඊට බාධාවක් කට නො හෙති.

එ හෙයින් නුවණැත්තවුන් විසින් ක්‍රොධ බහුල නො ව උපන් ක්‍රොධයෙක් ඇත්නම් ලෙඩට නිසි පිළියම්න් ලෙඩ සන්හිඳුවන සේ ක්‍රොධ සන්හිඳෙන්ට නිසි බණ දහම් මෙනෙහි කිරීමෙන් ක්‍රොධ සන්හිඳුවා කුසල්හි හැසිර නිවන් සිද්ධ කට යුතු.

---

## 186. එක්තරා භික්ෂුකෙණකුන් වහන්සේගේ වස්තුව

තව ද සහනයෙහි අනුසස් දක්වන්ට එක්කරා භික්ෂු කෙණකුන් වහන්සේ ගේ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්—

තිලෝගුරු බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේගේ ශරීර ප්‍රකෘති බලා රුක් මුල සෙනසුන් සූත්‍ර ප්‍රතිපත්ති වශයෙන් ධුතාඞ්ග පූරන තැනට හැර ගෙවල් සෙනසුනු ත් අනුදත් කල්හි රජගහා නුවර සිටාණන් පටන් බොහෝ දෙන සෙනසුන් කරවන්ට පටන් ගත් කල්හි අළවු නුවර වසන එක් භික්ෂු කෙණකුන් වහන්සේ

Non-Commercial Distribution

උපාසක සමවායක් තමන් වහන්සේගේ ප්‍රසිද්ධ කමක් නැති හෙයින් නො පෙනුණු වන්නා තමන් වහන්සේ ම තමන් වහන්-සේට සෙනස්නක් කරවනු කැමතිව එක් යහපත් ගසක් දැක කපන්ට පටන් ගත් සේක. විමන් දෙව් දූනුත් මිනිසුන් ලෙසින් දරුවන් වදන හෙයින් ඒ ගස වසන බාල දරු කෙණකුන් ඇති දෙවතා දුවණි කෙණෙක් පුතණුවන් වඩා ගෙන විමන සිටි තැනැත් තෝ ගස නට කලට විමන ත් නස්නා හෙයින් විමන නට කලට සමහර දෙව් කෙණකුනු ත් නස්නා හෙයින් 'ස්වාමීනි, මාගේ විමන නො නැසූ ව මැනව. බිළිඳි දරුවන් හැර ගෙන විමන් නැති ව ඇවිද්ද නො හෙමී' කිවු ය.

'අනික් මෙ සේ වූ ගසක් සොයා ගත නො හැක්කැ'යි දේවතා දුවණියන් වැළකුව ත් කපන සේක් ම ය. මේ බාල දරුවන් දැක ත් නැවත පියන සේකැ'යි පුතණුවන් ගස අත්තෙහි වැද හොවා ලූ ය. ගස කපන භික්ෂූන් වහන්සේ ද හොසොවා ගත් පොරව රඳවා ගත නො හී දේවතා පැටවාණන්ගේ අත කපා පී සේක. දේවතා දුවණි යෝ කිපී පියා 'ගසා මරා පියමී' අත ඔසවා පියා ත් මුන් වහන්සේ සිල්වත් සේක. ඉදින් මම මුන් වහන්සේ මරා පීම නම් නරකයෙහි ඉපැද පියා විමනින් තබා දිව සැපතිනු ත් පිරිහී අනන්ත කාලයක් බොහෝ දුක් ගනිමි. නරකයට යන ගමන් මේ දරුවෝ නවතා ලිය හෙ ත් ද? විමන් ඇත්තෝ මුත් මම මතු නො වෙමි. සෙන සුන් ඉදි කරණ සේකු ත් මුන් වහන්සේ මතු නො වන සේක. අස-වල් දේවතා දුවණියෝ කපට දණ්ඩක් කපන තැන අසවල් නම මරා පූ ය'යි එයි ත් එක කට යුත්තක් කොට ගෙන අනිකුත් දඬු පත් කපන වහන්දෑ සෙසු ත් විමන් ඇති දෙවියෝ මරති. ඒ පාපය ත් මා නිසා වන දෙය ය. මුන් වහන්සේ ත් තමන් වහන්සේට තමන් වහන්සේම මුදලි නො වන සේක. මුන් වහන්සේට බුදුන් නායක බැවින් 'ඔබට කියමි' මෙ තෙක් කට යුතු රාශි ය සිතා ගෙණ නිව නට දෙව ඇති වන බැවින් ඔසවා ගත් අත හකුළුවා ගෙණ හඬ හඬා බුදුන් කරා ගොසින් වැද ලා එකත් පස් ව සිටියහ. බුදුහු ත් සාද සාමීචියෙහි දක්ෂ බැවින් 'හැයි ද දේවතා දුවණියෙනි, වදළ සේක.

'ස්වාමීනි, මුඹ වහන්සේගේ භික්ෂු කෙණකුන් වහන්සේ මාගේ විමන ත් නසා පූ සේක. මම ත් ඔබ මරමී සිතා පියා සිතුව මනා දෙයක් පෙරළා සිතා ගෙණ නො මරා ම මුඹ වහන්සේට දන් වන්ට අයිමී'සියලු පවත ම විසතර කොට කිවු ය. බුදුහු ත් අසා වදරා තුන් විටක් විතර සාධු කාර දී 'හෙම්බා දේවතා දුවණියෙනි, යම

Non-Commercial Distribution

කෙණෙක් තමන්ට උපන් ක්‍රොධ ය යම් සේ රථ පැදීමෙහි දක්‍ෂ වූ රිය ඇදුරෝ ඉතා වහා දුවන රථයක් වහා යා නො දී තමන් කැමති තැනට පමුණුවා ගනිත් ද, එ මෙන් කාරණ සිතීමෙන් සන්හිඳුවා ගනිත් ද, උන් ක්‍රොධ නමැති අසුන් නවතා සිත් නමැති රථ ය පිළිවෙත් නමැති මහට බාගෙන චතුර්විධ මාර්‍ග ඥාන නමැති වාසල් වලින් නිවන් පුරයට පමුණුවා ලීමෙහි රිය ඇදුරු කොට කියමි. රජ යුව රජ ආදීන්ගේ රථ පදනවුන් රැන් අල්වන්නවුන් කොට මුත් රිය ඇදුරු කොට නො කියමි' වදාළ සේක.

දෙශනා කෙළවර දේවතා දුවණියෝ කටයුතු මාර්‍ග ය නො වැරැද්දුවා සේ නිවන් මහ ත් නො වරදවා සෝවාන් වූහ. සම්ප්‍රාප්තවූ පර්‍ෂදට ත් දෙශනා ව සප්‍රයෝජන වී ය. දේවතා දුවණියෝ සෝවාන් ව පියා ත් විමන් සෝක ය නො සන්හුන් බැවින් හඬ හඬා සිටියහ. බුදුහු ත් 'මාර්‍ග ඵල පුරා හැම ලබන්ට නු වූ හෙයින් ඊට මුසුප්පු ව හඬන්නා සේ 'හඬානැ'යි වදාළ සේක. 'ස්වාමීනි, මාගේ විමන් නට. ඒ නිසා හඬමි'යි කිවු ය.

'දේවතා දුවණියෙනි, තොපි මුසුප්පු නො ව ව. නිවන් පුර ය සාධා දී ලූයෙම් විමන් පමණ දී ලිය නො හෙම් ද? එයි ත් පිළිවනැ'යි දෙව්රම් ගඳ කිළියට ආසන්නයෙහි දෙවියන් නැති ව අවසර ව තුඹු ගසක් උන්ට දක්වන සේක්—'අසවල් තැන අවසර ව තුඹු ගසෙක් ඇත ඔබ යව'යි වදාළ සේක. උයි ත් ඒ රුක් විමනට ගියහ. එ වක් පටන් කවර තරම් දේවතා කෙණකු ත් බුදුන් දෙවා වදාළ විමන හෙයින් උගුළුවා ලිය නො හෙති. බුදුහු ත් ඒ මුල් ව ගස් තුරු ලිය ආදි ය කළනුකුරුවන්ට සික පදයන් පනවා වදාළ සේක.

එ සේ හෙයින් සත් පුරුෂයන් විසින් බොධි සත්‍ව චරිත ත් සලකා කවර අපරාධ ත් සහන ය කොට දයා බහුල ව ම කුසල්හි හැසිර නිවන් රට අත් කට යුතු.

## 187. උත්තරාවන් ගේ වත

තව ද ක්‍රොධයෙහි ආදීනව ත් ක්‍ෂමායෙහි අනුසස් ත් හඟවන්ට උත්තරාවන් ගේ වත දක්වමු.

කෙ සේ ද යත්—

රජගහා නුවර සුමන සිටාණන් නිසා පුණ්ණ නම් දුගියාණ කෙණෙක් බැල මේ කොට ජීවත් වෙති. උන්ගේ ඇමඹිනියන්

හා උත්තරා නම් දූවණි කෙණකුන් විනා උන් නිසා ජීවත් වන අනික් කිසි කෙණකුන් නැත. එක් කලෙක සතියක් නකත් කෙළි කෙළි ය යුතු ය'යි රජගහා නුවර රාජ සම්මතයෙන් විධාන යක් කළහ. ඒ අසා සුමන සිටු ද උදසන ම පූර්ණ නම් දූගියා ණන් බණවා ලා 'දරුව, අපගේ කර්මාන්ත කරණ අය අප ත් නකත් කෙළි කෙළිනා හෙයින් තුමූ ත් කෙළනා කැමැත්තාහ. කුමක් ද? තෙපි නකත් කෙළි කෙළු ද? නොහොත් බැළමෙම ම කරවුදූ'යි විචාළහ. 'ස්වාමීනි, කෙළි ලළු නම් පොහොසත් කෙණ කුන්ට වේ ද? සෙසු පොහොසත් කම තබා අපට සාල් නැළියක් මනාවක්ට ත් විදිකිදි නැත.

එ සේ හෙයින් නකත් කෙළි අපට හැයි ද? ගොන් ගෙයක් ලදෙ ත් සාන්ට යෙමී' කිවූ ය. කියා ලා ගොන් ගෙයකු ත් නඟුල් විය දඬු ත් හැර ගෙණ සාන්ට යන්නාහු ඇඹේණියන් බණවා ලා 'ඉසොඳුර, නුවර ඇත්තෝ නකත් කෙළි කෙළිති. අපි අප දුප්පත් හෙයින් බැළ මේයට යම්හ. වන්නාට අමුතු ලෙසට මෙ තෙක් දවස් පිසනා තරමින් බත් මාළු මදක් වඩා පිස ගෙණ සානා තැනට ගෙනෙව'යි කියා ලා සාන්ට ගියහ.

ධර්ම සෙනෙවි සැරියුත් මහ තෙරුන් වහන්සේ ද එ දවසට පෙරාතු සතියක් මුළුල්ලෙහි නිරොධයට සම වැද සතිය පිරුණු එ දවසට හෙයින් එ දවස් නිරොධයෙන් නැගී 'අද කවුරුන්ට සංග්‍රහ කෙරෙම් දෝ හෝ'යි දිවසින් බලන සේක්-පූර්ණ නම දුගියාණන් සසර නමැති මළ නො බැඳෙත ත් තමන් වහන්සේගේ නුවණ දූළ බැඳුණවුන් දූක 'මා එ තැනට ගිය කල තමන්ට නැති ව ත් මට සංග්‍රහ කරණ ලෙසට සැදෑ ඇද්දෝ? සංග්‍රහ කටහෙත් දෝ හෝ'යි බලා සැදෑ ඇති නියාව ත් සංග්‍රහ කරණ නියාව ත් කළ සංග්‍රහ නිසා මහා සම්පත් ලබන නියාව ත් දූක සඟළ සිවුර හා පාත්‍ර ය හැර ගෙණ උන් සානා තැනට වැඩ ඉවුරු බඩ එක් කැළයක් බල බලා වැඩ සිටි සේක.

පූර්ණ නම් දූගියාණෝ ද මහ තෙරුන් වහන්සේ දූක නුවණ සී ලදින් සානා සී තබා පියා අවුත් පසඟ පිහිටුවා වැඳ ලා 'කැළ ය බල බලා වැඩ සිටියේ දූවිටි දණ්ඩෙන් ප්‍රයෝජන ඇති නියා වනැ'යි සිතා දූවිටි දඬු කැප කොට දුන්හ. ඉක් බිත්තෙන් මහ තෙරුන් වහන්සේ පාත්‍ර ය ත් පෙරාන් කඩ ත් දෙවා ලූ සේක. වාක් හෙද කොට නො වදළ ත් 'පැණින් ප්‍රයොජන ඇති වනැ'යි සිතා ගෙණ පාත්‍ර ය ගෙණ ගොසින් පැන් පරහා දුන්හ.

Non-Commercial Distribution

මහ තෙරුන් වහන්සේ ද මූ තමන් අනුන් නිසා[1] වසන හෙයින් ගේ පිටි පස්සෙක හෝ මුලුසර තැනෙක හිඳිති. ඉදින් මුන්ගේ ගෙ දොරට සිහා ගියෙම් නම් මුන්ගේ ඇඹෙණියෝ තමන් මුලුසර ව හිඳිනා හෙයින් මා දොර කඩ සිහා සිටිය ත් දක පිය නොහෙති. යම් තාක් බත් හැර ගෙණ මහට එත් ද? ඒ තාක් මෙ තැන ම රඳමී' මදක් වැඩ සිට ලා උනු ත් බත් හැර ගෙණ මහට ආනියා ව දුන ඇතුළු නුවර බලා නික්මුණු සේක. උයි ත් අතර මහදී මහ තෙරුන් වහන්සේ දක රත්රන් රිදී ආදි ය නැත ත් සැදැ සිත් ඇති හෙයින් 'ඉදින් අපට පිළිගන්වා ලන්ට නිස්සක් සම්භ වී නම් පුණ්‍ය ක්‍ෂෙත්‍ර වූ ස්වාමි දරුවන් සම්භ වන්ට නැත. ස්වාමි දරුවන් අරුමයක් සේ සම්භ වූ කලට පිළිගන්වා ලන්ට නිස්සක් සම්භ වන්ට නැත. අද වූ කලි ගුණ සම්පන්න වූ ස්වාමි දරුවෝ ත් සම්භ වූ සේක. රස පරස නැත ත් අදහසින් අති පවිත්‍ර වූ බත් පමණෙක් ඇත. බොහෝ සුඛිතයන්ට සංග්‍රහ කොට ආ සේක්-අප සේ වූ දුක් පතුන්ට ත් සංග්‍රහ කරණ සේක් දෝ හෝ' යි සිත සිතා බත් සැළි ය බලා මහ තෙරුන් වහන්සේ වැද ලා 'ස්වාමීනි, මා පිළිගන් වන්ට සිතන බත් නපුරැ'යි නො සිතා ගැත්තවුන්ට ත් මඩියටත් සිද්ධ වන කුසල් හා ඒ කුසලින් අප දෙන්නා ලබන ලොවි ලොවු තුරා සැපතෙක් ඇත් නම් එ ම තකා අපගේ දුක් පත් දන ඉවසා වදළ යහපතැ'යි කිවු ය.

මහ තෙරුන් වහන්සේ ද බත් පිළිගන්නා සේක්- භාගයක් විතර පිළිගන්වා පී කලට උන්ට ත් භාග වුවමනා වෙ දැ'යි අතින් පාත්‍ර ය වසා ගත් සේක. උපාසිකාවෝ ද ඔබගේ අදහස් දන ලා 'ස්වාමීනි, මෙ එක් කෙණකුන්ට සෑහෙන බත. දෙ භාගයක් කළ කලට ඔබට ත් සෑහෙන්ට නැත. ගැත්තහුව මෙ ලොවින් කරණ සංග්‍රහ හැර ලා පර ලොව සංග්‍රහ ම කොට වදළ යහපත. සුහකු ත් නො රඳවා පිළිගන්වනු කැමැත්තෙමී' කියා ලා බත් හැම ම පිළිගන්වා ලා 'මෙ බත අමධුර වුව ත් මෙ කුසලයෙන් අති මධුර වූ නිවන් රස ලබමෝ ව'යි පතා ගත්හ. මහ තෙරුන් වහන්සේත් 'ඒ එ සේ ම වෙ ව'යි වදරා බත නපුරු'යි සිතන තැනැත්තවුන්ගේ අදහස යහපත් වන ලෙසට බණ වදරා පැන් ඵාසු තැනෙක වැඩ හිඳ අනුග්‍රහ නමැති මාළු ඇති ව වැළඳූ සේක.

උපාසිකාවෝ ද ගෙට ගොසින් සාල් සුහක් සොයා ගෙණ පෙරලා ත් බතක් පිසූහ. පුණ්ණ නම් දුගියාණෝ ද බිජුවට දමුණක් සරිය සා පියා විඩා ව ගොසින් බඩ සා ඉවසා ගත නො හී ගොන්

1. වත

Non-Commercial Distribution

උනා පියා සෙවන තැනකට පලා ගොසින් පෙර මහ බල බලා හුන්හ. උන්ගේ ඇඹෙණියෝ ද වේලා නංවා පියා බත් හැර ගෙණ එන්නෝ දුගියාණන් සෑ උනා පියා හුන්නවුන් දැක 'උදසන ත් බත් කා ලා එන්ට නුවූ හෙයින් බඩ ත් සා ව සා ත් විඩාව පෙර මහ බල බලා හුන්හ ඉදින් මූ තුමූ කල් යවා බත් ගෙණ හෙයින් තොරතුරු නො දැන මුසුප්පු ව ලා ලහ තුබූ කැවිටි දණ්ඩෙන් පහරක් ගසා පූ නම් මාගේ අදහස ත් නුපුරු ව ලා පිස නාසා පී බතක් සේ කල පින් කම ත් හීන ව ගියේ නම් නපුර. ලං නො ව පෙරාතු කොට කියමි' සිතා ලා ස්වාමීනි, අද එක දවස් සිත පහදවා ගත මැනව. මා කළ පින් කම ත් හානි නො කළ මැනව.

'මම උදසන ම බත් පිස ගෙණ එන්නෙම් අතුරු මග දී ධම සෙනෙවි ස්වාමීන් දැක මුඹට ගෙනෙන බත් ඔබට පිළිගන්වා පියා පෙරළා ගොසින් සාල් සපයා ගෙණ බත් පිස ගෙනාමි. කල් පලා ගියේ එ හෙයින. දුන් දන සිත පහදවා ගත මැනැවැ'යි කිවු ය. බඩ සා දැඩි හෙයින් ඉඳුරා අසා ගත නො හී පෙරළා ත් විචාරා නැවත ත් එ පවත් අසා 'මට ගෙනෙන බත් ඔබට පිළිගන්වා පී සේ ඉතා යහපත. සසර සිටිනා තෙක් කල් බතින් ගන්නා මුළා හළ නියා වේ ද, මම ත් අද උදසන ඔබට දැවිටි පැන් දෙවා ලීමි. සසර සිටිනා තෙක් කල් පරිවාර සම්පත්ති අඩු නැති නියා වේ දැ' යි පහන් සිත් ඇති ව තමන් ගෙන් එ බඳු විධානයක් නැත ත් ඇඹෙණියන් දුන් දනට සමාධි ව බත අනුභව කොට ලා වේලා නංවා ලත් බතක් හෙයින් ආයාස බලවත් ව උපාසිකාවන්ගේ ඔර හිස තබා ගෙණ වැදහෙව නිදති.

ඉක් බිත්තෙන් උදසන සාට තැන් සුණු ව ගිය පස් පටන් රත් රන් ව ගොසින් කිණිහිරි මල් සමූහයක් මෙන් බබළමින් සිටියේ ය. පුණ්ණයෝ ත් පිබිද ලා රත් රන් ගොඩවල් දැක ඇඹෙණියන් බණවා ලා 'සොඳුර, උදසන පටන් මා සාට බිජුවට දැමුණක් විතර රත් රන් ව පෙනෙයි. 'වේලා නංවා ලා බත කෑ හෙයින් ඇස් බමන නියා දෝ' ය යි කිවු ය. උපාසිකාවෝ ත් බලා පියා 'ස්වාමීනි, මා වේලා නංවා ලා කෑ බතක් නැත ත් මටත් එ සේ ම රන් වන් ව පෙනෙ'යි කිවු ය. පුණ්ණයෝ ත් නැඟී සිට ගොසින් ඉන් එක් කැටියක් හැර ගෙණ නඟුලිස ගසා රත් රන් නියාව දැක 'අනේ ධම සෙනෙවි ස්වාමීන්ට දුන් දනෙහි විපාක දුර නො යාම අද ම පෙනිණ. මෙ තෙක් රත් රන් සඟවා තබා ගෙණ ප්‍රයොජන විඳින්ට ත් බැරි ය යි ඇඹෙණියන් බත් ගෙනා වළඳ රත් රන් පුරා ගෙණ රජ ගෙට ගොසින් තමන් දකින්ට ගිය නියාව කියා ලා අවසර

ලදින් රජ්ජුරුවන් දැක ලා 'කුමක් නිසා අවු දැ'යි විචාළ කල්හි 'ස්වාමීනි, අද මා සාට තැන් මුළුල්ල ම රත් රන් වි ය. ඒ මුඹ වහන්සේ භාණ්ඩාරයට ගෙන්වා වදාළ මැනැවැ'යි කිවු ය. 'තෙපි කවුරු දැ'යි විචාළ කල්හි තමන් පුණ්ණ නම් දූගියාණන් නියාව කිවු ය.

රජ්ජුරුවෝ 'නො කරුණෙක මෙ සේ ම වන්ට කාරණ නැතැ'යි සිතා ලා 'තෙපි අද කුමක් කළා දැ'යි විචාළෝ ය. අප කළ දෙයෙක් නම් ධර්ම සෙනෙවි ස්වාමීන් මා සාමින් සිටි කුඹුර කරා වැඩි ගමනේ මම දැවිටි පැන් දී ලීමි. අපගේ අඹු දූරී කන්ට කුඹුරට ගෙනෙන බත් ඔබට පිළිගැන් වූ ය. මෙ විනා අනික් අප දෙන්නා කළ දෙයෙක් නම් මම කුඹුර සාටීමි. ඌ තුමූ දෙ විටක් විතර බත් පිසූ ය'යි කිවු ය. රජ්ජුරුවෝ ද ඒ අසා 'ගැඩඹ නම් අඹගස ඒ දවස් ම ඇති ව ලා පල ගත්තා සේ ධර්ම සෙනෙවි ස්වාමීන්ට දුන් දනෙහි විපාක අද ම පෙනුණු නියා වේ දැ'යි සමාධි ව අප කළ මනා කිම් දැ'යි විචාළෝ ය. ගැල් දහස් ගණන් යවා ලා රත් රන් ගෙන්වා වදාළ මැනැවැ'යි කිවු ය. රජ්ජුරුවෝ ද ගැල් යැවූ ය. රාජ නියොගයෙන් ගියවුන් රජ්ජුරුවන් සන්තක ය යි කියා ලා ඇර ගන්ට වන් කලට ගත් ගත් දෙයෙක් ඇත් නම් මැටි වෙයි. තුබූ තුබූ දෙය රත්රන. රාජ පුරුෂයෝ ද ගොසින් එ පවත් රජ්ජුරුවන්ට කීහ. රජ්ජුරුවෝ ද ''තෙපි කුමක් කියා ලා ඇර-ගන්ට වනු දැ'යි විචාරා 'මුඹ වහන්සේ සන්තක ය'යි කියා ලා ගතුමහ'යි කී කල්හි 'අප ත් ධර්ම සෙනෙවි සාමීන්ට අද දී ලූ දනෙක් ඇත් ද? අපි ඒ රත්රනට කවුරුමෝ ද? යව, ගොසින් 'පුණ්ණ නාම දූගියාණන් සන්තක ය'යි කියා ලා ගනුව''යි විධාන කළහ. උයි ත් එ ලෙස ම කළහ. ගත් ගත් දෙය ම රත් රන් වි ය. ඒ රත් රන් ගෙන්වා සෙණ්ඩුලුවෙහි රැස් කළහ. වඩුවෙන් අසූ රියනක් විතර ගොඩ වී ය.

රජ්ජුරුවෝ නුවර වැස්සන් රැස්කරවා ලා 'මේ නුවර මෙ තෙක් වස්තු ඇත්තේ කාගේ දැ'යි විචාළෝ ය. සෙස්සවුන්ට මෙ තෙක් වස්තු ඇති වන්නේ රජ ව සිටි මුඹ වහන්සේට ඇත් නම් වේ දැ යි කිවු ය. රජ්ජුරුවෝ ඒ අසා මෙ තෙක් වස්තු ඇති තැනැත්ත-වුන්ට සිටු තනතුරු නිසි වේ දැ'යි බොහෝ සම්පත් දී සිටු සේසත් නංවා සිටු තනතුරු දී බහුධන සිටාණෝ ය යි නමුත් දුන්හ. නම් දී ලා පරණ සිටාණ කෙණකුන්ගේ ගෙ බිමක් කැළෑ වැඩී තුබුවා පෑ ලා 'තෙල වල් කප්පා හරවා පියා හිඳිනට ගෙයක් කරවා ගනුව'යි විධාන කළහ. උයි ත් එතැන ගෙ බිම් කරවන්නෝ

Non-Commercial Distribution

බොහෝ නිධාන සැළවලු ත් දුක සම්පත් ලබන ගමනේ පරිවාර සම්පතු ත් බොහෝ කොට ලත් බැවින් කීප දවසක් විතරින් ම ගෙවල් කරා ගෙණ ගෙවදනා මඟුලු ත් සිටු සේස ත් මඟුලු ත් එක් ව ම කරන්නාහු සතියක් මුළුල්ලෙහි බුදු පාමොක් සඟනට මහ දන් දුන්හ. බුදුහු ද උන්ට බණ වදළ සේක. බණ වදළ අන්තයෙහි බහුධන සිටාණෝ ද උන්ගේ ඇඹේණියෝ ද ගුණෙන් අනුත්තර වූ උත්තරා නම් දියණියෝ දූ'යි තුන් පක්ෂයෙහි ඇත්තෝ ලොවුතුරා සැපතු ත් ලබන්නෝ සෝවාන් වූහ.

පසු ව කලක දී රජගහා නුවර සුමන සිටාණෝ බහුධන සිටාණන්ගේ දූ වූ උත්තරාවන් තමන්ගේ පුතණු කෙණකුන්ට සරණ විචාළහ. බහුධන සිටාණෝ ද සුමන සිටාණන්ගේ පුතණු වන් සැදැ නැති හෙයින් හා තමන්ගේ දියණියන් මාර්ග ගත වූ අචල ශ්‍රද්ධාවෙහි පිහිටි හෙයින් උන්ට සරණ දෙන්ට මැළි වූහ. සුමන සිටාණෝ ද 'එ සේ නො කළ මැනව. මෙ තෙක් කල් ජීවත් වූවා ත් අප ම නිසා බැවින් නෑ සම්බන්ධ ය නිසා අපගේ පුතණුවන්ට සරණ පාවා දුන මැනවැ යි කිවු ය. උන් එ සේ කීව ත් බහුධන සිටාණෝ දුවණියන්ට එන දවස වන මුසුප්පු ව නිසා මැළි වූ කල්හි බොහෝ පැරැත්තයෝ ද බහුධන සිටාණන් කරා ගොසින් සරණ පාවා දිය යුතු ම ය යි බොහෝ කාරණ කියා පැරැත්ත කීහ. බහුධන සිටාණෝ ද බොහෝ දෙනාට පටහැණි වීම යුක්ත නො වන්නේ වේ දූ යි උන් හැම දෙනාගේ පැරැත්ත ගිවිස, ඇසළ මස මැදි පොහෝ දවස් දුවණියන් සරණ පාවා දුන්හ.

උයි ත් සරණ ගිය තැන් පටන් සැදැ නැත්තවුන් කරා පැමිණ දනක් දී ගන්ට වේව යි බණක් අසා ගන්ට වේව යි සෙස්ස තබා විහාරයට යන ගමනක් පමණකු ත් කළ නුහුණු වූ ය. තමන්ගේ ගෙට එළඹෙන වහන්දැ නැති බැවින් වහන්දැගේ දක්ම ත් නැත. මෙ ලෙසින් දෙමස් දෙ පෝයක් විතර ගිය කලට ළඟ සිටියවුන් අතින් 'වසින් තව කෙ තෙක් දවස් විතර ඇත් දූ'යි විචාළහ. 'දෙ පෝයක් විතර තුබුයේ ය'යි කී කල්හි පියාණන්ට කියා යවන්නෝ 'සරණ පිට ලා ලා මෙ සේ වූ සිර ගෙයක ලූයේ හැයි ද? මෙ ලෙස කරණ කල දූ කම් කුම් වුව ත් විකිණ හැර ගන්නවුන් මිථ්‍යාදෘෂ්ටික ය යි නියම නැති හෙයින් සතක් ගසා පියා විකිණීම ම යහපත. මේ සැදැ නැති කුලයට සරණ අවුදින් පිණක් පිරෙන්ට නැතැ'යි කියා යවු ය.

Non-Commercial Distribution

බහු ධන සිටාණෝ ද බොහෝ මුසුප්පු ඇති ව මසුරන් පස-ළොස් දහසක් යවා ලා 'පුත, හෙම්බා මෙ නුවර සිරිමා නම් වෙශ්‍යා දුවක් ඇත. ඕ තොමෝ දවස් පතා පහෙණය පිණිස මසු දහසක් හැර ගන්නී ය. තෙළ පසළොස් දහස ඕබ යවා ලා ඇ ගෙන්වා ගෙණ මේ පසළොස් දවසට සිටු පුත්‍රයාණන්ට ඇ පාවා දී තමන් පින් කළ මැනැවැ'යි කීහ. උත්තරාවෝ ද සිරිමාවන් ගෙන්වා ගෙන 'යෙහෙළි, මෙ පසළොස් දහසක් විතර මසුරන් හැර ගෙන පසළොස් දවසක් අපගේ සිටු පුත්‍රයාණන්ට පාදපරිවාරිකා වව'යි කීවු ය. උයි ත් රන් දැක යහපතැ'යි ගිවිස්සෝ ය. උත්තරාවෝ ද උන් කැඳවා ගෙන සිටු පුත්‍රයාණන් ළඟට ගොසින් 'ස්වාමීනි, මේ දෙ පෝයෙහි මූ තුමූ මුඹට පාදපරිවාරිකා වෙති. මම මේ දෙ පෝ-යෙහි නුඹුන් සරියේ දනු ත් දෙනු කැමැත්තෙමි. නො ඇසූ සරියේ බණ ත් අසනු කැමැත්තෙමි' කීවු ය. සිටු පුත්‍රයාණෝ ද රූපත් ව පෙනෙන ත් සිරිමාවන් දැක උන් කෙරෙහි පිළිබඳ සිත් ඇති ව යහපතැ'යි ගිවිස්සහ.

උත්තරාවෝ ද බුදුපාමොක් වහන්දෑට ආරාධනා කරවා ගෙන්වා ගෙන 'ස්වාමීනි, වසින් තුබූ මෙ දෙ පෝයෙහි අතික් තැනකට නො වැඩ අපගේ මාළිගාවට සිහා වඩනේ 'යහපතැ'යි ආරාධනා කොට ගෙණ 'මෙ වක් පටන් වස් පවරන දවස් දක්වා බුදුන්ට උපස්ථාන කරන්ට ත් බණ අසන්ට ත් නිල ව ගතිමි' සතුටු සිත් ඇති ව මුළු තැන් ගෙයි දන් විධාන කොට ඇවිදිති.

සිටු පුත්‍රයාණෝ ද වස් පවරන්නාට පෙරාතු දවස් 'නුවණ නැති තැනැත්තී කුමක් කොට ඇවිදී දෝ'යි සී මැදුරු කවුළුවෙන් මුළු තැන්ගේ දිසාව බලා දැළි වැකුණු පිළි ඇති ව අළුවෙනු ත් තැවරී ඉතා විරූපත් ලෙසට පැමිණ පිසමන් විධාන කොට ඇවිදිනවුන් දැක 'අනේ මෝ තොමෝ ඉතා පින් මඳ එකෙක. මෙ වැනි ශ්‍රී සම්-පත් උසුලා ගත නො හී මුඬු මහණුන්ට බත් දීමත් කටයුත්තෙකැ'යි සිතා සැලි සැපී ඇවිද්ද'යි සිනාවක් සී ගෙන ඉවත් වූහ. උන් ඉවත් වූ කලට ළඟ සිටි සිරිමාවෝ 'මුන් සිනා සී පූයේ කුමක් දැක දෝ හෝ'යි එ ම කවුළු දෙරින් බලන තැනැත්තෝ මුළු තැන් ගෙයි සිටි උත්තරාවන් දැක 'සිනා සුණුයේ මුන් දැක ය. ඒකාන්තයෙන් ම මුන් හා පුරුදු කමක් ඇත මැනවැ'යි සිතූහ. ඌ තුමූ පිටතින් අවුත් ඒ ගෙයි රඳා සම්පත් වුන් පමණකට සම්පත් නම් ළඟු මිනිසුන් උපුල්වා පියන දෙයක් හෙයින් තමන් ඒ සම්පතට ඇතුළත් නියා-වක් සිතා ගෙණ උත්තරාවන් පිට ත් කෙණකුනැ'යි සිතූහ.

Non-Commercial Distribution

එ සේ සිතා 'උන්ට දුකක් උපදවා පියමි' මාළිගාවෙන් බැස මුළු තැන් ගෙට ගොසින් උත්තරාවන් කැවුම් පිසන ඇතිලියකින් කකිය කකියා සිටි තෙලක් අතින් උකා ගන්ට අත දන හෙයින් සැන්දකින් උකා ගෙණ උත්තරාවන් කරා නික්මුණා ය. උත්තරාවෝ ද උන් එන්නවුන් දැක මාගේ යෙහෙළි ය මට කළ උපකාර ය මූර්තිමත් දෙයක් වී නම් ලා උන්ට සරසින් සක්වළ ගබ ත් හක ය. උසින් බඹ ලොව දක්වා මේ අතුර ත් මිටි ය. මාගේ යෙහෙළි ය මට කළ උපකාර ය ඉතා බෙහෙව. මම වැළි ත් මුන් නිසා මේ තුදුස් දවසක් මාගේ අභිප්‍රාය ලෙසින් පින් කොට ගතිමි. මෙ සේවූ උපකාරී තැනැත්තන් කෙරෙහි මාගේ ක්‍රොධයෙක් ඇත්නම් ඒ ක්‍රොධ නමැති ගින්නෙහු ත් හුණු ව මේ තෙල් මා දවා ව යි. ඉදින් ක්‍රොධයෙක් නැති ව මෛත්‍රියෙක් ඇත් නම් මෛත්‍රී නමැති සිහිල් පැන් වැද හුණු ගුණ ය නිවී මාගේ ශරීරයෙහි මළ සම් පමණකට ත් හානියක් නො වේ ව'යි ගිනි මන්ත්‍රයක් සලකන පරිද්දෙන් සිරිමාවන් කෙරෙහි මෙත් කළහ. උන්ගේ මෛත්‍රියෙහි ආනුභාවයෙන් හිස වත් කළ උණු තෙල් ඇල් පැන් පරිද්දෙන් සිහිල් විය.

සිරිමාවෝ ද උන්ගේ ගුණානුභාවයෙන් වූ නියාව ම නො දැන 'මේ තෙල් සිහිල් නියා ය'යි නැවත පලා ගොසින් කකියන තෙලින් තෙල් සැන්දක් පුරා ගෙණ තව ත් උත්තරාවන් කරා එති. එ සේ එන්නවුන් උත්තරාවන්ගේ මිඩියෝ දැක 'තො චිටියළ තැනැත්තිය, තෝ තමා අපගේ ස්වාමි දියණියන් ඉස උණු තෙල් වත් කරන්නා තබා ලඟට අවුත් වැද පියන්ට තරම් වී ද? නී අපට වැඩී ගියේ කො තැනෙක් දැ'යි බසින් ම හය ගන්වමින් ඇතින් මැතින් අවුත් රැස් ව දඬුපත් සෙවීම කල් යන හෙයින් අතිනු ත් පයිනු ත් තළා බිම හෙලා ගත්හ. උත්තරාවෝ ද දුර සිට අඩ ගා කියා මැරීම් තැළීම් නවතා ගත නො හී ලඟට අවුත් සිට කෙල්ලන් මුළුල්ල නවතා ලා 'ඇයි සිරිමාවෙනි, නිකෘෂ්ට වූ වෙශ්‍යාකම් කොට ඇවිදිනා තොපට පසළොස් දවසකට වුව ත් මේ තරමක් මා කොට ලූ කල එ සේ කොට ලූ මට තෙල බන්දක් කළානැ'යි කියා හිපල් ගෙඩියක් නො ව අතින් පයින් ලත් ගෙඩි බැවින් පැන් හුණු කරවා නාවා පියා බෙහෙත් තෙල් ඇඟ මැඩවූහ.

සිරිමාවෝ ද එ වේලෙහි කෙල්ලන් කොට ලූ දෙයින් තමන් පිටතින් අවුත් රඳා හුන් නියාව දැන 'අනේ මා කළ දෑ නපුර, මුන්ගේ සමණන් දැක සිනා සී පී හෙයින් ඉදින් උඹ තුමූ මා දැක සිනාවක් සී පූ නම් මුන් මා හිස වත් කළ මනා තෙල් මම මුන් ඉස වත් කළෙමි. මුන්ගේ ම කෙල්ලන් අවුත් නැවති හෙයින් මුත්

Non-Commercial Distribution

ඇඟිලි වල තෙල් නිමියෝ ත් මුත් හුණු තෙල් මුන් ඉස වත් කිරීමෙහි නිමයෙක් ඇත් ද? එතකුදු වුව ත් කෙල්ලන්ට විධාන කොට මට ගහට කැර වුව මනා තැන කෙල්ලන් කරණ ගහට ත් නවතා ලා මට කැරවුව මනා සාද ම කැරවූ ය. ඉදින් මා කළ වරදට මුන් ක්‍ෂමා නො කරවීම නම් මාගේ ඉස සත් කඩක් ව පැළී ගිය නම් නපුරැ'යි වැද ගෙණ වැද හෙව 'ස්වාමීනි, ක්‍ෂමා කළ මැනවැ'යි කිවූ ය. උත්තරාවෝ 'මම තොප සේ නො වෙමි. මගේ පියාණන් වහන්සේ ත් ඇත. දෙ මවු-පියන් ඇති ව ඇති වූ සැටි ය මා කොට ලූ තරමින් ම දත්තාව ද? ඒ මාගේ පියාණන් වහන්සේ ක්‍ෂමා කරවත සේක් වී නම් ක්‍ෂමා කෙරෙමි' කිවූ ය. ඒ අසා සිරිමාවෝ වන්නාට ය. මුඹගේ පියාණන් වහන්සේ ත් ඇතුළු ව දෙ මවු-පියනු ත් ක්‍ෂමා කරවමි' කිවූ ය. පූර්ණ සිටාණෝ නම් සසරට පියාණෝ ය. උන් ක්‍ෂමා කරවීමෙන් ප්‍රයෝජන නැත. ආරිය ජාතියෙහි උපදවා ලූ පියාණන් වහන්සේ ක්‍ෂමා කැර වූ නම් ක්‍ෂමා කෙරෙමි' කියා උත්තරාවෝ කිවූ ය.

ඒ අසා සිරිමාවෝ පූර්ණ සිටාණන්, මුඹගේ ම ද පියාණන් නියා ව දනිමි. ආර්‍ය්‍ය ජාති ය තමා නො දන්නා බැවින් ආර්‍ය්‍ය ජාතියෙහි ඉපැද වූ පියාණන් නො දනිමි. උඹ කවුරු දැ'යි විචාළහ. නො දනු නම් ආර්‍ය්‍ය ජාතියෙහි ඉපැද වූ සේක් තිලෝගුරු බුදුහු ය යි කීහ. අප සැදෑවක් ඇති ව විහාරයට එළඹීමක් නැති හෙයින් බුද්ධවල්ලභ කම නැතිවන්නා ඔබ ක්‍ෂමා කරවන්නේ කෙසේ දැ'යි කිවූ ය. එ සේ වී නම් පිළිවන. බුදුහු සෙට දවස් සහ පිරිවරින් මොබ වඩනා සේක. තොපි සැහෙන ලෙස දනක් සරහා ගෙණ මේ අප්පගේ මාළිගාවට ම අවුදින් ක්‍ෂමා කරවා ගනුව යි කිවූ ය. උඹ ත් යහපතැ යි ගිවිස තමන්ගේ ගෙට ගොසින් තමනු ත් ඉතා දුක්පත් නො වන හෙයින් පිරිවර ගැනුන් පන් සියයකට විධාන කොට අති පවිත්‍ර කොට දනක් ඉදිකරවා ලා දෙ වන දවස් දන් ගෙන්වා ගෙණ උත්තරාවන්ගේ ගෙට ගොසින් වළඳවා ගත නො හී සිටියෝ ය. උත්තරාවෝ ඒ සියල්ල ම තමන් අතට හැර ගෙණ බුදු පාමොක් සඞ්ඝයා වහන්සේ වැළඳවූහ.

සිරිමාවෝ ද වළඳවා අනන්තයෙහි සහ පිරිවරින් බුදුන් වැඳ ගෙන හොත්තාහ. බුදුහු ද ක්‍ෂමා කරවන්ට නියා ව දැන තොප වරද කවරේ දැ'යි විචාළ සේක. ඊයේ දවස තමන් තෙල් සැන්දෑකා ගෙන උත්තරාවන් ඉස වත් කරන්ට ගිය තැන් පටන් පැවති තමන්ගේ අක්‍ෂමාව ත් උත්තරාවන් ඒ සියල්ල ම සහන ය කළ

Non-Commercial Distribution

නියාව ත් බුදුන්ට දන්වා ලා 'ස්වාමීනි, මම මුන්ගේ ගුණ සලකා වැද ගෙණ වැද හෙව ක්‍ෂමා කරන්ට කීමි. මුඹ වහන්සේ ක්‍ෂමා කළො ත් ක්‍ෂමා කෙරෙමි' කිවු ය. එ සේ හෙයින් මුඹ වහන්සේ ක්‍ෂමා කරවනු නිසා වැද ගෙණ වැද හොත් නියා ය' යි කිවු ය. බුදුහු ඒ අසා' 'සැබෑ ද, උත්තරාවෙනි' වදරා 'සැබව, ස්වාමීනි, කී කල්හි 'තොප හිස උණු තෙල් වත් කරන්ට ගිය ගමනේ තොප සිතුයේ කිම් දැ'යි විචාළ සේක. උත්තරාවෝ ද'ස්වාමීනි, මුන් කළ උපකාර ය එක් තැනක ලිය හැකි දෙයක් වී නම් සක් වළ ඉතා හක පටු ය. බඹ ලොව ඉතා මිටි ය. මුන්ගේ උපකාර මහත. මුන් නිසා මම මේ දවස් ගණන පින් කම ම හැසිර ගතිමි. ඉදින් මම මුන් කෙරෙහි ස්වල්ප මාත්‍ර වූ ත් මුසුප්පුයෙක් ඇත් නම් මේ තෙල් මා දවා පියව යි. එ සේ මුසුප්පුවෙක් නැත් නම් මේ තෙල් මා නො දවාව' යි සිතා ගෙණ මුන් කෙරෙහි මෙත් පැතිර වීමි' කීහ.

බුදුහු ද උන්ගේ බසට තුන් විටක් සාධු කාර දෙවා වදරා බණ වදරන සේක් 'හෙම්බා උත්තරාවනි, යම් කෙණෙක් ක්‍රොධීහු වී නම් ගිනි පිට ගිනි ලන්නා සේ තමා උන්ට ක්‍රොධ කිරීමෙන් සන් නො හිඳෙයි. එ හෙයින් තමා සහන ය කළ කලට උනු ත් නැවත ගන්නා හෙයින් පැනින් ගිනි නිවන්නා සේ තමා ගේ සහනයෙන් ක්‍රොධීන් ජය ගත යුතු ය. නැවත යම් කෙණෙක් යාප ත් නො වෙත් නම් තමා උන්ට යාපත් වීමෙන් ජය ගත යුතු ය. ජය ගැන්ම නම් තමා සේ ම යහපත් කරවා ගැන්ම ය. යම් කෙණෙක් තද මසුරු වූ නම් තමා සේ ම උනු ත් තැගි කරවා ගත යුතු ය. යම් කෙණෙක් බොරු බොහෝ කොට කිය ත් නම් තමා සැබෑ කියා ජය ගත යුතු ය. තමා බලා උනු ත් සැබෑ කියන ලෙසට කරවා ගත යුතු ය' යි වදළ සේක. දෙශනා කෙළවර සිරිමාවෝ පන් සියයක් ගැනුන් හා සමග උත්තරාවන් සත් සමවාය නසා සෝවාන් වූහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් ද්වෙෂයෙහි ආදීනව සලකා ද්වෙෂ ය හැර මෛත්‍රියෙහි එකොළොසක් පමණ අනුසස් ලබනු කැමැත හොත් සියල්ලන් කෙරෙහි මෙත් සිත් ඇති විය යුතු.

## 188. මුගලන් මහ තෙරුන් වහන්සේ ප්‍රශ්න විචාල වස්තුව

තව ද බැරෑරුම් නො වන යන් තම් කුසලයකිනු ත් දෙව් ලොව උපදනා නියාව හඟවන්ට මුගලන් මහ තෙරුන් වහන්සේ ප්‍රශ්න විචාළ වස්තුව කියමු.

Non-Commercial Distribution

කෙ සේ ද යත්—

එක් සමයෙක මුගලන් මහ තෙරුන් වහන්සේ දෙව් ලොවට වැඩ මහෙශාඛ්‍ය දෙව් දුවකගේ විමනක් කරා වැඩ උන් තමන් වහන්සේ ලඟට අවු ත් වැඳ ලා සිටියවුන්ට 'දේවතා දුවණියෙනි, තොපගේ සම්පත මහත. මේ සම්පත නිකම් හිඳ ලද හැක්කෙක් නො වෙයි. පිණක් කළො ත් මුත් ය. කෙ සේ වූ පිණක් කොට මේ සම්පත ලදු දැ'යි විචාළ සේක. දේවතා දුවණියෝ ද තමන් කළ කුසල ය ඉතා ලඝු ව තිබෙන හෙයින් කියන්ට ලජ්ජා ඇති ව 'ස්වාමීනි, ඒ විචාරා වදරන්ට නො කැමැත්තේ ය' යි කිවු ය. එ සේ කියන්ට මැලි වුව ත් මහ තෙරුන් වහන්සේ අර්ථී ව විචාරන හෙයින් නො කීම ත් යුක්ත නො වන්නා 'ස්වාමීනි, මිනිස් ලොව සිටිනා ගමනේ එ බඳු විභවයක් නැති හෙයින් දී ලූ දනකු ත් නැත. කොට ගත් චෛත්‍ය පූජාදියකු ත් නැත. අසා ගත් බණකු ත් නැත. අදහස් ලදෝතින් පිළිවන් බැවින් බොරුවක් තුඩ නො වකා සැබෑ පමණක් කීම්හ. එ පමණකින් දෙව් ලොව ඉපැද දෙව් සැප ත් ලදුම්හ' යි කිවු ය.

මහ තෙරුන් වහන්සේ ද එ පමණකින් නැවත නො පියා තව තව ත් දෙවඟනන්ගේ විමන් දෙර කඩවලට වැඩ අවුත් වැඳ ලා සිටියවුන් අතින් කළ කළ පින් කම් විචාරා කියා ලූ කලට ඉතා ලඝු හෙයින් කියන්ට මැලි ව සිටි කල්හි මිනිස් ලොවට වැඩ පියා සතුන් පින් කම යොදනු නිසා තර ව විචාළ සේක. විචාරන ලද්දවුන් ගෙන් එක් දේවතා දුවක් ''ස්වාමීනි, මම එක් ජාතියෙක අනුන්ට මිඩී වීමි. ස්වාමි දරු ව සිටියෝ දුටු විට මූණ ඔවති. දෙඩති, බෙණෙති. මම ඒ ගහට විදත්, හෙම්බා, ස්වාමිදරුව, සිටියෝ නම් කුමකු ත් කරන්නා ලද්දෝ ය. ඉසුරු ව සිටිනා බැවින් උං කුමක් කෙරෙ ත් නමු ත් තමා අනුන්ට අයිති වූ පසු තමාට වුවමනා නම් සහන ය ය. ඒ මෙ ලොව සාධා දී ලිය නො හී නමුත් පර ලොව සාධා දී ලයි. උන් කරණ කට යුත්තෙන් පර ලොව සාධා දී ලිය හෙන දෙයෙක් නැත. මෙ ලොවට ත් වඩා වුව මනා පර ලොව ය'යි සිතා උන් කරණ ගහට ඉවසා ක්ෂමාව කෙළෙමි. එ පමණකින් මේ සා මහත් දිව සැප ලදිමි.'' කිවු ය.

අනික් දේවතා දුවණි කෙණෙක් උක් සේනක් බලා හුන් ගමනේ උක් දණ්ඩක් පමණ පිළිගන්වා ලා දිව සැප ත් ලත් නියාව කිවු ය. එක් දේවතා දුවණි කෙණෙක් තිඹිරි පකක් පිළි ගන්වා ලා දිව සැප ත් ලත් නියාව කිවු ය. අනික් දේවතා දුවණි

Non-Commercial Distribution

කෙණෙක් කැකිරි පකක් පිළිගන්වා ලා දිව සැප ත් ලත් නියාව කිවු ය. අනික් දේවතා දූවණි කෙණෙක් බොරළු දමන පකක් පිළිගන්වා ලා දිව සැපත් ලත් නියාව කිවු ය. එක් දේවතා දූවණි කෙණෙක් මුල පලා මිටක් පිළිගන්වා ලා දිව සැපතට මුල් වූ නියාව කිවු ය. අනික් දේවතා දූවණි කෙණෙක් කොසඹ අත්තක් පමණ පිළිගන්වා ලා දිව සම්පත් ලත් නියාව කිවු ය.

මහ තෙරුන් වහන්සේ උන් හැම දෙනා කළ පින් කම් අසා මිනිස් ලොවට පහළ කරණු පිණිස බුදුන් කරා වැඩ 'ස්වාමීනි, අනික් පින් කමක් නැති ව සැබෑ කී පමණකින් හා අනුන් කෙරෙහි ක්‍රොධ නො කිරීම් පමණකින් හා තිඹිරි–කැකිරි ආදි ය දන් දුන් පමණකින් දිව සැප ත් ලද හැකි ද? මැළි ව නො කරණ හෙයින් මුත් පින් කම් නම් නිරායාශ නියා වේ දැ'යි විචාළ සේක. 'හැයි, මෞද්ගල්‍යායනයෙනි, කුමක් නිසා මා අතින් විචාරවූ ද? මෙ පමණකින් දිව සැප ත් සම්භ වන නියාව දේවතා දූ ම තොපට කීවෝ වේ ද? උන් උන් ලත් සම්පතු ත් දුටුවා දැ'යි වදාළ සේක. මා ම ඇසුව'යි දුටුව'යි පමණ කිම්ද? මකුළුවන් කෑ කෑ දෙයක් හු වන්නා සේ සුගන්ධ හස්තීන් අනුභව කළ දෙය සුවඳ වන්නා සේ මුඹ වහන්සේ වදාළ දෙයක් ධර්ම වන හෙයින් මේ අපෝත්පත්ති කොට කුදු ගොත් සඟිය විමන් වත පහළ කරණු නිසා විචාළෙමී' කී සේක.

බුදුහු ත් යම් කෙණෙක් සත්‍යයෙහි පිහිටා සැබෑ කිවු නම් කවර තරම් අපරාධයක් කළ කෙණකුන්ට වත් ඛන්තිවාද ජාත කාදියෙහි බොධි සත්ව චරිත ය සේ ක්‍රොධ නො කෙරෙත් නම්, තව ද යම් කෙණෙක් සිල්වතුන් ගම් ගෙවලට ගොසින් ඉල්වීමක් නැත ත් සල්ලෙඛ ප්‍රතිපත්ති ලෙස සිහා සිටීම ම 'උද්දිස්ස අරියා තිට්ඨන්ති එසා අරියාන 'යාචනා' යනු හෙයින් ඉල්වීමක් හා සරි හෙයින් එ සේ ඉල්වූ කල තමන්ට සෑහෙන පමණක් කුඩු මිටක් වැඩියක් වුව ත් පලා සැන්දක් වුව ත් කම් පල අදහා දෙත් ද, මෙ තුනින් වුව ත් දෙකකින් වුව ත් එකකින් වුව ත් දෙව් ලොවට යෙති'යි වදාළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන්දුටහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් මේ පින් කම් තුනක් වුව ත් මෙයින් සිද්ධ වන ලොවී සැප ත් තිබිය දී ලොවුතුරා සැප ත් නව–යක් බැවින් වැඩියුරු ව සිතා බැඳැරුම් පින් කම් බැරි වුව ත් මෙ පමණක ත් හැසිර ලොවී ලොවුතුරා සැප ත් සිද්ධ කට යුතු.

Non-Commercial Distribution

# 189. සාකෙත වත

තව ද සීලාදී ගුණෙන් යුත් උත්තමයන් ගේ උත්තම ගුණ හඟවනු නිසා **සාකෙත වත** දක්වමු.

කෙ සේ ද යත්—

රත් නෙළුම් වන මධ්‍යයෙක ගමන් ගත් රුවක් මෙන් සඟ ගණ පිරිවරා බුදු රජුන් වහන්සේ සාකෙත නුවරට සිඟා වඩනා කල්හි සාකෙත නුවර වසන එක් මහලු බමුණානෙ කෙණෙක් නුවරින් නික්මුණු තැනැත්තෝ වාසල් බඩ දී දශබල-ධාරී වූ බුදු රජුන් වහන්සේ දැක පය ඉස තබා ගෙණ වැද හෙව වළලු කර තරයේ අල්වා ගෙණ 'පුතඩ, දරුවන් නම් මහලු ව ගිය දෙ මවු පියන් රැක්ක මනා වේද? මෙ තෙක් කල් මුළුල්ලෙහි රක්නා තබා අවුත් විචාරන පමණකු ත් නො වී ය. අපි වන්නා දුටුමෝ වෙ ද? මැණියන්දෑ විචාරනට අව මැනැවැ'යි බුදුන් කැඳවා ගෙණ තමන්ගේ ගෙට ගියහ. බුදුහු ත් වැඩ ලා පැන වූ හස්නෙහි වැඩ හුන් සේක. වහන්දෑ ත් වැඩ හුන් සේක.

බැමිණිතියෝ ත් අවුත් බුදුන්ට බැස හෙව වැද ලා බමුණා නන් කී ලෙස ම කියා දූ දරුවනු ත් කැඳවා ලා 'තොපගේ බෑණන් වහන්සේ වඳුව'යි කියා ලා වැන්ද වූ ය. බුදුන් දුටු වේලේ පටන් බොහෝ සතුටු ඇති බුදු පාමොක් වහන්දෑ වළඳවා ලා 'ස්වාමීනි, නිරන්තරයෙන් ම ඔබ්බකට සිඟා නො ගොස් මුඹ වහන්සේගේ මහලු දෙමවු පියන්ට ම සඞ්ග්‍රහ කළ මැනැවැ'යි කීහ. සර්වඥ වරයෝ නම් බොහෝ දෙනාට පිරෙන පින් තබා පියා එක තැන කින් ම දන් නො වළඳති' කී කල්හි 'එ සේ වී නම්, ස්වාමීනි, යම් කෙණෙක් මුඹ වහන්සේට ආරාධනාවට අවු නම් උන් අප කරා එවුව මැනැවැ'යි කීහ.

බුදුහු ත් එ වක් පටන් පවරන්ට ආ කෙණෙක් ඇත් නම් 'බමුණානන්ට කියව'යි කියා ලා ඔබ යවන සේක. උයි ත් ගොසින් සෙට යට ආරාධනා අපගෙනැ'යි බමුණානන්ට කියති. බමුණානෝ දෙ වන දවස් තමන් ගෙන් බත් මාළු ගෙන්වා ගෙණ බුදුන් වැඩ හුන් තැනට යෙති. ඔබබෙකින් ආරාධනාවෙක් නැත් නම් බුදුහු බමුණානන්ගේ ගෙයි දී ම වළඳන සේක. දෙ මවු පිය කම් කියා ගත් බමුණානන් හා බැමිණියන් හා දෙන්න කවුරුන් දන් දෙත ත් නිරන්තරයෙන් ම තමන් සන්තක දෙය බුදුන්ට දන් දෙන්නාහු බණ ත් අසන්නාහු අනගැමි වූහ.

Non-Commercial Distribution

ධම් සෙණෙයි රැස් ව වැඩහුන්වහන්දෑ ද 'ඇවැත්නි, බමුණානෝ සුදෙවුන් මහ රජාණන් බුදුන්ට පිය නියාව ත් මහාමායා බිසොවුන් බුදුන්ට මවු නියාව ත් දනිති. දන දන ම තුමූ ත් බැමිණිනියෝ ත් බුදුන් තමන්ගේ පුතණුවන් වහන්සේ ය'යි කියති. බුදුහු ත් ඒ ඉවසන සේක. කාරණ කිම් දෝ හෝ'යි කථාව ඉපැද වූ සේක. බුදුහු ත් ඒ කථාව අසා මහණෙනි, උභ දෙන්න ම තමන්ගේ දරුවන්ට ම දරුවෝ ය යි කියති' වදරා ඉකුත් වත් දක්වන සේක් 'මහණෙනි, මේ බමුණානෝ පිට පිට පන් සියක් ජාතියෙහි මට ම ද පිය වූහ. එ සේ ම පිට පිට හෙළා පන්සියක් ජාතියෙහි කුඩා පිය වූහ. එ සේ ම පිට පිට හෙළා පන්සියයක් ජාතියෙහි මාලු පිය වූහ. බැමිණිනියෝ ද පිට පිට හෙළා පන්සියක් ජාතියෙහි වැදූ මවු වූ ය. අනික් පන් සියයක් ජාතියෙහි කුඩා මවු වූ ය. තව ත් පිට පිට හෙළා පන් සියයක් ජාතියෙහි මැලි මවු වූ ය. මෙ සේ මම යෙළ දසක් ජාතියෙහි බමුණානන් අත වැඩියෙමි. යෙළ දසක් ජාතියෙහි බැමිණිනියන් අත වැඩියෙමි' මෙ ලෙසින් තුන් දහසක් ජාතියෙහි පිට පිට හෙළා තමන් වහන්සේ උන් දෙන්නාට පත් වූ නියාව වදරා ලා-

''යස්මිං මනො නිවිසති — චිත්තඤ්චාපි පසීදති,
අදිට්ඨපුබ්බකෙ පොසෙ — කාමං තස්මිං 'පි විස්සසෙ''

යනු හෙයින් ආදී නුදුට ත් දක මා කෙරෙහි ප්‍රෙම ය බහුල ව පැවැත්තැ'යි වදරා බුදුහු ඒ කුල ය නිසා විසූ සේක.

බමුණු-බැමිණි දෙන්න ත් රහත් ව පියා ආයු ශක්ති ය ත් නිමි හෙයින් පිරිනිවියහ. ඒ දෙන්න ම මහ පෙරහරින් එක කුළුගෙයකට නංවා ආදහන භූමියට ගෙන යෙති. බුදුහු ත් පන්සියයක් දෙනා වහන්සේ පිරිවරා ආදහන භූමියට වැඩි සේක. බුදුන්ට දෙ මවු-පිය කම ප්‍රසිද්ධ හෙයින් බොහෝ දෙන ත් නික්මුණාහ. බුදුහු ත් ආදහන බිම ලඟ එක් ශාලාවකට වැද ලා වැඩ සිටි සේක. මිනිස්සුත් බුදුන් වැද ලා එකත් පස් ව සිට 'ස්වාමීනි, දෙ මවු-පියන් මළ යි සිතා මුසුප්පු වන්ට නො කැමැත්තේ ය' යනාදීන් සාද සාමීචි කෙරෙති. බුදුහු ත් 'එ සේ නො කියව'යි නො වදරා පෂීත්ගේ අදහස් බලා ඒ ඇසිල්ලට නිසි බණ වදරන සේක්—

''අප්පං වත ජීවිතං ඉදං – ඔරං වස්ස සතාපි මීයති,
යො චෙපි අතිච්ච ජීවති – අථ ඛො සො ජරායපි මීයති.

Non-Commercial Distribution

යනු හෙයින් 'මිනිස්ලොව ජීවත්වීම නම් ලඝු ය. හවුරුදු සියයට ඇත ත් මියෙති. වඩා වුව ත් ජරාවට පැමිණ පියා මියෙත් ම ය' යි වදාළ සේක. දෙශනා කෙළවර සූවාසූ දහසක් දෙන නිවන් දුටහ.

වහන්දෑ ද බමුණානන් හා බැමිණියන් පිරිනිවි නියාව නො දන 'ස්වාමීනි, උන් උපන්නේ කොයි දැ'යි විචාළ සේක. බුදුහු මහණෙනි, භවක්‍ෂ ය කළවුන්ගේ ත් උත්පත්ති ඇත් දැ'යි විචාරා බණ වදරන සේක් 'යම් කෙණෙක් සම්‍යක් ප්‍රතිපදවෙහි පිහිටා පර්‍ය්‍යාප්තියෙහි තර වූ අභියොගය ය ඇති බැවින් ප්‍රතිවෙධයට ත් යත්න කොට සමථාභියොග ය කොට සමථ ය උපදවා ගෙණ තත් පාදක වූ මාර්‍ග ඵල උපදවා ගත්තු නම් ඔහු අනුපධිශෙෂ නිර්වාණ ධාතුවෙන් පිරිනිවෙති. එ හෙයින් මුන් දෙන්න ත් පිරිනිවියහ'යි වදළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් සත් පුරුෂයන් විසින් මනාව පිළිපැද භවක්‍ෂයට ම උත්සාහ කටයුතු.

---

# 190. පූර්ණා නම් දියණියන් ගේ වස්තුව

තව ද සිත ප්‍රසන්න වන කලට දක්ෂිණාව අල්ප නො වන නියා ව හඟවන්ට පූර්ණා නම් දියණියන් ගේ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්—

එක් දවසක් උන් පාරිනට බොහෝ වී දුන්හ. උෟ දවල් ම පැර නිමවාපියන්ට බොහෝ හෙයින් රෑ ත් පාන නඟා ලා වී පාරිනාහු ගිම් නිවනු නිසා ගෙන් පිටත් ව ලා ඇඟ සුළඟ ගස්ව ගස්වා සිටියහ. එ කලට දබ්බමල්ලපුත්ත මහ තෙරුන් වහන්සේ වහන්දෑට සෙනසුන් පනවන සේක. උන් වහන්සේ ද බණ අසා පියා සැතපෙන ගෙවලට යන වහන්දෑට තමන් වහන්සේ ම විටින් විට යාම බැරි හෙයින් ඇඟිලි ම පාන්කඩ කොට පාන් දල්වා ගෙණ පෙරාතු ව ලා මං කිය කියා යවන වහන්දෑ මවා ලූ සේක.

පූර්ණාවෝ පහන් ආලොකයෙන් ඒ ඒ දිග වඩනා වහන්දෑ දක 'මම වන්නාට ය. සිල්වත් තැනට මෙහෙ කී අකුසලින් මේ වෙලා වන තුරු ත් මෙහෙ කොට නින්දක් ලද නොහෙමි. ස්වාමි දරුවන් නිදි නො ලබන්ට කාරණ කිම් ද, එකාන්තයෙන් මින් එක් නමකට ලෙඩක් දුකක් ඇත මැනවැ'යි සිතා ගෙන කර්මාන්ත කරණ පමණක් මුත් බත් එාසුවක් නැති හෙයින් උදසන ම කුඩු

Non-Commercial Distribution

සුහක් හැර ගෙණ පැණින් තෙමා පියා දද පූ[1] සැටියට හඹා ලා ගින්නේ ලා පළහා ගෙණ එ තැන දී කන්ට අවසර නැති හෙයින් දෝ නොහොත් වාල් ජාති ය නම් මුදලිවරුන් දක්ක දී කන්ට මැළි හෙයින් 'පැනට යන කල මහ දී කමී' සිතා කළ ය හැර ගෙණ පැන් තොට බලා නික්මුණාවු ය.

බුදුහු ත් ගමට සිහා වඩනා පිණිස එ ම මහට පැමිණි සේක. පුණ්ණාවෝ නමින් මතු නොව අදහසිනු ත් පිරි සිටි තැනැත් තෝ බුදුන් දක 'මම තෙක් දවස් බුදුන් දුටු කල පිළිගන්වා ලන්ට නිස්සෙක් සම්භ නො වෙයි. පිළිගන්නවා ලන්ට නිස්සක් සම්භ වූ කලට බුදුන් දක්නට නැත. අද වූ කලි නපුරු වුවත් පිළිගන්වා ලන්ට නිස්සකු ත් මා අත ඇත. බුදුහු ත් සම්භ වූ සේක. ඉදින් නපුර යි සිතා පිළි නො ගනිතො ත් මුත් මම මේ කුඩු කැවුම පිළිගන්වමි' සිතා ලා කළ ය එක් තැනෙක තබා ලා බුදුන් වැද ලා තමන් අදහසින් සුබිත බව මුත් සෙසු ලෙයින් දුක්පත් නියාව හඟවමින් 'සවාමීනි, මේ කුඩු කැවුම් හුදක් කුඩින් ම කළ හෙයි නු ත් තෙලක් පිටියක් නුමුසු හෙයිනු ත් මිහිරි නො වන ත් මිහිරි නිවන් සාධා දෙනු නිසා පිළි ගනතො ත් යහපතැ'යි කිවු ය. බුදුහු ත් කුඩු කැවුම පිළිගත් සේක.

පුණ්ණාවෝ ද කැවුම් පිළිගන්වා ලා වැද ගෙණ 'සවාමීනි, මේ කුඩු කැවුම් මුඹ වහන්සේට පැමිණි රසවත් ව උතුම් වන්නාසේ අනුන් සන්තක වූ මම මුඹ වහන්සේ කරා පැමිණ තෘෂ්ණාදශතුවයෙන් මිදී නිදහස් වෙම් ව' යි පැතූහ. බුදුහු ත් 'එ සේ ම වේව'යි වදරා ලා බණ ත් වදළ සේක. පුණ්ණාවෝ ත් 'බුදුහු මා කෙරේ කරුණාවෙන් දිව කැවුම් ලබ්බවනු නිසා කුඩු කැවුම් පිළිග ත් බව මුත් මේ කොයි වළඳන සේක් ද? වැළඳිය ත් හැකි ද? එකාන්තයෙන් තෙලෙ ඔබ්බකට ගෙණ ගොසින් ලා බල්ලන්ට හෝ ලවා පියා රජ යුව රජ ආදී වූ පොසොසත් කෙණකුන්ගේ ගෙට සිහා ගොසින් මධුරාහාර ය. වළඳනසේක.' යි සිතූ ය. බුදුහු ත් උන්ගේ අදහස් දන ගෙණ වැඩ හිඳිනා කැමැති ව අනද මහ තෙරුන් වහන්සේ මුණ බලා වදළ සේක, මහ තෙරුන් වහන්සේ ත් නුවරින් පිටත හෙයින් සතර පට කොට ලා සහළ සිවුර පනවා ලූ සේක. බුදුහු වැඩ හිඳ දිව කැවුම් වූ කුඩු කැවුම් වැළඳූ සේක.

දිව කැවුම් වූයේ නම් බුදු වන දවසු ත් පිරිනිවන් පානා දව සු ත් දෙවියෝ සක් වළ ගබ ඇති රස ඕජාව මී කැටියකින් මී

---

1 දපු පූ

Non-Commercial Distribution

මිරිකා ගන්නා සේ මිරිකා ගෙණ භාජන ගත භොජනයෙහි බහා ලති. සෙසු දවස් අතට හැර ගත් දෙයෙහි බලා ලති. එහෙයින් එ දවසු ත් කුඩු කැවුම් අතට පිළිගන්වා ලන්නා ම ඔබ්බෙක අනුභව යට නො නිසි බැවින් සක් වළ ඇති රස ය කුඩු කැවුමේ ම බහා ලූ ය.

පූර්ණාවෝ ත් බල බලා සිටියෝ ය. වළඳා අන්තයෙහි මහ තෙරුන් වහන්සේ බුදුන් අතට පැන් වැඩූ සේක. බුදුහු ත් වළඳා ලා පූර්ණාවන් බණවා ලා 'ඇයි, පූර්ණාව, කුමක් නිසා මාගේ සවුවන්ට දෙඩී දැ'යි විචාළ සේක. 'ස්වාමීනි, මා දෙඩුවේ නැතැ'යි කිවු ය. 'මාගේ සවුවන් රෑ දවස් බණ අසා යන්නවුන් දැක කුමක් කිවු දැ'යි විචාරා 'මම වන්නා මා අනුන්ට මිඩි වූ හෙයින් දවලු ත් රෑ ත් මෙහෙයෙන් නිදි නො ලැබෙමි. මේ ස්වාමි දරුවන් නිදි නො ලබා ඇවිදින්ට කාරණ කිම් ද? එකාන්ත ව ම මින් එක් තැනකට ලෙඩක් දුකක් ඇති නියාවනැ යි කීමි' කිවු ය.

බුදුහු උන්ගේ බස් අසා 'පූර්ණාවෙනි, තෙපි රෑ ත් දවලු ත් කර්මාන්ත ම හෙයින් අවසර නො ලදින් නො නිදව. මාගේ සවුවෝ නිදීමෙන් වඩනා කුසල් ධර්ම නැති හෙයින් නො නිදන පිණිස ම නො නිදති' වදරා 'නිවන්හි කළා වූ ආලයෙන් ත්‍රිවිධ ශික්ෂා පූරණ ය නිසා යම් කෙණෙක් රෑ වුව ත් දවල් වුවත් නො නිද ත් නම් උන්ගේ නො පමාව වැඩී ම නිසා හිර නැගෙ ත් නැගෙ ත් අඳුරු දුරු වන්නා සේ අවු පහරු ත් පහරු ත් පිනි සිඳෙන්නා සේ සව් කෙලෙස්හු නසිති' වදළ සේක. දෙශනා කෙළවර කුඩු කැවුම් පිළිගැන් වූ පූර්ණාවෝ ශ්‍රොත ආපත්ති නමැති දිව කැවුම් ලත්හ. තව ත් බොහෝ දෙනාට මේ දෙශනාව සප්‍රයොජන වී ය.

බුදුහු ත් කුඩු කැවුම් වළඳා ලා වෙහෙරට වැඩී සේක. ධම්සෙබෙයි රැස් ව හුන් වහන්දැ ත් බුදුන් පූර්ණාවන් දුන් කුඩු කැවුම් පිළිගත් නියාව ත් වැළඳූ නියාව ත් ඉතා විස්ම ය යි කථාව ඉපැද වූ සේක. බුදුහු ඒ අසා වදරා බුදු වූ අවසථාවේ තබා පැරුම් බිමදී ත් උන් දුන් කුඩු අනුභව කළ නියාව ත් වදරන සේක්—

"භුත්වා තිණපරිසාසං — භුත්වා ආචාමකුණ්ඩකං,
එතං තෙ භොජනං ආසි — කස්මා 'දනි න භුඤ්ජසි.

යනාදීන් කුණ්ඩක සින්ධව ජාතක ය විස්තර කොට වදළ සේක·

එ සේ හෙයින් සත් පුරුෂයන් විසින් බුදුන් පූර්ණාවන් කෙරෙහි කළ අනුග්‍රහයෙන් කුඩු කැවුම් වැළඳුවා සේ නිවන්හි

Non-Commercial Distribution

කළ ආලයෙන් රූක්‍ෂ ප්‍රතිපත්තියෙහි හැසිර බුදුන් ලත් ප්‍රශංසාවට ආසන්න ව සිටිනා ප්‍රශංසා ලද යුතු.

## 191. අතුල උපාසකයන් ගේ වස්තුව

තව ද නින්ද පරිභවයෙන් මිදී ගැන්ම බැරි නියා ව හඟවන්ට අතුල නම් උපාසකයන් ගේ වත දක්වමු.

කෙ සේ ද යත්—

සැවැත් නුවර වසන අතුල නම් උපාසකයෝ උපාසක පන් සියයක් පිරිවරා එක් දවසක් බණ අසන්ට විහාරයට ගොසින් රෙවත තෙරුන් වහන්සේ ගෙන් බණ අසනු කැමැති ව ඔබ වැඳ ගෙණ බණ අසන්ට හුන්හ. ඒ තෙරුන් වහන්සේ ත් විවෙක යෙහි ඇලී වසන හෙයින් කථාවෙහි ඇලුම් නැති සේක. එ හෙයින් මඳ බණක් වුවත් නො වදාළ සේක. උයි ත් තමන් බණ අසන්වම ගිය හෙයිනු ත් ඔබ බණ නො වදාළ හෙයිනු ත් මුසුප්පු ව සැරියුත් මහ තෙරුන් වහන්සේ ළඟට ගොසින් වැඳ ලා එකත් පස් ව සිටියහ. මහ තෙරුන් වහන්සේ ත් 'කුමක් නිසා අවු දැ'යි විචාළ සේක. 'ස්වාමීනි, මම මුන් හැම දෙන ත් කැඳවා ගෙණ බණ අසනු නිසා රෙවත තෙරුන් වහන්සේ ළඟට ගියෙමි, ඔබ බණ නො වදාළ සේක. මම මුසුප්පු ව ගෙණ මුඹ ආමි. බණ වදාළ යහපතැ'යි කිවු ය. 'එ සේ වී නම් හිඳුව'යි වදරා ලා බොහෝ කොට විදම්[1] බණ වදාළ සේක.

උපාසකයෝ ද විදම් බණ අසා 'මේ විදම් බණ නම් සියුම් හෙයින් සියුම් නුවණක් ඇති ව ඊ අභ්‍යාසයක් ඇති තැනකට මුත් අප හැම ඊ අභ්‍යාස නැත්තවුන්ට දැනෙන දෙයක් නො වෙයි. ඔබ ත් විදමට පටන් ගත් සේකැ'යි මුසුප්පු ව ගෙණ උපාසක පිරිස් පිරිවරා ගෙණ අනඳ මහ තෙරුන් වහන්සේ ළඟට ගොසින් ඔබ ත් 'උපාසකවරිනි, අවුනැ'යි වදාළ කල්හි 'ස්වාමීනි, බණ අසනු නිසා ආදි කොට රෙවත තෙරුන් වහන්සේ ළඟට ගියම්හ. ඔබ තමන් වහන්සේ දන්නා බණක් නැත්තා සේ මුයෙන් බැණ නො නැඟී සේක. අපි සැම මුසුප්පු ව ගෙණ ධම් සෙනෙවි ස්වාමීන් ළඟට ගියම්හ. ඔබ බණ වදරන ගමනේ අපට තමා නො දැනෙන විදම් බණ වදාළ සේක. අපි ඔබ කෙරෙහි මුසුප්පු ව ගෙණ මුඹ ආම්හ. මුයෙන් බැණ නො නැඟී ත් නො විද විදම් බණ ත් නො වදරා අපට බණක් වදාළ යහපතැ'යි කිවු ය.

---

1. විදම්–ඇතැම්

Non-Commercial Distribution

අනඳ මහ තෙරුන් වහන්සේ ද 'එ සේ වී නම් වැද හිඳ අසව'යි දත හැකි ලෙසට ඉතා බොහෝ ත් නො කොට බණ වදාළ සේක. වදරන බණ දැනෙත ත් මඳ ව ගිය හෙයින් ඔබ කෙරෙහි ත් මුසුප්පු ව බුදුන් කරා ගොසින් වැද ලා එකත් පස් ව හුන්හ. බුදුහු ත් කුමකට අවු දැ'යි විචාරා 'බණ අසන්ට ය'යි කී කල්හි 'බණ ඇසූ දැ'යි විචාළ සේක. ස්වාමීනි, ආදි කොට ම රෙවත තෙරුන් වහන්සේ ලඟට ගියම්හ. මුසුප්පුවක් ඇත්තා සේ ඔබ අපට බණ නො වදාළ සේක. ඔබ කෙරෙහි මුසුප්පු ව ගෙණ අනුබුද්ධ ව සිටි ධර්ම සෙනෙවි ස්වාමීන් කරා ගියම්හ. කුඩා සුඟුන් කටට මහා බත් පිඩි දික් කරන්නා සේ අපට දැන ගන්ට බැරි ව තිබෙන විදම් බණක් බා ගත් සේක. ඔබ ට ත් මුසුප්පු ව ගෙණ දහම් බඩගැරි අනඳ මහ තෙරුන් වහන්සේ ලඟට ගියම්හ. ඔබ උගුර රෙදෙන්නා සේ මදක් මදක් වදරා ලා තබා පි සේක. ඔබට ත් මුසුප්පු ව ගෙණ මුඹ ආම්හ'යි කිවු ය.

බුදුහු උන්ගේ කථා ව අසා ලා 'අතුල ප්‍රධාන වූ උපාසකවරිනි, මේ නින්ද ප්‍රශංසා දෙක නම් පුරාතනයෙහි පටන් පැවත ආ දෙයෙක. දැන් ඇතිවූ දෙයෙක් නො වෙයි. රජ දරුවන් පෘථිවීශ්වර ව සිටිය ත් සමහර කෙණෙක් උන්ට නින්ද කෙරෙති. සමහර කෙණෙක් ප්‍රශංසා කෙරෙති. කලෙක නින්ද කොළෝ ප්‍රශංසා කෙරෙති. ප්‍රශංසා කොළෝ නින්ද කෙරෙති. මහ පොළොවට වුව ත් ඉරට-සඳට වුව ත් දෙඩති. බෙණෙති. සිවු වනක් පිරිස් පිරිවරා හිඳ බණ කියන සර්වඥවරයන්ට පවා සමහර කෙණෙක් නින්ද කෙරෙති. සමහර කෙණෙක් ප්‍රශංසා කෙරෙති. නුවණ නැත්තෝ නින්ද කළ මනා දෙයට ප්‍රශංසා ත් කෙරෙති. ප්‍රශංසා කළ මනා දෙයට නින්ද ත් කෙරෙති. එ පමණ නො වෙයි. නුවණැත්තවුන් දැන කරණ හෙයින් යම් කෙණකුන්ට නින්ද කොළෝනම් උඃ නින්ද ලැබිබ'යුත්තෝ වේ ම ය.'යම් කෙණකුන්ට ප්‍රශංසා කොළෝ නම් උඃ ප්‍රශංසා ලැබිබ යුත්තෝ ම ය'යි බණ වදරා ''හෙම්බා යම් කෙණෙක් ස්වභාවයෙන් මිතභාණී බැවින් මුයෙන් නො බැණ හුන්නෝ නම් 'ගොළුවා සේ මෙ කිම් දැ'යි උන්ට ත් බෙණෙති. 'මිතභාණී හෙයිනැ'යි කියන්නෝ මඳ වු ය.

යම් කෙණෙක් බොහෝ කොට දෙඩ ත් නම් 'අකුරු පුළුලක් සේ සුළං තද තැන බැඳලූ තල් වක්කන්නක් සේ කටෙක් කම සේ නැත. 'සාළිත්ත සිල්ප ය දන්නෝ ඇත් නම් නැළි ගණන් ලාසු ගණන් එළු බෙටි ත් නොදක්වා ලා කටට ගසා ලිය හැක්ක' යනාදීන්

Non-Commercial Distribution

දෙඩති. බෙණෙති. ඉතා බොහෝ ත් නො කොට, ඉතා මඳ ත් නො කොට යුක්ත මුක්තවාදී ව කියන්නවුන්ට 'කුමක් ද? මූ තුමූ මුවෙයි තුබූ බස් පමණකට ඉතා ලෙටියෝ ය. බසක් කියා ලත් නම් ගැටෙකින් ගුලෙකින් මැත් කරණ දෙයක් මෙන් ඉතා ලෙටි කෙණකුන් රනක් රත්රනක් දී ලන්නා සේ බසක් ම හරවාගත නො හැක්කැ'යි දෙඩති. එ හෙයින් මෙ ලොව නින්ද නො ලබන කෙණෙක් නැත. ගිය දවස වුව ත් දන් වුව ත් මතු දවස වුව ත් මෙ නිඳ ලබන සැටි ම ය.

යම් කෙණෙක් ත්‍රිවිධ ශික්‍ෂායෙහි යෙදී වෙසෙත් ද, නොහොත් ධර්‍ම ජීවිකාවෙහි නො පමාවෝ ද, ධර්‍මෞජ ප්‍රඥවෙන් සමන්විත හෙයින් නුවණැත්තෝ ද, ලොවී ලොවුතුරා නුවණින් හා සිවු පිරිසුදු සීලයෙන් සමන්විතයෝ ද, එ සේ වූ සත් පුරුෂයන්ට දෙවියන් වුව ත් මිනිසුන් වුව ත් කවර නම් කෙණෙක් රිදී නුමුසු ඝන රනක් මෙන් කුදෘෂ්ට්‍යාදී මලාපගමයෙන් පවිත්‍ර වූ අදහස් ඇති හෙයින් දෙඩිය හෙත් දෑ'යි නින්දවෙන් තමන් වහන්සේ ගළවා වදළ සේක. දෙශනා කෙළවර පන් සියයක් උපාසකවරු තැගි තැනකින් සිත් පුරා ලබන සම්පතක් මෙන් සෝවාන් වූහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් ඒ උපාසකවරුන් පන් සිය ය බණ නො කීවාට ත්, විදම් බණ කීවාට ත්, බණ මඳ කොට කීවාට ත් මුසුප්පු ව බුදුන් කරා ගොසින් අදහස් ලෙසට වරියා ලෙසින් වදළ බණ අසා සෝවාන් වූවා සේ සියලු ලෙසින් පින් නො කිරීමෙහි ත් නො යෙදී ඉතා බැරි ව තිබෙන පින් කමට ත් නො සිතා පිළිවන් පිණෙක යෙදී නිවන් අත් කට යුතු.

## 192. සවග වහන්දෑ ගේ වස්තුව

තව ද දුෂ්ප්‍රතිපත්තියෙහි නපුර දක්වන්ට සවග වහන්දෑ ගේ වස්තුව කියමු.

කෙ සේ ද යත්—

බුදුහු එක් දවසක් පණ්ඩුක ය, ලොහිතක ය, මෙත්තිය ය, භුම්මජක ය' අස්සජි ය, පුනබ්බසුක ය යන ස වග වහන්දෑ ත් ඒ තැන්ගේ පඤ්ඳ ත් මරවඩි[1] පිටට නැඟී ලා අතින් ලී හැර ගෙණ ගල තල පිටට නැඟී සක්මන් කරණ ගමනේ තද බිමෙක අසුන් දුවාලියේ ලූවා සේ මහ අරගල අසා අනඳ මහ තෙරුන් වහන්සේ අතින් 'මේ කුමන අරගලයෙක්දූ'යි විචාළ සේක.

---

1 මිරිවැඩි



Non-Commercial Distribution

ස වග වහන්දෑගේ විකව නියාව දන් වූ කල්හි එ ලෙස නො කරන්ට සිඛ පද ත් පනවා ලා බණ වදරන සේක් භික්ෂූන් නම් කයින් සිද්ධ වන ප්‍රාණවධාදී වූ පවු කම් තුන ත් නො කොට කාය සඤ්ඤමය ත් ඇත මැනව. වචනින් සිද්ධ වන මුසාවාද දී චතුර්විධ වාග්දුශ්චරිතය ත් හැර වාක් සඤ්ඤමය ත් ඇත මැනව හුදක් සිතින් ම සිද්ධවන අභිධ්‍යා දීවූ පවු තුන ත් හැර සිතිනු ත් සඤ්ඤත වුව මැනව. යම් කෙණෙක් මෙ සේ තුන් දෙරින් සිද්ධ වන පවින් දුරු ව වෙසෙත් නම් සෙසු ශික්ෂා පූරණ ය. නිරායාසයෙන් සිද්ධ වෙ යි' වදළ සේක. දෙශනා කෙළවර කළ පිට වට වැසි සේ ස වග වහන්දෑට ඉන් ප්‍රයෝජනයක් නැත ත් බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් සෙස්ස ආයාස වුව ත් තුන් දෙරින් සිද්ධ වන අකුසලින් දුරු ව පිළිවන් පිණෙක හැසිර තුන් බොධියෙන් එක් තරා බොධියකට පැමිණිය යුතු.

# 193. ගෙරි මරා කන එකකු ගේ පුතකු ගේ වස්තුව

තව ද කළ පාප ය වැනි වූ ම අනිෂ්ට විපාක දක්වන්ට ගෙරි මරා කන එකකුගේ පුතකුගේ වස්තුව කියමු.

කෙ සේ ද යත්—

සැවැත් නුවර ගෙරි මරා කන එකෙක් ගෙරි සරක් මරා ගෙණ තුල් තුල් මස් පිසවා පියා අඹු දරුවන් හා සමග වැද හිඳ තෙමෙ ත් කයි. අධික දෙයක් මිලයට ත් විකුණෙයි. මෙ තෙමෙ මෙ ලෙසින් පස් පනස් හවුරුද්දක් මුළුල්ලෙහි ගෙරි සරක් මරා කා දවස් යවා ගන්නේ ළඟ විහාරයෙහි වැඩ හිඳිනා බුදුන්ට වෙව යි වහන්දෑට වෙව යි එක දවසෙක ත් බත් සැන්දක් පමණ වෙව යි හඹු සාළුවක් පමණ වෙව යි නුදුන් විරූ ය. තෙමේ කෙ තෙක් මාළු ඇත ත් දඩ මසක් කුඩ මසු කෙණෙකුන් නැති ව නො කයි.

ඒ එක් දවසක් දවල් දවස මුළුල්ලෙහි දඩ මස් විකුට පියා තමන්ට පිසන පිණිස මස් කඩක් දී ලා නාන්ට ගියේ ය. උන් නාන්ට යා දී උන්ගේ යාළුවාණ කෙණෙක් උන්ගේ ගෙට අවුත් 'අපගේ ගෙට අමුත්තාණ කෙණෙක් අවු ය. අමුතු බතක් දෙන්ට මාළු නැත. විකුණන්ට තුබූ දඩ මසෙක් ඇත් නම් දෙව'යි කියා උන්ගේ අඹුවන්ට කිවු ය. 'විකිණි මසෙක් නැත. මුඹගේ යාළුවාණෝ රනු ත් වුව මනා හෙයින් ගෙය නිපස් නො වන විචරට ත් නො තබා විකොට පියා නාන්ට ගියෝ ය'යි කිවු ය. 'එ සේ කියන්ට නො කැමැත්තෙ ය. ගෙය එ සේම නිපස් ද? සුහක් වුව ත් දෙන්ට

Non-Commercial Distribution

වුව මැනවැ'යි කිවු ය. මුඹගේ යාළුවාණන්ට රට පිසන්ට තුබූ දඩ මස් සුහක් විනා නැතැ'යි කිවු ය. 'ඒ වුව ත් දෙන්ට වුව මැනව'යි කී කල්හි 'දඩ මසක් නැති ව බත් නො කත් දෙන්ට බැරි'ය යි කිවු ය. එ සේ බැරි ය, බැරි ය කීව ත් තුමූ ම ගෙ වැද ලා මස් හැර ගෙණ ගියෝ ය. ගෙරි මරා කන්නෝ ත් නා පියා අවුත් බත් කන්ට හුන්නෝ අඹුව ත් බත් ලා ලා පලා කොළ ත් ලා ලූ කල්හි පිසන්ට දුන් දඩ මස් කොයි දැ'යි විචාරා 'නැතැ'යි කී කල්හි 'නැති වන්ට කාරණ කිමදැ'යි කිවු ය.

මුඹගේ යාලුවාණ කෙණෙක් අමුත්තාණ කෙණකුන් ආව යි කියා ලා විකිණ දඩ මස් විචාරා අවුත් රට පිසන්ට දීලා ගිය දඩ මස් මුත් නැතැ'යි ඒ දෙන්ට බැරි ය යි කීව ත් බලයෙන් ගෙට වැද ලා තුමූ ම හැර ගෙන ගියෝ ය'යි කිවූය. 'මම දඩ මස් නැති ව නො කම්. ගොසින් ගෙනව'යි කිවු ය. 'උන් හැර ගෙන ගිය දෙය ගෙනෙන්ට පිළිවන් ද? අදට කා පුව මැනවැ'යි කිවු ය. එ සේ මම් නො කම්' කියා ලා කන්ට ලූ බත් ඉවත් කරවා පියා- ගෙට පිටි පස්සෙ ගොනෙක් සිටියේ ය. යකඩක් හැර ගෙණ උං කරා ගොසින් උංගේ දිව මුලට බා කපා හැර ගෙණ ගොසින් පිසන්ට කල් යන හෙයින් අඟුරේ ලා පලවා බත් මත්තේ තබා ගෙණ හිඳ බත් පිඩක් කට තබා අරින් මස් සුහකුත් කට තිබී ය. ඒ ඇසිල්ලෙහි ම දිව මුල දීම කැඩී ගොසින් බත් මණ්ඩය පිට ම හී කමී ය වැනි වූ ම අනිෂ්ට විපාක ය ලද. ඒ ගොනා ද කටින් ලේ වගුරුව වගුරුවා ඇතුළු ගෙට වැද ලං හඬා ඇවිද්දි. ඒ වේලාට ගෙරි මැරුවාගේ පුතා ද පියා ලඟ සිටියේ ය. මැණියෝ 'පුත තෙල කටින් ලේ වගුරුව වගුරුවා හඬා ඇවිදිනා ගොනා දුටු වං ද? තුලූ විඳිනා දුක් තොපට ත් පැමිණියේ වී නම් නපුර. තෙපි ජීවත් වවු නම් මා ත් නො බලා කැමති තැනකට යව'යි කිවු ය. උයි ත් මරණ හයින් තැති ගෙන මැණියන් වැඳ ලා තක්සලා නුවරට ගියෝ ය. ගෙරි මරුවා ද ගොනා පරිද්දෙන් ගෙය මුළුල්ලෙහි හඬා ඇවිද මිය ගොසින් අවීචියේ උපන. ගොනා ත් මෙළේ ය.

ගෙරි මරුවාගේ පුතා ත් තක්සලා නුවරට ගොසින් බඩාල් කර්මාන්ත උගත. උන්ගේ ඇදුරු බඩාලාණෝ කම්මල සිට ගමට යන්නෝ මෙ වෙනි පළඳනාවක් කොට ලව යි කියා ලා කම්හල රඳවා ගියහ. උයි ත් කියා ලූ ලෙස පල්දනාව කළහ. ආචාරි අවුත් පලඳනාව දැක 'මූ කොයි ගියෝ වත් ජීවත්වී ය හෙති. කර්මාන්තය යහපතැ'යි තමන්ගේ විය පැමිණි දුවණි කෙණකුන් සරණ පාවා

Non-Commercial Distribution

දුන්හ. බඩාල් දුවණියෝ ද උන්ට දූ දරුවන් බොහෝ ලත්හ. ඒ දරුවෝ ද පියාණන් අතින් බඩාල් සිල්ප ඉගෙන පසු ව කලක දී සැවත් නුවරට ගොසින් එහි ගෙ දෙර ඇති ව වසන්නෝ සැදැ සිත් ඇති වූහ. උන් ගේ පියාණෝ ද තක්සලා නුවර රඳා හිඳිනෝ පිණක් කොට පිණින් මුකුරා ගැන්මක් නූව ත් වයසින් මුකුරා ගොසින් මාලු වූහ. උන්ගේ දරුවෝ පියාණන් දුර්වල හෙයින් තමන් ළඟට ගෙන්වා ගෙණ අන්තිම අවස්ථාවෙහි ආසන්නකර්ම කොට පියාණන් නමින් දන් දෙම්හ'යි බුදු පාමොක් සඟනට ආරාධනා කැරවූහ. ආරාධනා කරවා ලා දෙවන දවස් බුදු පාමොක් වහන්දැ ගෙයි වඩා හිඳුවා ලා සකස් කොට වළඳවා ලා වළඳා අන්තයෙහි බුදුන්ට 'ස්වාමීනි, මේ දන ජීවත් ව හුන් අපගේ පියාණන්දෑ නමින් දුනුම්හ. උන්දැට බණ වදළ යහපතැ'යි කිවු ය.

බුදුහු ත් උන් බණවා ලා 'උපාසකයෙනි, තොපි මාලු ව ගියව ඇඟ ත් පඬුවන් පැ ව ගොසින් විළික්සුණු පතක් වැනි වුව. පර ලොව යන ගමනට පින් නමැති සාලක් බතකුත් සපයන්ට ත් නො වී ය'යි වදරා ලා බණ වදරන සේක්. උපාසකයෙනි, තොපි දලුවේ පටන් ක්‍රම ක්‍රමයෙන් මුකුරා විළික්ස බිම හුණු පරඬල් පතක් මෙන් බාල අවස්ථාවේ පටන් ක්‍රම ක්‍රමයෙන් මුකුරා දූන් මාලු වුව. විළික්සුණු පත හෙන්ට අසන්න වූවා සේ මරණ ත් ආසන්න ව සිටියේ ය. තව ද දුර බැර ගමන් යන්නවුන්ට සැපයූ බතක් සාලක් නැත්තා සේ පරලෝ යන්නා වූ තොපට පින් නමැති මාර්ගෝපකරණ ත් නැත. එ සේ වූ තෙපි මුහුද නැව් නට වුන් දිවයින් සොයන්නා සේ කුසල් නමැති පිහිටක් කොට ගනුව. කොට ගන්නා පිහිටට වහ වහා වීර්‍ය්‍ය කරව. කරණ වීර්‍ය්‍යය ත් සමර්ථ අවස්ථාවෙහි ම කිරීමෙන් නුවණැති වත් වව. වඩනා ලද වීර්‍ය්‍යයෙන් රාගාදී වූ සිත් පිරිසිදු ව නිවන් සාධා ගනුව'යි වදළ සේක.

දෙශනා කෙළවර මාලු උපාසකයෝ සෝවාන් වූහ. තව ත් බොහෝ දෙනාට මේ දෙශනාව සප්‍රයෝජන වි ය. දෙවන දවසු ත් බුදුන්ට දන් දෙවා ලා වළඳා අන්තයෙහි මාලු උපාසකයන්ට බණ වදරන්ට බුදුන්ට ආරාධනා කළහ. බුදුහු ත් උන්ට බණ වදරන සේක්– 'හෙම්බා තොපි ගෙවී ගොසින් නිමන්ට ආසන්න වූ ආයු ඇත්තව' ආදී වයස ත් මධ්‍යම වයස ත් නිමා ගොසින් කෙළවර වයස ත් නිමන්ට ආසන්න ය එහෙයින් මියන්ට ආසන්න ව සිටියව. යම් සේ ගමන් යන්නාහු අතුරු මඟ දී වුව ත් කළ මනා දෙය කෙරෙ මින් රඳා හිඳිත් ද පර ලොවට යන්නවුන්ට එ සේ නැත. මුඟින්

Non-Commercial Distribution

මුඹින් මළ විට ම පර ලොවට පැමිණෙන් මුත් දන් පින් නිසා අතුරේ රැඳීමෙක් කවුරුන්ට ත් නැත. ඒ හැම විතරට ත් මිය පර ලොව යන තොපට නිවන් පුරවදනා තෙක් ජීවත් වන ලෙසට පින් නමැති බත් සාලු ත් සසර කතරට සපයා ගත් දෙයෙක් නැත. එ සේ වූ තොපි සසර නමැති මහමුහුදින් නිවන් පර තෙරට නැඟී යන්ට වීය්‍ය නමැති කුඹක් ඇති නුවණ නමැති රුවල් ඇති, පින් නමැති නැවක් ඉදි කරව. එ ලෙස කොට ජාති ජරාදි වූ දියෙන් පිරුණු සසර මහ මුහුදින් එතර වව'යි වදාළ සේක. මහලු උපාසකයෝ එ දවස් අනගැමි වූහ. සෙසු බොහෝ දෙනාට ත් මේ දෙශනාව සප්‍රයොජන වි ය.

එ හෙයින් නුවණැත්තවුන් විසින් සත් පුරුෂොපාශ්‍ර ය කොට ගෙරි මැරුවාණන්ගේ පුතණුවන් තමන් කොට ගත් පිණක් නැත ත් සත් පුරුෂ වූ දරුවන්ගේ සමවායෙන් බුදුන් කරා පැමිණ නිවන් දුටුවා සේ ලොවී ලොවුතුරා සැප ත් සිද්ධ කට යුතු.

# 194. එක්තරා බ්‍රාහ්මණ කෙණකුන් ගේ වස්තුව

තව ද ක්‍රම ක්‍රමයෙන් සිද්ධ වූ කුසලයෙහි ත් විපාකයෙහි අඩු නැති නියාව හඟවන්ට එක්තරා බ්‍රාහ්මණයාන කෙණකුන්ගේ වස්තුව දක්වමු.

කෙ සේ යත්—

ඒ බමුණනෝ එක් දවසක් උදසන ම නික්ම වහන්දෑ සිවුරු වළඳිනා නියාව බල බලා සිටියෝ ය. ඒ සිවුරු වළඳනා තැන ත් තණ වසා පියා තිබෙ යි. එක් නමක් – සිවුරු වළඳනා ගමනේ තණෙයි ගැවී ලා පින්නෙන් සිවුරු තෙමිණ. බමුණානෝ ඒ දැක දෙවන දවස් හුදැල්ලක් ගෙනවුත් එ තැන කළ විටක් සා කොට සැස ඉදි කළහ. දෙ වන දවස් එ තැනට අවුත් සිවුරු වළඳනා එක් නමකගේ සිවුරු කන බිම ගැවී පස් ගෑවෙන්නා දැක වැලි ගෙනවුත් ලා ලූ ය. එක් දවසක් පෙරවරු අවු තදව සිවුරු වළඳනා වහන්දෑගේ ඇඟින් ඩා වැගිරෙන්ට වන. ඒ දැක මඩුවක් ලවා ලූ ය. නැවත දවසක් පෙර වරු වැස්සක් වැස වහන්දෑ තෙමී ගියා දැක එ තැන ගෙයකු ත් කරවා ලා පූජා කොට ගෙ පිළිගන්වනු නිසා බුදුපාමොක් සඟනට ආරාධනා කොට ලා ගෙය ඇතුළෙත් පිටතත් වඩා හිඳුවා ලා දන් දී වළඳා අන්තයෙහි බුදුන්ට බණට ආරාධනා කොට ලා තමන් එ තැන තණ හල තැන් පටන් සියලු පවත් ම දැන්වූහ.

Non-Commercial Distribution

බුදුහු ත් උන්ගේ බස් අසා බමුණානෙනි, නුවණැත්තෝ මඳින් මඳින් වුව ත් පින් කොට බොහෝ කෙරෙති' වදරා 'බමුණානෙනි, යම් සේ බඩාල්ලු රත්රන් මේ වර කරණ කල එක වර කළ ගිනි වරින් ම රිදී භාග ය දවා කසළ හැර කර්ම්ක්‍ෂම කට නො හෙත් ද නො එක් වර කොට කර්ම ක්‍ෂම කිරීමෙන් ඔටුනු ආදී නො එක් ආභරණ කෙරෙත් ද, එ පරිද්දෙන් නුවණැත්තෝ මඳින් මඳින් වුව ත් නො එක් වර පින් කරන්නාහු කෙලෙස් කිලුටු පින් නමැති ගින්නෙන් දවා හැර සිත් නමැති සන රන් ලොවී ලොවුතුරා ගුණ නමැති පළඳනා කිරීමට තරම් කෙරෙති' වදළ සේක. දෙශනා කෙළවර බමුණානෝ ක්‍රම ක්‍රමයෙන් පින් කළා සේ ම ක්‍රම ක්‍රම යෙන් මාර්ග ඵල ලබන්නාහු පළමුකොට සෝවාන් වූහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් බමුණානන් ආදි තණ කසළ හළා සේ ම තදඞ්ග වශයෙන් කෙලෙසුන් නසා පසු ව වැලි ලා ධූලි පැටි කළා සේ ම විෂ්කම්භ වශයෙන් කෙලසුන් නසා පසු ව ගෙය කරවා බිම් හිත්තිවල සුණුවම් කරවා සියලු ලෙසින් ම ධූලි නැති කළා සේ ම සමුච්ඡෙද වශයෙන් කෙලෙසුන් නසා මාර්ගාධි ගම ඵලාධිගම කටයුතු.

---

## 195. තිස්ස නම් භික්ෂු කෙණකුන් ගේ වස්තුව

තව ද ලොභයෙහි ආදීනව දක්වන්ට තිස්ස නම් භික්ෂු කෙණකුන්ගේ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්—

සැවැත් නුවර වසන එක් කුල දරුවාණ කෙණෙක් සසුන් වැද මහණ ව මාලු පැවිද්ද ත් ලදින් කලෙක දනවු විහාරයක වස් විසූ සේක්-වස් අන්තයෙහි අට රියන් හිණ කඩක් ලදින් සැවැත් නුවරට ගොසින් ඒ හිණ කඩ තබා ලන නියායෙන් නැඟණියන් අතට දෙවා ලූ සේක. උයි ත් හිණ කඩ ඉතා දළ හෙයින් මාගේ බෑණන් වහන්සේට තරම් නො වන්නේ ය'යි සිතා මුවා ත් යහපත් කරය කින් කපා හරවා පියා වන ලා කොටා පියා පොළා නවාම්[1] කොට ගෙණ සීත් කොට හූ කැට ගෙණ හිණ කඩක් වියවා ලූ ය. තෙරුන් වහන්සේ ද හූ ඉදි කටු සපයා ගෙණ ගෙත් තම් කරණ වහන්දෑ ත් නිල කොට ගෙන නං උපාසිකාවන් ඔබ ගොසින් සිවුරක් කරණ නියායෙන් තොපි අතට දෙවාලූ පිළිය දෙවා ලව'යි ඉල්ලූ සේක.

---

1 නවාම-නඩාව,

Non-Commercial Distribution

උයි ත් නව රියන් හිණ කඩ ගෙණවුත් බැණන්වහන්සේ අතට දුන්හ. උන් වහන්සේ ත් හිණ කඩ සීන් නියාව බලා දෝ නොහොත් ලොභ ය බලවත් හෙයින් මාරුවක් කොළෙෝ නමුත් ය'යි මැන පියා 'අපගේ හිණ කඩ දළ. රියන් ගණනිනු ත් අට රියන. මේ හිණ කඩ සීන. නව රියන. තුබූ ගමනේ සීන් ව දික් වන්ට කාරණ නැත. මේ තොපගේ වත් මුත් අපගේ නො වෙයි. අනුන් සන්තකයෙන් අපට ප්‍රයෝජන ත් නැත. අප ගෙන් තබා ලූ හිණ කඩ ම දෙවා පියව'යි කී සේක. 'මෙය මුඹ වහන්සේගේ ම ය. හැර හත මැනැවැ'යි කීව ත් නො ඉවසන සේක. තමන් කළ ලෙස මුළුල්ල ම කියා ලා දෙවා පූ ය. උන් වහන්සේ ත් එවිට අතට හැර ගෙණ වෙහෙරට ගොසින් සිවුරු ගෙත්තමට පටන් ගත් සේක. උපාසිකාවෝ ත් ගෙත්තම් කරණ වහන්දෑට බත් දුන්හ. ගෙත්තම් කොට නිමි දවස් දනත් සරහා දුන්හ.

උන් වහන්සේ ත් සිවුර රදා අතට හැර ගෙණ බලා සිවුරෙහි පැය බලවත් හෙයින් ලොභ ය ත් බලවත් ව පසු ව වළඳිමී සිතා සිවුර පත් කොට තබා ලා එ දවස් රෑ ම මිය ගොසින් සිවුරෙහි හිණි කුණුව උපන් දෑ ය. නං උපාසිකාවෝ ත් තෙරුන් වහන්සේ මළ නියාව අසා ගණයට ගොසින් හැඬූ ය. වහන්දෑ ද උන් වහන්සේ ආදහන කරවා ලා ගිලන් තැනක් නැති බැවින් බෙද ගන්නා ලෙසට පෙනී තුබූ සිවුර ගෙන්වූ සේක.

ඒ හිණි කුණානෝ ත් 'මේ වහන්දෑ මාගේ සිවුර බෙදන සේ කැ'යි තමන්ගේ බසින් හඬා දෙඩා ගෙණ සිවුරේ ඇවිදිති. බුදුහු ගඳ කිළියේ වැඩ හිඳ ම දිව කනින් හිණිකුණා හඬන හඬ අසා අනඳ මහ තෙරුන් වහන්සේ බණවා ලා 'අනඳයෙනි, තිස්සයන්ගේ සිවුර නො බෙද සතියක් තබා පියන්ට කියව'යි වදළ සේක. ඔබ ත් එ ලෙස ම කැරවූ සේක. හිණි කුණානන්ට ආයු සත් දවසක්ට ම හෙයින් හිණි කුණානෝ මිය තුසී දෙව් ලොව උපන්හ.

බුදුහු ත් අට වෙනි දවස් සම්මුඛ වූ තැනක් ඒ සිවුර බෙද ගන්ට විධාන කළ සේක. වහන්දෑ ත් සිවුරු දුවීල නමකට හැම තැන් ගේ අනුමතින් පමුණුවා පී සේක. වහන්දෑ ද මළ සත් දවසක් තබවා පියා අට වැනි දවස් බෙද ගන්ට බුදුන් විධාන කරන්ට කාරණ ය දත නො හී කාරණ කිම්දෝ හෝ'යි කථාව ඉපැදවූ සේක.

බුදුහු ඒ අසා ''මහණෙනි, තිස්සයෝ සිවුරෙහි කළ ලොභ යෙන් බාධා නැති ව තනතුරක් ලබන කෙණකුන් මඳ වැරැද්දකට

Non-Commercial Distribution

ලබන යන්තම් විග්‍රහයක් සේ හිණි කුණු ව ඉපැද තොප හැම ඒ සිවුර බෙදන්ට වදිනා ම 'මා සන්තක ය උදුරති'යි හඬා ගෙණ ඇඟ මැත දිවෙයි. ඉදින් තෙපි සිවුර බෙදා ගත්තු නම් තොප කෙරෙහි සැටි නරකයේ උපද්දි. එ නිසා එ දවස් බෙදීමට බාධා කෙළෙමි. දැන් මිය ගොසින් තුසි දෙව් ලොව උපන. සිවුර බෙදා ගන්ට මා කීවේ ඉනැ'යි වදරා බණ වදරන සේක්–'මහණෙනි, යම් සේ යකඩින් ඇති වූ මළ එ ම යකඩ කා නසා ද, එ පරිද්දෙන් මේ ලොභය ත් යම් කෙණකුන්ගේ සන්තානයෙහි ඇති වී නම් එ ම ලොභ ය සත්‍වයන් සතර අපායට පමුණුවයි. අනික් පමුණුවන කෙණෙක් නැතැ'යි වදළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙනා නිවන් දුටහ.

එ හෙයින් සත් පුරුෂයන් විසින් ලොභ ය හරනට උත්සාහ කට යුතු.

## 196. ලාළුදායි තෙරුන්වහන්සේ ගේ වස්තුව

තව ද ආත්ම ශක්ති ය නො දන්මෙහි දෙෂ දක්වන්නට ලාළුදායි තෙරුන් වහන්සේගේ වස්තුව කියමු.

කෙ සේ ද යත්—

සැවැත් නුවර පස් කෙළක් විවර ආර්‍ය්‍ය ශ්‍රාවකයෝ ඇත. උඃ පෙර වරු දවස දන් දී ලා පස් වරු වේලේ වෙහෙරට ගොසින් බණ අසති. බණ අසා පියා යන කල ත් අදහස් දැන වදරන බණ හෙයින් අග සවු දෙ දෙනා වහන්සේගේ ගුණ මුඛ නො පෝනා තරමේ කියති. ලාළුදායි තෙරුන් වහන්සේ ඔබගේ ගුණ කථා බොහෝ කොට ම අසා තමන් වහන්සේගේ ඥාන ශක්ති ය නො දන ඔබ්බෙ නො දත්තවුන්ට අශක්ති ය හඟවන්නා සේ 'උපාසකවරිනි, අග සවු වහන්දැගේ බණ අසා තෙපි එ සේ ගුණ කියන්නා අපගේ බණක් ඇසූ නම් කැල ම ගුණ කියන්නාවා දැ'යි කියන දැ ය. මිනිස්සු ඒ අසා 'මුන් වහන්සේ ත් එක් බණ කියන තැනක් නියා ය. මුන් වහන්සේ ගෙනු ත් බණක් අසම්හ'යි තෙරුන් වහන්සේ කරා ගොසින් 'ස්වාමීනි, අද අප හැම බණ අසන දවසෙක. දවල් දවස් අපට බණ වදළ යහපතැ'යි කිවු ය. උන් වහන්සේ ද දන්නා බණක් නැත ත් ආරාධනාව ඉවසූ සේක.

උයි ත් බණ අසන වේලාට අවුත් 'ස්වාමීනි, බණ වදළ යහපතැ'යි කිවු ය. ලාළුදායි තෙරුන් වහන්සේ ද බණ කීමට බැරි වුව ත් ආසනයට නැඟීම පිළිවන් බැවින් අස්නට පැන

Non-Commercial Distribution

නැඟී ලා විසිතුරු වූ විජිනි පත්‍රයකු ත් හැර ගෙන නැතක් වේලා ත් හිඳ එක බණ පදයකු ත් කටට නො එන හෙයින් 'මම පසු ව පාළි පිරුවා පියමි. අනික් තැනක් කියන බව ය'යි කියා ලා හස් නෙන් බට දෑ ය. උපාසකවරු ද අනික් තැනක් ලවා බණ කියවා පියා පාළි කියවන්ට නැවත ත් ආසනයට නැංවූ ය. උන්දෑ ද පාළි පමණකු ත් කටට නො එන හෙයින් 'මම රෑ දවස් බණ කියමි. අනික් තැනක් පාළි පිරිවුව මැනවැ'යි කියා ලා අස්නෙන් බට-දෑ ය. උපාසකවරු ද මූන්දෑගේ අශක්තිය ම හැඟුණ හෙයින් දෙ අනික් තැනක් ලවා පාළි කියවා පියා රෑ දවස් තෙරුන් වහන්-සේ ගෙනා වූ ය. උන් වහන්සේ දවල් දවස් නො පෙනෙන දෙය රෑ දවල් කැලම නො පෙනෙන හෙයින් කිසිවකු ත් නො දැක 'මම අලුයම් වේලෙහි කියමි. පෙර සවස අනික් තැනක් කිව මැනවැ'යි කියා ලා අස්නෙන් බට දෑ ය. උපාසකවරු ද පෙර සවස අනික් තැනක් ලවා කියවා පියා පෙරළා අළුයම බණට ගෙන් වූ ය. අනික් තැනකට බාර කොට නැඟී සිටී ම මුත් බණක් නො වැටහිණ.

බොහෝ දෙන දඬුපත් ආදී යි හැර ගෙණ 'නුවණ නැති වහන්ස, මුඹ අග සවු දෙ දෙනා වහන්සේගේ බණ කීම් යහපතැයි අප කී කල්හි මුඹ ත් බණ කියන සේ දන්නා නියාවක් හැහවූයේ වේ ද? දූන් දෙ තුන් විටක් විතර නො කියන්ට කාරණ කිම් දූ'යි බසින් ම හයගන්වා ලා නැඟී සිට යන්ට වන් කල්හි ලුහුබඳ වා ගත්හ. උන්දෑ ද යන දෑ මහානුභාව සම්පන්න තැනට කළ ස්පර්-ධාව හෙයින් අත් පස් වළෙක හුණු දෑ ය. බොහෝ දෙන කථා උපදවන්නාහු ලාළුදායි තෙරුන් වහන්සේ අගසවු දෙ දෙනා වහන් සේ සේ ම තමන් දෑ ත් බණ කියන නියාවක් හහවා අප හැම බණ අසම්හ යි කී කල සතර වාරයක් දක්වා අස්නට නැඟී බණක් ම කියා ගත නුහුණු දෑ ය. බණට ආරාධනා කොළෝ ද, මෙ සේ බණ කිය නො හෙන කල අගසවු දෙ නමට ස්පර්ධා කරන්ට කාරණ කිම්දූ යි දඬු පත් ආදී ය හැර ගෙණ ලුහු බඳවා අත් පස් වළෙක හෙළා ගත්හ'යි කථාව ඉපැද වූ ය. ඒ කථාව වහන්දෑ කෙරෙහි ත් පැවැත්ත. බුදුහු වහන්දෑගෙන් ඒ කථාව අසා 'මහණෙනි, තුලූ ආත්මශක්ති ය නො දූන අත් පස් වළ හුණු යේ දූන් මතු නො වන්නේ වේ ද, පෙර හූරු ව උපන් කලෙක ත් සිංහයන් හා ස්පර්ධා කොට සිංහයන්ගෙන් වදිනා හයින් නැව-තෙනු නිසා අත් පස් වළෙක ගැලුණෝ ම වේ දූ'යි වදාරා—

"චතුප්පදෙ අහං සම්ම - ත්වම්පි සම්ම චතුප්පදෙ,
එහි! සීහ! නිවත්තස්සු – කින්නු භීතො පලායසි"

යනාදී මේ ජාතක ය විස්තර කොට වදාළ සේක. එ කල සිංහ යාමණෝ නම් සැරියුත් මහ තෙරුන් වහන්සේ ය. හූරාමණෝ නම් ලාළුදායි වහන්දෑ ය.

බුදුහු මේ දෙශනාව ගෙන හැර වදරා 'මහණෙනි, ලාළුදායි තෙමේ යන් තම් බණක් ඉගෙණ අභ්‍යාස තර නො කොළෝ ය. එ හෙයින් යම් කිසි කෙණෙක් යම් කිසි ශිල්පයක් ඉගෙන උගත් පමණක් මුත් ආසෙවන ය නො කරෙත් ද, ආසෙවන ය නො කිරීම ඒ ශිල්පයට මල ගැස්මක් හා සරි ය. ගිහි ගෙයි වසන්නවුන්ට වීය්‍ය්‍ය නැත් නම් ඇති වන කිසිවකු ත් නැති හෙයින් වීය්‍ය්‍ය නැති වීම කෘෂි වණික් ආදියට මළ ගැසීමක් හා සරි ය. ශාසනික තැනට ත් වීය්‍ය්‍ය මුල් ව ප්‍රතිපත්ති පූරණ ය වත් මුත් සෙසු ලෙසක නො වන හෙයින් වීය්‍ය්‍ය නැති වීම පිළිවෙත් පිරීමට ත් මල ගැසීමක් හා සරි ය.

'තව ද ගිහි වුව ත් පැවිදි වුව ත් කුසී ව සිරුරු පිළිදැගීම නො කරන්නවුන්ට ශරීරය පැහැ පත් නො වේ ද, එ හෙයින් කුසී වීම ශරීර වර්ණයට මල ගැසීමක් හා සරි ය. නැවත යම් කෙණෙක් ගෙරි සරක් රකිනෝ වී නම් ඔහු තුමූ පමාව ම නිදී— මෙන් කෙළි ලළුවෙන් දවස් යවත් නම් ඒ ගෙරි සරක් ක්‍රම ක්‍රමයෙන් නසිතො ත් මුත් වැඩියුරු වීමක් නැති හෙයින් යමක් රකිනවුන් පමා වීම ත් මල ගැස්මක් හා සරි ය. නැවත ශාසනික කෙණෙකුන් වුව ත් ස දෙර රැක ගත නොහෙ ත් නම් කෙලෙස්හු අවසර ලැබ පියා ශාසනයෙන් චුත කෙරෙති. එ හෙයින් පමාව විසී ම සිල් රක්‍ෂා කරන්නවුන්ට ත් මළ ගැස්මක් හා සරි ය'යි වදාළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් පයර්‍ය්‍යාප්තියෙහි අභියොග ය කරත ත් ආසෙවන ය බහුල ව එයි ත් මල නො ගස්වා අගාරික වුව ත් අනගාරික වුව ත් වීය්‍ය්‍ය බහුල ව උපදවා ගත් ගුණයෙක් ඇත් නම් එයි ත් නො පිරිහෙළා ගුණ සංරක්‍ෂණයෙහි ත් නො පමා ව ලොවී ලොවුතුරා සැප ත් සැදි ය යුතු.

## 197. එක්තරා කුලදරුවාණ කෙණකුන් ගේ වස්තුව

තව ද සියලු කිලුටින් අවිද්‍යා කිලුට බලවත් නියාව හඟවන්ට එක් තරා කුල දරුවාණ කෙණකුන් ගේ වස්තුව දක්වමු.

Non-Commercial Distribution

කෙ සේ ද යත්—

ඒ කුල දරුවාණන්ට ජාති ආදීන් සරි තරම වූ කුමාරිකා කෙණකුන් ගෙණවුත් පාවා දුන්හ. උයි ත් ආ දවස් පටන් තමන්ට ම තිබී ආ තුගුණයක් බැවින් පරපුරුෂ සංසෙවායෙහි ඇසිරෙති. ඒ කුල දරුවාණෝ ද උන්ගේ ව්‍යභිචාර පරකම නිසා උන් නිර්ලජ්ජි වුව ත් තමන් ලජ්ජා ඇති බැවින් කිසි කෙණකුහු ත් දක්නට මැළි ව බුදුන්ට උපස්ථාන ත් දවස් ගණනක් නැති ව පසු ව බුදුන් කරා ගොසින් 'කුමක් ද? උපාසක ය, දවස් ගණනක් නුදුටුමෝ වනැ'යි වදාළ කල්හි උපාසකයෝ අඹුව අනාචාර පර හෙයින් ඊට ලජ්ජාවෙන් නා නියාව කිවූ ය.

බුදුහු ඒ අසා 'හෙම්බා උපාක ය, පෙර ත් මා බොධිසත්ත්ව අවස්ථාවෙහි මෙ බන්දක් ම කියා තොප මා කරා ආ ගමනෙහි 'ගැනු නම් පැන් තොට ආදි ය හා සරියෝ ය. නුවණැත්තවුන් විසින් ඊට අමුත්තක් නො සිතිය යුතු ය'යි කීමි. තොපි භවයෙන් සැඟවුණු හෙයින් සලකා ගත නො හෙව. වන්නාට තොප සලකා ගත නො හෙන පසු එ වක අප කී සැටි ය දත් අසව'යි වදරා—

''යථා නදී ච පන්ථො ච – පානාගාරං සභා පපා
එවං ලොකිත්ථියො නාම – වෙලා තාසං න විජ්ජති''

යනු හෙයින් 'යම සේ ගඟ ත්, මහවත් මග ත්, රා සොඬුන් රා බොන්නා වූ ගෙය ත්, බොහෝ දෙන රැස් වන තැන ත්, පැන් ළිඳ ත් සියල්ලවුන්ට සාධාරණ මුත් එක් කෙණකුන්ට ම නියම ව නො තිබෙ ද, එ පරිද්දෙන් ස්ත්‍රීහු ත් අවසර ලත් නියායෙන් උත්තම අධම සියල්ලවුන්ට ම සාධාරණයහ. එ හෙයින් උපාසකයෙනි, තොපි ත් ඊට සහන ය කරව'යි වදරා ලා බණ වදරන සේක්—'යම ස්ත්‍රී කෙණෙක් පරපුරුෂ සෙවායෙහි හැසිරෙ ත් නම රක්ෂා කළහු ගෙන් නෙරිති. දෙ මවු පියෝ ත් නො කැමැත්තාහ. දෙ ලෙසින් ම ඔහු අනාථ ව අසරණ ව ඇවිදිති. ඒ හෙයින් ස්ත්‍රී පුරුෂ දෙ පක්ෂයට ම පරපුරුෂ සංසෙවා හා පරදර පරිග්‍රහ ය කිලුටු ය. දන් දෙන්නවුන්ට මසුරු සිත නම දනාද්ධ්‍යාස ය නවතන හෙයින් කිලුටු ය. සියලු ම අකුසලයෝ මෙ ලෝ පර ලෝ දෙක්හි ම වැඩ සාධා දී නො ලන හෙයින් ඉතා කිලුටු වූ ය. ඒ හැමට ත් වඩා මොහ ය නම සියල්ලකට ම බාධා ව සිටිනා හෙයින් බලවත් කිලුටෙකැ'යි වදාළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ.

Non-Commercial Distribution

එ හෙයින් නුවණැත්තවුන් විසින් දුශ්චරිතයෙනු ත් නැවත මසුරු සිත් නැති ව දන් දීමෙහි තර අදහස් ඇති ව සව් කෙලෙසුන් නසා අධිමුක්ති වූ ලෙසින් ත්‍රිවිධ බොධීන් එක් තරා බොධියකට පැමිණිය යුතු.

## 198. සැරියුත් මහ තෙරුන් වහන්සේ ගේ සද්ධි විහාරික නාමක ගේ වස්තුව

තව ද ශාසනානුරූප පිළිවෙතක් මුත් වෙද කම් ආදි වූ මිථ්‍යා ජීවයෙහි නාපුර හඟවන්ට සැරියුත් මහ තෙරුන් වහන්සේ ගේ සද්ධි විහාරික නමක ගේ වස්තුව කියමු.

කෙ සේ ද යත්—

ඒ වහන්සේ එක් දවසක් වෙද කම් කොට මධුරාහාරයක් ලදින් හැර ගෙණ එන දැ අතුරු මහ දී සැරියුත් මහ තෙරුන් වහන්සේ දැක 'ස්වාමීනි, මේ මා වෙද කම් කොට ලත් ආහාරයෙක. මුඹ වහන්සේ අනික් තැනකින් මෙ බඳු ආහාරයක් ලබන්ට නැත. ඒ වැළඳුව මැනව. මම වෙදකමින් නිරන්තරයේ මෙ බඳු ආහාර සපයා දෙමි' කී දැ ය. මහ තෙරුන් වහන්සේ උන්දැගේ බස් අසා මුයෙන් බැණ නො නැඟී ම වැඩ පී සේක.

වහන්දැ ද වෙහෙරට අවුත් එ පවත් බුදුන්ට දන්වූ සේක. බුදුහු ද 'පාපයෙහි භය ලජ්ජා නැත්තාහු ගසා කා ඇවිදිනා කවු ඩන් පරිද්දෙන් අභිප්‍රාය ලෙස ලබන්ට ඇති හෙයින් සුව සේ ජීවත් වෙති. ලජ්ජා සම්පන්නයෝ භික්‍ෂාටනයෙන් ලබන දෙයක් විනා සෙසු ලෙස ලබන්ට කරණ උත්සාහයක් නැති බැවින් මෙ ලොව දුක සේ ජීවත් වෙති' වදරා බණ වදරණ සේක්— 'මහණෙනි, මවු පිය ආදි නොවන්නවුන්ට මවු ය, පියෝ ය යනාදීන් කියා ගෙණ නළවා බද ජීවත් වෙත් නම්, මෙ ලොව උඟ සුව සේ ජීවත් වෙති. යම් සේ කපුටුවෝ බත් පැන් ලබනු නිසා බිත්කන් ආදියේ හිඳ තමන් කෙරෙහි සැක කෙරෙතී සිතා ඒ දිසා ව නො බලන බඳුව නිදන්නා සේ හිඳ ලා මිනිසුන්ගේ පමාව දැක උන් තැනින් බැස ලා වැළකිය දී ම වළන්වල තුබූ බත් ආදිය කට පුරා හැර ගෙණ පලා යෙත් ද, එ පරිද්දෙන් ශාසනික වූ පව්ටු පුහුලෝ භික්ෂූන් හා සමඟ ගමට සිඟා ගොසින් සිඟන සිඟමන් තබා ලා කැඳ බත් ආදි ය ඇති තැනක් ම නියම කෙරෙති.

සෙසු ලජ්ජී පෙශල භික්ෂූහු ගෙ පිළිවෙළින් සිඟා පිළිගැන්මෙහි ත්, අනුභවයෙහි ත්, හැර පීමෙහි ත්, පමණ දන්නා බැවින් යපෙන පමණක් පිළිගෙණ අසුන් හලට අවුදින් සකසා පස් විකාගෙණ කැඳ

Non-Commercial Distribution

වළඳා ලා බත් වේලා එන තෙක් කමටහන් මෙනෙහි කෙරෙති. හදරා පිරිවාති අසුන් හලම හිඳිති. පවිටු අදහස් ඇති පුහුල් එ කී දෙයින් කිසිවකු ත් නො කොට නො සිහන බඳු ව ලා හිඳී. සෙසු භික්ෂූන් තමා දිසාව බලත ත් තෙමේ නො බලන බඳු ව, අතිකෙක සිත හෙළා හිඳිනා බඳු ව, නිදන බඳු ව, සෙමෙන් සිට ගැට ගන්වන බඳු ව, සිවුරු තනන බඳු ව' ලැසි ගෙන ලා තණි පංගුව ගෙණ හුනස්නෙන් නැඟී ගම් වැද කැඳ බත් ඇතැ'යි කියා නියම දත් ගෙවලින් එක් තරා ගෙයකට ගොසින් ගෙවල මිනිසුන් මඳක් දෙර පියා ලා දෙර කඩ සිටිනා කල්හි එක් අතෙකින් දෙර හැර ලා ඇතුළු ගෙට වැදී ගෙවල මිනිස්සු ඔහු දැක කොට ලූ සැටියෙන් දී ලන්ට රුචි නැත ත් එක් තැනෙක හිඳුවා ලා කැඳ බත් ආදියෙන් යමක් ඇත් නම් ඒ දෙති. එ තෙමෙ අනුභව කරණ විත රක් අනුභව කොට ඉතිරියෙක් ඇත් නම් පාත්‍රයෙන් හැර ගෙණ ගොසින් කැමැත්තක් කෙරෙයි. මෙ තෙම කවුඩන් සේ සූරු ව ගසා කන බැවින් මෙ ලොව සුව සේ ජීවත් වෙයි.

තව ද 'අසවල් තෙරුන් වහන්සේ අපිස් සේක'යනාදීන් ගුණ කියන කල්හි 'කුමක් ද? අපි අපිස් නුවූමෝ ද' යනාදීන් අනුන්ගේ ගුණ නසයි. එ බන්දවුන්ගේ බස් අසා 'මූන්වහන්සේ අපිස්, සතොස් නියාවනැ'යි සිතා ගෙණ අපිස් සතොංස් තැනට දෙමින් සිටී දෙය නොං දී හැර පියති. නපුරු අදහස් ඇති පවිටු පුහුල් තෙමේ මෙ තැන් පටන් නුවණැත්තවුන්ගේ සිත් ගත නො හී බුදුන් ගෙන් ලබන ලාභයෙනු ත් පිරිහී අනුන්ගේ ගුණ ත් මකා අනුන් පැමිණි ලාභ ය ත් නසයි. නැවත භික්ෂූන් උදෑසනක් සේ මහ සෑ ආදියට කළ මනා වතාවත් කොට මඳ කලක් භාවනායෙහි යෙදී හිඳ භාවනා යෙන් නැඟී ගමට සිහා වන් කල්හි තෙමේ මූණ සෝධා පියා රන් වන් කොට රඳා ගොප් කළ සිවුරු වැළඳීමෙන් හා ඇස අඳුන් ගෑමෙන්, ඉස තෙල් ගෑමෙන්, බුලත් කෑමෙන් යනාදීන් ආත්ම මණ්ඩන ය කොට ගෙණ වත් පිළිවෙත් සරු ව හමදනා කෙණකුන් මෙන් මුස්න දෙ පිටට ගසා පියා උගත් වත් ලෙසට ඒ එක් තැනකට දමා පියා දෙරටුව බලා පියා යෙයි. මිනිස්සු ද උදෑසන මහබෝ වඳුම හ'යි පුදම්හ'යි යනාදීන් සිතා වෙහෙරට ආවාහු ඔහු දැක 'මේ විහා ර ය මූන් වහන්සේ නිසා පිරිමැසෙන වන. මූන් වහන්සේට ත් දෙම හ'යි සිතා ගෙණ වත් පිළිවෙත් සරු තැනකට දෙන තරමටත් වඩා දෙති. එ හෙයින් මෙ වැනි ශඨ ප්‍රයොග ඇත් තහු විසිනු ත් මෙ සේ ම සුව සේ ජිවත් විය හැක්ක.

තව ද යම් කෙණෙක් සිත එ බඳු ගුණයක් නැත ත් රූක්‍ෂ චීවර ධාරණාදියෙන් අනුන් කෙරෙහි කරණ සම්භාවනා ව තමන් කරා

Non-Commercial Distribution

නම් වත් ද උයි ත් මෙ ලොව සුව සේ ජීවත් වෙති. මෙ ලෙසින් කරණ ජීවිකාව මුළුල්ලම නිකෘෂ්ට ජීවිකා නම් වෙයි. යම් කෙණෙක් අධර්මයෙන් උපන් පසය අමෙද්ධ්‍යයක් මෙන් සලකා දුහැමෙන් සෙමෙන් ලද දෙයෙක්හි සතුටුව ගෙ පිළිවෙළින් සිහා ලත් දෙයකින් යපෙත් නම් උහු තුමූ පර ලොව ලබන සැපයක් මුත් මෙ ලොව දුක සේ ජීවත් වෙති. එ තකුදු වුව ත් මෙ බඳු ජීවිකාව ජිර වැද්ද හෙයින් යහපතැ'යි වදළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන චතුර් විධ මාර්ග ඥාන නමැති වාසල් වලින් නිවන් පුරයට පැමිණියහ.

එ හෙයින් සත්පුරුෂයන් විසින් මිථ්‍යාජීවයෙන් වැළක සම්‍යක් ආජීවයෙහි පිහිටා නිවන් අත්කට යුතු.

---

## 199. පන්සියයක් උපාසකවරුන් ගේ වස්තුව

තව ද පඤ්චශීල සංරක්‍ෂණයෙහි අනුසස් දක්වන්ට පන් සියයක් උපාසකවරුන්ගේ වස්තුව කියමු.

කෙ සේ ද යත්—

ඒ පන් සියයක් උපාසකවරුන් අතුරෙන් සමහර කෙණෙක් පණිවායෙන් වැළක වෙසෙති. සමහර කෙණෙක් අයිනාදනින් වැළක වෙසෙති. සමහර කෙණෙක් පරදරයෙන් වැළක වෙසෙති. සමහර කෙණෙක් බොරු කීමෙන් වැළක වෙසෙති. සමහර කෙණෙක් රා පීමෙන් වැළක වෙසෙති. උහු එක් දවසක් අප ම කරණ දෑ යහපත, අප ම කරණ දෑ යහපතැ'යි විවාද කොට ගෙණ සනිටුහන් කොට ගත නො හී බුදුන් කරා ගොසින් එ පවත් දන් වූ ය. බුදුහු ත් උන්ගේ කථා අසා එකක් එකකට අඩු නො කොට හැම ම රක්ක නො හැකි නියාව වදරන සේක් – 'උපාසකවරිනි, යම් කෙණෙක් තුමූ යට ත් පිරිසෙයින් ලේඩිල්ලන් පටන් උඩත් පිරිසෙයින් මහ බඹුන් දක්වා සංවෘති ව්‍යවහාර වශයෙන් සත්‍වයන් සාහත්‍ථිකාදී ප්‍රයොග සයින් එක් තරා ප්‍රයොගයකින් නසත් ද, අර්ථභඤ්ජක මෘෂාවාද කෙළි පිණිස වත් කියත් ද, නැවත අනුන් සන්තක ද හූ වැළක් විතර ත් සොර සිතින් හැර ගනිත් ද තව ද පරදර කර්මයෙහි ත් හැසිරෙත් ද, රා බී ඇවි දිත් ද, එසේ වූවෝ පර ලොව දුක් තිබෙව යි මෙ ලොව ම පිහිටක් ලැබ ගත නො හෙති.

'එ සේ හෙයින්, උපාසකවරිනි, පඤ්ච විධ දුශ්චරිතයෝ නම් ඉතා ලාමකයහ. අකුශල සිද්ධ වන්නේ ත් ලොභ මොහ දෙක හෙතු කොට ගෙණ හෝ ය. දෙෂ මොහ දෙක හෙතු කොට ගෙණ හෝ ය. හුදෙක් මොහය හෙතු කොට ගෙණ හෝ ය, එ හෙයින්

Non-Commercial Distribution

මේ අකුශල හෙතුහු තුන් දෙන සතර අපායට පමුණුවනු නිසා තොප කරා නො නැමෙත්ව'යි වදාළ සේක. දෙශනා කෙළවර පන් සියයක් උපාසකවරු හැම දෙනා සමෘද්ධ වූ පන් සිල්හි අනුසසින් සෝවාන් වූහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් පඤ්ච ශීල ය මුළුල්ල කොට වේව යි, නැත. ශක්ති වූ ලෙස සතරක් වේව යි, තුනක් වේව යි, දෙකක් වේව යි, යටත් පිරිසෙයින් එකක් වේව යි, රැක ලොවී ලොවුතුරා සැප ත් සිද්ධ කට යුතු.

# 200. තිස්ස නම් ලදරු භික්ෂූන් ගේ වස්තුව

කව ද ප්‍රශංසා කටයුත්තට අප්‍රශංසා කිරීමෙහි නපුර හඟවන්ට තිස්ස නම් ලදරු භික්ෂූන්දෑගේ වස්තුව කියමු.

කෙ සේ ද යත්—

ඒ භික්ෂූන්දෑ අනාථපිණ්ඩික සිටාණන් දෙන දනට ද, විශාඛාවන් දෙන දනට ද, සෙසු සෙස්සන් දෙන දනට ද, සෙස්සවුන් තබා කොසොල් රජ්ජුරුවන් දුන් අසදිස මහ දනට ද නින්‍ද ම කරණ දෑ ය. කෙලෙස නින්ද කරණදෑ ද යත් – ඒ ඒ දෙනා දන් දෙන තැනින් ඇල් දෙයක් ලදෙත් ඇලැ'යි කියා දෙඩන දෑ ය. හුණු දෙයක් ලදෙත් හුණු ය යි කියා දෙඩන දෑ ය. මඳ කොට දුන්නු නම් 'මෙ සේ දෙන දන් නො දී තබා පූකල නපුරු ද උන් දුන් දන් පමණෙක. අප වැළඳූ පමණෙක. උන්ගේ දීම ත් උදරතර නො වී ය. අපගේ වැළඳීම ත් බොහෝ නොවී ය'යි දෙඩන දෑ ය. දන් බොහෝ කොට දුන්නු නම් 'මුන්ගේ ගෙයි තබා ලන්ට අවසරයක් නැති සැටි ය. වහන්දෑට නම් යපෙන පමණක් දිය යුතු වේ ද? මෙ තෙක් කැඳ බත් නිෂ්ප්‍රයෝජන ව අපවත් වී ය'යි දෙඩන සේක. තමන්ගේ නෑයන් දී ලන කොට ලන දෙයක් නැත ත් 'අනේ අපගේ නෑයන්ගේ ගෙවල් නම් සතර දිගින් ආ වහන්දෑට පැන් ලිඳක් හා සරි ය' යනාදීන් කියා ප්‍රශංසා කරණ දෑ ය.

උන්දෑ තමා මුලින් කවුරු ද යත්—එක් නුවරෙක වාසල සිටිනා කෙණකුන්ගේ පුතණුවෝ ය. දනවුවල ඇවිදිනා වඩුවන් හා එක් ව සැවැත් නුවරට අවුදින් මහණ වූ දෑ ය.

වහන්දෑ ද දන් දෙන්නවුන්ට මෙ සේ දෙඩා ඇවිදිනා නියාව දැක 'මුන් තමන්ගේ නෑයන් උසස් කොට අනුන්ට හෙළා දෙඩන

Non-Commercial Distribution

නියාව කුමක් සේ දෝ හෝ යි පරීක්‍ෂා කරම්හ'යි සිතා 'ඇවැත්නි, තොපගේ නෑයෝ කොයි දැ'යි විචාරා 'අසවල් ගම ය' යනු අසා නෑයන්ගේ තරම විමසන්ට බාල වහන්දෑ කීප නමක් යවූ සේක. ඒ වහන්දෑ ද ඒ ගමට ගොසින් ගම ඇත්තවුන්ගෙන් කැඳින් බතින් සාද විඳ ගෙණ 'මේ ගමින් නික්ම මහණ වූ තිස්ස නම් කෙණෙක් ඇද්ද? උන්ගේ නෑයෝ කවුරු දැ'යි විචාළ සේක. මිනිස්සු ද ඒ අසා 'මේ ගම කුල දරු කෙණකුන්ගෙන් මහණ වූ කෙණෙක් නැත. කවුරුන් අරභයා වදරන නියා දෝ හෝ යි සිතා 'ස්වාමීනි, මේ ගම ප්‍රසිද්ධ කෙණකුන්ගෙන් මහණ වූ කෙණෙක් නැත. වාසල බලන තැනැත්තවුන්ගේ පුතකු වඩුවන් හා එක් ව පලා ගොසින් මහණ වුව යි ඇසුම්හ'යි කියා ලා 'ඒ සඳහා වදරන නියා වනැ'යි කීහ.

විමසනු නිසා ගිය වහන්දෑ ද කියා ලූ ලෙසට උන්දෑගේ ඒ ගම එ බඳු පොහොසත් නෑ කෙණකුන් නැති නියාව සැවැත් නුවරට ගොසින් 'ස්වාමීනි, මූ තුමූ නිකම් ම දෙඩා ඇවිදිති' සියලු පවත වහන්දෑට කී සේක. වහන්දෑ ද එ පවත් බුදුන්ට දන් වූ සේක. බුදුහු ද 'මෙම්බා මහණෙනි; තුමූ තෙල ලෙස දෙඩා ඇවිදින්නේ දන් මතු නො වෙයි. පෙර ත් දෙඩා ම ඇවිද්ද, ඒ දෙඩීම නිසා මෙ පරිද්දෙන් ම නින්ද පරිභව ත් ලදැ'යි වදරා—

'බහුම්පි සො විකත්ථෙය්‍ය — අඤ්ඤං ජනපදං ගතො'

යනාදීන් කටාහ ජාතක ය විස්තර කොට වදරා 'මහණෙනි, යම් කෙණෙක් අනුන් මඳ කොට වෙව යි බොහෝ කොට වෙව යි, නපුරු කොට වෙව යි, යහපත් කොට වෙව යි, දූන් කල්හි ත් නො හොත් සෙස්සවුන්ට දී තමන්ට නුදුන් කල්හි ත් මුසුප්පු වෙත් ද, උන්ට ලෞකික විෂයෙන් ධ්‍යානයෙක් වත් ලොවුතුරා විෂයෙන් මාර්‍ග ඵලයෙක් වත් නූපදවන්නේ ය'යි වදරා බණ වදරන බුදුහු සත්ව යන් මඳ කොට වුව ත්, බොහෝ කොට වුව ත්, නපුරු කොට වුවත්, යහපත් කොට වුව ත්, ස්ථවිර නවක මද්ධ්‍යමයන් කෙරෙහි සිත පහදවා ගෙණ පහන් ලෙසින් සෑදෑ සිත් ඇති ව දන් දෙත් නම් එසේ අනුන් දෙන දෙයෙහි සිත පහදවා ගත නො හී යම් කෙණෙක් මුසුප්පු වෙත් ද, උෟ තුමූ රෑ වුව ත්, දවල් වුව ත්, උපචාර වශයෙන් වුව ත්, අර්පණා වශයෙන් වුව ත්, මාර්‍ග වශයෙන් වුව ත්, මාර්‍ග ඵල වශයෙන් වුව ත්, සිත එකඟ වීමකට නො පැමිණෙති. යම් කෙණ කුන්ට රහත් මගින් එ හැම මුලින් ම නසන ලද්දේ වී නම් ඔහු

Non-Commercial Distribution

ලොවී ලොවුතුරා ගුණ විශෙෂයට පැමිණෙති' වදාළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන සෝවාන් ඵලාදියට පැමිණියහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් තමා ගෙන් දී ලන කොට ලන දෙයෙක් නැත ත් අනුන් කරණ දෙමයහි සිත පැහැදවීම් පමණකු ත් කොට එයින් ජනිත වූ කුශලානුභාවයෙන් භව සැප ත් වළඳා කෙළවර නිවන් සම්පත් අත් කට යුතු.

## 201. උපාසකවරුන් පස්දෙනකු ගේ වස්තුව

තව ද එකඟ සිතින් යහපත් කොට බණ අසා ගැන්මෙහි යහපත දක්වනු සඳහා උපාසකවරුන් පස්දෙනකුගේ වස්තුව කියමු.

කෙ සේ ද යත්—

ඒ උපාසකවරු පස් දෙන බණ අසනු කැමැති ව විහාරයට ගොසින් බුදුන් වැඳ ගෙණ එකත් පස් ව හුන්හ. සර්‍වඥවරයන්-ට ද 'මූ රජ දරුවෝ ය, මූ බ්‍රාහ්මණයෝ ය, මූ පෝසත්තු ය, මූ දුප්පත්තු ය, මුන්ට බණ වඩා කියමි. මුන්ට අඩු කොට කියමි' යන අදහස් උපදනට නැත. කවර ත් කෙණකුන් අරභයා බණ වදරන කළ වදරන බණ පොම්භාසතුන් කරා පැමිණ පෝසත් වීමක් හෝ දුක්පතුන් කරා පැමිණ දුක්පත් වීමක් හෝ නැති බැවින් ධර්‍ම ය තෙමේ එක තරම් ම ය. එ හෙයින් ධර්‍ම ගෞරව ය පෙරදැරි කොට ආකාශ ගංගා ව බිමට බානාක් මෙන් අති විස්තර කොට දෙසන සේක. එ සේ බණ වදරන බුදුන් ලඟ හිඳ බණ අසන පස් දෙනා ගෙන් එක් කෙණෙක් බණ ඇසීමෙහි තර අදහසක් නැති බැවින් හිඳ ම නිදන්නාහු ය. එක් කෙණෙක් ඇඟිල්ලෙන් බිම හිරි හැඳ හැඳ හුන්හ. එක් කෙණෙක් ලඟ සිටි ගසෙක අත්තක් සොලව සොලවා හුන්හ. එක් කෙණෙක් බණ එන අත් බලන්නා සේ ආස බල බලා හුන්හ. එක් කෙණෙක් ගිය වේලෙහි පටන් අසන්ට ගිය බණ හෙයින් වික්‍ෂෙප රහිත ව සකසා බණ ඇසූ ය.

අනඳ මහ තෙරුන් වහන්සේ බුදුන්ට පත් සල සලා සිටි සේක් උන් පස් දෙනාගේ ම බණ අසා ගන්නා සැටි ය දැක 'ස්වාමීනි, මුඹ වහන්සේ මුන් පස් දෙනකු හෙයින් පර්‍ජ ත් මද වේ දැ'යි නො සිතා සතර මහ දිවයින එක් පැහැර වස්නා වැස්සක් මෙන් බත දෙසන

Non-Commercial Distribution

සේක. මූ පස් දෙන මුඹ වහන්සේ මෙ ලෙස බණ වදරත ත් එක් කෙණෙක් රෑ නිදි නො ලද්දු සේ නිද නිදා හිඳිති. එක් කෙණෙක් ඇසූ ඇසූ බණ වැල්ලේ ලියං සිතට නහන්නා සේ බිම හිරි හැඳ හැඳ හිඳිති. එක් කෙණෙක් වල් ව ගිය කෙණකුන් තමන් හුන් නියං ව හහවන්ට අතු පතු සොලවන්නා සේ අත්තක් සොල ව සොලවා හිඳිති. එක් කෙණෙක් නකත් තරු බලන්නා සේ අහස බල බලා හිඳිති. එක් කෙණෙක් කන් යොමු කොට සකස් කොට ම අසති' වදාළ සේක.

බුදුහු ඒ අසා 'ආනන්දයෙනි, තොපි මුන් හැම දනු දෑ' යි විචාළ සේක. 'නො දනිමි, ස්වාමීනි' කී කල්හි 'මෙම්බා මුන් හැම දෙනා ගෙන් යමෙක් තෙමේ අසන බණ තබා ලා නිදා නම් ඒ තෙමේ සියක් ජාතියෙහි සර්ප ව ඉපැද දරණ ගබ හිස තබා නිදි ය. දෑනු ත් මූට නිදීමෙන් රිසි යැමෙක් නැත. එ හෙයින් මාගේ බණ මූ කන හෙන්ට නැතැ'යි වදාළ සේක. අනඳ මහ තෙරුන් වහන්සේ 'ස්වාමීනි, ඒ සර්ප ව උපන් ජාති පන් සිය ය පන්තීන් වදාළ නියා ද? නො හොත් අතරතුරෙක උපන් ජාති ගෙණ වදාළ නියා දෑ'යි විචාළ සේක. 'ආනන්දයෙනි, මූ කලෙක මිනිස් ලොව හා කලෙක දේවතාව හා කලෙක නාග ව උපන් කල්හි නාග ව උපන් ජාති ගෙණ කියතො ත් එ සේ නාග ව උපන් ජාති බුදු නුවණිනු ත් පිරිසිඳ දත නො හැක්ක. පිළිවෙළින් ම පන් සියයක් ජාතියෙහි නාග ව ඉපැද තර ව නිඳූ හෙයින් දෑනු ත් නිදන්ට සුරු ය'යි වදාළ සේක.

ඔහු බණ අස අසා හිඳ නිදීමට කාරණ ය වදරා ලා ඇඟිල්ලෙන් බිම හිරි හැඳ හැඳ උන් තැනැත්තේ පිට පිට මෙළා පන් සියයක් ජාතියෙහි ගැඩවුල් ව ඉපැද යන එන ගමනේ බිම හිරි හැඳ දෑනු ත් ඒ අභ්‍යාසයට බිම හිරි ඇඳීම පමණක් මුත් උයි ත් අසන බණෙක් නැත. අත්ත සොලව සොලවා හුන් තැනැත්තේ ද පිළිවෙළින් ජාති පන් සියයෙක වඳුරු ව උපන. දෑනු ත් පෙර පුරුද්දට අතු පත් සොලව සොලවා හිඳී. අත්ත සෙලවුණු හඬ අස ත් මුත් මා කියන බණින් ඌ කන හෙන දෙයෙක් නැත. ආස බල බලා හුන් බමුණු ද පිට පිට මෙළා පන් සියයක් ජාතියෙහි නැකැති ව උපන. ඒ ඒ ජාතිවල නකත් තරු බල බලා පුරුදු හෙයින් ද අද ත් ආස ම බලයි. මා කියන බණින් ඌට ඇසෙන දෙයෙක් නැත. එ හෙයින් ඇළ අශුද්ධ කලට කුඹුරට වදනා දියක් නැත්තා සේ උන් හැම දෙනා ගේ ත් ක්‍රියා නමැති ඇළ නපුරු ව අදහස් නමැති කුඹුරුවලට සදහම් නමැති පැන්

Non-Commercial Distribution

වදිනට නො වී ය. තෙල යහපත් කොට බණ අසන තැනැත්තේ පිට පිට හෙළා පන් සියයක් ජාතියෙහි වෙද මන්ත්‍ර හදරන බ්‍රාහ්මණ ව උපන්හ. දනු ත් මන්ත්‍ර සමන්නා කෙණකුන් මෙන් සකස් කොට බණ අසති'යි වදාළ සේක.

'ස්වාමීනි, මුඹ වහන්සේ වදරන බණ නම් සිත හෙළා අසන්නවුන්ට තුනු ඡවිය ත් බොල ඡවිය ත් මසු ත් නහර ත් ඇට ත් වැද ගෙණ ගොසින් ඇට මිදුලේ පැහැර සිටිනට ඇත. මොහු සතර දෙන කුමක් නිසා සිත හෙළා නො ඇසුණැ'යි විචාළ සේක. 'ආනන්‍දයෙනි, අපගේ ධර්‍මය අසන්ට හැම දෙනාට පිළිවන්දැ'යි වදාළ සේක. 'හැයි, ස්වාමීනි, අසන්ට බැරි සැටි ත් ඇද්දැ'යි විචාළ සේක. එ සේ ය'යි වදාළ කල්හි 'කුමක් නිසා දැ'යි විචාළ සේක. 'ආනන්‍දයෙනි, තුනුරුවන් නම් පමණකු ත් ලක්‍ෂ ගණන් කප්වල මේ සත්‍වයන් ඇසූ විරූ නැත. එ හෙයින් අනභ්‍යාස හෙයින් මේ ධර්‍මය අසන්ට සිත් පමණකු ත් හට නො ගන්නී බුදු නුවණිනු ත් නො දත හැකි අක් මුල් නැති සසර මේ සත්තු සග මොකට ඩහක් රාම-ගීතාදි කථා ම අසා පුරුද්දෝ ය. එ හෙයින් කෙළි මඩුලු ආදියෙහි පිරෙන පිණක් නැත ත් නටා ගී කියා ඇවිදිති. ගෙයි පටන් බණ අසන්ට ම නියැලී ගොසින් අසන බණ තබා කෙළි ලළුයෙන් දවස් යවති. එ බඳු යහපත් අදහස් පමණෙකු ත් නැතැ'යි වදාළ සේක.

වදරා ලා එ බඳු අදහස් නැති වන්ට කාරණ වදරණ සේක් 'ආනන්‍දයෙනි, රා දෙස් ඈ කෙලෙසුන් නිසා සත්‍වයන්ට එ බඳු අදහස් ඇති නො වෙයි. කල්ප විනාශ කාලයෙහි සත් හිර පහළ වීම නිසා උපන්නා වූ කප ගින්න ත් දවුව මනා දෙයින් කිසිවකු ත් නො තබා දවයි. එතකුදු වුව ත් ඒ ගින්න කිසි කලෙක දවයි. රාග නමැති ගින්න නො දවන කලෙක් නැත. එ හෙයින් දුමු ත් නො දක්වා අඟුරු ත් ඇති නො කොට ශරීර ය ඇතුළත ම ඇති ව දවීමෙන් රාග ය වැනි වූ ගින්නකු ත් නැත. යක්-පිඹුරු-කිඹුල් ආදීහු හැම කල් ම ඇල්විය නො හෙන්නෝ වෙති. ද්වෙෂය තෙමේ යම් තාක් ප්‍රහීණ නො වී නම් හැම කල් ම අල්වයි. එ හෙයින් ද්වෙෂ ය වැනි වූ අපායෙහි හෙළීමට තර ව අල්වන කෙණකු ත් නැත. නැවත ඉස වසා අවුල් ව හී මෙන් මොහ ය වැනි වූ දළෙකු ත් නැත. ගං වැව් ආදි ය පිරී තිබෙන කලු ත් අඩු ව තිබෙන කලු ත් වියළී තිබෙන කලු ත් පෙනෙයි. තෘෂ්ණා නමැති ගඟ පිරුණු කලක් වෙව යි, වියළුණු කලක් වෙව යි, රහත් මඟින් නැසෙන තැන් දක්වා පෙනෙන්ට නැත. නිරන්තරයෙන් අඩු ව ම පෙනෙන හෙයින් පුරා ලිය නො හැකි වීමෙන් තෘෂ්ණාව වැනි වූ ගඟකු ත් නැතැ'යි වදාළ සේක.

Non-Commercial Distribution

දෙශනා කෙළවර සකස් කොට බණ ඇසූ උපාසකයෝ සෝවාන් වූහ. තවත් පැමිණි යම් කෙණකුන්ට මේ දෙශනාව සප්‍රයෝජන වී ය.

එ හෙයින් නුවණැත්තවුන් විසින් රාගාදි කෙලෙසුන් තදඞ්ගාදි වශයෙන් නසා ශීල සංරක්‍ෂණාදී වූ සුචරිතයෙහි හැසිර භව ක්‍ෂයට උත්සාහ කටයුතු.

## 202. මෙණ්ඩක මහා සිටාණන්ගේ වස්තුව

තව ද දන මුඛයෙන් පැවති පරිත්‍යාග ය තෙමේ ලඝු වී නමුත් නුග බිජු වට කුඩා වුව ත් එයින් ඇති වන ශාඛා මහත් වන්නා සේ විපාක මහත්ව ය භවත්ට මෙණ්ඩක මහ සිටාණන් ගේ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්—

බුදුහු අඞ්ගුත්තරාප නම් දනවුවෙහි සැරි සරන සේක් මෙණ්-ඩක මහ සිටාණන් ද, ඇඹෙණියන් චන්‍ද්‍රපද්මා දේවීන් ද, පුතණුවන් ධනඤ්ජය සිටාණන් ද, යේළණියන් සුමනා දේවීන් ද, මිනිබිරි-ණියන් විශාඛාවන් ද, පුණ්ණ නම් වූ කොල්ලණුවන් දූ යි මුන් හැමදෙනා සෝවාන් වන්ට නිසි පින් ඇති නියාව දූන භද්දිය නුවරට වැඩි සේක. මැඩ මහ සිටාණෝ ද, එ නුවරට බුදුන් වැඩි නියාව ඇසූ ය.

උන්ට මැඩ මහ සිටාණෝ ය යි කියන්ට කාරණ කවරේ ද යත්—උන්ගේ ගෙ පිටිපස්සෙහි බිජුවට එක් යාළ දෙළසාමුණක් විතර වප් යන තැන්හි මහත් තරමින් ඇතුන් සා වූ ත් මද්ධ්‍යම තරමින් අසුන් සා වූ ත් කුඩා තරමින් ගොන් සා වූ ත් සන රන් මුවා එළුවෝ මහ පොළොව පළ ගෙණ පිටින් පිට පැහැර පැන නැංගාහු ය. උන්ගේ කටවල පස් පැයෙකින් විසිතුරු වූ පලස් හූවට ගන්වා තිබෙයි. ගිතෙල් තල තෙල් ආදියෙන් හෝ රත් රන් මුතු මැණික් ලෝ කඩ තඹ යකඩ ආදියෙන් හෝ ප්‍රයෝජන යක් ඇති කල්හි හැම එළුවන් සිටිය දී එකක්හුගේ කටින් වුව ත් පලස් හූවට ගැළ වූ නම් දඹදිව වැස්සන්ට සෑහෙන පමණ ලෙස එකී දෙය නික්මෙයි. එ තැන් පටන් මූ තුමූ මැඩ මහ සිටාණෝ ය යි ප්‍රසිද්ධ වූ හ.

එ සේ එළුවන් ලැබීමට කළ පින කවරේ ද යත්—විපස්සි නම් බුදුන් සමයෙහි මූ තුමූ අවරොජ නම් වූ බුදුන් දවල් දවස

Non-Commercial Distribution

වැඩ හිඳිනා ලෙස ත් දවල් බණ වදරන ලෙසත් කුඤ්ජර ශාලා නම් වූ මණ්ඩප ගෙයක් කරවාලී නම් යහපතැ යි සිතා වලට මිනිසුන් යවා ඊට නිසි වූ දඬු පත් ගෙන්වා ගෙන එක් වැඹෙක් රන් බඳවා ය. එක් වැඹෙක් රිදී පත් සඹලවා ය. එක් වැඹෙක් රුවන් කර්මාන්ත කරවා ය, යි මෙ සේ වැඹ ජේකඩ පුවරු සහල සංගාළියම් [1] දෙරලි දෙර බා ගොනැස් පුවට්වු ආදියත් රන් බැඳුව මනා දෙයෙහි රන් බඳවා රිදී පත් සඹල මනා දෙයෙහි රිදී පත් සඹලවා රුවන් කර්මාන්ත කැරවුව මනා දෙයෙහි රුවන් කර්මාන්ත කරවා මයිලණුවන් කැර වූ ගඳකිළියට ඉදිරියෙහි සත් රුවන් මුවා වූ කුඤ්ජර ශාලා නම් මණ්ඩපයක් කැර වූ ය. සොයන උළු ත් එ ලෙස ම කරවා සොයවා නිම වූ ය.

ඒ මණ්ඩපයෙහි කොටත බිබිල රන්මුවා ය. බිසෝ කොටුව හා කැරැල්ල පබළු මුවා ය. ඒ කුඤ්ජර ශාලාව මැද බුදුන් වැඩ හිඳිනා විතරකට වෙන තෝරා රුවන් මඩුවකු ත් කරවා ලා බුදුන් වැඩහිඳ බණ වදරන ලෙසට හැඳකු ත් කරවාලූ ය. ඒ ඇඳෙහි ඇඳ පත් හැඳවතු ත් ඝන රන්මුවා ය. රන් එළුවන් සතර දෙනකු කරවා ඇඳ පා සතරට පා අළු කොට ලවා ලූ ය. ඝන රන් එළුවන් දෙන්නකු කරවා ආසනයෙහි වැඩ හිඳිනා කල පය ඔබා ගන්නා ලෙසට තැබ්බුවූ ය. එළුවන් සදෙනකු ඝන රනින් කරවා මණ්-ඩප ය වට කොට සිටුවා ලූ ය. බණ වදරන්ට වැඩ හිඳිනා ඇඳ ද පළමු කොට හූ ලණුවලින් වියවා ලා මද්ධ්‍ය ය රන් කෙන්දෙන් වියවා ලා මොළොක නිසා මුඳුන පටහුයින් වියවූ ය. වැතිර වැඩ හිඳිනට සඳුන් දණ්ඩෙන් පිටාවුවකු ත් ගස්වා ලවා ලූ ය.

මෙ සේ කුඤ්ජර ශාලාව නිමවා ලා කරවා නිමි පූජාව කරණු තැනැත්තෝ බුදුන් ප්‍රධාන කොට ඇති එක් ලක්‍ෂ අට සැට දහසක් වහන්දැට ආරාධනා කොට සාර මසක් මුළුල්ලෙහි මහ දන් දුන්හ. දන් දී නිමවන දවස් හැම දෙනා වහන්සේටම තුන් සිවුරට සෑහෙන ලෙස පිළී පිළිගැන්වූහ. හැම දෙනා වහන්සේට පැවිද්දෙන් බාල ව සිටි නම් ලත් සිවුරු පිළී දහසක් වට්ටී.

මෙ සේ විදර්ශී බුදුන් සමයෙහි මේ පින්කම කොට එයින් සැව දෙව් ලොව ත් මිනිස් ලොව ත් අගති ගමනක් නූ වූ හෙයින් චුති ප්‍රතිසන්ධි වශයෙන් මිය ඉපැද ඇවිදිනාහු අනූ කපක් ගෙවා පියා මේ අප ගේ බුදුන් බුදු වූ කප බරණැස් නුවර මහ සැප ත් ඇති සිටු කුලයෙක ඉපැද බරණැස් සිටාණෝ ය යි ප්‍රසිද්ධ වූ ය. උන් එක්

1 සහලියම්, සහළියම්, සහාළියම්

Non-Commercial Distribution

දවසක් රජ්ජුරුවන් දක්නට යන්නෝ පෙරෙවි බමුණානන් අතුරු මහදී දැක 'කුමක් ද, ආචාරිනි, නකත් මොහොත් බලා පරීක්ෂා කෙළේ ඇද්දැ'යි විචාරා අනික් අප කරන්නේ කිම ද? ඊට ම නියැලී ඉඳිනා බැවින් බලන්නමෝ වෙ දැ'යි කී කල්හි රටට වන වැඩ අවැඩ කවරේ දැ'යි විචාළෝ ය. සෙසු කුමක් ද? එක් භයෙක් වෙ යි' කියා ග්‍රහ විස්නයක් දැක දෝ කීහ. කුමන භයෙක් දැයි සිටාණන් විචාළ හෙයින් සායක් රටට වන නියා කිවු ය. කෙ-තෙක් කලින් දැ යි සිටාණන් විචාළ කල්හි තුන් හවුරුද්දකින් වන නියා ව කිවු ය.

සිටාණෝ ඒ අසා බොහෝ ගොවිතැනු ත් කරවා ඉනු ත් ගෙයි ඇති වස්තු ත් වියදම් කොට ශාලි වරීහි ආදී ධාන්‍යයන් රැස්කරවා එක් දහස් දෙ සිය පනසක් විතර බඩසල් වෙයි. කරවා ලා ඒ හැමයේ ම දෙ ලෙසින් එක් කළ වී පුරවා ලූ ය. බඩසල්වලට බොහෝ දෙය අවසර ව තිබෙන සැළි තෘළි කළ කොතලා ආදියෙහි පුරවා පියා තව ත් බොහෝ හෙයින් බිම වළ ගස්වා පියා ලවා තව ත් බොහෝ හෙයින් ම මැටි හා එක් කොට හනා පිය භිත්ති වල ගස්වා පීහ.

තුන් හවුරුද්ද පලා ගොසින් සාය අවුත් වන් කල්හි නියඟ තද හෙයින් ගොයම් කිරීම් නැති ව අඩුව[1] පුරා සම්භ වන වී සාල් නැති ව රැස් කොට තුබූ වී සාල් කන්ට පටන් ගෙන බඩසල් මුළුල්ලෙහි වී ත් නිමා සැළි වලන් ආදියෙහි තුබූ වී ත් නිමි කල්හි බත් කන අය ත් බොහෝ හෙයින් බතු ත් සපයා ගත නො හී පරිවාර කැඳවා ලා 'තෙපි හැම දෙන පිළිවන් පිළිවන් තැනකට පලා ගොසින් ජීවත් ව ගෙන රට බත් ඇති කලට මා ළඟට එනු කැමැති කෙණෙක් නැඟී එව. ඊට ත් බාධා නැත. එනු නො කැමති කෙණකුන් අවමැනවැ යි නැත. ගිය ගිය තැන ම රඳන බව ය. සාය අවධියේ යවා පී හෙයින් නො ආව යි කියා අපි මුසුප්පු ත් නැතැ'යි කිවු ය. උඹ හැම ත් රඳා ජීවත් විය නො හැකි හෙයි නු ත් සිටාණන්ගෙන් සම්මත ඇති හෙයිනු ත් පලා ගියහ.

සාය නො සලකා ස්වාමි පක්ෂ පාත කම් ම තකා උන් ළඟ පුණ්ණ නම් කොල්ලණු කෙණෙක් ම රඳා පීහ. එ හෙයින් උන් හා සමඟ සිටාණෝ ය. සිටු දූවණියෝ ය, පුතණුවෝ ය. යෙළණියෝ යයි පස් දෙනෙක් ම වූ ය. රැඳුණු පස් දෙන බිම වළ වල තුබූ වී ත්

---

1 අවුව

Non-Commercial Distribution

නිමී කල්හි මස් දවස් ගණනක් නො ව සාය තුන් හවුරුද්ද ම සිටි හෙයින් හිත්තිවල වී මුසු මැටි ත් සාරා වගුරුවා ගෙන මැටි තෙමා වී වෙන් කොට ගෙන ඉනු ත් යැපෙති. සිටාණන්ගේ ඇඹේණියෝ ද සාය ත් බලවත් ව මැටියෙහි තුබූ වී ත් නිමා ගෙන යන්නා හිත්ති කැබැල්ලෙක තුබූ මැටි සුහ සාරා වගුරුවා ගෙන තෙමා පියා ගරා පෙරා වී දෙ නැළියක් දුක සේ ලදින් එ ගෙම හෙයින් පැර පියා සාල් නැළියක් ලදින් සාය සමයේ සොරුන් බොහෝ හෙයින් රැක තබනු නිසා කළයක ලා ලා පස් නො වදනා ලෙසට වසා ලා එළියේ තුබූ වෝ ත් සොරුන් කළයේ නො නවත්නා හෙයින් බිම වළක් සාරා ලා පස් වසා තබා ලූහ.

සිටාණෝ ද රජ්ජුරුවන් දක පියා අවුත් 'සොඳුර, බඩ සා ය. කිසිවක් ඇද්දැ'යි විචාළෝ ය. උයි ත් සාල් නැළියක් පමණ ඇති හෙයින් නැතැ යි නො කියා 'සාල් නැළියෙක් ඇතැ'යි කිවූ ය. ඒ කොයි දැ යි විචාළ කල්හි සොරුන් හැර ගනිති යි සිතා සඟව තබා ලූ නියා ව කිවූ ය. 'එ සේ වී නම් ඒ මැත් කොට ගෙණ පිසව යි කිවූ ය. සිටු දුවණියෝ තමන් ඉතා ලෙටි පාට ව හෙයින් මේ සාල් නැළියෙන් උළු කැඳක් පිසම් නම් මනාව මනාව බැවින් දෙ වේලකට ඇත. බතක් පිසතො ත් අප පස් දෙනකු හෙයින් සෙස්සවුන් හැර මුන් වහන්සේ නො කන හෙයින් එක වේලකට මුත් නැත. විචාරා අදහස් ලෙසක් කරම් යි සිතා 'කුමක් පිසම් දැ'යි විචාළෝ ය. සිටාණෝ 'තොපගේ බලයෙන් රැක තබා ගත් මේ සාල් නැළි ය විනා අනික් ජීවනූපායක් නැත. මියන ගමන් බත් අනුභව කොට ම මියම්හ. බත් ම පිසව'යි විධාන කළහ. උයි ත් සාල් නැළියේ බත පිස ලා පසු ව පමණ නො දනෙන හෙයින් ආදී කොට ම කොටස් පසක් කොට බෙද ලා සිටාණන්ට නිළ කළ කොටස තළියෙක ලා ලා ඉදිරියේ තබා ලූ ය.

ඒ වේලාට හිමවත ගඳමහන් පව්වෙහි නන්‍ද මූලක නම් ගල් ලෙණ වසන පසේ බුදු කෙණකුන් වහන්සේ සමවන් සමවතින් නැගී සේක. ඇතුළු සමවත දී සමවත් බලයෙන් බඩ සාය නො දනෙයි. සමවතින් නැගි කල ම ක්ෂුධාව බලවත් වෙයි. එ දවස් බතක් නො ලදෙත් ආහාර ක්‍ෂයින් මරණ වන හෙයින් ලබන තැනක් සලකා ම සිහා වඩිනා සේක. එ දවස් ඔබට දන් දුන් කෙණෙක් සෙනෙවිරත් තනතුරු ආදියෙන් එක්තරා තනතුරකට පැමිණෙති. එ හෙයින් එ දවස් පසේ බුදුන් වහන්සේ ද දිවසින් ලොව බලන සේක් සියලු දඹදිව සාය ගැති වි ය. බරණැස සිටානන්ගේ ගෙයි සාල් නැළියක් විතර බතක් පැසී තුබූයේ ය.

බත් වන්නා මදක් වුව ත් ඇති ව තුබූ යේ වේ ද? සංග්‍රහ කිරීමට තරම වූ සැදෑ සිත් කිම දෝ හෝ'යි විමසා පස් දෙන ම සැදෑ ඇති නියාව ත් සංග්‍රහ කරන්ට බල ඇති නියා ව ත් දැන ගැට වටු ගන්වා පාත්‍ර ය ත් පටවා ගෙන නිල් වූ ගුවන් කුසින් නිල් බිමෙක ලා ලන රන්වන් පට්ටිකාවක්[1] මෙන් වැඩ සිටාණන්ගේ ගෙයි දෙරකඩ සිහා සිටි සේක.

සිටාණෝ ද ඔබ දැක පහන් සිත් ඇති ව පෙර ත් කම් පල අදහා දනක් දී නුවූ ලූ හෙයින් දෝ සායක් දුටුම්හ. මේ බත් සුහ රැක පියා නම් එක දවසක් පමණ රැක පිය යි. මුන් වහන්සේට පිළිගන්වා පීම නම් පින් විෂයෙහි පවත්නා කුසල් ජවන් හෙයින් අසූරු සනකට සතර නැළි ගන්නා ලාස්සෙන් එක්සිය පනස් යාළ සතරමුණු අටලාස්සක් වී ඇට ගණනේ කුසල් ජවන් උපදනා හෙයින් දී ලන බත් සිහිත්ත මද වුව ත් කුසල් ජවන් බොහෝ වූ පමණින් නො එක් කප් කෙළ ගණනෙහි ලොව් සම්පත් සාධා දී ලා කෙළවර ලොවුතුරා සැපතු ත් සාධා දී ල යි සිතා බත් තලි ය ඉවත් කොට තබා ලා පසේ බුදුන් කරා ගොසින් පසඟ පිහිටුවා වැඳ ලා ඉතා වඩා ගෙණ ගොසින් ඒ බත් තළි ය හැර ගෙණ පසේ බුදුන්ගේ පාත්‍රයට පිළිගන්වන්ට වන්හ. භාගයෙනු ත් භාගයක් විතර පිළිගන්වා ලූ කලට පසේ බුදුහු අතින් පාත්‍ර ය වසා ගත් සේක. 'ස්වාමීනි, මේ බත් සුහ නම් සාල් නැළියේ බත් පස් කොටසක් කළායෙන් එක් කොටසෙක. මේ දෙකක් කරන්ට නො පිළිවන. කරණ සංග්‍රහයක් පරලොවින් මුත් මෙ ලොවින් නො කැමත්තේ ය. සුහකු ත් නො රඳවා පිළිගන්වනු කැමැත්තෙමි' කියා ලා තමන් ලත් කොටස පිළිගන්වා පීහ.

පිළිගන්වා ලා 'ස්වාමීනි, මේ ජාතියේ පටන් නිවන් දක්නා ජාති දක්වා මෙසේ වූ සායකුත් නො දකිමව'යි මෙ වක් පටන් දඹදිව වැස්සන්ට බත් බිජුවට ත් දිය හෙම්ව යි. සිය අතින් කර්මාන්ත ය කුත් නො කෙරෙමව යි. එක් දහස් දෙසිය පනසක් විතර බඩ සල් අවසර කරවා ලා ඉස් සෝධා නා පියා බඩ සල් දෙරකඩ හිඳ සිස් වූ ආස බලන්නා ම අදහස නො සිස් ව රත්හැල් වී කඳු අවුදින් සිස් ව තුබූ බඩ සල් පුරා ලව යි. උපනුපන් තැන මෙ ම සිටු දූවණියෝ අඹු වෙත්ව යි. මෙ ම පුතණුවෝ පුත් වෙත්ව යි. මෙ ම යේළණියෝ යේළි වෙත්ව'යි මෙ ම කොල්ලණුවෝ කොලු වෙත්ව'යි කියා ලා පතා ගත්හ. දී පියන දන් සවල්ප වුව ත් පතා ලූ පැතීම් සුහ නො වී ය.

1 පට්ටිගාවත්

Non-Commercial Distribution

සිටු දූවණියෝ තමන් ලත් බත් කොටස ත් පසේ බුදුන්ට පිළිගන්වා ලා 'නිවන් දක්නා ජාති දක්වා සායකු ත් නො දකිම් ව යි, සාල් දෙ නැළියක් විතර පැසෙන සැළි ගැවෙකින් බතක් පිස තබා ගෙණ දඹදිව වැස්සන් මුළුල්ලට බත් බෙදා දෙත ත් යම් තාක් නැගී නො සිටිම් ද ඒ තාක් සැළියේ බත් නො ගෙව ව යි, උප නුපන් ජාතියෙහි මේ සිටාණන් වහන්සේ ම මට ස්වාමි වන සේක් ව යි, මේ පුතණුවෝ පුත් වෙත් ව යි, මෙ ම යෙළණියෝ යෙළි වෙත් ව යි, මෙ ම කොල්ලණුවෝ කොලු වෙත් ව'යි පතා ගත්හ.

පුතණුවෝ ද තමන් ලත් බත් කොටස ත් පසේ බුදුන්ට පිළි ගන්වා ලා 'මෙ වක් පටන් මෙ සේ වූ සායකු ත් නො දකිම්ව'යි දහසින් බඳ පියල්ලක් හැර ගෙණ දඹදිව් වැස්සන්ට රන් බෙදා දෙත ත් පියල්ල අඩු නො වේව'යි නිවන් දක්නා ජාති දක්වා මෙ ම දෙ මවු පියෝ ම දෙ මවු පියෝ වෙත් ව යි, මෙ ම ඇඹෙණි යෝ අඹු වෙත් ව යි, මෙ ම කොල්ලණුවෝ කොලු වෙත් ව'යි පතා ගත්හ.

යෙළණියෝ ද තමන් ලත් බත් කොටස ත් පසේ බුදුන්ට පිළි ගන්වා ලා 'මෙ වක් පටන් මෙ සේ වූ සායකු ත් නො දකිම් ව යි, තිඹක් පල්ලාසක් විතර වී ගන්නා වී පෙට්ටියක් ඉදිරියේ තබා ගෙණ සියලු දඹදිව් වැස්සන්ට බත් බිජුවට බෙදා දෙත ත් පෙට්ටි ය අඩු නො වේව'යි කියා පතා ගත්හ. නැවත එ වක නැදි මයිලන් ම නැදි මයිලන් වන්ට හා එ වක ස්වාමි වූ සිටු පුත්‍රයන් ම ස්වාමි වන ලෙසට පතා ගත්හ.

කොල්ලණුවෝ ද තමන් ලත් බත් කොටස ත් පසේ බුදුන්ට පිළිගන්වා ලා 'මෙ වක් පටන් මෙ සේ වූ සායකු ත් නො දකිම් ව යි, සීයක් සෙම් නම් මැතින් හී විටි තුනක් හා ඇතින් හී විටි තුනක් හා මධ්‍යයෙන් හී විටක් හා එක් දඬු ඔරු සා හී විටි සතෙක් එක විට යේව'යි පතා ගත්හ. උඵ එ දවස් කැමැත්තො ත් සෙනෙවි රත් තනතුරක් වත් ලබන්ට නිසි ව ස්වාමි දරුවන් කෙරෙහි කළ ස්නේහයෙන් 'මේ ස්වාමි දරුවෝ ම ජාති ජාතියෙහි ම ස්වාමි දරු වෙත්ව'යි පතා ගත්හ.

පසේ බුදුහු ද ඒ හැම දෙනාගේ ප්‍රාර්ථනා කෙළවර 'ඒ එ සේ ම වේව'යි වදරා ප්‍රත්‍යෙක බුද්ධ ගාථාවෙන් අන්මෙවුනි කොට ලා 'යන ගමනිනු ත් හැම දෙනාගේ සිත පහද ලුව මනා වේ ද'යි සිතා මෙ තැන පටන් ගඳ මහන් පවුව දක්වා යන්නා වූ මා මොහු බලබලා සිටිත්ව'යි ඉටා ලා වැඩ පී සේක. උයිත් ඔබගේ ඉටන් බෙලෙන්

Non-Commercial Distribution

බල බලා ම සිටියහ. උන් වහන්සේ ත් වැඩ සාල් නැළියේ බත් පත් සියක් පසේ බුදුවරුන් වහන්සේ හා සමඟ බෙද වැළඳූ සේක. ඒ බත සුභ වුව ත් උන් වහන්සේගේ ආනුභාව ය නුසුඟ බැවින් හැම තැනට ම සෑහිණ. ඔහු පස් දෙනා බෙද වළඳනා නියාව බල බලා සිටියහ.

හිර මුඳුනෙන් ගැළ වූ කලට සිටු දූවණියෝ ද සැළි ය සෝධා පියා මලාවෙකින් වසා තබා ලූ ය. සිටාණෝ ද බඩ සාය බලවත් හෙයින් වැද හෙව නිදා පියා සවස පිබිද ඇමෙණියන්ට 'බඩ සාය දැඩි ය. බත් පිසූ සැළි පල්ලේ දමු කඩ ඇද්දැ'යි කිවූ ය. සිටු දූව ණියෝ සැළි ය සෝධා තිබූ නියා දැන ත් නැතැ යි නො කියා මලාව හැර ලා ම හඟවමි' නැඟී සිට සැළි ය කරා ගොසින් වසා ලූ මලාව හැර ලූ ය. ඒ ඇසිල්ලෙහි ම තුඹ මල් රැසක් වැනි වූ බතින් සැළි ය පිරී වසා ලූ මලාවත් උපුල්වා ගෙණ සිටියේ ය.

උයි ත් ඒ දැක ප්‍රීතින් පිනා ගොසින් සිටාණන්ට 'සවාමීනි, නැඟී සිටිය මැනව. මම වැළි ත් බත් පිසූ සැළි ය සෝධා පියා වසා ලා තබා ලීමි. දැන් ඒ සැළි ය තුඹ මල් රැසක් වැනි වූ බතින් පිරී තිබිණ. පින් නම් නො මැළි ව කළමනා දෙයක. තමාට නැත ත් දන් නම් දිය යුතු දෙයෙක. දන් දී මෙහි විපාක ඔබ්බෙන් අසා දත මැනැවැ'යි නැති ව අපි ම ඇස දුටුම්හ. නැඟී සිට බත් අනුභව කළ මැනැවැ'යි කියා ලා දෙ පුතු පියන්ට බත් ලා ලූ ය. උන් බත් කා නැඟී සිටි කලට යේළණියන් හා එක් ව වැද හිඳ බත් කා ලා ඉඳුල් බත්[1] පුණ්ණ නම් කොල්ලණුවන්ට දුන්හ.

සැළියේ බතු ත් උතුරුකුරු දිව සාල් නැළියෙක බත සේ නො ගෙවෙයි. එ දවස් ම එක් දහස් දෙ සිය පනසක් විතර බඩ-සලු ත් රත් හැලින් පිරිණ. සැළි වළන් ආදිය ත් ආදි පිරුණා සේ පිරිණ. සිටාණෝ ද 'අපගේ ගෙයි බත් ඇති වී ය. බත් බිජු වටින් ප්‍රයොජන ඇති කෙණකුන් අවුත් හැර ගත මැනැවැ'යි නුවර විධාන කැර වූ ය. නුවර වැස්සෝ ද උන් ගෙන් බත් බිජුවට ලත්හ. නුවර වැස්සන් තබා සියලු දඹ දිව් වැස්සෝ ත් සිටාණන් නිසා බත් බිජුවට ලත්හ. එ වක් පටන් සිටාණන් ගේ කුශල මහිමයෙන් රට සාය ත් නැති වී ය.

සිටාණෝ ද ආයු පමණින් සිට ලා එයින් චුත ව දෙව් ලෝ මිනිස් ලෝ දෙක්හි චුති ප්‍රතිසන්ධි වශයෙන් හැසිරෙන්නෝ මේ

---

1 ඉස්වුන බත–ඇතම

Non-Commercial Distribution

අපගේ බුදුන් සමයෙහි භද්දිය නුවර සිටු කුලයෙක උපන්හ. සිටු දුවණියෝ ද මහ සම්පත් ඇති සිටු කුලයෙක ඉපැද වැඩි විය පැමිණ මැඩ මහා සිටාණන්ට ම සරණ අවු ය. ඒ සිටාණන් කුඤ්ජර ශාලාව කරවා ලූ පින් කම නිසා ගේ පිටි පස්සෙහි රන් එළුවෝ පහළ වූහ. කරවන ඒ වක පුතණුවෝ දනු ත් පුත් වූහ. යෙළිඹයෝ යෙළි ම වූහ. කොල්ලණුවෝ කොලු වූහ.

එක් දවසක් සිටාණෝ තමන් කළ කුශලයෙහි විපාක විමසනු කැමැති ව එක් දහස් දෙ සිය පනසක් විතර බඩ සල් අවසර කර වා ලා තුමූ ඉස් සෝධා නා පියා බඩ සල් ලඟ හිඳ ආස බලා ලූ ය. රත් හැල් වී කඳු අවුදින් බඩ සල් පුරවා ලී ය. සිටාණෝ සිටු දුවණියන්ට ත්, පුතණුවන්ට ත් යෙළණියන්ට ත්, කොල්ල-ණුවන්ට ත් තමන් විමසූ ලෙස ම විමසන්ට විධාන කළහ. විධාන ලදින් සිටු දුවණියෝ ආභරණ ලා සැරහී ගෙණ බොහෝ දෙනා බල බලා සිටිය දී සාල් දෙ නැළියක් මන්වා පියා ඉන් බත් පිසවා ලා දෙරටුවේ පුටුවක් ලවා ගෙණ හිඳ රන් කෙණෙස්සක් හැර ගෙණ 'බත් කනු කැමැති කෙණෙක් අව මැනැවැ'යි විධාන කරවා ලා ආ ආවුන් ගෙණ ගෙණා වළන් පුර පුරා දෙති. දවස මුළුල්ලේ බත් බෙද දී ත් සැළියේ බත් අඩු වන්ට නැත.

උන් තමන් සසර සිටිනා කල බුදු පාමොක් මහ සඟනට වමතින් මලාව හා දකුණතින් සැන්ද හැර ගෙණ පාත්‍ර ය පුරා බත් පිළිගැන්වූ හෙයින් වමත්ල පුරා ගෙණ පියුම් ලකුණෙක් උපන. දකුණු අත්ල පුරා ගෙණසඳ ලකුණක් උපන. කෙණ්ඩිකා ඩබරා ආදි ය හැර ගෙණ පැන් ඇති තැනට ගොසින් පැන් පරභා දීම් ආදි වූ මෙහෙවර කළ හෙයින් දකුණු පත්ල පුරා ගෙණ සඳ ලකුණ උපන. වම් පත්ල පුරා ගෙණ පියුම් ලකුණ උපන. එ හෙයින් උෟ තුමූ චන්දපදුමා නම් වූහ.

උන්ගේ පුතණුවෝ ත් ඉස් සෝධා නා පියා දහසින් බඳ පියල් ලක් හැර ගෙණ 'රන් වුව මනා කෙණකුන් අව මැනැවැ'යි කියා ලා ආ ආවුන්ට බෙද දී සවස නැගී සිටිනා වේලාට මසු දහසින් මස්ස කු ත් අඩු නො වීය. යෙළණියෝ ද සව් බරණ ලා සැරහී ගෙණ වී පෙට්ටියක් හැර ගෙණ දෙර මිදුලේ වැද හිඳ බත් බිජු වට කැමැත්තවුන් රැස් කරවා ලා ආ ආවුන්ට ගෙනා ගෙනා වළන් පුරා දුන්හ. සවස නැඟී සිටින වේලාට පෙට්ටිය පිරුණු වන ම තුබූයේ ය. කොල්ලණුවෝ ද තමන් පළදනට තිසී ආභරණ ලා සැරහී ගෙණ රන් වියයේ රන් රැහින් ගොන් යොද ගෙණ රන්

Non-Commercial Distribution

කැව්ටක් හැර ගෙන ගොන් ඇඟ සුවඳ පස'හුල් දී ලා හං සතරේ රන් කුප්පි බහා ලා කුඹුරට ගොසින් සීයට පවත් ගත්හ. දෙ ඇළයෙන් තුන තුන හා මැදින් එකක් හා හී විටි සතෙක් එක් දඬු ඔරු සා වයෙයි. දඹ දිව වැස්සෝ බත් බීජු වට ආදිය ත් රත්රන් ආදිය ත් සිටාණන් ගෙන් ම ගෙන යන්නාහ.

මෙණ්ඩක මහ සිටාණෝ ද බුදුන් එ නුවරට වැඩි නියාව අසා පෙර ගමන් කොට නික්මුණු තැනැත්තෝ අතුරු මග දී නිවටුන් නො එක් වාහකුල් කියා බුදුන් කරා ගමනට බාධා කොට කීව ත් උන් හැම දෙනා කරණ වාහකුලට ත් වඩා කුශල කර්මයාණන්ගේ පැරැත්ත ය බලී හෙයින් නො නැවත ගොසින් බුදුන් වැද එකත් පස් ව හුන්හ. බුදුහු ත් නො නැවත ආ ලෙසට ප්‍රසාදයක් දෙන්නා සේ බණ වදළ සේක. බණ අසා සෝවාන් වීමෙන් අපායට යන ගමන නැවැත්තා සේ ම තමන් බුදුන් කරා එන ගමන ත් නිවටුන් නවතන්ට උත්සාහ කළ නියාව කිවු ය.

බුදුහු ඒ අසා වදරා 'සිටාණෙනි, අනුන්ගේ මඳ වරදෙක් ඇත් නමුත් ඒ සුව සේ ම පෙනී යෙයි. හබ ඇට විතරට කුඩා වුව ත් මහ මෙර විතරට ත් මහත් ව පෙනෙයි. තමාගේ මහ මෙර විතරට ත් මහා වරදක් වුව ත් පරමාණුවක් විතරට ත් ඒ නො පෙනෙයි. අනුන්ගේ කුඩා වූ වරද මහත් කොට දැක ත් එ විතරෙකින් රඳා පූමවාත් යහපත් වේද එසේ නො කොට උස් තැනෙක සිට රොඩු පොළා නහන්නා සේ ඒ ඒ තැන කියා ඇවිදිති. තමන්ගේ මහත් වරදක් වුව ත් සිනෙන් සැඟවෙන්නා සේ බළලුන් ඇස පියා ගෙන දී කන්නා සේ පර ලොව නො සැඟවෙත ත් පක්ෂි වැද්දහු කැළයෙකැ යි අවුත් හිඳිනා ලෙසට කොළ කැළවලින් තමාගේ ශරීර ය වසන්නා සේ සඟවති' වදළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටුහ.

එ හෙයින් සත් පුරුෂයන් විසින් තම තමන්ගේ ඇති නුගුණ සැඟවීමෙන් හා අනුන්ගේ ඇති නුගුණ ප්‍රකාශ කිරීමෙන් හා සිද්ධ වන වියවුල් නො වැද්ද දී කුශල්හි ම හැසිර ලොවී ලොව්තුරු සැප ත් සිද්ධ කට යුතු.

## 203. වරද සොයන තෙරුන් වහන්සේ ගේ වස්තුව

තව ද යහපත් අදහසෙකින් නො ව පව්ටු අදහසින් වරද සෙවීමෙහි දෙෂ හඟවන්ට කිපි සිත් ඇති ව වරද සොයන තෙරුන් වහන්සේගේ වස්තුව දක්වමු.

Non-Commercial Distribution

කෙ සේ ද යත්—

ඒ තෙරුන් වහන්සේ 'මුන් හැඳ ගත්තේ මේ සේ වේ ද? මුන් පෙරව ගත්තේ මෙ සේ වේ ද? මුන් හුන්නේ මෙ සේ වේ ද? මුන් සිටියේ මෙ සේ වේ ද? මුන් කෑයේ මෙ සේ වේ ද? මුන් පූයේ මෙ සේ වේ ද? යනාදීන් නපුරු අදහසින් අතුරම සොය සෙයා ඇවිදිනා සේක. වහන්දෑ ද 'ස්වාමීනි, අසවල් තෙරුන් වහන්සේ කියා ඇවිදින්නේ මෙ සේ වේ දැ'යි බුදුන්ට දන්වූ සේක. බුදුහු 'මහණෙනි, යම් කෙණෙක් නපුරු අදහසින් අනුන්ට වරද සලසන්ට මෙ ලෙස කියා කියා ඇවිදිත් නම් උන්ට ලොවී ලොවුතුරා ගුණ විශෙෂ—යෙන් කිසි ද දෙයකු ත් නූපද්දී. ආසට පොළොව දුරු වූවා සේ පොළොව ආසට දුරු වූවා සේ නිවනට උන් දුරු හෙයින් නො ගොස් සිටිනා පැනෙක කසළ බොහෝ එන්නා සේ රාග ද්වෙෂාදී කෙලෙස්හු ම ඕ හට වඩිති' වදාළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් අනුන් වරද සලසම්හ යි තමා වරදෙහි නො සැලසී පිළිවන් ලෙසක අනුන් වුව ත් සත් අපථයෙක ම යොද තමා ත් සත් පථයෙක්හි යෙදී නිවන් අත් කට යුතු.

## 204. සුභද්‍ර පරිබ්‍රාජකයන් ගේ වස්තුව

තව ද කරණ පින් කම ලැසි ගත් කල දී ලන විපාකයක් ලැසි ගන්නා නියාව හඟවන්ට සුභද්‍ර පරිබ්‍රාජකයන්ගේ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්—

ඌ තුමූ ගිය දවස බාල මලණුවන් එක ගොයම් මුරයේ නව අගස් බතක් දෙන ගමනේ දී ගත නො හී පසු බැස කෙළ වර දී අගස් බත කුම් වුව ත් දන් පමණක් දුන්හ. කොණ්ඩඤ්ඤ මහ තෙරුන් වහන්සේ බුදුන් ආදීයෙන් බණ වදාළ දවස් පළමු කොට නිවන් දුට ත් මූ තුමූ ප්‍රථම බොධියෙන් බුදුන් දැක ගත නුහුණු වූ ය. කෙළවර කොට ලා පිරිනිවන් පානට වැද හොත් දවස් 'මම මගේ සැක තුනක් මාලු මාලු පරිබ්‍රාජකවරුන් විචාරා මහණ ගොයුම්හු බාල ය යි සිතා නොසින් විචාරන්ට ගව් ඇති ව නො විචාළෙමි. දැන් පිරිනිවන් පානට හොත්තෝ ය. මහණ ගොයුම්හු අතිනු ත් බලා වුව ත් නුවණ බාල නො වන බැවින් විචාරා පියන්ට නො වී ය යි විපිළිසරෙක් උපන් නමුත් නපුරැ'යි

Non-Commercial Distribution

බුදුන් කරා ගොසින් අනද මහ තෙරුන් වහන්සේ නවතා වදාළ ත් කෙළවර කොට ත් කොට ලූ කුශල කර්ම මහිමයෙන් බුදුන් ගෙන් අවසර ලදින් තිරයෙන් ඇතුලට වැද ලා හැඳ යව වැද හිඳ 'කුමක් ද? මහණ, අහස පිය ඇත් ද? ශාසනයෙන් පිටත මහ ණහු ඇත් ද? නො නස්නා වූ ප්‍රත්‍යය සමුත්පන්න ධර්මයෝ ඇත් ද'යි මේ ප්‍රශ්න තුන විචාළහ.

බුදුහු ඕ හට ප්‍රශ්න විසඳීම් මුඛයෙන් බණ වදාරණ සේක් 'හෙම්බල පිරිවැජිය, මේ අහස පැයෙන් වේව යි, සැටියෙන් වේව යි, කියා පෑ ලිය හැකි පියවර ත් නැත. මේ ශාසනයෙන් පිටත වැව හාර පමණින් මුත් සතර මග සතර ඵලයෙහි පිහිටි ශ්‍රමණයෝ ත් නැත. මේ ලෙව්හි අනධිගත සත්ත්වයෝ නම් තෘෂ්ණා, ප්‍රපඤ්චාදි වූ ප්‍රපඤ්චයෙහි යෙදී වෙසෙති. සම්‍යක් සම්බුද්ධයෝ බෝ මැඬදී ම නසා පී හෙයින් ප්‍රපඤ්ච රහිතයහ. ප්‍රපඤ්ච තබා සව් කෙලෙස්හු ම නැත්තෝ ය. නො නස්නා සුලු වූ පඤ්චස්කන්ධ කෙණකු ත් නැත. උඃ හැම ම නස්නා සුල්ලෝ ය. සම්‍යක් සම්බුද්ධ වරයන් ශාශ්වත ග්‍රාහ උච්ඡෙද ග්‍රාහ නැති බැවින් ඒ විෂයෙහි සැලීම් පෙළීම් නැතැ'යි වදාළ සේක. දෙශනා කෙළවර සුභද්‍ර පරිබ්‍රාජක යෝ අනගැමි වූහ. සෙසු ත් බොහෝ දෙනාට මේ දෙශනාව සප්‍රයෝජන වි ය.

එ හෙයින් නුවණැත්තවුන් විසින් සුචරිත පූරණයෙහි ලැසි නො ගෙණ ත්‍රිවිධ සුචරිත පුරා ලොව් ලොවුතුරා සැපත් ලැබීම ට ත් පසු නො බැස්ස යුතු.

## 205. විනිශ්චයාමාත්‍යයන් ගේ වස්තුව

තව ද තරාදියක් සේ මැදහත් නොවී මෙන් අමධ්‍යස්ථ වීමෙහි නපුර දක්වන්ට විනිශ්චයාමාත්‍යයන්ගේ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්—

එක් දවසක් වහන්දෑ සැවැත් නුවර උතුරු වාසල් දෙර කෙරේ ගම සිඟා වළඳාලා වළදා අන්තයෙහි නුවර මැදින් විහාරයට වඩනා සේක. එ වේලාට වැස්සෙක් වස්නට වන. වැසි හෙයින් මහ ගාවා සිටි අධිකරණ ශාලාවකට මාගී සංඥව එළවා ගෙණ වැසි පායන තෙක් වැද අධිකරණ නායකයන් අත්ලස් නිසා හිමියන් නො හිමි කරවන නියා ව දුන 'අපි මුන් මැදහත් ව යුක්ති විචාරති සිතුම්හ. අධිකරණ ශාස්ත්‍ර නො දන්නා අපට ත් දූනෙන තරම් අයුක්ති

Non-Commercial Distribution

මුන් නො දන්නට කාරණ නැත. මැදහත් කමක් නැති නිසා ම ය'යි සිතා වැසි පායා පී කල්හි විහාරයට ගොසින් බුදුන් වැඳ එකත් පස් ව හුන් සේක්-එ පවත් බුදුන්ට දන් වූ සේක.

බුදුහු 'මහණෙනි, තෙල ලෙස යුක්ති විචාරන්නෝ මැදහත් නො වෙති' වදරා මැදහත් නො මැදහත් දෙ පක්ෂය දක්වන සේක් 'යම් කෙණෙක් ගිහි වූ නමුත් නෑ කමක් හෝ මිත්‍ර කමක් හෝ උපකාරයක් හෝ තකා උන් කෙරෙහි ප්‍රෙමයෙන් බොරු කියා නො හිමියන් හිමි කෙරෙත් ද, ශාසනික වූ නමුත් ඒ හැම තකා සාවැද්දයන් නිරවැද්ද කෙරෙත් ද, නැවත යම් කෙණකුන් කෙරෙහි මුසුප්පු ඇත්තෝ වී නම් බොරු යුක්ති කියා ලා හිමි යන් නො හිමි කෙරෙත් ද, ශාසනික වුවො ත් පක්ෂබල ලදින් නිර වැද්දයන් සාවැද්ද කෙරෙත් ද? සාවැද්දයන් නිරවැද්ද කෙරෙත් ද, නැවත අත්ලස් කා පියා කෑ අත්ලස් සලකත් මුත් යුක්ති නො සලකා යුක්ති විචාරන වෙලේ දී නො ඇසූ කන් ව කියන දෙය සිත හෙළා නො අසා ප්‍රතිසාත්‍යනය දෙක නැත ත් මොහයෙන් මුළා ව ගොසින් හිමියන් නො හිමි කොට නො හිමි යන් හිමි කෙරෙත් ද, ශාසනික වුවො ත් පාත්‍ර චීවරාදියෙහි ආලයෙන් පැමිණි විනිශ්චය ඉදුරා නො විචාරීමෙන් විනිශ්ච ය නසා ද-

'තව ද යම් කෙණෙක් පොහොසත්තු වූ නම් නො හිමි වුව ත් හිමි කරවා නුලූවො ත් ගහටයක් වැද හෙති යන හයින් අයුක්ති ය ම යුක්ති කොට කියත් ද, ශාසනික වුව ත් මෙ බඳු අදහසින් මූණු බලා අධර්ම අවිනයෙන් විනිශ්චය කෙරෙත් ද, යම් කෙණෙක් කවුරුන් කෙරෙහි ත් ප්‍රතිසාත්‍යනය නැති ව ශාස්ත්‍රානු රූප ව ධර්ම විනයානුරූප ව පැමිණි කටයුත්ත විචාරා මැදහත් ලෙසින් පනත් කොට ලත් නම් උඟ තුමූ ධර්මිෂ්ඨ නම් වෙති' වදළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් ඡන්දදී වූ අගති ගමන කළුවර දෙ පෝයේ චන්ද්‍රයාගේ කුඩා වීමට කාරණ වන්නා සේ හානියට කාරණ ය යි සලකා ඡන්දදියෙන් අගතියට නො ගොස් සුගති ය සිද්ධ කට යුතු.

---

## 206. සවග වහන්දෑගේ වස්තුව

තව ද දුෂ්ප්‍රතිපත්තියෙහි නපුර දක්වනු පිණිස සවග වහන්-දෑගේ වස්තුව කියමු.

Non-Commercial Distribution

කෙසේ ද යත්—

ඒ සවග වහන්දෑ විහාරවලත් ගම්වලත් භොජන ශාලා කසල කෙරෙමින් ඇවිදිනා දෑ ය. එක් දවසක් ගම දී වළඳා ලා ආ බාල වැඩි මාලු වහන්දෑ අතින් විහාරයෙහි වැඩහුන් වහන්දෑ 'ඇවැත්නි, ගම භොජන ශාලා කෙසේ තිබේදෑ'යි විචාළ සේක. 'ස්වාමීනි, අප අතින් විචාරන්ට නො කැමැත්තේ ය. සවග වහන්දෑ 'අපි ම සපනුම්හ. අපි ම නුවණැත්තම්හ. අප කළ දෙයකට කවුරු කුමක් කියත් ද? මුන් හැම දෙන ම මතු මුබ වළඳනට රිසි එල-වම්හ'යි මරා තලා ඉස කසළ ලා අපට මෙ ලෙස කොට භොජන ශාලායෙහි බොහෝ ආලොහළ කළ සේකැ'යි කිවු ය. එ පවත් ඇසූ වහන්දෑ ද බුදුන්ට දන් වූ සේක. බුදුහු ඒ අසා 'මහණෙනි, යම් කෙණෙක් මිතභාණී නො ව තමන් දෙඩමලු බැවින් සරුප් පමණකු ත් නො සලකා දෙඩා පුරා ගෙන ඇවිදිත් ද උඹ නුව-ණැත්තහ යි නො කියම්. යම් කෙණෙක් නිෂ්පාපීහු වී නම් නුව-ණැත්තෝ නම් ඔහු ය'යි වදළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන සතර මහ සතර ඵලයට පැමිණියහ.

එ හෙයින් නුවණැත්තවුන් දුශ්චරිතයෙන් දුරු ව සුචරිත පුරා නිවන් දහම් පසක් කටයුතු.

---

## 207. ඒකුදන රහත් තෙර කෙණකුන් වහන්සේගේ වස්තුව

තව ද දෙවියන්ට වුව ත් මිනිසුන්ට වුව ත් කායික ක්‍රියා-වෙනු ත් වාචසික ක්‍රියාවෙනු ත් නිර්ව්‍යාජ්වා තැන් ප්‍රසාදවහ නියාව හඟවන්ට ඒකුදන[1] රහත් තෙර කෙණකුන් වහන්සේගේ වස්තුව දක්වමු.

කෙසේ ද යත්—

ඒ තෙරුන් වහන්සේ තමන් වහන්සේ ගණ සඞගණිකායෙහි ඇල්මක් නැති හෙයින් එක් වන ලැහැබෙක තනිව ම වසන සේක.

'අධිචෙතසො අප්පමජ්ජතෙ-මුනිනො මොනපථෙසු සික්ඛතො,
සොකා න භවන්ති තාදිනො-උපසන්තස්ස සදා සතීමතො.'

යන මේ උදන ගාථාව ඉතා පුහුණු ය. එ සේ හෙයින් පොහෝ දවස් බණට හඩ ගානා අනික් කෙණකුන් නැති හෙයින් තමන් වහන්සේ ම බණට අඩගා පියා බණ අසන්ට එන මිනිසුන් මහ

---

1 ඒකුද්දන රහත්තෙර

Non-Commercial Distribution

වල හෙයින් නැත ත් දෙවියන් අරහයා උදන ගාථා ව ම වදරන සේක. බණ අසා පොළොව ගුගුරන කලක් මෙන් දෙවියෝ සාධු කාර දෙති.

ඉක් බිත්තෙන් එක් පොහෝ දවසෙක පන්සියක් පන්සියක් වහන්දෑ පිරිවරා ආගමධර තෙර දෙ දෙණකුන් වහන්සේ ඒකුදාන තෙරුන් වහන්සේ වසන තැනට ගිය සේක. ඔබ ද ඒ දෙ දෙනා වහන්සේ දැක සතුටු ව 'ආ නියා ව ඉතා යහපත. දෙශනාම ය කුශලයක් මුත් ශ්‍රවණ ම ය කුශල ය අපට තනි ව හිදිනා හෙයින් සිද්ධ වන්ට නැත. බණ කිව මැනව. බණ අසම්හ'යි කී සේක. 'ඇවැත්නි, මෙ වල බණ අසන්නෝ කවුරු දැ'යි විචාළ සේක. 'ඇවැත්නි, මෙ වල දී බණ පවත්නා ම පොළොව ගුගුරන්නා සේ දෙවියෝ සාධුකාර දෙති' වදාළ සේක. ආගමධර දෙ දෙනා වහන්සේගෙන් එක් නමෙක් පෙළ කියවා ලන සේක. එක් නමෙක් අත්‍ථ කියන සේක. දෙ නම කියන බණ අසා එක දේවතා කෙණෙකු ත් සාධුකාර නුදුන්හ. ආගමධර දෙ නම තුමූ 'ඇවැත්නි, බණ දවසෙක මේ වල දෙවියන් පොළොව ගුගුරුවන්නා සේ සාධුකාර දෙති' කිවූ ය. ඒ කිම් දැ'යි අරුන් වහන්සේ රහත් නියා ව නො දැන බසට සැක වූ සේක.

'ස්වාමීනි, මෙ තෙක් දවස් එ සේ ය. අද කුමක් නිසා සාධුකාර නුදුන් බව ත් නො දනිමි' වදාළසේක. ඒ අසා ඒ දෙන ම ඒ නම විමසනු නිසා 'එ සේ වී නම් තමන් බණ කිව මැනවැ'යි කී සේක. ඔබ ඒ අසා ඊට මැළි නො ව බණ අසන්ට නැඟී ලා විජිනි පත්‍රයක් හැර ගෙණ සමහර කෙණකුන් දවසක් මුළුල්ලෙහි කට එළන තෙක් කළ කථා එක බසෙකින් ම නිමවා ලන්නා සේ එක උදන ගාථාව ම වදාළ සේක. දෙවියෝ ද ආගමධර දෙ දෙන ම බණ කියන තෙක් වේලා නිද පියා එක විට පිබිද ගියා සේ මහත් කොට සාධු කාර දුන්හ. ආගමධර දෙ නමගේ පිරිවර සඟ දහස 'මේ වෙනෙහි දෙවියන්ගේ ත් කටයුත්ත මූණ බලා ය. ආගමධර දෙ නමක් මෙ තෙක් වේලා හිඳ මෙ තෙත් බණ කියත ත් ප්‍රශංසා පමණකු ත් නො කොට මේ මාලු තෙරුන් වහන්සේ දන්නා බණ ත් එ තෙක් ම හෙයින් දෝ එක ගාථාවක් කියන්නා ම සාධු කාර දී කියා ලූ ගාථාව පමණකු ත් වඩා පූ ය' යි නො සතුටු ව විහාරයට ගොසින් බුදුන්ට ත් දැන් වූ සේක.

බුදුහු ඒ අසා 'මහණෙනි, බොහෝ කොට බණ උගත ත් බොහෝ කොට බණ කියත ත් එ ලෙස පිළිපැදීමෙක් නො පෙනේ.



Non-Commercial Distribution

නම් බණ උගත් පමණකින් හා කියන පමණකින් ම ධම්ධර ය යි නො කියමි. යම් කෙනෙක් මදක් වුව ත් අසා ඉගෙන වෙළඳාම් දන්නා කෙණකුන් භාණ්ඩ මූල ය නො නසා වෙළඳාම් කරන්නා සේ පිළිවෙත නො නසා බණ පිළිමසත්[1] නම් උන් ධම්ධර ය යි කියමි. තව ද යම් කෙනෙක් වඩන ලද වීය්‍යී ඇති ව නො පමා වූ නම් උනු ත් පය්‍ය්‍යාප්තියෙහි අභියොග ය මඳ වුව ත් ධම්ධර ය යි කියමි වදාළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් සත් පුරුෂයන් විසින් නිස්සරණාධ්‍යාශයෙන් බණ ඉගෙන පය්‍ය්‍යාප්ති ය ප්‍රතිපත්තියට මුල් හෙයින් පිළිවෙත ත් යෙදී ප්‍රතිපත්ති ය ප්‍රතිවෙධය ට මුල් හෙයින් අධිගම ශුද්ධියට උත්සාහ කට යුතු.

---

## 208. ලකුණ්ටක භද්දිය තෙරුන් වහන්සේ ගේ වස්තුව

තව ද මේ ශාසනයට ගුණෙන් මහත් වීමක් මුත් උසින් මහතින් මහත් වීමෙහි ප්‍රයෝජන නැති නියා ව හඟවන්ට ලකුණ්ටක භද්දිය තෙරුන් වහන්සේ ගේ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්—

එක් දවසක් ලකුණ්ටක භද්දිය තෙරුන් වහන්සේ බුදුන් දැක පියා වඩනා කලට තිස් දෙණකුන් වහන්සේ බුදුන් දක්නට වඩනා සේක් අතුරු මඟ දී ලකුණ්ටක භද්දිය තෙරුන් වහන්සේ දැක කුඩා බුඩා හෙයින් තෙර නමක් නියා ව දත නො හී බුදුන් කරා ගොසින් වැඳ එකත් පස් ව හුන් සේක. බුදුහු ත් ඒ වහන්දෑ රහත් වන්ට නිසි පින් ඇති නියා ව දැන කථාවක් එළවන සේක් 'මහණෙනි, මෙ තැන සිට ලා ගිය ස්ථවිර භික්ෂූහු දුටු දැ'යි විචාරා වදාළ සේක. 'ස්වාමීනි, තෙර නමක් නුදුටුම්හ. හෙරණ කෙණකුන් දුටුම්හ'යි කී කල්හි 'තොප හැම හෙරණුන් හැඳිණි නියා ව යහපත් නො වෙ යි. ඌ හෙරණ කෙනෙක් නො වෙති. තෙර කෙණෙකැ'යි වදාළ සේක. 'ස්වාමීනි, තෙර තැන් පත් ලෙසට කුඩා ව පෙනෙන්නේ හැයි දැ'යි විචාළහ.

'මම, මහණෙනි, මාලු බැවින් හා තෙර හස්නෙහි හුන් පමණෙකින් තෙර ය යි නො කියමි. මාලුව ඉස කන්සක නර නැඟී ත් යන වයස සිස් ව පලා ගියෙයි කියමි. යම් කෙනෙක් චතුර්විධ

---

1 පිරිමසත්

Non-Commercial Distribution

මාර්ග විෂයෙහි දුඃඛ සත්‍ය ය පිරිසිඳ දැන්ම හා සමුදය සත්‍ය ය සමුච්ඡෙද වශයෙන් හැරීමෙන් හා නිරොධ සත්‍ය ය සාක්‍ෂාත් කිරීමෙන් හා මාර්ග සත්‍ය ය හැවීමෙන් චතුරාර්‍ය්‍ය සත්‍ය ය දෙළොස් ආකාරයකින් ප්‍රතිවෙධ කොළෝ ද, එ හෙයින් නව ලොව්තුරා දහ මුත් උන් කෙරෙහි ඇත් ද, නැවත චතුර්විධ බ්‍රහ්ම විහාර භාවනාව ත් ඇත් ද, සිවු පිරිසිදු සිල්හි පිහිටියෝ ද මාර්ග ඥාන නමැති මුඛයෙන් අනන්ත කාලයක් නො දිරා තුබූ රාගාදී කෙලෙස් නමැති අජීර්ණ භොජන ය වමාරා පූ ද, ස්ථවිර බවට කාරණ වූ මෙ කී ගුණෙන් යුක්ත හෙයින් ස්ථවිර ය යි උන්ට කියමි' වදාළ සේක. දෙශනා කෙළවර තිසක් පමණ වහන්දෑ රහත් වූ සේක.

එ හෙයින් සත් පුරුෂයන් විසින් භොග මහත්ත්වාදී තත්ත්වය නො පතා ශීල සමාද්ධ්‍යාදි ගුණ මහත්ත්වයට උත්සාහ කට යුතු.

---

## 209. බොහෝ වහන්දෑ ගේ වස්තුව

තව ද ලාභ සත්කාර මූලික පර්‍ය්‍යාප්තින් ප්‍රයෝජන ය මෙ ලොව කුම් වුව ත් පර ලොව නැති නියා ව හඟවන්ට බොහෝ වහන්දෑ ගේ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්—

එක් සමයෙක වහන්දෑ බණ දහම් උගන්වා ලීමෙන් ධර්‍මාචාරී ව සිටි තැනට සිවුරු ගෙත්තම් කිරීම් ආදී වූ මෙහෙ කරන්නා දැක සමහර වහන්දෑ 'අපි අර්ථ කුම් වුව ත් පද ව්‍යඤ්ජන ඉඳුරා උගත් බැවින් පාළි පමණක් ඉඳුරා ම දනුමහ. එ සේ වූ අපට අත් පා මෙහෙ කිරීම් පමණකිනු ත් ප්‍රයෝජන නැත. අපි ත් බුදුන් කරා ගොසින් 'ස්වාමීනි, අර්ථ නො දන්නා පමණ මුත් පාලි දනුමහ. කවුරුන් කෙරෙ උගත් බණ ත් මුන් කරා අවුත් හදරව'යි ග්‍රන්ථ ධුර පූරක වහන්දෑට විධාන කළ යහපතැ'යි දන්වමහ. එ සේ කලට අපට ත් ලාභ සත්කාර ඇත. එ ලෙසින් අපි ත් ප්‍රසිද්ධ වම්හ'යි යන නපුරු අදහස් ඇති ව බුදුන් කරා ගොසින් එ ලෙස ම කී සේක.

බුදුහු ඒ වහන්දෑගේ අදහසෙහි නපුර දැන වදරා 'මහණෙනි, යම් කෙණකුන්ගේ ශබ්ද මාධුර්‍ය්‍ය ය ඇත ත් ශරීර ශොභා ව ඇත ත් අත්පස් පුරා පිටත සිත්තම් කළ, කළ පරිද්දෙන් ඊර්‍ෂ්‍යාදී නො එක් නුගුණෙන් පිරී සිටිත් නම් උන් යහපතැ'යි මම නො කියමි. යම් කෙණකුන්ට සව් කෙලෙස්හු රහත් මගින් නට වූ

Non-Commercial Distribution

නම් උන් ම සියලු ලෙසින් යහපතැ'යි කියමි' වදළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් සත් පුරුෂයන් විසින් ලාභ සත්කාර නිරපෙක්‍ෂ ව ප්‍රතිපත්ති සාර ව සසර දුක් ගෙවා නිවන් අත් කට යුතු.

---

## 210. හත්ථකයන් ගේ වස්තුව

තව ද යම් කෙණෙක් මහණ වෙස ධරා ත් සැබෑ පමණක ත් කිය නො හෙත් නම් උන්ගේ ඒ ශ්‍රමණ වෙශයෙන් ප්‍රයෝජන නැති නියා ව හහවන්ට හත්ථකයන්දෑ ගේ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්—

උන්දෑ ද වාදීන් හා වාද කරම්හ'යි ගිවිස ලා තෙපි අසවල් තැනට වාදයට එව. එ තැන දී වාද කරම්හ'යි කියා ලා උන් එ තැනට නො යෙන තෙක් පෙරාතු කොට ගොසින් 'දුටුවා වා ද? තීර්ථකයෝ මා කෙරේ හයින් නො ආවෝ ය. නො ආ ගමනින් පැරැද්දෝ ය'යි කියන දෑ ය. වාද කරත ත් අනිකකින් වළහමින් ඇවිදින දෑ ය.

බුදුහු එ පවත් අසා කැඳවා ගෙන්වා ගෙන 'සැබෑ ද? තෝ මෙ බන්දක් කෙරෙයි දෑ'යි විචාරා සැබැවැ යී කී කල්හි කුමක් නිසා තෙල ලෙස කෙරෙයි ද, යම් කෙණෙක් පුරන පිළිවෙතකු ත් නැති ව ධුරද්වයිනු ත් පිරිහී සැබෑ පමණකු ත් නැති ව අල්පෙච්ඡ-තාව දුරින් දුරු හෙයින් ඒ ඒ දෙයෙහි ඉච්ඡාවෙන් අත්‍රිච්ඡතා-වට ත් බොහෝ දෙයෙහි ඉච්ඡාව ඇති හෙයින් මහිච්ඡතාවට ත් අසන්ත ගුණ සම්භාවනයෙහි ඉච්ඡාව ඇති බැවින් පාපිච්ඡතාවට ත් පැමිණියෝ ද, උඹ මුඩු වීම් පමණකින් ශ්‍රමණ නම් නො වෙති. හුදෙක් උකුණන් කෑම නැති පමණෙක. යම් කෙණෙක් සවල්ප වුව ත් පවින් වැලක වෙසෙත් නම් උන් ශ්‍රමණ ය යි කියමි' වදළ සේක. දෙශනා කෙලවර බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් තනතුරු ලද්දවුන් ඒ ඒ තනතුරට නිසි තරම් ඇති වන්නා සේ මහණ වෙස් ගත්තවුනු ත් විසින් ගත් වෙසට තරම් ලෙස වැස භවක්‍ෂයට උත්සාහ කට යුතු.

---

## 211. එක්තරා බ්‍රාහ්මණයාණ කෙණකුන් ගේ වස්තුව

තව ද සිහිම් පමණකින් එ බඳු පිළිවෙත් නැත්තවුන්ට භික්‍ෂු වැවහාර ය නො ලැබෙන නියා ව හහවන්ට එක්තරා බ්‍රාහ්මණ-යාණ කෙණකුන් ගේ වස්තුව දක්වමු.

Non-Commercial Distribution

කෙ සේ ද යත්—

ඒ බමුණානෝ තීර්ථායතනයෙහි මහණ ව සිඟා ජීවත් වන්නෝ මහණ ගෞයුම් තමාගේ සවුවන් සිඟා ජීවත් වන හෙයින් භික්ෂු වැවහරය කෙරෙයි. මම ත් සිඟා ජීවත් වෙමි. සිඟමනින් මාගේ ත් උන් ගේ ත් වෙනස කවරේ ද? මට ත් භික්ෂු වැවහාර ය කළ මනා වේ දැ'යි සිතින් සිතා ගෙණ බුදුන් කරා ගොසින් 'පින්වත් වූ ගෞයුම, ගෙයක් දෙරක් නැති බැවින් මම ත් තොපගේ සවුවන් සේ ම සිඟා ජීවත් වෙමි. මට ත් භික්ෂු ව්‍යවහාර ය කරව'යි කී ය.

බුදුහු ඕ හට වදරන සේක් 'හෙම්බල බමුණ, බඩ පදිනා ලෙසට සිඟා කෑම් පමණෙකින් සිංහ සම් පෙරවී කැණ විලූන්ට සිංහ ව්‍යවහාර කට නො හැක්කා සේ භික්ෂු වැවහාර මම නො කෙරෙමි' වදරා 'හෙම්බල බමුණ, යම් කෙණෙක් ශීල සංරක්ෂණයක් නිසා නො ව මෙ ලොව ජීවත්වීම් පමණක් නිසා අදහස් පවිටු වුව ත් භික්ෂු වෙස් ගෙණ සිඟා කත් නම් එ විතරක් තකා භික්ෂු වැවහාර ය උන්ට නො කෙරෙමි. එ පමණෙකින් භික්ෂු ත් නො වෙති. භික්ෂු වන්නෝ කවුරු ද යත් – යම් කෙණෙක් රහත් මඟින් පින් පව් දෙක ම දුරු කොට පියා තමන්ට විෂ ය වන ධර්ම ජාතයක් දූන වෙසෙ ත් නම් රහත් මඟින් බුන් කෙලෙසුන් ඇති බැවින් උඟ තුමූ භික්ෂු නම් වෙති' වදළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන චතුර් විධ මාර්ග ඥාන නමැති වාසල්වලට විදසුන් නමැති මඟින් ගොසින් නිවන් පුරයට වැද ගියහ.

එ හෙයින් සත් පුරුෂයන් විසින් රහත් මඟින් කෙලෙසුන් බිඳිනාට නිසි පිළිවෙත යෙදී නිර්ව්‍යාජයෙන්[1] භික්ෂු ව්‍යවහාර ය එව ගන්ට උත්සාහ කට යුතු.

## 212. තිඵයත් ගේ වස්තුව

තව ද නිර්ව්‍යාජ ලෙස පිළිපැදීම් මුත් ශය ප්‍රවෘත්තියෙහි නපුර හඟවන්ට තිඵයන් ගේ වත දක්වමු.

කෙ සේ ද යත්—

ඒ තිඵයෝ බත් දුන්නවුන්ට 'නිදුක් බව, නිරොගී වව, ආයු බොහෝ වව, අසවල් තැන මඩ බොර බොහෝ ව, ඔබ ත් නො යව, අසවල් තැන කටු පාණ බොහෝ ව, ඔබ ත් නො යව' යනාදීන් කුසල් මං නො දූන දන්නා ඒ ම හෙයින් ඒ මඟුල් කොට කියා ලති.

---

1 නිර්වඤ්චායෙන්

Non-Commercial Distribution

බුදු වූ තැන් පටන් නැතක් දවස් වහන්දෑට අනුමෙවෙනි බණ අනු නො දත් හෙයින් වළඳා ලා අනුමෙවෙනි බණ නො කියා ම වහන්දෑ නැඟී යන සේක. මිනිස්සු ත් 'අපි තිර්‍ථයන් ගෙන් මඟුල් අසම්හ. ස්වාමි දරුවෝ වළඳා ලා වැඩ පියන සේකැ'යි මුසුප්පු වෙති. වහන්දෑ එ පවත් බුදුන්ට දන්වූ සේක. බුදුහු ත් 'මහණෙනි, මෙ වක් පටන් අසුන් හල් ආදියෙහි දී අනුමෙවෙනි බණ කියව'යි වදාළ සේක. වහන්දෑ ත් විධාන ලත් පසු එ ලෙස ම කළ සේක. මිනිස්සු අනුමෙවෙනි ත් උපනිසින්නක කථාදිය ත් අසන්නාහු සැදෑ වඩා ගෙණ දන් පින් බොහෝ කොට කෙරෙති.

තිර්‍ථයෝ ඒ දැක සිත පහදවා ගත නො හී 'අපි දෙඩමලු වීම යහපත් නො වන හෙයින් මුවෙන් බැණ නො නැඟී සසර හයින් දවස් යවම්හ. මහණ ගොයුම්හුගේ සවුවෝ දන් දුන්නවුන්ට සවුල කම ලෙස දෙඩා හඬා ඇවිදති' කීහ. බුදුහු ඒ අසා 'මහණෙනි, හෙම්බා සමහර කෙණෙක් බැණ නැහෙන සේ නො දැන බැණ නො නැහෙති. සමහර කෙණෙක් දැන්ම ඇත ත් අවිසාරද හෙයින් බැණ නො නැහෙති, සමහර කෙණෙක් තමන් දන්නා දෙය අනුන්ට හඟ වන්ට මසුරු ව බැණ නො නැහෙති. මුනිභාව ය සිද්ධ කරන්නා වූ මාර්ග ඥනය ඇත් නම් මුත් තෙල පමණෙකින් මුනි ව්‍යවහාරය නො කරම්හ.

මුනි ව්‍යවහාරයට නිස්සෝ කවුරු ද යත්—යම්සේ තරාදි යෙන් කිරන කෙණෙක් බර ව තුබූ භාගයෙන් හැර අඩු ව තුබූ භාගයෙහි අතින් ලා බර සරි කෙරෙත් ද? එ මෙන් සසර දික් කරණ හෙයින් අධිකයක් හා සරි වූ පාප ය හරිමින් සසර ලුහුඩු කරණ හෙයින් එ ලෙසින් අඩුවක් හා සරි වූ තුන් සුසිරි පූරා නිවන් සාධා ගත් ද, ඌ තුමූ මුනි ව්‍යවහාරයට නිස්සහ. තව ද යම් කෙණෙක් ස්කන්ධාදීන්ගේ විභාග ත් ඥාත පරිඥාදී විසින් දනි ත් නම් ඌ තුමූ මුනි නම් වෙති' වදාළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් තරාදියෙහි අධිකය හරනා සේ පවු කම් හැර අඩුව ලන්නා සේ පින් කම් සමාදන් ව සුචරිත පූරා අධිගම සිද්ධ කට යුතු.

## 213. බිලී වැද්දකු ගේ වස්තුව

තව ද උතුම් ව තිබෙ නම් ගුණයක් ඇත්තවුන්ට මුත් ජාති සම්පන්න කෙණෙකුන්ට මුත් ප්‍රව්‍රජ්‍යාව තරම් නො වන්නා සේ

Non-Commercial Distribution

සෙසු භික්‍ෂුන්ට තරමුන්ට නො තරම නියා ව භගවත්ට බිලී වැද් දකු ගේ වත දක්වමු.

කෙ සේ ද යත්—

එක් දවසක් බුදුහු ඒ බිලී වැද්දණුවන් සෝවාන් වන්ට නිසි පින් අඹා ගෙන් බිලී කටුව වැසුණා සේ වැසී තුබුවා දැක සැවැත් නුවර උතුරු වාසල් දෙරගම සිභා ලා සභරැස පිරිවරා ඌ බිලී බානා තැන බලා වඩනා සේක. ඒ වේලාට බිලී වැදි ද බිලී බා මින් සිටි තැනැත්තේ බුදු පාමොක් සඞසයා වහන්සේ දැක බිලී ය දමා පියා සිටියේ ය. බුදුහු ත් ඕ හට නුදුරු තැනක සිට 'තොපි කිනමු ද' යි 'තොපි කිනමු ද'යි අගසවු දෙදෙනා වහන්සේ පටන් වෙන වෙන ම නම විචාළ සේක. ඔබ හැම ත් වෙන වෙන ම 'අපි සැරියුත් නමුම්හ. 'අපි මුගලන් නමුම්හ' යනාදීන් තමන් තමන් වහන්සේගේ නම කී සේක. බිලී වැද්දණුවෝ ත් 'බුදුහු වහන්දෑ-ගේ නම විචාළ සේක. මගේ නම ත් විචාරන සේක් වනැ' යි සිතූ-දැය.

බුදුහු ත් ඒ දැන ලා 'උපාසකයෙනි, තොපි කිනම්මු ද'යි විචාරා, 'මම ආර්‍ය්‍ය නම්මි' කී 'කල්හි හෙම්බල උපාසක ය, තා සේ පවු කරන්නෝ ආර්‍ය්‍ය නම නො වෙති. ආර්‍ය්‍යයෝ නම හිංසා පීඩා නො කෙරෙති' වදරා උන්ට බණ වදරණ සේක් 'හෙම්බල, උපාසක ය, බබුරන් පොවා අවුත් මේ ශාසනයෙහි මහණ ව රහත් වූ කල ශක්‍රාදී දෙවියන් උන් වැඳ පුදන්නේ ආර්‍ය්‍ය ජාතියෙහි පටන් උතුම වූ හෙයින. දැන් තොප ශක්‍රාදී දෙවියන් තබා තොපට අඩු තරම කෙණකුන් මුත් තොප වඳිනෝ කවුරු ද? තොපි ත් රහත් වූ නම දිව්‍ය-බ්‍රහ්මාදී වූ කවුරු ත් තොප වඳිති. ආර්‍ය්‍ය ජාතියෙහි පිහිටි හෙයින් ආර්‍ය්‍ය වන මුත් නම පමණෙකින් තොප ආර්‍ය්‍ය වන්නේ නැත. යම කෙණෙක් දයා ව ඇත්තෝ වී නම සෙසු ගුණධම් ත් උන් කෙරෙහි පිහිටන හෙයින් උත්තම ගුණ යොගයෙන් ඔහු ආර්‍ය්‍ය නම වෙති' වදළ සේක. දෙශනා කෙළවර බිලී වැද්දණුවෝ ද බිලී ය දැමුවා සේ ම සමහර කෙලෙස් කෙණකුන් දමා සෝවාන් වූහ. සෙසු ත් බොහෝ දෙනාට මේ දෙශනාව සප්‍රයොජන වි ය.

එ හෙයින් නුවණැත්තවුන් විසින් උත්තම ගුණ යොගයෙන් උතුම බව නිසා තුන් දුසිරින් දුරු ව තුන් සුසිරි පුරා මතු මතු යෙහි ලැබි ය යුතු ලොවී ලොවුතුරා ගුණ විශෙෂයෙහි පිහිටිය යුතු.

# 214. බොහෝ වහන්දෑ ගේ වස්තුව

තව ද ශීලසමාද්ධ්‍යාදි ගුණයෙහි පිහිටි පමණෙකින් භව ක්‍ෂය වූවා කොට සිතා ගෙණ පමා වන තැන් ඇත් නම් එ තැන් නො පමා වනු ව නිසා බොහෝ වහන්දෑ ගේ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්—

ඒ බොහෝ වහන්දෑ ගෙන් සමහර තැනෙක් 'අපි පිළිවෙත් පිරීමෙන් සිවු පිරිසිදු සිල්හි පිහිටියම්හ. එ හෙයින් අපට රහත් වීම බැරි නො වෙයි. කැමැති විටක ම රහත් වම්හ'යි සිතූ සේක. සමහර තැනෙක් විනය පිළිවෙත් පිටට සූත්‍ර ප්‍රතිපත්ති පිරීමෙන් අපි ත්‍රයොදශ ධූතාංග පූරකයම්හ. කෙලෙසුන් තවා ලීමෙහි ද දුවහ වැනි දෙයෙක් නැත. එ හෙයින් අපට ත් රහත් වීමෙහි අරුම නැතැ' යි සිතූ සේක. සමහර තැනෙක් 'අපි බොහෝ ඇසූ පිරූ තැන් ඇත්තම්හ. පය්‍ර්‍යාප්ති නම් ප්‍රතිපත්ති ප්‍රතිවෙධ දෙකට මුල් හෙයින් අපට රහත් වීම් නිරායාස ය'යි සිතූ සේක.

සමහර තැනෙක් ''අපි විවෙක වාසයෙහි ඇලී වසම්හ' යි විවෙක වාස ඇති තැනට ධ්‍යාන භාවනායෙහි ආයාස නැති බැවින් රහත් වන්ට පිළිවනැ''යි සිතූ සේක. සමහර තැනෙක් 'අපි පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති ලාභීම්හ. විෂ්කම්භන වශයෙන් කෙලෙසුන් කෙරෙන් දුරු ව සිටි තැනට ධ්‍යාන පාදක කොට විවසුන් වඩා මාර්ග පටිපාටියෙන් රහත් වීම බැරි නො වෙයි' සිතූ සේක. ඉන් ම අනගැමි තැන් ආසන්න ව සිටි බැවින් 'නැඟෙන්ට ආසන්න ව සිටි හිර වහා නැගෙන්නා සේ කරල් කටට නභා පි කල වහා පූදිනා සේ අපි ත් වහා ම රහත් වම්හ'යි සිතූ සේක.

ඒ ඒ ලෙස සිතූ හැම තැන් ම එක් දවසක් බුදුන් කරා ගොසින් වැඳ ලා එකත් පස් ව හුන් සේක් 'කුමක් ද, මහණෙනි, මහණ වූවන් විසින් කළ මනා දෙය කොට නිමවා ගතු ද' යි විචාළ කල්හි 'ස්වාමීනි, අපි මේ මේ තරම් ඇත්තම්හ. මෙ බඳු වූ තරම් ඇති තැනට රහත් වීම බැරි නොවන්නේ වේ දැ යි සිතා ඉඳුම් හ' ඕ කී සේක. බුදුහු ඒ වහන්දැගේ බස් අසා 'මහණෙනි, භික්‍ෂූන් විසින් නම් විනය පිළිවෙත් පමණෙකින් හා දුවහ පිළිවෙත් පමණෙකින් හා තෙවළා බුදුවදන් හදළ පමණෙකින් හා ධ්‍යානලාභී වීම පමණෙකින් හා අනගැමි වීම පමණෙකින් හා, මහණෙනි, ස්වල්ප වූ ත් අමෙධ්‍යය දුගඳ ව තිබේ ද, එ මෙන් ස්වල්ප මාත්‍ර වූ ත් භව ය දුක් ම හෙයින් භවක්‍ෂයට නො පැමිණ පමා නො වව' යි

Non-Commercial Distribution

වදාළ සේක. දෙශනා කෙළවර එ ලෙස සිතා හුන් ඒ වහන්දෑ හැම ම රහත් වූ සේක. සෙසු ත් බොහෝ දෙනාට නිවන් සාධා දෙනු නිසා දෙසනු[1] වි ය.

එ හෙයින් නුවණැත්තවුන් විසින් 'වරෙක දෙ වරෙක පින් කළම්හ. ලොවී ලොවුතුරා සැප ත් සාධා දී ලයි. ඉතිකින් පිණක් කළ මැනැවැ'යි නැත' යනාදීන් නො සිතා නිවන් සිද්ධ වන තෙක් නො පමා වන්ට උත්සාහ කට යුතු.

## 215. පන්සියයක් දෙනා වහන්සේ ගේ වස්තුව

තව ද කරණ යම් කථාවක් සග මොක් ම අරහයා මුත් අපාය මාර්ග ය අරහයා කිරීමෙන් කුශල සිද්ධි ය නැති නියාව හඟවන්ට **පන් සියක් දෙනා වහන්සේ ගේ වස්තුව දක්වමු.**

කෙ සේ ද යත්—

ඒ වහන්දෑ ද බුදුන් දනවූ සැරිසරා පියා පෙරළා සැවැත් නුවරට වැඩි කල්හි සන්නිපාත ශාලාවෙහි රැස් ව හිඳ 'අප හැම ගිය තැන අසවල් ගමට යන්නා වූ මග තැනි ය. අසවල් ගමට යන මහ වළ ගොඩ ඇත. බොරළු බොහෝ ව තිබෙයි' යනාදීන් සත් පථ කථා හැර අසත් පථ කථාවට පටන් ගත් සේක. බුදුහු ඒ වහන්දෑ රහත් වන්ට නිසි පින් ඇති හෙයින් උත්පථ ගමන හරවා ලා සත් පථ ගමනෙහි යොදනු නිසා එ තැනට වැඩ බුදු හස්නෙහි වැඩ හිඳ කරමින් හුන් කථාව විචාරා වදරා කළ කථාව කී කල්හි—

'මහණෙනි, තෙලෙ මඟෙක් නො වෙයි. නිවන් මඟෙක් වේ නම් අෂ්ටාංගික මාර්ග ය'යි වදරා ලා බණ වදරන සේක්-'මහණෙනි, සම්හර මං මහවත් ආදි ය සග මොක් දෙකට ම මං නො වන හෙයින් සග මොක් දෙකට මං වන්නේ කුශලය යි. කුසල් මඟිනු ත් සම්‍යක් දෘෂ්ටි ආදි වූ මාර්ගයෙන් මිථ්‍යා දෘෂ්ටි ආදි වූ අට නසා නගා ලූ පහන එක වට ම අඳුරු ත් දුරු කොට ආලොක ත් පවත්වා පාන් වැටි ය ත් දවා තෙලු ත් ගෙවන්නා සේ දුකු ත් පිරිසිඳ දන මාර්ගානුරූප ලෙසින් තෘෂ්ණාව ත් හරිමින් නිරොධය ත් සාක්‍ෂා ත් කොට මාර්ග ය හවන හෙයින් අෂ්ටාංගික මාර්ග ය ම උතුම. නැවත වාක් සත්‍ය, සං වෘති සත්‍ය, දෘෂ්ටි සත්‍යාදීන් අතුරෙහි දුඃඛාර්‍ය්‍ය සත්‍යාදි වූ චතුරාර්‍ය්‍ය සත්‍ය ය ම උතුම. තව ද ප්‍රත්‍යය සමුත්පන්න වූ ධර්මයන් අතු

1 නිවන් සාධා දෙනු නිසා දේශනා වි ය

Non-Commercial Distribution

රෙහි නිවනට වඩනා ධර්මයක් නැති බැවින් නිවන් ම උතුම. දිව්‍ය බ්‍රහ්මාදී වූ දෙපා ඇත්තවුන් මුළුල්ලට බුදු ඇස් ආදි වූ ඇස් පසක් ඇති සර්වඥවරයෝ ම අනික් ඇස් පසක් ඇති කෙණකුන් එ වකට නැති හෙයින් උතුම්හ. තොප හැම කියා ඇවිදිනා වූ මං නිවනට මං නො වන හෙයින් නිවනට මං නම් අෂ්ටාංගික මාර්ග ය ම ය. අනික් මහක් නැත. එ හෙයින් තෙපි මේ ආර්‍ය්‍ය වූ අෂ්ටාංගික මාර්ග ය ම උපදවන්ට උත්සාහ කරව. උත්සාහ කොට උපදවා ගතු නම් මාරයා හිස වසා හෙළා ලූ දැල් අවුලක් සේ ඕ හට මහා මුළා ය.

මාගේ අවවාද පිළිගෙන රහත් මඟ උපදවා ගතු නම් සසර දුකු ත් නිමවා ගතුව. රාගාදී කෙලෙසුන් නසන්නා වූ මේ රහත් මඟ අනුන් ගෙන් අසා දැන්මක් නැති ව මා විසින් ම ප්‍රත්‍යක්‍ෂ කොට දැන සත්‍වොපකාර ය නිසා දෙසන ලද. තොප හැම දෙනා විසින් මාර්ග ඵල උපදවනු නිසා නූ උපන් අකුසල් ධර්ම නූ උපදනා පිණිස ත්, උපන් අකුසල් ධර්ම නසන පිණිස ත්, නූ උපන් කුසල් ධර්ම උපදනා පිණිස ත්, උපන් කුසල් ධර්ම වැඩියුරු වීම පිණිස ත්, සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙහි හැසිරිය යුතු ය. කියා ලූ ලෙස කරන් නෝ ඇත් නම් සර්වඥවරයෝ කියන්නෝ ය. කියා ලූ ලෙස පිළි පන් කෙණෙක් පඤ්ච විධ මාර නමැති වැද්දන් අනාචාර්‍ය්‍ය ජන නමැති සතුන් බඳන්ට සසර නමැති වල් හසර එළවූ තෘෂ්ණා නමැති මළට හසු නො වෙති'යි වදාළ සේක. දෙශනා කෙළවර නිකම් මංවල සම විසම කියා හුන් පන් සියයක් දෙනා වහන්සේ කෙලෙස් කැල කපා හැර රහත් මං එළි කළ සේක. හෙවත් රහත් වූ සේක.

එ හෙයින් නුවණැත්තවුන් විසින් අකුසල් වල් නො වැද කුසල් මඟ වතට බැස. ඒ කුසල් මඟින් නිවන් පුරයට යා යුතු.

## 216. වස්තු තුනක්

තව ද සෙසු භාවනා තබා තිලකුණු පමණෙක ත් ඇලුම නැත්තවුන්ට එහි ඇලුම් කරවන නිසා වස්තු තුනක් දක්වමු.

කෙ සේ ද යත්—

ඒ වහන්දෑ යෙළ දස ම බුදුන් ගෙන් කමටහන් ඉගෙන වලට පලා ගොසින් රහත් ව ගත නො හී 'කමටහන් විහූත කොට විචාරම්හ' යි බුදුන් ලඟට යෙළ දස ම ආ සේක. බුදුහු ත් මුන්ට අනුකූල භාවනා කවරේ දෝ හෝ යි විමසන සේක් 'මොහු පන්

පන් සිය ය බැවින් තුන් මුළ ම කසුප් බුදුන් සමයෙහි විසි දහසක් හවුරුදු මුළුල්ලෙහි එක් මුළෙක් අනිත්‍ය ලක්‍ෂණයෙහි හා එක් මුළෙක් දුඃඛ ලක්‍ෂණයෙහි හා එක් මුළෙක් අනාත්ම ලක්‍ෂණයෙහි යෙදුනවු ය. ති ලකුණු භාවනා ත් තුන් මුළින් කැටි ව සමෘද්ධ වි ය. එ හෙයින් ති ලකුණු විසින් මුන් තුන් මුළට බණ කියමී සිතා වදරා පළමු පන් සියයට 'හෙම්බා මහණෙනි, ඒ ඒ භවයෙහි උපන් රුවාරූ දම්හු ඒ ඒ භවයෙන් අනික් භවයට නො හෙයින් ඊ ඊ ම නසිති. එ හෙයින් අනිත්‍යයහ යි යම් කෙණෙක් අනිත්‍ය ලක්‍ෂණය දනි ත් නම් ඌ උදව්යෙන් පෙළීමෙන් වන දුඃඛ ලක්‍ෂණ ය ත් තමා විසිය නො පැවැත්මෙන් වන අනාත්ම ලක්‍ෂණය ත් දැක දුක්හි කළ කිරෙති. කළකිරි ඒ දුකින් මිදෙන්ට උත්සාහ කෙරෙති. එයි ත් නිවනට ඒක් මහෙකැ' යී පළමු පන් සියයට වදළ සේක.

දෙවන මුළට සියලු ප්‍රත්‍යය සමුත්පන්න ධර්‍මයෝ උදව්යෙන් පෙළෙන හෙයින් දුක්හ යි දුඃඛ ලක්‍ෂණ ය යොගාවචර මහණහු විවසුන් නුවණින් දුටවු නම් දුඃඛ ලක්‍ෂණ ය දුටු කල ම අනික් ලක්‍ෂණ දෙක ත් පෙනෙයි. දුක්හි කලකිරී දුකින් මිදීමට යත්න කෙරෙයි. තෙලේ ත් නිවනට එක් මගෙකැ' යි වදළ සේක.

තුන් වන මුළට සියලු ම ප්‍රත්‍යය සමුත්පන්න ධර්‍මයන් තමා විසිය නො පවත්නා බැවින් අනාත්ම ය යි විදර්‍ශක භික්ෂූහු යම් කලෙක විවසුන් නුවණින් දකී ද, ඕ හට අනික් ලක්‍ෂණ දෙක ත් පෙනෙයි. ඒ දුක්හි කළකිරී ඉන් මිදෙන්ට යත්න කෙරෙති වදරා අනිත්‍ය ලක්‍ෂණයෙහි අභ්‍යාස ඇති පන් සියයට අනිත්‍ය විමොක්‍ෂය හා දුඃඛ ලක්ෂණයෙහි අභ්‍යාස ඇති පන් සියයට අප්පනිහිත විමොක්‍ෂය හා අනාත්ම ලක්‍ෂණයෙහි අභ්‍යාස ඇති පන් සියයට සුඤ්ඤත විමොක්‍ෂය වදළ සේක. දෙශනා කෙළවරවහන්දෑ යෙළ දස ම මල කා තුබූ කැට පත් මැද පූ කලට බබළන්නා සේ දෙශනා නැමැති උළුසුන් නන් සන්තාන නමැති කැට පත්වල කෙලෙස් කසළ ඉලී ගොස්න් රහත් ව බබළා ගිය සේක.

එ හෙයින් සත් පුරුෂයන් විසින් බැරි ව තිබෙන භාවනා කුම වුව ත් අනිස-දුක-අනත යන ති ලකුණු භාවනා පමනක්බැරි නො වන හෙයින් එ පමණක ත් හැසිර භවක්‍ෂයට ම උත්සාහ කට යුතු.

Non-Commercial Distribution

# 217. පධාන කම්මික තිස්ස තෙරුන් වහන්සේ ගේ වස්තුව

තව ද සාන වපුරන අවධියේ තබා පියා ද මඩනා අවධියේ වපුරන්නා සේ වීය්‍යී කළ මනා අවධි ය තබා පියා පසු ව කරණ වීය්‍යීයෙහි තපුර හඟවන්ට පධාන කම්මික තිස්ස තෙරුන් වහන්සේ ගේ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්—

සැවැත් නුවර පන් සියයක් කුලදරුවෝ බුදුන් ලඟ මහණ ව කමටහන් ඉගෙන භාවනාවට වලට ගිය සේක. ඊ ම ඇතුළත් එක් කෙණකුන් වහන්සේ රඳා ගිය සේක. සෙසු වහන්දෑ වල්හි මහණ ධම කරණ සේක් රහත් ව ලද්ද වූ ගුණ විශෙෂ බුදුන්ට දන්වනු නිසා සැවැත් නුවරට යන ගමනේ සැවැත් නුවරට සතර ගවු-වක් විවරේ එක් ගමක සිඟන්නා දක එක් උපාසක කෙණෙක් කැඳ බත්දී ලා අනුමෙවෙති ත් අසා දෙවන දවසට ත් ආරාධනා කළහ වහන්දෑ ද ආරාධනා ඉවසා ලා එ දවස් සැවැත් නුවරට ගොසින් පා සිවුරු තැන් පත් කොට තබා ලා සවස් වෙලේ බුදුන් කරා ගොසින් වැද ගෙණ එක ත් පස් ව හුන් සේක. බුදුහු ත් ඒ වහන්දෑට මුණු දී සතුටු ව සාද සාමීචි කළ සේක. භාවනාවට නො ගොසින් රඳා වැඩ හුන් තැනැත්තන් වහන්සේ 'බුදුහු මේ වහන්දෑ ලා කථාවට මුබ නො පෝනා සේ ම ය. මාගී ඵලයක් නො ලත් හෙයින් දෝ ලඟ රඳා හුන් මා ලා එක බසක් විචරිනුත් කථා නො කරණ සේක. මම ත් රහත් ව ගෙණ මා ලා ත් කථා කරවා ගනිමි' සිතූ සේක.

අර වහන්දෑ ද 'සවාමීනි, අද එන ගමනේ ම උපාසක කෙණෙක් සෙටයට ආරාධනා කොළෝ ය. සෙට ඔබ යන්ට වුව මැනැවැ'යි බුදුන් ගෙන් එ දවස්ම අවසර ගත් සේක. නො ගොස් රඳා හුන් යාළු මිත්‍ර නම් ද රෑ දෙ වරුවේ ම සක්මන් කරණ සේක් නිඳා ගෙණ සක්මන් කෙළවර තුබූ ගල් පුවරුවේ හුණු ගමනේ ම කෙලෙසුන් බිඳිනට කළ යත්නයෙන් විධි වරදවා කළ බෙහෙ දින් අතික් විපත්තියක් වදනා සේ පය බිඳිණ. පය බිඳී යන්නා ම වෙදනාව ඉවසා ගත නො හී මහ හඬින් හඩා පී සේක.

යහළු මිත්‍ර ව හුන් අමුතු ව ආ වහන්දෑ ද කට හඩ දූන ලා ඇතින් මැතින් අවුත් පාන් දල්වා ගෙණුළුන් වහන්සේට කළ මනා දෑ කට දී ම පාන් වී ය. ආරාධනා කළ ගමට යන්ට අවසර නො වී ය. බුදුහු ත් වහන්දෑ දූක ඊයේ දවස් ම අවසර ගත් හෙයින් 'ආරාධනා කළ තැනට නො ගියා ද'යි විචාළ සේක. වහන්දෑ ත් 'එ සේ ය, සවාමීනි' යි කියා ලා යා නුහුනු කාරණ ය කී සේක

Non-Commercial Distribution

බුදුහු ත් මහණෙනි, තුලුන් තොපට ලාභාන්තරාය කෙළේ දූන් මතු නො වන්නේ වේ ද? යට ගිය දවස ත් කොළෝ ය'යි වදරන බුදුහු-

'යො පුබ්බෙ කරණීයානි පච්ඡා සො කාතුමිච්ඡති,
වරණකට්ඨක භඤ්ජොව-ස පච්ඡා මනුතප්පති.'

යනාදීන් ජාතක ය වදරා 'එ කල අන්තෙවාසික පන් සිය ය නම් තොපි පන් සිය ය. දර කඩා යන්ට මැළි ව වරණ දර බිඳ කුසී ව හුන් අත වැස්සා නම් මේ මහණ ය. ඇදුරාණෝ නම් මම ය'යි කෙළවර වැදෑරීමෙන් ආදී ත් කුසී නියාව හඟවා ලා එ තැනට පැමිණි කෙණකුන්ට ප්‍රයෝජන සඳහා බණ වදරන සේක්-අශක්ති ලෙසට වෘද්ධ කමු ත් නැති ව බල ඇති ව මැළි කම නිසා වීර්‍ය්‍ය කළ මනා අවධියෙහි යම් කෙණෙක් වීර්‍ය්‍ය නො කෙරෙත් ද, හුන් තැන හිඳීම් හා සිටි තැන සිටීම් පමණක් හා වළඳා ලා රෑ ත් දවලු ත් නිදීමට මුත් ග්‍රන්ථ ධුර – විදශීනා ධුරයකට ම මැළියෝ ද එසේවූවාහු විපස්සනාභියොගයෙන් ලැබිය යුතු මාර්ගඵල දිඹුලෙන් ලබන මල් නැත්තා සේ නො ලැබෙති' වදාළ සේක. දෙශනා කෙළ වර බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් සත් පුරුෂයන් විසින් කරණ වීර්‍ය්‍යයක් අශක්ති අවධියට නො තබා බල ඇති අවසථාවේ ම කොට වීර්‍ය්‍ය ඵල වූ ලොවී ලොවුතුරා සැප ත් සිද්ධ කට යුතු.

———

# 218. සූකර ප්‍රේත වස්තුව

තව ද පාපයෙහි ආදීනව දක්වන්ට සූකර ප්‍රේත වස්තුව කියමු.

කෙ සේ ද යත්—

එක් දවසක් මුගලන් මහ තෙරුන් වහන්සේ ලක්‍ෂණ මහ තෙරුන් වහන්සේ හා සමඟ ගිජු කුළු පවුවෙන් බස්නා සේක්-එක් තැනක දී සිනා පහළ කොට වදරා සිනා පහළ කිරීමට කාරණ ලක්‍ෂණ මහ තෙරුන් වහන්සේ විචාළ හෙයින් 'දූන් වේලා නො වෙ යි. බුදුන් ලඟ දී විචාළ මැනවැ'යි කියා ලා රජ ගහා නුවර සිඟා වළඳා අන්තයෙහි වේළුවන වෙහෙරට වැඩ බුදුන් වැඳ ගෙණ වැඩහුන් සේක. ලක්‍ෂණ මහ තෙරුන් වහන්සේ ද සිනාවට කාරණ විචාළ සේක. මුගලන් මහ තෙරුන් වහන්සේ ද 'මම, ඇවැත්නි, එ තැන දී එක් ප්‍රෙතයකු දිටිමි. ඒ තෙමේ තුන් ගවු පමණ උස ඇත්තේ ය. ඌගේ හිස හුරු හිසක් වැනි ය. සෙසු අවයව

Non-Commercial Distribution

මිනිස් සැටිය ය. කට ඇතුළේ නඟුටෙක් ඇති වී ය. ඉන් පූයා කඳු වැගිරෙ යි. මම මා ඒ කර්මයෙන් ගැළවුණු නියාව තකා සිනා පහළ කෙළෙමි' වදළ සේක.

බුදුහු ඒ අසා 'මම ද තෙල ප්‍රේතයා බුදු වූ දවස් බෝ මැඩ දීම දිටිමි'යි කියා ලූ කල යම් කෙණෙක් හදහා නො ගත්තු නම් උන්ට බොහෝ පවු හෙයින් උන් කෙරෙහි කරුණාවෙන් නො කීමි. දැන් දෙසට මුගලන් මහ තෙරහු ඇත. ඒ ප්‍රේතයා ඇත්තේ සැබෑවැ'යි වදළ සේක. ඒ අසා වහන්දෑ ප්‍රේත වන්ට ඔහු කළ පවු විචාළ සේක. 'මහණෙනි, අසනු කැමති නියා දෑ'යි විචාරා 'අසම්හ'යි කී කල්හි ඔහු කළ පාප ය වදළ සේක.

කෙ සේ ද යත්—

කසුප් බුදුන් සමයෙහි ගම් පැල් වෙහෙරෙක තෙර දෙ න මෙක් සැමඟ ව විසූ සේක. ඉන් එක් කෙණකුන් වහන්සේ මාලු පැවිදි ව සැට වයස් ගිය සේක. එක් කෙණකුන් වහන්සේට සැට වයසට මද උන් වහන්සේ ශ්‍රද්ධා සම්පන්න කුල දරුවන් හෙයින් වෘද්ධ ගෞරව ය ඇති ව සාමණේර තැනක් මෙන් සැට වයස් ගොසින් වැඩි මාලු තැනට කළ මනා වත් පිළිවෙත් කරණ සේක. ඒ දෙ නම සමඟ ව වසන තැනට වගපුල් හස්සට මී බෙටියක් සම්භ වූවා සේ පවිටු අදහස් ඇති ධර්ම කථික නමක් සම්භවූ දෑ ය. එ දවස් දවැලිත් බණ ඇසූ ව මනා දවසෙක. තෙරුන් වහන්සේ ද පා සිවුරු ආදීයෙන් සංග්‍රහයක් කොට ලා 'සත් පුරුෂයාණෙනි, අපට බණක් කිව මැනවැ'යි කී සේක.

උන්දෑ ද නපුරු අදහසින් වුව ත් උගත් බණ හෙයින් සිත් ගන්වා ම බණ කී දෑ ය. තෙරුන් වහන්සේ ද 'බණ කියන තැනක් ලදුම්හ'යි සතුටු ව දෙවන දවස් උන්දෑ කැඳවා ගෙණ ආසන්න ගමට වැඩ සිහා වළඳා ලා වළඳා අන්තයෙහි බණ කියන නමට 'ඇවැත්නි, බණ කිව මැනැවැ'යි ඒ ගම මිනිසුන්ට ත් බැණ කියවූ සේක. මිනිස්සු බණ කථා අසා තව ත් බණ අසනු පිණිස දෙ වන දවසට ත් ආරාධනා කළහ. මෙ සේ වට ගොදුරු ගම්වලට දෙ දවසක් ම අරුන්දෑ කැඳවා ගෙණ සිහා වැඩි සේක.

ධර්ම කථික වහන්දෑ ද දවස් ගණනක් ව ගිය හෙයින් ගම බිමුත් හැඳින ගෙණ බණ කීමෙන් මිනිසුනු ත් නම්මවා ගෙණ 'මෙ තෙර දෙ දෙනා වහන්සේ මෙ තැනින් පලවා පියා මම රඳා පියම් නම් සිහා වළඳන්ට ගොදුරු ගමු ත් ඇත. විහාර ඵාසුව ත් ඇතැ'යි

Non-Commercial Distribution

සිතා ලා සවස ත් පිරිත් වේලාට අවුත් වත් පිරිත් නිමවා ගෙණ වහන්දෑ ගිය කල්හි පෙරළා අවුත් මහ තෙරුන් වහන්සේ ලඟට ගොසින් සැළ කළ මනා දෙයක් ඇතැ'යි කියා ලා 'කිව මැනැවැ'යි කී කල්හි මඳක් සිතා හිඳ පියා උගත් බණ විතරට සොර කම් බොහෝවා සෙයින් 'ස්වාමීනි, බසක් නම් කියා ලූ කලට වරදව යන වූවා ත් ඇතැ'යි කියා ලා නො කියා ම නැඟී ගිය දෑ ය. බාල තෙරුන් වහන්සේ ලඟට ත් ගොසින් ලා එ ලෙස ම කරණ දෑ ය. දෙ වන දවසු ත් එ ලෙස ම කොට ලා තුන් වන දවස් තෙර දෙ දෙනා වහන්සේට කුහුල් බොහෝ වූ කල්හි වැඩි මාලු තෙරුන් වහන්සේ ලඟට ගොසින් 'ස්වාමීනි, සැළ කරණ දෙයෙක් ඇත. සැළ කරන්ට මැළියෙමි' කී දෑ ය.

වැඩි මාලු තෙරුන් වහන්සේ ත් 'කියන්ට ම වුව මැනැවැ'යි තත්පර ව කී කල්හි 'කුමක් ද? ස්වාමීනි, කුඩා තෙරුන් වහන්සේ ඔබ හා එකසම්භොගී සේක් දැ'යි කී දෑය 'සත් පුරුෂයාණෙනි, කුමක් කියවු ද? අපි එක මවුන් දරුවන් වැන්නම්හ. මෙ තෙක් කල් මුළුල්ලෙහි එක් ව වැස උන් ගෙන් නුගුණයක් නුදුටුම්හ'යි කී සේක. "ස්වාමීනි මුඹ වහන්සේගේ කොවුන් කමක් නැති හෙයින් එ ලෙස සිතට නැඟි බව මුත් කුඩා තෙරුන් වහන්සේ මා ආ තැන් පටන් මේ වැඩි මහලු තෙරුන් වහන්සේ ලජ්ජී සේකැ'යි සිතා එක් ව සම්භොග කරතො ත් පරීක්ෂා කොට කරව'යි එක් වන් ව කියන සේක. මා ම හෙයින් මුත් අතික් තැනක් වූවො ත් නැඟී යන විතර ය'යි කී දෑ ය. වැඩි මාලු තෙරුන් වහන්සේ ද දූදන වහන්සේගේ බසින් මුසුප්පු ව පියා දණ්ඩෙන් ගසා ලූ කුඹල් වළ දක් බිඳෙන්නා මෙන් පාපිෂ්ට වහන්සේගේ කුසල් මුල් බිඳිමින් තමන් වහන්සේ ත් බුන් සේක. දුර්ජන වහන්සේ ත් ඔබ බිඳුවා ලා කුඩා තෙරුන් වහන්සේ ලඟට ත් ගොසින් වැඩි මාලු තෙරුන් වහන්සේට කී ලෙස ම කී දෑ ය. උන් වහන්සේ ත් බිඳී ගිය සේක.

මෙ තෙක් කල් මුළුල්ලෙහි එක දවසෙක ත් වෙන වෙන සිඟා නො ගොසින් දෙ වන දවස් වෙන වෙන සිඟා ගොස් කුඩා තෙරුන් වහන්සේ පෙරාතුව අවුත් භොජන ශාලාවෙහි සිටි සේක. වැඩි මාලු තෙරුන් වහන්සේ පසු ව පියා ආ සේක. කුඩා තෙරුන් වහන්සේ ඔබ දැක පෙර මහට ගොසින් පාත්‍ර ය හා සහළ සිවුර හැර ගනිම් දෝ හෝ යි සිතා මුසුප්පු බලවත් හෙයින් 'එ සේ නො කෙරෙමි'යි සිතා 'වන්නාට ය, එ බන්දක් මා කළ විරූ නැතැ'යි මොළොක් අදහස් ඇති ව ගෙණ වැඩි මාලු තෙරුන් වහන්සේ කරා

ගොසින් 'ස්වාමීනි, පා සිවුරු දුන මැනැවැ'යි කී සේක. වැඩි මාලු තෙරුන් වහන්සේ 'තො හික්මුණු තැනැත්තෙනි, තොපි ත් අපට වත් කරණ තරමු දැ'යි වදාළ සේක. 'එ සේ ය, ස්වාමීනි, මම ත් සිරිතක් සේ ආ පමණක් මුත් හුදෙක් සිතෙකින් නො ආමි' කී සේක. වැඩි මාලු තෙරුන් වහන්සේ 'ඇවැත්නි, මෙ වක් පටන් එක් ව වෙසති යි සිතවු දැ'යි විචාළ සේක් - කුඩා තෙරුන් වහන්සේ ත් එ ලෙස ම කියා ලා පාත්‍ර ය බැඳ ගෙණ නික්මුණු සේක. අනික් තෙරුන් වහන්සේ ත් නික්මුණු සේක. යන ගමන ත් එක් ව නො ගොසින් එක් නමෙක් බස්නාහිර බලා නික්මුණු සේක. එක් නමෙක් නැගෙණ හිර බලා නික්මුණු සේක. බණ කියන වහන්සේ ද රට සරියට පැරැත්තයකු ත් කියා පියා සිටුවයි කියන්නා ම අභිමතාර්ථ ය සිද්ධ වූ හෙයින් රඳා පී දැ ය.

දෙ වන දවස් ගමට සිඟා ගිය දැ ය. අනික් දෙ දෙනා වහන්සේ කොයි දැ යි විචාළ කල්හි 'උපාසිකාවරිනි, ඒ වහන්දෑගේ පවත් අප අතින් විචාරන්ට නො කැමැත්තේ ය. ඊයේ දවස ඔවුනොවුන් වහන්සේ හා ඩබර කොට ගෙණ නික්මුණු සේක. මම බොහෝ පැරැත්ත කියා ත් නවතා ගත නුහුණු වීමි' කී දැ ය. නුවණ නැති මිනිස්සුත් සැබැවැ යි ගිවිස ගත්හ. නුවණැත්තෝ 'අපි මෙ තෙක් කල් මුළුල්ලෙනු ත් ඒ දෙ දෙනා වහන්සේගෙන් එ බන්දක් නුදුටුම්හ. ඉදින් උන් වහන්සේට මුසුප්පුවෙක් වේ නමුත් මුන් වහන්සේ නිසා වෙ යි' සිතා මුසුප්පු වූහ.

ඒ තෙරුන් වහන්සේ ත් ගිය තැන සිතට සැපයක් නො ලත් සේක. වැඩි මාලු තෙරුන් වහන්සේ 'අනේ බාලයන්ගේ තරමක් ය. ඒ ඇසිල්ලෙහි දුටු ආගන්තුකයාණන්ට අප හා සම්භොග නො කරන්ට කිවු ල'යි සිතූ සේක. බාල තෙරුන් වහන්සේ ද වැඩි මාලු වසගින් තරමක් නො යාපත් නියා ය. මෙ තෙක් කල් මුළුල්ලෙහි අපගේ තරම දනිත ත් අමුතු ව ලා දුටු නමට අප හා සම්භොග නො කරන්ට කී සේක් ල'යි සිතූ සේක. මෙ ම සිතුවිල් ලෙන් ධුරද්වයිනු ත් පිරිහුණු සේක. ඒ දෙ දෙනා වහන්සේ හවුරුදු සියයක් ගිය කලට බස්නා හිරි දිග විහාරයට ගිය සේක. ගෙවල් මද හෙයින් දෙ නම එක ගෙයකට පැමිණියේ ය. වැඩි මාලු තෙරුන් වහන්සේ ගෙට වැඩ ලා හැඳ හුන් කලට බාල තෙරුන් වහන්සේ ත් ගේ ඇතුළට වැඩි සේක. වැඩි මාලු තෙරුන් වහන්සේ දැක හැඳින ලා කඳුලු නවතා ගත නුහුණු සේක.

Non-Commercial Distribution

බාල තෙරුන් වහන්සේ ත් වැඩි මාලු තෙරුන් වහන්සේ හැඳින ලා දැස කඳුලු පුරා ගෙණ කථා කෙරෙම් දෝ නො කෙරෙම් දෝ මහෝ යි සිතා ත් අනුන් ගේ බස් අදහන්ට බැරි ය යි සිතා වැඩි මාලු තෙරුන් වහන්සේ වැද ලා 'සවාමීනි, මම මෙ තෙක් කල් මුළුල්ලෙහි කැටු ව හුන්නෙම් වේ ද, බසකින් බිණීම-කින් දුටු වැරැද්දෙක් ඇත් දැ'යි විචාරා නැතැ යි කී කල 'එසේ කල අමුතු ව ලා දුටු නමට මා හා සම්භොග නො කරණ ලෙසට වදරන්ට කාරණ කිම් දැ'යි විචාළ සේක. 'මා එ සේ වූ දෙයක් කිවා නැතැයි කී කල්හි තමන් වහන්සේට ආගන්තුක නම එ ලෙස කී නියාව කී සේක. ඔබ ත් තමන් වහන්සේට කී පවත් කී සේක. ඔවුනොවුන් වහන්සේ ලා කථා කිරීමෙන් බිඳුවනු නිසා බොරු කී නියා ව දැන ගෙණ ඔවුනොවුන් වහන්සේ සමා කරවා ගත් සේක. අවුරුදු සියයක් මුළුල්ලෙහි අසමඟ ව හිඳ ත් දුටු දවස් ම සමඟ ව ලා අපගේ විහාරයට ගොසින් ඒ පවිටු පැනැත්තවුන් වෙහෙරින් නෙරැම් හ'යි නික්ම විහාරයට ගිය සේක පවිටු අදහස් ඇති නම ද තෙරුන් වහන්සේ දක පා සිවුරු ඉල්වා ලහට ගිය දැ ය. තෙරුන් වහන්සේ 'තොපි මේ විහාරයෙහි රඳන්ට නො නිස්සව'යි අසුර ගසා ලූ සේක.

උයි ත් රඳාගත නො හී එ විට ම ගියහ. විසි දහසක් හවුරුදු කළ මහණ ධමුත් කිරි පද්දේ ගොම අකක් ලුවා සේ කෙළවර නසා පී හෙයින් එයින් සැව අවීචියෙහි ඉපැද බුද්ධාන්තරයක් මුළුල්ලෙහි පැසී දුන් ගිජු කුළු පව්වෙහි ප්‍රේත ව ඉපැද දුක් විඳිනන් ය යි වදරා බණ වදරන බුදුහු චතුර් විධ වූ වාක් දුශ්චරිත ය දුරු කිරීමෙන් යම් කෙණෙක් සැබෑ බස පිහිටියෝ ද, අභිද්ධ්‍යාදිය දුරු කිරීමෙන් සිතනු ත් පනව ත් ව වෙසෙත් ද, ප්‍රාණවධාදි ය නො කිරීමෙන් කයින් සිද්ධ වන පවු ත් දුරු කොට වෙසෙත් ද, එසේ වූවෝ අපාය ගමනිනු ත් දුරු වෙති' වදළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන සෝවාන් ඵලාදියට පැමිණියහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් තුන් දුසිරින් දුරු ව තුන් සුසිරි පුරා මතු මත්තෙහි ලැබිය යුතු ලොවී ලොවුතුරා ගුණ විශෙෂයට පිහිටි විය යුතු.

## 219. පොටඨිල තෙරුන් වහන්සේ ගේ වස්තුව

තව ද ආගමාභියොග ය ඇති තැනට අධිගම සිද්ධි අනායාස නියාව හඟවන්ට පොටඨිල තෙරුන් වහන්සේ ගේ වස්තුව දක්වමු.

මෙ කෙ සේ ද යත්—

උන් වහන්සේ විදර්ශි ආදී වූ බුදු වරුන් වහන්සේ ගේ ශාසන යෙහි මහණ ව ආගමධර ව පන් සියයක් දෙනා වහන්සේට අසන තැන් කියන සේක. බුදුහු එක් දවසක් 'මුන් තමන් අනුන්ට පිහිට වන ගමනක් මුත් තමන්ට පිහිටයකට සිතිවිලි නැත. උන් තමන් ට ත් පිහිට වනු ලෙසක් කරවමි' සිතා එ වක් පටන් ඒ තෙරුන් වහන්සේ තමන් වහන්සේ ලඟට ආ කල 'සිස් පොටයීලයෙනි, එව. සිස් පොටයීලයෙනි, හිඳුව' යනාදීන් වදරන සේක. ඒ තෙරුන් වහන්සේ ත් 'මම වූ කලී තෙවිලා බුදු වදන් වන පොත් ධරමි. පන් සියයක් වහන්දෑ අටළොස් වර්ගයක් කොට ලා අසන තැනු ත් කියමි. එ තෙකුදු වුව ත් බුදුහු මට මෙ ලෙස වදරන සේක. ධ්‍යානාදී ගුණ විශෙෂයක් මා කෙරෙහි නැති හෙයින් වනැ'යි සිතා වලට ගොසින් මහණ ධර්ම කරණ ලෙසට ඔබකට නො හඟවා තමන් වහන්සේ ම පාත්‍රය බැඳ ගෙණ අළුයම් වේලෙහි අසා ගෙණ යන වහන්දෑ හා කැටි ව ම නික්මුණු සේක. මළුවේ හිඳ පිරිවන වහන් දෑ ත් ඇදුරු තෙරුන් වහන්සේ නියා සලකා ගත නුහුණු සේක.

උන් වහන්සේ ත් සාර සිය අසූ ගවුවක් විතර ගොසින් එක් වලෙක වසන තිස් දෙණකුන් වහන්සේ කරා ගොසින් වැඩි මාලු තෙරුන් වහන්සේ වැඳ ලා 'ස්වාමීනි. මට පිහිට වුව මැනවැ'යි කී සේක. ඒ අසා උන් වහන්සේ 'ඇවැත්නි, තුමූ ධර්මධරයෝ ය. තමන් ගෙන් අඩු-වැඩි අප දත මනා ව තිබෙන්නා – එ සේ කීයේ හැයි දෑ'යි කී සේක. පොටයීල තෙරුන් වහන්සේ ත් 'ස්වාමීනි, එ සේ නො වදළ මැනව. පිහිට වුව මැනවැ'යි කී සේක. තිස් නම ම රහත් හෙයින් අධිගමොපාය කියන්ට බැරි නැත. එතෙකුදු වුව ත් වැඩිමාලු තෙරුන් වහන්සේ ආගම ව්‍යක්තිය නිසා මුන්ට ඇති අභිමාන ය ඇරවුව මනා වෙ දෑ'යි ඉක්බිති තෙරුන් වහන්සේ කරා යැවූ සේක. උන් වහන්සේ ත් එ ම ලෙස ම වදළ සේක. එ ලෙසින් හැම තැන් ම ඉක්බිති ව හුන් තැන කරා යවන සේක් සත් හැවිරිදි හෙරණ කෙණකුන්දෑ කරා යැවූ සේක.

මෙ ලෙසින් බහුශ්‍රැත කම නිසා ඔබට ඇති වූ අභිමාන ය හැරිණ. උන් වහන්සේ ද නිහතමානී ව සාමණෙරයන් දෑ ලඟට ගොසින් දෝත මුදුනේ තබා ගෙණ 'සත් පුරුෂයාණෙනි, අපට පිහිට වව'යි වදළ සේක. ඒ අසා හෙරණුන්දෑ ද 'ආචාරීන් වහන්ස, කුමක් කියන නියා ද? මුඹ වහන්සේ වයෝවෘද්ධ - තපො වෘද්ධ කම ත් ඇති සේක. නැවත බහුශ්‍රැත සේක. එ හෙයින් මුඹ වහන්සේ

Non-Commercial Distribution

ගෙන් ම දත යුත්තක් අප දනිතො ත් මුත් අප ගෙන් මුඹ වහන්සේ දන්නේ කිම් දැ'යි කී සේක. 'සත් පුරුෂයාණෙනි, තෙල ලෙස කියා අප ඔබට නැවිද්ද පිහිට වව'යි වදාළ සේක. 'ඉදින් සවාමීනි, කීකරු සේක් වී නම් පිහිට වෙමි, කී කල්හි 'සත් පුරුෂයාණෙනි, ගින්නට වදින්ට කීවත් වදිමි' කී සේක. සාමණෙරයන් දැ ද ළඟ තුබූ පොකුණක් පැ ලා සවාමීනි, අන් පෙරෙවිය පිටින් ම තෙල පොකුණට බට මැනැවැ'යි කී සේක. එ සේ කීයේ නම් වැළඳ ගත් සිවුරු මා ඇඟි බව දූන ත් කීකරු නියා විමසන්ට ය. තෙරුන් වහන්සේ ද එක බසින් ම පොකුණට බස්නට වන් සේක.

ඉක් බිත්තෙන් වැළඳ ගත් අඳනයෙහි අසුන් කන් තෙමෙන්ටවන් කල්හි ගොඩට වැඩි ය මැනැව'යි කියා එක බසින් ම අවුත් සිටි කල්හි සාමණෙරයන් දැ 'සවාමීනි. යම් සේ එක සුඹසෙක සිදුරු සයෙක් ඇත් ද, ඉන් එක සිදුරකින් ගොයෙක් ඇතුළට වන. ඒ ගොයි අල්වනු කැමැති කෙණෙක් ගොයා වන් සිදුර හැර අනික් සිදුරු පස ඇසවා ලා ස වැනි සිදුර බිඳ වන් සිදුරෙන් ම අල්වත් ද. එ පරිද්දෙන් මුඹ වහන්සේ ත් රූපා දී ෂඩාලම්බනයට ප්‍රතිනියත වූ චක්ෂුරා දී ද්වාරයන් ස දෙනාගෙන් චක්ෂුරාදි වූ පස් දොර වසා ලා මුනි දොර කට යුත්තට පටන් ගත මැනැවැ'යි කී සේක. බහුශ්‍රැත භික්ෂූන් වහන්සේට මෙ පමණෙ-කින් ම භාවනා විධි ය පහන් නහා පූවා සේ වී ය. උන් වහන් සේ ද 'සත් පුරුෂයා ණෙනි, මෙ තෙක් ම සෑහෙයි' කියා භාවනාවට පටන් ගත් සේක.

බුදුහු ත් සාර සිය අසූ ගවුවෙකින් ඔබ්බෙ වැඩ හුන් සේක් රස් කඳක් විහිදුවා ලා ලං ව වැඩ හුන්නා සේ වලා 'එම්බල මහණ, අට තිස් අරමුණෙහි භාවනාභියොග ය නිසා විපස්සනා ඥනය උපද්දී. යම් කෙණකුන්ට ඒ භාවනාභියොග ය නැත් නම් උන්ට විපස්සනාව ත් නැත. එ හෙයින් භාවනාභියොග ය ත් අනභියොග ය ත් යථා ක්‍රමයෙන් වැඩ–අවැඩ දෙක ම වන්නේ ය යි දූන යම් ලෙසක ලොවී ලොවුතුරා නුවණ වඩී නම් එ ලෙස කටයුතු ය'යි වදාළ සේක. දෙශනා කෙළවර පොට්ඨිල තෙරුන් වහන්සේ රහත් වූ සේක.

එ හෙයින් නුවණැත්තවුන් විසින් සිද්ධ කරණ ආගම ව්‍යක්තිය නිරායාසයෙන් අධිගම ව්‍යක්ති ය වනු සඳහා කට යුතු.

Non-Commercial Distribution

# 220. මහලු වහන්දෑගේ වස්තුව

තව ද සම්භ නො වන නිවන් සඳහා කරණ සෝකයක් මුත් සෙසු සෝකයෙන් ප්‍රයෝජන නැති නියාව හඟවන්ට **මහලු වහන්දෑගේ වස්තුව** දක්වමු.

**කෙ සේ ද යත්—**

ඒ වහන්දෑ ගිහි අවධියේ සැවැත් නුවර පොහොසත් ව උන්නු කෙළෙඹිවරු ය. ගිහි අවධියේ ත් එක් ව පින් කරන්නාහු බුදුන් ගෙන් බණ අසා 'අපි මාලු ව ගියම්හ. ගිහි කම් කවුලෙන් කිම් කිම් දැ'යි බුදුන් කරා ගොසින් බුදුන් කෙරෙහි මහණ වූ හ. මාලු ව පැවිදි බැවින් ඥාන ශක්තිය ය අඩු ව බණ ඉගෙන ගත නො හී වෙහෙර කෙළවර පන්සලක් කරවා ගෙණ එක් ව ම වසන සේක. සිඟා වඩනා කල ත් බොහෝ සේ පරණ අඹු දරුවන්ගේ ගෙට සිඟා ගොසින් ඊ දී වළඳන සේක. ඉන් එක් නමකගේ පොරණ දෙවැනිණියෝ[1] පිසමන් යාපත් හෙයින් මධු පාචිකා නම්හ. උෟ තුමූ හේ හැම තැනට ම උපකාරීහ. එ සේ හෙයින් හැම තැන් මී සිඟා ගත් දෙයෙක් ඇත් නම් උන්ගේ ගෙයි දී ම වළඳන සේක. උෟ ද වැළි ත් නිරන්තර ව බත් කුම වූව ක් සිඟා ගත් බතට මාළුවක් පිස දෙති. පසු ව කලක දී වහන්දෑගේ ම අදෙව යක් සේ ම ලෙඩක් ව ලා මළෝ ය. ඉක් බිත්තෙන් මාලු වහන්දෑ ද සහාය ව හුන් තෙරුන් වහන්සේගේ පන්සලට රැස් ව ඔවුනොවුන් වහන්සේ වැළඳ ගෙණ 'බත් මාළු පිසනා සේ යහපත් කොට දන්නා උපාසිකාවෝ මළෝ ය' යි කිය කියා හැඬූ සේක.

වහන්දෑ ද ඇතින් මෑතින් අවුත් මෙ කිම දැ'යි විචාළ කල්හි 'අපට යාළු ව හිඳිනා නමකගේ පිසමන් යහපත් කොට දන්නා පොරණ දෙ වැනිණි කෙණෙක් ලෙඩක් ව ලා මළෝ ය. හින්නා තෙක් දවස් අපට උපකාරී කම ත් මහත. එ බඳු කෙණකුන් කෙ සේ ලබමෝ දැ'යි සිතා හඬම්හ'යි කී සේක. ඒ ඇසූ වහන්දෑ මේ කථාව ධම් සෙබෙහි දී ඉපැදවූ සේක. බුදුහු ඒ අසා වදරා 'මහණෙනි, දැන් මතු නො වෙයි. පෙර ත් තුලු තෙල ලෙස කවුඩු යෝනියෙක ඉපැද මුහුදු බඩ ඇවිදිනා ගමනේ රළ ගැස්මෙකින් මුහුදට වැද මළ කල්හි මූ හැම ත් කවුඩු ව ඉපැද කවුඩන් නම් හඬන්ට සුරු පක්ෂයක් හෙයින් හඬමින් වලපමින් මූද වැටී ගිය කැවිඩිය මැත් කොට ගනුම්හ'යි තුඩින් පැන් උක උකා ඉස්නාහු—

---

1 දෙවැනැණියෝ

Non-Commercial Distribution

''අපි නු හනුකා සන්තා - මුඛඤ්ච පරිසුස්සති,
ඔරමාම න පාරෙම - පූරතෙව මහොදධි''

යනු හෙයින් මූදු පැන් ඉසිනට පටන් ගෙණ ආයාස මහත් ව ගොසින් 'හනු ත් හැව්ලෙයි. කට ත් හැව්ලෙයි. ඉස ගත ත් නො හැක්ක. මූද ත් පිරෙ යි' කිවූ ය' යනාදීන් කාක ජාතක ය විස්තර කොට වදරා ඒ වහන්දෑ බණවා ලා 'මහණෙනි, රා දෙස් ඈ කෙලෙස් නැමති වන ය නිසා මේ සා මහත් දුකෙක් තොපට පැමිණියේ ය යි යන අදහසින් වන ය සිඳුව'යි වදළ කල්හි අලුත මහණ වූ වහන්දෑ 'බුදූහු අප ලවා කැති පොරෝ ආදියෙන් වල් කප්වනු කැමති සේක් වනැ'යි සිතූ සේක.

බුදූහු ද නිකම් වන නො වන නියා ව භගවත්ට 'මහණෙනි, ගස් කොළ නො කපව'යි වදළ සේක. වදරා ලා වහන්දෑ තමන් වහන්සේගේ අදහස් දත් කල්හි 'මහණෙනි, යම් සේ පියව් වනයෙන් සිංහ ව්‍යාඝ්‍රාදීන් ගෙන් නො එක් භය වේ ද, එ පරිද්දෙන් ම ජාතිභයාදී වූ නො එක් භය ත් කෙලෙස් වෙනෙන් උපද්දී. යම් සේ මහත් වූ ගස් වන නම් වේ ද, කුඩා කුඩා ගස් එහි පිහිටි හෙයින් වනථ නම් වේ ද, නො හොත් මූකුරා සිටි ගස් වන නම් වේ ද, පසු ව පසු ව ඇති වන පැළ වනථ නම් වේ ද, එ පරිද්දෙන් ම පිළිසැඳ දෙන කෙලෙස්හු වන නම් වෙති. ප්‍රවෘත්ති විපාක දයකයෝ වනථ නම් වෙති. එ මෙන් පෙර පෙර උපන් කෙලෙස්හු වන නම් වෙති. පසු ව පසු ව උපදනා කෙලෙස්හු වනථ නම් වෙති. එ හෙයින් මහණෙනි, ද්වි ප්‍රකාර වූ කෙලෙසුන් ම රහත් මඟින් සිඳ නිකෙලෙස් ව වසව.

'යම් කෙණකුන්ගේ සන්තානයෙහි ශෙෂ මාත්‍ර වුව ත් කෙලෙස් කෙණෙක් පවතිත් ද, ඒ තාක් උෟ තුමූ කිරි බොන වස්සන් කිරි වරත තාක් මවුන් පිළිබඳ වූවා සේ කෙලෙස් පිළිබඳ ව වෙසෙති' වදළ සේක. දෙශනා කෙළවර පන් සියයක් විවර මහලු වහන්දෑ සෝවාන් ව ආයාීී ජාතියෙහි අමුතු ව උපන් හෙයින් සඟ බාල වූ සේක. තව ත් බොහෝ දෙනා හට මේ දෙශනාව සප්‍රයෝජන වි ය.

එ හෙයින් නුවණැත්තවුන් විසින් මේ වක විෂ්කම්භන-සමුච්ඡෙද දෙක බැරි වුව ත් තදඞ්ග විමුක්ති ය පිළිවන් බැවින් ශීල සංරක්ෂණාදී වූ කුශලයෙහි පිහිටීමෙන් සියලු අකුසලින් දුරු ව ලොව් ලොවුතුරා සැප ත් සිද්ධ කට යුතු.

Non-Commercial Distribution

# 221. සැරියුත් මහ තෙරුන් වහන්සේගේ සද්ධිවිහාරික නමකගේ වස්තුව

තව ද සත්ත්වයන්ගේ චරිත දැන ගැන්ම නම් බුදුන්ට විනා ඔබ්බට බැරි නියාව හඟවන්ට සැරියුත් මහ තෙරුන් වහන්සේගේ සද්ධිවිහාරික නමකගේ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්—

බඩාලාණ කෙණෙක් යහපත් රූ ඇත්තෝ ය. අධිගම හෙතුව ඇත්තවුන්ගේ මහණ වීමට බාධාවක් නැති හෙයින් සැරියුත් මහ තෙරුන්වහන්සේ ලඟ මහණ වූ ය. මහ තෙරුන් වහන්සේ ද මහණ වූ තැනැත්තවුන් ද ධූර ද්වයෙන් එක්තරා ධූරයෙක යෙදුව මැනව. හැම දෙනාට හැම කමටහන් ම සැප නො වෙයි. මූ සඟ බාල හෙයින් මුන්ට රාගය උත්සන්න ය'යි සිතා රාග යට පිළිවක් වූ අසුභ කමටහන දුන් සේක. උන් වහන්සේට ද රිසි නැති ව කන බතක් සේ ඒ කමටහන සැප නො වෙයි. එ සේ හෙයින් වලට ගොසින් මසක් මුළුල්ලෙහි යත්න කොට ත් සිත එකඟ වීම පමණකුත් නො ලදින් නැවත මහ තෙරුන් වහන්සේ ලඟට අවුත් 'කමටහන විභූත දෑ'යි විචාළ කල්හි විභූත නො වන නියාව කී සේක.

මහ තෙරුන් වහන්සේ ද 'කමටහන උන්ට විභූත නො වත් අප කරන්නේ කිම දෑ'යි නො සිතා බර හෙයින් ගෙණ යා නො හැකි දෙයක් සැහැල්ලු කොට දී ලන්නා සේ ඒ කමටහන ලසු ක්‍රමයෙකින් වදාළ සේක. උන් වහන්සේ දෙ වැනි වත් භාවනාවට ගිය සේක් ගුණ විශෙෂයක් උපදවා ගත නො හී මහ තෙරුන් වහන්සේට වදාළ සේක. මහ තෙරුන් වහන්සේ ද තුන් වැනි ව ත් දහස් ගණන් රන් ඉතා බර හෙයින් ඒ දී ලා කළන් ගණනක් හැර ගත්තා සේ බොහෝ ව තිබෙන්නා වූ ඒ කමටහන ඉතා ම ලසු කොට සිත තිබී යන ලෙසකට කාරණොපමා සහිත කොට ලා උගන්වා ලූ සේක. උන් වහන්සේ තුන් වැනි ව ත් ගොසින් භාවනා කොට ලා නො වැටහෙන හෙයින් අවුත් කී සේක.

මහ තෙරුන් වහන්සේ ද 'භාවනා කරණ භික්ෂූහු නම් තමන් කෙරෙහි විද්‍යමාන වූ කාමච්ඡන්දාදීන් විද්‍යමාන ය යි කියා ත් දනිති. අවිද්‍යමානයන් අවිද්‍යමාන ය යි කියා ත් දනිති. මූ ද වැළි ත් භාවනාවට අයොග්‍ය කෙණෙක් නො වෙති. යොග්‍ය ම ය. මම මුන්ගේ අදහස් දත නො හෙමි. බුද්ධවෙනෙය්‍ය කෙණකුත් නියා ය'යි උන් වහන්සේ කැඳවා ගෙණ සවස් වේලෙහි බුදුන් කරා ගොසින්

Non-Commercial Distribution

බුදුන් වැද ලා 'ස්වාමීනි, මූ මාගේ සද්ධි විහාරිකයාණ කෙණෙක. මම මුන්ට රාග චරිත ය යි සිතා අසුභ කමටහන දිනිමි. 'උෟ ගුණ විශෙෂයක් උපදවා ගත නුහුණු ය'යි වදාළ සේක. අනුන්ගේ අදහස සියලු ලෙසින් ම දැනගැන්ම නම් දස පෙරුම් පුරා දස දහසක් සක් වළ මහ පොළොව ගුගුරුවා බුදු වූ කෙණකුන්ට ම පිළිවන් හෙයින් 'මූ කවර කුලයකින් අවුත් මහණ වූ දෝ හෝ'යි සලකන සේක්- 'බඩාල් කුලයෙනැ'යි දැන ඉකුත් අත් බැවු ත් බලන සේක් පිට පිට හෙළා පන් සියයක් ජාතියෙහි බඩාල් ව උපන් නියාව දැක 'මූ තුමූ බොහෝ කලක් රත්රන් කර්මාන්ත කරන්නෝ රන් මල් ආදි ය කෙරෙමින් රත්රන් ම අල්වා පුරුදු වූ ය. එ හෙයින් මුන්ට පිළිකුල් භාවනාව සිතට නො වැටහෙන හෙයින් පවිත්‍ර දෙයෙක් ම සිත වද්දී' සිතා වදරා 'ශාරිපුත්‍රයෙනි, තොපගෙන් කමටහන් ඉගෙන සාර මසක් මුළුල්ලෙහි දුක් ගත් භික්ෂුහු අද එක පස් වරුවෙන් රහත් කරවා ලන නියාව බලා හිඳුව. තෙපි යව'යි මහ තෙරුන් වහන්සේ යවා පියා තමන් වහන්සේගේ ආනුභාවයෙන් රථසකක් සා විවර මහත ඇති රන් පියුමක් මවා ලා පෙත්තෙනු ත් පියුම් නටුවෙනු ත් පැන් පෙරී වැගිරෙන ලෙසට කොට වදරා 'හිඳ' මහණ, තෙල පියුම හැර ගෙණ වෙහෙර පසල වැලි ගොඩක් පිට තබා ලා ලං ව ලා වැඩ හිඳ රන් පියුම හෙයින් 'ලොහිතකං ලොහිතකං' යි පිරියම් කරව'යි දුන් සේක.

පියුම අතට දී ලන්නා ම සිත පහන. උන් වහන්සේ ද විහාර කෙළවරට ගොසින් වැලි ගොඩක් රැස් කොට ලා මල් නටු ව එහි හිඳුවා ලඟ වැඩ හිඳ 'ලොහිතකං, ලොහිතකං'යි සමථ භාවනාවට පටන් ගත් සේක. භාවනාවට පටන් ගෙණ භාවනා කර ත් කර ත් කාමච්ඡන්දදී පස් නීවරණයෝ විකඹන[1] වූ ය. උපචාරධ්‍යාන උපන. ඊට අනතුරු ව ප්‍රථමධ්‍යාන උපදවා පස් ආකාරයෙකින් විසී බවට පමුණුවා හුන් සෙ හිඳ ම චතුෂ්ක නයින් අනික් ධ්‍යාන තුන ත් උපදවා වසිතාවට පැමිණවීමෙන් ධ්‍යාන සතර ම තර ව ගත් කල්හි ධ්‍යාන සමාපත්තියට සම වැද වැඩ හුන් සේක.

බුදුහු ඔබට ධ්‍යාන උපන් නියාව දැන 'කුමක් දෝ ? මූ තුමූ තමන්ගේ ශක්තීන් උපදවා ගත් ලොවී ගුණ පිටට ලොවුතුරා ගුණ ත් උපදවා ගත හෙත් දෝ හෝ'යි බලන සේක් සවශක්තීන් අසමර්ථ නියාව දැන 'තෙල පියුම තුලුන් බල බලා හින්ද දී ම පර ව යේව'යි කියා සිතා වදාළ සේක. ඒ පියුම ත් අතින් මිරිකා

1 විස්කම්බන

Non-Commercial Distribution

පූවාක් මෙන් පර වන්නේ කළු ව ගියේ ය.. උන් වහන්සේ ද ධ්‍යානයෙන් නැඟී ඒ පියුම බලා 'කුමක් දෝ හෝ, මේ පියුම පර වීමෙන් ජරාවක් හෙයින් ජරාවෙන් මඩනා ලද්දේ පෙනෙයි. අනින්ද්‍රි ය බද්ධයට පවා මෙ සේ ජරා ඇති කල ඉන්ද්‍රිය බද්ධයට කියනු කිම ද ? සක්විති රජ දරුවන්ගේ සක්රුවන සේ ශොභාමත් ව සිටියා වූ මේ පියුම පර ව බල බලා සිටිය දී ම ජරාවට පැමිණි-යේ ය. 'ඒකාන්ත ව නස්සී' සැලකීමෙන් අනිත්‍ය ලක්‍ෂණ ය දුටු සේක.

අනිත්‍ය ලක්‍ෂණ ය දක්මෙන් ඒ ම දුක් හෙයින් දුඃඛ ලක්-ෂණය ත් ඒ ම අනත් බැවින් අනාත්ම ලක්‍ෂයණ ත් දුටු සේක. උන් වහන්සේට තුන් භව ය ගිනි ගෙණ දිළිහී ගියා මෙන් කර බැඳ ලූ කුණක් මෙන් වැටහිණ. ඒ වේලාට ම බාල දරුවෝ ළඟ එක් විලකට බැස පියා ඇඹුල මල් කඩ කඩා ගොඩ රැස් කෙරෙති. තෙරුන් වහන්සේ 'අනින්ද්‍රියබද්ධ වස්තුව පවා මෙ ලෙස ජරාවට පැමිණේ යි. සත්ත්වයන්ට ජරාව අවුත් වදනා නියා කියනු ම කිම ද'යි තුන් ලකුණ තරයේ මෙනෙහි කළ සේක.

බුදුහු ත් කුමටහන් මුන්ට තර ව වැටහිණැ'යි දැන ගඳ කිළි යෙහි වැඩහුන් සේක් ම රස් කඳක් විහිදුවූ සේක. ඒ රස් කඳ ද ගොසින් උන් වහන්සේගේ මුහුණ වැද ගත. 'කුමක් දෝ හෝ'යි බැලූ කලට මේ වර කරණ කෙණකුන් යවා ඉන් නිහඬක් නො වන හෙයින් රජ්ජුරුවන් තමන් ම ගියා සේ බුදුන් ගොසින් සිටියා සේ උන් වහන්සේට වැටහිණ. උන් වහන්සේ ද දෝත මුදුනෝ තබා ගත් සේක.

ඉක්බිත්තෙන් බුදුහු ඔබට අනුකූල බණක් සලකා 'එම්බල මහණ, විලෙක ඇති වූ මහනෙල් ඉපුල්[1] ආදි වූ මල් අතින් කඩා ගන්නා සේ රහත් මගින් සියල්ලෙහි කරණ ඇල්මෙක් ඇත් නම් ඒ සිඳ පියා බුදුන් විසින් දෙසන ලද නිවනට විනා අනිකකට මං නො වන බුද්ධොත්පාද කාලයෙක මුත් සෙසු කාලෙක සම්භ නො වන අෂ්ටාංගික මාර්ග ය උපදවා ගත මැනැවැ'යි වදළ සේක. දෙශනා කෙළවර සැරියුත් මහ තෙරුන් වහන්සේ ගේ උපදෙශ යෙන් සාරමසක් විවරිනු ත් රහත් ව ගත නුහුණු තෙරුන් වහන් සේ එක පස් වරුයෙන් පිළියම් නො දන්නවුන් ගේ පිළියමින් කල් යන්නා වූ ලෙඩ දුක් පිළියම් දන්නවුන්ගේ වශයෙන් උදවුව සන්හිඳෙන්නා සේ බුදුන්ගේ උපදෙශයෙන් රහත් ව වදළ සේක.

---

1. උපුල්

Non-Commercial Distribution

එ හෙයින් නුවණැත්තවුන් විසින් සියල්ලකට ත් වඩා ති ලකුණු මෙනෙහි කිරීමෙන් භවසම්පතෙහි ආලය හැර නිවන් සම්පත් සාධා ගත යුතු.

---

## 222. මහධන වෙළෙඳාණන් ගේ වස්තුව

තව ද පවිටු අදහස් ඇති කල ලැසි ගැන්ම යාපත් වුව ත් කුශල විෂයෙහි එ සේ ලැසි ගැන්ම යහපත් නො වෙ යි සිතන ලෙසට මහ ධන වෙළෙඳාණන් ගේ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්—

ඒ වෙළඳාණෝ බරණැස් නුවර සිට වනුක් මලින් රඳු රත් වන් පිළි ගැල් පන් සියයක පුරා ගෙණ වෙළඳාමට සැවැත් නුවරට ගියෝ ය. ගොසිනු ත් ගඟ කරා පැමිණ 'සෙට ගඟින් එ තෙර වෙමි' මෙ තෙර ගැල් උනවා පියා එ තැන ම රැඳුණවු ය. රෑ දවස් මහත් කොට වැස්සක් වැස ගඟ දිය හෙළා පියා සතියක් මුළුල්ලෙහි වතුර නො බැස ම සිටියේ ය. නුවර ඇත්තෝ ද සතියක් මුළුල්ලෙහි උත්සවයක් කොළෝ ය. මඟුල් නිමන්නා ම රන් වන් පිළියෙන් ප්‍රයෝජන ත් නිමියේ ය. වෙළඳාණන් ද වතුර හෙළන්නාට පෙරාතු ව ම ගඟින් එ තෙර වන්ට නුවූ හෙයින් ගෙන්වා ගෙණ ගිය පිළි විකපත් වන්ට නො වී ය. එ හෙයින් ම 'මම දුර සිට අයිමි. පෙරළා ගියෝතින් කල් පලා යෙ යි. මෙ තැන ම් වැසි සමය ත්, හිම ත්[1] සමය ත්, ගිමන් සමය ත් යවා පියා මේ පිළී විකපත් වන අවධියක දී විකොට ගනිමි' සිතූහ.

බුදුහු ද නුවර සිඟන සේක් උන්ගේ සිතිවිල්ලට සිනා පහළ කොට අනඳ මහ තෙරුන් වහන්සේ සිනාවට කාරණ විචාළ කල්හි 'ආනන්‍දයෙනි, මහධන වෙළඳා දුටු දැ'යි විචාරා 'එ සේ ය'යි කී කල්හි 'එම්බා ආනන්‍දයෙනි, ඌ තුමූ තමන්ගේ ජීවත් වීම නො සලකා මෙ තැන ම පිළීයෙහි අග ය එන තෙක් අවුරුද්දක් ම රඳන්ට සිතා ගත්හ'යි වදාළ සේක. ඒ අසා අනඳ මහ තෙරුන් වහන්සේ 'ස්වාමීනි, උන්ට උවදුරක් පෙනෙනු නියා දැ'යි විචාළ කල්හි 'එ සේ ය, ආනන්‍දයෙනි, රඳන්ට සිතූ අවුරුද්ද තබා මසක් විවරට ත් ආයු නැති හෙයින් සත් දවසකින් මිය යන්නේ ය'යි වදාළ සේක. ඒ අසා අනඳ මහ තෙරුන් වහන්සේ 'ස්වාමීනි, මම ගොසින් උන්ට කියම් දැ'යි වදාළ සේක.

බුදුහු ත් 'ආනන්‍දයෙනි, වහා යව'යි වදාළ සේක. මහ තෙරුන් වහන්සේ ද ගැල් තුබූ තැනට ගොසින් සිඟු සේක. වෙළඳාණෝ ද

---

1 හිමන්,

Non-Commercial Distribution

තෙරුන් වහන්සේට දන් දුන්හ. වළඳා අන්තයෙහි 'වෙළඳා-ණෙනි, මෙ තැන කෙ තෙක් කල් රඳවුදැ'යි විචාළ සේක. 'ස්වාමීනි, අවුරුද්දක් විතර රඳා පිළී විකපත් කොට ගෙණම යෙම්'යි කිවු ය. 'උපාසකයෙනි, ජීවත් වීමෙහි නියම ය කියා ලිය නො හැක්ක. පමා නො වව'යි වදාළ සේක. වදාළ ලෙසින් ම දැන ලා 'ස්වාමීනි, උවදුරක් පෙනෙනු නියා දැ'යි කිවු ය. 'එ සේ ය, උපාසකයෙනි, සතියක් මුත් වඩා ජීවත් වීම නැතැ'යි වදාළ සේක.

ඒ අසා උපාසකයෝ තර ව මුසුප්පු ව බුදු පා මොක් මහ සඟනට ආරාධනා කොට සතියක් මහ දන් දී අනුමෙවෙනි බණට අරාධනා කළහ. බුදුහු ත් අනුමෙවෙනි බණ වදාරන සේක් 'හෙම්බා වෙළඳාණෙනි, නුවණැත්තෝ මෙ මේ දෙය කෙරෙමින් මෙ තැන වැසි සාර මස ත්, හිම ත්, ගිමන් අටමස ත් රදම්හ'යි රැඳීම් පමණක් සිතති. ජීවත් වීම කවර වෙව යි නො දනිති. ඒ ඒ තැන රැඳීමට ත් වඩා බඩු විකිණීමට ත් වඩා දැන ගත හොත් දවසක් රඳා හිඳිත ත් නිවන් සුව හැර ගන්නා ලෙසට කුසල් බඩු එක් කට යුතු ය'යි වදාළ සේක. දෙශනා කෙළවර ඒ වෙළඳාණෝ සෝවාන් වූහ. සතිය මුළුල්ලෙහි දුන් දන් නිවන් බඩුවට බඩු මිල වි ය. සෙසු ත් බොහෝ දෙන නිවන් දුටහ. වෙළඳාණෝ ත් බුදුන්ට ගමන් පසු කොට ලා රැඳුණු තැනැත්තෝ එ දවස් ම මිය ගොසින් දෙව් ලොව උපන්හ.

එ හෙයින් සත් පුරුෂයන් විසින් අද කළමනා පින් කම් අද ම කර ත් මුත් සෙටයට අනික් දවසකට නැහෙන මසට නැහෙන හවුරුද්දව නො තබා හිස ගිනි ගත් කෙණකුන් ඒ ගිනි නිවන්ට වන වෙළෙවියක් සේ ලොවුතුරා සැප ත් ලැබීමට වෙළෙවි[1] විය යුතු.

---

## 223. කිසාගෝතමීන්දෑ ගේ වත

තව ද යම් කෙණෙක් මළවුන් අරභයා ශොක කෙරෙත් නම් ඒ ශොක ය මුල් ව පීඩාවක් මුත් මෙ ලෝ පරලෝ දෙකින් ම ප්‍රයෝජනයක් නැති නියා ව හඟවන්ට කිසාගෝතමීන්දෑ ගේ වත දක්වමු.

කෙ සේ ද යත්–

එහි විස්තර කථාව සහස්ස වග ම ආ ය. එ කල බුදුහු 'කිසාගොතමීනි, අසුරක් විතර හබ සුහක් ලදුදැ'යි විචාරා ගම මුළුල්-ලෙහි ඇවිද ත් නො ලදුම්හ'යි කී කල්හි බුදුහු 'මීනී නො මළ

---

1 විළෙවි

Non-Commercial Distribution

ගෙයකින් හබ ලබන්ට බැරියා සේ ම රහත් ව අනුපධිශෙෂ නිර්වාණ ධාතුවෙන් පිරිනිවියො ත් මුත් නො මියාම ත් බැරි ය'යි වදරා ලා බණ වදරන සේක් ''හෙම්බා කිසාගොතමීනි, දරුවනු ත් ගෙරි සරකුනු ත් ලදින් 'අපගේ දරුවෝ ත් ඉතා රූපත්හ. පොහො සත්හ. පිරිමි සරක් සාලන්ට උසුලා ලන්ට බල ඇත්තෝ ය.

'ගැනු සරක් කිරි දෙති' යනාදීන් සිතා ගෙණ උන් කෙරෙහි පවත්නා වූ, තව ද ගිහි වුව ත් ශාසනික වුව ත් රන් රුවන් ආදියක් හෝ පා සිවුරු ආදියක් හෝ ලදින් ලත් ලත් විවරකින් ම සතුටු නො ව වඩ වඩා ලා ම උල සීරු තැනෙක පැන් උනා පිරෙන්නා සේ පතන්නා වූ සත්‍වයන් සිතන පතන පමණක් මුත් ලත් කිසිවකු ත් නැති ව ලද ත් ඒ තිබි සේ ම තිබිය දී ගෙධා පන්න සත්‍වයන් මර සොර අවුත් ලා ගහක් බඩ ගමක නිදා වැතිර ගියවුන් ගඟ බලවත් වතුර අවුත් යට ත් පිරිසෙයින් බල්ලන් බළ ලුන් පමණකු ත් නො රඳවා හැර ගෙණ යේ ද, එ මෙන් මරණ ඉක්ම පිය නුහුණුවුන් හැර ගෙණ යෙයි'' වදළ සේක. දෙශනා කෙළවර කිසාගෝතමීන්දැ සෝවාන් වූහ. තවත් බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් සත් පුරුෂයන් විසින් සෙසු සියල්ලෙක කරණ ඇල්මෙක් ඇත් නම් ඒ හැර දනා දී වූ පින් කම ඇලී වැස භව සැප ත් වළඳා කෙළවර නිවන් අත් කට යුතු.

## 224. පටාචාරාවන් ගේ වස්තුව

තව ද පිරිහුණා වූ ලෞකික ගුණ විශෙෂයක් සිද්ධ කොට ගත නුහුණු ලොවී ලොවුතුරා ගුණයක් නිසා නො ව සෙසු ශොක-යෙන් ප්‍රයොජන නැති නියාව හඟවන්ට පටාචාරාවන් ගේ වස්තු දක්වමු.

කෙ සේ ද යත්—

එහි විස්තර කථාව සහස්ස වග ම ආ ය. එ කල බුදුහු පටා-චාරාවන්ට ශොක තුනී නියාව දැන බණ වදරන සේක් 'හෙම්බා පටාචාරාවෙනි, මිය පර ලොව යන්නවුන්ට වැදූ දෙ මවු පියෝ වෙත් ව යි තමා වද ගත් දරුවෝ වෙත් ව යි ඒ දෙ පක්ෂ ය හැර සෙසු නෑයෝ වෙත් ව යි ඉදින් අපායකට පැමිණෙ ත් නම් ඊට නො යන ලෙසට වෙව යි නො මිය ජීවත් වන ලෙසට පිහිට විය නො හෙති. ජීවත් ව හිදිනා තෙක් දවස් කෙ සේ කුමක් කොළෝ

Non-Commercial Distribution

නමුත් මරු හා යුද්ධ වේලාට බලා සිටිතොත් මුත් කිසිත් සහායක් වී ය නො හෙති. කොට ගත් පිණෙක් ඇත් නම් මිය යා නො දී රඳවා පිය නො හෙන මුත් පරලෝ සැප ත් ලැබීමට පිහිට වෙයි' වදාළ සේක. දෙශනා කෙළවර පටාචාරාවෝ සෝවාන් ව මරු පරදවන්ට සහාය ලත්හ. සෙසු ත් බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් සුජනයන් විසින් පර ලොවට ම සහාය සේ‍යා මෙ ලොව නින්ද වළකනු ව[1] හැඳගන්නා ලෙසට පිළී පමණක් හා වෙලින් වේලාට යැපෙන පමණකට බත් පමණක් හා සපයමින් වැඩියක් නො පතා කරුකන් නිල ආදී වූ යම් කිසි තැනෙක රඳා හිඳ බැරැරුම් ව තිබෙන්නා වූ ලොවුතුරා සැපතට ම උත්සාහ කට යුතු.

## 225. ගඬගාරෝහණ වස්තුව

තව ද ස්ථානයෙහි කරණ ලද ලඝු තරම් වූ ත් පූජා සත්කාර මහත් විපාක සාධා දී ලන හෙයින් ලඝු නො වන නියාව හඟවන්ට ගඬගාරෝහණ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්—

එක් සමයෙක දඹ දිව විසල් මහ නුවර බතින් පැනින් ඉතා සමෘද්ධ ය. විපත්තියකු ත් ආසන්න හෙයින් රට මුළුල්ලේ වස්තු ගෙනවූ ත් ලා ලූවා සේ එ නුවර පිරී සිටිටි. අතිසුඛිත වූ බොහෝ මිනිස්සු ත් එහි ඇත. දවස එක් කෙණෙකුන්ට වන නියාමයෙන් එ නුවර රජ කම් කරණ රජ දරුවෝ සත් දස් සත් සිය සත් දෙනෙක. උන් වසන මාළිගා ත් කුළු ගෙවලු ත් උයන් කෙළි කෙළනා උයනු ත් පුෂ්පාරාම-ඵලාරාමාදිය ත් වෙන වෙන ම සත් දස් සත් සිය සත ම ය. වොටුනු පළන් රජුන් ම සත් දස් සත් සිය සත් දෙණකු හෙයින් මින් එක් කෙණෙකුන්ට රාජ්‍ය පැමිණෙන්නේ එක් විසි හවුරුදු සාරමස් සත් විසි දවසක් විතර ගිය කලට ය. ඒ නුවර දිගිනු ත් පළලිනු ත් තුන් තුන් ගවු විතර ය. තුන් වරෙකින් කැටි ව විසල් වූ හෙයින් විසල් මහ නුවර ය යි නමින් ප්‍රසිද්ධ වී ය. විසල් මහ නුවර ද දඹ දිව නමැති වොටුන්නෙහි ඔබා ලූ රුවන් පෙළ වැනි මාළිගාවලින් හා කුළු ගෙවලින් බබළයි. මැණික් කර්මාන්ත ගාවා ඔබා ලූ මුතු පෙළ සේ උඩු මාල් බිම් මාල් ගෙවලින් සැදී සිටි වීථි වින්‍යාසයෙන් ම ඉතා ශොභාවත.

---

1 මෙ ලොවැනි වළකනුව

Non-Commercial Distribution

භූරිදත්ත ජාතකයෙහි සමුද්‍රජාවන් තමන්ට සරණ දෙන්ට මැළි වූ නියාව අසා ධෘතරාෂ්ට්‍ර නම් නා රජ්ජුරුවන් අවුත් බරණැස් නුවර දරණ ගඹින් මැද කළා සේ එ නුවර වට ලුවා වූ උසින් අටළොස් රියන් උස් ව සුණුවමින් බබළන් පවුරු වළල්ල නම් එ නුවර රජ දරුවන්ට පැවැති කීර්ති ය ඇතුළු නුවර ජන ගහ න ය බලවත් හෙයින් ඉන් අවසර ලද නො හී අත් හැර යන්ට ත් මැළි ව වටා සිටියාක් වැන්න.

එ නුවර වාසල් සතර නම් චතුර් විධ මාර්ග ඥාන නමැති වාසල් වලින් අවඡන්දික ව නිවන් පුරයට වැද්ද නො හෙන[1] ලිච්ඡවීන්ට මෙ පමණකු ත් වුව මනා වේ ද යි ලවා ලූ වාසල් වැන්න. එ නුවර පොකුණු නම් විවසුන් නමැති දියෙන් පිරී සිටිනා පඤ්ච විධ විමුක්ති නමැති පස් පියුමෙන් ගැවසී ගත් නිවන් විලට බැස නා පියා නො හෙන්නවුන්ට මෙ පමණකු ත් ඇත මනා වේ ද'යි කළාක් වැන්න. තපො වනයට වැද්ද නො හෙන්නවුන්ට මෙ පමණකු ත් ඇත මනා වේ ද යි ඇති කළාක් වැනි වූ මල් පල් ලෙන් ගැවසී ගත් පුෂ්පාරාම-ඵලාරාම ත් ඇත.

එ සේ වූ නුවර කලක දී ඒ නුවර වසන්නවුන්ගේ පුරා කෘත අකුසලයට අවසර පානාක් මෙන් සායෙක් ගසා පියා බත් පැන් නැති වි ය. බත් බිජු වට නැති ව ගොයම් කරන්නවුන් නැති හෙයින් ගොයමු ත් නැති ව සාය තර වත් වත් නියහට පෙරාතු නො වන හෙයින් දෙසි ගස් මියන්නා සේ පළමු කොට බත් පැන් නො ලදින් දුක් පත්තු මියන්ට වන්හ. ඇඟ හුණු පණුවන් දවන්ට මැළි කරන්නා සේ ඒ ඒ තැනට දමා පූ මිනී කුණෙයි ගඳින් එළවුවට එන්නවුන් මෙන් යක්කු නුවරට හඬා වන්හ. බත් පැන් නැති තැනට යකුන් ඇති වූ හෙයින් මිනී මස් ලබන්ට යකුන්ගේ දෛව බොහෝ වූවා සේ බොහෝ දෙන මියන්ට වන්හ. කුණප ගන්ධ ය බොහෝ ව ගොසින් එයි ත් මුල් ව දුකට නො තබා නිමවන්ට කරන්නා සේ සත්‍වයන්ට අභිවාතක ලෙඩ ඇති වි ය. මෙ භය තුන විසල් මහ නුවරට සෙණ තුනක් මෙන් පහළ වි ය.

භයින් තැති ගත් නුවරවැස්සෝ නො මිය රඳා හුන් කෙණෙක් රැස් ව එ දවස් රජ කරණ රජ්ජුරුවන් කරා ගොසින් 'මහ රජ, මෙ නුවර මුහුද හඩ කෙවිලියන්ට නො දැනෙන්නා සේ මුඹ වහන් සේට නො දැනෙන බව මුත් එකි එකී භය ම සත්‍ව විනාශයට සෑහෙන තරම් දුර්භික්ෂ භයා දී වූ භය තුනක් ඇති වි ය. මෙයට පෙරාතු සත් වන රජ පරම්පරා දක්වා මෙ බඳු වූ භයෙක් නූපන් විරී ය. ධර්මිෂ්ඨ රජ දරුවන් සමයෙහි මෙ බඳු භයෙක් උපදනේ නැතැ'යි කිවු ය.

1 වැඩ නො ගෙණ ලීමේ පමණකු ත්

Non-Commercial Distribution

රජ්ජුරුවෝ ද සම්මන්ත්‍රණයට[1] රැස්වන්නා වූ ශාලාවට හැම දෙනා රැස්කරවා ලා 'තුමූ ත් ගොසින් ඉදින් මාගේ නො මැදහත් කමෙක්[2] ඇත් නම් විමසව'යි කිවු ය. විසල් නුවර ඇත්තෝ ද නො එක් ලෙසින් පරීක්‍ෂා කොට රජ්ජුරුවන් ගෙන් කිසි වරදක් නො දැක 'රජ්ජුරුවන් වහන්ස, මුඹ වහන්සේගේ කිසි වරදෙක් නැතැ'යි කියා 'මේ අපට පැමිණි භය කවර ලෙසකින් සන් හිඳී යේ දෝ හෝ'යි කථා කළහ. සමහර කෙණෙක් බිලියම් කළ කල සන්හිඳෙයි කිවු ය. සමහර කෙණෙක් දෙවතා ආරා—ධනාවෙන් සන්හිඳෙයි කිවු ය. සමහර කෙණෙක් විෂ්ණු ඊශ්වරා දීන්ට පූජා කළ කල සන් හිඳෙයි කිවු ය.

ඒ හැම ම පුරා කෘත අකුශල කර්ම ප්‍රතිබාහනයෙක්හි සමර්ථ දෙයක් නො වන හෙයින් ඒ හැම ම කොට ත් භය සන්හිඳුවා ගත නුහුණු වූ ය. භය නො සන්හිඳෙන නියාව දැක සමහර කෙ-ණෙක් හුණට තියඹරා යාපතැ'යි යන්නවුන් මෙන්, සෙමට උක් සකුරු යාපතැ යි යන්නවුන් මෙන්, උන් හැම අවත් දිවුණ තොත් මුත් නො සන්හිඳෙන භය පූරණ කාශ්‍යප ය, මක්ඛලීගොසාල ය, අජිතකෙශකම්බලී ය, නිගණ්ඨනාථපුත්‍ර ය, කකුධකාත්‍යායන ය, සඤ්ජයබෙලට්ඨි ය යන බුදුවරුන් වහන්සේ ලා ස දෙනා මහානු භාව සම්පන්න සේක. උන් වහන්සේ ලා මීට වැඩියො ත් මේ භය සන්හිඳෙයි කිවු ය.

එ ලෙස කොට ත් ඒ භය නො සන්හිඳෙන හෙයින් ඉන් ම සමහර නුවණැති කෙණෙක් 'තොප හැම කරණ කට යුතු නම් පාන ඇවිළෙමින් සිටිය දී ගිනි සොයා ගොසින් කණාමැදිරියකු දැක ගිනි ය යි සිතා පිඹින්නාක් වැන්න. නැවත කිරින් ප්‍රයො-ජනයක් ඇති විටෙක දෙනගේ දෙව ගන්ව පිළිවන් ව තිබෙන මොළොක් ව තිබෙන තන තිබිය දී කෙ තෙක් වෙලා දෙවිය ත් අතට වන ආයාස පමණක් මුත් කිරක් තමා ම නැති හභ අල්වා ගෙණ සැලෙන්නවුන් වැන්න. ති ලෝ ගුරු බුදු රජුන් වහන්සේ සම තිස් පෙරුම් පුරා බුදු ව වදරා සියල්ලවුන්ට හිත පිණිස බණ වදරණ සේක. මේ භය සන්සිඳුවත ත් මහානුභාව සම්පන්න හෙයින් ඔබට පිළිවන. සියල්ලවුන් කෙරෙහි කරණ ලද කරුණාව ත් අප හැර නො වන හෙයින් ඔබ මුඹ නො වඩි ඉන් ත් නැත. ඔබ ඉදින් මුඹ වැඩි සේක් වී නම් මේ භය තුන ම සන්හිඳේ'යි කිවු ය. උන්ගේ බස් හැම දෙන ම ගිවිස, කරන්ට ත් සිතා ගෙණ 'ඒ බුදුහු දැන් කොයි වසන සේක් දැ'යි කිවු ය.

---

1 සම්මන්ත්‍රනයට 2 නොදත් කමෙක්

Non-Commercial Distribution

එ කලට බුදුහු වස් වසන ආසන්නයෙහි බිම්සර මහ රජුන්ගේ ආරාධනා ඉවසා වස් වසන තෙක් වෙළුවන විහාරයෙහි වසන සේක. ඒ රාජ සමාගමයෙහි[1] හෙවත් බිම්සර මහ රජ්ජුරුවන් බුදුන් දක්නට ගිය දවස් උන් හා එක්ව ම සෝවාන් වූ මහාලි නම් ලිච්ඡවි රජ්ජුරුවෝ ඒ රැස් වූ පම්ත් හි හුන්හ. විසල් නුවර වැසියෝ ද දී සිත් ගන්නා නිසා බොහෝ පඩුරු ත් නිල කරවා බිම්සර මහ රජ්ජුරුවන්ට කියා ගිවිස්වා ගෙණ බුදුන් මොබ වඩා ගෙනෙව'යි ආයඍශ්‍රාවක ව සිටි මහාලි ලිච්ඡවි රජ දරුවන් ද පුරොහිත බමුණන්ගේ පුතණුවන් ද යවූ හ. උයි ත් ගොසින් බිම්සර රජ්ජුරුවන්ට පඩුරු ගෙණ ගියා දී ලා කත්නලච්ච ත් කියා ලා 'මහ රජ, බුදුන් අපගේ නුවරට වැඩි ය මනා කටයුතු ඇත. වඩා යවන්ට වුව මැනැවැ'යි කීහ.

රජ්ජුරුවෝ ඒ අසා 'මාගේ නුවර වැඩහුන් බුදුන් මා එ සේ වඩනට කියන්ට යුක්ති නො වෙ යි තෙපි ම දනුව'යි කීහ. උයි ත් බුදුන් කරා ගොසින් බුදුන් වැඳ ලා 'ස්වාමීනි, විසල් මහ නුවර දුර්භික්‍ෂ භය ත්, යක්‍ෂ භය ත් රොග භය ත් තුන ඇති වි ය. මෙ කී භය තුන නිසා මියන්නෝ ත් බොහෝ ව. මුඹ වහන්සේ ඔබ වැඩියොත් සදහම් නමැති වැසි වස්නා ම සාය ත් නැති වෙ යි. සදහම් නමැති ප්‍රල ය මන්ත්‍රානුභාවයෙන් යක්‍ෂොපද්‍රව ත් දුරුවෙයි. සදහම් නමැති දිව බෙහෙදින් රොග භය ත් නැති වෙයි. දිය ඩබර නිසා බොහෝ නෑයන් නස්නා නියාව දැක ඔබ වැඩියා සේ විසල් මහනුවර ත් නස්නා බොහෝ දෙනා දැක උන් කෙරෙහි කළ කරුණාවෙන් ඔබ වැඩිය යහපතැ'යි ආරාධනා කළහ. බුදුහු ත් උන්ගේ බස් අසා බුදු නුවණින් පරීක්‍ෂා කරණ සේක් 'විසල් මහ නුවර දී රුවන් සූත්‍රය දෙසූ කල්හි ඒ ආඥව කෙළ ලක්‍ෂයක් සක්වළ පැතිර සිට්ටි. සූත්‍ර ය දෙසා නිමි කල්හි සුවාසූ දහසක් සත්‍වයෝ නිවන් දක්නාහ. ඒ භය තුන ත් සන්හි දෙන්නේ ය'යි දැක ආරාධනා ඉවසූ සේක.

බිම්සර මහ රජහු ද බුදුන් විසාලා මහ නුවරට වඩනට කළ ආරාධනාව ඉවසූ නියාව අසා නුවර වැස්සන්ට මං පෙත් ඉදි කරන්ට විධාන කොට ලා තුමූ බුදුන් කරා ගොසින් 'කුමක් ද, ස්වාමීනි, විසල් මහ නුවරට වැඩීම ඇත් දැ'යි විචාරා 'එ සේ ය, මහ රජ'යි කී කල්හි මා මං පෙත් ඉදි කරණ තෙක් රැඳා වදළ මැනැවැ'යි කියා ලා රජගහා නුවරට ත් ගඟට ත් අතුරෙහි විසි ගවු වක් විවර මහ කණු මුල් උදුරුවා සම තල කරවා ලා සතර ගවු වෙන් සතර ගවුවට විහාර ත් කරවා ලා බුදුන් විසල් මහ නුවරට

1 ඒ සාර සමාගමයෙහි, ඒ සඳ රාජ සමාගමයෙහි.

Non-Commercial Distribution

වඩනට ආරාධනා කළහ. බුදුහු ද නිත්‍ය පරිවාර පන් සියක් දෙනා වහන්සේ පිරිවරා වඩනට මහට පිළිපන් සේක.

රජ්ජුරුවෝ ද විහාර පසට මද්ධ්‍යයෙහි සතර ගවු සතර ගවු විවර මග පය ඔබා ලූ කල දන දක්වා එරෙන තරමේ පස් වනක් මල් අතුරුවා ලා පස් වනක් පිළියෙන් ධජ පතාක ත් නංවා ලා කෙහෙල් තොරන් ආදි වූ දෙ පස තොරණ ත් ලවා ලා නැවත දෙ පස පුන් කලස් පුන් පැණ ත් තබවා ලා බුදුන්ට කුඩ මත්තේ කුඩයක් වන නියායෙන් කුඩ දෙකක් ලවා ලා එකි එකී නමට එකි එකී කුඩයක් වන නියායෙන් පන් සියක් දෙනා වහන්සේට කුඩ පන් සියයකු ත් ලවා ලා සෙනඟ පිරිවරා මහ පුද කෙරෙමින් කරවා ලූ විහාරවල සතජ්වා මහ දන් දී පස් දවසකින් ගංතෙරට වඩා ගෙණ ගොසින් එ තෙරට වඩා ගෙණ යන්ට හඟුලක් කරවා සිට ම විසල් නුවර ඇත්තවුන්ට ගඟ පටන් තමන්ගේ නුවරට මං[1] ඉදිකරවා ලා පෙර ගමන් කොට අවුත් වඩා ගෙණ යව'යි කියා යැවූ ය.

උයි ත් 'තනි රජ්ජුරු කෙණකුන් විසිගවුවක් විවර මහ සරහා ඉදි කරවා ලූ කල අප සත් දස් සත් සිය සත් දෙනකුට දෙළොස් ගවුවක් විවර මග නම් බෙදු පී කලට ගවුව ගවුව තබා ඉසුබ දෙකක් දෙකක් හා සිල්වාරමකට මුත් වඩා නැත. අපි ත් බිම්සර මහ රජුන්ට වඩා පූජා කරම්හ'යි විසල් මහ නුවරට ත් ගඟට ත් අතුරෙහි දෙළොස් ගවුවක් විවර මග සමතල කරවා ලා ධජ පතාකාදියෙන් සරහා ලා බුදුන්ට කුඩ මත්තේ කුඩ වන නියායෙන් කුඩ සතරක් ලවා ලා සඟ පන් සියයට ත් කුඩ මත්තෙහි කුඩයක් වන නියායෙන් කුඩ දෙක දෙක ලවා ලා වඩා ගෙණ යන අදහසින් කුඩ එක් දස් සතරක් හා සෙසු ත් පුද පෙරහර ගෙන්වා ගෙණ අවුත් ගං තෙර සිටියහ.

බිම්සර මහ රජහු අඟුළු දෙකක් එක් කොට ඇද වා ලා අඟුළු මත්තෙහි මණ්ඩපයක් කරවා ලා මල් දම් ආදීන් සරහා ලා බුදුන් වැඩ හිඳිනා ලෙසට සත් රුවන් මුවා හස්නක් පනවා ලූ ය. බුදුහු ඊ වැඩ හුන් සේක. වහන් දෑ ද අඟුළට නැගී ලා රත්රන් නැවක් මද්ධ්‍ය කොට පිපී වැනී ගිය රත් නෙළුම් වනයක් මෙන් බුදුන් පිරිවරා වැඩ හුන් සේක. බිම්සර මහරජහු ද ගමන් පසු කරන්නෝ කරවටක් පමණ දියට බැස ලා 'ස්වාමීනි, මුඹ වහන්සේ පෙරළා වඩනා තෙක් ගඟ මෙ තෙර ම රඳා හිඳිමී' කියා ලා අඟුළ එ තෙර කරවා ලා රදා පිහ.

---

1 මහමන්

Non-Commercial Distribution

බුදුහු ත් ගඟ පළල සතර ගවුවක් හෙයින් සසර මහ සයුරෙන් සදහම් නමැති නැවට නංවා සතුන් නිවන් පර තෙරට පමුණුවන ලෙස කොට ත් පානාක් මෙන් සතර ගවුව ගෙවා අභුලෙන් බැස ලා එ තෙර විසල් මහ නුවර ඇත්තවුන්ගෙ රාජ්‍ය සීමාවට පැමිණි සේක. ලිච්ඡවි රජ දරුවෝ ත් පෙර ගමන් කොට එන්නාහු බිම්සර රජ්ජුරුවන් කළා සේ ම කරවටක් පමණ දියට බැස ලා අභුළ එ තෙර කොට ගෙණ බුදුන් අභුලෙන් ගොඩට බාවා ගත්හ. බුදුන් අභුළෙන් බැස ගොඩ පය තබන්නා ම පොකුරු වැස්සෙක් වට. හැම තැන ම දණ පමණ වූ ත්, කළවේ පමණ වූ ත්, උකුළු පමණ වූ ත් වඩා ත් වතුරු හෙළා ලා සියලු කුණු සෝධා ගඟ හෙළා පීමෙන් කෙලෙස් කුණු නැති වීමෙන් නිකසළ වූ බුදුන් වඩනට මහ ත් නිකසළ වී ය. විවරණ ලබන දවස් දිවකුරු බුදුන් වඩනා මහ පවිත්‍ර කළ නියාව මෙ තැන තකා වූවා සේ වී ය. ලිච්ඡවී රජ දරුවෝ ත් සතර ගවුවට විහාරයක් බැගින් තමන් කැර වූ විහාර තුනෙයි තුන් දවසක් රඳවා ලා මහ දන් දී පූජා සත්කාර ත් වඩා කරන්නාහු තුන් දවසකින් විසල් මහ නුවරට වඩා ගෙණ ගියහ.

සක් දෙවිඳු ද දෙව ගණ පිරිවරා අවුත් වැද ගියහ. මහෙශාඛ්‍ය දෙවියෝ ත් අවුත් රැස්වීමෙන් රඳා ලන්ට බැරි ව යක්කු බොහෝ සේ පලා ගියහ. බුදුහු සවස් වේලෙහි නුවර වාසල කෙරේ වැඩ සිට අනඳ මහ තෙරුන් වහන්සේ බණවා ලා ‘ආනන්‍දයෙනි, මෙ රුවන් සූත්‍ර ය ඉගෙන ගෙණ විසල් මහ නුවර වළලු තුන හස්සෙහි පිරිත් කෙරෙමින් යක්‍ෂොපද්‍රව දුරු කරව’යි වදළ සේක. අනඳ මහ තෙරුන් වහන්සේ ත් රුවන් සූත්‍රය ඉගෙණ ගෙණ දූන් බුදුන් පමණක් මුත් එ දවසට නූ බුදුන් හෙයින් සතර වරමුන් ගෙනවුත් බුදුන්ට පිළිගැන්වූ මුං වන් සල ගල් පාත්‍රයෙන් පිරිත් පැන් හැර ගෙණ නුවර වාසල වැඩ සිට දිවකුරු බුදුන් ගෙන් අපගේ බුදුන් විවරණ ලත් තැන් පටන් පිරූ සමතිස් පැරුම් ඒ ඒ ජාතකවලින් ද සලකා—

තව ද අඞ්ග පරිත්‍යාගාදී පඤ්ච විධ පරිත්‍යාගයන් ද ලොකාර්‍ත්‍ථ චර්‍ය්‍යාදි වූ ත්‍රිවිධ චර්‍ය්‍යාවන් ද බුදු වන ජාතියෙහි නො එක් අසිරින් යුක්ත ව ඇසළ මස පුර පසළොස්වක් ලත් අභහරුවාද උතුරුසළ නකතින් මධ්‍යම රාත්‍රි වේලේ තුසී දෙව ලොවින් චුත ව කිඹුල් වත් නුවර සුදොවුන් මහ රජාණන්ට ද ව මහා මායා බිසොවුන් කුස පිළිසිඳ ගත් නියා ද, දස මස් අයාමෙන් ලුම්බිනි උයන්හි දී වලා ගබෙක සැඟවී තිබී ලා මැත් වන සඳ පරිද්දෙන්



Non-Commercial Distribution

මවු කුසින් බිහි වූ නියා ද, බුදු වන කල ආසන්න වන තෙක් විසි නව හවුරුද්දක් විවර ගිහි ගෙයි රදා ලා බුදු වන්ට මහභිනික්මන් කොට නික්මුණු නියා ද, නික්ම මහණ ව ලා සාවුරුද්දක් මුළුල්ලෙහි බුදු බව සාධන්ට ප්‍රධන් වීර්‍ය්‍ය කළ නියා ද, කරණ වීර්‍ය්‍ය කොට නිමවා ලා වෙසග මැදි පොහෝ දවස් බෝ මැඩ වැඩම කොට මාර විජය කොට අළුයම් වේලෙහි මහ පොළොව ගුගුරුවා බුදු වූ නියා ද, නව ලොවුතුරා දහම් පටන් සියලු බුදු ගුණ ද සලකා නුවරට වැද තුන් යම් රාත්‍රියෙහි පවුරු වළලු තුන හස්සෙහි පිරිත් බැණ ඇවිදි සේක.

අනද මහ තෙරුන් වහන්සේ රුවන් සුත "යං කිඤ්චි විත්තං" යනාදි ගාථාවෙහි 'යං කිඤ්චි' යන පද ය වදළ කල්හි පිරිතෙහි ආනුභාවයෙන් පිරිත් බැණ බැණ උඩට දමා ලූ පැන් අමනුෂ්‍යයන් ඇඟ වැතිර ගිය කල්හි යක්‍ෂයෝ ත් පලන්ට පටන් ගත්හ. නැවත රිදී බුබුළු සේ පිරිත් පැන් බිඳු අවුත් ලෙඩ දුක් මිනිසුන් ඇඟ වැගිරෙ ත් වැගිරෙ ත් උමංදෙවෙහි මහෞෂධ පණ්ඩිත කල උපන් බෙහෙදින්[1] සිරිවඩු සිවාණන්ට ත් සෙසු සෙස්සන්ට ත් ඇති ලෙඩ දුක් නැති වූවා සේ අනද මහ තෙරුන් වහන්සේ පිරිත් බැණ ඉස ලූ පැනින් ලෙඩ දුක් නැති ව ගොසින් අනික් ජාතියෙක උපන්නා සේ ලෙඩ ව හුන් මිනිස්සු අනද මහ තෙරුන් වහන්සේ පිරිවරා ගත්හ. බුද්ධානුභාවයෙන් යකුන් බොහෝ සේ නැඟී ගිය ත් බිතක්කන් කසළ ගොඩ ලිප් පිටි පස්[2] ආදියෙහි රඳා ගිය යක්‍ෂ කෙණෙක් ඇත් නම් බිඳ ගෙණ යන්නාහු නැඟී පලා යන්ට වාසල් නො සෑහෙන හෙයින් පවුරු පදනම් ආදිය බිඳ ගෙණ දිවන්ට වන්හ. මෙ සේ යකුන් පෙරළී පලා ගොසින් යක්‍ෂ භය ත් නැති වි ය.

ලෙඩ දුක් නැති ව ගිය බැවින් රොග භය ත් නැතිව සුඛිත වූ මිනිස්සු බුදුන් වැඩ හිඳිනා ලෙසට නුවර මැද බොහෝ දෙනා රැස් වන්නා වූ ගෙය පවිත්‍ර කරණු සඳහා සුවඳ පිරිබඩ ගෙණ ලා රන් තරු ආදියෙන් බබළන්නා වූ නොඑක් පැ ඇති පට කඩ වියනු ත් බඳවා ලා බුදුන් වැඩ හිඳිනට පඩු ඇඹුල් හස්න ගෙණ වුත් තුබුවා වැනි බුද්ධාසනයක් පැනවූහ. තිලෝගුරු බුදු රජහු ද යුගඳුරු මුදුනෙහි දහසක් රසින් බබළන අභිනව සූර්‍ය්‍යයා මෙන් සවනක් රස් විහිදුව විහිදුවා වැඩ හුන් සේක. නිත්‍ය පරිවාර පන් සියක් දෙනා වහන්සේ ද රුවන් මාළිගාවක් වට කොට ලා ලූ පබළුමුවා පදනම් පිළක් මෙන් ලීලොපෙත ව වැඩ හුන් සේක.

---

1. උපදනා වෙද බෙහෙදින් 2. ලිපිපිලිපස්

Non-Commercial Distribution

ලිච්ඡවි රජ දරුවෝ ද වහන්දෑට පිටි පසු ව ලා බුදුන් පිරිවරා හුන්හ. සක් දෙවිඳු ද දෙ දෙව් ලොව දෙවියන් පිරිවරා කිසි තැනෙක්හි සිටියේ ය.

අනඳ මහ තෙරුන් වහන්සේ ද නුවර සිසාරා පිරිත් බැණ ඇවි ද පිරිතෙහි ආනුභාවයෙන් ලෙඩින් දුකින් ගොඩ නැඟී මිනිසුන් පිරිවරා බුදුන් කරා ගොසින් වැද ගෙණ වැඩහුන් සේක. බුදුහු ත් පර්ෂද්ගේ අදහස් බලා මදක් කා රස දත් දෙයක් බොහෝ කොට කන්ට සිතන්නා සේ එ ම රුවන් සූත අසනු කැමැති නියා දැන එ ම සූත දෙසා වදාළ සේක. දෙශනා කෙළවර සුවා සූ දහසක් පමණ සත්‍වයෝ ලෙඩීනු ත් මිදෙනු නිසා නිවන් බෙහෙත් වැළඳූහ. හෙවත් නිවන් දුටහ. ඒ රුවන් සූත ආඥාව ත් කෙළ ලක්‍ෂයක් සක්වළ පැතිරිණ. බණ වදරන පිරිත් එක් දවස් ම මද හෙයිනු ත් නුවණ මූ කළ සේ නිවන් දක්වන්නවුන් සඳහා ත් ශාන්ති පිණිස ත් එම් රුවන් සූත සති යක් ම දෙසා වදරා පැමිණි තුන් භය ත් බොහෝ දෙනාට කෙලෙස් භය ත් සන්හුන් නියාව දැන වඩනා නියාව ලිච්ඡවි රජ්ජුරුවන්ට වදරා ලා නික්ම වදාළ සේක.

ලිච්ඡවි රජහු ද භය සන්හුන් හෙයින් ආලෙස්සම් නො ව දියුණු තියුණු කොට සත්කාර කරන්නාහු තුන් දවසක් විතරින් මහ ගං තෙරට වඩාගෙණ ගියහ. ගං පත්ලෙහි වසන්නාවූ නා රජ්ජුරුවෝ ත් 'මිනිස්සු බුදුන්ට සත්කාර කෙරෙති. අප නො කරන්ට කාරණ කිම් දැ'යි රුවන් මුවා අහුළු මවා ලා එහි රුවන් මුවා හසුනු ත් පනවා ලා ගඟ දිය ත් පස්වනක් පියුමෙන් සරහා ලා 'ස්වාමීනි, අපට ත් අනුග්‍රහ කරණ බව ය'යි එක බුදුන් වුව ත් තම තමන්ගේ අහුළුවලට නැහෙන්ට ආරාධනා කළහ. මිනිස්සු ත් නයි ත් තමන් තමන්ගේ බල පමණින් බුදුන්ට පූජා කෙරෙති. උන් දෙ පක්‍ෂයට ම වැඩී සිටියා වූ අප නො කරන්නට කාරණ කිම් දැ'යි භූමාටු දෙවියන් පටන් අකනිටා බඹ ලොව බඹුන් දක්වා අසඤ්ඤතල බ්‍රහ්මයන් හැර සියලු ම දෙවියෝ ත් සිතනා පමණක් විනා ආයාසයක් නැති බැවින් පූජා කළහ. නාග භවන යෙහි නයි තමන්ගේ නාග භවනයෙහි පටන් සතර ගවුවක් විතරෙහි කුඩ මත්තෙහි කුඩ සලසා ගත්හ.

මෙ සේ මිනිස් ලොවට පාතින් නයි ය, මිනිස් ලොව මිනිස්සු ය, භූමාටු දෙවියන් පටන් බඹ දෙවියන් දක්වා දෙවියෝ ය, නා ලොව පටන් අකනිටා බඹලොව දක්වා මෙ සක් වළ ඇතුළ

Non-Commercial Distribution

මුළුල්ල ම කුඩ මත්තෙහි කුඩ සලසා ගත්හ. කුඩ හසු හස්සෙහි ධජ හා ධජ හසු හස්සෙහි පතාක හා සලසා ගත්හ. පතාක හසු හස් සෙහි මල් දම් මල් කලප් මල්ලිය ආදි ය සලසා ගත්හ. දිව ආභ- රණ ලා සැරහුණු දෙව්යෝ සැණ වෙස් ගෙණ බුදුන්ට ස්තුති කෙරෙමින් ආස ඇවිදිති. ගඬඹ නම් අඹ ගස මුල දී යමා මහ පෙළහර කරණ දවසු ත් සකස් පුර නුවරට වැඩි දවසු ත් විසල් මහ නුවර ත්‍රිවිධොපද්‍රව ය සන්හිඳුවා රජගහා නුවරට වඩනට ගහ කරා වැඩිය දවසු ත් දිව්‍යබ්‍රහ්මාදීන්ගේ රැස්වීම බොහෝ විය.

ගඟින් එ තෙර බිම්සර මහ රජහු ද ලිච්ඡවීන් කළ පූජාවට වඩා පූජා සරහා ගෙණ සිටියහ. බුදුහු ද ගඟ එ තෙර මෙ තෙර රජ දරුවන්ගේ සත්කාර ද බලා වදරා නයින්ගේ ත් අදහස දැන උන් ගේ අදහස් පුරා අඟුළු පන් සියයෙහි සඟ පන් සිය ය පිරිවරා සිටි එක් අඟුළකට එක් බුදු කෙණකුන් වහන්සේ වන නියායෙන් බුදුවරුන් වහන්සේ ත් පන් සියයක් මවා ලූ සේක. උන් වහන්- සේ ද නයින් මවා ලූ එකි එකී කුඩයකට ද, කප් රුකකට ද, මල් වඩමකට ද යට නයි පිරිවරා හිඳිනා සේක. නයින්ට මෙ ලෙසින් බුදුවරුන් වහන්සේ සැලසුණු පසු සෙසු ත් දිව්‍ය බ්‍රහ්මාදීන් සිත් පහදවනු නිසා භූමාටු දෙවියන් පටන් අකනිටා බඹ ලොව දක්වා එකි එකී අවසරයෙහි ම පන් සියයක් පිරිවර හා සමඟ බුදු කෙණ- කුන් වහන්සේ වන නියායෙන් පිළිම ගෙයක සිත්තම් කරන්නා- වූත් අනික් සිත්තම් හැර ලා රහත් කැල හා බුදුරුව මැද අදනා සේ සක්වළ අතුළ මුළුල්ල ම බුදු කැලයක් කොට මවා ලූ සේක.

එ දවසට මෙ සක්වළ එක මඟුල් ගෙයක් මෙන් සැරහිණ. බුදුහු ත් නයින්ට අනුග්‍රහ නිසා එක් අඟුළකට නැඟි සේක. සඟ පන් සියය ත් අඟුළු නො සිස් කරන්ට එකි එකී අඟුළකට නැඟි සේක. නා රජහු ද බුදු පාමොක් සංඝයා වහන්සේ නාගභවනයට වඩා ගෙණ ගොසින් රාත්‍රි ය මුළුල්ලෙහි මත්තට හේතු නිසා ත් බණ අසා ත් දෙ වන දවස් බුදු පාමොක් සංඝයා වහන්සේ දිව බොජුන් වැළඳ වූහ. බුදුහු ත් අනුමෙවෙනි බණ වදරා නාග භව- නයෙන් නික්ම මුළු සක්වළ දෙවි බඹුන්ගෙන් පූජා සත්කාර විඳිමින් හඟුළු පන් සියයෙන් ම ගඟින් එ තෙර වූ සේක.

බිම්සර මහ රජ ද පෙර ගමන් කොට අවුත් බුදුන් එ තෙරට බා ගෙණ විසල් මහනුවර සිට බුදුන් වඩනා දවස් ලිච්ඡවි රජුන් කළ පූජා තරම දියුණු තියුණු කොට සත්කාර කෙරෙමින්

Non-Commercial Distribution

පස් දවසෙකින් රජගහා නුවරට වඩා ගෙණ ගියහ. දෙ වන දවස් වහන්දෑ සිහා වළඳා ලා සවස් වේලෙහි ධම් සබයට රැස් ව 'සර්‍වඥ වරයන්ගේ ආනුභාවයක් බලවත් නියා ය. දෙව් මිනිසුන් බුදුන් කෙරෙහි භක්තියෙක් බලවත් නියා ය. ගඟ එ තෙරින් මෙ තෙරින් කැටී ව දෙ තිස් ගවුවක් විතරට ගඟ එ තෙර මෙ තෙර රජ දරුවෝ සම තල කරවා ලා ධූලි නො නැඟෙන ලෙසට වැලි ලවා ලා දණ පමණින් පස් වනක් මල් අතුරුවා ලූහ. ගඟ පැනු ත් නයින්ගේ ආනුභාවයෙන් පස් වනක් පියුමෙන් සැදිණ.

නා ලොව පටන් අකනිටා බඹ ලොව දක්වා කුඩ මත්තෙහි කුඩ හා ධජ මත්තෙහි ධජ හා පතාක මත්තෙහි පතාක හා මල් දම් මත්තෙහි මල් දම් හා මල් කලප් මත්තෙහි මල් කලප් හා මල් සුමුහු මත්තෙහි මල් සුමුහු හා මල් ලිය මත්තෙහි මල් ලිය හා සැලසී සිටි ය. උපද්‍රව තුනක් වැද ලා නටුවා වූ මහ විසල් නුවර බුද්ධානුභාවයෙන් උපද්‍රවත් සන් හිඳී ලා ශොභා මත් ව සමෘද්ධ වන ගමනෝ එක හෙළා සමෘද්ධ වූවාක් මෙන් පූජා සත් කාරයෙන් සමෘද්ධ වී ය' යි කථාව ඉපැදවූ සේක. බුදුහු ත් ධම් සභයට වැඩී ගමනෝ ඒ කථාව අසා වදරා 'මහණෙනි, මේ පූජා සත්කාර ය මාගේ බුද්ධානුභාවයකිනු ත් නො වී ය. දිව්‍ය බ්‍රහ්මා දීන්ගේ ආනුභාවයකිනු ත් වූයේ නො වෙයි. සසර සිටිනා ගමනෙන් මා කොට ගත් යම් කුශලානුභාවයකින් වී ය'යි වදරා උදරතර වූ පූජා සත්කාර දුටු වහන්දෑ ඊට හේතුව සිටි කුශලය ත් අසනු කැමැති ව ආරාධනා කළ කල්හි—

''මහණෙනි, එසේ වී නම් යට ගිය දවස තක්සලා නුවර සංඛ නම් බමුණානා කෙණෙක් වූ ය. උන්ගේ සුසීම නම් පුතණු කෙණෙක් තමන් සොළොස් ඇවිරිදි කල පියාණන් ලඟට ගොසින් 'පියාණන් වහන්ස, බරණැස් නුවරට ගොසින් ශිල්ප උගන්නා කැමැත්තෙමි කිවු ය. පියාණෝ ත් ඒ අසා 'එ සේ වී නම්, පුත, බරණැස් නුවර වසන අසවල් බමුණානෝ මාගේ යාළුවෝ ය. උන් කරා ගොසින් හදරව'යි කිවූ ය. 'උයි ත් යහපතැ'යි ගිවිස බරණැස් නුවරට ගොසින් ඒ බමුණානන් දැක පියාණන්ගේ සවරූප කියා ලා උන් එවූ නියාව කිවු ය උයි ත් අසා යාළුවාණන් එවූ හෙයින් නො මැළි ව ගිවීස ගමන් විඩා සන් හුන් කලට යහපත් නකතකින් වේද මන්ත්‍ර හදරවන්ට පටන් ගත්හ.

ඌ තමන් මහ නුවණැති හෙයින් වහ වහා බොහෝ කොට උගන්නාහු උගත් උගත් දෙය ත් රන් වළඳෙක වත් කළ සිංහ

Non-Commercial Distribution

තෙල් මෙන් වන පොත් නැති වන්ට ත්, නැති හෙයින් නො බෝ කලකින් ම ඇදුරු බමුණන් ගෙන් උගත මනා සියල්ල ම ඉගෙන ගෙණ පිරිවා සමනන තැනැත්තෝ තමන් උගත් ශිල්පයෙහි ආදි ය හා මධ්‍ය ය ම දකිති. නිවන් කෙළවර නැති හෙයින් කෙළවරක් නො දකිති. නො දැක ආචාරීන් කරා ගොසින් 'ආචාරීන් වහන්ස, මම මා උගත් ශිල්පයෙහි ආදි ය හා මධ්‍ය ය ම දකිමි. කෙළවරක් නො දකිමි' කියා ආචාරීන් 'මම ත් නො දනිමි' කී කල්හි 'එ සේ කල දන්නෝ කවුරු දැ'යි විචාරා 'තෙල ඉසිපතන නම් උයන තවුසෝ වෙසෙති. උඹ ඉදින් දනි ත් නම් උන් කරා වුව ත් ගොසින් විචාරව'යි කී කල්හි එහි වසන පසේ බුදුවරුන් වහන්සේ කරා ගොසින් 'ශිල්පයෙහි කෙළවර මුඹ වහන්සේ දක්නා සේක් දැ'යි විචාළෝ ය. 'එ සේ ය, දනුම්හ'යි කී කල්හී 'එ සේ වී නම් අපට ත් වදළ මැනැවැ'යි කිවු ය.

'අපි අපගේ වෙස් ගන්නවුන්ට කියම්හ. ඉදින් කෙළවරක් දක්නට වුව මනා වී නම් මහණ වව'යි කීහ. උයි ත් ගිවිස ඔවුන් ලඟ මහණ වූ ය. මහණ වූ කල්හි අභිසමාචාරික ශික්‍ෂා ව 'මෙ සේ හඳු ව, මෙ සේ පොරොව ව, මෙ සේ හිඳු ව, මෙ සේ සිටු ව, මෙ සේ කව, මෙ සේ පොව, යනාදීන් කියා ලූහ. උයි ත් හික්මෙන්නෝ හෙතු සම්පන්න බැවින් නො බෝ කලකින් ම පසේ බුදු ව සියලු බරණැස් නුවර ඉර-සඳ පරිද්දෙන් ප්‍රසිද්ධ වී ලාභයෙන් හා යසසින් අගපත් වූහ. ලාභ ය හා යසසට පින් කළ බව මුත් බොහෝ දවසක් ජීවත් වන්ට නිසි පින් මඳ හෙයින් නො බෝ දවසකින් පිරිනිවියහ. ඉක් බිත්තෙන් පසේ බුදුවරු ද බොහෝ දෙන ද ආදහනය කරවා ලා ධාතු හැර ගෙණ නුවර වාසල කෙරේ ද ගබක් කැරවූහ.

සඞ්ඛ නම් බමුණානෝ ද 'ම පුතණුවන් ගියේ නැතක් දවස ශිල්ප ඉගෙන එන්ට වැළි ත් කල් ඇත. නො එන්ට කාරණ කිම් ද? උන්ගේ පවත් දනිමි' උන් දක්නා කැමැති ව තක් සලා නුවරින් නික්ම බරණැස් නුවරට ගොසින් බොහෝ දෙනා රැස් ව සිටියවුන් දැක 'එකාන්තයෙන් මුන් හැම දෙනා ගෙන් එක් කෙණකුන් වුව ත් ම පුතුන්ගේ පුවත් දනිති' උන් කරා ගොසින් 'සුසීම නම් ළදරුවාණ කෙණෙක් මුඹ අවු ය. උන්ගේ පවතක් දනු දැ'යි විචාළහ. 'එ සේ ය, බමුණානෙනි, දනුම්හ. අසවල් බමුණානන් ලඟ ශිල්ප ඉගෙන උගත් ශිල්පයෙහි කෙළවර උන් නො දන්නා හෙයින් දන්නා තැන් කරා ගොසින් මහණ ව කෙළවර නම් රහත් වීම හෙයින් පසේ බුදු ව පිරිනිවි සේක. මේ උන් වහන්සේගේ ධාතු වඩා කළ ද ගැබ යැ'යි ද ගැබ පැවු ය.

Non-Commercial Distribution

බමුණානෝ ද හඩා පියා වැලප පියා ද ගැබ් මළුවට ගොසින් මළුවෙහි තණ උදුරා පියා උතුරු සළුවෙන් වැලි ගෙනවු ත් ද ගැබ් මළුවේ ලා ලා, කමණ්ඩුලුවෙන් පැන් ගෙනවු ත් ධූලි මකා පැන් හිස ලා වන පස් මල් පුද ලා උතුරු සළුව පතාකාවක් කොට පුද ලා ගෙණ ගිය පත් කුඩ ය ද ගබ් කැරැල්ලෙහි බැඳ ලා නැඟී ගියහ. එ හෙයින් මහණෙනි. සඞ්ඛ නම් බමුණා ව උපන් මම දුසීමනම් පසේ බුදුන්ගේ ධාතු වඩා කළ ද ගබ් මළුවේ තණ උදු-රා හළිමි. එහි අසංඛ්‍ය විපාකයෙන් දෙ තිස් ගවුවක් විවර මහක මුල් උදුරා සම තල කළහ. නැවත එ ම ද ගබ් මළුවෙහි වැලි සුහක් ලා ලීමි. එහි විපාකයෙන් දෙ තිස් ගවුවක් විවර මහ මුතු පට හා සමාන වැලි ලා ලූහ. නැවත එ ම ද ගබට වන පස් මල් සුහක් පුද ලීමි. එහි විපාකයෙන් දෙ තිස් ගවුවෙහි ම පය ඔබා ලූ කල දණ දක්වා එ බෙන තරමේ වන පස් මලින් සාධා ලූහ.

ගඟ මුළුල්ල ත් පස් පියුමෙන් සැදිණ. නැවත කමණ්ඩුලු වෙන් පැනක් ගෙනවු ත් ධූලි මකා ඉසීමි. එහි විපාකයෙන් විසල් මහ නුවර පොකුරු වැසි වට. මා පෙරව ගෙණ ගිය උතුරු සළුව පතාක කොට ද ගබට පුද ලීමි. ඉසට කොට ගෙණ ගිය කුඩ පත් ද ගබ් කැරැල්ලෙහි බැඳ ලීමි. එහි විපාකයෙන් නා ලොව පටන් අකනිටා බඹ ලොව දක්වා ධජයෙන් පතාකයෙන් හා කුඩයෙන් ම සාදන ලද. එ හෙයින් මහණෙනි, ස්වල්ප මාත්‍ර සැපයක් හැර බොහෝ සැප ත් ලබනු නිසා 'මා පෙර ව ගන්ට නැත්තේ වේ දෑ'යි නො සිතා උතුරු සළුව පතාක කොට පිදුවා සේ 'අවු කන්නෙම් වේ දෑ'යි නො සිතා කුඩ ය පිදුවා සේ ස්වල්පයක් වුව ත් ස්වල්ප ය'යි නො සිතා කුසල්හි හැසිරෙති'' වදළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් සත් පුරුෂයන් විසින් බුදුන්ට මේ තරම් පූජා සත්කාරයක් බුද්ධානුභාවයකින් නො ව කුශලකර්මානු භාවයෙන් වූ නියාව සලකා කුශලානුභාවය බුද්ධානුභාවයට ත් වඩනා නියාව සිකා කුසල්හි හැසිර නිවන් සාධා ගත යුතු.

## 226. චිත්ත නාම් සිටාණන් ගේ වස්තුව

තව ද සත්‍වයන්ට සැදෑ ඇති වනු නිසා චිත්ත නම් සිටා ණන් ගේ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්—

ඒ චිත්ත සිටාණන්ගේ කථාව බාල වග දී කීමහ. මෙ තැන්හි අනඳ මහ තෙරුන් වහන්සේ 'ස්වාමීනි, චිත්ත සිටාණන්

Non-Commercial Distribution

මුඹ වහන්සේ ලඟට එන ගමනේ ම මේ සත්කාර ය ඇති වී ද? අනික් තැනකට යෙත ත් වේ දැ'යි විචාළ සේක. 'ආනන්‍දයෙනි, මා ලඟට එත ත් ඔබ්බකට යත ත් මේ වන සැටි ම ය. හෙම්බා මූ තුමූ බලව ත් සැදැ ඇත්තෝ ය. තුනුරුවන්හි පැහැද වෙසෙති. ඒ හෙයිනැ'යි වදරා බණ වදරන බුදුහු 'යම් කෙණෙක් ලොවී වූ ත් ලොවුතුරා වූ ත්, සැදැ ඇත්තෝ ද, ශීල ගුණෙනු ත් යුක්ත යෝ ද, සැදැ ඇති ව පින් කරණ හෙයින් භජන ය කරන්නවුන් බොහෝ හෙයින් පරිවාර සම්පද ත් ඇත්තෝ ද, තව ද ධන ධාන්‍යසම්පත්තීන් හා ආයඞ් ධන යම්පත්තීනු ත් සමන්විතයෝ ද, එ සේ වූවෝ ගිය ගිය යම් ම තැනෙක මේ චිත්ත නම් සිටාණන් මෙන් ප්‍රසිද්ධ වෙති' වදාළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් කවර ත් කුසලට මුල් ව සිටිනා ශ්‍රද්ධාව හෙයින් අතින් මිලයක් දී ලැබ ගන්නා දෙයක් නො වන බැවින් තම තමන්ගේ ම අදහස පමණෙකින් වන දෙයක් හෙයින් සැදැ ඇති ව කුසල්හි හැසිරිය යුතු.

## 227. කුකුළු බිජුවට කන කුමාරිකාව ගේ වස්තුව

තව ද පාපයෙහි ආදීනව දක්වන්ට කුකුළු බිජුවට කන කුමාරිකාව ගේ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්—

සැවැත් නුවරට ආසන්නයෙහි පඬු පුර නම් ගමෙක් ඇත. එහි එක් කෙවුලෙක් එක් දවසක් සැවැත් නුවරට යන්නේ අචිර වතී ගඟින් කැසුබ් බිජුවට හැර ගෙණ සැවැත් නුවරට ගොසින් එක් ගෙයක දී ඒ බිජුවට පිසවා ගෙණ කන්නේ ඒ ගෙයි එක් කුමාරිකාවකට ත් ඉන් එක් බිජු වටක් දින. ඔයි ත් ඒ කා ලා එ වක් පටන් අනික් දෙයක් කන්ට නො සිත යි. ඇගේ මවු ද කිකිළියක් බිජු වට ලූ තැනින් බිජුවටක් ගෙනවු ත් දුන. ඕ එයි ත් කා ලා රස තෘෂ්ණාවෙහි බැඳී ගොසින් එ වක් පටන් තොමෝ ම කිකිළියන්ගේ බිජු වට ගෙනවු ත් කයි. කිකිළි ත් තමා ම ලා ලූ බිජුවට කන්නි ය දැක අනික් කට හැක්කක් නො පෙණෙන හෙයින් වෛර බැඳ ගෙණ මිය ගොසින් එ ම ගෙයි බැළැල් ව උපන. කුකුළු බිජු වට කෑ කුඩා කෙළි ද මිය ගොසින් බඩ ලූ කුකුළු බිජු වටින් ඇති වූවා සේ එ ම ගෙයි කිකිළි ව උපන. ඈ ලූ ලූ බිජු වටෙක් ඇත් නම් ප්‍රාර්ථනා බලයෙන් කිකිළි බැළැල් ව

Non-Commercial Distribution

උපන් තැනැත්තී ත් අවුත් ලා කයි. කිකිළි ද 'තුන් වරෙක ලා ලූ බිජු වට ත් කා ලා ඉතිකින් මා ත් කන්නිහි වේ ද? මම ත් මෙයින් මිය තී වදු ලූ දරුවනු ත් තී ත් කා හෙම්ව'යි පතා මිය ගොසින් දිවි දෙන් ව උපන. බැළැල් මිය ගොසින් මුව දෙන් ව උපන. ඒ මුව දෙන් වදු ලන්නා ම දිවි දෙන් අවුත් මුව දෙන වදු ලූ දරුව නු ත් මුව දෙන ත් කැව.

මෙ සේ කා ඇවිදිනාහු නැතක් කලෙක පටන් පැවැති වෛර හෙයින් පත් සියයක් අත් බැව්හි ඔවුනොවුන් කා ඇවිද්දැහ. අපගේ බුදුන් සමයෙහි එක් කෙණෙක් යකිනි ව උපන්හ. එක් කෙණෙක් සැවත් නුවර කුල ගෙයක උපන්හ. ඒ කුල දුවණියන් දරුවන් වැදූ නියාව ත් වැදූ දරුවන් යකින්තා අවුත් කෑ නියාව ත් බුදුන් කරා පැමිණි නියාව ත් කැලි නම් යකින්නණියන්ගේ වස්තුවෙහි කී ලෙසින් ම දත යුතු.

මෙහි දී බණ වදරන බුදුහු යම් කෙණෙක් අනුන්ට දුක් එලවී මෙන් තුමූ මෙ ලෝ සුව විදිනා කැමති වෙත් ද, උන් තුමූ බිණුව වුන්ට පෙරළා බිණීමෙන් මැරුවන් පෙරළා මැරීමෙන් යනාදීන් ඇති වූ වෛරයෙක් ඇත් නම් එක් තැනෙක තර ව වැද ගෙණ යන ගින්නක් පැන් ඇති තැනකට පැමිණ නිවෙත් මුත් සෙසු ලෙසක නො නිමෙන්නා සේ බුදු කෙණකුන් කරා පැමිණියො ත් මුත් ඒ වෛරය සන් නො හිඳෙයි' වදළ සේක. දෙශනා කෙළවර යකිනි සරණ සීලයෙහි පිහිටා පන් සිල් සමාදන් ව වෛර ය හළහ. කුල දුවණියෝ සෝවාන් ව වෛර ය හළහ. බොහෝ දෙන ද නිවන් දුටහ.

එ හෙයින් සත් පුරුෂයන් විසින් වෛර ය නම් කපක් මුළුල්ලෙහි ත් වැඩි යෙයක ත් බොහෝ වූ අනර්ථ එළවන්නේ ය යි සිතා එ විට උපන් වෛර ය එ විට ම සන්හිඳුව ත් මුත් පසු වකට නො තබා සියල්ලවුන් කෙරෙහි මෙත් සිත් පවත්වා මෛත්‍රියෙහි අළොස[1] ලබන්ට උත්සාහ කට යුතු.

## 228. භද්දිය නුවර වහන්දෑ ගේ වස්තුව

තව ද ශීල සමාධ්‍යාදී ගුණ මණ්ඩනයෙන් මුත් පාත්‍ර චීවරාදී පරිෂ්කාර මණ්ඩනයෙන් ප්‍රයෝජනයක් නැති නියාව හහවන්ට භද්දිය නුවර වහන්දෑ ගේ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්—

භද්දිය නුවර වහන්දෑ ශික්ෂා පූරණ ය කුම් වුව ත් පරිෂ්කාර

1. ආලස්‍ය

Non-Commercial Distribution

මණ්ඩනයෙහි නිරත ව වසන සේක. වහන්දෑ එ පවත් බුදුන්ට දැන් වූ සේක. බුදුහු ඒ වහන්දෑට නිග්‍රහ මුඛයෙන් හික්මවනු නිසා දෙඩා වදරා 'මහණෙනි, තෙපි නො කළ මනා දෙයෙහි හැසිරෙන්නෝ හැයි දෑ'යි වදරා බණ වදරන සේක් 'හෙම්බා මහණෙනි, මහණ වූ තැන් පටන් අත්‍යන්ත පරිශුද්ධ සීලයෙහි පිහිටා ධුරද්වයෙහි හැසිරීමෙන් නො පමා ව ධුතාඞ්ග පිරිමැස්ම ත් ඇති ව ශික්‍ෂා පූරණයෙහි තර වූ වොත් කට යුතු ය. ඒ හැර කැප සරුප් ව තිබෙන මිටි පතට කැත ඇති ව පිල් කර්මාන්ත ආදියෙන් සරහා කුඩ ඉදි කිරීම, වහන් හා මරවැඩි[1] ඉදි කැරවීම, ඡවි නො නස්නා පමණක් හැර රිදී පත්‍ර ලෙසට පාත්‍ර සෝලු කිරීම, අනු දත් පටි දෙක හා අනුලොම් පටි හැර පටි සෝලු කැරවීම, සිවුරු උතුගාවා බැබළවීම යනාදි ය ශාසනිකයන් කළ මනා දෙයෙක් නො වෙයි. තොප හැම කරණ ලෙසින් ඒ හැම කළ මනා වා සේ ත් සෙසු වුව මනා කට යුත්තක් නො කළ මනා ලෙසට තිබෙයි.

යම් කෙණෙක් කරන්ට කී ලෙස තබා ලා මේ ලෙස කෙරෙ ත් නම් මත් නමැති නළ පුප්වා ගෙණ ඇවිදිනා උන්ට චතුරාශ්‍රව යෝ ම වඩිති. යම් කෙණෙක් කා ගියා සී කමටහනයෙහි යෙදී වෙසෙත් නම් තමන් කළ මනා දෙයෙහි ම යෙදුණු හෙයින් කිසි ලෙසකිනු ත් නො කළ මනා දෙයෙහි නො හැසිරෙති. සිහි නුවණ ඇති ව වසන්නවුන්ට ආශ්‍රවයනු ත් කට හෙන දෑ නැත. අනුන් නසන්නට ඇති ව ත් අන්තයෙහි තුමූ ම නසිති' වදාළ සේක. දෙශනා කෙළවර ඒ වහන්දෑ රහත් ව පරිෂ්කාර මණ්ඩන ය හැර ගුණ මණ්ඩනයට පටන් ගත් සේක.

එ හෙයින් සත් පුරුෂයන් විසින් නිවන් පුර යනු කැමැතොත් කුසල් මහ වත සරහනු මැනවි.

## 229. ලකුණ්ටක භද්දිය තෙරුන්වහන්සේ ගේ වස්තු දෙක

තව ද නිවන් පුරයට මං දක්වනු සඳහා ලකුණ්ටක භද්දිය තෙරුන් වහන්සේ ගේ වස්තු දෙක පඩක්තීන් දක්වමු.

කෙ සේ ද යත්—

එක් දවසක් බුදුන් දවල් වැඩ හිදිනා තැන වැඩ හුන් කලට බොහෝ ආගන්තුක වහන්දෑ අවුත් බුදුන් වැඳ ලා එකත් පස් ව හුන් සේක. ඒ වේලාට ලකුණ්ටක භද්දිය තෙරුන් වහන්සේ බුදුන් වැඩ හුන් තැනින් වඩනා සේක. බුදුහු ද ලකුණ්ටක භද්දිය

1 මිරිවැඩි – මරවඩි

Non-Commercial Distribution

තෙරුන් වහන්සේ දක ආගන්තුක වහන්දෑ සිතූ සිතිවිල්ල දැන 'මහණෙනි, මේ මහණ මවුපියන් මරා නිදුක් ව වසන්නේ ය'යි වදරා ඒ වහන්දෑ බුදුන් වදරන්නේ කිම ද යි සැක ව ඔවුනොවුන් වහන්සේ මූණු බලා 'ස්වාමීනි, වදරන්නේ කිමදෑ'යි කී කල්හි බණ වදරන බුදුහු 'හෙම්බා මහණෙනි, සත්වයන් තුන් භවයෙහි උපදවන හෙයින් මවක වැනි හෙයින් තෘෂ්ණාව මවු නම් වෙයි. 'මම අසවල් රජ්ජුරුවන්ගේ පුතණු වෙමි. අසවල් අමාත්‍යයාණන්ගේ පුතණු වෙමි. මන්[1] උපදනා හෙයින් පියාණකෙණකුන් වැනි හෙයින් මාන ය පිය නම් වෙයි.

'ලෝ වැස්සන් රජ දරුවන්ට අයති වන්නා සේ සියලු ම දෘෂ්ටි යෙක් ඇත් නම් ශාශ්වත දෘෂ්ටි-උච්ඡේද දෘෂ්ටි දෙකට අයති වෙයි. එ හෙයින් ඒ දෘෂ්ටි දෙක ප්‍රාධාන්‍යයෙන් රජ දරුවන් වැනි හෙයින් රජ දරුවෝ දෙ දෙණෙක් නම් වෙයි. දෙළොස් ආයතනයේ පැතිර පැවතීම් අර්ථයෙන් රට වැනි හෙයින් රට නම් වෙයි. සන්තාන වර්ති වූ රාග ය සියල්ලෙක ම බැඳෙන හෙයින් රට විචාරන ධූර යකු වැනියහ. එ හෙයින් තුලූ අර්හත් මාර්ග ඥාන නමැති කඩුවෙන් තෘෂ්ණා නමැති මෑණියන් ද, මාන නමැති පියාණන් ද; දෘෂ්ටිද්වය නමැති රජ දරුවන් දෙන්නා ද රාග නමැති රට විචාරන ධූරයා ද නසා නිදුක් ව සුව සේ ඇවිදිතී' වදළ සේක. දෙශනා කෙළවර බුදුන් දකින්ට අමුතු ව ගිය වහන්දෑ රහත් වූ සේක.

තව ද එක් දවසක් බුදුන් වැඩ හුන් තැනට අමුතු වහන්දෑ වැඩි සේක. එ දවසු ත් බුදුන් ලඟින් වඩිනා ලකුණ්ටක භද්දිය තෙරුන් වහන්සේ දක වහන්දෑ බණවා ලා 'මහණෙනි, තෙල මහණ දෙ මවු පියන් මරා නිදුක් ව වෙසෙයි' වදළ සේක. වහන් දෑ ද එ බසෙයි නීතාර්ථ ය මුත් නෙයාර්ථ ය දත නො හී 'ස්වාමීනි, කුමක් වදළ නියා දෑ'යි විචාළ සේක. බුදුහු ත් ඒ මුඛයෙන් වහන්දෑට බණ වදරන සේක් 'හෙම්බා මහණෙනි, තෙල මහණ මවක වැනි වූ තෘෂ්ණාව ද, පියකු වැනි වූ මාන ය ද, රජ දරුවන් දෙ දෙණකු වැනි වූ දෘෂ්ටිද්වය ද උපද්‍රව සහිත මඟක් වැනි වූ විචිකිත්සා නීව රණ ය ද තත් මුඛයෙන් සෙසු නීවරණ ද රහත් මඟින් නසා නිදුක් ව වෙසෙතී' වදළ සේක. දෙශනා කෙළවර ඒ වහන්දෑ රහත් වූ සේක.

එ හෙයින් නුවණැත්තවුන් විසින් මවක වැනි ය යි කී හෙයින් තෘෂ්ණායෙහි ත් පියකු වැනි ය යි කී හෙයින් මානයෙහි ත් කරණ මමායන ය හැර රජ දරුවන් වැනි ය යි කී හෙයින්

1 මුන්

Non-Commercial Distribution

දෘෂ්ටි දෙක ත් භජන ය නො කොට රට විචාරන ධුරයකු වැනි ය යි කී හෙයින් රාග සන්නිශ්‍රිත ත් නො ව උපද්‍රව සහිත මහක් වැනි වූ පස් නීවරණයන් කෙරෙන් දුරු ව මවු පියන්ට ත් වඩා රජ දරුවන්ට ත් වඩා රට නායකයන්ට ත් වඩා සියලු ලෙසින් නිරුපද්‍රව වූ නිවන් ම අත් කට යුතු.

## 230. දරුසාකටිකයන් ගේ වස්තුව

තව ද සම්‍යක් දෘෂ්ටික වීමෙහි යහපත හඟවන්ට දරුසාක ටිකයන් ගේ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්—

රජගහා නුවර සම්‍යක් දෘෂ්ටි කෙණකුන්ගේ ත් මිථ්‍යාදෘෂ්ටි කෙණකුන් ගේ ත් බාල දරුවෝ දෙදෙනෙක් ගුළ කෙළි කෙළිති. ඉන් සම්‍යක් දෘෂ්ටික තැනැත්තන් ගේ පුතණුවෝ ගුළ කෙළි කෙළි නා කල හුවට දමන ගමනේ ම බුදු ගුණ සඳහන් කෙරෙමින් හුවට දමති. මිථ්‍යාදෘෂ්ටික තැනැත්තන් ගේ පුතණුවෝ හුවට දමන කල පූරණ කාශ්‍යපාදීන්ට නමස්කාර කොට හුවට දමති. ඉන් බුදුන්ට නමස්කාර කොට ලා හුවට දමූ තැනැත්තෝ හැම විට ම දිනති. තීර්ථකයන්ට නමස්කාර කළ තැනැත්තෝ පරදිති. පරදනා තැනැත්තෝ අරුන් දිනන නියා ව දැන මූ මෙ ලෙසක් කියා ලා හුවට දමා නිරන්තර ම දිනති. මම ත් එ ලෙස කෙරෙමි' බුදුන්ට නමස්කාර කිරීමෙහි අභ්‍යාස කළහ.

එක් දවසක් අමුතු ව ලා බුදුන්ට නමස්කාර කිරීමෙහි අභ්‍යාස කළ තැනැත්තවුන්ගේ පියාණෝ ගැලක් හැර ගෙණ දර සොයා යන්නෝ පුතණුවන් කැඳවා ගෙණ මිල දී දර ගැලක් පුරා ගෙණ එන තැනැත්තෝ නුවරින් පිටත වාසල බඩ දී ගැල රඳවා ලා ගොන් උනා පියා හිඳ බත් කැවු ය. උන්ගේ ඒ ගොන් ද පළමු සේ ම මෙ තෙක් දවස් අභ්‍යාසයට නුවර ඇතුළට ම නැඟී ගියහ. ගොන් ඇති තැනැත්තෝ ද ගොන් බලා ඇවිද නුවරට ගොසින් ඉතා සවස් ව ගිය කල ගොන් දැක බැඳ ගෙන යන තැනැත්තෝ වාසල්වල යතුරු නො හෙළන තෙක් යා නො හිණ. උඹ නො යන තෙක් ම වාසල් යතුරු ලා පීහ. දර පමණක් වස්තු වූවා සේ පුතු කැටි ව කැඳවා ගෙන ත් නො ගියෝ ය. පුත් පැටවා ද රෑ දවස් තනිය ම ගැල යටට වැද ලා වැද හෙව නිදා පි ය

රජගහා නුවර පියවින් ම යක්කු බොහෝ ව. කුමාරයෝ ද වැලි ත් සොහොනක් බඩ ම හොත්හ. එ තැන්හි දී යක්කු දෙන්

ණෙක් ඔහු දුටුවූ ය. එකෙක් මිථ්‍යා දෘෂ්ටික හෙයින් ශාසනයට පටහැණිය. එක් කෙණෙක් තමන් සම්‍යයක් දෘෂ්ටික හෙයින් ශාසන යට පක්‍ෂයහ. ඉන් මිථ්‍යා දෘෂ්ටිකයා 'මේ අපට ගොදුරු වේ ද, මූ කම්හ'යි කී ය. සම්‍යක් දෘෂ්ටික තැනැත්තෝ නො කැමැත්තේ ය'යි නැවතූහ. උන් නැවතූ ව ත් උන්ගේ බස් නො ගිවිස බාල දරුවන්ගේ පය අල්වා ගෙණ ඇද ලී ය. උඹ තමන් බුදුන් සඳහන් කොට පුරුදු හෙයින් ඒ ඇසිල්ලෙහි 'නමො බුද්ධාය'යි කිවූ ය. යකා ත් බා ගොසින් ඉවත් ව ලා සිටියෝ ය.

ශාසන භක්තික යක්‍ෂයාණෝ 'කළ දෑ වැරැද්දේ ය. දඬුවම්[1] කරම්හ'යි කියා ලා 'තෝ මේ කුමරුවාට බත් ගෙන ත් දී ලා රාත්‍රිය මුළුල්ල මුරෙහි හිඳුව'යි කීහ. සම්‍යක් දෘෂ්ටික යක්‍ෂයාණන් එ තැන කුමාරයාණන්ට රකවලට සිටිය දී මිථ්‍යා දෘෂ්ටික යක්‍ෂයා නුවර ඇතුළට ගොසින් රජ්ජුරුවන් අනුභව කරන්ට ඉදි කළ බතින් රන් තළියක් පුරා ලා ගෙනා ය. ඉක් බිත්තෙන් උඹ දෙන්න උන්ගේ දෙ මවු පියන්ගේ වෙස් මවා ගෙණ උඹ නහා සිටුවා පියා බත් කවා ලා බත් ගෙනා තළියේ එ පවත මුළුල්ල ලියා ලා 'මේ අකුරු රජ්ජුරුවන් මුත් අනෙක් කෙණෙක් නො දකිත්ව'යි ඉටා ලා තළි ය ද දර ගැල හස්සේ ලා ලා රෑ දෙ වරු රකවල් ගෙණ සිට ලා උදසන නැඟී ගියහ.

දෙවන දවස් රජ ගෙයි භාණ්ඩාරයෙක් අපවතැ'යි කොලාහල කෙරෙමින් වාසල්වල යතුරු ලං ගෙණ මිනිසුන් පිටත යා නො දී බලා ත් නො දක නුවරින් නික්ම ඇත මැත බලන්නෝ දර ගැල රන් තළි ය තුබූවා දක 'මේ සොරා ය'යි කියා ලා අර දරුවන් ගෙණ ගොසින් රජ්ජුරුවන්ට පෑවූ ය. රජ්ජුරුවෝ ද තමන්ගේ තළියේ තුබූ අකුරු දක 'දරුව, මේ කුමන අකුරෙක් දැ'යි විචාරා 'මම, ස්වාමීනි, නො දනිමි. අපගේ දෙමවු පියෝ ගොසින් මා බත් කවා ලා රැක ගෙණ හුන්හ. මම ත් මාගේ මවු පියෝ ම ය'යි සිතා භයක් නැති ව නිදා පීමි. මා දන්නේ මෙ තෙකැ'යි කී ය. දෙ මවු පියෝ ත් පුතණුවන් රජ ගෙට ගෙණ ගිය හෙයින් රජ ගෙට ගියහ. රජ්ජුරුවෝ උන්ගෙනු ත් වෙන ම පවත ත් අසා උන් තුන් පක්‍ෂ ය ම කැඳවා ගෙණ බුදුන් කරා ගොසින් සියලු ම පවත් බුදුන්ට දන්වා ලා 'ස්වාමීනි, තුනුරුවනින් බුදු රුවන් සඳහන් කිරීමෙන් ම රක්‍ෂාව වේ ද? ධමුරුවන් සඟුරුවනු ත් සිහි කල යහපත් දැ'යි විචාළෝ ය.

බුදුහු ත් 'මහරජ, හුදක් බුදුන් සඳහන් කිරීම ම රක්‍ෂා ය'යි කියන්නේ කිම් ද ? බුද්ධානුස්මෘති ආදිවූ සයෙක් යම් කෙණකුන්ගේ

---

1. හඬුහම්

Non-Commercial Distribution

සිත්හි භට ගෙණ තිබෙ නම් උන්ට මන්ත්‍රෞෂධාදියකින් ප්‍රයෝජන නැතැ'යි වදරා ලා ඒ සය විභාග කොට වදරන සේක්- 'යම් කෙණෙක් දවල් වේ ව යි, හිඳිනා කල වේ ව යි, සිටිනා කල වේ ව යි, යන කල වේ ව යි, එන කල වේ ව යි, කන කල වේ ව යි, බොන කල වේ ව' යි නව අරහාදී බුදු ගුණ සිහි කෙරෙත් ද, නැවත නව ලොවුතුරා දහම්හුගේ පෙළ ධම් හා සමග දස වැදැරුම් වූ දහමෙහි ගුණ සිහි කෙරෙත් ද, තව ද සියල්ලවුන් කෙරෙහි පතළ කරුණා ඇති සැරියුත්-මහ මුගලන් දෙ අග සවු පරම්පරාවෙන් ආ සු පිළිපන් සඞසයාගේ ගුණ සිහි කෙරෙත් ද, නැවත කා ගියා සී කමටහන් එක් වන් මෙනෙහි කෙරෙත් ද, තව ද සියල්ලවුන් කෙරෙහි පතළ කරුණා ඇත්තෝ ද, තව ද සියල්ලවුන් කෙරෙහි මෙත් ඇත්තෝ ද, එ සේ වූ බුදු සවුවෝ නිදන කල ත් මෙ ම මෙනෙහි කෙරෙමින් සුව සේ නිඳා පුබුදිනා කල ත් මෙ ම මෙනෙහි කෙරෙමින් සුව සේ පුබුදිති' වදළ සේක. දෙශනා කෙළවර ගුළ කෙළියෙන් දිනන්ට වුව ත් බුදු ගුණෙහි අභ්‍යාස කළ කුමාරයෝ ත් උන්ගේ දෙ මවු පියෝ ත් එ දවස් සෝවාන් ව පසු ව සසුන් වැද මහණ ව රහත් වූ හ. තව ත් බොහෝ දෙනාට මේ දෙශනා ව සප්‍රයොජන වී ය.

එ හෙයින් නුවණැත්තවුන් විසින් සෙසු පින් බැරෑරුම් වී නමුත් තුනුරුවන්හි ගුණ පමණක් සැලකීම හා කා ගියා සී භාවනාව හා සියල්ලන් කෙරෙහි කරුණා පමණක් හා මෙත් පමණක් වුව ත් ඇති ව සසර දුක් ගෙවන්ට උත්සාහ කට යුතු.

## 231. වජ්ජීපුත්තක භික්ෂූන් වහන්සේ ගේ වස්තුව

තව ද ප්‍රතිපත්තියෙහි විසීම මඳ ව හෝ ගං ආදියෙන් එ තරව ගත නො හෙන්නවුන් පෙරළා ආ පස්සෙ යන්නා සේ ශාසනාභිරති ය මඳ ව ගිහි වියටි වෙත් නම් ශාසනාභිරති ය කරවනු නිසා වජ්ජිපුත්තක භික්ෂූන් වහන්සේගේ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්—

ඒ භික්ෂූන් වහන්සේ විසල් මහ නුවර රජ්ජුරු කෙණෙක වාරයෙන් පැමිණි රාජ්‍ය ය හැර මහණ වූ සේක. විසල් මහ නුවර ත් හිල් මස මැදි පොහෝ දවස් කාර්තිකොත්සව ය රාත්‍රි ය මුළුල්ලෙහි පවත්නා කල්හි විසල් මහ නුවරසත් දස් සත් සිය සත් දෙණකු පමණ වොටුනු පළන් රජුන් හා එ පමණම යුව රජ සෙනෙවිරත් ආදීන් නො එක් වෙස් ගෙණ සැරසී උත්සව නිසා වීථිවලට බට කල්හි සැට රියන් පමණ සක්මන සක්මන් කරණ

Non-Commercial Distribution

ඒ තෙරුන් වහන්සේ පසළොස්වක් දවස් පයියකින් මැත් කළ රිදී කැට පතක් වැනි වූ පුන් සඳ මඩල දුක සක්මන් කෙලවර පෝරුවෙහි වැතිර ගෙණ සිටි සේක්—

"එකකා මයං අරඤ්ඤෙ විහරාම–අපවිද්ධංව වනස්මිං දාරුකං,
එතාදිසිකාය රත්තියා–කොසුද'නි අම්හෙහි පාපියො"

යනු හෙයින් ආභරණ ලා සැරහීමක් නැති ව සිටි හෙයින් තමන් වහන්සේ වල දමා පූ දඬු කඳක් මෙන් සිතා ගෙණ අපට ත් අඩු තරම තැන් ඇත් දෝ හෝ' යි සිතී ගොසින් අපිස් සතොස් ගුණෙන් යුක්ත වුව ත් මහ වත යෙමින් සිට වල් හසරකට යන්නා සේ නිවන් පුරයට මහ වත් වූ පිළිවෙත් මහ යෙමින් සිට උකටලී වල් හසරට නික්මෙන්ට සිතා පී සේක. ඒ වේලාවට ඒ වෙණෙහි වසන දෙවියෙක් උන්දෑ ලා[1] බුදුන් කරා යවනු නිසා–

"එකකො ත්වං අරඤ්ඤෙ විරහසි–අපවිද්ධංව වනස්මිං දාරුකං
තස්ස තෙ බහුකා පිහයන්ති–නෙරයිකා විය සග්ගගාමිනං"

යන ගාථාව කී ය. උන් වහන්සේද ඒ ගාථාව අසා උකටලී ය ත් තුනී ව බුදුන් කරා ගොසින් වැඳ ගෙණ වැඩ හුන් සේක. බුදුහු ත් උන් වහන්සේගේ අදහස් දැන ලා ගිහි කම් කටුලෙහි දුක් හඟවනු නිසා දුක් පසක් වදාරන සේක් 'හෙම්බල මහණ, සියයෙන් මැත වූ යන්තම් සැපතක් හෝ දසින් ඔබ්බේ වූ බොහෝ සම්පත් හෝ හැර මැද වූ ත් බොහෝ වූ ත් නෑයන් සියන් හැර පියා මේ සස්නෙහි ල දී මහණ වීම ත් එ බඳු අදහස් ඇති ව මුත් බැරි හෙයින් දුක. දුකින් මහණ වුව ත් සිඟා වැළඳීම හා වත් පිළිවෙත් පිරීම හා බැරි හෙයින් එයි ත් දුක. ගිහිගෙයි වසන කල රජ දරුවන්ට රාජ කාරි ය හෝ කළ මැනව. පොහොසත් කෙණකුන් නිසා වසතො ත් උන් කියා ලූ දෙය ත් කළ මැනව. තමා නිසා වසන්නවුනු ත් රැක්ක මැනව.

සිල්වත් වූ මහණ බමුණන්ට සංග්‍රහ කළ මැනව. එ හෙයින් ගිහි ගෙයි විසීම නම් සිල් කළයක් මෙන් ද, මහ මුහුදක් මෙන් ද පුරා ලිය නො හැක්ක. එ හෙයින් ගිහි කම් කටුලු ත් දුක. තව ද ගිහින් වුව ත් ශාසනිකයන් වුව ත් ජාති ගොත්‍ර කුල භොගාදීයෙන් හා බහුශ්‍රැතත්වාදීන් හරිගස්වා හිඳි ත් නම් වාද විවාදයට මුත් අනිකකට අවසර නැති හෙයින් එයි ත් දුක. ඒ හැමට ත් වඩා යම් කෙණෙක් සසර රඳා හිඳීම කැමැති වූ නම් දුක් නම් ඒ ය. යම් කෙණෙක් මේ දුක් මුළුල්ල ම හළ වූ නම් යහපතැ' යි

---

1 උද්ද ලා – උද්දලා

Non-Commercial Distribution

වදාළ සේක. දෙශනා කෙළවර ඒ භික්ෂූන් වහන්සේ ද පස් තැනක ම දක්වා ලූ දුකින් ඔරම්භාගිය වූ ත් සංයෝජනයන් පස් දෙනා නසා රහත් වූ සේක.

එ හෙයින් නුවණැත්තා වූ සත් පුරුෂයන් විසින් සසර දුක් සලකා කුසල්හි හැසිර සියලු දුක් ගෙවා නිදුක් ව නිවන් අත් කට යුතු.

## 232. කුඩාසුභද්‍රාවන් ගේ වස්තුව

තව ද සත් පුරුෂ ගුණයෙහි පිහිටියවුන්ගේ ම යහපත දක්වන්ට අනාථපිණ්ඩික සිටාණන්ගේ දූ වූ කුඩාසුභද්‍රාවන් ගේ වස්තුව කියමු.

කෙ සේ ද යත්—

අනේපිඩු මහ සිටාණන් බාල කල පටන් උග්ග නම් නුවර වසන උග්ග නම් සිටු පුත්‍රයාණෝ යාලු මිත්‍ර ව වෙසෙති. ශිල්ප උගන්නා ගමනේ ත් එක ආචාරීන් කෙරෙහි ශිල්ප ඉගෙන කතිකාවක් කරන්නාහු අප වැඩි විය පැමිණි කල්හි යම් කෙණකුන්ගේ පිරිමි පුත්තු ඇත් නම් යම් කෙණකුන්ගේ දූ ඇත් නම් ඒ දූන් අර පිරිමි පුතුන්ට විවාළ කළ අප දෙ පක්ෂ ය ම බාධා කට යුතු නො වේ' යි කියා කතිකා කළහ. ඌ දෙ පක්ෂ ය ම වැඩි විය පත් ව තමන් තමන්ගේ නුවරවල සිටු තන තුරු ලත්හ.

එක් සමයෙක උග්ග සිටාණෝ වෙළඳාමෙහි යන්නෝ පන් සියයක් ගැල්වලින් බඩු ගෙන්වා ගෙණ සැවැත් නුවරට ගියහ. අනේපිඩු මහ සිටාණෝ ද තමන්ගේ කුඩා සුභද්‍රා නම් දූවණි යන් බණවා ලා 'පුත, තොපගේ පියාණෝ උග්ග සිටාණෝ අවු ය. උන්ට කළ මනා සාද සාමීචියෙක් ඇත් නම් තොපට ම භාර ය'යි කීහ. උයි ත් 'යහපතැ' යි ගිවිස ඒ සිටාණන් ආ දවස් පටන් සිය අතින් ම බත් මාළු ත් ඉදි කොට දෙති. සුවඳ විලවුන් ආදි ය ත් සපයා දෙති. බත් කන වේලේ ත් නහන පැන් උණු කරවා දෙවා ලා නා නිමන තෙක් කැරවුව මනා දෙය ත් කරවා ලති. උග්ග සිටාණෝ ත් උන්ගේ තරම් යහපත් නියා ව පිළිපැද ලන ලෙසින් ම දැන ගෙණ උන් කෙරෙහි පැහැද එක් දවසක් අනාථ පිණ්ඩික සිටාණන් හා කථා කොට කොට හුන්නාහු 'අපි බාල කල කතිකාවක් කළමෝ වේ දැ' යි කළ කථාව සඳහන් කරවා ලා කුඩා සුභද්‍රාවන් තමන්ගේ පුතණු කෙණකුන්ට විවාළහ.

Non-Commercial Distribution

ඒ උග්ග සිටාණෝ පියවින් ම සැදැ නැත්තෝ ය. එ පවත් බුදුන්ට දන්වා ලා බුදුනු ත් උග්ග සිටාණන් සෝවාන් වන නියා ව දැක අනුදත් කල්හි ඇඹෙණියන් හා ත් කථා කොට ලා 'යහපතැ'යි ගිවිස විශාඛාවන් සරණ දෙන ධනඤ්ජය සිටාණන් මෙන් මහල් පෙරහර බලවත් කොට කුඩා සුභද්‍රාවන් බණවා ලා 'පුත, නැදි මයිලන් ලඟ වසන කල නම් ඇතුළතින් ගිනි පිටත නො ලිය යුතු ය' යනාදීන් ධනඤ්ජය සිටාණන් විශාඛාවන්ට කියා ලූ මාලු කම් දස ය ත් කියා ලා 'ඉදින් ම දූන් සරණ ගිය තැන බාල දරුවන් හෙයින් පෙනුණු වරදෙක් ඇත්නම් විචාරා ලව'යි කෙළෙඹියන් අට දෙණකු සම්මත කොට කැටි ව යන්ට නිල කොට ලා දුවණි-යන් සරණ යන දවස් බුදු පාමොක් මහ සඟනට දන් දී ලා සසර සිටිනා කල දුවණියන් කළා වූ සුචරිතයෙහි ඉෂ්ට විපාක ය ලෝ වැස්සන්ට පහළ කරන්නාක් මෙන් බොහෝ මහල් පෙරහරින් යවූහ.

උන් උග්ග නුවරට ආසන්න ව ගිය කලට නැන්දණියෝ ත් තව ත් බොහෝ දෙන ත් මහ පිණැති තැනැත්තවුන් ගියා නියා ව අසා රුදා පියන්ට බැරි හෙයින් පෙර ගමන් කොට ගියහ. උයි ත් තමන්ගේ රූප ශොභාව හැම දෙන ම දක්නා නිසා රථයකින් නුවරට වැද නුවර ඇත්තවුන් එවූ පඬුරු හැර ගෙන දෙකක් කොට පියා එකක් තුමූ හැර ගෙණ එකක් එවූ එවුවන්ට ම තමන්ගෙන් යවා ලා නුවර වැස්සන් මුළුල්ල ම නෑයන් පරිද්දෙන් සිත් ගත්හ.

මහල් දවස් මයිලණුවෝ නිවටුන්ට සත්කාර කරන්නෝ අප ගේ යේළණියනු ත් රහතන් වැන්ද මැනවැ'යි කියා යවූහ. පිළි නැති ව හිඳිනවුන් හෙයින් දකිනට විළි ඇති ව නො යෙති. දෙ තුන් විටක් කොට කියා යවා ත් නො එන හෙයින් මුසුප්පු ව පියා ගෙන් යන්ට විධාන කළහ. කියා ලූ විට ම යාම යුක්ති නො වන හෙයින් කෙළෙඹියන් අට දෙනා කැඳවා ලා එ පවත් කිවු ය.

උයි ත් ආද්‍යන්ත විචාරා ඊ වරදක් නැති නියා ව දැන ලා බුදුන් කෙරෙහි භක්ති ඇත්තවුන් නිවටුන් කරා එළඹීම යුක්ත නො වෙ'යි යනාදීන් කියා සිටාණන් ගිවිස්වා පීහ. සිටාණෝ ද තමන්ගේ ඇඹෙණියන්ට 'මූ අපගේ රහතන් ලජ්ජා නැතැ'යි කියා ලා නො වඳිති'යි කිවු ය. සිටු දුවණියෝ ද 'මූ තමන්ගේ රහතන් ගේ ගුණ මුඛ නො පොහෝනා පරිද්දෙන් එක් වන් කියති. ගුණ ඇතැ යි කියා ලූ පමණෙකින් ම දැනේ ද, මුන්ගේ රහතන්ගේ

ගුණ මුත් අතින් විවාළ මනා වේ දෑ'යි උන් කැඳවා ලා තෙපි එක් වත් තොපගේ රහතන්ගේ ගුණ කියව. උන්ගේ සැටි කවරේ ද, උන්ගේ ස්වරූප අපට කියව'යි කීහ.

ඉක් බිත්තෙන් කුඩා සුභද්‍රාවෝ ද බුදුන්ගේ ත් බුදු සවුවන්ගේ ත් ගුණ කියන්නාහු අපගේ රහතන් වහන්සේ සියලු ඉරියවු-වෙහි ම නිසල පියෝ ඇති හෙයින් සන්හුන් සේක. කෙලෙස් සිත් නැති බැවින් සිතිනු ත් සන්හුන් සේක. සකසා හැඳ පෙර වගමන් වඩනා සේක් වී නම් දවසක් මුළුල්ලෙහි වඩිත ත්, එ ම පිය සිටින ත්, හිඳිත ත්, වැද හොවිත ත්, එක ද ඉරියවුවක් නපුරැයි කියන්නන්ට බැරි ය. සිහා යන කල ත් උවදුරක් ඇත හොත් දුර බලා පියතො ත් මුත් විය දඬු පමණෙකින් වඩා නො බලන සේක. කියන බණන දෙය ත් ධර්ම නිශ්‍රිත කථාවක් මුත් ස්වර්ග-මොක්ෂ බාධක කථා අත්හැර වසන හෙයින් මිතභාණී සේක. නැවත අපගේ රහතන්ගේ දෑගුම් හැමදුම් තණ කසළ ගැනුම් ගෙන්-නම් පත්නම් ආදී වූ දෙය ත් නිකසළ ය.

මෘෂාවාදදී චතුර්විධ වාග් දුශ්චරිතයන් නැති හෙයින් දවා පිරිසුදු කළ රත්රනක් සේ තෙපුල් ඉතා යහපත. කුදෘෂ්ට්‍යාදී මලාපගමයෙන් සිත් සතනු ත් අති පවිත්‍ර ය. නැවත මේ ලෙව්හි සමහර කෙණෙක් බැලුවන්ට රිසියෙන පියෝ ඇති ව ත් අදහස් නපුරු වෙති. සමහර කෙණෙක් පියෝ නපුරු වුව ත් අදහස් යහපත් වෙති. පුරා දෙක ම සම්භවන්ට නැත. අපගේ රහතන් වහන්සේ ඇතුළතිනු ත් පිටතිනු ත් ඉතා යහපත් සේක. රුවන් පුරා ලූ කරඬු මෙන් ගුණෙන් ම කෙලෙස් කසලකට අවසර නො පැ පිරී සිටිනා සේක. තව ද මෙ ලෝ වැස්සෝ ලාභයක් දුටු කල රත්රන් සතර වියට ලත් කවුස්සා රජ දරුවන් හා සරිගැස්සුවා සේ උඩඟු වෙති. ලද සම්පත් නට කලට මුසුප්පු වෙති. අපගේ රහතන් වහන්සේ පිළිගත යුත්තක් පිළිගන්නා කල ත් පමණ දන ම හෙයින් ලාභ ය දැක උඩඟු ත් නො වන සේක. නො ලදුම් හ'යි මුසුප්පු ත් නො වන සේක. තව ද මෙ ලෝ වැස්සෝ කීර්ති යෙක් පතළ නම් හෝ පරිවාර සම්පදවෙක් ඇති වී නම් උඩඟු වෙති. ඒ දෙකට ම පතා නො සම්භ වී නම් මුසුප්පු වෙති. මාගේ රහතන් වහන්සේට ඒ දෙකෙයි ම අමුත්තෙක් නැත. තරාදියක් මෙන් මැදහත් ව සිටිනා සේක.

තව ද මෙ ලෝ වැස්සෝ නැති ගුණයක් වුව ත් කියා පී කල සුළං දැඩි තැන බැඳපු ආස්පතක් සේ ඉපිලෙති. නුගුණයක්

Non-Commercial Distribution

කියා පු කෙණෙක් ඇත් නම් ඊට තරයේ රැහැණි වෙති. අපගේ රහතන් වහන්සේ කවුරුන් ගුණ කීව ත් නු ගුණ කීව ත් දෙ පක්‍ෂයෙහි ම මෙත් සිතින් සම අදහස් ඇති වතො ත් මුත් ඊට ඉපිලෙන්නේ ත් නැත. මුසුප්පු ත් නැති. තව ද මෙ ලෝ වැස්සෝ යන්තම් සැපයක් ලද්දු නම් ඒ තරපාරු කටයුත්තක් සේ සිතා ගෙණ උඩඟු වෙති. දුකක් වැද ගන්නා ම මුසුප්පු වෙති. අපගේ රහතුන් වහන්සේ කර්‍ම ප්‍රත්‍යවෙක්‍ෂාව කොට ගෙණ ඒ දෙකට ම සම අදහස් ඇති ව ගෙ෫ වැඩ හිදිනා සේක. යනාදීන් බුදුන් ගේ ත් බුදු සවුවන්ගේ ත් බොහෝ ගුණ තමන් දත් තරමෙකින් කියා නැන්දණියන් සතුටු කැරවූහ.

සතුටු වූ නැන්දණියනු ත් 'තොපගේ රහතන් අපට පාන්ට පිළිවන් දැ'යි විචාළ කල්හි 'පිළිවනැ'යි කිවු ය. 'එ සේ වී නම් යම් ලෙසකින් අපි උන් දකුමෝ නම් එ ලෙසක් කරව'යි කිවු ය. උයි ත් යහපතැ යි බුදු පා මොක් මහ සඟනට දන් සරහා ලා මාළිගාවේ මතුමාලේ සිට දෙවරම් වෙහෙර දිසාවට මූණ ලා ලා පසඟ පිහිටුවා වැද ගෙණ බුදුගුණ සඳහන් කොට මල් පුද ලා සෙට දවසට බුදු පාමොක් මහ සඟනට ආරාධනා කෙරෙමි. මේ සලකුණෙන් මා ආරාධනා කළ නියාව බුදුහු දන්නා සේක්ව'යි කියා ලා දෑ සමන් මල් අට මිටක් ආසට දමා ලූ ය. මලු ත් පලා ගොසින් සිවුවනක් පිරිස් පිරිවරා දෙව්රම් වෙහෙර බණ වදරන බුදුන් හිස් මුදුනෙහි මල් වියනක් ව සිටියේ ය. අණේපිඩු මහ සිටාණෝ බණ අසා ලා සෙට දවසට බුදුන්ට ආරාධනා කළහ. 'සිටාණෙනි, සෙටයට අපට ආරාධනා ඇතැ'යි වදළ සේක. 'මට පෙරාතුව ආ කෙණකු ත් නැත. ආරාධනා කොළෙළ් කවුරු දැ'යි විචාළහ.

'තොපගේ දුවණියෝ කුඩා සුභද්‍රාවෝ ය'යි වදරා, 'ඇයි ස්වාමීනි, මදු කුඩා සුභද්‍රාවෝ මෙ තැනට සාර සිය අසූ ගවුවෙකින් ඔබ්බෙහි වේ ද? උන් ආරාධනා කරන්නේ ත් මුඹ වහන්සේ ඉවසා වදරන්නේ ත් කෙ සේ දැ'යි විචාළ කල්හි ඒ වදරන බුදුහු 'සිටාණෙනි, රැස් කළා වූ කුසල් මුල් ඇති මහ පින් ඇති සත් පුරුෂයෝ දුර වූ නමුත් සාර සිය අසූ ගවුවෙකින් ඔබ්බෙ හුන් කුඩා සුභද්‍රාවෝ අපගේ නුවණැසට පෙනුණා සේ පහළ වෙති. කුමක් මෙන් ද යත්-තුන් දහසක් යොදුන් දිග ඇති, එ පමණ පළල ඇති නව දහසක් යොදුන් වට ඇති, පන් සියයක් යොදුන් උස ඇති, සුවාසූ දහසක් පමණ රුවන් කුළින් හෙබියා වූ හිමාල ය පර්‍වත ය දුර සිටියවුන්ට ත් පෙනේ ද - එ මෙනි. යම් කෙණෙක්

පර ලොව අත් හැර මෙ ලොව ම ගරු කරණ පව්වූ පුද්ගලයෝ සත්පුරුෂයන්ගේ දකුණු දණ මඩල ගාවා හුන ත් නො පෙනෙති. කුමක් මෙන් ද යත් – රෑ අඳුරෙහි වලට විද පූ හී දඬු මෙන් උපනිශ්‍රයක් නැති බැවින් නො පෙනෙති' වදාළ සේක.

ශක්‍රයෝ ද බුදුන් කුඩා සුභද්‍රාවන්ගේ ආරාධනාව ඉවසූ නිය ව දැන විස්කම් දෙව් පුතුන්ට කුළු ගෙවල් පන් සියයක් විවර මවා ලා බුදු පාමොක් සංඝයා වහන්සේ උග්ග නුවරට වඩාලව'යි විධාන කළහ. විස්කම් දෙව්පුත් ද උදසන ම කුළු ගෙවල් පන් සියයක් මවා ලා දෙව්රම් වෙහෙර වාසල ගාවා සිටුවා ලී ය. බුදුහු ත් සුභද්‍රාවන් කියා ලූ ගුණ ගිය වහන්දෑගෙන් ම පෙනෙන ලෙසට රහතන් ම පන් සියයක් තෝරා ලා පිරිවර සහිත ව කුළු ගෙවල වැඩ හිඳ උග්ග නුවරට වැඩි සේක. උග්ග සිටාණෝ ත් සහපිරිවරින් පෙර මඟ බල බලා සිටි තැනැත්තෝ සුභද්‍රාවන් කියා ලූ ලෙසට මහත් වූ බුද්ධානුභාවයෙන් බුදුන් වැඩි නියාව දැක පහන් සිත් ඇති ව සුවඳ මල් ආදියෙන් පූජා කෙරෙමින් වැඳ ආරාධනා කොට ගෙණ සතියක් මුළුල්ලෙහි මහ දන් දුන්හ. බුදුහු ත් උන් හැම දෙනාගේ ම අදහස් බලා රුචි බලා දෙන බතක් මෙන් බණ වදාළ සේක. උග්ග සිටාණන් ඇතුළු ව සුවාසූ දහසක් දෙන නිවන් දුටහ. බුදුහු ත් සුභද්‍රාවන් කෙරෙහි අනුග්‍රහයෙන් 'තෙපි මුඹ රඳව'යි කියා ලා අනුරුද්ධ මහ තෙරුන් වහන්සේ රඳවා ලා සැවැත් නුවරට ම වැඩි සේක. එ වක් පටන් එ නුවර ඇත්තෝ සැදැ ඇති වූහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් සත් පුරුෂොපාශ්‍රය නො හැර උන්ගේ අනුශාසනාවෙහි පිහිටා නිවන් පුර අත් කට යුතු.

## 233. එකවිහාරිය තෙරුන් වහන්සේ ගේ වස්තුව

තව ද විවේක වාසයෙහි යහපත දක්වන්ට එකවිහාරිය තෙරුන් වහන්සේගේ වස්තුව කියමු.

කෙ සේ ද යත්—

ඒ තෙරුන් වහන්සේ හිඳිනා කල ත් තනි ව ම හිඳිනා සේක. සක්මන් කරණ කල ත් තනි ව ම සක්මන් කරණ සේක. සිටිත ත් තනි ව ම සිටිනා සේක. මෙ ලෙසින් සිවුවනක් පිරිස් අතුරෙහි ප්‍රසිද්ධ වූ සේක. වහන්දෑ ද මුන් වහන්සේගේ තරම් බුදුන්ට දැන්වූ සේක. බුදුහු ත් ඔබගේ ගුණයට ප්‍රශංසා කරණ

Non-Commercial Distribution

සේක්- තුන් විටෙක සාධුකාර දෙවා වදරා සෙසු ත් වහන්දෑ විවේක වාසයෙහි යොදනු පිණිස විවේකයෙහි අනුසස් දක්වන සේක්- 'මෙම්බා මහණෙනි, දහස් ගණන් වහන්දෑ මද්ධ්‍යයෙහි ත් මුල් කමටහන නො හැර මනසිකාරයෙහි යෙදී යම් කෙණෙක් හිඳිත් නම් ඔහු තුමූ ගණ සඞ්ගනිකාදී නැති බැවින් තනිව ම හුන්නා නම් වෙති. තව ද යම් කෙණෙක් ලෝවාමහාපාය වැනි වූ ප්‍රාසාදවල යහපත් කොට අතුරන ලද යහන්වල බොහෝ වහන්දෑ පිරිවරා මුල් කමටහන නො හැරීමෙන් සිහි නුවණ එළවා ගෙණ දකුණු ඇළයෙන් වැද හොවිත් ද, එ සේ වූවෝ කෙ තෙක් දෙන පිරිවරා වැද හොවිත් නමුත් තනි ව ම වැද හොත්තෝ නම් වෙති.

යම් කෙණෙක් කමටහන් මෙනෙහි කිරීමක් නැති ව තනි ව ම වැද හොවිත් නමුත් කෙලෙසුන් කෙරෙන් නො වෙන් වූ හෙයින් තනි ව වසන්නෝ නම් නො වෙති. එ හෙයින් විවෙක වාසයෙහි ම ඇළුම් කරව. තව ද යම් කෙණෙක් අනලස් ව ජඞ්සා බල ය නිසා ජීවත් වීමෙන් නු කුසී ව සියලු ඉරියවුවෙහි තනි ව ම වෙසෙත් ද, රෑ වසන තැන් දවල් වසන තැනට වැද කමටහන්හි යෙදී මාර්‍ග ඵලයට පැමිණීමෙන් හුදකලාව ම තම තමන් හික්මවා ගනිත් ද, එ සේ වූවෝ ගණ සඞ්ගනිකා හැර පවිත්‍ර වූ අදහසින් ආරණ්‍ය - වෘක්‍ෂ මූලාදියෙහි ඇලුම් ඇති ව වෙසෙති' වදළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් කෙ තෙක් දෙනා එක් ව වසත ත් එක් ව නො විසු ව මනා කෙලෙසුන් හා එක් නො ව සත් පුරුෂ සෙවන ය කොට කෙලෙස් සතුරන් සාධා නිවන් රට අත් කට යුතු.

## 234. සුන්දරී පරිබ්‍රාජිකාවන් ගේ වස්තුව

තව ද නිරපරාධයන් කෙරේ කළා වූ අපරාධ ය දමු දමු ගොන් මැස්සන් දමුවන් කරා ම යන්නා සේ අපරාධ ය කළවුන් කරා ම පැමිණෙන නියා ව හඟවන්නට සුන්දරී පරිබ්‍රාජිකාවන්ගේ වස්තුව දක්වමු.

හේ කෙ සේ ද යත්—

එක් සමයෙක නො එක් ගංවලින් මහ වතුරු මුහුදට හඩා වදනා සේ බුදු සසුන් නමැති මුහුදට ලාභ සත්කාර නමැති

මහ වතුරු අවුත් හඩා වදනා කල්හි අමුණු බැඳ ලූ කලට ඇළවල පැන් සිඳෙන්නා සේ ලාභ සත්කාර නැති වූ තිර්ථයෝ හිරු නැඟි කලට කදෝපැණියන් මෙන් නිෂ්ප්‍රභා ව පියා එක් ව රැස් ව 'අපි මහණ ගොයුම්හු ඇති වූ තැන් පටන් ලාභ සත්කාර යෙන් පිරිහුණම්හ. ලාභ සත්කාරතබා අපඇති නියාව දන්නෝ ත් නැත. කවුරුන් හා එක් ව මහණ ගොයුම්හට අයසක් උපද වා පියා ලාභ සත්කාර නැති කරවා පියමෝ දෝ හෝ'යි කථා කළහ. කථා කොට ලා උපදෙස සොයන්නෝ 'සුන්දරී නම් පරිබ්‍රාජිකාවන් හා එක් වූවෝ නම් එ බන්දක් කට හෙම්හ'යි සිතා ඒ තිර්ථයෝ එක් දවසක් සුන්දරී නම් පරිබ්‍රාජිකාව තමන් වසන තැනට අවුත් වැඳ ලා සිටි තැනැත්තියට බැන නො නැංගාහ.

ඕ තොමෝ තව ත් තව ත් කථා කොට ත් බස් පමණක් නො ලදින් 'ස්වාමීනි, මුසුප්පු කුමක් දැ''යි විචාළී ය. 'හැයි පරිබ්‍රාජිකාවෙනි, මහණ ගොයුම්හු අපට උපදනා ලාභ සත් කාර ත් තමාට කොට ගෙණ අපට කරණ ගහට නො දකු ද? තව ත් ගහටයක් ඇත මනා දැ'යි කිවු ය. 'මා කළ මනා කුමක් දැ'යි විචාළ කල්හි 'තෙපි පරිබ්‍රාජිකාවෙනි, මනහර වූ රූ ඇත්ත ව. මිනිසාවන් කම ත් තොපගේ ඇත. මහණ ගොයුම් හට නො මිනිසාවන් කමක් උපදවා පියා තොපගේ බස් බොහෝ දෙනා ගිවිස්වා ගෙණ එක් අතෙක යන පැන් වැටියක් බැඳ අනික් අතකට නමා ලන්නා සේ මහණ ගොයුම් හට උපදනා ලාභ සත්කාර ය අප කරා නම්වා ලව'යි කිවු ය.

ඔයි ත් ඒ ගිවිස එ වක් පටන් මල් ගඳ විලවුන් කපුරු තකුල් ලමහ ආදී ය ගෙන්වා ගෙණ සවස් වේලෙහි බොහෝ දෙනා ගොසින් බුදුන්ගේ බණ අසා නුවරට වදින වේලාවට අඳුරු ගස්වා ගෙණ තොමෝ විහාර ය බලා යෙයි. බණ අසා එන්නවුන් 'කොයි යවු දැ 'යි විචාළ කල්හි 'මම මේ වේලේ අනික් කොයට යෙම් ද? එක ගඳ කිළියේ ලගිනා ලෙසට මහණ ගොයුම්හු කරා යෙමි' කියා ලා තිර්ථයන් හිඳිනා තැනෙක ලැග ලා උදෑසනක් සේ ම දෙවරම සිට එන මහට බැස ලා නුවර බලා එයි. දුටු දුටු කෙණකුන් 'කුමක් ද? සුන්දරීනි, කොයි සිට එවු දැ'යි විචාළ කල්හි 'වෙහෙරට ගොසින් මහණ ගොයුම්හු' හා සමහ එක ගඳ කිළියේ ලැග උන්ගේ අදහසට ලැබී ලා එමි කිය යි. කීප දවසක් ගිය කල තිර්ථයෝ වැන්දඹ[1] ලෙස ඔළ මොළ ව ඇවිදිනා නිකම කොලු කෙණකුන්ට අත්ලස් දී ලා 'යව, ගොසින් සුන්දරී නම් පරිබ්‍රාජිකාව මරා පියා මහණ ගොයුම්හුගේ ගඳ කිළි-

1. අපි ම මෙවා වැනි දඹ ලෙස, කුණු වැනි දඹ ලෙස.

Non-Commercial Distribution

ලඟ මල් කසළ හස්සේ ලා පියා එව' යි කිවු ය. උයි ත් එ ලෙස ම කළහ.

තිර්‍ථයෝ ද 'සුන්‍දරී නම් පරිබ්‍රාජිකාවන් නො දකුම්හ'යි කොලාහල කොට රජ්ජුරුවන්ට ත් කියා 'සැක ඇත්තේ කො කෙරේ දැ'යි විචාළ කල්හි 'මේ මේ දවස් දෙව්රම රඳා හුන්නු ල. ගියේ ත් ඊට ල. දුන් කොයි බවක් නො දනුම්හ' යි කියා ලා 'එසේ වී නම් ගොසින් විමසව' යි රජ්ජුරුවන් කී කල්හි තමන්ගේ උපාසකවරුන් හැර ගෙණ දෙව්රමට ගොසින් සොයන්නාහු මල් කසළ හස්සේ මිය පියා හොත්තවුන් දැක ඇඳෙක ලා ඉගණ ඇතුළු නුවරට හැර ගෙණ ගොසින් 'මහණ ගොයුම්හුගේ සවුවෝ තමන්ගේ බුදුන් කළ වරද සඟවනු නිසා සුන්‍දරීන් මරා පියා මල් කසළ හස්සෙහි ලා සඟවා පී ය'යි රජ්ජුරුවන්ට කීහ. රජ්ජුරු වෝ 'එ සේ වී නම් ගොසින් නුවර ත් කියා ඇවිදුව' යි කිවු ය. උයි ත් නුවර වීථිවල රජ්ජුරුවන් කී ලෙස ම කියා ඇවිද පියා නැවත ත් රජ්ජුරුවන්ගේ මාළිගා දොර කඩට ගියහ. රජ්ජුරු වෝ ත් සුන්දරීන්ගේ මළ සිරුර අමු සෝනෙක මැස්සක් නංවා ලා ඊ තබ්බවා ලා රැකවල් ලවා ලූහ.

සැවැත් නුවර ඇත්තවුන්ගෙනු ත් තිවන් දුටුවවුන් හැර සෙස්සෝ බොහෝ ඉස් ම 'මහණ ගොයුම්හු ත් ලොක ප්‍රසිද්ධ ව හිඳ කළ දැ බලව. උන් කළ තරමට ත් වඩා උන්ගේ සවුවන් කළ දෙය ත් බල ව' යනාදී කිය කියා ඇතුළු නුවර ත් පිටි නුව ර ත් ඇවිදිති. සමහරු සිඟා ආ වහන්දැට බෙණෙති. වහන්දැ එ පවත් බුදුන්ට දැන් වූ සේක. බුදුහු ද 'එ සේ වී නම්, මහණෙනි, තෙපි ත් බැණ ඇවිදිනා මිනිසුන්ට මේ ලෙස කියව' යි වදරන සේක් ''අනුන්ගේ වරද නො දැක ම බොරුවෙන්ම අනුන්ට දොඩත් ද උඟ තුමූ නරකයට යෙති. යම් කෙණෙක් පව් කම් කොට පියා ත් 'නො කෙළෙමි' කිය ත් නම් උයි ත් නරකයට යෙති. ඒ දෙ පක්‍ෂයේ ඇත්තෝ ම නරකයට යැමෙන් සරියෝ ය, නො සරි කවරෝ ද යත හොත්—යම් කෙණෙක් බොහෝ කොට පව් කම් කොළෝ නම් බොහෝ කලක් නරකයෙහි පැසෙති. පව් කම් මඳ කොට කළාහු නො බෝ කලක් පැසෙති. කළා වූ පාප ය කළ කළ ලෙසින් අනිෂ්ට විපාක ය දී මුත් නො හරන්නේ ය''යි වදාළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙනා තිවන් දුටහ.

රජ්ජුරුවෝ ද සුන්දරී නම් පරිබ්‍රාජිකාව වහන්දැ නො මරණ නියාව දැන 'ඈ මැරූ කෙණකුන් දනුව'යි මිනිසුන්ට විධාන

Non-Commercial Distribution

කළහ. ඉක්බිත්තෙන් මැරූ ධූර්ත කොල්ලෝ ද අත් ලස් රනින් රා හැර ගෙණ බොන්නාහු ඔවුනොවුන් හා ඩබරකට පටන් ගත්හ. එකෙකුට 'තෝ සුන්දරි ය එකපහරින් මරා පියා මල් කසළ හස්සේ ලා අත්ලස් රනින් රා හැර ගෙණ බොන්නෙහි වේ ද? තව රා ත් අරුම ද? රනු ත් අරුම ද? තව ත් රා මුට්ටු විටෙක අත්ලස් හැර ගෙණ මිනී මරණ බව වේ දැ'යි කී ය. රාජ පුරුෂ යෝ ද ධූර්තයන් අල්වා ගෙණ රජ්ජුරුවන්ට පැවූ ය. රජ්ජුරු–වෝ ත් 'ඒ පරිබ්‍රාජිකාව මැරුවෝ තෙපි දැ'යි විචාරා 'එ සේ ය'යි කී කල්හි 'තෙපි ම සිතා ගෙණ මැරූ ද? අනුන්ගේ විධානයෙකින් දැ'යි විචාළෝ ය.

තිථයන්ගේ විධානයෙන් නියාව කී කල්හි රජ්ජුරුවෝ තිථයනු ත් ගෙන්වා ලා වරද මුන් කෙරෙහිම පිහිටුවා ලා ''තෙපි නුවරට පලා ගොසින් 'මහණ ගොයුම් හට අයසස් උපදවනු නිසා සුන්දරින් අපි ම මැරූමහ. සුන්දරීන් කියා ඇවිදි කට යුතු ත් අප ගේ උගැන්මෙනැ'යි කියා ත් 'මහණ ගොයුම්හුගේ හා ඕහුගේ සවුවන් ගේ කිසි ත් වරදෙක් නැත. වරද අපගේ ම ය' යි කියා ත් නිරපරාධ බුදුන් හා බුදු සවුවන් වහන්සේගේ නැති වරද සිතට නැඟුවන්ට තොපගේ ඇති වරද කියා වරද තොප කෙරේ ම නියාව කියා සිතට නංවා ලව ' යි කීහ. උයිත් එ ලෙස ම කළහ. කිය කියා ලූ දෙයක් ම හදහන්නෝ එයි ත් හදහා ගත්හ. තිථයෝ ත් මනුෂ්‍ය වධ ය මුල් ව ලද මහා දඬ ලත්හ. එ වක් පටන් බුදු සස්නට සුන්දරි ය බලා අයසස් උපදවන්නන් නැති හෙයිනු ත් තිථයන්ව ලං වන්නවුන් නැති හෙයිනු ත් ලාභ සත්කාර බලවත් වී ය.

එ හෙයින් සුජනයන් විසින් ලාභ සත්කාරාදි ය නිසා අනුන් කෙරෙහි ඊර්ෂ්‍යා නූපදවා ලාභ සත්කාරාදියෙහි ගිජු නො ව දැහැමින් සෙමෙන් දවස් යවා නිවන් අත් කට යුතු.

## 235. දුශ්චරිත ඵලානුභවය කරණ සත්වයන් ගේ වස්තුව

තව ද දුශ්චරිතයෙහි නපුර හඟවන්ට දුශ්චරිත ඵලානුභව ය කරණ සත්‍වයන් ගේ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්—

මුගලන් මහ තෙරුන් වහන්සේ ලක්ෂණ මහ තෙරුන් වහන්–සේ හා සමඟ ගිජු කුළු පවුවෙන් බස්නා සේක් නො එක් ප්‍රේතයන්

Non-Commercial Distribution

ගේ ඇටසැකිලි ආදී වූ අත් බැව් දැක සිනා පහළ කොට ලක්‍ෂණ මහ තෙරුන් වහන්සේ සිනාවට කාරණ විචාළ කල්හි 'දැන් සිහා යන වේලාව හෙයින් සිහා යමින් සිට කරණ කථා නම් වත් නො වන හෙයින් යුක්ත නො වෙයි. බුදුන් ලඟ දී ම විචාළ මැනැවැ යි කියා ලා සිහිමත්[1] තැන් හෙයින් සිත තබා ගෙණ බුදුන් ලඟ දී විචාළ කල්හි ප්‍රේතයන් දැක සිනා පහළ කළ නියාව වදරන සේක් 'මම, ඇවැත්නි, ගිජු කුළු පව්වෙන් බස්නෙම් තුන් සිවුරු පාත්‍ර ත් ගිනි ගෙණ දිලි සෙන්නා වූ ඇට සැකිල්ලක් භික්‍ෂු ලෙසින් හා භික්‍ෂුණී ලෙසින් හා සාමණේර ලෙසින් හා සාමණේරී ලෙසින් හා හික්මන් ලෙසින් ඇවිදී ප්‍රේතයන් දිටිමි. මම උන් දැක සංසාර දෙෂයෙන් මම මිදිණි යි' සිනා පහළ කෙළෙමි' යනා දීන් මහණ ප්‍රෙත වක ආ ලෙසට වදළ සේක.

බුදුහු ත් ප්‍රෙත වත ආ ලෙසින් ම කසුප් බුදුන්ගේ සස්නෙහි මහණ වුව වුන් කළ මනා ලෙස තිබිය දී දුශ්ශීල ව විසූ නියාව වදරා ඒ ඇසිල්ලෙහි එ තැන රැස් ව හුන්නා වූ පවිටු අදහස් ඇති වහන්දෑට දුශ්ශීල ව වැස නරක දුක් බොහෝ කලක් විඳ තව ත් කම් ය නො ගෙවුණු හෙයින් ප්‍රේත ව ඉපැද ගන්නා දුකු ත් වදරා බණ වදරන බුදුහු 'මහණෙනි, යම් කෙණෙක් අදහස නපුරු හෙයින් මෙ ලොව ජීවිකාව නිසා සිවුරු පෙර ව ගෙණ දුශ්ශීල ව වෙසෙත් ද, කළා වූ අකුසල් බලයෙන් නිරා දුක් විඳ ගිත්තෝ පැළහී ගිය වුන් අවුවේ ලූවා සේ ප්‍රේත ව ත් ඉපැද බොහෝ දුක් විඳිති'යි වදළ සේක. දෙශනා කෙළවර පවිටු අදහස් ඇත්තාහු ඒ හැර කුසල් අදහස් ඇති ව බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් කවර ලෙසිනු ත් පවෙහි නො හැසිර ත්‍රිවිධ ශික්‍ෂාව පුරා අධිමුක්ති වූ ලෙසින් තුන් බොධීන් එක් තරා බොධියකට පැමිණිය යුතු.

## 236. වග්ගුමුදු නම් හෝ තෙර වසන වහන්දෑ ගේ වත

තව ද දුශ්ශීල ව විසීමෙහි නපුර හඟවන්ට වග්ගුමුදු නම් හෝ තෙර වසන වහන්දෑ ගේ වත දක්වමු.

කෙ සේ ද යත්—

මෙහි කථා සවරූප ය විනයෙහි උතුරු මිනිස් ධම පරිජ්ජෙහි ආ ය. එ කල බුදුහු 'මහණෙනි, බඩක්. නිසා තමා කෙරෙහි නැති මහඟු ලොවුතුරා දහම ගිහීන්ට කියා ඇවිද්ද දෑ'යි විචාරා

1 සිහමත්–සිහිමත්

Non-Commercial Distribution

'එ සේ ය'යි කී කල්හි නො එක් ලෙසින් ඒ වහන්දැට බැණ දෙඩා වදරා 'මහණෙනි, දුශ්ශීල ව සිට සැදැ ඇත්තවුන් දුන් සිවුරු පොරෝනා බලා ත් ගිනි ගෙණ දිලියෙන ය පට පොරෝනේ මැනව. සැදැ ඇත්තවුන් දුන් බත් වළඳනු බලා ත් ගිනි ගෙණ දිලි-සෙන යවට ගලනු මැනව. සැදැ ඇත්තවුන් කරවා දුන් සෙනස්-නෙහි ලගිනා බලා ත් ගිනි ගෙණ දිලියෙන ලෝ ගෙයි ලග්නේ මැනව. කුමක් නිසා ද යත්— එ ම ජාතියෙහි වන දුකක් මුත් ඉන් දෙ වන ජාතියට යන දෙයෙක් නැත. දුශ්ශීල ව සැදැ ඇත් තවුන් ගෙන් දුන් සතර පස ය අනුභව කළ කල එක ජාති ය නිසා නො එක් ජාති නස්සී' වදාළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් බිජු වට වැපිරීමට පෙරාතු කුඹුරු සරු සාර කරන්නා සේ දායකයන්ගේ පරිත්‍යාගම ය වූ කුසල් බිජුවට වපුරන නිසා සිත් සතන් නමැති කෙත්වලට නුවණ නමැති ඇළවලින් වීර්‍ය්‍ය නමැති පැන් මෙහෙයා කුසල් නමැති සී සෑමෙන් කෙලෙස් නමැති තණ කුණු කොට සැදැ නමැති බිජුවට වපුට ලොවී ලොවුතුරා සැප ත් නමැති ශස්‍ය ඵල සාධා ගත යුතු.

## 237. ඛෙම නම් උපාසකයන් ගේ වස්තුව

තව ද කුශලයෙහි ම අනුසස් දක්වන්ට ඛෙම නම් උපාසක-යන් ගේ වස්තුව කියමු.

කෙ සේ ද යත්—

උඹ තුමූ අනේපිඬු මහ සිටාණන්ගේ බෑණනුවෝ ය. රූපත් වන පින් කළ හෙයින් බලවත් රූ ඇත්තෝ ය. බොහෝ සේ ගෑනු මිනිස්සු උන් දැක රාගයෙන් මඩනා ලදු ව සිටි සේ සිට පිය නො හෙති. උයි ත් ගෑනු මිනිසුන් තමන්ට නැමෙන හෙයින් පරදර කර්මයෙහි ඇලී වෙසෙති.

එක් දවසක් ගම් රකවල්ලු ගෙයක හසු කොට ගෙණ ගසා-අල්වා ගෙණ රජ්ජුරුවන්ට පෑවූ ය. රජ්ජුරුවෝ ද සිටාණන් කෙරෙහි කළ සම්භාවනායෙන් සිතින් මුසුප්පු ඇත ත් කිසිවකු ත් නො කියා හරවා පූ ය. උයි ත් බරළින්[1] නැවැති පමණක් මුත් පර-

1 වරලින්-වරදින්, බමරළින්, මරනින්, බරවූ මරණින්

Non-Commercial Distribution

දර කර්‍මයෙන් නො නැවත්තෝ ය. දෙ වැනි වත් ගෙවල දී හසු කොට අල්වා ගෙණ රජ්ජුරුවන්ට පෑවූ ය. රජ්ජුරුවෝ සිටාණන් කෙරෙහි කළ දෙයින් ම හරවාපූ ය.

අනේපිඬු මහ සිටාණෝ ද එ පවත් අසා කැඳවා ගෙණ බුදුන් කරා ගොසින් බුදුන් කෙරෙහි ලජ්ජාවෙනු ත් හැර පිය ත් දෝ හෝ යි සිතා බුදුන්ට දන්වූහ. දන්වා ලා 'ස්වාමීනි, මූන්ට මෙලෝ පර ලෝ දෙකින් ම වන්නා වූ භය දක්වා බණ වදළ යහපතැ'යි කිවු ය. බුදුහු ත් උන්ට පරදර කර්‍මයෙහි දෙස් දක්වන සේක් 'ශෙම්බල සිටු පුත්‍ර ය, පරදර කර්‍මයෙහි නියුක්ත වීමෙන් පමා වූවාහු දුක් සතරකට පැමිණෙති. කවර දුක් සතරකට ද යත්—බොහෝ අකුසලු ත් රැස් වෙ යි. සිත ලෙස් නිදා පියන්ට නැති හෙයින් නිදි මැරීමෙනු ත් දුකෙක් සම්භ වෙ යි. තව ද බොහෝ නින්දා පරිභව ත් ලැබෙති.'

'එ හැම නුවූවා සේ සතර වැනි ව කටු හිඹුල් වනයට හෝ ලෝ කුඹු නරකයට හෝ පැමිණ බොහෝ දුක් විඳිති. මෙ සේ අකුශල ය නිසා අපායොත්පත්ති ය වන හෙයින් ගති ශුද්ධිය ත් නැත. තමා ත් කුමකින් කුමක් වේ දෝ හෝ යි භය පත් ව එ සේ ම භයපත් වූ ස්ත්‍රීන් හා කරණ සහවාසයක් හෙයින් එයින් අකුශල සිද්ධි ය වන පමණක් මුත් ස්වල්ප සැපයෙක. රජ දරුවෝ ත් අත් පා කැපීම් ආදි විසින් බොහෝ බරළ කෙරෙති. එ හෙයින් පරදර කර්‍ම ය ත් සෙසු ත් අකුසල් කළමනා දෙයෙක් නො වෙ'යි වදළ සේක. දෙශනා කෙළවර බෙම නම් සිටු පුත්‍රයාණෝ සෝවාන් ව පරදර කර්‍ම ය හළවූ ය. එ වක් පටන් බොහෝ දෙන ත් සුවසේ වැඩ හුන්හ.

මෙ ලෙස මූන් දුටු දුටුවන්ට ප්‍රසාදවහ වන්ට පෙර කළ පින් කවරේ ද යත්- මූ තුමූ කසුප් බුදුන් සමයෙහි මල්ලව ව ඉපැද සෞවර්ණ පිළියෙන් පතාක දෙකක් කසුබ් බුදුන්ගේ ධාතු වඩා කළ සතර ගවුවක් උස රන් දගබ් වහන්සේට පුද ලා පතන තැනැත්තෝ නැ සිය ලේ ගෑනු මිනිසුන් හැර සෙසු කවර ත් ගෑනු මිනිස්සු මා කෙරෙහි ඇලුම් ඇති වෙත්ව'යි පතා ගත්හ. එ හෙයින් මූන් උපනුපන් තැන ගෑනු මිනිස්සු සිටි සේ සිටි ය නො හෙති' වදළ සේක.

එ හෙයින් නුවණැත්තවුන් විසින් පරදර කර්‍මයෙහි ආදීනව අසා ඒ හරනා සේ සෙසු ත් පවු හැර කුසල්හි හැසිර නිවන් අත් කට යුතු.

## 238. දුර්‍වච නාමක ගේ වස්තුව

තව ද ධර්‍ම ගෞරව ය නැති වීමෙහි නපුර දක්වන්ට දුර්‍වච නාමක ගේ වස්තුව කියමු.

කෙ සේ ද යත්—

එක් භික්ෂු කෙණකුන් වහන්සේ නො දන එක තණ ගසක් කඩා පියා පසු ව සැක ව ගොසින් එක් නමක් කරා එළඹ 'ඇවැත්නි, කෙණෙක් තණ පතක් කඩා පූ නම් උන්ට කුමක් වේ දැ යි' විචාළ සේක. අනික් නම ත් තණ පතක් කැඩී ගිය යි කියා ලෝක වැද්දයක් නො වන බැවින් 'කුමක් ද? දෙසා ගන්නා වරද නැතැ යි' කියා සවල්ප මාත්‍ර වැද්දෙ ත්[1] භයක් නො වන ලෙසට විචාළ නම ත් යොද ලා තමන් වහන්සේ ත් දෑතින් තණ දෙ මිටක් කඩා ගත් සේක. වහන්දෑ එ පවත බුදුන්ට දන් වූ සේක.

බුදුහු ද ඒ නමට බැණ දෙඩා බණ වදරන සේක් 'යම් සේ කර තණ ආදී ය අල්වන සේ නො දන ඇල් වූ කල අල්වා ගත් අත ම කපා ද එ පරිද්දෙන් කරණ ලෙස තබා ලා නො කරණ ලෙස කළා වූ මහණ ධමු ත් අපායෙහි උපදවා දුක් එළවන පමණක් මුත් වැඩක් සාධා ලිය නො හෙයි. කරමෝ දෝ නො කරමෝ දෝ හෝ යි සිතා පසු බැස කළ මහණ ධමු ත් නො එක් ලෙසින් කිලුටු ලෙසට පවත්නා පැවතීමු ත් සඞ්ඝසන්නිපාතයට එළඹෙන කල නිරාශඞ්ක ව එළඹ පියන්ට නැති වීම ත් යහපත් නො වෙ යි. එ හෙයින් කරණ දෙයක් කළමනා ලෙසක කර ත් මුත් නො කළ මනා ලෙස කිරීමෙන් ප්‍රයොජන නැතැ'යි වදළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ. නො කීකරු නම ත් නො කීකරු කම් හැර විවසුන් වඩා රහත් වූ සේක.

එ හෙයින් නුවණැත්තවුන් විසින් දුර්‍වචත්‍ව ය සග මොක් දෙකට ම බාධා හෙයින් ඒ හැර සුවචත්‍ව ය කර ත්. මාළුවකට ලුණු දිවීම හිතයා සේ කවර ත් කුශලයට අනුකූල බැවින් එහි පිහිටා ලොවී ලොවුතුරා සැප ත් සිද්ධ කට යුතු.

## 239. එක්තරා ස්ත්‍රියක ගේ වස්තුව

තව ද ඊර්‍ෂ්‍යාවෙහි නපුර දක්වන්ට එක්තරා ස්ත්‍රියකගේ වස්තුව කියමු.

කෙ සේ ද යත්—

ඒ ස්ත්‍රියගේ සමණෝ තමන්ගේ ගෙයි ම කෙල්ලක හා බැඳී ගෙණ වෙසෙති. ඕ තොමෝ ඒ කෙල්ල කෙරෙහි ඊර්‍ෂ්‍යා ඇති ව

---

1 වැරැද්දෙක්

Non-Commercial Distribution

ඈ බැඳ සිටුවා ලා කන් නාසා කපා පියා එක් මුලු ව තිබෙන ගබඩාවෙක ලා දොර පියා ලා තමන් කළ කට යුත්ත සඟවනු නිසා විහාරයට ගොසින් බණ අසම්හ යි සමණන් කැඳවා ගෙණ විහාරයට ගොසින් බණ අස අසා හුන්හ. ඉක් බිත්තෙන් ඒ උපා-සිකාවන්ගේ නෑ කෙණෙක් ගෙට අවුත් දොර හැර පියා කෙල්ලට කළ මුළා දැක කෙල්ල උනා හළවු ය. ඔයි ත් විහාරයට ගොසින් සිවු වනක් පිරිස් මැද සිට තමාට කළ ගහට ය බුදුන්ට දන්වූහ. බුදුහු ද ඒ අසා බණ වදරන සේක් 'පාප ය නම් අනුන්ට නො හඟවා කිරීමට ත් වඩා බොහෝ දෙනාට හඟවා කිරීම යහපත. කුමක් නිසා ද යත හොත් අනුන් නො දත් වුව පසු තැවිලි වන්ට බාධා නැත. එ හෙයින් යමක් කළ කල සත්‍වයන්ට පසු තැවිලි නැත් නම් එ සේ වූ කුශල ය අනුන්ට හඟවා වුව ත් නො හඟවා වුව ත් කිරීම යහපතැ'යි වදළ සේක. දෙශනා කෙළවර කෙල්ල හා බැඳී විසූ උපාසකයෝ සෝවාන් වූහ. කෙල්ලට ගහට කළ ගැනි ද පුරා කෘත කුශල කර්ම ය බළී හෙයින් සෝවාන් වුව. ඒ කෙල්ල ද එ තැන දී ම නිදහස් කළහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් ඊර්ෂ්‍යාව නම් විෂ ඝොර සර්ප-යන් කොට සිතා එයින් දුරු වන්ට උත්සාහ කට යුතු.

## 240. ආගන්තුක බොහෝ වහන්දෑ ගේ වස්තුව

තව ද ජීවිත පොෂණයට ත් වඩා කුශල පොෂණ ය අවශ්‍ය-යෙන් කට යුතු වූ නියාව දක්වන්ට ආගන්තුක වූ බොහෝ වහන්-දෑ ගේ වස්තුව කියමූ.

කෙ සේ ද යත්—

වහන්දෑ පසල් රටක වස් වැස ලා පළමු මස සුවයෙන් විසූ සේක. දෙ වන මස සොරු අවුත් ඒ වහන්දෑගේ ගොදුරු ගම් පැහැර පියා කොල්ල හැර ගෙණ නැඟී ගියහ. එතැන් පටන් මිනිස්සු සොරුන් නවතන නිසා ඒ පසල් නුවර තරපාරු කොට කරන්නාහු ඒ වහන්දෑට උපස්ථානයක් කොට ගත නුහුණු වූ ය. වස් තුබූ අඩුවෙහි බොහෝ දුක් විඳ ත් වස් වැස නිමවා ලා බුදුන් දක්නා පිණිස සැවැත් නුවරට ගොසින් බුදුන් වැඳ ලා එකත් පස් ව හුන් සේක. බුදුහු ත් ඒ වහන්දෑ අතින් 'මහණෙනි, වස් සුව සේ විසූ දැ' යි වදරා 'ස්වාමීනි, අපි පළමු මස සුව සේ විසූම්හ. දෙ වන මස සොරු ගම් පැහැර පූ ය. එ වක් පටන් මිනිස්සු කර්මාන්ත යෙහි හී ගෙණ උපස්ථානයක් කොට ගත නුහුණු වූ ය.

එ හෙයින් බොහෝ දුක් වූනුම්හ'යි කී කල්හි 'මහණෙනි, ඒ නිසා මුසුප්පු නො වව'යි වදරා බණ වදරන බුදුහු 'මහණෙනි, යම් සේ මිනිස්සු ඒ පසල් නුවර පිටත දිසාවෙන් අගල පවුරු වාසල් අට්වාල ආදියෙන් තර කෙරෙත් ද, එ පරිද්දෙන් 'මහණෙනි, තෙපි ද රූපා දී ෂඩාලම්බන නමැති වාසල්හි ඇලී වසන්නා වූ ලොභ දෙෂාදී කෙලෙස් සොරුන් චක්ෂුරාදී ස දෙරින් වැද ලා ශීල සමාධ්‍යාදී ගුණ බඩු පැහැර නො ගන්නා ලෙසට චක්ෂුරාදී වූ ස දෙර සිහි නමැති දෙර පියා සිත් සතන් නමැති නුවර රැක ගනුව. එ සේ නො කළා නම් අෂ්ට දුෂ්ට ක්ෂණයෙන් විනිර්මුක්ත වූ නව වැනි බුද්ධොත්පාද කාලයක් තොප හැමට වැරැද්දී. එ සේ වැරද ගිය නම් සසර නමැති මුහුද හී පියා නිවන් පර තෙර කවර කලෙක දක්ක හෙවු ද'යි වදාළ සේක. දෙශනා කෙළවර ඒ වහන්දෑ ද නිවනෙහි ඇල්ම නිසා සසර ඇල්ම හැර රහත් ව වදාළ සේක.

එ හෙයින් නුවණැත්තවුන් විසින් මෙ ලොව විඳිනා දුකට වඩා පර ලොව විඳිනා දුක් ම දුක් කොට සිතා ගෙණ ඒ දුකින් මිදෙන්ට උත්සාහ කට යුතු.

## 241. නිවටුන් ගේ වස්තුව

තව ද යම් කෙණෙක් ලජ්ජා නැති ව කළ මනා පිණට ලජ්ජා ඇත්තෝ වූ නම් ලජ්ජා කළ මනා පවට ලජ්ජා නැත්තෝ වූ නම් භය නො කළ මනා කුශලයට භය ඇත්තෝ වූ නම් භය කළ මනා පාපයට භය නැත්තෝ වූ නම් එහි නපුර දක්වන්ට නිවටුන් ගේ වස්තුව කියමු.

කෙ සේ ද යත්—

එක් දවසක් වහන්දෑ නිවටුන් දැක කථාවක් උපදවන සේක් 'දිය ලණුවක් විවර ත් නැති ව ඇවිදිනා ගැවියන්ට[1] වඩා පෙකණියෙන් උඩ භාගය වුව ත් වසා ගෙණ ඇවිදිනා මෙ නිවට සගයෝ ම යහපත් හ. මුන් යන් තම් ලජ්ජාවක් ඇතැ යි සිතම්හ'යි වදාළ සේක. නිවටෝ ඒ අසා 'අපි ලජ්ජා නිසා අර්ධවෂාදක ව ඇවිදිනමෝ නො වම්හ. වැලි පස් ධූලි ආදියෙහි ත් ජීවිත ය ඇත. එ හෙයින් උයි ත් සත්වයෝ ම ය. එ හෙයින් ඌ තුමූ අපගේ භික්ෂා භාජනවල නුහුණු වූ නම් යහපතැ යි සිතා භික්ෂා භාජන රක්නා නිසා වසම්හ'යි කියා වහන්දෑ ලා හා වාද විවාද ලෙස බොහෝ කථා කළහ. වහන්දෑ ත් බුදුන් කරා ගොසින් එ පවත් බුදුන්ට දන් වූ සේක. බුදුහු ත්

1 ගැළ්ඹියන්ට

Non-Commercial Distribution

ඒ මුල් ව බණ වදරණ සේක්–'මහණෙනි, භික්‍ෂා භාජන කෙ තෙක් වෙලා සඟවා තබා ත් සිඟන විට, බත් කණ විට එළවුව මනා ම හෙයින් ලජ්ජා කළ මනා දෙයෙක් නො වෙයි. ඒ සඟවා ඇවිදීම් පමණෙකින් ලජ්ජා ඇත්තා නම් නො වෙති. උයි ත් අලජ්ජීහු ම ය. භික්‍ෂා භාජනයට ත් වඩා ලජ්ජා ස්ථාන ය නම් අවශ්‍යයෙන් වැසු ව මනා තැන ය. ඒ නො වසන්නාහු සෙසු කො තැනක් වැසුව ත් වැසු ව මනා තැන නො වසන හෙයින් අලජ්ජීහු ම ය.

වැසු ව මනා ලජ්ජා ස්ථාන නො වසා නො වැසුව මනා භික්‍ෂා භාජන වැසීම නම් විරුද්ධග්‍රාහ හෙයින් මිථ්‍යා දෘෂ්ටියේ ඇතුළත. ඒ මිථ්‍යාදෘෂ්ටි ය නිසා සත්‍වයෝ නරකාදි වූ සතර අපායට පැමිණෙති. භික්‍ෂා භාජන ය නිසා තමා ලොභනීය දෙසක් නො වන හෙයින් කෙලෙස් භයක් නැති හෙයින් ඒ වැසු ව මැනවැ'යි නැත. විරුද්ධ ලෙස සිතා ගෙණ යම් කෙණෙක් ඒ වසා ඇවිදි ත් නම් භය නො කළ මනා දෙයට භය කරන්නා නම් වෙති. ගුහ්‍ය ප්‍රදෙශ ය නම් නො එක් භයට කාරණ හෙයින් භයට ම හැර ලා ඒ නො වස ත් නම් භය කළ මනා දෙයට භය නො කරන්නා නම් වෙති. භික්‍ෂා භාජන ය නො වැසීමට භයත් ලජ්ජ ස්ථාන ය නො වැසීමට භය ත් කළ මනා භයක් නො වන බැවින් මිථ්‍යා දෘෂ්ටියෙහි ඇතුළත. ඒ නපුරු වූ ලබ්ධියක් නිසා සත්‍වයෝ අපායට පැමිණ දුක් විඳු ත් නමුත් සග මොක් සාධා ගත නො හෙති'යි වදාළ සේක. දෙශනා කෙළවර ඌර්ධ්ව කායම වසා ඇවිදිනා නිවටවරු ලජ්ජා ඇති ව අධඃකාය ත් එක් ව වසා මහණ වූහ. හෙතු සම්පන්න ව එ තැනට පැමිණි කෙණෙක් නිවන් දුටහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් පාපයෙහි ලජ්ජා ඇති ව පාපයෙන් දුරු ව සසර දුකෙහි භය ඇති ව නිදුක් ව තිබෙන නිවනට ම තැත් පිරි ය යුතු.

## 242. නිවට සවුවන් ගේ වත

තව ද නි වරද වරද ලෙස හා වරද නිවර ද ලෙස සිතා විරුද්ධ ලෙස පිළිපැදීමෙහි නපුර හඟවන්ට නිවට සවුවන් ගේ වත දක්වමු.

කෙ සේ ද යත් —

එක් සමයෙක නිවටුන්ගේ නිවට ගුණ ඇති උපාසකවරු තමන්ගේ දරුවන් ශාසන භක්ති ඇති වීමෙන් සැදෑ උපාසක වරුන්ගේ දරුවන් හා එක් ව පියා කෙළනවුන් දැක කෙළ පියා

Non-Commercial Distribution

ගෙට ගියවුන් ලවා වහන්දෑ නො වදින ලෙසට ත් විහාරවලට නො යන ලෙසට ත් දිවුරුවා පූ ය. උෟ හැම එක් දවසක් දෙවරම වෙහෙර දෙරටුවට පිටත හැම එක් ව පියා කෙළනාහු පිපාසා ඇති ව ශාසන භක්තික උපාසක කෙණකුන්ගේ පුතණු කෙණකුන්ට 'තොපි තෙල විහාර ය ඇතුළට ගොසින් පැන් බී පියා සපථයක් කළ හෙයින් අප ඇතුළු විහාරයට යන්ට බැරි ය. අපට ත් පැන් ගෙනෙව'යි කියා ලා විහාරයට යවූ ය.

උයි ත් විහාරයට ගොසින් පැන් බී ලා බුදුන් වැඳලා එ පවත දැන්වූ ය. බුදුහු 'තොප බොන පැන් බී ලා සෙස්සන් පැන් බොන්ට මුබ එවව'යි වදාළ සේක. උයි ත් සපථයට වඩා බුද්ධානුභාව ය බලවත් හෙයින් ගොසින් පැන් පූහ. බුදුහු ත් උන් කැඳවා ලා පැන් පීමෙන් පිපාසා සන්හිඳෙ ත් මුත් කෙලෙස් ගිම් නිවෙන්ට නැති හෙයින් කෙලෙස් ගිම් නිවනු නිසා චරිතානුකූල කොට බණ වදාරා සෝවාන් කරවා වදාළ සේක.

කුමාරවරු තම තමන්ගේ ගෙවලට ගොසින් එ පවත් දෙ මවු පියන්ට කිවු ය. දෙ මවු පියෝ 'අපගේ දරුවෝ දෘෂ්ටි ගත්හ'යි කියා මුසුප්පු ව ගෙණ හැඬූ ය. ඉක්බිති ගෙවල සැදෑ ඇති මිනිස්සු අවුත් මුසුප්පු හරවනු නිසා බණ කථා කීහ. උන්ගේ කථා අසා 'මේ දරුවන් මහණ ගොයුම්හු හා එක් වූ බැවින් ඕ හට ම පාවා දෙම්හ'යි නෑ සියෝ හැම විහාරයට ගෙණ ගියහ. බුදුහු ත් උන්ගේ අදහස් බලා බණ වදාරන සේක් 'යම් කෙණෙක් සග මොක් දෙකට කාරණ වූ කුශල ය වරද ය'යි ගෙණ අපා ය මාර්‍ග වූ අකුශල ය නි වරද ය'යි ගතිත් නම් ඒ විරුද්ධ ග්‍රාහ ය නිසා රත්-රනැ'යි සිතා ගිනි හිණ ලන්නවුන් මෙන්, සඳුනැ'යි සිතා අමෙධ්‍ය ය ඇඟ ගාන්නවුන් මෙන් බොහෝ මුළාවට පැමිණෙති. එ හෙයින් යම් කෙණෙක් කුසල් කුසල් සේ ගෙණ අකුසල් අකුසල් සේ ගෙණ අකුසලින් දුරු ව කුසල්හි නො වරදවත් නම් උන්ට සග මොක් දෙක ම නො වරද්දී'යි වදාළ සේක. දෙශනා කෙළවර හැම දෙන ම සරණ ශීලයෙහි පිහිටා නිරන්තර ව බණ අසන්නාහු සෝවාන් වූහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් සම්‍යක් දෘෂ්ටික වීම නම් නිවනට ඉඳුරා මහක් හෙයින් ලබ්ධි ය යහපත් කොට ගෙණ භවක්‍ෂයට ම උත්සාහ කට යුතු.

## 243. තමන් වහන්සේ ම අරහයා වදාළ වත

තව ද සහනයෙහි යහපත භගවන්ට බුදුන් තමන් වහන්සේ ම අරහයා වදාළ වත දක්වමු.

Non-Commercial Distribution

කෙ සේ ද යත්—

මේ කථා ව විස්තර විසින් අප්පමාද වග අටුවායෙහි ම ආ ය. අපි ත් ඔබ දී ම විස්තර කොට කියුම්හ. එ තෙකුදු වුව ත් මාගන්දි ය නම් බැමිණියගේ දෙඩීම-බිණීම තර හෙයින් අනද මහ තෙරුන් වහන්සේ අනික් නුවරකට යම්හ'යි කී කල්හි 'ආනන්‍දයෙනි, තොප එ සේ කිව ත් බැණ දෙඩා පිව'යි අපි එ සේ නො යම්හ'යි වදරා බණ වදරන සේක්- 'හෙම්බා ආනන්‍දයෙනි, මම නම් සටන් බිමට හැමිණි යුද්ධ ක්‍ෂම වූ ඇතු ඒ ඒ තැනින් අවුත් ඇඟ වැද ගත් හී දඩු ඉවසන්නා සේ නපුරු අදහස් ඇත්තවුන් නො එක් ලෙසින් බිණූ දෙය ත් ඉවසමි. තව ද උයන් කෙළි ආදී කෙළි ලළු පවත්නා තැනට ත් ඇත් කෙණකුන් අස් කෙණකුන් ගෙණ යෙත් නමුත් පූර්ණභද්‍ර නම් යක් සෙනෙවියන්ගේ හසු මෙන් හික්මුණු කෙණකුන් ම ගෙණ යෙති.

'රජ දරුවෝ ත් නැමෙහත් නම් එ සේ වූ ඇත් වාහන – අස් වාහන වලට නැඟෙති. ඊට ත් වඩා යම් කෙණෙක් කවර තරම් ව පෝසත් ව සිට ත් කවර තරම් කෙණකුනු ත් දෙඩා බැණ පී දෙය ඉවසත් නම් මිනිසුන්ගෙන් උං ම යහපත්හ. තව ද කොටළුවාට ද ව වෙළඹ කුසින් ආජානීය අශ්වයන් වුව ත් සින්ධු දෙශයෙහි උපන් සෙන්ධව අශ්වයන් වුවත් කාලාවකාදි දශ කුලයෙහි ඇතුන් වුව ත් හික්මුණාහු වූ නම් උං ත් යහපත. ඒ හැමට ත් වඩා යම් කෙණෙක් උද්ධත ගුණ ය සියලු ලෙසින් රහත් මගින් නසා තුමූ හික්මුණාහු නම් ඒ ම යහපතැ'යි වදළ සේක. දෙශනා කෙළවර අත්ලස් නිසා බිණූ පමණක් මුත් තමන් සිතා ගෙණ බිණූ ගමනක් නො වන හෙයින් බැණ ඇවිද්දෝ බොහෝ සේ ම සෝවාන් වූහ. අනික් තුන් මග තුන් ඵල ය බිණූ වරදට තිබී ගියා සේ ඒ අවධියට පමා වී ය.

එ හෙයින් නුවණැත්තවුන් විසින් ශුචි අශුචි නිඃක්‍ෂෙපයට මැදහත් ව සිටිනා පොළොව මෙන් ප්‍රතිසානුන ය දෙකට ම සම ව සිට සෙසු ත් ගුණයෙහි පිහිටා ලොවී ලොවුතුරා ගුණ විශෙෂ ය සිද්ධ කට යුතු.

## 244. හස්ති ශිල්පයෙහි දක්‍ෂ කෙණකුන් වහන්සේ ගේ වස්තුව

තව ද තමා නො හික්ම සිට අනුන් හික්මවීමෙහි නපුර දක්වන්ට මහණ විමට පෙරාතු හස්ති ශිල්පයෙහි දක්‍ෂ කෙණකුන් වහන්සේ ගේ වස්තුව කියමු.



Non-Commercial Distribution

කෙසේ ද යත්—

උන් වහන්සේ එක් දවසක් අචිරවතී නම් ගං බඩ දී එක් හස්ත්‍යාචාරියකු ඇතු තමා අභිප්‍රාය ලෙසට හික්මවා ගත නො හෙන නියාව දැක ලඟ සිටි වහන්දෑ බණවා ලා 'ඇවැත්නි, තෙල හස්ත්‍යාචාරියා ඇත් කෝල බලා තෙල ඇතු අසවල් තැන කොටා ලී නම් වහා ම ඌගේ අභිප්‍රාය ලෙසට නැමේ'යි කී සේක. හස්ත්‍යාචාරියා ත් ඒ අසා ලා උන් වහන්සේ වදාළ ලෙස ම කොට හික්මවා ගත. වහන්දෑ ද එ පවත් බුදුන්ට දැන්වූ සේක.

බුදුහු ත් ඒ භික්ෂූන් වහන්සේ බණවා ලා 'සැබෑ දැ'යි විචාරා 'සැබැවැ'යි කී කල්හි 'වළත්තෙන්[1] තට ප්‍රයෝජන කවරේ ද? යනාදීන් නො එක් ලෙසින් දොඩා වදරා එ තැනට පැමිණි තැනට වුව ත් ප්‍රයෝජන නිසා බණ වදරන සේක්— 'මහණෙනි, පූර්ව භාගයෙහි විදර්ශනා බලයෙන් හා පසු ව ආර්‍ය්‍ය ජාතියට පැමිණෙන කළ මාර්ග භාවනා බලයෙන් තුමූ දැමුණු කෙනෙක් ඇත් වාහන ආදියට නැඟී ත් කිසි කෙණකුන් සිනෙතු ත් නො ගිය විරූ නිවනට තුමූ ම ද මිණෙති. එ හෙයින් හික්ම වන සැටි උගැන්වීමට ත් වඩා තමා හික්මවනු මැනැවැ'යි වදාළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් සත් පුරුෂයන් විසින් අනුන් හික්මවත ත් තම තමා පෙරාතු හික්ම සිට හික්ම ගත් ලෙසට තුන් දුසිරින් දුරු ව තුන් සුසිරි පුරා ලොවී ලොවුතුරා ගුණ විශෙෂයට පිහිට විය යුතු.

## 245. එක්තරා මාලු බමුණාන කෙණකුන් ගේ වස්තුව

තව ද අනුන්ගේ විධානයෙන් වුව ත් දෙ මවු පියන්ට උපස්ථාන කිරීමෙහි යහපත හඟවන්ට එක්තරා මාලු බමුණාන කෙණකුන් ගේ වස්තුව දක්වමු.

කෙසේ ද යත්—

සැවැත් නුවර එක් බමුණාන කෙණෙක් අට ලක්‍ෂයක් පමණ වස්තු ඇත්තෝ ය. ඌ තුමූ වැඩි විය පැමිණ පුතුන් සතර දෙනකුට බමුණු කුලවලින් සරණ ත් ගෙන්වා පාවා දී ලා සතර දෙනාට සතර ලක්‍ෂයකු ත් දයාද කොට දුන්හ. බැමිණිනියන් මළ පසු පුත්තු එක් ව කථා කරන්නාහු ඉදින් මූන්දෑ අනික්

1. වළතත්තෙන් – වළමිත්තෙන්

Non-Commercial Distribution

බැමිණිනි කෙණකුන් ගෙනා දෑ වී නම් උන් වැදූ දරුවන්ට ත් දයාද වූවමනා කලට සම්පත අපට අපවත් වෙයි.

බැමිණිනි කෙණකුන් මුන්දෑ ගෙණෙත ත් කෑමෙන් පීමෙන් අපාසු ව නිසා වේ ද? කෑම පීම ඵාසු කොට ලූමෝ නම් මුන්දෑට සිතිවිලි නැත්තේ වේ ද, යන අදහසින් සංග්‍රහ කිරීමෙහි තර අද හසක් නැත ත් වස්තු ලොභයෙන් පලද නිසා ගසකට පැන් දෙන්නා සේ යහපත් කොට කවන්නෝ පොවන්නෝ යහපත් පිළී දෙන්නෝ නැවීම් ඉස් සේධීම් ආදී වූ මෙහෙවර ත් කරන්නෝ එක් දවසක් දවල් නිදා පියා නැඟී සිටි කලට පුත්තු සතර බෑයෝ ම අත-පය මැඩ මැඩ හුන්නාහු වෙන වෙන ම සොයා උපයා කන කලට බත් සෙවුව මැනව. ලුණු සෙවුව මැනව. හෝනා හිඳිනා දෑ සෙවුව මැනව. වාල් සරක් සෙවුව මැනව. රන් රත්රන් ආදී වූ දෑය සෙවුව මැනව. නො සෙවූ විට ම නැත. තමාගේ නැති කලට සොයා ගිය මැනව' යනාදීන් ගිහි ගෙවල බොහෝ දුක් කියා ලා 'අපි සතර දෙන මුඹ දිවි හිමියෙන් මේ ලෙසින් රකුම්හ. සෙසු වස්තුව ත් දී පුව මැනවැ'යි කීහ. බමුණානෝ වස්තුවෙන් වන ප්‍රයෝජන ත් මෙ තෙක් ම වේ දෑ'යි සිතා පුතුන් සතර දෙනාට තුබු සාර ලක්‍ෂය ත් ලක්‍ෂ ය ලක්‍ෂ ය බැගින් දී ලා හඳිනට පොරෝනට පිළී සහලක් විතර තමන්ට තබා ගෙණ සෙසු සම්පතු ත් සතර කොටසක් කොට බෙද දී ලූ ය.

කියා ලූ ලෙසට වැඩි මහලු පුතණුවෝ ද දවස් ගණනක් උප ස්ථාන කළහ. එක් දවසක් ගහට ගොසින් නා පියා එන කලට දෙරටුවේ සිටි යේළණියෝ 'හැයි, මුඹ දෑ වැඩීමාලු පුතණුවෝ ය යි දසක් පන්සියයක් වඩා දී ලූ දෙයෙක් ඇද් ද? දෙන දේ දී ලූවා සරියේ වුව සෙස්සනු ත් දෙ ලක්‍ෂ රනින් ලද. මේ ගෙට එන මහ මුත් සෙසු පුතුන්ගේ ගෙවලට මං හඳුනන්නේ නැද් දෑ'යි කිවු ය. බමුණානෝ ත් එ සේ කියා ලූ යේළණියන්ට දෙඩා බැණ ගෙණ අනික් පුතණු කෙණකුන්ගේ ගෙට ගියහ. ඒ ගෙයි යේළණියනු ත් කීප දවසක් විතරින් මෙ ලෙස ම කී කලට ලජ්ජාව ගොසින් අනික් පුතණුවන්ගේ ගෙට ගියහ.

මෙ සේ පුතුන් සතර දෙනාගෙන් ම සම්පත එවා ගන්නා තෙක් මුත් ගිනි පිඹ ගෙන පෙනෙල්ල දමුවා සේ මූණ ගසා. දෙඩීමෙන් නෙරනා ලදු ව සී රක්නා ව සිඟා කා ඇවිදිනෝ කල් ගිය කලට ජරා දුර්වල ව ගොසින් සිඟා ත් ජීවත් වීම දුක් හෙයින් පිළෙක වැද හෙව නිදා පියා නැඟී සිට හුන් තැනැත්තෝ තුමූ ම තමන්

බලා පියා පුතුන් ගෙන් කිසි ද රක්ෂාවක් නැති හෙයින් රැකෙන උපදෙසක් සිතන්නාහු 'මහණ ගොයුම්හු කවුරුන් දුට ත් මුණු දී බැණ නැගෙතොත් මුත් කර බානා කෙණෙක් නො වෙති. සිත් ගෙණ කථා කරණ සේ ත් දනිති. නො පදෙයි කියා ගිය කෙණකුන් නිසි ලෙසකින් රැක ලිය ත් හෙති. උන් කරා ගිය හොත් රැකී ගත හැක්කැ'යි දයිව[1] මතු වන වකක් හෙයින් සිතා ගෙණ පවුල සකහ ගෙණ මාණ පයක් හැර ගෙණ සැරවිටි ගසා බුදුන් ලඟට ගියහ. ගොසිනු ත් සිටිනට බල මඳ හෙයින් වැද හුන්හ.

බුදුහු ත් අශක්ති ව වැද හුන් බමුණානන් හා සමඟ සාද සාමීචි ලෙස කථාකරණ සේක් 'බමුණ, තොපි ත් දුර්වල ව ගියා හිත පවුල් පමණකු ත් තොපට ත් වඩා දුර්වල ය. තා රැක ලන කෙණකුන් නැති නියා ද'යි වදළ සේක. බමුණානෝ ද 'භවත් ගෞතමයෙනි, මාගේ පුත්තු සතර දෙනෙක් ආදි ත් සාර ලක්ෂයක් හැර ගෙණ පසුව ත් රකුම්හ යි කියා ලා තුබූ සාර ලක්ෂය ත් ලදින් වුව මනා ප්‍රයොජන විද නිමවා ලා තුමූ නො පෙනී අඹුවන් ලවා දෙඩවා බණවා නෙරිති' කීහ.

බුදුහු ත් 'යම් දරු කෙණකුන් ගෙන් ප්‍රයෝජනයක් විඳිම් යි සිතා වඩා වර්ධන කෙළෙම් නම් ඌ දුන් සෙසු සම්පත් හැර රනින් ම අට අට ලක්ෂයක් හැර ගෙණ බල්ලන් ලවා ලා හූරන් ලුහුබඳවන්නා සේ තුමූ නො පෙනී අඹුවන් ලවා ලා දෙඩවා නෙරිති. දුටු කල වැඩි මාලු නෑ කම් කියන පමණක් මුත් ඉතා දුර්ජනයෝ ය. රැක්ක මනා අවධියේ දී මා අත් හළවා වූ ඔහු පුත් සැටියේ අවුත් පෙනී ගිය යක්කු ය. ඒ මාගේ අසත් පුරුෂ දරුවන් බලා ත් මේ සැරවිට දණ්ඩ ම යහපත. කුමක් නිසා ද යත්—අතින්ව ආ ගෙරි සරක් වුව ත් කන්ට ආ බල්ලන් වුව ත් රදවා ලයි. අඳුරු තැන දී පෙරාතු වෙයි. ගැඹුරු දියෙහි යන කල පිටිවහල් වෙයි. යන කල පැකිළ ගිය ත් එවා ලා සිට පිය හැක්ක' යන ගාථා සිතා ලා 'බමුණානෙනි එ සේ වී නම්—

"යෙහි ජාතෙහි නන්දිස්සං - යෙසඤ්ච භවමිච්ඡියං,
තෙ මං දරෙහි සම්මුච්ඡා - සාව වාරෙන්ති සූ කරං.

අසන්තා කිර මං ජම්මා – තාත, තාතාති භාසරෙ,
රක්ඛසා පුත්තරූපෙන - තෙ ජහන්ති වයොගතං,

---

1. දෛව - දයිව

Non-Commercial Distribution

දණ්ඩොව කිර මෙ සෙය්‍යො-යෙ මෙ පුත්තා අනස්සවා,
චණ්ඩම්පි ගොණං වාරෙති – අථො චණ්ඩම්පි කුක්කුරං,

අන්ධකාරෙ පුරෙ හොති – ගම්භීරෙ ගාධමෙධති,
දණ්ඩස්ස චානුභාවෙන – ඛලිත්වා පතිතිට්ඨති.''

යන මේ ගාථා ඉගෙන ගෙණ බොහෝ දෙනා රැස් වූ තැන දී පුතුන් මධ්‍ය කොට ගෙණ කියා ලව'යි වදාළ සේක.

බමුණානෝ ද බුදුන්ගෙන් ඒ ගාථා ඉගෙන ගෙණ බමුණන් රැස් වන දවසෙක සව් බරණින් සැදී පුතුන් සතර දෙනා ත් අවුත් සභා මද්ධ්‍යයෙහි බ්‍රාහ්මණවරුන් පිරිවරා ගෙණ හුන් කලට මාලු බමුණු සිරක්නෝ ද 'මේ ගාථා කිව මනා කලැ'යි සභා මද්ධ්‍යයට වැද ලා අත උඩට ඔසවා ගෙණ 'පින්වත්නි, මම ගාථා බුදක් කියනු කැමැත්තෙමි. ඇසුව මැනැවැ'යි කියා ලා 'කියව, කියව, බමුණානෙනි, අසම්හ'යි කී කල්හි සිටි හැම දෙන හට අස්වා කියා ලූ ය.

එ සමයෙහි ද වැළි ත් යම් දරු කෙණෙක් දෙ මවු පියන්ගෙන් ප්‍රයෝජන විඳ පුතුන් සමත්ව දෙ මවු පියන් නො රකිත් නම් උන් මැරි ය යුතු ය යි මිනිසුන්ගේ පනතෙක. එ හෙයින් බමුණු සිරක්නන්ගේ පුත්තු ගාථාවල අර්ථ දනුණු හෙයින් විචාරා තමන් නියම වුව ත් නපුරැ'යි පියාණන් වැද ගෙණ වඩා වර්ධන ය කළා සේ ම මේ මරණිනු ත් ගළවා පිය මැනැවැ'යි කීහ. දරුවන්ගේ තද කම කෙ සේ වුව ත් දෙ මවු පියන් මොළොක් හෙයින් හැම දෙනාගෙන් ගහටයක් වැද යෙතී සිතා මම නිකම් කියාපීමි. අපගේ දරුවන්ට ගහට නො කළ මැනව. ඌ අප රකිතී' කීහ. මිනිස්සු ත් උන්ගේ පුතුන් සතර දෙනාට 'තුලුන් තෙල ලෙස පෙරළා කියමින් සිටිය දී කුමක් කට හැකි ද? අදට ගියේ ම ය. මෙ වක් පටන් මිය යන තෙක් යහපත් ව රකුව. එ ලෙස නො කළා නම් මරම්හ'යි කිවු ය.

උයි ත් බා ගොසින් පියාණන් පුටුවෙක හිඳුවා ගෙණ තුමූ ම ඔසවා ගෙණ ගෙට ගෙණ ගොසින් ඇඟ තෙල් මැඩ පියා ඇඟ උලා නාවා පියා බැමිණිවරුන් කැඳවා ලා 'අද පටන් අපගේ පියාණන් වහන්සේට කළ මනා දෙයෙහි අප කිව නො කිව පමා නො වව, පමා වූ නම් මරම්හ'යි කියා ලා මධුර ආහාරයක් අනුභව කැර වූහ. බමුණානෝ ද සුවසේ කන්ට බොන්ට ඇති හෙයින් දවස් ගණනෙකින් ම ශරීර බල ත් ඇති ව ඇඟ මූණ පැය ත් ඇති ව

Non-Commercial Distribution

අනික් අත් බැවක් සේ තමන්ගේ සැටිය දක 'මේ සියලු එාසු ම මහණ ගොයුම්හු නිසා වී ය'යි පඩුරට එක පිළී සහළක් හැර ගෙණ බුදුන් ළඟට ගොසින් සිට නො වැඳ ම සාද සාමීචි කොට ලා එකත් පස් ව හිඳ ඒ පිළී සහළ බුදුන් පා මුල තබා ලා 'භවත් ගෞතම යෙනි, අපි බ්‍රාහ්මණ වරුම්හ. භවත් ගෞතමයන් අපට ගුරු ව සිටි හෙයින් ගුරු පූජාවක් කරණු කැමත්තම්හ. තෙල පිළී සහළ පිළි ගත යහපතැ'යි කිවු ය. බුදුහු ත් උන්ගේ ප්‍රසාද ය වඩනා නිසා පිළි පිළිගෙණ ලා බණ වදළ සේක. බණ වදරා අන්තයෙහි බමුණානෝ සරණ සීලයෙහි පිහිටා 'භවත් ගෞතමයෙනි, ම පුතුන් සතර දෙනා ගෙන් මට නිරන්තර ව දෙන සතර බතෙක් ඇත. ඉන් දෙ බතෙක් මට ඇත. දෙ බතෙක් ඔබට දෙමි' කිවු ය. බුදුහු ත් 'යහපත, බමුණානෙනි, අභිප්‍රාය තැනකට එන්නමෝ වේ දෑ'යි වදරා ලා බමුණානන් යවා වදළ සේක.

බමුණානෝ ගෙට ගොසින් පුතුන් බණවා ලා 'මහණ ගොයුම්හු මාගේ යාළණුවෝ ය. තොප සතර දෙනා දෙන බත් සත රින් බත් දෙකක් උන්ට දිනිමි. තෙපි ත් තොපගේ ගෙවලට ආ කල පමා නො වව'යි කිවු ය. උයි ත් යහපතැ යි ගිවිස්සහ. බුදුහු ත් දෙ වන දවස් සිහා වඩනා සේක් වැඩි මාලු පුතණුවන්ගේ ගෙට සිහා වැඩි සේක. උයි ත් බුදුන් දක පාත්‍ර ය හැර ගෙන මධුරාහාරය දුන්හ. බුදුහු දෙ වන දවස් අනික් තැනැත්තන් ගේ ගෙට ය, තුන් වන දවස් අනික් තැනැත්තන් ගේ ගෙට යැ යි පිළිවෙළින් සතර දෙනා ගේ ගෙවලට ම වැඩි සේක. හැම දෙන සරියේ ම සත්කාර කළහ. එක් දවසක් වැඩි මාලු පුතණුවෝ මඟුලක් එළඹ සිටි කල්හි 'පියාණන් වහන්ස, මේ මඟුලෙහි කවුරුන්ට දන් දෙමෝ දෑ'යි විචාරා 'අනික් නිස්සෝ කවුරු ද? මහණ ගොයුම්හු අපට යාළු ව සිටිති. උන්ට දෙව' යි කී කල්හි 'එ සේ වී නම් සෙට දවසට පත් සියක් දෙනා වහන්සේ හා සමඟ පවරා ලු ව මැනැවැ'යි කිවු ය. බමුණානෝ ත් එ ලෙස ම ආරාධනා කළහ. බුදුහු දෙ වන දවස් සහපිරිවරින් උන්ගේ ගෙට වැඩි සේක. වැඩි මාලු පුතණුවෝ ද ගෙයි ගොම පිරිබඩ ගන්වා මඟුල් සැරහීමෙන් සරහවා ලා ඒ ගෙයි බුදු පාමොක් සඞ්ඝ යා වහන්සේ වඩා හිඳුවා පැන් නුමුසු කිරි බත් හා සමඟ මධුරා හාර ය වැළඳවූහ. කැඳ වළඳා ලා බත් වළඳන්නාට අතුරෙහි බමුණානන්ගේ පුත්තු සතර දෙන ම බුදුන් ළඟ හිඳ 'භවත් ගෞතමයෙනි, අපි අපගේ පියාණන් වහන්සේ යහපත් කොට ම රකුම්හ. ඊ පමාවෙක් නැත. ආදි ත් සැටි ය දක වදළ, දූන් සැටිය ත් බලා වදළ යහපතැ'යි කිවු ය.

Non-Commercial Distribution

බුදුහු ත් යහපතැ'යි වදරා ලා 'හෙම්බා, දෙ මවුපියන්ට උපස්ථාන කිරීම පෙර නුවණැත්තෝ ත් කොළෝ ම වෙ දැ'යි තමන් වහන්සේ ඇත් අවධියේ කළ උපස්ථාන වදරන සේක් 'තස්ස නාගස්ස විප්ප වාසෙන විරූළ්හා සල්ල කීච කුටජා ච' යනාදීන් එකාදශ නිපාතයෙහි මාතුපොසක ජාතක ය විස්තර කොට වදරන බුදුහු කසී රජ්ජුරුවන් හස්ත්‍යාචාරීවරුන් යවා ලා නා වනයෙන් ගෙන් වූ ගිලී බස්නා මද ඇති එ හෙයි න් ම නවතා ලිය නො හැකි ධනපාල නම් ඇත්, ඇත් හලට ගෙණ ගොසින් පට කඩ තිරයක් ඇද සුවඳ පිරිබඩ ත් ගෙණ ලා පට කඩ වියනු ත් ඇති පවිත්‍ර තැනෙක සිටුවා ලා රජ දරුවන්ගේ අනුභවයට ම නිසි බත ගෙණ ගොසින් තබා ලූ කල ත් තමා සිටිනා වෙනෙන් තමා බැඳගෙණ ආ හෙයින් නා වන ය සලකුණු කොට ඒ තරම් බත ත් අනුභව නො කොට තමාගේ මෑණියන් දැ වනයෙහි හෙයිනු ත් මෑණියන්ට කරණ උපස්ථාන බාධා හෙයිනු ත් නා වනයට ගියොත් මුත් ඒ කුශල ය නො පිරෙන හෙයිනු ත් බත් පැනට ත් වඩා මාතුපට්ඨාන කුසලයෙන් පිරිහුණු නියාව ම සිතී ය යි බුදුහු තමන් වහන්සේගේ මේ පූර්ව චරිත ය වදර ත් හැම දෙන ම ඇසින් කඳුළු ගනිමින් මොළොක් අදහස් ඇති ව කන් යොමු කළහ. ඉක්බිත්තෙන් බුදුහු චතුස්සත්‍ය ය ප්‍රකාශ කළ සේක. දෙශනා කෙළවර පුතුන් සතර'දෙනා හා ත්, යේළණියන් සතර දෙනා හා ත් සමඟ බමුණා නෝ සෝවාන් වූහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් මෙ පමණක් වුව ත් සිත තබා මවු පියන්ට උපස්ථාන කිරීමෙහි නො පමා ව එයින් ජනිත කුශලානුභාවයෙන් භව සැප ත් වළඳා නිවන් අත් කට යුතු.

## 246. පසේනදි කොසොල් රජ්ජුරුවන් ගේ වස්තුව

තව ද භොජනයෙහි පමණ දන්මෙහි යහපත දක්වන්ට පසේනදි කොසොල් රජ්ජුරුවන් ගේ වස්තුව කියමු.

කෙ සේ ද යත්—

එක් සමයෙක කොසොල් රජ්ජුරුවෝ මගධ නැළියෙන් සාල් සොළොස් නැළියෙක බත් ඊට සෑහෙන තරම් මාළුවෙන් කති. එක් දවසක් ඌ තුමූ බත් කා ලා භුක්තාලස්‍යය ත් යවා නො පියා ම බුදුන් ලඟට ගොසින් පමණක් නැති ව කා පී බත් හෙයින් බඩ ත් බර වන්නා ඇත මැත නැමී නැමී හිදිති, නිදා ත් හෙති.

Non-Commercial Distribution

බුදුහු ඒ දැක 'කුමක් ද, මහ රජ මදක් සැත පී නො ගෙණ අවුදැ'යි විචාරා 'එ සේ ය, ස්වාමීනි'යි කී කල්හි 'මහ රජ, පමණ නො දැන බොහෝ කොට කෑම නිසා තෙල ලෙස වන්නේ වේ දැ' යි වදරා පමණ දැන බත් කනු නිසා බණ වදරණ සේක් 'යම් කෙණෙක් බොහෝ කොට කෑම නිසා අභ්‍යාස හෙයින් ඒ කෑමට මුත් සෙස්සකට නිසි නො ව හැම වේලේ ම නිදත් ද, නිදන විට ත් බඩ බර හෙයින් සැලී පෙරළී හිදිත් ද, ඌ තුමූ වඩන හුරකු කුඩු ආදි ය කා මහත් ව ගොසින් ඇත මෑත යා නො දී හුස් ම සුස්මා ගොරව ගොරවා ඇවිදුත් මුත් ති ලකුණු පමණකු ත් මෙනෙහි නො කෙරෙති. ඒ මෙනෙහි නො කිරීමෙන් බඩ වඩා ගන්නා සේ ම සසර දුකු ත් වඩනේ ය'යි වදළ සේක.

ඒ බණ අසා රජ්ජුරුවෝ භුක්තානුභව ය පිරිහෙළන ලෙස බුදුන්ගෙන් උගත් උත්තර මාණවකයන් ගෙන් දැන දවස ආලොපයක් බැගින් පිරිහෙළන්නෝ නැළියක බත් පමණ වූ කල්හි ලඝු වූ ශරීර ඇති ව බුදුන් කෙරෙහි ගෞරවයෙන් බර වූ සිත් ඇති ව සතියක් මුළුල්ලෙහි මහ දන් දුන්හ. ඒ දන් බලන්ට රැස් වූ බොහෝ දෙන ත් ලොව් ලොවුතුරා සැප ත් සිද්ධ කළහ.

එ හෙයින් සත් පුරුෂයන් විසින් කුක්ෂි පොෂණ ය ජීවත් වීම විතරකට එක් තරමෙක කොට සුචරිතයේ පොෂණ ය ම බලවත් කොට ස්වර්ගමොක්‍ෂ පොෂණ ය කටයුතු.

---

## 247. සානු සාමණේර වත

තව ද වත් පිළිවෙත් සරු වීමෙහි අනුසස් දක්වන්ට සානු සාමණේර වත කියමු.

කෙ සේ ද යත්—

ඒ සානු සාමණේරයන් දෑ ද සැවැත් නුවර එක් කුල දුවණි කෙණෙක් මුන්දෑ බාල කල ම මහණ කරවා ලූ ය. මහණ වූ වක් පටන් ශික්‍ෂා ගෞරවය ත් ඇති දෑ ය. වත් පිළිවෙත් සරු දෑ ය. මසකට අට දවසක් උදැසන ම නැඟී සිට පැන් පරහා ගෙණවු ත් පැන් මළුවේ තබා ලා මළු මං පෙත් හැම ද පියා සවස පානු ත් දල්වා ලා මියුරු වූ කට හඩින් බණට හඩ ගානා දෑ ය. වහන්දෑ ද අවුත් උන්දෑ බණ කියන්ට බල ඇති නියාව දැන 'බණ කියව, මෙහෙණිනි' උන්දෑට ම ආරාධනා කරණ සේක. උන්දෑ ත් බණ අස්නට පැන නැඟී ලා හිමවු පියසින් ආකාශ ගඞ්ගාව එ තැනට කරන්නා සේ දහම් වතුරු හඩවා බණ කියා නිමවන විට 'මේ බණෙහි

Non-Commercial Distribution

පින් මාගේ දෙ මවු පියන්ට දෙමී' කියන දෑ ය. උන් දෑ ගේ මිනිස් දෙ මවු පියෝ පින් දුන් නියාව නො දනිති. දෙ වන ජාතියේ මවු කෙණෙක් යකිනී ව උපන. ඔයි ත් දෙවියන් හා සමඟ අවුත් බණ අසා පියා හෙරණුන් දෑ දුන් පින් තමනු ත් මෑණි කෙණකුන් හෙයින් 'පුතණ්ඩ, අනුමෝ වීමි' කියති.

සිල්වතුන්ට නම් දෙවි මිනිස්සු ඉතා පැහැද හිඳිති. ඒ හෙරණුන්දෑ කෙරෙහි මිනිසුන් තබා දෙවියෝ ත් ආදර ඇති ව මහබඹාණ කෙණකුන් මෙන් ද ගිනි කඳක් මෙන් ද සිතති. හෙරණුන්දෑ කෙරෙහි ගෞරවයෙන් ඒ යකින්නෑණියනු ත් උසස් කොට දකිති. දෙවතා සමාගම ආදියෙහි දී ත් යකින්නෑණියන්ට සානු මාතාවෝ ය යි කියා ලා හිඳිනා ආසන ත් යහපත් දෙයක් ම දෙති. අග්‍රෝදක ය හා අග්‍රපිණ්ඩය ත් දෙති. මහෙශාඛ්‍ය දෙවියෝ ත් උන් දුටු කල අවසර පෑ ලා මඟින් තුමූ ඉවත් වෙති. දුටු කල හුනස්නෙන් නැඟෙති.

ඒ හෙරණුන්දෑ වැඩී වර්ධන ව සස්නේ උකටලී ව උපන් උකටලි ය හැර ගත නො හී හිස කේ හා නිය ත් දික් ව සිවුරු ත් කොළ ව ගොසින් යන නියාව කිසි කෙණකුන්ට ත් නො කියා පා සිවුරු හැර ගෙණ ලමන්දූ උපාසිකාවන් ගෙට ගියදෑ ය. උපාසිකාවෝ ද පුතණුවන්දෑ දක වැඳ ලා 'පුතණ්ඩ මුඹ පෙර එන කල ඇදුරු වත් තෙරුන් වහන්සේ ලා කැටි ව හෝ හෙරණ වහන්දෑ ලා කැටි ව හෝ එන සේක. තනි ව ඊ ම යහපත් නො ව ත් එක නමක් වුව ත් කැඳවා නො ගෙණ බැලුවන්ව ත් නො රිසි යෙන තරමේ නැඟී ආයේ හැයි දෑ'යි කිවු ය. තමන් දෑ සස්නේ උකටලී නියාව කී දෑ ය. සැදෑ ඇති ලමන්දූ උපාසිකාවෝ නො එක් ලෙසින් ගිහි ගෙවල අවුල් වියවුල් කියා ත් පුතණුවන්දෑ ගිවිස්වා ගත නො හී තමන්දෑ ම සිතා ලා රඳා පියන දෑ වී නමුත් ය යි 'එ සේ වී නම් රඳා හුන මැනව. කැඳ ත් බතු ත් වළඳවා ලා පිළි ගෙනවු ත් දී ලමී' කියා ලා හස්නක් පනවා දී ලූ ය. හෙරණුන්දෑ හුන් දෑ ය. උපාසිකාවෝ හැසිල්ලෙකින් කැඳ අවුළු පත් ඉදි කොට දුන්හ. කැඳ අවුළු පත් වැළඳූ කලට බත් ඉදි කරණු නිසා නුදුරු තැනෙක හිඳ සාල් දෙවුන් ගනිති.

ඒ වේලාට යකිනී ද හෙරණුන් දෑ කොයි දෝ, බත් ලබන සේක් දෝ හෝ යි විමසන්නාහු සිවුරු හරනට හුන් නියාව දක මුන් වහන්සේ සිවුරු හළ සේක් නම් ලජ්ජාවෙන් දෙවියන් මූණ

Non-Commercial Distribution

බලන්ට මට ත් බැරි ය. ප්‍රසිද්ධ ව මුන් වහන්සේ වසහ ත් නියාවට මුන් වහන්සේ තකන්නෝ ත් නැත. නිකම් නිස්සාර කට යුත්තක් නිසා සීලාදි ගුණ සාරයෙනු ත් පිරිහෙන සේක. 'සිවුරු හරිමි' සිතන සිතිවිල්ලට බාධා කෙරෙමි'' අවුත් ඇඟ ආවිෂ්ට ව ලානො මියන ලෙසට කර අඹරා මූණ පිටි කර දසාවට තබා ලා බිම හෙළා ලුව. කටින් කෙළ දරා වැගිරෙයි. සාල් ගරමින් හුන් උපාසිකාවෝ පුතණුවන්දැට වූ ගහට ය දැක වහා අවුත් ආප දව සලකා පුතණුවන්දෑ ඔර වතුරුවා ගෙණ වැද හුන්හ. ගම මුළුල්ලේ ඇත්තෝ අවුත් බොහෝ ප්‍රතිකාර කළහ. උපාසිකාවෝ ද ''යම් කෙණෙක් මසක් මසක් පතා තුදුස් වක මධ්‍ය කරන්ට තෙළෙස් වක තුදුස් වක පසළොස් වක ත් පසළොස් වක මධ්‍ය කරන්ට තුදුස් වක පසළොස් වක පැළවිය ත් අට වක මධ්‍ය කරන්ට සත වක අට වක නව වක ත් පේ වෙත් ද සෙසු ත් පින් කම පිළිවන් ලෙසක යෙදී වෙසෙත් ද, උන් හා යකුන් නො කෙළෙති' රහතන් ගෙන් අසම්හ. ඒ කෙ සේ වදළ ත් සානු සාමණේරයන් දෑ ලා යකුන් කෙළන නියාව දුටුම්හ'' යි හඟවන්ට—

වාතුද්දසිං පඤ්චදසිං – යාව පක්ඛස්ස අට්ඨමී,
පාටිහාරියපක්ඛං ච – අට්ඨඞ්ගසුසමාගතං.

උපොසථං උපවසන්ති – බ්‍රහ්මචරියං චරන්ති යෙ,
න තෙහි යක්ඛා කීළන්ති – ඉති මෙ අරහතං සුතං,
සා දනි අජ්ජ පස්සාමි – යක්ඛා කීළන්ති සානුනා.

යන මේ ගාථාව කීහ. යකින්නැණියෝ ඒ අසා 'පින් කම හැසිර හිඳිනවුන් හා යකුන් නො කෙළෙතී වේ ද, තොප රහතන් ගෙන් ඇසූයේ. තොප හා කෙළින කෙණෙක් ඇත් නම් වේ ද රහතන්ගේ බස් නො සරි. ශාසනයෙන් පිරිහී පාපයෙහි හැසි රෙන්ට නිල වුවන් හා කෙළියෙන් කිම් ද? අපි සානුන් හා කෙළම්හ. ශාසනයෙන් නො පිරිහුණුවූ නම් අරුම්හ. පිරිහුණුවූ නම් අහසින් යත ත් අප ගෙන් මිදීමෙක් නැත්තේ වේ ද' යනු හඟවා–

''යං චෙච පාපකං කම්මං – කරිස්සති කරොති වා,
න තෙ දුක්ඛා පමොක්ඛන්ති – ආකාසා 'පි පලායතො' යි.

යකින්න කියා ලා ඒ යකිනී හෙරණුන් දෑ ඇඟින් පහ වුව. හෙරණුන්දෑ ත් ඇස දල්වා බලා පියා ලමන්දුන් හඬන නියාව ද, ගම මුළුල්ලේ ඇත්තවුන් රැස් වූ නියාව ද දැන තමන්දැව යක් විකාර ඇතිවූ බව නො දැන 'මම ආදි පුටුවක් පිට හුන්නෙමි. ලමන්

Non-Commercial Distribution

දූත් තුදුරු තැනෙක සාල් ගර ගරා හුන්න. දැන් මම බිම වැටී පියා හොත්තෙමි. මේ කිම දෝ හෝ' යි.

"මතං වා අම්ම රොදන්ති-යො වා ජීවං න දිස්සති,
ජීවන්තං අම්ම පස්සන්ති-කස්මා ත්වං අම්ම රොදසි."

යනු හෙයින් 'මළ කෙණකුන්ට හෝ හඬති. ජීවත් වුව ත් නො දැක හෝ හඬති. මා මළ ත් නැත. නො දක්නා ලෙසට දුර ගිය ත් නැත. හඬන්නේ හැයි දැ' යි විචාළ දැ ය. ලමන්දූ ත් සම්පත් හැර මහණ වූවන් පෙරළා සිවුරු හැරීමෙහි නපුර දක්වනු නිසා-

"මතං වා පුත්ත රොදන්ති – යො වා ජීවං න දිස්සති,
යො ච කාමෙ චජිත්වාන – පුනරාවත්තතෙ ඉධ;
තං වා පි පුත්ත රොදන්ති – පුන ජීවං මතො හි සො"

'මළවුන් ගියවුන්ට ත් හඬති. සැප ත් හැර මහණ ව මඳානු භවයක් මෙන් යම් කෙණෙක් සිවුරු හරිත් නම් නො මළේ ත් කිම ද? ශාසනයෙන් මළ හෙයින් මළා හා ම සරි බැවින් ඊට ත් හඬති' කියා ලා ගිහි ගෙය නම් ගිනි අඟුරු වැනි නියා ත් නරක වැනි නියා ත් ශාසන ය නම් නො එක් ලෙසින් නිරුපද්‍රව තැන් නියා ත් කියන්නෝ—

"කුක්කුළා උබ්භතො තාත – කුක්කුළං පතිතුම්චඡසි,
නරකා උබ්බතො තාත – නරකං පතිතුම්චඡසි"

යනු කියා ලා 'පුතණ්ඩ, මුඹට වැඩෙක් වේව යි ගිනි ගත් ගෙය කින් වුව මනා දෙයක් පෙරාතු කොට පිට ත් කරන්නා සේ බුදු-සස්නෙහි මහණ කරවා ලූම්හ. පිට ත් කළ ගමනේ පෙරළා ගිනි ගත් ගෙට ම යන්නා සේ එක් කෙණකුන් ගෙන් පැරැත්තයක් නැති ව මුඹ ම සිවුරු හරින්ට සැලෙන කල කරන්නේ කිම දැ' යි හඟවා—

"අභිධාවථ භද්දන්තෙ-කස්ස උජ්ඣාපයාමසෙ,
ආදිත්තා නීහටං භණ්ඩං පුනඩය්හතුම්චඡසි"

යනු කිවු ය. උන්දැ ද ලමන්දූන් කියන අවවාද අසා කාරණ සලකා පියා 'මට ගිහි වීමෙන් කම් නැතැ' යි කී දැ ය.

මැණියන්දැ ත් සතුටු ව ගොසින් ප්‍රණීතාහාර ය වළඳවා ලා 'පුතණ්ඩ, කී හැවිරිදි දැ' යි විචාරා 'විසි හැවිරිද්දෙමි' කී කල්හි

Non-Commercial Distribution

තමන් ශාසන සරූප දන්නා හෙයින් ඒ අඩු කලට මාලු පැවිද්ද බැරි හෙයින් තුන් සිවුරු පාත්‍ර සපයා දුන්හ. උන්දෑ ත් පාත්‍ර සිවුරු සපයා ගෙණ ගොසින් මාලු පැවිදි වූ සේක. මාලු පැවිදි වූ බවට අවවාද කරණ බුදුහු "මේ සිත නම් පෙර හික්මවීම නැති අවස්ථාවෙහි රූපාදි වූ අරමුණෙහි ඇලීම සැටීම ආදි විසින් යම් ලෙසක කැමැත්තො ත් එ ලෙස හැසිරීමෙන් බොහෝ කලක් පැවත පී ය.

'එ සේ වූ සිත දැන් ඇතරුවකු හකුස්සෙකින් මද නැඟි ඇතකු රඳවන්නාක් මෙන් භාවනා බලයෙන් නිගනිමි. මෙ තෙක් කල් සේ වියනො දෙමි' උත්සාහ කළ මනා වේ දැ' යි වදාළ සේක. දෙශනා කෙළවර සානු නම් භික්ෂූන් වහන්සේ රහත් වූ සේක. රැස් වූ බොහෝ දෙන ත් නිවන් දුටහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් දවස දවස පන් සිල් පොහොය අට සිල් වියයී ඇත දස සිලු ත් ගිහි ව සිට රැක ශාසනික වුව හොත් ශාසනික වූ තැන් පටන් අනුශිලී ව ශීල සංරක්ෂණ ය කරත් මුත් සස්නෙහි උකටලී වී මෙන් ලසුනු ය නො හඟවා ත්‍රි විධ ශික්ෂාවෙහි හැසිරිය යුතු.

## 248. බද්දෙරක නම් ඇතු ගේ වත

තව ද සෙවිතබබ මානයෙහි යහපත දක්වන්ට බද්දෙරක නාම් ඇතු ගේ වත දක්වමු.

කෙ සේ ද යත්—

ඒ ඇතා ලදරූ අවස්ථාවෙහ මහ බල ඇති ව පසු ව දුර්වල ව ගොසින් එක් මහත් විලකට බැස ලා කළල් මඩෙහි එරී ගොසින් ගොඩ නැංග නො හී සිටියේ ය. බොහෝ දෙන ත් ඔහු දැක 'මේ තරම ශක්ති ඇති ඇතා පවා දැන් දුර්වල වී ය' යි කථා ඉපැදවූ හ. රජ්ජුරුවෝ එ පවත අසා ඇතරුවා බණවා ලා ඇතු ගොඩ නඟන්ට විධාන කළහ. උයි ත් ගොසින් එ තැන දෙ පෙළ පිරිස් බෙද ලවා ලා සටන් ලෙසට සටන් බෙරයකු ත් ගැස්වූ හ. අභිමාන පර ඇතා උත්සාහවත් ව වෙගයක් ලා ලා ගොඩ නැඟී ලා සිට පී ය. වහන්දෑ ත් ඒ දැක බුදුන්ට දැන් වූ සේක. බුදුහු ඒ අසා 'මහ ණෙනි, ඒ ඇත් තමා තරුණ අවස්ථාවෙහි කවර ත් යුද්ධයකට පසු නො බස්නා හෙයින් අසෙවිත වූ අභිමානයක් ඇති ව අභිමාන බලයෙන් පියවි මඩින් ගොඩ නැංග.

Non-Commercial Distribution

තෙපි හැම දෙන බොහෝ තැන් කෙලෙසුන් කෙරෙන් දුරු ව වසන කලට 'අප එ සේ නො වන්ට කාරණ කිම ද'යි සෙවිතබ්බ වූ මාන ම උපදවා ගෙණ කෙලෙස් මහ මඩින් නැඟෙව'යි වදාරන සේක්- 'හැම දවස් ම සිහි නුවණ ඇති ව විසීමෙන් නො පමා ව පවකට නැමී යා නො දී සිය සිත රකිනාහු යම් සේ ඒ මඩෙහි ගැලුණු ඇත් තෙමේ උත්සාහයෙන් මඩෙන් නැඟී ගොඩ සිටී ද, තෙපි ත් එ පරිද්දෙන් කෙලෙස් මහ මඩින් විපස්සනා බල ඇති ව නිවන් ගොඩට පැන නැඟෙව'යි වදාළ සේක. දෙශනා කෙළවර ඒ වහන්දෑ රහත් වූ සේක.

එ හෙයින් නුවණැත්තවුන් විසින් පින් කරන්නවුන් බලා වඩ වඩා පින් කිරීමෙහි කරණ අභිමාන ය නම් සෙවිතබ්බ මාන යක් බැවින් එ සේ වූ මාන ය මානයට[1] නො ගෙණ සොත්සාහී ව පින් කම හැසිර හැම මත් ම රහත් මඟින් නසන්ට උත්සාහ කටයුතු.

## 249. පන්සියක් දෙනා වහන්සේ ගේ වස්තුව

තව ද නුවණ නැති පාපී පුද්ගලයන් හා එක් ව විසීම බලා ත් තනි ව විසීම යහපත් නියා ව හඟවන්ට ඒ ඒ දීගින් වැඩි පන්සියක් දෙනා වහන්සේ ගේ වස්තුව කියමු.

කෙ සේ ද යත්—

මෙහි විස්තර කථා ව යමක වග ආ ය. එ හෙයින් මේ වස්තු වෙයි විස්තරය ත් ඉන් ම දත යුතු.

අනඳ මහ තෙරුන් වහන්සේ පිටු බල කොට ගෙණ පාරිලෙය්‍ය වනයට ගිය පන්සියක් දෙනා වහන්සේ බුදුන් වල්හි වැඩ හුන්නා දක දුක් වුන්නා'යි සිතා 'ස්වාමීනි, මුඹ වහන්සේ බුදු සිවුමැලි වුව, රජ සිවුමැලි වුව, මේ වල වැඩ හුන්නේ කෙ සේ ද? වත් පිළිවෙත් පමණකු ත් නො ලත්හ යි සිතුමහ'යි කී සේක. බුදුහු ඒ අසා 'මහණෙනි, තොප හැම අවුත් වත් පිළිවෙත් නො කළ ත් පාරිලෙය්‍ය ඇතාණෝ මට කළ මනා වත් පිළිවෙත් කොළෝ ය. මෙ බඳු සහායක් ලදෙ ත් ඒ එක් ව හිඳීම යහපත. එ ලෙස නැත් නම් කග විසූණු හඟක් සේ තනි ව විසීම යහපතැ'යි වදරන සේක්- ඉදින් ගඞගොදක ය හා යමුනොදක ය සේ සම අදහස් ඇති

1 මානසට—මනසට

Non-Commercial Distribution

කල්‍යාණ මිත්‍ර කෙණකුන් ලදෙ ත් සිංහ ව්‍යාඝ්‍රාදි ප්‍රකටොපද්‍රව ත් රාග ද්වෙෂාදි අප්‍රකටොපද්‍රව ත් හැර සිහිමත් ව නුවණින් යෙදී සතුටු ව වසන්නේ ය. ඉදින් කැටු ව වැස පියන්ට නිසි එ බඳු සම වායක් නො ලදෙ ත් කළ මනා කවරේ ද යත්—

'මහත් වූ රජ සැප ත් හැර වලට පලා ගොසින් තපස් කරණ රජ්ජුරු කෙණකුන් මෙන් උදකලා ව ම වලට පලා ගොසින් යම් සේ තෙල පාරිලෙයය ඇත් රජ 'ඇත් මුළ හා එක් ව විසීමෙන් හැම දෙනා අගින් අගින් ගසා කා පූ තණ මුල් පමණක් තණින් ලැබෙමි. දලු කොළ තෙලා කා පූ නටු මුල් පමණක් කොළින් ලැබෙමි. හැම දෙනා බැස පැන් පූ කලට බී පියන්ට බොර පැන් ලැබෙමි. නා පියන්ට ය'යි බට කලට කුණු පලවා ඉලිම් නැත ත් මා මධ්‍ය කොට ලා දෙ ඇලයෙන් ගාවා ගෙණ යෙති' ඇත් මුළැ කළකිරී භික්ෂූන්ගේ විවාද සන්හිඳුවා ගත නො හී තනි ව ම මා නැඟී ආවා සේ අවුත් තනිව ම වෙසේ ද, එ මෙන් හුදකලාව ම වසන්නේ ය. යම් කෙණෙක් හුදකලා ව වසන්ට නිසි තරම් ඇත්තෝ වූ නම් මහණ වූ තැන් පටන් හුදකලා ව ම විසීම යහපත. දික් සඟියෙහි සිල් කඳු වග ආවා වූ ත්‍රිවිධ ශීල ය, අල්පෙච්ඡ කථා ආදි වූ දශ කථා වස්තු ය, ත්‍රයොදශ ධූතාඞ්ග ය, විවසුන් නුවණ ය, චතුර්විධ වූ ආය්‍ය්‍ර මාර්‍ග ය, චතුර්විධ වූ ශ්‍රාමාණ්‍ය ඵල ය, ත්‍රි විද්‍යාවෝ ය, ෂඩභිඥාවෝ ය, අමා මහ නිවන'යි මේ හැම කෙ තෙක් කල් එක් ව වස ත් බාලයන්ගෙන් ලද නො හැකි හෙයින් බාලයන්ගේ සහා ය කමෙක් නැත.

එ හෙයින් උන් හා එක් ව විසීම් තරමට තනි ව විසීම යහපත පව්වුන් හා එක් ව විසීමෙන් පව්වු අදහස් ඇති වන මුත් සත් පුරුෂයෝ තුමූ තනි ව ම හිඳිති. එ සේ හිඳිනාහු නිවන් පතා හෙයින් පවු ත් නො කෙරෙති. යම් සේ මේ ඇතා කිසි විටෙක ත් ඇතුන් ලඟට ගියො ත් පීඩා හෙයින් උත්සාහ නැත්තෝ ද එ පරිද්දෙන් කාය ජීවිත නිරපෙක්ෂ ව සුචරිත පූරණයට නියම වූවාහු කිසිවෙක ත් උත්සාහ නො කොට තුන් සුසිරි පිරීමට ම උත්සාහ ඇත්තෝ ය. එ හෙයින් තෙපි ත් එ ලෙසට ම උත්සාහ කරව'යි වදළ සේක. දෙශනා කෙළවර පන්සියක් දෙනා වහන්සේ ම රහත් වූ සේක.

එ හෙයින් නුවණැත්තවුන් විසින් තනි ව හිඳිත ත් පාප මිත්‍ර සංසර්ගයෙන් දුරු ව කල්‍යාණ මිත්‍ර භජන ය කොට කුශලයෙහි හැසිර නිවන් අත් කට යුතු.

## 250. මාරයා ගේ වත

තව ද වසවත් මරහුගේ අදහසෙහි නපුර හඟවන්ට මාරයා ගේ වත කියමු.

Non-Commercial Distribution

කෙ සේ ද යත්—

බුදුන් සමයෙහි බුදුන්ගෙන් බණ අසා ත් රජදරුවෝ වස්තු ලොභයෙන් ජන පීඩාව බොහෝ කොට කෙරෙති. ඉක් බිත්තෙන් බුදුහු රජ දරුවන්ගෙන් ගහට වූන් බොහෝ මිනිසුන් දැක කරුණා අදහසින් නො මරා නො තළා දඩ මුඩු නො ගෙණ කවුරුනු ත් මුසුප්පු නො කරවා දැහැමින් රාජ්‍ය ය කරන්ට පිළිවන් දෝ හෝ'යි සිතූ සේක. වසවත් මරු ද බුදුන් සිතා වදළ සිතිවිල්ල දැන ලා 'මහණ ගොයුම් රාජ්‍ය ය කරවන්ට පිළිවන් දෝ හෝ යි සිතී ය. බුදු වුව ත් සිඟා කැවිලි දුක් හෙයින් රාජ්‍ය ය ත් කොට ලන්ට සිතාපී වන. රාජ්ජය කිරීමුත් පව් පිරෙන දෙයෙක. රාජ්ජය කෙරෙත් නම් මා වෙසෙයි. පවත්වන්ට අවසරය ත් ලැබෙමි. ගොසින් උත්සාහ වඩවමී' සිතා බුදුන් කරා ගොසින් 'ස්වාමීනි, රජ දරුවන්ගේ අධර්මිෂ්ඨ කම නිසා මිනිසුන් විදිනා ගහට මහත. බුද්ධ රාජ්‍ය ය තබා පියා ජන සඞ්ග්‍රහ නිසා දැහැමින් රජ කළ මැනව.

'බුදු වන්ට සිතා ගත්තෙන් සත්‍වොපකාර නිසා වේ ද, ඒ සත්‍වොපකාර ය කරණ දෙය කළ හෙයිනු ත් නො කළ දෙයට උපදෙස් තබා ලූ හෙයිනු ත් නිමියා හා ම සරි ය. මේ ජන පීඩාව ත් අවශ්‍යයෙන් හළ මනා බැවින් රජ පැමිණ මුත් හළ නො හැකි හෙයින් අවශ්‍යයෙන් ම රජ වුව මැනැවැ'යි බුදුන්ගේ අදහස් පුරා දත නො හී තමාගේ ගොඩිගල් කම හඟවා කී ය. බුදුහු 'මාර ය, කුමක් නිසා තෙල ලෙස කී ද'යි විචාළ සේක. 'ස්වාමීනි, මුඹ වහන්සේ හිමාල ය පර්වත ය වුව ත් රත්රන් වන්ට සිතා වදළ සේක් වී නම් රත්රන් වෙයි. ඉනුත් වස්තුවෙන් අඩු නැත. මම ත් අඩුවකට සිටියෙමි. ඒ නිසා කීමි' කියා බුදුහු ත් ඒ තැනින් තොරනා සේක් දඬු පත් එසවීම පමණෙකින් නො යන්නවුන් බස මහත් කොට බැණ නැඟී ලා තොරනා සේ—

''යො දුක්ඛ මද්දක්ඛි යතො නිදානං-
කාමෙසු සො ජන්තු කථං නමෙය්‍ය,
උපධිං විදිත්‍වා සඞ්ගාති ලොකෙ-
තස්සෙව ජන්තු විනයාය සික්ඛෙ''

යන මේ ගාථාව වදරා ලා භය ගන්වා ලා 'මාර ය, තාගේ අවවාද නම් විරුද්ධ වාදව ත් මුත් අවවාද නො වෙයි. මකුළුවන් කෑ කෑ දෙය හූ වන්නා සේ අවවාද වන්නේ මා කියා ලූ දෙය කැ'යි

Non-Commercial Distribution

වදරා ලා අවවාද වදරන සේක් ‘ගිහීන්ට වුව ත් කෘෂි වණික් ආදි යට යම් කෙණෙක් සහාය ව ඒ සාධා දී ලත් නම් පැවිදිවරුන්ට වුව ත් සිවුරු ගෙත්තම් ආදියට සහාය ව ඒ නිමවා දී ලත් නම් උඹ තුමූ මිත්‍ර ප්‍රතිරූපයකු නො වන හෙයින් යහපත් මිත්‍රයහ. ඒ මිත්‍රයන් නිසා සැපයක් මුත් දුකක් නො වන හෙයින් උඹ යහපත්හ. තව ද ගිහීන් වුව ත් නිරවද්‍ය ජීවිකා තිබිය දී ම උමං බිඳීම් ආදි විසින් පව් කම හැසිරෙත් ද, පැවිදි වුව ත් ධර්ම ජීවිකා තිබිය දී එක් විසි අන්වේෂණ වසයෙන් අධර්ම ජීවිකාවෙන් දවස් යවත් ද, ඒ මෙ ලොව සැප යැ යි සිතා ඇවිදින පමණක් මුත් පර ලොව බොහෝ දුක් හෙයින් ඒ ජීවිකාව දුක් ම ය. ගිහි වුව ත් කෘෂි වණික් ආදියෙන් හා පැවිදි වුව ත් භික්ෂාටනයෙන් ලැබ ගත් දෙයකින් මු ත් අධර්ම ලෙසකින් ජීවත් නො වෙත් නම් නැවත ශාසනිකයෝ චීවරාදි චතුර් විධ ප්‍රත්‍යයෙහි යථා ලාභාදි ද්වාදශ විධ ආයර්‍ය සන්තොෂයෙන් සන්තුෂ්ට වූ නම් සැප වූ සන්තොෂ නම් එ ම ය.

‘තව ද මියන්ට ආසන්න ව කළා වූ කුශල කර්මයෙක් ඇත් නම් ආසන්න කර්ම ව සිට ඉෂ්ට විපාක දයක හෙයින් එයි ත් සැප ය. ඒ හැමට ත් වඩා සියලු දුක් නසන්නා වූ අර්හත්ව ය සැප ය. ලෞකික් කුශලයෙන් දෙ මවු පියන්ට උපස්ථාන කිරීම ත් මෙ ලොව ත් පර ලොව ත් සැප හෙයින් යහපත් වූ කුශලයෙක. දෙ මවු පියෝ ද වැළි ත් තමන්ගේ දරුවන් නො ළෙන් ගතු නියාව ත් දත්තු නම් තමන් සන්තක දෙය නිධාන කොට සඟවා හෝ යෙති. අනුන්ට හෝ දෙවා පියති. දෙ මවු පියන්ව නො ළෙන් ගතු නියාවට මෙ ලොව නින්ද පරිභව ත් ලැබෙති. දෙ මවු පියන්ට නිහරසර ව පර ලොව අශුචි නරකයෙහි ත් උපදිති. යම් කෙණෙක් සකසා උපස්ථාන කොළෝ නම් දෙ මවු පියන් සතු වස්තුව ත් අපවත් නො කරවා ලැබෙති. මෙ ලොව ප්‍රශංසා ත් ලැබෙති. ඒ හැම නැත් නමුත් පර ලොව සුව සම්පත් ලැබෙති. එ හෙයින් දෙ මවු පියන්ට උපස්ථාන කිරීම ත් සැප කාරණ හෙයින් සැප ය. තව ද බුද්ධ ප්‍රත්‍යෙක බුද්ධාදී උත්තමයන් කෙරෙහි මනා ව පැවැත්ම ත් හෙවත් එ තැනට උපස්ථාන කිරීම ත් සුබ කාරණ හෙයින් සැප ය.

තව ද මුත්හර තිසර සඬබලා ආදි වූ ත් පා මුදු පාඩගම් කයි බැඳි ආදි වූ ත් ආභරණ හැම දවසට ම තරම් නො වෙයි. සඟ බාල යන් පළඳනා වූවා මාලු මිනිසුන්ට තරම් නො වෙයි. මාලු මිනිසුන් පළඳනා වූවා සඟ බාලයන්ට තරම් නො වෙයි. තුමූ මාලු ව සිට සඟ මිනිසුන් පළඳිනා ඈභරණ හැම දවසට ම පළඳිති. තුමූ

Non-Commercial Distribution

සඟ ව සිටි මාලු මිනිසුන් පළ දිනා දෙය පළ දිති. මුන් දෙ පක්‍ෂයට ම වියරු ඇති සැටි යැ යි බෙණෙති. පන් සිල් වුව ත් දශ සිල් වුව ත් කවර ත් අවස්‍ථාවකට යහපත. එ හෙයින් කොට ගත හෙතො ත් මියන තුරා ත් සිල් රක්‍ෂා කිරීම යහපත. තව ද ලොවී ලොවුතුරා සැදැ යම් කෙණකුන්ට ඇත් නම් කවර ත් කුශලය-කට මුල් ව සිටීනා ශ්‍රද්ධාව සැපයට ත් මුල් වන හෙයින් සැදැ ඇති වීම ත් යහපත. නුවණැත්තවුන්ට කුමකු ත් බැරි නො වන හෙයින් ලොවී ලොවුතුරා නුවණ ඇති වීම ත් සුබ කාරණ හෙයින් සැප ය. පව් නො කිරීම කොට ගත හෙන පිණක් නැත ත් වෙන ම පිණක් හෙයින් සැපයෙකැ'යි වදළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙවියෝ නිවන් දුටහ. මර දෙව් පුත් කළ පින් නැති හෙයින් ගොයම් නො කළ එකකු ලබන පැල් දෙර නැත්තා සේ සිස් ව ම පලා ගියේ ය.

එ හෙයින් සත් පුරුෂයන් විසින් ලද මිනිසත් බව නිෂ්ඵල නො කොට බුද්ධොත්පාද කාලය ත් නො වරදවා පින් කම හැසිර හැම සැපයට උතුම් සැප වූ නිවන් සැප විඳ ගත යුතු.

---

## 251. කපිල නම් මත්ස්‍යයා ගේ වස්තුව

තව ද අකුශලයෙහි ම ආදීනව දක්වන්ට කපිල නම් මත්ස්‍යයා ගේ වස්තුව කියමු.

කෙ සේ ද යත්-

යට ගිය දවස කසුප් බුදුන් පිරිනිවි සමයෙහි කුල දරුවෝ දෙ බෑ කෙණෙක් ගිහි ගෙයින් නික්ම බුදුන් පිරිනිවිය ත් වහන්දෑ ලඟ මහණ වූහ. ඒ දෙ නමින් වැඩි මාලු නම සොධන නම් සේක. බාල නම කපිල නම් සේක. ලමන්දු උපාසිකාවෝ සාධනී නම්හ. නැගණියෝ තාපනා නම්හ. ඌ දෙ පුතු මවු ත් මෙහෙණි සස්නෙහි මහණ වූහ. මෙ සේ හැම දෙන ම මහණ වූ කලට දෙ බෑයන් වහන්සේ ඇදුරු වත් තෙර වත් ආදි ය කිරි-මෙන් ආභිසමාචාරික ශික්‍ෂාවෙහි ත් හැසිර උපසම්පදව ලදින් එක් දවසක් ආචාර්‍ය්‍ය උපාධ්‍යායයන් වහන්සේ අතින් 'ස්වාමීනි, මේ සාසනයෙහි ධුර කීයෙක් ද'යි විචාරා ග්‍රන්ථ ධුර ය හා විපස්සනා ධුරය නියාව අසා වැඩි මාලු තැනැත්තන් වහන්සේ විපස්සනා ධුර ය පුරමි සිතා ගෙණ පස් වසක් ආචාරි උපාධ්‍යා-යයන් වහන්සේ ලඟ ම වැස රහත් වීම දක්වා කමටහන් ඉගෙන වලට පලා ගොසින් විවසුන් වඩන සේක් එ බඳු පින් ඇති හෙයින් රහත් වූ සේක.

Non-Commercial Distribution

මලණුවන් වහන්සේ 'මම තව සග බාලයෙමි. මාලු කල ත් විවසුන් වැඩිය හැක්ක. සග අවස්ථාවෙහි ග්‍රන්ථ ධුර ය පුරමි' සිතා තෙවළා බුදු වදන් උගත් සේක. ආගමධර වීමෙන් ඇසීම පිරිවීම නිසා අසන පිරිවානා වහන්දෑ බොහෝ ඇති වූ සේක. ගණ ය මහත් වත් වත් ගණතො ලාභ ය වූ හෙයින්[1] ලාභ ය ත් මහත් වි ය. ආගම පණ්ඩිතත්‍ව ය නිසා අභිමාන ය ත් ඇති ව ලාභයෙහි ලොභ ය ත් බලවත් ව අනුන් කැප ය යි කි දෙයෙක් ඇත් නම් අකැප ය යි කියා ත් අකැප ය යි කී දෙය කැප ය යි කියා ත් සාවද්‍ය ය යි කී දෙය නිරවද්‍ය ය යි කියා ත් නිරවද්‍ය ය යි කී දෙය සාවද්‍ය ය යි කියා ත් නපුරු අදහසින් බණ උගත් නියාවට කියමින් ලජ්ජිපෙසල වහන්දෑ ධර්ම විනය පෑලා 'කපිලයෙනි, තෙල සේ නො කියව, නො කරව'යි අවවාද කළ තැන් කෙරෙහි ත් ශික්ෂායෙහි ත් ගෞරව නැති ව 'මුඹ වහන්සේලා කුමක් දන්නා සේක් ද? බොල් වැනි සේකැ'යි යනාදී දෙඩා ගෙණ බැණ ගෙණ අනාචාරී ව අනුපාධ්‍යාය ව ඇවිදිනා දෑ ය.

වහන්දෑ බැණන් වහන්සේ සෝධන තෙරුන් වහන්සේට ත් එ පවත් කී සේක. උන් වහන්සේ ත් මලණුවන්දෑ කරා ගොසින් 'කපිලයෙනි, තොප වැනි බුද්ධි සම්පන්නයන් උගත් පර්‍ය්‍යාප්ති ය පිටට සම්‍යක් ප්‍රතිපදවෙකු ත් ඇත් නම් හෙන ගෙයට දෙන රුකුලක් සේ ශාසනයට මහා වත්තම. තොප උගත් බණ ලෙසට ක්‍රියා කරත් මුත් අනික් ලෙස ක්‍රියා කොට ඇවිදිනා කලට ධර්මයට ත් පිටි පෑ තිබෙයි. තොපට ත් අල්වන සර්පයා අල්වන සැටියේ නො අල්වා නපුරු කොට ඇල් වූ කල වන අනර්ථ සේ ම බොහෝ අනර්ථ වෙයි. තෙල ලෙස නො කරව'යි වදළ ත් තමන්දෑගේ අස්ථානයෙහි උගත් බුහුටි කමට එයි ත් නො ගිවිසි දෑ ය. එ සේ වුව ත් බෑ තෙරුන් වහන්සේ දෙ තුන් විටක් කොට ත් වදරා නො ගිවිස්නා නියාව දැන 'තොපගේ නපුරු කටයුත්තෙන් තොපි ම පෙනෙන්නාවා දැ'යි වදරා ලා වැඩ පී සේක. එ වක් පටන් සෙසු ත් ලජ්ජී වහන්දෑ ශාසනයට ප්‍රයෝජන යක් නැති නියාව දැන හළ සේක.

ඒ වහන්දෑ ද මර්‍ය්‍යාදව[2] නපුරු ව ගොසින් කසළ පර්ෂ ත් ඇති ව වසන දෑ ය. එක් දවසක් කසළ පිරිස් පිරිවරා පොහෝ ගෙට ගොසින් විජිනි පත්‍රයකු ත් හැර ගෙණ ධර්මාසනයෙහි හිඳ 'මෙ තැනට රැස්වූ තැන් පා මොක් වන පොත් ඇත් දැ'යි විචාරා 'මුන් ලා දෙඩීමෙන් ප්‍රයෝජන කිම ද? සරු සාර තැනක් ලා වේ ද දෙඩුව මනා ය'යි නිරඝන ව හුන් වහන්දෑ දැක 'ඇවැත්නි

1 නු හෙයින්, 2 සිරියානුව, නිරසිතන ව

Non-Commercial Distribution

විනය ත් හැයි ද? පාමොකු ත් හැයි ද? බණ ත් හැයි ද? දහමු ත් හැයි ද'යි කියා ගෙණ බුදු සස්නෙන් ගොඩ නැඟි නියා හඟවමින් ආසනයෙන් නැඟී දෑ ය. මෙ සේ ඒ කම් කළ වහන්සේ කසුප් බුදුන්ගේ සස්න නිෂ්කලඩක ව පවත්මින් සිටියා පසු බා පූ දෑ ය. සොධන තෙරුන් වහන්සේ ද සසුන් නමැති ගුවන් කුස ගුණ රසින් හොබවා පිරිනිවි සේක. කපිලයන්දෑ ත් ආයු ගෙවා ගෙණ මිය අවීචියෙහි උපන්හ. මෙහෙණි සස්නෙහි මහණ වූ මෑණියන් හා නැගණියෝ ත් නපුරු තැනැත්තවුන් හා එක් ව සිල්වත් තැනට දෙඩා බැණ පුතණුවන් අත් නො හැර මෑණි-යෝ ත් බෑණන් අත් නො හැර නැගණියෝ ත් එ ම නරකයෙහි උපන්හ.

එ කල පන්සියක් දෙන ගම් පැහැරීම් ආදි වූ සොර කමින් ජීවත් වන්නාහු එක් දවසක් සොර කමෙක දී මිනිසුන් ලුහුබඳවා ගන්නා වල් වැද ගොසින් ඊ ත් සැඟවී ගන්නා අත් නැති ව වන වාස ව වැඩ හිඳිනා එක් කෙණකුන් වහන්සේ දැක වැඳ පියා 'සවාමීනි, අපට පිහිට වුව මැනැවැ'යි කීහ. තෙරුන් වහන්සේ ද 'තොපට මෙ තැන්හි පන් සිල් විනා අනික් පිහිටෙක් නැත. පන්-සිල් හැර ගනුව'යි කියා ලා උනු ත් ගිවිසි හෙයින් පන් සිල් දෙවා ලූ සේක. පන් සිල් දෙවා ලා 'මෙ තෙක් කල් කුම වුව ත් දැන් තෙපි සිල්වතු ව. ජීවිත ය නසිත ත් පන් සිලට හානි නො කර ව. සියල්ලවුන් කෙරෙහි ම මෛත්‍රී කරව'යි වදළ සේක. උයි ත් ඒ ගිවිස්සාහ. ලුහුබඳවා ආ වස්තු සවාමීහු ද එ තැනට අවුත් ඈත මෑත බලා සොරුන් දැක පන්සියය ම මරා පූහ. උයි ත් ඇසිල්ලෙක රැකි පන් සිල් පමණෙකින් හා කළ මෛත්‍රී පමණෙකින් නිසි බෙහෙදක් ලදින් ලෙඩක් ගුණ වූවා සේ නරකොත්පත්ති ය නැති ව දෙව් ලොව උපන්හ.

සොර දෙටුවාණෝ දෙව් ලොවදී ත් නායක ව උපන්හ. ඒ සත් පුරුෂ සමවායේ තරම ය. පාත දෙව් ලොව පටන් උඩ දෙව් ලොව ට ය, උඩ දෙව් ලොව පටන් පාත දෙව් ලොවට ය'යි අනුලොම-ප්‍රතිලොම විසින් දහසක් හවුරුද්දෙන් අහලක් වඩනා පොළොව සත් ගවුවෙක වඩනා විතර කල් දෙව් ලොව දෙව් සැප ත් වළඳා අපගේ බුදුන් උපන් සමයෙහි සැවැත් නුවර වාසල් බඩ පන්සියක් කෙවුළන් හිඳිනා කෙවුළු ගම යහපත් ජාති ලබන පිණක් නො කළ හෙයින් උපන්හ. දෙටු දෙව් පුත් කෙවුළු මුදලියාණන් අඹු-වන්ගේ බඩ පිළිසිඳ ගත. සෙස්සෝ සෙසු කෙවුළන්ගේ අඹුවන් බඩ පිළිසිඳ ගත. මෙ සේ උන් හැම දෙනාගේ මවු කුස පිළිසිඳ

Non-Commercial Distribution

ගැන්මත් එක දම විය. දස මස් පිරෙන්නා මවු කුසින් බිහි වීම ත් එක දම විය. කෙවුළු මුදලි ද 'මේ ගම තව ත් අද උපන් දරු කෙනෙක් ඇත්දෝ හෝ'යි පරීක්‍ෂා කරවා උන් හැම දෙනා ත් උපන් නියාව අසා 'මේ ගමට නායක හෙයින් මුන් හැම දෙනා මා දරුවන් පිරිවරා ඇවිද්ද මනා වේ දෝ'යි උන් හැම දෙනාට ත් පොෂණ ය තමන්ගෙන් ම තබ්බවා ලූහ. ඌ හැම දෙන ත් එක් ව ම වැඩී විය පත් වූහ. කෙවුළු මුදලින්ගේ පුතණුවෝ ම සෙසු කෙවුළු කුමාරවරුන්ට මුදලි වූහ.

කපිලයෝ ද බුද්ධාන්තරයක් මුළුල්ලෙහි නරකයෙහි පැසී පියා තව කර්ම ය ගෙවී නො ගිය හෙයින් චුත ව අචිරවතී ගඟැ කුඩ මසු ව උපන්හ. යහපත් ව විසූ භාගයෙහි සිල් රක්‍ෂා කළ හෙයින් රන්වන් වූහ. කුණු බොරු කියා ඇවිදි හෙයින් කුණු ගඳ හමන කටක් ඇති වූහ. එක් දවසක් කෙවුළු මුදලින්ගේ පිරිවර කෙවුළු පන්සිය ය කුඩ මස්සන් මරණු නිසා ගඟට මහ දැල් දමා ලා සිටියහ. උන් දමා ලූ දැල් ඇතුළත රන්වන් කුඩ මසු හසු විය. ඔහු දැක ලා කෙවුළු ගම ඇත්තෝ මුළුල්ල ම 'අපගේ දරුවන් ආදියෙන් දමා ලූ දැලට ම රන්වන් කුඩ මස්සෙක් හසු විය. රජ්ජුරුවන් වහන්සේ මහ සම්පත් දෙන සේකැ'යි සමාධි ව එක විට ම කොක් සන් ගැසූහ. ඒ දැල් දමූ කෙවුළු පන්සිය ය ද කුඩමස්සා හොරුවෙක ලා ගෙණ නො මියන ලෙසට පැනු ත් වත් කොට ලා හොරුව පිටින් ම රජ්ජුරුවන් කරා ගෙණ ගියහ.

රජ්ජුරුවනු ත් 'මේ කිම දෝ'යි විචාළ කල්හි කුඩ මස්සකු නියාව කිවු ය. රජ්ජුරුවෝ රන් වන් කුඩ මස්සා දැක රන් වන් වන්ට කාරණ ය කර්ම විෂය දන්නා බුදුන්ට මුත් තමන්ට නො දැනෙන හෙයින් කුඩ මස්සා ගෙන්වා ගෙණ බුදුන් කරා ගෙණ ගියහ. කුඩ මස්සා කට දල්වා ලන්නා ම සියලු දෙව්රම දුගඳ පැතිරිණ. රජ්ජුරුවෝ ද බුදුන් අතින් ඇඟ රන් වන් වීමට ත් කට කුණු ගඳ වීමට ත් කාරණ විචාළහ. බුදුහු 'මහ රජ, මේ තෙමේ කසුප් බුදුන්ගේ සස්නෙහි මහණ ව කපිල නම් ව බහුශ්‍රුත ව මහ පිරිවර ඇති ව ලාභ ගරුක ව අවවාද කළවුනට දෙඩා බැණ ගෙණ ධර්ම විනයට විරුද්ධ ලෙස කොට බුදු සස්නා පසු බස්වාපී ය. ඒ අකුශල කර්මයෙන් අවීචි නරකයෙහි ඉපැද බුද්ධාන්තරයක් මුළුල්-ලෙහි පැසී ත් තව කර්ම ය නො ගෙවුණු හෙයින් දැන් තිරිසන්

අපායෙහි කුඩ මසු ව උපන. ආදි භාගයෙහි රක්‍ෂා කළා වූ සීල මහිමයෙනු ත් බණ හදරා හදළ බණ අනුන්ට කී හෙයිනු ත් බණ කීම් මුඛයෙන් බුදු ගුණ කී හෙයිනු ත් තිරිසන් ව ත් රන් වන් වී ය. සිල්වතුන්ට බොහෝ කොට බැණ දෙඩා ඇවිදි හෙයින් කටින් දුගඳ හමයි. මහරජ, උහු ලවා කථා කරවම් දැ'යි වදළ සේක. රජ්ජුරුවෝ 'යහපතැ'යි කිවු ය.

බුදුහු ත් 'තෝ කපිලයා වේ දැ'යි විචාරා 'එ සේ ය' යි කී කල්හි 'කොයි සිට අයි දැ'යි විචාළ සේක. අවීචියෙහි සිට ආ නියාව කී ය. 'තාගේ බෑණෝ සොධන තෙරහු කොයි දැ'යි විචාළ කල්හි පිරිනිවි නියාව කිව. 'තොපගේ මවු සාධනීන් හා නැඟණියෝ තාපනාවෝ කොයි දැ'යි විචාළ කල්හි උන් දෙන්න ත් සිල්වත් තැනට බැණ ඇවිද නරකයෙහි උපන් නියාව කිව. දැන් කොයි යෙයි දැ'යි විචාරා වදළ කල්හි උදවූ මෙහෙවරෙක ආ කෙණකුන් මෙහෙවර කල් යන හෙයින් උදවුව ම යන්නා සේ කම් ගෙවීම් මෙහෙවර කල් යන හෙයින් උපන් තැනින් පෙරළා ත් අවීචියට ම යන නියාව කියා ලා මුසුප්පුව ත් බලවත් ව හොරු හිස ඉස ගසා ගෙණ මිය ගොසින් අවීචියෙහි ම උපන. බොහෝ දෙන ත් පාපයෙහි භය ඇති වූ හ.

බුදුහු එ විට එ තැනට රැස් වූ පර්ෂද්ගේ අදහස් බලා—

''ධම්මචරියං බ්‍රහ්මචරියං—එතදහු රසුත්තමං''

යනාදී සූත්‍ර නිපාතයෙහි කපිල සූත්‍ර ය වදරා ඉක් බිති ව 'යම් කෙණෙක් පින් කම් පමා වූවෝ නම් උන්ට ධ්‍යානයක් වත් විදර්‍ශනාවක් වත් මාර්‍ගයක් වත් ඵල ධර්‍මයක් වත් වඩනට නැත. වඩනේ කවරේ ද යත්—යම් ගසක් වැළඳ ගත් නම් ඒ ගස නසන්නා වූ මාලුවා ලියයක් මෙන් ඌ තමා ඊටම අවසර හෙයින් අෂ්ටොත්තර ශත ප්‍රභෙද වූ තෘෂ්ණා ව වඩ්ඩි. ඒ තෘෂ්ණා වඩනා ම තෘෂ්ණා වශභ වූ සත්ත්වයෝ වල්හි ඵලා ඵල කැමැති ව දුවන පනන වඳුරන් මෙන් භව ප්‍රාර්ත්‍ථනා බලයෙන් සසර දුක් ගෙණ ඇවිදිති.

යම් සේ පැන ඇවිදිනා වඳුරෝ ඒ අත්ත අල්වා ගෙණ මේ අත්තට පනිත්. මේ අත්ත අල්වා ගෙණ ඒ අත්තට පනිති. අත්තක් නො ලද්දු නම් සන්හිඳී වැද හිඳිති. යම් කෙණෙක් මහා වල[1] හෙයින් නැත් ද එ මෙන් තෘෂ්ණා වශභ වූ සත්ත්වයෝ භවයෙහි ඇවිදිනාහු යම් තාක් භවක්‍ෂ ය නො කොළෝ නම් අරමුණක් නො ලදින් තෘෂ්ණාවෙන් නැවැත්තෝ ය යි කියා ගත නො හෙති.

1. වල් හෙයින්

Non-Commercial Distribution

'තව ද මේ තෘෂ්ණාව ඉතා ලාමක වූ තරම් ඇත්ති සසර දුක් නමැති වස එළවන හෙයින් ද, නැවත ප්‍රවෘත්ති විපාක ප්‍රතිසන්ධි විපාක වශයෙන් අනිෂ්ට විපාක නිපදවන හෙයින් වස මල් වස පක් ඇති හෙයින් ද විෂානුභවයක් වැනි හෙයින් ද, රූපාදියෙහි විශෙෂයෙන් ශක්ත බැවින් ද, විසත්තිකා යන නම් ලදින් යම් කෙණකුන් වෙළා ගත් නම් යම් සේ මහ වල එක් වන් පොද හෙන කලට නො එක් තණ යහපත් ව හට ගෙණ වැඩේ ද, එ මෙන් ඒ සත්‍වයන්ට ත් ශොක ය වඩ්ඩී. යම් කෙණෙක් තෘෂ්ණාව නො එක් ලෙසින් ඉක්ම පූ නම් යම් සේ නෙළුම් පත පැන් බින්දු නොරඳා ද, එ මෙන් ඔහු කෙරෙහි ශොක ය ත් නො රඳයි.

'එ හෙයින් තොප හැමට කියමි. යම් තාක් මෙ තැනට රැස් වූ කෙණෙක් ඇත් නම් ඒ තොප හැම දෙනාට ම වැඩෙක් වෙව' යි ආ වඩාලා ත් 'තර වනු නිසා කියන නියා ය. යම් සේ සැවැන්දෙ මින් ප්‍රයොජන ඇති කෙණෙක් හුදල්ලෙකින් සැවැන්දෙට ගස් සාරත් ද අර්හත් මාර්ග ඥාන නමැති හුදල්ලෙන් සකල ක්ලෙශයන් ට මුල් ව සිටිනා අවිද්‍යාව නසන්නා වූ සව් කෙලෙසුන් නස්නා හෙයින් තෘෂ්ණාවගේ මුල උදුරා දමා ද, ගහක් බඩ හට ගත් හුණ ගසක් උදුරා යවන මහ වතුරක් මෙන් පස්මරහු තොපට හානියක් නො කෙරෙත්ව' යි වදළ සේක. දෙශනා කෙළවර එක ද උපන් කෙවුළු පන් සියය සසර දුකට බා ගොසින් නිවන් පතා බුදුන් ලඟ මහණ ව නො බෝ කලකින් රහත් ව කෙවුළු ජාති නැති ව ආර්‍ය්‍ය ජාතීන් සම්පන්න වූහ.

එ හෙයින් සත් පුරුෂයන් විසින් අකුසලින් දුරු ව කුසල්හි පිහිටා නො පමා ව පිළිපන් කෙවුළන් පවා ලබන ආර්‍ය්‍ය ජාති ය ලබන්ට උත්සාහ කට යුතු.

## 252. සූකර පොතිකාව ගේ වස්තුව

තව ද භවොත්පත්තියෙහි ම දෙෂ දක්වන්ට සූකර පෝතිකා ව ගේ වස්තුව කියමු.

කෙ සේ ද යත්—

එක් දවසක් බුදුහු රජ ගහා නුවරට සිහා වඩනා සේක් එක් හිරි පැටියක දැක මඩ වැකී පියා සිටි සැටියට සිනා පහළ කල සේක. සිනා පහළ කළ කලට මුඛ විවර විනිර්ගත වූ දන්ත රශ්මි ශොභාව දැක අනඳ මහ තෙරුන් වහන්සේ කාරණ විචාළ සේක.

1. අවලා—අවලාදත්

Non-Commercial Distribution

බුදුහු ත් 'ආනන්‍දයෙනි, තෙල සාරා කා ඇවිදිනා හීරි පැටිය දුටුවා ද' යි විචාරා 'එ සේ ය, ස්වාමීනි' යි කී කල්හි 'තුලු කකුසඳ බුදුන් සමයෙහි භොජන ශාලාවක් ලඟ උළු අවුළා කන කිකිළියක. එක් යෝගාවචර භික්ෂු කෙණෙකුන් විවසුන් කමටහනක් පිරිවන්නා අසා සිත පහදවා ගෙණ එයින් චුත ව රජ කුලයෙක ඉපැද උබ්බරී නම් රජ දුවක් වුවව. ඕ තොමෝ එක් දවසක් අමෙධ්‍ය පිණ්ඩයෙක ගලෑ ගෙණ හුන් පණු රැසක් දැක පුළුවක සංඥව උපදවා ගෙණ භාවනා කොට ප්‍රථම ධ්‍යාන ලාභී ව මිනිස් ලොව ආයු පමණින් සිට ස්ත්‍රීන්ට ධ්‍යාන පස උපන ත් උපදනා ප්‍රථම ධ්‍යාන තලයෙහි ම හෙයින් මිය පළමු ධ්‍යාන තෙලෙහි උපන. චුති ප්‍රතිසන්ධි වශයෙන් ඒ ඒ තැන ඉපැද ඇවිදිනී දැන් හීරි ව උපන. ඒ දැක සිනා පහළ කෙළෙමී' වදළ සේක.

ඒ අසා අනඳ මහ තෙරුන් වහන්සේ පටන් නො රහත් බොහෝ දෙනා වහන්සේට සසර භය ත් භයාකාරය ත් ඇති වී ය. බුදුහු මේ ලෙසින් භය උපදවා ලා භව තෘෂ්ණාවෙහි ආදීනව හඟවා ලා ඇතුළු වීපීයෙහි සිට ම බණ වදරන සේක් 'යම් සේ ගසෙක සතර දිගට ගිය මුල් සතර ත් පාතට බට මුල ත් මුල් පස කැපීම් ඉපිරීම් නැති ව තර ව සිටි කල්හි තල් පොල් ආදියක් නො ව භට ගන්ට නිසි ගසක් උඩ ත්[1] බා තබා පී වත් නැගේ ද, එපරිද්දෙන් රහත් මගින් තෘෂ්ණාව නසා නො පී කලට තෘෂ්ණාවට වූ හානියක් නැති බැවින් ප්‍රභව ය නුසුන් කලට ගඟ දිය පවත්නා සේ ඇති වේ ම ය.

තව ද යම් කෙණකුන්ට දෘෂ්ටි සන්නිස්‍රිත නොව හුදක් රූපාදි සාරමුණෙහි උපදනා තෘෂ්ණාවෝ ස දෙන ය, එ ම සාරමුණෙහි ශාශ්වත දෘෂ්ටි සන්නිශ්‍රිත ව උපදනා තෘෂ්ණාවෝ ස දෙන ය, උච්ඡෙද දෘෂ්ටි සන්නිශ්‍රිත ව උපදනා තෘෂ්ණාවෝ ස දෙන ය යි ස්වසන්තාන වර්ති වූ අටළොසෙක, අන්‍ය සන්තාන වර්ති වූ අටළොසෙකැ යි තෘෂ්ණාවෝ සතිස් දෙන තුන් කල්හි ම වීමෙන් එක් සිය අටක් අටක් පමණ වූවාහු සත්‍වයන් සසර නමැති මුහුද ලීමට වතුරක් වන හෙයින් ශ්‍රොත නම්හ. එ සේ වූ ශ්‍රොතසින් යුක්ත වූ තෘෂ්ණා තොමෝ මහත් ව පවත්නා හෙයින් ප්‍රවාහ ව පවතී ද, ධ්‍යානාදියක් නො නිසා නපුරු අදහස් ඇති ඕ හට රාග සන්නිශ්‍රිත ව පවත්ති. තව ද නො එක් ආකාරයෙන් පවත්නා මේ තෘෂ්ණාවෝ සත්කාය නුවර රඳා හිඳ ලා චක්ෂුරාදී වූ වාසල්වලින් පිටත් ව බඩු ඇති තැනක් බලා ඇවිදිනා වල් සොරුන් මෙන් රූපාදී වූ සාර මුණෙන් එක අරමුණකු ත් නො හැර හැම තැන ම හෙවත් තුන් භවයෙහි ම අරූප භවයෙහි මුත් මුනි දෙර ඇති බැවින්

1 උඩ තබා

Non-Commercial Distribution

පවත්ති. යම් අරමුණෙක්හු පැවැත්තෝ නම් ගස් වළඳන ලිය ගසින් කිසිවකු ත් නො තෝරා ගස කඩා ගෙණ හෙන මුත් වෙළන්නා සේ වෙළා ගෙණ සිටිති.

කළ මනා කවරේ ද යත්-වස ලියයක් නසන්නවුන් මුලු ත් නොරඳවා උදුරා දමන්නා සේ අර්හත් මාර්ග ඥාන නමැති කැපෙන යකඩින් තෘෂ්ණා නමැති වස ලිය ය මුල දී ම සිඳුව. කාරණ කිම ද යත්-යම් සන්තානයෙක මෝ[1] පැවැත්ති නම් උන් සසර නමැති මහ මුහුදින් නිවන් පර තෙරට නැංග නො දී ජාති දුක් ආදි වූ නො එක් දුකට පමුණුවයි. තෘෂ්ණා වසඟය ත් මාලු ගොන් සීයට මැළි වන්නා සේ සසරින් ගොඩ නැගෙන්ට මැළි හෙයින. තව ද තෘෂ්ණා වසඟ වූ සත්ත්වයෝ සංයොජන නමැති දැල බැඳී ගිය සත්තු සා දැල බැඳුණු සාවුන් මෙන් සැලෙති. පෙළෙති. සැලී පෙළී බොහෝ කලක් සසර දුක් ගනිති. එ හෙයින් නිවන් පතන්නවුන් විසින් නැති කළ මනා නම් තෘෂ්ණාව ම ය' යි වදළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ.

ඒ හීරිපැටි ද ඉන් මිය ගොසින් මලයුරු පාවුරුවෙයි[2] රජකුල යෙහි උපන. ඉන් චුත ව වනවාසී නම් රට එක් කුලයක උපන. ඉන් චුත ව සුප්පාරක නම් පටුන් ගම අස් වෙළෙඳ ගෙයක උපන. එයින් චුත ව කාවීර නම් පටුන් ගම නියමුවාණ කෙණකුන්ට දූ ව උපන. ඉන් චුත ව ලක්දිව අනුරාධ පුර නුවර පොහොසත් කෙණ කුන්ට දූ ව උපන. ඉනු ත් මිය ගොසින් අනුරාධ පුරයට දකුණු දිග හෙක්ඛන්ත[3] නම් ගම සුමන නම් කෙළෙඹියාණන්ට දූ ව සුමනාවෝ ය යි ප්‍රසිද්ධ වූහ. උන්ගේ පියාණෝ ද එ ගම හැර පියා රුණට පලා ගොසින් දිගා මඩුල්ලේ මහ මුනි[4] නම් ගම රඳා හුන්හ.

එ කල දුටුගැමුණු රජ්ජුරුවන්ගේ ලකුණ්ටක අතිම්බරු නම් ඇමැත්තෙක් කිසි කට යුත්තක ඒ ගමට ගියේ සුමනා නම් ඒ කුමාරිකාවන් දැක උන් කෙරෙහි ඇලුම් ඇති ව මඟුල් කොට සරණ පාවා ගෙණ මහා පුණ්ණ නම් ගමට ගියේ ය. එ කල කෙළ පව් වෙහෙර වසන මහා අනුල නම් තෙරුන් වහන්සේ එ ගමට සිඟා වැඩි සේක් සුමනා නම් කුමාරිකාව දැක වහන්දෑ ලා කථා කරණ සේක් 'ඇවැත්නි, හීරිපැටි පවා ලකුණ්ටක අතිම්බරු නම් ඇමැත්තාණන්ට අඹු වූව. ඉතා ආශ්චර්‍ය්‍ය ය යි වදළ සේක. සුමනාවෝ ද ඒ කථාව අසා සිහි නැති ව තුබූ දෙයක් සිහි

1 මොහ 2 පාවුරුවෙයි–පාරුවෙයි, පායුරුවෙනි
3 හොක්ඛන්ත–හොක්කන්ත 4 මහා ලුම්මුච්චිනි, මහා ලුම්බිනි

Non-Commercial Distribution

කරන්නාක් මෙන් ජාති සිහි කරණ නුවණ ලදින් ජාති සිහි කොට පියා සසර කළකිරි මෙහෙණිනි වනු කැමැති නියාව සමණන්ට කියා ලා මහ පෙරහරින් ගොසින් මෙහෙණි සස්නෙහි මහණ ව තිස් මා[1] වෙහෙරදී මහ සිවටන් සුත අසා බිසෝ ව උපන් අවධියේ කළ භාවනොපාශ්‍රයෙන් සෝවාන් වූහ.

පසු ව දුටුගැමුණුරජ්ජුරුවන් දෙමළුන් සාධා පී කලට නැයන් හිදිනා හෙක්ඛන්ත නම් ගමට අවුත් එහි වසන්නාහු කල්ලක වෙහෙර දී ආසිවිසොපම සූත්‍ර ය අසා රහත් වූහ. පිරිනිවන් පානා දවස් මහණ-මෙහෙණිනි දෙ පක්‍ෂ ය විවාළ කල්හි එ පව ත් මුළුල්ල ම කියා ලා පිරිනිවන් පානා තැන රැස් වූ වහන්දැලාගෙන් මුඩුලු වෙහෙර වසන ධම් පියා අටුවා ආවෙණික ව පිරිමසන මහා තිස්ස තෙරුන් වහන්සේට 'මම පෙර කකුසඳ බුදුන් සම යෙහි කිකිළි ව ඉපැද පියා උකුස්සකු අත නැසී, රජ කුලයෙක ඉපැද පරිබ්‍රාජිකා ව, ප්‍රථමද්ධ්‍යාන උපදවා බඹ ලොව ඉපැද, එයින් සැව සීටු කුලයෙක ඉපැද නොබෝ කලකින් මිය, ගෞතම බුදුන් සමයෙහි හීරි ව ඉපැද, ඉන් මිය මලයුරුවේ[2] ඉපැද, ඉන් මිය වනවාසී නම් රට ඉපැද, ඉන් මිය සුප්පාරක නම් පටුන් ගම ඉපැද, ඉන් මිය කාවීර නම් පටුන් ගම ඉපැද, ඉන් මිය දඹ දිව උපදිනා තැන් නිමියා සේ මෙ ලක්දිව අනුරාධ පුර නුවර ඉපැද, ඉනු ත් මිය මේ හෙක්ඛන්ත නම් ගම ඉපැද ය'යි මුල අත් බැව් මට තබා නිමවා දක්නට බුදුන්ට ත් පිළිවන් ද? කිකිළි ව උපන් ජාතියේ පටන් තෙළෙස් අත් බැවෙක ඉපැද දුන් මෙ වක මට පිහිට කොට ගතිමි. මා බලා හැම තැන් ම නො පමා වුව මැනැවැ'යි අවවාද කොට ලා සිවුවනක් පිරිස් මැද පිරිනිවියහ.

එ හෙයින් සත් පුරුෂයන් විසින් සංසාර දෙෂ ය භික්ෂුණීන්ට ම නො වන නියා ත් තමහට ත් වන නියාව දැන අවුල් වියවුල් සසර නො රඳන්ට ම සිතා කුසල්හි හැසිරිය යුතු.

## 253. සිවුරු හළ කෙණකුන් ගේ වත

තව ද තෘෂ්ණාව වශහ වූවනු ත් සත්පුරුෂ සමවාය බලයෙන් පැමිණි දුකින් මිදෙන නියාව හඟවන්ට සිවුරු හළ කෙණකුන් ගේ වත කියමු.

1. තිස්ස මහ 2. අරමණයේ—ඇතැම්.

Non-Commercial Distribution

කෙ සේ ද යත්—

මහසුප් මහ තෙරුන් වහන්සේගේ සද්ධිවිහාරික නමෙක් ධ්‍යාන ලාභී ව සිට ත් බඩාල් කුලෙන් අවුත් මහණ වූ හෙයින් බඩාල් දූවක කෙරෙහි පිළිබඳ සිත් ඇති ව සිවුරු හළහ. සිවුරු හළ ත් කර්මාන්තයට මැළි කම නො හළ බැවින් ගෙන් සපා නෙරපීහ. උඹ තුමූ රැකී ගන්නා අනික් උපදෙසක් නැති බැවින් සොර කම් කොට කැති.

එක් දවසක් සොරකම් හසුකොට ගෙණ ගසා අල්වා ගෙණ පිටිතල[1] හයා බැඳ ලා ඒ ඒ තැන දී සැමිටිවලින් මරන්නාහු මිනී මරණ තැනට ගෙණ යෙති. මහසුප් මහ තෙරුන් වහන්සේ ද සිඟන සේක් සිවුරඑවාණන්[2] දකුණු වාසලින් ගෙණ යන්නවුන් දැක බැම්ම ලිහිල් කරවා ලා 'පෙර තොප පිරිමසා ආ කමටහන සඳහන් කරව'යි වදාළ සේක. උයි ත් ඒ අවවාදයෙන් කමටහන් මෙනෙහි කොට අපවත් ව ගිය දෙයක් සොයා ගත්තා සේ ධ්‍යාන සතර ම පෙරළා ත් උපදවා ගත්හ.

ඉක් බිත්තෙන් මිනී මරණ තැනට ගෙණ ගොසින් ලා මරන් නෝ ත් එක විට ම නො මරා දුක් ගෙණ මියන ලෙසට දිවස් හුලට නැංගූ ය. උන්ට භයකු ත් ශඞ්කාවකු ත් නැත. ඒ ඒ දිග සිටි මිනිස්සු කොන්ත තෙප් අඩයටි ආදිය අනිනා ලෙසට පොවා ත් උන් නො බන නියාව දැන 'බල ව මුන්ගේ නිර්භීත කමක් ය. මෙ තෙක් දෙනා ආයුධ අල්වා ගෙණ සිටිය ත් තමන් උලට නැංගු ව ත් අචෙතනික දෙයක් මෙන් භයෙක් වත් වෙව්ලීමෙක් වත් නැත. ඉතා විස්ම ය'යි සතුටු ව කොක්සන් ගසා ගෙණ රජ්ජුරුවන්ට ත් එ පවත් කිවු ය. රජ්ජුරුවෝ ඒ අසා උඹ හැර පියව'යි කිවු ය. බුදුන්ට ත් එ පවත දැන්වූහ.

බුදුහු ත් උන් කරා රස් කඳක් විහිදුවා ලා උන්ට බණ වදරන සේක් 'යමෙක් ගිහි සම්පත ආලය නැති ව තපසෙහි ඇලී මහණ ව නපුරැ'යි දමා පූ දෙයකට පෙරළා ත් ආලය කරණා සේ පෙරළා ත් ගිහි සම්පතට ආලය කෙරේ ද, උඹගේ තරමක් බලව. ආලය හළ සම්පතෙහි පෙරළා ත් ආලය කෙරෙයි. ආදීනවයක් දැක දමා පි දෙය පෙරළා හැර ගන්නා සේ කලට අර ආදීනව ය තදසථ ව සිටිනා සේම ආලය හළ ගිහි සම්පත ත් ආදීනව වුව ආලය හැරී තුබූ දවස් ගණනේ ආදීනව ය හැරෙන්නා නැත. හළ ගිහි සම්ප-

1. පිටි තොල 2. සිවුරුඑවාණන් – සිවුරු අළුවාණන්

Non-Commercial Distribution

තෙහි ආල ය කරන්නෝ හැයි ද? ඊට කරණ ආල ය නිවනට කළ මනා වේ දැ'යි වදාළ සේක.

උලට නැඟි තැනැත්තෝ ද මෙ දෙශනාව අසා තිලකුණු මෙනෙහි කෙරෙමින් සෝවාන් ව සමවත් සුව විඳිනාහු කර්‍මය ත් එ පමණෙකින් ගෙවුණ වන්නා හුලින් ගැළවී අහසට නැඟී ලා අහසින් ම බුදුන් කරා ගොසින් බුදුන් වැඳ ලා මහණ ව සරාජික වූ පිරිස් මැදයේ ම රහත් වූහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් සියලු පවින් දුරු ව පින්හි හැසිර සසර නමැති මහ හුලින් නැහෙන්ට උත්සාහ කටයුතු.

---

# 254. බන්ධනාගාර වස්තුව

තව ද සසර නමැති සිරගෙට වඩා සිර ගෙයක් නැති නියාව ත් සුව විඳිනාහු කර්‍මය ත් තෘෂ්ණා නමැති බානට වඩා සත්ත්‍වයන් බැඳලීමෙහි තර බානක් නැති නියාව ත් හඟවන්ට බන්ධනාගාර වස්තුව දක්වමු.

කෙ සේ දයත්—

එක් සමයෙක උමං බිඳීම මං පැහැරීම ආදි වූ බොහෝ අකාරියෙහි බැඳී ඇවිදිනා සොරුන් අල්වා ගෙණ ගොසින් කොසොල් රජ්ජුරුවන්ට පෑවු ය. රජ්ජුරුවෝ උන් දඬු කත් තළ ආදියෙන් මස්වා ලූහ.

පිටිසර හිඳිනා වහන්දෑ ද බුදුන් දකින්ට අවුත් දැක වැඳ පියා දෙ වන දවස් සැවැත් නුවර සිඟන සේක් සිර ගෙය කරා ගොසින් මැස්මෙ හුන් සොරුන් දැක වළඳා අන්තයෙහි සවස් කොට ලා බුදුන් කරා ගොසින් 'ස්වාමීනි, අපි අද සිඟා ගිය ගමනේ සිඟන්නමෝ සිර ගෙවල මැස්මෙ හුන් බොහෝ දෙනා දුටුම්හ. තමන් උමං බිඳිනවුන් දම් බිඳ ගෙණ යන්ට බැරි නියා ද? ස්වාමීනි, මීට වඩා තව ත් තර බැඳුම් ඇත් දැ'යි විචාළ සේක. මහණෙනි, මෙ කුමන බැඳීම ද පෙර නුවණැත්තෝ යම් බැම්මක් සිඳ ගෙණ හිමවු පියසට ගොසින් මහණ වූ යම් තෘෂ්ණා බන්ධන ය මෙයට ලක්‍ෂ ගණන් තරමින් වඩිනෝ වේ දැ'යි වදරා ඒ වහන්දෑ විසින් ආරාධිත වූ බුදු රජුන් වහන්සෙ ඉකුත් වත් ගෙණ හැර දක්වන සේක්—

යට ගිය දවස බරණැස් නුවර බ්‍රහ්ම දත්ත නම රජ්ජුරු කෙණකුන් රජ කරණ කල්හි බෝසත්හු ඉතා දුප්පත් වූ ගොවි කුලෙහි උපන්හ. උන් වැඩී ගත් කලට පියාණෝ මළහ. උෟ බැළ මෙහෙ කොට ලා කනවැන්දඹු මෑණියන් රකිති. උන්ගේ මෑණියෝ ද උන් කිව නො කිව එක් කුල දුවණි කෙණකුන් ගෙනවුත් පාවා දෙවා ලා පසු ව කල් යැමකදී තුමූ ත් මළහ. ඇඹෙණියන් බඩ ත් දරු කෙණෙක් පිහිටා ගත්හ. උෟ ඇඹෙණියන් බඩ දරුවන් ඇති වූ නියාව නො දන ම 'සොඳුර, තෙපි තොපට පිළිවන් ලෙස රැකෙව. මම මහණ වෙමි'යි කිවු ය. 'දන් මහණ වන්නෙන් කෙ සේ ද? මා බඩ දරුවන් වුව. උන් වදු පියන්නා උනු ත් දක මහණ වුව මැනැවැ'යි දරුවන් පිට ලා ලා මහණ වීමට බාධා කළහ. උයි ත් යහපතැ යි ගිවිස උන් වදපී කල්හි සොඳුර, තෙපි සුව සේ ම වදපීහ. ඉතිකින් මහණ වෙමි. උන් දක පූයෙම වේ ද' යි කිවු ය.

'තව ද මේ දරුවන් කිරි බොන අවස්ථාවෙන් පතන තෙක් බැලුව මැනැවැ'යි කියා ලා එ ලෙසින් රඳවා ලා තව ත් දරි ඇති වු ය. උපාසකයෝ සිතන්නෝ 'මුන්ට කියා මුන් ගිවිස්සා ගෙණ මහණ වතො ත් මුන්ට කන්නලවු නො පෙනෙන්නේ ත් නැත. අපට මහණ වීමු ත් නැත. මහ වත හෙළා පූ හකුලක් සේ නිවන් මහ වතට හකුල් වූ මුන්ට නො කියා ම පලා ගොසින් මහණ වෙමි. උන්ට නො කියා ම රෑ දවස් පලා ගියහ. ගිය ගමනේ ගම රක වල ඇත්තෝ අල්වා ගත්හ. 'ස්වාමීනි, මම කනවැන්දඹු[1] මෑණියන්ට උපස්ථාන කෙරෙමි. මා හළ මැනැවැ'යි කියා හරවා ගෙණ එක් තැනක සැතපී පියා හිමවු පියසට පලා ගොසින් මහණ ව අභිඥා හා සමහ සමාපත්ති උපදවා ඔගණ විසූහ. එ සේ වසන්නෝ ත් 'අනේ, තර ව මුත් සිඳ ලිය නො හැකි කෙලෙස් බාන් සිඳ පිමී'යි උදන් ඇනූහ.

බුදුහු ත් උන්ගේ උදන් ම මෙ තැන්හි එළවන සේක් බුද්ධාදි වූ නුවණැත්තෝ යම යකඩින් කළ දමෙක් ඇත් නම එයි ත්, දණ්ඩෙන් පතින් ඉදි කළා වූ යම දඬු හැකිල්ලෙක් ඇත් නම එයි ත් කොසු ආදියෙන් කළා වූ යම රැහ බාන් ආදියෙක් ඇත් නම එයි ත් යකඩ ආදියෙන් කපා කඩා සිඳ බිඳ පිය හැකි හෙයින් ම තර ය යි නො කියති. තර බහන් කවරේ ද යත්-රත්රන් රිදී ආදි වූ අවිඥ්ඥාණක වස්තුයෙහි ත් වැල් සරක් ආදි වූ සවිඥ්ඥාණක වස්තුයෙහි ත් පැවැති යම ආලයෙක් ඇත් නම ඒ යකඩ

1. කනවැන්දුමු–කනවැන්දවු

Non-Commercial Distribution

ආදියෙන් සිඳ ලිය නො හැකි හෙයින් නුවණැත්තෝ ඒ තර බහන් ය'යි කියති.

ඒ බහනේ සැටි කවරේ ද යත්—යම් කෙණකුන් බැඳ වෙලා ගත් නම් ඇද පාත් කොට කොට අපායෙහි හෙළා ලයි. බැඳ ගත් තැන මළ සම පමණකට ත් හානි නො කරයි. අළුත් නො වැටෙයි. බැඳ ගත් නියාව ත් නො හඟවා දියෙහි ගොඩෙහි වන කර්මාන්ත ත් කට දෙයි. එ හෙයින් ලිහිල ලොභ වශයෙන් එක වරෙක ත් යම් තැනක් ඩැ ගත් නම් ඉදුබන් ඩැ ගත්තාක් මෙන් ගලවා ලිය නො දෙයි. මෙ සේ තර වූ කෙලෙස් බාන අර්හත් මාර්ග ඥාන නමැති කඩුවෙන් කපා පිය ත් මුත් සෙසු ලෙසක කෙ සේ කැපුව ත් නිමවා කැපි ය නො හෙයි' වදාළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් උනා ලිය, ගළවා ලිය නො හැකි කෙලෙස් මෑළයි ඉස් ලන්ට මැළි වුවො ත් පිණක හැසිර මුත් නිවන් සාධා ලිය නො හැකි හෙයින් කුසල්හි හැසිරිය යුතු

## 255. බෙමා නම් මෙහෙණින්නන් ගේ වත

තව ද වර්ණමදදියෙහි ත් නපුර දක්වන්ට බෙමා නම් මෙහෙණින්නන් ගේ වත දක්වමු.

කෙ සේ ද යත්—

උෟ තුමූ පියුමතුරා බුදුන් සමයෙහි අග්‍රශ්‍රාවිකා තනතුරට පතා ආ කෙණෙක. උතුම් තනතුරට පැතූ තරමට රුවෙනු ත් උතුම ව සිටිති. රුවින් උතුම් හෙයින් වර්ණ මදයෙන් මත් ව 'බුදුහු රූප විරාග ය උපදවනු නිසා කවර තරම් රුවක ත් දෙස් දක්වන සේක් ල'යි යන නපුරු අදහසින් බුදුන් කරා යන්ට මැළි යෝ ය. උන් නො සිතූ ව මනා සිතිවිල්ලක් සිතා ගෙණ බුදුන් ලඟට යන්ට මැළි නියාව රජ්ජුරුවෝ දැන වෙළුවන ය වර්ණනා කොට ගී බඳවා ලා විද්දතුන්ට දෙවූහ. විද්දතුන් ඒ ගී කියන නියාව අසා නන්ද දේවීන්ගේ රූප වර්ණනා ව අසා වූලනි රජ්ජුරුවන්ට නන්ද දේවීන් නො හඳුනන ලෙසට වැටහුණා සේ බෙමා දේවීන්ට ත් ඒ උයන නො හඳුනන්නා සේ වැටහිණ. මේ කවර උයන් වර්ණනාවෙක් ද තොප කරන්නේ ය'යි විචාරා 'බිසොවුන් වහන්ස, මුඹ වහන්සේගේ වෙළුවන විස්තර කරමහ'යි කී කල්හි අමුතු ආශ්චර්යයක්

Non-Commercial Distribution

ඇසූ කෙණකුන් ඒ දක්නට රුචි ඇති හෙයින් බිසවු ත් යනු කැමැති වූහ. බුදුහු ත් ඒ නියාව දැන පිරිස් පිරිවරා වැඩ හිඳ බණ වදරන සේක් ම තල් වැටක් හැර ගෙණ තමන් වහන්සේට පත් සල සලා සිටිනා දෙවඟනක සේ මනහර රූ ධර ස්ත්‍රී වෙසක් මවා ලූ සේක.

ඛෙමා බිසවු වෙළුවන විහාරයට යමින් සිට ම ඒ ස්ත්‍රී රුව දැක 'බුදුන් කවර තරම රුවක් දුට ත් ඊ දෙස් වදරති කියති. දැන් මුන් වහන්සේ ලඟ ත් ස්ත්‍රී කෙණෙක් පත් සල සලා සිටිති. මම උන් අස සිටිනට ත් නැත. මෙ සේ වූ කෙණකුන් තමා ත් නු දුටු විරීමි. බුදුන් ලඟට එන කෙණකුන් එත නො දෙන්ට කියා ගත් දෙයක් වනැ'යි සිතා බුදුන් වදරන බණෙ යි සිත නො හෙළා එ ම ස්ත්‍රී රුව බල බලා සිටියෝ ය. බුදුහු ත් ඛෙමා බිසො වුන් ඒ ස්ත්‍රී රුව සිත හෙළා බලනා නියාව දැන ඒ ස්ත්‍රී රුව සොළොස් හැවිරිදි වයස් තරමෙ ද, මද්ධ්‍යම වයස් තරමෙ ද, කෙළවර වයස් තරමෙ ද මවා පෑ ලා කෙළවර දී ඇට සම් පමණක් කොට ප්‍රෙත රුවක් සේ මවා පෑ ලූ සේක. ඛෙමා බිසවු ද සිත හෙළා ඒ රුව බලන බැවින් මෙ වැනි මෙ රුව ත් ඇසිල්ලකින් ම අනිත්‍යතාවට පැමිණියේ ය. සිතින් සිතා මුළා විදිනා පමණක් මුත් කේල් ගස්වල සාරයක් නැත්තා සේ මී ත්[1] සාරයක් නැතැ'යි සිතූහ. බුදුහු ත් උන්ගේ අදහස් නිරායාසයෙන් ති ලකුණට නැමෙන නියාව දැන—

"ආතුරං අසුචිං පූතිං – පස්ස ඛෙමෙ සමුස්සයං,
උග්ඝරන්තං පග්ඝරන්තං – බාලානම 'භිපත්ථිතං."

යන්න වදරා දිව්‍ය බ්‍රහ්මාදීන් විසින් මැණික් ආදීන් මවා පී රුවක් නො වන හෙයින් දෙ තිස් කුණු කොටසින් ගැවසී ගත් මහනෙල් ඉපුල් ආදි වූ පවිත්‍රයෙකින් නො ව, මවු කුසින් පහළ වූ හෙයින් ප්‍රභව ස්ථානය ත් නපුර. තෙමේ ත් නපුරැ'යි රූපයෙහි නපුර වදළ සේක. ගාථාව වදරා නිමවා ලන්නා ම වණී මද ය හැර තව ත් තව ත් හළ මනා කෙලෙසුන් හැර සෝවාන් වූහ. උන් බුදුන් කරා නොගි ය ගමන නම තුවණ මුහු කුරණ තෙක් හුන්නාක් වැන්න. වදළ ගාථාවෙන් සෝවාන් පමණක් ව රහත් නු වූ හෙයින් රහත් කරවනු සඳහා 'හෙම්බා ඛෙමාවෙනි, යම් සේ මකුළු දැල් බැඳ ලා දැල් මැද වැද හෙව දැල් කෙළවර මැස්සෙක් හෝ මදුරුවෙක් හෝ බැඳෙන්ට නිසි එකෙක් බැඳිනි නම් දැල් සෙල වී

1. මෙයිත්

Non-Commercial Distribution

යන්නා මත් සලකුණෙන් දළ හුය හොස්සෙහි ගොසින් ලා අල්වා ගෙණ රස බී පියා පෙරළා ත් අවු ත් එ තැන ම වැද හොවී ද එ පරිද්දෙන් යම් සත්‍ව කෙණෙක් රාගයෙන් රුදුණා වූ ද, ද්වෙෂයෙන් දුෂ්ට වූ ද, මොහයෙන් මුළා වූ ද ඒ සත්‍ව නමැති මකුළුවෝ අනුන් බැඳෙන්ට නො ව තමන් බැඳෙන්ට කොට ගත් තෘෂ්ණා නමැති දළ බැඳෙති.

බැඳී ගිය කරුණා පුරස්සර කෙණකුන් උපදෙසින් ගළවා ලත් මුත් තුමූ ගැළවී ගත නො හෙති. නුවණැත්තෝ එ සේ වූ තෘෂ්ණා දළත් අර්හත් මාර්ග ඥාන නමැති ගින්නෙන් දවා පියා සියලු දුක් ගෙවමින් සුව සේ දවස් යවති' වදළ සේක. දෙශනා කෙළවර බෙමා බිසවු පිපෙන්ට ආසන්න ව සිටි පියුමක් හිරු රැස් ගැසී පිපෙන්නා සේ රහත් වූහ. පිණැති කෙණකුන් මුල් ව වැස පී රුවන් වැසී බොහෝ දෙනාට ප්‍රයෝජන වන්නා සේ බෙමා බිසොවුන් මුල් ව වැස පී සදහම් නමැති රුවන් වැස්ස බොහෝ දෙනාට ප්‍රයෝජන විය. බොහෝ දෙන ඒ හැර ගෙණ ලොවී ලොවුතුරා සැප ත් ලත්හ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් වර්ණ මදය ත් ආරෝග්‍ය මද දී වූ සෙසු මදය ත් තත් තත් මුඛයෙන් සෙසු කෙළෙසුනු ත් නසා අමා මහ නිවන් අත් කට යුතු.

බුදුහු රජ්ජුරුවන්ට 'මහ රජ, බෙමා බිසවු මහණ වන්ට හෝ වුව මැනව පිරිනිවන් හෝ පැව මැනැවැ'යි වදළ සේක. රජ්ජුරුවෝ 'ස්වාමීනි, ආයු ශක්ති ය ඇත් නම් පිරිනිවී කිම් ද, මහණ කර වා වදළ මැනව'යි කිවු ය. බුදුහු ත් මෙහෙණවරට යවා මහණ මාලු පැවිදි කරවූ සේක. උන්දැ ත් කප් ලක්‍ෂයක් පිරූ පැරුම් ඇති බැවින් අග්‍රශ්‍රාවිකා වූහ.

## 256. උග්ගසේන නම් සිටුපුත්හු ගේ වස්තුව

තව ද උගනිත ත් නිරවද්‍ය ශිල්පයක් මුත් සාවද්‍ය ශිල්පයෙන් ඓහලෞකික ප්‍රයෝජනයක් මුත් පාරලෞකික ප්‍රයෝජන නැති නියාව හඟවන්ට උග්ගසේන නම් සිටු පුත්හු ගේ වත කියමු.

කෙ සේ ද යත්—

නටක විද්දතු පන් සියයෙක් හවුරුද්දෙන් ස මසින් රජගහා නුවරට අවුදින් රජ්ජුරුවන්ට සතියක් මුළුල්ලෙහි කෙළි පෑ බොහෝ රත් රන් ලැබෙති. අතරතුරේ බලන සඞ්ග්‍රහයේ පමණ

Non-Commercial Distribution

නැත. බොහෝ දෙන ත් මැසි මත්තෙහි මැසි ගස්වා ගෙණ කෙළි බලති.

එක් දවසක් කඹයේ නටන එකකු ගේ දුවක් හුණදඬු අග ක දී නටන එකක්[1] ශිල්ප බලයෙන් උඩ අහස සක්මනු ත් කෙරෙයි. නටයි. ගී ත් කියයි. එ දවස් උග්ගසේන නම් සිටු පුත් යාළුණු කෙණකුන් හා සමඟ මැස්සක් මත්තෙහි සිට ආස සිව නටන ඒ විද්දත් දුවගේ භාවභාව ලීලා දක වායොධාතුවාධික[2] රූප කලාප විකාරයක් බලවත් නියා ය යි නො සිතා ඈ කෙරෙහි බලවත් වූ ප්‍රෙම 'ඇති ව ලදෙ ත් ජීවත් වෙමි. නො ලදෙ ත් මියමි' සිතා ගෙණ නො කා නො බී හැඳට නැඟී ලා වැද හොත්තාහ. දෙ මවු පියන් විචාළ කල්හි විද්දත් දුව කෙරෙහි ආලයෙන් නියාව කිවු ය. දෙ මවු පියෝ ඒ අසා 'පුත, තෙල ලෙස කිරීම තොපට ත් අපට ත් තරම් නො වෙයි. තරම් තැනකින් සරණක් ගෙණවු ත් පාවා දෙම්' හ'ම කිවු ය. ඌ නො ගිවිසිමත් ම ය. නො ගිවිස්නා උන්ගේ යාළු වාණන් ද, කැඳවා ලා මසුදසක් දී ලා 'තෙල අහසට සිට නැටූ විද්දත් දුවගේ පියාව දී ලා තමාගේ දුව මපුතුන්ට පාවා දෙන්ට කියව'යි කියා ලා යවූහ.

විද්දතාණෝ ද ඒ අසා 'ම දුව විකුණන්නා නැත. රන් හැර ගෙණ නො දෙමි. අපට ත් රක්‍ෂා ව නම් ඌ ම වේ ද? නො ල-දෙත් මියෙත් නම් මිය ප්‍රයෝජන කිම් ද? අප හා එක් වන්නා ම දුව පාවා දෙමි'යි කිවු ය. දෙ මවු පියෝ එ පවත අසා බිඳුවන්ට[3] සිතා දෝ කිහ. 'එ සේ වී නම් මම උන් හා එක් වෙමි' කියා ලා නෑයන් සියන් නො එක් ලෙසින් නැවතුව ත් සිතා ගත් සිතිවිල්ල පිරිමැසූ බව මුත් කාරිය නො සලකා විද්දතුන් ළඟට ගියහ. විද්දතාණෝ ද, සිටු පුත්‍රයාණන් දන්නා විද්දත් ශිල්පයක් නැත ත් ඒ දෙය මේ දෙය අල්වා ගන්ට වුව ත් සහායක් වුව මනා හෙයින් දුවණියන් පාවා දී ලා උනු ත් කැඳ වා ගෙණ රට මුළුල්ලේ කෙළි ළළු පෑ ඇවිදිති.

ඒ විද්දත් දූ ත් නො බෝ කලෙකින් සිටු පුත් හට පුතකු වද පියා නළවන කල 'ගැල් රකිනවුගේ පුත, 'බර උසුලන්නවුගේ පුත 'කුමකු ත් නො දන්නවුගේ පුතැ'යි කිය කියා නළවයි. සිටු පුත්හු ද, ගැල් රඳවා ලා හුන් තැන දී ගොන්ට තණ ගෙනවු ත් ලති. කෙළි ළළු පෑ ඇවිදි තැන ලත් දෙයක් යන එන තැන ට අදිති. එ ම නිසා විද්දත් දූ ත් පුතු නළවන යම් විටෙක එ ම කියයි. සිටු පුත්‍රයාණෝ ත් ගීයක් යමක් අනිකකු නො ව තමන්

1. එකකුට 2. වයො සාධයික 3. සිඳුවන්ට

Non-Commercial Distribution

අරහයා කියන නියාව දැන ලා 'මේ හැම මා අරහයා කියවු දැ' යි විචාළෝ ය. 'එසේ ය, අනික් කාට කියම් ද? තොප ම කොට ඇවිදිනා කට යුතු හෙයින් තොප ම අරහයා කියමි' කී ය. 'තොප නිසා විද්ද ත් වූවා මදින් නපුරු ත් ඇසුව මනා ද? පලා යෙමි' බිනීම හරවා ගත හැක්කැ යි සිතා කී ය. ඔයි ත් 'තොප ගිය මැනව, හුන මැනව. තොප කුමකු ත් නො දන්නා තැනැත්තවු ගෙන් මට කම් කිම් දැ' යි කියා ලා අවකප්පනයෙන්[1] සැදූ හසුරැත අල්වා ඇදි ඇදි සේ දුවන්නාං සේ එම කිය කියා පුතු නළව යි.

ඕ තොමෝ තමාගේ රූ සම්පත් හැර ගෙණ සිටු පුත්‍රයාණන් තමාගේ කොල්ලකු කොට ත් නො සිත යි. සිටු පුත්‍රයාණෝ ද 'මැගේ මේ අභිමාන ය මැට වඩා සම්පත් ඇත්තන් ඇති හෙයින් සම්පත ත් නිසා ත් නො වෙ යි. තමා ජාති සම්පන්න නො වන හෙයින් ජාතියක් නිසා ත් නො වෙයි. රූපත් හෙයින් ඒ හා තමා දන්නා ශිල්ප පමණක් නිසා ය. මැ දන්නා ශිල්ප ත් උගත් හෙයින් මුත් සයංසිද්ධ[2] නො වන්නේ වේ ද– ඇගේ ඒ බැවුම පලවා මම ත් ශිල්ප උගනිමි' මයිලණුවන් කරා ගොසින් තමන් සමර්ථ හෙයින් උන් දන්නා ශිල්ප ඉගෙන ගෙණ පයි ඇදීමෙන් හැරී ගොසින් රට මුළුල්ලේ ශිල්ප පෑ ගෙණ ඇවිදිනෝ රජගහා නුවර උපන් වැඩී නුවර නො වේ දැ යි ලජ්ජාවෙන් වළඟා ත් නො පියා ඊට ත් අවුත් 'මේ තනට සත් වන දවස් මම ශිල්ප දක්වමි' උග්ගසේන සිටු පුත් නුවරට කියා යවූහ.

සත් වන දවස් බොහෝ දෙන ත් රැස් ව මැසි මත්තේ මැසි ලා ගත්හ. උග්ගසේන සිටු පුත්හු ද සැට රියන් හුණ දණ්ඩක් බිම හිඳුවා ලා උණ දඬු අගට නැංගෝ ය. එ දවස් බුදුහු ත් අලු යම් වේලේ ලොව බලන සේක් හුණ දඬු අගට නැගෙන්නාට පෙරාතු ව තමන් වහන්සේගේ නුවණ නමැති හුණ දඬු අග හුන්නවුන් දැක වන්නේ කුමක් දෝහෝ යි බලන සේක් 'සිටු පුත් තෙමේ ශිල්ප දක්වමි කියා ලා හුණ දඬු අග සිටවී. ඔහුගේ නැටීම් දක්නා නිසා බොහෝ දෙන රැස් වෙති. මම එ තැන දී ගාථාවක් කියමි. ඒ අසා සුවාසූ දහසක් දෙන නිවන් දකිති. උග්ගසෙනයෝ ත් හුණ දඬු අග දී ම රහත් වෙති' දැන වදළ සේක. එ සේ දැන දෙ වන දවස් සිඟා වඩනා වේලා සලකා ලා මහණ ගණ පිරිවරා රජගහා නුවරට සිඟා වන් සේක.

උග්ගසෙන නම් සිටු පුත් ද බුදුන් ඇතුළු නුවරට නො වඩනා තෙක් ම කෙළි ලළු බලන්ව රැස්වූවන් කොක්සන් ගසන

1 අවකප්පනායෙන් 2 සවයං සිද්ධ



Non-Commercial Distribution

නියාවෙන් ඇඟිලි පෑ හිඟි කොට ලා හුණ දඬු අග සිට ලා නික්ම සිස් අහස ම සත් විටක් පෙත්තක් මෙන් සිසැරී ලා බැස හුණ දඬු අග සිටියහ. ඒ වේලාට බුදුහු ත් නුවර ඇතුළට වඩනා සේක් රැස්වූ පිරිස බව අග[1] වුව ත් සිටිනට සමජ්ජවූ තමන් වහන්සේ දිසාව බලත් මුත් හුණ දඬු සැට රියනක් විතර මුත් වඩා උඩ සිටිනට බල නැති උග්ගසේනයන් දිසාව නො බලන ලෙසට ඉටා වදළ සේක.

උග්ගසේනයෝ ත් තමන් පානා කෙළි තමන් ම දක්නා පමණ මුත් රැස් වූවවුන් නො බලන නියාව දැන මුසුප්පු ව ගොසින් 'හවු රුද්දකින් සමසෙකින් අරුමයක් සේ පානා කෙළි බුදුන් අවුත් මෙ තැනට සම්භව ඔබ ම අමුතු ව පහළ වූවා සේ බලන බව මුත් මෙ නුවරට මා ආදියෙන් පානා කෙළි බලන්නෝ නැත. පැසුණු ගොයම් මුල් වූවා සේ දුක් ගෙණ උගත් ශිල්ප ය සිස් වී ය' යි සිතූහ. බුදුහු ත් උන්ගේ අදහස් දැන මුගලන් මහ තෙරුන් වහන්සේ බණවා ලා 'උග්ගසේන නම් සිටු පුත්‍රයාට ශිල්ප දක්වන්ට කියව'යි වදළ සේක. මහ තෙරුන් වහන්සේ ත් ගොසින්-

ඉඞ්ඝ පස්ස නටපුත්ත-උග්ගසෙන මහබ්බල,
කරෝහි රඞ්ගං පරිසාය–හාසයස්සු මහාජනං,

යන ගාථාව වදරා බුදුන් වදළ මෙහෙවර වදළ සේක. කෙළි ළළුවෙහි යොදන්ට බුදුන් මහ තෙරුන් වහන්සේට විධාන කෙළේ හැයි ද යත හොත්–මත්තෙහි ඕ හට වන ප්‍රයෝජන ය සලකා ය. උග්ගසේනයෝ ද මහ තෙරුන් වහන්සේගේ කථාව අසා බුදුහු ත් මාගේ ශිල්ප දක්නා කැමැති නියා වනැ'යි සතුටු ව හුණ දඬු අග සිට ම–

'ඉඞ්ඝ පස්ස මහාපඤ්ඤ-මොග්ගල්ලාන මහිද්ධික,
කරෝමි රඞ්ගං පරිසාය–හාසයාමි මහාජනං'.

කියා ලා හුණ දඬු අගින් අහසට නැඟී ලා තුදුස් විටක් විචර අහස සිසැරී පියා බැස ලා හුණ දඬු අග සිටියහ.

බුදුහු ත් බණ වදරන සේක් 'උග්ගසේනයෙනි, කෙළි ළළුවෙහි ඇලුම් තබා ලා ගිය දවස පැවැති පස් කඳෙහි ආලය ත් හරුව. එ ම පස් කඳ එන දවස පවත්නා ඇලුමු ත් හරුව. දැන් පවත්නා ස්කන්ධයන් කෙරෙහි ආලය ත් හරුව. එ සේ කළා නම් කෙළි ළළුවෙන් තබා ජාති ජරා මරණිනු ත් මිදෙව'යි වදළ සේක. දෙශනා කෙළවර සුවාසූ දහසක් විතර සත්‍වයෝ නිවන් දුටහ.

---

1 හව අහ

Non-Commercial Distribution

උග්ගසේන සිටු පුත්‍රයාණෝ ද කර'ග රහත් වන්නා සේ නො වන බව මුත් හුණ දඬු අගදී පිළිසිඹියා පත් රහත් ව හුණදණ්ඩෙන් බැස පියා බුදුන් ළඟට ගොසින් පසඟ පිහිටුවා වැද ගෙණ මහණ කරන්ට ආරාධනා කළහ. බුදුහු ත් දකුණත දික්කොට ලා 'මහණ, මෙ සේ එව' යි[1] වදළ සේක. ඒ වේලෙහි තුන් සිවුරු ආදි වූ අට පිරිකර ධරා සැට වස් ගිය මහ තෙර කෙණකුන් වහන්සේ මෙන් ආකල්ප සම්පන්න වූ සේක. වහන්දෑ ද 'ඇවැත්නි, සැට රියන් හුණ දණ්ඩෙන් බස්නා ගමනේ භයෙක් නො වී දෑ'යි විචාරා 'අපට භයෙක් නැතැ' යි කී කල්හි බුදුන් කරා ගොසින් 'ස්වාමීනි, උග්ගසේන තෙරහු හුණ දණ්ඩෙන් බස්නා ගමනේ තමන්ට භයක් නැතැ යි කියති. එ ලෙස කියා තමන් රහත් නියාවක් හඟවති' කී සේක. බුදුහු ත් 'මහණෙනි, ම පුතුන් වැන්නවුන්ට භයෙක් කොයින්දෑ'යි වදරා බ්‍රාහ්මණ වර්ගීන් ගාථාවක් වදළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් නිෂ්ප්‍රයෝජන වූ කෙළි ලළු ආදියෙහි ඇලුම හැර නිවනෙහි ම ඇල්ම කොට තුන් දුසිරින් දුරු ව තුන් සුසිරි පුරා මතු මතුයෙහි ලැබිය යුතු ලෞවී ලොවු තුරා ගුණ විශෙෂයට පිහිට විය යුතු.

නැවත එක් දවසක් ධම් සෙබෙයි කථාවක් උපදවන සේක් 'ඇවැත්නි, රහත් වන්ට නිසි මෙ වැනි පිණක් ඇති කෙණකුන් විද්දතුන් හා එක් වන්ට ත් කාරණ කිම ද? රහත් වන්ට නිසි ව කළ පිනු ත් කවරේ දෑ'යි කී සේක. බුදුහු ත් එ අසා වදරා 'මහණෙනි, මේ දෙකට ම නිස්ස කොළෝ මූ තුමූ ම ය' යි වදරා එ ම විභූත කරන්ට ''ගිය දවස කසුප් බුදුන්ගේ රන් ද ගබ කරණ කල්හි බරණැස් නුවර ඇත්තෝ සාල් බත් ගෙන්වා ගෙණ ද ගබ මෙහෙවර කරමහ යි යන්නාහු අතුරු මහ දී එක් තෙර කෙණකුන් සිඟා ගිය වුන් එක් කුල දුවණි කෙණෙක් දැක සමණන්ට 'එක් තෙර කෙණකුන් වහන්සෙ සිඟා වැඩි සේක. ගෙණ යන ගැල්වල බතු ත් බොහො ව ඇත. බත් පාත්‍රයක් පිළිගන්වා ගන්ට පාත්‍ර ය ගෙනව මැනවැ' යි කිවු ය. උයි ත් නො මැළි ව පාත්‍ර ය ගෙනවු ය. බත් පාත්‍ර ය පුරා ලා ස්ථවිර භික්ෂූන්ට පිළිගන්වා ලා 'නිවන් දකුමෝව' යි පතා ගත්හ. උන්ගේ දන පිළිගන්ට සමහ වූවෝ ත් රහත් කෙණෙක. එ හෙයින් දිවසින් බලනූවෝ ප්‍රාර්ථනාව තෙල ලෙසින් ම සමෘද්ධ වන නියාව දැන සිනා පහළ කළහ.

---

1 මහණ–මෙහි එව – ඇතැම

Non-Commercial Distribution

දන් දුන් උපාසිකාවෝ ද සිනා පහළ කළා දැක කාරණ ත් විචාරා නො පියා සමණන්ට 'මුන් වහන්සේ සිනාවක් සී පී සේක. විද්දත් කමෙක් ඇති වනැ' යි කිවු ය. සමණෝ ද 'එ සේ නො කියව' යි නො කියා 'එ සේ සැටි ය' යි කියා උන් කීවා ම ගිවිස ගෙණ නික්මුණාවු ය. මේ උන් දෙන්නා කළ කී කට යුතු ය. ඌ ර් ආයු පමණින් සිට දෙව් ලොව ඉපැද දැන් ඉන් චුත ව එ ලෙස බස කියා ලූ ස්ත්‍රී විද්දත් දූ ව උපන. උග්ගසේනයෝ සිටු කුලයෙහි ඉපැද ත් විද්දත් සැටි යැ යි කියා ලූ බස ගිවිසි පමණෙකින් තුමූ නො විද්දත් වත් විද්දතුන් හා එක් වූ ය. රහත් තෙරුන්ට දී ලූ බත් පාත්‍රයෙහි අනුසසින් උග්ගසේන තෙරහු රහත් වූ හ. විද්දත් දූ ද මෙහෙණි සස්නෙහි මහණ ව රහත් වීමෙන් මනුෂ්‍ය ජාතින් අඩු ව උපන ත් ආර්‍ය්‍ය ජාතින් සරි වුව'' යි වදාළ සේක.

මේ සිත තබා අනුන්ට හෙළා පිරිහෙළා කීමෙන් දුරු විය යුතු.

## 257. ධනුග්ගහ වත

තව ද ශාසනයෙහි උකටලී ඇත්තවුන් ගේ උකටලී හරවනු සඳහා ධනුග්ගහ වත දක්වමු.

කෙ සේ ද යත්—

එක් බාල භික්ෂු කෙණකුන් වහන්සේ ලා පතින් පැමිණ කැඳ ත් ලැබ ගෙණ වළඳන්ට හසුන් හලට ගෙණ ගොසින් පැන් නැති හෙයින් පැන් සොයා එක් ගෙයකට වැඩි සේක. ඒ ගෙයි එක් කුමාරිකා කෙණෙක් දැක ඔබ කෙරෙහි ආලයක් ඇති ව ඉල්වා ගිය පැනු ත් පරභා දෙවා ලා එ ලෙසින් වුව ත් දක්නා කැමැති ව 'ස්වාමීනි, තව ත් පැණින් ප්‍රයෝජනයක් ඇති කල මුබ ම වඩනේ යහපතැ' යි කිවු ය. උන් වහන්සේ ත් එ වක් පටන් යම් දවසෙක පැන් අවශ්‍ය වී නම් කුමාරිකාවන් ගෙන් ආරාධනා ඇති හෙයින් ඔබ ම යන සේක. කුමාරිකාවෝ ත් පාත්‍ර ය හැර ගෙණ පැන් පරභා දෙති.

මෙ සේ කල් යත් අතුර තුරෙහි කැඳ ත් දී ලා එක් දවසක් ගෙයි වඩා හිඳුවා ලා දන් වළඳවා ලා වළඳා අන්තයෙහි ලඟ ව හිඳ ඔබ තමන්ට ලං කොට ගන්නා කැමති ව 'ස්වාමීනි, මේ ගෙයි වුව මනා දෙයින් නැති දෙයෙක් නැත. එක් ව ප්‍රයෝජන විඳ ගන්නා තරම් පිරිමි මිනිස් කෙණකුන් පමණක් නො ලබමහ. අඩු ව නම් එ පමණකැ යි අරුන් වහන්සේට ඇසෙන ලෙස කථා කෙරෙති. 'මුඹ වහන්සේ සිවුරු හැර වැඩි ය මැනැවැ' යි අදහස දත නො හී කියා පිය නො හෙති.

Non-Commercial Distribution

උන් වහන්සේ ද කීප දවසක් විතර ම ඒ කථාව අසා සස්‍යනහි උකටලී සේක. උකටලී ය මහත් හෙයින් වාරිනට වන් සේක. එක් දවසක් අමුතු ව ආ වහන්දෑ ඒ ලදරු නම වැර ගිය නියාව දැක 'අව්‍යාසු කිම් ද? වැර ගියේ හැයි දෑ'යි විචාළ කල්හි සස්නෙහි උකටලිය නිසා සිවුරු හරිනට නැති හෙයින් වාරින නියාව[1] කී සේක. වහන්දෑ ඒ අසා පා සිවුරු ආදියෙහි ආලයෙන් සිවුරු හරිනට ම උත්සාහ නො කරවා ඇදුරු තෙර වත් තෙරවරුන් වහන්සේ කරා ගෙණ ගිය සේක. ඒ තැන් බුදුන් කරා කැඳවා ගෙණ ගොසින් බුදුන්ට දන්වූ සේක. බුදුහු ත් සැබෑ දෑ' යි විචාරා සැබැවැ'යි ස්වාමීනි' කී කල්හි 'මහණ තෝ කුමක් නිසා මෙ බඳු බුදු කෙණකුන්ගේ සස්නෙහි මහණ ව ගෙණ රහතැ'යි හෝ අනාගැමි ය යි හෝ සෙදගැමි ය යි හෝ යටත් පිරිසෙයින් සෝවානැ'යි හෝ කියවා නො ගෙණ උකටලී ය යි කියවා ගනිත් ද? කළ දෑ නපුර. එ සේ ත් කුමක් නිසා උකටලී ද? පිළිවෙත් පිරීම බැරී හෙයින් ද? ගිහි කම්කටුලකට ම සිතා දෑ'යි විචාළ සේක.

'ස්වාමීනි, එක් කුමාරිකා කෙණෙක් මා එ තැනට ගිය විටෙක තමන්ගේ සම්පත් ඇති නියාව ත් එක් ව ප්‍රයෝජන විඳිනා කෙණකුන් නැති නියාවකු ත් මා ඇසිය දී කියති. මම ඒ අසා ඒ සම්පත් එක් ව ප්‍රයෝජන විඳිනා කැමති ව ශාසනයෙහි උකටලී වීමි' කී කල්හි 'මහණ, ඒ ස්ත්‍රිය දූන් තාගේ බ්‍රහ්මචර්‍ය්‍යාවට බාධාවට සිතීම ආශ්චර්‍ය්‍ය නො වන්නේ වේ ද? පෙර එක් කලෙක මුළු දඹදිව දුනුවායන්ට අග්‍ර වූ ධනුග්ගහ පණ්ඩිතයන් වැනි වූ නිසි තරම් ඇත්තවුන් අත් හැර ඒ ඇසිල්ලෙහි දුටු සොරකු කෙරෙහි ස්නේහ ය උපදවා ගෙණ අර තරම් කෙණකුන් මරවා පීදූ 'යි වදරා එ පමණෙකින් නො හැඟෙණ හෙයින් ඒ තත්ව ය හඟවන සේක්–

යට ගිය දවස වුල්ල ධනුග්ගහ පණ්ඩිත කල තක්සලා නුවර දිසාපාමොක් ආචාරීන් ලඟ ශිල්ප මුළුල්ලෙන් ධනු ශිල්ප ය යහපත් කොට ඉගෙන ශිල්ප උගත් නියාවට සතුටු වූ ආචාරීන් සතුටු ලෙස හඟවා සරණ පාවා දුන් උන්ගේ දූවණියනු ත් කැඳවා ගෙණ දුන්නක් හා හී දඬු පණසකු ත් හැර ගෙණ බරණැස් නුවරට යෙමින් සිට කම් බලයෙන් බොහෝ දෙන නැවතුව ත් නො නැවත වල් කඩ දී සම්භ වූ සොරුන් පණස හී දඬු පණසින් විද හෙළා පියා සොර දෙටුවා විදිනට හී දඬු නිමා ගිය හෙයින් ගසා අල්වා බිම හෙළා ගෙණ 'සොඳුර, කඩු පත දෙව'යි කී කල්හි ඒ ඇසිල්ලෙහි දුටු සොරු කෙරෙහි ස්නේහ උපදවා ගෙණ ඔහට

1 වැරෙන නියාව–

Non-Commercial Distribution

කඩු පත දී සමණන් මරවා පූ නියාව ත් සොරු ද මෝ සමණන් මැරෙව්වා සේ ම මාත් මරවා පිය යි. මැ ගෙන් මට ප්‍රයෝජන කිම ද' යි සිතා ලා—

'සබ්බං භණ්ඩං සමාදය- පාරං තිණ්ණොසි බ්‍රාහ්මණ,
පච්චාගච්ඡ ලහුං ඛිප්පං- මමපි තාරෙහි දනිතො

යතු හෙයින් අතුරු මහදී ගඟක් දක ලා හන් පිළී ත් පළන් ආභරණ ත් හැර ගෙණ ඇ මෙ තෙර ම සිටුවා ලා සොරු ගඟින් එ තෙර වූ නියාව ත් ඇ තමා හැර පියා යන නියාව දන ලා 'මා ත් කැඳවා ගෙණ ගිය මැනැවැ'යි කී හෙයින් 'කිසි ත් පුරුදු කමක් නැති මා දක ලා බොහෝ කලක් පුරුදු ව හුන් සමණන් මරවා පිව. මඟ එන මිනිසුන් අරුම නො වන හෙයින් අනික් කෙණකුන් දුටු නම් මා ත් මරවා පියව. එ සේ හෙයින් දුරුබා ම යෙමි'යි කියා ලා ගිය නියාව ත්, ඇ තමා ත් අපගත වස්ත්‍ර ව ගොසින් එළියෙහි සිටිනට ලජ්ජා ඇති ව කැළිල කැළයක් හස් සට වැද ලා හුන් නියාව ත්, ඇට ම ලජ්ජා තර කොට උපදවනු නිසා ශක්‍රයන් කැණහිල් වෙසක් මවා ගෙණ මස් කැටියක් ඩැහැ ගෙණ ගං වැල්ලේ ඇවිදිමින් සිටි නියාව ත් ශක්‍රයන්ගේ විධාන යෙන් ම කුඩමසු වෙසක් ගත් දෙවතාවකු දියස් බඩ ගාවා ඇවිදි නා නියාව ත් කැණහිලාණන් කට තුබූ දඩ මස් කැටි ය වැල්ලේ තබා පියා කුඩ මස්සා සොයා නික්මුණු නියාව ත්, සක් දෙවිඳුහුගේ නියමයෙන් ම උකුසු වෙසක් ගත් දෙවියකු මස් කැටි ය ඩැගෙණ අහසට නැගී නියාව ත් කුඩ මස්සා දියට ම වන් නියාව ත් කැණ හිලාණන් දඩ මස් කැටීයෙනු ත් කුඩ මස්සාගෙනු ත් නො ව උපන් වනින් හිඳිනා උන් තමන් හා සරි ගස්වන්ට කළා සේ ඇ වැද හුන් කැළයට මූණ ලා ලා මුසුප්පු ව ගෙණ හුන් නියාව ත් අරුන් ඒ දක තමාට අනුන් සෙන සිනා තමා ම සෙන්නා සේ කළයක් බිඳ පූවාක් මෙන් මහත් කොට සී පූ නියාව ත් සිනා සී පූ හඩ අසා නො දත් බඳු ව කැණහිලාණන් 'මෙ තැන සිනාවට නිසි වූ කෙළි ලඑවක් නැත. 'සී පූයේ හැ යි ද'යි විචාළ නියාව ත් ඒ නු නුවණ තැනැත්තිය ත් 'නුවණ නැති කැණහිල, ඩැ ගෙණ යෙමින් සිටි දඩ මස් කැටි ය දිය කෝල් බඩ ඇවිදිනා කුඩමස්සා කෙරෙහි ආලයෙන් හැර කුඩමස්සා සොයා ගොසින් කුඩමස්සා දියට වැද ගිය හෙයිනු ත් දඩ මස් කැටි ය උකුස්සා ගත් හෙයිනුත් දෙකින් ම නො ව මුසුප්පු ව ගෙණ හුන් තාගේ නුවණ නැති කම සිතා ලා සීපීමි'යි

Non-Commercial Distribution

කී නියාව ත්, පෙරළා කැණහිලා 'අනුන්ගේ වරදහබයකට කුඩා වුව ත් මහ මෙර සේ මහත් ව පෙනෙයි. තමාගේ වරද මහ මෙර සේ මහත් වුව ත් හබයක් විතර වත් නො පෙනෙයි. තොපි වෛර පුරුෂයාට ආල ය කොට පූර්ව ස්වාමිපුරුෂයාගෙනු ත් නු වූව. වෛර පුරුෂයාගෙනු ත් නු වූව. තෙලට ත් මෙ තැන සී පියන කෙණකුන් නැති හෙයිනු ත් මුත් මෙයට වඩා සිනා නම් එ ම වේ දැ'යි කී නියාව ත් ඒ දූර්ජන තැනැත්ති ය ත්—

'කැණහිලාණෙනි, ඒ එසේ ම ය. එකෙක් නම් වැරද නො යේ ද? මෙ විට සුදුසු ස්වාමි කෙණකුන්ට සම්හ වීම නම් උන්ට හිත පක්ෂ වෙමහ'යි කී නියාව ත් කැණහිලාණන් 'යම් කෙණෙක් මැටි මලාවක් සොරා හැර ගත්තු නම් උෟ තුමූ කළ අභ්‍යාසයට රන් තැටියක් වුව ත් සහවති. උන් කෙරෙහි හැදහිල්ලක් කට නො හැක්ක. තෝ ආදින් තෙල තරමක් කෙළේ යි. පෙරළා ත් නැවැත්මෙක් ඇද්ද? එ ලෙසට ම කෙරෙයි කී ය'' යනාදීන් චුල්ලධනුග්ගහ ජාතක ය විස්තර කොට වදරා එ කල චුල්ල ධනුග්ගහ පණ්ඩිතයෝ නම් තොපි ය. ඒ ස්ත්‍රී නම් මේ ස්ත්‍රී ය. තොප මැ කෙරෙහි ඇලුම් කරණ බව මුත් එ වක මරවා ලූව. කැණහිල් ලෙසින් අවුත් ඇට ලජ්ජා ඉපැද වූ සක් දෙව්ඳු නම් මම ය' යි වදරා මෙ සේ ඒ ස්ත්‍රී ඒ ඇසිල්ලෙහි දුටු සොරු කෙරෙහි පෙම් කොට මුළු දඹ දිව දූනුවාවනට උතුම් ව සිටි එ වැන්නවුන් මරවා පිව. තොප වැන්නවුන් කෙරේ නවතී ද? ඇ කෙරෙහි කළ ඇල්මෙක් ඇත් නම් හරුව'යි බණ වදරන බුදුහු —

'යම් කෙණෙක් කාම විතර්කාදි වූ විතර්ක බහුල ව වෙසෙත් නම් රාග බහුලයෝ වූ නම් එ සේ වූවන්ට ධ්‍යානාදී ගුණධර්මයෙන් කුම කු ත් නැති ව ගොයම් නැති තැන තණ පිරෙන්නා සේ තෘෂ්ණා ව ම වඩ්ඩි. එ සේ වූ තැනැත්තේ උනා පියන්ට නිසි උපදෙස් නො දන්නා බැවින් හූ ලණුයේ ගැට ත් ඇද තර කරන්නා සේ තෘෂ්ණා බාන තර කෙරෙයි. යම් කෙණෙක් ධ්‍යාන බලයෙන් වත් කුශල විතර්ක බලයෙන් වත්, මිථ්‍යා විතර්කයෙන් දුරු වෙත් ද, අසුබ කමටහන යෙදී වෙසෙත් ද උෟ තුමූ ක්‍රම ක්‍රමයෙන් භව ප්‍රාප්තිනා ව ත් සිඳිති. නැවත මාරයා හෙළා ලූ මලක් වැනි වූ කම වට විවා වට කෙලෙස් වට ත් සිඳිති' වදළ සේක. දෙශනා කෙළවර සස්නෙහි උකටලී භික්ෂූන් වහන්සේ සෝවාන් වූ සේක. සෙසු ත් බොහෝ දෙන ලොවී ලොවුතුරා සැප ත් අත් කළහ.

Non-Commercial Distribution

එ හෙයින් සත් පුරුෂයන් විසින් කාම විතර්කාදි වූ මිථ්‍යා විතර්ක නම් අනර්ථාවහ දෙයක් බැවින් තදඩගාදී වීසින් එයින් දුරු ව නෛෂ්ක්‍රම්‍ය විතර්කාදියෙහි පිහිටා භවක්ෂයට ම යත්න කට යුතු.

## 258. මාරයා ගේ වත

තව ද කවුරුන් කුමක් කළ ත් කළවුන්ට වන භයක් මුත් රහතන්ට භය නැති නියාව හඟවන්ට මාරයා ගේ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්—

එක් දවසක් නො කල් නො වේලා කොට ලා බොහෝ මහර වරුන් වහන්සේ දෙව්රමට අවුත් සැතපෙන තැන් නො සැහෙන්නා රාහුල තෙරුන් වහන්සේ වසන තැනට ගොසින් උන් වහන්සේ උගුළුවා පියා තමන් වහන්සේ සැතපුණු සේක. රාහුල තෙරුන් වහන්සේ ද සැතපෙන තැනක් සොයා පියා අනික් තැනක් නො ලදින් බුදුන්ගේ දිව්‍ය මණ්ඩපයක් මෙන් සරහා තිබෙන වැසිකිළි පෙර මාලෙහි සැතපුණු සේක. උපසම්පන්න ව වසක් විතර ත් නො ගිය හෙයින් වයසින් බාල වුව ත් රහත් වූ හෙයින් ගුණෙන් මුකුරා සිටි සේක.

වසවත් මර දෙව් ලොව දී ම ඒ රාහුල තෙරුන් වහන්සේ වැසිකිළි පෙර මාළේ සැතපුනා දැක 'මහණ ගොයුම්හුගේ රෙදෙන ඇඟිල්ලක් වැනි පුතණුවන්දෑ වැසිකිළි පෙර මාළේ වැද හොත් දෑ ය. තමන් වහන්සේ ඇතුළු ගඳ කිළියෙහි සැතැපුණු සේක. ඇඟිල්ල රෙදවා ලූ කලට ඊගහට ඔබට ත් ඇති වන්නේ වේ ද'යි යන දුර්බුද්ධියක් සිතා ගෙණ මද නැඟි මහත් ඇත් වෙසක් මවා ගෙණ අවුත් ලා සොඬින් සිකනලකු හිසට නැඟි කලක් මෙන් හිස වෙළා ගෙණ භය ගන්වන්ට මහත් කොට ගසක් බිඳෙන කලක් මෙන් ගුගුරා පී ය.

බුදුහු ගඳ කිළියේ වැඩ හුන් සේක්-ඌ මාරයා නියාව දැන ලා 'මාරය, තා වැන්නෝ ලක්‍ෂයකු ත් ම පුතුන්ට භයක් උපදවා ලිය හෙත් ද, ඒ නො පිළිවනැ'යි වදරා ලා පුතණුවන් වහන් සේගේ තරම් වදරන බුදුහු 'හෙම්බල මාර ය, මේ රහල් තෙර හුගේ මේ ශාසනයට නිෂ්ටාව නම් අර්හත්වය ය. ඊට ත් මූ පැමිණියෝ ය. භය කාරණ මුලින් ම නසා පී හෙයින් භයකු ත් නැත්තෝ ය. කිසිවෙක ත් මුන්ගේ ඇල්මක් නැත. එ හෙයින් කෙ-ලෙසුන්ට අවසරයෝ නො වෙති. භවෝත්පත්ති කාරණ ත් සිඳ පීහ

Non-Commercial Distribution

තෙල තුලුන්ගේ ආත්ම භාවය ත් කඩ තෙල් නිමා සිටි පානක් මෙන් කෙළවර අත් බැව ය. පෙරළා අනික් තැනෙක උත්පත්තියකු ත් නැත. ස්කන්ධ භාව ය මෙ වක් පටන් ඔබබෙහි අය වීම නැති හෙයින් ස්කන්ධයන්ගේ ගැන්මෙකු ත් නැත. සිවු පිළිසිඹියායෙහි ත් දක්‍ෂයෝ ය.

'තව ද අවයව අක්‍ෂර ත් දනිති. අක්‍ෂරාත්මක වූ ශබ්ද වින්‍යාස ද දනිති. ඒ සුනිශ්චිත කොට දන්නා හෙයින් ආදි ය පෙනුණු කලට මධ්‍යාවසාන දෙක නො පෙනුණ ත් 'මේ අකුරු මුල් ව සිටි කලට මෙ මධ්‍යය ය. මේ කෙළවර ය'යි කියා ත් දනිති. කෙළවර අකුරු පෙනී ආදි මධ්‍ය ය නො පෙනුණු කලට මේ අකුරට මේ මධ්‍ය ය, මේ ආදිය'යි කියා ත් දනිති. මධ්‍යයේ අකුරු පෙනුණ කලට 'මේ අකුරට මේ අකුරු ආදිය ය. මේ අකුරු කෙළවර ය'යි කියා ත් දනිති. පශ්චිම භවික හෙයින් ත්‍රි හෙතුක ප්‍රතිසන්‍ධික ව මහා නුවණැත්තෝ ය. පූජ්‍ය පුරුෂ ව සිටි හෙයින් මහා පුරුෂයෝ ය'යි වදළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ. වසවත් මර තෙමේ පලා ගොසින් තමාගේ දිව සම්පත් දිට. අචිජ්ජීක තැනැත්තවු හෙයින් මත්තට උපාශ්‍රය විවරකු ත් නො වී ය.

එ හෙයින් නුවණැත්තවුන් විසින් අසන බණ දහම් මාරයා ඇසූ බණ දහම් සේ නො කොට භවක්‍ෂයට කල් නො වත ත් මත්තට උපාශ්‍ර ය වන ලෙසට බණ අසා ඒ වූ පරිද්දෙන් පිළිපැද තෘෂ්ණා දශඛයෙන් මිදෙන්ට උත්සාහ කටයුතු.

## 259. උපකාජීවකයන් ගේ වස්තුව

තව ද සර්‍වඥවරයන් ගේ කථා මතු මත්තට උපාශ්‍රය වන පරිදි භගවත්ට උපකාජීවකයන් ගේ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්—

බුදුහු බුදු ව ලා බෝ මැඩට නුදුරු ව සත් සති යවා වදරා බ්‍රහ්මාරාධනාවෙන් දම් සක් පවත්වන්ට බරණැස් නුවරට වඩනා සේක් අතුරු මහදී උපක නම් ආජීවකයන් දුටු සේක. උයි ත් ඔබ දක බුදු වූ නියාව නො දත් හෙයින් 'ඇවැත්නි, තොපගේ ඇඟ මූණ පැය යහපත. ඉන්ද්‍රියාවකාශයෝ ත් ඉතා ප්‍රසන්නයහ. කවුරුන් උදෙසා මහණ වූ ද? තොපට ශාස්තෘ කවුරු ද? කවුරුන් බණක් රුස්වා ගෙණ වසවු දැ'යි. විචාළහ.

Non-Commercial Distribution

බුදුහු ත් ස්වයම්භූ බව මුත් ආචාර්ය්‍ය-උපාධ්‍යාය කෙණකුන් නැති නියාව වදරන සේක්–‘ රහත් මඟින් සව් කෙලෙසුන් නසා සිටි හෙයින් ත්‍රෛලොක්‍ය භූමක[1] ධර්ම ජාත ය මැඩ සිටියෙමි. සාධා ගත්තාවූ බුදු නුවණින් චාතුර් භූමක ධර්ම ජාත ය මුළුල්ල ම දනිමි. වස මුසු දෙයක් බලා හරන පමණක් මුත් අනුභව ය නැත්තා සේ දත් පමණක් මුත් එහි ඇලුම් නැත්තෙමි. ඇලුම් නැති බැවින් ම නයින් නිරාලය ව සැව ගළවන්නා සේ ත්‍රෛභූමක ධර්ම ජාත ය ආදීනව දක්මෙන් හළිමි. ඇල්මක් කෙළෙම් නම් සාරාසැකි කප් සුවහස් මුළුල්ලෙහි කළා වී ම හෙයින් අර්හත් ඵල විමුක්තියෙහි ය. දත යුතු ධර්ම ජාතයෙහි ආදි මුළුල්ලට ම ගුරූපදෙශ නැති ව මා ම දැන ගත් කල ආචාර්ය්‍ය උපාධ්‍යාය කමට කවුරුන් පයිම් ද? දන් බුදු වූ අවස්ථාවෙහි තබා උපන් දවසු ත් මට වඩනන් තබා සරි ව සිටිනෝ ත් නැත්තෝ වෙත් දැ’යි වදළ සේක.

බුදුන් වදළ කථාවට උපකාජීවකයෝ සතුටු ත් නො ව මුසුප් පූ ත් නො ව හිස සලා ලා දිව ත් දික් කොට පියා එක් පියවර මං හසරකට නැඟී වැද්දන් වසන ගමකට ගොසින් වැදි දුවක රක්‍ෂා කොට ගෙණ හිඳ පසු ව ඇ හා ඩබරක් කොට වදළ කථා පමණ උපාශ්‍රය කොට ඔබ කරා අවුත් බණ අසා අනාගැමි ව ඒ ඇසිල්ලෙහි මිය අවිහ නම් බඹ ලොව ඉපැද උපන් ඇසිල්ලෙහි ම රහත් වූහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් කරණ කථා ත් සත් පුරුෂයන් හා ම කොට බුදුන් හා කථා කළ උපකාජීවකයන් මෙන් අර්‍ථ සිද්ධි ය එළවා ගත යුතු.

## 260. සක් දෙවිඳු ගේ වස්තුව

කව ද සියලු ම දුකට මුල් ව සිටිනා තෘෂ්ණාව නසා පි කලට බිජු වට නට කලට ගොයම නැත්තා සේ සියලු ම දුක් නැති නියාව භාවන්ට සක්දෙවිඳු ගේ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්—

එක් සමයෙක තව්තිසා දෙව ලොව දෙවියෝ රැස් ව හිඳ ‘දනින් කවර දනෙක් උතුම් දෝ? රසයෙන් කවර රසයෙක් උතුම් දෝ? ඇල්මෙන් කවර ඇල්මෙක් උතුම් දෝ? අර්හත්ව ය කුමක් නිසා උතුම් දෝ හෝ’යි මෙ ප්‍රශ්න සතර උපදවා ලූහ.

1. ත්‍රෛලොක්‍ය භූමික

Non-Commercial Distribution

උපදවා ලූ පමණක් මුත් මොළවා ලූ ගිනි මහත් වූ කලට නිවා ලිය නො හෙන්නා සේ ප්‍රශ්නයෙහි සරූප ය දන ගත හෙන්ට එක දේවතා කෙණකු ත් සමත් නො වූහ. එක් දේවතා කෙණෙක් අනික් දේවතාවාණ කෙණකුන් අතින් විචාරති. ඌ අනික් දේවතාවාණ කෙණකුන් අතින් විචාරති. දස දහසක් සක්වළ දෙවියෝ ම විචාළ මනා ම ප්‍රශ්නයක් හෙයින් දෙළොස් හවුරුද්දක් මුළුල්ලෙහි ම විචාරා ඇවිද්දෝ ය. දෙළොස් හවුරුද්දක් විචරිනු ත් සනිටුහනක් නො දක දස දහසක් සක්වළ දෙවියෝ මේ සක්වළට රැස් ව සතර වරම් රජුන් කරා ගොසින් 'දෙවතා සන්නිපාත ය මහත. කුමක් නිසා දැ'යි කී කල්හි 'ප්‍රශ්න සතරක් සිතා ලා ඒ ප්‍රශ්නවල සනිටුහන් නො දනෙත හෙයින් රැස්වූහ'යි කිවූ ය.

ප්‍රශ්න කවරේ දැ'යි විචාරා ප්‍රශ්න ත් අසා දන 'තෙල ප්‍රශ්න වල අර්ථ නො දනෙන්නේ තොප හැම දෙනාට මතු නො වෙ යි. අපට ත් නො දනේ ම ය. බල, එකෙක් ඇත. අපගේ සක් දෙව් රජ්ජුරුවන් වහන්සේ නුවණින් පිණින් අප හැමට ම වැඩි සිටිනා සේක. දහසක් දෙනා සිතා ලූ ප්‍රශ්න වුව ත් එක විට විසඳන්ට බල ඇති සේක. එව, ඔබ යම්හ'යි දෙව් පිරිස් කැඳවා ගෙණ සතර වරම්හු සක් දෙවිඳුහු කරා ගොසින් ශක්‍රයනු ත් 'වරම් රජුනි, දෙවියන් රැස්වූ නියාව මහත. කුමක් නිසා දැ'යි විචාළ කල්හි වරම් රජදරුවෝ සෙසු දෙවියන් තමන්ට කී ලෙස ම ශක්‍රයන්ට කීහ. ශක්‍රයෝ ඒ අසා තුමූ ඒ ප්‍රශ්නවල අර්ථ විමසන්ට උත්සාහ නො කොට 'හෙම්බා වරම් රජ දරුවෙනි, මේ ප්‍රශ්නවල අර්ථ කියා ලන්ට බුදු කෙණකුන් වහන්සේට මුත් තොප හැමට ත් මට ත් නො පිළිවන. බුදුහු දන් කො යි දැ'යි විචාරා දෙවරම නියාව අසා 'තරාදිය තබා පියා අතින් කිරන්නා සේ තොප ත් අප ත් ආයාස ගන්නේ හැයි ද? එව, ඔබ යම්හ'යි තමන් කරා ගොසින් රැස් වූ දෙවියන් කැඳවා ගෙණ මධ්‍යම රාත්‍රි වේලෙහි සියලු දෙව්රම බුදුන්ගේ රස් පහළ වූ තැන් හැර බොහෝ සේ බබුළුවමින් බුදුන් කරා ගොසින් වැඳ එකත් පස් ව සිට 'හැයි ශක්‍රයෙනි, බොහෝ දෙවියන් පිරිවරා කුමක් නිසා අවුදැ'යි විචාරා වදළ කල්හි 'ස්වාමීනි, දේවතාවෝ තමන් අතුරේ ම ප්‍රශ්න සතරක් සිතූහ.

ඒ ප්‍රශ්නවල අර්ථ සෙස්සන්ට තබා උන් තමන්ට ත් නො හැකෙ යි. තමන්ට නො හැකෙන්නා ඌ හැම වරමුන් කරා ගියහ. වරම්හු ත් උන් හැම හැර ගෙණ මා කරා අවු ය. මම මට ත්

Non-Commercial Distribution

නො හැඟෙන හෙයින් මුඹ වහන්සේ කරා අයිමි. මුහුද කෙ තෙක් පළල වුව ත් වෙරලාන්තයට පැමිණ නවත්නා සේ ප්‍රශ්න නමැති කෙ තෙක් රළ ත් සර්‍වඥ නමැති සමුද්‍ර රෙබාවට පැමිණ මුත් නො නවත්ති. වෙරලාන්තයට පැමිණ රළ බිඳී යන්නා සේ මේ ප්‍රශ්න නැමැති රළ ත් විසඳීමෙන් බිඳ වදළ මැනැවැ'යි කී කල්හි 'යහපත, ශක්‍රයෙනි, සම තිස් පැරුම් පූරා මා බුදු වූයේ ත් තොප හැම විචාළ ප්‍රශ්න හැර පියා සෙස්සක් විසඳන්ට නො වෙයි. මහා වහ්නි ස්කන්ධයක් ලූ ලූවක් ම නො තෝරන්නා සේ කවුරුන් විචාළ ප්‍රශ්න ත් විසඳන්ට ය. විචාරව'යි වදළ සේක. ශක්‍රයෝ ත් දෙවියන් සිතූ ලෙස ම විචාළෝ ය.

බුදුහු ත් ඒ ප්‍රශ්න විසඳන සේක් 'මහම්බා ශක්‍රයෙනි, යම් කෙණෙක් දිගිනු ත් පළලිනු ත් අට සාළිස් ලක්‍ෂ තෙ ළෙස් දහස් අට සියයක් ගවු පමණ වූ වටින් එක් කෙළ සිවු සාළිස් ලක්‍ෂ එක් සාළිස් දහස් සාර සියයක් ගවු පමණ වූ සක් වළ ඇතුළ මූදු මාන ය හැර සෙසු තැන් සමතල කරවා ලා බිම පටන් අකනිටා බඹ ලොව දක්වා රුවන් මණ්ඩපයක් කරවා ලා පත් කඩින් පත් කඩ ගාවා බුදු පසේ බුදු මහ රහතන් වඩා හිඳුවා ලා කෙහෙල් ගොප් හා සමාන සළු කප්වා පියා සිවුරු කරවා ලා දන් දුන්නු නමුත්, එ සේ ම අති මධුරාහාර ය පාත්‍ර පූරා දන් දුන්නු නමුත්, මහා විහාර ය වැනි ලක්‍ෂ ගණන් විහාර කරවා දන් දුන්නු නමුත්, ලෝවාමහාපාය වැනි ලක්ෂ ගණන් ප්‍රාසාද කරවා දුන්නු නමුත්–

'සුරුචි බ්‍රාහ්මණ ව උපන් මා මඬගල බුදුන් ප්‍රධාන වූ කෙළ ලක්‍ෂයක් මහ රහතන්ට පාත්‍ර පූරා ගිතෙල් මී සකුරු ආදී වූ බෙහෙත් බඩු දුන්නා සේ ගිලන්පස බෙහෙදු ත්[1] දුන්නු නමුත් දන් විෂයෙහි විශාඛාවන් පූර්වාරාමයට කළ පරිත්‍යාග ය සේ සත් විසි කෙළක් විතර වස්තු පරිත්‍යාග ය වී නමුත්, අනේපිඩු මහ සිටාණන් දෙව්රමට කළ පරිත්‍යාගය සේ සූ පනස් කෙළක් විතර වස්තු පෙණෙ නමුත්, ධර්මාශොක රජ්ජුරුවන් සූවාසූ දහසක් විහාරවලට කළ පරිත්‍යාග ය සේ සයානූ කෙළක් විතර වස්තු වියදම් දන් විෂයෙහි පෙනේ නමුත්, වේලාම බ්‍රාහ්මණ ව උපන් මාගේ පාත්‍ර පත්ලේ පටන් මුව විට උසින් අට රියනක් උස ඇති මුව පළල නව රියන් පමණ වූ පාත්‍ර පත්ලේ සිට බිජු වට අමුණක් වප්යන විතර පා මුව විට අසූන් තුන් දෙණකු යෙදූ රථ ය යා හැකි සූවාසූ දහසක් රිදී පාත්‍ර පූරා රත්රණ් හා රන් පාත්‍ර පූරා රිදී හා තඹ පාත්‍ර පූරා සත් රුවන් හා දඹ දිව වැස්සන්ට දුන්නා

1 බෙහෙතු ත්

Non-Commercial Distribution

සේ මහත් පරිත්‍යාගයක් පෙනේ නමුත්, ඒ හැමයට ත් වඩා යම් කෙණෙක් නිස්සරණාධ්‍යාශයෙන් සතර පෙදෙන් යුක්ත වූ ගාථා පමණෙකිනු ත් බණ කිය ත් නම් එ ම උතුම.

ඊට කාරණ කිම් ද යත්? බණ ඇසී ම පින් කිරීමට මුල් ව සිටිනා හෙයින. තව ද බුදු පසේ බුදු දෙ පක්‍ෂ ය හැර කපක් මුළුල්ලෙහි වටුවාවූ වැස්සෙහි ත් පොද ගණන් කියා ලන තරම් නුවණැති ශාරිපුත්‍රාදී මහ රහතන් රහසේ ත් තමන් වහන්සේගේ ශක්තීන් සෝවාන් විය නුහුණු සේක. අස්සජි ආදී වූ මහතුන් ගෙන් එක් ගාථා මාත්‍රයයක් පමණක් වුව ත් අසා ම ලොවුතුරා ගුණ විශෙෂයට පැමිණි සේක. බුදුන්ගේ බණ අසා අග සවු ත නතුරු ලත් සේක. එ හෙයිනු ත් ධර්මදාන ය ම උතුම.

රසයෙන් කවර රසයෙක් උතුම් දූ යි විචාළ වා ද? ඉක්ෂු-මධු ගුළ-ශර්කරාදිවූ යම් රසයෙක් ඇත් නම් එයින් උඩ ත් පිරිසෙයින් දෙවියන්ගේ සුධාභොජන රස ය දක්වා ත් ගෙධාපන්න ව අනු-භව කරන්නවුන් සසර ඇවිද්දීමට කාරණ වෙයි. පර්‍ය්‍යාප්ති මූලක වූ ප්‍රතිපත්තීන් සාධා ගන්නා වූ තව ලොවුතුරා දහම් රස-යෙක් ඇත් නම් වෘත්ත සන්නිශ්‍රිත නො වන හෙයින් එ ම උතුම.

තව ද ඇල්මෙන් කවර ඇල්මෙක් උතුම් දූ යි විචාළ වා ද? අඹු දරුවන් කෙරෙහි කරණ ඇලුම ය, වස්තුයෙහි කරණ ඇලුම ය යනාදී වූ යම් ඇල්මෙක් ඇත් නම් සසර නමැති සිර ගෙයි ලා ලා මහ දුක් විඳුවයි. ඉඳුරා සිතින් බණ කියන්නවුන්ට වේව යි බණ අසන්නවුන්ට වේව යි එහි උපදනා ඇල්මෙක් ඇත් නම් ඒ ඇල් මෙන් රහත් වීමෙන් මුදුන් පමුණුවානු යි ඒ ධර්ම රති ය හැමට ම වඩා උතුම. අර්හත්ත්ව ය වූ කලී සියලු දුක් ම නසන හෙයින් ම එ ම උතුමැ'යි වදාළ සේක. බුදුන් මේ ප්‍රශ්න සතර විසඳ ත් විසඳ ත් සුවාසූ දහසක් දෙවියෝ නිවන් දුටහ.

සක් දෙවිඳු ත් මේ බණ අසා බුදුන් වැඳ ලා 'ස්වාමීනි, ධර්ම-දාන ය මෙ සේ ම බලවත් කල බණ වදරා අන්තයෙහි අපට පින් නො දෙන්නේ හැයි ද? මෙ වක් පටන් වහන්දෑට විධාන කොට ලා බණ කියා අන්තයෙහි පින් දෙවුව මැනැවැ'යි කිවු ය. බුදුහු ත් උන්ගේ බස් අසා වහන්දෑ රැස් කරවා ලා 'මහණෙනි, අද පටන් යට ත් පිරිසෙයින් අනුමෙවෙනි බණක් වුව ත් බණ කිවූ නම් බණ කියා අන්තයෙහි හැම් දෙනාට ම පින් දෙව'යි වදාළ සේක. එ වක්

Non-Commercial Distribution

පවත් මෙ වක දක්වා ත් මෙ වක පටන් පස්වා දහස මුළුල්ලෙ හි ත් පවත්ති.

එ හෙයින් සෞජන්‍යයෙහි පිහිටියවුන් විසින් දෙශනාමය කුශල සිද්ධ කරන්ට තම හට බැරි වුව ත් විධාන කොට අනුන් ලවා ත් කරවා තමා කෙරේ ම පවත්වා ගෙණ එයින් ජනිත කුස ලානුභාවයෙන් භව සැප ත් වළඳා කෙළවර නිවන් අත් කට යුතු.

## 261. අපුත්තක සිටාණන් ගේ වත

කෙ සේ ද යත්—

ඒ සිටාණන් මළ නියාව අසා කොසොල් රජ්ජුරුවෝ 'සම්පත් හිමි වන්ට නිසි දරු මලු කෙණකුන් නැති කලට මෙ සම්පත් කවුරුන් සන්තක වේ දැ' යි විචාරා 'රජ දරුවන්ට වේ දැ'යි කී කල්හි වස්තුව ත් සුහක් නො වන හෙයින් පරිවාර යවා සත් දවසක් විත රින් රජ ගෙට ගෙන්වා ගෙණ සම්පත පිරිමස්වා තබ්බවා ලා තුමූ බුදුන් ලඟට ගොසින් 'දවාල් කොට පියා අවුනැ'යි විචාරා වදළ කල්හි 'ස්වාමීනි, මෙ සැවැත් නුවර සිටාණ කෙණෙක් මළෝ ය. සත් දවසක් විතරින් ඒ සම්පත ගෙන්වා භාණ්ඩාගාරයෙහි ලවා අවසර වූයෙ අද ම ය. ඒ නිසා මෙ තෙක් දවස් දකින්ට එන වේලෙන් අද වේලාව පැන නැංග'යි කිවු ය.

ඒ මිය ගිය සිටාණන්ගේ සැටි නම් රන් තළියෙන් නො එක් අග්‍ර රසයෙන් යුක්ත වූ භොජන ය කන්ට ගෙනා කලට 'මෙ සේ වූ දෙයකු ත් තමා මිනිසුන් අනුභව කරණ නියා ද? අප ලා කෙළනා නියා වේ දැ' යි දඬු පත් හැර ගෙණ බත් ගෙනාවවුන් මරා ලුහුබඳවා පියා මිනිසුන්ට වුව මනා ත් කැව මනා ත් මේ ය යි කාඩි ව ත් කරවා ගෙණ[1] නිමුඩු සාලේ බත් කති. සළු සොලී[2] පිළියක් හඳිනට ගෙණා කල ගෙනාවවුන් මරා නෙර පියා වක්කාරි පිළි රුස්වා හඳිති. නැහෙන්ව යහපත් රථයක් ගෙනවූ නම් රථ ය ගෙනාවවුන් මරා නෙර පියා ගොන් මාල්ලන් යෙදූ මාලු රථ ය කින් යෙති. හිසට කරන්ට හෙළ කුඩ ගෙණා කලට එයි ත් හිසට නො කරවා පත් කුඩ මාලු හිසට කරවති' යනාදීන් සිටාණන්ගේ

1 බත්කරවා ගෙණ 2 සොලි

Non-Commercial Distribution

පවත රජ්ජුරුවන් දුන්වූ කල්හි බුදුහු එ ලෙස උන් කරන්ට කාරණ වදරන සේක් 'මහ රජ, මෙයට යට ගිය දවස තගරසිඛී නම් පසේ බුදුන් දුක බතක් දෙව යි ඇමෙණියන්ට සම්මත කොට ලා තුමූ තමාගේ කට යුත්තෙක ගියහ. සැදෑ නැති තැනැත්තවුන් සිරිතක් සේ කියා ලා පලා ගිය ත් උන්ගේ ඇමෙණියෝ තමන් සැදෑ ඇති හෙයින් 'මුන් දනක් දෙන්ට කියන බසක් අද විනා මා ඇසූ විරූ නැත. මුන්ගේ අදහස් කවරේ වුව ත් මාගේ අදහස් වූ ලෙසට දනක් දෙමි' යි පසේ බුදුන් වහන් සේගේ පාත්‍ර ය ආරාධනා කොට ලා හැර ගෙණ මධුරාහාරයක් පුරා ලා දුන්හ.

බත් දෙන්ට විධානයක් කොට ලා ගිය සිටාණෝ ද පෙරළා ගෙට එන්නෝ 'මහණ, ලද්දේ කිම ද යි විචාරා පියා පාත්‍ර ය අතට හැර ගෙණ බැලූ තැනැත්තෝ මධුරාහාර ය දුක සතුටු වුව මනා තැන මසුරු සිත් බලවත් හෙයින් මුසුප්පු ව ගොසින් 'ඉදින් මෙ වැනි බතක් අපගේ කෙළි කොලු කෙණෙක් කැවූ නම් කර්මාන්ත නො මැළි ව කෙරෙති. මූ තුමූ බත අනුභව කොට ලා අනිත් කරණ බලන දෙයක් නැති හෙයින් නිදති. අනේ බතෙක්·නිෂ්ප්‍රයෝජන වූ බත්දේ' යි සිතී ය. මහ රජ, මෙ සිටු තගරසිඛී නම් පසේ බුදුන්ට බත් දෙන්ට විධාන කළ හෙයින් සත් වරෙක කාමස්වර්ගයෙහි උපන. දුක සිත පහදවා ගත නුහුණු අකුශලයෙන් මෙ ම සැවත් නුවර සත් වරෙක සිටු කුලයෙහි ඉපැද ලද සම්පත් විඳිනට මෙ පරිද්දෙන් ම අදහස් ලද නොහීන.

දරුවන් නැති වන්ට කාරණ කවරේ ද යත්—සසර සිටිනා කල තමන්ගේ බෑ[1] කෙණකුන් මළ තැන උන්ගේ පුත් පැටවකු මූ තමාගේ ඇඟිල්ලේ එළී ගෙණ ඇවිදිනා ගමනේ 'මූ අපගේ පියාණන් වහන් සෙ සන්තක වහල ය, සරක ය, යනාදීන් කී කල්හි කුඩා පිය ව සිටි මෙ සිටා 'මූ තුමූ දුන් ම මෙ ලෙස කියති. වැඩුණවූ නම් මෙ සම්පතින් අපට කුමක් හැර ලත් දෑ'යි කියා වලට කැඳවා ගෙණ ගොසින් ලා එක් ගසක් මුල දී බොටුව අඹරා මරා පියා ඒ වල ම දමා පියා ඒ අකුශල කර්ම බලයෙන් හවුරුදු කෙළ ගණන් නරකයෙහි පැසී පියා අකුශල කර්ම ය තව නො ගෙවුණ හෙයින් මෙ ජාති ය ඇතුළු ව සත් ජාතියෙක දරුවන් නැති සම්පත රාජ භාණ්ඩාර වී ය. මහ රජ, ඒ සිටා සිටු කුලවල උපද නට නිසි පරණ පිනු ත් ගෙවිණ. අමුතුව පිණක් සිද්ධ වන්ට ත්

---

1 බෑණා

Non-Commercial Distribution

නො වී ය. දනු ත් මිය මහා රෞරව නම් නරකයෙහි උපනැ යි වදළ සේක.

බුදුන් වදළ කථාව රජ්ජුරුවෝ අසා 'අනේ ස්වාමීනි, සිටාණන් ගේ තරමක් නපුරු නියා ය. බත් බිජුවට ඇති ව ම ගොයම් නො කළා සේ මේ සා මහත් සම්පතක් ඇති ව මුඹ වහන්සේ වැනි බුදු කෙණකුන් වහන්සේ බල බලා ත් පිණකු ත් කට නුහුණු වූ ය. පින් කරන්නා තබා තුමූ ත් ප්‍රයෝජනයක් විඳ ගත නුහුණු වූ ය'යි කිවූ ය. බුදුහු ත් ඒ මුල් ව බණ වදරන සේක් 'මහ රජ, යම් කෙණෙක් නිවන් සාධා ගත නුහුණු නම් එසේ වූ නුවණ නැත්ත වූන්ට සම්භ වූ සම්පත් කකුළුවන්ට සම්භ වූ දරුවන් මෙන් නස යි. නුවණ නැත්තා වූ සත්‍වයෝ වස්තු ලෝභයෙන් වෙදබ්භ ජාතකයෙහි එක් කෙණකුන් අධික යෙළ දහසක් විතර අනුනු ත් නසා තමනු ත් නැසී එක් කෙණකුන් විතර ත් ඉතිරි වන්ට නු වූ වා සේ ලද සම්පත් නිසා සාර්ථක කරණ උපදෙසක් නො දන්න හෙයින් අනුනු ත් නසති. තුමූ ත් නැසෙති' වදළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් ලද සම්පතෙක් ඇත් නම් අපුත්තක සිටු සේ නො ව ලොවී ලොවුතුරා සැපත් ම සාධන්ට උත්සාහ කට යුතු.

## 262. අඞ්කුර වස්තුව

තව ද සරු කෙත ලා ලූ බිජුවටක් මෙන් පුණ්‍ය ක්‍ෂෙත්‍රයෙහි වපුළ පින් බිජුවටින් ලොවී ලොවුතුරා ශස්‍ය ඵල ය සකසා සිද්ධ වන නියාව හඟවන්ට අඞ්කුර වස්තුව දක්වමු.

කෙ සේ ද යත්—

මෙහි කථාව විස්තර විසින් යමක ප්‍රාතිහාර්‍ය්‍ය වත ආ ය. වදරමින් හුන් විදම් හිණ සඬි කොට ලා අඞ්කුර දෙව් පුත් හට බණ වදරන සේක් —

'විචෙය්‍ය දනං සුගතප්පසත්‍ථං-යෙ දක්ඛිණෙය්‍යා ඉධ ජීවලොකෙ
එතෙසු දින්නානි මහප්ඵලානි-බීජානි වුත්තානි යථා සුඛෙත්තෙ

යනු හෙයින් 'දනක් නම් දෙන කල ගොයම් යහපත් ව නැඟෙන බිම් පරීක්‍ෂා කරන්නා සේ දන් පිළිගන්ට නිස්සවුන් පරීක්‍ෂා කොට ලා දිය යුතු. සරු කෙත් බලා වපුල බජුවට සේ පරීක්‍ෂා

Non-Commercial Distribution

කොට ලං දී ලූ දනෙහි විපාක මහතැ'යි වදරා තව ත් වදරන සේක් 'යම් සේ ගොයම් කළ බිම මාරතු ආදි ය ඇති වී නම් ඒ ගොයම් නසා ද, එ මෙන් යම් කෙණකුන්ගේ සන්තානයෙහි රාග ද්වෙෂ-මොහ ය හා ඉච්ඡාව බහුල ව පවත්නේ වී නම් උං තුමූ ගොඩ ගොයමට මඩ හෝ මඩ ගොයමට ගොඩ හෝ තරම් නො වන්නා සේ දයකයන්ගේ දන් පිළිගැන්මට තමන් සන්තාන ශුද්ධි ය නැති බැවින් නො නිස්සහ. එ හෙයින් බුද්ධ ප්‍රත්‍යෙක බුද්ධ ශ්‍රාවකයන්ට දුන් දෙයෙහි විපාක ඉන්‍දක දෙව් පුත්හු අනුරුද්ධ මහ තෙරුන්ට දුන් බත් සැන්ද මෙන් විපාක මහතැ'යි වදළ සේක. දෙශනා කෙවර ඉන්‍දක දෙව් පුත් හා අඞකුර දෙව් පුත්හු සෝවාන් වූහ. තව ත් බොහෝ දෙනාට මේ දෙශනාව සප්‍රයෝජන වී ය.

එ හෙයින් නුවණැත්තවුන් විසින් කල් දන කරණ ගොයමක් සේ සුළං බලා කරණ යාත්‍රාවක් සේ කරණ පින් කම් පින් කෙත් දන ම කට යුතු.

## 263. භික්ෂුවහන්දෑ පස්නමක ගේ වස්තුව

තව ද උපද්‍රව සහිත මං සයක් ඇති ගමක් වේව'යි නුවරක් වේව'යි රක්නවුන් මං සය ම රකිතො ත් මුත් එක මහක් රැක්කැ'යි සෙසු මං වලින් ඇති වන උපද්‍රව දුරු කට නො හැක්කා සේ චක්ෂුරාදී ස දෙරින් පවත්නා කෙලෙස් වියවුල චක්ෂුරාදි වූ ෂට්ද්වාරයන් අතුරෙන් එක් දෙරක් ම රැක්කැ'යි නිහඬ නැති නියාව අහවන්ට භික්ෂුවහන්දෑ පස්නමක ගේ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්—

එක් පස් දෙනකුන් වහන්සේගෙන් එක් කෙණකුන් වහන්සේ ඇසට විෂය වූ ඉෂ්ට රූපයෙහි ලොභයක් වේව යි, අනිෂ්ට රූපයෙහි ද්වෙෂයක් වේව යි, අසමපෙකඛණ වශයෙන් මොහයක් වේව යි නූපදවා චක්ෂුද්වාර ය රකිනා සේක. එක් නමෙක් කනට විෂය වූ යහපත් ශබ්දයෙහි අනුනයක් වේව යි, නපුරු ශබ්දයෙහි ප්‍රතිඝයක් වේ වයි, අසමපෙක්ඛණ වශයෙන් මොහයක් වේව යි නූපදවා ශ්‍රොතද්වාර ය පමණක් රක්නා සේක. එක් නමෙක් නාසයට විෂය වූ යහපත් සුවඳෙහි ලොභයක් වේව යි, දුගීන්ධයෙහි ද්වෙෂයක් වේව යි, අසමපෙක්ඛණ වශයෙන් මොහයක් වේව යි නූපදවා ඝ්‍රාණ ද්වාර ය ම රක්නා සේක.

Non-Commercial Distribution

එක් නමෙක් ජිව්හායට විෂය වූ යහපත් රසයෙක ලොභයක් වේව යි, නපුරු රසයෙක ද්වේෂයක් වේව යි, අසමපෙක්ඛණ වශයෙන් මොහයක් වේව යි නූපදවා ජිව්හා ද්වාර ය රක්නා සේක. එක් නමෙක් කයට විෂය වූ යහපත් පහසෙහි ලොභයක් වේව යි, නපුරු පහසෙහි ප්‍රතිඝයක් වේව යි, අසමපෙක්ඛණ වශයෙන් මොහයක් වේව යි නූපදවා කාය ද්වාර ය රක්නා සේක. කොතලයකින් හෝ කෙණ්ඩිකාවකින් හෝ පැන් පරහන කෙණ කුන් කට පමණෙකින් අකැප පැන් වැද්ද නො දී කෙමියෙන් වදනා පැනෙහි ආසා නැත්තා සේ එකි එ කී ද්වාර ය මුත් සෙසු ද්වාරවල ආසා නැති සේක.

එක් දවසක් පස් නම ම එක තැන් ව 'මම රක්ක නො හැකි දෙර රකිමි, 'මම නො රක්කැකි දෙර රකිමි'යි විවාද කොට ගෙණ 'බුදුන් විචාරා දනුමහ'යි බුදුන් කරා ගොසින් සවාමීනි, අපි පස් දෙනමෝ ම චක්ෂුද්වාරාදි පස් දෙරින් වෙන වෙන එකක් එකක් රකිනමු. පස් නමින් කැටි ව පස් දෙර රකිමහ. එ කි එකී නමකට සතර සතර දෙරක් නො රකෙයි. වෙන වෙන ම රකිනා දෙරවලින් කවුරුන් රකිනා ද්වාර ය නො රක්ක හැකි ද'යි විචාළ සේක.

බුදුහු ඉන් එක් නමකු ත් පසු නො බස්වා එක නමකු ත් උස් නො කොට සරිගස්වා සිටුවන සේක් 'මහණෙනි, තොප පස් දෙනා රකිනා දෙරවල් වෙන වෙන ම රක ලිය නො හැක්කෙ නො වෙයි. 'බල, එකෙක් ඇත. සෙසු දෙරවල් නො රක්නා කල පත්ලෙයි සිදුරු පසක් ඇති කළයෙක එක සිදුරෙක පෙදක් ගන්වා ලා තෙල් වත් කළ යි සෙසු සිදුරු ඇස්වා නු ලූ කලට වත් කළ තෙල් නො තිබෙන්නා සේ එක දෙරක් රකි පමණෙකින් නො රකෙ යි. වාසල් බොහෝ ඇති නුවරක් වට කළා වූ සතුරෝ සෙසු වාසල් මුළුල්ල හැර තබා ලා එක වාසලක් රක්ක යි බලත් ද? එ පරිද්දෙන් අවසර ව තුබූ ද්වාරවලින් නො වදිත් ද? දූන් තමන් එ කි එ කී ද්වාර ය පමණක් රක්නාවා ද? පෙර පස් දෙර නො රක බොහෝ මුළාවට පැමිණියාවා ද'යි වදරා 'කවර කල ද'යි විචාළ කල්හි 'යට ගිය දවස තෙපි පස් දෙන රජ කුලෙයි ඉපැද තක්සලා නුවර රාජ්‍ය ය ගන්ට යන්නාහු අතුරු මඟ දී යකින්නන් පොළොඹා ගන්නා නිසා මවා ලූ රූපයෙහි ද, කියන ගීයෙහි ද, උන්ගේ ශරීර සුගන්ධ යෙහි ද, එළවා ලූ දිව බොජුන් රසයෙහි ද, උන්ගේ ඇඟ පහසෙහි ද පෙළඹී කොස් ලාමයේ බැඳී ගිය මැස්සන් මෙන් ගැළවී ගත නො හිණ.

Non-Commercial Distribution

මම එ කල ත් දූන් කෙලෙස් සතුරන් නසා බුද්ධ රාජ්‍ය ය සාධා ගත්තා සේ තක්සලා නුවර සාධාගත්තෙමි වේ ද' යනාදීන් **තක්කසිලා** ජාතක ය වදරා 'මහණෙනි, භික්ෂූන් විසින් නම් එක් දෙර ම රකින්ට නියැලී නො හිඳ ස දෙර ම රක්ක මනා වේ දෑ'යි වදරන සේක් 'මහණෙනි, රූපාදී සාරමුණු නමැති වල්හි ගැලී වසන රාගාදී කෙලෙස් සොරහු චක්ෂුද්වාරාදි වූ ස දෙරින් එක දෙරක් රක්කැ'යි සෙසු දෙරවල් නො රක තුබූ කලට රැකි දෙරින් නැවැත්ත ත් සෙසු දෙරින් නවතිත් ද? එ හෙයින් ම හැම දෙරවලින් ම සිහි නමැති දෙරවල් පියා ගෙණ සිත් සතන් නමැති ඇතුළු නුවර තුබූ ශීල සමාධ්‍යාදී ගුණ රුවන් පැහැර ගත නො දීම යහපත. එ සේ කට හුණු කෙණෙක් සප්ත විධ ආර්‍ය ධන ප්‍රතිලාභයෙන් නො දිළිඳු ව සියලු දුකින් මිදෙති'යි වදළ සේක. දෙශනා කෙළවර පස් දෙනා වහන්සේ ත් සෝවාන් වූ සේක. සෙසු ත් බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් ස දෙර බොහෝ වුව ත් තුන් දෙර පමණක් රක නිවන් දහම් පසක් කට යුතු.

---

## 264. හංස ඝාතක භික්ෂූන්දෑ ගේ වස්තුව

තව ද කාය වාක් සංයම[1] නැති වීමෙහි නපුර දක්වන්ට **හංස ඝාතක භික්ෂූන්දෑ** ගේ වස්තුව කියමු.

කෙ සේ ද යත්—

සැවැත් නුවර වසන යාළුවෝ දෙ දෙනෙක් සසුන් වැද මහණ ව විවෙක වාසයට නිසි පිළිවෙතක් නැති හෙයින් එක් ව ම වසන සේක. උපසම්පද වුව ත් ඒ දෙ නම ගණ සඞගනිකා වාස ය හැර ගත නො හී එක් දවසක් අචිරවතී නම් ගඟට ගොසින් නහා පියා හස්සාරාමයෙන් දවස් යවමින් අවු තැප තැප සිටි සේක. ඒ වේලාට හංසයෝ දෙ දෙනෙක් අහසින් යෙති. අවු තපිමින් සිටි දෙ නමින් නමෙක් හකුරක් හැර ගෙණ 'තිලින් එක් හංසයකුගේ ඇසට ගසාලම් දෑ'යි කී සේක. අනික් නම ගස්වනු නිසා ම බැරි ය'යි කී සේක. 'එ සේ වී නම් අප දසාවේ ඇස තිබේ ව යි ඈත දසාවේ තුබූ ඇසට ම අතකුර ගසමි'යි කී සේක. උන් වහන්සේගේ අතකුරු ගැසීම් දක්නා නිසා ම 'එයි ත් බැරිය'යි කී සේක. 'එ සේ වී නම් බැලුව මැනව'යි කියා ලා තුනැස් හකුරක් හැර ගෙණ බුරවා ගසා ලූ සේක. හංසයා ත් හකුර හඬා ගෙණ එන හඬ අසා පෙරළී බලා ලී ය. ඒ බැලූ වේලාට වට හකුරක් හැර ගෙණ ගසා ලූ සේක. ඒ හකුරක්

---

1. සඤ්ඤම

Non-Commercial Distribution

නැමී බැලූ ඇස වැද ගෙණ අනික් ඇසින් පිටත් ව පලා ගියේ ය. හංසයා ත් හඬමින් කඩා ගෙණ හී ඒ වහන්දෑගේ පා මුල ම හිත.

එ තැන සිටි වහන්දෑ ත් ඒ දෘෂ්ට කම දැක 'ඇවැත්නි, තෙලෙ බුදු සස්නට තබා සැදෑ ඇති ගිහීන්ට වුව ත් තරම් කටයුත්තෙක් නො වෙ යි. දයා පමණකු ත් නැති ව ප්‍රාණ වධ කරන්ට කාරණ කිම් ද? තමා පාපභීරුක නො වත ත් පරූපවාද බව මනා වේ ද, යනාදී කියා ලා ඒ වහන්දෑ කැඳවා ගෙණ ගොසින් බුදුන්ට පැසේක. බුදුහු ත් 'සැබෑ ද? එ ලෙසක් කළා දෑ'යි විචාරා 'සැබැවැ'යි කී කල්හි 'මහණ, තෝ බුදුසස්නෙහි මහණ ව ගෙණ කුමක් නිසා පන්සිල් පමණකු ත් රක්නවුන් නො කරණ දෙය කෙළෙයි ද? පුරාතන නුවණැත්තෝ ත් ගිහි ව රැකෙන්නෝ ත් සර්‍වඥනුශාසන යක් අබුද්ධොත්පාද කාල ය හෙයින් නැත ත් දූන දූන කරණ දෙය ත් නොවත බැවින් වරද නැත ත් වරද ඇත්තා සේ සිතා ගෙණ කුකුස් කළහ. මෙ බඳු බුද්ධොත්පාද කාලයෙක ඉපැද ඉනු ත් බුදුසස්නෙහි මහණ ව පාපයෙහි හැකිළීම් පමණකු ත් නො කොළෝ ය'යි වදරා 'පෙර නුවණැත්තවුන් කුකුස් කළ පරිදි කෙ සේ දෑ'යි විචාළ කල්හි—

යට ගිය දවස කුරුරට ඉඳුපත් නුවර ධනඤ්ජය කොරව්‍ය නම් රජ්ජුරු කෙණකුන් රජ කරණ කල්හි පුත් පැරුම් ඇති මහ බෝසත්හු ඒ රජ්ජුරුවන්ගේ අගමෙහෙසුන් බිසොවුන් කුසින් ඉපැද වැඩි විය පැමිණ තක්සලා නුවරට ගොසින් ශිල්ප ඉගෙන අවුත් පිය රජ්ජුරුවන් යුවරජ තනතුරෙහි පිහිටුවා ලූ කල්හි පියාණන් මළ පසු රජ පැමිණ දස රජ දහම් පවත්නා වූ උතුරු කුරු දිව උපන්නවුන් මෙන් කුරු රට උපන්නවුන් පන්සිල් රක්‍ෂා කරණ හෙයින් බෝසත්හු ත් පන්සිල් සකසා රකිති. යම් සේ මහබෝසත්හු පන්සිල් රකිත් නම් එ ලෙස ම රජ්ජුරුවන්ගේ මෑණියෝ ත් අග මෙහෙසුන් බිසොවු ත් යුවරජ තනතුරෙහි පිහිටා සිටි රජ්ජුරුවන්ගේ මලණුවෝ ත් පෙරෙවි බමුණාණෝ ත් යටුවම්[1] ගසන ඇමැත්තාණෝ ත් රිය ඇදුරාත් සිටාණෝ ත් මණන තැනැත්තෝ ත් වාසල් රක්නා තැනැත්තෝ ත් නුවර වෙශ්‍යා දූ ත් ය යි මූ හැම ම ත් සකසා පන්සිල් රකිති.

මෙ සේ මෙ එකොළොස් දෙනා පන්සිල් සකසා රක්නා කලට කලිඟු රට දන්ත පුර නම් නුවර කලිඟු නම් රජ්ජුරු කෙණකුන් රාජ්‍යය කරණ කල්හි උන්ගේ රට වැසි නැති වී ය.

---

1. යටුවත්,

Non-Commercial Distribution

කුරු රට ඉඳුපත් නුවර මහ බෝසතුන්ගේ අඤ්ජන වසභ නම් වූ මඟුල් ඇතා මහ පිණැති වි ය. වැඩකරු ය. මහ මේ කුළක් මෙන් අවුත් වැද ගිය නම් ඌගේ වැඩ කරුකම් නිසා වැසි වැස පියා නමු ත් ය යි දන්තපුර නුවර වැස්සෝ සිතා ගෙණ රජ්ජුරු වන්ට කීහ. රජ්ජුරුවෝ ත් ඒ ඇතු ගෙනෙනු නිසා බමුණන් යවූහ. උයි ත් ගොසින්–

'තව සද්ධං ච සීලං ච — විදිත්වාන ජනාධිප,
වණ්ණං අඤ්ජන වණ්ණෙන—කාලිඞ්ගස්මිං විනිම්හසෙ.'

යනු කියා ඇතු ඉල්වූහ. ඉල්වා ඇතු ගෙණ ගිය ත් වැසි නැති කල්හි 'ඉඳුපත් නුවර රජ්ජුරුවන් සිල් රකිනා හෙයින් උන්ගේ රට පස් දවසින් දස දවසින් දෙ පෝයෙන් මසින් වැසි වසී ල. ඒ පන් සිල් අපි ත් රකුමෝ නමුත් ඒ දන්ට නැත. දෑහිඟුලෙන් රන් පත ඒ පන්සිල් ලියා ගෙනෙව'යි පෙරළා ත් කලිඟු රට රජ්ජුරුවෝ බමුණනු ත් ඇමත්තනු ත් යවූ හ. උනු ත් ගොසින් එකොලොස් දෙනාගෙන් ම පන්සිල් ඉල් වූ කල්හි කුරුධම් ජාත කයෙහි ආ ලෙසින් එ විවරකින් පන් සිලට හානි නැත ත් යන්තම් කුකුසක් සිතා ගෙණ මැළි වූහ. මැළි ව ලා 'තෙලෙ විවරයකින් දන කළ දෙයෙක් නො වන බැවින් පන් සිලට හානි නැතැ'යි කී කල්හි තමන් තමන් රක්ෂා කරණ පන් සිල් රන් පත ලියා දුන්හ. කලිඟු රජ්ජුරුවෝ ත් රන් පත ලියා ගෙනා පන් සිල් දැක සමා-දන් ව ගෙණ යහපත් කොට ම රකිති. එ කල පන් සිල්හි අනුසසින් රට වැසි ත් වැස පියා රට ත් ඉතා සමෘද්ධ වි ය. බුදු-හු ත් විස්තර ලෙසින් ම මේ කුරුධම් ජාතක ය වදරා ලා කෙළ වර—

'ගණිකා උප්පල වණ්ණාසි–පුණ්ණො දොවාරිකො තදා,
රජ්ජුගාහො ච කච්චානො–දොණමත්තො ච කොලිතො

සාරිපුත්තො තදා සෙට්ඨී-අනුරුද්ධො ච සාරථී,
බ්‍රාහ්මණො කස්සපො ථෙරො-උපරාජා නන්‍ද පණ්ඩිතො,

මහෙසි රාහුල මාතා–මායාදෙවී ජනෙත්තිකා,
කුරුරාජා බොධිසත්තො-එවං ධාරෙථ ජාතකං'යි.

ජාතක ය නිමවා වදරා 'මහණ, මෙ සේ පෙර නුවණැත්තෝ මද දෙයෙහි ත් කුකුස් උපන් කල්හි තමන්ගේ පන්සිල් බුන් දෝ හෝ'යි සැක කළහ. තොප මා වැනි බුදු කෙණකුන් ගේ

Non-Commercial Distribution

ශාසනයෙහි මහණ ව ලොක වැද්දව තිබෙන කට යුත්තෙහි කුකුසක් ම නො කරන්ට කාරණ කවරේ දැ'යි විචාරා බුදුහු 'යම් කෙණෙක් අතින්[1] කළ මනා ප්‍රාණවධාදියෙන් නවතිත් ද, ප්‍රාණ වධාදියට නො යැමෙන් පාදගමනයෙන් සිද්ධ වන දෙයිනු ත් නැවැත්තෝ ද, මෘෂාවාදදී චතුර්විධ වාක් දුශ්චරිතයෙනු ත් නැවැත්තෝ ද, සිතින් සිද්ධ වන ත්‍රිවිධ දුශ්චරිතයෙනු ත් නැවැත්තෝ ද, හැම වේලේ ම භාවනාභියොගයෙහි යෙදී වෙසෙත් ද භික්ෂු ය යි උන්ට කියත් මුත් තොප ඉස් හක කුරු ගසා හංසයන් මරන්නන්ට භික්ෂු ය යි කීම යුක්ත නො වෙ යි' වදාළ සේක. දේශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් ප්‍රාණ වධාදීන් දුරු ව සුචරිතයෙහි හැසිර නිවන් දහම් පසක් කරන්ට උත්සාහ කට යුතු.

---

## 265. කෝකාලික වස්තුව

තව ද වාක් පරුෂයෙහි නපුර දක්වන්ට කෝකාලික වස්තුව කියමු.

කෙ සේ ද යත්—

දෙව්දතුන්ට අග සවුව සිටි කෝකාලික තෙමේ තමාගේ කට ම නිසා පදුම නම් නරකයෙහි උපන. ධම් සෙබෙයි රැස් ව හුන් වහන් දෑ 'ඇවැත්නි, කොකාලිකයෝ දෙ අගසවුවන් වහන්සේට බැණ දෙඩා නිරැ වන්හ'යි කථාව ඉපැද වූහ. බුදුහු ත් ඒ අසා වදරා 'මහණෙනි, තුලූ තමාගේ කට නිසා නටුයේ දැන් මතු නො වෙ යි. යටගිය දවස හිමවු පියස එක් විලෙක ඉදුබෙක් වෙසෙ යි. හංස පැටවූ දෙන්නෙක් ගොදුරු කා ඇවිදිනාහු ඒ ඉදුබා හා පුරුදු ව ගෙණ එක් දවසක් ඉදුබාට 'සබඳ, අපගේ හිමවු පියස සිතු කුළු පව්වෙහි රන් ගුහා ඉතා යහපත. අප හා කැටි ව එවුදැ'යි විචාළෝ ය.

'මා අහසින් නැඟී යා නො හෙත් කෙ සේ එම් දැ'යි කීය. 'ඉදින් තෙපි කට රැක ගත හෙවු නම් කැඳවා ගෙණ යම්හ'යි කිවූ ය. 'මට නො පිළිවන් ව තිබෙන ගමන කරවා ලන කල පිළිවන් ව තිබෙන කට රකිනට බැරි කවරේ ද? මුවෙන් බැණ නො නැගෙන බව වේ ද? මා කැඳවා ගෙණ ගිය මැනවැ'යි කීය. උයි ත් 'යහපතැ'යි කියා ලා ඉදුබා එක් දඬු කඩක් මැදින් ඩැ ගත් කලට හංසයෝ දෙන්න දෙ කෙළවර ඩැ ගෙණ අහසට නැංගාහ.

---

1 කයින්

Non-Commercial Distribution

හංසයන් දෙන්නා එ ලෙසින් ඉදුබා ගෙණ යන්නා දැක ගම් දරුවෝ 'හංසයෝ දෙන්නෙක් ඉදුබකු අහසින් ගෙණ යෙති' කිවු ය. ඉදුබා ත් 'මාගේ මිත්‍රයෝ මා තමන් කැමති තැනකට ගෙණ යෙති. දුෂ්ට කොල්ලනි, තොපට වූයේ කුමක් ද'යි කියනු කැමැති ව හංස ගති ය ශීඝ්‍ර බැවින් බරණැස් නුවර රජගේ ඉද්දට ගිය කලට ඩැ ගත් දණ්ඩෙන් කට ගැළ වීගොසින් සෙණ්ඩුලුවෙහි[1] හී ලා දෙකක් ව බිඳී ගියේ ය.

බුදුහු මේ ඉකුත් වත ගෙන හැර දක්වා ලා-

"අධිව වත අත්තානං-කච්ඡපො බ්‍යාහරං ගිරං,
සුග්ගහීතස්මිං කට්ඨස්මිං-වාචාය සකියා වධි
එතම්පි දිස්වා නරවිරිය සෙට්ඨ-
වාචං පමුඤ්චෙ කුසලං නාතිවෙලං
පස්සසි බහුභාණෙන කච්ඡපං-ව්‍යසනං ගතං."

යන ගාථා දෙකින් යුක්ත වූ බහුභාණිය ජාතක ය විස්තර කොට වදරා තව ත් බණ වදරන බුදුහු යම් කෙණෙක් අනුත්ට හෙළා නො කීමෙන් වාක් සංයම ය ඇත්තෝ ද, කියන බණන බසෙක් ඇත්නම් නුවණින් සලකා කිය යුතු බසක් ම කියත් ද, සන්හුන් සිත් ඇත්තෝ ද, යම් කෙණෙක් අර්‍ථ පමණක් මුත් පාළි කියා ලිය නොහෙත් ද, යම් කෙණෙක් පාළි පමණක් කියා ලත් මුත් අර්‍ථ ප්‍රතිපාදන ය කොට කියා ලිය නොහෙත් ද, යම් කෙණෙක් පාළි ත් අර්‍ථ ත් කියා ලිය නො හෙත් ද, උන් ගේ කථා දුවා පිමක් නැති මාළු සේ රසවත් නො වෙයි. යම් කෙණෙක් පාළි වූ ලෙස අර්‍ථ ත් අර්‍ථ විරොධ ලෙස[2] පාළි ත් කියා ලත් නම් උන්ගේ තෙපුල් නිරර්‍ථක කථා නැති වීමෙන් මිහිරි ය'යි වදළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින්—

"නාතිවෙලං පභාසෙය්‍ය - න තුණ්හි සබ්බදා සියා,
අවිකිණ්ණමිදං වාචං - පත්තෙ කාලෙ උදීරයෙ."

යන්නෙහි පිහිටා වාක් සංයම ය ඇති විය යුතු.

## 266. ධම්මාරාම තෙරුන් වහන්සේ ගේ වත

තව ද ධර්‍ම ප්‍රසාද ය සත්‍වයන්ට උපදවනු නිසා ධර්‍මාරාම තෙරුන් වහන්සේ ගේ වත දක්වමු.

---

1. සෙණ්ඩුවාලුවෙහි 2 අර්‍ථ විරොධ නො වන ලෙසට

කෙ සේ ද යත්—

බුදු රජුන් වහන්සේ පන් සාලිස් හවුරුද්දක් විතර ජීවත් ව සිට ලා 'සාර මසක් විතරින් පිරිනිවන් පයිමි' යි වදළ කල්හි ලක්‍ෂ ගණන් වහන්දෑ බුදුන් පිරිවරා ගත් සේක. ඉන් පුහුදුන් වහන්දෑ හඬන සේක. වලප්නා සේක. රහතන් වහන්සේට ධර්ම සංවේග උපන. හැම තැන් ම 'කුමක් කරමෝ දැ'යි කියා ඇවිදිනා සේක.

ධර්මාරාම නම් තෙර කෙණකුන් වහන්සේ වහන්දෑ කරා නො යන සේක. වහන්දෑ ත් කුමක් කරන්නෝ දැ'යි කීව ත් බැණ නො නැඟී 'බුදුහු ත් සාර මසක් විචරින් පිරිනිවන් පානා සේක් ලා. මම රහත් ව ගත නුහුණුයෙමි. බුදුන් ජීවත් ව හින්දදී ම රහත් වෙමි' සිතා උත්සාහ කොට බුදුන් වදළ බණ සලකන සේක. වහන්දෑ කරණ කථාවට ත් ආලය හැර බණ හා ම කථා කරණ සේක. වහන්දෑ ත් බුදුන් කරා ගොසින් 'ස්වාමීනි, ධර්මාරාම තෙරුන් වහන්සේට මුඹ වහන්සේ කෙරෙහි ස්නේහ පමණකු ත් නැත. 'බුදුන් පිරිනිවන් පානා සේක. කළ මනා කිම් දැ'යි යන කථා පමණකු ත් අප හා කරන්ට නැත. වෙන් ව ලා ම ඇවිදිනා සේකැ'යි දැන්වූ සේක. බුදුහු ඒ ඔබ කැඳවා ගෙන්වාලා 'සැබෑ ද? තොපි තෙල ලෙස කරවූ දැ'යි විචාරා 'සැබැව' යි කී කල්හි 'කුමක් නිසා එ ලෙස කරා දැ'යි විචාළ සේක. 'ස්වාමීනි, මුඹ වහන්සේ සාර සමක් විචරින් පිරිනිවෙන හෙයිනු ත් මා තව රහත් විය නුහුණු හෙයිනු ත් වනු නිසා උත්සාහ කොට ගණ සඞ්ගනිකා වාස ය හැර ධර්මය ම සිතමින් දවස් යවමි' කී සේක.

බුදුහු ත් තුන් විටෙක සාධු කාර දෙවා වදරා 'මහණෙනි, මා කෙරේ ලෙන් ගතු කෙණකුන් කළ මනා තෙල ලෙස ම ය'යි වදරා තමන් වහන්සේ පිරිනොනිවෙන තෙක් 'ධර්මාරාම තෙරුන් වහන්සේ රහත් කරවනු නිසා බණ වදරන සේක් 'ශමථ විදර්ශනාදි ධර්මයෙහි ඇලී වසන්නා වූ, කියත ත් ඒ ම දෙයක් කියන්නා වූ සිතත ත් ඒ ම සිතන්නා වූ මහණ ප්‍රගුණ ග්‍රන්ථයක් සිතින් හැරී නො යන්නා සේ සත් තිස් බොධි පාක්ෂික ධර්මයෙනු ත් නවලොවු-තුරා දහමිනු ත් පඤ්චවොකාර භවයෙහි නාම රූප දෙක මෙන් වෙන් නො වෙති වදළ සේක. දෙශනා කෙළවර ධර්මාරාම තෙරුන් වහන්සේ රහත් වූ සේක. සෙසු ත් බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් සත් පුරුෂයන් විසින් සසර දුක් අත් හරිනට සිත තොත් ධර්මාභියොග ය අත් නො හරනට සිතිය යුතු.

Non-Commercial Distribution

# 267. විපක්‍ෂ සේවක භික්ෂූන් වහන්සේ ගේ වස්තුව

තව ද විපක්‍ෂ භජන නපුරු නියාව හඟවන්ට **විපක්ෂ සේවක භික්ෂූන් වහන්සේ ගේ වස්තුව දක්වමු.**

කෙ සේ ද යත්—

ඒ භික්ෂූන් වහන්සේට ද වැළි ත් මිත්‍ර ව හිඳිනා නමෙක් දෙව දත්ත පක්‍ෂයෙහි ය. ඒ දෙවදත්ත පාක්ෂික නම ත් එක් දවසක් වහන්දෑ හා එක් ව සිඟා වළඳා පියා එන භික්ෂූන් වහන්සේ දැක 'කොයි ද ගියෙ ය'යි විචාරා 'සිඟා වළඳන්ට අසවල් තැනට ගියම් හ'යි කී කල්හි 'සිඟා උපන් දැ'යි විචාළ දෑ ය. 'උපනැ'යි කී කල්හි 'සිඟා ආයාස ගැන්මෙන් ප්‍රයෝජන කිම ද? අපට උපදනා නියාව බලවත. එ කී එ කී සැළියෙ බත් දස දස දෙනකුට සෑහෙන ලෙසින් දවස් පතා බත් සැළි පන් සියයක් විචර උපද්දී. කීප දවසක් රඳන්ට වුව මැනැවැ'යි කී දෑ ය. උන් වහන්සේ ද උන් දෑගේ බසින් දවස් ගණනක් රඳා ලා රඳා හිඳිනා තැනට ගිය සේක.

වහන්දෑ ද එ පවත් දැන ලා බුදුන් කරා කැඳවා ගෙණ ගො සින් 'ස්වාමීනි, මූ දෙව්දතුන්ට පක්‍ෂ ව උන්ට උපන් දෙය වළ දති' කී සේක. බුදුහු ත් 'සැබෑ දැ'යි විචාරා 'ස්වාමීනි, මම ඊ එක මිත්‍ර නමක් නිසා දවස් ගණනක් රැඳිණිමි. දෙව්දතුන්ට මා පක්‍ෂ ව හුන්නෙ නැතැ'යි කී සේක. බුදුහු ත් 'කිසි සේ ත් තොප උන්ගේ ලබ්ධි ය ගත්තෙ නැත. එ තෙකුදු වුව ත් දුටු දුටු කෙණකුන්ට නැමී ඇවිදුව. එ ලෙස පැවැත්ම දැන් මතු නො වෙයි. යට ගිය දවස ත් දුටු දුටුවන් කී ලෙසට නැමී ම ඇත් ම ය'යි වදරා 'ස්වාමීනි, දැන් වන්නා දුටු දුටු කෙණකුන්ට නැමෙන බව ප්‍රත්‍යක්‍ෂ කොට ම දුටුමෝ වේ ද? යට ගිය දවස එ ලෙසක් ඇති නියාව දැනෙන්ට අප නු දුටු හෙයින් නැත. වදළ යහ පතැ'යි වහන්දෑ ආරාධනා කළ කල්හි මහිලාමුඛ නම් ඇතාණන් ආදි යහපත් තරම් ඇති ව ත් පසු ව ළඟ හිඳ කථා කරණ සො රුන්ගේ සොර කම් පහළ රෞද්‍ර කථා නිසා චණ්ඩ පරුෂ වූ නියාව ත් පසු ව බෝසතුන් උපදෙසින් ළඟ හිඳ කථා කරණ තාපසවරුන්ගේ කුසල් පිළිබඳ කථා අසා ඊට නැමී මොළොක් වූ නියාව ත් වදරන සේක්—

> "පොරාණ චොරාන වචො නිසම්ම,
> මහිලා මුඛො පොථයම'න්වචාරී,
> සුසඤ්ඤතානං හි වචො නිසම්ම
> ගජුත්තමො සබ්බගුණෙසු අට්ඨා"

Non-Commercial Distribution

යනාදීන් මහිලාමුඛ ජාතක ය විස්තර කොට වදරා එකෙක තරයක් නැති වඤ්චල සිත් ඇති වීමෙන් බොහෝ උවදුරු වන හෙයින් ඒ හරවන නිසා බණ වදරන සේක් 'යම් කෙණෙක් සපදනචාරික ධුතඬගානුරූප වූ භික්ෂාටනයෙන් වන්නා වූ ජීවිකාවෙන් ජීවත් වතොත් මුත් එක් විසි අනෙස්නෙන් ජීවත් නො වෙත් නම් උඹ තුමූ තමන්ට ම වන්නා වූ ලාභ ය හෙළා දක්නෝ නො වෙති. එ හෙයින් එලෙස කට යුතු ය. ධර්මාන්විත ව තමහට සම්භ වන දෙයක් මුත් අනුන්ට පැමිණෙන ලාභ ත් නො පැතිය යුතු.

අනුන්ට පැමිණෙන ලාභ ය පතන්නා වූ මහණ ඊට ම කරණ යත්නයක් මුත් උපචාර සමාධියකට වෙව යි, මාර්ග සමාධියකට වෙව යි පැමිණ ගත නො හෙයි. අල්පලාභී වුව ත් දිවි පෙවෙත් වටනු නිසා සිඟා ලද දෙයකින් යපෙන්නා වූ අත්‍යන්ත පරිශුද්ධ වූ ආජීව ඇති සිඟා ගැන්මෙහි කුසීත නො වන්නා වූ භික්ෂූන්ට දෙවියෝ ත් ප්‍රශංසා කෙරෙති' වදාළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන සෝවාන් ඵලාදියට පැමිණියහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් ලාභ ප්‍රාර්ථනාවක් ඇත් නම් ඒ හැර නිවන් ම පතා කුසල්හි හැසිරිය යුතු.

## 268. පඤ්චග්ගදායක බමුණන් ගේ වස්තුව

තව ද භික්ෂු ප්‍රතිපත්තිය ම හඟවනු නිසා පඤ්චග්ගදායක බමුණානන් ගේ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්—

ඒ බමුණානෝ ගොයම් කොට ජීවත් වන කෙණෙක. උඹ තුමූ ගොයම් දීම දී පෙරාතු අගහස් බතක් දෙති. කොළ කල විටි ලූ කල අගහස් බතක් දෙති. කොළ මිරිකා වී රැස් කළ කල ත් අගහස් බතක් දෙති. බත් පිස ලා තළියේ නො ලන තෙක් අගහස් බතක් දෙති. තළියේ ලා ලූ කල කන්ට පෙරාතු අගහස් බතක් දෙති. මෙ ලෙසින් කෙත[1] අක්බත ය, කළවිටි[2] අක්බත ය, වී අක්බත ය, සැළි අක්බත ය, තළි අක්බත ය'යි පස් අගකින් දන් දෙති. බත කන වේලාට පැමිණි කෙණකුන්ට ත් නො දී අනු භව නො කෙරෙති. එ හෙයින් පඤ්චග්ගදායකයෝ ය'යි නම් තබා ගත්හ.

බුදුහු උනු ත් බැමිණියනු ත් දෙන්නා අනගැමි වන්ට කළ පින් ඇති නියාව දැන බමුණානන් බත් කන වේලාට ගොසින්

1. කෙතෙක් බත ය. 2. කළවිට

Non-Commercial Distribution

දෙරකඩ වැඩ සිටි සේක. උයි ත් දෙර කඩ ගෙට මූණ ලා හිද බත් අනුභව කෙරෙති. බුදුන් දෙර කඩ වැඩ සිටි නියාව නු දුටු වූ ය. බැමිණිනියෝ ත් බත් ලා ලා සිටි තැනැත්තෝ බුදුන් වැඩ සිටියා දැක 'මේ බමුණානෝ පස් තැනෙක අගින් දී ලා අනුභව කෙරෙති. දුන් මහණ ගොයුම්හු ත් අවුත් මිදුලේ සිටියහ. ඉදින් බමුණානෝ තුලුන් දැක තළියේ තුබූ බත් දී පූ නම් පෙරළා පිසීම ගහට ය. මෙ සේ කළ කලට බමුණු මහණ ගොයුම් දැක පිය නො හෙයි' සිතා බමුණානන්ට පසු ව ලා බුදුන්ට තොමෝ පිටි පෑ පියා පුන් සඳ මඬල අත්ලෙන් වසන එකක් මෙන් නැඹුරු ව ලා සිටියා ය. එසේ සිට ත් ගියා දෝ නො ගියා දෝ යි තමා බැලූ නියාව ත් නො හහවා ම වමැස් කෙළවරින් සොර බැල්මෙන් බලා ලූව.

බුදුහු බික ගෙණෙන වේලා කුම් වුව ත් නිවන් දක්වන වේලා එන තෙක් වැඩ සිටි සේක. බැමිණිනියෝ ද බමුණානන්ට ඇසී යෙති යන හයින් එ තැන සිට අරුණු ය යි කියා ගත නො හී මඳක් පසු බැස ගෙණ ලා සෙමෙන් ම අරුණු ය යි දෙ විටක් කොට කියා ලූව. බුදුහු ත් බැමිණියන් ලවා සිනාවක් සෙවා තමන් වහන්සේ සිටි නියාව බමුණානන්ට හහවනු නිසා 'මම එ සේ නො යෙමි' ඉස අවුරා සලා ලූ සේක. ලොක ස්වාමී වූ තිලෝ ගුරු බුදු රජුන් වහන්සේ ඉස අවුරා සලා ලන්නා ම මහ පොළොව වුව ත් ධරා ලිය නො හෙන තරම් ඇති බුදු රජුන්ගේ හිස සැල්ම බලා ඉවසා ගත නො හී කුඩා කොට අරුණු කී බැවින් බැමිණිනියෝ මහත් කොට සිනාවක් සී පූ ය. ඒ වේලාට බුදුහු ත් ඇතුළු ගෙව රස් කඳක් විහිදුවා ලූ සේක. බමුණානෝ පිටි පෑ ලා හුන් තැනැත්තෝ බැමිණිනියන් සිනා සී පූ හඩ අසා ගෙට ගොසින් හිත්තියේ වැද ගත් සවනක් බුදු රසු ත් දැක පෙරළී බැලූ තැනැත්තෝ බුදුන් දුටු වූ ය.

බුදු රජුන් වහන්සේ නම් ගම දී වුව ත් වල දී වුව ත් හෙතු සම්පන්නයන්ට පෙනී ලා වැඩ නො පියන සේක. බමුණානෝ ද බුදුන් දැක 'පින්වත, තෝ රාජ පුත්‍රයාණන් අවුත් දෙර කඩ සිටි කල මට කියා නුලුයෙනැ' යි තී මට කෙළේ මහා අනාජිය. කෙළේ වැරැද්ද ය'යි කියා කමින් හුන් බත් තළි ය හැර ගෙණ බුදුන් කරා ගොසින් 'මහණ ගොයුමනි, අපි පස් තැනක දී අගින් දී ලා අනුභව කරමහ. මේ බත් තළිය ත් පැමිණි කෙණකුන්ට දෙනු නිසා දෙ භාගයක් කොට ලා භාගයක් තිබිය දී භාගයක් අනුභව කළමහ. ඉඳුල් බත් පිළිගන්නේ ඇත් දැ'යි විචාළෝ ය. බුදුහු 'ඉඳුල් වී නම් නො කැමැත්තේ ය'යි නො වදරා ම 'බමුණ,

ඉඳුල් දෙයට ත් මම නිස්සෙමි. ඉඳුල් නො වන දෙයට ත් මම නිස්සෙමි. මා ලබන බත් ඉඳුල් වුව ත් දුන්නවුන් ලබන ලොවී ලොවුතුරා සම්පත් ඉඳුල් නො වන්නේ වේ දැ'යි වදරා ලා බුදු වුවත් තමන් වහන්සේ අනුන් නිසා ජීවත් වන නියාව වදරන සේක්—

යදග්ගතො මජ්ඣතො සෙසතො වා—
පිණ්ඩං ලභෙථ පරදත්තූපජීවී,
නාලං ථුතුං නොපි නිපච්චවාදී—
තං වා 'පි ධීරා මුනිං වෙදයන්ති

යන ගාථාව වදාළ සේක. බමුණාණෝ ඒ අසා පහන් සිත් ඇති ව "ඉතා විස්ම ය. දීප ස්වාමී වූ රාජ පුත්‍රයාණෝ 'තොපගේ ඉඳුල් බතින් මට ප්‍රයෝජන නැතැ'යි නො කියා මෙ ලෙස කියති. නිහතමානීත්වයක් යහපත් නියා ය" යි මිදුලේ සිට ම ප්‍රශ්නයක් විචාරන්නෝ 'මහණ ගොයුමාණෙනි, තෙපි තොපගේ සවුවන්ට භික්ෂු ව්‍යවහාර කරව. කුමක් නිසා භික්ෂු වෙත් දැ'යි විචාළෝ ය.

බුදුහු කෙ සේ වූ දෙශනාවෙක් මුන්ට සත්ප්‍රාය දෝ හෝ යි විමසන සේක් 'මූ දෙන්න ම කසුප් බුදුන් සමයෙහි විදම් කථා කරන්නවුන් ගෙන් නාම රූප ය යන කථාව ඇසූ විරූ ය. නාම රූප ය නො හැර ම මුන්ට බණ කීම වටනේ ය යි' සිතා වදරා සංක්ෂෙප පුඩුවෙන් එකුන් අනූවක් පමණ වූ ත්, මධ්‍යම පුඩුවෙන් එක්සිය එක් විස්සක් පමණ වූ ත්, විස්තර පුඩුවෙන් බොහෝ වූ ත්, සියලු චිත්තයෙහි ත් දෙ පණසක් පමණ චෛතසිකයෙහි ත් භූතොපාදය වශයෙන් අට විසි වැදෑරුම් වූ ත්, කලාප වශයෙන් එක් දහස් පන් සිය එකක් පමණ වූ ත්, සියලු ම රූපයෙහි ත් මමායන ය කට යුතු කිසි ත් ලෙසක් නැති හෙයින් යම් කෙණකුන් ට ත් ඊ මමායන ය නැත් නම් නැවත ඒ නාම රූප දෙක නට ත් 'නස්නා සුලු දෙය නට. මට ඉන් කිම දැ'යි සිත ත් මුත් ශොක නො කෙරේ ද, භික්ෂු ව්‍යවහාර ය ඕ හට නිර්ව්‍යාජයෙන් ලැබෙ'යි වදාළ සේක. දෙශනා කෙළවර බමුණාණෝ ත් බත් දෙන්ට මැළි වුව ත් නිවන් ලබන්ට මැළි නො වූ බැමිණිනියෝ ත් දෙන්නම අනාගැමි වූහ. තව ත් බොහෝ දෙනාට දෙශනාව සප්‍රයෝජනවිය.

එ හෙයින් නුවණැත්තවුන් විසින් පඤ්චග්ගදායක බමුණාණන් මෙන් ත්‍යාගාධ්‍යාශය ඇති ව දනාදි වූ පින් කම හැසිර එයින් ජනිත වූ කුශලානුභාවයෙන් භව සැප ත් වළඳා කෙළවර නිවන් අත් කට යුතු.

Non-Commercial Distribution

## 269. බොහෝ වහන්දෑ ගේ වස්තුව

තව ද කුසල ධර්මයෙහි යම් කෙනෙක් හැසිරෙත් නම් කුසල ය උන්ට පිහිට වන නියාව හඟවන්ට බොහෝ වහන්දෑ ගේ වස්තුව කියමු.

කෙ සේ ද යත්—

එක් සමයෙක ආයු බොහෝ වූ කසයින් මහ තෙරුන් වහන්සේ අවන්ති[1] නම් දනවුවෙහි කුරරඝර නම් නුවර නිසා පවත්ත නම් පව්වෙහි වසන සමයෙහි කෙළක් වටනා ආභරණයක් කන පළඳනා හෙයින් කුටිකර්ණ සොණ නම් වූ උපාසක කෙනෙක් කසයින් මහ තෙරුන් වහන්සේගේ කථායෙහි පැහැද ඔබ ලඟ මහණ වනු කැමැති ව ඔබ ත් දෙ වාරයක් කොට ම 'ශීල සංරක්‍ෂණය බැරි දෙයෙක් වේ දෑ'යි වදළ ත් මහණ වීමෙහි තර අදහස් ඇති බැවින් තුන් වැනි වාරයෙහි තර ව කියා මහ තෙරුන් වහන්සේ ගිවිස්වා ගෙණ මහණ ව දකුණු දිග ගණ පූරක වහන්දෑ ලැබගැන්ම බැරි හෙයින් තුන් හවුරුද්දක් ගිය කලට උපසම්පද ව ත් ලදින් බුදුන් නො හඳුනන හෙයින් බුදුන් දක්නා කැමැති ව උපාද්ධ්‍යාය වූ කසයින් මහ තෙරුන් වහන්සේට කියා ලා ඔබ ගේ ත් මෙහෙවරින් දෙව්රමට ගොසින් බුදුන් වැඳ ලා බුදුන් ගෙන් සාද සාමීචි ත් ලදින් එක ගඳ කිළියේ ම සැතපෙන්ට විධාන කළ කල්හි රෑ දවස බොහෝ වේලක් අබ්වස සක්මන් කිරීමෙන් දවස් යවා මැද යම් දස පැය ගඳ කිළියට වැද සැත පී ලා අළුයම බුදුන්ගේ විධානයෙන් සූත්‍ර නිපාතයෙහි අෂ්ටක වර්‍ගාදී වූ සූත්‍ර මුළුල්ල ම පිරිවූ සේක. පිරිවා අන්තයෙහි බුදුහු තුන් විටක් කොට ම සුවඳ කරඬුවෙක පිධානයක් හළුවා සේ සියලු ගඳ කිළි ය මුඛ සුගන්ධයෙන් සුවඳ කෙරෙමින් සාධුකාර දුන්සේක.

බුදුන්ගේ සාධු කාර අසා භූමාටු දෙවියන් පටන් අකනිටා බඹ ලොව දක්වා සාධු කාර නාදයෙන් එකනින් නාද වී ය. ඒ වේලාවට ම දෙව්රම වෙහෙරට සාර සිය අසූ ගව්වකින් ඔබබෙහි වූ කුරරඝර නම් නුවර ඒ කුටිකර්ණ සොණ තෙරුන් වහන්සේගේ මවු උපාසිකාවන්ගේ ගෙයි අධිගෘහිත දෙවතාවා ත් මහත් කොට සාධු කාර දින. තෙරුන් වහන්සේගේ මවුඋපාසිකාවෝ ත් 'සාධුකාර දෙන්නෝ කවුරු දෑ'යි කියා විචාරා 'නඟණ්ඩ, මම ය'යි කී කල්හි 'තෙපි කවුරු ද'යි විචාළහ. මුඹගේ ගෙයි අධිගෘහිත දේව තාවා ය'යි කිවු ය. 'මෙ තෙක් කල් මුළුල්ලෙහි සාධු කාරයක් නො දී අද කුමක් නිසා සාධු කාර දුනු දෑ'යි විචාළ කල්හි 'මුඹට දුන් සාධු කාර නැතැ'යි කිවු ය. 'එ කල සාධු කාර දුන්නේ කාට දෑ'යි විචාළ කල්හි 'මුඹගේ පුත් වූ කුටිකර්ණ සොණ තෙරුන්වහන්සේට ය'යි කිවු ය.

---

1 අවන්

Non-Commercial Distribution

සාධු කාර දෙන තරමට උන් වහන්සේ කීයේ කෙළේ කිම් දැ'යි විචාළෝ ය. 'මුඹගේ පුතණුවන් වහන්සේ අද බුදුන් හා එක ගඳ කිළියෙහි සැතපී ලා පාන්දඩ වේලේ බණ පිරිවූ සේක. බුදුහු ඔබගේ බණ අසා පැහැද සාධු කාර දුන් සේක. ඔබ දුන් සාධු කාර අසා මම ත් සාධු කාර දිනිමි. මා තබා බූමාටු දෙවියන් පටන් බඹ ලොව බඹුන් දක්වා ත් සාධු කාර දුන්හ'යි කීහ. 'කුමක් ද? ස්වාමීනි, ම පුතණුවන් වහන්සේ බුදුන්ට බණ වදළ සේක් ද? බුදුහු ම පුතණුවන් වහන්සේට බණ වදළ සේක් දැ'යි විචාළෝ ය. 'මුඹගේ පුතණුවන් වහන්සේ බුදුන්ට බණ කී සේකැ'යි දෙවතාවාණන් කියන්නා ම උපාසිකාවන්ට පස් වනක් ප්‍රීති ඇඟ මුළුල්ල පැතිරිණ. ප්‍රීතින් පිනා ගොසින් ලා 'ඉදින් ම පුතණුවන් වහන්සේ බුදුන් හා ගඳ කිළියෙහි සැතපී ලා ඔබට බණවදරන්ට බල ඇති වී නම් මට ත් බණ වදළ හෙණ සේක. ම පුතණුවන් වහන්සේ මුඹ වැඩි කල බණ අසමි' සිතූහ.

සොණ තෙරුන් වහන්සේ ද තමන් වහන්සේගේ සූත්‍ර බණ අසා බුදුන් සාධු කාර දුන් කල්හි 'මේ අපගේ උපාධ්‍යායයන් වහන්සේ කියා එවා වදළ මෙහෙවර දන්වන්ට කලැ'යි බුදුන්ට පසල් දනවුවල විංශති වර්ග සඞ්ඝයා වහන්සේ වුව ත්, දශ වර්ග සඞ්ඝයා වහන්සේ වුව ත්, ලබින්ට බැරි හෙයින් විනයධර නම ඇතුළු ව පස් නමක් විවරින් මාලු පැවිදි කිරීමට අනුදැනුම් ආදි වූ පස් වර ය ඉල්වා ගෙණ කීප දවසක් බුදුන් ලඟ ම රඳා ලා උපාද්ධ්‍යායයන් වහන්සේ ලඟට යන් නියාව බුදුන්ට දන්වා ලා දෙව්රමින් නික්ම ඒ ඒ තැන සැතපි සැතපී උපාද්ධ්‍යායයන් ලඟට ගිය සේක.

කසයින් මහ තෙරුන් වහන්සේ ද මෙ වන දවස් උන් වහන් සේ කැඳවා ගෙණ සිහා වඩනා සේක් කුටිකර්ණ සොණ තෙරුන් වහන්සේගේ ලමන්දූ උපාසිකාවන්ගේ ගෙට වැඩි සේක. ඔයි ත් පුතණුවන් වහන්සේ දක සතුටු ව වැඳ ලා දන් සකස් කොට වළඳවා වළඳා අන්තයෙහි 'පුතණුවන් වහන්ස, මුඹ වහන්සේ බුදුන් හා එක ගඳ කිළියෙහි සැතපී ලා ඔබට බණ වදළේ සැබෑ දැ'යි විචාළේ ය. 'ලමන්දූනි, මුඹට කීවෝ කවුරු දැ'යි විචාරා වදළ සේක. ''පුතණුවන් වහන්ස, මේ ගෙයි අධිගෘහිත දේවතාවාණෝ මහත් කොට සාධු කාර දී 'සාධු කාර දුන්නෝ කවුරු දැ'යි විචාළ හෙයින් තමන් නියාව කියා ලා 'කුමකට දැ'යි විචාළ හෙයින් මුඹ වහන්සේගේ බණ අසා බුදුන් සාධු කාර දුන්

Non-Commercial Distribution

හෙයිනැ යි කිවු ය. මිනිස් ලොව පටන් බඹ ලොව දක්වා දෙවි මිනිසුන් මුළුල්ල ම සාධුකාර දුන් නියා ව ත් කිවු ය.

මම ඒ අසා 'ඉදින් ම පුතණුවන් වහන්සේ බුදුන්ට බණ කී සේක් නම් බණ සියලු ලෙසින් දන්නා ඔබට කියා ලිය හුණු පසු බණ වැඩියක් නො දන්නා තැනැත්තියට කියා ලිය හෙන සේකැ'යි සිතිමි. පුතණුවන් වහන්ස, මුඹ වහන්සේ බුදුන්ට බණ වදලේ ඇත්නම් මට ත් බණ වදළ හෙණ සේක. අසවල් දවස බණ අසනු කැමැත්තෙමි'යි කිවු ය. තෙරුන් වහන්සේ ත් ඉවසූ සේක. උපාසිකාවෝ ද වහන්දෑට මහ දන් දී ලා බණ පූජා ත් සරහා ලා පුතණුවන් වහන්සේගේ බණ අසනු නිසා ගෙය බලා හිඳිනට එක ම කෙල්ලක රඳවා ලා සියලු ම කෙළි-කොල්ලන් හැර ගෙණ පුතණුවන් වහන්සේ බණ වදරන තැනට බණ අසන්ට ගියහ.

එ කල සොරු නව සියයෙක් ඒ උපාසිකාවන්ගේ සම්පත මහත් හෙයින් සොරා හැරගන්ට අවසරයක් බල බලා ඇවිදිනාහු මෙ තෙක් දවස් මුළුල්ලෙහි අවසරයක් ම ලද නුහුණ වූ ය. අවසර නො ලබන්ට කාරණ කවරේ ද යත්—උන්ගේ ගෙය වටා පවුරු සතක් හා වාසල් සතෙක් ඇත. ගෙය සිසාරා වට කොට කීන බල් ලනු ත් බැඳ සිටුවති. සේනත්කනින්[1] පැන් වැගිරෙන තැන වට කොට ම ගැඹුරු කොට අගලක් කණවා ලා තුඹ පුරා ලූ ය. ඒ දවල් අවුවෙන් විරී හුණු ව ලෝ දිය මෙන් සිටටි. රෑ දවසට තද ව ගොසින් ගල් පවුරක් මෙන් සිටවී. භිත්තියට ත් තුඹය ව ත්[2] අතුරෙහි මහත් කොට ලා යහුල් ඝන කොට ගැඹුරේ බිම හිඳුවා ලූ ය. මෙ සේ රකවල තර හෙයිනු ත් උපාසිකාවන් ගෙයි හෙයිනු ත් අවසරයක් ම ලද නුහුණු වූ ය.

එ දවස් උපාසිකාවන් බණ අසන්ට ගිය නියා ව දැන උමං බිඳිනාහු තුඹ අගලව ත් යහුලට ත් යටතින් බිඳ ගෙණ ගෙට වැද ලා ඉදින් අප සොර කමට වන් නියා ව දැන ගෙට එන දැ වී නමුත් මරා පිව මැනවැ'යි කියා ලා සොර දෙටුවා උපාසිකාවන් ලඟට යවූ ය. උයි ත් ගොසින් උන් ලඟ සිටීයේ ය. සොරුන් ගෙට වැද ලා පානක් නහා ගෙණ මසුරන් තිබෙන ගබඩාවේ දෙර හළ වූ ය. ගේ බලා හුන් කෙළි ත් සොරුන් ගෙට වැද මසුරන් තුබූ ගබඩාවේ දෙර හැර රන් හැරගන්නා නියා ව දැන උපාසිකාවන් ලඟට, ගොසින් 'ස්වාමීනි, සොරු නැතක් දෙන ම ගෙට වැද ලා

---

1 සේනංකනින් 2 තුඹසක්

Non-Commercial Distribution

මසුරන් තුබූ ගබඩාවේ දොර හළවු ය'යි කීව. උපාසිකාවෝ සොරු තමන් දුටු මසුරන් ගෙණ යෙත්වයි. මම මාගේ පුතණුවන් වහන්සේ වදරන බණ අසමි. මා අසන බණට බාධා නො කොට තෝ ගෙට පලා ය'යි කියා ලා කෙල්ල යවා පූය. සොරුන් අතට සම්භ නු වූ දෙයක් මුත් මසුරන් මුළුල්ල ම හැර ගෙණ රිදී තිබෙන ගබඩාවේ දොර හළ වූ ය. කෙළි නැවත ත් ගොසින් එ පවත උපාසිකාවන්ට කීව.

උපාසිකාවෝ සොරු තමන් කැමැත්තක් කෙරෙත්ව යි. රන් රිදී හැර ගනිත ත් අද ම පුතණුවන් වහන්සේගෙන් මා ලබන දහම් රුවන් හැර ගත නො හෙත්නෝ වේ ද? අද මා අසන බණට බාධා නො කොට තෝ ගෙට නැඟී යව'යි කියා කෙල්ල යවාපීහ. සොරු රිදී ත් අත් පත් ගා හැර ගෙණ රත්රන් තිබෙන ගබඩාවේ දොර හළ වූය. කෙළී පෙරළා ත් ගොසින් එ පවත උපාසිකාවන්ට කීව. උපාසිකාවෝ පෙරළා ත් කියත්නාහු කෙල්ල තෝ දෙ තුන් විටක් කොට ම මා කරා එයි. සොරු තමන් කැමැත්තක් කෙරෙත් වයි. මාගේ පුතණුවන් වහන්සේගෙන් මා අරුමයක් සේ ලබන බණට බාධා නො කරව. මා දෙතුන් විටක් කොට කීව ත් පෙරළ පෙරළා ත් මා කරා එන්නට කාරණ කිම් ද? පෙරළා අයි නම් ඊට නිහඬ දනිමී' කියා ලා යවා පීහ.

සොර දෙටුවාණෝ ත් ළඟ සිටී තැනැත්තෝ දෙතුන් විට ම උපාසිකාවන් කී කථාව අසා ලා මෙ තරම් මැදහත් කෙණකුන්ගේ සම්පත් වස්තු ලොභයෙන් හැර ගතුමෝ නම් ජීවිත ලාභය ත් නැති ව හිස සත් කඩක් ව පැළී ගිය ත් නපුර. කළ මනා ම දෙ යෙක් නො වෙයි' සිතා සොරුන් ළඟට ගොසින් 'තෙල තොප හැරගත් දෙය පෙරළා පනත් කොට ආදී තුබූ ලෙසින් ම තබව'යි විධාන කළහ. උයි ත් මසුරන් තුබූ ගබඩාවේ ද, රිදී තුබූ ගබඩා වේ ද, රත්රන් තුබූ ගබඩාවේ ද, ආදී තුබූ ලෙස ම තුබූහ.

යහපත් කොට පිරිමසා ගත්දෑ නැවත නැවත සිටියවුන් රක්නා සේ සුචරිත ධර්මය ත් සුචරිත පූරකයන් රක්කි.

"ධම්මො හවෙ රක්ඛති ධම්මචාරිං
ධම්මො සුචිණ්ණො සුඛමාවහාති.
එසානිසංසො ධම්මෙ සුචිණ්ණෙ-
න දුග්ගතිං ගච්ඡති ධම්මචාරි"

යනු එ හෙයින් ම වදාළ සේක.

Non-Commercial Distribution

සොරු තමන් හැර ගත් වස්තුව පෙරළා ත් පනත් කොට තබා ලා වස්තුයෙහි ආලය හළවා සේ ම සොර කමෙ ත් ආලය හැර හැම දෙන ම බණ අසන තැනට ගොසින් සිට තුබූ අඩු බණ ඇසූහ.

කුටිකණ්ණ සොණ තෙරුන් වහන්සේ ත් තුන් යම් රාත්‍රිය මුළුල්ලෙහි ම බණ වදරා පාන් වූ කලට හස්තෙන් බට සේක. එ වේලෙහි සොර දෙටුවා බණ වදාළ තෙරුන් වහන්සේ සිටිය දී මුල් ව සිටි හෙයින් වඳනා සේ උපාසිකාවන් වැඳ ගෙණ වැදහෙව. 'ස්වාමි දූවණියනි, කමන්නැ'යි කී ය. හැයි, කුමක් දෑ'යි විචාළෝය. වස්තු ලොභයෙන් අනික් වෛරයක් නැත ත් මුඹ වහන්සේ මරන්ට ය යි මෙ තැන රැක ගෙණ සිටියෙමි. ඒ හෙයිනැ'යි කී ය. ක්‍ෂමාව නම් මෙ සේ වූ දෙයට වේ ද? ක්‍ෂමා කෙරෙමී' කිවු ය.

සෙසු සොරුනු ත් එ සේ ම වැඳ වැතිර පියා ක්‍ෂමා කරන්ට කියා 'ක්‍ෂමා කරම්හ'යි කී කල්හි 'මුඹ වහන්සේ ක්‍ෂමා කළ සේක් වී නම් අප හැම දෙනා මුඹ වහන්සේගේ පුතණුවන් වහන්සේ ලඟ මහණ කරවා ලුව මැනව. සොරකම් හැරෙන්නේ වේ දැ'යි කීය. උපාසිකාවෝ ද 'පුතණුවන් වහන්සේ වැඳ ලා පුතණුවන් වහන්ස, මේ සොරහු මාගේ ගුණයෙහි ත් මුඹ වහන්සේගේ ගුණයෙහි ත් පැහැද මහණ වනු කැමැත්තෝ ය. උන් මහණ කළ යහපතැ'යි කිවු ය. තෙරුන් වහන්සේ ත් යහපතැ යි ගිවිස සිවුරු කරන්ට කල් යන හෙයින් උන් හන් පිළියේ ම දවලු කපවා පියා ගුරින් රඳා පියා මහණ කොට දසසිල් පිහිට වූ සේක.

ඒ නව සියය ම උපසම්පන්න වූ කලට එකි එකී සියයට වෙන වෙන ම කමටහන් දුන් සේක. ඒ නව සියයක් දෙනා වහන්සේ ම නව සියයක් කමටහන් ගෙණ කොට ඇවිදි සොරකම් හැර කෙලෙස් සොරුන් නසනු නිසා එක් පර්වතයකට නැඟී ලා වෙන වෙන රුක් මුල්වල හිඳ මහණ ධමට පටන් ගත් සේක. බුදුහු ත් සාර සිය අසූ ගවුවෙකින් ඔබබෙහි දෙව්රම වැඩ හිඳ ඒ නව සියයක් දෙනා වහන්සේ වල සැහවී හුණන් දැක චරිතානුකූල බණ නියම කොට ලා රස් කඳක් විහිදුවා ලා ලඟ හිඳ කථා කරන්නාක් මෙන් ම බණ වදරන සේක් 'යම් කෙණෙක් තුමූ මෛත්‍රී ධ්‍යාන උපදවා වුව ත් නිකම් වුව ත් සියල්ලවුන් කෙරෙහි මෙත් සිත් ඇති ව බුදු සස්නෙහි පැහැද වෙසෙත් ද, එසේ වූවාහු නිවනට පැමිණෙති. තව ද මහණෙනි, මෙ ම අත් බැව් නමැති නැව්වල



Non-Commercial Distribution

මිථ්‍යා විතර්ක නමැති දිය උනා පිරී සිටී නම් සසර නමැති මුහුද ගලා පිය යි. එ හෙයින් විවසුන් අතින් හිස පියව. කුමක් නිසා ද යත්-

යම් සේ මුහුද යන්නා වූ නැවවල සිදුරු වලින් වදිනා පැන් සිදුරු හැසවා ලා හිස පී කලට සැල්හු ව ගොසින් මුහුද නො ගැලී වහා පටුන් තොට වලට බසී ද, එ පරිද්දෙන් මිථ්‍යා විතර්ක නමැති දියෙන් ම පිරුණු අත් බැව් නමැති නැව චක්ෂුරාදී වූ ද්වාර නමැති සිදුරු සංවර නමැති කීල් වසා ලා මිථ්‍යා විතර්ක නමැති දිය විවසුන් අතින් හිස පී කලට සැල්හු ව ගොසින් සසර මුහුද නො ගැලී නිවන් පර තෙරට වහා පැමිණෙ යි. සසර නමැති කණුවෙහි බඳනා කෙලෙස් නමැති බහනු ත් විවසුන් අතින් සිඳුව. එ සේ සිඳ පූ නම් රහත් ව අනුපධිශෙෂ නිර්වාණ ධාතුවට ත් පැමිණෙව. තව ද පය බැඳ ලූ ලූ ලණුවක් කපන කලක් මෙන් සැව තුන් මඟින් දෘෂ්ටි සංයොජනා දී වූ පාත් ව තිබෙන අපායට පමුණුවන ඔරම්භාගිය සංයොජනයන් පස් දෙනා ත් සිඳුව.

තව ද බොටුව බැඳ ලූ ලණුවක් කපන්නාක්හු මෙන් උඩ දෙව් ලොවට බඹ ලොවට පමුණුවන්නා වූ රූප රාගාදී උද්ධම්භාගිය සංයොජනයන් පස් දෙනා ත් රහත් මඟින් නසව. ඒ උද්ධම්භාගිය සංයොජනයන්ගේ ප්‍රහාණ ය නිසා ශ්‍රද්ධෙන්ද්‍රියාදී පඤ්චෙන්ද්‍රිය ය නු ත් වඩව. යම් කෙණෙක් රාගසඞ්ගය, දෙෂසඞ්ග ය, මොහසඞ්ගය මානසඞ්ග ය, දෘෂ්ටිසඞ්ග ය, යන පඤ්ච විධ සඞ්ග ය ඉක්ම වූ නම් කෙලෙස් මහ වතුරින් එ තෙර වූවා නම් වෙති. මහණෙනි, තෙපි ආරම්මණූපනිද්ධ්‍යාන-ලක්‍ෂණූපනිද්ධ්‍යානයෙහි දෝ හෙවත් සමථභාවනා - විපස්සනා භාවනාවෙහි යෙදී වසව. ප්‍රතිපත්ති පූරණයෙහි පමා ත් නො වව. තොපගේ සිතු ත් පස් කම් ගුණයෙහි නො පවත්ව ව. පමා ව වැස නිරා දුකට පැමිණ බත් ගිලූ උගුරෙන් ලෝ ගුළි ත් [1] නො ගලව [2]. ඉතා දුකැ යි හඬන්ට ත් නො කැමැත් තෙ ය. නුවණ නැත්තවුන්ට සිත එකඟ වීමක් නැත. එ සේ ම සිත එකඟ වීම් නැත්තවුන්ට විදර්ශනා-ප්‍රඥ ත් නැත. යම් කෙණෙ කුන්ට සමථ විදර්ශනා දෙක ඇත් නම් උ නිවනට ලං ව සිටිති.

තව ද ආරණ්‍ය - වෘක්‍ෂ මූලාදී වූ විවෙක ස්ථානයක හිඳ සන්හුන් සිතින් භාවනා කරන්නවුන්ට සමථ භාවනා වී නම් මාර්ග ත් උපද්දී. තව ද යම් කෙණෙක් රූපස්කන්ධාදී වූ පඤ්චස් කන්ධයන්ගේ උදය ලක්‍ෂණ ය පස් විසි ආකාරයෙකින් හා ව්‍යය ලක්‍ෂණය ත් පස් විසි ආකාරයෙකින් සලකා ප්‍රීති ප්‍රමොද්‍යයක්

---

1 ලෝගුළුත්, ලෝ ගලාත් 2 නො ගලව. නො ලව

Non-Commercial Distribution

ලැබෙත් ද සප්‍රත්‍යය වූ නාම රූපය ත් විභූත වීමෙන් ඒ ප්‍රීති ප්‍රමොද්‍ය ය අමා මහ නිවනට පමුණුවන හෙයින් නුවණැත්තවුන්ට ධාතු බෙදූ ද්‍රොණය ත් ධාතු වූවා සේ ම නිවන් ම වෙයි. තව ද මේ ශාසනයෙහි නුවණැත්තවුන්ට ආජීව කවරේ ද යත් - චතු පාරිශුද්ධිශීලය ය. එ හෙයින් සිව් පිරිසුදු සිල ත් තර ව පිහිටව. ධූර ද්වයින් පිටත් ව වසන පවිටු මිත්‍රයන් හැර අත්‍යන්ත පරිශුද්ධ වූ ආජීව ඇති ජඩසා බලයෙන් ම රකෙන හෙයින් නුකුසී වූ කල්‍යාණ මිත්‍රයන් ම භජන ය කරව. තව ද ආමිස පටිසන්ථාර ධම්ම පටිසන්ථාර දෙක ම පවතු ව වත් පිළිවෙත ත් යෙදී වසව. මෙ ලෙසින් විසීමෙන් සසර දුක් ගෙවෙ යි' වදාළ සේක. මෙ සේ බුදුන් වදාළ ගාථා නවයෙන් එකි එකී ගාථාවක් වදරා නිමවා ලන්නා ම සඟ සිය ය සිය ය හුනස්නේ හිඳ ම සිවු පිළිසිඹියා පත් රහත් ව අහසට පැන නැඟී ලා ආසින් සාර සිය අසූ ගවුව මහ ජෙතවා දෙව්රම් වෙහෙරට ගොසින් බුදුන් වැඳි සේක.

එ හෙයින් සත් පුරුෂයන් විසින් ආදි සොරු ව විසූ නවසිය යක් දෙන වහන්සේ යම් කෙලෙස් සොර කෙණකුන්ගේ සභා යෙන් එ ලෙස කළ සේක් වී නම් ඒ සොරුන් හැම නසා සසර දුක් ගෙවූවා සේ සසර දුක් ගෙවන්ට ම උත්සාහ කටයුතු.

---

## 270. පන්සියක් දෙනා වහන්සේ ගේ වස්තුව

තව ද තිලකුණු මෙනෙහි කිරීමට ත් වඩා වීරිය කිරීමෙහි යහපත දක්වන්ට පන්සියක් දෙනා වහන්සේ ගේ වස්තුව කියමු.

කෙ සේ ද යත්—

ඒ වහන්දෑ බුදුන්ගෙන් කමටහන් ඉගෙන ගෙණ වල හිඳ මහණ ධම් කරණ සේක් උදසන පිපියා වූ ඉද්ද මල් දවසකු ත් දෙ දවසකු ත් නො තිබී එ දවස සවස ම පර ව නටුයෙන් ගැළ වෙන්නා දැක තොප තෙල නටුවලින් ගැළවෙන්ට පෙරාතු අපි රාගාදී කෙලෙස් සතුරන් ගෙන් ගැළවෙමහ' යි වීර්‍ය්‍යයට පටන් ගත් සේක. බුදුහු ත් ඒ වහන්දෑ දැක 'මහණෙනි, භික්ෂූන් විසින් නම් නටු වෙන් මල් ගැලවෙන්නා සේ සසර දුකින් ගැළවීම යහපතැ යි වදරා ලා ගඳ කිළියේ වැඩ හිඳ 'යම් යම් සේ එ දවස් පිපුණ ත් ඉද්ද මල් බඳුවද මල් ආදි ය සවසට හෝ උදසනට පර ව හේ ද, එ පරිද්දෙන් තෙපි කල් යවා රැඳීමෙන් වන යහපතක් නැති

බැවින් වහා තොපගේ සතන් වලින් කෙලෙසුන් දුරු කරව' යි වදළ සේක. දෙශනා කෙළවර පන්සියක් දෙනා වහන්සේ ම රහත් වූ සේක.

එ හෙයින් නුවණැත්තවුන් විසින් වඩනා ලද වීර්‍ය්‍ය ඇත්ත වුන්ට සිද්ධ නො වන දෙයක් නැති බැවින් කුශල විෂයෙහි වීර්‍ය්‍ය කොට භවක්‍ෂය කටයුතු.

---

## 271. සන්තකාය තෙරුන් වහන්සේ ගේ වස්තුව

තව ද සන්හුන් පියෝ ඇති වීමෙහි යහපත හඟවන්ට සන්තකාය තෙරුන් වහන්සේ ගේ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්—

ඒ තෙරුන් වහන්සේගේ අනුන්ට නො රිසියෙන ලෙස අත සොල්වාලීමෙක් වත් පය සොල්වාලීමෙක් වත් නැත. හැම වේලේ ම සන්හුන් පියෝ ඇති සේක. ඊට කාරණ කවරේ ද යත් — පෙරාතු ජාතියෙහි සිංහ ව උපන් සේක.

සිංහයෝ නම් ගොදුරු අනුභව කොට ලා රිදී ගුහාවකට හෝ මැණික් ගුහාවකට හෝ වැද ලා සිරියෙල් සුන්නෙන් තැවරී පියා සත් දවසක් වැදහෙව නිදා පියා නැඟී සිට වැද හොත් තැන් බලා පියා ඉදින් නඟුට හෝ කන්පත් හෝ අත පය හෝ සෙල වී සිරියෙල් සුණු විසිර පියා තුබුවා දුටවු නම් 'මේ තොපගේ ජාති - ගොත්‍ර තරමට නිසි නො වේ'යි සිතා ලා තව ත් සතියක් නිරාහාර ව වැද හොවිති. එ සේ වැද හොත් කල සිරියෙල් සුණු නො විසිරිණි නම් 'මේ තොපගේ ජාති ගොත්‍රයට තරමැ'යි ගුහා වෙන් නික්ම කිලි පොළා පියා දස දිග බලා තුන් විටක් සිංහ නාද කොට පියා ගොදුරු සොයා යෙති. මුන් වහන්සේ ත් එ සේ වූ සිංහ යොනින් ආ සේක.

වහන්දෑ ත් මුන් වහන්සේගේ නිසල පියොව දැක බුදුන් කරා ගොසින් 'ස්වාමීනි, සන්තකාය තෙරුන් වහන්සේගේ පියොව තරම පියොවක් නුදුටු විරූම්හ. පියොව ඉතා ම යහපතැ'යි දැන්වූ සේක. බුදුහු ත් 'මහණෙනි, මහණුන් විසින් එ ලෙස ම වුවමනා වේ දැ'යි වදරා යම් කෙණෙක් ප්‍රාණඝාතාදී කාය දුශ්-චරිතයෙහි නො හැසිරීමෙන් සන්හුන් තරම ඇති ව, මෘෂා වාදදි වාක් දුශ්චරිතයෙන් දුරු වීමෙන් තෙපුලෙනු ත් සන්හුන් ~රම ඇති ව, අභිද්ධ්‍යාදිය නැති වීමෙන් සන්හුන් සිත් ඇති ව

වෙසෙත් ද, තුන් දෙරින් ම සිද්ධ වන අකුසල් නැති හෙයින් සන්හුන් තරම් ඇත්තෝ ද, චතුර්විධ මාර්‍ගඥාන නමැති මුඛයෙන් කෙලෙස් නමැති අජීර්‍ණ ය වමාරා පූ ද, නො සන්හුන් තරමට කාරණ ව සිටිනා කෙලෙසුන් නැති හෙයින් ශාන්ත ය'යි උන්ට කිය යුතු ය'යි වදාළ සේක. දෙශනා කෙළවර සන්තකාය තෙරුන් වහන්සේ සියළු ලෙසින් සන්හුන් තරම් ඇති ව රහත් වූ සේක. සෙසු ත් බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් සන්තකාය තෙරුන් වහන්සේට ජාත්‍යන්තරයෙහි ත් වූ උත්තම ජාතියෙහි නිසා උත්තම ගුණ ය යම් සේ සිද්ධ වේ ද, එ මෙන් උතුම් තරම් නිසා උතුම් ගුණ ඇති ව උතුම් තැනට පැමිණිය යුතු.

## 272. නඞ්ගලකූර තෙරුන් වහන්සේ ගේ වස්තුව

තව ද උපදෙශක ව සිටිනා තැන ත් තමා තමා හට පනත් ව ගැන්මෙහි යහපත දක්වන්ට නඞ්ගලකූර තෙරුන් වහන්සේ ගේ වස්තුව කියමු.

කෙ සේ ද යත්—

එක් දුප්පත් මිනිසාණ කෙණෙක් තමන් තමන්ට පැදෙන හෙයින් අනුන්ට බැළ මෙහෙ කොට ලා ජීවත් වෙති. එක් කෙණ කුන් වහන්සේ උන් තමන් කෝණම කඩ රෙද්දක් ඇඳ ගෙණ නඟුලක් කර තබා පියා බැළ සීයකට යන්නවුන් දැක ජීවත් වන ලෙසට අනුකම්පා ඇති ව 'තොප මෙ ලෙසට දුක් ගන්නවුන් මෙ දුක් ගෙවා මහණ වූ කල නපුරු දැ'යි වදාළ සේක. 'ස්වාමීනි, මම දුක් ගත නො හී මහණ වෙමි නමුත් මා සේ වූ දුක්පතියකු මහණ කරණ සේක් කවුරුන් වහන්සේ දැ'යි කිවූ ය. 'ඉදින් තෙපි මහණ වවු නම් මම මහණ කෙරෙමි' කී සේක. 'මහණ කරණ සේක් වී නම් මහණ වෙමි' උනු ත් කී කල්හි තෙරුන් වහන්සේ දෙව්රමට කැඳවා ගෙණ ගොසින් සස්නෙහි ඇලුම් ඇති වනු නිසා සිය අතින් ම නාවා පියා මළුවේ දී ම මහණ කොට ලා හැඳ ගත් රෙදි කඩ හා සමඟ නඟුල මළු කෙළවර අත්තෙක එල්වා තබා පූ සේක.

උන් වහන්සේ ද උපසම්පන්න ව නඞ්ගලකූර[1] තෙරුන් වහන්සේ ය'යි ප්‍රසිද්ධ වූ සේක. උන් වහන්සේ ද කිසි ත් ආයාස යක් නැති ව බුද්ධානුභාවයෙන් සුව සේ ජීවත් වන සේක් කලක දී

1. නඟලකූල

Non-Commercial Distribution

සස්නෙහි උකටලී ව පියා උකටලිය හැර ගත නො හී සිවුරු හරනට සිතා ගෙණ හැඳගන්ට පිළියක් නැති හෙයින් කඩ රෙද්ද තුබූ අත්ත කරා ගොසින් කඩ රෙද්ද තරම ත් වැළඳ ගත් සිවුරේ තරම ත් බලා පියා තමන් වහන්සේ ම තමන් වහන්සේට 'ලජ්ජා නැති තැනැත්ත ව, කඩ රෙද්ද හැඳ ගෙණ සිවුරු හැර ගොසින් ශාසනයේ සිට ලත් සම්පතක් නැති හෙයින් තව ත් බැළ මෙයට සිතා ගත්ති දැ'යි මාලු කම් කී සේක. මෙ ලෙස මාලු කම් කී කලට උකටලිය ත් තුනී ව ගත. නැවත අවුත් පෙරළා කීප දවසෙකින් උකටලී ව කඩ රෙද්ද තුබූ තැනට ගොසින් ආදි ලෙස ම මාලු කම් කියා තව ත් උකටලි ය තුනී වි ය. මෙ ලෙසින් සස්නෙහි ආල ය නැති වූ විට කඩ රෙද්ද තුබූ තැනට ම යන සේක.

වහන්දෑ ද එක් වන් ම යන නියාව දැක 'ඇවැත්නි, කොයි යවුදැ'යි විචාළ සේක. කඩ රෙද්ද හා නඟුල සිවුරු හැර පීමට ආල ය හරවා අවවාද කරණ ආචාරී තැනක් වැනි හෙයින් එ ලෙස සලකා ආචාරීන් වහන්සේ කරා යම්හ'යි කියන සේක. මෙ ලෙසින් දවස් ගණනෙකින් කඩ රෙද්ද හා නඟුල ම කමටහන් උගන්වන ඇදුරු කොට ගෙණ රහත් වූ සේක. වහන්දෑ ත් ඔබ වෙහෙසනු නිසා 'ඇවැත්නි, තොප ආචාරිය තැන් කරා යන මඟ ත් දැන් වල් වි ය. ඔබ යන ගමන නැතැ'යි කී සේක. 'එ සේ ය, ආදි එ බඳු තරමක් ඇති හෙයින් ගියම්හ. දැන් ඒ හැම නැති හෙයින් ඔබ ගමන හළම්හ'යි කී සේක.

වහන්දෑ එ පවත් අසා 'නැත්ත කියා තමන් රහත් නියාවක් භගවති' බුදුන්ට දැන් වූ සේක. බුදුහු 'මහණෙනි, ම පුතු තුමූ ම තමන්ට අවවාද කොට නිසි ලෙසින් වැස රහත් වූ ය'යි වදරා බණ වදරන බුදුහු 'මහණෙනි, අනුශාසක කෙණෙක් සම්භ නො වෙත් නම් උන් රැක නො හීද තමා තමහට අවවාද කළ මැනව. තමා ම තමාගේ තරම විමසුව මැනව. එ ලෙස වසන් නාහු හැම වෙලේ ම සිහි නුවණ ඇති ව වසන හෙයින් සතර ඉරියවුවෙහි ම සුව සේ දවස් යවති. අනුශාසකයන් ඇත ත් තමහට පිහිට වන්නෝ තුමූ ම ය. අනික් පිහිට වන්නෝ කවුරු ද? තමා ම කළ දෙයකින් මුත් අනුන් කළ පිණෙකින් සගමොක් දෙකට පැමිණෙන කෙණකුන් නැති හෙයින. එ හෙයින් ලාභ ය නිසා ආජානීය අශ්වයකු හික්මවන්නා සේ තමා ම තමා හික්ම වනු මැනව'යි වදාළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන සෝවාන් ඵලාදියට පැමිණියහ.

Non-Commercial Distribution

එ හෙයින් නුවණැත්තවුන් විසින් අනුන් බලා නො හිඳ තමා ම තමාට පිහිට කට යුතු.

## 273. වක්කලී තෙරුන් වහන්සේ ගේ වස්තුව

තව ද බුද්ධාලම්බන ප්‍රීතිය උපදවා වසන්නවුන්ට උත්සාහ වඩනු නිසා වක්කලී තෙරුන් වහන්සේ ගේ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්—

උන් වහන්සේ සැවැත් නුවර බමුණු කුලයෙක ඉපැද වැඩි විය පැමිණි සේක් සිහා වැඩි තිලෝ ගුරු බුදු රජුන් වහන්සේ දැක මේ ලෙව්හි ශොභාවෙක් ඇත්නම් මුළුල්ල එක් කොට හඹා පිවාක් වැනි වූ රුව දැක බලා ඇස් ඇද ගත නො හී 'මෙ සේ කළ කලට බුදුන් නිරන්තර ව දක්නෙම් වේ දැ'යි බුදුන් ලඟ ම මහණ ව යම් තැනෙක සිටි කල බුදුහු පෙනෙන සේක් වී නම් එ තැනට පලා ගොසින් ධුරද්වය හැර බුදුන් ම බල බලා සිටිනා සේක.

බුදුහු ත් ඔබගේ නුවණ මුහුකුරණ තෙක් කුමකු ත් නො වදරා නුවණ මුහු කළ නියාව දැන 'වක්කලීනි, තොප මාගේ දෙ තිස් කුණු කොටසින් ගැවසී ගත් ශරීරය බැලීමෙන් ප්‍රයෝජන කිම් ද? 'වක්කලීනි, යම් කෙණෙක් නුවණැසින් දහම් බලත් නම් උඹ මා දකිති. මා දක්නවුන් දහම් දක්ක මැනැවැ'යි අවවාද වදළ ත් බුදුන් පෙනෙන තැනින් අනික් තැනකට යා නො හෙන සේක. බුදුහු ත් 'මෙ ලෙසින් මුත් දුරු කට නො හැක්කැ'යි වස් වසන ආසන්නයෙහි රජගහා නුවරට වැඩ වස් වසන දවස් 'පලා යව, වක්කලීනි'යි වදරා නෙරපී සේක.

උන් වහන්සේ ත් 'බුදුහු මා හා කථා නො කරණ සේකැ'යි තුන් මසක් මුළුල්ලෙහි බුදුන්ව කයින් ලං ව ගත නො හී 'බුදුන් දක්ක නො හෙන මාගේ ජීවත් වීමෙන් ප්‍රයෝජන කිම් ද, පර්වතයට නැඟී ලා වැටී ගොසින් මියෙමි'යි ගිජු කුළු පවුවට නැඟි සේක. බුදුහු ත් ඔබ විඳිනා ආයාස ය දැක 'මේ මහණ මා ගෙන් අස්වැසිලියක් නො ලදින් මාර්ග ඵලොපනිශ්‍රය නසා ගත් නමුත් නපුරැ'යි තමන් වහන්සේ දක්වන්ට රස් කඳක් විහිදුවා ලූ සේක. බුදුන් දක්නා ම ඇඹුලෙකින් මල කඩක් නැති වන්නා සේ ශොකය නැති වී ය. බුදුහු ද වැසි නැති ව වියළී තුබූ වැවක් වැසි වැස පුරන කලක් මෙන් වක්කලී තෙරුන් වහන්සේට ත් ප්‍රීති

Non-Commercial Distribution

ප්‍රමොදාය උපදවනු නිසා 'හෙම්බල වක්කලීනි, යම් කෙනෙක් බුද්ධාලම්බන ප්‍රීති ය බලවත් වී නම් උං බුදු සස්නෙහි පහන් ව වෙසෙති. අනික් සිතිවිල්ලකට අවසරයක් නැති හෙයින් සම්‍යක් ප්‍රතිපදවෙහි පිහිටා භව ක්‍ෂය ත් කෙරෙති' වදරා ලා–

''එහි වක්කලි! මා භායි-ඔලොකෙන්තො තථාගතං,
අහං තං උද්ධරිස්සාමි-පඞ්කෙ සත්තංව කුඤ්ජරං

යනාදි ගාථා තුන[1] වදරා ලා අත දික් කොට වදළ සේක. උන් වහන්සේ ද ''බුදුහු ත් මා දුටු සේක. මම ත් ඔබ දිටිමි. එව'යි යන බස් පමණකු ත් ලදිමි''යි ප්‍රීතිය බලවත් ව ප්‍රීති වෙගයෙන් වඩනා මඟ ත් සොයා ගත නො හී බුදුන්ව හමුවූ ආසට උද්වෙග ප්‍රීති බලයෙන් නැඟී ලා බුදුන් වදළ ගාථා සලකමින් ආස දී ම ප්‍රීති ය විකඹා ලා විවසුන් වඩා පිළිසිඹියා පත් රහත් ව බුදුන් වැඳ වැඳ බිමට බැස ලා ලඟ වැඩ සිටි සේක. බුදුහු ත් පසු ව ශ්‍රද්ධා බහුල තැනට අග තැන තබා වදළ සේක.

එ හෙයින් නුවණැත්තවුන් විසින් කවරත් කුශලයට ශ්‍රද්ධාව මුල් වන හෙයින් සැදැ වඩනට නිසි වූ බණ අසා සැදැ ඇති ව කුසල්හි හැසිරිය යුතු.

## 274. සුමන සාමණේර වත

තව ද වයස බාල වුව ත් ගුණය මුකුරා තිබේ නම් එ ම ප්‍රයෝජන නියාව හඟවන්ට සුමන සාමණේර වත දක්වමු.

කෙ සේ ද යත්—

එහි ලා මේ පිළිවෙළ කථාව ය. පියුමතුරා බුදුන් සමයෙහි එක කුල දරුවාණ කෙණෙක් බුදුන් සිවු වනක් පිරිස් මැද වැඩ හිඳ එක් භික්ෂු කෙණකුන් වහන්සේ දිවස් ඇති තැනට තමන් වහන්සේට ඉක්බිති කොට අග තැන තබන්නා දැක තුමූ ද එ සැප ත් පතා පිණක් නො කොට ම ලද නො හැකි හෙයින් දනමය කුශලය ත් තදුපනිශ්‍රය හෙයින් බුදු පාමොක් සඟනට ආරාධනා කොට ලා සතියක් මුළුල්ලෙහි මහ දන් දී 'සවාමීනි, මම ද එන දවස එක් බුදු කෙණකුන් වහන්සේගේ සස්නෙහි ඒ බුදුන් විනා සෙසු දිවස් ඇති තැනට උතුම් වෙම්ව'යි පැතූහ. පියුමතුරා බුදුහු ත් මහාශ්‍රාවක බොධි ය කප් ලක්‍ෂයකින් මුත් මැත සම්භ නො වන හෙයින් අතුරෙක අධිගමයෙක් වේ නමුත් ය යි කප් ලක්‍ෂයක් මුළුල්ලෙහි බලන සේක් ප්‍රාර්‍ථනාව සමෘද්ධ වන නියාව දැන 'මේ

1 ගාථා දෙක 2 ඇසට

Non-Commercial Distribution

මා බුදු වූ කපට ලක්‍ෂයක් වන කප බුදු වන ගෞතම බුදුන් ගේ සස්නෙහි දිවස් ඇත්තවුන්ට අග්‍ර ව නමින් අනුරුද්ධ මහ තෙරහු ය යි ප්‍රසිද්ධ ව යි' වදාළ සේක.

කුල දරුවාණෝ ද ඒ විවරණ ය අසා මිනිස් ලොවින් අනූ ලක්‍ෂයක් හවුරුදු පළමු වන නරකයට දවසක් වන්නා සේ ලක්‍ෂ යක් වන කප ය යි වදරා ලා සෙට දවස් වන දෙයක් සේ සිතා ගෙණ ඒ බුදුහු ත් හවුරුදු ලක්‍ෂයක් වීවරින් කළ මනා බුද්ධ කෘත්‍ය යත් නිමවා පිරිනිවි කල්හි වහන්දෑ අතින් දිවස් ලැබීමට නිසි පින්කම් විචාරා 'පාන් පූජා කිරීම ආවෙණික පිණෑ'යි කී කල්හි පියුමතුරා බුදුන් ගේ ධාතු වඩා කළ අව විසි ගවුවක් වීවර උස ඇති රන් ද ගබ බට තො එක් දහස් ගණන් පාන් ඇගෑ අරංගු ආදි ය කරවා ලා පාන් පූජා කර ලා එයින් සැව දෙව් ලොව ඉපැද දෙව් ලොවින් කැටි ව මිනිස් ලොවින් කැටි ව කප් ලක්‍ෂ ය ගෙවා බුදුවරුන් වහන්සේ පස් නමකින් හෙබියා වූ මේ භද්‍ර කල්පයෙහි එක්තරා අකුශල කර්‍ම බලයෙකින් බරණැස් නුවර දිළිඳුකුලයෙක ඉපැද සුමන නම් සිටාණන් නිසා උන්ගේ අසුන්ට තණ ගෙනවු ත් ලා ලා ජීවත් වෙති. නමින් අන්නභාර නම්හ. සුමන සිටාණෝ ද එ නුවර දන් හල් සයක් කරවා ලා නිරන්තර ව මහ දන් දෙති.

ඉක් බිත්තෙන් එක් දවසක් උපරිට්ඨ නම් පසේ බුදුන් වහන් සේ ගඳ මහන් පව්වෙහි දී සතියක්මුළුල්ලෙහි නිරොධ සමාපත්ති යට සම් වැද සමාපත්තීන් නැඟී අද කවුරුන්ට සංග්‍රහයක් කෙරෙම් දෝ හෝ' යි සිතා 'අද අන්නභාරයන්ට සංග්‍රහයක් කෙළෙම් නම් යහපත. අද ම සංග්‍රහයක් කෙළෙම් නම් දිළිඳු කමු ත් හැරී මහ සම්පත් ලැබෙ යි. දනු ත් ඒ තෙමේ වලින් තණ හැර ගෙණ ගෙට එන්ට එ යි, දැන වදරාසිවුරු වැළඳ ගෙණ පාත්‍ර ය පටවා ගෙණ අහසින් වැඩ අන්නභාරයන් ඉදිරියේ වැඩ සිටි සේක.

අන්නභාරයෝ ද තමන්ගේ කුශලානුභාවයෙන් දිළිඳු කමින් මුදන්ට පොළොව පළා ගෙණ නැඟි කප් රුකක් වැනි වූ ඒ පසේ බුදුන් වහන්සේ දැක පාත්‍ර යත් සිස් නියාව දැන 'ස්වාමීනි, සිඟමන් උපන්දැ' යි විචාරා 'මහ පිණෑත්තව, ලබන්නමෝ වෙ දැ'යි අනා ගතාපෙක්‍ෂාවෙන් වදාළ කල්හි 'ස්වාමීනි, එසේ වී නම් මදක් වැඩ සිටිනේ යහපතැ' යි කියා ලා තණ කද බා තබා පියා වහාගෙට ගොසින් 'සොඳුර, උදවු බතෙක් ඇත් ද නැත් දැ'යි ඇමෙණියන් අතින් විචාරා 'ස්වාමීනි, ඇතැ' යි කී කල්හි පෙරළා වහා පලා

ගොසින් පසේ බුදුන් වහන්සේගේ පාත්‍ර ය ආරාධනා කොට ලා ඇර ගෙණ 'යම් දවසෙක දනක් දෙන්ට සිතිම් නම් එ දවස් දීලන්ට නිස්සක් සම්භ නො වෙයි. දී ලන්ට නිස්සක් සම්භ වූ කලට දන් පිළිගන්ට නිසි තැනක් ළද නො හෙමි. අද වූ කලි පිළිගන්ට නිසි කෙණකු ත් දෙර නො ඇවිද ම සම්භ වූ සේක. පිළිගන්වා ලන්ට නිස්සකු ත් ඇතිවි ය. මට වූයේ බලවත් ලාභ ය කැ'යි සිත සිතා ගෙට ගොසින් බත් පාත්‍ර ය පුරවා පියා ගෙණ අවුත් පසේ බුදුන්ට පිළිගන්වා ලා ''ස්වාමීනි, මේ ජාති ය පටන් මෙ සේ වූ දිළිඳු කමෙකු ත් නො වේව' යි, 'නැතැ'යි යන බසක් ම නො අසම්ව' යි පතා ගත්හ. පසේ බුදුන් වහන්සේ 'මහ පිණැතියා ණෙනි, එසේ ම වේව' යි වදරා ප්‍රත්‍යෙක බුද්ධ ගාථාවෙන් අනු මෙවුනි බණ ත් වදරා ලා වැඩි සේක.

සුමන සිටාණන්ගේ ඡත්‍රයෙහි වසන දේවතාවාණෝ උපරිට්ඨ නම් පසේ බුදුන් වහන්සේට දුන් දන ඉතා යහපතැ' යි තුන් විටක් සාධු කාර දුන්හ. සිටාණෝ තමන් දෙන දනට දුන් සාදු කාරයකැ යි සිතා 'මෙ තෙක් දවස් මා දෙන දන් නුදුටු දැ'යි විචාළෝ ය. 'මා තොපගේ දන ක් අරභයා දුන් සාධු කාරයෙක් නො වෙයි. අන්නභාරයන් උපරිට්ඨ නම් පසේ බුදුන් වහන්සේට දුන් බත් පාත්‍රයෙහි පැහැද සාධු කාර දිනිමි' කීහ. සිටාණෝ ද 'මා මෙ තෙක් කල් මුළුල්ලෙහි දන් දී ත් දෙවියන් ලවා සාධු කාර දෙවා ලිය නුහුණුයෙමි. අන්නභාරයෝ ස්ව ප්‍රධාන වාසයක් නැති ව මා නිසා ජීවත් වන තැනැත්තෝ මෙ තෙක් දවසෙක දුන් දනක් නැත ත් ඒ අද එක දවස දුන් දනින් ම එයි ත් බෙහෝවක් නො ව එක් බත් පාත්‍රයෙන් ම දෙවියන් ලවා සාධු කාර දෙවූහ. දෙවියන් ගෙන් සාධු කාර ලත් හෙයින් උන්ගේ දන වැඩි සිටි ය. උන්ට නිසි සංග්‍රහයක් කොට ලා ඒ බත් පාත්‍ර ය මා සන්තක කෙරෙමි' යි සිතා ලා අන්නභාරයන් ගෙන්වා ලා 'අද තොප කිසි තැනකට දුන් කිසිවක් ඇත් දැ'යි විචාළෝ ය.

'එසේ ය. 'ස්වාමීනි, මට ඉදි කළ බත් උපරිට්ඨ නම් පසේ බුදුන් වහන්සේට දිනිමි' කීහ. 'පින්වත, එසේ වී නම් තෙල කහ වණුව ගෙණ ඒ බත් පාත්‍ර ය මට දෙව' යි කීහ. නො දෙමි' කී කල්හි 'රන් මඳ හෙයින් නො දෙන වනැ'යි සිතා දෙ මස්සෙන් තුන් මස්සෙන්, දස කළඳින්, විසි කළඳින්, පනසින්, සැටින්, සියෙන් වඩා ගෙණ ගොසින් දහස දක්වා දෙමි' කීහ. අන්නභා රයෝ ද දහසට වුව ත් විකුණන්ට සිතා කළ දෙයක් නො වන

හෙයින් 'නො දෙමි' කීහ. සිටාණෝ ද උන්ගේ තර ය දැක 'අප තරම් උපකාරී තැනට මසු දහස හැර ගෙණ ත් බත් පාත්‍ර ය දී ලන්ට මැළි බැවින් ඒ දහස හැර ගෙණ බත් පාත්‍රයෙහි පින් දෙ ව'යි කීහ. මිල හැර ගෙණ පින් දී පී කලට පින් තමන්ට නැති ව සිටාණන්ටම වේ දැයි සිතා ගෙණ 'පසේ බුදුන් වහන්සේ ලා කථා කොට ලා පසු ව කියා ලමි කියා වහා ම පසේ බුදුන් වහන්සේ කරා ගොසින් 'ස්වාමීනි, සුමන සිටාණෝ මසු දහසක් දී ලා මුඹ වහන්සේට දුන් බත් පාත්‍රයෙහි පින් ඉල්වති දෙම් ද, නො දෙම් දැ' යි විචාළෝ ය.

ඔබ දෙන්ට ත් නො දෙන්ට ත් නො වදුරා පින් දුන්හ'යි කියා වඩනා දෙයක් මුත් අඩුවක් නැති නියාව හභවන්ට උපමාවක් දක්වන සේක් 'නුවණැත්තාණෙනි, ගෙවල් සියයක් ඇති ගමෙක එගම ගෙයක පානෙක් ඇවිළේ නම් සෙසු ගෙවල මිනිස්සු තමන් ගෙන් ම තෙල ගැලූ පාන් කඩ ගෙණවුත් අර පානින් පාන් අවුළුවා ගනිත් නම් පාන් කඩ එකුන් සියයකට ගියා වන්නා පළමු ඇවිළෙමින් සිටි පානෙන් ශොභාව ඇත් ද නැත් දැ'යි විචාල සේක. 'පාන් කඩවල තෙල් පාන් තුඩ ගැලි ලා ආදී විවරට ත් වඩා ඒ පානෙන් ශොභාව බලවත් වන්නේ වේ දැ'යි කිවු ය 'එසේ කලට පළමු තුබූපාන අර පාන්කඩ කරා නො යන නියා වේ දැ'යි වදළ සේක.

'එ සේ ය, ස්වාමීනි, කිවු ය. 'එ සේ වී නම් නුවණැත්තාණෙනි, එ පරිද්දෙන් ම යම් කෙණෙක් වැඩියක් නො වත ත් කැඳ සාළුවක් පමණ වේව යි බත් සැන්දක් පමණ වේව යි දන් දී ලා ඉදින් යම් තාක් දෙනාට පින් දුන්නු නම් ඒ තාක් ම උන්ට පින් කමු ත් වඩඩි. යම්තාක් තෙපි අපට බත් පාත්‍රයක් දුන්නාවා ද? ඒ පාත්‍රයෙහි පින් සිටාණන්ට දුන්නු නම් බත් පාත්‍ර දෙකෙක් වෙ යි. එකෙක් තොපට ය. එකෙක් සිටාණන්ට ය. එ හෙයින් පින් කෙතෙක් දෙනාට දුන් නමුත් ඊ අඩුවෙක් නැත. පින් දීම ත් දස පින් කිරිය වතින් එකෙකැ'යි වදළ සේක.

උයි ත් උපමාව උගන්වා වදළ හෙයින් තත්ත්‍ව ය දැන ගෙණ පසේ බුදුන් වැඳ ලා සිටාණන් ලඟට ගොසින් 'පින් හැර ගත මැනැව'යි කී හ. 'එ සේ වී නම් තෙල මසු දහස ගනුව'යි කීහ. 'මම බත් පාත්‍ර ය නො විකුණෙමි. සැදැයෙන් ම දෙමි' කිවු ය. 'තොපි තොප ගේ සැදැයෙන් ම දෙව, මම ත් බත් පාත්‍රයට මිල කොට නො දෙමි. තොපගේ ගුණයට පූජා කෙරෙමි කෙ තෙක් මසුරන් දිත් නමු ත් තොපට සිද්ධ වූ කුශල ය මා කරා නැති

Non-Commercial Distribution

නො එයි' කියා ගිවිස්වා ලා මසු දහසක් දී ලා 'මෙ වක් පටන් අපට කර්මාන්ත කිරීම නො කැමැත්තේ ය. තෙල වීථියෙහි ගෙයක් ඉදිකරවා ගෙණ හිඳුව. තොපට යමක් වුවමනා වී නම් මාගෙන් ම හැර ගනුව'යි කිවු ය. නිරොධ සමාපත්තීන් නැඟී තැනට දුන් දනේ විපාක එ දවස් ම පෙනෙ යි. එ හෙයින් රජ්ජුරුවෝ ද එ පවත් අසා අන්නභාරයන් ගෙන්වා ලා පින් ඉල්වා ගෙණ මහ සම්පත් දී ලා සිටු තනතුරුත් දුන්හ.

උඃ සුමන සිටාණන්ට සභාය ව ගෙණ දිවි පමණින් පින්කම් කොට එයින් සැව දෙව් ලොව ඉපැද එ වක් පටන් අපගේ බුදුන් බුදු වන තෙක් දෙව් ලොව ත් මිනිස් ලොව ත් චුති ප්‍රතිසන්ධි වශයෙන් ඇවිදිනාහු අපගේ බුදුන් සමයෙහි කිඹුල්වත් නුවර අමිතොදන නම් ශාක්‍ය රජ්ජුරුවන්ගේ ගෙයි පිළිසිඳ ගත්හ. අනුරුද්ධය යි කියා පියුමතුරා බුදුන් වදළ නම ම තුබූහ. ඒ අනුරුද්ධ කුමාරයෝ වැළි ත් මහානාම නම් ශාක්‍ය රජ්ජුරුවන්ගේ බාල මලණුවෝ ය. සුද්ධොදන රජ්ජුරුවන්ගේ මලණුවන් පුත් හෙයින් බුදුන්ට ත් මල් වන්නාහ. ඉතා සිවුමැල්ලහ. මහ පිණැත්තෝ ය.

එක් දවසක් හද්දිය කුමාරාදි වූ රාජ කුමාරවරුන් ස දෙනා කැවුමට ගිවිස ලා ගුළ කෙළි කෙළනා කල්හි අනුරුද්ධ කුමාරයෝ පැරැද කැවුම් එවන්ට මවු බිසොවුන්ට කියා යවූහ. උයි ත් රන් තළියක් පුරා ලා කැවුම් යවූහ. එක්ව වැද හිඳ කැවුම් කා ලා තව ත් කෙළනා ගමනේ අනුරුද්ධ කුමාරයෝ ම පැරැද ගොසින් තව ත් කැවුම් සොයා යවූහ. මෙ ලෙසින් පැරැද පියා තුන් වාර යක් ම කැවුම් ගෙන් වූ කලට සතර වැනි වාරයේ දී ගෙයි කැවුම් නැති හෙයින් නැතැ'යි කියා යවූහ. එ බස් අසා නැතැයි යන බසක් නො ඇසූ විරූ හෙයින් ඊ අර්ථ දැන ගත නො හී නැති කැවුමැ'යි යන දෙයක් ඇති නියා ය යි සිතා ගෙණ 'යව, ඒ නැති කැවුම් ගෙනෙව'යි යවූහ. ගිය තැනැත්තවුන් 'නැති කැවුම් යවන්ට කී සේ කැ'යි කී කල්හි 'ම පුතුන් උපන් වක් පටන් නැතැ යි යන බසක් ඇසූ විරූ නැත. එ සේ හෙයින් ඒ අර්ථ ය දත නුහුණු වූ ය. එ බසෙහි අර්ථ කෙසේ හඟවම් දෝ හෝ'යි උප දෙසක් සිතා ගෙණ රන් තළි ය සෝධවා පියා ඇතුළෙහි කිසිවක් නැත ත් අනික් රන් තළියකින් වස්වා 'තෙලෙ ගෙණ ගොසින් ම පුතුන් ට දෙව' යි කියා ලා යවූහ.

එ වේලාට නුවර රකවල සිටි දෙවියෝ 'මේ සවාමි දරුවාණන් අන්නභාර නම් දුගී ව උපන් අවධියෙහි උපරිට්ඨ නම් පසේ බුදුන්

Non-Commercial Distribution

වහන්සේට දනක් දී ලා 'නැතැ යි යන බසක් නො අසමහ'යි පතා ගත. අපි ඒ දූන ත් උපෙක්‍ෂා වූ නම් නො මැදහත්කම නිසා අපගේ හිස් පැළීණ නමුත් නපුරැ යි'' දිව කැවුමෙන් තළි ය පුරා ලූහ. තළි ය ගෙණ ගොසින් රාජ කුමාරවරුන් ලඟ තබා ලා වසා ලූ තළි ය හැර පී ය. දිව කැවුමෙහි සුවඳ සියලු නුවර පැතිරිණ. කැවුම් කට තබා ලන්නා ම සත් දහසක් රස නහර පිනා සිට ගත. අනුරුද්ධ කුමාරයෝ කැවුමෙහි සුවඳ අසා ත් රස දූන ත් 'අපගේ මෑණියන් වහන්සේ මෙ තෙක් කලෙක මෙ තරම් කැවුමක් නො එවූ විරූ සේක. මා කෙරේ ළෙන් ගතු නැති නියාවනැ'යි සිතා පියා ගෙට ගොසින් මවු බිසොවුන්ට 'මෑණියන් වහන්ස, මා කෙරේ ළෙන් ගතු කමක් නැති නියා දැ'යි විචාරා 'පුතණ්ඩ, කුමක් කියන්නේ ද? මාගේ ඇස් දෙකට ත් වඩා හෘදය මාංශයට ත් වඩා මුඹ ප්‍රිය වේ දැ'යි කිවු ය.

''මට මුඹ වහන්සේ ළෙන් ගතු කල මෙ තෙක් කල් මුළුල්ලෙහි මෙ 'නැති කවුම්' නුදුන්නේ හැයි දැ''යි විචාළහ. බිසවුන් සිස් තළි ය ගෙණ ගියවුන් අතින් 'තළියෙහි කිසිවක් ඇත් දැ'යි විචාරා 'එසේ ය, බිසවුන් වහන්ස, තළි ය කැවුමෙන් පිරිණැ'යි කී කල්හි බිසවු 'ම පුතුන් මහ පිණැත්තෝ ය. දෙවියන් දිව කැවුම් පුරා ලූ නියා ය'යි සිතූහ. අනුරුද්ධ කුමාරයෝ ත් ''මෑණියන් වහන්ස, මා මෙ තරම කැවුමක් කෑ විරූ නැත. මෙ වක් පටන් මට 'නැති කැවුම් ම' ඉදි කරවුව මැනවැ''යි කිවු ය. උයි ත් එව ක් පටන් තෙලු ත් නො දමා පිටිත් නො දමා 'කැවුමක් කමී' කී විටෙක රන් තළියක් සෝධවා පියා අනික් තළියකින් වස් වා ලා යවති. දෙවියෝ දිව කැවුමෙන් තළි ය පුරා ලති. මෙ සේ අනුරුද්ධ කුමාරයෝ ගිහි ගෙයි වසන කල ත් නැතැ යි යන බසෙහි අර්ථ නො දූන කැවුමක් කන විටෙක දිව කැවුම් ම අනුභව කෙරෙති.

බුදුන් පිරිවරා මහණ පිරිස් ඇවිදිනා නිසා කුල පිළිවෙළින් ශාක්‍ය කුමාරවරුන් මහණ වන කල්හි මහානාම නම් ශාක්‍ය රජ්ජුරුවන් 'මළ, සෙස්සවුන් ගොසින් මහණ වන තැන අප ගෙන් තව දක්වා මහණ වූ කෙණෙක් නැත. තොප හෝ මහණ වුව මැනව. මා හෝ මහණ වුව මැනැව'යි කී කල්හි අනුරුද්ධ කුමාරයෝ 'මම සිවුමැල්ලෙමි. මහණ වන්ට නො පිළිබනැයි' කිවු ය. 'එ සේ වී නම් අප ගෙන් යමකු මහණ නො වූ කල නපුර. ඇති ව සිටියවුන් අප දෙ බෑයන් වුව මම මහණ වෙමි. තොපි ගොවි කම්ාන්ත උගනුව'යි කීහ. බත් උපදනා තැන් පමණකු ත්

නො දන්නවුන් කර්මාන්ත දන්ට කාරණ නැති බැවින් 'කර්මාන්ත නම් තමා කිම් දැ'යි විචාළහ.

බත් උපදනා තැන් නො දන්නා පරිදි කෙ සේ ද යත්— එක් දවසක් අනුරුද්ධ කුමාරයෝ ය, භද්දිය කුමාරයෝ ය, කිම්බිල කුමාරයෝ ය, යන කුමාරවරු තුන් දෙන බත් උපදනේ කොයින් දැ'යි කථාව ඉපැදවූහ. ඉන් කිම්බිල කුමාරයෝ එක් දවසක් වීකක් ගුළ ලන්නා දැක බත් උපදනේ මින් නියා වේ දැ'යි සිතා 'බත් ගුළින් උපද්දී' කිවු ය. භද්දිය කුමාරයෝ 'තෙපි බත් උපදනා තැන් නො දනුව. මම දනිමි. බත් උපදනේ සැළියෙනැ'යි කිවු ය. එ සේ කියන්ට කාරණ කවරේ ද යත්—එක් දවසක් සැළියෙන් බත් තලියෙහි ලන්නා දැක බත් උපදනේ ඉනැ'යි සිතා ගෙණ කීහ. බත් වන්නේ සැලියේ දී ය යි කිවු නම් තවත් යුක්ත ය.

උන් දෙන්නා එ ලෙස කී කලට අනුරුද්ධ කුමාරයෝ 'බත් උපදනා තැන් තෙපි දෙන්න ම නො දනුව. බත් උපදනා තැන් දන්නෙම මම ය. මුව වීට රෙබා සියයක් ඇති තළිය මැද රිය නක් උස කැකුළක් ඇති රන් තළියෙන් බත් උපදනේ ය'යි කිවු ය. ඒ අනුරුද්ධ කුමාරයන් වීකක් අටුවේ ලන නියා වෙව යි, සැළි-යේ තුබූ බත් තළියේ ලන නියා වෙව යි දුටු විරූ නැත. රන් තළියෙහි ලා ලා ඉදිරියෙහි තබා ලූ බත් පමණක් ම දකිති. එසේ හෙයින් තළියෙන් බත් උපද්දී සිතා කිවු ය. බත් උපදනා තැන් පමණකු ත් නො දන්නා කුල දරුවාණන් බතට මුල් ව සිටිනා කර්මාන්ත දන්නේ කෙ සේ ද? එ හෙයින් 'කර්මාන්ත නම් කවරේ දැ'යි කීහ.

එ සේ විචාළ මළණුවන්ට දිවි හිමියෙන් ම කොට නිමක් නැති ලෙසට කර්මාන්ත කීහ. පළමු කොට කුඹුර ගෙවඩීම් බිම් නැඟීම් කට යුතු ය. ආදි වශයෙන් සාව යුතු ය. සෑ කැට ගා කළල්ලම්[1] කොට නිම් පසු වපුළ යුතු ය. වපුළ පසු ඉස්නන් තිබිය යුතු ය. පූදිනා තෙක් රැති ආදියට කෙම් කට යුතු ය. ඉන් පසු කිරි වදනා තෙක් වැලි ඉසීම් ආදි කට යුතු ය. ගොයම් පැසී ගත් කලට දිම්[2] මැඩීම් කට යුතු ය. පෙරළා හිපිනැලි සාට යුතු ය. වල් කෙටිය යුතු ය'' යනාදීන් බෑණන් කියා ලූ කර්මාන්තයෙහි සසර මුලක් නො පෙනෙන්නා සේ නියමයක් නො පෙනෙන නියාව දැන 'මට ඒ කර්මාන්තයෙන් ප්‍රයෝජන නැත. ප්‍රයෝජන වන

1 කළල්කම් 2 දම 3 රැති ආදියට–රැති ආදියට– රැදි දියට

Non-Commercial Distribution

කෙණකුන්ට ම වන්නාට ය'යි මහණ වන්ට රුචි ඇති නියාව මෑණියන්දෑට කියා ලා භද්දිය කුමාරාදි රාජකුමාර වරුන් පස්දෙනා හා සමඟ නික්ම අනුපිය නම් අඹ උයන්හි වැඩ හුන් බුදුන් කරා එළඹ මහණ වූ සේක.

මහණ ව ත් මනාව පිළිපැද රහත් වීමෙන් ත්‍රිවිද්‍යා වඩා ගෙණ හුනස්නෙහි හිඳ ම හස්තාමලක න්‍යායයෙන් දස දහසක් සක්වළ දක්නට සමර්ථ ව 'කුමන පිණක් කොට මේ තරම් ගුණ විශෙෂ- යෙක් ලදිම් දෝ හෝ'යි බලන සේක් පියුමතුරා බුදුන් සමයෙහි මේ තනතුරු පතා පැතූ පමණෙකින් වැද නො හිඳ කප් ලක්‍ෂ ය මුළුල්ලෙහි දිවස් ලැබීමට ත් රහත් වන්ට ත් නිසි පින්කම් කොට ලත් නියාව දුන 'තව ද එක් සමයෙක බරණැස් නුවර සුමන සිටාණන් නිසා ජීවත් වන්නා වූ මම අන්නභාර නම් වීමි.

'අන්නභාරො පුරෙ ආසිං—දළිද්දෙ කාජභාරකො,
පිණ්ඩපාතො මයා දින්නො – උපරිට්ඨස්ස යසස්සිනො'

යනු හෙයින් උපරිට්ඨ නම් පසේ බුදුන්ට දනක් දිනිමි. මා දුන් දනෙහි පින් අනුමෝ වූ සුමන සිටාණෝ දුන් කොයි දෝ හෝ'යි බලන සේක් වින්ධ්‍යාටවී නම් මහ වල ගල් පාවුලෙක මුණ්ඩ නම් නියම් ගමෙක් ඇත. ඒ ගම වසන මහා මුණ්ඩ නම් උපාසකයන් ගේ මහා සුමන ය චූල්ල සුමන ය යි පුත්තු දෙන්නෙක් ඇත. උන් දෙන්නාගෙන් කුඩා සුමන ව උපන්හ'යි දුටු සේක. දුක ත් ඔබ යෑමෙන් වන ප්‍රයෝජන කවරේ දෝ හෝ'යි සලකා 'මා ඔබ ගිය කලට කුඩා සුමන කුමාරයෝ සත් හැවිරිදි වයස දීම මහණ ව කර'ගම රහත් වෙති' දුන වස් ආසන්නයෙහි ආසින් වැඩ ගම දෙරට බට සේක.

මහා මුණ්ඩ උපාසකයෝ ත් අනුරුද්ධ මහ තෙරුන් වහන් සේලා පුරුද්දෝ ම ය. එ හෙයින් සිඟා යන වේලෙහි සිවුරු ගැට ගන්වන්නා දුක මහා සුමන කුමාරයන්ට 'පුත, අනුරුද්ධ මහ තෙරුන් වහන්සේ වැඩි සේක. ඔබගේ පාත්‍ර ය අනික් කෙණකුන් හැර නො ගන්නා තෙක් තොපි ගොසින් පාත්‍ර ය හැර ගනුව. මම වැඩ හිඳිනා ආසනයක් පනවා ලමී'යි කිවූ ය. උයි ත් ගොසින් පාත්‍ර ය හැර ගත්හ. උපාසකයෝ ද මහ තෙරුන් වහන්සේ ගෙයි වඩා හිඳුවා ලා සකස් කොට වළඳවා ලා වස් වසන්ට ආරාධනා කළහ. මහ තෙරුන් වහන්සේ ත් ඉවසා වදළ සේක.

Non-Commercial Distribution

එක් දවසක් කරණ උපස්ථානයක් මෙන් වස් තුන් මස උප ස්ථාන කොට ලා වස් නිම් දවස් තුන් සිවුරක් ද උක් සකුරු තල තෙල් සාල් ආදි ය ද ගෙණවුත් මහ තෙරුන් වහන්සේගේ පා මුල තබා ලා 'පිළිගත මැනව, 'ස්වාමීනි'යි කිවු ය. උපාසකයෙනි, නො කැමැත්තේ ය'යි වදාළ සේක. 'ස්වාමීනි, මේ අපගේ මෙ තැන වස් විසූ තැන් ලැබබ යුත්ත ය. පිළිගත මැනැවැ'යි කිවු ය. එ සේ කීව ත් නො කැමති වූ සේක. 'කැප දෙය වුව මැළි හැයි ද, ස්වාමීනි'යි කිවුය. 'අප ළඟ කැපකරු හෙරණ කෙණකුන් පමණක් නැති හෙයිනැ'යි වදාළ සේක. 'එ සේ වී නම මහා සුමන කුමාර යන් මහණ කළ මැනවැ'යි කිවු ය. උන්ගෙන් ප්‍රයෝජන නැතැ'යි වදාළ සේක. එ සේ වූ වොත් කුඩා සුමන කුමාරයන් මහණ කළ මැනවැ'යි කිවු ය.

මහ තෙරුන් වහන්සේ ත් 'යහපතැ'යි ගිවිස කුඩා සුමන කුමාරයන් මහණ කළ සේක. මහණ කරන්ට ය යි හිසකේ කපා නිමවා ලන්නා ම රහත් වූ සේක. කර අග රහත් නම් ඒ ය. මහ තෙරුන් වහන්සේ ත් දෙ පෝයක් විවර එ තැන රඳා ලා වස් අන්ත හෙයින් 'බුදුන් දකිමි' හෙරණුන්දැගේ නෑයන්ට කියා ලා ආසින් ම ගොසින් හිමවු පියස වනවාස පැලකට බට සේක.

මහ තෙරුන් වහන්සේ පියවින් ම වියහි ඇති සේක. එ හෙයින් පෙර යම ත් අලුයම ත් සක්මන් කරණ ගමනේ දී බඩ රුජාවෙක් පහරින්ට වන. හෙරණුන්දැ ද ඔබ මිරිකී පියා සිටි නියා ව දැක 'අථාසු කිම් ද, ස්වාමීනි'යි විචාළ සේක. 'බඩ රුජාවෙක් පහරන්නේ ය'යි වදාළ සේක.

'මෙ තෙක් කලු ත් ඇද්දැ'යි විචාරා 'ඇතැ'යි වදාළ කල්හි ගුණ ව ගන්නේ කුමකින් දැ'යි විචාරා අනවුතත් විල පැන් වැළඳූ කල ගුණ වෙයි' කී කල්හි 'එ සේ වී නම ස්වාමීනි, ගෙනෙමි' කී දැ ය. 'පිළිවන් දැ'යි විචාළ කල්හි 'පිළිවන, ස්වාමීනි'යි කී සේක. 'එසේ වී නම ඒ විල පන්නග නම නා රජ්ජුරු කෙණෙක් වෙසෙති. ඌ මා හඳුනති. උන්ට කියා ලා බෙහෙත් නිසා පැන් කළයක් ගෙනව'යි වදාළ සේක. උන්දැ ද 'යහපතැ'යි උපාධ්‍යායයන් වහන්සේ වැඳලා අහසට පැන නැඟී ලා ගවු දෙ දහසක් තැන් වැඩි සේක.

එ දවස නා රජ්ජුරුවෝ නා නළුවන් පිරිවරාදිය කෙළි කෙළ-නා කැමැති ව හුන්නෝ ය. හෙරණුන්දැ අහසින් වඩනා දැක 'මෙ

මුඩු මහණ තමාගේ පාද ධූලි මා හිස වගුරුවන්ට කරන්නාක් මෙන් ඇවිදින්නේ ය' යි කිපී ගොසින් පැනක් හිසා ආ වන. මේ විලින් පැනක් නො දෙමී' දෙ සීයක් ගවු පමණ දිග ත් පළල ත් ඇති ඒ විල මහා මලාවකින් සැළියක් වසන කලක් මෙන් පෙණයෙන් වසා ගෙණ වැද හොත්තේ ය. හෙරණුන්දෑ ත් නා රජ්ජුරුවන්ගේ සැටි දැක කිපි නියාව සලකා ලා—

"සුණොහි මෙ නාගරාජ – උග්ගතෙජ මහබ්බල,
දෙහි මෙ පානියඝටං – භෙසජ්ජම්හි ආගතො,,

යනු හෙයින් නා රජ්ජුරුවෙනි, උරණ තබා මා කියන බසු ත් අසව. බෙහෙත් පිණිස පැන් කළයක් සොයා ආමි. එහෙත් මට නො වෙයි. අනුරුද්ධ මහ තෙරුන් වහන්සේට බඩ රුජාවෙක් ඇති ව පැන් වැළඳුවො ත් මුත් ගුණ නො වන හෙයින් එක් පැන් කළයක් විවර දෙ ව' යි කී දෑ ය. ඒ අසා නා රජ්ජුරුවෝ—

"පුරත්ථිමස්මිං දිසාභාගෙ – ගඞ්ගා නාම මහානදී,
මහාසමුද්දං අප්පෙති – තතො ත්වං පානීයං හර,,

යනු හෙයින් මේ විලට නැගෙනහිර මුහුදට හුණුවා වූ ගඞ්ගා නාම ගඟෙක් ඇත පැන් වුව මනා වී නම් ඉන් ගෙණ ගිය මැනැවැ'යි කිවු ය. ඒ අසා හෙරණුන්දෑ ත් 'මේ නයා තමාගේ අදහසින් දී නො ලයි. බලයෙන් ම මාගේ තරම හඟවා ලා පැන් හැර ගනිමී' යි සිතා ලා–

"ඉතොව පානීයං හරිස්සං – ඉමිනාව 'මහි අත්ථිකො,
යදි තෙ ථාමබලං අත්ථි – නාගරාජ නිවාරය.

යනු හෙයින් නා රජ්ජුරුවෙනි, උපාද්ධ්‍යායයන් වහන්සේ මා ලවා මේ විලින් ම පැන් ගෙන්වන සේක් ගඟින් පැනක් ගෙණ යන්ට මා වදාළේ නැත. පැන් නම් එක් වස්තුවක් නො ව ත් මා නො වළකුව' යි වදාළ සේක. ඒ අසා නා රජ්ජුරුවෝ 'සාමණේරයන් වහන්ස, මුඹගේ තර බලයෙක් ඇත් නම් සුරුබුහුටි ව කියා ලූ බසට ම සතුටිමි. මා නො කැමැති කරවා පැන් ගෙණ යන්ට පිළිවන් වී නම් ගෙණ ගිය මැනැවැ' යි කිවු ය.

සාමණේරයන්දෑ ත් එසේ ද, මහ රජ ගෙණ යමෝ ද'යි වදාරා 'පිළිවන් වුව හොත් ගෙණ ගිය මැනැවැ' කී කල්හි තුන් විටක්

Non-Commercial Distribution

කොට ම 'ගෙණ ගිය මැනැවැ' යි කියවා ගෙණ 'තෙල සිත තුබුව මැනැවැ' යි කියා ලා අප්‍රසිද්ධ ලෙසින් ගෙණ යැමෙන් ප්‍රයෝජන නැත. බොහෝ දෙනාට බුදු සසුනෙහි බල හඟවා ම පැන් ගෙණ යෙමී' සිතා ලා සවු මහ රජයේ පටන් මැත දෙවියන් කරා ගිය දැ ය. උඹ හැම ත් අවුත් වැඳ ලා සිටියහ. 'හෙම්බා, තෙල අනවුතත් විල කෙරේ දී පන්නග නම් නා රජ්ජුරුවන් පැනක් නිසා අපට කරණ විවාදයෙක් ඇත. සහාය වීම් නැත ත් දිනනවුන් පරදිනවුන් බලන්ට එව' යි කී දැ ය.

මෙ ම ලෙසින් සවු මහ රජයට නායක වූ වරම් රජුන් කරා ය, දෙව් ලෝ දෙකට ම නායක වූ සක් දෙවිඳු කරා ය. යාම නම් දෙව් ලොවට නායක වූ සුයාම නම් දෙව් රජ්ජුරුවන් කරා ය, තුසී පුරයට නායක වූ සන්තුෂිත නම් දෙව් රජ්ජුරුවන් කරා ය, නිම්මාණරති දෙවලොවට නායක වූ සුනිම්මිත නම් දෙව රජ්ජුරු-වන් කරා ය, පරිනිම්මිත දෙව් ලොවට නායක වූ වසවත්හු කරා ය යි ප්‍රධාන දෙවියන් කරා ගොසින් එ පවත් කී සේක. එ පරිද්-දෙන් ම අසංඥයන් හා අරූපී බ්‍රහ්මයන් හා හැර සෙසු බඹුන් කරා ගොසින් අවුත් වැඳ ලා කුමක් දූ යි විචාළ කල්හි එ පවත් වදළ සේක. උන්දැගේ බස් අසා සියලු ම දෙව් බඹුන් අනවුතත් විල පිට තළෙක පුරා ලූ තුඹ සුණු මෙන් ආස පුරා ගෙණ සිටියහ.

දෙව් බඹුන් රැස් වූ කල්හි සාමණේරයන්දැ ත් ආස සිට ආදී ලෙසින් ම තුන් විටක් කොට නා රජ්ජුරුවන් ගෙන් 'තර බලයෙක් ඇත් නම් පිළිවන් වී නම් හැර ගත මැනැව' යි කියවා ගෙණ ආස සිට මහණ වෙස් හැර ලා අට සාළිස් ගවු පමණ උස ඇති බඹ අත් බැවක් මවා ගෙණ ආසින් බැස පියා නා රජ්ජුරුවන්ගේ එණ ගබ මිරිකා පා ත් බලා ඔබා ලූ සේක. එ වෙලෙහි ම ශක්තිසම්පන්න කෙණකුන් මැඩ ලූ මඩනා සමක් මෙන් නා රජ්ජුරුවන්ගේ එණ ගබ මැඩ ගන්නා ම කුඩයක ආම්‍යාකක්[1] නැමෙන කලක් මෙන් සන්ධි ආවෘත ව[2] එණමුළු හැකිළෙන්ට වන. එණය හැකුළුණු සේ තල් කඳ සා පමණ දිය කඳ නැගෙන්නට වන. හෙරණුන්දැ අහස දී ම ඒ විල පැන් පහරන්ට නැති හෙයින් කළ ය පුරා ගත් දැය. දෙව් බඹු සාධු කාර දුන්හ.

නා රජ්ජුරුවෝ ලජ්ජා ව හෙරණුන්දැට කිපුණාවූ ය. ක්‍රොධ යෙන් දිළිහී ගත් ලෙසට ඇස් දෙක ත් හුනිද[3] ඇට සේ රත් වි ය.

---

1 අමාකක්, 2 ආශ්‍රිත ව, 3 හොනිද

Non-Commercial Distribution

මූ තුමූ තමන් පමණෙකින් කරණ දෙයකු ත් නො ව, දෙව් බඹුන් රැස් කරවා පියා එණ ය මැඩ ගෙණ සිට මේ සා මහත් ලජ්ජාවක් උපදවා පීහ. මුන් අල්වා ගෙණ කට ඇතුළට අත ලා ලා ලෙයි මස හෝ මිරිකා පියමි. පය අල්වා ගෙණ මූදින් එ තෙරට හෝ ගසා පියමි' ලුහුබඳවා ගොසිනු ත් හඹා ගත නුහුණුවු ය.

හෙරණුන්දෑ ත් ගොසින් උපාද්ධ්‍යායයන් වහන්සේ අතට පැන් පිළිගන්වා ලා වළඳන්ට කී දෑ ය. නා රජ්ජුරුවෝ ද පසු පස්සෙහි අවුත් 'ස්වාමීනි, තෙල සාමණෙරයන් වහන්සේ මා සන්තක විල පැන් මා ගෙන් දීමක් නැති ව ගෙනා දෑ ය. වළඳන්ට නො කැමැත්තේ ය' යි කිවු ය. 'සැබෑ ද, සාමණෙරයෙනි' වදළ සේක. 'එක විටක් තබා තුන් විටක් කොට ත් ගෙනෙන්ට කිවු ය. වළඳා වදරණ බව යහපතැ' යි කී දෑ ය. මහ තෙරුන් වහන්සේ ද රහත් හෙරණුන් බොරු නො කියති දැන පැන වැළඳූ සේක. සෙස්සවුන්ට ඇල් පැන් පීමෙන් රුජා අධික වේ. නමුදු ඔබට රුජා සන් හුන.

නැවත ත් නා රජ්ජුරුවෝ 'ස්වාමීනි, මෙ සාමණෙරයන්දෑ දෙව් බඹුන් රැස් කරවා පියා තමන්දෑගේ සපන් කම් පම් යි මා ලජ්ජා කරවා පී දෑ ය. හෘදය වස්තුව හෝ මිරිකමි. පය අල්වා ගෙණ හෝ මූදින් එ තරට ගසා පියමි' යි කී ය. 'මහ රජ, සාමණෙරයෝ තමන් කුඩා පමණක් මුත් උන්ගේ ආනුභාව මහත. තෙපි උන්ට පටහැණි නො වව. එ සේ නටුවා ක්‍ෂමා කරවා ගනුව' යි වදළ සේක. උෟ පියවින් ම ආනුභාව සම්පන්න නියාව එණගබ මිරිකා ලූ ගමනිනු ත් දෙව් බඹුන් රැස් කළ ගමනිනු ත් දනිති. නො දන්ට කාරණ නැත. මෙව්වරකු ත් නො කළ කලට අන්නු නො තකන්නෝ වේ ද'යි බල සම්පන්න කම හඟවන්ට ලුහුබඳවා අවු ය. කට හෙන දෙයෙක් නැත. මහතෙරුන්වහන්සේ බසින් ක්‍ෂමා කරවා ගෙණ ආවෙණික මමායන ය ඇති ව ගෙණ 'මෙ වක් පටන් අනවුතත් විල පැණින් ප්‍රයෝජනයක් ඇති විටෙක මුඹ වහන්සේ වැඩිය මැනැවැ' යි නැත, මට වදරා එවන බව ය. මම ගෙනවුත් දී ලමි' යි කියා ලා නැඟී ගියහ.

මහ තෙරුන් වහන්සේ ද සාමණෙරයන්දෑ කැඳවා ගෙණ බුදුන් කරා නික්මුණු සේක. බුදුහු ත් මහ තෙරුන් වහන්සේ වඩනා නියාව දැන විශාඛාවන් කැර වූ පූර්වාරාමයෙහි වැඩ හුන් සේක. වහන්දෑ ද මහ තෙරුන් වහන්සේ වඩනා දැක පෙර ගමන් කොට ගොසින් සහළ සිවුරු ත් පාත්‍රය ත් ආගන්තුක සාද නිසා හැර

Non-Commercial Distribution

ගත් සේක. සාමණේර කෙණෙක් සාමණේරයන්දෑ කුඩා ව පෙනෙන හෙයින් ආනුභාව ය නො දන හිස අල්වා ගෙණ සලා පියා කණ ත් අල්වා ගෙණ සලා පියා 'කුමක් ද ? සමණේර පැටව, සස්නෙහි ඇලුම් ඇත්තෙහි ද? රෑ බත් නැති ව හින්ද හෙයි දෑ' යි යනාදීන් කියා වෙහෙසූ සේක. බුදුහු ත් එ වහන්දෑ කරණ සැටි ය දක 'මේ භික්ෂූන්ගේ කට යුත්තෙක් නපුරු නියා ය. විෂ ඝොර සර්පයකු ඇඟ අත ලන කලක් මෙන් මේ සාමණේරයන් අල්වති. ආනුභාව නො දනිති. තවත් නො දත්තු නම් තවත් නිහරසර කෙරෙති. අද වූ කලි සුමන සාමණේරයන්ගේ ආනුභාව ය පහළ කළ මැනැවැ' යි සිතූ සේක. මහ තෙරුන් වහන්සේ සාද සාමීචි විඳ ගෙණ බුදුන් වැඳ ගෙණ වැඩ හුන් සේක. බුදුහු ත් උන් හා සාද සාමීචි කොට ලා අනඳ මහ තෙරුන් වහන්සේ බණවා ලා 'ආනන්දයෙනි, අනොතත් විල පැණින් පා දෝනා කැමැත්තෙමි. සාමණේරවරුන්ට කළ දී ලා යවා ඒ විලින් පැන් ගෙන්වව යි වදළ සේක.

අනඳ මහ තෙරුන් වහන්සේ ද ඒ වෙහෙර පන් සියයක් පමණ හෙරණ වහන්දෑ රැස් කළ සේක. ඒ හෙරණ පන් සියයට සුමන හෙරණුන්දෑ අලුත මහණ වූ හෙයින් බාල දෑ ය. මහ තෙරුන් වහන්සේ හෙරණ පන් සියය ම පාළියෙහි සිටුවා ලා මුල් පාළියෙහි සිටි නම කරා ගොසින් 'හෙරණිනි, බුදුහු අනොතත් විල පැණින්,පා දෝනා කැමැති සේක. කළයක් හැර ගෙණ ගොසින් පැන් ගෙනෙව' යි විධාන කළ සේක. මුල් පාළියෙහි සිටි හෙරණ වහන්සේ බැරි ය'යි කියා ලා නො ගිවිසි සේක. සෙසු තැනට කී ගමනේ සෙසු තැනු ත් නො ගිවිසි සේක.

නො ඉවසන්ට කාරණ කවරේ ද? එ තෙක් හෙරණ වහන්දෑ ගෙන් පිළිසිඹියා පත් රහත් තැනක් නැති නියා ද යත්-ඇති දෑ ම ය. එ තෙකුදු වුව ත් රහත් තැන් 'මේ අපට බැඳි මල් මුළෙක් නො වෙයි. හෙවත් අප නිසා කළ විධානයෙක් නො වෙයි. සුමන හෙරණුන්ට බැඳි මල් මුළ ය. උන් නිසා විධාන කළ දෑ ය'යි සිතා ලා නො ඉවසූ සේක. පුහුදුන් තැන් බැරි හෙයින් ම නො ඉවසූ සේක. හැම තැනට කියා ඉක් බිති සුමන හෙරණුන්-දෑට එ ලෙස ම කී කල්හි හැම තැන් කී ලෙස බැරි ය යි නො කියා බුදුන් ගෙන්වන කල නො ගෙණෙන්ට පිළිවන් ද? ගෙණව මනා වේ දෑ' යි කියා ලා බුදුන් වැඳ ලා 'ස්වාමීනි, මා ලවා අනවුතත් විලින් පැන් ගෙන්වන්නේ ඇද්දෑ' යි විචාළ සේක. බුදුහු ත් 'සුමන යෙනි, එ සේ ය' යි වදළ සේක.

Non-Commercial Distribution

උන්දෑ ද විශාඛාවන් විහාර සන්තක කොට කරවා ලූ සත රන් කළ වලින් නිකම් කළවලින් පැන් සැට කළයක් ගන්නා. මහ කළයක් 'මෙ තරම් කළ කර තබන්නේ කිම් දැ'යි අතින් එල්වා ගෙණ ආසව නැඟි හිමවූ පියස අනවූතත් විල කරා නික්මුණුදැය. නා රජ්ජුරුවෝ ද දුරින් ම එන්නා වූ සාමණේරයන්දෑ දක පෙර ගමන් කොට ගොසින් කළ ය හැර ගෙණ අතින් එල්වා ගෙණ යන්ට බල ඇත ත් ආදර නිසා තමන් කර තබා ගෙණ 'සවාමීනි, මා තරම් කොල්ලකු ඇති කල මුඹ වහන්සේ පැනට වඩ නට කාරණ කවරේ දැ'යි කියා ලා පැන් කළයක් උකා ගෙණ ඔසවා කර තබාගෙණ 'සවාමීනි, පෙරාතු වුව මැනව. මම ම ගෙණවුත් දී ලම්'යි කිවු ය. ''මහ රජ, තොපි සිටුව. බුදුන්ගේ, විධානයෙන් ගෙණ යන පැන් මම ම ගෙණ යෙමි' කියා ලා නා රජ්ජුරුවන් රඳවා පියා එන කල ගෙනා ලෙස ම කළ ය අතින් එල්වා ගෙණ ආසින් එන දෑ ය. ආසින් එන සාමණේරයන් දෑ බුදුහු ත් දක වහන්දෑ බණවා ලා 'මහණෙනි, සුමන මෙහරණුන් ආසින් එන ලීලාවක් බලව. රන් වන් හංස පැටවකු මෙන් ඉතා මොබති' වදාළ සේක. උන්දෑ ත් පැන් කළ ය තබා ලා බුදුන් වැඳලා සිටි සේක.

බුදුහු ත් 'සුමනයෙනි, තෙපි කී හැවිරිද්ද දැ'යි විචාළ සේක. සවාමීනි, සත් හැවිරිද්දෙමි'කී දෑය. එ සේ වී නම් තෙපි අද පටන් උපසපනුව'යි ආවෙණික කොට දයජ්ජොපසම්පදව දෙවා වදාළ සේක. මේ සුමන සාමණේරයන් දෑ හා සොපාක සාමණෙ–රයන්දෑ හා දෙ නම සත් හැවිරිදි වයස දී තමන් තමන්දෑගේ තරම් නිසා මාලු පැවිදි ලත්දෑ ය. මෙ සේ මේ සුමන මෙහරණුන්දෑ මාලු පැවිදි වූ කල්හි ධම සෙබෙයි 'ඇවැත්නි, මේ සාමණෙර පැට වාණ කෙණකුන්ගේ ආනුභාවයක් බැලුව මැනව. පෙරත් සාම ණෙර වරුන් දුටු විරූමෝ වෙ ද, මෙ තරම් සාමණෙර කෙණකුන් නුදුටු විරූම්හ'යි කථාව ඉපැද වූ සේක. බුදුහු ත් ධම සබයට වැඩ වහන්දෑ කෙරෙමින් හිඳ බුදුන් දක තබා පූ කථාව විචාරා උන්දෑගේ ආනුභාව ගුණ කථාව නියාව අසා ඒ මුල් කොට බණ වදරන සේක් 'මහණෙනි, යම් කෙණෙක් මධ්‍යම අවසථාවට ත් සථවිර අවසථාවට ත් නො පැමිණීමෙන් බාල වුව ත් නො හොත් වයසින් බාල වුව ත් බුදු සස්නෙහි නො පමාව වෙසෙත් නම් උඟ තුමූ මෙ ලොව අභ්‍ර මහිකා දී පඤ්චොපක්ලෙශයෙන් මිදුණු සඳ පරිද්දෙන් බබුළුවති' වදාළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් කුසල්හි නො පමා ව ලෝ සසුන් දෙක බබුළුවන්ට උත්සාහ කට යුතු

---

## 275. ප්‍රසාද බහුල බමුණානන් ගේ වත

තව ද තුනුරුවන්හි ප්‍රසාද බහුල ව වසන්නවුන්ට උත්සාහ වඩනු නිසා ප්‍රසාද බහුල බමුණානන් ගේ වත දක්වමු.

කෙ සේ ද යත් —

ඒ බමුණාණෝ බුදුන්ගේ බණ අසා පහන් සිත් ඇති ව තමන් ගෙන් සොළොස් දෙණකුන් වහන්සේට නිරන්තර දනක් නිල කර වා වහන්දෑ සිඟා වැඩි වේලාවට පාත්‍ර හැර ගෙණ රහත් වහන්සේ වඩනා බව ය' යනාදීන් කියන යම් බසෙක් ම රහත් බැවහාර ය කියා ලා ම කියති. ඉන් පෘථග්ජන වහන්දෑ තමන් වහන්සේ රහතැ යි සිතා කියති. කියා ත් රහත් වහන්දෑ තමන් වහන්සේ රහත් නියාව දන පු ව යි කියාත් කුකුස් කොට ගෙණ රහත් නො රහත් දෙ පක්‍ෂය ම උන්ගේ ගෙට සිඟා නො යන සේක. බමුණා නෝ ත් මුසුප්පු ව පියා නො වඩනට කාරණ කිම් ද යි විහාරයට ගොසින් බුදුන් වැද ලා එ පවත් බුදුන්ට දැන්වූහ.

බුදුහු ත් වහන්දෑ බණවා ලා සිඟා උන්ගේ ගෙට නො යන්නේ කුමක් නිසා ද යි විචාරා එ පවත් දැන්වූ කල්හි රහතැයි යන බස තෙපි ඉවසු ද'යි විචාරා 'අප ඉවසුවේ නැතැ'යි කී කල්හි 'පැහැදැ පහන් සිතින් කියා ලූ දෙයෙහි වරද නැත. එ තෙකුදු වුව ත් උපන් කීර්ති ය නො පිරිහෙළි ය යුතු හෙයින් තෙපි රහත් නුවූ කෙණෙක් රහත් වන්ට උත්සාහ කරව'යි වදරා බණ වදරන බුදුහු 'හෙමබා, මෙ තෘෂ්ණාව නම් ලසුවෙකින් සිඳ ලිය නො හැක්ක. එ හෙයින් මහත් වූ උත්සාහ වීර්‍ය්‍යයෙන් තෘෂ්ණාව සිඳුනා නිසා වස්තු කාමය ත් තද්විෂයෙහිවූ ක්ලෙශ කාමය ත් හරුව. ති ලකුණු මෙනෙහි කිරීමෙන් නිවන් පසක් කරව'යි වදළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ.

බමුණානන්ගේ දෙයක් එ තැන්හි නො වදළ ත් උන් සිස් වන්ට යුක්ති නැත. ඒ තරමුන්ට අධිගම නැත් නම් තරමමු කවුරු ද? ඉන්ද්‍රි ය පරිපාක ය වූ කල්හි අධිගම ය වී ය යි දත යුතු.

එ හෙයින් සත් පුරුෂයන් විසින් ප්‍රසාද ය කළ මනා තන්හි ප්‍රසාද ය කොට අධිගම සිද්ධියට ම උත්සාහ කට යුතු.

Non-Commercial Distribution

## 276. බොහෝ වහන්දෑ ගේ වස්තුව

තව ද අෂ්ටාඞ්ගික මාර්ග ය නිවනට මං වුව ත් ශමථ-විදර්ශනා දෙක ඊට මං වන හෙයින් රුචි ය උපදවනු නිසා **බොහෝ වහන්දෑ ගේ වස්තුව කියමු.**

කෙ සේ ද යත්—

එක් දවසක් ඒ ඒ දිග වසන තිසක් පමණ වහන්දෑ අවුත් බුදුන් වැද ලා වැඩහුන් සේක. සැරියුත් මහ තෙරුන් වහන්සේ ද ඒ වහන්දෑ රහත් වන්ට නිසි පින් ඇති නියාව දැන තමන් වහන්සේ බුදුන් ලඟට ගොසින් 'ස්වාමීනි, ධර්ම දෙකෙක කෑ යි කියති' ඒ ධර්ම දෙක නම් කුමක් දෑ'යි විචාළ සේක. 'ශාරිපුත්‍රයෙනි, ධර්ම දෙක ය යි ශමථ-විදර්ශනාවට ම කියති' වදරා ශමථ—විදර්ශනාවෙහි ප්‍රයොජන දක්වන සේක් 'යම් කෙණෙක් ශමථ-විදර්ශනා දෙක සාධා සිටියෝ වූ නම් එ සේ වූවන්ට ඇත් අස් ආදීන් බැඳ රඳවන දම් පරිද්දෙන් සත්‍වයන් සසර යොදන්ට සමර්ථ වූ කාම යොගා දි වූ තත්මූඛයෙන් සව් කෙලෙස්හු නසිති' වදාළ සේක. දෙශනා කෙළවර තිස් දෙනා වහන්සේ ම රහත් වූ සේක.

එ හෙයින් නුවණැත්තවුන් විසින් පළමු ශීල විශුද්ධි ය සපයා ගෙණ ඉක්බිති ව ශමථ බලයෙන් උපචාර සමාධි—අර්පණා සමාධි ඉපැද වීමෙන් චිත්ත විශුද්ධිය ත් ඇති ව ලක්‍ෂණ රසාදී විසින් නාම රූප විභාග ය දැන්මෙන් දෘෂ්ටි විශුද්ධි ය ත් උපදවා උන්ගේ ම පස පිරිගැන්මෙන් කාංක්‍ෂා විතරණ විශුද්ධි ය ත් උපදවා ගෙණ ඔබ්බෙබි විශුද්ධි තුන ත් උපදවන්ට උත්සාහ කට යුතු.

## 277. මාරයා ගේ වස්තුව

තව ද සසර පරතෙරට පැමිණියවුන්ට මුත් සෙස්සවුන්ට සංසාර මුක්ති ය නැති නියාව හඟවන්ට **මාරයා ගේ වස්තුව** දක්වමු.

කෙ සේ ද යත්—

ඒ මාරයා එක් දවසක් එක්තරා මිනිස් වෙසක් මවා ගෙණ අවුත් උගුරට සොරා කත බෙහෙදක් සේ තමා නියාව නො හඟ වන්ට සිතා 'පාරාපාර' ය යි කියති. ඒ කිම දෑ'යි බුදුන් අතින් විචාළහ. බුදුහු ත් මාරයා නියාව දැන ලා 'පව්වු තැනැත්තව, දුශ්ශීලයන් ච පිළිවෙතින් ප්‍රයෝජන නැත්තා සේ තට ඉන් ප්‍රයෝජන කිම දෑ'යි වදරා ලා ඉන් ප්‍රයෝජන ඇත්තවුන්ට දක්වන සේක් 'හෙම්බල

පාර ය යි අද්ධ්‍යාත්මික වූ චක්ෂුරාදි ෂඩායතන ය කියති. අපාර ය යි බාහ්‍ය වූ රූපාදි ෂඩායතන ය කියති. 'පාරාපාර ය' යි ඒ දෙක එක් කොට කියති.

යම් කෙණකුන්ට මම ය යි කියා දෘෂ්ටිග්‍රාහ ය හෝ මාගේ ය යි කියා තෘෂ්ණාග්‍රාහ ය හෝ නැත්නම් (ඒ) කෙලෙස් පීඩාවෙන් මිදී සිටියවුන්ට මම බාහිත පාපිත්‍වයෙන් බ්‍රාහ්මණ ය යි කියමි. තා සේ වූවවුන් ඒ විතාරන්නේ හැයි දූ'යි වදාළ සේක. දෙශනා කෙළවර බල්ලන් ගෙණ හෙළා ලූ දඩ මස් දඩ ගියවුන්ට ප්‍රයෝජන් වත් මුත් බල්ලන්ට ඉන් ප්‍රයෝජන නැත්තා සේ මාරයන්ට ඉන් ප්‍රයෝජනයක් නූවූව ත් සෙසු බොහෝ දෙන සෝවාන් ඵලාදියට පැමිණියහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් මාරයා සේ කුසල්හි අවඡ-න්දික නො ව සුචරිත පූරණයෙහි සොත්සාහී ව තුන් සුසිරි පුරා අධිමුක්ති වූ ලෙසින් ත්‍රිවිධ බොධින් එක්තරා බොධියකට පැමිණිය යුතු.

---

## 278. එක්තරා බමුණු කෙණකුන් ගේ වස්තුව

තව ද දෑ ගොත් පමණෙකින් පත ත් පමණක් විනා බ්‍රාහ්මණ නො වන නියාව හඟවන්ට එක්තරා බමුණු කෙණකුන් ගේ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්—

ඒ බමුණානෝ එක් දවසක් 'බුදුහු තමන් වහන්සේගේ සවුවන් ට ත් බ්‍රාහ්මණ ය යි වදරන සේක. මම ද වැළි ත් ජාතිනු ත් ගොත්‍රයෙනු ත් බ්‍රාහ්මණයෙමි. මට ත් එ ලෙස කීම යහපතැ'යි සිතා බුදුන් කරා ගොසින් එ පවත දැන්වූහ. බුදුහු ත් 'රහත් වූවන්ට මුත් සෙස්සවුන්ට පැවති බැවහාර ලෙසින් ම එ ලෙස බැව හාර කරත් මුත් බ්‍රාහ්මණ ය යි නො කියමී' වදරා බ්‍රාහ්මණ ලක්ෂණ ය ඇත්තවුන් වදරන සේක් 'එම්බල, යම් කෙණෙක් ශමථයෙහි ත් විදර්ශනායෙහි ත් යෙදී වෙසෙත් ද, පඤ්චවිධ විමුක්ති නමැති ජලයෙන් රාගාදි කිලුටු සෝධා හළවු ද, ගණසඞ්ගනිකාවෙනු ත් ක්ලෙශ සඞ්ගනිකාවෙනු ත් දුරු වූ ද, ශ්‍රොත්‍ර ආපත්‍යාදි චතුර්විධ මාර්ගයෙන් දුඃඛපරිඥානතාදි වූ ෂොඩශ විධකෘත්‍ය ය කොට නිමවූ ද, කාමා ශ්‍රවාදි චතුර්විධ ආශ්‍රවයනු ත් නසා පූ ද, එ සේ වූ වන්ට රහත් ඵල සමවතට සමවැදීම වශයෙන් අර්හත්ඵල සමවත් පවත්වන හෙයින් බ්‍රාහ්මණ ය යි කියමි'යි

Non-Commercial Distribution

වදළ සේක. දෙශනා කෙළවර බමුණානෝ සෝවාන් ව ආර්‍ය්‍ය ජාතියට පැමිණීමෙන් බ්‍රාහ්මණ වන්ට නියම වූහ.

එ හෙයින් සත් පුරුෂයන් විසින් සෙසු කවර ත් ජාතියෙක ඇලුම් හැර ආර්‍ය්‍ය ජාතියට පැමිණෙන්ට යත්න කට යුතු.

## 279. අනඳ මහ තෙරුන් වහන්සේ ගේ වත

තව ද ගුණ ශොභාව තිබැදී රූප ශොභාවෙනුත් බුදුන් ම අධික නියාව හඟවන්ට අනඳ මහ තෙරුන් වහන්සේ ගේ වත දක්වමු.

කෙ සේ ද යත්—

පසේනදී කොසොල් රජ්ජුරුවෝ වස් නිමි දවස් සව් බරණ ලා සැරහී ගෙණ විහාරයට ගියහ. ඒ වේලාට කාළුදායි මහ තෙරුන් වහන්සේ ධ්‍යානයට සම වැදලා විහාර ය කෙළවර වැඩ හුන් සේක. කාළුදායි ය යන නම පමණක් මුත් තමන් වහන්සේ ඉතා හෙළලු සේක. එ වේලාට හිර ත් ගල හී සඳ ත් පැන නැංග. අනඳ මහ තෙරුන් වහන්සේ බස්නා වූ හිරහි ශොභාව ත් නැඟෙන සඳෙහි ශොභාව ත් රජ්ජුරුවන්ගේ ශරීර ශොභාව ත් කාළුදායි මහ තෙරුන් වහන්සේගේ ශරීර ශොභාව ත් දැක බුදුන්ගේ ශරීර ශොභාව ත් දුටු සේක. ඒ හැම ශොභාව ම සර්වඥ ශොභාව කරා පැමිණ නිශ්ශොභා වි ය. අනඳ මහතෙරුන් වහන්සේ බුදුන් වැදලා 'ස්වාමීනි, හිර ශොභාවට ත් සඳ ශොභාවට ත් රජ්ජුරුවන්ගේ හා කාළුදායි මහ තෙරුන් වහන්සේගේ ශරීර ශොභාවට ත් වඩා මුඹ වහන්සේගේ ශරීර ශොභාව ම මට යහපතැ'යි කී සේක.

බුදුහු ඒ අසා ඒ මුල් කොට බණ වදරන සේක් 'මෙම්බා ආනන්දයෙනි, හිර තෙමේ දවල් ම බබළයි. රෑ ව යන්නා ගිය මග කවරේ ද බව ත් නො දනෙයි. සඳ ත් පඤ්චොපක්ලෙශ විනිර්මුක්ත වී නම් රෑ දවස ම බබළයි. දවල් දවසට කවර මගක ගිය බව ත් නො දනෙයි. රජ්ජුරුවෝ ආභරණ ලා සැරහී සිවුරඟ සෙනඟ පිරිවරා සිටියෝ හොබිති. අප්‍රසිද්ධ ලෙසින් සිටියෝ ත් නො හොබිති. රහත්හු ත් ධ්‍යාන සමාපත්ති ය ඇතුළත හොබනා ලෙස සෙසු විට හොබිනෝ නො වෙති. සර්වඥවරයන්ට රෑ ය'යි කියා ත් නැත. දවල් ය කියා ත් නැත. හැම වේලේ ම තමන්ගේ ශීල තෙජසින් නිශ්ශීලයන් මැඩ ගුණ තෙදින් නිර්ගුණීන් මැඩ, ප්‍රඥ තෙජසින් මන්ද බුද්ධීන් මැඩ, 'කුශල තෙජසින් අකුසලුන් මැඩ, ධර්ම තෙජ

Non-Commercial Distribution

සින් අධර්ම ය මැඩ, නිරන්තර ව අංයුඃ කල්ප ය මුල්ලෙහි බබ ළතී' වදාළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් ශීල තෙජසින් – ගුණ තෙජසින් – ප්‍රඥා තෙජසින් – කුශල තෙජසින් යුතු ව මුළු ලොව බබුළුවන්ට උත්සාහ කට යුතු.

## 280. එක්තරා පැවිදි කෙණකුන් ගේ වත

තව ද බ්‍රාහ්මණ ලක්‍ෂණ ය ත් ශ්‍රමණ ලක්‍ෂණ ය ත් ප්‍රව්‍රජ්‍යා ලක්‍ෂණ ය ත් එක් කොට දක්වනු නිසා එක්තරා පැවිදි කෙණ කුන් ගේ වත දක්වමු.

කෙ සේ ද යත්—

එක් බමුණානා කෙණෙක් තීර්ථායතනයෙහි පැවිදි ව 'මහණ ගොයුම් තමාගේ සවුවන්ට පැවිදි බැවහාර කෙරෙති. මම ත් පැවිද්දෙමි. මට ත් බැවහාර එ ලෙස කළ මනා වේ දැ'යි සිතා බුදුන් කරා එළඹ තමන්ට ත් එ ලෙස ම බැවහාර කරන්ට කිවූ ය. බුදුහු 'මම එ බඳු ගුණයක් නැති ව වෙස් ගත් පමණෙකින් සිංහ සම් පෙරෙවි පමණෙකින් කැණහිලුන්ට සිංහ බැවහාර කට නො හැක්කා සේ ම තොප තරමුන්ට පැවිදි බැවහාර නො කෙරෙමි' වදරා ලා 'යම් හෙයකින් රාගාදී කිලුටු තමා කෙරෙන් පිට ත් කළ හෙයින් බ්‍රාහ්මණ වේ ද, අකුසලු ත් සන්හිඳවීමෙන් ශ්‍රමණ ය යි කියනු ලැබේ ද, එ සේ ම රාගාදී කිලුටු දුරු කළ හෙයින් එ ලෙස කළ කෙණෙක් පැවිදි නම් වෙති. තොප වැන්නවුන්ට ඒ බැවහාර කට නොහැක්කැ'යි වදාළ සේක. දෙශනා කෙළවර ඒ පැවිද්දණෝ සෝවාන් වූහ. සෙසු ත් බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් පැවිදි වෙස් ගෙණ ත් නො ගෙණ ත් පාපයෙන් ම දුරු වන්ට උත්සාහ කට යුතු.

## 281. සැරියුත් මහ තෙරුන් වත්සේ ගේ වස්තුව

තව ද ක්‍ෂමායෙහි යහපත දක්වන්ට සැරියුත් මහ තෙරුණ් වහන්සේ ගේ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්—

එක් තැනක රැස් ව හුන්නා වූ බොහෝ දෙන 'අනේ අපගේ ධම් සෙනෙවි ස්වාමීන් ගේ ක්‍ෂමාව යහපත. ගුව් අගුව්

Non-Commercial Distribution

නිඃක්‍ෂෙපයෙහි අනූන ය ප්‍රතිඝ රහිත පෘථිවිය මෙන් බිණුවා වූන් කෙරෙහි ත් සම අදහස් ඇති සේක' යනාදීන් ගුණ කීහ. එක් මිසදිටු ගත් බමුණෙක් 'නො කිපෙන්නෝ කවුරු දැ'යි විචාරා ධම්සෙනෙවි ස්වාමීන් නියාව අසා 'කුප්පවා පියනා කෙණෙක් නැත් දැ'යි විචාරා නැතැ යි කී කල්හි 'එ සේ වී නම් මම කුප්පවා පියමි' කී ය. 'පිළිවන් වී නම් කුප්පවා පියව'යි කී කල්හි වන් නාට පිළිවන් වේ දැ'යි කියා ලා මහ තෙරුන් වහන්සේ සිඟා වැඩී ගමනේ දැක පිටි පස්සෙන් අවුත් ලා පිඩි පිටට අතුල් පහරක් ගසා අනන්ත කාලයකට අකුසල් සිද්ධ කොට ගත.

මහ තෙරුන් වහන්සේ පිටි පස්ස බලා පියනා පමණකු ත් නැති ව කම් ප්‍රත්‍යවෙක්‍ෂාව කෙරෙමින් වැඩ පී සේක. බමුණාගේ ඇඟ මුළුල්ලේ දහ වැද ගත. ඒ තෙමේ ඔබගේ තරම අනූන්ගේ බසින් හදහා ගත නොහිණි නමුත් ගසා පී පහරට නො කිපි හෙයින් එවිට අදහා ගෙණ 'අනේ මුන් වහන්සේ යහපත් සේකැ'යි වැද ගෙණ වැද හෙව, 'කමන්නැ ස්වාමීනි'යි කියා ලා 'හැයි, කුමක් දැ'යි විචාළ කල්හි 'මුඹ වහන්සේගේ සහන ය බලන්ට පහරක් ගසා පීමි'යි කීහ. 'කමා කෙළෙමි' වදළ සේක. 'ඉදින් ක්‍ෂමා කළො ත් මාගේ ගෙයි වැඩ හිද වළඳන්ට වුව මැනැවැ'යි කියා ලා ආරාධනා කොට පාත්‍ර ය ඉල්වා ගත. මහ තෙරුන් වහන්සේත් පාත්‍ර ය දෙවූ සේක.

බමුණු ත් මහ තෙරුන් වහන්සේ ගෙයි දී වැළඳ වී ය. පහර ගැසූ නියාව දැක මිනිස්සු මුසුප්පු ව අපගේ නිරපරාධ ස්වාමි දරුවාණන්ට පහර ගසා පී ය. මු ගෙන් දඩ පමණෙකින් යවන්ට යුක්ති නැත. මතු එ බන්දක් නො කරණ ලෙසට මරා ම පියම්හ'යි පොළු මුගුරු හැර ගෙණ බමුණාගේ ගෙදෙරට ගියහ. මහ තෙරුන් වහන්සේ ත් වළඳා ලා වඩනා සේක් පාත්‍ර ය බමුණානන් අතට දෙවා ලූ සේක. මිනිස්සු ත් මහ තෙරුන් වහන්සේ කැටි ව යන්නවු දැක 'ස්වාමීනි, මුඹ වහන්සේගේ පාත්‍ර ය අතට හැර ගෙණ බමුණා රඳවා පුව මැනැවැ'යි කිවු ය. 'කුමක් නිසා දැ'යි විචාළ කල්හි 'මේ මුඹ වහන්සේට පහරක් ගැසී ය. ඌට කළ මනා දෑ ඇති හෙයිනැ'යි කීහ. 'කුමක් ද? තුලූ ගැසුයේ තොපට ද අපට දැ'යි විචාළ සේක. මුඹ වහන්සේට ය'යි කිවු ය. 'එ සේ වී නම් මා ගසන විට ගසා පියා පසු ව ක්‍ෂමා කරවා ගත. තෙපි යව'යි කියා මිනිසුන් යවා පියා බමුණා ත් මරණින් ගළවා පියා විහාරයට වැඩි සේක.

Non-Commercial Distribution

වහන්දෑ ද තමන් වහන්සේ එකාසංඛ්‍ය කප් ලක්‍ෂයක් පාරමිතා නො පිරූ හෙයින් 'ධම් සෙනෙවි සවාමීන් කුමක් කළ නියා ද? යම් බමුණකුගෙන් පහරක් ලත් සේ ක් වී නම් ඒ බමුණාගේ ගෙයිදී ම වැළඳූ සේක. ඔබට පහර ගැසූ තැනක් හකුළුවා ලන්ට නුවූ හෙයින් අනික් කොතැනක නවතී ද? මරා ම ඇවිදිනෝ වේ ද'යි කී සේක. බුදුහු ත් ඒ අසා වදරා 'මහණෙනි, සැබෑ බමුණෙක් වී නම් බමුණන් කුමට මරා ද? බමුණන් මැරූයේ නො බමුණු හෙයින. ක්‍රොධ ය නම් අනාගැමි මගින් ම නැති වෙයි. වදරා ලා බණ වදරන සේක් 'යම් කෙණෙක් රහත් වූ නම් තමන් රහත් නියාවට රහතන්ට වුව ත් කාට වුව ත් නො ගසති. පුරාකෘත කර්මානුරූප ව යමෙක් තමන්ට ගසාපූ නම් අනාගැමි මගින් ම කොපය සුන් හෙයින් උන්ට කෝප ත් නො කෙරෙති. යම් කෙණෙක් රහතන් මරත් නම් මම උන් නවතනු නිසා උන්ට නිඳා කෙරෙමි.

යම් කෙණෙක් රහතන් පහළ වූනම් අනික් ලෙසකින් නවතා නො ලා උන් මරත් නම් එයි ත් යහපතක් නො වෙයි. අනුන් නිසා කළ ත් ඒ පාප ය තමාට ම ය. යම් කෙණෙක් රහතන්ට බණන්නවුන් දැක නිකම් නවතො ත් මුත් තුමූ නො බෙණෙත් නම් මරන්නවුන් දැක මාලුකම් කියා නවත ත් මුත් තුමූ උන් නො මරත් නම් උඃ රහතන්ට ත් ඒ ගුණෙන් අඩු නො වෙති. යම් කෙණෙක් ක්‍රොධ අදහසින් නවති ත් නම් එයි ත් යහපත. යම් යම් ලෙසකින් ක්‍රොධයෙන් නවති ත් නම් එයිනු ත් සසර දුකි නු ත් නවති'යි වදළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් ක්‍ෂමාපර ව අක්‍ෂමාවෙහි ආදීනව එක්වන් සලකා අනුසස් එකොළොසක් විතර ඇති මෛත්‍රී ඇති ව විසිය යුතු.

## 282. මහා ප්‍රජාපතී ගෝතමීන්දෑ ගේ වස්තුව

තව ද යමකිසි කෙණෙක් සියලු ලෙසින් ම නිරුපද්‍රවයෝ වූ නම් උනු ත් බ්‍රාහ්මණ නියා ව භාවන්ට මහා ප්‍රජාපතී ගෝතමීන් දෑ ගේ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්—

උන්දෑ ද වැළි ත් පවිත්‍ර ශීලී කෙණකුන් සුවඳ මල් දමක් පිළි ගන්නා මෙන් සිය වස් ගිය මෙහෙණින්නනු ත් එ දවස් උප

Non-Commercial Distribution

සම්පන්න භික්ෂූන් වැන්ද යුතු ය, යනාදීන් අෂ්ට ගරු ධර්‍ම ය පිළිගැන්මෙන් පන් සියයක් දෙනා හා සමග උපසම්පදව ලත් දැ ය. උන්දැගේ උපසම්පදවට ආචාර්‍ය්‍ය උපාධ්‍යාය තැන් නැත. ඒ නිසා පසු ව කථාවක් උපදනේ 'මුන්දැගේ උපසම්පදවට ආචාර්‍ය්‍ය උපාධ්‍යා ය තැනු ත් නැත. මහණ වීමෙහි සිවුරු දෙවා ගැන්මකු ත් නො වී ය. මහණ ත් මාලු පැවිද්ද ත් සැක කරණ තරම් වුව'යි මෙහෙණිනි වහන්දෑ බුදුන් ගෙන් විභාග නො දත් හෙයින් කුකුස් කොට ගෙණ උන්දෑ හා සංවාස සම්භොග ත් නො කොට බුදුන්ට ත් දැන් වූ දැ ය.

බුදුහු ත් ඒ අසා 'හෙම්බා මෙහෙණිනි, අෂ්ට ගරු ධර්‍ම ය පිළි ගැන්මෙන් ම මහණ ත් මාලු පැවිද්ද ත් මා ගෙන් ම ලත්හ. උන්ට ආචාර්‍ය්‍ය උපාධ්‍යායයෝ නම් මම් ම ය' යි වදරා කුකුස් හරවනු නිසා බණ වදරන සේක් 'හෙම්බා මෙහෙණින්නෙනි, යම් කෙණෙ-කුන්ට කා විසි මුනි තුන් දෙරින් සිද්ධ වන තුන් දුසිරියෙක් නැත් නම් තුන් සුසිරි ම පිරේ නම් උඃ නිරුපද්දයහ. නො දන කුකුස් කළා නමුත් ඉතිබ්බ කුකුස් නො කොට හැක්කැ'යි වදළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් සත් පුරුෂයන් විසින් තුන් දෙරින් සිද්ධ වන අකු සලු ත් දුරු කොට සිත් සතන් සෙමෙහි තබන්ට උත්සාහ කට යුතු.

## 283. සැරියුත් මහ තෙරුන් වහන්සේ ගේ වස්තුව

තව ද ගුරු භක්තියෙහි යහපත දක්වන්ට සැරියුත් මහ තෙරුන් වහන්සේ ගේ වස්තුව කියමු.

කෙ සේ ද යත්—

උන් වහන්සේ අස්සජි මහ තෙරුන් වහන්සේ ගෙන් බණ අසා සෝවාන් වූ තැන් පටන් අස්සජි මහ තෙරුන් වහන්සේ යම් තැනෙක වෙසෙතී ඇසූ සේක් නම් සැතපෙන කල ඒ දිග වැඳ ලා ඒ දිගට හිස ලා ලා සැතපෙන සේක. වහන්දෑ ද ඒ දැක ආද්‍යන්ත ඔබ අතිනු ත් විචාරා නො පියා 'බ්‍රාහ්මණ ලෙසට දෘෂ්ටි ය නො හළ නියා වේ ද? අද දක්වා ත් දික් වැඳීම හරනේ නැතැ'යි සිතා ගෙණ එ පවත් බුදුන්ට දැන්වූ සේක.

බුදුහු ත් මහ තෙරුන් වහන්සේ බණවා ලා 'සැබෑ ද? තෙපි දික් වැඳ ඇවිදු දැ'යි විචාරා 'ස්වාමීනි, මා දෘෂ්ටි ගතික ව දික් වඳනා නියා ත් නො වඳනා නියා ත් ඔබ ම දන වදර ත් මා කියන්නේ

කිම ද'යි කී කල්හි 'හෙම්බා මහණෙනි, මූ තුඹු දික් වඳනෝ නො වෙති. යම් දිගක අස්සජි මහ තෙරුන් වෙසෙති දත්තු නම් උන්ගේ බණ අසා තමන් සෝවාන් වූ හෙයින් උන් ඇදුරු ව සිටි හෙයින් උන් වඳිති' වදරා බණ වදරන සේක් 'සත්වයෝ තුමූ යම් කෙණකුන් කෙරෙන් බුදු වදන් අසා දත්තු නම් උඟ ගිනි දෙවියා පුදන බමුණන් ඒ ගිනි දෙවියාට කරණ ආදර මෙන් ආදර සම්භාවනා ඇති ව වැන්ද මැනැවැ යි පිදුව මැනැවැ'යි වදළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් ගුරු ප්‍රත්‍යාඛ්‍යාන ය නො කොට ගුරු භක්ති ඇති ව විසිය යුතු.

## 284. දුළුලු බමුණාන කෙණකුන් ගේ වස්තුව

තව ද බාහිත පාපිත්‍වයෙන් බ්‍රාහ්මණ ව ත් මුත් සෙසු ලෙසකින් බ්‍රාහ්මණ නො වන නියාව හඟවන්ට දුළුලු බමුණාන කෙණකුන් ගේ වස්තුව කියමු.

කෙ සේ ද යත්—

උඟ තුමූ 'මම උභය කුල පරිශුද්ධ වූ බ්‍රාහ්මණයෙමි. මහණ ගොයුම්හු තමන්ගේ සවුවන්ට බමුණු ව්‍යවහාර කරණ කල මා ජාති බ්‍රාහ්මණයාට ත් මම ලෙස ම කොළෝ නම් යහපතැ'යි සිතා ලා බුදුන් කරා ගොසින් එ පවත් කිවු ය. බුදුහු ඒ අසා 'මෙම්බල බමුණ, තෙල විවර තරමක් හැර ගෙණ මම බමුණු ව්‍යවහාර නො කෙරෙමී' වදරා ඒ වැවහාරයට නිස්සවුන් වදරන සේක් 'ජාති පමණෙකින් හා ගොත්‍ර පමණෙකින් හා දළ මඩුලු බැඳීම් පමණෙකින් හා වැවහාර පමණක් මුත් බ්‍රාහ්මණ නම් නො වෙති. යම් කෙණකුන් කෙරෙහි සොළොස් ආකාරයෙකින් දූන සිටි යා වූ චතුරාර්‍ය්‍ය සත්‍ය ය ඇත් නම් ආර්‍ය්‍ය ජාතීන් යහපත් ජාති ඇත්තෝ ත් උඟ ම ය, බ්‍රාහ්මණ වන්නෝ ත් උඟ ම ය'යි වදළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් ශීල සමාධ්‍යාදී ගුණෙහි ම පිහිටා භවක්‍ෂයට යත්න කරත් මුත් කුහක ප්‍රතිපද වශයෙන් දළ මඩුලු ධැරීම ආදියට උත්සාහ නො කට යුතු.

## 285. කොවුන් බමුණකු ගේ වස්තුව

තව ද කුහක ප්‍රතිපදවෙහි නපුර දක්වන්ට කොවුන් බමුණකු ගේ වත කියමු.

Non-Commercial Distribution

කෙ සේ ද යත්—

එ තෙම විසල් මහ නුවර වාසල ළඟ එක් කුඹුක් ගසකට නැඟී ලා දෙ පයින් අත්තක් බැද ගෙණ ඉස බිම බල්වා ලා එලෙන්නේ 'මට කිඹුල් වන් දෙනුන් සියයක් දෙව. පාදපරිචාරිකාවන් දෙව. ඉදින් නු දුනු නම් කඩා ගෙණ හී මිය මේ නුවර පාළු කෙරෙමි' කිය යි. බුදුහු ත් වහන්දෑ පිරිවරා නුවරට සිඟා වඩනා කල්හි ත් ඔහු වවුලකු මෙන් එලෙන්නා දැක සිඟා පියා වඩනා කල ත් බැද එල්වා පි එකක්හු මෙන් එලෙන්නහු දුටු සේක. නුවර ඇත්තෝ ත් 'මෑ උදසන පටන් මෙ ලෙස කිය කියා එලෙන්නේ කඩා ගෙණ හී මිය ගොසින් මේ නුවර නු නුවර කෙළේ නමුත් ය'යි සිතා ලා නුවර නසී දෝ යන හයින් යමක් යමක් ඉල්වී නම යකුන් කොයි වුව ත් යක් දෙස්සන්ට කරණ සංග්‍රහ මෙන් ගුණ කුම වුව ත් කුහක ප්‍රතිපදව දැක ම දෙන්නාහ. එයි ත් බැස පියා හැම ම හැර ගෙණ නික්මීණ.

වහන්දෑ ද වෙහෙර උවසර සිම දී දෙනුන් හඩන්නා සේ හඩ හඩා යන්නාහු දැක හැඳින ගෙණ 'බමුණ, ඉල්වූ ඉල්වූ දෙය ලදු ද'යි විචාරා 'එ සේ ය, ලදුමහ'යි කී කල්හි බුදුන්ට ත් එ පවත දන්වූ සේක. බුදුහු ත් ඒ අසා 'මහණෙනි, තුලූ කොවුන් දූන් මතු නො වන්නේ වේ ද? යට ත් කොවුන් ම වේ දැ'යි වදරා 'දූන් තමා සේ ම අඥනයන් කොවුන් කමින් බද ඇවිද්දි. පෙර නුවණැත්ත වූහු ත් බදන්ට උත්සාහ කොව ත් බද ගත නො හිණි'යි වදරා ඉකුත් වත් දක්වන සේක්—

යට ගිය දවස කසී රට එක් ගමක් නිසා සැදෑයෙකින් නො ව ජීවිකා වෘත්ති ය නිසා තවුස් වෙස් ගත් එක් සොරෙක් වෙසෙයි. එක් උපාසක කුලයෙක් ගුණයක් ඇතැ'යි සිතා කවුඩු බෝයකට කරණ උපස්ථානයක් මෙන් උපස්ථාන කෙරෙති. තමන්ගේ දරු මලු කෙණකුන්ට දෙන දෙයක් මෙන් කන බොන දෙයින් දවලට ත් කොටසක් දෙති. සවස එක් කොටසක් තබා ලා දෙවන දවස් උදසන දෙති. එක් දවසක් සවස ගෝ මසක් ලදින් යහපත් කොට පිසවා ලා ඉන් කොටසක් තබ්බවා ලා දෙ වන දවස් ඕ හට සොර කමට යන්ට දෙන දෙයක් මෙන් දුන්හ. එයි ත් ගෝ මස් කා ලා රස දැන ගෙණ 'මේ කුමන මසෙක් දැ'යි විචාරා ගෝ මස් නියා ව දැන මිරිස් ලුණු ආදි ය සිඟා ගෙණ පන්සලට ගෙණ ගොසින් එක් තැනෙක තබා ලා හුන්හ.

Non-Commercial Distribution

පන්සලට ආසන්නයෙහි එක් තුඹසෙක ගෝ රජ්ජුරු කෙණෙක් වසන්නෝ කලින් කල සැබෑ තවුසෙකැ'යි සිතා ගෙණ සොර තවුසා වඳිනට එති. එ දවස් ඒ සොර ද ගෝ රජ්ජුරුවන් මරණු නිසා දණ්ඩක් සඟවා තබා ලා තුඹස ආසන්නයෙහි නිඳන බඳු ව ලා හුන්හ. ගෝ රජ්ජුරුවෝ ද තුඹසින් නික්ම ලා ඌ ලඟට එන තැනැත්තෝ ම ඌ එබි කමට හුන් ලෙස ම දැක ජාති ය තිරිසන් වුව ත් නුවණ තිරිසන් නො වන හෙයින් තමන් මරන්ට හුන් නියාව දැන ගෙණ එ දවස් ගමන තබා පිහ. කුළු දුල්ලා ත් ඒ නියාව දැන ලා මරණු නිසා මහ දණ්ඩක් දමා ලී ය. පව් වළහන සේ දන්නවුන්ට දඬු වැළහීම බැරි නො වන හෙයින් දමා ලූ දණ්ඩ වළහා පිහ. නොහොත් ගෝ රජ්ජුරුවන්ගේ කුශලානුභාවයෙන් දඬු කඩ ඉවත් ව හිණ. ගෝ රජ්ජුරුවෝ තුඹසට වැද ලා හිස මැත් කොට ලා ආ පස්ස බලන්නාහු සොරට තවුසා සිටිය වුට—

"සමණං තං මඤ්ඤමානො-උපගඤ්ඡිං අසඤ්ඤතං,
සො මං දණ්ඩෙන පාහාසි-යථා අස්සමණො තථා,
කිං තෙ ජටාහි දුම්මෙධ-කිං තෙ අජිනසාටියා,
අබ්භන්තරං තෙ ගහණං-බාහිරං පරිමජ්ජසි."

යනු හෙයින් 'තා ගුණයක් ඇතැ'යි සිතා තා කරා අයිමි. තෙපි දැන් අප මරන්ට ආරම්භ කළහ. නුවණ නැති තැනැත්තව, එ බඳු ගුණයක් නැතිව හිසට බර කොට දළ මඩුලු ඔසවා ත් කම කිම ද? කුණු ලබ්බෙක ඇතුලක් සේ අදහස නපුරු කල අසුචින් පිරුණු කළයක් පිටත සිත්තම කරන්නා සේ පිටත පිරිමසා ඇවිදීමෙන් කම් කිම ද? තිලින් පර ලොව පිරිමැසි ය නො හැක්කේ වේ දැ'යි කීවු ය. කුළු දුළුලු ද තමාට හැල් සාල් ඇති නියාව ත් මාළුවක් ඉදී කරත ත් මිරිස් ආදි වූ කුළු බඩු ඇති නියාවත් කියා ලා ඉදින් පොලඹා ගත හැකි කෙණකුනැ'යි සිතා—

"එහි ගොධෙ! නිවත්තස්සු-භුඤ්ජ සාලිනමොදනං,
තෙලං ලොණඤ්ච මෙ අත්ථි-පහූතං මය්හ පිප්ඵලි"

යනු කිවු ය. ගෝ රජ්ජුරුවෝ ද ඒ අසා නිවන් රසයේ මුත් සෙසු රසයෙක ඇලුම් නැති නියාව ත් ඌ එලෙස කීව ත් තමන් දුරු බා යනු කැමති නියාව ත් හඟවන්ට—

"එස භීයයො පවෙක්ඛාමි- වම්මිකං සතපොරිසං,
තෙලං ලොණඤ්ච කිං තෙහි-අහිතං මය්හ පිප්ඵලි"

Non-Commercial Distribution

යනු කිවු ය. මෙ සේ ද කියා ලා 'හෙම්බල, මම මෙ තෙක් කල් පරසිත් දන්නා නුවණ මට නැති හෙයින් තා ගුණයක් ඇතැ'යි සිතා තා කරා එළඹියෙමි. තමා දමා ලූ දණ්ඩ මා කරා අවුත් තාගේ තරම හඟවාපී ය. ආදී ගුණ ලවයක් ඇත්තෙහි වී නමුත් මා මරණු නිසා දඬු කඩ දැමූ වේලෙහි පටන් දර දණ්ඩෙ මොළොක් ගුණ ය නැත්තා සේ ම තාගේ සිත ත් ගුණ රස නැත. තා සේ වූ සැදෑ නැති පව්වුන් දළ මඩුලු උසුලනු බලා ත් වපුන් උසුලා ඇවිදීම යහපත. අඳුන් දිවි සම් පෙරවීම් බලා ත් කැණහිල් සම් පෙරවීම් යහපත තවුස් වෙස් ගැන්මෙන් පිටත ම පිරිමසා ඇවිදිනා පමණක් මුත් පිළියෙන් වැසුව මනා ලජ්ජා ස්ථාන ය එළි ව තිබිය දී මූණ පමණක් වසා ඇවිදිනා සේ පිරිමැසුව මනා සිත් සතන් පිරිමසා ගත නො හෙයි. මෙ වක් පටන් තා අපට හැයි දෑ'යි කීහ.

බුදුහු මෙ ඉකුත් වත ගෙණ හැර දක්වා ලා 'එ කල ඒ කො චුන් තවුසා නම් මේ වවුල් තපස් කරණ තැනැත්තෝ ය. ගෝ රජ්ජුරුවෝ නම් මම ම ය'යි වදරා ලා බණ වදරන සේක් නැතක් දවසෙක කියා ලූ දෙයක් සිත තබා ගත නුහුණුවන්ව පෙරළා සඳහන් කරවන්නාක් මෙන් බොධිසත්ව අවස්ථාවෙහි කියා ලූ—

'කිං තෙ ජටාහි දුම්මෙධ-කිං තෙ අජින සාටියා,
අබ්භන්තරං තෙ ගහණං-බාහිරං පරිමජ්ජසි'

යන මේ ගාථාව ම වදළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් කුහක ප්‍රතිපදවකින් දවස් නො යවා අවඩක අකුටිල ලෙස දවස් ගැළවිය යුතු.

---

## 286. කිසා ගොතමීන්දෑ ගේ වත

තව ද දළ මඩුලු අඳුන් දිවි සම් නැති වත් සොහොන් ආදී තෙවිසි තැනකින් කඩ ගෙණ දුඹුල් තැන් පියා තර තැන් ගෙණ සිවුරු කොට රදා වැළඳ ත් හවක්ෂයට කරණ යත්නයක් මුත් අසන්ත ගුණ සම්භාවනායෙහි ඉච්ඡානැත් නම් එ ම යහපත් නියා ව හඟවන්ට කිසා ගොතමීන්දෑ ගේ වත දක්වමු.



Non-Commercial Distribution

කෙසේ ද යත්—

එක් දවසක් සක් දෙව්ඳු පෙර යම් දස පැය ගිය කලට මෑ දෙව් ලොව දෙවියන් පිරිවරා අවුත් බුදුන් වැඳ ලා එකත් පස් ව බණ අසා හුන්හ. ඒ වේලාට කිසා ගොතමීන්දෑ ත් බුදුන් දක්නා නිසා ආසින් අවුත් සක් දෙව්ඳු දැක නැවතී දැ ය. සක් දෙව්ඳු ද නැවත යන තියාව දැක බුදුන් අතින් 'මුඹ එන්ට අවුත් ලා පෙර ළා යන සේක් කවුරුන් වහන්සේ දැ'යි කිවු ය. බුදුහු ත් 'මෙම්බා, තුලූ කිසා ගොතමී නම් වූ මාගේ එක් දුවණි කෙණෙක. මෙමෙහෙණි සස්නෙහි යම් කෙණෙක් පසුල් සිවුරු ධරත් නම් තුලූන්ට වඩනෝ නැතැ'යි වදරා 'යම් කෙණෙක් මහණ වුව ත් මෙහෙණි වුව ත් දුවහ පිරිම නිසා සිවුරු පසුල් ධරත් නම් රුක්ෂ වූ ප්‍රතිපත්ති පූරණය නිසා ගුණෙන් සින්දැරි කමු ත් නැත ත් වැර පියා වසන්නා වූ දුවිල වීමෙන් ම නහර වැල් ඉපිල සිටිනා වූ දුවිල වූව ත් වාස ඒාසුවකට නො සිතා ගණ සඞ්ගනිකාව හැර වෙන් ව වසන්නවුන්ට බ්‍රාහ්මණ ය යි කියමී' වදළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් සුජනයන් විසින් ධුතඞ්ගප්පිචඡතාදි ය ඇති ව ධුතාඞ්ග පූරණාදියෙහි හැසිර භවක්‍ෂයට උත්සාහ කට යුතු.

---

## 287. එක්තරා බ්‍රාහ්මණ කෙණකුන් ගේ වත

තව ද බ්‍රාහ්මණ ලක්‍ෂණය ම හඟවනු නිසා එක්තරා බ්‍රාහ්මණ කෙණකුන් ගේ වත හා උග්ගසෙන සිවු පුත්‍රයන් ගේ [1] වත කියමු.

කෙසේ ද යත්—

ඒ වස්තු දෙකින් බ්‍රාහ්මණ වස්තුයෙහි ඒ බමුණු තමා බ්‍රාහ්මණ ජාතියෙහි උපන් පමණක් මුත් 'මහණ ගොයුම් නො එක් කුලෙන් අවුත් තමාගේ සස්නෙහි මහණ වූවන්ට බ්‍රාහ්මණ ය'යි කිය යි. උන් හැමට කියන බමුණු කම මට ත් කිය නො හැකි දැ'යි සිතා ගෙණ බුදුන් කරා ගොසින් තමා සිතූ සිතුවිල්ල කී ය.

බුදුහු ත් බමුණු ජාතියෙහි උපන් පමණෙකින් බමුණු වැව හාර ලබන පමණක් මුත් බ්‍රාහ්මණ ලක්‍ෂණ නො වන තියාව වද රන සේක් 'යම් කෙණෙක් සකෙලෙස්හු වූ නම් බමුණු කුලෙහි උපන් පමණකට 'පින්වත, පින්වත'යි කී පමණක් ගෙණ 'හොවාදී' ය යි කියත් මුත් බ්‍රාහ්මණ ව්‍යවහාර ය නිර්වාජයෙන් රහතන්ට ම

---

1 උග්ගසේන වත' මෙ තැන නැත.

Non-Commercial Distribution

වන හෙයින් උන්ට තො කියමි. රාගාදි කෙලෙස් කසළක් නැති කාමූපාදනාදී චතුර්විධ උපාදානයෙන් ගැන්මෙක් හෝ නොහොත් පිළිසිඳ ගැන්මෙක් හෝ නැත්තවුන්ට ම බ්‍රාහ්මණ ය යි කියමි. තව ද යම් කෙණෙක් සසර නමැති මහා කණුවෙහි බඳනා තෘෂ්ණා නමැති බහන් සුන් බැවින් සසර භය ත් සිඳ පූ ද, උන්ට බ්‍රාහ්මණ ය යි කියමි'යි වදාළ සේක. මේ දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් ඉස ගිනි ඇවිළියක්හු ඒ ගිනි නිවන්ට වන වෙළෙවියක් මෙන් භවක්ෂයට ම වෙළෙවි විය යුතු.

---

## 288. බමුණන් දෙන්නකු ගේ වස්තුව

තව ද කවර බානු ත් සිඳීම් බිඳීමට ත් වඩා තෘෂ්ණා බාන් සිඳීමටම උත්සාහ කට යුතු නියාව හඟවන්ට බමුණන් දෙන්නකු ගේ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්—

ඒ බමුණන් දෙන්නා ගෙන් එක් කෙණකුන්ගේ චුල්ලරොහිත නම් ගොනෙක් ඇත. එක් කෙණකුන්ගේ මහාරොහිත නම් ගොනෙක් ඇත. බමුණෝ දෙන්නා ම එක් දවසක් තමන් තමන්ගේ ගොන් බල ඇතැ යි ඔවුනොවුන් හා විවාද කොට ගෙණ 'විවාද කිරීමෙන් කම් කිම් ද, බල විමසමහ'යි අචිරවතී නම් ගඟ බඩදී ගැලක වැලි පුරා ලා ගොන් යොද ලූහ. ඒ වේලාට වහන්දෑ ත් ගඟට නාන්ට ය යි වැඩි සේක. බමුණෝ ත් ගොන් බිණූහ. ගැල බර හෙයින් සැලීමක් නැති ව ම සිටි පි ය. වියබාන් කැඩිණ. වහන්දෑ ද ඒ දැක වෙහෙරට ගොසින් බුදුන්ට දන් වූ සේක. 'මහණෙනි, හෙම්බා, තෙල රැන බාන් සිඳිනට කය බල පමණිතු ත් පිළිවන. නුවණ බලයකින් මුත් සිඳ ලිය නො හැක්කේ කෙලෙස් බාන් ම ය.

'තොප හැම විසින් සුන මනා එ ම ය'යි වදරා බණ වදරන සේක් 'යම් කෙණෙක් අනර්ථාවහ බැවින් පැවති ක්‍රොධයක් බඳනා ලෙසින් පැවති තෘෂ්ණාව ත් අනුසය සිත ත් දෙසැට දෘෂ්ටිය ත් සිඳ ගෙණ සව් කෙලෙසුන්ට මුල් ව සිටිනා අවිද්‍යාව ත් නසාපු නම් චතුරාර්‍ය්‍ය සත්‍ය ය ප්‍රතිවෙධ ය කොට සිටියා වූ උන්ට බ්‍රාහ්මණ ය යි කියමි'යි වදාළ සේක. දෙශනා කෙළවර පන්සියක් දෙනා වහන්සේ කෙලෙස් බාන් සිඳ ගෙණ රහත් වූ සේක. තවත් බොහෝ දෙන නිවන් දුටහ.

Non-Commercial Distribution

එ හෙයින් නුවණැත්තවුන් විසින් කෙලෙස් මළ බානකට පය නො ලන්ට සිති ය යුතු.

---

## 289. අක්කොසක භාරද්වාජ නම් බමුණානන් ගේ වස්තුව

තව ද මහ පිණැත්තවුන්ට වරද්ද කළ දෙයක් නො වරදන නියාව හඟවන්ට **අක්කොසක භාරද්වාජ නම් බමුණානන් ගේ වස්තුව** දක්වමු.

කෙ සේ ද යත්—

ඒ බමුණානන්ගේ ධනඤ්ජනී නම් බැමිණිනියෝ සෝවාන් වූහ. උඹ කුමු කැස පියා ත් කිඹිස පියාත් පැකිල පියා ත් 'සියපින් ලකුණු ධරන්නා වූ නිකෙලෙස් වූ ඒ බුදුන් වදිමි'යි කියති. උඹ එක් දවසක් බමුණානන් බත් කමින් හින්ද දී බත් ලන්ට යන ගමනේ පැකිල පියා එ ලෙස ම බුදුන්ට නමස්කාර කළහ. බමුණානෝ ඒ අසා තමා මිථ්‍යාදෘෂ්ටික හෙයින් මුසුප්පු ව 'යන්තම් දෙයකට ම මුඩු මහණාට නමස්කාර කෙරෙයි. බලා හිඳුව, දැන් ම ගොසින් ලා මහණ ගොයුම් හා වාද කෙරෙමි'යි කීහ. බැමිණිනියෝ ඒ අසා 'තුන් ලෝ මුළුල්ල විමසා බැලුව ත් ඔබ හා වාද කට හෙන කෙණකුන් අපට නො දුනෙ යි බල, එකෙක් නම් වාද තබා ප්‍රශ්න විචාරව'යි කිවු ය.

බමුණානෝ ද බුදුන් කරා ගොසින් නො වැඳ ම එකත් පස් ව සිට 'සත්වයෝ කුමු කුමක් නසා සුව විඳිත් ද? කුමක් නසා පීමෙන් සෝක නැත්තෝ ද? කවර එක ධර්මයක් නසා පීමෙහි රුචි ඇත්තෝ දැ'යි විචාළෝ ය. බුදුහු ත් 'යම් කෙණෙක් මාර්ග පරම්පරාවෙන් ගොසින් අනගැමි මගින් ක්‍රොධ ය නසා පූ නම්, උඹ කාමරාග ය නැති හෙයින් සුවෙන් වෙසෙති. ඔහු ම සෝක නැත්තාහ. ශොක කාරණ නැති හෙයින. හෙම්බල බමුණ, කරණ අවසථාවෙහිදී සලකා ගත නොහීමෙන් යහපත සේ සිතෙ ත් මුත් පසු ව බොහෝ අවැඩ එළවන්නා වූ ක්‍රොධ ය පමණකු ත් නසා පීවො ත් සෙස්ස නිරායාසයෙන් නැසිය හැකි හෙයින් තනි ක්‍රොධ ය පමණක් නසා පීම යහපතැ'යි කියමි'යි වදාළ සේක. බමුණානෝ ද ඒ බණ අසා බුදු සස්නෙහි පැහැද මහණ ව රහත් වූහ.

අනිකු ත් උන් වහන්සේගේ එම නම් වූ මලණු කෙණකු ත් සුන්දරී භාරද්වාජ නම් මලණු කෙණකු ත් බිළඞගක භාරද්වාජ නම් වූ

Non-Commercial Distribution

මලණුකෙණකු ත් ය'යි මල්ලූ තුන් දෙණෙක් ම බෑණන් වහන්සේ මහණ වූ නියාව අසා මුසුප්පු ව බුදුන්ට බණන්ට අවුත් ඔබගේ බණ අසා මහණ ව රහත් වූහ. මෙ සේ සතර නම ම බුදුන්ට බණන්ට ගොසින් හැඳ පැකිළි තිල්ලේ හුණුවා සේ රහත් වූ කල්හි ධම සෙබෙහි රැස් ව හුන් වහන්දෑ 'ඇවැත්නි, බුදුන්ගේ ආනුභාවයක් බැලුව මැනව. සතර බෑයන් කෙලෙස බිණුව ත් ඇඟ අසුචි ගෑවන්ට උන් ඇඟ සඳුන් ගානා සේ උන්ට ම පිහිට වූ සේකැ'යි කථාව ඉපැද වූ සේක. බුදුහු ත් ඒ මුල් ව බණ වදරන සේක් 'යම් කෙණෙක් මරන්නවුන්ට වත් බණන්— නවුන්ට වත් නො කිපී ක්‍ෂමා පර බැවින් ඉවසත් ද එ ලෙසින් ක්‍ෂමා ඇත්තවුන් සියලු ගුණයට ම ආධාර වන බැවින් උතුම් කොට කියම්'යි වදාළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් ක්‍ෂමා පර වීමට ම උත්සාහ කට යුතු.

## 290. සැරියුත් මහ තෙරුන් වහන්සේ ගේ වත

තව ද ක්‍රොධ නො වීමෙහි ම අනුසස් දක්වන්ට සැරියුත් මහ තෙරුන් වහන්සේ ගේ වත කියමු.

කෙ සේ ද යත්—

එ කල මහ තෙරුන් වහන්සේ පන් සියයක් දෙනා වහන්සේ හැර ගෙන සිඟා වඩනා සේක් නාලක නම් බමුණු ගම මෑණියන්දෑ ගේ ගෙදෙරට සිඟා වැඩි සේක. මෑණියන්දෑ ද ගෙයි වඩා හිඳුවා ලා වළඳවන ගමනේ පුතණුවන් වහන්සේට 'ඉඳුල් කා ඇවිදිනා තැනැත්තෙනි, ඉඳුල් පමණකුත් ලබන්ට නැති ව කබලක් හැර ගෙණ සිඟා ගොසින් ඉඳුල් බත් ම ලබනු නිසා අසූ කෙළක් වස්තුව හැර මහණ වුව. තොප හැම නිසා අපි ත් පරිභව ලබම්හ. නො කා හිඳුන, කව' යනාදී කියා බෙණෙති. සෙසු වහන්දෑ ත් වළඳවන තැනැත්තෝ 'තොප හැම දෙන අපගේ දරුවන් තොපට ම හැර ගත්තාවා ද? අපට උන් ගෙන් කිසි ත් ප්‍රයෝජනයක් නැත්තේ වේ ද, 'කව කව'යි කියා බෙණෙති. මහ තෙරුන් වහන්සේ පාත්‍ර ය පිළිගෙණ ලා වේලාව ඇති බැවින් වළඳන්ට වෙහෙරට වැඩි සේක.

රහල් තෙරුන් වහන්සේ ද බත් වළඳන්ට බුදුන්ට ආරාධනා කළ සේක. බුදුහු ත් 'රාහුලයෙනි, සිඟා කොයි ගියා දැ'යි විචාරා

Non-Commercial Distribution

'ස්වාමීනි, අපගේ මුහුන් ලමන්දුන්ගේ ඔබ ය'යි කී කල 'තොපගේ උපාද්ධ්‍යායන්ව තොපගේ මුත්තණියන් කීයේ කිම් දැ'යි විචාළ සේක. 'ස්වාමීනි, අපගේ මුහුන් ලමන්දු ඔබට බිණූ ය'යි කී සේක. 'කුමක් කියං බිණූ දැ'යි විචාළ කල්හි බිණූ සැටි ය ම කිවු සේක. 'තොපගේ උපාද්ධ්‍යායයන් ඊට කීයේ කුමක් දැ'යි වදළ කල්හි බැණ නැඟි කුමකු ත් නැති නියාව කී සේක.

ධර්ම සෙබෙහි රැස් වූ වහන්දෑ ත් ඇවැත්නි, මහ තෙරුන් වහන්සේගේ සමාව ත් යහපත් නියා ය. මැණියන්දෑ කෙලෙස බණත ත් මුසුප්පු පමණකු ත් නො වී ය'යි වදළ සේක. බුදුහු ත් ඒ අසා 'මහණෙනි, රහතුන්ට ක්‍රොධ නැත්තේ වේ දැ'යි වදරා සම්ප්‍රාප්ත තැනට බණ වදරන සේක් 'යම් කෙණෙක් ක්‍රොධයෙහි බොහෝ ආදීනව සලකා ක්‍රොධ නො වෙත් ද, තම තමාට ප්‍රතිනියත වූ ධුතාඞ්ග පූරණයෙහි පවතිත් ද, පන්සිල් ආදියෙහි ත් පිහිටියෝ ද තෘෂ්ණා වසඟ නො වෙත් ද, අධිකයක් ම ඉන්ද්‍රිය සංවරයෙහි පිහිටියෝ ද, පශ්චිම භවිකයෝ ද, එ සේ වූවන් උත්තම ය යි කියමි' වදළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් සත් පුරුෂයන් විසින් මෛත්‍රී නමැති ප්‍රළයමන්ත්‍රයෙන් මහ කෝ රකුස්සා ගෙන් හා ක්ලෙශොපද්‍රවයෙන් දුරු වන්ට උත්සාහ කට යුතු.

## 291. උප්පලවන් ස්ථවිරීන්දෑගේ වස්තුව

තව ද යහපත් කොට ගිනිවර කළ රත්රන රිදී භාග ය නැත්තා සේ රහත් සතන කෙලෙස් කසළ නැති නියාව හඟවන්ට උප්පලවන් ස්ථවිරීන්දෑ ගේ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්—

මෙහි විස්තර කථාව මුල ම කියන ලද. 'රහතන්ට ත් කාම පීඩාව ඇති නියා වේ දැ'යි කථාව උපන් කල්හි ඒ එ සේ නො වන නියාව වදරන බුදුහු 'යම් කෙණෙක් තුමූ යම් සේ නෙළුම් පත පැන් බින්දු නො ඇලේ ද, පිහිටා නො සිටී ද, වැටීම හේ ද, හිදි කටු අග හබ ඇටයක් තබා ලූ පමණෙකින් නො රදා ද, වැටීම් හේ ද, කෙලෙස්හි ඇලුම් රහත් මඟින් ම සුන් බැවින් නැත්තෝ වී නම් බ්‍රාහ්මණ ය යි කියමි. වෙද ඉගෙන සූත්‍ර හූ කර ලා සක් හැර ගෙණ හෝම කොට ඇවිදීම් පමණකට පැවැති වැවහාරසෙයින් බමුණු ය කිය ත් මුත් සෙසු ලෙසින් බ්‍රාහ්මණ ය'යි

Non-Commercial Distribution

නො කියමි' වදළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් ස කෙලෙස් වීම සොපද්‍රව සෙයින් නිකෙලෙස් වන්ට ම උත්සාහ කට යුතු.

## 292. එක්තරා බ්‍රාහ්මණ කෙණකුන් ගේ වස්තුව

තව ද කම් බලයකින් අනුන් දස් වුව ත් තෘෂ්ණා දසත්වයෙන් මිදුණාහු වී නම එ ම යහපත් නියාව හඟවන්ට එක්තරා බ්‍රාහ්මණ කෙණකුන් ගේ වස්තුව කියමු.

කෙ සේ ද යත්—

ඒ බමුණානන්ගේ කොල්ලණු කෙණෙක් අනුන් දසුන්මහණ නො කොට හැක්කැ යි සිබ පද නොපැනූ හෙයින් දුර පලා ගොසින් මහණ ව ගෙණ අසුමස්සේ රහත් වන්ට නිසි පින් කළ හෙයින් රහත් වූහ. බමුණානෝ ද සොය සොයා හිඳිනෝ එක් දවසක් බුදුන් හා කැටි ව සිඟා යන්නා දැක වාසල ඇතුලේ දී ගසා අල්වා ගත්හ. බුදුහු දැක 'තෙල කිම ද'යි විචාරා 'කොලු හෙයිනැ'යි කී කල්හි' බමුණ, තෙලේ බර උසුළා ඇවිද්ද නො හී බර බා තබා පිය'යි වදළ සේක.

බමුණානෝ තමන් නුවණැති හෙයින් වදළ බසින් ම රහත් නියාව දත්හ. ඒ නියාව දැන 'එ සේ ම ද'යි විචාළහ. බුදුහු ත් 'එ සේ ම ය'යි වදරා ලා උන්ට බණ වදරන සේක් 'බමුණ, යම කෙණෙක් උදව්යෙන් පෙළන හෙයින් ස්කන්ධ භාර ය දුක් නියාව දනි ත් ද, එ ලෙසින් දැන කඳබර බා තබා පු නම කඳ බර බා තිබී මෙන් සව් කෙලෙසුන් කෙරෙන් දුරු ව සිටියා වූ ඔහු උත්තම ය'යි කියමී' වදළ සේක. දෙශනා කෙළවර බමුණානෝ සෝවාන් වූහ. සෙසු ත් බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් තෘෂ්ණා දසත්වයෙන් මිදෙනු කැමැත්තො ත් පින් කම හැසිරෙන්ට උත්සාහ කට යුතු.

## 293. බෙමා නම සථවිරින්දෑ ගේ වස්තුව

තව ද බ්‍රාහ්මණ ලක්‍ෂණ ය ම හඟවන්ට බෙමා නම සථවිරින්දෑ ගේ වස්තුව දක්වමු.

Non-Commercial Distribution

කෙ සේ ද යත්—

එක් දවසක් සක් දෙව්ඳු මධ්‍යම රාත්‍රි වේලෙහි දෙව් පිරිස් හා සමග අවුත් බුදුන් වැඳ ලා කථා කොට කොට හුන්හ. එ වේලාට ඛෙමා නම් ස්ථවිරින්දෑ ද බුදුන් දක්නා නිසා ආසින් අවුත් සක් දෙව්ඳු හා කථා කොට කොට හුන් නියාව දැක ආස සිට බුදුන්ට වැඳ ලා ආ පස්සෙහි නික්මුණු දෑ ය. සක් දෙව්ඳු ත් දැක 'එන්ට අවුත් ලා ආ පස්සෙහි ගියා කවුරුන් දෑ'යි විචාළෝ ය. 'ශක්‍රයෙනි, තුලූ මට අග්‍රශ්‍රාවිකා ව සිටි ඛෙමාවෝ වෙත් දෑ'යි වදරා බණ වදරන බුදුහු 'යම් කෙණෙක් මහ සයුර සේ ගැඹුරු නුවණැත්තෝ ද, තව ද ස්ථානොචිත ප්‍රඥා ක් ඇත්තෝ ද, මේ අකුශල ය නම් දුගතියට මහ ය, මේ කුශල ය නම් සුගතියට මහ ය යි දනිත් ද, නැවත සව් කෙලෙසුන් ගෙවා රහත් වූ ද, උන් උත්තම ය යි කියමි' වදළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් රහත් වීමට ම උත්සාහ කට යුතු.

## 294. පබ්භාරවාසී තිස්ස තෙරුන් වහන්සේ ගේ වස්තුව

තව ද ශීල විශුද්ධියෙහි පිහිටියවුන්ට රහත් වීම නිරායාස නියාව හඟවන්ට පබ්භාරවාසී තිස්ස තෙරුන් වහන්සේ ගේ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්—

උන් වහන්සේ බුදුන් ගෙන් කමටහන් ඉගෙණ වලට පලා ගොසින් සැප සෙනසුන් බලන සේක් කවර නැති ගල්තල්ලකට පැමිණි සේක. පැමිණි ඇසිල්ලෙහි ම සිත ත් එකඟ වි ය. 'මේ තැන රඳා හුනිම් නම් රහත් ව ගනිමි' සිතූ සේක. ගල් තල්ලේ විමන් ඇති ව වසන දෙව් දූ ද, 'සිල්වතුන් වහන්සේ මෙ තැනට පැමිණි සේක. මුන්වහන්සේ හා එක් ව වසන්ට ත් නො පිළිවන. මුන් වහන්සේ ත් මී ම රදා හිදිනට ආ සේක් ද? අද රෑ සැත පී ලා වැඩ පියන සේකැ'යි සිතා ලා දරුවන් හැර ගෙණ ගල් තල්ලෙන් ඉවත් ව ගත. තෙරුන් වහන්සේ ද දෙවන දවස් උදසන ම ගොදුරු ගමට සිහා වැඩි සේක් එක් වැඩි මාලු උපාසිකා කෙණෙක් දැක දරු පෙම් උපදවා ගෙණ ගෙයි වඩා හිඳුවා ලා වළඳවා ලා වස් තුන් මස එහි වසන්ට ආරාධනා කළහ. උන් වහන්සේ මුන් මුල් ව

Non-Commercial Distribution

භවයෙන් මිදී ගත හැක්කැ'යි වස් විසීමට කළ ආරාධනාව ඉව සාලා ගල් තල්ලට ම වැඩි සේක.

දේවතා දූ ත් ගල්තල්ලට ම වඩනා දැක 'යම් කෙණකුන් ආරාධනා කළ නියා ය. ආරාධනාවට අද හෙට රදා ලා වැඩ පියන සේකැ' යි සිතූ ය. මෙ සේ සිතූ උන්ට දෙ පෝයක් විවර පලා ගියේ ය. ඉක් බිත්තෙන් දවසින් දවසට කල් යන නියාව දැක 'වසු ත් මී ම වසන සේක් වන, දරු කම් කටුල ත් ඇති බැවින් මුන් වහන්සේ හා එක් ව වසන්ට ත් බැරි ය. මුන් වහන්සේට 'පලා ගිය මැනැවැ'යි කියන්ට ත් බැරි ය. මුන් වහන්සේගේ සිල්වත් කම කවර දෝ හෝ යි දිවසින් බලන තැනැත්තෝ මහණ වූ තැන් පටන් උපසම්පද මාලක ය දක්වා ත් එ වක් පටන් මෙ වකට ත් ධෞත සඞ්ඛයක් සේ ශීල ය නිර්මල නියාව දැන මුන් වහන්සේ සිල්වත් සේක. කිසි ලෙසකින් අයසක් උපදවා පියමි'යි උන් වහන්සේට උපස්ථාන කරණ උපාසිකාවන් ගේ, වැඩිමාලු පුතණුවන් ඇඟ ආවිෂ්ටව ලා කර අඹරා ලූ ය. ඇස් දෙක කකුළුවන්ගේ ඇස් සේ පිටතට නික්මිණ. කටින් කෙළ ධාරා ත් වැගිරෙයි.

උපාසිකාවෝ ත් එ දැක තුදුටු විරූ දෙයක් හෙයින් හඬන්ට වන්හ. දෙව් දූ ද නො පැනී සිට 'මේ කෙළේ මම ය. බිලියම් නු ත් මට කම් නැත. තොපගේ කුලුපග තෙරුන් වහන්සේ ගෙන් වැල්මී සුහක් ඉල්වා ගෙන තෙලක් පිස ගෙන ඒ තෙලින් තුලුන්ට නස්‍ය කරව. එ සේ කළා නම් හැර පියමි' කිවූ ය. උපාසිකාවෝ ඒ අසා 'රැකෙත් ව යි, මියෙත් ව යි. මා ඔබ අතින් වැල්මී ඉල්වන්ට බැරි ය'යිකිවූ ය. 'ඉදින් වැල්මී ගරුතර ව තිබෙන හෙයින් ඉල්වන්ට බැරි වුව ත් මුන්ගේ නාසයෙහි සුං සුහක් ලා ලන්ට කියව'යි කිවූ ය. 'එයි ත් කියන්ට බැරි ය'යි කිවූ ය. 'එ සේ වී නම් උන් වහන්සේ පය සෝධවා පූ පැන් ඉස ලව'යි කිවූ ය. උපාසිකාවෝ ඒ පිළිවන් වේදැ යි වළඳන වේලාට වැඩි තෙරුන් වහන්සේ වඩා හිඳුවා ලා කැඳ අවුළු පත් වළඳවා ලා බත් වලඳන තෙක් වැඩ හුන් තෙරුන් වහන්සේගේ පය සෝධා පැන් හැර ගෙන 'ස්වාමීනි, මේ පා දෙව් පැන් මේ දරු-වන්ගේ ඇඟ හිසිම්දැ'යි විචාරා 'ඉසුව'යි වදාළ කල්හි එ විතරකු ත් විචාරා කළහ. දෙව් දූ එ වේලේ ම පහ ව පලා ගොසින් ලෙණ දෙර කඩ සිටියා ය.

තෙරුන් වහන්සේ ත් වළඳා අන්තයෙහි හුනස්නෙන් නැඟී ශරීරාවයවයක් සේ කමටහන් අත් නො හරන හෙයින් කා ගියා යි

Non-Commercial Distribution

කමටහන් මෙනෙහි කෙරෙමින් නික්මුණු සේක. ලෙන දෙර කඩ කරා වැඩි කලට ඒ දේවතා දුව 'වෙදණෙනි, මුබ නො එව' යි කිව. උන් වහන්සේ ත් එ තැන ම රඳා සිට 'තොපි කවුරු දැ'යි විචාළ සේක. 'මම මෙ ගල් තල්ලේ වසන දෙව දූ'යි කිවු ය. තෙරුන් වහන්සේ ත් 'මා වෙද කමක් කළ තැනෙක් ඇත් දෝ'යි උපසම්පද මාලකයෙහි පවත් බලන සේක් එබන්දක් නැති නියාව දැක 'මා වෙද කමක් කළ නියාවක් මා නො දනු ත් තෙල ලෙස කුමක් නිසා කී දැ'යි විචාරා 'නො දක්නා සේ ක් දැ'යි කී කල්හි 'නො දක්මි' කී සේක. 'කියන්ට මැළි ය'යි කිව. 'කියව'යි වදළ සේක.

'දුර කට යුතු තිබෙව යි, ඒ මුඹ වහන්සේ සලකුණු ඇතැ'යි ත් නැත. උපස්ථාන කරණ උපාසිකාවන්ගේ පුතණුවන්ට අබුද්ධි විකාර ඇති වූ තැන මුඹ වහන්සේ පය සේධූ පැන් උන් ඇඟට ඉස්සේ ඇත් ද නැත් දැ'යි කිව. 'එ සේ ය, එ පමණක් කෙළේ ඇතැ'යි කී සේක. 'එ සේ කල ඒ නුඳුටු නියා දැ'යි කිව. ඒ නිසා කී නියා දැ'යි විචාරා 'එ සේ ය'යි කී කල්හි තෙරුන් වහන්සේ මා සැරි නියා ව ඉතා ම යහපත. දේවතා දූ ත් මෙ තැනින් තෙරා ගන්ට මා ගෙන් වරදක් ම සොයන්නී මේ විවරක් ම දුට. ඒ මේ වරදකු ත් නො වෙයි. මේ විතරක් දක්නී වරදක් වුව ත් දක්කි. මා රක්නා ගුණ දහම් ඉතා යහපත් නියා'යි බලවත් වූ ප්‍රීති ය ඔබට උපන. ප්‍රීති ය බලවත් ව යා නො දී ප්‍රීති ය විකඹා ලා භාවනා කෙරෙමින් සිටි පියෙහි ම සිට රහත් වූහ. 'අප වැන්න-වුන්ට මෙ බන්දක් උපදවා ලා මේ වන ලැහැබ නී රඳන්ට බැරි ය. නික් මෙන ත් තෝ ම නික්මෙ'යි කියන සේක්-

''විසුද්ධො වත මෙ වාසො–නිම්මලං මං තපස්සිතං,
මා ත්වං විසුද්ධං දූසෙසි–නික්ඛම පවනා ත්වං''

යි වදළ සේක. එ සේ වදරා වස් වැස නිමවා ලා බුදුන් ලඟට ගොසින් 'කුමක් ද ඇවැත්නි. රහත් වූයේ ඇත් දැ'යි විචාළ කල්හි ඒ ගල් තල්ලේ වස් විසූ වක් පවත් සියලු පවත් ම කියා ලා 'ඇවැත්නි, තෙපි දේවතා දුව තෙල ලෙස කළ කල කිපුණෝ ඇත් දැ'යි විචාළ කල්හි 'නො කිපිණිමි' කී සේක. වහන්දෑ ත් බුදුන් කරා ගොසින් 'ස්වාමීනි, මූ තුමූ දේවතා දුවක කී කළ දෙයකට නො කිපුණුම්හ යි කියා තමන් රහත් නියාවක් හඟවති' කී සේක. බුදුහු ඒ අසා ඔබ රහත් නියාව හඟවන 'සේක් 'මහණෙනි, යම් කෙණකුන්ට මෙ බඳු කෙණකුන් දැක්ම නිසා ත් උන්ගේ පවත්

Non-Commercial Distribution

ඇසීම නිසා ත් උන් හා කථා නිසා ත් යම් කෙණකුන් සන්තක දෙයක් අනුභව කිරීම නිසා ත් කයින් කය පැහැරීම් නිසා ත් ආසවාදයෙක් නැත් ද, ගිහීන් හා වුව ත් පැවිදිවරුන් හා වුව ත් අල පත නෙළුම් පත ඔත් දිය සේ එක් වීමෙකු ත් නැත් ද, කිසි වෙක ත් ඇලුම් නැති ව වෙසෙත් ද, එ බඳු තරම් ඇති ව පූතුන් පබ්භාරවාසී තිස්සයන්ට කවුරුන් කී කළ දෙයකට ත් උරණ කොයින් ද? එ හෙයින් ම උත්තමයහ යි කියමී' වදාළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් පබ්භාරවාසී තිස්ස තෙ—රුන් වහන්සේගේ තරම එවා ගෙණ ලොවී ලොවුතුරා සැප ත් සිද්ධ කට යුතු.

## 295. එක්තරා භික්ෂු කෙණකුන් වහන්සේගේ වත

තව ද ක්ෂමා පර වීමට උපදෙස් දක්වනු සඳහා එක්තරා භික්ෂු කෙණකුන් වහන්සේ ගේ වත කියමු.

කෙ සේ ද යත්—

ඒ භික්ෂූන් වහන්සේ ද බුදුන් ගෙන් කමටහන් ඉගෙන ඉගෙණ වලට පලා ගොසින් භාවනා කොට රහත් ව ලත් ගුණ ය බුදුන්ට දක්වනු නිසා වැඩ හුන් තැනින් නික්මුණු සේක. අතුරු මහ එක් ගමෙක හිඳිනා එක් ස්ත්‍රියක් සමණන් හා ඩබරක් කොට ලා උන් ගෙයි නැති තැන දෙ මවු පියන් අතුරට යන්ට නික්ම අතුරු මග දී තෙරුන් වහන්සේ දැක, 'තනි ව යන ගමන් මුන් වහන්සේ ලා කැටි වයෙමි' පසු පස්සෙහි නික්මුණා ය· තෙරුන් වහන්සේ උන් නුදුටු සේක.

සමණෝ ත් ගෙට අවුත් උන් නො දැක දෙ මවු පියන්ගේ ඔබ ගිය නියා යයි ලුහු බඳවා ගොසින් දැක ගෙණ මුන් තනි ව මෙ තෙක් තැන් එන්ට කාරණ නැත. කවුරුන් හා කැටි ව ආ නියා දෝ හෝ' යි බලන තැනැත්තෝ තෙරුන් වහන්සේ දැක 'මුන් කැඳවා ගෙණ යන දෑ මුන් දෑ වනැ'යි සිතා ගෙණ තෙරුන් වහන්සේට අනාදර ලෙස දෙඩූහ. උපාසිකාවෝ ද 'මුන් වහන්සේ මා නුදුටු සේක. කළ කථා පමණකු ත් නැත. ඔබට නො දෙඩුව මැනැවැ'යි කිවු ය. 'තෙපි තොප දුට ත් කථා කළ ත් කියා ද? තොපගේ බස්වලින් සැබැවට ගත මනා බසු ත් ඇත් ද? තොපට කළ මනා දෙයක් තුලුන්ට ම කෙරෙමී' ගැනි ය කෙරෙහි කළ

Non-Commercial Distribution

ක්‍රොධයෙන් තෙරුන් වහන්සේ තමන්ට සැක වූ සෙයින් තෙරුන් වහන්සේ මරා තළා බොහෝ ගහට කොට පියා උපාසිකාවන් කැඳවා ගෙණ නික්මුණු වූ ය.

කෙලෙස් ගහට නැති තෙරුන් වහන්සේට ගෙඩි ගහට ය වැද ලා ඇඟ මුළුල්ලේ ම වයිරි නැංගේ ය. වෙහෙරට ගිය තෙරුන් වහන්සේට ආගන්තුක සාද කරණ වහන්දෑ සිත වයිර නැත ත් ඇඟ වයිරි දැක 'මේ කිම දැ'යි විචාළ සේක. තෙරුන් වහන්සේ එ පවත් මුළුල්ල ම කී කල්හි වහන්දෑ 'ඇවැත්නි, උඹ එ ලෙස කරණ ගමනේ කීයේ කෙළේ කිම ද, උඹ කෙරේ ක්‍රොධයෙක් ඇති වී ද නො වී දැ'යි විචාළ සේක.

'මට උපන් ක්‍රොධයෙක් නැතැ'යි කී කල්හි ඒ වහන්දෑ බුදුන් කරා ගොසින් 'ස්වාමීනි, අපි මුන් මරණ තළන ගමනේ ක්‍රොධයෙක් වී දැ'යි විචාළම්හ. මූ නැතැ යි කියා තමන් රහත් නියාවක් හඟවති' කී සේක. බුදුහු උන් වහන්සේට ක්‍රොධ නැති නියාව හඟවන සේක් මහණෙනි, යම් කෙණෙක් සත්ව-යන්ට කරන්නා වූ හිංසා පීඩා තබා පියා ඉන් වැළකි හෙයින් තුමූ ත් අනුන් හිංසා පීඩා නො කෙරෙත් ද, අනුන් ලවා ත් නො කරවත් ද උන් උත්තම ය යි කියමි. එ හෙයින් තුලු ත් තමන් රහත් හෙයින් අනාගැමීන්ට ක්‍රොධ නට ම හෙයින් උන් කෙරේ ක්‍රොධ නො කළහ'යි වදළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් සත් පුරුෂයන් විසින් ලොවී ලොවුතුරා ගුණ විශෙෂයට පැමිණීමෙහි රුචිය ඇත් නම් සියලු අවැඩට මුල් ව සිටිනා ක්‍රොධය දුරු කොට සෙසු අකුසලු ත් දුරු කරන්ට උත්සාහ කට යුතු.

---

## 296. හෙරණ වහන්දෑ සතර නමක ගේ වස්තුව

තව ද ගුණ ඇත්තවුන්ගේ ගුණානුභාව දක්වන්ට හෙරණ වහන්දෑ සතර නමක ගේ වස්තුව කියමු.

කෙ සේ ද යත්—

එක් බැමිණි කෙණෙක් වහන්දෑ සතර නමකට දනක් සපයාලා බමුණානන්ට 'වෙහෙරට ගොසින් වැඩි මාලු වහන්දෑසතර නමක් වහන්දෑ ගෙන් ඉල්වා ගෙණ එව'යි කිවූය. උයිත් වෙහෙරට ගොසින් 'වැඩිමහලුවහන්දෑ සතර නමක් මට පාවා දුන මැනැවැ'යි

Non-Commercial Distribution

කිවූ ය. උන්ට සංකිච්ච සාමණෙර ය, පණ්ඩිත සාමණෙර ය, සොපාක සාමණෙර ය, රෙවත සාමණෙර ය'යි සාමණෙර සතර නමක් සත් හැවිරිදි වයස් හෙයින් වයසින් බාල වූව ත් පිළිසිඹියා පත් රහත් හෙයින් ගුණෙන් වෘද්ධ ව පැමිණි සේක.

බැමිණිනියෝ මහ ඇඟි කොට ආසන පනවා ලා සිටි තැනැත්තෝ සාමණෙර වහන්දෑ දැක ඔබගේ තරම නො දත් බැවින් කිපී පියා උදුනේ ලා ලූ ලුණු පරිද්දෙන් තතනමින් 'තෙපි විහාරයට ගිය තැනැත්ත, වහන්දෑ අරුමයා සේ තොපට මුනුබුරු පමණකට වත් නො සැහෙන බාල දරුවන් සතර දෙනකු දරු ආසාවේ වඩන්ට ගෙනාවා සේ හැර ගෙණ අවුත් සිටියව. තෙල මා මහ ඇඟී කොට පැන වූ හසුන්වල තුලුන් හැම හිඳිනට බැරි ය. මිටි පුටුවල හිඳුව'යි කුඩා බූඩා ලෙසට මිටි හසුන් පනවා ලා එහි හිඳිනට කියා ලා 'යව, බමුණානෙනි, මෙ විට ගොසින් මහලු තැන් බලා ගෙනෙව'යි කිවූ ය. බමුණානෝ ත් වෙහෙරට ගොසින් සැරියුත් මහ තෙරුන් වහන්සේ දැක කැඳවා ගෙණ ගියහ. තෙරුන් වහන්සේ ද අවුත් හෙරණ සතර නම හුන්නා දැක 'මූ බත් ලද්ද දෑ'යි විචාරා නො ලත් නියා ව අසා සපයා ලූ දන ත් සතර නමකට පමණ මුත් වඩා නැති නියාව දැන ගෙණ පාත්‍ර ය කට යුතු නො කරණ තෙක් ගෙන්වා ගෙණ වැඩ පී සේක.

බැමිණිනියෝ ද 'දන් නො වළඳා වැඩපීයේ හැයි දෑ'යි විචාරා හෙරණ සතර නමකට සපයා ලූ දන් හෙයින් වැඩ පී නියාව කී කල්හි ඊ ඊ පිට ලා ලා වළඳන්ට මැළි නියා ය. ගොසින් අනික් වැඩි මාලු තැනක් ගෙනෙව'යි කිවූ ය. බමුණානෝ ද වහා ගොසින් මුගලන් මහ තෙරුන් වහන්සේ දැක එ ලෙස ම කියා ලා ගෙණවූ ය. උන් වහන්සේ ද හෙරණ වහන්දෑ විවරට ඉදී කළ දන් හෙයින් දෙවා ලූ පාත්‍ර ය හැර ගෙණ වැඩ පී සේක. බැමිණියෝ ඔබ ත් වැඩි පී නියා ව දැන ලා 'වළඳන්ට මැළි ව ගිය නියා ය. බමුණන් හෝම කරණ තැනට ගොසින් ආදියෙන් ම ගෙණ ලෙසින් බාල කෙණකුන් නො ගෙණවුත් මාලු බමුණාන කෙණ කුන් ගෙනෙව'යි කිවූ ය.

හෙරණ වහන්දෑ උදෑසන පටන් හිඳ ත් ලත් කිසිවක් නැති වූ හෙයින් සාකුස් ඇති ව හුන්දෑ ය. ඒ තැන් ගුණානුභාව-යෙන් සක් දෙවිඳුහුගේ හස්න හුණු වී ය. හස්න හුණු වීමට කාරණ සොයන්නෝ එ පවත දැන මා ඔබ ගිය මැනව'යි මාලු බමුණු වෙසක් මවා ගෙණ හැම බමුණන්ට මූල් ව හුන්හ. බමු-

ණෝ ද උන් දක 'මෙ විට අපගේ බැමිණිය සතුටු වන්නී ය'යි සිතා ගෙණ උන් කැඳවා ගෙණ ගෙට ගියහ. බැමිණිනියෝ ද උන් දක සතුටු ව පියා හසුන් දෙකක අතුළ ඇතිරිලි එක හස්නෙක අතුට ලා 'ස්වාමීනි, තිලී හුන මැනැවැ'යි කිවු ය. සක් දෙවිඳු ද ගෙට වැද ලා හෙරණ සතර නම පසහ පිහිටුවා වැද ලා සතර නමට කෙළවර නිකම් බිම ම පලක් බැඳ ගෙණ හුන්හ. ඒ දක බැමිණිනියෝ බමුණානන්ට 'අනේ තොපගේ බමුණානන්ගේ තරමක් බලව. තොපට පිය වන තරම් තැනැත්තෝ තමන් මුණුබුරු තරමුන්ට ත් බාලයන් වදිමින් සිටියෝ ය. දන් පසු වත් දී ගත හැක්ක. තෙල තමාගේ තරම පමණක් නො දන්නා මාලු බමුණා ගෙන් පිටත් කරව'යි කිවු ය. කී කී දෙයක් ම කරණට සිටි කීකරු බමුණානන් හෙයින් අත ත් බොටුව ත් පිටි මුල ත් අල්වා නඟා සිටුවන්ට උත්සාහ කළ ත් නැඟී නො සිටිති.

බැමිණිනියෝ ද බමුණන් ගන්නා ආයාස බලා 'තොපි එක් අතක් අල්වා ගනුව. මම ත් එක් අතක් අල්ලා ගනිමි එ සේ කලට ගෙන් පිට ත් කොට හැක්කැ'යි දෙන්නා දැත අල්වා ගෙණ පිටට ගුටි බාමින් දෙර කඩින් පිට ත් කළහ. සක් දෙවිඳු ත් ආදි හුන් තැන ම හිඳ අත පෙරළා ලූ ය. බමුණු-බැමිණි දෙන්නා ම පෙරළා බැලුවාහු බමුණු වෙසින් ආ සක් දෙවිඳු ආදි හුන් තැන ම හුන් නියා ව දක හඬා මොරගා පියා අත හැර පූ ය. එ වෙලේ සක් දෙවිඳු තමන් සක් දෙවිඳු නියා ව හැඟවූ ය. සපයා ලූ දන් සක් දෙවිඳු ඇතුළු වූ පස් තැනට ම දුන්හ. පස් තැන ම බත් හැර ගෙණ එක් නමෙක් කැණි මඩල විනිවිද ගෙණ ගියදැ ය. එක් නමෙක් නැගෙන හිරි පල ය හිරා ගෙණ ගිය දැ ය. එක් නමෙක් බස්නා හිරි පල ය හිරා ගෙණ ගිය දැ ය. එක් නමෙක් පොළොව කිමිද ගෙණ ගිය දැ ය. සක් දෙවිඳු ත් එක් අතකින් ගියහ. එ වක් පටන් එ ගෙට 'පස් සිදුරු ගෙය'යි කියති.

හෙරණුන්දැ ත් වෙහෙරට ගිය කල්හි ගෙණෙහි හුන් වහන්දැ පවත් විචාළ සේක. හෙරණුන්දැ ත් බැමිණියන් තමන්දැ හැම දුටු වෙලේ පටන් මුසුප්පු ව හිඳි කළ හසුන්වල හින්ද නුදුන් නියාව ත්, තමන් දැ ලා බාල හෙයින් වැඩි මහලු වහන්දැ සොයා එවූ නියාව ත්, වැඩි මහලු වහන්දැට සැරියුත්-මුගලන් දෙ නම ගෙණ ගිය නියාව ත්, තමන් දැ ලා හුන් නියාව බලා ඒ දෙ නම පෙරළා වැඩ පී නියාව ත්, පසු ව හෝම කරණ තැනින් මාලු බමුණන් සොයා යවූ තැන මාලු බමුණු වෙසින් හුන් ශක්‍රයන් ගෙණ

Non-Commercial Distribution

ගිය නියාව ත්, උන් දැක සතුටු ව ආසන දෙකක ඇතිරිලි එක හස්නෙක අතුට ලා ඉඳිනට කී නියාව ත්, උන් ඊ නො හිඳ ම තමන්දෑ ලා වැද ලා. හසුන් කෙළවර බිම හුන් නියාව ත්, ඊට ත් උරණ ව බමුණන් නො එක් ප්‍රයොග කොට ත් ගෙන් පිටත් කරන්නා තබා නහා සිටුවා ගත නුහුණු බව ත්, පසුව දෙමාල්-ලන් දෙ අත අල්වා ගෙණ මරා තළා ගෙන් පිටත් කොට පියා පෙරළා බැලූ කලට සක් දෙව්ඳු හුන් තැන ම හුන් නියාව ත්, ඒ දැක අරුන් දෙන්නා බා ගිය නියාව ත්, සක් දෙව්ඳු ශක්‍ර නියාව දැන පස් දෙනාහට ම බත් දුන් නියාව ත්, නැඟී ආ ලෙසත් කී දෑ ය.

ඒ අසා 'උන් හැමට උරණ වූයේ ඇත් ද නැත් ද'යි විචාරා උරණ නැතැ'යි කී කල්හි රහත් නියාවක් හඟවන්ට නැත්තක් කීව යි සිතා ගෙණ බුදුන්ට දැන් වූ සේක. බුදුහු ඒ අසා සතර නමගේ තරම හඟවනු නිසා 'මහණෙනි, යම් කෙනෙක් කිපිය වුන්ට නො කිපෙත් ද, හිංසා පීඩා කරන්නවුන්ට හිංසා පීඩා නො කෙරෙත් ද, දෘෂ්ටිග්‍රාහ වසයෙන් මම ය යි හෝ තෘෂ්ණාග්‍රාහ වසයෙන් මාගේ ය යි හෝ ගැන්ම නැත් ද, උන් උත්තම ය යි කියමි. මුන් සතර දෙනා එ බඳු තරම ඇති හෙයින් බැමිණිය කුමක් කළ ත් උරණ නැතැ'යි වදාළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් ක්‍ෂමාව නම් දස පැරුමෙන් එකක් හෙයිනු ත් පැරුම් පිරීම නම් උත්තමයන් නියම හෙයිනු ත් තමා ත් උතුම් වන්ට සිතතොත් උතුම් ගුණෙ යි පිහිටා ගත යුතු

## 297. මහා පන්ථක තෙරුන් වහන්සේ ගේ වස්තුව

තව ද බුද්ධ ශෛවනෙය ව සිටියවුන් ශ්‍රාවක වෛනෙය නො වන නියා ව හඟවන්ට මහා පන්ථක තෙරුන් වහන්සේ ගේ වත දක්වමු.

කෙ සේ ද යත්—

මහා පන්ථක තෙරුන් වහන්සේ එක ගාථාව සාරමසක් විතරි නු ත්, චූල්ලපන්ථක තෙරුන් වහන්සේට උගන්වා ගත නොහී එ දවස් ම සසරින් පිටත් වන්ට නිසි ව සිටි තැන් සිවුරු හරනා නිසා ශාසනයෙන් පිටත් කළ සේක. ගාථාව උගැන් වූ නියාව ත් උගන්වා ගත නො හී නෙරි නියාව ත් පසු ව බුදුන්ගේ බලයෙන් රහත් වූ නියාව ත් චූල්ල පන්ථක වතින් දත යුතු. වහන්දෑ ද කොට

Non-Commercial Distribution

ලූ සැටි ය තද ලෙසක් සෙයින් 'රහතන්ව ත් ක්‍රොධ ය ඇති නියා වේ ද'යි කථාව ඉපැද වූ සේක. බුදුහු ඒ අසා කළ තද ලෙසක් බව මුත් ඔබට කිපී සිත් නැති නියා ව හඟවන්ට 'යම් කෙණෙකුන්ට රාග, ද්වෙෂ, මොහ තුන ත් උන්නති ලක්‍ෂණ වූ මනුත්, ගුණ නසන සුලු වූ මකු කමුත් ඉදිකටු අග නො රඳා හබ හෙන්නා සේ හිණි නම් උන් උතුමැ යි කියමි. මහා පන්ථකයනු ත් වැඩක් කැමැති ව ඒ ලෙසක් කළ බව මිස උරණ සිත් නැති බැවින් කිපී කළ දෙයක් නො වේ'යි වදළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ.

ඒ හෙයින් නුවණැත්තවුන් විසින් ක්‍රියාවෙන් හික්මවීම් මුඛ යෙන් තද කමක් හඟවත ත් සිතින් තද නො වන්ට උත්සාහ කට යුතු.

## 298. පිලින්දිවච්ඡ මහ තෙරුන් වහන්සේ ගේ වස්තුව

තව ද වාසනා දොෂ බුදුන්ට විනා සෙසු කොතැනට ත් ඇති නියා ව හඟවන්ට පිලින්දිවච්ඡ මහ තෙරුන් වහන්සේ ගේ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්—

උන් වහන්සේ ගිහි වුව ත් පැවිදි වුව ත් ගැනි වුව ත් පිරිමි වුව ත් දෙවි වුව ත් මිනිස් වුව ත් දුටු යම් කෙණකුන්ට සැඩොල් වැවහාර කරණ සේක. එක් දවසක් බොහෝ දෙනා වහන්සේ ඒ පවත් බුදුන්ට දන් වූ සේක. බුදුහු ත් ඔබ ගෙන්වා ලා සැබෑ දැ'යි විචාරා 'සැබැවැ'යි කී කල්හි ඒ විට ඔබගේ පෙර විසූ කඳ පිළිවෙළ දන්නා නුවණින් බලා වදරා 'මහණෙනි, තොපි පිලින්දිවච්ඡයන්ගේ බසට මුසුප්පු නො වව. උඹ තුමූ ද්වෙෂ සිත් ඇත්තෝ නො වෙති. තෙල ලෙස හෙළා පිරිහෙළා කියන්ට කාරණ කිම් ද යත්—

'පිට පිට හෙළා පන්සියයක් ජාතියෙහි තුලූ බ්‍රාහ්මණ ව උපන්හ. පන්සියක් ජාතියේ ම තුලුන් කියා පුරුදු බස ය. ඒ හෙයින් තෙල ලෙස කියති' වදරා 'යම් කෙණෙක් අනුන්ට රළු පරළු කොට නො කියත් නම්, කියත ත් අර්ථවත් වූ මියුරු බසක් ම කියත් නම් කිසි ලෙසකිනු ත් අනුන් සැටි යන ලෙසට නො කෙරෙත් නම් උන් උත්තම ය යි කියමි. වාසනා දොෂ ය නිසා බස කියවි යන පමණක් මුත් අනාගැමි මගින් ම ප්‍රතිඝය

Non-Commercial Distribution

නට හෙයින් රුෂ්ට අදහසින් කියන දෙයෙක් නො වෙයි' වදාළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් වාසනා දෙෂයෙන් වැරද යන දෙයක් විනා රුෂ්ට අදහසින් අනුන් සැටෙන තරම් බස් නො කියන්ට උත්සාහ කටයුතු.

## 299. එක් තෙර කෙණකුන් වහන්සේ ගේ වස්තුව

තවද සත්‍වයන් අනුන් සන්තක දෙයෙහි ඇලුම් හරවනු නිසා නම් ගොත් හෙයින් අප්‍රසිද්ධ වූ එක් තෙර කෙණකුන් වහන්සේ ගේ වත කියමු.

කෙ සේ ද යත්—

සැවැත් නුවර මිථ්‍යා දෘෂ්ටික වූ එක් බමුණෙක් ඩා ගඳ වැද ගනී දෝ හෝ යන අදහසින් පෙරව ගත් උතුරු සළුව ගළවා එක් තැනෙක තබා ලා ගෙට මූණ ලා ලා හුන. ඉක්බිත්තෙන් එක් රහත් කෙණකුන් වහන්සේ වළඳා ලා වෙහෙරට වඩනා සේක් ඒ උතුරු සළුව දැක ඇත මැත බලා පියා කිසි කෙණකුන් නො දැක 'හිමියන් නැති දෙයක් වනැ'යි සිතා පසුල් සංඝුවෙන් හැරගත් සේක. උතුරු සළුව ඇති බමුණු ත් දැක දෙඩ දෙඩා බැණ බැණ ගොසින් 'මුඩු මහණ, මාගේ උතුරු සළුව හැර ගතිනැ'යි කිවු ය. 'බමුණානෙනි, තොපගේ දැ'යි විචාරා 'එ සේ ය'යි කී කල්හි යමකු නිරාලය ව හැර පියා ගිය දෙයක් දෝ හෝ'යි සිතා පසුල් සංඝුව එළවා හැර ගතිමි. ඉදා ය'යි කියා ලා බමුණාට ම දී පියා වෙහෙ රට ගොසින් එ පවත් වහන්දැට කී සේක. ඒ වහන්දෑ ත් ඒ අසා වෙහෙසන සේක් 'ඇවැත්නි, ඒ හිණකඩ දික් ද? ලුහුඩු ද? දළ ද? සිහින් දැ'යි කී සේක. දික් වත් කිම? ලුහුඩු වත් කිම? දළ වත් කිම? සිහින් වත් කිම? ඉන් හැම ප්‍රයෝජන ය ඊ ආලය කරණ කෙණකුන්ට වේ ද, මා ඊ ආලයෙක් නැත. පසුල් සංඝුව එළවා හැර ගතිමි' කී සේක.

වහන්දෑ ද 'ආල ය නැත්තෝ දැක දැක පලා අවමනා වේ ද, හැර නො ගතමනා වේ ද, හිණකඩ හැර ගෙණ මෙ ලෙස කියන්ට කාරණ කිම දැ'යි බුදුන්ට දැන් වූ සේක. බුදුහු ත් ඔබ නැත්තක් නො වදරන නියා ව වදරන සේක් මේ ලෙව්හි ලුහුඩු ව තිබෙන්නා වූ ත් දික් ව තිබෙන්නා වූ ත් පිළී ආදියෙහි ද මහත් ව තිබෙන්නා වූ ත් කුඩා ව තිබෙන්නා වූ ත් මුතු මැණික් ආදියෙහි ත් මඳ ව තිබෙන්නා වූ ත් බොහෝ ව තිබෙන්නා වූ ත් වී සාල් ආදියෙහි ත්

Non-Commercial Distribution

යහපත් ව තිබෙන්නාවූ ත් නපුරු ව තිබෙන්නාවූ ත් රත් රන් රිදී ආදියෙහි ත් ලොභ ය උපදවා ගෙණ සොර සිතින් හැර නො ගනිත් නම් උන් උත්තම ය යි කියමි. එ තැන කිසි කෙණකුන් තුඩුවූ හෙයින් හිමියන් නැති දෙයකැ යි සිතා හැර ගත් බව මුත් මුන් තමන් රහත් හෙයින් වඤ්වා සිත් නැතැ'යි වදාළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් සත් පුරුෂයන් විසින් අනුන් සතු දහු වැළක් වුව ත් විෂ සොර සපුන් කොට සිතා අයිනාදනින් දුරු විය යුතු.

## 300. මුගලන් මහ තෙරුන් වහන්සේගේ වත

තව ද රහතන්ට වුව ත් පරුපවාද ඇති නියාව හඟවන්ට සැරියුත් මහ තෙරුන් වහන්සේ ගේ වත ත්, මුගලන් මහ තෙරුන් වහන්සේ ගේ වත ත් දෙක ම දක්වමු.

කෙ සේ ද යත්—

සැරියුත් මහ තෙරුන් වහන්සේ ත් සඟ පන් සියයක් හැර ගෙණ දනවුවෙහි එක් වෙහෙරකට ගොසින් වස් විසූ සේක. මුග ලන් මහ තෙරුන් වහන්සේත් සඟ පන් සියයක් හැරගෙණ දනවු වෙහෙරක වස් විසූ සේක. සැරියුත් මහ තෙරුන් වහන්සේ වස් විසූ ගම මිනිස්සු ත් මුගලන් මහ තෙරුන් වහන්සේ විසූ ගම මිනිස්සු ත් 'වස් අන්ත වූ කල බොහෝ වස්සාවාසික ලාභ ය පවත් කරම්හ'යි දෙ දෙනා වහන්සේට ම කීහ. දෙ දෙනා වහන්සේ ම වස් පවරා ලා ඒ විහාරවල වස් විසූ තැන් ලබන ලාභ ය තව සම්හ නො වන තුරු ම බුදුන් දක්නට වඩිනා සේක් ඒ විහාරවල රඳා හිදිනා තැනට 'උපාසකවරුන් වස්සාවාසික ලාභය ගෙනා කල කොටස් කොට බෙදා පියා අප හා කැටි ව ගිය තැනට පැමිණියා එවා ලන්ට හෝ වුව මැනව. එවා ලන්ට බැරි වී නම් තැන් පත් කොට තබා ලා කියා එවන්ට වුව මැනැවැ'යි දෙ දෙනා වහන්සේ වෙන වෙන ම සම්මත කොට ලා බුදුන් ලඟට වැඩි සේක.

වහන්දෑ ත් 'අනේ මේ දෙ දෙනා වහන්සේගේ ලොභ අදහස් බලවත් නියා ය. තව වස්සාවාසික ලාභ ඇති බව ත් නැති බව ත් නො දන ම තම තමන් වහන්සේගේ වහන්දෑ ට පිරිකර කොටස් එවන්ට හෝ තබන්ට හෝ කී සේකැ'යි නො සතුටු ලෙසා කථා

කළ සේක. බුදුහු ත් ඒ අසා 'මහණෙනි, උන් දෙන්නාට ලාභ ය ලොභ නැත. මිනිසුන්ට සිද්ධ වන පිණ හා ලාභීන්ට වන ලාභ නැති නුවමනා වේ ද යි සිතා කිවු ය'යි වදරා 'යම් කෙණ කුන්ට කුමකු ත් ආසය නැත් නම්, එ සේ කිසිවක ත් ආස ය නැති සව් කෙලෙසුන් කෙරෙන් වෙන් ව වසන්නවුන්ට ත් සංශයට කාරණ ව සිටිනා වස්තූන් අට දෙනා කෙරෙහි සංශ ය සෝවාන් මගින් ම නට හෙයින් යම් කෙණකුන්ට ඒ සංශ ය ත් නැත් නම් අමාමහ නිවනට පැමිණ සිටියා වූ උන් උත්තම ය' යි කියමි'යි වදළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් ලාභයෙහි කරණ ලොභ තරමට ත් පින් කම ම ලොභ ඇති ව නිවන් දහම් පසක් කට යුතු.

## 301. රෙවත තෙරුන් වහන්සේ ගේ වස්තුව

තව ද රහතන්ට පින් පව් දෙක ම නැති නියාව හඟවන්ට රෙවත තෙරුන් වහන්සේ ගේ වස්තුව දක්වමු.

කෙ සේ ද යත්—

එහි විස්තර කථාව සත් වන අරහන්ත වග ආ ම ය. එතෙ කුදු වුව ත් උන්වහන්සේ මහ පිණැති නියාව හඟවා වහන්දෑ කථා කළ කල්හි කුශල ය ඇත් නම් ඉෂ්ට විපාක ත් දෙ වන හෙයින් භවොත් පත්ති ය නු සුන් නියාව ද උන්ට භවොත් පත්ති ය නැති වීමෙන් ම පින් පව් නැති නියාව ද දක්වන සේක් 'යම් කෙණෙක් රහත් මගින් ම පින් පව් දෙක ම ගෙවා සිටියෝ ද, කිසි වෙක ත් ඇලුම් නැත්තෝ ද, කිසිවෙක ත් ඇලුමක් නැති බැවින් ම ශොක නැති වූ රාගාදී කෙලෙස් කසළ ත් නැති බැවින් අත්‍යන්ත පරිශුද්ධ වූ ඔහු උත්තම ය යි කියමි' වදළ සේක.

එ හෙයින් නුවණැත්තවුන් විසින් බොහෝ පින් කම හැසිර පින් පව් දෙක ම නසා භවොත්පත්ති ය වැළකිය යුතු.

## 302. චන්ද්‍රාභ තෙරුන් වහන්සේ ගේ වත

තව ද අනුන්ගේ කැණියලිනු ත් කළ පින් කම උදුරතර වූ විපාක ඇති බව හඟවන්ට චන්ද්‍රාභ තෙරුන් වහන්සේ ගේ වත දක්වමු.

Non-Commercial Distribution

කෙ සේ ද යත්—

යටගිය දවස බරණැස් නුවර වසන වෙළඳාණ කෙණෙක් 'පසල් දනව්වට ගොසින් සඳුන් දඬු ගෙනෙමි' බොහෝ පිළී සහ ආභරණ ආදිය ගෙන්වා ගෙණ පන් සියක් පමණ ගැලු ත් හැර ගෙණ පසල් ගමකට ගොස් ගම් දෙර කඩ කෙරේ නවාතැන් ගෙණ ඒ ගම හිඳිනා එඬේර කොලු පැටවුන් අතින් 'මේ ගම වලට ගොසින් කර්මාන්ත කරණ කෙණෙක් ඇත් දෑ'යි විචාරා 'ඇතැ'යි කී කල්හි 'උඹ කිනම් වූ ද දරුවෙනි'යි කීහ. මේ නම් වූ ය යි නම් කී කල්හි 'ඇමෑණියෝ කිනම්මු ද? දරුවෝ කිනම්මු දෑ'යි උන්ගේ නමුත් විචාරා ගෙණ 'ගෙය කොයි දෑ'යි විචාළ කල්හි 'ගෙය අසවල් තැන ය'යි කිවු ය.

උඹ උන් කියා ලූ සලකුණෙන් මිනිසාවන් ලෙසට වාහනය කින් උන්ගේ ගෙදෙරට ගොසින් වාහනයෙන් බැස පියා ගෙට වැද උපාසිකාවගේ නම කියා හඬ ගෑ ය. උයි ත් නම කියා හඬ ගැලූයේ නම් නෑ කෙණකුන් තියා වේ දෑ යි වහා අවුදින් හිඳිනා දෙයක් ලා ලූ ය. උඹ ඊ වැද හිඳ නම කියා බණවා ලා 'අපගේ යාළු වාණෝ කොයි දෑ'යි විචාළෝ ය. 'වලට ගියෝ'ය යි කී කල්හි අපගේ පුතණුවෝ මෙ නම්හ. අපගේ දූවණියෝ මෙ නම්හ. උඹ කොයි දෑ යි විචාරා 'මේ මේ පිළීත් මේ මේ ආභරණ ත් ඒ අපගේ දරුවන්ට දී ලව අපගේ මිත්‍රයාණන් වල සිට ආ කල උන්ට මේ පිළී හා ආභරණ දී ලව යි පිළියක් හා ආභරණයක් දුන්හ. උපාසිකාවන්ට ත් පිළී පළඳනා දුන්හ.

උපාසිකාවෝ ද උන්ට සාද යහපත් ලෙස කොට ලා සමණන් ආ කල්හි 'ආ වෙලේ පටන් හැම දෙනාගේ ම නම් කියා ලා තෙලෙ දුන් දේ ය'යි කිවු ය. උයි ත් සාද සාමීචි බොහෝ කොට ම කළහ සවස වැදහොත් වෙලෙහි 'සබඳ, තොප වල ඇවිදිනා කල බොහෝ කොට දක්නේ කුමක් දෑ'යි කිවු ය. 'අනික් අප දක්නා දෑ බොහෝ ව නැත. අතු ත් කොළත් රතු ව තිබෙන ගස් දිටිමි'යි කිවු ය. 'බොහෝ දෑ'යි විචාළ කල්හි 'බොහෝ ව' යි කිවු ය.

'එ සේ වී නම් ඒ ගස් අපට පාන්ට වුව මැනැවැ යි කියා ලා උන් හා කැටි ව ම ගොසින් රත් හඳුන් ගස් කපා ගෙණ ගැල් පන් සියයේ පුරා ගෙණ යන ගමනේ 'සබඳ, බරණැස් නුවර අසවල් තැන අපගේ ගෙය ය. අතුර 'තුරේ අපගේ ඔබ අව මැනව.

Non-Commercial Distribution

එන කල ත් අනික් දෙයක් අපට ගෙණෙන්ට නො කැමැත්තේය. රත් අතු ඇති දඬු කපා ගෙන අව මැනැ'යි කීහ. උයි ත් 'යහපතැ'යි කියා ලා අතුර'තුරේ උන් ලඟට යන කල තමන් ඊ නම් නො දන්නා පමණක් මුත් රත් හඳුන් ම ගෙණ යෙති. උයි ත් සඳුන් දඬු ඇර ගෙණ බොහෝ සම්පත් දෙති.

ඉක් බිත්තෙන් කල් යැමෙකින් කසුබ බුදුන් පිරිනිවී ධාතු වඩා රන් දා ගබක් කළ කල්හි පසල් දනවුවෙහි වසන තැනැත්තෝ බොහෝ සඳුන් දඬු ගෙන්වා ගෙණ බරණැස් නුවරට ගියහ. මිත්‍ර ව හිඳිනා වෙළඳාණෝ ද ගෙන්වා ගෙණ ආ සඳුන් දණ්ඩෙන් සඳුන් බොහෝ කොට ගාවා ගෙණ සඳුන් චලාවක් පුරා ගෙණ 'යාළු, බත් පිසන තෙක් දාගබ බදිනා තැනට යම්හ'යි කියා ලා පසල් දනව් වැසි යාළුවාණන් කැඳවා ගෙණ ඔබ ගොසින් සඳුන් කල්කයෙන් පූජා කළහ. පසල් දනවු වැසි යාළුවාණෝ ද දාගබ කුස සඳුන් කල්කයෙන් සඳ මඬලක් ලෙස කළහ. අනුන්ගේ සමවායෙන් වුව ත් කළ පින් කම් මෙතෙක. එ තෙකුදු වුව ත් එයින් සැව දෙව් ලොව ඉපැද අපගේ බුදුන් බුදුවන තෙක් දෙව් සැප ත් වළඳා අපගේ බුදුන් උපන් කල්හි රජගහා නුවර බමුණු මහ සල් කුලයෙහි උපන්හ. උන්ගේ පෙකිනියෙන් සඳ මඬලක් වැනි ව රස් පිඬෙක් කළ පින් කම ප්‍රකාශ කෙරෙමින් ඇති වි ය. එ හෙයින් නම් තබන්නාහු ත් චන්ද්‍රාභ ය යි නම් තබා ලූහ. කසුප් බුදුන්ගේ දා ගබ කුස සඳුනෙන් සඳ මඬල ඇඳි පින් කමින.

බමුණානෝ ද 'මූන් පැ ලා ලෝ වැස්සන්ගෙන් ලාභ විඳිනට පිළිවනැ' යි සිතා ගෙණ 'යම් කෙණෙක් මූන්ගේ ඇඟ අල්වා ලූ නම් උඟ මෙ බඳු සම්පත් ලැබෙති'යි කියා ගෙණ ඇවිදිති. සියයක් හෝ දහසක් හෝ දුන් කෙණෙක් ම උන්ගේ ඇඟ අල්වා පියනට ලැබෙති. උයි ත් මේ ලෙස කොට ඇවිදිනාහු සැවැත් නුවරට ගොසින් නුවරට ත් විහාරයට ත් අතුරෙහි නවා තැන් ගත්හ.

සැවැත් නුවර වසන පස් කෙළක් විවර ආර්‍ය්‍ය උපසකවරු පෙරවරු දවස් දන් දී ලා පස්වරු සුවඳ මල් ආදි ය ගෙන්වා ගෙණ බණ අසන්ට යෙති. අමුතු ව ලා ආ බමුණානෝ ද උන් හැම දෙනා විහාරයට යන්නවුන් දැක කොයි යවු දැ'යි විචාරා බුදුන් කරා බණ අසන්ට යම්හ'යි කී කල්හි 'ඔබ ගොසින් කුමක් කරවු ද? අපගේ චන්ද්‍රාභ නම් බමුණානන් තරම් ආනු

හාව සම්පන්න කෙණෙක් නැත. උන් ඇඟ අල්වා පී කෙණෙක් මෙ මේ සම්පත් ලැබබති. අවුත් උන් දකුව'යි කිවු ය. 'තොපගේ චන්ද්‍රාභ නම් බමුණානන් ඇඟ ඇල්වූ කෙණෙක් වේ ද සම්පත් ලබන්නෝ ය. අපගේ බුදුන්ගේ නම සිහි කළ කෙණකු ත් ලොවී ලොවුතුරා සැප ත් ලැබෙති. එ හෙයින් අපගේ බුදුහු වඩනා සේකැ'යි කිවූ ය. චන්ද්‍රාභයන්ව පක්‍ෂයෝ උන් ආනුභාව යෙන් වඩිති කියති. දෙ පක්‍ෂයේ ඇත්තෝ ම කාරණ කියා ගිවිස්වාලිය නො හෙති. ගිවිස්වා ගත නොහී 'ගොසින් ම දකුම් හ'යි චන්ද්‍රාභයන් කැඳවා ගෙණ දෙ පක්‍ෂ ය ම බුදුන් කරා ගියහ.

බුදුහු ත් උන් තමන් වහන්සේ ලඟට යත් යත් උන්ගේ පෙ-කිනියෙන් නික්මෙන රස් පිඩ නැති කළ සේක. බුදුන් ලඟට යත් යත් අඟුරු පැසෙක උන් කවුඩුවකු මෙන් නිශ්ශොභා වූහ. බුදුන්ගෙන් මඳක් දුරු කොට කැඳවා ගෙණ ගිය කලට ආදී ඇති ශොභාව පෙරළා ත් ඇති වි ය. නැවත බුදුන් කරා යන කලට හිර මුදුන් වීමෙන් සඳ රැස් නැති වූවා සේ ම චන්ද්‍රාභයන්ගේ ශොභා පුඤ්ජය නැති වී ය. මෙ සේ තුන් විටක් විතර දුරු වීමෙන් ශොභා ව ඇති ව ලං වීමෙන් නැති වන නියා ව දුක චන්ද්‍රාභයෝ 'මුන් ශොභා නැති කරණ මන්ත්‍රයක් දන්නා නියා ය'යි බුදුන් අතින් 'ශොභා නැති කරණ මන්ත්‍රයක් දන්නෝ ඇත් දැ'යි විචාළහ. 'එ සේ ය, දනිමි'යි වදාළ කල්හි 'එ සේ වී නම් මා ත් උගන්වාලුව මැනවැ'යි කීහ. 'ඒ මන්ත්‍රය මහණ තුවූ කෙණකුන්ට දෙන්ට බැරිය'යි වදාළ කල්හි චන්ද්‍රාභයෝ ද සෙසු බමුණන්ට 'තුලුන් දන්නා මන්ත්‍ර ය උගනිම් නම් මුළු දඹ දිවට උතුම් වෙමි. තෙපි හැම මෙ තැන ම රඳව. මම මහණ ව මන්ත්‍ර ය උගනිමි. මහණ වීමට බාධා නැත්තා සේ ම සිවුරු හැරීමට ත් බාධා නැති බැවින් කීප දවසකින් මන්ත්‍ර ය ඉගෙණ පලා එමි' කියා ලා මහණ කරන්ට බුදුන්ට ම ආරාධනා කොට ලා මහණ ව සම්පූර්ණ විංශති වර්‍ෂ හෙයින් මහලු පැවිද්ද ත් ලත් සේක.

මහණ-මහලු පැවිදි කළ තැන් කා ගියා සී කමටහන් ඉගැන් වූ සේක. 'මේ කිම දැ'යි විචාළ කල්හි 'තෙල මන්ත්‍රයට පෙරාතු උගත මනා දෙයෙක. තෙල නො දත් කල මන්ත්‍ර ය තර කට නො හැක්ක. තෙල උගනුව'යි වදාළ සේක. බමුණා නෝ ත් අතර'තුර ගොසින් 'මන්ත්‍ර ය උගත්තේ ඇත්දැ'යි විචාරති. 'තව උගත්තේ නැතැ'යි කිය කියා කීප දවසෙකින් ම රහත් ව රූප ශොභාව පිටට ගුණ ශොභාව එවා ගෙණ බමුණන් අවුත් මන්ත්‍ර ය උගත් නියාව විචාළ කල්හි 'තොප හැම යන

ගමනින් මම නැවැත්තෙමි' කී සේක. වහන්දෑ ත් බුදුන් කරා ගොසින් 'ගිහීන් කෙරෙහි ප්‍රසිද්ධ වූවා සේ ම ශාසනයෙහි ත්, ප්‍රසිද්ධ වන්ට දේ රහත් නියාවක් හඟවති' කී සේක. බුදුහු ත් 'උන් කියන්නේ ඇත්ත ම ය. තොපගේ කල්පනාව විරුද්ධ ය'යි ප්‍රසිද්ධ වන්ට දේ රහත්ං නියාවත් හඟවති, කීසේක. බුදුනුත් වදරාලා 'යම් කෙණෙක් පඤ්චොපක්ලෙශයෙන් විනිර්මුක්ත වූ සඳ පරිද්දෙන් අත්‍යන්ත පරිසුද්ධයෝ ද, සඳ තමන් සසල ගුණ ඇත් නමුත් රහත් වූවවුන් ට ලව මාත්‍ර වූ ත් ක්ලෙශ කාලුෂ්‍ය ය නැති බැවින් විශෙෂයෙන් ප්‍රසන්න වූ සිත් ඇත්තෝ ද, තමා කරා පැමිණි කෙණකුන් සසර මහ මුහුද ලාලන තෘෂ්ණං නැමැති මහ ගඟින් එතර වූ ද උන් මම උත්තම ය යි කියමි. චන්ද්‍රාභ යෝ ත් ඒ තරම් වූහ'යි වදාළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් රූප ශොභාව භව ක්‍ෂයට කාරණ නො වන හෙයින් භව ක්‍ෂයට කාරණ වූ ගුණ ශොභාව ම එවා ගන්ට උත්සාහ කට යුතු.

## 303. සීවලී මහ තෙරුන් වහන්සේ ගේ වත

තව ද තුනුරුවන් හි ගුණ මෙනෙහි කිරීමෙන් වන යහපත දක්වන්ට සීවලී මහ තෙරුන් වහන්සේ ගේ වත දක්වමු.

කෙ සේ ද යත්—

බුදුන්ගේ ම බන්ධු පක්‍ෂයෙහි වූ කෝලිය වංශයෙහි උපන් සුප්පවාසා නම් බිසවු සත් හවුරුදු සත් මස් සත් දවසක් දරු ගබ කුසින් උසුලා සත් දවසක් මූළල්ලෙහි විළි ලන්නාහු ප්‍රශව වෙදනාව බලවත් හෙයින් 'යම් බුදු කෙණකුන් වහන්සේ මෙ බඳු දුක් නසන්ට බණ වදරන සේක් වී නම් ඒ බුදුහු ත් සවුනෝ ගෙවා දන්නා සේක. ඒ ධර්‍ම ය ත් ස්වාඛ්‍යාතාදී ගුණෙන් යුක්ත ය. මෙ බඳු දුක් ම ගෙවන්ට පිළිපදනා වූ සඞසයා වහන් සේ ත් භව සම්පත් පතා පිළිපදනා පිළිපැදීමක් නො වන හෙයින් මනා ව පිළිපන් සේක.

'යමක් නිසා මෙ දුක් නසී නම් ඒ නිවනු ත් ඉතා සැප ය'යි මෙ තුන සිතමින් දුක් ඉවසන්නාහු සමණන් බුදුන් ලඟට යවා. උනු ත් සුප්පවාසා නම් බිසොවුන්ගේ වැඳීමෙන් බුදුන් වැඳි කල්හි බුදුහු ත් 'සුප්පවාසාවෝ නීරෝගී ව නිරෝගී පුතණු කෙණකුන් වද පියත් ව' යි වදාළ ඇසිල්ලෙහි තුමූ ත් නීරෝගී ව තමන් සේ ම නීරෝගී පුතණු කෙණකුන් වද පිහ. වද පියා බුදු පාමොක්

Non-Commercial Distribution

සඞ්ඝයා වහන්සේට ආරාධනා කොට ලා දුක් විඳපු සතියට සතියක් මුළුල්ලෙහි මහ දන් දුන්හ.

කුමාරයෝ ද උපන් දවස් පටන් ඩබරාව හැර ගෙණ ගොසින් පැන් පරහා දෙති. පසු ව නොබෝ කලකින් මහණ ව රහත් වූ සේක. වහන්දෑ ද ධම් සෙබෙයි රැස් ව හුන් සේක් බුදුන් ධම සබයට වඩනා තෙක් නිකම් හිඳිනා ගමනේ 'ඇවැත්නි, මෙ සේ රහත් වන්ට නිසි මහ පිණැත්තාණන් මවු කුස් මහ නරකයට පැමිණ සත් හවුරුදු සත් මස් සත් දවසක් විඳපු දුකක් බලාපුව මැනව. ඒ දුක් විඳ ත් සසර දුක් ගෙවා ගත්හ'යි කථාවක් ඉපැද වූ සේක.

බුදුහු ත් ඒ අසා ඒ මුල් කොට බණ වදරන සේක් 'යම් කෙණෙක් කෙලෙස් නැමැති මහ මඩ ත්, සසර නමැති මහ මුහුද ත් චතුරායසීසත්‍ය ය දැන ගත නො හෙන මොහ ය ත් ඉක්මවූ ද කෙලෙස් මහ වතුරට නො පැමිණ නිවන් පර තෙරට පැමිණියෝ ද ශමථ— විදර්ශනා දෙක යෙදී වෙසෙත් ද, කිසිවෙක ඇලුම් නැත්තෝ ද, බුද්ධාදි අට තැන්හි හෝ නො හොත් අතීතාදී වූ සොළොස් තැන්හි පවත්නා සංශ ය නැත්තෝ ද, එ සේ වූ වන් මම උතුමැ යි කියමි' වදාළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන සෝවාන් ඵලාදියට පැමිණියහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් කටුවෙන් ම කටුව හරනා සේ සසර විඳ ආ දුක් ම එක්වන් සලකා දුකින් මිදෙන්ට උත්සාහ කට යුතු.

තව ද යහපත් අදහස් ඇත්තවුන්ට වන හානි නැති නියාව හඟවන්ට සුන්දර සමුද්ද තෙරුන් වහන්සෙ ගේ වත දක්වමු.

කෙ සේ ද යත්—

සැවැත් නුවර සුන්දර සමුද්ද නම් කුල දරුවාණ කෙණෙක් ඇත. උඹ තුමූ සතළිස් කෙළක් පමණ වස්තු ඇති පොහොසත් කෙණකුන්ගේ පුතණුවෝ ය, උඹ තුමූ එක් දවසක් පස් වරු වෙලේ බණ අසනු නිසා දෙව්රමට යන්නා වූ බොහෝ දෙනා දැක 'කොයි යවු දැ'යි විචාරා 'බණ අසන්ට යම්හ' කී කල්හි 'මම ත් එමී' කියා ලා උන් හා කැටි ව ගොසින් බණ අසන්ට පිරිස් කෙළවර හුන්හ. බුදුහු ත් උන්ගේ අදහස දැන ලා ඇවිටි ගන්වනු නිසා පිළිවෙළ කථාව වදාළ සේක.

Non-Commercial Distribution

සුන්‍දර සමුද්‍දයෝ ද 'උන් වහන්සේ වදළ බණ රජ කුලෙහි නො ඉපැද සක්විති වන්ට බැරියා සේ ගිහි ගෙයි රඳා හිඳ පුරා ලිය නො හැක්ක. ඒ බණ ලෙස පවත්නා නිසා මහණ වෙමි' මහණ වීමෙහි තර අදහස් ඇති ව බණ අසා පිරිස ගිය කල්හි මහණ කරන්ට ආරාධනා කොට දෙමවු පියන් ගෙන් මහණ වීමට විධාන නො ලද්දවුන් බුදුවරහු මහණ නො කෙරෙති' යනු අසා ගෙට ගොසින් සුදින්න-රට්ඨපාලාදී කුල දරුවන් මෙන් බොහෝ යත්නයෙන් දෙමවු පියන් අනු දන්වා ගෙණ බුදුන් කෙරෙහි මහණ-මහලු පැවිදි ව 'නෑසියන් ඇති තැන රඳා හුන් කල මහණ ධම සිත සේ කට නො හැක්ක. දුරු බා යෙමි' සිතා ඒ යින් නික්ම එක් සිය අසූ ගවුවක් විවර ව තිබෙන රජගහා නුවරට ගොසින් සිහා වළඳා හිඳිනා සේක.

සැවැත් නුවර වසන ඔබගේ දෙ මවු පිය දෙ දෙන එක් උත්සව දවසෙක සැරහී පියා උන් වහන්සේගේ යාළු මිත්‍රයන් කෙළනවුන් දැක 'අනේ අපගේ පුතණුවන්ට මේ හැම නැත්තේ වේ දැ'යි මුසුප්පු ව හඬති. ඒ වේලාට එක් වෙශ්‍යා දුවක් එ ගෙට ගොසින් සුන්‍දර සමුද්‍ද තෙරුන් වහන්සේගේ ලමන්දුන් හඬන් නවුන් දැක 'හඬන්නේ හැයි දැ'යි විචාළී ය. පුතණුවන් වහන්සේ සලකුණු කොට පියා හඬන නියා ව කී කල්හි 'දැන් උන්දැ කොයි දැ'යි විචාරා 'මහණ වූ සේකැ'යි කී කල්හි මෙ සේ නො දැක හඬන ගමනේ දැක දැක හිඳිනට සිවුරු හරවා පී කල නපුරු දැ'යි කිව. 'එ සේ යහපත. උන් වහන්සේ සිවුරු හරිනට මැළි ව. ඒ ලෙසට අප පැරැත්ත ගනිති දෝ හෝ දුරු බා එක්සිය අසූ ගවුවක් විවර වූ රජගහා නුවරට ගිය සේකැ'යි කිවු ය.

'ඉදින් යම් උපදෙසකින් සිවුරු හරවා පී නම් මට කරණ සංග්‍රහ කිම්දැ'යි වෙශ්‍යා දුව කිවු ය. 'එ සේ කළා නම් තොප ම උන්දැට පාවා දී ලා මේ අපගේ සම්පතට හිමි කොට ලමහ'යි කිවු ය. 'එ සේ වී නම් මාගෝපකරණ ත් දනොපකරණ ත් දුන මැනැවැ'යි කියා ලා ඒ හැම ඉල්වා හැර ගෙණ මහ පිරිවරින් රජ ගහා නුවරට ගොසින් උන් වහන්සේ සිහා වඩනා වීථිය දෙතුන් දවසක් විවරින් නියම දැන ගෙණ ඒ වීථියේ ම නවාතැන් ගෙණ උදසන ම මධුරාහාරයක් සපයා ලා තෙරුන් වහන්සේ සිහා වැඩි වේලෙහි පිළිගන්වා ලා මෙ ම ලෙසින් කීප දවසක් විවර ගිය කලට 'ස්වාමීනි, පාත්‍රයට එක විට කට යුතු කළ කළට වළඳන්ට අවාසු ය. මේ ගෙයි දී ම වළඳන්නේ

Non-Commercial Distribution

යහපතැ'යි කියා ලා පාත්‍ර ය ඉල්වූ ය. ඔබ ත් උන්ගේ අදහස දත නො හී පාත්‍ර ය දුන් සේක.

එ දවස් පිළ වඩා හිඳුවා ලා වළඳවා ලා 'ස්වාමීනි, තුඹ සිඟා වඩිනට ආයාස ඇත්තේ වේ දැ'යි කියා ලා කීප දවසක් පිළදී ම වළඳවා ලා කෙළ ඇවිදිනා බාල දරුවන්ට කැවුම් පෙවුම් දී ලා නළවාලා 'තෙපි, දරුවෙනි, තෙරුන් වහන්සේ අවුත් වළඳන්ට මෙ පිළ හුන් වේලාට මා වැළකුව ත් ධූලි නංවව'යි උගන්වා ලූව. උයි ත් දෙ වන දවස් තෙරුන් වහන්සේ ගෙන් පිටත පිළ හිඳ වළඳවමින් හින්ද දී වෙශ්‍යා දුව බසින් කියා නැවතුව ත් ඇගේ අදහස් ලෙසට වළඳන තෙරුන් වහන්සේට අඵාසු කොට ධූලි නැංවූ ය. දෙ වන දවසේ වෙශ්‍යා දුව 'ස්වාමීනි, මෙ තැන දී වළ දන කලට මා කෙ සේ නැවතුව ත් තෙලෙ කනවැන්දුමු විටියළ කොල්ලෝ නො නැවත ධූලි නංවති. ඇතුළු ගෙයිදී ම වැඩ හිඳ වළඳන බව ය'යි කීප දවසක් ම ඇතුළු ගෙයි දී වැළඳ වූ ය. නැව ත ත් කුඩා කොල්ලන්ට කැවුම් පෙවුම් දී ලා නළවා ලා 'තෙපි මා වැළකුව ත් තෙරුන් වහන්සේ වළඳන කලට අරගල කරව' යි උගන්වා ලූ ය.

උයි ත් එ ලෙස ම කළහ. වෙශ්‍යා දූ දෙ වන දවස 'ස්වාමීනි, මෙ තැන කෝලාහල මහත. තෙලෙ නොවිටියළ කොල්ලෝ මා කෙ සේ කීව ත් නො නවතිති. අනුන්ගේ දරුවන් හෙයින් මරා නවතන්ට ත් බැරි ය. උඩු මාලට නැඟී ලා අරගල නො කරන්නෝ වේ ද, උඩු මාලේ දී වැළඳුව යහපතැ'යි කියා ලා තෙරුන් වහන් සේ ත් ගිවිසි කල්හි තෙරුන් වහන්සේ පෙරාතු කොට ලා තොමෝ පසු ව ගෙණ යට මාලේ අගුළු ලා ලා උඩු මාලට නැඟී ය. තෙරුන් වහන්සේ සපදන චාරික ධූතාඞ්ගයෙහි උත්කෘෂ්ට ය පූරණ සේකු ත් රස තෘෂ්ණායෙහි බැඳී ගොසින් ඇගේ බසින් වළඳන්ට උඩුමාලට නැඟි සේක. නැඟෙන සේකු ත් සත්මාල් පායේ උඩු මාලට නැඟි සේක. ඉකුත් ගෙන් ගෙණා දෙයක් හා නො සැප ත් ගෙන් ගෙණා දෙයක් නො පිළිගත් හෙයිනු ත් පත් දොර පා දුන් පමණක් විනා ගෙ පිළිවෙළ ඉක්මවා නො පී හෙයිනු ත් දූවහට කුමක් ද ? එ තෙකුදු වුව ත් මාගමක කියන කට යුතු හෙයින් ආද්‍යන්ත පරීක්ෂා කොට නො පියා රජස් නැගෙන හෙයින් එක් වන් පිළිගැන්ම ආයාස හෙයින් ඇතුළු ගෙයි හිඳ වළඳත ත් අර ගලයෙන් දුරුවන්ට උඩුමාලට වැඩියේ තමන් නො රහත් හෙයින් ඇගේ අදහස දත නො හී ය.

Non-Commercial Distribution

වෙශ්‍යා දූ ත් රස තෘෂ්ණාවෙන් බැඳී ගිය තෙරුන් වහන්සේ වඩා හිඳුවා ලා තමා මෙ තෙක් දෑ කළා ඔලොඹා ගන්නා නිසා මුත් සැදැයෙකින් නො වන හෙයින් මෙ තෙක් දවස් ඒ හැමයට අවසර ව හුන් වහන්සේ ම පමණක් වෙන් වන්ට නු වූ හෙයින් ඔබ ඔලොඹනු නිසා නුවණැත්තවුන්ට පෙරමාටු සේ තිබෙන ස්ත්‍රී විලාස ය දක්වන්නී ඔබගේ බසට උස් කොට තොමෝ බස් කියන්ට පටන් ගත.

කෙලෙස් රුජා පැහැර ලා හැඹරෙන්නාක් මෙන් හැඹරෙන්ට පටන් ගත. නැමෙන්ට පටන් ගත. නිය හස්සේ තුබූ කුණු හරනාක් මෙන් නිය යෙන් නිය ය කණ යි තමාගේ පය මත්තේ අනික් පය තබ යි. කොටුවෙන් කොටුව ගායි. තව ද දරුවන් වඩ යි. දරුවන් බාව යි. සිටුව යි උන් හා තොමෝ කෙළි යි. අනුන් කෙළනට විධාන කෙරෙ යි. දරුවන් තොමෝ සනා යි. උන් ලවා තමා සනව යි බලා හින්ද දී තොමෝ ත් කා යි. අනුන් ට ත් බත් ලා ලා කව යි. තමා සන්තක දෙයක් දෙයි. අනුන් ගෙන් ඉල්ව යි. කළ ලෙස කෙරෙ යි. බස් උස් කොට කිය යි. ඵලඩින් ගොඩ නැංගා සේ කුඩා කොට කිය යි. කාරණ ව ත් කොට කිය යි. සිහි ඇති ව කිය යි. නට යි. ගී කිය යි. බෙර ගස යි. මිරිස් සුන්නක් ඇසට පැවා සේ හඩ යි. බලා සිටිය දී සැරහෙ යි. මහත් කොට සිනා සෙ යි. මූණ බල යි. උකුළ සොල ව යි. ගුය්හ ස්ථාන ය සොලව යි. කළවේ පා යි. ඇඹර වස යි. උතුරු සළුව ඉවත් කොට තන බඩතුරු පා. යි අත ඔසවා කිසිළි පායි. ඇස් මරයි. බැමෙ උපුල්ව යි. පිටි තොල ලෝනි ය දිව දික් කෙරෙ යි. පිළි ලිල් කෙරෙ යි. පෙරළා තර කොට හඳි යි. හිසකේ උන යි. පෙරළා බඳි යි. මෙ සේ තව ත් ස්ත්‍රී විලාසයෙන් එ තැනට ලැබෙන දෙයකු ත් සම්පත් නිසා පානා විද්දත් කෙළි යක් මෙන් උන් වහන්සේ ඉදිරියේ සිට–

'අලත්තක කතා පාද – පාදුකාරුය්හ වෙසියා,
තුවම්පි දහරො මම – අහම්පි දහරා තව,
උභොපි පබ්බජිස්සාම – පව්ජාජිණ්ණා දණ්ඩපරායණා'

යනු හෙයින් 'මුඹ වහන්සේ හා මා හා ඔවුනොවුන්ට සග බාල ය. මා හා දූන් ගිහි ව සැප ත් විඳ පියා පසුව මාලු වූ කල දෙන්න ම මහණ වම්හ' යි කිව. තෙරුන් වහන්සේ ත් 'අනේ මා නො සලකා කළ දෙයකැ' යි බලවත් මුසුප්පු වූ සේක. ඒ වේලාට බුදුහු එක් සිය අසූ ගවුවක් විවරට තිබෙන දෙවරම වෙහෙර වැඩ හිඳ ම

Non-Commercial Distribution

සසරට විෂ ය නොවත ත් නුවණැසින් ඒ වෙශ්‍යා දුව කළ විකට රාසිය ත් තෙරුන් වහන්සේගෙන් වූ අමුත්තක් නැති නියාව ත් දැක කළ විකට ය සිනාවට ම නිසි හෙයින් පහළ කරණ සිනාවක් මෙන් සිනා පහළ කළ සේක. අනඳ මහ තෙරුන් වහන්සේ සිනා පහළ කිරීමට කාරණ විචාළ සේක. 'ආනන්‍දයෙනි, රජගහා නුවර දී සත් මාල් පායේ උඩුමාලේ දී සුන්‍දර සමුද්‍ද නම් භික්ෂු-වගේ හා වෙශ්‍යා දුවකගේ විවාදයෙක් පැවැත්තැ'යි වදාළ සේක.

'ජය කාට ද? පරාජය කාට දැ'යි, අනඳ මහ තෙරුන් වහන්සේ විචාළ කල්හි සුන්‍දර සමුද්‍ද තෙරුන් වහන්සේ දිනා ගිය නියාව ත් වෙශ්‍යා දුව මෙ ලොව පර ලොව දෙකින් ම පැරදි නියාව ත් වදාරා එ තැන වැඩ හිඳ ම රස් කඳක් විහිදුවා තමන් වහන්සේ ලං ව වැඩ හුන් ලෙසට හඟවා බණ වදාරන සේක් 'යම් කෙණෙක් රූප ශබ්දදී වූ පස් කම් ගුණෙහි ත් තද්විෂය වූ කෙලෙස් කම ත් ආදීනව සලකා ඒ දෙක ම හැර සසුන් වැද මහණ ව ශාසනානු කූල පිළිවෙත් ඇති ව වෙසෙ ත් ද, එ සේ වැස ත් අර්හත්ව ය සාධා ගත්තු නම් භවක්‍ෂය කළා වූ ඔවුන් උත්ත ම ය යි කියමි'යි වදාළ සේක. දේශනා කෙළවර තෙරුන් වහන්සේ රහත් ව මාර්ග ය හා සමඟ අභිඥ ත් ආ හෙයින් සෘද්ධි බලයෙන් අහසට නැඟී ලා කොට වදාළ සංග්‍රහයට බුදුන්ට ස්තුති කෙරෙමින් අවුත් බුදුන්ට වැදි සේක.

ධම් සෙබෙහි රැස් ව හුන් වහන්දෑ ද 'ඇවැත්නි, රසතෘෂ්ණා නිසා සුන්‍දර සමුද්‍ද තෙරහු ඇසිල්ලෙකින් නටුවෝ ය. බුදුන්ට පෙනුණු හෙයින් මුත්' ය යි කථාව ඉපැද වූ සේක. බුදුහු ත් ඒ අසා 'මහණෙනි, රස තෘෂ්ණාව නිසා නස්නා මොා හට පිහිට වූයේ දැන් මතු නො වන්නේ වේ ද, පෙර ත් මෙ ලෙසින් නස්නට සිටි යා වූ මොා හට පිහිට වීමි'යි වදාරා ඒ විතරකින් නො හැහෙන හෙයින්–

'න කිරත්‍ථි රසෙහි පාපියො – ආවාසෙහි ව සන්ථවෙහි වා,
වාතමිගං ගෙහ නිස්සිතං – වසමානෙසි රසෙහි සඤ්ජයො.

යනාදී මේ එකක නිපාතයෙහි වාතමිග ජාතක ය විස්තර කොට වදාරා එ කල රස තෘෂ්ණාව නිසා රජ ගෙය දක්වා ආ මුවා නම් මෙ සුන්දර සමුද්දයෝ ය. පැමිණි මරණ භයින් ගළවා ලූ ඇමැත්තාණෝ නම් මම ම ය'යි ජාතක ය නිම වූ සේක.

Non-Commercial Distribution

එ හෙයින් නුවණැත්තවුන් විසින් රස තෘෂ්ණාව නිසා කරණ ප්‍රාණවධාදි වූ පාපයෙක් ඇත් නම් ඉන් වැළක පින් කම හැසිර ඒ තෘෂ්ණාව සියලු ලෙසින් ම නසන්ට උත්සාහ කට යුතු.

## 305. ජටිල තෙරුන් වහන්සේ ගේ වත

තව ද පින් කම හැසිරෙන්ට මැළියවුන්ට උත්සාහ වඩනා නිසා ජටිල තෙරුන් වහන්සේ ගේ වත දක්වමු.

කෙ සේ ද යත්—

යට ගිය දවස බරණැස් නුවර කෙළෙඹියෝ දෙ බෑ කෙණෙක් මහත් කොට උක් සේනක් කැරවූහ. ඉක්බිත්තෙන් එක් දවසක් මලණුවෝ උක් සේනට ගොසින් උක් සේන බලා පියා බෑණන්ට උක් දණ්ඩක් හා තමන්ට උක් දණ්ඩක් හා කපා ගෙණ උක් පැන් පෙරී නොං වැගිරෙන ලෙසට කපාපි මූණ ත් පත් වසා බැඳ ලා අල්වා ගත්හ. එ කල උක් දඬු යත දී මැඩ මැතැවැ යි නැත. උක් දඬු කපා ලා අග හෝ මුල හෝ පාත් කොට එල්වා ගත් කල්හි ඩබරාවකින් වැගිරෙන පරිද්දෙන් උක් වසල්ල පමණක් තිබැ දී උක් පැන් තෙමේ ම පාත තුබූ වළඳට වැගිරෙයි. ඒ කෙළෙඹියාණන් උක් සේනෙන් උක් දඬු කපා ගෙණ එන වේලාට හිමවපියස ගඳ මහන් පවුවෙහි නන්‍දමූලක නම් ලෙන වසන පසේ බුදු කෙණකුන් වහන්සේ සතියක් මුළුල්ලෙහි නිරොධ සමාපත්තියට සම වැදී ලා එයින් නැඟී ‘අද කවුරුන්ට සඞ්ග්‍රහයක් කෙරෙම් දෝ හෝ’යි පරීක්‍ෂා කොට උක් දඬු දෙක ගෙණෙමින් සිටි තැනැත් තවුන් තමන් වහන්සේගේ නුවණ දැළ බැඳුණු නියාව ත් සංග්‍රහ කරන්ට සමර්‍ථ නියාව ත් දැන පාසිවුරු හැර ගෙණ අහසින් වැඩ උන්ට ඉදිරි ව ලා වැඩ සිටි සේක.

උයි ත් ඔබ දැක තෙල් ගා පහන් කළ පහනක් මෙන් පහන් සිත් ඇති ව උස් තැනෙක උතුරු සළුව අතුට ‘ස්වාමීනි, වැඩ හිඳිණේ යහපතැ’යි පසේ බුදුන් වහන්සේ වඩා හිඳුවා ලා පාත්‍ර ය නමාවා ඔබ ලවා ම වාවා ගෙණ උක් දණ්ඩේ වසා බැඳ ලූ පත උනා පියා පාත්‍ර ය මුදුනට කළහ. උක් පැනු ත් බැස පාත්‍ර ය පිරිණ. පසේ බුදුන් වහන්සේ උක් පැන් වළඳා පී කල්හි කෙළෙඹියාණෝ සමාධි ව උක් පැන් රස දන්නා සේම පින්කම ත් රස දැන ගෙණ ‘ඉදින් අපගේ බෑණන් වහන්සේ උක් දඬු පිළිගන්වා ලූ නියාවට මිල ගන්නා සේක් වී නම මිල දී පියමි. ඊ පින්කම මට ම වූවා වෙ යි. දී ලූ දෙයෙහි සිත පහදවා ගෙණ පින් හැර ගන්නා සේක් වී

Non-Commercial Distribution

නම් පින් දී පියමි. එ කල පින් කම දෙ පක්‍ෂයට වූවා වෙයි' සිතා ගෙණ 'ස්වාමීනි, තව ත් පාත්‍ර ය නමා වදළ යහපතැ'යි අනික් උක් දණ්ඩෙ ත් පත උනා පියා උක් පැනින් පාත්‍ර ය පුරා ලූහ. 'අපගේ බෑණන් වහන්සේ උක් සේනේ උක් දඬු ඇති බැවින් අනික් උක් දණ්ඩක් ගෙන්වා ගෙණ කන සේක. මේ උක් දණ්ඩ මා ගෙණා නියාව ත් දන් දුන් නියාව ත් නො දන්නා සේකැ'යි මේ විචර වක්වා සිතකු ත් අදහස ඉතා පවිත්‍ර බැවින් හට නො ගත්තේ ය.

පසේ බුදුන් වහන්සේ ද උක් පැන් පළමු වළඳා පී හෙයින් පසු ව ලත් උක් පැන් පාත්‍ර ය උක් පැන් නො ලත් සෙසු පසේ බුදුවරුන් වහන්සේට දෙනු කැමැති ව පැන් පාත්‍ර ය අල්වා ගෙණ වැඩ හුන් සේක. කෙළෙඹියාණෝ ද පිළිගත් ලෙසින් හා අල්වා ගෙණ වැඩ හිඳිනා ලෙසින් ම ඔබ්බකට පිළිගන්වන්ට සිතා වැඩ හිඳිනා නියාව දැන ගෙණ පසඟ පිහිටුවා වැඳ ලා 'ස්වාමීනි, මා පිළිගන්වා ලූ උක් පැනෙයි අනුසසින් දෙව් මිනිස් සැප ත් වළඳා කෙළවර මුඹ වහන්සේට සම්භ වූ නිවන් රස මට ත් සම්භ වේව'යි පතා ගත්හ. පසේ බුදුන් වහන්සේ ත් ඒ එ සේ ම වේව'යි වදරා තමන් වහන්සේ ගඳ මහන් පව්වට වඩනා තෙක් කෙළෙඹියාණන්ට පෙනෙන ලෙසට ඉටා ලා අහසින් ගඳ මහන් පවුවට ම වැඩ උක් පැන් පාත්‍ර ය පන් සියයක් පසේ බුදුන්ට බෙද දුන් සේක. කෙළෙඹියාණන්ට පින්කම මඳ නුවා සේ ම උක් පැනුත් මඳ නො වී ය.

කෙළෙඹියාණෝ ද ඒ පෙළහැර[1] දැක බලවත් ව සතුටු ව බෑණන් ලඟට ගොසින් 'කොයි ගියා දැ'යි විචාළ කල්හි උක් සේන බලන්ට ගිය නියාව කිවුය. 'නො ගිය කල කුම වුව ත් උක් සේනට ගිය කල උක් දඬු එකක් දෙකක් ගෙනව මනා නො වේ දැ'යි කී කල්හි ''එ සේ ය, උක් සේනට ගිය ගමනේ මුඹ වහන්සේට උක් දණ්ඩක් හා මට උක් දණ්ඩක් හා ගෙණාමි. අතුරු මඟදී එක් පසේ බුදු කෙණකුන් වහන්සේ දැක මට ගෙණා උක් දණ්ඩෙ පැන් ඔබට ම පිළිගන්වා පියා 'සැදැ සිත් නැති ව මිල ගන්නා සේක් වී නම් මිල දී පියා පින්කම මට ම කොට ගනිමි. දුන් දෙයෙහි සිත පහදවා පින් ඉල්ලූ සේක් වී නම් පින් දී පියමි. එ සේ කල ඒ පින්කම මුඹ වහන්සේට ත් මට ත් වන්නේ ය'යි මුඹ වහන්සේට ගෙණා උක් දණ්ඩෙ පැනු ත් ඔබට ම පිළිගන්වා පිමි කුමක් ද? ඊට මිල හැර ගන්නේ ඇත් ද? නො හොත් පින් හැර ගන්නේ ඇත් දැ'යි විචාළහ. 'වන්නාට උක් පැන් දෙවිටක් කොට දුන්නා-වාද පසේ බුදුහු ඊට කුමක් කළ සේක් දැ'යි විචාළෝ ය.

---

1. පෙරහර

Non-Commercial Distribution

මාගේ උක් දණ්ඩේ පැන් තමන් වහන්සේ වළඳා ලා මුඹ වහන්සේට ගෙණෙන උක් දණ්ඩේ පැන් පිළි ගෙණ ආසින් ගඳ මහන් පවුවට වැඩ පන් සියයක් පසේ බුදුන් වහන්සේට බෙද පිළිගැන්නූ සේක. ඒ පින්කම මුඹ වහන්සේට ත් මට ත් නො මඳ ව බෙදුණා සේම උක් පැන් පාත්‍ර ය ත් පන් සියයක් පසේ බුදුන්ට නො මඳ ව බෙදුණැ' යි කිවූ ය. වැඩි මාලු කෙළෙඹියාණෝ ද ඒ කිය ත් කිය ත් ප්‍රීතින් පිනා ගොසින් 'මට භව සම්පත්තීන් කම් නැත. නිවන් දකිම්ව' යි නිවන් පතා ගත්හ. මලණුවෝ දෙව් සැප ත් හා මිනිස් සැප ත් හා නිවන් සැප ත් හා තුන පැතූහ. බෑණෝ නිවන් සැප පැතීමෙන් ම භව සැපතු ත් එන හෙයින් නිවන් සැපත් ම පැතූහ. මේ උන්ගේ ඒ අවධියේ කළ පින් කම. ඔහු ආයු පමණින් සිට එයින් සැව දෙව් ලොව ඉපැද එක් බුද්ධාන්තරයක් මුළුල්ලෙහි දෙව්ලොව ම දවස් යවූහ.

උන් දෙව් ලොව වසන කල ම විපස්සී නම් බුදුහු ලොව උපන් සේක. ඒ දෙ බෑයෝ ත් දෙව් ලොවින් සැව බන්ධුමතී නුවර එක් කුල ගෙයක වැඩි මාලු තැනැත්තෝ වැඩි මාලු ව ත් බාල තැනැත්තෝ බාල ව ත් දෙ බෑ ව ම උපන්හ. ඉන් වැඩි මාලු තැනැත්තන්ට සේන ය' යි නම් තුබූහ. බාල තැනැත්තන්ට අපරාජිත ය' යි නම් තුබූහ. උන් දෙන්නා වැඩි විය පැමිණි කල්හි තුනුරුවන් ලොව පහළ වූ සේක. 'දන් දෙව, පින් කරව, අද අට වක් පොහොය ය, අද තුදුස් වක් පොහො ය, අද පසළොස් වක් පොහොය ය. පෙහෙ වව, බණ අසව, යනාදීන් පින් කම යොද ඇවිදිති. එ සේ කියා ඇවිදිනවුන්ගේ විධාන ත් අසා බොහෝ දෙන පෙරවරු දවස් දන් දී ලා පස් වරු වෙලාට බණ අසන්ට යන්නවුනු ත් දැක මහා සේන නම් කෙළෙඹියාණෝ ද 'කොයි යවු දැ' යි විචාළහ. බුදුන් කරා බණ අසන්ට යමහ' යි කී කල්හි 'මම ත් එමි' යි කියා ලා උන් හා සමග ම ගොසින් බණ අසනු නිසා පිරිස් කෙළවර හුන්හ. බුදුහු ත් උන්ගේ අදහස් දැන පිළිවෙළ කථාව වදළ සේක. ඔහු ත් බුදුන්ගේ බණ අසා මහණ වීමෙහි රුචි ඇති ව මහණ කරන්ට බුදුන්ට ආරාධනා කළහ.

බුදුහු ත් 'අනු දත මනා නෑයෝ ඇද්දැ' යි විචාරා 'ඇතැ' යි කී කල්හි එ සේ වී නම් උන්ට කියා ලා එව' යි වදළ සේක. උයි ත් මලණුවන් ලඟට ගොසින් 'අප සන්තක සියල්ලෙක් ඇත් නම් මෙ තෙක් කල් දෙන්නා සන්තක ව තුබූ ව. ත් මෙ වක් පටන් තොපි ප්‍රයොජන විඳුව, තොපට ම ය' යි කීහ. මුඹ වහන්සේ

1. සවස්වරු — සවස් පස්වර

නෑ' යි විචාළ කල්හි 'මම බුදුන් ලඟ මහණ වෙමි' යි කී ය. 'ස්වාමීනි, කුමක් කියන නියා ද? දෙ මවු පිය දෙ දෙනා නැත ත් බැණන් වහන්සේ හෙයින් දෙ මවු පිය තරමෙ සිටි සේක. අපගේ සම්පත් සුළුහෙක් නො වෙයි. මට මතු බොහෝව. ගිහි ගෙයි රඳා ත් පින් කට හැක්ක. මා තනි[1] කොට ලා මහණ නුව මැනැවැ' යි කිවු ය. 'මලණ්ඩ, බුදුන් ගෙන් බණ ඇසීමි. ඒ බණ ගිහි ගෙයි රඳා පුරා ලිය නො හැක්ක. මම මහණ වෙම්මැ' යි කියා ලා සම්පත මලණුවන්ට නිල කොට ලා බුදුන් ලඟ මහණ ව මාලු පැවිද්ද ත් ලදින් නො බොහෝ කලකින් ම පැතුවා නිවන් සම්පත් ම හෙයින් රහත් වූ සේක.

මලණුවෝ ද 'මහණවූ පූජාව කෙරෙමි' යි සතියක් මුළුල්ලෙහි බුදු සඟනට මහ දන් දී ලා සති ය කෙළවර බෑණන් වහන්සේ වැඳ ලා 'ස්වාමීනි, මුඹ වහන්සේ සසර දුකින් මිදී රහත් වූ සේක. මම පස් කම් ගුණෙහි ඇලී වසන හෙයින් ඇවිත් මහණ විය ත් නො හෙමි. ගිහි ගේ නම ධ්‍යාන භාවනාවට ස්ථාන නො ව ත් ගිහි ව කළ මනා පින් කම් මට වදාළ යහපතැ' යි කිවු ය. ඒ අසා තෙරුන් වහන්සේ 'නුවණැත්තාණෙනි, බුදුන් වසන ලෙසට ගඳකිළියක් කරව'යි වදාළ සේක.

උයි ත් යහපතැ යි ගිවිස දැව පෝරු ආදී වූ නො එක් දඬු පත් ගෙන්වා ගෙණ වඩුවන් ලවා සස්වා පියා එක් වැඹෙක රන් බඳවා ය, එක් වැඹෙක මැණික් ඔබ්බවා ය යි මේ නියායෙන් දැව ආදී වූ දඬු පත් මුළුල්ලෙහි ම රුවන් කර්මාන්ත කරවා ඉන් ගඳ කිළි ය කරවා ලා සත් රුවන් ඔබ්බවා කැරැවූ උළින් සොයවා ලූහ.

ගඳ කිළි ය කරවන කල්හි අපරාජිත නම් වූ බෑනණු කෙණෙක් ඒ කරවන පින්කම තමතු ත් මුසු කරන්ට කිවු ය. 'නෑ කම නෑ කම් ම ය. මේ නියා පින්කම් තනි ව කරත් මුත් අනික් කෙණකුන් මුසු නො කරමි'යි කිවු ය. උයි ත් මුසු වන්ට උත්සාහ කොට වෙහෙසී පියා මුසු ව ගත නො හී ගඳ කිළියට ඉදිරියෙහි කුඤ්ජර ශාලා නම් වූ වැඩ හිඳ බණ වදරන ලෙසට මණ්ඩපයෙක් වී නම යහපතැ යි සත් රුවනින් විසිතුරු කොට කුඤ්ජර ශාලා නම වූ සුධර්ම දෙව් සබයට අපහාස කරන්නාක් වැනි වූ මණ්ඩපයක් කරවා ලූහ. ඌ අපගේ බුදුන් සමයෙහි මෙණ්ඩක නම් වූ සිටු වූහ.

---

1 තන්

Non-Commercial Distribution

ගඳ කිළියෙහි ත් සත් රුවන් මුවා වූ කවුළු දෙර තුනකු ත් කැරැවූහ. ඊට ඉදිරි කොට ලා මඩ ඇති නො වන නිසා යටින් සුණුවම් කරවා ලා පොකුණු තුනකු ත් ඉදි කරවා සිවු දෑ සුවඳ පැන් පුරවා ලා අපරාජිත නම් වූ සිටු පුත්හු පස් වනක් පියුම් ගස් ඇති කැරැවූහ. කුමක් නිසා ද යත්—බුදුන් ඇතුළු ගඳ-කිළියේ වැඩ හුන් වේලාට සුළං හමා ලා රේණු සලා ගොසින් ඇඟ වැද ගන්නා නිසා ය. ගඳ කිළියේ කොත් කැරැල්ලේ බිබුළ රත්රන් ම ය ය. කැරැල්ල පබළු ම ය ය. කොත් කැරැල්ලට පාත සොයා ලූ උළු ඉඳුනිල්මුවා ය. මෙ සේ ඒ ගඳ කිළි ය පිල් සත් විදහා ගෙණ නටන මොනරකු මෙන් ඉතා හොබ්බී. සත් රුවනින් මහත් ව තිබෙන දෙයක් පොඩි කරවා පියා සීන් ව තිබෙන දෙය එ ලෙසින් ම හැර ගෙණ ගඳ කිළි ය වට මළුව හැර ලා බඳවා ලූ පවුරු වළල්ල හස්සේ පය ඔබා ලූ කලට දන දක්වා එරී යන තරමෙ සත් රුවන් පුරවා ලූහ.

මෙ සේ ගඳ කිළි ය කරවා නිමවා ලා අපරාජිත නම්සිටු පුත්හු බැණන් වහන්සේ ළඟට ගොසින් 'ස්වාමීනි, ගඳ කිළි ය කරවා නිමවා ලීමි. ප්‍රයෝජන වුනා[1] කල වේ ද මට පින් පිරෙන්නේ ය. ඒ ලෙසක් වුව යහපතැ'යි කිවු ය. තෙරුන් වහන්සේ ද බුදුන් කරා ගොසින් 'ස්වාමීනි, මේ අපගේ මල් සිටු පුත්හු ගඳ කිළි ය කරවා නිමවා ලා මුඹ වහන්සේ ප්‍රයෝජන විඳිනා කැමැති ව කියති' වදළ සේක. බුදුහු ත් හුනස්නෙන් නැඟී ගඳ කිළි පිරිවෙණ කරා වැඩමවා ලා ලූ සත් රුවන් බලා ඇතුළු මළුවේ පය නො තබා දෙරටුවේ ම වැඩ සිටි සේක. වැඩි සිටි නියාව බලා බුදුන් ගේ අදහස දත නො හී වඩනට ආරාධනා කළහ.

බුදුහු නො වැඩ සිටි සේක් ම ය. තුන් විටක් දක්වා වඩනට ආරාධනා කළ කලට බුදුහු උන්ගේ බැණ තෙරුන් වහන්සේගේ මූණ බැලූ සේක. බලා වදළ ලෙසින් ම ඔබ අදහස දැන ගෙණ මල් සිටාණන් බණවා ලා 'තෙල සත් රුවනේ රකවල් තොප පිළිබඳ කොට ගෙණ සුව සේ වැඩ වදරන්ට ආරාධනා කරව'යි වදළ සේක. උයි ත් ඔබ ගේ බස් අසා බුදුන්ට පසඟ පිහිටුවා වැඳ ලා ස්වාමීනි, යම් සේ මිනිස්සු රුප්පයක වැද හෙව ලා ඊට ආලයක් නැති ව පලා යෙත් ද, හොරු-අඟුළු ආදියට නැඟී ලා ගඟින්-හොයින් එ තෙර වූවාහු යම් සේ ඊ ආලයක් නැති ව පලා යෙත් ද, එ පරිද්දෙන් මුඹ වහන්සේ ත් තිලින් කුමක ත් ඇලුම් නො කොට විසූ ව මැනවැ'යි කිවු ය.

---

1 උන්



Non-Commercial Distribution

බුදුන් ගේ පත්ල නම් සෙස්සක් නො මිරිකා රුවන් ම මිරි කන්ට නිසි වුව ගඳ කිළියට රුවන් ම මිරිකා ගෙණ නො වැඩ සිටියේ හැයි ද යත්—'සර්වඥවරයන් හුන් තැනට නම් බොහෝ දෙන පෙර වරු ත් පස් වරු ත් එති. ආ ආවුන් නිරායාස ව තුබූ රුවන් උකා ගෙණ යන කලට වලකා ලන්ට අපට බැරි ය. පිරි—වෙණ මෙ තෙක් රුවන් ලවා ලූවා තමන් වහන්සේ ගේ උපාසක වරුන් ගෙණ යන නියාව බල බලා ත් නවතා නුපු සේකැ'යි සිටු පුත් මා කෙරෙර් මුසුප්පු ඇති ව ඇතුළ යාන් තිබැ දී[1] දඬු මැසිවල වැද හෙව දුක් විඳිනා සේ, මාළිගා තිබැදී රුප්පාවල වැද හෝනා සේ මී නියා පින් කමක් කොට ත් බොහෝ නිරා දුක් විඳී. උඹ එයින් නවතා ලුව මැනැවැ'යි මෙ තෙක් කාරණ සලකා වැඩ සිටි සේක. උන් 'රකවල් මට ම භාර ය. වඩනා යහපතැ'යි ආරාධනා කළ කල්හි වැඩි සේක.

සිටු පුත්‍රයාණෝ දසත් රුවනට රකවල් ලවා ලා රකවල සිටිය වුන්ට 'මලු පෙට්ටිවල ලා ගෙණ චේව යි හිණ ලා ගෙණ වේව යි යන කෙණෙක් ඇත් නම් ගෙණ යා නො දෙව. අතින් මිටින් පමණක් ගෙණ යන්නවුන් නො නවතව'යි විධාන කළහ. ඇතුළු නුවර ඇත්තවුන්ට ත් 'ගඳ කිළි පිරිවෙණ දන පමණ සත් රුවන් ලවා ලීමි. බුදුන් ලඟට ගොසින් බණ අසා පියා යන දුක් පතුන් දැත ගන්නා පමණක් උකා ගෙණ යන බව ය. පෝසතුන් දැතින් ගෙණ යන්ට බැරි ය. එක් අතකින් එක විට හැර ගත් දෙය මුත් වඩා නො ගෙණ ගිය මැනැවැ'යි විධාන කළහ.

මෙම ලෙස විධාන කෙළේ හැයි ද යත්—සැදැ ඇති කෙණෙක් සැදැයෙන් බණ අසා සසර දුක් ගෙවති. සැදැ නැත්තෝ වස්තු ලොභයෙන් වුව ත් පණ අසා සසර දුකින් මිදෙති. සත්වොපකාර ය ඇත මනා වේ දැ'යි මෙ ලෙස විධාන කළහ. බොහෝ දෙන ත් උන් ගේ විධාන ලෙසට රුවන් හැර ගන්ට වන්හ. එක් වරෙක ලවා ලූ රුවන් නිමි කලට නිමි නිමි සේ තුන් වාරයක් දක්වා දණ පමණ රුවන් ලැවූහ. බුදුන් පා මුල තියඹරාවක් සා අනැඟි මැණිකක් තබ්බවා ලූහ. ඒ කුමක් නිසා තැබ්බූ ද යත්—බුදුන් ඇඟින් නික්මෙන රසු ත් මැණිකෙන් නික්මෙන රසු ත් එක් වූ කලට වයිතියක් බිත කළ සිත්තමක් සේ බලා ඇස් ඇද්ද නො හැක්කේ වේ දැ'යි සිතා ය. බොහෝ දෙන ත් විඳ විඳ බලති.

---

1 තිබියදී

Non-Commercial Distribution

ඉක්බිත්තෙන් එක් දවසක් මිථ්‍යාදෘෂ්ටික වූ බමුණෙක් බුදුන් පා මුල තුබූ අනගි මැණික හැර ගනිම් යි වෙහෙරට ගොසින් බුදුන් වඳනට යන්නවුන් ලා කැටි ව තෙමේ ත් ලං වි ය. සිටාණෝ ද එන සැටියෙන් ම මැණික හැර ගන්නා කැමැති ව එන නියා ව සලකා ලා මැණික හැර නො ගත්තු නම් යහපතැ'යි සිතූහ. එයි ත් බුදුන්ට වඳනා එකක්හු මෙන් මහෞෂධ පණ්ඩිත අවස්ථාවෙහි පා මුල තුබූ මැණික හැර ගත් අභ්‍යාසයට කෙවට්ව යන් කළ දෙයක් මෙන් අත පොවා ලා මැණික හැර ගෙණ හිණ තබා ගෙණ පලා ගියහ. ඒ සිටාණෝ එ තෙක් රුවන් උකා යන නවුන් කෙරෙහි මුසුප්පුවක් නුවූව ත් ඒ මැණික ගත් බමුණා කෙරෙහි සිත පහදවා ගත නුහුණුවූ ය.

බණ වදරා කෙළවර බුදුන් ලඟට ගොසින් 'ස්වාමීනි, ගඳකිළිය වට කොට තුන් වාරයක් කොට දන පමණ සත් රුවන් ලවා ලූවා උකා ගනිත ත් මුසුප්පුවක් නො වෙමි. හැර ගත් හැර ගත් සේ ම සතුටු වීමි. මේ එක මැණික හැරගත් එක බමුණා කෙරෙහි සිත පහදවා ගත නුහුණුයෙමි'යි කිවු ය. බුදුහු උන්ගේ බස් අසා 'හැයි සිටාණෙනි, තමා සන්තක දෙය අනුන් නො කැමති කරවා හැර ගත නො හැකි ලෙසට කට නො හැකි දැ'යි වදළ සේක. උයි ත් බුදුන් වදළ උපදෙස දැන ගෙණ බුදුන් වැඳ ලා 'ස්වාමීනි, මෙ වක් පටන් මා සතු දහු වැලයක් පමණක් මා නො කැමැති කරවා රජ දරු කෙණෙක් වත් සොර කෙණෙක් වත් හැර ගත නො හෙත්ව යි. මා සන්තක දෙය ගින්නෙනු ත් නො දව යි, දියෙනු ත් නො නසීව'යි පතා ගත්හ. බුදුහු ත් 'ඒ එ සේ ම වේව'යි වදළ සේක. සිටාණෝ ද ගඳ කිළි ය නිමි පූජාව කර වන්නෝ එක් ලක්‍ෂ අට සැට දහසක් වහන්දෑ වෙහෙර ම වඩා හිඳුවා නව මසක් මුළුල්ලෙහි මහ දන් දී කෙළවර හැම තැනට ම සිවුරු පිළී දුන්හ. බාල නමට පැමිණි සිවුරු පිළී මසු දහසක් අග්ගී.

ඒ සිටාණෝ ද දිවි පමණින් පින් කම කොට එයින් සැව දෙව් ලොව ඉපැද විපස්සී බුදුන් සමයේ පටන් අප ගේ බුදුන් දක්වා එකානූ කප මුළුල්ලෙහි දෙව් මිනිස් සැපත් වළඳා මේ අප ගේ බුදුන් සමයෙහි නිවන් සම්පත් විඳුනා නිසා රජගහා නුවර එක් සිටු කුලයෙක පිළිසිඳ ගෙණ නව මස් දෙ පෝයක් මවු කුස විසූහ. මවු කුසින් බිහි වූ දවස් නුවර මුළුල්ලෙහි ආයුධ දිලිහී ගියේ ය. සියල්ලවුන් පළන් ආභරණ ත් බබළා ගියේ ය. සියලු නුවර එකාලොක වි ය. සිටාණෝ ද උදසන රජ්ජුරුවන් දක්නට ගියහ.

බිම්සර මහ රජ්ජුරුවෝ ද ආයුධ දිළියෙන්ට ත් ආභරණ බබළන්ට ත් කාරණ සිවාණන් අතින් විචාළහ. 'ඊට කාරණ නම් සවාමීනි, අප ගේ ගෙයි මුඹ වහන්සේගේ මිඩි පුතකු වදපිව. ඌගේ කුශලානුභාවයෙන් තෙලෙ බන්දෙක් වී ය'යි කිවු ය. අංගුලිමාල යන්දැ ත් උපන් දවස් එ සේ ම වූ හෙයින් සොර වන් නියා දැ'යි විචාළහ. රජ්ජුරුවන් වහන්ස, එ සේ වූ දෙයෙක් නැත. මහ පිණැත්තෝ ය. ඒ නිසා වී ය'යි කිවු ය. 'එ සේ වී නම් යහපත් කොට වඩව යි. කිරි මිල වුවමනා වේ දැ'යි දවස් පතා මසු දහ සක් දෙවති. උන්ට නම් තබන දවස් නුවර මුළුල්ල බබළා ගිය හෙයින් ජෝතිය යන නම් තුබූහ.

උන් වැඩිවිය පැමිණි කල්හි හිඳිනා ගෙවල් කරවන්ට බිම් බලන ඉදි කරණ කල්හි සක් දෙවිඳුහු ගේ හස්න හුණු වි ය. සක් දෙවිඳු ද හස්න හුණු වීමට කාරණ විමසන්නෝ ජෝතිය කුමාර යන්ට ගෙබිම් ඉදි කෙරෙති. විදර්ශී බුදුන්ට උන් කරවා දී ලූ ගඳ කිළි ය මිනිසුන් කළ ගෙවල වැඩ හිඳිනා තරමට නො වේ යි. මා ත් ඔබ ගිය මැනවැ'යි වඩු වෙසක් මවාගෙණ එ තැනට ගොසින් එ තැන කර්මාන්ත කරන්නවුන්ට නො දන්නා බඳු ව ලා කුමක් කරවු දැ'යි කිවු ය. 'ජෝතිය කුමාරයන්ට ගෙබිමක් කරම හ'යි කී කල්හි 'තෙපි හැම ඉවත් වව. තොප කළ ගෙවල හිඳුනෝ නො වෙති'යි කියා ලා බිජුවට සඩ්ඛ්‍යාවෙන් තුන් යාළ සතරමුණක් වප්යන බිම් පියස බලා ලූහ. ඒ බිම් පියස ත් ඇසිල්ලෙහි කිසුණු මඩුල්ලක් මෙන් සමතල වී ය. නැවත 'මේ පමණ තැන මහ පොළව පළාගෙණ සත් රුවන් මුවා සත් මාල් පායෙක් නැගේ ව'යි සිතා ලා බැලූ ය.

ශක්‍රයන් ගේ ශක්‍රානුභාවයට වත්තමක් ව[1] ජෝතිය කුමාරයන්ගේ කුශලානුභාවයෙන් ශක්‍රයන් සිතූ තරම් මාළිගාව පැන නැංග. නැවත 'මේ මාළිගාව මධ්‍ය කොට හාත් පසින් සත් රුවන් මුවා පවුරු වළලු සතෙක් නැගේව'යි සිතා ලා බැලූහ. සත් රුවන් මුවා එ සේ වූ පවුරු වළලු සතෙක් නැංග. 'පවුරු සත ගාවා කප් රුක් නැගේව'යි සිතා ලා බැලූ කලට කප් රුකු ත් නැංග. 'මාළිගාවට සතර කොන නිධාන සැළ සතරක් නැගේව යි සිතා ලා බැලූ කලට විපස්සී බුදුන් සමයෙහි ගඳ කිළි ය වට කොට තුන් වාරයක් විතර ලවා ලූ සත් රුවන් උකා ගත්තවුන්ගෙන් හැර ගෙණ පුරා තබා ලූවක් මෙන් නිධාන සැළ සතරෙක් නැංගේ ය. ඊ එක් සැලෙක උස ගවුවක් විතර ය. එ කෙක උස දෙ ගවුවක් විතර ය. එකෙක උස තුන් ගවුවක් විතර ය. එකෙක උස

1 වත්තමත් ව

Non-Commercial Distribution

සතර ගවුවක් විතර ය. මුව විට පළල කීයේ නැත. බොධිසත්‍ව යන්ට නැංගා වූ නිධාන සැළවල මුව විට් පළලය. උස කලී නව ලක්‍ෂ සැට දහසක් ගවු පමණය. සැළ සතර ම මැද කැපූ තල් පැනෙයි ඇසි[1] පිරී සිටිනා සේ සත් රුවන් පිරී තිබෙයි. මාළිගා වට සතර කොන පසේ බුදුන් වහන්සේට දී ලූ උක් පැනෙයි අනුබාය විපාක හඟවමින් හිමාල ය වනයෙහි උක් දඬු තරමට ත් මහත් ව නාඹ තල් කඳ සා ව පොළෝ පල්ලෙහි ඇති රස ඕජාවක් ඇත් නම් උක් දඬු ලෙසින් නැඟී ලෙසට ඝන රන්මුවා උක් දඬු සත රෙක් නැංග. උක් කොළ ඉඳුනිල් මිනිමුවා ය. පුරුක් රිදී මුවා ය. දෙරටු සතේ ප්‍රධාන යක්‍ෂයෝ සත් දෙනෙක් රකවල් ගත්හ.

පළමු වන දෙරටුයෙහි යමචොලි නම් යක්‍ෂයා තමා ගේ පිරි වර යක්‍ෂයන් දහස හා සමග රකවල් ගත. දෙ වන දෙරටුවෙහි ඉපුල නම් යක්‍ෂයා තමා ගේ පිරිවර යකුන් දෙ දහසක් හැර ගෙණ රකවල් ගත. තුන් වන දෙරටුවෙහි වජිර නම් යක්‍ෂයා තමා ගේ පිරිවර යකුන් තුන් දහසක් ගෙණ රකවල් ගත. සතර වන දෙරටුවෙහි වජිරබාහු නම් යක්‍ෂයා තමා ගේ පිරිවර යකුන් සාර දහසක් හැර ගෙණ රකවල් ගත. පස් වන දෙරටුවෙහි සකට නම් යක්‍ෂයා තමා ගේ පිරිවර යකුන් පන් දහසක් හැර ගෙණ රකවල් ගත. ස වන දෙරටුයෙහි කටච්ඡ නම් යක්‍ෂයා තමන් ගේ පිරිවර ස දසක් යකුන් හැර ගෙණ රකවල් ගත. සත් වන දෙරටුවෙහි දිසාමුඛ නම් යක්‍ෂයා තමා ගේ පිරිවර සත් දහසක් යකුන් හැර ගෙණ රකවල් ගත. මෙ සේ මාළිගාව ඇතුළ ත් පිට ත් රකවල් ගත් යකුන් බලවත් වී ය. 'ජොතිය කුමාරයන්ට සත් රුවන් මුවා සත් මාල් මාළිගාවෙක් පොළොව පළා ගෙණ පැන නැඟී හෙයින් මුත් විජයත් පාය අවුත් තුබුවා සේ පහළ වි ය. සත් රුවන්මුවා පවුරු සතක් හා දෙරටු සතකු ත් පහළ වි ය. 'නිධාන සැළ සතරකු ත් නැංගේ ල' යනු අසා බිම්සර මහ රජහු සිටු සෙසත් යවූහ. එ වක් පටන් ජෝතිය සිටාණෝ ය'යි ප්‍රසිද්ධ වූහ.

උන් හා එක් ව පින් කළ උපාසිකාවෝ ද උතුරුකුරු දිව යිත උපන්හ. දෙවියෝ උන් කැඳවා ගෙණ අවුත් සිටාණන් සැතපෙන ශ්‍රී යහන් ගබඩාවෙ ලූහ. උයි ත් එන ගමනේ උතුරු කුරු දිවයිනෙන් සාල් නැළියක් හා මැණික් ගල් තුනක් ගෙනා වූ ය. උන් දිවි පමණකට කෙ තෙක් දෙනා වුව ත් ඒ සාල් නැළිය ම ඇත. ඉදින් ගැල් දහස් ගණනේ ත් සාල් පුරවනු කැමැත්තෝ වූ නම් ඒ ගැල් මුළුල්ල පුරා ලා සාල් නැළි ය සාල්

1. ඇසිරි

Non-Commercial Distribution

නැළි ය තරමේ ම සිටවී, බත් පිසන වේලේ දී සාල් නැළි ය සැළියේ ලා ලා මැණික් තුන ළිප් කැට තුනක් සේ තබා ලා සැළිය ඊ පිට තබා පිසති. මැණික් ගල් එ වෙලේ ම ගිනි ඇවිළ ලා බත් පැසී ගන්නා මැණික් ගල් නිවී යෙයි. ඒ සලකුණෙන් බත් පැසුණු නියාව දනිති. මාළු ආදි ය පිසන කල ත් එ ම ලෙස ය. මෙ ලෙසින් උන්ට දර ගිනි නැති ව මැණික් ගලින් ම බත් මාළු ආදි ය පිසෙයි[1]. මැණික්වල ආලෝකයෙන් ම හිඳිති. ගින්නෙක ව ත් පානෙක ව ත් පැය පමණකු ත් නු දුටු විරූ ය.

ජෝතිය සිටාණන් ගේ සම්පත් මෙ බඳු ය'යි ඒ තරම සම්පත් මිනිස් ලොව නැති හෙයින් දඹදිව මුළුල්ලෙහි ප්‍රසිද්ධ වී ය. බොහෝ දෙන ත් සම්පත් බලන්ට යෙති. සිටාණෝ ද ආ ආව වුන්ට උතුරුකුරු දිවයින සාල් නැළියෙන් බත් දෙති. කප් රුක්වලින් හෝ තුන් ගවුවක් පමණ උස ඇති නිධාන සැළින් හෝ කැමැති සම්පත් උකා ගන්ට විධාන කෙරෙති. සියලු දඹ දිව වැස්සන් කැමැති ලෙසින් වස්තු උකා ගෙණ යත ත් විදර්ශී නම් බුදුන් සමයෙහි ගඳ කිළි ය වටා තුන් වාරයෙක ලවා ලූ රුවන් හැර ගත ත් අදහසෙහි අඩුවක් නූවා සේ ම නිධාන සැළින් අහලක් විතර ත් අඩු නො වෙයි. කප් රුක්වල ත් අඩුව නො පෙනෙයි. මෙ සේ බොහෝ දෙනා බොහෝ සම්පත් ගෙණ යන කල්හි බිම්සර මහ රජහු උන් ගේ මාළිගාව දක්නා කැමති වත් මිනිසුන් ගේ එළඹීම බොහෝ හෙයින් අවසරයක් නො ලත්හ.

පසු ව මිනිසුන් ගේ ගමන මඳ ව ගත් කලට රජ්ජුරුවෝ ජෝතිය සිටාණන් ගේ පියාණන්ට 'තොපගේ පුතණුවන් ගේ මාළිගාව දක්නා කැමැත්තම්හ'යි කිවු ය. සිටාණෝ ද 'යහපතැ'යි කියා රජ්ජුරුවන් වහන්සේ මුඹ ගේ මාළිගාව දක්නා කැමැති සේකැ'යි පුතණුවන්ට කීහ. 'යහපත, වඩනා සේක්ව'යි කී කල්හි රජ්ජුරුවෝ ත් මහ පිරිවරින් ගියහ. පළමු වන දොරටුව පිස ගා ලා දමා සිටිනා කෙලී ගිය රජ්ජුරුවන් තමා අත එලී ගෙණ එන දොරටුවට නැගෙන්ට අත දික් කොට ලුව. රජ්ජුරුවෝ ද කෙල්ල නියාව දත ත් ලජ්ජා ව වුව මනා තැන සිටාණන් ගේ ඇඹෑණියෝ දෝ හෝ'යි සිතා ලජ්ජාවෙන් අත නො ඇල්වූහ. සිටාණන් ගේ වාසල් පිස කසළ දමන කෙල්ලන් පවා තෙල සේ නි කසළ කලට කවුරුන් වුව ත් පවිත්‍ර අදහසින් පවිත්‍ර කොට පින් කට යුතු ය. අනික් දොරටු සය පිස කසළ දමන කෙල්ලනු ත් තමන් තමන් ගේ දොරටු කරා ගිය රජ්ජුරුවන්ට අත පොවන්නා ම සිටා

1. පිසති

Non-Commercial Distribution

ණන් ගේ අඹු වනැ'යි සිතා ම අත නො අල්වන්නාහ. සත් වන දෙරටුවට ගිය කලට ජෝතිය සිටාණෝ අවුත් වැද ලා සෙසු පින් කළ ත් රජ්ජුරුවන්ට පෙරාතු වන්ට නිසි පින් නො කළ හෙයින් තුමූ පසු ව රජ්ජුරුවන් පෙරාතු කළහ.

රජ්ජුරුවන්ට ත් මාළිගාවෙ ඉඳුනිල් මිණිමුවා බිම සිය ගණන් බඹ විවරට ත් ගැඹුරු වළක් සේ වැටහිණ. රජ්ජුරුවෝ ත් 'මා ආ ගමනේ අල්වනු නිසා වලක් කැණ වූ නියා ය' යි සිතා ගත්හ. එ සේ සිතා ගෙණ ලා ඇතුළු මාළිගාවට වදින්ට මැළි වූහ. සිටාණෝ ත් රජ්ජුරුවන් මැළි ව උන් ගමනින් නො කීව ත් වළෙකැ'යි සිතා හයින් ඇතුළු මාළිගාවට නො වදනා නියාව දැන 'ස්වාමීනි, තෙල ලෙස පෙනෙන පමණක් මුත් වළෙක් නො වෙයි. මුඹ වහන්සේ පසු ව ගත මැනැවැ'යි රජ්ජුරුවන් පසු කොට ලා තුමූ පෙරාතු වූහ. රජ්ජුරුවෝ ද සිටාණන් පෙරාතු වන්නා තුමූ ත් සැක නැති ව වැද යට මාලේ පටන් මාළිගාව බලා ඇවිදිති.

එ කල නො ඉපැද ම බඩ හිදිනා අවස්ථාවෙහි පිය රජ්ජුරුවන්ට සතුරු වූ හෙයින් අජාතසත්තු නම් කුමරහු පියාණන් ගේ ඇඟිල්ල අල්වා ගෙණ ඇවිදිනා තැනැත්තෝ 'අනේ, අප ගේ පියාණන් වහන්සේ නුවණ නැති සේක. ඊට ත් වඩා පින් මද සේක. ගොවි කුලෙහි උපන් තැනැත්තහු සත් රුවන් මුවා මාළිගාවල වසන තැන තමන් වහන්සේ දණ්ඩෙන් පතෙන් කළ ගෙවල හිදිනා සේක. තමන් ගේ අඩු ව හඟවන්නා සේ ඒ බලන්ට ත් එන සේක. මම රජ වීම් නම් මුන් මෙ ගෙයි හින්ද නොදෙමි' තමන් රජ කුලෙහි උපන් පමණක් හා උන් ගොවි කුලෙහි උපන් පමණක් සිතා ගෙණ පින් කමින් උන් වඩනා නියාව නො සලකා මේ තරම නපුරු සිතිවිල්ලක් සිතූහ.

රජ්ජුරුවනු ත් යට මාලේ පටන් මාලෙන් මාල බලා ඇවිදිනා වුන්ට දවල් බත් අනුභව කරණ වෙලාව ආසන්න වි ය. රජ්ජුරුවෝ සිටාණන් බණවා ලා 'සිටාණෙනි, දවල් බත මුඹ දී අනුභව කරම්හ'යි කිවූ ය. 'පෙර වරු වෙලේ මුඹ වැඩි කල මුඹ දී මේ නිම වන නියාව නො දනුමෝ ද? රජ්ජුරුවන් වහන්සේ මේ නිමවන්ට වසුනු ත් රැස් පිරිසට බතුත් ඉදි කැරැවූයෙම් ය'යි කිවූ ය. රජ්ජුරුවෝ ත් සුවඳ පැන් සොළොස් කළයක් විවරින් නා පියා සිටාණන් බත් අනුභව කරණ සත් රුවන්මුවා මණ්ඩපයට ගොසින්

Non-Commercial Distribution

උන් බත් කන්ට හිඳිනා පළඟ මත්තෙහි හුන්හ. රජ්ජුරු වන්ට ය යි වෙන නිල කළ සැරහුමෙක් නැත.

ඉක් බිත්තෙන් අත සෝධන්ට පැන් වත් කොට ලා මසු ලක්‍ෂ යක් වටනා තළියක හුණු කිරි බත් ලා ලා කොරඩා බත් ලෙසට තබා ලූහ. රජ්ජුරුවෝ බත සැටියෙන් අනුභව කරන්ට ලා ලූ බතකැ'යි සිතා ලා අනුභව කරන්ට ආරම්භ කළහ. සිටාණෝ අනික් කෙණෙක් නම් සිනා සී පුව මනා තැන 'ස්වාමීනි, තෙලේ මෙනිමවන්ට නිල කල බතෙක් නො වෙයි. කොරඩා බතට ලූවා ය. බත් තව ගෙණෙමින් සිටියෝ'යි කියා ලා අනික් ඝන රන් තළි යෙක බත් ලා ලා ආදි ගෙණ ගොස් තුබූ කිරි බත් තළි ය මුදුනේ තබා ලූහ. එ ලෙස කෙළේ කුමක් නිසා ද යත්—කිරි බතෙහි උණු ගුණ ය නිසා මුදුනෙහි තුබූ බත් අනුභව කරන්ට සැප හෙයිනි.

රජ්ජුරුවෝ ත් මධුරාහාර ය අනුභව කරණ තැනැත්තෝ එ දවසට කොසොල් රජ ව ගියා සේ පමණ දන ගත නො හී අනු භවයට පටන් ගත්හ. සිටාණෝ රජ්ජුරුවන් විවරක් අනුභව කළ කලට වැද ලා දෝත මුදුනේ තබා ගෙණ සිට 'ස්වාමීනි, තෙලේ විවරක් සෑහෙයි. වඩා වූවො ත් දිරවා ලිය නො හැක්කැ'යි කිවූ ය. රජ්ජුරුවෝ සිටාණන් බත් සාහා ගත නො හී කීව'යි සිතා ලා 'හැයි, සිටාණෙනි, අප බත් නො කෑ විරුවන් නො වත් තෙල ලෙස ම කියවූනැ'යි කිවූ ය.

'රජ්ජුරුවන් වහන්ස, මුඹ වහන්සේ ගේ කෙ තෙක් රැස් පිරිස් ගෙණා සේක් වී නමුත් වෙන බත් මාලු ඉදි කැරවුව මැනැවැ'යි නැත. මේ බත් මාලු සෑහෙයි. එතකුදු වුව ත් අයසක්[1] බා ය'යි කිවූ ය. 'කුමක් නිසා දැ'යි විචාළ කල්හි 'ඉදින් රජ්ජුරුවන් වහන්සේට ව්‍යාධි පමණක් වුව ත් රජ්ජුරුවන් වහන්සේ සිටා ණන් ගේ ගෙයි දී මෙ නිමවා ලා වැඩි සේක. මෙ ලෙසක් වූයේ සිටා ණන් කළ දෙයක් වනැ'යි කියා බස උපදිති යි සිතා ය. බත් අරුමයකින් නො වෙයි'' කීහ. 'එ සේ වී නම් තළි ය ඉවත් කර ව'යි කියා ලා තළි ය ඉවත් කරවා පියා අත සෝධා පීහ. රජ්ජුරු වන් මෙ නිමවා ඉක් බිති රැස් වූ පිරිසු ත් බත් කෑහ.

රජ්ජුරුවෝ කථා කොට කොට හිඳ සිටාණන් බණවා ලා 'කුමක් ද? මේ ගෙයි සිටු දූවණි කෙණෙක් ඇත් ද නැත් දැ'යි විචාළෝ ය. 'ඇතැ'යි කී කල්හි 'කොයි දැ' යි විචාළෝ ය. ශ්‍රී යහන් ගබඩාවේ

---

1 අයසසක්

Non-Commercial Distribution

හුන්හ. මුඹ වහන්සේ වැඩි නියා තව උන් දන්ට නැතැ'යි කීහ. ආත්ම ගර්වයකට කියා ලූ දෙයක් නො වෙයි. ඒ වේලා වනතුරු ත් ඌ තුමූ රජ්ජුරුවන් ආ නියා ව නො දනිත් ම ය. සිටාණෝ ද රජ්ජුරුවන් විචාළ ලෙසින් ම සිටු දුවණියන් දක්නා කැමැති නියා දන උන් ලඟට ගොසින් 'රජ්ජුරුවන් වහන්සේ වැඩි සේක. ගොසින් දුටු කල නපුරු දැ'යි කිවු ය. සිටු දුවණියෝ ද වැද හොත් තැනැත්තෝ නැඟී ත් නො සිට 'රජ්ජුරුවෝ නම් කවුරු දැ'යි කිවු ය.

'රජ්ජුරුවෝ නම් තොපට ත් අපට ත් නායක ව සිටිනා කෙණෙකැ'යි කී කල්හි නො සතුටු ව පියා 'අනුන්ට අයති. වන ගමන් හීන පිණක් කළ නියා ය. දෙන දන ත් කම්පල අදහා දී ගත නුහුණුවමෝ වනුම්හ. කරණ යම් පිණක් සිතින් නො සිතින් කළ නියා ය. ඉන් වේ ද දූන් යටත් වූවෝ ය. දූන් අප කළ මනා කුමක් දැ'යි විචාළහ. 'තල් වැටක් හැර ගෙන ගොසින් රජ්ජුරුවන් වහන්සේට ගිම් වේලා හෙයින් පත් සලව'යි කී ය. උයි ත් තල් වැටක් හැර ගෙණ ගොසින් රජ්ජුරුවන්ට පත් සලන කලට රජ්ජුරුවන් නළල බැඳි රුවන් සෝළුවෙහි මැණික් ගල් ගිනිවර කළ හෙයින් ඊ තෙජස සිටු දුවණියන් ඇසට පහළ. උන් ගේ ඇස් දෙකින් නො කළ විරූ මෙහෙයක් හෙයින් මුසුප්පුව හඬන්නා සේ කඳුළු ධාරා වැගිරෙන්ට වන. රජ්ජුරුවෝ ඒ දැක සිටාණන්ට 'සිටාණෙනි, ගෑනු නම් මායම් දන්නා හෙයින් නුවණ මඳ ය. අප තමන් ගේ සම්පත් දැක හැර ගනිති'යි මුසුප්පු වෙන් හඬති යි සිතම්හ. අප සම්පත් බලන්ට ආ පමණක් මුත් හැර ගන්ට නො ආ නියාව කියා ලා අස්වසා ලවයි' කීහ.

ඒ අසා සිටාණෝ 'ස්වාමීනි, හඬන නියා නො වෙ'යි කීහ. 'නො හඬන කල කඳුළු ධාරා වැගිරෙන්නේ හැයි දැ'යි කිවු ය. 'තෙලෙ මුඹ වහන්සේ ගේ රුවන් සෝළුවෙහි මැණික් ගල්වල තෙජස ඇස පැහැර ලා ඇසින් පැන් වැගිරෙයි. මූ තුමූ ගින්නක් වේව යි පහනක් වේව යි නො දැක මැණික් ආලොකයෙන් ම දවස් යවති. මුඹ වහන්සේ රජ ව සිට ත් පහන් ආලොකයෙහි හිඳිනු නියා වේ දැ'යි කිවු ය. 'එ සේ ය, සිටාණෙනි' කී කල්හි මෙ වක් පටන් පාන් ආලෝක ය හැර ලා මැණික් ආලෝකයෙහි හුන මැනවැ'යි කියා ලා එ වක බමුණා හැර ගත් මැණික හැර ගෙන තබා ගත්තා සේ නියඹරාවක් සා මහත ඇති මහඇඟි මැණිකක් දුන්හ. රජ්ජුරුවෝ ද සම්පත් බලා පියා ජොතියයන් ගේ සම්පත් මහතැ යි විස්තර කොට ගෙණ ගියහ.

**මේ ජොතිය සිටාණන් ගේ උත්පත්ති කථාව ය.**

Non-Commercial Distribution

# 305. ජටිල තෙරුන් වහන්සේගේ වත

## දූන් ජටිල තෙරුන් වහන්සේගේ උත්පත්ති කථාව දතයුතු.

කෙසේ ද යත්—

බරණැස් නුවර එක් සිටු දුවණි කෙණෙක් ඉතා රූපත්හ. උන් පසළොස් හැවිරිදි වයස දී හුදකලා පමණකට එක කෙල්ලක පාවා දීලා අසද්ධර්මයෙන් නවතනු නිසා සත් මාල් පායේ උඩු මාලේ ශ්‍රී යහන් ගබඩාවෙක ලූහ. උන් එක් දවසක් කවුළුදොර හැර පියා පිටත බල බලා සිටි කලට අහසින් යන්නාවූ විද්‍යාධරයෙක් උන් දැක උන් කෙරෙහි ස්නෙහයක් උපදවා ගෙණ කවුළු දොරින් වැද ලා උන් හා සහ වාස ය කෙළේ ය. උයි ත් ඒ සහවාස ය නිසා නොබෝ කලෙකින් ම දරු ඇති වූහ. කැටි ව සිටි කෙලි ත් දරු ඇති නියා ව දැන 'මේ කිම් දූ'යි විචාරා 'වන්නාට ය, කාට ත් නො කියව'යි සිටු දුවණියන් කී කල්හි උන් ගෙන් ගහටයක් වෙතී යන හයින් කාට ත් නො කීව.

උයි ත් දස-වෙනි මස පුතණු කෙණකුන් වදා පියා නවමු සැළි-යක් ගෙන්වා ගෙණ ඒ දරුවන් ඊ ලා ලා කඩ වස්නෙකින් වස්වා ලා මතුපිට මල් වඩමක් තබ්බවා ලා 'තෙලෙ හිස තබා ගෙණ ගඟසින් ලා ගඟ දියෙන් යවා පියව. විචාළ කෙණෙක් ඇත් නම් 'අපගේ ස්වාමි දියණියන්ට බිලියමෙකැ'යි කියව'යි කෙල්ලට සම්මත කළහ. උයි ත් විධාන ලෙසින් ම ගඟ දියෙහි ලා පුව. ගඟ පාත තොටක නාන ගැනු දෙන්නෙක් නවමු සැළි ය දියෙන් එන්නා දැක එක් කෙණෙක් 'තෙල සැළි ය මාගේ ය'යි කිවු ය. එක් කෙණෙක් 'ඊ ඇතුළේ යමක් ඇත් නම් ඒ මට ය'යි කියා ලා සැළි ය ලං වූ කල හැරගෙණ ගොඩ තබා ලා වසා ලූ වැස්ම හළ වූ ය. හැර ත් ඇතුළේ වැද හොත් කුමාරයන් දැක 'සැළි ය මාගේ ය යි කිවු තැනැත්තෝ ඇතුළේ හොත් දරුවන් තමන්ට ය යි කියති. අනික් තැනැත්තෝ තමන් ආදි ම කියා ලූ ලෙසට දරුවන් තමන්ට ය යි කියති. මෙ ලෙසින් විවාද කරණ පමණක් මුත් තුමූ යුක්තිය දත නොහී අධිකරණ නායකයන් කරා ගියහ. උනු ත් ඒ යුක්තිය කියා ලිය නුහුණු හෙයින් රජ්ජුරුවන් කරා ගියහ.

රජ්ජුරුවෝ උන්ගේ කථාව අසා යුක්තිය ත් එම හෙයින් 'සැළි ය මාගේ ය'යි කී තැනැත්තන්ට සැළි ය හැර ගන්ට කියා ලා 'ඇතුළේ දෙය මාගේ ය'යි කී තැනැත්තන්ට දරුවන් නිල කළහ. රජ්ජුරුවන් කළ නිල ය හෙයින් සැළි ය ලත් තැනැත්තෝ ත්

Non-Commercial Distribution

ගිවිස පූහ. ඉන් යම් කෙණකුන්ට දරුවෝ සම්භ වූ නම් උෟ කසයින් මහ තෙරුන් වහන්සේට උපස්ථාන කරණ කෙණෙක. එ හෙයින් 'මේ දරුවන් වඩා වර්ධන කොට ලා කසයින් සවාමීන් ලඟ මහණ කරවම්'යි සිතා ගෙණ වඩා වර්ධන කෙරෙති. උපන් දවස නාවා පියන්ට නො වූ හෙයින් හිසකේ එක් ව බැඳී ගොසින් අවුල් වියවුල් ව සිට්ටි. එහෙයින් ජටිල යන නාමය තබා ලූහ.

උන් පියවර ඔසවා ඇවිදිනා කලට කසයින් මහ තෙරුන් වහන්සේ ඒ ගෙට සිඟා වැඩි සේක. උයි ත් මහ තෙරුන් වහන්සේ වඩා හිඳුවා ලා වැළඳ වූහ. මහ තෙරුන් වහන්සේ ත් ජටිල කුමාර යන් දක 'කුමක් ද, උපාසිකාවෙනි, දරු කෙණකුන් ලත් නියා ද'යි විචාළ සේක. 'එ සේ ය, සවාමීනි, මේ දරුවන් මුඹ වහන්සේ ලඟ මහණ කරවනු නිසා වැඩීම්. උන් මහණ කළ මැනැවැ'යි කියා ලා පාවා දුන්හ. ඔබ ද උන් කැඳවා ගෙණ වඩනා සේක් මුන් ගිහි ව රඳා සම්පත් විඳිනට මෙදව ඇත්තෝ දෝ හෝ යි විමසන සේක් 'මුන් තමන් කුඩා බව මුත් පිණින් නු කුඩා වූ ය. මහ සම්පත් ලැබෙති. මහණ වන්ට කව වයස ත් බාල ය. රහත් වන්ට නුවණ ත් මූකුරා නො ගියේ'යි සිතා වදරා උන් කැඳවා ගෙණ තක්සලා නුවර එක් උපාසක කෙණකුන්ගේ ගෙට වැඩි සේක.

උයි ත් මහ තෙරුන් වහන්සේට වැඳ ලා සිටි තැනැත්තෝ කුමාරයන් දක 'සවාමීනි, කුමාර කෙණකුන් ලත් නියා ද'යි විචාළහ. එ සේ ය, උපාසකයෙනි, මූ මහණ වන්ට නිසි කෙණකු තව බාලයෝ ය. මූකුරා ගන්නා තෙක් තොප ලඟ රඳති' වදළ සේක. උයි ත් 'යහපතැ'යි ගිවිස උන් දරු කොට වඩති. උන්ගේ ගෙයි දෙළොස් අවුරුද්දක් විවර විකපත් වන්ට නැති හෙයින් බඩු බෝ ව පියා තිබෙ යි. උෟ අනික් ගමකට කත්නලවු වෙක යන්නෝ ඒ බඩු මුළුල්ල ම සල්පිළ ලා ලා වඩනා දරුවන් සල්පිළ හිඳුවා ලා ඒ ඒ බඩුවේ මිල කියා ලා 'මේ මෙතෙකට දී ලව'යි කියා ලා ගියෝ ය. එ දවස් නුවර රකවල සිටි දෙවියෝ යටත් පිරිසෙයින් මිරිස් ලූණු ආදි වූ කුළු බඩු පමණකිනු ත් ප්‍රයෝජන ඇති කෙණකුන් අනික් සල්පිළකට නො යවා ඒ බාල දරුවන් හුන් සල්පිළට ම යවූහ.

උයි ත් දෙළොස් හවුරුද්දක් විකපත් නු වූ බඩු අග ය නො නසා එක දවසින් විකපත් කළහ. කෙළෙඹියාණෝ අවුත් සිස් ව තුබූ සල්පිළ දක 'හැයි පුත, බඩු නිකම් ම නසා පූ ද'යි විචාළෝ ය. 'මා එ සේ නැසුයේ නැත. කියා ලූ ලෙස ම

Non-Commercial Distribution

වික්කෙමි. මේ මෙයට ගත් මිල ය, මේ මෙයට ගත් මිල ය'යි එක් කළ මිල මුළුල්ල ම පෑ වූය. කෙළෙණියාණෝ වයස තරමට කට යුත්ත මූකුරා තිබෙන හෙයින් සමාධි ව 'මූ අනර්ඝ කෙණෙක, කො තැනෙක වුව ත් රැකී ගනිති' තමන්ගේ වැඩිවිය පැමිණි දුවණියන් උන්ට පාවා දෙවා ලා තිදිනා පරිද්දෙන් ගෙයක් ඉදි කරන්ට මිනිසුන්ට විධාන කොට ලා ගෙය කොට නිමි කල්හි 'යව, ගොසින් තොපගේ ගෙයි හිඳුව'යි විධාන කළහ. උනු ත් ගෙට වදිනට ය යි එළිපතින් ඇතුළේ පයක් තබා ලන්නා ම ගෙ පිටි පස්සෙහි මහ පොළොව පළා ගෙණ බොහෝ ජාතිවල විපාක දෙන්ට නැති හෙයින් මේ එක ජාතියෙහි ම විපාක දෙන්ට කුසල් එක් වූවා සේ ඝන සංහත[1]ව වඩුවෙන් අසූ රියන් රන් පර්‍වතයක් නැංග. රජ්ජුරුවෝ ද ජටිල කුමාරයන්ගේ ගෙ පිටි පස්සෙහි පර්‍වත ය නැඟි නියා ව අසා ම උන්ට සිටු සේසත් යවූහ. උඹ එ වක් පටන් ජටිල සිටාණෝ ය යි ප්‍රසිද්ධ වූහ.

ඒ ජටිල සිටාණන්ගේ පුතුන් තුන් දෙනෙක් වූහ. උන් වැඩි විය පැමිණි කලට සිටාණෝ මහණ වන්ට සිතා ගෙණ ඉදින් අප හා සම්පතින් සරි සිටු කුලයෙක් ඇත් නම් අප මහණ විය දෙති. නැත හොත් මහණ විය නො දෙති. මේ දඹ දිව සම්පතින් අප හා සරි සිටු කුල ඇත් දෝ හෝ'යි විමසනු නිසා ඝන රන් මුවා උළක් ද, කැවිටි ලියක් ද, රන් පමුවක් ද කරවා ලා මිනිසුන්ට දී ලා තෙලෙ හැර ගෙණ කිසිවක් විමසන්නා සේ දඹදිව මුළුල්ලෙහි ඇවිද සම්පතින් අප හා සරි සිටු කුල ඇති නියා ව විමසව'යි යවූහ. උයි ත් මුළුල්ලෙහි විමසා ඇවිදිනාහු භද්දිය නුවරට ගියහ. මැඩ මහ සිටාණෝ උන් හැම දැක 'කුමක් කොට ඇවිදිනා නියාද'යි විචාරා 'එක්තරා කටයුත්තක් විමසා ඇවිදුම්හ'යි කී කල්හි 'මුන් රන් උළක් හා රන් කැවිටි ලියක් හා රන් පමුවක් හා හැර ගෙණ අනිකක් විමසන්ට කාරණ නැත. පොහොසතුන් විමසා ඇවිදිනා වනැ'යි සිතා ගෙණ 'සගයෙනි, අපගේ ගෙයි පිටි පස්සට ගොසින් බලන දෙයක් ඇත, බලව'යි කීහ.

උයි ත් ගෙපිටි පස්සට ගොසින් එක් යාළ සොළසාමුණක් වප් යන තැන පොළොව පළා ගෙන නැංගාවූ ඇතුන් සා වූ ත් අසුන් සා වූ ත් ගොන් සා වූ ත් ඇළයෙන් ඇළ ය පැහැර සිටියා වූ සියලු සම්පත්තින් පිරුණු කුස් ඇති ඝන රන් මුවා එළුවන් දැක උන් අසුහස් සෙන් ඇවිද පියා නික්මුණාහ. මැඩ මහ සිටාණෝත් 'යමක් සොයා විමසා ඇවිදු නම් ඒ දුටු ද'යි විචාළහ. මැඩමහ සිටාණන් සම්පතින් වැඩී සිටි හෙයින් තමන්ගේ ජටිල සිටාණන්ට වඩනා හෙයින්

---

1 සංගත 2 දෙන්නා ම

Non-Commercial Distribution

'දුටුම්හ' යි කීහ. 'එ සේ වී නම් යව' යි කියා ලා යවූහ. උයි ත් ගොසින් 'ස්වාමීනි, මුඹ වහන්සේ ගේ කුමන සම්පත් ද? භද්දිය නුවර මැඩ මහ සිටාණන් වහන්සේ ගේ සම්පත් මේ තරම් වේ ද' යි සම්පත් තමා විස්තර හෙයින් විස්තර කොට කීහ. ඒ අසා ජටිල සිටාණෝ සතුටු ව වැඩි තරම් ව සිටිනා එක් සිටු කුලයක් ලදිමි. තවත් ලද හැකි දෝ' යි ලක්‍ෂයක් වටනා පලසක් දී ලා යවා, ගොසින් තව ත් එ බඳු සිටු කුල ඇත් නම් විමසව' යි කීහ. උඹ රජගහා නුවරට ගොසින් ජොතිය සිටාණන් ගේ ගෙට නුදුරු තැනෙක ගිනි මැළයක් බැඳ ලා සිටියහ.

'මේ කිම් දැ' යි විචාළ කල්හි අපගේ මහ ඇඟි පලසෙක් ඇත. මිල දී ලා හැර ගන්ට කීව ත් මහ ඇඟි හෙයින් හැර ගත හෙන්නෝ නැත. හැර ගෙණ ඇවිදිනා කලට ඊ ලොහයෙන් සොර කෙණෙක් මරා පියත් දෝ හෝ යි බා ගින්නේ ලා දවා පියම් හ' යි සිතා ය' යි කීහ. ජොතිය සිටාණෝ ත් ඒ දැක 'තුලුන් කරන්නේ කිම් දැ' යි විචාරා එ පවත් අසා කැඳවා ගෙන්වා ලා 'මේ පලස කෙ තෙක් වටී දැ' යි විචාළහ. 'මසු ලක්‍ෂයක් අග්ගි'යි කී කල්හි පලස ගෙනාවුන්ට මසු ලක්‍ෂයක් දෙවා පියා 'තෙල පලස අපගේ පළමුවන වාසල පිස කසළ දමා සිටිනා කෙල්ලට දී පියව' යි කියා ලා පලස ගෙණා වවුන් අත ම ඒ කෙල්ලට යවූහ. ඔයි ත් පලස අතට හැර ගෙණ හඬමින් වලපමින් සිටාණන් ලඟට ගොසින් 'ස්වාමීනි, මිඩියන්ගේ වරදක් දුටු කල මැරවූ කල නපුරු ද? මේ දළ පිළී මිඩියට දෙන්ට කාරණ කිම් ද? මේ ගෝණි කඩක් සේ දළ, මිඩිය හඳනේ ත් පොරෝනේ ත් කෙ සේ දැ' යි කිව. සිටාණෝ ඒ අසා 'එම්බල, තෙල පලස හඳිනට පොරෝනට යවූ දෙයෙක් නො වෙයි. මම තිගේ තරම් නො දනිම් ද? තෙලෙ බිස්සක් සේ හකුළුවා ලා තී වැද හෝනා යාන බඩ තබා ලා වැද හෝනා වෙලේ සුවඳ පැණින් සෝධා පූ පා පිසිනට සිතා යවීමි. එ විතරකු ත් තිට බැරි නියා දැ' යි කිවූ ය.

'ස්වාමීනි, ආදි නො දත් විසින් මුත් ඊ බැරි කවරේ දැ' යි කියා ලා ලක්‍ෂයක් වටනා පලස තමා පය පිසින්ට ගෙණ ගියා ය. ජොතිය සිටාණන්ගේ සම්පතෙහි තරම සම්පත් විමසන්ට ගිය-වුන්ට කෙළි ම හහවා පී ය. විමසන්ට ගියවුන් ජටිල සිටාණන් කරා ගොසින් 'ස්වාමීනි, මුඹ වහන්සේගේ සම්පත් රජගහා නුවර ජොතිය සිටාණන් වහන්සේ ගේ සම්පත දුටු කලට උන්දැ ගේ ගෙයි මෙහෙ කරණ කෙල්ලන් තබා පළමු වන වාසල පිස කසළ දමන

Non-Commercial Distribution

කෙල්ලන්ගේ සම්පතට ත් නැත්මත් වේ දැ' යි කියා ලා ජොතිය සිටාණන්ගේ සම්පත් විස්තර කොට කීහ.

ජටිල සිටාණෝ උන් ගේ කථාව අසා සතුටු ව 'මහණ වීම ඉතිකින් පිළිවනැ' යි නුවර රජ කරණ රජ්ජුරුවන් ලඟට ගොසින් 'මහ රජ, මහණ වනු කැමැත්තෙමි' කීහ. 'යහපත' යි රජ්ජුරුවෝ ත් අනුදත්හ. සිටාණෝ ගෙට ගොසින් පුතුන් කැඳවා ලා රන් මිටක් ඇති උදැල්ලක් වැඩි මාලු පුතණුවන් අතට දී ලා 'යව, පුත, ගෙ පිටි පස්සෙහි සිටියා වූ රන් පවුවෙන් කැටියක් කපා ගෙණ ව' යි කිවු ය. උයි ත් උදැල්ල ගෙණ ගොසින් රන් පවුවට කොට ලා බැලූහ. ගල තලෙක පහළ කලක් මෙන් වි ය. කැපුණු දෙයක් නැත. ඒ උදැල්ල උන් අතින් හැර ගෙණ මැදි බෑ පුතණු වන්ට දී ලා යවූහ. උන්ට එ ලෙස ම වි ය. සුහකු ත් නො කැපිණ.

ඉක් බිති ව උදැල්ල බාල පුතණුවන්ට දී ලා යවූහ. උන් ගොසින් කොටන්ට වදනා ම බොරු පසක් කෙටෙන්නා සේ රන් පවුව සුණු ව කෙටෙන්ට වන. ඉක් බිත්තෙන් ජටිල සිටාණෝ උන් කැඳවා ලා 'මෙ තෙක් සෑහෙයි' කියා ලා අනික් පුතුන් දෙන්නා කැඳවා ලා හෙම්බා තෙලෙ, මේ රන් පවුව තොප දෙන්නා නිසා උපන්නා නො වෙයි. එ සේ නො වන නියා ව නො කෙටුණු ගමනින් ම දතුව. මාගේ හා තෙල තොපගේ කුඩා මලණුවන් ගේ කුශලානුභාවයෙන් උපන. තුලුත් වසයෙන් උන් මුල් ව ප්‍රයෝජන විඳුව' යි කීහ.

කුමක් නිසා ජටිල සිටාණන් හා උන් ගේ පුතණුවන් ගේ කුශලානුභාවයෙන් රන් පර්වත ය උපන් ද යත්—ඒ උන් දෙන්නා ගේ ම කුශල කර්ම මහිමයෙන. ජටිල සිටාණන් ඉපැද ලා දියෙන් යන්ට කාරණ කිම ද යත් —ඒ උන්ගේ අකුශල කර්ම බලයෙන. ඒ එ සේ මැ යි. කසුප් බුදුන්ගේ රන් දා ගබ කරණ කල්හි එක් රහත් තෙර කෙණකුන් වහන්සේ දා ගබ කර්මාන්ත කරණ තැනට ගොසින් කර්මාන්තයෙහි අඩු වැඩි බලා පියා 'උපාසකවරිනි, මෙ දා ගබ උතුරු දිග මූණ කුමක් නිසා නො නැංගේ ද? සතර අතින් ම සරි ව නැහෙන කල වේ ද, යහපතැ' යි වදළ සේක. 'බෙත් ම වූ නියායෙන් ඒ දිගට රත් රන් මද හෙයිනැ' යි කීහ. මම ඇතුළු ගමට ගොසින් සමාදන් කරවා රත් රන් එක් කරවමි. තොපි නො පමා ව කර්මාන්ත කරව'යි වදරා ලා නුවරට වැද 'උපාසකවරිනි, තොප හැම දෙනා කරවන දා ගබ එක් මූණ කට රත් රන් නො

සැහෙයි. අනික් තුන් මූණ කර්මාන්ත රත් රනින් කරණ හෙයින් මේ මූණ අනිකෙකින් කරන්ට බැරි වේ ද, පින් පූරා කරවන දෙය බැවින් බලාත්කාරයෙකින් නො වන පසු රත් රන් එක් කරව' යි සමාදන් කරවමින් බඩාල් ගෙයකට ත් වැඩි සේක. බඩාලාණෝ ද ඒ වේලාට ඇඹෙණියන් හා ඩබරක් කොට ගෙණ හුන්හ. තෙරුන් වහන්සේ ත් 'තොපට නියම වූ මුහුණට රත් රන් මද, රන් රනක් සපයව' යි වදාළ සේක.

උයි ත් අඹුවන් කෙරෙහි කළා වූ ක්‍රොධයෙන් කිපියවුන් සලකන කාරණ නැති බැවින් 'මුඹ ගේ බුදුන් දියෙහි ලා පියන් නැ' යි කිවු ය. උන්ගේ ඇඹෙණියෝ ද, 'කියා ලූ නියා ව ඉතා ම නපුර. මා හා ඩබර කළ කල මට ම කරණ කියන දෙයක් මුත් නිරපරාධ බුදුන්ට කියා ලූ ලෙස තමාගේ තරමට තරම් වත් ඔබට තරම් නො වේ' යි කීහ. බඩාලාණෝ ද ඒ වේලේ සලකා පියා කියන්නා තබා සිතු ව මනා දෙයකු ත් නො වන හෙයින් 'ස්වාමීනි, ක්‍ෂමා කළ මැනැවැ' යි කියා ලා තෙරුන් වහන් සේ වැද ගෙණ හොත්හ. තෙරුන් වහන්සේ ත් 'තොප අපට වර දවා කී දෙයෙක් නැත. වරදවා කීවා බුදුන්ට වුව. ඔබ ම ක්‍ෂමා කරවව' යි වදාළ සේක. 'කවර ලෙසකින් කුමක් කොට ක්‍ෂමා කරවා ගනිම් දැ' යි කීහ. 'රන් මල් යෙළ යාළක් කරවා ලා ද කුස ලා ලා ඉසින් කතින් දියෙහි ගැලී තෙත් පිළී ඇති ව තෙත් හිස කේ ඇති ව ක්‍ෂමා කරවව' යි වදාළ සේක. උයි ත් 'යහපතැ'යි ගිවිස රන් මල් කරණ තැනැත්තෝ පුතුන් තුන් දෙනාගෙන් වැඩි මාලු පුතණුවන් කැඳවා ලා පුත, හෙම්බා, බුදුන්ට වරදවා ලා කෝප බලයෙන් බසක් කියා පීමි. එ සේ හෙයින් මේ රන් මල් කොට ධාතු නිධානයෙහි ලා ලා ක්‍ෂමා කරවමි. තොපි ත් ඊට සහා ය වව' යි කිවු ය.

උං තුමූ ඒ අසා 'මා මුඹ වරදවා කියන්ට කීවා නැත. කර තොත් මුඹ ම කරන්නැ' යි කියා ලා සහාය නුවූහ. මැදි බෑ පුත ණුවන් බණවා ලා එ ලෙස කී තැන උයි ත් මැළි ව දඩුවම් ලෙසින් වුව ත් කරණ පින් කමට සහාය නුවූහ. බාල පුතණුවන් කැඳ වා ලා සහාය වන්ට කී තැන 'යහපත් වුව ත් නපුරු වුව ත් දෙ මවු පියන්ට පැමිණි කට යුත්ත දරුවන්ට භාර වේ දැ' යි සහාය ව රන් මල් කළහ. බඩාලාණෝ ත් වියත් සා විතර රන් මල් යෙළ යාළක් කොට ලා ධාතු නිධානයෙහි ලා ලා තෙත් පිළී හා තෙත් ඉස කේ ඇති ව බුදුන් ක්‍ෂමා කැරවූහ. ක්‍ෂමා කරවීම නිසා ප්‍රති සන්ධි විපාක ය නැති වුව ත් ප්‍රවෘත්ති විපාක බලයෙන් ආදි ත්

Non-Commercial Distribution

සවාරෙක ඉපැද ඉපැද ලා දියෙන් ගියහ. මේ කෙළවර අත් බැව ය. පසු ව විපාක දී පියන්ට අවසරයක් නැති හෙයින් රහත් වන ජාතියෙ ත් ඉපැද ලා දියෙන් ගියහ. ඒ අකුශල විපාක ය ත් ගෙවිණ. යම් සේ උන්ගේ දරුවෝ දෙන්නෙක් රන් මල් කිරීමට නො ලැබුණා වූ නම් රන් පර්වත ය උන් දෙන්නාට නො ලැබිණ. ජටිල සිටාණන් හා බාල පුතණුවන් රන් මල් එක් ව කළ බැවින් රන් පර්වතයක් එක් ව උපන.

මෙ සේ ජටිල සිටාණෝ පුතුන්ට මාලු කම් කියා ලා බුදුන් ලඟ මහණ ව කීප දවසකින් ම රහත් වූහ. බුදුහු එක් කලෙක පන් සියයක් දෙනා වහන්සේ හැර ගෙණ සිඟා වඩනා සේක් ජටිල තෙරුන් වහන්සේගේ පුතුන් තුන් දෙනාගේ ගෙට සිඟා වැඩි සේක. උයි ත් බුදුපාමොක් මහ සඟනට දෙපෝයක් මුළුල්ලේ මහ දන් දුන්හ. වහන්දෑ ද එක් දවසක් ධම් සෙබෙයි දී ජටිල තෙරුන් වහන්සේ බණවා ලා 'ඇවැත්නි, අසූ රියන් රන් පර්වත යෙහි ත් පුතුන් තුන් දෙනා කෙරෙහි ත් ඇලුම නැත් ද' යි විචාළ සේක. 'මට එ බන්දෙක් නැතැ' යි කී කල්හි වහන්දෑ 'නැත කියා රහත් නියා ව හඟවන නියාදැ'යි කී සේක. බුදුහු ඒ අසා වදරා ඔබට තෘෂ්ණාව කුමකු ත් නැති නියා ව හඟවන්ට බණ වදරණ සේක් යම් කෙණෙක් රූපාදි වූ සාරමුණෙහි ස දෙරින් පවත්නා තෘෂ්ණාව හැර ගිහිගෙන් නික්ම මහණ වූ ද, මහණ ව රහත් වීමෙන් භව ක්‍ෂය කළා වූ ඔහු උතුමැ' යි කියමි' වදාළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටුහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් ජටිල සිටාණන් අසූ රියන් රන් පර්වත ය පටන් මහා සම්පත් හැර ගොසින් මහණ ව භව ක්‍ෂය කළා සේ ම භව ක්‍ෂයට ම උත්සාහ කට යුතු.

## 306. ජොතිය තෙරුන් වහන්සේ ගේ වත

තව ද නො එක් ලෙසින් නස්නා සුලු සම්පත් හැර මහණ වීමට ත් නො නස්නා සුලු වූ නො හොත් කවුරුන් විසිනු ත් හැර පැහැර ගත නො හැකි සැපත් හැර මහණ වීමෙහි අරුමය දක්වන්ට ජොතිය තෙරුන් වහන්සේ ගේ වත දක්වමු.

කෙ සේ ද යත්—

අජාසත් කුමරහු දෙව්දතු උන් හා එක් ව ගෙණ උන්ගේ අසත් සමවායෙන් පියාණන් මරා රජ පැමිණි තැනැත්තෝ 'ජොතිය සිටාණන් ගේ මාළිගාව හැර ගනිමි' සටන් සරහා නික්ම මැණික්

Non-Commercial Distribution

පවුරෙහි සිවුරඟ සෙනඟ සහිත වූ තමන් ගේ ජායාව දැක ගොවියා පිත් සටන් සරහා ගෙණ නික්මිණි වනැ'යි සලකා ලා එළඹ ගත නුහුණු වූ ය. ජොතිය සිටාණෝ ද එ දවස් පෙහෙව ගෙන බත් අනුභව කොට ලා වෙහෙරට ගොසින් බුදුන් ලඟ බණ අසා අසා හුන්හ. පළමුවන දෙරටුවෙහි රකවල් ගෙන සිටි යමවොලි නම් යක්‍ෂයා පිරිවර යක් දහස හැර ගෙන කොයි එන නියා දැ යි කියා ලා මරා ලුහුබඳවා ගත. රජ්ජුරුවෝ බිඳී විහාරයට ම අවු ය. ජොතිය සිටාණෝ ද රජ්ජුරුවන් දැක ලා 'කුමක් ද, රජ්ජුරුවන් වහන්ස'යි කියා ලා නැඟී සිටියහ. 'සිටාණෙනි, තෙපි මා හා සට නට පිරිස මෙහෙයා ලා මුඹ අවුත් බණ අසන බඳු ව ලා හුන්නා දැ'යි කිවු ය. සිටාණෝ තමන් ඒ වෙලා වනතුරු නො දත් හෙයින් මාගේ මාළිගාව හැර ගන්ට වැඩියේ ඇත් දැ'යි විචාරා'එ සේ ය'යි කී කල්හි 'මුඹ වහන්සේ එක රජ්ජුරුවන් වහන්සේ තබා දහස් ගණන් රජ දරුවෝ ත් මා නො කැමති කරවා මාගේ සම්පත් ගත නො හෙන සේකැ' කිවු ය.

'එ සේ කලට තොප ම රජ නියා වේ දැ'යි අජාසත් රජ්ජුරු වෝ කිපී ගියහ. මා රජ කුලයෙක නුපන් හෙයින් මට රජ කමුත් නැත. එ තෙකුදු වුව ත් මා නො කැමති කරවා මා සන්තක ද හුයක් විවර ව ත් රජ දරුවන් ආදි කවර කෙණකු ත් හැරගත නො හෙති'යි කිවු ය. 'සෙස්සත් හැර ගත නො හෙත ත් මම තොප නො කැමති කරවා ම හැර ගනිම් දැ'යි කිවු ය. 'එ සේ වී නම් රජ්ජුරුවන් වහන්ස, දැන් ම පරීක්‍ෂා කොට හැක්ක. මාගේ ඇඟිලි දසයේ කැටි ව මුදු විස්සෙක් ඇත. මම එය රජ්ජුරුවන් වහන්සේට නො දෙමි. ඉදින් සපන් වූවොත් හැර ගත මැනැවැ'යි කිවු ය. රජ්ජුරුවෝ ත් වැළි ත් බිම කෙළිල්ලෙන් හිඳ ලා උඩ අහසට පිනූ නම් වඩුවෙන් අටළොස් රියනක් විතර පෙනෙති. කෙළින් සිට පිනූ නම් අටළොස් රියනක් විතරට පෙනෙති. ඒ තරම් බල ඇති රජ්ජුරුවෝ ත් නො එක් ලෙස යත්න කොට ත් එක මුන්දක් විවර ත් ගළවා ගත නුහුණු වූ ය. මච්ඡරිය කොසිය සිටාණන් කබලූ වෙන් කරන්ට උත්සාහ කොට විඩා වූවා සේ විඩා වූ පමණෙක.

සිටාණෝ ද සළු පට අතුට ලුව මැනවැ'යි කියා ලා ඇඟිලි ඊට නමා පෑ ලූ ය. මුදු විස්ස ම සිටාණන්ගේ දිමෙහි අදහස ඇති වන්නා ම සළු පිට වැගිරිණ. 'රජ්ජුරුවන් වහන්ස, මා සන් තක දෙයක් මා නො කැමති කරවා හැර ගත නො හැකි නියා ව තිලින් ම දත මැනවැ'යි කියා ලා කොට ලූ ලෙසට මුසුප්පු ඇති ව

Non-Commercial Distribution

මා මහණ වන්ට අනුදත මැනව'යි කිවු ය. රජ්ජුරුවෝ ත් 'මුන් මහණ වූ කලට මාළිගාව ත් සම්පතු ත් නිරායාසයෙන් ම මට එන්නේ වේ ද'යි සිතා දෛව ය යි සිතා ගත නො හී එක බසින් ම 'යහපත, මහණ වව'යි කිවු ය. ජොතිය සිටාණෝ ද බුදුන් ලඟ මහණ ව මාලු පැවිද්ද ත් ලදින් නො බෝ කලකින් රහත් ව ජොතිය තෙරුන් වහන්සේ ය යි ප්‍රසිද්ධ වූහ. උන් වහන්සේ රහත් වන්නා ම සම්පත් මුළුල්ල ම අතුරුදන් විය. ඇඹෑණිය වූ ත් දෙවියෝ උතුරු කුරු දිවයින ම ලා ලූ ය.

එක් දවසක් වහන්දෑ ජොතිය තෙරුන් වහන්සේ බණවා ලා 'කුමක් ද, ඇවැත්නි, තමන්ගේ ඒ රුවන් මහ පායෙ‍ ්‍ වේව'යි, සෙසු සම්පක වේව'යි, සිටු දූවණියන් කෙරෙහි වේව යි, ඇලුම් ඇත්දෑ'යි විචාරා නැති හෙයින් ම 'නැතැ' යි කී කල්හි 'මු ස්වාමීනි, නැත්ත කියා රහත් නියාවක් හඟවති' කී සේක. බුදුහු ත් ඔබට තෘෂ්ණාව නැති නියාව හඟවන සේක් 'යම් කෙණෙක් සියල්ලෙහි ම ඇලුම් හැර ගොසින් මහණ ව රහත් වූ නම් භවක්‍ෂය කළාවූ උන් උතුමැ'යි කියමි. එ හෙයින් ම පුතුන් ජොතිය තෙරුනු ත් රහත් වූ හෙයින් ඒ සියල්ලෙහි ම ආල ය නැත. තෙපි උන් කෙරෙහි අමුත්තක් නො සිතව'යි වදාළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් ජොතිය තෙරුන් වහන්සේ භව සැපත් වළඳා කෙළවර නිවන් සම්පත් අත් කළා සේ පින් කම නො පමා ව හැසිර භව සැපතු ත් තෙල ලෙසින් ම වළඳා කෙළවර නිවන් අත් කටයුතු.

## 307. රහත් වූ දෙනමක ගේ වස්තු දෙක

තව ද යම් කෙණෙක් නිෂ්ප්‍රයෝජන වූ කෙළි ලළුවෙහි ඇලුම කොට ගෙණ සප්‍රයෝජන වූ කුසල්හි පමා වූ නම් විද්දත් ව ඉපැ ද ත් කෙළි ලළු හැර මහණ ව රහත් වූ දෙනමකගේ වස්තු දෙක දක්වා ප්‍රයෝජනවත් නිමක් මෙ ලොව පර ලොව දෙකින් ම නැති කෙළි ලළු හරවා පින් කම හසුරුවන්ට ඒ වස්තු දෙක කියමු.

කෙ සේ ද යත්—

දෙන්න ම විද්දතුන්ව වුව මනා නම් කෙළි ලළු ම හෙයින් කෙළ ඇවිදිනාහු බුදුන් ගේ බණ අසා මහණ ව රහත් ව ධ්‍යාන ක්‍රීඩාවට පටන් ගත් සේක. එක් දවසක් ඒ දෙ නම බුදුන් හා කැටි ව

Non-Commercial Distribution

ගමට සිඟා ගිය කල්හි වහන්දෑ එක් විද්දතකු කෙළි පානාහු දැක විද්දත් ව මහණ වූ දෙ නමට 'ඇවැත්නි, තෙලේ තමන් දෙ නම මහණ වන්නාට පෙරාතු කෙළි පෑ ඇවිද්ද වේ ද? දැනු ත් තිලි ආල ය ඇත් දෑ'යි විචාරා 'නැතැ'යි කී කල්හි තෙලෙ ලෙස කියන්ට කාරණ කිම ද? ශාසනික ව සිට 'කීවා ගිරිකයන්ගේ කෙළි ලළුයෙහි පමණක් නැති හෙයින් ශාසනයෙහි ත් දුර්වල අදහස් ඇත්තවුන් කෙරෙහි නො පවත්නා නො ව ත් නැත්ත කියා රහත් නියාවක් හඟවන නියා වේ දෑ'යි සිතා ගෙණ එ පවත් බුදුන්ට දැන් වූ සේක.

බුදුහු ත් එ පවත් අසා 'මහණෙනි, විද්දත් කුල හැර ආයර්‍ය ජාතියට පැමිණී ම පුතුන්ට රහත් වූ තැන් පටන් ඒ අදහස් නැතැ'යි වදරා යම් කෙනෙක් දෙව් ලෝ මිනිස් ලෝ දෙකෙහි ම ඇති ආයු ත් සම්පතු ත් හළවූ ද? නැවත පස් කම් ගුණෙහි ඇලු මු ත් අරණ්‍යවාසයෙහි උකටලිය ත් හැර වෙසෙත් ද? කාමයො ගාදී චතුර්විධ යොගයෙන් මිදුනා වූ මාර්ග ඥාන නමැති ජලයෙන් එකොළොස් ගින්න නිවා ගත් හෙයින් ම නිකෙලෙස් වූ ඔහු උතු මැ'යි වදාළ සේක. මේ දේශනා කෙළවර බොහෝ දෙන සෝවාන් ඵලාදියට පැමිණියහ.

එ හෙයින් සත් පුරුෂයන් විසින් කවර ලෙසිනු ත් නිෂ්ප්‍රයෝජන දෙයෙක සිත් නො හෙළා කරණ කියන සිතන දෙයෙක් කුශල් ධර්ම වඩනා දෙයෙකට ම උත්සාහ කට යුතු.

## 308. වංගීස තෙරුන් වහන්සේ ගේ වත

තව ද කෙ තෙක් බාහ්‍ය ශාස්ත්‍රයෙනු ත් ශාසනයට ප්‍රයොජන නැති නියා ව හඟවන්ට වංගීස තෙරුන් වහන්සේ ගේ වත දක්වමු.

කෙ සේ ද යත්—

රජගහා නුවර වංගීස නම් බමුණානා කෙනෙක් මළ මිනි සුන් ගේ හිස් නිය පිටින් ගසා ලා 'මේ නරකයෙහි උපන් කෙණ කුන් ගේ හිස ය. මෙ තිරිසන් යොනියෙහි උපන් කෙණකුන් ගේ හිස ය. මේ ප්‍රෙත ලොකයෙහි උපන් කෙණකුන් ගේ හිස ය, මෙ මිනිස් ලොව උපන් කෙණකුන් ගේ හිස ය, මේ හිස දෙව් ලොව උපන් කෙණකුන් ගේ හිස ය'යි ශාස්ත්‍ර බලයෙන් දිවසින් දක්නා සේ දකිති. බමුණෝ ද මුන් මුල් ව ලොව රවටා කෑ හැක්කැ යි සිතා ගෙණ උන් රත් පිළියක් හඳවා ලා රත් පිළියක් පොරවා ලා හැර

ගෙණ දනවුවල ඇවිදිනාහු මිනිසුන්ට 'මෙ අපගේ වංගීස නම බමුණානෝ මළ මිනිසුන් හිස නිය පිටින් ගසා ලා උන් උපන් තැන් දනිති. තොප තොපගේ මළ නෑයන් උපන් තැන් විචාරව'යි කියති. මිනිස්සු ත් පැහැදීම් තරමට ම දස කළඳක් වුව ත් විසි කළඳක් වුව ත් සියයක් වුව ත් දහසක් වුව ත් දී ලා තමන් තමන් ගේ නෑයන් උපන් තැන් විචාරති. වංගීසයෝ ද හිස නිය පිටින් ගසා ලා මළවුන් උපන් තැන් කියති. ඒ බමුණෝ ත් මෙ ලෙසින් සැවැත් නුවරට ගොසින් දෙව්රම් වෙහෙරට නුදුරු තැනෙක නවාතැන් ගත්හ.

උයි ත් දවල් බත් කා ලා හුන්නාහු බොහෝ දෙනා බණ අසන්ට යන්නවුන් දැක 'කොයි යවු දැ'යි විචාරා බණ අසන්ට වෙහෙරට යමහ'යි කී කල්හි 'ඔබ ගොසින් කුමක් කරා ද? බණ අසන පමණෙක් ම වේ ද? දක්නා ඇරුම නැත්තේ වේ ද? තෙල අපගේ වංගීස නම් බමුණානෝ බලවත් කෙමණෙක. මළ මිනිසුන් ගේ හිස නිය පිටින් ගසා ලා ඇසුණු හඬින් ම උපන් තැන් දනිති. තොප හැමගේ ම මළ නෑයන් උපන් තැන් විචාරව'යි කිවු ය.

ඔහු ත් ඒ අසා 'තොපගේ වංගීසයෝ කුමක් දනිත් ද? ඒ විෂයට අපගේ බුදුන් වැනි කෙණෙක් ඇත් ද? තොප ගේ වංගීස යෝ නරකාදියෙහි උපන් පමණක් දන්නා බව මුත් උත්පත්ති කාර ණ වූ කර්ම විෂ ය[1] 'නො දන්නෝ වේ ද? අප ගේ බුදුහු කර්ම විෂ- ය ත් දැන වදරල සේකැ'යි කීහ. බ්‍රාහ්මණයෝ, කර්ම විෂ ය දනිත ත් නො දනිත ත් අපගේ වංගීසයෝ ම වඩිති'යි කීහ. මෙ ලෙස කියා පසු බැස්මක් නැති බැවින් කලහ වඩා ගෙණ 'එ සේ වී නම් තොප ගේ වංගීසයන් වඩනා නියා වෙව යි, අපගේ බුදුන් වඩනා නියා වෙව යි, එක් තැන් කොට ලා බලන්ට වුව මනා වෙ දැ'යි බමුණ නු ත් කැඳවා ගෙණ විහාරයට යන්ට නික්මුණාහ.

බුදුහු ත් උන් එන නියා ව දැන ලා නරකයෙහි ත් තිරිසන් යෝනියෙහි ත් මිනිස් ලොව ත් දෙව් ලොව ත් උපන් සතර දෙන කුගේ හිස් සතරක් හා රහත් තැනකගේ හිස ය යි හිස් පහක් ගෙන්වා ගෙණ පිළිවෙළින් තබ්බවා ලා උන් හැම දෙනා ආ කලට වංගීසයන්ට 'තොපි මළ වුන්ගේ හිස් නිය පිටින් ගසා පියා ලා උන් හැම උපන් තැන් දනු දැ'යි විචාළ සේක. 'එ සේ ය. දනිමි'යි කී කල්හි පන්තින් තැබූ හිස් වලින් මුල තිබූ හිස තෙලෙ කාගේ හිසෙක් දැ'යි විචාළ සේක. වංගීසයෝ ත් හිස නිය පිටින් ගසා පියා නරකයෙහි උපන් කෙණකුන්ගේ ය' කිවු ය.

---

1. කර්ම විශෙෂ ය

Non-Commercial Distribution

බුදුහු ත් උන් ගේ සිත සතුටු කරවා සාධුකාර දෙවා වදරා අනික් හිස් තුන ත් විචාරා උන් තිරිසන් යෝනියෙහි උපන් කෙණකුන් ගේ හා මිනිස් ලොව උපන් කෙණකුන් ගේ හා දෙව් ලොව උපන් කෙණකුන් ගේ හිසැ යි හිස් තුන ම තෝරා කියා ලූ කල්හි වෙන වෙන ම සාධුකාර දෙවා වදරාපස් වැනි ව තුබූ හිස පෑ ලා තෙලෙ කා ගේ හිස දැ'යි විචාළ සේක. උහු නිය පිටින් ගසා පියා උපන් තැනු ත් නැති බැවින් ඒ දන්ට නිසි ශාස්ත්‍ර ය ත් තමන් කෙරෙහි නැති බැවින් නො දත්හ. බුදුහු ත් වංගීසයෙනි, ඒ හිස ඇත්තවුන් උපන් තැන් නො දනු දැ[1]'යි විචාරා නො දනිමි කීකල්හි ඊ සවරූප මම දනිමි'යි වදාළ සේක. වංගීසයෝ ද තමන් ඒ හැම දන්නා මන්ත්‍රානුභාවයකින් හෙයින් බුදුන් ගේ දැන්ම ත් මන්ත්‍ර බලයෙකිනැ යි සිතා 'එ ම මන්ත්‍ර ය මට දෙන්ට වුවමැනැ වැ'යි කීහ. මහණ ව උගතමනා මන්ත්‍රයක් බැවින් මහණ නුවූ වන්ට දෙන්ට බැරි ය'යි වදාළ සේක.

වංගීසයෝ ද 'මෙ මන්ත්‍ර ය උගතිමි නම ශාස්ත්‍ර දැන්මෙන් මුළු දඹ දිවට උතුම වෙමි'යි සිතා ලා බමුණන් නම ශාස්ත්‍රලොභී හෙයින් මහණ ව උපසම්පදාවත් ලැබ කීප දවසෙකින් ම විවසුන් මතුරු බලයෙන් රහත් ව රහතන් ගේ හිසු ත් රහත් හිස යි දන්ට බල ඇති ව බමුණන් අවුත් මහණ වන්ට යන ගමනෙන් කළ කථා ලෙසට මන්ත්‍ර උගත් නියා ව විචාළ කල්හි යම මන්ත්‍රයක් අරහයා විචාරත් නම ඒ මන්ත්‍ර ය උගන්ව තමන් වහන්සේ අයොගා‍ය නියාව ත් බමුණානන් කරා ගමන් තබා සසර ගමන් නැති නියාව ත් කී සේක.

වහන්දෑ ද එ පවත් අසා 'මුන් මහණ වූයේ කවද ද? මෙ තෙක් කල් මහණ වූ අප හැම හින්ද දී මුන් ම රහත් වූ නියා දැ'යි හැදහිලි නැති ව බුදුන්ට දැන් වූ සේක. බුදුහු ඔබ රහත් නියා ව හඟවන සේක් 'මහණෙනි, යම කෙණෙක් සත්‍වයන් ගේ චුති-ප්‍රති සන්ධි දෙක දිවැස් ඇති බැවින් දනිත් ද, කිසිවෙක ත් ඇලුම නැත්තෝ ද, පිළිවෙත මනා ව පිහිටියෝ ද, චතුරාර්‍ය්‍ය සත්‍ය ය දැන සිටියෝ ද, උන් උතුමැ'යි කියමි. දෙවියන් වුව ත් මිනිසුන් වුව ත් යම කෙණකුන් ගේ නිවී ගිය පහනෙක ඔබ-බෙක පිහිටීම නැත්තා සේ භවෝත්පත්ති ය නැති හෙයින් උත්පත්ති ය නො දකිත් ද එ සේ වූ රහතන් තෙලෙ ලෙස කියන්ට ම තරම. මෙ ලෙස කියාදී ත් තෙපි උන් කෙරෙහි හැදහිල්ල නැත්තා නම තොපට වන හානි මුත් තෙලෙ ලෙස

1 නො දකු දැ යි

Non-Commercial Distribution

කීමෙන් උන්ට වන හානි නැතැ'යි වදාළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් සොපද්‍රව වූ මන්ත්‍ර ශාස්ත්‍රාදියෙහි ඇලුම් හැර නිරවද්‍ය ව තිබෙන කුශලයෙහි ම හැසිර සියලු ලෙසින් ම නිරුපද්‍රව වූ නිවන් ම අත් කට යුතු.

## 309. ධම්ම දින්නා මහන්දෑ ගේ වස්තුව

තව ද ගුණ ඇත්තවුන් ගේ ගුණයෙහි පහදු ත් මුත් ගුණමකු නො වීම සඳහා ධම්ම දින්නා මහන්දෑ ගේ වස්තුව දක්වමු.

කෙසේ ද යත්—

උන්දෑ ගිහි අවස්ථාවෙහි ස්වාමී ව සිටි විශාඛ නම් උපාසක යෝ එක් දවසක් බුදුන්කරා ගොසින් බණ අසා අනාගැමි ඵලයෙහි පිහිටා 'මා ගේ සියලු සම්පත් ම මා ඊ ඇලුම් නැති බැවින් ප්‍රයෝජන විඳින්ට නිසි ව සිටි ය ධම්මදින්නාවන්ට නිල කෙළෙම් නම් යහපතැ'යි සිතූහ. උං තුමූ ඊට පෙරාතු ගෙට එන කල ධම්මදින්නාවන් කවුළු දෙරින් බලා සිටිනවුන් දැක සිනාවක් පහළ කෙරෙති. එ දවස් ඒ දිග නො බලා මනික්මුණා හ. ධම්මදින්නාවෝ ත් කාරණ කිම් දෝ හෝ'යි සිතා 'වන්නාට, බත් කන වේලේ දී විචාරමි'යි සිතා ලා බත් කන්ට හුන් කලට බත් ලා ලා සිටියෝ ය. මෙ තෙක් දවස් විශාඛයෝ කැටි ව හිඳ බත් කන්ට ධම්මදින්නාවන් කැඳවති. එ දවස් නො කැඳවා ම බත් අනුභව කෙරෙති. එන ගමනේ මා දසාව බලා නුපුයෙ ත් බත් කන්ට නො කැඳවූයේ ත් මා කෙරේ මුසුප්පුවක් ඇති වනැ'යි සිතූ හ.

විශාඛයෝ ත් බත් කා ලා සුවසේ හුන් වේලේ දී උන් කැඳවා ලා 'මෙ ගෙයි සියලු සම්පත් තොපට දෙම්හ. තෝ ප්‍රයෝජන විඳුව'යි කීහ. ධම්මදින්නාවෝ ත් 'මුසුප්පුවක් ඇති කෙණෙක් සම්පත් නිල කෙරෙත් ද? කාරණ කිම් දෝ හෝ'යි සිතා 'මුඹ නැ'යි කිවු ය. මම මෙ වක් පටන් සම්පතෙක නො බැඳෙමි'යි කී කල්හි ධම්මදින්නාවෝ ත් තමන් කළ පින් ඇති හෙයින් 'කාරා දමා පූ කෙළ පිඩක් සේ මුඹ නිරාල ය ව හළ සම්පත් මට හැයි' ද? මාත් මහණ වන්ට අනුදත 'මැනැවැ'යි කිවු ය. උයි ත් යහපතැ'යි ගිවිස මහ පෙරහරින් උන් මෙහෙණවරට ගෙණ ගොසින් මහණ කරවූහ.

Non-Commercial Distribution

උන්දෑ ද උපසම්පදව ත් ලදින් විවෙකාර්ථී ව මෙහෙණින් වහන්දෑ හා කැටි ව දනවුවට ගොසින් එහි වසන දෑ නො බෝ කලෙකින් ම පිළිසිඹියා පත් රහත් ව සෙස්සවුන්ට පිරෙන පින් නෑයන්ට පිරෙන නිසා නැවත රජ ගහා නුවරට ආ දෑ ය. විශාඛ නම් උපාසකයෝ ත් උන් දෑ ආ නියා ව අසා කුමක් නිසා ආ නියා දෝ යි සිතා මෙහෙණවරට ගොසින් සාර්වරීන්දෑ වැඳ ලා එකත් පස් ව හිඳ සස්නෙහි උකටලී ඇති ව ආ නියා දූ යි විචාරීම යුක්ත නො වන්නේ වේ ද යි සිතා 'ලොවුතුරා විෂයෙන් ප්‍රශ්නයක් විචාරමි. ඒ ප්‍රශ්න අධිගත කෙණකුන්ට මුත් කියා ලීම බැරි බැවින් කියා ලූ සේක් නම් අධිගම ලත් නියා ය. අධිගත කලට උකටලී නැත්තේ වේ දැ'යි සිතා ශ්‍රොත ආපත්ති මාර්ග විෂයෙහි ප්‍රශ්න විචාළහ. සාර්වරීන්දෑ ද විසඳූ දෑ ය. උපාසක යන් සෙදගැමි අනගැමි-මග ත් ප්‍රශ්න විචාරා රහත් මග ත් ප්‍රශ්න විචාළ කල්හි උන් තව රහත් නුවූ හෙයින් 'ඒ තව තොපට විෂය නො වෙයි. කැමැත්තා නම් බුදුන් කරා ගොසින් විචාරව'යි කිවු දෑ ය.

උයි ත් බුදුන් කරා ගොසින් තමන් ප්‍රශ්න විචාළ ලෙස ත් ධම්මදින්නාවන් දෑ විසඳූ ලෙසක් මුළුල්ල ම බුදුන්ට දැන්වූහ. බුදුහු ත් ඒ අසා 'ධම්මදින්නාවන් කී නියා ව ඉතා ම යහපත. මා වුව ත් තෙලෙ ප්‍රශ්න විසඳන්නේ තෙලෙ තරමෙ ම ය'යි වදරා බණ වදරණ සේක් 'යම් කෙණකුන්ට ගිය දවස පැවැති පස් කඳෙහි ත් මතු එන දවස පවත්නා පස්කඳෙහි ත් ඇල්මෙක් නැත් නම් සියලු ලෙසින් ම නිකෙලෙස් වූ ඔහු උතුමැ යි කියමී'යි වදළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් යට ගිය දවස පැවැති ස්කන්ධයන් කෙරෙහි ඇලුම් හැර ගත නුහුණ ත් දැන් පවත්නා ස්කන්ධයන් කෙරෙහි ඇලුම් හැර මේ ජාතියෙහි භව ක්‍ෂය කට නුහුණ ත් ආයති කාලයෙහි භව ක්‍ෂයට උත්සාහ කට යුතු.

## 310. අඟුල්මල් මහ තෙරුන් වහන්සේ ගේ වත

තව ද රහතන්ට භය නැති නියා ව හඟවන්ට අඟුල්මල් මහ තෙරුන් වහන්සේ ගේ වත කියමු.

කෙ සේ ද යත්—

මල්ලිකා බිසොවුන් ගේ නියොගයෙන් දුෂ්ට ඇතා අඟුල්මල් මහ තෙරුන් වහන්සේට කුඩ ය අල්වා ගෙණ සිටියා බලා

Non-Commercial Distribution

'ඇවැත්නි, බා ගියේ ඇත් ද'යි විචාළ කල්හි 'භයෙක් නැතැ'යි කී හෙයින් 'ස්වාමීනි, අඞ්ගුල්මල් තෙරහු නැත්ත කියා රහත් නියාවක් හඟවති' යි වහන්දෑ ත් බුදුන්ට දන් වූ සේක. ඔබ රහත් හෙයින් භය නැති නියා ව බුදුහු වදරන සේක් යම් කෙණෙක් තෘෂ්ණා ගැන්මෙක් නැති බැවින් වෘෂභ රාජයක්හු වැන්නෝ ද, ශීල සමාධ්‍යාදි උත්තම ගුණ යොගයෙන් උතුම් වූහු ද, වඩන ලද චතුර් විධ සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍ය ඇත්තෝ ද, මහත් වූ ශීලස්කන්ධාදීන් ගවෙෂණ ය කෙරෙත් ද, තුන් මරුන් දිනා සිටියෝ ද, අර්හත් මාර්ග ඥාන නමැති පැණින් කෙලෙස් කුණු සෝධා නහා සිටියෝ ද, චතුරාර්‍ය්‍ය සත්‍ය ය දත්හු ද, උන් උතුමැ යි කියමි. අඞ්ගුල්මල් තෙරුනු ත් මෙ බඳු තරම් ඇති හෙයින් උන්ට භය නැති හෙයින් ම පුත්හු තමන්ට භය නැතැ'යි කිවු ය'යි වදාළ සේක. දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ.

එ හෙයින් නුවණැත්තවුන් විසින් සසර භය නුව මනා වී නම් රහත් වීමට ම උත්සාහ කට යුතු.

## 311. දෙවංගික බමුණානන් පැන විචාළ වත

තව ද ගිලන් පස ය විනවූවන්ට ත් විරොධ නැති නියා ව හඟවන්ට දෙවංගික බමුණානන් පැන විචාළ වත දක්වමු.

කෙ සේ ද යත්—

එක් සමයෙක බුදුහු ඇඟ පහරනා රුජා ඇති ව උපවාන තෙරුන් වහන්සේ හුණු පැනක් ඉල්වා ගෙණ එන්ට දෙවංගික නම් බමුණානන් ගේ ගෙට යවා වදාළ සේක. උන් වහන්සේ ත් උන් කරා ගොසින් බුදුන්ට රුජා ඇති නියා ව වදරා හුණු පැනක් ඉල්වූ සේක. ඒ බමුණානෝ සතුටු ව ගොසින් මට වූයේ බලවත් වූ ලාභයෙක. බුදුන් මා ගෙන් හුණු පැනක් ඉල්වා එවූ ගමනින් ම මාගේ තරම් සිටියේ ය'යි සිතා ගෙණ උණු පැන් කඳකු ත් මිනිසකු ලවා ගෙන්වා ගෙණ යන්ට නිල කොට ලා උක් පැණි මුලකු ත් උපවාන තෙරුන් වහන්සේ අතට පිළිගන්වා ලූහ. තෙරුන්—වහන්සේ ත් ඒ ගෙන්වා ගෙණ වෙහෙරට ගොසින් බුදුන් හුණු පැණින් නාවා පියා හුණු පැනෙයි පැණි වත් කොට කලන්දු කොට ලා බුදුන් වළඳවා ලූහ. ඒ ඇසිල්ලෙහි ම රුජා නැති වි ය. බමුණානෝ 'කවුරුන්ට දුන් දෙයෙහි විපාක බලවත් දෝ හෝ' යි ඒ බුදුන් විචාරමි' බුදුන් කරා ගොසින්—

Non-Commercial Distribution

"කත්‍ථ දජ්ජා දෙය්‍යධම්මං - කත්‍ථ දින්නං මහප්ඵලං,
කථං හි යජමානස්ස - කථං ඉජ්ඣති දක්ඛිණා."

යනු හෙයින් 'කොතැනකට දුන් දෙයෙහි විපාක බලවත් ද'යි විචාළෝ ය. බුදුහු ත් යම් තැනකට දුන් දනෙහි විපාක බලවත් වී නම් ඒ තැන් දක්වන සේක් 'යම් කෙණෙක් ත්‍රි විද්‍යාව සිද්ධ වී මෙන් පෙර විසූ කඳ පිළිවෙළ දනිත් ද, සප්ත කාම ස්වර්ග ය හා බඹ ලෝ විස්ස ත් සතර අපාය ත් දිවසින් දකිත් ද, රහත් වීමෙන් විශිෂ්ට වූ නුවණින් දත යුත්ත විශිෂ්ට වූ නුවණින් දැන, පිරිසිඳ දත යුත්ත පිරිසිඳ දැන, පැහිය යුත්ත පාහා, සාක්‍ෂාත් කට යුත්ත සාක්‍ෂාත් කොට හෙවත් දුක් පිරිසිඳ දැන තෘෂ්ණාව නසා මාර්‍ග භවමින් නිවන් සාධා ගෙණ සිටියෝ නම් උන්ට දුන් දෙයෙහි විපාක ත් බලවත. උන් උතුමැ'යි කියමි' වදරා දෙශනාව නිමවූ සේක. මේ දෙශනා කෙළවර බොහෝ දෙන නිවන් දුටහ. බමුණානෝ ත් තුනුරුවන්හි පැහැද සරණ සීලයෙහි පිහිටා උපාසක වූහ. මේ දෙශනාව පස්වා දහසක් මුළුල්ලෙහි බොහෝ දෙනාට චින්තා මාණික්‍ය-කල්ප වෘක්‍ෂ-කල්ප ලතා-භද්‍රඝටාදියක් මෙන් ඉෂ්ටාර්‍ත්ථ සාධක විය.

එ හෙයින් සත් පුරුෂයන් විසින් ගිලන් තැනට උපස්ථාන කිරීම ත් බුද්ධවර්ණිත කුශලයක් බැවින් එහි හැසිර ගිලනු ත් ලෙසින් මුදන සේ අකුසලින් දුරු ව උන් ආරොග්‍යතාවෙහි පිහිටියා සේ කුසල්හි පිහිටා ලොවී ලොවුතුරා සැපත් සිද්ධ කරන්ට උත්සාහ කට යුතු.

## 312. මඞ්ගල සූත්‍ර අටුවා ආදී වූ කථාන්තර

තව ද අකුසලින් දුරු වීමට හළ මනා දෙය ත් කුසල් හි පිහිටීමට කළ මනා දෙය ත් දක්වනු පිණිස මඞ්ගල සූත්‍ර අටුවා ආදී වූ කථාන්තර ත් දක්වමු.

කෙ සේ ද යත්—

දඹ දිව තෙලෙහි ප්‍රසිද්ධ ව තිබෙන නුවර වලින් බරණැස් නුවර ය, සැවැත් නුවර ය, ලිච්ඡවි රජුන් ගේ විසල් මහනුවරය, මිහිළි නුවර ය, අළවු නුවර ය, කොසඹෑ නුවර ය, තක්සලා නුවර ය, කාළ චම්පා නුවර ය, මදු රට සාගල නුවර ය; නුවරට බිම බලන දවස් කිඹුලකු හඬාපී හෙයින් හෝ කිඹුලකු වැනි ගල තලක් නුවර ගාවා ඇති හෙයින් සුංසුමාරගිරි නම් නුවර ය, මහාමන්ධාතු ආදී වූ රජ දරුවන් විසින් පරිග්‍රහ ය කරණ ලද

Non-Commercial Distribution

හෙයින් හෝ ගිජ්ඣ කූට වෙහරාදී පර්වතවලට මද්ධ්‍ය හෙයින් හෝ නොහො ත් බබළන්නා වූ මාළිගා ගෙවල් ඇති හෙයින් රජ ගහා නුවර ය, ශාක්‍ය රජුන් ගේ කිඹුල් වත් නුවර ය, සාකෙත—නුවර ය, කුරු රට ඉඳිපත් නුවර ය, පැළලුප් නුවර ය, ජයතුරා නුවර ය, සකස් පුර නුවර ය, මල්ල රජුන් ගේ කුසිනාරා නුවර ය, යන මෙකී නුවර වල ත් අඟු රට කම්පිල්ල රට ආදි නො එක් රට-වල ත් ශාක්‍ය දනවු ආදි වූ නො එක් දනවුවල ත් මිනිස්සු සකල සම්පත්තීන් සමෘද්ධ කාල ය හෙයින් බොහෝ දෙන රැස් ව පියාකයට සිතට දුක් නැති හෙයින් නිකම් නො කියන හෙයින් රන්රත් රන් ආදි ය දී පියා ත් කළ මනා වූ කුශල සන්නිශ්‍රිත කථා නො ව රාම ගීතා කථා දී වූ සවර්ග මොක්ෂ බාධක කථා කියවති. ඉන් එකි එකී කථාවක් ම වහා නිමවන්ට නැති ව සාර මසකින් නිම යි.

එක් දවසක් රැස් ව හුන්නවුන් ගෙන් එක් කෙණකුන් 'මඟුලට යම්හ'යි කී කල්හි 'මූ මඟුලට යම්හ'යි කියති. මඟුල නම් තමා කවරේ ද'යි උපදවා ගෙණ කරණ කථා අතුරට මේ මඞ්ගල කථාව ත් තමා වැඩ කරු කථා හෙයින් පහළ වි ය. රැස් ව හුන්නවුන් ගෙන් එක් කෙණෙක් 'මඟුල් නම් අභිවෘද්ධි කාරණ ය'යි මෙ විතරකින් කියා පියා තබා නො පියා නැවත 'දන්නා තැනකින් විචාරම්හ'යි කියා ත් නො පියා 'මම මඟුල් දනිමි. මේ ලෙව්හි යම් කිසි කෙණෙක් නිදා නැඟී සිට සරළුවන් දකිත් ද, නැවත බෙල් යටක් හෝ දකිත් ද, දූරි ඇති කෙණකුන් හෝ දකිත් ද, වැළවළලු ලා සරහා ලත් බාල දරුකෙණකුන් හෝ දකිත් ද, නැවත පිරුණු පැන් කළයක් හෝ දකිත් ද, අලුත් රේමසකු හෝ දකිත් ද, ආජානීය අශ්වයන් හෝ දකිත් ද, ආජානීය අශ්ව-යන් යෙදූ රථයක් හෝ දකිත් ද, බැමිණුවන් දෙනුන් හෝ දකිත් ද, තවත් අනිකු ත් මෙ බන්දක් දුටුවු නම් ඒ මඟුලැ'යි කිවු ය.

උන් ගේ බස් සමහර කෙණකුන් තමන් දන්නා මඟුලු ත් එ තෙක් ම හෙයින් ගිවිස ගත්හ. සමහර කෙණෙක් තමන් නො ගිවිස්සහ. යම් කෙණෙක් නො ගිවිස්සෝ නම් උඟ තුමූ දුටු දෙය මඟුලැ යි කීවවුන් හා විවාද කොට ගෙණ 'ඇස නම් යහපත ත් දක්කි, නපුරත් දක්කි. ඉදින් ඇසින් දුටු දෙය මඟුල් වේ නම් දුටු යම් දෙයක් ම මඟුල් වුව මැනව. එ සේ කලට ඒ යුක්ති නො වෙයි. අපි මඟුල් දනුම්හ. මේ ලෙව්හි යම් කෙණෙක් නිදා නැඟී සිට 'වඩත්' යන බස හෝ 'වඩ මනා යන බසක් හෝ 'පුණ්ණයෙනි' යන බසක් හෝ 'ඵුස්සයෙනි'

යන බසක් හෝ 'සුමනයෙනි, යන බසක් හෝ 'ශ්‍රියා ය'යි යන බසක් හෝ 'ශ්‍රී වැඩි ය'යි යන බසක් හෝ අද නකත් මොහොත යහපත, දවස් යහපතැ'යි යන බසක් හෝ තවත් අනික් යහපත් බසක් අසත් ද කනට ඇසුණු දෙය ම මඟුලැ'යි කිවු ය. උන් ගේ ඒ කථා ත් සමහර කෙණෙක් ගිවිස්සෝ ය. සමහර කෙණෙක් තමන් මඟුල් නො දනිතු ත් නො ගිවිස 'කනට නම් යහපත ත් ඇසෙ යි. නපුර ත් ඇසෙයි. කනට ඇසුණු දෙය ම මඟුල් වේ නම් මේ ලොව නපුරු මුව හොරා නැති නියා වේ දැ'යි වාද කළහ.

විවාද පමණෙකින් තබා පූ කලට තමන් ගේ දැනුමක් හෝ නො දැන්මක් හෝ නො පෙනෙන හෙයින් ගොඩිගළ කම් හඟවා 'අපි මඟුල් දනුම්හ. මේ ලෙව්හි යම් කෙණෙක් නිදා නැඟී සිට නාසයට ඇසෙන සඳුන් සුවඳ ආදී වූ සුවඳක් අසත් නම් එයි ත් මඟුල. නැවත අලුත් දැවිටි දණ්ඩක් කැවූ නම් ඉදින් දිවට දැනුණු රස ය ත් මඟුල. පොළොව අල්වා හෝ නිලිගත් ගොයම් අල්වා හෝ අලුත් දපු ගොයමක් අල්වා හෝ කැස්බකු අල්වා හෝ තල ගොයක් අල්වා හෝ නා මල් සපු මල් ආදියක් අල්වා හෝ වැල වරකා ආදී වූ එලා එලයක් අල්වා හෝ යම් පහසක් ලද්දූ නම් ඒ පහස ත් මඟුල, මඟුල් වේ නම් මේ තුන ය'යි කිවු ය.

උන් ගේ කථා ත් සමහර කෙණෙක් ගිවිස ගත්හ. සමහර කෙණෙක් 'ඒ කිම ද? නාසයට. සුවඳෙක් ම ඇසේ නම්, දිවට යහපත් රස ම දැනේ නම්, ඇඟට යහපත් පහස් ම දැනේ නම් තෙල යුක්ති ය. නාසයට නම් සුවඳ ත් ඇසෙ යි. දුගඳ ත් ඇසෙයි. දිවට යහපත් රස ත් නපුරු රස ත් දැනෙ යි. කයට යහපත් පහසු ත් නපුරු පහසු ත් දැනෙ යි. නාසයට ඇසුණු දෙය හා දිවට දැනුණු දෙය හා කයට හැඟුණු දෙය හා හැම මඟුල් වේ නම් කුණු ගඳ ත් ඇසී ගිය කලට නාසය හකුළු වන්නේ හැයි ද? තිත්ත දෙයක් සපා පියා මූණ හකුළුවන්නේ හැ යි ද? වස කෑ කල මියන්නේ හැයි ද? ගල පිට දඬු පිට වැද හොත් කලට 'පිට රෙදෙ යි ඇලය රෙදෙ යි' කියන්නේ ත් හැයි ද, තෙලේ ත් අයුක්ති ය'යි ඇසූ දෙය මඟුලැ යි කීවවුන් හා විවාද කළහ.

දුටු දෙය මඟුලැ යි කීවො ත් ඇසූ දෙය මඟුලැ යි කීවො ත් නාසයෙන් ඇසුණු දෙය හා දිවින් දත් රස ය හා කයට හැඟුණු පහස ම මඟුලැ යි කීවොත් පිළිවන් ව පෙනෙන හෙයින් ඔවුනොවුන් හා විවාද කරණ පමණක් මුත් තමන් කිය කියා ලූ

දෙය කාරණා කියා සිටුවා ලිය හෙන්නෝ නැත. මෙ ලෙසින් මේ මඟුල් කථාව දඹ දිව මුළුල්ලෙහි ම ප්‍රසිද්ධ වී ය. දඹ දිව වැසි මිනිස්සු මුළුල්ල ම මුළු මුළු ව පියා 'වැළි මේ හැම මඟුල් නො වන කලට මඟුල් නම් කවරේ දෝ හෝ යි සිතන්ට වන්හ. උන් ගේ වසයෙන් උන්ට රකවලට සිටිනා දෙවියෝ ත් 'මඟුල් නම් කවරේ දෝ හෝ'යි සිතන්ට වන්හ. උන් ගේ වසයෙන් උන්ට මිත්‍ර ව හිදිනා ගස් කොළවල වසන දෙවියෝ ද මඟුල් ම සිතන්ට වන්හ. උන් ගේ වසයෙන් උන්ට මිත්‍ර ව හිදිනා සව් මහ රජයෙන් පාත අහස වසන දෙවියෝ ත් සිතන්ට වන්හ. උන් ගේ මිත්‍ර ව හිදිනා සව් මහ රජයෙහි දෙවියෝ ත් මඟුල් සිතන්ට වන්හ. උන් ගේ වසයෙන් උන්ට මිත්‍ර ව හිදිනා තව්තිසා වැසි දෙවියෝ ය. උන් ගේ වසයෙන් උන්ට මිත්‍ර ව හිදිනා යාම දෙව් ලොව දෙවියෝ ය. යාම දෙවියන්ට මිත්‍ර වූ තුසී පුර වැසි දෙවියෝ ය. උන්ට මිත්‍ර වූ නිර්මාණරති දෙවියෝ ය. උන්ට මිත්‍ර වූ පරනිර්මිත වසවර්ති දෙව් ලොව දෙවියෝ ය යි මෙ දේවතාවෝ ත් 'මඟුල් නම් කවරේ දෝ හෝ'යි සිතන්ට වන්හ.

සිතන්ට සිත් නැති හෙයින් හා අසන්ට කන් නැති හෙයින් අසඤ්ඤයන් හා සිතන්ට සිත් ඇත ත් අසන්ට කන් නැති හෙයින් අරූපී බ්‍රහ්මයන් හැර සෙසු බඹ දෙවියෝ ත් මඟුල් සිතන්ට පටන් ගත්හ. මේ මඟුල් කථාව මේ දඹ දිව යම් සේ පැවැත්තේ වී නම් දෙව් බඹුන් ගේ වසයෙන් දස දහසක් සක්වළ මුළුල්ලෙහි ම පැවැත්තේ ය. 'මඟුල් නම් කවරේ දෝ හෝ'යි සිතිවිලි පමණක් මුත් මෙ ම මඟුලැ යි යන ලබ්ධි ය නැති හෙයින් නිවන් දුටුවවුන් හැර සියලු ම දෙව් මිනිස්සු ඇසින් දුටු දෙය මඟුලැ යි ලබ්ධි ගත් එක් පක්ෂයෙක, නාසයට ඇසුණු ගන්ධ ය හා දිවට දැනුණු රස හා කයට හැඟුණු පහස හා තුන මඟුලැ යි ගත් එක පක්ෂයෙකැයි තුන් පක්ෂයෙක් වූහ. මෙ සේ පක්ෂ වූ පමණක් මුත් ඔවුනොවුන් ගිවිස්වා ගත නො හෙති. කොලාහල පසින් මේ මඞ්ගල කොලාහල ය සංනිවුහන් නැති ව මිනිස් ලොව හවුරුදු ගණිනින් දෙළොස් හවුරුද්දක් පැවැත්තේ ය.

කොලාහල පසින් අනික් කොලාහල සතර කවරේ ද යත්— කප නස්නට අවුරුදු ලක්ෂයක් තිබිය දී ම කල් තබා කාමාවචර දෙවියෝ රත් සළු හැඳ ගෙණ හිසකේ උනා පිට හෙළා ගෙණ හඬමින් වලපමින් ඉතා නපුරු වෙස් ඇති ව මිනිස් ලොවට බැස පියා 'හෙම්බා, නිදුක්නි, මෙ වක් පටන් හවුරුදු ලක්ෂයක් ගිය කලට සත් හිර පහළ වීමෙන් කප නස්සි. කෙළ ලක්ෂ

Non-Commercial Distribution

යක් සක් වල එක පැහැර නස්සි. මහ මුහුද වියළෙ යි. මහ පොළ ව ත් මහ මෙර ත් නස්සි. නො නස්නා බඹ ලොව තබා සෙසු බඹ ලොව පටන් උඩින් නස්සි. නිදුක්නි අනික් පිණක් නැති බැවින් ඔවුනොවුන් කෙරෙහි මෙත් සිත් පතුරුවව. දුක්ඛිතයන් කෙරෙහි කරුණා ත් ඇති වව. සුඛිතයන් කෙරෙහි මුදිතා ත් ඇති වව. උපෙක්‍ෂා ත් ඇති වව. දෙ මවු පියන්ට උපස්ථාන ත් කරව. කුල දෙවුවන් පුදව. නො පමා වව'යි කියා ඇවිදිති. මේ කල්ප කෝලාහල ය.

සක්විති රජුන් උපදනාට පෙරාතු හවුරුදු සියයක් තිබැදී කාමාවචර දෙවියෝ ම මිනිස් ලොවට බැස මෙ වක් පටන් හවුරුදු සියයක් ගිය කලට සක්විති රජ්ජුරු කෙණෙක් ලොව පහළ වෙති කියා ඇවිදිති. මේ සක්විති කොලාහල ය.

යම් කලෙක බුදු කෙණකුන් වහන්සේ ලොව පහළ වන සේක් නම් හවුරුදු දහසක් තිබියදී ම පෙරාතු කොට ම අනැගැමි බඹු බ්‍රාහ්මාභරණයෙන් අමුතුවන් ව සැරහී ගෙන ශුද්ධාවාස බඹ ලොවින් මිනිස් ලොවට බැස පියා මෙ තැන් පටන් හවුරුදු දහසක් ගිය කලට බුදු කෙණකුන් වහන්සේ ලොව පහළ වන සේකැ'යි කියා ඇවිදිති. මේ බුද්ධ කොලාහල නම් වෙයි.

කල්ප කෝලාහලය ත් චක්‍රවර්ති කොලාහල ය ත් බුද්ධ කොලාහල ය ත් දෙව්-බඹුන් කියා ඇවිදිනා හෙයින් කෝලාහල වන්නාට ය. මඞ්ගල කථාව කෝලාහල වූයේ කෙසේ ද යත්-අනැගැමි බඹු ම දෙව් මිනිසුන් ගේ අදහස් දැන ගෙණ මිනිස් ලොවට බැස ලා 'දෙළොස් හවුරුද්දක් ගිය කලට බුදුහු මඟුල් වදරන සේකැ'යි කියා ඇවිදිති. ඒ තමා ත් උපදනේ බුදුන් උපන් සමයෙක. එ හෙයින් ඒ මඞ්ගල කෝලාහල නම් වෙයි.

තව ත් අනැගැමි බඹු ම මිනිස් ලොවට බැස පියා සත් හවුරුද්දක් ගිය කලට එක් කෙණකුන් වහන්සේ බුදුන් කරා එළඹ මුනි භාව ය කරන්නා වූ පිළිවෙත් විචාරන සේකැ'යි කියා ඇවිදිති. මේ මොනෙය්‍ය කොලාහල නම් වෙයි.

මෙ සේ මේ කොලාහල පසින් මඞ්ගල කෝලාහල ය ලොව පහළ ව මඟුල් දැනගත නො හීමෙන් ම දෙළොස් හවුරුද්දක් ගිය කලට තව්තිසා වැසි දෙවියන්ට උන්ගේ දින වසයෙන් සත් පෑ දෙළොස් විනාඩිගාවක් විතර ගිය කලට තව්තිසා වැසි දෙවියෝ එක් තැන්

Non-Commercial Distribution

ව ලා 'නිදුක්නි, යම් සේ ගෘහිමියෙක් ගෙයි මිනිසුන්ට මුදලි ද, ගම් මුදලියෙක් ගම් වැස්සන්ට මුදලි ද, රජ්ජුරු කෙනෙක් රට වැස්සන්ට නායකයෝ ද එ පරිද්දෙන් සක් දෙව්දුහු අප දෙව් ලොව දෙවියන්ට නායක සේක. උන් වහන්සේට මෙ පවත් කිව මනා වේ ද'යි ශක්‍රයනු ත් ඒ ඇසිල්ලට නිසි වූ සළු හැඳ ආභරණ ලා අඩු තුන් කෙළක් දෙවඟනන් පිරිවරා ගෙණ පරසතු රුක මුල පඬු ඇඹුල් සල හස්නෙහි විජම් දෙශනාවට පෙරාතු හෙයින් හුන්න වුන් කරා ගොසින් වැඳ ලා එකත් පස් ව සිට 'ස්වාමීනි, දන්වන්නට දෙයෙක් ඇත. මඞ්ගල කථාවෙක් ලොව ඉපැද දුන් මහා කොලා හල ය. සමහර කෙනෙක් ඇසින් දුටු දෙය මඟුලැ යි කියති. සම හර කෙනෙක් පියවි කනින් ඇසූ දෙය මඟුලැ යි කියති. සමහර කෙනෙක් ගන්ධ රස ස්පර්‍ශව්‍ය ය මඟුලැ යි කියති. එක්තරා සනි- ටුහනක් නො වූ හෙයින් මින් කවරක් මඟුල් බව ත් නො දනෙයි. ඉන් යමෙක් මඟුල් වේ නම් අපට ඒ වදළ යහපතැ'යි කිවූ ය.

සක් දෙව්දු ද තමන් මහ නුවණ ඇති හෙයින් 'මේ මඞ්ගල කථාව තෙපි ම සිතා ගතු ද? යමකුගෙන් ඇසූ දෑ'යි විචාළෝ ය. ඌ තමන් සව් මහ රජයෙහි දෙවියන්ගෙන් ඇසූ නියා ව කිවූ ය. උන් ගෙන් විචාළ තැන උන් ආකාශස්ථ දෙවියන්ගෙන් ඇසූ නියා ව කිවූ ය. උන්ගෙන් විචාළ තැන ඌ බූමාටු දෙවියන් ගෙන් තමන් ඇසූ නියා ව කිවූ ය. උන්ගෙන් විචාළ තැන මිනිසුන්ට රකවල සිටි දෙවියන්ගෙන් තමන් ඇසූ නියා ව කිවූ ය. උන් විචාළ තැන මිනිස් ලොව පහළ වූ නියා ව කිවූ ය. ඉක්බිත්තෙන් සක් දෙව්දු තරාදිය තිබැදී අතින් කිරන්නා සේ අප ආයාස ගන්නේ කිම ද බුදුහු දුන් කොයි වසන සේක් දෑ'යි විචාළෝ ය. අනික් කොයි වසන සේක් ද, මිනිස් ලොව වසන සේකැ'යි කී කල්හි ඔබ කරා ගොසින් ඔබගෙන් විචාළ කෙනෙක් ඇත් දෑ'යි කිවූ ය.

එ සේ විචාළ කෙනෙක් නැතැ'යි කී කල්හි කුමක් ද, තොප හැම ගිනි තිබිය දී ගිනි ය යි සිතා කන මැදිරියන් තබා ලා පිඹිනා නියා ද? මඟුල් වදරන්ට නිසි වූ නැවත දැකීම් වැඳීම් පිදීම් ආදි ය තබා තමන් වහන්සේ ගේ ගුණ සඳහන් කළ පමණෙකින් ම සඳහන් කළවුන්ට ලොවි ලොවුතුරා සැපත් සාධා දී ලන හෙයින් තමන් වහන්සේ ත් මඟුල් වූ බුදුන් අතින් නො විචාරා කුමක් දන්නා හෙයින් මා විචාරන්ට තබා ගතු ද, මඟුල් දන්ට වුව මනා වී නම් තෙපි ත් බුදුන් කරා ගොසින් ඔබගෙන් විචාරා මඟුල් මෙ ය යි

දැන ගනු ව. අප හැම දෙනා එක විට විචාරන්ට බැරි වේ ද, තෙපි විචාරව'යි එක් දේවතාවකුට විධාන කළහ.

ඒ දෙව් පුත් ද ඒ වේලාට නිසි වූ ආභරණ ලා සැරහී ගෙණ විදුලියක් මෙන් බබලමින් දස දහසක් සක්වළ දෙව් බඹුන් හා සමඟ මධ්‍යම රාත්‍රි වේලේ දෙව්රම් වෙහෙරට ගොසින් 'බුදුරජුන් වහන්ස, දස දහසක් සක්වළ දෙව් බඹුන් මඟුල් විචාරනු නිසා මේ එක සක්වළට රැස් ව හිසකෙ අගක් බහා ලන තැන දෙව් බඹුන් හා සමඟ දහයකු ත් විස්සකු ත් තිසකු ත් සතලිසකු ත් පනසකු ත් සැත්තෑවකු ත් අසූවකු ත් සියුම් අත් බැව් මවා ගෙණ රැස් වූ දෙවියන්ට වඩා දේවතා වූ බ්‍රහ්මයන්ට වඩා බ්‍රහ්ම වූ මුඹ වහන්සේට ආරාධනා කෙරෙමි. සියලු දෙව් බඹුන්ගේ ආරාධනා වෙනු ත් මිනිසුන්ගේ අනුමැතියෙනු ත් මඟුල් නම් මේ ය යි වදළ යහපතැ'යි කිවු ය.

බුදුහු ඒ අසා වදරා 'හෙම්බල දේවතාව, ළං තුන් පක්‍ෂ ය තෙපල ලෙස කියන්නා මුත් මඟුල් නම් කවරේ දැ'යි විචාළාව වැනි ව කියා ලූ බව මුත් කාරණයෙක. හෙළා නො කී බැවින් ඒ මඟුල් නො වෙ යි. මඟුල් නම් මෙ ලොවින් වු ව ත් පර ලොවින් වු ව ත් යමෙක් වැඩට කාරණ වේ නම් එය ය. එක ම මඟුලක් විචාළා වූ තොපට මඟුල් අට තිසක් කියමි' වදරා ලා මං විචාළවුන්ට යම් සේ මං දැන කියා ලන කෙණෙක් නො යා යුතු මං පළමු කියා යා යුතු මං පසු ව කියත් ද එ පරිද්දෙන් නො කළ මනා දෙය නො කරන්ට පළමු වදරා ලා පසු ව කළමනා දෙය වදරන සේක් 'හෙම්බල, යම් කෙණෙක් කරණ දෙයකු ත් මෙ ලොව පර ලොව වරදවා නපුරු කොට ම කෙරෙත් ද, කියන දෙයකු ත් දෙ ලොව ව ම වරදවා නපුරු සේ ම කියත් ද, සිතන දෙයකු ත් පර සිත් දන්නෝ ඇත් නම් මෙ ලොව නින්ද ලබන ලෙසට ත් තමාට වුව ත් පසු තැවිලි වන ලෙසට පරලොව ත් නසා සිතත් ද එ සේ වූ නුවණ නැති සත්‍වයන් හා එක් නො වීම ත් මඟුල් අට තිසින් එක් මඟුලෙක.

මඟුල් වන්ට කාරණ කවරේ ද යත්? උන් හා එක් නො වීම මෙ ලොව පර ලොව දෙක්හි ම වැඩට කාරණ හෙයිනි. උන් හා එක් වීමෙන් නපුර කවරේ ද යත්—යම් කෙණෙක් බාලයන් හා එක් වූ නම් කුණු මස් වසා ලූ පත ත් කුණු වන්නා සේ කවර තර මෙක යහපත් තරම් ඇත්තහු ත් නපුරු වෙති. තව ද, දධිවාහන

Non-Commercial Distribution

ජාතකයෙහි මී අඹ ගස ආදි මී අඹ යහපත් වූවා පසු ව කොසඹ ගස් හා අඟුලු වැල් හා ගස මුල ඇති වීමෙන් මුල් [මුල්] හා එක් ව බැදි කොළ කොළ හා එක් වී මී අඹ තික්ත වූවා සේ කවර තරම් ගුණ රස ඇත්තවුන් නීරස ව නිෂ්ප්‍රයොජන වන හෙයිනු ත්, තව ද යම් සේ දියෙන් වන භයෙක් දිය මුල් ව වේ ද ගින්නෙන් නො වේ ද, ගින්නෙන් වන භයට ගිනි ම මුල් ව ත් පැන් මුල් නො වේ ද, එ පරිද්දෙන් යම් කිසි භයෙක් උපදී නම් බාලයන් මුල් ව උපදුත් මුත් නුවණැත්තවුන් නිසා කිසි ත් භයක් නැති හෙයින් බාලයන් හා එක් වීම නපුර. පූරණ කාශ්‍යපාදී නිව වුන් ගෙන් එකක් එකක්හු මුල් ව උන් හා එක් වීමෙන් අසූ දහ-සක් පමණ සත්තු නරකයේ උපන්හ. නිවන් පත පින් කළ අජාසත් රජ්ජුරුවෝ දෙව්දතුන් ගේ සමවායෙන් ඒ ජාතියෙහි ලබන නිවනින් පිරිහුණහ.

තව ද අකිර්ති ජාතකයෙහි බොහෝ ව පතළ කීර්ති ය ඇති හෙයින් අකීර්ති නම් වූ බෝසත්හු ශක්‍රයන් ගෙන් වර ගන්නා ගමනේ 'දුටුවවුන්ට වැඩක් නැති හෙයින් බාලයන් දැක්මක් නො වේව යි, උන් ගේ පව ත් ඇසීමෙන් කිසි ත් ප්‍රයොජනයක් නැති හෙයින් උන් ගේ පවතු ත් නො අසම්ව යි, උන් හා එක් ව ඇසිල්ලක් වුව ත් විසීමක් නො වේව යි, එක් ව විසීම තබා ඉදින් දැක පුව ත් කථා පමණකු ත් නො වේව යි' කියා වර ගත්හ. එ හෙයින් උන් හා එක් නො වීම මෙ ලොව පර ලොව දෙකෙහි ම වැඩට කාරණ හෙයින් උතුම් මඟුලෙක.

තව ද යම් කෙණෙක් කෙරෙත් නමුත් දන් දීම ආදී වූ පිණක් වන දෙයක් මුත් දැන දැන ප්‍රාණ වධාදි ය නො කෙරෙත් ද, බසක් කියත් මුත් නිකම් කියා පියන බසෙක් වී නම් සැබෑවක් හා බණ මුසු දෙයක් මුත් බොරු ආදියක් නො කියත් ද, සිත ත් නමුත් පින් වඩනා දෙයක් මුත් පව් වඩනට නිසි දෙයක් නො සිතත් ද, එ සේ වූ බුදු පසේ බුදු සවුවන් භජන ය කිරී ම මෙ ලෝ පර ලෝ දෙක්හි වැඩට කාරණ හෙයින් උතුම් මඟුලෙක. තව ද සුනෙත්‍ර නම් ශාස්තෘහු ය, මහා ගොවින්ද පණ්ඩිත ය, විධුර පණ්ඩිත ය, සරභඞ්ග ශාස්තෘහු ය, මහෞෂධ පණ්ඩිත ය, සුතසෝම රජ්ජුරුවෝ ය, නිමි රජ්ජුරුවෝ ය, අයො-ඝර කුමාරයෝ ය, අකිර්ති කුමාරයෝ ය, යනාදීහු ත් භජන ය කළවුන්ට කුශල සන්නිශ්‍රිත වැඩ සාධා දී ලති. එ හෙයින් ඔවුන් භජන ය කිරීම ත් අභිවෘද්ධි කාරණ හෙයින් උතුම් මඟුල.

Non-Commercial Distribution

# 313. දීපඞ්කර නම් බුදුන්ගෙන් නිවන් දුටුවාහු

'හෙම්බල දේවතාව, බුද්ධාදීහු නම් තමන් භජන ය කළවුන්ට භයක් පැමිණි කල පහනක් සම්භව අඳුරු දුරු කරන්නා සේ භය දුරු කෙරෙති. එ හෙයින් තමන් භජන ය කළවුන්ට බඩ සා කලට බතක් මෙන් ද, පිපාසා කලට පැනක් මෙන් ද, පිහිට ව සිටිති. ඒ එ සේ මැ' යි. සර්වඥවරයන් නිසා ප්‍රතිනියත වූ සූවිසි අසඞ්ඛ්‍ය ය හැර සෙසු ත් බොහෝ දෙන නිවන් දකිති. සෙසු බොහෝ දෙනා නිවන් දක්නේ කෙ සේ ද යත්? කෙළ ගණන් විතරට ත් බොහෝ ව බුදු වූ බුදුවරුන් වහන්සේ කරා පැමිණ නිවන් දුටුවවුන් හැර මෙ කපට සාරාසඞ්ඛ්‍ය කප් ලක්‍ෂයකින් යට බුදු වූ දීපඞ්කර නම් බුදුරජුන් වහන්සේ සුනන්‍ද නම් වෙහෙර දී ධර්‍ම සක් පැවතුන් සූත්‍ර ය දෙසූ දවස් දෙව් මිනිසුන් ගෙන් සියක් කෙළ විතර නිවන් දුටහ. නැවත බුදු රජුන් වහන්සේ තමන් වහන්සේගේ උසභක්ඛන්ධ නම් පුතණු වන් වහන්සේ මුල් ව රාහුලොවාද සූත්‍ර ය වැනි වූ සූත්‍රයක් දෙසූ දවස් අසූ කෙළක් විතර දෙව් මිනිස්සු නිවන් දුටහ.

නැවත ඒ බුදුන් අමරවතී නම් නුවර මහරි ගස මුලදී යමා මහ පෙළහර කොට ලා තව්තිසා දෙව් ලොව පරසතු රුක් මුල්හි පඬු ඇඹුල් සල හස්නෙහි වැඩ හිඳ මාතෘ දිව්‍ය පුත්‍ර ප්‍රමුඛ දෙවි යන්ට විදම් බණ දෙසූ දවස් දෙවියෝ අනූ කෙළ දහසෙක් නිවන් දුටහ. තව ද සුනන්‍ද නම් වෙහෙර දී කෙල ලක්‍ෂයක් දෙනා වහන් සේ රහත් වූ සේක. නැවත එක් සමයෙක දිව්කුරු බුදු රජුන් වහන්සේ සාර ලක්‍ෂයක් පමණ රහතන් පිරිවරා දඹ දිව සැරි සරන සේක්, එක් තැනෙක බොහෝ දෙනා ගෙන් ලබන සත්කාර සම්මාන ඇති ඉතා ප්‍රසිද්ධ වූ යකුන්ගේ ම විසීම ඇති ඉතා භයා නක වූ වලායෙන් ගැවසී සිටිනා කුළු ඇති ගසින් කොළින් සැදුම් ලද නො එක් සිවු පාවුන් විසින් ගැවසී ගත් නාරද නම් වූ පර්වතයක් කරා වැඩි සේක. ඒ පර්වතයෙහි ත් නාරද නම් වූ යක්‍ෂයාණ කෙණෙක් වෙසෙති. ඒ යක්‍ෂයාණන්ට ත් හවුරුදු පතා දඹ දිව් වැස්සෝ මිනිස් බිලියක් ගෙණවු ත් දෙති. දීපඞ්කර නම් බුදු රජුන් වහන්සේ යක්‍ෂයාණන්ට බිලි ගෙණාවවුන් නිවන් දක් වනු නිසා සාර ලක්‍ෂයක් රහතුන් වහන්සේ සතර අතට යවා පියා කරුණා පමණක් සහාය කොට ගෙණ යක්‍ෂයාණනු ත් නිවන් දක්වනු සඳහා නාරද නම් පර්වතයට නැඟි සේක.

මිනිස් මස් 'කැමෙ මු ත් නිවන් කැමෙහි සිතක් නැති යකු මකුකම ඉවසා ගත නො හී බුදුන් එ තැනට වඩනා ම ක්‍රොධයෙන්



Non-Commercial Distribution

දිළිඳි පියා හය ගන්වා පලා පියනු කැමති ව තමාගේ ආනුභාව යෙන් පර්වත ය වෙවුල්වා පී ය. වෙවුල්වා පු පර්වතය ත් බුදුන්ගේ ආනුභාවයෙන් උන් කරා ම නමා ගෙණ යන්ට වන. තුමූ බා ගොසින් 'ගින්නෙකින් දවා මරවා පියෙමි' යි මහා ගිනි කඳක් මවා ලී ය. තමන් මවා ලූ ගිනි කඳ බුදුන්ගේ ආනුභාවයෙන් තමන් ම දවන්ට නමා ගත. බුදුන්ට තබා බුදුන්ගේ සිවුරෙහි හූ රළකට ත් හානි නො වී ය. යකා වැලි ත් 'මහණ දැ දෝ නො දැ දෝ' යි බලන්නේ සූර්‍ය්‍යයා ලං හෙයින් දුරුබා පලා යන තෙක් ශරත් චන්ද්‍රයා බැස ලා හුන් කලක් මෙන් ඉතා ශොභාවත් ව හුන් බුදුන් දැක 'අනේ, මේ මහණ මහානුභාව සම්පන්න ය. මෝ හට යම් අනර්ථයක් කෙළෙම් නම් ඒ මා කරා ම එ යි. පොළොව පැකිල්ලවුන්ට පොළොව ම පිහිට වන්නා සේ මුන් විනා මට පිහි- ටෙක් නැත. මුන්ම ආශ්‍ර ය කෙරෙමි' සිතා ලා බුදුන් සක් සහළින් ඉතා හොබනා පතුල් සහළ වැඳ ලා ක්‍ෂමා කරවන්ට කිවූ ය.

බුදුහු ත් අමුතු ව කරණ ක්‍ෂමාවක් නො වන බැවින් පිළිවෙළ කථාව වදළ සේක. දෙශනා කෙළවර නාරද නම් යක්‍ෂයාණෝ ද දස දහසක් පමණ යක්‍ෂයන් හා සමඟ සෝවාන් වූ ය.

එ දවස් සියලු දඹ දිව් වැස්සෝ බිලියම් නිසා එකි එකී ගම කින් එකි එකී මිනිසකු ගෙනවු ය. තව ත් බොහෝ වූ සාල් තල මුං කලත් ශකීරා ගිතෙල් මී සකුරු ආදිය ත් ගෙණවු ය- නාරද නම් යක්‍ෂයාණෝ ද එ දවස් ගෙණා සාල් ආදි ය ගෙණ ගෙණාවුන්ට ම දෙවා පියා බිලියමට ගෙණා මිනිසුන් බුදුන් කරා ගෙණ ගොසින් බුදුන්ට ම පිදී ය. බුදුහු ත් උන් හැම දෙනා 'මෙ සේ එව, මහණෙනි'යි වදළ බස් පමණෙකින් ම මහණ මාලු පැවිදි කරවා සතියක් ඇතුළත ම රහත් කරවා වදළ සේක. එ සේ රහත් වූ වහන් දැ ද කෙළ සියයෙක. නැවත ඒ බුදුහු සුදසුන නම් පවුවෙක වස් වැස අනූ ලක්‍ෂයක් දෙනා වහන්සේ රහත් කැරවූ සේක.

## 314. කොණ්ඩඤ්ඤ නම් බුදුන් ගෙන් නිවන් දුටුවාහු

නැවත ඔබට ඉක් බිති ව කොණ්ඩඤ්ඤ නම් බුදුන් ලෙව්හි ඉපැද ධම් සක් පැවතුන් සූත්‍ර ය දෙසන දවස් බුදුන් හා එක ද මහණ වූ දස කෙළක් විතර වහන්දැ නිවන් දුටු සේක. දෙව් මිනි සුන් ගෙන් කෙළ ලක්‍ෂයක් විතර නිවන් දුටහ. තව ද කොණ්ඩඤ්ඤ

Non-Commercial Distribution

නම් බුදුන් මහා මඞ්ගල සූත්‍ර ය දෙසූ දවස් සෝවාන්-සෙදගැමි-අන-ගැමි වූවන්ගේ ගණන් නැත. අනූ කෙළ දහසක් විතර රහත් වූහ. යමා මහ පෙළහර කෙරෙමින් සිට බණ වදළ ගමනේ සෝවාන් ආදී වූ තුන් මග තුන් ඵලයට පැමිණි තැන්ගේ ගණන් නැත. අසූ කෙළ දහසක් විවර රහත් වූ සේක.

තව ද කොණ්ඩඤ්ඤ බුදුහු බුදු ව ලා චන්‍දවතී නුවර නිසා සඳ නම් වෙහෙර වසන සේක. එ ම නුවර සඳ නම් බමුණු කුමරුවන් හා සුභද්ද නම් බමුණු කුමරුවන් හා දෙ දෙන කොණ්ඩඤ්ඤ බුදුන් ගෙන් බණ අසා පැහැද දහසක් දෙනා හා සමග මහණ වූහ. ඒ දෙනම මුල් ව කෙළ ලක්‍ෂයක් දෙනා වහන්සේ රහත් වූ සේක. ඉක් බිති විජිතසේන නම් පුතණුවන් වහන්සේ මුල් ව බණ වදළ දවස් කෙළ ලක්‍ෂයක් දෙනා වහන්සේ රහත් වූ සේක. නැවත එක් සමයෙක බුදුහු දනවු සැරි සරන සේක් උදේන නම් රජ්ජුරුවන්ට බණ වදළ සේක. ඒ රජ්ජුරුවෝ ද බණ අසා අනූ කෙළක් දෙනා හා සමග මහණ ව රහත් වූහ.

# 315. මඞ්ගල නම් බුදුන්ගෙන් නිවන් දුටුවාහු

කොණ්ඩඤ්ඤ නම් බුදුන්ට ඉක් බිති ව මඞ්ගල නම් බුදු රජුන් වහන්සේ බුදු ව ධම් සක් පැවතුන් සූත්‍ර ය දෙසූ දවස් බුදුන් හා එක ද මහණ වූ වහන්දෑ තුන් කෙළක් රහත් වූ සේක. දෙව් මිනි සුන් ගෙන් කෙළ ලක්‍ෂයක් දෙන නිවන් දුටහ. දඹ දිව චිත්ත නම් නුවර සපු ගස මුල්හි දී- ගැඩඹ නම් අඹ රුක් මුල්හි දී අපගේ බුදුන් මෙන් යමා මහ පෙළහර කොට ලා දෙව් ලෝ වැඩ හිඳ විදම් බණ දෙසූ දවස් මාතෘ දිව්‍ය පුත්‍ර ප්‍රමුඛ කෙළ ලක්‍ෂයක් දෙවියෝ නිවන් දුටහ. යම් කලෙක සුනන්‍ද නම් සක් විති රජ්ජුරුවෝ මධ්‍යයෙහි සිටි කලට එ කි එ කී අතින් සූ විසි සූ විසි ගවුව හා වටින් එක් සිය සිවු සාළිස් ගවුවෙක විතර පැතිර සිටි සක් විති පිරිස හා සමග මඞ්ගල බුදුන් කරා ගොසින් බුදු පාමොක් සඟනට මහදන් දී ලා තුන් සිවුරට සැහෙන ලෙසට කෙළ ලක්‍ෂයක් රහතනට කසී සළු ත් පිළිගන්වා ලා බණ අසන්ට හුන්නු ද, එ කල මඞ්ගල බුදුහු බණ වදළ සේක. රජ්ජුරුවන් ඇතුළු අනූ කෙළක් විතර රහත් ව දුන් පිළියෙහි විපාක එ ම ජාතියෙහි පෙනෙන්නා සේ 'මහණෙනි, මෙ සේ එව, යි වදළ බස් පමණෙ කින් ම මහණ ව මාලු දැව්දි වූ සේක.

මඞ්ගල නම් ති ලෝ ගුරු බුදු රජුන් වහන්සේ මෙබලා නම් නුවර වසන කල එ ම නුවර වසන සුදෙව ය - ධම්මසෙනය

Non-Commercial Distribution

යන ලදරුවෝ ද දෙනෙක් දස දහසක් ලදරුවන් පිරිවරා මඬගල බුදුන් ළඟ මහණ ව රහත් වූහ. තව ද උත්තර නම් වෙහෙර දී නෑ තැනින් ම කෙළ ලක්‍ෂයක් දෙනා වහන්සේ මහණ ව රහත් වූ සේක. අග සවු දෙ දෙනා වහන්සේ රහත් වූ දවස කෙළ ලක්‍ෂයක් දෙනා වහන්සේ ම රහත් වූ සේක.

## 316. සුමන නම් බුදුන්ගෙන් නිවන් දුටුවාහු

මඬගල බුදුන්ට ඉක් බිති ව සුමන නම් බුදුන් බුදු ව බ්‍රහ්මාරාධනාවෙන් දහම් සක මෙබලා නව් උයන්හි දී පවත්වා වදාළ කල්හි දෙව් මිනිසුන් ගෙන් කෙළ ලක්‍ෂයක් නිවන් දුටහ. සුමන නම් බුදුන් නිවන් දුටුවන් වෙන් ව හිඳිනා ලෙසට ත් ඒ කුසල් නමැති රුවන් කෙලෙස් සොරුන් වැද ලා හැර නො ගන්නා ලෙසට ත්, සිවු පිරිසුදු සිල් නමැති මහා පවුරක් ඇති, සමාධි නමැති අගල් ඇති, විවසුන් නමැති වීථි ඇති, චතුර් විධ මාර්ග නමැති වාසල් ඇති, සිහි නුවණ නමැති දෙර ඇති, සමවත් නමැති මණ්ඩප පොකුණු ආදීන් හෙබියා වූ බොධි පාක්ෂික ධර්ම නමැති ජනයන් විසින් ගැවසී ගත් නිවන් නමැති මහ නුවරක් කෙ තෙක් දෙනාට වුව ත් අවසර ඇති කොට මැවූ සේක. එ සේ මවා ලා ඒ නිවන් නුවර සතර සිහිවටන් නමැති රාජ වීථි සතරකු ත් මැවූ සේක.

ඒ මවා වදාළ සිහිවටන් වීථි නම් සතර නැළි ගන්නා ලාසෙන් එක් යාළෙක වී ඇට ස කෙළ තෙ තිස් ලක්‍ෂ සැට දහසක් වන නියාමයෙන් එක් සිය පනස් යාළ සතරමුණු අට ලාසෙක. වී ඇට ගණනින් හසුරු සනකට චිත්ත ප්‍රවෘත්ති ය වන හෙයින් කුසල් ජවන් නමැති බොහෝ ගෙවල් ඇත්තේ ය. ඒ වීථි ත් මායා දී රහිත බැවින් හැද පරස් නො ව ඉඳුරා සිට්ටි. බොහෝ විෂ ය ඇති බැවින් හැසී පළල් ව සිට්ටි. ඒ නිවන් නුවර සැලැසී සිටියා වූ සිහිවටන් වීථිවල ශ්‍රාමණ්‍ය ඵල ය, පිළිසිඹියා ය, අභිඥා ය, සමාපත්ති ය, යන මේ රුවන් තිබෙන සල් පිළි ත් ඇති කළ සේක. ඇති කොට ලා ඒ රුවන් හැර ගන්ට තරමුන් අභිප්‍රාය ලෙසින් හැර ගන්නා ලෙසට සදහම් නමැති බෙර ලැවූ සේක. සදහම් නමැති බෙර හඬ අසා කෙළ ලක්‍ෂයක් දෙනා නිවන් දැක්මෙන් ඒ රුවන් ලත්හ.

නැවත සුනන්‍දවතී නුවර අඹ රුක් මුල්හි දී යමා මහ පෙළහර කළ දවස් කෙළ ලක්‍ෂයක් සත්වයෝ නිවන් දුටහ. නැවත දස දහ

Non-Commercial Distribution

සක් සක්වල දෙවි බඹුන් මේ එක සක්වලකට රැස් ව දෙවි මිනි සුන් නිරොධ සමවත් විෂයෙහි කළ සැක දුරු කරන්ට බණ වදාළ දවස් අනූ කෙළ දහසක් සත්තු නිවන් දුටහ. තුව ද මෙබලා නම් නුවර වස් වැස කෙළ ලක්‍ෂයක් දෙනා රහත් කරවා වදාළ සේක. නැවත එක් සමයෙක සකස් පුර නුවරට නුදුරු තැනෙක අරින්‍දම නම් රජ්ජුරුවන්ගේ කුශලානුභාවයෙන් රන් පර්‍වත මුදුනෙහි යුගඳුරු මුදුනෙහි බබළන ශරත් චන්ද්‍රයා මෙන් බබළමින් වැඩ හිඳ බණ වදරා අනූ කෙළක් විතර රහත් කරවා වදාළ සේක. නැවත සක් දෙවිඳුහු තමන් වහන්සේ දක්නට ආ දවසෙක අසූ කෙළක් විතර රහත් කරවා වදාළ සේක.

## 317. රේවත නම් බුදුන්ගෙන් නිවන් දුටුවාහු

සුමන බුදුන්ට ඉක් බිති ව රෙවත නම් බුදුන් ඉපැද ධම්සක් පැවතුන් සුත දෙසූ දවස් කෙළක් පමණ වහන්දෑ රහත් වූ සේක. තුන් මඟ තුන් ඵලයෙහි පිහිටියවුන්ගේ ගණන් නැති. නැවත තුන් කෙළක් විතර මිනිසුන් හැර ගෙණ දක්නට ගිය අරින්‍දම නම් රජ්ජුරුවන්ට බණ වදාළ දවස් දෙවි මිනිසුන් ගෙන් කෙළ දහසෙක් නිවන් දුටහ. නැවත එක් දවසෙක නිරොධ සමවත අනුසස් විචාළ වුන්ට ඒ අනුසස් වදරා ලීමෙන් මිනිස්සු කෙළ සියයක් නිවන් දුටහ. සුධඤ්ඤවතී නම් නුවර දී ආදියෙන් පොහෝ කරණ දවසට එ දවස් මහණ ව රහත් ව අසඞ්ඛ්‍යයක් පමණ රහතන් වහන්සේ පොහොයට රැස් වූ සේක. දෙ වෙනි පොහොයට එ දවස් මහණ ව රහත් ව කෙළ ලක්‍ෂයක් විතර රහතන් වහන්සේ රැස් වූ සේක. රෙවත බුදුන්ගේ අග සවු වූ වරුණ නම් මහ තෙරුන් වහන්සේ ගිලන් වූ හෙයින් ඔබගේ ලෙඩ විචාරන්ට ආ බොහෝ තැනට බණ වදරා කෙළ ලක්‍ෂයක් විතර රහත් කරවා වදාළ සේක.

## 318. සොභිත නම් බුදුන්ගෙන් නිවන් දුටුවාහු

රෙවත බුදුන්ට ඉක් බිති ව සොභිත නම් බුදුන් ලොව පහළ ව මහ බඹහුගේ අයදමෙන් දහම් සක් පැවැත් වූ දවස් දෙවි මිනිසුන් ගෙන් අසංඛ්‍යයක් විතර නිවන් දුටහ. නැවත සුදසුන් නුවර පළලු රුක් මුල්හි දී යමා මහ පෙළහර කොට ලා තව්තිසා දෙව් ලොවට වැඩ විදම් බණ දෙසූ දවස් මාතෘ දිව්‍ය පුත්‍ර ප්‍රමුඛ අනූ කෙළක් දෙවියෝ නිවන් දුටහ. නැවත එක් සමයෙක සුදසුන් නුවර ජයසේන නම් රජ කුමරහු සතර ගවුවක් විතර වෙහෙරක් කරවා ලා විහාර ය වටා හෝපලු-මුරුත-සපු-නා-දෙඹි-පුවඟු-මුහුළු-අඹ-කොස්-පියා ගස්-සල්-කුඹුක්-ඇටඹ-කරවූ ආදි ගසින්

Non-Commercial Distribution

ගැවසී ගත් වත්තකු ත් කරවා ලා බුදු පාමොක් සඟනට දුන්හ. විහාරානිසංස මුඛයෙන් බණ වදාළ සේක. එකල්හි කෙළ දහසක් දෙන නිවන් දුටහ. සුනන්දවතී නම් නුවර දී බුදුන් ආදියෙන් පොහෝ කරණ දවසට එ දවස් අවුත් මහණ ව රහත් ව කෙළ සියයක් පමණ රහතන් වහන්සේ පොහොයට රැස් වූ සේක. නැවත මෙඛලා නම් නුවර ධම්මගණාරාම නම් විහාරයක් පිළිගෙණ වදාළ දවස් අනූ කෙළක් විතර මහණ ව රහත් වූ සේක. යම් කලෙක සොභිත බුදුහු දෙව් ලොව වස් වැස ලා වස් පවාරණ දවස් මිනිස් ලොවට බට සේක් ද - එ දවස් අසූ කෙළක් විතර මහණ ව රහත් වූ සේක.

## 319. අනෝමදස්සි නම් බුදුන්ගෙන් නිවන් දුටුවාහු

සෝභිත බුදුන්ට ඉක් බිති ව අනොමදස්සි නම් බුදුන් ලෙව්හි පහළ ව බ්‍රහ්මාරාධනාවෙන් සුභවතී නම් උයන වැඩ හිඳ දහම් සක පැවැත් වූ දවස් දෙව් මිනිසුන්ගෙන් කෙළ සියයක් නිවන් දුටහ. නැවත ඔසධී නම් නුවර දෙරකඩ පියාගස් මුල්හි දී යමාමහ පෙළහර කොට ලා තව්තිසා දෙව් ලොව වස් වැස විදම් බණ දෙසූ කල්හි මැණියන්දෑ ප්‍රධාන වූ අසූ කෙළක් දෙවියෝ නිවන් දුටහ. නැවත මඞ්ගල කොලාහල ය ඇති ව මහ මඟුල් සූත දෙසන දවස් අට සැත්තෑ කෙළක් නිවන් දුටහ. සොරෙය්‍ය නුවර දී ඉසිදත්ත නම් රජ්ජුරුවන්ට බණ දෙසන කල්හි පැහැද මහණ ව රහත් වූ අට ලක්‍ෂයක් රහතන් පිරිවරා බුදුහු ආදි පොහොය කළ සේක. දෙ වන පොහොය එ දවස් රහත් ව මහණ වූ සත් ලක්‍ෂයක් රහතන් පිරිවරා හිඳ කළ සේක. සොරෙය්‍ය නුවර දී පෙරළා ත් කරණ පොහොය එ දවස් රහත් ව මහණ වූ ස ලක්‍ෂයක් රහතුන් පිරිවරා කළ සේක.

## 320. පදුම නම් බුදුන්ගෙන් නිවන් දුටුවාහු

අනොමදස්සී බුදුන්ට ඉක් බිති ව පදුම නම් බුදුන් ලොව පහළ ව බ්‍රහ්මාරාධනාවෙන් දහම් සක පැවැත්වූ කල්හි කෙළ සියයක් විතර සත්‍වයෝ නිවන් දුටහ. නැවත පදුම නම් බුදුන්ට වෙමාතික මල් වූ උපසාල කුමාරයන් මහණ වූ දවස් අනූ කෙළක් විතර නිවන් දුටහ. රම්ම කුමාර නම් පුතණුවන් වහන් සේට බණ වදාළ දවස් අසූ කෙළක් නිවන් දුටහ. යම් කලෙක භාවිතත්ත නම් රජ්ජුරුවෝ පදුම බුදුන් ලඟ මහණ වූ ද එ කල පිරිවර කෙළ ලක්‍ෂයක් හා සමඟ රහත් වූහ. යම් කලෙක පදුම බුදුහු උසභවතී නම් නුවර වස් විසූ සේක් ද, එ කල තුන් ලක්‍ෂ

Non-Commercial Distribution

යක් විතර මහණ ව රහත් වූ සේක. වස් පවාරා නිමි පසු පිළියෙන් ම කෙළින් සිවුරු ත් දුන් කල්හි වහන්දෑ ඒ කෙළින් සිවුර පදුම බුදුන්ට අගසවු වූනුවණිනු ත්ගුණෙනු ත් විසල් වූ විසල් මහ තෙරුන් වහන්සේට පමුණුවා ලූ සේක. පමුණුවා ලූයෙ ත් ඔබ අගසවු හෙයින් නො වෙයි. ඔබගේ සිවුරු දුර්වල හෙයින. කෙළින් අතුළ සිවුරු එකද ම කොට රඳා නිමවා වැළැන්ද මනා හෙයින් සිවුරු ගෙත්තමට වහන්දෑ සහාය වූ සේක.

වහන්දෑ තබා බුදුහු ත් හිදි කටුමෙව් හූ ලා දුන් සේක. කෙළින් සිවුරු කොට නිමි කල්හි බුදුහු තුන් ලක්‍ෂයක් පමණ වහන්දෑ පිරිවරා සැරිසරා වැඩි සේක. එ සේ වැඩි ගමනේ ත් මල් ගෙණ ඵල ගෙණ නැමී සිටිනා අතු පතර ඇති ගසින් කොළින් ගැවසී ගත් මහනෙල් ඉපුල් නෙලුම් ආදියෙන් යුක්ත විල් ඇති, නො එක් සිවුපාවුන් හා පක්ෂීන් ඇති, මල් ගස් වලට බැස පියා රොන් ගන්නා බඹරුන්ගේ භෘඞ්ග නාදයෙන් ඉතා හොබනාවූ, ඵල රසානුභවයෙන් මත් ව නාද කරණ කෙවිල්ලන්ගේ කුරුවීක නාදයෙන් ම සිත්කලු වූ දූන් මෙ වක ගොසිඞ්ග සාල වන ය වැනි වූ වලෙක වස් විසූ සේක. ඒ වල වසන බුදුන් කරා එලබ මිනිස්සු දෙ ලක්‍ෂයක් විතර රහත් වූහ.

## 321. නාරද නම් බුදුන්ගෙන් නිවන් දුටුවාහු

පදුම බුදුන්ට ඉක්බිති ව නාරද නම් බුදුහු ලෙව්හි පහළ ව බ්‍රහ්මාරාධනාවෙන් ධනඤ්ජය නම් උයන්හි දී දහම් සක පැවැත් වූ සේක. එ දවස් කෙළ ලක්‍ෂයක් දෙන නිවන් දුටුහ. තව ද මහාදෙණ නම් නුවර බඩ වූ විලෙක මහාදෙණ නම් නා රජ්ජුරු කෙණෙක් වෙසෙති. මහත් වූ ආනුභාව ඇත්තෝ ය. උන්ගේ ආනුභාව නිසා බොහෝ දෙන ත් උන්ට පූජාසත්කාර කෙරෙති. යම් රටෙක මිනිස්සු උන්ට සත්කාර නො කෙරෙත් නම් උන්ගේ රටවල් නසා පියති. නාරද නම් බුදුහු ත් මහාදෙණ නම් නා රජ්ජුරුවන්ට බණක් කීවොත් බොහෝ දෙනාට ප්‍රයෝජන තියාව දූන බොහෝ භික්ෂූන් වහන්සේ පිරිවරා ඒ නා රජ්ජුරුවන් වසන තැනට වැඩි සේක. මිනිස්සු ත් ඔබට වඩනා බුදුන් දූක 'ස්වාමීනි, මෙල තැන මහානුභාව සම්පන්න නා රජ්ජුරු කෙණෙක් වෙසෙති. ගහටයක් කොට පියත් නමුත් ඔබ නො වඩනා බව ය'යි කිවූ ය.

බුදුහු ත් නො ඇසූ බඳු ව ලා ම වැඩලා උන් සත්කාර විඳුනා නිසා කළා වූ මල් හස්නෙහි වැඩ හුන් සේක. බොහෝ දෙන ද 'මුනි රජුන්ගේ සටන් බලම්හ'යි රැස් වූහ. නා රජ්ජුරුවෝ ද

Non-Commercial Distribution

තමන්ට නියම මල් හස්නෙහි බුදුන් වැඩ හුන්නා දැක ඉවසා පිය නො හී බුදුන් ව ගහට කරණු නිසා දුමා ගියහ. බුදුහු ත් දුමා ගිය සේක. නා රජ්ජුරුවෝ ගිනි කඳක් සේ දිළිහී ගියෝ ය. බුදුහු ත් දිළිහී ගිය සේක. නා රජ්ජුරුවෝ තමන් ඇඟින් නැඟි දුම් කඳින් හා ගිනි කඳින් බුදුන් ට වූ හානි නැත ත් බුදුන්ගේ ශරීරයෙන් නිකුත් දුම් කඳින් හා ගිනි කඳින් තැවී ගොසින් තරයේ ම කිපී පියා 'විෂයෙන් මරා පියමි' විෂ හළවූ ය. උන් හළ විෂ නම් දඹ දිව වුව ත් නසා පිය යි. බුදුන්ගේ ආනුභාවයෙන් ඒ විෂ ය බුද්ධානුභාව නමැති මන්ත්‍රානුභාවයෙන් බුදුන්ට ත් කාට ත් කිසිද පීඩා වක් කට නො හිත. නා රජ්ජුරුවෝ ද 'මහණහුගේ පවත් කිම් දෝ හෝ'යි බලන තැනැත්තෝ සවනක් රසින් බැබළීමෙන් ශරත් චන්ද්‍රයාට ත් වඩා ශොභාවත් වූ බුදුන් දැක 'අනේ මුන් වහන්සේ ආනුභාව සම්පන්න සේක. මා කළ දෙය නපුරැ'යි සිතා බුදුන්ට ම අවනත වූහ.

බුදුහු ද හැද දැඩි දණ්ඩක් ගින්නේ තවා හැද මිරිකන්නා සේ නා රජ්ජුරුවන් හික්මවා ලා එ තැනට රැස්වූවන්ගේ සිත් පහදවනු නිසා යමාමහ පෙළහර කළ සේක. එ කල අනූ කෙළ දහසක් රහත් වූ සේක. යම් කලෙක තමන් වහන්සේගේ පුත් වූ නන්දුත්තර කුමරුන්දැට බණ වදළ සේක් ද, එ කල අසූ කෙළ දහසක් නිවන් දුටහ. තව ද ථුල්ල කොට්ඨිත නුවර හද්දසාල ය–විජිතමිත්ත ය යන බමුණු යාළුවන් දෙන්නා කෙළ ලක්‍ෂයක් පමණ පිරිවර හා සමඟ මහණ ව රහත් වූ කල්හි බුදුහු ඒ කෙළ ලක්‍ෂයක් හා සමඟ පොහොය කළ සේක.

යම් කලෙක නාරද බුදුහු තමන් වහන්සේගේ නෑයන් රැස් වූ තැන් හි දී තමන් වහන්සේ යම් බුදු කෙණකුන් වහන්සේගෙන් විවරණ ලත් සේක් නම් එ තැන් පටන් බුද්ධවංශ වදළ සේක් ද එ කල අනූ කෙළ දහසක් වහන්දෑ රහත් වූ සේක. යම් කලෙක දෙණ නම් නා රජ්ජුරුවන් පහන් නියාව දැන වෙරොචන නම් නා රජ්ජුරුවෝ ගඩ්ගා නම් වූ ගඟ තුන් ගවුවක් පමණ වූ සත් රුවන් මඩුවක් මවා ලා තමන්ගේ දන් බලන්ට සියලු රටවල ඇත්තවුන්ට එන්ට විධාන කරවා ලා තුමූ ත් සහපිරිවරින් සැරහී ගෙණ බුදු පාමොක් මහ සඟනට මහ දන් දුන්හ. වළඳා අන්තයෙහි බුදුහු මහ වතුරක් මෙන් දුන් දන් සේ ම බණ වදළ සේක. එ කල මහණ ව රහත් වූ අසූ ලක්‍ෂයක් රහතන් හා සමඟ බුදුහු පොහෝ කළ සේක.

Non-Commercial Distribution

# 322. පියුමතුරා නම් බුදුන්ගෙන් නිවන් දුටුවාහු

නාරද නම් බුදුන්ට ඉක්බිති ව දිනන ලද පස් මරුන් ඇති, බා තබන ලද කඳ බර ඇති, මේරුව සේ ඉතා සාර වූ වනසා හැර පී සසර ඇති, බුදු වූ දවස් පටන් හවුරුදු ලක්‍ෂයක් මුළුල්ලෙහි පොළොව පළා ගෙණ නැංගා වූ සුදු පියුම් පිටින් ම වඩනා හෙයින් පියුමතුරා නම් වූ කුදෘෂ්ට්‍යාදි මලාපගමයෙන් අත්‍යන්ත පරිශුද්ධ වූ සදහම් නමැති රස ඇති, සම්‍යක් සම්බොධි ඥාන නමැති යුගඳුරු මුදුනෙහි පහළ වූ ත්‍රිවිධ බුද්ධ ක්‍ෂෙත්‍රයෙහි දෙශනා ලොක ශරීරා ලොක පැවැත්වීමට අසහාය සූර්‍ය්‍ය වූ සර්‍වඥ සූර්‍ය්‍යයා ලොව පහළ ව බ්‍රහ්මාරාධනාවෙන් මෙහිලී නම් උයන්හි වැඩ හිඳ දහම් සක පවත්වා ලූ දවස් නො හොත් සර්‍වඥ සූර්‍ය්‍යයා ගේ සදහම් රස් පවතු ත් විනෝජන නමැති පියුම් කෙළ ලක්‍ෂයක් විතර ප්‍රබුද්ධ වී ය. එ හෙයින් කෙළ ලක්‍ෂයක් දෙනා නිවන් දුටහ.

තව ද සරද නම් තවුසාණ කෙණකුන්ගේ සමාගමයෙහි දී බොහෝ දෙන නරක හයින් හය ගන්වා ලා බණ වදළ කල්හි ස තිස් ලක්‍ෂයක් නිවන් දුටහ. යම් කලෙක පියුමතුරා බුදුන්ට පිය රජ වූ ආනන්‍ද නම් රජ්ජුරුවෝ සිය නුවරට බුදුන් කැඳවා ගෙණෙන්ට විසි දහසක් යොධයින් පාවා දී ලා ඇමැත්තන් විසි දෙනකු බුදුන් කරා යැවූ ද, බුදුහු උන් හැම දෙනා ම රහත් කරවා මහණ කොට ගෙණ ඒ විසි දහස පිරිවරා ගොසින් හංසවතී නම් නුවර වසන සේක. වැස අපගේ බුදුන් කිඹුල්වත් නුවර උඩ අහස්හි රුවන් සක්මන් කෙරෙමින් සිට බුද්ධ වංශ දෙසුවා සේ ම පියුමතුරා බුදුහු ත් බුද්ධ වංශ දෙසූ සේක. එ කල පස් පනස් ලක්‍ෂයක් නිවන් දුටහ.

"යම්හි කාලෙ මහාවීරො—ආනන්‍දං උපසඞ්කමි,
පිතුසන්තිකමුපාගන්ත්වා—අහනී අමත දුන්දුභිං,

ආහතෙ අමත හෙරිම්හි—වස්සන්තෙ ධම්මවුට්ඨියා,
පඤ්ඤාස සතසහස්සානං—තතියාභිසමයො අහු"

යනු අපගේ බුදුන් විසින් බුද්ධ වංශ පාළියෙහි එ හෙයින් ම වදරන ලද. තව ද ආදියෙන් පොහොය කරණ දවසට එ දවස ම රහත් ව මහණ ව කෙළ ලක්‍ෂයක් දෙනා වහන්සේ රැස් වූ සේක. දෙ වෙනි පොහොයට එ දවස් ම රහත් ව මහණ ව අනූ කෙළක් රැස් වූ සේක. තුන් වෙනි ව කරණ පොහොයට අසූකෙළක් විතර රහත් ව මහණ ව බුදුන් හා එක් ව පොහොය කළ සේක.

Non-Commercial Distribution

# 323. සුමෙධ නම් බුදුන්ගෙන් නිවන් දුටුවාහු

පියුමතුරා නම් බුදුන්ට ඉක්බිති ව සුමෙධ නම් බුදුන් ඉපැද බ්‍රහ්මාරාධනාවෙන් සුදසුන් නම් උයන්හි දී දම් සක පැවැත් වූ කල්හි කෙළ ලක්ෂයක් නිවන් දුටහ. නැවත ඒ බුදුහු මහානුභාව සම්පන්න කුම්භකර්ණ නම් වූ යක්ෂයා අළුයම් වේලෙහි සමාපත්තීන් නැඟී ලොව බලන සේක් දැක නිත්‍ය පරිවාර වහන්දෑ තබා අග්‍ර උපස්ථායක තෙරුන් වහන්සේ ත් නො කැඳවා තනි ව ම ඒ යක්ෂයාගේ විමනට වැඩ උළු වැද හෝනා ශ්‍රී යහනෙහි වැඩ හුන් සේක. ඒ යකා මකු කම ඉවසා ගත නොහී කිපී ගොසින් භය නැති බුදුන්ට භයක් ඇති කෙරෙමී සිතා තමාගේ අත් බැව් භයානක කොට මවන්නේ පර්වතයක් සා ඉසක් ඇති, හිරු මඩල සේ ඇස් ඇති, ඇත් දළ වැනි දළ ඇති, උස් වූ පර්වතයක් වැනි බඳ ඇති, තල් ගස් වැනි වූ අත් පා ඇති, මැදින් වළ ව තිබෙන නාසා ගෙඩියක් ඇති, ගල් බිලයක් සේ කට ගෙඩියක් ඇති, දළ ව රතු ව තිබෙන තමා සේ ම රළු වූ හිසකේ ඇති රකුසු වෙසක් මවා ගෙණ බුදුන් ළඟට අවුත් දුමමින් දිළියෙමින් බුදුන්ට ගහට යට වසවත් මරහු ගෙන් උගත්තා මෙන් පහණ වැසි ආදී වූ නව වැස්සක් වස්වා ත් බුදුන්ගේ ඇඟින් ලොමකට ත් හානි කට නො හී ආළවකයන්ට උපදෙස් තබන්නාක් මෙන් බුදුන් ගෙන් ප්‍රශ්න විචාරා කියා ගත නුහුණො ත් මරමී' සිතා ප්‍රශ්න විචාළහ.

පැන විසඳීමෙන් ම බුදුහු යකාණන් මොළොක් කරවා තමන් වහන්සේට නම්වා ගත් සේක. දෙ වන දවසට දඹ දිව් වැස් සෝ ගැල්වලින් බතු ත් ගෙන්වා ගෙණ බිල්ලට රාජ කුමාර කෙණකුනු ත් ගෙණවු ත් කුම්භකර්ණ නම් යක්ෂයාණන්ට දුන්හ. යක්ෂයාණෝ රාජ කුමාරයන් බුදුන්ට දුන්හ. වන දෙර කඩ මිනිස්සු ත් බුදුන් ළඟට ගියහ. බුදුහු බණ වදරා යක්ෂයාණන් ඇතුළු ව අනූ කෙළ දහසක් නිවන් දක්වා වදාළ සේක. තව ද උපකාරී නම් නුවර සිරි නඳුන් නම් උයන්හි දී බණ වදාළ දහස් අනූ කෙළක් නිවන් දුටහ. සුදසුන් නුවර දී බණ වදරා කෙළ සියක් රහත් කරවා මහණ කොට ඒ රහතන් හා එක් ව පොහොය කළ සේක. තව ද දෙව් කුළු පවවෙහි දී බණ වදාළ ගමනේ අනූ කෙළක් මහණ ව රහත් වූහ. නැවත සැරිසරා වැඩි ගමනෙක බණ අසා අසූ-කෙළක් රහත් ව මහණ වූ සේක.

Non-Commercial Distribution

# 324. සුජාත නම් බුදුන්ගෙන් නිවන් දුටුවාහු

සුමෙධ බුදුන්ට ඉක්බිති ව සුජාත නම් බුදුන් ලෙව්හි පහළ ව සුමඞ්ගල නම් උයන්හි දී දහම් සක පවත්වා දෙව් මිනිසුන්ගෙන් අසූ කෙළක් නිවන් දක්වා වදාළ සේක. නැවත ඒ බුදුන් දෙව්ලොව වැඩ හිඳ විදම් බණ දෙසූ කල්හි මාතෘ දිව්‍ය පුත්‍ර ප්‍රමුඛ සත් තිස් ලක්‍ෂයක් දෙවියෝ නිවන් දුටහ. පිය මහ රජුන්ගේ ආරාධනාවෙන් සිය නුවරට වැඩි ගමනේ සැට ලක්‍ෂයක් නිවන් දුටහ. සුධම්මවතී නම් නුවර සුධම්මවතී උයන දී බණ වදාළ දවස් සැට ලක්‍ෂයක් මහණ ව රහත් වූහ. දෙව් ලොව දී විදම් බණ වදරා මිනිස් ලොවට බට දවස් පනස් ලක්‍ෂයක් රහත් ව මහණ වූහ. නැවත සුදසුන් නම් රජ කුමරුවන් මහණ වූ නියා ව අසා සතළිස් දහසක් මහණ ව රහත් වූහ.

# 325. පියදස්සි නම් බුදුන්ගෙන් නිවන් දුටුවාහු

සුජාත බුදුන්ට ඉක්බිති ව පියදස්සි නාම බුදුන් ලෙව්හි පහළ ව බ්‍රහ්මාරාධනාවෙන් ධම්සක් පැවතුන් සූත්‍ර ය උසභවතී නම් නුවර එ නම් උයන්හි දී දෙසූ කල්හි දෙව් මිනිසුන්ගෙන් කෙළ ලක්‍ෂයක් නිවන් දුටහ. නැවත උසභවතී නුවරට නුදුරු වූ සුදසුන් නම් පව් වෙක සුදසුන් නම් දෙව් රජ්ජුරු කෙණෙක් වෙසෙති. උඹ තුමූ මිථ්‍යා දෘෂ්ටිකයෝ ය. සියලු දඹදිව් වැස්සෝ ඒ දෙව් රජ්ජුරුවන්ට හවු රුදු පතා ලක්‍ෂයක් වටනා තරම් පිඬේනි ගෙන යෙති. ඒ දෙව් රජ්ජුරුවෝ ද පිඬේනි ගෙන්වා ගෙන ගිය රජ්ජුරුවන් හා එක හස්නෙහි හිඳ පිඬේනි ඉවසති. එ කල පියදස්සි බුදුහු ඒ දෙව් රජ් ජුරුවන්ගේ දෘෂ්ටි ය හරවනු නිසා ඒ දෙව් රජ්ජුරුවන් දිව්‍ය සමා ගමයට ගිය කල්හි උන්ගේ විමානයට වැඩ ශ්‍රී යහනට පැන නැඟී ලා සවනක් රස් විහිදුවමින් වැඩ හුන් සේක. උන්ගේ පිරිවර දේවතාදූහු තමන් හැම සැදෑ ඇති බැවින් සුවඳ මල් ආදීන් ගෙන් වා බුදුන්ට පූජා කොට ලා පිරිවරා ගෙණ සිටියහ.

සුදසුන් දෙව් රජ්ජුරුවෝ ද දිව්‍ය සමාගමයෙහි සිට එන තැන ත්තෝ තමන්ගේ විමනින් සවනක් බුදු රස් නික්මෙන්නා දැක මා ගේ විමනෙන් මෙ සේ වූ ශෝභාවක් මෙ තෙක් කලෙක දුටුවිරූ නැත. ඊට වැද ලා හුන්නෝ දේවතා කෙණෙක් දෝ කවුරු දෝ හෝ යි බලන තැනැත්තෝ උදගිරි තෙලෙහි බබලන හිරු මඬලක් මෙන් සවනක් රසින් බබලන බුදුන් දැක මේ මුඩු මහණ මාගේ දෙවඟනන් පිරිවරා ගෙන මා යානෙහි හුන්නේ ය' බුදු වන්ට සිතා හළ

Non-Commercial Distribution

හෙයින් මුත් ගිහි අවස්ථාවෙහි විමලා නම් බිසොවුන් ප්‍රධාන කොට ඇති තෙ තිස් දහසක් පුරඟනන් පිරිවැරූ මුනි රජුන් වහන්සේට උරණ ව මුන් මෙ ලෙස කළ කල මුන්ට මාගේ බල පාමි යි සියලු පර්‍වත ය මුළුල්ල ම නරක වළ[1] පර්‍වතයක් මෙන් කළහ. එ සේ කොට ලා මේ ගින්නෙන් මුඩු මහණ දැ දෙ නො දැ දෙ හෝ යි බල නුයේ ගිනිවර කිරීමෙන් පැ පත් වූ රන් කඳක් මෙන් ඉතා ශොභා මත් ව වැඩහුන් බුදුන් දැක 'මේ මහණ ගිනි නො බන වන. එ බැවින් දියෙහි ගලා මර පියමි යි තමාගේ විමන දසාවට මහ වතු රක් පවත්වාලීය. කෙලෙස් මහ වතුරෙන් හානි නො වූ ඔබට උන් මැවූ වතුරු කුමක් කොට ලා ද, වැළඳ ගත් සිවුරෙන් හූ රළක් පම ණකුත්, ඇඟින් ලොම් අගක් පමණකුත් නො තෙමිණ.

සුදසුන් දෙව් රජ්ජුරුවෝ ද මහණ පැන් බී මෙළේ ය' යි වතුරු නැති කොට ලා බැලූ තැනැත්තෝ බුදු රජුන් වහන්සේ මෙස මුබ යට පැමිණි ශරත් චන්ද්‍රයා මෙන් විමන ඇතුළත කිසි ත් හානියක් නැති ව සවනක් රසින් විමන ගොණුස් නපුරු හෙයින් රුවන් ගොණුස් උරවන්නා සේ සවනක් රස් විහිදුවමින් වැඩ හුන්නා දැක පහන මනා තැන නො පහන් ව මෙ ලෙසින් මරවා පියමි' නො එක් සැටි ඇති ආයුධ වැස්සක් වැස් වී ය. ඒ ආවුධ මුළුල්ල ම බුදුන්ගේ ආනුභාවයෙන් නො එක් සැටි ඇති මල් වඩම් ව ගොසින් බුදුන් දෙ පත්ලෙහි සක් ලකුණු සරහා සිටගත. ඒ විස්ම ය ත් දැක තර යේ ම උරණ ව ගොසින් බුදුන් දෙ පය අල්වාගෙන තමාගේ විම නෙන් මැත් කරණු කැමැති ව ඔසවා ගෙණ මහ මුහුද පැන ගෙණ සක්වළ ගල කරා ගොසින් 'මහණ මළ දෙ නො මළ දෙ හෝ' යි බලනුයේ වැඩහුන් ශ්‍රී යහනේ වැඩ හුන්නා දැක 'අනේ මේ මහණ මහානුභාව සම්පන්න ය. මම මොහු මින් තෙරා ගත නො හෙමි. ඉදින් යම්කිසි කෙණෙක් දැක පූ නම් මට වන්නේ අයස ය. යම්තාක් මා කිසි කෙණෙක් දැක නො පිය ත් නම් එ ලෙසට මුන් අත් හැර පලායෙමි' සිතූ ය.

බුදුහු ත් උන්ගේ අදහස් දැන ලා එතැනට පැමිණි කෙණෙක් උන් දකිත් නම් එ ලෙසට ඉවා ලූ සේක. එ දවසට ද වැළි ත් සියලු දඹදිව එක් සියයක් රජ දරුවෝ උන්ට පිදේනි ගෙන්වා ගෙණ අවු ය. උං හැම ත් බුදුන්ගේ පය අල්වා ගෙණ හුන් දෙව් රජ්ජුරු වන් දැක 'අනේ අපගේ දෙව් රජ්ජුරුවෝ බුදුන්ගේ පය මඩිති.

1. නරාවළ පර්‍වතයක්

අනේ බුදුවරහු ඉතා ආශ්වර්යයී සේකැ'යි පියදස්සී බුදුන් කෙරෙහි පැහැද බුදුන් වැඳ සිටියහ. පියදස්සි බුදුහු දෙව් රජ්ජුරුවන් මුල් ව බණ වදාළ සේක. ඒ දැක දෙව් මිනිසුන්ගෙන් සූදැසුන් දෙවී රජ්ජුරුවන් ඇතුළු ව අනූ කෙළ දහසෙක් නිවන් දුටහ.

තව ද සතිස් ගවුවක් විතර දිග පළල ඇති කුමුද නම නුවර වසන අපගේ බුදුන්ට දෙව්දතුන් වැනි වූ සොණ නම තෙර කෙණකුන්දැ මහා පදුම නම කුමාර කෙණකුන් ලබ්බවා ගෙණ උන් ලවා උන්ගේ පියාණන් මරවා පියා තුමූ පියදස්සී බුදුන් උන්ගේ සහායෙන් මරණු නිසා නො එක් ප්‍රයොග කොට ත් ජාති මූලික මරණ විනා උපක්‍රමයෙන් වන මරණ ත් බුදුවරුන් වහන් සේලාට නැති හෙයින් මරා ගත නො හී ද්‍රොණමුඛ නම ඇතු නැගෙන ඇතරුවා[1] කැඳවා ගෙන්වා ගෙණ ඔහු නළවා ගෙණ ඔහට 'යම් දවසෙක පියදස්සී බුදුහු මේ නුවරට සිඟා අවු නම් එ කල ද්‍රොණමුඛ නම් ඇතු මෙහෙයා ලා මරවා පියව'යි කිවු ය.

ඇතරුවෝ ත් 'මුන් වහන්සේ රාජවල්ලභ සේක. කියා ලූ දෙය නොකළො ත් අනර්ථයක් පැමිණ ගිය ත් නපුරැ'යි මෙ ලොව අනර්ථ සැලකූ බව මුත් පර ලොව අනර්ථ නො සලකා යහපතැ'යි ගිවිස ගෙණ දෙවන දවස් සිඟා වඩනා වේලාව සලකා ලා යහපත් ව සැලසී සිටිනා වූ නළලක් හා කුම්භස්ථලයක් ඇති, නැඟු දුන්නක් වැනි වූ දෙ කන්නෙන් නැමී මැදින් උස් වූ ඝන ව හැසී සිටිනා පිටක් ඇති, පළල් ව මොළොක් ව පිට හුන්නවුන්ට සලන තල් වැට දෙකක් බඳු වූ කන් සඟළක් ඇති, පිඟුවන් ව තිබෙන ඇස් සඟලක් ඇති, වටව ඝන ව තිබෙන දුවන් කල ඇති, සැඟ වී තිබෙන ගුය්හ ඇති, රිය හිස් වැනි වූ මනහර දළ සඟළක් ඇති, යහපත් වූ වාලධියකින් යුක්ත වූ සියලු හස්ති ලක්‍ෂණයෙන් සමන්විත වූ නිල් මේ කුලක් මෙන් ඉතා ශොභාමත් වූ සිංහයන්ගේ ගමන් බඳු ලීලොපෙත වූ ගමන් ඇති, උස මහත ඇති වීමෙන් එක් අතකට ගමන් ගත් ගල් කුළක් වැනි වූ සොඬ ය වරාඞග ය වාළධි ය පා සතර ය යන මේ සත් තැනින් බිම පිහිටීම ඇති ගිලී බස්නා මද ඇති ද්‍රොණමුඛයන් කරා ඇතරුවා ගොසින් රා පෙවීම් ආදි යෙන් තරයේ මත් කරවා ලා ශත්‍රු මර්‍දනයෙහි සමර්ථ වූ ඒ හස් තිහු බුදුන් මරණු පිණිස මෙහෙයාලී ය.

ඒ ඇත් ද මද නංවා ලා හැරලන්නා ම මිනී මරමින් ලේ වැකි සිරුරු ඇති ව වාසල් පවුරු තොරණ ආදි ය බිඳිමින් මොළ කම් කොට ගෙණ යන්නේ සභ ගණ පිරිවරා බුදුන් වඩනා

දක සෙලත් තැනෙකින් පර්වත ගලක් පෙරළුවාක් මෙන් බුදුන් කරා නික්ම ගත. ඔහු දකිමින් හයින් තැති ගත් නුවර වැස්සෝ ද මාළිගා උඩුමාල් වලට, වාසල් වලට, පවුරු වලට, ගස් උඩුවලට නැංගාහු ඇතු බුදුන් කරා නමා ගත් නියාව දක මොර ගාන්ට වන්හ. සමහර කෙණෙක් බලි ව ඇවිත් ඇතු නවතන්ට උත්සාහ කළහ. සර්වඥ නමැති ඇත් රජ්ජුරුඛන් වහන්සේ තෙල සේ වූ ඇතුන් කෙළ දහසකට කාය බල ඇති හෙයින් ඔහු කෙරෙහි ආසථාවක් ම නො කොට කරුණාවෙන් සිහිල් සිත් ඇති ම සේක් ඔහු කෙරෙහි මෙත් පතුරුවා ලූ සේක.

බුදුන්ගේ මෙත් සිත තමා කෙරෙහි පැතිරෙත් පැතිරෙත් ඇත් රජ ද මොළොක් සිත් ඇති ව තමාගේ වරද දක ලා බුදුන්ට ඉදිරි ව සිටිනට ලජ්ජාවෙන් පොළොවට වදිනට නමන්නාක් මෙන් බුදුන් පා මුල්හි වැද වැතිරිණ. අඳුන් කුළක් මෙන් කළු වූ ඇතාණෝ ද බුදුන්ට ලං වීමෙන් සන්ධ්‍යා වලායෙන් රැඳුණු රන් පර්වතයක් කරා පැමිණි නිල් වළාකුළක් මෙන් ඉතා හොබනට වත. මෙ සේ ඇත් රජහු බුදුන් වැද ගෙණ හොත් නියාව දුටුවා වූ නුවර වැස්සෝ එතරම සතුටක් නැති හෙයින් බලවත් සතුටු ව සාධුකාර දෙන්ට පටන් ගත්හ. ගුණ රුවනින් අඩුවක් නැති බුදුන්ට සත් රුවන් දමන්ට වන්හ. සතුටු බලවත් කල කළ මනා දෙයක් බැවින් පිළි ත් හිස සිසාරන්ට වන්හ. තව ත් ආශ්චර්‍ය්‍ය පහළ වි ය.

බුදුන් වැද ගෙන හොත් ඇත් රජහුගේ ආත්මභාව ය සඵල කරවණු සඳහා ජාල ලක්‍ෂණයෙන් විසිතුරු වූ ශ්‍රී හස්තයෙන් හිස පිරිමැද ලා ඕ හට නිසි බණක් වදරන සේක් ඇත් රජ්ජුරුවෙනි, හොළ මොළ කම තබා වැඩට නිසි කියන්නා වූ මාගේ බස් අසා එලෙස කරව. තොප ගේ දුෂ්ට කමෙක් මොළ කමෙක් ඇත් නම් ඒ හැර පියා සන්හුන් තරම ඇති මා කරා නැමුණු බැවින් තොපි ත් සන්හුන් තරම ඇති වව. ඇත් රජ්ජුරුවෙනි, යම කෙණෙක් මස් අනුභව කිරීම නිසා ලොභයෙන් වුව ත්, වෛර නිසා ද්වෙෂයෙන් වුව ත්, ආදීනව සලකා ගත නො හී මොහයෙන් වුව ත්, පණිවාංයෙහි හැසිරෙත් ද, පණිවාංයෙහි හැසුරුණු ඒ සත්තු නරකවල ඉපැද පියා නරකදුක් අනන්ත කාලයක් විඳිති. ඇතාණෙනි, මෙතෙක් කල් කෙ සේ කළ නමුත් මෙ බන්දක් නො කරව, මෙ ලෙසින් තරව මා කියන්නේ ප්‍රාණ වධ කළා වූ සත්තු අනන්ත කල්පයක් මුළුල්ලෙහි අවීචියෙහි ඉපැද දුක් ගනිති. එ තෙක් කල් මුළුල්ලෙහි ත් නරක දුක් විඳ පියා ත් ඒ ප්‍රාණවධ කළා වූ සත්තු ගැළ වී අවුත් මිනිස් ලොව උපන්නු නම ආයු

Non-Commercial Distribution

මඳ වෙති. බාල වයස දී ම මියෙති. දුටු දුටුවවුන්ට අප්‍රිය වෙති. මිනිස් ලොව ඉපැද ත් අනුන්ට කළ දුක් තමන් කරා ම පැමිණෙයි.

ඇත් රජ්ජුරුවෙනි, තොප ගේ ජීවිත ය තොපට යම් සේ ප්‍රිය වී නම් සෙස්සවුන්ගේ ජීවිත ත් උන් උන්ට ප්‍රිය ය. තෙපි යම් සේ මියනු නො කැමැත්තෝ නම් සෙස්සෝ ත් එ සේ ම මියනු නො කැමැත්තෝ ය. පණිවා නම් තෙලෙ සලකා අවශ්‍යයෙන් ම තමා බොහෝ කලක් ජීවත් වනු කැමැත්තෝ නම් හළ යුතු ය. මේ මා කියා ලූ ලෙසින් පණිවායෙහි බොහෝ ආදීනව ත් දැන පණිවායෙන් දුරු වීමෙහි බොහෝ අනුසසු ත් සලකා අහෙතුකයන්ට තබා ද්විහෙතුකයන්ට ත් ඒ ජාතියෙහි නිවන් නැති හෙයින් පර ලොව දී වුව ත් ලොවුතුරා සැපත් සිද්ධ වනු නිසා සියලු ලෙසින් ම පණිවා හරුව. හෙම්බා ඇත් රජ්ජුරුවෙනි, යම් කෙණෙක් පණිවං ආදී වූ පස් පවින් ම වැළැක්කෝ නම් මෙ ලොව දී සෙස්සක් නැත ත් දුටු දුටුවන්ට ප්‍රසාදවහ වෙති. පර ලොව දී අනන්ත වූ සම්පත් ලැබෙති. මෙ ලෙව්හි උපන් සියල් ලෝ ම සැපයක් ම කැමති වත් මුත් දුකක් නො කැමැති වෙත් ද, එ හෙයින් අනුන්ට කරන්නා වූ හිංසා පීඩා හැර පියා සියල්ලවුන් කෙරෙහි කරුණා ත් ඇති වව'යි වදාළ සේක.

මෙ සේ බුදුන් අවවාද කරත් කරත් ඇතාණෝ නිවනට ආධාර නො වත ත් අවවාද පිළිගන්ට ආධාර බැවින් වදාළ අවවාද පිළිගෙන ගුණයට තමන් අවසර වුව මනා හෙයින් නුගුණ හැර ගුණයෙහි පිහිටියහ. මෙ සේ පියදස්සී බුදුන් අප ගේ බුදුන් නාලාගිරි නම් ඇතු හික්මවූවා සේ ම ද්‍රොණමුඛයනු ත් හික්මවා ලා බණ වදාළ සේක. එ දවස් අසූ කෙළදහසක් නිවන් දුටහ. තව ද සුමඞ්ගල නම් නුවර පාලිත නම් රාජකුමාරයන් හා සබ්බදස්සී නම් බ්‍රාහ්මණ කුමාරයන් හා දෙන්නා බුදුන් ගේ බණ අසා කෙළ ලක්‍ෂයක් හා සමඟ රහත් ව මහණ වූ සේක.

## 326. අත්‍ථදස්සී නම් බුදුන් ගෙන් නිවන් දුටුවාහු

පියදස්සී බුදුන්ට ඉක් බිති ව උපන් දවස් නැතක් කලෙක අපවත් ව තුබූ නිධාන ඇත්තවුන්ට පවත් වූ හෙයින් අත්‍ථදස්සී නම් බුදුන් ලොව පහළ ව අනොමා නම් නුවර එ නම් වූ උයන්හි වැඩ හිඳ දහම් සක පැවැත් වූ දවස් කෙළ ලක්‍ෂයක් නිවන් දුටහ. නැවත දෙව් ලොව දී විදම් බණ වදාළ කල්හි කෙළ ලක්‍ෂයක් දෙවියෝ නිවන් දුටහ. පිය රජුන් ගේ ආරාධනාවෙන් සොභ නුවරට වැඩ බණ වදාළ දවස් කෙළ ලක්‍ෂයක් නිවන් දුටහ. තව ද

Non-Commercial Distribution

සුවණ්ණක නම් නුවර වසන සන්ත නම් රාජ පුත්‍රයාණන් හා උපසන්ත නම් බ්‍රාහ්මණ පුත්‍රයාණන් හා දෙන්න තමන් උගත් ශිල්පයෙහි සාරයක් නො දක නුවර සතර වාසල නුවණැති සතර දෙනකු සිටුවා ලා 'තෙපි නුවණැති කෙණකුන් දුටු නමුත්, පව තක් ඇසූ නමුත් අපට කියව'යි විධාන කළහ. එ කල අත්‍ථදස්සී බුදුහු සුවණ්ණක නුවරට පැමිණි සේක.

එ පවත දන්වන්ට සිටියෝ ද බුදුන් වැඩි නියා ව ගොසින් රාජ පුත්‍රයාණන්ට ත් පුරෝහිත පුත්‍රයාණන්ට ත් කිවූ ය. උයි ත් අසා බලවත් ව සතුටු ව දහසක් දෙනා පිරිවරා බුදුන්ට පෙර ගමන් කොට ගොසින් බුදුන් වැඳ ලා ආරාධනා කොට ගෙණ සති-යක් මුළුල්ලෙහි මහ දන් දී ලා සත් වන දවස් නුවර වැස්සන් හා-සමග බණ අසා රහත් ව අට අනූ ලක්‍ෂයක් විතර මහණ ව පළමු පොහොයට රැස් වූ සේක. තමන් වහන්සේට පුත් වූ සේල තෙරුන් වහන්සේට බණ වදාළ දවස් අටාසූ ලක්‍ෂයක් රහත් වූ සේක. තවත් මහා මඞ්ගල සූත්‍ර ය දෙසූ දවස් අට සැත්තෑ ලක්‍ෂයක් රහත් වූ සේක.

## 327. ධම්මදස්සි නම් බුදුන් ගෙන් නිවන් දුටුවාහු

අත්‍ථදස්සී බුදුන්ට ඉක් බිති ව ධම්මදස්සී නම් බුදුන් ලෙව්හි පහළ ව දහම්සක පැවැත් වූ කල්හි කෙළ ලක්‍ෂයක් නිවන් දුටහ. තව ද තගර නම් නුවර සඤ්ජය නම් රජ්ජුරු කෙණෙක් අනූ කෙළක් සමග හිමවු පියස ගොසින් තවුස් වෙස් ගෙණ මහණ ව හැම ම අභිඥලාභී වූහ. ලෞකික ගුණ ලත් සඤ්ජය ප්‍රමුඛ තවුසන්ට ලොවුතුරා ගුණ දෙවනු පිණිස ඒ බුදුහු ආසින් තවු සන්ගේ පන්සලට වැඩ බණ වදාළ සේක. තවුසෝ අනූ ලක්‍ෂය ම නිවන් දුටහ. තව ද සරණ නම් නුවර දී වෙන මවුන් දරු වූ පදුම කුමාරයන් හා ඵුස්සදෙව කුමාරයන් හා මුල් ව බණ වදාළ ගමනෙන් ඒ දෙ දෙනා ඇතුළු ව කෙළ ලක්‍ෂයක් රහත් වූහ. බුදුන් දෙව් ලොව දී විදම් බණ දෙසා බට දවස් කෙළ සියයෙක් රහත් වූ සේක. සුදසුන් නුවර දී තෙළෙස් ධුතාඞ්ගයෙහි අනුසස් වදාළ දවස් අසූ කෙළක් රහත් වූ සේක.

## 328. සිද්ධාර්ථ නම් බුදුන්ගෙන් නිවන් දුටුවාහු

ධම්මදස්සි බුදුන්ට ඉක්බිති ව සිද්ධාත්‍ථ නම් බුදුන් ලොව පහළ ව බ්‍රහ්මාරාධනාවෙන් දහම් සක පැවැත් වූ කල්හි කෙළ ලක්‍ෂයක් නිවන් දුටහ. තව ද භීමරථ රජ්ජුරුවන් ගේ ආරාධනා

Non-Commercial Distribution

වෙන් හිමරථ නුවර දී පුරවී කෙවිල්ලන් ගේ කට හඬට ත් වඩා අති මධුර වූ අසන්නවුන්ගේ කන්හි අමා වක්කරන්නාක් වැනි වූ කට හඬින් බණ වදාළ දවස් අනූ කෙළක් නිවන් දුටහ. වෙභාර නුවර දී නෑයන්ට බුද්ධ වංශ දෙසූ දවස් අනූ කෙළ ලක්‍ෂයක් නිවන් දුටහ.

තව ද දිව්‍ය පුරයක් හා සමාන වූ අමර නම් නුවර සම්බල ය සුමිත්ත ය යන රජ දරුවෝ දෙ දෙනෙක් රාජ්ජ ය කෙරෙති. එ කල සිද්ධාත්‍ථ බුදුහු ඒ රජුන් දෙන්නාගේ හෙතු සම්පත් නිසාව දැක ආසින් අමර නුවර මැදට වැඩ සක් ලකුණෙන් සැරහුණා වූ පත්ලෙන් පදලස දක්වා ලා අමර නම් උයනට වැඩ තමන් වහන සේගේ කරුණාව සේ සිහිල් වූ ගල් තලෙක වැඩ හුන් සේක. ඒ රජදරුවෝ දෙන්න ත් බුදුන්ගේ පදලස් දැක ඒ සලකුණෙන් බුදුන් කරා ගොසින් වැඳ ලා හුන්හ. බුදුහු අදහස් බලා බණ වදාළ සේක. රජ දරුවෝ දෙන්නා ද බණ අසා කෙළ සියයක් හා සමඟ රහත් වූහ. තව ද සුරසෙන නම් වෙහෙර දී අසූ කෙළක් රහත් වූ සේක.

## 329. තිස්ස නම් බුදුන්ගෙන් නිවන් දුටුවාහු

ඒ සිද්ධාත්‍ථ බුදුන්ට ඉක්බිති ව තිස්ස නම් බුදුන් ලොව්හි පහළ ව යසවතී නම් උයන්හි දී දහම් සක පැවැත් වූ කල්හි කෙළ සියක් නිවන් දුටහ. තව ද තිස්ස බුදුන් හා එක ද මහණ වූ කෙළක් විතර වහන්දෑ ඔබ බුදු වන්ට බෝ මැඩට වඩනා හෙයින් අනික් තැනකට වැඩ බුදුන් ධම් සක් පැවැත් වූ නියාව අසා යසවතී උයනට වැඩ බුදුන් වැඳ ලා පිරිවරා හුන් සේක. ඒ දවස් වදාළ බණින් අනූ කෙළක් දෙනා වහන්සේ නිවන් දුටු සේක. තව ද මහා මඞ්ගල සූත්‍ර ය දෙසූ දවස් සැට කෙළක් නිවන් දුටු සේක. තව ද යසවතී නම් නුවර දී ලක්‍ෂයක් දෙනා වහන්සේ රහත් වූ සේක. තව ද නාරිවාහන කුමාරයන් ඇතුළු වූ අනූ දහසක් දෙනා මහණ ව රහත් වූහ. තව ද ඛෙමවතී නම් නුවර දී නෑයන්ට බුද්ධ වංශ දෙසූ දවස් අනූ ලක්‍ෂයක් රහත් වූහ.

## 330. ඵුස්ස නම් බුදුන්ගෙන් නිවන් දුටුවාහු

තිස්ස බුදුන්ට ඉක් බිති ව ඵුස්ස නම් බුදුන් ලොව පහළ ව සකස් පුර නුවර ඉසිපතන උයන්හි දී දහම් සක් පැවත් වූ කල්හි කෙළ ලක්‍ෂයක් නිවන් දුටහ. තව ද සිරිවඩු නම් තවුසා ණන් මුල් ව බණ වදාළ දවස් අනූ ලක්‍ෂයක් නිවන් දුටහ. තමන්

Non-Commercial Distribution

වහන්සේගේ පුත් වූ අනුපම කුමාරයන්ට බණ වදාළ දවස් අසූ ලක්ෂයක් නිවන් දුටහ. තව ද කණ්ණකුජ්ජ නම් නුවර සුරක්ඛිත නම් රජ කුමරුන් හා ධම්මසෙන නම් බමුණු කුමරුන් හා ඵුස්ස බුදුන් තමන්ගේ නුවරට වැඩි කල්හි සැට ලක්ෂයක් දෙනා හා සමග ගොසින් සතියක් මුළුල්ලෙහි මහ දන් දී බුදුන්ගේ බණ අසා සැට ලක්ෂයක් හා සමඟ රහත් වූහ. තව ද කසී නුවර ජයසේන රජ්ජුරුවන් මුල් ව නෑයන්ට බුද්ධ වංශ දෙසූ දවස් පනස් ලක්ෂයක් පමණ රහත් වූහ. තව ද මඞ්ගල සූත්‍ර දේශනාවෙහි දී සතළිස් ලක්ෂයක් රහත් ව මහණ වූහ.

## 331. විදර්ශී නම් බුදුන්ගෙන් නිවන් දුටුවාහු

ඵුස්ස බුදුන්ට ඉක් බිති ව විදර්ශී නම් බුදුන් ලොව පහළ ව බ්‍රහ්මාරාධනාවෙන් දහම් සක පැවැත් වූ කල්හි දෙව් මිනිසුන් ගෙන් අසඞ්ඛ්‍යයක් නිවන් දුටහ. තව ද ඛන්ධ නම් රාජ පුත්‍රයාණන් හා තිස්ස පුරොහිත පුත්‍රයාණන් හා මහණ වන ගමනේ අනු ව මහණ වූ සුවා සූ දහසට බණ වදරා ඒ සුවා සූ දහසක් නිවන් දක්වූ සේක. තව ද තමන් වහන්සේ අනු ව මහණ වූ සුවා සූ දහසට ත් බණ වදරා ඒ සතුන් හැම ත් නිවන් දක් වූ සේක. තව ද යමා මහ පෙළහර දැක පැහැද ලක්ෂයක් රහත් වූ සේක. තව ද විපස්සී බුදුන්ට වෙන මවුන් දරු ව මල් වූ තුන් බෑ කෙණෙක් පසල් දනවුව සන්හිඳුවා ලා බුදුන්ට උපස්ථාන කරන්ට වර ලදින් තමන්ගේ නුවරට ගෙණ ගොසින් උපස්ථාන කොට බණ අසා අසූ දහසක් හා සමඟ රහත් වූ සේක.

## 332. සිඛී නම් බුදුන්ගෙන් නිවන් දුටුවාහු

විදර්ශී බුදුන්ට ඉක්බිති ව ගිතෙල් හිස දීප්තිමත් කරණ ලද වහ්නි ශිඛාවක් සේ සොභාමත් වූ සිඛී නම් බුදුන් ලෙව්හි පහළ ව අරුණවතී නුවර ගාවා 'මිගාචීර නම් උයන්හි දී ,හම් සක පැවැත් වූ කල්හි කෙළ ලක්ෂයක් නිවන් දුටහ. ත◌ ද අරුණවතී නුවර ලඟ ම වසන්නා වූ අභිභූ ය–සයම්භූ ය යන රාජ පුත්‍රවරුන් දෙන්නා මුල් ව බණ වදාළ දවස් අනූ කෙළක් නිවන් දුටහ. යම් කලෙක සුරියවතී නම් නුවර සපු රුක් මුල්හි දී තිථ යන්ගේ මත් බිඳිනු නිසා ත්, කෙලෙස් ඇලින් ඇල් වැද ගිය වුන්ට ගිනි කඳ විහිදුවා ඇල් හරනා නිසා ත්, කෙලෙස් ගින් නෙන් තැවී ගියවුන් ගේ ගිම පලවන්ට දිය කඳ පවත්වා ගිම හරවනු නිසා ත්, බුදුන් යමාමහ පෙළහර කරණ කල්හි ඊ ත්

පැහැද, බණ ත් අසා අසූ කෙළක් නිවන් දුටහ. අභිභූ ය-සයම්භූ ය යන අග සවු දෙ නම හා එක් ව ලක්‍ෂයක් මහණ ව රහත් වූ සේක. අරුණවතී නුවර නෑයන් ගෙන් අසූ ලක්‍ෂයක් රහත් වූහ. ධනඤ්ජය නම් නුවර දී ධනපාල නම් ඇත් රජහු හික්ම වන දවස් සැත්තෑ දහසක් රහත් වූහ.

# 333. වෙස්සභූ නම් බුදුන්ගෙන් නිවන් දුටුවාහු

සිඛී බුදුන්ට ඉක් බිති ව වෙස්සභූ නම් බුදුන් ලෙව්හි පහළ ව අරුණ නම් උයන්හි දී දහම් සක පැවැත් වූ කල්හි අසූ කෙළ දහසෙක් නිවන් දුටහ. තව ද දනවු සැරිසරා වැඩි ගමනෙහි සැත්තෑ කෙළ දහසෙක් නිවන් දුටහ. තව ද අනූපම නම් නුවර දී තිර්යන්ගේ දෘෂ්ටි නමැති දල් සිඳිමින්, මන් නමැති ධජ ලෙළවමින්, දහම් නමැති ධජ නංවමින්, තුන් සිය සැට ගවුවෙක පැතිර සිටි මිනිසුන් හා අනන්ත වූ දෙව් බඹුන්ට යමා මහ පෙළහර දක්වන දවස් දෙව් මිනිසුන් ගෙන් සැට කෙළක් නිවන් දුටහ. තව ද සොණ ය-උත්තර ය යන අග සවු දෙ දෙනා වහන්සේ මහණ ව රහත් වූ දවස් අසූ දහසක් රහත් වූ සේක. වෙස්සභූ බුදුන් හා එකද මහණ වූ ස තිස් දහසක් පමණ වහන්දෑ දහම් සක පවත්වන දවස පසු ව ගොසින් සොරෙය්‍ය නම් නුවරට අවුත් බුදුන් දැක ඊ දී රහත් වූ සේක. නැවත නාරිවාහන නම් නුවර උපසාන්ත නම් රජ්ජුරුවෝ බුදුන් තමන්ගේ නුවරට වැඩි නියා ව අසා සහපිරිවරින් බුදුන් කරා එළඹ පවරා ගෙණ මහ දන් දී බණ අසා සැට දහසක් හා සමඟ රහත් වූ සේක.

# 334. කකුසඳ නම් බුදුන්ගෙන් නිවන් දුටුවාහු

වෙස්සභූ බුදුන්ට ඉක්බිති බුදුවරුන් වහන්සේ පස් නමක ගෙන් හෙබියා වූ මේ මහා භද්‍රකල්පයෙහි කකුසඳ නම් බුදුන් ලෙව්හි පහළ ව සම්භූත නම් උයන්හි දී දහම් සක පැවැත් වූ කල්හි සතළිස් කෙළ දහසක් නිවන් දුටහ. තව ද කණ්ණකුජ්ජ නම් නුවර මහ සල්රුක් මුල්හි දී යමා මහ පෙළහර කළ දවස් කෙළ දහසක් නිවන් දුටහ. තව ද ඛෙමවතී නම් නුවරට ආසන්නයෙහි එක් තරා දෙවොලෙක වසන නරදෙව නම් මහා ප්‍රසිද්ධ වූ යක්‍ෂයෙක් වල් මද්ධ්‍යයෙහි සිහිල් පැණින් පිරුණා වූ මහනෙල් ඉපුල් ආදීයෙනු ත් හොබනා ජන සඤ්චාර ය නැති විලක් බඩ රදා මහනෙල් ඉපුල් ආදීන් මිනිසුන් පොළොඹා ගෙන්වා ගෙණ කයි. නැවත එ ම වල එක් තැනක සැභවී වැද හිඳ එ තැනට පැමිණිය

Non-Commercial Distribution

වුනු ත් ක යි. ඒ මහ ත් යකුන් මිනී කනී ප්‍රසිද්ධ වී ය. ඔබිනු ත් මොබිනු ත් වන දොර කඩ කරා ආ මිනිස්සු ඇ ත් මැ ත් වී ය නො හී සිටිති. පහ වූ භවබන්ධන ඇති කකුසඳ නම් බුදුහු එක් දවසක් අළුයම්හි කුලුණු සමවතින් නැඟී ලොව බලනා සේක් නර දෙව නම් යක්‍ෂයා ත් වල් කතරට පැමිණි ජන සමූහයා ත් නුවණ දැල බැඳුණවුන් දුටු සේක.

දැක ලා අහසින් වැඩ ඒ ජන සමූහයා බල බලා සිටියදී ම නොයෙක් පෙළහර දක්වමින් බුදුහු නරදෙව නම් යකුගේ විමනට වැඩ ඔහු හිඳිනා පලඟ ම වැඩ හුන් සේක. මිනිස් මස් කන්නා වූ යකාණෝ ද විදුලියෙන් වළඳනා ලද හිරු මඬලක් මෙන් සවනක් රසින් බබළමින් තමන්ගේ විමන් නමැති උද ගිරි තලට සවිඳ නමැති හිරු මඬල පහළ වූ නියාව දැක 'බුදුන් මා කෙරෙහි කරුණාවෙන් වැඩි නියා ය'යි පැහැද තමන් පිරිවර යකුනු ත් හැර ගෙණ හිමවු පියසට පලා ගොසින් සුවඳැති මලු ත් හැර ගෙණ සඳුන් ආදී වූ සුවඳ ත් ගෙණවු ත් තමන් ගේ මහුල් පලඟ වැඩ වුන් බුදුන්ට පූජා කොට ලා වැඳ වැඳ සිටියහ. ඒ පෙළ හර දැක මිනිසුණ් පැහැද භය හැර අවුත් බුදුන් වැඳ ලා සිටියහ. ඉක් බිත්තෙන් අන් භවයක ප්‍රතිසන්ධාන නැති කකුසඳ නම් බුදුහු බණ වදළ සේක. එ දවස් ඒ යක්‍ෂයාණන් ඇතුළු වූ අසඞ්ඛ්‍ය යක් සත්හු නිවන් දුටහ. කණ්ණකුජ්ජ නුවර ඉසිපතන නම් උයන්හි දී සතළිස් දහසෙක් රහත් වූහ.

## 335. කොණාගමන නම් බුදුන් ගෙන් නිවන් දුටුවාහු

ඔබට ඉක් බිති ව කොණාගමන නම් බුදුන් ලෙව්හි පහළ ව ඉසිපතන නම් උයන්හි දී දහම් සක් පැවැත් වූ කල්හි තිස් කෙළ දහසක් නිවන් දුටහ. තව ද සුන්දර නම් නුවර මහ සල් ගස මුල දී යමා මහ පෙළහර කළ දවස් විසි කෙළක් නිවන් දුටහ. යමා මහ පෙළහර කොට ලා දෙව් ලොවට වැඩ මෑණියන්දෑ ප්‍රධාන වූ දෙවියන්ට විදම් බණ දෙසූ දවස් දෙවියෝ දස-කෙළක් නිවන් දුටහ. තව ද සුරිඳැවති නුවර දී සිරිදෙවතා නම් උයන වැඩ හිඳ බණ වදළ කල්හි තිස් දහසක් දෙනා වහන්සේ රහත් වූ සේක.

## 336. කාශ්‍යප නම් බුදුන්ගෙන් නිවන් දුටුවාහු

කොණාගමන නම් බුදුන්ට ඉක් බිති ව කසුප් බුදුන් ලෙව්හි පහළ ව ඉසිපතන නම් උයන්හි දී දහම් සක පැවැත් වූ කල්හි විසි කෙළක් නිවන් දුටහ. තව ද දනවු සැරිසරා වැඩි ගමනේ

Non-Commercial Distribution

දස කෙළක් නිවන් දුටහ. සුන්දර නම් නුවර දෙර පියා ගස මුල දී යමා මහ පෙළහර කෙරෙමින් බණ වදළ දවස් පස් කෙළක් නිවන් දුටහ. පෙළහර කොට ලා මාතෘ දිව්‍ය පුත්‍ර ප්‍රමුඛ කොට දෙවියන්ට විදම් බණ දෙසූ දවස් තුන් කෙළ දහසක් පමණ දෙවියෝ නිවන් දුටහ. එ කල දඹ දිව නරදෙව නම් යක්‍ෂයෙක් දඹ දිව එක් නුවරක රජ්ජුරුවන්ගේ වෙස් මවා ගෙණ කාව ත් නො හඟවා ඒ රජ්ජුරුවන් කා පියා පුරහනන් සහිත වූ රට තෙමේ අත්කර ගන්නා මිනිස්සු ත් බොහෝ ව ඇත. මේ තෙමේ ද වැළි ත් ස්ත්‍රී ධූර්ත ය. යම් දවසෙක සියුම් නුවණ ඇති ගෑනු මූ අපගේ රජ්ජුරුවෝ නො වෙති' දත්තු නම් ඒ දවස් තෙමේ ලජ්ජා ව පියා පුරහනන් හැම ත් කාපියා අනික් නුවරක් අත් ගන්නී.

මෙ නියායෙන් මිනිසුන් ගසා කා ගෙණ ඇවිදිනෝ බුදුන් වැඩ හුන් නුවර බලා නික්මීණ. නුවර වැස්සෝ ඔහු දක බා ගොසින් නුවරින් නික්ම ඒ ඒ තැනට යන්ට වන්හ. කසුබ් බුදුන් උන් හැම හයින් පලන්නවුන් දක නරදෙව යක්‍ෂයාට ඉදිරි ව ලා සිටි සේක. යක්‍ෂයා ත් බුදුන් වැඩ සිටි නියා දක භය ගන්වන්ට ය යි සිතා හඬකු ත් ගසා හවා ගත නො හී ප්‍රශ්න විචාළ. ප්‍රශ්න විසඳීමෙන් ම උන් හික්මවා ලා බණ වදළ කල්හි අසඬ්ඛ්‍යයක් සත්තු නිවන් දුටහ. තව ද තිස්ස නම් තවුසාණන් ඇතුළු විසිදහසක් තවුසෝ කසුප් බුදුන්ගෙන් බණ අසා රහත් වූහ.

# 337. ගෞතම බුද්ධ චරිතය

කසුප් බුදුන්ට ඉක් බිති ව අපගේ බුදුහු දීපඞ්කරාදී වූ සූ විස්සක් පමණ බුදුවරුන් වහන්සේ ගෙන් විවරණ ලදින් පැරුම් පුරා අවුත් වෙසතුරු අත් බැවින් පැරුම් බිම නිමන හෙයින් එ තැන දක්වා අවුත් දිවකුරු බුදුන් ගෙන් විවරණ ලත් තැන් පටන් කවර ත් බෝසතුන්ට ධර්මතා හෙයින් අවීචි මහා නරකයෙහි ත් සක්වළ ගලට පිටත් ව සක්වළ තුනකට මද්ධ්‍යයෙහි තිබෙන ලෝ ඇදිරි මහ නරකයෙහි ත් නො ඉපැද, සකල ශරීර ය මුළුල්ල ම ගිනි කඳු ව තිබෙන ප්‍රෙත ව ත්, කාලකඤ්ජක නම් අසුර ව ත් නො ඉපැද, තිරිසන් ව උපදින ත් වටුවන්ට කුඩා ව නො ඉපැද, මිනිස් ලොව උපදනා කල ත් ජාත්‍යන්ධ නො ව ජාතින් බිහිරි ත් නො ව, ජාතින් ගොළු ත් නො ව, පිළු ත් නො ව, සංරාසැකි කප් සුවහස් මුළුල්ලෙහි ස්ත්‍රී ත් නො ව උභතොබ්‍යඤ්ජනක ත් නො ව, නපුංසක ත් නො ව, ආය්‍ය්‍ර්‍යයන් කෙරෙහි ඇතුළතු ත් නො ව, පඤ්චානන්තරිය කර්මයෙහි ත් නො හැසිර, කර්ම ක්‍රියාවාදී ව ත් මුත්

Non-Commercial Distribution

මිසදිටු ත් නො ගෙණ සවර්ගයෙනු ත් පන් සියයක් කපට ආයු ඇති අසංඥ බඹ ලොව ත් නො ඉපැද අනගැමි නො වන හෙයින් සුද්ධාවාසවල ත් නො ඉපැද, පැරුම් පුරා අවුත් වෙසතුරු අත් බැව සිට මහ පොළොව ගුගුරුවා මහ දන් දීමෙන් පැරුම් පුරා නිමවා ලා ආයු කෙළවර එයින් සැව තුසී පුරයෙහි සන්තුෂිත නම් දිව්‍ය රාජන් ව උපන්දැ ය.

මහ බෝසතුන් තුසී පුරෙහි වසන කලට පැවති බුද්ධ කොලාහල ය අසා දස දහසක් සක්වළ දෙව් බඹුන් එක්තැන් ව රැස් ව මුන්දෑ බුදු වන නියා ව නියම කොට ලා උන්දෑ ත් ඒ දෙව් ලොවින් චුත වන්ට පළන් මල් මැලම් ආදීවූ පූර්ව නිමිත්ත ඇති කලට එක් තැන් ව රැස් වූ දෙව් බඹහු බෝසතුන් කරා ගොසින් 'නිදුකාණෙනි, මුඹ පැරුම් පූරන ගමනේ ශක්‍ර සම්පත් බ්‍රහ්ම සම්පත් ආදි යක් පතා පිරූ පැරුමෙක් නැත. පැරුම් පිරූයේ බුදු බැව් පතා ය. මේ බුදු වන්ට කලැ'යි කියා කල් දැන්වූහ.

මුන් හැම දන්වන තෙක් මහ බෝසතුන් බුදු වන්ට කල් නියා ව නො දත් නියා ද යත් — නො දන්ට කාරණ නැත. බණ දෙසීමට බ්‍රහ්මාරාධනාව ඇත මනා සේ මෙයි ත් ඇත මනා හෙයින.

මහ බෝසත්හු ද දෙවියන් ආරාධනා කළ කල්හි තව පිළිණ නො දී කල් දෙස් ආදි ය විමසන දැ හවුරුදු ලක්ෂයෙන් ඔබ හා සියක් හවුරුද්දෙන් මුඹ කල් නො වන බව මුත් අතුරුකල් හෙයින් එ වකට මිනිස් ලොව ආයු හවුරුදු සියයක් හෙයින් බුදුවන්ට මිනිස් ලොව උපදනට කලැ යි කියා ත් දත් දැ ය. තව ද මිනිස් ලොව ත් උපන මනා ස්ථාන බලන දැ දිවයින් සතරින් දඹදිව ම ඉපැද්ද යුතු ය යි නියම දැන තව ද දඹදිව මහත දස දහසක් යොදුන. දෙශ කවරේ දෝ හෝ යි බලන දැ 'දිගින් එක් දහස් දෙසියක් ගවු පමණ වූ පළලින් ගවු දහසක් පමණ වූ වටින් තුන් දහස් සසියක් ගවු පමණ වූ මද්ධ්‍ය මණ්ඩලයෙහි කිඹුල්වත් නම් නුවරෙක් ඇත.

ඊ මා ඉපැද්ද යුතු ය'යි නියම දැන නැවත ත් ඉපැද්ද යුතු වූ කුල විමසන දැ සර්වඥවරයෝ නම් ව්‍යාපාර කුලවල ත් ගොයි කුල වලත් නො උපදිති. උපදිතොත් රජ කුලයෙක හෝ බමුණු කුලයෙක හෝ ය. දැන් රජ කුල ය උතුම් ව සිට්ටි. සුදොවුන් මහ රජහු තරම්හු ය'යි දැන මවුවන්ට තරමුන් විමසන දැ සර්වඥවරයන්ට එ සේ මෙ සේ වූ කෙණෙක් මවු නො වෙති. කප්ලක්ෂයක් බුදු කෙණකුන්ට මවුවන්ට පතා අව මැනව. උපන් තැන්

Non-Commercial Distribution

පටන් පන් සිලු ත් රකිති. මහාමායා බිසවු ත් එතරම් හ. ඌ මට මවු වෙති' නියම කොට ආයු කෙතෙක් දෝ හෝ යි බලන දෑ දස මස සත් දවසකට මුත් වඩා ආයු නැති නියා ව දුටු දෑ ය.

මෙ සේ මේ හැම දක දෙවි බඹුන්ගේ ආරාධනාව ඉවසා සෙසු දෙවි බඹුන් යවා පියා තුසී දෙව්ලොව දෙවියන් පිරිවරා ගෙණ සියලු දෙව් ලොව ම නඳුන් උයන් ඇති බැවින් තුසී දෙව් ලොව නඳුන් උයනට වැද ලා මිනිස් ලොව ව්‍යවහාර ලෙසට ඇසළ මස පුර පසළොස්වක් ලද අඟහරුවාද උතුරු සළ 'නකතින් මධ්‍යම රාත්‍රි වේලෙහි දෙව් ලොවින් චුත ව සුදෙවුන් මහරජාණන්ට ද ව මහාමායා බිසොවුන් කුස පිළිසිඳගත් දෑ ය. මවු කුස පිළිසිඳ ගත් වේලාට දස දහසක් සක් වළ පොළොව ගිගිරීම් ආදි වූ දෙති සක් විතර පූර්ව නිමිත්ත පහළ වි ය. බෝසතුන් මවුකුස පිළිසිඳ ගත් වේලේ පටන් දෙ පුතු මවුන්දෑට ම උවදුරු නවතනු නිසා දේවතාවෝ සතර දෙනෙක් කඩු අල්වා ගෙණ රකවල් ගත්හ.

මහාමායා බිසොවුන්ට ත් එ වේලෙහි පටන් දසමස් සත් දවස කින් පිරිමි වන තෙක් පුරුෂ ලොලත්ව ය නො වී ය. ලාභයෙන් යසසින් වැඩී ගියහ. දූරි ඇති සෙස්සවුන් සේ මහාමායා බිසොවුන් තමන් මහ පිණැති හෙයිනු ත් වදන පුතණුවන්දෑ මහ පිණැති හෙයිනු ත් කිසි දුකෙක් නැත. දෑවාණමය කරඬුවෙක වඩා ලූ රන් පිළිමයක් මෙන් වැඩහුන් පුතණුවන් දකිති. බෝසත් වරුන් විසූ මවුකුස් නම් ධාතු වැඩූ දාගබ වැනි හෙයින්, අනික් කෙණකුන් ඒ මව් කුස පිළිසිඳ ගන්ට නො වන හෙයින්, බොධි සත්වවරයන්ගේ මවු බෝසතුන් උපන් සත් දවසකින් මිය ගොසින් තුසීපුරයෙහි දිව්‍ය පුත්‍ර ව උපදිති. දරුවන් වදන සෙසු ස්ත්‍රීහු දසමස් නුපුරා ත් දස මසකට වඩා ය යි මෙ සේ කල් වරදවා ත් හිඳ ත් වැදහෙවත් වදති. බෝසත්වරුන්ගේ මවු එ සේ වදන්නෝ නො වෙති. දස මසක් කුසින් උසුලා පියා සිට ම වදති. මේ කවර ත් බෝසත් කෙණකුන්ගේ මවුන් සවභාවයෙක.

මහාමායා බිසවු දසමසක් මුළුල්ලෙහි මහ බෝසතුන් කුසින් උසුලා පියා වදන අවස්ථාවෙහි නෑයන් හිඳිනා දෙව්දහ නුවරට යනු කැමැති ව සුදෙවුන් මහ රජ්ජුරුවන්ට තමන් ඔබ යනු කැමැති නියාව කිවු ය. රජ්ජුරුවෝ ත් යහපතැ'යි ගිවිස කිඹුල්වත් නුවර පටන් දෙව් දහ නුවර දක්වා මහ සමතල කොට කරවා ලා ධජ පතාක පුන්කලස ආදියෙන් මහ සරහවා ලා මහ මායා බිසොවුන්

Non-Commercial Distribution

රන්සිවි ගෙයක හිඳුවා ලා මහ පෙරහරින් යවූ හ. නුවර දෙකට මැද දෙ නුවර ඇත්තවුන්ට ම ප්‍රයෝජනවත් වූ ලුම්බිනී නම් මඟුල් උයනෙක් ඇත. ඒ උයන ත් ඒ දවසට කොළ පතක් නැත්තා සේ මලින් ගැවසී සිට ගත. අතු හස්සෙන් හා මල් හස්සෙන් නික්මුණා වූ බමරුන්ගේ භෘඞ්ග නාදයෙන් ශොභාමත් වූ දෙව් ලොව නඳුනුයන වැනි වූ සල් උයන දැක මහාමායා බිසොවුන් උයන් කෙළියට සිත නැමුණ. ඇමැත්තෝ ද රජ්ජුරුවන්ට කියා යවා ලා මහාමායා බිසොවුන් ලුම්බිනී වනයට කැඳවා ගෙණ ගියහ.

බිසොවුන් මඟුල් සල් ගස කරා ගොසින් ලා මල් පල්ලෙන් ගැවසී ගත් යම් අත්තක් අල්වනු කැමති වූ නම් ඒ අත්ත බිසොවුන්ගේ දකුණතට ආසන්න ව පැමිණ. බිසවු ද ඒ සල් අත්ත තඹ වන් ව අගින් උස් ව සිටිනා නියායෙන් බබළන්නා වූ පියුම් පෙති පෙළක් සේ ශොභාමත් වූ මුලින් දළ ව අගින් සීන් ව තිබෙන වට වූ ඇඟිලි ඇති ව රුවන් වළල්ලෙන් හොබනා දකුණතින් අල්වා ගත්හ. සල් අත්ත අල්වා ගෙණ සිටියා වූ මහාමායා බිසවු ද නිල් වලාකුළකට ලං වූ චන්ද්‍ර රෙඛාවක් මෙන් ද නැතක් වෙලා පවත්නා වූ විදුලියක් මෙන් ද, නඳුන් උයනට පැමිණී දෙවඟනක මෙන් ද, බබලන්නාහ. ඒ වේලේ ම විලි ත් පහරන්ට වන. වට පටකඩ තිරයක් අද්දවා ලා මිනිස්සු ඉවත් වූහ. ඒ වේලේ ම රන් වලා ගබකින් මෑ ත් වන පුන් සඳ මඬලක් මෙන් ම මහාමායා දෙවී නමැති රන් වලා ගබින් බෝසත් නමැති පුන්සඳ නිකුත් වී ය. එ වේලෙහි දී රහත් බඹු සතර දෙනෙක් රන් දැලක් හැර ගෙණ අවුත් මහ බෝසතුන් පිළිගෙණ ලා බිසොවුන්ට සතුටු වුව මැනව. මුඹ වහන්සේට පිණැති පුතණු කෙණකුන් වහන්සේ සම්භ වූ සේකැ'යි කිවූ ය.

සෙස්සෝ මවුකුසින් බිහි වූ කලට වදන තැන මුසු වූවන් ඉස් සෝධා නහන තරමට ඉතා අපවිත්‍ර වෙති. බෝසත්වරහු එසේ අපවිත්‍ර නොවෙති. දෙ අත් – දෙ පය ත් දික් කොට ගෙණ මවු කුස කඳ ලේ ආදියෙහි ම නො වැකී සිට මවු කුසින් බිහි වන බැවින් කසී සළුවක තුබූ මිණි රුවනක් මෙන් ඉතා පවිත්‍ර ව බිහි වෙති. එ තකුදු වුව ත් බෝසතුන්ට ත්, මහාමායා බිසොවුන් ට ත් සත්කාර නිසා ආසින් පැන් ධාරා දෙකක් අවුත් දෙ පුතු මවුන්දැගේ ශරීරයෙහි සෘතු ගැන්වූහ.

Non-Commercial Distribution

රන් දැලින් පිළිගෙණ සිටි බඹුන් අතින් වරම් රජ දරුවෝ සතර දෙන අභිමඞ්ගල සම්මත වූ සුව වූ පහස් ඇති අඳුන් දිවි සමෙකින් පිළිගත්හ. උන් අතින් බිමට බැස ලා සිට නැගෙන හිරි දසාව බැලූ දැ ය. නො එක් දහස් ගණන් සක් වළවල් එකාලොක ව හෙළි වි ය. එහි සිටියා වූ දෙවි-මිනිස්සු සුවඳ මල් ආදි ය පුද ලා 'සවාමීනි, මුඹ වහන්සේ හා සරි කෙණෙක් මෙ දිග නැත. වැඩි කරම් මුත් මුඹ වහන්සේ ය'යි කීහ.

මෙ සේ දස දිග ම බලා වැඩ තමුන් තබා සරි කෙණකුනු ත් නො දැක උතුරු දිගට මූණ ලා සත් පියවරක් ඔසවා ගිය දැ ය. යන ගමන ත් පොළොවින් ම ගිය දැ ය. අහසිනු ත් නො වෙයි. සළු නො හැඳ ම ගිය දැ ය. පිළී හැඳ ත් නො වෙයි. බාල ව ම ගිය දැ ය. සොළොස් හැවිරිදි වයසට පැමිණ ත් නො වෙයි. එත කුදු වුව ත් බලා සිටියවුන්ට ආසින් යන්නා ම සේ ද සළු හැඳ රාජාභරණ ලූවා සේ ද එ දවස් උපන ත් සොළොස් හැවිරිදි වයසට පැමිණියා සේ ද පෙණෙන දැ ය. සත් පියවරක් ඔසවා ගොසින් සත් වන පියවරට පොළොවට පළා ගෙණ නැංගා වූ සත් බුමු බියුම මත්තෙහි සිට 'ලොවට අග්‍රයෙමි. ජ්‍යෙෂ්ඨයෙමි. ශ්‍රෙෂ්ඨ යෙමි. මේ කෙළවර ජාතිය ය. පෙරළා අනික් තැනෙක ඉපදීමෙක් නැතැ' යි කියා උතුම් වූ නාද පැවැත් වූ දැ ය.

මහ බෝසත්හු ද අත් බැව් තුනක දී ම මවු කුසින් බිහි ව ලා ම කථා කළ දැ ය. මහෞෂධ ව උපන් ජාතිය ය, වෙසතුරු අත් බැව ය, මෙ ම අත් බැව ය යි මේ තුන් අත් බැව ය. මහෞෂධ අත් බැව දී මවු කුසින් බිහි වන වේලාට ලොවෙහි ප්‍රසිද්ධ කරණු නිසා ත් සක් දෙවිඳු දිව සඳුන් ගැටයක් අත තබා ලා ගියහ. උන්දැත් මිට මොළවා ගෙණ බිහි ව සුමනා දේවීන් 'පුතණ්ඩ. අත කුමක් ද' යි විචාළ කල්හි 'මැණියන් වහන්ස, බෙහෙදකැ'යි කියා ලා බෙහෙදෙහි ආනුභාව ය ත් කී දැ ය. වෙසතුරු අත් බැව දී මවු කුසින් බිහි ව ලං ම දකුණත දික් කොට ලා සිර ගෙය ලූවා සේ දස මසක් මුළුල්ලෙහි දනක් ම දී ලන්ට නු වූ හෙයින් දනක් දී ගන්ට සිතා ගන්නා සේ 'මැණියන් වහන්ස, ගෙයි කිසිවක් ඇත් ද දන් දී පියන්ට ය'යි කී දැ ය. ඵුසති බිසොව ද දහසින් බැඳි පියල්ලක් අත තබා ලූහ. මෙ බුදු වන අත් බැව දී මේ සිංහ නාද ය පැවැත් වූ දැ ය.

මවු කුසින් බිහි වූ ඇසිල්ලෙහි ත් දෙ තිසක් විවර පූර්ව නිමිත්ත පහළ වි ය. යම් දවසෙක අප මහ බෝසත්හු ලුම්බිනි වෙනෙහි දී

Non-Commercial Distribution

උපන්දෑ ද එ ම දවස් බිම්බා බිසවු ද, ඡන්න නම් ඇමැත්තාණෝ ද, අනඳ මහ තෙරුන්වහන්සේ ද, කාළුදයි නම්ඇමැත්තාණෝද, කන්ථක නම් අස් රජ ද, බෝ රුක ද, නිධාන සැළ සතර ද, උපන. ඉන් එක් සැලෙක මුව විට පළල ගවුවක් විවර ය. එකෙක මුව විට පළල දෙ ගවුවක් විවර ය. එකෙක මුව විට පළල තුන් ගවුවක් විවර ය. එකෙක මුව විට පළල සතර ගවුවක් විවර ය. උස නම් පස් පොළොව බොල ය. සත්ත සහජාතයෝ නම් මොහු ය.

දෙ නුවර ඇත්තෝ බෝ සතුන් කිඹුල් වත් නුවරට ගෙණ ගියහ. එ දවස් ම 'සුදෙවුන් මහ රජ්ජුරුවන් වහන්සේගේ පුතණු වන් වහන්සේ බුදු වන සේකැ'යි තව්තිසා වැසි දෙවියෝ සතුටු ව කෙළි ලළුවට පටන් ගත්හ. එ කල කාළදෙවල නම් තවුසාණෝ රජ ගෙයි දී බත් අනුභව කොට ලා දවල් දවස් යවන පිණිස තව්තිසා දෙව් ලොවට ගොසින් එහි හුන් තැනැත්තෝ දෙවියන් කෙළනවුන් දැක 'කුමක් නිසා සතුටු ව කෙළු ද? සතුටු වන්ට කාරණ කියව' යි කිවු ය. දෙවියෝ ද 'කිඹුල් වත සුදෙවුන් රජ්ජුරුවන්ගේ පුතණු කෙණෙක් උපන්හ. බෝ මැඩ හිඳ බුදු ව දහම් සක පවත්වති. බුදු වූ ඔබගේ සර්‍වඥ ලීලාව ත් දකුම්හ. බණ ත් අසම්හ යි සිතා සතුටු ව නටම්හ' යි කිවු ය.

උන්ගේ බස් අසා කාළදෙවළයෝ දෙව් ලොවින් බැස සුදෙවුන් මහ රජාණන්ගේ මාළිගාවට ගොසින් 'මහ රජ, තොපගේ පුතණුවන් දක්නා කැමැත්තම්හ' යි කිවු ය. රජ්ජුරුවෝ ද පුත් රුවන ගෙන්වා ලා තවුසාණන් වන්දවන්ට ආරම්භයක් කළහ. මහ බෝ සතුන්ගේ සත් ලකුණෙන් විසිතුරු පතුල් දෙක නිල් වලා කුළෙක පිහිටන විදු ලිය සහළක් මෙන් තවුසාණන්ගේ දළ මවුල්ලෙහි පිහිටා ගත. ඒ ජාතියෙහි බෝසතුන් ගෙන් වැඳුම් ලබන්ට තරම් කෙණෙක් නැත. තවුසාණෝ ද හුනස්නෙන් නැඟී සිට බෝසතුන් වැන්දහ. රජ්ජුරුවෝ ද ඒ විස්ම ය දැක පුත් රුවන වැන්දහ. තවුසාණෝ ද මහ බෝසතාණන්ගේ ලක්‍ෂණ සමෘද්ධි ය දැක සක්විති වන පිණැත්තවුන්ට ත් දෙ තිස් මහා පුරුෂ ලක්‍ෂණ ය සම්භව වන හෙයින් 'මුන් වහන්සේ බුදු වන සේක් දෝ හෝ, සක්විති වන සේක් දෝ හෝ' යි අනාගත ඥාන යෙන් බලනුවෝ සැක නැති ව ම බුදු වන නියාව දැන සමාධි ව සිතා සිනා සී පූ ය.

නැවත 'බුදු වූ මුන් වහන්සේ මම දක්කහෙම් දෝ හෝ'යි බලනුවෝ දැක නො හෙමි. අතුරෙක මිය ගොසින් බුදුන් දහ

Non-Commercial Distribution

සක් වැඩ ත් නිවන් දක්වා ලිය නො හැකි අරූතලයෙහි උපදිමි'යි දැක 'අනේ මෙ වැනි තැනක් දක්ක නො හෙමි. මට වන්නේ බලවත් හානියෙකැ'යි කම් බලයෙන් ධ්‍යාන නිකාන්ති ය හැර ගත නො හී හැඩූහ. මිනිස්සු ද ඒ දැක 'අපගේ තවුසාණන් වහන්සේ දූන් ම සිනා සී පියා හඩන්ට ත් වන් සේක. කුමාරයන් වහන්සේට උවදුරක් ඇති නියා දෝ හෝ' යි සිතා විචාළහ. තවුසාණෝ ද 'උවදුරක් නැත. සැක නැති ව ම බුදු වන සේකැ'යි කිවූ ය, 'එ සේ කල සිනා සී ම වන්නා යුක්ති ය. හැඩුයේ හැයි දැ'යි විචාළහ. 'මෙ වැනි තැනක් මම මා පින් නැති හෙයින් දක්ක නො හෙමි' සිතා හඩා පීමි කිවූ ය.

ඉක් බිත්තෙන් බෝසතුන් උපන් පස් වැනි දවස් නාවා පියා නම් තබම්හ යි කියා රජ ගෙයි සිවුදැ සුවඳින් පිරිබඩ ගන්වා ලා ලද පස් මල් මහුල් පිණිස හිස ලා, පැන් අමිශ්‍ර කිරිබත් පිසවා ලා ත්‍රි වේදයෙහි දක්‍ෂ වූ අටෝරාශියක් බමුණන් ගෙන්වා ගෙණ රජ ගෙයි හිඳුවා ලා කිරිබත් අනුභව කරවා, තව ත් කළ මනා සත්කාර කොට ලා, බෝසතුන්ට වන වැඩ අවැඩ විචාළහ. ඒ අටෝ රාශියක් බමුණන්ගෙන් රාම ය, ධජ ය, ලක්‍ෂණ ය යනාදී වූ බමුණෝ අට දෙන තම තමන් මහ නුවණැති හෙයින් ලක්‍ෂණ දනිති. ඒ අට දෙනාගෙනු ත් සත් දෙනෙක් ඇඟිලි දෙක දෙක ඔසවා ලා 'මේ ලකුණු ඇත්තෝ ගිහි ගෙයි විසූ නම් සක්විති රජ වෙති. මහණ වූ නම් බුදු වෙති' කීහ. උන් සත් දෙනාට ම බාල කොණ්ඩඤ්ඤ නම් බමුණු සුහිත්තෝ බෝසතුන්ගේ ලකුණු දැක 'මුන් වහන්සේ ගිහි ව රැඳීමට කාරණ නැත. ඒකාන්තයෙන් බුදු වන සේකැ' යි දැන එක ම ඇඟිල්ලක් ඔසවා ලා බුදු වන නියා ව නියම කොට කිවූ ය.

ඉක් බිත්තෙන් නම් තබන්නාහු සියලු ලෝ වැස්සන්ට අර්ථ සිද්ධි ය කරණ හෙයින් සිද්ධාර්ථ ය. යන නම තබා ලූහ. දෙතක් කොට නිමිත්ත කී බමුණෝ සත් දෙන ද තම තමන්ගේ ගෙවලට ගොසින් පුතුන් බණවා ලා· අපි මාලු ව ගියම්හ. සුදෙවුන් මහ රජ්ජුරුවන් ගේ පුතණුවන් වහන්සේ බුදු වූ කලට අපි සම්භ වමෝ හෝ ය, නො වමෝ හෝ ය. තෙපි උන් වහන්සේ මහණ ව බුදු වූ කලට ඔබගේ සස්නෙහි මහණ වව'යි කීහ. ඒ බමුණෝ සත් දෙන ත් ආයු පමණින් සිට ලා· මිය ගියහ. කොණ්ඩඤ්ඤ නම් බමුණානෝ තව මාලු නො වූහ.

සුද්ධොදන රජ්ජුරුවෝ ද පුතණුවන්දැ මහණ වන නියාව අසා 'ම පුතු කුමක් දැක මහණ වෙත්ද'යි විචාළෝ ය, 'ජරා

Non-Commercial Distribution

රුවක් හා රෝගී රුවක් හා මළ රුවක් හා මහණ රුවක් දැක ය'යි කිවු ය. රජ්ජුරුවෝ ද, 'මෙ වක් පටන් එ බඳු කෙණකුන් ම පුතුන්ට නො පාව'යි කියා ලා සතර දිග ගවුව ගවුව රකවල් ලැවූහ. ඒ දවස් නම් තබන මඟුලට පිය පක්‍ෂයෙන් රැස් වූ අසූ දහසක් නෑයන් අතුරෙන් එකි එකී කෙණෙක් 'මුන් දෑ බුදු වුව ත් නු වුවත් පිරිවරා ඇවිදිනා ලෙසට අප අප ගෙන් කුමාරවරුන් පාවා දෙමහ'යි කියා ලා අසූ දහසක් රාජ කුමාර වරුන් පාවා දුන්හ. ඌ අසූ දහස ත් බෝසතුන් බුදු වූවො ත් මහණ වන්ට හා සක්විති වූවො ත් සසර සිටිනට නියත වූහ.

සුදොවුන් මහ රජහු ද පුත් රුවනට අතිදීර්ඝාදී දෙෂ වර් ජිත කිරි මවුනු ත් තෝරා දෙවූහ. මහ බෝසත්හු ද මහ පෙර හරින් වඩනා දෑ ය. එක් දවසක් රජ්ජුරුවන්ගේ වප් මඟුලෙක් ඇත. එ දවස් රජ්ජුරුවෝ වප් මඟුලට නුවරින් නික්මෙන තැනැත්තෝ පුත් රුවන ත් කැඳවා ගෙණ ගියහ. සානා කුඹුරු බඩ ද එක් දඹ ගසෙක් ඉතා ශොභාවත. සෙවන මඬුල්ල ත් යහපත. ඒ දඹ රුප්පයෙහි යහනක් පනවා ලා උඩ රන් තරු රිදී තරු ආදියෙන් විසිතුරු වියනකු ත් බඳවා ලා වට පට කඩ තිරයකු ත් බඳවා ලා කුමාරයන්දෑ එහි සතප්පවා ලා රජ්ජුරුවෝ වප් මඟුලට ගියහ.

ඒ වප් මඟුල් කරන්නෝ කෙ සේ ද යත්— රජ්ජුරුවෝ රන් නඟුලක් සීයට හැර ගනිති. ඇමැති ආදීහු රිදී නඟුල් ආදි ය හැර ගනිති. ඒ දවස් නඟුල් දහසක් යොදති.

මහ බෝසතුන් පිරිවරා හුන් කිරි මවු ද 'රජ්ජුරුවන්ගේ සම් පත් දකුම්හ'යි තිර ය ඇතුළතින් පිටත් ව ගියහ. එ කල බෝසත්හු ඇත මෑත බලා කිසි කෙණකුනු ත් නො දැක වහා නැඟී සිට පලක් බැඳ ගෙණ ආනාපානසති භාවනාවෙන් ප්‍රථමද්ධ්‍යාන ය උපදවා ගත් දෑ ය. කිරි මවුන් කන බොන තැනට වැද පියා මඳක් කල් යවා පිහ. සෙසු ගස්වල සෙවණවල් හිර නවා පී හෙයින් නැගෙන හිරට නැමී සිටියහ. දඹ ගස සෙවන කොත් නො නැමී පිල් සතක් මෙන් සිටී ය. කිරි මවු 'කුමාරයන් වහන්සේ ලඟ කවුරු ත් නැත්තෝ වේදූ'යි වහ වහා තිර ය ඇතුළට වන්නාහු ශ්‍රී යහනෙහි පලක් බැඳ ගෙණ හුන් නියා ව ත් දඹ සෙවණ ඉවත් නු වූ නියාව ත් දැක ගොසින් රජ්ජුරු වන්ට කිවු ය. රජ්ජුරුවෝ ත් වහා අවුත් වැද ලා 'මේ පුතණ්ඩ ෆදවෙනි ව වැදි නියා ය'යි කිවු ය.

Non-Commercial Distribution

මහ බෝසත්හු ද කලාවෙන් කලාවට වඩනා සඳ පරිද්දෙන් සොළොස් හැවිරිදි වූ දැ ය. රජ්ජුරුවෝ ද මහ බෝසතුන්ට තුන් සෘතුවට නිසි කොට පස් මාල් කොට ත්, සත් මාල් කොට ත්, නව මාල් කොට ත්, රම්ම ය, සුරම්ම ය, සුභ ය යන මේ නම් ඇති මාළිගා තුනක් කරවා දුන්හ. මාළිගා තුනෙහි ම උස ත්‍රිවිධ සුචරිතයට ම සම වූවා සේ සරි ය. මාල් පමණෙක් වෙන.

නැවත සුදෙවුන් රජ්ජුරුවෝ 'ම පුත්තු වැඩි විය ත් පැමිණියහ. ඔටුණු පළඳවා ලා රජසිරි විඳිනා නියා ත් බලමි' ශාක්‍ය දරුවන්ට 'ම පුත්තු වැඩි විය පැමිණියහ ඔටුණු පළඳවමි' බිසෝවරුන් ඇත මනා බැවින් තමන් තමන්ගේ දූවරුන් එවුව මැනවැ'යි කියා යවූහ. උයි ත් ඒ අසා 'කුමාරයන් රූප ත් බව ඇත. දන්නා ශිල්ප නුගත් හෙයින් නැත. ශිල්ප නො දන්නා කල දරාහරණ ය කෙ සේ ද? අපි අපගේ දූ දරුවන් නො එවම්හ'යි කියා යවූහ. රජ්ජුරුවෝ එ පවත් අසා පුතණුවන්දෑ ලඟට ගොසින් එ පවත් කීහ. බෝසත්හු ද 'කුමන ශිල්පයක් දක්වමෝ ද'යි විචාළ දැ ය. 'දහසක් දෙනා නඟන දුන්න නඟා ලීම යහපතැ'යි කිවු ය.

මහ බෝසත්හු ද දහසක් දෙනා නඟන දහසක් දෙනා බාන දුන්න ගෙන්වා ලා සිංහාසනයේ හිඳ ම දුනු දිය පය මාපට ඇඟිල්ලෙහි වෙළාගෙණ අදිමින් පය මාපට ඇඟිල්ලෙන් ම දුන්න නගාලා වමතින් දුන්න අල්වා ගෙණ දකුණතින් දුනු දිය අත පොළා ලූ දැ ය. සියලු නුවර ඉපිල යන කලක් මෙන් වී ය. ''මේ කෙසේ වූ අරගලයෙක් දැ'යි විචාළ කල්හි සමහර කෙණෙක් ආකා ගුගුරන නියා ය යි කිවු ය. ඒ අසා සමහර කෙණෙක් 'තෙල ලෙස ත් ආස ගුගුරා ද? ආස ගුගුරන නියා නො වෙයි. සිද්ධාත්‍ථ කුමාරයන් දුන්න නඟා ලා දුනු දිය අත පොළා ලූ හඬ ය'යි කිවු ය. ශාක්‍ය රජ දරුවෝ ඒ අසා එ පමණකින් ම සතුටු වූහ.

තව ද මහ බෝසත්හු 'දුන්න නගා ලූ පමණෙකින් ශිල්ප [illegible] නිම ත් කුමන ශිල්පයක් දක්වමෝ දැ'යි විචාළ දැ ය. අවහුල් බොල ඇති යාපත් විදීම යහපතැ'යි කිවු ය. ඒ විද පියා 'අනික් කිම් දැ'යි විචාළ කල්හි 'වියතක් බොල ඇති දිඹුල් පෝරුවක් විදීම යහපතැ'යි කිවු ය. එයි ත් විද පියා 'අනිත් කිමදැ'යි විචාළ කල්හි වැලි ගල් ආදිය ත් විද දියෙහි එක් සිය සතළිස් රියනක් හා ගොඩ එක් දහස් එක් සිය විසි රියනක් විද

Non-Commercial Distribution

පී දෑ ය. හී දඬු බස්නා පමණ තැන් අස් වලින් කරබටුවක් බඳවා ලා එල්වා ලා කරබටුව බා ලා වල් දෙපළු කළ මැනවැ'යි කිවූ ය. එ සේ වී නම් 'සතර ගවුවක් විතරේ බඳුව'යි බඳවා ලා දුවල් වීද මත් අරුම නො වන්නේ වේ දෑ'යි රැ සන අඳුරෙහි විද ලූ ගමනේ අස්වාල ය පලා ගෙණ හීය පොළවට වන. එ දවස් පෑ ශිල්ප නම් මෙ තෙක් නො වෙයි. මහ බෝසත්හු මෙ ලෙව්හි පවත්නා යම් ශිල්පයෙක් ඇත්නම් බුදු ව දතමනා සියල්ල ම දන්නා සේ සියලු ශිල්ප ම පෑ දෑ ය.

එ කල ශාක්‍ය රජ්ජුරුවරු ඇති ව සිටි දූ දරුවන් එ තෙක් නියා ද කිම ද සතලිස් දහසක් බිසෝවරුන් යවූහ. බිම්බා බිසොව උන් හැම දෙනාට වැඩියුරු හෙයින් අග මෙහෙසුන් වූහ. මහ බෝසත්හු ද අඩු තුන් කෙළක් පුරඟනන් පිරිවරා දෙව් සැපත් විඳිනා සක් දෙවිඳුහු මෙන් නළු ගන පිරිවරා දෙව් සැපත් විඳිනා දෑ එකි එකී මාළිගාවේ සාර මසක් සාරමසක් හිඳිනා දෑ ය.

එක් දවසක් මහ බෝසත්හු උයන් කෙළියට යන පිණිස රිය ඇදුරා බණවා ලා 'රථ ය යොදු ලව. උයනට යනු කැමැත්තෙමි' කී දෑ ය. එයි ත් යහපතැ'යි ගිවිස කුඩා පමණෙකින් මුත් ශක්‍ර යන්ගේ විජයත් රථ ය වැනි ය යි කිය හැකි වූ රථයක් සරහා ලා සුදු වූ මඟුලසුන් සතර දෙනකු යොදු ලා බෝසතුන්ට කී ය. මහ බෝසත්හු ද දෙව් විමනක් වැනි රථයට නැඟී ලා උයන දසා වට නික්මුණු දෑ ය. එ කල දෙවියෝ 'සිද්ධාර්ථ කුමාරයන් බුදු වන කල් උදවූ වී ය. මහණ වන ලෙසට සසර කළකිරුවම්හ'යි එක් දෙව් පුතකු ජරා වැද ලා දිරා ගිය සිරුරු ඇති කොට දත් වැගිර ගියා වූ ඉස විලික්ෂ ගියා වූ වක ගැසී ගොසින් සැරයටියක් හැර ගෙණ වෙවුල වෙවුලා යන්නහු පෑවූ ය.

ඒ සැටියේ ම මවා ලූ රුව බෝසතුන් හා රිය ඇදුරාණෝ දකිති. සෙසු දක්නා කෙණෙක් නැත. මහ බෝසත්හු ඔහු දැක 'රිය ඇදුර, තුලු කවුරු ද ? හිසකේ ත් සෙස්සවුන්ගේ හිසකේ සේ නො වේ'යි යනාදී මහාපනාද සූත්‍රයෙහි ආ ලෙස ම විචාරා රිය ඇදුරාගෙන් පවත් අසා 'ජරාවට මුල් වූයේ ජාතිය ය. ජාතිය නැත්නම් ජරාව නැත. මෙ සේ කුණු වූ ජාතියක් හැර ගෙණ ත් උයන් කෙළි කෙළිම්දෑ'යි සසර කළකිරී ගොසින් පෙරළා රජ ගෙට ම ගිය දෑ ය. රජ්ජුරුවෝ ද 'ම පුත්තු කුමක් නිසා නැවැත් තෝ දෑ'යි විචාරා 'මාලු මිනිස් කෙණෙක දැක ය'යි කී කල්හි රක

Non-Commercial Distribution

වල් නපුරු නියා වේ දැ'යි සතර අතින් දෙ ගවුවෙක රකවල් ලැවූහ.

නැවත එක් දවසක් බෝසත්හු උයනට යන දැ දෙවියන් මවා පෑවා වූ රෝගී එකක්හු දැක ආදි ලෙසින් ම විචාරා රෝගී එකක්හු නියාව දත සසර කළකිරී නැවත රජ ගෙට ගියදැ ය. රජ්ජුරුවෝ ද අසා මහණ වීමෙහි රුචි හරවන්ට නළුවන් ඇති කරවා ලා සතර අතින් තුන් ගවු පමණ රකවල් ලැවූහ.

නැවත මහ බෝසත්හු උයනට යන දැ එ සේ ම දෙවියන් මවා ලූ මිනියක් දැක තෙලේ කිමැ දැ යි විචාරා මිනියක් නියාව අසා ජරා දැක, ව්‍යාධි දැක, සසර කළකිරුණු දැ මරණත් දැක, තර ව කළ කිරී උයන් කෙළියට යන ගමන් තබා රජ ගෙට ම ගිය දැ ය. රජ්ජුරුවෝ ද එ පවත් අසා නැවත රකවල් වඩනෝ සතර දිගින් සතර සතර ගවුවෙක රකවල් ලැවූහ.

නැවත එක් දවසක් උයන් කෙළියට යන දැ එ සේ ම දෙවි යන් මවා ලූ සන්හුන් පියෝ ඇති මහණ රුවක් දැක 'මූ කවුරු දැ'යි විචාළ දැ ය. රිය ඇදුරා ද බුද්ධොත්පාද කාලයක් නො වන බැවින් මහණුනු ත් මහණුන්ගේ ගුණ ත් නො දන්නේ දෙවියන් ගේ ආනුභාවයෙන් ''මූ පැවිදි කෙණෙකැ'යි කියා ලා මහණ වීමෙහි ගුණ ත් කියා ලී ය. මහ බෝසත්හු ද මහණ වීමෙහි රුචි උපදවා ගෙණ එ දවස් උයන් කෙළියට ම ගිය දැ ය.

බොහෝ ආයු ඇති බෝසත්හු හවුරුදු සියයක් සියයක් ගිය කලට ජරා රූ ආදී ය දකිති. අපගේ බෝසත්හු ආයු මද අවධියේ උපන් හෙයින් සාර මසක් සාර මසක් ගිය කල උයනට යන දැ පිළිවෙළින් එකක් එකක් දුටු දැ ය. දික් සඟිය පිරිමසන තැන් අරමුණු සතර එක ද ම දුට යි කියන සේක.

එ දවස් උදසන පටන් සවස් වේලා වන තුරු උයන් කෙළි කෙළ පියා මඟුල් පොකුණෙන් නහා පියා හිර ගල හුණු වේලාට සැරහෙණු කැමැති ව මඟුල් සල්වට හුන් දැ ය. මහ බෝසතුන් ගේ රුචි ය දත් සක් දෙවිඳුහුගේ විධානයෙන් විස්කම් දෙව් පුත්හු අවුත් මඟුල් කපු වෙස් ගෙණ සළු පිළී දස දහසකින් පිළී වොටුන්න සළසා ලා දිවබරණින් සරහා ලූ ය. සැරහී ගෙණ නළුවන් රැස් ව කෙළි ළළු පංමින් සිටිය දී ම නුවරට නික්මෙන්ට රථයට නැඟීදැය.

ඒ වේලාට බිම්බා බිසොවුන් රහල් කුමරුවන් වැදූ නියාව සුද්ධොදන රජ්ජුරුවෝ මහ බෝසතුන්ට කියා යවූහ. මහ බෝ-සත්හු ඒ අසා රහල් කුමරුන් ඉපැද වූයේ වියවුලෙකැ'යි කී දැ ය. මහ රජාණෝ ද 'ම පුතුන් කීයේ කිම් දැ'යි විචාරා එ පවත් අසා මුනුබුරාණන්ට රාහුල කුමාරයෝ ය යි නම් තුබූහ. බෝසත් හු ද රථයට නැඟී ලා මහත් වූ ශ්‍රී ශොභාවෙන් යුක්ත ව නුවරට වත් දැ ය. ඒ වේලාට රුවින් හා සම්පත්තීන් කෘශ නො වත ත් තමින් කෘසාගෞතමී නම් මහ බෝසතුන්ට බැදෑ වන බිසෝ කෙණෙක් තමන්ගේ මාළිගාවේ මතු මාලේ සිටියාහු ඇතුළු නුවරට වදනා මහ බෝසතුන්ගේ රූප ශොභාව දැක—

''නිබ්බුතා නූන සා මාතා – නිබ්බුතො නූන සො පිතා,

නිබ්බුතා නූන සා නාරී–යස්සායං ඊදිසො පති''

යන මේ ගීය අනුරාග වසයෙන් තුන් විටක් කොට ම කී ය. මහ බෝසත්හු ද ඒ අසා 'මම ත් නිවන් සිත සිතා හිඳිමි. මුයි ත් නිවී ගියේ ය'යි කියති. මුවහොර ය යහපත. නිවන් නිසා මහණ වන්ට අද ම යන්ට වුව මැන ව. මේ තරම මුවහොරයක් කිව වුන්ට සංග්‍රහයක් ඇත මනා වේ දැ'යි ලක්‍ෂයක් වටනා මුත්හර කරින් ගළවා පියා කෘශාගෞතමී බිසොවුන්ට යවූ දැ ය. උයි ත් මෙ තෙක් කල් එ බන්දක් නැති හෙයින් තමන් කෙරෙහි පිළිබඳ සිතක් ඇති ව යවුව යි සිතා සතුටු වූහ. මහ බෝසත්හු ද මහත් වූ ශ්‍රී ශොභාවෙන් යුක්ත ව තමන්දැගේ මාළිගාවට නැඟී ලා ශ්‍රී යහනේ වැද හොත් දැ ය.

ඒ වේලාට පුන් සඳක් හා සමාන වූ සොම් මුහුණු ඇති ව රූප නමැති සාගරයෙහි ගමන් ගත් පබළු මුවා නැව් වැනි වූ දසන්-වසන් ඇති, රන් පර්වතවලින් හුණු කළු ගං පරිද්දෙන් නිල් වූ හිසකේ ඇති, තව ද රුවන් මුවා මාළිගාවල ඉඳුනිල්මණිමුවා කවුළු දොර වැනි නෙත්‍ර යුග්මයන් ඇති, දෙව් දුනු හා සමාන වූ බැම සහළක් ඇති, රන් ගල් තලවල හුන් රන් වන් හංස පැටවුන් වැනි තන සහලවල් ඇති, මිණි මෙවුල් දම් ආදියෙන් සරහන ලද දුවන්තලා ඇති, ඇත් සොඬ හා සමාන ව පව්වුන්නත වූ කළවා ඇති, නැටීම්-ගී කීම්-බෙර ගැසීම් ආදියෙහි දක්‍ෂ වූ දෙවඟනන්වැනි වරඟනෝ මහ බෝසතුන් පිරිවරා නැටීම්- ගී කීම් හා බෙර ගැසීමට පටන් ගත්හ. මහ බෝසත්හු ද මහණවීමෙහි අදහස් තර ව ඊ ඇල්මක් නැති බැවින් නිදන්ට පටන් ගත් දැ ය. නළු ගැනු ද අපි යම් කෙණකුන් ඇලවන්ට සිතා සැලී හැපී ආයාස ගනුමෝ නම්

Non-Commercial Distribution

උන්දෑ දූන් නිදා වැතිර ගිය දෑ ය. අපි ත් නිදම්හ'යි මද්දල හිසට ලා ගෙණ නිදන්ට වන්හ.

රන් වැටවල සුවඳ තෙල් පාන් ඇවිළෙ යි. මහ බෝසත්හු ද මහණ වන්ට නික්මෙන්ට ත් වුව මනා හෙයින් පිබිද පියා යහන පිට පලක් බැඳ ගෙණ හුන් දෑ නිදන නළු ගෑණුන් දුටු දෑ ය. ඒ වේලාට කවර ලෙසක වැද හොත්තෝ ද යත්—සමහර කෙණෙක් කටින් කුණු කෙළ බබා නිදති. සමහර කෙණෙක් තමන්ගේ නැටීම් නො බලා ගී නො අසා නිදන්නාට මුසුප්පු ව දත් කන්නා සේ දත් කති. සමහර කෙණෙක් කැස කැස සෙම් ගිලෙති. සමහර කෙණෙක් නන් දෙඩති. සමහර කෙණෙක් කට දල්වා ගෙණ නිදති. සමහර කෙණෙක් අපගත වස්ත්‍ර ඇති ව නිදති. සමහර කෙණෙක් හිස කේ ඉනී විසිර ගිය නියා ත් නො දැන නිදති.

මහ බෝසත්හු ද ඒ විකට දැක තරයේ ම ගිහි සම්පත් ඇලුම් හළ දෑ ය. ඒ වේලාට මහ බෝසතුන්ට දෙව් සැපතින් පිරුණු විජයත් පාය සේ ඉතා ශොභාමත් ව සිටිනා මාළිගාව මිනී කුණින් ගැවසී ගත් අමු සොහොනක් මෙන් වැටහිණ. තුන් භවය ත් ගිනි ගත් ගෙවල් මෙන් වැටහිණ. මහණ වීමට සිත තරයේ ම නැමිණ. 'අද ම මහණ වන්ට යන්ට වුව මැනවැ'යි ශ්‍රී යානෙන් බැස පියා දෙර කඩ කරා ගොසින් 'මෙ තැන කවුරු දැ'යි කී දෑ ය. එළිපත හිස තබා ගෙණ වැද හොත් සන් ඇමැත්තෝ 'මම ස්වාමීනි, ඡන්නයෝ ය'යි කිවු ය. 'අද මම මහණ වන්ට නික්මෙනු කැමැත් තෙමි. කාට ත් නො හඟවා වහා අසකු සද ගෙණෙව'යි කී දෑ ය.

සන් ඇමැත්තෝ ද අසු‌‌ෙ සදන සැත් ඊ ල හැර ගෙණ අස් හලට ගොසින් රන් වැටවල සුවඳ තෙලින් ඇවිලෙන පාන් ආලොකයෙන් දෑ සමන් මල් ඔඩම් සහිත වියන යට සිටියා වූ කන්ථක නම් අස් රජහු දැක, 'මාගේ ස්වාමි දරුවාණන් නැඟී ලා වඩනට අද මේ මඟුලසු ම සදමී' සිතා ලා කන්ථකයන් සදන්ට පටන් ගත්හ. අසාණෝ ද සදන ගමනින් ම 'අද සද ලන සැටි ය මෙ තෙක් දවස් සේ නො වෙයි. එකාන්තයෙන් ම මාගේ ස්වාමි දරුවාණන් වහන්සේ අද රාත්‍රියෙහි මහණ වන්ට නික්මෙන සැටි ය'යි සතුටු ව හෙෂාරවයක් පැවැත්වූහ. ඒ හෙෂාරව ය කිඹුල්වත් නුවර මුළුල්ලට ම ඇසෙන්ට ඇත. දෙවියෝ තමන්ගේ ආනුභාව යෙන් ම කිසි කෙණකුනු ත් ඇසි ය නුදුන්හ.



Non-Commercial Distribution

මහ බෝසත්හු ද අසු සද ගෙණෙන තෙක් රහල් කුමරුන් බලා පියනු කැමැති ව බිම්බා බිසොවුන් සැතපෙන ශ්‍රී යහන් ගබඩාව කරා ගොසින් ගබඩාවේ දෙර හළවූ ය. ඒ වේලාට ඇතුළු ගබඩාවේ රන් වැටවල සුවඳ තෙල් පාන් ඇවිළෙ යි. බිම්බා බිසොවුන්දෑ දෑ සමන් මල් ඉද්ද මල් ආදී වූ මලින් අමුණක් විතර අතුළ ශ්‍රී යහනෙහි පුත් රුවන ඇඟ පිට අත තබා ලා නිදති. මහ බෝසත්හු ද එළි පත පයක් තබා ලා 'ඉදින් බිසොවුන්ගේ අත ඉවත් කොට පියා ම පුතුන් වඩා ගනිම් නම් බිසවු පිබිද යෙමි. එසේ කලට මාගේ මහභිනික්මනට බාධාවක් වී නමුත් නපුර. බුදුව ලා ම අවුත් ම පුතුන් දකිමි' සිතා ලා මාළිගාවෙන් බැස පියා කන්ථකයන් ළඟට ගොසින් 'පුත කන්ථකයෙනි, තොපි මා අද එක රැයින් එ තෙර කරව. මම තොප නිසා බුදු ව ගෙණ දෙවි මිනිසුන් සහිත ලෝ වැස්සන් සසර සයුරෙන් එ තෙර කරමි' කියා ලා උඩට පැන ලා කන්ථකයන් පිටට නැඟි දෑ ය.

කන්ථකයෝ ද කර පටන් දිගින් අටළොස් රියන් හා උස ත් එ දිග තරමට සරියෙන විතර ත් ඇත්තෝ ය. චන්ද්‍රකාන්ති පුඤ්ජයක් සේ ඉතා ශුභ්‍රයහ.

ඉක් බිත්තෙන් මහ බෝසත් අසු පිටට පැන නැඟී ලා සන් ඇමැත්තාහට අසුගේ වාල්ධි ය අල්වා ගන්ට සම්මත කොට ලා මධ්‍යම රාත්‍රි වේලෙහි නුවර මහ වාසල කරා පැමිණි දෑ ය.

ඊට පෙරාතු ම සුදෙවුන් මහ රජාණෝ 'මහ බෝසතුන් වේලෙක නො වේලෙක නැඟී යෙති' කියා නුවර වාසල් දෙර මෙහයින් එකී එකී දෙර ලැල්ල ම දහසක් දෙනා හැර ලන ලෙස දහසක් දෙනා පියා ලන ලෙස එක් කොට හැර ලන්ට දෙ දසක් හා පියාලන්ට දෙ දසක් වන ලෙසට වාසල් දෙර ලවා ලා සතර වාසල ම බොහෝ දෙන සිටුවා ලූහ. මහ බෝසත්හු වැළි ත් ඇතුන් ගෙන් වී නම් කෙළ දහසක් විතර ඇතුන්ට බල ඇති දෑය. බල මැදුම් පිරිමින් ගේ ගණනින් වූවො ත් දස කෙළ දහසකට බල ඇති දෑ ය. එ හෙයින් 'මේ වාසල නො හැරිණි නම් කන්ථකයන් පිට හුන්නෙම් මම වාලධි ය අල්වා ගත් සන් ඇමැත්තහු හා සමග කන්ථකයන් කළවයෙන් බඳ ගෙණ වඩුවෙන් අටළොස් රියන් පවුරු පැන පියෙමි' සිතූ දෑ ය. සන් ඇමැත්තෝ ත් කන්ථකයෝ ත් දෙන්න ම එ සේ ම 'පනමහ'යි සිතූහ. වාසල වසන දෙවියෝ වාසල දෙර හළවූ ය.

ඒ වේලාට මහ බෝසත්හු වඩිනවා දැක වසවත් මරහු ද 'මහ බෝසතුන්ගේ මහ ණවීමට ගමන බාධා කෙරෙමි' අහස සිට—

Non-Commercial Distribution

"මා නික්ඛම මහාවීර-ඉතො තෙ සත්තමෙ දිනෙ,
දිබ්බන්තු චක්කරතනං-අද්ධා පාතුභවිස්සති."

යනු හෙයින් 'සත් දවසක් විතරින් සක් රුවන පහළ ව ත් සක්විති රාජ්‍ය ය කළ මැනව. නො ගිය මැනැවැ'යි කිවුය. මහ බෝසත්හු ද 'තෙපි කවුරු දැ'යි විචාරා 'මම වශවර්තියා'යි කී කල්හි 'මාර ය, මා ගිහි ගෙයි රඳතො ත් සක් රුවන පහළ වන නියාව දනිමි. මට ඉන් කම් නැත. මහ පොළොව ගුගුරුවා බුදු වූ කලට දහම් සක පතළ ව මාගේ ආඥව කෙළ ලක්‍ෂයක් සක්වළ පවත්ති තෝ පලා ය'යි කී දැ ය. එයි ත් එක බසින් ම අතුරුදන් වී ය. මහ බෝසත්හු ද එකුන් තිස් හවුරුද්දේ දී අත් පත් වූ සක් විති රාජ්‍ය ය හැර පියා සක් විති රාජ්‍යශ්‍රියට ස්ථාන වූ රජ ගෙන් නික්ම ඇසළ මස මැදි පොහෝ දවස උතුරුසළ නක තින් නුවරින් නික්ම නුවර බලා පියනු කැමැති වූ දැ ය. එ සේ සිතන්නා ම ඒ බිම් පියස කුඹල් සකක් මෙන් තෙමේ ම පෙර ළිත. මහ බෝසත්හු ද කිඹුල් වත් නුවර බලා පියා එ තැන අසු නැවති සැය යි ද ගබකට ස්ථානයක් දක්වා ලා යා යුතු මහට ම කන්ථකයන් නමා ලූ දැ ය.

මෙ සේ මහ බෝසතුන් මධ්‍යම රාත්‍රි වේලේ නික්මුණු කලට දේවතාවෝ සැට දහසෙක් පෙරාතුව ලා රන් දඬු වැට පහන් ලා ලූ ය. දකුණැල ය දසාවේ ත් වමැළ ය දසාවේ ත් පිටි පස්සෙ ත් සැට දහසක් දෙවියෝ ම රන් දඬු වැට පහන් ලා ලූ ය. සමහර දේවතා කෙණෙක් මල් කලප් මල් වඩම් ධජ පතාකාදී වූ පූජා භාණ්ඩ හැර ගෙණ නික්මුණුවු ය. මෙ සේ මහ පෙරහරින් යන්නා වූ මහ බෝසත්හු ද එක රැයින් රාජ්‍ය සීමා තුනක් ඉක්ම එක් සිය විසි ගවුවක් විතර ගෙවා ගොසින් අනොමා නම් වූ ගඟ බඩට පැමිණි දැ ය. පැමිණ ලා සන් ඇමැත්තන් අතින් 'මේ ගඟ කිනම් දැ'යි විචාළ දැ ය. 'අනොමා නමැ'යි කිවු ය. 'අපගේ මහණ වීම ත් අලාමක ය' යි සිතා ගෙණ විළුමෙන් අසුට සන් කළ දැ ය. අසාමෙණ් ද එක් දහස් එක් සිය විසි රියන් පළල ඇති ගඟ පැන එ තෙර සිටියහ.

මහ බෝසත්හු ද අසු පිටින් බැස පියා මුතු රැසක් වැනි වූ වැලි තලා මත්තෙහි සිට සන් ඇමැත්තන් බණවා ලා 'තොපි මං පළන් ආභරණ ද කන්ථකයන් ද හැර ගෙණ කිඹුල් වත් නුවරට යව. මම මහණ වෙමි' කී දැ ය. සන් ඇමැත්තෝ 'මමත් මහණ වෙමි' කීහ. 'තොප මහණ වන්ට බැරි ය'යි කියා ලා ආභරණ ත් කන්ථකයනු ත් සන් ඇමැත්තන්ට පාවා දී ලා 'මේ මාගේ

හිසකේ මහණ සරුප් නො වෙයි. මඟුල් කඩුවෙන් කපමි' සිතා ලා දකුණතින් කඩුව හැර ගෙණ වමතින් හිසකේ වැටි ය අල්වා ගෙණ කපා පී දෑ ය. හිස කෙස් කපා පූ මුල් දැඟුල් විතර ව ලා දක්ෂිණාවෘත්ත ව සිසැරි ලා හිස ම ඇලී ගත. එ දවස් කැපූ හිසකේ යෙන් පසු ව එක් පනස් හවුරුද්ද ම බැ හිස කේයෙක් නැත. දැළි ත් එ පමණ ව ම සිටි ය.

මහ බෝසත්හු හිසකේ කොණ්ඩ ය හැර ගෙණ 'ඉදින් මම බුදු වෙම් නම් තෙල හිසකේ වැටි ය අහස සිටී ව යි නැත. බිම හෙව'යි කියා ලා උඩ දමා ලූ දෑ ය. හිසකේ වැටිය ත් සතර ගවුවක් විතර උඩ නැඟී ලා අහස නිල් වලා කුළක් මෙන් සිටි ය. සක් දෙවිඳු දිව ඇසින් දුටු තැනැත්තෝ සතර ගවුවක් උස රුවන් කරඬුවෙක කෙස් ද ලා ගෙණ තව්තිසා දෙව් ලොව සිළුමිණි සෑ ද ගබ් කළහ.

නැවත මහ බෝසත්හු 'මේ මා හැඳ ගත් කසී සළුව ත් මහ ඇඟි ය. මහණ සරුප් නො වෙ' යි සිතූ දෑ ය. එ සේ සිතූ කලට කසුප් බුදුන් සමයෙහි මිත්‍ර ව විසූ අනගැමි බඹ ලොව උපන් ඝටිකාර නම් මහ බඹාණෝ බුද්ධාන්තරයක් මුළුල්ලෙහි වෙන් ව විසූ බැවින් 'අද මාගේ යාළුවාණෝ මහභිනික්මන් නික්මුණවු ය. මහණ පිරිකරක් සපයා ගිය ගමණක් නො වන බැවින් මහණ පිරිකර මම ගෙණ යෙම්'යි සිතා විවට්ට සාගරයෙහි බඹ ලොව දක්වා නැඟී නෙළුම් පඳුරෙහි නෙළුම් මල මේ කප බුදු වන පස් දෙනා වහන්සේට ම විචිත වූ පිරිකර පසින් කකුසඳ, කෝණාගමන, කසුප් තුන් දෙනා වහන්සේ මහණ වන දවස් තුනක් දුන ත් තව දෙකක් ඇති බැවින් මෙතේ බුදුන්ට එකක් තබා ලා තුන් සිවුරකු ත්, පාත්‍රයකු ත්, කරයකු ත්, ඉදි කටුවකු ත්, පටියකු ත්, පෙරාන්කඩකු ත් ය යි මේ අට පිරිකර ගෙණවුත් දුන්හ.

මහ බෝසත්හු ද සිවුරු වැළඳ ගෙණ මහණ වෙස් ගෙණ' සන් ඇමැත්තෙනි, මා විචාළ නියාව අපගේ දෙ මවු පියන්ට කියව'යි කියා ලා සමු දුන් දෑ ය. ඔහු ද මහා පුරුෂයාණන් වැඳ පැදකුණු කොට ලා නික්මුණවු ය. කන්ථකයෝ ද මහ බෝසතුන් සන් ඇමැත්තන් හා කරණ කථාව අසා ලා 'මාගේ සවාමි දරුවාණන් මෙ වක් පටන් දක්නට නැති නියා වේ දැ'යි ඇසව පෙනෙන තැනින් දුරුව ත් ශොක ය ඉවසා ගත නො හී ශොක ය පිරී ලා පැළී ගියාක් මෙන් ලය පැළී ගොසින් මිය තව්තිසා දෙව් ලොව කන්ථක නම් දෙව්පුත් ව උපන්හ. උන් එහි උපන් නියාව විමන් වත් අටුව

Non-Commercial Distribution

වෙන් දත යුතු. සත් ඇමැත්තෝ ද සෝක දෙකින් පෙළී පියා හඬමින් වලපමින් දුක සේ ගියහ.

මහ බෝසත්හු ද මිහණ ව එතැන ම අනුපිය නම් අඹ උය නේ සතියක් මුළුල්ලෙහි මහණ සුවෙන් දවස් යවා අට වෙනි දවස් සන්ධ්‍යා ප්‍රභායෙන් රැඳුණ වලාවෙකින් වැසුණු ශරත් චන්ද්‍රයා මෙන් සිවුරෙන් වැසී ලා හුදකලා වුව ත් කැටි ව නො එක් දෙනා ඇත්තා මෙන් ඒ උයන්හි වසන සිවුපා ආදීන් ඇස අමා වත්කරන්නාක් මෙන් මතතැක්හු ගමන් බඳු වූ ගමනින් නික්මෙන මහ දැතුරෙ ත් රත් පියුමෙන් සරහන කලක් මෙන් පා ගමනින් පෙර වරු දවස් එක් සිය විසි ගවුවක් ගෙවා ගොසින් උස්ව තැග බිඳෙන රළ පතර ඇති ගංගා නම් ගඟින් එතර ව ලා සිවුර ගැටවටු ගන්වා ගෙණ පාත්‍ර ය පටවා ගෙණ රජගහා නුවරට සිහා වැද ගෙපිළිවෙළින් සිඟන්ට පටන් ගත් දැ ය.

මහ බෝසතුන්ගේ අනන්‍ය සාධාරණ වූ රුව දකිමින් සියලු නුවර නාළාගිරි නම් ඇතු අවුත් වන් කලක් මෙන් ද අසුරයන් වන් කලට දෙව්නුවරක් මෙන් ද ඇළලී ගියේ ය. මහ බෝසතුන් ගේ රුව දක්මෙන් සතුටු වූ බොහෝ දෙන බලා ඇස් ඇද ගත නො හෙති. ඉන් සමහර කෙණෙක් තෙලෙ මේ තරම් කෙණකුන් මිනිස් ලොව අප දුටු විරූ නැත. රාහු කෙරෙහි හයින් රස් සඟ වා ගෙණ ආ පුන්සඳ ය, තෙලෙ මිනිස් ලොවට බටුයේ ය'යි කීහ. ඒ අසා සමහර කෙණෙක් තෙලේ කුමක් කියන නියා ද? පුන් සඳක් මිනිස් ලොවට බට නියාවක් කවර කලෙක දුටු ද? බිම්සර රජ්ජුරුවන් වහන්සේගේ ත් නුවර වැස්සන්ගේ ත් ශ්‍රී විභූති ය දැක ආ අනඬගයා නොවේ ද? වෙස් වලහා තෙලේ කිළියටි ආයේ ය'යි කිවූ ය.

සමහර කෙණෙක් ඒ අසා සිනාසී පියා 'කුමක් ද, තොප වියරු හී පියා කියන නියා ද? ඒ අනඞගයාගේ ශරීර භාගයෙක් ඊශ්වර යාගේ නළලින් නැඟි ගින්නෙන් ද ගියේ ය. තුලුන්ගේ එබන් දෙක් නැත. තමන්ගේ තව්තිසා දෙව් නුවර ය යි සිතා සක් දෙවිඳු නොවේද් ද අවුත් වන්නෝ ය'යි කිවූ ය. සමහර කෙණෙක් ඒ අසා අක්කොලින් මදක් සී පියා අක් මුල් නැති කථා කුමකට කියා ද? අතුරක් සේ කියා පියන දෙය ත් සිනා සෙන ලෙසම කිවමනා ද? තුලුන්ගේ දහසක් පමණ නුවණැසු ත් කොයි ද? වජ්‍රායුධය ත් කොයි ද? ඓරාවන නම් හස්තියා ත් කොයි ද? ඒ හැම නැති හෙයින් තුලූ සක් දෙවිඳු නො වෙති. බමුණන් පමා නියාවක් දන වෙදඞගාදියෙහි යොදන්ට අවුත් වන්නා වූ තුලූ මහ බඹ ය'යි

කිවූ ය. සමහර කෙණෙක් හැමයට ම බැන නො නැඟී සිට ලා තුලූ පුන් සඳකු ත් නො වෙති. අනංගයා ත් නො වෙති. සක්දෙවිඳු ත් නො වෙති. මහ බඹු ත් නො වෙති. සියලු ලෝ වැස්සන්ට අනුශාසක ව සිටිනා ආශ්චර්ය්‍ය පුරුෂයාන කෙණෙකැ'යි කිවූ ය.

මෙ සේ උන් හැම කථා කොට සිටිය දී ම සමහර කෙණෙක් ගොසින් ඒ පවත රජ්ජුරුවන්ට කිවූ ය. කියන්නාහු ත් රජ්ජුරුවන් වහන්ස, දේවතා කෙණකුන් බව ත් කා බව ත් නො දනුම්හ. මෙ තරම් කෙණෙක් නුවර සිඟා ඇවිදිති' කිවූ ය. රජ්ජුරුවෝ ද ඒ අසා සඳැල්ලේ සිට ම මහා පුරුෂයාණන් දැක ඉතා විස්ම ව ගොසින් කියා ආ මිනිසුන්ට 'යව, ගොසින් විමසව. ඉදින් යක්‍ෂ කෙණෙක් වූ නම් නුවරින් පිටත් ව ලා අතුරුදන් වෙති. ඉදින් දේවතා කෙණෙක් වූ නම් ආසට නැඟී ලා යෙති. ඉදින් නාග කෙණෙක් වූ නම් පොළොව කිමිද ගෙණ පලා යෙති. ඉදින් මිනිස් කෙණෙක් වූ නම් සිඟා ලත් බත එක් තැනෙක දී අනුභව කෙරෙති' කිවූ ය.

මහ බෝසත්හු ද සන්හුන් පිංයෝ ඇති ව රූප ශෝභාවෙන් බොහෝ දෙනාගේ ඇස් තමන්දැ කරා අදනා මෙන් වියදඬු පම ණෙකින් වඩා නො බලා යපෙන පමණක් ව කෙණෙසි අහර සිඟා ගෙණ සිඟා වන් වාසලින් ම පාණ්ඩව නම් ගල් තල්ලෙහි නැඟෙන හිරට මුහුණ ලා ලා හිඳ පස්විකා ගෙණ වැළඳූ දැ ය. විම සන්ට ගිය මිනිස්සු ත් එ පවත රජ්ජුරුවන්ට කිවූ ය.

බිම්සර මහ රජහු ද අසා පී තරමින් ම දක්නා කැමති ව නුව රින් නික්ම පාණ්ඩව ගල කරා ගොසින් වාහනයෙන් බැස පියා මහ බෝසතුන් ලඟට ගොසින් සත් පුරුෂයන්ගේ අදහස සේ සිහිල් ගල තලා පිට හුන් මහ බෝසතුන්ගේ සැටියෙන් ම පැහැද මහ බෝසතුන්ට රාජ්‍ය ය කරන්ට ආරාධනා කොට ලා තමන්ගේ රාජ්‍ය ය භාර කළහ. මහ බෝසත්හු ද 'මට රාජ්‍යයෙන් ප්‍රයෝජන නැත. කිඹුල්වත රඳා හිඳීම් නම් මට සක්විති රාජ්‍යය ත් සම්භව වෙයි. එයි ත් හැර බුදුවන නිසා ආමි'කී දැ ය. රජ්ජුරුවෝ නො එක් ලෙස ආරාධනා කොට ත් නො ලැබෙන හෙයින් මෙ තරම් තරයක් ඇති බැවින් මුඹ වහන්සේ බුදුවන බව නියත ය. බුදුව ලා පළමු කොට මාගේ නුවරට වඩනා බව ය'යි කියා ලා නුවරට ගිය හ. උන් ගිය කලට මහ බෝසත්හු ද එ තැනින් ගිය දැ ය.

**''අථ රාජගහං වරරාජගහං – නරරාජ වරෙ නගරන්තු ගතෙ,**
**ගිරිරාජවරො මුනිරාජවරො – මිගරාජගතො සුගතොපි ගතො.**

යනු හෙයින් කියන ලද–

Non-Commercial Distribution

මහ බෝසත්හු ද සැරිසරන දෑ ආළාරක නම් වූ ත් උද්දකරාම පුත්‍ර නම් වූ ත් තවුසන් දෙන්නා කරා ගොසින් සමාපත්ති අට උප දවා ගෙණ 'මේ බුදු වීමට මඟෙක් නො වෙයි. මේ නම් බඹ ලොවට මඟ ය'යි දැන එ ම නො පිරිමසා ප්‍රධන් වීර්‍ය්‍යී කරණු කැමැති ව උරුවෙල් දනවුවට ගොසින් 'මේ බිම් පියස සිත්කලු ය ' යි එ තැන ම රඳා බුදු වන්ට වීර්‍ය්‍යී කළ දෑ ය.

ලක්‍ෂණ කී මාලු බමුණන්ගේ පුත්තු සතර දෙනකු ත් කොණ්ඩඤ්ඤ නම් බමුණානෝ ත් පස් දෙන ම මහණ ව ගෙණ ගම් නියම් ගම් ආදියෙහි සිඟා අනුභව කෙරෙමින් උරුවෙල් දනවුවෙහි දී බෝසතුන් දුටහ. දැක ලා 'දැන් බුදු වන සේක. දැන් බුදු වන සේකැ' යි සාවුරුද්ද මුළුල්ලෙහි ම මළු හැමදීම පැන් පෙරා තිබීම් ආදී වත් පිළිවෙත් කරමින් ලඟ ම රැඳුණු දෑ ය. මහ බෝසත්හු ද දුක් ම ගන්නා නිසා තල ඇටකින් වුව ත් බත් හුළකින් වුව ත් දවස් යවන දෑ ය. සමහර දවසෙක සුන් බත් වන දෑ ය. දෙවියන් තමන්ගේ ආනුභාවයෙන් ලොම් පිහිටි වළින් ශරීර ගත කරණ ඕජාව ත් නො ඉවසන සේක. මෙ ලෙසින් ඉතා දුර්වල වීමෙන් අනොජා මල් දමක් සේ රන් වන් වූ ශරීර ය කළු ව ගියේ ය. දෙ තිස් මහා පුරුෂ ලක්‍ෂණ ත් පුරා කෘත අකුශලයට බා ගියා මෙන් සැඟවිණ.

මහ බෝසත්හු ද කර්‍ම ය නිමන තෙක් දුක් ගෙණ නිමවා පියා බුදු වීමට මේ මඟෙක් නො වෙ' යි සිතා ගෙණ ශරීර බල ය එවා ගන්නා නිසා මධුරාහාර ය ලබනු පිණිස ගම් නියම් ගම් ආදි යෙහි සිඟා වළඳන දෑ ය. සිඟා සුව සේ වළඳනා කලට දෙ තිස් මහා පුරුෂ ලක්‍ෂණ ය ත්[1] අකුශල කර්‍ම නමැති සොර භය නැති වන්නා ම එළි බස්නා සේ පියවි ශරීර ය ත් රන් වන් වි ය. පස් වග වහන්දෑ ද 'මුන්දෑ සාවුරුද්දක් මුළුල්ලෙහි දුක් ගෙණ ත් බුදු විය නුහුණුදෑ ය. දැන් සුව සේ වළඳා ඇඟ මස් ලෙස් ඇති කරණ දෑ කෙ සේ නම් බුදු වන දෑ ද? ප්‍රත්‍ය ය බාහුලික වීමෙන් ප්‍රධන් වීර්‍ය්‍යය ත් හළ දෑ ය. මුන්දෑ අපට හැයි දෑ' යි හැර පියා තමා ම වෙන් කළ මනා තැන තමන් වහන්සේලා ම බරණැස ඉසිපතන නම් උයනට ගිය සේක.

මහ බෝසත්හු ද වෙසඟ මැදි පොහෝ දවස් උරුවෙල් දනවුවෙහි සෙනානි නම් නියම් ගම සෙනානි නම් කෙළෙඹියාණන් ගේ දූ වූ සුජාතාවන් දුන් වහන ලද දිව රස ඇති කිරි බත නිල් තලා හෝ බඩ දී වළඳා රන් තළි ය උඩුගං බලා යවා නාග භවනයට රන් තළියේ "රාං" යන හඬ ත් නිදන කාල නම් නා රජ්ජුරුවන් පිබිද්දූ දෑ ය. මහ බෝසත්හු ද සවස් වේලා එන තෙක් නිල්තලා[2]

---

1 පූර්‍ව ලක්ෂණයන් 2 නිල්තරා

Non-Commercial Distribution

හෝ බඩ පිපී වැනී ගිය සල් ගසින් ඉතා ශොභාවත් වූ සල් උයන්හි දවල් දවස් යවා සවස් වේලෙහි දෙවියන් සරහා ලූ මගින් බෝ මැඩට නික්මුණු දෑ ය. දිව්‍ය බ්‍රහ්මාදීහු ත් පූජා භාණ්ඩ හැර ගෙණ කැටි ව නික්මුණාහ. ඒ වේලාට සොත්ථිය නම් බමුණානකෙණෙක් හී තණ හැර ගෙණ පෙර මඟට එන්නෝ මහා පුරුෂයාණන් බුදු වන්ට නික්මුණු නියාව දැන හී තණ අට මිටක් දුන්හ.

මහ බෝසත්හු ද හී තණ හැර ගෙණ අඳුන් කුළක් සේ නිල් ව ශොභාවත් වූ තමන් වහන්සේගේ කරුණාව සේ සිහිල් සෙවණ ඇති උඩින් අජටාකාශ ය දක්වා ජන සඤ්චාර රහිත වූ මඳ පවනින් සැලෙන අතු වලින් ප්‍රීතින් පිනන්නාක් වැනි වූ ඇසතු බෝ රුක් මුලට ගොසින් බෝ රුක තුන් විටක් පැදකුණු කොට ලා ඊශාන කොණෙහි සිට හී තණ අගින් අල්වා ගෙණ සලා බිම වගුරුවා ලූ දෑ ය. මහ පොළොව ගුගුරුවා ලූ ය. ඒ ඇසිල්ලෙහි තුදුස් රියන් උස ඇති විදුරස්නෙක් පහළ වී ය. ඒ හී තණ ත් සිත්තම ඇඳ ලූවාක් මෙන් අස්නා වටා සිටී ය. මහ බෝසත්හු ද තුදුස් රියන් විදුරස්නෙහි පසු ව දස දිග පැතිරෙන තෙක් එක් ව සිටියා වූ කීර්ති පුඤ්ජයක් වැනි වූ පනස් රියන් උස ඇති බෝ රුකට පිට දී බුදු ව මුත් නැඟී නො සිටිමි' යන තර අදහස් ඇති ව පලක් බැඳ ගෙණ හුන් දෑ ය. රන් වන් සිවුරෙහි වැගිරෙන්නා වූ බොධි දලු උතුරු මුහුද පතළ පබළු දලු මෙන් ඉතා හොබ්බ.

මහ බෝසතුන් බුදු වනු නිසා හුන් කල මාර දෙව් පුත් 'සිදුහත් කුමරු මා මැඩ පවත්නට සිත යි. එ ලෙස කොට නො දෙමි' මර සෙනඟට ත් එ පවත් කියා ලා තම අදහස් ඇත්තවුන් හෙයින් මර සෙනඟ හැර ගෙණ බුදු බව උගුළුවන්ට නික්මිණ ඒ මර සෙනඟ ද මාරයාට පෙරාතු ව අට සාළිස් ගවුවෙක එතී. දකුණ ත් පසිනු ත් වම ත් පසිනු ත් එ සේ ම අට සාළිස් අට සාළිස් ගවුවෙක පැතිර එති. පිටි පස්සෙන් බෝ මැඩ පටන් සක් වල ගල දක්වා පැතිර සිටියහ. උසින් සතළිස් ගවුවෙක පැතිර සිටියහ. මර සෙනඟෙහි පිරිස් ගිගුම සාර දස් ගවුවෙහි පටන් පොළව ගුගුරන්නා සේ ඇසෙයි.

ඒ වේලාට මහ බෝසතුන් ලඟ සක් දෙවිඳු එක්සිය විසි රියන් පමණ දිග ඇති විජයතුරා සක පසු ව දමසක් පිඹින බෝසතුන්ට පිඹ පිඹ සිටියහ. පන් සිළු නම ගඳඹ දෙව් පුත් තුන් ගවුවක් දිග ඇති බෙලුව නම් වූ වීණාව මහල් ගී කිය කියා ගායනා

Non-Commercial Distribution

කෙරෙති. සුයාම නම් දෙව්රජ තුන් ගවුවක් පමණ දිග ඇති ශරත් චන්ද්‍රයාගේ චන්ද්‍ර කාන්ති පුඤ්ජයක් වැනි වූ චාමරයකින් පවන් සල සලා සිටියේ ය. සන්තුෂිත නම් දෙව් රජ තුන් ගවුවක් පමණ වූ ඉඳුනිල් මිණි මුවා තල් වැටක් සලමින් සිටියේ ය. දස දහසක් සක්වළ දෙව් බඹහු රන් කලස ආදී වූ පූජා භාණ්ඩ හැර ගෙණ ආවඩ වඩා සිටියහ.

මර දෙව් පුත් තෙමේ ස සියක් ගවු පමණ දිග ඇති තුන් සිය සැට ගවුවක් පමණ උස ඇති හිමවූ ගිරි කුළක් සේ ඉතා ශොභා මත් වූ ගිරිමෙවුල් නම් ඇත් වාහනයකට නැඟී ලා පසු ව හිස ලන අත් නො දකිත ත් අත් දහසක් මවා ගෙණ නො එක් ලෙස් ඇති ආයුධ දහසක් ගත. මර සෙනඟ ද කඩු කොන්ත ආදී වූ නො එක් ආයුධ ත් හැර ගෙණ රාක්‍ෂස රූපාදි වූ භයානක නො එක් රූ ත් මවා ගෙණ බුදු මඟුලෙයි පුරමාට්ටු පාන්ට ආ කොමා ලින්[1] මෙන් බෝසතුන් පිරිවරා ගත්හ.

මර සෙනඟ ලං ව එත් එත් ශක්‍ර බ්‍රහ්මාදීන් අතුරෙන් එක් කෙණකු ත් රඳා සිටි පිය නො හී ඉස් ලූ ලූ අත දිවූහ. සක් දෙ විඳු තෙමේ මිටි තැන සිට පිඹි කල දුර නො ඇසෙන හෙයින් උස් තැනකට යන්නා සේ සක පිට එල්වා ගෙණ සක්වළ ගල මුවවිට සිටි ය. සහම්පතී නම් මහ බඹු තෙමේ දෙළොස් ගවුවක් පමණ මහත ඇති හෙළ කුඩ ය නිකම් බිමෙක හෙළා පියා නො පියා සක් වළ ගල කෙළවර තබා පියා බඹ ලොවට ම ගියේ ය. කාළ නම් රජ්ජුරුවෝ ද කැටි ව ආ නා නළුවනු ත් හැර පියා පොළොව කිමිද ගෙණ ගවු දෙ දසක් දිග පළල ඇති මාඤ්ජෙරික නම් නාග භවනයට පලා ගොසින් මර දෙව් පුත් හට මූණ අත්දෙන්නා සේ අතින් මූණ වසා ගෙණ යානේ වැද හොත්තෝ ය. එක දේවතා කෙණකු ත් බ්‍රහ්ම කෙණකු ත් බැද්දකට වැදලා වුව ත් සිට පිය නුහුණුවූ ය. මහ බෝසත්හු කවුරුන් පලා ගිය ත් සිස් විමනෙක මහ බඹක්හු මෙන් හුදකලාව ම හුන්දෑ ය.

වසවත් මරහු එතැනට එන්නාට පෙරාතු ව ම අවලක්‍ෂණ ලෙසින් උඟ තමා හිස නුහුණත් ඒ ඒ තැන ගිනි සෙණ හෙන්ට වන. මූ තමාගේ සිත නුනුවණින් අඳුරු වූවා සේ ම දුද්දින බලා දවස ත් අඳුරු වී ය. තව ද සිත් පිත් නැති මහ පොළව ද සිත් පිත් ඇති එකක මෙන් දිව්‍ය බ්‍රහ්මාදීනු ත් පලා ගොසින් මහ බෝසතුන්

---

1 කොමලුන්

Non-Commercial Distribution

තනි ව ගියාට 'තනි බෝසතුන් හැර ගෙණ මූ බලි තැනැත්තවුට කුමක් කට හැකි දැ'යි හයින් වෙවුලා ගියාක් මෙන් දෝ මෝ නො හොත් මහ බෝසතුන්ගේ ගුණ භාරයෙන් වෙවුලා ගියාක් මෙන් වෙවුලා ගියා ය. තව ද මර සෙනඟට ත් මරුට ත් දෙව්-බඹ නා-ගුරුළු ආදීන් කට හැක්කක් නැත ත් ගලා මරන්ට කරණ දෙයක් මෙන් මුහුද ත් උප්පාතික වන්ට වන. යට ගං බලා යන ගඟු ත් පිට පුරා සිටින්ට එන්නා සේ උඩු ගං බලා නමා පී ය. මරු හා මර සෙනඟ එන මහ හකුල් එළන්නා සේ ගල් කුළු හා ගස් කොළන් උදුරා ගෙණ වැගිරෙන්ට වන.

තව ද මරු හා මර සෙනඟ සුළඟේ පලවන්ට කරණ දෙයක් මෙන් මහ සුළඟ හමා ලා සෙණ ත් ගසන්ට වන. මරු හා මර සෙනඟ එත නො දෙන්ට කරන්නාක් මෙන් හිරු ආලෝක ත් නැති ව මහ අඳුරු වී ය. පැරුම් නැමති යොධ භටයන් කරා අවුත් හිස් කප්පවා ගන්නාක් මෙන් හිස් නැති මිනිස් අහස පවත්නට වන්හ. මෙ සේ වූ අවලක්ෂණ ඇති ව මහ බෝසතුන්ට ගහට කරණ නිසා එන්නා වූ වසවත් මරහු දක දිව්‍ය බ්‍රහ්මාදීහු අනුකම්පාවෙන් 'අනේ මේ කිම් දැ'යි කියන්ට වන්හ. මහ බෝසත්හු ඒසා මර සෙනඟක් මැදට පැමිණ ත් කෙතෙක් පක්ෂීන් කෙරෙහි ත් භයක් නැති ගුරුළු රජ්ජුරු කෙණකුන් මෙන් ද සියලු සිවුපාවුන් කෙරෙහි භයක් නැති සිංහයාණ කෙණකුන් මෙන් ද ඉස් ඇස් ආදිය දීමෙහි භයක් නැත්තා සේ භයක් ශඞ්කාවක් නැති ව හුන් දැ ය.

වසවත් මරහු ද 'සිදුහත් කුමරුන් බවා පලවා පියමී'යි මහ සුළං මුසු වැස්සෙක, කල්පාන්ත වර්ෂාවක් වැනි මහ වැස්-සෙක, පහණ වැස්සෙක, අවි වැස්සෙක, අඟුරු වැස්සෙක, හුණු හළු වැස්සෙක, වැලි වැස්සෙක, කළල් මඩ වැස්සෙක, අඳුරු සහිත වැස්සෙකැ යි වැසි නවයක් වස්වා ත් වැස්සූ දෙය පූජෝපකරණ වන හෙයින් මහ බෝ සතුන් උගුළුවා ගත නො හී උරණ ව ගොසින් 'හැයි. කොල, සිටිනැ යි. සිදුහතු නොසිදුහත් කරවා මරව, කොටව' යනාදීන් මර සෙනඟට ත් විධාන කෙරෙමින් තෙමේ ත් ගිරිමෙවුලා පිට හිඳගෙණ එක් අතකින් හියක් නටව නටවා මහබෝසතුන්ට ලං ව 'සිදුහතිනි, පලඟින් නැඟී සිටුව'යි කීහ. මර සෙනඟ ත් සවුලයන් හෙයින් බොහෝ කොට දෙඩූහ.

මහ බෝසත්හු ද ඒ සා මහත් මර සෙනඟක් සමතිස් පැරුම් නමැති යොධ භටයන් තිස් දෙනා පමණෙකින් හිර ගලා නො

හෙන තෙක් සාධා පියා පෙර යම් දස පැයින් පෙර විසූ කඳ පිළිවෙළ දන්නා නුවණ උපදවා ගෙණ, මැද යම් දස පැයින් දිව් ඇස් උපදවා ගෙණ, අළුයම් වේලෙහි විවසුත් වඩා රහත් මඟින් සව් කෙලෙසුන් ගෙවා රහත් වීමෙන් ම බුදු ව වදරා 'අනේක-ජාති සංසාරං'' යනාදී වූ උදනු ත් අනා වැඩ හුන් බුදුහු 'මම මේ පලඟ නිසා සාරාසැකි කප් සුවහසක් මුළුල්ලෙහි බොහෝ දුක් ගතිමි. පලඟ නුගුළුවා හිඳ බුදු වීමි. එ හෙයින් මෙ පලඟ ඉතා වැඩකරු ය. බුදු වූ පමණෙකින් නැඟී නො සිටිමි' නිවන් රස අනුභව කෙරෙමින් කෙළ ලක්‍ෂ ගණන් එල සම වතට සම වදිමින් සතියක් මුළුල්ලෙහි විදුරස්න වැඩ හුන් සේක.

එ සේ වැඩ හුන් කලට සමහර දේවතා කෙණෙක් තව බුදු වි ය නුහුණු නියා වේ ද'යි සිතූහ. බුදුහු උන්ගේ අදහස් දැන ඒ සිතිවිල්ල හරවනු නිසා අහසට නැඟී යමා මහ පෙළහර දක්වා දෙවියන්ගේ සැක හරවා ලා අහසින් බැස පලඟට ඊසාන කොන වැඩ සිට වැඩ හුන් පලඟට දල්වා ලූ ඇස නො පියා සතියක් මුළුල්ලෙහි නෙත්‍ර පූජාව කළ සේක. තව ද වැඩ හුන් පලඟට ත් වැඩ සිටි තැනට ත් අතුරෙහි රුවන් සක්මණක් මවා ලා සති යක් මුළුල්ලෙහි ඒ රුවන් සක්මණ සක්මන් කළ සේක. සතර වන සතියෙහි බෝධීන් වහන්සේට වායව්‍ය කොණයෙහි දෙවි යන් මැවූ රුවන් ගෙයි වැඩ හිඳ විදම් පිටක ය සලකමින් සති යක් යවා වදළ සේක. මෙ සේ බෝරුක් මුල්හි ම අට විසි දව සක් යවා වදරා පස් වන සතියෙහි බෝ රුක් මුලින් වැඩ අජ පල් නම් නුග ගස මුල දහමුත් සලක සලකා සම වත් සුවෙ නු ත් දවස් යවූ සේක. එ තැනින් මිදෙල් විල කරා වැඩි කලට සති වැලල්ලක් ඇති වූ හෙයින් මුචලිඳු නම් නා රජ්ජුරුවන්ගේ දරණ ගබ වට ව තිබෙන ගඳ කිළියෙක වසන කලක් මෙන් සති යක් මුළුල්ලෙහි වැඩ හුන් සේක. වැඩ හිඳ ලා සති ය ඉකුත් කලට කිරිපලු ගස කරා වැඩ සමවත් සුව විදිමින් සත් වන සති ය යවා වදළ සේක.

මෙ පමණෙකින් සතළිස් නාව දවසක් පිරිණ. මෙ දෙදැතුරෙහි[1] බුදු වන දවස වැළඳූ බත ම පතට නිල කොට නිවන් රස වැළඳූ සේක. බුදුහු බුදු වූ දවස් පටන් එකුන් පනස් වැනි දවස් සක් දෙවිඳුහු ගෙණා නාලිය දැහැටි වළඳා ලා අනොතත්ත විල පැනින් කට සෝධා පියා කිරිපලු ගස මුල වැඩ හුන් සේක. ඒ වේලාට තපුස්ස ය – හල්ලුක ය යන වෙළෙන්දෝ දෙන්නෙක් පූර්ව ජාති යෙහි තමන්ට නැකමක් ඇති දෙවතාවාණ කෙණකුන්ගේ නියොග

1 මෙ දැරෙහි

Non-Commercial Distribution

යෙන් අත්සුණු සහ අග්ගලා ගෙණවුත් පිළිගන්නා ලෙසට බුදුන්ට ආරාධනා කළහ. 'බුදුන් මහණ වන දවස් අට පිරිකර ත් සමඟ වූ පාත්‍රය කිරි බත් තළිය පිළිගත් දවස් අතුරුදන් වූ හෙයින් පාත්‍රයත් නැත. කුමකින් පිළිගනිම් දෝ හෝ'යි සිතූ සේක.

බුදුන්ගේ අදහස් දැන වරම් රජ දරුවෝ සතර දෙන සතර දිගින් ඉඳුනිල් මිණිමුවා පාත්‍ර සතරක් ගෙනාහ. බුදුහු මහණ සරුප් නො වන හෙයින් නො පිළි ගත් සේක. නැවත මුං වන් සල ගල් පාත්‍ර සතරක් ගෙණවු ය. බුදුහු වරමුන් කෙරෙහි කරුණා වෙන් එකක් හැර ගෙණ සෙස්ස හළොත් සෙස්සන් මුසුප්පු හෙයින් පාත්‍ර සතර එක පාත්‍රයක් වන්ට ඉටා එක් වූ කල්හි ඉන් අත් සුණු සහ අග්ගලා පිළි ගෙණ වළඳා ලා වෙළඳුන් දෙන්නාට අනුමෙවෙනි බණ වදාළ සේක. ඒ දෙ බෑ වෙළෙන්දෝ ද තව සඞ්ඝයා වහන්සේ නැති බැවින් බුදුරුවන් ධමුරුවන් සරණ ගියහ.

බුදුහු කිරිපළු රුක මුල දී වළඳා ලා අජපල් නම් නුග ගස මුලට වැඩ එ තැන්හි වැඩ හුන් සේක. එ තැන වැඩ සිටිය බුදුන්ට තමන් වහන්සේ සියුම් නුවණින් දත් ධර්‍මය සෙස්ස වුන් දත නො හෙන හෙයින් අනුන්ට 'බණ නො කියමී' යන අදහස ඇති වි ය. ඉක් බිත්තෙන් සහම්පතී නම් මහ බඹාණෝ දස දහසක් සක්වල දෙව් බඹුන් පිරිවරා අවුත් බණ දෙසන්ට ආරාධනා කළහ. බුදුහු ඒ ආරාධනාව ඉවසා 'කවුරුන්ට බණකියම් දෝ හෝ' යි විමසන සේක් පස් වග වහන් දෑ උපකාරී හෙයින් ඒ පස් දෙනා වහන්සේ සඳහන් කොට 'දැන් උඟ කොයි වෙසෙත් දෝ හෝ' යි විමසන සේක් බරණැස් නුවර නිසා ඉසිපතන නම් උයන්හි වසන නියාව දැන 'ඔබ ගොසින් දම් සක් පවත්වමී' කීප දවසක් බෝ මැඩට ආසන්නයෙහි ම සිහා වළඳා වැඩ හිඳ ඇසළ මස මැදි පොහෝ දවස් බරණැසට වඩනා නිසා පා සිවුරු හැර ගෙණ දෙ සැත්තෑ ගවුවක් විතර ව තිබෙන මහ වඩනා සේක් අතුරු මඟ දී උපක නම් ආජීවකයන් දැක මතු උන්ට වන ප්‍රයෝජන සලකා උන්ට තමන් වහන්සේ බුදු නියාව හඟවා ලා එ දවස් සවස් වේලාට ඉසිපතන නම් උයනට වැඩි සේක.

පස් වග වහන්දෑ ත් දුරින් ම වඩනා බුදුන් දැක 'ඇවැත්නි, මේ මහණ ගොයුම්හු සුව සේ සිහා වළඳා දුර්වල කම ත් හැරී ගොසින් මස් ලෙය් ඇති ව ප්‍රසාදවහ ව පියා එති. දුක් ගන්නා

Non-Commercial Distribution

අවධියේ බුදුව ගත නුහුණු කලට දැන් කෙසේ බුදුව ගත හෙත් ද? වැඳීම පිදීම නො කරම්හ. හිඳිනා අසුන් පමණක් පනවම්හ'යි කතිකා කළ සේක. බුදුහු ඒ වහන්දෑගේ අදහස් දැන සියල්ලවුන් කෙරෙහි සාමාන්‍යයෙන් පතළ මෙත් සිත් ආවෙණික ව ඒ පස් නම කෙරෙහි පවත්වා වදළ සේක. මෛත්‍රියෙහි ආනුභාවයෙන් බුදුන් ලං ව ත් ලං ව ත් කතිකා වත පිහිටා ගත නො හී වැඳීම ආදී ය කළ සේක.

බුදුහු ද 'ඇවැත්නි' කිය කියා කථාවට පටන් ගත් වහන්දෑට තමන් වහන්සේ බුදු වූ නියා ව හඟවා ලා පනවා ලූ බුදු හස්නෙහි වැඩ හිඳ උතුරුසළ නකතින් අටළොස් කෙළක් බඹුන් පිරිවරා පස්වග වහන්දෑ බණවා ලා දහම්සක් පැවැත් වූ සේක. එ දවස් අටළොස් කෙළක් බඹුන් හා සමඟ කොණ්ඩඤ්ඤ නම් මහ තෙරුන් වහන්සේ නිවන් දුටු සේක. නැවත මහා මඞ්ගල සූත්‍ර ය හා රාහුලොවාද සූත්‍රය හා දෙක දෙසූ දවස් අසඞ්ඛ්‍යයක් නිවන් දුටහ.

## 338. මඞ්ගල කාරණා

මෙ සේ යම් කෙණෙක් නුවණැත්තෝ නම් බුදුන් උන් හැමට උත්කෘෂ්ට හෙයින් බුදුන් භජන ය කළා වූ අසඞ්ඛ්‍ය ගණන් සත්තු ලොවී ලොවුතුරා සැපත් සාධා ගත්හ. සැරියුත්–මුගලන් ආදී වූ අසූ මහ සවුවන් වහන්සේ භජන ය කළවුන් ගෙන් නිවන් දුටුවෝ ත් බොහෝ වූ ය. අසු අසූ දහසක් පමණ දෙව් ලොව උපන්හ. එ හෙයින් නුවණැත්තවුන් භජන ය කිරීම වැඩට කාරණ හෙයින් මඟුල.

තව ද පිදි ය යුතු වූ බුදු පසේ බුදු සවුවන්ට කරන්නා වූ පූජා ත් අට නැළියක් විවර දෑ සමන් මල් අට මිටක් කොට බුදුන්ට පූජා කළ සුමන නම් මාලාකාරයාණන් අට පැයක් නො ව අට දවසක් නො ව, අට මසක් නො ව, අට හවුරුද්දක් නො ව, අට සියයක් හවුරුදු නො ව, අට දහසක් හවුරුදු නො ව, කප් ලක්‍ෂයක් මුළුල්ලෙහි නරකාදි වූ සතර අපායට නො ගොසින් දෙව් ලොව දෙව් සැප ත් වළඳා, මිනිස් ලොව සැප ත් වළඳා කෙළවර සුමන නම් පසේ බුදු වූ හෙයිනු ත් සඞ්ඛ නම් බමුණු ව උපන් අප මට බෝසතුන් සුසීම නම් පසේ බුදුන්ගේ ද ගබට කළ යන්තම් විතර පූජාවක් නිසා බුදු වූ අවස්ථාවෙහි නා ලොව පටන් අකනිටා බඹ ලොව දක්වා සක්වළ ඇතුළ පැවැති පූජා සත්කාර ගඞ්ගාරොහණ වතින් පෙනෙන බැවිනු ත් ලොවී ලොවු තුරා වැඩට කාරණ හෙයින් මඟුල.

Non-Commercial Distribution

තව ද මධ්‍ය දෙශාදිවූ යම් දෙශයක සිවුවනක් පිරිස් වෙසෙත් නම් දනාදි වූ දශ පින් කිරිය වත පවතී නම් තෙවළා බුදු වදන් පවතී නම් එසේ වූ නිසි තැන විසීම ත් ලොවී ලොවුතුරා වැඩට කාරණ හෙයින් මඟුල.

තව ද ස්ක්විත්තන් වුව ත්, පසේ බුදුන් වුව ත්, රහතන් වුව ත්, දඹදිව නැඟෙන හිර දිසාවෙන් කජඞ්ගලා නම් නියම් ගමට එපිට් සල් ගසින් හා ගිනි කොනින් සලලවතී නම් වූ ගඟින් හා දකුණු දිග ශෙවතකර්ණිකා නම් නියම් ගමින් හා බස්නාහිර ථූන නම් බමුණු ගමින් හා උතුරු දිග උසීරද්ධජ නම් පර්වතයෙන් හා එපිට පසල් දනාවුව ය. මැද මධ්‍ය දෙශ ය. එහි උපදිති. ඉන් සක්විත්තන් හා පසේ බුදුන් උපන් සමයෙහි එ තැන්ගේ අවවාදයෙහි පිහිටා ලොවී සැප ත් ලැබෙති. බුදුන් උපන් සමයෙහි ලොවී ලොවුතුරා සැප ත් දෙක ම ලැබෙති. එ හෙයින් එ සේ වූ කාලයෙහි එ සේ වූ දෙශයෙහි විසීම ලොවී වූ ත් ලොවුතුරා වූ ත් වැඩට කාරණ හෙයින් මඟුල.

බුද්ධාදීන් අරහයා පෙර කළ පින් ඇති බව ත් බුද්ධාදීන් කරා පමුණුවා ලා ලොවී ලොවුතුරා සැප ත් සාධා දී ලන හෙයින් මඟුල.

තව ද යම් කෙණෙක් පන් සිල් පමණකු ත් නො රැකීමෙහි ආදීනව සලකා පන් සිල් පමණක් වුව ත්, වඩා වුව ත්, සිල් රැකිත් ද මකුළු හුයක් යටි පිටින් ද උඩු පිටින් කළු වන් නො වන තෙක් රැකි පන්සිල් පමණක් අනන්ත දිව සැප ත් සාධා දී ලන හෙයින් මඟුල.

තව ද යම් කෙණෙක් සැදැ නැති කල ගල තල පිට ගොයම් හට නො ගන්නා සේ කුසල් නමැති බිජු වටින් ලොවී ලොවුතුරා සැප ත් නමැති ශස්‍ය ඵල ලබන්ට නැතැ යි සැදැ ඇති වූ නම් ඒ නිසා අනාථ පිණ්ඩික - විශාඛා ආදීන්ට මෙන් කුශල සිද්ධි ය වන හෙයින් එයි ත් මඟුල.

තව ද අදින්නපුබ්බක, මච්ඡරිය කොසියාදීන් මෙන් තද මසුරු වූ කලට දනමය කුශල නම් තැගී කමක් මුල් ව මුත් මසුරු ව කට නො හැක්කැ යි තැගි වූ නම් ඒ තැගි කම නිසා දනමය කුශලය ත් සෙසු කුශලය ත් සිද්ධ වන හෙයින් තැගි වූ නම එයි ත් මඟුල.

තව ද බොහෝ ඇසූ පිරූ තැන් ඇති බව ත් විදර්ශී ආදී බුදුවරුන් සත් දෙනකුන් වහන්සේ සමයෙහි ආගමාභියොග ය

Non-Commercial Distribution

කළ කොටයීල මහ තෙරුන් වහන්සේට අපගේ බුදුන් සමයෙහි අධිගම ය නිරායාස වූ හෙයින් එයි ත් මඟුල.

තව ද යම් ශිල්පයක් උගැන්ම නිසා මෙ ලෝ පර ලෝ දෙකින් ම අවැඩක් නො වේ නම් එ සේ උගන්නා නකත් ආදී වූ අගාරිකයන්ට නිසි වූ අගාරික ශිල්ප උගැන්ම ත් අනගාරික තැනට නිසි වූ සිවුරු ගෙත්තම් ආදි වූ ශිල්ප උගැන්ම ත් තමන් ට ත් අනුන්ට ත් මෙ ලෝ පර ලෝ දෙකින් වැඩ සාදන හෙයින් මඟුල.

ගිහි වූවො ත් පණිවා ආදීන් දුරු ව දන මානනාදියෙහි හැසිරී ම ත් පැවිදි වූවො ත් සිවු පිරිසුදු සිල් පිහිටීම ත් ලොවී ලොවුතුරා සැපතට පිහිට බැවින් මඟුල.

තව ද බොරු නො වන කේලාම් නො වන රළු පරළු නො වන නිෂ්ප්‍රයෝජන කථා නො වන තෙපුල් කීම ය් මෙ ලෝ පර ලෝ දෙකට වැඩ කාරණ හෙයින් මඟුල.

නොහොත් නිස්සරණාධ්‍යාසයෙන් අනුන්ට බණ කීමත් බණ කියන්නවුන්ට අමා මහ නිවන් දෙන හෙයින් එයි ත් මඟුල.

තව ද දෙ මවු පියන් නම් වදා පූ දරුවන්ට ඉතා උපකාරී හෙයින් පිටත කෙළ පියා ආ දරුවන් දූක ඇඟ වැලි පස් පිස පියා හිස සිඹ පියා උපදවා පී ස්නෙහ ය හවුරුදු සියයක් වුව ත් දසක් වුව ත් මුළුල්ලෙහි බිම බා නො තබා දෙ මවු පිය දෙන්නා කරින් උසුලා ත් ගෙවා ලිය නො හැකි හෙයින් දෙ මවු පියන් නැවීම් හිස් සේදීම් කැවීම් පෙවීම් ආදියෙන් උපස්ථාන කෙරෙත් ද මෙ ලෝ පර ලෝ දෙක්හි ම බොහෝ වැඩ සාධා දී ලන හෙයින් මඟුල.

කව ද අඹුවන්ට හා දරුවන්ට උන් කෙරෙහි හරසර ඇති වීමෙන් හෙළා නො දක්මෙන් උන් හික්ම නො පැවැත්මෙන් ඉසුරු උන්ට අත් හැරීමෙන් ආභරණ කරවා දීමෙනැ යි මෙ ලෙස සංග්‍රහ කිරීමෙන් අඹුවෝ වුව ත් ගෙය දඩ ඉඳුරා විචාරති. දරුවෝ වුව ත් ඉතා පක්ෂ වෙති. ගෙයි ඇති කෙලි කොල්ලෝ හිත පක්ෂ වෙති. සවාමීහු ඉක්ම පවත්නෝ ත් නො වෙති. උපයා රැස් කළ දෙය නො නසා රැක ත් ලති. සියල්ලෙහි ම අනලස ත් අප්‍රමාද ත් වෙති. අඹුවන්ට හා දරුවන්ට සංග්‍රහ කරන්නෝ—

"යෙ ගහට්ඨා පුඤ්ඤකරා – සීලවන්තො උපාසිකා,
ධම්මෙන දරං පොසෙන්ති – තෙ නමස්සාමි මාතලි"

යනු හෙයින් ශක්‍රයන් ගෙන් පවා වැඳුම් ලැබෙති. එ හෙයිනු ත් මෙ ලෝ පර ලෝ දෙකට කාරණ හෙයින් මඟුල.

තව ද නො කිරීම ය, කල් ඉක්මවා කිරීම ය, නපුරු කොට කිරීම ය, මැළි ව කිරීම ය යනාදිය නැති ව කල් දන නිසි ලෙසින් නො මැළි ව කොට ගන්නා වූ සී වප් ආදි වූ කර්මාන්ත ඇති බව ත් ධන ධාන්‍ය සම්පත් ඇතිවීමට කාරණ බැවින් මඟුල.

"පතිරූපකාරී ධුරවා – උට්ඨාතා වින්දතෙ ධනං"

යනු ත්—

"න දිවා සුප්පන සීලෙන-රත්තිනුට්ඨාන දස්සිනා,
නිච්චං මත්තෙන සොණ්ඩෙන-සක්කා ආව සිතුං ඝරං"

යනු ත්—

"අතිසීතං අති උණ්හං-අතිසායමිදං අහු,
ඉති විස්සට්ඨකම්මන්තෙ-අත්‍ථා අච්චෙන්ති මානවෙ.

යොච සීතඤ්ච උණ්හඤ්ච-තිණා භීයොයා න මඤ්ඤති,
කරං පුරිසකිච්චානි-සො සුඛා න විහායති."

යනු ත්—

"භොගෙ සංහරමානස්ස-භමරස්සෙව ඉරීයතො,
භොගා සන්නිචයං යන්ති-වම්මිකො වුපචීයති."

යනු ත්—

එ හෙයින් වදරණ ලදී.

තව ද කුඩු කැවුම් දුන්නා වූ මාලාකාරීන් දූන්ට පවා බිසෝ පට ලබන හෙයින් පාත්‍ර ය සෝධන්ට කොළ පමණක් කඩා දුන්න වුන් රුක්දෙවි ව උපදනා හෙයින් දන්දෙන ගෙවලට අත ඔසවා මං පැවවුන් අතින් කල්පලතාවෙකින් මෙන් අභිමතාර්‍ථ සිද්ධ වන හෙයිනු ත් කම් පල අදහා දන් දීම ත් මෙ ලෝ පර ලෝ වැඩට කාරණ හෙයින් මඟුල.

තව ද දන් දීම, සිල් රක්‍ෂා කිරීම, පින් දීම, පින් අනුමෝ වීම, බණ කීම, බණ ඇසීම ආදි වූ දස පින්කිරි ය වත හැසිරීම ත් ස්වර්ගෝත්පත්තියට කාරණ බැවින් මඟුල.

තව ද මවු පක්‍ෂ ය පිය පක්‍ෂ ය සත් වන කුල පරම්පරා ව පටන් පැවත ආ දුක් පත් ව ගොසින් තමා කරා ආ නෑයන්ට බල පමණින් බත් පිළී ආදිය දීමෙන් සංග්‍රහ කිරීම ත් මෙ ලෝ පර ලෝ වැඩට කාරණ හෙයින් මඟුල.

Non-Commercial Distribution

තව ද පොහෝ දවස් නො වරදවා පෙහෙ වීම, ගුරුන් වතුන් කුල දෙටුවන්ට මෙහෙ කිරීම හා මල් වතු පැන් පොකුණු උයන් ශාලාවු අම්බලම් හේ දඬු ආදිය පින් නිසා කිරීම ත් මෙ ලෝ පර ලෝ වැඩට කාරණ හෙයින් මඟුල.

තව ද 'මේ අපගේ ජාතියට අපගේ තරමට නිසි නො වේ'යි සිතින් ම සලකා පියා පවින් වැලැක්ම ත් මෙ බන්දක් මෙ වක් පටන් නො කරම්හ'යි කියා ලා නො කිරීම ත් පවින් වැලක්ම ත් මෙ ලෝ පර ලෝ වැඩට කාරණ හෙයින් මඟුල.

තව ද රා පූව වුන් කාරණා කාරණ නො දන්නා හෙයිනු ත් මවු පියන් වුව ත් කුල දෙටුවන් වුව ත් බුදු පසේ බුදු මහ රහතන් වුව ත් නො හඳුනන හෙයිනු ත් මෙ ලොව වියරු වෙස් ගෙණ ඇවි දිනා හෙයිනු ත් පර ලෝ අපාය දුක් විඳිනා හෙයිනු ත් එයින් නැවත් ම ත් මෙ ලෝ පර ලෝ වැඩට කාරණ හෙයින් මඟුල.

තව ද කරණ පින් කමු ත් සකස් කොට කිරීම, එක් වන් කිරී ම, නො තබා කිරීම, නො මැළි ව කිරීම, වීර්‍ය ඇති ව කිරීම, සිහි ඇති ව කිරීමැ යි මෙ සේ පින් කම් නො පමා වීම ත් නිවන් නො පමා වන හෙයින් උතුම් මඟුල.

තව ද ගරු කළ මනා උසස් කළ මනා බුදු පසේ බුදු මහ රහ තනු ත් දෙ මවු පිය නැඳි මයිල් බෑ බුන් ආදී නු ත් ගරු කෙරෙත් ද එ සේ වූවන් දෙව් ලොව ඉපැද ඔබාහෝ සම්පත් ලබන හෙයින් මිනිස් ලොව උපදිත ත් උසස් කුලයෙහි උපදනා හෙයින් අභිවෘද්ධි කාරණ වේ නු යි ගරු කළ මනාවුන් ගරු කිරීම ත් මඟුල.

තව ද ගුණෙන් – නුවණින් කවර තරම් තරමක් ඇති වත් නිහතමානී බැවින් පා පිස්නා බිසි වැනි ව, සියල්ලවුන්ට ම යටත් ව පැවැත්ම ත් කීර්ති ආදි ගුණයට හේතු බැවින් මඟුල.

තව ද යම් භික්ෂු කෙණෙක් යහපත් වුව ත්, නපුරු වුව ත් සිවුරු පිඩු පා සෙනසුන් ගිලන් පස යන සිවු පස ය ලදින් ලද දෙයින් ම යැපෙත් ද, අනිකක් නො පතත් ද, ඉදින් රෝගීහු වී නම් බර සිවුරු වැළැන් ද නො හෙත් නම්, රූක්ෂාහාරය වළඳා ගත නොහෙත් නම් අයප සෙනස්නෙහි සැතපිය නො හෙත් නම්, රූක්ෂාහාර වූ ඔබහෙත් වැළඳිය නො හෙත් නම්, සභාග තැනට ඒ දී පියා එ තැනින් විහිත දෙයක් හැර ගෙණ ප්‍රයෝජන විඳි ත් ද ඉතා මා හැඟි වූ සිවුරු හෝ බත් හෝ සෙන සුන් හෝ ගිලන් පස හෝ ලදින් මහලු සබ්‍රම්සර තැනට දී පියා

Non-Commercial Distribution

පසුල් සිවුරෙන් හා සිඟා ලත් කෙණෙසි අහරින් හා රුප්පා අබවස් ආදියෙන් හා ගෝ මූ අරළු පමණෙකින් සතුටු වෙත් ද ඒ මෙ ලෙසින් පැවති ද්වාදශ විධ ආර්‍ය්‍ය සන්තොෂ ය ත් ඒ ඒ දෙයෙහි ඉච්ඡාව හා බොහෝ දෙයෙහි ඉච්ඡාව හා තමා කෙරෙහි නැති ගුණ හැඟවීමෙහි ඉච්ඡාව හා නසා ලොවී ලොවුතුරා ගුණ විශෙෂය සාධා දී ලීමට කාරණ බැවින් මඟුල.

තව ද මඳක් වුව ත්, බොහෝ වුව ත්, අනුන් තමන්ට කළ උපකාර දැන්ම ත් ඒ නිසා උන්ට උපකාර කිරීම් මුඛයෙන් කුසල්හි හැසිරෙන හෙයින් එයි ත් මඟුල.

අනුන්ව උපකාර කරන්නෝ ත් කළ උපකාර සලකන්නෝ ත් අරුමයෝ ය යි බුදුහු වදාළ සේක.

තව ද යම් වේලෙක සිත උඩඟු ව පවතී නම් ඒ වේලෙහි ත් නිරන්තර ව බැරි වුව ත් පස් පස් දවසින් වුව ත් බණ ඇසීම සියලු කුශලයට ම මුල් ව සිටිනා හෙයින් මඟුල.

තව ද යම් කෙණකුන් කලාබු නම් කසී රජහු කළ අපකාර උපකාර මෙන් සැලකූ ඛන්තිවාදී තවුසන් මෙන් සහන ය ඇත් නම් එයි ත් උන්ට ඛන්තිවාදී තවුසන් කළ සහන ය බුදු බව සාධා දී ලූවා සෙ අභිවෘද්ධි කාරණ හෙයින් මඟුල.

සරභංග බෝසත්හු ත් සහනයෙහි ම යොද—

"කොධං වධිත්වා න කදාචි සොචති—
මක්ඛප්පහානං ඉසයො වණ්ණයන්ති,
සබ්බෙසං වුත්තං ඵරුසං ඛමෙථ—
එතං ඛන්තිං උත්තමමාහු සන්තො."

යනු කිවු ය. සක් දෙව්දු ත් කවර තරමෙක අනර්‍ථ කරන්ට බලී වුව ත් සහන ය ම කරන්ට කිවු ය. බුදුහු ත් සහන ය ම උතුම් කොට නො එක් තැන වදාළ සේක.

කුශල විෂයෙහි යොදා අවවාද කළ කල මුසුප්පු ත් නො ව කළ අවවාදයෙ හි චේව යි අවවාද කළවුන් කෙරෙහි චේව යි නිහරසරත් නො ව රාහුල තෙරුන් වහන්සේ මෙන් කීකරු වීම ත් මෙ ලෝ පර ලෝ වැඩට කාරණ හෙයින් මඟුල.

තව ද ගුණ ඇත්තවුන් කරා එළඹීම ය. උන්ට උපස්ථාන කිරීම ය. උන් එක් වන් ව සිහි කිරීම ය. උන්ගේ පවත් ඇසීම ය

Non-Commercial Distribution

සිත් පහදවා බලා පි වන්ට නො එක් දහස් ගණන් ජාතිවල ත් ඇසට වන රොග නැති හෙයින් දැකී ම ය යන මේ සියල්ල ත් භික්ෂු සඞ්ඝයා වහන්සේ පිරිවරා වෙදිය[1] නම් පර්වතයෙහි වැඩ හුන් බුදුන් දැක සිත පහදවා බලා පී බකමූණා පවා කප් ලක්ෂයක් මුළුල්ලෙහි දුගතියකට නො ගොස් හොඳ මුහුණු ඇති ව දෙව් සැප ත් වළඳා කෙළවර සොමනස්ස නම් පසේ බුදු වන හෙයින් ගුණ ඇත්තවුන්ගේ දැකීමු ත් මඟුල.

තව ද පෙර යම හෝ අළුයම හෝ සූත්‍ර පිටකයෙහි අභ්‍යාස ඇති තැන් සූත්‍ර කථා කරණ සේක් ද, විදම් දෙසීමෙහි අභ්‍යාස ඇති තැන් විදම් කථා කරණ සේක් ද, ජාතකයෙහි අභ්‍යාස ඇති තැන් ජාතක කථා කරණ සේක් ද, අටුවායෙහි අභ්‍යාස ඇති තැන් ඉන් කථා කරණ සේක් ද, ඒ කථාව ආගම ව්‍යක්ති ආදී වූ ගුණයට කාරණ බැවින් මඟුල.

තව ද යම් කෙණෙක් චක්ෂුරාදී වූ ස දෙරට විෂ ය වූ ඉෂ්ට රූපා දී සාරමුණෙහි ඇලුමු ත් නො වෙද්ද, අනිෂ්ට දෙයෙහි සැටි-මුත් නොවෙත් ද. එ ලෙසින් ඉන්ද්‍රිය සංවර ය හෝ කෙලෙසුන් තවන්නා වූ වීර්‍ය්‍ය ය හෝ ඇත් නම් එ තෙමේ ධ්‍යානාදීන්ගේ ප්‍රතිලාභයට කාරණ බැවින් මඟුල.

තව ද යම් කෙණෙක් මෙවුන්දමින් වැළැක්කෝ ද, සෙසු ත් මහණ ධම්හි යෙදී වෙසෙත් ද, ප්‍රතිවෙධ ය පසු කොට ත් පර්‍ය්‍යාප්ති ප්‍රතිපත්ති දෙක්හි යෙදී වෙසෙත් ද, ඒ සියල්ල ම ලොවී ලොවු තුරා ගුණ ලැබීමට කාරණ බැවින් මඟුල.

තව ද යම් කෙණෙක් භාවනාභියොගයෙන් මාර්ගාධිගම ය ඵලාධිගම ය කළෝ නම් සසර දුකින් මිදීමට කාරණ හෙයින් මඟුල.

මාර්‍ගාධිගම ඵලාධිගම දෙකිනු ත් රහත් වීම ජාති දුක් ආදී වූ සියලු දුක් ගෙවන හෙයින් උතුම් මඟුල.

තව ද යම් කෙණෙක් ලාභයක් වත් යසසක් වත් ප්‍රශංසාවක් වත් සැපයක් වත් ලදින් එ ම තර දෙයක් සේ සිතා උඩඟු නො වෙත් ද නැවත අලාභයකට හෝ නින්දවකට හෝ දුකකට හෝ පැමිණ අනිත්‍යතා ව වටහත් මුත් මුසුප්පු නැත්තෝ ද එ තරම් තම අදහස් ඇත්තෝ ත් බුදු බව ත් සාධා දී ලන හෙයින් උතුම් මඟුල.

තව ද යම් කෙණකුන්ට කිසිවෙක ත් ශොක නැත් නම් නැවත රාගාදී වූ රජසු ත් නැත් නම් කෙලෙස් සතුරන් ගෙන්

---

1. වෙදියක

Non-Commercial Distribution

උපද්‍රව නැත් නම් සියලු ලෙසින් ම ඒ හැම සමහ වන්නාං ම රහතන්ට හෙයින් නිශ්ශොකි වීම ත් නිකෙලෙස් වීම ත් බබුරන් වුව ත් ශක්‍රාදීන් ගෙන් වැඳුම් ලබන ලෙසට කරවා ලන හෙයින් මඟුල.

බුදුහු ''අසෙවනා ච බාලානං'' යනාදි වූ ගාථා දහසයකින් මඟුල් අට තිසක් වදාළ සේක. මඞ්ගල සූත්‍ර ය දෙසා වදාළ කල්හි දෙවියෝ කෙළ ලක්‍ෂයක් රහත් වූහ. සෝවාන් සෙදගැමි අන ගැමි වූවෝ අසඞ්ඛ්‍යයෙක.

දෙ වන දවස් බුදුහු අනඳ මහ තෙරුන් බණවා 'ආනන්‍දයෙනි, ඊයේ රෑ එක දෙවතාවෙක් මා කරා අවුත් මඟුල් විචාළ. මම ඕහට මඟුල් අට තිසක් කීමි. ආනන්‍දයෙනි, මේ මඞ්ගල සූත්‍ර ය ඉගෙන ගෙණ භික්ෂූන්ට උගන්ව'යි වදාළ සේක. ඔබ ත් ඉගෙණ වහන්දෑ ඉගැන්වූ සේක. එ හෙයින් එ වක් පටන් මෙ වක් දක් වා ත් මෙ වක් පටන් පස්වා දහස මුළුල්ලෙහි ත් මේ සූත්‍රය සප්‍ර යෝජන වන්නා සේ ම නුවණැත්තවුන් හා එක් ව නුවණැත්ත වුන් හජන ය කොට පිදිය යුත්තවුන් පුද, සුදුසු පියස පෙර කළ පින් ඇති බැවින් තමා යහපත් ව නිරවද්‍ය ශිල්ප ඉගැන් මෙන් බොහෝ ඇසූ පිරිවූ තැනු ත් ඇති බැවින් සුපිළිවෙතින් සස්න හොබවා කියන බසෙක් ඇත් නම් යහපතක් ම කියමින් දෙ මවු පියන්ට උපස්ථාන කිරීමෙන් සාලිකෙදර ජාතකයෙහි ගිරා ව උපන් බෝසතුන් කී ලෙස දරණ ණය ගෙන්වා ගෙණ අඹු දරුවන්ට සංග්‍රහ කිරීමෙන් මත්තට නිසා පොලී පිට ලා ගෙණ නිරවද්‍ය වූ කෘෂි වණික් ආදිය ඇති වීමෙන් ධනධාන්‍යාදී සම් පත් ඇති ව දන් දීමෙන් භොගයෙහි සාර ය හැර ගෙණ ශීල සංරක්‍ෂණයෙන් ජීවිත සාර ය හැර ගෙණ නෑයන්ට සංග්‍රහ කිරී මෙන් සව පක්‍ෂ ය හිත කරවමින් නිරවද්‍ය වීමෙන් අනුන් හිත කරවමින් පවින් වැළැක්වීමෙන් ජන පීඩා ත් නැති ව රාමෙරෙන් දුරු වීමෙන් තමාට වන පීඩා ත් නසා නො පමා වීමෙන් කුසල් ධම වඩමින් පිණට සිත් නැමුණු බැවින් ගිහි සැප ත් හැර මහණ ව,

බුද්ධාදීන් කෙරෙහි ගෞරව ත් ඇති ව උද්ධතා වාස ය ශාස නානු රූප නො වන බැවින් කො තැන් කෙරෙහි ත් යටත් වූ පැවැ තුම ඇති ව, වත් පිළිවෙත් සාර ව, චතුර් විධ ප්‍රත්‍යයෙහි ද්වා දශ විධ

Non-Commercial Distribution

ආයෂ්‍ය සන්තොෂ ඇති බැවින් පසයෙහි ලොල් බැව් හැර හළ දෙයෙහි ගුණ දන්නා බැවින් සත් පුරුෂ ව, පින් කම්හි මැළි බවෙක් ඇත් නම් බණ ඇසීමෙන් දුරු කොට ක්‍ෂමා කරවීමෙන් සියලු උවදුරු නසා කීකරු බැවින් සියල්ලකට ම නිසි ව ගුණ ඇත්තවුන්ගේ දක්ම නිසා උන්ගේ අනුශාසනාවෙන් තමා ත් ගුණ ඇති ව කුසල් විෂයෙහි උපන් සැක ඇත් නම් නුවණැත්ත වුන් හා කථා කිරීමෙන් ඒ දුරුකොට ගෙණ සිවු පිරිසිදු සිල්හි පිහිටීමෙන් ශීල විශුද්ධි ය සපයා ගෙණ සමථාභියොගයෙන් චිත්ත විශුද්ධි ය උපදවා, දෘෂ්ටි විශුද්ධි ආදි ය නැති ව ඥාන දර්‍ශන විශුද්ධි ය සපයන්ට බැරි බැවින් ලක්‍ෂණාදි විසින් නාමරූප නිශ්චයාදි විසින් සෙසු විශුද්ධි ත් සපයා ගෙණ මාර්‍ග පිළිවෙළින් ගොසින් රහත් ව සුළහෙකින් මහමෙර සොලවා ලිය නො හැක්කා සේ අෂ්ටලොක ධර්‍ම නමැති මහ පවනින් නො වෙවුලා නිශ්ශොක වීමෙන් නිකෙලෙස් වීමෙන් හැම තැන්හි ම නො පරදනා ලද අත් බැව් සාර්ථක කට යුතු.

# 339. දානානිශංසාදි අනුශාසනා

අප විසින් කරණ සද්ධර්‍ම රත්නාවලී ය ආද්‍යන්ත කොට අසා කවර ත් ශාස්ත්‍රය සුනිශ්චිත කොට දන ගැන්ම බැරි වුව ත් අඥනයන්ට නො දන්ම පිළිවන් වන්නා සේ කිරීම බැරි වුව ත් නො කිරීම පිළිවන් ව තිබෙන කුශලයෙහි මහ මෙර ඔසවන්ට කරණ යත්නයක් සේ තර ව පිහිටා ගොතා ලූ මල්වඩම් නො වි දීම වඳුරන්ට බැරි වුව ත් විද පීම පිළිවන් සේ නො කිරීම බැරි වුව ත් අඥන වුව ත් කිරීම පිළිවන් වූ පවින් දුරු ව දෘෂ්ටි විශුද්ධි පරම්පරාවෙන් ගොසින් ඥාන දර්‍ශන විශුද්ධි ය සපයා නිවන් පුර වදනවුන් දන් දීම නම් දස පින්කිරි ය එකට මුල් ව සිටී. විවරණ ලදින් බුදුකුරු ධර්‍ම සොයන බෝසත්වරුන්ට පළමු ව පෙනෙ යි.

පිළිවෙළ කථාවට ත් මුල් ව වෙස්සන්තර ජාතකයෙහි වෙස තුරු ව උපන් බෝසත්හු උපන් ඇසිල්ලෙහි දන් දෙන්ට නිස් සෙක් ඇද්ද යි ඵුසති බිසොවුන් විචාරා අතුල් සුහින්තෙහි දහසින් බැඳි සියල්ලක් තබා ලූ කල්හි ඒ තැනට පැමිණියවුන්ට බෙදූ දුන්හ. අට ඇවිරිද්ද ඇතුළත පලන්-කුමරපළඳනා අට වරෙක කිරි මවුන්ට දන් දුන්හ. පසු ව සොළොස් ඇවිරිද්දෙහි රජ පැමිණ කලිඟු රට සිට දන් ඉල්ලා ආ බමුණන්ට ඇතු පටන්

Non-Commercial Distribution

සූවිසි ලක්ෂයක් අගනා මුත්හර එබු මැණික පටන් අනගි වස්තු සයක් හා අනගි වූ පණ්ඩර නම් වූ ඇතු තමා ත් දන් දුන්හ. ඇතු දන් දුන්හ යි දෙවියන්ගේ වශයෙන් නුවර වැස්සන් මුසුප්පු ව පියා රටින් යවන හෙයින් රටින් යන ගමනේ සියල්ලන් සත් සත් සිය ය ඔබාදීන් සතසතු මහ දන් දුන්හ.

නො සිතින් වුව ත් තපස් නිසා වක්ගල් කුසට නික්මුණු ගමනේ සතසතු මහදන්ට පසු ව පියා ලුහුබඳවා ගිය බමුණන්ට රථයෙහි යෙදූ අසු දන් දුන්හ. පසු ව දන් ඉල්වා ගිය බමුණන්ට රථ ය දන් දුන්හ. ගොසින් වක්ගල් කුස හිදිනා ගමනේ දුනු විටි නම් බමුණු ගම සිට අඹුවගේ කැණියලින් වාල් දනක් ඉල්වා ගිය දුගී දුවක[1] බමුණාට දරු සඟළ දන් දුන්හ. අඩු තුන් කෙළක් පුරහනන් ඇත ත් අඹු දන් ඉල්වා බමුණු වෙසින් ගිය සක් දෙව්දු හට මද්‍රි බිසොවුන් දන් දුන්හ.

පිය මහ රජුන්ගේ අයාමෙන් සිය නුවරට ගොසින් ගිය දවස් වැස පූ සත් රුවන් දන් දුන්හ යි හිමව් මහ මෙර ආදි ය හා සමග මහ පොළව වෙවුල් වා දුන් මහ දන් සිහි කොට දන් දීමෙහි යෙදී-තව ද කවර ත් ම පිණකට ගං වලට හිමවත මුල් වන්නා සේ නුවණ මුල් ව සිටිනා හෙයින් උමංදයෙහි මහෞෂධ ව උපන් බෝසත්හු සත් හැවිරිදි අවස්ථාවෙහි තමන් සත් හැවිරිදි වුව ත් නුවණ සත් හැවිරිදි නො වන හෙයින් දහසක් දෙනා නුවණින් උකුස්සාගෙන් එළවා ගත නුහුණු මස් කැටි ය තුමූ තනි ව නුවණින් එළවා ගත්හ.

ගොන් යුක්තියෙහි දී ගොන් ගෙය ගෙණ ගිය සොරුට ගොන් කෑ තණ ලවා දෙස් කියෙව්වා සේ, බෙතින් වැකූ පැන් ගොන් පොවා තණ නංවා පියා උදු හා තල මුරුවට ගොන් නො නැඟු හෙයින් ගොන් සොරු නුවණින් ම හසු කළහ.

ගැටහු පළඳනාව සොරා හැරගත් තැනැත්ති ය කෙසේ ගැට කම් කළ ත් සුවඳ කවන තැන සිටියා සේ පුවඟු මල්වල සුවඳින් ම ඒ සෙරගේ සොර කම ත් නුවණින් ම හසු කළහ. හූ වැටි සොර කම ත් සොර තැනැත්ති ය කියා ලූ කපු ඇට ය නො ව තිඹිරි ඇට ය හෙයින් අනි ත් දෙසුන් නැත ත් තිඹිරි ඇටින් ම දෙස් කියවා සොරකම් හරවා ලූහ.

---

1. ජූජක

Non-Commercial Distribution

දරු ඩබරේ දී යකින්න ලවා තමා යකිනි නියාව කියවා ලා කුමරුන් දරුවන් ඇති තැනැත්තවුන්ට ම දෙවා පීහ.

ගොලකාළයාගේ අඹු ඩබරෙහි උන් තුන් දෙනාගේ ත් දෙ මවු පියන්ගේ ත් නම් විචාරා දික්පිටියාගේ කථා සුහකු ත් සරි නො වන දික් තලගේ කථාවෙනු ත් ගොලකාළයන්ගේ කථා වෙනු ත් දික් තලගේ හා දික්තලයන්ගේ දෙ මවු පියන්ගේ නම් සරි හෙයින් ගොලකාළයන්ගේ ත් උන්ගේ දෙ මවු පියන්ගේ ත් නම් විචාරා දන්නා නම් ම වඤ්වා නිසා නො කී නියා මුත් තමාගේ නම ත් දෙ මවු පියන්ගේ නමු ත් ගොලකාළයන් කියා ලූ සැලැස්ම කියා ලූ හෙයින් ගොලකාළයන්ගේ ත් උන්ගේ දෙ මවු පියන්ගේ ත් දික්තල දන්නා නියාවට නියම කොට ලා ගොලකාළයන්ට ම දික්තල පාවා දුන්හ.

රථ යුක්තියෙහි දී දහසක් දෙනා විචාළ ප්‍රශ්න එක විට විසඳන තරම් නුවණ ඇති ශක්‍රයන් ශක්‍ර නියාව උන් ලවා ම කියවා විජයත් රථ ය ඇති ශක්‍රයන්ට එ සේ වූ රථවලින් ප්‍රයෝජන ම නැති හෙයින් රථ ය ඇති තැනැත්තවුන්ට ම රථ ය තිල කළහ.

ලියවා පී වියතක් දිග කිහිරි දණ්ඩෙහි අග මුල නුවණ නමැති තරාදියෙහි ලා කිරා බරින් මුල ත් සැහැල්ලු කමින් අග ත් දත්හ.

සම් වගුළ මිනී හිස් දෙක දැක පිල්වන්න කියවා ලා වස්තුයේ නියම දන්නා සේ ම මැස්ම දැක ම ගෑනි හිස ත් පිරිමි හිස ත් දත්හ.

නුවණ විමසන්ට ම එළවා ලූ සපු හා සැපින්න දැක නියම ය කියා ලූ කෙණකුන් නැති ව 'මූ සපී වන්ට මේ කාරණ ය, මැ සැපිනි වන්ට මේ කාරණය ය'යි පසු ව දතහෙන මහ බෝසත්හු අරේ දැන ගන්ට සලකුණු ඇති ලෙසින් දත්හ.

පය හං ඇති[1] ඉස් මුදුනෙහි මොල්ලියක් ඇති තුන් වේලේ හඬන ගොනකු යවන්ට කියා යැවූ තැන හැළි කුකුළකු යවූහ.

අට තැනකින් වක් තුබූ මැණික දිරා ගිය තුබූ පරණ ලණු ව හැර පියවන්ට ත් අලුත් ලණුවක් අවුණා ලන්ට ත් නැති ව තුබූවා තමන් ගෙන් කුමුවන්ට විධානයක් ඇත්තා සේ උන් ලවා පරණ ලණුව ත් හරවා අලුත් ලණුවක් මැණික වක් වුව ත් නුවණ නො වක් හෙයින් ලවා ලා රජ්ජුරුවන්ට යවූහ.

---

1. පය අං ඇති

Non-Commercial Distribution

මහුල් ගොනුගේ හං මුලට බා කපවා පියා හිවූ උඳු කවා බඩ ද රිඇති බඩක් සේ මහත් කරවා පියා වදවා වසු පස්සේ ලා එවන්ට කියා යවූ තැන එම වෛදෙහ රජ්ජුරුවන් ලවා ම තුන් කල් පිරිමින් දරුවන් වැදූ තැනක් ගැනු ව උපන් කලට මුත් නැතැ යි කියවා මහුල් ගොනා ත් නො වදන නියාව සාධා ලූහ.

නො සාල් නො දිය නො ගිනි නො දර නො ළිප් නො සැළි යක දී නො ගැනුන් ලවා, නො පිරිමින් ලවා, පැසි බතක් පිසවා ලා නොමහකින් යවන්ට කියා යවූ තැන සුන් සාල් පිනි පැන් ආදීන් පැසි බත් පැසවා ලා නමින් පැසි බත වුව ත් නුවණින් නො පැසි බත යවූහ.

ලණු කඹ බැඳ කෙළිනා කෙළියට වැල්ලෙන් කඹයක් අඹරවා පියා යවන්ට කියා යවූ තැන වැල්ලෙන් කඹ තබා වියටක් දිග ලණුවකු ත් ඇඹරිය නො හැකි නියාව එ ම රජ්ජුරුවන් ලවා ම කිය වූහ.

දිය කෙළියට පොකුණක් හා උයන් කෙළියට උයනක් යවන්ට කියා යවූ තැන ඈදා ගෙණ එන්ට පොකුණු හා උයන් ඉල්වා යවීමෙන් ම එ ම ලෙස උයන් හා පොකුණු ගෙනෙන්ට බැරි නියාව තුමූ නො කියා එ ම රජ්ජුරුවන් ලවා ම නුවණ නමැති දෙවතානුභාවයෙන් කියවූ ය.

හැම තැන දීම පියා පුතුට වැඩි නො වන නියාව කිසි තැනක දීවත ත් ඒ බොහෝ නො වන නියා ව අනඝ වූ සෛන්ධව අශ්වයාට පිය වූ කොටළුවා අට මස්සක් විතරින් වඩා නුපුස්නා නියාව කියා සරාජික පෂී ත් ගිවිස්වා ලූහ.

පය බරවයට පිටි කර බෙහෙත් බඳනා සේ මැණික තල් ගස උඩු තිබිය දී පොකුණේ පැන් ඉස්වා මඩ හැර වූ සේනක පණ්ඩිත යන් නො දක්මෙහි පවා කවුඩුවා අවුත් කියා ලූවා සේ මැණික බාවා රජ්ජුරුවන්ට දුන්හ.

කටුසු පැණෙහි රත්රන් සතර වියටක් නිසා කටුස්සාට ඇති වූ අභිමාන ය බුදු වූ අවස්ථාවෙහි අදහස් දන්නා අනික් ලෙසකින් වුව ත් මේ ආකාරයෙන් ම දත්හ.

ශ්‍රී කාන්තාව හා කාලකණ්ණියා එක තැනක නො වසන හෙයින් පිංගුත්තරයන් උදුම්බරා බිසොවුන් නො කැමැති වූ නියාව දන රජ්ජුරුවන් ගිවිස්වා උදුම්බරා බිසොවුන් දිවි රැක තුමූ බොහෝ දවසක් ජීවත් වූහ.

මෙණ්ඩක ප්‍රශ්නයෙහි රජ්ජුරුවන් ප්‍රශ්න විචාළ ලෙසින් ම දූක කියා ලූ බව මුත් සිතින් සිතා කියා ලූ දෙයක් නො වන නියා ව දූන උදුම්බරා බිසොවුන් කියා ලූ ලෙසින් රජ්ජුරුවන් එළුවාගේ හා බල්ලාගේ ක්‍රියාව දූක ම කී නියා ව දත්හ.

අමරා දේවී ත් සඟවා කියා ලූ යම් දෙයක් ම කප් ලක්‍ෂයක් මුළුල්ලෙහි පිරූ පැරුමට සාරාසැකි කප් සුවහස් පිරූ පැරුම් බොහෝ හෙයින් තුමූ නො සඟවා ම දත්හ.

සිරිමන්‍ද ප්‍රශ්නයෙහි නුවණ නැත ත් සම්පත් ඇත්තහු උතුමැ යි යන කාරණ ය දෘෂ්ටාන්තයට ගෝරිමන්‍දයන් පෙනෙන හෙයින් බොහෝ දෙන ගිවිසිත ත් දූක් පත් වුව ත් නුවණ නමැති ධන ය යම් කෙණකුන්ට ඇත් නම් ඒ ධනයට වඩනා අනික් ධනයෙක් නැති බැවින් උන් ම උතුම් නියා ව නො එක් කාරණ කියා ගිවිස්වූහ.

දේවතා දුව විචාළ බජ්ජොපනක ප්‍රශ්න ය විසඳා දේවතා දුවගෙන් සත් රුවන් හා රජ්ජුරුවන්ගෙන් සෙනෙවිරත් පට ලත්හ.

පඤ්ච පණ්ඩිත ප්‍රශ්නයෙහි සෙනකාදි පණ්ඩිත වරුන් සතර දෙනා තමා සිත ඇති රහස් කටයුතු මුත් මුන්ට කීම යහපතැ යි කීව ත් තුමූ කාට ත් කීම නපුරැ යි කියා ලා කීමෙහි නපුර දෙවන දවස් උන් උන් ගෙන් ම පෑ ලූහ.

නැවත කෙවට්ටයන්ගේ උපදෙසින් චූලනී රජ්ජුරුවන් එක් සියක් රජුනු ත් අටළොස් අක්‍ෂෞහිණියක් විවර සේනාව ත් හැර ගෙණ මියුලු නුවරට සටනට ආ තැන කිසි කෙණකුන්ගේ ත් ජීවිතයට හානි නො කොට පසු ව වසවත් මරු හා මර සෙනඟ බිඳ පලවන්නා සේ ම පලවා පියා මා ඇඟි වස්තු මියුලු නුවර වැස්සන් දෙ පෝයක් විවරින් ඇද නිමවන විවර යකඩ ලෝකඩ ආදී වූ දෙය සාරමසක් විවරින් ඇද නිමවා ගන්නා විවර කොල්ල ලත්හ. පසු ව එ ම කෙවට්ටයන්ගේ උපදෙසින් පඤ්චාල චණ්ඩි නම් වූ දුවණියන් සරණ පාවා දෙම්හ යි කියා ලා සරණ පාවා දෙන්ට ඔබ ගෙන්වූ කල චූලනී රජ්ජුරුවන් කළ ප්‍රයෝගයෙහි සිතා කළා කුමක් වුව ත් බසින් කීවා සැබෑ කොට උමං සොර කමින් ගෙන්වා ගෙණ ඒ සා මහත් රජ සෙනඟක් උපකාරී නුවර වටා සිටියදී ම වෙදෙහ රජ්ජුරුවන්ට පඤ්චාලචණ්ඩි කුමාරිකාවන් සරණ පාවා දී ලා එක රැයින් ම මියුලු නුවරට යවා වෙදෙහ රජ්ජුරුවන්ගේ අභිමතාර්ථ ය සිද්ධ කළහ.

Non-Commercial Distribution

පසු ව තුමූ ත් තමන් කළ යම් දෙයක් චූලනී රජ්ජුරුවන් සිත් ගන්ට කළා සේ උන් පහදවා ගෙණ පහන් රජ්ජුරුවන් ගෙන් රත්රන් පස් විසි දහසක් හා හවුරුදු පතා අසූ ලක්‍ෂයක් බද්ද නිමන ගම් අසූවක් හා කෙල්ලන් සාර සියයක් හා කම්මිත්තන් සියයක් හා තවත් බොහෝ දැ ලදින් කෙලෙස් සතුරන් සාධා සර්‍වඥ ගුණ නමැති බොහෝ සම්පත් ලදින් කිඹුල්වතට ගියා සේ ම මියුලු නුවරට ගියහ. වෛදෙහ රජ්ජුරුවන්ගේ අයාමෙන් උත්තර පඤ්චාල නුවරට ගිය පසු හෙරී පරිබ්‍රාජිකාවන් හස්ත මුද්‍රිකාවෙන් විචාළ ප්‍රශ්න හස්තමුද්‍රිකා-යෙන් ම විසඳා පරිබ්‍රාජිකාවන්ට තමන්ගේ නුවණෙහි තරම හැඟවූහ. පරිබ්‍රාජිකාවන්ගෙන් තරම් අසා රජ්ජුරුවන් එක පැහැර සම්පත් දී පූරා පි හෙයින් කවර අදහසකින් දුන් බව ත් නො දන තමන් රජ්ජුරුවන්ගේ අදහස් දැන්ම තරම් නො වන හෙයින් හෙරී පරිබ්‍රාජිකාවන් ලවා දිය රකුසු පැනයෙන් ලෙන් ගතු ව ම සම්පත් දුන් නියා වි දත්හ.

මේ හැම නුවණ හෙයින් කරණ කියන සිතන යම් දෙයකට නුවණ ම පෙරදැරි කොට තව ද විධුර ජාතකයෙහි විධුර පණ්ඩිත ව උපන් බෝසතුන් ඉරන්‍දතී නම් නාග කන්‍යාවන්ගේ නියොග-යෙන් වෙසවුණු රජ්ජුරුවන්ගේ බෑණ වූ පූර්ණක නම් යක් සෙනෙවියන් කුරු රට ඉඳිපත් නුවර ධනඤ්ජය කොරව්‍ය රජ්ජුරු වන් දූ කෙළ පරදවා වඩ්ඩියට ලදින් මරා පියා හෘත් මාංශ ය හැර ගෙණ යන්ට නො එක් ප්‍රයොග කළ ත්, වානරින්‍ද ජාතකයෙහි වඳුරු ව උපන් බෝසතුන් හෘත්මාංශ ය හැර ගන්ට කිඹුලා කළ උපදෙස් දැන හෘත්මාංශ ය ගළවා ගත් ලෙස තිබී ගියා සේ ම මරණු නිසා දෙසිය සතළිස් ගවුවක් උස ඇති කාළගිරි නම් ගල් මුදුනට නැඟි ලා දෙ පය අල්වා ගෙණ හිස ගසා මරන්ට අල්වා ගත් තැන ගල නො ගසන තෙක් 'සාධු නර ධර්‍ම නම් බණක් දනිමි. මා මළො ත් ඒ නියා බණක් අපවත් වේ ද, ඒ බණ අසා පියා මරව'යි කියා ඒ බණ කියා මරණින් ගැළවුණා සේ සියලු පවින් වැළහී—

තව ද නාරද කාශ්‍යප ජාතකයෙහි නාරද නම් මහ බඹ ව උපන් බෝසතුන් අංගාති රජ්ජුරුවන් ගුණෙන් නිර්ගුණී වූව ත් නමින් ගුණ නම් වූ නිවවාගේ සමවායෙන් දෘෂ්ටි ගත් නියා ව දැන උරුවෙල් කසුබු දමනයෙහි තුන් දහස් පන්සියයක් පමණ පෙළහර දක්වා හරවන දෘෂ්ටිය තුනී කරවන්නාක් මෙන්

Non-Commercial Distribution

අංගාති රජ්ජුරුවන් කරා ගොසින් බණ කියා දෘෂ්ටි ය හරවා අපායොත්පත්ති හැරවූවා නම් සත්ත්වොපකාර ය නිසා හෙයින් තමා ත් සත්ත්වොපකාර නිරත ව—

**කණ්ඩහාල** ජාතකයෙහි ඛණ්ඩහාල නම් පුරොහිත බමුණු යන්තම් කට යුත්තෙකින් නිරපරාධ බෝසතුන් කෙරෙහි බද්ධ ආඝාත ඇති ව තෝරා ලා කිරීම යුක්ත නො වන හෙයින් නිරපරාධ බොහෝ දෙනා ත් එක් කොට ගෙණ යාග පිට ලා ලා කරන්ට සිතූ අවැඩ උඩු සුළඟ සිට දමා ලූ හළු ආදි ය දැමුවන් ඇඟට ම යන්නා සේ ඛණ්ඩහාලයන්ට ම පැමිණි හෙයින් එ බන්දෙක නො හැසිර අනුන්ට වැඩෙහි හැසිරීමෙන් ඒ වැඩ ගොන් මැස්සා දැමු දැමුසේ දැමුවන් කරා ම යන්නා සේ තමා කරා පමුණුවා ගෙණ—

**භූරිදත්ත** ජාතකයෙහි භූරිදත්ත නම් නා රජ ව උපන් බෝසත්හු පෙහෙවස් නිසා සොපද්‍රව වූ මිනිස් ලොවට ගොසින් පාම්බට්ටියකුට සම්භව ව කෙළවා ඇවිදිනා ගමනේ සුදර්ශන නම් බෑණන් හා එක පියන්ට ද අච්චිමුඛී නම් නැඟණියන් දැක ලජ්ජා වූවා සේ පාපයෙහි ලජ්ජා ඇති ව—

**නිමි** ජාතකයෙහි නිමි රජ ව උපන් බෝසතුන් කලාර ජනක රජහු[1] සිඳ පූ දනප්‍රවෙණි ය පෙරළා පවත්වා ලූවා සේ කරන්නවුන් නැති වීමෙන් අපවත් ව තුබූ කුශල ය පවත්වමින්—

**සාම** ජාතකයෙහි සාම බෝසතුන් ඇස් නැති දෙ මවු පියන් රක්කා සේ රකින්නත් ඇති ව මුත් තමා ම තමාට නො රැකෙන කුසල් ධම් රැක ගෙණ—

**මහා ජනක** ජාතකයෙහි මහා ජනක රජ්ජුරුවන් නැඟී නැව නට ත් එ තෙර වන්ට සත් දවසක් මූද පීනූවා සේ පින් කිරීමෙන් සසර සයුරෙන් එ තෙර වන්ට වීර්‍ය්‍ය ඇති ව—

**මූගපක්ඛ** ජාතකයෙහි තෙමිය බෝසතුන් ජාති සිහි කරණ නුවණින් එක් කලෙක බරණැස රජ ව ඉපැද විසි හවුරුද්දක් දැහැමෙන් සෙමින් රජ කොට අසූ දහසක් හවුරුදු ඔසුපත් පැසුණු නියා ව දැක රජ කම් කිරීමට මැළි ව නො ගොළු ව ගොළු ලෙසින්

1 රජ කරණ රජහු

Non-Commercial Distribution

හා නො බිහිරි ව බිහිරි ලෙසින් හා නො පිළි ව පිළි ලෙසින් හා සොළොස් පැයක් විවර ත් අනුන්ට බැරි වූවා සොළොස් හවුරුද්දක් දවස් යවා නිෂ්ප්‍රයොජන එකෙකැ'යි අමු සොහොනෙක වළ ලන්ට යවු තැන එ ලෙසින් රජ ගෙය නමැති සිර ගෙන් ගැලවී ගෙණ රාජ්ජ ය කිරීමට ගොළු—බිහිරි—පිළි වුව ත් තපසට පැමිණෙනු නිසා එ හැම නැති ව මහ වල් වැද මහණ ව අභිඥලාභී වූවා සේ ම සියලු පවු හැර කුසල්හි පිහිටා 'චිත්ත ශුද්ධි ය කර තො ත් අදක ර්යෙක නො ව වල් සොරුන් පරිද්දෙන් අනන්ත කාලයෙක සතුරු ව ආ කෙලෙස් සතුරන් නසා නිවන් රට සාධා මුත් බැරි ය. නිවන් රට ත් කෙලෙස් සතුරන් නසා මුත් සාධා ලිය නො හැක්ක.

———

## 340. සංක්ෂිප්ත ගෞතම බුද්ධ චරිතය

කෙලෙස් සතුරන් හා සටන ත් ප්‍රයොග බලයකින් මුත් නිකම් ඝට නො හැක්ක යි සිතා සමථ භාවනා විදර්ශනා භාවනා නමැති යුද්ධ ප්‍රයොග ත් දැන ගෙණ කෙලෙස් නමැති සතුරන් විදිනා අකුසල් නමැති හී දඩු ඇඟ වැද නො ගන්නා නිසා සිල් නමැති සන්නාහ ලා ගෙණ නුවණ නමැති අසුන් නැඟී සමථ හස්තයෙන් අර්පණා ඵලක ය විදර්ශනා හස්තයෙන් මාර්ග ඥාන නමැති කඩුව හැර ගෙණ බල ධර්ම නමැති සෙනඟ පිරිවරා කෙලෙස් රණ බිම් වැද කෙලෙස් සතුරන් නසා අසංඛ්‍ය ගණනු ත් රඳා හිඳිනට අවසර ඇති නිවන් රට සාධා ගෙණ සාධා ගත් නිවන් රට පිහිටි සිවු පිරිසිදු සිල් නමැති කෙලෙස් සතුරන් වැද්ද නො හැකි අගළ ඇති සවිතර්ක සවිචාර සමාධි ය, අවිතර්ක අවිචාර සමාධි ය, සප්‍රීතික සමාධි ය, නිෂ්ප්‍රීතික සමාධි ය, උපචාර සමාධි ය, අර්පණා සමාධි ය, මාර්ගසමාධි ය, ඵලසමාධි ය යි කියන ලද සමාධි නමැති බඹ ලොවට වුව ත් උස ඇති මහ පවුරක් ඇති, චතුර් විධ වූ ආර්ය්‍ය මාර්ග නමැති වාසල් සතරක් ඇති, ඵල සම වත් නමැති අට්ටාල ඇති, සිහිවටන් නමැති වීථි ඇති චතුරාර්ය්‍ය සත්‍ය නමැති අංගාණ ඇති, සත් තිස් බොධි පාක්ෂික ධර්ම නමැති රුවන් තබා විකුණන සල්පිල් ඇති—

අබුද්ධොත්පාද කාලයෙක සිස් ව ත් බුද්ධොත්පාද කාලයෙක අරි පුහුලන් ගෙන් පිරී සිටිනා නිවන් මහ නුවරට වදනා ගමන සර්වඥ නමැති හිමාලය පර්වතයෙන් හී නිවන් මහ මුහුදට ගොසින් වන් අෂ්ටාංගික මාර්ග නමැති පැණින් පිරුණු පර්ය්‍යාප්ති-ප්‍රතිපත්ති නමැති මෙ තෙරක් ඇති, ප්‍රතිවෙධ නමැති එ තෙරක් ඇති, සද හම් නමැති මහ ගඟින් නා පියා චතුර් විධ ආර්ය්‍ය මාර්ග නමැති වාසල්වලින් වැද විවසුන් මහ වෙය හොස්සේ ගොසින් එම

Non-Commercial Distribution

නිවන් නුවර පිහිටි විවසුන් නමැති තීර ලෙබා ඇති, අෂ්ටාංගික මාර්ග ජලයෙන් පිරී සිටිනා පඤ්චවිධ විමුක්ති නමැති පස් පියුමෙන් සුසන්තර සිහිවටන් ආදී වූ දහම් නමැති මසුන් ඇති, නිවන් පොකුණේ පැන් බී ගෙණ, හිරි-ඔතප් නමැති සළු හැඳ, සිල් නමැති සුවඳ විලවුන් ගෙණ, ශ්‍රද්ධාදී ගුණ ධර්ම නමැති ආභරණ ලා සැරහී ගෙණ, බල ධර්ම නමැති සෙනඟ පිරිවරා, දහසක් නය නමැති ඇමැත්තන් පිරිවරා, මෙත්තා කරුණාදී ගුණ ධර්ම නමැති පුරඟනන් හා සමඟ, කුශල ධර්ම නමැති හට්ට වරුන් ලවා, කීර්ති නමැති ආශීර්වාද කරවමින් එ නුවර පිහිටි ඉද්ධිපාද නමැති වැම් ඇති, සෘධි ය නමැති ජේකඩ ඇති, ආයතන නමැති දූව වළලු ඇති, ධාතු නමැති පෝරු ඇති, සෙසු ත් ලොවුතුරා දහම් නමැති සහල සහාලියම් උඩුමාල් පා ගොනැස් පූට්ටු ආදි ය ඇති, නව ලොවුතුරා දහම් නමැති නව මාල් පායේ අට වැනි මාලට නැඟී ලා—

තුන් ලෝ පතල කීර්ති නමැති ධවලච්ඡත්‍ර ය යට පනවන ලද අර්හත් ඵල විමුක්ති යහනෙහි හිඳ ප්‍රත්‍යය සන්නිශ්‍රිත ශීලයෙහි ධැමින් සෙමින් උපන් සතර පසයෙහි ලොභ-ද්වෙෂ-මොහ දුරු කොට නා මනා මඳ බොහෝ නො ඉල්වා සසර කතර ගෙවන්ට කාරණ සලකා පස් විකීමෙන් අපගේ බුදුහු ගිහි අවස්ථාවෙහි පිය මහ රජුන් විසින් කරවා දුන් රම්ම ය, සුරම්ම ය, සුභ ය යන මාළිගා තුනෙහි බිම්බා බිසොවුන් ප්‍රධාන වූ සතළිස් දහසක් පුරහනන් පිරිවරා ශක්‍ර සම්පත් විඳ කුසී ව මිනිස් සම්පත් විඳිනට බට ශක්‍ර දෙවේන්ද්‍ර ලීලාවෙන් විසි නව හවුරුද්දක් ගිහි සැප ත් වළඳා මහණ වීම් කල් යන හෙයින් පැරුම් නමැති රජ දරු වන් ගෙන් මහණ වන්ට විධානයේ ආ බාල කෙණකු මෙන් බිම්බා බිසොවුන් කුසින් රහල් කුමරුන් උපන් දවස් ම අස් වාහනයකින් ගොසින් මහණ ව සාවුරුද්දක් බුදු වන්ට වීර්‍ය්‍ය කොට බුදු වන තැනට—

බුදු වන දවස් කිරි බතක් දෙමි පතා කප් ලක්ෂයක් පින් කළා වූ සෙනානී නම් නියම් ගම සිටාණන්ගේ දූ වූ සුජාතා නම් වූ සිටු දූවණියන් පිසන කිරි බතට කිරි සන කරණු නිසා දෙනුන් දහසක් සතියක් මුළුල්ලෙහි වැල්මී වෙනෙහි කවා ගෙට බණවා ගෙණ දහස දෙ භාග කොට පන් සියයක් දෙනුන්ගේ කිරි දෙවා ගෙණ අනික් දෙනුන් පන් සියයට පොවා පියා කිරි පූ දෙනුන් පන් සිය ය තව ත් සතියක් වැල්මී වෙනෙහි කවා ගෙට බණවා ගෙණ පන් සිය ය දෙ භාග කොට දෙනුන් දෙ සිය පනසකගේ කිරි

දෙව ගෙණ අනික් දෙසිය පනස පොවා පියා කිරි පූ දෙනුන් දෙසිය පණස තව ත් සතියක් වැල්මී වෙනෙහි කවා ගෙට බණවා ගෙණ දෙ සිය පණස දෙ භාග කොට එක් සිය පස් විස්සක් දෙනුන් ගේ කිරි දෙව ගෙණ අනික් එක් සිය පස් විස්ස පොවා පියා කිරි පූ දෙනුන් තව ත් සතියක් වැල්මී වෙනෙහි කවා ගෙට බණවා ගෙණ එක් සිය පස් විස්ස දෙ භාග කොට දෙ සැටක් හා තෙ සැටක් තෝරා ලා දෙනුන් තෙ සැට දෙනාගේ කිරි දෙව ගෙණ දෙ සැටක් දෙනුන් පොවා පියා කිරි පූ දෙනුන් දෙ සැට දෙනා තව ත් සතියක් වැල්මී වෙනෙහි කවා ගෙට බණවා ගෙණ දෙ සැට දෙනා සම භාග කොට එක් තිස් දෙනකුගේ කිරි දෙව ගෙණ අනික් එක් තිස් දෙනා කිරි පොවා ලා—

කිරි පූ දෙනුන් එක් තිස් දෙනා තව ත් සතියක් වැල් මී වෙනෙහි කවා ගෙට බණවා ගෙණ සම භාග ව බැරි හෙයින් පස ළොසක් හා සොළසක් තෝරා ලා සොළොස් දෙනාගේ කිරි දෙව ගෙණ දෙනුන් පසළොස් දෙනාට පොවා ලා, කිරි පූ දෙනුන් පස ළොස් දෙනා තව ත් සතියක් වැල්මී වෙනෙහි කවා ගෙට බණවා ගෙණ සත් දෙනකු හා අට දෙනකු තෝරා ගෙණ අට දෙනාගේ කිරි දෙව ගෙණ දෙනුන් සත් දෙනාට පොවා ලා, කිරි පූ දෙනුන් සත් දෙනා තව ත් සතියක් වැල්මී වෙනෙහි කවා ඒ දෙනුන් සත් දෙනා ගෙට බණවා ගෙණ දෙනුන් පත් සියයකගේ කිරි ත් දෙසිය පණසකගේ කිරි ත් එක් සිය පස් විස්සකගේ කිරි ත් දෙ සැටක් දෙනුන්ගේ කිරි ත් එක් තිස් දෙනාගේ කිරි ත් සොළොස් දෙනකු ගේ කිරි ත් අට දෙනකුගේ කිරි ත් ය යි නව සිය තෙයානුවක් වන ගණනේ දෙනුන්ගේ කිරි ස පණස් දවසක් ඇතුළත මේ දෙනුන් සත් දෙනා පූ හෙයින් කිරි ඝන වූ හෙයිනු ත් පිට පිට හෙළා පණස් දවසක් වැල්මී වෙනෙහි කෑමෙන් මියුරු වූ හෙයිනු ත් ඒ දෙනුන් සත් දෙනාගේ කිරින් පිස පිළිගන්වන ලද කිරි බත් වෙසඟ මැදි පොහෝ දවස් වළඳා ලා බුදු වූ සේක.

ඔබ උපන් නුවර කිඹුල් වත් නම. පිය මහ රජහු සුදෙවුන් නම්හ. මවු බිසවු මහාමායා නම්හ. දකුණ ත් සවු නම සැරියුත් නම් සේක. වම ත් සවු නම මුගලන් නම් සේක. උපස්ථායක නම ආනඳ නම් සේක. අග්‍ර ශ්‍රාවිකා කැනින් දකුණ ත් සවු නම ඛෙමා නම්හ. වම ත් සවු නම උපුල්වන් නම්හ. බෝධි වූයේ ඇසතු ගසෙක. බ්‍යාමප්‍රභා මණ්ඩල ය එකි එ කී අතින් බඹ ය බඹ ය ඔබාදීන් සොළොස් රියනෙක පැතිර සිට්ටී. ඔබ තමන්

Non-Commercial Distribution

වහන්සේ අටළොස් රියන් සේක. බුදු ව හවුරුදු පන් සාළිසක් ජීවත් වූ සේක.

## 341. කාශ්‍යපාදී සූවිසි බුදුවරයන්ගේ සංක්ෂිප්ත ජීවන චරිත

1 කසුබ් බුදුන් උපන් නුවර බරණැස් නම. පිය වූ බමුණු උතුමාණෝ බ්‍රහ්මදත්ත නම්හ. මවු බ්‍රාහ්මණීහු ධනවතී නම්හ. දකුණත් සවු නම තිස්ස නම් සේක. වමත් සවු නම භාරද්වාජ නම් සේක. උවටා නම සබ්බමිත්ත නම් සේක. අග්‍රශ්‍රාවිකා තැනින් දකුණත් සවු නම අනුලා නම්හ. වමත් සවුනම උරුවෙලා නම්හ. බෝධි වූයේ නුග ගසෙක. උසින් වඩුවෙන් විසි රියන් වන සේක. බුදු ව විසි දහසක් හවුරුදු ජීවත් වූ සේක.

2 කොණාගමන නම් බුදුන් උපන් නුවර සොභවතී නම්හ. පිය වූ බමුණු උතුමාණෝ යඤ්ඤදත්ත නම්හ. මවු බැමිණියෝ උත්තරා නම්හ. අග සවු දෙනමින් දකුණත් සවු නම භියස[1] නාම සේක. වමත් සවු නම උත්තර නම් සේක. උවටා තෙරුන් වහන්සේ සොත්ථිජ නම් සේක. අග්‍රශ්‍රාවිකා තැනින් දකුණත් සවු මෙහෙණින්නෝ සමුද්ද නම්හ. වමත් සවු මෙහෙණින්නෝ උත්තරා නම්හ. බෝධි වූයේ දිඹුල් ගසෙක. ඒ බුදුහු උසින් තිස් රියන් සේක. බුදු ව තිස් දහසක් හවුරුදු ජීවත් වූ සේක.

3 කකුසඳ බුදුන් උපන් නුවර ඛෙම නම. පියවූ බමුණු උතුමාණෝ අග්ගිදත්ත නම්හ. මවු බැමිණියෝ විශාඛා නම්හ. විධුර නම් තෙරුන් වහන්සේ දකුණත් සවු සේක. සංජීව නම තෙරුන් වහන්සේ වමත් සවු සේක. උපස්ථායක නම බුද්ධිජ නම් සේක. සාමා නම් මෙහෙණින්නෝ දකුණත් සවු වූහ. වමත් සවු මෙහෙණින්නෝ චම්පා නම්හ. බෝධි වූයේ මහරි ගසෙක. උසින් සතළොස් රියන් උස ඇති සේක. බුදු ව සතළිස් දහසක් හවුරුදු ජීවත් වූ සේක.

4 වෙස්සභූ නම් බුදුන් උපන් නුවර අනුපම නම. පිය මහ රජහු සුප්පතීත නම් හ. මවු බිසවු යසවතී නම්හ. සොණ නම තෙරුන් වහන්සේ දකුණත් සවු වූහ. වමත් සවු නම උත්තර නම් සේක. උවටා තෙරුන් වහන්සේ උපසන්ත නම් සේක. දමා නම් වූ ත් සමලා නම් වූ ත් මෙහෙණින්නෝ දෙන්නෙක් අග්‍රශ්‍රාවිකා වූහ. බෝධි වූයේ මහ සල් ගසෙක. උසින් සැටරියන් සේක. බුදු ව සැට දහසක් හවුරුදු ජීවත් වූ සේක.



Non-Commercial Distribution

5 සිඛී බුදුන් උපන් නුවර අරුණවතී නම. පිය මහ රජහු අරුණ නම. මවු බිසව ප්‍රභාවතී නම්හ. අභිභූ නම් තෙරුන් වහන්සේ දකුණත් සවු සේක. සම්භව නම් තෙරුන් වහන්සේ වමත් සවු සේක. උවටා තෙරුන් වහන්සේ ඛෙමඞ්කර නම් සේක. අඛිලා ය, පදුමා ය යන මෙහෙණින්නෝ දෙන්නෙක් අග්‍ර ශ්‍රාවිකා වූහ. ඔබට බෝධි වූයේ ඇටඹ ගසෙක. සැත්තෑ රියන්, පමණ උස ඇති සේක. බුදු ව සැත්තෑ දහසක් හවුරුදු ජීවත් වූ සේක.

6 විපස්සී බුදුන් උපන් නුවර බන්ධුමතී නම. පිය මහ රජහු බන්ධුමා නම්හ. මවු බිසවු බන්ධුමතී නම්හ. ඛන්ධ ය – තිස්ස ය යන තෙර සඟළෙක් අග සවු වූ සේක. අසොක නම් තෙරුන් වහන්සේ උපස්ථායක සේක. චන්ද්‍රා ය – චන්‍ද්‍රමිත්තා ය යන මෙහෙණින්නෝ දෙන්නෙක් අග්‍ර ශ්‍රාවිකා වූහ. ඔබට බෝධි වූයේ පළලු ගසෙක. ඔබ උසින් අසූ රියනක් වූ සේක. බුදු ව අසූ දහසක් හවුරුදු ජීවත් වූ සේක.

7 ඵුස්ස බුදුන් උපන් නුවර කසී නම. පිය මහරජහු ජයසේන නම්හ. මවු බිසවු සිරිමා නම්හ. සුරක්ඛිත ය-ධම්මසේන ය යන තෙර සඟළෙක් අග සවු වූ සේක. උපස්ථායක තෙරුන් වහන්සේ සභිය නම් සේක. සාලා ය–උපසාලා ය යන මෙහෙණින්නෝ දෙන්නෙක් අග්‍ර ශ්‍රාවිකා වූහ. බෝධි වූයේ ඇඹුලු ගසෙක. ඔබ අට පණස් රියන් උස ඇති සේක. බුදු ව අසූ දහසක් හවුරුදු ජීවත් වූ සේක.

8 තිස්ස බුදුන් උපන් නුවර ඛෙම නම පිය මහ රජහු ජනසන්ධ නම් හ. මවු බිසවු පදුමා නම්හ. බ්‍රහ්මදෙව ය– උදය ය යන තෙර සඟළෙක් අග සවු සේක. සමඞ්ග නම් තෙර කෙණකුන් වහන්සේ උපස්ථායක සේක. ඵුස්සා ය–සුදත්තා ය යන මෙහෙණින්නෝ දෙන්නෙක් අග්‍රශ්‍රාවිකා වූහ. බොධි වූයේ පියා ගසෙක. ඔබ උසින් සැට රියන් වූ සේක. බුදු ව හවුරුදු ලක්‍ෂයක් ජීවත් වූ සේක.

9 සිද්ධාත්‍ථ බුදුන් උපන් නුවර වේභාර නම. පිය මහරජහු උදෙන නම්හ. මවු බිසවු සුඵස්සා නම්හ. සම්බල ය- සුමිත්ත ය යන තෙර සඟළෙක් අග සවු සේක. උවටා තෙරුන් රෙවත නම් සේක. සීලවා ය සුරාමා ය යන මෙහෙණින්නෝ දෙදෙනෙක් අග්‍රශ්‍රාවිකා වූහ. ඔබට බොධි වූයේ කිහිරි ගසෙක. සැට රියන් විවර උස ඇති සේක. හවුරුදු ලක්‍ෂයක් ජීවත් වූ සේක

Non-Commercial Distribution

10 ධම්මදස්සි බුදුන් උපන් නුවර සරණ නම. පිය මහ රජහු ත් සරණ නම්හ. මවු බිසවු සුනන්ද නම්හ. පදුම ය – ඵුස්සදේව ය යන තෙර සඟළෙක් අග සවු සේක. උවටා තෙරුන් වහන්සේ සුනෙත්ත නම් සේක. ඛෙමා ය – සබ්බනාමා ය යන මෙහෙණින් නෝ දෙ දෙනෙක් අග්‍ර ශ්‍රාවිකා වූහ. ඔබට බොධි වූයේ රත් කරව් ගසෙක. උසින් අසූ රියන් සේක. හවුරුදු ලක්‍ෂයක් ජීවත් වූ සේක.

11 අත්ථදස්සි බුදුන් උපන් නුවර සොභන නම. පිය මහ රජහු සාගර නම්හ. මවු බිසවු සුදස්සනා නම්හ. සන්ත ය — උපසන්ත ය යන තෙර සඟළෙක් අග සවු සේක. උවටා තෙරුන් වහන්සේ අභය නම් සේක. ධම්මා ය – සුධම්මා ය යන මෙහෙණින්නෝ දෙ දෙනෙක් අග්‍ර ශ්‍රාවිකා වූහ. ඔබට බෝධි වූයේ සපු ගසෙක. අසූ රියන් පමණ උස ඇති සේක. හවුරුදු ලක්‍ෂයක් ජීවත් වූ සේක.

12 පියදස්සී බුදුන් උපන් නුවර සුධඤ්ඤ නම. පිය මහ රජහු සුදත්ත නම්හ. මවු බිසවු චන්ද්‍රා නම්හ. පාලිත ය – සබ්බදස්සි ය යන තෙර සඟළෙක් අග සවු සේක. උවටා තෙරුන් වහන්සේ සොභිත නම් සේක. සුජාතා ය-ධම්මදින්නා ය යන මෙහෙණින් නෝ දෙ දෙනෙක් අග්‍ර ශ්‍රාවිකා වූහ. බොධි වූයේ කුඹුක් ගසෙක. අසූ රියන් විවර උස් වූ සේක. අසූ දහසක් හවුරුදු ජීවත් වූ සේක.

13 සුජාත නම් බුදුන් උපන් නුවර සුමඞ්ගල නම. පිය මහ රජහු උග්ගසෙන නම්හ. සුදස්සන ය-දෙව ය යන තෙර සඟළෙක් අග සවු වූ සේක. උවටා තෙරුන් වහන්සේ නාරද නම් සේක. නාගා ය – නාගසමාලා ය යන මෙහෙණින්නෝ දෙ දෙනෙක් අග්‍ර ශ්‍රාවිකා වූහ. ඔබට බොධි වූයේ මහ හුණ ගසෙක. ඒ බුදුහු පණස් රියන් උස ඇති සේක. අනූ දහසක් හවුරුදු ජීවත් වූ සේක.

14 සුමෙධ බුදුන් උපන් නුවර සුදසුන් නම. පිය මහ රජහු සුදත්ත නම්හ. මවු බිසවු සුදත්තා නම්හ. සරණ ය – සබ්බකාමී ය යන තෙර සඟළෙක් අග සවු සේක. උවටා තෙරුන් වහන් සේ සාගර නම් සේක. රාමා ය – සුරාමා ය යන මෙහෙණින් නෝ දෙ දෙනෙක් අග්‍ර ශ්‍රාවිකා වූහ. ඔබට බොධි වූයේ බක්මී ගසෙක. අට අසූ රියන් පමණ උස ඇති සේක. අනූ දහසක් හවුරුදු ජීවත් වූ සේක.



Non-Commercial Distribution

15 පියුමතුරා බුදුන් උපන් නුවර හංසවතී නම. පිය මහ රජහු ආනන්‍ද නම්හ. මවු බිසවු සුජාතා නම්හ. දෙවල ය - සුජාත ය යන තෙර සඟළෙක් අග සවු සේක. උවටා තෙරුන් වහන්සේ සුමන නම් සේක. අමිතා ය - අසමා ය යන මෙහෙණින්නෝ දෙ දෙනෙක් අග්‍ර ශ්‍රාවිකා වූහ. සළල රුකෙක් බෝධි වි ය. ඔබ තමන් වහන්සේ අට පණස් රියන් උස ඇති සේක. දෙ වුර හස්ස අටළොස් රියන. නළල පස් රියන. අතුල් දෙක ත් එකොළොස් එකොළොස් රියන.

ඔබට ආයු හවුරුදු ලක්‍ෂයක් හෙයින් ඒ හවුරුදු ලක්‍ෂ ය මුළුල්ලෙහි ම යම් තැනකට වඩිතො ත් ශ්‍රී පාද ය පිළිගන්ට පොළොව පළාගෙණ නැගෙන සුදු පියුමෙහි ත් රත් පියුමෙහි ත් ආස[1] සිටිනා මහ පෙතී අනූ රියනෙක. කෙසුරු තිස් රියන. එ කි එකී පියුමෙහි රේණු නව කළයක් විවර ය. එකොළොස් රියන් පතුල් වලින් දෙළොස් රියන් පියුම් කෙමි නො විසිර රත් මර වැඩිවල සිටියා සේ වැඩ සිටි කලට නව කළයක් විවර රේණු ශ්‍රී පාදයෙ පවන් සිරස දක්වා රන් පිළිමයක හිඟුල් රෙඛා දෙන්නා සේ නැඟී ලා පෙරළා පියුමට බැස ගන්නි. වඩනා යම් තැනකට පියුම මත්තෙන් ම වඩනා හෙයින් ඔබට ම එ නම තරම.

16 නාරද බුදුන් උපන් නුවර ධඤ්ඤවතී නම. පිය මහ රජහු සුදෙව නම්හ. මවු බිසවු අනොමා නම්හ. භද්දසාල ය - ජිත මිත්ත ය යන දෙ නමක් අග සවු සේක. උවටා තෙරුන් වහන් සේ වාසෙට්ඨ නම් සේක. උත්තරා ය-එග්ගුනී ය යන මෙහෙණින්නෝ දෙ දෙනෙක් අග්‍ර ශ්‍රාවිකා වූහ. බෝධි වූයේ මුරුත ගසෙක. ඔබ වූ කලි උසින් අටාසූ රියන් වූ සේක. අනූ දහසක් හවුරුදු ජීවත් වූ සේක.

17 පදුම බුදුන් උපන් නුවර රම්මක නම. පිය මහ රජහු අසම නම්හ. මවු බිසවු අසමා නම්හ. සාල ය-උපසාල ය යන තෙර සඟළෙක් අග සවු සේක. වරුණ නම් තෙර කෙණකුන් වහන් සේ උවටා සේක. රාමා ය-සුරාමා ය යන මෙහෙණින්නෝ දෙ දෙනෙක් අග්‍ර ශ්‍රාවිකා වූහ. ඔබට බෝධි වූයේ හුණ ගස ය. උසින් අට පණස් රියන් විතර උස ඇති සේක. හවුරුදු ලක්‍ෂයක් ජීවත් වූ සේක.

18 අනොමදස්සී බුදුන් උපන් නුවර චන්‍දවතී නම. පිය රජහු යසවා නම්හ. මවු බිසවු යසොධරා නම්හ. නිසභ ය - අනොම ය යන තෙර සඟළෙක් අගසවු වූ සේක. සුන්‍දරී ය - සුමනා ය යන

1. අස

Non-Commercial Distribution

මෙහෙණින්නෝ දෙ දෙනක් අග්‍ර ශ්‍රාවිකා වූහ. බොධි වූයේ කුඹුක් ගසෙක. ඔබ උසින් අට පණස් රියන් සේක. හවුරුදු ලක්‍ෂයක් ජීවත් වූ සේක.

19 සොභිත බුදුන් උපන් නුවර සුධම්මා නම. පිය මහ රජහු ත් සුධර්ම නම්හ. මවු බිසොවු ත් සුධර්‍මා නම්හ. අසම ය සුනෙත්ත ය යන තෙර සඟලෙක් අග සවු වූ සේක. උවටා තෙරුන් වහන්සේ අනොම නම් සේක. නකුලා ය සුජාතා ය යන මෙහෙ ණින්නෝ දෙ දෙනෙක් අග්‍ර ශ්‍රාවිකා වූහ. ඔබට බොධි වූයේ නා ගසෙක. ඒ බුදුහු අට පණස් රියන් සේක. අනූ දහසක් හවුරුදු ජීවත් වූ සේක.

20 රෙවත බුදුන් උපන් නුවර සුධඤ්ඤක නම. පිය මහ රජහු විපුල නම්හ. මවු බිසවු විපුලා නම්හ. වරුණ ය, බ්‍රහ්මදෙව ය යන තෙර සඟලෙක් අග සවු සේක. සම්භව නම් තෙර කෙණකුන් වහන්සේ උවටා සේක. භද්දා ය, සුභද්දා ය යන මෙහෙණින්නෝ දෙ දෙනෙක් අග්‍ර ශ්‍රාවිකා වූහ. ඔබට ත් බොධි වූයේ නා ගසෙක. ඔබ වූ කලි අසූ රියන් සේක. සැට දහසක් හවුරුදු ජීවත් වූ සේක.

21 සූමන බුදුන් උපන් නුවර මෙඛලා නම. පිය මහ රජුහු සුදත්ත නම්හ. මවු බිසවු සිරිමා නම්හ. සරණ ය, භාවිත ය යන තෙර සඟලෙක් අග සවුවූ සේක. උවටා තෙරුන් වහන්සේ උදෙන නම් සේක. සොණා ය, උප සොණා ය යන මෙමෙහෙණින්නෝ දෙ දෙනෙක් අග්‍ර ශ්‍රාවිකා වූහ. ඔබට ත් බොධි වූයේ නා ගසෙක. උසින් අසූ රියන් සේක. අනූ දහසක් හවුරුදු ජීවත් වූ සේක.

22 මඞ්ගල බුදුන් උපන් නුවර උත්තර නම. පිය මහ රජහු ත් උත්තර නම්හ. මවු බිසවු ත් උත්තරා නම්හ. සුදෙව ය, ධම්ම සෙන ය යන තෙර සඟලෙක් අග සවු සේක. උවටා තෙරුන් වහන්සේ පාලිත නම් සේක. සීවලා ය, අසොකා ය යන මෙහෙණින්නෝ දෙ දෙනෙක් අග්‍ර ශ්‍රාවිකා වූහ. ඔබට ත් බොධි වූයේ නා ගසෙක. උසින් අටාසූරියන් සේක. අනූ දහසක් හවුරුදු ජීවත් වූ සේක.

23 කොණ්ඩඤ්ඤ බුදුන් උපන් නුවර රම්මවතී නම. පිය මහ රජහු සුනන්ද නම්හ. මවු බිසවු සුජාතා නම්හ. භද්දය, සුභද්ද ය යන තෙර සඟලෙක් අග සවු සේක. අනුරුද්ධ නම් තෙර කෙණ කුන් වහන්සේ උවටා සේක. තිස්සා ය, උපතිස්සා ය යන මෙහෙ ණින්නෝ දෙ දෙනෙක් අග්‍ර ශ්‍රාවිකා වූහ. ඔබට බොධි වූයේ සල් කලණ ගසෙක. අට අසූ රියන් පමණ උස ඇති සේක. හවුරුදු ලක්‍ෂයක් ජීවත් වූ සේක.

Non-Commercial Distribution

24 දිවකුරු බුදුන් උපන් නුවර රම්මවතී නම. පිය මහ රජහු සුදෙව නම. මවු බිසවු සුමේධා නම්හ. සුමඞ්ගල ය, තිස්ස ය යන තෙර සඟළෙක් අග සවු සේක. උවටා තෙරුන් වහන්සේ සාගත නම් සේක. නන්‍ද ය, සුනන්‍ද ය යන මෙහෙණින්නෝ දෙ දෙනෙක් අග්‍ර ශ්‍රාවිකා වූහ. ඔබට බොධි වූයේ පුලිල ගසෙක. උසින් ඔබ අටාසූ රියන් සේක. හවුරුදු ලක්‍ෂයක් ජීවත් වූ සේක.

## 342. බුද්ධ රශ්මි ප්‍රමාණය

මඞ්ගල බුදුන්ගේ ශරීරයෙන් නික්මුණු රස් අනූ දහසක් හවුරුදු මුළුල්ලෙහි දස දහසක් සක්වළ මුළුල්ලෙහි පැවැත්තේ ය. පියුමතුරා බුදුන්ගේ රස් නිරන්තර ව අට සාළිස් ගවු විතර වටින් පැතිර සිටියේ ය. විදර්ශී බුදුන්ගේ රස් වටින් අට විසි ගවුවෙක පැතිර සිටියේ ය. සිඛී බුදුන්ගේ රස් වටින් දොළොස් ගවුවෙක පැතිර සිටියේ ය. කකුසඳ බුදුන්ගේ රස් නිරන්තර ව වටින් සතළිස් ගවුවෙක පැතිර සිටියේ ය. අපගේ බුදුන්ගේ ඇඟින් නිකුත් රස් වටින් බඹ ය බඹයේ සිටිනේ ය. මෙ සේ වූ නියම ය සෙසු බුදුවරුන් වහන්සේට නැත.

## 343. දුෂ්කරක්‍රියා කාලප්‍රමාණය

තව ද දීපඞ්කර ය, කොණ්ඩඤ්ඤ ය, සුමන ය, අනෝමදස්සි ය, සුජාත ය, සිද්ධාර්ථ ය, කකුසඳ ය යන මේ බුදුවරහු දස මසක් ප්‍රධන් වීර්‍ය්‍ය කළ සේක. මඞ්ගල ය, සුමේධ ය, තිස්ස ය, සිඛී ය, යන මේ බුදුවරහු බුදු වනු නිසා අට අට මස වීර්‍ය්‍ය කළ සේක. රෙවත බුදුහු සත් මසක් වීර්‍ය්‍ය කළ සේක. සොභිත බුදුහු සාර මසක් වීර්‍ය්‍ය කළ සේක. පදුම ය, අත්‍ථදස්සි ය, විපස්සි ය, යන බුදුවරහු අට අට මස වීර්‍ය්‍ය කළ සේක. නාරද ය, පදුමුත්තර ය, ධම්මදස්සි ය, කාශ්‍යප ය, යන මේ බුදුවරහු සති ය සති ය වීර්‍ය්‍ය කළ සේක. පියදස්සි ය, ඵුස්ස ය, වෙස්සභූ ය, කොනාගම ය, යන බුදුවරහු ස මස ස මස, වීර්‍ය්‍ය කළ සේක. අපගේ බුදුහු සාවුරුද්දක් වීර්‍ය්‍ය කළ සේක.

## 344. අනාගත වංශ දේශනාව

නැවත බුද්ධ වංශ දෙශනා ගමනින් ම අනාගත වංශයට අව සර තුබූ සේක. එ හෙයින් සොළසාසැකි කප් සුවහසක් පැරුම් පුරා නිමවා තුසී පුරෙහි වසන මෛත්‍රී බෝසත්හු අපගේ බුදුන්ට පරමායු හවුරුදු සියය ක්‍රම ක්‍රමයෙන් පිරිහී පස්වා දහස ඉකුත් ව දස අවුරුදු වයසට ගොසින් පෙරළා ධර්‍ම සමාදනයෙන් ක්‍රම ක්‍රම

Non-Commercial Distribution

යෙන් වැඩී හවුරුදු අසංඛ්‍යයට ගොසින් පෙරළා ත් අධර්‍ම සමාදන ය නිසා ක්‍රම ක්‍රමයෙන් පිරිහී දඹ දිව වැස්සන්ට අසූ දහසක් විතර ආයු ඇති කල්හි මෙතේ බුදුහු බුදු වෙති. ඒ මහා පුරුෂ යාණන් විවරණ ලද්දේ කවර කලෙක ද යත්—

මෙතේ මහ බෝසත්හු තුමූ සොළසාසැකි කප් සුවහසකින් යට දඹ දිව එක් තරා නුවරෙක ප්‍රභාවත් නම් සක්විති රජ ව උපන්හ. එ කල ලෙව්හි මුහුතී නම් බුදු කෙණකුන් වහන්සේ බුදු ව දහම්සක පවත්වා නො එක් ලක්‍ෂ ගණන් මහණ ගණා පිරිවරා සත්‍වානුග්‍රහ කරණ සේක. ප්‍රභාවත් නම් සක් විති රජහු ද බුදුන් ලොව පහළ වූ නියාව අසා එක් සිය සිව් සාළිස් ගවුවෙක පැතිර සිටි සක්විති පිරිස් පිරිවරා බුදුන් කරා ගොසින් සක් රුවන බුදුන්ට පුද පියා බුදුන් වැද ගෙණ පිරිස් හා සමඟ එකත් පස් ව හිඳ බණ අසා පැහැද සක්විති සැප ත් හැර පියා ඒ බුදුන්ගේ සස්නෙහි මහණ ව රත්න තෙරුන් වහන්සේ ය යි යන නහොමද්ධ්‍ය ගත පුන් සඳ මෙන් ගුණ නුවණින් ප්‍රසිද්ධ ව අභිඥලාභී ව නිරායාස ව තිබෙන හෙයින් නිවන් දකින්ට පිළිවන් වුව ත් සසර දුක් ගෙණ සිටිනා බොහෝ සතුන් දැක කරුණා අදහසින් උන් හැම දෙනා සසර නමැති වළින් නගා නිවන් ගොඩ පිට ලනු නිසා බුදු බව පතා වීර්‍ය්‍යාධික ව දන් දීමෙහි ත් තර අදහස්. ඇති ව වසන සේක. එ කල ධර්‍ම සභා මණ්ඩපයෙහි රැස් ව හුන් වහන්දෑ මේ ස්ථවිරයන්ගේ තරම් ඉතා බලවත. මූ මතු ශක්‍ර වෙත් දෝ බ්‍රහ්ම වෙත් දෝ කුමක් වෙත් දෝ'යි කථා ඉපැද වූ සේක.

එ කල මුහුතී නම් බුදුහු සරහන ලද ධර්‍ම සෙබෙයි දහසක් රැසින් මුහුදු කුස බබලන හිරුමෙන් සවනක් රැසින් සියලු ධර්‍ම සෙබෙයි රන් රස ධාරා ඉස්නාක් මෙන් තරු කැල පිරිවැරූ පුන් සඳ මෙන් මහණ ගණා පිරිවරා පනවන ලද බුදු හස්නෙහි වැඩ හුන් සේක. සුපිපි රත් පියුම් වනයෙක හැසිරෙන පස් පැහැයෙකින් හොබනා බමරුන් ඉදන්නකු මෙන් පස් පැහැයෙකින් හොබනා ඇස් සහළින් මහණ පිරිස බලා ඒ වහන්දෑගේ අදහස් දැන සිවු දෑ සුවඳ පුරා ලූ කරඬුවෙක පිධානයක් හරන කලක් මෙන් මුඛ පද්ම ය විවෘත කොට බ්‍රහ්ම නාදයට ත් වඩා ශොභාමිත් වූ කට හඬින් වහන්දෑ බණවා ලා 'එම්බා මහණෙනි රත්න ය යන නමට තරම් ගුණ ඇති තෙල මහණ ලසු එකෙක් නො වෙ යි. බුදු බිජුවටෙක වැසි වලායෙකින් වැසී සිටියා වූ හිර මෙන් ද, වලා හස්සේ සැඟ වුණු පුන් සඳක් මෙන් ද, හළුවෙන්

Non-Commercial Distribution

සැඟවුණා වූ ගිනි කඳක් මෙන් ද, පසින් වැසී තුබූ මැණිකක් මෙන් ද, පොළොව යට තුබූ මහා නිධානයක් මෙන් ද, හවයෙන් වසා ගෙණ තිබෙන බුදු පැළයෙක.

ප්‍රබුද්ධාසන්න වූ පියුම් කැකුළක් මෙන් ද, යුගඳුරු මුදුනට ආසන්න වූ ළ හිරු මඬලක් මෙන් ද, වඩ දියට ආසන්න වූ යුගඳුරු පව්වක් මෙන් ද, බුදු වන්නට ආසන්න ව මාගේ ශාසනසෙහි අවුත් මහණ වූ මොහු රුවන් මහ නැවෙක ඇදී සිටිනා රන් ගල් වතක් මෙන් ද, සඳ මඬලට ලං වූ තරුවක් මෙන් ද, මහ මෙරට ආසන්න වූ යුගඳුරු පව්වක් මෙන් ද, මහ සඳුතක්හු ගාවා සිටියා වූ සඳුත් පැටවකු මෙන් ද, සක්විති කෙණකුන් ලඟ සිටි පුත් රුවනක් මෙන් ද, මහ බඹුට ලං වූ බ්‍රහ්ම පැටවකු මෙන් ද, මට ලං වූ මොහු එ සේ මෙ සේ කෙණෙක් නො වෙති. මතු එන දවස සොළසා සඞ්ඛ්‍ය කප් සුවහසක් ගිය කලට මෙත්තෙය්‍ය නම් බුදු වෙති'යි විවරණ දුන් සේක.

ඒ මහ බෝසත්හු ද මුහුත්ත නම් බුදුන්ගෙන් විවරණ ලදින් සොළසාසැකි කප් සුවහස් මුළුල්ලෙහි—

'දසතො පාරමී නත්ථි – දසතො නත්ථි ඌනකා,
අනූනා අනධිකා සබ්බා – පූරිතා දස පාරමී'.

යනු හෙයින් පැරුම් දස ය පාරමිතා, උප පාරමිතා, පරමාත්ථ පාරමිතා හෙයින් තිසක් කොට පුරා නිමවා දෙව් බඹුන්ගේ අයද මෙන් බුදු වන්ට මිනිස් ලොව උපදිත් නම් එකලට දඹ දිව කෙතුමතී නම් වූ රාජධානියෙක පහළ වෙයි. එ නුවර දිගින් අට සාළිස් ගවුවක් පමණ ය. පළලින් අටවිසි ගවුවක් පමණ ය. පිරිසිදු වූ අදහස් ඇති දෙවතා සමූහයක් වැනි වූ ජනයන්ගෙනු ත් ගහන ය. සතුරන්ගෙනු ත් එ නුවරට ක්‍ෂෙම හෙයින් කට හැක්කෙක් නැත. ධර්මයක් විනා අධර්මයකු ත් නැත. එ නුවර තබා රට දනවුව මුළුල්ලෙහි ත් නැත.

එ සේ වූ කෙතුමතී නුවර සතර මහා දිවයිනට නායක වූ සත් රුවනින් සමන්විත වූ සඞ්ඛ නම් සක්විති රජ්ජුරු කෙණෙක් වෙති. ඒ රජ්ජුරුවන්ගේ ශරීරයෙන් සඳුන් සුවඳ හම යි. බැණ නැඟි කල කටින් මහනෙල් මල් සුවඳ හමයි. කඩු ගත් දෙවියෝ සතර දෙනෙක් උන්ට රකවල් ගෙණ සිටිති. අහසින් යන්ට ශක්ති ඇත්තෝ ය.

Non-Commercial Distribution

ඒ කේතුමතී නම් නුවර සඞ්ඛ නම් සක්විති රජ්ජුරුවන් ගේ කුශලානුභාවයෙන් උන් වසන පරිද්දෙන් දිගිනු ත් පළලිනු ත් දෙ ගවු දෙ ගවු පමණ වූ උසින් සියක් ගවු පමණ වූ උස ඇති නොයෙක් ධජයෙන් ගැවසී ගත් ඉඳුනිල් මිණිමුවා සිවු මැදිරි කවුළු දෙර ඇති ශෙබියා වූ සත් රුවණ්මය මාළිගාවෙක් පහළ වෙයි. සඞ්ඛ නම් රජ්ජුරුවෝ එහි වෙසෙති.

ඒ සඞ්ඛ නම් සක්විති රජ්ජුරුවන්ට දෙවඟනන් වැනි මන හර රූ ධරන්නා වූ නො එක් ආභරණ පළන් නැටීම් ගී කීම් ආදි යෙහි දක්ෂ වූ සුවාසූ දහසක් විතර නළු ගැනු වෙති. පුතුන් දහසකට නායක අජිත කුමාර නම් පුතණු කෙණෙක් පරිනායක රත්න වෙති. ඒ රජ්ජුරුවන් යම් තැනකට නික්මුණු කලට ගසන පිඹින අය ත් අට සාළිස් ගවුවක් විතර පැතිර සිටිති. රන් සූත්‍ර ලා ශාන්ති කොට සිටිනා බ්‍රාහ්මණ පඞ්ක්ති සියක් ගවුවෙක පැතිර සිටිති. සව් බරණ ලා සැරහුණා වූ නො එක් වෙස් ගත් අමාත්‍ය මණ්ඩලයා එක් සිය දෙයානු ගවුවෙක පැතිර සිටිති.

සෙසු නිකම් පඞ්ක්ති තුන්සිය සැට ගවුවෙක පැතිර සිටිති. සිවුරඟ සෙනඟ ගවු දෙ දසක් විතර පැතිරී සිටිති. සතර දිග සුවාසූ කෙළ දහසක් පමණ බල ඇණි සිටිති. එ කලට දඹදිව සුවාසූ දහසක් විවර නුවර ඇති වෙයි. අනූ කෙළ ලක්ෂයක් විතර රජ දරුවෝ වෙති. උං හැම දෙන ම සඞ්ඛ නම් සක්විති රජුන්ට අනුව වෙසෙති. ඒ සඞ්ඛ නම් රජ්ජුරුවෝ මෙ තරම් ශ්‍රී සමෘද්ධි-යක් ඇති ව ඒ මාළිගාවේ වෙසෙති.

තව ද එ ම කෙතුමතී නම් නුවර—

තථාපි තස්මිං නගරෙ – නානා වීථී තහිං තහිං,
සුමාපිතා පොක්ඛරණී – රමණී යා සුපතිත්ථකා,
අච්ඡොදකා විප්පසන්නා – සාදු සීතා සුගන්ධිකා.

සමතිත්ථකා කාකපෙයයා – අථො වාලුකසන්ථතා,
පදුමුප්පල සඤ්ඡන්නා – සබ්බොතුකමනා'වටා.

යනු හෙයින් ධජ පතාකාදියෙන් හා පුන්කළස් මල් ඇගෑ ආදි යෙන් හා නිරන්තරව සරහා තිබෙන්නා වූ ඇත්-අස් ආදීන්ගෙන් හා ස්ත්‍රී පුරුෂ සමූහයාගෙන් පිරී සිටිනා වූ කස්තුරු කපුරු කළු වැල් ආදී වූ සුවඳ තබා විකුණන සුවඳ පිළින් හා දෑ සමන් බෝලිද්ද සිහිනිද්ද උපුල් මහනෙල් ආදී වූ මල් තබා විකුණන සල්පිළින් හා

Non-Commercial Distribution

සළු පිළි ආදී වූ පිළි තබා විකුණන පිළීසල් හා ඇල් වී ආදි ය තබා විකුණන ධාන්‍යාපණ වලින් හා මුතු මැණික් ආදී වූ රුවන් තබා විකුණන රත්නාපණ වලින් හා ඉතා හොබනා වූ මුතු පට හා සමාන වැල්ලෙන් තැවරී තිබෙන නො එක් වීථි ඇත.

තව ද කේතුමතී නම් රාජධානියෙහි කුසාවතී නම් නුවර සුදසුන් මහ රජුන්ගේ කුශලානුභාවයෙන් පහළ වූ පොකුණු මැවී ගියා සේ නෙත් සිත්කලු ඉවුරු හී තිබෙන්ට නැති බැවින් බස්නට පාසු ව තිබෙන සත් රුවන්මුවා රළපාණ ඇති, තව ද ප්‍රසන්න වූ සිහිල් වූ මිහිරි වූ පැන් ඇති ගොඩ හුන් කපුටුවන් තුඩ පොවා පිය හැකි තරම් හැම කල ම පිරී සිටිනා පියුම් ඉපුල් ආදියෙන් හා මහනෙල් මල් ආදියෙන් ගැවසී ගත් පොකුණු ත් එ නුවර ඒ ඒ තන්හි ඇත.

තව ද ඒ කේතුමතී නුවර හිසාරා සත් රුවන්මුවා පවුරු වළලු සතෙකු ත් පහළ වෙයි. පවුරු වළලු දෙකකට මධ්‍යයෙහි තල්පන්තියක් වන නියායෙන් තල් පන්ති සතෙකු ත් සත් රුවන්මුවා නුවර වටා පහළ වෙයි. ඉන් එක් තල් පන්තියෙක් රන්මුවා ය. එක් තල් පන්තියෙක් රිදීමුවා ය. එක් තල් පන්තියෙක් වෙරළු මිණිමුවා ය. එක් තල් පන්තියෙක් පිළිවහණමුවා ය. එක් තල් පන්තියෙක් රත් මැණික්මුවා ය. එක් තල් පන්තියෙක් මැසිරි ගල් මැණික්මුවා ය.

එක් තල් පන්තියෙක් සත්රුවන් මුවා ය. ඉන් රන්මුවා තල් පන්ති ය රන්මුවා පවුර ගාවා සිටිටි. රිදීමුවා තල් පන්ති ය රිදීමුවා පවුර ගාවා සිටිටි. මැණික් මුවා තල් පන්ති ය මැණික් මුවා පවුර ගාවා සිටිටි සත් රුවන්මුවා තල් පන්තිය සත් රුවන් මුවා පවුර ගාවා සිටිටි. ඉන් සත් රුවන්මුවා පවුර සැට රියනක් විතර උස ඇති ව මධ්‍යයෙහි සිටිටි. පවුරු තුනෙක් ඊට ඇතුළත ක්‍රම ක්‍රමයෙන් මිටී ව සිටිටි. පවුරු තුනෙක් ඊට පිටත ක්‍රම ක්‍රමයෙන් මිටි ව සිටිටි. තාලපන්ති උසින් අසූ රියන් පමණ උස ඇති.

"චතුක්කෙ නගරද්වාරෙ – කප්පරුක්ඛො භවිස්සති,
නීලං පීතං ලොහිතකඩකං – ඔදතඤ්ච පභස්සරං."

යනු හෙයින් වීථි කොන්වල ත් නුවර වාසල්ගාවා ත් පොළොව පළාගෙණ කප් රුක් නැංගේය. හේ කුමන කුශලයෙන් ද යත්—

Non-Commercial Distribution

කාලක කුළුපොතු දෙපුතු පිය කෙණෙක් දිඹුල් දණ්ඩෙන් ගෙයක් ඉදි කොට වස් සතෙක. පසේ බුදුවරුන් වහන්සේ සත් නමක් වස් වසවා උපස්ථාන ත් කොට සත් වස ම පිරිකර ත් දන් දී ඒ පින් කමින් දෙව්ලොව ඉපැද අනන්ත කාලයක් දෙව් සැප ත් විඳ ඒ දෙන්නා ගෙන් එක් කෙණෙක් සක් දෙව්දුගේ විධානයෙන් පණස් දහසක් හවුරුදු දූ දරු කෙණකුන් නැති හෙයින් දරුවන් පතා ජෙ ව හොත් සුමෙධා බිසොවුන් කුස සුරුචි රජ්ජුරුවන්ට ද ව ඉපැද මහා පනාද නම් රජ ව දිඹුල් දණ්ඩෙන් කළ ගෙය මත්තෙහි විපාක තව ම නිමන්ට නැති හෙයින් සක් දෙව්දුගේ නියොගයෙන් විස් කම් දෙව් පුත්හු මවා ලූ දිගින් පළලින් දෙ ගවු දෙ ගවු පමණ දිග පළල ඇති සියක් ගවු විතර උස ඇති සියක් මාල් ඇති මාළිගාවෙහි අසංඛ්‍යයක් හවුරුදු රජ සැප ත් විඳ පෙරළා අවුත් දෙව් ලොව ඉපැද සම්පත් විඳුනෝ අපගේ බුදුන් දවස නිවන් සම්පත් විඳිනා නිසා දෙව් ලොවින් අවුත් භද්දජි නම් සිටු පුත් ව සසුන් වැද මහණ ව රහත් වීමෙන් කළ පින් ගෙවා පිහ.

එක් ව පින් කළ අනික් නළකාර දෙව් පුත් දෙව් ලොව වැස මෙතේ බෝසතුන් බුදු වන්ට කේතුමතියෙහි උපදනාට පෙරා තු ව එ ම කේතුමතියෙහි සංඛ නම් සක් විති වෙයි. හුදක් මහාපනාද රජ්ජුරුවන්ගේ ම කුශලානුභාවයෙන් පහළ වුණු හෙයින් සංඛ නම් සක්විත්තනු ත් මුසු ව කළ පින් හෙයින් උන්ට ත් මැවුව මනා වේ දූ යි යන්නාක් මෙන් මහාපනාද රජ් ජුරුවන් නැති වන්නා ම තෙමේ ත් නැති නො ව ආසට පැන නැඟී ආයින් ගොසින් ගඞ්ගා නම් ගං පත්ලෙහි සැඟවී තිබී සංඛ නම් සක්විති රජ්ජුරුවන් කුළු පොතු අවස්ථාවෙහි දිඹුල් දණ්ඩෙන් කළ ගෙය ලසුව ත් පසේ බුදුවරුන් වහන්සේට ගන්වා ලීමෙන් පැවැති කුශලය ලසුනො වන නියාව ත් සංඛ නම් රජ්ජුරු වන් කුළු පොතු දෙ පුතු දෙන්නා ගෙන් අනික් තැනැත්තන් නියාව ත් හඟවන්නාක් මෙන් සියක් මාල් රුවන් පාය ගං පත් ලෙන් උඩ නැඟී මුබ අවුත් මෙ නුවර පිහිටි ය. කළ පින් කම් නම් ඒ ම නො වන හෙයින් තව ත් තව ත් ඇති හෙයින් ඒ පින් කම් විපාක අපි හඟවම්හ' යි යන්නාක් මෙන් මහ පොළොව පළා ගෙණ නුවර ඒ ඒ තැන කප් රුක් නැංග. ඒ කප් රුක්වලිනු ත් එහි වසන රජ්ජුරුවන් පටන් සියල්ලවුන්ගේ කුශලානුභාවයෙන් පහළ වූ හෙයින් දිව සළු ත් එහි ම ඇත. දිව ආභරණ ත් එහි ම ඇත. උපභොග පරිභොග වස්තු සොයා එහි වසන්නවුන් ඔබ්බකට ගිය මැනැවැ' යි නැත. ඒ සියල්ල ම එහි ම ඇත.

"තතො නගරමජ්ඣම්හි – චතුස්සාලං චතුම්මුඛං,
පුඤ්ඤකම්මාභිනිබ්බත්තො – කප්පරුක්ඛො භවිස්සති."

යනු හෙයින් නුවර මැද සිවුරැස් ව දොර සතරකු ත් ඇති ව තිබෙන්නා වූ ශාලාවෙකු ත් බොහෝ දෙනා රැස් ව සැතපී හිඳිනා නිසා ත් විසිතුරු වූ කර්මාන්ත කුශල නමැති වඩුවන් විසින් සකස් කොට ඉදිකරණ ලද ඒ ශාලා දොරකඩ පොළොව පළා ගෙණ කප් රුකෙක් නැංග. වීථි කොන් වල නැංගා වූ කප්රුකින්, වාසල් ගාවා නැගි කප්රුකින්, නුවර මැද නැංගා වූ කප් රුකින්, සිවුරැස් ශාලාව කෙරේ නැංගා වූ කප් රුකිනැ' යි මේ කප් රුක් මුළුල්-ලෙන් කපු පිළී තිහිරි පිළී ආදී වූ පිළී ත් කැමැති කැමැති යම් කෙණකුන්ට සම්භව වෙති. තව ද පැළැන්ද යුතු වූ මුත්හර තිසර සංබලා බාහුදණ්ඩි ආදි වූ ආභරණ ත් කප් රුක්වලින් ම සම්භව වෙ යි.

තව ද එකල සීයකින් වපකින් නො ව තෙමේ තමාට ම හටගත් රත් හැලෙයි එක කරලෙක වී දෙ දස් දෙ සිය දෙ සැත්තෑ යාළ සොළසාමුණු අට ලාසක් වන හෙයින් කුඹුරු විකක් නැත ත් කරලෙ දී ම දවසෙයයා නැති ව, කුඩු ත් නැති ව හැල් සාලේ බත් ම ඒ වක උපන් මිනිසුන්ට සෑහෙන්නේ ය.

ඒ කල ඒ කෙතුමතී නම් නුවර වසන සත්වයෝ ඒ ඒ තැන පහළ ව තිබෙන්නා වූ දෙව් ලොව නන්ද නම් පොකුණ සේ ශොභා මත් වූ පොකුණු වලින් ගැලී නා පියා කප් රුක්වලින් හෝ අනාහොත් නුවරින් ම නිරායාසයෙන් සම්භව වන සුවඳ විලවුන් ගෙණ මල් පැළඳ ගෙණ කප් රුක්වලින් තමන් තමන්ට අභිප්‍රාය වූ සළු සොළි පිළි හැඳ පියා අභිප්‍රාය ලෙසින් කැමැති කැමැති ආභරණ ත් පැළඳ ගෙණ නිරායාසයෙන් සම්භව වන සුවඳ හැල් සාලේ බතු ත් අනුභව කොට දිව යහන් වැනි වූ යහන් වලට වැදහෙත්නාහු, දෙවියන්ගේ ගී වැනි ගී අසන්නාහු, දෙව් දූන්ගේ නැටීම් වැනි නැටීම් බලන්නාහු, නිදා පියා නැවත ගී කියන හඬින් ම පිබිද රන් වැටවල ඇවිළෙන සුවඳ තෙල් පහන් ආලෝකයෙන් තමන්ගේ සම්පත් බලා සතුටු වන්නාහු, කයට සිතට පීඩාවක් නැති ව සුව සේ වෙසෙති.

මෙතේ බුදුන් උපදනා හෙයින් මේ තරමක් ඇත්තේ කෙතුමතී නුවර මතු නො වෙයි. දඹ දිව මුළුල්ලේ ත් ඒ තරමේ ම යහපත් වෙයි. කෙ සේ ද යත්– දස දහසක් යොදුන් දිග පළල ඇති

Non-Commercial Distribution

දඹ දිවින් මිනිසුන්ට ප්‍රයොජනවත් ව තිබෙන තැන නිෂ්කණ්ටක ය; සොර භයෙක් සතුරු භයෙක් තමා ම නැත. නොහොත් හැම තැන ම මොළොක් පහස් ඇති වැල්ලෙන් හා හී තණින් ගැවසී තිබෙන හෙයින් කොයි යත ත් පය ඇනෙන කටු කණු නැති, තව ද හළු ගා උඬෙර බැඳ ලබ්බ ගෙණ ඇවිදිනාවුන් නැති හෙයින් හෝ නොහොත් මිනිසුන් ගහණ ව සමෘද්ධ ව තිබෙන හෙයින් වල් ව තිබෙන්ට නැති හෙයින්, කටු කැලෑ ආදි ය නැති ව හෙළි ව තිබෙ යි. වළ ගොඩ නැති ව අතුල් තල මෙන් සමතල ව තිබෙයි. ධූලි නො නැගෙන්ට නිල් පලස් වසා ලූවාක් මෙන් හැම තැන ම හී තණ ඇති ව තිබෙ යි.

දසයොජන සහස්සානි – ජම්බුදීපො භවිස්සති,
අකණ්ටකො අගහණො – සමො හරිත සද්දලො.

යනු ඒ හෙයින් වදාරන ලද—

එ කල උපන් මිනිසුන්ට එක ද රොගයකු ත් නැත. උන් හැමට රොගයෙක් වේ නම් බත් කැව මනා වේලාට ඇති වන බඩ සාය හා බත් කා පුරා පිවේලාට පෙරළා බඩසාය ඇති වන තෙක් බතට රුචි නැති වීම හා හවුරුදු අසූ දහස නිමන්ට ආසන්නයෙහි මාලු වීම හා මේ තුන ය. එකල පන් සියයක් හැවිරිදි කුමාරිකාවරුන් එතරම ම වයස් ඇති කුමාරවරුන්ට සරණ පාවා දෙති. ආයු බොහෝ අවධි ය හෙයින් කල් යවා සරණ පාවා දුන්නා නම් වෙයි. එසේ පාවා දී ලූ කල මිය වෙන් වන තෙක් සමඟ ව වෙසෙති. සියලු මුළු ලොව නැංගා වූ ගසෙක් කොළෙක් ඇත්නම් මලින් පලින් සැදී සිටිටි. ගිමෙක ඇලෙක යන දෙයක් සත්‍වයන්ට තමා ම නැත. වැසි වස්නා කල එක් තැනෙක වැස පියා අනික් තැනෙක නො වස්නේ ත් නැත. බිම් තෙමෙන පමණකට මදක් වස්නේ ත් නැත. වැව් අමුණු ආදී ය කැඩෙන ලෙසට තර ව වස්නේ ත් නැත. ගොයම් වප ආදී වුවමනා කල තබා පියා දීම මැඩීම් ආදී වූ නො වටමනා කල වස්නේ ත් නැත. පස් දවසින් දස දවසින් දෙ පෝයෙන් වස්සි.

වස්නා කල ත් මධ්‍යම රාත්‍රියෙහි වැව් අමුණු පුරා වැස ලා පායා පිය යි. සුළං හමන කල ත් ප්‍රයෝජනවත් ව තිබෙන ගස් කොළත් කඩා පලවා පියන තරම් ව ගෙවල් විදන තරම් ව නො හමා ප්‍රයෝජනවත් තරමෙක හම යි. හැම කල ම සෘතු සම්පන්න ව තිබෙයි. ප්‍රයෝජනවත් ව තුබූ ගං හෝ ආදි ය වියලී නැති වන්නේ ත් නැත. හැම දවස් ම වැස ලන සැවි ය යහපත් හෙයින්

Non-Commercial Distribution

පිරී ම සිටිටි. සියලු දඹ දිව මුළුල්ල සක්විති රජ්ජුරු කෙණකුන් උයන් කෙළියට සරහාලූ උයනක් මෙන් හැම කලම සැරහී සිටිටි. දඹ දිව මුළුල්ලෙහි ම මේ ගම පිටිසේනෙන් අනික් ගම පිටිසේනට කුකුළන් පියාසර කරණ තරමට හෝ නොහොත් මෙ ගම් අතුරෙහි පටන් අනික් ගම් අතරට කුකුළන් පයින් නැඟී යන තරම් ගම් ගෙවල් ගහන ය. අවීචි නරකයෙහි පැසෙන සතුන් ගහනයා සේ දඹ දිව මිනිස්සු ත් ගහන ය. සියලු සම්පත්තීන් ම අඩුවක් නැති ව ගෙණ වෙළඳුන් ගෙනා විකිණි බඩු ඇර ගන්නවුන් නැති ව විකපත් නො වන හෙයින් උන්ගේ බඩුයෙහි අගය ත් නස්සි. දෙවියන්ගේ අළවු මදුරා නුවර මෙන් ඉතා සිත් කලු ය.

දඹ දිව එසේ වූ අවධියෙහි මෙතේ බෝසත්හු දෙවි බඹුන්ගේ අයදමෙන් කල් දෙස් ආදි ය විමසා බුදු වන්ට කල් හෙයින් දඹ දිව මධ්‍ය දෙශයෙහි කෙතුමති නම් නුවර ඒ අවධියට බමුණු කුල ය උතුම් බැවින් සංඛ නම් සක්විති රජ්ජුරුවන්ට පුරොහිත වූ සුබ්‍රාහ්මණ නම් බමුණු උතුමාණන් නිසා දස මස් සත් දවසට ආයු ඇති බ්‍රහ්මවතී නම් බ්‍රාහ්මණීන් කුස ඇසළ මස මැදි පොහෝ දවස් පිළිසිඳ ගෙණ දස මසක් මවු කුස වැස දස මස් අයාමෙන් බිහිවන තෙක් මහ බෝසතුන්ට ත්, වදන මෑණියන්ට ත් උවදුරු දුරු කරණ නිසා මේ මඟුල් සක්වළ සතර මහ වරම්හු කඩු හැර ගෙණ ශ්‍රී යාන්ගබඩාවේ සතර කොන රකවල් ගනිති.

දස දහසක් සක්වළ සතළිස් දහසක් වරම්හු ගබඩාවේ දෙර කඩ පටන් සක්වළ ගල දක්වා රකවල් ගනිති. දෙවියන් විසින් ගන්නා ලද රකවල් ඇති බ්‍රහ්මවතී නම් බ්‍රාහ්මණීහු ත් දස මස පිරෙන්නා ම කෙතුමති නුවර මඟුල් උයන්හි දී වදති. බිමට බිහි වන තෙක් අනගැමි බඹු සතර දෙනෙක් අවුත් රන් දැලෙකින් පිළි ගනිති. උන් අතින් සතරවරම්හු අභිමඞ්ගල සම්මත වූ අඳුන් දිවි සමෙකින් පිළිගනිති. උන් අතින් ඇමැත්තෝ දුහුල් සළුවක් හකුළුවා ලා ඉන් පිළිගනිති. උන් අතින් බිමට බැස දෙ පත්ල තර ව බිම ඔබා ලා නැගෙනහිර දසාව බල බලා සිටිනාහ. පොළො ව මිනා කොට පතුල් පිහිටවීම නම් මහා පුරුෂ ලක්‍ෂණ දෙතිසක් විතර ආශ්වර්‍ය්‍ය පහළ වන්නා සේ ම පහළ වන හෙයින් ඉන් එකෙක.

දෙතිස් මහල් ලකුණු වන්ට කාරණ කවරේ ද යත්—සොළසා සැකි කප් මුළුල්ලෙහි බුදු වනු නිසා දනක් දෙත ත් මඩෙහි හිඳුවංලූ හිරටක් සේ වෙවුලැසි නො ව තර අදහස් ඇති ව යම් බෙහෙත් ගසෙකින් මුල් කැමැති කෙණෙක් මුල් හැර ගෙණ යෙත් ද, ගැට කැමැති කෙණෙක් ගැට ගෙණ යෙත් ද, සුඹුළු කැමැති කෙණෙක් සුඹුළු හැර ගෙණ යෙත් ද, කඳ කැමැති කෙණෙක් කඳ කපා ගෙණ යෙත් ද, වෙළෙප් කැමැති කෙණෙක් වෙළෙප් ගෙණ යෙත් ද, අතු කැමැති කෙණෙක් අතු කපා ගෙණ යෙත් ද, කොළ කැමැති කෙණෙක් කොළ ගෙණ යෙත් ද, මල් කැමැති කෙණෙක් මල් ගෙණ යෙත් ද, ඵල ජාති කැමැති කෙණෙක් ඵල ගෙණ යෙත් ද, ඒ ගෙණ යන්නවුන්ට ඒ බෙහෙත් ගස් කරණ බාධා නැත් ද, එ මෙන් රන් රිදී-මුතු මැණික් ආදිය ත් ඉස්-ඇස්-මස් ආදිය ත් ඉල්වා ආ කෙණකුන්ට බුදුවීම් අදහසෙහි තර ව පිහිටා දුන්හ.

සිල් රක්‍ෂා කරණ කල ත් 'මේ සිල් නමැති පැන් නම් දහස් ගණන් ගංවල පැනිනු ත් සෝධා හළ නො හැකි කෙළෙස් කිලුටු සෝධා හැර පිය යි. සඳුන් පිනිදිය ආදීයෙනු ත් හළ නො හැකි කෙළෙස් මහ ගිම් සන්හිඳුවා ල යි. තව ද සත්‍වයන් සරහා ලන්නා වූ වොටුනු ආදී වූ ආභරණ ත් මේ සිල් නමැති ආභරණයට නො එක් ලෙසින් අඩු ය. නිවන් මහ නුවරට මාවත් මහක් හා සරි ය. සිතූ පැතූ සියල්ලක් සාධා දී ලන හෙයින් කප් රුක් ආදියක් හා සරි ය'යි සිතා ගෙණ තර ව පිහිටා ජීවිත විනාශයක් වේ නමුත් ශීල විනාශ ය නො කොට සිල් රක්‍ෂා කළහ.

තව ද ගිහි සම්පතෙහි බොහෝ ආදීනව හා මහණ වීමෙහි බොහෝ අනුසස් දැක මහණ වෙත් නමුත් කුද්දල පණ්ඩිතයන් ගේ කෙළවර මහණ වීම සේ තර අදහස් ඇති ව මහණ වන්ට නික්ම මහණ වූහ.

තව ද කවර කුමක් කරත ත් යම් සේ ජීවිතෙන්ද්‍රිය නැති ව ශරීර ය නො පවතී ද, චක්ෂුර්විඥනාදීන් නැති ව හුදක් චක්ෂුඃ ප්‍රසාද ය තමන්ට ප්‍රතිනියත වූ රූප දර්‍ශනාදි ය කට නො හෙත් ද, එ මෙන් නුවණ නැති ව කුමකු ත් කිරීම නපුරැ යි සිතා නුවණින් ම කරණ යම් දෙයක් කළහ.

තව ද හීන වීර්‍ය්‍යයන්ට සිද්ධි වන ලොවුතුරා ගුණ තබා ලොවී ගුණ ත් නැති හෙයින් ලේන ව උපන් අවධියෙහි මූද වැටී ගිය

Non-Commercial Distribution

දරුවන් හැර ගන්ට නභූට ගල ගලා මූද පැන් ඉස්නට කළ වීයඨි සේ කුශල පාක්ෂික වීයඨිය ත් තර ව කළහ.

තව ද 'සහන ය කිරීම නම් ක්‍රොධ නමැති ගිනි නිවන පැණෙක. පව්වු පුහුලන්ගේ රළු – පරළු බස් නමැති විෂයට දිව බෙහෙදක් හා සරි ය. ද්වේෂ නමැති මහ මුහුදට ඉවුරක් හා සරි ය. අපායට යන මහ අවුරා ලූ අකුලක් වැන්න. සියලු ගුණයට මුල් ව තිබෙ'යි යනාදී සලකා ක්‍ෂමා කරවීමෙහි ත් තර වූහ.

තව ද සබ වස නැතිවීමෙන් ශීලාදි ගුණධර්ම ය නො පිරෙන හෙයිනු ත් 'මම බුදු ව ලා සියල්ලවුන් නිවන් දක්වමි' යනාදීන් ක්‍රියා ලූ ලෙසට පිටි පෑ තිබෙන හෙයිනු ත් අසීහඤ්ජක බොරුවක් නො කිහ.

තව ද යම් දෙයක් කෙරෙමි යි ඉටා ගත්තු නම් ඊ ත් තර වූහ.

තව ද සියල්ලවුන් කෙරෙහි මෙත් පැතිරීමෙහි අනුසස් එකො ළොසක් ඇති හෙයින් තර අදහස් ඇති ව දිසාඵරණාදී විසින් සියල්ලවුන් කෙරෙහි මෙත් පැතුරුවූහ.

තව ද හිතයන් කෙරෙහි අනුනය කරතො ත්, අහිතයන් කෙරෙහි ප්‍රතිඝය කරතො ත් දරු දන් දී දරුවන්ට ගහට දූක දරු පෙම් නිසා සිත අනිකෙක් වී නම් දරු දන් සිද්ධ නො වන හෙයි නු ත් දරු දන් සිද්ධ නූ වූ කල බුදු බව ත් සිද්ධ නො වන හෙයින් සියල්ලෙහි ම මැදහත් වූහ.

ඒ හැමයෙහි අනුසසින් බුදු වන ජාතියෙහි රන් මරවඩි සහ ලක් සේ බිම සම ව පිහිටන්නා වූ පතුල් ඇති දෑ ය. එයි ත් එක් පුරුෂ ලක්‍ෂණයෙක.

තව ද ඒ මෙතේ බෝසත්හු ද බොහෝ කලෙක බොහෝ දෙනාට වැඩකරු ව බොහෝ දෙනාට ප්‍රයෝජනවත් ව සිත් ගෙන විසූ දෑ ය. ඊ මහිමයෙන් යට පතුල් දෙකෙයි ඉඳුනිල්මිණි මුවා නැබ ඇති, පබළු මුවා නිම් වළලු ඇති, නැබ මැද රිදී මුවා සිදුරු ඇති, නැම්වලට ත් නිම් වළලුවලට ත් අතුරු ව සත් රුවන් මුවා දූවී දහසක් ඇති, නිම් වළලු පිට අටතුරාසියක් මඟුල් ලකුණු හා මුණ්ඩාරම හා කුඩ කොන්ත ඇති, සක් රුවන් දෙකෙක් පෙනෙ යි. ඒ දෙ වන මහා පුරුෂ ලක්‍ෂණ ය.

Non-Commercial Distribution

තව ද ඒ මෙතේ බෝසත්හු ප්‍රාණ වධ නො කරණ බැවින් පණිවායෙන් වැලැක්කහ. ඒ කුශලයෙන් පත්ල සතර භාගයක් කළ කල දෙ භාගයක් අක් පත්ලට ව භාගයක කෙණ්ඩ ය පිහිවා එක් භාගයක් විළුඹට වන හෙයින් දික් වූ විළුඹ ඇත්තාහ. එයි ත් එක් මහා පුරුෂ ලක්‍ෂණයෙක.

ඇඟිලි ත් සිරියලින් වටා ලූවා සේ මුලින් දළ ව අගින් සීන් ව දික් ව තිබෙයි. එයි ත් එක් මහා පුරුෂ ලක්‍ෂණයෙක.

ගාත්‍ර ය ත් නො නැමී බ්‍රහ්මයාගේ ශරීර ය සේ ඉදුරා ව සිටවි, එයි ත් එක් මහා පුරුෂ ලක්‍ෂණයෙක.

තව ද ඒ මහ බෝසත්හු පැරුම් බිම දී තැගි කමින් උස් ව සිටිනාහ. එ හෙයින් තළල් මහපට ඇඟිලිවල නිය අක් ආදි වූ සත් තැනෙක් උස් ව සිටවි. එයි ත් එක් මහා පුරුෂ ලක්‍ෂණයෙක.

තව ද මහ බෝසත්හු පෙර බොහෝ කලක් ම දන ය, ප්‍රිය වචන ය, අර්ථචර්‍ය්‍යා ය, සමානාත්මතා ය යන සතර සංග්‍රහ වස්තුයෙන් ජන සංග්‍රහ ය කළහ. එයින් ජාල කවුළුවක් සේ ජාල ලක්‍ෂණයෙන් විසිතුරු වූ අතුල් පතුල් ඇති බව ත් අලුත උපන් කුමාරවරුන් සේ හැම දවස ම මොළොක් වූ අතුල් පතුල් ඇති බව ය යි මේ මහා පුරුෂ ලක්‍ෂණ දෙක වෙ යි.

ලොකස්වාමි වූ ඒ මහා පුරුෂයාණෝ පෙර බොහෝ කලක් ම වැඩට නිසි ව ප්‍රයෝජනවත් බසක් මුත් නිෂ්ප්‍රයෝජන බසක් නො කීහ. එ හෙයින් පිට පතුල් රන් කකුළුවන් මෙන් නහර නොපෙනී උස් ව සිටවි. එයි ත් එක් මහා පුරුෂ ලක්‍ෂණයෙක.

ශරීරයෙහි ලොමු ත් කුණ්ඩලාවෘත්ත ව සිසැරී ලා අක් උඩු ව තිබෙ යි. එයි ත් එක් මහා පුරුෂ ලක්‍ෂණයෙක.

තව ද ඒ මහ බෝසත්හු පෙර ශිල්පයක් ශාස්ත්‍රයක් උගන්වත් නම් සකස් කොට උගන්වති. එ හෙයින් ඒණි මුවන්ගේ කෙණ්ඩ වැනි කෙණ්ඩ වෙයි. එයි ත් එක් මහා පුරුෂ ලක්‍ෂණයෙක.

තව ද ඒ මහ බෝසත්හු පෙර මහණ බමුණන් කරා එළඹ 'ස්වාමීනි, කුසල් කවරේ ද? අකුසල් කවරේ ද? සාවද්‍ය කුවරේ ද? නිරවද්‍ය කවරේ ද? කුමක් සේවන ය කටයුතු ද? කුමක් සේවන ය නො කටයුතු ද? කුමක් කළ කල

Non-Commercial Distribution

අහිතයට දුඃඛයට කාරණ වේ ද? කුමක් කළ කල බොහෝ කලක් හිත සැප එළවා දැ' යි විචාරති. එ හෙයින් ඔහු සියුම් ඡවි ඇති වෙති. එයි ත් එක් මහා පුරුෂ ලක්‍ෂණයෙක.

තව ද ඒ මහා පුරුෂයාණෝ පෙර කිසි කෙණකුන් කෙරෙ හි ත් කොපයක් නැතියහ. යම් කිසි අසත් පුරුෂ කෙණකුන් බොහෝ ආක්‍රොශ පරිභව බිණුව ත් දෙමනසක් නො ඉපැද වූ ය. එ හෙයින් ඔප් නැඟූ කනක රූපයක් සේ ඉතා රන් වන් වූ ශරීර ඇති වෙති. එයි ත් මහා පුරුෂ ලක්‍ෂණයෙක.

තව ද ඒ මහ බෝසතාණෝ පෙර බොහෝ කලක් වෙන් ව විසූ නෑයන් හා මිත්‍ර ජනයන් හා කුස ඔත්තවුන් හා අවශෙෂ නෑයන් කයින් සිතින් වෙනස් නො වන සේ සමඟ කැර වූ ය. එ හෙයින් ඔවුන්ට කොෂයෙහි සැඟවී තිබෙන වස්ත්‍ර ගුය්හ ඇති වෙ යි. එයි ත් එක් මහා පුරුෂ ලක්ෂණයෙක.

තව ද ඒ මහ බෝසත්හු පෙර ජනයාට සංග්‍රහ කරණ කල මොහු මෙ පමණ සත්කාරයට සුදුස්සෝ ය'යි පුරුෂ විශෙෂ ය දැන සුදුසු වූ සත්කාර කොළෝ ය. එ හෙයින් සම පරිමණ්ඩල වූ නුග රුකක් සේ උස හා සම වූ බැම හා බැම හා සම වූ උස ඇති බව ය. සිටි සේ සිට නො නැමී දැත දෙ අත්ලෙන් දෙ දණ පිරිමදින බව ය- යන මේ මහා පුරුෂ ලක්‍ෂණ දෙකින් යුක්ත වෙති.

තව ද ඒ මහ බෝසත්හු පෙර කෙ සේ මේ සත්‍වයෝ සැදැහැ යෙන් වැඩි දෝ හෝ, කෙ සේ ශීල සම්පත ත්‍යාග සම්පත පිහිටත් දෝ හෝ, කෙ සේ ඇසිය යුත්තක් අසා ගනිත් දෝ හෝ, කෙ සේ නම් මොවුන්ට නුවණ වර්ධන ය වේ දෝ හෝ, කවර උපායකින් ධන ධාන්‍ය උපදවා ගනිත් දෝ හෝ, කෙසේ නෑයන් මිත්‍රයන් බොහෝ කොට ගනිත් දෝ හෝයි මෙසේ මහා ජනයාට එකාවන් ව වැඩක් මකැමති වූ ය. එ හෙයින් සිංහයාගේ ඌර්ධව ශරීර ය මෙන් සම්පූර්ණ වූ ශරීර ඇති බව ය. පිට දෙ භාග ය වෙන් ව නො තිබී රන් පුවරුවක් සේ සම ව තිබෙන බව ය, එ සේ ම සම ව සිටිනා කඳව ඇති බව ය-යන මේ මහා පුරුෂ ලක්‍ෂණ තුන පහළ වෙ යි.

තව ද ඒ මහා බෝසත්හු පෙර කැට කැබිලිත්තකින් වත් යම් කිසි දඬු ආදියකින් වත් ආයුධයකින් වත් සත්‍වයන්ට පීඩාවක් නො කොළෝ ය. එ සේ හෙයින් ඔවුන්ගේ රස දිවට

Non-Commercial Distribution

එක් ව උඩු බලා සිට රසග්‍රාස ය කරණ රස නහර ඇති ය. එයි ත් එක් මහා පුරුෂ ලක්‍ෂණයෙක.

තව ද ඒ මහා පුරුෂයාණෝ පෙර මහ ජනයාගේ මුහුණ ප්‍රෙමයෙන් බැලූ ය. එ හෙයින් එවුන්ට ඉතා නිල් නුවන් ඇති බව ය, අලුත වැදූ වස්සන්ගේ ඇසි පිය සේ යහපත් වූ ඇසි පිය ඇති බව ය යන මේ මහා පුරුෂ ලක්‍ෂණ දෙක පහළ වෙ යි.

තව ද ඒ මහා බෝසතාණෝ සසර වසන කළ මහ ජනයාට ඉදිරි ඉදිරි ව කුසල් කළහ. එ හෙයින් ඔවුන් හිස් මුදුනෙන් උඩ වඩු රියනක් තැන් නැඟී හැම වේලෙහි ම ජෝතිමත් ව බබළන්-නාවූ රශ්මි කදම්බයක් ඇති වෙ යි. එයි ත් එක් මහා පුරුෂ ලක්‍ෂණයෙක.

තව ද ඒ මහතාණෝ පෙර මුස වාදයෙන් වැළක සබා බස් ම කීහ. එ හෙයින් එවුන්ට එ කි එ කී රෝමයක් අට ගෙණ අඳුන් වන් පැහැ ඇති ව මුදුන් බලා සිටිනා බව ය. මද බැම අතුරෙහි මකුල් තිලකයක් සේ ඌර්ණ රොම ධාතුවක් ඇති බව ය, යන මේ මහා පුරුෂ ලක්‍ෂණ දෙක පහළ වෙ යි.

තව ද ඒ මහා පුරුෂයාණෝ පෙර ඔවුනොවුන් බිඳෙන්ට කේළමක් නො කීහ. අසමඟයන් සමඟ කැරවූහ. සමඟයන් නො සමඟ නො වන සේ අවවාද දුන්හ. එ හෙයින් සම සතළිස් දන්තධාතු ඇති බව ය. හැම දන්තයන් සක් පත් වළලු දෙකක් සේ නො සිදුරු ව සිටිනා බව ය- යන මේ මහා පුරුෂ ලක්‍ෂණ දෙකින් යුක්ත වෙති.

තව ද මහ බෝසත්හු පරුෂ වචනයෙන් වැළැක්කහ. සියල් ලවුන් සිත් ගන්නා ප්‍රේමණීය වූ, මනොඥ වූ, තෙපුල් ම කීහ. එ හෙයින් දිගු පුළුලු මොළොක් වූ දිව ඇති බව ය, මහා බ්‍රහ්මයා ගේ ශබ්ද ය සේ අෂ්ටාඞ්ග සමුපෙත වූ තෙපුල් ඇති බව ය, යන මේ මහා පුරුෂ ලක්‍ෂණ දෙක ඇති වෙ යි.

තව ද ඒ මහ බෝසත්හු පෙර ප්‍රයෝජනවත් වූ නෛර්‍යාණික බස් ම කිවු ය. එ හෙයින් සිංහයාගේ හනු සේ සම්පූර්ණ වූ හනු ඇති වෙ යි. එයි ත් එක් මහා පුරුෂ ලක්‍ෂණයෙක.

තව ද ඒ මහ බෝසත්හු පෙර බොහෝ කලක් මුළුල්ලෙහි සොරවෙළදාමක් නො කොළෝ ය. මිථ්‍යාජීවයෙන් දුරු වසමයක්

Non-Commercial Distribution

ආජීවයෙන් ජීවිකාවෘත්ති ය කළහ. එ හෙයින් දතක් දතකට උස් නො ව සිටිනා දත් ඇති බව ය. සුදු වූ සතර දළ ද ඇති බව ය යන මේ ලක්‍ෂණ ඇති වෙ යි.

මෙ සේ දෙ තිස් මහා පුරුෂ ලක්‍ෂණයෙන් හොබනා වූ මහ බෝසත්හු පිටී පත්ල උගුළුවා, උතුරු දිගට මුහුණ ලා, සත් පියවරක් ඔසවා ගොසින් පියුම් මත්තෙහි සිට සිංහ නාද පවත්වා, එ වක් පටන් ක්‍රමයෙන් වැඩි විය පැමිණෙති. වැඩි විය පැමිණි කලට විපාක දී නිමවා පිය ත් බුදු වන ජාතියෙහි ම කල් මද වුව ත් සොළසාසැකි කප් සුවහස් මුළුල්ලෙහි කළ පින් කම බොහෝ හෙයින් මහත් බඩසල් දසයෙක තුබූ විකක් කුඩා එක් බඩසලෙක පටවන කලක් මෙන්, මහා පත්තායම් දසයෙක තුබූ රුවන් එක පෙට්ටගමෙක ලන කලක් මෙන්, මහ නැව් දසයෙක තුබූ බඩු කුඩා ඔරුවෙක ලන කලක් මෙන්, සතර මහ මුහුද පැන් පොකුණෙක වත් කරණ කලක් මෙන්, බුදු වන ජාතියෙහි ම විපාක දෙන හෙයින් ගිහි සම්පත් විඳුනා නිසා මහ බෝසතුන්ගේ කුශලානුභාවයෙන් ශ්‍රී සම්පත්තීන් වැඩියා වූ වඩමන නම් පහයෙක් ද, සිදුහත් නම් පහයෙක් ද, චන්‍දක නම් පහයෙක් ද, ත්‍රිවිධ සුචරිතයෙහි විපාක ය පොළෝ යට සැඟ වී තිබී ලා උඩ නැඟි කලක් මෙන් පොළොව පළා ගෙණ පැන නැඟෙ යි. ලක්‍ෂයක් විවර පුරහනෝ වන්නාහ. චන්‍ද්‍රමුඛී නම් බ්‍රාහ්මණී කෙණෙක් අග මෙහෙසුන් වෙති. බ්‍රහ්මවර්ධන නම් කුමාර කෙණෙක් පුත් වෙති.

මාළිගා තුන ම සත් මාල් සත් මාල් වෙ යි. එ කි එ කී මාලේ රුවන්මුවා ලක්‍ෂයෙක් ලක්‍ෂයෙක් කුළු ගෙවල් වෙ යි. හැම එක් කොට එක් විසි ලක්‍ෂයක් විවර කුළු ගෙවල. එ කි එ කී මාළිගාවක් වටා සත් රුවන් මුවා පවුරු වළලු සතෙක් සිට්ටි. රන්මුවා පවුරෙහි වාසල කෙරේ රිදීමුවා තොරණ පෙළෙක් සිට්ටි. රිදීමුවා පවුරෙහි වාසල කෙරේ රන්මුවා තොරණ පෙළෙක් සිට්ටි. පබළුමුවා පවුරෙහි වාසල කෙරේ පිළිවහණ තොරණ පෙළෙක් සිට්ටි. පිළිවහණ මුවා පවුරෙහි වාසල කෙරේ පබළුමුවා තොරණ පෙළෙක් සිට්ටි. රත් මැණික් මුවා පවුරෙහි වාසල කෙරේ මැසිරි ගල් මැණික් මුවා තොරණ පෙළෙක් සිට්ටි. මැසිරි ගල් මැණික් මුවා පවුරෙහි වාසල කෙරේ සත් රුවන්මුවා තොරණ පෙළෙක් සිට්ටි. සත් රුවන්මුවා පවුරෙහි වාසල කෙරේ සත් රුවන්මුවා තොරණ පෙළෙක් සිට්ටි. මාළිගා තුන ම වට කොට සත් රුවන්මුවා යව අගැ නො එක් පැයෙන් විසිතුරු ධජ පතාක ලෙළෙයි. මාළිගා තුනෙහි ම මාලින් මාල මුත්

Non-Commercial Distribution

තැන්වල දිව්‍ය ගීතිකා නාද සේ නාද පවත්වන්නා වූ රන් රසු දැල් එලෙ යි. ධජ පතාක අක්වල රන් මිණි එලෙ යි.

මහ බෝසතුන්ගේ කුශලානුභාවය තරමට එක සඳ මඳ හෙයින් පැන නැඟී තුන් සඳක් මෙන් තුන් විමනින් ම රස් විහිද්දී, සත් රුවන් මුවා කුළු ගෙවල් පිරිවරා සිටිනා වූ මාළිගා දෙව් දූන් ගෙන් වැළඳි වළාකුලක් මෙන් ඉතා හොබ්බි. මාළිගාවල ත් භිත්ති වල ත් පිටත දසාවෙහි නිල් මැණිකෙන් විසිතුරු වූ තල් ගස් පෙළක් හා සත් රුවන් මුවා මකර වළලු පෙළක් හා සිංහ පෙළක් හා ව්‍යාඝ්‍ර පෙළක් හා ඇත් පෙළක් හා අස් පෙළක් හා ව්‍යාළ රූප පෙළක් හා රථ පෙළක් හා මොණර පෙළක් හා හංස පෙළක් හා කොස්වා ළිහිණි පෙළක් හා කොක් පෙළක් හා ගිජු ළිහිණි පෙළක් හා ගුරුළු පෙළක් හා දේවතා පෙළක් හා බඹ පෙළක් ළියවැල් පෙළක් හා ගස් පෙළක් හා නුවර පෙළක් හා ගං පෙළක් හා විල් පෙළක් හා මුහුදු පෙළක් හා නැව් පෙළක් හා පට්ටිගා පෙළෙකැ'යි මෙ කී සියල්ල ත් සිත්තම ඇඳ ලූ දෙයක් මෙන් විභාගවත් ව පෙනෙ යි.

තව ද නිරන්තර ව ම ඒ මාළිගාවල මල් වැසි වස්සී. ඒ ඒ මාළිගාවෙහි එකි එ කී මලෙක ගබඩා සත් සත් දහස් වෙයි. එ කි එකී ගබඩාවෙක එ කි එකී පලක් බැගින් වෙරළුමිණිමුවා පලක් සත් සත් දහස් වෙයි. එ කි එකී පලහකට එකක් එකක් බැගින් රුවන් කර්මාන්තයෙන් හොබනා හෙළ කුඩ සත් සත් දහස් වෙ යි. එ කි එ කී ගබඩාවකට එ කි එකී යාන් බැගින් මහ ඇඟි කොට අතුළ සත් සත් දහස් ශ්‍රී යාන් වෙ යි. ඒ යාන් ගාවා රුවන් කර්මාන්තයෙන් විසිතුරු වූ මිටි ඇති සත් සත් දහස් කොන්ත සිටිටී. එ කි එ කී මාළිගාවක් ම වට කොට සියලු හස්ත්‍යලඞ්කාර යෙන් සරහන ලද ධජ පන්ති ඇති සදන් රජකු ඇති ව සත් සත් දහස් ඇත්තු සිටිති. එ සේ ම සියලු අශ්වාලඞ්කාරයෙන් සර හන ලදවලාහක අශ්ව ප්‍රමුඛ වූ සත් සත් දහස් අස්සු සිටිති. එසේ ම රථාලඞ්කාරයෙන් සරහන ලද ලහිරු මඩලවල් සේ ඉතා ශොභා මත් වූ තමන්ගේ ශොභාවෙන් මාළිගා ගලා පියන්නාක් වැනි වූ සත් සත් දහස් රථ ත් මාළිගා වටා සිටිටී. එ කි එ කී මාලෙක දෙවඟනන් වැනි මනහර රූ ධරන්නා වූ සව් බරණ ලා සැරහුණු ගී නැටීමෙහි දක්‍ෂ වූ යහපත් ජාති ඇති නළු ගෑනු සත් සත් දහස සිටිති.

පුරඟනන් මුළුල්ලට ත් නළු දූන්ට ත් ප්‍රධාන වූ චන්ද්‍රමුඛී නම් අග මෙහෙසුන්නු හැම දෙනාට වඩා විශිෂ්ට රූ ඇති වෙ යි. ඉතා

උසු ත් නො වෙති. ඉතා මිටි ත් නො වෙති. ඉතා සීනු ත් නො වෙති. ඉතා බෙටි ත් නො වෙති. ඉතා කැළි ත් නො වෙති. ඉතා හෙළළි ව සුදු මැළි ත් නො වෙති. මිනිස් ලොව ගැනුන්ගේ රුවට වැඩි සිටිති. දෙවඟනන්ගේ රුවට ආසන්න ව සිටිති. උන්ගේ ශරීරයෙන් සඳුන් සුවඳ හම යි.. කටින් මානෙල් මල් සුවඳ හම යි. ශරීරාලොක ය දෙළොස් රියනෙක පැතිරෙ යි. සියක් වර පොළා පී පුළුනක් මෙන් ඉතා මොළකැටි වෙති. ඌ තුමූ මෙතේ බෝසතුන්ට බ්‍රහ්මවර්ධන නම් පුතණු කෙණකුන් වදති. සක්විති සිරිතක් මෙන් සෙසු ත් පුරඟනන් ගෙන් පුත්තු දහසෙක් ම ඇති වෙති.

එ කි එ කී මාළිගාවෙක ම සතර සතර කොන සතර සතර ගවු පමණ වූ සත්රුවන් පිරී සිටිනා නිධාන සැළවල් සතර සතර වෙ යි. මාළිගා තුනට ම සතර සතරක් ඔබාදීන් කප් රුක් දෙළොසෙක් පොළොව පළා ගෙණ නැගෙ යි.

මෙතේ බෝසත් හු ද එකි එකී මාළිගාවේ සව් බරණ ලා සැරහී ගෙණ දෙවඟනන් වැනි වූ පුරඟනන් පිරිවරා හවුරුදු අට දහසක් සම්පත් විදිති. එ කල මහ බෝසතුන්ගේ කුශලානුභාවයෙන් කෙතුමතී නුවර පටන් දඹ දිව සුවාසූ දහසක් නුවරවල රජදරුවෝ සංඛ නම් සක්විති රජ්ජුරුවන් ඇතුළු ව අනූ කෙළ ලක්‍ෂයක් රජ දරුවෝ සෙසු දෙව් මිනිසුන් හා එක් ව මෙතේ බෝසතුන් කරා ගොසින් 'මුඹ වහන්සේ කීවාක් කොට ලා සිටින්ට ආම්හ'යි කියති. ඉදිරියෙහි තැන තැන සිටිති. මහ බෝසත් හු 'අපට මෙහෙ කරන්නෝ ඇත. ගිය මැනවැ'යි උන් හැම යවති. එ කල මහ බෝසතුන් සමඟ දෙව් ලොවින් අවුත් කෙතුමතී නුවර ඒ ඒ උතුම් කුලවල උපන් දෙවියෝ අටළොස් කෙළක් මහ බෝසතුන්ට අමාත්‍ය මණ්ඩල වෙති.

මෙ සේ මෙතේ මහ බෝසත්තු දෙව් සැපට ත් වඩනා තරම් මහ සැප ත් විඳිමින් අට දහසක් හවුරුදු ගිහිගෙයි රඳා චන්ද්‍රමුඛී නම් අගමෙහෙසුනු ත් බ්‍රහ්මවර්ධන නම් පුත් රුවන වැදූ කල්හි බුදු වන කලු ත් ආසන්න හෙයින් උයන් කෙළියට යන ගමනේ ජරා ජීර්ණාදී අරමුණු දැක ක්‍රමයෙන් යෞවන මදය ත්, ආරොග්‍ය මදය ත්, ජීවිත මදය ත්, හැර සතර වැනි වාරයෙහි මහණ රුවක් දැක මහණ වීමෙහි රුචි ඇති ව මහණ ව 'මහණදම් කට හෙම් දෝ හෝ'යි විමසනු නිසා කලට නිසිව ත් මහණ වීමට නිසිව ත් මහණ

Non-Commercial Distribution

වන්නාට පෙරාතු ව ම සතියක් යම් දූකක් ගැනීම් වශයෙන් ප්‍රධන් වීයඞ කොට මැණික් ගල් ගුහාවෙක ඇලුම් හරන කෙශර සිංහයක්හු මෙන් සම්පත්තින් පිරී තිබෙන මාළිගාවල ත් සියල්ලෙහිත් ඇලුම් හැර මහණ වන්ට නික්මෙනු කැමැති ව නික්මෙන්ට සිතන්නා ම මහ බෝසතුන්ගේ කුශලානුභාවයෙන් දස දහසක් සක්වල දෙවි බඹුහු ත් මේ එක සක්වළට රැස් වෙති. කෙතුමති ය මුළුල්ලෙහි ත් මුළු දඹදිව ත් 'අජිත කුමාරයෝ මහභිනික්මන් නික්මෙති'යි මහා කොලහල වෙයි.

ඒ වේලාට සඞ්ඛ නම් සක්විති රජ්ජුරුවෝ සුවාසූ දහසක් පමණ වූ නළු ආදීන් පිරිවරා මහ බෝසතුන් එ දවසට වසන මාළිගාව පිරිවරා සිටිති. සෙසු ත් රජ බමුණු ආදීහු පුන් කළස් මල් ඇගෑ ආදි වූ පූජොපකරණ අල්වා ගෙණ පිරිවරා සිටිති. අහස දෙවියෝ ත් සැණ වෙස් ගෙණ ධජ පතාකාදිය හැර ගෙණ සාධු කාර දි දී අහස සිටිති. සක්වළ ගල පටන් අකනිටා බඹ ලොව දක්වා සිටියා වූ දෙවි බඹුන් රුවන්මුවා කරඬුවලින් දමා ලූ සුවඳ සුණු ආදි ය මහ වැස්සක් මෙන් පැවැත්ත.

ඒ වේලාට බෝසතුන් හුන් රුවන් මාළිගාව බෝසතුන්ගේ නළු ආදීන් හා සමඟ අහසට රන්වන් හංසයක්හු මෙන් නැඟෙ යි. ඒ වේලාට රැස් වූ මහ පිරිස ත් මහ බෝසතුන්ගේ කුශලානුභාවයෙන් ද, සක්විති රජුන්ගේ රාජානුභාවයෙන් ද, දෙවියන්ගේ දෙවතානුභාවයෙන් ද යම් යම් කෙණෙක් මහ බෝසතුන් හා කැටී ව යනු කැමැත්තෝ නම් උඵ උඵ අහසට නැඟෙති. මහා පුරුෂයාණන්ට මහ බඹාණ කෙණෙක් හෙළ කුඩ ය ලති. සක් දෙවිඳුහු විජයතුරා සක පිඹ පිඹ සිටිති. සුයාම-සන්තුෂිත දෙව් රජහු තල්වැට චාමර ගෙණ සිටිති. පන්සිළු නම් දෙව් පුත් වීණා ගායණා කෙරෙමින් සිටිටි.

වරම් රජ දරුවෝ කඩු හැර ගෙණ සතර දිග රකවල් ගනිති. දෙ තිස් දෙව් කුමරියෝ රන් පැණ රිදී පැණ ගෙණ සිටිති. අට විසි යක් සෙනෙවියෝ කඩු හැර ගෙණ ඒ ඒ දිග රකවල් ගනිති. අසුරයෝ දිව්‍යමය ධජ පතාක ගෙණ හාත්පසින් සිටිති. නා රජහු මිණි දඬු වැට පහන් ගෙණ සිටිති. ගරුඩයෝ ස්තුති ගී කිය කියා ගායනා කෙරෙමින් සිටිති. සඳකිඳුරෝ මිහිරි කට හඬින් ගී කිය කියා ගායනා කෙරෙති. දිව නළුවන් හා දිව්‍යාඞ්ගනාවෝ දිව්‍යමය නෘත්‍ය ගීත වාද්‍යයෙන් පූජා කෙරෙමින් දස දිග පිරිවරා සිටිති.

මෙ සේ මෙ බඳු ශ්‍රී සෞභාග්‍යයෙන් යුක්ත වූ දිව්‍ය මනුෂ්‍ය සෙනාව විසින් පිරිවරන ලද මහ බෝසතාණෝ පර්වත රාජයන්ගේ නැටීමෙන් හා ඇතුන්ගේ කුඤ්චනාදයෙන් හා අසුන්ගේ හේෂා රවයෙන් හා සිංහයන්ගේ සිංහ නාදයෙන් හා ව්‍යාඝ්‍රයන්ගේ පැළඹීමෙන් හා හංසයන්ගේ සතුටු හඬින් හා දෙවියන්ගේ සාධු නාදයෙන් හා අසුරයන්ගේ ස්තුති ඝොෂාවෙන් හා බ්‍රහ්මයන්ගේ අත් පොළසනින් හා එකනින්නාද වූ එකඝොෂ වූ ආකාශ තල ය අලංකාර කෙරෙමින් ප්‍රාසාදයෙන් ම මහභිනික්මන් නික්ම මහ බෝමැඩ සමීපයට යෙති. ඒ සත් රුවන් මහ පාය බෝමැඩ සමීපයෙහි ආකාශයෙන් බැස ඉතා සිත්කලු වූ බිම් පෙදෙසක පිහිට යි.

එ කෙණෙහි ම මහබඹා දිව්‍යමය වූ අට පිරිකර ගෙණ එ තැනට පැමිණෙයි. මහ බෝසතාණෝ මඟුල් කඩුයෙන් හිස කෙස් වැටිය කපා ආකාශයට හැර මහබඹු අතින් සිවුරු පිරිකර ගෙණ පැවිදි වෙති. මෙ සේ මහ බෝසතුන් මහණ වූ ඉක් බිති වෙද වෙදඬගයෙහි පර තෙරට පැමිණියා වූ සුවාසූ දහසක් බ්‍රාහ්මණයෝ එද ම මහණ වෙති. ඉසිදත්ත ය, පුරාණය යි යන බමුණු දෙ බෑ කෙණෙක් වෙන වෙන ම සුවාසූ දහසක් පිරිවරා ගෙණ මහණ වෙති. ජිතමිත්ත ය, විජිත ය යන පණ්ඩිතවරු දෙ දෙනෙක් සුවාසූ දහසක් සුවාසූ දහසක් පිරිවරා ගෙණ මහණ වෙති.

සිද්ධාර්ථ නම් සිටාණ කෙණකුන් හා සඞ්ඛ නම් උපාසක යකු හා දෙදෙන සුවාසූ දහසක් සුවාසූ දහසක් පිරිවරාගෙණ මහණ වෙති. සුධන නම් උපාසකයකු හා සඞ්ඝ නම් උපාසක කෙණ කුන් හා දෙ දෙන සුවාසූ දහසක් සුවාසූ දහසක් උපාසකවරුන් හා මහණ වෙති. යසවතී ය, විශාඛා ය යන උපාසිකාවරු දෙ දෙ නෙක් සුවාසූ දහසක් සුවාසූ දහසක් පිරිවරා ගෙණ මහණ වෙති. සෙසු බොහෝ නාගරික ජනයන් හා ජනපදවාසී වූ රජ බමුණු වෙළඳ ගොවි ආදි නානා ජාතියෙහි මහා ජනයෝ ද මහණ වෙති.

බෝසතාණෝ මහණ ව ලා ම සිල් සමාදන් ව ගඟට බැස පැන් සනහා චන්ද්‍රමුඛී නම් අග බිසොවුන් දුන් මිහිරි කිරි බත් වළඳා වැළඳූ රන් තළි ය උඩු ගං බලා හැර පිපි මල් කැනින් හා ළපලු පතින් සැරහුණා වූ සල් වෙනෙහි දිවා විහාර කොට සවස රන් වන් කෙසුරු සළා ඇති සුවඳ කුසුමයන් තුවටුයෙන් ගිලිහී මදටවන් සිවුර මත්තෙහි හෙන්නට වන් කල්හි, නා - ගුරුළු ආදීන් දිව මල් දිව සුවඳ ආදි ය ගෙණ පුදන්ට වන්-කල්හි, දස

දහසක් සක්වළ එක පැහැර බමන්ට වන් කල්හි, දෙවියන් විසින් සරහන ලද මහට බැස දෙව් බඹ පිරිස් පිරිවරා ගොස් නාග සිරි බොධීන් වහන්සේ කරා එළඹ හැම බුදුවරයන් විසින් අවිජ හිත වූ නිශ්චල භූමි ය පරීක්ෂා කොට එක්තරා පුරුෂයකු විසින් එළවන ලද කුසතණ අට මිටක් අගින් අල්වා ගෙණ බෝ මුල සලා වගුරුවා එ තැනින් නැඟී අපරාජිත පර්‍ය්‍යංකයට පැන නැඟී නාගසිරි බෝධීන් වහන්සේට පිට ලා නැගෙනහිර බලා සිවුරහ ඉටා ගෙණ පලක් බැඳ හිඳ එ කෙණෙහි මාරයා භයඞ්කර වූ මර සෙනහ ගෙණ තමාගේ දෙව් ලොවින් නික්ම සක්වළ ගල මුව විවට බැස මෙතේ බෝසතාණන් හුන්නා වූ විලාස ය දැක ශ්‍රී මුඛ ය බලා මහා පුරුෂයාණන්ගේ මෛත්‍රී ආනුභාවයෙන් මැත ආ නො හී එ තැන් හි ම සිට බිඳී පලා ගෙ යි.

එ කෙණෙහි සම පනස් යොදුන් පමණ ඇති දහසක් රසින් බබලන හිරු මඬල නිම් වළල්ල අල්වා ගෙණ මූද ගලන ලද රන් සකක් මෙන් හස්ත ගත වෙමින් සිටටි. එකුන් පනස් යොදුන් පමණ ඇති සඳමඬල දස දිග අමාරස් විහිදුවමින් සක්වළ ගබ කිරි මුහුද ගලනාක් මෙන් ද, නිම් වළල්ල අල්වා ගෙණ අහසට නගන රිදී සකක් මෙන් ද,නැගෙනහිරින් නැගී සිටටි. සක්වල මැද තමන් වහන්සේගේ රන්වන් රසින් රන්වන් කිරීමෙන් ඉතා ශොභා මත් ව විදුරස්නෙහි හිඳිනා සේක.

මහභිනික්මන් නික්මුණු වේලේ මෙන් ධවලච්ඡත්‍රාදි ය හැර ගෙණ පිරිවරා සිටිති. බුදු මඟුලේ සමහර දෙව් කෙණෙක් රුවන් තොරණ අල්වා ගෙන සිටිති. සමහර දෙවී කෙණෙක් රුවන් ඇගෑ අල්වා ගෙණ සිටිති. සමහර දෙව් කෙණෙක් රණ් කේල් ගස් අල්වා ගෙණ සිටිති. සමහර දෙවී කෙණෙක් රුවන් මුවා සිරිවස් අල්වා ගෙණ සිටිති. සමහර දේවතා කෙණෙක් වල්විදුනා අල්වා ගෙණ සිටිති. සමහර දේවතා කෙණෙක් රුවන් අකුසු අල්වා ගෙණ සිටිති. සමහර දේවතා කෙණෙක් රේමස් යුගළ අල්වා ගෙණ සිටිති. සමහර දේවතා කෙණෙක් නඳවට අල්වා ගෙණ සිටිති. සමහර දේවතා කෙණෙක් භද්‍රපීඨ අල්වා ගෙණ සිටිති.

සමහර දේවතා කෙණෙක් සක් අල්වා ගෙණ සිටිති. සමහර දේවතා කෙණෙක් රුවන් කලස අල්වා ගෙණ සිටිති. සමහර දේවතා කෙණෙක් මල් මාලා අල්වා ගෙණ සිටිති. සමහර දේවතා කෙණෙක් මල් කලප් සහිත කළ අල්වා ගෙණ සිටිති. සමහර

Non-Commercial Distribution

දේවතා කෙනෙක් දුම් කෙනෙසි අල්වා ගෙණ සිටිති. සමහර දේවතා කෙනෙක් මිණි දඬු වැට පහන් අල්වා ගෙණ සිටිති. සමහර දේවතා කෙනෙක් රන් කැට පත් අල්වා ගෙණ සිටිති. සමහර දේවතා කෙනෙක් රිදී කැට පත් අල්වා ගෙණ සිටිති. සමහර දේවතා කෙනෙක් මැණික්කැට පත් අල්වා ගෙණ සිටිති. සමහර දේවතා කෙනෙක් රුවන් කැට පත් අල්වා ගෙණ සිටිති. සමහර දේවතා කෙනෙක් ධජ-පතාක අල්වා ගෙණ සිටිති. සමහර දේවතා කෙනෙක් කප්රුක් අල්වා ගෙණ සිටිති.

එ කල මහ බෝසතුන් වහන්සේ සක්වළ ගල් නමැති පට කඩ තිරයක් වටා බඳනා ලද තරු නමැති මැණික් ඔබා කළ අහස් නමැති වියනක් ඇති, සියලු රාත්‍රි ය මුළුල්ලෙහි තිබෙන සඳ නමැති පහනක් ඇති, සක්වළ ගබ මද්ධ්‍ය නමැති රුවන් මණ්ඩප ය මැද බෝ රුක් නමැති නිල් කුඩයක් ඇති, විදුරස්නෙහි නළුවන් සහිත වූ දෙව් මිනිසුන් පිරිවරා පෙර යම් දස පැයින් පෙර විසූ කඳ පිළිවෙළ දන්නා නුවණ උපදවා ගෙණ, මැද යම් දස පැයින් දිවස් උපදවා ගෙණ, අලුයම් වේලෙහි මහ පොළොව ගුගුරුවමින් බුදු වෙති. බුදු ව සත් සති යවා වදරා උතුම් වූ දහම් සක පවත්වන සේක් ධම් සක් පැවතුන් සූත්‍ර දෙශනාව අසා ගවු සාර සියයෙක පුරා සිටියාවූ මිනිසුන් ගෙන් හා සක්වළ ගබ පුරා සිටි දෙවියන් ගෙන් හා දෙ පක්‍ෂයෙන් කැටි ව මිනිසුන් ගෙන් කෙළ ලක්‍ෂයක් හා දෙව් බඹුන් ගෙන් අසඞ්ඛ්‍යයක් නිවන් දකිති.

එ කල සඞ්ඛ නම් සක්විති රජ්ජුරුවෝ ද දිඹුල් දණ්ඩෙන් කළ ගෙ පතෙහි අනුසසින් ලද්ද වූ සියක් ගවු විවර උස ඇති, සියක් මාල් ඇති, දෙ ගවු දෙ ගවු පමණ දිග පළල ඇති රුවන් මාළිගාව තමන් මහණ වන්ට සිතන හෙයින් බුදු පාමොක් සඟනට පිළි ගන්වා පියා බොහෝ දෙනාට බොහෝ දනු ත් දී පියා අනූ කෙළ දහසක් දෙනා හා සමඟ බුදුන් කරා ගොසින් අති මධුර වූ බණ අසා සහපිරිවරින් සසුන් වැද මහණ ව රහත් වෙති. නිත්‍ය පරිවාර රහතන් වහන්සේ කෙළ ලක්ෂයක් විවර වන සේක.

ඔබට බොධි වූ නා ගස මුල පටන් කඳ වෙළෙප ඉත්රුණු තැනට එක් සිය විසි රියන. එ තැන පටන් අතු අගට ත් එක් සිය විසි රියන. මුල පටන් අතු අගට දෙ සිය සතළිස් රියන් පමණ. කඳ ත් ගැට පපටිකා නැති ව රිදී කඳක් සේ වට ව තිබෙන සේක. බස්නා හිර අතු අග පටන් නැගෙන හිර අතු අගට ත් උතුරු දිග අතු අග පටන් දකුණු දිග අතු අගට ත් දෙ සිය සතළිස් රියන් දෙ සිය

Non-Commercial Distribution

සතළිස් රියන් පමණ සේක. කොළ මඬුල්ල වටින් සත්සිය විසි රියන් සේක. පවත්නා තෙක් දවස් සුඹුලු ත් නො හෙයි, පතු ත් නො හෙයි. පතුත් විලික්ෂ වේව යි නිකම් වේව යි නො හෙයි. අතුරතුරෙහි දළු ලීමක් විනා නිල් ව ම සිටිනා සේක. පත්හසු වල ගත් මල් කැකුළු හස්සෙහි දෙළොස් නැළියක් විවර පැන් ගනිති. පිපී ගියා වූ මල් රළු සක් සා ඇත. එ කි එ කී මලෙහි රේණු නැළියක් විවර වෙ යි.

බුදු වන දවස් පිපියා වූ නා මල් අසූ දහක් හවුරුදු පර නො වී තිබෙ යි. බෝධීන් වහන්සේ වට දෙළොස් ගවුවක් විතරෙහි මල් පිපෙන්නා වූ ගස් බෝධීන් වහන්සේට වැඳුම් ගෙණ සිටිටි. බෝධීන් වහන්සේට වටින් දෙ ගවුවක් විතරෙහි බිම රුවන් වැලි ලෙන් තැවරී සිටිටි. ඒ වැලි තලාව මත්තෙහි දියෙහි ගොඩෙහි පිපෙන සුවඳ මල් අතුට තිබෙ යි. නිරන්තරයෙන් ම ඒ බිම අනෝජා සිඳුවර ඉද්ද සමන් පළලු සපු නා ආදී වූ මල් වැසි වස්සී. බොධීන් වහන්සේ වට කොට මහනෙල් මල් කළස් සහිත රන් පැණ තිබෙ යි. සතර කෙළවර සඞ්ඛ ඇත්තා වූ රුවන් මුවා වැටවල පහන් ඇවිළෙ යි. බොධීන් වහන්සේට උඩු මල් වියනකුත් සිටිටි. මුදුනෙන් ගමන් නැත ත් ඉවතින් යන පක්ෂීන් මියුරු කට හඬින් තම හට හිත කැමති පූජා කොට ලා යන්නාහ. කඳ වෙළෙප් අතු ආදියෙහි ත් රඳා පියන පක්ෂි කෙණෙක් නැත. ඒ බොධීන් වහන්සේ මෙ බඳු විස්ම ඇති වන සේක.

එ කෙණෙහි බුදුන් වහන්සේ උසින් අටාසූ රියන් සේක. පත් ලෙහි පටන් දණ කරා දෙ විසි රියන් සේක. දණ පටන් පෙකණි-යට දෙ විසි රියන් සේක. පෙකණියෙහි පටන් අකු ඇට දක්වා දෙ විසි රියන් සේක. අකු ඇට පටන් ඉස් මුදුන දක්වා දෙ විසි රියන් සේක. ඉස් මුදුනෙහි පටන් දෙවුරට අතුර පස් විසි රියනෙක. කන් දෙක වෙන වෙන සත් රියන් පමණ ය. කන් වැල් දෙක සැලී නැහෙන කලට විදුලි ය ගසන්නා සේ ය. ඇස් දෙක ම පස් පස් රියන. රන් පර්වතයක හුණු දෙව් දුනු සහළක් වැනි වූ බැම සහළ ත් පස් පස් රියන.

බැම දෙකට අතුර ත් පස් රියනෙක. රන් අකුස්සක් වැනි නාස ය සත් රියනෙක. තොල් සහළ ත් පස් පස් රියන් විවර ය. සිනිඳු වූ මොළොක් වූ තුනී වූ රතු වූ පළල් වූ දිව සරියන. වට වූ සොඳ වූ හිස පිටින් පස් විසි රියන. සර්වඥ නමැති අනවතප්ත

Non-Commercial Distribution

වීලින් සදහම් නමැති අමා ගං වැහෙන නැසින්නක් වැනි වූ මුඛය ද වටින් පස් විසි රියන. රන් කලස කරක් වැනි කර ද පස් රියන. වට වූ අත් සහළ ම වෙන වෙන සතළිස් රියන. අතුල් සහළ ද එකෙක් එකෙක් ම පස් රියන. ඝන අඳුරෙක වුව ත් තමන් වහන්සේගේ මසැසින් එ කි එ කී අතින් අට සාළිස් අට සාළිස් ගවුවෙක තුබූ අතිසූක්ෂම වූ රූ ත් දක්නා සේක.

ඒ බුදුරජාණන් වහන්සේගේ ශරීරයෙන් නික්මුණා වූ සවනක් රශ්මි ත් අසූ දහසක් හවුරුදු මුළුල්ලෙහි ම දස දිගින් ම සියක් ගවු විතරේ පැතිර සිටිටි. එ සේ පැතිර සිටිනා රශ්මි ත් අහස විදුලිය කලප් මෙන් දීප්තිමත් ව සිටිටි. ති ලෝ ගුරු බුදුහු ත් ලක්ෂ ගණන් පහනින් බබලන පහන් රුකක් මෙන් නො එක් රුවනින් විසිතුරු වූ අටාසූ රියන් ඇගෑයක් මෙන් ද හොබනා සේක. ඔබගේ ශරීරයෙහි පිහිටි දෙ තිස් මහා පුරුෂ ලක්ෂණ ත් පිළිවෙළින් තබා ලූ සඳ මඩල දෙ තිසක් මෙන් ද, හිරු මඩල දෙ තිසක් මෙන් ද, පිළිවෙළින් සිටි සක්විත්තන් දෙ තිසක් මෙන් ද, වරම් රජුන් දෙති සක් මෙන් ද, ශක්‍රවරුන් දෙ තිසක් මෙන් ද, සුයාමුන් දෙ තිසක් මෙන් ද, සන්තුෂිතයන් දෙ තිසක් මෙන් ද, සුනිර්මිතයන් දෙ ති සක් මෙන් ද, වසවත් මරුන් දෙ තිසක් මෙන් ද, මහ බඹුන් දෙ තිසක් මෙන් ද, ඉතා ශොභාමත.

ඉන් බබළන්නා වූ ඔබගේ ශරීර ය තරු රසින් බබළන අහ සක් මෙන් ද, සුපිපි මහ පියුම් විලක් මෙන් ද, නො එක් රුවින් බබළන රුවන් ආකරයක් මෙන් ද, ඉතා හොබ්බි. තම්බ නඛතා-තුඞ්ග නඛතා ආදී වූ අශීත්‍යනුව්‍යඤ්ජන නිසා ඔබ ගේ ශරීර ය සඳ වලායෙන් මුසු වූ විදුලිය හා දෙව් දුන්නෙන් වෙළන ලද රන් පර්වතයක් මෙන් ද, හොබ්බි. ඇහින් නික්මෙන සවනක් රශ්මි ත් ඉඳුනිල්මිණිමුවා කළවලින් වැගිරෙන නිල් රස ධාරා මෙන් ද, රන් කළවලින් වැගිරෙන කොකුම් රස ධාරා මෙන් ද, පබළුමුවා කළ වලින් වැගිරෙන අලතා ධාරා මෙන් ද, රිදී කළවලින් වැගිරෙන කිරි ධාරා මෙන් ද, මදට වන් කළවලින් වැගිරෙන මදට රස ධාරා මෙන් ද, නික්ම යුග්ම යුග්ම පිළිවෙළින් තල් කඳ සං ව ද, රථ සක් සා ව ද, කඩ ආදිය සාව ද පවතිමින් යටින් වා පොළොව ඉක්ම, උඩින් භව අග ඉක්ම, සරසින් අනන්ත වූ සක් වළවල් ඉක්ම, ඔබගේ ශාසන ය පවත්නා තෙක් පවත්ති.

තව ද ඒ බුදුන් යම් තැනකට වඩනා කල බිම තබා ලූ පතුල් පිළිගන්ට මහ පොළොව පළා ගෙණ උපුල් පියුම් නැඟෙයි. ඒ පියුම්

Non-Commercial Distribution

චල මහ පෙති තිස් රියන. කුඩා පෙති පස් විසි රියන. කෙසුරු විසි රියන. පියුම් කෙමි සොළොස් රියන් වෙයි. එ කී එ කී පියු මෙහි රේණු අමුණ අමුණ වෙයි. දෙ පත්ලෙන් පියුම් කෙමි දෙකක් මිරිකා ගන්නා මහ හිඟුල් සුණු වැනි වූ රන් වන් රේණු සළා පත් ලෙහි පටන් සිරස දක්වා රන් පිළිමයෙක හිඟුල් රෙබා දෙන කලක් මෙන් සියල් සිරුරු තවරා නැඟී ලා පෙරළා පා මුල්හි වැගි රෙයි. බොහෝ සෙ නැඟෙන්නේ රත් පියුමු ත් සුදු පියුමු ත් නැඟෙ යි. මෙ සේ ඒ මෛත් බුදුහු අනන්ත වූ බුද්ධ ලීලායෙන් අනුපමෙය්‍ය වූ බුදු සිරින්, දිළිහි දිළිහී මුළු ලොව බුද්ධ රාජ්‍ය ය කෙරෙති.

ඒ මෛත්‍රෙය බුදුන්ගේ ගඳ කිළි ය දිව්‍ය විමානයක් සෙ දෙව ලොව වසන දෙවියෝ නන් විසිතුරු ඇගෑ පන්තීන් නිර්මිත කෙරෙති. එයින් රන් ඇගෑ අටෙක් වෙයි. රිදී ඇගෑ අටෙක් වෙයි. මැණික් ඇගෑ අටෙක් වෙයි. පබළු ඇගෑ අටෙක් වෙයි. නො එක් දහස් ගණන් මල් ඇගෑ පන්තිහු සතර දිග සැදී සිටි ත්. ඒ ඇගෑ සියල්ල ම උසින් අටාසූ රියන් පමණ වෙයි. මහ ත් ආනු භාව ඇති නාග-ගුරුළු-ගඳඹ ආදීහු නො එක් පැහැ ඇති නානා රත්නයෙන් විසිතුරු වූ සිය දහස් ගණන් ධජ මාලාවෙන් ද, රන් දම්-රිදී දම්-මුතු දම්-මැණික් දම් එල්වා අලඞ්කාර කොට මිණි කිකිණි දැළින් වට කරණ ලද රන් රුවන් මය මුදුන් මල් කඩින් හා ලම්බමාන පෙති පතර ඇති රන් පියුම් රුවන් කෙමි ආදියෙන් යුක්ත වූ සත් රුවන්මය මාහැඟි වියනින් ද ඒ ඇගෑ මුදුන නිරන්තරයෙන් සරහා අලඞ්කාර කෙරෙති.

ඇම කල ම දිව මල් වැසි වස්සී. දෙව් මිනිස් ලොව ඇති නො එක් ජාතියෙහි සුවඳ සුණු අහසින් බස්සී. ඒ ඇගෑ මුදුනෙහි පස්වනක් පැහැයෙන් විසිතුරු වූ දස දෙස ආලොක පැතිරෙන මනහර වස්ත්‍ර ජාතිහු පවන් වේගයෙන් ලෙළ දි දී දස දිග හොබවා සිටීති. ඒ බුදුන් කෙරෙහි පහන් වූ දෙව් මිනිස්සු නිරන්තර ව කෙළිති. නටති. අත්පොළසන් දෙති. සාධු නාද පවත්වති. හාත්පස එකනිග්ඝොස එකනින්නාද කෙරෙති.

ගඳ කිළි දෙර ඉදිරියෙහි පැන නැංගා වූ දහසක් රියන් උස ඇති රුවන් ඇගෑ හා රන් තොරණ පන්තිහු විසිතුරු ධජ මාලාවෙන් විභූෂිත ව ඒ ඒ දිග විහිදුනා රශ්මි සමූහයෙන් ශොභාමත් ව බබළති. ඒ ඇගෑ හා තොරණ පන්ති මධ්‍යයෙහි මහ පොළොව පළා ගෙණ හාත්පසින් දෙළොස් යොදුන් පමණ රුවන් මණ්ඩප

Non-Commercial Distribution

යෙක් නැහෙ යි. ඒ මණ්ඩප ය සතර කොන තිස් තිස් රියන් දිග ඇති මහ මිණි සතරෙක් මැවී තිබෙ යි. ඒ මිණි සතර පවතින් පහළ වේලෙහි නික්මෙන්නා වූ ශබ්ද ය මුළු සක්වළ පැතිර එකතින් නාද කෙරෙ යි. ඒ මණ්ඩප ය මැද සත් රුවනින් විසිතුරු වූ ඉඳුනිල්මිණි පලඟෙක් මැවෙ යි. ඒ මුදුනෙහි සත් රුවන්මය දිව සේසතෙක් මැවී සිටි.

එ කල ඒ ඇගෑ සතර හා තොරණ පන්ති මැද පිහිටි මණ්ඩප යෙහි බික් සඟුන් පිරිවරා මිණි පලඟ වැඩ හුන් බුදුහු බඹ ගණ පිරිවරා හුන් මහබඹා සේ ද දෙව් ගණ පිරිවරා පඬු ඇඹුල් සලසුන් නැඟී හුන් සක් දෙව්ඳු සේ ද අතිශයින් බබළති.

තව ද ඒ මණ්ඩපයෙහි ඒ ඒ කොන්වල පියගඳ කුසුම ආදීන් සුවඳ කවන ලද මිහිරි සිහිල් දිය පිරි සත් රුවන්මය වූ මහ දිය කළ පන්ති ද, සිවු දෑ ගඳින් පිරුණා වූ රුවන් කරඬු පන්ති ද, සුවඳ තෙලින් දල්වන ලද සත්රුවන්මයි වූ පහන් රුක් පන්ති ද, අතුරු නො දී සතර දිග පිළිවෙළින් තිබෙ යි. ඒ තොරණ ඇගෑ මණ්ඩප පියුම ආදී වූ සියල්ල ම බුදුන් ගමන් නික්මෙන වේලෙහි කැටිව ම නික්මෙ යි. උන් සිටි සැතපුණු වේලෙහි ඒ ඒ තැන ම සිටි. නැවත කුල ගමට එළඹෙන වේලෙහි ද කැටි ව ම නික්මෙ යි. එ කල ඒ මණ්ඩපයෙහි මිණි ගිගිරි ශබ්දයෙන් වඩනා බැව් දන මනුෂ්‍යයෝ පෙර ගමන් කෙරෙති. මෙ සේ කුල ගමට වැද වළඳා බණ දෙසන වේලෙහි දී ඒ බුදුන් ගේ ශබ්දය අසා නො එක් දෘෂ්ටිගතුවෝ බුද්ධාලම්බන ප්‍රීති උපදවා ගෙණ ඒ ඒ තැන ම සිටියාහු බුදුන්ගේ නො එක් ආශ්චර්‍ය්‍ය දක තමන් තමන් ගත් මිථ්‍යා දෘෂ්ටි හැර සරණ ශීලයෙහි පිහිටා ලොවී ලොවුතුරා සැප ත් සාධා ගනිති.

ඒ මෙතේ බුදුන් නො වරදවා දක්නෝ කවුරු ද, නො දක්නෝ කවුරු ද යත්— පඤ්චානන්තරිය කර්මයෙහි හැසිර අවීචියෙහි උපන්නාහු ත් නියත මිථ්‍යා දෘෂ්ටිකයෝ ත් ආර්‍ය්‍යයන්ට බස හෙළා දෙඩුවාහු ත් අරුතල ආදී වූ ස්ථානවල උපන්නාහු ත් නො දකිති. ඉන් ආර්‍ය්‍යයන්ට බැණ දෙඩුවාහු ආර්‍ය්‍යෝපවාද විධි ලෙසින් දෙසා ගත්තු නම් උඹ දකිති.

එ සේ කල දක්නෝ කවුරු ද යත්— මෙ කී දෙය නැති ව තව ද මෙතේ බුදුන් දකුම්ව යි සිතා දන් දුන්නාහු ත් පන් සිල් පමණක් වුව ත් සිල් රක්කාහු ත් ති ලකුණු පමණක් වුව ත්

භාවනා කළාහු ත්, පොහෝ නො වරදවා පෙහෙවස් විසූවාහු ත්, දාගබ් මහබෝ පිහිටු වූවාහු ත්, පින් නිසා මල් වතු කැරවූවාහු ත්, පල ගන්නා ගස් කොළ ලැවූවාහු ත්, හේ දඬු ලැවූවාහු ත්, අම්බලම් ගොනටු කැරවූවාහු ත්, ළින් පොකුණු කැරවූවාහුත්, පසු බස්නා ශාසන ය පිහිටු වූවාහු ත්, බණ කියන්න වුන් හිඳ බණ කියන නියායෙන් බණ ගෙවල් කරවා බණ කියන්ට හිඳිනා හසුන් විජිනි පත්‍ර අතට දුන්නාහු ත්, තමා බණ කියා ගත නො හෙත ත් සංග්‍රහ විඳුනවුන්ට සංග්‍රහ කොට බණ කියවූවාහු ත්, මවු පියන්ට උපස්ථාන කළාහු ත්, කුල දෙටුවන් පිදූවාහු ත්, දස පින් කිරිය වත් පිරූවාහු ත්, තවද මෙත් බුදුන් දකුම් ව යි සිතා එක මල් මිටක් පමණ වුව ත්, එක පහනක් වුව ත් පිදූවාහු ත්, වඩා නැත ත් බත් ආලෝපයක් පමණක් දුන්නාහු ත්, තමා පින් කළ නො හෙත ත් අනුන් කළ පින් අනුමෝ වූවාහු ත් බාධා නැති ව දකිති.

ඒ බුදුන් උපදනා නුවර නම් දඹදිව් නමැති වොටුන්නෙහි මැඳුම් පියෙස් නමැති වොටුනු අග ඔබා ලූ මැණිකක් වැනි වූ කෙතුමතී නම් නුවර. එ වකට බමුණු කුල ය උතුම් බැවින් උභය කුල පරිශුද්ධ වූ සුබ්‍රාහ්මණ නම් බමුණු උතුමාණකෙණෙක් ඒ බුදු රජුන්ට පිය වෙති. එ සේ ම උභය කුල පරිශුද්ධ වූ බ්‍රහ්මවතී නම් බැමිණි කෙණෙක් මවු වෙති. අශෝක නම් තෙර කෙණෙක් දකුණු ත් සවු වන සේක. බ්‍රහ්මදෙව නම් තෙර කෙණෙක් වමත් සවු වන සේක.

උපස්ථායක තෙරුන් වහන්සේ සීහ නම් වන සේක. පදුමාය, සුමනා ය යන මෙහෙණින්නෝ දෙ දෙනක් අග්‍ර ශ්‍රාවිකා වෙති. සුධන නම් වූ ත් සඞ්ඝ නම් වූ ත් උපාසකවරු දෙ දෙනෙක් නිරන්තර ව උපස්ථාන කෙරෙති. යසවතී නම් වූ ත් සංඝා නම් වූ ත් උපාසිකාවරු දෙ දෙනෙක් උපස්ථාන කෙරෙති. බොධි වන්නෙ නා ගසෙක. උසින් අටාසූ රියන් සේක. අසූ දහසක් හවුරුදු ජීවත් වන සේකැ යි සලකා නිවන් රස අනුභව කිරීමෙන් චිත්ත සුද්ධි ය කළ යහපති.

Non-Commercial Distribution

## 345. ග්‍රන්ථාවසාන ය

සද්ධම්මට්ඨිතිමිච්ඡන්තො – 'ධම්මසෙන' යතිස්සරො,
අකාසි පවරං එතං – 'සද්ධම්මරතනාවලිං.'

දසබලසෙලප්පභවා – නිබ්බාණ මහාසමුද්දපරියන්තා,
අට්ඨඞ්ගමග්ගසලිලා – ජිනවචන නදී චිරං වහතු.

ධම්මස්සෙනවතො'ථවා යසවතො ධම්මෙන ධම්මද්ධජො,
පුණ්ණින්දුජ්ජුති ධම්මසෙන ඉති යො ථෙරො මහාවිස්සුතො
ජෙතං සො සුචිරං තිපෙටකධරො සාධූහි සම්භාවිතො.
යෙනෙ'සා රතනාවලී විරචිතා සද්ධම්ම වංසුබ්භවා.

පූජ්‍යාචාර්‍ය්‍ය ධර්‍මසේන යතීශ්වරයන් ලියූ
සද්ධර්‍ම රත්නාවලී නම් වූ ප්‍රබන්ධය
මෙ තෙකින් නිමියේ යි.

Non-Commercial Distribution